Ministerial Consultative Committee on Justice and National Integration

The Hon. Harshana Nanayakkara (Chairman), The Hon. Muneer Mulaffer, The Hon. Rauff Hakeem, The Hon. G.G. Ponnambalam, The Hon. U.P. Abeywickrama, The Hon. M.K.M. Aslam, The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, The Hon. (Mrs.) Chamindranee Kiriella, The Hon. Sarath Kumara, The Hon. (Mrs.) Nilanthi Kottahachchi, The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, The Hon. (Mrs.) Thushari Jayasingha, The Hon. (Mrs.) Anushka Thilakarathne, The Hon. Susantha Dodawatta, The Hon. (Prof.) Sena Nanayakkara, The Hon. Chithral Fernando, The Hon. (Dr.) S. Sri Bavanandarajah, The Hon. Priyantha Wijerathna, The Hon. (Mrs.) Hiruni Wijesinghe, The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara, The Hon. Chandima Hettiaratchi, The Hon. Bhagya Sri Herath

PARLIAMENT

THE SPEAKER - The Hon. (Dr.) Jagath Wickramaratne
THE DEPUTY SPEAKER AND CHAIRMAN OF COMMITTEES - The Hon. (Dr.) Rizvie Salih
THE DEPUTY CHAIRPERSON OF COMMITTEES - The Hon. (Mrs.) Hemali Weerasekara

PRINCIPAL OFFICIALS

SECRETARY-GENERAL OF PARLIAMENT – Mrs. K.A. Rohanadeera
CHIEF OF STAFF AND DEPUTY SECRETARY-GENERAL OF PARLIAMENT- Mr. G.K.A. Chaminda Kumara Kularatne
ASSISTANT SECRETARY-GENERAL - Mr. A. H. M. H. H. S. Abeyrathne

OFFICE OF THE SECRETARY-GENERAL OF PARLIAMENT

CO-ORDINATING SECRETARY TO THE SGP - Mrs. S.P. Gamage
PARLIAMENTARY OFFICER - Mrs. E.A. Sirisena
CONSTITUTIONAL COUNCIL - Mrs. S.R.W. Gunasekara, Miss. D.I.T. Sarathchandra, Mrs. C.S.C. Fonseka (Assistant Principal Officers)

INTERNAL AUDIT OFFICE

CHIEF INTERNAL AUDITOR – Mr. W.K.D.C. Withana
PRINCIPAL OFFICER - Mrs. G.N.D. Thilakarathna
ASSISTANT PARLIAMENTARY OFFICER - Mrs. W.R.G.S. Shamalee

DEPARTMENT OF THE SERJEANT-AT-ARMS

SERJEANT-AT-ARMS - Mr. Kushan Sampath Jayarathna
DEPUTY SERJEANT-AT-ARMS - Mr. N.A.S. Cooray
ASSISTANT SERJEANT-AT-ARMS - Mr. K.S.L. Kadigamuwa
Mr. P.D.N. Fernando, (Deputy Principal Officer); Mr. U.D.M.M. Wijesinghe (Assistant Principal Officer); Mr. A.G.R.K. Abeyrathne (Parliamentary Officer); Mrs. N.A. Dharmadasa (Telephone Supervisor); Mrs. K.T.D. Sooriyabandara (Assistant Parliamentary Officer)

ADMINISTRATION DEPARTMENT

DIRECTOR (ADMINISTRATION) - Mrs. C.I. Dissanayaka

DEPUTY DIRECTOR (ADMINISTRATION) - Mrs. E.D.S.M. Fernando

ESTABLISHMENTS OFFICE - Mr. W.A.K.C. Udapola (Assistant Director - Administration); Mr. P.G.P. Priyankara, Mrs. V.P.G.S. Vidanapathirana (Principal Officers); Mrs. J.A.D. Jayasinghe (Deputy Principal Officer); Mrs. K.I.M. Perera, Mrs. W.S.Y. Zoysa, Mrs. G.M.H.S. Gamlath, Mrs. R.R.G.D.K. Jayathilaka (Assistant Principal Officers); Mrs. U.G.T.P. Gunasekara, Mrs. I.U. Dewage (Parliamentry Officers); Mrs. H.A.R.R. Gunasekara (Assistant Parliamentary Officer)

MEMBERS' SERVICES OFFICE - Mr. K.P. Chandana, Mr. W.P.J. Pushpakumara Pathirana (Principal Officers); Mr. J. Naseerdeen (Deputy Principal Officer); Mr. A.G.M.M.M. Nusky (Parliamentary Officer)

HUMAN RESOURCE DEVELOPMENT OFFICE – Mr. P. K. D. S. W. Wijegunawardena (Principal Officer); Mrs. G.K.S. Priyadarshani (Assistant Principal Officer)

FOREIGN RELATIONS AND PROTOCOL OFFICE – Mrs. G.V. Ama Sudanthi, Mrs. T.W.A. Jayaratne, Mr. H.N.D.R.B. Nanayakkara (Senior Parliamentary Protocol Officers)

TRANSPORT OFFICE - Mr. H.M.L.A. Samaranayake (Transport Officer); Mrs. R.C. Kulathilaka, Mr. D. A. M. Baddewithana (Assistant Principal Officers); Mr. R.P.H. Kularatne, Mr. G.M. Prasantha (Assistant Parliamentary Officers)

RIGHT TO INFORMATION UNIT - Mrs. N.N. Hettige (Parliamentary Officer)

SENIOR STENOGRAPHERS - Mr. H.P.C.S. Tilakaratne, Mr. R.P. Rasika Rajapaksha

STENOGRAPHERS - Mrs. P.D.N.P. Kumari, Mrs. S. Rajanimala, Mrs. D.W.B.A. Jayanatha, Mrs. P.W.C. Priyadarshani

SENIOR TRANSLATORS - Mrs. A. Rukmanidevi, Mr. S.M. Nazir, Mr. M.M. Haleemdeen

BUNGALOW MANAGER - Mr. D.M.P. Athukorala, Mr. Y. M. Chaminda

RECORD KEEPER - Mr. E.K.K.P. Pushpalal

DOCUMENTATION SUPERVISOR – Mr. S.V. Bokalawela

HANSARD DEPARTMENT

EDITOR OF HANSARD – Mrs. C.N. Lokukodikara de Silva

DEPUTY EDITORS OF HANSARD – Mrs. S.K.M.W. Samarasekera, Mr. M.S.M. Linnas, Miss H.G. Pujika

ASSISTANT EDITORS OF HANSARD - Mrs. R.D.P. Sujeewani, Mrs. D.P.A.N.N. Weerasinghe, Mrs. K.G.N.P. Rabel, Mrs. K.P.S. Perera, Mrs. K.D.S. Kularatne Aluthgamage, Miss Geethani Warnasuriya, Mr. H.G. Lakshitha, Mrs. P.M.G.P. Priyangika, Mrs. M.I.S. Nishra, Mrs. E.H.W. Irangika, Mrs. T.T. Kumanayake

SENIOR HANSARD REPORTERS – Mrs. P.V.T.V. Gamage Arumadura, Mrs. W.A.D.P. Wijekonda, Miss S.M.A. Kumuduni, Mrs. F.H.A.N. Silva, Mrs. H.R.P. Chandani, Miss C.R. Karunaratna, Mr. M.T.A.D. Millagastenna, Mr. H.G. Manjula, Mrs. D.R.D. Hettige, Miss M.M.C.K. Marasinghe, Mrs. M.P. Niroshi Sajeewani, Mrs. T.U. Weerasekara, Miss G.A. Hiruni Punsara, Mr. K.M.D. Lanka, Mrs. M. Pushpakumara, Mrs. T.N. Samarasinghe, Mrs. H.R.U.S. Nivarchana

HANSARD REPORTERS – Mrs. E.V.T.R. Edirisinghe, Mrs. Indunil Dhammika, Mrs. M.A. Jesmina, Miss A. Mirunalini, Mrs. W.G.P.R. Samanmali, Mrs. R.S. Alahapperuma, Mrs. H.G. Maduka Shithari, Mrs. M.B.T.N. Priyadarshani, Miss S. Thushanthini, Miss S.U. Ranasinghe, Mrs. M.A.K.S. Sanjeewani, Mrs. S.N. Kalawana

SENIOR COMMITTEE REPORTERS - Mrs. P.G.K.N. Mihiri, Mrs. J.A.T. Samanthika

COMMITTEE REPORTERS – Mrs. J.K.I. Nilmini, Mrs. L.P.Wadanambi, Miss T.P.R.T. Kumari, Mrs. D.S. Hewavithana, Miss R.P.G. Kumari

SENIOR INDEXING OFFICERS – Mr. M.M.M. Nasaar, Miss S.A.D. Manori, Mrs. M.B.V.N.T. Fernando, Mr. A.M.C.M. Adikari

RECORDING SUPERVISOR – Mr. S.D.S.K. Thilakasiri

FINANCE AND SUPPLIES DEPARTMENT

DIRECTOR (FINANCE) – Mr. G. Sarath Kumara

FINANCE AND ACCOUNTS OFFICE – Mrs. K.A.I. Senarathna (Assistant Director - Administration); Mrs. D.V.O. Weerakoon (Principal Officer); Mrs. R.A.N.D. Alwis, Mr. R.C. Wijayathilake (Deputy Principal Officers); Mrs. L.D.H. Molligoda, Miss H.M.D. Lakmali, Mrs. H.E.C. Silva, Mr. T.G. Balasooriya, Mr. K.M.G.K. Jayawardana (Assistant Principal Officers); Miss. L.B.L.I. Laddusinghe (Parliamentary Offices)

SUPPLIES AND SERVICES OFFICE – Mr. N. N. Wewelwela (Assistant Director—Administration); Mrs. H.A.T.D. Hewarachchi (Principal Officer); Mrs. D.M.D. Alahakone, Mrs. G.R.U. Gamage (Deputy principal Officers); Mrs. E.A.N.M. Edirisinghe, Mrs. U.M.S. Prabhashini, Mrs. M.S. Bandulahewa (Assistant Principal Officers); Mrs. B.N.H. Tissera (Senior Help Desk Co-ordinator)

CATERING ACCOUNTS OFFICE – Mr. I.M.A.K. Idirisinghe (Assistant Parliamentary Officer)

RECEIVING OFFICER – Mr. B. K. Sampath

SHROFF – Mr. M.G.N.G. Dharmasena

STOREKEEPER (TECHNICAL) - Mr. M.P. G. Silva

PURCHASING OFFICER - Mr. M.G.P.K. Dharmasena

DEPARTMENT OF THE CO-ORDINATING ENGINEER

CO-ORDINATING ENGINEER – Mr. D.L.D. Adikari

DEPUTY CO-ORDINATING ENGINEER – Mr. K. K. D. Hannadi

CHIEF INSPECTOR (ELECTRICAL) – Mr. P.W.A.U.K. Dayaratne

CHIEF INSPECTOR (CIVIL) – Mr. C.S. Balasooriya

INSPECTOR (ELECTRICAL) - Mr. W.R.A. de Mel

INSPECTOR (CIVIL) – Mr. C. U. B. Gamage

SENIOR TECHNICAL OFFICER (ELECTRICAL) - Mr. P.A.S. Lalith Kumara

TECHNICAL OFFICER (ELECTRICAL) - Mr. N.M.S.S. Nawarathne

TECHNICAL OFFICER (CIVIL) - Mrs. H.D. Jayakody, Mr. P. R. Wickramaarachchi

ASSISTANT PARLIAMENTARY OFFICER - Mr. B..K. Chanaka

CATERING AND HOUSEKEEPING DEPARTMENT

DIRECTOR (CATERING AND HOUSEKEEPING SERVICES) - Mr. R. H. Edirisinghe

EXECUTIVE CHEF - Mr. L.K.C.S. Gajanayaka

EXECUTIVE HOUSEKEEPER - Mr. D.D.I. Thushara

F & B MANAGER - Mr. K.S. Sumanaweera

DEPUTY F & B MANAGER - Mr. G.D. Anil

SOUS CHEF - Mr. D.M.M.M.B. Ulapane

ASSISTANT HOUSEKEEPER -

RESTAURANT MANAGERS - Mr. W.N.R. Wijewardena, Mr. D.H.B.B. Pathmasiri, Mr. H.D.T. Priyantha, Mr. J.A.S.K. Jayakody, Mr. W.D.S.R. Kumara

GARDEN SUPERVISOR – Mr. R.M.J. Rajapaksha

SENIOR HOUSEKEEPING SUPERVISORS - Mr. M.D.E.M.N. Karunarathna, Mr. S.D. Rathnasiri

HOUSEKEEPING SUPERVISORS – Mr. G.R.S.K.D. Gamlath, Mr. B. D. Jagath Kumara, Mr. N.H.M. Janaka

F & B SUPERVISORS - Mr. N. W. M. Turin, Mr. A.D.D.S. Gunasekara, Mr. S.J. Gamage, Mr. H.R.K.S.K. Peiris, Mr. U.A.D. Nishantha, Mr. I.G.C. Kumara

KITCHEN STEWARDING SUPERVISOR - Mr. G.A. Wijesinghe

CHEF-DE-PARTIE - Mr. P.R. Wijesinghe, Mr. B.T.R. Hewamana , Mr. R.P. Helambage, Mr. M.W.W.M.P.C.C. Walgama

LEADING COOKS - Mr. A.A.D. Suranga, Mr. K.V.A. Jayawardena, Mr. R.M.M. Srimal, Mr. G.S.P. Suraweera, Mr. B.A.P. Pushpakumara, Mr. D.A.A. Amarathunga, Mr. P.D.P. Pushpakumara, Mr. M.B.A.P. Muthukumarana, Mr. R.K.A.D.T. Roshan, Mr. R.L.A.C.P. Rajakaruna

DEPARTMENT OF LEGISLATIVE SERVICES

DIRECTOR (LEGISLATIVE SERVICES) - Mr. M. J. Perera

TABLE OFFICE - Mr. P.H. Kumarasinghe, Mr. K.R. Herath (Assistant Directors - Administration); Mr. R.A.R.L. Ranawaka, Mr. S.A.M. Shaheed, Mrs. T.M.N.P. Tennakoon (Deputy Principal Officers); Mrs. A.N.D. Gunarathna, Mrs. J.M.S. Nirmani, Mr. U.P.B.M. Undugoda, Miss D.R.K. Ranasinghe (Assistant Principal Officers); Miss E.H. Jayaweera, Mr. K.D.G.M. Krisantha (Parliamentary Officers)

BILLS OFFICE - Mr. W.W.N.S.C. Fernando (Assistant Director - Administration); Mrs. B.J.Abeysinghe (Principal Officer); Mrs. K.C.K. Peiris, Mrs. A.C.F. Nusrath (Deputy Principal Officers); Mrs. M.E.K.K. Fernando, Miss G.K.C. Thilakarathna (Assistant Principal Officers)

COMMITTEE OFFICE - Mrs. C.M. Bulathsinhala (Assistant Director - Administration); Mrs. U. N. Panditha (Principal Officer); Mr. D.G.M.S.M. Dehigahalanda, Mrs. W.L.S.D. de Alwis, Mr. M.A.K.D.C. Kumara, Mrs. R.M.S. Samanjika (Deputy Principal Officers); Mrs. W.M.L.M. Weerasinghe, Mrs. B.W.K.J. Welaratne, Mrs. H.N. Fernandopulle, Mr. T.H.S.U. Thirimanna (Assistant Principal Officers)

COMMITTEE OFFICE II – Mrs. H.M.C.N.K. Herath (Assistant Director - Administration); Mrs. S.W.T.R. de Silva (Principal Officer); Mr. H.U.P. Kumara, Mrs. D.C.S. Rupasinghe (Deputy Principal Officers)

PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE - Mrs. K.T.C.K. Peiris, Ms. S.R.M.H.G. Samaradiwakara, (Assistant Directors - Administration); Mr. L.B.R. Pathmasiri, Mrs. H.R. de Soysa (Principal Officers); Mr. S.L. Wickrma (Deputy Principal Officer); Mrs. R.A.D.N. Geyowanee, Mr. J.T.L.P. Sameera (Assistant Principal Officers); Mrs. G.V.S.K. Kumari, Miss. G.D.J.D. Ayeshmanthi (Parliamentary Officers)

PUBLIC PETITIONS COMMITTEE OFFICE - Mr. M.M.M. Mabrook (Assistant Director - Administration); Mrs. M.K.S.D. Alwis (Principal Officer); Mrs. R.P.Y.T. Warusavithana, Mr. M.R.D.T. Thilakasiri (Deputy Principal Officers); Mr. K.T.L.A. Chandrasiri, Mrs. T.P. de Costa (Assistant Principal Officers); Ms. D.I.T. Munasinghe (Parliamentary Officer)

MINISTERIAL CONSULTATIVE COMMITTEE OFFICE - Mr. D.D.U.K. Munasinghe (Assistant Director - Administration); Mrs. C.M. Subasinghe (Principal Officer); Mrs. O.R.A.M.D. Sewwanthi (Assistant Principal Officer); Mr. W.K.A.M.M.M. Arthanayaka (Parliamentary Officer)

NATIONAL COUNCIL OFFICE –

LIBRARIAN - Mr. S.L. Siyath Ahemed

DEPUTY LIBRARIAN - Miss K.D.S. Wijenayake

ASSISTANT LIBRARIAN - Mrs. J.P.M.P. Jayasinghe, Mrs. D.G. Wasana Madushani, Mr. A.H.L.A.R. Weerasiri

JUNIOR ASSISTANT LIBRARIAN - Mrs. W.K.H. Jayani, Mr. S.H.M.W. Samarakoon, Mr. W.A.A.Wekkasinghe

CHIEF RESEARCH OFFICER - Mrs. G.R.A. Godagama

SENIOR RESEARCH OFFICERS - Mr. M. Ajiwadeen, Mrs. P.L.T. Erandathi

RESEARCH OFFICERS - Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas, Mrs. D.S.P.A.K. De Silva, Miss A.G.J. Chathurika

ASSISTANT RESEARCH OFFICERS - Ms. G. H. M. S. S. Ananda

CHIEF PARLIAMENTARY INTERPRETER - Mr. C.J. Karunarathna

DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS - Mr. A.G. Mohamed Fiqrhi, Mr. K.D.R. Padmasiri, Mr. A. Saravanabavanandan

SENIOR PARLIAMENTARY INTERPRETERS - Mr. G.F.B. Sureshwaran, Mrs. N.B.C.J. Nissanga, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. M.H.M. Ramis, Mrs. A.L.A.D. Thiumini, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mr. D.D.V.N. Dhammage, Mr. M.Z.M. Azka

PARLIAMENTARY INTERPRETERS - Mr. M.I.M. Fazi, Mr. C. Manimaran, Mr. P.M.A. Hussain, Mr. B.M. Razeel, Mr. S. Pradeep

DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT) - Mr. N.B.U. Nawagamuwa

SYSTEMS ENGINEER - Mr. C.J. Willoraarachchi

SYSTEMS ANALYST - Mr. M.N.C. Wickramasinghe

COMMUNICATION / SECURITY ENGINEER - Mr. G.N. Lakmahal

SYSTEMS DESIGNER -

SYSTEMS ADMINISTRATOR - Mr. A.S.D.M. Wickramaratne

WEB AND NETWORK ADMINISTRATOR -

SENIOR COMPUTER PROGRAMMERS- Mr. D. Panditha, Miss P.M.M. Chandima

COMPUTER PROGRAMMER - Mrs. S.A.A.B. Athukorala

SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) - Mr. U.L. Geeganage

SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) - Mr. M.N.M. Shifaq

ASSISTANT PRINCIPAL OFFICER – Miss A.P.K.K.P. Thilakaratne

SENIOR COMPUTER OPERATORS - Mrs. P. Jehanya, Mr. J.S. Colambage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyathunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardhana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Ali, Mr. A.R.M. Rikaz Aly, Mr. A.M. Fowsul Ameen

SENIOR COMPUTER TECHNICIANS - Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

SENIOR TECHNICAL ASSISTANTS - Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

DEPARTMENT OF COMMUNICATION

DIRECTOR (COMMUNICATION) (ACTING) - Mr. M. J. Perera

PUBLIC OUTREACH MANAGER – Miss R.M.B.R. Ramanayake

MEDIA MANAGER – Mrs. R.M.N.P.M. Hathiyaldeniya

PUBLIC OUTREACH OFFICERS – Mrs. H.D.I.E. Wickramasinghe, Mr. P. Rudrakumar, Mr. M.G.D.L. Wickramasinghe, Mrs. Y.L. Rishmiya Nootan, Mr. A.S.M. Yasry

MEDIA OFFICERS – Mr. H.A.K.A.M. Jayalath, Mr. M. Pirassath, Mr. B.S.K. Ekanayake, Mrs. U.U.M. Perera

MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) – Mr. U.G. Nuwan Duminda

PUBLIC OUTREACH OFFICE COORDINATORS – Mr. A.G.P. Amarasinghe, Mr. S. Jeyaprakash

MEDIA OFFICE COORDINATOR - Mr. K.R.G. Jayathilaka

පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

දසවන පාර්ලිමේන්තුව - පළමුවන සභා වාරය

பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

பத்தாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்

PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

TENTH PARLIAMENT - FIRST SESSION

317 වන කාණ්ඩය **தொகுதி 317** **VOLUME 317**

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි 17වන සඳුදා
2025 பெப்ருவரி 17, திங்கட்கிழமை
Monday, 17th February, 2025

ප.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the following Reports:

(i) Budget, Economic and Fiscal Position Report 2025;
(ii) Major Public Investment Projects 2025-2027;
(iii) Citizens Budget 2025;
(iv) Medium-term Debt Management Strategy Report; and
(v) Annual Borrowing Plan.

I move that these Reports be referred to the Committee on Public Finance.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

The Draft Budget Estimates of the Democratic Socialist Republic of Sri Lanka for the Fiscal Year 2025 (Volume I, II and III) - [The Hon. (Dr.) Harini Amarasuriya]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් පනත් කෙටුම්පත සහ වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(i) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත; සහ

(ii) 2020 සහ 2021 වර්ෂ සඳහා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 7.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2025 - දෙවන වර කියවීම.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 10.34]

ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

පූර්විකාව

ගරු කථානායකතුමනි, අපේ රජයේ පළමු ජාතික අය වැය මේ සභාවට ඉදිරිපත් කිරීමට ලැබීම ගැන අප සතුටු වෙනවා.

ශ්‍රී ලංකාව 2022 වසරේදී නිදහසින් පසු එහි ගැඹුරුතම හා සංකීර්ණතම සමාජ, ආර්ථික හා දේශපාලනික අර්බුදයට මුහුණ දුන්නා. අර්බුදය 2022 වසරේදී එහි දරුණුතම අවස්ථාවට පැමිණියත්, අර්බුදයට බලපෑ කරුණු ඓතිහාසික මෙන්ම ව්‍යුහාත්මකයි. දූෂිත පාලනයන්, අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති සහ වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය මෙම අර්බුදයේ මූලයයි. මෙම තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස රටේ ආර්ථික ක්‍රියාකාරකම්වල සාමාන්‍ය තත්ත්වය බිඳ වැටුණා. එය ව්‍යාපාරවල සිට කුටුම්බ දක්වා සියලු අංශ සහ සමාජ කණ්ඩායම් විසින් අත්විඳිනු ලැබුවා. ඉන්ධන, විදුලිය, අත්‍යවශ්‍ය ආහාර, ඖෂධ ඇතුළු භාණ්ඩ හා සේවා හිඟය හේතුවෙන් රටේ ජනතාව, විශේෂයෙන්ම කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයන් සහ වැඩිහිටි ජනතාව දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්නා; වෘත්තියවේදීන් රට අත් හැර ගියා. ජනතාවට මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දින ගණන් දීර්ඝ පෝලිම්වල රැඳී සිටීමට සිදු වුණු අතර, ඇතැමුන් පෝලිම්වල රැඳී සිටියදීම මිය ගියා. 2022 වසරේදී ඇති වූ මේ අර්බුද හුදු ආර්ථික අර්බුදයක් පමණක් නොවේ, එතෙක් පැවැති දේශපාලන බලයේ දැවැන්ත අසාර්ථකත්වයක්. අර්බුදය කළමනාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මඟින් ආරම්භයේදී වූ ආර්ථිකයේ බිඳ වැටීම සැලකිය යුතු දුරකට පාලනය කර ඇතත්, 2022 වසරේදී ඇති වූ ආර්ථික අර්බුදය සමාජයේ දුප්පත්ම හා වඩාත්ම අවදානමට ලක්විය හැකි කොටස්වලට බලපාන මානුෂීය අර්බුදයක් බවට පරිවර්තනය වුණා.

ආර්ථික හා සමාජයීය වශයෙන් ඔබ්බට යමින් අර්බුදය රට තුළ දේශපාලනමය වශයෙන් වෙනසක්ද ඇති කළා. දරාගත නොහැකි ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බලයෙන් ඉවත් වීමට බල කරමින් දූෂිත පාලකයින්ට විරුද්ධව ජනතාව නැඟී සිටියා. ජනතා බලය විසින් ඔවුන් පලවා හරිනු ලැබුවා.

අනතුරුව, ජන වරම විකෘති කරපු තාවකාලික ආණ්ඩුවක් පිහිටුවනු ලැබුවා. මෙම තාවකාලික රජය දූෂිතයන් ආරක්ෂා කිරීම, දූෂණයේ යෙදීම, මහජන මුදල් නාස්ති කිරීම, ජනතා මර්දනය පෙර පරිදිම සිදු කළා. ඒ නිසාම සමාජ, ආර්ථික හා දේශපාලන පරිවර්තනයක් සඳහා වූ ජනතා අභිලාෂයන් ඉටු වුණේ නැහැ.

එවැනි විශාල අභිලාෂයකින් තමයි ජනතාව ඉදිරියට ආවේ. නමුත්, එම විකෘති පාලනය එම ජනතාවගේ අභිලාෂයන් ඉටු කරන්න අසමත් වුණා.

2023 වසරේ මාර්තු මාසයේ පැවැත්වීමට නියමිතව තිබුණු පළාත් පාලන මැතිවරණය කල් දැමීම මඟින් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ද ජනතාවගේ අභිලාෂයන් බිඳ දැමුවා.

2024 වසර අග දී පැවැත්වූ ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය තුළින් රටේ ආර්ථික, සමාජීය හා දේශපාලන ක්‍රමය වෙනස් කරමින්, පොදු සමෘද්ධිය කරා රට යොමු කිරීම සඳහා නොසැලෙන අධිෂ්ඨානයකින්, කැපවීමෙන් හා නායකත්වයෙන් ශක්තිමත් ජන වරමක් සහිත නව රජයක් පිහිටුවීමට ජනතාව ඉදිරිගාමී තීරණයක් ගනු ලැබුවා.

එම ජන වරම තුළින් පිළිබිඹු වන අපේක්ෂාවන් ඉටු කරලීමේ අරමුණින් යුතුව, තිරසාර ආර්ථික වර්ධනයක් හා සංවර්ධනයක් කරා අවශ්‍ය වන ආර්ථික පදනම සකසන මෙම අය වැය ඓතිහාසික අය වැයක් බවට පත් වෙනවා.

ආරම්භයේදීම අප මුහුණ දුන් එක් අභියෝගයක් වූයේ මෙම ජයග්‍රහණය වැළැක්වීමට උත්සාහ කළ අය විසින් අපගේ ආර්ථික ප්‍රතිපත්තියට සහ අපේ දැක්මට එරෙහිව ව්‍යාජ්ත කරන ලද මිථ්‍යාවන් සහ ද්වේශ සහගත ප්‍රචාරයන් විසින් ඇති කරන ලද වැරදි ප්‍රතිරූපය නිවැරදි කිරීමයි. එයට අප සමත්ව තිබෙනවා. ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඩොලරය රුපියල් 400 දක්වා ඉහළ යනු ඇතැයි ද, ඉන්ධන පෝලිම් යුගයක් යළි එනු ඇතැයි ද, ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් සහ රටවල් නව රජය හුදෙකලා කරනු ඇතැයි ද, ආයෝජකයන්ගේ විශ්වාසය නැති වී යනු ඇතැයි ද, පෞද්ගලික දේපොළ සම්පූර්ණයෙන්ම ජනසතු කරනු ඇතැයි ද යන වැරදි මත ප්‍රකාශයට පත් කළා මතක ඇති, මා හිතන විධියට බොහෝ අයට. කියපු අයටත් එක්ක හොඳේ. අපට එරෙහිව එවැනි ඍණාත්මක ප්‍රචාරණයක් සිදු වුණත්, ආර්ථිකය ස්ථාවර කිරීමටත්, ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීමටත්, ආයෝජකයින් අතර විශ්වාසය ඇති කිරීමටත් අපි සමත් වුණා.

ඒ අනුව, වාර්ෂික භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය සියයට 8.8 දක්වා අඩු වීමත් සමඟ මූල්‍ය අංශය ක්‍රමයෙන් ස්ථාවර වූ අතර, 2024 වසරේ දෙසැම්බර් මස ඇමෙරිකානු ඩොලර් මිලියන 570ක ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ ගෙවීම් සිදු කිරීමෙන් පසුව වුවද -පළමු වතාවට- 2024 අවසානයේදී විදෙස් මුදල් සංචිතය ඩොලර් බිලියන 6.1ක මට්ටමක පවත්වා ගැනීමට අප සමත් වුණා. මීට අමතරව, මුදල් අවප්‍රමාණය වීම පිළිබඳ සැක සංකාවන් පවතිද්දී වුවද, දළ වශයෙන් ඩොලරයට රුපියල් 300ක් පමණ ලෙස ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වුණා. 2025 වර්ෂය සඳහා සියයට 5ක පමණ ආර්ථික වර්ධනයක් අප අපේක්ෂා කරනවා.

2022 වසර මැද භාගයේ සිට අර්බුදය විසඳීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අනෙකුත් ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ සහාය ඇතිව ශ්‍රී ලංකාව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළා. මෙම අර්බුදය සමනය කිරීමේ ඇතැම් ක්‍රියාමාර්ග, විශේෂයෙන්ම පිරිවැය මත බලශක්ති මිල ගැළපුම, බදු වැඩි කිරීම් සහ පොලී අනුපාත ඉහළ දැමීම් වැනි පියවර පුරවැසියන් මත පීඩනයක් එල්ල කළා. ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන මඟින් ඉටු කරන ලද කාර්යභාරය අප වටහාගෙන ඇති අතරම, අපගේ ආර්ථික න්‍යාය පත්‍රය අප විසින්ම සකසා ගැනීම වෙනුවෙන් ආර්ථික ස්වෛරීත්වය ළඟා කර ගැනීම අත්‍යවශ්‍ය බව අපේ හැඟීමයි.

අපි මොන දේ කථා කළත් අද අපි ආර්ථික වශයෙන් ස්වාධීන හෝ ආර්ථික වශයෙන් අපේ ස්වෛරීභාවයක් නැහැ. අපි ඒක අහිමි කරගෙන තිබෙනවා. එය නැවත ළඟා කර ගැනීම අපේ අපේක්ෂාවයි.

මෑත අතීතයේ දී ආර්ථිකයේ සිදුවූ තවත් ප්‍රධාන කරුණක් වූයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය 2024 වසරේ දෙසැම්බර් මාසයේ අවසන් කිරීමයි. ඇත්තෙන්ම අප බලයට පත්වන විට රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ නිරත වෙමින් සිටි අතර, එයට සැලකිය යුතු වෙනසක් සිදුවුවහොත් එමඟින් ආර්ථිකය අස්ථාවර වීමට ඇති විය හැකි බලපෑම හමුවේ ඊට බාධා කිරීමට අපට අවශ්‍ය වූයේ නැහැ. මෙම තීරණය ගැනීමේ දී ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා දැනටමත් වැය කර ඇති සැලකිය යුතු කාලය සහ එම ක්‍රියාවලිය තවවුරටත් ප්‍රමාද වීම විසින් ඇතිවිය හැකි අමතර වියදම් පිළිබඳව ද අප සලකා බලනු ලැබුවා.

මේ තුළින් සැලකිය යුතු මට්ටමකින් ණය සහනයක් ලැබී ඇති අතර, මෙය ණය සේවාකරණයට අදාළ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කරනවා. විදේශ හා රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක ශක්තිමත් කිරීමට, අපනයන වර්ධනය සහ විදේශ ආයෝජන වැනි ණය වර්ධනය නොවන ලැබීම් වැඩිදියුණු කිරීමට සහ දිගු කාලීන මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා වන ලෙස අනාගතයේ දී ණය ආපසු ගෙවීම ක්‍රමවත්ව නැවත ආරම්භ කිරීමට මෙම රාජ්‍ය මූල්‍ය අවකාශය ප්‍රයෝජනයට ගැනීම අත්‍යවශ්‍ය වෙනවා.

මොකද, අපට නැවත ණය ගෙවන්න සිදු වන්නේ 2028දී. අපට ඒ සඳහා අවුරුදු 3ක වාගේ අවකාශයක් ලැබිලා තිබෙනවා. මේ අවකාශය අප උපයෝගී කර ගන්න ඕනෑ, ණය ගෙවා ගත හැකි ශක්තිමත් ආර්ථිකයක් බවට අපේ රට පරිවර්තනය කර ගැනීම සඳහා.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, ෆිච් රේටින්ග්ස් - Fitch Ratings - සහ මූඩීස් - Moody's - වැනි ප්‍රමුඛ ගෝලීය නියෝජිතායතන විසින් ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් එකවර කාණ්ඩ කිහිපයකින් ඉහළ නැංවුවා. ඒ අනුව ක්‍රමයෙන් ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනැගීම, වෙළඳාම සහ ආයෝජන අවස්ථා වර්ධනය කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු පිරිවැය අඩු කිරීම තුළින් ආර්ථික වර්ධනය ළඟා කර ගැනීමට අවස්ථාව විවෘත වී තිබෙනවා.

අනෙක් අතට, ඇති කළ ආර්ථික අර්බුදය බොහෝ දෙනෙකුට, විශේෂයෙන්ම සමාජයේ වඩාත්ම අවදානමට ලක් විය හැකි ජන කණ්ඩායම්වලට අඛණ්ඩව බලපෑම් කරමින් තිබෙනවා. ඒ අර්බුදය විසින් පහළ ස්තරයන්ට ඇති කර තිබෙන බලපෑම තවමත් මුළුමනින්ම අවසන් වී නැහැ.

2022 වසරේදී උද්ධමනය සියයට 70ක් දක්වා ඉහළ යාම ජීවන වියදම විශාල ලෙස ඉහළ යාමට හේතු වුණා. උද්ධමනය දැන් පහත වැටී තිබුණත්, බොහෝ භාණ්ඩ හා සේවාවල මිල මට්ටම් තවමත් ඉහළ මට්ටමක තිබෙන අතර, මිල වැඩි වූ තරමටම ජනතාවගේ ආදායම් වැඩිවීමක් සිදු වුණේ නැහැ. ඒ නිසා ජනතාවගේ ජීවන තත්ත්වය පහත වැටී තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය වසර දෙක තුළ මූර්ත වැටුප සැලකිය යුතු ලෙස පහත වැටී ඇති බැවින් සාධාරණ වැටුප් වැඩිවීමක් ලබා දිය යුතුව තිබෙනවා. තවද, රජය අස්වැසුම වැඩසටහන හරහා ආධාර ලැබිය යුතු ඉලක්කගත ප්‍රජාව වෙත ලැබෙන මුදල් ප්‍රමාණය වැඩි කර, ප්‍රතිලාභ ලැබෙන කාලසීමාව දීර්ඝ කර ඇති අතර, අවශ්‍යතා ඇති අයට සහන සැලසීම සඳහා වෙනත් සමාජ ප්‍රතිලාභ ලබා දී තිබෙනවා.

කෙසේ වුවත්, ශ්‍රී ලංකාව තුළ පැතිරී ඇති දිළිඳුකම තුරන් කිරීම සඳහා මෙවැනි මුදල් ආධාර පමණක් ලබා දීම තිරසාර විසඳුමක් නොවෙයි. විවිධ දුෂ්කරතා සහ අභියෝග හේතුවෙන් ඵලදායී ආර්ථික කටයුතුවල නිරතවීමට නොහැකි පුරවැසියන් රැකබලා ගැනීම මානුෂික රජයක යුතුකමකි. අස්වැසුම වැඩසටහනට ප්‍රතිලාභීන් ඇතුළු කිරීමේ සහ බැහැර කිරීමේ දෝෂ ඇති බව අප කවුරුත් දන්නවා.

අපි දන්නවා, ගමකට ගියාම අස්වැසුම ලැබිය යුතු පිරිසක් ඉන්නවා, නොලැබෙන; සමහර පිරිසක් ඉන්නවා, එය නොලැබෙන. ඒ නිසා මෙතැන ප්‍රශ්නයක් මතු වී තිබෙන බව අපි කවුරුත් දන්නවා.

එම වැඩසටහන සඳහා වඩාත් සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට රජය සැලසුම් කර තිබෙන්නේ ඒ නිසායි. ඒ අතරම, සියලු ජනතාවට ඔවුන්ගේ උපරිම විභවතාවෙන් ආර්ථික ක්‍රියාකාරකම්වල නියැළීමේ අවස්ථා වැඩිදියුණු කිරීම තුළින් දරිද්‍රතාව පිටුදැකීම සඳහා තිරසාර විසඳුමක් ද අවශ්‍ය වෙනවා.

සියලු ම පුරවැසියන්ට ආර්ථික ක්‍රියාවලියට සහභාගි විය හැකි පරිදි අවස්ථා වැඩිදියුණු කර, එහි ප්‍රතිඵල සමාජයේ සෑම ස්තරයකටම සාධාරණ ලෙස ලබා ගත හැකි අයුරින් ආර්ථික

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

වර්ධනය සිදු විය යුතුයි. සමාජයේ සියලු ම සාමාජිකයන්ගේ ජීවිත නහාසිටුවීමේ මාධ්‍යයක් මිස ආර්ථික වර්ධනය හුදෙක් ආර්ථික ක්‍රියාවලියේ ප්‍රසාරණයකට පමණක් සීමා වේ නම්, සමාජයට ඉන් ඇත්තේ කුඩා ප්‍රයෝජනයක් පමණයි. දශක කිහිපයක් තිස්සේ ආර්ථික ක්‍රියාකාරකම් සහ ආර්ථික ප්‍රතිලාභ සංකේන්ද්‍රණය වී තිබෙන්නේ සුළු පිරිසක් අතයි.

ඒක අපි පිළිගත යුතුයි. ඉතා කුඩා කණ්ඩායමක් අත අපේ ආර්ථිකයේ බලවත් කොටසක් සංකේන්ද්‍ර වී තිබෙනවා.

මෑත කාලීන, එනම් 2019 කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව, ඉහළම ආදායම්ලාභී කුටුම්භ සියයට 20ක් සමස්ත ගෘහස්ථ වියදම්වලින් සියයට 47ක් සිදු කරනු ලබනවා. එමෙන්ම, 2023 වසරට අදාළව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 44ක් සඳහා දායක වී තිබෙන්නේ බස්නාහිර පළාතයි.

මේ දත්තවලින් පෙන්නුම් කරනු ලබන්නේ අපේ ආර්ථිකය මොන තරම් ප්‍රමාණයකින් සංකේන්ද්‍ර වී තිබෙනවාද කියන වගයි.

ඒ අනුව අපට ඉදිරියට යාමට ආර්ථික අවස්ථා වඩාත් සාධාරණව බෙදී යන ආර්ථිකයේ විශාල ප්‍රජාතන්ත්‍රීකරණයක් අවශ්‍ය වෙනවා. පොදුජන අරගළ සහ පසුගිය වසරේ පැවැති මැතිවරණවලදී ජනතාව තම දේශපාලන අයිතීන් තහවුරු කර ගත්තා. දැන් අත්‍යවශ්‍ය වී තිබෙන්නේ ජනතාවගේ ආර්ථික අයිතිවාසිකම් ද තහවුරු කිරීමයි. මෙම අය වැයේ දර්ශනය වන්නේ එම ආර්ථික අයිතිවාසිකම් තහවුරු කිරීමයි.

මෙවර අය වැය සකස් කොට තිබෙන්නේ බොහෝ සීමාවන්ට යටත්වයි. 2022 වසරේ සිට අප අත්විඳින ආර්ථික අර්බුදයේ බරපතළකම ගැන අප අමතක නොකළ යුතුයි. බොහෝ රටවල් ස්වෛරීත්ව ණය පැහැර හැරීමකින් අනතුරුව "අහිමි දශකයක්" ලෙස හඳුන්වනු ලබන කාලයක් ඔස්සේ ගමන් කොට තිබෙනවා. ණය අර්බුදයට පත් වුණාම, ණය ගෙවා ගන්න බැරි වුණාම, රටක් බංකොලොත්භාවයට පත් වුණාම බොහෝ රටවල් ඒ රාජ්‍යයට අහිමි දශකයක් ගතකොට තිබෙනවා. දශකයක කාලයක්; තමන්ගේ සියල්ල නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වී තිබෙනවා.

කෙසේ වුවත්, මේ වනවිට අප යම් ස්ථාවරත්වයක් අත්පත් කරගැනීමට සමත්ව තිබෙනවා. මෙය ශක්තිමත්ව ස්ථාවර කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය විනය, ආර්ථික දැක්ම සහ මහ පෙන්වීම සහිතව මෙම අය වැය සකස් කොට තිබෙනවා. එහි අරමුණු ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය කරුණක් වන දේශපාලන නායකත්වය සැපයීමට අප සූදානම්.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ රාජ්‍ය මූල්‍ය නීතියක් ලෙස, ප්‍රාථමික වියදම් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක සීමාවක් දක්වා තිබෙනවා. ඒ වාගේම මෙවර අය වැය මෙම අවශ්‍යතාවට අනුකූලව සකස් කොට තිබෙනවා. එබැවින්, වියදම්වලින් හොඳම සමාජ ප්‍රතිලාභය ලබා ගැනීම සහතික වන ලෙස සීමිත බදු අරමුදල් ප්‍රවේශමසහගත ලෙස කළමනාකරණය කිරීම කෙරෙහි අප අවධානය යොමු කොට තිබෙනවා.

මා හිතන විධියට, විපක්ෂයේ හිටපු බොහෝ අයටත් මේක අවධානයට යොමු විය යුතුයි. සීමිත බදු මුදල් ප්‍රමුඛතාවෙන් යුතුව පරිහරණය කිරීම තමයි, පාලකයන් හැටියට අපේ වගකීම. හැබැයි, සමහර ප්‍රවෘත්තිවලින් අපි දකිනවා, හිටපු අය සීමිත බදු මුදල් පරිහරණය කරන්නේ කොහොමද කියලා. තේරුම් ගන්න මේක. අපට වගකීමක් තිබෙනවා, මේ සීමිත බදු මුදල් අපි ප්‍රමුඛතාවෙන් යුතුව අත්‍යවශ්‍ය කරුණු සඳහා යොදවන්නේ කොහොමද කියන එක ගැන. කිසිදු කෙනෙකුට ඒ මූල ධර්මයෙන් බැහැර වීමට හැකියාවක් තිබේවි කියා මා විශ්වාස කරන්නේ නැහැ.

මෙවර අය වැයෙන් අපිට රිසි උපරිම අයුරින් මුදල් වෙන් කිරීමට නොහැකි වුණත් අපේ ප්‍රධාන ප්‍රමුඛතා රැසකට මුදල් වෙන් කිරීමට අපට හැකි වුණා. මෙම අවධානය යොමු කර ඇති ක්ෂේත්‍ර සාම්ප්‍රදායික අය වැයවලට වඩා වෙනස් වන අතර, අපගේ ජන වරම සමඟ ගැළපීම් සිදු කරන අතරම, දැනට සිදු කෙරෙමින් පවතින කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන්නට ද අප අරමුදල් වෙන් කර තිබෙනවා. අස්වැසුම වැඩසටහන සහ අනෙකුත් සමාජ සුබසාධන ප්‍රමුඛතා සඳහා අප වැඩි කළ වියදම්වලින් එය පැහැදිලි වෙනවා. දැඩි මූල්‍ය සීමාවන් අනුව, කළ හැකි උපරිම ප්‍රමාණයට යටත්ව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පොලී සහනාධාරය සඳහා අපි 2025 වසරේ ජූලි මාසයේ සිට මුදල් වෙන් කර තිබෙනවා. මෙම යෝජනා ක්‍රමය අවභාවිත කිරීම වැළැක්වීම සඳහා ශක්තිමත් යන්ත්‍රණයක් අප ඇති කරනවා.

ඒ වාගේම අපි දන්නවා, මීට පෙර මෙම යෝජනා ක්‍රමය ඉතාම අපහරණය වෙලා තිබුණු බව. ඒ සඳහා අපි විධිමත් ක්‍රමයක් ඇති කරනවා.

අප මෙවර අය වැයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් වෙන් කර තිබෙනවා. මෙය ආර්ථික වර්ධනය සඳහා රජයෙන් ලැබෙන ප්‍රධාන දායකත්වයක්. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අංශය ශක්තිමත් කිරීම, පොදු ප්‍රවාහනය, ග්‍රාමීය සංවර්ධනය හා සවිබලගැන්වීම, කෘෂිකාර්මික පුනර්ජීවනය, දේශීය ව්‍යවසායකත්වය, පර්යේෂණ දිරිගැන්වීම සහ දේශීය හා අපනයන-අභිමුඛ කර්මාන්තවල වර්ධනයට හා කාර්යක්ෂමතාවට ඇති බාධා ඉවත් කිරීමට කටයුතු කරනවා. මේ සියල්ලේ දී සහ අනෙකුත් රාජ්‍ය වියදම්වල දී ප්‍රමුඛත්වය, ඉලක්කගත කිරීම, ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ මුදල් සඳහා වටිනාකම සහතික කිරීම සම්බන්ධයෙන් අපි වැඩි සැලකිල්ලක් දක්වනවා. එම නිසා, මහජන මුදලින් වියදම් කරන සෑම රුපියලකින්ම ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභය වැඩි වනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. සෑම රුපියලක්ම අපි වියදම් කරන්නේ එක්කෝ ආර්ථික වශයෙන් හෝ සමාජයීය වශයෙන් ප්‍රතිඵල අපට අත්පත් විය යුතුය කියන බලාපොරොත්තුවෙනි.

අපි මේ ආර්ථිකය නහා සිටුවීමේ මාර්ගයේ අඛණ්ඩව ගමන් කරන විට තව තවත් රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් වෙනවා. කාර්යක්ෂමතා වර්ධනයන්, දූෂණය හා නාස්තිය ඉවත් කිරීම, වඩා හොඳ ඉලක්කගත කිරීම් සහ වඩා හොඳ බදු පරිපාලනය තුළින් සැලකිය යුතු ඉතුරුම් ප්‍රමාණයකට අවස්ථාව සැලසෙන විට, ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතා ඉටු කිරීමට අපට තව තවත් සම්පත් ලැබෙනු ඇති. ඒ නිසා රටක් ලෙස අප ඉවසිලිවන්තව කටයුතු කළ යුතු වන අතර, සාමූහික විනයකින් සහ දැඩි අධිෂ්ඨානයකින් යුතුව කටයුතු කරමින් අප ඉදිරියට යන විට එහි ප්‍රතිලාභ අපේ රටට ඉතා ඉක්මනින් ළඟා කරගත හැකි වේයැයි අප විශ්වාස කරනවා.

2025 අය වැයේ මූලධර්ම

මා මෙය පැහැදිලි කරන්නේ වෙන කිසිවක් නිසා නොව, අපේ ආර්ථික ප්‍රතිපත්තිය, අපේ ක්‍රියාමාර්ග පිළිබඳව යම් සැකයකට තුඩු දෙනවා නම්, ආර්ථිකය නහා සිටුවීමේදී අපේ දැක්ම සහ මූලධර්ම මොනවාද කියන එක කියන්නයි.

අය වැයක් යනු, ඉදිරි වසර සඳහා වන ආදායම් සහ වියදම් යෝජනා මාලාවක් පමණක් නොවේ. එය ආර්ථිකය නහා සිටුවීමේ සහ සමස්ත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රජයේ ප්‍රවේශය

පිළිබඳ පිළිබිඹුවක්. මෙම අය වැය තුළ ආර්ථික ප්‍රතිපත්ති අරමුණුවල සැපයුම් අංශයේ ප්‍රධාන අංශ තුනක් ඇතුළත් වෙනවා.

මේවා තමයි, අපේ ආර්ථික ප්‍රතිපත්තියේ මූලධර්ම.

i. කර්මාන්ත, සේවා හා කෘෂි කර්මාන්ත අංශවල නිෂ්පාදනයේ වර්ධනය.

අපි මේ ක්ෂේත්‍රවල නිෂ්පාදන වර්ධනයක් අත් පත් කරගත යුතුයි.

ii. මෙම නිෂ්පාදනය ජනතාවගේ සක්‍රිය දායකත්වය සහ සහභාගිත්වය මත සිදු විය යුතු වීම.

ජනතාවගෙන් හුදෙකලා කරන ලද ආර්ථිකයකින් පලක් නැහැ. නිෂ්පාදනය වර්ධනය කරගත යුතුයි, එයට ජනතාවගේ සහභාගිත්වය ලබාගත යුතුයි.

iii. නිෂ්පාදනයෙන් ලැබෙන ප්‍රතිලාභ සහ වර්ධනයන් සමාජය පුරා සාධාරණව බෙදී යා යුතු වීම.

මේවා තමයි, අපේ ආර්ථිකයේ මූලික මූලධර්ම වන්නේ.

ඒ හා සමානව භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම සැලකීමේදී රජයේ ප්‍රතිපත්තිය, අරමුණු වන්නේ; ඒ කියන්නේ අපි භාණ්ඩ හා සේවා වෙළෙඳ පොළ හැසිරවීමට බලාපොරොත්තු වෙන්නේ කොහොමද?

i. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා අඛණ්ඩව සැපයීම සහතික කිරීම.

ii. එවැනි භාණ්ඩ හා සේවා සාධාරණ මිලකට සැපයිය යුතු වීම.

iii. භාණ්ඩ හා සේවා පිළිගත හැකි මට්ටමේ ගුණාත්මක බවකින් යුක්ත වීම.

මේක තමයි රජයක් හැටියට අපට තිබෙන වගකීම. භාණ්ඩ හා සේවා අඛණ්ඩවත්, ගුණාත්මකවත්, සාධාරණ මිලකටත් පුරවැසියන්ට ලබා දීමේ වගකීම රජයක් සතුව තිබෙනවා.

මෙම සැපයුම සහ ඉල්ලුමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ යන්ත්‍රණය පහත පරිදි කටයුතු කරනවා.

i. වෙළෙඳ පොළ බලවේග ඔස්සේ සැපයුම, ඉල්ලුම සහ මිල තීරණය කරනු ලබන තරගකාරී වෙළෙඳ පොළ.

සමහර ක්ෂේත්‍ර සඳහා අපි තරගකාරී වෙළෙඳ පොළේ මිල තීරණය කිරීමට එකඟතාව පළ කරනවා. සමහර ඒවා නියාමනයෙන්.

ii. නියාමනය: මෙහිදී රජය විසින් නියාමන ආයතන හරහා වෙළෙඳ පොළ නියාමනය කිරීම.

සමහර ක්ෂේත්‍රවලට නියාමනය ඇතුළත් කරගත යුතුයි.

iii. ඇතැම් ක්ෂේත්‍රවල සැපයුම සහ ඉල්ලුම සඳහා සක්‍රිය රාජ්‍ය සහභාගිත්වය.

සමහර ක්ෂේත්‍ර තිබෙනවා, වෙළෙඳ පොළෙන් රජය පංගුවක් අත්පත් කරගත යුතුයි.

iv. සමහර ක්ෂේත්‍රවල නිෂ්පාදන සංවිධානය කිරීම.

සමහර ක්ෂේත්‍රවල නිෂ්පාදන සමුපකාර ආකෘතියකට සංවිධානය කළ යුතුයි. එය අපේ වැඩ පිළිවෙළ තුළ සඳහන් කර තිබෙනවා.

මෙවර අය වැය මෙම මූලධර්ම මත පදනම්ව සකස් කර තිබෙන අතර, සියලු පුරවැසියන් ක්‍රියාකාරී සහභාගිවන්නන්, ක්‍රියාකාරී පාර්ශ්වකරුවන් සහ ක්‍රියාකාරී ප්‍රතිලාභීන් වන ආර්ථිකයක් නිර්මාණය කිරීමට පදනමක් සැකසීමට අප අදහස් කරනවා. රජයේ කාර්යභාරය වන්නේ, මිනිසුන්ට තම ආර්ථික විභවයන් සපුරා ගැනීමට ඇති බාධා ඉවත් කර පහසුකම් සැලසීමයි. දුෂ්කර ප්‍රදේශයක ජීවත් වීම හේතුවෙන්, යම් පුද්ගලයෙකු ආබාධිතභාවයක් හේතුවෙන්, අධ්‍යාපන අවස්ථා නිහවීම හේතුවෙන්, මූලික යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන් තම ආර්ථික හැකියාව සපුරා ගැනීමට නොහැකි වූ විට ඒක අසාධාරණයක්. එවැනි විෂමතා මත ආර්ථිකයට සම්බන්ධ වීම සඳහා තිබෙන බාධා අපි ඉවත් කළ යුතුයි.

මෙය එක රැයකින් විසඳිය හැකි පහසු ක්‍රියාවලියක් නොවෙයි. පුරවැසියන් ඔවුන්ගේ ආර්ථික විභවයන් සපුරාලීම සඳහා බලගැන්වීමට විශාල උත්සාහයක් අවශ්‍ය වෙනවා. එහිදී ජනතාවගේ අවශ්‍ය කුසලතා සහ ධාරිතාව ගොඩනැංවීම සඳහා අධ්‍යාපනය සහ පුහුණුව වෙනුවෙන් ආයෝජනය කිරීම වැදගත්. මිනිසුන්ට ඔවුන්ගේ හැකියාවන් සපුරාලීමට අවස්ථාව ඇති බව සහතික කිරීම සඳහා සෞඛ්‍ය සේවා සඳහා ආයෝජනය කිරීම අත්‍යවශ්‍යයි. අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා ඉතිහාසයේ වැඩිම මුදල මෙවර අය වැය ලේඛනයෙන් වෙන්කොට තිබෙනවා.

ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෙළෙඳ පොළ වෙත ප්‍රවේශ වීමට සහ ආර්ථික අවස්ථා සමඟ සම්බන්ධ වීමට ජනතාවට හැකි වන පරිදි යටිතල පහසුකම් සැපයිය යුතුයි. සැමට සම අවස්ථා නිර්මාණය කරන වෙළෙඳ පොළ බලයේ අධික සංකේන්ද්‍රණයක් නොමැති ලෙස තරගය සාධාරණ වන බවට රජය විසින් සහතික කළ යුතුයි.

තරගය විසින් ඒකාධිකාරය නිර්මාණය වීම වැළැක්විය යුතුයි. අපි දන්නවා, සමහර ක්ෂේත්‍රවල අපි වෙළෙඳ පොළ තරගයට ඉඩ දී තිබෙන බව. හැබැයි, තරගය විසින් සිදු කර තිබෙන්නේ කුමක්ද? යම් ඒකාධිකාරීන් නිර්මාණය කොට තිබෙනවා. එහිදී තරගයේ සාධාරණත්වය ඇති කිරීම රජයේ කාර්යභාරයක් ලෙස අපි සලකනවා.

මෙම අය වැය යෝජනා මඟින් මේ රටේ ජනතාව ආර්ථික වශයෙන් සවිබලගැන්වීම ආරම්භ කරනවා. මෙය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රජාතන්ත්‍රීකරණය සඳහා පදනම දමනු ඇත.

අඛණ්ඩ ඵලදායිතා වර්ධනය සඳහා ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම අත්‍යවශ්‍යයි. ආර්ථික ප්‍රගමනය සඳහා පමණක් නොව, සමාජය නහා සිටුවීමට සහ දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා වන තවත් තීරණාත්මක පදනමක් වන්නේ යහපත් ආණ්ඩුකරණය සහ දූෂණය ඉවත් කිරීමයි. අපේ රාජ්‍යය ඉස්සරහට යන්න නම්, අපි ඒ කාර්යයන් සම්පූර්ණ කළ යුතුයි.

යහපත් ආණ්ඩුකරණය සඳහා වන ප්‍රතිසංස්කරණ සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග අප රජයේ ප්‍රධානතම ප්‍රමුඛතාවන් වෙනවා. මෙම අභිලාෂයට ජීවය ලබා දීම ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ අරමුණයි.

මධ්‍ය කාලීන සාර්ව ආර්ථික දිශාව

මෙවර අය වැයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා සමඟින් අපි සාර්ව ආර්ථික ගමන් මාර්ගයේ නව පෙරළියකට අඩිතාලම දමමින් *නිබෙනවා.* මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 5කට වඩා වැඩියෙන් අපි මැදි කාලීනව අපේක්ෂා කරනවා. ආර්ථිකයේ සැපයුම් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා අප ගනිමින් සිටින ක්‍රියාමාර්ග තුළින්, මිල නිසා හටගත හැකි කම්පන අවම කර ගැනීමටත්, එමඟින් අඩු සහ ස්ථාවර උද්ධමනයක් තවදුරටත් පවත්වා ගැනීමටත් අපි අපේක්ෂා කරනවා. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාර්ගය, විශාල ජංගම ගිණුම් හිඟයක් පැවැති යුගයට

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

නිත තබමින් විදේශ අංශයේ ජංගම ගිණුමේ ස්ථාවර ශේෂයක් අපේක්ෂා කරනවා. ඒ අනුව වෙළෙඳ පොළ මූලධර්ම මත පදනම් වූ අපගේ විනිමය අනුපාතය තවදුරටත් ඉහළ උච්චාවචනයන්ට ලක් නොවනු ඇත. ඒ සඳහා අවශ්‍ය වන වැඩ පිළිවෙළ අපි සකස් කරනවා.

2025 වසරේදී -මේ වසරේදී- භාණ්ඩ හා සේවා අපනයන තුළින් ඩොලර් බිලියන 19කට ආසන්න වාර්තාගත ඉහළම මට්ටමක් අපි අපේක්ෂා කරනවා. ශක්තිමත් අපනයන අංශයක් මඟින් ආර්ථික වර්ධනය තවදුරටත් ඉහළ යනු ඇතැයි බලාපොරොත්තු වනවා. ශක්තිමත් ආර්ථික වර්ධනයක් සමඟින් ණය නොවන ගලා ඒම්වල වර්ධනය සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක රාජ්‍ය අය වැයෙහි ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීම මඟින් ශ්‍රී ලංකාව 2028 වසරේ සිට ක්‍රමානුකූලව වැඩි වන ණය සේවාකරණ ගෙවීම් සඳහා ඉතා හොඳ සූදානමක සිටින බව අපි තහවුරු කරනවා, මේ වසර වෙනකොට.

අපි එකී අතිරික්තය පවත්වා ගන්නවා. එනම්, ප්‍රාථමික ගිණුමේ සියයට 2.3ක අතිරික්තයක් අපි පවත්වා ගන්නවා, මේ වසරේ. ඒ සඳහා තමයි අපි මුළු අය වැය ලේඛනයම පෙළ ගස්වා තිබෙන්නේ.

කවුරුවත් බිය විය යුතු නැහැ. අපි ගත්තු ණය ගෙවිය යුතුව තිබෙනවා. හැබැයි අපි ඒ ණය ගෙවීම සඳහා කාලයක් අරගෙන තිබෙනවා. ඒ කාලයේදී අප කළ යුත්තේ කුමක්ද? ඒ ණය ගෙවීම සඳහා හැකියාව ලැබෙන ආර්ථික තත්ත්වයක් අත්පත් කර ගැනීමයි. ඒ නිසා කිසිවෙක් බිය වෙන්න එපා. 2028 වසරේදී අපි ඒ ණය ඉතා සාර්ථකව ගෙවන රාජ්‍යයක් බවට මේ රට පරිවර්තනය කරනවා.

ලෝක බැංකු ඇස්තමේන්තුවලට අනුව, 2023 වසරේදී රටේ දරිද්‍රතා අනුපාතය සියයට 25.9ක්. ස්වෛරීත්ව ණය පැහැර හැරීමට ලක් වූ බොහෝ රටවල් දිළිඳුකම දිගු කාල සීමාවක් අත් විඳින අතර, 2025 වසර වන විට මෙම ප්‍රවණතාවේ ආපසු හැරීමක් දැකීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ ආර්ථිකය කඩා වැටීමෙන් පසුව දිළිඳුභාවය වර්ධනය වෙමින් තිබෙනවා. හැබැයි දිළිඳුභාවයේ වර්ධනයට තිත තබලා එය අවගමනය කිරීම සඳහා අවශ්‍ය වන සැලසුම් මේ 2025 වසරේදී අපි ආරම්භ කරනවා. එය අපේ දිළිඳුභාවයේ හැරවුම් ලක්ෂ්‍යයක්. එය මේ 2025 වසරේදී සටහන් කරනවා.

මෙම අය වැය යෝජනා මඟින් සමාජයේ දිළිඳුම සහ වඩාත්ම අවදානමට ලක් විය හැකි සාමාජිකයන් සවිබලගැන්වීමේ පුළුල් ප්‍රයත්නයකට පළමු පියවර තබන අතර, දරිද්‍රතාවේ අඛණ්ඩ අඩුවීමක් අපේක්ෂා කරනවා.

නිසි මුදල් කළමනාකරණය, වගකීමෙන් යුතුව ණය කළමනාකරණය කිරීම, මානව ප්‍රාග්ධනය සඳහා වූ ආයෝජන, ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාල, ආර්ථික විවිධාංගීකරණය, අපනයන ප්‍රවර්ධනය, ආයෝජන පරිසරයේ වර්ධනය, කෘෂිකර්මාන්තය නවීකරණය, හරිත ආර්ථික ප්‍රතිපත්ති, නවෝත්පාදන, ඩිජිටල්කරණය, ව්‍යවසායකත්වය සහ නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පටපිටාව සකස් කර දීම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය, දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සහ විනිවිදභාවය සහ තිරසාර වර්ධන ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරීම මඟින් දිගු කාලීන ආර්ථික ස්ථාවරත්වය සහ සමෘද්ධිය ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආර්ථිකයේ පරිවර්තනීය වෙනසක් ඇති කිරීම සඳහා පශ්චාත් අර්බුද අවස්ථාව වඩාත් හොඳින් යොදා ගැනීමට අපි අපේක්ෂා කරනවා.

අපට අර්බුදය හමුවේ හඬා වැලපෙමින් ඉන්න පුළුවන්. අර්බුදයේ දත්ත කියමින් ඉන්න පුළුවන්. හැබැයි මේ අපේක්ෂාව මොකක්ද? මේ අර්බුදය විසින් ඇති කර තිබෙන තත්ත්වය, වඩාත් හොඳ තත්ත්වයක් නිර්මාණය කර ගැනීම සඳහා අපි උපයෝගි කර ගන්නවා.

මම දැන් මෙම පාර්ලිමේන්තුවට 2025 අය වැය යෝජනා ඉදිරිපත් කරනවා.

1. භාණ්ඩ හා සේවා අපනයනය පුළුල් කිරීම

ශ්‍රී ලංකාවේ භාණ්ඩ ගෝලීය වෙළෙඳ පොළට අපනයනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා අපනයන හැකියාව මහා පරිමාණයෙන් වැඩි කිරීමේ අරමුණින් රජය 2025-2029 සඳහා ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් සකස් කරනු ඇත. නව අපනයන වෙළෙඳ පොළට ප්‍රවේශවීමට, පවතින වෙළෙඳ පොළවල් පුළුල් කිරීමට හෝ මහා පරිමාණ අපනයනකරුවන්ගේ අගයදාම සහ ගෝලීය අගයදාම සමඟ සම්බන්ධවීමට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් - MSMEs - ට පහසුකම් සැලසෙනු ඇත.

මතක තබා ගන්න, උසස් තත්ත්වයේ, දැරිය හැකි මිලකට ලබා ගත හැකි අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශවීමේ සීමා ඉවත් කිරීමේ අරමුණින් සරල, විනිවිද පෙනෙන සහ පුරෝකථනය කළ හැකි තීරුබදු රාමුවක් නිර්මාණය කිරීම සඳහා ජාතික තීරු බදු ප්‍රතිපත්තියක් මත පදනම්ව නව තීරු බදු නිර්ණය වේ.

ඒකට හේතුව මොකක්ද? අපි දීර්ඝ කාලයක් අපේ රටේ අපනයනය වර්ධනය කිරීම සඳහා සැලසුම් හදලා තිබෙනවා. හැබැයි, අපනයනය වර්ධනය කිරීමට සාපේක්ෂව ඒ සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය වර්ධනය කිරීම සඳහා අපට සැලැස්මක් තිබිලා නැහැ. ඒ නිසා මෙම අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් ආරක්ෂිත පියවරක් කරා අපේ අවධානය යොමු කර තිබෙනවා.

විශේෂයෙන් කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වය - RCEP - සහ අනෙකුත් ගිවිසුම් හරහා ආසියාන් - ASEAN - සංවිධානයේ රටවල් සමඟ ආර්ථික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින්, උපායමාර්ගික හවුල්කරුවන් සමඟ ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම් - FTA - ජාලය පුළුල් කිරීම සඳහා කටයුතු කරනවා.

අපගේ භාණ්ඩ හා සේවා අපනයනය වැඩිදියුණු කිරීම සඳහා අපගේ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවල කැපවූ සහ වඩාත් ව්‍යක්තියමය උත්සාහයන් සමඟ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනවා.

අපගේ අපනයනකරුවන් සමඟ විදේශීය ව්‍යාපාරික ජාල, වාණිජ අවස්ථා සහ වාණිජ සහයෝගිතාව වැඩිදියුණු කළ හැකි වන ප්‍රවේශයක් සඳහා විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව යොදා ගන්නවා.

විදේශ වෙළඳාමට සම්බන්ධ ප්‍රධාන ආයතන -key border agencies - සහ අපනයනකරුවන් ලියාපදිංචිය ස්වයංක්‍රියකරණය හා ඩිජිටල්කරණය කිරීම තුළින් ජාතික තනි වෙළඳ කවුළුවක් - TNSW - ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා.

ආදායම් එකතු කිරීම හා වෙළඳ පහසුකම් කාර්යක්ෂම කිරීමට නව රේගු පනතක් හඳුන්වාදීමට අපි කටයුතු කරනවා.

දැනට සකස් කර තිබෙන රේගු පනත සංශෝධනය කොට නව රේගු පනතක් අපි ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. දැනටමත් ඒ වැඩකටයුතු ආරම්භ කර තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ - DTA - ගිවිසුම් දැනට පවතින ද්විත්ව බදු ගිවිසුම් 44න් ඔබ්බට පුළුල් කරනු ලබන අතර, එහිදී ඉහළ වෙළඳ හා ආයෝජන විභවයක් ඇති රටවලට ප්‍රමුඛතාවක් ලබා දෙනවා.

2. ආයෝජන ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම

අපනයන කේන්ද්‍ර කරගත් ආයෝජන සහ විශේෂිත අංශ සඳහා වන කලාප පුළුල් කිරීම, නිරසාර භාවිතයන්, සම්පත් කළමනාකරණය සහ හරිත තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන පරිසර හිතකාමී කාර්මික උද්‍යාන පිහිටුවීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය සහ පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන කලාප හරහා රජය සිය සහයෝගය ලබාදීමට කටයුතු කරනවා.

මොකද අප ආර්ථික කලාප තියා ගත්තාට සමහර අවස්ථාවල අපට ආයෝජන කැඳවා ගැනීමේ හැකියාව නැහැ. අපි පෞද්ගලික අංශයට ලබාදෙන්න ලෑස්තියි සමහර ආර්ථික කලාප. ඒවා අපට කළමනාකරණය කරන්නත් පුළුවන්, ඒවාට ආයෝජකයන් කැඳවන්නත් පුළුවන්. ඒ සඳහා අවශ්‍ය වන දොරටු විවෘත කරන්න අපි සූදානම්.

නැඟී එන ආයෝජන වර්ධනයට ගැළපෙන පරිදි ආර්ථික පරිවර්තන පනත සංශෝධනය කරනවා.

දැනට ඉදිරිපත් කර තිබෙන පනත සංශෝධනය කරලා නැවත එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඵලදායී ආර්ථික කටයුතු සඳහා රජය විසින් භාවිත නොකළ රජය සතු ඉඩම් ඵලදායී ආර්ථික කටයුතු සඳහා බදු දෙනවා.

අපට විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ ඉඩම්වලට මොනවාද වෙලා තිබෙන්නේ? ඒ ඉඩම් නිසරුභාවයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ඉඩම් වඩාත් ඵලදායී ආයෝජන සඳහා ලබා දෙන්න අපි සැලසුම් කර තිබෙනවා.

ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ සහ ආරක්ෂාව සැපයීමේ අරමුණින් ආයෝජන ආරක්ෂණ පනතක් සම්මත කරනු ලැබේ.

දේපළ ලියාපදිංචි කිරීම, බදු ගෙවීමේ පහසුව, වෙළඳ පහසුකම් සැපයීම, කොන්ත්‍රාත්තු බලාත්මක කිරීම, ණය ලබා ගැනීම වැනි ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළව රටේ ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිදියුණු කිරීමට අපි කටයුතු කරනවා. රාජ්‍ය සේවා ඩිජිටල්කරණය සඳහා වන පියවර මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

සෑම පියවරක් සඳහාම නිශ්චිත කාල රාමු සැකසීම සහිතව, අවශ්‍ය වන සියලු අනුමැතීන් ඒකාබද්ධව ලබා ගත හැකි වන පරිද්දෙන් "එක් ස්ථානයකින් සියලු සේවා" යන සංකල්පය -one stop shop- ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නීති සම්පාදනය කරනවා.

ඉපැයීම් සහ ලාභාංශ නැවත මෙරටට ගෙන්වා ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා සුදුසු ආරක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමෙන් දේශීය සමාගම් හට විදේශයන්හි ආයෝජනය කිරීමට ඇති බාධක සමාලෝචනය කර ඒවා ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීමට කටයුතු කරනවා.

අපේ දේශීය ව්‍යාපාරිකයන් ඉදිරියට යන්න ඕනෑ. ඔවුන් මේ රට ඇතුළේ පමණක් ආයෝජනයේ යෙදීමෙන් පළක් නැහැ. ඔවුන් ඉදිරියට යා යුතුව තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන නිදහස ක්‍රමානුකූලව ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය - PPP - සම්බන්ධව නව පනතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ඉඩම් හිමිකම් සංවර්ධනය සහ ඉඩම්වල වාණිජමය භාවිතය වැඩි කිරීම සඳහා බිම් සවිය වැඩසටහන කඩිනම් කරනවා.

දැනටමත් කෙටුම්පත් අදියරවල පවතින බංකොලොත්භාවය පිළිබඳ පනත් කෙටුම්පතේ කටයුතු කඩිනමින් ඉදිරිපත් කරනවා.

ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් සහ සමුද්‍ර ආර්ථිකයේ ආයෝජන, කාර්මික සංවර්ධනය සහ අපනයන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනයට නොගත් විභවයන් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කිරීම සඳහා රජය ඍජු විදේශ ආයෝජන අපේක්ෂා කරනවා.

අපනයනකරුවන්ට තත්ත්ව පරීක්ෂණ සහ සහතිකකරණය ලබා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය සහාය රජය විසින් ලබා දෙනවා.

පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාර, යොමු කිරීමේ මධ්‍යස්ථාන, පිළිකා කාරක පර්යේෂණ සඳහා යොමු කිරීමේ මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල සහ කාර්මික තාක්ෂණ ආයතනය ඇතුළු අනෙකුත් තක්සේරු ආයතන සේවාදායකයින් සඳහා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා සංවර්ධනය කරනවා.

රට තුළ ජාතික තත්ත්ව කළමනාකරණ පද්ධතියේ අපේක්ෂිත ප්‍රතිඵල අපට අවශ්‍යයි. ජාතික තත්ත්ව කළමනාකරණ පද්ධතියක් අපට අවශ්‍යයි. අපේ භාණ්ඩයක්, අපේ සේවාවක් අපි විදේශයකට ලබා දෙනවා නම් ජාතික තත්ත්ව සහතිකයක් ලබා දෙන්නේ කවුද? ඒක අපට අවශ්‍යයි.

රට තුළ ජාතික තත්ත්ව කළමනාකරණ පද්ධතිය අපේක්ෂිත ප්‍රතිඵලයන් සපුරාලීමට, 2025 වසර සඳහා රුපියල් මිලියන 750ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

3. ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම උපයෝගී කර ගැනීම

ශ්‍රී ලංකාවට වෙළෙඳාම, භාණ්ඩ සේවා සැපයුම්, මූල්‍ය සේවා සහ ඩිජිටල් ආර්ථිකය සඳහා කේන්ද්‍රස්ථානයක් වීමට හැකියාව තිබෙනවා. මෙම අය වැය තුළින් මෙකී විභවයන් සපුරාලීම සඳහා මූලික පියවර සපයනවා.

රටේ උපායමාර්ගික භූගෝලීය පිහිටීම උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛතම බලවේගයක් ලෙස කටයුතු කිරීමට භාණ්ඩ හා සේවා පහසුකම් සැලසීමේ අංශය සැලකිය යුතු විභවයක් දරනවා. වර්තමානයේ, මෙම භාණ්ඩ සේවා පහසුකම් සැලසීමේ අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් ආසන්න වශයෙන් සියයට 2.5ක් සහ අපනයන සඳහා සියයට 7ක දායකත්වයක් ලබා දෙන අතර, ඇස්තමේන්තුගත පුද්ගලයින් 40,000 සිට 50,000කට ඍජු හා පූර්ණ කාලීන රැකියා සපයයි.

නැහෙනහිර සහ බටහිර බහලුම් පර්යන්ත ව්‍යාපෘති අවසන් වූ පසු කොළඹ වරායේ සැලකිය යුතු ධාරිතාවක් වර්ධනය වනු ඇත. ඊට අමතරව යෝජිත කොළඹ බටහිර පර්යන්තය සහ කොළඹ උතුරු වරාය ශ්‍රී ලංකාවේ වරායවල ක්‍රියාකාරිත්වය වේගවත් කරනු ඇතැයි අපි අපේක්ෂා කරනවා. මසක් ඇතුළත එම ව්‍යාපෘති -ඒ කියන්නේ බටහිර ව්‍යාපෘති දෙකත්, උතුරු වරායත් - සඳහා අභිලාෂයන් ප්‍රකාශ කිරීම් - EOI - කැඳවීමට අප කටයුතු කරනවා.

ඒකට අපි ඉතා ඉක්මනින් යා යුතුව තිබෙනවා.

බහලුම් පරිමාවන් ඉතා සැලකිය යුතු ලෙස ඉහළ ගිහින් ඇති බැවින්, කොළඹ වරාය දැනට දැඩි තදබදයකට මුහුණ දීම නිසා යටිතල පහසුකම් සහ පද්ධති සහ ක්‍රියා පටිපාටිවල තීරණාත්මක සංවර්ධනයක් අවශ්‍ය වී තිබෙනවා. එබැවින්, කෙරවලපිටිය රේගු

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

පරීක්ෂණ අංගනයේ සහ බිලූමැන්ඩල් භාණ්ඩ සේවා සැපයුම් උද්‍යානයේ මූලික සූදානම් කිරීමේ කටයුතු සඳහා **රජයේ** සහාය වීම පිණිස - වරායෙන් කරයි - 2025 අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා.

වරායේ තදබදය ඒ ඒ මොහොතේ පැන නඟින ගැටලුවලට පිළිතුරු සපයලා විසඳන්න ලැබෙන්නේ නැහැ. ඒ සඳහා අපිට දිගු කාලීන විසඳුමක් අවශ්‍යයි. ඒ නිසා එම දිගු කාලීන විසඳුමකට අවශ්‍ය අඩිතාලම මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා.

කොළඹ වරාය තුළ සහ අවට බහලුම් රථවාහන තදබද ලිහිල් කිරීම සහ අගය එකතු කිරීම තුළින් විදේශ ඉපැයීම් වැඩි කිරීම සඳහා දිගු කාලීන පියවරක් ලෙස, දුම්රිය පාදක ඒකාබද්ධ බහුමාධ්‍ය භාණ්ඩ හා සැපයුම් මධ්‍යස්ථානයක් - IMCLC - ලෙස වෙයන්ගොඩ අභ්‍යන්තර බහලුම් අංගනයක් - Internal Container Dry Port, ICD - ස්ථාපිත කිරීමට මම යෝජනා කරනවා. ඒ සඳහා ආයතන යන්ත්‍රණයක් හඳුනා ගැනීම, ඉඩම් අත්පත් කර ගැනීම සහ අනෙකුත් මූලික සූදානම් කිරීමේ කටයුතු සඳහා සහාය වීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

ජාතික තනි කවුළු පද්ධතිය, ට්‍රක් රථ පැවරීමේ පද්ධතිය - Truck Appointment System, විද්‍යුත් බහලුම් නිරීක්ෂණ - Tracking System - සහ "වරාය ප්‍රජාව" තොරතුරු හුවමාරු පද්ධතිය - Port Community System - අපිට අවශ්‍යයි. මේවා එක යුගයකට තිබුණා. නමුත්, මේ යුගයට නොගැළපෙන තත්ත්වයකට මේ පද්ධතීන් පත් වෙලා තිබෙනවා. එම නිසා එම පද්ධතීන් සංවර්ධනයට සහාය වීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

මේ වරාය මත අපට යා හැකි ආර්ථිකයේ උපරිම දුර යන්න අපි සැලසුම් සකස් කරමින් තිබෙනවා.

භාණ්ඩ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ අනිනවීන තාක්ෂණය ඇතුළත් කිරීම ඉතා වැදගත්. යල් පැන ගිය පරිලෝකන - scanning - පද්ධති සමස්ත සැපයුම්දාමයේ ප්‍රමාදයන්ට හේතුවක්.

ගරු කථානායකතුමනි, ඇස් දෙකෙන් බලලා, නහයෙන් ඉඹලා කටයුතු කරන ඒ යුගය අවසන්.

එබැවින්, කොළඹ වරාය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා උසස් පරිලෝකන පද්ධතිවල මූලික සංවර්ධනය සහ ස්ථාපිත කිරීමට සහාය වීම සඳහා රුපියල් මිලියන 1,000ක් මෙම අය වැය ලේඛනයෙන් වෙන් කරනවා.

4. ඩිජිටල් ආර්ථික දියුණුව

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකයේ සංවර්ධනය වේගවත් කිරීම අපගේ ආර්ථික සංවර්ධන උපාය මාර්ගයේ වැදගත් කොටසක්. කාර්මික හා සේවා අංශ තුළ ඵලදායීතාව වැඩිදියුණු කිරීම, ආර්ථික අවස්ථා ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ පාලනයේ සහ රාජ්‍ය මූල්‍යයේ විනිවිදභාවය වැඩිදියුණු කිරීම තුළින් ඩිජිටල් පරිවර්තනය සහ ආර්ථික වර්ධනය ඉහළ යනු ඇත.

සියලු ම පුරවැසියන් සඳහා ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හඳුනා ගැනීම -ඒ කියන්නේ ඩිජිටල් හැඳුනුම්පත, SL-UDI - ස්ථාපිත කිරීම ප්‍රමුඛතාවක්. SL-UDI යනු ඩිජිටල් ආර්ථිකයක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය මූලික ඩිජිටල් පොදු යටිතල පහසුකම් - DPI - වේ.

ඩිජිටල් හැඳුනුම්පතක් ගැන සාකච්ඡාව 2012 ඉඳන් තිබෙනවා; 2012 ඉඳන් එම ව්‍යාපෘතිය ගැන සාකච්ඡා කරලා තිබෙනවා. නමුත්, තවමත් අපට එතැනට යන්න බැරි වී තිබෙනවා. ඒ නිසා අපි මෙම ඩිජිටල් හැඳුනුම්පතෙහි කටයුතු ඉතා ඉක්මනින් අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා. එය තමයි ඩිජිටල්කරණයේ මූලික පදනම බවට පත් වෙන්නේ කියලා අපි හිතනවා.

මෙම ක්‍රියාවලිය සඳහා වන පියවර දැනටමත් ආරම්භ කර ඇති අතර, මෙම ක්‍රියාවලිය කඩිනම් කෙරෙනු ඇතැයි අපේක්ෂා කරනවා.

ඩිජිටල් සේවා සහ පද්ධතිවල ආරක්ෂාව සහ අඛණ්ඩතාව පිළිබඳව මහජන සහ ආයතනික විශ්වාසය ඩිජිටල් පරිවර්තනයේ සාර්ථකත්වය සහ තිරසරභාවය සඳහා ඉතා වැදගත්. නව නීති සම්පාදනය කිරීම සහ පවතින නීති ශක්තිමත් කිරීම හරහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය පාලනය කර ආරක්ෂා කරනවා.

මොකද, මේ දත්ත එකතු කරන්න, තමන්ගේ ක්‍රියාමාර්ග ඩිජිටල් පද්ධතියට ගේන්න බොහෝ අය තුළ බියක් තිබෙනවා. හැබැයි, අපි ඒ සම්බන්ධයෙන් ශක්තිමත් ආරක්ෂණ පද්ධතියක් පිළිබඳ සහතිකයක් දෙනවා.

අදාළ ආයතනික රාමුව ශක්තිමත් කිරීම කෙරෙහි ද අපි අවධානය යොමු කරනවා. ඩිජිටල් ආර්ථිකය තවදුරටත් වේගවත් කිරීම සහ ඩිජිටල් පද්ධතියේ අනෙකුත් විෂය අනුබද්ධ ආයතන මෙන්ම ඉහළ මට්ටමේ ඩිජිටල් ආර්ථික අධිකාරියක් බලගැන්වීම සඳහා අපි නව නීති සම්පාදනය කරනවා.

ඩිජිටල් ආර්ථික අධිකාරියක් පිහිටුවීමට අපි අපේක්ෂා කරනවා. සයිබර් ආරක්ෂාව, දත්ත රහස්‍යභාවය සහ දත්ත ආරක්ෂණයට අදාළ නීති සහ ආයතනද අප ශක්තිමත් කරනවා. අපි මෙතැනට විවෘත වෙනවා නම්, ඒවායේ ආරක්ෂණය සඳහා අවශ්‍ය නීති අපි ශක්තිමත් කළ යුතුයි.

ඩිජිටල් ගෙවීම් යටිතල පහසුකම් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික රාමුවේ තවත් මූලික අංගයක්. රජය, ව්‍යාපාර සහ පුරවැසියන් අතර ගලා යන ඩිජිටල් ගෙවීම් වේගවත් කිරීමට අපි කටයුතු කරනවා. මෑතකදී දියත් කරන ලද GovPay පද්ධතිය මීට උදාහරණයක්. මුදල් නෝට්ටු පදනම් කර ගත් ආර්ථිකයෙන් ක්‍රමයෙන් ඉවත් වීම අවශ්‍ය වෙනවා. මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. එය පැහැදිලි සන්නිවේදනයක් සහිතව, ප්‍රවේශමෙන් අදියර කිහිපයකින් යුක්තව ක්‍රියාත්මක වෙනවා.

මුදල් නෝට්ටු එක්ක තිබෙන මේ සෙල්ලම අපි නතර කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය නීති අපි වේගයෙන් ක්‍රියාත්මක කරනවා. හැබැයි, තිබෙන ආර්ථිකය කඩා වැටෙන්න ඉඩ නොදී, ඒ සමතුලිතතාවත් ආරක්ෂා කරමින් මුදල් නෝට්ටු පරිහරණය අවම කිරීම සඳහා අවශ්‍ය සැලසුම් අපි සකස් කරනවා.

ඩිජිටල් ආර්ථිකයේ සියලු ම අංශ හරහා පෞද්ගලික ප්‍රාග්ධනය සහ හවුල්කාරිත්වයන් ආකර්ෂණය කර ගැනීම වෙනුවෙන් රජය හිතකර ආයෝජන පරිසරයක් සඳහා පහසුකම් සපයනු ඇත. මෙය කෘත්‍රිම බුද්ධිය, රොබෝ විද්‍යාව, මූල්‍ය තාක්ෂණය සහ අනෙකුත් නැඟී එන තාක්ෂණයන්හි නවෝත්පාදනයන් සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට උපකාරී වෙයි.

ඉදිරි වසර පහ තුළ ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 15 ඉක්මවන මට්ටමකට හෝ ජාතික ආර්ථිකයෙන් සියයට 12කට වඩා වැඩි මට්ටමකට වර්ධනය කිරීම අපගේ අරමුණයි. මෙම අභිලාෂය සාක්ෂාත් කර ගැනීම සඳහා රජය පරිගණක හා තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වාර්ෂික අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීමට පහසුකම් සැලසීම ඉලක්ක කරනවා.

ඒ අනුව, විස්තර කර ඇති මූලපිරීම් සඳහා ඩිජිටල් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා, දැනට වෙන්කොට තිබෙන මුදල්වලට අමතරව.

5. සංචාරක අංශය

සංචාරක පැමිණීම් සංඛ්‍යාව කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම වෙනුවට සංචාරක ව්‍යාපාරයෙන් ජනනය වන වටිනාකම් කෙරෙහි අවධානය යොමු කිරීම සහතික කිරීම අවශ්‍ය වෙනවා.

මේ සඳහා, අවශ්‍ය යටිතල පහසුකම් සහිතව එම ගමනාන්තයන්ට අනන්‍ය වූ සංස්කෘතික වටිනාකම් පිළිබිඹු කිරීම සඳහා එම ගමනාන්ත දේශීය සන්නාමකරණයක් සමඟ එක් එක් ගමනාන්තයෙන් වටිනාකම් උත්පාදනය ප්‍රශස්ත කිරීම සඳහා දේශීය ගමනාන්ත සංවර්ධනය කිරීමට පියවර ගන්නවා.

හේතුව මොකක්ද? අපි සංචාරකයින් විශාල ප්‍රමාණයක් අපේක්ෂා කරනවා. ලක්ෂ 25 ඉක්මවන සංචාරකයින් ප්‍රමාණයක් මේ වසරේ පැමිණෙනවා. හැබැයි, ඔවුන්ට ගමනාන්ත කිහිපයක් නම් තිබෙන්නේ, එතකොට විශාල තදබදයක් ඇති වීමේ අනතුරට අපි මුහුණ දෙනවා. යාලට ගිහිල්ලා, ඔහුට යාල නැරඹීම සඳහා ඇතුළු වීමට පැය දෙකක කාලයක් ගත වෙනවා නම්, එය නැවත අපේ සංචාරක කර්මාන්තයට අහිතකර ප්‍රතිඵල ඇති කරනවා. ඒ නිසා අපි නව ගමනාන්ත හඳුන්වා දිය යුතුව තිබෙනවා.

හඳුනා ගැනීමෙන් පසුව, අවශ්‍ය තීරණාත්මක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2025 - 2026 වසර දෙකක කාලය තුළ ප්‍රමුඛතා පදනමක් මත සිදු කරනු ඇත.

උදාහරණයක් හැටියට ගත්තොත්, අනුරාධපුරය, අපේ සංචාරක කර්මාන්තයේ ගමනාන්තයක් නොවෙයි. යාපහුව අපේ සංචාරක ගමනාන්තයේ ස්ථානයක් නොවෙයි. අපේ පඬුවස්නුවර ඉතා ඓතිහාසික රාජධානියක්. හැබැයි, ගමනාන්තයක් නොවෙයි. යාපනය ගමනාන්තයක් නොවෙයි. අලුතින් අපට ඇල්ල, අරුගම්බේ වැනි ස්ථාන ඇති වෙලා තිබුණත්, විශාල ස්ථාන ප්‍රමාණයක් තිබෙනවා, අපට අලුත් ගමනාන්තයක් නිර්මාණය කළ හැකි.

මෙම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා, සංවර්ධිත ගමනාන්ත සඳහා ඒකාබද්ධ නගර නාමකරණ සහ ප්‍රවර්ධන ව්‍යාපාරයකින් සහාය වනු ඇත. මේ සඳහා 2025 වසර සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

අනුරාධපුරය අපේ පළමු රාජධානිය බව අපි දන්නවා. එය, අපේ ඉතා පැරණි ගෘහ නිර්මාණ ශිල්පවලින් සමන්විත වෙලා තිබෙනවා. අපේ පළමු ජනපද තිබෙනවා. හැබැයි, මොකක්ද සිදු වී තිබෙන්නේ? අනුරාධපුරය, "අනුරාධපුරය" ලෙස market කරන්න අප අසමත් වී තිබෙනවා. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය වන අලුත් brand cities නිර්මාණය කිරීමේ අපේක්ෂාවක් අපට තිබෙනවා, සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ අපි ලබා ගන්නට නම්.

සංචාරක ක්ෂේත්‍රයේ, සන්නිවේදනය සහ අනෙකුත් කුසලතා පිළිබඳ තරුණ-තරුණියන් පුහුණු කිරීම සඳහා රජය පහසුකම් සපයනවා.

සංචාරකයින්ගේ සංචරණ ධාරිතාව පුළුල් කිරීම සඳහා නව සංචාරක ගමනාන්ත සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම රජයේ ප්‍රමුඛම කාර්යයක් වනු ඇත.

ඊට සමගාමීව, අධික තදබදය පිළිබඳ ගැටලු විසඳීමට සහ ක්ෂේත්‍රයේ ධාරිතාව වැඩිදියුණු කිරීමට ඩිජිටල් ටිකට්පත් ක්‍රමයක් හඳුන්වා දීමට අපි බලාපොරොත්තු වෙනවා.

පෝලිමේ ඉඳලා ටිකට් එක අරගෙන සීගිරියට යන්න ඕනෑ නැහැ. මේවා වෙනස් කරන්න ඕනෑ. අපි ඒ සඳහා කටයුතු කරනවා. ඒ වාගේම අපි කවුරුත් දන්නවා, අද අපේ කටුනායක ගුවන් තොටුපොළ ඒ ධාරිතාව දරා ගන්න බැරි තරමට හිර වෙමින් තිබෙන බව. ඇයි, ඒ? ඒ ව්‍යාපෘතිය අවසන් කරන්න තිබුණේ 2023 වර්ෂයේ. හැබැයි, 2023 වර්ෂයේ අවසන් කරන්න තිබුණු ව්‍යාපෘතිය තවම අපට අවසන් කර ගන්න බැරි වෙලා තිබෙනවා. ජපන් රජය තමන්ගේ ණය සහනවලින් ඉවත් වෙලා ගියා.

ජපන් ආයෝජනවල සහාය ඇතිව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ දෙවන පර්යන්තය ඉතා ඉක්මනින් අපි ආරම්භ කරනවා.

ජපන් රජය අපිත් එක්ක එකඟතාව පළ කරලා තිබෙනවා. අපි ඉතා ඉක්මනින් ඒ ව්‍යාපෘතිය පටන් ගන්න දැන් සියලු කටයුතු කරලා තිබෙනවා, අපේ ගුවන් සේවා අමාත්‍යතුමාගේ දායකත්වයෙන්.

සංචාරක ආකර්ෂණීයත්වයක් ඇති ස්ථාන පිළිබඳ තොරතුරු සැපයීම, ආරක්ෂක අනතුරු ඇඟවීම් ලබා ගැනීම, සංචාරක අත්දැකීම් පිළිබඳ ප්‍රතිචාර සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ලැබෙන පැමිණිලි අධීක්ෂණය කිරීම සඳහා සංචාරක පොලිසිය, රාජ්‍ය ආයතන සහ සිවිල් සංවිධාන සම්බන්ධ කරන තාක්ෂණ පාදක විසඳුම් සංයෝජනයක් හරහා සංචාරක ආරක්ෂාව සහ පහසුකම් සැපයීම කෙරෙහි රජයේ අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

සංචාරකයන් ප්‍රමාණය වැඩි වෙන්න, වැඩි වෙන්න ඔවුන්ගේ අනාරක්ෂිතතාව පිළිබඳ ගැටලුවක් ඇතිවීමේ අවදානමක් තිබෙනවා. ඒ නිසා අපි ඒ පිළිබඳව අවධානය යොමු කරන්න සැලසුම් කරලා තිබෙනවා.

6. ආර්ථික සංවර්ධනයේ කොඳු නාරටිය වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම රජයේ ප්‍රධාන අරමුණක් වේ. මූල්‍ය සඳහා ප්‍රවේශය දිගු කලක් තිස්සේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ග්‍රාමීය ව්‍යවසායකයින් මුහුණ දෙන විශාලතම අභියෝගයන්ගෙන් එකකි.

ඔවුන්ට අවශ්‍ය වන ප්‍රාග්ධන මුදල සපයා ගන්නට විධියක් නැහැ. හැකියාව තිබෙනවා; වුවමනාව තිබෙනවා; දක්ෂතාව තිබෙනවා. හැබැයි, ඔවුන්ට ආරම්භක මූල්‍ය පිරිවැය සපයා ගැනීමේ දුෂ්කරතාවක් තිබෙනවා.

මේ රටේ මූල්‍ය සංස්කෘතිය ඇපකර මත පදනම් වූ ණය දීම වන අතර එමඟින් විශාල කොටසකට මූල්‍ය සඳහා වන ප්‍රවේශය ඇහිරී තිබෙනවා. බැංකු තම තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ ණය දීමේ පිළිවෙත්වල තාර්කික බව සහතික කළ යුතු අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ නව ව්‍යවසායකයින් සඳහා ද විසඳුමක් ලබා දිය යුතුයි.

මේ සඳහා රජය සංවර්ධන බැංකුවක් පිහිටුවීමට කටයුතු කරමින් සිටිනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

මොකද, සංවර්ධන බැංකුවල ඉතිහාසයත් ඒ තරම් හොඳ එකක් නොවෙයි. "ලංකාපුත්‍ර" බැංකුව ගැන මතක ඇති. වීරකැටියේ පන්සලේ ඉඩම් උකසට අරගෙන ණය දුන්නා. ඒ අත්දැකීම ගැනත් අපි හොයන්න ඕනෑ.

පළමු පියවර ලෙස, නව පරිපාලන ව්‍යුහයක් හරහා සංවර්ධන බැංකුවක ක්‍රියාකාරීත්වය දැනට පවතින රාජ්‍ය බැංකු යන්ත්‍රණය හරහා ස්ථාපිත කරනවා. ජාතික ණය ඇපකර ආයතනය - NCGI - හරහා ලබා ගත හැකි ණය ඇපකර පහසුකම් තුළින් රජය මෙම කාර්යයට සහාය වනවා.

එහෙම කරන්න ඕනෑ. ඒ නිසා අපි රාජ්‍ය බැංකු එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. ඔවුන් ඒ සඳහා සුළු ප්‍රතිචාරයක් දක්වලා තිබෙනවා. මේ සංවර්ධන ණය යෝජනා ක්‍රමයට ඔවුන්ගේ එකඟතාව පළ කර තිබෙනවා.

7. නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය පෝෂණය කිරීම.

පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන සහ පෞද්ගලික අංශය සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් සහ උපදේශනයෙන්, පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති කර්මාන්ත අවශ්‍යතා සමඟ පෙළගස්වනු ලබනවා. පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා පර්යේෂණ සහ සංවර්ධන මූලපිරීම්වලට ප්‍රමුඛතාවක් දෙනවා.

මොකද, අපි දන්නවා ලෝකය එක තැනක රඳා පවතින්නේ නැහැ කියලා. මිනිසුන්ගේ අවශ්‍යතා විශාල ප්‍රමාණයක් වෙනස් නොවුණාට මිනිසුන් අවශ්‍යතා සපුරා ගන්නා ආකාරය වෙනස් වනවා. ඒ නව ආකාරයන්, එවැනි පර්යේෂණ එනි ප්‍රතිඵල හරහා තමයි මිනිසුන්ගේ අවශ්‍යතා සපුරා ගන්නා නව ආකාරයන් නිර්මාණය වෙන්නේ. ඒ නව ආකාරයන් විසින් තමයි වෙළෙඳපොළ නිර්මාණය කරන්නේ. එහෙම නම්, අපි මේ පර්යේෂණ ක්ෂේත්‍රයට විශාල පිරිවැයක් දැරිය යුතුව තිබෙනවා.

පර්යේෂණ සහ සංවර්ධන මූලපිරීම්වලට ප්‍රමුඛතාව දෙන ක්ෂේත්‍ර මේවායි.

- තෝරා ගත් පර්යේෂණ සහ සංවර්ධන මූලපිරීම් සඳහා සම මූල්‍යකරණය සැපයීම.

පර්යේෂණ කරන්න, ඔවුනුත් දෙනවා; රජයෙනුත් මුදල් පංගුවක් දෙනවා.

- ගෝලීය වශයෙන් සමාන ක්ෂේත්‍රවල නියැළී සිටින ශ්‍රී ලාංකිකයන් සමඟ රාජ්‍ය පර්යේෂණ සහ සංවර්ධන ආයතන සහ අදාළ විශ්වවිද්‍යාල අතර සම්බන්ධතා සම්බන්ධීකරණය කිරීම.

පර්යේෂණවල යෙදෙන විදේශගත ශ්‍රී ලාංකිකයන් ඉන්නවා. පර්යේෂණවල යෙදෙන විදේශ විශ්වවිද්‍යාල තිබෙනවා. අපි ඒවා අතර අන්තර් සබඳතාවක් නිර්මාණය කරන්න ඕනෑ.

- මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය වෙත ඇතුළු වීම හරහා අපනයනකරුවන්ට ගෝලීය වශයෙන් වෙළෙඳ නාම ආරක්ෂාව ලබා ගැනීමට පහසුකම් සලසන්න ඕනෑ.

2020 වසරේ දී පේටන්ට් බලපත්‍ර ලියාපදිංචි කිරීම් 272ක් සිදු වූ බවත්, ඉන් පේටන්ට් බලපත්‍ර 223ක් අනේවාසික ලියාපදිංචි කිරීම් බවත්, 2019 වසරේ දී පේටන්ට් බලපත්‍ර අයදුම්පත් ඉදිරිපත් කිරීම අනුව 61වන රට ලෙස ශ්‍රී ලංකාව ශ්‍රේණිගත වී ඇති බවත් වාර්තා වනවා. වාණිජකරණය තුළින් ආර්ථිකයේ යහපත සඳහා යොදා නොගත් සහ ආයෝජන අවස්ථා නෙළා නොගත් පර්යේෂණ සොයාගැනීම් ගණනාවක් ඇති බව අප නිරීක්ෂණය කරනවා. එබැවින්, පර්යේෂණ ආයතන මෙහෙයවීම සහ වාණිජකරණයට විභවයන් සහිත පර්යේෂණ, ප්‍රධාන ධාරාවට ගෙන ඒම සඳහා ශක්තිමත් ප්‍රමුඛ මධ්‍යගත ආයතනික ව්‍යුහයක් අවශ්‍යයි.

පර්යේෂණ කරලා වැඩක් නැහැ, පර්යේෂණවලින් අත්පත් කර ගන්නා ප්‍රතිඵලයෙන් වැඩක් නැහැ, ඒ ප්‍රතිඵලය අපි නියමිත පරිදි වාණිජකරණයට ගෙන එන්න අසමත් වනවා නම්.

මේ සඳහා, පර්යේෂණ සොයාගැනීම් වාණිජකරණය කිරීමට නවෝත්පාදන සහ නව නිපැයුම් අරමුදලක් නිර්මාණය කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. පර්යේෂණවලින් අපේ රට ඉස්සරහට යා යුතුව තිබෙනවා.

8. රාජ්‍ය වියදම් කළමනාකරණය

රාජ්‍ය වියදම් විධිමත් කිරීමට රජය අඛණ්ඩව උත්සාහ දරනවා. මහජන නියෝජිතයින්ට ලබා දෙන දීමනා සහ ප්‍රතිලාභ පිළිබඳව සමස්ත පද්ධතියම සමාලෝචනය කරනවා.

රුපියල් ලක්ෂ දහයක් වන insurance එක, ලක්ෂ දෙකහමාර දක්වා අඩු කරනවා, 2023 දී තිබුණු මට්ටමට.

වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් දේශපාලන නායකත්වය පැත්තෙන් ආදර්ශයක් දීම සඳහා ඇමති මණ්ඩලය අමාත්‍යාවරුන් 21දෙනෙකුට සීමා කළා. රාජ්‍ය වියදම් අඩු කරමින් අමාත්‍යාවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යාවරුන්ගේ වියදම් තාර්කීකරණය කර තිබෙනවා.

මේ රටේ මහජනයාගේ ධනය සතයක්වත් නාස්ති කරන්න අපට යුක්ති සහගත අයිතියක් නැහැ.

ජනාධිපතිවරයා, අගමැති, මැති ඇමතිවරු වෙනුවෙන් වෙන් කරන ලද මන්දිර ඇතුළු පොදු සම්පත් ඵලදායී ලෙස මහජන භාවිතයට යොමු කිරීම සඳහා දැනටමත් අපි කමිටුවක් පත් කර තිබෙනවා. එවැනි දේපළ ආර්ථික වශයෙන් ශක්‍යතාවක් ඇති ව්‍යාපෘති සඳහා සහ මහජන අවශ්‍යතා සඳහා උපරිම ලෙස භාවිත කිරීමට කටයුතු කරනවා.

දැනටමත් ඇමතිවරයෙක් හිටපු නිල නිවාසයක්, දූෂණ විරෝධී කාර්යාලයට ලබා දුන්නා, ඉඩ මදි කියලා. ඒක මහ ජනයාගේ අවශ්‍යතාවක්. ඇමතිවරයා ඉන්නවාද, දූෂණ විරෝධී කාර්යාලය තියනවාද? ප්‍රමුඛ මොකක්ද? අපි ප්‍රමුඛතාවට යොදවා තිබෙනවා. ඒ නිසා මේ නිවාස, මන්දිර ජනතාවගේ ප්‍රයෝජනයටත්, රටේ ආර්ථිකයටත් හිතකර ලෙස යොදවන්න අපි පැකිළෙන්නේ නැහැ. මේ නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කරනු ලබනවා.

ඒ වෙන කිසිවක් නිසා නොවෙයි. මේ රාජ්‍ය සේවය බරයි. ජනතාව අසීමිත බරක් දරනවා එය නඩත්තු කිරීම වෙනුවෙන්. මේ අර්බුදයෙන් ගොඩ එන්න අපි කැප කිරීම් කළ යුතු නැද්ද? ඒ සඳහා අපි ලැහැස්තියි.

අධික ධාවන සහ නඩත්තු වියදම් දැරීමට සිදු වන සියලු සුඛෝපභෝගි වාහන වෙන්දේසි කරනවා, මාර්තු මාසයේ.

අලුත් වාහන සඳහා ගැසට් එක ගහනකල් තමයි හිටියේ. කවුරු හරි ඇහුවා, විකුණන්නේ නැත්තේ ඇයි කියලා. අලුත්

වාහන ගෙන්වීම සඳහා ගැසට් එක ගැහුවාම වෙළෙඳ පොළේ මිලේ වෙනසක් ඇති වෙනවා. ඊට පසුව විකිණීම තමයි අපේ අපේක්ෂාව වුණේ. තේරුම් ගන්න, වැඩේ හරියට කරන්නේ එහෙමයි.

- **වාහන සඳහා රජයේ වියදම් අවම කිරීම**

රජයේ නිලධාරින්ට නිල වාහන ලෙස පවරන ලද වාහන ඉහළ ඉන්ධන පරිභෝජනයක් ඇති සැලකිය යුතු වටිනාකමකින් යුක්ත වාහන වනවා. මෙම වාහන සඳහා අධික නඩත්තු පිරිවැයක් දැරීමට සිදු වනවා.

සමහර වාහන අවුරුදු හත අට පැරණියි. දැන් අවුරුදු හයකින් විතර රජයට වාහන ගෙන්වා නැහැ. අවුරුදු අට දහය පැරණි වාහන තමයි රජයේ නිලධාරින් පාවිච්චි කරන්නේ. ඒ සඳහා විශාල නඩත්තු වියදමක් දරනවා.

එබැවින් තෝරාගත් නිලධාරින්ට සුදුසු මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම හරහා වාහන සඳහා වන අධික වියදම් අවම කිරීමට රජය තීරණය කර තිබෙනවා.

අපි යම් සැලකිය යුතු මුදලක් වාහනයක් හිමි නිලධාරින්ට ලබා දීමට කටයුතු කරනවා. අපි ඒ වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරලා මුදල තීරණය කරන්නම්.

මන්ත්‍රීවරුන්ට වාහන පර්මිට් එක ලැබෙන්නේත් නැහැ; මේ අවුරුද්දේ වාහන ලැබෙන්නේත් නැහැ. මේ අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කරලා නැහැ. ඒවා දරාගන්න බැහැ, මේ ආර්ථිකයට.

- **රාජ්‍ය ආයතන විධිමත් හා කාර්යක්ෂම කිරීම**

වසර ගණනාවක් පුරා ශ්‍රී ලාංකීය රාජ්‍ය යන්ත්‍රණය පහසුවෙන් පාලනය කළ නොහැකි ව්‍යුහයක් දක්වා ක්‍රමයෙන් විශාල වී තිබෙනවා. සුදුසු අධ්‍යයනයකින් හෝ පදනමකින් තොරව රජයේ ආයතන ගණනාවක් ස්ථාපිත කර තිබෙනවා. රාජ්‍ය සම්පත් නාස්තියක් මෙන්ම, එමඟින් රාජ්‍ය සේවාවන් ඵලදායී ලෙස සැපයීමට ද විශාල ලෙස බාධාවන් ඇති වී තිබෙනවා. මෙහි ප්‍රතිඵලයක් ලෙස එකම කාර්යය දෙවරක් සිදු කිරීම, නාස්තිය සහ රාජ්‍ය සේවාවන් ඵලදායී ලෙස සැපයීමට ද බාධා වීම සිදුව තිබෙනවා.

මේ රාජ්‍ය විශාලයි. මේ රාජ්‍ය බරයි. රාජ්‍ය සේවය නොවෙයි බර. ජනතාවට මේ සේවය ලබා දීම සඳහා මේ රාජ්‍ය විසින් දරන පිරිවැය විශාලයි. මේක අඩු කරන්න ඕනෑ නැද්ද? අපි අහන්නේ තමුන්නාන්සේලාගෙන්.

මෙම තත්ත්වය මඟ හරහා ගැනීම සඳහා රාජ්‍ය ආයතන රැසක කාර්යයන් සහ ඒවායේ ඵලදායිතාව සමාලෝචනය කිරීමට කමිටුවක් අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ මූලිකත්වයෙන් යුක්තව දැනටමත් පිහිටුවා තිබෙනවා. එහිදී කුමන ආයතන අඛණ්ඩව පවත්වාගෙන යා යුතු ද, වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ කළ යුතු ද, වසා දැමිය යුතු ද, අරමුණු වෙනස් කළ යුතු ආයතන තිබේ ද, ආයතනයේ අරමුණට අනුකූල වන ලෙස ප්‍රතිසංවිධානය කළ යුතු ආයතන මොනවාද ආදිය ඒ අනුව යළි තීරණය කරන්නට පුළුවන්.

ඒවා පිළිබඳව එම කමිටුවෙන් අපට නිර්දේශයක් ලබා දෙයි; වාර්තාවක් ලබා දෙයි.

මෙමඟින් රාජ්‍ය සේවාවන් සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම හරහා රාජ්‍ය මුදල් නාස්තිය වළක්වා ගැනීම සම්බන්ධයෙන් ද සැලකිය යුතු ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට අපි අපේක්ෂා කරනවා.

- **රජය සතු ව්‍යවසායන්හි ආයතනික පාලනය**

රජය සතු ව්‍යවසායයන් හේතුවෙන් පැන නඟින අනාගත මූල්‍ය අවදානම අවම කිරීම සහ කාර්යක්ෂම කිරීම සඳහා මූලික අවශ්‍යතාවක් වන්නේ රජය සතු ව්‍යවසායයන්හි ආයතනික *පාලන ව්‍යුහය* වැඩි දියුණු කිරීමයි. මේ සඳහා පාලනය, මූල්‍ය විනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් තෝරාගත් රාජ්‍ය ව්‍යවසායන් පරිපාලිතයන් ලෙස පවත්වා ගනු ලබන රාජ්‍ය හිමිකාරිත්වය සහ පාලනය ඇති පරිපාලක සමාගමක් පිහිටුවනවා.

ඒ කියන්නේ holding company එකකට තෝරාගත් රාජ්‍ය ව්‍යවසායයන් පවරන්න අපි බලාපොරොත්තු වෙනවා.

9. කාන්තා ආර්ථික සහභාගිත්වයට සහාය වීම

කාන්තා කටයුතු,- *[බාධා කිරීමක්] මොකක්ද හර්ෂ මන්ත්‍රීතුමා? [බාධා කිරීමක්] ඔබතුමා ඉල්ලන ඒවා මට දෙන්න බැහැ නේ. මම කොහොමද කොළඹ දිස්ත්‍රික් නායකත්වය දෙන්නේ? මට බැහැ නේ, ඒවා දෙන්න. ඒක ඉතින් විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා ගන්න ඕනෑ.*

කාන්තා කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය මෙන්ම පළාත් සභා මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. ඒ තුළ විශේෂයෙන්ම ගැබිනි මාතාවන් සඳහා පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා මාසික ආධාරයක් ලබා දෙන අතර, ඒ සඳහා රුපියල් මිලියන 7,500ක් *දැනටමත්* වෙන් කර තිබෙනවා. එසේම මවුවරුන්ගේ හා දරුවන්ගේ පෝෂණය සඳහා ත්‍රිපෝෂ වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා.

එම ආයතනය වහනවා කියලාත් කිව්වා නේද? කිව්වා නේද?

ළමා හා කාන්තා හිංසනය වැළැක්වීම, කාන්තා සවිබල ගැන්වීම සහ කාන්තාවන් සුරැකීම යන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 120ක් *වෙන් කරනවා.* කාන්තාවන් ඉලක්ක කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දිවයින පුරා ව්‍යාප්තව ඇති කාර්යාල ජාලය පවත්වා ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 720ක් දැනටමත් වෙන් කරලා තිබෙනවා.

10. නීරෝගී සමාජයක් කරා

i. සෞඛ්‍ය පද්ධතිය ඩිජිටල්කරණය

කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය තුළ ඩිජිටල්කරණය අවම මට්ටමකයි තිබෙන්නේ. ඒ අනුව, 2025 වසරේ සිට සෞඛ්‍ය සේවා සැපයීම ඩිජිටල්කරණය වීම වැඩිදියුණු කිරීම සඳහා නව මුල පිරීම් හා මැදිහත්වීම් සිදු කරනවා. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ - NMRA එකේ - සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ - SPC එකේ - කාර්යයන් ඩිජිටල්කරණය කිරීම සහ "සුවස්ථා" පද්ධතිය වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම මෙයට ඇතුළත් වෙනවා.

ii. ග්‍රාමීය මට්ටමේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම

බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක - PMCUs - 1,000කට අධික ප්‍රමාණයක සහ ප්‍රාදේශීය රෝහල්වල සේවා සැපයීම වැඩිදියුණු කිරීමට පියවර ගන්නවා. තවද, විශේෂයෙන් වයස්ගත ජනගහනය ඉලක්ක කර ගනිමින් සෑම දිස්ත්‍රික්කයකම තෝරා ගත් ප්‍රාථමික

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

වෛද්‍ය ප්‍රතිකාර ඒකකවලින් සහන සහ වයෝවෘද්ධ සත්කාර සේවා පවත්වනවා. පවතින මානව සම්පත් ප්‍රතිසංවිධානය කිරීම හරහා අවශ්‍ය මානව සම්පත් ලබා දීමට කටයුතු කරනවා.

iii. වතු ආශ්‍රිත සෞඛ්‍ය තත්ත්වය

ප්‍රාදේශීය වැවිලි සමාගම් සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන්ට - PPP - එළඹීම හරහා වතු ආශ්‍රිත සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගන්නවා. වතුවල ඇති රෝහල්වලට අවශ්‍ය මානව සම්පත්, අවශ්‍ය උපකරණ සහ ඖෂධ රජයෙන් ලබා දෙනවා.

iv. වසංගත සූදානම

ඉදිරි වසර තුන තුළ සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව වසංගත වැළැක්වීම, සූදානම සහ වසංගත සඳහා සුදුසු පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ඇති ජාතික ධාරිතාව වැඩිදියුණු කරනවා. මීට අමතරව, ඉදිරියේදී ඇති විය හැකි සෞඛ්‍ය උවදුරු කල් ඇතිව සූක්ෂ්මව නිරීක්ෂණය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ හැකියාව ශක්තිමත් කරනවා.

සෞඛ්‍යසම්පන්න ජනගහනයක් මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා තීරණාත්මක වන අතර, එය ඵලදායීතාව ඉහළ නැංවීමට, අධ්‍යාපනික ප්‍රතිඵල වර්ධනයට, ශ්‍රම බලකායේ සහභාගිත්වය ඉහළ නැංවීමට, නවෝත්පාදන සහ කුසලතා සංවර්ධනය සඳහා සෘජුවම දායක වෙනවා. එය සමාජ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට, ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට සහ ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය ප්‍රවර්ධනයට හේතු වෙනවා. ඒ අනුව, 2025 වසර සඳහා රජයේ සෞඛ්‍ය අය වැය ප්‍රතිපාදනය රුපියල් බිලියන 604 දක්වා සැලකිය යුතු ලෙස වැඩි කර තිබෙනවා.

ආසන්න වශයෙන් ගත්තොත්, ඩොලර් බිලියන 2ක් අපි සෞඛ්‍යයට වෙන් කර තිබෙනවා. එය හොඳ සූදානමක්.

ඖෂධ සැපයුම සහ වෛද්‍ය සැපයුම සහතික කිරීම සඳහා 2025 අය වැයෙන් රුපියල් බිලියන 185ක් වෙන්කර තිබෙනවා.

ඒ කියන්නේ බෙහෙත්වලට. බෙහෙත් හිඟයක් ඇතිවීමට කිසි හේතුවක් නැහැ, මුදල් ප්‍රතිපාදන දෙස බැලුවාම. වෙන ප්‍රශ්නයක් එතැන තිබෙනවා. ඒ ප්‍රශ්නය සෞඛ්‍ය අමාත්‍යතුමා විසඳයි කියලා මම බලාපොරොත්තු වෙනවා. මේ දත්ත අනුව, මේ මුදල් වෙන්කිරීම අනුව බෙහෙත් -ඖෂධ- හිඟයක් ඇති විය හැක්කේ කොහොමද? බිලියන 185ක් අපි වෙන් කරනවා නම් ඖෂධ සහ උපකරණ සඳහා, ඒවා ක්‍රමවත්ව යෙදවීමේ ගැටලුවක් අපේ රටේ මතු වී තිබෙනවා.

ගුණාත්මක ඖෂධ සහ වෛද්‍ය සැපයුම් කිසිදු බාධාවකින් තොරව ප්‍රසම්පාදනය හා බෙදා හැරීම සහතික කිරීමටත්, ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ප්‍රශස්ත කරන අතරම නාස්තිය අවම කිරීමටත්, අරමුදල් සම්පූර්ණයෙන් භාවිත කිරීමටත් රජය සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබනවා.

v. ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා සෞඛ්‍ය ප්‍රතිකාර ලබා දීම

ශ්‍රී ලංකාව තුළ පසුගිය දශකය තුළ ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් තිබෙනවා.

මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා අවශ්‍ය සෞඛ්‍ය, අධ්‍යාපන සහ අනෙකුත් සේවා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වසර 5ක ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජිතයි. මූලික පියවරක් ලෙස ස්නායු සංවර්ධන ආබාධ සහිත ළමුන් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහිත ප්‍රතිකාර මධ්‍යස්ථානයක් රිජ්වේ ආර්යා ළමා රෝහලේ පිහිටුවීම සඳහා 2025 වසර සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා. තවද, ඉදිරි වසර පහ තුළ අවශ්‍ය මානව සම්පත් සහිතව සෑම දිස්ත්‍රික්කයකම මෙවැනි ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීමට අපේක්ෂා කරනවා.

vi. ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා සියල්ල අන්තර්ගත මූල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක්

ඔටිසම් තත්ත්වයේ පසුවන ළමුන් සඳහා පෙර පාසල් සහ දිවා සුරැකුම් පහසුකම් සීමිතයි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත ළමුන් සඳහා ලබා දිය යුතු ***සියල්ල*** අන්තර්ගත අධ්‍යාපනය සහ මූල් ළමාවිය සංවර්ධනය පිළිබඳ පෙර පාසල් ගුරුවරුන් සහ භාරකරුවන්ට ඊට අවශ්‍ය හැකියාව හා අවබෝධය නොමැතිකමයි. ඒ අනුව ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

ඒ කියන්නේ, ඔටිසම් දරුවන් රැකබලා ගන්නේ කොහොමද කියන එකට. මොකද, එවැනි ආදර්ශයක් තවම අපේ කොතැනකවත් නැහැ. ඒක අප රජය විසින් ලබා දෙනවා. පෞද්ගලික අංශය ඊට පසුව ඒකට අවශ්‍ය වන තව දායකත්වය සපයයි.

11. සැමට අධ්‍යාපන අවස්ථා

රට තුළ පැවති ආර්ථික අභියෝග හේතුවෙන් 2019 සිට පාසල් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමක් සිදු වුණේ නැහැ.

2019 ඉඳලා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමක් සිද්ධ වෙලා නැහැ.

එබැවින්, පාසල් යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා 2025 අය වැය තුළින් රුපියල් මිලියන 10,000කට වඩා දැනටමත් වෙන්කොට තිබෙනවා.

එමෙන්ම විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා රුපියල් *බිලියන 135ක්* මේ වන විටත් වෙන් කර තිබෙනවා.

- **පෙර පාසල් ළමුන්ගේ පෝෂණය**

පෙර පාසල් උදෑසන ආහාර වේල සැපයීමේ වැඩසටහන යටතේ එක් ආහාර වේලකට කරනු ලබන ගෙවීම රුපියල් 60 සිට රුපියල් 100 දක්වා වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා 2025 අය වැය ඇස්තමේන්තු තුළින් රුපියල් මිලියන 1,000ක් දැනටමත් වෙන් කර තිබෙනවා. තෝරා ගත් මූල් ළමා විය අධ්‍යාපන මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 80ක් වෙන් කිරීමට අපේක්ෂා කරනවා.

තවද, පෙර පාසල් ගුරුවරුන් මානව සම්පත් සංවර්ධනයේ ප්‍රධාන පාර්ශ්වයක් ලෙස හඳුනා ගනිමින්, පෙර පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ සේවය ඇගයීම සඳහා ඔවුන්ට දැනට ලබා දෙන දීමනාව මේ

වසරේ ජූනි මාසයේ සිට තව රුපියල් 1,000කින් වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට *අපේක්ෂා* කරනවා.

- **පාසල් අධ්‍යාපනය නව්‍යකරණය කිරීම**

මෙය ඉතා වැදගත් ප්‍රශ්නයක්. අපි කවුරුත් මේ කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ.

පදිංචි ස්ථානයේ සිට කිලෝමීටර තුනක අරයකින් යුත් ප්‍රදේශය තුළ ප්‍රාථමික පාසලක් සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වෙනවා. මේ වන විට දීප ව්‍යාප්තව රජයේ පාසල් 10,126ක් *පමණ* තිබෙනවා. ඉන් 3,946ක් පමණ ප්‍රාථමික පාසල් වන අතර, මෙම පාසල්වලට දළ වශයෙන් ළමුන් 634,094ක් ඇතුළත් වී තිබෙනවා. මේවායින් සිසුන් 100ට වඩා අඩු පාසල් 3,000කට වඩා වැඩියි. පාසල් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක ළමයි 100ට වඩා අඩුයි.

ඉන් පාසල් 1,471ක සිටින්නේ, ළමුන් 50ට වඩා අඩු සංඛ්‍යාවකි. මෙම පාසල් බොහොමයක් ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල පිහිටා තිබෙනවා. මෙමඟින් පාසල් අතර විශාල විෂමතාවක් ඇති වී තිබෙනවා. මෙම විෂමතාව නිසා බහුතර සිසුන් සංඛ්‍යාවකට අසාධාරණයක් සිදු වී තිබෙනවා. මේ නිසා, පවතින පාසල් පද්ධතිය සමාලෝචනය කොට, යළි ස්ථානගත කිරීමට අවශ්‍ය වන ජාතික සැලැස්ම සකස් කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අපි *අපේක්ෂා* කරනවා.

මේ පාසල් පද්ධතිවල ඉතා ගැටලුකාරී තත්ත්වයක් තිබෙනවා. පසුගිය 2016 වර්ෂයේදී පමණ වාර්තාවක් ආවා. එහි පාසල් 138ක් තිබුණා, එක ළමයෙක්වත් ඇතුළත් නොවුණු. පාසල් 137ක් තිබුණා, ඒ වසරේ ළමයි දෙන්නයි ඇතුළත් වී තිබුණේ. එහෙම නම් මේ පාසල් පද්ධතිය තුළ අලුත් ස්ථානගත කිරීමක් අපට අවශ්‍ය වෙන්නේ නැද්ද? අපි ඒ පිළිබඳව සමීක්ෂණයක් කරනවා. සමීක්ෂණය කරලා ඒ වාර්තා මත පදනම්ව පාසල් පද්ධතිය යළි ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය වන සැලැස්ම අපි දියත් කරනවා.

- **ශිෂ්‍යාධාර**

i. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ සුදුසුම් ලත් අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ගේ ශිෂ්‍යාධාර මුදල රුපියල් 750 සිට රුපියල් 1,500 දක්වා වැඩි කිරීමට යෝජනා කරනවා, දෙගුණයකින් වැඩි කරන්න. මේ සඳහා රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

ii. ක්‍රීඩා පාසල්වල සිසුන්ට ලබා දෙන මාසික පෝෂ්‍යදායී ආහාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000 දක්වා දෙගුණයකින් වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා 2025 අය වැයෙන් දැනටමත් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

iii. විෂ්තීය අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා මාසික දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කිරීමට අප යෝජනා කරනවා. මේ සඳහා 2025 අය වැයෙන් දැනටමත් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, අමතරව තවත් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා.

iv. විශ්වවිද්‍යාල සිසුන් සඳහා ගෙවනු ලබන මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා වැඩි කිරීමටත්, විශ්වවිද්‍යාල දරුවන්ට දෙන ශිෂ්‍යාධාර දීමනා රුපියල් 4,000 සිට 6,500 දක්වා වැඩි කිරීමටත් අප යෝජනා කරනවා. මේ සඳහා රුපියල් මිලියන 4,600ක මුදලක් 2025 අය වැයෙන් දැනටමත් වෙන්කොට තිබෙනවා.

මේ සියලු දීමනා ගෙවීම් 2025 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වෙනවා.

අය වැය සම්මත වුණාට පසු මේ සියලු දීමනා ගෙවීම ක්‍රියාත්මක වෙනවා.

- **උසස් ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය**

අපට ඉන්නේ අතිදක්ෂ දරුවන්. හැබැයි ඒගොල්ලන්ට ජාත්‍යන්තරයේ ඉතා උසස් ප්‍රමිතිගත අධ්‍යාපනයකට ප්‍රවිෂ්ට වීමට ඉඩ නැහැ. අන්න එවැනි දරුවන්ට අ.පොෂ. උසස් පෙළ විභාගයෙහි කැපී පෙනෙන දක්ෂතා පෙන්වන සිසුන්ට ඉහළ පෙළේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීමට ශිෂ්‍යත්ව පිරිනැමීමටත්, ඔවුන් ලබා ගත් දැනුම සහ කුසලතා රටෙහි සංවර්ධනයට යොදා ගැනීම සඳහා නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමටත් වැඩසටහනක් ඇති කරනවා. 2025 වසරේ දී මෙම වැඩසටහන ආරම්භ කිරීමට රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

- **ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම**

පළාත් පහක විශේෂිත ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමට අප යෝජනා කරනවා. බස්නාහිර, උතුර, මධ්‍යම, ඌව සහ උතුරුමැද පළාත් මේ සඳහා තෝරා ගනු ලබනවා. එම පළාත්වල ක්‍රීඩා පාසල් සංවර්ධනයට රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **යාපනය සහ අනෙකුත් ප්‍රදේශවල පුස්තකාල වැඩිදියුණු කිරීම**

මේකට අපි ඓතිහාසික සාධාරණත්වයක් ඉටු කළ යුතුයි. සාමාන්‍යයෙන් මැතිවරණ ව්‍යාපාරවලදී ගෙවල් ගිනි තියපු ඉතිහාස අපි දැකලා තිබෙනවා. මැතිවරණ ව්‍යාපාරවලදී එකිනෙකාට අඩන්තේට්ටම් කරපු ඉතිහාස අපි දැකලා තිබෙනවා. හැබැයි, ලංකා ඉතිහාසයේත්, ලෝක ඉතිහාසයේත් මැතිවරණවලදී පුස්තකාල ගිනි තැබුවා. තවමත් ඒ කම්පනය ඒ මිනිස්සුන්ගේ හදවත් තුළ තිබෙනවා. සාධාරණ ද, පුස්තකාලයක් ගිනි තියන්න මැතිවරණයකට? මොකක්ද හේතුව? ඒ, අන් කවරක්වත් නොවෙයි. යාපනයේ පුරවැසියන්ට පුස්තකාල එක්ක ඓන්ද්‍රීය සබඳතාවක් තිබෙනවා. මා දැක තිබෙනවා, යාපනය පුස්තකාලයට පුරවැසියන් යන්නේ සෙරෙප්පු දෙක ගලවලා. එම පුස්තකාලයත් එක්ක ඔවුන්ගේ අධ්‍යාත්මික සබඳතාවක් තිබෙනවා. අන්න ඒ අධ්‍යාත්මික සබඳතාවට තමයි පහර දෙන්න ඕනෑ, ඒ නිසා තමයි 1981 සංවර්ධන සභා මැතිවරණයේදී යාපනය පුස්තකාලයට ගිනි තියන්නේ. ඒක රටම කම්පාවට ලක් කළ සිද්ධියක්. අපි නිරන්තරයෙන් ඒ සඳහා යුක්තිය, සාධාරණය ඉටු කළ යුතුයි.

යාපනයේ සහ අවට දූපත්වල පාසල් සිසුන් ඇතුළු පාඨකයන් විශාල පිරිසක් යාපනය පුස්තකාලය භාවිත කරනවා. නමුත් මෙම පාඨකයන්ගේ ප්‍රයෝජනය සඳහා යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය කර නැහැ. එම නිසා මෙම පුස්තකාලයට පරිගණක ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් ලබා දීමට මෙවර අය වැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. ඊට අමතරව, අනෙකුත් ප්‍රදේශවල පුස්තකාල සංවර්ධනය සඳහා මෙම අය වැය යටතේ තවත් රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

12 බලශක්ති අංශය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා බලශක්ති ක්ෂේත්‍රය ඉතා වැදගත් වෙනවා. බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පුනර්ජනනීය බලශක්තිය සහ

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

යටිතල පහසුකම් නවීකරණය කිරීම සඳහා වැඩි නැඹුරුවක් දක්වනවා. ගාස්තු තීරණය කිරීමේ දී ලංකාවට උපරිම වාසියක් ලබා දිය හැකි දේශීය හා විදේශීය ආයෝජකයින් දිරිගන්වන අතර බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට රජය අඛණ්ඩව කටයුතු කරනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගතකරණයට පහසුකම් සැලසීම සඳහා නියාමන රාමුවට අවශ්‍ය ප්‍රතිසංස්කරණවලට ප්‍රමුඛත්වය දෙමින් සංශෝධිත විදුලිබල පනත ඉක්මනින් සම්මත කිරීමට අපි අපේක්ෂා කරනවා.

මා දැක්කා, පාර්ලිමේන්තුවේත් විටින් විට මේ ගැන කථා වුණා.

සුළං බලයෙන් විදුලිය ජනනය කිරීමේ මෙගාවොට් 50ක ව්‍යාපෘතියකට අදාළව විදුලි ඒකකයක් සඳහා ඇමෙරිකානු ඩොලර් ශත 4.65ක මිලකට පසුගිය දා ටෙන්ඩරය ප්‍රදානය කළා.

ඒක තමයි අඩුම මිල. මතක තබාගන්න, අඩුම මිල. ලංකා ඉතිහාසයේ කවර හෝ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයක් මෙගාවොට් 50ක ධාරිතාවෙන් යුතු බලාගාරයක් මෙවැනි මිලකට ලබා දීලා නැහැ. ඒ, එය සෝලා ද, එය ජලය ද, එය සුළං ද කියා භේදයකින් තොරව. අපි සුළං විදුලි බලාගාරයක් සඳහා නියමිත පරිදි ටෙන්ඩර් කැඳවා අඩුම ලංසුවට -මෙගාවොට් 50ක්; ඒකකයක් ඩොලර් ශත 4.65ට- ලබා දුන්නා.

එවැනි තත්ත්වයක් තිබියදී, ඇමෙරිකානු ඩොලර් ශත 8.26ක් වැනි අධික ගාස්තුවකට ව්‍යාපෘති ලබා දීම සාධාරණීකරණය කළ නොහැකියි.

අපි ඒක කරන්න ඕනෑද? සමහර ව්‍යාපෘති රට අත්හැර යනවා කියලා බොහෝ අය පසුගිය දා අදෝනා නැඟුවා. හැබැයි, එසේ අදෝනාවක් නැඟිය යුතු ද? එය මන්නාරමේම ලංකාවේ සමාගමක් ඩොලර් ශත 4.65ට හදනවා. හැබැයි, ඒ මන්නාරමේම විදේශීය සමාගමක් ඒකකයක් ඩොලර් ශත 8.26ට හදන්න කියලා යෝජනා කරනවා. ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා.

කර්මාන්ත, අපනයනකරුවන් සහ පාරිභෝගිකයින්ට තරගකාරී පිරිවැයකින් බලශක්තිය සැපයීම සඳහා අපි අවම ගාස්තුවක් මත පදනම් වූ බලශක්ති ආයෝජන සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දීමට කටයුතු කරනවා. ආයෝජන ගෙන එනු ලබන සමාගම් හෝ රට මත රඳා පවතිමින් කටයුතු කිරීමට කිසිවිටකත් අප බලාපොරොත්තු වන්නේ නැහැ.

ආයෝජන ගෙන එනු ලබන සමාගම අපි සැලකිල්ලට භාජන කරන්නේ නැහැ වාගේම රට මත අපි රඳා පවතින්නේත් නැහැ. අපි හැම විටම කටයුතු කරන්නේ එය අපේ විදුලි පාරිභෝගිකයන්ටත්, අපේ කර්මාන්තවලටත් කොච්චර හිතකර ද, නැද්ද කියන සාධකය මතයි. රට කවරක්ද, සමාගම කුමක්ද කියන එක අපි සැලකිල්ලට භාජන කරන්නේ නැහැ. ඒක තමයි කළ යුතු වන්නේ. අපි ඒ කාර්යය කරනකොටත් අඬනවා නම් මට තේරුම් ගන්න බැහැ, ඒ මන්ත්‍රීවරයා කවුද කියලා.

මෙට්‍රික් ටොන් 10,000 බැගින් ක්‍රියාකාරී ධාරිතාවකින් යුත් ටැංකි 99කින් සමන්විත ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණයේ තෙල් සංස්ථාවට හා ඉන්දියානු ඔයිල් සමාගමට ලබා දී තිබෙන තෙල් ටැංකි හැර තවත් තෙල් ටැංකි 61ක් තිබෙනවා. මෙම තෙල් ටැංකි පිහිටි ස්ථානය ද සලකා බලන විට, ජාත්‍යන්තර ඉන්ධන වෙළෙඳ පොළ වෙත ප්‍රවේශ වීම සඳහා හොඳ අවස්ථාවක් තිබෙනවා, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ. ජාත්‍යන්තරව පිළිගත් ආයතන සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස එය සංවර්ධනය කිරීමට අප අපේක්ෂා කරනවා.

මොකද, ඒ තෙල් ටැංකි 61 සංවර්ධනය කිරීම හරහා ජාත්‍යන්තර වෙළෙඳ පොළට ප්‍රවිෂ්ටවීම සඳහා අපේ CPC එකට ඒ ශක්‍යතාව නැහැ. ඒ සඳහා හැකියාව, නිපුණතාව තිබෙන සමාගම් එක්ක ඒකාබද්ධව අපි එය සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වෙනවා.

13. කෘෂි කර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව

කෘෂි කාර්මික අංශය මගින් රටේ ශ්‍රම බලකායෙන් දළ වශයෙන් සියයට 30කට රැකියා සපයන අතර කෘෂි කාර්මික අංශය ග්‍රාමීය ආර්ථිකයේ කොදු නාරටිය වෙනවා. එමඟින්, කෘෂි කාර්මික අංශයේ විභවයන් වැඩිදියුණු කිරීම, ශ්‍රී ලාංකිකයන් අතිමහත් බහුතරයකගේ ආර්ථික අවස්ථා වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අවශ්‍යතාවක්.

කෘෂි කාර්මික අංශය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය එහි ඵලදායීතාව, තරගකාරිත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම අරමුණු කරගෙන තිබෙනවා. වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා රජය දැනටමත් 2025 වසර සඳහා රුපියල් මිලියන 35,000ක් වෙන් කරලා තිබෙනවා.

මොකද, රුපියල් 15,000ක් වූ පොහොර සහනාධාරය අපි රුපියල් 25,000 දක්වා වැඩි කළා.

ගුණාත්මක බීජ සංවර්ධනය, එල්ලංගා පද්ධති කළමනාකරණය සහ කෘෂි කර්මාන්තය තුළ කාර්යක්ෂම ලෙස ජලය භාවිතය ආදිය ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස රජය හඳුනාගෙන ඇති අතර, අය වැය ප්‍රතිපාදන මඟින් එම ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරනවා.

- **ප්‍රමාණවත් වී ආරක්ෂණ තොගයක් පවත්වා ගැනීම**

අපි දන්නවා, අපේ රටේ වී ගොවිතැන ගොවීන්ගේ ආර්ථිකය එක්ක ගැටගැහිලා තිබෙන බව. සහල් පරිභෝජනය පාරිභෝගික ජනතාවගේ ආර්ථිකයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා. ඒ නිසා මෙතැන monopoly එකක්; ඒකාධිකාරයක් නිර්මාණය වෙනවා. මෙය අප බිඳිය යුතුයි.

වී මිල නිරන්තරයෙන් පවතින අස්ථායීතාවයෙන් මිදීම සඳහාත්, වෙළෙඳ පොළේ සහල් ඉල්ලුම සහ සැපයුම සීමා කිරීමේදී ඊට ඔරොත්තු දීමේ පියවරක් ලෙසත්, 2024/2025 මහ කන්නයේ සිට ප්‍රමාණවත් ආරක්ෂණ තොගයක් පවත්වා ගැනීමට අපේක්ෂා කරනවා. ඒ අනුව, 2024/2025 මහ කන්නය සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා, වී මිලදී ගන්න.

වී අලෙවි මණ්ඩලය රුපියල් බිලියන 5ක වී මිලදී ගත්තාම, තව අවශ්‍ය නම්, ඒ වී තොගය ආරක්ෂණ තොගයක් හැටියට තියලා බැංකුවලින් තව ණය මුදලක් ලබා ගන්න පුළුවන්. අපි රාජ්‍ය බැංකුත් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. එතකොට අපි රුපියල් බිලියන 5ක් ආරම්භක වශයෙන් දෙනවා; ඒකෙන් වී මිලදී ගන්නවා; ඒවා ගබඩා කරනවා; ගබඩාවේ තිබෙන වී තොගය තියලා බැංකුවෙන් ණයක් ගන්නවා, නැවත වී මිලදී ගන්න. මේ ආරක්ෂණ වී තොගය නඩත්තු කිරීම අපේ ප්‍රමුඛතම කාර්යයක් හැටියට අපි සලකනවා.

- **තොරතුරු පද්ධති**

කෘෂි කාර්මික ක්ෂේත්‍රය මුහුණ දී ඇති ප්‍රධාන ප්‍රශ්නයක් තමයි සත්‍ය තොරතුරු දත්ත පද්ධති නොමැතිවීමේ ගැටලුව.

කෘෂි කාර්මික අංශයට කාලීන තීරණ ගැනීම සඳහා යාවත්කාලීන කරන ලද දත්ත සහ තොරතුරු පද්ධතියක් නැහැ. එබැවින් නිෂ්පාදන ස්ථානයේ සිට පාරිභෝගිකයා දක්වා සමස්ත වටිනාකම් දාමය ආවරණය වන පරිදි යාවත්කාලීන කරන ලද දත්ත සහ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරනවා. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහාය සමඟින් දැනටමත් ක්‍රියාත්මක "ආහාර සුරක්ෂිත ජීවනෝපාය හදිසි ආධාර ව්‍යාපෘතිය" මඟින් මූලදී සහාය දක්වන අතර, පසුව ලෝක බැංකුවේ "ඒකාබද්ධ ග්‍රාම නගර සංවර්ධන සහ දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘතියෙන්" ලැබෙන අරමුදල් සමඟ පුළුල් කිරීමට අපේක්ෂා කරනවා.

ඒ නිසා කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව පමණක් නොවෙයි, සෑම ක්ෂේත්‍රයක් ගැනම අපි තීන්දු තීරණ ගත යුත්තේ දත්ත මත පදනම්වයි. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ තීන්දු තීරණ විශාල වශයෙන් අභිතකර බලපෑමක් ඇති කර තිබෙනවා, නිවැරදි දත්ත පද්ධති නොමැතිවීම නිසා. ඒ නිසා නිවැරදි දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අපි කටයුතු කරනවා.

- **අනෙකුත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය වැඩි කිරීම**

වීවලට අමතරව, ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අනෙකුත් ක්ෂේත්‍ර භෝගවල නිෂ්පාදනය සහ ඵලදායීතාව ඉහළ නැංවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනවා. විශේෂයෙන්ම මුංඇට, උඳු, මිරිස්, රතු ලූනු, කව්පි, සෝයා, බඩ ඉරිඟු, අර්තාපල් සහ අනෙකුත් තෝරා ගත් ධාන්‍ය වර්ග මෙන්ම අල භෝග නිෂ්පාදනය, 2025-2027 මධ්‍යකාලීනව කඩිනම් වැඩ පිළිවෙළක් හරහා වර්ධනය කිරීමට නියමිතයි. 2025 වසර සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා දුන් ප්‍රතිපාදනයන්ට අමතරව - මේවාට කලින් සල්ලි දීලා තිබෙන්නේ - රුපියල් මිලියන 500ක් මේ සඳහා ලබා දීමට අප යෝජනා කරනවා.

වෙළෙඳ පොළේ වී සහ සහල් තොග එකතු කිරීම සහ ගබඩා කිරීම නියාමනය කිරීම සඳහා නියාමන රාමුවක් සකස් කිරීම අවශ්‍ය වෙනවා.

දැනට නියාමනය කිරීම සඳහා අපට නීති පද්ධතියක් නැහැ; පනතක් නැහැ; බලයක් නැහැ. තාවකාලික පනතක් සහ බලයක් තමයි අපට තිබෙන්නේ.

ඒ සඳහා, වී හා සහල් එකතු කිරීම සහ ගබඩා කිරීම නියාමනය කිරීමේ බලතල පැවරීම සඳහා වී අළෙවි මණ්ඩල පනත සංශෝධනය කිරීමට අප යෝජනා කරනවා.

- **නිෂ්පාදනය සඳහා ඉඩම් යොදා ගැනීම**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව - LRC, ප්‍රාදේශීය වැවිලි සමාගම් - RPCs, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය - NLDB - විසින් පාලනය කරන ඇතැම් වතු - *මනක නබා ගන්න* - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - SLSPC, ජනතා වතු සංවර්ධන මණ්ඩලය - JEDB - විසින් කළමනාකරණය කරනු ලබන ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන එම ඉඩම්වල යෝග්‍යතාවය පිළිබඳ සැලකිල්ලට ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතියන් ඇතුළත් පෞද්ගලික ආයෝජන සඳහා යොමු කිරීමට කටයුතු කරනවා.

මට මතකයි, සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාත් එක්ක අපි අමාත්‍යාංශ සාකච්ඡාවේදී කිව්වා, මධ්‍යම පළාතේ විතරක් ඌන උපයෝජිත ඉඩම් අක්කර 90,000ක් තිබෙන බව, මේවාට අයිති. අපේ ප්‍රතිපත්තිය මොකක්ද? ඉඩම් නිකම් තිබෙන්න බැහැ. අපට ඉඩම් සීමිත සම්පතක්. අපි දූපතක්, ඉතා කුඩා රටක්. ඒ නිසා ඉඩම් නිකම් නොතැබිය යුතුයි. ඒ නිසා ඌන උපයෝජිත ඉඩම් නැවත සංවර්ධනය කරන්න ඕනෑ. ඒ සඳහා පළමුකොටම මේ සම්බන්ධයෙන් වන මූලික කටයුතු සිදු කිරීමට අප රුපියල් මිලියන 250ක් වෙන් කරනවා.

අධ්‍යයනය කරලා කොතැනද කියලා හඳුනාගෙන කියන්න, අපි ආයෝජන කැඳවමු. කුඩා, මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඉඩම් ලබා දෙමු. වගා කරන්න, ආරම්භ කරන්න. මේ රට ගොඩ නඟන්න.

- **තරුණ ව්‍යවසායකයින් සහ නිෂ්පාදක සමුපකාර**

වර්තමානයේ සාර්ථක නිෂ්පාදක සමුපකාර ක්‍රමවේද පිළිබඳ ගෝලීය උදාහරණ බොහොමයක් තිබෙනවා. නවසීලන්ත කිරි නිෂ්පාදන සමුපකාරයක් වන ෆොන්ටෙරා, ඉන්දියානු කිරි ගොවි සමුපකාරයක් වන අමූල්, ස්පාඤ්ඤයේ මොන්ඩ්‍රගොන් සේවක සමුපකාරය මෙයට හොඳ ගෝලීය උදාහරණ වනවා.

සමුපකාර යන්ත්‍රණය දියුණු කරන විකල්ප නිෂ්පාදන ප්‍රවේශයක් අනුගමනය කිරීමට අප යෝජනා කරනවා. ඉඩම්, කෘෂි කාර්මික ව්‍යාප්ති සේවා සහ වෙනත් ආධාර සැපයීම තුළින් රජය මෙම සමුපකාර යන්ත්‍රණයට සහාය දීමට අපේක්ෂිතයි. මෙම ක්‍රමවේදයේ නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට -නීතියක් අවශ්‍යයි. නිකම් අපට සමුපකාර හදන්න බැහැ. අන්න ඒ නීතිමය රාමුව ශක්තිමත් කිරීමට- සහ අවශ්‍ය යටිතල පහසුකම් සහ මූල්‍ය දිරිගැන්වීම් ලබාදීම සඳහා 2025 වසරේ දී රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අපි අපේක්ෂා කරනවා.

- **කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය**

කෘෂි කර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාර ආරම්භ කිරීමට මුල පුරන සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයින් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනවා.

ඒ කියන්නේ, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායකයන් අපි කැඳවිය යුතුයි.

මේ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **කිරි නිෂ්පාදනය**

දැනට දේශීය කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් වන්නේ දේශීය ඉල්ලුමෙන් සියයට 45ක් පමණ සපුරාලීමට පමණයි. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරි නිෂ්පාදන අගයදාම වැඩිදියුණු කිරීම සහ දැනට ක්‍රියාත්මක වන අන්තර් සම්බන්ධතා සංවර්ධන ව්‍යාපෘතිය හරහා කිරි ගොවිපළ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2025-2026 වසර සඳහා රුපියල් මිලියන 2,500ක් ආයෝජනය කිරීමට අප යෝජනා කරනවා, කිරි ක්ෂේත්‍රයේ සංවර්ධනයට.

- **වාරිමාර්ග අංශයේ සංවර්ධනය**

ග්‍රාමීය ජනගහනයෙන් සියයට 75ක් පමණ කෘෂි කාර්මික අංශය පදනම් කරගත් ආර්ථිකයක් තුළ කටයුතු කරනවා. 2025 වසරේ වාරිමාර්ග අංශයේ සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයේ සමස්ත ආයෝජනය රුපියල් මිලියන 78,000ක් වෙනවා.

රුපියල් මිලියන 78,000ක් යොදවනවා, වාරි ක්ෂේත්‍රයේ සංවර්ධනයට. එ් නිසා තමයි මම හැම වෙලාවේම කියන්නේ, වී කියන්නේ පුද්ගලයෙකුගේ අයිතියක් නොවෙයි, ජාතික නිෂ්පාදනයක් කියලා. අපි මේ අවුරුද්දේ පමණක් වාරිමාර්ග ක්ෂේත්‍රයට රුපියල් මිලියන 78,000ක් යොදවනවා. ඒකෙන් අපට වී අස්වැන්න ආවාම ව්‍යාපාරිකයෙක් දෙදෙනෙකුගේ ඒකාධිකාරයට යටත් කරන්න බැහැ. ඒවා ජාතික ධනය. ඒ නිසා තමයි මා කලින් කිව්වේ ආරක්ෂණ තොගයක් නඩත්තු කිරීමත්

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

කරන බව. වී අලෙවි මණ්ඩලය පනත සංශෝධනය කළත් ඒක ආරක්ෂා කරන්න ඕනෑ.

මල්වතු ඔය, ගිං ගඟ, නිල්වලා, මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධනය, මුන්දෙනි ආරු ව්‍යාපෘතිය ඇතුළු නව ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති මධ්‍ය කාලීනව පවතින මූල්‍ය අවකාශය තුළ ප්‍රමුඛතාව සලකා ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනවා.

ඒ වාගේම ගල් ඔය, රාජාංගනය, මින්නේරිය සහ හුරුළු වැව පැරණි වාරිමාර්ග. සමහර පැරණි වාරිමාර්ගවලට අවුරුදු 70, 80ක් වාගේ වනවා. මේ යටතේ තිබෙන පහළ වාරිමාර්ග ඇළවල් ඔක්කොම විනාශ වෙලා තිබෙන්නේ.

ගල් ඔය, රාජාංගනය, මින්නේරිය සහ හුරුළු වැව යෝජනා ක්‍රමවල පහළ සංවර්ධන කටයුතු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2025දී රුපියල් මිලියන 2,000ක් ලබා දීමට අප කටයුතු කරනවා.

ඇත්තටම මේ මුදල වැඩි කළ යුතුව තිබුණා. එහෙත් ඒ ආයතනවලින් විමසා බැලුවාට පස්සේ මීට වඩා වැඩි මුදලක් මේ මාස 8හි වියදම් කිරීමට නොහැකි බව ඔවුන් ප්‍රකාශ කළා. නැත්නම් අපේ අපේක්ෂාව තිබුණේ තවත් වැඩි ප්‍රමාණයක් මෙම වාරිමාර්ග සඳහා ලබා දෙන්න. නමුත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු වන ධාරිතාව මත ඊට වඩා වැඩි මුදලක් මේ ස්ථාන 4ට වෙන් කරන්න යොදවන්න අමාරුයි කියලා ඔවුන් කිව්වා.

14. වැව්ලි සහ අනෙකුත් අපනයන භෝග

- **පොල් නිෂ්පාදනය වැඩි කිරීම**

පොල් නිෂ්පාදන සඳහා ගෝලීය ඉල්ලුම අඛණ්ඩව වැඩිවෙමින් පවතින අතර, කර්මාන්තකරුවන් විසින් පුරෝකථනය කර ඇති පරිදි, 2030 වසරේ දී රටේ මුළු ගෙඩි අවශ්‍යතාව ගෙඩි මිලියන 4,500ක් වනවා. එහිදී ගෙඩි මිලියන 1,800ක් ගෘහස්ථ පරිභෝජනය සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරන අතර ඉතිරි ගෙඩි මිලියන 2,700 කර්මාන්ත කටයුතු සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරනවා.

හැබැයි, අපේ නිෂ්පාදනය තිබෙන්නේ පොල් ගෙඩි මිලියන 3,000ක පමණ ප්‍රමාණයක්. නමුත්, 2030 වන විට අපට පරිභෝජනයට සහ කර්මාන්ත සඳහා පොල් ගෙඩි මිලියන 4,800ක් අවශ්‍යයි කියලා ඇස්තමේන්තු කර තිබෙනවා.

පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත ස්ථාපිත උතුරු පොල් ත්‍රිකෝණයේ - උතුරේ තිබෙනවා, හඳුනා ගත් පොල් ත්‍රිකෝණයක් - නව පොල් ඉඩම් අක්කර 16,000ක් පිහිටුවීම සඳහා උතුරු ප්‍රදේශයේ වගාකරුවන්ට ඉහළ අස්වැන්නක් සහිත පොල් පැළ සහ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට *මා* යෝජනා කරනවා.

- **අනෙකුත් අපනයන භෝග - කුළු බඩු**

කුරුඳු වැනි සාම්ප්‍රදායික අපනයනවල අගය එකතු කිරීම පුළුල් කිරීම සඳහා පියවර ගැනීමට නියමිතයි. මෙම නිෂ්පාදන අලෙවිකරණය සහ ප්‍රවර්ධනය ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල හරහා වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරනවා. සැපයුම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ජාත්‍යන්තර හවුල් ව්‍යාපාර හරහා අගය එකතු කළ අපනයනකරුවන් සමඟ සම්බන්ධ වීමට පහසුකම් සැලසීම සඳහා රජය ගොවීන්ට තාක්ෂණික සහාය ලබා දෙනවා.

ගෝලීය වටිනාකම් දාමයන්ට සම්බන්ධ වීම සඳහා ලංකා කුරුඳු සහ අනෙකුත් අපනයන භෝග සඳහා ඒකාබද්ධ නිෂ්පාදන සංවර්ධන සහ වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

15. ධීවර හා ජලජීවී වගාව

මිරිදිය ඉස්සන් බීජ ලබා ගැනීමේ හැකියාව සීමිත වීම ශ්‍රී ලංකාවේ මිරිදිය ඉස්සන් වගා කර්මාන්තය සහ සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාව තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන බාධාවක් ලෙස හඳුනාගෙන තිබෙනවා. ටැංකිවල මිරිදිය ඉස්සන් වගා කිරීම සහ සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීම සහ අපනයන ආර්ථිකය අරමුණු කරගත් අනාගත නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා ගොවි ප්‍රජාව/ ධීවර සමිති සහ ප්‍රාදේශීය ප්‍රජාවන් බලගැන්වීම සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව - PPP - ආකෘතියක් යටතේ මිරිදිය ඉස්සන් අභිජනනාගාර ස්ථාපිත කිරීම, ගොවි සමුපකාර හා අළෙවිකරණ ජාල ස්ථාපිත කිරීම සහ එවැනි අළෙවිකරණ ජාල සමඟ සම්බන්ධ වීමට ගොවි සමිතිවලට පහසුකම් සැලසීමට කටයුතු කරනවා. මේ සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරනවා.

16. සමාජ ආරක්ෂණය

වයස්ගත ජනගහනය වැඩිවීම, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය අඩු වීම සහ ශ්‍රම වෙළෙඳ පොළ හැකිළීම ආදී හේතු නිසා රට තුළ අභියෝගාත්මක තත්ත්වයක් නිර්මාණය වී තිබෙනවා. තවද ළමුන්, අඩු ආදායම්ලාභී කාන්තාවන්, වැඩිහිටියන්, දුප්පතුන් සහ ආබාධ සහිත පුද්ගලයන් ඇතුළුව ඇතැම් කොටස් අතර අසමානතාවන් සහ අවදානම් විශේෂයෙන් පවතින බව නිරීක්ෂණය වෙනවා. එබැවින්, ඵලදායී හා සමාන හවුල්කරුවන් ලෙස සමාජයට ඒකාබද්ධ කර ගනිමින් ඔවුන් ආරක්ෂා කිරීම සහ බලගැන්වීම අප රජයේ වගකීමක් කොට අපි සලකනවා.

- **"අස්වැසුම" ප්‍රතිලාභ ඉහළ නැංවීම**

අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් මත පැටවී ඇති බර ලිහිල් කිරීම සඳහා, සමාජ ප්‍රතිලාභ ලේඛනයේ සිටින අය සඳහා මුදල් ප්‍රදාන වැඩි කිරීමෙන් ඔවුන් ආරක්ෂා කිරීමට රජය අවශ්‍ය පියවර ගන්නවා. ඒ අනුව රජය 2025 වසරේදී සමාජ ආරක්ෂණ වියදම් සඳහා -ඒ කියන්නේ, අස්වැසුම සඳහා- රුපියල් බිලියන 232.5ක් දක්වා ශුද්ධ වියදම වැඩි කිරීමට අපේක්ෂා කරනවා. රුපියල් බිලියන 232.5ක් ඒ සඳහා වෙන් කරනවා. දුප්පතුන් සහ අන්ත දුප්පතුන් යන සමාජ කණ්ඩායම් දෙකටම ගෙවනු ලබන මාසික ප්‍රතිලාභ දීමනාව පිළිවෙළින් රුපියල් 8,500 සිට රුපියල් 10,000 දක්වා සහ රුපියල් 15,000 සිට රුපියල් 17,500 දක්වා 2025 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කළා. 2025 මාර්තු 31 වන දින එම ගෙවීම් අවසන් වීමට නියමිතව තිබූ සංක්‍රාන්ති මට්ටමේ සිටි සමාජ කණ්ඩායම් සඳහා ප්‍රතිලාභ ගෙවීමේ කාලය 2025 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කිරීමට අපි යෝජනා කරනවා. තවද, අස්වැසුම වැඩසටහනට ඇතුළත් නොවූ, එහෙත් සුදුසුකම් ලත් අයට යෝජනා ක්‍රමයට ඇතුළත් වීමට තවත් අවස්ථාවක් ලබා දෙමින් 2025 මැයි මාසයේදී නව තෝරා ගැනීම් අවසන් කිරීමට අපි අපේක්ෂා කරනවා.

නව තෝරා ගැනීම් යටතේ ආසන්න වශයෙන් පවුල් 280,000ක්වත් ඇතුළත් කරගත හැකි වෙයි කියලා අපි හිතනවා.

- **වකුගඩු රෝගීන් / ආබාධිත / වැඩිහිටි දීමනාව වැඩි කිරීම**

වකුගඩු රෝගීන් සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන මාසික දීමනා රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා වැඩි

කරන්න අපේක්ෂා කරනවා. වැඩිහිටි පුද්ගලයන් සඳහා වන මාසික දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා 2025 අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කිරීමට අපි යෝජනා කරනවා.

- **නිරසාර වෙනසක් සඳහා "අස්වැසුම" ප්‍රතිලාභීන් සවිබලගැන්වීම**

රජයේ ප්‍රතිපත්තිය අනුව මිලියන 1.2ක් වූ අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් දේශීය සහ විදේශීය අරමුදල් භාවිත කර සවිබලගන්වනවා. ආසියානු සංවර්ධන බැංකුවේ සහ ලෝක බැංකුවේ අරමුදල් සපයන ව්‍යාපෘතිවල සහාය ඇතිව නියමු ව්‍යාපෘතියක් ලෙස සවිබලගැන්විය යුතු පවුල් 25,000ක් තෝරාගෙන තිබෙනවා.

අස්වැසුම ලබන, එහෙත් ආදායම් මාර්ගයක් අහිමි අයගේ ආර්ථිකය වර්ධනය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් හැටියට පවුල් 25,000ක් තෝරාගෙන තිබෙනවා.

විභවතාව සහිත, සුදුසුකම් ලත් ඉතිරි පවුල් ක්‍රමානුකූලව, දේශීය අරමුදල් යොදා ගනිමින් සවිබලගැන්වීමට අපේක්ෂා කරනවා. ඒ අනුව සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා වෙන්කිරීම් රුපියල් මිලියන 500කින් වැඩි කිරීමට අපි යෝජනා කරනවා.

අධ්‍යාපනයට අදාළ ලිපිද්‍රව්‍ය සහ පොත්පත් මිලදී ගැනීමට සහාය වීම සඳහා අඩු ආදායම් ලබන කණ්ඩායම්වල එක් සිසුවෙකුට රුපියල් 6,000ක් ලබාදීම දැනටමත් ප්‍රකාශයට පත්කර ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන්ම ආර්ථික අර්බුදයේ දිගු කාලීන බලපෑම්වලට ඔරොත්තු දීමට උපකාර කිරීම සඳහා ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය මාර්ගයට ආධාර කිරීම පිණිස 2024 වසරේ ඔක්තෝබර් මාසයේ සිට 2025 මාර්තු මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ භූමිතෙල් සහනාධාරය වෙනුවෙන් ලබා දී ඇති මුළු මුදල රුපියල් මිලියන 3,000ක් වෙනවා.

- **පරිවාස-පුනරුත්ථාපන ආයතනවල, සහතිකලත් පාසල්වල, රිමාන්ඩ් භාරයේ සහ ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින ළමයින්ගේ සුබසාධනය වැඩි කිරීම.**

ඔවුන් දරුවන්. ඔවුන් පරිවාස භාරයේ ඉන්නවා; රිමාන්ඩ් භාරයේ ඉන්නවා; දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ඉන්නවා. අපි ඒ ගොල්ලන් බලා ගන්න ඕනෑ නැද්ද?

මේ වනවිට සහතිකලත් පාසල්, රැඳවුම් නිවාස, ළමා නිවාස 379ක් ක්‍රියාත්මකව පවතිනවා. එයින් ආයතන 47ක් රජය විසින් ක්‍රියාත්මක කරනවා. එම නිවාසවල පහසුකම් ඉතා අඩු මට්ටමක පවතින අතර, ඇතැම් ස්ථානවල ආරක්ෂාව පවා ප්‍රමාණවත් නොවන බව පෙනී ගොස් තිබෙනවා. ඇතැම් ගොඩනැඟිලි අලුත්වැඩියා කළ යුතු වන අතර, ඇතැම් දිස්ත්‍රික්කවල පවතින නිවාසවල ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති බවත් පෙනී යනවා.

එබැවින්, ළමුන්ගේ සුරැකුම් මධ්‍යස්ථානවල ධාරිතාව භෞතික වශයෙන් සහ මානව සම්පත් සංවර්ධනය යන අංශවලින් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා.

- **වූදිත ළමුන් අධිකරණවලට සහ එහි සිට ප්‍රවාහනය කිරීමේදී ආයතනගත ළමුන් සඳහා ළමා හිතකාමී ප්‍රවාහන ක්‍රමයක් ස්ථාපනය කිරීම.**

වූදිත ළමුන් ඉන්නවා. ඔවුන් අධිකරණ වෙත ප්‍රවාහනය කරනකොට අර විශාල අපරාධකරුවන් එක්ක එකම බස් රථයකින් තමයි අරගෙන එන්නේ. ඒ දරුවන්ගේ මානසිකත්වය ගැන අපි කිසිසේත්ම හිතන්නේ නැහැ. ඒගොල්ලන් දරුවන්. ඒ අය අපරාධකරුවන් එක්ක එකට බස් එකේ ගෙනෙන්න අවශ්‍ය නැහැ.

ප්‍රමාණවත් නොවන *ප්‍රවාහන* පහසුකම් ඇතුළු බොහෝ හේතු මත ආයතනගත නිවස්නවල සිටින ළමයින් දැඩි අවදානමක සිටින බව අපි නිරීක්ෂණයකොට තිබෙනවා. ඒ අනුව, ඒ සඳහා සුදුසු වාහන මිලදී ගැනීමට 2025 වසර සඳහා රුපියල් මිලියන 250ක මුදලක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා.

- **අනාථ දරුවන් සහ තරුණයින් සඳහා සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම.**

අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සෑම පුරවැසියෙකුටම ගෞරවාන්විත සහ සුරක්ෂිත ජීවිතයක් ගතකිරීමට අවස්ථාව ලබාදීම සහතික කිරීමට රජය දක්වන කැප කිරීමට අනුකූලව අනාථ දරුවන් සඳහා පුළුල් සමාජ ආරක්ෂණ සහ නිවාස ලබා දීමට අපි යෝජනා කරනවා. මේ මූලික ක්‍රියාමාර්ගයෙන් ඔවුන්ට දිගු කාලීන සහයෝගය, කුසලතා සංවර්ධනය සහ මූල්‍ය සුරක්ෂිතභාවය ලබා දෙන අතර, ආර්ථිකයට ධනාත්මක ලෙස දායක විය හැකි, සවිබලගැන්වූ පුද්ගලයන් ලෙස ඔවුන්ගේ යහපැවැත්ම සහ සමාජයට ඒකාබද්ධ වීම සහතික කරනවා.

2025 වසරේ අය වැය මඟින් රජයේ ආයතනවල සහ රැඳවුම් නිවාසවල ඉන්න දරුවන්ගේ සුබසාධනය සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමේදී අදාළ ආයතන පහත කරුණුවලට ප්‍රමුඛතාව ලබා දිය යුතුය.

i. රැඳවුම් නිවාසවල සිටින ළමුන්ට සහ අනාථ දරුවෙකුට රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දෙනවා. එයින් රුපියල් 2,000ක් එම දරුවාගේ ගිණුමේ තැන්පත් කරනවා. ඉතුරු රුපියල් 3,000 ඒ දරුවන්ගේ වියදම් සඳහා ඔවුන්ගේ නීත්‍යානුකූල භාරකරුවන්ට ලබා දෙනවා.

ඒ දරුවා ඉන්නේ රැඳවුම් නිවාසයක; අනාථ නිවාසයක. හැම මාසයකම රුපියල් 2,000ක් ඒ දරුවාගේ ගිණුමේ තැන්පත් කරනවා. අමතරව, ඒ භාරකරුවන්ට තවත් රුපියල් 3,000ක් දෙනවා. ඒ කියන්නේ ඒ දරුවන් වෙනුවෙන් රුපියල් 5,000ක් අපි වෙන් කරනවා.

2025 වසරේ අය වැයෙන් මේ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

ii. මෙම දරුවන්ගෙන් බොහෝදෙනෙකුට නිවාස සහ ආරක්ෂාව සමඟ ජීවිතය ආරම්භ කිරීමට උපකාර කිරීම සඳහා පවුල් පසුබිමක් හෝ ආධාර පද්ධතියක් නැහැ.

එතැනින් එළියට ආවාට පසු ඒ දරුවන්ට එහෙම පසුබිමක් නැහැ; නැවත සමාජගත වීම සඳහා අවස්ථාවක් නැහැ.

එබැවින් එම අවදානමට ලක් විය හැකි ප්‍රජාවට නිවාස ලබා ගැනීමට නොහැකි වීම නිසා විවාහය කල් දමමින් සිටින අතර, එය සමාජ ආතතියට සහ *සමාජ* ආර්ථික විෂමතාවන්ට හේතු වෙනවා. ඔවුන්ට ඉතිරි කිරීමේ පදනමක් සපයන අතර, -අපි කලින් කියපු පරිදි ඉතිරි කිරීමේ පදනමක් සපයන අතර- නිවසක් තැනීමේ පිරිවැය පියවා ගැනීමට එය ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියලා අපි හිතනවා. මෙම යථාර්ථය සැලකිල්ලට ගනිමින් ස්ථාවර සහ ආරක්ෂිත නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියනයක නිවාස ආධාර ප්‍රදානයක් අප යෝජනා කරනවා.

මේ අවතැන් වෙලා සිටින දරුවන් විවාහයට පත් වෙනවා නම්, ඔවුන්ට නිවසක් ඉදිකර ගැනීම සඳහා රුපියල් මිලියනයක් ලබා දෙනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

මෙය ක්‍රියාත්මක කිරීම සඳහා රජය 2025 අය වැයෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවා.

iii. රැකවරණ නිවාසවල සහ රජයේ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සිටින දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබාදීමේදී නිසි අධ්‍යාපන පහසුකම් සහිත ළඟම ඇති ජාතික හෝ පළාත් සභා පාසලට ඇතුළත්වීමට අවස්ථා සහතික කිරීමට අප අපේක්ෂා කරනවා.

ඔහු ඉන්නේ රැඳවුම් මධ්‍යස්ථානයක නම්; ඔහු ඉන්නේ සුරැකුම් මධ්‍යස්ථානයක නම්, ඒ දරුවාට ඇඩ්‍රස් එකක් නැහැ. හැබැයි, අපි එතැන තිබෙන ළඟම ජාතික පාසලට හෝ පළාත් සභා පාසලට ඔවුන්ට ඇතුළත් වීම සඳහා අවශ්‍ය වන නීති සම්පාදනය කරනවා.

iv. පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සිටින පුනරුත්ථාපනය වන තරුණ තරුණියන්ට NVQ 3 හෝ 4 මට්ටමේ ගුණාත්මක වෘත්තීය/කුසලතා පුහුණුවක් ලබාදෙන පුනරුත්ථාපන ක්‍රමවේද අනුගමනය කිරීම, - නිදහස්වීමෙන් පසුව මොකක්ද වෙන්නේ? අපි දන්නවා, ගොඩාක් අය රිමාන්ඩ්භාරයේ ඉඳලා නිදහස් වුණාට පස්සේ මොකක්ද වෙන්නේ කියලා. ඒ අය රැකියාවකට යන්න කියලා පොලිස් සහතිකයක් ගන්න ගියොත් මොකක්ද දෙන clearance එක? ඔහු රිමාන්ඩ්භාරයේ හිටියා; වරදකරුවකු බවට පත්වෙලා හිටියා කියා තමයි වාර්තාව දෙන්නේ. ඒ නිසා ඔහු කිසිදු රැකියාවකට බඳවා ගන්නේ නැහැ. ඒ නිසා රිමාන්ඩ්භාරයේ හිටපු කෙනාට නැවත රිමාන්ඩ් වීම හැර වෙන පිළිතුරක් නැති තත්ත්වයට පත්වී තිබෙනවා. - නිදහස්වීමෙන් පසු වෘත්තියක් හෝ ජීවනෝපායක් සහිත යහපත් හා ඵලදායී පුරවැසියන් ලෙස සමාජයට සම්බන්ධවීමට ඔවුන්ට හැකිවීම, පුනරුත්ථාපනය වූ සහ යහපත් හැසිරීමක් පෙන්නුම් කරන අයට සුදුසු රැකියාවක් ලබා ගැනීමට බාධාවක් නොවන ආකාරයෙන් පොලිස්/ග්‍රාම සේවා සහතික නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අපගේ රජය අවධානය යොමු කරනවා.

v. රැඳවුම් නිවාසවල දරුවන් වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු සමාජයට නැවත ඒකාබද්ධ කරන විට සහ එවැනි දරුවන් -විශේෂයෙන් කාන්තාවන් සඳහා- විවාහ වන විට රජයේ නිවාස ආධාර, පුහුණුව සහ රැකියා බඳවා ගැනීම් සඳහා සුදුසුකම් මත ප්‍රමුඛතාව ලබාදීමට අප කටයුතු කරනවා.

vi. රැඳවුම් නිවාසවල දරුවන් වයස අවුරුදු 18 සම්පූර්ණ කිරීමෙන් පසු සමාජයට නැවත ඒකාබද්ධවීමට සුදුසු ස්ථානයක් නොමැති විට, විවිධ පුද්ගලයන් විසින් ඔවුන් අපයෝජනය කිරීම සහ සූරාකෑම වැළැක්වීමේ අරමුණින්, යම් යම් කොන්දේසි යටතේ පුද්ගලයන්ට මෙම ආයතනවල දිගටම පදිංචිවීමට ඉඩ සැලසෙන පරිදි අදාළ නීති සංශෝධනය කිරීමට අප අපේක්ෂා කරනවා.

අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසුව ඔහුව රැඳවුම් මධ්‍යස්ථානයෙන් එළියට දමන්න අපි අපේක්ෂා කරන්නේ නැහැ.

- **ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ දත්ත පද්ධතියක්**

ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් ආබාධ එකක් හෝ වැඩි ගණනකින් පෙළෙනවා. ඔවුන්ගේ ව්‍යාප්තිය, දුෂ්කරතා, අධ්‍යාපන මට්ටම, ආර්ථික කටයුතුවල නියැලීමේ **නොහැකියාවන්** සහ රැකියා පිළිබඳ විශ්වාසදායක දත්ත පදනමක් නොමැති බව අපට නිරීක්ෂණය වන කරුණක්. එබැවින්, 2025 වර්ෂයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ලේකම් කාර්යාලය යටතේ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ පුළුල් දත්ත සමුදායක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **ආපදා සහන**

මේක තමයි කලින් ආණ්ඩුවේ හිටපු මන්ත්‍රීවරු වැඩියෙන් අරගෙන තිබුණු සහනය. පසුගිය කාලයේ රුපියල් කෝටි 122ක පමණ මුදලක් හිටපු මන්ත්‍රීවරු ගත්තේ ආපදා සහන යටතේ.

ආපදා නිසා ජීවිත අහිමි වූ සහ ස්ථිර වශයෙන් ආබාධිතභාවයට පත් වූ පුද්ගලයන්ට මේ වන විට රුපියල් 250,000ක වන්දියක් ගෙවනු ලැබේ. ස්වභාවික ආපදා සහ වනසත්වයන්ගෙන් සිදු වන හානි නිසා සිද්ධ වන මරණ හා පූර්ණ ආබාධිත තත්ත්වයන් සඳහා ගෙවන වන්දි මුදල රුපියල් 1,000,000 දක්වා ඉහළ නැංවීමට *අපි අපේක්ෂා කරනවා.*

ආපදාවන් නිසා හානියට ලක් වූ ළමා නිවාස, වැඩිහිටි නිවාස සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ මධ්‍යස්ථාන ආදී වූ දේපොළ සඳහා රුපියල් මිලියන 2.5ක වන්දි මුදලක් ලැබෙන යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබේ.

හැබැයි, ලක්ෂ 900ක් නම් බැහැ.

- **මානසික සෞඛ්‍යය**

අපි පසුගිය කාලයේ දැක්කා, විශාල උස බිල්ඩින්වලින් බිමට පැනලා පාසල් දරුවන් මිය ගිය ආකාරය. මානසික ආතතිය සම්බන්ධ විශාල ප්‍රශ්නයක් අද සමාජය වෙළාගෙන තිබෙනවා. ඉතාම හිරිමල් වයසේ සිටින දරුවන් කිහිප දෙනෙකුම තට්ටු ගොඩනැඟිලිවලින් බිමට පැන මිය යන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. රජයක් ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි.

නව යොවුන් වියේ පසුවන්නන් අතර සියදිවි නසාගැනීම් පිළිබඳ අවාසනාවන්ත සිදුවීම් රාශියක් අප අත්විඳිමින් සිටිනවා. මෙම ගැටලුවේ බරපතළකම සමාජ ගැටලුවක් ලෙස රජය හඳුනාගෙන තිබෙනවා. එබැවින්, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් සිසුන් සහ නව යොවුන් වියේ පසුවන්නන් සඳහා දැනුවත් කිරීමේ සහ උපදේශන සේවා පුළුල් කිරීම සඳහා මධ්‍ය කාලීන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වසරේ රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

- **දේශීයව සහායක උපකරණ නිෂ්පාදනය කිරීම**

ආබාධ සහිත පුද්ගලයන් සඳහා සහායක උපකරණ ඉතා වැදගත් වන අතර, ඒවා ඔවුන්ගේ ශරීරයේ කොටසක් ලෙස සැලකේ. සියලුම පළාත්වල මෙම උපකරණ දේශීයව නිෂ්පාදනය කිරීමේ පහසුකම් පුළුල් කිරීම සඳහා පුළුල් වැඩසටහනක් අවශ්‍ය බව රජය අවබෝධ කරගෙන තිබෙනවා. එබැවින්, 2025දී මේ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. මූලදී රාගම, රක්තවේදය සහ පුනරුත්ථාපන රෝහලේ සහායක උපකරණ නිෂ්පාදන පහසුකම් ජාතික මධ්‍යස්ථානය ලෙස පුළුල් කරනු ලබන අතර අවශ්‍ය පරිදි කලාපීය නිෂ්පාදන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට කටයුතු කරනවා.

- **අලුත් අවුරුදු කාලය තුළ සහන මිලකට අත්‍යවශ්‍ය ආහාර ලබා දීම**

වැඩි වූ ජීවන වියදම අඩු කිරීම සඳහා ආධාරක පියවරක් ලෙස දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමට ඉඩ සලසමින් උත්සව සමය සඳහා ආහාර පැකේජයක් ලබා දීමට රජය තීරණය කර තිබෙනවා. ඒ අනුව, ඉදිරි අලුත් අවුරුදු සමයේදී ලංකා සතොස සමාගම හරහා සහල්, ටින් මාළු, පරිප්පු, ලූනු, අර්තාපල් සහ කරවල ඇතුළු වියළි ආහාර සලාකයක් ලබා දීමට යෝජනා කරනවා. මෙම සලාක ලබා දීමේ පිරිවැය වෙනුවෙන් අප රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අපේක්ෂා කරනවා.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මැතිවරණයෙන් ඉස්සෙල්ලාද? පස්සේද?

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
මම හිතන විධියට මැතිවරණය තිබෙන්නේ ඊට කලින්.

17. විදෙස්ගත ශ්‍රී ලාංකික ප්‍රජාව

ශ්‍රී ලංකාවේ විදෙස්ගත ශ්‍රමිකයින්, විදේශ විනිමය ප්‍රේෂණ සහ විදේශ රැකියාවලින් පසුව ඔවුන් ආපසු මව්බිමට ගෙන එන කුසලතා යන දෙඅංශයෙන්ම රටේ සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා. මෙම වැදගත් ශ්‍රී ලාංකික ප්‍රජාව දිරිගැන්වීමේ සහ ත්‍යාග පිරිනැමීමේ ක්‍රම අපි ගවේෂණය කරමින් සිටිනවා. පළමු පියවර වශයෙන්, ශ්‍රී ලංකාවේ විදෙස්ගත ශ්‍රමිකයන් නැවත මෙරටට පැමිණෙන විට ගුවන් තොටුපොළේ දී ඔවුන් සඳහා තිරු බදු නිදහස් සීමාව - duty-free allowance එක - වැඩි කිරීමට අපි යෝජනා කරනවා. පවතින විකල්ප පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයකින් පසුව දීමනාව සඳහා වන නිර්ණායක සහ පදනම තීරණය කිරීම ප්‍රසිද්ධ කරනවා.

18. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොලී යෝජනා ක්‍රමයක්

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොලී යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අප යෝජනා කරනවා. මෙම යෝජනා ක්‍රමය යටතේ වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයින් සුදුසුකම් ලබන අතර, ඔවුන්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා රුපියල් මිලියන 1ක් දක්වා වසරක ස්ථාවර තැන්පතු සඳහා වෙළෙඳ පොළේ පවතින පොලී අනුපාතවලට වඩා සියයට 3ක වාර්ෂික අතිරේක පොලී අනුපාතයක් ලබා දීමට යෝජනා කරනවා.

රුපියල් ලක්ෂ දෙකක් තිබුණොත්, සාමාන්‍ය බැංකු පද්ධතියේ තිබෙන පොලියට වඩා සියයට 3ක් ලැබෙනවා. ඔහුගේ තැන්පතුවේ රුපියල් ලක්ෂ 10ක් තිබෙනවා නම්, අවුරුද්දට රුපියල් 30,000ක් අතිරේකව ලැබෙනවා. ඒ කියන්නේ මාසයකට රුපියල් 2,500ක් අතිරේක පොලියක් හැටියට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දෙනවා.

මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවිය යුතු සියයට 3ක අමතර පොලියට අවශ්‍ය ප්‍රතිපාදන සඳහා රුපියල් මිලියන 15,000ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා. මෙය 2025 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වනවා.

19. මතින් තොර සමාජයක් බිහි කිරීම

සමාජයේ විවිධ කොටස්වලට බලපාන, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ගැටලුවක් බවට පත් වී තිබෙනවා. එබැවින්, දඬුවම් කිරීමෙන් එහා ගිය බහුවිධ ක්‍රමවේදයන් ඔස්සේ මත් ද්‍රව්‍යවලින් තොර සමාජයක් ඇති කිරීමේ වැදගත්කම රජය හඳුනා ගෙන තිබෙනවා. ඒ අනුව දැනුවත් කිරීමේ වැඩසටහන්, උපදේශනය ඇතුළු පුනරුත්ථාපන කටයුතු, සමාජ බලගැන්වීම සහ සමාජගත කිරීම සහ නීතිය බලාත්මක කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් සකස් කිරීමට අපි යෝජනා කරනවා. ඒ අනුව, මතින් තොර සමාජයක් ඇති කිරීමේ පුළුල් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මෙම මත් ද්‍රව්‍ය උවදුර තුරන් කරන්න අපි දැනට මත් ද්‍රව්‍ය ගෙන එන, විකුණන අය පසුපස තමයි හඹාගෙන යන්නේ. මේ විධියට අපි ප්‍රහාරය එල්ල කරන්නේ supply chain එකට. හැබැයි, මේකට තිරසර විසඳුමක් හොයන්න නම් demand chain එකත් අපි අඩපණ කරන්න ඕනෑ. Demand එක තිබෙනවා නම්, මොන නීති හා මොන ආරක්ෂණ විධි තිබුණත් supply එක සිදු වෙනවා. ඒ නිසා supply chain එක අඩපණ කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විශාල කාර්යයක් ඉටු කරමින් සිටිනවා. රජයේ අනෙකුත් ආයතන විසින් ඉල්ලුම - demand එක - අවම කිරීම සඳහා එම ප්‍රජාව - මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්, ඇබ්බැහිවීම් පරිසරයක ඉන්න අය - නැවත යථාවත් කිරීම් සඳහා තමයි අපි මෙම මුදල වෙන් කරන්නේ.

20. වරදකරුවන් වූ සිරකරුවන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන

දැනට දිවයින පුරා පිහිටි බන්ධනාගාර 37ක සිරකරුවන් 30,000ක් පමණ සිටිනවා. ඔවුන්ගෙන් තුනෙන් එකක් වැරදිකරුවන් වන අතර, අනෙක් අය රිමාන්ඩ් සිරකරුවන්. "සිරකරුවන් ද මනුෂ්‍යයන් ය" යන මතය උල්ලංඝනය කරන බන්ධනාගාරවල තදබදය අධික වීම, ඔවුන්ගේ ජීවන තත්ත්වය පිරිහීමට හේතු වෙනවා.

සිරකරුවන්ගෙන් සියයට 65ක් පමණ ඔවුන්ගේ වැඩ කරන වයසේ, එනම් අවුරුදු 40ට අඩු වයස් සීමාවේ උපරිමයට පැමිණ සිටියි; *සිරකරුවන්ගෙන්* සියයට 65ක් අවුරුදු 40ට වඩා අඩුයි. එබැවින්, වෘත්තීය පුහුණු ආයතන සමඟ එක්ව රැකියා කළ හැකි සහ නිසි ඇගැයීමක් ලබා ගත හැකි කුසලතා සංවර්ධනයට අදාළ පාඨමාලා පවත්වා අදාළ වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අප යෝජනා කරනවා.

දැනට වෘත්තීය කටයුතු අමාත්‍යාංශය මඟින් මුදල් වෙන් කරලා තිබෙනවා, මේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කරන්න.

අමතර වශයෙන්, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දැනට වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 100කින් වැඩි කරන්න අපේක්ෂා කරනවා.

21. පොදු ප්‍රවාහනය නවීකරණය කිරීම

කාර්යක්ෂම පොදු ප්‍රවාහන පද්ධතියක් යනු අර්ථවත් ආර්ථික කටයුතු සහ සංචරණය සඳහා මිනිසුන්ගේ ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ තීරණාත්මක අංගයක්. එබැවින් නාගරික සහ තදාසන්න ප්‍රදේශවල වැඩි වන මගී ඉල්ලුමට සරිලන විධියට පවතින පොදු

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ප්‍රවාහන පද්ධතිය නව තාක්ෂණය සමඟ වැඩිදියුණු කිරීම සහ නව ප්‍රවාහන ක්‍රම හඳුන්වා දීම අත්‍යවශ්‍ය වෙනවා. ඒ අනුව, මහාමාර්ග සහ දුම්රිය යන ප්‍රවාහන පද්ධති දෙකම වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම කාලෝචිත අවශ්‍යතාවක්.

- **බස් රථ ප්‍රවාහනය නවීකරණය**

පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීමේ මූලික පියවරක් ලෙස නවීන සහ සුවපහසු, දියුණු තාක්ෂණයන් සහිත බස් රථ සමූහයක් නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දීමට අප කටයුතු කරනවා. ඒ අනුව, කොළඹ නගර ප්‍රදේශය තුළ ප්‍රධාන මාර්ග කොරිඩෝ තුනක් ඔස්සේ මගී ප්‍රවේශය සඳහා පහත් පතුලක් සහිත - low-floor buses - සැපපහසු බස් රථ 100ක් යෙදවීමට අපේක්ෂා කරනවා.

ඒ, කොට්ටාව - කොළඹ, මොරටුව - කොළඹ, වත්තල - කොළඹ සහ කඩවත - කොළඹ වශයෙන්. ඇත්තටම ගත්තොත් ප්‍රවේශ මාර්ග 4යි. ඒකට සැපපහසු බස් රථ 100ක් මිලදී ගැනීමට අපේක්ෂා කරනවා.

ඒ සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. මීට අමතරව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මගී ප්‍රවේශයට පහසු, පහත් පතුලක් සහිත බස් රථ 200ක් තම අරමුදල් යොදා ගනිමින් සේවයේ යොදවනු ඇති.

මොකද, අපි පොදු ප්‍රවාහන සේවය දියුණු කරනවා නම් මේ තිබෙන බස් රථවලින්, මේ තිබෙන ප්‍රවාහන සේවයෙන් එය දියුණු කරන්න බැහැ. ඒ නිසා අපි නව තැනකට යන්න ඕනෑ. ඒ සඳහා ආරම්භයක් ලෙස අපි නගර ආශ්‍රිතවත්, ලංගම මණිනුත් එය ක්‍රියාත්මක කරන්න සැලසුම් කර තිබෙනවා.

මෙම බස් රථ මෙට්‍රෝ බස් සමාගම ලෙස හඳුන්වන අලුතින් ස්ථාපිත කිරීමට අපේක්ෂිත බස් සමාගමක් යටතේ ක්‍රියාත්මක කරනවා. මේවා පරණ තැනටම දාන්නේ නැහැ.

යෝජිත බස් සමාගම් සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය වූ ක්‍රමවේදයක් මත ක්‍රියාත්මක වනු ඇති.

- **දුම්රිය ප්‍රවාහනය නවීකරණය**

දුර බැහැර මෙන්ම නාගරික සහ උපනාගරික ප්‍රදේශවලදී ද දුම්රිය පොදු ප්‍රවාහනය ඉතා වැදගත් වෙනවා. කෙසේ වුවද, මෙම දුම්රියවල දුර්වල තත්ත්වය මගීන්ගේ ආරක්ෂාවට, සුවපහසුවට සහ දුම්රියේ වේගයට ඍණාත්මකව බලපෑමක් ඇති කරනවා.

තවද, රට තුළ නව දුම්රිය මැදිරි අලුත්වැඩියා කිරීම සහ ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම එය කර්මාන්තයක් ලෙස ස්ථාපිත කිරීම වැදගත්කොට සලකනවා.

ඒ අනුව, එහි පළමු පියවර ලෙස දුම්රිය සේවාවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ වැඩි වන මගී ඉල්ලුමට සරිලන පරිදි සේවාවන් සැපයීමට, පැරණි මගී දුම්රිය මැදිරි ප්‍රතිසංස්කරණය කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අපේක්ෂා කරනවා.

රට තුළ ඇති නව මගී දුම්රිය අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් නව දුම්රිය මැදිරි ඉදිකිරීම ආරම්භ කිරීමට 2025 වසර සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

කාර්යක්ෂම දුම්රිය සේවාවක් සැපයීම සහ පොදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන කැලණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ලෙන් ඔබ්බට අදියර වශයෙන් දීර්ඝ කිරීමට යෝජනා කරනවා.

එය අධ්‍යයනය කළ යුතුව තිබෙනවා. එහි අවතැන් වුණු අය ඉන්නවා; පදිංචි වුණු අය ඉන්නවා. විශාල ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ නිසා අපට මේ වසරේ එහි වැඩකටයුතු ආරම්භ කරන්න බැහැ. හැබැයි, අපට මේ වසරේ පුළුවන් ඒකට කුමක්ද කරන්නේ යන්න හඳුනා ගැනීම සඳහාත්, ජනාවාස ඉවත් කිරීමේදී සිදු වන වන්දි ගෙවීම සඳහාත් කටයුතු කරන්න.

ඊට අදාළ මූලික වැඩකටයුතු ආරම්භ කිරීම සඳහා 2025 අය වැය තුළින් රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට අපි අපේක්ෂා කරනවා.

ලංගම බස් රථ සහ පෞද්ගලික බස් ක්‍රියාකරුවන් අතර සෑම බස් මාර්ගයකම ඒකාබද්ධ කාල සටහනක් ක්‍රියාත්මක කිරීමේ හැකියාව රජය විසින් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ක්‍රියාත්මක කරනවා.

මොකද, අද පෞද්ගලික බස්, රජයේ බස් එක කාල සටහනකට නොවෙයි ධාවනය කරන්නේ. ඒ නිසා තරගය වැඩි වෙලා තිබෙනවා; පොරබැදීම වැඩි වෙලා තිබෙනවා. එම නිසා එම වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරලා ඒකාබද්ධ කාල සටහනකට යන්න ඕනෑ කියන යෝජනාව අපට තිබෙනවා.

ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් වැදගත් බලපෑම් ඇති කරන මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජය අඛණ්ඩව ආයෝජනය කරනවා.

- **කෘෂි කාර්මික නිෂ්පාදන සඳහා දුම්රිය ප්‍රවාහනය**

අධික පිරිවැය, ප්‍රවාහනයේදී පසු අස්වනු හානිය, මාර්ග තදබදය සහ පාරිසරික ගැටලු හේතුවෙන් මාර්ග ජාලය හරහා කෘෂි කාර්මික භාණ්ඩ ප්‍රවාහනය ප්‍රධාන අභියෝගයක් ලෙස පවතිනවා. මෙයට පිළියමක් ලෙස, කෘෂි කාර්මික නිෂ්පාදන එම නිෂ්පාදන මධ්‍යස්ථානවල සිට ගමනාන්තය දක්වා ගෙන යාමට ඒ සඳහාම විශේෂිත වූ දුම්රිය පාදක ප්‍රවාහනයක් හඳුන්වා දීමට අප යෝජනා කරනවා. නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි කාර්මික කලාපයක් වන තඹුත්තේගම සිට වෙනත් සුදුසු ගමනාන්ත වෙත කෘෂි කාර්මික නිෂ්පාදන ප්‍රවාහනය කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට අපි යෝජනා කරනවා.

ඒක තඹුත්තේගම වෙන්නේ, ආර්ථික මධ්‍යස්ථානයක් අසල තිබෙන එකම දුම්රිය ස්ථානය නිසායි. අනෙක් දුම්රිය ස්ථාන ආසන්නයේ ආර්ථික මධ්‍යස්ථාන නැහැ. තඹුත්තේගම දුම්රිය ස්ථානය එක්ක මට ඉතිහාසගත බැඳීමකුත් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒකත් මට මේ වෙලාවේ සිහිපත් වෙනවා.

අධ්‍යයනයේ නිර්දේශ මත ගබඩා පහසුකම් සහිත පැටවුම් තටාක ඇතුළත් කරමින් තඹුත්තේගම දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීමට අප සැලසුම් කරනවා. මෙම මූලික කර්තව්‍යය සඳහා සහාය දැක්වීමට ශක්‍යතා අධ්‍යයනය සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරනවා.

මා මීට කලිනුත් කියලා තිබෙනවා, මාගේ නිවසේ - අපේ ගෙදර - ලිපිනය බවට පත් වෙලා තිබුණේ, "කොළඹ දෙසට තනි සිග්නල් කනුව අසල, නල්ලච්චිය - තඹුත්තේගම" යනුවෙන්. ඒ නිසා සම්බන්ධයක් තිබෙනවා. මේ දුම්රිය ස්ථානය පමණක් නොවෙයි, උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඒ ප්‍රදේශ විශාල ආර්ථික ගැටලු ගණනාවකට මුහුණ දීලා තිබෙනවා. ඒ පිළිබඳව අපි අවධානය යොමු කරනවා.

- **ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ කලක් තිස්සේ පවතින ණය පියවීම**

ශ්‍රීලන්කන් ගුවන් සමාගම ගුවන් මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ප්‍රමුඛතම සේවාවක් ඉටු කරනවා. තවද, පසුගිය රජයන් රාජ්‍ය අයිතිය ඉවත් කර පුද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ගත් උත්සාහයන් ද අසාර්ථක වුණා.

ඒක දැම්මා. කවුරුවත් ආවේ නැහැ. ආපු අයට ඒ හැකියාව නැහැ. මතක නේ.

මේ අනුව, රජය එම බැංකු සමඟ ගිවිසුමක් අත්සන් කර 2025 වසරේදී ණය ආපසු ගෙවීම සඳහා රුපියල් මිලියන 10,000ක් මෙන්ම පොලිය ගෙවීමට රුපියල් මිලියන 10,000ක් වැය කිරීමට නියමිතයි.

ඒ කියන්නේ, ශ්‍රීලන්කන් ගුවන් සමාගමට අදාළ මේ ණය නැවත ගෙවීම සඳහා රුපියල් මිලියන 20,000ක වැය බරක් දරන්න භාණ්ඩාගාරයට සිදු වී තිබෙනවා. මා ස්ථිරව කියන්නම්, ණය ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙන්න පුළුවන්. හැබැයි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමට දෛනික operation කටයුතු සඳහා නම් භාණ්ඩාගාරයෙන් සල්ලි දෙන්නේ නැහැ.

කලක් තිස්සේ පවතින මෙම ණය සේවා පිරිවැය රජය විසින් පියවා ගත් පසු මෙහෙයුම් ලාභදායිත්වය සහනික කිරීම සඳහා ගුවන් සමාගම සම්පූර්ණ වගකීම දරනු ඇත. මේ සඳහා සමාගම විසින් නව මධ්‍ය කාලීන උපාය මාර්ගික සැලැස්මක් සකස් කරමින් සිටී. ඒ අනුව මේ සඳහා රුපියල් මිලියන 20,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

සාමාන්‍යයෙන් අපි කියනවා, "රජයකට බරක් දරාගෙන එනවා. මේවා බරවා කකුල් වාගේ වෙලා තිබෙනවා දැන්. බර දරාගෙන යන්න සිදු වෙලා තිබෙනවා" කියලා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අලුතින් ගන්න.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
ශක්‍යතා අධ්‍යයනය කරලා, තිබෙන තත්ත්වය හදලා, අපේ මූල්‍ය තත්ත්වය වර්ධනය කරගෙන තමයි අපට අලුතින් rent එකට හරි ගුවන් යානා ගත හැකි වන්නේ.

- **මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.**

ශක්තිමත් මාර්ග ජාලයක් යනු පුරවැසියන්, වෙළඳ පොළ සහ පොදු ජනතාව සේවය ලබා ගන්නා ස්ථාන සමඟ සම්බන්ධ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම්වල තීරණාත්මක අංගයක්.

ඒ අනුව දිවයින පුරා ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා දැනටමත් වෙන් කර ඇති රුපියල් මිලියන 26,680ට අමතරව, ඌන සංවර්ධන ග්‍රාමීය ගම්මාන, සංචාරක ගමනාන්ත, කර්මාන්තපුර සහ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන/ ප්‍රදේශ සම්බන්ධ කරන මාර්ග සඳහා ප්‍රමුඛත්වය දෙමින් ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කිරීමට අපේක්ෂා කරනවා.

සියලුම ජනතාවට ආරක්ෂිත සහ විශ්වසනීය ගමනාන්තයක් සහතික කිරීම අරමුණු කරගනිමින්, ග්‍රාමීය පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අපේක්ෂා කරනවා, වෙන් කොට තිබෙන මුදලට අමතරව.

- **උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග සහ පාලම්**

උතුරු පළාත ප්‍රධාන සංවර්ධන ක්‍රියාවලින් බොහෝ දුරට හුදකලා වී ඇති බව නිරීක්ෂණය වෙනවා. කෙසේ වෙතත්, එම පළාතෙන් අපගේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට විශාල හැකියාවක් තිබෙනවා. ඒ නිසා මූලික යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග සහ පාලම් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

පසුගිය දා යාපනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ගිය වෙලාවේදී එම පළාත් අධ්‍යක්ෂ මහත්වරු පෙන්වා දෙනු ලැබුවා, ඔවුන්ට මෙම මිලියන 5,000 මේ අවුරුද්දේ වියදම් කළ හැකි බව. ඊට වඩා ඔවුන්ට වියදම් කරන්න පුළුවන් නම් ඒත් අපි දෙන්න ලැහැස්ති වෙලා සිටියා. නමුත් ඔවුන් කිව්වා, රුපියල් මිලියන 5,000ක් වියදම් කළ හැකියි කියලා. අපි රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. යාපනය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා, මේ රුපියල් මිලියන 5,000 නිසි පරිදි මේ මාස අට ඇතුළත වියදම් කරලා ඒ ග්‍රාමීය පාරවල් සංවර්ධනය කර ගැනීම සඳහා මැදිහත් වීමට.

- **මුලතිව් වඩඩුවාකල් පාලම ඉදිකිරීම**

මෙකත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් ආපු යෝජනාවක්.

වඩඩුවාකල් මුහුදු මාර්ගය මුලතිව්, පුදුකුඩිරිප්පු සහ යාපනය යා කරන ප්‍රධාන මාර්ගය වන මුලතිව්, නන්දිකඩාල් කළපුවේ ද්වාරය හරහා පටු පාලමක් තිබෙනවා. මෙම පාලම අබලන් තත්ත්වයක පවතින බැවින් මගී ජනතාව දැඩි අවදානමකට ලක් වී තිබෙනවා. ඒ නිසා මුලතිව් දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතාවලට සමගාමීව වඩඩුවාකල් පාලම ඉදිකිරීමට අප යෝජනා කරනවා. ඒ අනුව, මේ සම්බන්ධ වැඩ ආරම්භ කිරීමට මෙවර අය වැය යටතේ රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප අපේක්ෂා කරනවා.

22. ප්‍රාදේශීය සංවර්ධනය

නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම කෙරෙහි අවධානය යොමු කරමින් විමධ්‍යගත අය වැය වැඩසටහන 2025 වසරේ ක්‍රියාත්මක කරනවා.

දන්නා අයට නොවෙයි, යටින් ලියුම් අරගෙන යන ඒවාට නොවෙයි, ජනාධිපති ලේකම් කාර්යාලයට ඇවිල්ලා යටින් යටින් මුණ ගැහෙන අයට නොවෙයි, listsවලට නොවෙයි ඒවා ලබා දෙන්නේ.

එක් මන්ත්‍රීවරයෙකුට 2025 වසර සඳහා රුපියල් මිලියන 10ක් වෙන් කර ඇති අතර, ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා දැනටමත් වෙන් කර ඇති රුපියල් මිලියන 11,250ක අය වැය ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 2,250ක් මේ සඳහා යොදා ගන්නවා. ඉතිරි අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 9,000ක් වෙන් කරනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ඒ රුපියල් මිලියන 9,000 දිස්ත්‍රික් සංවර්ධන කමිටුවලට එනවා. එතැනින් එන යෝජනා අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න පුළුවන්. වඩාත් හොඳ ඒකයි කියලා අපි හිතුවා. මොකද, පෞද්ගලිකව ලැබුණාම සමහර ඒවා අපතේ ගිය ඉතිහාසයක් අපට තිබෙනවා. අපි ඒක දන්නවා. ඒ නිසා යෝජනාවලට යන එක වඩාත් යෝග්‍යයි කියලා අපි කල්පනා කළා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපිවත් ගන්නවාද?

ගරු අනුර කුමාර දිසානායක මහතා
(*மாண்புமிகு அநுர குமார திஸாநாயக்க*)
(The Hon. Anura Kumara Dissanayaka)
නම ගැන, පාට ගැන නොවෙයි කල්පනා කරන්නේ. ව්‍යාපෘතිය ගැන.

23. දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන

අප දන්නා පරිදි, රජය විසින් වාර්ෂිකව අය වැය මඟින් විවිධ වැඩසටහන් සඳහා විශාල ආයෝජනයක් සිදු කළ ද දිස්ත්‍රික්ක රැසක පිළිතුරු නොමැති ප්‍රශ්න තිබෙනවා. මෙම විශේෂිත ගැටලු යටිතල පහසුකම් සංවර්ධනය, දේශීය නිෂ්පාදන වැඩිදියුණු කිරීම, ඵලදායී සේවා සැපයීම, වෙළෙඳාම සහ අළෙවිකරණය, ආයතනික සංවර්ධනය කිරීම් යනාදිය හා සම්බන්ධව විය හැකියි. සියල්ල ඇතුළත් සහ තිරසාර සංවර්ධනයක් කරා ළඟා වීමට නම්, දිස්ත්‍රික්කවල අවධානය යොමු නොවූ සහ නැගී එන අවශ්‍යතාවලට විසඳුම් අවශ්‍ය වෙනවා. මෙමඟින් පුද්ගලික අංශය ආර්ථික සංවර්ධනය සඳහා ආයෝජන ගෙන ඒම සඳහා උත්ප්‍රේරකයක් වන අතර මෙමඟින් දේශීය ප්‍රජාවට ඔවුන්ගේ ජීවනෝපාය යහපත් ලෙස ඉහළ නැංවීමට ද හැකියාව ලැබෙනවා. මෙම සන්දර්භය තුළ, දිස්ත්‍රික් මට්ටමින් මතු වන ගැටලු විසඳීම සඳහා 2025 වසරේ අය වැයෙන් අමතර රුපියල් මිලියන 2,000ක් වෙන් කිරීමට මා අපේක්ෂා කරනවා.

ඒ කියන්නේ, මේ වෙන් කරන ඒවාට අමතරව කුඩා කුඩා ගැටලු මතු වෙන්න පුළුවන්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට ගියාම දැනට අපි සකස් කර තිබෙන යෝජනාවලට අමතරව වෙනත් යෝජනා එනවා. එතකොට මුදල් නැහැ කියලා ලබන වසරට යන්න ඕනෑ කියනවා. අපි ඒකට මුදල් සංචිතයක් වෙනම තබනවා.

24. නැඟෙනහිර පළාත සංවර්ධනය

නැඟෙනහිර පළාත ආර්ථික සංවර්ධනය සඳහා විශාල විභවතාවක් ඇති පළාත්වලින් එකකි. එබැවින්, අධ්‍යාපනය, සෞඛ්‍යය, කෘෂිකර්මය, ධීවර, සංචාරක සහ ප්‍රජා සවිබලගැන්වීම් යන ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනයට සහාය වීම සඳහා ඉන්දියානු බහු-ආංශික ප්‍රදාන ආධාර සමඟ නැඟෙනහිර පළාතේ පුළුල් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපි යෝජනා කරනවා.

ඉන්දියානු රජය විශාල ප්‍රදානයක් ලබා දෙන්න අපට එකඟතාව පළ කරලා තිබෙනවා. අපි ඒ ගිවිසුම් මේ වන කොට අත්සන් කරලායි තිබෙන්නේ.

25. "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ වැඩසටහන්

"මලයගම්" ජනතාව ශ්‍රී ලාංකීය ජාතියේ කොටසක් වන අතර ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ සැලකිය යුතු දුෂ්කරතා මැද ජීවත් වෙනවා. කෙසේ වෙතත්, මෙම ප්‍රජාවගේ ජීවනෝපාය තවමත් ගෞරවනීය ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට වඩා පහළින් පවතින්නේ. ඒ අනුව, පහත සඳහන් මුලපිරීම් සඳහා දැනටමත් රුපියල් මිලියන 7,583ක් අය වැය තුළ වෙන් කර තිබෙනවා.

i. වතු නිවාස සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 4,267ක් වෙන් කර තිබෙනවා.

ii. "මලයගම්" දෙමළ, තරුණයින්ගේ වෘත්තීය පුහුණුව, ජීවනෝපාය සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 2,450ක් වෙන් කර තිබෙනවා.

iii. "මලයගම්" දෙමළ ප්‍රජාවේ පාසල් සඳහා නවීන/ සුභූරු පන්ති කාමර සඳහා රුපියල් මිලියන 866ක් වෙන් කර තිබෙනවා.

26. කාර්මික සංවර්ධනය

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය, රටෙහි ආර්ථිකයේ ප්‍රධාන වශයෙන් රැකියා අවස්ථා සැපයීම, ආදායම් වැඩි කිරීම, නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සහ අපනයන ප්‍රවර්ධනය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, පහත යෝජනා ඉදිරිපත් කරනවා.

ශ්‍රී ලංකාවේ විශාල වශයෙන් ඇති ඛනිජ සම්පත්වල අගය එකතු කිරීම වැඩිදියුණු කිරීමට සහ දේශීය නිෂ්පාදන සඳහා අත්‍යවශ්‍ය කාර්මික යෙදවුම් සැපයීමේ අරමුණින්, අම්ල සහ ක්ෂාර ඇතුළු රසායනික නිෂ්පාදන සඳහා වෙන් වූ කාර්මික කලාපයක් පරන්තන්හි පිහිටුවීමට යෝජනා කරනවා. තවද, කන්කසන්තුරේ, මාන්කුලම්, ඉරනවිල, ත්‍රිකුණාමලය යන කාර්මික කලාප හතර ද කුරුණෑගල සහ ගාල්ල යන ප්‍රදේශවල ආරම්භ කර, එහෙත් අඩාළ වී ඇති කාර්මික කලාප, කාර්මික උද්‍යාන - techno parks - සංවර්ධනය කරනු ලැබේ. මේ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා.

කුරුණෑගල techno parks ආරම්භ කළා. හැබැයි එය අද අඩාළ වෙලා තිබෙනවා. ගාල්ලේ බිල්ඩින් එකක් තිබෙනවා; ඒ සඳහා ණයක් අරගෙන තිබෙනවා; දැන් එහි කැලය වැවිලා තිබෙනවා. විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා. මේවා කරලා තිබෙන්නේ එක එක කාලයට එක එක වුවමනාවට. සමහර ඒවාට සල්ලි දාලා තිබෙන්නේ, TRCSL එකෙන්. සමහර ඒවාට සල්ලි දාලා තිබෙන්නේ ලංකා බැංකුවෙන් ණයක් අරගෙන. ඒ නිසා වගකිව යුත්තෙක් නැති, අයිතිකාරයෙක් නැති තැන් බවට ඒවා පත් වෙලා තිබෙනවා.

- **මෝටර් රථ සහ රබර් නිෂ්පාදනය සඳහාම වෙන් වූ කාර්මික කලාපය**

උපාංග නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය වශයෙන් අගය එකතු කළ මෝටර් රථ නිෂ්පාදන/ එකලස් කිරීමේ කර්මාන්තය සහ රබර් නිෂ්පාදනය සඳහා සැලකිය යුතු මට්ටමේ ආයෝජනයක් අපනයන වෙළෙඳ පොළේ තරගකාරී වීම සඳහා අවශ්‍ය වනවා.

මෙම අරමුණින්, මෝටර් රථ උපාංග සහ රබර් නිෂ්පාදනය සඳහා කැප වූ කාර්මික ජනපදයක් ස්ථාපිත කිරීමට අපි යෝජනා කරනවා.

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ දැනටමත් වෙන් කර ඇති රුපියල් මිලියන 1,500ක අය වැය ප්‍රතිපාදන තුළ මෙම අවශ්‍යතාව කළමනාකරණය කිරීමට අප යෝජනා කරනවා.

27. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන

ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන ශ්‍රී ලංකාව සහ සමස්ත ශ්‍රී ලාංකීය සමාජය ඉහළ මට්ටමකට තිරසාරව ඔසවා තැබීම සඳහා සමාජීය සංවර්ධනය, පාරිසරික සංවර්ධනය සහ ආචාරධර්ම සංවර්ධනය යන ප්‍රධාන කුලුනු තුන ඔස්සේ ක්‍රියාත්මක කරන දැවැන්ත වැඩසටහනක්. මේ සඳහා සමස්ත මහජනතාව, රාජ්‍ය යන්ත්‍රණය, ව්‍යවසායකයන්, ව්‍යාපාරිකයන් ඇතුළු පෞද්ගලික අංශය, ජාතික සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව, ජාත්‍යන්තර ආධාර දෙන ආයතන, විවිධ වෘත්තිකයන්, විශේෂඥයන් ඇතුළු සියලුදෙනාගේ සහයෝගය ලබා ගැනීමට අපි අපේක්ෂා කරනවා.

මේ යටතේ ශ්‍රී ලාංකික සමාජයේ විවිධ ජාතීන් අතර, විවිධ ආගම් අතර, විවිධ වූ ජන කොටස් අතර සබැඳියාව, අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කරමින් සියලු ජන කොටස්වලට එක්ව සතුටු විය හැකි සංස්කෘතික උළෙලක් පැවැත්වීම, අප රටේ ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් වන වෙනස් හැකියාවන් පවතින කොටස් සඳහා පහසුකම් නිර්මාණය කිරීම, සංචාරක ව්‍යාපාරය සඳහා ත්‍රීවීල්, ටැක්සි රියදුරන් සහ සංචාරක මඟ පෙන්වන්නන් වැනි පහසුකම් සපයන්නන්ගේ ආචාරධර්ම ප්‍රවර්ධනය සහ ධාරිතා වර්ධනය කිරීම, පෞරාණික උරුමයන් සහිත තෝරාගත් නගර කිහිපයක් පෞරාණික අනන්‍යතාව සහිතව ප්‍රතිනිර්මාණය කිරීම, අඩු පහසුකම් සහිත තෝරාගත් පළාත් පාසල් ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීම, පාසල් උපකරණ අලුත්වැඩියාව සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේද දායකත්වයෙන් ඉහළ ප්‍රමිතියෙන් යුතු අධ්‍යාපන පරිසරයක් ඇති කිරීම, නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂක පහසුකම් වර්ධනය, ආහාරපානවල පිරිසිදුභාවය තහවුරු කිරීම, මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය, මත්ද්‍රව්‍ය නිවාරණය, අයාලේ යන වීදි සතුන් කළමනාකරණය, ගන අපද්‍රව්‍ය කළමනාකරණය, වෙරළ තීරය ආකර්ෂණීය සහ පාරිසරිකව තිරසාර ලෙස නිර්මාණය කිරීම, ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සහ ගංගාවල ජලයේ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම, ඉහළ සම්පත් උපයෝගිතාවක් ඇතිකිරීම සහ සුපිළිපන් රාජ්‍ය සේවයක් ගොඩනැඟීම සඳහා ක්ලීන් ශ්‍රී ලංකා සංකල්පය ප්‍රවර්ධනය සහ ප්‍රචාරය සිදු කරනවා.

ඒක වාහනවල අමතර කෑලි ගැලවීමක් හෝ වෙරළ ශුද්ධ කිරීමක් නොවෙයි, එතැනින් එහා යන පුළුල් සංකල්පයක්.

මේ සඳහා සහයෝගය ලබා දෙන්නන්ගේ මූල්‍යමය දායකත්වයට අමතර වශයෙන් 2025 වසරේ රාජ්‍ය අය වැය මඟින් රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා.

විශේෂයෙන්ම අපි දන්නවා, අපේ රටේ සිදුවන මාර්ග අනතුරු ගැන. පසුගිය අවුරුදු පහ ඇතුළත මාර්ග අනතුරුවලින් 12,000ක් මිය ගිහින් තිබෙනවා. 33,000ක් සදාකාලික ලෙස ආබාධිතයෝ වෙලා තිබෙනවා. 40,000ක් තුවාල ලබා තිබෙනවා. එතකොට, මේ මාර්ග අනතුරු විශාල ව්‍යසනයක් බවට පත් වී තිබෙනවා. අපි හැමදෙනාම රජයක් හැටියටත්, පුරවැසියන් හැටියටත්, අනෙකුත් දේශපාලන ව්‍යාපාරයත් -අපි හැම දෙනාමත්- මාර්ග අනතුරු කෙරෙහි අවධානය යොමු කළ යුතු නැද්ද? පසුගිය අවුරුද්දේ විතරක් 2,321ක් මාර්ග අනතුරුවලින් මියගොස් තිබෙනවා. මේක ජාතික ව්‍යසනයක්. මේ ජාතික ව්‍යසනය අපි පරාජයට පත් කළ යුතුයි. ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන මාර්ග අනතුරු අවම කිරීම, ජීවිත විනාශ වීම අවම කිරීම, ආබාධිතවීම අවම කිරීම සඳහා වන සැලසුමක්. මා ඒකට හැම දෙනාගෙන්ම සහාය ඉල්ලනවා. හැම වැඩසටහන්ම දිහාම දේශපාලන කෝණයෙන් බලන්න. හැබැයි, මෙම වැඩසටහන දෙස ඔබ දේශපාලන කෝණයෙන් බලන්න එපා. මෙය ජාතික අවශ්‍යතාවක් ලෙස අපි හඳුනාගත්ත වැඩසටහනක්.

28. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

රටේ බොහෝ ප්‍රදේශවල ගන අපද්‍රව්‍ය කළමනාකරණය ඉහළ යමින් පවතින ගැටලුවක්. සැලකිය යුතු ඓතිහාසික සංස්කෘතික වටිනාකමක් ඇති නගරයක් වන අනුරාධපුරයේ පවත්නා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුව එවැනි එක් උදාහරණයකි. වැඩිවන ජනගහනයත් සමඟ අනුරාධපුර ශික්ෂණ රෝහලේ සහ සාමාන්‍ය රෝහල්වල අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම අභියෝගයක් වී ඇති අතර, මහජන සෞඛ්‍යයට සහ පරිසරයට ද තර්ජනයක් වී ඇත. මෙයට මුහුණ දීම සඳහා, අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් සඳහා රුපියල් මිලියන 750ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා. මෙම මූලාරම්භය අනුරාධපුර නගරයේ පවිත්‍රතාව ඉහළ නැංවීම, පරිසරය ආරක්ෂා කිරීම සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වනු ඇත.

29. අලි-මිනිස් ගැටුම අවම කිරීම සහ වන සංරක්ෂණය

වන අලින්ගෙන් සිදුවන භෝග හානි, දේපළ විනාශය සහ ජීවිත හානි අවම කිරීම සඳහා පියවර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා කිලෝමීටර් 5,611ක් පමණ විදුලි වැටවල් වැඩිදියුණු කිරීම ඇතුළත් වන අතර, ප්‍රතිසංස්කරණය සඳහා කිලෝමීටර 1,456ක් හඳුනාගෙන ඇත. ඊට අමතරව වැට දිගේ ආරක්ෂක කණු ඉදිකිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගනු ලැබේ. මීට අමතරව ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, වඩා හොඳ තණබිම් කළමනාකරණය සහ වැඩිදියුණු කළ ජලමූලාශ්‍ර හරහා අලි වාසස්ථාන වැඩිදියුණු කරනු ලැබේ. මෙම උත්සාහය සඳහා රුපියල් මිලියන 300ක් දැනටමත් අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා.

තවද, වනජීවී කලාප කාර්යාල, ආරක්ෂක කාර්යාල සහ බීට්ටු නිලධාරීන් ඇතුළු කාර්යාල 270ක ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. මෙම අරමුදල් විදුලිවැට නඩත්තු කිරීම, වාහන සහ බෝට්ටු නඩත්තු කිරීම, වනජීවී අපරාධ වැළැක්වීම සහ අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා වන සමස්ත උත්සාහය සඳහා සහාය දක්වනු ඇත. එවැනි ගැටුම්වලට ගොදුරුවූවන් සඳහා වන්දි වශයෙන් අතිරේක රුපියල් මිලියන 240ක් වෙන් කර ඇති අතර, අලි- මිනිස් ගැටුම අවම කිරීම සඳහා වන මුළු වැය රුපියල් මිලියන 640 දක්වා වැඩිකොට තිබෙනවා. එපමණක් නොව, ස්වාභාවික පුනර්ජනනය ප්‍රවර්ධනය කිරීම සහ වන විනාශය ආමන්ත්‍රණය කිරීම සඳහා රුපියල් මිලියන 1,050ක් වෙන් කර තිබෙනවා. මෙම අරමුදල් නැවත වන වගා ප්‍රයත්න, වන සංරක්ෂණ මූලපිරීම්, වාණිජ වන වගා ව්‍යාප්තිය, පාරිසරික ආරක්ෂාව සහ කඩොලාන කළමනාකරණයට සහාය වනු ඇත. මේ තුළින් පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරයට පහසුකම් සැලසීම, වන ආවරණය වැඩි කිරීම, ළැව් ගිනි අවම කිරීම සහ වනාන්තර ආශ්‍රිත අපරාධ වැළැක්වීම සඳහා ද කටයුතු කිරීමට අපේක්ෂා කරනවා.

30. තිරසාර මූල්‍යකරණය

පාරිසරික, සමාජ සහ පාලන යන ක්ෂේත්‍ර මත පදනම් වූ මූල්‍යකරණයේ සමෘද්ධිමත් පරිසර පද්ධතියක් පෝෂණය කිරීම සඳහා රජය තිරසාර මූල්‍යකරණයේ අවස්ථා ප්‍රයෝජනයට ගනු ඇත. දේශගුණික විපර්යාස සඳහා වන මූලික ක්‍රියාමාර්ගයන් සහ ඒ ආශ්‍රිත ප්‍රයත්නවලට සම්බන්ධ ගෝලීය වශයෙන්

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

පවතින තිරසාර මූල්‍ය සංචිත වෙත ප්‍රවේශවීමට පරිසර අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව සමඟ එකිනෙක සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරනු ඇත.

31. මූල්‍ය වෙළෙඳ පොළ සංවර්ධනය

ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදයෙන් ක්‍රමයෙන් මිදීමත් සමඟ මූල්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය ද පැවැති පීඩාකාරී තත්ත්වයෙන් මිදී සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් සිටී. මූර්ත ආර්ථිකයේ වර්ධනය සඳහා උපකාරී විය හැකි ලෙස ස්ථානගත වන ආකාරයට මූල්‍ය වෙළෙඳ පොළ සංවර්ධනය කිරීම සඳහා දැන් කාලය එළඹ ඇත. ප්‍රාග්ධන වෙළෙඳ පොළ උචිත පරිදි නව අංගයන් සහ උපකරණ සහිතව තාක්ෂණය මුසුකර ගනිමින් සංවර්ධනය කිරීම සඳහා පුළුල් කිරීම සඳහා අවශ්‍ය වී තිබේ. රජය පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය හිමිකාරීත්ව ප්‍රාග්ධනය සහ ණය ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමට ආයතන උනන්දු කරවීම සඳහා රජය ක්‍රියාකාරීව අවශ්‍ය කටයුතු සූදානම් කරනු ඇත.

බැංකු පොලී අනුපාතික පහත වැටෙනවිට, සුළු පරිමාණ ආයෝජකයන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලැබෙන සුදුසු නිසි ලෙස නියාමනයට ලක් වුණු මූල්‍ය උපකරණ තුළ ආයෝජනය කිරීමේ ප්‍රවේශය තිබීම වැදගත් වේ. භාර අරමුදල්, ආයෝජන අරමුදල් සහ අනෙක් සමූහ ආයෝජන ක්‍රමවේද මේ වෙනුවෙන් භාවිත කිරීම පහසු කරවීම තුළින් මූල්‍ය වෙළෙඳ පොළේ ඇති හිඩැස් පිරවිය හැක. මේ සඳහා නවෝත්පාදන ක්‍රමවේද සහ සංකීර්ණ ගනුදෙනු කළ හැකි ක්‍රමවේද නිසි සුපරීක්ෂාවෙන් යුක්තව සහ අදාළ ආරක්ෂණ ක්‍රමවේදවලට අනුකූලව ඵලදායී නියාමන පරිසරයක් තුළ සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසනු ලැබේ.

32. පාලන ප්‍රතිසංස්කරණ

ආර්ථික ප්‍රගතියට ප්‍රධාන බාධාවක් වන්නේ දූෂණයයි. එබැවින්, සාමූහික උත්සාහයක් ලෙස රටේ තිරසාර ආර්ථික සංවර්ධනයට බාධා කරන ලෙස ව්‍යාප්ත වන දූෂණයට විසඳුම් සෙවීමේ හදිසි අවශ්‍යතාවක් පවතී. මෙම සන්දර්භය තුළ රජයේ නිලධාරීන් පමණක් නොව, පෞද්ගලික අංශයේ පුද්ගලයින් සහ සෑම පුරවැසියෙකුම දූෂණය පැවතීමට අදාළව ඔවුන්ගේ දායකත්වයක් ඇත්නම්, එය පිළිගත යුතුය. දූෂණය පිටු දැකීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පාලනය, විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා දූෂණ විරෝධී මූලපිරීම් මෙහෙයවීම සඳහා ජාත්‍යන්තර ආයතනවල සහාය ද ඇතිව ප්‍රසාරණය වන මූල්‍ය සහ අනෙකුත් සහයෝගය සමඟ අපරාධ ආදායම් පිළිබඳ පනත් කෙටුම්පත බලාත්මක කිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම - CIABOC - තවදුරටත් ශක්තිමත් කිරීම කඩිනම් කරනු ලැබේ. එපමණක් නොව, සහයෝගී කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියකින් පසු දැනට කෙටුම්පත් අදියරේ පවතින අපරාධ ආදායම් පිළිබඳ නීති සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීමට අප බලාපොරොත්තු වෙනවා.

ඒ අනුව වංචා, දූෂණ අවම කිරීම සඳහා අවශ්‍ය වන නීති ශක්තිමත් කිරීමට අවධානය යොමු කර තිබෙනවා.

33. ශ්‍රී ලාංකික දිනය

"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති රාමුව, ප්‍රජාවන් අතර පරතරයන් පියවීමට කැප වී, සංහිඳියාවෙන් යුත් ශ්‍රී ලංකාවක් සඳහා දැක්මක් ඉදිරිපත් කරයි. එබැවින්, "ශ්‍රී ලාංකික දිනය" ජාතික උත්සවය පැවැත්වීමට මා යෝජනා කරනවා. මෙම උත්සවය පෞද්ගලික අංශයේ ද සහභාගිත්වයෙන් සංවිධානය කෙරේ. මේ සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කිරීමට මා අපේක්ෂා කරනවා.

දෙමළ, මුස්ලිම්, සිංහල ජනයාගේ සංස්කෘතීන්, ආහාර රටා, විලාසිතා, සංගීතය ආදී සියල්ල මුසු කරපු ශ්‍රී ලාංකික දිනයක් අවශ්‍යයි. ඒ දිනය අපි මේ අවුරුද්දේ දෙවැනි සංචාරක season එක පටන් ගන්නකොට, ආරම්භ කිරීමට සූදානම් කර තිබෙනවා.

34. අභ්‍යන්තරව අවතැන්වූවන් සඳහා නිවාස

සංහිඳියා මූලපිරීම් සහ ඉඩම් නිදහස් කිරීමත් සමඟ අභ්‍යන්තරව අවතැන් වූ ජනතාව - අභ්‍යන්තර අවතැන්වූවන් - නැවත පදිංචි කරවනු ලබන අතර, ගැටුමෙන් පසු නැවත පදිංචි කිරීම සඳහා සරණාගතයින් උතුරු සහ නැඟෙනහිර පළාත්වලට නැවත පැමිණෙමින් සිටිනවා. කෙසේ වෙතත්, නැවත පදිංචි කරන ලද පවුල්වල මූලික යටිතල පහසුකම් සහ උපයෝගිතා තවමත් ඉටු කර නැහැ.

ඒ අනුව උතුරු සහ නැඟෙනහිර ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලු විසඳීම සඳහා බහුවිධ උපාය මාර්ගයක් ආරම්භ කිරීමට අප යෝජනා කරනවා. 2025 අය වැයෙන්, මෙම ජනතාව නැවත පදිංචි කිරීමේ අවශ්‍යතා සපුරාලීමට සහ නිවාස වැඩසටහන වේගවත් කිරීමට සහ වර්තමාන අවශ්‍යතාව මත පදනම්ව නිවාස නොමැති පවුල්වලට අත්‍යවශ්‍ය සහන ලබා දීමට රුපියල් මිලියන 1,500ක් වෙන් කිරීමට අපි යෝජනා කරනවා.

යාපනයේ සම්බන්ධීකරණ කමිටුවේදී මේ යෝජනාව ඒ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වුණා.

35. රජය විසින් ඉදිකරන ලද මහල් නිවාස සඳහා අත්‍යවශ්‍ය නඩත්තු

නඩත්තු නොමැතිකම සහ අවභාවිතය හේතුවෙන් මහල් නිවාසවල භෞතික තත්ත්වය දුර්වල වී තිබෙනවා. මෙම සියලු ගොඩනැඟිලිවල බාහිර මුහුණතේ ඉරිතැලීම්, විඛාදන සහ ජල කාන්දු වැනි බොහෝ භෞතික දෝෂ තිබෙනවා. මධ්‍යම රජය විසින් ඉදිකරන ලද මහල් නිවාස සංකීර්ණවල අත්‍යවශ්‍ය නඩත්තුව සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප අපේක්ෂා කරනවා.

මේ මහල් නිවාස යළි ප්‍රතිසංස්කරණය කළ යුතුයි.

36. කලාකරුවන්/මාධ්‍යවේදීන් සඳහා නිවාස

මහජන චීන සමූහාණ්ඩුවේ ආධාර ඇතිව නිවාස ඒකක 1,996ක් ඉදිකරමින් පවතී. මේ තුළ අප සමාජයේ සංස්කෘතික සුපෝෂණයට විශේෂ දායකත්වයක් සපයන කලාකරුවන් සහ මාධ්‍යවේදීන් සඳහා නිවාස ඒකක 108කින් සමන්විත මහල් නිවාස සංකීර්ණයක් කොට්ටාව, පලතුරුවත්ත ප්‍රදේශයෙන් වෙන් කරනවා.

ඒක ඉතා ඉක්මනින් ඉදිකිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

37. පානීය ජල අංශය

- **දැනට ක්‍රියාත්මක වන මහා පරිමාණ ජල යෝජනා ක්‍රම සහ ප්‍රජා ජල ව්‍යාපෘති කඩිනමින් නිම කිරීම.**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන නළ මාර්ග පානීය ජල ආවරණය රටේ ජනගහනයෙන් සියයට 62ක් පමණ ආවරණය කරයි. ආරක්ෂිත ජල සැපයුම සහතික කිරීමේ ජාතික

වැදගත්කම හඳුනා ගනිමින්, ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය, අලුත්ගම, මතුගම සහ අගලවත්ත ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය, පොල්ගහවෙල, අලව්ව සහ පොතුහැර ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය සහ ආර්ථික අර්බුදය සහ අදාළ ණය දෙන්නන් විසින් ණය පහසුකම් අත්හිටුවීම හේතුවෙන් නිම කිරීම ප්‍රමාද වී ඇති තඹුත්තේගම ජල සැපයුම් ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීම සඳහා අය වැය ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. පවත්නා මූල්‍ය අවකාශය තුළ හිඳිමින් වසර දෙකක කාලයක් තුළ රුපියල් මිලියන 41,234ක අරමුදලක් අවශ්‍ය බව අපි හඳුනා ගෙන තිබෙනවා.

රුපියල් මිලියන 41,000ක් අවශ්‍යයි, මෙම ව්‍යාපෘති සම්පූර්ණ කරන්න.

ඒ අනුව, ඉහත ප්‍රමුඛතා ව්‍යාපෘති නිම කිරීමට 2025 වර්ෂය සඳහා වන ජාතික අය වැයට රුපියල් මිලියන 20,000ක් දැනටමත් ඇතුළත් කොට තිබෙනවා.

- **ප්‍රජා ජලසම්පාදන යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම**

මේකත් යාපනය සම්බන්ධීකරණ කමිටුවෙන් අපට ආපු යෝජනාවක්.

විශේෂයෙන්ම නළ ජල ආවරණය සීමාසහිත ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා මූලික ජල සම්පාදන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අප අවබෝධ කරගෙන තිබෙනවා. උතුරු ප්‍රදේශය සහ නිදන්ගත වකුගඩු රෝගයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ ඇතුළු ජලය හිඟකමින් දුෂ්කරතා ඇති ප්‍රදේශවල අවදානම් තුරන් කිරීම මඟින් ග්‍රාමීය ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සම්පූර්ණයෙන්ම පිරිපහදු කළ පානීය ජල සැපයුම් සඳහා ප්‍රජා මූලික ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම එවැනි ප්‍රදේශවල ව්‍යාප්ත කිරීමේ වැදගත්කම අපි හඳුනා ගෙන තිබෙනවා.

ඒ අනුව, 2025 වසර සඳහා ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව යටතේ අය වැය ඇස්තමේන්තුවලින් වෙන් කර ඇති රුපියල් මිලියන 2,000ක් දැනටමත් ආරම්භ කර ඇති ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම අවසන් කිරීමටත්, නව ප්‍රජා ජල යෝජනා ක්‍රම ආරම්භ කිරීමටත් යෙදවීමට මා අපේක්ෂා කරනවා.

- **ගිරිබාව - එප්පාවල ජල යෝජනා ක්‍රමය නැවත ආරම්භ කිරීම**

උතුරු මැද පළාතට අයත් ගිරිබාව සහ එප්පාවල ප්‍රදේශ වියළි කලාපයක පැවතීම නිසා ගුණාත්මක පානීය ජලය ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවී ඇති අතර, එමඟින් එම ප්‍රදේශවල ජනතාවට විවිධ අවදානම් තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වී තිබේ. කලා ඔය හරහා කලා වැවෙන් පෝෂණය වන රාජාංගනය වැවෙන් ගිරිබාව සහ එප්පාවල ප්‍රදේශයට මතුපිට ජල මූලාශ්‍රවලින් පානීය ජලය ලබා දීමේ වැදගත්කම අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ සඳහා ප්‍රදේශයට නළ ජලය සැපයීම පිණිස ගිරිබාව - එප්පාවල ජල සම්පාදන යෝජනා ක්‍රමයේ මූලික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

38. රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම

රාජ්‍ය අංශය දේශපාලනඥයින්ගේ ආධාරකරුවන්ගෙන් පුරවා ගැනීමේ අතීත පුරුද්ද අප නතර කර තිබෙනවා.

කිසිදු කෙනෙක් දේශපාලන හිතවත්කම් මත අපි රාජ්‍ය සේවයට බඳවා ගන්නේ නැහැ.

රජයේ දැක්මට අනුකූලව රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ ස්ථාන මාරුවීම් දේශපාලන බලපෑම්වලින් තොර සුදුසුකම් සහ කුසලතා මත පදනම්ව සිදු කිරීමට අප කටයුතු කරනවා.

කොවිඩ්-19 වසංගතය, ආර්ථික පසුබෑම සහ දේශපාලන අස්ථාවරත්වය විසින් එල්ල කරන ලද අභියෝග හේතුවෙන් රැකියා විරහිත උපාධිධාරීන් විශාල පිරිසක් බිහි වී තිබෙනවා.

අපි පසුගිය දා රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයක් හඳුනා ගත්තා; විශාල පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවා. එහෙත්, මේ රාජ්‍ය යන්ත්‍රණය පවත්වා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයක් මැද තට්ටුවේ - මැද layer එකේ - තිබෙනවා.

ඒ නිසා රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා 30,000ක් බඳවා ගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක කරනවා. ඒ අනුව 2025 වසරේ දී මේ සඳහා රුපියල් මිලියන 10,000ක් වෙන් කිරීමට අපි අපේක්ෂා කරනවා.

ඒ රැකියා විරහිත උපාධිධාරීන් තොග පිටින් ගන්නා සංස්කෘතිය නැහැ. ඒ කියන්නේ, බඳවා ගන්නවා; කාර්යයකුත් නැහැ; තනතුරකුත් නැහැ; අනාගතයකුත් නැහැ; පුටුවකුත් නැහැ. ඒක සාධාරණද? ඒ නිසා අපි කරන්නේ, අත්‍යවශ්‍ය පුරප්පාඩු හඳුනා ගෙන තිබෙනවා. ඒවාට බඳවා ගැනීමේ පටිපාටිය අනුව මේ 30,000ම බඳවා ගන්න කටයුතු කරනවා. මේ වසරේ ඒ සඳහා අපි රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා තිබෙනවා.

39. රාජ්‍ය අංශයේ වැටුප් වැඩිවීම

රාජ්‍ය සේවයේ මූලික වැටුප් සංශෝධනයක් සිදු කොට දශකයකට ආසන්න කාලයක් ගත වී ඇති හෙයින්, සියලු ඝාධක සමස්තයක් ලෙස තක්සේරු කර, වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීමට දැන් කාලය පැමිණ තිබේ. රාජ්‍ය අංශයේ සේවකයන්ට යහපත් ජීවන තත්ත්වයක් ලබා දීම අවශ්‍ය වන අතර, රජයට දක්ෂ හා පුහුණු ශ්‍රමිකයන් ආකර්ෂණය කර ගැනීමට හැකි වන අතරම අය වැය මත අධික බරක් පැටවීම වළක්වා ගනිමින් මෙම වැටුප් වැඩි කිරීම සිදු කිරීමට අපි අපේක්ෂා කරනවා.

ඒ අනුව, අවම මාසික මූලික වැටුප රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා රුපියල් 15,750කින් වැඩි කිරීමට අප යෝජනා කරනවා.

මම දැක්කා, සමහර ගුරු ශ්‍රේණිවලට තිබෙන්නේ රුපියල් 38,000ක වැටුපක්. ඒ වැටුප රුපියල් 61,000 දක්වා වැඩි වෙනවා. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ වැටුප රුපියල් 80,000ක, 90,000ක ප්‍රමාණයකින් වැඩි වෙනවා.

දැනට පවතින තාවකාලික අතුරු දීමනාව සහ විශේෂ දීමනාව මූලික වැටුපට ඒකාබද්ධ කරන අතර රුපියල් 8,250ක ශුද්ධ වැඩිවීමක් මූලික අවම වැටුපට අදාළව සිදු කිරීමට යෝජනා කරනවා.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීමට සමගාමීව අධිකරණ සේවා, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා ද මෙය අදාළ වේ.

රුපියල් 15,750ක අවම මාසික මූලික වැටුප් වැඩිවීමට අමතරව වාර්ෂික වැටුප් වර්ධකයේ වටිනාකම සියයට 80කින් වැඩි කරනවා. ඒ අනුව, රුපියල් 250ක අවම වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 450 දක්වා වැඩි කරනවා. රුපියල් 500ක වැටුප් වර්ධකය රුපියල් 900 දක්වා වැඩි කරනවා. රාජ්‍ය අංශයේ සියලුම සේවකයන්ගේ වාර්ෂික වැටුප් වර්ධකය එම ප්‍රතිශතයට ගැළපීමට ද යෝජනා කරනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

මෙම වැටුප් වැඩිවීමේ සමස්ත ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 325ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවතින රාජ්‍ය මූල්‍ය බාධාවන් සැලකිල්ලට ගනිමින් මෙම වැටුප් වැඩිවීම අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනවා. මුළු ශුද්ධ වැටුප් වැඩිවීමෙන් රුපියල් 5,000ක් සහ ඉතිරි මුදලින් සියයට 30ක් 2025 වසරේ අප්‍රේල් මාසයේ සිට ගෙවනු ලබන අතර, ඉතිරි සියයට 70, 2026 වසරේ ජනවාරි සහ 2027 වසරේ ජනවාරි මාසවලදී සමාන කොටස් වශයෙන් ලබා දෙනවා.

එබැවින්, 2025 වසරේ දී යෝජිත වැටුප් වැඩිවීම් සඳහා රුපියල් බිලියන 110ක් වෙන් කිරීමට අපේක්ෂා කරනවා.

මෙම වැටුප් වැඩිවීමේ කොටසක් ලෙස, යෝජිත 2025 වැටුප් ක්‍රමය යටතේ විශ්‍රාම ප්‍රතිලාභ ලැබෙන බව සහතික කරමින්, 2025 ජනවාරි මස 1වැනි දා හෝ ඉන් පසුව විශ්‍රාම යන නිලධාරීන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ නව වැටුප් ව්‍යුහය මත ගණනය කිරීමට යෝජනා කරනවා.

ඒ කියන්නේ, 2025 ජනවාරි මාසයේ 01වැනි දායින් පසුව විශ්‍රාම යනවා නම්, කලින් කිව්ව මුළු වැටුප් වැඩිවීමට අනුරූප වන පරිදි විශ්‍රාම වැටුප ගළපනවා. මෙහිදී 2015, 2020 වර්ෂවල සිදු වුණු වියවුලක් තිබෙනවා. ඒ නිසා විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා. අවම වැටුප වශයෙන් රුපියල් 40,000ක් ලබන කෙනෙක් අද විශ්‍රාම යනවා නම්, ඔහුගේ වැටුප රුපියල් 40,000 දක්වා වැඩි වෙන්නේ අදියර තුනකින්. හැබැයි, විශ්‍රාම වැටුප රුපියල් 40,000ට අද හදනවා.

රාජ්‍ය සේවකයින්ගේ අවම මූලික වැටුප වැඩි කිරීම සලකා බැලීමේදී රාජ්‍ය සේවකයින්ගේ ආපදා ණය සීමාව දැනට පවතින රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා ඉහළ නංවනවා. වැටුප් වැඩිවීම් පිළිබඳ වැඩිදුර විස්තර ඇමුණුම v තාක්ෂණික සටහනෙහි දක්වා තිබෙනවා.

එක් එක් අයට වැටුප් වැඩි වෙන්නේ කොහොමද කියලා ඒකෙන් බලා ගන්න පුළුවන්.

40. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම

පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දැනට පවතින අවම මාසික වැටුප රුපියල් 21,000 සිට 2025 වසරේ අප්‍රේල් මස රුපියල් 27,000ක් ලෙස සහ 2026 වසරේ සිට රුපියල් 30,000 ලෙස ඉහළ නැංවීමට සේවායෝජකයන්ගේ සංගමය - Employers' Association එක - එකඟ වෙලා තිබෙනවා.

දැන් පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප ලෙස ලැබෙන්නේ රුපියල් 21,000යි. මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ සිට මූලික වැටුප රුපියල් 27,000ක් වෙනවා. 2026 ජනවාරි සිට ඒක රුපියල් 30,000ක් වෙනවා.

41. වතු කම්කරුවන්ගේ වැටුප් නැවත සලකා බැලීම

මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. අපි ස්ථාවරයක ඉන්නවා.

ප්‍රධාන වශයෙන් තේ, රබර් සහ පොල් යන ක්ෂේත්‍රවල නියැළෙන වතු කම්කරුවන් මිලියන 1.5කට ආසන්න සංඛ්‍යාවක් සිටිනවා. ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බව රජයේ අදහසයි. වතුකරයේ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇති වැඩසටහන්වලට අමතරව දැනට යෝජිත රුපියල් 1,700ක වැටුප ලබා දීම රජය සහතික කරනවා; මැදිහත් වෙනවා. මේක ලබා දෙන්න ඕනෑ.

දැනට රුපියල් 1,350යි. 350ට ඇවිල්ලා තිබෙනවා. දැන් බලමු අපි. එහෙම තමයි අපි යන්න ඕනෑ.

42. රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප්

විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප මේ වන විටත් රුපියල් 3,000ක් අප විසින් ජනාධිපතිවරණය ජයගත් විගසම වැඩිකොට තිබෙනවා.

රුපියල් 3,000ක් දැනටමත් වැඩි කරලා තිබෙනවා. නමුත්, 2017.12.31 දක්වා විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන් එකම වැටුප් පරිමාණයක සිටින බැවින්, 2016-2020 දක්වා විශ්‍රාම ගිය රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් පමණක් සංශෝධනය කිරීම තුළින් වැටුප් විෂමතාවක් ඇති වන බව අප නිරීක්ෂණය කළා.

ඒ කියන්නේ, විශාල ලෙස මේ 2016-2020 කාලයේ විශ්‍රාම ගිය අයගේ දුක්ගැනවිල්ලක් තිබෙනවා. ඔවුන්ට, ඔබතුමාගේ චක්‍රලේඛයකුත් තිබුණා. ඒ චක්‍රලේඛය අනුව ඒ වැටුප් වැඩිවීම සිද්ධ වුණේ නැහැ. *[බාධා කිරීමක්]*

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි නොවෙයි නැවැත්තුවේ. ගෝඨාභය රාජපක්ෂ.

ගරු අනුර කුමාර දිසානායක මහතා
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayaka)
කොහොම හරි නතර කළා, හවුලේ. ඊට පස්සේ අධිකරණයට ගියා නේ. ඒවා නඩු නිමිති හැටියට තිබෙනවා. නමුත්, ඒගොල්ලන්ට සාධාරණයක් ඉටු විය යුතුයි. හැබැයි, මේ අයට සාධාරණය ඉටු කරනකොට ඊට පෙර විශ්‍රාම ගිය අයට ආයෙත් අසාධාරණයක් සිද්ධ වීමේ ඉඩකඩ තිබෙනවා. ඒ නිසා, මේ විශ්‍රාමිකයන්ගේ ගැටලුව නැවත මතුවීමට ඉඩක් නැති වන පරිදි විසඳීමට අපි අපේක්ෂා කරනවා.

මෙම ගැටලුව දිගු කලක් තිස්සේ නොවිසඳී පවතින බැවින්, පවතින සීමිත මූල්‍ය අවකාශය තුළ එය අදියර වශයෙන් විසඳාගත යුතු බව අප විශ්වාස කරනවා. එනිසා, 2020.01.01 දිනට පෙර විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව 2020 වසරට අදාළ වැටුප් පරිමාණයන්ට අනුරූපව අදියර තුනකින් සංශෝධනය කිරීමට අප යෝජනා කරනවා.

ඒ කියන්නේ, 2020 ජනවාරි මාසයේ 01 වැනිදා වෙනකොට වැටුප් තලයක් තිබෙනවා. හැබැයි, 1990 දී විශ්‍රාම ගිය කෙනාගේ වැටුප් තලය වෙනස්. 2016දී විශ්‍රාම ගිය කෙනාගේ වැටුප් තලය වෙනස්. වැටුප් තල ගණනාවක් තිබෙනවා. හැබැයි, අපි 2020 ජනවාරි මාසයේ 01 වැනිදාට පෙර විශ්‍රාම ගිය සියලු දෙනාගේ විශ්‍රාම වැටුප 2020 ජනවාරි මාසයේ 01 වැනිදාට ගළපනවා. 1996 දී ඔහු විශ්‍රාම ගිහින් තිබුණත් 2020 ජනවාරි මාසයේ 01 වැනිදා වැටුපට අපි එය ගළපනවා. ගළපලා මොකද කරන්නේ? අපි ඒක අදියර තුනකින් ක්‍රියාත්මක කරනවා.

පළමු අදියර ලෙස, -ඔබතුමන්ලා වැටුප් වැඩි කරපු විධියට- 2018.01.01 දිනට පෙර විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි 2018 වසරට අදාළ තුන්වන අදියර වැටුප් පරිමාණයන්ට අනුකූලව සංශෝධනය

කරනු ලබන අතර එය 2025 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතයි. මෙම අදියර සඳහා, 2025 අය වැය හරහා රුපියල් මිලියන 10,000ක් වෙන් කිරීමට අප අපේක්ෂා කරනවා.

ඊළඟට 2026දී 2019 වැටුපට ගළපනවා. 2027දී 2020 වැටුපට ගළපනවා. 2027 වෙනකොට ලංකාවේ 2020ට පෙර විශ්‍රාම ගිය සියලු දෙනා ඉන්නේ එකම වැටුප් තලයක. එතකොට මේ වැටුප් විශාල ප්‍රමාණයකින් වෙනස් වෙනවා වාගේම විශ්‍රාමිකයන් අතර ඇති විශාල විෂමතාව අවම වෙනවා.

තවද, වැටුප් පරිවර්තනයේ සිව්වන සහ පස්වන අදියරවලට අදාළ විශ්‍රාම වැටුප් පරිවර්තනයන් පිළිවෙළින් 2026 ජූලි සහ 2027 ජූලි මාසවල සිට ක්‍රියාත්මක කිරීමට ද අප යෝජනා කරනවා.

43. නීති ප්‍රතිසංස්කරණ

ඉදිරි වසර තුළ රජය විසින්, වේගවත් ආර්ථික සංවර්ධනය, යහපත් ආණ්ඩුකරණය සහ ඵලදායී රාජ්‍ය සේවා සැපයීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ශක්තිමත් නීතිමය විධිවිධාන ස්ථාපිත කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ ගණනාවක් හඳුන්වා දීමට අපේක්ෂා කරනවා. මෙම නීති අතරට රාජ්‍ය ව්‍යවසායන්හි පාලනය වැඩිදියුණු කිරීම, -මම කලින් කිව්වේ, හෝල්ඩින් සමාගම- රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා නීතිමය රාමුවක් නිර්මාණය කිරීම, ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ පාලනය වැඩිදියුණු කිරීම, රාජ්‍ය වත්කම් කළමනාකරණය, සංඛ්‍යාලේඛන, දත්ත හුවමාරුව, තක්සේරු කිරීම, වත්කම් කළමනාකරණය, ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි වීම සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය යනාදිය ඇතුළත් වේ. මෙම නීති පිළිබඳ වැඩි විස්තර අය වැයෙහි ඇමුණුම VIII මඟින් දක්වා ඇත.

අපි නීති විශාල ප්‍රමාණයක් සංශෝධනය කරන්න බලාපොරොත්තු වෙනවා. දැන් තිබෙන ප්‍රශ්නය තමයි මේවාට සල්ලි කොහෙන්ද කියන එක.

44. ආදායම් ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනට පදනම වී ඇත්තේ, ආදායම මූලික කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයයි. ආර්ථික අර්බුදයට මහ පාදා දෙමින් රජයේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.3ක් වූ ලෝකයේ අඩුම මට්ටමක් 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ වාර්තා වුණා.

ලෝකයේ අඩුම ආදායම් මට්ටම තමයි 2022දී වාර්තා වූ සියයට 7.3.

2025 වර්ෂය සඳහා, ආදායම් උත්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් 2025 පෙබරවාරි 01 වන දින සිදු වූ මෝටර් රථ ආනයනය ලිහිල්කරණය මඟින් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා.

අපි දැනටමත් ඒවා ඉදිරිපත් කරලායි තිබෙන්නේ.

වාහන ආනයනය විදේශ අංශයේ ස්ථාවරත්වයට අනවශ්‍ය ඍණාත්මක බලපෑම් ඇති නොවන බව සහතික කිරීම සඳහා මෙම ක්‍රියාවලිය සැලකිලිමත් ලෙස අධීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වනවා. 2024 දෙසැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවේ දී දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අනෙකුත් ප්‍රධාන ආදායම් පියවර අතරට, පුද්ගලික ආදායම් බද්ද - PAYE Tax එක - සඳහා බදු රහිත සීමාව රුපියල් 100,000 සිට රුපියල් 150,000 දක්වා වැඩි කළා. දෙවන ආදායම් බදු ස්තරයට තවදුරටත් ගැළපීම් සිදු කළා. මට මතකයි, මා එය එදා පාර්ලිමේන්තුවේදී කිව්වා. නැවුම් කිරි සහ යෝගට් සඳහා වැට් බද්ද ඉවත් කිරීම යනාදිය ද ඇතුළත් වුණා.

පෙර ආණ්ඩු විසින් එකඟ වූ, අය කරන ලද කුලී ආදායම් බද්ද මෙම වසරේ ක්‍රියාත්මක නොකිරීමට ද රජය තීරණය කර තිබෙනවා.

ගිය අවුරුද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකඟතාවකට ආවා එය ක්‍රියාත්මක කරන්න. අපි එය ඉවත් කර තිබෙනවා.

මෙම අහිමි වන ආදායම් නැවත ලබා ගැනීම සඳහා ඩිජිටල් සේවා සඳහා වැට් බද්ද හඳුන්වා දීම, සේවා අපනයනය සඳහා සංස්ථාපිත ආදායම් බද්ද පැනවීම සහ සිගරට්/මත්පැන් සහ ක්‍රීඩා සඳහා සංස්ථාපිත බද්ද වැඩි කිරීම ඇතුළු පියවරයන් රජය දැනටමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට තිබෙනවා.

මේ කිසිවක් නැවත අලුතෙන් බදු පැනවීම් නොවෙයි. බදු පැනවීම් සියල්ල ජනවාරි මාසයේ සහ පෙබරවාරි මාසයේ මුල අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

මෙහි දක්වා ඇති බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මඟින් ශ්‍රී ලංකාවට, 2025දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.1ක ආදායම් ඉලක්ක සපුරා ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය කරන ආදායම ලබා දෙනු ඇතැයි අපි අපේක්ෂා කරනවා. කෙසේ වෙතත්, ඊට සමගාමීව, රජය බදු පරිපාලනය සහ අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ උත්සාහයන් ගන්නවා.

විශේෂයෙන්ම පසුගිය අවුරුද්දේ රේගු දෙපාර්තමේන්තුව සමත් වුණා, ඒ අවුරුද්දේ ඉලක්කසහගත බදු ආදායම උපයා දෙන්න. ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, බිලියන 20ක, 30ක වාගේ පරතරයක් ඇතුව ආදායම් උපයා දෙන්න සමත් වුණා. සුරාබදු දෙපාර්තමේන්තුව හරහා බදු ආදායම්වල විශාල ඉහළ යෑමක් ගිය වසරේ ලබා ගන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ කියන සියයට 15.1ක ආදායම් ඉලක්කය සපුරා ලීමේ කාර්යය රේගු දෙපාර්තමේන්තුවත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත්, විශේෂයෙන්ම සුරාබදු දෙපාර්තමේන්තුවත් තමන්ගේ කාර්යක්ෂමතාව වැඩි කරමින්, කැප කිරීම් පෙන්වමින් ඉටු කර දෙයි කියලා. මේ වැටුප් වැඩිවීම්වලින් අප අපේක්ෂා කරන්නේ එයයි. එම නිලධාරින්ට අවශ්‍ය කරන සහාය අපි ලබා දෙන්නම්. හැබැයි, තමන්ගේ රාජකාරී නිසි පරිදි අපට ඉටු කරලා දෙන්න, රටට ඉටු කරලා දෙන්න කියා අපි එම නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා.

ඇත්ත වශයෙන්ම, ඉදිරි අය වැය සඳහා ශ්‍රී ලංකාවේ ආදායම් උපායමාර්ගය තුළින් බදු පරිපාලනය ශක්තිමත් කිරීම, අනුකූලතාව වැඩිදියුණු කිරීම, වැඩිදියුණු කළ ඩිජිටල්කරණය සහ දැඩි අධීක්ෂණ යන්ත්‍රණ හරහා ආයතනික ශක්තිය වැඩිදියුණු කිරීම මඟින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගනු ලබනවා. ඒ සමඟම සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහන ලබා දීම ද අපේක්ෂා කරනවා.

මා කිව්වා, විශාල ලෙස සහන ලබා දෙන ආකාරය.

බදු පරිපාලනයේ මානව අන්තර්ක්‍රියා අවම කරන අතරම, කාන්දුවීම් අඩු කිරීම සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා බදු පද්ධති ඩිජිටල්කරණය කිරීම කෙරෙහි උත්සාහයන් යොමු කිරීමට අපේක්ෂා කරනවා.

ආර්ථිකය විධිමත් කිරීම සහ ආදායම් එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා වන පුළුල් ඩිජිටල්කරණ න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස, ශ්‍රී ලංකාව කාසි සහ නෝට්ටු රහිත ආර්ථිකයක් කරා ගමන් කරවනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

නවම අපි සාකච්ඡා කරමින් සිටිනවා. ටිකක් රිදෙන තීන්දු ටිකක් ඒ ක්ෂේත්‍රයේ ගන්නවා. ඒවා රටේ ආර්ථිකයටත්, දූෂණය වළක්වා ගැනීමටත්, කාර්යක්ෂමතාවටත් ඉතාම හොඳ තීන්දු. හැබැයි දූෂිතයන්ට, මුදල් අයථා ලෙස පරිහරණය කරන්නන්ට, වත්කම් අයථා ලෙස එක්රැස් කරගෙන තිබෙන අයට එයින් ටිකක් හානි වෙයි. කමක් නැහැ නේ. එහෙම කවුරුත් නැහැ නේ මෙතැන. එහෙම නම් ප්‍රශ්නයක් නැහැ. එහෙම ඉන්නවා නම් තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

ඩිජිටල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සහ මුදල් මත යැපීම අඩු කිරීම සඳහා ප්‍රධාන මූලපිරීමක් ලෙස, විශේෂයෙන් වැට බදු ලියාපදිංචි ව්‍යාවසායන් තුළ, ව්‍යාපාර තුළ point-of-sale යන්ත්‍ර - POS machines - භාවිතය ක්‍රියාත්මක කිරීමට අපි අපේක්ෂා කරනවා. POS machines *භාවිතය ක්‍රියාත්මක කරන්න ඕනෑ*. කාසි සහ නෝට්ටු රහිත ආර්ථිකයක්, බදු පැහැර හැරීම් සහ නීති විරෝධී මූල්‍ය ක්‍රියාකාරකම් මැඩ පවත්වනවා පමණක් නොව, ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනයට දායක වන මූල්‍ය කාර්යක්ෂමතාව ද වැඩි දියුණු කරනු ඇත.

රාජ්‍ය ආදායම් උත්පාදනය කරන ආයතන ඩිජිටල්කරණය කිරීම සහ සමස්ත ඩිජිටල් ආර්ථිකය, ආදායම් වැඩි දියුණු කිරීමේ උත්සාහයන් සඳහා සැලකිය යුතු ශක්තියක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් වගකීමක් ඇත්තේ බදු එකතු කිරීමේ බලධාරීන්ට පමණක් නොවේ.

විගණන සමාගම් සහ බදු ගණකාධිකාරිවරුන් ඇතුළු තවත් පාර්ශ්වකරුවන්ට, රජයට නිසි බදු ආදායම අහිමි නොවන පරිදි සමාජීය වශයෙන් වග කිව යුතු ආකාරයකින් තම රාජකාරි ඉටු කිරීමේ වගකීමක් ඇත.

අපි දන්නවා, ගණකාධිකාරිවරුන්, විගණන සමාගම්, බදු උපදේශකවරුන් වැඩිපුර උපදෙස් දෙන්නේ හා වැඩිපුර කටයුතු කරන්නේ රජයට ලැබෙන බදු ආදායම අහිමි කිරීමේ දිශාවට බව. අපි කියනවා, ඔවුන්ට සමාජයේ කාර්යයක් තිබෙනවා. ඔබ ඔබගේ ගනුදෙනුකරුවාගේ, ඔබගේ පාරිභෝගිකයාගේ බද්ද නිසි පරිදි රජයට ලබා දීම සඳහා කටයුතු කරන්න කියලා අපි ඉල්ලනවා.

මේ සම්බන්ධයෙන්, නියාමන සහ නීතිමය රාමුවට අනුකූල වීම සහතික කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට අප අපේක්ෂා කරනවා.

බදු පැහැර හරින්න බැහැ. සැම දෙනාම බදු ගෙවන්න ඕනෑ. සාධාරණ බද්දක් ගෙවන්න ඕනෑ. බදු ගෙවන එ් සැම කෙනාටම අපි කියනවා, ඔබ ගෙවන හැම බද්දකට අදාළ හැම රුපියලක්ම ආරක්ෂා කරලා, පෙරළා අපේ රටේ ජනතාවටත්, රට වෙනුවෙනුත් යොදවන්නම් කියලා. ඒ නිසා බදු ගෙවන්න. කිසි කෙනෙකු බදු නොගෙවා ඉන්න එපා. ඔබ සාධාරණ බද්දක් මේ රටේ සහ මේ සමාජයේ පැවැත්ම වෙනුවෙන් ගෙවිය යුතුයි. ඒ සඳහා මම ආරාධනා කරනවා.

මෙම බදු පරිපාලනය සහ බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ පියවර තුළින් 2025න් ඔබ්බට ශ්‍රී ලංකාවට ආදායම් ඉලක්ක ඉක්මවා යෑමට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරනවා. එම අවස්ථාවේදී, ආදායම් ඉලක්ක සපුරා ගැනීමට හානියක් නොවන ආකාරයෙන් සහ රටේ රාජ්‍ය මූල්‍ය හා ආර්ථික ස්ථාවරත්වය සහතික කරන ආකාරයෙන් මහජනතාවට තවදුරටත් සහන සැලසීමට හැකි වනු ඇත.

එතකොට තවත් ආධාර සපයන්න පුළුවන්. මේ ආර්ථිකය ගොඩ ගන්න පුළුවන් නිසි පරිදි බදු ගෙවන සංස්කෘතියක් අපේ රටේ නිර්මාණය වුණොත්. අපේ රටේ නිසි පරිදි බදු ගෙවන සංස්කෘතියක් වෙනුවට, බදු පැහැර හැරීම සඳහා උපක්‍රම හොයන සංස්කෘතියක් තිබෙනවා. ඒ සංස්කෘතියෙන් මිදුණොත් මේ රට අපට ගොඩ ගන්න පුළුවන්.

45. ණය ගැනීමේ සීමාව

2025 මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සඳහා ණය ගැනීමේ සීමාව ඇමුණුම IIහි ඉදිරිපත් කර තිබෙනවා. අදාළ වියදම් සහ ආදායම් පියවර පිළිබඳ තාක්ෂණික සටහන ඇමුණුම III සහ ඇමුණුම IVහි පිළිවෙළින් දක්වා තිබෙනවා. තවද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අය වැය දෙවන වර කියවීම සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන ද සභාගත කර තිබෙනවා.

මම ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා, මේ ලේඛන හොඳින් පරිහරණය කරන්න කියලා. අපේ ආර්ථිකය තිබෙන ස්ථානයත්, මේ ආර්ථිකය වෙනස් කිරීම සඳහා අපි දරන ප්‍රයත්නත් එහි මැනවින් පෙන්නුම් කර තිබෙනවා. අපි දන්නවා, අපේ ආර්ථිකය තිබෙන්නේ ඉතාම අසීරු තැනක බව. ඉතාම අසීරු තැනක සිට අපි මේක ගොඩ දැමිය යුතුයි. ඒ නිසා මේ සංඛ්‍යා දත්ත, මේ වාර්තා ඇතුළේ අපේ ආර්ථිකයේ ස්වභාවය, එය ගොඩ නඟා ගැනීම සඳහා දරන ප්‍රයත්නයත් සම්පූර්ණයෙන්ම සඳහන් වී තිබෙනවා. ඒ නිසා ඒවා අධ්‍යයනය කරන්න කියලා මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

සමාප්තිය

මම අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අය වැය යෝජනාවලිය තුළ ඇතුළත් ප්‍රතිපත්ති අප මේ තනතුරට පත් කරමින් රටේ ජනතාව අප වෙත තැබූ බලාපොරොත්තුවේ තීරණාත්මක පිළිබිඹුවක් වෙනවා. මේ අය වැය සහිත ප්‍රතිපත්ති වැඩ පිළිවෙළ මගේ හුදකලා ප්‍රයත්නයක් නොවන අතර, සහමුලින්ම සාමූහික උත්සාහයක ප්‍රතිඵලයක් වෙනවා. එය සමස්ත රජයේම අධිෂ්ඨානශීලී කැපවීමක් වෙනවා. අපගේ ආණ්ඩුවේ බොහෝ දෙනෙක් පාර්ලිමේන්තුවට ආගන්තුක වුවත් ඒ අය සතුව විශාල අත්දැකීම් හා ප්‍රායෝගික දැනුමක් තිබෙනවා.

මේ බොහෝ දෙනෙක් පාර්ලිමේන්තුවට ආගන්තුකයි. විටින් විට එය අවඥාවට භාජන කරන්න, එය සැහැල්ලුවට භාජන කරන්න දරන උත්සාහය මේ පාර්ලිමේන්තුවේ මා දැක තිබෙනවා. අපට සඟවන්න කිසි දෙයක් නැහැ. මේ සියලුදෙනා මේ පාර්ලිමේන්තුවට ආගන්තුක බව ඇත්ත. හැබැයි, ආගන්තුක වුවත් ඔවුන් සතුව ඇත්තේ විශාල අත්දැකීම් හා ප්‍රායෝගික දැනුම බව සිහිපත් කළ යුතුයි. මෙම අය වැය ප්‍රකාශය බිහි වූයේ අපේ රටේ ඉතිහාසය අලුතින් හැඩගැස්වීමේ අවස්ථාවට දායක වූ ඉමහත් කැපවීමක් ඇති, අනුග්‍රහශීලී නිලධාරීන් හා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අත්දැකීම්වලින්. ඒ වාගේම, තමන්ගේ වෘත්තීය ජීවිතය තුළ කීර්තිමත් වූ, දේශප්‍රේමී වෘත්තිකයන්ගේ ආත්ම විශ්වාසය හා ධෛර්යයෙන්.

මුළු ඩිජිටල් පරිවිඡේදයම ලිව්වේ ඒ පිළිබඳව ඉන්න විද්වතුන් විසින්. එහෙමයි මේ අය වැය ලේඛනය සකස් වී තිබෙන්නේ.

ඔවුන් ඉතිහාසයේ පළමු වතාවට පිරිසිදු, ක්‍රියාකාරී සහ හෘදයාංගම බවින් පිරි පාලනයකට දායක විය හැකි බව දැඩිව විශ්වාස කරනවා.

ඔබ මෙම රජයේ පෙළගැස්ම දෙස බැලුවොත් ඔබට පෙනෙනු ඇත්තේ, වඩාත්ම උද්‍යෝගශීලී හා විනයගරුක දේශපාලකයන් සහ තමන්ගේ වෘත්තීය ජීවිත, පවුල් සමඟ ගත කළ යුතු කාලය හා ව්‍යාපාරික උරුමය පවා තම රට වෙනුවෙන් කැප කළ, වඩාත් කීර්තිමත් විද්වතුන් හා වෘත්තිකයන්ගේ මිශ්‍රණයක්. අපි සියලුදෙනා එක්ව, දීර්ඝ අධිෂ්ඨානශීලී ගමනක් ආරම්භ කොට තිබෙනවා.

අපි ජීවන වියදම් අඩු කර තිබෙනවා. අපි අපගේ යුක්තිය පසිඳලීමේ පද්ධතිය පිළිබඳ විශ්වාසය ප්‍රතිස්ථාපනය කිරීම ආරම්භ කර තිබෙනවා.

යළි අපේ රටේ පොලීසිය පිළිබඳව, අධිකරණ පද්ධතිය පිළිබඳව, නීතිය පිළිබඳ විශ්වාස කරන සමාජයක් අවශ්‍යයි. අපි එය ආරම්භකොට තිබෙනවා.

එමෙන්ම, අපි ප්‍රථම වතාවට දූෂණය පමණක් නොව, බලයේ ඉහළ ධුරාවලියෙන් පවා දූෂණයට දක්වන අතරමැදි භූමිකාව අහෝසිකොට තිබෙනවා.

දූෂණය විතරක් නොවෙයි, ඒ සඳහා මහ පෙන්වන භූමිකාව පවා අහෝසි කොට තිබෙනවා.

වසර ගණනාවක් තිස්සේ, ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට කැමති අයට යමක් කිරීමට පෙර, අනවශ්‍ය ලෙස අතරමැදියන්ට ආයෝජනය කිරීමට සිදු වුණා.

මා මුණගැහෙන හැම ආයෝජකයෙකුටම කියන්නේ, "අතරමැදියන් අවශ්‍ය නැහැ, ඔබේ නියෝජිතයා තමයි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය" කියන එක. මොකටද, අමතර නියෝජිතයෝ? අතරමැදියෝ මොකටද? එම නිසා අපි ආයෝජකයන්ට කියන්නේ, ඔබට ආණ්ඩුවේ නියෝජිතයා ඉන්නවා, එම නිසා අතරමැද නියෝජිතයින් පස්සේ යන්න එපා කියායි. ආණ්ඩුවේ නියෝජිතයා තමයි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය. එම නිසා ඔබ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත එන්න.

ඒ යුගය දැන් අවසන් වී තිබෙනවා. මෙම රජයේ මහජන නියෝජිතයෙකු හෝ පත් කරන ලද කිසිදු නිලධාරියෙකු තම රාජකාරියට මුවාවී අනුග්‍රහ ලෙස අල්ලස් හෝ උපකාර ඉල්ලා සිටින්නේ නැති බවත්, එවැනි අවස්ථාවක් යම් හෙයකින් උදා වුවහොත් ඔවුන්ට අපගේ කිසිදු ආරක්ෂාවක් ලැබෙන්නේ නැති බවටත්, ඔවුන්ට එරෙහිව ගතහැකි සියලු ස්වාධීන නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවටත් සහතික වෙනවා.

එවැනි පාලනයක් අපට අවශ්‍යයි. එවැනි පාලනයකින් පමණයි මේ රට ගොඩනැඟිය හැකි වන්නේ. මෙම රජය කිසි විටෙකත් තම ගමන තුළ දූෂණයට ඉඩ තබන්නේ නැහැ. දැන් සංතෝසම් දිය යුතු අය බිය විය යුතු නැහැ. ඉස්සර නම් සංතෝසමක් නොදී වැඩක් කර ගන්න බයයි. ඒගොල්ලෝ දැන් බිය වෙන්න ඕනෑ නැහැ. එහෙත්, සංතෝසම් ගැනීමට උත්සාහ කරන්නන් බිය විය යුතුයි.

හැබැයි, අපේ රටේ මේ පාර්ශ්ව දෙකම බිය වුණා. අල්ලසක් ලබා නොදී වැඩේ කර ගන්න බැහැ කියලාත් බිය වුණා. දැන් අපි කියනවා, අල්ලසක් දෙන්න ඕනෑ කියලා කිසි කෙනෙක් බිය වෙන්න එපා. බිය නොවී ඉන්න. ඒ කියන්නේ මොකක්ද? අල්ලස් දෙන්න එපා. හැබැයි, අල්ලස් ගන්න අය බය වෙන්න ඕනෑ. මම සෑම ආයතනයකම ඉහළ නිලධාරීන්ටත්, දේශපාලකයන්ටත් කියන්නේ, හැම කෙනෙක්ම අල්ලස් ගන්න බය වන සමාජයක් නිර්මාණය කරන්න ඕනෑ කියන එකයි.

අපගේ අධිකරණය කිසි විටෙකත් මින් පෙර මෙතරම් නිදහස් හෝ ස්වාධීන වී නැහැ. අපගේ පොලිස් බලකාය කිසි විටෙකත් මින් පෙර මෙතරම් බලසම්පන්නව සහ ස්වාධීනව ක්‍රියාත්මක වී නැහැ.

මා ඔබට එක කාරණයක් කියන්නම්. අපේ පොලිස් දෙපාර්තමේන්තුවේ වර්තමාන වැඩ බලන පොලිස්පතිතුමා වැඩිම දඬුවම් ප්‍රමාණයක් ලබා දී තිබෙන්නේ පොලීසිය ඇතුළටයි. අත්අඩංගුවට ගැනීම් සිදු කර තිබෙනවා, 50කට ආසන්න ප්‍රමාණයකගේ වැඩ තහනම් කරලා තිබෙනවා. සමහර DIGsලා ඉන්නවා, OICsලා ඉන්නවා. ඒ ඇයි? ඔවුන් නම් අපගේ ආරක්ෂකයින්, පොලිස් දෙපාර්තමේන්තුව නම් නීතිය හා සාමය ස්ථාපිත කිරීමේ ප්‍රධාන ආයතනය, එම ආයතනය ඇතුළේ දූෂණය සිද්ධ වෙනවා නම්, ඒ ආයතනය ඇතුළේ අපරාධ සිද්ධ වෙනවා නම්, අපේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන්න බැහැ. එම නිසා වර්තමාන වැඩ බලන පොලිස්පතිතුමා විසින් මේ වන විටත් වැඩිම දඬුවම් ප්‍රමාණයක් ලබා දී තිබෙන්නේ පොලීසිය ඇතුළට. අපගේ පොලිස් බලකාය කිසි විටෙකත් මින් පෙර මෙතරම් බලසම්පන්නව සහ ස්වාධීනව ක්‍රියාත්මක වී නැහැ.

ඔවුන් කිසිවෙකුට බිය හෝ පක්ෂපාතීභාවයකින් තොරව නීතිගරුකව සිය ආයතනවල රාජකාරි කරනවා. එහෙත්, ශ්‍රී ලංකාව හැර ගිය බොහෝදෙනා දන්නා පරිදි, දූෂණයට නිත තැබීම යනු යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය බලාත්මක කිරීම පමණක් නොවෙයි. ඒ සඳහා රජය ක්‍රියාත්මක වන ආකාරය නවීකරණය කිරීම, රාජ්‍ය යන්ත්‍රණය වඩාත් කාර්යක්ෂමව හා වඩාත් පාරදෘෂ්‍යව ක්‍රියාත්මක කිරීම ද කළ යුතුයි. එවිට දූෂණයේ මූලික හේතුව විසඳෙනු ඇතැයි අප විශ්වාස කරනවා. දූෂණයේ මූල බීජය මෙයින් සහමුලින්ම තුරන් කරන අතර, අල්ලස් දීමට ඇති පෙළඹවීම අධෛර්යවත් වීමද, අල්ලස් ගැනීම තවදුරටත් අසීරු, දුෂ්කර කටයුත්තක් වනු ඇති.

ශ්‍රී ලංකාවට නවීන ලෝකය සමඟ ගැළපීමට මෙවන් ස්වර්ණමය අවස්ථාවක් මින් පෙර උදා වී නැහැ. අද මම දකින්නේ, එක්සත් ශ්‍රී ලංකාවක්, පිරිසිදු ශ්‍රී ලංකාවක්, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් තුළින් සැමදෙනාගේ අපේක්ෂාවන් සඵල කිරීමට ඇති සුවිශේෂී අවස්ථාවයි.

විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන්ද ඉල්ලීමක් කළ යුතුයි. ඇතැම් විට ඔබ ශ්‍රී ලංකාවේ උපත ලබා විදෙස්ගත පුරවැසියන් ලෙස ජීවත් වනවා විය හැකියි. එහෙත්, ඔබට ඇත්තේ ශ්‍රී ලංකාවේ මූලයන් බව අප විශ්වාස කරනවා. සමහර විට ඔබ ඔබේ මව්බිම ගැන ඔබේ දෙමව්පියන්ගෙන් පමණක් අසා ඇති වන්නට පුළුවන්. අපට නම් ඔබ සියලුදෙනාම ශ්‍රී ලාංකිකයන් බව අප විශ්වාස කරනවා.

ඔබේ රට ඔබේ සාර්ථකත්වය ගැන ආඩම්බර වෙනවා.

විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් විශාල සාර්ථකත්වයක් ලබාගෙන තිබෙනවා. ඔවුන් ප්‍රධාන ආයතනවල වැඩ කරනවා. ඔවුන්ගේ සාර්ථකත්වය පිළිබඳව අපි ආඩම්බර වෙනවා.

අපේ මව්බිම පිළිබඳව ඔබේ විශ්වාසය අහිමි වීමට හේතු අපට තේරුම්ගත හැකියි. ඔබ ඔබේ විශේෂඥ දැනුම, දක්ෂතා හා දෘෂ්ටිකෝණයන් අපේ මේ මනරම් දූපත් රටට දායක කිරීමට ගන්නා සෑම උත්සාහයක් සඳහාම අප හදවතින්ම කෘතඥතාව පළ කරනවා.

අප ඔබට ආරාධනා කරනවා, ශ්‍රී ලංකාව කොතරම් වෙනස් වී ඇත්දැයි බැලීමට ආපසු එන්න කියලා.

පෞද්ගලික, රාජ්‍ය හෝ ලාභ නොලබන අංශයේ වුවද ඔබගේ විශේෂඥ දැනුම, ආකල්ප සහ දෘෂ්ටි කෝණය අපගේ අධිෂ්ඨානශීලි දූපතට දායක කරන්න. අප සමඟ එකතු වන්න, අප සමඟ වැඩ කරන්න, අපට එක්ව ළඟා කළ හැකි සාර්ථකත්වයට එක්වන්න.

ගතවූ වසරේදී අපගේ රට වැසියන් බොහෝ දෙනෙක් නව මාර්ගයක් නිර්මාණය කිරීමටත්, අපේ රට නැවත ගොඩනැඟීමටත්, අපේ පුරවැසියන්ගේ සම්පූර්ණ ශක්තිය ඊට ලබා ගැනීමටත් ඡන්දය ප්‍රකාශ කළා. ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රදේශ උතුරේ සිට දකුණ දක්වා, නැඟෙනහිර සිට බටහිර දක්වා පොදු අරමුණක් යටතේ එකට එක් වුණා. ආගම, ජාතිය, ලිංගිකත්වය, පන්තිය හා වයස තවදුරටත් අපව බෙදන්නේ නැති බව අවධාරණය කළ යුතුයි. අපේ රටේ ජනතාව නැවත කිසි විටෙකත් එකිනෙකාට එරෙහිව බෙදෙන්නේ නැති බව අපට සහතිකයි. ඒ වාගේම තමන්ගේ දේශපාලනික, පෞද්ගලික ලාභ සඳහා අපේ රටේ ජනතාව එකිකෙනාට එරෙහිව පොලඹවා

ගැනීමට උත්සාහ කරන්නන්ගෙන් මුළා නොවන බවට මට විශ්වාසයක් තිබෙනවා.

යළි ජාතිවාදයේ ගැටුම මේ රටේ ජනතාව විශ්වාස නොකරයි කියලා අපි විශ්වාස කරනවා.

අපගේ රජයේ මහජන නියෝජිතයන් හෝ අප විසින් පත්කළ නිලධාරීන් සියලුදෙනා තුළ ඇත්තේ පොදු අරමුණක්. ඒ වගේම වෙනසක් කිරීමට අප සමඟ එක් වූ දහස් ගණනක් වන, වෙහෙස වී වැඩ කරන දේශප්‍රේමී රාජ්‍ය සේවකයන්ට ඇත්තේත් එවැනි පොදු අරමුණක්. අපි කිසි විටෙකත් එම වගකීමෙන් සහ ප්‍රතිපත්තිවලින් බැහැර නොවන අතර, කුමන හේතුවකටවත් මෙරට පුරවැසියන්ගේ අපේක්ෂාවන් පාවා නොදෙන බවට සහතික වෙනවා. අපි ඒ ආදර්ශය නායකත්වයේ සිටම ලබා දෙනවා. සියලු ශ්‍රී ලාංකිකයන් එක්ව මේ රට ඉහළින් ඔසවා තබමු. සියලුදෙනා එක්ව සමෘද්ධිමත් වෙමු. අප සියලුදෙනාම එකිනෙකා ගැන ගෞරවනීය වෙමු. මෙම ලස්සන, පූජනීය දූපත අපේ මාතෘ භූමිය වීම ගැන අපි ආඩම්බර වෙමු.

Resolving the Pension Anomalies of Pensioners who retired before 01st January 2020

The details related to the phased revision of the pensions of all pensioners who retired before 01st January 2020 to the salary scales relevant to 01st January 2020 as per Public Administration Circular No. 03/2016 are mentioned below.

Phase	Description	Effective date
01	Revision of the pensions of all pensioners who retired before 01st January 2018 corresponding to the third stage salary scales on 01st January 2018 as per the Public Administration Circular No. 03/2016	01st July 2025
02	Revision of the pensions of all pensioners who retired before 01st January 2019 corresponding to the fourth stage salary scales on 01st January 2019 as per the Public Administration Circular No. 03/2016	01st July 2026
03	Revision of the pensions of all pensioners who retired before 01st January 2020 corresponding to the fifth stage salary scales on 01st January 2020 as per the Public Administration Circular No. 03/2016.	01st July 2027

Annexure VII

Key Welfare, Subsidy and Development Assistance Programmes - 2025

Programme	Rs. Million
Pension payments (1)	441,300
Aswesuma cash grant programme	232,500
Medical supplies for hospitals	185,000
Service compensation for death and injured soldiers	49,000
Fertilizer subsidy	35,000
School nutritional food programme	32,100
Housing programme for low income families	18,000
Free school text books	15,500
Schools, vocational education and higher education season Tickets	11,500
Nutritional food package for expectant mothers	7,500
Construction of housing units for low income people	7,000
School uniforms	6,400
Farmer pensions scheme	5,600
Programmes for food security (1)	5,550
Triposha programme	5,000
Suwasariya Free Ambulance Service	4,900
Mahapola and Bursary for university students (1)	4,600
Estate housing programme	4,267
Resettlement / permanent houses for the conflict affected families	3,500
Morning meal for pre-school children	3,200
Financial support for the revival of the fisheries industry	3,000
Loan scheme for the students who are unable to get into the state universities	2,785
Shoes for students	2,500
Health insurance for school children (Suraksha)	2,400

Programme	Rs. Million
Contribution to socially obligatory bus services	2,200
Ranaviru Mapiya Rakawarana allowance	2,200
Subsidy for Tea, Rubber, Coconut and other crops	2,120
Operating buses on economically non profitable routes	2,000
Grade 5 scholarships (1)	1,845
World Food Programme	1,800
Government contribution for crop insurance	1,500
Sanitary napkins for female students	1,440
Allowance for pre-school teachers (1)	1,050
Assistance for export crop development	1,000
Financial support for orphaned, low income young married couples for housing	1,000
Social Security allowance to orphaned children (1)	1,000
Government contribution for agrahara insurance scheme	970
Facilitate dhamma school teachers relating to all religious	940
Allowance to low income vocational trainees (1)	900
Nutrition food programme for sports school children and national athletic pools	630
Providing assistive devices for differently able people (1)	500
Resettlement of displaced people due to landslides	500
Scholarship for pursuing undergraduate courses at high-ranking universities (1)	200
Printing of dhamma school text books	150

Note (1) : Provision including Budget Proposals in 2025

2025 Budget Estimate

Key Development Projects

Project	Rs. Million
Central Expressway Kadawatha - Meerigama Section	81,300
Maintenance, Widening and Improvement of Road Network and Connected Bridges	47,800
Central Expressway Pothuhera - Rambukkana Section	34,000
Mahaweli Water Security Investment Program	32,500
Port Access Elevated Highway Project and Interchanges	28,400
Stimulating Loan Scheme for Re-energizing the SME Development Sector	20,000
Completion of Gampaha - Attanagalle - Minuwangoda, Polgahawela - Pothuhera, Aluthgama - Mathugama and Tambuttegama Water Supply Projects which commenced under foreign financing and subsequently halted	20,000
Inclusive Connectivity and Development Project (Rehabilitation of Rural Roads)	18,080
Urban Regeneration Programme for relocation of underserved settlements (Colombo/Suburbs)	18,035
Rehabilitation & Improvement of Rail Fleet, Track & Signaling System (1)	16,400
Completion of Flyovers at Baladaksha Mawatha, Kohuwala and Getambe	13,400
Providing Bio-medical Equipment to Hospitals	13,325
Science & Technology Human Resource Development Project	12,300
Primary Health Care System Enhancing Project	12,190
Colombo Suburban Railway Efficiency Improvement Project	11,525
Complesiton of activities of existing Water Supply Schemes	9,300
Health System Enhancement Project	9,260
Climate Resilience Multi-phase Programmatic Approach Project	9,080

Project	Rs. Million
Climate Smart Irrigated Agriculture Project	8,775
Kandy Multimodal Transport Terminal Development	7,730
Kandy North & Pathadumbara Integrated Water Supply Project	7,560
Construction of 2,000 Housing units for Low Income People (Chinese Grant)	7,000
Small and Medium Sized Enterprises Line of Credit Project	6,868
Health Information and Quality Improvement	6,631
Establishment of Faculty of Medicine at University of Sabaragamuwa	6,430
Improvement of Road Network in Northern Area (1)	5,000
Clean Sri Lanka Programme (1)	5,000
Housing Programmes for Low Income Earners	4,750
Estate Housing Programmes	4,267
Renovating Rural Roads & Bridges (1)	4,000
Housing Programmes in Conflict Affected Areas	3,500
Modernization of Public Transport (1)	3,000
Decentralized Budget Programme	2,250
Rehabilitation of key Irrigation Systems including, Galoya, Rajanganaya, Huruluwewa, Minneriya (1)	2,000
District Development Programme (1)	2,000
Construction of Vadduvakal Bridge in Mullativu (1)	1,000
Commencing Giribawa-Eppawala Water Supply Scheme (1)	1,000

Note (1) : Provision including Budget Proposals

Annexure VIII

Proposed Legal Reforms for 2025

The following new laws and legal amendments are planned to be introduced in 2025 in furtherance of the policies of the new Government.

01. The Act on the Exchange of Information between State Institutions

A new Act on the "Exchange of Information between State Institutions" is set to be introduced to enhance the efficiency of public services and ensure the proper collection of state revenues, especially to facilitate the seamless exchange of information among relevant state institutions, including the Department of Inland Revenue, Department of Customs, Department of Import and Export Control, Department of Registration of Persons, Department of the Registrar General, and the Department of Motor Traffic.

02. Investment Protection Act

An overarching new legislation will be introduced to safeguard the rights of the investors and provide a conducive environment for foreign investment.

03. State Business Enterprises Management Act

Since gaining independence, Sri Lanka's economic development has been significantly hindered by the politicization and mismanagement of state-owned enterprises. Over the years, various governments have pursued privatization policies for many of these enterprises; however, the desired objectives have not been fully realized. Hence, a new legal framework will be introduced to ensure the effective management of state-owned business enterprises, thereby creating those enterprises free from political influence and enable them to operate as commercially driven institutions that provide high-quality goods and services to the public. This law will further enable those businesses to be managed by industry experts by ensuring that boards of directors are appointed independently.

04. Public – Private Partnership Investment Management Act

This new law is intended to encourage foreign and domestic private investments in collaboration with the public sector, a crucial factor for the country's rapid economic development. The aim is to create an attractive legal framework for investment and to conduct such investments as partnerships, providing public and government support. By enhancing investor confidence, the law will encourage financial investments in Sri Lanka, strengthen security for such investments, and create a more reliable and expansive investment environment, whilst also mitigating any fiscal risks that arise from such partnerships.

05. Statistics Act

Access to high quality data and analysis thereof is crucial for economic development and governance. A new Statistics Act will be introduced to replace the long-standing legislation governing population statistics and Census in Sri Lanka, incorporating updated methodologies and concepts. This will create a new environment for conducting an efficient population census through new technological methods, enhancing the utilization of census data collected by the Department of Census and Statistics for governance, data sharing with private institutions, and establishing a comprehensive data and information repository that will be instrumental in country's economic growth.

06. Valuation Act

The Government expects to introduce new legislation for the management of the Government Valuation Department. The present hundred year old department needs modernization to cater growing demand to transform its role in a way that is more effective and conducive to economic development. Improving the efficiency of the department will enable timely valuation of state assets, thereby increasing revenue for local government institutions while also making valuation services more accessible to the public.

07. Public Asset Management Act

The Government intends to introduce new legislation for non-financial asset management to ensure the effective utilization, proper maintenance, and optimal value extraction of those properties. Accordingly, this new legislation will envisage enactment of provisions to provide the required legal basis for the Non-Financial Assets management of public institutions, while ensuring institutional compliance for recording and reporting the information of these assets and thus enabling protection and proper management of public properties.

08. Public Procurement Law

The procurement of goods, works, and services accounts for a significant portion of government expenditure. Procurement related malpractices have also been an importance source of corruption vulnerabilities. Therefore, introducing a public procurement law is a timely necessity to support the country's economic development. This legislation will ensure the efficient use of public funds by promoting optimal performance, value for money, competitiveness, and transparency while also preventing corruption and strengthening accountability.

09. Micro Finance and Credit Regulatory Authority Act

The government plans to introduce a new law, the "Micro Finance and Credit Regulatory Authority Act," to address the shortcomings of the existing Micro Finance Act No. 6 of 2006. The current Micro Finance Act does not provide comprehensive regulation and supervision of the microfinance industry. Additionally, it lacks adequate focus on consumer protection and the regulation of market conduct by microfinance institutions—issues that are particularly important in the current context. Therefore, the government has prioritized the introduction of the new law this year.

10. Strengthening of Anti-Money Laundering and Countering the Financing of Terrorism (AML/CFT) Framework

Strengthening the Anti-Money Laundering and Countering the Financing of Terrorism (AML/CFT) framework has become a crucial aspect of a country's economic development and governance. A robust AML/CFT framework promotes financial sector integrity and ensures compliance with international standards. The Convention on the Suspension of Terrorist Financing Act, No. 25 of 2005, the Prevention of Money Laundering Act, No. 5 of 2006, and the Financial Reporting Act, No. 6 of 2006 are the primary legislations that support and strengthen Sri Lanka's AML/CFT framework. Amendments to these legislations have been identified as essential to further enhance the country's AML/CFT regime, demonstrating Sri Lanka's technical competence and effectiveness in financial transactions in line with international standards. As a result, the government has prioritized these amendments, recognizing the importance of addressing the concerns at hand.

11. Amendment to Paddy Marketing Board Act No 14 of 1971

The government plans to amend the Paddy Marketing Act No. 14 of 1971 to address contemporary challenges in the paddy and rice market. The proposed amendment will establish a regulatory mechanism for paddy and rice stockpiling, while strengthening existing licensing provisions and other related regulations.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීමේ විවාදය කල් තැබීම, ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, "විවාදය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
*එතැන් සිට විවාදය **2025** පෙබරවාරි **18**වන අඟහරුවාදා පවත්වනු ලැබේ.*

இதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.
விவாதம், 2025 பெப்ருவரி 18, செவ்வாய்க்கிழமை மீளத் தொடங்கும்.
Debate stood adjourned accordingly.
Debate to be resumed on Tuesday, 18th February, 2025.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2025 විසර්ජන පනත් කෙටුම්පතට අදාළව කාරක සභා අවස්ථාවේ දී යෝජනා කිරීමට නියමිත සියලුම සංශෝධන 2025 පෙබරවාරි 20 බ්‍රහස්පතින්දා අපර භාග 3.00ට හෝ ඊට ප්‍රථම පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත භාර දිය යුතු බව දැනුම් දීමට කැමැත්තෙමි.

අපර භාග 2.00 දක්වා සභාවේ වැඩකටයුතු අත්හිටවනු ලැබේ.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. **2.00**ට නැවත පවත්වන ලදී.*

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 2.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 2.00 p.m. and then resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම. ගරු අමාත්‍යතුමා.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
LOCAL AUTHORITIES ELECTIONS (SPECIAL PROVISIONS) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.01]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ඊට අදාළව යම් පැහැදිලි කිරීමක් කළ යුතුව තිබෙනවා. මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉදිරිපත් වන්නේම, 2023 මාර්තු 9වැනි දින පැවැත්වීමට නියමිතව තිබුණු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සාධාරණ හේතුවකින් තොරව කල් දැමීම නිසාය කියන කාරණය මුලින්ම සඳහන් කරන්න ඕනෑ. මේ මැතිවරණය සඳහා නාම යෝජනා කැඳවා තිබුණා; නාම යෝජනා බාර දුන්නා; මැතිවරණයට දින නියම කර තිබුණා. ඒ සියලු තත්ත්ව සම්පූර්ණ වෙලා තිබියදී එවකට පැවති රජය අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බව සඳහන් කරලා, -එහි සාධාරණත්වය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් අපට තිබෙනවා- මැතිවරණය කල් දැමීමා. ඒ සඳහා නැවත දිනයක් අප්‍රේල් මාසයේ නියම කරලා තිබුණා. නමුත්, ඒ දිනයේදීත් මැතිවරණය පැවැත්වීමට නොහැකි වුණා. ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස 2023 පළාත් පාලන මැතිවරණය කල් දැමීමට එරෙහිව මේ රටේ පුරවැසියන් විවිධ ආකාරයෙන් විරෝධතා ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, ඒ විරෝධතාවලදී එක් පුද්ගලයකුගේ මරණය පවා සිදු වුණු බව අපට මතකයි. මෙන්න මේ වටපිටාව ඇතුළේ තමයි විපක්ෂය සහ වෙනත් ආයතන ඒ මැතිවරණය කල් දැමීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කරලා තිබුණේ. ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම් විභාග කරලා තීරණය දැනුම් දුන්නා. ඒ අනුව, ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවටත්, ඒ නිසා හැකි ඉක්මනින් මැතිවරණය පවත්වන ලෙසටත් තීරණය කර තිබුණා. නමුත්, පසුගිය ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය ළඟ ළඟ පැමිණි නිසා ඒ මැතිවරණය පැවැත්වීමට අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ අනුව, කල් ගිය -කල් ගිය නොවෙයි හිතාමතාම කල් දැමූ- පළාත් පාලන මැතිවරණය නැවත පැවැත්වීමේ අවශ්‍යතාව දැඩි ලෙස තිබෙනවා.

නමුත්, මෙතැනදී ගැටලුවක් පැන නැඟුණා, ගරු කථානායකතුමනි. ඒ තමයි, පැවැති නාම යෝජනා ලැයිස්තු එලෙසම පිළිගැනීමේ ගැටලුව. ඒ වාගේම තමයි, 2023 සහ 2024 වර්ෂවලට අදාළව අලුතින් එකතු වූ ඡන්ද දායකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම හෝ/සහ අපේක්ෂකයන් හැටියට ඉදිරිපත්වීමේ අවස්ථාව අහිමි වීම කියන කාරණය. මෙන්න මේ වටපිටාව ඇතුළේ ඒ පැවති නාම යෝජනා අහෝසි කරලා, ඒ වෙනුවට අලුතින් නාම යෝජනා කැඳවන්න කියලා 2024 නොවැම්බර් 25වැනි දා -අපි දිවුරුම් දුන්නේ නොවැම්බර් 21වැනි දා- සියලු පක්ෂවල නායකයන් එකතුව ඇති කරගත් පොදු එකඟතාවක් අපි අතර තිබුණා. ඒ අනුව තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙන්නේ, ගරු කථානායකතුමනි. ඊට අදාළ වෙනත් කරුණු අපට සාකච්ඡා කරන්න පුළුවන්. මූලික වශයෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂ නායකයන්ගේ එකඟතාවෙන් තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න අපි කටයුතු කළේ.

ඒ අනුව අපි ජනවාරි 9වැනි දා මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඉන් අනතුරුව දින 14ක කාලයක් පුරවැසියන්ට අයිතිය තිබුණා ඊට විරෝධතා දක්වන්න. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් කිහිපයක් ගොනු වෙලා තිබුණා.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

ඒ පෙත්සම් විභාග කිරීමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ඔබතුමාට දැනුම් දීම අනුව තමයි අපි පසුගිය සිකුරාදා ඒ පිළිබඳව සාකච්ඡා කළේ. දැන් අපට ඒ එකඟතා පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාව තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි මේ සැලකිල්ලට ගන්නේ සාමාන්‍ය බිම් මට්ටමේ පුරවැසියාගේ -ගමේ වෙන්න පුළුවන්, නගරයේ වෙන්න පුළුවන්- දෛනික අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය මහජන නියෝජිතයන් තෝරා ගැනීමේ කාරණය. 2018දී තමයි අවසාන වරට පළාත් පාලන මැතිවරණයක් තිබුණේ. ඒ පළාත් පාලන මැතිවරණයෙන් පසුව 2022 වසරේ නැවත පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට නියමිතව තිබුණා. නමුත්, එවකට හිටපු ඇමතිවරයා විසින් ඒ පළාත් පාලන මැතිවරණය අවුරුද්දකින් කල් දමනු ලැබුවා. ඒක නීත්‍යානුකූල තත්ත්වයක් වුවත්, එමඟින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් භාවිත කිරීමේ අවස්ථාව වසරකින් කල් ගියා. වසරකින් කල් ගිය ඒ අයිතිය තමයි තවත් අවුරුදු දෙකකට දින නියමයක් නැතිව කල් ගිහිල්ලා තිබුණේ. එතකොට ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩ වුණා වාගේම, ඔවුන්ගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා තිබෙන ආයතනවල මහජන නියෝජිතයන් නොමැතිවීමේ ගැටලුව බරපතළ විධියටම තිබුණා. ඒ වාගේම, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ව්‍යූහය තුළ ප්‍රජාතන්ත්‍රවාදීව පත් කරනු ලබන නියෝජිතයන් නොමැතිව නිලධාරීන් මඟින් ඒ සේවා ඉටු කිරීම -ඒ සේවය කරපු නිලධාරීන්ට නිසි ගෞරවය දෙන අතරම- කොතෙක් දුරට උචිත ද කියන ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා. ඒ නිසාම තවත් කල් නොයවා මේ ආයතනවලට මහජන නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ අවශ්‍යතාව ප්‍රමුඛ කාර්යභාරයක් හැටියට අද අප ඉදිරියේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා පළාත් පාලන ආයතන, නැත්නම් බිම් මට්ටමේ පාලන සංවිධාන අපට එන්නේ අපේ මුල්ම රාජධානි සමය වන අනුරාධපුර රාජධානියේ සිට බව. එදා සිට බිම් මට්ටමේ පාලන සංවිධාන තිබුණා. අද වාගේ ඡන්ද ක්‍රමයකින් ඒවා පත් කළේ නැති වුණාට ඒ අවශ්‍යතා ඉෂ්ට කිරීම සඳහා කටයුතු කළ දීර්ඝ කාලීන අත්දැකීමක්, ඉතිහාසයක් අපට තිබෙනවා.

ක්‍රිස්තු පූර්ව 4වන ශතවර්ෂයේ අනුරාධපුරය රාජධානියක් හැටියට පිහිටුවා ගත්ත පණ්ඩුකාභය රජතුමාගේ අභිෂේකයෙන් 10වන වර්ෂයේ දී මුළු ලංකාව පුරාම ග්‍රාම සීමා නියම කරපු බව මහාවංශයේ මෙසේ සඳහන් වෙනවා:

"දසවස්සාභි සිත්තෝසෝ - ගාම සීමා නිවේසයි
ලංකාදීපම්හි සකලේ - ලංකින්දෝ පණ්ඩුකාභයෝ"

අවුරුදු 2400ක් පැරණි කාලයක සිට අපි ග්‍රාමීය මට්ටමේ පරිපාලන ආයතන පිහිටුවලා තිබුණා වාගේම, ශක්තිමත්ව ක්‍රියාත්මක කරලාත් තිබුණා. ඒවා ක්‍රියාත්මක නොවෙනවා නම් ජනතාවට විශාල ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙනවා. මහා වංශයේ ඒ කොටසේම සඳහන් වෙනවා ඇයි පණ්ඩුකාභය රජතුමා මේවා ආරම්භ කළේ කියලා.

"පඤ්ච සතානි චණ්ඩාල පුරිසේ පුරසෝධකේ"

කම්කරුවෝ 500ක් අනුරාධපුරයේ පුරසෝධකයෝ හැටියට, නැත්නම් නගරයේ පවිත්‍රතා කටයුතු සඳහා යොදවලා තිබුණා. අපි Clean Sri Lanka ගැන අද කථා කරනවා වාගේම, Clean Anuradhapura ගැන පණ්ඩුකාභය රජතුමා කටයුතු කරපු ආකාරය අපට දකින්නට පුළුවන්. ඒ කාලයේ පුරසෝධකයෝ 500ක් නගරයේ පවිත්‍රතා කටයුතු සඳහා යෙදෙව්වාය කියන එකෙන් අපට හිතා ගන්න පුළුවන්, බිම් මට්ටමේ පවිත්‍රතාව පිළිබඳ මොන විධියේ අදහසක්, හැඟීමක් අපේ පැරණි ශ්‍රී ලාංකිකයන් අතර තිබුණා ද කියන එක.

"ද්වේ සතානි චණ්ඩාල පුරිසේ වච්ඡසෝධකේ"

වච්ඡසෝධන කියන්නේ මිනිස් මළ - human excreta - බැහැර කිරීම. ඒ සඳහා පුරසෝධකයන් 500ට අමතරව තවත් 200දෙනෙක් දාලා තිබුණා. අද කොළඹ ප්‍රදේශයේ විතරක් නොවෙයි, ප්‍රධාන නගරවල පමණක් නොවෙයි, ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගෙන් පවා අපට එන ප්‍රධාන දුක් ගැනවිල්ලක් තමයි, අපේ කැළි කසළ ටික හරියට වෙලාවට බැහැර කෙරෙන්නේ නැහැ, විධිමත්ව මේ කටයුතු කෙරෙන්නේ නැහැ කියන එක. හැබැයි, අපි කැළි කසළ බැහැර කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් යොදපු රටක් බව අතීතයේ සිටම තිබෙන මේ තොරතුරු අනුව සඳහන් වෙනවා. තවත් දීර්ඝ වශයෙන් සඳහන් තොරතුරු තිබෙනවා. නමුත්, ඔක්කෝම සඳහන් කරන්න අවශ්‍ය නැහැ. බිම් මට්ටමේ ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අනුරාධපුර යුගයේ ආරම්භයේ සිටම අපට තිබුණු ක්‍රමය මේ මැතිවරණ කල් දැමීමත් එක්ක බිඳ වැටිලා තිබෙනවා. ඒ නිසා අපි හිතනවා ජනතාවගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කර ගැනීම සඳහා තිබෙන මහජන නියෝජිතයන්ගෙන් සමන්විත පළාත් පාලන ආයතන, නැවත මහජන ඡන්දයෙන් පත් වෙන නියෝජිතයන් මඟින් ක්‍රියාත්මක විය යුතු බව.

මීට අදාළව තිබෙන තව කරුණු අපට සාකච්ඡා කරන්න පුළුවන්. පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට දින නියම කර තිබියදීත් එවකට පැවති රජය අත්තනෝමතික ලෙස ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් මැතිවරණය කල් දැමුවා. එම කල් දමපු පළාත් පාලන මැතිවරණය විධිමත්ව පවත්වා, ජනතා නියෝජිතයන්ගේ දායකත්වයෙන් එම ආයතන ක්‍රියාත්මක කර මහ ජනතාවට සුබසිද්ධිය සැලසීම තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ මූලික අරමුණ වන්නේ, ගරු කථානායකතුමනි. එහිදී පොදු එකඟතාවෙන් අපි දැකපු දෙයක් තමයි, ඉදිරිපත් කරලා තිබුණු අපේක්ෂක ලැයිස්තු සම්බන්ධ ගැටලු. විශේෂයෙන්ම අපටත් වැඩිය විරුද්ධ පක්ෂවලට. ඒ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් මේ පනත් කෙටුම්පත තුළින් අප ඉදිරිපත් කරන එකම කාරණය තමයි කලින් ලබා දුන් නාම යෝජනා වෙනුවට අලුතෙන් නාම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්නය කියන එක. ඒ පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ඔබතුමා දැනුම් දුන්නා. ඒ නිසා මම ඒ ගැන විශේෂයෙන් කථා කරන්නේ නැහැ. මෙම සංශෝධනය සම්මත කර ගැනීම සඳහා අප සියලු දෙනාම එකාවන්ව කටයුතු කරමු කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.14]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් කර තිබුණු පරණ නාම යෝජනා අවලංගු කරන්නයි අද මේ පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. පළාත් පාලන

ආයතන පිහිටුවීම වාගේම මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද අයිතිය ලබා දීමේ එක් අවස්ථාවක් තමයි මේ මැතිවරණය කියලා අපි දන්නවා. පළාත් පාලන ආයතන හරහා දේශපාලනයට පිවිසුණු පුද්ගලයකු විධියට පළාත් පාලන ආයතනවල වැදගත්කම, එහි කාර්යභාරය සහ එයින් ජනතාවට සලසන සේවය ගැන මම දන්නවා. එහි වැදගත්කම නිසා තමයි ලබාදී තිබෙන නාම යෝජනා අවලංගු කර අලුත් නාම යෝජනා භාර දෙන්නට අපි පක්ෂ නායක රැස්වීමේදී තමුන්නාන්සේලාත් එක්ක එකඟත්වයකට ආවේ. එම මැතිවරණය පවත්වන්න තිබුණේ 2023 මාර්තු මාසයේ. එදා තිබුණු රනිල්-රාජපක්ෂ රජය කිසිම හේතුවක් නැතිව එම මැතිවරණය කල් දැම්මා. ඒ මැතිවරණය ඉතා ඉක්මනින් පවත්වන්න කියලා සමගි ජන බලවේගය විධියට අපි එදා අධිකරණයට ගියා. එදා අධිකරණයෙන් තීන්දුවක් ලැබුණා, නාම යෝජනා ඉදිරිපත් කළ ඒ මැතිවරණය ඉතා ඉක්මනින් පවත්වන්න කියලා. නමුත් එම රජය ක්‍රියාත්මක වුණේ නැහැ. අද අලුත් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා එම මැතිවරණය පවත්වන කටයුත්තට දැන් ප්‍රවේශ වෙලා තිබෙනවා. මේ මැතිවරණය පවත්වන්න අපි සහයෝගය ලබා දෙනවා.

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. එදා එම මැතිවරණය සඳහා 80,000කට වැඩි අපේක්ෂකයන් ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. ඒ අපේක්ෂකයන් සියලුදෙනාගේම ඇප තැන්පතු දැන් තිබෙන්නේ භාණ්ඩාගාරයේ. ඊළඟ මැතිවරණයේ නාම යෝජනාවලට ඒ මුදල් ලබා ගන්න ඕනෑ. අපේ පක්ෂවලට වෙන කොහෙන්වත් එන විශාල මුදල් නැහැ. අපේ පක්ෂයේ අයගේ පාර්ලිමේන්තු වැටුප පක්ෂ අරමුදලට යන්නේ නැහැ. අද තමුන්නාන්සේලාගේ පක්ෂ අරමුදලට මාසයකට කෝටි 5ක් විතර එනවා. ඒ නිසා තමුන්නාන්සේලාට ඇප තියන්න සල්ලි තිබෙනවා. මේ මැතිවරණයට නාම යෝජනා දෙන්න ඉස්සෙල්ලා එම අපේක්ෂකයන්ගේ ඇප තැන්පතු ආපසු ලබා දෙන්න කටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* අපට පැලවත්තෙන් හම්බ වෙන්නෙත් නැහැ නේ. පැලවත්තෙන් දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. ණයක් ගන්න වෙන්නේ පැලවත්තෙන් තමයි. *[බාධා කිරීමක්]* පොලියත් අඩු කළා කියලා කිව්වා. දැන් වැඩිය සල්ලි තිබෙන්නේ පැලවත්තේ. ගරු කථානායකතුමනි, කරුණාකරලා ඒ ඇප තැන්පතු ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අදින් පස්සේ; ගරු කථානායකතුමා මෙම පනත් කෙටුම්පතට අත්සන් කළාට පස්සේ, මේ මැතිවරණය පවත්වන කාර්යභාරය තිබෙන්නේ මැතිවරණ කොමිසමට. මැතිවරණ කොමිසම තමයි ඒකට දින නියම කරන්නේ.

ඒ සඳහා මාස තුනක කාලයක් තිබෙනවා. හැබැයි, ආණ්ඩුවේ කැබිනට් ප්‍රකාශකවරයා; ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා කියනවා, මේ මැතිවරණය ලබන අප්‍රේල් මාසයේ පවත්වනවා කියලා. ආණ්ඩු පක්ෂයේ කැබිනට් ප්‍රකාශකයා මැතිවරණයට දින නියම කරන්නේ කොහොමද? තමුන්නාන්සේලා මැතිවරණ කොමිසමට නියෝග දෙනවාද කියලා මම අහනවා. ඒ වාගේම මැතිවරණ කොමිසමේ ස්වාධීනත්වය විනාශ කරන්න කටයුතු කරනවාද කියලා මම අහනවා. අහවල් දවසට ඡන්දය තියන්න කියලා මැතිවරණ කොමිසමට කියන්න ඇමතිවරයෙකුටවත්, කැබිනට් ප්‍රකාශකවරයාටවත්, රජයටවත් බලයක් නැහැ. පැලවත්ත පක්ෂ කාර්යාලයටත් එහෙම කියන්න අයිතියක් නැහැ. ගණන් හදලා බැලුවොත්, මාස තුනක කාලයක් තිබෙනවා, මැතිවරණය පවත්වන්න.

ජනාධිපතිවරයා, මුදල් ඇමතිවරයා විධියට අද දින අය වැය යෝජනා ඉදිරිපත් කළා. ලබන 21වැනි දා වෙන කල් අපි මේ අය වැය යෝජනා ගැන සාකච්ඡා කරනවා. අය වැය යෝජනාවේ වැඩි කොටස තිබෙන්නේ කාරක සභා අවස්ථාවේ විපක්ෂයේ විවාදයේදී. මෙතැනදී අපි ජනතාවගේ ප්‍රශ්න, අපේ යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ. අපි පාර්ලිමේන්තුවේ ගණපූරණය සකසන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් සහ මැතිවරණ කොමිසමෙන් අහනවා, අපව පාර්ලිමේන්තුවේ හිර කරලාද මේ මැතිවරණය පවත්වන්න යන්නේ කියලා. හැමෝටම සම බිමක් ඕනෑ. අපි මාර්තු 21වැනි දා වෙන කල් පාර්ලිමේන්තුව තුළයි ඉන්නේ. ඒ නිසා තමයි මේ පාර්ලිමේන්තුවේ සිටින විපක්ෂයේ සියලු කණ්ඩායම්, අනෙක් නායකයෝ ගිහිල්ලා ඉල්ලීමක් කළේ, සුදුසු පසුබිමක; සම පසුබිමක මැතිවරණය තියන්න කියලා. මැතිවරණය කල් දමන්න කියලා අපි කියන්නේ නැහැ; මැතිවරණය මාස ගණනකින් කල් දමන්න කියලා අපි කියන්නේ නැහැ. ඉදිරියේදී අපොස සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වෙනවා. අපේ රටේ සම්ප්‍රදායික ක්‍රමයක් තමයි විභාග කරන ළමයින්ට කරදරයක් නොවන විධියට මැතිවරණ පවත්වන එක. මැතිවරණයක් ආවාම ශබ්දවාහිනී යන්ත්‍ර පාවිච්චි කරනවා. අපි රැස්වීම් තියනවා. මැතිවරණ ප්‍රචාරණ කටයුතු කරනවා. ඉතින්, ඒක ගැනත් සලකා බලන්න කියලා අපි කියනවා. ඒ වාගේම ඉස්සරහට සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද එනවා. ඒ වෙනුවෙන් මුළු රටටම දවස් දහයක විතර නිවාඩු වකවානුවක් තිබෙනවා. ඒ දේවල් ගත්තාම, අපේක්ෂකයන්ට, ඡන්ද දායකයන්ට මේ මැතිවරණ ව්‍යාපාරය ප්‍රශ්නයක් වෙනවා. රාජ්‍ය සේවකයන්ට ප්‍රශ්නයක් වෙනවා.

මෙතැන කාරණා කිහිපයක් තිබෙනවා. ආණ්ඩුවට ඕනෑ විධියට මැතිවරණ කොමිසමට නියෝග දෙන්න ආණ්ඩුව අද උත්සාහ කරනවා. මැතිවරණ කොමිසමට අපි කියනවා, ස්වාධීනව තීන්දු ගන්න කියලා. මැතිවරණ කොමිසමේ එක නිලධාරියෙක් කියලා තිබෙනවා මම දැක්කා, "මැතිවරණය පවත්වන්න කියලා නඩු දමපු කට්ටියම දැන් කල් දමන්න කියනවා" කියලා. එහෙම මැතිවරණය කල් දමන්න කියලා අපි කියන්නේ නැහැ. නිලධාරියෙක් එහෙම කථා කරන එක සුදුසුද කියලා මම දන්නේ නැහැ. එතුමා පැලවත්තේ පක්ෂ කාර්යාලයේ මාධ්‍ය ප්‍රකාශකද කියලා මම දන්නේ නැහැ. එම නිලධාරියාට අපි කියනවා, කරුණාකරලා ස්වාධීනව කටයුතු කරන්න කියලා. මම හිතන විධියට, මැතිවරණ කොමිසම එහෙම කටයුතු කරන එකක් නැහැ. කරුණාකරලා සුදුසු වකවානුවකදී පළාත් පාලන මැතිවරණය පවත්වන්න කියලා අපි මැතිවරණ කොමිසමට කියනවා. පාර්ලිමේන්තුවේ විශාලම කාර්යභාරය තමයි අය වැය. අය වැය තිබෙන වෙලාවක අපි මැතිවරණ ව්‍යාපාරයක් ගෙන යන්නේ කොහොමද? ඒක නිසා කරුණාකරලා මේ වැඩසටහන්වලට ගැළපෙන විධියට, සුදුසු විධියට මැතිවරණ නාම යෝජනා ඉදිරිපත් කිරීම සහ මැතිවරණය පැවැත්වීම සිදු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම මේ මැතිවරණයට අපි තරුණ නියෝජනය එකතු කරලා තිබෙනවා. මැතිවරණ ක්‍රමය සම්බන්ධව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළා. එම කාරක සභාවේ නිර්දේශ කියවන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. එහි තිබෙනවා, පළාත් පාලන මැතිවරණය සම්බන්ධව. සමගි ජන බලවේගය විධියට එදා ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා එම කාරක සභාවට යෝජනා කළා, පළාත් පාලන මැතිවරණයට වැඩි තරුණ නියෝජනයක් ඕනෑ කියලා. එදා රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ආණ්ඩුවෙන් 1991දී මේ තරුණ නියෝජනය ගෙනාවා. 1988-89 කාලයේ ඇති වූ නීති විරෝධී ජනතා කැරැල්ලෙන් -ත්‍රස්තවාදී කැරැල්ලෙන්- පස්සේ තරුණ කොමිසමක් පත් කළා. ඒ කොමිසමෙන් කිව්වා, තරුණයන්ට දේශපාලනයට එන්න අවස්ථාව දෙන්න ඕනෑ කියලා. එදා අවස්ථාව දුන්නා. හැබැයි, ඒක නැවත නැති කළා. අපි එම විශේෂ කාරක සභාවට යෝජනා කරලා, නාම යෝජනාවලින් සියයට 25ක් තරුණයෝ වෙන්න ඕනෑ කියන අවස්ථාව ගන්න අපට

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

පුළුවන්කම ලැබිලා තිබෙනවා. එය අපි දකින්නේ, අපේ පක්ෂය ලබපු ජයග්‍රහණයක් හැටියටයි. ඊළඟට, කාන්තා නියෝජනය. ඒ සියල්ලම මෙම මැතිවරණ ක්‍රමයේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පත් කළ එම පාර්ලිමේන්තු විශේෂ කාරක සභා වාර්තාවේ තිබෙනවා, විද්‍යුත් ඡන්ද ක්‍රමය ගෙනෙන්න කියලා. ඇයි, අපි විද්‍යුත් ඡන්ද ක්‍රමය ගෙනෙන්න කියන්නේ? මැතිවරණ ඉතිහාසයේ කවදාවත් සිදු නොවුණු විධියට පසුගිය මැතිවරණයේදී සමහර නිලධාරීන් පක්ෂග්‍රාහීව කටයුතු කළා. තමුන්නාන්සේලා වැඩියෙන් ඡන්ද ගත්තා. තමුන්නාන්සේලාගේ ගොඩ වැඩි වනකොට ඡන්ද ගණන් කරන මධ්‍යස්ථානවල ඡන්ද ගණන් කරන්න හිටපු නිලධාරීන් අත්පුඩි ගැහුවා. ඒකද ස්වාධීන මැතිවරණ ක්‍රමය? මේ රටේ මැතිවරණ ක්‍රමය ස්වාධීන කරනවා කියන්නේ මේකටද? මම මැතිවරණ කොමිසමට, මැතිවරණ කොමසාරිස්ට කියනවා, මෙවැනි විධියටයි කටයුතු කළේ කියලා. එම නිසා කරුණාකරලා මැතිවරණ ක්‍රමයේ ස්වාධීනත්වය රකින්න කියලා අපි එතුමන්ලාට කියනවා. නිලධාරියෙක් ඡන්ද ගණන් කරනකොට එහෙම කරනවා නම්, එය වැරදි වැඩක් නේද? මේ සම්බන්ධව අපේ පාක්ෂිකයෝ, අපේ සංවිධායකවරු අපට පැමිණිලි කරලා තිබෙනවා. ඒ වාගේම ඡන්ද ගණන් කරද්දී එක පැත්තක් අවහිර කරලා, අනෙක් පැත්තට විතරයි නිරීක්ෂණය කරන්න දුන්නේ. මෙවැනි දේවල් ගැන පැහැදිලි කරන්න.

අද මම දැක්කා, මෙම මැතිවරණය ඉලක්ක කරගෙනද කොහෙද ජනාධිපතිවරයා අය වැය කථාවේදී කියනවා, අලුත් අවුරුද්ද සඳහා බඩු මිල අඩු කරන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවා කියලා. ඒකයි ජනාධිපතිවරයාගෙන් මම ඇහුවේ, මැතිවරණය නිසාද මේ මුදල වෙන් කරන්නේ කියලා. මේ රටේ ජනතාව අලුත් අවුරුද්දට විතරද කන්නේ? අනෙක් දවස්වල වැඩි මිලට බඩු ගන්න ඕනෑද? එතුමා කිව්වේ, අලුත් අවුරුද්දට බඩු මල්ලක් දෙනවා කියලායි. මැතිවරණ බඩු මල්ලක් දෙන්න තමයි ඒ විධියට රුපියල් මිලියන 1,000ක් දෙන්න යෝජනා කරලා තිබෙන්නේ. මම ඒක ජනාධිපතිතුමාගෙන් ඇහුවා. හැබැයි, එතුමා ඒකට උත්තර දුන්නේ නැහැ. මෙම මැතිවරණය සර්ව සාධාරණ විධියට පවත්වන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, මේ වෙලාවේ අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, මේ මැතිවරණ ක්‍රමය ඇත්තෙන්ම සංශෝධනය වෙන්න ඕනෑ බව. මෙම මැතිවරණ ක්‍රමය අනුව වැඩියෙන් ඡන්ද ලබා ගන්න කොට්ඨාසයටවත් සභාව පිහිටුවන්න බැරි වෙලා තිබෙනවා. පසුගිය වතාවේ අපි බදුල්ල නගර සභාවේ ආසන නවයම දිනුවා. නමුත් මේ අලුත් ක්‍රමය, එල්ලන ක්‍රමය කියන සියල්ලත් එක්ක අපට බැරි වුණා, නගර සභාව පිහිටුවා ගන්න. ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලනවා, අවශ්‍ය සංශෝධන ගෙනෙන්න කියලා. අපි දෙගොල්ලන්ම පිළිගන්නවා, පළාත් පාලන ආයතනවල භාරදහස් ගණනක් ලෙස හිටපු සභික සංඛ්‍යාව අටදහස් ගණනට වැඩි කළ බව. අපේ ආණ්ඩුව කාලයේදී තමයි ඒ දේ සිදු වුණේ. අපි කියනවා, ඒවාත් සංශෝධනය වෙන්න ඕනෑ කියලා. මෙම පනත් කෙටුම්පත ඇමතිතුමා ඉදිරිපත් කරන්නේ පරණ nominations අවලංගු කරන්න. තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බහුතර බලයක් තිබෙනවා. මේ සංශෝධනයත් එක්කම එම සංශෝධනත් ඉදිරිපත් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවෙන් කරලා තිබෙන යෝජනා එකක්වත් ක්‍රියාත්මක කරන්න තමුන්නාන්සේලා කටයුතු කරලා නැහැ. අපි කියනවා, කරුණාකරලා එම යෝජනා ක්‍රියාත්මක කරන්න කියලා. මට මතක විධියට, වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාත් එම කාරක සභාවේ හිටියා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාත් අර පරණ ක්‍රමය සම්බන්ධයෙනුත්, සභිකයන් සංඛ්‍යාව අටදහස් ගණනක් කරද්දීත් අදහස් ඉදිරිපත් කරලා තිබෙනවා. අපි කියනවා, මැතිවරණ ක්‍රමයේ තිබෙන එවැනි යම් යම් වැරදි නිවැරදි කරන්න කියලා. ඒ සඳහා මේ අවස්ථාව යොදා ගන්න කියලාත් අපි ඉල්ලා සිටිනවා.

අපි මැතිවරණයකට ඕනෑ වෙලාවක ලැහැස්තියි. මැතිවරණය ඉලක්ක කරගෙන බඩු බෙදන්න අපි ළඟ සල්ලි නැහැ. අපි සාධාරණව සහ ස්වාධීනව මෙම මැතිවරණය කරනවා. මෙම මැතිවරණය අපි ජයග්‍රහණය කරන බවත් ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා.

[අ.භා. 2.27]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව කෙරෙන මේ විවාදයේදී යම් කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි.

ගරු කථානායකතුමනි, ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් සැලසුමක් ඇතිව කරන ලද විනාශයක ප්‍රතිඵලයකට තමයි අපි කවුරුත් අද මුහුණ දීලා තිබෙන්නේ.

එතුමා තමයි මෙතැනට එහා පුටුවේ ඉඳගෙන, "ඡන්දෙකුත් නැහැ, සල්ලිත් නැහැ" කියලා රටේ ජනතාවත්, මේ පාර්ලිමේන්තුවත් තුට්ටු දෙකට දාලා එම ප්‍රකාශය කළේ. ඒ ප්‍රකාශය කරද්දී එතුමාත් සමඟ හිනාවෙච්ච අයත් මෙතැන ඉන්නවා. මා ළඟ ඒ වීඩියෝ පටය තිබෙනවා. ඒ වීඩියෝව පෙන්වන්න හොඳ නැහැ, මේ පාර්ලිමේන්තුව නිසා. මේ රටේ සිදු වූ ජනතා අරගළයකින් පස්සේ, විශාල ජනතා නැඟිටීමකින් පස්සේ, ඒ දූෂිත පාලකයන් පන්නා දැම්මාට පස්සේ අටවා ගත්ත ආණ්ඩුවට පිනට ආපු රනිල් වික්‍රමසිංහ මහත්තයා තමයි මේ පළාත් පාලන මැතිවරණය කල් දැම්මේ; cancel කළේ. ගරු කථානායකතුමනි, එතුමා ඒ මැතිවරණය කල් දමනකොටත්, ඒක අවලංගු කරනකොටත්, 2022දී පවත්වන්න නියමිතව තිබුණු පළාත් පාලන මැතිවරණය අවුරුද්දකින් කල් ගිහින් තිබුණේ. අද අපට මේ පාර්ලිමේන්තුව තුළ කරන්න වෙලා තිබෙන්නේ පරණ පව් ගෙවීමයි. රනිල් වික්‍රමසිංහලා, රාජපක්ෂලා -විවිධ නායකයන්- විසින් හිතාමතා කරන ලද විවිධාකාරයේ - අහම්බයෙන් නම් ප්‍රශ්නයක් නැහැ - දේශපාලන, ආර්ථික අපරාධවලට තමයි අද ලංකාවටම කරගහන්න වෙලා තිබෙන්නේ.

මේ පිළිබඳව අපි නඩුවක් පැවරූ බව ඔබතුමන්ලා දන්නවා. අපි විතරක් නොවෙයි, තවත් අය නඩු ගණනාවක් දැම්මා. මා ළඟ ඒ තොරතුරු තිබෙනවා. ඒ අවස්ථාවේ පොලීසිය කලින්ම කිව්වා, ආරක්ෂාව දෙන්න බැහැ කියලා. හිටපු මුද්‍රණාලයාධිපතිනිය ඒ

වෙලාවේ කිව්වා, කොළ නැහැ කියලා. වෙන කියන්න දෙයක් නැහැ. ඒ වෙලාවේ හිටපු සමහර නිලධාරීන් රනිල්ගේ බලය අරගෙන දේශපාලන තක්කඩිකම් කළා. එහෙම තමයි ප්‍රජාතන්ත්‍රවාදය හැකිළුවේ. ඊට පස්සේ මේ පිළිබඳව නඩු දැම්මා. අවශ්‍ය නම් මට නඩු අංකත් කියන්න පුළුවන්. විවිධ පක්ෂ නඩු දැම්මා. ගරු කථානායකතුමනි, ඒ නඩුවේ තීන්දුවත් ලැබුණේ අවුරුදු එකහමාරක් විතර පහුවෙලා. 2023 පෙබරවාරි මාසයේ මැතිවරණය cancel කළාට පස්සේ ඒකෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙලා තිබෙනවා කියලා තීන්දුව ලැබුණේ 2024 අවුරුද්දේ. ඒ අතරවාරයේ අතුරු තහනම් නියෝගයක් වාගේ එකක් ලැබුණා. ඒක අතුරු තහනම් නියෝගයක්ම නොවෙයි. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට යම් කිසි නියෝගයක් ලැබුණා, මැතිවරණයට මුදල් නොදී සිටීම වැරදියි කියලා. මුදල් දෙන්න කියලා ඒත් ඒ වෙලාවේ නියෝගයක් ආවේ නැහැ. මැතිවරණයට මුදල් නොදී සිටීම වැරදියි කියලා තමයි ඒ නියෝගයත් ආවේ. එහෙම තමයි ලංකාවේ පළාත් පාලන මැතිවරණය අද පවතින තත්ත්වයට පත් වුණේ. අතිවිශාල මුදලක් වියදම් කරලා තිබියදී තමයි ඒ මැතිවරණය cancel කළේ. ගරු කථානායකතුමනි, මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගෙනාවේ අපි. අලුත් පාර්ලිමේන්තුව අපි පටන් ගත්තේ නොවැම්බර් 21වැනි දා. නොවැම්බර් 21වැනි දා අපි ආවාට පස්සේ, නොවැම්බර් 25වැනි දා පැවති පක්ෂ නායක රැස්වීමට මෙතැන හිටපු දේශපාලන පක්ෂ නායකයෝ සියලු දෙනාම වාගේ සහභාගි වුණා. එතකොට Parliamentary Business Committee එකවත් හරියට පිහිටුවා තිබුණේ නැහැ. ඒ පක්ෂ නායක රැස්වීමේදී ප්‍රධාන කරුණු දෙකක් තීරණය වුණා.

ඉන් පළමුවැනි එක තමයි, අපේ පැරණි නාම යෝජනා අහෝසි කරන්න ඕනෑය කියන එක. මොකද, ඒ පැරණි නාම යෝජනා මත මැතිවරණයකට යන්න බැහැ. පැරණි නාම යෝජනා මත මැතිවරණයකට යන්න බැරි ඇයි කියන එකට හේතු ගණනාවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එකක් තමයි, පළාත් පාලන මැතිවරණයට 2023දී නාම යෝජනා දුන් සමහර දේශපාලන පක්ෂ දැන් නැහැ; ඒ පක්ෂත් නැහැ, ඒ ලකුණුත් නැහැ, ඒ ලකුණු ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. දෙවැනි කරුණ, සමහර අපේක්ෂකයන් තමන්ගේ දේශපාලන පක්ෂය මාරු කරලා තිබීම. තුන්වැනි කරුණ, සමහර අපේක්ෂකයන් දේශපාලනයෙන් ඉවත් වීම හා තරග කිරීමට අපේක්ෂා නොකිරීම. මොකද, මේ මැතිවරණය මේ වෙනකොට අවුරුදු දෙකක් පරණයි. ඒ සමහර අපේක්ෂකයන් දැන් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා තිබෙනවා. අපේ කණ්ඩායමේ මන්ත්‍රීවරුන් 100ක් විතර ඉන්නවා, ඒ පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙච්ච අපේක්ෂකයන්. අද ඔවුන් පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙනවා. මේවා උසාවියට ඉදිරිපත් වෙච්ච කරුණු.

ගරු කථානායකතුමනි, අනෙක් කරුණ තමයි, මෙය බ්‍රිතාන්‍ය පාලන කාලයේ ගොඩනඟපු පැරණි ආඥාපනතක් වීම. ඒ නිසා මේ ආඥාපනතේ අපේක්ෂකයෙකුගේ මරණය සම්බන්ධව හැර ඉහත කරුණු සම්බන්ධව ප්‍රතිපාදන මොකුත් සකස් කරලා නැහැ.

ඡන්දයක් කියන්නේ ජනතාවගේ අභිලාෂයේ ප්‍රකාශනයක්. ඔබතුමා දන්නවා, 2022ත්, 2024ත්, අදත් ගත්තාම ලංකාවේ political chemistry එක සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙන බව. ජනතාවගේ අවශ්‍යතා, අභිලාෂ සහමුලින්ම වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි ඒ පැරණි නාම යෝජනා මත නැවත මැතිවරණය පවත්වන්න සුදුසු නැහැ කියන එකට පක්ෂ නායකයන් සියලුදෙනාම එකඟ වුණේ. මම හිතන විධියට පක්ෂ නායකයින්ට විනාඩි 30ක් ගත වුණේ නැහැ, ඒ තීන්දුව ගන්න. එහිදී සියලු පක්ෂ නායකයන් එකතු වුණා. පාර්ලිමේන්තුවේ අපි ඒක පළමුවෙන් කරපු වැඩක්, 2024 නොවැම්බර් 21වැනි දා පත් වුණාට පසුව.

ගරු කථානායකතුමනි, ඒ පක්ෂ නායක රැස්වීමේදී අපි එකඟ වුණා, කාරණා දෙකකට. එකක් තමයි, පැරණි නාම යෝජනා අවලංගු කරන්න, අලුත් නාම යෝජනා ගන්න. දෙවැනි එක තමයි, මෙතෙක් පළාත් පාලන මැතිවරණය පැවති ආකාරයටම ඒක පවත්වන්න. මොකද, අපි ඒවාට එකඟ වුණේ ඒක වෙනස් කරන්න ගියොත් මැතිවරණය තව විශාල වශයෙන් කල් යනවා කියන පදනම මතයි.

ඊට අමතරව ගරු මන්ත්‍රීවරයෙක් කියපු විධියට තරුණ නියෝජනය සියයට 25ක් මේකට ඇතුළත් කළ යුතුව තිබෙනවා කියන එකත් අපට අවබෝධයේ තිබුණා. එම නිසා ගරු කථානායකතුමනි, මේ පනත සංශෝධනය සඳහා ගරු වන්දන අබයරත්න මැතිතුමා අමාත්‍යවරයා වශයෙන් ඉදිරියට ගියේ මුළු පාර්ලිමේන්තුවේම ආශීර්වාදය ඇතුවයි. අපි විශ්වාස කළා, මේ පනතට කවුරුවත් විරුද්ධ වෙන එකක් නැහැ, මේකට දේශපාලන පක්ෂවල සම්පූර්ණ එකඟතාව තිබෙනවා කියලා. නමුත් අපේ රටේ ජනතාවට අයිතියක් තිබෙනවා, පනත්වලට අදාළව උසාවි යන්න. ඒ නිසා උසාවි ගියා. ගරු කථානායකතුමනි, ඔබතුමා මේ මාසයේ 14වැනි දා තමයි එම නඩු තීන්දුව ප්‍රකාශයට පත් කළේ. ඒ නඩු තීන්දුවට අනුව, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් මේක සම්මත කරන්න කියලා උසාවියෙන් කියා තිබෙනවා.

අපි ඒ නඩු තීන්දුව දිහා බැලුවාම මොකක්ද පෙනෙන්නේ? ඇයි, මේ වාගේ පනතක් තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කරන්න කියලා උසාවිය කියන්නේ? ඒක අතිශය වැදගත්. මොකද, උසාවිය කියන ප්‍රධාන දෙය මෙයයි. ඔබතුමා දන්නවා, අප ඇතුළු විවිධ පක්ෂ දමපු මූලික අයිතිවාසිකම් නඩුවට 2024දී තීන්දුව දෙන වෙලාවේ උසාවිය කිව්වේ මොකක්ද කියලා. මේ මැතිවරණය වහාම පවත්වන්න ඕනෑය කිව්වා; හැකි ඉක්මනින්, ඉතාම ඉක්මනින් පවත්වන්න ඕනෑය කිව්වා. නමුත් අපි දන්නවා, ජනාධිපතිවරණය ව්‍යවස්ථානුකූලව පවත්වන්න තිබුණාය කියන එක. පාර්ලිමේන්තු මැතිවරණයත් ඒ සමඟම පැවැත්වුණා. ඒ නිසා උසාවි නියෝගයේ දවසටම, උසාවි නියෝගයෙන් කියපු පරිදිම එය සිදු කර ගැනීමේ නීත්‍යානුකූලමය ප්‍රශ්නයක් තිබුණා. ව්‍යවස්ථානුකූලමය වශයෙනුත් යම්කිසි ගැටීමක් තිබුණා. ඒ වාගේම ප්‍රායෝගික බාධාවකුත් තිබුණා. එම නඩු තීන්දුවේ තිබෙනවා, මැතිවරණ කොමිසමට මේවා පවත්වන්න යම් ඉඩකඩක්; ඉතාම අවංකව, සද්භාවයෙන් පවත්වන්න පුළුවන් කාලය තීරණය කර ගැනීමේ බලයක්. නමුත් මේ නඩු තීන්දුව ගත්තාම, මොකක්ද වෙලා තිබෙන්නේ? මේ නඩු තීන්දුවෙන් මුළු පාර්ලිමේන්තුවම වරදකරු කරලා වාගේ තමයි මට තේරෙන්නේ. මම නීති විශාරදයෙක් නොවෙයි. මේ නඩු තීන්දුවෙන් මොකක්ද කියන්නේ? උසාවිය කියනවා, Fundamental Rights case එකට දීපු judgment එකේ තිබෙනවා, මැතිවරණය ඉක්මනටම තියන්න කියලා; හැබැයි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තමන්ට නීති පැනවීමට තිබෙන බලය පාවිච්චි කරලා උසාවි තීන්දුව overrule කළා කියලා. උසාවි තීන්දුවේ තිබෙන්නේ මැතිවරණය ඉක්මනින් පවත්වන්න කියලා. මේ සියලුම දේශපාලන පක්ෂ නායකයන් එකතු වෙලා සහ ඉතාම ප්‍රායෝගික කරුණු මත,- මේකේ වෙන පෞද්ගලික අවශ්‍යතාවක් තිබෙනවා කියලා අපට නම් තේරුණේ නැහැ, කිසිම දේශපාලන පක්ෂයකට.

ගරු කථානායකතුමනි, අපි දන්නවා, ජනතා පරමාධිපත්‍යය මත උසාවියට බලතල ප්‍රමාණයක් තිබෙන බව. ඒ වාගේම පාර්ලිමේන්තුවට බලතල ප්‍රමාණයක් තිබෙනවා; ජනාධිපතිවරයාට -විධායකයට- තිබෙනවා. අපි දන්නා ප්‍රමාණයන් තිබෙනවා. රටක පාර්ලිමේන්තුව පැත්තෙන් ගත්තොත්, විධායකය පැත්තෙන් ගත්තොත්, මේ රටේ පාලනය පිළිබඳව, මේ රටේ ජනතාවගේ අවශ්‍යතා පිළිබඳව අපටත් පාර්ලිමේන්තුවක් ලෙස පොදුවේ අවබෝධයක් තිබෙනවා. ඒ නිසා මට කියන්න තිබෙන්නේ

[ගරු බිමල් රත්නායක මහතා]

මේකයි. ප්‍රධාන වශයෙන් ගත්තොත්, උසාවිය ඉදිරිපත් කර තිබෙන මේ තීරණ මත අපට මේ මැතිවරණය කිසිසේත්ම නැවත කල් දමන්න බැහැ. හැකි නම් අද හෙටම පවත්වන්න තමයි තිබෙන්නේ.

ඒ නිසා අපි උසාවියට ගරු කරන්න ඕනෑ. උසාවි නියෝගවලට ගරු කළ යුතුයි. මේ ආයතන තුනම එකිනෙකාගේ වගකීම දැනගෙන, එකිනෙකාට ගරු කිරීම මත තමයි මේ රට පවත්වා ගෙන යන්න වෙන්නේ, ගරු කථානායකතුමනි. කිසියම් ආයතනයක් හිතුවොත් අපි තමයි සියල්ල තීන්දු කරන්න ඕනෑ කියලා, ඒක වැරදියි. පාර්ලිමේන්තුව එහෙම හිතන්නත් හොඳ නැහැ; විධායකය එහෙම හිතන්නත් හොඳ නැහැ; මම හිතන විධියට, අධිකරණය වුණත් එහෙම හිතන එකක් නැහැ. දැන් මේ මැතිවරණය සම්බන්ධව විවිධ තර්ක ඉදිරිපත් කරනවා. අපට ඕනෑ වුණත් දැන් මේ මැතිවරණය කල් දමන්න බැහැ. උසාවි නියෝග දෙකක් තිබෙනවා, මැතිවරණය තියන්න කියලා. සියලුම දේශපාලන පක්ෂවල නායකයන්, නොවැම්බර් 25වැනි දා ඇති කරගත් එකඟතාවෙන් තමයි මේ තීරණය ගත්තේ. ඒ වාගේම අපි අද දිනයේ මේ පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා තීන්දු කළේත් පක්ෂ නායක රැස්වීම්වලදී ඒ පිළිබඳව ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ඡා කරලා. ඒක තමයි මට මූලික වශයෙන්ම කියන්න තිබෙන්නේ. උසාවි නියෝගය මත පදනම් වෙලා හිතුවත් මේ මැතිවරණය පවත්වන්න අවශ්‍යයි.

ඊට අමතරව ඔබතුමා දන්නවා, පසුගිය අවුරුදු ගණනක් තිස්සේ රටේ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වුණේ නැහැ කියන එක. පළාත් පාලන ආයතන කියන්නේ ඉතාම වැදගත් ආයතන. අපි කවුරුත් දන්නවා, ඒවායෙන් කෙරෙන සේවය පිළිබඳව. සමහර විට ඒ සේවය පාර්ලිමේන්තුවට නොදෙවෙනි නැහැ. ප්‍රායෝගිකව ගත්තොත්, ඒවායින් ජන ජීවිතයට විශාල සේවයක් කරනවා. ඒ වාගේම අපි හිතනවා, ඉදිරි කාලයේදී ඒවායින් අලුත් මහජන නියෝජිතයන් අතිවිශාල ප්‍රමාණයක් නිර්මාණය කරාවි කියලා. අලුතෙන් ගොඩ නැඟී තිබෙන දේශපාලන සංස්කෘතිය අනුව යන අලුත්, තරුණ නායක නායිකාවන්ට විවිධ දේශපාලන පක්ෂවලින් එන්න අවස්ථාවක් මේ තුළින් ලැබෙනවා. ඒ වාගේම තරුණ නියෝජනය සියයට 25ක් ඇතුළු වෙලා තිබෙනවා.

ඊළඟට කාන්තා නියෝජනය ගැන කිව්වොත්, ලෝකය ඉස්සරහා අපි ආඩම්බර වෙනවා. ළඟදී ජිනීවාවල පැවතුණු කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සමුළුවට අපේ කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමිය සහභාගි වුණා. එහිදී අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් විසිදෙදෙනාම -අගමැතිතුමිය ඇතුළුව- ලංකාව වෙනුවෙන් ඉදිරිපත් කරපු Action Plan එක එක්සත් ජාතීන්ගේ සංවිධානයේ_පැසසුමට ලක් වුණා. ගරු කථානායකතුමනි, කලින් වාගේ අපට හිටියේ මන්ත්‍රීතුමියලා 4ක්, 5ක් නම් ඒක වෙන්නේ නැහැ; සමහර විට ඇමති දූලා විතරක් වුණා නම් ඒක වෙන්නේත් නැහැ. නමුත් අද එහෙම නොවෙයි. ඉතාම මහන්සියෙන් දේශපාලන සමාජ ක්‍රියාකාරකම් කරලා, ඉගෙන ගත්ත, මිනිසුන් වෙනුවෙන් වගකියන මන්ත්‍රීවරියන් රාශියක් අද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර මැතිතුමනි, ඔබතුමා ඒ ගැන කල්පනා කරලා බලන්න. ඊළඟ ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් මන්ත්‍රීවරු 9,000ක් විතර තේරෙනවා. අඩුම ගාණේ ඒකෙන් 2,500ක් විතර කාන්තාවන් සිටීවි. ඔබතුමා ඒ ගැන කල්පන කර බලන්න. පොඩි පොඩි අඩුපාඩුකම් මුලින් තිබේවි. හැබැයි, කාන්තා දේශපාලනය පැත්තෙන්, කාන්තාවන්ගේ දේශපාලන භූමිකාව පැත්තෙන් අතිවිශාල පිම්මක් මේ මැතිවරණයත් එක්ක ඇති වෙනවා. ඒ නිසා අපි හිතනවා, මේ මැතිවරණය පළාත් පාලන ආයතන ස්ථාපිත කිරීම යටතේ වාගේම රට ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමේදී සියයට 52ක් වන කාන්තාවන් දේශපාලනයට ඇතුළත් කර ගැනීමේ පැත්තෙන් ගත්තත් ඉතාම වැදගත් කියලා.

මම මේ කාරණයත් කියන්න ඕනෑ. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා, මැතිවරණයට කල් මදි කියලා. මම දන්නා තරමින් මැතිවරණයට ගොඩක් කල් මදි වෙන්නේ නැහැ. දැන් තිබෙන calculations අනුව ගත්තොත්, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු දන්නේ නැහැ වාගේ රහපාන එක හොඳ නැහැ. මැතිවරණයක දින ගණනය කිරීම පක්ෂයක මහ ලේකම් කෙනෙකුත් දන්නේ නැත්නම් ඒ මහ ලේකම්කම ගැන ප්‍රශ්න කරන්න ඕනෑ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පනත ගැන දැනගන්න ඕනෑ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පක්ෂයක මහ ලේකම් කෙනෙක් පනත බලලා මැතිවරණය සඳහා දිනය තීරණය කරන්න දන්නේ නැත්නම්, ඇත්තටම ඒ මහ ලේකම්කම ගැන මට ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමනි, මම ඔබතුමාගේ මහ ලේකම්කම ගැන challenge කරන්නේ නැහැ. ඔබතුමා ඔහොමම ඉන්න. ඔබතුමා ඉන්න එක අපට හොඳයි. ඔබතුමා ඉන්න. විපක්ෂ නායකතුමා අපි කොහොමත් බලා ගන්නවා. මේක rocket science නොවෙයි. මේක කවුරුත් දන්නවා. මැතිවරණය පැවැත්වෙන්න පුළුවන් කාල සීමා පිළිබඳව යම් අදහසක් අපට තිබෙනවා. ඒක තමයි අපි කිව්වේ. අනිවාර්යයෙන්ම දවස් 49කට කලින් මැතිවරණය තියන්න ඕනෑ, නාම යෝජනා අනුව. *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමයි. *[බාධා කිරීමක්]* දවස් 35ත්, 49ත් අතර. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමනි, ඔබතුමා මහ ලේකම්කම තියා ගන්න ඕනෑ. no change. *[බාධා කිරීමක්]* ඒ, කලින් ඉපදිව්ව නිසා නේ. මම පාර්ලිමේන්තුවට ආවේ වයස අවුරුදු 26න්. ඔබතුමා ආවේ අවුරුදු කීයෙන්ද?*[බාධා කිරීමක්]* ඒ වාදයට යන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* ඒක තමයි. ඒකට එන්න ඕනෑ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ පොඩි play එකක් තියන්න ඕනෑ නේ. මැතිවරණයට කල් මදි කියලා ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. Budget එක තිබෙන නිසා මේ කටයුතු හිරවෙලා තිබෙන බව අපි පිළිගන්නවා.

Budget එක මාර්තු 21වන දා අවසන් වෙනවා. අපිට පෙනෙන හැටියට දැන් යන විධියත් එක්ක අනිවාර්යයෙන්ම මේ මැතිවරණය පවත්වන්න තිබෙන්නේ අප්‍රේල් මාසයේ අගදි. ඒ නිසා අඩුම ගණනේ සති පහකට ආසන්න කාලයක් ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබෙනවා, තමන්ගේ ආසනවලට ගිහිල්ලා ප්‍රාදේශීය සභා කටයුතු සංවිධානය කරන්න. මම හිතන විධියට සති පහක් කියන්නේ, කාටත් හොඳටම ප්‍රමාණවත් කාලයක්. කොහොමත් මේවා මම තීන්දු කරන ඒවා නොවෙයි, උසාවියෙන් තීන්දු කරලා තිබෙන දේවල්. ඊට පස්සේ මැතිවරණ කොමිසම තීන්දු කරන්නේ.

ඊළඟට, O/L විභාගය ගැන කථා කළා. මේ සභාවේත් ගුරුතුමන්ලා සහ ගුරුතුමියන්ලා ඉන්නවා. O/L විභාගය මාසය පුරා තිබුණාට, දවස් දහයකින් වාගේ ඉවර වෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දවස් දහයයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
දවස් දහයයි තිබෙන්නේ. ඒ නිසා ඒ තර්කයත් එච්චර වැදගත් නැහැ. අනෙක් එක තමයි, ඡන්ද රැස්වීම් තිබෙන්නේ සවස් වරුවේ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, ගරු කථානායකතුමනි. මම කථාව අවසන් කරන්නම්.

මාර්තු 21වැනි දායින් පස්සේ මැතිවරණය එන නිසා අය වැය සම්බන්ධව ප්‍රශ්නයක් එන්නේ නැහැ. ඒ වාගේම කාලය මදි වෙන්නේත් නැහැ. මොකද, අප්‍රේල් මාසයේ අග කියන්නේ, මැතිවරණයට සැහෙන්න කාලයක් තිබෙනවා.

ඔබතුමන්ලා ඇප මුදල් ගැනත් කිව්වා. ගරු කථානායකතුමනි, අපි ඒ ගැන සතුටු වෙනවා. පසුගිය මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය සහ සමගි ජන බලවේගය වාගේ පක්ෂ budget එක ඉදිරිපත් කළා නේ. මැතිවරණයේ budget එක මැතිවරණ කොමිසමට ඉදිරිපත් කළා. ඒ අනුව ලංකාවේ වැඩියෙන්ම මුදල් වියදම් කරලා තිබෙන පක්ෂය මොකක්ද? ජනාධිපති අපේක්ෂකයා කවුද? රුපියල් මිලියන නවසිය ගණනක් වියදම් කරලා තිබෙන්නේ පැරදුණු විපක්ෂ නායකතුමා. දිනපු අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ කීයද? අපි ඉදිරිපත් කරලා තිබෙන ගණන තිබෙන්නේ ඒ ලැයිස්තුවේ තුන්වෙනියට. *[බාධා කිරීමක්]* මට ගණන මතක නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමන්ලා දැම්මේ බොරු ගණන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඒවා ඉතින් දුකට කියන කථා. මට මතක විධියට, අපි ඉදිරිපත් කරලා තිබුණේ රුපියල් මිලියන 400 ගණනක්. *[බාධා කිරීමක්]* එතකොට, ඒ කාලයේ සල්ලි තිබුණේ කොහොමද? දැන් ඔබතුමන්ලා කියන්නේ පක්ෂයක් විධියට අපේ ප්‍රතිපත්තිය ගැන. ඒක තමයි අපේ ශක්තිය. අපි ඇවිල්ලා තිබෙන්නේ පෞද්ගලිකව පොහොසත් වෙන්න නොවෙයි. අපි ඇවිල්ලා තිබෙන්නේ මේ රටේ දේශපාලන සම්ප්‍රදායක් භඳන්න. අපි ඒක හොඳට කරගෙන යනවා. අපිට සතුටක් දැනෙනවා, ඔය අති ධන කුවේරයින්ගේ පක්ෂය අද අපේ පැලවත්ත කාර්යාලයට ඇවිල්ලා සල්ලි ඉල්ල ගන්නවා නම්. එන්න පෝලිමේ, අපි පොඩ්ඩ, පොඩ්ඩ දෙන්නම්. ඒ නිසා අපි මැතිවරණ කොමිසමෙන් ඉල්ලා සිටිනවා,-*[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මට වෙලාව නැහැ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, එතුමාගෙන් වේලාව ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා පක්ෂයක් විධියට ආදර්ශයක් දුන්නාය කිව්වා. පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ පඩිය එක account එකකට යනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ වැටුප් යන්නේ ඒ මන්ත්‍රීවරුන්ගේ ගිණුම්වලට. මන්ත්‍රීවරුන් විසින් ඒක පක්ෂය වෙත ලබා දෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පක්ෂයට ලබා දෙනවා?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, අපි එහෙම තමයි. පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් ඒක ලබා දෙනවා. ඔබතුමන්ලාට ඒක කර ගන්න බැරි වෙච්ච එකට අපිට කරන්න දෙයක් නැහැ.

ගරු කථානායකතුමනි, ඇප මුදල් සම්බන්ධවත් කිව්වා. ඒ මුදල් ඇත්තේ මුදල් අමාත්‍යාංශය සතුව වෙන්න ඇති. මම දන්නේ නැහැ, කොහේද තිබෙන්නේ කියලා. අපිත් හිතනවා, ඒ මුදල් නැවත ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියලා. මොකද, අතිවිශාල සල්ලි ප්‍රමාණයක් එතැනට හිර වෙලා තිබෙනවා. ඒ නිසා ඒක ලබා දෙන්න මැතිවරණ කොමිසම කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, අපි ලංකා ඉතිහාසයේ ඉතා නිවැරැදිව, ඉතා සාධාරණව, රාජ්‍ය දේපළ තඹ සතයක් පාවිච්චි කරන්නේ නැතුව, පසුගිය මහ මැතිවරණය කරලා තිබෙන බව. එහෙම තිබියදී නිකම් ඉතා සවුත්තු කථා කියන්න එපා කියලා තමයි මට කියන්න තිබෙන්නේ. මොකද, ඒකට ඊට වඩා හොඳ වචනයක් කියන එක අපරාදේ. ඒ නිසා අපි දැන් අරවා කරයි, මේවා කරයි කියලා කියන්න තරම් පහළට වැටෙන්න එපා. අපි කරලා නැහැ නේ. අපි කිසිම දේශපාලන පළිගැනීමක් කරලා නැහැ නේ. පාර්ලිමේන්තු මැතිවරණයක් තිබුණා, ඒකට කිසිම රාජ්‍ය දේපළක් පාවිච්චි කරලා නැහැ නේ. එහෙම කරලා නැහැ. දැනුත් කරන්නේ නැහැ. දැනුත් අපි රක්ෂා දෙන්නේ නැහැ. අපි මොනරාගලින් කට්ටිය ගෙනැල්ලා ලංගම පුරවන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කලින් දරපු අමාත්‍යාංශයක් භාර ඇමතිවරයා විධියට දැන් මමයි ඉන්නේ. ඒ නිසා මට ඒ සේවකයන්ගේ ඇඩ්‍රස් පෙනෙනවා. ඒකයි ඇත්ත. ගරු කථානායකතුමනි, එහෙම තමයි මේගොල්ලන් ලංගම විනාශ කළේ.

[ගරු බිමල් රත්නායක මහතා]

අවසාන වශයෙන්, මට කියන්න තිබෙන්නේ මේකයි. අපි ඉතාම හොඳ, සදාචාර සම්පන්න, සාධාරණ දේශපාලන ක්‍රමයක් කරගෙන කරනවා. ඉතාම සාධාරණ මැතිවරණයක් පවත්වනවා කියලා අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහතික වෙනවා. ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත සම්මත කරලා, පළාත් පාලන මැතිවරණය පවත්වලා ඉතා ඉක්මනින් මේ පළාත් පාලන ආයතන ශක්තිමත්ව පටන් ගැනීම අත්‍යවශ්‍යයි. ඒ වෙනුවෙන් සියලුදෙනා ඒක රාශි වන ලෙස ඉල්ලා සිටිමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Next, the Hon. Sivagnanam Shritharan. You have seven minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු (වෛත්තියර්) රිස්වි සාලි] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[பி.ப. 2.48]

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2023ஆம் ஆண்டு மார்ச் மாதம் 09ஆம் திகதி நடத்தப்படவேண்டிய உள்ளூர் அதிகாரசபைகளின் தேர்தல்கள் நடைபெறாமல் நீண்ட காலம் இழுபறியில் இருந்த நிலையில், நீதிமன்றத் தீர்ப்பை அடுத்து, இன்றைய தினம் நீங்கள் உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலத்தை இரண்டாம் மதிப்பீட்டுக்காகச் சமர்ப்பித்து இருக்கின்றீர்கள். அதில் குறிப்பாக, 2023ஆம் ஆண்டின் 30ஆம் இலக்க, உள்ளூர் அதிகாரசபைத் தேர்தல்கள் (திருத்தம்) சட்டம், 2023ஆம் ஆண்டு நவம்பர் 17ஆம் திகதியன்று நடைமுறைக்கு வந்துள்ளதன் அடிப்படையில், இளம் வேட்பாளர்களுக்குச் சந்தர்ப்பம் வழங்குவது தொடர்பில் ஏற்பாடு செய்தல் அவசியமெனக் குறிப்பிடப்பட்டு இருக்கின்றது. இதற்கூடாக, ஏற்கெனவே பெண்களுக்கு 25 சதவீத ஒதுக்கீடு வழங்கப்பட்ட சந்தர்ப்பமும் இருக்கின்றது. இவை நல்ல விடயங்கள்! தேர்தல் தொடர்பான சட்டத் திருத்தங்களில் இளையோருக்கும் பெண்களுக்கும் வழங்கப்பட்டு இருக்கின்ற விடயங்கள் வரவேற்கத்தக்கவை.

உள்ளூர் அதிகாரசபைத் தேர்தல்களில் பின்பற்றப்படுகின்ற 60:40 என்ற நடைமுறையால், எப்பொழுதும் அந்தச் சபைகளில் உறுதியான ஆட்சி அமைக்க முடியாத ஒரு தொங்குநிலை உருவாக்கப்பட்டு இருக்கின்றது. அண்மைக் காலத்தில் தேர்தல் வெற்றிகளைப் பெற்றுக்கொண்ட NPP கட்சிகூட, எல்பிட்டிய பிரதேச சபைக்கான தேர்தலில் வெற்றிபெற்றும் தொங்கு நிலையில் ஆட்சி அமைத்திருப்பதை நாங்கள் பார்க்கக் கூடியதாக இருக்கின்றது. ஏனெனில், உள்ளூராட்சி மன்றத் தேர்தலில் குறித்த ஒரு சபையில் எந்தக் கட்சி பெரும்பான்மை ஆசனங்களைப் பெற்று ஆட்சி அமைப்பதென்பது, அந்த வட்டாரங்களிலிருந்து தெரிவாகின்ற பிரதிநிதிகளைக்கொண்டு மட்டும் தீர்மானிக்கப்படுவதில்லை. மேலதிக பிரதிநிதிகள் உள்ளீர்க்கப்படுகின்றபோதுதான் இந்த நிலைமை தோன்றுகின்றது.

உதாரணத்துக்கு, பூநகரிப் பிரதேச சபையை எடுத்துக் கொள்வோம். அச்சபைக்கு 11 பேர் வட்டாரங்களிலிருந்து தெரிவுசெய்யப்படுகின்ற அதேநேரம், மேலதிகமாக 09 பேர் பிரதிநிதிகளாக நியமிக்கப்படுகின்றார்கள். மொத்தமாக 20 பேர் இருப்பார்கள். இவர்கள் வெவ்வேறு கட்சிகளைப் பிரதிநிதித்துவப்படுத்தி வருவதால், வட்டாரங்களில் பெரும்பான்மை உறுப்பினர்களை வென்ற கட்சி, தனித்து ஆட்சி அமைக்க முடியாத நிலை உருவாகின்றது. இது இந்தத் தேர்தல் முறையில் இருக்கின்ற மிகப்பெரிய குறைபாடாகும். நீங்கள் கொண்டுவந்திருக்கின்ற திருத்தங்களில் இந்த விடயங்களும் உள்ளடங்கி இருக்கக்கூடும். நீங்கள் இது பற்றிப் பேசி இருக்கலாம். நாங்கள் இது பற்றி பலமுறை சொல்லியும் தவிர்க்கப்பட்டு இருக்கின்றது. அதாவது, கலப்பு முறையானது 70:30ஆக இருந்தால், அதாவது, 70 சதவீதம் தொகுதிவாரி முறையிலும், 30 சதவீதம் விகிதாசார முறையிலும் அமைந்தால், அது சாத்தியப்பாடானதாக இருக்குமென நாங்கள் பல முறை சொல்லியிருக்கிறோம். உள்ளூராட்சி மன்றத் தேர்தலுக்கான வேட்புமனுவில் இளையோருக்கும் பெண்களுக்கும் இட ஒதுக்கீடு கொடுத்திருப்பது நல்ல விடயம்! அதேபோல, இத்தேர்தலில் 70:30 என்ற நடைமுறையும் இருந்திருந்தால், இன்னும் சிறப்பாக இருந்திருக்கும். அதற்கான வரையறை இதற்குள் இருக்கிறதா? திருத்தம் செய்ய முடியுமா? அதற்கான காலம் போதுமா? என்பதை நீங்கள் சொல்ல வேண்டும்.

நீதிமன்றம் வழங்கியிருக்கின்ற மூன்று மாத காலப்பகுதிக்குள் உள்ளூராட்சி மன்றத் தேர்தலை நடத்த வேண்டுமென்ற முனைப்பு உங்களிடம் இருக்கின்றது. நாங்கள் அதை வரவேற்கின்றோம். ஆனால், க.பொ.த. சாதாரண தரப் பரீட்சை, வரவு செலவுத்திட்ட விவாதம், 'ஈஸ்டர்' தினம் உட்பட பல சமய நிகழ்வுகள் என்பன இந்தக் காலப்பகுதிக்குள் நடைபெறப்போகின்றன. இதற்குள் இந்தத் தேர்தலுக்கான பிரசாரத்தையும் மேற்கொள்ள வேண்டும். இங்கிருக்கின்ற உறுப்பினர்கள்தான் தங்களது பிரதேசங்களுக்குச் சென்று தேர்தல் பிரசாரப் பணிகளிலும் ஈடுபட வேண்டும். எங்களைப் பொறுத்தவரை, இந்தத் தேர்தலை ஏப்பிரல் மாதத்தில் நடத்துவது என்பது நெருக்கடியானதாக இருக்கும். எனவே, தேர்தல் திணைக்களம் அல்லது அரசாங்கம் இந்தத் தேர்தலுக்கான திகதியை கொஞ்சம் பிற்போடுவது பொருத்தமானதாக இருக்குமென்பது என்னுடைய கருத்தாகும்.

சாதாரணமாக பாராளுமன்றத் தேர்தல் அல்லது மாகாண சபைத் தேர்தல்களில் 5 சதவீதத்துக்குக் குறைவான வாக்குகளை ஒரு கட்சி அல்லது சுயேட்சைக் குழு பெற்றிருந்தால், விருப்பு வாக்குகள் எண்ணப்படுவதில்லை. ஆனால், உள்ளூராட்சி மன்றத் தேர்தலில் 5 சதவீதத்துக்குக் குறைவான வாக்குகளை ஒரு கட்சியோ, சுயேட்சைக் குழுவோ பெற்றிருந்தால், விருப்பு வாக்குகள் எண்ணப்படுகின்றன. அவ்வாறு எண்ணப்படுகின்றபோது, 'மேலதிக உறுப்பினர்கள்' என்ற விடயம் உள்ளூராட்சி மன்றங்களில் மிகப்பெரிய பிரச்சினைக்குரிய விடயமாக மாறுகின்றது. இலங்கையில் பாராளுமன்றத் தேர்தலிலும் மாகாண சபைத் தேர்தல்களிலும் இருக்கின்ற இந்த 5 சதவீத நடைமுறையை ஏன், உள்ளூராட்சி மன்றத் தேர்தலில் பின்பற்றுவதில்லை? ஏன் அந்தத்

திருத்தத்தை உங்களால் கொண்டுவர முடியாமல் போனது? இந்த நாட்டில் பாராளுமன்றத் தேர்தல், மாகாண சபைத் தேர்தல்களில் ஒரு கட்சி அல்லது சுயேட்சைக் குழு ஆசனமொன்றைப் பெறவேண்டுமென்றால், ஆகக் குறைந்தது 5 சதவீத வாக்குகளைப் பெறவேண்டுமென்ற சட்ட ஏற்பாடு இருக்கின்றது. உள்ளூராட்சி மன்றத் தேர்தலில் - ஒரு பிரதேச சபையின் எல்லைக்குள், ஒரு நகர சபையின் எல்லைக்குள், ஒரு மாநகர சபையின் எல்லைக்குள் - 5 சதவீதத்துக்குக் குறைவான வாக்குகளைப் பெறுகின்ற சுயேட்சைக் குழுக்கள் அல்லது கட்சிகளின் விருப்பு வாக்குகள் ஏன் எண்ணப்படுகின்றன என்பது எங்களுக்குள் இருக்கின்ற கேள்வியாகும். அதை நீங்கள் ஒரு திருத்தமாகக் கொண்டுவந்திருக்கலாம். இது ஒரு சிறிய விடயம்! நீதிமன்றக் கட்டளையின் பிரகாரம், இந்தச் சட்டமூலத்தை 2/3 பெரும்பான்மையோடு நிறைவேற்ற வேண்டும் என்று இருக்கையில், இந்தச் சிறிய விடயத்தையும் இதில் உள்ளீர்த்திருக்கலாம்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உள்ளூராட்சி மன்றங்கள் என்பது, வீதிப் போக்குவரத்து, கழிவகற்றல், கிராமங்களின் வளர்ச்சி போன்ற மக்களின் அடிப்படைத் தேவைகளை நிறைவேற்றுகின்ற மிக முக்கிய நிறுவனங்களாக இருக்கின்றன. கிட்டத்தட்ட அது ஒரு குட்டி அரசாங்கம்! அந்தக் குட்டி அரசாங்கம் தன்னுடைய அதிகாரத்தைப் பயன்படுத்தி, தனது அதிகார எல்லைக்குள் இருக்கின்ற மக்களுக்கான பணிகளைச் சிறப்பாக ஆற்ற வேண்டும். அதுவே உள்ளூராட்சி மன்றங்களின் மிகப் பெரிய கடமை! அதனை மையமாக வைத்துத்தான் மக்கள் வாக்களிக்கின்றார்கள். அதாவது, "இவர் இந்தப் பணியைச் செய்வார்" என்று வேட்பாளர்களுடைய முகத்தைப் பார்த்து வாக்களிக்கின்றார்கள். கீழ்மட்ட நிலையில் இருக்கின்ற அரசியல் தலைவர்களை - மூன்றாம் நிலை அரசியல் தலைவர்களை - உருவாக்குகின்ற ஓர் இடமாகவும் உள்ளூராட்சி மன்றங்கள் இருக்கின்றன. இவ்வாறான அடிப்படையில் இருக்கின்ற உள்ளூராட்சி மன்றங்களுக்கான தேர்தலை நடத்துவதற்கு ஏன் நீங்கள் அவசரப்படுகின்றீர்கள்? கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வேட்புமனுக்களைத் தாக்கல் செய்வதற்குத்தான் மூன்று மாதங்கள் என நீதிமன்றம் சொல்லியிருக்கிறது. அதற்குப் பிறகும் தேர்தலுக்குரிய திகதியை நிர்ணயிக்க முடியும்.

குறித்த காலப்பகுதி க.பொ.த. சாதாரண தரப் பரீட்சை நடைபெறவிருக்கின்ற காலப்பகுதி. அதுமாத்திரமன்றி, பல மதத்தவர்களுடைய சமயம் சார்ந்த விடயங்கள் நடைபெறவிருக்கின்ற காலப்பகுதி. குறிப்பாக, முஸ்லிம்களின் நோன்பு காலம் வருகின்ற காலப்பகுதி. இவையெல்லாம் இந்தக் காலப்பகுதியில் இருக்கையில், ஏன் நீங்கள் இந்தத் தேர்தலை நடத்துவதற்கு அவசரப்படுகின்றீர்கள்? எனவே, இதில் கொஞ்சம் மாற்றத்தைக் கொண்டுவரலாமா எனச் சிந்தித்துப் பார்க்க வேண்டுமென நான் கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களையும் ஆளும் கட்சி சார்ந்த பிரதிநிதிகளையும் கேட்டுக் கொள்கின்றேன். தயவுசெய்து, இந்த விடயத்தில் அவசரமில்லாமல் செயற்பட்டு, சேர்க்கவேண்டிய சில திருத்தங்களையும் சேர்த்து, இந்த உள்ளூராட்சி மன்றத் தேர்தலுக்கான திகதியை நிர்ணயிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். க.பொ.த. சாதாரண தரப் பரீட்சை 10 நாட்கள் நடைபெறலாம். ஒரு மாணவன் 11 ஆண்டுகள் படித்து, காத்திருந்து எழுதப்போகும் பரீட்சையை தேர்தல் பிரசாரத்துக்காகப் போகும் நபர்கள் குழப்புவார்களாக இருந்தால், அந்த மாணவனுடைய அந்த 11 வருட வாழ்க்கை என்னவாகும் என்பதைச் சற்று யோசித்துப் பாருங்கள்! எனவே, நாங்கள் இதனை வெறுமனே 10 நாட்கள் நடைபெற விருக்கின்ற பரீட்சை எனக் குறிப்பிட முடியாது.

ஒரு மாணவனுடைய 11 வருட கால வாழ்க்கையின் தொடர்ச்சிதான் க.பொ.த. சாதாரண தரப் பரீட்சை! இந்தப் பரீட்சையை எழுத இருக்கும் மாணவர்கள், இப்பரீட்சை நடவடிக்கைகளில் ஈடுபடவுள்ள ஆசிரியர்கள், உத்தியோகத்தர்கள் இந்தத் தேர்தல் காலத்தில் சந்திக்கப் போகின்ற இடர்கள் மிகக் கடினமானவை. நாங்கள் வரவு செலவுத்திட்ட விவாதங்களில் கலந்துகொள்வதற்காகப் பாராளுமன்றம் வந்திருக்கின்றோம். இனி நாங்கள் ஊர்களுக்குத் திரும்பிச் சென்று தேர்தல் பிரசார நடவடிக்கைகளில் ஈடுபடுவதா? வாண்மை ரீதியாக இந்த வரவு செலவுத்திட்ட விவாதங்களில் பங்குகொள்வதா? என்ற நிலை காணப்படுகின்றது. தயவுசெய்து இது பற்றிச் சிந்தியுங்கள்! இது மிக முக்கியமானது. ஆகவே, இந்தத் தேர்தல் நடைபெறவிருக்கின்ற காலப்பகுதியை மாற்றுங்கள்!

நான் மேலே குறிப்பிட்ட, வாக்குகள் எண்ணப் படுவதற்கான வெட்டுப்புள்ளி 5 சதவீதம் பற்றி யோசியுங்கள்! இந்தத் தேர்தல் முறையில் உள்ளீர்க்கப்படுகின்ற உறுப்பினர் களின் எண்ணிக்கையில் வட்டாரங்களுக்கு முக்கியத்துவம் கொடுங்கள்! வட்டாரங்களில் வெற்றிபெறுகின்ற கட்சி, அந்தச் சபையில் தனித்து ஆட்சி அமைக்கக்கூடிய வல்லமை கொண்ட தாக இருக்க வேண்டும். மேலதிகமாக நியமிக்கப்படுகின்ற பிரதிநிதிகள் அதனைக் குழப்புவதாக இருக்கக்கூடாது என்பதை நான் இந்த இடத்தில் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next Speaker is the Hon. P. Ruwan Senarath. You have 18 minutes.

[අ.භා. 2.56]

ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විශේෂ දවසක්. ඒ විශේෂ දවසේ අපට තවත් වැදගත් කාරණාවකට මැදිහත් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ තමයි වසර කිහිපයක් තිස්සේ කල් දමා තිබෙන පළාත් පාලන මැතිවරණයට අදාළ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත මේ මොහොතේ විවාදයට ගැනීම. 2023.03.09 වැනි දින පැවැත්වීමට නියමිතව තිබුණු පළාත් පාලන මැතිවරණය දින නියමයක් නොමැතිව කල් දැමුවා.

පළාත් පාලන ආයතන 341ක් අපේ රටේ තිබෙනවා. ඇල්පිටිය ප්‍රාදේශීය සභාව හැරුණු කොට තවත් පළාත් පාලන ආයතන 340ක ඡන්දය පවත්වන්නට නියමිතව තිබෙනවා. අපි දන්නවා, පළාත් පාලන ආයතනවල මැතිවරණය නොපැවැත්වීම නිසා වසර කිහිපයක් තිස්සේ ඒවා මහජන නියෝජිත ආයතන විධියට නොපැවතුණු බව. ඒ හේතුවෙන්, ඒ පළාත් පාලන ආයතනවලින් ජනතාව බලාපොරොත්තු වෙච්ච අවශ්‍යතා ඉෂ්ට කර ගන්න බැරිව, අද ඒ ජනතාවට අවශ්‍ය මැදිහත් වීම සිදු වන්නේ නැති තත්ත්වයකට පළාත් පාලන ආයතන පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ මූලික පහසුකම් සපයන ප්‍රධාන ආයතනය තමයි පළාත් පාලන ආයතනය. ග්‍රාමීය මං මාවත් නඩත්තු කිරීම, වීදි ලාම්පු ආලෝකකරණය, ජල පහසුකම් ඇතුළු

[ගරු පී. රුවන් සෙනරත් මහතා]

ජනතාවගේ මූලික අවශ්‍යතා වෙනුවෙන් ගමේ කටයුතු කරන්නේ පළාත් පාලන ආයතනයයි. හැබැයි, වසර කිහිපයක් තිස්සේ මේ පළාත් පාලන ආයතන මහජන නියෝජිත ආයතනයක් නොවීම නිසාම, ඡන්දය නොපවත්වපු නිසාම අද එම ආයතන අකර්මණ්‍ය වෙලා තිබෙනවා; ඒවායේ ක්‍රියාකාරිත්වය දුර්වල වෙලා තිබෙනවා. ඒක නිසාම අද එම ආයතන ජනතාවගෙන් බදු එකතු කරන, ජනතාවට සේවය සපයා ගන්න බැරි තත්ත්වයකටම පත් වෙලා තිබෙනවා. ඒ නිසා හැම පැත්තෙන්ම අපට ජනතාවගෙන් මැසිවිලි එනවා, තමතමන්ගේ පළාත් පාලන ආයතන තුළින් අවශ්‍ය කාරණා ඉටු වෙන්නේ නැහැ කියලා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඉතා කඩිනමින් ඡන්දය පවත්වා මේ අකර්මණ්‍ය වෙච්ච මහජන ආයතනය මහජන නියෝජිත ආයතනයක් බවට පත් කරලා, ග්‍රාමීය වශයෙන් ජනතාවගේ එදිනෙදා ජීවිතයේ මතු වෙලා තිබෙන මේ ගැටලුවලට මූලික මැදිහත් වීම් කරන්න ඕනෑ කියලා. ඒ නිසා තමයි මේ මැතිවරණය කල් දැමීමට එරෙහිව අද ආණ්ඩුවක් විධියට අප කටයුතු කරන්නේ. එදා විපක්ෂයේ ඉඳගෙනත් අපි මේ වෙනුවෙන් දිගින් දිගටම කටයුතු කළා.

අපි දැක්කා මේ පළාත් පාලන මැතිවරණය කල් දමන්න එවකට ඉදපු ආණ්ඩු කටයුතු කළ ආකාරය. විශේෂයෙන්ම මැතිවරණයට දින නියම වෙලා තිබියදී; මැතිවරණයට අදාළ සියලු කටයුතු සූදානම් වෙලා තිබියදී, ඒ වෙලාවේ ආණ්ඩුව කරපු අය කටයුතු කළ ආකාරය අපි දැක්කා. අපට මතකයි, හිටපු ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ පවත්වපු විවාදයේදී පැහැදිලිව කිව්වා, "ඡන්දය කල් දමලාත් නැහැ, කල් දමන්න ඡන්දයකුත් නැහැ, ඡන්දය පවත්වන දිනයක් මැතිවරණ කොමිසම නිල වශයෙන් තවම ප්‍රකාශ කරලාත් නැහැ" කියලා. එය මාධ්‍යවලත් වාර්තා කළා.

මා ළඟ තිබෙනවා 2023 පෙබරවාරි 23 දිනැති හැන්සාඩ් වාර්තාව. අපි විපක්ෂයෙන් අහනවා, ඇත්තටම අද ඔබතුමන්ලා මේ කරුණු පැහැදිලි කරන්නේ සද්භාවයෙන්ම ඡන්දය පවත්වන්න වුවමනාව ඇතිව ද කියලා. මොකද, ඒ විවාදයේදී රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාම මේ පාර්ලිමේන්තුවේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් නම් කරලාම කිව්වා, මේ මේ අය තමයි මැතිවරණය කල් දමන්න කියලා මගෙන් දිගින් දිගටම ඉල්ලීම් කළේ කියලා. ඒ බව මේ හැන්සාඩ් වාර්තාවේ සඳහන්ව තිබෙනවා. හැබැයි, ඒ පාර්ලිමේන්තුවේදීම අපි දැක්කා, අද කථා කරපු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඇතුළු එදා විපක්ෂයේ සිටි මන්ත්‍රීවරු බෝඩ් අල්ලාගෙන මේ මැතිවරණය පවත්වන්න කියලා ඉල්ලීම් කරනවා. මේකේ දයාසිරි මන්ත්‍රීතුමාගේ ෆොටෝ එකත් තිබෙනවා, ඡන්දය පවත්වන්න කියලා ඉල්ලීම් කරනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ඔව්.

ගරු පී. රුවන් සෙනරත් මහතා
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)
ඒ වාගේම තමයි, දැන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. මීට සතියකට කලින් මම දැක්කා,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, මගේ නම කිව්ව නිසායි මම මේ කියන්නේ. අපි දිගටම ඉල්ලුවේ මේ මැතිවරණය පවත්වන්න කියලා. එහි කිසි වෙනසක් නැහැ. එතැන මගේ ෆොටෝ එක තියෙනවා තමයි. මේ මැතිවරණය තියන්න කියන තීරණයේ තමයි අපි හිටියේ. අපි ආයෙත්,-

ගරු පී. රුවන් සෙනරත් මහතා
(மாண்புமிகு பீ. ருவன் செனரத்)
(The Hon. P. Ruwan Senarath)
හොඳයි. ඊළඟ කාරණය අහගෙන ඉන්න.

හැබැයි, දැන් දවස් ගණනාවකට කලින් මේ පවත්වන්න හදන මැතිවරණය කල්දාන්න පුළුවන්ද කියලා බලන්න පිරිසක් මැතිවරණ කොමිසමට යනවා අපි දැක්කා. මම දැක්කා, ඒ වෙලාවේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ඇතුළු කණ්ඩායමක් යනවා. ඒ නිසා අපට ආපහු ප්‍රශ්නයක් මතු වෙනවා, ඇත්තටම සද්භාවයෙන් මේ අය මේකට මැදිහත් වෙනවාද, එහෙම නැත්නම් මේ මැතිවරණය පවත්වන එක නතර කරලා මැතිවරණය කල් දමන්න සැලසුම් කරනවාද කියලා.

මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතේ අලුත් සංශෝධන ඇතුළේ වැදගත් කාරණා කිහිපයක් සඳහන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පෙරදී පැවැත්වීමට තිබුණු මැතිවරණය පැවැත්වුවා නම්, අද මේ තරම් අර්බුදයක් නැහැ. හැබැයි, ඒ මැතිවරණය කල් දැම්මා. ඒක විසින් මේ අලුත් සංශෝධන යටතේ අපේ රටේ අලුත් ඡන්ද දායකයන්ට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. විශේෂයෙන් තරුණ බලවේගයට අවස්ථාවක් ලැබිලා තිබෙනවා; තරුණ නියෝජනයට සියයට 25ක අවස්ථාවක් ලැබිලා තිබෙනවා. අවුරුදු 35ට අඩු තරුණයන්ට මේ අපේක්ෂක ලැයිස්තු නියෝජනයට අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒක අතිශය වැදගත් එකක්. මේ පළාත් පාලන මැතිවරණවලදී තරුණ නියෝජනයට වැඩි අවස්ථාවක් ලබාදීම පිළිබඳ කරුණු පැහැදිලි කරද්දී, එතුමන්ලා තමයි ඒකට ඉඩ හැදුවේ කියලා කියනවා අද මම අහගෙන හිටියා. ඒගොල්ලන් තමයි තරුණ නියෝජනයට අවස්ථාවක් ලබා දුන්නේ කියනවා.

ඒ වාගේම තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් වාර්තාව පිළිබඳවත් කථා කළා. හැබැයි, තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා, එදා තරුණයා සටන් කළේ ඇයි, එදා තරුණයා අරගළ කළේ ඇයි, එදා තරුණයා දිවි පරදුවට තිබ්බේ ඇයි කියන කාරණා. එදා ඒ ආණ්ඩුවල හිටපු අය තරුණයන් මර්දනය කරලා, ඝාතනය කරලා, වධකාගාර පවත්වාගෙන ගියා. තරුණයන්ගේ අයිතිවාසිකම් දෙනවා වෙනුවට, අයිතිවාසිකම් අහිමි කරපු යුගයක් තමයි එදා තිබුණේ. ඒ මර්දනයෙන් බේරුණු කණ්ඩායම, ඒ සහෝදරවරු තමයි වද කඳවුරු තුළ ඉඳගෙන තරුණයන් පිළිබඳව, තරුණ අසහනය පිළිබඳ කොමිෂන් සභාවට කරුණු කිව්වේ. ඒවා තමයි පසුගිය කාලයේ එළි දැක්වුයේ, තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තා ලෙස. "කොළඹට කිරි ගමට කැකිරි" කියන හැඳින්වීම තමයි මේ කොමිෂන් වාර්තාව ඇතුළේ තිබෙන්නේ. තරුණයන්ට එදා තිබුණු අසහනයට එරෙහිව, ඒ තිබුණු අසහනයෙන් තරුණයන් මුදා ගන්නට, තරුණයන් දේශපාලනයට එකතු කර ගන්න ඕනෑ, රාජ්‍ය පාලනයට එකතු කර

ගන්න ඕනෑ කියලා ඒ වෙනුවෙන් තමයි ඇත්තටම මේ සංශෝධන ආවේ. ඒක නිසා තමයි තරුණයන්ට අවස්ථාවක් ආවේ. එහෙම නැතුව අද මේ කථා කරන, එදා ආණ්ඩුවල ඉඳපු අය, තරුණයන් මර්දනය කරන්න මැදිහත් වෙච්ච අය නොවෙයි මේවා ගෙනාවේ. ඒ කාර්යය වෙනුවෙන් ජීවිත දහස් ගණනක් මේ මහපොළොවට පරිත්‍යාග කළා. ඒක තමයි එදා තිබුණු සටන. හැබැයි, අද අපට දැනෙන විධියට මේ මැතිවරණය පවත්වන එක නතර කරන්න තමයි මේ අයගේ උත්සාහය තිබුණේ. මොකද, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් මේ පිළිබඳ සාකච්ඡා වුණා. ඇත්තටම අපි විපක්ෂයට කියන්නේ, මේ මැතිවරණය පවත්වන්න ඔබතුමන්ලා කැමැතිද, නැද්ද කියන එක හරියටම කියන්න කියලායි. ඒක හරියටම පැහැදිලිව රටට කියන්න. මීට කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා බොහොම පැහැදිලිව අපෙන් අහනවා, "මැතිවරණය පවත්වන එක ගැන ප්‍රශ්නයක් නැහැ, ඇප තැන්පත් කරපුවා ලබා ගන්න පුළුවන්ද?" කියලා. මම දන්නේ නැහැ, එතුමා මේක කියවලා ආවේ නැද්ද කියලා. මේ වගන්තියේ බොහොම පැහැදිලිව තිබෙනවා, ඇප තැන්පත් කරපු ඒවා නැවත ගන්න විධිය. හැබැයි, පක්ෂය දාලා ගියාට පස්සේ, ඇප තැන්පත් කරපු අය වෙන වෙන පක්ෂවලට ගියාට පස්සේ, ඒවා බේරා දෙන්න ක්‍රමයක් අපට නැහැ. ඒ නිසා ඒවා බේරා ගන්න වෙන්නේ ඔබතුමන්ලාටමයි. අපෙන් ඒක බේරාගන්න බැහැ; අපෙන් ඒක ඉල්ලුවාට වැඩක් නැහැ. ඒ නිසා ඒක ඔබතුමන්ලා බේරා ගන්න ඕනෑ.

මේ අලුත් සංශෝධන ඇතුළේ අද තරුණයන්ට අවස්ථාව ලැබිලා තිබෙනවා, පළාත් පාලන ආයතන නියෝජනය කරන්න. අපේක්ෂක ලැයිස්තුවලට ඇතුළත් වෙන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම කාන්තාවටත් වැඩි අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ඒ නිසා ඉතා කඩිනමින් පළාත් පාලන මැතිවරණය පවත්වන්න ඕනෑ. මොකද, රටේ පළාත් පාලන ආයතන 341න් 340ක්ම අකර්මණ්‍ය වෙච්ච තත්ත්වයක් ඇතුළේ ඉතා කඩිනමින් ඡන්දය පවත්වන්න ඕනෑකම තිබෙනවා.

ජාතික වශයෙන් ආණ්ඩුව නව අය වැය -මංගල අය වැය- අද ඉදිරිපත් කරලා, රටේ ග්‍රාමීය ජනතාවගේ දුප්පත්භාවය තුරන් කිරීම, රට ඩිජිටල්කරණය, Clean Sri Lanka කියන තුන්වැදෑරුම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න සූදානම් වෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, රටේ ග්‍රාමීය ජනතාවගේ දුප්පත්භාවය තුරන් කිරීම වෙනුවෙන්, ග්‍රාමීය ජනතාව වෙනුවෙන් වැඩ කරන්න තිබෙන වැදගත් ආයතනයේ ඡන්දය -පළාත් පාලන ආයතන ඡන්දය- ඉතා කඩිනමින් පවත්වලා ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය මොනවා කිව්වත් මේ මැතිවරණය අපි පවත්වන්න ඕනෑ. මේ මැතිවරණය පවත්වලා රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය -ඡන්දය දීමේ අයිතිය- ලබා දෙන්න ඕනෑ; අලුත් ඡන්ද දායකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දෙන්න ඕනෑ; අලුත් තරුණයන්ට ඡන්දය ඉල්ලීමේ අයිතිය ලබා දෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් හැමදාමත් කටයුතු කරන දේශපාලන ව්‍යාපාරයක්, අපි අපි ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන දේශපාලන ව්‍යාපාරයක්. අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරපු ව්‍යාපාරයක්. ඒ නිසා අපේ ආණ්ඩුව මේ මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කරනවා. මැතිවරණය අනිවාර්යයෙන්ම පවත්වනවා.

අද විපක්ෂයේ කණ්ඩායම් මාධ්‍ය සන්දර්ශන පවත්වනවා අපට පෙනෙනවා. ඡන්දයට සූදානම් වෙනවා වාගේ, අපේක්ෂකයෝ බඳවා ගන්නවා වාගේ පෙන්නුවාට, අපි දන්නවා, ඇත්තටම ඒ අය දැවැන්ත අර්බුදයක ඉන්නේ කියලා. ඒක තමයි ඇත්ත කතන්දරය. ඒක වහ ගන්න මේ වෙලාවේ ඒගොල්ලන් උත්සාහ කරනවා, පළාත් පාලන මැතිවරණය කල් දමා ගන්න පුළුවන්ද කියලා බලන්න. ඒ නිසා විභාග ප්‍රශ්න දමනවා. තව තව නොයෙකුත් ප්‍රශ්න දමනවා. අලුත් අවුරුද්ද එනවා කියනවා. ඒ එක එක දේවල් දාලා තමන්ගේ බැරිකම වහගන්න මේ වෙලාවේ උත්සාහ කරමින් ඉන්නවා. එහෙම තමන්ගේ බැරිකම වහගන්න උත්සාහ කරන්න එපා. ඒවායින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට නැවත අකුණු පහරක් වදින්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, පළාත් පාලන මැතිවරණය පවත්වන්න ඕනෑ කියලා. ඒ වෙනුවෙන් විපක්ෂයේ සියලුදෙනාගේම සහයෝගය අපි බලාපොරොත්තු වනවා. මොකද, මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය ඒ මැදිහත්වීම ඕනෑ.

විශේෂයෙන්ම විෂයභාර නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මම දන්නවා, මේ කාල සීමාව ඇතුළේ පළාත් පාලන ආයතනවල මතු වෙලා තිබෙන ගැටලු පිළිබඳව. රටේ හැම පළාත් පාලන ආයතනයක් පිළිබඳව අපි සාකච්ඡා කළා. ඒ පළාත් පාලන ආයතන තුළ මේ වෙලාවේ මතු වෙලා තිබෙන ගැටලු පිළිබඳව අපි දිගින් දිගටම සාකච්ඡා කළා. ඒ පළාත් පාලන ආයතන බල සීමාවේ ඉන්න ජනතාවගේ ගැටලු පිළිබඳව අපි සාකච්ඡා කළා. උතුරේ ජනතාව වාගේම, උතුරේ නිටපු දේශපාලන නියෝජිතයෝත් අපේ අමාත්‍යාංශයට ඇවිල්ලා අප හම්බ වුණා. "ඇමතිතුමා, අපේ පළාත් පාලන ආයතනයෙන් කිසි දෙයක් කෙරන්නේ නැහැ" කියලා තමයි ඒ අය කියන්නේ. එතැනට මේ අර්බුදය ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, හැකි ඉක්මනින් මේ පළාත් පාලන මැතිවරණය පවත්වලා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා රට ගොඩ නඟන කටයුත්ත කරගෙන යන්න ඕනෑ කියලා. ඒක තමයි නව රජයේ බලාපොරොත්තුව, නව රජයේ අරමුණ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණය කල් නොදමා ඉතා කඩිනමින් පවත්වන්න ඕනෑ.

ඒ වාගේම අපි දැක්කා, පසුගිය දවස්වල විවිධ කාරණා කියැවෙනවා, ඡන්දය පවත්වන්නේ නැහැ කියන එක වෙනුවෙන්. විශේෂයෙන්ම ජනතාව මේ ඡන්දය ඉල්ලන්නේ නැහැ කියලා ප්‍රකාශ කරන්න ගත්තා. ඇත්තටම ඡන්දය තියන්නේ ජනතාව ඉල්ලන නිසා නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන නිසා. ඒ නිසා අනිවාර්යයෙන්ම ඡන්දය තියන්න ඕනෑ. මහජන නියෝජිත ආයතන වුණාම ඒවාට ඡන්දයෙන් නියෝජිතයන් තෝරා පත් කර ගන්න ඕනෑ. පැවැති ධුර කාලය අවසන් වුණාට පස්සේ අනිවාර්යයෙන් ඡන්දය පවත්වන්න ඕනෑ. හැබැයි, ඒක පසුගිය කාලයේ සිද්ධ වුණේ නැහැ. ඒ නිසා තමයි අපි කියන්නේ ඉතා කඩිනමින් මේ ඡන්දය පවත්වන්න ඕනෑ කියලා.

විශේෂයෙන්ම ගත්තොත්, පළාත් පාලන ආයතන ඇතුළේ මේ වෙලාවේ කසළ ප්‍රශ්නය බරපතළයි. මෙම කසළ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් වෙනුවෙන් අපි Clean Sri Lanka වැඩසටහන යටතේ සැලැස්මක් හදලා තිබෙනවා. පළාත් පාලන ආයතනවල කසළ ප්‍රශ්නය විසඳන්න, එහෙම නැත්නම් රට clean කරන කටයුත්තට විශාල මුදලක් වෙන් කරන්න මෙවර අයවැය තුළිනුත් තීන්දු අරගෙන තිබෙනවා. ඒක නිසා නව පළාත් පාලන ක්‍රියාවලිය තුළින් විශේෂයෙන්ම පරිසරය පිරිසිදු කරන කටයුත්ත, නගර අලංකරණ කටයුත්ත, අලුත් නගර නිර්මාණය කරන කටයුත්ත ක්‍රියාත්මක කරන්න අපේ ආණ්ඩුව අපේ අමාත්‍යාංශය හරහා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම නව නගර සංවර්ධනය කිරීම, අලුත් ආදර්ශ නගර නිර්මාණය කිරීම විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම වසර කිහිපයක් තිස්සේ අකර්මණ්‍ය වෙච්ච, ජනතාවගේ මූලික පහසුකම් ලබා දීමට නොහැකි වුණු පළාත් පාලන ආයතන, ජනතාවට මූලික පහසුකම් ලබා දීම වෙනුවෙන් වන මහජන නියෝජිතායතන බවට පත් කරලා, ඒවා නැවත

[ගරු පී. රුවන් සෙනරත් මහතා]

ක්‍රියාත්මක කරන්න පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහා මැදිහත් වෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඉදිරි කාල සීමාව ඇතුළේ Clean Sri Lanka වැඩසටහන සෑම පළාත් පාලන ආයතනයක් තුළම ක්‍රියාත්මක කරලා ලස්සන රටක් නිර්මාණය කිරීම වෙනුවෙන්, පිරිසිදු නගර නිර්මාණය කිරීම වෙනුවෙන්, අලංකාර නගර නිර්මාණය කිරීම වෙනුවෙන් මැදිහත් වෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් විශේෂ මැදිහත් වීමක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම පසුගිය කාලයේ පළාත් පාලන ආයතන තුළ දූෂණ, වංචා ගොඩක් සිද්ධ වෙලා තිබුණා. සෑම පළාත් පාලන ආයතනයක් තුළම සිදු වී ඇති එවැනි දූෂණ, වංචා පිළිබඳව නැවත විමර්ශනය කරලා, ඒ සම්බන්ධව පරීක්ෂණ කටයුතු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

පළාත් පාලන ආයතන ඇතුළේ දැනට තිබෙන තත්ත්වය ගත්තොත්, නිලධාරීන් අතර ගැටලු ඇතිවෙලා තිබෙනවා. හැම පළාත් පාලන ආයතනයකින්ම අපට එවැනි ගැටලු පිළිබඳව වාර්තා වෙනවා. එම නිසා දැනට මතුවෙලා තිබෙන තත්ත්වයන් තුළ ඒ සියල්ල නිරාකරණය කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා ඉතා කඩිනමින් පළාත් පාලන මැතිවරණය පවත්වා, පළාත් පාලන ආයතන සක්‍රිය කරලා, ජනතාවගේ -විශේෂයෙන්ම ග්‍රාමීය ජනතාවගේ- මූලික අවශ්‍යතා ඉටු කරන්න හැකි වෙයි කියලා අපි විශ්වාස කරනවා. ග්‍රාමීය යටිතල පහසුකම් ගොඩනැඟීම, මංමාවත් සකස් කිරීම, වීථි ලාම්පු සකස් කිරීම, පානීය ජල ප්‍රශ්නය විසඳීම ඇතුළු සියලු කටයුතු වෙනුවෙන් පළාත් පාලන ආයතන කටයුතු කරන්න ඕනෑ. එම නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ජනතාවගේ මූලික අයිතියක් වන ඡන්ද අයිතිය තහවුරු කරලා, තරුණ තරුණියන්ට පළාත් පාලන ආයතන නියෝජනය කරන්න වැඩි ඉඩ කඩක් ලැබෙන මේ සංශෝධනය ගෙනල්ලා, හැකි ඉක්මනින් මේ ඡන්දය පවත්වන්න අපි බලාපොරොත්තු වෙනවා. රජයක් හැටියට අපි අන්න ඒ වෙනුවෙන් කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය මූලික මැදිහත්වීම් කරලා, එම කටයුත්ත අපි ක්‍රියාත්මක කරන බව සඳහන් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Faiszer Musthapha. You have ten minutes.

[3.14 p.m.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

Hon. Deputy Speaker, it is my privilege as a former Minister of Provincial Councils and Local Government to speak regarding this Bill.

Firstly, I would like to go into the contents of this Bill. What do we expect to do with this Bill? Nominations were called in 2023, but the Local Authorities Elections were not held. Therefore, it is expedient and agreed to by all that the nominations should be cancelled because you cannot have the election in 2025 in relation to the nominations called in 2023. We are all in agreement with that and I am thankful to the Government for taking this step because it is not expedient to hold the election when you have called for the nominations in 2023. Also the Electoral Register of 2024 is now in operation.

The second issue is, how do you cancel the nominations? Already, there is a Supreme Court Order or Judgment regarding the election, under which the Government is compelled to hold the election; it is obliged to do so. So, when this Bill was brought in, there was an issue. On the one hand, the Supreme Court Judgment states that the election should be held and on the other, there is this Bill, which, some would construe, would delay the election. Therefore, the majority decision of the Supreme Court on this Bill was that it requires a special majority of Parliament.

I appeal to the Government to read this Bill and look at the spirit of it. This Bill gives the Government three months from the date on which this Bill is certified as an Act to proceed. In 2017, as Minister of Provincial Councils and Local Government, I brought in the Local Authorities Elections (Amendment) Bill, which became an Act consequent to it being passed in Parliament. Through that Bill, we did away with the දූෂිත මනාප ක්‍රමය and introduced increased female representation in local authorities. Today, the Government boasts that they have a lot of women representing their party to contest the Local Government Elections. The Act we brought in, which allowed a 25 per cent female representation, gave them that opportunity. So, I think it was a very progressive step and the nominations of the Government party with regard to this election are also to be cancelled. So, if we look at it, we have a very progressive Act, but, however, there are issues. Firstly, a 10 per cent women representation should be in the nomination paper and 50 per cent should be in the list. Therefore, a majority of the women who represented the local authorities were from the Opposition. Therefore, I appeal to the Government to look at amending the Act before holding the Election. The issue of the election being delayed does not arise because මෙම පනත් කෙටුම්පතේ දින 30ක් දක්වා ඉල්ලා තිබෙනවා, නාම යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඒ නිසා මම මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. දැනට තිබෙන පනතේ අඩුපාඩු තිබෙනවා. So, we have to rectify those deficiencies with regard to female representation. Today, we have female Ministers and female Members in Parliament representing the Government. But, unfortunately, if you take the statistics of local authorities, the majority of the women had been from the Opposition. Therefore, we need to amend the Act to change that 10 per cent women representation in the nomination papers. That is something that the Government has to look at very carefully. At the time I brought in that Bill, there was strong opposition including from the Government party saying that the 8,000 local authority members are excessive. I would also say that having 8,000 members is a cost on the Government coffers.

So, there should be a mechanism to reduce that number. Therefore, I appeal to the Minister of Public Administration, Provincial Councils and Local Government that if we bring in that amendment, we can do so within the three months.

Sir, various quarters were raising issues saying that the Opposition is trying to postpone the election. The Opposition cannot postpone the election because in terms of this Bill, the Government should call for fresh nominations within 90 days. Therefore, consensus could be reached among parties to look at the deficiencies in the Act and make it very progressive. There is no point in just having the election expeditiously when we all know that there are various issues in the previous system. Also, there is no point in having arguments and confrontations.

What is best is best for the country. You all are aware that before this election system was introduced, there was the Preferential Vote system or the මනාප ක්‍රමය and what the Preferential Vote system brought about. The Amendments we brought in did away with the Preferential Vote system for the local bodies and thereby, the issues that arose at that time did not arise again. Under the system we brought in, a member represents a vote, which I believe is very progressive. Otherwise, earlier, you put some names and according to the number of votes each party receives, you form a council.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන කරුණු ගැන විවාදයක් නැහැ. ඒ සඳහා ඔබතුමාට ඕනෑ තරම් අයිතිය තිබෙනවා. මම දැනගන්න කැමැතියි, දැන් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වෙච්ච නඩුවටත් ඔබතුමා නීතිඥයෙකු වශයෙන් මේ අවස්ථාවේදීත් ඉදිරිපත් වුණාද කියලා.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මම නඩුවට ඉදිරිපත් වුණේ නැහැ. හැබැයි, මම නඩු තීන්දුව කියෙව්වා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම නම් කමක් නැහැ. පළාත් සභා මැතිවරණය පැවැත්වීම මේ වෙනකොට අවුරුදු 7ක් කල් ගිහිල්ලා තිබෙන්නේ. මොකද අපට මතකයක් තිබෙනවා, ඔබතුමාම present කරපු Delimitation Report එකට ඔබතුමාම විරුද්ධ වුණා කියලා.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Deputy Speaker, - *[Interruption.]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා විරුද්ධ වුණාද, නැද්ද කියන්නකෝ.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මට උත්තර දෙන්න විනාඩියක් දෙනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා විරුද්ධ වුණාද, නැද්ද?

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
ගරු සභානායකතුමනි, ඒ සම්බන්ධයෙන් උත්තර දෙන්න මට අවස්ථාවක් දෙනවාද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මේ කාලය මගේ වෙලාවෙන් ගන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු සභානායකතුමනි, මගේ උත්තරයට ඇහුම්කන් දෙන්න. පළාත් සභා මැතිවරණයේදී සීමා නිර්ණයක් තිබුණා. ඒ සීමා නිර්ණය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ එක විතරයි මම කළේ. හැබැයි සියලුම මන්ත්‍රීවරුන්ට එම සීමා නිර්ණය වාර්තාවට එකඟද, විරුද්ධද කියන එක සම්බන්ධයෙන් ඡන්දයක් තිබුණා. ඒක පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් තිබුණු ඡන්දයක් නොවෙයි. එම සීමා නිර්ණය වාර්තාව පාර්ලිමේන්තුව ප්‍රතික්ෂේප කළා නම්, ඒ සම්බන්ධයෙන් අභියාචනා ක්‍රියාදාමයක් තිබුණා. ඒ නිසා මම පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා මම ම ඒකට විරුද්ධ වුණාය කියලා ඔබතුමා කියන එක වැරදියි. හේතුව, එම සීමා නිර්ණය කමිටුව පත් කරන්නේ අතිගරු ජනාධිපතිතුමා. මේක ඔබතුමා විතරක් නොවෙයි, හැම කෙනාම කියන දෙයක් තමයි. *[බාධා කිරීමක්]* මගේ කාලයෙන් ගන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතිහාසගත වෙනවා, තමන් ඉදිරිපත් කළ වාර්තාවකට තමන්ම විරුද්ධ වුණු එකම ඇමතිවරයා වශයෙන්.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
ගරු සභානායකතුමනි, මම ඉදිරිපත් කළේ ස්වාධීන වාර්තාවක්. ඒක මම පත් කරපු සීමා නිර්ණ කමිටුවක් නොවෙයි. ඕනෑ කෙනෙකුට ඕනෑ දෙයක් කියන්න පුළුවන්. හැබැයි මම කටයුතු කළේ සද්භාවයෙන්. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු හැටියට එම වාර්තාවේ අඩංගු කරුණුවලට විරුද්ධ වීමේ අයිතිය

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

මට තිබුණා. මම ඒ අයිතිය අනුව ක්‍රියා කළා මිසක් මම ඉදිරිපත් කළ කෙටුම්පතකට විරුද්ධ වුණා නොවෙයි. අවාසනාවකට වාගේ, සීමා නිර්ණය පිළිබඳ ස්වාධීන කමිටු වාර්තාවක් සහ කෙටුම්පතක් අතර වෙනසක් තිබෙන බව සමහර අය තේරුම් අරගෙන නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් මට දොස් කියන්න එපා.

May I now continue with my speech.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Faiszer Musthapha, yes, you may continue with your original submission.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
But, please do not take that time from me, Sir.

We all are in agreement that there are issues with regard to this present electoral system: with regard to female representation, the number of wards and the proportion or the number of wards created according to the population. So, if we are to look at this progressively, in line with the Bill which has been brought before Parliament today, we have 90 days to bring in necessary amendments. Therefore, I appeal to the Government; ඔබතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා. අපි ප්‍රගතිශීලි විය යුතුයි. 2004දී මම ඉදිරිපත් කරලා සම්මත කළ පනතේ අඩුපාඩු තිබෙන බව සියලුදෙනාම පිළිගන්නවා. නමුත් එම අඩුපාඩු සංශෝධනය කිරීමේ වගකීමත් අප සියලුදෙනාටම තිබෙනවා. *[බාධා කිරීමක්]* Hon. Minister, you have 90 days, in terms of this Bill you have introduced, to make any amendments. Therefore, we, in this House, need not beg anybody for further time to bring in any amendments. So, I am appealing to you, -

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
The Supreme Court had said "as soon as possible".

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Deputy Minister, the Supreme Court had said "as soon as possible", but here, you all have asked for 90 days. - *[Interruption.]* The Supreme Court Judgment had ordered to have it as soon as possible. But, you all, as the Government, have submitted a Bill seeking up to 90 days to submit fresh nomination papers. So, my request to you all, Hon. Deputy Minister, is, in line with the Bill you have brought in, to make the necessary amendments with those 90 days. - *[Interruption]* No, I thank you. I am very confident that the Hon. Minister would take what I have said into consideration. I believe there is no need for confrontational politics. You all came to power to do the right thing. Hon. Wasantha Samarasinghe, when you say you all want to do the right thing, I am confident that you all would consider what I have said. Once this Bill becomes law, it is totally your right to do what you all want. But, please hear out the voices of the Members of the Opposition. Nobody in this world knows everything. We also know some things. So therefore, take into consideration whatever we humbly tell you. Also, if you take the time frame of the election, the upcoming O/L Examination, the Sinhala New Year and all those other factors are there to be considered. But, I am not going to deal with those factors. You all have continuously mentioned that there are issues in this Act.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Faiszer Musthapha, your time is up.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Sir, I want another minute because my time was taken by the Hon. Bimal Rathnayake.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, you can have that.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
I will conclude, Sir.

So, I am only saying this. I appeal to the Government - you all have 90 days - please consider what I have said. It will be progressive to amend the Act.
Thank you, Hon. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Muneer Mulaffer. You have 16 minutes.

[අ.භා. 3.28]

ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපට මතකයි, 2023 මාර්තු මස 9වැනි දා පළාත් පාලන මැතිවරණය සඳහා දින නියම වෙලා තිබුණු බව. ඒ වෙලාවේ අපේ රටේ තිබුණු සියලුම දේශපාලන පක්ෂ, එදා හිටපු ජනාධිපතිවරයා නියෝජනය කළ දේශපාලන පක්ෂය පවා එම මැතිවරණය සඳහා නාම යෝජනා භාර දීලා, ඒ මැතිවරණය සඳහා සූදානම් වෙමින් සිටියා. රටේම ජනතාව ඒ මැතිවරණය දැක්කේ රටේ වෙනසක් ඇති කරන්න, අලුත් වෙනසක් ගෙන එන්න තමන්ට ලැබෙන සුවිශේෂී අවස්ථාවක් ලෙසයි. ඒ පළාත් පාලන මැතිවරණයේදී වැලිගම

නගර සභාවට අපේක්ෂකයෙකු ලෙස මමත් ඉදිරිපත් වෙන්න සූදානමින් හිටියා. විශේෂයෙන්ම ඒ පළාත් පාලන මැතිවරණයට අපි සූදානම් වන විට රටේ ජනතාව තුළ විශාල උද්‍යෝගයක්, අවශ්‍යතාවක් තිබුණා, පැවති ඒ දේශපාලන ක්‍රමය වෙනස් කරලා අලුත් දේශපාලන සංස්කෘතියක් ගොඩ නහන්න ඕනෑය කියලා. හැබැයි මේ සභාවේ ඉන්න හෘදය සාක්ෂියක් තිබෙන සියලුදෙනාම දන්නවා, එදා ඒ මැතිවරණය කල් දැම්මේ රටේ ජනතාව ගැන හිතලාවත්, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව හිතලාවත්, වෙනත් කාරණා නිසාත් නොව, පැහැදිලිවම තමන්ට තව අවුරුද්දක හරි වැඩිපුර කාලයක් බලයේ සිටීමට ඇති වුවමනාව වෙනුවෙන් බව. ඉතාම කැත විධියට එදා ඒ මැතිවරණය කල් දැම්මා. ඒ මැතිවරණය කල් දැමුවා විතරක් නොවෙයි, විශේෂයෙන්ම ජනාධිපතිවරයා නියෝජනය කරන පක්ෂයත් නාම යෝජනා දීලා, ඒ වෙනුවෙන් තරග කරන්න සූදානම් වෙලා සිටියදී, ජනාධිපතිවරයා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, "ඡන්දය කල් දාලා නැහැ, කල් දාන්න ඡන්දයකුත් නැහැ" කියලා. ඒක 2023.02.27වන දා "දිනමිණ" පත්තරේ පළ වුණා. මැතිවරණය පවත්වන දිනයක් මැතිවරණ කොමිසම නිල වශයෙන් තවම ප්‍රකාශ කළේ නැහැ කියලා, ඒ තරම් කැත විධියට එදා ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව කථා කළා. ඒ අවස්ථාවේ අපි දැක්කා, විශේෂයෙන්ම විවිධ දේශපාලන පක්ෂ, සිවිල් පුරවැසියන්, විවිධ පාර්ශ්ව ඒ ඇති වෙච්ච තත්ත්වය නිවැරදි කර ගැනීම සඳහා මැතිවරණය පැවැත්වීමට අධිකරණයේ සහාය පැතූ ආකාරය. මේ පිළිබඳව අධිකරණ තීන්දුවකුත් තිබෙන බව අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහසින් පස්සේ, පසුගිය කාලය පුරාවටම රට පාලනය කළ සියලු පක්ෂ පළාත් පාලන මැතිවරණය පාවිච්චි කළේ බොහෝදුරට තමන්ගේ බලය තහවුරු කරන මෙවලමක් හැටියටයි. පසුගිය සතියේ අපි පොදු රාජ්‍ය මණ්ඩලයීය සමුළුවක් සඳහා පාකිස්තානයට ගියා. ඒ සමුළුව තුළ සාකච්ඡා වූ විශේෂම කාරණාව තමයි, පළාත් පාලන ආයතන ශක්තිමත් කරලා, ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සපයන්නේ කොහොමද කියන එක. එම කාරණාව පිළිබඳව එහිදී බොහෝ රටවල් සාකච්ඡා කළා.

හැබැයි, අපට ආඩම්බර වෙන්න පුළුවන්, අපේ රට පළාත් පාලන ආයතන ඉතාම නිවැරදි විධියට හසුරුවන රටක් විධියට. ඒ අවස්ථාවේදී ඒ සාකච්ඡාව තුළත් අපේ රට ඉස්මතු වුණා. අපි බොහෝ දුරට දැකපු දෙයක් තමයි, හැම දාමත් බලයේ හිටපු ආණ්ඩු තමන්ගේ බලය නිසා නිසි කලට මැතිවරණය පැවැත්වූයේ නැහැ, ඒ මැතිවරණය ප්‍රමාද කළා කියන එක. එහෙම නැත්නම් ඒ මැතිවරණය කල් දැම්මා. සමහර අවස්ථාවලදී කොටස් වශයෙන් මැතිවරණය පවත්වපු අවස්ථාත් අපේ රටේ මැතිවරණ ඉතිහාසය තුළ තිබුණා. සෑම විටම තමන්ගේ බලය තහවුරු කර ගැනීම වෙනුවෙන් ඒ බලය පවත්වා ගැනීම උදෙසා එලෙස ඒ ආණ්ඩු කටයුතු කළා. එදා මැතිවරණය පිළිබඳ බලාපොරොත්තුව ජනතාව තුළ නැති වුණාම, ඒ පුරවැසි අයිතිය නැති වුණාම විපක්ෂයේ හිටපු විශාල පිරිසක් මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා ඒ පිළිබඳව තමන්ගේ අප්‍රසාදය, තමන්ගේ අකැමැත්ත ප්‍රකාශ කර සිටි බව අපි දන්නවා.

2023.03.13වැනි දා විපක්ෂය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මාධ්‍යයට කිව්වා, පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වී නැවතත් මැතිවරණය කල් දැමීමට හදනවා කියලා. මම ඒ ගැන අසා පුදුමයට පත් වුණා. එදා තමන්ගේ නායකයා මැතිවරණය කල් දමන විට, ඒ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අහෝසි කරන විට නිහඬව හිටපු ඒ පක්ෂය - ඒ කණ්ඩායම - නියෝජනය කරන මන්ත්‍රීවරයා අද ඇවිල්ලා පනතේ තිබෙන අඩුපාඩු පිළිබඳව, එහි සඳහන් කරුණු කාරණා පිළිබඳව සාකච්ඡා කරනවා. අපි දන්නවා, ලෝකයේ කොහේවත් සර්ව සම්පූර්ණ මිනිස්සු නැති බව. ඒ වාගේම තමයි ලෝකයේ මොන පනත් හැදුවත් සර්ව සම්පූර්ණ පනත් හදන්නේත් නැහැ, හදන්නත් බැහැ. ඒවායේ අඩුපාඩු ඇති වෙනවා. කාලය වෙනස් වෙනකොට ඒ වෙනස්වීමත් එක්ක ඒ පනත්වල නිවැරදිකාවත් ඇති වෙනවා.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේම වෙනස් විය යුතු දේ තිබෙන බව අප අනිවාර්යයෙන්ම පිළිගන්නවා. ඒ වාගේම ඒ නිවැරදිම වෙනස්වීම් කළ හැක්කේ මේ රටේ වෙනත් කිසිම දේශපාලන ව්‍යාපාරයකට නොවෙයි. ඒක කළ හැක්කේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකට පමණයි කියන එක ඉතාම පැහැදිලිව මම කියන්න කැමතියි. මේ පළාත් පාලන මැතිවරණය එදා කල් දැම්මාම මොන තරම් විශාල පිරිසක් ඒ කාරණා පිළිබඳව සාකච්ඡා කළාද? කඩිනමින් එම මැතිවරණය පැවැත්විය යුතුයි කියලා හැම කෙනාම තමන්ගේ හඬ අවදි කළා. ඔබතුමන්ලා දන්නවා, ඒ පළාත් පාලන මැතිවරණය සඳහා දින නියම වෙලා ලබන මාසය වනවිට අවුරුදු දෙකක් සම්පූර්ණ වන බව. පළාත් පාලන මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් පවා සමහර විට හාල්, පරිප්පු, ටකරන්, වැසිකිළි පෝච්චි යනාදී විවිධ දේවල් දීලා, එතැනින් තමන්ගේ බලය තහවුරු කර ගන්න උත්සාහ කළ අවස්ථා අපි අතීතයේ ඕනෑ තරම් දැකලා තිබෙනවා.

අද අපි හැමෝම කථා කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන. ඡන්ද බලය වෙනුවෙන් මැතිවරණ ප්‍රමාදය ගැන හඬා වැටෙන නමුත්, ඒ ඒ මැතිවරණවලදී පවා සමහරු ජාතිවාදය පාවිච්චි කරනවා අපි දැකලා තිබෙනවා. වගකීමක් ඇති රජයක් ලෙසත්, පක්ෂයක් ලෙසත්, ජනතාවගේ බලාපොරොත්තුවත් එක්ක, ජනතාවගේ විශ්වාසයත් එක්ක පත් වුණු ආණ්ඩුවක් ලෙසත් අනිවාර්යයෙන් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම තහවුරු කිරීම අපේ වගකීමක් ලෙස අපි දකිනවා.

මුස්ලිම් සමාජය තුළ පවතින රාමදාන් මාසය තුළ මේ පළාත් පාලන මැතිවරණය පැවැත්වීම නුසුදුසුයි කියන කාරණය මතු වුණා. මම පැහැදිලිව විශ්වාස කරනවා, පළාත් පාලන මැතිවරණය රාමදාන් මාසය තුළ පවත්වන්නේ නැහැ, අනිවාර්යයෙන්ම ඊට පසුව තමයි ඒ මැතිවරණය පවත්වන්නේ කියලා. හැබැයි, මතක් කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. 2000 වර්ෂයේ ඔක්තෝබර් 10වැනි දා - රාමදාන් මාසයේ - 8වෙනි උපවාස දිනයේදී අපේ රටේ මහ මැතිවරණයකුත් පවත්වලා තිබෙනවා.

ඒ වාගේම විභාග පැවැත්වෙන කාලය පිළිබඳවත් කථා කළා. ඉතිහාසයේ මැතිවරණ පැවැත්වූ දිනයන් පිළිබඳව නිරීක්ෂණය කළා නම් අපට දැක ගන්න පුළුවන්, අපේ රට විභාග පැවැත් වූ කාල පරිච්ඡේදවලත් තමන්ගේ බලය තහවුරු කර ගැනීම සඳහා කොටස් වශයෙන් මැතිවරණ පවත්වපු රටක් වග. අපි එය අමතක නොකළ යුතුයි. එදා මැතිවරණය කල් දැම්මාම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් තවත් තැනකදී කියලා තිබුණා, මැතිවරණයට ටොයියෝ, බයියෝ සහ කයියෝ භය වෙලා කියලා. දැන් මොන අයියලා භය වෙලාද කියන එක රටම හඳුනාගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහරු කිව්වා, මාස 6ක් යනකොට මේ රජය කඩා වැටෙන්න පුළුවන් කියලා. ලබන මාසය වෙනකොට අපි බලයට පත් වෙලා මාස 6ක් වෙනවා. ඔබතුමන්ලාට එහෙම ධෛර්යයක් තිබෙනවා නම්, අපව පරද්දන්න පුළුවන් නම් ඉදිරි පළාත් පාලන මැතිවරණයට සූදානම් වෙලා, තරග කරලා ඒ සම්බන්ධව තීන්දු තීරණ ගැනීමේ අවස්ථාව ජනතාවට ලබා දෙමු.

පක්ෂයක් ලෙස අඩුපාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කරගෙන ක්‍රමවත් විධියට අපේ ගමන අපි යා යුතුයි. විශේෂ කාරණාවක් මම මෙතැනදී මතක් කරනවා. ඉතිහාසයේ පළමුවෙනි වතාවට රාජ්‍ය බලය අප සතුව තිබියදීත් මහ මැතිවරණයට රජයේ කිසිම දෙයක්

[ගරු මුනීර් මුලාෆර් මහතා]

පාවිච්චි නොකර සාමකාමීම මැතිවරණය පවත්වලා අපි රටට ආදර්ශයක් ලබා දුන්නා. ඒ තුළින් මැතිවරණ සමය තුළත් අපි සාමකාමීයි, මැතිවරණ ජයග්‍රහණයෙන් පසුවත් අපි සාමකාමීයි කියන පණිවුඩය අපි මේ රටට ලබා දීලා තිබෙනවා. ඒ නිසා කවුරුවත් අනිසි බියක් ඇති කර ගන්න අවශ්‍යතාවක් නැහැ. පැහැදිලිව ඉදිරි පළාත් පාලන මැතිවරණය ඉතිහාසය තුළ ඔබ දකින සාමකාමීම පළාත් පාලන මැතිවරණයක් වෙනවාට කිසිම සැකයක් නැහැ කියන කාරණය අපි කියන්න කැමැතියි.

විශේෂයෙන් අද මැතිවරණ බිය පිළිබඳව, මැතිවරණය පිළිබඳව කථා කරන උදවිය දන්නවා, අතිදැවැන්ත ජයග්‍රහණයක් ලබන විටත්, තුනෙන් දෙකකට එහා ගිය ජයග්‍රහණයක් ලබන විටත්, තනි මන්ත්‍රීවරයෙක් ඉතිහාසයේ ලබා ගත් විශාලම මනාප සංඛ්‍යාව ලබා ගන්නා විටත් මැතිවරණ ජයග්‍රහණ සැමරුවේ කොහොමද කියන ආදර්ශය අපි මේ රටට ලබා දීලා තිබෙන බව. පසුගිය දවස්වල සමුපකාර ඡන්දයක් දිනුවාම රනිඤ්ඤා පත්තු කරලා, වාහනයටත් හානි කරපු අය අද මැතිවරණ ප්‍රචණ්ඩත්වය, මැතිවරණ නිදහස හා මැතිවරණ සාමකාමීත්වය පිළිබඳව කථා කරනවා.

විශේෂයෙන් අපි පළාත් පාලන නියෝජිතයන් පිළිබඳවත් කථා කළ යුතුයි. අපි දන්නවා, ගම් සංවර්ධනය වෙනුවෙන් ඉස්සර අපේ ගම්වල "මැම්බර්"ලා හිටපු බව.

ගමේ සංවර්ධනය ගැන හොයලා බලලා, ගමේ අඩුපාඩු හොයලා බලලා, ගමේ සංවර්ධනය වෙනුවෙන් කැපවුණු වැදගත් මහත්වරු 2,000ක් එදා හිටියා. 1991 ප්‍රාදේශීය සභා හරහා ඒ 2,000ක් වූ සංඛ්‍යාව 4,500ක් කළා. ඒ වාගේම මෙතැනදී කථා වුණු පනත හරහා ඒ 4,500 පසුව 8,500ක් බවට පත් කළා. ප්‍රාදේශීය සභා නියෝජිතයෙකු වෙන්න පුළුවන්, කොට්ඨාස සභාවක නියෝජිතයෙකු වෙන්න පුළුවන් එහෙම නැත්නම් ගමේ සංවර්ධන සභාවක නියෝජිතයෙකු වෙන්න පුළුවන්, ඔවුන්ගේ ඒ නියෝජනය තුළ තිබුණු පරමාර්ථය තමයි ඒ ප්‍රදේශයේ අඩු පාඩු සොයා බලා ඒ වෙනුවෙන් කටයුතු කරන එක. හැබැයි, පසුගිය කාලයේ මොකක්ද වුණේ කියන එක අපි හැම කෙනාම දන්නවා. පසුගිය කාලයේ කොහොමද ඒ සඳහා තෝරා ගත්තේ? එක්කෝ, තමන්ගේ පාර්ලිමේන්තු වරම වෙනුවෙන් ගමේ උදවු කරපු මැරවරයෙක්. එහෙම නැත්නම් තමන් වැරැදි විධියට හම්බ කරන මුදල් ඔහු හරහා යොදවලා තමන්ගේ ව්‍යාපාර පවත්වා ගැනීම සඳහා එදා ඒගොල්ලන් මේ අයව පාවිච්චි කළා.

අවසාන වශයෙන් මේ කරුණු කාරණා දෙක පිළිබඳවත් මම මතක් කළ යුතුයි. එකක් තමයි, අද තරුණ නියෝජනය පිළිබඳව කථා කරනවා. තරුණ නියෝජනය පාර්ලිමේන්තුව තුළට පැමිණිය යුතුයි, පළාත් පාලන ආයතනවලට පැමිණිය යුතුයි, පළාත් සභාවලට පැමිණිය යුතුයි කියලා කථා කරන ඔය පක්ෂවල තරුණයන් ලෙස බොහෝ දුරට තරග කළේ තමන්ගේ එක්කෝ තාත්තා එහෙම නැත්නම් සහෝදරයන්. පවුලේ පසුබිමත් එක්ක ආපු අය තමයි තරුණයෝ ලෙස ඒ වරම දිනා ගත්තේ. හැබැයි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ලෙස අපට ආඩම්බර වෙන්න පුළුවන්, ඒ කිසිම දේශපාලන සම්බන්ධතාවක් නැති සාමාන්‍ය පවුල්වල හැදුණු වැඩුණු තරුණයන්ටත් අපේ ආණ්ඩුව තුළ ඒ නියෝජනය ලබා දීම ගැන. එය පනතටත් එහා ගිහින් ප්‍රායෝගිකව මේ රටට ඔප්පු කරලා තිබෙනවා.

ඒ වාගේම කාන්තා නියෝජනය පිළිබඳවත් කථා කළා. ඔබ පුළුවන් නම් නැහැයි කියා ඔප්පු කරන්න; අද තිබෙන ප්‍රධාන පක්ෂවල කාන්තා නියෝජනය බොහෝදුරට හැදී තිබෙන්නේ කොහොමද කියා බැලුවොත්, එක්කෝ ස්වාමි පුරුෂයා දේශපාලනයේ යෙදිලා ඇති; එහෙම නැත්නම් තාත්තා දේශපාලනය නියෝජනය කරපු නිසා දේශපාලනයට ඒ කාන්තාව පැමිණ ඇති. හැබැයි, අපේ පක්ෂයේ කාන්තාවෝ විසිදෙනෙකු පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ ඒ කිසිම පසුබිමකින් තොරව. ඒ කාන්තාවන්ට ඒ නිසි නියෝජනය ලබා දිය යුතුයි කියන එක පනතටත් එහාට ගොස් ප්‍රායෝගිකව අපි පෙන්වා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

ගරු මුනීර් මුලාෆර් මහතා
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආදර්ශවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු බිහි කරනවා සේම අනිවාර්යයෙන් මේ මැතිවරණය පැවැත්විය යුතුයි. ඒ මැතිවරණය හරහා ඉතා හොඳ පළාත් පාලන නියෝජිතයන් බිහි කරමින්, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" සඳහා වූ ක්‍රියාමාර්ග වෙනුවෙන් අපි සියලු දෙනා එකතු වෙලා වැඩ කරමු කියලා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have eight minutes.

[අ.භා. 3.43]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රථමයෙන් මේ කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. පසුගිය දිනක මම ගරු කථානායකතුමාට ලියුමක් භාර දුන්නා USAID එක ඇතුළු රාජ්‍ය නොවන සංවිධානවල මූල්‍ය ගනුදෙනු පිළිබඳව සොයා බලන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. කථානායකවරයා නොවූවත් නියෝජ්‍ය කථානායකවරයා විධියට ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඉතා කඩිනමින් ඒ සඳහා පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I will bring it to the notice of the Hon. Speaker.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
Thank you, Hon. Deputy Speaker.

ආණ්ඩු පක්ෂයේ බොහෝ අය මැතිවරණ කල් දැමීම ගැන කථා කෙරුවා. හැබැයි, මේ රටේ මැතිවරණ කල් දමන මේ මෑත ඉතිහාසය පටන් ගත්තේ 2015 වර්ෂයෙන් පස්සේ. 2015 ප්‍රාදේශීය සභා මැතිවරණය 2016දී පවත්වන්න තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, ඒක 2018 වර්ෂයට කල් දැම්මා. ඒක

කල් දමන කොට එදා අපි විරුද්ධ වුණා. අපි අදටත් මැතිවරණ කල් දමන එකට විරුද්ධයි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේත් මැතිවරණ කල් දැමීම පිළිබඳව මත දෙකක් තිබුණා. අපි හිටියේ, මැතිවරණය තියන්න ඕනෑ කියන තැන. අපේ පක්ෂය හිටියේ එතැන. හැබැයි, එදා යහපාලන ආණ්ඩුව වෙලාවේ මැතිවරණය කල් දමන කොට ජනතා විමුක්ති පෙරමුණේ පස්දෙනාත් ඒ මැතිවරණ කල් දමන පනත් කෙටුම්පත සම්මත කරන්න ඡන්දය ලබා දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ බොහෝ අය ඒ ගැන නොදන්නවා ඇති. මැතිවරණ කල් දැමීමේ පාපයට ඔබතුමන්නාන්සේලාත් මුල පුරලා තිබෙනවා. ඒ හදපු ආණ්ඩුවෙන්ම තමයි පළාත් සභා මැතිවරණයත් කල් දැම්මේ. මැතිවරණ කල් දැමීම කියන ක්‍රමවේදය තුළ, නැත්නම් මැතිවරණය කල් දමන්න කියන අදහසේ අපේ පක්ෂය සහ අපි නැහැ.

හැබැයි, මැතිවරණයක් පැවැත්වීමේදී එක පැත්තකින් මැතිවරණය නිදහස් හා සාමකාමීව පවත්වන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, රටේ පුරවැසියන්ට හානියක් නොවන්න මැතිවරණය පවත්වන්න ඕනෑ.

අපි දන්නවා, ප්‍රාදේශීය සභා මැතිවරණය පවත්වන්නේ නැතුව අවුරුදු ගණනාවක් එය කල් ගිය බව. එම නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලන්නේ, මැතිවරණය කල් දමන්න එපා. මැතිවරණය පවත්වන්න. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර ලක්ෂ හතරක්, හතරහමාරක් පමණ දරුවෝ සාමාන්‍ය පෙළ විභාගයට පෙනී ඉන්නවා. ස්වාධීන කණ්ඩායම් එක්ක අපේක්ෂකයෝ අසූදාහක්, ලක්ෂයක් විතර මෙම මැතිවරණයට ඉදිරිපත් වෙනවා. එම අපේක්ෂක අපේක්ෂිකාවන් මැතිවරණය මෙහෙය වනකොට එම දරුවන්ගේ විභාග කටයුතුවලට, අධ්‍යාපන කටයුතුවලට යම් බාධාවක් ඇති වෙන්න පුළුවන්. අපි දන්නවා, අපේ රටේ දෙමව්පියන් කෙතරම් සංවේදී ද කියලා දරුවන්ගේ විභාග සම්බන්ධයෙන්. විශේෂයෙන්ම සාමාන්‍ය පෙළ විභාගය කියන්නේ, කඩඉම් විභාගයක්. එම විභාගය සම්බන්ධයෙන් දෙමව්පියන් ඉතාම සංවේදියි. මොකද, උසස් පෙළ කරලා විශ්වවිද්‍යාල ප්‍රවේශය දක්වා දරුවෝ යොමු වෙන්නේ එතැනින්. එම නිසා ආණ්ඩුවත්, මැතිවරණය කොමිසමත් එම දරුවන්ට අසාධාරණයක් නොවන්න, විභාග කටයුතුවලට බාධාවක් නොවන්න මෙම මැතිවරණය මෙහෙයවයි කියලා අපි විශ්වාස කරනවා; අපි බලාපොරොත්තු වෙනවා. මොකද, මෙම මැතිවරණ ව්‍යාපාරයේ අපේක්ෂකයෝ අසූදාහක්, ලක්ෂයක් තමන්ගේ මැතිවරණය මෙහෙය වනකොට සාමාන්‍ය පෙළ විභාගයට පෙනී ඉන්න දරුවන්ට යම් බාධාවක් වුණොත්, එය ලොකු අසාධාරණයක් වෙනවා. ඇතැම් විට එම අපේක්ෂකයන්ගේ දරුවනුත් විභාගයට පෙනී ඉන්නවා ඇති. අනිවාර්යයෙන් පෙනී ඉන්නවා. මේ සමහර ගරු මන්ත්‍රීවරුන්ගේ දරුවනුත් විභාගයට පෙනී ඉන්නවා ඇති; නෑදෑ හිත මිත්‍රයෝ පෙනී ඉන්නවා ඇති. ඉතින් ඒ අයටත් අසාධාරණයක් නොවෙන්න කටයුතු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා මෙම ආණ්ඩුව එක පැත්තකින් පසුගිය කාලයේ මර්දනයට ලැහැස්ති වෙනවා. මාධ්‍යයට තර්ජනය කරලා පටන් ගත්තේ. මාධ්‍යයට සහ මාධ්‍යවේදීන්ට තර්ජනය කළා. පාර්ලිමේන්තුවේ කරපු කථාවල මෑතකදී නම් මට මාධ්‍ය ආයතනවල නම් ඇහුණේ නැහැ. හැබැයි, මෙම ආණ්ඩුව ආපු දවසේ ඉඳලා මාධ්‍ය ආයතනවල නම් කියලා ඒ ප්‍රධානීන්ගේ ප්‍රශ්නවලදී තර්ජනය කළා. තවත් පැත්තකින්, සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත්තා. අධිකරණයේ විභාග වන කාරණා නිසා මම ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. හැබැයි, විෂය භාර අමාත්‍යවරයා එදා කිව්වා, උතුරේ ත්‍රස්තවාදී සැමරුම් සම්බන්ධයෙන් සිද්ධි දහයක් වාර්තා වෙලා තිබෙනවා කියලා. හැබැයි, ඒ දහයට වෙච්ච දෙයක් පිළිබඳව අද වන කල් ගරු සභාවට දැනුම් දුන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කෙසේ වෙතත්, පසුගිය දින කිහිපය තුළත් සිදුවීම් කිහිපයක් වාර්තා වුණා.

මාතලේ දිස්ත්‍රික්කයේ අපි දැක්කා, ඔබතුමන්ලාගේ පක්ෂය නියෝජනය කරමින් අනතුරු ඇඟවීමේ නිලධාරියෙක් ගියා ගෙදරකට. එම වීඩියෝ එකත් සමාජ මාධ්‍ය තුළ ප්‍රචාරය වෙනවා. මාධ්‍යවලත් එම වීඩියෝ එක පෙන්නුවා. පොලිසියේත් පැමිණිල්ලක් දාලා තිබෙනවා. අනතුරු ඇඟවීමේ නිලධාරීන් දැන්ම ගෙවල්වලට යන්න පටන් අරගෙන. කිව්වේ, ගමට අධිකරණ බලය දෙනවා කියලා නේ. ඒක වෙනම කාරණයක්. අපි ඒ ගැන වෙලාව ආවාම සාකච්ඡා කරමු. *[බාධා කිරීම්]* දැන් ආණ්ඩුව ඔබතුමන්ලාගේ නේ. දැන් ඒවා ගැන පරීක්ෂණ කටයුතු කරන්න. නීතිපතිවරයා ගෙන්වලා තර්ජනය කරලා, නීතිපති දෙපාර්තමේන්තුව බය කරලා වැඩ කර ගන්න බැහැ. පරීක්ෂණ කටයුතු කරන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීම්]* ඕක නේ කියන්නේ? අර එහා පැත්තේ ජොෂ්ඨ අය ඔබතුමන්ලාට නෝණ්ඩි දානවා ඊට පස්සේ, ඔවා කියන්න එපා කියලා.

ආණ්ඩුව ඔබතුමන්ලාගේ. ඔබතුමන්ලා ඒවා ගැන හොයන්න. හැබැයි, ඔබතුමන්ලාට මොකක්ද තිබෙන බලය අනතුරු ඇඟවීමේ නිලධාරියෙක් ගෙවල්වලට යවන්න? අද අකුරැස්ස ප්‍රදේශයෙනුත් තව සිදුවීමක් වාර්තා වෙලා තිබෙනවා. පොලීසිය භාර ගරු අමාත්‍යවරයා සභාවේ ඉන්නවා. ගරු අමාත්‍යතුමනි, මම මාතලේ සිදුවීම ගැන සඳහන් කළේ. සමාජ මාධ්‍යවල එම වීඩියෝ එක ප්‍රචාරය වුණා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඊළඟට, අකුරැස්සේත් සිදුවීමක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම අහුණුකොළපැලැස්සේත් සිදුවීමක් වාර්තා වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට හාත්පසින් විරුද්ධ දේශපාලන මතවාදයක් තිබෙන පිරිසක් වෙන්න පුළුවන්. ඒ අය අපටත් විරුද්ධයි. හැබැයි, ඒ අයට තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න අයිතියක් තිබෙනවා. අහුණුකොළපැලැස්සේ ගොවි සමුළුවක් විරෝධතාවක් කළාම යම්කිසි පිරිසක් ගිහිල්ලා ඒ අයට පහර දෙනවා නම්, ඒක හරි නැහැ; ඒක හොඳ නැහැ.

අතිගරු ජනාධිපතිතුමන් අය වැය කථාවේදී සඳහන් කළේ, අලුත් දේශපාලන සංස්කෘතියක් ගැන, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වංචා, දූෂණවලින් තොර වෙන්න ඕනෑ බවයි කිව්වේ. ඒ නිසා තමයි අපි කියන්නේ, USAID එකෙන් යම්කිසි ආයෝජනයක් වෙලා තිබෙනවා නම්, ඒකෙදි අකටයුත්තක් වෙලා තිබෙනවා නම්, නැත්නම් හොඳක් වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව රට දැන ගන්න ඕනෑ. එම නිසා තමයි අපි ඒ සම්බන්ධව විශේෂ කාරක සභාවක් පත් කරන්න කියා ඉල්ලන්නේ. එම නිසා තමයි අපි කියන්නේ, මැතිවරණය සාධාරණව පවත්වන්න කියලා. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී ඉන්න දරුවන්ට අසාධාරණයක් නොවන ලෙස ඡන්දය පවත්වන්න. අනෙක් පැත්තෙන් ගම්වල ඉන්න ඔබතුමන්ලාගේ පාක්ෂිකයන්ටත් කියන්න, ගිහිල්ලා අනෙක් අයට තර්ජනය කරන්න එපා කියලා. ඒක හරි නැහැ. ඒක ඔබතුමන්ලාට හොඳ නැහැ. මොකද, ඔබතුමන්ලා පාර්ලිමේන්තුව ඇතුළේ අලුත් දේශපාලන සංස්කෘතියක් ගැන කථා කළත්, අධිකරණ බලය අතට ගන්න ඕනෑය කියන නිලධාරියෙක් ගමේ ඉන්නවා නම්, එහෙම නැත්නම් අනතුරු ඇඟවීමේ නිලධාරියෙක් ඉන්නවා නම්,- *[බාධා කිරීම්]* හරි, හරි. ඒවා ගැන අපි කථා කරමු. මම කිව්වා නේ. ඒකට වෙලාව එයි. කලබල වෙන්න එපා. ඇයි කලබල? ඇයි කෙදිරි ගාන්නේ?

අනේ මහත්තයෝ, කෙදිරිගාන්න එපා. වෙලාව එනවා. *[බාධා කිරීම්]* වෙලාව ආවාම අපි ඒවා කථා කරමු. *[බාධා කිරීම්]* වෙලාව ආවාම අපි ඒවා ගැන කථා කරමු. හැබැයි, අද අපි

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ කරුණාකරලා මර්දනය නවත්වන්න කියලායි. *[බාධා කිරීම්]* කරුණාකරලා මර්දනය නවත්වන්න. මේ ඉන්න මන්ත්‍රීවරුන්ට -ඔබතුමන්ලාගේ පැත්තේ අයට වෙන්න පුළුවන්, වෙනත් පක්ෂයක අයට වෙන්න පුළුවන්, ස්වාධීන කණ්ඩායම්වල අයට වෙන්න පුළුවන්- නිදහසේ මැතිවරණය මෙහෙයවන්න ඉඩ දෙන්න. මාධ්‍යවේදීන්ට තර්ජනය කරලා, මාධ්‍ය ආයතනවලට තර්ජනය කරලා, දේශපාලන පක්ෂවලට තර්ජනය කරලා තමන්ගේ දේශපාලනය කරන්න ලැහැස්ති වෙන්න එපා. *[බාධා කිරීම්]* අනේ මහත්තයෝ, ඉතිහාසය අවුස්සනවා නම් 1988-89 ඉඳන් ලැයිස්තු කියන්න පුළුවන්. හැබැයි, ඒ ලැයිස්තුවල ප්‍රතිඵලයක් නැහැ. ඔබතුමන්ලා ආයෙත් පරණ සංස්කෘතියටම නේ යන්නේ. *[බාධා කිරීම්]* ආයේ පරණ සංස්කෘතියටම නේ යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපතිතුමා කථාව කරලා ගෙදර ගියා විතරයි. ඔබතුමන්ලා ආයෙත් පරණ සංස්කෘතියට බැහැලා නේ. ඒකට කමක් නැහැ. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ එක දෙයයි. කරුණාකරලා මැතිවරණ මෙහෙයවනකොට ගම්වල ඉන්න තමන්ගේ පාක්ෂිකයන්ටත් අදාළ උපදෙස් ටික දෙන්න. ඒ අය පණිවුඩකරුවන් බවට පත් වුණොත් මේ වැඩේ කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මැතිවරණය කල් දමන්න එපා. *[බාධා කිරීම්]* මැතිවරණය කල් දමන්න එපා. මැතිවරණය තියන්න. අපි කියන්නේත් ඒකයි. *[බාධා කිරීම්]* හැබැයි, මැතිවරණය තියන කොට සාමාන්‍ය පෙළ විභාගය ලියන දරුවන්ට අසාධාරණයක් නොවෙන්න ආණ්ඩුව වග බලාගන්න ඕනෑ. ඒ ගැන මැතිවරණ කොමසාරිස්වරයා සමඟත් කථා කරන්න. අපි කියන්නේ එච්චරයි. මැතිවරණ කල් දමන එකට අපි විරුද්ධයි. අපි පැහැදිලිවම කියන්නේ වෙලාවට මැතිවරණ තියන්න ඕනෑ කියලායි. අද වන කොට පළාත් සභා සොයා ගන්නත් නැහැ, කල් දමපු කල් දැමිල්ලට. *[බාධා කිරීම්]* ප්‍රාදේශීය සභාව,- *[බාධා කිරීමක්]* එතකොට ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඔබතුමන්ලාගේ නායකයින්ගෙන් ඇහුවොත් කියයි, පළාත් සභා මැතිවරණය කල් දමන්න උදවු කළේ කවුද කියලා. එදා එකට අත උස්සපු අය කවුද කියලා එතකොට කියයි. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක යහ පාලන ආණ්ඩුව හදන කොට එතුමා හොඳයි. එතුමා -රනිල් වික්‍රමසිංහ මහත්මයා- අනෙක් පැත්තට ගියාට පස්සේ හොඳ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දේශපාලනය කරනවා නම් දේශපාලනය කරන්න. එදා එකට වැඩ කරන කොට ඒ පුද්ගලයා හොඳ වුණා. එදා එකට අත උස්සලා ප්‍රාදේශීය සභා ඡන්දය අවුරුදු දෙකකින් කල් දමා ගන්න කොට එතුමාගේ ප්‍රතිපත්තිය හොඳ වෙන්නයි, අද එතුමා නරක වෙන්නයි විධියක් නැහැ නේ. ප්‍රතිපත්තිමය වශයෙන් අපට වෙනස්කම් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ආණ්ඩුවේ ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ කරුණාකරලා මැතිවරණය තියන්න කියලායි. හැබැයි, මේකත් අහගන්න. මැතිවරණය තියන කොට ගම්වල ඉන්න ඔබතුමන්ලාගේ අනතුරු ඇඟවීමේ නිලධාරීන්ව පොඩ්ඩක් පාලනය කර ගන්න. ඒක ඔබතුමන්ලාට හොඳ නැහැ. අනෙක් පැත්තෙන් සාමාන්‍ය පෙළ විභාගය ලියන දරුවන්ටත් අසාධාරණයක් නොවෙන්න කටයුතු කරන්න. මොකද, ඔබතුමන්ලාගේ සමහරුන්ට දරුවන් ගැන හැඟීමක් නැති වෙන්න පුළුවන්. ඒක සමහරුන්ගේ දේශපාලන ක්‍රමවේදය. හැබැයි අපි දන්නවා, සාමාන්‍ය පෙළ විභාගයට දරුවන් ලැහැස්ති වෙන විධිය. මේ ගරු සභාවේ ගුරුවරුත් ඉන්නවා නේ. ඉස්සෙල්ලා දෙන්නෙක් විතර අත උස්සනවා මම දැක්කා. ඔබතුමන්ලා මේ කාරණා පිළිබඳ අවධානය යොමු කරලා සාධාරණව මැතිවරණය තියන්න; වෙලාවට මැතිවරණය තියන්න. ඒ වාගේම දරුවන්ටත් අසාධාරණයක් නොවෙන්න ඔබතුමන්ලා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Sunil Watagala. You have 18 minutes.

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතුන්පිරකු, මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුழුක්කළിන් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

[අ.භා. 3.53]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම පිළිබඳ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න මම කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2023 වසරේ පවත්වන්නට තිබුණු පළාත් පාලන මැතිවරණය එදා කල් දැම්මා. එසේ කල් දැමීමට එරෙහිව අපේ පක්ෂයේ නායකයන් සමඟ උරෙනුර ගැටිලා ඒ මැතිවරණය පවත්වා ගැනීම වෙනුවෙන් සැලකිය යුතු කාර්යභාරයක් පෞද්ගලිකවත්, පක්ෂ මට්ටමිනුත් මා කළා.

රනිල් වික්‍රමසිංහ මහත්මයා මැතිවරණය කල් දැම්මාට පස්සේ අපේ පක්ෂයේ හරිනි අමරසූරිය සහෝදරියත්, සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාත් එවකට ඒ පෙත්සම අභියෝගයට ලක් කළා.

අද ඔවුන් කවුද? අද හරිනි අමරසූරිය, අග්‍රාමාත්‍යවරියයි; සුනිල් හඳුන්නෙත්ති, කර්මාන්ත අමාත්‍යවරයායි. ඒ වෙලාවේ අප පළාත් පාලන ආයතනයක් ජයග්‍රහණය කිරීම වළක්වන්න ගත් තීරණය ඇතුළේ තමයි අද අප මේ දැවැන්ත වෙනසට පරිවර්තනය වෙලා ඉන්නේ. ඒගොල්ලෝ කල්පනා කළා, අපේ පක්ෂයේ දේශපාලනය ඒ අවස්ථාවේදී අකුළා දමන්න. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා මේ මැතිවරණය එවකට අවසාන අවස්ථාවට ඇවිල්ලා තිබුණු බව. ඒ කියන්නේ පළාත් පාලන ඇමතිවරයා ලෙස එම මැතිවරණය වසරකිනුත් කල් දමලායි තිබුණේ. එතකොට වසර 5ක් වෙනවා. එතැනින් එහාට යන්නම බැහැ. ඒ වෙලාවේ තමයි මැතිවරණ කොමිසම ඒ මැතිවරණය කැඳෙව්වේ. නමුත් රනිල් වික්‍රමසිංහගේ ක්‍රියා කලාපය ඇතුළේ ඒ මැතිවරණය කල් දමන්න සිද්ධ වුණා. අපි අධිකරණයට ගියා. අධිකරණයෙන් තීන්දුවක් ලැබුණා. ඒ

තීන්දුවේ මොකක්ද, කියන්නේ? ඒ තීන්දුවේ එක තැනක ඉහත කී කාරණය හරි පැහැදිලිව කියනවා. මේ මහත්වරු ඒ ගැන දන්නේ නැත්නම් අහගන්න. ශ්‍රේෂ්ඨාධිකරණය හරි පැහැදිලිව කියනවා, මහත්මයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12. (1) සහ 14. (1) ව්‍යවස්ථා රනිල් වික්‍රමසිංහ විසින් උල්ලංඝනය කළා කියලා. The Supreme Court Judgment states, I quote:

> "3. The impugned acts and omissions of H.E. the President who is also the Minister of Finance that were impugned by making these applications against the Honourable Attorney-General had resulted in the infringement of fundamental rights guaranteed under Articles 12(1) and 14(1) (a) of the Constitution due to arbitrary and unlawful conduct..."

කාගේද? රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ "arbitrary and unlawful conduct". ඒ conduct එක නිසා තමයි මේ මැතිවරණය කල් දමන්න වුණේ කියලා කියනවා. ඊට පසුව දැන් තීන්දුවක් දීලා තිබෙනවා. දැන් දීපු තීන්දුවේ පැහැදිලි කරලා තිබෙනවා, කාරණාව.

"මොකදැයි හදිසිය?" කියලා අපෙන් ඇහුවා නේ, විපක්ෂයේ මන්ත්‍රීවරු. "ඇයි, ඔයගොල්ලන්ට මාර හදිසිය?" කියලා ඇහුවා නේ. අපේ හදිසියක් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ඇතුළේ එය හදිසි කරලා තිබෙනවා. කොහොමද, ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ඇතුළේ හදිසි කරලා තිබෙන්නේ? Again, the Supreme Court Judgment states, I quote:

> ".....schedule the Local Government Elections 2023 at the earliest possible....."

It states "at the earliest possible". ෆයිසර් මුස්තාෆා මන්ත්‍රීතුමා මොකක්ද දන්නේ නැහැ, ඒ වචනවලට දෙන අර්ථ නිරූපණය? රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මොකක්ද දන්නේ නැහැ ඒ ගැන කියන්නේ? කිඹුල් කඳුළු හෙළනවා දැන්. වෙනත් ප්‍රශ්නයක් ඒගොල්ලන්ට තිබෙනවා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට ගරු කරලා තමයි අපි මේ මැතිවරණය පවත්වන්නේ. So, it goes on to state, I quote:

> ".... at the earliest possible with due regard to their duty to hold other elections as required by law."

කාරණය හරි පැහැදිලියි. මෙතැන ඒ අවශ්‍යතාව තිබෙනවා.

මේ වත්මන් නඩුවේදී තර්ක කළේ මොකක් ගැන ද? එතැන නීතියේ ලොකු සංකල්පයක් ගැන තර්ක කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මොකක්ද ඒ සංකල්පය? "Legitimate expectations" කියන සංකල්පය. මොකක්ද ඒ? නීතියේ අපේක්ෂාව. නීතියේ අපේක්ෂාවක් තිබිලා තියෙනවා එදා නාම යෝජනා දීපු හැමෝගේම, ඒ මැතිවරණය තියයි කියලා. හැබැයි, මැතිවරණය තියයි කියලා හිතුවාට රනිල් වික්‍රමසිංහ මහත්මයා ඔහුගේ ක්‍රියා කලාපය ඇතුළේ ඒ මැතිවරණය කල් දැම්මා. මැතිවරණය කල් දැම්මාට පසුව දැන් ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ මොකක්ද? දැන් මේ පනත් කෙටුම්පත 2/3ක වරමක් සහිතව සම්මත කර ගන්න කියලායි. අපේ ගරු බිමල් රත්නායක අමාත්‍යවරයාත් මේ කාරණය ගැන පැහැදිලි කිරීමක් කළා. ඇත්ත වශයෙන්ම මෙහෙම තීරණයක් ආවේ එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා මූලික මිනිස් අයිතිවාසිකම් කඩ කිරීමේ තත්ත්වය තුළයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ සභාවේදී කියනවා, මේකට 2/3ක කැමැත්තක් ගන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණය නියම කර තිබෙන තීන්දුව ඇතුළේ යළිත් කියනවා, මේ වැඩේ කළේ රනිල් වික්‍රමසිංහ, මේකට වග කියන්න ඕනෑ රනිල් වික්‍රමසිංහ කියලා. ඒක නිසා දෙවැනි වරටත් අධිකරණ තීන්දුවක් ඇවිල්ලා තිබෙනවා, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කැඩුවා කියලා. දැන් ධුරයෙනුත් ගිහිල්ලා කුජීත වෙලා ඉන්න වෙලාවේත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දීලා කියනවා, රනිල් තමයි මේ වැඩේ කළේ; ඔහු තමයි 2/3ක කැමැත්තක් ගන්න සැලැස්සුවේ කියලා.

ඒ නිසා අප මත පැටවිලා තිබෙන්නේ වෙනත් කාරණාවක්. තුනෙන් දෙකක වරමක් කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙනුත් කියලා තිබෙන්නේ. වත්මන් ආණ්ඩුව ලෙස අපි, අධිකරණ තීන්දුවට ගරු කරලා ඡන්දය තියන්න යනකොට කරන්න දෙයක් නැතිකමට දැන් මෙහෙම කියන්න සිද්ධ වෙලා ඇති. ඒ නිසා විපක්ෂයේ මහත්වරුන්ට අපි මේ කථාව කියනවා. නීතියේ අලුත් සංකල්පයක් ඇති වෙලා තිබෙනවා, ඒ අලුත් සංකල්පය මත පදනම්ව තමයි අද අපට මෙවැනි ආකාරයක මැතිවරණයක්වත් දෙන්න ශ්‍රේෂ්ඨාධිකරණය කටයුතු කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් මෙතැන මේ මැතිවරණය සම්බන්ධයෙන් යම් යම් කථා ඉදිරිපත් වුණා. "මේ මැතිවරණය පවත්වන්න ඇයි මෙච්චර හදිසි" වාගේ කථා මතු වුණා. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා, "මාර වැඩේ නේ කල් තියනවා නේ" වාගේ අදහසක හිටියා. ෆයිසර් මුස්තාෆා මන්ත්‍රීතුමාත් ඒ වාගේ. මොනවද මේ කියන්නේ?

Ninety days ගැන තව කථාවක් මතු වුණා. මැතිවරණය earliest possible date එකක තියන්න හදනකොට ඒ පිළිබඳව විවිධ සැක සංකා මතු කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? මැතිවරණ කොමිසමට අපි බලපෑමක් කරනවා වාගේ කථාවක් එතුමා කිව්වා. ඉතිහාසය මම කියන්නම්. මේ මැතිවරණය ප්‍රකාශයට පත් කළාට පස්සේ 2023.01.26දා අපට ආරංචි වුණා, මැතිවරණ කොමිසමේ සාමාජිකාවක් ඉල්ලා අස් වුණා කියලා. ටික දවසකට පස්සේ ආරංචි වුණා එතුමිය උතුරේ ආණ්ඩුකාරවරිය කියලා. මේවා අහගන්න, රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. කෝ, එතුමා නැහැ නේ අපේ කථා අහගන්න. මැතිවරණ කොමිසමට බලපෑම් කරලා තිබෙන්නේ එහෙම.

ඊට පස්සේ 2023.01.30වැනි දා මැතිවරණ කොමිසම නිවේදනයක් කරනවා, අපි මැතිවරණය තියන්න ලෑස්තියි කියලා. *[බාධා කිරීමක්]* මැතිවරණ කොමිසම ලෑස්තියි කියනකොට අන්න රනිල් වික්‍රමසිංහ වැඩ පටන් ගන්නවා. 2023.02.02වැනි දා චක්‍රලේඛයක් නිකුත් කරලා කියනවා, අත්‍යවශ්‍ය කාරණාවලට පමණයි මුදල් වෙන් කරන්නේ, අත්‍යවශ්‍ය කාරණා ලැයිස්තුවේ මැතිවරණය නැහැ කියලා. එතකොට ගමන් මග පේනවා නේ. අත්‍යවශ්‍ය කාරණා ලැයිස්තුවේ මැතිවරණය නැහැ. ඊට පස්සේ තවදුරටත් මැතිවරණ කොමිසම ක්‍රියාත්මක වෙනවා. ඒ ක්‍රියාත්මක වෙනකොට, අක්මුදල් නිදහස් කරන්නේ නැහැ කියලා 2023.02.06දා චක්‍රලේඛයක් නිකුත් කරනවා. ඒ අස්සේ තමයි අර මායාදුන්නේ-හපුහින්න ජවනිකාව එන්නේ. අන්තිමට ලේකම්ලා අල්ලලා බිත්තියට හේත්තු කරනවා. මායාදුන්නට ඉල්ලා අස්වෙන්න කියනවා. නීල් හපුහින්න එතැනට ගේනවා.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Madam, may I seek a clarification?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජී.ජී. පොන්නම්බලම් මැතිතුමා.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Thank you, Madam.

Hon. Deputy Minister, I do not want to take your time. As a very senior lawyer, you know that even previously the Supreme Court had given a ruling saying that the elections must not be postponed. That is, long before even the Parliamentary Election took place. Now, you are quoting from the Judgment with regard to this present Bill. Your Government has brought in this Bill seeking the elections to be held in three months' time from the time this Bill is passed, despite the fact that previously also, even before the Parliamentary Election, the Supreme Court had said that the elections must not be postponed. Then, whilst giving the ruling on this Bill, it talks of having the elections as soon as possible. But, your Government, despite knowing what the Supreme Court had previously said, has asked for three months. So, you are estopped from saying that asking for anything up to three months is trying to postpone the elections. Our request is that the nominations must be done in such a way that it does not inconvenience or effectively disenfranchise the Hon. Members here. As long as our asking that the elections not be postponed beyond three months is not a postponement. You are estopped, your Government is estopped from saying that we are asking for a delay because you yourselves have brought in this law.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඕනෑ කෙනෙකුට තේරෙනවා මේ රටේ ව්‍යවස්ථානුකූලව ආපු මැතිවරණයක් තිබුණු බව. ඒ තමයි ජනාධිපතිවරණය. ඊට පස්සේ ව්‍යවස්ථානුකූලව ආපු මැතිවරණය තමයි පාර්ලිමේන්තු මැතිවරණය. ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම දෙන්නම් හරිම පැහැදිලි උත්තරය. මේ Judgment එකේ තිබෙනවා, "අනෙක් මැතිවරණවලට බාධාවක් නොවන පරිදි" කියලා. ඒ කොළේ හම්බ වුණාම ඒ ගැන කියන්නම්. ඒවාට බාධාවක් නොවන පරිදි තමයි මේ මැතිවරණය පවත්වන්න ඕනෑය කියලා කියන්නේ. අනෙක් කාරණාව මෙයයි. චත්මන් නඩු තීන්දුවේ එක කාරණයක් සඳහන් වෙනවා, මීට කලින් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට ලක් වෙන්න හේතු වුණු නඩු තීන්දුවල තිබෙන කාරණා overrule වීමක් නොවෙයි මේ කරන්නේ කියලා. ඒ නඩු තීන්දුවල විවිධ අර්ථකථන ඇති. ඒ නඩු තීන්දුවල කොහොම සඳහන් වුණත් මේ නඩු තීන්දුව ඇතුළේ යන්න පුළුවන් සීමාව මෙච්චරයි කියන එක ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව තුළ පැහැදිලි කර තිබෙනවා. ඒ නිසා මෙය චත්මන් ආණ්ඩුව හිතා මතා කරන ප්‍රමාදයක් හෝ වෙනත් තත්ත්වයක් නොවෙයි. ආණ්ඩුවක් ලෙස අපට පුළුවන් වේලාසනම දවසේ තමයි අපි මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ මත පදනම්ව මැතිවරණ කොමිසම ඉස්සරහට කටයුතු කරනවා ඇති. අපි මැතිවරණ කොමිසමට යම් බලපෑමක් කරනවා යැයි කියන චෝදනාවට අදාළව තමයි මම රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාට මේ කථාව පැහැදිලි කළේ. අපේ ඩියුටිය තමයි මෙතැනදී මේ පනත් කෙටුම්පත සම්මත කරලා දෙන එක. මැතිවරණ කොමිසමේ ඩියුටිය තමයි ඒ පනතට අනුව මැතිවරණය පවත්වන එක. අතීතයේ වෙච්ච දේවල් අපට කියන්න ඕනෑ නේ. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මෙතැන උඩ පැන පැන වාගේ කෑ ගැහුවා, මේකට යම් යම් බලපෑම් ඇති වෙනවා වාගේ අදහසක් කියලා.

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ ඉතිහාසය අපි දන්නවා නේ. එතුමා, "විජේ සහ අජේ" චිත්‍රපටයේ වාගේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක එකතු වෙලා මෙතැනට ඇවිල්ලා, "මැතිවරණයක් පවත්වන්න සල්ලිත් නැහැ, පවත්වන්න මැතිවරණයකුත් නැහැ" කියනකොට, හුරේ දාලා අත්පුඩි ගහපු මහත්මයා. එතුමා දැන් මෙතැනට ඇවිල්ලා කිඹුල් කඳුළු හෙළලා, "මැතිවරණයක් පවත්වන්න ඇයි ඔච්චර හදිසි" වාගේ දෙයක් කියනවා. අපි දන්නවා, භාවිතාව ඇතුළේ ශ්‍රේෂ්ඨාධිකරණයට මොන තරම් බලපෑම් ඇති කරපු කණ්ඩායමද ඒගොල්ලෝ කියන එක. නේද? තවමත් ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටින සූරසේන විනිශ්චයකාරවරයා විසින් මේ මැතිවරණය පවත්වන්න අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වහා සපයන්න කියලා අතුරු නියෝගයක් දුන්නා. එදා ඒ මැතිවරණය තියන්න කියලා වචනයක් මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ නැහැ. දැන් ඇවිල්ලා මෙතැන කිඹුල් කඳුළු හෙළනවා, "මාර වැඩේ. ඔච්චර හදිසි ඇයි, කමක් නැහැ, කමක් නැහැ මැතිවරණය තියනවා නම් තියන්න" කියලා. නමුත් ඒ මහත්වරුන්ගේ භාවිතාව ඇතුළේ ශ්‍රේෂ්ඨාධිකරණයට මොන තරම් බලපෑමක් එල්ල කරලා තිබෙනවාද? අපි එහෙම බලපෑමක් කරලා නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි හරි පැහැදිලිව අධිකරණයේ ක්‍රියාකලාපය අනුව අධිකරණයට යන්න ඉඩ දීලා, මැතිවරණ කොමිසමේ ක්‍රියාකලාපය අනුව මැතිවරණ කොමිසමට කටයුතු කරන්න ඉඩ දීලා කටයුතු කරන දේශපාලන ව්‍යාපාරයක්. අපි, අපේ පක්ෂයේ නායකයා අද උදේ මේ පාර්ලිමේන්තුවේදී කියපු මූලධර්මය ඒ විධියටම, ඒ බරින්ම රකින දේශපාලන ව්‍යාපාරයක්. ඒ වාගේම අපට අදාළ නැති උදාහරණ කිහිපයක් කිව්වා. දැන් අහුණුකොළපැලැස්සේ සිද්ධියක් ගැන කිව්වා. එතැන කිසිදු පහරදීමක් සිද්ධ වෙලා නැහැ. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියනවා, පහරදීමක් වෙලා තිබෙනවා කියලා. අපට අදාළ නැති සමහර සිද්ධි මෙතැනට ගෙනැල්ලා ආරූඪ කරන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද ඒගොල්ලන්ට කියන්න සටන් පාඨයක් ඉතුරු වෙලා නැහැ. ඒ නිසා අද "සූබ් කැලි" හොයනවා තැන් තැන්වල තිබෙන. අද මොනවාද ඒගොල්ලන්ට ඉතුරු වෙලා තිබෙන සටන් පාඨ? දැන් අභියාචනාධිකරණයට නඩු දෙකක් දාලා තිබෙනවා. එකක් තමයි, ගරු ආනන්ද විජේපාල අමාත්‍යාවරයා ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා ලෙස කටයුතු කරනවා කියන එක. අනෙක් එක තමයි, ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමාට නඩුවක් දාලා තිබෙනවා එතුමාගේ පත්වීමේදී එක දවසක සිද්ධියක් තිබෙනවා කියලා. අනේ පව! දේශපාලනයේ වැටිලා තිබෙන තැන. අද ඉස්පිලි, ඇලපිලි, තාක්ෂණික කෑලි හොයන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි කියනවා, අපේ දේශපාලන භාවිතාව ඇතුළේ අපේ මන්ත්‍රීවරුන් 159දෙනාට එරෙහිව මහජන දේපළ සම්බන්ධයෙන් එකදු චෝදනාවක් නහන්න බැරි කරලා තිබෙන බව. එහෙමයි අපේ දේශපාලන භාවිතාව. ඒ නිසා අද ඒගොල්ලෝ අපට එරෙහි දේශපාලන කාරණාවලට ඉස්පිලි, පාපිලි, ඇලපිලි හොයනවා. දැන් ඡෝෂා විතානගේ මන්ත්‍රීතුමා ආණ්ඩුවට අභියෝග කරලා කියනවා, මේ මැතිවරණයෙන් ආණ්ඩුවට එක පළාත් පාලන ආයතනයක්වත් ජයග්‍රහණය කරන්න වෙන්නේ නැහැ කියලා. අනේ පව! බොහොම කනගාටුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

හරි. එහෙම නම් අපි හේෂා විතානගේ මන්ත්‍රීතුමාට මේ අභියෝගය කරන්නම්කෝ. එළැඹෙන පළාත් පාලන මැතිවරණයේදී සමගි ජන බලවේගය එක පළාත් පාලන ආයතනයක් ජයග්‍රහණය කරලා පෙන්වන්න. ඒක කරන්න බැහැ. සමස්ත පළාත් පාලන ආයතනවල ජයග්‍රහණය යන්නේ ජාතික ජන බලවේගයට බව තහවුරු වෙලා ඉවරයි. ඒක නිසා ඒ අභියෝගය භාර ගන්න ඒගොල්ලන්ට බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි අද මේ පළාත් පාලන මැතිවරණය නීත්‍යානුකූලව, හරි පිළිවෙළට දම්වැලක පුරුක් ලෙස එකට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒක මේ රටේ නීතියේ බලයටත්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයටත් හරියටම ගරු කරලා ගෙනාපු තත්ත්වයක්. ඒක අද අපේ ජනාධිපතිවරයා කියපු සංකල්පවලට කිසිදු විරෝධතාවක් නැහැ. අපි ඉතිහාසයේ ප්‍රථම වතාවට සාමකාමී මැතිවරණ නිර්මාණය කරලා දීලා තිබෙනවා. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය ඇතුළේ එකදු සාහසික ක්‍රියාවක් සිද්ධ වුණේ නැහැ. මැතිවරණයේ සම බිම අපි නිර්මාණය කරලා දීලා තිබෙනවා. තමුන්නාන්සේලාට කියන්නේ, මේ මැතිවරණයේදීත් අපි මැතිවරණයේ සම බිම ආරක්ෂා කරලා දෙන්නම්, පුළුවන් නම් ඒක ඇතුළේ ජයග්‍රහණය කරලා පෙන්වන්න. අපි මේ පළාත් පාලන මැතිවරණයේදී සමස්තය ජයග්‍රහණය කරනවා කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.13]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට ඉතාම කෙටි කාලයක් ලැබී තිබෙන්නේ. මට ප්‍රශ්නයක් තමයි ඉදිරිපත් කරන්න තිබෙන්නේ. ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ ඡන්දය කල් දමන්න කියපු වෙලාවේ, අර ලේකම්තුමා - මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා - තමයි මුදල් නැහැ කිව්වේ. ඒ ලේකම්තුමාම තමයි දැන් ඔය අය වැය හදලා අනුර කුමාර දිසානායක මහත්මයාට කිව්වේ. එදා නම් හිරේ දානවා කිව්වා. එහෙම කියපු ලේකම්තුමා තමයි අදත් මුදල් අමාත්‍යාංශයේ ඉන්නේ. ඒ වාගේම, අන්තිම අවුරුදු විස්සේ පළමුවැනි මැතිවරණය කල් දමන්න, - ප්‍රාදේශීය සභා මැතිවරණය සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් තිබෙන වෙලාවේ ඔබතුමන්ලාගේ - හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමිය සිටියේ නැහැ - ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු හයදෙනාත් අත ඔසවලා තමයි මැතිවරණය 2016 සිට 2018 දක්වා කල් දාන්න කටයුතු කළේ. මමත් ඒ කාලයේ පාර්ලිමේන්තුවේ සිටියා නේ. අපි නම් ඒකට විරුද්ධ වුණා. ඔබතුමන්ලා විරුද්ධ වුණේ නැහැ. ඒ වාගේම අනීතිකව,- *[බාධා කිරීමක්]* මොකද, අද වෙනකල් ප්‍රාදේශීය සභා මැතිවරණයට ඡන්දය ඉල්ලන සියලුදෙනා අපේක්ෂකයන්. මේ අපේක්ෂකයන්ට හැකියාවක් නැහැ, තමන්ගේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළේ නිලතල දරන්න. හැබැයි, අද වේදීදී අනීතිකව ටිරෝන් ශීලවංශ කියන අය කලවාන ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් පත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, මෙම ප්‍රාදේශීය සභා මැතිවරණයටම ඉදිරිපත් වෙලා සිටින අපේක්ෂකයෙක් මේ මොහොතේත් පත් කරලා තිබෙනවා, ඒ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන්. මෙහෙම වෙන්න පුළුවන්ද? රටේ නීතිය අනුව පළාත් පාලන කොමසාරිස්තුමාට කිසිම බලයක් නැහැ, අමාත්‍යතුමාට කිසිම බලයක් නැහැ, ඡන්දය ඉල්ලන අපේක්ෂකයෙක් ලේකම් වශයෙන් පත් කරන්න. අපි දන්නේ මෙවැනි එක් සිදුවීමක් පමණයි. මේ වාගේ තව කී දෙනෙක් ලංකාව තුළ පත් කරලා තිබෙනවාද? ගරු ඇමතිතුමනි, අද දවසේ ඔබතුමාට කාලය තිබෙනවා අපට උත්තර ලබා දෙන්න. අදින් පස්සේ ඒක කරන්න පුළුවන්. අද වෙනකල් අනීතිකව මෙහෙම පත්වීම් දීලා තිබෙනවා. ඔබතුමන්ලාගේ අපේක්ෂකයෝ දේශපාලන වශයෙන් පත් කළේ කොහොමද කියලා අපට කියන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.15]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මුලින්ම මම අපේ ගරු ආනන්ද විජේපාල මහජන ආරක්ෂක ඇමතිතුමාගේ අවධානයට ජාතික වැදගත්කමක් තිබෙන ප්‍රශ්නයක් යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් මේකට ඇහුම්කන් දෙන්න. වටවල වැවිලි සමාගමට අයත් උඩුගම, හෝමදොළ වතු යායේ කාබීල් කොටසේ සේවය කරන ගාමිණී කිංස්ලි කියන වතු නිලධාරියා හෝමදොළ වතු යායේ මායිමේ ඇති බටකැටිය කොටසේ පේළි නිවෙස්වල ජීවත් වන දමිළ තරුණයෙකුට අමානුෂික ලෙස පහර දීලා තිබෙනවා. ඊයේ-පෙරේදා තමයි මේ සිදුවීම සිද්ධ වෙලා තිබෙන්නේ. මේක social mediaවල viral වෙනවා. Viral වෙනවා විතරක් නොවෙයි, මේක virus එකක්, ජාතිවාදී virus එකක්. ඔබතුමා හිතන්න එපා මම ආණ්ඩුවට දොස් කියනවා කියලා. අපේ අගමැතිතුමිය එදා මගේ ඇහට කඩා පැන්නා වාගේ ඔබතුමාත් කඩා පනින්න එපා. මම කියන්නේ, system එක ගැනයි. වතු යායේ system එක වැරදියි. කරුණාකර, මේ ගැන සොයා බලන්න. මොකක්ද වෙලා තිබෙන්නේ කියලා ඒ වීඩියෝ එක බැලුවාම ඔබතුමාට තේරුම් යයි. හවස් වෙලාවක ඒ තරුණයා බීමට දාලා බල්ලෝ උසිගන්වලා තිබෙනවා. බල්ලෝ හපනවා. කට්ටියක් වටේ ඉඳගෙන බලාගෙන ඉන්නවා. අර නිලධාරියා සහ ඔහුගේ බිරිඳ ද දන්නේ නැහැ, කට්ටියක් වටේට ඉන්නවා. මම දන්නේ නැහැ ආරවුල මොකක්ද කියලා. සමහර වෙලාවට බීම වැටිලා හිටපු අර දමිළ තරුණයා වරදක් කරලා ඇති. එහෙම වෙන්න පුළුවන්. මම දන්නේ නැහැ, එයා වැරදිද, මෙයා වැරදිද කියලා. ඒක පොලීසියෙන් සොයා බලන්න ඕනෑ. නමුත්, මෙහෙම බීමට දාලා බල්ලන් උසිගන්වන එක වැරදියි. මේක දකින්න අමාරුයි. අමානුෂික වැඩක් මේ කරලා තිබෙන්නේ. කරුණාකර ඒ ගැන සොයා බලන්න.

අද මම සතුටු වුණා, අපේ ජනාධිපතිතුමා "මලයගම්" කියන වචනය පාවිච්චි කළා. මම නැහිටලා කථා කළා නේ. මම එතුමාට ස්තුති කළා, ඒක හොඳයි කියලා. ප්‍රශ්නයක් නැහැ. නමුත්, මේවා ගැනත් සොයා බලන්න. මධ්‍යම පළාතේ, සබරගමුව පළාතේ, බස්නාහිර පළාතේ, ඌව පළාතේ සහ වයඹ පළාතේ මේ කඳුකර ජනතාව ජීවත් වෙනවා. උතුරු පළාතේත් ඔවුන් ජීවත් වෙනවා. රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා දන්නවා, ඒගොල්ලන් උතුරු පළාතේත් ජීවත් වෙනවා කියලා. දැන් මේ දකුණු පළාතේ මාතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල තමයි ඉතා අමානුෂික දේවල් සිදු වෙන්නේ. මට කියන්න ලජ්ජයි, සමහර වෙලාවට ඒ දුෂ්කර, හුදෙකලා වෙලා තිබෙන වතුවලට රෑ යාමේ ගිහිල්ලා ගැහැනු ළමයි උස්සාගෙන යන තත්ත්වයක් තිබෙනවා. මම ඇත්ත කියන්නේ.

[ගරු මනෝ ගනේසන් මහතා]

මේ ගැන පොඩ්ඩක් හොයලා බලන්න. මේ ගැන පොලීසියට කියලා බලන්න. මේක අදාළ වෙන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ, උඩුගම පොලීසියට, ගරු ඇමතිතුමනි. OICගේ නමත් සඳහන් වෙනවා. OICගේ නම දැම්මද. මම OICට දොස් කියනවා නොවෙයි. මේ ගැන පොඩ්ඩක් සොයා බලන්න. මෙවැනි දේවල් කරන්න ඉඩ දෙන්න එපා. අමානුෂික සිදුවීමක් වෙලා තිබෙන්නේ.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමා, ගාල්ලේ උඩුගම ප්‍රදේශයද?

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමා, මම ඔබතුමාට විස්තර එවන්නම්. මේ ගැන පොඩ්ඩක් සොයා බලන්න. මෙය ඉවසාගෙන ඉන්න බැහැ. මොකද, අමානුෂික වැඩක් මේ කරලා තිබෙන්නේ. ඒ තරුණයා බිමට දාලා බල්ලා උසිගන්වලා තිබෙනවා. කරුණාකරලා පොලීසියට කියන්න, මේ පුද්ගලයා අත් අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරන්න කියලා. උසාවියට ඕනෑ තීන්දුව ගන්න කියන්න. දඩුවම් දෙන්න ඕනෑ, නැත්නම් අවවාද කරන්න ඕනෑ. මොකද, නැවතත් මේක වෙන්න බැහැ නේ. මේකයි මේ වතුවල තත්ත්වය, විශේෂයෙන්ම දකුණු පළාතේ. මේක තමයි system එක. ඉතින් system එක වෙනස් කරන්න නේ, ඔබතුමන්ලා ඇවිල්ලා තිබෙන්නේ. අපිත් එන්න හිටියේ ඒකට තමයි. ජාතිවාදය අතුගාලා දාන්න ඕනෑ. System එක වෙනස් කරන්න ඕනෑ. නැත්නම් මේක කරන්න බැහැ. හැමදාම මේක කරන්න බැහැ. අපිට බලාගෙන ඉන්න බැහැ. මට කොළඹ ඉඳලා මේක ගැන බලලා නිකම් ඉන්න පුළුවන්. හැබැයි, මම එහෙම ඉන්න කෙනෙක් නොවෙයි. මට එහෙම ඉන්න බැහැ. මොකද, අමානුෂික වැඩක් නේ, මේ කරලා තිබෙන්නේ. තරුණයා බිමට දාලා බල්ලා උසිගන්වලා තිබෙනවා. මගේ බිරිඳ මේ සිද්ධිය දැකලා කඳුළු සලනවා. ඇය අහනවා, මේ වගේ දේවල් වෙන්නේ ලංකාවේද කියලා. අමානුෂික වැඩක් මේක. කරුණාකරලා පොලීසිය කැඳවලා ඒ පුද්ගලයා අත්අඩංගුවට අරගෙන උසාවියට ඉදිරිපත් කරලා උසාවියෙන් නීතිය ක්‍රියාත්මක කරන්න. නීතියෙන් දඬුවම් දෙන්නේ නැත්නම්, මෙහෙම කරන්න එපා කියලා ඔහුට අවවාද කරන්න. ගාල්ල දිස්ත්‍රික්කයේ සහ මාතර දිස්ත්‍රික්කයේ වතු ක්ෂේත්‍රය තුළ ඒ ජනතාවට මෙවැනි විශාල අපරාධ සිදු වෙනවා. දැන් බලන්න, ඇමතිතුමා. ඒ තරුණයා දමිළ තරුණයෙක්. කිංස්ලි කියන නිලධාරියා සිංහල එක්කෙනෙක්. දෙගොල්ලන්ම ශ්‍රී ලාංකික තමයි. මේ පුද්ගලයා සිංහල ජනතාව නියෝජනය කරන්නෙත් නැහැ, දෙමළ ජනතාව නියෝජනය කරන්නෙත් නැහැ. නමුත් අනෙක් පැත්තට මේ සිද්ධිය වෙලා තිබුණා නම්, මොනවා වෙයිද? ගාල්ලේ කෝලාහලයක් ඇති වෙයි, නේද? අපි ඇත්ත කථා කරන්න ඕනෑ නේ, ඇමතිතුමා. ඉතින් ඒවාට ඉඩ දෙන්න එපා. කරුණාකරලා වග බලා ගන්න. මේ ආණ්ඩුවට මම දොස් කියනවා නොවෙයි. මේ system එක වෙනස් කරන්න. ඒක පටන් ගන්න. නැත්නම් මේක හරි කනගාටුදායක තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට වේලාව තව කොච්චර තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 4ක් තිබෙනවා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
හොඳයි.

මම දැන් මේ මොහොතේ කථා කරන මානෘකාවට එන්නම්. මේ මැතිවරණය කල් දමන්න ඕනෑ කියන වුවමනාවක් අපට නැහැ. අපි මැතිවරණයට මුහුණ දෙමු. මැතිවරණය අපට අවශ්‍යයි. නමුත් අද තමයි අපට Budget Programme එක ලැබුණේ. දැන් බලන්න, මාර්තු මාසයේ 21 වෙනිදා වෙනතුරු මේ අය වැය විවාදය පැවැත්වෙනවා. Budget Debate එක කියන්නේ විපක්ෂයේ Debate එක නේ. අපි නේ, ඒක ඉල්ලන්නේ. අපි ඉල්ලන්නේ නැත්නම් Debate එක ඕනෑ නැහැ. ඔබතුමන්ලාට අය වැය සම්මත කරගෙන යන්න පුළුවන්. ඉතින් අපි ඔක්කෝම මෙතැනට යොමු වෙලා ඉන්න එපා යැ. මෙතැන ඉන්නකොට කොහොමද, ඡන්ද ප්‍රචාරක කටයුතු කරන්නේ? ඒක කරන්න බැහැ නේ. සම තලයක් නැහැ නේ. ආණ්ඩුවේ අපේ වටගල නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, සම තලයක් ලබා දෙනවා කියලා. ඒ වුණාට සම තලයක් නැහැ නේ. රාමසාන් සමයද, අලුත් අවුරුදු සමයද, විභාග සමයද කියලා වෙන ප්‍රශ්න තිබෙනවා.

නමුත් පළමුවෙනි ප්‍රශ්නය මේකයි. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රශ්නයක් නේ, මේක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාර්ලිමේන්තුව තුළත්, එළියේත් අපි ඉන්නවා. ඉතින් සම තලයක් අවශ්‍යයි; විපක්ෂය, පක්ෂය සමානව. එතුමා කිව්වා, සෑම පළාත් පාලන ආයතනයක්ම දිනා ගන්නවා කියලා. හොඳයි, ගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් අපිත් තරග කරන්න එපා යැ. විපක්ෂයක් ඕනෑ නේ. සම තලයක් නැහැ නේ, මේකේ. ප්‍රධාන ප්‍රශ්නය ඒක තමයි. අපි මාර්තු 21වෙනි දා වෙනතුරු මෙතැන ඉන්නකොට කොහොමද ඡන්ද ප්‍රචාරණ කටයුතු කරන්නේ?

මැතිවරණ දිනය පමණක් නොවෙයි නේ, බිමල් රත්නායක මැතිතුමා මේකට අදාළ වෙන්නේ. මැතිවරණ දිනය පමණක් නොවෙයි වුවමනා වෙන්නේ. දිනය ඔබතුමා සඳහන් කළා. ඔබතුමා කිව්වා, එය තීරණය කරන්නේ මැතිවරණ කොමිෂන් සභාවෙන් කියන එක. ඔබතුමා කිව්වා, අප්‍රේල් මාසයේ 26 වාගේ දිනයක් වෙයි කියලා. මම ඒ ගැන දන්නේ නැහැ. ඒක ඔබතුමාගේ මතය නේ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කියනවා කියලා මම කියන්න යන්නෙත් නැහැ. නමුත් එහෙම නම් ප්‍රචාරක කටයුතු තිබෙනවා නේ. එතකොට මෙහේ එනවාද, එහේ යනවාද? මට යන්න තිබෙනවා, කොළඹ දිස්ත්‍රික්කය, කළුතර, රත්නපුර, නුවරඑළිය, බදුල්ල, මාතලේ ප්‍රදේශවලට. ඉතින් කොහොමද මේ කටයුතු කරන්නේ? කරන්න බැහැ නේ. ඒ නිසා ඒ ගැන සලකා බලා සාධාරණව මේ ඡන්දය පවත්වන්න. ඡන්දය කල් දාන්න කියන්නේ නැහැ, අපි. ඡන්දය කල් දමන්න ඕනෑ නැහැ. ඡන්දය තියන්න ඕනෑ. හැබැයි, මේ ගැනත් සලකා බලා සම අවස්ථා ලබා දෙන්න. ඔයගොල්ලන් නේ, බලය තිබෙන ආණ්ඩුව. බලය තිබෙන ආණ්ඩුව. *[බාධා කිරීමක්]* ඒක හරි, උසාවියට කියන්නම්.

අපි උසාවියට යන්නම්. එහෙම ප්‍රශ්නයක් නැහැ. ගරු බිමල් ඇමතිතුමා, එහෙම කියන්න එපා. උසාවියට යන්න පුළුවන්, අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් අපි දැන් ඔබතුමාට සාධාරණව කථා කරන්නේ. ඉල්ලීමක් කරන්නේ. වගකිව යුතු ඇමතිවරයා හැටියට අපි ඔබතුමාගෙන් මිත්‍රශීලිව ඉල්ලීමක් කරන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඇත්තටම ඔබතුමා වාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකුගෙන් මම මෙය බලාපොරොත්තු වුණේ නැහැ, ඔබතුමා සත්‍ය කථා කරන කෙනෙක් විධියට. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නොවැම්බර් 25 වෙනිදා Party Leaders' Meeting එකේදි ගත් තීන්දුව මා ළඟ තිබෙනවා. මම එය හැන්සාඩ්ගත වීම සඳහා කියවන්නම්. *[බාධා කිරීමක්]* මම ඔබතුමාගේ වේලාව ගන්නේ නැතුව අපේ වෙලාවෙන් ගන්නම්, ගරු මන්ත්‍රීතුමා. එහිදී සියලු දේශපාලන පක්ෂවල සම්පූර්ණ එකඟතාවෙන් තමයි මේ තීන්දුව ගත්තේ. I quote:

> "…. all the Leaders of the Political Parties in Parliament were of the view that the Local Authorities Elections need to be held and fresh nominations need to be called for the same."

This was decided at the Party Leaders' Meeting in Parliament held on the 25th of November, 2024 at 5.00 p.m.

මේ ඔක්කෝම පක්ෂ නායකයන් ගත් තීන්දු. ඔබතුමන්ලා පසුගිය කාලයේ කිය කියා හිටියා නේ, අපි සමුපකාර ඡන්ද ඔක්කෝම පැරදුණා කියලා. ඒ නිසා මේ මැතිවරණයත් ඔබතුමන්ලාට දිනන්න පුළුවන් නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මාර්තු 21වැනි දා තුන්වෙනි වර කියවා අය වැය විවාදය අවසන් වනවා. අප්‍රේල් මාසයේ අග තමයි මේ මැතිවරණය පවත්වන්න ඉඩ තිබෙන්නේ. එහෙම නැත්නම් මැයි මාසයේ වෙන්නත් පුළුවන්. ඒක Election Commission එක තීන්දු කරයි. මේක අපි ඔක්කෝම එකඟතාවෙන් කරපු දෙයක්. ඔබතුමන්ලාට වඩා දුර්වල තත්ත්වයක අපි ඉඳලා තිබෙනවා. අපි තුන්දෙනා ඉඳලා තිබෙනවා, හයදෙනා ඉඳලා තිබෙනවා. නමුත් කවදාවත් අපි ආණ්ඩු පක්ෂවලට කියලා නැහැ, මැතිවරණය තියන්න එපා, අපට අවාසියි කියලා. අපි පැරදිලා තිබෙනවා. හැබැයි, කවදාවත් අපි ඔහොම කරලා නැහැ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ වෙලාව,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අපේ කාලයෙන් ගත්තේ, ඔබතුමා මේ දේවල් කියපු නිසා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

නැහැ, නැහැ. ඔබතුමා කියන එක මට තේරෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අපි රාජ්‍ය දේපළ පාවිච්චි කරන්නේ නැහැ, රාජ්‍ය මාධ්‍ය පාවිච්චි කරන්නේ නැහැ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

මම එහෙම දොස් කිව්වේ නැහැ නේ. ඇයි, නිකම් තොප්පි දමා ගන්නේ? මම එහෙම කිව්වේ නැහැ නේ. ඔබතුමන්ලා මැතිවරණයෙන් පසුව ප්‍රචණ්ඩත්වයට ගියා කියලා මම කිව්වේ නැහැ නේ. මම සාධාරණ ඉල්ලීමක් කරන්නේ. අපටත් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා කාලයක් ඕනෑ නේ. ඒකයි මම කියන්නේ. පක්ෂ නායක රැස්වීමේදී ඔබතුමන්ලා එකඟ වුණා කියලා කියනවා. ඒ ගැන කථා කරන්න ඕනෑ නැහැ නේ, ගරු ඇමතිතුමා. ඒකේ පොඩි ගැටලුවක් තිබෙනවා. පක්ෂ නායක රැස්වීමේදී අපි ඔක්කෝම නියෝජනය වෙන්නේ නැහැ. එතැන වෙන ඒවා අපි දන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය. ඒක වෙනම ප්‍රශ්නයක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මම නම් ටික කිව්වේ නැහැ නේ. මම ඒ නම් ටිකත් කියන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාලය මෙතුමාගේ වෙලාවෙන් ගන්න එපා. මේ පක්ෂ නායකයෝ කවුද? The Hon. (Dr.) Harini Amarasuriya, The Hon. (Dr.) Rizvie Salih, The Hon. (Mrs.) Hemali Weerasekara, The Hon. Bimal Rathnayake, The Hon. Sajith Premadasa, The Hon. (Dr.) Nalinda Jayatissa, The Hon. Sivagnanam Shritharan, The Hon. Ravi Karunanayake, The Hon. Namal Rajapaksa, Attorney-at-Law, The Hon. (Dr.) M.L.A.M. Hizbullah, The Hon. Dilith Jayaweera, The Hon. Jeevan Thondaman, The Hon. G.G. Ponnambalam, The Hon. K. Kader Masthan and The Hon. (Dr.) Ramanathan Archchuna.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

නැහැ, නැහැ. එහෙම ප්‍රශ්නයක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මම හිතන විධියට ඒ කාලයේ ඔබතුමා පත් වෙලා හිටියේ නැහැ, නොවැම්බර් 25වන දා වන විට. ඔබතුමා සතියක්,- *[බාධා කිරීමක්]* ඔබතුමා ඒ වෙලාවේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඒ වෙලාවේ ඔබතුමා හිටියා නම් මේ රැස්වීමට එනවා නේ. මම කියන්නේ මේ අය පක්ෂ නායකයන් කියලායි.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ඒක හරි. ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒක වෙන ප්‍රශ්නයක්. ඒක දැන් සාකච්ඡා කරන්න අවශ්‍ය නැහැ. මම කියන්නේ පොඩ්ඩක් සාධාරණ වෙමු කියලායි. මම කියන තර්කය තේරුම් ගන්න. මම කියන්නේ මෙයයි. අප්‍රේල් මාසය අවසන් වනකොට මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා කාලයක් තිබෙනවා නේ. අපේ මතය ඔබතුමාට කියන්න ඕනෑ. ඒක අපි රටට කියනවා. රටේ ජනතාව අහගෙන ඉන්නවා නේ. ඒකයි මේ දේවල් කියන්නේ. මම කරන්නේ සාධාරණ ඉල්ලීමක්, වෙන මොකක්වත් නොවෙයි. ඔබතුමන්ලා දිනලා එන්න. පළාත් සභා ටික, මහ නගර සභා ඇතුළු පළාත් පාලන ආයතන ටික දිනලා ගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත්, මැතිවරණ ප්‍රචාරණ කටයුතු සාධාරණව වෙන්න ඕනෑ. ඔබතුමන්ලා බලවත් ආණ්ඩුවක්. 159දෙනෙක් ඉන්නවා. ප්‍රශ්නයක් නැහැ. අපට සතුටුයි. වැඩකටයුතු කරගෙන යන්න. හැබැයි, මැතිවරණ ප්‍රචාරණ කටයුතු හරියාකාරව කරන්න ඕනෑ. ඒ කටයුතු කරන්න අපට අවස්ථාව තිබෙන්න ඕනෑ. දැන් වෙලාව නැහැ නේ අපට.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔක්කෝම සති 6ක් තිබෙනවා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Hon. Deputy Chairperson of Committees, this Debate is an Opposition Debate.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
The Debate of the Government.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
No, no, Budget එක Government එකේ, නමුත් Debate එක අපේ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය ඒක නේ. පාර්ලිමේන්තු සම්ප්‍රදාය කියන්නේ, ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙනවා, Budget එකක්. අපි තමයි debate කරන්නේ. අපි ආවේ නැත්නම් ඔයගොල්ලන්ට සම්මත කරගන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ නේ. එහෙම තමයි සම්ප්‍රදාය තිබෙන්නේ. ඒක දන්නේ නැත්නම් මට කරන්න දෙයක් නැහැ. ඒක තමයි සම්ප්‍රදාය. අපි මෙතැනත් ඉන්න ඕනෑ. පොළොවෙත් ඉන්න ඕනෑ. දිස්ත්‍රික්කවලටත් යන්න ඕනෑ. ඉතින්, කොහොමද මේක කරන්නේ? මම රාමසාන් ගැන කථා කළේ නැහැ, විභාග ගැන කථා කළේ නැහැ, අලුත් අවුරුද්ද ගැන කථා කළේ නැහැ. මම කියන්නේ මේකයි. මේක සලකා බලන්න. මම සාධාරණ ඉල්ලීමක් කරන්නේ. මම මෙච්චර සාධාරණව කියනකොට ඒක තේරුම් ගන්න බැරි නම් මට කරන්න දෙයක් නැහැ. මම කියන්න ඕනෑ කරුණු ටික කියලා ඉවරයි. බොහොම ස්තුතියි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය සම්බන්ධයෙන් මම විමසා බැලුවා. එතුමා කියපු විධියට මේ සිද්ධිය වෙලා තිබෙනවා, දෙවැනි මාසයේ 5වැනි දා. පොලීසියට පැමිණිලි කර තිබෙනවා, 13වැනි දා. පොලීසියට පැමිණිලි කිරීමෙන් පස්සේ එකම පවුලේ තිදෙනෙකු ඒ සිද්ධිය සම්බන්ධයෙන් පොලීසිය විසින් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ අයව අත්අඩංගුවට අරගෙන B/21924/25 යටතේ අධිකරණයට ඉදිරිපත් කර කරුණු වාර්තා කර තිබෙනවා. අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පස්සේ අධිකරණයේදී පාර්ශ්ව දෙක සමථයකට පත් වෙලා තිබෙනවා. පැමිණිලි පාර්ශ්වයේ නීතිඥයා අඩුම වශයෙන් මේ අය රිමාන්ඩ් කරන්න කියලාවත් ඉල්ලීමක් කරලා නැහැ. නීතිඥයෝ මාර්ගයෙන් මේක සමථයකට පත් කර තිබෙනවා. මේක තමයි තත්ත්වය, ගරු මන්ත්‍රීතුමා.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
බොහොම හොඳයි, ගරු ඇමතිතුමා. ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ, අමානුෂික සිදුවීමක් වෙලා තිබෙනවා කියලායි. ඒක පොඩ්ඩක් අවබෝධ කර ගන්න. සමහර වෙලාවට පැමිණිලිකරුත් භය වෙලා ඇති. ඒගොල්ලන් කියලා ඇති, රිමාන්ඩ් කරන්න එපා කියලා. සමථ වෙන්න ඇති. ඒක මම දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔය මාතෘකාව සම්බන්ධයෙන් විවාදයකට යන්න අවශ්‍ය නැහැ. දැන් උත්තරය ලැබුණා නේ. මොකද, කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
නැහැ, පොඩ්ඩක් ඉන්න. මේ වාගේ දේවල් සිදු වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන අවධානය යොමු කරන්න. ඔබතුමා විෂය භාර ඇමතිවරයා නේ. ඒ නිසා ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් බලන්න. එච්චරයි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මේ සිද්ධිය සම්බන්ධයෙන් පොලීසිය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඊට සම්බන්ධ තිදෙනාම අත්අඩංගුවට අරගෙන තිබෙනවා. පහර දීමක් සිද්ධවෙලා තිබෙනවා. ඒක මම හරියටම දන්නේ නැහැ, පොලීසිය මට කියපු විධියට. ඒක අමානුෂික පහරදීමක් කියලා කියමුකෝ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
I will send you the video. You will see, අමානුෂික පහර දීමක් තමයි සිදුවෙලා තිබෙන්නේ.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
අධිකරණය තමයි ඒක තීන්දු කරන්න ඕනෑ. අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා නේ. අධිකරණට ඉදිරිපත් කළාට පස්සේ තුන්දෙනාටම ඇප දීලා තිබෙනවා. පැමිණිලි පාර්ශ්වයේ නීතිඥයා මේ සම්බන්ධයෙන් විරෝධතාවක්වත් අඩු ගණනේ දක්වලා නැහැ. දෙපාර්ශ්වයේම නීතිඥයින් උසාවියේදී සමථයකට පත්වෙලා තිබෙනවා. පහර දීම් සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කරන්න ඕනෑ නම් පැමිණිලි පාර්ශ්වය තමයි ඒ සඳහා ඉදිරිපත් වෙන්න ඕනෑ. ඒක තමයි තත්ත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන විවාදයට සම්බන්ධ වෙමින්, මෙම කෙටුම්පත

සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දුන් මතයේදී ගරු විනිසුරුවරයෙකු සඳහන් කළ ඉතා වැදගත් ප්‍රකාශයකින් මගේ කථාව පටන් ගන්න කැමැතියි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අපේ රට "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය" - Democratic Socialist Republic of Sri Lanka - යනුවෙන් හඳුන්වනවා. විනිසුරුතුමා තවදුරටත් කියනවා, "Republic" කියන වචනය හැදෙන්නේ ග්‍රීක "*res publica"* කියන වචනයෙන් කියලා. එහි අර්ථය, "මිනිසුන්ට අයිති දෙය" යන්නයි. "Democratic" කියන වචනය උත්පාදනය වන්නේ ග්‍රීක "*demokratia*" කියන වචනයෙන්. එහි තේරුම, "මිනිසුන් විසින් ගෙන යන පාලනය" කියන එකයි. මිනිසුන්ට අයිති දෙය සහ මිනිසුන් විසින් ගෙන යන පාලනය කියන එක අපට හරිම වැදගත් සංකල්ප දෙකක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මොකද, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 (ඉ) ව්‍යවස්ථා කියන්නේ, අපි ජනතා පරමාධිපත්‍යය ගැන කථා කරන ව්‍යවස්ථායි. විශේෂයෙන්ම, 4 (ඉ) ව්‍යවස්ථාව අනුව පරමාධිපත්‍යය ක්‍රියාත්මක කරන්නේ, ජනතාව විසින් තෝරා පත් කර ගන්නා ලද ව්‍යවස්ථාදායකය විසින්. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27වන ව්‍යවස්ථාව වන, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ එහි (4) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

> "පරිපාලනය විමධ්‍යගත කිරීමෙන් සහ මහජන කටයුතුවලට සහ පාලන කටයුතුවලට සෑම අවස්ථාවක ම ජනතාව සහභාගි කරවා ගැනීමෙන් ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදී පදනම සහ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ද රජය විසින් තහවුරු කොට පුළුල් කළ යුත්තේ ය."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ පදනමේ ඉඳගෙන මම අවධාරණය කරන්න කැමැතියි, පළාත් පාලන ආයතනවල තිබෙන අතිවිශේෂ වැදගත්කම් මොනවාද කියලා.

"2012 හාජියාර් මොහොමඩ් එරෙහි මැතිවරණ කොමිසම" කියන නඩුවේදී හිටපු අගවිනිසුරුවරයෙකු වූ ගරු ප්‍රියසාත් ඩෙප් මහතා මෙන්න මේ විධියේ ප්‍රකාශයක් කරනවා. මම ඒක දළ වශයෙන් සිංහලට අනුවාදනය කළා.

"පළාත් පාලන ආයතනවලට දිගු ඉතිහාසයක් ඇති අතර, එය බිම් මට්ටමේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එහි කාර්යය වන්නේ, රීති පැනවීම, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතාවන්, පොදු මාර්ග සම්බන්ධ සියලු කරුණු පරිපාලනය, මහජනතාවගේ මෙන්ම, නගරයේ හෝ ගමේ පහසුව සහ සුබසාධනය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම යනාදිය යි. තොටිල්ලේ සිට සුසාන භූමිය දක්වා සියලු ක්‍රියාවන් එමඟින් ආවරණය කරයි. සමහර පළාත් පාලන ආයතන මානෘ සායනවල සිට සුසාන භූමි දක්වා පරිපාලනය කරයි. මැතිවරණ ප්‍රමාද කිරීම හේතුවෙන් මිනිසුන්ට තමාගේ ගැටලු සහ සුබසාධන අවශ්‍යතා කථා කළ හැකි නියෝජිතයන් පත් කර ගැනීමට ඇති අයිතිය අහිමි වී යයි."

එතුමාගේ නඩු තීන්දුවේ පිටු අංක 15 ගැන තමයි මම ඒ කිව්වේ. මට කලින් කථා කරපු ගරු බිමල් රත්නායක ඇමතිතුමා කිව්වා, කාන්තාවන් සහ තරුණ දේශපාලකයින් වෙනුවෙන් සහ ජනතාවගේ එදිනෙදා ජීවිතයේ තිබෙන වැදගත්කම්වලට එහා ගිය සංකල්පමය වැදගත්කමක් වෙනුවෙන් පළාත් පාලන ආයතන අතිවිශේෂ දායකත්වයක් දක්වනවා කියලා. විශේෂයෙන්ම කාන්තා දේශපාලනය ගත්තාම අපි දන්නවා, මෙය කාන්තා දේශපාලනය ප්‍රවර්ධනය කරන්න දායක වෙන ඉතාම වැදගත් සහ සාධනීය පියවරක් බව. ඒ වාගේම ප්‍රථම වතාවට තමයි දේශපාලන පසුබිමක් නියෝජනය නොකරන පවුල්වලින් කාන්තාවන් 20දෙනෙක් එකම පක්ෂයකින් මෙවර පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. කාන්තා දේශපාලනය වෙනුවෙන් අපි දක්වන උනන්දුව, අවධානය සහ ඒ සඳහා පක්ෂයක් ලෙස කරන කැපවීම කොතෙක්ද කියලා ඒකෙන් පෙනෙනවා. මේ අවස්ථාවේ මම අමුතුවෙන් අවධාරණය කරන්න අවශ්‍ය නැහැ, මීට කලින් කථා කරපු සියලු මන්ත්‍රීවරුන් පැහැදිලි කරපු ආකාරයට පළාත් පාලන ආයතනවලින්, තොටිල්ලේ සිට සුසාන භූමිය දක්වා අතිවිශේෂ කාර්යභාරයක් අපේ ජීවිතවලට ඉටු කරනවා.

අපි දන්නවා, පොදුවේ ගත්තාම පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ කල් දැමීම සම්බන්ධයෙන් අධිකරණ තීන්දු රාශියක් ලබා දී තිබෙන බව. ඒ වාගේම එය කොයි තරම් දුරට මූලික අයිතිවාසිකම් කඩ කිරීමක්ද කියලා ඒ තීන්දුවලින් ප්‍රකාශ කරලා තිබෙනවා.

සමගි ජන බලවේගයේ මහ ලේකම්තුමාත් පෙත්සම්කරුවෙක් ලෙස හිටපු, 2023දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දුව ප්‍රකාශයට පත් කරපු මූලික අයිතිවාසිකම් පෙත්සමේ සහ ඊට කලින් බොහෝ නඩුවල තීන්දුවලත් තිබෙනවා, පළාත් පාලන මැතිවරණයක් සහ පොදුවේ මැතිවරණයක් කල් දැමීම කියන්නේ, එක පැත්තකින් මිනිසුන්ගේ සමානාත්මතාව, ඒ කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්, අනෙක් පැත්තෙන් 14(1)(අ) අනුව්‍යවස්ථාව වන භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිවාසිකම - the freedom of speech and expression - උල්ලංඝනය කිරීමක් කියලා.

මීට කලින් කථා කළ ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, අපි ඉතිහාසය තුළ මැතිවරණ කල් දමන්න දායක වෙලා තිබෙනවාය කියලා. මම එතුමාට ඉතා ගෞරවයෙන් මේ කාරණය මතක් කර දෙන්න කැමැතියි. 2023 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව දුන්නු වෙලාවේ පැවති රජය -රනිල් වික්‍රමසිංහ රජය- විසින් මැතිවරණය කල් දමන්න ගත්ත තීන්දුවෙන් අනතුරුව එය මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් - විශේෂයෙන්ම භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිවාසිකම - උල්ලංඝනය කිරීමක්ය කියන තීන්දුව ආවාට පස්සේ එතුමාගේ හිතවත්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ප්‍රේමනාත් සී. දොලවත්ත මහත්මයා ලවා පාර්ලිමේන්තුවට Motion එකක් ඉදිරිපත් කළා, මේ ගරු විනිසුරුතුමන්, ඒ කියන්නේ ලංකාවේ ගරු අධිකරණය පාර්ලිමේන්තුවට අපහාස වන අන්දමේ තීන්දුවක් දීලා තිබෙනවාය, ඔවුන් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට ගෙන්වලා ප්‍රශ්න කරන්න ඕනෑය කියලා. අන්න ඒ වාගේ ඉතිහාසයක් තිබෙන, ඒ වාගේ යෝජනා ගෙනාපු, මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහෝසි කරන්න යෝජනා ගෙනාපු, එහෙම වැඩ කරපු ආණ්ඩුවක ඉඳපු එතුමා තමයි අද අපට බෝලය පාස් කරන්න හදන්නේ.

ඒ වාගේම මීට කලින් කථා කළ ගරු රංජිත් මද්දුම බණ්ඩාර, සජබ මහ ලේකම්තුමා මෙන්න මෙහෙම කාරණා ටිකක් කිව්වා. මම හිතන විධියට ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාත් මේ ගැන කථා කළා. ඉදිරියේදී අපොස (සාමාන්‍ය පෙළ) විභාගය තිබෙනවා, ඒ වාගේම සිංහල දෙමළ අලුත් අවුරුද්ද එනවා ආදී වශයෙන් විවිධ ප්‍රශ්න ගැන කිව්වා. අය වැය විවාදය පැවැත්වෙනවාය කියලා ඉස්සර වෙලා කථා කළ මන්ත්‍රීතුමා කිව්වා. ඔව්, අය වැය විවාදයට අපේ මන්ත්‍රීවරුන්ටත් සහභාගි වෙන්න වෙනවා. ලංකාවම නියෝජනය කරන මන්ත්‍රීවරු ඉන්නවා. ඔව්, ඒක කරදරයක් තමයි. අමාරුයි තමයි එහෙම කාලයක මැතිවරණ කරන්න. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේ කාරණය මතක තියා ගන්න ඕනෑ. 2023 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ 43වන පිටුවේ පැහැදිලිව මෙසේ කියා තිබෙනවා:

> "There should be a proximate and rational nexus between the restriction and the objective...".

ඒ කියන්නේ, යමෙකු මැතිවරණයක් කල් දැමීමට තීන්දුවක් ගන්නවා නම්, ඒ තීන්දුව ගැනීම සහ එහි තර්කය පිටුපස සමීප සහ තාර්කික සම්බන්ධයක් තිබෙන්න ඕනෑ කියා, that it should be

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

proportionate. ඒ කියන්නේ, ඒක සමානුපාතික වෙන්න ඕනෑ; මිනිසුන්ගේ අයිතිවාසිකම් අහිමි කිරීම සහ කල් දැමීමේ අරමුණ සමානුපාතික වෙන්න ඕනෑ. ඒ වාගේම, it cannot be unreasonable. ඒ කියන්නේ, අසාධාරණ විය යුතු නැහැ. ඒ වාගේම ඉතා වැදගත් දෙයක් කියනවා, මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන්. ඒ, ලංකාවට අතිවිශේෂයෙන් බලපාපු ඉතාම බරපතළම තත්ත්වයක්. ඒ කියන්නේ ආර්ථික අර්බුදය. අපි දන්නවා, ඒක ඉතා බරපතළයි කියන එක. ඒ තරම් බරපතළ ආර්ථික අර්බුදයක් තිබිලාත් අධිකරණය තීරණය කරනවා, "the postponement resulted in a grossly unjustified delay in the exercise of the right to vote" කියලා. ඒ අනුව බරපතළ ලෙස, යුක්තිසහගත නොවන අන්දමට මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කරලා තිබෙනවා. ඒ නිසා මම මේ වෙලාවේ අවධාරණය කරන්න කැමැතියි, අපට කිසිම ආකාරයකින් මේ මැතිවරණය කල් දැමීම කියන එක, මූලික මිනිස් අයිතිවාසිකමක් අහෝසි කිරීම කියන එක සාධාරණීකරණය කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපොස (සාමාන්‍ය පෙළ) විභාගය පැවැත්වෙනවා, අය වැය විවාදවලට සම්බන්ධ වෙන්න තිබෙනවා, එහෙම නැත්නම් සිංහල දෙමළ අලුත් අවුරුද්ද එනවාය කියන හේතු මත. මොකද අපි දන්නවා, ආර්ථික අර්බුදය වැනි ඉතා බරපතළ, මානුෂීය සහ භෞතික කාරණයක් පවා මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වීමට සාධාරණ හේතුවක් ලෙස ගරු ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගත්තේ නැහැ කියන එක. මේ සභාවේ දිගටම කිව්වා, "මැතිවරණය කල් දමනවාට අපි කැමැති නැහැ, හැබැයි මෙන්න මේ මේ කාරණා සලකා බලන්න, දින 90ක් කල් ගන්න, මැතිවරණය කල් දමන්න අපට ඕනෑ නැහැ" කියලා. ඒ නිසා මටත් හරියටම පැහැදිලි කර ගන්න ටිකක් අමාරු වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කියන්නේ මැතිවරණය කල් දමන්න එපා කියලාද, එහෙම නැත්නම් මැතිවරණය කල් දමන්න කියලාද කියලා. මමත් ටිකක් වෙලා කල්පනා කළා, මේ කියන්නේ මොකක්ද කියලා.

අපි දන්නවා, සම බිමක සටන් කරන්න ඕනෑ කියන එක. ඔව්, අපි හැමෝම ඒකට එකඟයි. විපක්ෂයේ මන්ත්‍රීතුමා කියපු වචනය, "සම බිම" කියන වචනය. අපි ඒකට එකඟයි. අපි හැමදාමත් සටන් කළේ සම බිමක අයිතිවාසිකම් වෙනුවෙන්. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා ඇහුවා, අපට මැතිවරණය කරන්න පැලවත්තට ඇවිල්ලා සල්ලි ඉල්ලන්න වෙයිද කියලා. මෙහෙමයි. "සම බිම" කිව්වාම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "මුදල්" කියන එකත් අයිතියි. මුදල් නැතිකම කියන්නේත් සම බිම අහිමි වෙන්න හේතුවක්.

විශේෂයෙන්ම ලංකාවේ කාන්තා දේශපාලනය ගැන උනන්දු කෙනෙක් හැටියට මම කියන්න ඕනෑ, අපි හැමදාමත් - අවුරුදු ගණනාවක්; මම හිතන විධියට දශකයකට, දෙකකට වැඩි කාලයක් - පර්යේෂණ කළ බව. ඒ අනුව දේශපාලන ව්‍යාපාර, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධාන සහ රජය විසිනුත් පිළිගන්නවා, campaign financing කියන්නේ බරපතළ ප්‍රශ්නයක් කියන එක.

මොකද, එක පැත්තකින් මුදල් නැතිකම කාන්තාවන්ට දේශපාලනයට එන්න බැරි වෙන්න බලපාන ලොකු ප්‍රශ්නයක්. ඒ වාගේම තරුණ අයට ලොකු ප්‍රශ්නයක්. සමහර වෙලාවට මැතිවරණ කරන්න දූෂිත ව්‍යාපාරිකයින් මත යැපෙන්න සිදුවීම ලොකු ප්‍රශ්නයක්. ඔව්, අපි පිළිගන්නවා. එතැනින් සම බිම අහිමි වෙනවා තමයි. හැබැයි, ඒකට හොඳම විසඳුම විධියට තමයි අපි සාමූහික ව්‍යාපාරයක් ලෙස මේ මුදල් කියන කාරණය ගැන කථා කරන්නේ. මෙය දිගින් දිගටම කථා වුණු නිසා තමයි මට මේ ගැන කියන්න හිතුණේ. පක්ෂයක් ලෙස, කාන්තාවෝ ලෙස අපි කාටවත් අපේ තාත්තලාගෙන් අරගෙන ආපු දේශපාලන බලය හෝ එකතු කර ගත්ත මුදල් තිබුණේ නැහැ. නමුත් අපි හැමෝම වැඩ කළේ එක පිළිවෙළකට. අපිට වියදම් කරන්න සල්ලි ගෙනෙන්න, මිනිස්සුන්ගෙන් සල්ලි හොයන්න කියලා අපිට කවදාවත් බල කෙරිලා කරලා නැහැ. ඒකේ ප්‍රතිඵලයක් ලෙස තමයි අද අපේ පක්ෂයෙන් මේ ගරු සභාවට මන්ත්‍රීතුමියලා 20දෙනෙක් පත්වෙලා ඉන්නේ. මම හිතනවා, මේ සම බිම හදන්න අපි තරම්; ජාතික ජන බලවේගය තරම් මහන්සි වෙච්ච පක්ෂයක් ලංකාවේ නැහැ කියලා. අපි පිළිගන්නවා තවමත් අපි සියයට සියයක් අපේක්ෂා කරන සම බිම හැදිලා නැතිව ඇති කියලා. කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්ව විධියට මේකේ ප්‍රශ්න තිබෙනවා. මොකද, පළාත් පාලන ආයතනවල කාන්තාවන්ගේ list එක වෙනස් නිසා නියෝජනයේ වෙනසක් වෙන්න පුළුවන්. ඒක හරි. නමුත්, අපි විශ්වාස කරනවා සම බිම හදන්න නම් කාන්තාවන්ට දේශපාලනයට ඇතුළත් වෙන්න විශේෂ අවස්ථා ලබා දෙන්න ඕනෑ බව. ඔව්. ඒ සටනේ ප්‍රතිඵලයක් තමයි, පළාත් පාලන ආයතන ආයතන සඳහා 2016දී ආපු සංශෝධන පනත. හැබැයි, මේකේ අපේ දීර්ඝ කාලීන අරමුණ තමයි විශේෂ ප්‍රතිපාදනයක් නැතිව පවා දේශපාලනයට සම බිමක fight කරන්න පුළුවන් තත්ත්වයක් හදන එක. එහෙම නම්, කවදා හරි ඒ යන අරමුණ වෙනුවෙන් මේ වාගේ විශේෂ quota එකක් විතරක් තිබිලා මදි. ඒ quota එක කියන්නේ ප්‍රවේශයක් විතරයි. හරියට සම බිමක fight කරන දේශපාලන භූමියක, ක්‍රීඩා පිටියක විශේෂ quota එකක් අවශ්‍ය වෙන්නේ නැහැ. හරියට සම බිමක් තිබෙනවා නම් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ වචනය ගෙන ඒම ගැන ස්තුතිවන්ත වන අතරේම මම කියන්න කැමැතියි, අපි අර සම බිම නිර්මාණය කරන්න පක්ෂයක් හැටියට-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මම දන්නවා ඒ පක්ෂයේ සමහරවිට මුදල් වියදම් කරන්නේ එක්කෙනෙක්. ඒ, පෞද්ගලිකව accountsවලින් එන සල්ලි. අපිට එහෙම නැහැ. අපිට පොදු ගිණුමක්, පොදු වැඩක් තිබෙන්නේ. අපි ඒ ගැන නියමිත විධියට ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ මුදල් වියදම් කරන කෙනා මේ සැරේ මුදල් වියදම් කරන්න කැමැති නැද්ද කියලා අපි දන්නේ නැහැ. එතුමන්ලාට ඒ ප්‍රශ්නය ඇති. නමුත් අපිට ඒ ප්‍රශ්නය නැහැ.

අවසාන වශයෙන් මම කැමැතියි, ඇත්තෙන්ම එතුමාම පෙත්සම්කරුවකු වෙච්ච 2023 මූලික අයිතිවාසිකම් පෙත්සමේ එතුමාගේ නීතීඥවරයා විසින් -මම මේ කථා කරන්නේ සජබයේ මහලේකම්තුමා ගැනයි- එතුමාගේ උපදෙස් මත draft කරපු වචන කිහිපයකින් මගේ කථාව අවසන් කරන්න. ඒ වෙලාවේ විවිධ සිවිල් සංවිධාන මේ petition එක දැම්මා, ඡන්දය කල් දැමීමට විරුද්ධව. එතුමාගේ පෙත්සමේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "....that actions... of the Secretary to the Treasury and the Ministry of Finance ... are arbitrary, wrongful, illegal, malicious, capricious, pernicious and unlawful."

ඒක සිංහලෙන් කිව්වොත්, අත්තනෝමතිකයි, වැරදියි, නීති විරෝධියි, ද්වේශ සහගතයි, වපලයි, විනාශකාරියි. ගරු නියෝජ්‍ය

කාරක සභාපතිතුමියනි, මම නැවත වතාවක් කියනවා, අපි මේ මැතිවරණය ඉතා ඉක්මනින් පවත්වන්න ඕනෑ බව. පළාත් පාලන ආයතන කියන්නේ එදිනෙදා මිනිස්සුන්ගේ ජීවිතයට බලපාන අතිශය වැදගත් ආයතන. අපි බලයට ආවාම උසාවි ගමට ගෙනයයි, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන cancel කරලා දමයි වාගේ බොරු බිය ඇති කර ගත්තා. නැහැ. අපි හැම දාම බලාපොරොත්තු වුණේත්, අපි කරගෙන ගියේත් කිසියම් ආකාරයකින් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීම මිසක්, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන දුර්වල කිරීම නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට ලැබී තිබෙන කාලය අවසන් ගරු මන්ත්‍රීතුමියනි.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි මහජන මුදල්, රාජ්‍ය මුදල් අවභාවිතයකින් තොරව ඡන්දයක් කිරීම ගැන පූර්වාදර්ශයක් සපයපු රජයක්.

ඒ නිසා මම නැවතත් කියන්නේ, මේ මැතිවරණය ඉතා ඉක්මනින් පවත්වන්න අවශ්‍යයි. ඒ වාගේම, ජනතා ප්‍රජාතන්ත්‍රවාදය සහ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් නැවත වතාවක් අපි සහතිකයක් දෙනවා; ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම කාරණා කිහිපයක් මතු කරන්න මම කැමැතියි. ආණ්ඩුව පැත්තෙන් දිගින් දිගටම කියාගෙන යනවා, මේ මැතිවරණය කල් දමන්න අපේ උත්සාහයක් තිබෙනවා කියලා. අපේ මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමාත් ඒ විධියට කියා තිබෙනවා. මට තේරෙන්නේ නැහැ, එතුමා ඒ වාගේ කථාවක් කිව්වේ ඇයි කියලා. මැතිවරණය කල් දමන්න අපේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. තිබුණු මැතිවරණය තියා ගන්න පුළුවන් තරම් උසාවි ගිහිල්ලා, ඒ වෙනුවෙන් මේ පාර්ලිමේන්තුව ඇතුළේ බෝඩ් උස්සාගෙන කෑ ගහපු අය අපි. ඒ නිසා මැතිවරණය කල් දමන්න කිසිම වුවමනාවක් අපට නැහැ. මැතිවරණ කල් දමන්න වුවමනාව තිබුණු එක ඔප්පු කරන්න පුළුවන් වෙන්නේ, මෙතුමන්ලාම ගෙනාපු මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතේ 3වැනි වගන්තියට ඇතුළත් කර තිබෙන එක කියෙව්වාම. එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "එසේ වුව ද, ආඥාපනතේ 26 වන වගන්තිය ප්‍රකාරව, නාමයෝජනා දැන්වීම් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නිශ්චය කරනු ලැබිය හැකි දිනයක දී පළ කළ යුතු අතර, එම දිනය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස තුනකට පසු දිනයක් නොවිය යුතු ය."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුනෙන් දෙකක බලයක් වර්තමාන රජයට ලබා දීලා තිබෙන්නේ, මේ මැතිවරණය ඉක්මනින් පවත්වන්න වාගේම, හරි දේ මේ රට වෙනුවෙන් කරන්න. මම විශ්වාස කරන කාරණය තමයි මේ මැතිවරණ ක්‍රමයේ විශාල අඩුපාඩු ගණනාවක් තිබෙනවා කියන එක. අඩුපාඩු ගණනාවක් එක්ක මේ මැතිවරණය මේ ආකාරයෙන්ම කරගෙන යෑම කොච්චර දුරට සාධාරණද, නැද්ද කියන කාරණය තිබෙනවා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන යම් මන්ත්‍රීවරයෙකු කියනවා නම් මේ මැතිවරණ ක්‍රමයේ කිසිම ගැටලුවක් නැහැ, ප්‍රශ්න නැහැ, මේක හොඳයි, මේ ක්‍රමය තමයි මේ රටට සුදුසු කියලා, අන්න ඒකත් එක්ක තර්ක කරන්න අපි සූදානම්.

විශේෂයෙන් පසුගිය ක්‍රමය තුළ මතයක් ගොඩ නැඟුවා කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙකු ඕනෑ කියලා. ඒ තුළ තමයි මේ මැතිවරණය ආවේ. එය, පළාත් පාලන විෂය සම්බන්ධව දැනුමක් නොමැති කණ්ඩායමක් ගෙනාපු අදහසක්. මේ සභාව මන්ත්‍රීවරු 225දෙනෙක් නියෝජනය කරනවා. පළාත් පාලනයේ සිට මේ ගරු සභාව නියෝජනය කරන්න පැමිණි කීදෙනෙකු මේ 225 දෙනා අතර ඉන්නවාද කියලා ඇහුවොත්, මම හිතන හැටියට තුනෙන් එකකටත් වඩා අඩු ප්‍රමාණයක් තමයි පළාත් පාලනය නියෝජනය කරලා පාර්ලිමේන්තුවට සම්බන්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම පළාත් පාලනයේ හිටපු කෙනෙකු විධියට මම කියනවා, මේ මැතිවරණ ක්‍රමය තුළ දැඩි ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. ඒ සම්බන්ධ කාරණා කිහිපයක් ගරු දයාසිරි ජයසේකර මැතිතුමා සඳහන් කළා. මම කරුණු ඉදිරිපත් කරන්නේ, Budget එක නිසාවත්, O/L නිසාවත්, මේ මැතිවරණයට වියදම වැඩියි කියන කාරණය නිසාවත් ඇතිවන තත්ත්වය ගැන නොවෙයි, මේ මැතිවරණය ප්‍රජාතන්ත්‍රවාදී විධියට මේ රටට කොච්චර සුදුසුද කියන කාරණාව මතයි.

මේ රටේ වර්තමාන ඡන්ද ක්‍රමයේ මම දකින ප්‍රධානම අඩුපාඩුව මෙකයි. මේ මැතිවරණ ක්‍රමයෙන් නායකයන් බිහි වෙන්නේ නැහැ. කවුරු හරි කියනවා නම් මේ ක්‍රමය තුළින් නායකයන් බිහි වෙනවා කියලා, ඒ තර්කය වැරදියි. මොකද, කොට්ඨාසයක

නායකයෙකු බිහි වුණාම ඔහුට එතැනින් එහා දේශපාලන ගමනක් යන්න -පළාත් සභාවට වෙන්න පුළුවන්, පාර්ලිමේන්තුවට වෙන්න පුළුවන්- ක්‍රමයක් මේ තුළින් ගොඩ නැඟෙන්නේ නැහැ. උදාහරණයක් විධියට මම කලින් කිව්වා වාගේ කොටියාසයට වග කියන මන්ත්‍රීවරයෙකු පත් කරගන්නවා කියන කාරණාව ගත්තොත්, ඔවුන් දන්නේ නැහැ පළාත් පාලන විෂයය තුළ තිබෙන කාරණා. විශේෂයෙන් පළාත් පාලන ආයතනයකට වගකීමක් තිබෙනවා, ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ග්‍රාමීය ප්‍රජා කමිටු හදන්න. ඒ ප්‍රජා කමිටුවල සභාපතිවරු ඇතුළු නිලධාරි මණ්ඩලයකින් තමයි සාමාන්‍යයෙන් ගමේ යෝජනා ගන්නේ. මේ තිබෙන මැතිවරණ ක්‍රමය තුළින් ඒ පත් වෙන මන්ත්‍රීවරයා ඒ ප්‍රජා කමිටුවේ කලින් හිටපු සභාපති කෙනෙකු වාගෙයි. ඒ නිසා මගේ තර්කය නම් මේ තුළින් නායකයෙන් බිහි වෙන්නේ නැහැ කියන එකයි. අපි හිටියාටත් වඩා පල්ලෙහා මට්ටමකටයි ඇවිත් තිබෙන්නේ. ඒ කියන්නේ, කලින් යම් මන්ත්‍රීවරයෙකු පත් වුණා නම්, ඒ මන්ත්‍රීවරයාට වඩා පල්ලෙහා තැනක සිටින මන්ත්‍රීවරයෙකු, වගකීම් රහිත මන්ත්‍රීවරයෙකු තමයි මේ හරහා පත් වන්නේ.

අනෙක් කාරණාව තමයි සභාපතිවරයෙකු පත්වෙන්නෙත් කොටියාසයකින්. ඔබතුමන්ලා විශ්ලේෂණයක් කරන්න. පසුගිය මැතිවරණය තුළින් පත් වෙච්ච පළාත් පාලන ආයතනවල නියෝජිතයන් එක්ක කථා කළොත්, ඒ සභාපතිවරයාටත් වෙන කොටියාසයකට ගිහිල්ලා වැඩ කරන්න ගියාම ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. එවැනි ප්‍රායෝගික ගැටලු තිබෙනවා. ඒ නිසා මේ කොටියාස ක්‍රමයක් ගැනීමෙන් ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා.

වරක් අපි දැක්කා, රැල්ලක් ඇති වෙලා පොහොට්ටු පක්ෂයේ මන්ත්‍රීවරු විශාල ප්‍රමාණයක්, සියලු පළාත් පාලන ආයතන ජයග්‍රහණය කළා. අපි හිතමු කෝ, ඒ වාගේ රැල්ලකදී යම් පක්ෂයක් ජයග්‍රහණය කළා කියලා. එතකොට අර list එකේ ඉන්න මන්ත්‍රීවරු නිකමුන් කණ්ඩායමක් බවට පත් වෙනවා.

එතකොට list එකක් දමන්නේ මොනවාටද කියන ප්‍රශ්නය එතැනදී මතු වෙනවා. ඒ වාගේම ඒ රැල්ල මඟින් තවත් පක්ෂයක් සම්පූර්ණයෙන්ම නැති වෙලා යනවා. එතකොට ඒ පක්ෂයට වෙන්නේ මොකක්ද? මැතිවරණය තුළින් යම් පක්ෂයක් අන්න පරාජය වෙනවා කියලා හිතන්න කෝ. ඔවුන් කිසිම පළාත් පාලන ආයතනයක් දිනන්නේ නැහැ. එතකොට ඔවුන්ට සිද්ධ වෙනවා, පක්ෂයකින් කණ්ඩායමක් පත් කරන්න. එතකොට කල්පනා කරලා බලන්න, ඒ විධියට පක්ෂයකින් කණ්ඩායමක් පත් කරද්දී සලකා බලන නිර්ණායක මොනවාද කියලා. එතකොට සාධාරණ විධියට ගත්තොත්, ඕනෑ නම් ප්‍රතිශතය බලයි. හැබැයි, ප්‍රතිශතය කියන දේ ඒ කොටියාසය තුළ ඉන්න ජනතාවගේ ඡන්දය අනුව වෙනස් වෙනවා. සමහර කොටියාස තිබෙනවා කාලයක් තිස්සේ යම් යම් පක්ෂවලට වැඩි නැඹුරුතාවක් තිබෙන. එතකොට දුර්වල අපේක්ෂකයෙකු වුණත්, වැඩි ප්‍රතිශතයක් අරගෙන සභාපතිවරයෙකු වුණොත්, මොන වාගේ ඉරණමකටද පත් වෙන්නේ කියලා කල්පනා කරලා බලන්න. ඒ නිසා මේ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයට යම් පටහැනි ආකාරයේ මැතිවරණ ක්‍රමයක් කියන එකයි මගේ පෞද්ගලික මතය.

අපි මේ අඩු පාඩු කියනවා වාගේම, අපට මේ සම්බන්ධයෙන් කරන්න පුළුවන් යෝජනාව කුමක්ද? අද තිබෙන්නේ තුනෙන් දෙකක බලයක් ලබා දීලා තිබෙන ආණ්ඩුවක්. ඒ නිසා මගේ යෝජනාව තමයි, පැරණි මැතිවරණ ක්‍රමය -මනාප ක්‍රමය- ගෙනැල්ලා ඒකට තරුණ නියෝජනය සහ කාන්තා නියෝජනය ඇතුළත් කරන්න පුළුවන් නම්, මේ තිබෙන ප්‍රශ්න ගොඩක් නිරාකරණය කර ගන්න පුළුවන් කියන එක. හැබැයි, ඒ මැතිවරණ ක්‍රමයෙන් දිනන්න පුළුවන් යම් මුදලක් තිබෙන මිනිස්සුන්ට, සල්ලි තිබෙන මිනිස්සුන්ට කියලා යම් මතයක් තිබෙනවා. ඒකට මැතිවරණ වියදම් නියාමනය පිළිබඳ නීති - රීති ගෙන එන්න පුළුවන්. ඒ නීති ගෙනැල්ලා විශේෂයෙන්ම අපේක්ෂකත්වය නැති කරන්න, මන්ත්‍රී ධුරය නැති කරන්න කටයුතු කළොත් ඒ කාරණාව නිරාකරණය කර ගන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

ගරු චතුර ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ඒ වාගේම, ඒක විශාල කාලයක් ගත වෙන දෙයක් නොවෙයි. මොකද, පරණ පනත බලාත්මක කරන ගමන්, තරුණ නියෝජනය සහ කාන්තා නියෝජනය ඇතුළත් කිරීම පමණයි කරන්න තිබෙන්නේ. ඒකට විශාල කාලයක් ගත වෙනවා කියලා කවුරු හරි කියනවා නම්, ඒක බොරු කාරණාවක්. මොකද, ඔබතුමන්ලා වාගේ වැඩි ජනතා බලයක් දීලා තිබෙන ආණ්ඩුවකට ඒක ඉක්මනින්ම කර ගන්න පුළුවන්. මගේ යෝජනාව අනුව ඒ කටයුත්ත කරනවා නම්, ඔබතුමන්ලාට දීලා තිබෙන ජන වරම අනුව ඒ සංශෝධනය කරන්න ඔබතුමන්ලා එකඟ වෙනවා නම්, ඒක ඔබතුමන්ලා රටට කරන ලොකු දෙයක් කියන එක තමයි මගේ තර්කය.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.48]

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
(මාණ්පුමිකු (කලානිති) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீதிமன்றத் தீர்ப்புக்கு இணங்க, இந்த நாட்டில் மீண்டும் உள்ளூராட்சி மன்றங்களை இயங்கவைக்க வேண்டும் என்பதற்காகக் கொண்டுவரப்பட்டுள்ள உள்ளூர் அதிகார சபைகள் தேர்தல்கள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம் தொடர்பில் ஒருசில விடயங்களைக் கூறுவதற்கு வாய்ப்பு வழங்கியமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

உள்ளூராட்சி மன்றத் தேர்தல் கட்டாயம் நடாத்தப்பட வேண்டும். அதில் எந்தவித மாற்றுக் கருத்தும் இல்லை. நான் முதன்முதலாக 1991ஆம் ஆண்டு நுவரெலியா பிரதேச சபையின் தலைவராக இருந்துதான் இன்று இந்த நிலைக்கு வந்திருக்கிறேன். அந்த அடிப்படையில், எனக்கு இந்தப் பாராளுமன்றத்தில் 20 வருடங்கள் உறுப்பினராக இருப்பதற்கான வாய்ப்புக் கிடைத்திருக்கிறது. உள்ளூராட்சி மன்றங்கள் மூலமாக நிறைய சேவைகளைச் செய்யலாம் என்பது எங்களுக்குத் தெரிந்த ஒரு விஷயம்! முதல்முதலில் 1988ஆம் ஆண்டு உருவாக்கப்பட்ட உள்ளூராட்சி சபைகள், 1991இல் அதிகாரபூர்வமாக ஆரம்பிக்கப்பட்டன. அன்று நான் நுவரெலியா பிரதேச சபையின் தலைவராகக் கடமைபுரிந்த நேரத்தில் பல்வேறு சேவைகளைச் செய்யக்கூடிய சந்தர்ப்பம் கிடைத்தது. ஓர் அரசியல்வாதியின் வாழ்க்கையின்

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

අත්තිවාරමාක ඉරුක්කින්ර ඉන්ත උළ්ළූරාට්චි සපෙකළ්, මක්කළුටන් මික නෙරුංකිය තොටර්පුටෙය සපෙකළාකවුම් ඉරුක්කින්රන. අන්ත අටිප්පටෙයිල් ඉන්තච් සපෙකළ් ඉයංක වේණ්ටුම් එන්පතෙත්තාන් නාංකළ් විරුම්පුකින්රෝම්.

කටන්ත 'නල්ලාට්චි' අරචාංක කාලත්තිල් නුවරෙලියා මාවට්ටත්තිලිරුක්කින්ර පිරතේච සපෙකළින් එණ්ණික්කෙ අතිකරික්කප්පට්ටතු. නුවරෙලියා මාවට්ටත්තිල් පිරතේච සපෙකළින් එල්ලෛක්කුට්පට්ට පකුතිකළිල් ඉරණ්ටු ඉලට්චත්තුක්කුම් මේර්පට්ටවර්කළ් ඉරුන්තාර්කළ් එන්පතු උංකළුක්කුත් තෙරියුම්! අතාවතු, නුවරෙලියා, අම්පකමුව, වලප්පනෙ, කොත්මලෙ ආකිය පිරතේච සපෙකළින් එල්ලෛක්කුට්පට්ට පකුතිකළිල් ඉරණ්ටු ඉලට්චත්තුක්කුම් මේර්පට්ටවර්කළ් ඉරුන්තාර්කළ්. එනවේ, ඉන්තප් පිරතේච සපෙකළෛ ඉන්නුම් පල පිරිවුකළාකප් පිරික්ක වේණ්ටුමෙන නාංකළ් 'නල්ලාට්චි' අරචාංකත්තිටම් කෝරික්කෛ විටුත්තෝම්. අතන් කාරණමාක, ඔව්වොරු පිරතේච සපෙයුම් තලා මූන්රු පිරතේච සපෙකළාකප් පිරික්කප්පට්ටතු. අතන්මූලම් අන්තප් පිරතේච සපෙකළින් අතිකාරම් මක්කළෛප් පෝය්ච් චේර්වතර්කාන නටවටික්කෛකළ් එටුක්කප්පට්টන.

ඉන්ත නල්ල කාරියත්තෛ තමිල් මුර්පෝක්කුක් කූට්ටණි චෙය්තිරුන්තතු. එනිනුම්, කුරිප්පිට්ට කාලප්පකුතියිල් ඉන්තප් පිරතේච සපෙකළ් නටෛමුරෛයිල් ඉල්ලාමර් පෝය්විට්ටන එන්පතු වරුත්තත්තුක්කුරිය විෂයමාකුම්. අතුමාත්තිරමන්රි, අප්පෝතිරුන්ත චනාතිපති අවර්කළ් උළ්ළූරාට්චි මන්රත් තේර්තලෛ නටත්තුවතර්කාන වළිවකෛකළෛච් චෙය්යවිල්ලෛ. අතනෛ එව්වාරු තළ්ළිප්පෝට මුටියුමෝ, අතර්කාන නටවටික්කෛකළෛ එටුත්තිරුන්තාර්. කෛරව තයාසිරි ජයචේකර අවර්කළ් ඉංකු පේචුම්පෝතු, අතු තොටර්පාන පල විටයංකළෛ කුරිප්පිට්ටිරුන්තාර්. අවෛයෙල්ලාම් කට්ටායම් චෙය්යප්පටවේණ්ටිය විෂයංකළ්! එනිනුම්, අවෛ තොටර්පිල් argue පණ්ණුවතර්කු - debate පණ්ණුවතර්කු - නේරම් පෝතාමල් ඉරුක්කින්රතු. එංකළෛප් පොරුත්තළවිල්, ඉන්තත් තේර්තල් කට්ටායම් නටත්තප්පට වේණ්ටුම්. අතිල් මාර්රුක් කරුත්තු කිටෛයාතු.

ඉන්තත් තේර්තලෛ නටත්තුවතාල් ඒර්පටුකින්ර ඉටෛයූරුකළ් එන්න එන්පතෛක් කවනත්තිර්කොළ්ළ වේණ්ටුම්. එනවේ, තමිල් - චිංකළ පුත්තාණ්ටුක්කුප් පිරකු, නීංකළ් ඉන්තත් තේර්තලෛ නටත්තිනාල් චිරප්පාක ඉරුක්කුම්. ඉතු එංකළුටෛය ආලෝචනෛ මට්ටුම්තාන්. ඉතෛ නීංකළ් විරුම්පිනාල් චෙය්යලාම් අල්ලතු චෙය්යාමලුම් විටලාම්. ඒනෙනිල්, ඉප්පොළුතු උංකළුටෛය අරචාංකම්තාන් ඉරුක්කිරතු. එනිනුම්, එංකළුටෛය ආලෝචනෛකළෛයුම් නීංකළ් ඒර්රුක්කොළ්ළ වේණ්ටුමෙන්පතු එනතු තාළ්මෛයාන කරුත්තාකුම්. එතිර්වරුම් මාර්ච් මාතම් 21ආම් තිකති වරෛ පාරාළුමන්රත්තිල් වරවු චෙලවුත්තිට්ට විවාතම් නටක්කවිරුක්කින්රතු. ඉතනාල් එතිර්වරුම් මාර්ච් මාතම් 21ආම් තිකති වරෛ එල්ලා උරුප්පිනර්කළුම් busyආක - මිකුන්ත වේලෛප්පළුවාක - ඉරුප්පාර්කළ්. අතර්කුප් පිරකු චිංකළ - තමිල් පුත්තාණ්ටු වරවිරුක්කිරතු. ඉව්වාරු ඔව්වොන්රාකච් චොල්ලික්කොණ්ටු පෝකලාම්. එනවේ, ඉවර්රුක්කුප් පිරකු ඉන්තත් තේර්තලෛ නටත්තුවතර්කුරිය නටවටික්කෛකළෛ එටුත්තාල්, මිකවුම් චාතකමාක ඉරුක්කුම් එන්පතෛ නාන් අරචාංකත් තරප්පිනරිටම් අන්පාකච් චොල්ලික් කොළ්කින්රේන්.

නාංකළ් වාළුකින්ර පෙරුන්තෝට්টප් පකුතියිල් ඉරුක්කින්ර මක්කළුටෛය පිරච්චිනෛකළෛ අණුකුවතර්කු උළ්ළූරාට්චි සපෙකළ් කට්ටායම් තේවෛ. ඉන්රුම්කූට, නුවරෙලියා මාවට්ටත්තිල් 10,000 පේරුක්කු ඔරු කිරාම චේවකර් පිරිවු ඉරුක්කින්රතු.

නුවරඑළිය වාගේ ප්‍රදේශවල දහදාහක විතර ජනගහනයක් ඉන්න Grama Niladhari Divisions තියෙනවා. වෙන්වර් කියන එත්තේ ජනගහනය 10,750ක් ඉන්නවා. හැබැයි, Grama Niladhari Division එකයි. ඒ ගැනත් කල්පනා කරලා, ඒකත් කොටස්වලට කඩන්න කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

එය මේ මැතිවරණයෙන් පස්සේ කරමු.

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)

(The Hon. (Dr.) V.S. Radhakrishnan)

හොඳයි, ගරු ඇමතිතුමනි. ඔබතුමා කියනවා නම්, ඒක අනිවාර්යයෙන්ම කරනවා.

ඔබතුමා ඉන්න නිසා තව පොඩි කාරණයක් මට කියන්න ඕනෑ. Nuwara Eliya District General Hospital එකේ Gynaecology and Obstetrics Ward එකේ beds 10කට ටොයිලට් එකයි තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් හොයලා බලන්න. ඒක පරණ බිල්ඩින් එකක තිබෙන්නේ. Beds 10කට ටොයිලට් එකයි තිබෙන්නේ. මම ඊයේ පෙරේදා එතැනට ගියා. එතැන ඉන්න මිනිස්සු කියනවා, "සර්, මේක දිහා බලන්න" කියලා. ඒ මිනිස්සු ඇහුවේ මොනවාද කියලා දන්නවාද? ඇයි, ඔබතුමන්ලා මෙච්චර කාලයක් මේ ගැන බැලුවේ නැත්තේ කියලා අහනවා. අපි දන්නවා, අපිත් වරදක් කරලා තිබෙනවා කියලා. නමුත්, ඒ වරද ඔබතුමන්ලා කරන්න එපා. ඔබතුමන්ලා මැදිහත් වෙලා ඒ කටයුතු කරන්න කියලා අපි මේ අවස්ථාවේදී කියන්න කැමතියි.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.53]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ මොහොත, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ විවාද කරන මොහොතයි. මෙම පනත් කෙටුම්පතේ පූර්විකාවේ මෙසේ සඳහන් වනවා:

> "ඡන්ද විමසීම් කැඳවනු ලැබ සහ කල් තබා ඇත්තා වූ ඇතැම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ එම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද පනතකි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයට මෙවන් පනත් කෙටුම්පතක් ගෙන එන්න සිද්ධ වුණේ ඇයි? ඒකට හේතුව ඓතිහාසිකයි. අපේ ගරු මන්ත්‍රීවරු රාශියක් ඒ ගැන කථා කළා.

ඒක තමයි, 2023 මාර්තු මාසයේ පවත්වන්න තිබුණු පළාත් පාලන ඡන්දය එවකට රනිල්-රාජපක්ෂ රජය විසින් අනීතිකව කල් දැමීම. අපේ ජාතික ජන බලවේගය පක්ෂයක් වශයෙනුත්, දේශපාලන ව්‍යාපාරයක් වශයෙනුත් හැම විටම ජනතාවගේ මූලික අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී හිටපු පක්ෂයක්. ඒ ඡන්දය කල් දැම්මාම ඒකට එරෙහිව අපි අධිකරණයේ පෙත්සම් ගොනු කළා පමණක් නොව, ජනතාව වෙනුවෙන් පාර පුරා උද්ඝෝෂණ පවා කරලා තිබෙනවා. ඒ කියන්නේ, මොනම ආණ්ඩුවක් හෝ ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කරන්න උත්සාහ කරනවා නම් එයට එරෙහිව පෙනී හිටපු පක්ෂයක්, අපි. නමුත්, අපි දන්නවා රනිල්-රාජපක්ෂ ආණ්ඩුව ගැන. රනිල් කියන්නේ, පත් කළ ජනාධිපති. එයා ඡන්දයක් දිනුවේ නැහැ; පිනට පත් වුණේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා අයින් කරන්න මිනිස්සු ගෝල් ෆේස් එකේයි, පාරේයි අරගළ කරන කොට ඒ ගෙදර ඇතුළට පිටුපස දොරෙන් පැනපු රනිල් වික්‍රමසිංහ අනීතික ලෙස, සදාචාරාත්මක වරමක් නොමැතිව පළාත් පාලන ඡන්දය පැවැත්වීමේ ක්‍රියාවලිය අකුළන්න, ප්‍රජාතන්ත්‍රවාදී සිතියම අකුළන්න කටයුතු කරමින් සිටියා. එයට එරෙහිව ගොනු කරපු පෙත්සම් සලකා බලා ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන්නේ මොකක්ද? ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියනවා, මෙන්න මෙහෙම. එයින් කොටසක් විතරක් මම කියවන්නම්.

"The impugned acts and omissions of H.E. the President..."

"Ranil Rajapaksa !".

"...who is also the Minister of Finance that were impugned by making these applications against the Honourable Attorney-General had resulted in the infringement of fundamental rights guaranteed under Articles 12(1) and 14(1)(a) of the Constitution due to arbitrary and unlawful conduct ..."

"Arbitrary and unlawful conduct" - නීති විරෝධී කටයුතු. නමුත්, ඔහු ඒ කරපු කාර්යය සම්බන්ධයෙන් නියෝගය එන්නේ 2024දී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසානයේ සිද්ධ වුණේ, රටේ ජනතාවට සමීපතම ව්‍යුහය අද වනකල් නිසියාකාරව ක්‍රියාත්මක නොවන තත්ත්වයක් උද්ගත වෙලා තිබීම මිස වෙන මොකුත් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා මින් පෙරත් යම් යම් අවස්ථාවල පළාත් පාලන ඡන්දය කල් දමන්න කටයුතු කරලා තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයට එක් උදාහරණයක් තමයි, Hajiar Muhammad and Others Vs. Election Commission of Sri Lanka and Others කියන නඩුව. එහිදී ගරු ඩෙප් විනිශ්චයකාරතුමා පළාත් පාලන ආයතනයක තිබෙන වැදගත්කම හරි ලස්සනට කියා පානවා. The Supreme Court Judgment on that case states, I quote:

"Local authorities has a long history and it plays an important role at the grassroot level. Its functions are regulation, control and administration of all matters relating to the public health, public utility services and public thoroughfares and generally with the protection and promotion of comfort, convenience and welfare of the people and the amenities of the town/village. It is stated that its activities covers from the cradle to the grave. Some local authorities have maternity clinics and burial grounds/ cemeteries are controlled and administered by the Local Authorities. By delay in holding elections people are deprived of representatives who could have addressed their grievances and attend to their welfare needs."

මෙන්න මේක තමයි පළාත් පාලන ආයතනයක් කියලා කියන්නේ. ඇත්ත වශයෙන්ම කියනවා නම් ඒක පාර්ලිමේන්තුව වාගේම, විධායකය වාගේම වැදගත් ආයතනයක්. මොකද, ඒක තමයි ජනතාවට සමීපතම ව්‍යුහය.

මහජන දිනවලදී පුද්ගලයන් අප හමුවීමට පැමිණෙනවා. ඔවුන් අපට කියන කරුණු මොනවාද? "පාරේ ලයිට් නැහැ, කානු හිර වෙලා, කුණු ගෙනියන්නේ නැහැ, මාතෘ සායනය හරියට පවත්වාගෙන යන්න බැහැ, burial groundsවල ප්‍රශ්න තිබෙනවා, ක්‍රීඩා පිටිවල ප්‍රශ්න තිබෙනවා. වගකීමක් ගන්න කෙනෙක් ගමේ නැහැ" කියලායි කියන්නේ. ඔව්, අපි දන්නවා ඒවා. දැන් කොමසාරිස්වරු යටතේ යම් ව්‍යුහයක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. නමුත්, ගමට වග කියන මන්ත්‍රීවරයෙක් නැහැ. ජනතාවට තමන්ගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න පුළුවන්, ගමට වග කියන මන්ත්‍රීවරයෙක් නැහැ. ඒකෙන් වෙලා තිබෙන්නේ මොකක්ද? වෙලා තිබෙන්නේ වසර ගණනාවක් තිස්සේ මේ රටේ ජනතාවට සමීපතම ව්‍යුහය, ජනතාවගේ බරපතළම ප්‍රශ්න විසඳන්න තිබෙන ව්‍යුහය ක්‍රියාත්මක නොවීමයි.

රනිල් වික්‍රමසිංහගේ අර ක්‍රියාවලියෙන් පස්සේ Supreme Court එක කලින් නඩුවේ තීන්දුව දුන්නා, හැකි ඉක්මනින් මේ ඡන්දය පවත්වන්න ඕනෑ කියලා. නමුත්, එය පවත්වන්න මුදල් නැහැ කිව්වා; කල් දමන්න ඡන්දයක් නැහැ කිව්වා. අර කලින් කිව්වා වාගේ මැතිවරණ කොමිසමේ උදව්ය ඡන්දය පවත්වන්න ගිහිල්ලා මරණ බයේ හැංගිලා හිටියා. මේ තීන්දුව දීපු නඩුකාරතුමන්ලා ඒ රනිල්-රාජපක්ෂ රජය විසින් වරප්‍රසාද කඩ වුණා කියලා පාර්ලිමේන්තුවට ගෙන්නුවා. ඒ වාගේ හිරිහැර රාශියක් ගැන අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා පැහැදිලිව කිව්වා. මේ සියල්ලෙන්ම පෙන්නුම් කළේ පවත්වන්නට නියමිතව තිබුණු, ජනතාවට සමීපතම මේ ව්‍යුහයේ ඡන්දය කල් දැමීම නිසා රටට, පුද්ගලයන්ට වෙච්ච හානියයි. එහෙම නම්, අපට රජයක් වශයෙන් විශාල වගකීමක් තිබෙනවා. ඒ අනුව අපි හැකි ඉක්මනින්ම ප්‍රායෝගිකව මේ ඡන්දය පවත්වන්න ඕනෑ.

මෙතැනට යෑමේදී හරි වැදගත් කරුණක් තිබෙනවා. අපට සිද්ධ වුණා, ජනාධිපතිවරණය තියන්න. ඉන්පසු පාර්ලිමේන්තු මැතිවරණය තියන්න. මොකද, ඒ නියමිත කාලසීමාව අනුව ඒවා පවත්වන්න අපට සිද්ධ වුණා. අපි මේ පනත් කෙටුම්පත ගේන්නේම මේ නිසායි. මෙම පනත් කෙටුම්පතේ පූර්විකාව මම ඔබට කියවන්නම්.

"ඉහත කී පළාත් පාලන ආයතන සඳහා නාමයෝජනා භාර දීමේ දිනය 2023 ජනවාරි මාසයේ දී අවසන් වූ හෙයින් සහ අලුත් ඡන්ද හිමියකු වශයෙන් 2024 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති තැනැත්තන් සඳහා අලුතින් ඡන්ද විමසීම් පැවැත්වීමට නියම කරන ලද දිනයේ දී ඡන්දය භාවිත කිරීමේ ස්වකීය අයිතිය අභිමිවීම වැළැක්වීම සඳහා සහ මෙහි උපලේඛනයේ දක්වා ඇති ඉහත කී පළාත් පාලන ආයතනවලට තෝරා පත්කර ගැනීම සඳහා නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කිරීමේ ස්වකීය අයිතිය අභිමිවීම වැළැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීමේ අවශ්‍යතාවය පැහැනැගී ඇති හෙයින් ද:"

ඒ කියන්නේ මොකක්ද? Not only the right to vote, but even the right to contest ! මොකද, මේ ලැයිස්තුව දැම්මේ 2023දී. 2024න් පස්සේ තව කී දෙනෙක් මේ ලැයිස්තුවට එකතු වුණාද? එතකොට, ඡන්දය දීමේ අයිතිය පමණක් නොවෙයි, ඡන්දය ලබා ගැනීම වෙනුවෙන් පෙනී සිටීමේ අයිතියකුත් අපි මේ පනත් කෙටුම්පතින් ගේනවා. මෙම පනත් කෙටුම්පතට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු නිමිත්තක් තිබුණා මෙහි ව්‍යවස්ථානුකූලභාවය සම්බන්ධයෙන්. ගරු විනිශ්චයකාර අර්ජුන ඔබේසේකර මැතිතුමා විසින් දීපු තීන්දුවේ පොඩි කොටසක් මා ඔබට කියවන්නම්.

"Thus, it is clear that guarantees given under Article 25 of the ICCPR - International Covenant on Civil and Political Rights - form an essential part of the freedom of expression recognised by Article 14(1)(a) of the Constitution. It would be imperative upon this Court to give heed to Article 27(15) of the Constitution and give full effect to Article 25 of the ICCPR, which includes the right "to be elected" or, put differently, the right to contest."

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

මෙන්න මේ පැහැදිලි කිරීම ඒ විනිශ්චයකාර අර්ජුන ඔබේසේකර මැතිතුමන් කරනවා. එතකොට අපි මේ පනත් කෙටුම්පතින් සිද්ධ කරන්නේ මොකක්ද? අන්න ඒ අයිතිවාසිකම - 2024 ලැයිස්තුවට ආපු අයගේ ඒ අයිතිවාසිකම - අපි ආරක්ෂා කරනවා.

අපි මතක තියා ගන්නට ඕනෑ, 2022 අරගළයෙන් පස්සේ මේ රටේ මිනිස්සු හිතන විධිය වෙනස් වුණෙ බව. ඒක තේරුම් ගන්න විපක්ෂය තවමත් අසමත් වෙලා තිබෙන එක ගැන තමයි මම මවිත වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ ඒ හඬ නියෝජනය වෙන්නට ඕනෑ. අන්න ඒකටයි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ - පෙර නාමයෝජනා ඉවත් කරලා අලුතින් නාමයෝජනා ඉදිරිපත් කිරීම සඳහා අවසර දෙන්නේ. මා දන්නවා, ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. මොකද, පක්ෂ නායක රැස්වීමේදී හැමෝම එකඟ වෙලා තිබෙනවා, මේක අත්‍යවශ්‍ය කාරණාවක් බවට. ඒත් මෙම සංශෝධනය විශේෂ බහුතරයකින් සම්මත කර ගන්න ඕනෑ කියලා Supreme Court එක තීන්දුවක් දීලා තිබෙනවා.

> "Thus, the right to vote and the right to contest are all part of the right to take part in public affairs and elections which forms the bedrock of a democratic process, and is an essential part of the freedom of expression guaranteed under Article 14(1)(a). It would therefore not be possible to restrict the scope of the freedom of expression only to one aspect of voting. The right to vote would be meaningless if voters do not have the right to contest."

මෙන්න මේ පැහැදිලි කිරීම ඒ විනිශ්චයකාර අර්ජුන ඔබේසේකර මැතිතුමන් කරනවා. එතකොට අපි මේ පනත් කෙටුම්පතින් සිද්ධ කරන්නේ මොකක්ද? අන්න ඒ අයිතිවාසිකම - 2024 ලැයිස්තුවට ආපු අයගේ ඒ අයිතිවාසිකම - අපි ආරක්ෂා කරනවා.

අපි මතක තියා ගන්නට ඕනෑ, 2022 අරගළයෙන් පස්සේ මේ රටේ මිනිස්සු හිතන විධිය වෙනස් වුණෙ බව. ඒක තේරුම් ගන්න විපක්ෂය තවමත් අසමත් වෙලා තිබෙන එක ගැන තමයි මම මවිත වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ ඒ හඬ නියෝජනය වෙන්නට ඕනෑ. අන්න ඒකටයි මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ - පෙර නාමයෝජනා ඉවත් කරලා අලුතින් නාමයෝජනා ඉදිරිපත් කිරීම සඳහා අවසර දෙන්නේ. මා දන්නවා, ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. මොකද, පක්ෂ නායක රැස්වීමේදී හැමෝම එකඟ වෙලා තිබෙනවා, මේක අත්‍යවශ්‍ය කාරණාවක් බවට. ඒත් මෙම සංශෝධනය විශේෂ බහුතරයකින් සම්මත කර ගන්න ඕනෑ කියලා Supreme Court එක තීන්දුවක් දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂය කරුණු දක්වද්දී, ආරම්භයේදී කියනවා, "ඔව්, අපට මේක ඕනෑ" කියලා. නමුත් ඊට පස්සේ හීන් කෙදිරියක් ඇහෙනවා. ඒක අර්ථකථනය කරන්න වෙන්නේ, "අපි ඡන්දයට බයයි වාගේ" ගතියක් ලෙස. කමක් නැහැ. ඒක මට හිතිච්ච විධිය; මම වැරදි වෙන්න පුළුවන්.

කෙසේ හෝ වේවා, මේ අතර වාරයේ කරුණු කිහිපයක් ගොඩ නැගුණා. මොකක්ද? එක පැත්තකින් මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් කිව්වා, මේ පනත් කෙටුම්පතේ තිබෙන දුර්වලතා, මේවා සංශෝධනය වෙන්න ඕනෑය කියන කාරණාව. විශේෂයෙන් මන්ත්‍රීවරු 8,000ක් පත්වන එක යනාදී කරුණු. මා පිළිගන්නවා, මා ඒකට එකඟයි. නීති රීති කවදාවත් එක විධියට තියෙන්නේ නැහැ. ඒවා සංශෝධනය වෙනවා. ඒවා සංශෝධනය වෙන්නේ මානව සමාජයේ අවශ්‍යතා අනුව සහ ඒ පවතින තත්ත්වය අනුව. ඒ නිසා අංග සම්පූර්ණ නීතියක් කියලා එකක් කොහේවත් නැහැ. ඒ නිසා මා පිළිගන්නවා, යම් සාධනීය යෝජනා සංශෝධනය කරන්න අවශ්‍යයි කියලා.

නමුත් අපට ඒකේ බර කිරන්න වෙන්නේ කොහොමද? මේ සංශෝධන ගේන්න කියලා අපි නඩුව කල් දාලා, මිනිසුන්ගේ අත්‍යවශ්‍ය අයිතිවාසිකමක් වන පළාත් පාලන ආයතනවලට මන්ත්‍රීවරු පත් කර ගැනීමේ වැඩේ කල් යන්න ඉඩ දෙනවාද? නැත්නම් ඒකට සංශෝධන ගේනවාද?. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින අප වැනි ආණ්ඩුවක් කිසිසේත්ම කිසිදු ඡන්දයක් කල් දාන්න කැමැති අය නොවෙයි. හැම ඡන්දයම හැකි ඉක්මනින් තියන්න ඕනෑය කියන ස්ථාවරය තුළ අපි ඉන්නවා. ඒ නිසා මැතිවරණ කොමිෂන් සභාවෙන් නියම කරන දිනයක මැතිවරණය පවත්වනවා; the elections will be held at the earliest possible date, as decided by the Commission.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී තවත් කරුණක් ඉදිරිපත් වුණා. ඒ මොකක්ද? O/L exam තිබෙන බව කිව්වා. ඇත්ත. ඒ ඔක්කොම තිබෙනවා. හැබැයි, අපි ඡන්ද සංස්කෘතිය වෙනස් කළා නේ. මැතිවරණ කොමිසමත්, ආණ්ඩුවේ අපිත් ඉතාම වගකීමෙන් යුතුව කිසිදු කෙනෙකුට අපහසුතාවක් නොවෙන්න, දරුවන්ගේ examsවලට අපහසුතාවක් නොවෙන්න අපේ ඡන්ද ව්‍යාපාරය කරන්නම්. අපි ඒක කරලා පෙන්නුවා. අපි ජනාධිපතිවරණය දිනුවාට පස්සේ රතිඤ්ඤා පත්තු කරන්න ගියේ නැහැ, ප්‍රතිවාදීන්ට හිරිහැර කරන්න ගියේ නැහැ. ඊට පස්සේ අපි රාජ්‍ය බලය අතේ තියාගෙන මහ මැතිවරණයට පෙනී සිටියා. අපි එතැනදී රාජ්‍ය දේපළ අවභාවිත කළේ නැහැ. අපේ බලය පාවිච්චි කරලා ප්‍රතිවාදීන්ට හිරිහැර කළේ නැහැ. මම දන්නවා, ඒ කාලය තුළ විශේෂයෙන්ම අපේ විපක්ෂයේ කට්ටිය කියපු කථා. අපි බලයට ආවොත් දළදා පෙරහැර නවත්වනවා, මුස්ලිම් මිනිසුන්ගේ රෑවුල කපනවා, ඔක්කොම ව්‍යාපාර රජයට ගන්නවා, හාමුදුරුවන්ට දානය ලැබෙන්නේ නැහැ කිව්වා. ඒ වාගේ පව හළලා, හළලා, ඒ සියල්ලම අද බොරුවක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, ඒ කිසිවක් අපි කළේ නැහැ. ඒ නිසායි සාධාරණ මැතිවරණයක් පවත්වන්න කියලා ගරු මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේ කියනකොට අපි පොඩ්ඩක් මවිතයට පත් වුණේ. මොකද, අපි තරම් සාධාරණව, යුක්තිසහගතව මැතිවරණ කරපු පක්ෂයක් මෑත ඉතිහාසයේ නැහැ, මේ සා බලයක් තියාගෙන.

ඒ වාගේම මේ ගරු සභාවේ කථා කරන්නට යෙදුණා, මර්දනය ගැන. සමහර දේවල් තිබෙනවා. ඒවාට හිනා යන්නේ ඒවායේ අන්තර්ගතයේ තිබෙන හාස්‍යජනක බව නිසා. තව සමහර ඒවාට හිනා යනවා, ඒක කියන කෙනා නිසා. අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ගොඩක් දේවල් එක දිගට කිව්වා. මම ඒ වචන ටිකත් ලියා ගත්තා. අපි නීතිපතිට බලපෑම් කරනවා, මර්දනය ගෙනෙනවා, මාධ්‍යවේදීන්ට තර්ජනය කරනවා, භය කරනවා කිව්වා. මම දන්නේ නැහැ, එතුමා කථා කළේ මේ වසර ගැන ද, එහෙමත් නැත්නම්, 2009 සිට 2015 කියන කාල සීමාව ගැන ද කියලා. මොකද, ඒ කාලයේ එතුමා කියපු සියල්ලම සිද්ධ වෙච්ච නිසා. මම ඒ ලැයිස්තුව කියන්න යන්නේ නැහැ. මම ඒ නම් දෙකක් විතරක් කියලා නවත්වන්නම්. එක, ශිරාණි බණ්ඩාරනායක. මතකද? ශිරාණි බණ්ඩාරනායක පාර්ලිමේන්තුවට ගෙනාවේ තේ කෝප්පයක් දෙන්නද? නැහැ. සරත් ෆොන්සේකාගෙන් අහන්න කෝ, මර්දනය ගැන. එතුමා කියයි. මම අනෙක් නම් නොකියන්න හේතුවක් තිබෙනවා. මොකද, තවම ඒ විමර්ශන ටික පැවැත්වෙනවා. ඒවා ඉවර නැහැ. අපි දන්නවා ඒ විමර්ශන පැවැත්වෙන බව. හැබැයි, මර්දනය කියන්නේ නීත්‍යානුකූලව විමර්ශනයක් කරලා, සාක්ෂි ප්‍රමාණවත් නිසා නීතිපතිවරයා විසින් අධිචෝදනාවක් ඉදිරිපත් කිරීම වෙන්න බැහැ. That is the rule of law and the due process is taking place. දැන් අපි දන්නවා, එක නඩුවක,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ක්‍රිෂ් නඩුව සම්බන්ධයෙන් මා හිතන ආකාරයට, මට වැරදීමක් වෙලා නැත්නම්, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට අධිචෝදනා හෙට භාර දෙන්න ඕනෑ. මම දන්නේ නැහැ, දවස හරිද කියලා. නමුත්, හෙට සිතාසි එන්න ඕනෑ. යෝෂිත රාජපක්ෂට, ඩෙසි ආච්චිට හෙට-අනිද්දා සිතාසි එන්න ඕනෑ. මොකද, ඒ අධිචෝදනා පත්‍ර යවලා තිබෙන්නේ. මම හිතන්නේ, හෙට වෙන්න ඕනෑ ක්‍රිෂ් නඩුවට අදාළව අධිචෝදනා පත්‍ර එන්නේ. මට හරියටම ඒක ෂුවර් නැහැ. හැබැයි, මේ හැසිරුණු විධියෙන්, උණ විකාරයෙන් වාගේ කියවන්නේ මර්දනයක් තිබෙන හින්දා නොවෙයි, හෙට නඩුව හින්දා කියලාමයි මට හිතෙන්නේ. එතුමා මේ ගරු සභාවේ හිටියා නම් ඒක අපට අහගන්න තිබුණා. නමුත්, එතුමා මේ ගරු සභාවේ නැහැ. ඒ නිසා අනෙක් දවසේ ඇවිල්ලා මේකට උත්තර දුන්නා නම් හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමන්ලා ඉදිරිපත් කරන ලද සාධනීය කරුණු සියල්ලටම අපි සවන් දුන්නා. ඒ පිළිබඳ ගැටලුවක් නැහැ. නමුත්, මේ පනත් කෙටුම්පත හරහා අපි ඇත්ත වශයෙන්ම කරන්නේ පළාත් පාලන මැතිවරණය හැකි ඉක්මනින් පවත්වන්න පුළුවන් වාතාවරණයක් හදලා මහජනතාවට නැවත තමන්ගේ නියෝජිතයා ඉක්මනට පත් කර ගැනීමට අවස්ථාව සලසා දීමයි.

අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. සමහර අය කිව්වා, ඡන්දයට ලෑස්ති වෙන්න වෙලාවක් නැති වෙනවා කියන කාරණාව. ඇත්ත වශයෙන්ම ඒ ගැන ජාතික ජන බලවේගයෙන් පොඩ්ඩක් ඉගෙන ගත්තා නම් ලේසියි. අපි මැතිවරණ කාලයට විතරක් ගමට දුවලා ඡන්ද එකතු කරන්නේ නැහැ. අපි හැම දාම ගමත් එක්ක මහජන දින පවත්වාගෙන ඉන්නවා. එතකොට අපිට ගමේ කරන්න තිබෙන වැඩ ප්‍රමාණය අඩුයි. මොකද, අපි ගමත් එක්ක ඉන්නවා. නමුත්, දේශපාලන සංස්කෘතියක් තිබෙනවා, ඡන්ද කාලයට ගමට දුවලා ඡන්ද එකතු කරන. අන්න එතකොට වැඩේ අමාරුයි තමයි. *[බාධා කිරීමක්]* ඒ වැඩේ පහසු කරගෙන ඡන්දය තියන්න.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එස්. කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[ප.ව. 6.09]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (விசேட ஏற்பாடுகள்) சட்டமூலத்தின் இரண்டாம் மதிப்பீட்டின்மீதான விவாத்தில் உரையாற்றுவற்கு வாய்ப்பு வழங்கியமைக்கு நன்றி தெரிவித்துக்கொண்டு என்னுடைய உரையை ஆற்றலாம் என நினைக்கின்றேன். நீண்ட காலமாக நடத்தப்படாமல் இருந்த உள்ளூராட்சி மன்றத் தேர்தலை நடத்த முன்வந்தமைக்கு முதற்கண் அரசாங்கத்திற்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். அதேபோன்று பெண்கள், இளைஞர்களுக்கு அதிக இட ஒதுக்கீடு வழங்கியமைக்கும் எனது பாராட்டைத் தெரிவித்துக்கொள்கின்றேன். இந்த வேளையிலே, உள்ளூராட்சி மன்றங்கள் தொடர்பாக பின்வரும் விடயங்களை இந்த உயரிய சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகிறேன்.

உள்ளூராட்சி மன்றங்களைப் பொறுத்தவரையில் 2018ஆம் ஆண்டுக்கு முன்பு இலங்கை முழுவதும் இருந்த 341 உள்ளூராட்சிச் சபைகளில் 4,493 உறுப்பினர்கள் இருந்தார்கள். இவர்களுக்கு மாதத்திற்கு 75 மில்லியன் ரூபாய் என்ற அடிப்படையில் ஆண்டுக்கு 900 மில்லியன் ரூபாய் கொடுப்பனவாக வழங்கப்பட்டது. 2018ஆம் ஆண்டு நடைபெற்ற உள்ளூராட்சி சபைத் தேர்தலில் உறுப்பினர்களின் எண்ணிக்கை 8,356ஆக உயர்த்தப்பட்டது. அத்தோடு, 385 தொங்கும் உறுப்பினர்களையும் சேர்த்து மொத்தமாக 8,741 உறுப்பினர்கள் 341 உள்ளூராட்சிச் சபைகளுக்குத் தெரிவு செய்யப்பட்டார்கள். இவர்களுக்குக் கொடுப்பனவாக மாதத்திற்கு கிட்டத்தட்ட 142 மில்லியன் ரூபாய் என்ற அடிப்படையில் ஆண்டுக்கு 1,680 மில்லியன் ரூபாய் வழங்கப்பட்டது. இது முன்னைய ஆண்டைவிட மாதத்திற்கு 65 மில்லியன் ரூபாய் அதிகமானது; ஆண்டுக்கு 780 மில்லியன் ரூபாய் அதிகமானது.

இந்தச் செலவினங்களைக் குறைக்கும் பொருட்டு ஆய்வுசெய்து பரிந்துரை வழங்குமாறு திரு. மஹிந்த தேசப்பிரிய, திரு. ரவி ஜெயலத், திரு. ஹமீட், திரு. தவலிங்கம், திருமதி அதிகாரி ஆகியோரை உள்ளடக்கிய குழுவொன்று 2022ஆம் ஆண்டு ஒக்ரோபர் மாதம் நியமிக்கப்பட்டது. இந்தக் குழுவானது பல்வேறு ஆய்வுகளைச் செய்து, உள்ளூராட்சி மன்ற உறுப்பினர் தொகையை 56% ஆக, அதாவது 8,356 இலிருந்து 4,714 ஆகக் குறைக்க முடியுமென்றும், ஆண்டுக்கு ஏறத்தாழ 750 மில்லியன் ரூபாய் அரச செலவினத்தைக் குறைக்க முடியுமென்றும் பரிந்துரை செய்தது.

இப்பொழுதுள்ள முறையின்படி, உள்ளூராட்சி மன்றங்களில் நிலையில்லாத்தன்மை - அடிக்கடி ஏற்படும் தலைமை மாற்றங்கள், நிருவாக மாற்றங்கள் - ஏற்படுகின்ற சூழல் இருக்கின்றது. எனவே, அரச செலவினங்களைக் கட்டுப்படுத்த வேண்டுமென்று இந்த அரசு கூறுகின்ற வேளையிலே, செலவினங்களைக் குறைக்கும் பொருட்டும், அவற்றின் நிலையற்ற தன்மையைத் தவிர்க்கும் பொருட்டும், நாட்டின் நன்மை கருதியும் இவ்வாண்டு நடத்தவுள்ள உள்ளூராட்சி மன்றத் தேர்தலை மேற்படி குழுவின் பரிந்துரையின்படி 4,714 உறுப்பினர்களைத் தெரிவுசெய்யும் வண்ணம் நடத்துமாறு பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்டுக் கொள்கின்றேன்.

இந்த அவையிலே "பெண்களை வலுவூட்டவேண்டும், இளைஞர்களை வலுவூட்டவேண்டும்" என்று கூறப்பட்டது. அவர்களை இந்த உள்ளூராட்சிச் சபைகளுக்கு உறுப்பினர் களாகத் தெரிவுசெய்தால் மட்டும் போதாது; அந்தச் சபைகளுக்குப் போதுமான அதிகாரங்கள் வழங்கப்பட வேண்டும். எங்களுடைய அண்டைய நாடான இந்தியாவிலும் சரி, ஏனைய மேற்குலக நாடுகளிலும் சரி, உள்ளூராட்சி மன்றங்களுக்கு மிகக் கூடுதலான அதிகாரங்கள் வழங்கப்பட்டிருக்கின்றன. கனடாவின் ரொரன்டோ மாநகர சபை முதல்வர் Police Commissionஐ நியமிக்கக்கூடியளவு

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

අධිකාරම් පැවරිලා තිබෙනවා. ඉන්දියාවේ තියෙන ප්‍රාදේශීය ආණ්ඩු ක්‍රම මේ රටේ තියෙන්නේ නැහැ. ඒ වගේ ප්‍රාදේශීය ආණ්ඩු ක්‍රම මේ රටේ තියෙනවා නම්, ඒ ආණ්ඩු ක්‍රම ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවට ඒ ප්‍රදේශවල ඉඩම් ගැන,

ඒ වාගේම මම මේ කාරණය කෙරෙහිත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමන්ලාගේ මේ කඩිමුඩිය තුළ, මේ හදිසිය තුළ පවත්වන මෙම මැතිවරණය, මේ ක්‍රමයට පවත්වන අවසන් මැතිවරණය බවට පත් කර ගනිමු කියලා මම යෝජනා කරනවා. ඊළඟ මැතිවරණයට පෙර අපි නියත වශයෙන්ම මේ පාර්ලිමේන්තුවට නැවත පනත් කෙටුම්පතක් ගෙනැල්ලා, 1987 පළාත් පාලන පනත නැවත ක්‍රියාත්මක කරමු. ඊළඟ ප්‍රාදේශීය සභා මැතිවරණය එනකොටවත් අපි එතැනට යොමු වුණොත්, අපේ රටේ දේශපාලනයට සුබදායක වෙයි කියලා මම විශ්වාස කරනවා.

මෙම මැතිවරණය පවත්වන්නට යනකොට තවත් කරුණු කිහිපයකට මුහුණ දෙන්න අපට සිදු වුණා.

විශේෂයෙන්ම අපේ රටේ රාජ්‍ය සේවයේ නියැළුණු, දේශපාලනයට හිත තිබුණු, දේශපාලනය තුළින් ගමට යමක් කරන්න ඕනෑය කියලා ආශාවක් තිබුණු බොහෝදෙනෙක් මෙම මැතිවරණයට නාම යෝජනා භාර දුන්නා. නමුත්, ඒ අයට විශාල මානසික පීඩනයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. මොකද, මැතිවරණය පැවැත්වූයේ නැහැ. ඒ කාල සීමාවේ ගත් නිවාඩුවලට අදාළව ඒ අයට වැටුප් ලැබුණේත් නැහැ. ඊට පස්සේ පාර්ලිමේන්තුවේ කථා කරලා-කථා කරලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන බොහොම අමාරුවෙන් ඒ අය නැවත සේවයේ පිහිටුවන්න අවස්ථාව සලසා දුන්නා. ඒ දුන්නාමත් තමන්ගේ කොට්ඨාසයෙන් පිට රාජකාරී ස්ථානයකට යන්න ඔවුන්ට සිද්ධ වුණා. ඒ නිසාත් ඒ අයට විශාල මානසික පීඩනයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ නිසා ඒ අයට යම් කිසි සාධාරණයක් ඉටු වෙන්න ඕනෑ. ඒ නිසා දැන් ඇවිල්ලා මැතිවරණය පවත්වනවා කියන එක නොවෙයි වෙන්න ඕනෑ. ඔවුන්ට අසාධාරණයක් වුණා; ආර්ථික වශයෙන් පාඩුවක් වුණා. අනෙක් පැත්තෙන් මානසික පීඩනයකට ලක් වුණා. ඒ නිසා ඒවා පිළිබඳව අවධානය යොමු කරලා, ඒ අයටත් යම් කිසි සාධාරණයක් ඉටු කිරීමට හැකියාවක් තිබෙනවා නම් හොඳයි. මම මේ ගරු සභාවට මතක් කරනවා, රාජ්‍ය සේවයේ නියැළිලා, තමන්ගේ ගමට, ප්‍රදේශයට සේවය කරන්න පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙලා, ඒ අවස්ථාව නොලැබුණු අයට මෙවර හෝ යම් අවස්ථාවක් ලබා දෙනවා නම් හොඳයි කියලා.

ඒ වාගේම කලින් කථා කරපු අපේ අමාත්‍යතුමා කිව්වා, අපි මේ මැතිවරණයට බයේ දැන් කෙඳිරිගානවා වාගේ කතන්දරයක්. සමගි ජන බලවේගය විධියට අපි මේ මැතිවරණයට කොහෙත්ම බය නැහැ. 2023දී රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ අශීලාචාර වැඩේ කරන්නේ නැතුව මැතිවරණය පැවැත්වූවා නම්, අද ඔබතුමන්ලාගේ පක්ෂයෙන් ඔය පුටුවල ඔව්වර ප්‍රමාණයක් නොසිටින්න ඉඩ තිබුණා. එදා ඒ මැතිවරණය පවත්වා තිබුණා නම්, මේ තත්ත්වය මීට වඩා භාත්පසින් වෙනස් වෙන්න තිබුණා. ඒ නිසා ඒ මැතිවරණය නොපවත්වා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඔබතුමන්ලාට තමයි උදව්ව කළේ. ඔබතුමන්ලාට තමයි දෙන්න පුළුවන් සම්පූර්ණ සහයෝගය ලබා දුන්නේ. ඒ සහයෝගයෙන් ඇවිල්ලා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට බැණ-බැණ ඉන්නේ නැතුව ඒ කරපු වැඩේ නිවැරැදි කරන්න. එදා ඒ මැතිවරණය පැවැත්වූවා නම් මොකක්ද වෙන්නේ කියලා අපි හොඳටම දන්නවා. ඔබතුමන්ලා මෙතැන අද මොන කතන්දර කථා කළත් ගම්වල තිබුණු ප්‍රායෝගික තත්ත්වය ඒක. ඒ නිසා අපි මැතිවරණවලට බය නැහැ. අපි ජනතාවත් එක්ක ඉන්නේ. අපි ජනතාවට බොරු කරලා නැහැ. අපි ජනතාවට ඇත්ත කියලා තිබෙනවා. ජනතාව තුළ අපි වෛරය වැපිරුවේ නැහැ. ඔබතුමන්ලා ඒ සියල්ලම කරලා ඇවිල්ලා, අද ඒ සියල්ල වමාරගන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා. නමුත් අපි ජනතාව ඉදිරියට යනවා, කොන්ද කෙළින් තියාගෙන.

ඔබතුමන්ලා අද ඔබතුමන්ලාගේ මංගල අය වැය ඉදිරිපත් කළා; පුනරුද යුගයේ පළමුවැනි අය වැය. 70 වසරක ශාපයෙන් පස්සේ ඉදිරිපත් කරපු පළමුවැනි වාසනාවන්ත අය වැය ඉදිරිපත් කළා. මේ අය වැය තුළින් ඔබතුමන්ලා ජනතාවට දීපු සහන කන්දරාව බලන්න. රාජ්‍ය සේවයේ අය දැනටම අපට තොරතුරු එවනවා, ඔවුන්ගේ වැටුපට වෙච්ච වාසිය මොකක්ද කියලා. ඒ නිසා මේ කියන කාරණාත් එක්කාසු කරගෙන ඔබතුමන්ලා එන්න ගමට. ගමේ ජනතාව බලාගෙන ඉන්නවා. අද ජනතාව පාඩම් ඉගෙන ගෙන තිබෙනවා. වෛරය තුළ ඉඳගෙන උඩ බලාගෙන කෙළ ගහ ගත්තා. තමන්ගේ සියතින්ම බෙල්ල සිඳ ගත්තා.

මෙතෙක් බලය නොගිය කඳවුරකට මේ රටේ දේශපාලන බලය මෙවර ලබා දෙන්න බොරුවට රැවටිලා අපි ඡන්දය ලබා දුන්නා කියන කාරණය අද මේ රටේ බහුතර ජනතාව අවබෝධ කරගෙන ඉන්නවා. රැල්ලට, වෛරයට, පෙන්නපු බොරුවට, සුරංගනා ලෝකවලට රැවටිලා කතිරය ගැහුවා, දැන් අපි ඒ වැරැද්ද නිවැරැදි කරගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා මේ රටේ සුවහසක් බුද්ධිමත් ජනතාව කියනවා. ජනතාවට ඒ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමන්ලා ඕනෑම අවස්ථාවක මැතිවරණ ගෙනෙන්න. හැබැයි, මේ මොහොතේ මැතිවරණයක් පවත්වන එකේ ප්‍රායෝගික ගැටලුවක් තිබෙනවා. මොකද, මේ අය වැය විවාදයට අපේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට එනවා. අපේ ප්‍රදේශවල අස්වනු නෙළනවා. අපොස සාමාන්‍ය පෙළ විභාගය පවත්වන්නත් තිබෙනවා. ඒ නිසා මේ කියන ප්‍රායෝගික ගැටලු කළමනාකරණය කරලා මේ අවස්ථාවේදී අපි කටයුතු කරන්න ඕනෑ. අපි මැතිවරණ කොමිසමට කියනවා, එක එක දේශපාලන පක්ෂවල වුවමනාවට නොව, රටේ සැබෑ තත්ත්වය අවබෝධ කරගෙන මැතිවරණය සඳහා දින නියම කරන්න කියලා. ඒ ඕනෑම දිනයකට සමගි ජන බලවේගයේ අපි සූදානම් කියන කාරණය කියමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.22]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය ආරම්භයේදීම මගේ ප්‍රාර්ථනාව තමයි, ලෝකයේ කවර කවමදාකවත් කොහේවත් පාර්ලිමේන්තුවක විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නම් මේ වාගේ නස්පැත්තියක් වෙන්න එපා කියන එක, අද වාගේ දවසක වාගේ. ඒ කියන්නේ අද අපේ ජනාධිපතිතුමා ඇවිල්ලා අය වැය ඉදිරිපත් කළාට පස්සේ ඒ අය වැය ගැන මොකක්වත් කියාගන්න විධියක් නැතුව විපක්ෂය මාධ්‍ය ඉස්සරහ අසරණ වෙලා, මාධ්‍යවේදීන් ඉස්සරහ අසරණ වෙලා "බ-බ" ගගා හිටියා. එතුමන්ලාට අය වැය ගැන කියන්න දෙයක් නැහැ. ඒකෙන් ඒ නස්පැත්තිය ඉවර වුණා කියන්න කෝ. ආයෙත් ආවා, පළාත්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදය. දැන් ඒ ගැන මොකක්ද කියන්නේ? ඒ ගැන විපක්ෂය පැත්තෙන් කථා කරන හැම මන්ත්‍රීවරයාම කියන එකම කාරණය තමයි මැතිවරණය කල් දමන්න කියන එක. O/L විභාගය තිබෙනවා, තව කල් ගන්න, මේ වෙලාවේ මැතිවරණයට ඉදිරිපත් වෙන්න බැහැ කියනවා. අපි දන්නවා, සාමාන්‍යයෙන් ආණ්ඩු තමයි පළාත් පාලන මැතිවරණ වාගේ ඒවා එනකොට ඒවා කල් දමාගන්න කරුණු ඉදිරිපත් කරන්නේ කියලා. එහෙම කරලා තිබෙනවා නේ. 2011දී, 2012දී, 2013දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේදීත් පළාත් පාලන මැතිවරණ තිබුණා. පළාත් පාලන ආයතනවල ධුර කාලය අවුරුදු 4යි. එතකොට 2015දී, 2016දී මැතිවරණය තියන්න ඕනෑ. නමුත්, තිබ්බේ නැහැ.

මැතිවරණය තියන්නේ නැතිව, ඇදගෙන ඇදගෙන ගිහිල්ලා නොතියා බැරිකමට 2018දී මැතිවරණය තිබ්බා. නැත්නම් අවුරුදු 4න් ඒ මැතිවරණය තියන්න ඕනෑ. ඒ කාලයේ තිබුණු ආණ්ඩුව - 2015 පත් වෙච්ච ආණ්ඩුව - මෛත්‍රීපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව - ඒ පළාත් පාලන මැතිවරණයට භය වුණා. ඒ නිසා ආණ්ඩුව මැතිවරණය කල් දැම්මා. 2018දී තිබුණු පළාත් පාලන මැතිවරණයේදී ජනතාව දීපු බලය අනුව හරි නම් 2022දී ඒ මැතිවරණය තියන්න ඕනෑ. නමුත්, 2022දී ඒ මැතිවරණය තිබ්බේ නැහැ. ඒ පනතේ තිබෙනවා නේ, විෂය භාර ඇමතිට පුළුවන් කියලා අවුරුද්දක් ඒ කාලය දිගු කර ගන්න. ඒ වගන්තිය උපයෝගි කරගෙන මැතිවරණය තව අවුරුද්දක් විතර කල් දා ගත්තා. ඒ විධියට තමයි 2023 මාර්තු මාසයේදී මේ මැතිවරණය පවත්වන්න නියම වුණේ.

හැබැයි, එවකට හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ එදා වාගේම -අගමැති කාලයේ වාගේම- ආයෙත් මැතිවරණය කල් දැම්මා; මැතිවරණය තිබ්බේ නැහැ. ඒක අපට මතකයි නේ. "ඡන්දය තියන්න සල්ලිත් නැහැ, තියන්න ඡන්දයකුත් නැහැ" කියලා එතුමා කිව්වා. එහෙම තමයි එතුමා හැසිරුණේ. ඒ විතරක් නොවෙයි. රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්න පුළුවන් උපරිම දේවල් ඒ කාලය ඇතුළත කළා. නාම යෝජනා කැඳවලා තිබුණු මැතිවරණයක්, ප්‍රචාරක කටයුතු ආරම්භ වෙලා තිබුණු මැතිවරණයක් තමයි එදා කල් දැම්මේ. එදා ඒ පළාත් පාලන මැතිවරණයේ තැපැල් ඡන්ද පත්‍රිකා ටික මුද්‍රණය කර ගන්නවත් භාණ්ඩාගාරයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුවට මුදල් දුන්නා නම්, ඒ මැතිවරණය තියන්න තිබුණා. ඔය රුපියල් බිලියන 10ම එක සැරේ කවදාවත් මැතිවරණයකට ඉල්ලන්නේ නැහැ. ඒ මුදල් දෙන්නේ කොටස් වශයෙන්. හැබැයි, තැපැල් ඡන්ද පත්‍රිකා ටික මුද්‍රණය කරන්නවත් මැතිවරණ දෙපාර්තමේන්තුවට මුදල් වෙන් කරලා දුන්නා නම් ඒ මැතිවරණය පවත්වන්න තිබුණා. හැබැයි, ඒකත් කඩාකප්පල් කළා. එහෙම කඩාකප්පල් කරලා මැතිවරණය තියන්නේ නැතිව, ඒ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාට එදා සිට අද දක්වා නියමින් හෝ අනියමින් උදව් කරන මේ විපක්ෂයේ කණ්ඩායම අද ඇවිල්ලා කියන්නේත් මැතිවරණය තියන්න එපා කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක්ම කියනවා මම අහගෙන හිටියා, ඒ අයට මේ අය වැය විවාදයට සම්බන්ධ වෙන්න ඕනෑ, විපක්ෂයේ ඉන්නේ මන්ත්‍රීවරුන් 66ක් වාගේ කුඩා සංඛ්‍යාවක්, ආණ්ඩුව පැත්තේ මන්ත්‍රීවරුන් 158ක් ඉන්නවා, මේ අය වැය අස්සේ ඒගොල්ලන්ට මේ මැතිවරණය කර ගන්න බැහැ කියලා. Parliamentary Business Committee, COPA, COPE, උපදේශක කාරක සභා පත් කරනකොටත් ඔය තර්කයම ගෙනාවා නම් හොඳයි නේ. එතකොටත් කිව්වා නම් හොඳයි නේ, විපක්ෂයේ අපට ඉන්නේ මන්ත්‍රීවරු 66යි, ඒ ප්‍රමාණයට සාපේක්ෂව අපේ නියෝජනය දෙන්න කියලා. නමුත් එදා එහෙම කිව්වේ නැහැ නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපි ඒක කිව්වා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එදා කිව්වේ මොකක්ද? එදා කිව්වේ, "අපි ළඟ කණ්ඩායම් 13ක් ඉන්නවා. ඒ කණ්ඩායම් 13ට නියෝජනයක් ඕනෑ. ඒ නිසා අපට ඕනෑ මේ ජාතියේ නියෝජනයක්" කියලායි. එහෙමනේ කිව්වේ. අපිත් හැදුවේ ඒ මන්ත්‍රීවරුන් 66ට සාපේක්ෂව නියෝජනය දෙන්නයි. එහෙම දෙන්න තමයි අපි හැදුවේ. මේ පැත්තට මන්ත්‍රීවරුන් 159ක් ඉන්නකොට අපට ඕනෑ ඒකට සාපේක්ෂ නියෝජනයක් විපක්ෂයට දෙන්නයි. හැබැයි, එහෙම තිබියදීත් අපි ඒ කමිටුවලදී ඔබතුමන්ලාට දෙන්න පුළුවන් සාධාරණ නියෝජනයක් ලබා දීලා තිබෙන්නේ. ඒ කමිටුවලට එන එක ඔබතුමන්ලාගේ වැඩක්. දැන් මේ අස්සේ කියනවා, නාම යෝජනා අත්සන් කර ගන්නත් යන්න විධියක් නැහැ කියලා, හරියට හැමදාම පාර්ලිමේන්තුවට එන උදවිය වාගේ. බලමුකෝ ඉස්සරහට ඉතිරි දවස්වල කොහොමද පාර්ලිමේන්තුවට එන්නේ කියලා. ඇත්තටම මේ අය ආපු වෙලාවල් ටික බලලා ජනතාවට කියන්න ඕනෑ, කොහොමද මේ අය පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ කියලා. ඒ අයගේ ගෙවල්වලටත් මේක කියන්න ඕනෑ. මේ අය ගෙවල්වලින් ඇවිල්ලා තිබෙනවා, පාර්ලිමේන්තුවට යනවා කියලා. මේ පණිවුඩ අපි මේ සැරේ යවනවා. *[බාධා කිරීමක්]* වැඩිපුර කෑ ගැහුවොත් වැඩේ අහුවෙනවා. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමා, ආපු නැති උදවියගේ නම් ටික කියන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා ගැන කියන්නේ නැහැ. මේ අය වැය විවාදය අතරතුර ඉරිදා දින තිබෙනවා. නිවාඩු දවස් තිබෙනවා. නාම යෝජනා අත්සන් කරගන්න පුළුවන්. භය වෙන්න දෙයක් නැහැ. ඒ නිසා ඒක තර්කයක් නොවෙයි.

ඊළඟට කියනවා, ඇප බඳින්න සල්ලි නැහැ කියලා. මේ මැතිවරණය ගැන කථා කරනකොටම සජබයේ මහ ලේකම්තුමා ඇතුළු පිරිසක් ගිහිල්ලා මැතිවරණ කොමිසම ඉදිරියේදී දීපු voice-cut එකේත් තිබෙනවා මම දැක්කා, ඇප බඳින්න සල්ලි නැහැ කියන කථාවක්. ඇත්තටම විපක්ෂයේ ඉන්න ඔය මන්ත්‍රීවරුන්ගෙන් බොහෝ දෙනෙක් දේශපාලනය කරනවාට වඩා ව්‍යාපාර කරන අය. ඒ පක්ෂවලට සල්ලි තිබෙනවා. රුපියල් කෝටි 5ක් ගැන කථාවකුත් කියලා තිබුණා නේ, අපේ පැලවත්ත office එකෙන් ඉල්ලා ගන්න කියලා. අපි දිහාට හැරෙන්න එපා. හිටපු මන්ත්‍රීවරයෙක් රුපියල් නවකෝටි අසූලක්ෂයක් වන්දි අරන් තිබෙනවා. ඔබතුමන්ලා ඔය කියන මුදල කෙහෙළිය රඹුක්වැල්ලගෙන් ඉල්ලා ගන්න කෝ. මම හිතන විධියට කෙහෙළිය රඹුක්වැල්ල රජයේ මුදල්වලින් අරගෙන නැත්තේ අස්වැසුම සහනාධාරය විතරයි. ඒකත් ගත්තා ද දන්නේ නැහැ, මොකක් හරි වෙන නමක් දාලා.

ඒ හැර අනික් ඔක්කෝම අරගෙන තිබෙනවා. ඒක නිසා නිකම් විහිළු කරන්න එපා, ඇප බඳින්න සල්ලි නැහැ කියලා. ඒවා හේතු නොවෙයි. කෙහෙළිය රඹුක්වැල්ල ජනාධිපති අරමුදලෙනුත් අරගෙන තිබෙනවා; වන්දිත් අරගෙන තිබෙනවා. තවත් හොයන්න ඕනෑ. අපි ඉදිරියේදී ඒ තොරතුරු දෙන්නම්. ඇමති නිල නිවාසවල ඉන්නකොට වතුර බිල්, විදුලි බිල් ගෙව්වේ කොහොමද කියලාත් තොරතුරු ඉදිරියේදී ලබා දෙනවා. හරිද? *[බාධා කිරීම]* ඒක නේ. අස්වැසුමත් නුවර පැත්තෙන් ගත්තාද කියලා බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය මෙයයි. දැන් පොදුවේ කියන්න පටන් අරගෙන තිබෙනවා, මැතිවරණ ක්‍රමයේ තිබෙන upset එක ගැන. මේක මේ අපි අලුත් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න හෝ සමානුපාතික නියෝජන ක්‍රමය වෙනස් කරන්න හෝ ගෙනාපු එකක් නොවෙයි නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ, ඔබතුමන්ලාත් නාම යෝජනා භාර දීපු, ඇප බැඳපු, මැතිවරණ campaign එක කරපු, මැතිවරණයක්ම - ඒ ක්‍රමයම - තමයි ඉස්සරහට යන්නේ. ඒකේ දෝෂ තිබෙනවා නම් ඒ ගැන ඒ කාලයේ කථා කරන්න තිබුණා. නමුත්, ඒ කාලයේ කථා කළේ නැහැ නේ. මම අහගෙන හිටියා අලුත් මන්ත්‍රීතුමෙක් කියනවා, මේකෙන් ගමට මන්ත්‍රීවරයෙක් එන්නේ නැහැ, මේකෙන් දේශපාලනයෙන් උඩට එන්න බැහැ, මේක ඇත්ත ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි කියලා. දැන් මේ ආදී ගොඩක් දේවල් කියන්න පටන් අරගෙන තිබෙනවා. මේ තිබුණු පනතක්,- *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා නොවෙයි,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාങ്കුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමාත් දන්නවා නේ, මොකක් හරි දෙයක් කළාම තමයි experience එක එන්නේ කියලා. මේ ක්‍රමයත් ක්‍රියාත්මක දැන් කරලා අවුරුදු හතරක් ගත වුණා. ඒක ඇතුළේ තිබෙන ප්‍රශ්න ටික තේරෙන්නේ කළාට පස්සේ. ඒ නිසායි අපි කියන්නේ, මේක වෙනස් කරලා කරමු කියලා.

ගරු චතුර ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු සත්තුර කලප්පත්ති)
(The Hon. Chathura Galappaththi)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාങ്കුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මොකක්ද, point of Order එක?

ගරු චතුර ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු සත්තුර කලප්පත්ති)
(The Hon. Chathura Galappaththi)
ඔබතුමා මේ ගැන සඳහන් කරපු නිසායි මම මේ කරුණ කියන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) නළින්ද ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

ගරු චතුර ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු සත්තුර කලප්පත්ති)
(The Hon. Chathura Galappaththi)
ඒ කාරණාව මේකයි. මම පළමුවෙනි වතාවටයි පාර්ලිමේන්තුවට ආවේ. මට මේ ගැන කථා කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. ඒ නිසා තමයි පාර්ලිමේන්තුවේ කථා කරලා, ඔබතුමන්ලාට මේ දීපු බලය තුළින් හරි තීන්දුව ගන්න කියන යෝජනාව කළේ. නැතිව, වෙන යෝජනාවක් නොවෙයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍යර්) නළින්ද ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හරි. හරි. පෙනෙන්න ඉන්නවා, කථා කළා කියලා ගෙදරට පණිවුඩයක් යැව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ ක්‍රමවල තිබෙන ප්‍රශ්න වෙනම කථා කරමු. නිකම් මේ නින්දෙන් අවදි වුණා වාගේ අද මේකේ තිබෙන ආදීනව කියලා තේරුමක් නැහැ. ඒ වාගේම මේ කාරණයත් මතක තියා ගන්න. අපට මේ මැතිවරණය ඕනෑ. අපට පළාත් පාලන මැතිවරණය ඕනෑ, ඔබතුමන්ලාට එපා වුණාට. මේක අපට ඕනෑ. අපි හිතනවා, මැතිවරණ කොමිසම කඩිනමින් මේ මැතිවරණය පවත්වයි කියලා. ජනතාවටත් මේ මැතිවරණය ඕනෑ. ඒ, කරුණු දෙකක් නිසා.

පළමු කරුණ මෙයයි. අපට මේ රට උපරිම වශයෙන් ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමට අවශ්‍යයි. මහ ජනතාව මේ පාලනයට සම්බන්ධ කර ගන්න ඕනෑ. ඒ නිසා පාර්ලිමේන්තුව පමණක් තිබීම ප්‍රමාණවත් නැහැ; විධායක ජනාධිපති කෙනෙක් සිටීම පමණක් ප්‍රමාණවත් නැහැ. බිම් මට්ටම දක්වාම ප්‍රජාතන්ත්‍රවාදීව ජනතාවට අවස්ථාවක් ලැබෙන්න ඕනෑ, තමන්ගේ නියෝජිතයෝ පත් කර ගන්න. ඒ අර්ථයෙන් ගත්තාට පස්සේ අපට මේ පළාත් පාලන මැතිවරණය අවශ්‍යයි. ගමේ ඉන්න කෙනාට ගමේ සංවර්ධන ව්‍යාපෘතිවලට සම්බන්ධ වෙන්න සිටින තමන්ගේ නියෝජිතයා පත් කර ගන්න තිබෙන අවස්ථාව තමයි පළාත් පාලන මැතිවරණය කියන්නේ. ඇයි ඒක අහෝසි කරන්නේ? ඇයි, තමුන්නාන්සේලා ඒ මැතිවරණය කල් දමන්න කියන්නේ? ඇයි, බයද? තමන්ගේ ගමේ, පක්ෂයේ නියෝජිතයෙක් ඒ සභාවලට එන එක වළක්වන්නේ ඇයි? මතක තියා ගන්න, මේ පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ අපි පළාත් සභා මැතිවරණයකටත් මුහුණ දෙන්න සූදානම්. මොකද කියන්නේ? ඒක නිසා තාත්තා දුව පාර්ලිමේන්තුවට එව්වා වාගේ ගමේ කෙනාටත් අවස්ථාවක් දෙන්න, ප්‍රාදේශීය සභාවට, නගර සභාවට එන්න. ගරු චමින්ද්‍රානී කිරිඇල්ල මන්ත්‍රීතුමියනි. ඒ සඳහා දෙන්න අවස්ථාව.

දෙවැනි කාරණය මෙයයි. ජනාධිපතිවරණයෙන් මාස පහක් ගත වෙලා, මහ මැතිවරණයෙන් මාස තුනක් ගත වෙලා මේ රට පාලනය කළේ අපි ඉදිරිපත් කරපු අය වැයක් මත නොවෙයි. අතුරු සම්මත ගිණුමක් අනුව එදිනෙදා වැඩ ටික කරගෙන යෑම සඳහා budget එකක් තමයි අපට තිබුණේ. දැන් තමයි පළමුවැනි වතාවට අපේ ජනාධිපතිවරයෙක්, අපේ ආණ්ඩුවක් විසින් රට හදන්න පුළුවන් අය වැයක් ගෙනැල්ලා තිබෙන්නේ. අන්න, ඒ අය වැය අනුව අපි රට හදනවා. එතැනදී අද උදෑසන ඉදිරිපත් කරපු, ඉදිරි දිනවල අපි සාකච්ඡා කරන මේ අය වැයට අනුව මේ රටේ ග්‍රාමීය ආර්ථිකය හදනකොට, සංවර්ධනය ගමට ගලාගෙන යන්න නම් එහෙම ශක්තිමත් නියෝජන යන්ත්‍රණයක් අවශ්‍යයි. අන්න ඒකට තමයි පළාත් පාලන මැතිවරණය ඕනෑ. ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒ ගැන දන්නවා. නිකම් හිතන්න කෝ, සෞඛ්‍ය අමාත්‍යාංශයට විතරක් රුපියල් බිලියන 604ක් වෙන්කර තිබෙනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ලේසි වැඩක් නොවෙයි, ඩොලර් බිලියන 2ක්. අධ්‍යාපන අමාත්‍යාංශයට රුපියල් බිලියන 600කට වැඩියි. රුපියල් බිලියන 1,200ක් අධ්‍යාපන සහ සෞඛ්‍ය කියන අමාත්‍යාංශ දෙකට විතරක් වෙන්කර තිබෙනවා. ග්‍රාමීය ආර්ථිකය හදන්න, වාරි මාර්ගවලට, කෘෂි කර්මාන්තයට, ධීවර කර්මාන්තයට, කුඩා කර්මාන්තවලට මේ ආදී වශයෙන් ගමට මුදල් ගලාගෙන යන අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ කටයුතු නිකම් ම කරන්න බැහැ. අමාත්‍යාංශවල නිලධාරීන්ගෙන් විතරක් කරන්න බැහැ. ඒ සඳහා ගමේ ජනතාවගේ ප්‍රමුඛතා හඳුනා ගන්නට ඕනෑ. ඒවා උඩට අරගෙන එන්නට ඕනෑ. මේ කරන ව්‍යාපෘති අධීක්ෂණය වෙන්න ඕනෑ. ඒවායෙහි අඩුපාඩුකම් නිවැරදි කර ගන්නට ඕනෑ. ඒ සියල්ල කරන්න නම් මේ පළාත් පාලන යන්ත්‍රණය අවශ්‍යයි.

එපමණක් නොවෙයි. දැනුත් සමහර වැඩ හිරවෙලා තිබෙන්නේ. කසළ කළමනාකරණ ප්‍රශ්නය, ඩෙංගු මර්දන ප්‍රශ්නය ආදී පළාත් පාලන ආයතනවලින්ම විසඳිය යුතු, මැදිහත් විය යුතු ව්‍යාපෘති ගණනාවක් එක තැන නතර වෙලා තිබෙන්නේ. පළමුව රට ප්‍රජාතන්ත්‍රීකරණය කරන්නට, දෙවනුව, මේ සංවර්ධන ව්‍යාපෘති සඳහා මහ ජනතාවගේ ඇත්ත සහභාගිත්වය ගන්න නම් පළාත් පාලන මැතිවරණය අවශ්‍යයි කියලා තමයි අපි කියන්නේ. ඒ නිසා තමයි අපි මැතිවරණ කොමිසමෙන් ඉල්ලා සිටින්නේ අද මේ පනත් කෙටුම්පත සම්මත කරලා දුන්නාට පස්සේ හැකි ඉක්මනින් පනත ප්‍රකාරව මැතිවරණය පවත්වන්න කියලා. අපි ඒකට ලෑස්තියි.

මතක තියා ගන්න, මේ රටේ ජනතාව පසුගිය මාස තුනේදී මේ ආණ්ඩුව කරපු දේවල් අනුමත කරන මැතිවරණය බවටත් මේ පළාත් පාලන මැතිවරණය පත් වෙන බව. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා භයයි නේ. මේ අය වැය ක්‍රියාත්මක වෙන්න ගත්තාට පස්සේ මොකක්වත් නැති වෙනවා; මොකක්වත් නැහැ. ඒකට තමයි භය තිබෙන්නේ. එතකොට ඔයගොල්ලන්ට වැඩ කර ගන්න තිබෙන පහළ යන්ත්‍රණයත් නැති වෙනවා. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තත්පරයක් දෙන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
එතුමාට අවස්ථාව දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you so much.

ඔබතුමා කිව්වා, පළාත් පාලන මැතිවරණය මේ වතාවේ නියනවා කියලා. අපි පළාත් පාලන මැතිවරණයේදී ඔබතුමන්ලාට හොඳ challenge එකක් දෙනවා. මම නම් හිතන්නේ ඔබතුමන්ලාට දිනන්න බැහැ. අපි බලමු, පළාත් පාලන මැතිවරණයේදී. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමනි, කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගොඩක් කියන්න දේවල් නැහැ. අපට තිබෙන්නේ මේ මැතිවරණය ඕනෑ බව කියන්නයි. මේ මැතිවරණය අපි පවත්වමු. මේ පළාත් පාලන මැතිවරණය පවත්වන්නත් කලින්ම, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා නියෝජනය කරන, අද එකතු වෙන්න කථා කරමින් සිටින නාමල් රාජපක්ෂ, රනිල් වික්‍රමසිංහ, සජිත් ප්‍රේමදාස, රවුෆ් හකීම්, රිසාඩ් බදියුදීන් ඇතුළු කණ්ඩායමේ - සමස්ත විපක්ෂයේම - භීතිකාව විසින් පෙන්නුම් කරන්නේ මැතිවරණ ප්‍රතිඵලයෙන් ජාතික ජන බලවේගය විශිෂ්ට ජයග්‍රහණයක් ලබන බව කියමින් මා නිහඬ වෙන්නම්.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[6.36 p.m.]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Presiding Member, I am honoured to be entrusted with delivering the winding-up speech on behalf of the Opposition in Parliament, especially as a newcomer. I pay my sincere gratitude to the Hon. Leader of the Opposition and my Leader. நான் இதனைத் தமிழிலும் சொல்ல வேண்டும். பாராளுமன்றத்துக்குப் புதிதாக வந்த ஓர் உறுப்பினராக இருந்தாலும், இன்றைய விவாதத்தில் எதிர்க்கட்சி சார்பாக கடைசியில் பதிலுரை நிகழ்த்துவதற்கு என்னைத் தெரிவுசெய்தமைக்காக முதலில் எதிர்க்கட்சித் தலைவருக்கும் என்னுடைய கட்சித் தலைவருக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවට අපේ සභානායකතුමාගේ කථාවෙන් ප්‍රවේශයක් ලබා ගන්න මම කැමතියි. එතුමාගේ කථාවේ අතරමහදී සඳහන් කළා - වරදක් කියනවා නොවෙයි - ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුවෙන් - Determination එකෙන් - පාර්ලිමේන්තුව වැරැද්දක් කළා කියලා පෙනෙනවාය කියා සමහර විට හිතෙනවා කියලා. නැහැ, එහෙම නොවෙයි. මම හිතන්නේ ලොකු වැරදි අවබෝධයක් තිබෙනවා. ඉස්සෙල්ලාම අනිවාර්යයෙන් ඒක හරි ගස්සා ගන්න වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය එවකට තිබුණු මූලික අයිතිවාසිකම් නඩු තීන්දුවට පටහැනිව මේ සංශෝධිත පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා කියන පදනම මත නොවෙයි තුනෙන් දෙකක විශේෂ බහුතරයක් අවශ්‍යයි කිව්වේ. I hope the Hon. Sunil Watagala and the Hon. Harshana Nanayakkara would clarify this.

මම ඒ කොටසේ අදහස කියන්නම්. Parliament does not have the power to overrule any judgment of the Supreme Court. A decision of the Supreme Court on any matter is final and binding. However, Parliament has the legislative power to remove the *substratum* or foundation of a judgment provided it does not transgress on any other constitutional limitations. ඒ කියන්නේ, ව්‍යවස්ථාදායක බලතල පාර්ලිමේන්තුවට තිබෙන බවට ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා පැහැදිලිව special Supreme Court Determination එකේ කියලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය මේ පාර්ලිමේන්තුවට තිබෙන ඒ බලතල පිළිබඳව කෙළින්ම හෝ වක්‍රානුකූලව කිසිම බලපෑමක් එතැනදී ඉදිරිපත් කරලා නැහැ. දැන් මේක සිදු වුණේ මෙහෙමයි. ඔබතුමන්ලා බොහෝ දෙනෙක් හිතන්නේ විශේෂ බහුතරයක්

ශ්‍රේෂ්ඨාධිකරණය ඉල්ලුවේ අර එවකට තිබුණු මූලික අයිතිවාසිකම් නඩු තීන්දුවට පටහැනිව මේ පනත් කෙටුම්පත ගෙනාපු හින්දා කියලා. එහෙම නොවෙයි. ඇත්තෙන්ම විශේෂ බහුතරයක් ඉල්ලා සිටින්නේ වෙනයම් හේතුවක් නිසා. ඒ ටිකත් මම කියවන්නම්. In page 50 of the Determination of the Supreme Court, it is stated, I quote:

> "For the foregoing reasons, we hold that the Amending Act was not intended to apply to the nominations already called for and accepted by the time it was certified. The Bill seeks to apply it now.
>
> Therefore, it is irrational and unreasonable and inconsistent with Article 12 (1) of the Constitution."

අපේ හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ඉතා පැහැදිලිව මේකේ පූර්විකාව ගැන සඳහන් කළා. එම පූර්විකාවට - Preamble එකට- මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. අද අපි සම්මත කිරීමට බලාපොරොත්තු වෙන පනත් කෙටුම්පතේ පූර්විකාවේ මෙහෙම කියලා තිබෙනවා.

ටක්කෙටම අහන්න ඕනෑ. වෙන වෙන ලැයිස්තු ඉදිරිපත් කරලා වැඩක් නැහැ, ගරු කථානායකතුමනි. දැන් ඇමතිතුමා කිව්වා නේ පරණ කට්ටිය ගත්ත ඒවා කියන්නම් කියලා. හැබැයි වැඩේ තිබෙන්නේ, පරණ කට්ටියගෙන්ම තමයි තවම තෙල් ගන්නේ. මම දන්නේ නැහැ, ඒ කට්ටිය අලුත් කට්ටියටත් දෙනවාද කියලා. අද ඇමතිතුමා හිටියා නම් මම අහන්න හැදුවේ, හිටපු ආණ්ඩුව ගහපු ගිවිසුම් හැර අලුත් තෙල් ගිවිසුම්වලට ඇවිල්ලා තිබෙනවාද, ඒ ගිවිසුම්වල තොරතුරු ටික අපට ඉදිරිපත් කරනවාද කියලා. මේ අයයි, හිටපු අයයි අතර කිසිම වෙනසක් නැහැ, පරණ කට්ටියගෙන්ම තමයි තෙල් ගන්නේ. ඒ premium එක ඒ විධියටම ගන්නවා; premium එකෙන් තමයි ඔය හොරකම සිද්ධ වෙන්නේ.

ඔබතුමන්ලා අපට දිගින් දිගටම කිව්වේ ඒ ආයතනවලට අලුතින් පත්වන අය පඩි ගන්නේ නැතුව වැඩ කරනවයි කියලා. ඒ වාගේ කාරණා තමයි කිව්වේ. හැබැයි, මේ සභාපතිතුමා 2024 නොවැම්බර් මාසයට අදාළව රුපියල් 625,000ක allowance එකක් ගන්නවා. මා ළඟ ඒ paper එක තිබෙනවා. හැබැයි ඒ ආයතනයේ වැඩ කරන අයම තමයි, එහි සභාපති විධියට, Executive Director විධියට ඇවිල්ලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர*)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම ප්‍රශ්නය අහන්නයි හදන්නේ, ගරු කථානායකතුමනි. මේ දේවල් කියන්න එපා යැ. නැත්නම් මේ අය panic වෙනවා. ජනාධිපතිතුමා එහෙම panic වෙන්නේ නැහැ. ජනාධිපතිතුමා බොත්තම වැරදියට දාගෙන ආවත්, පසුව ඒක ලස්සනට ෂේප් එකේ දා ගන්නවා. මේගොල්ලන් පොඩ්ඩක් panic වෙනවා. ඒකයි මම මේ කියන්න හැදුවේ.

රාජකරුණා මැතිතුමා අරගෙන තිබෙනවා, ඒ ගණන. ඊළඟට රුපියල් 293,214ක් අරගෙන තිබෙනවා, Dr. Mayura Neththikumarage, Managing Director, CPSTL. ඔබතුමන්ලා දිගින් දිගටම කිව්වා, ඒ අය නොමිලේ වැඩ කරන්නේ, සම්පූර්ණයෙන් කැප කිරීම් කරලා තමයි වැඩ කරන්නේ කියලා. ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමා පිළිගන්නවාද? මොකද, මීට කලින් හිටපු සභාපතිවරයාට තිබුණාටත් වඩා වැඩි ප්‍රමාණයක් මේගොල්ලන් වැඩි කරගෙන තිබෙනවා. විශේෂයෙන් විවිධ ලැයිස්තු ඉදිරිපත් කරන අපේ ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, මේක ඔබතුමා පිළිගන්නවාද, නැද්ද කියලා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ලැයිස්තු ඉවර නැහැ, තව තිබෙනවා. ගෙවල්වල ලයිට් බිල්, වතුර බිල් ගෙවා ගත්තේ කොහොමද කියලා අපි ඉදිරියේදී කියන්නම්. Premium එක ඩොලර් 37 ඉඳලා අපි කොහොමද අඩු කරගෙන තිබෙන්නේ කියන එකත් ඉදිරියේදී අපට කියන්න පුළුවන්. ගරු කථානායකතුමනි, ඒක නිසා ඒවාට දෙන්න පුළුවන් සහන ලබා දෙනවා. එක එක නම් කියපු නිලධාරීන් ගන්නා දේවල් මොනවාද, නොගන්නා දේවල් මොනවාද කියන එක ඇමතිතුමා ඉදිරියේදී කියයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -112/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -133/2024- (2), ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -247/2024- (2), ගරු නීතිඥ රවුෆ් හකීම් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ජාතික පාසල්වලට අනුයුක්ත පළාත් පාසල් ගුරුවරුන්: විස්තර
தேசிய பாடசாலைகளுடன் இணைக்கப்பட்டுள்ள மாகாண சபைப் பாடசாலை ஆசிரியர்கள்: விபரம்
PROVINCIAL COUNCIL SCHOOL TEACHERS ATTACHED TO NATIONAL SCHOOLS: DETAILS

296/2024

5. ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පළාත් සභා පාසල්වලින් ජාතික පාසල් සඳහා රජයේ ගුරුවරුන් අනුයුක්ත කර ඇති බව දන්නේද;

(ii) එම ගුරුවරුන් අනුයුක්ත කර ඇති කාල සීමාව නැවත දීර්ඝ නොකිරීමට තීරණය කර තිබේද;

(iii) එම කාල සීමාව දීර්ඝ නොකිරීම හේතුවෙන් ජාතික පාසල්වල ඇති වන ගුරු පුරප්පාඩු තුලනය කරනු ලබන ආකාරය කෙසේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மாகாண சபை பாடசாலைகளிலிருந்து தேசிய பாடசாலைகளுக்கு அரச ஆசிரியர்கள் இணைக்கப்பட்டுள்ளார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி ஆசிரியர்கள் இணைக்கப்பட்டுள்ள கால எல்லையை மீண்டும் நீடிக்காதிருக்கத் தீர்மானிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி கால எல்லை நீடிக்கப்படாததால், தேசிய பாடசாலைகளில் ஏற்படும் ஆசிரியர் வெற்றிடங்கள் எவ்வாறு சமநிலைப்படுத்தப்படும் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that government teachers have been attached to National Schools from provincial council schools;

(ii) whether it has been decided not to extend the period for which those teachers have been attached to; and

(iii) as to how the vacancies arising in National Schools for teachers will be balanced due to the said non-extension?

(b) If not, why?

ගරු (ආචාර්ය) හරිනී අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්,

දැනට ජාතික පාසල්වල හා පළාත් පාසල්වල පවතින ගුරු ඌනතා සඳහා එම පාසල් අතර ගුරුවරුන් තාවකාලිකව අනුයුක්ත කරනු ලැබේ.

(ii) නැත.

ජාතික පාසල්වල අතිරික්තව සිටින ගුරුභවතුන් එම විෂයයන් සඳහා ඌනතා පවතින පළාත් පාසල් වෙත අනුයුක්ත කිරීම හා ජාතික පාසල්වල ඌනතා පවතින විෂයයන් සඳහා පළාත් පාසල්වල අතිරික්ත ගුරුභවතුන් අනුයුක්ත කිරීම කලාප අධ්‍යාපන කාර්යාලයේ විෂය අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශය අනුව සිදු කළ යුතු බව 2023.07.14 දිනැති හා ED/01/27/14/1-2 අංක දරන ලිපිය මඟින් සියලු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත දන්වා ඇත.

(iii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමියනි, බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයට තමයි මගේ දරුවෝ දෙදෙනා යන්නේ. පළාත් පාසල්වල සමහර විෂයයන්වලට දක්ෂ ගුරුවරුන් ඉන්නවා. හැබැයි, බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයට සමහර විෂයයන්වලට ගුරුවරුන් නැහැ. නමුත් ආණ්ඩුකාරතුමා සහ පළාත් අධ්‍යාපන කාර්යාලයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක හා ලේකම් විසින් අවශ්‍යතාව මත විටින් විට මාස හයකට, අවුරුද්දකට බදුල්ල ධර්මදූත විද්‍යාලයට වාගේම, බදුල්ල මධ්‍ය මහා විද්‍යාලයට ගුරුවරුන් අනුයුක්ත කර තිබෙනවා.

බදුල්ල විහාර මහාදේවි බාලිකා පාසලත් පළාත් පාසලක්. පළාත් පාසල්වලත් දක්ෂ ගුරුවරුන් ඉන්නවා. හැබැයි, අවශ්‍යතාව මත ඒ ඒ වෙලාවට ඒ ගුරුවරුන් ජාතික පාසල්වලට අනුයුක්ත කරගෙන පළාත තුළ වැඩ කරගෙන ගියා. ඔබතුමියගේ කාලයේ නොවෙයි, පසුගිය කාලයේ චක්‍රලේඛයකින් මේක නැවැත්වූවා.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ආණ්ඩුකාරවරුන්ටත් මේ ගැන කියලා තිබුණා. ඒක නිසා තමයි මම මේ ප්‍රශ්නය ඔබතුමියගෙන් ඇහුවේ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, සමහර ප්‍රශ්න පළාතට විසඳාගන්න දෙනකොට පළාත් පාසල්වලට ඒ ඒ විෂයයන්වලට අදාළ ගුරුවරුන් ලබා දුන්නොත් හොඳයි. බදුල්ලේ ජාතික පාසල් 36ක් තිබෙනවා. බදුල්ලේ තමයි වැඩිම ජාතික පාසල් සංඛ්‍යාවක් තිබෙන්නේ. ජාතික පාසල් සංකල්පය ගෙනෙනකොට ඩී.ජ.මු. ලොකුබණ්ඩාර මහතා තමයි අධ්‍යාපන ඇමති. ජාතික පාසල් වැඩියෙන්ම තිබෙන්නේ බදුල්ලේ නිසා තමයි මම මේ ප්‍රශ්නය ඔබතුමියගෙන් ඇහුවේ. අපේ දරුවෝ කොළඹ පාසල්වලට යන්නේ නැහැ, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඒ නිසායි මම මේ වෙලාවේ මෙම කාරණය කිව්වේ.

ඊළඟ කාරණය මෙකයි. දැනට විද්‍යාපීඨවලින් පිටවුණු batches කිහිපයක් ඉන්නවා, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඒගොල්ලනුත් පත්වීම් ගන්න බලාගෙන ඉන්නවා. ඒ, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නා පරිදි අපට කාලයක් තිස්සේ ජාතික පාසල්වල ගුරු පුරප්පාඩු පුරවන්න බැරි වුණා, උසාවියේ නඩුවක් විභාග වන කාරණයත් එක්ක. නමුත් අපි මේ ප්‍රශ්නය දැන් විසඳාගෙන තිබෙනවා. ඒ අතරතුර තමයි ඔය පළාත් පාසල්වලින් ජාතික පාසල්වලට අනුයුක්ත කරන arrangement එක ගියේ. නමුත් දැන් අපි මේ ප්‍රශ්නය විසඳාගෙන යනවා. මේ අවුරුද්ද තුළ ගුරු පුරප්පාඩු පුරවන්න අපි වැඩ කරමින් යනවා. මේ ගුරු පුරප්පාඩු තිබෙන්නේ හැම විෂයකටම අදාළව නොවෙයි. සමහර විෂයයන්වලට අදාළව පුරප්පාඩු තිබෙනවා. අපි මේ වෙලාවේ කටයුතු කරමින් ඉන්නේ ඒ පුරප්පාඩු පුරවන්නයි.

මේ අවුරුද්දේදී මේ ගුරු පුරප්පාඩු බොහෝදුරට පුරවන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම විද්‍යාපීඨවලින් පිටවෙන ගුරුවරුන්ටත් මේ අවුරුද්ද තුළ ඒ පත්වීම් ලබා දෙන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මම ප්‍රධාන ඇමතිවරයා වශයෙන් සිටි කාලයේත් ගුරු මාරුවීම් කටයුතුවලදී මේ රටේ වෘත්තීය සමිතිවලින් මම භීතන විධියට ජනතා විමුක්ති පෙරමුණේ union එක තමයි හැම දාම හිටියේ. ගුරු මාරුවීම්වලදීත් ඔයගොල්ලන්ගේ union එක powerful. අපේ unionsවල සිටින අය එහෙම සම්බන්ධ වෙන්නේ නැහැ, ස්ථාන මාරුවීම්වලට. අපේ ආණ්ඩු තිබුණු කාලයේත් ස්ථාන මාරුවීම් සම්බන්ධ කටයුතුවල ගොඩක් හිටියේ ඔයගොල්ලන්ගේ unionsවල අය තමයි. ඒක පිළිගන්න වෙනවා. මොකද, අපේ unions තිබුණාට ඔය ස්ථාන මාරුවීම් කටයුතුවලට ඒ අය යන්නේ නැහැ. ඒ ගැන දන්නවා නේ, ඇමතිතුමා. අම්පාරේ සේනානායක විද්‍යාලයෙනුත් කථා කරලා මට මේ ගැන කිව්වා.

ගරු අග්‍රාමාත්‍යතුමියනි, ගුරු මාරුවීම් සංකල්පය ගත්තාම, සමහර ගුරුවරු ජාතික පාසල්වල අවුරුදු 20ක් විතර ඉන්නවා. නගරයේ පාසල්වල අවුරුදු 20ක් තිස්සේ සිටින ගුරුවරු ඉන්නවා. Unionsවල සිටින සමහර අය උගන්වලාම නැහැ. එහෙම නැති අයත් ඉන්නවා. උදාහරණයක් වශයෙන්, විහාර මහාදේවි විද්‍යාලය ගත්තොත්, එම පාසලේ ගුරුවරයෙක් ඉන්නවා, උගන්වලාම නැති. එහෙම අය බදුල්ල විද්‍යා විද්‍යාලයේත් ඉන්නවා. මම මේ අතුරු ප්‍රශ්නය ඇසුවේ ඔබතුමියලා අපහසුතාවට පත් කිරීමට නොවෙයි. නමුත් ඒ unionsවලින් ස්ථාන මාරුවීම් කරනකොට, අවුරුදු 20, 30 ඉන්නා අය සාධාරණව බෙදා ඔබතුමිය මැදිහත් වෙලා එම ස්ථාන මාරුවීම් සිදු කරන්න කියන ඉල්ලීම තමයි මම දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ඉදිරිපත් කරන්නේ.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, වෘත්තීය සමිතිවලින් නොවෙයි, ගුරු මාරු මණ්ඩලයෙන් තමයි ගුරු මාරුවීම් සිද්ධ කරන්නේ. ඒකේ වෘත්තීය සමිති නියෝජනයක් තිබෙනවා.

සියලුම වෘත්තීය සමිතිවල නියෝජනයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ මොහොතේදීත් මෙච්චර ජරමරයක් වෙලා තිබෙන්නේ වෘත්තීය සමිතිවල මැදිහත් වීම නිසාම නොවෙයි. දේශපාලනඥයන්ගේත් මැදිහත් වීම නිසා තමයි මේක මේ වෙලාවේ මහා අව්වාරුවක් වෙලා තිබෙන්නේ. මෙවර මම සියලුම වෘත්තීය සමිතිවල නායකයන් මුණ ගැහුණා, අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරන්න. *[බාධා කිරීමක්]* ඒ වෙලාවේදී ඔවුන් මට කිව්වා, අවුරුදු ගණනාවකින් පළමු වරට ස්වාධීනව, හරියට මේ ගුරු මාරු පත්වීම් කරගන්න පුළුවන් වුණු පළමුවෙනි වසර මේ වසර කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒක සිද්ධ වුණේ මම ඒකට මැදිහත් නොවුණු නිසායි. මගේ ස්ථාවරය මෙයයි. ගුරු මාරු මණ්ඩලය කියලා නිල මණ්ඩලයක් තිබෙනවා. ගුරු මාරු සිද්ධ විය යුත්තේ, ඒ ගුරු මාරු මණ්ඩලයෙන් මිසක් ඇමතිතුමිය මැදිහත් වෙලා නොවෙයි. මගේ මැදිහත්වීම වෙන්නේ ගුරු මාරු මණ්ඩලය ස්වාධීනව වැඩ කරනවාද කියලා බලන්න පමණයි.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

බිංගිරිය අපනයන සැකසුම් කලාපය: ආයෝජන සහ රැකියා අවස්ථා

பிங்கிரிய ஏற்றுமதி செயலாக்க வலயம்: முதலீடுகள் மற்றும் வேலைவாய்ப்புகள்

BINGIRIYA EXPORT PROCESSING ZONE: INVESTMENTS AND EMPLOYMENT OPPORTUNITIES

112/2024

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කරන ලද දිනය කවරේද;

(ii) මේ වනවිට එම කලාපය සඳහා ලැබී ඇති ආයෝජන සංඛ්‍යාව හා ඒවායේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයෝජන තුළින් මේ වනවිට උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අපනයන කලාපය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නිති, තිට්ටමිටල් මත්‍රුම් පොරුළාතාර අපිවිරුත්ති අමෛච්චරෛක් කේට්ට විනා:

(අ) (i) පිංකිරිය ඒත්‍රුමති චෙයලාක්ක වලයම් තාපික්කප්පට්ට තිකති යාතෙන්පතෛයුම්;

(ii) මේත්පටි වලයත්තිර්කාක ඉන්‍රළවිල් කිටෛත්තුළ්ළ මුතලීටුකළින් එණ්ණික්කෛ මත්‍රුම් අවත්‍රින් පෙරුමති වෙව්වේරාක යාතෙන්පතෛයුම්;

(iii) මේත්පටි මුතලීටුකළාල් ඉන්‍රළවිල් උරුවාක්කප්පට්ටුළ්ළ නේරටියාන මත්‍රුම් මරෙමුකමාන වේලෛවාය්ප්පුකළින් එණ්ණික්කෛ තනිත්තනියේ යාතෙන්පතෛයුම්;

(iv) මේත්පටි ඒත්‍රුමති වලයත්තෛ මේලුම් අපිවිරුත්ති චෙය්වතර්කාක මේර්කොළ්ළප්පටුම් නටවටික්කෛකළ් යාවෛ එන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) date on which the Bingiriya Export Processing Zone was established;

(ii) number of investments received for the said zone and their value, separately;

(iii) numbers of direct and indirect employment opportunities that have been generated through the aforesaid investments, separately; and

(iv) measures taken for further development of the export zone concerned?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2019 මාර්තු 4.

(ii)

	ව්‍යාපෘති නම	ඇස්තමේන්තුගත ආයෝජන (ඇමෙරිකානු ඩොලර් මිලියන)		
		විදේශීය	දේශීය	එකතුව
1	සයිනර්ජි ෆාමසූටිකල්ස් කෝර්ප්	-	16.14	16.14
2	ෆයිලොකෙම්	6.00	-	6.00
3	සිලෝන් ප්‍රැග්රන්ස් ගෘප්	1.80	-	1.80
4	එම්පයර් ෆිඩ් මිල්ස්	0.57	13.71	14.29
5	ඩොංෂියා ඉන්ඩස්ට්‍රියල් ලංකා	9.00	-	9.00
	එකතුව	**17.37**	**29.86**	**47.23**

(iii)

	ව්‍යාපෘති නාමය	රැකියා (ගණන)	
		ඇස්තමේන්තුගත	සත්‍ය
1	සයිනර්ජි ෆාමසූටිකල්ස්	150	-
2	ෆයිලොකෙම්	73	-
3	සිලෝන් ප්‍රැග්රන්ස් ගෘප්	60	-
4	එම්පයර් ෆිඩ් මිල්ස්	182	16
5	ඩොංෂියා ඉන්ඩස්ට්‍රියල් ලංකා	3000	413
	එකතුව	**3465**	**429**

එමඟින් ආසන්න වශයෙන් සෘජු රැකියා උත්පාදනයට වඩා තුන් ගුණයකින් වක්‍ර රැකියා උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

(iv) බාහිර යටිතල පහසුකම් සංවර්ධනය

- ප්‍රවේශ **මාර්ගය**

  තුන්තොට සිට හෙට්ටියාකොටුව දක්වා ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් කරගෙන යනු ලබන අතර, මුළු දිග ප්‍රමාණය කිලෝමීටර් 6.05ක් වේ. අපනයන සැකසුම් කලාපයේ අවරෝධක කලාපය තුළ ඉදිකෙරෙන වතුවත්ත සිට හෙට්ටියාකොටුව දක්වා වන මාර්ග කොටසෙහි සියයට 80ක පමණ ප්‍රමාණයක් ඇස්ෆෝල්ට් තාර දමා සම්පූර්ණ කර ඇති අතර, කිලෝමීටර 4.85ක් පමණ වන තුන්තොට සිට වතුවත්ත දක්වා කොටස සියයට 7ක පමණ සංවර්ධන මට්ටමක පවතී. මාර්ග කොටස සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්තුමියගේ මූලිකත්වය යටතේ දැනට සිදු කෙරෙමින් පවතී. ඉහත මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2025 වසර තුළ පවත්වා ගෙන යාම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 1,000ක මුදලක් ඉල්ලුම් කර ඇත.

- ජල සැපයුම්

  දිනකට ඝන මීටර් 2,000ක ජල සැපයුමක් කලාපය සඳහා මේ වනවිට ලබා දී ඇත. පවතින ජල සැපයුම් වැඩිදියුණු කිරීම සඳහා නව ජල සැපයුම් යෝජනා ක්‍රමයක් ස්ථාපිත කළ යුතුව ඇත. ඉදිරියේදී ජල සැපයුම් දිනකට ඝන මීටර් 10,000ක ප්‍රමාණයක් දක්වා වැඩිදියුණු කිරීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ඉල්ලුම් කර ඇති අතර, එම ආයතනයේ ඉදිරි සැලසුම්වලට මෙය ඇතුළත් කරගනු ලැබ ඇත.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

- විදුලි සැපයුම
මෙගාවොට් 2ක විදුලි සැපයුමක් කලාපය සඳහා මේ වනවිට ලබා දී ඇත. විදුලි සැපයුම මෙගාවොට් 10 දක්වා වැඩිදියුණු කිරීම සඳහා විදුලි උප පොළ ඉදිකිරීම විදුලිබල මණ්ඩලය යටතේ මේ වනවිට ආරම්භ කර ඇත.

<u>අභ්‍යන්තර යටිතල පහසුකම් සංවර්ධනය</u>

- අභ්‍යන්තර මාර්ග ජාලය
අභ්‍යන්තර මාර්ග ජාලය සඳහා මූලික ආකෘති ගොඩනැඟීම දැනටමත් අවසන් කර තිබේ.
2025දී මාර්ග මතුපිට වැඩ නිම කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සැලසුම් කරයි.

- ජල සැපයුම
අභ්‍යන්තර ජල විතරණ ජාලය දැනටමත් අවසන් කර ඇති අතර, බිංගිරිය EPZහි ආයෝජකයින්ට ජල සම්බන්ධතාවන් ලබා දී ඇත.

- විදුලි සැපයුම
අභ්‍යන්තර විදුලි විතරණ ජාලය දැනටමත් සම්පූර්ණ කර ඇති අතර, ආරම්භක ඉල්ලුම වන 10 MVA ස්ථානයේදී ලබා ගත හැකි වේ.

සියලුම පළමු හා දෙවන අදියර (Phases I & II) සඳහා වන මුළු විදුලි සැපයුම 20 MVA දක්වා වර්ධනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය (CEB) එකඟ වී ඇත.

- ආරක්ෂිත වැට
පළමු අදියර සඳහා මීටර් 3,625 දිග ආරක්ෂිත වැට දැනටමත් සම්පූර්ණ කර ඇත. ප්‍රධාන ප්‍රවේශ ද්වාරය සහ ඉතිරි ආරක්ෂිත වැට 2025දී සම්පූර්ණ කිරීමට BOI සැලසුම් කරයි.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -133/2024- (2), ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

COVID-19 පිළිබඳව වන සායනික පුහුණු මාර්ගෝපදේශකය නමැති ප්‍රකාශනය: විශේෂඥ සම්පත්දායකයින්

COVID-19 சிகிச்சை நடைமுறை வழிகாட்டல் வெளியீடு: துறைசார் வல்லுநர்கள்

PUBLICATION ON PROVISIONAL CLINICAL PRACTICE GUIDELINES ON COVID-19: EXPERT RESOURCE PERSONS

247/2024

4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rauff Hakeem, Attorney at Law)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 'COVID-19 වැලදී ඇතැයි සැක කෙරෙන රෝගීන් සහ තහවුරු කරන ලද රෝගීන් පිළිබඳව වන සායනික පුහුණු මාර්ගෝපදේශකය' නමැති ප්‍රකාශනය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රකාශනයට අන්තර්ගතය සහ නිර්දේශ මඟින් දායක වූ විශේෂඥයින්ගේ නම් කවරේද;

(iii) ඔවුන් විශේෂඥ සම්පත්දායකයින් ලෙස සේවය කරන අවස්ථාවේදී ඔවුන් අනුබද්ධිතව සිටි ආයතන සහ ඔවුන්ගේ තනතුරු නාම කවරේද;

(iv) ඔවුන් පත් කිරීම සඳහා වගකීම දැරූ බලධාරියා කවුරුන්ද;

(v) ඔවුන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද නිර්ණායක/පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ප්‍රකාශනයේ 7 වන ඡේදය පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, එම ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සඳහා වග කිව යුතු නිශ්චිත විශේෂඥ සම්පත්දායකයින්ගේ නම් කවරේද;

(iii) 7 වන ඡේදයේ අන්තර්ගතය සහ නිර්දේශ සකස් කිරීම සඳහා භාවිත කරන ක්‍රියාවලිය, ලේඛන සහ ආශ්‍රේය ග්‍රන්ථ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 7 වන ඡේදයේ නිර්දේශ දේශීය හෝ ජාත්‍යන්තර වශයෙන් වෛද්‍ය ආචාර ධර්ම සහ වෛද්‍ය මානව විද්‍යාව යන ක්ෂේත්‍රවල විශේෂඥයින්ගේ වෘත්තීය මතයට භාජනය වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'COVID-19 சந்தேகத்திற்கிடமான மற்றும் உறுதிப்படுத்தப்பட்ட நோயாளிகளுக்கான சிகிச்சைக்குரிய நடைமுறை வழிகாட்டுதல்கள்' தொடர்பான வெளியீட்டினைப் பற்றி அவர் அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி வெளியீட்டின் உள்ளடக்கத்திற்கும் விதப்புரைகளுக்கும் பங்களித்த துறைசார் வல்லுனர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) அவர்கள் துறைசார் வளவாளர்களாகப் பணியாற்றும்போது அவர்கள் இணைக்கப் பட்டிருந்த நிறுவனங்கள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

(iv) அவர்களை நியமிப்பதற்குப் பொறுப்புடைய அதிகாரி யார் என்பதையும்;

(v) அவர்களைத் தெரிவுசெய்வதற்குப் பின்பற்றப் பட்ட அளவுகோல்கள் அல்லது அடிப்படைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வெளியீட்டின் பிரிவு 7 தொடர்பில் அவர் அறிந்திருக்கின்றாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்குறிப்பிட்ட பிரிவின் உள்ளடக்கத்திற்கும் விதப்புரைகளுக்கும் பொறுப்பான குறிப்பிட்ட துறைசார் வல்லுநர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) பிரிவு 7இன் உள்ளடக்கத்தினையும் விதப்புரைகளினையும் உருவாக்குவதற்குப் பயன்படுத்தப்பட்ட செயன்முறை, ஆவணங்கள் மற்றும் உசாத்துணைகள் என்பவற்றினை வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) பிரிவு 7இல் காணப்படும் விதப்புரைகள் உள்நாட்டு அல்லது சர்வதேச மருத்துவ நெறிகள் மற்றும் மருத்துவ மானுடவியல் துறையிலுள்ள நிபுணர்களின் தொழில்சார் அபிப்பிராயத்திற்கு உட்படுத்தப்பட்டதா;

என்பதையும் அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware of the publication "Provisional Clinical Practice Guidelines on COVID-19 Suspected and Confirmed Patients";

(ii) if so, the names of the experts who contributed contents and recommendations to the publication;

(iii) their affiliations and designations at the time of their serving as expert resource persons;

(iv) the authority responsible for appointing them; and

(v) the criteria/basis followed to select them?

(b) Will he also inform this House -

(i) whether he is aware of Section 7 of the above publication;

(ii) if so, the names of the specific expert resource persons responsible for the content and recommendations in the above-mentioned Section;

(iii) separately, the process, documents and references used to develop the content and recommendations in Section 7; and

(iv) whether the recommendations in Section 7 are subject to the professional opinion of experts in the fields of medical ethics and medical anthropology, either locally or internationally?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii), (iii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

Annex 01

GUIDELINES DEVELOPMENT AND EDITORIAL COMMITTEE

Dr. Ananda Wijewickrama	Consultant Physician, National Institute of Infectious Diseases, IDH/President, Ceylon College of Physicians
Dr. Damayanthi Idampitiya	Consultant Physician, National Institute of Infectious Diseases, IDH
Dr. Eranga Narangoda	Consultant Physician, National Institute of Infectious Diseases, IDH
Dr. Amitha Fernando	Consultant Respiratory Physician, NHSL, Colombo
Dr. Chandimani Udugodage	Consultant Respiratory Physician, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura
Dr. Jayantha Weeraman	Consultant Paediatrician, Epidemiology Unit, Colombo
Dr. Neranjan Dissanayake	Consultant Respiratory Physician, Teaching Hospital, Ratnapura
Dr. Manoj Edirisooriya	Consultant in Intensive Medicine, NHSL, Colombo
Dr. Upul Dissanayake	Consultant Physician, NHSL, Colombo
Dr. Priyankara Jayawardana	Consultant Physician, De Soysa Maternity Hospital, Colombo
Dr. Rohitha Mutugala	Consultant Virologist, Teaching Hospital, Kandy
Dr. Channa Perera	Consultant Judicial Medical Officer, Colombo
Dr. Indika De Lanerole	Consultant Emergency Physician, NHSL, Colombo
Dr. Hasitha Tissera	Consultant Epidemiologist, Epidemiology Unit

Editorial Assistance

Dr. Azhar Ghouse	Senior Registrar in Community Medicine, Family Health Bureau
Dr. Sammani Ratnayake	Research Assistant, Epidemiology Unit

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iv) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

(v) අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති පිරිසක් මේ සඳහා පත් කිරීමට කටයුතු යොදන ලදී.

(ආ) (i) ඔව්. ඇමුණුම 02* මඟින් දක්වා ඇත.

(ii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

(iii) අදාළ විශේෂඥයන්ගෙන් සමන්විත කමිටුව මඟින් පවත්වන ලද රැස්වීම හා අන්තර්ජාතික වශයෙන් එවකට අනෙකුත් රටවල් අනුගමනය කළ ක්‍රියාපිළිවෙත් හා කාලීනව ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් නිකුත් කරන ලද මාර්ගෝපදේශන පදනම් කරගෙන විද්වත් කමිටුවේ ඒකමතික තීරණයක් මත ලංකා කායික විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා ඒකකය විසින් සකස් කරන ලදී.

(iv) අන්තර්ජාතික වශයෙන් පිළිගත් වෘත්තීමය නිපුණතාවක් සහිත විද්වතුන්ගේ අදහස්, නිර්දේශ හා පළ කරන ලද ලියවිලි මත පදනම්ව මෙම ප්‍රකාශනය නිකුත් කර ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

මෑතකදී දිවයින පුරා සිදු වූ විදුලිය බිඳවැටීම
நாடளாவிய ரீதியில் அண்மையில் ஏற்பட்ட மின்தடை
RECENT ISLANDWIDE POWER OUTAGE

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I ask the following Questions from the Hon. Minister of Energy:

1. What were the root causes of the recent power failure and how did the monkey incident at the Panadura Substation contribute to that outage? Is this the first time an animal had caused a nationwide blackout?
2. What measures were taken to restore power, mitigate disruptions of this essential service and why did it take approximately six hours to fully restore electricity across the country?
3. What steps are being taken to prevent such widespread power failures in the future and what is the timeline for implementing those measures?
4. Could the Hon. Minister confirm whether there were any prior warnings or indicators of a potential grid instability, which were overlooked?
5. What is the estimated economic impact of this power outage on businesses and households and what compensation, if any, is being considered for those affected?
6. Is there any indication of negligence, technical failure or sabotage and if so, will there be any independent inquiry into the matter?
7. What is the average cost of generation at the CEB in the last three months and is the entity pursuing a cost-reflective policy as of today?

Hon. Speaker, I am disappointed that the Hon. Minister concerned is not here to answer the Question regarding a very important incident that happened ten days ago. Normally, there has been a sense of discipline pursued by the Hon. Ministers in answering these Questions.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවැනි වරටත් ලැබෙන්නේ නැහැ වාගෙයි උත්තරය.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අපි පිළිතුරු ලබා දෙනවා, ගරු මන්ත්‍රීතුමා. බලශක්ති ඇමතිතුමා මේ සතිය ඇතුළත උත්තරයක් ලබා දෙයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මම හිතන විධියට එතුමාට පෞද්ගලිකව ඒකට උත්තරයක් දෙන්න අමාරු වෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක හැටියටයි මම මේ උත්තරය ලබා දෙන්නේ. බලශක්ති ඇමතිතුමා මේ සතිය ඇතුළත ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තර ලබා දෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට උත්තර ඉල්ලන්නේ අද දවසේ. නැවත උත්තර දෙන්නේ කවදාද කියලා අපි දන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් මීට වඩා විනයක් ඔබතුමන්ලාට තිබිය යුතුයි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ජාතික වශයෙන් වැදගත්කමක් සහිත ප්‍රශ්නයක් ඇහුවාම සාමාන්‍යයෙන් ඇමතිවරයා එම ප්‍රශ්නයට එදාම උත්තර ලබා දෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් තොරතුරු ලබාගෙන දවස් දෙක තුනක් ඇතුළත උත්තර ලබා දෙන්නත් පුළුවන්. ඒ අනුව ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට මේ සභිය ඇතුළත ගරු ඇමතිතුමා විසින් පිළිතුරක් ලබා දෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට එක් කාරණයක් අහන්න ඕනෑ. අපි ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් අහනවා නම්, එම ප්‍රශ්නය පැය 48කට පෙර හෝ පැය 72කට පෙර භාර දෙන්න ඕනෑ. එසේ ප්‍රශ්නය ලබා දී තිබියදී ඇමතිතුමාට උත්තරයක් ලබා දෙන්න බැරි ඇයි? මේ කාරණය ඉතාම දරුණු ප්‍රශ්නයක් ලෙස රට පුරාම කථා කළා.

මේ සිද්ධිය ලෝකයටම ගියා, වඳුරෙකු නිසා මුළු විදුලිය පද්ධතියම බිඳ වැටුණා කියලා. ඒ සම්බන්ධයෙන් අතුරු ප්‍රතිඵල ගණනාවක් ඇති වෙලා තිබෙනවා. අද solar power, wind power තුළින් විදුලිය ජනනය කරන්න ඉඩ දෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා විනයක් අනුව කටයුතු කරනවා කියලා කියනවා. මම දන්නවා, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කරලා වැඩක් නැති බව. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් හෙට හෝ අනිද්දා උත්තරයක් ලැබෙවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මම කියපු හැටියටම ඉතාම කඩිනමින්, දවස් කිහිපයක් ඇතුළතදී අපි එතුමාට ඒ පිළිතුර ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමා, දැන් විදුලිය තිබෙනවා නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදුලිය තිබෙන එක නොවෙයි. පාරිභෝගිකයෝ හැටපන්ලක්ෂයක් ඉන්නවා. බැරි වෙලාවත් මේ අයට රුපියල් 10ක බිලක් ගෙවන්න තිබිලා ඒක ගෙව්වේ නැත්නම් ලංකා විදුලිබල මණ්ඩලය ගිහිල්ලා විදුලිය කපනවා. විදුලිබල මණ්ඩලයට තිබෙන්නේ uninterrupted power supply එකක් දෙන්න. නමුත් ඒගොල්ලන් හිතුමතේ දවසට තුන් හතර වතාවක් විදුලිය විසන්ධි කරනවා. එතකොට ඒ සම්බන්ධයෙන් මේ පාරිභෝගිකයන්ට වන්දි ගෙවනවාද? මමත් හිටපු විදුලිබල, බලශක්ති ඇමතිවරයෙකු වශයෙන් තමයි මේ ප්‍රශ්නය අහන්නේ. එතැන ඉංජිනේරුවන් 1,928දෙනකු ඉන්නවා. මේ සම්බන්ධයෙන් මේ දුන්නු උත්තරය මම හිතන විධියට රටට සෑහීමට පත්වීමට මදි. ඒ සම්බන්ධයෙන් මීට වැඩිය උනන්දුවෙන් සහ ආරක්ෂාවෙන් උත්තර දිය යුතුයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විදුලිබල පද්ධතියේ ඇතිවෙලා තිබෙන අසමතුලිතතාව සම්බන්ධයෙන් ඒ මණ්ඩලය සැලකිය යුතු මැදිහත්වීමක් කරමින් ඉන්නවා, මේකට ස්ථාවර පිළිතුරක් සොයා ගැනීම සඳහා. ඇත්තටම කියන්න ඕනෑ, දැන් ඔය වඳුරාගේ සිද්ධිය ඉවරයි නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ වඳුරා නිතර නිතර මතක් කරන්න එපා, මෙතැන. *[බාධා කිරීමක්]* අපි ඒ පද්ධතියේ අස්ථාවරත්වයට උත්තරයක් සොයමින් ඉන්නේ. පද්ධතියේ අස්ථාවරත්වයට උත්තරයක් සොයනවා. ඒ නිසා අපි ඒකට පිළිතුරක් ලබා දෙනවා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, දින දෙකකින් උත්තරය ලැබෙනවා කියලා කිව්වා නේ. අපි සභාවේ ඊළඟ වැඩකටයුතුවලට යමු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීමේ විවාදය. පළමුවැනි වෙන් කළ දිනය.

විවාදය ආරම්භ කිරීම, the Hon. (Dr.) Harsha de Silva. You have 45 minutes.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කල් තබන ලද විවාදය නවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.

ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]

"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [17th February]

"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]

Question again proposed.

[පූ.භා. 10.00]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, පුනරුදා ආණ්ඩුවේ පළමුවැනි අය වැය ඊයේ ගරු ජනාධිපති මා මිත්‍ර අනුර කුමාර දිසානායක මැතිතුමා මුදල් ඇමති හැටියට ඉදිරිපත් කළා. ඉදිරිපත් කරන ගමන් එතුමා මට පොඩි "ෂොට්" එකකුත් ගැහුවා. කමක් නැහැ, යාළුවා නේ. හැබැයි, ඉතින් ජේවීපී එක ජනතාවට දීපු පොරොන්දු ඉටු කර ගන්න බැරුව, මම ඉල්ලන දේවල් එතුමාට දෙන්න බැහැ නේ.

මුලින්ම මම එතුමාට සුබ පතනවා, එතුමාගේ නායකත්වයෙන් මන්ත්‍රීතුමන්ලා 3දෙනෙකු හිටපු පාර්ලිමේන්තුව අද මන්ත්‍රීතුමන්ලා 159ක් දක්වා ශක්තිමත් කර ගන්න හැකි වීම සම්බන්ධයෙන්. දැන් තුනෙන් දෙකක බලයක් තිබෙන නිසා ඕනෑ ජාතියේ අය වැයක් සම්මත කර ගැනීමේ හැකියාවක් ආණ්ඩුවට තිබෙනවා. මන්ත්‍රීලා,

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඇමතිලා මහා ලොකුවට තැන් තැන්වල කථා කරනවා අපි දකිනවා, "අපි තමයි සියල්ල දත්, අපේ ආණ්ඩුව අවුරුදු 5ක් නොවෙයි අවුරුදු 15ක් ඉන්නවා" කියලා. සාකච්ඡාවකදී එක ඇමතිවරයෙක් අපේ විවේචනයක් දුෂ්ට ප්‍රකාශයක් කියලා බොහොම පහත් විධියට කියනවා ඊයේ රෑ අපි TV එකේ දැක්කා. එහෙම කට්ටියත් ඉන්නවා. ලජ්ජයි! අපි දැක්කා, පෙරේදා මාතලේ සිද්ධිය. Facebook එකේ post එකක් දාලා ආණ්ඩුව විවේචනය කළා කියලා JVP එකේ එක්කෙනෙක් ගෙදරකට ගිහිල්ලා කරපු තර්ජනය viral වෙලා තිබුණා. ගෝඨාභය ජනාධිපතිතුමාගේ කාලයේත් මෙහෙම අය හිටියා. ඔවුන් දැඩි අධිතක්සේරුවක හිටියා. රට වැටෙන්න යන කොට එදා විපක්ෂය හැටියට අපි එතුමන්ලාට ආයාචනා කළා, "ඔය දේ කරන්න එපා, දැන් හරි IMF එකට ගිහිල්ලා මේ රට වැටෙන්න කලින් ගොඩ ගන්න කියලා. වෘත්තීයවේදීන් ද එතුමන්ලාට එහෙම කිව්වා. නමුත්, ඇහුවේ නැහැ. මට මතකයි, එතුමන්ලා කියපු එක කථාවක්. ගරු කථානායකතුමනි, Opposition එකට ඇඟිල්ල දිගු කරලා එදා කිව්වා, "You can have your say, but we will have our way" කියලා. ඒ කියන්නේ, ඔයගොල්ලන් මොනවා කිව්වත් අපට වැඩක් නැහැ, අපේ දේ අපි කරනවා කියන එකයි. එතුමන්ලා පාර්ලිමේන්තු කමිටු ඔක්කොම අල්ලා ගත්තා. විපක්ෂයට කිසිම විධියකට තමන්ගේ මත ප්‍රකාශ කරන්න අවස්ථාවක් තිබුණේ නැහැ.

ගරු කථානායකතුමනි, පැරණි ග්‍රීක කියමනක් තිබෙනවා, hubris leads to nemesis කියලා. ඒ කියන්නේ, උඩඟුකම විනාශයට පාර කපනවා කියන එකයි. එහෙම අය තමයි දේශපාලන විවේචනයක් දරා ගන්න බැරිව "දූෂිතයෝ, දුෂ්ටයෝ" කියලා මිනිසුන්ට කියන්නේ.

ඇයි, මම මේ කථාව කිව්වේ? මට විශ්වාසයක් තිබෙනවා, ගරු ජනාධිපතිතුමා එහෙම නොකරයි කියලා. එහෙම කියන්න මට හේතුවකුත් තිබෙනවා. ගරු කථානායකතුමනි, මට හොඳට මතකයි, මීට අවුරුදු දෙකහමාරකට විතර කලින් මේ Lobby එකේදී එතුමායි, මමයි ලොකු argument එකක් ගිය බව. ඒක වුණේ ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කරන්න පුළුවන්ද බැරිද කියන එක සම්බන්ධයෙන්. එතුමා කිව්වා, බැහැ කියලා. මම කිව්වා, පුළුවන් කියලා. අවසානයේදී එදා මම කියපු දේ එතුමා පිළිගත්තේ නැහැ. 'මම දෙන්නම්කෝ, ඔයාට' කියලා එතුමා මට කිව්වා. හැබැයි, තවත් දින දෙකකට පස්සේ එතුමායි, මමයි විනාඩි 45ක් විතර දුරකථනයෙන් කථා කළා. එහිදී මම එතුමාට පැහැදිලි කර දුන්නා. එදා මම කථා කළේ, "අනුර" කියලා.

මම කිව්වා, "අනුර, මේක කරන්නේ මෙහෙමයි. අපි මේ විධියට කරමු" කියලා. එතකොට එතුමාත් විපක්ෂයේ, මමත් විපක්ෂයේ. අන්තිමට එතුමා ඒක පිළිගත්තා. ගරු කථානායකතුමනි, ඉතින් ඒ ආදර්ශයත් සමඟ මම විශ්වාස කරනවා, "දුෂ්ටයා" කියමින් යනවා වෙනුවට තුනෙන් දෙකේ ආණ්ඩුවට හැකියාවක් තිබෙවි කියලා, මාසයක් පුරාවට කරන අය වැය විවාදයේදී විපක්ෂය ගෙන එන විවේචනවලට ඇහුම්කන් දෙන්න; ධනාත්මක විවේචන පිළිගෙන මේ රට වැටී තිබෙන තැනින් යළි ගොඩ ගැනීමට ක්‍රියාත්මක වෙන්න. මොකද, අපි විපක්ෂයේ සිටියත් මේක අපේ රට. වැටුණේ ජේවීපී එකවත්, පොහොට්ටුවවත්, සජබයවත්, යූඑන්පී එකවත් නොවෙයි; වැටුණේ අපි ඔක්කෝම. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ සිටින අප කාටත් වගකීමක් තිබෙනවා, මේ රට ගොඩ ගන්න උදව් කරන්න.

ගරු කථානායකතුමනි, 2025 අය වැය විවාදය ආරම්භ කරන්න අද මට අවස්ථාව ලබා දුන් ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට ස්තුතිවන්ත වෙමින්, ඊයේ ඉදිරිපත් කළ අය වැය යෝජනාවලියට පිළිතුරු දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

මම ඉස්සෙල්ලාම ප්‍රශ්නයක් අහන්නම්. පල්ලියේ පූජකතුමාට පන්සලේ බණ කියන්න පුළුවන්ද? ඕක තමයි ප්‍රශ්නය. හැබැයි, මේක වැරදියට අර්ථ කථනය කරන්න එපා. මම ආගම ගැන කථා කරනවා නොවෙයි මේ. මම ගන්නේ උපකල්පනයක්. ඕනෑ නම් ඒ ප්‍රශ්නය අනෙක් පැත්තට අහන්නත් පුළුවන්, පන්සලේ ස්වාමීන් වහන්සේට පල්ලියේ පූජාව තියන්න පුළුවන්ද කියලා. අමාරුයි. සමහරු උත්සාහ කරන්න පුළුවන්; කරන්නත් ඉඩ තිබෙනවා. හැබැයි, ලෙහෙසි නැහැ. උදාහරණයක් හැටියට, සිහාලෝවාද සූත්‍රය හොඳින් තේරුම් අරගෙන ආර්ථිකය ආශ්‍රයෙන් බණක් කියන්න හැකියාවක් තිබේවි. එහෙම කරන කොට ප්‍රශ්නයක් මතු වෙනවා, ධම්ම පදය පිළිගන්නේ බයිබලය අතහැරලා ද කියලා. ගරු කථානායකතුමනි, මෙන්න මේ වාගේ කාරණාවක් තමයි අද විග්‍රහ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මම ඊයේ කාටූන් එකක් පෙන්නුවා. මේ කාටූන් එකටත් නොයෙක් අය පහර ගහලා තිබුණා. හසන්ත විජේනායක තමයි ඊයේ "අරුණ" පත්තරේට මේ කාටූන් එක ඇඳලා තිබෙන්නේ. මිනිසුන් කියන දේවල් තමයි මේවායේ තිබෙන්නේ. මොකක්ද, මේකේ තිබෙන්නේ? මෙහි එක පැත්තක ඉන්නවා හිටපු ජනාධිපතිතුමා, කැරකෙන පුටුවේ ඉන්නවා මුදල් ලේකම්තුමා, අනෙක් පැත්තේ ඉන්නවා අනුර ජනාධිපතිතුමා. අය වැය මෙන්න මෙහෙමයි කියලා හිටපු ජනාධිපතිතුමා දෙන අය වැය මුදල් ලේකම්තුමා වත්මන් ජනාධිපතිතුමාට දෙනවා. මේක තමයි අද සමාජයේත් කථා වන දේ. සමාජයේ කථා වන දේවල් තමයි මිනිස්සු කාටූන්වල අඳින්නේ. යමෙක් යමක් විශ්වාස කරනවා නම්, ඒ පිළිබඳව යමක් කියනවා නම්, ඒ කියන දේ හදවතේ ගැඹුරුම තැනින් එන්න ඕනෑ. හැබැයි ප්‍රශ්නය වන්නේ එහෙම වනවාද කියන එකයි.

1970-1977 කාලයේ ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා සමසමාජ පක්ෂයේ මුදල් ඇමතිවරයා හැටියට එතුමන්ලාගේ පළමුවැනි අය වැය ඉදිරිපත් කළා. ලංකාව සමසමාජ දේශපාලනය ක්‍රියාත්මක වන රටක් බවට පරිවර්තනය කරන්න එතුමා දැවැන්ත උත්සාහයක් ගත්තා. දේශපාලනික, ආර්ථික මතවාදය පළමුවැනි අය වැයෙන් එතුමා රටට පැහැදිලි කළා. මම එයින් වචන කිහිපයක් කියවන්නම්. මේ, 1970 ඔක්තෝබර් 25වැනි දා එතුමා කළ ප්‍රකාශය:

"Mr. Speaker,

It is a great privilege to have the honour of presenting the first Budget of the United Front Government ...."

"On the 27th of May, 1970, the people of this country endorsed the programme of the United Front placed before them and gave the Front an overwhelming majority with a mandate to carry through this programme. In the process, the country has rejected the policies hitherto followed by the United National-cum-Federal Party during the period 1965-1970."

"In repudiating and rejecting the policies followed by the U.N.P.-F.P. Government, the country has endorsed the programme of the United Front of the Sri Lanka Freedom Party, the Lanka Samasamaja Party and the Communist Party. That programme lays the foundation for the building up of a socialist society. It assumes as its thesis that a developing country cannot leave development at the mercy of the inter-play of forces which are motivated solely by the profit instinct."

"We have embarked upon a unique task."

මොකක්ද මේ කියන්නේ? එතුමන්ලා ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය ජනතාවට ගිහිල්ලා කියපු එක වැරදියි, යූඑන්පී එක වැරදියි, අපි තමයි හරි කියලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමන්ලාගේ න්‍යාය, මතය ඉදිරිපත් කළා. ඊට පස්සේ තමයි එතුමන්ලා අය වැය ගැන ඇත්ත වශයෙන්ම සාකච්ඡාවක් කරන්නේ. ඒ වාගේම ගරු කථානායකතුමනි, රොනී ද මැල් හිටපු ඇමතිතුමාගේ 1978 අය වැය කථාවෙන් මම වචනයක් දෙකක් කියවන්නම්. එතුමා ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතාගේ අය වැය සම්පූර්ණයෙන්ම විවේචනය කරලා කියනවා, මේක වැරදියි, ඒ නිසා අපි අලුත් දෙයක් කරනවා, ඒකට තමයි හයෙන් පහක බලයක් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට ලැබුණේ, එතුමන්ලා මේ system එක change කරනවා කියලා. මම එයින් කොටස් කිහිපයක් කියවන්නම්. 1977 නොවැම්බර් 15වැනි දා මුදල් හා ක්‍රම සම්පාදන ඇමති ගරු රොනී ද මැල් මහතාගේ අය වැය කථාවේ මේ මේ විධියට කියනවා.

"මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ වෙන කවදාවත් නොලැබුණු වැඩි ඡන්ද බලයක් 1977 ජූලි 21 වැනි දා මේ ආණ්ඩුව තෝරා පත්කර ගනු ලැබිණි."

මහජනයා තමන්ගේ ඒ තීන්දුවෙන් 1970 සිට 1977 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළහ."

ගරු කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ මැනිවරණ ප්‍රකාශනයෙහි සඳහන් පරිදි අපේ මාතෘ භූමියෙහි නිදහස් නිවහල් ධර්මිෂ්ඨ සමාජයක් ගොඩ නැංවීමට අපි ඇප කැප වී සිටින්නෙමු."

නිදහස් නිවහල් ආර්ථික පදනමක් නොමැතිව නිදහස් නිවහල් සමාජයක් බිහි කළ නොහැකිය."

මා ඉදිරිපත් කරන්නේ, නිදහස් නිවහල් ආර්ථිකයක් ගොඩනැංවීමේ පවිත්‍ර චේතනාවකින් යුතුවයි."

එහෙම එතුමාගේ කථාව කියාගෙන යනවා.

මම මේ කියන්න උත්සාහ කරන්නේ මෙකයි. ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතාගේ දේශපාලන මතවාදයට අනුව එතුමා සහ එතුමාගේ ආණ්ඩුව ඉදිරිපත් කළා, වැඩ පිළිවෙළක්. ඊට පස්සේ රොනී ද මැල් ඇමතිතුමා පෙනී හිටපු එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව ඔවුන්ගේ වැඩ පිළිවෙළ, ඔවුන්ගේ මතවාදය ඉදිරිපත් කළා. නමුත් ඊයේ මොකක්ද වුණේ? ඊයේ වුණේ ඊට හාත්පසින්ම වෙනස් දෙයක්.

එතුමන්ලා කාලයක් තිස්සේ විවේචනය කරපු, ඡන්දය ගන්න රට වටේ, ලෝකය වටේ ගිහිල්ලා හැමදේම වැරදියි, වැරදියි, වැරදියි කියපු එතුමන්ලාගේ මැතිවරණ ප්‍රකාශය මා ළඟ තිබෙනවා. මේ තිබෙන්නේ ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන මැතිවරණ ප්‍රකාශනය. මෙම මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් කර තිබෙනවා, "නිදහසින් පසු මෙරට පාලකයින් අනුගමනය කළ විනාශකාරී ආර්ථික ප්‍රතිපත්ති..." කියලා. එසේ අර්ථ කථනය කරපු වැඩ පිළිවෙළ ඇහට නොදැනී පොඩි පොඩි වෙනස්කම් ටිකක් කරලා සමස්තයක් වශයෙන් 2022 පැවැති රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ IMF වැඩ පිළිවෙළ ඒ විධියටම - ගෙඩිය පිටින්ම - ක්‍රියාත්මක කළා. ජනාධිපතිතුමා කියනවා, මෙවර අය වැය පදනම් වෙන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශය මත කියලා. ඒ, අර මම පෙන්වපු ප්‍රකාශනය.

මේ ළඟදී මම ඔබතුමන්ලාගේ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමති අනිල් ජයන්ත මැතිතුමා සමඟ පොඩි විවාදයක පැටළුණා. ඒක මම ඊයේ ඍ මේ කරුණු ලියනකොට මතක් වුණා. මම එතුමාගෙන් ඇහුවේ, ඔබතුමන්ලාගේ ආර්ථික model එක කුමක්ද, ඊළඟ අවුරුදු පහේ ආර්ථික වර්ධනය ඇති කර ගන්නේ කොහොමද කියලායි. මුදල් අමාත්‍යාංශ තිබෙනවා, Autoregressive Distributed Lag model එකක්. Autoregressive කියන්නේ, යම් විචල්‍යයක අද අගය ඊයේ අගයට හා හෙට අගයට සම්බන්ධයි කියන එක. ඒ, ඒ model එක. මම එදා එ් ගැන පැහැදිලි කරලා දුන්නා. හැබැයි, මම එතුමාත් එක්ක පොඩි විවාදයකට ගියාම එතුමා කිව්වා, "නැහැ. ඒ තමයි අමාත්‍යාංශය පාවිච්චි කරන model එක කියලා. අපට තිබෙන්නේ වෙන model එකක්.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Do not disturb. You reply when you speak. - *[Interruption.]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි දන්නවා ආර්ථිකය ගොඩනඟන්නේ කොහොමද, අපට ඒකට model එකක් තිබෙනවා කියලා එතුමා කිව්වා. නිෂ්පාදන ආර්ථිකය මඟින් 2030දී US Dollar 120 billion තත්‍ය දළ දේශීය නිෂ්පාදිතයක් හදනවා කියලා කියනවා; US Dollar 120 billion real GDP එකක් ලබා ගන්නවා කියලා මේකේ ලියනවා. අපි දන්නේ නැහැ අපේ රටේ ආර්ථිකයේ real GDP එක US Dollars වලින් මැන්නේ කවදද කියලා. කරුණාකරලා පුළුවන් නම් ඒක අපට පෙන්වා දෙන්න. US Dollarsවලින් නොවෙයි real GDP එක මනින්නේ Sri Lankan Rupeesවලින්. හැම දාම අපි එහෙම තමයි කළේ. මොකද Sri Lankan Rupees තමයි උද්ධමනයට හසු වෙන්නේ. ඉතින් ඒ නිසා අපි සාමාන්‍යයෙන් කියන්නේ මෙච්චර US Dollars ගණනක ආර්ථිකයක් ගොඩනඟනවා කියලායි. නැතිව, US Dollarsවලින් කියන real GDP එකක් ගැන අපි කවුරුත් කථා කරන්නේ නැහැ. ඉතින් ඒක පස්සේ වෙලාවක පැහැදිලි කරලා දෙන්නම්. 2030 වෙනකොට real GDP එක US Dollars බිලියන 130ක් නම් බලාපොරොත්තු වෙන්නේ, nominal ලෙස US Dollars කියක් බලාපොරොත්තු වෙනවාද කියන එකත් කරුණාකරලා අපට ඉදිරිපත් කරන්න.

දැන් බලන්න, 2023දී GDP එක රුපියල් බිලියන 27,275යි. 2024දී GDP එක රුපියල් බිලියන 30,000යි. ඒ කියන්නේ, නාමිකව සියයට 8කින් වර්ධනය වෙලා තිබෙනවා ගිය අවුරුද්දේ මේ රට; අපේ ආර්ථිකය. ගිය අවුරුද්දේ උද්ධමනය හරියටම කීයද කියලා නවම කියලා නැහැ. ගරු කථානායකතුමනි, නමුත් උපකල්පනය තිබෙන්නේ සියයට 1.3ක් වාගේ වෙලා කියලා. එහෙම නම්, අපේ ආර්ථිකය ගිය අවුරුද්දේ මූර්ත වශයෙන්, අඩුම වශයෙන් සියයට 6කින් විතර වර්ධනය වෙලා තිබෙනවා. උද්ධමනයයි, දළ දේශීය නිෂ්පාදනයේ අවධමනකයයි අතර, ඒ කියන්නේ, the difference between inflation and the deflator, පොඩි වෙනසක් තිබෙනවා, ලොකු වෙනසක් නොවෙයි. උද්ධමනයෙන් මනින්නේ ගෘහස්ථයට ගන්නා භාණ්ඩ පැස පිළිබඳව. හැබැයි, අවධමනකයෙන් මනින්නේ ඒ පැසට අමතරව රටේ නිෂ්පාදනය වෙන අනෙක් සියලු භාණ්ඩ හා සේවා තමයි ගරු කථානායකතුමනි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඊයේ ගරු ජනාධිපතිතුමා කියනවා 2025දී මූර්ත වර්ධනය සියයට 5ක් පමණ වෙයි කියලා බලාපොරොත්තු වෙනවා කියලා. එහි පසුබිම් කථාවකුත් තිබෙනවා, ගරු කථානායකතුමනි. අපේ මුදල් කමිටුවේ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. අපට ඉදිරිපත් කරලා තිබුණා වාර්තාවක්. අපි පක්ෂ-විපක්ෂ වුණාට එතැනදී අපට යම් code of conduct එකක් තිබෙනවා. අපි ඒවා එළියේ කථා කරන්නේ නැහැ. මොකද, ඒවායේ යම් sensitive information තිබෙන නිසා. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් කොහේවත් කථා කළේ නැහැ, අද තමයි කථා කරන්නේ. ඒකේ වර්ධනය සියයට 3ක් බලාපොරොත්තු වුණා කියලා තමයි නිලධාරින් පාර්ලිමේන්තුවට, -කමිටුවට- වාර්තා කළේ. ඇත්ත වශයෙන්ම එතැන හිටපු ගරු මන්ත්‍රීතුමන්ලාට මේක හොඳට මතකයි. අපි ඒ ගැන පැය භාගයක විතර විවාදයකුත් තිබුණා. මූර්ත වශයෙන් සියයට 3කින් වර්ධනය වෙන්න නම් උද්ධමනය කීයක් විය යුතුද කියන කාරණය පිළිබඳව අපි විවාද කළා. සියයට 5ක් මූර්ත ලෙස වර්ධනය වෙන්න නම්, නාමිකව සියයට 10ක් වර්ධනය වෙන්න නම්, මොකක්ද විය යුත්තේ?

රුපියල් බිලියන 30,000ට තිබෙන ආර්ථිකය එන අවුරුද්දට ගණනය කරලා තිබෙන්නේ 33,000යි කියලා. එහෙම නම් මූර්ත 5යි, උද්ධමනය 5යි වෙන්න ඕනෑ. එහෙමත් නැත්නම් මේ combination එක වෙනස් වෙන්න ඕනෑ 4යි, 6යි, එහෙම නැත්නම් 7යි, 3යි වාගේ. ඒක අපි දන්නේ නැහැ. හැබැයි අපට යම්කිසි විධියකට අවධමනය උපකල්පනය කර ගන්න හැකියාවක් තිබෙනවා. මොකද, ගිය මාසයේ උද්ධමනය ඍණ 4යි. එතැන පොඩි වෙනසක් තිබෙන එක මම කලින් පැහැදිලි කළා. එතකොට මේ අවුරුද්දටම, 2025 අවුරුද්දටම බලාපොරොත්තු වෙන්නේ බොහොම අඩු අගයක උද්ධමනයක්.

ඒ නිසා ඇත්ත වශයෙන්ම අපට දැන ගන්න ඕනෑ, උද්ධමනය අඩුවෙන අවස්ථාවක ඔබතුමන්ලාගේ ඔය කියපු ආර්ථික model එක පාවිච්චි කරලා, මෙච්චර කල් විනාශකාරී ආර්ථික ප්‍රතිපත්තියක් නිසා වැටිච්ච ආර්ථිකය ගොඩ ගන්නේ කොහොමද කියලා. ඒ සඳහා model එක කුමක්ද? අලුත් model එක මොකක්ද? අපි කිව්වා නේ, ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා ඔවුන්ගේ දර්ශනය ඉදිරිපත් කළා. රොනී ද මැල් ඔවුන්ගේ දර්ශනය ඉදිරිපත් කළා. එදා අනිල් ජයන්ත මහාචාර්යතුමා කියපු දේ 2025 ජනවාරි 7වැනි දා හැන්සාඩ් වාර්තාවේ 69වන තීරුවේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"මන්ත්‍රීතුමා, මම කිව්වේ දැනට තිබෙන තත්ත්වය - දැන් හදලා තිබෙන model එක - ...."

Autoregressive Distributed Lag model එක.

"... ගැන මිස අපි අනුගමනය කරන model එක ගැන නොවෙයි. ඒ නිසා ඒක වැරැදි විධියට අර්ථකථනය කරන්න එපා"

හරි, කරන්නේ නැහැ. එහෙම නම් අපට කියන්න, මේ බලාපොරොත්තු වන ඉලක්කවලට යන්නේ කොහොමද කියලා. එහෙම නම් ආර්ථික වර්ධනය සියයට තුනද, සියයට පහද, මොකක්ද? පැහැදිලි කරන්න. තුනයි, පහයි අතර කියලා Fiscal Management (Responsibility) Act එකේ තිබෙනවා. එහෙම නොවෙයි නේ, මොකක් හරි අගයක් දෙන්න ඕනෑ. අඩුම වශයෙන් අගය මොකක්ද කියන එක තමන්ට තර්කානුකූලව කියන්න පුළුවන් වෙන්න ඕනෑ. හැබැයි, අපට වරදින්න පුළුවන්. මොකද තවම දත්ත එළියට ඇවිල්ලා නැති නිසා. 2024ට වඩා 2025දී පුරෝකථනය කරන වර්ධනය අඩුයි. නග්ගලා දීපු බෝලයට ගහගන්න බැරි සයිස් එකක් තමයි අපට පෙනෙන්නේ. ජනාධිපතිතුමා කියනවා, 2025 අය වැය හැදුවේ ජනතාවගේ දායකත්වයෙන් කර්මාන්ත, සේවා, කෘෂිකර්මාන්ත අංශවල නිෂ්පාදනය වර්ධනය කරන්න කියලා. ඒක වෙන්න ඇති, ඔවුන් අදහස් කරන නිෂ්පාදන ආර්ථිකය.

ගරු කථානායකතුමනි, ඕක තමයි growth theory එකේ තිබෙන්නේ. It is the foundation of the Cobb-Douglas production function. අපි බොහෝ වෙලාවට කියනවා, Neoclassical Growth Model කියලා. සෝලෝ කියන පුද්ගලයාට තමයි Solow Growth Model එක ආදේශ කළාට Nobel Prize එක දුන්නේ. එතකෙන් කියන්නේ මොකක්ද? Our output is a function of labour and capital, ශ්‍රමයේ සහ ප්‍රාග්ධනයේ. මෙතැන ඇවිල්ලා ඕක තමන්ගේ model එක කියලා කියන්න බැහැ. අපි දන්නා ආර්ථික විද්‍යාවේ මූල ඉඳන්ම තිබෙන්නේ, "Y is a function of L and K" කියලා. හැබැයි, ප්‍රශ්නය වන්නේ මෙයයි. ඔය basic function එකෙන් එක්කෝ සියයට දෙක, එක්කෝ සියයට පහ, එක්කෝ සියයට දහය කියන ආර්ථික වර්ධනය ලබා ගන්නේ කොහොමද?

ඒකට තමයි ideology එකක් ඕනෑ. 1947දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඉදිරිපත් කරපු අය වැයේ ඉඳලා හැම දාම මූලික සිද්ධාන්තය වුණේ ඒක. මේක තමයි theory එක කියලා එය නැවත පැහැදිලි කරන්න දෙයක් නැහැ. නිෂ්පාදනය වැඩි කරන ideological stance එක තමයි අපට අවශ්‍ය වෙන්නේ. ගරු කථානායකතුමනි, හැබැයි කනගාටුවෙන් වුවත් මෙය කියන්න ඕනෑ. ඊයේ එහෙම ideology එකක් අපි දැක්කේ නැහැ. මොකද, අවුරුදු 76ක් තිස්සේ කළේ විනාශයක් නම්, ඒකම autoregressive එකක් හැටියට ඉස්සරහට අරගෙන යන්නේ කොහොමද? මොකක්ද වෙනස? කෝ, වෙනස? දැන් ඩොනල්ඩ් ට්‍රම්ප් නම් නොයෙකුත් දේවල් කියනවා. අඩු ගණනේ කියන්න පුළුවන් නේ, මෙන්න මේක තමයි අපි විශ්වාස කරන්නේ කියලා. අපි සමාජවාදී ද, ධනවාදී ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ද සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් ද, මොකක්ද කියලා කියන්න පුළුවන් නේ. ඒක තමයි අපි අහන්නේ පූජකතුමාට බයිබලයයි, ධම්මපදයයි පැටලුණාද කියලා. එහෙම නැත්නම්, පූජකතුමා බයිබලය අත හැරියා ද කියලා. එහෙමත් නැත්නම් මේක transition period එකක්ද කියලා. මොකද, අතිශයින් වැදගත් දේ තමයි, කෙනෙක් යමක් නිවැරදිව විශ්වාස කරන්නේ නැත්නම් ඇත්ත ජයග්‍රහණයක් ලබා ගන්න බැහැ කියන එක.

මම පොඩි උදාහරණයක් දෙන්නම්. මහ බැංකුව ස්වාධීන කරන පනතට විරුද්ධව එදා මෙතුමන්ලා බෙරිහන් දුන්නා. බැහැමයි කිව්වා. සමහරු මහ බැංකුවේ අධිපති නන්දලාල් වීරසිංහ මහතාට නුසුදුසු යම් යම් වචන පවා කිව්වා. තර්කය වුණේ මේකයි. ජනතා ඡන්දයෙන් පත් වුණු ආණ්ඩුවට පුළුවන් වෙන්න ඕනෑ මහ බැංකුව පාලනය කරන්න. මට හොඳට මතකයි, ඒ විවාදය. ඒක තමයි මෙතුමන්ලාගේ මතවාදය වුණේ. මොකද, ස්වාධීන මහ බැංකුවක් තියෙන්න බැහැ. පත් වුණේ ජනතා ඡන්දයෙන් නම්, ඔවුන්ගේ මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට යම්කිසි ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් තිබෙනවා කියන එක තමයි ඔවුන් ඒකට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරනකොට පාවිච්චි කළේ.

ඊළඟට, ප්‍රතිපත්ති පොලිය ස්ථාවර කිරීම සම්බන්ධයෙනුත් එතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. ඒ කියන්නේ පොලී අනුපාතය තිබිය යුත්තේ කුමන මට්ටමේද කියලා දේශපාලන තීරණයක් ගන්න පුළුවන් කියලා.

ඊළඟට තිබෙනවා, මූල්‍ය ප්‍රතිපත්තිය කියලා කොටසක්.

මේ තිබෙන්නේ. මූල්‍ය ප්‍රතිපත්තිය කියලා කොටසක් තිබෙනවා. මේ මූල්‍ය ප්‍රතිපත්තිය කියන්නේ මොකක්ද? ඉංග්‍රීසියෙන් ඒක financial policy ද, monetary policy ද? මම ගිහින් ඉංග්‍රීසි එක බැලුවා. ඉංග්‍රීසි එකේ තිබෙන්නේ, "monetary policy" කියලා. මම දැන් මූලික දෙයක් කියන්නම්කෝ. ගරු කථානායකතුමනි, මොකක්ද monetary policy කියන්නේ? Monetary policy කියන්නේ පාර්ලිමේන්තුවේ Budget එකෙන් කරන්න පුළුවන් දෙයක්ද? පාර්ලිමේන්තුවේ Budget එකෙන් පොලිය වෙනස් කරන්න පුළුවන්ද? එක නේ තර්කය වුණේ, පුළුවන් වෙන්න ඕනෑ කියලා.

Monetary policy කියන එක ගැන මහ බැංකුව කියන්නේ මෙන්න මේකයි. මම එය උපුටා දක්වන්නම්. "මුදල් ප්‍රතිපත්තිය යනු මිල ස්ථායිතාවය යන සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා මහ බැංකුවක් විසින් ආර්ථිකයක් තුළ මුදලේ පිරිවැය සහ මුදල් සැපයුම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියයි" ඒක තමයි monetary policy කියන්නේ. මේගොල්ලන් කරන්නේ fiscal policy. Fiscal policy කියන්නේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය. මේක දෙකක්. ඉතින්, මහ ලොකු පටලැවිල්ලක් ගැන මම මේ කියන්නේ. බයිබලයෙන් කෑල්ලයි, ධම්ම පදයෙන් කෑල්ලයි, කුරානයෙන් කෑල්ලයි. එහෙම කරන්න බැහැ. එතකොට බොහොම තදින් කැපිලා පෙනෙනවා, තමන්ගේ අය වැය හදන්න පාවිච්චි කරපු ප්‍රතිපත්ති ප්‍රකාශයේ මූලධර්මය ඊයේ ඉදිරිපත් කළ අය වැයට පරස්පරයි කියලා.

ඊයේ අය වැය කථාවෙන් මම උදාහරණ දෙකක් දෙන්නම්. ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගැන ලොකු කථාවක් තිබුණා; තවමත් තිබෙනවා. ඔවුන් රුපියල් බිලියන 250ක් ණය අරගෙන තිබෙනවාය කියනවා. දළ දේශීය නිෂ්පාදනයට සියයට 52ක දායකත්වයක් ලැබෙන්නේ ඔවුන්ගෙන්. රැකී රක්ෂාවලින් සියයට 45ක දායකත්වයක් ලැබෙනවා. ඔය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඡන්ද කාලයේ ඔයගොල්ලන් කොච්චර නම් ගිහින් කිව්වාද සහන දෙනවා කියලා. කිව්වාද, නැද්ද? කිව්වා. *Parate* execution postpone කළේ වෙන කවුරුත් නිසා නොවෙයි, සජිත් ප්‍රේමදාස මහත්මයා නිසා. එතුමා තමයි එදා තර්ක කරලා කිව්වේ *parate* execution postpone කරන්න කියලා. ඒක තවදුරටත් postpone කළා. හරි, අවුලක් නැහැ. හැබැයි ඔයගොල්ලන් කිව්වා, මිලියන 25ට අඩු නම් මෙච්චරයි, මිලියන 25 සිට 50 දක්වා මෙච්චරයි, මිලියන 50ට වැඩි නම් මෙච්චරයි, මෙන්න මේ පොලී අනුපාත යනාදි වශයෙන් සහන දෙනවා කියලා. ගරු කථානායකතුමනි, - මම දැක්කේ නැද්ද දන්නේ නැහැ. - හැබැයි ඊයේ අය වැය කථාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට - MSMEsවලට - අය වැය හරහා ලබා දෙන පොලී සහනය මොකක්ද කියලා කියනවා මම නම් දැක්කේ නැහැ. ඒක මම දැක්කේ නැහැ. රුපියල් බිලියන 20ක් තිබෙනවා, වෙනම කථාවකට. ඒක පොලිය අඩු කරන්න ආණ්ඩුවෙන් දෙන එකක් නොවෙයි; it is not an interest subsidy. මට දැනගන්න ඕනෑ, interest subsidy එක මොකක්ද කියලා. තිබෙනවා නම් කියන්න. රුපියල් බිලියන 250කට සාපේක්ෂව මේක ලොකු ගණනක් වෙන්න ඕනෑ. මම ඒක compare කරන්නේ මේ නිසායි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සියයට 5ක් දෙනවා කියලා ඔය කණ්ඩායම කිව්වා. නමුත් සියයට 3ක් දුන්නා. ඒක කමක් නැහැ කියමුකෝ. සියයට 3ක් හරි දුන්නා නේ. හැබැයි, මෙන්න මෙහෙමයි කියන්නේ. "...will be eligible for one-year fixed deposits of up to Rs. 1 million..." බොහොම සූක්ෂ්මව ලිස්සලා ගිහිල්ලා තිබෙනවා, රුපියල් මිලියනයක් දක්වා වූ වසරක ස්ථාවර තැන්පතු සඳහා කියලා. කරුණාකරලා පිළිතුරු කථාවේදී කියන්න, මේ සියයට 3 දෙන්නේ අවුරුද්දකට විතරද, රුපියල් මිලියනයකට විතරද කියලා. එහෙම කිව්වේ නැහැ නේ. සියයට 3ක් වැඩිපුර දෙනවා කිව්වා. අපි අහන ප්‍රශ්නය, සියයට 3 දෙන්නේ අවුරුද්දකටද, රුපියල් මිලියනයක් දක්වා පමණද කියන එකයි. ඒක එහෙම නොවෙයි නම් කරුණාකරලා අපට මේ ගැන පැහැදිලි කරන්න. පැහැදිලි කරලා විතරක් නොවෙයි, ඒකට කොපමණ මුදලක් යෙදෙව්වාද කියලාත් පෙන්වන්න. මොකද, යොදවා තිබෙන්නේ රුපියල් බිලියන 15ක පමණ මුදල් ප්‍රමාණයක්.

මම මේ කියන්න හදන්නේ මේකයි. මූල්‍ය ප්‍රතිපත්තිය ගැන පටලවා ගෙන තිබුණාට ඒක මූල්‍ය නොවෙයි, රාජ්‍ය මූල්‍ය. රාජ්‍ය මූල්‍ය නම් මුදල් වෙන් කළ යුතුයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා වාර්ෂික අතිරේක පොලී අනුපාතයක් ලබා දීමට රුපියල් බිලියන 15ක් වෙන් කළා. නමුත්, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යවසායකයන්ට කිසිදු වෙන් කිරීමක් කරනවා අපි දැක්කේ නැහැ. ඒක තමයි මම කලින් කිව්වේ, ජවිපෙ විශ්වාස කරන්නේ සමාජවාදය වුණාට, NPP ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ වෙන මොකක්ද එකක් කියලා. මම දන්නේ නැහැ, ඒක ධනවාදයද, සමාජවාදයද කියලා. ඒක මොකක්ද කියලා මට නම් තේරෙන්නේ නැහැ. මොකද, නායකයා ලොකු අයියා; ගරු ටිල්වින් සිල්වා මැතිතුමා. මම කල්පනා කළා, එතුමා මොකක්ද මේ ගැන කියන්නේ කියලා.

කැළුම් බණ්ඩාර කියන්නේ "Daily Mirror" පුවත් පතට ලියන, අපි කවුරුත් දන්නා ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියක්. ඔහු NPP ආණ්ඩුව සම්බන්ධයෙන් ටිල්වින් සිල්වා මැතිතුමාගෙන් අහනවා, ජවිපෙ පක්ෂය ඔවුන්ගේ මූලධර්මවලින් ඈත් වෙලාද කියලා. එතකොට ටිල්වින් සිල්වා මැතිතුමා කියනවා, "නැහැ, අපේ මූලික පරමාර්ථය තමයි සමාජවාදී සමාජයක්, රටක් ගොඩනඟන එක" කියලා. මොකක්ද මේ කියන්නේ? මේක තමයි ජවිපෙ ප්‍රධානියා කියපු කථාව. අධිරාජ්‍යවාදී, ධනවාදී ආර්ථික ක්‍රමය තුළ රට අගාධයට ගියා කියලාත් එතුමා කියනවා. ධනවාදී ආර්ථික ක්‍රමවේදය තුළ රට අගාධයට ගියා ලු. ඊළඟට කියනවා, සංස්කෘතිය නැති වුණා, පවුල් විනාශ වුණා, එතුමන්ලා ඒකට විරුද්ධයි කියලා.

එහෙම නම් මොනවද මේ කථා කරන්නේ? ඔය හේතුව නිසා නොවෙයිද, දශක ගණනාවක් තිස්සේ ආර්ථික ක්‍රමය විනාශ කරන්න සමහරු උදේ රෑ වෙහෙසුණේ? 1977දී ආර්ථික model එක හරහා පටන් ගත්ත ප්‍රතිසංස්කරණ නවත්වන්න ඔබතුමන්ලා කොපමණ මහන්සි වුණාද? අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඉඳලා, රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණවල ඉඳලා, ඉන්දියන් විරෝධතාවේ ඉඳලා, නිදහස් වෙළෙඳ ගිවිසුමේ ඉඳලා, MCC එකේ ඉඳලා, දැන් කරගෙන යන CEB Act එක නැවත වෙනස් කරන එක දක්වා කාලය තුළ වටිනා මිනිස් ජීවිත කීයක් නැති වුණාද? රුපියල් බිලියන කීයක දේපළ නැති වුණාද? ආර්ථිකය කොච්චර පස්සට ගියාද? ආයෝජකයෝ කී දෙනෙක් හැරිලා ගියාද? මා මිත්‍ර සුනිල් හඳුන්නෙත්ති මහත්මයා දවසක් කිව්වා, "මගෙ කලිසම අගේට ඇඳගෙන උගේ වාගේ යනවා" කියලා. මේක විහිළුවක් නොවෙයි. අවුරුදු 48ක් තිස්සේ රට යා යුතු මාර්ගය අවහිර කරලා දැන් ඒ පාරේ යන්න ඕනෑය වාගේ කථාවක් කියන එක දෙවයේ සරදමක් ද? හැබැයි මම කියනවා, පාර මොකක්ද කියන එක ඔවුන් දන්නේ නැහැ කියලා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පාර හොයනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
පාර හොයනවා. පාර පැටලිලා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මංමුළා වෙලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මංමුළා වෙලා. හැත්තෑපස් අවුරුද්දක් තිස්සේ මේ රටේ පාලකයෝ කළේ ආර්ථිකය විනාශ කරපු එක නම් දෙවියන්ගේ නාමෙට අපට කියන්න, මොකක්ද ඔයගොල්ලන්ගේ දැවැන්ත වෙනස, මොකක්ද පරිවර්තනය කියලා. මැතිවරණයට කලින් කිව්වේ අසත්‍යද? අසත්‍ය කිව්වේ අවබෝධයෙන්ද? අසරණ මහජනතාව ඇන්දුවාද? කෙනෙක් කිව්වා, IMF එකත් එක්ක agreement එකට යනවාද නැද්ද කියලා ඔවුන් තීරණය කළේ ආණ්ඩුව ගත්තායින් පස්සේ කියලා. ඒ පිළිබඳව අද මට WhatsApp message එකක් ඇවිත් තිබුණා. ඒ, viral වන එකක්. මොනවද මේ කථා? එතකොට ඒක අහන පුද්ගලයා මෙන්න මෙහෙම කියනවා. මට මතක විධියට ඒ, 360º වැඩසටහනේ කලිඳු. ඔහු කිව්වා, "360º වැඩසටහනට ඇවිල්ලා ජනාධිපතිතුමා කිව්වාය කියලා IMF එකත් එක්ක යනවා" කියලා. එතකොට දුන් පිළිතුර තමයි, "ඔව්, ඒ අර ඡන්දෙ ළං වෙච්ච නිසා නේ" කියන එක. මාර කථාවක් නේ ඒක. අපි තමයි කිව්වේ ඔය IMF එකේ තිබෙන ණය තිරසාර කිරීමේ විශ්ලේෂණය - Debt Sustainability Analysis, DSA එක - වෙනස් කරන්න බැහැ කියලා. නැහැ, නැහැ, පුළුවන් කිව්වා; පුළුවන්මයි කිව්වා. කෝ? පොතෙත් ලිව්වා.

අපි පොඩ්ඩක් පැත්තකට ගිහිල්ලා ජනතාව අහන ප්‍රශ්න බලමු, ගරු කථානායකතුමනි. ඒක නේ වැදගත් වෙන්නේ. ජීවන වියදම අඩු කරනවා කිව්වා. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ඇහට දැනෙන්න වැඩි කරනවා කිව්වා. එක ඇමතිවරයෙක් කිව්වා, ඇඩෙන්න වැටුප් වැඩි කරනවා කියලා. ආදායම් බදු අඩු කරනවා කිව්වා. ජපානයේ මෝටර් බයිසිකල් ගේන්න chance එක දෙනවා කිව්වා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඒක කිව්වේ ජනාධිපතිතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
නිකම් නොවෙයි, ජපානයේ මෝටර් බයිසිකල් ගේනවා කිව්වා. වී කිලෝවකට රුපියල් 140ක් දෙනවා කිව්වා. හැබැයි, මේ අය වැයෙන් ඒ පොරොන්දු ඉෂ්ට වුණාද? මම ඒ පොරොන්දු තුන හතරක් ගන්නම්. ආහාර මත පනවා ඇති බදු අතිශයින්ම අසාධාරණයි කිව්වා, ඒ නිසා ඒවා ඉවත් කරනවා කිව්වා. නමුත්, 2024 දෙසැම්බර් 31වැනි දායින් අවසන් වුණු විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සියලු ආනයනික ආහාර සඳහා දිගටම අය කරගෙන යනවා. ඔබතුමන්ලා ඒ බද්ද ඉවත් කරනවා කිව්වාට, දිගටම ඒක අය කරගෙන යනවා. Library එකේ Research Division එකට ගිහිල්ලා එම ලැයිස්තුව ගන්න පුළුවන්. සීනිවලට රුපියල් 50යි, මැකරල්වලට රුපියල් 200යි යනාදී වශයෙන් එහි සඳහන් වනවා. එක පැන් පහරින් හාල් මාෆියාව නැති කරනවා කිව්වා. නමුත්, ඔබතුමන්ලාට අවශ්‍ය විධියට දෙසැම්බර් මාසයේ නාඩු කිලෝව රුපියල් 220යි, සම්බා කිලෝව රුපියල් 230යි කියලා ගැසට් පත්‍රයක් ගැහුවා. ඊට පස්සේ මිල අඩු කරනවා වෙනුවට, මිල වැඩි කරලාත් තව ගැසට් එකක් ගැහුවා. නාඩුවලට රුපියල් 230යි, සම්බාවලට රුපියල් 240යි කියලාත් ගැසට් එකක් ගැහුවා. අඩු කරනවා කියපු එක වැඩි කළා. අඩු කරනවා කියලා නේ ඔබතුමන්ලා ආවේ. ඒ වුණාට වැඩි කරලා ගැසට් එකක් ගැහුවා.

ගරු කථානායකතුමනි, හැම දවසකම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් Daily Price Report එකක් නිකුත් කරනවා. ඒක download කරලා බලන්න. ඊයේ නිකුත් කරපු වාර්තාව මම බැලුවා. පිටකොටුවේ නාඩු කිලෝවක් කීයද? රුපියල් 250යි. පිටකොටුවේ සම්බා කිලෝවක් කීයද? රුපියල් 260යි. ඒක තිබෙන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුව ඊයේ රාත්‍රී නිකුත් කරපු වාර්තාවේ. අගෝස්තු 30වැනි දා සංවර්ධන නිලධාරීන්ගේ සමුළුවේදී අනුර කුමාර දිසානායක අපේක්ෂකතුමා කිව්වා, පඩිය මාස හයෙන් හයට වැඩි කරනවා කියලා. අපි කිව්වා, එහෙම කරන්න බැහැ කියලා. නැහැ, නැහැ, එතුමන්ලාට ඒක කරන්න පුළුවන් කිව්වා.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දිගුවක් හැටියට අපි "Blueprint 3.0" ඉදිරිපත් කළා. එම "Blueprint" එකේ 25වැනි පිටුවේ සඳහන් වෙනවා, "ඉහත සැකසීම් දෙක මඟින් රාජ්‍ය සේවයේ අවම දළ වැටුප ජීවන වියදම් දීමනාව ඇතුළුව රුපියල් 57,500ක් වේ." කියලා. අපට තර්කයක් තිබුණා, ඒක කියන්න. ඊයේ ජනාධිපතිතුමා කළේ මොකක්ද? ඒකට රුපියල් 300ක් එකතු කළා. රුපියල් 57,800යි කිව්වා. ඔබතුමන්ලාගේ Budget Speech එක අරගෙන බලන්න. ඒ අය වැය කථාවේ පඩි වැඩි වෙන විධිය තිබෙනවා නේ. එහි 70වැනි පිටුව බලන්න. එහි "Minimum gross salary increase of government sector employees" යටතේ වර්තමාන total gross salary එක තිබෙන්නේ රුපියල් 49,550යි. හැබැයි ඒක වැඩි වෙනවා කිව්වා, රුපියල් 57,800ක් දක්වා. 70වැනි පිටුවේ එහෙම තිබෙනවා. දැන් මම පෙන්වූයේ මොකක්ද? අපි සැප්තැම්බර් මාසයේ කිව්වේ රුපියල් 57,500ක් කියලා. ඒක කරන්න බැහැමයි කිව්වා. ඊට වඩා දේවල් කරන්න පුළුවන් කියලා කිව්වා.

හැබැයි, මේ රුපියල් 57,500 කියන කථාව, රුපියල් 40,000 කියන කථාව ඇත්තවශයෙන්ම එච්චර සරල නැහැ, සංකීර්ණයි. මොකද, ඇත්ත කථාව තමයි ඕක තුනට කඩලා දෙන්නේ. ඔය රුපියල් 15,750න් ඇත්තටම ලැබෙන්නේ රුපියල් 8,250ක් විතරයි. මම නැවතත් ඒ ගැන කියන්නම්. ජනතාවට කිව්වා, රුපියල් පහළොස්දහස් ගණනක් ලැබෙනවා කියලා. නමුත් රුපියල් 8,250 ලැබෙන්නේ. ඒකෙනුත් අප්‍රේල් මාසයේ ලැබෙනවා, රුපියල් 5,975ක්. මේ අවමය. ඊට පස්සේ 2026 ජනවාරිවල ඒකට එකතු කරනවා, රුපියල් 1,137ක්. ඊට පස්සේ 2027 ජනවාරිවල ආයෙත් එකතු කරනවා, රුපියල් 1,137ක්. එතකොට මුළු එකතුව රුපියල් 8,250යි. දැන් නම් අඬන්න වෙලා තිබෙන්නේ කාටද මම දන්නේ නැහැ. රුපියල් පන්දහස් ගණනයි ලැබෙන්නේ මේ අවුරුද්දට. ඉතින් ඇඩෙන්නම දීලා තිබෙනවා. මම දන්නේ නැහැ, මට ඊයේ රෑ ඉඳලා අද උදේ වෙනකල් දිගට හරහට SMS එනවා, නොයෙකුත් වෘත්තීයවේදීන්ගෙන්. මගේ යහළු doctor කෙනෙකුත් මට SMS එකක් එවලා තිබුණා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ colleaguesලාත් - doctorsලා - සමහර විට SMSs එවලා ඇති, ඔවුන්ගේ පඩි අඩු වෙලාය කියලා. මම දන්නේ නැහැ ඔවුන්ගේ පඩි අඩු වෙලාද, නැද්ද කියලා. මට වෙලාවක් තිබුණේ නැහැ, ඒ ගැන විශ්ලේෂණය කරන්න. ඒ නිසා, allowances කපලා, මේක කොහොමද වෙන්නේ කියලා හොඳ කථාවක් ලියලා එවා තිබුණා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
OT කපලා, allowances කපලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතකොට උපයන විට ගෙවීමේ බදු threshold එක රුපියල් 200,000ට ගෙනයනවාමයි කිව්වා. අපි කිව්වා, ඒක කරන්න බැහැ කියලා. නැහැ, නැහැ, පුළුවන්, රුපියල් 200,000ට ගෙනයනවාමයි

කිව්වා. කළාද? කළාද, ගරු කථානායකතුමනි? කළේ නැහැ. රුපියල් 150,000යි. අපි මොකද කිව්වේ? අපි කිව්වා, නැහැ, රුපියල් 100,000 ඉඳලා අපි බද්ද ගහනවා කියලා. සජිත් ප්‍රේමදාස නායකතුමායි, මමයි ඒ ගැන පැය දෙකක් තර්ක කළා. "ඇයි, හර්ෂ අපට පුළුවන් නේ" කියලා එතුමා කිව්වා. මම කිව්වා, "සජිත්, අපට රුපියල් 500 ගහන්න වෙන්නේ රුපියල් 100,000 ඉඳලා රුපියල් 150,000ට" කියලා. රුපියල් 500ක් දෙන්න අපේ මිනිස්සු අකැමැති නැහැ, දරුවාගේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට, සුවසැරියට, පාරට. රුපියල් 500ක් දෙනවා කියන්නේ මොකක්ද? ඒක පොඩි ගණනක්. ඒකෙන් tax base එක අඩු කරන්නේ නැතිව tax base එක ඒ ගණනට තබාගෙන ඉන්නවා. දැන් මොකද කළේ? රුපියල් 150,000 වෙනකල් බර ගණනක් tax base එකෙන් අයින් කළා. ඊට පස්සේ රුපියල් 200,000 වෙනුවට රුපියල් 150,000ට විතරක් සීමාව වැඩි කළා. හැබැයි, loss එක කොහොමද cover කරන්නේ? කොහේවත් කථා නොකරපු, ඔයගොල්ලන්ට නොකියපු රඳවා ගැනීමේ බද්දක් - පොලිය මත සියයට 5 ඉඳලා සියයට 10 දක්වා - ගැහුවා. දැන් කවුද ඇමතිවරයෙක් කිව්වා, ඊයේ අපි බදු වැඩි කළේ නැහැ කියලා. ඔව්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
නලින්ද ඇමතිතුමා කිව්වේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
කවුද කිව්වා, බදු වැඩි කළේ නැහැ, අලුත් බද්දක් ගෙනාවා කියලා. ඔව්, නේන්නම්. මාර වැඩේ. මම දෙසැම්බර් මාසයේ 18වැනි දා හැන්සාඩ් වාර්තාව පාර්ලිමේන්තුවෙන් ගත්තා. ඒක කියවලා බලන්න. දෙසැම්බර් මාසයේ 18වැනි දා තමයි බදු වැඩි කළේ. බලන්න, ඒකේ ලස්සන, කලාව. කලින් බදු වැඩි කරලා දැන් කියනවා, බදු වැඩි කළේ නැහැ ලු. මාර වැඩක් නේ මේක.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේකෙන් වැඩි කළේ නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හැබැයි, බදු වැඩි වෙන්නේ අප්‍රේල් මාසයේ 01වැනි දා ඉඳලා. ඊයේ නොවෙයි ඒක කළේ, සති කිහිපයකට කලින්. කාවද මේ අන්දන්නේ? උදාහරණයක් හැටියට මම කියන්නම්, ඒ මොනවාද කියලා. එකක් තමයි, සේවා අපනයනය. මෙච්චර කල් සේවා අපනයනය කරනකොට බද්දක් තිබුණේ නැහැ. ඒක සියයට 15ට ඉහළ දැම්මා. IT සේවාව අපනයනය කරන, IT කට්ටියට කොච්චර නම් දේවල් කිව්වාද? ඒක සියයට 15ට වැඩි කළා. සියයට 30ට වැඩි කරන්න හිටියා ලු, ඒක සියයට 15ට අඩු කරගත්තා, සියයට 15ට වැඩි කළා ලු. පුදුම කථාවක් ඒක. ඊට පස්සේ Capital Gains Tax එක සියයට 30ට වැඩි කළා.

ඊළඟට, අපනයනකරුවන් ගැන කථා කළා. ඔවුන්ගේ ලොකුම ඉල්ලීම වුණේ SVAT එක අයින් කරන්න එපා කියන එක. දැන් ඔන්න කියනවා, SVAT එක අයින් කරපු කථාවක්. කවදා ඉඳලා අයින් කරලාද කියලා මම දන්නේ නැහැ. හැබැයි, Technical Notesවල තිබෙනවා. අයවැය කථාවේ නොවෙයි, ඒකේ Technical Notesවල තිබෙනවා, SVAT එක අයින් කරනවා, risk-based refund එකක් ගේනවා කියලා. හැබැයි, risk-based refund එකක් ගෙනාවාට, ඉබ්බාගෙන් පිහාටු ගන්නවා වාගෙයි IRD එකෙන් refund එකක් ගන්න එක. ඒ නිසා මේ බදු ගහනකොට රුපියල් 150,000ට වඩා ආදායම අඩු අසරණ කට්ටියටත් මේ බද්ද වදිනවා. හැබැයි, ඔවුන් කියනවා, IRD එකට ගිහිල්ලා කොළ පුරවලා refund එකක් ගන්න කියලා. නමුත් ඒවා වෙන දේවල් නොවෙයි.

ඒ වාගේම තවත් මහා බලාපොරොත්තුවක් තිබුණා නේ. මම කිව්වා නේ, Japanese motorcycle එකක් ගන්න, පොඩි කාර් එකක් ගන්න බලාපොරොත්තුවක් තිබුණා කියලා. රුපියල් ලක්ෂ 12ට ගන්න පුළුවන් කියලා කවුරු හරි කිව්වා, මම දන්නේ නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
රුපියල් ලක්ෂ 14ට.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔව්, රුපියල් ලක්ෂ 14ට. එතකොට මේ අලුත් prices මම බැලුවා. Toyota Raize කාර් එක රුපියල් ලක්ෂ 122යි. හැමෝම පාවිච්චි කරන, සාමාන්‍යයෙන් අපේ doctorsලා ළඟත් තිබෙන, මගේ නංගි ළඟත් තිබෙන Yaris කාර් එකේ මිල රුපියල් ලක්ෂ 185යි. Prius කාර් එකේ මිල රුපියල් ලක්ෂ 289යි. ගරු කථානායකතුමනි, මෙතැන ලොකු අවුලක් නිර්මාණය වෙනවා. ඊයේ ජනාධිපතිතුමා කිව්වා, මේ බදු වැඩිවීමේ වැඩි දායකත්වයක් තිබෙන්නේ මෝටර් වාහන ආනයනය හරහා කියලා. මම සොයා බැලුවා, කීයද කියලා. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.6ක් විතර වැඩි වෙන්න ඕනෑ, බදු. ඒකෙන් භාගයක් විතර එන්නේ වාහන ආනයනයෙන්. මම හරියට දන්නේ නැහැ, දන්ත නැති නිසා. නමුත් මට තේරෙන විධියට වාහන ආනයනයෙන් තමයි ඒ ආදායම එන්නේ. නමුත් වාහන ආනයනය අතිශයින් අවදානම්. මොකද, මේ වාගේ ගණන්වලට කවුද වාහන ගේන්නේ? ඔහොම වාහන ගේන්න පුළුවන් සල්ලිකාරයෝ ඉන්නවා කියලා මම නම් හිතන්නේ නැහැ. ඉතින් ඒ නිසා මේ ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම භයානකයි, අවදානම්.

අවසාන වශයෙන් ගොවි මහත්තයාට වී කිලෝවට රුපියල් 140ක් දෙනවාය කිව්වා. එහෙම කිව්වේ නැහැ කියලා නම් කියන්න එපා. කිව්වාමයි. ඒක තමයි සටන් පාඨය වුණේ. දැන් එතුමන්ලා එකතු වෙලා වී කිලෝවකට රුපියල් 120ක් දෙන්නම් කියලා කියනවා. මම ඒ ගැන දන්නේ නැහැ. අපි දැක්කා, වී ගෝනි තුනක් ගෙනැල්ලා press release එකකුත් තියලා තිබුණා. ඒ වාගේම ජනාධිපතිතුමා ඊයේ කිව්වා, 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනත වෙනස් කරනවා කියලා. වී අලෙවි මණ්ඩලයට අනික් කට්ටිය නියාමනය කරන්න පුළුවන් කියලා කිව්වා. ගරු කථානායකතුමනි, මම කිව්වා නේ, මේක පැටලැවිලා කියලා. මොකක්ද කියන්නේ කියලා දන්නේ නැහැ. සමාජවාදය නම් ඒක කරන්න පුළුවන්. වී අලෙවි මණ්ඩලයට පුළුවන්, තමන්ගේ තරගකාරීන්ව regulate කරන්න. හැබැයි, අපි විශ්වාස කරන්නේ නැහැ, ඒක හරි කියලා. ඒක කරන්න බැහැ. ඒක නිකම් SLT එක ඩයලොග් එක නියාමනය කළා වාගේ. එහෙම බැහැ. එතකොට ඔය කරන්නේ සම්පූර්ණ පැටලැවිච්ච දෙයක්. ඒකයි මම කියන්නේ, ධම්මපදයයි, බයිබලයයි, කුරානයයි පැටලිලා කියලා. ඇත්ත කථාව තමයි ඊයේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය ඇතුළේ කිසිසේත්ම පොරොන්දු වෙච්ච, ජනතාව උද්‍යෝගයෙන් බලා ඉඳපු system change එකක් තිබුණේ නැහැ කියන එක. අලුත් economic model එකක් ඒකේ නැහැ. Autoregressive Distributed Lag model එකක්ම තමයි තිබුණේ. නොහැකියාව කියන්නේ, 2024 ලැබිච්ච වර්ධනයවත් මේ වතාවේ ලබා ගන්න පුළුවන් වෙයිද කියලා කියන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, මට තව විනාඩි 10ක කාලයක් ලබා දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, එතුමාට තව විනාඩි 10ක් ලබා දෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතකොට ඔක්කොම විනාඩි 12යි.

ගරු කථානායකතුමනි, මම skip කරන්නම් නොම්මර ටික. නමුත් ගරු කථානායකතුමනි, මේ අය වැය ගෝනියේ සියඹලා තිබුණේම නැහැ නොවෙයි. පොඩ්ඩක් තිබුණා. උදාහරණයක් හැටියට විනාශකාරී වියදම් කපා හරින එක. අඩු කරන්න, perks අයින් කරන්න, කිසි අවුලක් නැහැ. ඒක කරන්න. අපි දැක්කා, සමහර වියදම් අඩු වෙලා තිබෙනවා. ඒක හොඳයි. අපි ඒකට ගරු කරනවා. ඒක හොඳයි. දූෂණය, හොරකම මර්දනය කිරීමට CIABOC එකට අවශ්‍ය මුදල් ලබා දුන්නා කිව්වා. ඇමති කෙනෙක්ගේ නිවසක් දුන්නා කිව්වා, CIABOC එකේ office එකට. කිසි අවුලක් නැහැ. අපි ඒ වෙනුවෙන් අත් දෙකම ඔසවනවා. දූෂණයට විරුද්ධව සටන් කරන්න. අපි ඒකට අවශ්‍ය සහයෝගය දෙනවා.

ඒ වාගේම ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ ඉතාම හොඳයි. හැබැයි, මේ digital public infrastructure එකක් හදන එක ගැන අද ඊයේ නොවෙයි, කාලයක් තිස්සේ සාකච්ඡා වුණා. නමුත් මට කෙනෙක් කිව්වා, මේ කරන්න හදන්නේ ප්ලාස්ටික් කාඩ් එකක් හදන්න යන එකද කියලා. එහෙම නම් කරන්න දෙන්න එපා. Aadhaar එකට ප්ලාස්ටික් කාඩ් නැහැ. ප්ලාස්ටික් කාඩ් හරහා ලොකු වංචනික වැඩ පිළිවෙළක් කලිනුත් වෙන්න ගියා.

ඒ වාගේම විපක්ෂ නායකතුමා දිගින් දිගටම කථා කරපු දෙයක් තමයි අස්වැසුම ප්‍රතිලාභීන් හරියට තෝරා ගත්තේ නැහැ කියන කාරණාව. දැන් ඒ අය හරියට තෝරා ගන්නවාය කිව්වා. ඒක හොඳයි. ඊට පස්සේ ඔවුන් සවිබලගන්වනවා කිව්වා. ඔවුන්ට දෙන දීමනාව වැඩි කරන්න මේ ළඟදී පක්ෂ, විපක්ෂ සියලුදෙනාම එකඟ වුණා.

ඒ නිසා ධනාත්මක විවේචනයක් අපි මේ කරන්නේ. හැබැයි, එක දෙයක් කියන්න ඕනෑ. දිගින් දිගටම අපි කියපු දෙයක් තමයි, ණය ප්‍රතිව්‍යුහගත කර ගත්තාම,- මේගොල්ලන් කිව්වා, අපි තමයි සති දෙකෙන් කළේ කියලා. එහෙම නොවෙයි. කලින් කළේ. ඒ කෙසේ වෙතත්, දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී සේවක අර්ථසාධක අරමුදලේ ඉන්න ලක්ෂ සංඛ්‍යාත ජනතාවට අසාධාරණ ලෙස පහරක් එල්ල වුණා. අපි කිව්වා, ඒක වෙනස් කරන්න, අපි සහයෝගය දෙන්නම් කියලා. නමුත් මේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී සේවක අර්ථසාධක අරමුදලේ ඉන්න අයට වෙච්ච අසාධාරණය ගැන අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා එකම එක වචනයක්වත් ඊයේ කථා කළේ නැහැ. ගරු කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, මේ අය වැය විවාදය ඇතුළේදී මේ ගැන කියාවි කියලා. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, Adjournment Motion එකක් ගෙනැල්ලා හෝ අපේ Private Members' Motion එකක් හැටියට හෝ අපට මේක ඉදිරිපත් කරන්න පුළුවන්ද? කරුණාකර මේ අය වැය ඇතුළේ මේ සංශෝධනය කරන්න. මොකද, MLB එකෙන් විදේශිකයන්ට ලබා දෙනවා නම්, මහන්සි වෙලා බර ඇදපු අපේ වැඩ කරන මිනිස්සුන්ටත් ඒ සහනය ලබා දෙන්න කියලා අපි ඉල්ලනවා.

ගරු කථානායකතුමනි, ගැඹුරු තාක්ෂණික විශ්ලේෂණයක් කරන්න තිබෙනවා. නමුත් වෙලාව නැහැ. හැබැයි, මම ඉතාම කෙටියෙන් කාරණයක් සඳහන් කරන්න කැමැතියි. Verite Research ආයතනය "Public Finance Lounge" කියලා වැඩසටහනකට ආණ්ඩුවටයි, අපිටයි දෙගොල්ලන්ටම invitation එකක් එවා තිබුණා. ඒගොල්ලන් පෙන්වා දී තිබෙනවා, debt sustainability curve එකේ අපි කොහොමද ඉන්නේ, අපට තිබෙන විවල්‍යයන් මොනවාද, එ්ක වෙනස් කර ගන්නේ කොහොමද කියලා. මට මේක table කරන්න බැහැ. මොකද, ඔවුන් තවම ඒක publish කරලා නැති නිසා. ඔවුන්, publish කළාම table කරයි. මේකේ තිබෙනවා, වැදගත් දෙයක්. ජනාධිපතිතුමා කිව්වා, අපට ණය ගෙවන එකේ කිසි අවුලක් නැහැ, 2028දී ණය ගෙවනවාමයි, ඒකේ කිසිම අවුලක් නැහැ කියලා. ඒක එහෙම නොවෙයි. එහෙම වෙන්න නම්, අවම වශයෙන් සියයට 15ක ආදායමක් රජයට ලබා ගන්න නම්, පොලී අනුපාතය, -අපි කියනවා, yield එක කියලා,- සියයට 8.5ත් සියයට 11.5ත් අතර ප්‍රමාණයක තිබෙනවා නම්, - ඒ වාගේ එකක් තමයි දැන් තිබෙන්නේ - එහෙම නම් අපේ ආර්ථිකය අවම වශයෙන් සියයට 5කින් සෑම අවුරුද්දකම වර්ධනය වෙන්න ඕනෑ. ඊළඟ අවුරුදු තිස් ගණනේම ඒක වෙන්න ඕනෑ. එහෙම නැති වුණොත්, 2028 ඉඳලා ණය ගෙවන එක සත්‍යයක් වෙන්නේ නැහැ. මේක මම නොවෙයි, Verite Research ආයතනය කියන්නේ.

නොයෙක් සුන්දර කථා කියන්න පුළුවන්. අර කවුද කිව්වා නේ, අපි ආණ්ඩුව ගත්තාම ලූ දැක්කේ, IMF එකත් එක්ක යන්න ඕනෑ කියලා. ඒ වාගේ බොළඳ කථා නොවෙයි, තමන්ට පුළුවන් වෙන්න ඕනෑ විශ්ලේෂණය කරගන්න; ඉස්සරහට මොකක්ද විය යුත්තේ කියන එක උපකල්පනය කරලා පුරෝකථනය කර ගන්න. නැත්නම් ආණ්ඩුවකින් ඇති වැඩක් නැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්. ජනාධිපතිතුමා කිව්වා, ලොකු අසීරු කාරණාවක්, IMF එකේ රාමුව ඇතුළේ තමයි වැඩ කරන්න ඕනෑ කියලා. ඒක තමයි අවුල. ඒකට කරන්න දෙයක් නැහැ. අපි කොච්චර බදු එකතු කළත් අපට සියයට 13ක් විතරයි වියදම් කරන්න පුළුවන්. බදු සියයට 25ක් එකතු කළත් දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 13යි අපට වියදම් කරන්න පුළුවන්, පොලිය හැරුණාම. ඒක තමයි අපි පිළිගෙන තිබෙන්නේ. ඒකට හේතුව මොකක්ද? අපි ණය වෙලා. අපේ ආදායමෙන් සියයට 60ක් වැය වෙන්නේ ණය පොලිය ගෙවන්න. ලෝකයේ වැඩිම ප්‍රතිශතයක් හැටියට ණය පොලිය ගෙවන්නේ අපේ රටයි.

ඊයේ මම අහගෙන හිටියා, අපනයනය ප්‍රවර්ධනය කරන්න ඕනෑ කියනවා. එක වෙලාවක මම තිගැස්සුණා. මොකද, කලින් ඉදිරිපත් කළ ආර්ථික පරිවර්තන පනත ඉදිරිපත් කරනවා කියලාත් කිව්වා. ඇත්තටම මම මෙසෙට පොඩි තට්ටුවකුත් දැම්මා. එතකොට තමයි මම හිතන්නේ, ජනාධිපතිතුමා පොඩ්ඩක් fire වුණේ. මොකද, JVP එක ඒකට විරුද්ධව නඩු කිව්වා. ආර්ථික පරිවර්තන පනත -Economic Transformation Bill එක- තමයි model එකක් හැටියට ඉදිරිපත් කරලා තිබුණේ. මෙතුමන්ලාගේ දෙදෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ගිහිල්ලා

කිව්වා, මේක කරන්න බැහැ කියලා. ඒකට හේතු දෙකක් කිව්වා. එක, අපනයන අභිමුඛ ආර්ථිකයක් හදනවා නම්, ආනයන ආදේශන ආර්ථිකයට ප්‍රමුඛත්වයක් ලැබෙන්නේ නැහැ, ඒක ව්‍යවස්ථාවට පටහැනියි කිව්වා. දෙක, විදේශීය ආයෝජකයෙක් ආවා නම් ඔහුට දේශීය ආයෝජකයෙක් ලෙස සලකා සහනාධාර දෙනවා නම්, දිරිගැන්වීම් දෙනවා නම්, ඒක ව්‍යවස්ථාවට පටහැනියි, ඒ නිසා අපි Economic Transformation Bill එකට විරුද්ධයි කියලා එදා කිව්වා. මේක මාර වැඩක් නේ. ජනාධිපතිතුමා කියනවා, ඒක පොඩ්ඩක් සංශෝධනය කරලා ඉස්සරහට අරගෙන යනවා කියලා. ඒක තමයි මම අහන්නේ, බයිබලය ද, ධම්ම පදය ද, කුරානය ද මොකක්ද මේ කියලා.

අවසානයේදී අපට ආයෝජන අවශ්‍ය වෙනවා. මොකද, growth එක තමයි වැදගත්. Sir, what we need is growth because we have got stability. That came about before this Government took over. There is macroeconomic stability; there is exchange rate stability; there is interest rate stability and there is price stability. So, what you need is growth. How are you going to achieve growth? I told you, we have a 13 per cent cap on what we can spend, on primary expenditure.

එහෙම නම් SOEs සම්බන්ධයෙන් දෙන පිළිතුර මොකක්ද? ආයෝජන කොහාටද එන්නේ? මම අහගෙන, "අපි ඊයේ පෙරේදා SriLankan Airlines එකට ඩොලර් මිලියන 500ක්ද කොහේද දුන්නා, ණයක් ගෙවන්න" කියලා කියනවා. මෙන්න බොලේ තව රුපියල් බිලියන 20ක් SriLankan Airlines එකට දෙනවා ලු, ඒගොල්ලන්ගේ තව ණයක් ගෙවන්න. දැන් එහෙම කරලා operational expenses cover කර ගන්නවා ලු. එතකොට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමායි, මමයි ජනාධිපතිතුමාගෙන් ඇහුවා, එහෙම නම් planes ගන්නේ කොහොමද කියලා. එතකොට කිව්වා, "ඒක අපි දන්නේ නැහැ, ඒක පස්සේ බලාගන්නවා" කියලා.

දැන් බලන්න, Air India එක, TATA එකට දීලා privatize කළාට පස්සේ එයාර්බස් 470ක් order කළා. IndiGo එක එයාර්බස් 550ක් order කළා. එතකොට අපට තිබෙන planes ටික වැඩි කර ගන්නේ කොහොමද? ආණ්ඩුවට වියදම් කරන්න බැහැ. ජනාධිපතිතුමා ඊයේ කිව්වා, "සතයක්වත් දෙන්නේ නැහැ" කියලා. ඉතින් අපි මේ box එකෙන් එළියට ගිහිල්ලා හිතන්න ඕනෑ නැද්ද? ඒකයි මම කියන්නේ. මේගොල්ලන්ගේ තර්ක මේගොල්ලන්ටම පැටලිලා. එතැනින් මෙතැනට ආවා නම්, මේ තර්කය පිළිගන්න ඕනෑ. ඒ සඳහා අවකාශය ලැබෙන්න ඕනෑ.

අනෙක් කාරණය තමයි, අදානිගේ ප්‍රශ්නය ගැනත් මෙතැන මහ ලොකුවට කථා වුණා. දැන් කවුරුවත් කියන්නේ නැහැ, විදුලිය ඒකකයක් ඇමෙරිකානු ඩොලර් ශත 8ට දෙන්න ඕනෑ කියලා. ඩොලර් ශත 8 හොඳටම වැඩියි. ඊට පස්සේ ඇහුවා, "ඩොලර් ශත 4.8ට ආපු එක අපි ඩොලර් ශත 4.6ට දුන්නා. ඒක වැරදිද?" කියලා. ඒක නොවෙයි ප්‍රශ්නය. ප්‍රශ්නය වෙන්නේ, කොහොමද ඒක දුන්නේ කියන එකයි. ඒක reject වුණු ටෙන්ඩර් එකක්. Tender procedure එක හරියට කළාද කියන එකයි ප්‍රශ්නය. එහෙම නැතුව අදානිගේ මිලයි, මේ මිලයි සංසන්දනය කරනවා කියන්නේ, රඹුටනුයි, කෙසෙල් ගෙඩියි සංසන්දනය කරනවා වාගේ වැඩක්. ඒක කරන්න බැහැ. ඒ නිසා මේක තේරුම් ගන්න. අපි මෙහෙම හිතමුකෝ. අදානි බැරි නම් වෙන කවුරු හරි, electricity, නැත්නම් වෙන මොකක් හරි වේවා, අපි මේ උදාහරණය ගනිමුකෝ. අපි හිතමුකෝ, ඒගොල්ලන් ඩොලර් ශත 4.8ට එකඟ වුණා කියලා. දැන් ඒගොල්ලෝ උතුරේ ඉඳලා New Habarana Grid Substation එක දක්වා transmission line එකක් ගහන්න ඕනෑ. මේ කට්ටිය තමයි ඒ transmission line එක ගහන්න ගියේ. හැබැයි, ඔබතුමන්ලා දැන් Sri Lanka Electricity Act එක වෙනස් කරන්න යනවා. කොහොමද, වෙනස් කරන්න යන්නේ? හැම generation plant එකකම සියයට සියයක් අයිතිය ආණ්ඩුවට තිබෙන්නට ඕනෑ කියලා. කලින් තිබුණේ කොහොමද? රන්දෙනිගල, මහවැලි ව්‍යාපාරය, කොත්මලේ, වික්ටෝරියා - ඒවා - හැමදාම සියයට සියයක් මේ රටේ ජනතාවට අයිතියි. නමුත්, නොරොච්චෝලේ බලාගාරය වෙන්න පුළුවන්, ආණ්ඩුවට අයිති සුළං බලාගාර වෙන්න පුළුවන්, ආණ්ඩුවට අයිති solar power වෙන්න පුළුවන්, ඒවා යම් යම් අවස්ථාවලදී SOE holding company එකක් හරහා යම් කිසි විධියකට Colombo Stock Exchange එකේ දමන්න පුළුවන්. ඒක තමයි ජනාධිපතිතුමා Ceylon Chamber of Commerceහි event එකේදීත් කිව්වේ. හැබැයි, දැන් ආණ්ඩුව කියන්නේ මොකක්ද? "නැහැ, transmission line එක අලුතින් හදන්න කාටවත් අවකාශයක් නැහැ" කියලා කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I am going to finish, Sir.

කලින් එකේ තිබුණා, transmission lines හදන්න වෙනත් කෙනෙකුට පුළුවන් කියලා. දැන් transmission lines හදන්නත් බැහැ, කවුරු හරි invest කරනවා නම් සියයට 50ක investment එකක් ආණ්ඩුවෙන් කරන්න ඕනෑ. එම නිසා මේක complicated. You have to be clear here. That is why I said, Sir, that it has to come from your heart, that it has to come from within. ඒක කට පාඩම් කරලා කියන්න බැහැ. එතකොට ඒක හරියට එන්නේ නැහැ. අපටත් පුළුවන්, ChatGPT එකට, එහෙමත් නැත්නම් DeepSeek එකට ගිහිල්ලා මොකක් හරි එකක් හදාගන්න. ඒකට, ළමයෙක් essay එකක් ලියන්න කිව්වාම, ඒක ලියලා දෙනවා. හැබැයි, ළමයා දන්නේ නැහැ, මොකක් ගැනද essay එක ලියලා තිබෙන්නේ කියලා. ඒක හදවතින් එන්නේ නැහැ.

අපි දන්නේ නැහැ, කොහොම වෙයිද කියලා. මම මේ ආණ්ඩුවට කියන්නේ, පස්සේ "දුෂ්ටයා" ඒවා මේවා කියලා අපට බණින්න එපා. අපි කියන දේවල් අහගෙන ඉන්න. ඒකට ශක්තියක් තිබෙන්න ඕනෑ. මොකද මම දැක්කා, ටිල්වින් සිල්වා මහත්මයායි, අද පැමිණ නැති බලශක්ති ඇමතිතුමායි දෙදෙනාම දවස් දෙකක් තිස්සේ ඉන්දියන් මහ කොමසාරිස්තුමාගේ ගෙදරට ගිහිල්ලා තිබුණා. මම දැක්කා, ඒක පත්තරේත් තිබෙනවා.

තව එක කාරණයක් කියලා මම කථාව අවසන් කරන්නම්. ගරු කථානායකතුමනි, export market එකක් හදන්න ඕනෑ, growth ගේන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ තමයි අපි මේ විවේචන ඉදිරිපත් කළේ, ගරු කථානායකතුමනි. අපි පෙන්වා දෙන්න උත්සාහ කළේ, තමන්ට ආවේණික වූ, තමන් විශ්වාස කරන මොකක් හෝ දෙයක් පිළිබඳව කථා කරනකොට ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳව විශ්වාසයක් තිබෙන්නට ඕනෑ කියන එකයි. විශ්වාසයක් නැතුව මේක කරන්න බැහැ. භාගයක් socialist; භාගයක් capitalist. එහෙම බැහැ. එහෙම නැත්නම් කියන්න ඕනෑ, "Social market economy එකක් තමයි අපි මේ හදන්නේ, අපි සමගි ජන බලවේගයේ "The Blueprint" එක තමයි ක්‍රියාත්මක කරන්නේ" කියලා. අවුලක් නැහැ. එක්කෝ එහෙම කියන්න.

ඒත් කමක් නැහැ.

ගරු ඇමතිතුමනි, රුපියල් 300යි නේ වෙනස් වුණේ වැටුප.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මොකක්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
රුපියල් 300යි වෙනස් වුණේ. අපි "The Blueprint" එක ලිව්වේ ගිය අවුරුද්දේ මැද. ඒකේ තිබෙන්නේ පඩිය රුපියල් 57,500යි කියලා. ගරු කථානායකතුමනි, මේගොල්ලන් ඒකට රුපියල් 300ක් එකතු කරලා-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is up.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I will conclude, Sir. Let me conclude with what I mentioned at the beginning: hubris leads to nemesis. Let us all consider what I am saying.

Thank you very much for the time given, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Mahinda Jayasinghe. You have 20 minutes.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කළා. ඒ ගැන පැහැදිලි කරන්න පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු අමාත්‍යතුමා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
ඒ ගරු මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරමින් යම් කාරණයක් කිව්වා. ඒ මන්ත්‍රීතුමා කිව්වා, අප දෙදෙනා අතර සිදු වෙච්ච සාකච්ඡාවක් ගැන. ඇත්තටම ඒක එහෙම නොවෙයි. පාර්ලිමේන්තුවේ සිදු වෙච්ච විවාදයකදීයි කිව්වේ. ඒ ඉදිරිපත් කරපු කාරණය වැරදියි. මම කිව්වේ autoregressive model එක අපේ ආර්ථික model එක කියලා නොවෙයි. ඒක වැරදියි. ඇත්තටම autoregressive model එක කියන්නේ statistical model එකක්. ඒක ආර්ථික විද්‍යාවේ model එකක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, අපට කරන්න දෙයක් නැහැ, ඔබතුමා ආර්ථික විද්‍යාවේ models පිළිබඳව- *[බාධා කිරීමක්]* එවැනි විවිධ දේවල් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඉන්න පැහැදිලි කරන කල්. එතකොට කිව්වේ,- *[බාධා කිරීමක්]* ඒකට අපි වෙනම විවාදයක් ගනිමු. පොතේ ලියලා තිබෙන models කිහිපයක් තිබෙන්න පුළුවන්. විශේෂයෙන්ම මේ මතු කරපු models අතරේ ඔය කියන්නේ සාම්ප්‍රදායික, පරණ කිපයක් ගැනයි. විශේෂයෙන්ම production function එක base කරගත්තු Cobb-Douglas model එකත්, ඊට පස්සේ ආපු macroeconomic model එකත් පිළිබඳව පොත්වල ලියවිච්ච කිහිපයක් ගැන තමයි ඔය කියන්නේ. දැන් ලෝකය ගමන් කරන්නේ ඒ දෙසට නොව, behavioural and complexities models, AI-based modelsවලට අනුවයි. ඒ නිසා අප කියන්නේ මේකයි. අපි ක්‍රියාත්මක කරන model එක evolve වෙනවා. මේ model එක මොකක්ද කියලා බලාගන්න, ඉවසීමෙන් මේ අවුරුදු පහ දකින්න. ඔබතුමන්ලා අලුත් නමක් අරගෙන එන්න, අපේ ආර්ථික model එක මොකක්ද කියලා කියන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order. එතුමාට මයික් එක දුන්නාම එතුමා මට පහර ගහගෙන ගහගෙන ගියා. මට තත්පර 30ක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අයවැය විවාදය කරගෙන යන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට තත්පර 30ක් දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ඔබතුමා කථාව කළා නේ. දැන් අපේ වෙලාව. අපේ වෙලාව අපට දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අයවැය විවාදයට යමු. මීළඟට, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]*

[පූ.භා. 10.56]

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අපේ ගරු අනුර දිසානායක ජනාධිපතිතුමා ඊයේ දවසේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, අපේ ආණ්ඩුවේ පළමු අය වැය ලේඛනය; අපේ පස් වසරක ගමන් මහේ පළමු අය වැය. එතුමා ඊයේ දවසේ, මෙතෙක් ආපු ගමන් මහ වෙනස් කරන අය වැයක්, ඓතිහාසික අයවැයක් ඉදිරිපත් කළා. කලින් ත්‍රිපෝෂ කම්හල් විකුණනවා යැයි කියපු, විරුද්ධ පක්ෂය පැත්තේ ඉන්න මහත්තුරු මේ අය වැය ගැන මේ විධියට කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ. ඒවා ආරම්භ කරන්න මුදල් වෙන් කරන කොට, ඒවා පවත්වා ගෙන යන්න විශාල මුදලක් වෙන් කරන කොට විපක්ෂය කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ.

ගරු කථානායකතුමනි, කලින් කථාව අහන කොට මට සිහිපත් වුණේ, පණ්ඩිත් අමරදේවයන්ගේ "පෙර දිනයක මා පෙම් කළ යුවතිය සිය පුතු නළුවනවා" කියන ගීතය. අහෝ! කනගාටුයි. ඉතින් අපි බලාගෙන හිටියා, ටිකක් විද්වත් සාකච්ඡාවකට ඇහුම්කන් දෙන්න; විද්වත් කථාවකට ඇහුම්කන් දෙන්න. හැබැයි අපට අහන්න වුණේ වෙන වල්පල් ටිකක්.

කොහොම වුණත්, ඊයේ දවසේ ඉදිරිපත් කරන ලද අය වැය මේ රටේ ඓතිහාසික අය වැයක් බවට පත් වෙනවා. ඒ ගැන කිසි සැකයක් නැහැ. පසුගිය දශක 7කට වැඩි කාලයක් තිස්සේ මේ රට බිඳ වටිටපු, මේ රට දුෂිතයන්ගේ පාරාදීසයක් බවට පත් කරපු, මේ රටේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වටිටපු අය මේ රටේ දුප්පත්කම පවුල් ලක්ෂ 6 ඉඳලා පවුල් ලක්ෂ 24 දක්වා වැඩි කළාට, මේ රට ගොඩනඟන, ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කරලා ඩිජිටල් ආර්ථිකයක් කරා යන, නිෂ්පාදන ආර්ථිකයක් කරා යන අය වැයක් තමයි ඊයේ ඉදිරිපත් කළේ. ඉතින් ඒ අය වැය නිසා විපක්ෂය මේ විධියට අන්දුන් කුන්දුන් වන එක ගැන, හොල්මන් වන එක ගැන අපට අහන්න දෙයක් නැහැ.

ඊයේ දවසේත් සමහර මාධ්‍යවේදීන් අප හමු වෙලා කිව්වේ මොකක්ද? වසර 30ක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ අය වැය අහලා තිබෙනවා, හැබැයි ඒ ගත වෙච්ච වසර 30ටම අහපු අර්ථාන්විත අය වැය මේකයි කියලායි. එහෙම තමයි ඔවුන්ගේ පැත්තෙන් කිව්වේ. අද මුළු රටේම මේ අය වැය ගැන කථා කරන අය ඒ විධියට කථා කරනවා. සමහරු ඉන්නවා සාධනීය කරුණු පෙන්වා දෙන. ඊයේත් සමහර ආර්ථික විශ්ලේෂකයන් යම් යම් සාධනීය කරුණු පෙන්වා දෙනවා අපි දැක්කා.

හැබැයි, සමහරුන්ට අද මේක දරා ගන්න බැහැ. ඒ වෙන මොකවත් නොවෙයි, ගරු කථානායකතුමනි, කුහකකම. ඊළඟ ආණ්ඩුව හැටියට රනිල්ගේ ආණ්ඩුව එයි කියලා හිතලා ඒ ආණ්ඩුවේ අය වැය කථාව සිදු කරන්න පසුගිය කාලයේ බලාගෙන හිටපු අයට අද විපක්ෂය පැත්තේ ඉඳගෙන කථා කරන්න වුණාම මේ වාගේ විවිධ දේවල් කියවෙන එක ගැන අපට පුදුම වෙන්න දෙයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ වීය.

අතන්පිරකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සමහර කරුණුවලට අපේ මුදල් විෂයට අදාළ නියෝජ්‍ය ඇමතිවරු උත්තර දේවි. මම කැමතියි ඊයේ දවසේ ඉදිරිපත් කරන ලද අය වැයේ සඳහන් වැටුප් වැඩි වීම ගැන වැඩි අවධානයක් යොමු කරන්න.

මේක ඓතිහාසික වැටුප් වැඩිවීමක්. මෑත ඉතිහාසයේ මෙතෙක් සිදු වුණු වැඩිම වැටුප් වැඩි කිරීම තමයි රාජ්‍ය සේවකයාට ඊයේ දවසේ ඉදිරිපත් කළ අය වැයෙන් ලබා දීලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, මේ අය වැය මඟින් වැටුප් වැඩි කරද්දී වෘත්තිය සමිති නායකයන් ලෙස වාගේම මේ ආණ්ඩුවේ ක්‍රියාදරයන් ලෙස, ඇමතිවරුන් ලෙස, අපි මේ සඳහා අපේ දායකත්වය ලබා දුන්නා. මෑත ඉතිහාසයේ 2016න් පසුව අවුරුදු 9කට වැඩි කාලයක් තිස්සේ රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප වැඩි වුණේ නැහැ. මෙවර අය වැයෙන් තමයි අවුරුදු 9කට පසුව රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප වැඩි වුණේ.

කලින් රුපියල් 2,500ක් වැඩි කරන කොට, රුපියල් 5,000ක් වැඩි කරන කොට හරි ලෙහෙසියි. මෙවර අය වැයෙන් රුපියල් 5,000ක වැටුප් වැඩි වනු ඇත කියලා කියනවා. ඒක ගණනය කරන්න, හිතා ගන්න හරි ලෙහෙසියි. හැබැයි, මූලික වැටුප සමානුපාතිකව වැඩි වන කොට සමහරුන්ට එය මැන ගන්න අමාරුයි. සමහරුන් එය මනින්නේ පරණ අය වැයවල ඉදිරිපත් කරපු විධියට. ඒ නිසාම කලින් කථාවේදීත් ගත්තේ කුමන කාණ්ඩයේ වැටුප විතර ද? PL-1 කියන කාණ්ඩයේ වැටුපයි. ඊයේ අය වැය ඉදිරිපත් කරපු අවස්ථාවේ අපේ ජනාධිපතිතුමා සඳහන් කළා PL-1 කියන කාණ්ඩය ගැන. PL-1 කියන්නේ රාජ්‍ය සේවයේ අවම වැටුප. අද දවසේ ප්‍රාථමික ශ්‍රේණි සඳහා නුපුහුණු කම්කරු කියන ශ්‍රේණියට බැඳෙන කෙනාගේ අවම වැටුප තමයි රුපියල් 24,250. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක තමයි basic salary එක ලෙස රුපියල් 40,000 දක්වා වැඩි වෙන්නේ. අපි කොහේවත් අංක ගණිතයෙන් හංගලා නැහැ. මම දැක්කා සමහර විවේචන මතු වෙනවා, මෙහිදී මේ හංගලා ගහලා තිබෙනවා, ගණිතය වරද්දලා තිබෙනවා කියලා. ඒ ආදී විවිධ කථා කියනවා. ඉතින්, ගණිතය ගැන නොදන්නා අයට ගණිත පාඩම් උගන්වන්න අපට බැහැ. එහෙත් මම කැමතියි මේ ගැන පැහැදිලි කරන්න.

රුපියල් 40,000 දක්වා PL-1 කියන කාණ්ඩයේ වැටුප වැඩි වෙනවා. එතකොට මූලික අවම වැටුප -basic salary එක- රුපියල් 15,750කින් වැඩි වෙනවා. මූලික අවම වැටුප රුපියල් 15,750 දක්වා වැඩි වනවා කියන්නේ මොකක්ද? අපි ඒ ගැන හංගලා නැහැ. එහිදී කරන දේ අපි කියලා තිබෙනවා. මේ වන විට රාජ්‍ය සේවකයන්ට දීමනා වර්ග දෙකක් දෙනවා. එකක් තමයි ජීවන වියදම් දීමනාව වන රුපියල් 17,800. පසුගිය කාලයේ වැඩි කරපු තවත් දීමනා දෙකක් තිබෙනවා, රුපියල් 5,000ක් සහ 2,500ක් ලෙස. මෙන්න මේ රුපියල් 7,500 අර කියන 15,750 ඇතුළේ ඒ වැටුප් වැඩිවීමට එකතු වෙනවා. Basic salary එක රුපියල් 15,750කින් වැඩි වන කොට එතැන තිබෙනවා රුපියල් 7,500ත්, ඒ වාගේම ඉතිරි කොටසත්. මේ වසරේ අප්‍රේල් මාසයේ සිට මේ රටේ සියලු රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි වෙනවා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සඳහන් කළේ PL-1 කාණ්ඩයේ වැටුප විතරයි. එතුමා අනෙකුත් වැටුප් කාණ්ඩ ගැන කථා කළේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ගැනත් පැහැදිලි කරන්නම්. රුපියල් 5,000කුත්, අර ඉතිරි රුපියල් 3,250න් රුපියල් 975කුත් මේ වසරේ වැඩි වෙනවා. අන්න එතකොට රාජ්‍ය සේවයේ PL-1 කාණ්ඩයේ අවම වැටුප රුපියල් 5,975කින් වැඩි වෙනවා. සමහර අය සූත්‍ර හදලා, ගණන් හදලා ඒ වැටුප් වැඩි වීම රුපියල් 165යි කියනවා මම දැක්කා. සමහර සමූහයන් ඇතුළේ සංසරණය වුණු එවැනි තොරතුරු මා ළඟ තිබෙනවා. ඒ නිසා මේ ගැන නිරවුල්ව පැහැදිලි කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවයේ හැම කෙනෙකුගේම වාර්ෂික වැටුප් වර්ධකය සියයට 80කින් වැඩි වෙනවා.

අවම වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 250යි. එය රුපියල් 450 දක්වා සියයට 80කින් වැඩි වෙනවා. ඒ ආකාරයට අනෙකුත් කාණ්ඩවලත් වැටුප් වැඩි වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි මේ කාරණය පැහැදිලි කරන්න, තවත් සේවා කිහිපයක් උදාහරණ ලෙස ගනිමින්.

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ග්‍රාම නිලධාරී සේවාවේ GN-1 කාණ්ඩයට දැන් තිබෙන වැටුප 28,940යි. ග්‍රාම නිලධාරීන්ගේ මූලික වැටුප ලබන වසර තුනක් ඇතුළත 50,630 දක්වා වැඩි වෙනවා. ඒ වාගේම අමතක කරන්න එපා අර 40,000 කියන basic salary එකට 17,800 කියන ජීවන වියදම් දීමනාව ඒ ආකාරයටම එකතු වෙනවා, ඒකේ කිසි වෙනසක් වෙන්නේ නැහැ. එතකොට 57,800ක් ඔහුට ලැබෙන වැටුප. 28,940ක් වන ග්‍රාම නිලධාරී මහත්මයෙකුගේ වැටුප 50,630 දක්වා වැඩි වෙනවා. එතකොට ඔහුගේ දළ වැඩිවීම 21,690ක්. හැබැයි, එතැනින් 7,500 ඉවත් කළාම ඔහුගේ ශුද්ධ - net - වැඩිවීම රුපියල් 14,190ක්. 7,500 අඩු වුණාම 14,190ක් ඔහුගේ ශුද්ධ වැඩිවීම. ඒ කියන්නේ GN-1 කියන කාණ්ඩයට, අද දවසේ ග්‍රාම නිලධාරී සේවාවට බැඳෙන ග්‍රාම නිලධාරී මහත්මයෙකුගේ වැටුප රුපියල් 9,257කින් වැඩි වෙනවා. 9,257කින් වැඩි වෙනවා.

වෛද්‍ය නිලධාරී මහත්වරුන්ගේ වැටුප ගැනත් අපේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා. එතුමා කිව්වා වෛද්‍යවරුන්ගේ වැටුප අඩු වෙනවා කියලා. මේ මොහොතේ වෛද්‍ය සේවාවට බැඳෙන වෛද්‍යවරයකුගේ - MO කෙනෙකුගේ - වැටුප 54,290යි. ඒ අයට 91,750 දක්වා basic salary එක වැඩි වෙනවා මේ වැටුප් සංශෝධනයත් එක්ක. එතකොට ඔහුගේ දළ වැඩිවීම 37,460යි. ඒකෙන් 7,500ක් අඩු කළාම 29,960යි. අන්න එකෙන් තමයි සියයට 30ක් දෙන්නේ. දළ වැඩි වීමෙන් 7,500ක් අඩු කරලා ඉතුරු වෙන එකෙන් සියයට 30ක් මේ අප්‍රේල් මාසයේ 01වෙනි දා සිට සියලු රාජ්‍ය සේවකයන්ට වැඩි වෙනවා ගරු කථානායකතුමනි. එතකොට MO කෙනෙකුගේ වැටුප - රුපියල් 8,988+5,000 - රුපියල් 13,988කින් වැඩි වෙනවා.

දැන් සමහරු මත හදන්න උත්සාහ කරනවා OT එක අඩු වෙනවා කියලා. නැහැ. දැන් OT පැයකට ගෙවන්නේ රුපියල් 687යි. මේ අලුත් වැටුප් වැඩි වීමත් එක්ක OT පැයකට, -මම මේ කියන්නේ අලුතින් බැඳෙන Medical Officer කෙනෙකුට- රුපියල් 764ක් වෙනවා. ඉතින්, වැරදි විධියට මේවා විග්‍රහ කරනවා, වැරදි විධියට ගණන් හදනවා. මේ සමාජය තුළ මේ ඓතිහාසික වැටුප් වැඩි වීම ගැන විවිධ වැරදි මත හදන්න උත්සාහ කරමින් ඉන්නවා.

ඒ වාගේම තමයි සංවර්ධන නිලධාරී මහත්මයෙකුගේ 37,260 - *[බාධා කිරීමක්]*

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
මට විනාඩියක් දෙන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංඝ)
(The Hon. Mahinda Jayasinghe)
මගේ කථාවට විනාඩි 20යි තිබෙන්නේ. *[බාධා කිරීම්]*

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
අවුරුදු තුනකින්නේ මේක ලැබෙන්නේ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංඝ)
(The Hon. Mahinda Jayasinghe)
2016දී කොහොමද වැටුප් වැඩි වුණේ?

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
10,000ක් එකතු කළා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංඝ)
(The Hon. Mahinda Jayasinghe)
කොහේද? ගරු මන්ත්‍රීතුමා, 2016 ඔබතුමා මුදල් ඇමතිද කියලා මම දන්නේ නැහැ. ඒ 10,000 එකතු කළේ අවුරුදු 5කින්. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඒ 10,000 - *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. එදා 10,000 එකතු කළා අදියර 5කින්. රුපියල් 2,000 ගාණක් වාගේ තමයි වැටුප් වැඩි වුණේ, එදා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Hon. Members, can we continue with the Debate?

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංඝ)
(The Hon. Mahinda Jayasinghe)
අද PL-1 කාණ්ඩයට 5,975කින් වැටුප වැඩි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Hon. Mahinda Jayasinghe, you may continue with your - *[Interruption.]*

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංඝ)
(The Hon. Mahinda Jayasinghe)
Yes. I have only 20 minutes. Please, do not disturb me. I have to explain a lot.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Yes, the Hon. Mahinda Jayasinghe. You may continue. - [*Interruption.*]

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංඝ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමා දැන් doctor නොවෙයිනේ, ඒ නිසා පොඩ්ඩක් ඉන්න.

හරි, සංවර්ධන නිලධාරීන්ගේ මූලික වැටුප වැඩි වෙනවා 37,260 සිට 63,440 දක්වා. ඒකේ වෙනස තිබෙනවා 26,187ක්. ඒකෙන් 18,687ක් ලැබෙනවා ශුද්ධ වැඩිවීම ලෙස. අන්න ඒකට සියයට 30ක් කියන්නේ 5,606යි. ඒ කියන්නේ සංවර්ධන නිලධාරියෙකුගේ වැටුප අප්‍රේල් 01වෙනි දා වෙනකෙට 10,606කින් වැඩි වෙනවා. *[බාධා කිරීමක්]* ඔව්, අද බැඳෙන කෙනෙකුට. අවුරුදු දෙක තුනක් හිටපු අයට නොවෙයි. ඒ අයට වාර්ෂික වැටුප් වර්ධකත් එකතු වුණාම මේ අගය වැඩියි.

උදාහරණයක් විධියට PL-1 කෙනාගේ වැටුප් වර්ධකය රුපියල් 250 ඉඳලා රුපියල් 460 දක්වා වැඩි වෙනවා. රුපියල් 210කින් ඒ අයගේ වැටුප් වර්ධකය වැඩි වෙනවා. මේ වැටුප් වැඩිවීම අවසන් වෙන්නේ 2027 අවුරුද්දේ. එතකොට ඔහුට අලුතින් වැටුප් වර්ධක එකතුවීම නිසා තව රුපියල් 630ක් වැටුපට

වැඩි වෙනවා. ඇත්තට ගත්තොත් රුපියල් අටදහස් ගණන නොවෙයි, තවත් 630ක් වැඩි වෙලා තමයි ඔහුට වැටුප ලැබෙන්නේ. ඒ විතරක් නොවෙයි, MN-1 කළමනාකරණ -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
පහළම සේවකයාට ලැබෙන, අලුත්ම සේවකයාට ලැබෙන ගණන කියන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම සේවා අනුව කිව්වේ. පහළම සේවකයා කියන්නේ, PL-1 කාණ්ඩයේ. අප්‍රේල් 1වැනි දා ඔහුගේ අතට ලැබෙනවා, රුපියල් 5,975ක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අවුරුදු 5ක් වැඩ කරපු පුද්ගලයෙකුට?

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඒක මම ගණන් හදන්න ඕනෑ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සාමාන්‍යයෙන් ඊට වඩා වැඩියි?

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
අවුරුදු 10ක් වැඩ කරපු කෙනාට රුපියල් 250 ගණනේ දහයක් එකතු වෙලා නේ. ඒ කියන්නේ රුපියල් 2,500ක් එකතු වෙලා. ඔහු ඉන්න වැටුප් තලය අනුව ඔහුගේ වැටුප් වැඩිවීම තවත් වැඩියි. මේක අවම එක; පහළම එක. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඊළඟට MN-1 -

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
කමක් නැහැ, එතුමාට අවස්ථාව දෙන්න කෝ, නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, the Hon. (Dr.) Ramanathan Archchuna.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you so much.

The only thing is that the doctors are only being provided 120 hours of OT for the entire month. So, I am kindly requesting you to let them do 200 hours. So, at least, they can earn Rs. 2,000. That is what I am asking. - *[Interruption.]*

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
Okay. It will be explained later.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, you may continue. You have a few minutes left.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
MN-1, කළමනාකරණ සේවයේ I ශ්‍රේණියේ කෙනෙකුගේ මූලික වැටුප රුපියල් 27,140 සිට 45,230 දක්වා වැඩි වෙනවා; basic salary එක. MN-2 එකේ ඉන්න කෙනෙකුට රුපියල් 28,940 සිට 48,470 දක්වා වැටුප වැඩි වෙනවා. ඒක නිසා බොරු සමාජගත කරන්න එපා කියලා අපි විපක්ෂයෙන් වාගේම අනෙක් අයගෙනුත් ඉල්ලන්න ඕනෑකම තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මම වෘත්තීය සමිති නායකයකු විධියට පසුගිය කාලයේ ගුරු විදුහල්පතිවරුන්ගේ වැටුප් වෙනුවෙන් විශාල අරගළයක් කළා. ඊයේ දවසේ සිට අපට විවිධ චෝදනා එල්ල වෙමින් තිබෙනවා. ඒවා ගැන අපි කම්පා වෙන්නේ නැහැ. අපි එවැනි චෝදනාවලට හොඳට හුරු මිනිස්සු. අපි විවිධ අපහාස විඳපු මිනිස්සු. ඒක නිසා අපි කිසිවෙක් ඒවාට සැලෙන්නේ නැහැ. මම විතරක් නොවෙයි, අපේ ආණ්ඩුවේ කිසිවෙක් ඒවාට සැලෙන්නේ නැහැ. අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයාට, අපේ අගමැති හරිනි අමරසූරිය සහෝදරිය ඇතුළු අපේ අයට විවිධ අපහාස, අවලාද නහනවා. ඒ කිසිවකට අපි සැලෙන්නේ නැහැ. සැලෙනවා නම් අපි ආණ්ඩු හදන්නේත් නැහැ. අපි හැමෝටම කියන්න ඕනෑ, මේ අවුරුදු පහ තුළ මේ රට ගොඩනඟලා මිසක් අපි ආපසු හැරෙන්නේත් නැහැ කියලා. ඒ කාරණයත් අපි අවධාරණය කරන්න ඕනෑ.

ගුරු වැටුප ගැනත් කථා කරන්න මට කෙටි වෙලාවක් දෙන්න, අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් ගුරු සේවයේ අවම වැටුප රුපියල් 31,490යි. ඒ කියන්නේ උසස් පෙළින් පසු අද දවසේ ගුරු සේවයට බැඳෙන ගුරුවරයෙකුගේ වැටුප 31,490යි. ඔහුගේ වැටුප් වර්ධකය 445යි. ඔහුගේ වැටුප වැඩි වෙනවා, රුපියල් 53,060 දක්වා වසර තුනක් ඇතුළත. රුපියල් 445හේ වැටුප් වර්ධකය රුපියල් 800ක් වෙනවා. ඔහුගේ අප්‍රේල් මාසයේ 1වැනි දා වැටුප -ඒක නේ, වැදගත් වෙන්නේ- රුපියල් 31,490 ඉඳලා රුපියල් 39,211ක් වෙනවා. රුපියල් 7,721ක වැටුප් වැඩිවීමක් ලැබෙනවා ගුරුවරුන්ට අප්‍රේල් මාසයේ 1වැනි දාට.

අපේ බිමල් රත්නායක ඇමතිතුමා අහපු විධියට අවුරුදු පහක සේවා කාලයක් තිබෙන කෙනෙකුගේ වැඩිවීම කොහොමද? අවුරුදු පහක සේවා කාලයක් තිබෙන කෙනෙකුගේ වැටුප් වැඩිවීම රුපියල් 8,253යි. මේක අවමය. ගුරු සේවයේ 3 - I වැටුප් වැඩිවීම, රුපියල් 34,160යි. වැටුප් වර්ධකය රුපියල් 525යි. ඒක වැඩි වෙනවා, රුපියල් 57,860 දක්වා. වැටුප් වර්ධකය 940 දක්වා වැඩි වෙනවා, සියයට 80කින්. මේ සමඟ තව වැටුප් වැඩි වීම් වෙනවා. ඒ විතරක් නොවෙයි, අප්‍රේල් 1වැනි දාට 3-I කාණ්ඩයේ උපාධිධාරී ගුරුවරයෙකු ලෙස සේවයට බැඳෙන කෙනාට රුපියල් 50,020ක

[ගරු මහින්ද ජයසිංහ මහතා]

මූලික වැටුපක් ලැබෙනවා. අමතක කරන්න එපා, ඒකට එකතු වෙනවා, රුපියල් 17,800ක්. ඒ කියන්නේ උපාධිධාරියෙකු ලෙස අද දවසේ සේවයට බැඳෙන කෙනාට රුපියල් 67,820ක් ලැබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලික වැටුපයි, දීමනාවයි පැහැදිලි කරන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලික වැටුප කියන්නේ basic salary එක. අපි උදාහරණයක් ලෙස මෙහෙම හිතමු. ආපදා ණයට, "10-month" කියලා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, you have only two more minutes.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට තව විනාඩි පහක් දෙන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හරි. ඔහුගේ වැටුප් වැඩි වීම අප්‍රේල් මාසයට, රුපියල් 8,360යි.

වසර පහක් හිටපු උපාධිධාරි ගුරුවරයෙක් නම් ඔහුට රුපියල් 8,982ක වැටුප් වැඩි වීමක් තිබෙනවා. ඒ වාගේම ගුරු සේවයේ 2:II ශ්‍රේණියේ ගුරුවරයෙක් දැන් ලබන්නේ රුපියල් 39,175යි. ඔහුගේ වැටුප රුපියල් 66,880ක් දක්වා ලබන වසර තුන තුළ වැඩි වනවා. අප්‍රේල් 01වැනි දාට ගුරු සේවයේ 2:II ශ්‍රේණියේ ගුරුවරයෙක් ගෙදර ගෙන යනවා රුපියල් 56,236ක් සමඟ රුපියල් 17,800ක්. ලබන අප්‍රේල් 01වැනි දාට ගුරු සේවයේ 2:II ගුරුවරයෙක් රුපියල් **73,350**ක් ගෙදර ගෙනි යනවා. වසර පහක් ගුරු සේවයේ 2:II ශ්‍රේණියේ හිටපු ගුරුවරයෙකුගේ වැටුප රුපියල් 10,559කින් වැඩි වනවා. රුපියල් 8,000 ගණුනින්, රුපියල් 9,000 ගණුනින් නොවෙයි. ඒ වාගේම ගුරු සේවයේ 2:I ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ දැන් වැටුප රුපියල් 47,425යි. ඒක වැඩි වනවා, රුපියල් 81,780 දක්වා. වැටුප් වර්ධකය රුපියල් 1,335 ඉඳලා රුපියල් 2,400 දක්වා වැඩි වනවා. ඒ විතරක් නොවෙයි. ඔහු අප්‍රේල් 01වැනි දාට ගෙදර ගෙන යනවා රුපියල් 66,481ක් සමඟ තව රුපියල් 17,800ක්. ඒ කියන්නේ ලබන අප්‍රේල් 01වැනි දාට ගුරු සේවයේ 2:I ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ වැටුප ආසන්න වශයෙන් රුපියල් 83,000ක් දක්වා වැඩි වනවා. වසර පහක් ගුරු සේවයේ 2:I ශ්‍රේණියේ හිටපු ගුරුවරයෙකුට රුපියල් 13,154ක වැටුප් වැඩි වීමක් ලැබෙනවා. රුපියල් 13,154ක්! අද ගුරු සේවයේ 2:I ශ්‍රේණියට පත් වූ කෙනෙකුට හම්බ වෙන්නේ රුපියල් 11,556යි. වසර පහක් වැටුප් වර්ධක උපයා ගත් කෙනෙකුට අප්‍රේල් 01වැනි දා ඉඳලා රුපියල් 13,154ක වැටුප් වැඩි වීමක් ලැබෙනවා.

ඊළඟට, ගුරු සේවයේ 1 පන්තියේ ගුරුවරයෙකුගේ දැන් වැටුප රුපියල් 56,770යි. දැන් ආරම්භක වැටුප රුපියල් 56,770යි. වසර තුනක් ඇතුළත රුපියල් 98,580ක් දක්වා ඒක වැඩි වෙනවා. ඔහුගේ වැටුප් වර්ධකය රුපියල් 1,630 ඉඳලා රුපියල් 2,940ක් දක්වා වැඩි වනවා. ඒ විතරක් නොවෙයි. ගුරු සේවයේ 1 පන්තියේ ගුරුවරයෙකුට රුපියල් 13,793ක වැටුප් වැඩි වීමක් ලැබෙනවා. ගුරු සේවයේ 1 පන්තියේ වසර පහක් හිටපු ගුරුවරයෙකුට රුපියල් 15,578ක් ලැබෙනවා. ගුරු සේවයේ 1 පන්තියේ ආරම්භක වැටුපක් ලබන ගුරුවරයෙක් අප්‍රේල් මාසයේ 01වැනිදාට රුපියල් 78,063යි, තව රුපියල් 17,800ක් ගෙදර ගෙන යනවා. රුපියල් 78,063ට රුපියල් 17,800ක දීමනාවක් එකතු වනවා. 1 පන්තියේ ආරම්භක වැටුපක් ලබන ගුරුවරයෙක් රුපියල් 95,000ක් ගෙදර ගෙන යනවා. විදුහල්පති සේවයේත් මේ විධියටම වැටුප් වැඩි වනවා. *[බාධා කිරීමක්]* ඔව්, මන්ත්‍රීවරුන්ට විතරයි නැත්තේ. රාජ්‍ය සේවයේ හැමෝටම වැටුප් වැඩි වෙලා තිබෙනවා.

විදුහල්පති සේවයේ 3 පන්තියේ විදුහල්පතිවරයෙක් දැන් ලබන වැටුප රුපියල් 42,175යි. ඒක වැඩි වනවා රුපියල් 72,280 දක්වා. වැටුප් වර්ධකය රුපියල් 930 සිට රුපියල් 1,670 දක්වා වැඩි වනවා. විදුහල්පති සේවයේ 3 පන්තියේ විදුහල්පතිවරයෙකුගේ අප්‍රේල් 01වැනි දා වැටුප රුපියල් 52,456යි. ඔහුගේ වැඩි වීම රුපියල් 10,081යි. අවුරුදු පහක් හිටපු කෙනෙකුගේ වැඩි වීම, රුපියල් 11,391යි. ඒ විතරක් නොවෙයි. විදුහල්පති සේවයේ 2 පන්තියේ ආරම්භක වැටුප රුපියල් 48,685යි. ඒක වැඩි වනවා, රුපියල් 86,370 දක්වා. විදුහල්පති සේවයේ 2 පන්තියේ විදුහල්පතිවරයෙකුගේ වැටුප් වර්ධකය රුපියල් 1,335 ඉඳලා රුපියල් 2,400 දක්වා වැඩි වනවා. ඔහු අප්‍රේල් මාසයේ 01වැනි දා ගෙදර ගෙන යන වැටුප, රුපියල් 61,240 එකතු කිරීම රුපියල් 17,800. විදුහල්පති සේවයේ 3 පන්තියේ විදුහල්පතිවරයෙක් අප්‍රේල් 01වැනි දා ගෙදර ගෙනි යන වැටුප රුපියල් 52,456 එකතු කිරීම, රුපියල් 17,800. ඒ විතරක් නොවෙයි. විදුහල්පති සේවයේ 2 පන්තියේ වැටුප් වැඩි වීම රුපියල් 12,555යි. වසර පහක් හිටපු කෙනෙකුගේ වැටුප් වැඩි වීම රුපියල් 14,153යි. විදුහල්පති සේවයේ 1 පන්තියේ දැන් ආරම්භක වැටුප රුපියල් 58,345යි. ඒක වැඩි වනවා රුපියල් 103,740 දක්වා. විදුහල්පති සේවයේ 1 පන්තියේ වැටුප් වර්ධකය රුපියල් 1,650 ඉඳලා රුපියල් 2,970 දක්වා වැඩි වනවා. විදුහල්පති සේවයේ 1 පන්තියේ විදුහල්පතිවරයෙකුට අප්‍රේල් 01වැනි දා ලැබෙන වැටුප් වැඩි වීම රුපියල් 73,273කුත්, තව රුපියල් 17,800ක්. ඔහුගේ වැටුප් වැඩි වීම රුපියල් 14,868යි. විදුහල්පති සේවයේ 1 පන්තියේ අවුරුදු පහක් හිටපු කෙනෙකුගේ වැටුප් වැඩි වීම රුපියල් 16,848ක්. එම නිසා විපක්ෂයේ මහත්වරුන්ට, ඒ වාගේම සමාජ මාධ්‍යවල විවිධ මත හඳන අයට අපි කියනවා, වැරදි මත හදන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Mahinda Jayasinghe, you have only two more minutes.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මෙතුමාට තව විනාඩි පහක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

දැන් සමහර අය කියනවා, "අපි ඉල්ලපු එක නොවෙයි දීලා තිබෙන්නේ" කියලා. "කෝ, සුබෝධනී කමිටු වාර්තාව අනුව අපට නැහැ නේ" කියලාත් කියනවා. මා ළඟ තිබෙනවා, සුබෝධනී කමිටු වාර්තාව. සුබෝධනී කමිටුවෙන් ලබා දුන් යෝජනාවල මොකක්ද තිබුණේ? ගුරු සේවයේ 2:II ශ්‍රේණියට තිබුණේ රුපියල් 47,615යි. යෝජනාව තිබෙන්නේ මේකේ.

හැබැයි ඒක වැඩි වෙනවා, රුපියල් 66,880 දක්වා. ඉල්ලුවේ රුපියල් 47,000යි. ඒක රුපියල් 66,880 දක්වා වැඩි වෙනවා. ගුරු සේවයේ 2:1 ශ්‍රේණියට ඉල්ලුවේ 62,595යි. ඒක වැඩි වෙනවා, රුපියල් 81,780 දක්වා. ගුරු සේවයේ 2:1 ශ්‍රේණියට ඉල්ලුවේ රුපියල් 62,595යි. ඒක වැඩි වෙනවා, රුපියල් 81,780 දක්වා. *[බාධා කිරීමක්]* ඔව්. ඒ සුබෝධිනි, මේ AKD! ගුරු සේවයේ පළමුවැනි ශ්‍රේණියට ඉල්ලුවේ රුපියල් 76,175යි. ඒක රුපියල් 98,580 දක්වා වැඩි වෙනවා.

මම මේකෙන් අදහස් කරන්නේ නැහැ, ගුරු සේවාවේ තිබෙන සමස්ත වැටුප් විෂමතාව අවසන් වෙලා කියලා. ඒ වාගේම ගොඩක් අය මේ ගුරු සේවාව සංසන්දනය කරනවා, ලෝකයේ දියුණු සමහර රටවල ගුරු සේවාවත් එක්ක. "ඔවුන්ගේ තත්ත්වය මේක, අපේ තත්ත්වය මේක" කියලා කියනවා. අන්න, ඒ සඳහාත් මේ වනවිට අධ්‍යාපන අමාත්‍යාංශය, - *[බාධා කිරීමක්]* ඔව්, ඒ පොතේ 16වැනි පිටුවේ තිබෙනවා, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. පිටුවත්, තැනත් ඔක්කොම අපි දන්නවා. බය වෙන්න එපා. අපි ඒ ගැන හොඳට දන්නවා. ඒක ගැන වගන්ති කට පාඩම්. 16වැනි පිටුවේ මොකක්ද කියන්නේ? *[බාධා කිරීමක්]* පුළුවන් නම් ප්‍රස්ථාරයක් ඇඳලා දෙන්න. 16වැනි පිටුවේ මොකක්ද කියන්නේ? අපි වැටුප් විෂමතා විසඳනු ඇත කියලා. ඒ වාගේම යටින් තිබෙන ජේළි ටිකත් කියවන්න. මොකක්ද තිබෙන්නේ? අලුත් ගුරු සේවා ව්‍යවස්ථාවක් හදනවා කියලා. ඒ කියන්නේ වර්තමාන, නවීන ලෝකයට ගැළපෙන විධියට ගුරුවරයෙක් නිර්මාණය කරන්න සමත් අලුත් ව්‍යවස්ථාවක් හැදෙනවා. ඒ විතරක් නොවෙයි, එහි තව දෙයක් කියනවා. අපි ගුරු සභාවක් හදනවා. දැන් අපේ අවධානය ඒ සඳහා යොමු වෙලා තිබෙනවා. අපේ අගමැතිතුමිය - අපේ අධ්‍යාපන ඇමතිතුමිය - එක්ක, නියෝජ්‍ය ඇමතිවරු එක්ක අපි පසුගිය කාලයේ සාකච්ඡා කළා. අපි ගුරු සභාව වෙනුවට අධ්‍යාපන සභාවක් -Education Council එකක්- හදමු. ඒ අධ්‍යාපන සභාව හැදෙනකොට මේ ගුරු සේවාවේ තත්ත්වය -quality එක- තවත් ඉහළට යනවා. වැටුප් විෂමතා ඉතිරි වෙලා තිබෙනවා නම්, ඒවාත් ඉවත් වෙන වැඩ පිළිවෙළ හැදෙනවා. ඒක කෙටි කාලින වැඩ පිළිවළක් නොවෙයි.

මේ ආණ්ඩුවට මාස තුනයි. අද 18වැනි දා. අද තමයි අපේ ආණ්ඩුවේ ඇමති මණ්ඩලය දිවුරුම් දීලා මාස තුනක් වෙන දවස. අපි මාස තුනක ආණ්ඩුවක්. නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි 18 වෙනකොට ඇමති මණ්ඩලය දිවුරුම් දීලා මාස තුනයි. තුන් දෙනෙකුගේ භාරකාර ආණ්ඩුවෙන් මිදිලා ඇමති මණ්ඩලයක් ලෙස දිවුරුම් දීලා, පූර්ණ ආණ්ඩුවක් ලෙස කටයුතු කිරීම ආරම්භ කළා. *[බාධා කිරීමක්]* මගේ වෙලාව ඉවර වෙලා තිබෙන්නේ, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි. පසුව අහන්න. අපි ඉදිරි කාල සීමාව තුළ තවදුරටත් විසඳිලා නැති ගැටලු විසඳන්න ඕනෑ කරන අවධානය යොමු කරනවා. මේ රටේ ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට, සමස්ත රාජ්‍ය සේවකයින්ට ඉතා පැහැදිලිව කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ අය පසුගිය මැතිවරණවලදී සියයට 80කට වැඩි තැපැල් ඡන්ද ලබා දෙමින් අප කෙරෙහි විශාල විශ්වාසයක් තැබූ බව අපි දන්නවා. අපේ ආණ්ඩුව කෙරෙහි තැබූ ඒ විශ්වාසය අපි ඉහළින්ම ආරක්ෂා කර තිබෙනවාය කියන සහතිකය අපි ඔබට ලබා දෙන්න ඕනෑ කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා පසුගිය මැතිවරණවලදී - ජනාධිපතිවරණයේදී, මහ මැතිවරණයේදී- මේ රටේ ගුරුවරු විශාල කාර්ය භාරයක් ඉටු කළ බව. ඔවුන් මේ මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කළා. ඒ නිසා අපි කිසිලෙසකින්වත් ඔවුන්ව අමතක කරලාත් නැහැ, අමතක කරන්නෙත් නැහැ කියන සහතිකය ලබා දෙනවා. කවුරු මොන අවලාද නැඟුවත්, කවුරු මොන විධියේ කුහක කථා කිව්වත් ඕක තමයි සත්‍යය. ඒ සත්‍ය ඊයේ නැති වුණොත් අද; අද නැති වුණොත් හෙට; මේ රටේ වැඩ කරන ජනතාව අවබෝධ කර ගන්නවා. මේ අය වැය එක පැත්තකින් වැඩ කරන ජනතාවගේ වැටුප් වැඩිවීම ඇතුළු අයිතිවාසිකම් ආරක්ෂා කරපු අය වැයක්. ඒ වාගේම මේ රටේ සමස්ත ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරපු අය වැයක්. දිගු ගමනක ආරම්භක පියවර තමයි මේ අය වැය. මෙය දිගු ගමනක ආරම්භක පියවර මිස අවසානය නොවෙයි.

අපි මේ තබපු පියවර තවදුරටත් ඉදිරියට තබමින්, බිඳ වටිටපු මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා මෙහෙයවමින් ගොඩනඟන්න ඕනෑ කරන සැලසුම් අපි සකස් කරලා තිබෙනවා. ඒ සැලසුම්වල පළමුවැනි පිටුව තමයි මේ පෙරළලා තිබෙන්නේ. ඒ නිසා පිට කවරය විතරක් බලන්න එපා. ඇතුළ බලන්න. පිට කවරය විතරක් බලලා මේකට සහතික ලියන්න එපා. පිට කවරය විතරක් බලලා අය වැය ගැන විග්‍රහ දෙන්න සුදානම් වෙන්න එපා කියලා මන්ත්‍රීවරුන් ඇතුළු එළියේ සිටින සියලුදෙනාගෙනුත් ඉල්ලීමක් කරනවා. මේ අය වැය අගය කරන්න බැරි නම් අඩුම ගණනේ කුහක නොවී ඉන්න. අපි දන්නවා, මේක අගය කරන්න හරි අමාරුයි කියලා. කුහකකම් කරන්න එපා කියලා විපක්ෂය ඇතුළු එළියේ සිටින සමහරුන්ගෙන් අපි ඉල්ලන්න කැමැතියි.

එසේ ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ රටේ ජනතාවට වඩාත් හොඳ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් උදාකරන්න ජාතික ජන බලවේගය විධියට ඉදිරිපත් කළ මේ පළමුවැනි අය වැයෙන් තබපු පියවර සමඟ එක්ව අප සියලුදෙනා -දේශපාලකයන් විධියට අපි, රජය සේවකයන්, මේ රටේ සාමාන්‍ය පොදු ජනතාව- අත්වැල් බැඳගෙන පෙරට යමු කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. මට මේ අවස්ථාව ලබා දීම ගැන බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sivagnanam Shritharan. You have 18 minutes.

Order, please! the Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අපේ මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා, වෘත්තීය සමිති නායකයා කිව්වා, වැටුප් ගැන. මම වැටුප් ගැන කථා කරන්න යන්නේ නැහැ. මොකද, වැටුප අතට ආවාම තමයි ඔය පරිප්පුව බලාගන්න පුළුවන් වෙන්නේ. අප්‍රේල් මාසයේ තමයි රාජ්‍ය සේවකයෝ අතට වැටුප එන්නේ. එතකොට තමයි රාජ්‍ය සේවකයන්ගෙන් අපට ඒක ගැන අහගන්න පුළුවන් වෙන්නේ. හැබැයි, දැන් මට call එකක් ආවා, බදුල්ල ඉස්පිරිතාලෙන්. මේක ඇත්ත කථාවක්. මම අසත්‍ය කියන්නේ නැහැ. බදුල්ල ඉස්පිරිතාලේ doctorsලා දැන් එළියට බහින්න යනවා කියලා තමයි මට මේ දැන් call එක ආවේ. ඒ මොකටද කියන්න දන්නේ නැහැ, *[බාධා කිරීම්]* නැහැ, මේ වැටුප් සම්බන්ධයෙන් දැනට බදුල්ල රෝහලේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන මම දන්නේ නැහැ. *[බාධා කිරීම්]* දොස්තරලාගේ ප්‍රශ්නයක්. මම දන්නේ නැහැ. ඊයේ අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගෙන් මම ඇහුවා, මට මේ වැටුප් ගැන පොඩ්ඩක් විශ්ලේෂණය කරලා දෙන්න පුළුවන්ද කියලා.

නමුත්, මට ඒක හරියට ලැබුණේ නැහැ. නැත්නම් මම අද ඒක හරියට කියනවා. Doctorsලාගේ ප්‍රශ්නය මම හරියටම දන්නේ නැහැ. හැබැයි, ඒගොල්ලන් එළියට බහින තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා ඒක හරියට බලාගන්න. අනෙක් කාරණය මේකයි. ගුරුවරු ඔබතුමන්ලා කෙරෙහි ලොකු බලාපොරොත්තු තබාගෙන හිටියා; රාජ්‍ය සේවකයෝ ඔබතුමන්ලා කෙරෙහි ලොකු විශ්වාසයක් තබාගෙන හිටියා. ඒ නිසා ඒ අය සියයට 80ක් ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ඒ නිසා ඔබතුමන්ලා තමයි වගකීම් පැහැර හරින්න බැරි එකම ආණ්ඩුව. ජනතාව ඔබතුමන්ලා කෙරෙහි ලොකු බලාපොරොත්තු තියාගෙන ඉන්නවා.

මම මීට වඩා කථා කිරීමට බලාපොරොත්තු වෙන්නේ නැහැ. අය වැය ලේඛනය ගැන තව ගොඩක් දේවල් තිබෙනවා කියන්න. ඉදිරි කාලයේදී අපි හොයලා කියන්නම්. දැන් ඔබතුමන්ලාට news එන්නේ නැහැ. අපට තමයි දැන් news එන්නේ. ඔබතුමන්ලා ඒකත් හොඳට මතක තබා ගන්න. අපට තමයි අඩු පාඩු කියන්නේ. ඉස්සර තමයි ඔබතුමන්ලාට කිව්වේ. දැන් අපට තමයි කියන්නේ. අපි ඒවා බලලා කියන්නම්. එතකොට ඒවා හදා ගන්න. ඒවා හදා ගත්තේ නැත්නම් වෙන්නේ මොකක්ද කියලා දන්නවාද? ගෝඨාභය මහත්මයාට වුණේ. ඔබතුමන්ලාටත් ඒක වෙයි. ඒ නිසා අපි හොයලා දෙන්නම්. ඔබතුමන්ලා හරියට වැඩකටයුතු ටික කරන්න. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.22]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ චාමර සම්පත් මන්ත්‍රීතුමාට වැටුප් ගැන තේරෙන්නේ නැහැ කිව්වා. මොකද, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඊයේ හරියට කියලා දුන්නේ නැති නිසා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ගණන් හදලා කිව්වා, රුපියල් 300කින් විතරයි වැටුප් වැඩි වෙලා තිබෙන්නේ කියලා. මට හිතෙන විධියට ඔය ගණන් හැදීම එක්කම තමයි විපක්ෂයේ කට්ටියට හැම දාම ඉන්න වෙන්නේ. පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය, වතු ක්ෂේත්‍රවල වැටුප් වැඩිවීම පිළිබඳව බිල්ලෙක් මවන්න උත්සාහ කරනවා. විශේෂයෙන්ම වෘත්තීය සමිති ක්ෂේත්‍රය ඇතුළේ අපි පසුගිය කාලය පුරාවට වැටුප් පිළිබඳ අරගළ කළා. ඒ නිසා වැටුප් වැඩිවීම පිළිබඳව හදන්න උත්සාහ කරන බිල්ලා කොහොමද නිර්මාණය කරන්න හදන්නේ, මේ මොකක්වත් හම්බ වුණේ නැහැ කියලා? හැබැයි, රුපියල් 24,250ක අවම වැටුප රුපියල් 40,000ක් වෙනවා කියලා දන්නවා. ඒ වාගේම එතැන් සිට සියලුදෙනාගේ වැටුප් වැඩි වෙනවා කියලා දන්නවා. ඒ නිසා දශකයක්, දෙකක් අපි ආපස්සට හැරිලා බැලුවොත්, අපේ රටේ රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වීම, පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම, වතු ක්ෂේත්‍රයේ වැටුප් වැඩිවීම පිළිබඳව මේ හැමෝටම අදහසක් තිබෙනවා. හැබැයි, ඒ අදහස තියාගෙන තමයි ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩි වෙච්ච අය වැය පිළිබඳව විවිධ කථා කියන්න උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මේ කථාව කියනකොට අපි කියන්න ඕනෑ, අපේ රටේ ශ්‍රම බලකායෙන් විශාල පිරිසක් සිටින්නේ පෞද්ගලික අංශයේ බව. ඒ වාගේම වතු ක්ෂේත්‍රය නියෝජනය කරන, අපනයන ආදායමට විශාල දායකත්වයක් දක්වන, තේ, පොල්, රබර් කියන ක්ෂේත්‍ර තුනෙහිම වැඩ කරන ජනතාව ඉන්නවා.

දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට තිබෙන නිසා මම පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීම

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ගැන ඉස්සෙල්ලාම කියන්නම්. අපේ රටේ පෞද්ගලික අංශයේ වැටුප රුපියල් 21,000යි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ රුපියල් 21,000 හැදෙන්නේ මෙහෙමයි. පනතින් රුපියල් 17,500ක අවම වැටුපක් තිබෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති හැටියට අපි මැදිහත් වෙලා, පනත් දෙකකින් මීට පෙර වැඩි කරගත් රුපියල් 3,500ක් තිබෙනවා. මේ දෙක එකතු වුණාම තමයි රුපියල් 21,000ක් බවට අවම වැටුප පත් වෙන්නේ. එතකොට රුපියල් 21,000ක අවම වැටුපක් තමයි අද අපේ රටේ පෞද්ගලික අංශය තුළ වැඩ කරන සියයට 60කට ටිකක් වැඩි සේවකයන්ට ලැබෙන්නේ. රුපියල් 21,000ට ටිකක් වැඩි වැටුපක් හම්බ වෙනවා වෙනත් යම් යම් දීමනාත් එක්ක. පැමිණීමේ දීමනා, වෙනත් දීමනා හරහා ඔවුන්ගේ වැටුප රුපියල් 28,000ක් රුපියල් 30,000ක් වුණාට මේ මූලික වැටුප තිබෙන්නේ අඩුවෙන්. ඒ නිසා තමයි පෞද්ගලික අංශයේ වෘත්තීය සමිති, පෞද්ගලික අංශයේ හාමුපුතුන් -මේ සියලුදෙනා- එක්ක සාකච්ඡා කරලා අපේ ආණ්ඩුව පෞද්ගලික අංශයේ වැටුප් පිළිබඳව තීරණය ගත්තේ. මොකද, සේවකයකුගේ මූලික වැටුප වැඩි නොවී ඔහුට ලැබෙන ව්‍යවස්ථාපිත හිමිකම් - සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, විශ්‍රාම යන මොහොතේ ඔහුට ලැබිය යුතු පාරිතෝෂිකයට -gratuity එකට- ලැබෙන දායකත්වය වාගේම ඔහු වැඩ කරමින් සිටින කාලය තුළ ඔහුට ලැබිය යුතු අතිකාල, වාර්ෂික බෝනස් එක ගණන් හදන්නේ මේ මූලික වැටුපට. ඒ නිසා මෙතුමන්ලා මොනවා කියන්න උත්සාහ කළත්, අපේ රටේ පෞද්ගලික අංශයේ සේවකයාට එතෙක් මෙතෙක් ඉතිහාසයේ වැඩි වුණු වැඩිම මූලික වැටුප් වැඩි කිරීම මෙවර අපි කරලා තිබෙන බව අපි කියන්න ඕනෑ. ඒ අනුව රුපියල් 21,000ක් ලෙස තිබෙන මූලික අවම වැටුප රුපියල් 30,000 දක්වා වැඩි කරන්න අපේ ආණ්ඩුව කටයුතු කර තිබෙනවා. අපි හාමුපුතුන් එක්ක සාකච්ඡා කරලා, හාමුපුතුන්ගේ සම්මේලන එක්ක සාකච්ඡා කරලා එකඟතාවක් හැදුවා. මේ වනකොට රුපියල් 30,000ක අවම වැටුප් වැඩිවීමක් වෙන්න ඕනෑ. මොකද, රාජ්‍ය අංශයේ වැටුප රුපියල් 40,000ක් වෙනවා. වතු සේවකයන්ගේ අවම වැටුප රුපියල් 33,750ක් වෙනවා. ඊට අමතරව ඔවුන්ට තවත් productivity incentive එකක්, එහෙම නැත්නම් ඔවුන් එදිනෙදා වැඩ කරද්දී වැඩිපුර නෙළන තේ දලු කිලෝවකට - for every extra kilo - රුපියල් 50 ගණනේ රුපියල් 350ක් දක්වා වැඩි කර ගැනීමේ අවස්ථාව ඔවුන්ට තිබෙනවා.

අපේ ආණ්ඩුව සාකච්ඡා කරලා එකඟතාවකට ඇවිල්ලා තමයි මේ වැටුප් වැඩිවීම සිදු කළේ. එම නිසා සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කරලා අප්‍රේල් 1වැනි දා සිට පෞද්ගලික අංශයේ සියලුම සේවකයන්ගේ අවම වැටුප රුපියල් 27,000ක් දක්වා වැඩි කරන්න අපි කටයුතු කර තිබෙනවා. මේක ගැන කවුරුවත් කියන්නේ නැහැ. ඊට අමතරව ලබන ජනවාරි 1වැනි දා සිට අවම වැටුපට තවත් රුපියල් 3,000ක් එකතු වෙනවා. ඒ අනුව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප රුපියල් 30,000ක් වෙනවා. අවම වැටුප රුපියල් 30,000ක් වෙනකොට ඒකත් එක්ක පෞද්ගලික අංශයේ සේවකයන්ගේ EPF, ETF, gratuity, bonus, overtime කියන මේ සියල්ල වැඩි වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. බැංකුවකට ගිහිල්ලා ණයක් ගන්නකොට basic salary එක කීයද කියලායි බලන්නේ. Basic salary එකට තමයි සේවක අර්ථසාධක අරමුදල ගණනය කරන්නේ. ඊට අමතරව හිමිකම් ලැබිය යුතු වෙනත් දීමනාවක් තිබෙනවා නම්, ඒ ගැනත් කියලා තිබෙනවා. හැබැයි, basic salary එකටයි හදන්නේ. අතිකාල ගණනය කරන්නේ basic salary එකට. පැය 200න්, 240න් බෙදන්නේ basic salary එකට අදාළව. එම නිසා පෞද්ගලික අංශයේ සේවකයන්ට ඉතිහාසයේ ලබා දුන් ඉහළම වැටුප් වැඩි වීම අපේ ආණ්ඩුව ලබා දුන්නාය කියන එක කියන්නේ නැතුව සමහරුන් කටවැටි පනින්න හදනවා.

ඒ විතරක් නොවෙයි. වතු සේවකයන්ගේ වැටුපත් එහෙමම තමයි. පසුගිය මැයි මාසයේ 1වැනි දා රනිල් වික්‍රමසිංහ මහත්තයා හදිසියේම වතුකරයට ගිහිල්ලා ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් කරනවා කියලා ආවා. හැබැයි, ඒක දන්නාද? නැහැ. පසුගිය සැප්තැම්බර් මාසයේ 10වැනි දා පඩිපාලක සභාවල හාමුපුතුන් ගෙන්වා, ඔවුන් එකඟ කරගෙන තමයි අපි මේ කටයුත්ත කර ගත්තේ. ඒ සඳහා වෘත්තීය සමිතිත් මැදිහත් වුණා. වතු කම්කරුවන්ගේ අවම වැටුප රුපියල් 1,350කට ගේන්න වෘත්තීය සමිතිත් අපි එකඟ කර ගත්තා. මේ රුපියල් 1,350ත් ප්‍රමාණවත් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ මොකද? මේ අයගේ රාජකාරිය විතරක් නොවෙයි, ඔවුන් ජීවත් වන වටපිටාව, ඔවුන්ගේ ආහාර රටාව, ඒ සියල්ල මේ වැටුපත් එක්ක තීරණය වෙනවා. හැබැයි, ඔවුන් මාසයකට දින 25ක් වැඩට එන්න ඕනෑ. මොකද, ඔවුන්ට ගෙවන්නේ දෛනික වැටුපක්. මාසික වැටුපක් ගෙවන්නේ නැහැ. දින 25ම වැඩ ලැබුණොත් විතරයි රුපියල් 33,750ක වැටුපක් ඔවුන්ට ලැබෙන්නේ. එම නිසා වතු සේවකයන්ට තව රුපියල් 350ක් එල්ලාගන්න නම්, ඔවුන් දවසකට නෙළන දලු ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. නිෂ්පාදනයේ ඵලදායීතාව වැඩි කරලා, දලු කිලෝ එකකට රුපියල් 50 ගණනේ එල්ලාගත්තේත් ඔවුන් යම් අරගළයක් කරලායි. හැබැයි, විපක්ෂය පසුගිය කාලය පුරාවට මේ ආයතනත් එක්ක ගනුදෙනු කළාට මෙහෙම කටයුත්තක් කරලා වතු සේවකයන්ගේ වැටුප රුපියල් 1,700ක් බවට තහවුරු කරන්න මැදිහත් වුණේ නැහැ. එම නිසා ඒ රුපියල් 1,700ම ලබා දීම වෙනුවෙන් තමයි අපේ ආණ්ඩුව සහ අපි උත්සාහ කරන්නේ. වතු හාමුපුතුන් එක්කත් කථා කරලා, වතු සමාගම් එක්කත් සාකච්ඡා කරලා ඔවුන්ගේ දින විසිපහේ වැටුපට සාපේක්ෂව අඩුම තරමින් ඒ අයටත් මාසිකව රුපියල් 40,000කට ආසන්න වැටුපක් ලබා දෙන්නටයි අපි උත්සාහ කරන්නේ. එහෙම නැතුව ඔවුන්ට ජීවත් වෙන්න අමාරුයි. එම නිසා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුපත්, වතු සේවකයන්ගේ වැටුපත් කියන කාරණා දෙකම අපේ රටේ ආර්ථිකය ඇතුළේ අතිශය විශාල සේවාවක් සපයන පෞද්ගලික අංශයේ සේවකයන්ට වැදගත් කරුණක්. මොකද, අපේ රටේ රාජ්‍ය අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ඔක්කෝම ශ්‍රම බලකාය ඉන්නේ ලක්ෂ 15යි. වතු ක්ෂේත්‍රයත් ඇතුළුව කුඩා කඩ සාප්පු, කාර්යාල, මහා පරිමාණ කර්මාන්තශාලා දක්වා ලක්ෂ 45කට ආසන්න පිරිසක් පෞද්ගලික අංශයේ වැඩ කරනවා. ඒ සියලුදෙනාට බලපාන්නේ මෙන්න මේ මූලික වැටුප වැඩි වීමයි. එම නිසා මූලික වැටුප වැඩි වුණාට පස්සේ ඊට සමගාමී ලෙස අනෙක් දීමනා වැඩි වීමත් වෙන්න ඕනෑ. එම නිසා මේ කථාව කියාගෙන යනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාට මේක හරියට කියලා දුන්නේ නැහැ කියලාත් කිව්වා. රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වීම් ගැන කියන්න කලින් මම ඒ ගැනත් කියන්න ඕනෑ.

චාමර මන්ත්‍රීතුමා කිව්වා, අර 30,000ක පිරිස රස්සාවලට බඳවා ගන්න බැරි වෙනවා නේ කියලා. එම 30,000ක පිරිස බඳවා ගන්නවා කියලා අපි ඉතාම පැහැදිලිව කිව්වා. ඒක කරනකොට අපි තොග පිටින් බඳවා ගන්නේ නැහැ, තරග විභාග තියලා අවශ්‍ය අය අවශ්‍ය තැන්වලටයි බඳවා ගන්නේ. එම නිසා paper advertisements දාලා, interview කරලා ඔවුන් බඳවා ගන්න තව මාස 6ක් තිබෙනවා. එතකොට මේ අවුරුද්දේ අපි මාස 6ක් වැඩ කරන්න පටන් ගත්තොත්, සේවයට බඳවා ගනිද්දී රුපියල් 40,000ක් තමයි අවම වැටුප විධියට තිබෙන්නේ. ඊට අමතරව cost of living එක විධියට තව රුපියල් 17,800ක් තිබෙනවා. එතකොට මේ සියලුදෙනාගේම වැටුප රුපියල් 50,000ට වඩා වැඩි වෙනවා. මේ ඔක්කෝම ගණන් හදලා අපට මේ මාස හයේ 15,000ක් බඳවා ගන්න පුළුවන් වුණොත්, ඒත් අපට වැය වෙන්නේ රුපියල් මිලියන 9,000යි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අවම වැටුප තමයි රුපියල් 50,000ක් කියලා මම කිව්වේ. හැබැයි, ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් බඳවා ගැනීමත් එතැන තිබෙනවා. ඒ වාගේම විවිධ ආයතනවල විවිධ පුරප්පාඩු

තිබෙනවා. ඒ 30,000න් 15,000ක් බඳවා ගත්තොත්, ඒ වාගේම ඒ සියලු ශ්‍රේණිවල වැටුපේ average එක රුපියල් 100,000ක් විධියට ගත්තොත්, ඒ සඳහා වැය වෙන්නේ රුපියල් මිලියන 9,000යි.

ඒ බඳවා ගන්නේ පළමුවැනි ශ්‍රේණියට නම්, එහෙම නැත්නම් රුපියල් 40,000ක අවම වැටුපකට නම්, රුපියල් 40,000ක් නොවෙයි රුපියල් 50,000ක් ගෙව්වත්, ගරු වාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, ඒ අය බඳවාගෙන මාස හයක් යනකොට රුපියල් මිලියන 9,000යි වැය වෙන්නේ. රුපියල් මිලියන 1,000ක් ඉතුරුත් වෙනවා. ඒ නිසා බැරි වැඩක් නොවෙයි මේ කියලා තිබෙන්නේ. ඒ නිසා ගණන් කියලා දෙනකොට හරියට කියලා දෙන්න කියන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අපර භාග 1.00 දක්වා අත්හිටුවන බැවින්, ගරු ඇමතිතුමාගේ කථාවේ ඉතිරි කොටස දිවා ආහාර විවේකයෙන් පසුව කරගෙන යන්න පුළුවන් බව දන්වා සිටිනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා කථා කරන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැයෙන් ඉදිරිපත් වෙච්ච වැටුප් වැඩිවීම පිළිබඳව තමයි මම කථා කරමින් හිටියේ. විපක්ෂය මේ වැටුප් පිළිබඳව අධ්‍යයනයකින් තොරව සමහර කරුණු ඉදිරිපත් කරනවාය කියලා තමයි මට හිතෙන්නේ. මොකද, මේ අය වැය කථාව තුළ වගු හදලා, සංඛ්‍යාලේඛන ඇතුළත් කරලා ඒ පිළිබඳ විස්තර ඔක්කෝම සටහන් කර තිබෙනවා. පෞද්ගලික අංශය වාගේම වතු ක්ෂේත්‍රය පිළිබඳවත් මම දිවා ආහාර විවේකයට පෙර කිව්වා.

ඒ නිසා රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම පිළිබඳව තමයි දැන් මම අවධානය යොමු කරන්නේ. විශේෂයෙන්ම රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම පිළිබඳව අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය තමයි 1:4ට වැටුප් වැඩිවීම තියාගෙන යන්න ඕනෑය කියන එක. 1:4 වශයෙන් වැටුප් වැඩිවීම තියාගෙන යෑම වෙනුවෙන් තමයි අපි මේ වැටුප් වැඩිවීම සිද්ධ කරලා තිබෙන්නේ. එතකොට අපේ ප්‍රතිපත්තිය වෙනස් කරලා නැහැ. රාජ්‍ය සේවයේ සියලුදෙනාගේ -කාර්යාල කාර්ය සහායක රැකියාව කරන සේවකයාගේ සිට අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා- වැටුප් අතර විවිධ විධියේ ප්‍රශ්න, විවිධාකාරයේ විෂමතා තිබුණා; විවිධ අවස්ථාවලදී අපි, අපේ වෘත්තීය සමිති ව්‍යාපාරය ඇතුළේ සාකච්ඡා කළ ප්‍රශ්නත් තිබුණා. ඒ සියලු ගැටලු, ඉතිහාසයේ තිබිච්ච සියලුම තත්ත්වයන්, ඒ තිබිච්ච සියලු විෂමතා විසඳීම ඉලක්ක කරගෙන තමයි අපි මේ වැටුප් වැඩිවීම කළේ. ඒ නිසා දැන් මේ සමහර සාකච්ඡාවලදී අපට දැනෙන්නේ මේ පවතින තත්ත්වයන් එසේම තිබියදී වැටුප් වැඩිවීමක් අපේක්ෂා කළා වාගේයි. ඒ නිසා රජයක් හැටියට අපට වගකීමක් තිබෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වැඩ කරන ජනතාව මුහුණ දීලා තිබෙන ගැටලු විසඳන්න. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයා, විශ්‍රාමිකයා, පෞද්ගලික අංශයේ සේවකයා, ඒ වාගේම විවිධ ශ්‍රේණි -ඒ ඒ ශ්‍රේණි- අතර තිබෙන ගැටලු, එකම සේවාවේ ශ්‍රේණි අතර තිබෙන ගැටලු, වැටුප් විෂමතා සියල්ලට එකවර address කරන්න පුළුවන් නම්, එකවර ආමන්ත්‍රණය කරන්න පුළුවන් නම්, ඒ සඳහා තමයි අපි මේ වැටුප් වැඩිවීම ඉදිරිපත් කළේ.

මේ වැටුප් වැඩිවීම ගැන කථා කරනකොට රුපියල් 300, රුපියල් 400, රුපියල් 900 වාගේ කථා කියනවා නේ. ඒ නිසා මේ වැටුප් වැඩිවීම පිළිබඳ සාකච්ඡාවේදී අවධානය යොමු කරන්න ඕනෑ, අපේ ආණ්ඩුවට මේ වැටුප් වැඩි කිරීම සඳහා රුපියල් බිලියන 325ක් වැය වනවා කියන කාරණය කෙරෙහියි. ඒ නිසා රුපියල් බිලියන 325ක් මේ වෙලාවේ දරන්න පුළුවන්ද, බැරිද කියන කාරණය පිළිබඳව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් කල්පනා කරන්න ඕනෑ කියායි මම කියන්නේ. බංකොලොත් වෙච්ච රටක් බංකොලොත්භාවයෙන් ගොඩ අරගෙන ඉදිරිපත් කරන පළමු අය වැය, මේක. නමුත්, රාජ්‍ය සේවය සඳහා වැටුප් වැඩි කිරීම් මෙපමණ ප්‍රමාණයක් ලබා දෙන්නත් මෙම අය වැය තුළින් කටයුතු කරලා තිබෙනවා. මම එහෙම කියන්නේ මේ නිසායි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපට 2025ට ඒ සඳහා රුපියල් බිලියන 102ක් වැය වෙනවා; 2026ට රුපියල් බිලියන 128ක් වැය වෙනවා; 2027ට රුපියල් බිලියන 95ක් වැය වෙනවා. ඒ අනුව රුපියල් බිලියන 325ක් මේ වැටුප් වැඩි කිරීම සඳහා අපට ගෙවන්න වෙනවා. ඒ නිසා රුපියල් බිලියන 325ක් වෙන් කරන එක ඇතුළේත් තවත් නැහැ කියනවා නම් ඉතින්,- රාජ්‍ය සේවකයාගේ අතට තමයි ඒක ලැබෙන්නේ. හැබැයි එහෙම කියද්දී මේ අයට අමතකයි, මීට කලින්, ඒ කියන්නේ 2016දී වැටුප් වැඩිවීම කියලා මොකක්ද කළේ කියන එක. 2016දී රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම කියලා රුපියල් 20යි වැඩි කළේ. 2016 රුපියල් 20යි, වැටුප් වැඩිවීම. කොහොමද ඒක සිද්ධ වුණේ? රුපියල් 11,730ක අවම වැටුප තිබුණා; රුපියල් 12,500ක දීමනා තිබුණා; රුපියල් 11,730යි, රුපියල් 12,500යි එකතු කරලා, රුපියල් 20ක් එකතු කරලා රුපියල් 24,250යි කිව්වා. නැත්නම් රුපියල් 24,230යි නේ එන්නේ. රුපියල් 24,250 කියලා මූලික වැටුප ගෙනාවා. ඒ, 2016දී. 2016දී මූලික වැටුප රුපියල් 24,250ට ගෙනෙන්නේ, රුපියල් 12,500ක තිබුණු දීමනාව එහෙමම පඩියට එකතු කරලා. එතැනින් පස්සේ වැටුප් වැඩිවීම් සිද්ධ වුණේ නැහැ. එතැනදීත් කළේ වැටුප් වැඩි කිරීමක් නොවෙයි. දීමනාව වැටුපට එකතු කළ එක. ඔක තමයි සිද්ධ කරපු කාරණය. ඊට අමතරව ජීවන වියදම් දීමනාවක් අපට තිබෙනවා. දීමනා එක්ක තමයි මේ කථාව යන්නේ. 2016දී රුපියල් 20ක් එකතු කරපු අය තමයි අපට කියන්නේ අපි වැටුප් වැඩි කළේ නැහැ කියලා. නමුත්, රාජ්‍ය සේවකයාගේ අවම වැටුපට මේ අවුරුදු තුන තුළදී රුපියල් 8,250ක් වැඩි වෙනවා. රාජ්‍ය සේවකයාගේ basic salary එක තවත් වැඩි කර තිබෙනවා. ඒ නිසා මේ දීමනා අතර පවතින ප්‍රශ්න සියල්ලත් එක්ක තමයි අපේ ආණ්ඩුව මේ වැටුප් වැඩිවීමට address කර තිබෙන්නේ. සාමාන්‍ය රාජ්‍ය සේවකයෙකුගේ රුපියල් 15,750ක වැටුප් වැඩිවීමේ සිට අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ වැටුප් වැඩිවීම දක්වා මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2025 අප්‍රේල් පළමුවැනිදායින් පස්සේ යම් කෙනෙක් තමන්ගේ පළමුවැනි රැකියාව හැටියට රාජ්‍ය සේවයට එකතු වෙනවා නම්, ඔහුට රුපියල් 15,750ක් වැටුප් වැඩි වෙනවා. ඒ වාගේම, SLAS අමාත්‍යාංශ ලේකම්වරයෙකු ලෙස අලුතින් වැඩ පටන් ගන්නවා නම්, ඔහුගේ වැටුප රුපියල් 69,300ක් දක්වා වැඩි වෙනවා. එහෙම වැඩිවෙලා තමයි ඔහු අලුතින් වැඩ පටන් ගන්නේ. ඒ නිසා මේ සියලුදෙනාට වැඩි වෙච්ච වැටුප් ගැන කථා නොකර තමයි එතුමන්ලා මේ විධියට කටයුතු කරන්නේ. අපේ ආණ්ඩුව මේ වැටුප් වැඩි කිරීමේ ක්‍රියාවලිය ඇතුළේ තිබෙන මේ වැඩිවීම් පිළිබඳව හොඳින් පැහැදිලි කර තිබෙනවා. හැබැයි මේ අය මේක

[ගරු වසන්ත සමරසිංහ මහතා]

හංගන්න හදන්නේ, බාල කරන්න හදන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි. අපේ රටේ රාජ්‍ය සේවකයා මේ වැටුප් වැඩි කිරීම ගැන වඩා හොඳ අවබෝධයකයි ඉන්නේ. රුපියල් 15,750 සිට රුපියල් 70,000කට ආසන්න ප්‍රමාණයකින් සියලුදෙනාට මේ වැටුප් වැඩිවීම සිද්ධ වෙනවා. ඒ වැටුප් වැඩිවීම අවුරුදු 3ක් ඇතුළත දෙන්නේ එකවර රජයට මේ වෙලාවේ මේක දරන්න බැරි නිසායි. අපි ඒක කියා තිබෙනවා. ඒ නිසා තමයි අපි රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප රුපියල් 40,000ක අවම වැටුපට ගෙනැල්ලා, එතැන් සිට සියලුදෙනාගේ වැටුප් වැඩි කරන්නේ. හැබැයි අපි කියන්න ඕනෑ, මේ මූලික වැටුප රුපියල් 40,000ට වැඩි කරලා මේක එතැනින් නවතින්නේ නැහැ කියලා. අතිකාලවලදී, එහෙම නැත්නම් සේවකයෙකුගේ අනෙකුත් දීමනා හදද්දී 2025 අප්‍රේල් මාසයේ පළමුවැනි දා වැඩි වෙච්ච වැටුප් වැඩිවීම සලකා තමයි එ ගණන් හදන්නේ.

චාමර සම්පත් මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. එතුමා කියන්න උත්සාහ කළා, වෛද්‍යවරු ස්ට්‍රයික් එකකට ලෑස්ති වෙනවා, වෛද්‍යවරු ප්‍රශ්නයකයි ඉන්නේ කියලා. හැබැයි, සෞඛ්‍ය සේවාවේ නිරත අය, විශ්වවිද්‍යාල ආචාර්යවරු, කළමනාකරණ සේවාවේ නිරත අය, ගුරුවරු -අපේ මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ගුරුවරුන්ගේ ප්‍රශ්න ගැන කිව්වා- කාර්යාල කාර්ය සහායක සේවාවේ නිරත අය ඇතුළු සියලුදෙනාගේ service එක සම්බන්ධයෙන් මෙතෙක් කල් තිබ්බ ප්‍රශ්න විතරක් නොවෙයි, විශ්‍රාමිකයාගේ ප්‍රශ්නත් මෙවර අය වැය තුළින් අපි විසඳලා තිබෙනවා. 2017, 2018, 2019 අවුරුදුවල විශ්‍රාම ගිය විශ්‍රාමිකයා බරපතළ ප්‍රශ්නයක ඉන්නේ. ඔවුන්ගේ ප්‍රශ්නත් මෙවර අය වැයෙන් විසඳලා තිබෙන්නේ. මම උදාහරණයක් අරගෙන ඒ ගැන කියන්නම්. අපට කියනවා නේ, මේ ප්‍රශ්නය විසඳන්න අපි කටයුතු කරලා නැහැ කියලා. මේ අය වැය කථාව හරියට කියෙව්වා නම්, අපි මේ කියන කාරණා එහෙම පිටින්ම තේරුම් ගන්න පුළුවන්. මේ අය වැය කථාවත් එක්ක එකතු කර තිබෙන Annexuresවල වැටුප් වැඩිවීමත්, වැටුප් වැඩිවීමට අදාළ කරුණුත් ඉතාම පැහැදිලිව තිබෙනවා. මේ සම්බන්ධයෙන් විවිධ අය වැරදි අර්ථ කථන කරන්න හදන්නේ, වැරදි විධියට ගණනය කරන්න හදන්නේ නිකම් නොවෙයි. චාමර සම්පත් මන්ත්‍රීතුමා වෛද්‍යවරු ගැන කථා කරපු නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමාට කලබල වෙන්න කිසිම දෙයක් නැහැ. වෛද්‍ය වෘත්තියට අදාළ medical officersලාගේ overtime payment එක හැදුවේ මීට කලින් basic salary එක 80න් බෙදලා. ඒක හරි. Basic salary එක -රුපියල් 54,290ක මුදල- 80න් බෙදුවාම පැයක වටිනාකම රුපියල් 678යි. එතකොට දැන් මේක තුළින් කියක් ලැබෙනවාද? දැන් medical officer කෙනෙක් හැටියට, වෛද්‍යවරයෙක් හැටියට කෙනෙක් පත් වුණාම ඔහුගේ වැටුප රුපියල් 91,750යි. එතකොට අපි කලින් 80න් බෙදපු එක 120න් බෙදනවා. එහෙම බෙදුවාට පස්සේ පැයක වටිනාකම කීයද? රුපියල් 764යි. පැයක වටිනාකම රුපියල් 678ට තිබුණු එක දැන් රුපියල් 764ක් වෙලා තිබෙනවා. ඒ නිසා අඩුවීමක් වෙලා නැහැ. වැඩිවීම තමයි හැම පැත්තෙන්ම තිබෙන්නේ. ඒ නිසා වැඩිවීම් ඇතුළේ මේක address කර තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු ඇමතිතුමනි, මට හොඳ දෙයක් කියන්න තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳ එක ඔබතුමාගේ වෙලාවේදී කියන්නකෝ, ගරු මන්ත්‍රීතුමනි. මම තවම කියලා ඉවර නැහැ. මම මේ ගැන කියලා පැහැදිලි කරනකම් ඉන්න.

ඊට පස්සේ, නිවාඩු දිනවල වැඩ කරන එක සම්බන්ධයෙනුත් කියා තිබුණා. එහිදී ලැබෙන මුදල මීට පෙර දින 20කින් තමයි බෙදලා තිබුණේ. එහෙම බෙදුවේ රුපියල් 54,290ක basic salary එකෙන්. ඒක දින 20කින් බෙදුවාම දිනක වැටුප හැටියට රුපියල් 2,715ක් එනවා. එහෙමයි තිබුණේ. දැන් කීයද කියන්නේ? රුපියල් 91,750ක basic salary එක 30න් බෙදුවාම රුපියල් 3,058ක් වෙනවා. ඒත් වැඩියි. ඒ කියන්නේ වැටුප් හදන ක්‍රම තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ නිසා රාජ්‍ය සේවයේ වාගේම පෞද්ගලික අංශයේත් විවිධ servicesවල වැටුප් හදන ක්‍රම තිබෙනවා. හෙද සේවාවේත් මේ විධියටම තිබ්බ 120, 140 කරලා තිබෙන්නේ. ඒ අයගේ වැටුපත් වැඩිවෙලා; අතිකාලත් වැඩිවෙලා. ඒ අයගේ ඉපැයීමකට කිසිදු හානියක් වෙලා නැහැ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු ඇමතිතුමනි, මේ කාරණය කියන්න මට පොඩි අවස්ථාවක් දෙන්නකෝ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හරි. කියන්නකෝ ඔබතුමා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you so much, Madam.
මම මේ ගැන කියන්න ඕනෑ. අපේ doctorsලාට පැය 120යි ලියන්න පුළුවන්. එතකොට ඔය postgraduate traineesලා ඉන්නවා නේ, ඒගොල්ලන් සතියේ පැය 24ම hospital එකේ වැඩ කරනවා. අපි අහන්නේ අඩුම ගණනේ ඒගොල්ලන්ට විතරක්වත් පැය 120න් එහාට පැය 140ක් හෝ, පැය 160ක් හෝ, පැය 200ක් හෝ ලියන්න දෙන්න. ඒ පොඩි උදව්ව හරි doctorsලාට කරලා දෙන්න. මොකද, ගිය අවුරුද්දේ අපේ රටෙන් doctorsලා 2,000ක් විතර ගිහිල්ලා තිබෙනවා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, කාරක සභා අවස්ථාවේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය විවාදයට ගැනෙන අවස්ථාවේ ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඉන්නවා. ඒක සලකා බලන්න පුළුවන් නම්, training ඉන්න වැඩ කරන අයටත්-

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Trainees ලාටත් දෙන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක තමයි. Traineesලා සම්බන්ධයෙන් මේ කථාව කියනවා. මොකද, පෞද්ගලික අංශයේ වුවත්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවම වැටුප රුපියල් 30,000ක් වෙනකොට,

පෞද්ගලික අංශයේ මාස හයක් training වෙන කෙනෙකුට අඩුම ගණනේ රුපියල් 25,000ක්වත් ගෙවන්න කියලා නියමයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉතින් මේ කාරණය විවිධ විධියට අර්ථ කථනය කරලා, අඩු වුණාය කියලා කියන්න හදනවා. මම දැන් ගණන් හදලා පෙන්නුවා නේ.

Consultant කෙනෙකුගේ අවම වැටුප මීට වැඩියි. ඒ අයගේ service එකට ඒ අයගේ අත්දැකීමට, ඒගොල්ලන්ගේ සේවාවට ඒ වටිනාකම තියන්න ඕනෑ. අපි ඒක වටිනාකමක් හැටියට තියලා තමයි මේ වැටුප් වැඩිවීම කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒක කොච්චර ද කියලා කියනවා නම් රුපියල් 54,290ක් ලෙස තිබුණු basic salary එක - gross salary එක තිබුණේ, රුපියල් 232,000යි. දැන් ඒක 277,000ක් දක්වා වැඩි වෙනවා -94,000ක් දක්වා වැඩි වෙනවා. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ගැනත් සමහරු විවිධ කථා කියන්න ගත්තා, වැටුප් කපා හැර තිබෙනවා කියලා. එහෙම නැහැ. ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ මේක විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් වැඩිවීම ඇතුළෙන් තිබෙනවා. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ අවම වැටුප තිබුණේ රුපියල් 54,600යි. රුපියල් 54,600ට සියයට 20ක Backlog Clearing Allowance එකක් ගෙවලා තිබුණා. ඒ, මීට කලින් ආපු double batch එකක් වෙනුවෙන් ගෙවපු එකක්. දැන් ඒ double batch එක එළියට ගිහිල්ලා තිබෙනවා. හැබැයි, ඒත් ආණ්ඩුව ඒ ඔක්කෝම නැවැත්තුවේ නැහැ; ඒ ඔක්කෝම අයින් කළේ නැහැ. ඒ නිසා ඒ අයගේ දීමනා ගණන් හදද්දී දැන් වැටුප කීයද? ඉස්සර ගණන් හැදුවේ රුපියල් 54,600ට, 1.44න් වැඩි කරලා. දැන් අවම වැටුප රුපියල් 91,365යි. එය 0.82න් වැඩි වෙන්නේ. එතැන ඉඳන් - මේකේ chart එක තිබෙනවා - ඒ අනුව විවිධ ගණන්වලින් වැඩි වෙලා තිබෙනවා. මම මේ කියන්නේ අඩුම එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අඩුම ගණන අපි මේ කියන්නේ. අද service එකට - ඒ කියන්නේ, මේ අය වැය සම්මත වුණාට පස්සේ - එන කෙනාට ලැබෙන වැටුප තමයි මේ කියන්නේ. දැන් මේ රුපියල් 91,365ක වැටුප 0.82න් වැඩි කරලා 12,000ක් තවත් එකතු කරනවා. එතකොට රුපියල් 86,980ක් වෙනවා. එතකොට අර Backlog Clearing Allowance එකේ ලැබුණු ගණනෙනුත් සියයට 75කට වැඩි ප්‍රමාණයක් වැටුපට එකතු කරලා තිබෙනවා. එහෙමයි කරලා තිබෙන්නේ. එහෙම නැතිව, කිසිදු වෙලාවක අඩු කිරීමක් කරන්න අපි කටයුතු කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)
මට විනාඩි දෙකක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ අයට Academic Allowance එකක් හැටියට ලැබුණු මුදල තිබෙනවා. ඒ වාගේම අධ්‍යයන දීමනා තිබෙනවා. මේ සියලු තැන්වල; රාජ්‍ය සේවයට එකතු වුණු කිසිදු කෙනෙකුට වැටුප් අඩුවීමක් වෙලා නැහැ. වැඩිවීම ගත්තොත්, රුපියල් 15,750 සිට රුපියල් 98,355 දක්වා වැඩි වෙලා තිබෙනවා. අපි අහනවා, රාජ්‍ය සේවයේ මූලික වැටුප මීට කලින් මේ පාර්ලිමේන්තුවේ මොන අය වැයෙන්ද මෙහෙම වැඩි කළේ කියලා. එහෙම වැඩි කරලා නැහැ. දීමනා එකතු කරපු වෙලාවක් තිබුණා හැර වැටුප මෙහෙම වැඩි කරලා නැහැ. ඒ නිසා අපි ඉතා වගකීමෙන් කියනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ රටේ වැඩ කරන ජනතාවගේ ශක්තිය, වැඩකරන ජනතාවගේ හයිය එක්ක එකතු කරපු ආණ්ඩුවක් බව. පෞද්ගලික අංශය, රාජ්‍ය අංශය, වතු අංශය වාගේම ගොවි ජනතාව, ධීවර ජනතාව යනාදී මේ සියලු දෙනා එක්ක මුළු රටක් දිහා බලලා හදපු අය වැයක් අපි ඉදිරිපත් කර තිබෙන්නේ. එය අතිගරු ජනාධිපතිතුමා ඊයේ දවසේ කිව්වා.

සමහරුන්ට මේක දැනිලා තිබෙනවා, අපි උතුරට සැලකුවා, අරහෙට සැලකුවා, මෙහෙට සැලකුවා කියලා. නැහැ, මුළු රටටම සලකලා තිබෙන්නේ. මුළු රටටම සලකද්දී රටේ වැඩ කරන ජනතාවට ඉතිහාසයේ කවදාටත් වඩා වැඩි වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබෙනවා. රාජ්‍ය සේවයේ පහළම ඉන්න කාර්යාල කාර්ය සහායකගේ සිට අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා ඒ වැඩි වීම වෙලා තිබෙනවා. රුපියල් ලක්ෂයකට ආසන්න මුදලක් අමාත්‍යාංශ ලේකම්වරයාට වැඩිවෙද්දී රුපියල් 15,000ක මුදලක් කාර්යාල කාර්ය සහායකට වැඩි වෙනවා. ඒ නිසා වැටුප් පිළිබඳ ප්‍රතිපත්තියත්, රාජ්‍ය සේවයේ තිබුණු මේ තත්ත්වයත්, වැටුප් අතර විෂමතාවත් අවසන් කරලා, මෙතෙක් කල් පීඩාවට පත් කරපු විශ්‍රාමිකයන්ට හිමි වැටුපත් මේ වැටුප් සංශෝධනයත් එක්ක ලබා දීලා මේ රටේ වැඩ කරන ජනතාවට ඉහළම සාධාරණය ඉටු කරන ලද අය වැය අපි ඉදිරිපත් කළා කියන කාරණය කියමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිනිඳු සමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.14]

ගරු දිනිඳු සමන් මහතා
(*மாண்புமிகு தினிந்து சமன்*)
(The Hon. Dinindu Saman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේ අය වැය පිළිබඳව කථා කරන මේ විවාදයේදී මට මතක් වෙනවා ඉන්දියාවේ හිටපු ජනාධිපති අබ්දුල් කලාම් මැතිතුමා කියපු කථාවක්. එතුමා කියනවා, "සිහිනය යනු නින්දේදී දකින දෙයක් නොව, එය ඔබට නිදා ගැනීමට ඉඩ නොදෙන දෙයක්" කියලා. ඇත්ත වශයෙන්ම ජාතික ජන බලවේගයේ මේ මංගල අය වැය අපි දැකපු හීනයක්. අපි දැකපු ඒ හීනය හැබෑ කර ගන්න දාපු මුල් අඩිතාලම තමයි මේ මංගල අය වැය ඇතුළේ තිබෙන්නේ. රටක් විධියට මේ රට සුන්දර කරන්නේ කොහොමද, මේ රටේ හැමෝටම සමාන විධියට ආර්ථිකය බෙදී යාම සිද්ධ කරන්නේ කොහොමද, පහළ ඉන්න ජනතාවට ආර්ථිකය බෙදන්නේ කොහොමද කියන කාරණය අපි කාලාන්තරයක් තිස්සේ හීනයක් විධියට දැක්කා. ඒ හීනය හැබෑ කරන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට ඇවිල්ලා, ඊයේ දවසේ මංගල අය වැය ඉදිරිපත් කරලා අද අපි ඒ මංගල අය වැය පිළිබඳව සාකච්ඡා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මේ අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ සුවපහසු රටක නොවෙයි. මේ අය වැය ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ බංකොලොත් කරලා, ආර්ථිකය පල්ලත් එක්ක හූරාගෙන කාලා අඩියටම බිඳ වට්ටලා තිබුණු රටක. හොරකම, වංචාව, දූෂණය, මැරකම සංස්කෘතියක් බවට පත් කර ගත්ත රටක තමයි අපට මේ අය වැය ගැන කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම රටක උඩ ඉඳන් පහළට සමස්ත යන්ත්‍රණයටම සහන බෙදී යන පරිදි සාර්ථක අය වැයක් ඉදිරිපත් කරන්න අපි අද දවසේ කටයුතු කරලා තිබෙනවා. එක

[ගරු දිනිදු සමන් මහතා]

පැත්තකින් රුපියල් බිලියන 604ක් සෞඛ්‍යයට වෙන් කර තිබෙනවා. අපේ රටේ මහජනතාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න ඉතිහාසයේ වැඩිම මුදල මේ අය වැය තුළ වෙන් කරන්න අපි සමත් වෙලා තිබෙනවා. මේ රටේ දුප්පත් ජනතාව බෙහෙත් පෙත්තක් ගන්න බැරිව ඉන්න වටපිටාවක, ඒ ජනතාව වෙනුවෙන් සහන දෙන්න අදාළ කරන අය වැයක් සම්පාදනය කරන්න පුළුවන් වීම ගැන අපි සතුටු වෙන්න ඕනෑ.

එක පැත්තකින් අපි ගිය ආණ්ඩුව ඇතුළේ මොනවාද දැක්කේ? මේ සභාවේ ඉඳන් පාරම්බාන විපක්ෂයෙන් අප අහනවා, ඔයගොල්ලන්ගේ ආණ්ඩුව ඇතුළේ සෞඛ්‍ය පද්ධතිය දාලා තිබුණු තැන මොකක්ද කියලා. මිනිහෙක් බෙහෙත් ගන්න ගියාම injection එකක් ගහන්න වුණොත් ඒ injection එක විදගෙන මැරෙනවාද, නොවිද මැරෙනවාද කියන එක ඒ මනුස්සයාට හිතන්න සිද්ධ වුණා. එහෙම කළ ආණ්ඩුවක්, සෞඛ්‍ය පද්ධතිය එහෙම කඩා වට්ටපු ආණ්ඩුවක් තමයි පසුගිය කාලයේ තිබුණේ. නමුත්, අපි සමත් වෙලා තිබෙනවා රුපියල් බිලියන 604ක් මේ අය වැය තුළින් සෞඛ්‍ය පද්ධතියට එකතු කරන්න. සමස්ත මහ ජනතාවගේ සෞඛ්‍ය සඳහා අපි ඒක වෙන් කරන්න සමත් වෙලා තිබෙනවා. අපේ වාමර සම්පත් මහත්තයා දිගටම අනුරාධපුරයේ hospitalsවලට වෙන් වුණු සල්ලි ගාණ කිව්වා. අය වැය කියවද්දී එතුමාට බදුල්ල දිස්ත්‍රික්කයේ ශීර්ෂ ජේන්නේ නැති එක ගැන අපට තිබෙන්නේ කනගාටුවක්. බදුල්ල මහ රෝහලේ තට්ටු 10ක බිල්ඩින් එකක් ඉදි කරන්න රුපියල් මිලියන 500ක් මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා, බදුල්ල ජනතාවට සේවයක් වෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා මේ අය වැය ඇතුළේ අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක්, ඉතිහාසයේ වෙන් කළ වැඩිම මුදල විධියට වෙන් කරලා තිබෙන බව. මම ඒ ගැන සතුටු වෙනවා විශ්වවිද්‍යාලයක නිටපු ශිෂ්‍ය නායකයෙකු විධියට. මොකද, අපි විශ්වවිද්‍යාලය ඇතුළේ ඉන්න කාලයේ මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 500කින් 1,000කින් වැඩි කර ගන්න ගිහින් ගුටි කාපු අවස්ථා තිබෙනවා, කඳුළු ගෑස් කාපු අවස්ථා තිබෙනවා. ඉතිහාසයේ ශිෂ්‍යයන්ට කඳුළු ගෑස් ගහපු, ශිෂ්‍යයන්ට, ශිෂ්‍ය නායකයන්ට ගුටි දෙන්න කටයුතු කරපු මිනිස්සු, පොලීසිය, හමුදාව දාලා ශිෂ්‍යයෝ මර්දනය කරපු මිනිස්සු අද කිඹුල් කඳුළු හෙළනවා මේ වැඩි කළ රුපියල් 2,500 මදි කියලා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ උද්ඝෝෂණය කළේ නැහැ, අරගළ කළේ නැහැ තමන්ගේ මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කරන්න කියලා. නමුත්, අපි ස්වේච්ඡාවෙන් ආණ්ඩුවක් විධියට තීන්දු කළා මහපොළ වැඩි කරන්න.

අධ්‍යාපනයට වෙන් කරන මුදල ගැන බැලුවාම ප්‍රාථමික අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා හැමෝටම සහන සලසන අය වැයක් බවට මේක පරිවර්තනය වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීවරයෙක් මේ සභාවේදී කිව්වා, ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් එතුමන්ලාට අදහසක් නැහැ කියලා. ප්‍රාථමික අධ්‍යාපනය හරියට කළා නම් ඒ වාගේ කථා එන්නෙත් නැහැ. එතුමන්ලා කරුණු ඉදිරිපත් කරමින් අපේ අය වැය විවේචනය කළාට, ප්‍රාථමික අධ්‍යාපනය ඇතුළේ ළමයාගේ පෝෂණ තත්ත්වය වැඩි කරන්න පවා අපි සැලකිල්ල යොමු කරලා තිබෙන්නේ. ඒ වාගේම අපි දන්නවා ප්‍රාථමික අධ්‍යාපනය ලබා දෙන ගුරුවරුන්ගේ ධාරිතාව ප්‍රවර්ධනය කරන්න ඕනෑ. ඔවුන්ට උගන්වන්න සුදුසු පරිසරයක් අලුතෙන් හදලා දෙන්න ඕනෑ, ඒ අයට හොඳ වැටුප් තලයක් හදලා දෙන්න ඕනෑ. ඒකට අදාළ කරන පහසුකම් මේ අය වැය ඇතුළේ හදලා තිබෙන්නේ. රටේ සියලු දරුවන්ට ඒ සම්පත් බෙදී යනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා මේ අය වැය ඇතුළේ අධ්‍යාපනය සංවර්ධනය කරන්න වැඩි බරක් තබා තිබෙන බව.

ඒ වාගේම පාසල් සංවර්ධනය ගැනත් වැඩි අවධානය යොමු කර තිබෙනවා. මා ඉගෙන ගත්තු බදුල්ල ධර්මදූත මහා විද්‍යාලය ක්‍රීඩා පාසලක් විධියටයි ඒ කාලයේ හැඳින්වුයේ. බදුල්ල ධර්මදූත මහා විද්‍යාලය ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ජාතික ක්‍රීඩකයන් නිර්මාණය කරපු තැනක්. හැබැයි, උෟව පළාතේ තිබෙන ධර්මදූත මහා විද්‍යාලය වාගේ විද්‍යාලවලට -දුප්පත් විද්‍යාලවලට- පසුගිය ආණ්ඩුව විසින් කරපු කුඩම්මාගේ සැලකිල්ල නිසා ක්‍රීඩාවට තිබුණු තැන නැති වෙලායි තිබෙන්නේ. මේ අය වැය ඇතුළේ උෟව පළාත ඇතුළු පළාත් කිහිපයක ක්‍රීඩා පාසල් සංවර්ධනය කරන්න අවශ්‍ය කරන මුදල් වෙන් වෙලා තිබෙනවා.

ආණ්ඩුවක් විධියට අපි සතුටු වෙන්න ඕනෑ. මොකද, මාලිමා ආණ්ඩුවේ පළමු අය වැය; ජනතාවාදී අය වැය; මංගල අය වැය තුළ අපි සමත් වෙලා තිබෙනවා, උතුර, දකුණ නැඟෙනහිර ආදි සියලු ප්‍රදේශවල ජනතාවට ප්‍රතිලාභ සමානව බෙදී යන අය වැයක්, ප්‍රතිලාභ සමානව බෙදී යන ආර්ථිකයක් හදලා දෙන්න.

අධ්‍යාපනය වෙනුවෙන් මුදල් වෙන් කිරීම තුළ විශේෂත්වයක් අපි දකිනවා. මෙය, එක් පැත්තකින් පාසල් දරුවන්ගේ පොත් ටික ගන්න සල්ලි වෙන් කරපු ආණ්ඩුවක්. අපි එය මේ අය වැයට ඇතුළත් කළේ නැහැ. ඒ වාගේම මෙය, පාසල් දරුවන්ට පාවහන් යුගල ගන්න සල්ලි වෙන් කරපු ආණ්ඩුවක්; පාසල් දරුවන්ට සියලු වරප්‍රසාද දෙන්න, නිල ඇඳුම් දෙන්න සල්ලි වෙන් කරපු ආණ්ඩුවක්. ඒ සියල්ල කරලා තිබියදීත් පාසල් දරුවන්ගේ පහසුකම් සංවර්ධනය කිරීමට අදාළව රුපියල් බිලියන 619ක් වියදම් කරන්න යෝජනා කරලා තිබෙනවා. අප කාලයක් තිස්සේ අය වැය තුළ පාසල් අධ්‍යාපනයට, උසස් අධ්‍යාපනයට මුදල් වෙන් කරන්න කියද්දී දැන් ඔය පැත්තේ වාඩි වෙලා ඉන්න අය හිනා වුණා. ඒවායේ ප්‍රතිඵල තමයි අද මේ පෙනෙන්නට තිබෙන්නේ. අපි සඳහන් කරනවා, මින් පස්සේ අපේ පරම්පරාවට එහෙම ඉරණමක් අත් වෙන්න අපේ ආණ්ඩුවක් යටතේ ඉඩ තබන්නේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ රටේ දුප්පත්කම තුරන් කරන්න ඕනෑ. බදුල්ල දිස්ත්‍රික්කය කියන්නේ දුප්පත්කමින් පීඩාවට පත් වෙච්ච දිස්ත්‍රික්කයක්. මගේ දිස්ත්‍රික්කය ඇතුළේ දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් තිබෙනවා. ඒවායේ වෙසෙන දුප්පත් අයගේ දුප්පත්කම නැති කරන්න ඕනෑ. දුප්පත්කම සහ අධ්‍යාපනය අතර අන්තර් සම්බන්ධයක් තිබෙනවා. ඒ දරුවන්ට හොඳට ඉගැන්වීම මඟින් මේ රටේ දුප්පත්කම තුරන් කරන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. එක පැත්තකින්, සහනාධාර ගන්න ලොකු පිරිසක් බිහි වෙලා සිටිනවා. මේ අය වැය ඇතුළේ අපි ඒගොල්ලන් තනි කරලා නැහැ. ජනතාවට අවශ්‍ය කරන සහනාධාර ලබා දෙන්න සාධනීය පියවරක් මේ අය වැය තුළ ගෙන තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඒක ඉදිරියටත් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් වේවි කියලා. සහනාධාර දෙනවා වාගේම ඒ පවුල් ශක්තිමත් කිරීමට අදාළව, ඒ පවුල්වල හොඳ ආර්ථිකයක් ගොඩ නැඟීමට අදාළව මේ අය වැය තුළින් මුදල් වෙන් කර තිබෙනවා.

අපි විශ්වාස කරනවා, අපේ අය වැය තුළ ආර්ථිකය ගොඩ නහන්න, අපේ අය වැය තුළ මේ සමාජ පද්ධතිය ගොඩ නහන්න, අපේ අය වැය තුළ දුප්පත්කම නැති කරන්න සාධනීය සංවර්ධන පියවරක් තබා තිබෙනවා කියලා. ඒවා මේ විපක්ෂයට තේරෙන්නේ නැහැ. අපට සතුටුයි විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද කියන කථා ගැන. කොහොමටත් ඔබතුමන්ලාට මේ අය වැය තේරුම් ගන්න බැහැ. බටර් ගාන අය වැයක් ඉදිරිපත් කරන්න අපට වුවමනා නැහැ. අපි ඉදිරිපත් කළේ ජනතාවාදී අය වැයක්. මේ ජනතාවාදී අය වැය ඉදිරිපත් කරන කොට අපි මතක් කරලා දෙන්න ඕනෑ, මේ අය වැය ඇතුළේ ඔබතුමන්ලාගේ පවි අපට ගෙවන්න සිදු වෙලා තිබෙන බව.

ශ්‍රීලන්කන් ආයතනයට ණය සහ පොලී ගෙවන්න විතරක් රුපියල් මිලියන 20,000කට වැඩි ප්‍රමාණයක් මේ අය වැය තුළ වෙන් කර තිබෙනවා. ඒ, ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ කරපු පව් ගෙවන්නයි. ඒ පව් ගෙවන ගමන් තමයි අපට මේ අය වැය රටේ සංවර්ධනයට යොදවන්න වෙලා තිබෙන්නේ. අපි කියනවා මේ රට වෙනුවෙන් අපට කළ හැකි සියලු දේ කරන බව. ඒක මේ මංගල අය වැය තුළින් අප ප්‍රදර්ශනය කර තිබෙනවා කියන එකත් අපි සඳහන් කරන්න කැමැතියි.

පාසල් පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, මා ජීවත් වන බටුල්ල දිස්ත්‍රික්කය වාගේ දුෂ්කර ප්‍රදේශවල පාසල්වලට මුදල් වෙන් කිරීම මේ අය වැය තුළ ගෙන තිබෙන සාධනීය පියවරක් කියා අපට හඳුනා ගන්න පුළුවන්. ඒ වාගේම වෘත්තීය අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට ඉල්ලීමක්වත් කරන්නේ නැතුව ඒ ගොල්ලන්ගේ දීමනාව රුපියල් 4,000 සිට 5,000 දක්වා වැඩි කර තිබෙනවා. අධ්‍යාපනය සඳහා හොඳම දැක්ම තිබෙන මේ ආණ්ඩුව, අධ්‍යාපනය සඳහා හොඳම වැඩ පිළිවෙළ තිබෙන මේ ආණ්ඩුව ශිෂ්‍යයන්ට සලකන්නේ එහෙමයි. අපි විශ්වාස කරනවා, මේ රටේ හෙට දවස භාර ගන්න ඕනෑ ඒ ශිෂ්‍යයන් බව; මේ රටේ හෙට දවසේ අනාගතය විය යුත්තේ ඒ ශිෂ්‍යයන් බව. ඒක නිසා ඒ ශිෂ්‍යයන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් අපේ අය වැය තුළින් සලස්වන්න අපි සමත් වෙලා තිබෙනවා.

රජයේ සේවකයෙකු, වෘත්තීය සමිති නායකයෙකු විධිය මම සතුටු වෙනවා. කාලයක් රජයේ සේවකයන්ට නායකත්වයක් දෙන්න වෘත්තීය සමිති සටන්වලදී අපි පෙරමුණ ගත්තා. රුපියල් 20,000ක වැටුප් වැඩි වීමක් ඉල්ලන කොට වික්‍රමසිංහ ආණ්ඩුව අපට දුන්නු උත්තරය අපට මතකයි. වික්‍රමසිංහ ආණ්ඩුව උද්ඝෝෂණයට ගිය අය එළියේ තියලා, එයට නොගිහින් හිටපු අයට වැටුප් වර්ධක වැඩි කරපු ආණ්ඩුවක්. මේ විපක්ෂයේ ඉන්න අයට මතක නැහැ එහෙම කළා කියලා. අපේ ඒ අරගළය පාවා දීපු, වික්‍රමසිංහ ආණ්ඩුවට පක්ෂපාතිත්වය දරපු ඒ අයට ප්‍රශංසා සහතික පවා නිකුත් කළා. අන්න එහෙම ආණ්ඩුවක් විසින් කාබාසිනියා කරපු රාජ්‍ය සේවකයාට හොඳ වැටුප් තලයකට එන්න අවස්ථාව සලසන්න, හොඳ වැටුප් තලයක් දෙන්න, සාධාරණ වැටුප් තලයක් දෙන්න අපේ ආණ්ඩුව සමත් වෙලා තිබෙනවා.

මේ රටේ සියලු රාජ්‍ය සේවකයන්ට අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි දන්නවා, සියයට 80කට වැඩි රාජ්‍ය සේවකයෝ මේ ජනතාවාදී ආණ්ඩුව පත් කරන්න හීන දැකපු බව. ඔබ මේ ජනතාවාදී ආණ්ඩුව පත් කරන්න ප්‍රායෝගිකව මහන්සි වුණා. මෙය, ඔබ වෙනුවෙන් කළ හැකි සියල්ල කරන ආණ්ඩුවක්. එම නිසා ඔබ මේ විපක්ෂයේ අසත්‍ය ප්‍රකාශවලට මුළා වෙන්න එපා. විපක්ෂයේ අසත්‍ය ප්‍රකාශවලින් රාජ්‍ය සේවකයන් අන්දන්න බැහැ කියා අපි විශ්වාස කරනවා. රාජ්‍ය සේවකයාට හොඳටම සලකපු, රාජ්‍ය සේවකයා වෙනුවෙන් නිවැරදි වැටුප් වැඩි කිරීම කරපු ආණ්ඩුව තමයි අපේ ආණ්ඩුව. මෙම අය වැය තුළින් අපි එය සිදු කර තිබෙනවා.

ඒ වාගේම, දුෂ්කර පළාතක් වන අපේ පළාත ඇතුළුව මේ රටේ අලි-මිනිස් ගැටුම නතර කරන්නත්, අලි-මිනිස් ගැටුමෙන් පීඩාවට පත් ජනතාවට සහන දෙන්නත් මෙම අය වැය තුළින් මුදල් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටට අවශ්‍යව තිබුණු දෙයක් තමයි, ජාතික සමගිය. නමුත්, මේ රටේ ජාතික සමගිය නිර්මාණය වුණේ නැහැ. යුද්ධය අවසන් වෙලා අවුරුදු ගණනක් ගිහිල්ලාත් ශ්‍රී ලාංකික ජාතිය නිර්මාණය කර ගන්න අසමත් වෙච්ච පිරිසක් අපි. අවුරුදු 30ක යුද්ධයෙන් පසුවත් අපි තවමත් ජාතිවාදී කතන්දර කියනවා, මේ උත්තරීතර පාර්ලිමේන්තුව ඇතුළේ. නැවත එසේ නොවන තැනට මේ රට හදන්න ඕනෑ. ජාතීන් අතර සමගිය හදන, ජාතීන් අතර යහ පාලනය හදන, ජාතීන් අතර සහෝදරත්වය හදන, ශ්‍රී ලාංකික ජාතිය නිර්මාණය කරන යෝජනා මෙම අය වැය තුළ තිබෙනවා. මේ අය වැය තුළ අපි යෝජනා කර තිබෙනවා, "ශ්‍රී ලාංකික දිනය" සමරන්න. ඒ සඳහා රුපියල් මිලියන 300ක මුදලක් වෙන් කර තිබෙනවා. එය, උතුර, දකුණ හා නැගෙනහිර යා කරන අලුත් දිනයක්; උතුර, දකුණ හා නැගෙනහිර සංස්කෘතිකමය වශයෙන් යා කරන දිනයක්. එහෙම දිනයක් ගැන සංකල්පයක්වත් ඉතිහාසයේ සිටි පාලකයන්ට තිබුණේ නැහැ කියා අපි හිතනවා. නමුත්, අපි සමත් වෙලා තිබෙනවා ජාතීන් අතර ඒ සමගිය හදන්න. ශ්‍රී ලාංකීය ජාතිය නිර්මාණය කරන, නව සංවර්ධිත රටක්, නව සංවර්ධිත දේශයක් ගොඩ නඟන පළමු වැනි අඩිය තමයි අප මේ තබා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එහිදී හැම ක්ෂේත්‍රයකටම අදාළව අපේ අය වැය තුළ සාධාරණ පංගුවක් වෙන් වෙලා තිබෙනවා. එම සාධාරණ පංගුව වෙන් කිරීමට අදාළව මාලිමා රජය ගත්තු මහන්සිය ජනතාව තේරුම් ගෙන තිබෙනවා, ජනතාව එහි විශේෂත්වයක් දැක තිබෙනවා කියා අපි විශ්වාස කරනවා. මොකද, මම Facebook එකේ පළ වූ post එකක් දැක්කා. එහි තිබුණා, "ඉතිහාසයේ පළමු වතාවට තමන්ට තිබෙන දේවල් කැප කරලා අනුන්ට දෙන ආණ්ඩුවක් දැක්කා" කියලා. එහෙම කරනවා අපි දැකලා තිබෙන්නේ අම්මලා, තාත්තලා විතරයි. හැබැයි, ඉතිහාසයේ පළමු වතාවට මේ රටට අම්මා, තාත්තා වාගේ ආණ්ඩුවක් පත් වෙලා තිබෙනවා; අම්මා තාත්තා වාගේ සලකන ආණ්ඩුවක් පත් වෙලා තිබෙනවා. එම නිසා මේ රටේ ජනතාවට අපි කියනවා, අද පත් වෙලා තිබෙන්නේ ඔබ වෙනුවෙන් වැඩ කරන ආණ්ඩුවක්, එය විශ්වාස කරලා ඔබ වැඩ කරන්න, ඔබ වෙනුවෙන් වැඩ කරන්න අපි සූදානම් කියලා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 1.27]

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළේ, උණ්මෙයිල් ඉන්ත වරවු සෙලවුත්තිට්ටම්, තර්පෝතෙය නිලෙමෙයිල් ඉන්ත නාට්ටු මක්කළ් ඔරළවු නන්මෙයටෙයක්කූටිය විතත්තිල් අමෙන්තිරුක්කින්රතු. කුරිප්පාක, කටන්ත කාලංකළිල් මිකවුම් පාතික්කප්පට්ටිරුන්ත මලෙයක මක්කළුක්කු ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිනූටාකප් මිල්ලියන් කණක්කාන නිති ඔතුක්කප්පට්ටු, අවර්කළුටෙය වාළ්වාතරත්තෙ, වාළ්ක්කෙත් තරත්තෙ මේම්පටුත්තුවතර්කුරිය තිට්ටංකළුම් මුන්මොළියප්පට්ටිරුක්කින්රන.

අතේපෝල, කල්වික්කුම් කූටුතලාන නිති ඔතුක්කප්පට්ටිරුක් කින්රතු. කුරිප්පාක, යුත්තත්තාල් පාතික්කප්පට්ට වටක්කිල් පල පාටසාලෙ මාණවර්කළ් මර නිළලිල් ඉරුන්තුතාන් කල්වි කර්කක්කූටිය නිලෙමෙ ඉරුක්කිරතු. කටන්තකාල අරසාංකම් අවර්රුක්කුප් පෙතික වසතිකළෙච් චෙය්තුකොටුප්පතර්කාක වකුප්පරෙක් කට්ටටංකළුක්කුම් ඒනෙය කට්ටටංකළුක්කුම් නිති ඔතුක්කීටුකළෙච් චෙය්තතු. කට්ටුමාන වේලෙකළුම් ආරම්පික්කප්පට්ටන. එනිනුම්, අවෙ අරෙකුරෙයාක

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

இடைநிறுத்தப்பட்டிருக்கின்றன. இவ்வாறான நிலைமை அங்கு பல இடங்களில் இருக்கின்றது. எமது வன்னி மாவட்டத்தில் மாத்திரம் கிட்டத்தட்ட 38 பாடசாலைக் கட்டட வேலைகள் பூர்த்திசெய்யப்படாமல் இடைநிறுத்தப்பட்டிருக்கின்றது. கடந்த காலத்தில் நாம் அந்த 38 பாடசாலைகளில் 14 பாடசாலைகளுக்குரிய கட்டடங்களைக் கட்டுவதற்கு முயற்சி எடுத்து, விசேட நிதி ஒதுக்கப்பட்டு, அதற்கான வேலைகளை ஆரம்பிக்கவிருந்தபோது, தேர்தல் நடைபெற இருந்ததன் காரணமாக அந்த நிதி திருப்பியனுப்பப்பட்டிருக்கின்றது. அந்தப் பாடசாலைகளுக்குரிய கட்டடங்களைக் கட்டாயம் கட்டித் தரவேண்டும். ஏனென்றால், அங்குள்ள மாணவர்கள் மிகவும் கஷ்டப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். அந்த அடிப்படையில், கல்வி நடவடிக்கைகளுக்கு ஒதுக்கிய நிதிகளிலிருந்து கட்டாயம் அந்தப் பாடசாலைகளில் குறையாக உள்ள வேலைத்திட்டங்கள் பூர்த்தி செய்யப்பட வேண்டும். சில வேலைகளுக்குக் கடந்த காலத்தில் tender கோரப்பட்டிருக் கின்றது. ஒரு சிலர் அரசியல் காரணத்திற்காக அவ்வேலைகள் நிறுத்தப்பட்டிருப்பதாகச் சொன்னார்கள். அரசியல் அல்ல, அந்த நேரம் தெரிவுகளில் ஏற்பட்ட பிழைகள் அதற்குக் காரணமாக இருக்கலாம். எனவே, நீங்கள் அவற்றைச் செய்து தரவேண்டுமென்று நாங்கள் கூறிக்கொள்கிறோம்.

அத்தோடு, உயர் கல்வி சம்பந்தமாக எடுத்துக்கொண்டால், முதலில் யாழ். பல்கலைக்கழகத்தின் ஒரு வளாகமாக அமைக்கப்பட்டிருந்த வவுனியா வளாகம் அண்மையில்தான் வவுனியாப் பல்கலைக்கழகம் என்ற நிலைமைக்கு உயர்த்தப்பட்டிருக்கின்றது. அதற்குப் பல தேவைப்பாடுகள் இருக்கின்றது. நல்லதொரு வைத்தியசாலை வவுனியாவில் இருக்கின்ற நிலையில், அந்த வைத்தியசாலையினை வைத்து அங்கு Medical Faculty ஒன்று உருவாக்கப்பட வேண்டுமென்பது தொடர்பில் கடந்த காலங்களில் நாங்கள் தொடர் முயற்சிகளை எடுத்திருந்தோம். Vavuniya University Medical Faculty தொடர்பில் இந்த 'பட்ஜெட்'இல் எதுவும் குறிப்பிடப்படவில்லையென்று நான் நினைக்கின்றேன். ஆனால், கட்டாயம் எங்களுக்கு அங்கே ஒரு Medical Faculty உருவாக்கப்பட வேண்டும். அதையும் இம்முறை ஒதுக்கப்பட்டிருக்கின்ற நிதியினூடாக நிறைவேற்றித்தர வேண்டுமென்று கூறிக்கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த முறை வடக்கு மாகாணத்திற்கு குறிப்பாக வீதிகள், பாலங்கள் மற்றும் பல வேலைத்திட்டங்களுக்கெனப் பாரிய நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருப்பது உண்மையில் பாராட்டக்கூடிய ஒரு விடயம். கடந்த காலங்களில் சில அரசுகள் விட்ட பிழைகளை நீங்களும் செய்யக் கூடாது. கடந்த காலத்தில் வேலைகள் ஆரம்பிக்கப்பட்டு முடிக்கப்படாமல் அரைகுறையாகப் பல வீதிகள் இருக்கின்றன; பல பாலங்கள் அரைகுறையாக இருக்கின்றன. இவற்றை ஏன் கடந்த அரசாங்கம் செய்து முடிக்கவில்லையென்று நீங்கள் கேட்கலாம். நாட்டில் ஏற்பட்ட பொருளாதாரத் தாக்கம் அதற்குக் காரணமாகக் கூறப்பட்டது. முதலாவதாக நீங்கள் அவற்றை அடையாளப்படுத்தி இந்த நிதி ஒதுக்கீடுகளிலிருந்து அவ்வேலைகளை முடித்துத் தரவேண் டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன். அண்மையில் ஒரு பத்திரிகையாளர் மாநாட்டில் கௌரவ அமைச்சர் அவர்கள், பாலங்கள் மற்றும் 1200 கிலோமீற்றர் நீளமான வீதிகளை அமைப்பது தொடர்பில் குறிப்பிட்டிருந்தார்; உண்மையில் மிகவும் பாராட்டப்படக்கூடிய விடயம். கடந்த காலங்களில் தென்பகுதிகளில் தொடர்ச்சியாக அபிவிருத்தி நடைபெற்றிருக் கின்றது. வடபகுதியை எடுத்தால் அங்கு அப்படியில்லை. முப்பது வருட யுத்தம் காரணமாகப் பாரிய அபிவிருத்திகளை அங்கே செய்ய இயலாமல் இருந்திருக்கின்றது. இந்தத் திட்டங்கள் உண்மையில் நல்ல பயன்தரும் என்பதால், அவற்றுக்கு நிதி ஒதுக்கியமைக்காக நான் இந்த இடத்தில் ஜனாதிபதி அவர்களுக்கும் இந்த அரசாங்கத்திற்கும் நன்றி கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோல, இந்த நாட்டில் இடம்பெற்ற யுத்தம் 2009ஆம் ஆண்டில் முடிவடைந்திருந்தாலும் இன்றுவரைக்கும் அந்தப் பகுதிகளில் மீள்குடியேற்றம் சரியாக நடைபெறவில்லை. குறிப்பாக நாங்கள் சொல்வதாக இருந்தால், யுத்தத்தால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்கு மக்கள், அதேபோல எல்லைப் பகுதிகளில் இருந்த ஏனைய மாகாண மக்கள் - கிட்டத்தட்ட 17,000 குடும்பங்கள் - மீள்குடியேற்றப்பட வேண்டிய நிலைமையில் இருக்கின்றார்கள். பிச்சைக்காரன் தனது புண்ணைக் காரணம் காட்டிப் பிச்சை எடுப்பது மாதிரி இல்லாமல், இந்த விடயத்தில் அரசாங்கம் சரியாகத் திட்டமிட்டுச் செயற்பட வேண்டும். கடந்த காலங்களில் அரச இயந்திரம் சரியாக இயங்கவில்லை; சரியான நடைமுறைகள் இல்லையென்ற அடிப்படையில்தான் உங்களுக்கு இந்தளவுக்கு மக்களின் ஆதரவு கிடைத்து, ஒரு பெரிய வெற்றியோடு நீங்கள் ஆட்சிக்கு வந்திருக்கின்றீர்கள். அந்த அடிப்படையில், கிராம மட்டங்களில் உங்களுடைய அமைப்பு எவ்வளவு உறுதியாக இருக்கின்றதோ அதனைப் பயன்படுத்தி இந்த மீள்குடியேற்றம் என்ற பிரச்சினைக்கு ஒரு முடிவைக் கொண்டு வாருங்கள்! இன்னும் ஒரு வருடத்திலோ, இரண்டு வருடத்திலோ, மூன்று வருடத்திலோ இதனைச் செய்து முடிக்கக்கூடிய ஒரு திட்டத்தை நீங்கள் முன்னெடுங்கள்!

இங்கே எல்லாப் பக்கமும் பிரச்சினைகள் இருக்கின்றன. மீள்குடியேறியவர்களுக்குக் காணி வழங்குவதில் பிரச்சினை இருக்கின்றது. கடந்த காலங்களிலும் Forest Department, Wildlife Department போன்றவற்றின் தலையீடுகளால் காணி வழங்குவதில் பிரச்சினை இருந்தது. ஆனாலும் நாங்கள் காணி வழங்கும் நடவடிக்கைகளைச் செய்திருக்கின்றோம். வசதி படைத்த, செல்வாக்கானவர்கள் அங்குள்ள காணிகளை ஏக்கர் கணக்கில் அபகரித்து துப்புரவாக்குகின்றார்கள். ஆனால், சாதாரண குடிமகன் ஒருவன் ஓரடி நிலத்தைத் துப்புரவாக்கினால்கூட உடனடியாக அவரை arrest பண்ணுகிறார்கள். கடந்த காலங்களில் இருந்த இப்படியான நிலைமை இன்றும் தொடர்கின்றது. அதில் மாற்றத்தினை ஏற்படுத்த வேண்டும்; அதற்காகத்தான் மக்கள் உங்களைத் தேர்ந்தெடுத்திருக்கின்றார்கள்.

1985ஆம் ஆண்டுக்குப் பிறகு இருந்த நிலைமையின்படி, thick forestஆக இல்லாத காணிகளை விடுவிக்க வேண்டும். அங்கேயிருந்து யுத்த காலங்களில் இடம்பெயர்ந்த மக்கள் பலர் இன்றைக்கு diasporaகளாக வெளிநாடுகளில் இருக் கின்றார்கள்; நல்ல நிலைமையில் இருக்கின்றார்கள். அவர்கள் மீண்டும் வந்து நாட்டின் அபிவிருத்திக்கு உதவி செய்வதற்கு ஆயத்தமாக இருக்கின்றார்கள். ஆனால், கடந்த காலங்களில் அதற்கான ஒழுங்குகள் செய்யப்படவில்லை; இப்பொழுதும் இதுவரைக்கும் அதைச் சரியாகச் செய்வதாகத் தெரியவில்லை. வடக்கிற்கு ஒதுக்கப்பட்டிருக்கின்ற நிதி ஏற்பாடுகளின்மூலம் கட்டாயமாக அவற்றைச் செய்யுங்கள்! குறிப்பாக, யுத்தத் தினால் பாதிக்கப்பட்டவர்களுக்கான வீடுகளை அமைத்துக் கொடுத்து, உட்கட்டமைப்புத் தேவைகளை நிவர்த்திசெய்து, மீள்குடியேற்றத்தைப் பூரணமாகச் செய்து தாருங்கள்! அமைக்கப்படவுள்ள 1,200 கிலோமீற்றர் வீதிகள்மூலம் அநேகமாக அந்த உட்கட்டமைப்பு வந்துவிடும். அவர்களின் இடம்பெயர்வுதான் forest பிரச்சினை ஏற்படக் காரணமாக இருக்கிறது. யுத்தம் காரணமான இடம்பெயர்வுகளினால் அந்த இடங்களில் 05 - 06 அடிக்கு மரங்கள் வளர்ந்தவுடனே அந்த

இடம் forest என்று சொல்கின்றார்கள். இதுபோல் Department of Wildlife Conservation பிரச்சினையென்பதும் பாரிய பிரச்சினை! இவை எங்களுடைய மக்களின் முன்னேற்றத்தை அடியோடு இல்லாமல் செய்கின்ற பிரச்சினைகள்! எனவே, நீங்கள் அதற்குரிய சரியான முடிவுகளை எடுக்க வேண்டும்.

அதுபோல், யானைப் பிரச்சினைக்கு வேலி போடுவதற்கான இடத்தை அடையாளப்படுத்துவதற்குப் போனால் அங்கும் forest இடங்களென்று பிரச்சினை! இந்த நிலைமைகளைக் கவனத்திற்கொண்டு, இவ்வரவு செலவுத் திட்டத்தின் மூலம் ஒதுக்கப்பட்டுள்ள நிதியில் பிரதானமாக எங்களுடைய பகுதிகளில் யானை வேலியை அமைத்து, அந்தப் பிரச்சினைக்குத் தீர்வுகாண வேண்டும். யானைத் தாக்கத்தினால் ஏற்படுகின்ற அழிவுகளுக்குப் பாரிய இழப்பீடு வழங்குவதென்பது உண்மையிலே நல்ல விடயம். இதுபோன்று ஏனைய விடயங்களுக்கும் இந்த வரவு செலவுத்திட்ட நிதி ஏற்பாடுகளில் ஒதுக்கீடுகளைச் செய்து தரவேண்டுமென்று நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

அடுத்து, ஏனைய வளர்ச்சியடைந்த மற்றும் வளர்ச்சியடைந்து வருகின்ற நாடுகளைப் போன்று இங்கும் digital பொருளாதாரத்தை அபிவிருத்தி செய்கின்ற ஏற்பாடுகளின் அடிப்படையில் நாணயத் தாள்களின் பாவனையைக் குறைத்து எல்லாவற்றையும் digital முறைமைக்குக் கொண்டுவருவது மிகப் பொருத்தமானது. இது வரி ஏய்ப்புச் செய்பவர்களுக்கு அதனைச் செய்ய முடியாத ஒரு சூழ்நிலையை ஏற்படுத்துமென்பதால், நல்லதொரு விடயமென்ற அடிப்படையில் அதனை நாங்கள் பாராட்டுகிறோம். அவ்வாறே சிறுவர்களின் முன்னேற்றத்திற்குரிய நிதியேற்பாடுகளும் பாராட்டக்கூடிய விடயமாக இருக்கின்றது.

மேலும், இலங்கையில் படித்த இளைஞர்கள் உயர்தரப் பரீட்சையில் சித்தி பெற்றதற்குப் பின்னர் வெளிநாடு சென்று படிப்பதற்குரிய வேலைத்திட்டங்களுக்கான நிதி ஏற்பாடுகள் செய்யப்பட்டிருப்பது உண்மையிலேயே பாராட்டக்கூடியதாக இருக்கின்றது. அதேபோன்று, இந்த அபிவிருத்தித் திட்டங்களில் எமது வடக்கு மாகாண மாவட்டங்களுக்குரிய விளையாட்டுத் துறைக்கான நிதியேற்பாடுகள் செய்யப் பட்டிருப்பதும் ஒரு நல்ல விடயம். எங்களைப் பொறுத்தவரை இவ்வாறான நல்ல விடயங்களை நாங்கள் பாராட்டுகிறோம்.

இங்கு பலரும் கூறுவது போன்று கடந்த காலங்களில் ஏற்பட்ட தொடர்ச்சியான பிழையான நடவடிக்கைகளால் நாடு எவ்வாறு சீரழிந்ததோ அந்த நிலைமைகள் மீண்டும் வராமல் பாதுகாக்க வேண்டும். நாட்டில் அபிவிருத்தி நடைபெற்றிருக்கிறது; அபிவிருத்தி நடைபெறாவிட்டால் கடந்த 75 வருடங்களாக ஒன்றுமே நடைபெறவில்லையென்று அர்த்தமாகும். எமது நாடு அன்று சுதந்திரம் பெறும்போது இருந்த நிலையில் இன்று இல்லை; நாடு உயர்ந்திருக்கின்றது. ஆனால், அதைக் கையாண்ட விதங்களில் ஏற்பட்ட பிரச்சினைகள் போன்று தொடர்ச்சியாக அங்கும் இங்கும் பந்தை மாற்றிக் கொண்டிருக்காமல், அந்தப் பிழைகளால்தான் மாண்புமிகு சனாதிபதி தோழர் அநுர குமார திஸாநாயக்க அவர்கள்மீது மக்கள் நம்பிக்கைவைத்து இன்று உங்களுக்கு இந்த ஆட்சியைத் தந்திருக்கின்றார்கள் என்பதை உணர்ந்து நீங்கள் நடந்துகொள்ள வேண்டும்.

எமது வட மாகாணத்தைப் பொறுத்தவரையில் உண்மையிலேயே ஓரளவு சரியாகப் பார்த்து உங்களுடைய நடவடிக்கைகளை ஆரம்பித்திருக்கிறீர்கள் என்பது எங்களுக்குத் தெரிகின்றது. ஆனால், கடந்த காலத்தில் நாட்டில் பெருமளவு பொருளாதாரத் தாக்கம் ஏற்பட்டபோதுகூட அங்கு மீள்குடியேற்றத்திற்கு 2,500 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கப் பட்டிருந்தது. ஆனால், இம்முறை 1,500 மில்லியன்தான் ஒதுக்கப்பட்டிருக்கின்றது; அந்த நிதி ஒதுக்கீடு போதாது. மாண்புமிகு சனாதிபதி அவர்கள் அடிக்கொரு தடவை யாழ்ப்பாணம் சென்று அங்கு நடந்த கூட்டங்களில் பங்குபற்றியதன் அடிப்படையில், இம்முறை குறைந்தது 5,000 மில்லியனாவது எங்களுக்கு நிதி ஒதுக்கீடு செய்வார் என்று நாங்கள் நம்பியிருந்தோம். பரவாயில்லை! இன்னும் காலம் போகவில்லை. இந்த 1,500 மில்லியனை 5,000 மில்லியனாகத் திருத்தம் செய்து, வட பகுதியில் வீட்டுத் திட்டம், ஏனைய உட்கட்டமைப்பு வேலைகள் மற்றும் மீள்குடியேற்றத்திற்கு நிதி ஒதுக்கித் தருமாறு கேட்டுக் கொள்கின்றோம்.

முக்கியமாக, "நாங்கள் tourismக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும், வெளிநாட்டவர்களைக் கவர வேண்டும், என்று சொல்கின்றோம். எனினும், ஒரு பிரதான tourism areaஆக இருக்கின்ற புத்தளத்திலிருந்து மன்னாருக்கு வருகின்ற இலவங்குளம் வீதி இதுவரை புனரமைக்கப் படவில்லை. அதுபற்றிக் கேட்டால் RDA அதிகாரிகள் ஏதோ ஒரு விளக்கம் சொல்கின்றார்கள். Courtஇல் வழங்கப்பட்ட கட்டளையில் அந்த வீதி தடைசெய்யப்படவில்லை என இருக்கின்றது. ஆனால், அந்த வீதி தடை செய்யப்பட்டிருக்கின்றது. அது எதற்காக என்று தெரியவில்லை. அந்த வீதியைத் திறந்தால் அங்குள்ள ஏதாவது ஒரு பகுதி அபிவிருத்தி அடைந்துவிடுமோ என்கின்ற நிலைப்பாடுதான் அதற்குக் காரணமாக இருக்கலாம். இனவாதம் என்பது இது போன்ற விடயங்களில்தான் வெளிப்படுகின்றது. எனவே, RDAயின் முரண்பாடான கருத்தை அவதானித்து, tourismக்கு ஒதுக்கப்பட்ட நிதியின் மூலமாகவோ அல்லது வீதிப் புனரமைப்புக்காக ஒதுக்கப்பட்ட நிதியின் மூலமாகவோ அந்த வீதியையும் செப்பனிட்டு, மக்களுடைய பாவனைக்கு விடுவிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
ஒரு நிமிடம் தாருங்கள்!

அவ்வாறு செய்கின்றபொழுது, அந்தப் பாதையினூடாக யாழ்ப்பாணத்திற்குச் செல்வதற்கு கிட்டத்தட்ட 82 கிலோ மீற்றர் தூரம் குறைகின்ற ஒரு நிலை இருக்கின்றது. இதனால் எரிபொருளைச் சேமிக்கவும் வாகனத் தேய்மானத்தைக் குறைக்கவும் முடியும். அப்படியான அந்த வீதியை ஏன் பாவனைக்கு அனுமதிக்கக் கூடாது? கடந்த காலத்தில் ஏற்படுத்தப்பட்ட ஏதாவது அழுத்தங்களால்தான் அது செய்யப்படவில்லை. இந்த அரசாங்கம் அதுபோன்ற அழுத்தங்களுக்குப் பணிந்துபோகின்ற நிலையில் இல்லை; அவ்வாறு அடிபணிகின்ற சனாதிபதியும் தற்போது இல்லை என்ற அடிப்படையில், இதனைக் கட்டாயம் செய்துதர வேண்டுமென்று கேட்டு, சந்தர்ப்பமளித்தற்கு நன்றிகூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.

[අ.භා. 1.41]

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය පරිදි; ජනතාවට දුන් පොරොන්දු පරිදි ඉදිරිපත් කළ පළමුවැනි අය වැයෙන් අප විසින් මේ රට ගොඩ නහන දිසාව පැහැදිලිවම ඉදිරිපත් කරලා තිබෙනවා. රටක අය වැය කියලා කියන්නේ දර්ශන, සංඛ්‍යා, දත්ත පමණක් නොවෙයි. ඒ සංඛ්‍යාවලින්, ඒ දත්තවලින්, ඒ දර්ශනවලින් වැහිලා තිබෙන්නේ මිනිසුන්ගේ ජීවිතයි. මේ අය වැය මීට පෙර ආණ්ඩු ඉදිරිපත් කළ අය වැය වාගේ නොවෙයි. මේක ඓතිහාසික අය වැයක්.

මෙපමණ කාලයක්, දශක ගණනාවක් හැන්ද අතේ තිබුණු උදව්ය බෙදා ගත්තේ කොහොමද කියලා මේ රටේ ජනතාව දන්නවා. ඒකයි ඔවුන් අපිව බලයට ගෙනාවේ. ඔබතුමන්ලාගේ අතේ හැන්ද තිබෙනකොට වාහන පර්මිට් බෙදා ගත්තා; වරප්‍රසාද බෙදා ගත්තා; විදේශ සවාරි බෙදා ගත්තා. මොකද, හැන්ද තිබුණේ ඔබතුමන්ලාගේ අතේ නිසා. නමුත් දැන් හැන්ද තිබෙන්නේ ජාතික ජනබලවේගය අතේ. අපි බෙදන්නේ මහජනතාවට. ඔවුන්ගේ වුවමනාවන් ඉෂ්ට කරන්නයි අපි මේ අය වැය ගෙනාවේ.

ඒ වාගේම මේ රට ගෑස් පෝලිම්, තෙල් පෝලිම් නිසා දුක් විඳපු ජනතාවක් සිටින, කඩා වැටුණු, විනාශ වුණු රටක් කියලා කිව්වා. එහෙම රටක් ඉදිරියට ගෙන යෑමේදී ක්‍රමවත් සැලැස්මක්, ඉවසීමක්, පරිණතභාවයක් අවශ්‍ය වෙනවා. ඒ සියල්ලම සහිතව අපි ඉදිරියට යන ආකාරය අපේ අය වැය තුළ පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා. ආර්ථිකය දියුණු වෙලා විතරක් ඇද්ද? මොකද, ආර්ථිකය පිටුපස ඉන්නේ මිනිසුන් නිසා. ඒ මිනිසුන්ගේ ජීවිත ගැන අනිවාර්යයෙන්ම අවධානය යොමු කළ යුතු වෙනවා. ජනාධිපතිතුමාගේ අය වැය කථාවෙන් සමාජ ආරක්ෂණය පිළිබඳව මීට කලින් කවදාවත් කථා නොකෙරුණු අංශ රාශියකට මුදල් වෙන් කෙරෙන්නේ අන්න ඒ නිසායි. ඒ මනුෂ්‍යත්වය පිළිබඳ හැඟීම ජාතික ජන බලවේගයේ අපට තිබෙන නිසා. අපි ඔවුන්ට සහන දෙන්නේ කොහොමද? වංචාව, දූෂණය නතර කරලා තිබෙනවා. රජයේ නාස්තිය අඩු කරලා තිබෙනවා. ඒ වාගේම රජයට තිබෙන්නා වූ වියදම් කපා හැරලා ඒ මුදල් ඉතුරු කර ගනිමින් බංකොලොත් රටක් වුණත් ජනතාවට සහන දෙන්න වැඩ පිළිවෙළක් හදන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, we are aware that due to the financial crisis, so many suffered. But, those who suffered most were the marginalized people. People are marginalized due to their race, gender, cast, financial status, age and disabilities. So, they are the ones who had the most impact. Therefore, it is natural for a Government like ours to focus on those groups who are marginalized. එම ආන්තිකරණයට ලක් වූ ජන කොටස්වලට සහන ලබා දිය යුතු වෙනවා.

Madam, may I quote from the Holy Bible: Proverbs 31:8-9? It states:

> "Speak up for those who cannot speak for themselves, for the rights of all who are destitute.
>
> Speak up and judge fairly; defend the rights of the poor and needy."

And that is what we are exactly plaining to do.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අස්වැසුම ප්‍රතිලාභ ලබා දෙන ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා කියලා අපි දන්නවා. ඒ වාගේම අවදානමට ලක්විය හැකි පුද්ගලයන්ට ප්‍රතිලාභ ගෙවීමත්, කාල සීමාවත් වැඩි කරලා තිබෙනවා. අපි විශ්වාස කරන්නේ නැහැ, ඔවුන් හැම දාම රජයෙන් යැපෙමින් ඉන්න ඕනෑ කියලා. නමුත් ඕනෑම දියුණු රටක පවා කෙනෙකු ප්‍රධාන ආර්ථික රාමුවෙන් හැලී ගියාම, ඔවුන්ට පවත්වා ගෙන යන්න අවශ්‍ය ජීවිතයක් තිබෙනවා. මොකද, ඔවුන්ටත් දරුවෝ ඉන්නවා; ඔවුන් කන්න බොන්න ඕනෑ; අසනීප වුණාම බෙහෙත් ටික ගන්න ඕනෑ. අන්න එවැනි පුද්ගලයන් ගැන කල්පනා කරලා තමයි අස්වැසුම ප්‍රතිලාභ දෙන්න ශුද්ධ වියදම විධියට රුපියල් බිලියන 232ක් වෙන් කරන්නේ. අපේ මන්ත්‍රීවරුන්ට අපි වාහන දුන්නේ නැහැ. හැබැයි, මිනිස්සුන්ට අවශ්‍ය සහනය ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන දීමනාව රුපියල් 7,500 සිට 10,000 දක්වා වැඩි කර තිබෙනවා. වැඩිහිටි දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කර තිබෙනවා. මේ සියල්ලම අපි කරන්නේ - මූලිකව ඒ සීමිත මුදල් ප්‍රමාණය හරියට හඳුනාගෙන තමයි අපි මේ රටේ සමාජ ආරක්ෂණය කරන්නට ඕනෑ. මොකද," පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන්නේ කිහිප දෙනෙක් කාලා, බීලා, ඇඳලා ඉන්න එක නොවන නිසා. ඒ වාගේම ආබාධ සහිත අයට ඔවුන්ගේම හැකියාවන් තිබෙනවා. නමුත් ඔවුන් පත් වෙලා සිටින අවාසි සහගත තත්ත්වය නිසා ඔවුන්ට සමාජ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙන්න බැරි වෙලා තිබෙනවා. අන්න ඒ නිසායි ඔවුන්ව ඒ තත්ත්වයෙන් මුදා ගැනීම අවශ්‍ය වෙන්නේ. අස්වැසුම ප්‍රතිලාභ ලබා දීමත් අපේ ප්‍රතිපත්තිය පරිදිම සිදු වන දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමාජ හේතු මත, ආර්ථික හේතු මත ළමයින්ට තමන්ගේ දෙමව්පියන්ගෙන් වෙන්වීමට සිදු වෙන අවස්ථා තිබෙන බව අපි දන්නවා. ඔවුන්ට දෙමව්පියන් නැතුව ජීවත්වන්නට සිදු වෙනවා. එහෙම අයට අවසානයේදී හිමි වෙන්නේ එක්කෝ සුරැකුම් මධ්‍යස්ථානයක්, එහෙම නැත්නම් සහතික කළ පාසල් හෝ රිමාන්ඩ් එක. ළමයින් වින්දිත දරුවන් වශයෙන් නීතිය හා ගැටෙනවා, භාරය හා ආරක්ෂාව තුළදී. මේ දරුවන් රජයේ වගකීමක් වෙනවා. මක් නිසාද, ඔවුන්ට දෙමව්පියන්ගේ භාරකාරත්වය නැති වෙලා තිබෙන නිසා. කිසිදු අය වැයක දරුවන් ගැන මේ තරම් details සහිතව කිව්වාද? ඒ දරුවන් වෙනුවෙන් කරන්න ඕනෑ දේවල් ගැන කිව්වාද? නැහැ. When children are in orphanages, their welfare must be the priority of the Government. Out of sight is out of mind - you put a child in an orphanage and then you forget that the child exists. Our Government will not do that.

අපි දන්නවා, වැඩිහිටියෙකුට කරදරයක් වුණොත් ඒගොල්ලන්ට කථා කරන්න පුළුවන්කමක් තිබෙනවා, හඬක් තිබෙනවා. ඒගොල්ලන්ට වෘත්තිය සමිති හදන්න පුළුවන්. එහෙම නැත්නම් ලිප්ටන් වටරවුමේ උද්ඝෝෂණය කරන්න පුළුවන්. But, children? They suffer in silence; they are voiceless. ඔවුන්ගේ හඬ වෙන්න ඕනෑ වැඩිහිටි අපියි. මොකද, "අපට ඉස්කෝලේ යන්න ලැබුණේ නැහැ; අපිට කන්න ලැබුණේ නැහැ; අපිට ගැහුවා" කියලා ඔවුන් කවදාවත් උද්ඝෝෂණයක් කරනවා ඔබ දැක තිබෙනවාද? නැහැ. They suffer in silence. Therefore, there is a massive duty and a very serious responsibility on the part of the Government to look after the welfare needs of those children who are in orphanages. අන්න ඒ ප්‍රතිපත්තිය මත පිහිටා තමයි පරිවාස-පුනරුත්ථාපන/සහතික ලත් පාසල්/රිමාන්ඩ් භාරයේ සහ ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින ළමුන්ගේ සුභසාධනය වැඩි දියුණු කරන්න අපි රුපියල් මිලියන 500ක් වෙන් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ ඇතැම් ස්ථානවල ආරක්ෂාව ප්‍රමාණවත් නැති බව තමයි පැහැදිලි වන්නේ. ඒවායේ අවම ප්‍රමිතීන් ආදි සියල්ල සඳහා, සුභසාධනය සඳහා අපි රුපියල් මිලියන 500ක් වෙන් කරනවා. We - our Government - give a voice to the children who are voiceless.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමහර වෙලාවට ඒ ළමුන් චූදිතයන් වශයෙන් ඉන්නවා, සමහර වෙලාවට ඒ ළමුන් සාක්ෂිකරුවන් වශයෙන් අධිකරණවලට යන්නට ඕනෑ. ළමයින් හා යෞවනයන් පිළිබඳව වන ආඥාපනතේ පැහැදිලිවම කියනවා, මේ ළමයින් ප්‍රවාහනය කිරීමේදී වැඩිහිටියන්ගෙන් වෙන්කොට ප්‍රවාහනය කරන්නට ඕනෑ බව. එසේ කියා තිබියදීත් තිබුණු ආර්ථික ගැටලු, ප්‍රශ්න නිසා දශක ගණනාවක් මේ දරුවෝ සමහර වෙලාවට වැඩිහිටි සිරකරුවන් සමඟ ප්‍රවාහනය කර තිබෙනවා. සමහර අවස්ථාවල පොලිස් වාහනවල, සමහර අවස්ථාවල බන්ධනාගාර වාහනවල. මම කවදාවත් ඒ බන්ධනාගාර නිලධාරීන්ට හෝ පොලිස් නිලධාරී මහත්වරුන්ට දොස් කියන්නේ නැහැ. මොකද, පහසුකම් තිබෙන විධියට ළමයාව ගෙනියන්නට ඕනෑ, සාක්ෂි දෙන්න. සමහර වෙලාවට නඩුව තිබෙන්නේ බදුල්ලේ. ළමයා ඉන්නේ ගම්පහ, රන්මුතුගල. එතකොට සමහර වෙලාවට දවසකට-දෙකකට පමණ කලින් තමයි වෑන්වල දරුවන්ව ගෙනියන්නේ. ඒක නැවතුණාට පසුව ඒ අදාළ නිවාසවල උදව්ය තමන්ගේ වියදමින් හෝ පුළුවන් අයගෙන් සල්ලි ඉල්ලා ගෙන ඒ දරුවන් උසාවි ගණනේ ගෙනියනවා. සමහර වෙලාවට ඒ අය ප්‍රසිද්ධ වාහනවල ගෙනියන්න බැහැ. බස්වල ගෙනියන්න බැහැ. මොකද, ආරක්ෂාව මදි. එවන් තත්ත්වයකදී ඔවුන් එසේ ප්‍රවාහනය කිරීමත් රජයේ වගකීමක් විය යුතුයි. රජය ඒ වෙනුවෙන් යම් දෙයක් සිදු කළ යුතුයි. අපි වසර ගණනාවක් මේ ගැන කිව්වා. විපක්ෂයේ සිටියදීත් කිව්වා. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ අය හැටියට එවැනි දරුවන් ප්‍රවාහනය කිරීමේදී ඇති වන ගැටලු ගැන අපි දන්නවා. සමහර වෙලාවට උසාවි ඉවර වෙන්නේ හවස 3.30ට, 4.30ට පමණ. ආයෙත් ගෙදරකට යන්න විධියක් නැහැ. දැනට සති දෙකකට කලිනුත් පරිවාස නිලධාරීන් පිරිසක් මා මුණ ගැහිලා මේ ප්‍රශ්නය පිළිබඳව දිගින් දිගටම කිව්වා. ඔවුන් මට කථා කරන්නේ "හර්ෂණ" කියලා. ඔවුන්, ළමා රක්ෂණ අධිකාරියේ හිටපු මගේ හිතවත් පරිවාස නිලධාරි මහත්වරුන්. ඔවුන් මට කිව්වා, සරෝජා ඇමතිතුමිය එක්කත් කථා කරලා මේ ප්‍රශ්නය විසඳලා දෙන්න, ඔවුන්ට වාහන දෙක තුනක් දෙන්න, ලොකු ඒවා එපා, පරණ ඒවා හරි කමක් නැහැ, මේ දරුවන් ගෙනයන්න වාහන දෙක තුනක් ලබා දෙන්න කියලා. ඒ මිනිස්සු එතරම් මහන්සි වෙලා වැඩ කරනකොට පැවති රජයයන් මොකද කළේ? වාහන පර්මිට් ගත්තා; විදේශ සවාරි ගියා. නමුත්, ජාතික ජන බලවේගය රජය එහෙම කරන්නේ නැහැ. අවස්ථා කිහිපයකදීම විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිව්වා, රනිලුත් මේක කරන්න හිටියේ, දැන් අපි එක එක දේවල් කරනවා කියලා. මේ අය කලබල වෙනවා, අපට ලේබල් අලවන්න. මේ අය නියෝලිබරල් ද අරකද මේකද කියලා අපට ලේබල් අලවන්න උත්සාහ කරනවා. ලේබල් අලවන එක විපක්ෂයේ වැඩක්. වැඩේ කරන එක අපේ වැඩක්. අපි කරන්නේ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියපු දේවල්.

මම පෙන්වන්නම්, පොහොසත් රටක්-ලස්සන ජීවිතයක් කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 82වන පිටුව. එයට අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "නීතිමය කටයුතු සඳහා දරුවන් ප්‍රවාහනයේදී ආරක්ෂිත සහ ගෞරවනීය ප්‍රවාහනය සහතික කිරීම සඳහා ළමා හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම"

මේවා අපි ලිව්වේ සැලසුම් කරලායි. අපි මේ මැතිවරණ දිනුවේත් මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මත; ආණ්ඩුව කරන්නේත් මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මත. අන්න ඒ හින්දා තමයි අපේ මේ මංගල අය වැයෙන්ම මෙවැනි යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ. ප්‍රමාණවත් නොවන ප්‍රවාහන පහසුකම් ඇතුළු බොහෝ හේතූන් මත ආයතනගත නිවස්නයන්හි සිටින ළමයින් දැඩි අවදානමක සිටින බව අප විසින් නිරීක්ෂණය කර තිබෙනවා. ඒ අනුව ඒ සඳහා සුදුසු වාහන මිලට ගැනීමට 2025 වසර සඳහා රුපියල් මිලියන 250ක මුදලක් අපි වෙන් කරන්න යෝජනා කරලා තිබෙනවා.

කවුරු හරි කියනවා නම්, රනිල් මේ දේවල් කරන්න හිටියේ කියලා, එහෙමනම් මම අහනවා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයත් ලිව්වේ රනිල් ද කියලා. මේවා අපි සැලසුමක් ඇතුව කරන දේවල්. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන පොරොන්දු තමයි මේ අය වැය පුරාවටම අපි ඉෂ්ට කරන්නේ කියන එක ඉස්සෙල්ලාම මේ අයට පැහැදිලි කළ යුතු වෙනවා.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සෑම පුරවැසියෙකුටම ගෞරවාන්විත සහ සුරක්ෂිත ජීවිතයක් ගත කිරීමේ අවස්ථාව අපි ලබා දිය යුතුයි. රැඳවුම් නිවාසවල සිටින ළමයින්ට සහ අනාථ දරුවන්ට ගොඩක් වෙලාවට ඒ තැන්වලට යන්න වෙන්නේ, ඔවුන්ගේ දෙමව්පියන්ට ඔවුන් ආර්ථික වශයෙන් බලාගන්න හැකියාවක් නොමැතිකම මතයි. අන්න ඒ නිසාම තමයි රැඳවුම් නිවාසවල සිටින ළමයින්ට සහ අනාථ දරුවන්ට රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දෙන්න මේ රජය තීන්දු කළේ. මේ සඳහා රුපියල් මිලියන 1,000ක් අපි වෙන් කරනවා. So, look at what we are doing under this Budget - social protection. What we basically say is that the poor and the needy must be looked after first. If you say that children are our asset,

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

then you must match your words with actions. We are looking after the most marginalized group - the children of poor families who cannot support themselves.

ඒ වාගේම මේ නිවාසවල සිටින ගොඩක් දරුවන්ට තමන්ගේ අධ්‍යාපන කටයුතු කර ගන්න පාසල් නැහැ. මොකද, පාසල්වලට ඒ දරුවන් ගන්නේ නැහැ. අපි දන්නවා, පාසලකට දරුවෙකු ඇතුළත් කරන එක කොච්චර අමාරුද කියලා. එහෙත් අපි යෝජනා කරලා තිබෙනවා, ඒ ළමා නිවාසය ළඟම තිබෙන ජාතික පාසලකට හෝ සුදුසු පාසලකට ඒ දරුවන් යොමු කිරීමේ ප්‍රතිපත්තියක්. මම මේ සියලුදෙනාගෙන් අහනවා, මේ වාගේ ආන්නීකරණයට ලක් වෙච්ච පුද්ගලයන්ගේ සමාජ රැකවරණය සඳහා මින් පෙර ඉදිරිපත් කළ කිසිදු අය වැයකින් කටයුතු කළාද, මින් පෙර පැවති කොයි ආණ්ඩුවද එවැන්නක් සඳහා කැප වුණේ කියලා? මොකද, එහෙම කැපවෙන්න නම් හෘදය සාක්ෂියක් තිබෙන පිරිසක් ආණ්ඩුවක ඉන්න ඕනෑ. ඒ වාගේම ඒ පිරිසගේ පපුවල තෙතමනයක් ද අවශ්‍ය වෙනවා. අන්න ඒ දේ තමයි අපි මේ කරගෙන එන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රට තුළ නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ලබා දෙන ප්‍රතිපාදන වැඩි කරලා මේ රටේ අල්ලස, දූෂණය තුරන් කිරීමේ කටයුත්තක් ද අපි ආරම්භ කර තිබෙනවා. මේ හරහා රටට විශාල ධනයක් ඉතිරි කරගත හැකියි. මොකද, වංචාව, දූෂණය, අල්ලස තිබෙන රටවල සෑම දෙයක්ම කඩාගෙන වැටෙනවා. අපි දන්නවා, අපේ රටට බාල බෙහෙත් ගෙනාවේ කොහොමද, ඒ අය රිමාන්ඩ් වුණේ කොහොමද කියලා. අල්ලස, දූෂණය තිබෙනකල් අපට හරි බෙහෙත් පෙත්තක්වත් හම්බ වෙන්නේ නැහැ. ආහාර ටිකක් ගන්න කඩයකට ගියොත් ඒවායේත් වසවිස මිශ්‍ර වෙලා තිබෙනවා නම් එතැන මොකක්ද තිබෙන්නේ? අල්ලසයි, දූෂණයයි. අල්ලස, දූෂණය කියන්නේ මේ රට වෙළාගත් පිළිකාවක්. අපේ ගරු ජනාධිපතිතුමා පැහැදිලිවම කියා තිබෙනවා, අල්ලසට, දූෂණයට ඉඩක් නොමැති බවත්, අල්ලස් දෙන්නත් එපා, අල්ලස් ගන්නත් එපා කියලා. මේ මානුෂීය මෙහෙවර හරහා අපි මේ රට ගොඩ නඟන බවට සහතිකයක් දෙනවා.

මානසික සෞඛ්‍යය ගැන කථා කළොත් ගොඩක් වෙලාවට තිබෙන ගැටලුවක් තමයි, තරුණ වයසේ ළමයින්ට ඇතිවන මානසික පීඩා. එක අතකට ඒ ගැටලුව මතු වෙන්නේ, දෙමව්පියන් තමන්ගේ ආර්ථික තත්ත්වය නහාසිටුවන්න ඉතා කාර්යබහුල ජීවිත ගත කරනකොට ඔවුන්ට තමන්ගේ දරුවන් සමඟ ගත කරන්න තිබෙන කාලය අඩු වෙන නිසායි. දරුවෙක් නව යොවුන්වියට පත් වෙනකොට, දරුවෙක් වැඩෙනකොට, ඔවුන්ට දෙමව්පියන් එක්ක කථා කරන්න අවශ්‍ය කාලය, දෙමව්පිය රැකවරණය නැතුව යනවා. ඒ අවස්ථාව නැතිව ගියාම, they lose touch with their primary caregiver and that is mainly due to the economic strains the parents are going through. එහෙම වෙනකොට මොකක්ද වෙන්නේ? එතකොට ඒ දරුවාට තමන්ගේ වේදනාව, දුක සන්නිවේදනය කර ගන්න විධියක් නැති වෙනවා.

ඉදිරියේදී අපි ආර්ථිකය නිසි පැත්තට හැරවුයේ නැත්නම්, මේ තත්ත්වය තවත් තීව්‍ර විය හැකියි. මොකද ආර්ථිකය කියන්නේ, මනුෂ්‍යයෙක් නිකම් කාලා, බීලා, බුදියගන්න එක නොවෙයි නේ. මනුෂ්‍යයා කියන්නේ සංස්කෘතික සත්වයෙක්. ඔවුන්ට විවේකය අවශ්‍යයි, විනෝදය අවශ්‍යයි. නමුත්, එහෙම දෙයක් අපේ රටේ පවුල්වලට දැන් නැහැ. මොකද, පැය 24න් 18ක්ම රස්සා කරන්න වෙලා තිබෙනවා. එවන් තත්ත්වයක් යටතේ සිය දිවි නසාගැනීම් පිළිබඳ අවාසනාවන්ත සිදුවීම් රාශියක් ද පෙනෙන්න තිබෙනවා. ඒ නිසා අපට අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සිසුන් සහ යොවුන්වියේ පසුවන්නන් දැනුවත් කිරීමේ උපදේශන සේවා පුළුල් කරන්නට සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ සඳහා උපදේශන සේවා විතරක් මදි. සමහර වෙලාවට ළමයින්ව ආරක්ෂා කරන්න නම් ඉස්සෙල්ලාම අපට දෙමව්පියන් පුහුණු කරවන්න වෙනවා, ළමයින්ට ඇහුම්කන් දෙන විධියට. ඒක ලෙහෙසි වැඩක් නොවෙයි. ළමයා සමඟ quality time ගත කරනවා කියන්නේ, ළමයාගේ අතට ෆෝන් එක දීලා, දෙමව්පියන් ටෙලිවිෂන් එක බලන එකම නොවෙයි. නමුත් මේ සියල්ල කරන්න නම්, ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නහාසිටුවීමත් අවශ්‍යයි. එයත් අපේ මේ අය වැය හරහා සිද්ධ වෙනවා.

ඒ වාගේම තවත් පිරිසක් ඉන්නවා, හඬ එළියට නොඇසෙන. ඒ පිරිස තමයි, වරදකරුවන් වූ සිරකරුවන්. ඔවුන්, ඔවුන්ගේ ජීවිතයේදී යම් වැරැදි කරලා තිබෙනවා. ඒ වැරැදි නිසා ඔවුන් දඬුවමකට යටත්ව බන්ධනාගාරගත වෙනවා. ඒත් ඔවුනුත් මිනිස්සු. ඔවුන්ගේ අයිතිවාසිකම් එකක්වත් නැති වෙන්නේ නැහැ. ඔවුන්ගේ මනුෂ්‍යත්වය නැති වෙන්නේත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගොඩක් වෙලාවට ඒ පුද්ගලයන් වසර ගණනාවක් බන්ධනාගාර තුළ ඉඳලා එළියට එනකොට, ඔවුන්ගේ ජීවිතයේ හොඳම කාලය ගත වෙලා ඉවරයි. ඔවුන් එළියට ආවාට පස්සේ ඔවුන්ට රැකියාවක් දෙන්න කවුරුවත් ඉදිරිපත් වෙන්නේ නැති වෙන්න පුළුවන්. මොකද, ඔවුන්ට නිපුණතාවක් නැහැ. ඔවුන් කිසි දෙයක් පුහුණු වෙලා නැහැ. නමුත්, ඒ පුද්ගලයින් නිදහස්වීමෙන් පසුව ඔවුනුත් ඵලදායී ලෙස ආර්ථිකයට සම්බන්ධ කර ගත යුතු වෙනවා. එසේ ඵලදායී ලෙස ඔවුනුත් ආර්ථිකයට සම්බන්ධ කර ගන්න නම්, අපි ඔවුන්ගේ නිපුණතා වර්ධනය කළ යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ අනුව ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යයි. මොකද, ඔවුන් එළියට ආවාම සමාජයට වැඩදායී පුද්ගලයින් බවට ඔවුන් පත් කිරීමට සහාය දක්වන්න අපට පුළුවන්. වරදකරුවන් වූ සිරකරුවන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහනකට මේ වන විට වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 100කින් අපි වැඩි කරලා තිබෙන්නේ ඒ නිසායි. අපි මේ මුළු අය වැය තුළම ක්‍රියාත්මක කරන්නේ, අපේ ප්‍රතිපත්තිය මිස කාගේවත් මොනවත් නොවෙයි. නමුත් මේවා ඇසෙනකොට සමහර මන්ත්‍රීතුමන්ලා නම්, සද්භාවයෙන්ම සන්තෝෂ වෙන බව පෙනෙනවා. විශේෂයෙන්ම අපි උතුරු-නැගෙනහිර සඳහා කරන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන්, the Hon. (Dr.) Ramanathan Archchuna was honestly happy. But, would you tell me whether the others are happy the same way? Not really. Do you know why? Because, they feel, "My God! They are doing so much for the North. We are going to lose all the votes now". But, not (Dr.) Archchuna. He is very happy about what has been done for his people. අපි මේ අය වැය ඉදිරිපත් කළේ උතුර හා දකුණ කියලා වෙනසක් නැතුව, මේ රටේ ඉන්න ඔක්කෝම මිනිස්සු කියන පදනම මතයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා මෙසේ කියා මගේ කථාව අවසන් කරන්නම්. අපි මේ ආණ්ඩුව ගත්තේ මිනිස්සුන්ගේ ජීවිත සුවපත් කරන්න මිසක්, අපට බෙදාගන්න නොවෙයි. ඒ නිසා අපි මේ ආරම්භ කරපු ගමන තුළින් මේ වසර පහ තුළ සාර්ථක

ලෙස, ජනතාවට දැනෙන විධියට ඔවුන්ගේ ජීවිත උසස් කරනවා, ඒ වාගේම මේ අය වැය පොහොසත් රටක්-ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට උරුම කර දෙන්නට ගෙනා අය වැයක්. මේ අය වැය අනිවාර්යයෙන්ම වැඩිම ඡන්දයෙන් සම්මත විය යුතුයි කියලා මා යෝජනා කරනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Minister of Justice. Actually speaking, we are very happy that the NPP Government has allocated a great amount of money to the Northern Province. Also the visit of the Hon. President and the Hon. Prime Minster to the Northern part of the country is historically remarkable and we are very thankful to them.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.00]

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද දවසේ මේ ආරම්භ කෙරුණු ජාතික ජන බලවේගයේ පළමු අය වැය -මංගල අය වැය- විවාදය කියන්නේ මම දකින විධියට මේ රටේ දේශපාලන ඉතිහාසයේ ඓතිහාසික අවස්ථාවක්. ඒකට හේතුව මෙයයි. අද උදෑසන සිටම මේ අය වැය සම්බන්ධව විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් විවිධ න්‍යායික තර්ක, විවිධ ආර්ථික මොඩියුල ගැන ආර්ථික ඔස්තාර්වරුන් ලෙස විවිධ අර්ථ දැක්වීම්, අදහස් දැක්වීම් සිද්ධ කළා. එවන් අයම පාලනය කරපු රටක් විධියට පසුගිය දශක ගණනාව පුරාවට ආපු ඒ වැරදි ආර්ථික ප්‍රතිපත්ති මත අද වනවිට අපේ රට ස්ථානගත වෙලා තිබෙන්නේ කොයි වාගේ තැනකද කියලා අපි දන්නවා. එවන් බංකොලොත් රටක ජනතාවාදී අය වැයක් සම්මත කර ගැනීම සඳහා ජාතික ජන බලවේගය ඊයේ දිනයේ මේ ජනතාවාදී අය වැය මේ පාර්ලිමේන්තුවේ ජනගත කරලා තිබෙනවා. වැරදි පාරක ගිය ගමනක්; වැරදි පාරක ගිය රටක් නිවැරදි මාර්ගයට යොමු කරන පළමු අය වැය විධියට මේ අය වැය ඓතිහාසික වෙනවා කියලා මම හිතනවා. මොකද කියනවා නම්, පසුගිය කාල සීමාව පුරාවටම වැරදි ආර්ථික ප්‍රතිපත්ති මත බංකොලොත් රටක් වීම නිසාම අපි රටක් විධියට අපේ අතීතය සහ වර්තමානය අභිමි කරගත් රටක් බවට පත් වුණා. ඒ නිසා අපේ මේ ජාතික ජන බලවේගයේ අය වැය කියන්නේ අතීතයෙන් හා වර්තමානයෙන් පාඩම් ඉගෙන ගෙන අනාගතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීම සඳහා වන, අනාගත ඉලක්ක අපේක්ෂාවන් මුදුන්පත් කර ගන්නට වන ජනතාවාදී අය වැයක් කියායි මම හිතන්නේ. ඒ වාගේම, ඒ තුළින් අභිමි වෙච්ච ආර්ථික නිදහස, ආර්ථික ස්වාධීන බව මේ රටට උරුම කර දෙන අය වැයක් විධියටත් මේ අය වැය අපට හඳුන්වන්න පුළුවන්.

අපි දන්නවා, සාමාන්‍යයෙන් ලෝකයේ බංකොලොත් වෙච්ච රටවලට පවා නැවත ගොඩනැඟෙන්නට මහා උත්සාහයක් දරන්නට සිද්ධ වුණු බව. ඒ තුළ අඳුරු දශකයක් එහෙම නැත්නම් අභිමි දශකයක් විධියට ඒ රටවලට ගොඩනැඟෙන්නට යම් කාලයක් ගත වෙනවා. වෙලාවකට අපට අමතක වෙනවා, අපි ජාතික ජන බලවේගය විධියට මේ රට භාර ගනිද්දී කොයි වාගේ ආර්ථික තත්ත්වයක් ද අපට තිබුණේ කියලා. එවන් තැනක සිට තමයි අපි ඊයේ දිනයේ මේ අය වැය සමාජගත කරලා, ජනගත කරලා තිබෙන්නේ.

කෙසේ නමුත් අපට ඕනෑ තරම් පාරම් බාන්න පුළුවන්, අතීතයේ කරපු දේවල් ගැන. හැබැයි, ඒ චින්දිත මානසිකත්වයෙන් එහාට ගිහින් මේ සමාජයටම ස්ථාවරත්වයක්, ගොඩනැඟීමේ මානසිකත්වයක් - growth mindset එකක් - ලබා දෙන්නට මේ අය වැය තුළින් අපි සමත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය කියන්නේ, සමස්ත වශයෙන්ම කඩා වැටිච්ච රටක්, කඩා වැටිච්ච සමාජයක් එහෙම නැත්නම් කඩා වැටිච්ච මානසික තත්ත්වයක් සම්පූර්ණයෙන්ම ඉහළට ඔසවා තබන, සම්පූර්ණයෙන්ම වෙනත් දිශාවකට ඔසවා තබන අය වැයක් විධියට අපට හඳුන්වන්නට පුළුවන්. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මේක සමාජ පුනරුදයක් බවට අපට හඳුන්වන්නට පුළුවන්. ඇයි, මම එහෙම කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමාජයේ සෑම කොට්ඨාසයක්ම; සමාජයේ සෑම ක්ෂේත්‍රයක්ම; සමාජයේ සෑම මනුෂ්‍යයෙක්ම ආවරණය වන විධියට මේ අය වැය තුළින් සහන ලබා දෙන්නට අපි තීරණය කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මහජන නියෝජිතවරියක් විධියට මම ඉතාම සතුටට පත් වෙනවා, මේ අය වැය තුළින් කාන්තාවන් සම්බන්ධව තබා තිබෙන බර පිළිබඳව. මොකද, මේ දේශපාලන ඉතිහාසය තුළ කාන්තාවන් වන අපව හැම දාම පාවිච්චි කළේ ඡන්ද මැෂිමක් විධියට විතරයි; ඡන්ද පොරොන්දු විධියට විතරයි. එතැනින් එහාට කාන්තාවන් සම්බන්ධව සද්භාවයෙන් වැඩි බරක් තබපු අය වැයක් විධියට අපට මේ අය වැය හඳුන්වන්නට පුළුවන්. අපි දන්නවා, මහජන නියෝජිතයන් විධියට -විශේෂයෙන් ගාලු දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතවරියක් විධියට- කටයුතු කරද්දී අපේ මහජන දිනවලදී ඇති තරම් කාන්තාවන් අපව හමුවෙන්න එන බව. එලෙස ඇවිල්ලා ඔවුන් තමන්ගේ ජීවිත කාලය පුරාවටම කඳුළු කරගත්, හදවතේ තබාගෙන සිටින කථා අපි එක්ක කියනවා. විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, එවන් අවස්ථාවලදී අපට ඔටිසම් වාගේ ස්නායු දුර්වලතා තිබෙන දරුවන්ගේ දෙමව්පියන් හමුවෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉතාම සතුටට පත් වෙනවා, මේ උත්තරීතර පාර්ලිමේන්තුව ඇතුළේ ජනාධිපතිවරයෙක් එවන් දරුවන් සම්බන්ධව වචනයක් හෝ කථා කිරීම සම්බන්ධව. මම මේ මොහොතේ ඉතාම සංවේදීව එහි ගෞරවය ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාට ලබා දෙන්නට කැමැතියි. ඉතිහාසයේ කවරදාකවත් මේ දරුවන් සම්බන්ධව ජනාධිපතිවරයෙක් මේ භූමිය තුළ කථා කරලා නැතුව ඇති. ඒ නිසා මේ වාගේ සංවේදී කාරණා සම්බන්ධවත් කථා කරන අය වැයක් බවට ජාතික ජන බලවේගයේ මේ මංගල අය වැය සමත් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි කාන්තාවන් සම්බන්ධව කථා කරනකොට මම කලිනුත් කිව්වා වාගේ ඡන්ද මැෂිමකින් එහාට ගිහිල්ලා,

[ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය]

කාන්තාවන් සවිබලගැන්වීම සඳහා, කාන්තාවන් ආර්ථිකයට එකතු කර ගැනීම සඳහා වන අය වැයක් විධියටත් මේ අය වැය සඳහන් කරන්න පුළුවන්. මොකද, කාන්තාවන් දිරිගැන්වීම සඳහා වාගේම කාන්තා හිංසනය වැළැක්වීම සඳහාත් රුපියල් මිලියන 120ක් මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා. නීතිඥවරියක් විධියට මමත් විවිධ නීති කටයුතුවලට අධිකරණයට යනවා. එතකොට මේ රැකවරණ නිවාසවල ඉන්න දරුවන් අපට මුණ ගැසෙනවා. ඒ දරුවන් මේ සමාජයෙන් විතැන් කරලා තමයි මෙච්චර කාලයක් තිබුණේ. හැබැයි, එතැනින් එහාට ගිහිල්ලා, ඒ දරුවන්ටත් ලැබිය යුතු ස්ථානය ලබා දෙමින්, ඔවුන්ව හඳුනා ගැනීම පවා මම හිතන්නේ ඉතාම ප්‍රගතිශීලී අවස්ථාවක් විධියට හඳුනා ගන්නට අපට පුළුවන්.

අපට කියන්න පුළුවන්, "මෙච්චරක් වෙන් කරලා තිබෙනවා මේකට; කෝ, මෙච්චරක් මේකට වෙන් කරලා නැහැයි" කියලා. ගණන් හිලව් බෙදලා, දත්ත තොරතුරුවලින් අපට ඕනෑ තරම් විවාද කරන්න පුළුවන්. හැබැයි, මම මේ කථා කරන, මේ කියන ගුණාංග සම්බන්ධව අපට ගණන් හිලව් නැහැ. අපි කොහොමද ඒවාට අගයක් එකතු කරන්නේ? අපි කොහොමද, හරි ගාණට මැනලා, වෙන් කරලා මේවා මෙන්න මෙච්චරක් වටිනවා කියලා කියන්නේ? මොකද, ඒවා පදනම් වෙන්නේ මානුෂීය ගුණාංග මත. සහකම්පනය, අනෙකාව දැනීම, අනෙකාව තේරීම, අනෙකාට අනන්‍යතාවක් ලබාදීම කියන මිල කරන්න බැරි මානුෂීය ගුණාංගවලින් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කියන දේවල් සම්බන්ධව වටිනාකමක් අපට තීරණය කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි, අපි දන්නවා, අද උදෑසන සිටම පාහේ මේ අය වැය සම්බන්ධවත් ඇතැම් විවේචන තිබුණු බව. මේ විවේචන අතර අපට දකින්න පුළුවන් වුණු දෙයක් තමයි "අපි කියපුවා නොවෙයි ලු මේ කරන්නේ; ජාතික ජන බලවේගය බලයට එන්න කලින් කියපු දේවල් නොවෙයි, බොරු තමයි මේගොල්ලන් මේ කියන්නේ" කියලා මතයක් සමාජගත කරන්න උත්සාහ දැරීම. නැහැ, ඒක එහෙම නොවෙයි. ඉතාම වගකීමෙන් කියනවා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියලා මැතිවරණවලදී අපි ප්‍රකාශ කරපු ඒ ප්‍රතිපත්ති මතම පිහිටා තමයි අප ඊයේ දිනයේ අය වැය ජනගත කළේ කියන එක.

හැබැයි, අපි ගැන මේ සමාජයේ ගොඩනහන්න හදපු මතයක් තිබුණා. අපට මතකයි, ජාතික ජන බලවේගය බලයට ආවොත් පන්සල් නැති වෙයි; පෙරහැර නැති වෙයි; ගෙවල් දෙකක් තිබුණොත් එකක් භාර ගනීවි; වාහන දෙකක් තිබුණොත් එකක් භාර ගනීවි; සංචාරක කර්මාන්තය නැති වේවි; පෝලිම් යුගයක් නැවත ඇති වේවි කියලා ඒ අය කියපු කථාවක් තිබුණු බව. ඒ නිසා අපට තේරෙනවා, ඒ අය කියපු ඒ කථාව අද බොරු වෙලා තිබෙන නිසා යම්කිසි හිත් වේදනාවක් ඒ අයට ඇති බව. එම නිසා ඒ විවේචනත් තේරුම් ගන්නට ඉතාම හොඳ සමබර මනසක් අපට තිබෙනවා. ඒ වාගේම තමයි මේ කියන විවේචන ඇතැම් විට සාධාරණත් නැහැ කියලා හිතෙනවා. මොකද, අපි දන්නවා, වෙනත් ආණ්ඩුවලට තිබුණු චෝදනා මොනවාද කියන එක. ඒවා තමයි වංචාව, දූෂණය, අක්‍රමිකතාව, අල්ලස් ගැනීම කියන චෝදනා. හැබැයි, අද වෙද්දී, මේ විපක්ෂයේ විවේචන බොත්තමකට, බටර් පාරකට විතරක් සීමා වෙලා තිබෙන එක සම්බන්ධවත් මම ඉතාම සතුටට පත් වෙනවා. අපි දන්නවා, මේ අය සමහර වෙලාවට කියනවා, "වෙනසක් නැහැ ලු; කෝ, මොකුත් වෙලා නැහැ ලු; කලින් එකම ලු; රනිල් කරන්න හිටියෙත් මේකමයිලු" කියලා.

අපට මතකයි, හොඳට කරපුවා. මොකද, මේ රටේ මිනිස්සු මැරිලා ඉපදිලා නැහැ, කරපු දේවල් අමතක වෙන්න. අධ්‍යාපන වැය ශීර්ෂය අඩු කරලා, ප්‍රභූ ආරක්ෂාව වැඩි කරලා ඒ අය දේශපාලනිකව ලබාගත් වාසි අපට මතකයි. සෞඛ්‍ය වෙනුවෙන් පිළිකා රෝගීන්ට දෙන බෙහෙතෙනුත් හොරා කාලා, ඒක එහෙම කළේ නැහැයි කියලා විශ්වාස භංගයක් ගෙනෙද්දී, ඒවාටත් අත ඔසවපු පාර්ලිමේන්තුවක හිටපු අය තමයි මේ කියන විවේචන අද කරන්නේ. ඒ නිසා ඒ කිසිවකට අපට සැලෙන්න දෙයක් නැහැ. මොකද, ඉතිහාසයේ සෞඛ්‍ය වෙනුවෙන් සහ අධ්‍යාපනය වෙනුවෙන් වැඩිම මුදලක් වෙන් කරපු අය වැය බවට ජාතික ජන බලවේගයේ මේ පළමු මංගල අය වැය සමත් වෙලා තිබෙනවා. අපි දන්නවා, වෙනදා ජනතාවට පටි තද කර ගන්න කියලා කියපු ආණ්ඩු තමයි හිටියේ කියන එක. හැබැයි, අද වනවිට මේ ජනතාව වෙනුවෙන් සැබෑ ජනතාවාදී අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

ජනාධිපති වැය ශීර්ෂය අඩු කරලා, concessionary vehicle permits නැති කරලා දාලා, ඒ වාගේම දේශපාලකයන් පස්සේ ගිහිල්ලා රැකියා ගන්න ඒ දේශපාලන සංස්කෘතිය පවා අපි අද වෙනස් කරලා තිබෙනවා. මේක තමයි, ජාතික ජන බලවේගයේ mandate එක, එහෙම නැත්නම්, ජන වරම. ඒ ජන වරම මත පිහිටා තමයි, අපි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ.

ඊළඟට තිබෙන කාරණාව තමයි, කොහොමද මේවා කරන්නේ, කිව්වාට කරන්න පුළුවන්ද කියන එක. පුළුවන්. ඒ කොහොමද? මූල්‍ය විනය, ආර්ථික දැක්ම සහ නිවැරදි දේශපාලන නායකත්වය තුළින් මේ කියන දේවල් අපට සාක්ෂාත් කර ගැනීමට හැකියි. ඒවා අපි උපයාගෙන තිබෙනවා. එවන් තැනකට මේ රට ඔසවා ගන්නට අපි සමත් වෙලා තිබෙන බවත් මේ අවස්ථාවේ මම කරුණු දක්වන්න කැමැතියි. ඒ නිසා පැහැදිලිවම, මේ රට ගොඩනැඟීමේ ආරම්භය බවට මේ අය වැය පත් වේවි කියායි මම හිතන්නේ. ඒ තුළින් ඉතිහාසයේ ස්ථාවරම සහ ක්‍රමිකව මේ රට ගොඩනඟන ජනතාවාදී ආණ්ඩුව බවට නැවත නැවතත් ජාතික ජන බලවේගය පත් වෙනවා. කවුරු හෝ හිතනවා නම් වැඩි කල් යන්න පුළුවන් වෙයිද, මේ ආණ්ඩුව කඩාගෙන වැටෙයිද කියලා, එහෙම වෙන්නේ නැහැ. මේ ගොඩනඟලා තිබෙන්නේ ඉතිහාසයේ ස්ථාවරම ජනතාවාදී ආණ්ඩුවයි කියන එක මේ අය වැය තුළින් අපට පෙනෙනවා.

උතුර නැඟෙනහිර, දකුණ බටහිර, මේ සියල්ලම එක්සේසත් කරන, සියල්ලට දැනෙන ආණ්ඩුකරණයක් අපි දැන් ස්ථාපනය කර තිබෙනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" සැබෑ වෙන වසරක පදනම තමයි අපි අද දාලා තිබෙන්නේ. ඒ නිසා මේ දූපත සර්ව සම්පූර්ණ මනුෂ්‍ය වාසයක් කරනු පිණිස ඉතිහාසයේ ලස්සනම අවස්ථාව අපට ලැබිලා තිබෙනවා. එම නිසා ඒ අවස්ථාවත් එක්ක එකතු වෙන්න කියලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලුදෙනාට ආරාධනා කරමින්, මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) M.L.A.M. Hizbullah. You have 14 minutes.

[பி.ப. 2.12]

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாம்

மதிப்பீட்டின்மீதான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மிகவும் சந்தோசமடைகின்றேன். இந்த அரசாங்கத்தின் முதலாவது வரவு செலவுத்திட்டத்தை நேற்று இச்சபையில் நிதி அமைச்சராான மாண்புமிகு சனாதிபதி அநுரகுமார திஸாநாயக்க அவர்கள் சமர்ப்பித்தார். அதற்காக அவருக்கு எங்களுடைய பாராட்டுக்களையும் வாழ்த்துக்களையும் தெரிவிக்கின்றோம். இம்முறை வரவு செலவுத்திட்டத்தில் பல்வேறுபட்ட தேவைகளுக்காக, அபிவிருத்திப் பணிகளுக்காகப் பாரியளவு நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. அதேபோன்று, சிறுவர்கள், பெண்கள் மற்றும் நோய்களால் பாதிக்கப்பட்டவர் களுக்கான நிவாரணங்கள், பல்கலைக்கழக மாணவர் களுக்கான 'மஹபொல' கொடுப்பனவு அதிகரிக்கப்பட்டமை என்பன உண்மையிலேயே பாராட்டப்பட வேண்டிய விடயங்களாகும்.

தற்போது நாடு இருக்கின்ற பொருளாதார நிலைமையில், இவ்வாறான மிகச் சிறப்பானதொரு வரவு செலவுத்திட்டத்தை மாண்புமிகு சனாதிபதி அவர்கள் சமர்ப்பித்திருக்கிறார். இருப்பினும், இந்த வரவு செலவுத்திட்டத்தில் அரச மற்றும் தனியார்த்துறை ஊழியர்களுக்கான சம்பள உயர்வு போதியளவு வழங்கப்படவில்லை என்ற குறைபாடு இருக்கின்றது. நேற்று Budget சமர்ப்பிக்கப்பட்டதன் பின்னர், 'மாலை முரசு' பத்திரிகையில், "அரச, தனியார் துறையினரை ஏமாற்றிய அநுரவின் 'பட்ஜெட்'; எதிர்பார்த்த அளவு சம்பள அதிகரிப்பு இல்லை!" என்பது தலைப்புச் செய்தியாக வெளிவந்து இருக்கின்றது. அரசாங்கம் தன்னால் முடிந்தளவு சகல தரப்பினரையும் திருப்திப்படுத்தி இருக்கின்றது. கடந்த தேர்தலில் இந்த அரசாங்கத்தின் வெற்றிக்காக 70-80 சதவீதமான அரச ஊழியர்கள் வாக்களித்திருந்தார்கள். இருந்தாலும், அரச ஊழியர்களுடைய சம்பள அதிகரிப்பு எதிர்பார்த்தளவு இடம்பெறவில்லை. அவர்களுக்கான சம்பள உயர்வு மூன்று ஆண்டுகளுக்குப் பிரித்து வழங்கப்பட்டுள்ளது. ஒவ்வோர் ஆண்டும் குறிப்பிட்டதொரு வீதத்தை வழங்குவதாகத் தெரிவிக்கப்பட்டுள்ளது. இந்த ஆண்டு மிகக் குறுகியளவு தொகையே சம்பள அதிகரிப்பாக வழங்கப்பட்டுள்ளது என்ற கவலை அரச ஊழியர்கள் மத்தியில் இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டத்தில் கிழக்கு மாகாணம் முற்றுமுழுதாகப் புறக்கணிக்கப்பட்டு இருக்கின்றது என்ற செய்தியையும் நான் இங்கு சொல்லியாக வேண்டும். கிழக்கு மாகாணத்தின் அபிவிருத்திக்கென எந்தவொரு விசேட நிதியும் இந்த Budgetஇல் ஒதுக்கப்படவில்லை. வடக்கு மாகாணத்திலுள்ள கிராமிய பாலங்கள் மற்றும் வீதிகளை மேம்படுத்துவதற்காகப் பாரியளவு நிதி -5,000 மில்லியன் ரூபாய்- ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. நாங்கள் அதை வரவேற்கின்றோம்; பாராட்டுகின்றோம்; அதற்காக நன்றி தெரிவிக்கின்றோம்.

கிழக்கு மாகாணம் என்பது, யுத்தத்தினால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட ஒரு பிரதேசம்; மூவின மக்களும் ஒன்றுமையோடு வாழுகின்ற ஒரு பிரதேசம்; இயற்கை மற்றும் செயற்கை அனர்த்தங்களால் அழிவுக்கு உட்படுகின்ற ஒரு பிரதேசம்! கிழக்கு மாகாண சபைக்குக்கூட, போதியளவு நிதி அரசாங்கத்திடமிருந்து கிடைப்பதில்லை. அதாவது, மிகக் குறைந்தளவு நிதிதான் அந்த மாகாணத்துக்குக் கிடைக்கின்றது. அண்மையில் அடுத்தடுத்து ஏற்பட்ட வெள்ள அனர்த்தத்தால் அந்தப் பிரதேசத்தில் இருக்கின்ற பாலங்கள், வீதிகள், பாடசாலைக் கட்டிடங்கள் என்பன அழிக்கப்பட்டு இருக்கின்றன. அவற்றை மீளக் கட்டியெழுப்புவதற்கு இதுவரை எந்தவித நிதி ஒதுக்கீடும் செய்யப்படவில்லை. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்றைய தினம் சமர்ப்பிக்கப்பட்ட Budgetஇல் அதற்கான நிதி ஒதுக்கப்படாவிட்டாலும், மூலதன நிதி ஒதுக்கீட்டிலிருந்து அதற்கான நிதியை ஒதுக்கீடு செய்ய முடியும். எனவே, கிழக்கு மாகாணத்தில் இருக்கின்ற பல்வேறுபட்ட வேலைத்திட்டங் களுக்கான நிதியை ஒதுக்கீடு செய்து தர வேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

தென்கிழக்குப் பல்கலைக்கழகம் பல்வேறுபட்ட தேவைகளோடு இருக்கின்றது. அங்கு கல்வி கற்கின்ற பல்லாயிரக்கணக்கான மாணவர்களுக்குப் போதியளவு கட்டிட வசதி இல்லை. வெள்ளம் வருகின்ற ஒவ்வொரு தடவையும் - வருடத்துக்கு இரண்டு தடவை - சுமார் மூன்று அடிக்கு வெள்ளநீர் நிரம்புவதால் அந்தப் பல்கலைக்கழகத்தை மூடவேண்டிய நிலை ஏற்படுகின்றது. அந்தப் பல்கலைக் கழகத்துக்குள் நுழைய முடியாத அளவுக்கு வெள்ளநீர் நிரம்பியிருக்கும். எனவே, அந்தப் பல்கலைக்கழகத்தை வெள்ள அனர்த்தத்திலிருந்து நிரந்தரமாகப் பாதுகாப்பதற்குத் தேவையான நிதி ஒதுக்கீட்டைச் செய்துதர வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கிழக்கு மாகாணத்தில் இருக்கின்ற ஒலுவில் துறைமுகமானது கட்டிமுடிக்கப்படாமல் அப்படியே இருக் கின்றது. அங்குள்ள மக்களுக்குப் பிரயோசனப்படும் வகையில், அதைப் புனரமைக்க வேண்டும். அங்கு ஆயிரக்கணக்கான மீனவர்கள் இருந்தும் அவர்களுக்கென ஒழுங்கான மீன்பிடித் துறைமுகம் ஒன்று இல்லை. தென் மாகாணத்தில் பல இடங்களிலும் மீன்பிடித் துறைமுகம் இருக்கின்றது. ஆனால், மீன்பிடித்துறைமூலம் இந்த நாட்டுக்கு வருமானத்தை ஈட்டிக்கொடுக்கின்ற முக்கிய மாகாணமான கிழக்கு மாகாணத்தில் ஒழுங்கான ஒரு மீன்பிடித் துறைமுகம்கூட இல்லை. திருகோணமலை துறைமுகம்கூட, மட்டுப்படுத்தப் பட்ட அளவிலே இருக்கின்றது. வாழைச்சேனை துறைமுகம் மிகவும் சிறியது. உண்மையிலே அது ஒரு துறைமுகமல்ல. எனவே, கிழக்கு மாகாணத்தில் உருவாக்கப்பட்ட ஒலுவில் துறைமுகத்தை மீன்பிடித் துறைமுகமாக மாற்றி, அதற்குத் தேவையான வசதிகளைச் செய்துகொடுத்து, பாதிப்புகளைச் சரிசெய்து, அதனைக் கட்டியெழுப்பவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது.

மேலும், கிழக்கு மாகாணத்தில் இருக்கின்ற பாடசாலைகள், தொழில்நுட்பக் கல்லூரிகள் பல்வேறு தேவைகளோடு இருக்கின்றன. அதுமாத்திரமன்றி, அங்குள்ள பல வீதிகள், பாலங்கள் புனரமைக்கப்படாமல் உடைந்த நிலையில் இருக்கின்றன. இவற்றைச் சரி செய்வதற்குத் தேவையான நிதி ஒதுக்கீடுகளை அரசாங்கம் செய்ய வேண்டும். அரசாங்கத்தின் கவனம் கிழக்கு மாகாணத்தைக் கட்டியெழுப்புவதில் இருக்க வேண்டும். ஏனெனில், கடந்த தேர்தலில் அங்குள்ள அதிகமான மக்கள் குறிப்பாக மூவின மக்களும் இந்த அரசாங்கத்தின் வெற்றிக்காக வாக்களித்திருக்கிறார்கள். எனவே, கிழக்கு மாகாணத்தைக் கட்டியெழுப்புவது அரசாங்கத்தின் கடமையாகும். அதற்குத் தேவையான நிதி ஒதுக்கீட்டைச் செய்ய வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் அரசாங்கத்தைக் கேட்டுக்கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் ஏற்படுகின்ற வெள்ளமானது, அந்த மாவட்டத்தில் பெய்கின்ற மழையால் ஏற்படுவதல்ல. மாறாக, மலையகப் பகுதிகளில் - மத்திய, ஊவா மாகாணங்களில் - பெய்கின்ற மழையாலே ஏற்படுகின்றது. அதாவது, மலையகப் பகுதியில் பெய்கின்ற மழையால் உருவாகின்ற நீரானது, கிழக்கு மாகாணத்தை நோக்கி வந்து மட்டக்களப்பிலுள்ள ஆறுகளில் விழுவதால், மட்டக்களப்பு

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

වාවි නිறைந்து, அந்தப் பிரதேசம் முழுவதும் வெள்ளக் காடாக மாறுகின்றது. அதனால் அங்கிருந்து மக்கள் வெளியேறவேண்டி ஏற்படுவதுடன், அவர்களுடைய வீடுகளும் பாதிக்கப்படுகின்றன. இந்த வெள்ள நிலைமையைத் தடுப்பதற்காக மட்டக்களப்பில் இருக்கின்ற பாரிய குளங்களை ஒன்றிணைக்க வேண்டும். அவ்வாறு செய்தால் ஆயிரக்கணக்கான ஏக்கரில் விவசாயம் செய்யக்கூடிய சூழ்நிலையும் ஏற்படும். அதன்மூலம் நீரைச் சேமித்தும் வைக்க முடியும். அதற்கான திட்டங்கள் நீர்ப்பாசனத் திணைக்களத்திடம் இருக்கின்றன. அதுதொடர்பான ஆய்வுகள் மேற்கொள்ளப்பட்டு இருக்கின்றன. உலக வங்கி, ஆசிய அபிவிருத்தி வங்கி, உலக உணவுத் திட்டம் என்பவற்றின் உதவியுடன் ஏற்கனவே இது தொடர்பில் பல திட்டங்கள் தயாரிக்கப்பட்டு இருக்கின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கிழக்கு மாகாணம் என்பது, உச்சளவு அரிசியை இந்த நாட்டுக்குக் கொடுக்கின்ற ஒரு மாகாணம். அதேபோல், மீன்பிடித் துறையிலும் முன்னேற்றகரமான ஒரு மாகாணம். எனவே, அந்த மாகாணத்தில் இருக்கின்ற பிரச்சினைகளைத் தீர்த்து, அங்குள்ள அபிவிருத்திப் பணிகளை நிறைவுசெய்யவேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. அந்த வகையில், நீங்கள் முயற்சிகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

கிழக்கு மாகாணத்தின் கல்வி நிலை அடிமட்ட நிலையிலே இருக்கின்றது. அதனை மேம்படுத்துவதற்காக அங்குள்ள பாடசாலைகளில் இருக்கின்ற ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்தி செய்ய வேண்டும். சில பிரதேசங்களிலுள்ள பாடசாலைகளைத் தவிர, அநேகமான பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறை இருக்கின்றது. அதனை நிவர்த்தி செய்வதற்குரிய அனுமதிகளை நீங்கள் வழங்க வேண்டும். அண்மையில்கூட, கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரான எங்களுடைய பிரதம அமைச்சர் அவர்கள் அதற்கான அனுமதியை வழங்கியிருந்தார். இன்னும் இருக்கின்ற வெற்றிடங்களை நிரப்புவதற்குத் தேவையான அனுமதியை வழங்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ நீதி அமைச்சர் அவர்களுடைய உரையை நான் கேட்டுக்கொண்டு இருந்தேன். நீதிமன்ற நடவடிக்கைகளுக்காகச் செல்லும் சிறுவர்கள் பற்றி அவர் குறிப்பிட்டிருந்தார். சிறிய, சிறிய காரணங்களுக்காக தடுப்பு நிலையங்களிலிருந்து அச்சிறுவர்களை சிறைக்கைதிகளுடன் சேர்த்து வாகனங்களில் அனுப்புவதன்மூலம் அவர்களின் எதிர்காலம் அப்படியே பாழடைகின்றது. உண்மையிலேயே அந்தச் சிறுவர்கள் பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுக்கிறார்கள் என்பதை சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதி அமைச்சராக நானும் ஒரு காலத்தில் இருந்தவன் என்ற அடிப்படையில் கூறுகின்றேன். எனவே, அந்தச் சிறார்களைத் தனி வாகனங்களில் நீதிமன்றத்துக்குக் கொண்டுசெல்வதற்கு எடுத்திருக்கின்ற முயற்சியை நாங்கள் பாராட்டுகின்றோம். அதற்கு எங்களுடைய நன்றியையும் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்கள் இங்கு இருக்கிறார். அவரும் எங்களுடைய மாகாணத்தோடு நெருக்கமான ஒருவர். கிழக்கு மாகாணம் மீன்பிடித் துறையில் முன்னேற்றம் அடையவேண்டிய ஒரு மாகாணம். வாழைச்சேனை துறைமுகம் பற்றி நான் அவருடன் பேசியிருக்கிறேன். வாழைச்சேனை துறைமுகத்தில் 200 boatsஐக்கூட கட்ட முடியாது. அந்தத் துறைமுகத்தில் எந்த வசதியுமே கிடையாது. அது வெறும் மீன்பிடிப் படகுகளைக் கட்டுகின்ற தளம் மாத்திரம்தான். அங்கு இடமில்லாத காரணத்தால் ஆயிரத்துக்கும் மேற்பட்ட பெரிய படகுகளை வெளியில் கொண்டுபோய் கட்டுகிறார்கள். அந்தத் துறைமுகத்தை விஸ்தரிப்பதற்கு சுமார் 800 மில்லியன் ரூபாய் தேவையென மதிப்பிடப்பட்டுள்ளது. இரண்டு மாவட்டங்களைச் சேர்ந்தவர்கள் பாவிக்கின்ற அந்தத் துறைமுகம் பல்வேறு குறைபாடுகளோடு காணப்படுகின்றது. கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய காலத்தில் இந்தத் துறைமுகத்தைக் கட்டியெழுப்புவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அதன்மூலமாக கல்முனை, காத்தான்குடி, வாழைச்சேனை, ஓட்டமாவடி, வாகரை போன்ற பிரதேச மீனவர்கள் பயனடைவார்கள் என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, Valaichchenai Paper Mill பற்றிக் கூற வேண்டும். இது மிகப் பெரிய வரலாற்றைக் கொண்ட ஒரு factory; பாரியளவில் உற்பத்தியை மேற்கொண்ட ஒரு factory. அது யுத்தம் காரணமாக மூடப்பட்டது. இன்று மிகச் சிறியளவிலே அதன் உற்பத்தி இருக்கிறது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up, Hon. Presiding Member.

இந்த வாழைச்சேனை கடதாசி ஆலையை - Paper Millஐ - வெளிநாட்டு முதலீட்டாளர்களின் ஒத்துழைப்போடு மீண்டும் முழுமையாக இயக்க - கட்டியெழுப்ப - முடியுமாக இருந்தால், அங்கு நிறையப் பேருக்கு தொழில்வாய்ப்புகளை வழங்கலாம். அதுமாத்திரமல்ல, நமது நாட்டுக்குத் தேவையான papersஐயும் நாங்கள் பெற்றுக்கொள்ளலாம். அவற்றை import பண்ணவேண்டிய தேவை ஏற்படாது. ஒரு காலத்தில் நாடு முழுவதற்கும் தேவையான papersஐ வழங்கிய factoryதான் இந்த Valaichchenai Paper Mill. இன்று அது மிகக் குறைந்த அளவிலே இயங்கிக்கொண்டு இருக்கின்றது. எனவே, அதனை முழுமையாக இயக்குவதற்குத் தேவையான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று வட, கிழக்கு மாகாணங்களில் குறிப்பாக, கிழக்கு மாகாணத்தில் நிருவாக ரீதியான பல பிரச்சினைகள் இருக்கின்றன. பிரதேச சபைகள் உருவாக்கப்பட்டுள்ள போதிலும் இன்னும் அவற்றுக்கான பிரதேச செயலகங்கள் உருவாக்கப்படவில்லை. குறிப்பாக, கோரளைப்பற்று மத்தி பிரதேச சபை, கோரளைப் பற்று தெற்கு - கிரான் பிரதேச சபை என்பன உருவாக்கப்பட்டும், அவற்றுக்கான பிரதேச செயலகங்கள் உருவாக்கப்படவில்லை; எல்லைகள் வரையறுக் கப்படவில்லை. இதனால் அங்குள்ள மக்கள் பல்வேறு சிரமங்களை எதிர்நோக்குகின்றார்கள். அவற்றுக்கான பிரதேச செயலகங்களை உருவாக்கிக் கொடுக்கவேண்டுமென Panambalana Commissionஇன் Reportஉம் சொல்கின்றது. இருந்தாலும், இன்னும் அது நடைமுறைப்படுத்தப்படவில்லை.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் உரிய நடவடிக்கைகளை எடுத்து, நிருவாக ரீதியாக இருக்கின்ற பிரச்சினைகளைத் தீர்த்துவைக்க வேண்டும். அதன்மூலம் இனங்களுக்கு இடையில் மேலும் பரஸ்பர ஒற்றுமையை ஏற்படுத்த முடியும்.

கிழக்கு மாகாணம் என்பது, மூவின மக்களும் ஒற்றுமையோடு வாழுகின்ற ஒரு மாகாணம். அங்கு மூவின மக்களும் -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Please give me one more minute, Hon. Presiding Member.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමා.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ உறுப்பினர் அவர்களே, இம்முறை வரவு செலவுத்திட்டத்தில் கடற்றொழில் அமைச்சுக்கு 11.4 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கிறது. அதனால் கட்டாயம் இந்த முறை வாழைச்சேனைக்கு மாத்திரமல்லாமல், முழு கிழக்கு மாகாணத்துக்கும் கூடுதலான கவனிப்பு மேற்கொள்ளப்படும்.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
கடற்றொழில் அமைச்சுக்கு ஒதுக்கப்பட்டிருக்கின்ற பாரிய நிதி ஒதுக்கீட்டின்மூலம் கிழக்கு மாகாணத்தில் கடற்றொழிலை மேம்படுத்துவதற்கான முயற்சிகளை எடுப்பதாக கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார். அதற்காக நான் அவருக்கு கிழக்கு மாகாண மக்கள் சார்பில் எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நாட்டில் மூவின மக்களும் ஒற்றுமையோடு வாழுகின்ற ஒரு மாகாணம்தான் கிழக்கு மாகாணம்! அந்த மாகாணத்தைக் கட்டியெழுப்புவதற்கு உங்களுடைய அரசாங்கம் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.28]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය අවුරුදු 4කට එහා ගිය ප්‍රතිපත්ති නිර්මාණය කරලා, ඊට පස්සේ රටේ බලය ලබාගෙන ඉදිරිපත් කරපු පළමු අය වැය තමයි, මේක. එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ගෙන ආ පළමුවැනි අය වැය පිළිබඳ විවාදයේදී කථාවක් කරන්නට ලැබීම මා භාග්‍යයක් කොට සලකනවා.

විපක්ෂයේ කථා අහගෙන ඉන්න කොට මතක් වෙනවා, ගමක ළමයෙක් "කොටියා ආවෝ, කොටියා ආවෝ" කියලා කෑ ගහලා, ගමේ මිනිස්සු දක්කා ගෙන ඇවිල්ලා තමන්ම රැවටුණු කථාව. ජනාධිපතිවරණය වෙලාවේත් ආර්ථිකය ගැන බිල්ලෝ මවලා ජනතාව රවටටන්න හැදුවා. නමුත් ජනතාව රැවටුණේ නැහැ. එතැනින් එහාට ගිහිල්ලා මහ මැතිවරණයේදීත් කිව්වා, ආර්ථිකය අස්ථාවර වෙයි, IMF එක පැනලා දුවයි, රට කඩාගෙන වැටෙයි, රට ආයෙත් බංකොලොත් වෙයි කියලා. අපේ ආර්ථික මොඩලය මේකයි, රජය ඉන්නේ පහසුකම් සපයන්නෙකු විධියටයි, ආර්ථිකයේ එන්ජිම වෙන්නේ පෞද්ගලික අංශයයි, අවශ්‍ය තැන්වලදී රජය මැදිහත් වෙනවා කියලා අපි දිගින් දිගටම කිව්වත්, කොච්චර කිව්වත්, ආර්ථික ඔස්තාර්ලා බොරු ජනගත කරන්න උත්සාහ කළා. "කොටියා ආවෝ, කොටියා ආවෝ" කියලා කෑ ගහනවා වාගේ බොරු කියලා අවසානයේ සියයට 18ක් තමයි තමන්ගේ ආසනවලිනුත් ඒ අයට ලැබුණේ. අවසන් වතාවටත් ඒ දේවල්ම කියමින් සිටියත් ඒවා සම්පූර්ණ අසත්‍ය බවට පත් වුණා අප අය වැය ඉදිරිපත් කළාට පස්සේ. දැන් ඉතින් ඊළඟ මැතිවරණය සඳහා විපක්ෂයට කිසිදු සටන් පාඨයක් නැහැ.

මේ ආර්ථිකය ගැන කථා කරන ඔස්තාර්ලා අපේ රට බංකොලොත් කළේ මොන ආර්ථික මොඩලයෙන් ද කියලා අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒගොල්ලන්ගේ ආර්ථික මොඩලය ගැන මම මුලින්ම පොඩ්ඩක් පැහැදිලි කරන්නම්. එය හරිම පැහැදිලියි. අය වැයක් ඉදිරිපත් කළාම ගිජු ලිහිණියන් වාගේ ට්‍රිලියන 2ක්, 3ක් යාළුවන් අතර බෙදා ගන්නා ආර්ථික මොඩලයක්, එය. එහෙම එකක් අපට නැහැ. ඒ වාගේම, රටට කිසිම ඵලදායිතාවක් ගෙනෙන්නේ නැතිව රාජ්‍ය සම්පත් සහ වැය ශීර්ෂ වෙන් කරපු, ණය අරගෙන රට බංකොලොත් කරපු ආර්ථික මොඩල අපට අදාළ නැහැ. ඒ වාගේම, ගොඩනැඟුණු යම්කිසි ආර්ථිකයක සමස්ත ප්‍රතිලාභ සියයට 1ක් වාගේ පිරිසකට හිමි වන ආර්ථික මොඩල අපි අත් හැරලායි තිබෙන්නේ. ඒ වාගේම තමයි, බලශක්තිය, බැංකු, විශේෂයෙන් සංවර්ධන බැංකු විනාශ කරපු ආර්ථික ක්‍රමයකට වෙනස් ආර්ථික මොඩලයක් තමයි අප ගෙනැවිත් තිබෙන්නේ. ඒ වාගේම, අධ්‍යාපනයට, සෞඛ්‍යයට, පොදු ප්‍රවාහනයට, යටිතල පහසුකම්වලට අවම ආයෝජනයන් කරපු ආර්ථික මොඩල මේ රටේ ජනතාව සහමුලින්ම පරද්දලා තිබෙනවා.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

අපේ ආර්ථික දර්ශනය ගැන කිව්වොත්, එය ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ඉතා පැහැදිලිව ප්‍රකාශ වෙලා තිබෙනවා. ඒක අවුරුදු 5කට ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළක්. ඒ තුළ අපි පැහැදිලිව කියනවා, ඉතිරි අවුරුදු තුන අපි IMF Agreement එක ඇතුළේ යනවා කියලා; එහි තිබෙන රාමුව ඇතුළේ තමයි අපට කළ හැකි වෙනස්කම් කරන්න තිබෙන්නේ කියලා. මොකද, මේ ඉදිරිපස සිටින ආර්ථික ඔස්තාර්ලා අපේ රටේ ස්වෛරීත්වය නැති කරලා තමයි ජාතික ජන බලවේගයට ආණ්ඩුව භාර දුන්නේ. එහෙම නම්, වියට්නාමය, දකුණු කොරියාව, ඉන්දියාව වාගේ වේගවත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්න පුළුවන් ස්වෛරී ආර්ථිකයක අය වැයක් අපට බලා ගන්න පුළුවන් වෙන්නේ 2029 ඉඳලා තමයි. හැබැයි, මේ සීමා සහිත තත්ත්වයන් ඇතුළේත් විශේෂයෙන්ම අප කියපු නිෂ්පාදන ආර්ථිකය බිහි කරන්න අවශ්‍ය කරන රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, සමුපකාර අංශය දැඩිව වෙළෙඳ පොළට මැදිහත් වන, පූර්ණ තරගය, නියාමනය, රාජ්‍ය මැදිහත් වීම සහ වෙළෙඳ පොළ සංවිධානය කියන ආකෘති හතරම භාවිත කරන ආර්ථික ක්‍රමයක් තමයි අප පැහැදිලි කරන්නේ. ඉතින් විපක්ෂයට ඒක ඇහෙන්නේ නැති වුණාට අපට කරන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අපේ මේ ආර්ථික ක්‍රමය; මේ ආර්ථික මොඩලය; එහෙම නැත්නම් මේ වැඩ සැලැස්ම පිළිබඳව දිගින් දිගටම අහන අයට තව වරක් පැහැදිලි කරලා දෙන්නම්, නිෂ්පාදන ආර්ථිකය, එහෙම නැත්නම් රටේ ආර්ථික වර්ධන වේගය වැඩි කරන්න අප මේ අය වැය තුළ හදලා තිබෙන කොටස් ටික ගැන. මෙතැන කොටස් 10ක් තිබෙනවා. මෙතුමන්ලා තමයි වෙනදාත් අය වැය හැදුවේ, ඇමතිතුමාගේ මුහුණ බලලා. ඇමතිතුමාගේ මුහුණ බලලා තමයි අය වැයෙන් කොච්චරක් වෙන් කරනවාද කියලා බැලුවේ. හැඳුනුම්කම් අනුව, නෑදෑකම් අනුව තමයි අය වැයෙන් මුදල් වෙන් කළේ. නමුත් මෙවර ජාතික ජන බලවේගය ඉදිරිපත් කළ අය වැය ලංකාවේ පළමුවෙනි වතාවට ඉදිරිපත් කළ integrated Budget එකක්. එ් කියන්නේ, කර්මාන්ත සහ ව්‍යවසායකත්වය නංවන්න අමාත්‍යාංශ 7, 8ක් එකතු වෙලා දායකත්වය දෙන අය වැයක්.

මේකේ පළමුවෙනි එක තමයි, Ease of Doing Business කියන එක. ලංකාවේ ව්‍යාපාර කරන්න බැරි කරලා, පොඩි ව්‍යාපාරිකයා, විදේශ ව්‍යාපාරිකයා, දේශීය ව්‍යාපාරිකයා තම තමන්ගේ පස්සෙන් ගෙන්වා ගන්න, ඇමතිතුමාගෙන් කොළ ගන්න, ලියුම් ගන්න තත්ත්වයට පත් කරපු ආර්ථික ඔස්තාර්ලා තමයි අපේ ආර්ථික වැඩ පිළිවෙළ මොකක්ද කියලා අහන්නේ. Ease of Doing Business එකේ 99වන තැන තිබියදී තමයි අපට භාර දුන්නේ. ඒක වෙනස් කර ගන්න අවශ්‍ය අණපනත් සියල්ලම අපි ගෙනෙනවා. මේ අණපනත් එකක්වත් 2015 ආණ්ඩුවටත් ගෙනෙන්න බැරි වුණා, 2019 ආණ්ඩුවටත් ගෙනෙන්න බැරි වුණා, 2022 ආණ්ඩුවටත් ගෙනෙන්න බැරි වුණා. Tariff policy එකක්, Customs Act එකක්, Statistics Act එකක්, Solvency Act එකක් ගෙනෙන්න සහ ඩිජිටල් ආර්ථිකයට බිලියන 21ක්.

ඊළඟට, ඒගොල්ලන්ට කවදාවත් ඩිජිටල් ආර්ථිකය ගෙනෙන්න බැහැ. මොකද වංචාව, දූෂණය කරන්න බැරි වෙනවා, ඩිජිටල් ආර්ථිකය ආවාම; විනිවිදභාවය ආවාම. ඒ හින්දා ඔය ඔස්තාර්ලා කොච්චර කෙඳිරි ගෑවත්, උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු කියන නායකයෝ පස්සේ ගිහිල්ලා ඇඬුවා කියලා දැන් ඉතින් තේරුමක් වෙන්නේ නැහැ.

ඊළඟ කාරණය හැටියට, නිෂ්පාදන ආර්ථිකයට යන්න නම් රටේ නිෂ්පාදන පිරිවැය අඩු කරන්න ඕනෑ. පසුගිය ආණ්ඩුවලට කිසිම වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, බලශක්ති මිල ගණන් අඩු කරන්න. ඒ වාගේම පොදු ප්‍රවාහනය දියුණු කරන්න, ආනයනික අමුද්‍රව්‍යවල බදු අඩු කර ගන්න tariff policy එකක් ගෙනෙන්න වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. මේ ක්‍රියා වෙනුවෙන් තමුන්නාන්සේලා කිසිම දෙයක් කළේ නැහැ. මෙතැනට ඇවිල්ලා කෑ ගැහුවාට එළියට ගිහිල්ලා කටක් ඇරලා කියන්න බැහැ, අදානි වාගේ ආයෝජන අපේ රටට බර වැඩියි කියලා. සිංහනාද කළාට බලු කෙඳිරිලි තමයි ඒගොල්ලන්ගේ තිබෙන්නේ. නිෂ්පාදන ආර්ථිකයට යන්න නම් සැපයුම්දාමය - supply chain එක - ශක්තිමත් කරන්න ඕනෑ. අද අපනයන කර්මාන්තයේ, කෘෂි කර්මාන්තයේ තේ, පොල්, රබර් වාගේ ඒවා තිබුණාට සමස්ත යෙදුම් කර්මාන්තය බිඳ වටිටලා තමයි අපට භාර දීලා තිබෙන්නේ. නමුත්, මේ අය වැයෙන් කෘෂි කාර්මික යෙදවුම්වලට රුපියල් බිලියන 11ක්, මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරන්න රුපියල් බිලියන 11ක් ලබා දීම සහ සමුපකාර ප්‍රවර්ධනය කිරීම වාගේ යෝජනා ඇතුළත් කර තිබෙනවා.

ඊළඟ කාරණය තමයි, investment promotion. ආයෝජන ප්‍රවර්ධනයක් කරගන්න බැරි වුණා, මේ ආර්ථික ඔස්තාර්ලාට. 1977 ඉඳලා ලංකාවට සෘජු විදේශ ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ බිලියන 21යි. වියට්නාමයට අවුරුද්දකට බිලියන 23ක් එනවා. මේ අය වැයේ පැහැදිලිව අපි කියලා තිබෙනවා, public-private partnershipවලට යනවා කියලා. වරාය සංවර්ධනයට, බලශක්තියට, තෙල් ටැංකි සංවර්ධනයට, industrial zones හදන්න, පෞද්ගලික අංශයට එන්න පුළුවන් කියලා පැහැදිලිව මේ අය වැයේ ලියා තිබෙනවා. ඒ නිසා දැන් මේ අයට කියා ගන්න දෙයක් නැති වෙලා තිබෙන්නේ, අපේ ආණ්ඩුවට විරුද්ධව.

මේ රටේ ඉඩම් ටික බදාගෙන කොල්ල කෑවා මිසක් ඒ ඉඩම් ටික කවදාවත් කර්මාන්තවලට ලබා දුන්නේ නැහැ. ඒ නිසා ඒ ඉඩම් ටික වෙන් කරගෙන නිෂ්පාදන කටයුතු සඳහා යොමු කරන්නත් රුපියල් බිලියන 13.7ක් මේ ආණ්ඩුව මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ඊට පස්සේ සේවකයන් ගැන තිබෙනවා. රටක ආර්ථිකය ඉහළ නංවන්න නම් ශ්‍රම සම්පතට ආයෝජනය කරන්න ඕනෑ. තමුන්නාන්සේලා හැමදාම අධ්‍යාපන අවස්ථා කැපුවා. ඩිජිටල් තාක්ෂණය දරුවන්ට දුන්නේ නැහැ. කාර්මික දැනුම දරුවන්ට දුන්නේ නැහැ. නමුත් මේ ආණ්ඩුව කුසලතා සංවර්ධනයට - skills development සඳහා - විතරක් රුපියල් බිලියන 15ක් වෙන් කරලා තිබෙනවා. ඉතිහාසයේ වැඩිම ප්‍රතිපාදනය, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.9ක් අධ්‍යාපනයට වෙන් කළේ ජාතික ජන බලවේගය විතරයි.

අපි ඉස්සරහට යන්න නම්, අන්තර්ජාතික අගය දාමය - global value chain - එක්ක එකතු වෙන්න ඕනෑ. ඒ තමයි ඊළඟ කාරණය. ඒ සඳහා අවශ්‍ය රටට සුදුසු වෙළෙඳ ගිවිසුම්වලට එළඹෙන්නට හිටපු පාලකයන්ට හැකියාවක් තිබුණේ නැහැ. මොකද, ඒ රටවල් ඒ අය විශ්වාස කළේ නැහැ.

ඒ වාගේම actively promote කරන්න විදේශ තානාපති සේවය භාවිත කර ගන්න තමුන්නාන්සේලාට බැරි වුණා. මොකද, ඒකට යැව්වේ තමන්ගේ යහළුවන් සහ හොර තක්කඩි. ඒ අය තමයි අපේ රට නියෝජනය කළේ මෙච්චර කාලයක්. මේ ඔස්තාර්ලාට බැරි වුණා, infrastructure network එක හදලා දෙන්න අපේ ආයෝජනවලට. අපේ කර්මාන්තපුර හදලා තිබෙනවා, access roads නැතුව. අපේ කර්මාන්තපුර හදලා තිබෙනවා කිසිම සැලැස්මක් නැතුව, ඇමතිතුමාගේ අවශ්‍යතාවට ඉඩම් බෙදලා. ඒවා දැන් අපට හදන්න වෙලා තිබෙනවා. ඒ නිසා

පාරවල් හදන්න, industrial parks හදන්න, විශේෂයෙන්ම වරාය සංවර්ධනයට බිලියන 9ක් වෙන් කරලා තිබෙනවා. ඩිජිටල් තාක්ෂණික යටිතල පහසුකම් සපයන්නත් මේ අය වැයෙන් අවධානය යොමු වෙලා තිබෙනවා.

ඊළඟ කාරණය තමයි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර. සුළු හා මධ්‍ය පරිමාණ අංශයට කිසිම සහායක් මෙතෙක් පැවැති රජයන්වලින් ලැබිලා නැහැ. ඒ ව්‍යාපාරිකයන් තම තමන්ගේ ශක්තියෙන් දියුණු වුණා. හැබැයි අපි සතුටුයි කියන්න, මේ නිෂ්පාදන ආර්ථිකයට, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහාය දීම සඳහා රුපියල් බිලියන 90ක විතර ප්‍රතිපාදන සමස්ත අය වැය ඇතුළේ වෙන් කරලා තිබෙන බව. එක පැත්තකින් ගත්තාම ව්‍යවසායකයන් සංවර්ධනය කරන්න, ව්‍යවසායකත්වය ඇති කරන්න, ඵලදායිතාව වැඩි කරන්න, ආරම්භක අංකුර ව්‍යාපාර - start-up ecosystem - ප්‍රගමනය කරන්න මේ ආර්ථික ඔස්තාර්ලාට මෙච්චර කාලයක් බැරි වෙලා තිබෙනවා.

ඊළඟ කාරණය හැටියට, ආර්ථිකයක් ඉස්සරහට යන්න නම් ආර්ථිකයට එකතු වෙන ආයෝජන, එහෙම නැත්නම් ඉතුරුම්, නිෂ්පාදනය දක්වා ගලා එන්න ඕනෑ. එහෙම ක්‍රමයක් තිබුණේ නැහැ. මොකද, ඔබතුමන්ලාගේ ආර්ථික modelsවල commodity එකක් විධියට තමයි ධනය තිබුණේ. ඉතුරුම් ටික ඔක්කෝම අරගෙන ගිහිල්ලා මූල්‍ය වෙළෙඳ පොළේ, කොටස් වෙළෙඳ පොළේ දමලා තමයි ඔබතුමන්ලා ලාභ ලැබුවේ. එහෙම නැත්නම් භාණ්ඩාගාර බිල්පත්වල දමලා, ආණ්ඩුවටත් පාඩු වෙන්න තමයි EPF එකෙන්, ETF එකෙන් හොරකම් කළේ. ඒ සමහර ඔස්තාර්ලා සංවර්ධන බැංකුවල සභාපතිවරු හැටියට හිටපු අය. ලංකාවේ සංවර්ධන බැංකු පෞද්ගලීකරණය කරන්න මූලික වෙච්ච ඔස්තාර්ලා දැන් නහයෙන් අඬනවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහන දෙන්න කවුරුවත් නැහැ කියලා. ජාතික ජන බලවේගය තමයි නැවතත් අපේ රටේ සංවර්ධන බැංකු ක්‍රමයක් ආරම්භ කරන්නේ. ඒ සඳහා සියලු බැංකු මේ වෙනකොට සූදානම්න් සිටිනවා. මේ ක්‍රියාවලිය ගත්තොත්, මේ අවුරුද්දේ මේ ආර්ථිකයේ දැවැන්තම ආයෝජකයා බවට පත් වෙන්නේ රජය. අපි රුපියල් ට්‍රිලියන 1.3ක් මුදා හරිනවා, ආර්ථිකයට. මේක දැවැන්ත ආයෝජනයක්. මේ හරහා පමණක් සියයට 2කට එහා ආර්ථික වර්ධනයක් අපට ලබා ගන්න පුළුවන්.

ඊළඟ කාරණය මේකයි. පර්යේෂණ හා සංවර්ධනයට - for research and development - සත පහක්වත් වෙන්කර ගන්න මේ ඔස්තාර්ලාට බැරි වුණා. මේ ඔස්තාර්ලාට වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, අපේ රටේ අවශ්‍යතා අනුව කර්මාන්තවල ප්‍රශ්න විසඳන්න, විශ්වවිද්‍යාල පද්ධතිය එකතු කරගෙන කෙරෙන නවෝත්පාදන commercialize කරන්න, නවෝත්පාදන භාණ්ඩ හා සේවා බවට පත් කරන්න, ඒවාට ලෝකයේ පංගුවක් අත්පත් කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් කිසි Budget එකක මීට කලින් තිබිලා නැහැ. ඒකත් එන්නේ මේ ජාතික ජන බලවේගය ඉදිරිපත් කළ මංගල අය වැයෙන්. ඉතින් අපට ඔස්තාර්ලාට කියන්න තිබෙන්නේ මෙකයි. ඉතාම සංවිධිත, ඉතාම විද්‍යාත්මක වැඩ පිළිවෙළක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය වැඩිදියුණු කරලා, රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5කට එහා ගෙන යන්න.

මේ වසරේ පමණක් අපනයන ප්‍රමාණය බිලියන 19කට ගෙනිහිල්ලා, මේ රටේ ඒ ලබන ධනය සමස්ත ප්‍රජාවටම බෙදිලා යන්න, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රය හරහා රටේ වෙනත් පාර්ශ්වවලට බෙදී යන්න, දරිද්‍රතාව තුරන් කරන්න අවශ්‍ය කරන දැවැන්ත ආර්ථික හැරවුමක් තමයි මේ අය වැයෙන් අරන් තිබෙන්නේ. ලංකාවේ නව ලිබරල් ආර්ථික ක්‍රමය අපි මේ අවුරුද්දේ අහෝසි කරනවා. එතකොට නැවතත් අපි සංවර්ධන ආර්ථික ක්‍රමයකට යන පළමුවැනි අය වැය බවට මේක පත් වෙනවා. ලබන අවුරුද්දේ අපට මීට වඩා වෙනස්කම් කරන්න පුළුවන්. 2027 අවුරුද්දේ අපට තවත් වෙනස්කම් කරන්න පුළුවන්. 2028 වෙනකොට අපි නැවතත් ස්වෛරී රාජ්‍යයක් බවට පත් වෙනවා. අන්න එතකොට තමයි අපට ලෝකය අත්පත් කර ගන්න පුළුවන් වන්නේ, අතපය නිදහසේ අපේ රට නැවත ගොඩ නඟා ගන්න පුළුවන් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. පුළුවන් නම් මේ කරුණු 10 කවුරු හරි තේරුම් ගන්න. මේ කරුණු 10 යටතේ සමස්ත අය වැය ගොඩ නැඟිලා තිබෙනවා, කොහොමද මේ නිෂ්පාදන ආර්ථිකය බිහි කරන්නේ කියලා. අපේ අභියෝගය තමයි මේ කියපු කාරණා මාස 8ක්, 9ක් ඇතුළත මහ පොළොවේ පැළ කරන එක. ඒ සඳහා දැවැන්ත ශක්තියක්, දැවැන්ත ධෛර්යයක් මේ ආණ්ඩුවට තිබෙනවා කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් මාපලගම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.42]

ගරු රුවන් මාපලගම මහතා
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට පෙර කථා කළ නියෝජ්‍ය අමාත්‍ය චතුරංග සහෝදරයා වාගේම මේ අය වැය විවාදයේ පළමු දිනයේම මමත්, ආණ්ඩු පක්ෂයේ හැමෝමත්, පසුගිය මැතිවරණයේදී මාලිමාවට ඡන්දය දුන් අය විතරක් නොවෙයි, ඡන්දය නොදුන් අයත් ඊයේ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ඉදිරිපත් කළ අය වැය නිසා සතුටින් තමයි ඉන්නේ; ප්‍රහර්ෂයෙන් තමයි ඉන්නේ. එකින් එක එය පැහැදිලි කරන්න, මට අවසර දෙන්න. මා නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කය. දේශගුණික කලාප වශයෙන් බැලුවාම ගම්පහ දිස්ත්‍රික්කය අයත් වන්නේ තෙත් කලාපයට වුණත්, ආසන්න වසර කිහිපයේ අපේ දිස්ත්‍රික්කයේ ජනතාව බරපතළ පානීය ජල අර්බුදයකින් පෙළෙනවා. පානීය ජලය නැතිව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයකම ජනතාව පීඩාවට පත්වෙලා ඉන්නවා. පාර්ලිමේන්තුවේ; මේ උත්තරීතර සභාවේ මම කථා කරන මේ මොහොතේත් නිවටඹුව ඕර්වඩ්වත්ත, කත්තොට, වෙදගම, රොස්වුඩ්**වත්ත**, උඩුතුත්තිරිපිටිය, බෙම්මුල්ල වාගේ ප්‍රදේශවල සිටින අපේ ප්‍රදේශවාසීන්ට, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවෙන් ජල ටැංකි යවලා දිනපතා වතුර බවුසර් දීලා තමයි පානීය ජලය සපයන්නේ. මේ ගැටලුවට විසඳුමක් ලෙස තමයි පැවති රජයන් ගම්පහ, අත්තනගල්ල, මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය ආරම්භ කරන්නේ. මේක බොහොම ප්‍රසිද්ධ වුණේ "කරස්නාගල ජල ව්‍යාපෘතිය" කියලායි. නමුත්, පැවති රජය ලංකාව බංකොලොත් කරලා, බංකොලොත් රටක් බව මහ බැංකුව නිල වශයෙන් නිවේදනය කරලා විදේශ ණය ගෙවීම් නැවැත්වූවාට පසු මේ සියලු පානීය ජල ව්‍යාපෘති මහ ඇනහිටියා; ක්‍රියාත්මක කිරීම නැවතුණා. ගම්පහ දිස්ත්‍රික්කයේ මිනිස්සුන්ට බොන්න ගෙනාපු වතුර ටික, ඒ වෙනුවෙන් හදපු ව්‍යාපෘති එහෙමම ඇනහිටියා. නමුත්, මෙම රජය බලයට පත්වෙලා ඉතාම කෙටි දින කිහිපයක් ඇතුළත අපේ ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, නියෝජ්‍ය ඇමති මහින්ද ජයසිංහ සහෝදරයාත්, ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍ය මුනීර් මුලාෆර් සහෝදරයාත්, මමත් කරස්නාගල

[ගරු රුවන් මාපලගම මහතා]

ව්‍යාපෘතිය නිරීක්ෂණයට ගියා. අපි ගිහිල්ලා ඉංජිනේරුවන් එක්ක සාකච්ඡා කළා. අවශ්‍ය ප්‍රතිපාදන දෙන්නම්, නැවත එහි වැඩ ආරම්භ කරන්න කියලා අපි ඔවුන්ට උපදෙස් දුන්නා. ඒ අනුව තමයි මෙවර අය වැයෙන් ඒ ජල ව්‍යාපෘතිය ඇතුළු ලංකාවේ සියලුම පානීය ජල ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 20,000ක් වෙන් වෙන්නේ. සතුටු නැද්ද? මහජන නියෝජිතයකු ලෙස මෙවාට සතුටු වෙන්න බැරි නම්, මෙවාට අකුල් හෙළනවා නම්, ඔවුන් මහජන නියෝජිතයෝ ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය කාලයේ කොළඹ වරායේ බහලුම් තදබදය නිසා ඇති වූ ගැටලුව අපි දැක්කා. මේ මාලිමා රජය පැලැස්තර විසඳුම් දමන, එදිනෙදා විසඳුම් ගහන, ඩෙලි ගේම ගහන රජයක් නොවෙයි. දිගු කාලීන විසඳුමක් ලෙස අභ්‍යන්තර බහලුම් අංගනයක් යෝජනා කළා. කොළඹ වරායේ සහ ඒ අවට බහලුම් රථ වාහන තදබදය ලිහිල් කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ආසනයට, වේයන්ගොඩට අභ්‍යන්තර බහලුම් අංගනයක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කළා. අලුත් රැකියා උත්පාදන මාර්ග, අලුත් ආදායම් ක්‍රම දිස්ත්‍රික්කයේ ජනතාවට, ප්‍රදේශයේ ජනතාවට ලැබෙනකොට සතුටින් තමයි ඉන්නේ. මහජන නියෝජිතයෝ සතුටින්. මාලිමාවට ඡන්දය දුන්න ජනතාව සතුටින්. මාලිමාවට ඡන්දය නොදුන්න ජනතාව ප්‍රාදේශීය සභා මැතිවරණයේ දී ඡන්දය ලබා දෙන්නයි බලාපොරොත්තුවෙන් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම සංචාරක පහසුකම් සංවර්ධනය සහ නාමකරණ ප්‍රවර්ධනය වෙනුවෙන් මෙවර අය වැයෙන් නැවත වතාවක් රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙන බව මම කියන්න කැමතියි. අපේ ගම්පහ දිස්ත්‍රික්කය මුල් කරගෙන නව සංචාරක කලාපයක් නිර්මාණය වෙනවා. කටුනායකින් අපේ රටට බහින සංචාරකයා ගම්පහ දිස්ත්‍රික්කය හරහා තමයි නුවර දළදා මාළිගාවට, දඹුල්ලට, සීගිරියට යන්නේ. මෙතෙක් පැවැති ඉතිහාසයේ ඔය ආර්ථික ඔස්තාර්ලා කිසිම කෙනෙකුට බැරි වුණා, රාජ්‍ය නායකයෝ මෙපමණ බිහි කරපු ගම්පහට; ලෝකයේම පළමු රාජ්‍ය නායිකාව බිහි කරපු ගම්පහට; ලංකාවේ පළමු විධායක ජනාධිපතිනිය බිහි කරපු ගම්පහට, අත්තනගල්ලට එක විදේශීය සංචාරකයෙක් ගෙන්වා ගන්න. නමුත්, මේ මාස තුන ඇතුළේ මේ වැඩසටහන හැදුවා. අත්තනගල්ල, අලවල ප්‍රදේශයේ agritourism වෙනුවෙන් දැනටත් අපි ප්‍රජා කමිටු හදලා ඉවරයි. ඉතාම කෙටි කාලයකින් විදේශීය සංචාරකයෝ ගම්පහට එනවා. අත්තනගල්ල, අලවල, පිලිකුත්තුව, වාරණ, මාලිගාතැන්න, වේයන්ගොඩ, දඩගමුවේ තිබෙන ඓතිහාසික ස්ථාන නරඹන්නත්, අලවල තිබෙන ක්‍රිස්තු පූර්ව 37000ට අයත් ප්‍රාග් ඓතිහාසික යුගයේ ලෙන් අපේ සංචාරක මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීමත් අරඹලා තිබෙනවා. ඉතින් සතුටු නොවී පුළුවන්ද?

ඒ වාගේම ආසන්න වසර කිහිපය තුළ අපේ රටේ පොදු ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා වැඩිම අය වැය ප්‍රතිපාදන වෙන් කළ අය වැය මාලිමා රජයේ මේ පළමු අය වැය බවත් කියන්න අවශ්‍යයි. ඔය කියන ආර්ථික ඔස්තාර්ලා තමයි, ඔය කෑ ගහන අය තමයි, අද මාලිමාවට උපදෙස් දෙන අය තමයි අවුරුදු 76ක් මේක කළේ. දැන් උපදෙස් දෙනවා. ඔය ආර්ථික ඔස්තාර්ලා රට පාලනය කරන කාලයේත්; නිදහස ලැබිලා අවුරුදු 70 ගණනක් සමරන කොටත් අපේ රටේ පෙර පාසල් දරුවෙකුට උදේ ආහාර වේල වෙනුවෙන් වෙන් කරලා තිබුණේ රුපියල් 60යි. හැබැයි, ඊයේ ඉදිරිපත් කළ අය වැයෙන් මාලිමා රජය තමයි පළමු වතාවට එම මුදල රුපියල් 100ක් දක්වා වැඩි කළේ. මෙවර අය වැයෙන් ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලංකාවේ පෙර පාසල් ගුරුවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන්ගේ වැටුප එළඹෙන ජූනි මාසයේ සිටම රුපියල් 1,000කින් වැඩි වෙනවා. ඒ සඳහා මේ අය වැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ලංකාවම දන්නවා, මේ රජය අය වැය එනකල් හිටියේ නැහැ කියලා ජනතාවට අවශ්‍ය දේ දෙන්න. ඡන්දයට කලින් අපි ජනතාවට කිව්වා. ජනතාව අපි කියන දේ අහලා අපට ඡන්දය දුන්නා. ඡන්දය දිනපු අපි, කියපු දේවල් කළා. අපි ඡන්දයට කලින් කිව්වා, පාසල් දරුවන්ගේ පෙළ පොත්වල, පාසල් උපකරණවල මිල වැඩියි කියලා. මේ ජනවාරි මාසයේ මුල සිටම ලංකාවේ පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට ලිපි ද්‍රව්‍ය සහ පාසල් උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් 6,000 ගණනේ දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒවා වෙන ආණ්ඩු වාගේ අය වැයට දාලා ඡන්ද ගුණ්ඩු බවට පත් කර ගන්නේ නැහැ. වෙන ආණ්ඩු වාගේ ඒවා අය වැයට දාලා මිනිස්සු රවටන්නේ නැහැ. අවශ්‍යතාව තිබෙන වෙලාවේ; ජනවාරි මාසයේ ඒක දුන්නා. ඒ විතරක් නොවෙයි. ලංකාවේ දුප්පත් පවුලක දරුවෙකුට අධ්‍යාපනයෙන් ඉහළට යන්න හම්බවෙන පළමු කඩඉම පහ වසර ශිෂ්‍යත්ව විභාගයයි. මෙච්චර කාලයක් මේ රට පාලනය කරපු ඇත්තෝ වලව්කාරයෝ. ඒ අයට ශිෂ්‍යත්ව විභාගය ඕනෑ නැහැ. හැබැයි, අපේ ගම්වල දුප්පත් දරුවන්ට ශිෂ්‍යත්වය සමත්වීම තුළින් ඉහළට යන්න, නගරයේ පාසලකට යන්න පළමු දොර විවර කිරීම සිදු කරනවා. පහ වසර ශිෂ්‍යත්වය සමත් අඩු ආදායම්ලාභී පවුලක දරුවෙකුට මෙතුමන්ලා මෙච්චර කල් ගෙව්වේ රුපියල් 750යි; රුපියල් 750යි. මාලිමා රජය පළමු අය වැයෙන්ම එය දෙගුණයක් කළා, දැන් ශිෂ්‍යත්වය සමත් අඩු ආදායම්ලාභී පවුලක දරුවෙකුට රුපියල් 1,500ක් ගෙවනවා. මේ ආණ්ඩුව ආවේ නැත්නම්, පැරණි විධියටම ගියා නම්, මෙතුමන්ලා රට පාලනය කළා නම් ලංකාවේ ශිෂ්‍යත්වය සමත් දරුවන්ට මේ වැඩිවීම ලැබෙන්නේ තව අවුරුදු 150කින් විතර. ඒ විතරක් නොවෙයි. දැනට ක්‍රීඩා පාසල්වල දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වෙනුවෙන් ගෙවන්නේ රුපියල් 5,000යි. අපි දන්නවා, රටේ පවතින ජීවන වියදමත් එක්ක ගමක දරුවෙකුට රුපියල් 5,000කින් පෝෂ්‍යදායී ආහාර ලබා ගන්න බැහැ කියලා. මේ රජය පළමු අය වැයෙන්ම ඒ රුපියල් 5,000ක මුදල දෙගුණයකින් වැඩි කළා. එය, රුපියල් 10,000ක් දක්වා. ඒ වාගේම ෘෂ්ත්‍රීය අධ්‍යාපනය ලබන සිසුන්ගේ දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කළා. විශ්වවිද්‍යාල bursary එක රුපියල් 4,000 සිට රුපියල් 6,500ට වැඩි කළා, මහපොළ ශිෂ්‍යාධාරයත් රුපියල් 5,000 සිට රුපියල් 7,500ට වැඩි කළා. මේ වාගේ දීමනා දෙනකොට, ජන ජීවිතය දියුණු කරනකොට සතුටු හිතෙන්නේ නැත්තේ කුහක හිතක් ඇත්තෙකුට විතරයි.

එපමණක් නොවෙයි. මේ අය වැයේදී කළ තව විශාල වෙනස්කමක් තමයි, රට නව දිශානතියකට යොමු කිරීම. ජනාධිපති අනුර දිසානායක සහෝදරයා මේ ගරු සභාවට අය වැය ඉදිරිපත් කරමින් කිව්වා, කාසි සහ මුදල් නෝට්ටු භාවිතය අවම කිරීම සඳහා, ඒවා භාවිතය අධෛර්යවත් කිරීම සඳහා නව රජය ගන්න ප්‍රධානම ක්‍රියාදාමයන් තුනෙන් එකක් ඩිජිටල්කරණය කියලා. අපි දන්නවා, යුරෝපයේ දියුණු රටවල සියලු ගෙවීම් කරන්නේ ඩිජිටල් තාක්ෂණයෙන් බව. එනම්, online ගෙවීම්, කාඩ්පත් ගෙවීම්, චෙක්පත් ගෙවීම් වශයෙන්. අපේ රටත් ඒ මට්ටමට යා යුතුයි. එහෙම කරනකොට අයථා ක්‍රමයෙන් මුදල් හම්බ කරගෙන, කොමිස් ගහලා, මත් ද්‍රව්‍ය ජාවාරමින් මුදල් හම්බ කරලා රුපියල් 5,000 නෝට්ටුවලින් ගෙදර මුදල් ගොඩගහගෙන ඉන්න අයට තවත් කොත්තු කඩ දාන්න බැරි වෙනකොට, තවත් බුරියානි කඩ දාන්න බැරි වෙනකොට, තවත් බිස්නස් පටන් ගන්න බැරි වෙනකොට රිදෙනවා. හැබැයි, රටේ ආර්ථිකය ඩිජිටල්කරණය කළ යුතුයි. එතකොට හැම කෙනාටම බැංකු හරහා ගනුදෙනු කිරීමේ පහසුකම් ලැබෙනවා.

අපේ ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය කිව්වා වාගේ අපේ ඉතිහාසයේ පළමු වතාවට මානව ශිෂ්ටාචාරය ගමන් කරන්නේ අතීතයට නොවෙයි අනාගතයටයි. මානව ශිෂ්ටාචාරයක් ලෙස මුලින්ම අපි මානව අයිතිවාසිකම් ගැන කථා කළා, ඉන් පසු කම්කරු අයිතිවාසිකම් ගැන කථා කළා. ඉන් පසු සත්ව අයිතිවාසිකම් ගැන කථා කරනවා. දියුණු රටවල් කුඩා ජන ප්‍රජාවන් ගැන දක්වන අවධානය දියුණු රටවල ශිෂ්ටසම්පන්න බව මනින නිර්ණායකයක් ලෙස අද ලෝකය පිළිගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෙමෙදාතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු රුවන් මාපලගම මහතා
(මාණ්පුමිකු රුවන් මාපලකම)
(The Hon. Ruwan Mapalagama)
පළමු වතාවට තමයි ඔටිසම් රෝගයෙන් පෙළෙන දරුවෝ පිළිබඳව, ස්නායු ආබාධ සහිත දරුවෝ පිළිබඳව, විශේෂ හැකියා සහිත පුද්ගලයන් පිළිබඳව, පුනරුත්ථාපනයේ සහ රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉන්න ළමයින් පිළිබඳව අය වැය කථාවකින් කියැවෙන්නේ.

මෙහෙම කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. යම් පිරිසක් යාපනයේ පුස්තකාලයට ගිනි තැබුවා. මාලිමා අය වැයෙන් තමයි රුපියල් මිලියන 100ක් වෙන් කරන්නේ ඔවුන් ගිනි තැබූ පුස්තකාලයට නැවත පොත් දෙන්න, පරිගණක පහසුකම් දෙන්න. මෙතෙක් කල් මේ පාර්ලිමේන්තුවේ අය වැය යෝජනාවලදී අත්පොළසන් දුන්නේ තමන්ගේ වරප්‍රසාද වැඩි කරගෙන, තමන්ගේ වරදාන වැඩි කරගෙනයි. ඉතිහාසයේ පළමු වතාවට තමන්ගේ වරප්‍රසාද අඩු කරගෙන, වරප්‍රසාද නැති කරගෙන, වාහන පර්මිට් නැති කරගෙන මන්ත්‍රීවරුන් ජනතාව එක්ක අත්පොළසන් දෙනවා, ජනතාව වෙනුවෙන් ගෙනා මේ අය වැයට.

මට පෙර කථා කළ ගරු වාමර සම්පත් දසනායක අපේ හිතවත් මන්ත්‍රීතුමා කිව්වා, ගමට යන්න බැහැ, අපි පරදිනවා කියලා. ඔව්, ඒ ගැන අපි දන්නවා. අපි හැම දාම ඉන්න ආවේ නැහැ. ඔබතුමන්ලා වාගේ අපි මේවා පාරම්පරික බූදල් විධියට තියාගන්නේ නැහැ. අපි යනවා. හැබැයි, මේ මාලිමා ආණ්ඩුව යන්නේ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදලායි. "දේශපාලනය" හම්බ කරන වෘත්තියක් නොකර, මහජන සේවයක් කළාට පස්සේ අපේ වගකීම ඉටු කරලා අපි යනවාය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෙමෙදාතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Next, the Hon. Thurairasa Ravikaran. You have seventeen minutes.

[ப.ப. 2.55]

ගරු තුරෙරාසා රවිකරන් මහතා
(මාණ්පුමිකු තුරෙරාසා රවිකරන්)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மன்னார் தீவுப் பகுதியில் மக்களுடைய விருப்பத்திற்கு மாறாகக் கனிய மணல் அகழ்வுச் செயற்பாடு நடைபெறுகின்றது; அது உடனடியாக நிறுத்தப்படல் வேண்டும். மன்னார் தீவுப் பகுதியென்பது மிகவும் குறுகிய, கடல் மட்டத்திலிருந்து மிகவும் தாழ்வான நிலப்பகுதியென்பதனால் மழைக் காலத்தில் நீர் வடிந்தோட முடியாத நிலை காணப்படுவதால், பொதுமக்கள் தொடர்ந்தும் இடம்பெயரவேண்டிய துர்ப்பாக்கிய நிலையிலுள்ளனர். இயற்கை அனர்த்தத் தாங்குதிறன் கொண்டதாகத் தீவுப்பகுதியின் தரைத்தோற்ற அமைவிடம் இல்லை. அதனால்தான் மன்னார் தீவில் 3 மாடிகளுக்குமேல் கட்டடம் அமைப்பதற்கு நகர அபிவிருத்தி அதிகாரசபை அனுமதி வழங்குவதில்லை. ஆகவே, இப்பகுதியில் கனிய மணல் அகழ்வென்பது பொதுமக்களுக்குப் பாரதூரமான விளைவுகளை ஏற்படுத்தும். மத்திய சுற்றாடல் அதிகாரசபையின் தலைமையின்கீழ் 23 அரச திணைக்களங்கள் இரண்டுமுறை மன்னார் தீவுப் பகுதிக்குச் சென்று கள ஆய்வு மேற்கொண்டு, சுற்றுச்சூழல் தாக்க மதிப்பீட்டு அறிக்கை வழங்குவதற்குரிய ஏற்பாட்டைச் செய்தபோதிலும், மக்களின் பாரிய எதிர்ப்புக் காரணமாக அதனை மேற்கொள்ளமுடியாத நிலைமை காணப்பட்டது.

நேற்றைய தினம் மன்னார் நீதிமன்றத்தில் பொலிஸார்மூலம் போராட்டத்திற்கு எதிரான தடையுத்தரவைப் பெற்றுக்கொண்டு, நாளைய தினம் அப்பகுதியில் கள ஆய்வை மேற்கொள்ளவிருக்கின்றார்கள்; இது உடனடியாகத் தடுத்து நிறுத்தப்பட வேண்டும். அந்த மக்களுடைய விருப்பமில்லாமல் தனியார் காணிகளுக்குள் அத்துமீறி உட்புகுந்து இந்த ஆய்வை மேற்கொண்டு தனியார் நிறுவனங்களுக்குக் கனிய மணல் அகழ்வுக்கு அனுமதி வழங்குவதென்பது அந்த மக்களுக்குச் செய்யும் மிகப்பெரிய துரோகமாகும். எந்தத் திட்டமாகவிருந்தாலும் மக்களுடைய விருப்பமின்றிச் செயற்படுத்த முடியாது. இதற்கெதிராக மக்கள் பாரியளவில் போராட்டத்தை முன்னெடுக்கக்கூடிய சூழ்நிலை நிலவுவதால் ஆபத்தான நிலைமை தோன்றலாம்; சட்டம், ஒழுங்குப் பிரச்சினை ஏற்படக்கூடிய வாய்ப்புள்ளது. ஆகவே, மத்திய சுற்றாடல் அதிகாரசபையும் ஏனைய திணைக்களங்களும் நாளைய கள விஜயத்தை நிறுத்த வேண்டுமென இந்த உயரிய சபையினூடாகக் கோரிக்கை விடுகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது தொடர் கோரிக்கையை ஏற்று, எம்மோடு தானும் நொந்துபோன இறுதிப் போரின் சாட்சியமான வட்டுவாகல் பாலத்தைப் புதிதாக நிர்மாணம் செய்வதற்கான நிதி ஒதுக்கீட்டை 2025ஆம் ஆண்டின் வரவு செலவுத்திட்டத்தில் ஏற்படுத்திய மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கு மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். இக்கோரிக்கை நிறைவேறிய இப்பொழுதிலே இன்னமும் நாங்கள் பல வழிகளிலும் பசித்துள்ளோம் என்பதையும் இந்தப் பேரவையில் பதிவுசெய்கிறேன்.

அடுத்ததாக நான் சுகாதாரத்துறை சம்பந்தமாகக் கதைக்க எண்ணுகின்றேன். நான் வன்னித் தேர்தல் மாவட்டத்தைச் சார்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினர். முல்லைத்தீவு மாவட்டத்தில் சுகாதாரத் துறையின் மேம்பாடு ஆழ்ந்து நோக்கப்பட வேண்டிய ஒன்று. இன்றளவும் பல குறைகள் கொண்டதாக முல்லைத்தீவு மாவட்டத்தின் சுகாதாரப் பகுதி காணப்படுவதை இந்தப் பேரவையில் தெரிவித்துக்கொள்ள விரும்புகிறேன். மருத்துவருக்காகக் காத்திருந்து காத்திருந்து அல்லற்படுகின்ற நோயாளிகள், பல பிரதேச மருத்துவமனைகளையும் நிறைக்கின்றார்கள். எனவே, எங்களது தேவையை, மாவட்டப் பொது மருத்துவமனைக்கான தேவையாகவும் முல்லைத்தீவு பிராந்திய சுகாதார சேவையின் தேவையாகவும் இங்கு முன்வைக்க விரும்புகின்றேன்.

[ගරු තුරෙරාසා රවිකරන් මහතා]

මාවට්ටப් பொது மருத்துவமனை சார்பாக, நிரந்தர மருத்துவ விடுதிக்கான தேவை, உள்ளகப் பயிற்சி மருத்துவர்களுக்கான தேவை என்பன நிறைவேற்றப்படுவது மிக முக்கியமானது. மேலும், முல்லைத்தீவு பிராந்திய சுகாதார சேவை தொடர்பில் நோயாளர் காவு வண்டிக்கான உடனடித் தேவை, சுகாதார வைத்திய அதிகாரிக்கான வாகனத் தேவை, ஆளணி மீளாய்வின் தேவை, ஆளணி வெற்றிடங்களை நிரப்புதல் உள்ளிட்ட தேவைகள் நிறைவேற்றப்படுவது இன்றியமையாததாகக் காணப்படுகின்றது.

முல்லைத்தீவு மாவட்டப் பொது மருத்துவமனையானது இம்மாவட்டத்துக்கான மூன்றாம்நிலை மருத்துவ சேவைகளை வழங்கிவரும் ஒரேயொரு மருத்துவமனையாகும். தற்போது இம்மருத்துவமனை உள்ளகப் பயிற்சி மருத்துவர்களைப் பெறுவதில் கணிசமான பல இடர்பாடுகளை எதிர்நோக்கியுள்ளது. நாட்டின் ஏனைய மாவட்டப் பொது மருத்துவமனைகளைப் போலல்லாது, எமது மாவட்டப் பொது மருத்துவமனையானது உள்ளகப் பயிற்சி மருத்துவர்களின் வசதிகளற்ற ஒன்றாகவே காணப்படுகின்ற நிலையானது எங்களது இயலுமையைப் பாதிப்பதுடன் ஏனைய மருத்துவத்துறைப் பணியாளர்களின் பணிச் சுமையையும் அதிகரிக்கிறது. ஒரு மருத்துவமனையில் உள்ளகப் பயிற்சி மருத்துவ வசதிகளைத் தொடங்குவதற்குக் குறைந்தபட்சம் நான்கு சபைத் தராதரம் மிக்க மருத்துவ நிபுணர்கள் அங்கு பணியாற்ற வேண்டும். தற்போது இம்மருத்துவமனையில் அத்தகைய தராதரம் மிக்க இரண்டு மருத்துவ நிபுணர்கள் - ஒருவர் பொது மருத்துவர், மற்றவர் குழந்தை நல மருத்துவர் - மாத்திரமே கடமையாற்றுகின்றார்கள். பெண் நோயியல், மகப்பேறு மற்றும் சத்திரசிகிச்சைத் துறை மருத்துவ நிபுணத்துவ சேவைகள் போன்ற ஏனைய இரண்டு மருத்துவத் துறைகளுக்குமான சேவைகளை ஏனைய மாவட்டத்தில் இருந்தே தற்காலிக அடிப்படையில் பெற்றுக்கொள்ள வேண்டியுள்ளது.

உள்ளகப் பயிற்சி மருத்துவர்களைக் கொண்டிருத்தலானது, மருத்துவப் பயிற்சி வழங்கும் தன்மையை மேம்படுத்துவதுடன், நோயாளர் பராமரிப்பிலும் மேன்மையை ஏற்படுத்தும். தங்களின் அலுவலகம்மூலம் இதற்காக எடுக்கப்படக்கூடிய நடவடிக்கைகள் பற்றி நான் சுகாதார அமைச்சரிடம் குறிப்பிட விரும்புகின்றேன். வெகுவிரைவில் உள்ளகப் பயிற்சிக்கான நியமனங்களைப் பெறுவதற்கு ஒரு பெரிய எண்ணிக்கையிலான மருத்துவர்களின் அணி - அண்ணளவாக 1,500க்கும் அதிகமானோர் - தயாராக உள்ளனர்.

முல்லைத்தீவு மாவட்டப் பொது மருத்துவமனையையும் உள்ளக மருத்துவப் பயிற்சி வழங்கும் மருத்துவமனைகளின் பட்டியலில் உள்ளடக்க நடவடிக்கை மேற்கொள்ளுதல் வேண்டும். உள்ளகப் பயிற்சி வசதிகளைத் தொடங்குவதற்குத் தேவையான மீதி இரண்டு மருத்துவத் துறைகளின் - பெண் நோயியல் மற்றும் மகப்பேறு, சத்திரசிகிச்சைத் துறை - நிபுணர்களை நியமனம் செய்ய வேண்டும். இந்நியமனங்கள் உரிய முன்னுரிமையுடன் சுகாதார அமைச்சினால் வழங்கப்பட வேண்டும்.

நிரந்தர மருத்துவ நிபுணர்களின் சேவைகள் இம்மாவட்ட -

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
Madam, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මන්ත්‍රීතුමා.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ உறுப்பினர் ரவிகரன் அவர்களின் கோரிக்கை தொடர்பான விடயமாக, சென்ற வாரம் நானும் பிரதி அமைச்சர் உபாலி சமரசிங்க, கௌரவ பாராளுமன்ற உறுப்பினர் (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன் ஆகியோரும் முல்லைத்தீவு மாவட்ட மாஞ்சோலை வைத்திய சாலைக்கு நேரடியாகச் சென்று பார்வையிட்டு, அங்கு பல்வேறுபட்ட குறைபாடுகளை இனங்கண்டிருக்கின்றோம். எதிர்வரும் காலங்களில் நாங்கள் அதுதொடர்பாக முக்கிய கவனம் செலுத்த இருப்பதோடு, வீட்டுத்தொகுதி மாதிரியான 2 கட்டிடத் தொகுதிகளைத் தற்காலிகமாக அவர்களுக்குப் பெற்றுக் கொடுப்பதற்குரிய ஒழுங்குகளை மேற்கொண்டிருக்கின்றோம். அதனைப் பெற்றுக்கொடுப்பதற்கு மன்னார் மாவட்ட அரசாங்க அதிபர் உதவி செய்வதாகக் கூறியிருக்கின்றார். எனவே, நாங்கள் நிச்சயமாக எங்களுடைய சுகாதார அமைச்சரின் கவனத்திற்கு இதனைக் கொண்டுவந்து, மாஞ்சோலை வைத்தியசாலைக்கான தேவையினை இயன்ற வரை பூர்த்தி செய்வதற்கு எண்ணியுள்ளோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සභාවේ point of Order එකක් ඉදිරිපත් කරන ක්‍රමයක් තිබෙනවා. එතුමාට point of Order එක ඉදිරිපත් කරන්න අවස්ථාව දුන්නේ කොහොමද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි ඒක නවත්වන්න කියලා ඒ ගරු මන්ත්‍රීතුමාට මම උපදෙස් දුන්නේ. ඒ අනුව එතුමා ඒක නැවැත්වුවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු රවිකරන් මන්ත්‍රීතුමා එතුමාගේ නම සඳහන් කළේ නැහැ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙරාසා රවිකරන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු රවිකරන් මන්ත්‍රීතුමා එතුමාගේ නම සඳහන් කළේ නැහැ. නම සඳහන් නොකර එහෙම අවස්ථාවක් දෙන්න බැහැ. ඒක කවුරු කළත් වැරදියි.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, என்னுடைய நேரத்தைக் குறைக்கவேண்டாம் என்று கேட்டுக்கொள்கின்றேன்.

நன்றி, கௌரவ உறுப்பினர் ஜெகதீஸ்வரன் அவர்களே! தாங்கள் பார்வையிட்டது சரி, உரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என்பதுதான் எங்களுடைய கோரிக்கை. இந்தக் கோரிக்கைகளை நான் கௌரவ சுகாதார அமைச்சர் அவர்களிடமும் வலியுறுத்தியிருக்கிறேன்; உரிய கடிதங்களையும் கொடுத்திருக்கின்றேன். கௌரவ பிரதம அமைச்சரிடமும் அவருடைய அலுவலகத்திற்குச் சென்று குறித்த கடிதங்களை வழங்கியிருக்கின்றேன். குறித்த கடிதங்களின் பிரதிகளைக் கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர் கௌரவ உபாலி சமரசிங்க அவர்களிடமும் இன்று பாராளுமன்ற உறுப்பினர் கௌரவ (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன் ஊடாக ஒப்படைத்திருக்கின்றேன். இந்த விடயங்கள் நிறைவேற்றப்பட வேண்டும் என்பதே எங்களுடைய வேண்டுகோளாகும்.

நான் மேலும் சில கருத்துகளைச் சொல்லிவைக்க விரும்புகின்றேன். தற்போது மாவட்டப் பொது மருத்துவமனை, முல்லைத்தீவில் நிரந்தர மருத்துவ விடுதிக் கட்டடங்கள் எதுவும் இல்லாது தற்காலிகக் கட்டடங்களிலேயே இயங்கி வருகின்றது. ஆண்கள் விடுதிக் கட்டில்களின் எண்ணிக்கை 23 ஆகவும், பெண்கள் விடுதிக் கட்டில்களின் எண்ணிக்கை 19 ஆகவும் மட்டுப்படுத்தப்பட்டுக் காணப்படுகின்றது. விசேட சிகிச்சைப் பிரிவுகளை உள்ளடக்க முடியாமையால் இந்தப் பிரச்சினை மேலும் தீவிர நிலையை அடைந்துள்ளது. நோயாளர்கள் அனைவரையும் உள்ளடக்க முடியாததால் அவர்களை வரவேற்பு அறைகளிலும் விறாந்தைகளிலும் நிலத்திலும் படுக்க வைக்க வேண்டிய நிலை உள்ளது. நிலப்பரப்பும் குறைவாக உள்ளதால் நோயாளர் பராமரிப்பு மேலும் மோசமான நிலையில் உள்ளது.

2017 - 2018 காலப்பகுதியில் இந்திய அரசின் உதவியுடன் மருத்துவ விடுதிக் கட்டடம் அமைப்பதற்கான திட்டம் தொடங்கப்பட்டது. எனினும் அத்திட்டமானது மிகவும் தேக்க நிலையை அடைந்து, 2024 இறுதியில் மண் பரிசோதனை செய்யும் அளவுக்கே முன்னேற்றம் கண்டுள்ளது. மாவட்டத்தின் தற்போதைய நெருக்கடி நிலை மற்றும் அதிகரித்துவரும் தேவைகளைக் கருத்திற்கொண்டு இந்த மருத்துவ விடுதித் தொகுதியின் கட்டுமானத் திட்டத்தை விரைவுபடுத்துமாறு கேட்டு நிற்கின்றோம்.

நான்கு நோயாளர்கள் காவு வண்டிகளுடன் இயங்கிவருகின்ற முல்லைத்தீவு மாவட்டப் பொது மருத்துவ மனைக்கு, அங்கிருந்து நோயாளர்களை மேற்சிகிச்சைக்காக உயர் மருத்துவமனைகளான யாழ்ப்பாணம், அநுராதபுரம் மற்றும் கொழும்பு போன்ற இடங்களுக்கு உடனடியாக மாற்றுவதற்கு இந்நோயாளர் காவுவண்டிகள் இன்றியமை யாதவையாகும். அங்குள்ள இந்த வண்டிகள், இரண்டு இலட்சம் கிலோமீற்றர் தொடக்கம் எட்டு இலட்சம் கிலோமீற்றர் வரையான தூரங்களை ஓடிக்கடந்தவைகளாக, கனதியான பாவனை கொண்டவையாகக் காணப்படுகின்றன. இதன் காரணமாக அடிக்கடி பழுதுகள் ஏற்படுவதால், நோயாளர் காவு வண்டிகளின் சேவை அடிக்கடி தடைப்பட்டு, நோயாளர் மாற்றத்தினை மேற்கொள்வதில் பாரிய இடர்நிலைகளையும், தாமதங்களையும் எதிர்கொள்ள வேண்டியுள்ளது.

அடுத்து, மருந்துக் கலவையாளர் வெற்றிடங்கள் தொடர்பாக எடுத்துக்கொண்டால், மருந்துக் கலவையாளர்கள் சுகாதார சேவையில் முக்கிய இடம் வகிக்கின்றார்கள். மருந்து வழங்கல், சத்திரசிகிச்சைப் பொருட்கள், மருத்துவப் பொருட்கள் என்பவற்றின் பொருட் பதிவேட்டைப் பேணுதல், மருந்துக் கையிருப்பைப் பேணுதல், மருந்துக் களஞ்சியத்தைப் பேணுதல் என்பன அவர்களின் முக்கிய பணியாகும். முல்லைத்தீவு மாவட்டத்தில் மருந்துக் கலவையாளர் ஆளணி 34 ஆகும். ஆயினும், தற்போதுள்ள மருந்துக் கலவையாளர் களின் எண்ணிக்கை வெறும் 13 மட்டுமேயாகும். ஐந்து ஆண்டுகளுக்கும் மேலாக மருந்துக் கலவையாளர்களுக்கான ஆட்சேர்ப்புப் பயிற்சிநெறிகள் சுகாதார அமைச்சினால் மேற்கொள்ளப்படவில்லை. எமது சில மருத்துவமனைகளின் மருந்துக் கலவையாளர்களின் பணியானது, மருத்துவ அதிகாரி யின் மேற்பார்வையில் வேறு ஊழியர்களாலேயே மேற்கொள்ளப்படுகின்றது. இந்த நிலை நோயாளர் பாதுகாப்பு மற்றும் தரம் என்பவற்றில் பாரதூரமான விளைவுகளை ஏற்படுத்துமென்பதைத் தெரிவித்துக் கொள்கின்றேன்.

புதுக்குடியிருப்பு ஆதார வைத்தியசாலையானது கேந்திரமுக்கியத்துவமான இடத்தில் அமைந்துள்ளதுடன், இம்மாவட்டத்தின் மூன்றிலொரு பங்கு சனத்தொகைக்கான சேவைகளை வழங்கி வருகின்றது. ஆயினும், இம்மருத்துவ மனையில் மருத்துவ நிபுணர்களின் சேவைகள் மற்றும் முக்கிய துணை மருத்துவப் பணிகளான மருத்துவ ஆய்வுகூடத் தொழில்நுட்பவியலாளர் மற்றும் எக்ஸ் - கதிர் படப்பிடிப்பாளர் ஆகியோர் இல்லாத நிலையே காணப்படுகின்றது.

மாங்குளம் ஆதார மருத்துவமனையானது ஒரு "A" தரத்திலான ஆதார வைத்தியசாலையாகும். மாகாணத்திற்குரிய புனர்வாழ்வு மருத்துவ அலகினையும் இது கொண்டுள்ளது. A-9 நெடுஞ்சாலையில் கேந்திர முக்கியத்துவமான இடத்தில் இது அமைந்துள்ளதால், இம்மருத்துவமனை முக்கியத்துவம் பெறுகின்றது. நெதர்லாந்து அரசின் அண்மைய செயற்றிட்டத்தின்மூலம் இதன் சேவைப் பரப்பு இன்னும் கணிசமாக விரிவடைந்து தரமான நோயாளர் சேவை இடம்பெறுகின்றது. இது ஒரு "A" தரத்திலான ஆதார மருத்துவமனையாக இருப்பதால், அனைத்து முக்கிய மருத்துவ நிபுணத்துவ சேவைப் பிரிவுகளும் துணை மருத்துவ சேவைகளும் இங்கு அமைதல் வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one more minute, Madam.

இந்த ஆதார மருத்துவமனையானது மகப்பேற்று மருத்துவர், குழந்தைகள் சிகிச்சை நிபுணர், மூட்டுவாத சிகிச்சை நிபுணர் மற்றும் முக்கிய துணை மருத்துவப் பணிகளான இயன் மருத்துவ சிகிச்சையாளர் மற்றும் எக்ஸ் - கதிர் படப்பிடிப்பாளர் என்போரின் சேவைகள் இல்லாத நிலையிலேயே தற்போது இயங்கி வருகின்றது.

அளம்பில் பிரதேச வைத்தியசாலைக்கான நோயாளர் காவு வண்டி மற்றும் மணலாறு சுகாதார வைத்திய அதிகாரிக்கான வாகனத் தேவை -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
ஒரு நிமிடத்தில் முடித்துக்கொள்கிறேன்.

අළම්පිල් ප්‍රාදේශීය රෝහලේ ඔරු නෝයාළර් කාවු වණ්ඩි ඉල්ලාමලේයේ ඉයංකි වරුකින්රතු. ඉතු මුල්ලෛත්තීවිලිරුන්තු 20 කිලෝමීට්රර් තොලෛවිල් උළ්ළතු. ඉම්මරුත්තුව මනෛක්කාන නෝයාළර් කාවු වණ්ඩිච් සේවෛකළ් ඉතර මරුත්තුවමනෛකළාන 22 කිලෝමීට්රර් තූරත්තිල් උළ්ළ කොක්කිළාය් ප්‍රාදේශීය මරුත්තුවමනෛ, 35 කිලෝමීට්රර් තූරත්තිල් උළ්ළ සම්පත්නුවර ප්‍රාදේශීය මරුත්තුවමනෛ ආකියවට්රින් කාවු වණ්ඩිකළ් මූලමාකවේ මේර්කොළ්ළප්පටුකින්රතු. තයවුසෙය්තු සුකාතාර අමෛච්චර් අවර්කළ් ඉවට්රෛක් කවනත්තිලෙටුත්තු, ඉන්තත් තේවෛයෛ නිච්චයමාක නිරෛවේට්රිත් තරවේණ්ටුම්. ඉතනෛ අවර් සෙය්යමාට්ටාර් එන්රු නාන් සොල්ලවිල්ලෛ. සුකාතාර අමෛච්චරෝටු නාන් නේරඩියාක කතෛත්තපෝතු අවර් නිච්චයමාක ඉතුපට්රික් කවනමෙටුප්පතාකත්තාන් සොල්ලි යිරුන්තාර්. ඉතුපට්රිය එනතු කෝරික්කෛකළින් ප්‍රතිකළෛක් කෞරව ප්‍රතම අමෛච්චරුක්කුම් එංකළුටෛය මාවට්ට අපිවිරුත්තික් කුළුත් තලෛවරාන කූට්ටුරවු අපිවිරුත්තිප් ප්‍රති අමෛච්චර් කෞරව උපාලි චමරසිංහ අවර්කළිටමුම් කොටුත්තුළ්ළේන්. තයවුසෙය්තු ඉන්ත උතවිකළෛච් සෙය්තු, මුල්ලෛත්තීවු මාවට්ටත්තින් වෛත්තිය සේවෛයෛච් සීරාක්කුමාරු කේට්ටුක් කොළ්කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.

[අ.භා. 3.14]

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අය වැය ජාතික ජන බලවේගයේ අය වැයක් කියලා කියනවාට වඩා පුරවැසි අය වැයක් කියලා අපට සඳහන් කරන්න පුළුවන්. ඒ ඇයි? ජාතික ජන බලවේගයේ රජය බලයට පත් වෙලා අපට තිබුණා, මේ රටේ ජනතාවගේ අභිලාෂයන් ජයග්‍රහණය කර දෙන්න. අවුරුදු 76ක් මේ රට පාලනය කරපු උදවිය මේ රට පාලනය කරපු හැටි අපි දැක තිබෙනවා. ඒ පාලකයෝ සහ ඒ පාලකයෝ වටා සිටි කණ්ඩායම්වල සුබසිද්ධිය සඳහා තමයි අය වැය ඉදිරිපත් කර තිබුණේ. නමුත් අද අපි මේ දකින්නේ අපේ සාමාන්‍ය පන්තියේ ජනතාවගේ ජීවිත නඟා සිටුවන්න හදපු අය වැයක්. විශේෂයෙන් මේ අය වැය ග්‍රාමීය ජන ජීවිතය නඟා සිටුවන්න විශාල මුදලක් වෙන් කරපු අය වැයක් කියලා මම කියන්න කැමැතියි.

ජාතික ජන බලවේගයේ අපි බලාපොරොත්තු වුණේ මොකක්ද? අපි බලාපොරොත්තු වුණා, මේ රටේ අවුරුදු 30ක ඊළාම් යුද්ධය, අවුරුදු 14ක මුස්ලිම් විරෝධය වැනි තත්ත්වයන් මේ රටේ ඇති වෙන්න හොඳ නැහැ කියලා. අපේ රට ජාතිවාදී කෝලාහලවලින් මුදා ගෙන ජාතීන් අතර සමඟිය ඇති කරලා, මේ රටේ දූෂණය, වංචාව නැති කරලා, නාස්තිය නැති කරලා මේ රටේ සම්පත් ආරක්ෂා කරගෙන, ඒවා නිසි පරිදි පාවිච්චි කරගෙන මේ රට ඉස්සරහට ගෙන යන්න ඕනෑ. ඒ වාගේම හැකියාවන් අඩුවෙන් තිබෙන අහිංසක ජනතාව, එහෙම නැත්නම් පාලකයෝ කොන් කරපු ඒ සමාජය ඉස්සරහට ගෙනෙන්න තමයි ජාතික ජන බලවේගයට අපේ රටේ ජනතාව මේ වරම දුන්නේ. අද අපි සතුටු වෙනවා, මොකද මේ අය වැයේදි පාලකයෝ, අපි පටි තද කරගත්තා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට මේ අය වැයෙන් කිසිම දෙයක් වෙන් කරගත්තේ නැහැ. හැබැයි, එහෙම වෙන් කර ගත්තේ නැති වුණත් අපේ ජනතාවට විශාල සේවයක් කරන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා.

ජාතික ජන බලවේගයේ රජයෙන් මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා හොඳ සෞඛ්‍ය පද්ධතියක්. මේ අය වැය, ඉතිහාසයේ කවදාවත් නැති තරමට සෞඛ්‍ය සේවය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරපු අය වැයක්. ඒ විතරක් නොවෙයි, සෞඛ්‍යයට වාගේම හොඳ අධ්‍යාපන පද්ධතියක් සකස් කිරීම වෙනුවෙනුත් ඉතිහාසයේ කවදාවත් නැති තරමට ලොකු මුදලක් වෙන් කරපු අය වැයක්, මේක. අපේ රටේ පාසල් 10,191ක් තිබෙනවා. ඒ පාසල් 10,191ට අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ගුරුවරු 221,698ක්, ළමුන් මිලියන 4.1ක් ඉන්නවා. රුපියල් කෝටි 4,500ක් ඒ පාසල් ළමුන් වෙනුවෙන් මේ රජය වෙන් කරලා තිබෙනවා.

අපේ රටේ විශාල පිරිසක් භාවිත කරන්නේ ලංගම බස් රථ හා පෞද්ගලික බස් රථ. ඒ වාගේම කෝච්චිය. අපි අලුතෙන් බස් රථ 600ක් ගෙන්වන්නත්, අපේ දුම්රිය සේවය ඉතා කාර්යක්ෂම කරන්නත් අලුත් එන්ජින් සහ අලුත් දුම්රිය කට්ටල ගෙනෙන්නත් මෙම අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

ඊළහට, ග්‍රාමීය පාරවල් සහ පළාත් සභා පාරවල් ගැන වැඩි අවධානයක් යොමු කරලා, අපි ග්‍රාමීය ජනතාවගේ ජීවිතය නඟා සිටුවන්න හොඳ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මෙම අය වැය හොඳයි කියන අපේ සමහර ගරු මන්ත්‍රීවරුන් සමහර තැන්වල වරද්දා ගන්නවා. එක්තරා මන්ත්‍රීවරයෙක් කියනවා, "අපේ ප්‍රදේශයට මුදල් වෙන් කරලා නැහැ, අපේ පළාතට මුදල් වෙන් කරලා නැහැ" කියලා. අපි එහෙම කථා කරන්න අවශ්‍ය නැහැ. මොකද, මේක ලංකාව. මේ අපේ රට.

අපේ රටේ උතුරු පළාතේ, නැහෙනහිර පළාතේ, විශේෂයෙන් කඳුකර පළාත්වල ජනතාවට බොහෝ අඩු පාඩු තිබෙනවා. එම ජනතාව ජීවිතය කියන එක මොකක්ද කියලාවත් දන්නේ නැහැ. විශේෂයෙන් උතුරේ කඳුකර ප්‍රදේශයේ ජනතාව. මම පසුගිය බ්‍රහස්පතින්දා රිදීගම, රෑද්දගොඩ කියන ලයිම් කාමර තිබෙන ප්‍රදේශයට සාකච්ඡාවකට ගියා. එම සාකච්ඡාවේදී මතු වුණේ, වතුවල වැඩ කරන අභිංසක දමිළ ජනතාවගේ ගැටලු. එම අවස්ථාවේ සිටි අයගෙන් කෙනෙකු නැඟිටලා කථා කළා. ඔහු දමිළ භාෂාවෙන් කථා කළේ. ඔහු කිව්වා, "අයියා, අපි මේ රටට විදේශ විනිමය ගෙනෙන්න විශාල සහයෝගයක් දෙනවා. ටීවීවල කථා කරද්දී අපි ගැන ඉහළින් කථා කරනවා. අපි තමයි මේ රටේ ඉන්න විශේෂ පුද්ගලයෝ කියලා කියනවා. නමුත්, ඇත්ත ජීවිතයේදී අපව කවුරුත් ගණන් ගන්නේ නැහැ. අපි ළඟ කවුරුවත් වාඩි වෙන්නේ නැහැ. පාසලට යන්න බැහැ, අපේ ළමුන්ව කොන් කරනවා. Hospital එකකට යන්න බැහැ, එතැනදීත් අපව කොන් කරනවා. පොලීසියේ ද, ප්‍රාදේශීය සභාවේ ද ඒ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. අඩුම ගණනේ අපේ ගෙවල්වලට ලියුමක්වත් ගෙන්වා ගන්න බැරි අසරණ ජනතාවක් තමයි අපි" කියලා.

ඒ විතරක් නොවෙයි. "රම්බඩගල්ල ජාතික පාසල තිබෙනවා. එතැනින් එහා දෙමළ මාධ්‍ය පාසලක් තිබෙනවා, පානගමුව අන්නූර් මධ්‍ය මහා විද්‍යාලය කියලා. රම්බඩගල්ල ජාතික පාසල ළඟට ලංගම බස් රථයක් යනවා. එතැන් සිට කිලෝමීටර තුනක් එහායින් තිබෙන පානගමුව අන්නූර් මධ්‍ය මහා විද්‍යාලයට ළමුන් එක්ක ගෙන යන්නේ නැහැ. අපේ ළමුන් 200ක් එම පාසලට යනවා. අපට තිබෙන මේ දුක කවුද නැති කරන්නේ?" කියලා ඒ අය අහනවා. ග්‍රාම නිලධාරීන් ඉන්නවා, සංවර්ධන නිලධාරීන් ඉන්නවා. ඒ අය ගමට එන්නේ නැහැ කියනවා. අම්මලා තාත්තලා; වයසක උදවියත් එම නිලධාරීන් හොයා ගෙන යන්න ඕනෑ තත්ත්වයක් තිබෙනවා කියා ඒ අය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය නැති වෙන්න ඕනෑ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් තුළ මීන් පස්සේ අපේ රටේ කිසිම කෙනෙකු පෞරුෂයක් නැති, කොන්ද කැඩුණු, කොන් වුණු තත්ත්වයෙන් ජීවත් වෙන්න ඕනෑ නැහැ. එම ජනතාවට මම පොරොන්දු වුන්නා, "ඔබේ ගමට ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී අනිවාර්යයෙන් සතියට දවසක් පැමිණෙයි" කියා. මම ප්‍රාදේශීය ලේකම්තුමා එක්කත් කථා කළා.

ඒ වාගේම රිදීගම ලංගම ඩිපෝවේ ස්ථානභාර නිලධාරි එක්කත් මම සාකච්ඡා කළා. ඊයේ -සඳුදා- ඉඳලා එම බස් රථය පානගමුව අන්නූර් මධ්‍ය මහා විද්‍යාලය දක්වා ධාවනය වනවා. ඊළඟට, රිදීගම තැපැල් ස්ථානාධිපතිතුමිය එක්කත් මම සාකච්ඡාවක් යොදා ගෙන තිබෙනවා. ඒ ජනතාවගේ ගෙදරට ලියුමක්වත් එන්නේ නැති නම් මොකක්ද ඒ අය ගෙවන ජීවිතය? උකස් භාණ්ඩ වෙන්දේසි කරනවා කියන ලියුමක් වෙන්න පුළුවන්; පත්වීම් ලියුමක් වෙන්න පුළුවන්; නැත්නම් වෙන report එකක් එනවා වෙන්න පුළුවන්. ඒ සියලු දේවල් තැපැල හරහා සිදු වෙන්නේ. ඒවා ඒ අයට ලැබෙන්නේ නැත්නම් ඒ අය ඉතාම අසරණ තත්ත්වයකට පත් වෙනවා. මෙවැනි සිදුවීම් අපේ රජයක් තුළ මීන් පසුව සිදු වන්න බැහැ. මොකද, අපට වරම ලැබුණේ මුස්ලිම්, සිංහල, දෙමළ සියලු ජනතාවගෙන්. මේ කිසිකෙනෙකු මේ රටේ කොන් වෙලා ජීවත් වෙන්න ඕනෑ නැහැ.

අපි ඒ ජනතාවට රැකවරණය දෙන්න ඕනෑ. මම අපේ ප්‍රදේශයේ ජනතාවට නම් කිව්වා "ඔබ අපිට භාරයි" කියලා. අපි ඒ වගකීම ගන්නවා. ජනාධිපතිතුමා රටේම වගකීම අරගෙන තිබෙන්නේ. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට අපේ ප්‍රදේශයේ සියලු දේවල්වලට මා වග කියනවා කියලා මම වගකීමෙන් කියන්න කැමතියි. ඒ වාගේම අනෙකුත් ආයතනවල ප්‍රධානීන් ද ඒ වගකීම අරගෙන ජනතාවට හොඳ සේවයක් කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අපි ඒ සේවය ඉෂ්ට කරන්න ඕනෑ.

විශේෂයෙන් කුරුණෑගල ප්‍රදේශයෙන් ආපු මම කුරුණෑගල ප්‍රදේශයේ ජනතාවට යමක් කියන්න කැමතියි. කාලයක් මීරිගම-කඩවත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් නවතා තිබුණා. ඒ ව්‍යාපෘතිය අපි මේ අවුරුද්දේ පටන් ගන්නවා. ඒ වාගේම, පොල්ගහවෙල-රඹුක්කන ද්විත්ව දුම්රිය මාර්ගය ස්ථාපිත කරන්නත් අපි ලෑස්ති වෙලා ඉන්නවා.

මම තවත් කාරණයක් කියන්න කැමතියි. අප මේ අය වැයෙන් කියන්න යන්නේ මොකක්ද කියන එක ගැන, අපේ ජන වරම ගැන තේරුම් ගන්නේ නැතිව විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේ අය වැය දේශපාලනය කරන්න යොදා ගන්න හදනවා මම දැක්කා. මේක අපේ ප්‍රතිපත්තියට අනුකූලව හදපු අය වැයක්. දුප්පත්කම තුරන් කිරීම, ඩිජිටල් ආර්ථිකය, ක්ලීන් ශ්‍රී ලංකා කියන ප්‍රතිපත්තිවලට අනුකූලව අපි මේ අය වැය හදලා තිබෙනවා. මේකට විරුද්ධ වෙනවාමයි කියලා නිකම් කථා කරන්නේ නැතුව මේ අය වැයේ හොඳ නරක පෙන්වා දෙන්න. ඔබතුමන්ලාගේ අදහස් සැලකිල්ලට අරගෙන අවශ්‍ය වෙනස්කම් කරන්න අපි කැමැතියි; අපි ඒකට සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එකතු වෙලා මේ රටේ තත්ත්වය වෙනස් කරමු. අපි මේ අය වැය හදලා තිබෙන්නේ ග්‍රාමීය ජනතාවගේ, නිර්ධන පන්තියේ ජනතාවගේ, සාමාන්‍ය ජනතාවගේ ජීවිත නහා සිටුවන්නටයි. නිර්ධන පන්තියේ ජනතාවගේ ආර්ථිකය නහා සිටුවන්නට, ඒ අයට හොඳ ජීවිතයක් දෙන්නට, හොඳ අධ්‍යාපනයක් දෙන්නට, හොඳ සෞඛ්‍ය පද්ධතියක් හදා දෙන්නට, ග්‍රාමීය පාරවල් දියුණු කරන්නට, එම වෙනස ඇති කරන්නට අප ගන්නා මේ උත්සාහය මෑත ඉතිහාසයේ කිසිම රජයක් අරගෙන නැහැ කියලායි මා හිතන්නේ. අපි අනිවාර්යයෙන් මේ වෙනස් කිරීම කරනවා. මේ රට වෙනස් කරන්නේ ජාතික ජන බලවේගය බව කියමින්, අපේ රටේ සියලු ජනතාවට මේ අය වැය හරහා ලැබෙන ප්‍රතිලාභ ඉක්මනින් ලැබෙන බව කියමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.25]

ගරු සංජීව රණසිංහ මහතා
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය රජයේ මංගල අය වැය -2025 අය වැය- පිළිබඳ විවාදය ආරම්භ වෙලා ඒ පිළිබඳව බොහෝ කරුණු කාරණා සාකච්ඡා වෙමින් තිබෙනවා. අපි විශ්වාස කරනවා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" අරමුණු කරගෙන අපේ රජය විසින් සැලසුම් කොට තිබෙන ක්‍රියාවලියේ ගමන් මඟ සාර්ථක කර ගැනීම සඳහා මෙම අය වැය මහත් පිටුවහලක් වේවි කියලා.

අපි මෑත ඉතිහාසය තුළ වසර ගණනාවක් තිස්සේ අය වැය ගණනාවකට ඇහුම්කන් දීලා තිබෙනවා; පෙනී සිට තිබෙනවා; ඒ අය වැයවලට පෙර බොහෝ දේවල් ඉල්ලා තිබෙනවා; අරගළ කරලා තිබෙනවා. ඒ සඳහා සටන් වැදුණු ඉතිහාසයක් අපේ රටේ

[ගරු සංජීව රණසිංහ මහතා]

ව්‍යාපාර තුළ, අරගළ තුළ, වැඩ බිම්වල ලියැවිලා තිබෙනවා. හැබැයි, අපි දැකපු ඒ හැම අය වැයක් ඇතුළේම බොහෝ අවස්ථාවල තිබුණේ අප බලාපොරොත්තු වුණු, අප අභිලාෂයන් ලෙස ගොඩ නහාගෙන තිබුණු දෙයට එහා ගිය හිස් බවක්, නිසරු බවක්. නමුත්, අපි විශ්වාස කරනවා, අපේ රජයේ 2025 අය වැය මේ රටේ සමාජ, ආර්ථික, දේශපාලන පරිවර්තනයක් සිදු කරන මංගල අය වැය බවට පත් වේවි කියලා. අපේ ප්‍රතිපත්ති තුළ; වැඩ පිළිවෙළ තුළ; සැලසුම් තුළ අපි නිර්මාණය කරන්න හදපු රටක් තිබෙනවා. අපි ඒ ගැන කථා බහ කළා. අප අපේක්ෂා කරපු, අප බලාපොරොත්තු වුණු රාජ්‍යයක සිහිනයක් අපට තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ ගොඩ නැහෙන්නේ එයයි කියලා. ඒ සඳහා තැබූ පළමු පියවර ලෙස තමයි අප මේ අය වැය හඳුන්වන්නේ.

අපි පාර්ලිමේන්තුවේ දිවුරුම් දීලා මාස 3කට ආසන්න කාලයක් තමයි ගත වෙලා තිබෙන්නේ. මේ මාසයේ 21 වැනි දාට ඒ මාස 3 සම්පූර්ණ වෙනවා. අපට අභියෝගයක් තිබුණා. මොකද, අපේ අය වැයක් නැතුව තමයි අපි මෙච්චර කල් මේ ගමන ආවේ. අපේ නොවන මූල්‍යමය සැලසුමක් ඇතුළේ, අපේ නොවන වැඩ පිළිවෙළක් ඇතුළේ තමයි අපට ගමන් කරන්න සිද්ධ වුණේ. හැබැයි, ඒ තිබුණු අභියෝග වෙනස් කරන්න සමත් වුණු අය වැයක් විධියට අපි මෙය සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සහෝදරවරුන්, සහෝදරියන් බොහෝ දෙනෙක් අදහස් දැක්වුවා, මොනවාද මේ අය වැය ඇතුළේ සටහන් වෙලා තිබෙන්නේ කියමින්. මීට පෙර ඉදිරිපත් වුණු අය වැය ලේඛන ගත්තාම, ඒවා තුළ ජනතාවට ලැබුණු සහන මොනවාද කියලා අපි දැක්කා. ජනතාව පීඩාවට පත් කරන බදු ගොන්නක් ඒවායේ ගොඩ ගහලා තිබුණා. පාලකයන්ගේ; ආණ්ඩුවල හිටපු අයගේ හිතවතුන්ට විවිධ ව්‍යාපාර ක්ෂේත්‍රවලට අදාළව වරදාන, වරප්‍රසාද ලබා දෙන යෝජනා ඒවායේ ඇතුළත් වුණා. ඒ වාගේම ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් විධියට ඔවුන් වෙත පවරා ගන්නා මහා වරප්‍රසාද ප්‍රමාණයක් ඒවායේ ලියැවී තිබුණා.

නමුත් අපි විශ්වාස කරනවා, මේ රටේ පළමු වතාවට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන සියලු ජනතාව එකතු කරපු, ජාතික සමඟිය නිර්මාණය කරන්න හැකි වුණු අය වැයක් එළි දක්වන්න අපට පුළුවන් වුණා කියලා. ඒ විතරක් නොවෙයි, සෑම ක්ෂේත්‍රයකම ජනතාවට සතුටු වෙන්න පුළුවන් ආකාරයේ අය වැයක් අපි නිර්මාණය කර තිබෙනවා; එළි දක්වා තිබෙනවා. රුපියල් බිලියන 930කින් ආදායම් ඉහළ දැමීමට අපේක්ෂා කරන අය වැයක් අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව රජයේ ආදායම රුපියල් බිලියන 4,960ක් දක්වා ඉහළ දමන්න අපි අපේක්ෂා කරනවා. ඒ වාගේම, බදු නොවන ආදායම රුපියල් බිලියන 370ක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන අය වැයක් තමයි අපි ගෙනැල්ලා තිබෙන්නේ.

රජයේ වියදම් ගෙන බලමු. රජයේ වියදම් කියන්නේ මැති ඇමතිවරුන්ගේ වියදම් නොවෙයි. ඒවා මේ රාජ්‍යයේ ජනතාව වෙනුවෙන්, ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් කෙරෙන වියදම්. රුපියල් බිලියන 7,190ක් රජයේ වියදම් හැටියට දරන්න සූදානමින් සිටින අය වැයක්, මෙය. පුනරාවර්තන වියදම් විධියට රුපියල් බිලියන 5,886ක් දරන්න සූදානමින් සිටින අය වැයක්, මෙය. ඒ වාගේම, වැටුප් ගෙවීම් වෙනුවෙන් රුපියල් මිලියන 1,230ක්, ඒ කියන්නේ රුපියල් බිලියන 130ක්, පැවති අය වැයට සාපේක්ෂව වැඩිපුර දරන්න අපි සූදානමින් ඉන්නවා.

ඔබ දන්නවා, අධ්‍යාපනය සහ සෞඛ්‍ය වෙනුවෙන් තමයි අප විශාලම පිරිවැයක් දරා තිබෙන්නේ කියලා. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අප බලාපොරොත්තු වන ඒ පරිවර්තනය වෙනුවෙන්, ඒ ස්ථානගත කිරීම් වෙනුවෙන්, පත් කිරීම් වෙනුවෙන්, ආයතන සංයුතියේ වෙනස්කම් වෙනුවෙන්, ඒ වාගේම අධ්‍යාපනයේ සමස්ත පහසුකම් ගොඩ නැගීම වෙනුවෙන් විශාල වැය බරක් දරන්න අපි සූදානමින් ඉන්නවා. ඔබතුමන්ලා දන්නවා, සෞඛ්‍ය ක්ෂේත්‍රය කියන්නේ මේ රටේ දැවැන්ත ප්‍රශ්න නිර්මාණය කරපු ක්ෂේත්‍රයක් බව. සෞඛ්‍ය සඳහා රුපියල් බිලියන 604ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් වනවා. ඒ තුළ ඖෂධ ගෙන්වීමට පමණක් රුපියල් බිලියන 185ක් වෙන් වනවා. අපි දන්නවා, අපේ රට ඇතුළේ ඖෂධ හිඟය මොන තරම් ප්‍රමාණයකින් තිබුණා ද කියලා. ඖෂධ වර්ග 150ක් නැහැ, 200ක් නැහැ, 300ක් නැහැ කියා තමයි ඒ කාලයේ අපට හැම තැනින්ම ඇහුණේ. හැබැයි, මෙවර ඖෂධ ගෙන්වීම වෙනුවෙන් රුපියල් බිලියන 185ක් වෙන් කරලා වසර ගණනාවකට ඖෂධ හිඟයක් ඇති නොවන ආකාරයෙන් එම ක්ෂේත්‍රය ගොඩ නහන්න අපි සූදානමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි, ඔබ දන්නවා සංචාරක ක්ෂේත්‍රය ඇතුළේ දැවැන්ත පරිවර්තනයක් අප අපේක්ෂා කරන බව.

ඒ ආකාරයට මෙතෙක් ඉතිහාසයේ අපට කථා කරන්න නොතිබුණු වර්ගයේ, පන්නයේ අය වැයක් අපේ මාතෘ භූමියේ ජනතාව වෙනුවෙන් අපි අරගෙන ඇවිත් තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" මේ රටේ ජනතාව වෙනුවෙන් නිර්මාණය කිරීම සඳහා වන වැඩ පිළිවෙළ සාර්ථක කර ගත් අය වැයක් අප ඉදිරිපත් කළා කියලා.

කර්මාන්ත ඉදිවෙන, කුඩා ආයෝජන දිරි ගන්වන, ඔවුන් වෙනුවෙන් බැංකු ණය ලබා දෙන අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ එක්කම, මේ රටේ වටිනා රක්ෂිත භූමි, වන රක්ෂිත භූමි, අභය භූමි, සමාජ පාරිසරික වටිනාකම් සහිත භූමි හැර වගා කළ හැකි සියලු බිම් වගාකොට ස්වයංපෝෂිත ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා වන ආර්ථික ක්‍රියාවලිය ද මේ අය වැය තුළ සටහන් වී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, සංචාරක ක්ෂේත්‍රය හරහා ඉලක්ක සහගතව ලක්ෂ 40කට ආසන්න සංචාරකයන් ප්‍රමාණයක් දිවයිනට ගෙන්වා ගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක වන අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. එමෙන්ම, මේ රට පවත්වා ගෙන යෑම සඳහා මේ රටේ පාලකයන් පාවිච්චි කරපු පහත් ආකාරයේ ජාතිවාදය අපි අහෝසි කරලා තිබෙනවා. නැවත මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදී කිසිදු ජන වර්ගයක් අතර කිසිම ආකාරයක වර්ගවාදී ගැටුම් නිර්මාණය නොවන රටක් නිර්මාණය කිරීමේ සැලැස්ම මේ අය වැය තුළ තිබෙනවා. මෙතෙක් ඉතිහාසය තුළ අසාධාරණයට, අයුක්තියට ලක් වුණු, ඒ වාගේම සංවර්ධනයේ කොටස් අඩුවෙන් බෙදී ගිය මේ රටේ උතුරු නැගෙනහිර පළාත්වල ජනතාව වෙනුවෙන් සංවර්ධන යෝජනා දියත් වෙන අය වැයක් අපි නිර්මාණය කරලා තිබෙනවා.

එමෙන්ම, මේ සමාජය තුළ දෙවන පුරවැසියන් ලෙස තකන, නොසැලකිල්ලට භාජන වන කණ්ඩායම්වලට සමාජ වටිනාකම් නිර්මාණය කර ජීවන වටිනාකම් අත්පත් කර දෙන අය වැයක් අපි නිර්මාණය කර තිබෙනවා. ඔටිසම් දරුවන්, ආබාධිත පුරවැසියන් හා වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් මේ අය වැය තුළ විශාල ස්ථානයක් වෙන් කර දී තිබෙනවා. මේ අය වැය, ඉතිහාසයේ සිට ලංකාවේ අපි බලාපොරොත්තු වෙන පුළුල් සමාජ පරිවර්තනය ඇති කරන, ලෝකයේ දියුණු රාජ්‍යයක තිබෙන ලක්ෂණ ඇති කරන, ගතිකත්ව සහිත රටක අපේක්ෂාව අපේ අභිමුව නිර්මාණය කරන, ඒවා යථාර්ථයක් බවට පත් වෙන අය වැයක් කියලා අපි සහතික වෙනවා.

ඔබ දන්නවා, ලෝකයේ දියුණු යැයි සම්මත රටවල් ජාතිවාදය බැහැර කරපු රටවල් බව. ඒ රටවල එකම පන්ති කාමරය විවිධ වර්ගයේ ලස්සන මල් තිබෙන වත්තක් වාගෙයි. ඒ රටවල හැම ජන වර්ගයකම දරුවන් එක පන්ති කාමරයක් ඇතුළේ ලස්සනට, සාමුහිකව, ගෞරවාන්විතව අධ්‍යාපනය හදාරනවා. ඒක ජාතික සමගිය ඇතුළේ ගොඩනැඟෙන සංකල්පයක්. ඒ රටවල සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රමය ඇතුළේ නිර්මාණය වන ආර්ථික පදනම තුළ ගොඩනැඟෙන ජාතික සමගිය, අපේ රටේත් ගොඩනැඟෙන, ඒ සඳහා සැලසුම් නිර්මාණය වුණු අය වැයක් විධියට තමයි ඔබට-අපට මේ අය වැය දිස් වන්නේ.

ඒ විතරක් නොවෙයි, රාජ්‍ය සේවය ඇතුළේ මෙතෙක් ඉතිහාසයේ තිබුණු වැටුප් වැඩිවීම්වලට සාපේක්ෂව, ඉතා විද්‍යාත්මක ලෙස වැටුප් වැඩි කිරීම සඳහා මැදිහත් වුණු අය වැයක් විධියට තමයි අපි මේ අය වැය හඳුන්වන්නේ. මෙතෙක් හැමදාම මේ රටේ පාලකයන් රාජ්‍ය සේවයේ, පෞද්ගලික අංශයේ මූලික වැටුපට ඒ වැඩි කිරීම් එකතු කරන්න කවදාවත් සූදානම් වුණේ නැහැ. ඒ පාලකයන් දන්නවා, රුපියල් 5,000ක්, 10,000ක් වැටුපට එල්ලුවාට, ඒකෙන් මූලික වැටුප වැඩිවීමක් වෙන්නේ නැහැ කියලා. ඒ නිසා රජයට දරන්න වෙන්නේ, ඒ එල්ලපු මුදලේ බර විතරයි. හැබැයි, මෑත ඉතිහාසය තුළ පළමු වතාවට කරපු දැවැන්තම, විද්‍යාත්මක වැටුප් පරිවර්තනය ජාතික ජන බලවේගයේ අපි මේ අය වැය තුළින් කළාය කියන එක අපේ රාජ්‍ය සේවක සහෝදර සහෝදරියන්ට ඉතා සතුටින් ප්‍රකාශ කරනවා. රාජ්‍ය සේවකයෝ සියයට 80ක්, රාජ්‍ය සේවයේ ඉන්න අපේ ආදරණීය සහෝදර සහෝදරියෝ, අපේ ව්‍යෘත්තීය සගයන්, අපි කෙරෙහි දැඩි විශ්වාසයක් තැබුවා. අපි ඉතා සතුටින් ඔවුන්ට කියනවා, ඔබ තැබූ ඒ විශ්වාසය, ඔබට තිබුණු අපේක්ෂාව, ජාතික ජන බලවේගයේ අපි හොඳින් තේරුම් අරගෙන ඔබේ ගෞරවය, ඔබේ අභිමානය, ඔබේ බලාපොරොත්තු ආරක්ෂා කරන්න, මේ අය වැයේදී සූදානම් වුණාය කියන එක.

ඒක නිසා අපි විශ්වාස කරනවා, මේක සාම්ප්‍රදායික අය වැයක් නොවෙයි කියන එක. මේක ඉලක්කම් හරඹයක් නොවෙයි. මේක සම්ප්‍රදායක් ලෙස වසරකට රාජ්‍යයකට අවශ්‍ය නිසා ඉදිරිපත් වුණු අය වැයක් නොවෙයි. මේක මේ සමාජය ගැඹුරු පරිවර්තනයකට ලක් කරන, ආර්ථික දේහයේ ගැඹුරු වෙනසක් වෙනුවෙන් සකස් වුණු අය වැයක්. මේක එක පැත්තකින් ගුවන් තොටුපළවල් පුළුල් වන, නව පැත්තකින් වරායේ තිබෙන ඒ සියලු අඩු පාඩු සකස් කරන, අනෙක් පැත්තෙන් සංචාරක ව්‍යාපාරය සඳහා මහ පෙන්වන්නන් වෙනුවෙන් අත්වැල් සපයන ව්‍යාපෘති නිර්මාණය වන අය වැයක්. මේ සමස්ත ක්‍රියාවලිය ඇතුළේ ලෝකයේ දියුණු ආර්ථිකයක් ඇතිකර ගන්නා, එයින් සැලකිය යුතු පංගුවක් අත්කර ගන්නා රාජ්‍යයක් බවට පත් කර ගැනීම සඳහා මේ අය වැයෙන් ශක්තිමත් දායකත්වය ලබා දෙනවා. මේ දේ වෙනුවෙන් අපට අවස්ථාව ලබා දුන් ශ්‍රී ලාංකීය ජනතාවට, ඒ ජන වරමට සාධාරණය ඉටු කරන්න අපට හැකි වීම පිළිබඳව හදවතින්ම සතුටු වෙනවා. අපි මේ රට ගොඩනඟන්න, මේ රට නිවැරැදි මාවතකට ගෙන යන්න මෙවැනි අය වැයක් ලාංකීය සමාජයට දායක කළා. රට ගොඩනඟන්න අපට ශක්තිය හා ධෛර්ය ලබා දුන් ශ්‍රී ලාංකීය සමස්ත ජනතාවට ආචාරය පුද කරමින් මා සමු ගන්නවා.

ඔබ සියලුදෙනාට ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.39]

ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය වැය ගැන කථා කරන මොහොතේ අපට මුලින්ම කියන්න තිබෙන්නේ, මේ අය වැය අපි කිව්වා වාගේම ජනතාවාදී අය වැයක් කියන එකයි.

මේ ජනතාවාදී අය වැය කියන කාරණාව ගත්තාම, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අපි කථා කරපු විධියටම "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" වෙනුවෙන් ගෙන එනු ලබන ඒ පුනරුදයේ අය වැය මෙය බව අපි පැහැදිලිවම කියනවා. පළමු අය වැයේදී අපි බලාපොරොත්තු වුණු ආකාරයටම සුභසාධන කටයුතු සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම තමයි අපි ජනතාවට දීපු පොරොන්දු ඒ ආකාරයෙන්ම ආරක්ෂා කර ගනිමින් කටයුතු කරනවා. මෙය මේ රටේ ජීවත් වන සියලු පුරවැසියන් -රාජ්‍ය සේවකයින්, පෞද්ගලික අංශයේ සේවකයින්, වතු සේවකයින්, ඒ වාගේම අපේ රටේ සිටින හව්හරණක් අවශ්‍ය වන; පිළිසරණක් අවශ්‍ය වන සෑම ජන කොටසක්ම, පාසල් දරුවන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, ඒ වාගේම රැකවරණ මධ්‍යස්ථානවල රැඳවියන් හැටියට සිටින අය සහ අවධානය අවශ්‍ය වන ජන සමාජයේ සියලු කොටස්- පිළිබඳව අවධානය යොමු කරපු අය වැයක්.

අය වැය කියන කාරණාවේදී වැටුප කියන්නේ එක් තලයක්, සමාජ සුරක්ෂාව කියන්නේ තව තලයක්. මේ අය වැය ඉදිරිපත් වන තුරු පසුගිය කාල පරාසය පුරා අය වැයේ වැඩිම වෙන් කිරීම් සිදු වෙලා තිබෙන්නේ ජාතික ආරක්ෂාව කියන කාරණාවට බව අපි දැක්කා. අන්න ඒ ජාතික ආරක්ෂාව වෙනුවෙන් අය වැයේ වැඩිම පංගුව වෙන් කරගෙන පවුල් කිහිපයක් -දේශපාලනයේ ප්‍රභූත්වය ආරක්ෂා කරමින් සිටි කිහිපදෙනෙක්- විතරක් සුරක්ෂිතව හිටපු ඒ ක්‍රමය අද වෙනස් කරලා තිබෙනවා. අධ්‍යාපනයට, සෞඛ්‍යයට, ප්‍රවාහනයට වාගේම ඒ සියල්ල ඉක්මවා යමින් සියලුම ජන සමාජයන් ආවරණය වන සමාජ ආරක්ෂණ පද්ධතිය යථා තත්ත්වයට පත් කර සවිබල ගැන්වීම වෙනුවෙන් රුපියල් බිලියන 749ක් වෙන් කරපු අය වැයක් හැටියට තමයි අපි මෙවර අය වැය දකින්නේ. අපි දන්නවා, මීට පෙර අය වැයවලදී සිද්ධ වුණේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් අතිවිශාල මුදලක් වෙන් කර ගැනීම බව. හැබැයි, මෙවර අධ්‍යාපනය වෙනුවෙන්, සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල් ගත්තාම, රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කිරීම සඳහා වෙන් කර තිබෙන මුදලත් එක්ක අපි ඒක සංසන්දනාත්මකව බලන්න ඕනෑ.

විශේෂයෙන්ම රටක අය වැයෙන් වැටුප් වැඩිවීම කියන එක ගත්තාම සේවා නියුක්තියේ විධිමත් රැකියා කරන, එහෙම නැත්නම් මාසයේ අන්තිමට වැටුප් ලේඛනයකින් වැටුප් ලබා ගන්නා විධිමත් සේවකයන් අතට ලැබෙන වැටුප කියන්නේ ඉතාම වැදගත් දෙයක්. මොකද, ඒ මුදල තමයි සමාජය තුළ සංසරණය වෙන්නේ. රාජ්‍ය සේවකයෙක් හෝ පෞද්ගලික අංශයේ සේවකයෙක් අරගෙන යන ඒ වැටුප තුළින් තමයි ගෙදර ඇතුළේ ගෘහ සුරැකුම් කාර්යය කියන එක සිද්ධ වෙන්නේ. දරුවන්ගේ අධ්‍යාපනය, ලෙඩ වෙලා සිටින අයගේ සෞඛ්‍ය තත්ත්වය, ආබාධිත ජන ප්‍රජාව රැක බලා ගැනීම, වැඩිහිටියන් රැක බලා ගැනීම, දරුවන්ගේ පෝෂණයේ ඉඳලා අධ්‍යාපනය දක්වා සියල්ලට වියදම් කරන්න ගෙදරක් ඇතුළට ගලාගෙන එන මුදල තමයි අපි මේ වැටුප කියලා ගණනය කරන්නේ.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

ඒ නිසා රාජ්‍ය සේවකයාගේ හා පෞද්ගලික අංශයේ සේවකයාගේ වැටුප් වැඩිවීම කියන එක සමස්ත සමාජයේම ජීවන පැවැත්ම, ජන සමාජය තුළ සිටින ජනතාවගේ පරිභෝජන හැකියාව; පරිභෝජන මට්ටම ඉහළ නංවන්න දායක වෙනවා කියන එක අපි දන්නවා. අන්න ඒ නිසා, ඒ රටේ ජීවත් වන පුරවැසියන්ගේ පරිභෝජන හැකියාව කොයි විධියටද වර්ධනය කරන්නේ, ඒ පරිභෝජන හැකියාව සඳහා අතේ මිටේ යහමින් මුදල් ගැවසෙන ආර්ථිකයක් කොයි විධියටද හදන්නේ කියන කාරණා කේන්ද්‍ර කර ගනිමින් සැලසුම් සකස් කිරීම සෑම රජයකම වගකීම වෙනවා. ඒ නිසා තමයි මෙවර අය වැය ජනතාවාදී අය වැයක් කියලා අපි කියන්නේ. රටේ ජනතාවගේ ජීවන පැවැත්මට අත්‍යවශ්‍ය සාධක වන තමන්ගේ දරුවන්ට කෑම බීම ටික දෙන එක, දරුවන්ගේ අධ්‍යාපනයට අමතරව සෞඛ්‍ය ගැන බලන එක වාගේ හැම දෙයක්ම පිළිබඳ වගකීම් දරන කාන්තාවකට; අම්මා කෙනෙකුට ගෙදර ඇතුළේ දැනෙන බර අවම කරන්න; අම්මා කෙනෙකුගේ කර මත පැටවිලා තිබුණු අන්න ඒ අධ්‍යාපනයේ බර, සෞඛ්‍යයේ බර වාගේම ප්‍රවාහනය හා අනෙකුත් සේවා සපයා ගැනීම සඳහා ගෙදර ආර්ථිකයෙන් එළියට වියදම් කරපු ඒ මුදල් කන්දරාව නැවත තමන්ගේ දරුවන් වෙනුවෙන් හොඳ කෑම වේලකට ඉතිරි කර ගන්නේ කොහොමද, හොඳ අධ්‍යාපනයක්, හොඳ සෞඛ්‍ය පද්ධතියක් ලබා ගන්නේ කොහොමද කියන එක සමබර කරපු අය වැයක් හැටියට අපි මේ අය වැය දකිනවා.

ඒක විස්තරාත්මකව කියනවා නම්, සමාජ සුභසාධන ලබා දීමේදී විශේෂයෙන්ම මෙවර අය වැයෙන් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන පංගුව ගත්තොත්, මේ අධ්‍යාපන පද්ධතිය ඇතුළේ අස්වැසුම ප්‍රතිලාභ ලබන පවුල්වල දරුවන්ට රුපියල් 6,000ක් අධ්‍යාපන මෙවලම් ලබා ගැනීම සඳහා වෙන් කර තිබෙනවා කියා අපි දන්නවා. ඒ විතරක් නොවෙයි. පාසල් දරුවන්ගේ පෙළපොතේ ඉඳලා පාසල් දරුවන්ගේ පාවහන් දක්වා මුදල් වෙන් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. බාලිකාවන්ට සනීපාරක්ෂක තුවා ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 1.4ක විශේෂ වෙන් කිරීමක් කරලා තිබෙනවා. හැම ගෙදරක්ම දරුවන්ගේ අධ්‍යාපනයට විශාල බරක් දරද්දී, පවුල ආර්ථික වශයෙන් දුෂ්කරතාවලට මුහුණ දෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන් හා පෞද්ගලික අංශයේ සේවකයන් හම්බ කරගෙන ගෙදරට ආවාට වැඩක් නැහැ. මොකද, දරුවන්ට පොත්පත් අරගෙන දෙන්න, සපත්තු අරගෙන දෙන්න, school bag එක අරගෙන දෙන්න වාගේම සනීපාරක්ෂාව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් තමන්ගේ නිවසෙන්, තමන්ගේ ගෙදරින් ඉවතට ගලාගෙන යනවා නම්, ඒ ගෙදර තුළ රැඳෙන මුදල් ප්‍රමාණය අඩු වෙනවා. ඉතින් දරුවන්ගේ අධ්‍යාපනයේ බර දෙමව්පියන්ගේ කරමත පටවන්නේ නැහැ කියලා අපි කිව්වා වාගේම, අන්න ඒ කියපු පොරොන්දුව රකින්න පුළුවන් වන විධියට මෙවර අය වැය සකස් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම දරුවන්ගේ අධ්‍යාපනයේ බර ආණ්ඩුව විසින් මෙවර භාරගෙන තිබෙනවා.

ඒ වාගේම සෞඛ්‍ය සඳහා වෙන් කරලා තිබෙන ඒ මුදල් ප්‍රමාණය අතිශය වැදගත් බව අපි කියන්න ඕනෑ. මොකද, සෞඛ්‍ය සඳහා වෙන් කරලා තිබෙන මුදල ඇතුළේ පැහැදිලිවම පෙනෙන්න තිබෙන දෙයක් තමයි අධ්‍යාපනයට වෙන් කරපු මුදල්වලට අමතරව, සෞඛ්‍ය පද්ධතිය ඇතුළේ අපි බලාපොරොත්තු වෙච්ච ඒ ගුණාත්මක සංවර්ධනය සඳහා ඒ වෙන් කිරීම් ටික සිදු වෙලා තිබෙන බව. අපට පැහැදිලිවම සුවපත් සමාජයක් සඳහා නීරෝගි දිවි පෙවතක් අවශ්‍යයි. ඒක රෝහල් සංවර්ධනය තුළින් විතරක් නොවෙයි, වෛද්‍ය කාර්ය මණ්ඩලවලට සහ වෛද්‍ය වෘත්තිකයන්ට වැටුප් ලබා දීම තුළින් විතරක් නොවෙයි, වෛද්‍ය සැපයුම්වලට මුදල් වෙන් කිරීම තුළින් විතරක් නොවෙයි, ත්‍රිපෝෂ ඇතුළු පෝෂණ වැඩසටහන් සඳහාත් රුපියල් බිලියන 12.5ක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. රෝග වැළැක්වීමේ ක්‍රමවේද පිළිබඳව ජනතාව දැනුවත් කිරීමත්, ඒ රෝග වැළැක්වීම සඳහා Clean Sri Lanka ව්‍යාපෘතියත් එක්ක සම්බන්ධ වෙලා පාරිසරික පවිත්‍රතාව හරහා රෝග ව්‍යාප්තවීම වැළැක්වීම සඳහාත් වූ ක්‍රමවේද සඳහා මේ රුපියල් බිලියන 12.5 වෙන් වෙනවා. ඒ වාගේම සෞඛ්‍ය හා සම්බන්ධ පර්යේෂණ කටයුතු දියුණු කිරීමටත්, සුවසැරිය ගිලන් රථ සේවාව සඳහාත් ආදී වශයෙන් ගත්තාම, විධිමත් සෞඛ්‍ය සේවාවක් සඳහා වන වෙන් කිරීම මේ අය වැය තුළ දකින්නට ලැබෙනවා. ගුණාත්මක ඖෂධ ලබා ගැනීම අපි සෑම දෙනාටම බලපාන වැදගත් කාරණයක්. සෞඛ්‍ය තුළ කාන්තාවන්ට, දරුවන්ට, වැඩිහිටියන්ට අත්‍යවශ්‍යම කාරණාවක් තමයි ඖෂධවල තිබෙන ගුණාත්මකභාවය. අපි මෙවර අය වැයේදී පැහැදිලිවම දකිනවා, ජනතාව මත පටවා තිබුණු ඒ සෞඛ්‍යයේ බර රජය විසින් භාර ගෙන තිබෙන බව.

ඒ නිසා හැම වෙලාවේම වැටුප ප්‍රමාණාත්මකව කොච්චර ඉහළ ගියත් වැඩක් නැහැ. මොකද, අපි ලබන වැටුප ගෙදර ගෘහ ආර්ථිකය නඩත්තු කරන්න, අත්‍යවශ්‍ය සේවාවන් ලබා ගන්නට විශාල වශයෙන් වැය කරන්න අපට සිද්ධ වෙනවා නම්. හැබැයි, මෙවර අය වැයේ තිබෙන විශේෂත්වය තමයි ප්‍රමාණාත්මක වැටුප් වැඩිවීමකට අමතරව, මෙන්න මේ ජනතාව පෙළන ඒ වැය බර, සෞඛ්‍ය කෙරෙහි, අධ්‍යාපනය කෙරෙහි, ප්‍රවාහනය කෙරෙහි සහ අනෙකුත් සේවාවන් කෙරෙහි දරන වැය බර ආණ්ඩුව විසින් භාරගෙන තිබීම. අන්න ඒ නිසා මේ අය වැය අපි ඉතාම සංවේදීව තේරුම්ගත යුතු වෙනවා. අතට ලැබෙන වැටුපේ වැඩිවීමට අමතරව, මෙන්න මේ සේවාවන් සඳහා අපෙන් වැය වන වියදම් රජය පාර්ශ්වය භාර ගැනීම නිසා ආර්ථික තුළනය නැවතත් මේ රට ඇතුළේ තහවුරුවීමක් අපි දකිනවා.

ඒ වාගේම අපි පැහැදිලිවම මේ අවස්ථාවේදී කිව යුතු තව දෙයක් තමයි සුභසාධන කටයුතු පිළිබඳ කාරණය. අපි මේ අය වැය තුළින් දැකපු දේ තමයි ආබාධිත ප්‍රජාව, රැඳවියන්, පරිවාසගත වෙලා ඉන්න සහනික කළ පාසල්වල ඉන්න දරුවන්ගේ සුභසාධනය. මොකද, මත්ද්‍රව්‍ය නිවාරණය ආදී සියල්ල සඳහා මේ අය වැය ඇතුළේ වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය ගත්තොත්, එය විශාල මුදලක්. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා සිටින දරුවන්, තරුණයන් ඉන් මුදවා ගැනීම අතිශය වැදගත්. දඬුවමට එහා ගිය උපදේශන සේවාවන් තුළින් ඔවුන්ව නැවත පුනරුත්ථාපනය කරලා සමාජගත කිරීම සඳහා වන මෙහෙවර දක්වාම මේ කාර්යභාරය විහිදිලා තිබෙනවා. ඒ නිසා ඒ සඳහා වන පුළුල් දැක්මක් සහිත වැඩපිළිවෙළක් මේ තුළ තිබෙනවා. මේක ඉලක්කම්වලින්, සංඛ්‍යා දත්තවලින් පිරිමහන්න පුළුවන් දෙයකට වඩා එහා ගිහිල්ලා, සමාජීය පුරවැසියාගේ වගකීම භාර ගත්ත, සමාජයේ සිටින සෑම ජන ප්‍රජාවකගේම ජීවන තත්ත්වය උසස් කරන අය වැයක් බව අපි මේ අය වැය කියවා බලද්දී තේරුම් ගන්නවා. ඒ නිසාම තමයි මේ අය වැය තුළ අපි වඩාත්ම වගකීම් සහගත වෙන්නේ. ඇත්තටම රටක සංවර්ධනයේදී අපේ ආර්ථිකයේ ගුණාත්මක බව අපි තක්සේරු කරන්නේ මේ සමාජය ඇතුළේ සමාජ බරින් පීඩිත ජනතාව ඉන් මුදවා ගැනීම සඳහා, සමාජ සුභසාධනය වෙනුවෙන් අපි වෙන් කරන මුදල්වලින් කොයිතරම් හැකියාවක් තිබෙනවාද කියන කාරණය හරහායි.

ඒ වාගේම පරිවාසගත වෙලා ඉන්න දරුවන් වයස අවුරුදු 18 ඉක්ම වූවාට පසුව වෘත්තීය මාර්ගෝපදේශනයට ඇතුළු කරලා, ඒ වෘත්තීන් හරහා ඔවුන් සවිබල ගැන්වීම; කාන්තා රැඳවියන් හැටියට ඉන්න දැරියන් අවුරුදු 18න් පස්සේ විවාහ වනවා නම්, ඔවුන්ට නිවාස ණය ලබා දීලා, රැකියා අවස්ථා ලබා දීලා සවිබල ගැන්වීම;

තවදුරටත් ඒ සමාජයේ අසරණ වෙච්ච ජනතාව අසරණ නොවී රඳවා ගැනීම සඳහා වන වෑයම, ඔවුන් දෙපයින් සිටුවා සවිබල ගන්වන, ඒ වාගේම ඔවුන් ස්වාධීන පුරවැසියන් කරන වගකීම ඉටු කරන ආකාරය බොහෝදුරට මේ අය වැය තුළ අපි දකිනවා. ඒ නිසා තමයි අපි කියන්නේ, මේ අය වැය ආර්ථිකමය වශයෙන් වැටුප වැඩි වනවා කියන කාරණාවෙන් එහාට ගිහිල්ලා, මේ සෑම කටයුත්තක් තුළින්ම සමාජ සුරක්ෂිතභාවය ඇති කිරීමේ වගකීම වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරපු අය වැයක් කියලා.

අවුරුදු 76ක ඉතිහාසය පුරාවට සෑම ජන ප්‍රජාවකම ජීවන මට්ටමට වග කියන, ජීවන තත්ත්වයට වග කියන, ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන අය වැයක් තමයි අපට මෙවර ජාතික ජන බලවේගය රජයෙන් දකින්නට ලැබිලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ, මේක ජනතාවාදී අය වැයක්, සෑම පුරවැසියෙකුටම වග කියන අය වැයක් කියලා. ඒ අය වැය ඇතුළේ තමයි අපි මේ කියන කතන්දරය, අපි පොරොන්දු වෙච්ච ජීවිතය, අපි ජනතාවට ලබා දෙනවා කියපු ජීවිතය ලැබිලා තිබෙන්නේ. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමත්, සමාජ සුබසාධනය ඉහළ නැංවීමත් කියන ක්‍රියාවලි තුනම ඉතා පැහැදිලිව ඉටු කළ අය වැයක් හැටියට අපි හැම කෙනාම මේ අය වැය දකිනවා. ඒ වාගේම මෙවර අය වැය තුළින් අපි රාජ්‍ය සේවයට, පෞද්ගලික අංශයට අමතරව වතුකරයේ ජනතාව ගැනත් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

අතේපොල, නාන් සොල්ලුකින්ර මුක්කියමාන විටයම්, ඉනංගලුක්කිටෙයිලාන ඔත්රුමෙ අල්ලතු ඉනප්පිරච්සිනෙක්කාන තීර්වු එන්පතු, වෙරුමනේ අරසියල් තීර්වාක මට්ටුමල්ලාමල්, නාංකළ් පාර්ක්කින්ර විතත්තිල් කූරුවතානාල්, මලෙයක මක්කළුක්කුම් වටක්කු, කිළක්කු මාකාණංකළිල් වාළ්කින්ර මක්කළුක්කුම් අතු අවර්කළින් පොරුළාතාර වළර්ච්සික්කානතාකවුම් අමෙය වේන්ටුම් එන්පතෙත්තාන්. අන්තවකෙයිල් පොරුළාතාරත්තින් සීරාන තන්මෙයින් ඌටාක අවර්කළින් වාළ්විල් මරුමලර්ච්සියෙ එර්පටුත්තුම් විතත්තිලාන ඔරු පොරුළාතාරත් තිට්ටම් ඉන්ත වරවු-සෙලවුත් තිට්ටත්තින්මූලම් මුන්වෛක්කප්පට්ටුළ්ළතු.

කොළුම්පෙ මාත්තිරම් මෛයප්පටුත්තියිරුන්ත අපිවිරුත්තියානතු, තර්පෝතු කිරාමප් පුරංකළෙයුම් වන්තටෛන්තිරුක්කින්රතු; වටක්කු මාකාණත්තෛයුම් වන්තටෛන්තිරුක්කින්රතු. ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තින් ඌටාක, කුරිප්පාක වට්ටුවාකල් පාලප් පුනරමෛප්පු මට්ටුමල්ලාතු, තොළිර්චාලෛකළ්, තොළිල්නුට්පම් එන්පන අන්තප් පිරතේසංකළුක්කු වන්තටෛවතන් කාරණත්තාල් අන්ත මක්කළුටෛය වාළ්ක්කෛත්තරම් උයරුම් එන්රු නාංකළ් එතිර්පාර්ක්කින්රෝම්.

අතුමට්ටුමල්ලාතු, මලෙයකත් තෝට්ටත් තොළිලාළර් කළුක්කු 1,700 රූපාය් සම්පළත්තෛ උරුතිප්පටුත්තුවතර්කාක මුතලාළිමාර් සම්මේළනත්තෝටු ඉණෛන්තු අතනෛප් පෙර්රුක්කොටුප්පතර්කාන නටවටික්කෛකළෛ මේර්කොළ්ළක් කූටිය වකෛයිලාන වරවු සෙලවුත්තිට්ටමාකවුම් ඉතු අමෛන්තිරුක්කින්රතු.

නාංකළ් උරුතියාකක් කූරුකින්ර, ඔර් අරසාංකම් එන්ර වකෛයිල් නාංකළ් නම්පුකින්ර 3 මුක්කියමාන කාරණංකළ් ඉරුක්කින්රන: ඔන්රු, පොරුළාතාර ජනනායකම් - පොරුළාතාරත්තින් සුයාතීනත්තන්මෛ සකල මක්කළෛයුම් වන්තටෛය වේන්ටිය ඔරු කට්ටායම් ඉරුක්කිරතු; ඉරණ්ටාවතු, අටිප්පටෛ වසතිකළ් එල්ලාමේ පූර්ත්ති සෙය්යප්පට්ට ඔරු සමුතායමාක ඉරුත්තල්; මූන්රාවතු, සට්ටත්තින් මුන් අනෛවරුම් සමම් එන්පතු. අතාවතු, සට්ටත්තින්මුන් අනෛවරුමේ සමමාක මතික්කප්පටක්කූටිය වකෛයිලාන සමුතාය අමෛප්පෛ උරුවාක්කුතල්. ඉන්ත 3 විටයංකළුම් පූර්ත්ති සෙය්යප්පටුම්පෝතු ඉන්ත නාට්ටිල් වාළ්කින්ර අනෛත්තු මක්කළුම් ඔන්රාක වාළක්කූටිය සූළල් උරුවාකුම්.

ඉව්වළවු කාලමුම් කොළුම්පෙ මාත්තිරම් මෛයමාකක්කොන්ටු වළර්ච්සියටෛන්තුකොන්ටිරුන්ත ඉන්ත නාට්ටිල් තර්පෝතු ඒනෛය පිරතේසංකළෛයුම්, මුක්කියමාක මලෙයකත්තෛයුම් කරුත්තිර්කොන්ටු ඉන්ත අරසාංකම් තනතු වේලෛත්තිට්ටංකළෛ ආරම්පිත්තිරුප්පතෛ නාංකළ් පාර්ක්කින්රෝම්. මලෙයකප් පාටසාලෛකළින් අපිවිරුත්තික්කු මට්ටුමල්ලාතු, මලෙයක මාණවර්කළුක්කුත් තොළිල්නුට්පක් කල්වියෛ වළුක්කුම් විතමාක අංකු අතර්කාන වසතිකළෛ අපිවිරුත්তි සෙය්වතර්කාන ඔතුක්කීටුකළ්, මුතලීටුකළ් අනෛත්තුමේ ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිල් උළ්වාංකප්පට්ටිරුක්කින්රන.

ඔට්ටුමොත්ත මක්කළ් සමුතායත්තෛප් පොරුප්පේර්කින්ර ඔර් අරසාංකම් එන්රාල්, අතන් වේලෛත්තිට්ටංකළ් අන්තච් සමූකත්තිල් වාළ්කින්ර අනෛවරුටෛය වාළ්වෛයුම් කට්ටියෙළුප්පක්කූටිය වකෛයිලානතාක ඉරුක්ක වේන්ටුම්. වටක්කු, කිළක්කුප් පිරතේසංකළෛප් පොරුත්තවරෛයිලුම්කූට, මීනවත් තොළිලිල් ඊටුපටුපවර්කළුක්කු, විවසායත් තුරෛකළිල් ඊටුපටුපවර්කළුක්කු, අවර්කළුටෛය වාළ්වාතාරත්තෛක් කට්ටියෙළුප්පුවතර්කාන ඔතුක්කීටුකළ් මේර්කොළ්ළප්පට්ටුළ්ළන. කුරිප්පාක, වටක්කිල් ඒර්පටුත්තවිරුක්කින්ර මාර්රංකළුක්කාන ඔතුක්කීටුකළෛ ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිල් නාංකළ් කාණ්කින්රෝම්.

ඉන්රු නාංකළ් කෛයිල් වාංකුකින්ර සම්පළම් එව්වළවු අතිකමාක ඉරුන්තාලුම්කූට, අතනෛච් සේමික්ක මුටියාතුළ්ළතු. ඒනෙන්රාල්, කල්වික්කාක, සුකාතාරත්තිර්කාක, පෝක්කුවරත්තුක්කාක, මර්රුම් වාළ්ක්කෛත් තේවෛකළුක්කාක නාංකළ් පාරිය සෙලවුකළෛච් සෙය්යුම්පෝතු, එතෛයුමේ සේමික්ක මුටියාත නිලෛයිල්, නාම් පෙරුම් අන්ත වරුමානත්තින් අර්ත්තමේ ඉල්ලාමර් පෝය්විටුකින්රතු. ආකවේතාන් කල්වි මර්රුම් සුකාතාරච් සෙලවුකළ් මක්කළුක්කුච් සුමෛයාක ඉරුක්කාත වකෛයිල්, කල්වික්කාන පොරුප්පෛ අරසාංකම් ඒර්පිරුක්කින්රතු; සුකාතාරත්තුක්කාන සුමෛයෛ ඒර්පිරුක් කින්රතු. අන්ත මක්කළුක්කුච් සම්පළ උයර්වෛ වළුක්කියිරුප්පතු මාත්තිරමල්ලාමල්, තේවෛප්පටුකින්ර අටිප්පටෛ වසතිකළින් පොරුප්පෛක්කූට අරසාංකම් තාංකියිරුප්පතාල්, ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තෛ මක්කළුටෛය වාළ්ක්කෛච් සුමෛයෛක් කුරෛක්කින්ර විතත්තිල් අමෛන්තිරුක්කින්ර, මක්කළ් මයමාක්කප්පට්ට, මක්කළාට්සික්කු - මක්කළ් ආණෛක්කු උත්තරවාතමළික්කින්ර ඔන්රාක නාංකළ් පාර්ක්කින්රෝම්.

අපේ ආදරණීය ජනතාවට පොරොන්දු වුණු හැටියටම මෙවර ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කරන්නට ලැබීමෙන් සැබෑ ලෙසම ජනතාවට දුන් පොරොන්දු සුරකින ආණ්ඩුවක් බවට පත් වන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මේ අය වැය ක්‍රියාත්මක තලයට එනකොට ඒ බව තවත් පැහැදිලි වනවා. පූර්ව ළමාවිය සංවර්ධනයේදී අපි දැකපු විශේෂතාවක් තමයි, දරුවන්ගේ ඔටිසම් තත්ත්වය. ඔටිසම් තත්ත්වයේ ඉන්න දරුවන්, ශ්‍රවණාබාධ සහිත දරුවන්, කථනාබාධ සහිත දරුවන්, දෘශ්‍යාබාධ සහිත දරුවන් මූලික පෙර පාසල් වියේදීම හඳුනා ගැනීම අත්‍යවශ්‍ය කාරණාවක්. ස්නායු ආබාධ සහ අනෙකුත් ආබාධ සහිත දරුවන් සඳහා වන විශේෂ පූර්ව ළමාවිය සංවර්ධන අවස්ථාවන්ට අපේ අය වැය තුළින් මුදල් වෙන් කර තිබෙනවා.

[ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය]

ඒ වාගේම අපි දැක්කා, පරිවාසගත දරුවන් -පරිවාස රැඳවියන් හැටියට ඉන්න දරුවන්- ප්‍රවාහනය කරන ආකාරය. යම් කිසි සිදුවීමකදී දරුවන්ව උසාවියට ඉදිරිපත් කරලා, මේ දරුවන් රැඳවුම් නිවාසවලට යවද්දී, එහෙම නැත්නම් පරිවාසගත කරද්දී මහා සාපරාධී ක්‍රියාවලට යොමු වූ එහෙම නැත්නම් වැඩිහිටි අපරාධකරුවන් සමඟ එකට එකම බන්ධනාගාර බස් එකේ ගෙන යන අවස්ථා අපි දැක තිබෙනවා. ඒ නිසා ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයේ අපි මේ සම්බන්ධව සාකච්ඡා කරද්දී පැහැදිලිවම කියපු දෙයක් තමයි, මේ පුංචි දරුවන් නොයෙක් හේතු මත අපරාධවලට යොමු වෙලා පරිවාසගත වෙනවා නම්, අනිවාර්යයෙන්ම ඔවුන් ආරක්ෂිතව අධිකරණවලට ගෙන යන්නත්, අධිකරණවලින් ගෙන එන්නත් පුළුවන් ප්‍රවාහන ක්‍රමයක් අවශ්‍යයි කියන එක. ඒ නිසා පරිවාසගතවන ළමා රැඳවියන් ප්‍රවාහනය කිරීම සඳහාත් මෙවර අය වැයෙන් අපි මුදල් වෙන් කර තිබෙනවා. ඒ අනුව ළමා සුරැකුම් මධ්‍යස්ථානවල ධාරිතාව භෞතික වශයෙනුත්, මානව සම්පත් සංවර්ධනය යන අංශවලිනුත් වැඩිදියුණු කිරීම සඳහාත් අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමා රැඳවියන් ප්‍රවාහනය සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 250ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අනාථ දරුවන් සහ තරුණයන් සවිබලගැන්වීම සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා. අනාථ දරුවන්ගේ වාගේම තරුණයන්ගේ අධ්‍යාපන කටයුතු අවසන් වෙලා, ඔවුන්ට වයස අවුරුදු 18 සම්පූර්ණ වුණාට පසු NVQ මට්ටමේ වෘත්තීය පාඨමාලා හදාරලා ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. මේ සියල්ල ගත්තාම අපි පැහැදිලිවම දකිනවා, වැටුප් වැඩි කිරීම විතරක් නොවෙයි; වැටුප් තලවල ඉහළ යෑම විතරක් නොවෙයි, සමාජ සුරක්ෂිතභාවය කියන එකත් මේ අය වැය තුළින් ඉතා හොඳින් තහවුරු කර තිබෙන බව.

අම්මා කෙනෙක් හැටියට වාගේම කාන්තාවක් හැටියට ගෘහ සුරැකුම් කාර්යයේදී අපි හැම කෙනෙක්ම බලාපොරොත්තු වෙන්නේ, අපේ පවුල ඇතුළට ගලාගෙන එන ආදායමෙන් විශ්වවිද්‍යාලයට ගිය තමන්ගේ දරුවාට උගන්වන්නයි. විශ්වවිද්‍යාලයට යන දරුවන්ට ලබා දෙන ශිෂ්‍යාධාර මුදල සහ මහපොළ ශිෂ්‍යත්වය ප්‍රමාණාත්මකව වැඩි කිරීම කියන්නේ, අන්න ඒ ගෘහ සුරැකුම් ආර්ථිකයෙන් පීඩා විඳින කාන්තාවන්ට ලැබෙන විශාල සහනයක්. අපි දන්නවා, දරුවන්ගේ නවාතැන්වලට, කෑමවලට, ජාල විශේෂාංග පහසුකම්වලට, දුරකථන ගාස්තුවලට ඔබට ඉතා විශාල මුදලක් දරන්න සිදු වන බව. දරුවන් වෙනුවෙන් ඔබ දරපු අන්න ඒ පීඩනය මෙවර අය වැයෙන් යම්තාක් දුරට රජය විසින් භාරගෙන දරුවන් වෙනුවෙන් ඒ වගකීම ඉටු කරන්න සූදානම් වෙලා තිබෙනවා.

ඒ වාගේම වසර ගණනක් වැඩ කරලා විශ්‍රාම ගිය අපේ දෙමව්පියන්ට; අපේ වැඩිහිටි ප්‍රජාවට ඔවුන්ගේ තැන්පතුවලට ඉහළ පොලියක් ලබා දී ජීවිතයේ අවසන් කාලයේ තමන්ට අවශ්‍ය බෙහෙත්-හේත් ටික ගන්න, ගමනක් බිමනක් යන්න, වන්දනාවේ යන්න, තමන්ට කැමති දෙයක් මිලදී ගන්න අවස්ථාව ලබා දී තිබෙනවා. මෙන්න මේ සුරක්ෂිත ආර්ථිකය ඇතුළේ වැඩිහිටි හැම කෙනෙක්ම, දරුවන්ව, ඒ වාගේම අධ්‍යාපනය ලබන තරුණ ප්‍රජාව ආදී සියලුදෙනාටම වගකියන රජයක් හැටියට මෙවර අය වැය තුළින් සහන ලබා දී තිබෙනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ, අපි බොහෝ කාලයක් බලාපොරොත්තු වුණු වැටුප විතරක් නොවෙයි, සමාජ සුරක්ෂාවත් තහවුරු කරමින් මිනිසුන්ගේ ජීවන මට්ටම ඉහළ නංවන්න මෙවර අය වැයෙන් අපට හැකියාව ලැබී තිබෙන බවයි. මේ තමයි, 2016න් පස්සේ -වසර 9කට පස්සේ- රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප වැඩි වුණු, රාජ්‍ය සේවකයාට වගකියපු, රාජ්‍ය සේවකයාගේ ජීවන අභිමානය වැඩි කරපු අය වැය. විශේෂයෙන්ම ගෘහ සුරැකුම් ආර්ථිකය තුළ විශාල පීඩනයක හිටපු අපේ කාන්තාවන්ට සහ දරුවන්ට වගකියන රජයක් හැටියට මෙතැනින් එහාට කාල පරාසය තුළ සහන සලසන අය වැයක්, මේ. ඒ නිසා මේ අය වැය ජනතාවාදී අය වැයක්. අපි හැම කෙනාටම ගමට ගිහිල්ලා කියන්න පුළුවන්, මෙය පුනරුදය යුගයක් වෙනුවෙන් ලබා දුන් පොරොන්දු ඉටු කරන ආණ්ඩුවක ජනතාවාදී අය වැයක් කියලා. මේ අය වැයත් එක්ක අපට ගමේ වැඩ කරන්න පුළුවන් කියන සහතිකය අපි ඔබට ලබා දෙනවා. මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට කොපමණ වේලාවක් තිබෙනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
කවුරුන් හෝ මන්ත්‍රීවරයෙකුගෙන් කාලය අරගෙන මට විනාඩි 15ක කාලයක් දෙන්න පුළුවන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම සන්තෝෂයි, විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමෙකුට මූලාසනය දරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ගැන ප්‍රශංසා කිරීමට නම් නොවෙයි මම පැමිණියේ. එවැනි දෙයක් බලාපොරොත්තු වන එකත් වැරදියි. අඩුපාඩුකම් ගැන අපි ඉදිරිපත් කරන මේ විවේචන දිහා වැරදි කෝණයකින් බලන්නත් එපා. විපක්ෂයක් හැටියට කරුණු පෙන්වා දීම අපේ සම්පූර්ණ වගකීමක්. ඒක තමයි අපි ඉෂ්ට කරන්න යන්නේ.

At the outset, நான் ஒரு விடயத்தை தமிழில் சொல்லியாக வேண்டும். அதாவது, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டமானது, கிழக்கு மாகாணத்தை முற்றுமுழுதாக கைவிட்ட ஒரு வரவு செலவுத்திட்டமாகும். மம දන්නවා, මම කියන ටික අහන්න එක් මන්ත්‍රීවරයෙක්වත් headphone එක දමන්නේ නැහැ කියලා. ඒකට ප්‍රශ්නයක් නැහැ.

මේ අය වැය, නැඟෙනහිර පළාත එහෙමපිටින්ම අනාථ කරලා අත්හැරපු අය වැයක්. තරහා වෙන්න එපා එහෙම කිව්වාට. මම කියවන්නම්, ගරු ජනාධිපතිතුමා එතුමාගේ අය වැය කථාවේ නැඟෙනහිර පළාත ගැන කියලා තිබෙන කාරණය. පේළි භයයි එහි තිබෙන්නේ. I am so disappointed.

2025 අය වැය කථාවේ 35වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"නැහෙනහිර පළාත ආර්ථික සංවර්ධනය සඳහා විශාල විභවතාවයක් ඇති පළාත්වලින් එකකි. එබැවින්, අධ්‍යාපනය, සෞඛ්‍ය, කෘෂිකර්මය, ධීවර, සංචාරක සහ ප්‍රජා සවිබල ගැන්වීම් යන ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධනයට සහාය වීම සඳහා ඉන්දියානු බහු-අංශික ප්‍රදාන ආධාර සමඟ නැහෙනහිර පළාතේ පුළුල් සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අප යෝජනා කරනවා."

That is all.

இந்த அரசாங்கம் கிழக்கு மாகாணத்தின் அபிவிருத்தியை இந்தியாவிடம் பாரம்கொடுத்து இருக்கிறது. இதனைக் கேட்பதற்கு மிகவும் வெட்கமாக இருக்கின்றது. கிழக்கு மாகாணத்தைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்களாகிய நாம், நாளை அல்லது நாளை மறுதினம் இந்திய தூதுவரைச் சந்தித்து, அவரிடம் எங்களுடைய மாகாணத்திலுள்ள பிரச்சினைகளைச் சொல்வதற்கு நினைத்திருக்கிறோம். Do not take it very lightly. அண்மையில் ஏற்பட்ட வெள்ள அனர்த்தத்தால் மிகக் கூடுதலாகப் பாதிக்கப்பட்டது கிழக்கு மாகாணம். Gal Oya Dam - சேனாநாயக்க சமுத்திரத்தின் அணைக்கட்டில் ஏற்பட்ட உடைவு காரணமாக அந்தப் பிரதேசம் முழுவதும் வெள்ள நீரில் மூழ்கியது. அதுமாத்திரமல்ல, எங்களுடைய விவசாய நிலங்களும் வெள்ள நீரில் மூழ்கின. இதற்கு முக்கிய காரணம், கல்ஓயா - சேனாநாயக்க சமுத்திரத்தை அண்மித்திருக்கின்ற downstream என்று சொல்லப்படுகின்ற பிரதேசத்தில் சரியான அபிவிருத்தி கிடையாததுதான்.

மம හිතන විධියට, ගල්ඔය ජලාශයේ downstream එක - ඒකට වෙනත් වචනයක් තිබෙනවා නම් මම හරියට හඳුනාගෙන පසුව කියන්නම් - සඳහා වූ සංවර්ධන වැඩ පිළිවෙළක් නැති වුණොත්, ඊළඟ කන්නවලදීත් අපට කෘෂි කර්මාන්තයෙන් ලැබෙන වී අස්වැන්න අඩු වෙනවා, අඩු වෙනවාමයි කියන එක ලියලා තියා ගන්න. එපමණක් නොවෙයි. ඒකට උදුම්ලෙබ්බේ මන්ත්‍රීතුමාත් සාක්ෂි දරයි; ඔබතුමන්ලාගේ නියෝජ්‍ය ඇමති වසන්ත පියතිස්ස මැතිතුමාත් සාක්ෂි දරයි; අතම්බාවා මන්ත්‍රීතුමාත් සාක්ෂි දරයි; කෝඩීස්වරන් මන්ත්‍රීතුමාත් සාක්ෂි දරයි. ඒක විශාල කරදරයක් අපට. ගල්වැට කැඩිලා; Gal Oya Dam එකේ තිබෙන ගල්වැට කැඩිලා, වතුර overflow වෙලා. ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ, පානීය ජලය ලබා ගැනීම සම්බන්ධවත් විශාල ප්‍රශ්නයක් මතු වුණු බව.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அங்குள்ள மக்களுக்குக் குடிப்பதற்குக்கூட, தண்ணீர் இல்லாத நிலைமை ஏற்பட்டது. இது பாரியதொரு பிரச்சினையாகும். மஹிந்த சிறிவர்தன எழுதிய இந்த வரவு செலவுத்திட்டத்தில் அது பற்றி எதுவுமே இல்லை. தூக்கி எறியவேண்டிய ஒரு வரவு செலவுத்திட்டமாகத்தான் நாங்கள் இதைப் பார்க்கின்றோம். இவ்வாறு சொல்வதையிட்டு என்னை மன்னிக்க வேண்டும். நாங்கள் அந்தப் பிரதேசத்திலிருந்து இங்கு வந்திருக்கின்றோம். எனினும், இந்த வரவு செலவுத்திட்டத்தில் அந்தப் பிரதேசம் பற்றி ஒன்றுமேயில்லை. யாரோ ஒருவர் சொல்கிறார், இதைப் பிரதேச வாரியாகப் பார்க்க வேண்டாமென்று. இது என்ன மடமைத்தனமான கதை? அவர்களே சொல்வதுபோன்று, இவ்வளவு வளங்களுள்ள கிழக்கு மாகாணத்தின் அபிவிருத்திக்காக ஒதுக்கப்படவேண்டிய நிதியை இந்தியாவிடம் பெற்றுக்கொள்ள வேண்டுமென தேசிய வரவு செலவுத்திட்டத்தில் சொல்வதற்கு உங்களுக்கு வெட்கமில்லையா? கிழக்கு மாகாணத்திலுள்ள முஸ்லிம் மக்களும் தமிழ் மக்களும் சிங்கள மக்களுக்கும் உங்களுக்கு எவ்வளவோ வாக்குகளைக் கொடுத்தார்கள். எங்களை யாரிடம் போய் காசு கேட்கச் சொல்கின்றீர்கள்? 'சும்மா' ஒரு சாட்டுக்காக expenditure proposalஇல் குறிப்பிட்டு இருக்கின்றீர்கள். அதில் Gal Oya downstream development பற்றி எதுவும் கிடையாது. ஏன்? நாங்கள் என்ன அநியாயம் செய்தோம்? அண்மையில் அங்கு ஏற்பட்ட வெள்ளப் பெருக்கால் 'A' தரப் பாதையிலுள்ள ஒரு பாலம் உடைந்துவிட்டது.

ඔය ජල ගැල්ම හේතුකොටගෙන පාලමක් කැඩිලා තිබෙනවා. ඒ පාලම පිහිටා තිබෙන්නේ "A" route එකක. ඒ, South Eastern University එක ළඟ තිබෙන පාලමක්. අපි හැමදාම එතැනින් යන්නේ, ඔලුවිල් යනකොට. මම හිතන විධියට ඒ පාලම තිබෙන්නේ A4 පාරේ. ඒ පාලම දැන් තාවකාලිකව හදලා තිබෙනවා. ලොරියක් දෙකක් ගියාම ඒකත් කැඩෙයි. ඉතින් ඒ පාලම හදන්න මෙවර අය වැයෙන් යම්කිසි ප්‍රතිපාදනයක් වෙන්කර තිබෙනවාද? නැහැ. ඇයි, ඒ? අන්දප් පාලත්තෙප් පුනරමෙප්පුච් චෙය්වතර්කාන එන්දවොරු නිදි ඒර්පාටුම් ඉන්ද වරවු සෙලවුත්තිට්ටත්තිල් කිටෙයාදු. ඒනෙන්රු එනක්කුප් පුරියවිල්ලෙ! Gal Oya Dam සාර්න්දු ඉරුක්කින්ර මිකප් පෙරිය ප්‍රච්චිනෙ එන්නවෙනිල්, අංකිරුක්කින්ර downstream management සම්පන්දමාක secondery dam - ඉරණ්ඩාම් දර dam ඔන්රු උරුවාක්කප්පට වේණ්ඩුම් එන්පදුදාන්.

තවත් දෙයක් ගැන මම අනිවාර්යයෙන් කථා කරන්න ඕනෑ. Smart irrigation system එකක් තිබෙන්න ඕනෑ, to face the climate change. දේශගුණික විපර්යාස; කාලගුණ වෙනස්වීම. ඒ කියන්නේ ගෝලීය වශයෙන් අපි මුහුණපාන කාලගුණ විපර්යාස ගැන ඔබතුමන්ලා අපට වඩා දන්නා විශේෂඥයෝ. දැන් මොකද දන්නවාද වෙන්නේ, නැහෙනහිර, උතුරු පළාත්වල? නියහය කාලයට වහිනවා; වහින කාලයට නියහය. මේක තමයි කාලගුණ විපර්යාසය. මේ සම්බන්ධයෙන් සුහුරු ලෙස මුහුණ දීම සඳහා - to face this issue smartly - වැඩ පිළිවෙළක් තිබෙනවාද?

යල කන්නය පටන් ගන්නා දින වෙනස් වෙන්න ඕනෑ. මහ කන්නය පටන් ගන්නා දිනත් වෙනස් වෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් කෘෂිකාර්මික විශේෂඥයන් විසින් යම්කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවාද? ඒ වැඩ පිළිවෙළ සඳහා ඒ විශේෂඥ දැනුම ලබා ගැනීමට මුදලක් වෙන් කර තිබෙනවාද? නැහැ. කිසිම දෙයක් නැහැ. හරිම කනගාටුයි. There is absolute disappointment regarding this particular Budget. අපි අපේ පළාත වෙනුවෙන් පෙනී සිටින මන්ත්‍රීවරු. ඔබතුමන්ලා අපේ නැහෙනහිර පළාත අනාථ කරලා, ඉන්දියාවට ගිහිල්ලා සල්ලි ඉල්ලා ගන්න කියලා කියන්න බැහැ. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි.

දැන් බලන්න, මම තව දෙයක් කියන්නම්. இந்த வரவு செலவுத்திட்டத்தில் tourist promotion பற்றி குறிப்பிடப்பட்டுள்ளது. இந்த நாட்டுக்கு அந்நியச் செலாவணியை ஈட்டிக்கொடுக்கின்ற மூன்று முக்கிய சுற்றுலா தலங்கள் உள்ள பிரதேசம்தான் கிழக்கு மாகாணம். Nilaveli in Trincomalee District, Arugam Bay and Pottuvil in Ampara District and Pasikudah in Batticaloa District. මේ දිස්ත්‍රික්ක තුනෙන්ම විදේශ සංචාරකයන් මඟින් විශාල විදේශ විනිමයක් ලබා ගන්න පුළුවන්. ඔවුන්ගේ යටිතල පහසුකම් සම්බන්ධයෙන්, ප්‍රවාහනය සම්බන්ධයෙන් මොනවාද මේකේ කියලා තිබෙන්නේ? කිසිම දෙයක් නැහැ. මට මතකයි, 1970 ගණන්වල අපි ඉස්කෝලේ යන කාලයේ ගමේ ඉඳලා කොළඹට අපි දුම්රියෙන්

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

එනවා. කොළඹ ඉඳලා ගමට යනකොට පාසිකුඩා කියලා පොඩි railway station එකක පොඩ්ඩක් නවතිනවා. නවත්වපු ගමන් backpack touristsලා එතැනින් බැහැලා පාසිකුඩා වෙරළට පයින් යනවා. දැන් මම අහන ප්‍රශ්නය මෙයයි. නැහෙනහිර පළාතේ දුම්රිය සේවා සම්බන්ධයෙන් මොනවා හරි වැඩ පිළිවෙළක් මේකේ තිබෙනවා ද? අනේ! මම කියන්න කැමැතියි, මම ඊයේ-පෙරේදා දවසකත් කාරණයක් කිව්වා. කොච්චර කිව්වත් මාව ගණන් ගන්නේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැහෙනහිර පළාතට ඔබතුමා නම් train එකේ යනවා ද කියන්න මම දන්නේ නැහැ. මම first class එකේ යනවා. First class කිව්වාට මඩකලපුව-ත්‍රිකුණාමලය දුම්රියේ නිදන කාමරවල A/C නැහැ. හැබැයි, රුපියල් 4,800ක් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල් 4,800ක් ගන්නවා. ඔබ දන්නවාද, ඒ නිදන කාමරයේ උඩ තිබෙන bed එකට නඟින්න තබා තිබෙන්නේ මොකක්ද කියලා? ඔබතුමන්ලා මම කියන එක විශ්වාස කරන්න; නැත්නම් ගිහිල්ලා බලන්න. මෙන්න මේ තරම්, අඟල් 3ක් පළල, අඟල් 5ක් දිග ඉතා කුඩා පඩිපෙළක්. ඒකත් අනාරක්ෂිතව තියලා තිබෙන්නේ. ඒක උඩ නැගලා තමයි යන්න ඕනෑ. ඒක steelවලින් හදපු එකක්. කොයි විදේශිකයා ද ඒ විධියට ගමන් කරන්නේ? ඒකේ තිබෙන toilets සම්බන්ධයෙන් මම මීට පෙර ගරු අගමැතිතුමිය ඉන්නකොටත් කිව්වා. At least long distance train එකේ තිබෙන toiletsවත් water seal කරන්න විධියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කොච්චර කාලයක් ද ඉතිරිව තිබෙන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have two more minutes.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
No, Sir, I am getting two extra minutes.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
It is after adding those extra two minutes also.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Is it? Oh, my God!

එතැන කිසිම සංවර්ධනයක් නැහැ. ඔයගොල්ලන් කියා තිබෙන පොදු ප්‍රවාහනය සහ railway සඳහා ලබාදී තිබෙන ප්‍රතිපාදන මත මුකුත්ම අපට නැද්ද?

මම තව කාරණයක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නැහෙනහිර පළාතට යනකොට මඟව හන්දිය හරහා යනවාද? මම හිතන්නේ ඔබතුමා නම් ගිහිල්ලා ඇති. ඔබතුමන්ලා දන්නවාද, මේ රටේ මඟව හන්දිය කියන තැන තිබෙනවා, දුම්රිය වංගුවක්. මේක මොන විහිළුවක්ද? වංගුවක් කියලා කිව්වාම ඔබතුමන්ලා හිතා ගන්න එපා එහේ කඳු තිබෙනවා කියලා. කිසිම කන්දක් නැහැ. මඟව හන්දියට train එකේ ගියාම -මම හිතන විධියට අපේ Backbenchersලා සියලුදෙනා ගිහිල්ලා ඇති- පැය භාගයක් නවත්වාගෙන ඉන්නවා. මොකද දන්නවාද? එන්ජින් එක ගලවලා අනෙක් පැත්තට ඇදගෙන එනවා. ඔය වංගුව කෙළින් කරන්න පොඩි මුදලයි යන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පොඩි මුදලයි යන්නේ. ඒකවත් කරලා නැහැ නේ. එතකොට විදේශිකයන් අපේ දුම්රිය ප්‍රවාහන පහසුකම භාවිත කරලා ගියාම, මඟව හන්දියේ පැය භාගයක් තියාගෙන ඉන්නවා. ඒ පැය භාගය ඇතුළත ඒ දුම්රියේ fans වැඩ කරන්නේ නැහැ. ඔබතුමන්ලා ගැන කියන්න මම දන්නේ නැහැ. නමුත්, මේ කියන ස්ථානය හරහා අපි ගොඩක් දිනවල යනවා, එනවා. Fan එක පැය භාගයක් වැඩ නොකරනකොට, මේ වාගේ නියඟය පවතින කාලයක මඟව හන්දියේ දුම්රිය නවත්වාගෙන ඉන්නකොට දරුවන් කෑ ගහනවා; අඬනවා. අපටත් නිදාගන්න බැහැ. ඇයි? එච්චරටම ඇඟට හරිම අමාරුයි. මොකද, ආපහු ඒ එන්ජිම ගලවාගෙන ඇවිත් දුම්රියේ අනෙක් පැත්තට සවි කරන්න ඕනෑ. මේ වාගේ කාරණා ගැන කවුරුවත් සොයා බලන්නේ නැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්.

දැන් මේ railway එකත් එක්ක metro bus companies ගැන ජනාධිපතිතුමා කියලා තිබෙනවා. හරි හොඳ වැඩක්. මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ ඉඳලා පොතුවිල් දක්වා ticket එකක් දෙන්න බැරි ඇයි? ඔයගොල්ලන් හිතනවා ඇති, එතැන ඉඳලා -ඒ කියන්නේ, මඩකලපුවේ ඉඳලා- කිලෝමීටර 40යි, 25යි එකතුව කිලෝමීටර 65ක් මේ railway track එක දාන්න ඕනෑ කියලා. එහෙම දමන්න ඕනෑ නැහැ. එක ticket එකක් දෙන්න. මම අරුගම්බේ යනවා නම් මට පුළුවන් වෙන්න ඕනෑ ticket එකක් අරගෙන මඩකලපුව railway station එකේ බැහැපු ගමන් මටම වෙන් කරපු ආසනයක් තිබෙන බස් එකක නැඟලා අරුගම්බේ යන්න. ඒ මුදලත් එකතු කරලා ticket එකක් දෙන්න. අපි වෙනුවෙන්, මගීන් එනකම් බස් සේවයක් තියා ගන්න බැරි ඇයි? මේ වාගේ සරල දේවල් තිබෙනවා. තවත් කරුණු කියන්න තිබුණත් මට වෙලාව නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I conclude my speech by expressing my disappointment, with all responsibility, at the irresponsible manner in which money has been allocated in this Budget for the development of the Eastern Province.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[අ.භා. 4.15]

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඊයේ සවන් දුන්නේ ජාතික ජන බලවේගය රජයේ පළමු අය වැය ලේඛනයටයි. පළමු අය වැය ලේඛනයට බොහෝදෙනකු කියනවා, මංගල අය වැය ලේඛනය කියලා. ප්‍රථමයෙන් සිද්ධ වෙන සියල්ල හොඳ නම්, ඒ වචනය පාවිච්චි කළාම ඉතාම ගැළපෙනවා. ඔව්, ඇත්තටම ඊයේ ඉදිරිපත් කළ අය වැය ලේඛනය මංගල අය වැය ලේඛනයක්. මොකද, සමාජයේ සියලුදෙනාටම එයින් සුබසෙත සැලසෙන නිසා. සමාජයේ සියලුදෙනා මත තිබෙන බර යම් මට්ටමකට හැල්ලු කරමින් ඔවුන්ගේ මුහුණට සිනහවක් ගෙනාපු නිසා අපි විශ්වාස කරනවා ඒ අය වැය ලේඛනය මංගල අය වැය ලේඛනයක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් කථා කළ ගරු මන්ත්‍රීවරයා කිව්ව පරිදි මේ අය වැය ලේඛනය යම් කිසි ප්‍රදේශයක් අත් හැරලා කියලා මට තේරුම් ගන්න බැහැ. මගේ දැක්ම, මගේ කියවීම අනුව සමස්ත ශ්‍රී ලංකානු භූමියම වැළඳ ගත්තු අය වැය ලේඛනයක් තමයි මේක. අනෙක් පැත්තෙන්, සමස්ත ශ්‍රී ලාංකීය සමාජයම වැළඳ ගත්තු අය වැය ලේඛනයක්; සමාජයේ සෑම ස්තරයක්ම ආවරණය කරමින්, අමතමින් නිර්මාණය කරපු, සකස් කරපු, සැලසුම්ගත කරපු අය වැය ලේඛනයක්. මේ අය වැය ලේඛනයේ මුඛ්‍ය හරය වචන කිහිපයකට ගන්න පුළුවන්. එකක්, සුරක්ෂිතතාව. අනෙක් එක, බලගැන්වීම. අනෙක් එක, සහභාගිත්වය නැත්නම් අන්තර්කරණය. මම මේ කාරණා කියන්නේ, මම නියෝජනය කරන ආබාධ සහිත, ආන්තිකරණයට සහ අවාසිදායක තත්ත්වයන්ට පත් වෙච්ච කණ්ඩායම් ගැන කථා කරද්දී.

මේ අය වැය ලේඛනයේ පූර්විකාවේම ඉතා ප්‍රබල කාරණයක් ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක සහෝදරයා සඳහන් කරනවා. එකක් තමයි ආබාධිත කණ්ඩායම්, අවාසි සහගත කණ්ඩායම් අනිවාර්යයෙන්ම ඔවුන් තුළ තිබෙන ආර්ථික විභව ශක්තීන් හඳුනා ගනිමින් මේ මහා ආර්ථික ප්‍රවාහයට ඇතුළත් කර ගත යුුතුයි කියන කාරණය. අන්න එහෙම වුණාම තමයි මේ ආබාධ සහිත ප්‍රජාවට මේ අවාසිදායක කණ්ඩායම් කියලා සමාජයෙන් ඈත් කරපු, කොන් කරපු කණ්ඩායම්වලට අවස්ථාවක් හම්බ වෙන්නේ අභිමානවත් ජීවිතයකට ප්‍රවේශ වෙන්න. මේ සම්බන්ධයෙන් අපි දන්නවා 1988දී ගෙනා සියයට 3ක රැකියා කෝටාවක් පිළිබඳ අදහසක් තිබෙන බව; වක්‍රලේඛයක් තිබෙන බව.

1996දී ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ගෙනැල්ලා තිබෙනවා. ඒ පනතේ වෘත්තීය පුහුණුවට ප්‍රවේශය, රැකියාවට ප්‍රවේශය කියන කාරණා අයිතිවාසිකම් විධියට පෙන්වා දී තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පනත ගෙනැල්ලා දැනට අවුරුදු 28ක් වෙනවා. අදත් ආබාධ සහිත ප්‍රජාවගෙන් සියයට 71ක් රැකියා විරහිතව, යැපුම් මට්ටමේ ඉතා දුක්ඛිත ජීවිත ගත කරමින් ගෙවල්වලට වෙලා ඉන්නවා. මෙන්න මේ ප්‍රජාව ගැන තමයි ජනාධිපතිවරයා සඳහන් කරන්නේ, ආර්ථික විභවතා හඳුනා ගනිමින් ඔවුන් මේ ආර්ථික ප්‍රවාහයට අවශෝෂණය කර ගත යුතුයි කියලා; අන්තර්ග්‍රහණය කර ගත යුතුයි කියලා. ඒ සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විශ්වාස කරනවාද, පසුගිය අවුරුදු 76 තුළම ආබාධ සහිත ප්‍රජාව පිළිබඳව නිසි සංගණනයක් සිද්ධ වෙලා නැහැ, දත්ත එකතු කිරීමක් සිද්ධ වෙලා නැහැ කිව්වාම? එවැන්නක් සිද්ධ වෙලා නැහැ. ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ අය වැය ලේඛනයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කරනවා, ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ පුළුල් දත්ත සමුදායක් ස්ථාපිත කිරීම සඳහා. දත්ත නැතිව කොහොමද විද්‍යාත්මක ප්‍රවේශයකින් විද්‍යාත්මකව ප්‍රතිපත්ති ගොඩනඟන්නේ, සැලසුම් හදන්නේ? මා හැම දාම කියනවා වාගේ අවුරුදු 76ක් තිස්සේ ඒගොල්ලෝ කරලා තිබෙන්නේ මොකක්ද? තොරතුරු නැතිව, විද්‍යාත්මක යැයි තමතමන්ම උපකල්පනය කරපු ක්‍රමවේද හරහා කටයුතු කිරීමයි. ආබාධ සහිත ප්‍රජාව බලගන්වනවා කිව්වා, සුබසාධනය සලසනවා කිව්වා, අයිතිවාසිකම් දෙනවා කිව්වා. අන්තිමට බැලුවාම කිසිම දෙයක් නැහැ; පුස්ස බින්දා වාගෙයි. ආබාධ සහිත ප්‍රජාව තවතවත් දුකින් දුකට පත් වෙමින්, ආන්තිකරණයට ලක් වුණු කණ්ඩායම් තවදුරටත් ආන්තිකරණයට ලක් වෙමින්, අවාසිදායක තත්ත්වයන්ට මුහුණ දීපු ජනතාව තව තවත් අවාසිදායක තත්ත්වයන්ට මුහුණ දෙමින් දුක්ඛිත ජීවිතයක් තමයි ගත කරන්නේ. අපි මේක දන්නවා. අපි මේ ගැන දන්නේ, රට පුරා යමින් ඔවුන්ගේ සපත්තුවට බැහැලා ඔවුන්ගේ ජීවිතය තේරුම් ගන්න දරන උත්සාහය තුළයි. දත්ත නැත්නම් ලංකාවේ හරිහමන් විද්‍යාත්මක categorization එකක්, ආබාධිතතාව පිළිබඳව වර්ගීකරණයක් කොහෙත්ම නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පනත ගෙනැල්ලා අවුරුදු 28යි. නමුත්, වර්ගීකරණයක් හදා ගන්න බැරි වෙලා තිබෙනවා. තවමත් අපට හිතෙන විධියට අපි කියනවා ශාරීරික ආබාධ තියෙන අය, දෘශ්‍යාබාධිත අය, ශ්‍රව්‍යාබාධිත අය, බුද්ධි වර්ධන ඌනතා තිබෙන අය, මනෝ සමාජ ප්‍රශ්න තිබෙන අය කියලා. ලියුකේමියාව, තැලසීමියාව, මිහිමිත් ජනතාව - little people - ආදි කණ්ඩායම් ද ඇතුළත් කරගෙන විද්‍යාත්මක පදනමකින් ක්‍රමවේදයක් හදන්න ඕනෑ, ආබාධ සහිත පුද්ගලයන් වර්ගීකරණය කරන්න. අන්න එවන් තත්ත්වයක් තුළ තමයි ප්‍රතිපත්තියක්, සැලසුමක්, වැඩ පිළිවෙළක් අනුව මේ ප්‍රජාව සමාජගත කරන්න අපට පුළුවන් වන්නේ.

මගේ පළමුවෙනි කථාවේදීත් කියපු කාරණයක් ඇත්තෙන්ම දැන් ඉෂ්ට සිද්ධ වෙලා තිබෙනවා. ඒ ගැන හරිම සතුටුයි. ආබාධ සහිත පුද්ගලයන්ට ලබා දෙන දීමනාව රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ මුදල නිශ්චිතව නිශ්චිත දිනයක, අපහසුතාවකින් තොරව ආබාධ සහිත පුද්ගලයාගේ අතට ලැබෙන්න සලස්වනවා නම්, ඔබේ ප්‍රාර්ථනාව ඉටු වේවි; අප දිනා

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

ගත්තු දේ ලබා ගන්න අපට තවත් පහසු වේවි; තවත් සරල වේවි; ආබාධ සහිත පුද්ගලයා පීඩාවෙන් පීඩාවට පත් වන එක නතර වේවි.

ආබාධ සහිත ප්‍රජාව පිළිබඳ තවත් ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, ඔවුන් පාවිච්චි කරන උපකරණ, ඔවුන්ගේ ආබාධිතතා අවම කිරීමට පාවිච්චි කරන උපකරණ පිට රටින්ම ගෙන්වීම. ඒවා දේශීයව නිෂ්පාදනය වෙන්නේ නැහැ. හැබැයි ඒවා දේශීයව නිෂ්පාදනය කිරීමේ හැකියාව නැත්තේ නැහැ.

අමුද්‍රව්‍ය සහ තාක්ෂණය තිබෙනවා. මේවා කළමනාකරණය කිරීමයි අවශ්‍ය වෙලා තිබෙන්නේ. අන්න ඒ වෙනුවෙන් මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා, ආබාධ සහිත වූවන් සඳහා සහායක උපකරණ, මෙවලම් නිෂ්පාදනය කිරීමේ ආරම්භයක් රාගම ප්‍රදේශයෙන් ලබා දීමට. මේක ඉතා ප්‍රශස්ත වැඩක්. රෝද පුටුව, අත්වාරුව, කිහිලිකරුව, බ්‍රේල් උපකරණ ආදී මේ ඔක්කොම රටින් එන කල් අපි හූල්ල හූල්ල ඉන්නේ ඇයි? අපි අපේ නිෂ්පාදන පාවිච්චි කරමු. දෙපා අහිමි කෙනාට මේ මහ පොළොවේ අමුද්‍රව්‍ය යොදාගෙන, මේ මහ පොළොවේ ඉපදිච්ච විද්‍යාඥයන්, තාක්ෂණවේදීන් යොදාගෙන අපි දෙපයක් නිර්මාණය කරමු. ඉන්දියාව කරන්නේ එහෙමයි. අපි රෝද පුටුව දියුණු කරමු, විද්‍යුත් රෝද පුටුවක් දක්වා. එතකොට ඔබට මහා මාර්ගයේ දැනට දකින්න නොලැබෙන රෝද පුටු භාවිත කරන සහෝදර සහෝදරියන් දකින්න ලැබේවි.

අපට තිබෙන ගැඹුරුම ප්‍රශ්නයක් තමයි, මා හැම දාම මතු කරන ප්‍රවාහන ප්‍රශ්නය. මේ තිබෙන පෞද්ගලික බස්වලට, මේ තිබෙන SLTB බස්වලට ආබාධ සහිත පුද්ගලයන්ට -විශේෂයෙන් රෝද පුටු භාවිත කරන සහෝදර සහෝදරියන්ට, චලන ආබාධ තිබෙන සහෝදර සහෝදරියන්ට- නඟිනවා නියා හිතන්නවත් බැහැ. ඒ අය වෙනුවෙන් මේ අය වැයෙන් යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඒ තමයි, SLTB එකටත්, පෞද්ගලික ප්‍රවාහන අංශයටත් පහත් පතුල් සහිත බස් රථ ගෙන්වීම. මේවා තමයි නිර්මාණය කරන කොළඹ ආශ්‍රිත ප්‍රධාන මාර්ග කොරිඩෝ 5හි ධාවනය කරන්න ලැබෙන බස්රථ. මේක තමයි ලක්ෂ සංඛ්‍යාත ආබාධ සහිත ප්‍රජාවගේ බලාපොරොත්තුව. ස්වාධීනව බස් රථයට ගොඩ වෙලා, තමන්ගේ චලන අවශ්‍යතාව, තමන්ගේ සංචලන අවශ්‍යතාව ඉෂ්ට සිද්ධ කර ගැනීම තමයි ඔවුන්ගේ බලාපොරොත්තුව. එවිට බස් ටිකට් එකකට පොදුවේ හැමෝටම වැය වන මුදලකට ආබාධ සහිත ප්‍රජාවටත් යන්න පුළුවන් වෙනවා. එහෙම නැත්නම් ඒ සහෝදරවරුන්ට සිදු වෙනවා, පෞද්ගලිකව කුලී රථ පාවිච්චි කරන්න. ඒක අධික වියදමක්. ඒ අධික වියදම දරන්න වෙන්නේ ආබාධිත ප්‍රජාවට ප්‍රවාහන පහසුකම් සපයන්න අපේ ප්‍රවාහන පද්ධතිය අපොහොසත් වීම නිසායි. මේක තමයි ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් අන්තර්කරණීය පළමුවැනි ප්‍රවේශය. මෙය අපේ පළමුවෙනි අය වැය. මම හිතනවා, අවුරුදු පහක් යන කොට ප්‍රවාහනය, මහා මාර්ග ආබාධිත සහිත ප්‍රජාවට අනිවාර්යයෙන් හිතකර වේවි කියලා.

අපේ අය වැය ලේඛනයෙන් තවත් වැදගත් කාරණයක් මතු කරනවා. ඒ තමයි, රැකවරණ සහ කුසලතා වර්ධන ස්ථාන පිහිටුවීම. විශේෂයෙන් ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ තත්ත්වයන් පිළිබඳව මුල් ළමා වියේදී, විශේෂයෙන් උපතේ සිට පළමුවැනි තුන් මාසයෙන් පස්සේ හඳුනා ගැනීම සිදු කළොත් අප අසා තිබෙන පරිදි, විශේෂඥයන්ගේ අදහස් පරිදි ඒ ළමයින් ඉතා ඉහළ මට්ටමකට, ප්‍රශස්ත මට්ටමකට සංවර්ධනය කරන්න හැකියාව ලැබෙනවා. අනෙක් පැත්තෙන්, ඒ වාගේ ආබාධ සහිත ප්‍රජාවගේ බිහි වීම යම් ප්‍රතිශතයකින් ඉහළ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ රජය අවධානය යොමු කිරීම ඉතාම වැදගත්. වැදගත්ම දේ තමයි, ඉදිරි මාස අට තුළ එකී ස්ථාන නිර්මාණය කරලා ප්‍රවේශ පහසුකම් සහිතව විශේෂඥයන් ඒ සඳහා යොදවමින් ඒ වූවා දරුවන්ගේ රැකවරණය, සුරක්ෂිතතාව තහවුරු කර සමාජ සංවර්ධනයට දායක කරගැනීමේ මංපෙත් හැදීම.

අපි ආඩම්බර වෙනවා, සෞඛ්‍යයට විශාල මුදලක් වෙන් කරපු අය වැය මේ අය වැය ලේඛනය වීම ගැන. ඒ වෙන් කර තිබෙන විශාල මුදල තුළ අනිවාර්යයෙන්ම ආබාධ සහිත තැනැත්තන් ඒ ආබාධ සහිත තත්ත්වයන්ගෙන් මුදා ගැනීමේ අවස්ථාව නිර්මාණය වනවා ඇති. කලින් වාගේ හානිකර බෙහෙත් ඇස්වලට දාලා දෘශ්‍යාබාධිතයන් බිහි කරන සෞඛ්‍ය ක්‍රමයක් යළි ඇති නොවේවි. මෙය, එවැනි පශ්චාත්තාපයක් ඇති කරන ඇමතිවරු නැති සෞඛ්‍ය සේවයක් වේවි. රෝහලට යන තැනැත්තන් මල්ශාලාවෙන් ගමන අවසන් නොකරන සුව, සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහි කිරීමට මේ මුදල් ඉවහල් වේවි.

ඊළඟට, අධ්‍යාපනය. අධ්‍යාපනයටත් ඉතා ඉහළ වටිනාකමක් ලබා දෙමින් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. මේ ප්‍රතිපාදන තුළින් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරිය විධියට ගරු අග්‍රාමාත්‍යතුමිය විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහ විශේෂ අවශ්‍යතා සහිත කණ්ඩායම් සඳහා සැලකිය යුතු මට්ටමින් උපකරණමය, තාක්ෂණිකමය, ගුරු පුහුණුමය පහසුකම් නිර්මාණය කරමින් එම අංශයත් ආවරණය කරයි කියන විශ්වාසය අපට තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආබාධ සහිත ලක්ෂ සංඛ්‍යාත ප්‍රජාවගේ අභිමතාර්ථවලින් විශාල කොටසක් පූරණ කර ගැනීමට හැකි වුණු බව දුරකථනවලින් රටේ හවස ඉඳන් මට වාර්තා කරනවා. ඇත්තෙන්ම, ආඩම්බරයි, සන්තෝෂයි, මෙවැනි අය වැය ලේඛනයකට එක අතක් නොවෙයි, අත් දෙකම ඔසවලා ප්‍රතිචාර දක්වන්න, සම්මත කරන්න දායක වීමට හැකි වීම ගැන. අවසාන වශයෙන් තව එක කාරණයක් කියන්න ඕනෑ.

අපට ඇහුණා, ජල ප්‍රහාරවලට ලක් වූ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට අපි සැලකුවා මදි කියනවා. ඒ ජල ප්‍රහාරවලට ලක් වූ අයගේ පැත්තේ ඉඳගෙන නොවෙයි, ජල ප්‍රහාර එල්ල කරපු අයගේ පැත්තේ ඉඳගෙන කිඹුල් කඳුළු හෙළන කට්ටියට මේ කාරණය කියන්න ඕනෑ. අපි ශිෂ්‍ය ව්‍යාපාර හරහා මතු වුණු දේශපාලන ව්‍යාපාරයක්. විශ්වවිද්‍යාල ශිෂ්‍යයා කියන්නේ අපේ දේශපාලන ව්‍යාපාරයේ ගාමක බලවේගය. ඔවුන් අමතක කරන සිරිතක්, ඔවුන් අමතක කරන ක්‍රමයක් අප තුළ නැහැ. ශ්‍රී ලාංකික සමාජය වැලඳ ගත්ත මේ ක්‍රමය, මේ අය වැය ලේඛනය තමයි අපේ ගමනේ පළමු පියවර. ඉදිරි අවස්ථාවලදී මීටත් වඩා සුබදායී, ජනසෙත සඳන, ජනතාවාදී අය වැය ඉදිරිපත් වේවි. ඒ සඳහා විපක්ෂයේ සියලුදෙනාගේම සහයෝගයත් ප්‍රාර්ථනා කරන අතර, මට

ලබා දුන් මේ අවස්ථාවට, මට ලබා දුන් කාලයට බෙහෙවින්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නන්ද බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

ගරු නන්ද බණ්ඩාර මහතා
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසය වෙනස් කරමින් නව පුනරුදයකට මඟ කියන ජාතික ජන බලවේගයේ මංගල -පළමු- අය වැය ඊයේ අපේ පක්ෂ නායක අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විසින් මේ රටේ ජනතාවට ඉදිරිපත් කරනු ලැබුවා. විධායක ජනාධිපතිවරයා විධියට අනුර කුමාර දිසානායක සහෝදරයා තේරී පත් වෙලා, අපට ආණ්ඩු බලය ලැබිලා මාස පහක් වනවා. අපට රාජ්‍ය බලය ලැබිලා මාස තුනක් යනකොට අපට පුළුවන්කම ලැබුණා අපේ මංගල අය වැය ඉදිරිපත් කරන්නට. අය වැය ලේඛනයක් කියන්නේ, ඉදිරි වර්ෂය සඳහා රජයක් විසින් කළ යුතු වියදම් පිළිබඳව ඉදිරිපත් කිරීමක් සහ එම වියදම් පියවා ගැනීම සඳහා ආදායම් උපයා ගන්නා මාර්ග දැක්වෙන විධිමත් සංයුක්ත ලේඛනයක්. මාලිමා ආණ්ඩුවේ මංගල අය වැය තුළ මේ රටේ රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, චතුක්ෂේත්‍රය, සමස්ත ගොවි ජනතාව වාගේම, කර්මාන්ත ක්ෂේත්‍රය, සංචාරක ව්‍යාපාරය ආදි අංශ සඳහාත් විශාල ප්‍රාග්ධන ආයෝජනයක් කරලා තිබෙනවා. මේ අය වැය කථාව අහලා, මේ රටේ දුකින්, වේදනාවෙන් හා ආතතියෙන් පීඩිත මිනිසුන් ඉතාම සතුටින් ඉන්න මොහොතක, මේ අය වැය හරියට තේරුම් ගන්න බැරිව විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු විවිධාකාරයේ voice-cuts දෙනවා මාධ්‍ය තුළින් අපි දැක්කා. ඒ තමයි නිල්, කොළ දේශපාලනය නියෝජනය කරලා, ඒ කාලයේ අය වැය තුළින් මේ රටේ ජනතාවට බදු බර පටවලා, ජනතාව ණය උගුල්වල හිර කරවපු මේ රටේ හිටපු පාලක පන්තියේ අය.

දේශපාලනය, බලය තමන්ගේ සදාකාලික උරුමයක් විධියට විශ්වාස කරගෙන මේ රටේ පාලන බලය හොබවපු, පසුගිය මැතිවරණ දෙකේදීම මේ රටේ ජීවත් වන සිංහල, දමිළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන සමස්ත ජනතාව එකතු වෙලා බලයෙන් පහ කරපු, නැත්නම් එළවා දමන ලද, ඒත් අද අප ඉදිරියේ විපක්ෂයේ වාඩි වෙලා ඉන්න අයට බලය අහිමි වීම නිසා, වරප්‍රසාද අහිමි වීම නිසා මේක දරාගන්න අමාරුයි. කිහිපදෙනෙක් -ඉතාම අල්ප පිරිසක්- මේ ජනතාවාදි අය වැයේ යම් යම් කරුණු සාධනීයව දැක්කත්, විපක්ෂයේ බහුතරයක් මන්ත්‍රීවරු මේක දකින්නේ ඉතා නරකම අය වැයක් විධියට. දේශපාලන වශයෙන් අසමගිව ඉන්න විපක්ෂයේ අයට සමගි සම්පන්නව මේවාට මුහුණ දෙන්න බැරි තත්ත්වය නිසා අද ඉතාම අසරණව මේ අය වැය මහා පරිමාණයෙන් විවේචනය කරනවා.

ඊයේ මාධ්‍යයට voice-cuts දීපු මන්ත්‍රීවරයෙක් මේක රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ තුන්වැනි අය වැය විධියට, එහෙම නැත්නම් ඔහුගේ අය වැයේ දිගුවක් විධියට හඳුන්වනවා අපි දැක්කා. රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක එක ගෙයි ජීවත් වුණු, මම නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ, මම නියෝජනය කරන මාවනැල්ල ආසනයේ පදිංචි කබීර් හෂීම් මැතිතුමා කිව්වා, "මේ අය වැය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අය වැයක්. මේකේ අලුත් මොකුත් නැහැ. අලුත් තත්ත්ව කිසිවක් නැහැ. මේක ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් හදපු අය වැයක්" කියලා. අපට අද එතුමන්ලා ගැන තිබෙන්නේ ලොකු කනගාටුවක්. එතුමන්ලාගේ දුක, වේදනාව අපට තේරෙනවා. මේ අය වැය තුළින් කිසිදු මන්ත්‍රීවරයෙකුට, ඇමතිවරයෙකුට මෙතෙක් කල් ලැබුණු වරප්‍රසාද ලැබිලා නැහැ. මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට, පාලකයන්ට වෙන් වුණු වරප්‍රසාද වෙනුවට, මේ රටේ ජීවත් වන සමස්ත ජනතාවට තමයි මේ අය වැයෙන් සියලු පහසුකම්, සියලු අයිතිවාසිකම් වෙන් කරලා තිබෙන්නේ. අපේ රජයේ පළමුවන අය වැය විධියට මේ අය වැය රටේ සමස්ත ජනතාවගේම සැලකිල්ලට ලක් වෙච්ච අය වැයක්. එහෙම නම් අපට කියන්න තිබෙන්නේ විපක්ෂය ගැන ඉතාම කනගාටුයි කියන එක විතරයි. මේ රටේ ආර්ථිකය බිමටම සමතලා කර තිබෙන මොහොතක අද මේ විපක්ෂයේ අය මොනවාද කියන්නේ? ඒ බිමට සමතලා කරපු ආර්ථිකය නැවත ගොඩ නඟනකොට මහා පරිශ්‍රමයක්, වෙහෙසක් දරන්න වෙනවා. ආණ්ඩු පක්ෂය විධියට මොන දුෂ්කරතා තිබුණත්, මීට පෙර ආණ්ඩුවල හිටපු අය ලබපු වරප්‍රසාද නොගත් නිසා තමයි මේවාගේ අය වැයක් අපට ගෙන්න පුළුවන් වෙලා තිබෙන්නේ. මේ අය වැය සහනවලින් පිරුණු අය වැයක් විධියට අපි හඳුන්වන්න කැමතියි. ඒ නිසා ඉතාම සාධනීය විධියට මේ අය වැය යෝජනාවලිය දිහා බලන්න කියලා මම විපක්ෂයට ආරාධනා කරනවා. මේ රට ගොඩ නඟන දියුණු විද්‍යාත්මක වැඩ පිළිවෙළක් සහිතව අපි රටේ ජනතාවත් එක්ක ඉදිරියට ගමන් කරනවා.

මේ අය වැය තුළින් දේශපාලකයන්ගේ සැප අඩු වෙනවා වාගේම, සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න අවශ්‍ය සියලු ආකාරයේ තීන්දු තීරණ ගන්නවා. ඒ වාගේම, දේශපාලකයන්ගේ පැත්තේ වැය ශීර්ෂ කපලා ජනතාවගේ පැත්තේ වැය ශීර්ෂ වැඩි කරපු අය වැයක් විධියටත් අපි මේ අය වැය දකිනවා.

පක්ෂයක් විධියට අපි මේ රට ගොඩ නඟන කාර්යයේදී මූලිකවම අවධානය යොමු කරන ප්‍රධාන අංශ දෙකක් තිබෙනවා. ප්‍රධාන කුලුනු දෙකක් අපි හඳුනාගෙන ඉන්නවා. එහි පළමුවැනි පියවර තමයි සෞඛ්‍යය සහ පෝෂණය. දෙවැනි පියවර තමයි අධ්‍යාපනය. රටක සෞඛ්‍ය සම්පන්න ජනතාවක් නැත්නම් අනාගත රටේ ශ්‍රම බලකාය ශක්තිමත් වෙන්නේම නැහැ.

මේ අය වැයෙන් විශාලම මුදලක් වෙන් කර තිබෙන්නේ මේ රටේ මූලික සෞඛ්‍ය පහසුකම් ලබා දීමට අදාළව. අත්‍යවශ්‍ය ඖෂධ ආදිය සඳහාත්, රෝහල්වලට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් ඒවා නවීකරණය කරදීම සඳහාත් මේ අය වැය තුළින් සුවිශාල මුදලක් වෙන් කර තිබෙනවා.

ඊළඟට, අධ්‍යාපනය. මම කලින් කිව්වා වාගේම සෞඛ්‍ය සම්පන්න දරුවෙක් නොවුණොත්, නිවැරදි අධ්‍යාපනයක් දෙන්නට බැහැ; නිවැරදි මඟ පෙන්වීමක් කරන්නට බැහැ. මෙවර අය වැයෙන් සෞඛ්‍යයට වෙන් කළ මුදලට පසුව වැඩිම මුදලක් වෙන් කර තිබෙන්නේ අධ්‍යාපනය වෙනුවෙන්. ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතීයික අධ්‍යාපනය සහ තෘතීයික අධ්‍යාපනය වෙනුවෙන් සුවිශාල මුදලක් මේ තුළ වෙන් කර තිබෙනවා. පෙර පාසල් ගුරුවරියන් වෙනුවෙන්, පෙර පාසල් දරුවාට ලබා දෙන ආහාර වේල වෙනුවෙන්, පාසල් යන දරුවන්ගේ සියලු අවශ්‍යතා වෙනුවෙන්, දරුවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන්, දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම වෙනුවෙන්, වසා තිබෙන ගුරු විද්‍යාල යළි විවෘත කර විධිමත්, ක්‍රමවත් ගුරු පුහුණුවක් ලබා දීම වෙනුවෙන් මේ අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, විශ්වවිද්‍යාල දරුවන්ගේ නේවාසික පහසුකම් වැඩිදියුණු කරන්න, විශ්වවිද්‍යාල දරුවන්ට ලබා දෙන මහපොළ ශිෂ්‍යාධාරය ඇතුළු අනෙකුත් ශිෂ්‍යාධාර වැඩි කරන්න මේ අය වැයෙන් තීන්දු අරගෙන තිබෙනවා.

මම නියෝජනය කරන්නේ ගුරු පරපුර. මම නියෝජනය කරන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න සුවිශාල පිරිසක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. එහෙම නම් අපට අත්හළ නොහැකි වගකීමක් තිබෙනවා. ඒ ක්ෂේත්‍රයේ අය වෙනුවෙන් අපි කථා කළ යුතුයි. මේ අය වැය තුළින් සමස්ත රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීමට සාපේක්ෂව, මේ රටේ ගුරු වෘත්තිය තුළ සිටින සියලු ශ්‍රේණිවල ගුරුවරුන්ගේ ජීවන

[ගරු නන්ද බණ්ඩාර මහතා]

තත්ත්වය උසස් කිරීම සඳහා ඉතාම සාධාරණ වැටුප් වැඩිවීමක් සිද්ධ කර තිබෙනවා. ඒ අනුව 2/3ට වඩා වැඩි ප්‍රමාණයක වැටුප් වැඩිවීමක් මේ අය වැය තුළින් ලබා දී තිබෙනවා. මේ රටේ සමස්ත ගුරු ප්‍රජාවම මේ කාර්යය ඉතා ඉහළින් අගය කරනවා. ණය බරින් පීඩිත රාජ්‍ය සේවකයන් අතර සියයට 95ක්ම සිටින්නේ ගුරුවරු, විදුහල්පතිවරු සහ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිටින අනෙකුත් අය කියලා මම හිතනවා. රැකියාව කිරීමේ මානසික සැහැල්ලුවක් නැති තරමට ආතතියෙන්, වේදනාවෙන්, පීඩනයෙන් සිටින ගුරුවරු තමයි මේ රටේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්නේ. ඒ නිසා මේ අය වැය තුළින් ඒ අයට මේ ආකාරයේ විශාල වැටුප් වැඩිවීමක් කරන්නට ලැබීම ගැන අපි සතුටු වෙනවා.

ඒ වාගේම, විශ්‍රාමිකයන්ට ලබා දෙන විශ්‍රාම වැටුප අතීතයට බලපාන පරිදි විශාල ප්‍රමාණයකින් වැඩි කරලා තිබෙනවා. ඒ අනුව 2018ට පෙර විශ්‍රාම ගිය අපේ ආදරණීය විශ්‍රාමික වැඩිහිටියන් වෙනුවෙන් 2018ට අදළාව එම වැටුප් වැඩිවීම ගැළපුම් කර තිබෙනවා. ඒ විධියටම ඉදිරියටත් විශ්‍රාමිකයන් සඳහා විශාල සහනයක් මේ අය වැය තුළින් ලබා දීලා තිබෙනවා.

වංචාව, දූෂණය, හොරකම පිටුදකිනවා වාගේම, මේ අය වැය තුළින් ලැබෙන සියලු ප්‍රතිපාදන ගම් මට්ටම, බිම් මට්ටම දක්වා යනකොට ඒ මුදල් හොරකම් කරන්න හෝ වංචා කරන්න හෝ තමන්ගේ ඥාතීන්ට කොන්ත්‍රාත් දෙන්න හෝ ඒ ආකාරයේ වෙනත් කිසිදු කටයුත්තකට අපේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කිසිදු ඇමතිවරයෙක්, කිසිදු මන්ත්‍රීවරයෙක් යොදවන්නේ නැහැ කියලා අපි ඉතා නිහතමානීව මේ රටේ ජනතාවට සහතිකයක් දෙනවා. විවෘත ටෙන්ඩර් පටිපාටියක් ඇතිව ඉදිකිරීම් කාර්යයන්වලදී සහ අනෙකුත් කාර්යයන්වලදී ඉතා විනිවිද ආකාරයෙන් මේ මුදල් මේ රටේ ජනතාව වෙනුවෙන් ආයෝජනය කරන්න අපි සූදානමින් ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසන්.

ගරු නන්ද බණ්ඩාර මහතා
(මාණ්පුමිකු නන්ත පණ්ටාර)
(The Hon. Nanda Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න.

අපේ සුගත් සහෝදරයා කිව්වා වාගේම, මෙතෙක් කල් කිසිදු පාලකයෙකුගේ අවධානයට යොමු නොවුණු කාරණයකට මේ අය වැය තුළින් අවධානය යොමු කර තිබෙනවා. ඒ අනුව ආබාධිත, අසරණ දරුවන් වෙනුවෙන්, වැඩිහිටියන් වෙනුවෙන් අවශ්‍ය පහසුකම් ලබා දීමට අදාළ ක්‍රියාමාර්ග මේ අය වැය තුළ ගෙන තිබෙනවා. අපට අදාළ සමස්ත වියදම් ශීර්ෂ පිළිබඳව වාගේම, ලැබිය යුතු ආදායම් ශීර්ෂ පිළිබඳවත් සම්පූර්ණ වගකීමක් සහිතව මේ අය වැය ඉදිරිපත් කර තිබෙනවා කියන කාරණයත් මතක් කරනවා. අපි ජනතාවට ඉදිරිපත් කරපු පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් කියන අරමුණ ජයග්‍රහණය කරන තෙක් අපේ අරගළය, අපේ සටන මේ රටේ ජනතාව වෙනුවෙන් දියත් කරන්න සූදානම් කියන පණිවුඩයත් ලබා දෙමින්, සියලු ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින්, ඉහළ සෞඛ්‍ය මට්ටමක්, ඉහළ අධ්‍යාපන මට්ටමක් තුළින් ඉතා ශක්ති සම්පන්න අනාගත පරම්පරාවක් මේ රටේ බිහි කරන්න අවශ්‍ය මූලික අඩිතාලම දැමීම සඳහා මේ අය වැය ඉදිරිපත් කරන්න ලැබීම ගැන නැවතත් අපේ සතුට, ප්‍රසාදය පළ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මැතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.46]

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, නමදු සනාතිපති අවර්කළාල් නේර්න්දු මුන්වෛක්කප්පට්ට ඉන්ත වරුඩ වරවු සෙලවුත්තිට්ටත්තිල් උණ්මෛයිලේ මක්කළ් පයන්පෙරක්කූඩිය සිල විඩයංකළ්, තිට්ටංකළ් ඉරුක්කින්රන. නාංකළ් එතිර්ක්කට්සියිනර් එන්පතනාල්, මක්කළ් නන්මෛයඩෛකින්ර අල්ලතු නාට්ටුක්කු නල්ලවකෛයාන තිට්ටංකළෛ එතිර්ප්පවර්කළ් අල්ලර්. ආනාල්, උංකළෛ වළිනඩත්තවේණ්ඩිය පාරිය පොරුප්පු එංකළුඩෛය කෛකළිල් වළංකප්පට්ටිරුක්කින්රදු එන්පතෛක් කෞරව ආළුංකට්සි උරුප්පිනර්කළුක්කු නාන් සොල්ල වේණ්ටුම්.

මාණ්පුමිකු සනාතිපති අනුර කුමාර තිසානායක්ක අවර්කළෛප් පොරුත්තවරෛ ඉන්තප් පාරාළුමන්රත්තිල් එතිර්ක්කට්සියිල් ඉරුන්තුකොණ්ටු, ආළුංකට්සික්කු ඔරු පඩිප්පිනෛයාක අමෛයක්කූඩියතාක ඔව්වොරු විඩයංකළෛයුම් පේසිප්පේසි ආළුංකට්සියෛ වළිනඩාත්තිය ඕර් අනුපවම් අවරුක්කු ඉරුක්කින්රදු. ඉන්තප් පාරාළුමන්රත්තිල් එතිර්ක්කට්සි උරුප්පිනර්කළාක නාංකළ් 64 පේර් ඉරුක්කින්රෝම්; ආළුංකට්සියිල් 159 පේර් ඉරුක්කින්රීර්කළ්. උංකළිඩම්තාන් අතිකාරම් වළංකප්පට්ටිරුක්කින්රදු. නීංකළ් අතිකමාන වාක්කුරුතිකළෛ ඉන්ත නාට්ටු මක්කළුක්කු අළිත්තිරුක්කින්රීර්කළ්. කඩන්ත කාලංකළිල් ආට්සි සෙය්තවර්කළින් තවරුකළාල් උංකළුක්කු අතිකමාන මක්කළ් වාක්කළිත්තිරුක්කින්රාර්කළ්; ඉතෛ නාංකළ් ඒර්රුක්කොළ්කිරෝම්. අන්ත වකෛයිල්, උංකළෛ වළිනඩත්තවේණ්ඩිය ඔරු කඩමෛ එංකළුක්කු ඉරුක්කින්රදු. එනවේ, ඉංකේ නාංකළ් තෙරිවික්කින්ර කරුත්තුකළෛයුම් නීංකළ් කවනත්තිල් එඩුක්ක වේණ්ටුම්.

ඉන්රු අල්ලතු නාළෛ උංකළෛ ආට්සියිලිරුන්තු විලක්කිවිට්ටුත් තාංකළ් ආට්සික්කු වරවේණ්ඩුමෙන්ර මනප්පාංකුඩන් එතිර්ක්කට්සියිල් ඉරුක්කින්ර සිල කෞරව උරුප්පිනර්කළ් ඉන්තච් සපෛයිල් නඩන්තුකොළ්වතු මිකවුම් කවලෛයාන විඩයම්. ආළුංකට්සික්කු එව්වළවු පොරුප්පිරුක්කින්රතෝ, අතේපෝන්රු ඉන්තප් පාරාළුමන්රත්තෛ, ඉන්ත අරසාංකත්තින් ආට්සියෛ වළිනඩත්තවේණ්ඩිය පාරිය පොරුප්පු එතිර්ක්කට්සියිනරාකිය එංකළුක්කුම් ඉරුක්කිරදු. එනවේ, එංකළුඩෛය යෝසනෛකළෛයුම් වරවු සෙලවුත්තිට්ටම් තොඩර්පාක එමදු පාරාළුමන්ර උරුප්පිනර්කළ් තෙරිවික්කින්ර කරුත්තුකළෛයුම් නීංකළ් කවනත්තිලෙඩුත්තු, උංකළුඩෛය නඩවඩික්කෛකළෛච් සීර්සෙය්යවේණ්ඩුමෙන්රු නාන් කේට්ටුක්කොළ්කිරේන්.

උණ්මෛයිලේ, නේර්රු මාණ්පුමිකු සනාතිපති අවර්කළුඩෛය වරවු සෙලවුත්තිට්ට උරෛයෛක් කේට්ටපෝදු නාංකළ් එල්ලෝරුම් සන්තෝසමඩෛන්තෝම්. අදුමාත්තිරමල් ලාමල්, නේර්රු නඩෛපෙර්ර උළ්ළූර් අතිකාරසපෛත් තේර්තල් තොඩර්පාන තිරුත්තච් චට්ටමූලත්තෛයුම් නාංකළ් - එතිර්ක්කට්සියිනරුම් ආළුංකට්සියිනරුම් - ඔන්රාකච් චේර්න්දු ආතරිත්තු, අත්තේර්තලෛච් සන්තිප්පතර්කුත් තයාරාකියුළ්ළෝම්. ආනාල්, අත්තේර්තල් සම්පන්තමාකප් පේසිය සිල

உறுப்பினர்கள், ஏதோ எதிர்க்கட்சியினராகிய நாங்கள் அதனை எதிர்நோக்கப் பயந்ததுமாதிரி இங்கே பேசினார்கள். நாங்கள் பயப்படவில்லை. எங்களுக்குக் கடமை இருக்கிறது; எங்களுக்கு ஒரு தர்மம் இருக்கிறது. அந்த வகையில், நாங்கள் எந்தவொரு தேர்தலையும் சந்திப்பதற்குத் தயாராக இருக்கின்றோம். அதுபோல, இந்த நாட்டு மக்கள் எதிர்பார்க்கின்ற அத்தனை விடயங்களையும் செய்து கொடுக்கவேண்டிய பொறுப்பு உங்களுக்கிருக்கின்றது. உங்களுடைய காலத்திற்குள் நீங்கள் நல்லதைச் செய்ய வேண்டுமென்பதுதான் எங்களுடைய எதிர்பார்ப்பு.

நான் முன்னர் குறிப்பிட்டதுபோன்று, இந்த வரவு செலவுத்திட்டத்தைப் பொறுத்தவரையிலே சில நல்ல விடயங்கள் இருக்கின்றன; அதை நாங்கள் வரவேற்கின்றோம். ஆனால், குறிப்பாக கிழக்கு மாகாண மக்கள் மத்தியிலே நேற்றிலிருந்து பாரிய அதிருப்தி ஏற்பட்டிருக்கிறது. கிழக்கு மாகாணத்தில் முன்னொருபோதுமில்லாமல் சிங்களவர், தமிழர், முஸ்லிம்கள் என மூவின மக்களும் உங்களுக்கு அதிகமாக வாக்களித்திருக்கின்றார்கள். பாராளுமன்றச் சபை முதல்வர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் இங்கு பேசும்போது, "நாங்கள்தான் முஸ்லிம்களுடைய அதிகமான ஆதரவைப் பெற்ற ஆளுங்கட்சி" என்று சொன்னார். அதற்கு முதல்நாள் நான் இந்தச் சபையில் சொல்லியிருந்தேன், வடக்கு, கிழக்கிலே பன்னிரண்டு இலட்சம் தமிழ், முஸ்லிம் மக்கள் உங்களுக்குத்தான் வாக்களித்தார்கள் என்று; இது தெளிவான விடயம். ஆகவேதான், அந்த மக்களுக்கான சிறந்த பணிகளை நீங்கள் செய்ய வேண்டுமென்று நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கிழக்கு மாகாண மக்களின் பொருளாதாரத்தில் பாரிய பாதிப்பு ஏற்பட்டு இருக்கின்றது. அங்குள்ள விவசாயிகளுக்கு இரண்டு தடவை பாரிய நட்டம் ஏற்பட்டு இருக்கின்றது. 2024ஆம் ஆண்டின் இறுதியில் ஏற்பட்ட வெள்ளத்தாலும், 2025ஆம் ஆண்டின் ஆரம்பத்தில் ஏற்பட்ட வெள்ளத்தாலும் இரண்டு தரம் அந்த விவசாயிகள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அவ்வாறு பாதிக்கப்பட்டிருந்த நிலையிலும், கிழக்கு மாகாணம் முழுவதும் அறுவடை நடந்த பிறகுதான் இந்த அரசாங்கம் நெல்லுக்கான நிர்ணய விலையைத் தீர்மானித்தது. அதனால் அங்குள்ள விவசாயிகள் மிகவும் கவலையோடு இருக்கின்றார்கள். அவர்களுடைய பொருளாதாரத்தில் பாரிய வீழ்ச்சி ஏற்பட்டிருக்கின்றது. எனவே, இனிவரும் காலத்தில் உரிய நேரத்தில் நெல்லுக்கான விலையை நிர்ணயிக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

இந்த வரவு செலவுத்திட்ட விவாதத்தில் உரையாற்றும்போது எமது கட்சியின் செயலாளர் நாயகமும் பாராளுமன்ற உறுப்பினருமான கௌரவ நிசாம் காரியப்பர் அவர்கள், அம்பாறை மாவட்டத்தில் உள்ள பாரிய அணைக்கட்டுக்கள், வாய்க்கால்கள் பல இந்த வெள்ளத்தினால் உடைக்கப்பட்டிருப்பது பற்றிச் சொல்லியிருந்தார். குறிப்பாக, எனது மாவட்டமான அந்த அம்பாறை மாவட்டத்திலே இந்த வெள்ளத்தினால் பாரிய நட்டம் ஏற்பட்டிருக்கின்றது. எனவே, அவற்றைச் சரிசெய்வதற்கான நிதி ஏற்பாட்டை இந்த வரவு செலவுத்திட்டத்தில் நீர்ப்பாசனம் சம்பந்தமான அமைச்சின் ஒதுக்கீடுகளுக்குள் உள்வாங்கவேண்டுமென்று நான் கேட்டுக்கொள்கிறேன்.

அடுத்து, கல்விக்காக கிழக்கு மாகாணத்துக்கு ஒதுக்கப்பட்ட நிதி போதாதென்று நான் நினைக்கிறேன். கல்விக்குப் பொறுப்பான கௌரவ பிரதம மந்திரி அவர்கள் இந்தச் சபையில் இல்லை. எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் மறைந்த தலைவர் மர்ஹூம் அஷ்ரப் அவர்களுடைய வேண்டுகோளுக்கிணங்கத் தென்கிழக்குப் பல்கலைக்கழகம் உருவாக்கப்பட்டது. இன்று அந்தப் பல்கலைக்கழகம் ஒரு தேசிய பல்கலைக்கழகமாக இயங்கிக்கொண்டிருக்கின்றது. நான் நினைக்கிறேன், அந்தப் பல்கலைக்கழகத்துக்கு ஒவ்வொரு வருடமும் 2,000 - 2,500 மாணவர்கள் அனுமதிக்கப்படுகிறார்கள். சிங்கள மாணவர்கள்தான் அதிகளவில் உள்வாங்கப்படுகிறார்கள்; தமிழ் மொழியில் சில மாணவர்கள் அனுமதிக்கப்படுகிறார்கள். அந்தப் பல்கலைக்கழகத்தின் அபிவிருத்தி பற்றி இந்த வரவு செலவுத்திட்டத்தில் எதுவும் குறிப்பிடப்படவில்லை என்பது அந்த மாகாண மக்களின் கவலையாக இருக்கிறது. அங்கே விஞ்ஞான பீடம் இருக்கின்றது, கலைப் பீடம் இருக்கின்றது. அறபு மொழிப் பீடம் இருக்கின்றது, தொழில்நுட்பப் பீடம் இருக்கின்றது, முகாமைத்துவ பீடம் இருக்கின்றது. பொறியியல் பீடம் இருக்கின்றது. கடந்த அரசாங்கத்தில் அங்கு மருத்துவ பீடத்தை உருவாக்குவதற்கு எல்லோரும் முயற்சி செய்தார்கள்; பின்னர் கைவிட்டு விட்டார்கள். எனவே, ஒரு தேசிய பல்கலைக்கழகமாக இருக்கின்ற தென்கிழக்குப் பல்கலைகழகத்தில் மருத்துவ பீடத்தை மாத்திரமன்றி, சட்ட பீடத்தையும் உருவாக்குவதற்கான ஏற்பாடுகளைச் செய்யவேண்டுமென்று நான் கௌரவ பிரதம மந்திரி அவர்களிடம் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

பொருளாதார ரீதியான பிரச்சினைக்கு நீங்கள் எந்தத் தீர்வை முன்வைத்தாலும் அதற்கு நாங்கள் ஆதரவு தெரிவிப்போம். முப்பது ஆண்டு காலமாக இந்த நாட்டிலே நடந்த கொடூர யுத்தத்தை நாங்கள் கண்டிருக்கிறோம்; மனிதர்கள் மனிதர்களைக் கொலை செய்த காட்சியைக் கண்டிருக்கிறோம். இவற்றை முடிவுக்குக் கொண்டுவர இனப் பிரச்சினைத் தீர்வுக்கு நாங்கள் போக வேண்டும். அதற்குரிய நடவடிக்கைகளை நீங்கள் எடுக்கவேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன். நீங்கள் புதிய அரசியலமைப்பை முன்வைப்பதாகச் சொல்லியிருக்கிறீர்கள்; அதனை முன்வைக்க வேண்டும். இந்த நாட்டிலே வாழுகின்ற சகலரும் சமாதானமாகவும் ஐக்கியமாகவும் வாழக்கூடிய வகையில் இனப் பிரச்சினைக்குத் தீர்வு காணவேண்டிய பொறுப்பு உங்கள் எல்லோருக்கும் இருக்கின்றது.

உண்மையில் நாங்கள் இங்கு சில விடயங்களைப் பற்றிப் பேச வேண்டும். இந்த வரவு செலவுத்திட்டத்தினூடாக நீங்கள் மக்களுக்குப் பல நன்மைகளைச் செய்திருக்கின்றீர்கள்; அதை ஏற்றுக் கொள்கின்றோம். ஆனால், நான் இந்தப் பாராளுமன்றத்தில் இருக்கும்வரை 2 - 3 விடயங்களைப் பற்றி - அந்தக் குறைபாடுகள் தீர்க்கப்படும்வரை - பேசிக்கொண்டே இருப்பேன். நீங்கள் Clean Sri Lanka என்ற ஒரு திட்டத்தைக்கொண்டு வந்திருக்கின்றீர்கள். அந்தத் திட்டம் தொடர்பான ஆணைக்குழுவுக்கு இதுவரையில் முஸ்லிம், தமிழ் உறுப்பினர்கள் எவரையும் தெரிவுசெய்யாமல் இருக்கிறீர்கள்; இது கவலையான விடயம். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் எல்லோரும் சேர்ந்து அதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். நாங்கள் இவ்வாறு கேட்பது தவறென்று நினைக்கக் கூடாது; இனவாதம் என்று நினைக்கக் கூடாது. அந்த ஆணைக்குழுவில் ஏன் எங்களுடைய சமூகங்களைச் சேர்ந்த இரண்டு உறுப்பினர்கள் இருக்க முடியாது என்பதற்கான காரணத்தை நீங்கள் சொல்ல வேண்டும் அல்லது அவ்வாறு நியமிப்பதை யாரும் எதிர்க்கிறார்களா? என்ற விடயத்தை இந்தச் சபைக்குச் சொல்ல வேண்டும்.

இது பாராளுமன்றம். உச்ச நிறுவனமான இந்தப் பாராளுமன்றத்திலே நாங்கள் தீர்மானங்களை எடுக்கின்றோம்.

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

නීතිය, නියාය

නීතිය, නියායමාත නීතිය, නියායමාත

නීතිය, නියායමාත

නීතිය, නියායමාත

විභාගය අසමත් තමන්ගේ බාප්පා දමාගෙන, තමන්ගේ පවුලේ අනෙක් අය දමාගෙන, තමන්ගේ ඥාතීන් දමාගෙන ඒ රාජ්‍ය ව්‍යවසාය සම්පූර්ණයෙන් අකර්මණ්‍ය කරන ආකාරය අපි දැක්කා. එහෙම පාලනය කරගෙන ඇවිල්ලා තමයි මේ රට මේ අර්බුදයට පත් කරනු ලැබුවේ.

ඒත් එක්කම මෙහි සඳහන් කරනවා, "Policy recommendations focus on" කියලා. මොනවාද recommend කරන්නේ? Enhancing tax revenue. අපි tax revenue එක වැඩි කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ අය වැය ලේඛනය ඇතුළේ සඳහන් කරලා තිබෙනවා. අපි තෝරු මෝරුන්ට ලිස්සා යන්න බැරි විධියේ බදු ප්‍රතිපත්තියක් මේ තුළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ජනතාවට සහන දෙමින්, තෝරු මෝරුන්ට ලිස්සා යන්න බැරි විධියේ බදු ප්‍රතිපත්තියක් අපි, අපේ ක්‍රියාවලිය ඇතුළේ නිර්මාණය කරලා තිබෙනවා.

ඒ වාගේම තමයි, "strengthening public finance management". ඒ කියන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය. අපි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරන්නේ කොහොමද? ඉතා ධනාත්මකව රාජ්‍ය වියදම් කළමනාකරණය කරන ආකාරය අය වැය කථාව තුළින් ඊයේ ජනාධිපතිතුමා පෙන්වුවා. ඒ එක්කම, ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමිය, ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු විතරක් නොවෙයි, ජාතික ජන බලවේගය නියෝජනය කරන සියලු මන්ත්‍රීවරු රාජ්‍ය වියදම් කප්පාදු කරන්නේ කොහොමද කියලා ඔප්පු කරලා පෙන්වලා තිබෙනවා. ජනාධිපතිවරයාට තිබෙන පහසුකම් ටික, ජනාධිපතිවරයාගේ ආරක්ෂාවට ඉන්න සොල්දාදුවෝ, එහෙම නැත්නම් පොලීසිය, ආරක්ෂාවට ඉන්න සියලුදෙනා ඉවත් කරලා ඉතා කුඩා කණ්ඩායමක් සහිතව කොහොමද මේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරන්නේ කියලා ජනාධිපතිතුමා පෙන්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසු ගිය කාලයේ දැක්කා, මේ රාජ්‍ය මූල්‍ය වැරැදි විධියට භාවිත කරමින් විදේශ සම්බන්ධතා ගොඩනැඟීම සඳහා පිටරටවලට ගිය හැටි. ඒවා හරියට දඹදිව වන්දනා ගමන් වාගේයි. දඹදිව වන්දනා ගමන් යනවා වාගේ ඒවායේ ජනාධිපතිතුමා ඉන්නවා, බිරිඳ ඉන්නවා, දරුවෝ ඉන්නවා. අගමැතිතුමා ඉන්නවා, බිරිඳ ඉන්නවා, දරුවෝ ඉන්නවා. අනෙක් අයත් එහෙම තමයි. එහෙම ගිය අයගෙන් සමහර අය මෙතැන ඇති. ඒ ගොඩක් අය දැන් මෙතැන නැහැ. එහෙම තමයි, bureaucratic relationships maintain කළේ. මේ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පාලනය කළේ ඒ විධියට තමයි. හැබැයි, අපේ ජනාධිපතිතුමා විදේශ සංචාරවලට යන්නේ කොහොමද? මේ රටේ පොදු ජනතාවගේ නායකයා විදේශ සංචාරවලට යන්නේ කොහොමද? එතුමා ඉන්දියාවට ගිය හැටි බලන්න; චීනයට ගිය හැටි බලන්න. ඒ වාගේම, පසුගිය දවස්වල UAE ගිය හැටි බලන්න. එහෙම යනකොට හඳුන්වා දුන් දේශපාලන සංස්කෘතිය බලන්න. ජනාධිපතිවරයා වශයෙන්, මේ රටේ පළමුවැනි පුරවැසියා වශයෙන් ඒ ගමන්වලට ඩොලර් දුන්නාම, ඒ ඩොලර්වලින් කොටසක් ඉතුරු කරගෙන නැවත ගෙනැල්ලා, මේ රටේ ජනතාව වෙනුවෙන් භාණ්ඩාගාරයට භාර දුන්නා. එහෙම කරපු පාලකයෝ ගැන අපි අහලා තිබුණේ පිටරටවලින්. අපි එහෙම කරපු පාලකයෝ ගැන අහලා තිබුණේ කථා පොත්වලින්. හැබැයි මොකක්ද වුණේ? අපේ වාසනාවට අද අපට එහෙම පාලකයෙක් ලැබිලා තිබෙනවා. එහෙම තමයි රාජ්‍ය වියදම් කළමනාකරණය කරන්නේ.

අනෙක් පැත්තෙන් ගත්තාම, රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය කරන විධිය ගැනත් අපි පූර්වාදර්ශ දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රාජ්‍ය ව්‍යවසායවලට කිසිම ඥාතියෙක් දමන්නේ නැහැ. දේශපාලන හිතවත්කම් මත අපි කිසි කෙනෙක් ඒවාට පත් කරන්නේ නැහැ. අන්න ඒක තමයි, මූල්‍ය විනය ආරම්භ කිරීමේ පළමුවැනි පියවර. එහෙම තමයි අපි මේ මූල්‍ය විනය ආරම්භ කරන්නේ. ඒ නිසා එහෙම දේවල් මේ තුළ සඳහන් කරලා තිබෙනවා.

මෙහි සඳහන් ඉතා වැදගත් කාරණාව තමයි, "attaining fiscal sustainability" කියන එක. මූල්‍ය තිරසරභාවය ළඟා කර ගැනීම සඳහා, "requires a strong political will, technical capabilities and cooperation among all stakeholders". මූල්‍ය තිරසරභාවය - fiscal sustainability - ළඟා කර ගන්න ඕනෑ නම් මෙන්න මේ දේවල් තිබෙන්න ඕනෑය කියනවා. ඒ සඳහා strong political will එකක් තිබෙන්න ඕනෑ; හොඳ දේශපාලන වුවමනාවක් තිබෙන්න ඕනෑ; හොඳ දේශපාලන දැක්මක් තිබෙන්න ඕනෑ.

එහෙම දේශපාලන දැක්මක් ගැන කොහොමද සඳහන් වෙන්නේ? අය වැය කථාව අවසන් කරනකොට මොකක්ද ජනාධිපතිතුමා කිව්වේ? ජනාධිපතිතුමා සියලුදෙනාට ආරාධනා කරලා මොකක්ද කිව්වේ?

ජනාධිපතිතුමාගේ ප්‍රකාශනයෙන් මා ඒ කොටස උපුටා ගන්නවා:

> "අපගේ රජයේ මහජන නියෝජිතයින් හෝ අප විසින් පත් කළ නිලධාරීන් සියලුදෙනාම තුළ ඇත්තේ පොදු අරමුණක්. ඒ වගේම වෙනසක් කිරීමට අප සමඟ එක්වූ දහස් ගණනක් වෙහෙස මහන්සි වී වැඩ කරන දේශප්‍රේමී රාජ්‍ය සේවකයින්ට ඇත්තේත් එවැනි පොදු අරමුණක්. අපි කිසි විටෙකත් එම වගකීමෙන් සහ ප්‍රතිපත්තිවලින් බැහැර නොවන අතර, කුමන හේතුවකටවත් මෙරට පුරවැසියන්ගේ අපේක්ෂාවන් පාවා නොදෙන බවට සහතික වෙනවා. අපි ඒ ආදර්ශය නායකත්වයේ සිටම ලබා දෙනවා."

මෙන්න, මේක තමයි strong political will එක. ඒ strong political will එක අපට තිබෙනවා. ඒ political will එක තිබෙනකොට විපක්ෂයට ඒක පිළිගන්න බැහැ; විපක්ෂය ඒක කියන්නේ නැහැ. විපක්ෂය කියනවා, එහෙම political will එකක් නැහැ කියලා.

හැබැයි, පසුගිය දවසක ඇමෙරිකානු තානාපතිතුමිය ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශයේ සඳහන් වෙනවා, මෙන්න මෙහෙම. මේ තමයි, strong political leadership එක. මේ තමයි strong political will එක. ඇය මොකක්ද කියන්නේ? "United States Ambassador to Sri Lanka, Julie Chung commended Sri Lanka's commitment to transparency, good governance and fostering a welcoming business environment at the 42nd AGM of the Sri Lanka Apparel Exporters Association" යනුවෙන් එය වාර්තා කර තිබුණා. ශ්‍රී ලංකාවේ තිබෙන කැපවීම. මොකටද? විනිවිදභාවය - transparency - සඳහා. අපි කරන හැම ගනුදෙනුවකම විනිවිදභාවයක් තිබෙනවා. විදේශ සංචාරයක යෙදුණාම ඉතිරි ඩොලර් ටික නැවත ගෙනැල්ලා දෙනවා. මේක තමයි විනිවිදභාවය. එහෙම කරන්නේ නැති, opposite දේ කරපු අයට මේක මැජික්. ඒක හරි. ඒක අපි පිළිගන්නවා. ඒක අපට තේරෙනවා. අනික් පැත්තෙන් යහ පාලනය - good governance. "යහ පාලනය" කියලා නම දාගෙන ආවේ නැති වුණාට යහ පාලන මූලධර්ම මේ අය වැයේ අන්තර්ගත කරලා තිබෙනවා. මේ අය වැයේ හැම තැනකම ඒක තිබෙනවා.

මේකේ තිබෙන වැදගත්ම කොටස හැටියට තානාපතිතුමිය මෙන්න මෙහෙම කියූ බව වාර්තා වෙනවා: "Ambassador Chung also highlighted Sri Lanka's leadership in ethical manufacturing practices". Ethical manufacturing practices ගැන කියනවා. ඉතා හොඳ ආචාර ධර්ම පුරුදු පුහුණු කිරීම්,

[ගරු රුවන් විජේවීර මහතා]

නායකත්වය දීම ඇය ඉතා අගය කරනවා. ඒ විතරක් නොවෙයි තවදුරටත් කියනවා, "...and reaffirmed the US's support for Sri Lanka's economic progress" යනුවෙන්. ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා ඇමෙරිකාවේ සහයෝගය ලබා දෙන බව ඇය ප්‍රකාශ කරනවා.

මේ අය වැය විවේචනය කරන්නේ නැතුව සමහරුන්ට වෙන කරන්න දෙයක් නැහැ. හේතුව මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටින් ඇමෙරිකාව යනවා කිව්වා, ඉන්දියාව යනවා කිව්වා, චීනය යනවා කිව්වා, කවුරුත් ඉන්නේ නැහැ කිව්වා. International relationships stuck වෙනවා කිව්වා. එහෙම කියද්දී, මේ වාගේ media report එකක් ආවාම ඒකේ අවුලක් තිබෙනවා. හැබැයි, එහෙම දෙයක් ගන්න පුළුවන් විධියේ ශක්‍යතාවක්, political will එකක්, leadership එකක් ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුවට තිබෙනවාය කියන එක මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒත් එක්කම, මම මේ අය වැයේ තිබෙන කරුණු කිහිපයකට අවධානය යොමු කරන්න කැමැතියි. අද ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවට, විශේෂයෙන්ම මානව ප්‍රාග්ධනය වර්ධනය කිරීම සඳහා ගුරුවරුන්ගේ වැටුප් වැඩිවන ආකාරය. අධ්‍යාපනයට පෙර නොවූ විරූ තරමේ විශාල මුදලක් - රුපියල් බිලියන 619ක් වාගේ මුදලක් - මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒක ඇතුළේ මානව ප්‍රාග්ධනය වෙනුවෙන්, ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට සහ කාර්ය මණ්ඩලයට වැටුප් වැඩිවන ආකාරය එතුමා ඉතා හොඳින් පැහැදිලි කරනු ලැබුවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ රටේ ගුරුවරු, විදුහල්පතිවරු වෙන දා නැති ජවයකින් කටයුතු කරයි කියලා. මේ රටේ රාජ්‍ය සේවකයෝ මේවාත් එක්ක එකතු වෙයි කියන විශ්වාසය අප සතුව තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, මේ අය වැයේ සඳහන්ව තිබුණු විශේෂ දෙයක් මම කියන්න ඕනෑ. මම හිටියේත් මොනරාගල මහානාම මධ්‍ය මහා විද්‍යාලයේ. ඒ විද්‍යාලය ක්‍රීඩා පාසලක් ලෙස ආරම්භ කරන්න බැහැ. ඒ පාසල තමයි මොනරාගල දිස්ත්‍රික්කයට තිබෙන එකම ක්‍රීඩා පාසල. නමුත් ඒ විද්‍යාලයේ ක්‍රීඩා පාසල ආරම්භ කරන්න විධියක් නැහැ. ඒකට හේතුව මොකක්ද? ඒකට හේතුව තමයි, දරුවන්ට කන්න දෙන්න තරම් ප්‍රමාණවත් මුදල් වෙන් වෙන්නේ නැතිකම. ඒ වාගේම අනෙකුත් පහසුකම් නැහැ. ඒක නිසා මේ ක්‍රීඩා පාසල ආරම්භ කරන්න බැරි වෙලා තිබුණා. හැබැයි, මේ අය වැය ලේඛනය තුළ සඳහන්ව තිබෙනවා, ක්‍රීඩා පාසල්වල දරුවන්ට ලබා දෙන ආහාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000 දක්වා වැඩි කරනවා කියලා. ඒ විතරක් නොවෙයි, ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් පළාත් පහ අතරට ඌව පළාතත් ඇතුළත් කරලා තිබෙනවා. අපි සතුටු වෙනවා, එවැනි ප්‍රවේශයන් ලබා දීම පිළිබඳව. මම එහෙම කියන්නේ මේ නිසායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හෙට හෝ අනිද්දා නවසීලන්ත සංචාරය සඳහා පිටත්වන ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ පැල්වත්ත ප්‍රදේශයේ ක්‍රීඩිකාවක් ඉන්නවා. ඇය මොනරාගල වාගේ ප්‍රදේශයකින් අත්ත දුක් විඳලා ආපු දරුවෙක්. ඒ දරුවා ගැන අපි පෞද්ගලිකව දන්නවා. ඒ වාගේම ජාතික කණ්ඩායම් නියෝජනය කරන ක්‍රීඩිකාවන් දෙදෙනෙක් මොනරාගල දිස්ත්‍රික්කයෙන් බිහිවෙලා තිබෙනවා. ඒක නිසා ක්‍රීඩාව වෙනුවෙන්, අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනය හරහා මොනරාගල වැනි දිස්ත්‍රික්කවලින් ඉදිරියේදී දරුවන් විශාල ප්‍රමාණයක් බිහි වෙයි කියන අපේක්ෂාව අප සතුව තිබෙනවා.

මේ සියලු කාරණාත් එක්ක තව බොහෝ දේවල් මේ අය වැය තුළ අන්තර්ගත කරලා තිබුණා. අවසාන වශයෙන් මම මේ ප්‍රකාශය, ජනාධිපතිතුමාගේ අය වැය කථාවෙන් උපුටා ගනිමින්, සමස්ත ශ්‍රී ලාංකාවාසී ජනතාවට ගෞරවයෙන් ආදරයෙන් ඒ ආරාධනය කරනවා.

ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී මෙසේ කියා තිබෙනවා:

> "අප ඔබට ආරාධනා කරනවා, ශ්‍රී ලංකාව කොතරම් වෙනස් වී ඇත්දැයි බැලීමට ආපසු එන්න. පෞද්ගලික, රාජ්‍ය හෝ ලාභ නොලබන අංශයේ වුවද, ඔබේ විශේෂඥ දැනුම, ආකල්ප හා දෘෂ්ටිකෝණය අපේ අධිෂ්ඨානශීලී දූපතට දායක කරන්න. අප සමඟ එකතු වන්න, අප සමඟ වැඩ කරන්න, අපට එක්ව ළඟා කළ හැකි සාර්ථකත්වයට එක්වන්න."

එතෙර මෙතෙර සිටින සමස්ත ශ්‍රී ලාංකිකයන්ට ඒ ආරාධනාව කරන අතර, මේ අය වැය යථාර්ථයක් බවට පත් කරමින් ජනතාව වෙනුවෙන් පොහොසත් රටක් හදන්නට සියලුදෙනාට ශක්තිය ධෛර්ය ලැබේවා කියන ප්‍රාර්ථනාවත් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.12]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ මංගල අය වැය වෙනුවෙන් මගේ අදහස් ඉදිරිපත් කරන අවස්ථාවයි මේ. ඇත්තටම මේක මේ රටේ ආර්ථිකය පිළිබඳව දිගින් දිගටම විවේචනාත්මක අදහස් ඉදිරිපත් කරපු පක්ෂයක්, ආණ්ඩුව, රාජ්‍ය බලය ලබා ගෙන තමන්ගේ පළමුවෙනි අය වැය ඉදිරිපත් කරන අවස්ථාව.

රටක ආර්ථිකය මෙහෙයවන ආකාරය, දිශානතිය තීරණය කරන ලියවිල්ල තමයි අය වැය කියන්නේ. මේ රටේ අනාගත ආර්ථිකය කවර දිශාවකට යොමු වෙනවාද, මේ රටේ ආර්ථිකය කොපමණ ප්‍රමාණයකින් විශාල වෙනවාද, මේ රටේ ආර්ථිකයට මෙතෙක් දායකත්වයක් සපයන්න බැරි වුණු මිනිස්සු කොයිතරම් විශාල ප්‍රමාණයක් මේ ආර්ථිකයට අලුතින් එකතු වෙනවාද කියන කාරණා පිළිබඳව ඉදිරිපත් කරන වැදගත් ලියවිල්ල තමයි අය වැය කියන්නේ. මේ අය වැය වාර්තාව ඉදිරිපත් කරපු හැම අවස්ථාවකම, ඒ කියවපු හැම තැනකම "වැය" පිළිබඳව තමයි ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන් ඉදිරිපත් කරපු අදහස්වල තිබුණේ. වැය පිළිබඳව ඉදිරිපත් කරන අදහස මහ ලොකු දෙයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "අය" තමයි මේ රටේ අර්බුදය.

ඔබතුමන්ලා ඔය කියමින් තිබෙන සෑම කාරණාවකටම අවශ්‍ය මූල්‍ය සැපයුම කොහෙන්ද ලබා ගන්නේ? ඒ මූල්‍ය සැපයුම ලබා ගැනීම උදෙසා වර්ෂ 2022දී මේ රටේ මධ්‍යම පාන්තිකයන් ඇතුළු බහුතර මහජනතාව බදුවලින් හිර වෙලා හෙම්බත් වෙලා තිබෙන රටක, මේ වැය කිරීමේ වර්ණනා නතර කරලා, මහජනතාවට අවම පීඩනයක් යටතේ අපි මේ අය පැත්ත හදා ගන්නේ කොහොමද කියන කාරණාවට තමයි අවධානය යොමු කළ යුත්තේ. නමුත් මේ අය වැය වාර්තාව ඉදිරිපත් කරපු තැන පටන් අදහස් දක්වන මේ ගෞරවනීය සභාවේ සියලු මන්ත්‍රීවරු "අය" පිළිබඳව සාකච්ඡාවට නොගන්නේ, අය පිළිබඳව කරන සාකච්ඡාවකට, අය පිළිබඳව දක්වන අදහස්වලට මේ රටේ මහජනතාව විරෝධතා ඉදිරිපත් කරයි කියන බිය නිසායි. අර ක්ෂේත්‍රයට මේවා දෙනවා, මෙයාලාට මේවා දෙනවා, ළමයින්ට මෙහෙම දෙනවා කියනවා. හැබැයි, කොයිම තැනකවත් අය පිළිබඳ සාකච්ඡාවට බඳුන් කරන්නේ නැහැ. එහෙම නම් මේ රටට අවශ්‍ය ආදායම් මාර්ග ටික කොහෙන්ද අපි හදා ගන්නේ? මේ අය වැය ලේඛනය හරහා මොනවාද ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඒ සඳහා ඉදිරිපත් කරලා තිබෙන ප්‍රතිසංස්කරණ? අන්න ඒ පිළිබඳව තමයි අපි රටක් විධියට සාකච්ඡා කළ යුත්තේ.

රටක් පොහොසත් කිරීම කළ යුත්තේ කවර ආකාරයකින්ද? ඔබතුමන්ලා කියන්නේ "පොහොසත් රටක්" කියන එක. ඉතින් පොහොසත් රටක් අරගෙන, ඒ පොහොසත් රටේ උදාහරණ අපේ රටට ආදේශ කරලා හරි යන්නේ නැහැ. ඒ රට පොහොසත් වුණේ කොහොමද, ඒ රට පොහොසත් වෙන්න ගිය ගමන් මාර්ගය කුමක්ද, ඒ ගමන් මාර්ගයේ යෑමේදී ඇති වූ බාධා දුෂ්කරතා කවර ආකාරයකින්ද අය වැය ලේඛනය හරහා යටපත් කර ගන්නේ, මහහරවා ගන්නේ සහ මේ ආර්ථිකය පණ නංවා, ඔසවලා අරගෙන පොහොසත් රටක් නිර්මාණය කරන්නේ කොහොමද කියන කාරණාවයි අපි සාකච්ඡා කළ යුත්තේ.

ලෝකයේ ඕනෑම රටක් පොහොසත් තත්ත්වයට පත් වුණේ රාජ්‍ය පංගුව විශාල කර ගැනීමෙන් නොවෙයි. පෞද්ගලික අංශයට ආර්ථිකය මෙහෙයවන්න ඉඩ දෙමින්, ආර්ථිකය ප්‍රසාරණය කරන්න පෞද්ගලික අංශයට ඉඩ දෙමින් රාජ්‍ය පංගුව ක්‍රම ක්‍රමයෙන් කුඩා කර ගත්තොත් පමණයි, රාජ්‍ය කුඩා කර ගත්තොත් පමණයි, රාජ්‍ය වියදම් අඩු කර ගත්තොත් පමණයි, මේ රටේ මිනිස්සුන්ට ඔය යන ගමන් මාර්ගයේදී යහපතක් සලසා ගත හැක්කේ. නමුත් මේ අය වැය ලේඛනය හරහා පවා රාජ්‍ය වියදම්වල ප්‍රමාණය පෙර වසරට වඩා වැඩි වෙලා තිබෙනවා. රාජ්‍ය වියදම් ප්‍රමාණය වැඩි වෙනවා කියන එකේ අදහස කුමක්ද? රාජ්‍ය වියදම් වැඩි වෙනවා කියන එකේ අදහස තමයි රාජ්‍ය පංගුව ආර්ථිකය ඇතුළේ ක්‍රමයෙන් විශාල වෙනවාය කියන එක.

ආර්ථිකය ඇතුළට රාජ්‍ය මැදිහත්වීම් වැඩි වනකොට පෞද්ගලික අංශය ක්‍රම ක්‍රමයෙන් කුඩා වෙනවා. ඒ නිසා රාජ්‍ය වියදම් වැඩි වීම ඇතුළේ පෞද්ගලික අංශයේ කුඩා වීම ඇතුළේ ඔබ අපි බලාපොරොත්තු වන ආර්ථික පිම්ම ගැනීම ක්‍රමානුකූලව අපෙන් ඈතට යනවා. ඒ නිසා රාජ්‍යයක වගකීම විය යුත්තේ ආණ්ඩු කිරීමේදී ඔබ ද, අපි ද කියන එක නොවෙයි. අපි හැමෝටම අවශ්‍ය කරන්නේ පොහොසත් රටක්. ආර්ථිකමය වශයෙන් පොහොසත් රටක් ලබා ගැනීම සඳහා ගමන් කරන මාර්ගය හැකිතාක් පෞද්ගලික අංශයට විවර කිරීම හරහා පමණයි ඒක කරන්න පුළුවන් වෙන්නේ. නමුත්, රාජ්‍ය වියදම් වැඩි වීම කියන අදහස ඇතුළේ පෞද්ගලික පංගුව කුඩා වෙනවා කියන එක තමයි මගේ අදහස.

අය වැය ලේඛනය විශාල බලාපොරොත්තු දීලා, අලංකාර වචන දාලා, ලස්සන කථා ගොඩක් ඇතුළත් කරලා නිර්මාණය කළොත්, ඒ අය වැය සම්බන්ධ විශ්වසනීයත්වය බිඳ වැටෙනවා. ඇත්තටම අය වැය ලේඛනයක් නිර්මාණය කළ යුත්තේ, අපේ වාගේ රටක කරන්න පුළුවන් දේවල් ටික පමණක් ඇතුළත් කරලායි. ඒ අය වැය ලේඛනයේ පිටු සංඛ්‍යාවවත්, ඒ අය වැය ලේඛනය ඉදිරිපත් කරන පැය සංඛ්‍යාවවත්, ඒ අය වැය ලේඛනය හදන්න වෙච්ච මහන්සියවත් නොවෙයි වැදගත්. එය කරන්න පුළුවන් දේවල් ප්‍රමාණය සහ ඒ වෙලාවේදී කරන්න බැරි දේවල් පිළිබඳ සත්‍ය ලියවිල්ලක් විය යුතුයි. එහෙම නොවුණොත් මේ වාගේ රටක් කවදාවත් පොහොසත් රටක් බවට පත් කරගන්න බැහැ.

අතීත කාල සීමාවේ -ඔබ නිරන්තරයෙන් කියන අවුරුදු 77ක ඉතිහාසය තුළ- මේ වාගේ අය වැය ලේඛන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වුණු බව ඔබ කවුරුත් දන්නවා. ඒ අය වැය ලේඛන යම් යම් ප්‍රමාණවලින් සාර්ථක වුණා. සමහර ලේඛනවලින් ගත්ත තීරණ අසාර්ථක වුණා. ඒ සාර්ථක වෙච්ච තීරණවලට අයිතිකරුවන් සිටියත්, අසාර්ථක වෙච්ච තීරණවලට තමයි අයිතිකරුවන් නැති වුණේ. ඒ අසාර්ථක වෙච්ච තීරණ නිසා ඇති වෙච්ච ආර්ථිකමය බලපෑම මේ දසවැනි පාර්ලිමේන්තුවේ ඉන්න ඔබ අප සියලුදෙනාටම විසඳන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අය වැය වාගේ ලේඛනයක් අතිශය වගකීම් සහගත විය යුතුයි. එහෙම නැතිව හැම තැනකටම, හැම ක්ෂේත්‍රයකටම මෙන්න සල්ලි, මෙන්න සල්ලි කියලා දුන්නත්, අවසානයේදී වසර අවසානයට ඒ කරුණු ටික ඉෂ්ට කර ගන්න බැරි නම්, ඒ ආර්ථික ලේඛනය හරහා ගත්ත තීරණවලින් රටේ අනාගත මිනිස්සුන්ට දැවැන්ත බලපෑමක් සිද්ධ වනවා කියන එක තමයි මගේ අදහස.

මේ ආර්ථික ලියවිල්ල -මේ අය වැය ලේඛනය- විශේෂයෙන්ම අවුරුදු 60ක් වාමාංශික දේශපාලනය කරපු ජනතා විමුක්ති පෙරමුණ සහිත මේ NPP ආණ්ඩුව නිර්මාණය කරද්දී, ඒ වාමාංශික සමාජවාදී ප්‍රතිපත්තිවලට පයින් ගැහුවා. මට ඒකට සතුටුයි. හැම වෙලාවකම මේ මන්ත්‍රීවරු කියන දෙයක් තිබෙනවා. ඉන්දියාව යයි, ඇමෙරිකාව යයි. ඔව්, යනවා, වාමාංශික විධියට මේ අය වැය හැදුවා නම්. IMF එකෙන් ඔබතුමන්ලා අයින් වුණා නම්, ස්ථිර වශයෙන්ම අපේ රට ලෝකයේ හුදෙකලා වනවා. හැබැයි, ඔබ අපේ රටේ මිනිස්සුන්ගේ වාසනාවට වාමාංශික පැත්ත ඉවත් කරලා, -ඒක හරියට ඔබේ පෙළපාළිවලින් ලෙනින්ලා අයින් කළා වාගේ- ආර්ථිකය ඇතුළට සමාජවාදී කෑල්ල නොගැනීම නිසා තමයි මේ මොහොතේදී ඉන්දියාව, ඇමෙරිකාව ඇතුළු රටවල් අපි පිළිබඳව යම් හෝ විශ්වාසයක් තබාගෙන ඉන්නේ. IMF එකත් එක්ක ඔබ කරන ගනුදෙනුවට අපි එකඟයි. IMF එකත් එක්ක කරන ගනුදෙනුව හරහා තමයි, මේ මොහොතේ මේ රට මෙතැනින් උඩට ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා දැනට මේ ආර්ථික ලියවිල්ල හරහා යන ගමන් මහ මේ වසර පුරා ක්‍රියාත්මක කළොත් අපිත් විශ්වාස කරනවා, මේ රට තව පොඩ්ඩක් උඩට ගන්න පුළුවන් වෙයි කියලා.

කලින් අවුරුදුවල, විශේෂයෙන්ම ළඟම ආණ්ඩුව ගත්තොත්, ළඟම ආණ්ඩුවේ අය වැය ලේඛනයේ වියදම් කරන්න බලාපොරොත්තු වෙච්ච මුදල් ප්‍රමාණයට වඩා ඔබතුමන්ලාගේ ආණ්ඩුව කෝටියේ කොටස් ලක්ෂ එකහමාරක් වියදම් කරන්න බලාපොරොත්තු වනවා. මගේ අතේ තිබෙන මේ වතුර බෝතලය කෝටියේ කුට්ටියක් නම්, ඔබ මේ අවුරුද්ද තුළ ගිය අවුරුද්දට වඩා මේ වාගේ කුට්ටි ලක්ෂ එකහමාරක් වියදම් කරන්න බලාපොරොත්තු වනවා. හැබැයි, ආදායමේ සමස්ත ප්‍රමාණය කෝටියේ කුට්ටි ලක්ෂ 5ක් වෙද්දී, වියදම කෝටියේ කුට්ටි ලක්ෂ 7යි. අපි සාකච්ඡා කළ යුත්තේ, මේක කෝටියේ කුට්ටියක් නම් මේ වාගේ කෝටියේ කුට්ටි ලක්ෂ 2ක් ඔබ අමතරව උපයන්නේ කොහෙන්ද, ඒ මාර්ගය කුමක්ද යන්නයි. ඒකේ තේරුම තමයි, එක්කෝ අලුතින් බදු ගෙනෙන්න වෙනවා. නැත්නම් ඔය කියන මුදල් වියදම් කරන්න බැහැ. එහෙම නැත්නම් ඔබතුමන්ලාට ණය

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ගන්න සිද්ධ වෙනවා. ණය ගැනීම, බදු වැඩි කිරීම කියන ක්‍රියාවලි දෙකටම ඔබතුමන්ලා යන්නේ නැත්නම් අර කෝටියේ කොටස් ලක්ෂ දෙකක් කොහෙන්ද රට ඇතුළට ගෙනෙන්නේ? එතකොට ඔබ ඔය කියපු ලියවිල්ලේ වැය කොටසේ තිබෙන අලුතින් වියදම් කරන්න බලාපොරොත්තු වන කෝටියේ කොටස් ලක්ෂ එකහමාර වියදම් කරන්නේ කෙසේද? ඒකයි මම කිව්වේ, අය වැය ලේඛනයක් ප්‍රායෝගික වෙන්න ඕනෑ කියලා. අය වැය ලේඛනයක ඕනෑ තරම් දේවල් ඇතුළත් කරන්න පුළුවන්. නමුත්, වසර අවසානයේදී අපි ඒවා සාර්ථක කර ගන්නවාද, නැද්ද කියන එක මත අපට ඊළඟ අවුරුද්දේ රට පොහොසත් වීම කරා සමීප වෙන්න පුළුවන් කියන අදහස තමයි මේකේ තිබෙන්නේ.

ඒ වාගේ තමයි, ඩිජිටල්කරණය. ඩිජිටල්කරණය කියන්නේ, ID card එකක් හදන එක නොවෙයි. ඒක එතැනින් එහාට ගිය මහා පිම්මක්. විශේෂයෙන්ම සමස්ත පද්ධතියම පරිගණකගත කිරීම හරහා මේ රටේ රාජ්‍ය අංශයේ කොායි කොයි ස්ථානවල ද පුරප්පාඩු තිබෙන්නේ, කොයි කොයි තැන්වල ද සේවක අතිරික්තයක් තිබෙන්නේ කියා සොයා ගන්න පුළුවන්.

සේවක අතිරික්තයක් තිබෙන තැන්වලින් අරගෙන පුරප්පාඩු පුරවන්න ඉතාම පහසුවෙන් පුළුවන් වේවි ඩිජිටල්කරණය හරහා. ඩිජිටල්කරණය කියන්නේ ඇත්තටම අපේ ලිබරල්වාදී, ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියට සම්බන්ධ එකක්. ඒක සමාජවාදී ප්‍රතිපත්තියක් නොවෙයි. ඒ හරහා සිදු වන පළමුවැනි දේ තමයි, රාජ්‍ය අංශය කුඩා කරන්න පුළුවන් වීම, රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව අඩු කරන්න පුළුවන් වීම. රාජ්‍ය සේවකයන් අඩු කරන්නේ කොහොමද? රාජ්‍ය සේවකයන් හිඟ තැන්වලට යොදවන්න අවශ්‍ය රාජ්‍ය සේවකයන් වැඩිපුර ඉන්නේ කොතැනද කියලා ඒ හරහා සොයා ගන්න අපට පුළුවන්. මෙන්න මේ ක්‍රියාවලිය හරහා රාජ්‍ය අංශය කුඩා වෙනවා, කාර්යක්ෂම වෙනවා. ඒක අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක්. හැබැයි, ඩිජිටල්කරණය හරහා රාජ්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සැලසුමක් තුළට, එහෙමත් නැත්නම් දත්ත පද්ධතියක් ඇතුළට ගන්න ඕනෑ කියන ගමන්, තව 30,000කට අලුතින් රැකියා දෙන්න ඕනෑ කියලාත් ඔබතුමන්ලා කියනවා. එක පැත්තකින් රාජ්‍ය සේවය බර වැඩියි, බදු මුදල්වලින් විශාල ප්‍රමාණයක් වැටුප්වලට යනවා. අපි ඒක පිළිගන්නවා. කවර ආණ්ඩුවකට වුවත් මේ රටේ ආර්ථිකය ඉහළට ගෙන යෑම සඳහා සමහර ආයතනවල ඇති සේවක අතිරික්තය ලොකු බාධාවක් වෙලා තිබෙනවා. සේවක අතිරික්තය සේවකයන් හිඟ තැන්වලට ගන්න පුළුවන්ද කියා සොයා බලනවා වෙනුවට, ඔබතුමන්ලා අලුතින් තවත් රැකියා නිර්මාණය කරනවා කියන එකයි, ඩිජිටල්කරණය කියන ක්‍රියාවලියයි අතර පරස්පර තත්ත්වයක් පෙන්නුම් කරනවා.

ඒ වාගේම තමයි වැටුප් වැඩි වීමත්. වැටුප් වැඩි වීම ඉතාම හොඳයි. මොකද, ඕනෑම අය වැය ලේඛනයක් හරහා මිනිස්සු ප්‍රතිලාභ බලාපොරොත්තු වෙනවා. ඒ අයගේ අනාගත අපේක්ෂා, එහෙමත් නැත්නම් ඒ අයගේ වර්තමාන ජීවිතය දැනට තිබෙනවාට වඩා යහපත් තත්ත්වයකට ගන්න මිනිස්සු බලාපොරොත්තු වෙනවා. එම නිසා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම ඉතාම හොඳයි. නමුත්, ඔබතුමන්ලා රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා නොවෙයි. ඔබතුමන්ලා කළේ රාජ්‍ය සේවකයන්ට මෙතෙක් කොටස් වශයෙන් වෙන් කර දී තිබූ දීමනා මූලික වැටුපට එකතු කරපු එකයි. ඒ හරහා ඔබතුමන්ලා කරපු යහපත් එක දෙයක් තිබෙනවා. එය තමයි, ඒ අයට ලොකු පෙන්ෂන් එකක් නිර්මාණය කර දීම. ලොකු පෙන්ෂන් එකක් නිර්මාණය කරපු එක හොඳ දෙයක්. මොකද, මූලික වැටුපට තමයි පෙන්ෂන් එක හැදෙන්නේ.

වැටුප් වැඩි කිරීම පිළිබඳව කිසි ප්‍රශ්නයක් නැහැ. වැටුප් වැඩි වෙන්න ඕනෑ. රුපියල් අටදහස් ගණනකින් වැටුප් වැඩි වෙලා තිබෙනවා. අපි ඒක අගය කරනවා. *[බාධා කිරීමක්]* වැටුප් වැඩි වෙලා තිබෙනවා කියද්දී ඒක අහගෙන ඉන්නවත් බැහැ නේ. දැනටත් රුපියල් 8,250කින් වැටුප් වැඩි වෙලා තිබෙනවා කිව්වාම, මැද්දෙන් පැන්නා. රුපියල් 8,250ක් වැඩි වෙලා නැද්ද?

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මම එහෙම කියද්දී, ඒක බොරු කියනවා. කමක් නැහැ, මම මගේ කථාව කියන්නම්කෝ.

එතැන තිබෙන අර්බුදය ඒක නොවෙයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. එතැන තිබෙන අර්බුදය මෙන්න මේකයි. මෙතෙක් කාලයක් මූලික වැටුප රුපියල් 25,000 දක්වා වැඩි කරගෙන ආවා. එක් වරම මූලික වැටුප රුපියල් 40,000ට වැඩි වුණාට පස්සේ කවර හෝ අනාගත ආණ්ඩුවකට විශ්‍රාම වැටුප් සඳහා දැන් ගෙවන මුදලට වඩා වැඩි මුදලක් ගෙවන්න සිද්ධ වෙනවා. අන්න ඒකයි මා කිව්වේ, අය වැය කියන්නේ වගකීම්සහගත ලියවිල්ලක් කියලා. කලින් ඇති කරපු ප්‍රශ්න මේ මොහොතේ අපත්, ඔබත් විසඳන්න දරන වෑයමම අනාගත ආණ්ඩුවලට පෙර නොවූ විරූ ආකාරයකට එනවා. ඔබතුමන්ලා තමයි මේ මොහොතේ වර්තමාන ආණ්ඩුව මෙහෙයවන කණ්ඩායම. ඔබතුමන්ලාගේ වගකීම තමයි මෙන්න මේ විශ්‍රාම වැටුප ඉදිරි කිසියම් හෝ අවුරුද්දක -2030 හෝ 2035 අවුරුද්දේ වෙන්න පුළුවන්- ගෙවීම සඳහා සුදුසු අරමුදලක් තවතවත් තර කරමින් පවත්වාගෙන යන එක. දැනට කපා ගන්නා මුදලින් විශ්‍රාම වැටුප ගෙවා ගන්න බැරි වුණොත් අනාගත ආණ්ඩුත් විශ්‍රාම වැටුප් ගෙවීමේ අර්බුදයකට මුහුණ දෙනවා. එම නිසා මේ යෝජනා පිළිබඳව අනිවාර්යයෙන් සැලකිලිමත් වෙන්න ඕනෑ.

ඒ වාගේම මේ රටේ මිනිසුන්ට මේ ගෙවෙන දශක එකහමාරක, දෙකක කාල සීමාව තුළ කෙසේ හෝ මේ රට දියුණු කර ගැනීමට ලොකු අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා තමයි වසර 5කට වතාවක් ආණ්ඩු මාරු කරමින්, මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් කාටද කියලා බලන්නේ. හැබැයි, එම ක්‍රියාවලිය ඇතුළේ මේ රටේ බහුතර මහජනතාව නොදන්නා දෙයක් තිබෙනවා. ඒ තමයි, මේ රට ආර්ථික වශයෙන් දියුණු කරන්න නම් අප අනිවාර්යයෙන් ලෝකයත් එක්ක බැඳෙන්න ඕනෑ කියන එක. ඉන්දියන් සාගරයේ කෙළවරක තිබෙන අපේ රටට ළඟම රට ඉන්දියාව පමණයි. අපට අනෙක් පැත්තේ රටවල් නැහැ. මේ රට අදහස් අතින් සහ ආර්ථිකමය වශයෙන් දූපතක් ලෙස තවතවත් හුදෙකලා වෙන්න දරන වෑයමෙන් මිදෙන්නේ නැතිව ආර්ථික පිම්මක් පනින්න අපට කවදාවත් පුළුවන් වෙන්නේ නැහැ. එම නිසා ඔබේ අය වැය ලේඛන සියල්ල නිර්මාණය කළ යුත්තේ අපි ලෝකයත් එක්ක කොයි තරම් ප්‍රමාණයකින් සම්බන්ධ වෙනවාද කියන එක මත. විශේෂයෙන්ම අපේ රට ආර්ථිකමය වශයෙන් දුප්පත් වීමට බලපෑ එක හේතුවක් තමයි, අපේ රට ලෝකයේ අනෙක් රටවල් එක්ක සම්බන්ධ වෙන්න දැරූ වෑයම් ප්‍රමාණය අවම වීම. රටක් හැටියට අපේ රට ලෝකයේ අනෙක් රටවල් එක්ක මීට වඩා සම්බන්ධ වුණා නම්, අපට දැනට වඩා ආර්ථික දියුණුවක් ලබා ගන්න පුළුවන්කම තිබුණා.

ඒ වාගේම, පළමුවැනි වතාවට රාජ්‍ය හා පෞද්ගලික අංශය එකතු වෙලා මේ රටේ ආර්ථිකය දියුණු කරන්න එකඟතාවකට පැමිණීම පිළිබඳව මේ රටේ මහජනතාව හැටියට අපි ඔබට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මෙතෙක් කාලයක් රටේ තිබෙන මොනවා හෝ දෙයක් පෞද්ගලික අංශයට පැවරුවාම ඔබතුමන්ලා ඒ හරහා බිල්ලෙක් නිර්මාණය කළා. ඒ නිර්මාණය කරපු බිල්ලා අයින් කරලා පෞද්ගලික අංශය මේ රටට අවශ්‍යයි කියලා ඔබ විශ්වාස කරපු එක අපි අගය කරනවා.

හැබැයි ගරු ජනාධිපතිතුමා ඊයේ මෙතැනට ඇවිල්ලා මුදල් ඇමතිවරයා ලෙස දූෂණය, නාස්තිය, වංචාව, සහචරවාදය පිළිබඳව කථා කළත් ඔබතුමන්ලා මතක තබා ගත යුතුයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ටෙන්ඩර් මණ්ඩලය හරහා දෙවතාවක් අසමත් වෙච්ච ආයතනයකට සුළං බලාගාර ව්‍යාපෘතිය දෙන්න යනවා කියන කාරණාව. එහෙම දෙන්න යන්නේ සුවඳ බලලා ද, මුහුණ බලලා ද, වාඩි වෙලා ද, ළඟ ඉඳලා ද, එහෙම නැත්නම් වෙනත් හේතුවක් නිසා ද කියලා අපි දන්නේ නැහැ. දැන් ඔබතුමන්ලා ඒ සහචරවාදය අවසන් කළා නම්, ටෙන්ඩර් මණ්ඩලය හරහා ෆේල් වෙච්ච ආයතනයකට සුළං විදුලි බලාගාර ව්‍යාපෘතිය දෙන හේතුවත් පැහැදිලි කළ යුතුයි. මොකද, ඔබතුමන්ලා කියන විධියට මේක පාරිශුද්ධ ආණ්ඩුවක්. හැම වෙලාවකම කථා කරන්නේ ඒ පිළිබඳවයි.

වර්තමාන ආණ්ඩුවේ යහපත් ආර්ථික දැක්මට මේ රටේ වෘත්තිය සමිති මැදිහත්වීම් ප්‍රමාණය අවම වීම ද රටක් හැටියට වාසියක්. ඇයි අපි එහෙම කියන්නේ? ගෙවුණු කාල සීමාව පුරාවට, අවුරුදු ගණන පුරාවට දේශපාලන වෘත්තිය සමිති ත්‍රස්තවාදය විසින් මේ රටේ ආර්ථිකය අඩ පණ කරන්න දරපු සෑම වෑයමක්ම මිනිසුන් හැටියට අපි භුක්ති වින්දා. මොන ප්‍රශ්නය ආවත් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට වාසියක් තිබෙනවා. විශේෂයෙන්ම වැටුප් ප්‍රශ්නය හරහා රජයේ වෛද්‍යවරු, එහෙම නැත්නම් nursesලා තමන්ගේ OT ප්‍රමාණය අවම වීම වාගේ දේවල් පිළිබඳව කථා කළත්, කණ්ඩායම් වශයෙන් ඇවිල්ලා රජයට බලපෑම් නොකිරීම රටක් හැටියට අප ලබන ජයග්‍රහණයක්.

ඒ වාගේම තමයි ගුරුවරුන්ගේ ප්‍රශ්නය. මම විශේෂයෙන් ගුරුවරයෙකු ලෙසත් ඔබතුමන්ලාට කියනවා, ගුරුවරුන්ගේ තුනෙන් දෙකක වැටුප් වැඩි කිරීම පිළිබඳව අවධානය යොමු කරන්න කියලා. හේතුව, පාසල් පද්ධතියට දක්ෂ මිනිසුන් එන්න නම්, ඒගොල්ලන්ට ප්‍රමාණවත් වැටුපක් තිබෙන්න ඕනෑ. ඊළඟ අය වැයේදී හෝ වැටුප් වැඩි කරන වෙලාවට මේ විශේෂ ක්ෂේත්‍ර සඳහා වැඩි අවධානයක් යොමු කරන්න කියා ඉල්ලමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.28]

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ඉදිරිපත් කර තිබෙන්නේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ -වත්මන් ආණ්ඩුවේ- පළමුවැනි අය වැය ලේඛනයයි. අප අහලා තිබෙන හැටියට අය වැය ලේඛනය යනු, රටක ඉදිරි වර්ෂය සඳහා ඉදිරිපත් කරන අය සහ වැය ඇතුළත් ප්‍රධාන ලේඛනයයි. ඉදිරි වර්ෂයේදී ඒ රට ඉස්සරහට යනවා ද පස්සට යනවා ද කියලා තීරණය කරන්නේ අය වැය ලේඛනයයි. ඒ වාගේම, ඒ රටේ ජනතාව සතුටින් තබනවා ද, දුකෙන් තබනවා ද කියලා තීරණය කරන ලියවිල්ලත් අය වැය ලේඛනයයි.

අද දවස පුරා -උදේ ඉඳලා මේ වනකල්- මෙම අය වැය පිළිබඳව සංවාද, සාකච්ඡා ගොඩක් ඇති වුණා. ඒ හැම සාකච්ඡාවක් තුළම හොඳ වාගේම නරකත් කියපු අය සිටියා. මේ අය වැය පිළිබඳව අදහස් ඉදිරිපත් කරන කොට බලන්න ඕනෑ, අපේ දැක්ම මොකක්ද කියලා. අප ඉදිරිපත් කරපු අය වැයට අදාළව ක්ෂේත්‍ර 12ක් ඔස්සේ අපි කියනවා, මේ අය වැය මොකක් වෙනුවෙන් ද ඉදිරිපත් කරන්නේ කියලා.

මේ අය වැයෙන් සුවපත් සමාජයක් සඳහා නිරෝගී දිවි පෙවෙතක් ඇති කිරීමට රුපියල් බිලියන 604ක් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ආරක්ෂිත, කාර්යක්ෂම පරිසර හිතකාමී සහ තිරසර ප්‍රවාහන සේවයක් සඳහා රුපියල් බිලියන 483ක් වියදම් කරනවා. අධ්‍යාපනයේ ගුණාත්මක බව, සමානාත්මතාව සහ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම වෙනුවෙන් රුපියල් බිලියන 619ක් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා. රටේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම වෙනුවෙන් ඵලදායී, නවීකරණය කරන ලද තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා රුපියල් බිලියන 254ක්, සදාහරිත ජීවිතයක් සඳහා සහාය දීමට රුපියල් බිලියන 44ක්, සාමකාමී සහ සාධාරණ සමාජයක් සඳහා සහාය දීමට රුපියල් බිලියන 278ක්, ජාතික ආරක්ෂාව සඳහා රුපියල් බිලියන 404ක්, ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය සඳහා රුපියල් බිලියන 99ක්, තිරසර, ආරක්ෂිත බලශක්ති සැපයුම සඳහා රුපියල් බිලියන 21ක්, ජනතා හිතවාදී රාජ්‍ය සේවයක් සඳහා රුපියල් බිලියන 296ක්, සියල්ල ආවරණය වන සමාජ ආරක්ෂණය සඳහා රුපියල් බිලියන 749ක් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන්නේ මේ අය වැයේ පදනම තිබෙන්නේ මෙතැන කියලායි. මේ අය වැයේ පදනම මෙතැනයි කියන එක කාටවත් හංගන්න දෙයක් නැහැ. එය හංගලා නොවෙයි තිබෙන්නේ. එය එළිපිටම කියලායි තිබෙන්නේ. එහෙම නම් අපි මේ මුදල් ප්‍රමාණය වියදම් කරන්න බලාපොරොත්තු වන්නේ කොහොමද? අපි මේ මුදල් වෙන් කිරීම් ගැන කියන කොට, ඒක සමහර අයට ටිකක් මැජික් වාගේ වෙලා තිබෙන්නේ. දැන් ටිකකට කලින් කථා කළ මන්ත්‍රීතුමාත් ඇහුවා වාගේ සමහර අය උදේ ඉඳන්ම අහනවා මම දැක්කා, "කොහෙන්ද මේවාට සල්ලි?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩුව පිහිටුවලා අදට මාස 3යි. අපේ ජනාධිපතිතුමා බලයට පත් වෙලා මාස 5කට ආසන්න කාලයක් වෙන්නේ. හැබැයි, ඒ කාලසීමාව තුළ අපි මුදල් කළමනාකරණය කළේ කොහොමද, වියදම් කරන්න තිබිච්ච මුදල් මහජනතාව වෙනුවෙන් වෙන් කර දෙන්න balance කළේ කොහොමද කියන එක පිළිබඳව අලුතින් උගන්වන්න දෙයක් නැහැ. පසුගිය දවස්වල අපි ඒ ඉතිරි කරපු, කළමනාකරණය කරපු මුදල්වලින් ජනතාවට දුන්නු සේවාව පිළිබඳව අපට අත්දැකීමක් තිබෙනවා. ඒ නිසා තමයි අපේ රුවන් විජේවීර මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අපේ ජනාධිපතිවරයා විදේශ සංචාරයක් ගිහිල්ලා ආවාට පස්සේ එතුමාට පෞද්ගලිකව වියදම් කරන්න දීපු ඩොලර් එකක්වත් වියදම් කරන්නේ නැතිව ආපහු ගෙනැල්ලා දෙන තැනට පත් වුණේ. කළමනාකරණය කියන එක පිළිබඳව කිසිවක් නොදන්නා කෙනෙකුට අපේ මේ අය වැය ප්‍රශ්නයක් වුණාට, කළමනාකරණය හොඳට දන්නා කෙනෙකුට මේ අය වැය

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සල්ලි හොයන හැටි පිළිබඳව ගොඩක් දේවල් කථා කරන්න ඕනෑ නැහැ. අපි මේ විපක්ෂයට කියනවා, අපි සල්ලි හොයලා වියදම් කරලා රට යම් නිශ්චිත තැනකට ගෙන එන විධිය බලාගෙන ඉන්න කියලා.

අපි දැක්කා, චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කියනවා, රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා අවුරුද්දට බඩු පාර්සල් දෙන්නේ කොහොමද කියලා. මම එතුමාට මේ කාරණය කියන්න ඕනෑ. අපි බඩු පාර්සල් නොමිලේ දෙනවා කිව්වේ නැහැ. අපි මොකක්ද කිව්වේ? අපේ රටේ දුප්පත් මිනිස්සු ලක්ෂ ගණනක් ජීවත් වෙනවා. අප්‍රේල් මාසයේ සිංහල-දෙමළ අලුත් අවුරුද්ද එනකොට අන්න ඒ ජනතාවට සහනදායී බඩු මල්ලක් ලබාදීම වෙනුවෙන් තමයි මෙන්න මේ මුදල වෙන් කරන්නේ. මේ මුදල වෙන් කරන්නේ නොමිලේ බඩු මල්ලක් දෙන්න නොවෙයි. අපේ ලංකා සතොස හරහා ලබාදීමට බලාපොරොත්තු වන සහනදායී බඩු මල්ල සඳහා යන වියදම අපි නිකම් ගණන් හදලා බැලුවා. ආණ්ඩුවෙන් ලැබෙන සහනයත් එක්ක ඒ බඩු මල්ලට හාල් කිලෝග්‍රෑම් 10ක්, සීනි කිලෝග්‍රෑම් 5ක්, පරිප්පු කිලෝග්‍රෑම් 2ක්, බී ලූනු කිලෝග්‍රෑම් 2ක්, අල කිලෝග්‍රෑම් 5ක්, සැමන් ටින් 3ක්, බිස්කට් රුපියල් 1,000ක, හාල්මැස්සෝ රුපියල් 1,000ක, කුළුබඩු ඇතුළු මේ සියල්ල ඇතුළත් කරලා රුපියල් 10,000ක මිලකට දෙන්න අපට පුළුවන්. ඔය කියපු භාණ්ඩ ඔක්කෝම ඇතුළත් කරලා රුපියල් 10,000ක මුදලකට බඩු මල්ලක් දෙන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් ගණන් හදපු චාමර මන්ත්‍රීතුමාට අපි ඒක කියන්න ඕනෑ. ලංකා සතොස හරහා සහනදායී මිලට අපි ඒ බඩු මල්ල දෙන්නේ ගන්න අවශ්‍ය ඕනෑම කෙනෙකුට ගන්නයි. රුපියල් 15,000ක් විතර වටිනා බඩු මල්ලක් රුපියල් 10,000ට දෙන්න පුළුවන් විධියට තමයි ඒක හදලා තිබෙන්නේ. අපි ඒ බඩු මල්ල නිකම් දෙන්න හැදුවේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව වටපිටාව පිළිබඳව හරියට අධ්‍යයනය කරලා, රටේ ජනතාවගේ විවිධ ක්ෂේත්‍ර හඳුනාගෙන මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන බව අපි දැක්කා. සෑම ක්ෂේත්‍රයකටම අත තියලා, ඇහුම්කන් දීලා, සෑම කෙනෙකු පිළිබඳවම දැනුවත්භාවයක් සහිතව ඉදිරිපත් කරපු අය වැයක් තිබෙනවා නම්, ඒ 2025 වසර වෙනුවෙන් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඉදිරිපත් කරපු අය වැය ලේඛනයයි. ඇයි මම එහෙම කියන්නේ? කිසිදු කෙනෙක් එළියට දමන්නේ නැතිව, හැම කෙනෙකුටම සහන දෙන්න පුළුවන් මට්ටමට, හැම කෙනෙකුටම සහන ලැබෙන මට්ටමට මේ අය වැය ලේඛනයට කරුණු ඇතුළත් කර තිබෙනවා.

අනෙක් පැත්තෙන්, මහපොළ ශිෂ්‍යාධාර ලබන සිසු සිසුවියන්ට ජීවත් වෙන්න අමාරුයි කියනකොට ආණ්ඩුව තීරණයක් ගන්නවා, සියයට 50කින් මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කරන්න. රුපියල් 5,000ක මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 7,500 දක්වා වැඩි වෙන්නේ එහෙම. ඒ වාගේම, ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා රුපියල් 2,500කින් -සියයට 60කට ආසන්න ප්‍රමාණයකින්- වැඩි වෙනවා. විපක්ෂය පැත්තේ ඉන්න ගරු මන්ත්‍රීවරයෙක් ඇහුවා, කුඩා කර්මාන්තවලට මොනවාද දීලා තිබෙන සහන කියලා. මට පෙනන විධියට ඒ මන්ත්‍රීතුමා මේ වෙලාවේ ගරු සභාවේ නැහැ. කුඩා කර්මාන්තවලට දීලා තිබෙන සහන ගැනත් මම පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ. ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය සඳහා මේ අය වැය ලේඛනය ඇතුළේ කර්මාන්ත ප්‍රවර්ධනය වෙනුවෙන් රුපියල් බිලියන 7.98ක් වෙන් කර තිබෙනවා. ආයෝජන ආකර්ෂණය සඳහා රුපියල් බිලියන 2.4ක් වෙන් කර තිබෙනවා. සංචාරක ආකර්ෂණය සඳහා රුපියල් බිලියන 14.4ක් වෙන් කර තිබෙනවා. සුළු හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත සංවර්ධනය සඳහා රුපියල් බිලියන 38.64ක් වෙන් කර තිබෙනවා.

වෙළෙඳ කටයුතු පහසු කර ගැනීම සඳහා රුපියල් බිලියන 4.28ක් වෙන් කරලා තිබෙනවා. කර්මාන්තපුර 32ක් වෙනුවෙන්, ඒවා සංවර්ධනය කර ගැනීම වෙනුවෙන් තමයි මේ සල්ලි වෙන් කරලා තිබෙන්නේ. ඊට අමතරව නව ආර්ථික කලාප පිහිටුවීම සඳහා බලාපොරොත්තුවක් සහිතවයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා කර්මාන්ත පිළිබඳව බොහෝ කරුණු කියන්න උත්සාහ කරපු විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමන්ට කියන්න ඕනෑ, එතුමන්ලා මේ කර්මාන්ත පවත්වා ගෙන ගියේ කොහොමද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනරාගල දිස්ත්‍රික්කයේ රඳා පවතින ප්‍රධාන කර්මාන්ත තුනයි තිබෙන්නේ. පෞද්ගලික අංශය සතුව එකක් තිබෙනවා. රාජ්‍ය අංශය සතුව ප්‍රධාන කර්මාන්ත දෙකයි තිබෙන්නේ. ඒ කර්මාන්ත දෙක තමයි පැල්වත්ත සීනි සමාගම සහ සෙවණගල සීනි සමාගම. මේ කර්මාන්ත දෙක තුළ තමයි ඒ ගම් මට්ටමේ, බිම් මට්ටමේ මිනිස්සුන්ගේ ජීවිත ගැට ගැහිලා තිබෙන්නේ. හැබැයි, ඔය කර්මාන්ත ගැන පම්පෝරි ගහන කට්ටිය පසුගිය පාලන කාල දෙකේදීම එකතු වෙලා පැල්වත්ත සීනි සමාගම බංකොලොත් තත්ත්වයට ගෙනාවා. පැල්වත්ත සීනි සමාගම බංකොලොත්භාවයට ගෙනාවේ කොහොමද? පැල්වත්ත සීනි සමාගමේ ඉන්න ඕනෑ සේවක සංඛ්‍යාව 2800 ගණනක් වෙනකොට, පැල්වත්ත සීනි සමාගමට තවත් සේවකයෝ දාලා, දාලා, දාලා පිරෙව්වා. 4000කට වැඩිය ඉන්න විධියට සේවකයන් පුරවලා මේ කර්මාන්තශාලාව අකර්මණ්‍ය කරලා, මේ කර්මාන්තය දුවන්න බැරි තැනකට ගෙනැල්ලා, ඒ සේවකයන්ගේ රස්සාවත්, ඒ ප්‍රදේශයේ මිනිස්සුන්ගේ ජීවිතත් අවුල් කරන තැනට ගෙනාවා. ඒ වාගේම, සෙවනගල සීනි කර්මාන්තශාලාවේ ඉන්න ඕනෑ සේවකයන් ප්‍රමාණය 500කට ආසන්න ගණනක් වුණත්, සේවකයන් එක්දහස් ගණනක් දක්වා සියයට සියයකින් වැඩි කළා. කවුද ඒ වැඩි කළේ? පොදුජන පෙරමුණ ආණ්ඩුව තිබෙන කාලයේත් සේවකයන් දැම්මා. යහ පාලන ආණ්ඩුව තිබෙන කාලයේ ඒකට හවුල් වෙලා, දැන් ඉන්න සමගි ජන බලවේගයේ ඉන්න ඒ ප්‍රදේශවල හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරු මිනිස්සු ඒ රස්සාවලට දැම්මා. කරන්න කිසිදු කාර්යභාරයක් නැතත් ඒ රස්සාවලට දාලා, සෙවනගල සීනි ෆැක්ටරි එකත් දැන් වැටිලා දුවන්න බැරි තැනකට ගෙනාවා. දැන් සීනි ටික විකුණා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ චිතරක් නොවෙයි, අනෙකුත් සියලු කටයුතු අකර්මණ්‍ය වෙලා ඒ කර්මාන්ත වැටෙනකොට දැන් ප්‍රශ්නයක් තිබෙනවා කොහොමද මේ කර්මාන්ත බේරා ගන්නේ කියලා. අපි මේ කර්මාන්තශාලාව විකුණන්නේ නැතිව පවත්වා ගෙන යන්නේ කොහොමද කියලා බලනවා. ඒ වාගේම, මේ කර්මාන්තශාලාව වහන්නේ නැතිව පවත්වාගෙන යන්නේ කොහොමද කියලා බලනවා. ඒ දෙකම කරන්න වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට හදන්න පුළුවන් නම්, ආර්ථිකය ගොඩනහන්න පුළුවන් නම් ඊට ප්‍රධාන වශයෙන් බලපාන කර්මාන්තයක් තමයි කෘෂිකර්මාන්තය. අපේ අය වැය තුළින් කෘෂිකර්මාන්තය සඳහා රුපියල් බිලියන 124.7ක්, ධීවර කර්මාන්තය සඳහා රුපියල් බිලියන 11.4ක්, වාරි මාර්ග සංවර්ධනය සඳහා රුපියල් බිලියන 89.5ක්, පශු සම්පත් සංවර්ධනය සඳහා රුපියල් බිලියන 3.5ක්, වැවිලි කර්මාන්තය සඳහා රුපියල් බිලියන 11.3ක් වෙන් කරලා තිබෙනවා. රුපියල් බිලියන ගණනින් මෙතරම් මුදලක් වෙන් කරන්නේ ඒ ක්ෂේත්‍ර නිෂ්පාදනයට දායක කර ගන්න තමයි. නිෂ්පාදනය ශක්තිමක් වෙනකොට තමයි රට ගොඩ නැගෙන්නේ; ආර්ථිකය හැදෙන්නේ; කර්මාන්ත බිහි වෙන්නේ. එහෙම නැතිව කර්මාන්ත

හදලා යන්ත්‍ර-සූත්‍ර ගෙනැල්ලා සවි කළාට කර්මාන්ත බිහි වෙන්නේ නැහැ. කර්මාන්ත බිහි වෙන්න නම් නිෂ්පාදනය තිබෙන්න ඕනෑ. අන්න ඒ නිෂ්පාදනය ඉලක්කකර ගත්ත වැඩ පිළිවෙළක් තමයි මේ තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අධ්‍යාපනයටත් මුදල් වෙන් කළා. අධ්‍යාපනය ගත්තොත්, පාසල් අධ්‍යාපනයට රුපියල් බිලියන 458.8ක්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට රුපියල් බිලියන 135.3ක්, වෘත්තීය අධ්‍යාපනයට රුපියල් බිලියන 15.4ක්, විද්‍යා හා තාක්ෂණයට රුපියල් බිලියන 6.5ක්, දහම් පාසල් අධ්‍යාපනය රුපියල් බිලියන 1.3ක්, පූර්ව ළමා විය සංවර්ධනය රුපියල් බිලියන 4.4ක් වෙන් කරලා තිබෙනවා.මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ ගොඩක් දේවල්වලට මුදල් වෙන් කළා.

නැහෙනහිර පළාතේ මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් කිව්වා, ඒ ප්‍රදේශ අත්හැරලා තමයි මේ අය වැය හදලා තිබෙන්නේ කියලා. අපේ ජනාධිපතිතුමා ඊයේ කිව්වේ මොකක්ද? නැහෙනහිර පළාතේ සංවර්ධනය වෙනුවෙන් ඉන්දියානු ආධාර යටතේ වෙනම ව්‍යාපෘතියක් තුළින් කටයුතු කරන්න රජය මැදිහත් වෙනවා කියන එක තමයි කිව්වේ. එහෙම නැතිව නැහෙනහිර පළාත අත්හැරියා නොවෙයි. නැහෙනහිර පළාතට ඒ මුදල් වෙන් කරනවා විතරක් නොවෙයි,

නැහෙනහිර පළාතට ඒ මුදල් වෙන් කරනවා විතරක් නොවෙයි, වාරිමාර්ග සංවර්ධනයටත් රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ යටතේ වැව් 4ක් ඇතුළත් වෙනවා. ඒ හතරෙන් එකක් තමයි ගල්ඔය ව්‍යාපාරය. එතකොට අවම වශයෙන් ගල්ඔය ව්‍යාපාරයට මිලියන 500කට වැඩි ප්‍රමාණයක් වෙන් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු ඇමතිතුමා.

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

මට අවසානයට කියන්න තිබෙන්නේ මේකයි. දැන්, "වැටුප්, වැටුප්, වැටුප්" කියමින් වැටුප් ගැනම කියනවා. ඇත්තටම වැටුප් ගැන මේ අය වැය පොතේ ඉතා පැහැදිලිව විග්‍රහ කරලා තිබෙනවා. උදේ ඉඳලා මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමාත්, වසන්ත සමරසිංහ අමාත්‍යතුමාත් ඉතා පැහැදිලිව කිව්වා කොහොමද වැටුප් වැඩි වෙන්නේ කියලා. ගුරුවරයාට කොහොමද, අනෙක් නිලධාරීන්ට කොහොමද, ඩොක්ටර්ට කොහොමද වැටුප් වැඩි වෙන්නේ කියලා කිව්වා. ඒ සියලුදෙනාට වැටුප් වැඩි වෙන ආකාරය ඉතා පැහැදිලිව කිව්වා. තේරෙන්නේ නැත්නම් නැවත වතාවක් කියවන්න. තේරුම් ගන්න බැරි නම් තේරුම් කරලා දෙන්න කාට හරි කියන්න. ඒ දෙක තේරුම් ගත්තා නම් ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කෙසේ වෙතත්, මේ අය වැය සාර්ථක අය වැයක්, අනාගත අපේක්ෂා ඉෂ්ට කරන අය වැයක් කියලා මම හිතනවා. මේ නිසා විශ්‍රාම වැටුප් වැඩි වෙනවා කියලා කෑ ගැහුවාට, ඒ විශ්‍රාම වැටුප ගෙවන්නේත් ජාතික ජන බලවේග ආණ්ඩුව කියන එක ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග ගුණසේකර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.43]

ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අය වැය විවාදයේ අපේ පැත්තෙන් අවසන් කථාව කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ජාතික ජන බලවේගය විධියට අපි ඊයේ පුරවැසි අය වැයක් ඉදිරිපත් කළා. එම අය වැය ඉදිරිපත් කළාට පස්සේ විපක්ෂයේ මහත්වරුන්ට අමාරුවෙන් සොයා ගත් කෑලි දෙක තුනක් තමයි ඒ ගැන කියවන්න පුළුවන් වුණේ. එකක් තමයි අනුර සහෝදරයාගේ ෂර්ට් එකේ බොත්තම, දෙවැනි එක තමයි කොළ කෑල්ලක් අතේ තියාගෙන කියෙව්වා කියන එක, තුන්වෙනි එක තමයි මේක IMF එකෙන් දීපු අය වැයක් කියන එක. හතරවෙනි එක විධියට කිව්වා, රනිල් කියවන්න හිටපු අය වැය තමයි කියෙව්වේ කියලා. ඒ හැරෙන්න වෙන මෙලෝ දෙයක් මේ සභාවේ කිව්වේ නැහැ.

දැන්, අද මොකක්ද තිබෙන සාකච්ඡාව? අඩුම තරමින් ඒ මහත්වරු තමන්ගේ පක්ෂයේ එකඟතාවක් හරි හදාගෙන මෙතැනට එන්න ඕනෑ කථා කරන්න. උදේ පාන්දර එක්කෙනෙක් ඇවිල්ලා කිව්වා, ලිබරල් ආර්ථිකය මත පදනම් කර ගත්, නව ලිබරල්කම මත පදනම් කර ගත් අය වැයක් තමයි මේ ඉදිරිපත් කළේ කියලා. ඒ පක්ෂයේම තව කෙනෙක් ඇවිල්ලා දැන් කියනවා, මේකේ රාජ්‍ය පංගුව වැඩියි ලු. ඒ නිසා මම කියනවා, අඩුම තරමින් තමන්ට ලියලා දෙන කථාවේ මුලයි, මැදයි, අගයි පොඩ්ඩක් නැවත බලන්න කියලා. එක පැත්තකින් කියනවා, රාජ්‍ය පංගුව වැඩියි ලු. අනෙක් පැත්තෙන් කියනවා, මේකෙන් පෞද්ගලික අංශය සීමිත කරලා ලු. තව පැත්තකින් කියනවා, ඩිජිටල්කරණය කියන්නේ ලිබරල්කරණයේ එකක් ලු. මොකක්ද මේ? එතුමා ළමයින්ට උගන්වනවා නම්, ගුරුවරයෙක් නම් අඩුම තරමින් කථාවේ මුල, මැද, අගවත් තේරුම් අරගෙන මෙතැනට එන්න. ඒ එක්කම මේ ගැන තමන්ගේ පක්ෂයේ එකඟතාව හදාගෙන එන්න. මහත්තයෝ, පුළුවන් නම් එකක් කියන්නකෝ. මේ අය වැය ලිබරල්ද, සමාජවාදීද, රාජ්‍ය පංගුව වැඩිද? හරියට බලලා ඒ එකක් කියන්නකෝ. එහෙම නැතිව ඔහේ කියවනවා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? එතුමන්ලාට හිතා ගන්නත් බැහැ මේ මොකක්ද වෙන්නේ කියලා. ඇයි ඒ? එතුමන්ලාට කවදාවත් මේ වාගේ අය වැයක් හදන්න පුළුවන් වුණේ නැහැ. අවුරුදු 76කට පසුවත් එතුමන්ලාට කවදාවත් මේක තේරුම් ගන්න බැහැ. ඒක ගැන අපි සතුටු වෙනවා. මොකද, ඔබතුමන්ලාට කවදාවත් මේක තේරුම් ගන්න බැරි වෙන්නේ ජනතාවගේ නැඟිටීම කවදාවත් කියවා ගන්න බැරි නිසා. මෙතැන විපක්ෂයේ සිටින ගොඩක් මහත්වරු හිතුවේ නැහැ, ඔබතුමන්ලාට ඔය පැත්තට යන්න වෙයි, අපි මේ පැත්තට එයි කියලා. හැබැයි, අපි හැමෝම විශ්වාස කළා, කුමන හෝ දවසක ජනතාව නැඟිටිනවා කියලා. ඒක තමයි මේ සිද්ධ වුණේ. ඒ නිසා ඔබතුමන්ලාට මේක හිතා ගන්න බැහැ.

[ගරු එරංග ගුණසේකර මහතා]

අපි ජනතාවත් එක්ක එකතු වෙලා මේ රට හදනවා. මොකක්ද අපි මේ කරමින් සිටින්නේ? අපි ඉදිරිපත් කළ අය වැය කියන්නේ වෙන මොකක්වත් නොවෙයි, පුරවැසි අය වැයක්. අපි මේකට පුරවැසි අය වැයක් කියන්නේ ඇයි? අවුරුදු 76කට පස්සේ අපේ රටේ පුරවැසියන් නැඟිටිටා; පුරවැසියන් අවදි වුණා. ඒ විතරක් නොවෙයි. ඒ පුරවැසියන් මේ රටේ හිටපු දූෂිත බලවේග අතුගා දැම්මා. ඒක තමයි අද විපක්ෂයට වෙලා තිබෙන්නේ. ජනතාව දූෂිත බලවේග අතුගාලා දැම්මා. ඒ විතරක් නොවෙයි. ජනතාවට පුළුවන් වුණා, ජනතාවාදී මිනිසුන්ගෙන් මේ පාර්ලිමේන්තුව පුරවන්න.

මේ රටේ සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම්, මැලේ සියලුදෙනා නියෝජනය වෙන ශ්‍රී ලාංකීය අය වැයක් ඉදිරිපත් කළා නම් ඉදිරිපත් කළේ, අවුරුදු 76කට පස්සේ ජාතික ජන බලවේගය ආණ්ඩුව කියන එක මතක තියා ගන්න. එහි වෙනත් කැලි බැලි නැහැ. ඒ විතරක් නොවෙයි. තරුණයන්, වැඩ කරන ජනතාව, බුද්ධිමතුන්, ව්‍යාපාරිකයන් වාගේම, සමාජයේ කොන් වෙලා හිටපු සියලු ජනතාව පදනම් කරගෙන ඔවුන්ගේ මතය නියෝජනය කරන, ඔවුන්ගේ හඬ නියෝජනය කරන, ඔවුන්ගේ අවශ්‍යතාව නියෝජනය කරන පුරවැසි අය වැයක් තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

දෙවැනි කාරණය මෙයයි. මේක system change එකට තියපු පළමු පියවර විධියට තිබෙන අය වැයක්. ඇයි අපි ඒක එහෙම කියන්නේ? අපි දන්නා විධියට මීට පෙර අය වැය හදද්දී අපේ රටේ ඉස්සෙල්ලා මතයක් හදනවා, "රට අමාරුයි. ගෙන යන්න විධියක් නැහැ" කියලා. රටේ පුරවැසියාට කියනවා, පටි තද කරගන්න කියලා. පටිය තද කර ගන්න කියන ගමන් අපේ රටේ පාලකයෝ පටිය දිග ඇර ගත්තා. ඒක තමයි අපේ රටේ අය වැයේ තිබුණු සම්ප්‍රදාය. හැබැයි, අපි මොකද කරලා තිබෙන්නේ? මේ ජනතාවාදී ආණ්ඩුව විසින් අපේ රටේ පාලනය භාර ගෙන සිටි ඒ පිරිසගේ වරප්‍රසාද, වරදාන කපලා තිබෙනවා. අපේ ඒවා අඩු කරගෙන තිබෙනවා. එහෙම අඩු කරගෙන ලංකාවේ පළමුවැනි වතාවට උපරිම ප්‍රමාණයෙන් පුරවැසියාට දේශපාලන මහ පෙන්වීම සහ සහන දෙන අය වැයක් අපට ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ මේක system change එක මත යන අය වැයක් නිසා. ඔය ලිබරල් කියන, එහෙම නැත්නම් මේක ගැන හිතා ගන්න බැරිව ඉන්න මහත්වරුන්ට අපි කියනවා, ඔය ගොල්ලන්ගේ පසුගිය අය වැය අරගෙන බලන්න කියලා. ඒවා කොහොමද ඉදිරිපත් කළේ කියලා බලන්න.

ඒ විතරක් නොවෙයි. මේක විශේෂයෙන් අපේ රටේ තාරුණ්‍යයට මහ පෙන්වන, තාරුණ්‍යයට මහ කියන අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ අරගළයත්, අපේ රටේ පුරවැසියන්ගේ අවදිවීම තුළත් සැලකිය යුතු පංගුවක් හිටියා, අපේ රටේ තරුණ පරම්පරාව. ඒ තරුණ පරම්පරාව මොකක්ද කියමින් හිටියේ? ඔවුන්ට ඉන්න හිටින්න පුළුවන් රටක් නොවෙයි තිබුණේ. අපේ රටේ පාලකයන්ට රිසි ලෙස අපේ රටේ දේපළ කොල්ලකන ඉතිහාසයක් තිබුණේ. හැබැයි, අද අපේ රටේ තරුණ පරම්පරාවට බලාපොරොත්තු දල්වන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපේ රටේ තරුණ පරම්පරාවට අනාගතය පෙන්වන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපේ රටේ තරුණ පරම්පරාවට වගකියන රටක් නිර්මාණය වෙනවා කියන එක මේ අය වැය ඇතුළේ අපට පෙන්වන්න පුළුවන් වෙලා තිබෙනවා.

2021 වර්ෂයේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට මේ විපක්ෂයේ මහත්වරු හිටපු ආණ්ඩුවෙන් රුපියල් මිලියන 6,000යි වෙන් කළේ. 2024 වර්ෂයේ රුපියල් මිලියන 10,200යි වෙන් කළේ. නමුත් මෙවර පුරවැසි අය වැයෙන් තරුණ පරම්පරාවට මහ පෙන්වන්න අපේ රටේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට රුපියල් මිලියන 12,100ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔබ මේ අය වැය ඉතා හොඳින් අධීක්ෂණය කළොත්, මේ අය වැය දෙස ඔබ ඉතා හොඳින් බැලුවොත්, මේ අය වැය හදලා තිබෙන්නේ ඇමතිවරයාට, පවුලේ කීප දෙනෙකුට, සමහර මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට මේ Budget එකෙන් සල්ලි වෙන් කරන පදනමකින් නොවෙයි. මීට පෙර තිබුණු තත්ත්වය අපි දැක්කා. පවුලේ කීප දෙනෙක් ඉන්නවා. ඒ කීප දෙනාට තමයි අය වැයේ සැලකිය යුතු පංගුවක් වෙන් කර ගත්තේ. හැබැයි, මේ අය වැය එහෙම නොවෙයි. අපේ ප්‍රමුඛතා ලැයිස්තුව මත තමයි අපි අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ. එතැනින් පස්සේ තමයි ඒවා අමාත්‍යාංශ 24ට වෙන් කරලා තිබෙන්නේ. ඒක තමයි මේ අය වැයේ වෙනස. ඒක තමයි system change එක. ඒ අනුව පළමුවැනි වතාවට ප්‍රමුඛතාව මත අපි අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අය වැය ඇතුළේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට වාගේම අනෙකුත් අමාත්‍යාංශවලටත් අපේ රටේ තරුණයන් වෙනුවෙන් සෘජුව වෙන් කරපු මුදලක් තිබෙනවා. රුපියල් මිලියන 17,000කට වඩා වැඩි ප්‍රමාණයක් අනෙක් අමාත්‍යාංශවලට ඒ සඳහා වෙන් කරලා තිබෙනවා. අපි සාමාන්‍යයෙන් ගත්තොත් තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයට මිලියන 12,100කුත්, අනෙකුත් අමාත්‍යාංශවලට රුපියල් මිලියන 17,000කට වඩා වැඩි මුදල් ප්‍රමාණයකුත් වෙන් කරලා තිබෙනවා. අපේ මේ පුරවැසි අය වැය ඇතුළේ රුපියල් මිලියන 29,100කට වඩා වැඩි ප්‍රමාණයක් රටේ තරුණ පරම්පරාව වෙනුවෙන් වෙන් කරපු පළමුවැනි අය වැය බවට මේ අය වැය පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ අය වැය තුළින් ව්‍යාත්තීය අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් මිලියන 15,400ක ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඇයි ඒ? අපේ රටේ තරුණ පරම්පරාවේ ව්‍යාත්තීය දැනුම දැන් නවීනත්වයට පත් වෙන්න ඕනෑ. එම දැනුම ජාතික වශයෙන් නවීනත්වයට පත් වෙන්න ඕනෑ. ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් නවීනත්වයට පත් වෙන්න ඕනෑ. ලෝකයේ මතුවන අලුත් තත්ත්වයටත්, අපේ රටේ ආර්ථිකයේ සැලකිය යුතු පංගුකාරයන් බවට අපේ රටේ තරුණ පරම්පරාව පත් කර ගැනීමත් වෙනුවෙන් රුපියල් මිලියන 15,400කට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙවර අපේ ජනතාවාදී අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

මට ඇහුණා මෙතැන කියනවා, ඩිජිටල් ආර්ථිකය කියන්නේ ලිබරල් ක්‍රමය කියලා. ඒ, තොරතුරු නොදන්නාකමේ තිබෙන ප්‍රශ්නයක්. දැනුමේ තිබෙන දුප්පත්කම තමයි ඒ තුළින් පෙන්වන්නේ. දැනුම කියන්නේ මේ සමාජයේ මිනිසාගේ නිර්මාණයක්. ඒක තේරුම් ගන්න නොහැකි සමහර අය හිතනවා, මේ අය වැය ලිබරල් අදහසින් හදපු එකක් කියලා. මේ මුළුමහත් මිනිස් සමාජයේ නිර්මාණයක් තමයි ඒ තිබෙන්නේ. ඒක නිසා අපි ඉන්නේ දියුණුම දේවල් මේ රටේ මිනිසුන්ට ලබා දෙන්න ඕනෑය කියන අදහසේ. කිහිපදෙනෙකුට විතරක් නොවෙයි, මේ රටේ තරුණ පරම්පරාව ඇතුළු සාමාන්‍ය මහජනතාවට එය අත්පත් කර දීම වෙනුවෙන් තමයි අපි වැඩ කරමින් යන්නේ. ඩිජිටල්කරණයට යනවා කියන්නේ, හැදුනුම්පත්වලට පමණක් අදාළ ක්‍රියාවලියක් නොවෙයි. එය ආරම්භයයි. අපි දන්නවා, ඔබ හය වෙලා තිබෙන තරම. අප නිසැකවම එම වැඩ පිළිවෙළ පියවරෙන් පියවර ආරම්භ කරනවා. රුපියල් මිලියන 21,000කට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ඒ සඳහා අපි වෙන් කරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ රැකියා ලබා දීම පිළිබඳව තිබෙන සාකච්ඡාව අප දන්නවා. අද විපක්ෂයේ ඉන්න සමහර මහත්වරු ආණ්ඩු බලයේ ඉන්නකොට රස්සා දුන්නේ කොහොමද කියලා අපි දන්නවා. සියඹලා ගස් ගාවට ඇවිල්ලා උස

ද කියලා බලනවා, මිටි ද කියලා බලනවා. එහෙම jobs දීපු ඉතිහාසයක් තමයි අපේ රටේ තිබුණේ. හැබැයි, අද මොකද කරලා තිබෙන්නේ? අද අප එය වෙනස් කරලා තිබෙනවා. අපේ ගරු ඇමතිවරු, ගරු මන්ත්‍රීවරු කවුරුවත් listsවලට jobsවලට දාන්නේ නැහැ. අපේ අමාත්‍යාංශ 24ක් තිබෙනවා. ඔබට පුළුවන් හොයන්න, අපි list එකක් මත, සුදුසුකම් නැතිව කවුරු හෝ කෙනෙක් රස්සාවකට දාලා තිබෙනවා ද කියලා. ඒ සංස්කෘතිය අවසන්. ඒවාට තමයි මහත්තයෝ, system change කියන්නේ. ඒවා ගැන ඔබතුමන්ලාට හිතන්නවත් බැහැ. මොකද, ඔබතුමන්ලා පුරුදු වෙලා තිබුණේ ඒවා කරන්න, තරුණයන් රවටන්න. හැබැයි, අපි මොකද කරලා තිබෙන්නේ? අපි කිව්වා වාගේම අවුරුදු පහකට පස්සේ -2020න් පස්සේ- ලෑස්ති වෙලා තිබෙනවා, 30,000ක් මේ රටේ රාජ්‍ය පංගුවට එකතු කර ගන්න. අන්න එතකොට මතක් වනවා, ආ ඒක රාජ්‍ය පංගුවට ගන්න එක අවුලක්ද කියලා. නැහැ. ඉස්සර ඔබතුමන්ලා තමයි ඒවා කළේ. ඔබතුමන්ලා ඔහේ එකඑක්කෙනා jobsවලට ගත්තා. අඩුම තරමින් මේසයක්, පුටුවක්වත් ඔවුන්ට තිබුණේ නැහැ. පඩි දෙන්න ක්‍රමයක් තිබුණේත් නැහැ. අපේ රටේ උපාධිධාරින් නන්නත්තාර කළා. අපි කටයුතු කරන්නේ එහෙම නොවෙයි. ඉතාම විද්‍යානුකූලව පසුගිය මාස කිහිපය ඇතුළේ අපි සැලසුම් කළා, මොන-මොන ක්ෂේත්‍රවලද පුරප්පාඩු තිබෙන්නේ කියලා. මේසයක්, පුටුවක් නැතුව අපි නිකම් ඒ අය රාජ්‍ය සේවයට ගන්නවා නොවෙයි. අපි බඳවා ගන්නා මේ සෑම තරුණ තරුණියක්ම අනිවාර්යයෙන්ම අපේ රටේ ආර්ථිකයේ සැලකිය යුතු පංගුකාරයෙකු බවට පත් කිරීමේ අරමුණින් තමයි ඒ 30,000ක පිරිස බඳවා ගන්නේ.

තවත් ගරු මන්ත්‍රීවරයෙක් අද උදේ කියනවා මම දැක්කා, මේ 30,000 බඳවා ගන්න සල්ලි මදි කියලා. ඉතින් කොහොමද මේක බෙරන්නේ? දැන් ගණන් කියා දෙන්නත් අපට සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අය වැය මාර්තු මාසයේ 21වැනි දා සම්මත වෙනවා. ඉන් පසුව මේ යෝජනා ක්‍රියාත්මක වනවා. සාමාන්‍යයෙන් රජයේ රස්සාවලට බඳවා ගැනීමේ ක්‍රමයක් තිබෙනවා. මේ බඳවා ගැනීම් සඳහා ගැසට් කරන්න ඕනෑ. ඊට පස්සේ සමහර තනතුරු සඳහා විභාග පවත්වන්න වෙනවා. ඊළඟට, interviews පවත්වන්න වනවා. එම කටයුතුවලට අඩුම තරමින් මාස දෙකක් හෝ දෙකහමාරක් ගතවනවා. මම නිකම් ගණන් හදලා බැලුවා. අලුත් වැටුප් වැඩිවීම යටතේ බඳවා ගන්නා සමහර තනතුරුවල මූලික වැටුප සාමාන්‍යයෙන් රුපියල් 45,000ක්, 50,000ක් විතර වාගේ වෙන්න පුළුවන්. සාමාන්‍ය අගයක් ගන්න ඕනෑ නිසා රුපියල් 50,000ක් අපි දැම්මොත්, වැටුප් ගෙවන්න මාස හයක් ඉදිරියට තිබෙනවා. 50,000 වැඩි කරනවා 6න්, රුපියල් 300,000යි. එතකොට එක්කෙනෙකුට මාස 6කට වැටුප් ගෙවන්න රුපියල් 300,000ක් යනවා, ආණ්ඩුවට තිබෙන මේ සැලසුම අනුව. එතකොට මොකද වෙන්නේ? අපි ඒ වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා, රුපියල් මිලියන 10,000ක්. හැබැයි, 30,000කට වැටුප් ගෙවීම සඳහා රුපියල් මිලියන 9,000යි යන්නේ. තව රුපියල් මිලියන 1,000ක් ඉතුරුයි. මෙම මහත්වරුන්ට ගණන් හදා ගන්න බැරිව කියනවා, ඒක කරන්න සල්ලි නැහැ ලු. ඒ මොකද? මේ කටයුතු මෙහෙම කරලා පුරුදු නැහැ නේ. මෙතැන මොකක් හෝ අවුලක් ඇති කියන තැනටයි මේ අය එන්නේ. ඒ නිසා පට්ටපල් බොරු කියන්න හදන්න එපා. අපි පොරොන්දු වුණා වාගේම අපේ රටේ තරුණ පරම්පරාවට රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළකට අපි යනවා. ඒක රාජ්‍ය පංගුවට විතරක් නොවෙයි. ජාතික සහ ජාත්‍යන්තර රැකියා සඳහාත් යොමුවන තරමට ඔවුන් සුදුසුකම් අතින් ශක්තිමත් වෙන්න ඕනෑ. අපේ රටේ රැකියා විරහිත උපාධිධාරින් සැලකිය යුතු ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන් තවත් එතැන නොතියා රාජ්‍ය පංගුවට සක්‍රියව දායක කර ගැනීම වෙනුවෙන් අපි යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. නිසැකවම උපාධිධාරින්ට ප්‍රමුඛතාව දෙමින් 30,000කට වඩා වැඩි පිරිසක් අනිවාර්යයෙන්ම රාජ්‍ය පද්ධතියට අපි එකතු කර ගන්නවා.

ඒ විතරක් නොවෙයි. තරුණ ව්‍යවසායකයන් වෙනුවෙනුත් අපේ මැදිහත්වීමක් තිබෙනවා. මේ අය වැය ඇතුළේ තිබෙනවා, තරුණ ව්‍යවසායකයන් සඳහා දිරිගැන්වීමේ වැඩසටහනක්. සමුපකාර system එක ඇතුළේ ඔවුන් මේ ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 100කට වැඩි මුදලක් අපි වෙන් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ අපි සංවර්ධන බැංකු පිළිබඳව කියද්දි මේ සමහර මහත්වරු අපට දේශනා දුන්නා. එහෙම තිබෙන්නේ කොහේද ඇහුවා, එහෙම කරන්න පුළුවන්කම තිබෙන්නේ කොහොමද ඇහුවා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අපි මේ අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා, බැංකු සියල්ල සමඟ සාකච්ඡා කරලා නව සංවර්ධන බැංකු ක්‍රියාදාමයක්. අපේ රටේ සංවර්ධනයට කැමැති, සංවර්ධනය වෙනුවෙන් පෙනී ඉන්න තරුණ පරම්පරාවට ඒ වැඩ කටයුතු කිරීම සඳහා අපි මේ අය වැය ඇතුළේ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, අපේ රට කෘෂි කාර්මික රටක් බව. ඒ නිසා අපි කෘෂිකර්ම ක්ෂේත්‍රයට යම් මැදිහත්වීමක් කරන්න ඕනෑකම තිබෙනවා. අපි තරුණයන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කර ගැනීම සඳහා රුපියල් මිලියන 500කට වැඩි මුදලක් වෙන් කර තිබෙනවා.

අපේ රටේ ක්‍රීඩා ප්‍රතිපත්තියේ කරුණු දෙකක් තිබෙනවා. එකක් තමයි, අපේ රටේ ක්‍රීඩා සංස්කෘතියක් හැදීම. දෙවැනි එක තමයි, ක්‍රීඩා ආර්ථිකයකට මහ පෙන්වීම. ඒවා පදනම් කරගෙන තමයි අපි මේ අය වැයට ක්‍රීඩා ක්ෂේත්‍රය සම්බන්ධ යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි දන්නවා, පසුගිය කාලයේ හිටපු මහත්වරු ක්‍රීඩා සංකීර්ණ, ක්‍රීඩා පිටි හැදුවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒ ක්‍රීඩා සංකීර්ණ තිබෙනවා, හැබැයි ඒ ක්‍රීඩා සංකීර්ණවල වහල කඩාගෙන වැටෙනවා. Tracks තිබෙනවා, නමුත් ඒවායේ කෙල්ලන්ට, කොල්ලන්ට දුවන්න බැහැ. එහෙම තත්ත්වයක් තමයි ඒවායේ තිබෙන්නේ. මේ කවුරුවත් ඒවා ගැන සොයා බැලුවේ නැහැ. ඒවායේ තමන්ගේ නම් ගහගන්න විතරයි කටයුතු කළේ. නමුත්, මේ පුරවැසි අය වැය ඇතුළේ විශේෂයෙන්ම සුගතදාස ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 1,000කට වැඩි මුදලක් වෙන් කරලා තිබෙනවා. ජාතික තරුණ සේවා සභාවේ වහලත් මේ වෙනකොට කඩාගෙන වැටෙන තත්ත්වයක තිබෙන්නේ. අද ඒවා ඇතුළේ උත්සව පවත්වන්න බැහැ. ඒවා ප්‍රතිසංස්කරණය සඳහාත් අපි මේ ජනතාවාදී අය වැය ඇතුළේ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මම මේ අය වැය ඇතුළේ දැකපු දේවල් ටිකක් තමයි මේ කිව්වේ. ඒවා නිසා මේ අය වැය එක පැත්තකින් පුරවැසියාගේ අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් මේක system change කර ගැනීම සඳහා බර තබන, අඩිය තබන එකක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ අනාගතය මේ රටේ තරුණ පරම්පරාව කියන සංකේතය සනිටුහන් කර ගැනීම සඳහා මේ අය වැයෙන් මහ පෙන්වා තිබෙනවා. මේක තමයි ලංකාවේ පළමුවැනි වතාවට ශ්‍රී ලාංකීය ජනතාව පදනම් කර ගත් අය වැයක් බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු එරංග ගුණසේකර මහතා
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රටේ ජනතාවත්, තරුණ පරම්පරාවත් - ඔබ අප සියලුදෙනා - එකතු වෙලා දැවැන්ත මහජන නැඟිටීමක් ඇතුළේ තමයි කටයුතු කළේ. ඒ මහජන බලය තමයි මේ සනිටුහන් කරලා තිබෙන්නේ. අද විපක්ෂයේ සමහර මහත්වරු පොඩි පොඩි කෙඳිරිගෑම් කරමින් ඉන්නවා, මොනවා හරි සෙල්ලමක් කරන්න පුළුවන් කියලා. නමුත්, ඒක කිසිසේත්ම වෙන්නේ නැහැ. පුරවැසි බලය පදනම් කරගෙන මේ ආණ්ඩුව බලය ගත්තා වාගේම, අනිවාර්යයෙන්ම ඒ බලය රකිනවා. බලය රකිනවා විතරක් නොවෙයි, මාර්තු මාසයේ 21වැනි දායින් පස්සේ -මේ අය වැය වැඩි ඡන්දයකින් සම්මත කර ගත්තාට පස්සේ- අවුරුද්ද පුරා මෙතැන ඉන්න සහෝදර සහෝදරියනුත්, මේ රටේ ජනතාවත් ඇතුළු අපි සියලුදෙනා මේ අය වැය මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කිරීම වෙනුවෙන් මැදිහත් වෙනවා කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 19 වන බදාදා පවත්වනු ලැබේ.

අප්පෝතු පි. ප. 6.00 මණියාකිවිඩවේ, අලුවල්කළ් ඇඩෙනිරුත්තප්පට්ටු, විවාතම් ඔත්තිවෙක්කප්පට්ටතු.

විවාතම්, 2025 පෙප්‍රුවරි 19, පුතන්කිළමෙ මීළත් තොටංකුම්.

It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.
Debate to be resumed on Wednesday, 19th February, 2025.

කල්තැබීම
ඔත්තිවෛප්පු
ADJOURNMENT

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

දෙහිවල, මීලාද් විද්‍යාලය සඳහා අමතර ගොඩනැඟිල්ලක් ලබා දීම
தெஹிவளை, மீலாத் வித்தியாலயத்துக்கான மேலதிகக் கட்டிடம்
ADDITIONAL BUILDING FOR MEELAD VIDYALAYA, DEHIWALA

[අ.භා. 6.00]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1952 වසරේ ආරම්භ කරන ලද දෙහිවල, පිළියන්දල කොට්ඨාසයට අයත් දෙමළ මාධ්‍ය පාසලක් වන මීලාද් විද්‍යාලයේ සිසුන් 574ක් පමණ මේ වන විට ඉගෙනුම ලබති. පාසලේ භූමි ප්‍රමාණය පර්චස් 23ක් පමණ වන අතර, ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම නිසා ළමුන් බොහෝ පිරිසක් අධ්‍යාපන කටයුතුවල නියැළීමට නොහැකි වී නිවෙස්වල රැඳී සිටී.

උසස් පෙළ කලා විෂයයන්ද ඇති මෙම පාසල ද්විභාෂා පාසලක් වේ.

මෙම පාසලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා පිළියන්දල කලාපයට අයත් දෙහිවල ප්‍රදේශයේ භාවිත නොකරන ලද ගොඩනැඟිල්ලක් 2024.10.10වන දින මේ සඳහා ලබා දී ඇත. ඉන්පසු මෙම ගොඩනැඟිල්ල අලුත්වැඩියා කිරීම සඳහා පාසල් සංවර්ධන සමිතිය විසින් රුපියල් ලක්ෂ 30ක පමණ ප්‍රමාණයක් වියදම් කර එහි අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

2025 ජනවාරි මස 08වන දින 1-5 ශ්‍රේණියට අයත් ළමුන්ගේ අධ්‍යාපනය සඳහා මෙම ගොඩනැඟිල්ල භාවිත කිරීමට යෝජනා වී තිබියදී කිසියම් කණ්ඩායමකගේ මැදිහත්වීම මත මෙය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. නව පාසල් වාරය ආරම්භ වී මාසයකට වැඩි කාලයක් ගත වී ඇතත්, මෙම ළමුන්ගේ අධ්‍යාපන කටයුතු කිරීමට නොහැකි වී එළිමහනේ එම ළමුන් අධ්‍යාපන කටයුතුවල නියැළෙන බව වාර්තා වී ඇත.

මෙම කරුණ කෙරෙහි විශේෂ අවධානය යොමු කර මෙම ප්‍රදේශය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් භාවිත නොකරන ලද ගොඩනැඟිල්ලක් මේ සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම පිළියන්දල අධ්‍යාපන කලාපයට අයිති වන දෙහිවල, ගල්කිස්ස, රත්මලාන කියන සියලු ප්‍රදේශවලට තිබෙන දෙමළ මාධ්‍ය පාසල් ප්‍රමාණය කොපමණද කියලා අපි කියන්න ඕනෑ. රත්මලානේ හින්දු විද්‍යාලය තිබෙනවා. මා දන්නා තරමින් එම ප්‍රදේශයේ තිබෙන දෙමළ මාධ්‍ය පාසල එයයි. සිංහල මාධ්‍ය පාසල් රාශියක් තිබෙනවා. මම ඉහත සඳහන් කළ ඉඩකඩ ප්‍රමාණවත් නැති ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේත් දෙමළ මාධ්‍ය පාසලක. තව පාසලක් තිබෙනවා, මොරටුවේ. ඒ කියන්නේ කොළඹ දිස්ත්‍රික්කය අවසාන වන කෙළවරේ; මොරටුව ප්‍රදේශයේ දෙමළ මාධ්‍ය පාසලක් තිබෙනවා. ඒ පාසලයි, මේ පාසලයි ගත්තාම කිලෝමීටර 10කට, 15කට ආසන්න දුර ප්‍රමාණයකුත් එම පාසල් දෙක අතර තිබෙනවා. මේ කියන ප්‍රදේශයේ දෙමළ භාෂාව කථා කරන විශාල ජන ප්‍රජාවක් ඉන්නවා. 20,000කට, 30,000කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. පසුගිය කාලය පුරාම එම පාසලේ ඉඩකඩ වැඩි කරගන්නේ කොහොමද කියන එක ගැන විශාල ගැටලුවක් තිබුණා. මම කලින් සඳහන් කළ ආකාරයට පාසල් කිහිපයක් තිබුණත්, ඒ පාසල් ආගමික පදනම් සහිත පාසල් හැටියට තමයි ගැනෙන්නේ. එතකොට ආගමික ගණයට වැටෙන පාසල්වල අනෙකුත් ජන කොටස්වලට ලැබෙන ඉඩකඩ ප්‍රමාණය ගත්තාම, සියයට 1ක්, සියයට 2ක් වාගේ තමයි ලැබෙන්නේ. ඒ අනුව

බලාපොරොත්තු වෙන ආකාරයට ඒ සියලුදෙනාටම එම පාසල් ලැබෙන්නේ නැහැ. ඒ නිසාම තමයි ද්විඛ භාෂාවෙන් උගන්වන මේ පාසලට විශාල ඉල්ලුමක් ආවේ.

මේ පාසල තුළ අපොස (උසස් පෙළ) කලා විෂයයට අදාළ පන්ති පැවැත්වෙනවා. මෙය ද්විභාෂා පාසලක්. 6 වසරේ සිට ඉංග්‍රීසි මාධ්‍යයෙනුත් උගන්වන නිසා මේ පාසලට විශාල ඉල්ලුමක් තිබෙනවා. එම පාසලේ ඉඩකඩ ප්‍රමාණවත් නැති ප්‍රශ්නය මත පසුගිය කාලයේ පාසලේ විදුහල්පතිතුමා මැදිහත් වෙලා අධ්‍යාපන බලධාරින් එක්ක ඒ ගැන සාකච්ඡා කළා. විශේෂයෙන්ම පිළියන්දල අධ්‍යාපන කලාපය තුළ -මේ පාසල අවට- ළමුන් 60කට අඩු ප්‍රමාණයක් ඉගෙන ගන්න පාසල් කිහිපයක් තිබෙනවා. ඒ වාගේම භාවිත නොකරන ගොඩනැඟිලි රාශියක් තිබෙනවා. එම පාසලේ විදුහල්පතිතුමා පසුගිය කාලය පුරාම මහන්සි වෙලා හිටපු අධ්‍යාපන ඇමතිතුමාටත් කථා කරලා, ආණ්ඩුකාරතුමාටත් කථා කරලා තාවකාලිකව අවුරුද්දක වාගේ කාල සීමාවකට තමයි මම අර කලින් සඳහන් කළ දෙහිවල ප්‍රදේශයේ පිහිටි ඒ පාසලේ ගොඩනැඟිල්ලක් ලබා ගන්න උත්සාහ කළේ. සුමග විද්‍යාලයට අයත් ඒ ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා ඔවුන් රුපියල් ලක්ෂ 30ක් වාගේ විශාල මුදලකුත් යට කළා. එහි 1-5 දක්වා පන්ති පටන් ගන්න හදනකොටම අවාසනාවකට වාගේ එතැනට යම් පිරිසක් ඇවිල්ලා ඒකට විරෝධය මතු කළ නිසා එම කටයුත්ත ක්‍රියාත්මක වුණේ නැහැ. කෙසේ වෙතත්, පිළියන්දල අධ්‍යාපන කොට්ඨාසයේ අධ්‍යක්ෂතුමිය, පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධ්‍යාපන බලධාරින් ඇතුළු සියලුදෙනාගේම අනුමැතිය මත තමයි 1-5 වසර දක්වා පන්ති එතැන තාවකාලිකව පටන් ගන්න ඒ අවසරය ලබා දුන්නේ. එවැනි අවසරයක් ලබා දී තිබියදීත් අවාසනාවකට මම කලින් කිව්ව විරෝධය මත එම කටයුත්ත කරගන්න බැරිව ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොහොතේ වාර්තා වන විධියට මීලාඳ් විද්‍යාලයේ තිබෙන ගොඩනැඟිලි මදිකම නිසා එම පාසලේ 1-5 වසරවල ළමුන්ට එළිමහනේ තමයි අධ්‍යාපන කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ නිසා අපි විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමියගේ අවධානයට මේ කාරණය යොමු කරනවා. ඒ ප්‍රදේශය තුළ පාසල් කිහිපයක් තිබෙනවා. ළමුන් ඉතා අඩු සංඛ්‍යාවක් ඉගෙන ගන්නා පාසල් තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයට අයිති යම් ගොඩනැඟිලි කිහිපයකුත් තිබෙනවා. ඒවා පරිහරණය කරන්නේ නැහැ. ඒ හින්දා එවැනි ළමුන් අඩු පාසලක -මම හිතන හැටියට දෙහිවල ප්‍රදේශය තුළ ළමයි 60කටත් වඩා අඩු ප්‍රමාණයක් ඉගෙන ගන්න පාසල් 6ක් විතර තිබෙනවා- ගොඩනැඟිල්ලක් ඉතා ඉක්මනින් ලබා දී මේ ළමුන්ගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යන්න අවස්ථාව ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මේ පිළිබඳව ඉතා ඉක්මනින් අධ්‍යාපන ඇමතිතුමියගේ මැදිහත් වීම අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම 1වැනි වසර සඳහා ඒ පාසලට අලුතින් ළමුන් ඇවිත් තිබෙනවා. පන්ති කාමර නැතිව ඒ ළමයිනුත් එළිමහනේ තමයි අද වනකොට අධ්‍යාපන කටයුතු කරගෙන යන්නේ. ඒක එතරම් හොඳ තත්ත්වයක් නොවෙයි.

ගරු අගමැතිතුමිය කොළඹ දිස්ත්‍රික්කය තමයි නියෝජනය කරන්නේ. අධ්‍යාපන ඇමතිතුමිය හැටියටත් ඉන්නේ එතුමිය. ඒ නිසා මීලාඳ් විද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණවත් නොමැති ප්‍රශ්නයට තාවකාලික විසඳුමක් හැටියට ඊට යාබදව තිබෙන ළමයි අඩු පාසලක ගොඩනැඟිල්ලක් හෝ රජයේ ගොඩනැඟිල්ලක් හෝ ලබා දී ඉතා ඉක්මනින් මේ ගැටලුව විසඳන්න මැදිහත් වෙන්න කියලා අපි රජයට - විශේෂයෙන්ම අගමැතිතුමියට - යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ සභාව කල් තැබීමේ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය.

[අ.භා. 6.09]

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීලාඳ් මුස්ලිම් විද්‍යාලය සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව කරුණු කිහිපයක් පැහැදිලි කරමින් එහි අවශ්‍යතාව මොන තරම් වැදගත් ද කියලා මමත් මේ සභාවට පැහැදිලි කරන්න කැමතියි. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කියපු විධියට දෙහිවල ප්‍රදේශයේ දෙමළ මාධ්‍ය පාසල් කිහිපයයි තිබෙන්නේ. දෙහිවල හන්දියේ දෙමළ මහා විද්‍යාලය තිබෙනවා. නුගේගොඩ තිබෙනවා, නුගේගොඩ දෙමළ විද්‍යාලය. ඊට අමතරව ගත්තොත්, මීලාඳ් මුස්ලිම් පාසල මුලින් දෙමළ මාධ්‍යයෙන් විතරක් පටන්ගෙන දැනට ද්විභාෂා පාසලක් විධියට ළමයින්ගේ අධ්‍යාපන කටයුතු කරනවා. මම මේ පිළිබඳව පසුගිය කාලය තිස්සේ හොඳින් අධ්‍යයනය කළා. ඒ වාගේම මම මේ දරුවන්ගේ ප්‍රශ්නයට මැදිහත් වෙමින් ඉන්නවා; මැදිහත් වෙනවා. අධ්‍යාපන ඇමතිතුමිය විධියට ගරු අග්‍රාමාත්‍යතුමිය සමඟ ද මම මේ පිළිබඳව සාකච්ඡා කළා. ඇත්තටම දැනට ඒ පාසලේ ඉඩකඩ මදි. ඒ කියන්නේ, ඒ පාසලට ළමයින්ගේ විශාල ඉල්ලුමක් තිබෙනවා. මේ පාසල ඉතා හොඳින් කටයුතු කරගෙන යන පාසලක්. ඒ නිසා දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන්න දරුවන්ගෙන් ලොකු ඉල්ලුමක් තිබෙනවා. ඒ වාගේම 1වැනි වසරට සමහර පාසල්වලට ළමයි අඩු වෙද්දී මේ පාසලට ළමයි වැඩිපුර ඇතුළත් වන තත්ත්වයක් පෙනෙන්න තිබෙනවා. හැබැයි, දැන් තිබෙන ප්‍රශ්නය තමයි ඒ පාසලේ ඉඩකඩ මදිකම. ඒ නිසා මේ පිළිබඳව විදුහල්පතිතුමා මැදිහත් වෙලා කලාප කාර්යාලයෙන් වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ද දිගටම ඉල්ලීම් කර තිබෙනවා. ඒ ඉල්ලීමට අනුව දැනට වැහුණු පාසලක් විධියට තිබෙන සුමග විද්‍යාලය ලබා දෙන්න ඔවුන් මැදිහත් වෙලා තිබෙනවා. 2024 ඉඳන් මේ මැදිහත් වීම කරලා තිබෙනවා. එවකට අධ්‍යාපන ඇමති විධියට හිටපු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා 2024.07.03වැනි දා කලාප අධ්‍යාපන කාර්යාලයට යම් බලයකුත් ලබා දීලා තිබෙනවා, මේ සඳහා අවශ්‍ය මැදිහත්වීම් කරන්න කියලා. හැබැයි, ඒ කාලය තුළ ඒ අවශ්‍ය මැදිහත්වීම් වුණේ නැහැ. මේ අවුරුද්දේ මුල තමයි වැහෙමින් පැවතුණු සුමග පාසල - බිල්ඩින් විතරයි එතැන තිබෙන්නේ - මීලාඳ් පාසලට ලබා දෙන්න තීරණය කරලා තිබෙන්නේ.

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

ඒ ප්‍රදේශයේ අය, ළමයින්, දෙමාපියන් සංවර්ධන කටයුත්තකුත් කරනවා. හැබැයි, ඒ සංවර්ධන කටයුත්ත කරලා පළමුවැනි වසරට දරුවන් ඇතුළත් කරන්න පටන් ගැනීමේදී ඒ අවසර දුන්නු අයගේම යම් කණ්ඩායමක් ජාතිවාදී ස්වරූපයෙන් මේ පාසල පටන් ගන්න එකට විරුද්ධ වුණා. ඒ නිසා දරුවන්ට පාසලක් නැතිව යනවා. මොකද, මේ දෙහිවල ප්‍රදේශයේ ඉන්න දරුවෝ. ඒ දරුවන්ට පාසලක් තිබෙන්න ඕනෑ. අපි මොන දේශපාලන මත දැරුවත්, දරුවන්ට පාසලක් ලබා දීම පවතින රජයේ වගකීමක්. ඒ වාගේම, නිලධාරිනුත් ඒ සඳහා විවිධ විධියට මැදිහත් වුණා. හැබැයි, එක එක්කෙනාට අයිතියි කියමින්, එක එක කාලයේ පැවත එනවා කියමින්, මේ දරුවන්ට අයිති පාසල්, අධ්‍යාපනය අමාත්‍යාංශයට අයිති පාසල් වර්ග කර ගන්න උත්සාහ කරනවා. මම හිතන විධියට, ඒක විය යුත්තක් නොවෙයි. ඒ නිසා වර්තමාන ආණ්ඩුවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය තමයි, සිංහල, දෙමළ, මුස්ලිම් කියලා පාසල් තිබෙන්න විධියක් නැහැ, ළමයින්ට භාෂා තුනෙන්ම ඉගෙන ගන්න පුළුවන්; ත්‍රෛභාෂා පාසල් ආරම්භ කරන්න ඕනෑ කියන එක. දැනට තිබෙන සිංහල භාෂාවෙන් උගන්වන, දෙමළ භාෂාවෙන් උගන්වන පාසල් ඒ ආකාරයෙන්ම තිබෙන්න පුළුවන්. අලුතින් පාසල් පටන් ගන්නවා නම්, පටන් ගත යුත්තේ ත්‍රෛභාෂා පාසල්. තමන්ට කැමැති භාෂාවකින් ඉගෙන ගන්න පුළුවන් පාසල් තමයි, අපේ රටේ ඇති විය යුත්තේ.

දැන් මෙතැනදී ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම් මේ දරුවන්ට පාසලක් ඕනෑ. ඒ නිසා යෝජනා කිහිපයක් පසු ගිය දවස්වල ඉදිරිපත් වුණා. කලාප අධ්‍යාපන කාර්යාලය, බස්නාහිර පළාත් සභාවේ නිලධාරින්, අධ්‍යාපන අමාත්‍යාංශය, සහ ගරු අගමැතිතුමිය මැදිහත් වෙලා සාකච්ඡා කිහිපයක් කළා, මේ දරුවන්ට පාසලක් ලබා දිය යුතුයි කියලා. ඒ අනුව යෝජනා කිහිපයක් ඉදිරිපත් වුණා. දැනට මේ මිලාද් පාසලේම තමයි පළමුවැනි වසරේ දරුවන් බිම පැදුරක වාඩි වෙලා අධ්‍යාපනය ලබන්නේ. එහෙම අධ්‍යාපනය ලබන්න ඕනෑ නැහැ. මොකද, දෙහිවල, රත්මලාන හා මොරටුව ප්‍රදේශවල පාසල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. කලින් කිව්වා වාගේ, ළමයින් එකසිය ගණනක්, හැට ගණනක් වාගේ ඉන්නේ. එක පාසලක බිල්ඩින් 20ක් විතර තිබෙනවා. හැබැයි, ළමයින් නැහැ. ඉතින්, පාසල් තිබෙනවා නම්, ඒවායේ බිල්ඩින් තිබෙනවා නම්, ඒ දරුවන්ට අපි අලුතින් පාසලක් හදනතුරු බිම වාඩි වෙලා ඉගෙන ගන්න ඕනෑ නැහැ. ඒ ළමයින්ට අනිවාර්යයෙන්ම ඒ තිබෙන පහසුකම් දිය යුතුයි. ඒ නිසා අපි මැදිහත් වෙලා, ඒ වාගේම අදාළ බලධාරින් මැදිහත් වෙලා යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. එකක් තමයි, අවට පාසල් කිහිපයක් තාවකාලිකව මේ දරුවන්ට ලබා දෙන්න කියන එක. ඒ වාගේම, දෙහිවල එස්. ද එස්. ජයසිංහ මහා විද්‍යාලය භාෂා තුනෙන්ම ළමයින්ට ඉගෙන ගන්න පුළුවන් විධියට සංවර්ධනය කරන්න යෝජනා කළා. ඒ, 2025 වර්ෂයේ. මොකද, අද මේ ප්‍රශ්නයට උත්තරයක් සෙව්වත්, ලබන අවුරුද්දේත් අපිට දෙමළ මාධ්‍යයෙන් උගන්වන හොඳ පාසල් තිබෙන්න ඕනෑ කියන ප්‍රශ්නයට විසඳුමක් ඕනෑ. ඒ සඳහා අපි ගරු අගමැතිතුමිය එක්ක කථා කරලා, දෙහිවල එස්. ද එස්. ජයසිංහ මහා විද්‍යාලය ජාතික පාසලක් බවට පත් කරන්න ඕනෑ කියන ස්ථාවරයේ ඉඳන් දැනටමත් තීන්දු තීරණ අරගෙන තිබෙනවා. හැබැයි, මේ දරුවන් සම්බන්ධයෙන් එතෙක් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව අපි යෝජනා කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනා ක්‍රියාත්මක කිරීමට දැනටමත් ප්‍රමාද වැඩියි. අදත් අපි දෙහිවල සම්බන්ධීකරණ කමිටුවේදී තීන්දුවක් ගත්තා.

නිකපෙ පාසලත් වැහිලා ගිය පාසලක්. දැනට එහි තිබෙන බිල්ඩින්වලින් එකයි පාවිච්චි කරන්නේ. ඒකත් කලාප කාර්යාලයේ නිලධාරින් අධ්‍යාපන කටයුතුවලට පාවිච්චි කරනවා. හැබැයි, එතැන තව තට්ටු තුනක් තිබෙනවා. ඒ තට්ටු තුන තාවකාලික පදනමින් මේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න යොදා ගන්න තීරණයක් ගත්තා. ඒ නිසා ඉතා පුංචි කාලයක් තුළ කරන්න පුළුවන් සංවර්ධන කටයුතු සියල්ල කරලා, ඒ දරුවන්ට පාසලක් දෙන්න වැඩකටයුතු කරනවා. ඒ නිසා ඒ දරුවන්ට සාධාරණයක් වෙන්න ඕනෑ කියලා හිතලා අපි තීරණයක් අරගෙන තිබෙනවා.

ඒ වාගේම අපි කියන්න කැමැතියි මෙහෙම දෙයකුත්. දෙහිවල ප්‍රදේශය කියන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලුදෙනා ඉතාම සමගියෙන් ජීවත් වන ප්‍රදේශයක්. හැබැයි, විවිධ දේශපාලන අරමුණුවලින්, එහෙම නැත්නම් ජාතිවාදී අරමුණින් මේ දරුවන්ව පාවිච්චි කරන්න හදනවා. ඒකට අපට ඉඩ දෙන්න බැහැ, ඒක කවුරු කළත්. අධ්‍යාපනය කියන්නේ අපේ රටේ සියලු දරුවන්ට ලැබිය යුතු අයිතියක් ලෙස අපි සලකනවා. අපි ඒකට දරුවාගේ වර්ගය, කුලය, දේශය බලන්නේ නැහැ. ඒක අපේ වගකීමක්. අපි ඒකට මැදිහත් වෙනවා. ඒ දරුවන්ගේ අයිතිය වෙනුවෙන් අපි පෙනී සිටිනවා. අපි දැක්කා, පසුගිය කාලයේ මේ මුස්ලිම් ජනතාවට විශාල ප්‍රශ්න ප්‍රමාණයක් ආවා. හැබැයි, ඒ ප්‍රශ්නවලදීත් ජාති, කුල, ආගම් බලන්නේ නැතිව ඒ මුස්ලිම් ජනතාව වෙනුවෙන් අපි පෙනී සිටියා.

ඒ වාගේම අනුමැතිය ලබා දුන් අයත් අද වෙද්දී ගොඩනැඟිලිවලට අනුමැතිය නොදී ජාතිවාදය අවුස්සන්න හදනවා. ඒ ජාතිවාදයත් අපි ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ දරුවන්ගේ ප්‍රශ්නයට - මිලාද් විද්‍යාලයේ දරුවන්ගේ ප්‍රශ්නයට - ස්ථීර විසඳුමක් විධියට දැනට අපි යෝජනා කිහිපයක් අරගෙන තිබෙනවා. තව දවස් දෙකක් ඇතුළත ඒ දරුවන්ට නිකපෙ විද්‍යාලයේ අධ්‍යාපනය ලබන්න පුළුවන් විධියට මැදිහත් කරන්න පුළුවන් කියන විශ්වාසය අපි ලබා දෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.18]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින් ගෙනාපු යෝජනාව පිළිබඳව අදහස් පළ කරද්දී, විශේෂයෙන්ම මම කියන්න ඕනෑ මේ දෙහිවල, රත්මලාන සහ මොරටුව ප්‍රදේශ කියන්නේ දළ වශයෙන් 35,000කට අධික මුස්ලිම් ජනතාවක් ජීවත් වන ප්‍රදේශ බව. අපි විශ්වාස කරනවා, ඕනෑම දරුවෙකුට තමන් ජීවත් වන ප්‍රදේශයේ තමන් කැමැති භාෂාවකින් අධ්‍යාපනය ලබන්න අයිතිය තිබෙන බව. ඕනෑම දරුවෙකුට තමන් කැමැති භාෂාවකින් තමන්ගේ ආගමික අධ්‍යාපනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථයට - syllabus එකට - අනුව ලැබීමේ අයිතිය තිබෙනවා. කාලාන්තරයක් මුළුල්ලේ මේ මිලාද් පාසල දියුණු කරන්න බැරිවෙලා තිබෙනවා. ඒකට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න බැරිවෙලා තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නයට විසඳුමක් ලබා දීම රජයක වගකීමක්. හැබැයි, ඒ කාර්යය කරගෙන යද්දී ඒක සිංහල සහ මුස්ලිම් ජනතාව අතර, එහෙම නැත්නම් සිංහල සහ දෙමළ ජනතාව අතර ජාතිවාදී අර්බුදයක් නිර්මාණය කරන්න බලාගෙන ඉන්න අයට උඩගෙඩි දෙන විධියට කරන්න ගියොත් අවුලක් වෙනවා.

ගරු සමන්මලී ගුණසිංහ මැතිනිය කියපු කථාව හරි. පොහොට්ටු පක්ෂය නියෝජනය කරපු නගර සභා මන්ත්‍රීවරු දෙදෙනෙක් තමයි දැන් මේක අවුස්සන්නේ. ඒක නේ ඇත්ත කථාව. ඒ නිසා ඒ අයට උඩගෙඩි දෙන්න අවස්ථාවක් නොලැබෙන විධියට මේ දරුවන්ගේ අයිතිවාසිකම් රකිමින්, ඔවුන්ට තමන් කැමැති භාෂාවකින් අධ්‍යාපනය ලබන්න අවශ්‍ය පහසුකම් ලබා දීමට රජය කටයුතු කළ යුතු යැයි අපි යෝජනා කරනවා.

මේ මිලාද් පාසලේ ප්‍රශ්නයට අදාළ නැති වුණත් මේ කාරණයත් මම කියන්න කැමැතියි. දෙහිවල එස්. ද එස්. ජයසිංහ මහා විද්‍යාලය ජාතික පාසලක් කරන්න යන එක ඉතාම කාලෝචිත වැඩක්. මොකද, විශේෂයෙන්ම මේ දෙහිවල, රත්මලාන ප්‍රදේශ ගත්තාම, ඉහළ පෙළැන්තියේ අයගේ දරුවන් තමයි ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයට යන්නේ. හැබැයි, මේ දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශයේ ජීවත් වන සාමාන්‍ය දරුවන්ට ඉහළ අධ්‍යාපනයක් ලබා ගන්න අයිතියක් නැතිවෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, යෝජනාවට අදාළව කථා කරන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
යෝජනාවට අදාළව තමයි මම කථා කරන්නේ. එතුමිය කියපු කාරණා ගැන තමයි මම කියන්නෙත්. ඒ නිසා දෙහිවල එස්. ද එස්. ජයසිංහ මහා විද්‍යාලය ජාතික පාසලක් කරනකොට ඒක ත්‍රෛභාෂා පාසලක් කරනවා නම් ඉතාම හොඳයි. ඒ පාසලේ බිල්ඩින් හදන්න ඉඩකඩත් තිබෙනවා. ඒ හරහා සිංහල, දෙමළ දරුවන්ගේ එකමුතුවකුත් ඒකේ නිර්මාණය වේවි. මොකද, මම විශ්වාස කරනවා මුස්ලිම් දරුවන් සිංහල මාධ්‍ය පාසල්වල ඉගෙන ගන්න ඕනෑ කියලා. ඒ වාගේම, සිංහල ළමයින්ට දෙමළ ඉගෙන ගැනීමේ හැකියාව තිබෙන්නත් ඕනෑ. එතකොට අනාගතයේදීවත් මේ සැකය, අවිශ්වාසය කියන දේ නැති වේවි. දැන් මේ මිලාද් පාසල මේ මොහොතේ තවත් පාසලකට අනුබද්ධ කරන්න යද්දී ගැටලු ගණනාවක් මතුවෙන්න ඉඩ තිබෙනවා. විශේෂයෙන්ම දැන් පළාත් පාලන මැතිවරණය කිට්ටු වෙන නිසා මේ කට්ටිය තව අවුස්සයි. ඒ නිසා ඒ ප්‍රදේශයේ තිබෙන පාවිච්චි නොකරන, භාවිතයට නොගෙන තිබෙන රජයේ ගොඩනැඟිලි හෝ ඉඩම් හෝ පාවිච්චි කරමින් මේ සඳහා අවශ්‍ය කටයුතු කරලා, ඒ දරුවන්ගේ අයිතිය තහවුරු කරන ලෙස මම රජයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 6.21]

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා.

මූලිකව ගත්තොත්, පිළියන්දල අධ්‍යාපන කලාපයට අයත් දෙහිවල අධ්‍යාපන කොට්ඨාසයේ මිලාද් මුස්ලිම් විද්‍යාලය හා සම්බන්ධ ගැටලු තමයි මෙහිදී මතු වන්නේ. එම විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ඉතාම ඉක්මනින් වැඩි වෙමින් පවතිනවා. එහි 2015 වර්ෂයේදී 52ක් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 2025 වර්ෂය වන කොට 544 දක්වා වැඩි වීමක් පෙන්වනවා. ඒ වාගේම, එම විද්‍යාලය 1 ශ්‍රේණියේ සිට අ.පො.ස. (උසස් පෙළ) දක්වාම ශිෂ්‍යයන් ඉගෙනුම ලබන දෙමළ භාෂා මාධ්‍ය විද්‍යාලයක්. ඒ සම්බන්ධයෙන් අපි හඳුනාගෙන තිබෙනවා, ශිෂ්‍යයන්ට ඉඩ කඩ මදිකම සහ රැස්වීම් ශාලාවක් නොමැතිකම කියන ගැටලු. ඒ ගැටලු නිසා තමයි මේ කියන ඉල්ලීම් එන්නේ. කලාප සහ පළාත් අධ්‍යාපන කාර්යාලය මැදිහත් වීමෙන් තමයි අවශ්‍යතාව අනුව ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන ඉල්ලීම් කරන්නේ. ඒ අවශ්‍යතාව ඉතාම සාධාරණයි. අපි ඒක පිළිගන්නවා.

එතැන දැනට පන්ති කාමර 11ක් තිබෙනවා. නමුත් පන්ති කාමර අවශ්‍යතාව 37ක් වනවා. ඒ නිසා අලුත් පන්ති කාමර 26ක අවශ්‍යතාවකුත් එතැන තිබෙනවා. ඒ නිසා තමයි සුමග විද්‍යාල ගොඩනැගිල්ල තාවකාලික පදනම මත ලබා ගැනීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය සහිතව පියවර ගන්නේ. ඉහත කී ගොඩනැඟිල්ල සඳහා රුපියල් ලක්ෂ 25ක පමණ මුදලක් වියදම් කර තිබෙනවා, මිලාද් මුස්ලිම් විද්‍යාලය. මේ තත්ත්වය යටතේ තමයි ප්‍රදේශයේ ඉන්න අන්තවාදී පිරිස් අතර මේ කියන කාරණාව පිළිබඳ ප්‍රශ්නය මතු වන්නේ. ඒකත් එක්ක තමයි ඒ විද්‍යාලයේ ශිෂ්‍යයන්ට ඉගෙනීමේ අවස්ථා අහිමි වන්නේ. ඒ නිසා ඒ ගැටලුව සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විධියටත්, පළාත් සභා සහ කලාප අධ්‍යාපන කාර්යාලය විධියටත්, මෙන්න මේ මැදිහත්වීම් ටික කර තිබෙනවා. විකල්ප ගොඩනැගිලි කිහිපයක් ගැන යෝජනා වෙලා තිබෙනවා. ඒවා තමයි, පිළියන්දල විජය විද්‍යාලය, බුද්ධඝෝෂ මහා විද්‍යාලය, පිළියන්දල සුමග විද්‍යාලය ආදිය. නමුත් අද දෙහිවල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ තීරණයක් ලෙස නිකපේ විද්‍යාලය ඒ සඳහා යෝජනා වෙලා තිබෙනවා. ඉතාම ඉක්මනින් එතැනට දරුවන් රැගෙන යෑමේ හැකියාවක් තිබෙනවා. ඒ නිසා අපි ඒ යෝජනාව, යෝජනාවක් විධියට ගනිමු. ඒ අනුව, එතැනින් මේ ක්‍රියාවලිය බොහොම සාමකාමීව, ගැටුම්වලින් තොරව කෙළවර වෙයි කියා අපි හිතනවා.

මෙහිදී අප මෙන්න මේ කරුණ තවදුරටත් ඉස්මතු කරන්න අවශ්‍යයි කියලා මා හිතනවා. අපේ අධ්‍යාපන ප්‍රතිපත්තිය විධියට සැලකෙන එක කාරණාවක් තමයි අධ්‍යාපනය සඳහා ජාති, ආගම් වර්ග භේදවලින් තොරව සමාන අවස්ථා තිබිය යුතුයි කියන එක. දෙවන කාරණාව තමයි, ආගමික වාර්ගික සහයෝගිතාව සහිතව සියලු ශිෂ්‍යයන්ට එකට ඉගෙන ගත හැකි ත්‍රෛභාෂා අධ්‍යාපන පද්ධතියක් නිර්මාණය කළ යුතුයි කියන එක.

මේ සිද්ධිය, එක සිද්ධියක්. නමුත් නැවත එවැන්නක් සිදු නොවිය යුතුයි. ඒ කාරණය සම්බන්ධයෙන් අපේ මැදිහත් වීම දීර්ඝව සිදු කරමින් අපි බලනවා, මොකක්ද වෙන්නේ කියලා. ඒ ගැටලුව එතැනින් ඉවර වෙයි කියලා අපි හිතනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාට. ඒ, නිකපේ විද්‍යාලයේ ගොඩනැඟිලි තාවකාලිකව ලබා දෙන්න පුළුවන් කියන තීන්දුවක් ගෙන තිබීම ගැනයි. ඒ සම්බන්ධයෙන් අපි එතුමාට නැවතත් ස්තුතිවන්ත වෙනවා. අප කලින් කිව්වා වාගේම මිලාද් විද්‍යාලයේ ඉඩ පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙනවා වාගේම පසුගිය කාලය පුරාම ඒ පාසලේ විශාල සංවර්ධනයකුත් වෙලා තිබෙනවා. ඒ නිසාම එයට ඉල්ලුම වැඩි වෙලා තිබෙනවා. ඒ ඉල්ලුම වැඩි වීමත් එක්ක තමයි ඉඩ කඩ මදි වීම කියන ප්‍රශ්නය එතැන පැන නැඟුණේ. මොකද, මීට කලින් ඒ මුළු පාසලටම තිබුණේ එක ගොඩනැඟිල්ලක් විතරයි. පෞද්ගලික දානපතියෙකු විසින් පසුගිය කාලයේ යම් ගොඩනැඟිල්ලක් ලබා දීම උඩ යම් ඉඩ ප්‍රමාණයක් ලැබුණා. ඒ ප්‍රදේශයේ දෙමළ මාධ්‍ය පාසල්වල තිබෙන විශාල භීභය නිසාම ඒ පාසලට තමයි ඉල්ලුමක් එන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි නැවත නැවතත් ස්තුතිවන්ත වෙනවා ඔබතුමා මැදිහත් වෙලා ඒ පාසලේ ඉන්න 1-5 වසර ළමුන් ඉතා ඉක්මනින් නිකපේ විද්‍යාලයට තාවකාලිකව අනුයුක්ත කරලා, ඒ ළමුන්ගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යෑමට අවස්ථාව ලබා දීම ගැන.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.26ට, 2025 පෙබරවාරි 06 වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 19 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அதன்படி, பி.ப. 6.26 மணிக்கு பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 06ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 19, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.26 p.m. until 9.30 a.m. on Wednesday, 19th February, 2025, pursuant to the Resolution of Parliament of 06th February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

317 වන කාණ්ඩය - 03 වන කලාපය
தொகுதி 317 - இல. 03
Volume 317 - No. 03

2025 පෙබරවාරි 19වන බදාදා
2025 பெப்ருவரி 19, புதன்கிழமை
Wednesday, 19th February, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 පෙබරවාරි 19වන බදාදා
2025 பெப்ருவரி 19, புதன்கிழமை
Wednesday, 19th February, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
පාර්ලිමේන්තුවේ කාරක සභාවල විපක්ෂයේ නියෝජනය [තීරුව 483]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 493-512]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
දරිද්‍රතාව සහ අස්වැසුම වැඩසටහන පිළිබඳ දත්ත [තීරුව 513]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [දෙවන වෙන් කළ දිනය]:
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 523 - 650]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
பாராளுமன்றக் குழுக்களில் எதிர்க்கட்சியின் பிரதிநிதித்துவம் [ப: 483]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 493-512]

தனி அறிவித்தல் மூல வினா:
வறுமை மற்றும் அஸ்வெசும நிகழ்ச்சித்திட்டம் பற்றிய தரவுகள் [ப: 513]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 – [ஒதுக்கப்பட்ட இரண்டாம் நாள்]:
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 523-650]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Representation of Opposition in Committees of Parliament [Col. 483]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 493-512]

QUESTION BY PRIVATE NOTICE:
Data on Poverty and Aswesuma Programme [Col. 513]

APPROPRIATION BILL, 2025- [Second Allotted Day]:
Second Reading - Debate Adjourned [Cols. 523– 650]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි 19වන බදාදා
2025 பெப்ருவரி 19, புதன்கிழமை
Wednesday, 19th February, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තුවේ කාරක සභාවල විපක්ෂයේ නියෝජනය
பாராளுமன்றக் குழுக்களில் எதிர்க்கட்சியின் பிரதிநிதித்துவம்
REPRESENTATION OF OPPOSITION IN COMMITTEES OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

As per the requests made by Hon. (Dr.) Pathmanathan Sathiyalingam, Hon. Dayasiri Jayasekara, Attorney-at-Law, Hon. Ajith P. Perera, Hon. Ravi Karunanayake, Hon. M. Nizam Kariapper, PC, and Hon. (Dr.) V.S. Radhakrishnan on 03rd February, 2025 with regard to the breach of Privilege of Members of Parliament in allocating seats of Committees of Parliament disproportionately to the Opposition Members, I, as the Speaker of Parliament, carried out a study on this particular matter and decided to disclose my stance to this august Assembly as I promised on 05th February, 2025.

I would like to enumerate the descriptive decision as follows:

1. Since I am the custodian of this august Assembly which represents both the Government and the Opposition, I always maintain my impartiality in carrying out the Business of Parliament.

2. In accordance with the Parliament (Powers and Privileges) Act, no breach of Privilege has been committed since no particular Clause of that Act has clearly emphasized the matter that the Hon. Members raised regarding the Committee representation.

3. Considering the fact that the composition of the Committees in previous Parliaments - 7th, 8th and 9th Parliaments - both parties, the Government and the Opposition, had agreed to increase the number of Members from both sides regardless of the Standing Orders in compromise with both the Government and the Opposition.

   Furthermore, I have observed that the number of seats in some Committees, especially the Committee on Parliamentary Business and the Ministerial Consultative Committees, have increased with the discretion of both parties in this 10th Parliament.

4. The book titled "Practice and Procedure of Parliament" with particular reference to the Lok Sabha by M.N. Kaul and S.L Shakdher has overtly mentioned that "A Parliamentary Committee is appointed or elected by the House or nominated by the Speaker". It further elaborates that appointment, term of office, functions and main lines of procedure for conducting Business of the Committees are regulated under the provisions of the rules and the directions of the Speaker. Therefore, the Speaker had to follow the Standing Orders in order to form those Committees in taking such decisions.

   Page number 775 of the aforementioned book further explains that Members are appointed or elected to a Parliamentary Committee by the House on a Motion made and adopted or nominated by the Speaker. Thus, he has to adhere to a set of written rules as to how the procedure should strictly be followed within the purview of Standing Orders in order to maintain his neutrality and impartiality.

   Page number 776 of the book has articulated that "Members to specified Parliamentary Committees may be nominated by the Speaker after consultation with the Leader of the House and the Leaders of the Opposition Parties and the groups in the House".

   Therefore, it is up to the House to take a compromised decision after negotiating with each Party in this House.

5. The book "Treatise on the Law, Privileges, Proceedings and Usage of Parliament" by Erskine May has clearly articulated that in nominating Members, the Committee of Selection is directed to have regard to their qualifications and to the composition of the House. Thus, the Committee of Selection will always ensure that Committees reflect the party-political composition of the House. Furthermore, it is explained in general that there is no limit to the number of Members who may be nominated to a Committee. Committees may be enlarged by adding of Members appointed in the same way as those originally nominated.

   Therefore, in formulating the equation for this composition with regard to the Committees, I am not in a position to breach the fundamentals of the Standing Orders of Parliament.

[ගරු කථානායකතුමා]

If any Party needs to exceed the recommended number of Members in a Committee, the decision should be taken in compromise with each stakeholder.

6. Finally, I would like to request you to get together as the Government and the Opposition parties in order to discuss this issue at length as to how these allocations can be increased in a compromised manner.

Furthermore, I endorse that no Privilege of Members of Parliament has been violated since no clause of the aforementioned Act regarding powers and privileges has clearly mentioned it.

7. I urge you to understand the gravity of this problem and take this matter seriously in order to preserve Parliamentary democracy.

මීළඟට, ලිපි ලේඛනාදිය පිළිගැන්වීම.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඉතා වැදගත් කාරණයක් සම්බන්ධයෙන් ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා සඳහන් කළ පරිදිම ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් එකමුතුව සාකච්ඡා කරමින් පාර්ලිමේන්තු කාරක සභාවල සංයුතිය පිළිබඳව තීරණය කරන්න පුළුවන්. විශේෂයෙන් ඔබතුමා විසින් සියලුම පක්ෂ නායකයින් කැඳවා මේ පිළිබඳව ඉක්මනින්ම සාකච්ඡා කොට විසඳුමකට එළැඹීමට අවස්ථාව දෙන ලෙස අපි ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මක් නිසාද, සාමාජිකයන් පත් නොකිරීමේ ප්‍රශ්නය නිසා ඇතැම් කමිටුවල ක්‍රියාකාරිත්වයට ගැටලු ඇතිවෙලා තිබෙන බව ඔබතුමා දැනටමත් දන්නවා. එය සතුටුදායක තත්ත්වයක් නොවෙයි. එම නිසා ඉක්මනින්ම - දිනක් හෝ දින දෙකක් ඇතුළත - ඔබතුමා විසින් සියලු පක්ෂ නායකයින් කැඳවා ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් අතර එකඟතාවකින් යුතුව මේ ප්‍රශ්නය විසඳා ගැනීමට කටයුතු කරන්න කියලා ඔබතුමාගේ නියෝගයේ හරය අනුව මා ඉල්ලා සිටිනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් මේ සභාවේදී නඟපු ප්‍රශ්නයකට ඔබතුමා ප්‍රතිචාර දැක්වීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා සඳහන් කළ පරිදිම Parliamentary Business Committee එක ඉක්මනින් කැඳවලා දෙපාර්ශ්වයේම පක්ෂ නායකයන්ට මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට අවස්ථාවක් දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මේ සතියේම එය කරන්න පුළුවන් නම් වඩා හොඳයි. මොකද, කමිටුවලට අපේ මන්ත්‍රීවරුන් ඉක්මනින් නම් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. කඩිනමින් ඒ අවස්ථාව ලබා දෙන්න කියලා අප ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් මීට පෙර දිනයක - 5වැනි දා - මම සඳහන් කළා, Parliamentary Business Committee එකේදී ආණ්ඩු පක්ෂයත් එක්ක සාකච්ඡා කරලා එකඟතාවකට පැමිණ, දෙගොල්ලන්ගේම එකඟතාව මත මේක සිද්ධ විය යුතුයි කියලා. ඒ අනුව වැඩකටයුතු කරන්න කියලා මම එදාත් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනාට දැනුම් දුන්නා. ඒ අනුව අවශ්‍ය වැඩකටයුතු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Speaker, I thank you for your observations with regard to the matters of Privilege raised by several Hon. Members of Parliament.

Sir, I would urge you to take the initiative to call all the Leaders of the Opposition parties rather than a selected few who would be participating at the Parliamentary Business Committee because that would enable the Government and the major Representatives of the Opposition to engage in a dialogue in order to ensure that there is no acrimony, no conflict between the two sides of the aisle in coming to a settlement with regard to the numbers participating in Committees in a very congenial manner.

In order to do so, Hon. Speaker, I would very humbly request yourself to take the leadership, sparing a moment of your time to call the major Representatives of the Government and also the Representatives of the 12 Parties which separately comprise 66 Members of Parliament. Let us sit round the table, have a discussion and finish it off in an amicable manner so that we do not

need to bring up this matter in this august Assembly in a repeated manner. ගරු කථානායකතුමාගෙන් මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, ඔබතුමාගේ නායකත්වය තුළ මේ අවස්ථාවේදී අපිට වෙලාවක් සහ ස්ථානයක් ප්‍රසිද්ධ කරනවා නම් හොඳයි කියලා. ආණ්ඩු පක්ෂයේ ගරු නියෝජිතවරුන් සහ විපක්ෂයේ පක්ෂ 12ම නියෝජනය වන ආකාරයට ඒ නියෝජිතවරුන් කැඳවලා මේ පිළිබඳ ඉතාම සාධාරණ, සාමූහික ප්‍රශස්ත සාකච්ඡාවකට එළැඹිලා මේ ප්‍රශ්නයට තිරසර විසඳුමක් ලබා ගන්න පුළුවන් නම් හොඳයි. නැවත වරක් මේ ප්‍රශ්නය මේ සභා ගර්භයේ මතු නොවෙන ආකාරයට විසඳුමක් ලබා ගන්නට ඔබතුමාගේ නායකත්වය යටතේ අපි ප්‍රාර්ථනා කරනවා. අපිට මේ වෙලාවේ දීම ඒ සඳහා දිනයක් සහ වෙලාවක් ලබා දීම යෝග්‍යයි කියලා ගරු කථානායකතුමාට මම යෝජනා කරන්න කැමතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක - පෝක්කුවරත්තු, නෙටුඤ්චාලෙකළ්, තුරෙමුකංකළ් මර්රුම් සිවිල් විමාන සේවෙකළ් අමෙච්චරුම් පාරාළුමන්රච් සභෙ මුතල්වරුම්)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියෝගය සහ පැහැදිලි කිරීම් පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඔබතුමා සඳහන් කරලා තිබුණා, දැනටමත් විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ එකඟතාවෙන් මේ ප්‍රශ්නයේ යම් ප්‍රමාණයක් වෙනස් කරගෙනත් තිබෙනවා කියලා. සභාවේ සහ ජනතාවගේ දැනගැනීම සඳහා නැවත මතක් කළොත්, දැනටමත් Standing Ordersවල නැති නමුත් අප අතර එකඟතාවෙන් Committee on Parliamentary Business, COPE, COPA, Committee on Public Petitions, Ministerial Consultative Committees සහ Backbencher Committee කියන කාරක සභා හයක ratio එක අනුව විපක්ෂයට හිමි සාමාජිකත්ව සංඛ්‍යාව තවත් වැඩි කිරීමට අපි යෝජනා කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව සමහර කාරක සභාවල සාමාජිකත්වය දැනටමත් වැඩි කරලාත් තිබෙනවා. නමුත්, විපක්ෂය නම් යෝජනා නොකළ නිසා සමහර ඒවාට පත් කරලා නැහැ, සමහර ඒවාට වැඩිපුර පත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේත් එකඟතාව ඇතිව අපිත් එකඟව දැනටමත් අපි Committee on Parliamentary Businessහි පක්ෂ නායකයින්ගේ සාමාජික සංඛ්‍යාව වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදී ඔබතුමා කියන අවස්ථාවකදී මුණ ගැහිලා, සාකච්ඡා කරලා, වඩාත් සාධාරණ ක්‍රමයකට මේ ප්‍රශ්නය විසඳා ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

මම ඉදිරියේදී විපක්ෂ නායකතුමාටත්, ගරු මන්ත්‍රීතුමන්ලාටත් දැනුම් දෙන්නම්, මොන දිනයේදී ද රැස්වීම පවත්වන්නේ කියලා.

ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(මාණ්පුමිකු අමිර්තනාතන් අඩෙක්කලනාතන්)
(The Hon. Amirthanathan Adaikkalanathan)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමා.

ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(මාණ්පුමිකු අමිර්තනාතන් අඩෙක්කලනාතන්)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ சபாநாயகர் அவர்களே, முக்கியமானதொரு விடயத்தைச் சொல்வதற்கு அனுமதித்தமைக்கு நன்றி!

இன்று காலை மன்னாரில் மக்களுக்கும் பொலிஸாருக்கும் இடையில் பதற்றநிலை ஏற்பட்டிருக்கிறது. அரசாங்கம் அதில் கவனம்செலுத்த வேண்டும். அங்கு கனிய மணல் அகழ்வு சம்பந்தமான ஒரு முயற்சி நடைபெறுகின்றது. அதற்கு மக்கள் எதிர்ப்புத் தெரிவிக்கின்றார்கள். எனினும், அதற்குப் பொலிஸார் உடந்தையாக இருக்கின்றார்கள். இதனால் அங்கு பொலிஸாருக்கும் மக்களுக்கும் இடையில் முறுகல்நிலை ஏற்பட்டு, கொந்தளிப்பான ஒரு சூழல் ஏற்பட்டு இருக்கின்றது. எனவே, இதனை உடனடியாக நிறுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். பேச்சுவார்த்தைமூலம் இணக்கப்பாட்டுக்கு வருவதனூடாக இப்பிரச்சினையைத் தீர்க்கலாமென நினைக்கின்றேன்.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා දැනට දන්නා තොරතුරු මත පදනම්ව මේ පිළිබඳව කරුණක් කියන්න කැමැතියි. එතැන තිබෙන ඛනිජ සම්පත් - mineral sands - explore කිරීම සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩුවලදී ලබා දුන් බලපත්‍රයක් තිබෙනවා. ඒ බලපත්‍රය ලබා දීම නීත්‍යානුකූල ක්‍රමයට සිදු කළාද කියන එක පිළිබඳව විවාදයක් තිබෙනවා. නමුත්, ඒ සඳහා බලපත්‍රයක් තිබෙනවා. ඒ අනුව තමයි ගරු අඩෙක්කලනාදන් මැතිතුමනි, ඒ අදාළ ආයතනවලින් ගිහිල්ලා ඒ පිළිබඳව පරීක්ෂණ කරන්නේ. ඔවුන්ගේ පැත්තෙන් ගත්තොත් මොකක් හෝ ආණ්ඩුවකින් දීපු බලපත්‍රයක් ඔවුන්ට තිබෙනවා. ඒ බලපත්‍රය ගත්තේ නීත්‍යානුකූලව public consultationsවලට ගිහිල්ලාද, නැද්ද කියන එක පිළිබඳව පැහැදිලිවම ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඊට අමතරව බලශක්ති ප්‍රශ්නයක් සම්බන්ධයෙනුත් ගැටලුවක් තිබෙනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිත්වය දරන්නේ උපාලි සමරසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එහි සාමාජිකයෙක්. ඔබතුමාත් හොඳටම දන්නවා, මෙහිදී ආණ්ඩුවේ ස්ථාවරය වුණේ මොකක්ද කියලා. මොන ආණ්ඩුවෙන් හීන්දු ගත්තත්, වර්තමාන ආණ්ඩුවට තමයි දැන් මේ ප්‍රශ්නවලට වගකියන්න සිදුවෙලා තිබෙන්නේ. එතැනදී ගත් හීන්දුව තමයි, ඛනිජ සම්පත් නම් කර්මාන්ත අමාත්‍යාංශයට, බලශක්ති නම් ඒ අමාත්‍යාංශයට, ඒ අදාළ අමාත්‍යාංශයේ ඇමතිවරුන්ට ඇවිල්ලා බලලා හීන්දුවක් ගන්න කියන එක. මන්නාරම් දූපතේ තිබෙන්නේ ඉතා සුවිශේෂී තත්ත්වයක්. මන්නාරම් දූපත මුහුදු මට්ටමේ සිට අහල් හයක්, හතක්, අඩියක් විතර උඩින් තිබෙන්නේ.

ඒ නිසා ඒ පිළිබඳව අදාළ අමාත්‍යවරුන් සාකච්ඡා කරලා ජනතාවට තහවුරුවක් දිය යුතුයි, මේ කරන්නා වූ ව්‍යාපෘතිවලින් ජන ජීවිතයට හානියක් වෙන්නේ නැහැ කියලා. ජන ජීවිතයට හානියක් වෙනවා නම්, ඒක නොකර ඉන්න තමයි වෙන්නේ. ආණ්ඩුවේ ස්ථාවරය ඒකයි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී එය කියලා තිබෙනවා. මේ සම්බන්ධව සොයා බලන්න අද පරීක්ෂණ කණ්ඩායමක් ගියා කියලා මට දැනගන්න ලැබුණා. මේ ප්‍රශ්නයේදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දුන් උපදෙස් මත

[ගරු බිමල් රත්නායක මහතා]

තමයි කටයුතු කරන්න තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට කථා කරලා මේ පිළිබඳව තවත් සොයා බලන්න කියන්නම්. ඔබතුමාගේ පැත්තෙනුත් යම් සොයා බැලීමක් කරන්න.

ආණ්ඩුව විධියට අපි කිසිසේත්ම එතැන තිබෙන පොදු ජන මතයට විරුද්ධව යන්නේ නැහැ. මන්නාරම් දූපතේ තිබෙන විශේෂත්වය බරපතළ ලෙස සැලකිල්ලට අරගෙන තමයි ඒක කරන්නේ. නමුත්, එම බලපත්‍ර කලිනුයි ලබා දීලා තිබෙන්නේ. ඒ, කලින් ආණ්ඩුව බාර් පර්මිට් දුන් විධියටම තමයි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අඩෙක්කලනාදන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

කෞරව අමාත්‍යාංශයේ ලේකම් අවර්කලේ, උංකලුක්කු මන්නාරෙප් පට්රි නන්රාකත් තෙරියුම්! නාංකළ් කටන්ත DCC meetingඉල් තීර්මානමොන්රු එටුත්තෝම්, අංකු කනිය මණල් අකළ්වෙච් සෙය්යක්කූටාතු එන්රු. අංකු කටල් මට්ටමුම් නිල මට්ටමුම් සමමාක ඉරුක්කින්රපටියාල්, ඉච්චෙයර්පාට්ටෙ නිරුත්ත වේණ්ඩුමෙනත් තීර්මානික්කප්පට්ටතු. ඉංකු එංකළුටෙය නාටාළුමන්ර උරුප්පිනර්කළුම් ඉරුක්කිරාර්කළ්. අංකු කනිය මණල් අකළ්වෙච් සෙය්යක්කූටාතු එන්ර මුටිවුතාන් කටෙසියාක එට්ටප්පට්ටතු.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව එහෙම තීරණයකට ආවා වුණත් රටේ නීතියක් තිබෙනවා. නීතිය අනුව පසුගිය කාලවලදී මේවාට බලපත්‍ර දීලා තිබෙනවා. ඒ බලපත්‍ර ගත්ත සමාගම් ඒ නීතිය මත පදනම් වෙච්ච සහතික පදනම් කරගෙන ඒවාට එනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීන්දුව තමයි තිබෙන්නේ. නමුත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තීන්දුව නීත්‍යානුකූලව බලාත්මක දෙයකට වඩා දේශපාලන සහ සමාජයීය වශයෙන් බලාත්මක වෙනවා. ඒකයි අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් පසුවත් යෝජනා කළේ, "අදාළ ඇමතිවරුන්ට වගකීමක් තිබෙනවා. මේ ප්‍රශ්නය ලියුම්වලින් විසඳා ගන්න බැහැ. කරුණාකරලා ගිහින් විසඳා ගන්න" කියලා. ඒ නිසා මම සහතික වෙන්නම්, අදාළ ඇමතිවරුන් දැනුවත් කරලා ඉතා ඉක්මනින් ගිහින් ජනතාව හමුවෙලා ඔවුන්ට කරුණු එත්තු ගන්වලා, මේ පිළිබඳව ඉදිරියට කටයුතු කරන්න සලස්වන්නම් කියලා.

ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

කෞරව අමෙච්චර් අවර්කළේ, අතනෙ උටනටියාක නිරුත්ත මුටියාතා?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම යටතේ, කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිසර

අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) මාවතගම, අරම්පොවත්ත, අංක 143 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.ආර්. රාජසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාවතගම, වැලිකුඹුර, අංක 09 දරන ස්ථානයෙහි පදිංචි එම්.පී. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) වැලඩ, පරගහදෙණිය, නුවර පාර, අංක 56 දරන ස්ථානයෙහි පදිංචි එම්.ආර්.එස්. රහ්මාන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) දොඩම්ගස්ලන්ද, මීපිටිය, ගොන්ගහවත්ත යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්. අනුලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

Hon. Speaker, I present,

(1) A petition from Mr. A.L.M. Mukthar of No. 541 A/1, Water Supply Road, Sainthamaruthu 14; and

(2) A petition from Mr. M.A. Wimalasena Prabhath of No. 268, Kandekumbura, Galagedara.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු කථානායකතුමනි, කොටදෙණියාව, පොල්වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ. රංජනී කුසුමලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නන්ද බණ්ඩාර මහතා
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දෙවනගල, රුවන්දෙනිය, අංක ඩී - 78 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එම්.එස්.ඩී.එස්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හිඟුල, උඩමාකඩවර, ඇටඹලන්ද යන ලිපිනයෙහි පදිංචි කේ.එම්. දසනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු කථානායකතුමනි, යටියන්තොට, වී ඔය, කොටුවේ ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. විල්මට් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දීප්ති වාසලගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) தீப்தி வாசலகே)
(The Hon. (Mrs.) Deepthi Wasalage)

ගරු කථානායකතුමනි, මාතලේ, වාරියපොළ පාර, අංක 23/13 දරන ස්ථානයෙහි පදිංචි ඒ. සුන්දරලිංගම් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් හය මම පිළිගන්වමි.

(1) නිට්ටඹුව, වේබඩගල්ල, කුරුඳුවත්ත, අංක 66/04 දරන ස්ථානයෙහි පදිංචි එච්.පී.ඩබ්ලිව්. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගම්පහ, මුදුන්ගොඩ, අංක 329/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ. මාලා ධර්මසිරි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) පල්ලේවෙල, පනාවල්ලන්ද, අංක 46/2 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එස්.එස්.එච්.එම්.එච්. ධර්මපාල හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මීගමුව, දකුණු කදිරාන, ජයබිම, අංක 27/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ. සෝලිත සුබසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) එල්ලක්කල, වලලියද්ද, අංක 80/7 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.ඒ.ඩී. පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) පල්ලේවෙල, බෝරුක්ගමුව, අංක 64 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ.ඒ.කේ. අජිත් වික්‍රමසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කෙරවලපිටිය අපද්‍රව්‍ය-බලශක්ති බලාගාරය: විස්තර
கெரவலப்பிட்டிய, கழிவு - மின்னுற்பத்தி நிலையம்: விபரம்
WASTE-TO-ENERGY POWER PLANT IN KERAWALAPITIYA: DETAILS

152/2024

1. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෙරවලපිටියේ පිහිටුවා ඇති කසළ මඟින් විදුලිය උත්පාදනය කරන විදුලි බලාගාරයේ (Waste-to-Energy Power Plant) උත්පාදනය කරනු ලබන විදුලිය ඒකකයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවනු ලබන මිල කොපමණද;

(ii) එම බලාගාරය ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම සඳහා දිනකට අවශ්‍ය වන කසළ ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) 2024 වර්ෂය තුළ එම බලාගාරය වෙත දෛනිකව සපයනු ලැබූ කසළ ප්‍රමාණයේ සාමාන්‍ය අගය මෙට්‍රික් ටොන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත බලාගාරය සඳහා කසළ සැපයීම සිදු කරනු ලබන පළාත් පාලන ආයතන කවරේද;

(ii) කසළ දහනය කිරීමෙන් පසුව මේ වනවිට ඉහත බලාගාර පරිශ්‍රය තුළ එක්රැස් වී ඇති අළු ප්‍රමාණය කොපමණද;

(iii) බලාගාරයෙන් නිකුත් වන අළු පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ඉහත බලාගාරය සඳහා 2023 වර්ෂයට අදාළව පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වලුසක්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) කෙරවලප්පිට්ටියවිල් නිරුවප්පට්ටුල්ළ කළිවුකළාල් මින්නුට්පත්ති සෙය්යුම් මින්නුට්පත්ති නිලෙයත්තිල් (Waste-to-Energy Power Plant) උට්පත්ති සෙය්යප්පටුම් ඔර් අලකු මින්සාරත්තුක්කු ඉලංකෛ මින්සාර සපෛ සෙලුත්තුම් විලෙ යාතෙන්පතෙයුම්;

(ii) මේට්පඩි මින්නුට්පත්ති නිලෙයත්තෛ මිකච් සිරප්පාන මුරෛයිල් ඉයක්කුවතර්කු ඔරු නාළෛක්කු තේවෛප්පටුම් කළිවුකළින් අළවු එත්තනෛ මෙට්රික් තොන්කළ් එන්පතෙයුම්;

(iii) 2024ආම් ආණ්ටු මේට්පඩි මින්නුට්පත්ති නිලෙයත්තුක්කු තිනසරි වළංගප්පට්ට කළිවුකළින් සරාසරි අළවු එත්තනෛ මෙට්රික් තොන්කළ් එන්පතෙයුම්;

අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ஆ) (i) மேற்படி மின்னுற்பத்தி நிலையத்துக்குக் கழிவுகளை வழங்கும் உள்ளூராட்சி நிறுவனங்கள் யாவையென்பதையும்;

(ii) கழிவுகள் எரியூட்டப்பட்டதன் பின்னர், தற்போது மேற்படி மின்னுற்பத்தி நிலைய வளாகத்தினுள் சேர்ந்துள்ள சாம்பலின் அளவு எவ்வளவு என்பதையும்;

(iii) மின்னுற்பத்தி நிலையத்திலிருந்து வெளியாகும் சாம்பலை சுற்றாடல் நேயமிக்க வகையில், முகாமைத்துவம் செய்வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி மின்னுற்பத்தி நிலையத்துக்கு 2023ஆம் ஆண்டுக்குரிய சுற்றாடல் பாதுகாப்பு உரிமம் பெறப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House the -

(i) price paid by the Ceylon Electricity Board for a unit of electricity generated by the Waste-to-Energy Power Plant located at Kerawalapitiya;

(ii) number of metric tons of waste required per day for the above power plant to run optimally; and

(iii) average value of the waste supplied daily to that power plant in 2024 in metric tons?

(b) Will he also inform this House -

(i) the names of the local government authorities which supply waste to the above power plant;

(ii) the volume of ash that has accumulated at the above power plant premises after burning waste;

(iii) the steps that will be taken to manage the ash released by the power plant in an environment-friendly manner; and

(iv) whether an Environment Protection Licence had been obtained in relation to the above power plant for 2023?

(c) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කෙරවලපිටියේ පිහිටුවා ඇති කසළ මඟින් විදුලිය උත්පාදනය කරන Western Power Company (Pvt.) Limited ආයතනයට අයත් විදුලි බලාගාරයේ (Waste-to-Energy Power Plant) උත්පාදනය කරනු ලබන විදුලිය ඒකකයක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් රුපියල් 36.20ක් ගෙවනු ලබන අතර, භාණ්ඩාගාරය විසින් ඒකකයක් සඳහා රුපියල් 13.10ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කරනු ලබයි.

(ii) දිනකට නාගරික ඝන අපද්‍රව්‍ය (Municipal Solid Waste - MSW) මෙට්‍රික් ටොන් 650-700 අතර අවශ්‍ය වේ.

(iii) දෛනික සාමාන්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 584ක් වේ.

(ආ) (i) කොළඹ මහ නගර සභාව සහ සමහර අවස්ථාවලදී බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (WMA) විසින් අවශ්‍යතාව දැන්වීම අනුව බස්නාහිර පළාතේ වෙනත් පළාත් පාලන ආයතනවලින්ද මේ සඳහා කසල සපයනු ලැබේ.

(ii) බලාගාර පරිශ්‍රයේ දැනට ආඝන්න වශයෙන් අළු මෙට්‍රික් ටොන් 15,000ක් පමණ එකතු වී ඇත. එයින් මෙට්‍රික් ටොන් 12,000 සැහැල්ලු අළු (fly ash) වන අතර මෙට්‍රික් ටොන් 3,000 බර අළු (bottom ash) වේ.

(iii) මධ්‍යම පරිසර අධිකාරියේ ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන ඇත. එහි කොන්දේසි අනුව අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(iv) 2023 ජනවාරි සිට 2023 ජූලි දක්වා පරිසර බලපත්‍රය ලබාගෙන ඇත. ඊට අමතරව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් 2024 අගෝස්තු සිට 2025 අගෝස්තු දක්වා ලබාගෙන ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, මෙම ව්‍යාපෘතියට සමාන්තරව යහ පාලන රජය කාලයේ අපි රත්මලාන, කරදියානේ තවත් මෙගාවොට් 10ක waste-to-energy power plant එකක් හදන්න ආරම්භ කළා. මොකද, බස්නාහිර පළාතේ කොළඹ මහ නගර සභාව හැරුණාම අනෙක් පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ තිබෙන අභියෝගයට විසඳුමක් වශයෙන් තමයි මේ විසඳුම අපි සොයා ගත්තේ. මේක ඉතා විද්‍යානුකූල විසඳුමක්. ඔබතුමා හොඳටම දන්නවා, දැන් කෙරවලපිටියේ ඉතාම සාර්ථකව මේ waste-to-energy power plant එක ක්‍රියාත්මක වෙන බව. රත්මලාන, කරදියාන waste-to-energy power plant එකේ කටයුතු තවමත් අවසන් වෙලා නැහැ. ඔබතුමාට පැහැදිලි කරන්න පුළුවන්ද, රත්මලාන, කරදියානේ තිබෙන මේ waste-to-energy power plant එකේ කටයුතු මෙතෙක් අවසන් නොවීමට හේතුව කුමක්ද, ඒ කටයුතු අවසන් කරන්න ඔබතුමා විසින් ගන්නා පියවර මොනවාද කියලා.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඇත්තටම නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය යටතේ තමයි එහි මූලික කටයුතු කරගෙන යන්නේ. තවම ලංකා විදුලිබල මණ්ඩලය හෝ බලශක්ති අමාත්‍යාංශය විදුලි බලය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරලා නැහැ. ඒ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියට අදාළ අමාත්‍යාංශයෙන් විමසීම පහසුයි කියලා මම හිතනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කලින් මේ කාරණය ඔබතුමාට කියන්න කැමැතියි. කෙරවලපිටිය බලාගාරය හදද්දී නායකත්වය දුන්නේ විදුලිබල අමාත්‍යාංශය.

මම පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ විෂයභාර රාජ්‍ය ඇමතිවරයා හැටියට ඒ පිළිබඳව උනන්දුවෙලා කටයුතු කළා. මොකද, බලශක්තිය මිලදී ගන්නේ අපි. ඒ ව්‍යාපාරය යථාර්ථවත් කරන්නට අවශ්‍ය කරන ආර්ථික ශක්තිය දුන්නේ විදුලිබල මණ්ඩලය. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරන්නේ, මේක පොදු ප්‍රශ්නයක්, පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නයක්, පළාත් පාලනය පිළිබඳ ප්‍රශ්නයක්, ඒ වාගේම බලශක්තිය පිළිබඳ ප්‍රශ්නයක්, ඒ නිසා නායකත්වය අරගෙන කටයුතු කරන්න කියලායි. මොකද, කලින් කෙරවලපිටිය බලාගාරය හදද්දී, විදුලිබල අමාත්‍යාංශය තමයි ඊට නායකත්වය දුන්නේ.

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගියදා සිදු වුණු විදුලිය බිඳවැටීමත් එක්ක සූර්යබල සංග්‍රාමය හරහා අපේ රටේ විදුලි පද්ධතියට එකතු කරලා තිබෙන මෙගාවොට් 1,400කට ආසන්න සූර්ය විදුලි බලය ජාතික පද්ධතියට එකතු කිරීම නතර කිරීමට හෝ සීමා කිරීමට හෝ කටයුතු කරන බව දැන ගන්න ලැබිලා තිබෙනවා. අද වන විට මේ රටේ ව්‍යාපාර 1,000කට වැඩිය මේ rooftop solar හා සම්බන්ධව කටයුතු කරනවා. සේවකයෝ 25,000ක් විතර වැඩ කරනවා. ඒ වාගේම රටේ බලශක්ති අවශ්‍යතාවට විශාල ශක්තියක් දීලා, ජාතික ධනය, විදේශ විනිමය ඉතුරු කරනවා. ඉතින් මේ තත්ත්වය තුළ විශාල කම්පනයක් ඇති වෙලා තිබෙනවා, පසුගිය දා සිදු වුණු ඒ විදුලි බිඳ වැටීමත්, ඒකට හේතු වශයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරපු කරුණුත් එක්ක. මේ සූර්ය බලශක්තිය ජාතික පද්ධතියට එකතු කිරීම පිළිබඳ දැවැන්ත සැකයක් ඇති වෙලා තිබෙනවා. ඔබතුමා සූර්ය විදුලි බලය ජාතික පද්ධතියට එකතු කිරීම නතර කරනවාද, සීමා කරනවාද, නැත්නම් ඒ පිළිබඳව ගන්නා ඉදිරි පියවර මොනවාද, ඒ වාගේම සූර්ය විදුලි බලය ප්‍රවර්ධනය කිරීමට ඔබතුමා ක්‍රියාත්මක කරන්නා වූ වැඩ පිළිවෙළ කුමක්ද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. සියල්ල සංක්ෂිප්ත කරලා මම උත්තරයක් දෙන්නම්. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවටවත් එන්න බැරි වෙච්ච, පරාද වෙච්ච හිටපු මන්ත්‍රීවරු අසත්‍ය ප්‍රචාරය කරගෙන යනවා. ඇත්තටම ඒක දැඩිවම ඒගොල්ලෝ කරගෙන යනවා, රජය අපහසුතාවට පත් කරන්න.

අපේ කිසිම අරමුණක් නැහැ, සූර්ය බලශක්තිය නිපදවීම සීමා කරන්න හෝ අඩු කරන්න හෝ නවත්වන්න. අදත් news එකක් පළ වී තිබෙනවා මම දැක්කා, ඒ වෙනුවෙන් කමිටුවක් පත් කර තිබෙනවා කියලා. එහෙම නැහැ. මම අභියෝග කරනවා, එවැන්නක් තිබෙනවා නම් ඔප්පු කරන්න කියලා; එහෙම මොනවා හරි තොරතුරක් තිබෙනවා නම් ඒක සභාගත කරන්න කියලා. මොකද, අපි දැනුවත්ව හෝ නොදැනුවත්ව එහෙම දෙයක් කරන්නේ නැහැ. මොකද, මෙහි අවශ්‍යතාව අපි හොඳින් හඳුනාගෙන තිබෙනවා. අපි ඒක ක්‍රමවත් කිරීමක් කරනවා, තිබුණාට වඩා. එය අරමුණු කරගෙන අපි යම් යම් වැඩ පිළිවෙළ කරගෙන යනවා. ඒක හින්දා සූර්ය බලශක්තිය ලබා ගැනීම සීමා කරන්න අපේ කිසිම අරමුණක් නැහැ. මොකද, අපි සියයට 70ක renewable energy ඉලක්කයක් කරායි යන්නේ. ඒකට

[ගරු කුමාර ජයකොඩි මහතා]

අනිවාර්යයෙන් තව විශාල ප්‍රමාණයක් සූර්ය බලශක්තිය ඕනෑ. මොකද, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබෙනවා, අපට සූර්ය බලශක්තිය මෙගාවොට් 2,000ක් කඩිනමින් එකතු කර ගන්න ඕනෑය කියන එක. අපි ඒ අරමුණටයි යන්නේ. ඒක හින්දා අසත්‍ය ප්‍රචාරවලට හසු වෙන්නත් එපා, සැක තියාගන්නත් එපා. මොකද, ඒගොල්ලෝ හරි කැමැතියි, රජයට මොකක් හරි කියලා media coverage එකක් ගන්න. මා වගකීමෙන් කියන්නේ මෙතැන එහෙම කිසිම දෙයක් නැති බව. මේක ක්‍රමවත් කිරීමේ වැඩ පිළිවෙළ අපි කරගෙන යනවා. සමහර වෙලාවට මේක ඉස්සරහට ගෙන යන්න ඒවාත් ධෛර්යයක් වෙයි.

ලංකා විදුලිබල මණ්ඩලය: ණය සහ සේවක දීමනා
இலங்கை மின்சார சபை: கடன்கள் மற்றும் ஊழியர் கொடுப்பனவுகள்
CEYLON ELECTRICITY BOARD: PAYMENT OF LOANS AND STAFF EMOLUMENTS

179/2024

2. ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාගත කරන ලද දිනය කවදාද;

(ii) රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලය සඳහා ආයෝජනය කරන ලද මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙන ලද කෙටි-කාලීන හා දිගු-කාලීන ණය මුදල්වල එකතුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ලංකා විදුලිබල මණ්ඩලය තුළ සේවය කරන ස්ථිර හා අනියම් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වැටුප්, අතිකාල දීමනා, වෘත්තීයවේදී දීමනා, ප්‍රසාද දීමනා, ප්‍රවාහන වියදම් සහ වෙනත් කවර හෝ පාරිශ්‍රමික සඳහා දරන ලද මුළු මාසික පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය සිය කාර්ය මණ්ඩලය වෙනුවෙන් උපයන විට ගෙවීමේ බදු ගෙවන්නේද;

(iv) නොඑසේ නම්, එම ආයතනය උපයන විට ගෙවීමේ බදු ගෙවීම නැවැත්වූ දිනය කවදාද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

වලුසක්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கை மின்சார சபை கூட்டிணைக்கப்பட்ட திகதியையும்;

(ii) இலங்கை மின்சார சபைக்காக அரசாங்கம் முதலீடு செய்த மொத்த மூலதனத்தையும்;

(iii) இலங்கை மின்சார சபைக்கு வழங்கப்பட்ட குறுகிய கால மற்றும் நீண்ட கால கடன்களின் மொத்தத் தொகையை வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கை மின்சார சபையில் பணிபுரிகின்ற நிரந்தர மற்றும் அமய ஊழியர்களின் எண்ணிக்கையை தனித்தனியாகவும்;

(ii) 2024 சனவரி முதல் டிசெம்பர் வரை பணியாட்டொகுதியினருக்கு மாதாந்தம் வழங்கப்பட்ட சம்பளம், மேலதிக நேர ஊதியம், தொழில் படிகள், மிகையூதியம், போக்குவரத்துச் செலவுகள் மற்றும் வேறு ஏதேனும் ஊதியங்கள் ஆகியவற்றுக்காக மொத்தம் செலவான தொகையை தனித்தனியாகவும்;

(iii) இலங்கை மின்சார சபை அதன் பணியாட்டொகுதியினருக்கான உழைக்கும்போது செலுத்தும் வரியை (PAYE) செலுத்துகிறதா என்பதையும்;

(iv) இன்றேல், உழைக்கும்போது செலுத்தும் வரியை அது செலுத்தாது நிறுத்திய திகதியையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the date the Ceylon Electricity Board was incorporated;

(ii) the total capital invested by the Government in the CEB; and

(iii) the total amount of short-term and long-term loans provided to CEB, separately;

(b) Will he also inform this House-

(i) the number of permanent and casual employees working at CEB, separately;

(ii) the total monthly cost of salaries, overtime, professional allowances, bonuses, transport costs and any other emoluments paid to the staff from January to December, 2024, separately;

(iii) whether the CEB pays the PAYE Tax for its staff; and

(iv) if not, the date on which it ceased paying the PAYE Tax?

(c) If not, why?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාගත කරන ලද්දේ 1969 නොවැම්බර් මස 01වැනි දා ය.

(ii) 2024.11.30 දින වන විට රජය විසින් ලංකා විදුලිබල මණ්ඩලය තුළ ආයෝජනය කරන ලද මුළු ප්‍රාග්ධනය (දායක ප්‍රාග්ධනය) රු. 991,430,290,925කි.

(iii) 2024.11.30 දින වන විට ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙන ලද කෙටිකාලීන හා දිගුකාලීන ණය මුදල්වල එකතුව වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

	කෙටිකාලීන ණය * (රු. මිලියන)	දිගුකාලීන ණය (රු. මිලියන)	එකතුව (රු. මිලියන)
විදුලිබල අංශයේ ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතා ආයතනවලින් රජය ණය ලබාගෙන ලංකා විදුලිබල මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරය විසින් උපණය පදනමින් (on lend) ලබා දී ඇති ණය	-	72,659	72,659
ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදේශීය/දේශීය බැංකු සහ මූල්‍ය ආයතන මඟින් ලබාගත් ණය			
කාරක ප්‍රාග්ධන කාර්යයන් සඳහා ලබාගත් කාලීන ණය	21,626	50,910	72,536
ව්‍යාපෘති ණය	10,899	98,654	109,553
ණයකර	-	20,000	20,000
බැංකු අයිරාව	17,315	-	17,315
මුළු එකතුව (රු. මිලියන)	**49,839**	**242,223**	**292,063**

* සටහන - 2025 නොවැම්බර් 30 දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය

(ආ) (i) 2024.12.31 දින වන විට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

සේවක වර්ගය	සේවක සංඛ්‍යාව
ස්ථිර	22,135
අනියම්	150
කොන්ත්‍රාත්	95
ආධුනික පුහුණුවන්නන්	26

මීට අමතරව ලංකා විදුලිබල මණ්ඩලයේ අනුබද්ධිත ආයතනයක් වන ශ්‍රී ලංකා එනර්ජිස් ආයතනය මඟින් ලබාගත් 56දෙනෙකු සේවයෙහි යොදවා ඇත.

(ii) 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාර්ය මණ්ඩලය වෙත ගෙවන ලද වැටුප්, අතිකාල දීමනා, වෘත්තීයවේදී දීමනා, ප්‍රසාද දීමනා, ප්‍රවාහන දීමනා සහ වෙනත් කවර හෝ පාරිශ්‍රමික සඳහා දරන ලද මුළු මාසික පිරිවැය රුපියල් මිලියනවලින් වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

	ජන-24	පෙබ-24	මාර්තු-24	අප්‍රේල්-24	මැයි-24	ජූනි-24	ජූලි-24	අගෝ-24	සැප්-24	ඔක්-24	නොවැ-24	දෙසැ-24	එකතුව
වැටුප්	1,838	1,781	1,826	1,726	1,796	1,805	1,808	1,877	2,394	2,170	2,130	2,109	23,259
අතිකාල	933	960	953	914	1,024	1,044	999	1,090	1,098	1,203	1,232	1,168	12,618
වෘත්තීය දීමනා සහ අනෙකුත් ගෙවීම් ඇතුළත් දීමනා	589	650	557	934	825	749	754	716	767	764	829	748	8,880
ව්‍යවස්ථාපිත ගෙවීම්	365	370	359	349	368	362	360	364	464	435	406	417	4,619
විශ්‍රාම වැටුප් අරමුදල	160	163	158	148	162	160	159	160	195	192	193	183	2,032
ප්‍රසාද දීමනා	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
වෛද්‍යාධාර	-	-	-	-	-	-	-	-	-	-	-	1,666	1,666
එකතුව	3,885	3,924,	3,852	4,070	4,173	4,120	4,078	4,208	4,917	4,763	4,790	6,291	53,074

[ගරු කුමාර ජයකොඩි මහතා]

(iii) ලංකා විදුලිබල මණ්ඩලය සිය කාර්ය මණ්ඩලය වෙනුවෙන් උපයන විට ගෙවීම් බදු ගෙවන්නේ නැත.

(iv) උපයන විට ගෙවීම් බදු ගෙවීම නැවැත්වූයේ 2020 නොවැම්බර් මස 01 වැනි දා ය.

(ඇ) අදාළ නොවේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා දුන්නු සවිස්තර පිළිතුර වෙනුවෙන් මගේ ස්තුතිය පුද කරනවා. මේ මොහොතේ ලංකා විදුලිබල මණ්ඩලයේ සම්පූර්ණ අලාභය රුපියල් බිලියන 288යි. ඒ කියන්නේ, දැනට carry-forward loss එක. ඒ වාගේම, මේ සේවක පිරිසට ගෙවන සම්පූර්ණ පඩි නඩිවලට අවුරුද්දකට රුපියල් මිලියන 6,000ක් යනවා. මේක නිෂ්පාදන වියදමත් එක්ක බැලුවොත් සියයට 45ක් විතර වෙනවා. ඔබතුමන්ලා මේ මොහොතේ cost-reflective pricing procedure එකක්ද අනුගමනය කරන්නේ? ඔබතුමන්ලා selling price එක කොයි ආකාරයෙන් ද මේ අවස්ථාවේ ඇති කර තිබෙන්නේ? මොකද, අලාභයට යනවාය කියලා අපි දැනුවත් වෙලා තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ cost-reflective approach එකකට තමයි ගිවිසුම්ගතව තිබෙන්නේ. ඔබතුමන්ලා ඒක අනුගමනය කරනවා ද, නැද්ද කියන එක කරුණාකරලා හෙළිදරව් කරන්න පුළුවන් ද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

අපි අනුගමනය කරනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

දැන් ඔබතුමන්ලාගේ සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 28ක් වෙන අතර, මේ මොහොතේ නිෂ්පාදන වියදම රුපියල් 39.30යි. ඒකෙන් ආයෙත් මිල වැඩි කිරීමක් ඇති වෙන්න යනවා ද, නැද්ද කියලා ඔබතුමා රට දැනුවත් කරනවා ද? මොකද, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නයට උත්තරයක් සෙවීමට අවශ්‍යයි. මේක දේශපාලනීකරණය කරන්නේ නැතිව, ආයේත් මේ ආයතනය බංකොලොත් වෙන්නේ නැති වෙන විධියට යන්න ඕනෑ. නමුත්, පාරිභෝගිකයාට අධික මිලක් ආයේත් ඇති නොවන විධියට කටයුතු කරන්නත් අවශ්‍යයි.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඇත්තටම ඒක මතු වෙන්නේ මේ දවස්වල ඇති වන වර්ෂාව සහ කාලගුණය අනුව. මොකද, දැනට තිබෙන විධියට අපට ලොකු ගැටලුවක් වෙන එකක් නැහැ. හැබැයි, මේ දවස්වල එන වියළි කාලගුණයත් එක්ක තමයි අපට ඇත්තටම ඊළඟ මිල,-

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hydropowerම පාවිච්චි කරලා generate කරන්න පුළුවන් සම්පූර්ණ නිෂ්පාදනය වන්නේ සියයට 35ක් විතර. ඒ නිසා ඇති කරන මිල මේ අවස්ථාවේදී අපි දැනගන්න අවශ්‍යයි. මොකද, තාප බලාගාරවලින් නිපදවන ඒකකයක් රුපියල් 45ත්, 55ත් අතර වෙනවා. මේ මොහොතේ විකුණුම් මිල රුපියල් 29 වෙනකොට, නිෂ්පාදන මිල රුපියල් 39 වෙනකොට ප්‍රශ්නයක් ඇති වෙනවා. Hydropowerම පාවිච්චි කරලා අපි මිල තීරණය කරන්න ගියොත්, ආයේත් මීට පෙර තිබුණු අලාභ තත්ත්වයටම මේ ආයතනය ගමන් කරනවා. එම නිසා අපි මීට වැඩිය වැදගත්කමකින් සහ ඕනෑකමින් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ. මේ ආයතනය අලාභයට යන්නේ නැති වන විධියට අපි කටයුතු කරන්න අවශ්‍යයි. මම දන්නවා ඒක අමාරු තීන්දුවක් කියලා. නමුත්, අන්තිමට ඒක තමයි පාරිභෝගිකයා බලාගෙන සිටින්නේ.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ඇත්තටම ඒකට තමයි මම කලින් කිව්වා වාගේ අපි සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය කරන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ. අපි තෙල්වලින් විදුලිය ගන්න එක පුළුවන් තරම් මේ මොහොතේත් අවම කරලා තිබෙන්නේ. අපට coalවලින් රුපියල් 20කට කිට්ටු වියදමක් යන්නේ. ඒවාත් එක්ක තමයි මේ average එක පල්ලෙහාට අපි අරගෙන තිබෙන්නේ. අපි සපයා ගන්නේ ජල විදුලියෙන් විතරක් නොවෙයි. සූර්ය විදුලි බලයත් පාවිච්චි කරගෙන, ඒ ඔක්කෝම එකතු කරගෙන තමයි අපි average එක පල්ලෙහාට ගත්තේ. අපි කිව්වා වාගේම, අපේ ප්‍රතිපත්තියේ තිබෙන විධියටම සූර්ය විදුලි බල ධාරිතාව තව වැඩි කර ගන්න ඕනෑ, මේ average එක පල්ලෙහාට ගන්න. මම කලින් කිව්වා වාගේ අවුරුදු 3ක් ඇතුළත සියයට 30ක් අඩු කරනවා කියන්නේ, හැමදාම මිල උච්චාවචනය වන තත්ත්වයකට නොවෙයි. අපි මේ මිල flat අගයකට ගේන්න ඕනෑ. ඒක තමයි අපේ target එක. 30ක් අඩු කරලා, 20ක් අඩු කරලා නැවත 30ක් වැඩි කරන පරණ ක්‍රමය නැතිව, අපට මේ මිල flat තැනකට ගේන්න ඕනෑ. ඒකට තමයි අපි මේ ප්‍රවර්ධන කටයුතු කරගෙන යන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -245/2024-(1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

හෝලුවාගොඩ සංවර්ධන ව්‍යාපෘතිය: වත්මන් තත්ත්වය සහ අපේක්ෂිත ප්‍රතිලාභ
ஹோலுவாகொட அபிவிருத்திக் கருத்திட்டம்: தற்போதைய நிலைமை மற்றும் எதிர்பார்க்கப்படும் நன்மைகள்
HOLUWAGODA DEVELOPMENT PROJECT: PRESENT STATUS AND EXPECTED BENEFITS

257/2024

4. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ `හෝලුවාගොඩ' සංවර්ධන ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත කෘෂිකාර්මික භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණය කෘෂිකර්මාන්ත කටයුතු සඳහා යොදා ගැනීමට මේ වන විට ඇති බාධා කවරේද;

(iv) එම ව්‍යාපෘතිය වෙනුවෙන් මේ දක්වා කරන ලද වියදම් හා සංසන්දනය කිරීමේදී, එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ට මැතිතුමා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)

(අ) (i) • හෝලුවාගොඩ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2023.12.20 දින වන විට අවසන් කර ඇත.

• ඒ අනුව, හෝලුවාගොඩ දියඳම් උයන 2024.03.13 දින මහජනතාව වෙත විවෘත කර ඇත.

• එම උද්‍යානය කළමනාකරණය සඳහා රුහුණු සංචාරක කාර්යාංශය වෙත භාර දී ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) මෙම ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රතිලාභ සපුරාලීමට අපේක්ෂා කරන ලදී.

- නිසි ජලාපවහන පද්ධතියක් මඟින් ගංවතුර අවම කිරීම
- අවට ප්‍රජාවට විනෝදාස්වාද පහසුකම් සැපයීම
- වෙළෙඳ කුටි සහිත වෙළෙඳ පොළ ප්‍රදේශ මඟින් ආර්ථික දියුණුව සහ වැවිලි කර්මාන්ත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය
- කෘෂිකාර්මික වගාව හරහා දිවෙන මාර්ගවලින් නගර අලංකරණය
- සංචාරක ප්‍රවර්ධනය
- ඇවිදින මංතීරු සහ ළමුන් සඳහා ක්‍රීඩා කිරීමට වෙන් වූ ඉඩකඩක් සකස් කිරීම.

ඒ අනුව, අදාළ ප්‍රතිලාභ ලැබී ඇති බව නිරීක්ෂණය කරමි.

(ආ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන මෙම දියඳම් උයන ඇතුළු හෝලුවාගොඩ සමස්ත ව්‍යාපෘතිය සම්බන්ධව ප්‍රදේශවාසීන්ගේ වාගේම අපේත් අදහස තමයි, ඒ කියන අපේක්ෂිත අරමුණු නිසියාකාරව ඉටු වෙලා නැහැ කියන එක. ඒකට හේතුව මෙයයි. හෝලුවාගොඩ ව්‍යාපෘතියේ සමස්ත ක්‍රියාවලියට බද්ධ වෙච්ච විශාල ඉඩම් ප්‍රමාණයක් -අක්කර 4,000කට වාගේ ආසන්න ප්‍රමාණයක්- දැඩි ලෙස පුරන් වෙලා තිබෙන්නේ. ඒවා පුරන් කුඹුරු බවට පත් වෙලා තිබෙනවා සහ වෙනත් වගාවක් කළ නොහැකි මට්ටමට පත් වෙලා තිබෙනවා. නව රජය පත් වුණාට පස්සේ යම් ආකාරයකින් ඒ ප්‍රදේශයේ එකතු වන වතුර ප්‍රමාණය බැස්සවීමට අවශ්‍ය ක්‍රියාවලිය සැලසුම් කර තිබෙනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, ඒ ප්‍රදේශය ආශ්‍රිතව තවදුරටත් විශේෂයෙන්ම මැදිහත් වෙලා සොයා බලන්න ඕනෑ කටයුත්තක් තිබෙනවා. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තයේ දියුණුව අපේක්ෂාවෙන් තමයි මේ ඉදි කිරීම් කර තිබෙන්නේ. නමුත්, ඇත්තටම විදේශීය සංචාරකයන්ගේ පැමිණීමේ ලොකු අඩුවක් තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ දීපු පිළිතුරට එහා ගිහිල්ලා, නැවත වරක් මේ ගැන නිසි අධීක්ෂණයක් කරලා මේ ස්ථානයේ කාර්යභාරය නිසි ලෙස ඉටු වනවා ද, ඒ අරමුණු ඉෂ්ට වෙලා තිබෙනවා ද කියා සොයා බලන්න කියලා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
හොඳයි.

ගරු මන්ත්‍රීතුමා, මේ ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබෙන ඉඩමේ ප්‍රමාණය අක්කර 18.89ක්. අක්කර 19කට ආසන්නයි. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය කරලා තිබෙන්නේ මේ ඉඩම අත්පත් කර දීමට අදාළ මැදිහත්වීම පමණයි. නාගරික සංවර්ධන අධිකාරිය තමයි මේකට සැලසුම් හදලා, මුදල් වැය කර තිබෙන්නේ රුපියල් මිලියන 222.1ක්. කෙසේ වුවත්, ඔබතුමා කියපු කාරණයට අමාත්‍යාංශයක් හැටියට ඉදිරියේදී අපි මැදිහත් වෙලා, පුරන් වෙච්ච කුඹුරු තවදුරටත් තිබෙනවා නම්, ඒවා වැඩ කර ගන්න අපහසු නම්, ඒ ගැන අවශ්‍ය සොයා බැලීම් කරන්න සූදානම්.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, රුහුණු සංචාරක කාර්යාංශය යටතේ මේ උද්‍යානය පවතිනවා කියලා අදහසක් තිබුණත්, පසුගිය දවස්වල කළ බොහෝ ක්‍රියාකාරකම් රුහුණු සංචාරක කාර්යාංශයේ අවබෝධයෙන් තොරව සිදු වූ බවක් තමයි නිරීක්ෂණය වෙලා තිබෙන්නේ. ඒ වාගේම එතැන පාලනයේ ඉන්න කණ්ඩායම ප්‍රදේශවාසීන්ට යම් දැනුවත් කිරීම් කරමින් ඉන්නවා. ඒ කියන්නේ, රුහුණු සංචාරක කාර්යාංශයත් එක්ක සම්බන්ධීකරණයක් නැතිව වැඩ කරලා, ඒවාට අදාළව යම් මහජන විරෝධතා ගොඩ නඟමින් ඉන්නවා. ඒ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා, රුහුණු සංචාරක කාර්යාංශයට අයිති වැඩ කොටස නිසි ලෙස ඉටු වනවාද කියා සොයා බැලිය යුතුයි කියා යෝජනා කරනවා.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, එතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ගැන අමාත්‍යාංශයක් හැටියට අපි සොයා බලන්නම්. කෙසේ වෙතත්, ඒක අපේ අමාත්‍යාංශය යටතේ නොවෙයි ක්‍රියාත්මක වෙන්නේ, රුහුණු සංචාරක කාර්යාංශය මඟින්.

මම මුලින් කිව්වා වාගේ, එහි ඉඩම අත් පත් කර දීමේ කාර්යය සඳහා තමයි වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මැදිහත් වෙලා තිබෙන්නේ. දකුණු පළාත් රුහුණු සංචාරක කාර්යාංශය වෙත තමයි මෙහි ඉදිරි පරිපාලන කටයුතු භාර දීලා තිබෙන්නේ. ඔබතුමා සඳහන් කළ කාරණයට මැදිහත් වෙන්න කියලා අපි එම කාර්යාංශයට දැනුම් දෙන්නම්.

බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණය: නවීකරණය
பண்டாரவளை பொது விளையாட்டரங்கு: நவீனமயப்படுத்தல்
BANDARAWELA PUBLIC PLAYGROUND: RENOVATION

440/2025

5. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණය (නගර සභා ක්‍රීඩාංගණය) ක්‍රීඩා තරග පැවැත්වීම සඳහා යෝග්‍ය තත්ත්වයක නොපවතින බවත්;

(ii) එම ක්‍රීඩාංගනයේ ජලය බැස යාම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බවත්;

(iii) එහි ඉදිකර ඇති කානු පද්ධතිය හේතුවෙන් ක්‍රිකට් තරග පැවැත්වීමට නොහැකි බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2024 දක්වා එම ක්‍රීඩාංගණය නවීකරණය කිරීම සඳහා වැය කරන ලද මුදල් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ක්‍රීඩාංගණයට සිදු වී ඇති හානි සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iii) බණ්ඩාරවෙල ප්‍රදේශයේ ක්‍රීඩකයන්ට සහ පාසල් සිසුන්ට භාවිතා කිරීමට හැකි වන පරිදි ඉහත ක්‍රීඩාංගණය නවීකරණය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பண்டாரவளை பொது விளையாட்டரங்கு (நகர சபை விளையாட்டரங்கு) விளையாட்டுப் போட்டிகளை நடாத்துவதற்கு உகந்த நிலையில் காணப்படவில்லை என்பதையும்;

(ii) மேற்படி விளையாட்டரங்கில் நீர் வழிந்தோடுவதற்கு முறையான வழிமுறையொன்று இல்லை என்பதையும்;

(iii) அங்கு நிர்மாணிக்கப்பட்டுள்ள வடிகாலமைப் பின் காரணமாக கிரிக்கட் போட்டிகளை நடாத்த முடியாதுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) 2015ஆம் ஆண்டு முதல் 2024ஆம் ஆண்டு வரை மேற்படி விளையாட்டரங்கை நவீனமயப்படுத்த செலவிடப்பட்ட தொகை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி விளையாட்டரங்குக்கு ஏற்பட்டுள்ள பாதிப்பு சம்பந்தமாக விசாரணை நடாத்தப் படுமா என்பதையும்;

(iii) பண்டாரவளை பிரதேச விளையாட்டு வீரர்கள் மற்றும் பாடசாலை மாணவர்கள் பயன்படுத்தக் கூடிய வகையில் மேற்படி விளையாட்டரங்கை நவீனமயப்படுத்த நடவடிக்கை மேற்கொள்ளப் படுமா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பான எதிர்காலத் திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Is he aware that -

(i) the Bandarawela Public Playground (Municipal Ground) is not in a condition fit to hold sports events;

(ii) there is no proper system to drain water from the ground concerned; and

(iii) cricket matches cannot be played owing to the drainage system constructed there?

(b) Will he inform this House -

(i) the amounts of money spent from 2015 to 2024 to renovate that ground in relation to each year, separately;

(ii) whether an inquiry will be conducted in regard to the damages caused to the above ground;

(iii) whether steps would be taken to renovate the ground to enable the players as well as school children in Bandarawela area to use it; and

(iv) If so, the future plans in that regard?

(c) If not, why?

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) යෝග්‍ය නොවන බව දනිමි.

(ii) ජලය බැස යාම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බව දනිමි.

එහි නවීකරණ කටයුතු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සාර්ථකව සිදු කර අවසන් කිරීමෙන් පසු නැවත 2022.01.19 දින බණ්ඩාරවෙල මහ නගර සභාව වෙත භාර දෙන අවස්ථාවේදී විධිමත් කාණු පද්ධතියක් ඉදිකර තිබී ඇත. එදින සිට එම ක්‍රීඩාංගණයේ නඩත්තු කටයුතු කරනු ලබන්නේ බණ්ඩාරවෙල මහ නගර සභාව විසිනි.

(iii) ක්‍රිකට් තරග පැවැත්වීමට නොහැකි බව දනිමි.

එහෙත්, බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණය ක්‍රිකට් තරග පැවැත්වීම සඳහා සකස් කළ ක්‍රීඩා පිටියක් නොව, මලල ක්‍රීඩා පැවැත්වීම සඳහා සකස් කළ ක්‍රීඩා පිටියකි.

ඒ නිසා එම ක්‍රීඩාංගණය ක්‍රිකට් තරග පැවැත්වීමට සුදුසු නැත. කෙසේ වුවත්, සංවර්ධන කටයුතුවලින් පසු එහි ක්‍රිකට් තරග පවත්වනවා නම්, boundary line එක තිබෙන්නේ කාණුවෙන් එළියේ. ඒ විධියට තමයි එහි සංවර්ධන කටයුතු සිදුවෙලා තිබෙන්නේ.

(ආ) (i) දක්වා ඇති කාල සීමාව තුළ 2019, 2020 සහ 2021 වර්ෂවල පමණක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වැය කරන ලද මුදල් පහත පරිදි වේ.

වර්ෂය	වැය කරන ලද මුදල
2019	රුපියල් 16,409,553.76
2020	රුපියල් 41,745,045.23
2021	රුපියල් 1,716,901.30

(ii) බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණය නවීකරණය කිරීමෙන් පසු 2022.01.19 දින අඩු පාඩු රහිතව එම ක්‍රීඩාංගණය බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් භාරගෙන ඇති බැවින්, එදින සිට මේ දක්වා යම් හානියක් සිදු වී ඇත්නම් එම හානි සම්බන්ධයෙන් පරීක්ෂණයක් බණ්ඩාරවෙල මහ නගර සභාව මඟින් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

මොකද, ඒ සම්බන්ධයෙන් වගකීම තිබෙන්නේ බණ්ඩාරවෙල මහ නගර සභාවටයි. එම නිසා බණ්ඩාරවෙල මහ නගර සභාව ඒ පිළිබඳව සොයා බලන්නට ඕනෑ.

(iii) 2025 වර්ෂයේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා රජය විසින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන යටතේ මෙම ක්‍රීඩාංගණයේ නවීකරණය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත.

මොකද, එය බණ්ඩාරවෙල නගර සභාවට අයිති ක්‍රීඩාංගණයක් නිසා.

නමුත්, දැනට අත්‍යවශ්‍ය පහසුකම් සහිත නඩත්තු කටයුතු බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් ඉටු කිරීමට නියමිතය.

(iv) බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණය, බණ්ඩාරවෙල මහ නගර සභාව යටතේ පවතින බැවින් පවතින ප්‍රතිපාදන මත කලින් කලට අවශ්‍ය පහසුකම්, සියලු ප්‍රතිසංස්කරණ හා නඩත්තු කටයුතු බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් සිදු කළ යුතු වේ.

(ඇ) එම ක්‍රීඩා සංකීර්ණ ඉදිකර අවසන් කිරීමෙන් අනතුරුව පරිපාලන හා නඩත්තු කටයුතු සඳහා අදාළ පළාත් පාලන ආයතනවලට භාර දිය යුතු අතර, ඒ අනුව බණ්ඩාරවෙල මහජන ක්‍රීඩාංගණය ද නවීකරණ කටයුතුවලින් අනතුරුව බණ්ඩාරවෙල මහ නගර සභාව වෙත නිසියාකාරව භාර දී ඇති බැවින් නවීකරණය සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් මහ නගර සභාව විසින් සකස් කළ යුතු වේ.

මේ ක්‍රීඩාංගණය දැනට මහ නගර සභාවට අයිති නිසා මේ සියලු කටයුතුවල වගකීම මහ නගර සභාවට තිබුණත්, ඒක එසේ නොවන්නේ නම් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කිරීම අමාත්‍යාංශයේ වගකීමක් විධියට දකින නිසා අපි මේ ගැන සොයා බලන්නත් කටයුතු කරනවා.

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මම එක අතුරු ප්‍රශ්නයක් තමයි යොමු කරන්නේ. අපේ ගරු ඇමතිතුමාගේ කථාව තුළ පැහැදිලි වුණා, මේ ක්‍රීඩාංගණයට කරලා තිබෙන විනාශය ගැන. ඇත්තටම එම ක්‍රීඩාංගණයේ මීට කලින් ක්‍රිකට් තරග පැවැත්වුවා. නමුත් එම ක්‍රීඩාංගණයේ boundary line එකට ඇතුළෙන් තමයි කාණු පද්ධතිය තිබෙන්නේ. එහෙම ස්ථානයක ක්‍රිකට් ක්‍රීඩා කිරීම ඉතාම අනතුරුදායකයි. දැනටත් මෙහි ක්‍රිකට් තරග පැවැත්වෙනවා. මේ හේතුව නිසා බණ්ඩාරවෙල ප්‍රදේශයේ big match එකක් එහෙම ගහනකොට සූරියවැවට යන්න සිද්ධ වෙලා තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාංගණයකට ඔබින එකක් නොවෙයි කියලා කියන්න නම් හරිම ලෙහෙසියි. බණ්ඩාරවෙල කියන්නේ අවිධිමත් සංවර්ධනයෙන් පීඩා විඳින නගරයක්. විකල්ප මාර්ගයක් තිබුණා. තොග පොළ දමලා, දැන් ඒ විකල්ප මාර්ගය නැහැ; නගරය හැර, යන විකල්ප මාර්ගයක් නැහැ. ඒ වාගේම, Commercial Centre - CC - එකක් ඉදි කළා. ඒකේ parkingවලට හදපු තැන තමයි පොළ තිබෙන්නේ. ඉතින්, අපේ ගරු ඇමතිතුමාගෙන් මම අහන්නේ මේකයි. දැන් ඒ ක්‍රීඩාංගණයේ ක්‍රිකට් තරග පවත්වන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ. අතීතයේදී එය ජාත්‍යන්තර තලයට ගිය ක්‍රීඩකයන් බිහි වෙච්ච ක්‍රීඩාංගණයක්. ජයතිස්ස කියලා ඉතා කීර්තිමත් පුහුණුකරුවෙක් හිටියා. හේමලාල් ප්‍රියංකර, සූරියගේ, එස්.ඒ. ලලිත් වාගේ කීර්තිමත් ක්‍රීඩකයන් බිහි වුණා. ඔබතුමාත් දන්නවා, එම ක්‍රීඩාංගණය මලල ක්‍රීඩාව සඳහාත් යෝග්‍ය නැහැ කියලා. එහි වතුර බැස යන නිසි ක්‍රමවේදයක් නැහැ. මේ නිසා මඩ වගුරක් බවට පත් වෙලා තිබෙනවා. ඒක විනාශ කරපු ක්‍රීඩාංගණයක්. ඒ නිසා ක්‍රිකට් තරග පවත්වන්න, මලල ක්‍රීඩා පවත්වන්න, බණ්ඩාරවෙලට විකල්ප ක්‍රීඩාංගණයක් ලබා දෙන්න.

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

සංවර්ධනය කළ විකල්ප ක්‍රීඩාංගණයක් ලබා දෙන්න. සංවර්ධනය කළ උතුරු කැබිල්ල ක්‍රීඩාංගණය තිබෙනවා, බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩාංගණය තිබෙනවා, ගුරු විද්‍යාල ක්‍රීඩාංගණය තිබෙනවා. බණ්ඩාරවෙලට විකල්ප ක්‍රීඩාංගණයක් සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලායි මම අහන්නේ.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ගැන සොයා බැලුවා. ඇත්තටම අපේ රටේ පසුගිය කාලයේ දිගින් දිගටම සිද්ධ වෙච්ච කිසිම සැලසුමක් නැති සංවර්ධන ක්‍රියාවලීන්වල ප්‍රතිඵලයක් තමයි මේ බණ්ඩාරවෙල ක්‍රීඩාංගණය. එම ක්‍රීඩාංගණය සංවර්ධනය කරනකොට අඩුම ගණනේ ඒ වෙලාවේ මේ සම්බන්ධව අදහසක් හදා ගන්න තිබුණා. මේ ක්‍රීඩාංගණයේ ක්‍රිකට් තරග පවත්වන්නත්, අනෙකුත් තරග පවත්වන්නත් පුළුවන් විධියට මෙය සංවර්ධනය කරන්න තිබුණා. නමුත්, ඔබතුමා කියනවා වාගේ මේ ක්‍රීඩාංගණයේ අපි cricket match එකකට boundary line එකක් ගැහුවාම, boundary line එකට කලින් ක්‍රීඩකයාට හමු වෙනවා යකඩ බට දාපු කාණුවක්. ඒක ක්‍රිකට් ක්‍රීඩාවේ දී අනතුරුදායකයි. මොකද, වැටිලා ඔළුව වැදුණොත් ලොකු අනතුරක් සිද්ධ වෙන්න පුළුවන්. කාණුවක් පැනලා ගිහිල්ලා boundary line එකක් තිබෙන ක්‍රීඩාංගණ අපි දැකලා නැහැ. ඒ නිසා මේක සංවර්ධනය කරපු කට්ටිය මේකට වගකියන්න ඕනෑ කියලා මම හිතනවා. අපි නගර සභාවත් එක්ක කථා කරලා උත්සාහ ගන්නවා, එක්කෝ මේක ක්‍රිකට් ක්‍රීඩාවට ගන්න පුළුවන් විධියට නැවත පිළිසකර කරන්න. එහෙම නැත්නම් ඔබ ප්‍රදේශයට අලුතින් ක්‍රීඩාංගණයක් සංවර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි වටය.

කොළොන්නාව ප්‍රා.ලේ. කොට්ඨාසයේ ගංවතුර පාලනය: ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

கொலன்னாவை பிரதேச செயலாளர் பிரிவில் வெள்ளக் கட்டுப்பாடு: நடைமுறைப்படுத்தப்படாத கருத்திட்டங்கள்

FLOOD CONTROL IN KOLONNAWA DS DIVISION: UNIMPLEMENTED PROJECTS

245/2024

3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු එස්.එම්.මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. S.M. Marikkar)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගංවතුර පාලනය කිරීම සඳහා යෝජිත ව්‍යාපෘති අතරින් මේ දක්වා ක්‍රියාත්මක නොකර ඉතිරිව ඇති ව්‍යාපෘති කවරේද;

(ii) ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානුව, අරමුදල් සපයා ගනු ලබන ආකාරය සහ ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

නගර අපිවිරුත්ති, නිර්මාණිප්පු මට්රුම් වීඩමෛප්පු අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) කොලන්නාවෛ පිරදේච චෙයලාළර් පිරිවිල් ඒට්පඩුම් වෙළ්ළප්පෙරුක්කෛ කට්ටුප්පඩුත්තුවදට්කාන උත්දේච කරුත්තිට්ටඞ්කළිල් ඉදුවරෛ චෙයට්පඩුත්තප්පඩාදු එඤ්චියුළ්ළ කරුත් තිට්ටඞ්කළ් යාවෛ එන්පදෛයුම්;

(ii) අවට්රෛච් චෙයට්පඩුත්තුවදට්කුත් තිට්ටමිඩප් පට්ටුළ්ළදා එන්පදෛයුම්;

(iii) ආමෙනිල්, මේට්පඩි ඔව්වොරු කරුත්තිට්ටමුම් චෙයට්පඩුත්තප්පඩුම් කාලප්පකුදි, නිදි වසදි පෙරප්පඩුම් විදම් මට්රුම් චෙයට්පඩුත්තුම් නිරුවනම් වෙව්වේරාග යාවෛ එන්පදෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ஆ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) the projects that are left without being implemented so far, out of the projects planned for flood control within the Kolannawa Divisional Secretary's Division;

(ii) whether plans have been made for implementing them; and

(iii) if so, the timeframe for implementing the project, how funds are to be found and the implementing agency, separately in respect of each such project?

(b) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i).

1. දහම්වෙල ප්‍රධාන ඇළ මාර්ගය
   - බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම - (ගණන 11)
   - ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - (ඇළෙහි මුළු දිග 3.85 km)

2. පස්සැන්න ප්‍රධාන ඇළ මාර්ගය

- වැසිජල රැඳවුම් තටාක ඉදි කිරීම - (ගණන 2)
- බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම - (ගණන 8)
- ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම - (ඇළෙහි මුළු දිග 4.485 km)

3. සැළලිහිණි ප්‍රධාන ඇළ මාර්ගය

- පොම්පාගාර ඉදි කිරීම
- බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම - (ගණන 5)
- ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම - (ඇළෙහි මුළු දිග 3.25 km)

4. දඹුතොට ප්‍රධාන ඇළ මාර්ගය

- බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීම - (ගණන 6)
- පොම්පාගාරය ඉදි කිරීම
- ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම - (ඇළෙහි මුළු දිග 1.4 km)

- මෙයට අමතරව කළු පාලම ජල දොරටුවට පොම්ප සවිකිරීමට යෝජිත ව්‍යාපෘතිය සඳහා (ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව) වෙත යොමු කර එහි අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

(ii). කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ තුළ පිහිටි පහත සඳහන් ඇළ මාර්ග පද්ධති, කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහා භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය කොට ප්‍රතිසංස්කරණය කිරීම 2025 සිට 2029 දක්වා වූ අවුරුදු 5ක කාලය තුළ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් ක්‍රියාත්මක කොට නිම කිරීමට සැලසුම් කර තිබේ.

1. කිත්තම්පහුව ඇළ මාර්ග පද්ධතියට අයත් පස්සැන්න ඇළ මාර්ගය සහ දහම්වෙල ඇළ මාර්ගය සහ ඒවාට අයත් ද්විතියික ඇළ මාර්ග.

2. සැළලිහිණි මාවත ඇළ මාර්ගය සහ ද්විතියික ඇළ මාර්ග, සැළලිහිණි මාවත පොම්පාගාරය

3. දඹුතොට ඇළ මාර්ගය හා ද්විතියික ඇළ මාර්ග, දඹුතොට ඇළ පොම්පාගාරය -කළු පාලම පොම්පාගාරය සඳහා අවශ්‍ය මූලික සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන - design and built - සකස් කර ඇත. ක්‍රියාත්මක කිරීම, අවශ්‍ය අනුමැතිය සහ ප්‍රතිපාදන වෙන් වූ පසු කිරීමට යෝජිතය.

(iii)

ඇළ මාර්ගයේ නම	ඉංජිනේරු- සැළසුම් සකස් කිරීම	ක්‍රියාත්මක කිරීම	නඩත්තු කටයුතු සිදු කිරීම	අරමුදල් සපයා ගන්නා ආකාරය	කාල වකවානු
පස්සැන්න ඇළ	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	භාණ්ඩාගාර අරමුදල්	2025-2029
පස්සැන්න ද්විතියික ඇළ මාර්ගය		කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව		
දහම්වෙල ඇළ		ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව		
දහම්වෙල ද්විතියික ඇළ මාර්ගය		කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව		
සැළලිහිණි මාවත ඇළ		ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව		
සැළලිහිණි ද්විතියික ඇළ මාර්ගය		කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව		
දඹුතොට ඇළ		ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව		
දඹුතොට ද්විතියික ඇළ මාර්ගය		කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව		

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

දරිද්‍රතාව සහ අස්වැසුම වැඩසටහන පිළිබඳ දත්ත
வறுமை மற்றும் அஸ்வெசும நிகழ்ச்சித்திட்டம் பற்றிய தரவுகள்
DATA ON POVERTY AND ASWESUMA PROGRAMME

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් සඳහා රජයක් විසින් විද්‍යාත්මක දත්ත මත තීරණ ගත යුතුය. එබැවින්, පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරන අතර, ඒ සඳහා නිවැරදි පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් අපේක්ෂා කරමි.

01. රටේ පාලකයන් විසින්ම බංකොලොත්භාවය පිළිගත් රටක ඉදිරි තීන්දු තීරණ ගැනීමේ දී දරිද්‍රතාව පිළිබඳ නව දත්ත වාර්තා වඩාත් වැදගත් වන බව රජය පිළිගන්නේද? එසේ නම්, එත්මන් අය වැය සැකසීමේදී දරිද්‍රතාව පිළිබඳ සැලකිල්ලට ගත් මිනුම් දඬු මොනවාද? එහි මූලාශ්‍ර මොනවාද?

02. ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය - Household Income and Expenditure Survey - පිළිබඳ නව වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නේ කවදාද? අවසන් වරට ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණයක් සිදු කර ඇත්තේ කවදා ද? ජන හා නිවාස සංගණනය පිළිබඳ නව දත්ත වාර්තාවක් නිකුත් කිරීමට රජය අපේක්ෂා කරන්නේ කවදා ද?

03. පසුගිය රජය යටතේ ක්‍රියාත්මක කළ අස්වැසුම වැඩසටහන සැබැවින්ම මෙරට දුප්පත්කම තුරන් කළ හැකි වැඩසටහනක් වශයෙන් එත්මන් රජය පිළිගන්නේද? නොඑසේ නම්, ඊට හේතු කවරේ ද? පවතින ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේද නිසා අස්වැසුම හිමිවිය යුතු නමුත්, එය නොලබන කොපමණ පිරිසක් සිටී දැයි රජය සතු ඇස්තමේන්තුව කුමක්ද? එම නිගමන සඳහා පැමිණියේ කවර දත්ත මත පදනම්වද?

එතැන පැහැදිලි ගැටලුවක් තිබෙනවා. අස්වැසුමට ඇතුළු කරන්නේ, අස්වැසුමෙන් බැහැර කරන්නේ මොන මොන නිර්ණායක පදනම් කරගෙනද කියන කාරණය ගැන. අපට ඒ ගැන පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

04. අස්වැසුම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හිමිවන්නේ ආධාර මඟින්ද? එසේ නම්, එම ආධාර ලබා දෙන ආයතනය කුමක්ද? නැතහොත්, රජය මෙම ප්‍රතිපාදන ලබා දෙන්නේ ලබා ගත් ණය උපයෝගී කරගෙනද? එසේ නම්, එම ණය ලබා දී ඇත්තේ කවුරුන්ද? කවර පොලී අනුපාතයක් යටතේද? මෙවැනි පසුබිමක් තුළ අස්වැසුම වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යන බවට රජයට සහතික විය හැකිද?

05. දරිද්‍රතාව පිටුදැකීමට නම් නිෂ්පාදනය, ආයෝජනය, ඉතිරි කිරීම්, පරිභෝජනය හා අපනයනය යන ක්‍රියාදාම ඇතුළත් වැඩසටහනක් අවශ්‍ය බව රජය පිළිගන්නේද? නොඑසේ නම්, හුදෙක් යම් කාල සීමාවක් තුළ මූල්‍යමය ආධාර ලබා දී දුප්පත්කම තුරන් කරලීම වත්මන් රජයේද ප්‍රතිපත්තිය වන්නේද? නැතහොත් හදුනා ගත් විකල්පය රටට හඳුන්වා දෙන්නේ කවදාද? එය කුමක්ද?

06. ජාත්‍යන්තර වෙළෙඳ පොළ තුළ ඉදිරියේදී ඇතිවීමට නියමිත තරගකාරිත්වයේ හා බදු අනුපාත වෙනස්වීම් හමුවේ ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට මුහුණදීමට සිදුවන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් මේ වන විට සිදු කර තිබේද? නොඑසේ නම් ඒ මන්ද?

මොකද අපට පේනවා, ලෝකයේ වෙළෙඳ ආරක්ෂණ ක්‍රියාවලියක් - economic protectionism - තිබෙන බව. ඒ තුළ tariff rates ඉහළ දමනවා. මේ රටේ ග්‍රාමීය සහ නාගරික දුප්පත් ප්‍රජාව විවිධ කර්මාන්තවල නියැළෙනවා, විශේෂයෙන්ම ඇඟලුම් කර්මාන්තයේ. බැරි වෙලාවත් tariff increase එකක් තුළ අපේ අපනයනවලට, ඒ වාගේම අපනයන ගමනාන්තයන්ට - export destinationsවලට - ඒ වාගේ බරපතළ බලපෑමක් සිදු වුණොත් රජයට තිබෙන සැලසුම් මොනවාද, යම්කිසි විසඳුමක් ලබා දෙන්නට?

රටක් වශයෙන් මේ පිළිබඳව ඉදිරියේදී කටයුතු කිරීමට මෙම රජය බලාපොරොත්තු වන්නේ කෙසේද? මෙවන් තත්ත්වයන් යටතේ අපනයනකරුවන් ආරක්ෂා කර ගැනීමේ රජයේ වැඩ පිළිවෙළ කුමක්ද?

විශේෂයෙන්ම මම බලාපොරොත්තු වෙනවා, රජයෙන් මෙයට පිළිතුරක් ලැබෙයි කියලා. ගරු කථානායකතුමනි, මේක ඉතාම සංකීර්ණ මාතෘකාවක් නිසා ගරු ඇමතිතුමා ලබා දෙන පිළිතුර මත පැහැදිලි කර ගැනීම් කර ගන්නට අවස්ථාව ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මේකේ ප්‍රධාන වශයෙන් ප්‍රශ්න හයක් සහ ඒ යටතේ අනුකාණ්ඩ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ සඳහා මම සංක්ෂිප්ත උත්තරයක් ලබා දෙන්නම්.

01. ඇත්ත වශයෙන්ම රටක ඉදිරි තීන්දු තීරණ ගැනීමේදී දරිද්‍රතාව පිළිබඳ දත්ත, දුප්පත්කම පිටුදැකීම සඳහා දත්ත ඉතා වැදගත් වෙනවා. ඒ වාගේම අපේ අය වැය සකස් කිරීමේදී ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද මාසික සහ වාර්ෂික නිල දරිද්‍රතා රේඛාව, ගෘහස්ථ ආදායම් සහ වියදම් සමීක්ෂණය 2019, බහුමාන දරිද්‍රතා දර්ශකය 2019 සහ 2023 ආර්ථික අර්බුදයේ බලපෑම් පිළිබඳ නිවාස සමීක්ෂණයත් පදනම් කරගෙන තිබෙනවා.

ඒවා මාධ්‍ය වෙත නිකුත් කිරීමත්, වෙබ් අඩවියට මුදා හැරීම පිළිබඳවත් දින වකවානු ඉදිරිපත් කරලා තිබෙනවා. එතැන ලේඛන හතක් තිබෙනවා. ඒ පිළිබඳ විස්තර මෙසේයි.

අංක	තේමාව	නිකුත් කිරීමේ දිනය		වෙබ් අඩවියට මුදා හැරීමට නියමිත දිනය	මුද්‍රිත මාධ්‍ය වෙත නිකුත් කිරීමට නියමිත දිනය
		නම	අනුරූපිත කාලසීමාව		
1	CPH 2024	ප්‍රධාන සොයා ගැනීම්	2025	30.06.2025	30.06.2025
2	CPH 2024	අවසාන වාර්තාව	2025	29.08.2025	29.08.2025
3	CPH 2024	උපකරණ පුවරුව හරහා දත්ත බෙදා හැරීම	2025	29.08.2025	මුද්‍රිත මාධ්‍ය නොමැත
4	CPH 2024	තේමාත්මක සිතියම	2025	29.08.2025	29.08.2025
5	CPH 2024	දිස්ත්‍රික් මට්ටමේ වාර්තා	2025	31.12.2025	31.12.2025
6	CPH 2024	ප්‍රාදේශීය ලේකම් මට්ටමේ වාර්තා	2025	31.12.2025	31.12.2025
7	CPH 2024	දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව මූලික නිවාස තොරතුරු	2025	31.12.2025	31.12.2025

02. ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2025 වසරේ ජනවාරි සිට 2026 වසරේ ජනවාරි දක්වා කාලය තුළදී පවත්වන්න නියමිතයි. එහි සංක්ෂිප්ත වාර්තාව 2026 වසරේ ජූනි මාසයේදීත්, අවසන් වාර්තාව අගෝස්තු මාසයේදීත් නිකුත් කිරීමට නියමිතයි.

- ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය අවසන් වරට සිදු කරලා තිබෙන්නේ 2019 වසරේදීය.
- ශ්‍රී ලංකාව සෑම වසර 10කටම වරක් ජන හා නිවාස සංගණනය පවත්වනවා. ජන හා නිවාස සංගණනයක් කියන්නේ, රටේ සිටින සියලුම පුද්ගලයින් හා නිවාස එකවර ගණන් ගැනීමක්. මෙහිදී කිසිම පුද්ගලයෙකු හෝ නිවාසයක් මඟ නොහැරෙන ලෙසත්, දෙවරක් ගණනය සිදු නොවන ලෙසත් තොරතුරු එක් රැස් කරනවා.

  මේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට ජන හා නිවාස සංගණනයක් අදියර හතරකින් කරනු ලබනවා.

  1. සිතියම් සකස් කිරීමේ අදියර.
  2. ගොඩනැඟිලි ලැයිස්තුගත කිරීමේ අදියර.
  3. ගණන් ගැනීමේ අදියර.
  4. දත්ත ප්‍රචලිත කිරීමේ අදියර.

සිතියම් සකස් කිරීමේ අදියර 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, ග්‍රාම නිලධාරී කොට්ඨාසය පදනම් කරගනිමින් මුළු දිවයිනම "සංගණන කාණ්ඩ" ලෙස හඳුන්වනු ලබන කුඩා කොටස්වලට වෙන් කරන ලදී. මෙම සිතියම් සකස් කිරීමේ කාර්යය 2020 වර්ෂයේදී අවසන් වූ අතර මුළු දිවයිනම සංගණන කාණ්ඩ 88,000කට පමණ වෙන්ව සිතියම්ගත කර ඇත. මේ වන විට මෙම සියලු සංගණන කාණ්ඩ ඇතුළත් භූගෝලීය දත්ත පද්ධතියක් සකස් කොට ඇත.

සංගණනයෙහි දෙවන අදියර වන්නේ දිවයිනෙහි පවතින සියලුම ගොඩනැඟිලි සිතියම් අදියරෙහිදී සකස් කළ සිතියම් පාදක කරගනිමින් ලැයිස්තුගත කිරීමයි. පුද්ගලයෙකුට ජීවත් විය හැකි සියලුම ගොඩනැඟිලිවල ලේඛලයක් අලවා ලැයිස්තුවක් සකස් කර ගැනීම 2023 ඔක්තෝබර් සිට 2024 ජනවාරි දක්වා සාර්ථකව කරන ලදී. මෙම වාර්තාව දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ 2024.10.31 දිනැතිව පළ කර ඇත.

සංගණනයෙහි තුන්වන අදියර වන ගණන් ගැනීමේ අදියර 2024 ඔක්තෝබර් මාසයේදී ආරම්භ විය. ගොඩනැඟිලි ඒකකවල පදිංචි සාමාන්‍ය පුද්ගලයන්ගේ ජීව දත්ත තොරතුරු, අධ්‍යාපනය, සාක්ෂරතාව, කායික හා මානසිකත්වයන්, සංක්‍රමණික තත්ත්වයන් ආදී තොරතුරු රැසක් එක් එක් පුද්ගලයාගෙන් වෙන් වෙන්ව ලබා ගන්නා මෙම අදියරේදී, ඊට අමතරව නිවාස ඒකක සකස් කර ඇති ද්‍රව්‍ය, ආහාර සකස් කිරීමට භාවිත කරනු ලබන ඉන්ධන වර්ග, සනීපාරක්ෂක පහසුකම් වැනි තොරතුරු රාශියක් ලබා ගැනේ.

2024 ඔක්තෝබර් මස 07 දින තොරතුරු රැස් කිරීමේ ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලද අතර, 2024 දෙසැම්බර් මස 19 දින "සංගණන දිනය" ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. 2024 නොවැම්බර් මස 26 දින සිට දින කිහිපයක් පැවති අධික සුළං සහිත වර්ෂාව හා ඇතැම් දිස්ත්‍රික්ක ගංවතුර තත්ත්වයකට මුහුණදීම ද ගණන් ගැනීමේ අදියරෙහි ක්ෂේත්‍ර කටයුතු ප්‍රමාද කරන ලදී. එසේ වුවද, සැලසුම් කළ පරිදි 2024 දෙසැම්බර් මස 18 දින රාත්‍රී කාලයේ මුළු දිවයිනම ආවරණය වන පරිදි හිසට වහලක් නොමැති සියලුම පුද්ගලයන් ගණන් ගන්නා ලදී.

දිස්ත්‍රික්ක 23ක තොරතුරු රැස් කිරීමේ කටයුතු සැලසුම් කළ දිනට අවසන් වූ අතර, එම තොරතුරු මේ වන විට ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත සර්වර් පරිගණක වෙත ලැබී ඇත. මේ වන විට දත්ත පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. ගණන් ගන්නා නිලධාරීන්ගේ හිඟය, දිවා කාලයේදී බොහොමයක් නිවාස වසා තැබීම, සුපිරි මහල් නිවාසවලට ප්‍රවිශ්ටවීමේ අපහසුව වැනි විවිධ කරුණු මත, පත් කරන ලද ගණන් ගන්නා නිලධාරීන් සංගණන කටයුතු අතරමගදී ඉවත් වීම නිසා කොළඹ සහ ගම්පහ වැනි තදාසන්න ප්‍රදේශයන්හි තොරතුරු රැස් කිරීමේ කටයුතුවල යම් ප්‍රමාදයක් සිදු විය. එම ප්‍රදේශයන්හි තොරතුරු රැස් කිරීම සංගණන දිනය ආරම්භ වන මොහොත පදනම් කර ගනිමින් - එනම්, 2024 දෙසැම්බර් මස 19 දින 00:00ට- සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනය හා එක්ව කඩිනම් පියවර ගැනීමට කටයුතු කරමින් පවතී.

ගණන් ගැනීමේ අදියර පිළිබඳ මූලික වාර්තාව මාර්තු 05 දින නිකුත් කිරීමට නියමිතය. ගණන් ගැනීමේ අදියර පිළිබඳව අනිකුත් වාර්තාව ඉහත වගුව පරිදි කාලවකවානුවලින් නිකුත් කිරීමට නියමිතය.

[ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා]

03. අස්වැසුම වැඩසටහන සහ දුප්පත්කම තුරන් කිරීම කියන කාරණයේදී ඇත්ත වශයෙන්ම දුප්පත්කම සැබෑ ලෙසම තුරන් කිරීමට හුදු මුදල් සහනාධාරයක්, මුදල් ආධාරයක් පමණක්ම දීම විසඳුමයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ වාගේම අතීතයේ සිටම පවත්වාගෙන ආ මුදල් දීමේ ක්‍රමවේද තුළින් දුප්පත්කම නැති වෙලා නැති බව පෙනෙනවා. එමඟින් තවතවත් දුප්පත්කම වැඩි වෙලා පවුල් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා.

කෙසේ වෙතත්, දුප්පත්කම සැබෑ ලෙස පිටුදැකීමේ වැඩ පිළිවෙළකට යන තෙක් මූලික පදනමක් සකස් කර ගැනීමට, එම ජනතාවට විශ්වාසය ගොඩනඟා ගැනීමට මුදල් ආධාර ලබා දීම අවශ්‍ය බව අපි පිළිගන්නවා. ඒ අනුව තමයි අස්වැසුම වැඩසටහනත් ඉදිරියට ක්‍රියාත්මක වෙන්නේ. දුප්පත්කම පිටුදැකීමේ සැබෑ වැඩ පිළිවෙළක් විධියට එය ක්‍රියාත්මක කිරීමේදී, විශේෂයෙන්ම මා කලිනුත් සඳහන් කළ දත්ත පද්ධතිය ඩිජිටල්කරණය කිරීම හරහා එම තොරතුරු ඒක රාශි කරගෙන ඒකාබද්ධ කිරීමේ වැඩසටහනකුත්, එයට උදවු කිරීම සඳහා විශේෂයෙන්ම ඩිජිටල් ආර්ථිකකරණය යටතේ Sri Lanka UDI project එකත් අපි යෝජනා කරලා තිබෙනවා. එතකොට වඩාත්ම නිවැරදි, තර්කානුකූල සහ විද්‍යාත්මක පදනමකින් දත්ත ලබා ගන්නට පුළුවන්. මේකට සම්බන්ධ විවිධ ආයතන සහ කණ්ඩායම් එකතු කරලා විධිමත් වැඩ පිළිවෙළක් අපි යෝජනා කරනවා.

අස්වැසුම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලැබිය යුතු අය තෝරා ගැනීමට දැනට ක්‍රියාත්මක වන Integrated Welfare Management System එකේ තිබුණු තාක්ෂණික ගැටලුත්, තෝරා ගැනීමේදී මිනිසුන්ගේ මැදිහත් වීම නිසා ඇති වුණු ප්‍රායෝගික ගැටලුත් නිසා ප්‍රතිලාභ ලැබිය යුතු සැලකිය යුතු පිරිසක් මෙතැනට අන්තර්ගත වෙලා නැහැ කියන කාරණය අපි පිළිගන්නවා. ඒකට බලපෑවේ දත්ත එකතු කර ගන්නා අවස්ථාවේදී තොරතුරු සංගණන ක්ෂේත්‍ර නිලධාරීන් වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමයි. සමහර අවස්ථාවලදී එම නිලධාරීන් එම කටයුත්තට සහාය නොදැක්වීම නිසා ප්‍රාදේශීය ලේකම්වරුන්ට සිදු වෙලා තිබෙනවා, ඒ සඳහා බාහිර පුද්ගලයින් යොදා ගන්න. ඒ වාගේම පුද්ගලයින්ගේ තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කිරීමට වැඩිදියුණු කරන ලද වෙනත් දත්ත පද්ධතියක් නොතිබීමත්, තොරතුරුවල නිරවද්‍යතාව යම් ආකාරයකින් අඩු වීම නිසාත් මේ ගැටලු පැන නැඟිලා තිබෙනවා.

කෙසේ වෙතත්, එම හිමිකම ලැබීම අහිමි වුණා යැයි කියන අයට දුක්ගැනවිලි ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. එහි පළමු අදියරේදී තේරීමට ලක් නොවූ මිලියනයකට අධික පිරිසක් දුක්ගැනවිලි ඉදිරිපත් කරලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අභියාචනා කමිටු හරහා ඒ සියල්ලක්ම පරීක්ෂා කරලා අදාළ තීන්දු ලබා දීලා තිබෙනවා. ඊට අමතරව අයදුම් කිරීමට නොහැකි වූ කොටසක් ඉන්නවා නම්, කියන පදනම මත එවැනි අය සඳහා තවත් අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඒ ලබා දුන් අවස්ථාව අනුව අපේ රජය බලයට පත් වුණාට පසුව තවත් අයදුම්පත් ලක්ෂ 8ක් පමණ ඉදිරිපත් වෙලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඔක්කෝම අයදුම්පත් කීයක් විතර ඉදිරිපත් වෙලා තිබෙනවාද?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)

නව අභියාචනා මතද, නැත්නම් සම්පූර්ණ එකද? *[බාධා කිරීමක්]* ඇත්තටම මූලික ඇස්තමේන්තුවේ තිබුණේ පවුල් ලක්ෂ 24කට. පවුල් ලක්ෂ 37කින් applications ලැබිලා තිබුණා. සැකසීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගත්තා, පවුල් ලක්ෂ 33ක්. කෙසේ වෙතත්, අර නිර්ණායක ඇතුළේ තෝරාගෙන තිබෙන්නේ පවුල් ලක්ෂ 18යි. හරියටම ගත්තොත් ඒ ප්‍රමාණය මේ වර්ෂය අවසන් වනවිට පවුල් 1,800,032යි.

නව රජය යටතේ ඉදිරිපත් වෙලා තිබෙන අයදුම්පත් ලක්ෂ අට පිළිබඳව ඉදිරියේදී සමීක්ෂණය කරලා ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කටයුතු කරනවා. ඒ වාගේම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ග්‍රාමීය මට්ටමේ ක්‍රියා කරන ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සම්බන්ධ කරගෙන කමිටුවක් පත් කර සිදු කරන්නත් යෝජනා වෙලා තිබෙනවා.

04. 2025 වර්ෂය සඳහා අස්වැසුම වැඩසටහනට මූල්‍ය ප්‍රතිපාදන ඇත්තටම රජයෙන් තමයි ලැබෙන්නේ; බදු මුදල්වලින්. ඊට අමතරව ලෝක බැංකු ආධාර යටතේ රුපියල් බිලියන 72ක් ලැබෙනවා. *[බාධා කිරීමක්]* ආණ්ඩුවෙන් වියදම් කරන මුදල රුපියල් බිලියන 232.5යි. ඉන් රුපියල් බිලියන 72ක් ලෝක බැංකු ආධාර යටතේ අපට ලැබෙනවා. *[බාධා කිරීමක්]* ආධාර කියලා තිබෙන්නේ. මෙහි තිබෙන්නේ ආධාර කියලා. අපි check කරලා බලමු. සහන පොලී යටතේ ලැබෙන ඒවාත් ආධාර කියන category එක යටතේ එනවා. මේක ආපසු නොගෙවන ආධාරයක්ද කියලා මම පරීක්ෂා කරලා කියන්නම්.

05. දරිද්‍රතාව නැති කිරීමට ඇත්තටම තිරසාර වැඩ පිළිවෙළක් අපි හදන්නේ කොහොමද කියන කාරණයයි මේ ප්‍රශ්නයෙන් මතු කරන්නේ. ඒ සඳහා රටේ නිෂ්පාදනය, ආයෝජනය, ඉතිරි කිරීම්, පරිභෝජනය සහ අපනයනය සම්බන්ධ කරගෙන විධිමත් වැඩ පිළිවෙළක් තුළින් මහ ජනතාව සවිබලගැන්වීමේ ක්‍රියාමාර්ගයට අපි යොමු වෙමින් තිබෙනවා. ඒ අනුව අඩු ආදායම් ලබන අය සවිබලගැන්වීමේදී නිෂ්පාදන ක්‍රියාවලියට එකතු කර ගත්තොත් සහනාධාරයක් දෙනවාට වඩා ඔවුන්ට ආදායම් උපයාගෙන අභිමානයෙන් ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයකට පරිවර්තනය කරන්න පුළුවන්. ඒ අරමුණින් තමයි අපේ වැඩසටහන් ක්‍රියාත්මක වෙන්නේ. ඒ අනුව 2025 ඇතුළත මේ සඳහා මැදිහත්වීම නියෝජනය වෙන්නේ මෙන්න මේ ආකාරයට.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරමින් තිබෙනවා, පළමුකොටම පවුල් 25,000ක් 2025 සහ 2026 කාල සීමාව තුළ සවිබලගැන්වීමට. මේ සඳහා 2025 අය වැය ඇස්තමේන්තුව යටතේ රුපියල් මිලියන 4,118ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඊට අමතරව 2025 අපේ අය වැය කථාව තුළ වියදම් යෝජනාවක් විධියට තවත් රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා.

මෙම ප්‍රතිපාදනවලට අමතරව ජීවනෝපාය වර්ධනය කර ගැනීම සඳහා විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ද ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. එම ප්‍රතිපාදන ද අඩු ආදායමලාභීන් සවිබලගැන්වීම සඳහා යොදා ගැනීමට රජයට පුළුල් අපේක්ෂාවක් තිබෙනවා. ඊට අමතරව විමධ්‍යගත අය වැය වැඩසටහන යටතේ ග්‍රාමීය මට්ටමේ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම සඳහාත් රුපියල් මිලියන 2,250ක් වෙන් වෙනවා.

06. ජාත්‍යන්තර වෙළෙඳ පොළ සම්බන්ධයෙන් තමයි මෙහිදී අසා තිබෙන්නේ. එහිදී ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු වෙන්නේ අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා. අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රමුඛව අපනයන දිරිමත් කිරීම සහ ආරක්ෂණය සඳහා කටයුතු කරනු ලබන අතර, ඒ සඳහා වාණිජ දෙපාර්තමේන්තුව, වෙළෙඳ අමාත්‍යාංශය ඇතුළු සෘජුව හා වක්‍රව සම්බන්ධ වන තවත් ආයතන මැදිහත් වෙලා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙනවා.

එහිදී විශේෂයෙන්ම ලෝකය තුළ පැනනඟින විවිධ හිතකර හා අහිතකර සහ ගැටලුකාරී තත්ත්වයන් සියල්ල හමුවේ ආර්ථිකය මුහුණ දෙන උච්චාවචන පිළිබඳවද, ඒ අනුව ජාත්‍යන්තර වෙළෙඳ පොළ තුළ ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ගොඩනැඟෙන්නා වූ තත්ත්වය පිළිබඳවද ඉදිරියේදී ලෝක දේශපාලනික සහ ආර්ථික හැසිරීම් අනුව ඇති විය හැකි නව තරගකාරීත්වය මෙන්ම හිතකර පරිසරය පිළිබඳව ද මේ රජය නිරන්තරයෙන්ම අධ්‍යයනයකින් හා අවධානයකින් යුතුව කටයුතු කරනවා.

විශේෂයෙන්ම අපේ අපනයන දිරිමත් කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙළක් 2025 වසර සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව අය වැය යෝජනාවලදී සහ ඉන් ඔබ්බට ක්‍රියාත්මක කරන සමස්ත සැලසුම්කරණයේ සංක්ෂිප්තයක් මම සඳහන් කරන්නම්.

1. භාණ්ඩ හා සේවා අපනයනය දිරිමත් කිරීම හා පුළුල් කිරීම සඳහා 2025-2029 කාලය සඳහා වන ජාතික අපනයන සංවර්ධන සැලැස්ම මෙවර අය වැය යෝජනා මඟින් ඉදිරිපත් කර තිබෙනවා. මේ යටතේ අපනයන දිරිමත් කිරීම, අපනයන විවිධාංගීකරණය කිරීම, අපනයන වෙළෙඳ පොළ පුළුල් කිරීම ආදී විශාල පරාසයක පැතිරුණු වැඩසටහනක් යෝජනා කර ඇත. එම වැඩසටහන මඟින් ගෝලීය අගයදාමයන් සමඟ සම්බන්ධවීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්හටද -MSMEs- පහසුකම් සලසනු ඇත.
2. 2025 වසර තුළ භාණ්ඩ හා සේවා අපනයනය ලොකු ඉලක්කයක්. 2025 වසර තුළ භාණ්ඩ හා සේවා අපනයන බිලියන 19ක ඉලක්කයක් සපුරා ගැනීමට අවශ්‍ය කරන යටිතල පහසුකම් ඇතුළු අනෙක් සියලු පහසුකම් සැපයීමටත් අවධානය යොමු කරනවා.
3. විශේෂයෙන්ම විදේශ වෙළෙඳ පොළ ශක්තිමත් කර ගැනීමේදීත්, නව වෙළෙඳ පොළවල් සොයා ගැනීමේදීත් විදේශීය දූත මණ්ඩල, කාර්ය මණ්ඩල මේ සඳහා සම්බන්ධ කර ගන්නේ මොන ආකාරයෙන්ද කියන කාරණා සම්බන්ධවත් අවධානය යොමු කර තිබෙනවා.

   අපනයන වෙළෙඳ පොළ පුළුල් කිරීම හා විවිධාංගීකරණය කිරීමේ තවත් පියවරක් වශයෙන් විදේශීය දූත මණ්ඩල නිලධාරීන් ද සම්බන්ධ වන පරිදි ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය පිළිබඳව අවධානය යොමු කෙරෙන අතර ආයෝජන වර්ධනයන්ට ගැළපෙන පරිදි ආර්ථික පර්වර්තන පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත.
4. ඒ වාගේම කලාපීය හා ගෝලීය හවුල්කාරීත්වය දියුණු කිරීම තුළින් අපනයන වෙළෙඳ පොළ පුළුල් කිරීමටත් පියවර ගන්නවා. විශේෂයෙන්ම නව ගිවිසුම්වලට එළඹීම,- විශේෂයෙන්ම අපි partnering, collaboration and cooperation කියන ප්‍රවේශය ගන්න උත්සාහ කරනවා.
5. ඒ වාගේම අපනයනකරුවන්ට එම අපනයන කටයුතු පහසු කර ගැනීම සඳහා ජාතික තනි වෙළෙඳ කවුළුව ක්‍රියාත්මක කිරීම, ආර්ථික ඩිජිටල්කරණය, අපනයන ලියාපදිංචිය ස්වයංක්‍රියකරණය සහ ඩිජිටල්කරණය ආදී ක්‍රියාමාර්ග තුළින් අවශ්‍ය පහසුකම් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා.
6. ඒ වාගේම ආයෝජන ප්‍රවර්ධනයත් විශේෂ තැනක් ගන්නවා, මේ අපනයනය සඳහා. එහිදී අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම හා ආයෝජන ප්‍රවර්ධනයට වඩාත් හිතකර පරිසරයක් ගොඩනැඟීමේ අරමුණෙන් වරායන්, විශේෂයෙන්ම කොළඹ වරාය දියුණු කිරීම ඉලක්ක කර ගන්නවා. රාජ්‍ය ආයතන සහ වෙනත් ව්‍යවසායන් දියුණු කිරීම, බලශක්ති සැපයුම වර්ධනය කිරීම වැනි කාරණාත් ඇතුළත්ව විශේෂයෙන්ම අය වැය යෝජනා අංක 26හි සඳහන් ආකාරයට අපි විශේෂ වැඩසටහනක් සම්බන්ධ කරනවා, industrial zones ඇති කරන්න. ඒ සමඟර කලාපවල හිමිකාරත්වය පෞද්ගලික අංශයට දෙන්න යෝජනා කරනවා, කලාපය කළමනාකරණය කරලා අපනයනය ප්‍රවර්ධනය කිරීමට. ඒ අනුව 2025 වර්ෂයේදී සියයට 5ක ආර්ථික වර්ධනයක් පවත්වා ගෙන යාමට අපේක්ෂා කරන ගමන් දේශීය නිෂ්පාදකයන් අපනයනකරුවන් බවට පරිවර්තනය කර අපනයන වෙළෙඳ පොළ පුළුල් කිරීමටත්, ඒ මඟින් අනාගතයේදී ඇති විය හැකි තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දීමටත් කටයුතු කරනවා. විශේෂයෙන්ම ක්‍රමයෙන් පුළුල් වෙන ගෝලීය සැපයුම් දාමය තුළ අපේ අපනයනකරුවන්ට අපනයන භාණ්ඩ ලබා ගැනීමේ අවස්ථාව පුළුල් කිරීමටත් බලාපොරොත්තු වෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(*மாண்புமிகு சஜித் பிரேமதாஸ*)
(The Hon. Sajith Premadasa)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ලබා දුන්නු පිළිතුරට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම මේ විවාදයකට යන්න හදනවා නොවෙයි. හැබැයි, මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. අපේ රටේ දරිද්‍රතාව හරියාකාරව ගණනය කර නොවෙයි - දුප්පතුන් කොපමණ ප්‍රමාණයක් ඉන්නවාද කියලා ඒ නිර්ණායක කිසිවක් නැතුව තමයි- මේ අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක කර තිබෙන්නේ. මේක ඔබතුමාගේත් වගකීමක්. මෙහි ප්‍රධාන වගකීම පසුගිය රජය සතුයි. විශේෂයෙන්ම දුප්පත්කම කියන්නේ මොකක්ද? මොකක්ද එහි නිර්වචනය? මොකක්ද poverty line එක? දැන් ඔබතුමාම කියනවා, මේක පදනම් වෙන්නේ 2019 සහ 2023 සංඛ්‍යාලේඛනවලට අනුව කියලා. ගෘහයක ආදායම්, වියදම් පිළිබඳව සමීක්ෂණයක් කරන්නේ නැතුව දරිද්‍රතා රේඛාව - poverty line එක - උපකල්පනය කරලා තමයි මේ අය දුප්පත්, මේ අය දුප්පත් නොවන කියලා කාණ්ඩවලට වෙන් කරලා තිබෙන්නේ. ඒ අනුව සමඟර නුසුදුස්සන්ට අස්වැසුම ප්‍රතිලාභය ලැබී තිබෙනවා; සමඟර සුදුස්සන් කප්පාදු වෙලා තිබෙනවා. මම ඔබතුමන්ලාට මේ කාරණය යෝජනා කරනවා. මේ කාරණය ජනාධිපතිතුමා හමුවුණු වෙලාවේදීත් මම කිව්වා. LIRNEasia survey එක පැහැදිලිවම කියනවා, බංකොලොත්භාවයට පත් වුණු මේ රටේ ලක්ෂ 70ක් - රටේ ජනතාවගෙන් තුනෙන් එකක් - දුප්පත් කියලා.

ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාව දිහා බැලුවොත් පෙනෙනවා, එතුමාත් දරිද්‍රතාව කියලා පෙන්නුම් කරන්නේ ලෝක බැංකුව ලබා දෙන සංඛ්‍යාලේඛන -figures- මත පදනම් වෙලාය කියන එක. අපේ රටේ ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන නැද්ද? සංඛ්‍යාලේඛන නැත්නම් අස්වැසුම ප්‍රතිලාභීන් තෝරා ගන්නේ කොහොමද? ඒ නිසා මේ පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවනවා. ඒක වහාම නිවැරැදි කර ගත යුතු දෙයක්.

ඊළඟ කාරණය මෙයයි. ඔබතුමා පැහැදිලිවම පිළිගත්තා, අස්වැසුම කියන්නේ අංගසම්පූර්ණ ලෙස දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් නොවෙයි කියන එක. ඒකට මම ස්තුතිවන්ත වෙනවා. එතකොට ඒක දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නොවන්නේ නම්, ඒකට පරිභෝජනය, ආයෝජනය, ඉතිරි කිරීම, නිෂ්පාදනය, අපනයන සහ අනෙකුත් කොටස් එකතු කරලා, ඒක සැබැවින්ම දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළක් හැටියට ක්‍රියාත්මක කිරීම ඔබතුමන්ලාගේ වගකීමක් නේද? මම විශේෂයෙන්ම මේ කරුණු කාරණා ඉදිරිපත් කරන්නේ මේක බරපතළ ප්‍රශ්නයක් නිසායි. අපි මහ පොළොවේ යථාර්ථයක්, සත්‍යයක් නොදැන තමයි දුප්පත්කම ගැන මේ අය වැය කථාවේදී කථා වෙලා තිබෙන්නේත්, මේ මුදල් වෙන් කරලා තිබෙන්නේත්. එම නිසා ඒ පිළිබඳව වඩාත් කාර්යක්ෂම, වඩාත් දත්ත කේන්ද්‍රීය, වඩාත් විද්‍යාත්මක වැඩ පිළිවෙළකට ප්‍රවේශ වෙන්න කියලා මා ඔබතුමාට යෝජනා කරනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ මම වැදගත් කාරණයක් මතු කරන්නේ. අලුත්කඩේ උසාවියේ Court No. 5 එකට යම් පුද්ගලයෙකු lawyer කෙනෙක් විධියට ඇවිල්ලා, පුද්ගලයෙකුට වෙඩි තියලා ගිහින් තිබෙනවා. මේක විශාල අර්බුදයක්. ඊයේ රාත්‍රියේ ළමයින් දෙදෙනෙකු එක්ක ගිය පුද්ගලයෙකුට මිද්දෙනියේදී වෙඩි තියලා ගිහිල්ලා තිබෙනවා. අලුත්කඩේ උසාවියේ වෙඩි තැබීම මේ දැන් සිද්ධ වෙලා තිබෙන්නේ. මේ රටේ ආරක්ෂාව පිළිබඳව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. කෝටි එකක් ඇදගෙන lawyer කෙනෙක් විධියට ඇවිල්ලා weapon එකෙන් වෙඩි තියලා ගිහිල්ලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේක විශාල ප්‍රශ්නයක්. මේක විහිළු කථාවක් නොවෙයි. "ගනේමුල්ලේ සංජීව" කියන පුද්ගලයාට තමයි මේ වෙඩි තබා තිබෙන්නේ. ඔහු පාතාලයට සම්බන්ධ පුද්ගලයෙක්. ඒක වෙනම කාරණයක්. ඔහුගෙන් වෙන විධියකට තමයි සාක්ෂි විමසමින් හිටියේ. හැබැයි, අද ඔහුව Court No. 5 එකට ගෙනැල්ලා විනිශ්චයකාරතුමා සාක්ෂි විමසුවා. එතකොට වෙඩි තියලා මරලා දැම්මා. ඔහුට වෙඩි තබන්න ආවේ lawyer කෙනෙක් විධියට. දැන් නීතිඥවරුන් - lawyersලාත් - කිසිම ආරක්ෂාවක් නැති තැනට පත් වෙලා තිබෙනවා. පොලිස්පතිතුමා ගැන ජනාධිපතිතුමාත් ඉතා හොඳින් කථා කළා. නමුත්, මේ කාලය තුළ මරණ 78කට වැඩිය සිද්ධ වුණා, ගරු කථානායකතුමනි. මේ ගැන අපි seriously කල්පනා කළේ නැත්නම් ඊළඟට මේක කොතැනින් නතර වෙයිද කියලා මට තේරෙන්නේ නැහැ. අද මිනිහෙක් මරලා දමන එක ඉතා සුළු දෙයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැන අපි පාර්ලිමේන්තුව විධියට seriously කල්පනා කරන්න ඕනෑ කියන එක මම ඔබතුමාට ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පාතාලයේ මේ කටයුතු පිළිබඳව ආණ්ඩුව seriously කල්පනා කරනවා. ඒ සම්බන්ධව ගනිමින් සිටින ක්‍රියාමාර්ග ගණනාවකුත් තිබෙනවා. හැබැයි, මේ විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් දන්නවා පාතාලය, කළු සල්ලි, කුඩු ජාවාරම ඇතුළු තවත් ක්ෂේත්‍ර ගණනාවක් එක්ක සම්බන්ධයි කියන එක. මේක මෙහෙයවන සමහර අය ලංකාවේත් නොවෙයි ඉන්නේ. ඒ වාගේම, මේවා පිළිබඳ සොයාගෙන යනකොට සමහර තැන්වලදී යම් යම් ආරක්ෂක අංශ සාමාජිකයන් මේවාට සම්බන්ධ වෙලා තිබෙනවා කියලාත් ඔබතුමන්ලා දන්නවා ඇති. අපි යම් ක්‍රියාමාර්ග ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම විශේෂ කාර්ය බලකාය, පොලීසිය සහ බුද්ධි අංශය මේ කටයුත්තට යොදවලා තිබෙනවා. ඒ නිසා අපි මේක ඉතාම ගැඹුරින් සහ seriously ගන්නවාය කියන එක මම අවධාරණය කරන්න කැමැතියි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විශේෂයෙන්ම අද රටේ උද්ගත වෙලා තිබෙන තත්ත්වය බලද්දී නීතිය හා සාමය ක්ෂේත්‍රයේත් බරපතළ ගැටලුවක් මතු වෙලා තිබෙනවා. දිනපතාම මිනීමැරුම් සිද්ධ වෙනවා; ජීවිත සාතන සිදු වෙනවා. කුඩා දරුවන් පවා මිය යනවා. අපි ඉල්ලීමක් කරනවා රජයෙන්, මේ පිළිබඳව මීට වඩා ශක්තිමත් විසඳුමක් අවශ්‍යයි. අපිත් සූදානම් රජයට සහයෝගය ලබා දීලා මේ රටේ නීතිය, සාමය ස්ථාපනය කරන්නට. මේ රටේ යුක්තිගරුකභාවය, විනයගරුකභාවය වාගේම, මනුස්සයෙකුට පාරේ බැහැලා යන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. ඇත්තවශයෙන්ම ගරු කථානායකතුමනි, අද මේ සිදු වුණු දේ ගත්තාම දැන් අධිකරණයටවත් යන්න බැරි නම්, මොකක්ද රටේ තත්ත්වය? පුද්ගලයෙකුට අධිකරණයටවත් යන්නට බැරි නම්, පුද්ගලයෙක් අධිකරණයට යන්නේත් මරණ බියෙන් නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ තත්ත්වය සමාජයේ අනෙක් තැන්වලත් ක්‍රියාත්මක වෙනකොට බරපතළ ප්‍රශ්නයක් මතු වෙනවා.

ඒ නිසා මම ඉල්ලීමක් කරනවා රජය නියෝජනය කරන ප්‍රධාන සංවිධායකතුමාගෙන්. මේවා පිළිබඳව -විශේෂයෙන්ම නීතිය හා සාමය පිළිබඳව- ගන්නට තිබෙන ශක්තිමත්ම තීන්දු තීරණ ටික ගන්න කියලා. නීතිය හා සාමය ස්ථාපනය කරන්නට ඕනෑ. මේ සමාජය තුළ මේ ආකාරයට මිනීමැරුම්, හිංසන, දූෂණ සිදු වෙන්න බැහැ. ඒ පිළිබඳව රජය ශක්තිමත් තීන්දුවක් ගන්න. අපිත් සූදානම් නීතිය හා සාමය ශක්තිමත් කිරීම උදෙසා අපට ලබාදිය හැකි සහයෝගය ලබා දෙන්න. හැබැයි, දැන් ඒ සඳහා බලය තිබෙන්නේ ඔබතුමන්ලාගේ අතේ. රාජ්‍ය බලය තිබෙන්නේ ඔබතුමන්ලාගේ අතේ. මීට පෙරත් මම දින වකවානු පෙන්වලාම කිව්වා, මේ දින වකවානු තුළ මරණ විශාල ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා කියලා. මේවාට පියවරක් ගන්නේ නැහැයි කියන එක තමයි අපට එළියට පෙනෙන්නේ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ තත්ත්වය පිළිබඳව රජය පැහැදිලිවම ගන්නා තීන්දු තීරණ මොනවාද කියලා ඔබතුමා විශේෂ ප්‍රකාශයක් කළොත් වැදගත් වෙයි කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔව්, මේක අපි ඒ විධියට අරගෙන තිබෙනවා කියලා කියන්න කැමැතියි. විපක්ෂ නායකතුමාගේ පැහැදිලි කිරීමටත් බොහොම ස්තුතියි. ඒ නිසායි පසුගිය කාලයේදී රජය මඟින් ලබාදීලා තිබෙන අවි ආයුධත් භාර දෙන්න කියලා ආරක්ෂක අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කළේ. ඒ අනුව යම් ප්‍රමාණයක් භාර දීලා තිබෙනවා. ඒ වාගේම මේකේ පරීක්ෂණ කටයුතු දියත් වෙමින් පවතිනවා. ඔබතුමා දකින්න ඇති, ඉන්දියාව සහ ඩුබායි රාජ්‍යයේ සිටි සමහර අපරාධකරුවන් ඉක්මනටම මේ රටට ගෙනැල්ලා නීතිය ක්‍රියාත්මක කරන්න අපි මැදිහත් වෙලා තිබෙන බව. මේ ආදී පියවර ගණනාවක් යනවා. සියලු පියවර පාර්ලිමේන්තුවට හෙළිදරව් කරන්න බැරි වෙයි. නමුත් මම යළිත් අවධාරණය කරනවා, රජය මේ පිළිබඳව ඉතාම දැඩිව මැදිහත් වෙන බව. මේ පාතාල කටයුතුවලට අපි කිසිසේත්ම බුරුලක් ලබා දෙන්නේ නැහැ, නීතිය තදින් ක්‍රියාත්මක කරනවා කියන එක මම අවධාරණය කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1. විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීම. දෙවැනි වෙන් කළ දිනය.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.

ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]

"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ඉදිරිවෙක්කப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக".- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [17th February]

"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]

Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Kabir Hashim. You have 45 minutes.

[පූ.භා. 10.52]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, ප්‍රථමයෙන්ම, මේ අවස්ථාව ලබා දීම ගැන අපේ පක්ෂ නායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා සහ ජනතා විමුක්ති පෙරමුණ සිය පළමු අය වැය ඉදිරිපත් කරනකොට මට හරියට දැනුණේ රනිල් වික්‍රමසිංහ මහතාගේ තුන්වැනි අය වැය ඉදිරිපත් කිරීමක් හැටියටයි. මොකද, රජය ව්‍යුහාත්මක ප්‍රතිව්‍යුහගත කිරීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, ජාත්‍යන්තර සහසම්බන්ධතා - international partnerships - ඇති කර ගැනීම, විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක බැඳී සිටීම මේ අය වැයෙන් තහවුරු වෙනවා. ප්‍රධාන යෝජනා අතරින් බදු වැඩි කිරීම, වියදම් මත මිල කරන විදුලිය, ඉන්ධන සඳහා ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම, පෞද්ගලීකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන එක, public-private partnerships, ඉඩම් පෞද්ගලික අංශයට ලබාදීම ආදී වශයෙන් වූ කාරණා මේ අය වැයෙන් සනාථ වෙනවා. මේ අය වැයට සමාජවාදී අනුවර්ණයක් දෙන්න උත්සාහ කළත් මෙය neoliberal පිවිසුමක් ඇති විවෘත ආර්ථික මොඩලයට යන අය වැයක් කියන එක මේකෙන් පැහැදිලියි. ඇත්ත වශයෙන්ම මම උපකල්පනය කළා, සමගි ජන බලවේගය ආණ්ඩුවක් අද තිබුණා නම්, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා අපේ මුදල් ඇමති හැටියට මෙය ඉදිරිපත් කරලා තිබුණා නම්, මට එකඟ වෙන්න බැරි, IMF එකත් එක්ක එකඟ වෙන්න බැරි කරුණු කාරණා ගොඩක් මේ අය වැයේ තිබෙනවා කියලා.

එතුමා මේක ඉදිරිපත් කරලා තිබුණත්, මට නැඟිටලා සමහර ඒවාට විරුද්ධ වෙන්න සිද්ධ වෙනවා කියලා මට හිතෙනවා. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 156දෙනෙකුගෙන් "මීක්" සද්දයක් නැහැ. ඔක්කෝම හරි. පෞද්ගලීකරණය ඇතුළු ඔක්කෝම හොඳයි. මාර වෙනසක්! *[බාධා කිරීමක්]* නැහැ. මම කියන්නේ ජේවීපී එක ගැන.

අය වැයකින් රජයේ ආර්ථික උපාය මාර්ගය ස්ථාපනය කරනවා, ආර්ථික මාර්ග සිතියම - road map එක - ස්ථාපනය කරනවා. ඒක තමයි පෙරේදා වුණේ. Road map එක මේක තමයි කියලා රටටම පෙන්වලා තිබෙනවා. මේ වෙලාවේදී අපි, අපේ කණ්ඩායම අනුර කුමාර දිසානායක මැතිතුමාටයි, ජනතා විමුක්ති පෙරමුණටයි අපේ ප්‍රණාමය පුද කරන්න ඕනෑ. මොකද, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා 2025 පෙබරවාරි 17වැනි දා ඉදිරිපත් කරපු අය වැයෙන් වසර 74ක සාපය කියන එක මිථ්‍යාවක් බවට පත් කරලා, ඒක නිවැරදි කරලා තිබෙනවා.

ආර්ථිකයට අහිතකරයි කියපු, ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙනවාය කියපු, අපේ ස්වෛරීත්වයට බලපෑමක් වෙනවාය කියපු, ඔබතුමන්ලාගේ දේශපාලන වේදිකාවේ දිගටම හංවඩු ගහපු ඇතැම් ප්‍රතිපත්ති පෙරේදා මේ අය වැයෙන් ඔබ ඉදිරිපත් කරලා ඒවා අනුමත කළා; මගේ භාෂාවෙන් කියනවා නම් හලාල් කළා. මෙතෙක්, "රටට තර්ජනයක් වෙනවා, මේක වැරදියි" කියලා ඔබතුමන්ලා කියපු ප්‍රතිපත්ති ඔක්කෝම මෙතැනට ඇවිල්ලා අනුමත කළා. ජනාධිපතිතුමා කිව්වා නේ, අපි ඔක්කෝම එකතු වෙලා "ශ්‍රී ලාංකික දිනය" සමරන්න ඕනෑ කියලා. ඒක ඔක්තෝබර් මාසයේ නේ, තිබෙනවා කියලා කිව්වේ. නමුත් ඒක සමරන්න ඕනෑ, පෙබරවාරි මාසයේ. "ශ්‍රී ලාංකික දිනය" කියලා ජාතියේ උත්තමාචාරය දෙන්න ඕනෑ, පෙබරවාරි 17වැනි දා. මොකද, ඔබතුමන්ලා පිළිගන්නවා, මෙතෙක් වෙච්ච දේවල් ඔක්කෝම හරි කියලා. මෙතෙක් කාලයක් ඔබතුමන්ලාගේ ජනතා විමුක්ති පෙරමුණේ වේදිකාවේ කළේ මොකක්ද? අපේ මව් පක්ෂයේ හිටපු නායකයින්ට; මේ වන විට මිය ගොස් තිබෙන ඩී.එස්. සේනානායක මැතිතුමා, ඩඩ්ලි සේනානායක මැතිතුමා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා වැනි ඒ අපේ කඳවුරේ හිටපු නායකයින් කොටසකට මොකක්ද කළේ? ඒ අයට ඉන්නකම් වද දුන්නා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, පසුගිය කාලයේ සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමා?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

රනිල් වික්‍රමසිංහ මහත්තයා තවම පණපිටින් ඉන්නවා නේ. මම කිව්වේ ජීවතුන් අතර නැති අය ගැන. එතුමාටත් එහෙම තමයි කරන්නේ. අර මම කියපු අපේ නායකයින්ට ඉන්නකම් ඔබතුමන්ලා වද දුන්නා. පහර ගැහුවා නැති වෙන්න. අපහාස කළා, උපහාස කළා, චරිත ඝාතනය කළා. ඒ විතරක් නොවෙයි, එතුමන්ලා මිය ගියාට පස්සේ එතුමන්ලාගේ ආත්මයටත් වෛර කළා. ඒක තමයි ජේවීපී එක වේදිකාවල කළේ. එතුමන්ලාගේ ආත්මයටත් වෛර කළා. හැබැයි මේ පසුගිය පෙබරවාරි 17වැනි දා ඔබතුමන්ලා ඒක එතැනින් ගැලෙව්වා. ඒ චෝදනා ඔක්කෝම සුද්ධ කළා. ඒ කළේ වරදක් කියලා පිළිගත්තා.

හැබැයි තව දෙයක් වුණා, පසුගිය පෙබරවාරි 17වැනි දා. 1971දී ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් පන්ති පහ කරපු, 1971 කැරැල්ලේදී තමන්ගේ ජීවිතය පරිත්‍යාග කරපු, මාක්ස්වාදය වෙනුවෙන් ජීවිතය පුද කරපු විශාල තරුණ පිරිසකගේ; දහස් ගණනකගේ; 1989 කැරැල්ලේදී ජීවිතය පුද කළ විශාල තරුණ පිරිසකගේ; "මාක්ස්වාදය රකින්න අපේ සමාජවාදී ප්‍රතිපත්තිය රකින්න" කියලා ජීවිතය පුද දුන්න අයගේ ආත්මයටත් ඔබතුමන්ලා අපහාස කළා. පසුගිය පෙබරවාරි 17වැනි දා ඉදිරිපත් කරපු අය වැයත් එක්ක බැලුවාම අපරාදේ ඔවුන් ජීවිත බිලිදුන්නේ. ඒ අය වෙනුවෙන්, ඔවුන්ගේ පවුල් වෙනුවෙන් අපි අපේ කනගාටුව අද ප්‍රකාශ කරනවා. මොකද, ඔබතුමන්ලා ඒ අයව පාවා දුන්නා. ඊයේ එක්කෙනෙක්වත් නැඟිටලා ඒ අය ගැන කථා කළේ නැහැ. අවුරුදු ගණනාවක් ඔවුන් මාක්ස්වාදය වෙනුවෙන් ජීවිතය පුද කළා. හැබැයි ඊයේ ඇවිල්ලා කිව්වේ වෙන කථාවක්. ඒ ගැන කනගාටුයි.

මෑත ඉතිහාසය අරගෙන බලන්න. ඊයේ පෙරේදා පැවති 2024 මහ මැතිවරණයේදී ලක්ෂ 69ක්ද කොහේද ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ඒ පාවාදීම ගැන අපි කථා කරමු. 2024 මහ මැතිවරණයේදී ජේපීවියට ජනතා ආකර්ෂණය ලබාගත්තේ කොහොමද? ජේවීපී ආණ්ඩුව හදන්න ඒ ආකර්ෂණය ලබාගත්තේ කොහොමද? ගොවීන්, කම්කරුවන්, තරුණයන්, මධ්‍යම පාන්තිකයන්, වෘත්තිකයන් ඒ හැමෝම එකතු වෙලා ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. ඒ ආකර්ෂණය ලබාගත්තේ කොහොමද? අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මොකක්ද පෙන්වුවේ? ජනතා පීඩනය ඇති වෙලා තිබෙන්නේ මොන හේතු නිසා කියලාද එතුමා ඒ වේදිකාවල කිව්වේ? "අසාර්ථක ආර්ථික මොඩලයක්" කියමින් කථා කළා. එතුමාගේ අය වැය කථාවේ පළමුවැනි පිටුවේ මොකක්ද කියන්නේ? අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තිය ගැන කථා කරනවා. හැබැයි, ඒ අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තියම තමයි එතුමා ඒ පොතේ ඊට පස්සේ කියාගෙන යන්නේ.

හැබැයි, එදා වේදිකාවේ පෙන්නුවේ එය අසාර්ථක ආර්ථික මොඩලයක් ලෙසයි. ඊට පස්සේ එතුමා මොකක්ද පෙන්නුවේ? රනිල් වික්‍රමසිංහයි, IMF එකයි අත්සන් කරපු ඒ ගිවිසුම. ඒකෙන් තමයි පීඩනය ඇති වෙන්නේ කිව්වා. රනිල් වික්‍රමසිංහ සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම කළ අය එක්ක අත්සන් කරපු ගිවිසුම නිසා තමයි ඔබ දුප්පත්; ඔබ මේ තරම් පීඩනයට පත් වෙලා ඉන්නේ කියලා ජනතාවට කිව්වා. ඊට පස්සේ දූෂණය ගැන කිව්වා. ඊට පස්සේ දේශපාලනඥයන් සහ ව්‍යාපාරිකයන් අතර තිබෙන මාෆියාව නිසා තමයි ඔබ දුප්පත් කියලා ජනතාවට කිව්වා. ඒ ප්‍රකාශ ආකර්ෂණීය විධියට ජනතාවට විකුණුවා.

වාමාංශික ආර්ථික විශේෂඥයන් දිගටම කිව්වා, IMF එකත් එක්ක නැවත සමාලෝචනයකට යන්නේ නැතිව, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සමාලෝචනයට ලක් කරන්නේ නැතිව system change එකක් කරන්න බැහැ කියලා. හැබැයි, ඒ කියපු දේ මේ අය වැයේ කිසිම තැනක කියලා නැහැ නේ. දැන් IMF එකත් එක්ක යනවා; ණය ප්‍රතිව්‍යුහගතකරණයත් ඒ විධියටම යනවා. එදා ඒ කියපු මොනම වෙනසක්වත් කෙරුවේ නැහැ. ඒක තමයි ඊළඟ පාවා දීම.

ජනතා විමුක්ති පෙරමුණේ වේදිකාව හරියට සිනමා තිරයක් වාගේ නේ තිබුණේ. අවුරුදු 74ක ශාපය සහ වෛරය විකුණලා, මිනිස්සු කුපිත කරලා, ජනතාවගේ සිත් තුළ වෛරය ඇති කරලා, ජනතාව දිගින් දිගටම කුපිත කරපු එක තමයි කළේ.

ගරු කථානායකතුමනි, මම නිතරම යූටියුබ් එක බලනවා. යූටියුබ් එක බලන කොට දැක්කා මම ආස සින්දුවක් තිබෙනවා. පෙරේදා මේ අය වැය කථාව කළාට පස්සේ මම ගෙදර ගිහිල්ලා ඒ සින්දුව ආපහු ඇහුවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ සින්දුව ලස්සනට කියන්නකෝ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

මට සින්දු කියන්න අමාරුයි. අත්තිඩියේ පුඤ්ඤරතන ස්වාමීන් වහන්සේ තමයි එය පද රචනය කර තිබෙන්නේ. ඒ ගීතය කියන්නේ සංජීව් ලෝන්ලියෙස්. "පිටකවරය" තමයි ඒ ගීතයේ නම. ඔබතුමන්ලාත් එය අහලා ඇති. ඇත්තටම ඒ "පිටකවරය" ගීතය ගැළපෙනවා, ඔබතුමන්ලාගේ අය වැයට. මොකද, මිනිස්සුත් රූපය බලලා, පිටින් බලලා තමයි වෛරය ඇති කර ගත්තේ, අවුරුදු 74ක ශාපය ගැන කථා කරන කොට. ඔවුන් ඒක හරියට තේරුම් ගත්තේ නැහැ. ඔවුන් ඒ දිහා හරියට බැලුවේ නැහැ. අවුරුදු 74ක ශාපය කියලා JVP එක කියන කොට, අපේ නායකයන් දිහා, ඒ නායකයන්ගේ මුහුණ, රූපය දිහා ඔවුන් බැලුවේ කොහොමද? ජනතාවට පිටකවරය පෙන්නුවා, මෙන්න මුන් තමයි මේ රට කෑවේ කියලා. ඒ අය වෛරයක් ඇති කර ගත්තා. අර කියපු ගීතයේ එක පද පේළියක කියනවා, "ඒ ටැටුව දැකලා චරිතේ ලියන ගොඩක් උන්ට කෝමා" කියලා. අන්න ඒ කෝමාව තමයි ඔබතුමන්ලාට හැදිලා තිබෙන්නේ. ඒ ටැටුව දැකලා චරිතේ ලියන ගොඩක් උන්ට කෝමා. ඔබතුමන්ලාටත් ඒ කෝමාව හැදිලා තිබුණා. හැබැයි, පෙරේදා අය වැය ඉදිරිපත් කළාට පස්සේ ඒ කෝමාව දැන් trauma වෙලා ඇති. දැන් කෝමාත් නැහැ. අන්න ඒක තමයි වුණේ. හැබැයි, ඇත්තටම ඇතුළු පැත්ත බලන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, ඇතුළත තිබෙන ඇත්ත මොකක්ද කියන එක ගැන කල්පනා කළේ නැහැ, ඡන්ද දායකයා.

1948දී මේ රට නිදහස ලබා ගන්න කොට බහුතරයක් අන්ත පරිහානියෙන් ජීවත් වෙච්ච, වහල්භාවයෙන් ජීවත් වෙච්ච ජන සමාජයක් තමයි තිබුණේ. එවකට හිටපු ආණ්ඩුකාර සෝල්බරි සාමිවරයාගේ වාර්තාවේ ඒ බව සටහන් වෙනවා. 1948දී අපේ රටේ සාක්ෂරතාව ගත්තාම ලියන්න පුළුවන්, කියවන්න පුළුවන් මිනිසුන් ඉඳලා තිබෙන්නේ සියයට 35යි. ඒ කියන්නේ, එදා මේ රටේ සියයට 65කට කියවන්නත් බැහැ; ලියන්නත් බැහැ. හැබැයි, ඊට පස්සේ අපේ රටේ ජනතාවට නිදහස් අධ්‍යාපනය උරුම කළා. ඊට පස්සේ මේ රටේ සියයට 94කට ලියන්නත් පුළුවන් වුණා; කියවන්නත් පුළුවන් වුණා. ඒක අවුරුදු 74 ශාපය ද? 1948දී මේ රටේ මිනිසුන්ගේ ආයු අපේක්ෂාව අවුරුදු 45යි. එදා අවුරුදු 45න් බහුතරයක් මිනිස්සු මැරුණා. හැබැයි, නිදහස් සෞඛ්‍ය මේ රටට උරුම කළා. ඊට පස්සේ 1994 වන කොට ආයු අපේක්ෂාව අවුරුදු 75 වන කල් වැඩි වුණා. එදා මේ රටේ සහල් නිෂ්පාදනය ගත්ත. 1948, 1950, 1960 වන කොට අපි පිට රටින් සියයට 65ක් සහල් ආනයනය කළා. හැබැයි, ඊට පස්සේ මොකක්ද වෙන්නේ? ගොවි ජනපද හදලා මේ රට ස්වයංපෝෂිත කළා. ගල්ඔය, මිනිපේ, මින්නේරිය, තඹබෝව, යෝධවැව, මහවැලිය වාගේ විශාල ව්‍යාපෘති කරලා 1980 වන කොට මේ රට ස්වයංපෝෂිත කළා; මේ රට සහල්වලින් ස්වයංපෝෂිත කළා. ඒක අවුරුදු 74 ශාපය ද? ඒ විතරක් නොවෙයි. 1960 ගණන්වල මේ රටේ අපනයනවලින් සියයට 95ක්ම තේ, රබර්, පොල්. හැබැයි, 1980 විවෘත ආර්ථික වැඩසටහනින් පසුව අපේ කාර්මික සහ නිෂ්පාදිත භාණ්ඩ අපනයනය සියයට 75 දක්වා වැඩි වෙනවා. තේ, රබර්, පොල් අපනයනය අඩු වෙනවා. අපි ඒ පැවැති තත්ත්වය වෙනස් කළා. ඒ වාගේම තමයි, නිදහස් වෙළෙඳ කලාප ආරම්භ කිරීම නිසා, ඇඟලුම් කර්මාන්ත ආරම්භ කිරීම නිසා ඇති වුණු දියුණුව ගත්තත්. ඒවා නිකම් වුණේ නැහැ. නමුත්, ඔබතුමන්ලා අවුරුදු 74ක ශාපයක් ගැන කථා කළා.

හැබැයි, 1980 වර්ෂයේ චීනයේ එවකට හිටපු අගමැති ඩෙන් ෂියාඕ පිං චීනයෙන් කණ්ඩායමක් මේ රටට එවනවා, ලංකාවට ගිහිල්ලා ලංකාවේ නිදහස් වෙළෙඳ කලාප මොඩලය බලාගෙන කොපි කරගෙන එන්න කියලා; චීනයේත් එය ක්‍රියාත්මක කරන්න කියලා. ඒ කණ්ඩායම 1982 වර්ෂයේ ද කොහේද මෙහේට ඇවිල්ලා බලලා මෙහේ එක කොපි කරගෙන ගිහිල්ලා චීනයේ හදපු නිසා තමයි, චීනය අද ලෝකයේ බලවත්ම නිෂ්පාදිත රට බවට පරිවර්තනය වුණේ. හැබැයි, අපි එක තැනක කැරකෙනවා. *[බාධා කිරීමක්]* අපි එතැනින් ඉස්සරහට යන්නේ නැහැ. ඇයි ඒ? මොකද, අපට ඒක කරන්න දුන්නේ නැහැ. මොකක්ද වුණේ කියලා මම කියන්නම්. ජනතාව පිට කවරය පමණක් බලලා තීන්දුවක් දුන්නා. අර ගීතයේ කිව්වා වාගේ පොත බැලුවේ නැහැ. ඇතුළ බැලුවේ නැහැ. "ටැටුව දැකලා චරිතේ ලියන ගොඩක් උන්ට කෝමා" ඒක තමයි සිදු වුණේ. කනගාටුයි කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා දන්නවා ඇති, සමාජවාදය, මාක්ස්වාදය පිළිබඳව. මා මිත්‍ර ලාල් කාන්ත මැතිතුමා ඒ ගැන හොඳින්ම දන්නවා ඇති; ඒක කියවලාත් ඇති. මේ සමාජවාදී, මාක්ස්වාදී අයගේ බයිබලය මොකක්ද? "දාස් කැපිටාල්" කෘතිය. කාල් මාක්ස් ලියූ "දාස් කැපිටාල්" කෘතිය තමයි ඒ අයගේ බයිබලය. ඒ බයිබලය ගැන කථා කරමින් තමයි ඊයේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වේ, පූජකතුමායි, ස්වාමීන් වහන්සේයි පටලවාගෙන කියලා. ඒ වාගේම ධනවාදී චින්තනයේත් - දක්ෂිණාංශික චින්තනයේත් - බයිබලයක් කියලා එකක් තිබෙනවා. ඒ තමයි, ඇඩම් ස්මිත් ලියූ "The Wealth of Nations" කෘතිය. ඔබතුමන්ලා මොකක්ද කළේ? අනුර කුමාර දිසානායක මහත්මයා පිට කවරයේ "දාස් කැපිටාල්" දමාගෙන වේදිකාවේ හිටගෙන මිනිසුන්ට පෙන්නුවා ඒ "දාස් කැපිටාල්" එක. හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා නේ, පූජකතුමාට පන්සලට ගිහිල්ලා බණ කියන්න බැහැ කියලා; ස්වාමීන් වහන්සේට පල්ලියට වැඩම කරලා පූජාව කරන්න බැහැ කියලා. ඒ වාගේ තමයි මේකත්. ඇත්තම කථාව මොකක්ද? පිට කවරයේ "දාස් කැපිටාල්" දාලා, අනුර කුමාර දිසානායක මහත්මයා ඒ පිට කවරය ජනතාවට පෙන්වා ගෙන හිටියාට ඒක ඇතුළේ තිබුණේ මොකක්ද? ඇතුළ බැලුවේ නැහැ නේ, ඡන්ද දායකයා. ඇතුළේ තිබුණේ ඇඩම් ස්මිත්ගේ "The Wealth of Nations". ඒක තමයි, පෙරේදා අය වැය.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Combined එකක්.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

Combined එකක් නොවෙයි, සම්පූර්ණයෙන්ම neoliberal. Combined එකක් නැහැ. මේක neoliberal. ඔන්න ඔතැනදී තමයි පිට කවරය බලලා ඔබගේ කාඩරය මුළා වුණේ. ජේවීපේ එකේ කාඩරය "දාස් කැපිටාල්" පිට කවරය දැක්කා; නමුත් එය ඇතුළේ තිබෙන, ඇඩම් ස්මිත්ගේ "The Wealth of Nations" දැක්කේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර 74ක අපේ කඳවුරේ - මා නියෝජනය කරපු කඳවුරේ- වැරදි තිබුණේ නැතුවා නොවෙයි. අපේ අඩු පාඩු ගොඩක් තිබුණා. හැබැයි, අපි නිහතමානීව ඒ වැරදි නිවැරදි කරන්නට සූදානම්. අපි එය කරන්න පටන් ගත්තා. ඒ නිසා තමයි අපි සමගි ජන බලවේගය හැදුවේ. ඒ නිසා තමයි අපි හිතුවේ, අපේ චින්තනය වෙනස් විය යුතුයි කියලා. එක්සත් ජාතික පක්ෂයෙන් එළියට ඇවිල්ලා ස්වයං විවේචනයක් කරන්න අපට හයිය තිබුණා, අපි අලුත් විය යුතුයි කියලා. *[බාධා කිරීමක්]* අලුත් වීමට, වෙනස් වීමට අපි භය නැහැ. අපි අලුත් වීමටත් භය නැහැ, වෙනස් වීමටත් භය නැහැ. *[බාධා කිරීමක්]*

අනුර කුමාර දිසානායක මැතිතුමා පෙරේදා තම අය වැය ඉදිරිපත් කරපු අවස්ථාවේදී කිව්වා, යාපනය පුස්තකාලය ගැන. එතුමා කිව්වා, යාපනය පුස්තකාලයට ද්‍රවිඩ ජනතාව බොහෝ ගරු කළා, සිසුන් සපත්තු, සෙරෙප්පු ගලවලා තමයි ඒ පුස්තකාලය ඇතුළට ගියේ, යම් දේශපාලන පක්ෂයක් ඒක ගිනි තියන්න උදවු වුණා කියලා. ඔව්, මට මතකයි, අපේ මව් පක්ෂය ඒකට ගෑවුණු බව. මොකද, අපේ ඇමතිවරුන් දෙදෙනෙකු ඒ වෙලාවේ යාපනයේ හිටපු නිසා එක්සත් ජාතික පක්ෂය විසින් ඔය දේ කළා කියලා චෝදනා කළා. හැබැයි, ඒ ගැන අපි කනගාටු වෙනවා. එහෙම දෙයක් ගැන අපි ඇත්තටම පසුතැවිලි වෙනවා. ඒකට අපේ නම ගෑවුණා කියන එකටත් අපි කනගාටු වෙනවා. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා දැන් අවුරුදු කිහිපයකට කලින් මේ පාර්ලිමේන්තුවේදී එක්සත් ජාතික පක්ෂයේ නායකයා හැටියට සමාව ඉල්ලුවා. අපි නිහතමානී වුණා ඒක කරන්න. හැබැයි, අනුර කුමාර දිසානායක මහත්මයා ඒ ගැන කථා කරන කොට එතුමාට මතක් වුණේ නැද්ද ජේවීපී එක එදා බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ වන දළදා මාළිගාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කරපු එක? එතුමන්ලා ඒකට අද සමාව ඉල්ලා තිබෙනවා ද? එතුමන්ලා ඒ ගැන පසුතැවෙන්නේ නැද්ද? යාපනය පුස්තකාලය ගැන කථා

[ගරු කබීර් හෂීම් මහතා]

කරන එක හරි. හැබැයි, ඔබ කරපු වැරදි ගැන ඔබ ස්වයං විවේචනයක් කර තිබෙනවා ද? ඔබ එදා දළදා හිමියන්ට කරපු අපහාසය, අගෞරවය ගැන ඔබ කථා කරලා තිබෙනවා ද? නැහැ. එහෙම නම්, ඔබතුමන්ලාට අයිතියක් නැහැ, අනෙක් අයට බණ කියන්න.

Sir, let me set the record straight. ඔබතුමන්ලා අවුරුදු 74ක ශාපය ගැන කිව්වාට අවුරුදු 74ක ශාපයේ ප්‍රධාන වග උත්තරකරුවන් ඔබතුමන්ලායි. මම කියන්නම්, ඒ ඇයි කියලා.

මම නිකම් චෝදනාවක් කරන්නේ නැහැ. 1980, නිදහස් වෙළෙඳ කලාප සංකල්පය ශ්‍රී ලංකාවට ගේනකොට ඩෙන් ෂියාඕ පිං ඒක බලන්න චීනයෙන් කණ්ඩායමක් එව්වා. හැබැයි, එදා ඔබතුමන්ලාගේ නායකයා වූ රෝහණ විජේවීර මහතා ප්‍රකාශයක් කළා, "මේ ආයෝජන කලාපයට විදේශිකයන් ඇවිල්ලා ආයෝජනය කළොත්, ජේවීපී ආණ්ඩුවක් ආපු ගමන් සතයක්වත් වන්දි ගෙවන්නේ නැතුව පැය 24ක් තුළ ඔවුන් පන්නනවා" කියලා. එතකොට ආයෝජකයන්ගෙන් සියයට 50ක් ඔක්කෝම අකුළාගෙන ගියා. එදා ශ්‍රී ලංකාවට කරපු පාඩුව මනින්න බැහැ. අද ඔබතුමන්ලා ආයෝජකයන් ගෙන්වනවා කියලා මේ අය වැයෙන් කියනවා. අරක දෙන්නම්, මේක දෙන්නම් කියලා වැඳ, වැඳ කියනවා. හැබැයි, එදා කිව්වේ මෙහෙම නොවෙයි. එම නිසා ඔබතුමන්ලා ඒ වගකීම භාර ගන්න ඕනෑ.

1981දී ජපානයේ තිබෙන ප්‍රධාන කර්මාන්ත ආයතන වන ටොයෝටා, මැස්ඩා, හොන්ඩා කියන ආයතන තුනම වාහන හදන්න, මේ රටේ කර්මාන්ත හදන්න ආයෝජකයන් පිරිසක් එක්ක ලංකාවට ආවා. හැබැයි එදා ජේවීපී එකේ unions මහ පාරට බැහැලා කිව්වා, "මේවාට ඉඩ දෙන්නේ නැහැ" කියලා. එතකොට ටොයෝටා, මැස්ඩා, හොන්ඩා සමාගම් ඔවුන්ගේ ආයෝජන අකුළාගෙන මැලේසියාවට, තායිලන්තයට, ඉන්දුනීසියාවට ගියා. ඒ විධියට අපට ඒ ආයෝජන අහිමි වුණා. කෝටි ගණනක ආයෝජන අපට අහිමි වුණා. ඒකෙන් අපේ අයට හිමි වෙන්න තිබුණු රස්සා ටික නැති වුණා. ඒකට වගකියන්න ඕනෑ ඔබතුමන්ලා.

1980දී ධවල පත්‍රිකාව ඉදිරිපත් කළා. ධවල පත්‍රිකාව කියන්නේ, the most progressive education reforming Bill එකක්. 1980දී මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙක්. ඒ වෙලාවේ ජේවීපී එකේ union එකකින් අපට කිව්වා, පාරට බහින්න කියලා. මමත් පාරට බැහැලා ධවල පත්‍රිකාවට විරුද්ධව පෙනී සිටියා. මම දැනගෙන සිටියේ නැහැ ඒකේ මොකක්ද තිබුණේ කියලා. ඒ හේතුවෙන් එදා අපට ඉංග්‍රීසි අධ්‍යාපනය නැති වුණා. ඔබතුමන්ලා ඒ වගකීමත් භාරගත යුතුයි. අද ඔබතුමන්ලාගේ දරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නේ නැද්ද? ඔබතුමන්ලාගේ දරුවන් ජාත්‍යන්තර පාසල්වල නැද්ද? ඔබතුමන්ලාගේ දරුවන් විදේශ විශ්වවිද්‍යාලවල නැද්ද? හැබැයි, මේ රටේ බහුතර ජනතාවගේ දරුවන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය අහිමි කළේ තමුන්නාන්සේලා.

1981 සැප්තැම්බර් මාසයේ ජේ.ආර්. ජයවර්ධන මහතා රාගම වෛද්‍ය විශ්වවිද්‍යාලය ආරම්භ කරන්න උත්සාහ කළා. 1988දී ජේවීපී එක ඒ පරිපාලන ගොඩනැඟිල්ලට ගිනි තැබුවා. අන්තිමට රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාට ඒකට ඔරොත්තු දෙන්න බැරුව ඒක සම්පූර්ණයෙන්ම වහලා දැම්මා. ඊට පස්සේ මොකක්ද වුණේ? මහතීර් මොහමඩ් මැලේසියාවේ සිට ඒවා බලාගෙන ඉඳලා මොකක්ද කළේ? අපේ ඒ මහාචාර්යවරු, ආචාර්යවරු ඔක්කෝටම කථා කළා ඒ රටට. එහෙම කථා කරලා ඒ සෙට් එකම මැලේසියාවට ගත්තා. අරගෙන, International Medical University එක ස්ථාපනය කළා, මැලේසියාවේ. අවුරුදු 25ක්, 30ක් තිස්සේ හැම වසරකම ලංකාවේ සිසුන් 150ක්, 200ක් මැලේසියාවේ ඒ විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්න යනවා, ඩොලර් ලක්ෂ ගණනක් වියදම් කරගෙන. ඒ පව කාගේද?

ඒ වාගේම මම ඔබතුමන්ලාගෙන් මේ කාරණයත් අහන්න කැමැතියි. NSBM එකේ පෞද්ගලික වෛද්‍ය විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන්න ගිය වසරේ අනුමැතිය ලබා දුන්නා. ඔබතුමන්ලා ඒක ආරම්භ කරන්න කටයුතු කරනවාද, නැද්ද කියලා උත්තරයක් දෙන්න. ඔබතුමන්ලා දැන්වත් වෙනස් වෙලාද කියන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රේගු ආඥාපනත සංශෝධනය කරනවා කියලා අය වැය ඉදිරිපත් කරනකොට අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා. ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කරන්න ඕනෑ කියලා එතුමා කිව්වා. දේශීය ආදායම් පනත සංශෝධනය කරන්න ඕනෑ කිව්වා. ඒ වාගේම, රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් public-private partnership එකක් ගේන්නත් යනවා. කොටස් වෙළෙඳ පොළ තුළ ඒවායේ කොටස් විකුණන්න යනවා. ඒ වාගේම privatizationවලට යනවා කියලා එතුමා කියනවා. හැබැයි, 2003දී එවකට තිබුණු එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුවත් මේ යෝජනා ටික ගෙනාවා. ඒ වෙලාවේ මේ යෝජනා ටික ගෙනාවේ වෙන කිසිවක් නිසා නොවෙයි. ඒ වෙලාවේ තිබුණු ආණ්ඩුව දැක්කා, ණය අර්බුදයක් එනවා, ණය ප්‍රතිව්‍යුහගත කරන්න නම් මේ ප්‍රතිව්‍යුහගත කිරීම් ටික කරන්න ඕනෑ කියලා. ජේවීපී එක ඒකට විරුද්ධව පෙනී සිටියා; ආණ්ඩුව පෙරළුවා. හැබැයි, දෛවය කොහොමද කියලා බලන්න. එදා විරුද්ධ වුණු හැම දෙයක්ම අද ඔබතුමන්ලාගේ අතින්ම කරන්න සිද්ධවෙලා තිබෙනවා. මේ ඔක්කෝම වෙන්නේ අවුරුදු ගණනාවකින් පස්සේ. දැන් මම ඔබතුමන්ලාගෙන් අහන්නේ මේකයි. ඇත්තටම කවුද හැත්තෑහය වසරක ශාපයේ වගකීම ගන්න ඕනෑ? ඒ ප්‍රධාන වගඋත්තරකරුවෝ තමුන්නාන්සේලා. කවුද ඒවාට සමාව ඉල්ලන්න ඕනෑ? අපි නොවෙයි, ඔබතුමන්ලා. මේ අය වැයෙන් පස්සේ ඔබතුමන්ලාට යුතුකමක් තිබෙනවා, ඒ කරපු වැරදි වෙනුවෙන් මේ රටේ ජනතාවගෙන් සමාව ගන්න. මොකද, අවුරුදු 50ක්, 60ක් අපි ආපස්සට ගියා. එදා අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබුණා නම්, අද මැලේසියාවට, තායිලන්තයට, වියට්නාමයට, කාම්බෝජයට, බංග්ලාදේශයට, සිංගප්පූරුවට වඩා ඉදිරියෙන් ලංකාවට යන්න තිබුණා.

හැබැයි ඒක කරන්න දුන්නේ නැත්තේ ඔබතුමන්ලාමයි. අද දෛවය විසින් ඔබතුමන්ලාටම ඒ ඔක්කෝම නිවැරදි කරන්න සිද්ධවෙලා තිබෙනවා. ඉතින් ඒක මාර වැඩක්. නිදහස් වෙළෙඳ ගිවිසුම් ටික නතර කළා. ඒ හැම එකකටම විරුද්ධ වුණා. එට්කා ගිවිසුමට විරුද්ධ වුණා. සිංගප්පූරුවත් එක්ක අත්සන් කරපු ගිවිසුමට විරුද්ධ වුණා. දැන් ඒක ක්‍රියාත්මක කරන්න වෙලා තිබෙනවා.

දැන් බලන්න, මම දැක්කා ජනාධිපතිතුමා ආර්ථික සමුළුවට - ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයෙන් සංවිධානය කරපු සමුළුවට- ගියා. ජනාධිපතිතුමා ඒ සමුළුවට ගිහිල්ලා කිව්වා, මේ එන විදේශ ආයෝජකයන්ගේ ආයෝජන අනුමත කර ගන්න අවුරුදු දෙකක් යනවා, ඒක වැරදියි, ඒක අපි නිවැරදි කරන්න ඕනෑ, ඒ ආයෝජන ඉක්මනට අනුමත කරන්න ඕනෑ කියලා. ආයෝජන අනුමත කරන්න යන අවුරුදු දෙකහමාරක කාලය දවස් 82කට අඩු කරන්න ඕනෑ කියලා එතුමාම යෝජනා කරනවා. බොහොම හොඳයි. එදා පන්න පන්නා එළියට දමපු ආයෝජකයන්ගේ ඒ ආයෝජන දවස් 82කින් අනුමත කරලා දෙන්න ඕනෑ කියලා එතුමාම කියනවා. හැබැයි, මේ ආයෝජකයන් නොවෙයි අනුර දිසානායක මැතිතුමාට ඡන්දය දුන්නේ. සමහර අය කියනවා,

මේක ජනතාවාදී අය වැයක් කියලා. ඒ ආයෝජකයෝ ඡන්දය දුන්නේ නැහැ. ආයෝජකයන්ගේ ආයෝජන අනුමත කරන්න යන කාලය අඩු කරන්න. හැබැයි, වාණිජ මණ්ඩල සමුළුවට ගිහිල්ලා ආයෝජකයන් වෙනුවෙන් අනුර දිසානායක මැතිතුමා කථා කළත්, එතුමාට ඡන්දය දුන් ලක්ෂ ගණනක් මිනිසුන්ගෙන් කොටසක් හැමදාම පැය ගණනක් පාස්පෝට් පේලිමේ ඉන්නවා; දවස් ගණනක් පාස්පෝට් පේලිමේ ඉන්නවා. මම දන්නවා, එක තරුණයෙක් රට යන්න දහලනවා. එයා පාස්පෝට් එක ගන්න ගියාම ඔක්කෝම ලියලා භාර අරගෙන, අගෝස්තු මාසයේ එන්න කියලා තිබෙනවා. මාස හයක් හතක් යනවා, පාස්පෝට් එක ගන්න. හැබැයි, මේ අය වැයේදී ආයෝජකයන්ට පහසුකම් දෙනවා කියලා කිව්වාට, මේ රටේ පුරවැසියන්ට පාස්පෝට් එක ගන්න පහසු කරන්න සතයක් වෙන් කරලා නැහැ. ඒ තත්ත්වය වෙනස් කරන්න, අපේ මිනිසුන්ට ඒ කටයුත්ත පහසු කරලා දෙන්න කිසිම දෙයක් කරලා නැහැ. ඒ ගැන කථා කළේවත් නැහැ.

දැන් ඔබතුමන්ලා නියෝජනය කරන්නේ වෙන පන්තියක් කියලා අපට පෙනෙනවා. ඒක තමයි ප්‍රශ්නය. ඒ ආර්ථික සමුළුව තිබුණේ කොහේද? වාණිජ මණ්ඩලයේ. ඒ ආර්ථික සමුළුවට ජනාධිපතිතුමා සහ ඇමතිවරු කිහිපදෙනෙක් ගියා. ඒක පුදුමයක් නොවෙයි. වාණිජ මණ්ඩලයේ අය තමයි මේ ඔක්කෝම සංවිධානය කරන්නේ. එතැනදී මට හිතුණේ මෙහෙම දෙයක්. දැන් බලන්න, ඇමෙරිකාවේ ජනාධිපතිවරයා ඩොනල්ඩ් ට්‍රම්ප් නේ. ආර්ථික කටයුතු පිළිබඳ ඉන්න ජනාධිපති උපදේශක කවුද, ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ? ධනපතියෙක්; කෝටිපතියෙක්; ඒ, ඊලෝන් මස්ක්. ඊලෝන් මස්ක් තමයි ඔක්කෝම ප්‍රතිපත්ති හදන්නේ; තීරණ ගන්නේ. ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ජනාධිපති උපදේශක ඊලෝන් මස්ක් වාගේ, අපේ රටේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ ජනාධිපති උපදේශක කවුද? වාණිජ මණ්ඩලයේ සභාපති, දුමින්ද හුලංගමුව. ඔබතුමන්ලාගේ ව්‍යක්තිය සමිති සභාපතිවරයෙක් නොවෙයි එතුමාගේ උපදේශක. වාණිජ මණ්ඩලයේ සභාපති තමයි එතුමාගේ උපදේශක. කමක් නැහැ. හැබැයි එයා වාණිජ මණ්ඩලයේ සභාපති වාගේම තවත් ලොකු සමාගමක, අර බදු නොගෙවන්න කියලා දෙන සමාගම් තිබෙන්නේ, නීත්‍යානුකූලව බදු ගෙවන්නේ නැති සමාගමකත් ප්‍රධානියෙක්. එයා තමයි ජනාධිපතිතුමාට උපදෙස් දෙන්නේ. ඉතින් ඔබතුමන්ලාගේ ආදායම් වැඩි කර ගන්නේ කොහොමද කියලා මට නම් හිතා ගන්න බැහැ. හැබැයි වාණිජ මණ්ඩලය හැමදාම ඒ ආර්ථික සමුළුවට විපක්ෂයට ආරාධනා කරනවා. විපක්ෂයට ආරාධනා කරන එක යුතුකමක්. මොකද අපි තමයි විකල්ප ආණ්ඩුව. හැබැයි මෙවර පළමුවැනි වතාවට අපට ආරාධනා කළේ නැහැ. ඉතින් එක්කෝ ආණ්ඩුව වාණිජ මණ්ඩලය අල්ලාගෙන තිබෙනවා. නැත්නම් වාණිජ මණ්ඩලය ආණ්ඩුව අල්ලාගෙන තිබෙනවා. වෙලා තිබෙන්නේ ඒ කොයි එකද මම දන්නේ නැහැ. කනගාටුයි කියන්න, විපක්ෂයට එන්න කිව්වේ නැහැ. මේ අලුත් සංස්කෘතියක්ද? පුදුමයි! ඉතින් මේක තමයි ප්‍රශ්නය.

මේ අය වැය ජනතා අය වැයක් කියලා කියනවා. මම නම් එහෙම හිතන්නේ නැහැ. මේක ලස්සනට එළියෙන් පෙන්වූවාට ජනතා අය වැයක් කියලා, මේක ජනතාව අන්දන අය වැයක්. කෙළින්ම කියනවා නම්, මේක ජනතාව අන්දන අය වැයක්. මේක pro-poor Budget එකක් නොවෙයි. සමහර අය කඩේ යනවා. මාධ්‍යයේත් සමහර අය ඉන්නවා නේ, කඩේ යන. මම මෙහෙම කියන්නම්කෝ. රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කිරීමට රුපියල් බිලියන 345ක් වෙන් කළා. ලක්ෂ 14ක් රාජ්‍ය සේවකයන් ඉන්නවා. හැබැයි, අවිධිමත් අංශයේ කී දෙනෙක් ඉන්නවාද? පෞද්ගලික අංශයේ කී දෙනෙක් ඉන්නවාද? ලක්ෂ 60ක්. ඔවුන්ට ණයක් ගන්න බැහැ. ඔවුන්ට ජීවත් වෙන්න අමාරුයි. ඔවුන් ගැන කොච්චර දුරට හිතලා තිබෙනවාද? රාජ්‍ය සේවකයන්ට වුණත් මේ කරපු වැටුප් වැඩි කිරීම ප්‍රමාණවත්ද?

ගරු ඇමතිතුමනි, හොඳට හිතලා බලන්න ප්‍රමාණවත් ද කියලා. රාජ්‍ය සේවකයන් අතරින් සියයට 51ක්ම ඉන්නේ non-minor employees කියන category එකේ කියලා මම හිතනවා. ඒ කියන්නේ පහළ මට්ටමේ වැඩ කරන අය. ඒ අනුව, මෙම Budget Speech එකේ 70 වෙනි පිටුවේ සඳහන් කර තිබෙනවා, ඔවුන්ගේ වැටුප් වැඩි කිරීම රුපියල් 8,250යි කියලා. හැබැයි, මේ අවුරුද්දට - අප්‍රේල් මාසයේ සිට මේ අවුරුද්ද අවසන් වෙනකන් - ඔවුන්ට ලැබෙන්නේ රුපියල් 5,900යි. හැබැයි, ඒ රුපියල් 5,900 අනුව මම මෙහෙම කියන්නම්කෝ. මේ මුදල ප්‍රමාණවත්ද, නැද්ද කියලා මම ගණන් හදලා බැලුවා. මම හිතන විධියට හතර දෙනෙක් ජීවත් වෙන ගෙදරක දවසකට දෙවරක් බත් කනවා නම් සාමාන්‍යයෙන් හාල් කිලෝවක් ඕනෑ. එතකොට දවස් 30කට හාල් කිලෝ 30ක් ඕනෑ. ඒ කියන්නේ, අවම වශයෙන් හාල් කිලෝවක් ඕනෑ. සමහර ගෙවල්වල පිරිස තුන්වරක් බත් කනවා. දෙවරක් බත් කනවා කියලා අපි හිතමුකෝ. එතකොට JVP ආණ්ඩුව එන්න කලින් හාල් කිලෝවක් රුපියල් 180යි. දැන් මේ දවස්වල හාල් කිලෝවක් රුපියල් 260යි. රුපියල් 260යි, රුපියල් 180යි අතර මිල වැඩිවීමේ ප්‍රමාණය හාල් කිලෝ එකකට රුපියල් 80යි. එතකොට, මාසයකට කිලෝ 30ක් ඕනෑ. රුපියල් 80ක හාල් මිල වැඩි වීම ගත්තාම, මාසයකට හාල්වලට විතරක් රුපියල් 2,400ක් වැඩියෙන් යනවා. ඒ, හාල්වලට විතරක්. එතකොට බත් කන්න මාසයකට රුපියල් 2,400ක් වැඩිපුර යනවා. හැබැයි, බත් විතරක් කන්න බැහැ නේ.

පොල් ගත්තොත්, හතර දෙනෙක් ජීවත් වෙන ගෙදරකට දිනකට අවශ්‍ය පොල් ප්‍රමාණය මම ගණන් හදලා බැලුවා. සමහර අය කියනවා, හොඳට කනවා නම් පොල් ගෙඩි එකහමාරක් ඕනෑ කියලා. දැන් ඉතින් හොඳට කන්න බැහැ නේ. පොල් සම්බෝලය හදන්නෙත් පොල් ටික මිරිකලා එන පොල් කුඩු ටිකෙන්මයි. එතකොට හතර දෙනෙක් ජීවත් වෙන ගෙදරකට පොල් ගෙඩියක් දවසකට ප්‍රමාණවත්. එතකොට මාසයකට පොල් ගෙඩි 30ක් ඕනෑ. ඔබතුමන්ලා බලයට එන්න කලින් පොල් ගෙඩියක් රුපියල් 100යි. දැන් පොල් ගෙඩියක් 240යි. මම පෙරේදා එනකොට නිට්ටඹුවේ දී දැක්කා ලොකු බෝඩ් ගහලා තිබුණා, 'පොල් ගෙඩියක් 240යි' කියලා. රුපියල් 140කින් පොල් ගෙඩියක මිල වැඩි වෙලා. පොල් ගෙඩියක වැඩිවීම රුපියල් 140ක් වුණාම, පොල් ගෙඩි 30කට මාසයකට රුපියල් 4,200ක් වැඩිපුර වැය වෙනවා. ඒ රුපියල් 4,200යි, හාල්වලට වැඩි වුණු රුපියල් 2,400යි ගත්තාම මාසයකට පොල් සහ හාල් මිල වැඩිවුණු ගණන ගෙවන්න රුපියල් 6,600ක් වියදම් වෙනවා. හැබැයි, ඔබතුමන්ලා රාජ්‍ය සේවකයන්ට දෙන්නේ රුපියල් 5,900යි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahman)
ලුණු දාන්නත් බැහැ.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ආ, ලුණු දාන්නත් බැහැ. ලුණු දාන්න ගියොත් මිනිහා ඉවරයි. එතකොට මේ පඩි වැඩිවීම ප්‍රමාණවත් ද? මේක මේ අන්දවන වැඩක් නේ? මිනිස්සු පව්. මේ ඔක්කෝම බඩු මිල වැඩි කරවලා බොරුවට මේවා එහෙන් එල්ලලා, මෙහෙන් එල්ලලා මේ අවුරුද්දට මෙච්චරයි, ලබන වසරට මෙච්චරයි කිව්වාම මේ මිනිස්සු ඇත්තටම තවත් දුප්පත් වෙනවා. ඇත්ත කථා කරමු. එතකොට system change එකක් ඇවිල්ලා නැහැ. බතුයි, පොල් සම්බෝලයි කන්න වුණත් පඩි වැඩි කිරීම ප්‍රමාණවත් නැහැ. මේක තමයි යථාර්ථය.

[ගරු කබීර් හෂීම් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය ගන්න. මම දකින්නේ මේ අය වැය රනිල් වික්‍රමසිංහගේ අය වැයක් කියලා. කොහොමද මේක වෙනස් කරන්න කියන්නේ? දැන් බලන්න, අය වැයේ ඉඩම් ගැන කියලා තිබෙන දේ. මේ අය වැය ජනතාවාදී අය වැයක් නම් මෙහෙම කියනවාද? 2024 වර්ෂයේ දී ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉදිරිපත් කරපු අය වැය ගත්තොත්, එතුමා ඉදිරිපත් කරපු අය වැයේ 36 වෙනි පිටුවේ කියා තිබෙන්නේ මොකක්ද? හැබැයි, එතුමා ඔබතුමන්ලාට වඩා advanced. එතුමා කියන්නේ, "රජය විසින් භාවිත නොකළ රජය සතු ඉඩම් ඵලදායී ආර්ථික කටයුතු සඳහා බදු දෙනු ඇත" කියලායි.

ඔබතුමන්ලාගේ අය වැය ලේඛනයේ 23 වන පිටුවේ ඉඩම් ගැන මෙසේ සඳහන් කර තිබෙනවා:

> "...ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන එම ඉඩම්වල යෝග්‍යතාවය පිළිබඳ සැලකිල්ලට ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඇතුළත් පුද්ගලික ආයෝජන සඳහා යොමු කිරීමට කටයුතු කරනවා. මේ සම්බන්ධයෙන් මූලික කටයුතු සිදුකිරීමට රුපියල් මිලියන 250ක් වෙන් කරනවා."

ඒ කියන්නේ, ඉඩම් පෞද්ගලික අංශයට ලබා දෙනවා කියන එකයි. මම ඒකේ වරදක් දකින්නේ නැහැ. මේක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා පසුගිය වසරේ දී මේකම කිව්වා, මේ ඉඩම් දෙනවා කියලා. ඔබතුමන්ලා තවදුරටත් ගිහිල්ලා, කොම්පැනිවලටත් දෙනවා කියලා තිබෙනවා. මේ රටේ බිම් අහලක් නැති මිනිස්සු ලක්ෂ ගණනක් ඉන්නවා. ගෙයක් නැති මිනිස්සු ඉන්නවා. ඔවුන් ගැන කථා කළේ නැත්තේ ඇයි?

ඔවුන් ගැන කථා කළේ නැත්තේ ඇයි? ඔවුන්ට ඉඩම් දෙන එක ගැන කථා කළේ නැත්තේ ඇයි? ව්‍යාපාරිකයන්ට ඉඩම් බෙදලා දෙනවා කියලා කිව්වා. ඒ ජනතාව ගැන ඔබතුමන්ලාට යුතුකමක් තිබෙනවා නේ. ඔබතුමන්ලා නියෝජනය කරන්නේ කාවද? එතකොට එතැනම ප්‍රශ්නයක් තිබෙනවා. මේ අන්දවලා තිබෙන්නේ.

2024දී රනිල් වික්‍රමසිංහ මහත්මයා ආයෝජන නීතියක් ගැන කථා කරනවා. එතුමා ඒ ආයෝජන නීතිය ගැන කියන්නේ මොකක්ද? "ආයෝජන හිතකාමී නෛතික පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නව ආයෝජන නීතිය සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව නීතිය හඳුන්වා දීම අප ආරම්භ කළා" කියලා එතුමා කියනවා. හැබැයි ඔබතුමන්ලා දැන් කියනවා, ආයෝජකයන් ආරක්ෂා කරන පනතක් ගැන, Investment Protection Bill එකක් ගැන. රනිල් වික්‍රමසිංහ මහත්මයා කියපු එකම අනුර කුමාර දිසානායක මහත්මයාත් කියනවා. 2025 අය වැය කථාවේ 96වැනි පිටුව අරගෙන බැලුවා නම් Investment Protection Bill එක ගැන තිබෙනවා. රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය - public-private partnership - ගැන තිබෙනවා. ඒකත් රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වා. මේ දෙකම එකයි. ඒකයි මම කිව්වේ. ගිය පාර ඉදිරිපත් කළ අය වැය කථාවම තමයි මේ එහාට මෙහාට මාරු කරලා ගෙනාවේ.

රනිල් වික්‍රමසිංහ මහත්මයා new Customs Regulations Bill එකක් ගැන යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඒ කියන්නේ රේගු පනත සංශෝධනය කිරීම පිළිබඳව. ඕනෑ නම් මට ඒකේ පිටු අංකයත් එක්ක කියන්න පුළුවන්; ඒකත් තිබෙනවා. ඒ වාගේම, "ජාතික තනි වෙළෙඳ කවුළුව" - "National Single Window" - ගැනත් රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා. ඒකම තමයි අනුර කුමාර දිසානායක මහත්මයාත් කියන්නේ. රේගුව ප්‍රතිව්‍යුහගත කරන එක ගැන. මේක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ තුන්වැනි අය වැය කියලා මම කිව්වේ, ඒ හේතුව නිසා. මම නිකම් කිව්වේ නැහැ. වචනයට වචනය බැලුවාම ඔක්කෝම එකයි, එකම තැනින් තමයි මේවා හැදෙන්නේ කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැතිතුමිය බලයට එන්න කලිනුත් දිගින් දිගටම කිව්වා, අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6ක් අනිවාර්යයෙන්ම වෙන් කරනවා කියලා. ඒකට ඔබතුමන්ලා අසමත් වෙලා තිබෙනවා. 2024 පසුගිය ආණ්ඩුවේ අය වැයට වඩා සියයට 12ක වැඩිවීමක් පමණයි මෙවර අධ්‍යාපනයට වෙන් කරලා තිබෙන්නේ. රුපියල් බිලියන 240, රුපියල් බිලියන 271කට වැඩි වෙලා තිබෙනවා. එතකොට අධ්‍යාපනයට දීපු ප්‍රමාණය මදි.

ඔබතුමන්ලා IMF එකේ කොන්දේසි සමාලෝචනය කරන්නේ නැතිව යටත්වීම නිසා තමයි මේ සමහර ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. හර්ෂ ද සිල්වා මැතිතුමාත්, මමත් මේ ගැන නිතරම කථා කළා. අපි IMF එකට කියලා තිබුණා, අපි බලයට ආවොත් ඔබතුමන්ලාගේ හැම කොන්දේසියකටම එකඟ වෙන්නේ නැහැ කියලා. මොකද, IMF එක කියන ඔක්කෝම හරි නැහැ. අපි දැන ගන්න ඕනෑ, ඒගොල්ලන්ගේ රාමුව තුළ අපට ඕනෑ දේවල් කර ගන්න. ඔවුන්ට බැහැ අපේ රට හදලා දෙන්න. ඔවුන්ට රාමුව - road map එක - හදලා දෙන්න පුළුවන්. ඒක ඇතුළේ රට හදන්නේ කොහොමද කියලා අපි දැන ගන්න ඕනෑ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යෝජනා කළා, අපේ ප්‍රාථමික වියදම - primary expenditure - දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13කට සීමා කරන්න කියලා. ලෝකයේ රටවල් 10ක්වත් නැහැ එතැන. ඊයේ හර්ෂ ද සිල්වා මැතිතුමාත් ඒක කිව්වා. ඒ රටවල් 10 වුණත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 50ක් ප්‍රාථමික වියදම් සඳහා යොදවනවා. අපට එය සියයට 13ට සීමා කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලය මොකක්ද? ප්‍රාග්ධන වියදම අඩු කරන්න ඕනෑ, සහනාධාර අඩු කරන්න ඕනෑ. ඇයි ඉතින් අපි ඒවා කරන්නේ? හැබැයි ආණ්ඩුව ඒකට එකඟ වුණා. ඒ කොන්දේසි කිසි දෙයක් වෙනස් කරන්න ගියේ නැහැ. භයටද දන්නේ නැහැ, තේරුණේ නැති නිසාද දන්නෙත් නැහැ. එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ මහත්මයා උපදෙස් දුන් නිසාද දන්නෙත් නැහැ.

අනෙක් පැත්ත බලමු. අපේ ඊළඟ පිම්ම මේ රට සංවර්ධනය කිරීම. අපි වගකීමක් ඇති විපක්ෂයක්. අපි අය වැය විවේචනය කරන්න විතරක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ රට ගොඩ ගන්න වැඩිම වගකීම තිබෙන අමාත්‍යාංශ තුනට අඩුම මුදලක් තමයි වෙන් කරලා තිබෙන්නේ. අමාත්‍යාංශ 8කට තමයි මේ අය වැයෙන් සියයට 90ක්ම මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඔබතුමාත් ඒක ඇතුළේ ඉන්නවා කියලා මම හිතනවා, ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි. හැබැයි, මේ රටේ ප්‍රධාන අමාත්‍යාංශ තුනක් තිබෙනවා. එකක් තමයි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය. ජනාධිපතිතුමා පර්යේෂණ කටයුතු ගැන ගොඩක් කථා කළා. හැබැයි, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට ගිය අවුරුද්දට වඩා මුදල් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම තමයි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය - Ministry of Trade, Commerce, Food Security and Co-operative Development - සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය. මම දන්නා තරමට මේ අමාත්‍යාංශ තුනටම බිලියන 20යි වෙන් කරලා තිබෙන්නේ.

එතකොට මේ අමාත්‍යාංශ වෙන්න ඇති, මේ රට සංවර්ධනය කරන්න ඊළඟට ලොකුම වගකීම ගන්න ඕනෑ. Ministry of Industry and Entrepreneurship Development යටතේ තමයි SMEs තිබෙන්නේ. අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඊයේ වැදගත් කාරණාවක් ඉදිරිපත් කළා, මේ SMEs ගැන. මේ රට

නැවත ගොඩගන්න නම් කුඩා සහ මධ්‍ය පරිමාණ දේශීය ව්‍යාපාර නහාසිටුවන්න කටයුතු කරන්න ඕනෑ. හැබැයි, මේ සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපි දන්නවා. ඔබතුමන්ලා මහා ලොකුවට කථා කළා, කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට, අපේ දේශීය කර්මාන්තවලට ලොකු මුදලක් දෙනවා කියලා. ඒ සඳහා රුපියල් බිලියන 20ක් වෙන් කරලා තිබෙනවා කිව්වා. මම හෙව්වා, අය වැය පොතේ කොහේද එය සඳහන්ව තිබෙන්නේ කියලා. බලනකොට ඒක මුදල් අමාත්‍යාංශය යටතේ ද කොහේද දාලා තිබෙනවා. හැබැයි, ඒ රුපියල් බිලියන 20 ගිය වසරේ රනිල් වික්‍රමසිංහ මහත්තයාත් දාලා තිබෙනවා. ඒ රුපියල් බිලියන 20 අලුත් එකක් නොවෙයි. ඒක දෙන්නේ ණය ගෙවන්න බැරි වෙච්ච, හිර වෙච්ච අයව නැවත ගොඩගන්න නොවෙයි. මේ රුපියල් බිලියන 20 මම දන්නා තරමට ongoing project එකක්. ඒකෙන් රුපියල් බිලියන පහක් විතරයි වෙන් කරන්නේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ ගෙවන්න බැරි වෙච්ච loansවලට - non-performing loansවලට. ඉතුරු රුපියල් බිලියන 15 දෙන්නේ තෝරා ගත් කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තවලට. අපි මේ ගැන හොයලා බැලුවා. හර්ෂ ද සිල්වා මැතිතුමායි, මමයි හොයලා බැලුවා. ගිය සැරේත් රුපියල් බිලියන පහක් කර්මාන්තවල non-performing loansවලට වෙන් කරලා තිබුණා. හැබැයි, බැංකුවලට දීපු සල්ලිවලින් loans 24යි දීලා තිබුණේ; මුළු අවුරුද්දටම loans 24යි. මෙවරත් කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ව අන්දවනවා; බොරුවක් කරන්නේ. මේ යන්නේත් පරණ scheme එකමයි. අලුතින් කිසි දෙයක් නැහැ. සංවර්ධන බැංකුවක් - development bank එකක් - හදන්න යනවා කියලා ජනාධිපතිතුමා මෙතැනදී කිව්වා. සංවර්ධන බැංකුවක් හදන්න කොහෙන්ද මුදල්? ඒකට දාන ප්‍රාග්ධනය මේ අය වැය ලේඛනයේ වියදම්වල කොහේවත් නැහැ. ඒක අසත්‍යයක් නේ. ඒ බැංකුව මේ අවුරුද්ද තුළ හැදුවොත් මම මගේ කන කපනවා. මම දන්නා තරමට ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරලා නැහැ. මේ වාගේ කුඩා කර්මාන්තවලට මේ සහාය නොදී ඉදිරියට යන්න අමාරුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න කලින් මම මේ කාරණයත් කියන්නම්. මේ වෙලාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපි IMF එක භාවිත කළේ අපේ මූල්‍ය තත්ත්වය ස්ථාවර කරගන්න බව. IMF එක දීපු උපදෙස්වලින් ගොඩගිය රටවලුත් තිබෙනවා; ගොඩ නොගිය රටවලුත් තිබෙනවා. හැබැයි, අද අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය මොකක්ද? මේ ලෝකයේ ප්‍රාග්ධන බලය තිබෙන්නේ සීමිත කණ්ඩායමකටයි. ඒ ප්‍රාග්ධන බලය භාවිත කරලා අද ආණ්ඩු පාලනය කරන්නේ corporate sector එක. ගොඩක් තැන්වල corporate සමාගම්, බිස්නස්කාරයෝ තමයි ආණ්ඩු කරවන්නේ. ඒකට ඉඩ දෙන්න බැහැ. අද ප්‍රාග්ධන බලය නිසා ආදායම් අසීමිත විධියට එකතු වෙන්නේ ඉතා කුඩා පිරිසකටයි. ලංකාවේ ධන උත්පාදනය ගත්තාම ජනගහනයෙන් සියයට එකක් මේ රටේ ධනයෙන් සියයට 40ක් අයිති කරගෙන ඉන්නවා. සියයට 20ක් හෝ 30ක් වන දුප්පත්ම මිනිසුන්ට තිබෙන්නේ ධනයෙන් සියයට හතරයි. මේ ක්‍රමවේදය වෙනස් කරන්න මේ අය වැය තුළ කිසිම වැඩ පිළිවෙළක් තිබෙන බව මම දකින්නේ නැහැ.

සමාජ සාධාරණත්වය ඇති කරන්නත් මේ අය වැයේ වැඩ පිළිවෙළක් නැහැ. ඒකට මේ අය වැය pro-poor Budget එකක් වෙන්න ඕනෑ. රටක් දියුණු වෙන්න ඕනෑ. අපි ආයෝජකයන්ට උදව් කරන්න ඕනෑ. හැබැයි, ගජමිතුරු ධනවාදය මත මේක කරන්න දෙන්න බැහැ. අපි හිතනවා, ඒ ගජමිතුරු ධනවාදය තුළ මේ ආණ්ඩුවත් හිර වෙලා ඉන්නවා කියලා. ඔබතුමන්ලා පොරොන්දු වුණා, මාෆියා ටික කඩනවා කියලා. නමුත්, ඔබතුමන්ලා එක මාෆියාවක්වත් කැඩුවාද? මේ රටේ පීඩනය ඇති වෙලා තිබෙන්නේ මේ මාෆියා නිසාය කිව්වා. ලංකා විදුලිබල මණ්ඩලය යම්කිසි ටෙන්ඩරයක් දීපු ක්‍රමය වැරැදියි කියලා අපි දන්නවා. ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කිව්වා, අඩු ගණනකට එම ටෙන්ඩරය දුන්නා කියලා. හැබැයි, procurement process එකකදි තාක්ෂණ කමිටුවෙන් ප්‍රතික්ෂේප කරපු සමාගමකටයි ඔබතුමන්ලා එම ටෙන්ඩරය දීලා තිබෙන්නේ.

එතකොට මිනිස්සු හිතනවා නේ, මේ ගනුදෙනුව ඇතුළේ යම් බලපෑමක් තිබෙනවා කියලා. අපි හිතනවා, ආණ්ඩුවත් එක්ක මොකක් හෝ සම්බන්ධතාවක් තිබෙන ව්‍යාපාරිකයන්ට තමයි ආයෙත් පාර හැදෙන්නේ කියලා. ඔබතුමන්ලාට බැරි වුණා, විදුලිබල මණ්ඩලයේ මාෆියාව නැති කරන්න. ඔබතුමන්ලාට බැරි වුණා, පාස්පෝට් මාෆියාව නැති කරන්න. ඔබතුමන්ලාට බැරි වුණා, මේ රටේ හාල් මෝල් හිමියන්ගේ එක මාෆියාවක්වත් කඩන්න. ඔබතුමන්ලා මේ system change එක සාර්ථකව කරලා නැහැ. *[බාධා කිරීමක්]* මම ඒකට උත්තරය වෙන වෙලාවක දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කනගාටුවක් තිබෙනවා. මොකද අපි බලාපොරොත්තු වුණා, ජාතික ජන බලවේග ආණ්ඩුව යම් වෙනසක් ඇති කරන්න උත්සාහ කරයි කියලා. අපි ලැහැස්තියි, එයට සහාය දෙන්න. හැබැයි, ඔබතුමන්ලා පරණම system එක අනුව යන බව තමයි අපි දකින්නේ.

ස්තුතියි.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, state your point of Order, please,

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Hon. Deputy Speaker, you will understand the point of Order I am raising.

ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම මේ කාරණය මතු කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාත්, සෞඛ්‍ය අමාත්‍යතුමාත් වෛද්‍යවරුන්. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, වෛද්‍යවරුන්ගේ අනිකාල රාජකාරි සඳහා ගෙවන වේතනය වන 80/1 කියන ගෙවීම අඩු වෙලා තිබෙනවා, 120/1 දක්වා. තරුණ වෛද්‍යවරයෙකු හැටියට ඔබතුමාත් දන්නවා, වෛද්‍යවරුන්ට කොයි වාගේ වැටුපක්ද ලැබෙන්නේ කියන එක.. අපට මතකයි, කෙහෙළිය රඹුක්වැල්ල සෞඛ්‍ය ඇමතිවරයා හැටියට සිටි කාලයේ වෛද්‍යවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව අවුරුදු 60 සිට අවුරුදු 55 දක්වා අඩු කළාම දැවැන්ත brain drain එකක් වුණු බව. 2,000කට ආසන්න වෛද්‍යවරුන් පිරිසක් ඒ අවස්ථාවේ රට අතහැර ගියා. වාහන පර්මිට් එකත් වෛද්‍යවරුන්ට ලැබෙන්නේ නැහැ. රුපියල් ලක්ෂ 30ක් වාගේ ඉතාම අඩු මුදලක් තමයි එම වාහන පර්මිට් එකට යන්නේ. මාසයකට රුපියල් 60,000ක වාගේ මුදලක් ඒ අයට අහිමි වෙනවා. ඒ අයට ප්‍රවාහන දීමනාවක්, එහෙම නැත්නම් රියදුරෙක් ලැබෙන්නේත් නැහැ. සමස්ත වෛද්‍යවරුන් වෙනුවෙනුයි මා මේ ඉල්ලීම කරන්නේ; Sir, I am talking on behalf of all the doctors in this country. I think we have to safeguard them.

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, දැන් නම් අපට බාල ඖෂධ ගැන අහන්න ලැබෙන්නේ නැහැ. අපේ විපක්ෂ නායකතුමාගේ අනුදැනුම මත මම තමයි කෙහෙළිය රඹුක්වැල්ල සෞඛ්‍ය ඇමතිවරයා හැටියට සිටි කාලයේ බාල ඖෂධ ගෙනෙනකොට එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවකුත් ගෙනාවේ. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, වෛද්‍යවරුන්ගේ චේතනය පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, make your point of Order brief.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, let me speak only for 30 seconds.

The Hon. Kabir Hashim mentioned in his speech that Rs. 100 million has been allocated for the Jaffna Library. First of all, we thank the Government for allocating that money. He also mentioned that we have never apologized for bombing Sri Dalada Maligawa. At that time, I was seven years old and now, if that was commited by the LTTE and if they were representing us, on behalf of the people of the Northern Province, I sincerely apologize for the wrongdoing, the bombing of Sri Dalada Maligawa.

Unfortunately, since 1983, we have been facing systemized discrimination in this country and that is the only reason why the Tamil people were forced to take up arms. But, at this moment, we do not want to talk about that unfortunate past; we want to move forward. Therefore, we would like to ask the Government and the Opposition parties to stop talking about ethnic issues. Let us move forward as one country. That is the biggest request coming from the Northern Province, as we have faced a lot of consequences. Thank you.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Deputy Speaker, he mentioned my name and raised an issue.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Kabir Hashim?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Member, I am not sure whether you are apologizing on behalf of the JVP or on behalf of the Tamil people.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, I heard him referring as "The bombing of Sri Dalada Maligawa by the LTTE" at that time. So, I am apologizing on behalf of the people of the Northern Province. Those 55,000 LTTE cadres came from the Northern Province. *[Interruption]*.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, give me a minute.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, could we move on with the Debate?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Member, I really respect that you apologized for that. That is why I asked the JVP also to apologize because they also bombed the Sri Dalada Maligawa. But, they have not apologized yet. That is the apology I am expecting, from them.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chief Government Whip.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටයි මම උත්තර දෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය මතු කිරීම සම්බන්ධව ස්තුතියි. මේ රටේ සෞඛ්‍ය සේවාව පවත්වාගෙන යෑමේදී වෛද්‍යවරුන්ගේ සිට සෞඛ්‍ය සහායකයන් දක්වා කරන සේවාව පිළිබඳව අපේ විශාල ඇගැයීමක් සහ ගරුත්වයක් තිබෙනවා. ඒ අය ඇත්තටම තමන්ට තිබෙන OT පැය 120ටත් වඩා - extra duty පැය 120ටත් වඩා - වැඩ කරමින් තමයි මේ සේවාව පවත්වාගෙන යන්නේ කියන එක ඔබතුමාත් දන්නවා. එම නිසා තමයි මෙවර අය වැයේදී අපි වෛද්‍යවරු ඇතුළු රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප වැඩි

කරන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාට කියන්න කැමතියි, විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ කිසිම කෙනෙක් කලබල වෙන්න ඕනෑ නැහැ කියන එක. යම් කුඩා කණ්ඩායමක් කලබල ඇති කරන්න උත්සාහ කළාට ඒකට අහු වෙන්න ඕනෑ නැහැ. මේ හැමදෙනාගේම වැටුප් ඉහළ යනවා. වැඩි කරපු මූලික වැටුප අපි කොටස් තුනකින් ලබා දුන්නාට ඒ සමස්ත මූලික වැටුපට අදාළව තමයි extra duty එකේ PH එක හැදෙන්නේ. එම එකතුවේ 2025 මාර්තු මාසයේ ගන්න පඩියට වඩා අප්‍රේල් මාසයේ සැලකිය යුතු වෙනසක් වෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත්, සීමාවාසික පුහුණුව අවසන් කරලා රාජ්‍ය සේවයට පිවිසෙන වෛද්‍යවරයෙකුට - Preliminary Grade Medical Officer කෙනෙකුට - අප්‍රේල් මාසයේදී සමස්ත වැටුප රුපියල් 26,000කට වැඩිය ලැබෙනවා. එම නිසා කවුරුවත් ඒ ගැන කලබල වෙන්න එපා. මේ පිළිබඳව සවිස්තරව සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා එතුමාගේ කථාවේදී කරුණු ඉදිරිපත් කරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Nimal Palihena. You have 13 minutes. - *[Interruption]*.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, give me just ten seconds, please.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you can take that up later.

[පූ.භා. 11.40]

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ජාතික ජන බලවේග රජයේ මංගල අය වැය පිළිබඳ විවාදයේ දෙවැනි දිනයේ රජය නියෝජනය කරමින් මේ මොහොතේ කථා කිරීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි මේ රජය ස්ථාපිත කළේ මහත් පීඩාවට පත් වෙච්ච ජනතාවක් සමඟ අත්වැල් බැඳගෙනයි. ඔවුන්ගේ අභිලාෂ ඉෂ්ට කිරීම පිණිස අපට වගකීමක් පැවරිලා තිබෙනවා. මූලික වශයෙන් ඒ වගකීම හඳුනා ගනිමින් මෙවර අය වැය අප විසින් ඉදිරිපත් කරනු ලැබුවා. එහිදී අපි රුපියල් බිලියන 8,835ක වැය බරක් දරන්නත්, ඒ වාගේම බදු සහ අනෙකුත් ආදී වශයෙන් රුපියල් බිලියන 4,990ක් ලබා ගැනීමටත් සැලසුම් කර තිබෙනවා. මෙම වියදම් අප ප්‍රධාන වශයෙන් අමාත්‍යාංශ 24ක්, දෙපාර්තමේන්තු 134ක් සහ විශේෂිත ඒකක 21ක් හරහා මේ රටේ ජනතාවට සේවය කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂිතයි.

මේ අවස්ථාවේදී අපි සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ රජය විසින් මේ රට භාර ගන්නා මොහොත දක්වා පැවතුණු තත්ත්වයෙන් සියයට සියයක් මිදී ක්‍රියාත්මක වීමේ හැකියාවක් අපට නැහැ. පැවැති ක්‍රමයට යම් ආකාරයකට අනුගත වෙමින්, එනි නුසුදුසු කොටස් ඉවත් කරමින්, වඩා ජනතා හිතවාදී විධියට අය වැය සකස් කිරීම තමයි අපේ අභිලාෂය සහ වගකීම වුණේ. ඒ අනුව මේ රටේ ජනතාව මුල් කර ගනිමින්, ඔවුන් පත් වෙලා සිටි දැඩි පීඩාකාරී තත්ත්ව සැලකිල්ලට ගනිමින් මේ අය වැය සකස් කරලා තිබෙනවා. ඇත්තෙන්ම කියනවා නම් අය වැය කියන්නේ නිකම්ම නිකම් අංක ටිකක් හෝ වටිනාකම් ටිකක් සඳහන් වන කඩදාසියක් නොවෙයි. එය අපි අපේක්ෂා කළ වුවමනාව වෙනුවෙන්, මේ රටේ ජනතාව අපට දුන්නු වරම අනුව ඔවුන්ට ඒ ආකාරයෙන්ම සේවය සැපයීම සඳහා වන සැලැස්මක්. විශේෂයෙන් මේ රටේ ප්‍රධාන ගැටලු විසඳීමට ක්ෂණිකව මැදිහත් විය යුතු තැන් සහ යම් ආකාරයකින් දිගුකාලීනව අප විසින් අත ගැසිය යුතු තැන් අපි මේ තුළ හඳුනා ගනිමින් සිටිනවා.

ඒ වාගේම මේ අය වැය තුළ ප්‍රධාන වශයෙන් ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම සම්බන්ධයෙන් මැදිහත් වීමත්, ඒ එක්කම කෘෂිකර්මය, රැකියා උත්පාදනය කිරීම සහ සංචාරක ව්‍යාපාරය වැනි කටයුතු සඳහා විශේෂ අවධානයක් යොමු කිරීමත් අපි විසින් කරනු ලබනවා. මේ තුළින් අපි අපේක්ෂා කරන්නේ මෙපමණ කාලයක් පීඩාවට පත් වෙමින්, ගැටලු රාශියකට මුහුණ දෙමින් සිටි ජනතාව යම් ආකාරයකට නහාසිටුවීමයි. අපේ මංගල අය වැය තුළින් 2025 වසර තුළදී අනිවාර්යයෙන් ජනතාවට ප්‍රතිලාභ අත්වෙනවා කියන විශ්වාසය අප තුළ තිබෙනවා. මෙම අය වැයේදී සමාජ සුබසාධනය පිළිබඳව අපි විශේෂයෙන් අවධානයට ලක් කරන්නේ ජනතාවගෙන් ඉතා විශාල ප්‍රමාණයක් දරිද්‍රතාවට පත් වෙලා සිටින නිසායි. ආර්ථික දුෂ්කරතා නිසාම ජීවිතය පවත්වාගෙන යන්න බැරි, එහෙම නැත්නම් දරුවාට අධ්‍යාපනය ලබා දෙන්න බැරි තත්ත්වයක් අද වනකොට උදා වෙලා තිබෙන නිසා තමයි අපි මුල් වටයේදීම අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් යන දරුවන්ට පාසල් උපකරණ මිලදී ගන්න රුපියල් 6,000ක දීමනාවකුත්, සපත්තු දෙකක් මිලදී ගන්න රුපියල් 3,000ක දීමනාවකුත් වාගේම සමස්ත ජනතාවගෙන් තෝරා ගත් කොටසකට අස්වැසුම ප්‍රතිලාභ ලබා දීමටත් කටයුතු කරනු ලැබුවේ. ඒ සියලු දේවල් මේ අය වැය තුළට අන්තර්ගත කරලා, සාධාරණ සමාජමය මැදිහත්වීමක් කරමින් ඉන්න අවස්ථාවක් තමයි, මේ අවස්ථාව.

ඒ වාගේම පසුගිය කාලයේ අපේ රට තුළ ඇති වුණු දේශගුණික සහ කාලගුණික තත්ත්වය තුළ අපේ රටේ ජනතාව ඉතා දැඩි ව්‍යසනයන්ට භාජන වුණා. ඒ අනුව ඉතා ඉක්මනින් අපි මැදිහත් විය යුතු අවස්ථා ගණනක් නිර්මාණය වුණා. මම ජීවත් වන, මම නියෝජනය කරන අනුරාධපුරයේ ජනතාවත් දැඩි ලෙස ආපදාවලට ලක් වුණා. මේ වනවිට ඒ සඳහා අවශ්‍ය සාධාරණ මැදිහත්වීම ඉක්මනින් සිදු කර වැව් ප්‍රතිසංස්කරණය, මාර්ග ප්‍රතිසංස්කරණය ආදී කටයුතු ඉතා වේගයෙන් සිදු වෙමින් පවතිනවා.

අපිට වෝදනාවක් එල්ල වෙනවා, මේ අය වැය අලුත් එකක් නොවෙයි, මෙය පෙර ආණ්ඩුව කරගෙන ආපු වැඩ පිළිවෙළේම ඉදිරි පියවරක් කියලා. මම සඳහන් කරන්න කැමැතියි, මෙතෙක් කාලයක් ආණ්ඩු කරපු අය මේ දේවල් හරියට කළා නම් අද අපේ රට ඉතා දියුණු රටක් බව. හැබැයි, විවේචන කරන්නේ, වෝදනා කරන්නේ ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉතිහාසය පුරාම මේවාට විරුද්ධ වුණා, ඒ නිසා මේ රට ඉදිරියට ගියේ නැහැ කියලායි.

සිංගප්පූරුව ගොඩනැඟූ ලී ක්වාන් යූ මහතා විසින් අනුගමනය කළ සංකල්පය ගැන මම මේ අවස්ථාවේදී පොඩ්ඩක් පැහැදිලි කරන්න කැමැතියි. මොකද, එම සංකල්පය නිසා තමයි අද වනවිට සිංගප්පූරුව ලෝකයේ දියුණුම රට බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි උත්සාහ කරනවා, අපේ අය වැය ඇතුළේදී එම සංකල්පය යම් ආකාරයකට අපේ රටට ගැළපෙන විධියට යොදා ගන්න. එම සංකල්පය අපි කෙටියෙන් MPH- Meritocracy, Pragmatism and Honesty - කියලා හඳුන්වනවා. ඒ කියන්නේ,

[ගරු නිමල් පලිහේන මහතා]

කුසලතා තිබෙන මිනිසුන්, හැකියාව තිබෙන මිනිසුන්, සුදුසුකම් ඇති මිනිසුන් තනතුරුවලට පත් කිරීම, ඒ වාගේම ප්‍රායෝගික තත්ත්වය තුළ කටයුතු කිරීම - ඔහුගේ කථාවෙන්ම කියනවා නම්, බළලා කළුද, සුදුද කියලා අදාළ නැහැ, වැඩේ කරගන්න පුළුවන් නම් එය කළ යුතුයි කියන එක - සහ අවසාන වශයෙන් honesty කියන එක. ඒ කියන්නේ අවංකභාවය.

අපේ රටේ මෙපමණ කාලයක් බලය දරපු දේශපාලන පක්ෂ ඒ කාලයේදී මෙන්න මේ කරුණු තුන කෙරෙහි කොතරම් අවධානය යොමු කළාද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. මම දකින විධියට මේවායෙන් ඈත්වීම තමයි මේ රට කඩා වැටීමට හේතු වුණේ. අවංක මනුස්සයෙකුට රට භාර දුන්නා නම් - පසුගිය රජය පැවැති කාලයේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා බවට පත් වූයේ අවංක පුද්ගලයෙක්ද කියන එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඔවුන්ට අවංකකමක් තිබුණා නම් මේ රට ගොඩනඟන්න හොඳ මිනිසුන්ට භාර දෙන්න ඕනෑ තරම් අවස්ථාව තිබුණා. නමුත් සිදු වුණේ රට කඩා වැටීම ඇතුළේ; ඒ අර්බුදය ඇතුළේ හොරකමට, ඒ වාගේම වංචාවට, දූෂණයට ඉඩ තියපු එක විතරයි. ඒ නිසා මේ විධියට ප්‍රශ්න කරන අයට අපි කියන්න කැමැතියි, අපේ රජය කිසි විටකත් වංචාව, දූෂණය ආදී කිසිම දේකට ඉඩක් තියන හෝ අවස්ථාව ලබා දෙන රජයක් නොවෙයි කියන එක. අපි කැපවීමෙන් සහ වගවීමෙන් කටයුතු කරනවා කියන එක මේ වෙලාවේදී මේ රටේ ජනතාවට මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප විසින් මේ ගෙනැවිත් තිබෙන අය වැය හරහා විශේෂයෙන්ම රටේ වැඩ කරන ජනතාවගේ වැටුප් වැඩි කිරීමටත් කටයුතු කර තිබෙනවා. මේ අවස්ථාවේදී විවිධ පාර්ශ්ව ඒවා විවේචනයට ලක් කරමින් පවතිනවා. විරුද්ධ පක්ෂයත් අද විවේචනය කළා, මේ වැටුප් වැඩි කිරීම ප්‍රමාණවත්ද කියන කාරණය සම්බන්ධව. අපි දන්නා තත්ත්වය යටතේ ජීවන වියදම් දර්ශකයට අනුව අද වනවිට මේ රට තුළ ජීවත් වෙන 4දෙනෙකුගෙන් යුත් පවුලකට මාසයකට අඩුම තරමින් රුපියල් 75,000ක්වත් අවශ්‍යයි. ඒත් රටේ පවතින තත්ත්වය සහ මෙතෙක් පැවැති වැටුප් ක්‍රම සලකා බැලීමේදී ඇත්තවශයෙන්ම අපේ රටේ වැඩ කරන ජනතාව නිශ්චිත වූ මූලික වැටුපක් ලබා නැහැ. යම් යම් ආකාරයේ ක්‍රමවේද ඔස්සේ ඔවුන්ට ලබා දීලා තිබෙන්නේ දීමනා.

වෛද්‍යවරුන්ගේ ප්‍රශ්නය ගැනත් අද විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මතු කළා. ඒ වාගේම සමාජය තුළත් මේ කාරණය කථා බහට ලක් වෙලා තිබෙනවා. ඒ අයගේ මූලික වැටුප වැඩි කරන්න කටයුතු කළ නිසා තමයි දීමනා සම්බන්ධයෙන් අපි ඊට වඩා වෙනස් ආකාරයකින් ක්‍රියාත්මක වෙමින් ඔවුන් දැනට ලබන වැටුපට වඩා වැඩි වැටුපක් ලබා ගන්න අවස්ථාව, අවකාශය සලසා තිබෙන්නේ.

ඒත් එක්කම මම කියන්න කැමැතියි, PAYE Tax කියලා එකක් කලින් තිබුණු බව. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා එය ඉවත් කරලා ඒ බදු ආදායම සම්පූර්ණයෙන්ම භාණ්ඩාගාරයට එන්න තිබිච්ච අවස්ථාව ඇහිරුවා. ඊටපස්සේ එම බදු Advance Personal Income Tax - APIT - කියලා වෙනත් නමකින් නැවත වටයකින් හඳුන්වා දුන්නා. ඒ වෙනකොට සියයට 6 සිට සියයට 36ක සීමාවක් දක්වා බදු ගෙවන තත්ත්වයක් තිබුණා. අද අපේ රජය මේ අය වැය තුළින් බදු සඳහා තිබිච්ච රුපියල් ලක්ෂයේ සීමාව රුපියල් 150,000 දක්වා නිදහස් කොට තිබෙනවා. ඒ තුළ රජයේ සේවකයින්ට සාමාන්‍ය ප්‍රමාණයක ඉතිරියක් වී තිබෙන නිසා අද ඔවුන්ගේ ආදායම වැඩිවීමට එය හේතුවක් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් තුළ පැහැදිලිවම සඳහන් වෙන්නේ, ඉතා ඉහළ ප්‍රමාණයක දීමනා. ඔවුන්ට මූලික වැටුපක් කියලා දෙයක් හරියට හඳුනා ගන්න බැරි තරමටම දීමනාවලින් පිරිලා තිබෙන්නේ. ඔබ හමුවේ යම් තොරතුරු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. උදාහරණයක් විධියට probationary lecturer කෙනෙකුට ලැබී තිබුණු මූලික වැටුපට අතිරේකව දීමනා වශයෙන් සියයට 200ක් ලැබෙනවා. අද අපි ඔහුගේ මූලික වැටුප රුපියල් 91,365ක් දක්වා වැඩි කරමින් සමස්ත වැටුප රුපියල් 215,357ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ අනුව ඔහුට අතිරේකව ලැබෙන වැටුප් වැඩිවීම රුපියල් 29,000ක් වෙනවා. එයින් පළමුවෙනි වර්ෂය තුළ, එහෙම නැත්නම් මේ අවුරුද්දේ අප්‍රේල් 01වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි වැටුපක් ලැබෙනවා. එය ප්‍රමාණය වශයෙන් සඳහන් කරනවා නම්, ඇත්ත වශයෙන්ම ඒ රුපියල් 29,303ක වැඩිවීම, පළමුවෙනි අවුරුද්ද තුළ -මේ 2025 වර්ෂය තුළ- රුපියල් 12,291කින් වැඩි වෙනවා. දෙවැනි අවුරුද්දේදී -2026දී- එය රුපියල් 20,707ක් දක්වා වැඩි වෙනවා. තුන්වැනි අවුරුද්ද වෙනකොට සමස්ත වැටුප් වැඩිවීමම ලබා දීමට කටයුතු කරනවා. මේ අනුව බලනකොට ඔවුන්ගේ වැටුප් වැඩි වීම ඉතා සාධාරණයි කියලා අපට ප්‍රකාශ කරන්න පුළුවන්. මේකට එබී බලා වැඩක් නැහැ. මතු පිට කවරය දෙස බලා වැඩක් නැහැ. ඇතුළු වෙලා බලන්න. මේවා විශ්ලේෂණය කරන්න. විග්‍රහ කරන්න. එතකොට මේවා හොඳින් දකින්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

රජයේ වෛද්‍යවරයෙකු ගත්තාම -මෙතැන ප්‍රශ්නයකුත් ඇහුවා - medical officer කෙනෙකුට මූලින් තිබිච්ච රුපියල් 232,725ක දළ වැටුප මේ වෙනකොට, අලුත් තත්ත්වය යටතේ රුපියල් 277,800 දක්වා වැඩි වීමක් වෙලා තිබෙනවා. ඒ අනුව දළ වැටුපෙහි වැඩිවීම රුපියල් 45,075ක් වන අතර, එලඹෙන අප්‍රේල් 01වැනිදායින් පටන් ගන්න මාසයේ ඔහු ලබන වැටුපට අතිරේකව රුපියල් 25,923ක වැටුප් වැඩිවීමක් ලබා ගන්න හැකියාව තිබෙනවා.

මේ අනුව සලකා බලද්දී, මේ රජය විසින් ඉදිරිපත් කරන ලද අය වැය තුළ විශේෂයෙන් රජයේ සේවකයන් අරමුණු කරගෙන කරන ලද වැටුප් වැඩිවීම තුළ ඉතා සාධාරණයක් මේ සමාජයට ඉෂ්ට කර තිබෙනවා කියන කාරණාව ඉතා පැහැදිලියි. තවදුරටත් මේ ගැන කරුණු සඳහන් කරන්න අවශ්‍ය වුවත් කාලය නැහැ. අවසාන වශයෙන් මා මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. ඉතිහාසයේ අප සටන් කරලා තමයි වැටුප් දිනා ගත්තේ. මට මතකයි, මමත් විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු විධියට වැඩ කරපු කාලයේ දින 100කටත් වඩා අපි පාරේ හිටියා, මේ වැටුප් වැඩිවීම් ලබා ගන්න. නමුත් අපට හම්බ වුණේ, දීමනා විතරයි. අද කිසිදු උද්ඝෝෂණයකින්, ඉල්ලීමකින් තොරව අපේ රජය සමත් වෙලා තිබෙනවා, කරුණු සොයා බැලීමකට ලක් කරලා, විමර්ශනය කරලා, ඒවා හොඳින් අධ්‍යයනය කරලා ඔවුන්ගේ ප්‍රශ්නයට ඉතා උචිත පිළිතුරක් ලබා දෙන්න. අපේ රජය ජනතාවාදී රජයක්; ජනතාවගේ අභිලාෂයන් ඉටු කරන රජයක් විධියට පළමුවෙනි මංගල අය වැය ඉදිරිපත් කළා කියන කාරණාව ඔබ හමුවේ තබමින් මා නිහඬ වෙනවා. කාලය ලබා දීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have 16 minutes.

[மு.ப. 11.55]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு 19 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது. தயவுசெய்து, எனக்கு அதை முழுமையாகப் பெற்றுத்தாருங்கள்!

2025ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டம் தொடர்பில் எங்களுடைய மக்கள் சார்பாக கருத்துத் தெரிவிப்பதற்கு அனுமதித்தமைக்காக நான் இந்தச் சபைக்கு நன்றி தெரிவிக்கின்றேன்.

2022ஆம் ஆண்டு எங்களுடைய நாட்டில் ஏற்பட்ட பொருளாதார நெருக்கடியானது, நாடு முழுவதிலுமுள்ள மக்கள் அனுபவித்த ஒரு நெருக்கடியாகும். அந்த நெருக்கடிக்கு இரண்டு முக்கிய காரணங்கள் இருந்தன. ஒன்று, அரசியல் ரீதியான காரணங்கள். மற்றையது, கட்டமைப்பு ரீதியான காரணங்கள். அரசியல் ரீதியான காரணங்களில், இந்த நாட்டில் 30 வருடங்கள் நடைபெற்ற யுத்தம் முக்கியமானது. இது இந்த நாட்டின் பொருளாதாரப் பின்னடைவுக்கு முக்கிய காரணியாக இருந்தது. கட்டமைப்பு ரீதியான காரணங்களில், குறுகிய பார்வைகொண்ட - நீண்ட காலத் திட்டங்கள் அற்ற - அரசாங்கத்தின் ஆட்சி முறை, முறையற்ற நிதி முகாமைத்துவம், வீண்விரயம், ஊழல், மோசடி என்பன முக்கியமானவை. இவை இந்த நாட்டினுடைய பொருளாதார வீழ்ச்சிக்கு மிக முக்கிய காரணங்களாக இருந்தன. இவ்வாறான விடயங்கள் கடந்த காலங்களில் தொடர்ச்சியாக இருந்தபடியால், இந்த நாட்டில் வாழுகின்ற மக்கள் சமூக, பொருளாதார நெருக்கடிகளுக்கு உள்ளானார்கள். அந்த சமூக, பொருளாதார நெருக்கடியானது இந்த நாட்டில் பாரியதோர் அரசியல் மாற்றத்தை ஏற்படுத்தியது. அதனூடாக அமைந்த புதிய அரசாங்கம், தற்போது தன்னுடைய முதலாவது வரவு செலவுத்திட்டத்தை - 2025ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டத்தை - சமர்ப்பித்திருக்கிறது.

இந்தச் சந்தர்ப்பத்தில் நாங்கள், எங்களுடைய வடக்கு, கிழக்கு மாகாணங்களின் பொருளாதார நிலை எப்படிக் காணப்படுகின்றது என்பது சம்பந்தமாக ஆராய வேண்டும். இலங்கையின் மொத்த உள்நாட்டு உற்பத்தியில் நான் வாழுகின்ற வடக்கு மாகாணமானது வெறுமனே 4.2 சதவீதமான பங்களிப்பையே வழங்குகின்றது. அதேநேரம், மேல் மாகாணம் 43.4 சதவீதமான பங்களிப்பை வழங்குகின்றது. எங்களுடைய நாட்டில் பொருளாதாரத் திட்டமிடல் மாகாணங்களுக்கு இடையே பாரிய வித்தியாசத்தைக் கொண்டிருக்கின்றது. எந்தத் தொழிற்றுறையை எடுத்துக்கொண்டாலும், வடக்கு மாகாணம் கீழ்நிலையிலேயே காணப்படுகின்றது. அதற்கு முக்கிய காரணம், புவியியல் ரீதியான சமத்துவமற்ற பொருளாதாரத் திட்டமிடல் ஆகும்.

இந்த வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்து உரையாற்றிய நிதி அமைச்சரான மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த நாட்டின் பொருளாதார ஜனநாயகம் பற்றிப் பேசினார். பொருளாதார ஜனநாயகம் ஏற்பட வேண்டுமென்றால், இந்த நாட்டில் வாழ்கின்ற அனைத்து மக்களுக்கும் பொருளாதார ரீதியாக சம வாய்ப்பும் சம அந்தஸ்தும் கொடுக்கப்பட வேண்டும். வடக்கு, கிழக்குக்கு வெளியில் ஏனைய மாகாணங்களில் வாழ்கின்ற மக்கள் தங்களுடைய அரசியல் உரிமையை தேர்தலுக்கூடாக நிலை நாட்டினார்கள். அவர்களுடைய பொருளாதார உரிமையை நிலைநாட்டுவதற்காக 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தை இங்கு சமர்ப்பிப்பதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் தெரிவித்திருந்தார்.

எங்களுடைய மாகாணங்களைப் பொறுத்தவரையில், அங்கு சற்று வித்தியாசமான சூழலே காணப்படுகின்றது. அது இந்த நாட்டின் பொருளாதார அபிவிருத்தியில் நிச்சயமாக தாக்கத்தை ஏற்படுத்தும். பொருளாதாரத்தின் முக்கிய அடித்தளங்களில் அரசியல் ஸ்திரத்தன்மை, நிர்வாக மேம்பாடு, ஊழல் ஒழிப்பு என்பன மிக முக்கியமானவை. எங்களுடைய மாகாணங்களில் மக்களின் அரசியல் உரிமையை தேர்தலுக் கூடாகப் பெறமுடியாத ஒரு சூழலே காணப்படுகின்றது. நீண்டகால உள்நாட்டுப் பிரச்சினை இந்த நாட்டின் பொருளாதார வீழ்ச்சிக்கு முக்கிய காரணமாக இருந்தது. இதனை வேறு விதமாகச் சொல்வதாக இருந்தால், தமிழ் பேசும் மக்களின் அரசியல் உரிமைப் பிரச்சினை தீர்க்கப்படாமல் நாங்கள் பொருளாதார முன்னேற்றத்தைப் பற்றிச் சிந்திக்க முடியாது. அதாவது, இந்த நாட்டில் ஒரு மக்கள் பிரிவினர் அரசியல் ரீதியாகத் தாழ்த்தப்பட்டிருந்தால், அவர்களுக்கான அரசியல் உரிமை கொடுக்கப்படாமல் இருந்தால், நிச்சயமாக அது எங்களுடைய பொருளாதாரத்தில் பாரிய நெருக்கடியை ஏற்படுத்தும். அதுமாத்திரமன்றி, நாங்கள் கனவு காணும் பொருளாதார அந்தஸ்தை இந்த நாடு அடைந்து கொள்ளமுடியாத ஒரு சூழலும் நிச்சயமாக ஏற்படும்.

வடக்கு மாகாணத்தில் வருமானத்தை ஈட்டித்தரும் முக்கிய தொழில்களாக விவசாயமும் கால்நடை வளர்ப்பும் காணப்படுகின்றன. எனினும், அம்மாகாணத்தின் விவசாய உற்பத்தியானது, மொத்த உள்நாட்டு உற்பத்தியில் 6.2 சதவீதத்தை மாத்திரமே கொண்டிருக்கின்றது. இந்த நாட்டினுடைய பொருளாதாரத்தில் வடக்கு மாகாண விவசாயத்தின் பங்களிப்பு எவ்வளவு குறைவாக இருக்கின்றது என்பதை நீங்கள் இதிலிருந்து தெரிந்துகொள்ளலாம். இன்று நாங்கள் உற்பத்திப் பொருளாதாரம் தொடர்பாகப் பேசிக்கொண்டு இருக்கின்றோம். உற்பத்திப் பொருளாதாரம் இந்த நாட்டின் பொருளாதாரத்தையே மாற்றும் என்பதில் எந்தவித மாற்றுக் கருத்துமில்லை. எங்களுடைய மாகாணத்தை இந்த உற்பத்திப் பொருளாதாரத்தினூடாக எப்படி முன்னோக்கிச் கொண்டுசெல்லலாம் என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். இந்த நாட்டிலுள்ள ஒட்டுமொத்த விவசாயிகளும் உரிய நேரத்தில் உர மானியத்தைப் பெற வேண்டும். அவர்களுடைய உற்பத்திக்கான சந்தை வாய்ப்பு உரிய முறையில் கிடைக்கப்பெற வேண்டும். அவர்களுக்கு அனர்த்தத்தால் ஏற்படுகின்ற இழப்புகளுக்கான இழப்பீடு உரிய நேரத்தில் வழங்கப்பட வேண்டும். இந்த மூன்றும் மிக முக்கியமானவை. எங்களுடைய விவசாயிகளுக்கு உர மானியம் உரிய நேரத்துக்குக் கிடைகின்றதா என்றால், இதுவரை இல்லை என்றுதான் சொல்ல வேண்டும். அது எதிர்காலத்தில் கிடைக்கலாம்! எங்களுடைய விவசாயிகளின் உற்பத்திக்கான சந்தை வாய்ப்பு எங்கிருக்கின்றது என்று பாருங்கள்!

அரசாங்கத்தால் நெல்லுக்கான விலை நிர்ணயம் செய்யப்படுவதற்கு முதல் எங்களுடைய மாகாணத்திலுள்ள விவசாயிகள் தங்களது நெல்லை அறுவடை செய்ததால், மிகக் குறைந்த விலைக்கே அதை விற்கவேண்டிய ஒரு சூழல் ஏற்பட்டது. இலங்கையில் சிறுதானிய உற்பத்தி அதிகளவு மேற்கொள்ளப்படுவது வடக்கு மாகாணத்திலாகும். குறிப்பாக, உளுந்துச் செய்கையில் ஈடுபட்டவர்கள் இந்த வருடம் 100 சதவீத அழிவைச் சந்தித்திருக்கிறார்கள். எனினும், அவர்களுக்கான இழப்பீட்டை வழங்குவதற்கான எந்தவிதமான வாய்ப்பும் இதுவரை ஏற்படுத்தப்படவில்லை.

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

எங்களுடைய மக்களுக்கு பல பிரச்சினைகள் இருக்கின்றன. விசேடமாக, உற்பத்திப் பொருளாதாரத்தை எடுத்துக்கொண்டால் எங்களுடைய மக்கள் தங்களுடைய உற்பத்திகளை மேற்கொள்வதற்குக் காணி அற்றவர்களாக இருக்கின்றார்கள். யுத்த காலத்தில் கையகப்படுத்தப்பட்ட எமது மக்களுடைய வயல் நிலங்கள், மேட்டு நிலங்கள் இன்றுவரை முழுமையாக விடுவிக்கப்படவில்லை. நிலைமை இப்படி இருக்கையில், எப்படி நாங்கள் உற்பத்திப் பொருளாதாரம் பற்றிப் பேசலாம்? எங்களுடைய மக்களின் விவசாயக் காணிகள் இராணுவத்தினராலும் தொல்பொருளியல் திணைக்களத்தினாலும் வனப் பாதுகாப்புத் திணைக்களத்தினாலும் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தினாலும் கையகப்படுத்தப்பட்டு இருக்கின்றன. மக்களுடைய விவசாய நிலங்களில் எல்லைக் கற்கள் இடப்பட்டு, அங்கு அவர்கள் போக முடியாத ஒரு சூழல் ஏற்படுத்தப்பட்டு இருக்கின்றது. மேலும், எங்களுடைய மாகாணத்தில் நீண்ட காலமாகப் புனரமைக்கப்படாத பல விவசாயக் குளங்கள் காணப்படுகின்றன. நாங்கள் உற்பத்திப் பொருளாதாரத்தைப் பற்றிப் பேசுவதாக இருந்தால், அத்தகைய நீர்ப்பாசனக் குளங்கள் புனரமைக்கப்பட வேண்டும்; விவசாயக் காணிகள் விடுவிக்கப்பட வேண்டும்.

எங்களுடைய மாகாணங்களில் யுத்தத்தால் இடம்பெயர்ந்து மீளக்குடியமர்ந்த மக்கள் ஒரு துண்டு மேட்டுக் காணி யிலேயே வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். விவசாயம் செய்வதற்கென அவர்களிடம் காணிகள் இல்லை. ஆனால், எங்களுடைய வன்னிப் பிரதேசத்தில் கைவிடப்பட்ட குளங்கள் - abandoned tanks - மற்றும் கைவிடப்பட்ட வயல்கள் பெருமளவில் காணப்படுகின்றன. மாண்புமிகு சனாதிபதி அவர்கள் தனது உரையில் பிரயோசனமற்றுக் காணப்படுகின்ற அரச காணிகள் பற்றிப் பேசினார். ஆனால், எங்களுடைய மாகாணத்தில் அரச காணிகளுக்கு மேலதிகமாக கைவிடப்பட்ட குளங்களும் கைவிடப்பட்ட தனியார் வயல்களும் இன்னும் மக்களிடம் கையளிக்கப்படாமல் இருக்கின்றன. உற்பத்திப் பொருளாதாரம் பற்றிப் பேசுகின்ற நீங்கள், நிச்சயமாக அந்த இடங்களை விடுவித்து அவற்றை மக்களுக்குக் கொடுக்க வேண்டும். மேலும், எங்களுடைய கால்நடைகளுக்குப் போதியளவு மேய்ச்சல் தரை இதுவரை ஒதுக்கப்படவில்லை. இது மிக முக்கியமான ஒரு பிரச்சினையாகும். கால்நடைகள் வீதிகளில் படுத்திருப்பதால், எங்களுடைய பிரதேசங்களிலுள்ள "A" Grade roadsஇல் நிறைய road accidents நடக்கின்றன. கால்நடைகளுக்குப் போதியளவு மேய்ச்சல் தரைகளை ஒதுக்கினால், நிச்சயமாக road accidents நடைபெறுவதற்கான சந்தர்ப்பத்தைக் குறைக்கலாம்.

இந்த வரவு செலவுத்திட்ட முன்மொழிவுகளில் முதலீட்டு ஊக்குவிப்புத் தொடர்பாக நிறைய விடயங்கள் சொல்லப்பட்டு இருக்கின்றன. ஆனால், வெளிநாடுகளில் வாழுகின்ற எங்களுடைய உறவுகள் யுத்தம் முடிந்த பிற்பாடு இந்த நாட்டில் முதலீடுகளைச் செய்ய வரும்போது, தேவையான காணியைப் பெறுவதற்கு மூன்று வருடங்களுக்கும் மேல் பல்வேறு திணைக்களங்களுக்கும் அலையவேண்டிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது. இவ்வாறான நிலையில், எப்படி நாங்கள் உள்நாட்டு முதலீடுகளை ஊக்குவிக்கலாம்? அவ்வாறு காணியைப் பெற்றால்கூட, football அடிப்பதுபோல் அவர்கள் வெவ்வேறு திணைக்களங்களுக்குப் பந்தாடப்படுகின்றார்கள். எனவே, ஓரிடத்திலேயே அதற்கான எல்லா அனுமதிகளையும் பெறுவதற்கான வாய்ப்பு ஏற்படுத்தப்பட வேண்டும். வெளிநாடுகளிலிருந்து இங்கு வந்து முதலீடுசெய்ய விரும்புகின்றவர்களுக்கு எங்களுடைய நாட்டில் one-spot solution - ஓரிடத்தில் எல்லாப் பிரச்சினைகளையும் தீர்க்கக்கூடிய வசதி - இல்லையென்றால், உள்நாட்டு முதலீட்டை நாங்கள் கனவில் மாத்திரம்தான் காணக்கூடியதாக இருக்கும்.

எங்களுடைய வடக்கு மாகாணமானது, இலங்கையில் இருக்கின்ற இரண்டாவது பெரிய மாகாணம்; கூடிய கால்நடைகளைக்கொண்ட மாகாணம். எங்களுடைய மாகாணத்தில் கிட்டத்தட்ட நான்கு இலட்சம் கால்நடைகள் இருக்கின்றன. அவற்றில் 150,000 மாத்திரமே பால் பெறுவதற்காகப் பயன்படுத்தப்படுகின்றன. மிகுதி இறைச்சிக்காக, தோல் பெறுவதற்காக எனப் பல்வேறு தேவைகளுக்காகப் பயன்படுத்தப்படுகின்றன. வட மாகாணத்தில் இறைச்சி, தோல் பதனிடும் தொழிற்சாலைகள் ஒன்றேனும் இருக்கின்றதா? என்றால், இல்லை! உள்நாட்டு உற்பத்தியைப் பெருக்க வேண்டுமாக இருந்தால், எங்களுடைய பிரதேசங்களில் கிராமிய, சிறிய, மத்திய தர தொழிற்சாலைகள் உருவாக்கப்பட வேண்டும். யுத்தம் முடிவடைந்து 15 வருடங்களாகியும் இன்றுவரை எங்களுடைய மாகாணத்தில் ஒரு தொழிற்சாலைகூட நிறுவப்படவில்லை. எங்களுடைய மாகாணத்திலுள்ள கால்நடைகளால் பெறப்படுகின்ற வருமானம் எங்களுடைய மக்களைச் சென்றடைவதில்லை. எங்களுடைய மாகாணத்தில் சுமார் இரண்டு இலட்சம் ஆடுகள் இருக்கின்றன. அவற்றின்மூலம் ஏற்படுத்தப்படுகின்ற வருமானம் எங்களுடைய மக்களுக்கு நேரடியாகக் கிடைப்பதில்லை.

பால் உற்பத்தித் துறையை எடுத்துக்கொண்டால், எங்களுடைய வட மாகாணத்தில் ஒரு நாளைக்கு கிட்டத்தட்ட 125,000 லீற்றர் பால் உற்பத்தி செய்யப்படுகின்றது. எங்களுடைய வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள மூன்று மாவட்டங்களிலும் ஒரு நாளைக்கு கிட்டத்தட்ட 50,000 லீற்றர் பால் உற்பத்தி செய்யப்படுகின்றது. எனினும், அதில் 50 சதவீதத்துக்கும் மேற்பட்ட பால் வேறு இடங்களுக்கு எடுத்துச் செல்லப்படுகின்றது. அங்கு அந்தப் பாலுக்கு value addition நடைபெறுவதில்லை. எனவே, அங்கு அதற்கான வசதி வாய்ப்புகள் ஏற்படுத்தப்பட்டு பெறுமதிசேர் தொழிற்றுறை ஊக்குவிக்கப்பட வேண்டும்.

எங்களுடைய மாகாணத்தில் காணப்படுகின்ற இவ்வாறான இன்னும் பல விடயங்களை நான் இங்கு குறிப்பிடலாம். அவற்றில் முக்கியமானது கனிய வளம் சம்பந்தமான பிரச்சினை! இன்றுகூட மன்னார் மாவட்டத்தில் கனிய மணல் அகழ்வு சம்பந்தமாகப் பாரியதோர் ஆர்ப்பாட்டம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. அங்கு பொலிஸாருக்கும் மக்களுக்கும் இடையில் முறுகல்நிலை ஏற்பட்டுள்ளது. எங்களுடைய மன்னார் மாவட்டம் குறிப்பாக மன்னார் தீவு கடல் மட்டத்திலிருந்து குறைந்தளவு உயரத்திலேயே இருக்கின்றது. அதாவது, கடல்மட்டம் நிலத்தைவிட சற்றுக்கீழே இருக்கின்றது. இவ்வாறானதொரு பிரதேசத்தில் கனிய மணல் அகழ்வு இடம்பெறுமாக இருந்தால், அங்கு பூர்வீகமாக வாழ்ந்து வருகின்ற மக்களின் வாழ்விடம் அழிக்கப்படும். ஏற்கெனவே, கடந்த அரசாங்க காலத்தில் மணல் அகழ்வுக்கான அனுமதி வழங்கப்பட்டு இருந்தால், அதையும் இரத்துச் செய்ய வேண்டும். ஏனெனில், மக்களுடைய வாழ்விடங்களை அழிக்க முடியாது.

அடுத்து சுற்றுலாத்துறையை எடுத்துக்கொள்வோம். இலங்கையின் கடற்கரையில் 2/3 பகுதி வட, கிழக்கு மாகாணங்களிலேயே இருக்கின்றது. எனினும், அங்கு இன்னும்

சுற்றுலாத்துறை மேம்படுத்தப்படவில்லை. அங்கு சுற்றுலாத்துறை சார்ந்த ஆளணியினர் போதியளவு இல்லை. அதுமாத்திரமல்ல, அவர்களைப் பயிற்றுவிப்பதற்கென ஒரு பயிற்சி நிலையம்கூட இல்லை. எனவே, உற்பத்திசார் பொருளாதாரம் பற்றிப் பேசுவதற்கு முதல் இவ்வாறான அடிப்படைக் குறைபாடுகளைத் தீர்க்க வேண்டும்.

எங்களுடைய வட மாகாணத்தில் இடம்பெற்ற நீண்ட கால யுத்தம் காரணமாக மிகவும் பாதிக்கப்பட்ட மூன்று மக்கள் பிரிவினர் இருக்கின்றனர். அவர்கள்தான் பெண் தலைமைத்துவக் குடும்பத்தினர், முன்னாள் போராளிகள், மாற்றுத்திறனாளிகள். இவர்கள் எங்களுடைய மொத்த சமுதாயத்தில் 1/3 பகுதியாக இருக்கின்றார்கள். எனினும், இவர்களுக்கென எந்தவொரு திட்டமும் இந்த வரவு செலவுத்திட்டத்தில் முன்வைக்கப்படவில்லை. ஒரு சமுதாயத்தில் 1/3 பகுதியினர் தமது சொந்தக்காலில் நிற்க முடியாதவர்களாக இருக்கும்போது, எவ்வாறு அந்தச் சமுதாயம் முன்னேறும்? எனவே, நான் இந்த அரசாங்கத்திடம் கேட்டுக்கொள்வது என்னவெனில், நீண்ட கால யுத்தத்தால் பாதிக்கப்பட்ட எங்களுடைய மாகாணத்துக்கென விசேட திட்டங்களைக் கொண்டுவர வேண்டும் என்றுதான்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Pathmanathan Sathiyalingam, could you please wind up?

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Hon. Deputy Speaker, please give me one minute.

எங்களுடைய மாகாணத்தில் அடிப்படைத் தேவைகளாக இருக்கின்ற வீதிகள், பாலங்கள், யானை வேலிகள் என்பவற்றை அமைப்பதற்கு இந்த அரசாங்கம் ஓரளவு முயற்சி எடுத்திருக்கின்றது. அதற்காக எங்களுடைய மக்கள் சார்பாக இந்த அரசாங்கத்துக்கு நன்றி கூறுகின்றேன். இறுதியாக, இந்தச் சந்தர்ப்பத்துக்கு மீண்டும் நன்றிகூறி, விடைபெறு கின்றேன். வணக்கம்!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Handunnetti**.** You have 18 minutes.

[අ.භා. 12.12]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේග රජයේ ගරු ජනාධිපතිතුමාගේ මංගල අය වැය පිළිබඳ විවාදයේදී වැදගත්ම කාරණා කිහිපයක් මතු කරන්න මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ විවාදයේදී විපක්ෂය පැත්තෙන් මතු වන ප්‍රධාන කාරණාවක් තමයි, මේ ආණ්ඩුව ඉදිරිපත් කරලා තිබෙන අය වැය රනිල් වික්‍රමසිංහගේ අය වැයක් කියන එක. ඒ වාගේම, මේක IMF එකේ අය වැයක් කියනවා. මේකේ වාමාංශික ගතියක් නැහැ කියනවා. මේක නිකම් වමට ගිහිල්ලා දකුණට හැරවුණු අය වැයක් කියනවා. ඉතින්, ඔබතුමන්ලා සතුටු වෙන්න එපායැ, එහෙම නම්, විපක්ෂයට මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්න බැහැ. මොකද, අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ මේ රට පාලනය කරන්න දායක වෙලා තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සමගි ජන බලවේගය, පොදුජන පෙරමුණු ඇතුළු සන්ධාන නම්, ඒ ප්‍රතිපත්තියට අනුව නම් මේ අය වැය හදලා තිබෙන්නේ, කොහොමද මේකට විරුද්ධ වෙන්නේ? එක පැත්තකින්, ඒ නිසා විරුද්ධ වෙන්න බැහැ. අනික් පැත්තෙන්, මොකක්ද මේකේ තිබෙන හරය? ඒක දැනගන්න රනිල් වික්‍රමසිංහගේ IMF වැඩ පිළිවෙළේ, බහුජාතික සමාගම්වල ගජ මිතුරන්ගේ පිළිවෙළේ වෙනස් වෙන්නේ කොතැනද කියලා අපි හරියට දැනගන්න ඕනෑ.

මම දැක්කා, කබීර් හෂීම් මන්ත්‍රීතුමා අය වැය ගැන කියද්දී කියනවා, මේකේ සංවර්ධන බැංකුවකට සල්ලි වෙන් කරලා නැති ලු. ඒක නිසා එතුමා දිව කපා ගන්නවා ලු. මේ අවුරුද්ද අවසාන වෙනකොට එතුමාට දිව කපාගන්න වෙනවා ලු. අපි එතුමාට කියනවා දිව කපාගන්න වෙනවා වාගේම, දැනටම තොල විකාගන්නත් වෙනවා කියලා. මොකද, අපි සංවර්ධන බැංකුවේ වැඩකටයුතු ආරම්භ කරලා තිබෙන්නේ, දැන්. ඒ සංවර්ධන බැංකුව වෙනුවෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව එක්ක බිලියන 50ක අරමුදලක් ආරම්භ කරන්න අපි සාකච්ඡා පටන් අරගෙන තිබෙන්නේ. එහි පළමු පියවර හැටියට මේ වෙනකොට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ව්‍යවසායකයන් 15,000ක් හඳුන්වා දීම දියත් කරලා තිබෙන්නේ. අපි මේ වැඩ පටන් අරගෙන තිබෙන්නේ. මේ අය වැය පටලවාගෙන ඉන්නේ මේගොල්ලන්. මේගොල්ලන් ජනතාවත් පටලවන්න හදනවා. එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහලාගේ, සජිත් ප්‍රේමදාසලාගේ අය වැය ඉදිරිපත් වුණේ මොන පදනමින්ද? මීට පෙර ඉතිහාසයේ ඉදිරිපත් වුණු අය වැයවලින් කළේ සාමාන්‍ය ජනතාව මත බදු පටවලා, ගජ මිතුරු පවුල්වාදය තර කරපු එක. ජනතාවටයි ඔබතුමන්ලා බදු ගැහුවේ. ජනතාවගේ බඩට ගහලා, ජනතාවට පටි තද කරගන්න කියලා, වැටුප් වැඩි කරන්නේ නැතුව, උද්ඝෝෂණය කරන අයට කඳුළු ගෑස් ගහලා, ඉල්ලීම් ඉල්ලන අයට පහර දුන්නා. අපි දන්නවා, ඒ අය වැය විවාදය තිබුණු කාලයේ මේ පාර්ලිමේන්තු වට රවුමේ කොච්චර උද්ඝෝෂණ තිබුණාද කියලා. ඒවාට ගහලා, මර්දනය කරලා තමයි පාර්ලිමේන්තුවේ අය වැය සම්මත කළේ. හැබැයි, ගජ මිතුරන්ට වාසි, ප්‍රයෝජන දුන්නා. මෙන්න වෙනස.

2024 අය වැය කථාවේදී මුදල් අමාත්‍යවරයා හැටියට රනිල් වික්‍රමසිංහ මහත්මයා මොනවාද කියන්නේ? එතුමා මෙහෙම කියනවා.

"සමහර කණ්ඩායම් පඩි වැඩි කරන්න කියා උද්ඝෝෂණ කරනවා. පඩි වැඩි කිරීම ගැනත් මම වචනයක් සඳහන් කළ යුතුයි. පඩි වැඩි කිරීම හිතුමතේ කරන්න බැහැ. රජයේ සේවකයන්ට පඩි ගෙවීම සඳහා රජයේ බදු ආදායමින් සියයට 35ක් වැයවෙනවා. තවත් පඩි වැඩි කරන්න නම්, රජයේ ආදායම් වැඩි කරගන්න ඕනෑ."

ජනතාවට වැල් පාලමේ යන්න කිව්වේ ඒ අය වැයේදී තමයි. එදා රනිල් වික්‍රමසිංහ ජනතාව වැල් පාලමේ යවලා එතුමා කොහේද ගියේ? ගෙවල් ගිනි තැබුවා කියලා ජනතාවගේ බදු මුදල් මිලියන ගණන් බෙදාගත්තා. ජනාධිපති අරමුදලින් සෞඛ්‍ය ව්‍යසම්වලට කොහොමද සල්ලි ගත්තේ කියලා පසුගිය දවසක ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා පාර්ලිමේන්තුවේ ඒ විස්තර සභාගත කළා. එදා ජනතාව වැල් පාලමේ යැව්වා; වැටුප් වැඩි කරන්න දුන්නේ නැහැ. වැටුප් වැඩි කරනකොට ඒක කවදාවත්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මූලික වැටුපට එකතු කළේ නැහැ. ඒක දීමනාවක් හැටියට එල්ලලා ජනතාව රවට්ටලා, අනික් පැත්තෙන් ඒගොල්ලන් ගසා කෑවා.

ඒ විතරක් නොවෙයි, ඒ ආණ්ඩුව හඳුන්වා දුන් කැසිනෝ බද්ද ක්‍රියාත්මක වුණේ අවුරුදු 12කට පස්සේ. අවුරුදු 12කට පස්සේ ක්‍රියාත්මක කරපු කැසිනෝ බද්දෙන් රජය ආදායම් ලබා ගත්තේ කොහොමද? 2019 අය වැයෙන් 2019 ජූනි 01වැනි දා ඉඳලා කැසිනෝ ගාස්තුවක් හඳුන්වා දුන්නා, ඩොලර් 50ක ඇතුළත් වීමේ ගාස්තුවක් ලෙස. කැසිනෝ මත පනවන ලද වාර්ෂික බලපත්‍ර ගාස්තු රුපියල් මිලියන 200 ඉඳලා 400 දක්වා වැඩි කළා. රුපියල් මිලියනයක රැජිනෝ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් හඳුන්වා දුන්නා. හැබැයි, අවුරුදු ගණනකට පස්සේ ඒවා ක්‍රියාත්මක කරද්දී 2022දී කැසිනෝවලින් ලැබුණු රුපියල් බිලියන 2ක් වූ ආදායම, 2023දී රුපියල් මිලියන 500ට බැස්සුවා.

ආදායම් අඩුවීම සියයට 75යි. ඒ වාගේම Capital Gain Tax එක හඳුන්වා දුන්නා, සියයට 49ක් ආදායම අඩු කර ගත්තා. රුපියල් බිලියන 5ක් සොයන්න ඕනෑ එක රුපියල් බිලියන 2ට අඩු කර ගත්තා. එහෙමයි වුණේ. ඒ වාගේම ඔබ අප කවුරුත් දන්නවා, ඒ ආණ්ඩුවල ප්‍රතිපත්ති නිසා රජයට ආදායම අහිමි කළේ කොහොමද කියලා. රජයේ ආදායම අහිමි කළා. 2019දී මුළු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය සියයට 54යි; 2020දී සියයට 38යි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීමේ ක්‍රියාවලිය දුර්වල වෙලා, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 6.8ක් වෙච්ච බදු ආදායම එකතු කිරීම සියයට 3.5ට අඩු කළා. ආදායම් බද්ද සියයට 31කින් අඩු වුණා. එකතු කළ අගය මත බද්ද සියයට 48කින් අඩු වුණා. ජාතිය ගොඩ නැඟීමේ බද්ද අහෝසි කළා. ඒක නිසා සියයට 96කින් අඩු වුණා. ආර්ථික සේවා ගාස්තුව සියයට 72කින් අඩු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආදායම් නැතුව රටක් ගෙනියන්න බැහැ. අපි එදා ඒ අය වැය ඉදිරිපත් කරද්දී කිව්වා, එදා තිබුණු ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව නිසා ආදායම් බදු එකතු වෙන්නේ නැහැ, ශ්‍රී ලංකා රේගුවේ ආදායම එකතු කරන්නේ නැහැ කියන එක. ගජ මිතුරන්ට ඒවා බෙදා ගන්න ඉඩ හැදුවා. දුප්පත් මිනිහාට ටෙලිකොම් බද්ද ගැහුවා, දුප්පත් මිනිහාට විදුලි බද්ද ගැහුවා, තෙල්වලට බද්ද ගැහුවා. අය වැය ඉදිරිපත් කරන්න කලින් දවසේත් බදු ගහනවා. අය වැය ඉදිරිපත් කළාට පස්සේ දවසේත් SMS එක එනවා. එහෙම වුණේ නැද්ද? IMF එක කියලා නොවෙයි, ඒවා කළේ. ඔබතුමන්ලා මේ රටේ ජනතාවට අය වැය ගැන තිබුණු විශ්වාසය බිඳ වැටිටුවා. හැමදාම SMSවලින් බදු ගැහුවේ. ඒක තමයි ඇත්ත. අය වැය එන්න කලින් බදු ගැහුවා. අය වැය ඉදිරිපත් කළාට පස්සේත් බදු ගැහුවා. ඒක තමයි ඇත්ත. එදා තිබුණේ එහෙම කරපු ආණ්ඩුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ තිබෙන වෙනස තමයි, ජනතාවට වියදම් කරන්න මුදල් අතට දීලා, ජනතාවට ආදායමක් හදලා දීලා, නිෂ්පාදන ආර්ථිකය දියුණු කිරීම. ජනතාවගේ ක්‍රය ශක්තිය වැඩි කරනවා. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩි කරනවා. කර්මාන්ත ගමට ගෙනියනවා. ව්‍යාපාර ආරම්භ කරනවා. ජාතික ආදායම දියුණු කරනවා. ආර්ථිකයට ජන සහභාගිත්වය ගෙනැල්ලා ඒ හරහා ජනතාවගේ කැමැත්තෙන් රජයට ආදායම එකතු කරනවා. රජයට බදු ගෙවනවා.

ඒ වාගේම, මුදල් අමාත්‍යාංශයට හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්වරුන්ට අපි ස්තුතිවන්ත වෙනවා. අපේ ජනාධිපතිතුමා වැඩ භාර ගත්තාට පස්සේ, සියයට 99ක් ඒ අයගේ කාර්යක්ෂමතාව වැඩි වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා රේගුවේ ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය සියයට 90කින් වැඩි වෙලා තිබෙනවා. ඒ බලහත්කාරයෙන් නොවෙයි. දැන් ව්‍යාපාරිකයෝ, කර්මාන්තකරුවෝ තමන්ගේ බදු මුදල් වංචා කරන්නේ නැහැ, හොරකම් කරන්නේ නැහැ, පගාවට යට වෙන්නේ නැහැ කියලා විශ්වාසයක් ඇතිව ඒවා රජයට දෙනවා. "සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන්ගේ දේ දෙවියන්ටත් දෙන්න" කියලා තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා වාගේ, අදාළ තැනට අද ආදායම එකතු කරනවා. ඒකයි වෙනස. ඒක IMF කථාවක් නොවෙයි. ඒක රනිල් වික්‍රමසිංහගේ කථාවක් නොවෙයි. රනිල් වික්‍රමසිංහලා ගජ මිතුරන්ට බෙදුවා, ජනතාවට බඩේ පහර ගැහුවා. අද මේ ආණ්ඩුව ජනතාවට වියදම් කරන්න ආදායම අතට දීලා, රජයේ සේවකයාගේ වැටුප් වැඩි කරලා, විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරලා, වතු කම්කරුවාට ආදායමක් දීලා, පෞද්ගලික අංශයේ සේවකයාට රුපියල් 9,000කින් වැටුප වැඩි කරලා දීලා, වියදම් කිරීමේ හැකියාව හදා දීලා තිබෙනවා. ඉතින් අමාරුයි, බලාගෙන ඉන්න බැහැ. "අපටත් මේවා කරන්න තිබුණා නේ" කියලා හිතෙනවා. යටි හිතින් කියනවා, "අපේ නායකයෝ මේවා කළේ නැහැ නේ. අපට රෙදි ඇඳගෙන දැන් ගමට යන්න බැහැ නේ" කියලා. කරන්න දෙයක් නැහැ. මේකට සමාජ වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය ලු, මේක අපි කරන්න හිතාගෙන හිටපු එක ලු, මේ වෙලා තිබෙන්නේ ඒක ලු. සිද්ධ වෙලා තිබෙන්නේ මේකයි. ඔබතුමන්ලා ඔය පැත්තේ ඉඳගෙන අපි ගැන කියපු ඒවා දැන් ඔබතුමන්ලාටම වමාරන්න සිදු වෙලා තිබෙනවා. මැතිවරණවලදී ජනතාවට ගිහිල්ලා කිව්වේ මොකක්ද? "අනුර කුමාර දිසානායක ජනාධිපති වුණොත් ආයෝජකයෝ එන්නේ නැහැ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දාලා යනවා, වාහන දෙකක් තිබුණොත් එකක් ආණ්ඩුවට ගන්නවා, බිල්ඩින් දෙකක් තිබුණොත් එකක් ආණ්ඩුවට ගන්නවා, රට බංකොලොත් වෙනවා, සාගතයෙන් මැරෙන්න වෙනවා, ව්‍යාපාර බංකොලොත් වෙනවා, පෞද්ගලික අංශයත් එක්ක මුහුණ බලන්නේ නැහැ" කිව්වා. එහෙම නේ, කිව්වේ.

හැබැයි, දැන් අපේ මේ පුරවැසි අය වැයෙන් අපේ දැක්ම, වැඩ පිළිවෙළ, සැලැස්ම සමාජයට ඉදිරිපත් කරලා තිබෙනවා. සමාජය ඒක පිළිගෙන තිබෙනවා. අද ජනතාව ඒක පිළිගන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතුමන්ලාට ඒක බලාගෙන ඉන්න බැහැ. ඒක නිසා මෙතුමන්ලා එක පැත්තකින් කියනවා, "අපි මේකට විරුද්ධ නැහැ, මේක අපේම වැඩ පිළිවෙළ, අපිත් මේවා කරන්න හිතා ගෙන හිටියේ, සීයාත් මේවාම තමයි කිව්වේ" ආදී වශයෙන්. එහෙම කියන ගමන් කියන්න දෙයක් නැති නිසා පොඩි පොඩි කැලි අල්ලා ගෙන අරකේ අඩුවක් තිබෙනවා, මේකේ අඩුවක් තිබෙනවා කියලා කියනවා. ඇත්ත කථාව මේක නේ. මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් හිතන්නේ නැද්ද, මේ වැඩ පිළිවෙළ ඔය පැත්තේ අයගේ කටකින් කියවා ගන්න පුළුවන් වුණා නම් හොඳයි කියලා?

සජිත්ගේ කටින් හරි, රනිල්ගේ කටින් හරි, රාජපක්ෂ පවුලේ කටකින් හරි, බැසිල් රාජපක්ෂගෙන් හරි මුදල් ඇමතිවරයෙක් හැටියට මේ වාගේ අය වැය කථාවක් කියවා ගන්න පුළුවන් වුණා නම්, "අපිත් රෙදි ඇඳගෙන ගමට යනවා නේද?" කියලා හිතෙන්නේ නැද්ද? එහෙම කියවන්න බැහැ. ඒවාට හැඟීමක් තිබෙන්න ඕනෑ; දැනීමක් තිබෙන්න ඕනෑ. සමාජය ස්පර්ශ කරලා ජීවත් වෙලා, මිනිස්සුත් එක්ක වැඩ කරලා, ඒ අදහස් හුවමාරු කර ගත්ත අත්දැකීමක් තිබෙන්න ඕනෑ. ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට ඒ අත්දැකීම තිබෙනවා. උතුරේ ජනතාවගේ හෘද ස්පන්දනය දැනෙනවා. ඡන්ද ගන්න නොවෙයි. නැහෙනහිර පළාතේ ජනතාවට වෙච්ච අසාධාරණය දන්නවා. එතුමා

"මලයගම්" කියන වචනය අය වැය කථාවේ ඉදිරිපත් කරන්නේ නිකම් නොවෙයි. වතුකරයේ ජීවත්වෙන ඒ මිනිස්සුන්ගේ ඇත්ත හෘද ස්පන්දනය දන්නා මහජන නියෝජිත මන්ත්‍රීවරු ඒක දන්නවා. "මලයගම්" කියන වචනය අය වැය විවාදයකදී කථාවකට ආපු පළමුවෙනි අවස්ථාව මේ. ඒ මිනිසුන්ගේ ඇත්ත වටිනාකම දීපු අය වැය මෙකයි. *[බාධා කිරීමක්]* ඒක පිළිගන්නවා කියලා රාධාකෘෂ්ණන් මන්ත්‍රීතුමා කියනවා. ඒක ඇත්ත. මනෝ ගනේසන් මන්ත්‍රීතුමා මට අය වැය අවසන් වෙච්ච වෙලාවේම කිව්වා, "හඳුන්, මේක තමයි වෙන්න තිබ්බේ දේ" කියලා. ලංකාවේ පළමුවෙනි වතාවට රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා, ජාතික සංකේත දිනයක් වෙනුවෙන්. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ හැමෝම එකතු වෙලා රටක් හැටියට හිතන්න මේ අය වැයේ මහ පෙන්වීමක් දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුරෝපයේ රටක තිබෙන දියුණුව හඹා යන්න පුළුවන් ආර්ථික දැක්මක් මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. යුරෝපයේ රටක දියුණුව කරා යන්න පුළුවන්. අද යුරෝපය කාසි හා නෝට්ටු භාවිතයෙන් තොර digital payment ක්‍රමයකට ගිහිල්ලා තිබෙනවා. බස් එකේ ගියත්, කෝච්චියේ ගියත් අද ගෙවීම් - payments - කරන්නේ ඩිජිටල් ක්‍රමයට. නමුත් අපි තවම කඩදාසි සල්ලි කොළ සාක්කුවේ පුරවාගෙන යනවා. අද ඒ යුගය අවසන් කරන්න ඕනෑ. අද ඒ යුගය අවසන් කරන්නට ඩිජිටල් තාක්ෂණය පාවිච්චි කරන්න අවස්ථාව ඇවිල්ලා තිබෙනවා. රජය ඒවා භාගයක් ක්‍රියාත්මක කරලා තමයි ඇවිල්ලා තිබෙන්නේ. රජයේ paymentsවලට දැන් GovPay app එක ක්‍රියාත්මක කරලා තිබෙනවා. රටක් ඉස්සරහට යන්න ඕනෑ එහෙමයි. ඒවා කියන්න කුහක වෙන්න එපා; ඒවා කියන්න ලජ්ජා වෙන්න එපා. ඒවා අපට කර ගන්න බැරි වුණා කියලා ඇඹරෙන්න එපා. ඒවා හොඳ දේවල් හැටියට පිළිගන්න ඕනෑ.

කල්පනා කරලා බලන්න, අද metro bus service එක පටන් ගන්න තීරණය කරලා තිබෙනවා. සංචාරක කර්මාන්තයට දුම්රිය සේවය නවීකරණය කරලා යොදවන්න තීරණය කරලා තිබෙනවා. අයාලේ ගිය SLTB එක අද අලුත් යුගයකට යන්න පටන් අරගෙන තිබෙනවා. ඇළ මාර්ග පද්ධතිය භාණ්ඩ ප්‍රවාහනයට, මගී ප්‍රවාහනයට යොදවා ගන්න ක්‍රමය ගැන අද හිතමින් තිබෙනවා. රටේ අභ්‍යන්තර ප්‍රවාහනය ශක්තිමත් කර ගන්න ඕනෑ. මොකද, අපේ රට ලොකු වෙන්නේ නැහැ. හැබැයි, මේ රටේ කාර්යක්ෂමතාව ලොකු කරන්න නම්, අපි මේ පද්ධතිය දියුණු කරන්න ඕනෑ. වරාය පුළුල් කළාට විතරක් වැඩක් නැහැ, බහලුම් පද්ධතිය තව දියුණු කරන්න ඕනෑ. ඒකට බිලූමැන්ඩල්වල, පෑලියගොඩ විතරක් නොවෙයි, වෙයන්ගොඩ දක්වා අද clearance සේවාව දියුණු කරලා තිබෙනවා. මේවා අලුත් දේවල්; අලුතෙන් හිතපු දේවල්.

ඒ විතරක් නොවෙයි. මේ අය වැයෙන් වීදී දරුවන් ගැනත් හිතලා තිබෙනවා. රැඳවුම් භාරයේ සිටින ළමයින් ගැන හිතලා තිබෙනවා. ඒ ළමයෙකුට රුපියල් මිලියනයක ආධාරයක් දීලා ගෙයක් හදා ගන්න අවස්ථාව දෙන්න තීරණය කරලා තිබෙනවා. ඒවා රනිල් වික්‍රමසිංහලා හීනෙන්වත් හිතපු ඒවා නොවෙයි. ඒවා රාජපක්ෂලා හීනෙන්වත් හිතපුවා නොවෙයි. එහෙම ක්‍රමයක් හදලා තිබෙනවා. හිරගෙවල් වල ඉන්නෙත් මිනිස්සු කියන එක බෝඩ් ලෑල්ලට සීමාවෙච්ච යුගයක් වෙනුවට ඒවා දැන් යථාර්ථයක් බවට පත් කරන්න තීරණය කරලා තිබෙනවා. ඒවා හොඳ වැඩ. ඒවා අලුත් දේවල්. අපේ අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වුණාම විපක්ෂයෙන් කිව්වා අපට මතකයි, අනුරාධපුරයේ ගොවි පියෙකුගේ පුතෙක් ත්‍රිපෝෂ ෆැක්ට්‍රිය වැහුවා කියලා. එහෙම මාධ්‍ය සංදර්ශන දැම්මා. මේ අය වැයෙන් ඒවා වහනවා නොවෙයි, ඒකට තව මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. මේවා ඇත්ත.

අද සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා කථා කරනකොට කිව්වා මම දැක්කා, කර්මාන්තවලට ඉඩක් දීලා නැහැ; SMEs දියුණු වෙන්නේ නැහැ; කර්මාන්ත අමාත්‍යාංශයට මුදල් වෙන් කරලා නැහැ කියලා. කාරක සභා අවස්ථාවේදී අපි ඒ ගැන තව කථා කරමු. අපි විපක්ෂයේ සිටියදී ආණ්ඩු පක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඇවිල්ලා අපට ඔය කෙඳිරිල්ල කිව්වා, අපට මතකයි. අපට ඇවිල්ලා කිව්වා, "මගේ අමාත්‍යාංශයට කපලා තිබෙන්නේ; මචං, පුළුවන් නම් ටිකක් මම ගැන කථා කරපන්; මට බැන්නත් කමක් නැහැ" කියලා. එහෙම කිව්වා. ඒ කාලයේ කිව්වා, පවුලටම බෙදාගෙන තිබෙන්නේ කියලා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒවා ගැන දන්නේ නැහැ නේ. ඔබතුමා දන්නේ නැහැ, මේගොල්ලෝ ඇවිල්ලා අපට කියපුවා. "පවුලටම බෙදාගෙන තිබෙන්නේ. සියයට 90ක් පවුලට අරගෙන තිබෙන්නේ, අපට මොකුත් නැහැ" කියලා කිව්වා. "අපට මොකුත් නැහැ, පුළුවන් නම් පොඩ්ඩක් අපි ගැන කථා කරන්න" කියලා කිව්වා. එහෙම ප්‍රශ්නයක් මේ අය වැයේ නැහැ. "කර්මාන්ත අමාත්‍යාංශයට අඩුයි, වෙළඳ අමාත්‍යාංශයට අඩුයි" වාගේ ඒවා මේකේ නැහැ . ඔබතුමන්ලා අය වැය ගැන දන්නවා. අය වැය කථාවේ තිබෙන්නේ මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරන අලුත් යෝජනා. විසර්ජන පනත් කෙටුම්පතේ තිබෙන්නේ අමාත්‍යාංශවලට කරපු වෙන් කිරීම්. අය වැය කථාවත් එක්ක ඉදිරිපත් කරන මේ, "ජාතික අය වැය 2025 පුරවැසි අයවැය" පොත කියවන්න.

මේ පොතේ තිබෙනවා, විසර්ජන පනතෙන් රේඛීය අමාත්‍යාංශවලට අයත් ආයතනවලට වෙන් කරලා තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය. මම මේක කියන්නේ වගකීමෙන්. මේ පොතේ එම සංඛ්‍යා දත්ත ලිඛිතව තිබෙන්නේ; print කරලා තිබෙන්නේ. බලන්න, මේ පොතේ 41වැනි පිටුවේ ශීර්ෂය විධියට සඳහන්ව තිබෙනවා, "2025 වර්ෂය සඳහා ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය" යනුවෙන්. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 99ක් වෙන් කර තිබෙනවා. ඒ, පුනරාවර්තන වියදම්වලට රුපියල් බිලියන 38කුත්, ප්‍රාග්ධන වියදම්වලට රුපියල් බිලියන 59කුත් වශයෙන්. ඒ යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට රුපියල් බිලියන 38ක් වෙන් කර තිබෙනවා. මේ පොතේ තිබෙනවා, අලුතෙන් යෝජනා කරපු ගොඩක් දේවල්. Paranthan Chemicals Company Limited එකේ නම තිබුණාට පරන්තන්වල chemicals හැදුවේ නැහැ. අපි අද උතුරේ පරන්තන්වල chemicals නිෂ්පාදන කර්මාන්ත නගරයක් හදන්න තීරණය කර තිබෙනවා. වහලා තිබුණු, අඩාළ වෙලා තිබුණු වාලච්චේනයි කඩදාසි නගරය අද අපි ආරම්භ කර තිබෙනවා. ඒකට ඉස්සර කිව්වේ "Paper City" කියලා. ලංකාවට අවශ්‍ය කරන සියලු කොළ; පාසල් දරුවන්ට අවශ්‍ය පොත්පත් සියල්ල හැදුවේ Paper City එකේ. ඒ Valaichchenai Paper City එකටම යන්න හදපු දුම්රිය සේවය තවමත් තිබෙනවා. කැබිනට් මණ්ඩලයේ අපි දැනටමත් තීරණයක් අරගෙන ඉවරයි, රජයේ සියලු ආයතනවල ඉවත දමන කඩදාසි අරගෙන ලංකාවට අවශ්‍ය කඩදාසි නිෂ්පාදනය කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා විශ්වාස කරන්න, අවුරුද්දකට රුපියල් බිලියන 197ක් වැය වෙනවා, ලංකාවට පිටරටින් කඩදාසි ගේන්න. අපි ඒ මුදල ඉතුරු කරන්න ඕනෑ. ආදායම එකතු කරනවා වාගේම ආදායම ඉතුරු කරන එකත් ක්‍රමයක්. ඒ සඳහා අපි මේ රටේ නිෂ්පාදන දියුණු කරන්න ඕනෑ. අපි ලබන මාසයේදී කන්කසන්තුරේ ලුණු නිෂ්පාදනාගාරය අලුතෙන් ආරම්භ කරනවා. මම සහතිකයක් දෙනවා, ලබන අවුරුද්ද අවසාන වෙනකොට ලංකාවට අවශ්‍ය ලුණුවලින් සියයට 70කට වැඩිය නිෂ්පාදනය සම්පූර්ණ කිරීම අපි රජයේ ලුණු කර්මාන්තශාලා දෙකෙන් ආරම්භ කරනවා කියලා. ඒ, ජාතික ලුණු සමාගම සහ Lanka Salt Limited එක. අපි ඒක කරනවා. මේක හදිසි තත්ත්වයක්. හැබැයි අපි මේ හදිසි තත්ත්වයට මුහුණ දීලා, ඒ තත්ත්වය සමනය කරගෙන තිබෙනවා. අපේ රටේ හෙක්ටෙයාර 16,000ක අලුතෙන් පොල් වගා කරන්න උතුරු පොල් ත්‍රිකෝණය ආරම්භ කර තිබෙනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ජනාධිපතිතුමාට ගෞරවයක් හැටියට මම අද මේක කියන්න ඕනෑ. ජනාධිපතිතුමා ඉන්දියාවේ විදේශ කටයුතු ඇමති ජයශංකර් මැතිතුමා හම්බ වෙච්ච වෙලාවේ උතුරේ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරන්න එතුමා මැදිහත් වෙනකොට ජනාධිපතිතුමා ඉන්දියානු විදේශ ඇමතිතුමාට කිව්වා, "උතුරේ ජනතාව මම හිතුවාටත් වඩා ලොකු වගකීමක් මට භාර දීලා තිබෙනවා. ඒ ජනතාව මගේ ජනතාව. ඒක හින්දා මම ඒ ජනතාවගේ වගකීම භාරගන්න ලැහැස්තියි" කියලායි. ඒ වෙලාවේ එතැන හිටපු මාධ්‍යවේදීන් පුදුම වුණා. මොකද, ජයශංකර් මහතා එක්ක කවුරුවත් එහෙම මුහුණට කථා කරලා නැහැ. එතුමාට ඒක එහෙම කෙළින් කියන්න තරම් ධෛර්යයක් තිබෙන නායකයෙක් තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මුදල් ඇමතිතුමා වශයෙන් ගරු ජනාධිපතිතුමා මෙවර අය වැය ඉදිරිපත් කළා විතරක් නොවෙයි, භය නැතුව ඒ සඳහා ප්‍රතිපාදනත් වෙන් කර තිබෙනවා. හැබැයි අපි දැක්කා, මීට කලින් හිටපු මුදල් ඇමතිවරුන් කටයුතු කළේ එහෙම නොවෙයි කියලා. ඒ අය උතුරට ප්‍රතිපාදන වෙන් කරන්න භයයි, දකුණ කලබල වෙයි කියලා; දකුණේ තමන්ගේ ඡන්ද පදනම වෙනස් වෙයි කියලා. ඒ අය ජාතිවාදී පදනමින් තමයි ඒවා දැක්කේ. කොච්චර සුරංගනා කථා ඒ අය වැයවල තිබුණාද, "රුවන්වැලි සෑය ළඟයි මම දිවුරුම් දුන්නේ, මම මෙහෙමයි හරමයි කරන්නේ" කියලා. එහෙම කථාවක් මේ අය වැයේ නැහැ. මේක ජාතිය සමගිය දිශාවට යන අය වැයක්, ජාතික නිෂ්පාදනය දියුණු කරන අය වැයක්, ඒ වෙනුවෙන් මෙතෙක් සංවර්ධනයට එකතු කරගත්තේ නැති උතුරු නැඟෙනහිර පළාත්, වතුකරයේ ජනතාව ඒකාබද්ධ කරන අය වැයක්. මේක ජාතික සමගි අය වැයක්. මේක වම, දකුණ මාරු වෙච්ච අය වැයක් නොවෙයි.

අපේ දේශපාලන ස්ථාවරයන් අපි හොඳට දන්නවා. අපේ ප්‍රතිපත්ති අපි හොඳට දන්නවා. ශ්‍රී ලංකාව ආපස්සට යන්න නොවෙයි, ඉදිරියට යන්න තිබෙන රටක්. අපි ලංකාව අතීතයට ගෙනියන්නේ නැහැ. අපි ලංකාව අනාගතයටයි ගෙනියන්නේ. අනාගත ලෝකයත් එක්ක බද්ධ වෙන්න අපි හොඳට දන්නවා. ශ්‍රී ලංකාව පොල් කට්ටෙන් වහන මානසිකත්වයක් අපට නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සීමාවලුත් අපි දන්නවා, ලෝක බැංකුවේ සීමාවලුත් අපි දන්නවා. අසල්වාසී ඉන්දියාවේ, චීනයේ geopolitics ගෙන අපි දන්නවා. ඒ සියලු දේශපාලනය අඳුරගෙන මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරලා ආසියාවේ සුන්දරම, ලස්සනම, පොහොසත්ම රට බවට මේ රට පත් කරන්න අපට දැඩි අධිෂ්ඨානයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අධිෂ්ඨානය වෙනුවෙන් අපි වැඩ කරනවා. අපි ඉතුරු කරපු සල්ලි තමයි ජනතාවට දීලා තිබෙන්නේ. අද මිනිස්සුන්ට විශ්වාසයක් තිබෙනවා, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට බෙදාගන්න පුළුවන්කම තිබෙන වරප්‍රසාද ජනතාව වෙනුවෙන් දීලා ජනතාවගේ අතට ආදායමක් ඉතුරු කරලායි මේ වැඩ කරන්නේ කියලා. අද මිනිස්සු කියන්නේ එහෙමයි.

ඉස්සර අය වැයක් ආවාම ඇමතිවරුන්ට පර්මිට් හදාගන්නවා, වැටුප් වැඩි කරගන්නවා, බෝනස් හදාගන්නවා, insurance එක වැඩි කරගන්නවා, වාහන ගෙන්වන්න තීරණය කරනවා. ජනාධිපතිතුමා කෙළින්ම කිව්වා, අපි බෝනස් හදාගන්නේ නැහැ, අපි වරප්‍රසාද ගන්නේ නැහැ, පර්මිට් එක ගන්නේ නැහැ කියලා. අපි ඒවා අඩු කරලා තිබෙනවා. කැප කිරීම අපේ පැත්තෙන් පටන් අරන් තිබෙනවා. අපි රාජ්‍ය නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කළා. ඒ මොකක්ද? ඔයගොල්ලන්ගේ වැටුප් වැඩි කරනවා, දැන් සේවය හරියට කරන්න, අල්ලස් ගන්න එපා කියලා.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට, විගණන ආයතනවලට කිව්වේ මොකක්ද? බොරු ෆයිල් හදන්න උගන්වන්න එපා; විගණනයේදී බදු වංචා කරන්න උගන්වන්න එපා; ඒ වෙනුවට හරියට බදු ගෙවන්න උගන්වන්න කියලා තමයි කිව්වේ. ඒ නිසා ආදායම් බදු සම්බන්ධ ප්‍රශ්නයක් අපට නැහැ. ආදායම් එකතු කිරීම සම්බන්ධයෙනුත් අපට ප්‍රශ්නයක් නැහැ. මේක ඔබතුමන්ලාට අලුත් වෙන්න පුළුවන්. ඔබතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්තිය අනුව මේකට මොන ලේබලය දමා ගත්තත් අපට කමක් නැහැ. අපට ඒකට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපි කියන්නේ මේකයි. මේ අය වැය රටේ ජනතාවගේ උන්නතිය වෙනුවෙන් අපි නිර්මාණය කරපු අය වැයක්. මේ වෙනුවෙන් ජනතාවගේ අදහස් අරගෙන තිබෙනවා; වෘත්තිකයන්ගේ අදහස් අරගෙන තිබෙනවා. අපේ රටේ ව්‍යවසායක ආර්ථිකයක් නිර්මාණය කරන්න, අපේ අපනයන ආදායමේ පරතරය වෙනස් කරලා, ආනයන අපනයන පරතරය වෙනස් කරලා, රටේ ප්‍රාථමික ගිණුම ශක්තිමත් කරන අය වැයක් අපි ඉදිරිපත් කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ රටේ විපක්ෂය මේ අය වැයට භය වුණාට, මේ රටේ ජනතාව මේ අය වැය ආදරයෙන් වැළඳ ගත්තා කියලා. එසේ ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. සියලුදෙනාටම බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended for lunch till 1.00 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Namal Rajapaksa. You have 17 minutes.

[අ.භා. 1.00]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අය වැය විවාදය අතරතුර අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව.

බොහෝ වෙලාවට අය වැය තුළින් රටේ ආර්ථිකය සහ ඉදිරි දැක්ම පිළිබඳව යම් අදහසක් මේ වසර ඇතුළත ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධයෙන් අපට දැනගන්න පුළුවන්. හැබැයි, ආණ්ඩු පක්ෂයේ බොහෝ අය සඳහන් කළේ නොයෙක් ක්ෂේත්‍රවල අය මුණ ගැහිලා, ඒ අයගේ අදහස් උදහස් අරගෙන මේ අය වැය ලේඛනය සකස් කළා කියන කාරණයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බැලූ බැල්මට ඒ සියලු පාර්ශ්වයන් හම්බ වෙන්න ඇති. හැබැයි, තමුන්නාන්සේලාගේම ප්‍රතිපත්ති ප්‍රකාශනය හදපු අය හම්බ වුණාද, නැද්ද කියන ප්‍රශ්නය නම් පැන නඟිනවා. අය වැයට පෙර වැඩි කළ යුතු බොහෝ බදු වැඩි කළා. ඒක හරි. අතිගරු ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවේදී සඳහන් කළා, අපි අය වැය තුළින් බදු වැඩි කරන්න යන්නේ නැහැ කියලා. ඒක හරි. මොකද, ඊට පෙර වැඩි කළ හැකි බොහෝ දේවල් වැඩි කළා.

හැබැයි, IMF රාමුව තුළ මේ රටේ ආර්ථිකය යම් මධ්‍ය ලක්ෂ්‍යයකට පරිවර්තනය කළ යුතුයි කියන කාරණය මැතිවරණ කාල සීමාව තුළත් අපි පුන පුනාම කිව්වා. නමුත් එදා තමුන්නාන්සේලා ඊට හාත්පසින්ම වෙනස් ප්‍රතිපත්ති මාලාවක් තමයි අනුගමනය කළේ. හැබැයි, 76 වසරකට වෝදනා කරපු ඔබ, ඒ 76 වසර තුළ යෝජනා වෙච්ච කාරණා බොහොමයක් බලයට ආවට පස්සේ අඩු වැඩි වශයෙන් අද තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති විධියට ඉදිරිපත් කරනවා. සමහර කාරණා සාධනීයයි. ඩිජිටල්කරණය පිළිබඳව ගත් තීරණ සම්බන්ධවත් මම ස්තුතිවන්ත වෙනවා. මොකද, ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ ඩිජිටල් තාක්ෂණ ඇමතිවරයා විධියට මම ඒ වෙනුවෙන් යම් උත්සාහයක් දැරුවා. විශේෂයෙන්ම Unique Digital Identity Card - UDI - එක tender process එක වෙනකම් අපි ගෙනාවා. හැබැයි, එදා අරගළය එක්ක ආණ්ඩු වෙනස් වුණාට පස්සේ රටේ priorities - නැත්නම් ආණ්ඩුවේ අවධානය - යොමු වුණේ වෙනත් කාරණාවලට. එම නිසා ඒ Unique Digital Identity Card එකේ tender එක කැඳවන්නේ නැතිව ඊට පස්සේ පත් වෙච්ච ආණ්ඩුව තමන්ගේ අවධානය වෙන පැත්තකට යොමු කළා. වර්තමාන ආණ්ඩුව අද ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. ඒක හොඳයි. නවත් පැත්තකින් ඒ සඳහා රෙගුලාසි අවශ්‍යයි.

මෙය කඩිනම් කරන්න ඕනෑම නම් අතිගරු ජනාධිපතිතුමාට පුළුවන්, Data Protection Authority එක පත් කරන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. Personal Data Protection Act එක මේ වන විටත් පාර්ලිමේන්තුවේ සම්මත කර අවසන්. හැබැයි, එදා ඒ පනත් කෙටුම්පත ගේනකොට නම් ජනතා විමුක්ති පෙරමුණ ඒකට විරුද්ධව තමයි පාර්ලිමේන්තුවේදී කථා කළේ. නමුත් citizen data protect කරන්න, නැත්නම් ජනතාවගේ දත්ත ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ඒජන්සිය පත් කරලා, ඒ අවශ්‍ය නිලධාරීන් පත් කරලා, එතැනින් මේ කර්තව්‍ය ඉස්සරහට ගෙනියන්න අද එතුමන්ලාට පුළුවන්. නමුත් අපි තවම දකින්නේ නැහැ, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා කියන කාරණය. නවත් පැත්තකින් තමුන්නාන්සේලා IMF එකත් එක්ක යනවා නම්, 2024ට සාපේක්ෂව රුපියල් බිලියන 900ක් අමතරව ආදායම හොයන්න ඕනෑ.

දළ වශයෙන් ට්‍රිලියනයක අමතර ආදායමක් රජයට ගෙනෙන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය බදු වැඩි කිරීම් අය වැයට පෙර කළා. නවත් පැත්තකින් අතිගරු ජනාධිපතිතුමාම සඳහන් කළා, වාහන ලංකාවට ගෙන්වන්න අවසර දීලා තිබෙනවා, ඒ තුළ රුපියල් බිලියන 300ක වාගේ බදු ආදායමක් ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා, ඒ තුළින් මේ කාරණයට අවශ්‍ය මුදල් හොයා ගන්න පුළුවන් කියලා. තමුන්නාන්සේලා මැතිවරණ කාලයේ රුපියල් ලක්ෂ 12කට වාහනයක් දෙනවා කියලා තමයි කිව්වේ. හැබැයි, වර්තමාන බදු ක්‍රමවේදයත් එක්ක වාහන මිල බැලුවාම අඩු ගාණේ රුපියල් ලක්ෂ 80ක්, රුපියල් ලක්ෂ 100ක් අතර ප්‍රමාණයක් වැය වෙනවා අඩුවෙන්ම ගෙනෙන වාහනය මිලදී ගන්නත්. හැබැයි, රුපියල් ලක්ෂ 80ක, ලක්ෂ 100ක වාහනයකට රුපියල් ලක්ෂ 50ක lease එකක් වාරිකය අවුරුදු 4කින් ගෙවලා අවසන් කරන්න දැම්මත්, මාසයකට රුපියල් 132,000ක වාරිකයක් ගෙවන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 12කට වාහනයක් ගන්න බලාගෙන හිටපු මේ රටේ මධ්‍යම පන්තියේ තරුණයෙක් රුපියල් ලක්ෂ 100ක, රුපියල් 80ක වාහනයක් ගන්න රුපියල් ලක්ෂ 50ක lease එකක් දැම්මත්, අවුරුදු 4කින් ගෙවලා අවසන් වෙන්න ඕනෑ නම්, රුපියල් 132,000ක වාගේ වාරිකයක් අනිවාර්යයෙන්ම ගෙවිය යුතුයි.

එදා රුපියල් ලක්ෂ 12කට වාහනයක් ගන්න බලාගෙන හිටපු මේ රටේ මධ්‍යම පන්තිය එහෙම නැත්නම් මේ රටේ රාජ්‍ය සේවකයන්, ව්‍යවසායකයන් අද වනකොට වාහනයක් ලබා ගන්නේ කොහොමද? වාහන මිලදී ගැනීම අඩු වුණොත්, ආණ්ඩුවට තමන් අපේක්ෂා කරපු බදු ආදායම වාහනවලින් ලැබුණේ නැත්නම් ආණ්ඩුවේ ඊළඟ විකල්පය මොකක්ද? පසුගිය කාලයේ යෝජනා වුණා වාගේ දේපළ බද්ද, පරම්පරාවෙන් එන දේපළවලට බදු ගැසීම එහෙම නැත්නම් වෙනත් ආකාරයෙන් අලුත් බද්දක් මේ වසර මැදදී හඳුන්වා දෙන්න ආණ්ඩුව කටයුතු කරනවාද, නැද්ද කියන ප්‍රශ්නය අපි තමුන්නාන්සේලාගෙන් අහන්න ඕනෑ. මොකද, අය වැයෙන් සල්ලි වියදම් කරන ආකාරය ගැන කිව්වා. හැබැයි, සල්ලි උපදවන ආකාරය පිළිබඳව පැහැදිලි දර්ශනයක්, දැක්මක් අපට තමුන්නාන්සේලාගෙන් ලැබුණේ නැහැ. ඒ පිළිබඳව ප්‍රශ්න කරනකොටත් සමහර අමාත්‍යවරු කියන්නේ, "අවුරුදු පහ ඉන්න, අපි පෙන්වන්නම්" කියායි. හැබැයි, ඒ සැලැස්ම මොකක්ද?

දැන් ඩිජිටල්කරණය ගැන කථා කරනවා. UID එක හරි. Digitalization of citizen services, ආණ්ඩුව වියදම් කළ යුතු කාරණයක්. ඒක හරි. ඒක ආදායම් උත්පාදනයක් නොවෙයි. හැබැයි, ඒක තුළින් ලොකු ඩිජිටල් අවකාශයක් රටේ නිර්මාණය වනවා. එක පැත්තකින් servicesවලට සියයට 15ක බද්දක් ගන්නවා. දැන් මේ services ඇතුළේ digital services අඩංගුද? ඔව්. අනෙක් පැත්තෙන්, ඩිජිටල් ආර්ථිකය - digital economy එක - ඇමෙරිකානු ඩොලර් බිලියන 15කට ගෙනැවිත් ආර්ථිකය වර්ධනය කරනවා කිව්වාම, ඒ අතරේ ICT industry එකේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 5කට ගෙනෙනවා ලු. දැන් මේ ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක මුදල ගෙනෙන්න තිබෙන සැලැස්ම මොකක්ද? ගෙනෙන ඩොලර් ටිකටත් සියයට 15ක් බදු ගහනවා නම්, ආයෝජකයෙකු හෝ දේශීය ව්‍යාපාරිකයෙකු අපේ රටේ ව්‍යාපාර කරලා, මේ ක්ෂේත්‍රය තුළ ලාභ ලබන ආයතනයක් බවට පත් වෙන්නේ කොහොමද?

අනෙක් පැත්තෙන්, IT ක්ෂේත්‍රයේ ඉන්න සේවකයන්ගෙන් ගන්න බද්ද ගැන බලමු. කලින් රුපියල් 200,000කට slab එක ගෙනෙනවාය කිව්වා. හැබැයි, කමක් නැහැ. ඒක කළේ නැහැ. ඒක රුපියල් 150,000කට ගෙනාවා. ඒකෙන් යම් සහනයක් තිබෙනවා. සමස්ත වියදම - cost එක - ගත්තාම ඔබ අපේක්ෂා කරන ඩිජිටල් ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක ආර්ථිකයකට නැත්නම් සමස්ත technology industry එක US Dollars 15 billionවලට අරගෙන යන්න පුළුවන්ද? දැන් මේක ඇතුළේ creator economy එක තිබෙනවා. YouTube කරන, blogs කරන, TikTok කරන, Gaming කරන content creatorsලා ලෙස මේ ක්ෂේත්‍රය තුළ ඩොලර් උත්පාදනය කරන දරුවන්ටත් සියයට 15ක බද්ද වදිනවා; ඒ අයටත් සියයට 15ක බද්ද වදිනවා. එතකොට එතැනින් ඇති වන අලුත් පරම්පරාවේ ව්‍යවසායකයාට මොකද වෙන්නේ?

ව්‍යවසායකයන්ට බැංකු හදනවා කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, මේ රටේ බැංකු පනත අනුව, මහ බැංකුවේ රෙගුලාසි අනුව, collateral එකක් නැත්නම්, වත්කමක් - asset එකක් - නැත්නම් ණයක් දෙන්න බැහැ. ආණ්ඩුව කොච්චර කිව්වත් පාර්ලිමේන්තුව ඇතුළේ මේ නීතිරීති වෙනස් කරනකල් ඒක කරන්න බැහැ. Business proposal එක ගෙනැල්ලා, මුළු proposal එකම බලලා අවසානයේ වත්කමක් ඉල්ලනවා, ණය දෙනකොට. ඉතින්, මේ රෙගුලාසි වෙනස් කරන්නේ නැතිව අලුත් බැංකුවක් හැදුවා කියලා මේකේ ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ.

මේක තමයි ඇත්ත කථාව. අපි ඒ ගැන කථා නොකර හැම ජනාධිපතිවරයෙක්ම, හැම ආණ්ඩුවක්ම, හැම අය වැයකින්ම මේවා කියලා වැඩක් නැහැ. ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා විධියට පත් වෙන එක ගැන කලින් නම් මෙතුමන්ලාගේ ලොකු

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

විරෝධයක් තිබුණා. හැබැයි දැන් ඒ ප්‍රතිපත්තිය වෙනස් වෙලා. දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් හදලා තිබෙනවා. ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා බවට පත් වුණා. ඒක ප්‍රශ්නයක් නැහැ, කලින් විධියමනේ. හැබැයි, මේ රෙගුලාසි වෙනස් කරන්නේ නැතුව ඔබතුමන්ලා අපේක්ෂා කරන්නේ මොකක්ද? ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ව්‍යවසායකයාට අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය දෙන්නද? ඒක ප්‍රායෝගික වෙන්නේ නැහැ. ඔබතුමන්ලා මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා වාගේම පසුගිය අය වැයේදීත් ව්‍යවසායකයන්ට මුදල් වෙන් වුණා. ඒ හින්දා මේ රෙගුලාසි හදනකල් මේවායින් කාටවත් ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැයි කියන එකත් අපි ඔබතමුන්නාන්සේලාට මතක් කර දෙන්න ඕනෑ.

ඊළඟට ආයෝජකයන්ට ඇවිල්ලා ආයෝජනය කරන්නය කියනවා. එක පැත්තකින් බදු ගහනවා. Servicesවලටත් සියයට 15ක tax එකක් ගහනවා. අනෙක් පැත්තෙන් VAT එක ගහනවා. මීට කලින් ලංකාවෙන් භාණ්ඩ පිට රට යවන අයට - exportersලාට - ඒ වාගේම විදේශ වශයෙන් raw materials purchase කරන අයට අදාළ බදු simplify කරන්න SVAT එක හදුන්වා දුන්නා. අද අය වැයෙන් ඒක අයින් කර තිබෙනවා. ඒ තුළ මේ industry එක ඇතුළේ, මේ ක්ෂේත්‍ර ඇතුළේ විශාල අර්බුදයක් ඇති වෙනවා. මට මතකයි, නිවැරදි කිරීමට යටත්ව, 2011, 2012 වාගේ කාලවල වැටි බදු වංචාවක් - VAT fraud එකක් - කේන්ද්‍ර කරගෙන තමයි මේ SVAT එක ගෙනැල්ලා බදු ක්‍රියාවලිය simplify කළේ complication එක නැති කරන්න. ව්‍යාපාරිකයෙක්, ව්‍යවසායකයෙක් විදේශ වෙළෙඳ පොළට නිෂ්පාදනයක් යවනවා නම්, ඒක පහසු කරලා දෙන්න තමයි ඒක කළේ. හැබැයි මේ අය වැයෙන් ඒ SVAT එක අයින් කළාම මොකක්ද වෙන්නේ? ඒ ව්‍යාපාරිකයා නැවත වතාවක් පරණ ක්‍රමවේදයට; පරණ system එකට යනවා. ඒක IMF එකේ එක කොන්දේසියක් වෙන්න පුළුවන්. හැබැයි ඔබතුමන්ලා බලයට එනකොට කිව්වා IMF එකත් එක්ක සාකච්ඡා කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අඩුම ගණනේ මේ වාගේ සාමාන්‍ය දෙයක් ගැනවත් සාකච්ඡා කරලා ව්‍යවසායකයාට, ව්‍යාපාරිකයාට උදව් කරන්න බැරි නම් මොකක්ද ඇති වන තත්ත්වය?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රැකියා උත්පාදනය කරන්න ඕනෑ. රැකියා උත්පාදනය නොකර අපි මොනවා කළත් අපට මේ අර්බුදයෙන් එළියට එන්න බැහැ. ලංකාවේ ආයෝජනය කරන්න අපි ආයෝජකයන්ට එන්න කියනවා. 1977 BoI එක හදපු කාලයේ ඉඳලා අවුරුදු 48ක්ම ලංකාවේ ආයෝජනය කරලා තිබෙන්නේ දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 20යි. ඒකෙනුත් ලංකාවට බහුතරයක් ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ 2005-2015 කාල සීමාව තුළ.

අද වියට්නාමය වාගේ රටවල් අවුරුද්දකට ඩොලර් බිලියන 20ක ආයෝජන ගේනවා. ඒ කොහොමද? ඔවුන් system එක simplify කරලා තිබෙනවා, පහසු කරලා තිබෙනවා. අසීමිත බදු වෙනුවට ව්‍යවසායකයාට, ව්‍යාපාරිකයාට, ආයෝජකයාට සාධාරණ විධියට බදු ගෙවන්න පුළුවන් ක්‍රමයක් හදලා තිබෙනවා. රටවල් කේන්ද්‍ර කරගෙන ව්‍යාපාර දිහා බලන්නේ නැතුව ව්‍යාපාරයේ ස්වභාවය දිහා බලලා ඒ රට ආයෝජනවලට ගිහිල්ලා තිබෙනවා. එදා ෂැංග්‍රි-ලා හෝටලයට ආයෝජනය කරනකොට ඒ පිළිබඳව FCID එකෙන් පවා පරීක්ෂණ කළා. ඒ වාගේම එදා Colombo Port City එක හදන්න පටන් ගත්තාට පස්සේ ඒ සම්බන්ධයෙනුත් පරීක්ෂණ කළා. ආයෝජකයෝ දිරි ගන්වනවා වෙනුවට ඔබේ දේශපාලන සංස්කෘතිය ඇතුළේ තිබුණේ, හැම තිස්සේම ආයෝජකයෝ ආපස්සට ඇද දමන එක; ආයෝජකයන්ට අවශ්‍ය සහන දෙනවා වෙනුවට ආයෝජකයා දිහා වෙනස් කෝණයකින් බලන එක.

අද ඔබ බලයට ඇවිල්ලා තිබෙනවා. ඔබ බලයට ආවට පස්සේ මේ වෙනකොට ලෝකයේ ප්‍රධාන පෙළේ ආයෝජකයෝ දෙදෙනෙක් ආපසු හැරී ගොස් තිබෙනවා. ඇයි ඒ අයත් එක්ක සාකච්ඡා කරලා ප්‍රශ්නය විසඳා ගන්න බැරි? අදානි සමාගම වෙන්න පුළුවන්, යුනයිටඩ් පෙට්‍රෝලියම් සමාගම වෙන්න පුළුවන්, ඒ අයත් එක්ක සාකච්ඡා කරන්නේ නැත්තේ ඇයි? ආයෝජකයෙක් ලංකාවට ආවට පස්සේ මේ රටේ තිබෙන දේශපාලන, සමාජ වාතාවරණය මත හෝ වෙනත් හේතුවක් මත හෝ ආයෝජනය කරන්න බැහැයි කියනවා නම්, ඔවුන් මේ රටින් ඈත්වෙලා යන එක නවත්වන්න බැහැ. ඒ තුළ ගොඩනැඟෙන ප්‍රතිරූපය මොකක්ද? ඒ ප්‍රතිරූපය සාධනීය ප්‍රතිරූපයක් නොවෙයි. ඒ හේතුවෙන් රටට ආයෝජන ඒම තවත් අඩාළ වෙනවා.

අධ්‍යාපනය සඳහා අය වැයෙන් සියයට 6ක් වෙන් කරන්න කියලා ගරු අග්‍රාමාත්‍යතුමිය එදා ගාල්ලේ ඉඳලා කොළඹට පයිනුත් ආවා, උද්ඝෝෂණය කළා. හැබැයි අද එතුමිය අධ්‍යාපන අමාත්‍යවරිය විධියට සිටියත් වෙන් කරලා තිබෙන්නේ සියයට 1.9යි. ප්‍රමාණාත්මක වශයෙන් අධ්‍යාපනය සඳහා ඉතිහාසයේ වැඩිම මුදල වෙන් කර තිබෙනවාය කියලා කියනවා. හැබැයි එදා ඔය තර්කය ඔබතුමියලා, ඔබතුමන්ලා පිළිගත්තේ නැහැ. නමුත් අද ඔබ ඒ තර්කය ගේනකොට අපි පිළිගන්න ඕනෑ. අද සියයට 6 ඕනෑ නැහැ, ප්‍රමාණාත්මකභාවය තිබුණාම ඇති. සියයට 6 කියන කාරණය අද අදාළ වෙන්නේ නැහැ. අද ඒ කාරණය අදාළ වෙන්නේ නැහැ, එදා අදාළ වුණාට.

අනෙක් පැත්තෙන් දුම්රිය සේවය ගැන කථා කරනවා. මම දැක්කා, බස් ගෙනෙන්න රුපියල් බිලියන 3ක් දීලා තිබෙනවා. හොඳයි. ප්‍රශ්නයක් නැහැ. හැබැයි, දුම්රිය සේවයට? රුපියල් මිලියන 250ක් දීලා තිබෙනවා, කැලණි වැලි දුම්රිය මාර්ගය හදන්න. නේද? කැලණි වැලි දුම්රිය මාර්ගය හදන්න මූලික වැඩ කටයුතුවලට රුපියල් මිලියන 250ක් දීලා තිබෙනවා. හැබැයි දැන් ඒ රුපියල් මිලියන 250කින් කරන්න පුළුවන් මොනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕමන්තේ දුම්රිය මාර්ගයේ වැඩ කටයුතුවලට Indian grant එක යටතේ ඩොලර් මිලියන 91ක් දීලා තිබෙනවා, දළ වශයෙන් එක කිලෝමීටරයකට ඩොලර් දෙලක්ෂ හතක් වැය වෙනවාය කියන ඇස්තමේන්තුව මත. රුපියල් මිලියන 250ක් කියන්නේ, කිලෝමීටර භාගයයි බොහොම අමාරුවෙන් හදාගන්න වෙන්නේ.

ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා, "IMF එකත් එක්ක යන්නේ නැහැ, මේක අපේ අය වැයක්" කියලා. අනෙක් පැත්තෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, IMF එකේ රෙගුලාසි අස්සේ තමන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න පොඩි උත්සාහයකුත් දරනවා. ඒක අපි නැහැ කියන්නේ නැහැ. ඒ නිසා දැන් මේක අව්වාරුවක් වෙලායි තිබෙන්නේ. දෙන්න ඕනෑ නිසා පොඩ්ඩක් දෙනවා. IMF එක නිසා ගොඩක් දෙන්නත් බැහැ. ඡන්දය කාලයේදී කියපු නිසා පොඩි ගණනක් දෙනවා. දැන් පොහොරවලට රුපියල් බිලියන 35යි නේද, මේ වතාවේ වෙන් කරලා තිබෙන්නේ? ගිය වතාවේ රුපියල් බිලියන 54ක් වෙන් කරලා තිබුණා. මේ වතාවේ රුපියල් බිලියන 35යි. හැබැයි රුපියල් 15,000 රුපියල් 25,000ක් කරනවාලු. රුපියල් 15,000 රුපියල් 25,000ක් කරනවා; රුපියල් බිලියන 54 රුපියල් බිලියන 35 කරනවා!

දැන් වී මිලදී ගන්න රුපියල් බිලියන 5ක් දෙනවා. බිලියන 5ක් දුන්නාම මෙට්‍රික්ටොන් 41,000යි මිලදී ගන්න පුළුවන්, රුපියල් 120 ගණනේ ගත්තත්. දැන් මොකක්ද ආණ්ඩුවේ සැලැස්ම? සුරක්ෂිතභාවය? දැන් මේ මාෆියාව නවත්වන්න නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඔක්කෝම කරන්නේ. හැබැයි මේ ගන්න පියවරවලින් වෙන්නේ මොකක්ද? තවත් මාෆියාවක් අපේ රටේ ගොඩ නැඟෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු කාරණා කරන්න, මේ සියලු දේවල් කරන්න රටේ ජාතික ආරක්ෂාව වැදගත්. මම දැක්කා ඊයේ ආණ්ඩු පක්ෂයේ කැබිනට් අමාත්‍යවරියක් කිව්වා, "ජාතික ආරක්ෂාවට අපි අඩුවෙන්ම මුදල් වෙන් කරලා තිබෙන්නේ. දැන් ප්‍රශ්නයක් නැහැ. ඕනෑ කෙනෙකුට ඕනෑ විධියකට පයින් යන්න පුළුවන්" කියලා. හැබැයි අද දවසට මිනී මැරුම් දෙකයි. ඊයේ රාත්‍රියේ අපේ මිද්දෙනිය ප්‍රදේශයේ මිනී මැරුමක් වුණා; පොඩි දරුවන් දෙදෙනෙකුත් ඝාතනය වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් අධිකරණ පද්ධතියේ අධිකරණය ඇතුළට ගිහිල්ලා නඩුකාරවරිය ඉදිරිපිට මනුෂ්‍ය ඝාතනයක් සිද්ධ කර තිබෙනවා. පාතාලය වෙන්න පුළුවන්. ඔවුන්ගේ චර්යාව පිළිබඳව මම කථා කරන්න යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි එවැනි සිදුවීම් වෙනකොට මොකද වෙන්නේ? ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා මේ රටේ පුරවැසියාට දැන් ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නැහැ, ඕනෑ තැනක යන්න කියලා. අනෙක් පැත්තෙන් මොකක්ද වෙන්නේ? මහ දවල් මිනී මැරීම් සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Naml Rajapaksa, you have only two more minutes.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම අනෙක් පැත්තෙන් කියනවා, ආයෝජකයන්ට එන්නලු; ආයෝජනය කරන්නලු. පාතාලය මර්දනය කිරීමේ සැලැස්මක් ඔබතුමන්ලා ළඟ තිබෙනවා නම්, ඒක අපි දන්නේ නැහැ. ඒක අපි අහන්නේත් නැහැ. කියන්නත් එපා. හැබැයි ලංකාව පිළිබඳව ලෝකයට යන ප්‍රතිරූපය මේක නම් ඒක හොඳ නැහැ. අධිකරණ පද්ධතිය ඇතුළේ, උසාවිය ඇතුළේ වුණු සිදුවීමක්. මන්නාරමේ සිදුවීම වුණේ උසාවියෙන් එළියේ. කොළඹ සිදුවීම වුණේ උසාවිය ඇතුළේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම අද නීතිඥ සංගමයේ නිලවරණය. මේ රටේ නීතිඥ සංගමයේ - Bar Association එකේ - නිලවරණය පැවැත්වෙන වෙලාවේ නීතිඥවරයෙකු වාගේ ඇඳගෙන, අධිකරණ පද්ධතිය ඇතුළට ගිහිල්ලා -සමාජ මාධ්‍ය සහ අනෙකුත් මාධ්‍යවල වාර්තා වන විධියට- ඒ දේ කර තිබෙන්නේ.

ඉතින් මෙවැනි දේවල් සම්බන්ධව ආණ්ඩුව අවධානය යොමු කරන්නේ නැත්නම්, IT sector එකේ ඩොලර් බිලියන 15ක economy එකකට යන්න ඔබතුමන්ලාට කවදාවත් හම්බ වෙන්නේ නැහැ, මේ බදු ක්‍රමයත් එක්ක. අනෙක් පැත්තෙන් මේ රටේ ආයෝජකයන්ගේ ආරක්ෂාව සපයන්නේ නැත්නම්, විදේශ ආයෝජන ලංකාවට ගෙනෙන එක කවදාවත් ඔබතුමන්ලාට කරන්න හම්බ වෙන්නේ නැහැ, මේ තිබෙන බදු ක්‍රමයත් එක්ක; රටේ ජාතික ආරක්ෂාව තහවුරු කළේ නැත්නම්.

ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ, එක පැත්තකින් මේ රටේ පුරවැසියා ආරක්ෂා කරන්න. ඔවුන්ගේ චර්යාව පිළිබඳව, ඉතිහාසය පිළිබඳව, ක්‍රියාකලාපය පිළිබඳව ගනුදෙනු කරන ආණ්ඩුවේ ක්‍රමවේදයක් තිබෙනවා නම් JVP එකේ පරණ ක්‍රමවේදය විධියට, ඒක ඔබේ සංස්කෘතිය. හැබැයි ඒක රටේ සංස්කෘතිය නොවෙයි. ඒක රටේ සංස්කෘතිය කරන්නත් එපා. මොකද, ඒක අනෙක් පැත්තෙන් සමස්තයක් විධියට මේ රටේ ආර්ථිකයට බලපානවා. සංචාරක ව්‍යාපාරය හිස ඔසවාගෙන එනවා විතරයි. මේ විධියට ජාත්‍යන්තර මාධ්‍ය මඟින් මිනී මැරුම් වාර්තා වෙනකොට මොකද වෙන්නේ? එක වෙලාවක ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා කළා, වදුරෙක් පැනලා විදුලිය කැපුණා කියලා. ඒක බොහොම අමාරුවෙන් හදාගෙන එනකොට අනෙක් පැත්තෙන් අධිකරණය ඇතුළට ගිහිල්ලා මිනී මරනවා කියලා වාර්තා වුණාම, මංකොල්ලකෑම් වාර්තා වුණාම, මහ දවල් වෙඩි තියනවාය කියලා වාර්තා වුණාම, ඒක මේ රටේ සංචාරක ව්‍යාපාරයට බලපානවා.

ඒවා පිළිබඳවත් ඔබතුමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා. ඒ වාගේම, මම අතිගරු ජනාධිපතිතුමාටත්, ආණ්ඩුවටත් සුබ පතනවා; ආශීර්වාද කරනවා.

මැතිවරණ කාලයේ ඔබතුමන්ලා පොරොන්දු වෙච්ච දේවල් එකක්වත් මේ අය වැය ලේඛනයේ නැහැ. අඩුම ගණනේ මේ අය වැය ලේඛනයෙන් ඔබතුමන්ලා පොරොන්දු වෙච්ච දේවල්වත් ඉටු කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම මා කරනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Chandana Sooriyaarachchi. You have 13 minutes.

[අ.භා. 1.18]

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව -අපේ ආණ්ඩුව- පළමු අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ අය වැය යෝජනා පිළිබඳව විපක්ෂය ඉල්ලා සිටි විවාදයට සම්බන්ධ වෙමින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට ඒ සම්බන්ධයෙන් විශේෂ කරුණු කිහිපයක් දක්වන්න මම මේ මොහොතේ බලාපොරොත්තු වෙනවා.

අපි කවුරුත් දන්නවා අපේ රටේ අය වැය ඉදිරිපත් කරන්නේ වසර ගණනාවක සිට බව. 1977 සිට අපේ රට තුළ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වුණා. පසුගිය සැප්තැම්බර් මාසයේ වත්මන් ජනාධිපතිවරයා ලෙස අනුර දිසානායක මැතිතුමා පත්වන අවස්ථාව දක්වා වූ පාලන කාලය තුළ ඒ විවෘත ආර්ථික ප්‍රතිපත්තියම කරේ තියාගෙන, ඒ ප්‍රතිපත්තියම ක්‍රියාත්මක කරපු කණ්ඩායම් අපේ රටට අවසානයට ඉතිරි කළේ බරපතළ බෙදවාචකයක්. අපි ඒ බෙදවාචකය පිළිබඳව යළි යළිත් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, මේ රටේ සුවහසක් බහුතර ජනතාව අනුර දිසානායක ජනාධිපතිතුමාටත්, වත්මන් ජාතික ජන බලවේගය ආණ්ඩුවටත් මේ ශක්තිමත් ජනවරම ලබා දුන්නේ දශක ගණනාවක් තිස්සේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ බිඳ වැටිටපු මේ රට, විශේෂයෙන් මේ ආර්ථිකය, මේ සමාජය, පැවැති ත්‍රාඩ දේශපාලන සංස්කෘතිය -මට පෙර කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමාත් ඒ කාරණය මතු කළා-, දේශපාලනඥයන්ගේ රැකවරණය යටතේ මේ රටේ විවිධ අපරාධකරුවන්, පාතාලකරුවන් මෙහෙයවපු සමාජ වටපිටාව වෙනස් කරන්නයි.

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වත්මන් ජනාධිපති අනුර දිසානායක මැතිතුමා ඒ වගකීම භාර ගෙන අදට මාස 5යි. ඒ වාගේම, වත්මන් ජාතික ජන බලවේගය ආණ්ඩුවට අදට මාස තුනයි. මේ කෙටි කාල සීමාව තුළ අපේ ආණ්ඩුව ඉදිරිපත් කරපු පළමු අය වැය ලේඛනයයි, මෙය. මේ රටේ සෑම ජන කොටසකටම අවශ්‍ය කරන ජයග්‍රහණ සහ විශේෂ සහන ලබා දීපු, අපේ රට පත්ව තිබූ ආර්ථික අස්ථාවරත්වය වෙනස් කරලා අපේ රටේ ආර්ථිකය ස්ථාවරත්වයට ගෙන යෑම සඳහා අඩිතාලම දමපු පළමු අය වැය විධියට, පළමු පියවර විධියට -ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පළමු අය වැය විධියට- මේ අය වැය හඳුන්වා දෙන්න අපි කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ආමන්ත්‍රණය කරපු අය වැයක් බව අපි දන්නවා. ඒ වාගේම, බිඳ වටිටපු ආර්ථිකය යළි ශක්තිමත් කරන්න අවශ්‍ය කරන අඩිතාලම දමපු අය වැයක්, මෙය. ඒ වාගේම සමාජයේ විවිධ ක්ෂේත්‍රවල, විවිධ ජන කණ්ඩායම්වල, විවිධ පිරිස්වල, ඒ සියලු දෙනාගේ වුවමනා එපාකම් පළමු අදියරේදීම ආවරණය කරපු, ආමන්ත්‍රණය කරපු අය වැයක්, මේක.

මහා පරිමාණ මාතෘකාවලට යන්න කලින් මා මතක් කර දෙන්න කැමැතියි, මේ අය වැය සංවර්ධනය ඉලක්ක කර ගත් අය වැයක් වාගේම ජනතාවට අවශ්‍ය කරන සුබසාධන පහසුකම්, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් අවශ්‍ය අවධානය ද යොමු කළ අය වැයක් බව. මෙය අපේ රටේ සියලු අමාත්‍යාංශවල කාර්යභාරය සහ විෂය පථය වෙනදාට වඩා ශක්තිමත්ව, කාර්යක්ෂමව නිවැරැදිව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන වෙන් කරපු අය වැයක් වාගේම ඉතාම සංවේදී අය වැයක් බව ද මම කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇයි මා ඒ ආකාරයෙන් පවසන්නේ? ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය කථාවේ, ඒ යෝජනාවල එක මාතෘකාවක් තිබුණා, "අනාථ දරුවන් සහ තරුණයින් සඳහා සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම" කියලා. ඒ ගැන 2025 - අය වැය කථාවේ පිටු අංක 28හි මෙසේ සඳහන් වනවා:

> "i. රැඳවුම් නිවාසවල සිටින ළමුන්ට සහ අනාථ දරුවෙකුට රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දෙනවා. එයින් රුපියල් 2,000ක් එම දරුවාගේ ගිණුමට තැන්පත් කළ යුතු අතර, ඉතිරි රුපියල් 3,000 දරුවන්ගේ වියදම් සඳහා ඔවුන්ගේ නීත්‍යානුකූල භාරකරුවන්ට ලබා දෙනු ඇත..."

පවුලක තාත්තා සුරාවෙන්, සූදුවෙන්, සල්ලාලකමෙන්, විවිධ අකටයුතුකම්වලින් තොරව තමන්ගේ පවුල ගැන හිතලා, පවුලේ වැඩිදියුණුව ගැන හිතලා තමන්ගේ ඉපයීම් ආදායම නිසි පරිදි කළමනාකරණය කරලා තමන්ගේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ආයෝජනය කරන හැඟීම ජනිත වන ආකාරයෙන් වත්මන් ආණ්ඩුව සෑම කෙනෙකු පිළිබඳවම, සෑම පුරවැසියෙකු පිළිබඳවම අවශ්‍ය සංවේදීතාව සහ දැනුවත්භාවය සහිතව මේ අය වැය හසුරුවා තිබෙන බව අපි දන්නවා. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කිව යුතුව තිබෙනවා මහා පරිමාණ සංවර්ධන ඉලක්ක වාගේම අපේ රටේ අවධානයට ලක් නොවුණු සෑම පුරවැසියෙකු පිළිබඳවම අවධානය යොමු කිරීම සඳහා අවශ්‍ය කරන ආරම්භය තබපු, පියවර තබපු අය වැයක් විධියට අපට මේ අය වැය හඳුනා ගන්න පුළුවන්කම තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අප මේ අය වැය ඉදිරිපත් කරද්දී විශේෂයෙන් සැලකිල්ලට ගත්තු කාරණයක් තිබෙනවා. අපි මීට පෙර වෙනත් ආණ්ඩු ඉදිරිපත් කළ අය වැය කථාවලට ඇහුම්කන් දීලා තිබෙනවා. එක අතකින් දීලා අනෙක් අතින් ගන්නා අය වැය තමයි මෙච්චර කල් ඉදිරිපත් වුණේ. එවකට පැවති ආණ්ඩු වැඩ කරන ජනතාවට යම් වැටුප් වැඩි කිරීමක් යෝජනා කරලා අනෙක් පැත්තෙන් විශාල ප්‍රමාණයෙන් බදු ගහලා ඒ වැඩි කරපු ගණන කීය හෝ දෙගුණයක් තුන්ගුණයක් නැවත බදු හරහා අය කර ගත්තා. එවැනි අය වැය යෝජනා ඇතුළත් අය වැය කථා තමයි මීට පෙර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා අප අහලා තිබෙන්නේ. හැබැයි ඒ වෙනුවට මේ රටේ වැඩ කරන ජනතාවට, පොදු ජනතාවට, පෞද්ගලික අංශයේ වැඩ කරන අයට, වතු ක්ෂේත්‍රයේ ජනතාවට, විශ්‍රාමික ප්‍රජාවට, අබල දුබල ජනතාවට, ඒ සෑම කෙනාටම යම් යම් සහන, යම් යම් විසඳුම් සහිත අය වැයක් අද මේ පාර්ලිමේන්තුවට ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා මේ අය වැය ජනතාවට බදු බර පටවපු අය වැයක් නොවෙයි. මේ අය වැය මේ රටේ තිබෙන රාජ්‍ය සම්පත්, රාජ්‍ය දේපොළ විකුණාගෙන කන්න යෝජනා කළ අය වැයකුත් නොවෙයි. ඒ වාගේම, මේ අය වැය අපේ රට තවදුරටත් ණය කරලා, මේ රටේ උපදින්න ඉන්න දරුවන් පවා ණයකරුවන් බවට පත් කරලා, අපේ රට තවතවත් ණය උගුලකට හසු කරන්න සැලසුම් කළ අය වැයකුත් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ අනාගතය ගැන හිතලා, රටේ ස්ථාවරත්වය ගොඩනැඟීමේ අපේක්ෂාව සහ බලාපොරොත්තුව ප්‍රමුඛ අභිලාෂයක් බවට පත් කරගෙන ඉදිරිපත් කළ අය වැයක් ගැන තමයි අද මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මමත් අපේ රටේ වැඩ කරන ජනතාව වෙනුවෙන් සටන් කරපු, අරගළ කරපු ව්‍යෘත්තීය සමිති නායකයෙක්; මේ රටේ වැඩ කරන ජනතාවගේ අනාගත සුරක්ෂිතතාව වෙනුවෙන් නිරන්තරයෙන් පෙනී සිටින කෙනෙක්; පෙනී සිටි කෙනෙක්. එදා වැඩ කරන ජනතාවගේ විශේෂ ඉල්ලීම් කීපයක් තිබුණු බව අපි දන්නවා. දීමනා දෙනවා වෙනුවට තමන්ගේ මූලික වැටුප වැඩි කරන්න කියන සටන් පාඨය, ඒ ඉල්ලීම දශක ගණනාවක සිට ජනතාව ආණ්ඩුවලට ඉදිරිපත් කළා. ව්‍යෘත්තීය සමිති නායකයෙකු විධියට මට ඒ අත්දැකීම හොඳින්ම තිබෙනවා. අද දවසේ හැම කාර්යාලයකම, හැම වැඩ බිමකම වැඩ කරන සෑම සහෝදර සහෝදරියකටම මම මේ කියන කාරණාව ඉතා පැහැදිලි, සමීප කාරණාවක්. වැඩ කරන සියලු ජනතාවගේ අභිලාෂය වුණේ තමන් ලබන වැටුපට අමතර දීමනා වෙනුවට තමන්ගේ අවම මූලික වැටුප ශක්තිමත්, ස්ථාවර පදනමක් සහිත, බරක් සහිත වැටුප් අගයක් බවට පත් කර ගැනීමයි. ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රටේ වැඩ කරන ජනතාවගේ අවම මූලික වැටුප ස්ථාවර කරන්න, ශක්තිමත් කරන්න අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. එහි පළමු පියවර තමයි මෙය. ඒ අනුව මෙතෙක් රාජ්‍ය සේවකයන් සහ එම ශ්‍රේණි අතර තිබුණු වැටුප් වැඩි වීමේ 1:4 අනුපාතය තබා ගනිමින්, ඒ අනුපාතය රැක ගනිමින් සමස්ත වැඩ කරන ජනතාවගේ අවම මූලික වැටුප වැඩි කිරීම සඳහා අවශ්‍ය පියවර අපි ගෙන තිබෙනවා.

මම උදාහරණ කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. අපි ඉදිරිපත් කළ අය වැය යෝජනාවලින් අපේ රටේ වැඩ කරන ජනතාවට වැඩි කරපු වැටුප් ප්‍රමාණ කිහිපයක් මම කියන්නම්. රුපියල් 24,250ක් තමයි නුපුහුණු කම්කරුවෙකුට මීට පෙර පැවති වැටුප. අපි යෝජනා කරනවා රාජ්‍ය සේවයේ අවම මූලික වැටුප රුපියල් 40,000 දක්වා වැඩි කිරීමට. ඒ වාගේම පුහුණු කම්කරුවෙකුගේ 2025 මාර්තු දක්වා තිබෙන මූලික වැටුප තමයි, රුපියල් 25,790.

පුහුණු කම්කරුවෙකුගේ මූලික වැටුප 2025 අප්‍රේල් සිට රුපියල් 42,780 දක්වා වැඩි කරන්න අපි යෝජනා කරනවා. කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියෙකුට තිබුණු මූලික වැටුප රුපියල් 27,140යි. ඔවුන්ගේ අවම මූලික වැටුප රුපියල් 45,230 දක්වා වැඩි කිරීමට අපි යෝජනා කරනවා. ආශ්‍රිත සේවාව නියෝජනය කරන සංවර්ධන නිලධාරීන් ඇතුළු ඒ සේවාවට අයත් නිලධාරීන්ගේ ආරම්භක වැටුප තිබුණේ රුපියල් 31,490යි. ඔවුන් බඳවා ගැනීමේ අවම මූලික වැටුප රුපියල් 53,060ක් ලෙස අපි යෝජනා කරනවා. ගුරු සේවයේ උපාධිධාරී, පුහුණු ගුරුවරුන්ගේ ආරම්භක වැටුප තිබුණේ රුපියල් 34,160යි. ඔවුන්ගේ අවම මූලික වැටුප රුපියල් 57,860ක් ලෙස අපේ ආණ්ඩුව යෝජනා කර තිබෙනවා. මේ ආදී වශයෙන් වැඩ කරන ජනතාවට අවශ්‍ය විධියට විවිධ තනතුරුවල අවම මූලික වැටුප වැඩි කිරීම සඳහා ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාවේ තිබෙන විශේෂත්වය මෙකයි. දශක ගණනාවක් ගත වුවත් රාජ්‍ය සේවකයාගේ ආරම්භක වැටුප් වර්ධක අගය කිසිදු ආණ්ඩුවක් වැඩි කළේ නැහැ. කොච්චර ඉල්ලීම් කළත් වැඩි කළේ නැහැ. හැබැයි, අපේ රටේ වැඩ කරන ජනතාවගේ වැටුප් වර්ධක අගය සියයට 80කින් වැඩි කරන්න ජාතික ජන බලවේග ආණ්ඩුවේ මංගල අය වැයේදී අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. එම වැඩි කරන වැටුප් වර්ධක අගය වාර්ෂිකව තමන්ගේ වැටුපට ඉහළ අගයක් සේ එකතු වන බව මේ රටේ වැඩ කරන ජනතාව දන්නවා. නුපුහුණු කම්කරුවෙකුගේ රුපියල් 250ක් වූ වැටුප් වර්ධකය රුපියල් 450 දක්වා වැඩි කරන්න, පුහුණු කම්කරුවෙකුගේ රුපියල් 270ක් වූ වැටුප් වර්ධකය රුපියල් 490 දක්වා වැඩි කරන්න, කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකුගේ රුපියල් 300ක් වූ වැටුප් වර්ධකය රුපියල් 540 දක්වා වැඩි කරන්න, සංවර්ධන නිලධාරියෙකුගේ රුපියල් 445ක් වූ වැටුප් වර්ධකය රුපියල් 800 දක්වා වැඩි කරන්න වත්මන් ආණ්ඩුව ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

ඊළඟට, අපේ රටේ වැඩ කරන ජනතාව නියෝජනය කරන පෞද්ගලික අංශය, වතු ක්ෂේත්‍රය, විශ්‍රාමික ප්‍රජාව, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කියන ඒ සියලුදෙනාත් ආවරණය වන පරිදි අවශ්‍ය වෙනස්කම්, විසඳුම් හා යෝජනා ජාතික ජන බලවේග ආණ්ඩුවේ පළමු අය වැයෙන් ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සංවාදයට ලක් වෙලා තිබෙනවා වෛද්‍යවරුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී තවත් කරුණු දක්වයි. අද විවිධ වෘත්තීය සමිති, ඇතැම් නායකයන් මේ පිළිබඳව වැරදි අර්ථකථන සමාජගත කරන්න උත්සාහ කරනවා. 2025 ජනවාරි වනකොට ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකුගේ මූලික වැටුප රුපියල් 54,290යි. ආණ්ඩුවේ යෝජනාව අනුව, 2025 අප්‍රේල් වනකොට ඔවුන්ගේ මූලික වැටුප රුපියල් 70,778ක් දක්වාත්, 2026දී රුපියල් 81,264ක් දක්වාත්, 2027දී රුපියල් 91,750 දක්වාත් වැඩි වනවා. මූලික වැටුප ස්ථාවර කිරීමේ ක්‍රියා මාර්ගයක් තමයි ආණ්ඩුව අරගෙන තිබෙන්නේ. එදා ED එක රුපියල් 687යි. එය පැය 120න් වැඩි කළාම 2025 ජනවාරි ලැබුණේ රුපියල් 82,440යි. ED එක රුපියල් 764 දක්වා වැඩි වීම පැය 120න් වැඩි කළාම, 2025 අප්‍රේල් වනකොට රුපියල් 91,650ක් එම වෛද්‍යවරයාට ලැබෙනවා. ඒ රුපියල් 91,650ක මුදල 2026දී, 2027දී වෙනසක් නැතිව ලැබෙනවා. එදා PH එක රුපියල් 8,143යි. 2025 අප්‍රේල් ඉඳලා වෛද්‍යවරයෙකුගේ PH එක රුපියල් 9,175යි. ඒක වෙනසක් නැතුව අඛණ්ඩව ලැබෙනවා. DAT එකේ වෙනසක් නැහැ. ජීවන වියදම් දීමනාවේ -COLA - වෙනසක් නැහැ. අනෙක් සියලු දීමනාවල වෙනසක් නැහැ. ඒ අනුව 2025 මාර්තු වැටුප රුපියල් 226,497ක් වන ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍යවරයෙකුගේ 2025 අප්‍රේල් වැටුප, රුපියල් 255,142ක් බවට පත් වෙනවා. අද මේ රටේ රාජ්‍ය සේවකයන්ගේ, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ හා අනෙකුත් ක්ෂේත්‍රවල වැටුප් වැඩි කිරීම සඳහා ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විශාල මැදිහත්වීමක් කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අය වැය තුළින් අපේ රාජ්‍ය සේවයේත්, පෞද්ගලික අංශය ඇතුළු වැඩ කරන ජනතාවගේත් වැටුප් වැඩි කිරීම පමණක් නොවෙයි, අපේ රට ආර්ථිකමය වශයෙන් ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු අනෙකුත් කරුණු කාරණා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. අද විපක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන් අහනවා,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chandana Sooriyaarachchi, your time is up.

ගරු චන්දන සූරියආරච්චි මහතා
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු අහනවා, ආණ්ඩුව මේ තරම් ප්‍රමාණයකින් වියදම් අඩු කරලා තිබියදී මෙවැනි සහන ජනතාවට දෙන්නේ කොහොමද කියලා. මම කියනවා, ඒක තමයි වෙනස. මේ විවාදය ආරම්භ කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ අය වැයේත්, කලින් අය වැයේත් එකම මාතෘකාව, එකම දේවල් තමයි කියැවෙන්නේ කියලා. අපට විෂයයන් වෙනස් කරන්න බැහැ. හැබැයි, ඒ විෂයයන්වලට අදාළ කටයුතු ක්‍රියාත්මක කරද්දී ඒ අරමුණ, ක්‍රියාකාරී සැලැස්ම, චේතනාව, භාවිතාව යන දේවල් අතර වෙනස්කම තමයි තිබෙන්නේ. මේ මාස පහ ඇතුළත අපට පුළුවන් වෙලා තිබෙනවා මේ රටේ ජනතාවගේ බදු සල්ලි නාස්ති නොකර, හොරකම් නොකර, වංචා නොකර, විනාශ නොකර පරිස්සම් කරලා සකසුරුවම්න් මේ රටේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් යොදවන්න. අපේ රටේ ජනතාව ජාතික ජන බලවේගය ආණ්ඩුවට ලබා දුන් ජනවරම තුළින් වගකීමක් භාර දීලා තිබෙනවා. ඒ වගකීම ඉටු කරන්න අපි සූදානම්. ඉදිරි කාලසීමාව තුළ ක්‍රමානුකූලව, පිළිවෙළට ඒ වගකීම අපි ඉටු කරනවා. මේ අය වැය මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළේ අඩිතාලම බව මම සිහිපත් කරනවා. අවසාන වශයෙන්, වෑත්තෑවේ හාමුදුරුවන් විසින් රචනා කරන ලද ගුත්තිල කාව්‍යයේ සඳහන්, "අහෝ දෙවිදත් නො දිටි මොක්පුර" යන කවි පදය සිහිපත් කරමින්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අවධානයට එය යොමු කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Amirthanathan Adaikkalanathan. You have 12 minutes.

[பி.ப. 1.34]

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, புதிய அரசாங்கத்தினுடைய இந்த நிதியாண்டிற்கான வரவு செலவுத்திட்டம் தொடர்பாகச் சில கருத்துகளைச்

[ගරු අමීර්තාදන් අලෙක්කලනාදන් මහතා]

சொல்லலாமென்று எண்ணுகின்றேன். முதலாவதாக, இந்த நிதியாண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் உண்மையிலேயே வரவேற்கத்தக்க சில விடயங்களை நாங்கள் காணக்கூடியதாக இருக்கிறது. குறிப்பாக, வடக்கிற்குக் கூடுதலான நிதியை அரசாங்கம் ஒதுக்கியிருக்கிறது; அதற்கு நாங்கள் முதலில் நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றோம். ஆனால், சனாதிபதி அவர்கள் உரையாற்றுகின்றபோது கிழக்கின் அபிவிருத்தியை இந்தியா கையாளுமென்று சொல்லியிருந்தார். உண்மையில் நாங்கள் இந்தியாவை மதிக்கின்றோம்; இந்தியா இலங்கைக்குப் பல உதவிகளைச் செய்து வருகின்றது. அந்த வகையில், கிழக்கையும் அது அபிவிருத்தி செய்யுமென்ற நம்பிக்கை இருக்கிறது. ஆனால், சனாதிபதி அவர்கள் இந்தியா என்ன அபிவிருத்தியைச் செய்ய வேண்டும் என்பது தொடர்பாகத் தெளிவாக வலியுறுத்தியிருக்கவில்லை என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

அபிவிருத்தி என்ற ரீதியிலே கிழக்கை இந்தியாவிடம் ஒப்படைத்ததுடன் அரசாங்கம் தங்களுக்கான அபிவிருத்தி நிதியை ஒதுக்கவில்லை என்ற குறை கிழக்கு மக்களுக்கு இருக்கிறது. இதிலே ஒரு விடயத்தை நான் பார்க்கின்றேன். அதாவது, மட்டக்களப்பு மாவட்டம் கூடுதலாக இந்த அரசாங்கத்திற்கு வாக்களிக்கவில்லை என்றவொரு நிலை காணப்படுகிறது. அதனாலோ என்னவோ அரசாங்கம் கிழக்கின் அபிவிருத்தி நிதியைக் குறைத்திருக்கிறதா அல்லது இந்தியாவிடம் ஒப்படைத்திருக்கிறதா? என்ற கேள்வி எழுகிறது. இந்தியா அதனைச் செய்யும் என்ற நம்பிக்கை இருக்கிறது. ஆனால், எந்த அபிவிருத்தியைச் செய்வதற்கு நீங்கள் இந்தியாவை அனுமதித்திருக்கிறீர்கள் என்பதை வரவு செலவுத்திட்டத்தின் ஊடாக நீங்கள் வெளிப்படுத்த வேண்டும்.

அடுத்து, வடக்கைப் பொறுத்தமட்டில் அங்கு போரால் பாதிப்படைந்த மக்கள் - விவசாயிகளாக இருக்கலாம், கடற்றொழிலாளர்களாக இருக்கலாம் - உண்மையிலே நலிவடைந்த நிலையில் இருக்கிறார்கள். பல்வேறு வகையிலும் பாதிக்கப்பட்ட எங்களுடைய பிரதேசத்தின் அபிவிருத்திக்குப் பலகோடி ரூபாய்களை சனாதிபதியும் நிதி அமைச்சருமான கௌரவ அநுர குமார திஸாநாயக்க அவர்கள் ஒதுக்கியிருக்கிறார்கள். இதிலே வட்டுவாகல் பால நிர்மாணம் என்பது மிக முக்கியமானது. உண்மையிலே இனவழிப்பு என்று சொல்லப்படுகின்ற வரலாற்று முக்கியத்துவமிக்க நிகழ்வு அந்த வட்டுவாகல் பாலத்துடன் தொடர்புடையது. இறுதி யுத்தத்தின்போது முள்ளிவாய்க்காலில் செறிந்திருந்த எங்களுடைய மக்கள் கஷ்டப்பட்டு, துன்பப்பட்டு அந்தப் பாலத்தினூடாகத்தான் பயணித்தார்கள். தந்தையை இழந்து, தாயை இழந்து, குழந்தைகளை இழந்து, சகோதரர்களை இழந்து, இறந்த உறவுகளைப் புதைக்கக்கூட முடியாமல் ஓடிவந்த அவர்கள் இன்றைக்கும் தங்களுடைய மனங்களிலே அந்த ஏக்கத்தைச் சுமந்துகொண்டிருக்கின்றார்கள். இவ்வாறாக எங்களுடைய இனத்தின் வரலாற்றைச் சொல்லுகின்ற அந்த வட்டுவாகல் பாலத்தின் புனரமைப்புத் தொடர்பில் சனாதிபதியவர்கள் கவனஞ்செலுத்தியிருப்பது உண்மையிலே வரவேற்கத்தக்கது. நல்லாட்சி அரசாங்கமாகவிருக்கலாம், அல்லது கடந்த அரசாங்கமாகவிருக்கலாம்! முன்னைய அரசாங்கங்களிடம் இந்த வட்டுவாகல் பாலம் சம்பந்தமாகப் பலமுறை நாடாளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் எடுத்துக் கூறியும் அது கவனத்திலெடுக்கப்படாத ஒரு சூழலில், அந்தப் பாலத்தைக் கட்டுவதற்கான ஒரு முனைப்பை இந்த அரசாங்கம் எடுத்ததை நான் வாழ்த்தி நிற்கின்றேன்.

இன்று பத்திரிகைச் செய்திகளைப் பார்க்கின்றபோது, 'வடக்கு' என்றால், அது 'யாழ்ப்பாணம்தான்' என்று கருதுகின்றார்களோ என எனக்கு ஓர் அச்சம் ஏற்படுகின்றது. ஏனென்றால், வடக்கை நோக்கிப் பயணிக்கின்றவர்கள் - வெளிநாட்டுத் தூதுவர்களாக இருக்கலாம் அல்லது அமைச்சர்களாக இருக்கலாம் அல்லது சனாதிபதியாக இருக்கலாம் - யாழ்ப்பாணத்திற்கு மாத்திரம் முக்கியத்துவம் கொடுத்து அங்கு முகாமிடுகின்ற ஒரு நிலை காணப்படுகின்றது. ஆனால், வடக்கிலேயுள்ள 5 மாவட்டங்களில், வன்னிப் பகுதியான வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய 3 மாவட்டங்களுக்கும் யாருமே பெரும்பாலும் வருவதில்லை. தேர்தல் காலங்களிலே சனாதிபதியவர்கள் வந்தார். வரவிருக்கின்ற அடுத்த தேர்தலுக்காகவும் அங்கு வருவாரோ என்னவோ தெரியவில்லை. ஆனால், இந்த வன்னிப் பகுதியை இந்த அரசாங்கம் கவனத்திலெடுக்க வேண்டும் என்பது என்னுடைய கோரிக்கையாகும். அங்கு பல வழிகளிலே எங்களுடைய மக்கள் துன்பப்பட்டுக் கொண்டிருக்கிறார்கள். இம்முறை வடக்கிற்கு ஒதுக்கப்பட்டிருக்கின்ற அந்தப் பெருந்தொகை நிதி வன்னிக்கும் கிடைக்குமா? என்ற ஒரு கேள்வி இருக்கின்றது. ஏனென்றால், பத்திரிகைச் செய்திகளெல்லாம் யாழ்ப்பாணத்தை மையப்படுத்தியதாகவே இருக்கின்றன. யாழ்ப்பாணத்திற்குச் செய்ய வேண்டாம் என்று நான் சொல்லவில்லை; வடக்கைச் சார்ந்த எல்லா இடங்களுக்கும் அந்த நிதி பயன்படுத்தப்பட வேண்டும் என்பதுதான் என்னுடைய கோரிக்கையாகவிருக்கிறது. சனாதிபதியவர்கள்கூட யாழ்ப்பாணத்தை மட்டும் கருதிக்கொண்டுதான் அந்தப் பண ஒதுக்கீட்டைச் செய்திருப்பதாகவே பொதுவாகப் பார்க்கப்படுகின்றது. யாழ்ப்பாணத்திலே ஏதாவது ஓர் அபிவிருத்தி நடந்தால் அது தமிழர்களுக்காகக் கொடுக்கப்படுகின்ற ஒரு வரப்பிரசாதமாக உலகளாவிய ரீதியில் பார்க்கப்படுவதுண்டு. ஆகவே, வடக்கிற்கு ஒதுக்கப்பட்ட நிதி எல்லா இடங்களுக்கும் பகிர்ந்து செல்ல வேண்டுமென்பது எங்களுடைய கோரிக்கை.

மாண்புமிகு சனாதிபதியவர்கள் உள்ளூராட்சி மன்றத் தேர்தலுக்காக வருவதற்கு முன்பாக எங்களுடைய பிரதேசங்களுக்கு வரவேண்டும். அங்கேயிருக்கின்ற மக்கள் இன்றைக்கு road வசதி, பாடசாலை வசதி, வைத்தியசாலை வசதி உட்பட எந்தவொரு வசதியுமில்லாமல் இருக்கின்றார்கள். குறிப்பாக, எங்களுடைய 3 மாவட்டங்களிலுமுள்ள வைத்தியசாலைகளின் சேவை பாரியளவில் பின்னடைந்திருக்கிறது. ஆகவே, இவை தொடர்பான பார்வை அமைச்சர்களுக்கும் இருக்க வேண்டும் என்பது என்னுடைய கருத்து. ஆகவே, வடக்கிற்கு ஒதுக்கப்பட்ட நிதி ஏனைய இடங்களுக்கும் பகிர்ந்தளிக்கப்பட்டு, தேவையான வசதிகள் உடனடியாகச் செய்து முடிக்கப்பட வேண்டும். ஆளுநர் அவர்கள் இது தொடர்பில் மிக முக்கியமான கவனத்தைச் செலுத்தியிருக்கிறார். ஆகவே, ஆளுநர், கௌரவ அமைச்சர் உட்பட வன்னியிலேயிருக்கின்ற அதிகாரிகள், அரச அதிபர்கள் மற்றும் பிரதேச செயலாளர்கள் எல்லோரதும் செயற்பாடுகள் இந்தப் பணம் திருப்பியனுப்பப்படாத வகையில் அதனை உரியமுறையில் பகிர்ந்து, அங்கு தேவையான விடயங்களை நடைமுறைப்படுத்துகின்ற விதத்திலே இருக்க வேண்டுமென்பது என்னுடைய கோரிக்கையாகவிருக்கிறது.

இன்றைக்கு யாழ்ப்பாண நூலகத்திற்காக மாண்புமிகு சனாதிபதியவர்களின் தலைமையிலான இந்தப் புதிய அராசங்கம் நிதி ஒதுக்கியிருக்கிறது; அதற்கு எமது நன்றி. பல

ஆண்டுகளுக்கு முன்னர் இந்த நூலகத்தை எரித்த வரலாற்றை இன்றைக்கும் எங்களுடைய தமிழினம் தாங்கிநிற்கின்றது. ஆசியாவிலேயே முதன்மை இடத்தைப் பெற்றிருந்த அந்த நூலகம் கடந்த காலத்திலே எரிக்கப்பட்டிருக்கிறது. ஆனால், வெறுமனே பணத்தை ஒதுக்கி அதை முன்னேற்றகரமான நிலைக்குக் கொண்டுவருவதென்பது வேறு; அதனை எரித்தவர்களைக் கண்டுபிடிப்பதென்பது வேறு. இந்த நூலகத்தை எரித்தவர்களைக் கண்டுபிடிப்பதற்கான ஒரு குழுவை நீங்கள் நியமிக்க வேண்டும். ஏனென்றால், இந்த நூலகத்தை எரித்தவர்கள் இப்போதும் சுதந்திரமாக நடமாடிக்கொண்டிருக்கின்றார்கள். எனவே, ஒரு விசாரணைக் குழுவை அமைத்து, அவர்களின் குற்றத்தை நிரூபித்து, அவர்களுக்குத் தண்டனை வழங்கும் ஒரு வாய்ப்பை உருவாக்கவேண்டும்.

வடக்கு, கிழக்கைப் பொறுத்தவரை யாழ்ப்பாணம் கல்வியிலே மேலோங்கி வளர்ந்த ஒரு மாவட்டம். யாழ்ப்பாணம் என்றால் சிறந்த கல்விமான்கள் நிறைந்து விளங்கும் மாவட்டம் என இலங்கை பூராவும் சொல்லப்பட்ட ஒரு காலம் இருந்தது. ஆனால், இன்றைக்கு அங்கு கல்வி நிலை பின்தங்கியிருப்பதற்கு இந்த நூலகம் எரிக்கப்பட்ட பின்பு அங்குள்ளவர்களின் வாசிப்புத்திறன் இல்லாமற்போனமையும் ஒரு காரணம். இத்தகைய செயல்கள்மூலம் எமது வரலாறுகள் ஒழிக்கப்படுகின்ற நிலை காணப்படுகின்றது. ஆகவே, அந்த நூலக அபிவிருத்திக்காக நிதி ஒதுக்கீடு செய்ததற்கு ஜனாதிபதி அவர்களுக்கு மீண்டும் நன்றியைத் தெரிவித்துக்கொள்வதோடு, ஒரு விசாரணைக் குழுவை அமைத்து விசாரணைகள் மேற்கொள்ளப்பட்டு, அதை எரித்தவர்களைக் கண்டுபிடித்து, சம்பந்தப்பட்டவர்கள் தண்டிக்கப்படுகின்ற ஒரு வாய்ப்பை உண்டுபண்ண வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, அரச உத்தியோத்தர்களுடைய சம்பள உயர்வு பற்றிச் சொல்லப்பட்டது. ஆனால், அந்தச் சம்பள உயர்வு ஒரு குழப்ப நிலையில் இருக்கின்றது. அது மூன்று வருடங்களில் படிப்படியாகக் கிடைக்குமென்று சொல்லப்பட்டிருக்கின்றது. ஏன் அதை உடனடியாக உயர்த்த முடியாது? இன்றைக்கு விலைவாசிகள் உயர்ந்திருக்கின்ற சூழலில், அரச உத்தியோகத்தர்களுக்கு அழிவுகளுக்கான நட்ட ஈடு கொடுக்கப்படுவதில்லை; வீடுகளும் கொடுக்கப்படுவதில்லை; வேறு எந்தவொரு சலுகையும் வழங்கப்படுவதில்லை. காரணம், அவர்கள் அரசாங்க உத்தியோகத்தில் இருப்பதாகும். ஆகவே, அவர்கள் தொடர்பில் கவனஞ்செலுத்தி, இந்த ஊதிய உயர்வை 3 வருடங்களில் பிரித்துக்கொடுப்பதைவிட, உடனடியாகக் கொடுப்பதற்கான வாய்ப்பை நீங்கள் ஏற்படுத்த வேண்டும்.

இன்னுமொரு விடயம் பற்றிச் சொல்ல வேண்டும். இன்று மாற்றுத்திறனாளிகள் இலங்கை பூராவும் இருக்கிறார்கள். மாற்றுத்திறனாளியான ஒருவர் உங்களுடைய அரசாங்கத்தினால் நாடாளுமன்ற உறுப்பினராக நியமிக்கப்பட்டிருக்கிறார். ஆனாலும் அவர்கள் தொடர்பிலும் இந்த வரவு செலவுத்திட்டத்தில் ஒன்றுமே சொல்லப்படவில்லை. அவர்கள் இந்த நாட்டிலே பல துன்பங்களை அனுபவித்துக்கொண்டு இருக்கின்றார்கள். ஆகவே, அந்த விடயத்திலும் நீங்கள் கவனம் செலுத்த வேண்டும்.

அடுத்தது, போரால் பாதிக்கப்பட்ட முன்னாள் போராளிகள் பற்றிச் சொல்ல வேண்டும். அவர்கள் எந்த இயக்கங்களைச் சேர்ந்தவர்கள் என்று பாராமல், அவர்களும் வாழ்க்கையைக் கொண்டு நடத்துவதற்கான திட்டங்களுக்கு இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கப்பட வேண்டும். இன்றைய அரசாங்கக் கட்சியும் கடந்த காலத்தில் ஒரு போராட்ட இயக்கமாக இருந்தது. அந்தப் போராட்டத்தில் தங்களுடைய தலைவர் உட்படப் பலரை இழந்திருக்கின்றது. அந்த வகையில், முன்னாள் போராளிகளை இந்த அரசு கவனத்தில் எடுக்க வேண்டும் என்பது என்னுடைய முக்கியமான கருத்தாக இருக்கின்றது.

இந்த வரவு செலவுத்திட்டமென்பது உண்மையில் சாமானிய மக்களுக்கு நல்லதொரு வரப்பிரசாதமாக இருக்கின்றது என்பது என்னுடைய கருத்து. எங்களுடைய பிரதேசத்திலே நல்ல road இல்லாத பல கிராமங்கள் காணப்படுகின்றன. மழை வந்தால் பள்ளிக் குழந்தைகள் பாடசாலைக்குக்கூடச் செல்ல முடியாத நிலையில் காணப்படுகின்ற அந்தப் பாதைகள் இந்த நிதியினூடாக மேம்படுத்தப்பட வேண்டும். முதலாவது இலக்காக இந்தப் பாதைகளைப் புனரமைக்கின்றபோது எங்களுடைய விவசாயிகள்கூட தங்களுடைய உற்பத்திப் பொருட்களைத் தாங்களே கொண்டுசென்று நல்ல விலைக்குக் கொடுத்து வருமானம் பெறுகின்ற சூழல் ஏற்படும்.

இன்னுமோர் ஆலோசனையையும் சொல்லுகிறேன். இன்றைக்கு வடக்கு, கிழக்கிலே இருக்கின்ற கூடுதலான இராணுவத்தினர் மக்களுடைய காணிகளை அபகரித்து விவசாயம் செய்கிறார்கள்; தோட்டங்கள் செய்கிறார்கள். மக்களுடைய கால்நடைகளை அவர்கள் வளர்த்துப் பால் கறக்கிறார்கள்; அதனால் பல நன்மைகளை அடைகிறார்கள். இராணுவத்தினரின் கையில் உள்ள மக்களுடைய காணிகளை விடுவிப்பது தொடர்பில் இந்த அரசாங்கத்தினுடைய திட்டம் பற்றி ஜனாதிபதி அவர்கள் சொல்லியிருந்தார். அவை விடுவிக்கப்படுகின்றபோது உண்மையிலே விவசாயத் துறையில் ஊக்கமுடையவர்களாகத் திகழும் எங்களுடைய விவசாயிகள் மற்றும் கால்நடை வளப்பாளர்கள் இந்த நாட்டின் வருமானத்தை மீட்டெடுக்கின்ற செயற்பாட்டையும் செய்வார்கள்.

அத்தோடு கடற்றொழிலுக்கும் கூடுலான நிதி ஒதுக்கப்பட வேண்டும். வடக்கு, கிழக்கில் உள்ள மீனவர்கள், குறிப்பாக வட மாகாணத்திலே உள்ள மீனவர்கள் படுகின்ற துன்பங்களுக்கு எந்தவொரு நிவாரணமும் கிடைப்பதில்லை. அவர்கள் கடலில் பல துன்பங்களை அனுபவிக்கிறார்கள். அந்த வகையில், எமது மீனவர்களுக்கும் உதவும் வகையில் இந்த நிதியாண்டில் கூடுதலான நிதியை ஒதுக்கிக் கொடுக்க வேண்டுமென்று கேட்டு, வாய்ப்பளித்ததற்கு நன்றி கூறி, விடைபெறுகிறேன். வணக்கம்.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ සැලසුම් සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Suriyapperuma?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
Sir, I just want to make a small clarification on the matter raised by the Hon. Amirthanathan Adaikkalanathan.

උතුර සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තව තිබුණා නම් හොඳයි කියලා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. දැනටම රුපියල් මිලියන 5,000ක ප්‍රමාණයක් උතුරු පළාත සංවර්ධනය සඳහා වෙන් කරලා තිබෙනවා. මම හිතන විධියට විරුද්ධ පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ඒ පිළිබඳවත් ගැටලු මතු කළා, එච්චර මුදලක් වෙන් කරන්නේ ඇයි කියලා. ඊට අමතරව එම ගරු මන්ත්‍රීතුමා ඇහුවා, ආබාධිත පුද්ගලයන් සඳහා වෙනත් වැඩි කිරීමක් කරලා නැද්ද, සුදුසු ප්‍රතිපාදන දීලා නැද්ද කියලා. වකුගඩු රෝගීන් සඳහා, ආබාධිත පුද්ගලයන් සඳහා වන මාසික දීමනා රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා සහ වැඩිහිටි පුද්ගලයන් සඳහා වන මාසික දීමනාව රුපියල් 3,000 සිට 5,000 දක්වා අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කිරීමට යෝජනා කරනවා කියලා මේ අය වැය යෝජනාවල තිබෙනවා. That means, there are adequate provisions made, irrespective of whether they are from the Northern Province or the Southern Province. But, specific attention has been given to the Northern Province with funding. Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wijesiri Basnayake. You have 13 minutes.

[අ.භා. 1.47]

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අය වැය විවාදයේදී කථා කරන්න මට කාලය වෙන් කර දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මෙම උත්තරීතර සභාවේ අපි මේ විවාද කරමින් සිටින්නේ නිදහස් ශ්‍රී ලංකාවේ 79වැනි අය වැය පිළිබඳවයි. ඒ වාගේම ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමා මුදල් අමාත්‍යවරයා ලෙස ඉදිරිපත් කළේ මේ සභාවේ 49වැනි අය වැය. ඒ වාගේම මෙක ජාතික ජන බලවේගයේ මංගල අය වැය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනයක් කියන්නේ මොකක්ද? රජයක් ඉදිරි වර්ෂයේදී ආදායම් ලබා ගන්නා ආකාරයත්, ඒ ලබා ගත් ආදායම් වියදම් කරන ආකාරයත්, ඒ වාගේම අය වැය හිඟයක් තිබෙනවා නම් ඒ හිඟය පියවා ගන්නා ආකාරයත්, ඒ වාගේම යම්කිසි අය වැය අතිරික්තයක් තිබෙනවා නම් එම අතිරික්තය බෙදා හරින්නේ කොහොමද කියන එක පිළිබඳවත් ප්‍රකාශ වෙන මූලික ලියවිල්ල තමයි අය වැය ලේඛනය කියන්නේ කියලා අපි දන්නවා. ජාතික ජන බලවේගයේ මංගල අය වැය පිළිබඳව තමයි අපි මේ සාකච්ඡා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මංගල" කියන වචනයේ අදහස ගත්තොත් ඒකේ නිරූපණය වෙන්නේ "සුබ" කියන එක. මංගල කාරණා. අපි දන්නවා, මේ රටේ බෞද්ධ ජනතාව නිරන්තරයෙන්ම සජ්ඣායන කරන සූත්‍ර දේශනාවක් තිබෙනවා. ඒ තමයි මහා මංගල සූත්‍රය. මෙන්න මේ සූත්‍රයේ තිබෙනවා, කාරණාවන් 38ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ කාරණාවලින් මනුස්සයෙකුගේ ඒ ආර්ථික ජීවිතයේ, සමාජයීය ජීවිතයේ, සංස්කෘතික ජීවිතයේ, අධ්‍යාත්මික ජීවිතයේ යහපැවැත්ම පවත්වාගන්නේ කොහොමද කියලා මනාවට පැහැදිලි කරනවා. ඒ වාගේම තමයි මේ ජාතික ජන බලවේගයේ මංගල අය වැය තුළත් වැදගත් කාරණා 45ක් තිබෙනවා. මේ ලේඛනය පරිශීලනය කළොත් ඔබට ඒක බලාගන්න පුළුවන්. මෙන්න මේ කාරණා මුල් කරගෙන කරන්න හදන්නේ මොකක්ද?

පසුගිය කාලයේ අපේ රට ඍණ ආර්ථිකයක් අත්පත් කර ගැනීම නිසා විදේශීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන වන Moody's සහ Fitch Ratings වාගේ ආයතන අපේ රට පහළටම දාලා තිබුණා. පසුගිය කාලයේ මේ රටේ උද්ධමන වේගය අපි දැක්කා. ඒක අහස උසට තිබුණා. ඒ වාගේම ලෝකයේ රටවල් වර්ගීකරණය කරන තරගකාරිත්ව දර්ශකයේ - Global Competitiveness Index එකේ - පහළින්ම තමයි අපි සිටියේ. ඒ වාගේම තමයි Ease of Doing Business Index එකේ අපි බොහොම පහළ තැනක හිටියේ. එහෙම රටක්, මේ. ඒ වාගේම research and developmentවලට අඩුම මුදලක් වෙන් කරපු රටක්. ඒ වාගේම තමයි අපේ රටේ labour productivity එක, අපේ රටේ මානව සම්පතින් නියම ප්‍රයෝජනය ගන්න බැරිව වැටුප් ඇතුළු ඒ සියල්ල අඩු වෙච්ච රටක්. මෙන්න මේ රට කෙළින් කරන විධිය තමයි අපි මේ සාකච්ඡා කරන්නේ. එහෙම කරලා මේ රටේ ආදරණීය ජනතාවගේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික, අධ්‍යාත්මික ජීවිතය, යහපැවැත්ම ඉහළට ඔසවා ගැනීම තමයි අපේ මංගල අය වැයෙන් සම්පූර්ණයෙන්ම ඉලක්ක කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විපක්ෂයේ මහත්වරුන් අහනවා, අපේ ආර්ථික model එක මොකක්ද කියලා. එදා අපේ අනුර දිසානායක ජනපතිතුමා පැහැදිලි කළා, 2025 අය වැයේ ප්‍රධාන මූලධර්ම - principles - ගැන. එහි ප්‍රධාන මූලධර්ම 3ක් තිබෙනවා. එහි පළමු කාරණය තමයි, කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශවල නිෂ්පාදන වර්ධනය. අපේ Manifesto එක තුළ අපි කථා කළා, නිෂ්පාදන ආර්ථිකයක් ගැන. ඒ වාගේම එහි දෙවැනි කාරණය තමයි, නිෂ්පාදන ආර්ථිකයට මේ රටේ ජනතාවගේ සක්‍රිය දායකත්වය, සහභාගිත්වය ලබා ගැනීම. ඒ වාගේම ඔවුන් ලබා දෙන ඒ දායකත්වයට, ඒ සහභාගිත්වයට ලැබෙන ප්‍රතිලාභ සමාජය පුරා සාධාරණව බෙදා හැරීම එහි තුන්වන කාරණයයි. මෙන්න මේ මූලික මූලධර්ම මත පදනම්ව තමයි මෙවර අය වැය නිර්මාණය කර තිබෙන්නේ.

මෙම අය වැය තුළ සඳහන් කර තිබෙන මධ්‍ය කාලීන සාර්ව ආර්ථික දිශාව - mid-term economic direction - පිළිබඳව බැලුවාම අපට පෙනී යනවා, මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 5ට වඩා වැඩි කිරීමත්, ආර්ථිකයේ සැපයුම් ධාරිතාව පුළුල් කිරීමත්, අඩු හෝ ස්ථාවර උද්ධමන මට්ටමක් මේ රටේ පවත්වා ගැනීමත්, ඒ වාගේම ජංගම ගිණුමේ ස්ථාවර ශේෂයක් පවත්වා ගැනීමත් මුල් කරගෙන තමයි මේ අය වැය සකස් කර තිබෙන්නේ කියලා. මේ හරහා අපි බලාපොරොත්තු වෙනවා, මූලික වශයෙන් මේ රටේ මහජනතාවගේ ජීවන තත්ත්වය ඔසවා තැබීමට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ මූලිකම දර්ශනය වන්නේ, මේ රටේ ජනතාවගේ ආර්ථික අයිතිවාසිකම් තහවුරු කිරීමයි. මෙන්න මේක තමයි මූලිකම philosophy එක. මෙය මුල් කරගෙන තමයි මේ අය වැය නිර්මාණය වෙලා තිබෙන්නේ.

විපක්ෂයේ සමහර ගරු මන්ත්‍රීවරුන් කිව්වා, මෙය මැතිවරණය ඉලක්ක කරගත් අය වැයක් කියලා. නැහැ, මේක මැතිවරණය ඉලක්ක කරගත් අය වැයක් නොවෙයි. මේ අය වැය මේ රටේ ජනතාවගේ ආර්ථික අයිතිවාසිකම් - economic rights - වැඩිදියුණු කිරීමට නිර්මාණය කළ අය වැයක්. ඒ වාගේමයි මේ රටේ ජීවත් වන සෑම සමාජ තීරුවක්ම, සෑම පුද්ගලයෙක්ම, සෑම සමාජ කණ්ඩායමක්ම නියෝජනය වන විධියට අපි මේ අය වැය සකස් කර තිබෙනවා. මේ රටේ ආර්ථික ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ඒ සෑම ක්ෂේත්‍රයක්ම වඩාත් පුළුල්ව නියෝජනය වන පරිදි නිර්මාණය කරපු අය වැයක්, මෙය.

ඔබ මේ අය වැය ලේඛනය දිහා හොඳට විමසිල්ලෙන් බැලුවොත් පෙනී යාවි, මෙහි තිබෙන කාරණා ගැන. මෙහි සඳහන් කර තිබෙනවා, සිරකරුවන් බලාගැනීම ගැන. සිරකරුවෝත් මනුෂ්‍යයන්. ඒ නිසා ඔවුන්ගේ ජීවිතත් වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමට අපි මේ අය වැය හරහා කටයුතු කරනවා.

ඒ විතරක් නොවෙයි. අනාථ දරුවන්, ආබාධිත පුරවැසියන් සම්බන්ධවත් මේ අය වැය තුළ සඳහන් කර තිබෙනවා. මේ රටේ ජනතාවගෙන් විශාල පිරිසක් ගමනාගමනයට භාවිත කරන්නේ පොදු ප්‍රවාහන සේවයයි. මේ පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයටත් අපි මේ අය වැය හරහා විශාල බරක් තබා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ තරුණ ප්‍රජාව බලාගෙන ඉන්නවා, තමන් ඉගෙන ගත් දෙයට -පාසල් අධ්‍යාපන සහතිකවලට, උපාධි සහතිකවලට, ඩිප්ලෝමාවලට- අගයක් ඇති වෙනකම්. ඒ අනුව මෙවර අය වැයෙන් අපි යෝජනා කර තිබෙනවා, 30,000කට රැකියා අවස්ථා ලබා දීමට. පිළිගත් ක්‍රමවේදයකට තරග විභාග පවත්වා, සම්මුඛ පරීක්ෂණ පවත්වා අපි පිළිවෙළකට ඒ කටයුත්ත කරනවා. ඒ වාගේම තමයි, මේ රටේ තරුණයන්ගේ මානසික සෞඛ්‍ය - mental health - වර්ධනය කිරීමටත් මේ අය වැය හරහා ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. අපි දන්නවා, මේ වන විට අපේ රටේ තරුණ දරුවෝ බොහොමයක් smartphone එකට ඇබ්බැහි වීම නිසා ඔවුන්ගේ මානසික සෞඛ්‍ය - mental health - පහළ වැටී තිබෙන බව. මේ ව්‍යසනයෙන් දරුවන් ගොඩගන්න ඕනෑ. ඒ සඳහා මානසික සෞඛ්‍යය කියන කාරණය යටතේ අපි ලොකු වැඩසටහනක් නිර්මාණය කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි මෙම අය වැය හරහා මේ රටේ ආර්ථිකයේ ඉහළ වර්ධනයක් අත්පත් කර ගන්න සැලසුම් කර තිබෙනවා. එහෙම නම් අපි මේ රටේ දළ දේශීය නිෂ්පාදිතය - GDP එක - වර්ධනය කරන්න ඕනෑ. GDP formula එකේ තිබෙන්නේ මොනවාද? අපි ඒ ගැන හොයා බලන්න ඕනෑ. මේ තුළ විචල්‍යයන් කිහිපයක් තිබෙනවා.

ජනතාවගේ දේශීය පරිභෝජනය - domestic consumption, මේ රට තුළ කරනු ලබන ආයෝජන, ඒ කියන්නේ investments - ඒකට සෘජු විදේශ ආයෝජන වාගේම දේශීය ආයෝජකයන් කරනු ලබන ආයෝජනත් ඇතුළත් වෙනවා - ඊළඟට රජයේ වියදම්, යටිතල පහසුකම් - infrastructure, අපනයන සහ ආනයන කියන මේ කාරණා ටික එකතු වුණාම තමයි රටක දේශීය නිෂ්පාදිතය කියලා කියන්නේ. මෙන්න මේ දේශීය නිෂ්පාදිතය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා විශාල යෝජනා ගණනාවක් මේ අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි බැලුවොත්, රටක මූලික sectors පහක් තිබෙනවා. එනම්, ආර්ථික අංශය - economic sector එක, social sector එක, national security, infrastructure, government transformation. අපි මේ අංශ වෙන වෙනම අරගෙන බලමු. අපි ආර්ථික අංශය - economic sector එක - නැවතත් කොටස් කරනවා, කෘෂිකර්මය, නිෂ්පාදනය, සේවා - agriculture, manufacturing and services - කියලා. මේ එක එක sectors ඇතුළේ තවත් කොටස් තිබෙනවා. අපේ රට තුළ ප්‍රධාන clusters 30ක් විතර අපට හඳුනාගන්න පුළුවන්. මෙන්න මේ අංශ දියුණු කිරීම සඳහා මේ අය වැය තුළින් අපි විශාල අවධානයක් යොමු කරලා තිබෙනවා. පළමු වසර තුළ අපි කොහොමද මේ අංශ වැඩිදියුණු කරන්නේ කියන සාකච්ඡාව තමයි මේ අය වැය තුළ අපි නිර්මාණය කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අපට චෝදනාවක් එල්ල කළා, විවේචනයක් කළා, මේ අය වැය තුළ රාජ්‍ය පංගුව වැඩි කරලා පෞද්ගලික අංශය හකුළා තිබෙනවා කියලා. නැහැ, ඒක මුසාවක්. මේ අය වැය යෝජනා හොඳට පරිශීලනය කළොත් ඔබතුමන්ලාට බලාගන්න පුළුවන්, පෞද්ගලික අංශය වැඩිදියුණු - expand - කිරීම සඳහා මේ තුළ විශාල වැයක්, යෝජනා රාශියක් තිබෙනවා කියලා. අපනයනකරුවන්ට තත්ත්ව පරීක්ෂණ සහතික ලබා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම, ආයෝජන ආරක්ෂණ පනත සම්මත කිරීම, කොළඹ වරායේ නැහෙනහිර සහ බටහිර බහලුම් පර්යන්ත ව්‍යාපෘති අවසන් කිරීම, යෝජිත කොළඹ බටහිර පර්යන්තයේ සහ කොළඹ උතුරු වරායේ ක්‍රියාකාරිත්වය වේගවත් කිරීම, කෙරවලපිටියේ රේගු පරීක්ෂණ අංගණයේ සහ බිලූමැන්ඩල් භාණ්ඩ සේවා සැපයුම් උද්‍යානයේ මූලික කටයුතු සූදානම් කිරීම වැනි විශාල යෝජනා හරහා වැඩි වෙන්නේ, වර්ධනය වෙන්නේ මේ රටේ පෞද්ගලික අංශයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා, මේක රනිල්ගේ අය වැයක්, IMF එකේ අය වැයක් කියලා. නැහැ, මේක සුබදායක අය වැයක්. සියලුදෙනාම මෙවර අය වැය කියවලා බලන්න. මෙවර අය වැයෙන් සමාජ ආරක්ෂණය සඳහා රුපියල් බිලියන 749ක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය කාල පරිච්ඡේදය පුරාම බිඳ වැටිච්ච මහජන සෞඛ්‍ය සේවා වර්ධනය කිරීම සඳහා මෙම අය වැයෙන් රුපියල් බිලියන 604ක් වෙන් කර තිබෙනවා. මේ රටේ සුවහසක් වූ දරුවන්ගේ, විශ්වවිද්‍යාල දරුවන්ගේ අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් වෙන් කරලා තිබෙනවා. අපට සියයට 6ක ප්‍රතිශතයට යන්න බැරි වුණත් ක්‍රමයෙන් හැම වර්ෂයකම මේ මුදල වර්ධනය කිරීමට සැලසුම් අපි නිර්මාණය කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ අමතක කරපු දෙයක් තමයි පෙර පාසල් දරුවන්ගේ පෝෂණය. පෙර පාසල් අධ්‍යාපනය නහාසිටුවන්න රුපියල් බිලියන 619ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් -ආසන්න වශයෙන් රුපියල් ට්‍රිලියන 1.3ක්- මූලික වශයෙන් මේ සමාජයට ආයෝජනය කරලා තිබෙනවා. මෙන්න මේ හරහා මේ රටේ දැවැන්ත වෙනසක්, දැවැන්ත පරිවර්තනයක් සිද්ධ වෙනවා.

ඒ වාගේම ඩිජිටල්කරණය - digitalization - යටතේ මේ රටේ විශාල වෙනසක්, පරිවර්තනයක් සිදු කිරීමට කටයුතු කර තිබෙනවා. අපි කථා කරන cashless society, paperless office, peopleless office, officeless society එකක් කරා මේ රට නිර්මාණය කිරීමේ වගකීම හොඳින් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදනය කරලා තිබෙනවා. මේ රටේ මහ ජනතාවගේ ආර්ථික, සමාජ, දේශපාලන, සංස්කෘතික සහ අධ්‍යාත්මික ජීවිතය උසස් කිරීම සඳහා අවශ්‍ය යෝජනා මේ තුළ අන්තර්ගත වෙලා තිබෙනවා. එහෙම නම්, අපි ඔක්කොම එකතු වෙලා ආසියාවේ ලස්සනම රට හදමු; අපි ඔක්කොම එකතු වෙලා ආසියාවේ පිරිසිදුම රට හදමු; අපි සියලුදෙනාම එකතු වෙලා ආසියාවේ පොහොසත්ම රට හදමු. මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ramanathan Archchuna, state your point of Order, please.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, this is regarding the incident that occurred today inside a courtroom in the main Court Complex, Colombo. I would like to mention that a couple of weeks ago, I was threatened by a couple of people in Jaffna. We are planning to go back to Jaffna after the Parliamentary Sessions. So, I would like to request the Hon. Minister of Public Security to provide us with security, at least during Parliamenet Sessions, as this issue has become an important incident in our country. Please convey this message to the Hon. Speaker.

Thank you, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. I will convey it to the Hon. Speaker.
The next speaker is the Hon. (Dr.) Hansaka Wijemuni. You have 14 minutes.

[අ.භා. 2.03]

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද දින විවාදයට ගැනෙන්නේ එක පැත්තකින් NPP ආණ්ඩුවේ පළමුවෙනි අය වැයයි. අනෙක් පැත්තෙන්, මේ රට අලුත් දිශානතියකට වෙනස් කිරීමේ මංගල අය වැය ගැනයි. හැම දාම අපි අය වැය කථා ඇහුවා. නමුත්, ඒ අය වැය කථාවල, අය වැය proposalsවල තිබුණු දේවල් යථාර්ථයක් වෙනවා අපි දැක්කේ නැහැ. අද පළමුවෙනි වතාවට අපි දකිනවා, වඩාත් පුළුල් සංවිධානාත්මක බවකින්, වඩාත් පුළුල් අධ්‍යයනයකින් ඉදිරිපත් කරපු අය වැයක්. ඒ නිසා මේ අය වැය සම්බන්ධයෙන් විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් සහ නියෝජ්‍ය ඇමතිවරයෙක් විධියට මට කථා කරන්න අවස්ථාව ලැබීම විශාල භාග්‍යයක්කොට සලකනවා. මෙය, නිකම්ම නිකම් ප්‍රාග්ධන වියදම්, එහෙම නැත්නම් පුනරාවර්තන වියදම්, එහෙමත් නැත්නම් සංවර්ධන යෝජනා තිබෙන අය වැයක් නොවෙයි; නිකම්ම නිකම් ඉලක්කම් තිබෙන අය වැයක් නොවෙයි. මේක, ජනතාවගේ හදවත හඳුනාගෙන තිබෙන අය වැයක්. ඇයි, මම එහෙම කියන්නේ? ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් කථා නොකළ, මෙතෙක් සංවාදයට භාජන නොවුණු කාරණා ගැන මෙවර අය වැයෙන් කියැවෙනවා.

විශේෂයෙන්ම ඔටිසම් නැමැති රෝගී තත්ත්වයෙන් පෙළෙන ළමයි, disabled persons, ඍඳවියන් - විශේෂයෙන්ම ළමා ඍඳවියන් -, මත් ද්‍රව්‍යවලට ගොදුරු වෙලා ඉන්න තරුණ පරම්පරාව, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ඇතුළු මේ සමාජයේ සෑම තරාතිරමක් ගැනම මේ තුළ කියැවෙනවා. මේ අය වැය කියවනකොට තේරෙනවා, මේක ජනතාවගේ හදවත හඳුනාගෙන තිබෙන අය වැයක් බව.

ඒක බොහොම විශේෂයි. ඒ වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉතිහාසයේ මෙතෙක් වෙන් කරපු ලොකුම මුදල වන රුපියල් බිලියන 604ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. අපි දැක්කා, විපක්ෂයෙන් අද උදේ ප්‍රශ්න යොමු කරනවා. හැම තිස්සේම වැටුප් ගැන තමයි එතුමන්ලා කථා කළේ. ඇත්තටම අපි මේ අය වැය හදලා තිබෙන්නේ මේ රටේ ජනතාව වෙනුවෙනුයි. මේ අය වැය, නිකම්ම නිකම් වැටුප් ගැන සඳහන් වෙන එකක් නොවෙයි. විශේෂයෙන්ම මේ රටේ පුරවැසියා මූලික කර ගත් සංවර්ධනයක් අපි මේ තුළින් සැලසුම් කරලා තිබෙනවා; මේ රටේ රෝගියා මුල් කර ගත් සංවර්ධනයක් අපි සැලසුම් කරලා තිබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන අනවශ්‍ය පෝලිම්, ඖෂධ හිඟය, උපකරණ හිඟය නැති කිරීම සඳහා අවශ්‍ය වන කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන විසඳුම් අපි දැනටමත් සකසා තිබෙනවා. ඒ සඳහා වූ මුදල් ප්‍රතිපාදන ලෙස තමයි, මේ වසරට මෙච්චර මුදලක් අපට ලැබෙන්නේ.

අපි දකිනවා, අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය භෞතික සම්පත්වලින් වාගේම දැඩි මානව සම්පත් හිඟයකින් පීඩා විඳින බව. මානව සම්පත් හිඟයෙන් පීඩා විඳින අතරම අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැඩ කරන බොහෝ වෘත්තිකයන් දැඩි අපහසුතා මැද ජීවත් වෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිරත වූ අය විධියට මමත්, සෞඛ්‍ය ඇමතිතුමාත් ඒ පිළිබඳව විශේෂ සොයා බැලීමක් සිදු කරනවා. ඒ වාගේම ඒ පිළිබඳව විශේෂ සහකම්පනයක් අපට තිබෙනවා. අපේ රටේ වෛද්‍යවරුන් අතරින් සීමාවාසික වෛද්‍යවරු මේ රටේ ලොකු කර්තව්‍යයක් කරනවා. ඔවුන් ලබන්නේ ඉතා අඩු දීමනාවක්. එම නිසා ඒ දීමනාව වැඩි කර ගැනීමේ දැඩි අවශ්‍යතාවක් අපට තිබෙනවා. ඔවුන්ට නිල නිවාස ලබා දීම කෙසේ වෙතත් ඒ අතරින් බොහෝදෙනෙකුට නවාතැන් සඳහා අවශ්‍ය කාමරයක්වත් සැපයීමට අපේ සෞඛ්‍ය පද්ධතිය අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම්, ප්‍රවාහන පහසුකම් ලබා දීම අපේ රජයේ වගකීමක් විධියට අපි සලකනවා.

ඒ වාගේම ශ්‍රේණි වෛද්‍යවරුන් ගත්තාම, වෛද්‍යවරයෙක් රෝහලට ඇවිල්ලා ප්‍රතිකාර සහ අනෙකුත් සේවා කරලා උපයා ගත යුත්තේ වැටුප පමණක් නොවෙයි. ඔහු යම් වෘත්තීය නිපුණතාවක් උපයා ගන්නවා වාගේම ඒ නිපුණතාවට අවශ්‍ය reward එකක්, එහෙම නැත්නම් ඒ නිපුණතාවට අවශ්‍ය ලකුණු දීමේ ක්‍රමයක් තිබිය යුතුයි. ඒ නිසා ශ්‍රේණි වෛද්‍යවරුන් සඳහා මධ්‍යම ශ්‍රේණියේ තනතුරු ක්‍රමයක් - middle-grade posts ක්‍රමයක් - ඇති කළ යුතුව තිබෙනවා. ඒ වාගේම වෛද්‍යවරුන්ගේ නිල නිවාස, ප්‍රවාහනය සම්බන්ධව වාගේම ස්ථාන මාරුවීම් සම්බන්ධවත් දැඩි ගැටලු තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන දත්ත පද්ධති යාවත්කාලීන කිරීමට වැඩි මුදලක් මේ අවුරුද්දේ වෙන් කරන්න. ඒ වාගේම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන සියලු මාරුවීම් ඒ දත්ත පද්ධතිය හරහා සිදු කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා. එමඟින් අනවශ්‍ය ඇඟිලි ගැසීම් සියල්ල හමාර කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම විශේෂඥ වෛද්‍යවරුන්ට සහ යම් යම් තනතුරු දරන වෛද්‍යවරුන්ට ඔවුන්ගේ සම ශ්‍රේණිවල ඉන්න, විශේෂයෙන් All Island Services නවයේ සිටින අනෙකුත් රජයේ සේවකයන්ට හිමි වරප්‍රසාද අහිමි වෙලා

තිබෙනවා. විශේෂයෙන්ම transport සම්බන්ධයෙන් වූ වරප්‍රසාද අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සියල්ල සමාලෝචනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, විශේෂඥ වෛද්‍යවරුන්ට අවශ්‍ය උසස් තාක්ෂණික උපාංග නිසි පරිදි ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. අපේ සෞඛ්‍ය සම්බන්ධ වූ වැඩසටහනේදී පහළම මට්ටමේ සිටින ක්ෂේත්‍රය family medicine තත්ත්වයට දියුණු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. Family doctor කෙනෙක් හැම පුරවැසියෙකුටම ලබා දීමට වාගේම ඉහළම තලයේ තිබෙන, apex එකේ හැම රෝහලකටම උපරිම පහසුකම් ප්‍රමාණය ලබා දීමටත් බලාපොරොත්තු වෙනවා.

අද බොහෝ වෛද්‍යවරුන් පුහුණුව සඳහා විදේශගත වෙලා ඉන්නවා. අපි දන්නවා, ඒ පුහුණුව සඳහා විදේශගත වූ වෛද්‍යවරු හැම දෙනාටම ඒ රටවලදී job එකක් ලැබෙන්නේ නැහැ කියලා. එසේ විදේශගත වූ වෛද්‍යවරුන්ට අපි තවම ගෙවන්නේ පරණ ගණනමයි. නමුත්, ඒ ගණනින් ඔවුන්ට ජීවත්වීමට නොහැකි වෙලා තිබෙනවා. ඒ නිසා එය පවා සමාලෝචනය කළ යුතුව තිබෙනවා. ඔවුන් නැවත ලංකාවට එන විට ඔවුන්ගෙන් උපරිම සේවය ගැනීමට සැලසුම් සැකසිය යුතුව තිබෙනවා. අපි ඒ සඳහා වූ සැලසුම් දැනට හදාගෙන යනවා. මේ සියල්ල මැද දැනට පවතින ක්‍රමය තුළ ඔවුන් මේ රට හැරදා යන්නේ හුදෙක් ආර්ථික කාරණා නිසාම නොවෙයි. අපගේ රාජ්‍යයේ තිබුණු අසංවිධානාත්මක ස්වරූපය නිසායි. ඒ වාගේම, හෙදියන්, පරිපූරක වෛද්‍ය සේවය, අතුරු වෛද්‍ය සේවය, සෞඛ්‍ය කාර්ය සහායක, අනෙකුත් කාර්ය මණ්ඩල කියන මේ හැම එකකටම ඔවුන්ටම අනන්‍ය වූ; ඔවුන්ටම සුවිශේෂ වූ කාරණා, ගැටලු, අභියෝග පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජය බලයට පත් වීමට පෙර සිටම අපි මේ සෑම ක්ෂේත්‍රයක් සම්බන්ධවම පුළුල් අධ්‍යයනයක් කරලා තිබුණා. ඒ අනුව අපි මේ සෑම ක්ෂේත්‍රයකම, සෑම පුද්ගලයෙකුටම, සෑම සෞඛ්‍ය සේවකයෙකුටම අනන්‍ය වූ ප්‍රශ්නවලට විසඳුම් සොයමින් සිටිනවා. සෑම කෙනෙකුටම, සෑම වෘත්තියකටම තමන්ගේ ක්ෂේත්‍රයෙන් ඉදිරියට යෑමට, එහෙම නැත්නම් මානව සංවර්ධනයට තිබෙන බාධා ඉවත් කිරීමට ගත යුතු සෑම පියවරක්ම රජයක් විධියට අපි ගන්නවා. ඒක වැටුප් විධියට වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් වෙනත් කාරණා විධියට වෙන්න පුළුවන්. විශේෂයෙන්ම පසුගිය කාලවල පසුගිය රජයන් විසින් බොහෝ සේවකයන් බඳවාගෙන තිබුණේ ඒ ඇමතිවරයා ඉන්න දිස්ත්‍රික්කයෙන්. ඒකේ අනිවාර්ය ප්‍රතිඵලය විධියට බොහෝ සේවකයන්ට ස්ථාන මාරුවීම් ලබා ගැනීමට නොහැකි වෙලා තිබෙනවා. අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ මේ කාරණය සැලකිල්ලට අරගෙන ඔවුන්ට විශේෂ වූ ස්ථාන මාරුවීම් ක්‍රමයක් සකසමින් තිබෙනවා.

පොදුවේ ගත්තාම රජයේ සේවකයන්ට වැටුප් වැඩි වුණේ අවුරුදු 9කට පසුවයි. අවුරුදු 9කට පසුව මූලික වැටුප වැඩි වෙච්ච එක ටිකක් ආගන්තුක අත්දැකීමක් වාගේ අපට පෙනෙනවා බලාගෙන ගියාම. මොකද, මේ වැටුප් වැඩිවීමේදී අනෙකුත් දීමනා වැඩි වෙන්නේ කොහොමද කියන එක ගැන සමහර අයට ලොකු වැටහීමක් නැහැ. සමහරු හිතාමතාම මේ පිළිබඳව විකෘති අර්ථකථන ඉදිරිපත් කරනවා. ඒ නිසා මේ වැටුප් වැඩිවීමට අදාළ සංඛ්‍යාලේඛන මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා වෙනුවට ඒ සඳහා වූ මූලික කාරණා සම්බන්ධව යම් දෙයක් ඉදිරිපත් කිරීම සුදුසු යැයි මම හිතනවා. අපි මේ අය වැයෙන් හැම රජයේ සේවකයෙකුගේම මූලික වැටුප ලොකු ගණනකින් වැඩි කරලා තිබෙනවා. එසේ වැඩි කරන අතර 1:4 වූ වැටුප් අනුපාතය පවත්වාගෙන යෑමට සැලකිලිමත් වෙලා තිබෙනවා. ඒ වාගේම, ඉතිහාසයේ සිදු කළ උපරිම වැටුප් වර්ධක ලබා දීම කරලා තිබෙනවා. ඒ, සියයට 80ක ප්‍රමාණයක්. දීමනා ගත්තාම, ඒ දීමනා සියල්ල ප්‍රක්ෂේපණය කරලා තිබෙන්නේ; විශේෂයෙන්ම OT, extra duty allowance, ඒ වාගේම public holidaysවලට දෙන නිවාඩු දින දීමනා කියන දීමනා තුන ප්‍රක්ෂේපණය කරලා තිබෙන්නේ 2027දී ලැබෙන වැටුපටයි. ඒ වාගේම, extra duty allowance සහ OT එක 2027 වැටුපට ප්‍රක්ෂේපණය කරන අතර, ඒ ගණනය කිරීම්වලදී,- අපි දන්නවා, එක් එක් සේවකයාට අදාළ වැටුප් කාණ්ඩයක් තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Hansaka Wijemuni, you have two more minutes.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
Okay.

ඒ වැටුප් පරිමාණය ඇතුළේ මධ්‍ය අගයක් තිබෙනවා. උදාහරණයක් විධියට, වැටුප් වර්ධක 12ක් හිමි යම්කිසි ශ්‍රේණියක් තිබෙනවා නම්, අන්න ඒකේ මැද අගය තමයි ගන්නේ. ඒ මැද අගය අරගෙන තමයි extra duty allowance සහ OT කියන එකේ මධ්‍ය අගය ගන්නේ. ඒ වාගේම, ඒවා නියම කිරීමේදී යම් අනුපාතයක්, යම් භාගයක් තීරණය වෙනවා. OT එක, එහෙම නැත්නම් overtime allowance එක තීරණය වෙන්නේ 140න් එකකට.

ඒ වාගේම extra duty allowance කියන එක තීරණය වන්නේ මුදල් අමාත්‍යාංශය විසින් තීරණය කරන යම් සාධාරණ භාගයකට. අපි හිතනවා, මෙවර මුදල් අමාත්‍යාංශය විසින් ලබාදිය හැකි උපරිම සාධාරණ භාගය ලබාදීලා තිබෙනවා කියලා. මොකද, උදේ මන්ත්‍රීවරයෙක් ඒ ප්‍රශ්නය ඇහුවා.

අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ, මේ සෑම දෙයක්ම, යම්කිසි නිලධාරියෙකුට ලැබිය යුතු වැටුප්වල මූලික වැටුප සහ සියලු දීමනාවල significant increase එකක්, ඒ කියන්නේ පැහැදිලිව පෙනෙන වැඩිවීමක් රජයක් විධියට ලබා දීලා තිබෙනවා කියන එකයි. ඒ වාගේම අනික් පැත්තෙන් ගත්තාම, වෘත්තිකයන්ගේ බදු බර අපි අයින් කරලා තිබෙනවා. සමස්ත අය වැය ගත්තාම මම ඉස්සෙල්ලා කිව්වා වාගේ මේක නිකම්ම නිකම් ලේඛනයක් නොවෙයි. මේක ලොකු කතන්දරයක්. මේක ඇතුළේ මේ දමමින් සිටින්නේ ලංකාවේ අනාගතය සඳහා වූ අඩිතාලම. මේ දමමින් සිටින්නේ මේ රටේ මෙතෙක් ගමන් කළ මාර්ගය වෙනස් කිරීම සඳහා වූ අඩිතාලමයි. ඒක නිසා මේක නිකම්ම නිකම් ඉලක්කම් සෙල්ලමක් නොවෙයි.

බොහෝදුරට මේ අය වැය සම්බන්ධයෙන් චෝදනා නැති නිසාම සමහරු ඉලක්කම්වල එල්ලිලා සිටිනවා. ඒක නිසා අපි මේ රටේ ජනතාවට ආරාධනා කරනවා, ඒ ඉලක්කම්වලට එල්ලෙන්න එපා කියලා. ඔබ සියලු දෙනාගේ වැටුප කීයද කියලා අප්‍රේල් මාසයේ මුල වෙනකොට අපි හැමෝටම බලා ගන්න පුළුවන්. ඒක නිසා අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, අපි මේ අලුත් ගමන යමු කියලා. අපට ඒ අලුත් ගමන යන්න පුළුවන්. ඒ සඳහා වූ හොඳ අඩිතාලමක් මේ අය වැයෙන් ලැබෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Susantha Dodawatta. You have 13 minutes.

[අ.භා. 2.17]

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන්නේ ජාතික ජන බලවේගයේ මංගල අය වැයයි. දූරදර්ශී, අනාගතවාදී දැක්මක් සහිත අය වැයක දෙවන වර කියැවීමේ විවාදයේදී අදහස් දක්වන්න අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක්කොට සලකනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇයි, මේ අය වැය දූරදර්ශී, අනාගත දැක්මක් සහිත අය වැයක් කියලා අපි ප්‍රකාශ කරන්නේ? මට කලින් කථා කරපු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කරපු ආකාරයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන්, සෞඛ්‍ය පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සඳහා යෝජනාවක් මේ අය වැය තුළ යෝජනා වෙලා තිබෙනවා. මේ රටේ යම් රෝගියෙකුගේ, ක්ලිනික් කාඩ් පත යම් හෙයකින් අස්ථානගත වුණොත්, නැති වුණොත්, ඔහුට රෝගය පිළිබඳ ඉතිහාසය, තමන් ලබාගත්ත ප්‍රතිකාර පිළිබඳ ඉතිහාසය, තමන් විසින් කරන ලද පරීක්ෂණ පිළිබඳ ඉතිහාසය අහිමි වෙන තත්ත්වයක් තුළ, සෞඛ්‍ය පද්ධතිය ඩිජිටල්කරණය කිරීම හරහා මේ රට දියුණු ලෝකයේ, දියුණු සෞඛ්‍ය පද්ධතියකට යන ගමන මේ අය වැය යෝජනාව හරහා සිද්ධ වෙන්න නියමිතව තිබෙනවා. ඒකයි, අපි මේක දූරදර්ශී, දීර්ඝ කාලීන දැක්මක් සහිත අය වැයක් කියලා කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අය වැය තුළින් යෝජනා කරනවා, "ශ්‍රී ලාංකික දිනය"; "Sri Lanka Day" ගැන. මොකක්ද, ශ්‍රී ලාංකික දිනය කියන්නේ? අපේ රට බහු වාර්ගික, බහු ආගමික, බහු සංස්කෘතික රටක්. සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් කියන සියලු ජාතීන් ජීවත් වෙන රටක්. මේ රටට විවිධාකාරයේ ජාතික, ආගමික, සංස්කෘතික, කලාත්මක අනන්‍යතා තිබෙනවා. හැබැයි, මෙතෙක් කල් මේ රටේ මොකක්ද සිද්ධ වුණේ? මේ රට පාලනය කරපු පාලකයෝ තමන්ගේ පටු දේශපාලන අරමුණු, අභිමතාර්ථ වෙනුවෙන් මේ රටේ මහජනතාව වාර්ගික වශයෙන්, ආගමික වශයෙන් බෙදා වෙන් කරලා පාලනය කිරීමේ ප්‍රතිඵලයක් විධියට අපි දීර්ඝ කාලයක යුද්ධයකට මුහුණ දුන්නා. මම උත්සාහ කළා, යුද්ධයෙන් මිය ගිය සියලු පුරවැසියන්ගේ සංඛ්‍යාලේඛන ලබා ගන්න. නමුත් සංඛ්‍යාලේඛන ලබා ගන්න තිබෙන්නේ ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ මිය ගිය අය සම්බන්ධයෙන් පමණයි. යුද්ධයෙන් මිය ගියේ මේ රටේ පුරවැසියෝ.

ඒ නිසා අපට ජාතික අවශ්‍යතාවක් තිබෙනවා. ඒ තමයි, ශ්‍රී ලාංකීය ජාතිය ගොඩනැඟීමේ අවශ්‍යතාව. ඒ අවශ්‍යතාව ඉටු කර ගැනීම තමයි "ශ්‍රී ලාංකික දිනය" ජාතික උත්සවය නම් කිරීමෙන් අප ගොඩනඟන්න උත්සාහ කරන්නේ. ඔබතුමන්ලා දන්නවා, මේ වන විට ලෝකයේ විවිධ රටවල මෙවැනි දින නම් කර තිබෙන බව. ජර්මනියේ Oktoberfest, බ්‍රසීලයේ Carnival in Rio de Janeiro, ඉන්දියාවේ Diwali වාගේ තැන්වල සංස්කෘතික උළෙලවල්, උත්සව, සැමරුම් තිබෙනවා. හැබැයි, ශ්‍රී ලාංකීය ජාතිය විධියට සියලු ජාතීන් එකතු වෙලා සියලු ජාතීන්ගේ අනන්‍යතාවන් සහිතව, සංස්කෘතික ලක්ෂණ සහිතව, කලාංග සහිතව සමරන්න එවැනි උත්සවයක් නොමැති වීමේ අඩු පාඩුව අපට තිබෙනවා. එවැනි උත්සවකාර සැමරුමක් අපට තිබුණා නම් ජාතීන් අතර නිර්මාණය වෙච්ච මේ බෙදීම්, මීට පෙර තිබිච්ච වෙන්වීම්, විරසකයන් ඇති නොවෙන්නට ඉඩ තිබුණා කියා අපි විශ්වාස කරනවා.

අපි දන්නවා, අපේ රටේ ජාතීන් අතර විවිධ කලා අනන්‍යතා, ආහාර සම්බන්ධයෙන් වන විවිධ අනන්‍යතා, ඇඳුම් සම්බන්ධයෙන් වන විවිධ අනන්‍යතා, සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳ විවිධ අනන්‍යතා තිබෙන බව. "ශ්‍රී ලාංකික දිනය" කියන වැඩ පිළිවෙළ හරහා මෙන්න මේ සියලු අනන්‍යතාවන් එක තැනකට එකතු කරලා, සමස්ත ශ්‍රී ලාංකික ප්‍රජාවට එකට එකතු වෙලා ඒ විවිධ අනන්‍යතා ලෝකය ඉස්සරහා සමරන්න, ශ්‍රී ලාංකික ජාතියේ අභිමානය ලෝකයට ගෙන යන්න අවස්ථාව හිමි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ටීවන් කෝවේ කියන අධ්‍යාපනඥයා, ලේඛකයා කියා තිබෙනවා, "Strength lies in differences, not in similarities" කියලා; අපගේ ශක්තිය වන්නේ වෙනස්කම මිස එක් ආකාරයකට ක්‍රියා කිරීම නොවෙයි කියලා. එහෙම නම්, මෙවැනි දිනයක්; මෙවැනි සැමරුමක් හරහා අපි මොකක්ද අපේක්ෂා කරන්නේ? මෙය එක් දිනයකට සීමා වන සැමරුමක් නොවෙයි. මෙවැනි සැමරුමක් හරහා අපි අපේක්ෂා කරනවා, ජාතීන් අතර සංහිඳියාව ඇති කරන්න සහ ජාතීන් අතර එකිනෙනාට ගරු කරන, අනෙකාගේ සංස්කෘතිය, කලාව, කර්මාන්ත ඇතුළු සියල්ල එක්ව සංස්පර්ශ කරන, එක්ව විඳින සංස්කෘතියක් නිර්මාණය කරන්න.

අපි දන්නවා, ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් විදේශ රටවල පුරවැසියන් විධියට, රැකියා නියුක්තිකයන් විධියට, ස්ථිර පදිංචිකරුවන් විධියට විදේශ රටවලට ගිහින් ඉන්නවා කියලා. ඒ කණ්ඩායම් අවුරුද්දේ විවිධ අවස්ථාවලදී තමන්ගේ ජාතික අනන්‍යතාවට අනුව, ආගමික අනන්‍යතාව අනුව මේ රටට පැමිණෙනවා, ඒ උත්සව වෙනුවෙන්. එය සිංහල අවුරුද්ද වෙන්න පුළුවන්, තෛපොංගල් වෙන්න පුළුවන්, ඇසළ පෙරහැර වෙන්න පුළුවන්, රාමසාන් උත්සවය වෙන්න පුළුවන්, මහ සිකුරාදා වෙන්නත් පුළුවන්. ඔවුන් වෙන් වෙන්ව ඇවිත් තමන්ගේ අනන්‍යතාව ඇතුළේ එකී උත්සව සමරමින් ඉන්නවා. නමුත් "ශ්‍රී ලාංකික දිනය" වැනි සැමරුමක්, මෙවැනි උළෙලක්, මෙවැනි උත්සවයක් හරහා, මේ සමස්ත සංස්කෘතික අංග එක තැනකට එකතු කිරීම හරහා මේ රටින් දැනට විදේශගත වෙලා ඉන්න ඒ ශ්‍රී ලාංකිකයන් touristsලා විධියට මේ රටේ සංචාරක කර්මාන්තය සඳහා ආකර්ෂණය කර ගැනීමේ ඉඩ ප්‍රස්ථාව නිර්මාණය වෙනවා. ඒ හරහා අපට මේ රටේ නැඟී එමින් තිබෙන සංචාරක කර්මාන්තය සඳහා සංචාරකයන් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමේ හැකියාව තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ යෝජනාව ගෙනෙන්නේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී ක්‍රියාත්මක වෙන්න. නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළදී තමයි මේ රටට වැඩිම විදේශිකයන් සංඛ්‍යාවක් එන්නේ. ඒ අනුව අපට හැකියාව ලැබෙනවා, විදේශීය සංචාරකයන් මෙවැනි ජාතික සැමරුමක්, ජාතික සැණකෙළියක්, මෙවැනි උළෙලක් හරහා මේ රටේ සංචාරක කර්මාන්තයට ආකර්ෂණය කර ගන්න. සංගීත සන්දර්ශන වෙන්න පුළුවන්, සංස්කෘතික උත්සව වෙන්න පුළුවන්, food festivals වෙන්න පුළුවන්, පෙරහැර ඇතුළු කලා සංස්කෘතික වැඩමුළු වෙන්න පුළුවන්, පාරම්පරික කර්මාන්ත සම්බන්ධ වැඩමුළු වෙන්නත් පුළුවන්. මෙවැනි දීර්ඝ සැමරුමක් හරහා මේ රටේ සංචාරක කර්මාන්තයට විශාල ආලෝකයක් ලබා ගැනීමේ විභවතාව මේ සංකල්පය ඇතුළේ; මේ යෝජනාව ඇතුළේ තිබෙනවා.

මේ හරහා අපේ දේශීය කලාවන්, අපේ දේශීය කර්මාන්ත අනාගතය සඳහා රැක ගැනීමේ හැකියාව ද අපට ලැබෙනවා. ඒ

වාගේම, දේශීය කලාවන්හි නියැළෙන, දේශීය කර්මාන්තවල නියැළෙන මේ රටේ ජනතාව වෙත විශාල ආර්ථික ශක්තියක් ලබා දීමේ සහ ඔවුන් මේ රටේ ආර්ථිකයේ කොටස්කරුවන්, පංගුකරුවන් කර ගැනීමේ හැකියාව ද අපට ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ශ්‍රී ලාංකික දිනය" කියන සංකල්පය හරහා අප නිර්මාණය කරන්න යන්නේ මොකක්ද? ඒ හරහා අප නිර්මාණය කරන්න යන්නේ සියලු ජනවර්ග, සියලු ප්‍රදේශ, සියල්ල එකතු කර ගත්; ජාතිවාදය, ආගම්වාදය, වෙනත් ආකාරයක ආන්තීකරණයන් වැනි පටු දේශපාලන වුවමනාවලට යට නොවන ලෞකික වාගේම ආධ්‍යාත්මික අතින් ද සැබවින්ම පොහොසත්, පරමාදර්ශී රාජ්‍යයක්. එවැනි රාජ්‍යයක් නිර්මාණය කිරීමේ වැඩ පිළිවෙළ තමයි මේ වැඩසටහන තුළ තිබෙන්නේ. ඒ නිසා අපි ඔබතුමන්ලාට ආරාධනා කරනවා, මෙයට සහාය දෙන්න, මෙය සමඟ එකතු වෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය යෝජනා තුළ තිබෙනවා, වරදකරුවන් වූ සිරකරුවන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහනක් පිළිබඳ යෝජනාවක්. ඒ සඳහා දැනටමත් වෙන් කර තිබෙන මුදල රුපියල් මිලියන 100කින් වැඩි කිරීමට යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේදී අපරාධ ගැන කථා කරනවා. අද දවස ගත්තත් එහෙමයි. ලෝකයේ දඬුවම් ලබා දීමේ හරය මොකක්ද, අරමුණ මොකක්ද? දඬුවම් ලබා දීමේ අරමුණ, කරන ලද වරදට දඬුවම් කිරීම පමණක් නොවෙයි. ඒ දඬුවම අවසානයේ ඒ ක්‍රියාවලිය හරහා මේ සමාජයට, සමාජ ප්‍රගමනයට, සමාජ යහපතට සුදුසු පුද්ගලයෙකු මුදා හැරීමයි අරමුණ. හැබැයි අපි දන්නවා, මේ රටේ එක් වරක් බන්ධනාගාරගත වන පුද්ගලයෙකු බන්ධනාගාරයෙන් එළියට එන්නේ සිටියාට වඩා දරුණු ගණයේ අපරාධකාරයෙකු වෙලා බව. ඒවායේ ප්‍රතිඵල තමයි අප අද මේ භුක්ති විඳිමින් ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025.02.18 දින වන විට වරදකරුවන් වූ සිරකරුවන් 9,092ක් ලංකාවේ බන්ධනාගාර තුළ ඉන්නවා. මේ එක් රැඳවියෙකු වෙනුවෙන් රජය දවසකට රුපියල් 1,084ක මුදලක් වැය කරනවා. අවසානයේ මොකක්ද අප බලාපොරොත්තු වන්නේ? මොකක්ද අපට ලැබිලා තිබෙන්නේ? අපට ලැබිලා තිබෙන්නේ නැවත අපරාධකරුවන් රජ කරන රාජ්‍යයක්. මෙන්න මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා තමයි වරදකරුවන් වූ සිරකරුවන් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහනක් ඇති කරන්නේ. බන්ධනාගාරයෙන් එළියට ආවාම ඔවුන් සමාජය විසින් බාර ගන්නා පුද්ගලයන් බවට පත් කිරීමේ, යම් වෘත්තීයමය සුදුසුකමක් සහිතව මේ සමාජයේ අනෙක් සාමාන්‍ය සිවිල් පුරවැසියන් සමඟ ගනුදෙනු කරන්න පුළුවන් පුද්ගලයන් බවට පත් කිරීමේ, මේ සමාජය එම පුද්ගලයන් සාමාන්‍ය පුරවැසියන් ලෙස බාර ගන්න පුළුවන් සමාජයක් බවට පත් කිරීමේ අභිලාෂය මේ යෝජනාව ඇතුළේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. දැන් ටිකකට කලින් නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා මේ දින දෙකේදී සිද්ධ වෙච්ච අපරාධ පිළිබඳව කථා කළා. ඊයේ දවසේ සිද්ධ වෙච්ච ත්‍රිපුද්ගල මිනීමැරුම සම්බන්ධයෙන් මම කියන්න ඕනෑ. ඒ මිය ගිය තැනැත්තා ප්‍රසිද්ධ YouTube නාළිකාවකට සම්මුඛ සාකච්ඡා දෙකක් දීලා තිබෙනවා. මම ඒ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගෙදර ගිහිල්ලා ඒවා බලන්න කියලා. තමාව මරන්න ඉන්නේ කවුද කියලා ඒගොල්ලන් ඒකේ කියනවා. ඒ නිසා මම ඒ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගෙදර ගිහිල්ලා ඒවා බලන්න කියලා.

මෙවර ජාතික ජන බලවේගය තමන්ගේ මංගල අය වැය විධියට ගෙනැල්ලා තිබෙන්නේ මේ රටේ ඉතිහාසය තුළ සාම්ප්‍රදායිකව ගෙනෙන අය වැයක් නොවෙයි. මෙය, දීර්ඝ කාලීනව මේ රට දිහා බලලා, මේ රට අනාගත ලෝකයත් එක්ක දීර්ඝ කාලීනව ඉදිරියට යන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් බලලා දූරදර්ශී දැක්මක් සහිතව ඉදිරිපත් කරන ලද අය වැයක්.

ඒ වාගේම අපි මාධ්‍ය හරහාත් දැක්කා, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ අය වැය පිළිබඳ කිසිදු ආකාරයක තාර්කික, පිළිගත හැකි විවේචනයක් ඉදිරිපත් කරන්න බැරිවෙලා තිබෙන බව. "මේක අහවලාගේ අය වැයේම දිගුවක්" වැනි තර්කානුකූල නොවන විවේචන එතුමන්ලා ඉදිරිපත් කරමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයෙන් ඉදිරිපත් කරපු කරුණු කාරණා අනුව මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ, ජාතික ජන බලවේගයේ මංගල අය වැය විපක්ෂයේද සහාය ඇතිව ඉදිරි දිනයකදී සම්මත වීමට නියමිත බවයි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. J.C. Alawathuwala. You have 15 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

[අ.භා. 2.32]

ගරු ජේ.සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය දා ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ අය වැය ලේඛනය පිළිබඳව මේ වෙනකොට මන්ත්‍රීවරු ගණනාවක් අදහස් දැක්වුවා. ඒ හැම කෙනාටම තිබුණා, point එකක්. ඒ වාගේම, සියල්ලම අංගසම්පූර්ණ වෙන්නේ නැහැ කියලාත් අපි දන්නවා. ජනාධිපතිතුමා කරපු කථාවේ ඡේද 45ක් ඇතුළත් වෙලා තිබෙනවා. අද ඒ සියල්ලම දිහා බැලුවාම අපට ලොකු වෙනසක් දකින්න තිබෙනවා. පසුගිය ජනාධිපතිවරණයට පෙර අවුරුදු 60ක් තිස්සේ ජනතා විමුක්ති පෙරමුණ සමාජගත කරපු සංකල්ප සහ අදහස් අරගෙන බලනකොට, පසුගිය 17වැනි දා ඉදිරිපත් කරපු අය වැය ලේඛනයත් එක්ක ඒවායේ ලොකු වෙනසක් තිබෙනවා. මම ඒ තුළින් දකින්නේ, අවුරුදු 60ක් තුළ සහ පසුගිය ජනාධිපතිවරණයේදී ඔබතුමන්ලා වමට දාපු signal එක දකුණට හරවා තිබෙන ආකාරයක්. එහෙම තමයි අපට පෙනෙන්නේ. නමුත් ඒකේ වරදක් අපි දකින්නේ නැහැ. ඒ ගැන අපි සතුටු වෙනවා, එක පැත්තකින්. හැබැයි, ඒ තුළින් ඉතිහාසයේ සිට අපට,

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

සමාජයට, රටට අත් වුණු පාඩුව සම්බන්ධයෙන් ලොකු දුකක් තිබෙනවා. ඒකට හේතුව මේකයි. ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ අඩංගු ගොඩක් කාරණා සම්බන්ධයෙන් -හැම ක්ෂේත්‍රයකටම අදාළව- පසුගිය කාලය තුළ ඔබතුමන්ලාගේ දේශපාලන ව්‍යාපාරය තුළින් සහ වෘත්තීය සමිති ව්‍යාපාරය තුළින් විරෝධතා ගණනාවක් ඉස්සරහට ගෙනාවා. එහෙම කටයුතු කරපු නිසා ඒ සමහර දේවල් පසුගිය හැත්තෑභය වසර තුළ ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඒකට හේතුව තමයි, ඔබතුමන්ලා ගෙනාපු විරෝධතා නිසාම ගොඩක් දේවල් හකුළා ගන්නට සිදු වීම. ඒ හරහා රටටත්, ජනතාවටත් විශාල පාඩුවක් වුණා වාගේම, අද අපි ඉන්න තැනට පත්වෙන්නත් ඒ තත්ත්වය ලොකුවට බලපෑවා. ඔබතුමන්ලා නිරන්තරයෙන් කථා කළා, අවුරුදු හැත්තෑභයක් ගැන. ඒ අවුරුදු හැත්තෑභය තුළ සිදු වුණු පාඩුවට, අලාභයට, අද ලබන අත්විඳීම්වලට ඔබතුමන්ලාගේ දායකත්වයත් විශාල ලෙස බලපා තිබෙනවා.

පසුගිය මැතිවරණ දෙකේදීම ඔබතුමන්ලා කියපු බොහෝ දේවල් අරගෙන බැලුවොත්, අද මේ අය වැය ලේඛනයත් එක්ක ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්න යන්නේ ඊට හාත්පසින්ම වෙනස් ප්‍රතිපත්ති ගණනාවක් කියන එක අපි පැහැදිලිවම කියනවා. ඒ නිසා ඔබතුමන්ලාත් එක්ක හිටපු විශාල පිරිසක්, දීර්ඝ කාලයක් ඔබතුමන්ලා විශ්වාස කරපු විශාල පිරිසක් රැවටීමට ලක් වුණාද කියලා මේ අය වැය දෙස බැලුවාම අපට හිතෙනවා.

අද මේ අය වැය ලේඛනය දිහා බැලුවාම අපට පැහැදිලියි, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව - පසුගිය ආණ්ඩුව - ගෙන ගිය වැඩ පිළිවෙළ IMF රාමුව තුළ ඉදගෙනම ඒ විධියටම ඉස්සරහට අරගෙන යන බව. ඒ තත්ත්වය තමයි අපට පැහැදිලිවම පෙනෙන්නේ. මේ තත්ත්වයත් එක්ක අය වැය හිඟය රුපියල් බිලියන 2,200ක් වෙලා තිබෙනවා. ගිය වර අය වැයට වඩා, පොලිය සහ ගෙවීම් හැර මේ අය වැයේ වියදම්වල සියයට 23ක වැඩිවීමක් තිබෙනවා. ඒක ගිය වසරට වඩා අය වැය හිඟයේ සියයට 7.8ක වැඩිවීමක්. ඒකට හේතු ගණනාවක් තිබෙනවා. ඒ වාගේම, බදු හැරුණු විට අනෙකුත් මාර්ගවලින් ලැබෙන ආදායම කොහොමද වැඩි කරන්නේ කියලා පැහැදිලි පෙන්වීමක් මේකෙන් කරලා නැහැ. ඒ අනුව බලනකොට මේ කියන සියලු කාරණා වර්ෂය අවසන් වෙනකොට ඉෂ්ට කරන්න පුළුවන්ද කියලා ගැටලුවක් තිබෙනවා.

පසුගිය 2024 අය වැයෙනුත් ගෙනාපු යෝජනා සියයට 100ක් ඉටු කරලා තිබෙනවාද? මේක වසර ගණනාවක ඉඳන් වෙන දෙයක්. සමහර යෝජනා ගෙනැල්ලා තිබෙනවා. හැබැයි ඒ වසර අවසන් වනවිට ඒ යෝජනා සම්බන්ධයෙන් කිසිම වැඩ පිළිවෙළක් අරගෙන නැහැ. 2024 අය වැය දිහා බැලුවත් එහෙමයි. ඒ සියයට 25ක් පමණ යෝජනා සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ. ඉතින් මේ අය වැය යෝජනාව අනුවත් විශාල මුදලක - රුපියල් බිලියන 2,200ක - ආදායම් සහ වියදම් අතර පරතරයක් තිබෙන නිසා, ඒ රුපියල් බිලියන 2,200 හොයා ගන්න ක්‍රමයක් පෙනෙන්න නැති නිසා මේ සමහර යෝජනාත් කථාවට පමණක් සීමාවෙයිද කියලා අපට හිතෙනවා. අපට එවැනි සාධාරණ සැකයක් එනවා.

මේ අය වැය ලේඛනය තුළ ඉදිරිපත් කරපු කාරණා දිහා බැලුවාම, රජයේ සේවකයන්ගේ වැටුප සම්බන්ධයෙන් අද මේ වනවිට ලොකු කතිකාවක් තිබෙනවා. ඒ කරුණු ඉදිරිපත් කරපු විධියට ඒ හැම එකක්ම බලාපොරොත්තු වන ආකාරයෙන් වැඩි වෙනවාද? අද කථා කරපු ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් කිව්වා, පළමුවැනි වතාවට තමයි මූලික වැටුප වැඩි කළේ කියලා. එහෙම නැහැ. 2015-2019දී පැවති යහ පාලන ආණ්ඩුවේදීත් අපි මූලික වැටුප සියයට 107කින් වැඩි කළා. මම හිතන විධියට මහින්ද ජයසිංහ මැතිතුමා ඒක දන්නවා, වෘත්තිය සමිති ව්‍යාපාරයේ හිටපු නිසා. එදා, අවුරුදු දහයකට කලින් ගොඩක් අයගේ මූලික වැටුප දෙගුණයකට වඩා එහා ගියා. ඒ නිසා ඒක ඉස්සර වෙලාම අද වුණාය කියනවා නම්, මම හිතන හැටියට ඒක නිවැරදි නැහැ. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාත් දන්නවා, එතුමා රාජ්‍ය පරිපාලන ඇමති හැටියට හිටපු කාලයේ සියයට 107කින් වැඩි වුණා, මූලික වැටුප. ඒ අනුව තමයි ඒ වෙලාවේ රාජ්‍ය සේවකයන්ට විශාල වශයෙන් සහන ලැබුණේ. නමුත් ඇත්තටම අද අපි පිළිගන්නවා, පසුගිය බංකොලොත් වීමත් එක්ක, මේ රටේ මුදලේ අගයට වෙලා තිබෙන දෙයත් එක්ක, රාජ්‍ය සේවකයන් ඉතා අමාරු තැනකට වැටිලා තිබෙන බව. රාජ්‍ය සේවකයන් විතරක් නොවෙයි, රටේ සමස්ත ජනතාවම. ඒ නිසා මේ වැඩිවීම් එකක්වත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ, අද තිබෙන ජීවන වියදමත් එක්ක. අද උදේ අපේ කබීර් හෂීම් මැතිතුමා මතක් කළා, මේ වැඩි වෙලා තිබෙන ප්‍රමාණය ගණනය කරලා බැලුවාම, හතරදෙනෙක් ඉන්න පවුලකට හාල්වලටයි පොල්වලටයි යන වියදම අනුව ඒ වැඩි වෙච්ච ගණනත් ප්‍රමාණවත් නැහැ කියලා. මොකද, ඔබතුමන්ලාගේ ආණ්ඩුව එන්න ඉස්සර වෙලා තිබුණු මිලයි අද මිලයි බැලුවාම, හාල් කිලෝ එකක මිලේ රුපියල් 80ක, 100ක වෙනසක් තිබෙනවා. පොල් ගෙඩියක මිලේ රුපියල් 100ක වෙනසක් තිබෙනවා. එතකොට, දවස් 30කට ගණනය කරලා බැලුවාම, මේ වැඩි වෙච්ච මුදල අඩු ගණනේ හාල් පොල් ගන්නවත් ප්‍රමාණවත් නැහැ කියලා එතුමා පෙන්නුවා. ඉතින් ඒ නිසා මේ තත්ත්වය තුළ සාමාන්‍ය ජනතාවට ජීවත් වෙන්න තිබෙන අමාරුව අඩු වීමක් මේ අය වැයෙන් සිදු වුණාය කියලා අපට විශ්වාස කරන්න බැහැ.

මේ අය වැයෙන් යම් යම් ප්‍රමාණවලින් මහජන සහනාධාර වැඩි කරලා තිබෙනවා. නමුත්, දැන් මේ ඇති වෙලා තිබෙන අලුත් තත්ත්වය තුළ -බඩු මිලත් එක්ක- ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුදු කාලය තුළ ප්‍රධාන ආහාරවල මිල -හාල්, පොල් මිල- පහත බැසීමක් සිදු වෙයි කියලා අපට විශ්වාස කරන්න බැහැ. මේවායේ මිල තවත් වැඩි වන්නට පුළුවන්. ඒ නිසා ජනතාවට යම් සහන මල්ලක් දෙනවා කියලා ජනාධිපතිතුමා අය වැය ලේඛනයෙන් කිව්වා. නමුත්, ඒ වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය දිහා බැලුවාම ඒක ඉතා සුළු මුදලක්. ඒ නිසා මේ තත්ත්වය තුළ ජනතාවගේ ජීවන බර; ජීවත්වීමේ අමාරුව අඩුවීමක් නොවෙයි, තවදුරටත් වැඩිවීමක් සිදු වන බවක් තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැය ලේඛනයේ තිබෙන සමහර දේවල් දිහා බැලුවාම අපට වැටහෙන දෙයක් තිබෙනවා. ඉදිරියේ දී පළාත් පාලන මැතිවරණය පැවැත් වෙනවා. මේකේ ඉදිරිපත් කරපු සමහර යෝජනා බැලුවාම, පළාත් පාලන මැතිවරණය මුල් කරගෙන ජනතාවට යම් යම් පොරොන්දු දුන් අය වැය ලේඛනයක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක පැහැදිලි වෙනවා. සුබසාධනය සඳහා වෙන් කරලා තිබෙන මුදල් සහ අනෙකුත් කාරණා දිහා බැලුවාම ඒක පැහැදිලියි. ඒ නිසා, මූලික වශයෙන් ජනතාව බලාපොරොත්තු වුණු කාරණා ගණනාවක් පිළිබඳව අද ජනතාවට කර කියා ගන්න දෙයක් නැති තැනට පත්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජනාධිපතිවරයාගේ අය වැය යෝජනාවල අධ්‍යාපනය සම්බන්ධයෙන් සඳහන් කර තිබෙනවා. පෞද්ගලික අංශයත් සම්බන්ධ කරගෙන කළ හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ කටයුතු ගැන යෝජනා ගණනාවක් තිබෙනවා. අපි ඒ ගැන එක පැත්තකින් සතුටු වෙනවා. අද අපේ දරුවන්ට අපේ රටේ විශ්වවිද්‍යාල අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුළත්

වෙන්න බැරි තරගකාරිත්වයක් තිබෙනවා. උසස් පෙළ විභාගය සමත් වෙලා ඒ සුදුසුකම් ලබා තිබෙන ගොඩාක් දෙනෙකුට අවශ්‍ය පහසුකම් අපේ රට තුළ ලබා ගැනීමට නොමැති නිසා ඒ දරුවෝ - විශේෂයෙන්ම වෛද්‍ය ක්ෂේත්‍රයේ ඉගෙනුම ලබන දරුවෝ- අද විදේශගත වෙලා ඉන්නවා; නොයෙකුත් රටවලට ගිහින් තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ දරුවෝ ඉන්දියාවට, බංග්ලාදේශයට සහ නොයෙකුත් රටවලට ගිහින් තිබෙන බව. පසුගිය මහ බැංකු වාර්තා දිහා බැලුවාම පෙනී යනවා, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක්, මිලියන 250ක් වාගේ විශාල මුදලක් අපේ රටෙන් විදේශ විනිමය හැටියට ගිහිල්ලා තිබෙන බව. ඒ වාගේම සමහර දරුවන්ට සිද්ධ වෙලා තිබෙනවා, හොඳ පරිසරයක් නැති රටවලට පවා ගිහිල්ලා ඉගෙන ගන්න. ඒකට හේතුව තමයි, මුල් කාලයේ ඉඳලා අපේ රට තුළ ඇති කරන්න ගියේ පෞද්ගලික විශ්වවිද්‍යාල, එහෙම නැත්නම් ඒ අවශ්‍ය පහසුකම්. ඒවා මේ රට තුළ ක්‍රියාත්මක කරන්න බැරි වුණු නිසා තමයි අද ඒ දරුවන්ට වෙනත් රටවලට ගිහිල්ලා ඉගෙන ගන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ දවස්වල ගොඩාක් අය කිව්වා, මේ අය මුදල් තිබෙන අය කියලා. අපි දන්නා විධියට ගොඩාක් දෙනෙක් ඉන්නවා මුදල් තිබිලාම නොවෙයි දරුවන් වෙනුවෙන් මේ දේවල් කරන්නේ. තමන්ගේ දරුවන්ට උගන්වන්න හැම දෙමව්පියෙක්ම විශාල වෙහෙසක් ගන්නවා. අපි දැක තිබෙනවා, සමහර අය අක්කර දෙකක, අක්කර තුනක ඉඩමක් තමන්ට තිබෙනවා නම් ඒකෙන් කොටසක් විකුණලා තමන්ගේ දරුවන් විදේශ අධ්‍යාපනය සඳහා යවනවා. ඒ නිසා විශේෂයෙන් කියන්න ඕනෑ, මෙන්න මේ කාරණා සම්බන්ධයෙන් ඔබලා මුලින් ක්‍රියා කරපු ඒ තත්ත්වය තුළ තමයි අපට එවැනි ආයතන ගණනාවක් අප රට තුළ ක්‍රියාත්මක කරගන්න බැරි වුණේ කියන එක.

ඇත්තටම අපේ රටේ තිබෙන නිදහස් අධ්‍යාපනයත් එක්ක අපි ජයග්‍රහණ ගණනාවක් ලබාගෙන තිබෙනවා. දකුණු ආසියාවේ රටවල් ගත්තාම, අපි අනෙක් රටවලට වඩා ඉදිරියෙන් ඉන්නවා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තත් වෙනස්කම් ගණනාවක් කරන්න තිබෙනවා. ඒවා නිසි ආකාරයෙන් කරන්න පසුගිය කාලවල අවස්ථාව ලැබුණේ නැහැ. ඒ වාගේම තමයි අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පැත්තෙන් ගත්තත්, දකුණු ආසියාවේ අපි ගොඩාක් ඉහළින් ඉන්නවා. ලෝකයම ගත්තත්, දියුණු රටක තත්ත්වයට අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. අපේ රටේ සිටින වෛද්‍යවරු, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින හෙදියන් ඇතුළු සියලු දෙනාගේ දායකත්වය ලැබිලා තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය පසුගිය කාලවල දී කිව්වා, අපේ රටේ සෞඛ්‍ය ඉතාම ඉහළ තැනකට ඇවිල්ලා තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම මේ තත්ත්වයන් අපි ලබා ගත්ත ජයග්‍රහණ. දැන් අපි වසර 76ක් ගැන කථා කරනකොට ගොඩාක් වෙලාවට මේවා එකක්වත් අපි ලබපු ජයග්‍රහණ හැටියට හඳුන්වන්නේ නැහැ. අපි ගොඩාක් පහළ තැනක ඉන්නවා කියලා තමයි ජනතාවට හැඟෙන්නේ.

නමුත් 1948දී නිදහස ලබා ගන්නකොට අපි හිටපු තැනයි, අද සිටින තැනයි ගත්තාම ලොකු ජයග්‍රහණ ගණනාවක් අපේ රටේ ජනතාවට ලැබිලා තිබෙනවා. ඔබතුමන්ලා පසුගිය කාලය තුළ ගත් ක්‍රියාමාර්ග තුළ, නොයෙකුත් මතිමතාන්තර, එහෙම නැත්නම් වෙනත් විරුද්ධ ක්‍රියාමාර්ග තුළ සමහර ජයග්‍රහණ ලබා ගන්න තිබුණු අවස්ථා අහිමි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්. මේ අය වැය ලේඛනයෙන් වෙන් කරලා තිබෙන ප්‍රතිපාදන දිහා බැලුවාම, අය වැය හිඟය දිහා බැලුවාම අපට යම් දෙයක් හිතා ගන්න පුළුවන්. රුපියල් බිලියන 2,200ක් හිඟයක් හැටියට තිබෙනවා. ඒක කොහොමද හොයා ගන්නේ කියන එක පැහැදිලිව සඳහන් කරලා නැහැ. ඒ නිසා මේ සඳහන් කරලා තිබෙන සමහර යෝජනා 2024 අය වැය වාගේම, 2023 අය වැය වාගේම ක්‍රියාත්මක නොවන යෝජනා හැටියට තමයි අපට පෙනෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගයේ මංගල අය වැය පිළිබඳව අද දවසේ මට කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මෙය පුරවැසි අය වැයක් යයි කීමට කාරණා දෙකක් බලපානවා. පළමුවැනි කාරණය තමයි, මෙය පුරවැසියන් විසින් නැඟිට, ඔවුන් විසින්ම පත් කර ගත් ආණ්ඩුව, ඔවුන්ගේ යහපත පිණිස ඉදිරිපත් කළා වූ අය වැයක් වීම. මේක ජනතාවගේ අය වැයක් ලෙස කීමට බලපාන අනෙක් කාරණාව මෙයයි. මෙච්චර කල් ඉදිරිපත් වුණු අය වැය ලේඛනවලින් ලැබුණා වූ ප්‍රතිලාභ තුළ සියලු අංශ එක තැනකට කොටු වී තිබුණා. එහෙත් මෙවර අය වැය ජනතාවට හිතකර, ජනතාවාදී අය වැයක් කිව්වොත් ඒක නිවැරැදියි. මක්නිසාද, උතුරු නැඟෙනහිර ඇතුළු මුළු රටම, මුළු ජාතියම -සියලු ජනතාව- එකට එකතු කරපු අය වැයක්, මේක. ඒ වාගේම සියලු සංවර්ධන වැඩ කටයුතු සඳහා සමස්ත ජනතාවම නියෝජනය කිරීමට ඉඩ සැලැස්වූ අය වැයක්. සියලු ජනතාව සක්‍රිය කර ගත්තා වූ, දායක කර ගත්තා වූ, සහභාගී කර ගත්තා වූ අය වැයක් බවට තමයි මේ අය වැය පත් වෙන්නේ. ඒ වාගේම ප්‍රතිලාභ මුළු සමාජයටම සමාන ලෙස බෙදී යාමක් මේ තුළ අපට දැකිය හැකියි. මෙම අය වැය ලේඛනයේ තව විශේෂ කාරණා කිහිපයක්ම තිබෙනවා. ඒ ගැන අපි අවධානය යොමු කරමු.

இந்த வரவு செலவுத்திட்டமானது, மாற்றத்தை ஏற்படுத்தக்கூடிய ஒரு வரவு செலவுத்திட்டமாகவே கருதப்படுகின்றது. காரணம், கடந்த காலங்களில் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத்திட்டங்களைப் போலல்லாது, இது முழு நாட்டு மக்களையும் ஒரே குடையின்கீழ் கொண்டுவந்து இருக்கின்றது. ஒரு தகப்பன் தன் பிள்ளைகளைப் பார்ப்பதுபோல, வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு, மலையகம், மத்தி என இந்த நாட்டின் எல்லா பகுதிகளிலுமுள்ள மக்களையும் இது உள்வாங்கி இருக்கின்றது. இவ்வளவு காலமாகப் புறக்கணிக்கப்பட்டு வந்த மக்களையும் இது உள்வாங்கி இருக்கின்றது. இந்த வரவு செலவுத்திட்டத்தில் இளைஞர்கள், சிறுவர்கள் தொடர்பில் முக்கிய கவனம் செலுத்தப்பட்டு இருக்கின்றது. இதற்குக் காரணம், எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் எதிர்கால சந்ததியினர்மீதும் நாட்டின் எதிர்காலம்மீதும் கொண்டுள்ள அக்கறையாகும்.

இந்த வரவு செலவுத்திட்டத்தில் கர்ப்பிணிப் பெண்களுக்கான போஷாக்கு உணவுக்காகவும், பாலூட்டும் தாய்மார் மற்றும் குழந்தைகளுக்கான 'திரிபோஷா'வுக்காகவும் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. இதற்குக் காரணம், போஷாக்கான குழந்தைகள் பிறப்பதனூடாக வளமாக

[ගරු අමිබිකා සාමිවෙල් මෙනෙවිය]

எதிர்கால சமூகத்தை உருவாக்கலாம் என்பதுதான். மேலும், சிறுவர் மற்றும் பெண்களுக்கு எதிரான வன்முறைகளைத் தடுப்பதற்காக இந்த வரவு செலவுத்திட்டத்தில் அதிகளவு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. இன்று பெண்கள் மற்றும் சிறுவர்கள் துன்புறுத்தல்களுக்கும் துஷ்பிரயோகங்களுக்கும் உள்ளாக்கப்படுகின்றார்கள். அந்த வகையில், பெண்களைப் பாதுகாக்கும் நிகழ்ச்சித்திட்டங்களுக்காக 120 மில்லியன் ரூபாயும் பெண்களை இலக்காகக்கொண்ட நிகழ்ச்சித்திட்டங்களுக்காக 720 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது. சிறுவர்களைப் பாதுகாக்கும் வேலைத்திட்டங்கள் தற்காலத்தில் நடைமுறைப்படுத்தப்பட வேண்டியது அத்தியாவசியமானது. ஏனென்றால், இன்று பிள்ளைகள் தமது வீட்டிலேயே பாதுகாப்பு இல்லாத நிலையில் காணப்படுகின்றார்கள். பெண்களை ஊக்குவிக்கும் இவ்வாறான நிகழ்ச்சித்திட்டங்களினூடாக தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, 'பெண் என்பவள் ஒதுக்கிவைக்கப்பட்டவள்' என்ற எங்களுடைய சமூகத்தின் நிலையை மாற்றி, அவளையும் நாட்டின் அபிவிருத்தியின் பங்குதாரராக மாற்றியிருக்கிறது.

தடுப்பு இல்லங்களில் வைக்கப்பட்டுள்ள பிள்ளைகளின் நலன்களை மேம்படுத்துவதற்காக அவர்கள் தங்கவைக்கப்பட்டு இருக்கும் பராமரிப்பு நிறுவனங்களைப் புதுப்பிப்பதற்கு இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. அத்துடன், சிறுவர் குற்றவாளிகளின் போக்குவரத்துக்கும் நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. நிறுவனமயப்பட்ட சிறுவர்கள் நீதிமன்றங்களுக்குச் சென்று திரும்புவதற்காக சிறுவர் நட்பு போக்குவரத்து அமைப்பை நிறுவுவதற்கு இந்த வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்டுள்ளது. சிறுவர் குற்றவாளிகளுக்கு இவ்வாறான போக்குவரத்து சேவையைப் பெற்றுக்கொடுப்பதன் ஊடாக அவர்களைப் பாதுகாக்க முடியும். அந்தச் சிறுவர்கள் குற்றவாளிகளாக இருந்தாலும், அவர்களை அன்பான முறையில் மனிதாபிமானத்தோடு நீதிமன்றங்களுக்குக் கொண்டுசெல்வதற்கு ஏற்ற வகையிலே இந்த வரவுசெலவுத்திட்டத்தில் இந்த முன்மொழிவு முன்மொழியப்பட்டுள்ளது. குற்றவாளிகளைக்கூட, எதிர்காலத்தில் குற்றச்செயல்களில் ஈடுபடாத ஒரு நல்ல பிரஜையாக மாற்றி, அவர்களைச் சமூகத்துடன் இணைப்பதற்கான நல்லதொரு திட்டத்தை நாங்கள் Clean Sri Lanka வேலைத்திட்டம்மூலம் முன்னெடுக்க இருக்கின்றோம். அதற்கான முன்மொழிவுகள் இந்த வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்டுள்ளது.

எங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தில் குறிப்பிடப்பட்டுள்ள விடயங்கள் சிலவற்றை இந்த வரவு செலவுத்திட்டத்தில் காணவில்லை என எதிர்க்கட்சியினர் சொல்லிக்கொண்டு இருக்கின்றார்கள். எங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்திலும் மாண்புமிகு சனாதிபதி அவர்களின் கொள்கைப் பிரகடன உரையிலும் தோட்டப்புறங்களில் காணப்படுகின்ற வைத்தியசாலைகளை தேசிய நீரோட்டத்துடன் இணைத்து செயற்படுவதாகச் சொல்லப் பட்டது. அதற்கு இணங்க, இம்முறை சுகாதாரத்துறைக்கு அதிக நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. பெருந்தோட்டப் பகுதிகளில் சுகாதார சேவையை திறம்படச் செய்வதற்காக மனித வளங்கள், உபகரணங்கள், மருந்துகள் என்பவற்றை வழங்குவதற்காக அரசாங்கம் நடவடிக்கை எடுத்துள்ளது. மலையக மக்கள் சுகாதார ரீதியாகப் புறக்கணிக்கப்பட்டு, எத்தனையோ இன்னல்களுக்கு உட்பட்டிருந்த நிலையிலேயே அரசாங்கம் இதனை முன்னெடுத்திருக்கிறது. தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் சொன்னதைச் செய்திருக்கிறோம். நாங்கள் எங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தில் என்னென்ன விடயங்களைச் சொன்னோமோ, அவற்றை இந்த வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கி இருக்கிறோம்.

முன்பள்ளிச் சிறுவர்களுக்கான ஊட்டச்சத்து நிகழ்ச்சித்திட்டத்தின்கீழ் காலை உணவுக்காக மாணவர் ஒருவருக்குப் பெற்றுக்கொடுக்கப்படும் தொகையை 60 ரூபாயிலிருந்து 100 ரூபாயாக அதிகரிக்க முன்மொழியப்பட்டுள்ளது. மலையகப் பகுதிகளிலுள்ள சிறுவர்கள் போஷாக்கு குறைந்தவர்களாகக் காணப்படுகின்றார்கள். இவ்வாறான திட்டங்களைக் கொண்டுவருவதனூடாக அவர்களுடைய போஷாக்கை அதிகரிக்க முடியும். இந்த வரவு செலவுத்திட்டமானது, எல்லா சமூகத்தையும் உள்ளடக்கி இருக்கிறது. விசேடமாக, மலையக சமூகத்தை அதிகமாக உள்ளீர்த்து இருக்கின்றது என்று சொன்னால் அது மிகையாகாது. மேலும், முன்பள்ளி ஆசிரியர்களுக்கான கொடுப்பனவு அதிகரிக்கப்பட்டு இருக்கின்றது. இவை எல்லாம் எங்களுடைய எதிர்காலச் சந்ததியினரை வலுப்படுத்துவதற்குத் தேவையான, அவர்களுக்குச் சரியான அடித்தளத்தை இடுவதற்கான வேலைத்திட்டங்களாகும். இவ்வாறு மிகக் கவனமாக யோசித்துத்தான் இந்த வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டு இருக்கின்றது என்று சொன்னால், அது மிகையாகாது.

இன்று நாங்கள் பொருளாதார நெருக்கடிமிக்க சூழலிலே வாழ்ந்துகொண்டு இருக்கின்றோம். பிள்ளைகளுக்கு கல்வியைப் புகட்டுவது என்பது பெரும் சவாலான விடயமாகும். இதனைக் கருத்திற்கொண்டு புலமைப் பரிசில் தேர்வில் சித்திபெற்ற மாணவர்களுக்கான கொடுப்பனவு, விளையாட்டு பாடசாலை மாணவர்களுக்கான போஷாக்கு உணவுக் கொடுப்பனவு மற்றும் தொழிற்பயிற்சி நிலையங்களில் கல்விகற்கும் மாணவர்களுக்கு வழங்கப்படுகின்ற கொடுப்பனவு என்பன அதிகரிக்கப்பட்டு இருக்கின்றன. எங்களுடைய பிள்ளைகளின் கல்வி நிலையை உயர்த்த வேண்டும் என்பதற்காகவே இவ்வாறான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு இருக்கின்றன. ஒரு சமூகம் முன்னேற வேண்டும் என்றால், அந்தச் சமூகத்தில் இருக்கின்ற பிள்ளைகளின் கல்வி நிலை உயர வேண்டும். ஒரு மனிதன் கல்வியில் தேறினால் அவன் சார்ந்த சமூகம் சீரான ஒரு சமூகமாக மாறும். இந்த நோக்கத்தோடுதான் பிள்ளைகளின் கல்வி நடவடிக்கைக்காக உத்தரவாதத்துடன்கூடிய இவ்வாறான வேலைத்திட்டங்கள் இந்த வரவு செலவுத்திட்டத்தில் முன்மொழியப்பட்டு இருப்பதை நாங்கள் காணலாம்.

அடுத்து, போதைவஸ்துக்கு அடிமைப்பட்ட ஓர் இளைஞர் சமூகத்தை நாங்கள் எங்களுடைய நாட்டில் தொடர்ச்சியாகப் பார்த்து வருகின்றோம். இதன்மூலம் நாங்கள் இந்த நாட்டின் எதிர்காலச் சந்ததியினரை இழந்துகொண்டு வருகின்றோம். இந்தச் சந்தர்ப்பத்தில் தேசிய மக்கள் சக்தி அரசாங்கம் அவர்களை மறக்கவில்லை. போதையற்ற சமூகத்தைக் கட்டியெழுப்பும் நோக்கில், விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டங்கள், வலுவூட்டல் நிகழ்ச்சித்திட்டங்கள் என்பவற்றை மேற்கொண்டு, அதன்மூலம் அவர்களை அதிலிருந்து மீட்பதற்காக இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. இதற்கு முக்கிய காரணம், எங்களுடைய சிறிய, அழகான நாட்டிலுள்ள ஒவ்வொரு பிரஜையும் மிக முக்கியமானவர்கள் என்பதுதான். சிறுவர்கள், இளைஞர் - யுவதிகள்தான் இந்த நாட்டின் எதிர்காலத் தலைவர்கள்! அவர்களை நாங்கள் இழந்துவிடக்

கூடாது. அவர்களுடைய வாழ்க்கைத் தரத்தைக் கட்டியெழுப்புவதற்கான வேலைத்திட்டங்களையும் அவர்களைப் போதைப்பொருள் பாவனையிலிருந்து விடுதலை செய்வதற்கான வேலைத்திட்டங்களையும் நாங்கள் முன்னெடுத்து வருகின்றோம்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மலையக வாழ் தமிழ் மக்களுடைய வாழ்க்கைத் தரத்தை மேம்படுத்துவது தொடர்பில் இந்த வரவு செலவுத்திட்டத்தில் அதிக கவனம் செலுத்தப்பட்டுள்ளது. இது பற்றி நான் ஏற்கெனவே கூறியிருந்தேன். அவர்களுடைய வாழ்க்கைத் தரத்தை மேம்படுத்துவதற்காக இந்த வரவு செலவுத்திட்டத்தில் 7,583 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. மேலும், பெருந்தோட்ட வீடமைப்பு மற்றும் உட்கட்டமைப்பு அபிவிருத்திக்காக 4,267 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. எங்களுடைய மக்களின் வீடமைப்புக்காக கடந்த கால அரசாங்கங்களின் வரவு செலவுத்திட்டங்களில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருந்தாலும், அவை உரிய முறையில் நடைபெறவில்லை.

எனினும், நாங்கள் எதிர்வருகின்ற காலங்களில் இது தொடர்பான வேலைத்திட்டங்களை ஆரம்பிப்போம். மலையக மக்களின் வீட்டுப் பிரச்சினை, காணிப் பிரச்சினை என்பவற்றைத் தீர்ப்பதற்கான வேலைத்திட்டங்களை தேசிய மக்கள் சக்தி அரசாங்கம் மேற்கொண்டு வருகின்றது. மலையக தமிழ் இளைஞர்களுக்குத் தொழிற்பயிற்சி வழங்குவதற்கான ஏற்பாடுகளும் நடைபெற்றுக்கொண்டு வருகின்றன. அவர்கள் பாடசாலைக் கல்வியை முடித்துவிட்டு, வேலைவாய்ப்பு இல்லாமையால் கொழும்புப் பகுதிக்கு வந்து வீடுகளிலும் கடைகளிலும் வேலைசெய்துகொண்டு இருக்கின்றார்கள். இந்தக் கலாசாரத்தை மாற்றி, அவர்களுக்குச் சரியான தொழிற்பயிற்சிகளை வழங்கி, அவர்களையும் உற்பத்தியாளர்களாக மாற்றுவதற்கான திட்டங்களை தேசிய மக்கள் சக்தி அரசாங்கம் முன்னெடுத்து வருகின்றது.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

அடுத்து, மலையகப் பிள்ளைகளின் தொழில்நுட்பக் கல்வியை மேம்படுத்துவதற்காக அங்குள்ள பாடசாலைகளில் smart வகுப்பறைகளை அமைப்பதற்காக 866 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. இவை எல்லாவற்றிலிருந்தும் விளங்குகின்ற விடயம் என்னவென்றால், தேசிய மக்கள் சக்தி அரசாங்கமானது இந்த வரவு செலவுத்திட்டத்தில் நான் சார்ந்த மலையக சமூகத்தினரையும் ஏனைய சமூகத்தினரையும் உள்வாங்கி இருப்பதுதான். இந்த வரவு செலவுத்திட்டத்தில் தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளம் வழங்கப்படுமென அரசாங்கம் உறுதியளித்துள்ளது. நாங்களும் 'இலங்கையர்கள்' என்ற ரீதியில் கனகாலமாக இந்தப் பிரச்சினையை முன்வைத்து வருகின்றோம். எனவே, பெருந்தோட்டக் கம்பனி உரிமையாளர்களுடன் பேச்சுவார்த்தை நடத்தி, ஒரு தீர்வுத் திட்டத்தை முன்வைத்து, நீண்ட நாட்களாகப் பேசப்பட்டு வருகின்ற தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினையை அரசாங்கம் தீர்த்துவைக்கும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2025 අය වැය අපේ රටට විශේෂ අය වැයක්. ඒක විශේෂ අය වැයක් වෙන්නේ ලංකා ඉතිහාසයේ සැබෑම ජනතාවාදී ආණ්ඩුවක් විසින් ඉදිරිපත් කරපු පළමු අය වැය මේ 2025 අය වැය වන නිසායි. ඒ වාගේම මේ අය වැය, අපේ රටේ ආර්ථිකය පිළිබඳ ඉතා යථාර්ථවාදී විග්‍රහයක් යටතේ ඉදිරිපත් කරපු අය වැයක්. එමෙන්ම මේ මොහොතේ තිබෙන ආර්ථිකය සම්බන්ධයෙන් හොඳ විග්‍රහයක් සහිතව, ඒ මත පදනම් වෙලා දිගුකාලීන දැක්මක් ඇතිව ඉදිරිපත් කරපු පළමු අය වැය තමයි මේ අය වැය. ඒ වාගේම මේ අය වැයේ අනෙක් විශේෂත්වය වන්නේ භූදු ආර්ථිකමය කරුණු ගැන විතරක් සැලකිලිමත් නොවී සමස්ත සමාජයම ආවරණය වෙන විධියට, සමාජයේ සෑම ස්තරයක් ගැනම සැලකිලිමත් වෙමින් අය වැය ඉදිරිපත් කිරීමයි.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයක් බරපතළ ලෙසම අර්බුදයට යවපු අය වැයත් මේ අය වැය බවට ඉතිහාසගත වෙනවා ඇති කියා මම විශ්වාස කරනවා. මේ අය වැය සම්බන්ධයෙන් රටේ ජනතාව කරුණු දක්වද්දී, මේ අය වැයෙන් දීලා තිබෙන සහන සම්බන්ධයෙන් වාගේම මේ අය වැයෙන් රටේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය කිරීම සම්බන්ධයෙන් ජනතාව ප්‍රශංසා මුඛයෙන් කථා කරද්දී, විපක්ෂය ඒ සම්බන්ධයෙන් සැක සංකා සහිතව අසුබවාදය ජනිත කරවන ආකාරයෙන් තමයි කථා කරන්නේ. ඒක විපක්ෂයට හොඳ නැහැ කියලා මම විශ්වාස කරනවා. මොකද, ජනතාව මේ අය වැය සම්බන්ධයෙන් ප්‍රශංසාත්මකව කථා කරද්දී, විපක්ෂය මේ සම්බන්ධයෙන් අසුබවාදීව කථා කිරීමෙන් තවදුරටත් වෙන්නේ විපක්ෂය තවතවත් ජනතාවගෙන් ඈත්වීමයි. ඒ වාගේම අපි විශ්වාස කරනවා, මේ අය වැය සම්බන්ධයෙන් විපක්ෂයට වැරදි මත සමාජගත කරන්න පුළුවන් වෙන්නේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැය සම්බන්ධයෙන් විපක්ෂය විවිධ චෝදනා ඉදිරිපත් කළා. නමුත් අපට පෙනෙනවා, ඒ එකක්වත් කිසිදු ශක්තිමත් පදනමක් මත ඉදිරිපත් කරපු චෝදනා නොවෙයි කියලා. විපක්ෂයේ ආර්ථික ඔස්තාර් මහත්වරු මේ සම්බන්ධයෙන් මතු කරපු ප්‍රධාන කාරණයක් තමයි මේ අය වැය සමාජවාදී අය වැයක් නොවෙයි කියන එක. ජාතික ජන බලවේගය ආණ්ඩුව සමාජවාදී අය වැයක් ඉදිරිපත් කරන්න අසමත් වෙලා තිබෙනවාය කියනවා. ඒ ගැන විපක්ෂය බොහොම දුක් වෙනවා. ජාතික ජන බලවේගය සමාජවාදී අය වැයක් ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් විපක්ෂය දුක් වෙන්නේ ඇයි කියායි අපි අහන්නේ. ඒ වාගේම ඒගොල්ලන් කියනවා, මේක නව ලිබරල්වාදී අය වැයක් කියලා. ඒ සම්බන්ධයෙනුත් ඒගොල්ලන් දුක් වෙනවා. අපි සමාජවාදී අය

[ගරු (වෛද්‍ය) දමිමික පටබැඳි මහතා]

වැයක් ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙනුත් විපක්ෂය දුක් වෙනවා. ඒක නව ලිබරල්වාදී අය වැයක් වීම සම්බන්ධයෙනුත් දුක් වෙනවා. මේකෙන් අදහස් කරන්නේ අපි ඔවුන් කියන ආකාරයට සමාජවාදී අය වැයක් ඉදිරිපත් කළා නම් ඔවුන් අපට ප්‍රශංසා කරයි කියලාද? නැහැ. ඔවුන් කවදාවත් අපට එහෙම ප්‍රශංසා කරන්නේ නැහැ. අපි සමාජවාදී අය වැයක් කියලා මේක ඉදිරිපත් කළා නම්, ඒත් ඔවුන් මේක දෝෂ දර්ශනයට ලක් කරනවා. ඒ තමයි, මේ විපක්ෂයේ හැටි. ඒ වාගේම 2025 අය වැය ඉදිරිපත් කරන්න තිබුණේ විපක්ෂයට නම් ඒගොල්ලන් ඉදිරිපත් කරන්නේ මේ අය වැය නොවෙයි.

ඇත්ත වශයෙන්ම ඒගොල්ලන් තමයි රනිල්ටත් වඩා ඉස්සරහට ගිහිල්ලා, රනිල්ගේ ඊළඟ අය වැය ඉදිරිපත් කරන කණ්ඩායම බවට පත් වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එම නිසා අපට තේරෙනවා විපක්ෂය මේ අය වැය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්නේ කිසිදු පදනමක් නැති තර්ක බව. අපි සමාජවාදී අය වැයක් ඉදිරිපත් කරන බව කිව්වා කියලා හැඟවෙන විධියේ ප්‍රකාශ විපක්ෂය විසින් ඉදිරිපත් කරනවා. නමුත්, අපේ ආර්ථික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික ජන බලවේගය කියලා තිබෙන්නේ මොකක්ද? ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 101හි පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, අපේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද කියලා. එහි මෙසේ සඳහන් වනවා:

> "ජනතාවට නිදහසේ ආර්ථික කටයුතුවල නියැළීමට සාධාරණ අවස්ථා, සමාන මැදිහත්වීමක් යටතේ ආර්ථික තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධවීම හා සෑමට ආර්ථික ප්‍රතිලාභවල සාධාරණ පංගුවක් ලැබීම සහතික කරන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය මූලික කර ගනිමින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හා තාක්ෂණික සංවර්ධන මාර්ග සිතියමක් සමඟ එකිනෙක බද්ධ වූ නොසැලෙන නිෂ්පාදන ආර්ථිකයක් මඟින් 2030දී ඇ.ඩො. බිලියන 120ක තථ්‍ය ද.දේ.නි. -Real GDP- ඉලක්කයක් සහිතව තිරසාර ආර්ථික වෘද්ධියක් හා සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා ප්‍රධාන මූලධර්ම දහයක් පදනම්ව ජාතික ජන බලවේගයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුව ගොඩනඟා ඇත."

එහෙම තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ. අපගේ ආර්ථික වැඩ පිළිවෙළේ ප්‍රධාන ලක්ෂණ මොනවාද? ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය, නිෂ්පාදනීය ආර්ථිකය, ජනසහභාගීත්ව ආර්ථිකය සහ ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යන ආර්ථිකයක් තමයි අපේ ආර්ථික ප්‍රතිපත්තියේ තිබෙන්නේ. අන්න ඒ ආර්ථික ප්‍රතිපත්තියට ගැළපෙන අය වැයක් තමයි අපේ පළමු අය වැය හැටියට අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයේ ආර්ථික විශේෂඥයෝ, -අපි ඒ අයට කියනවා, ආර්ථික ඔස්තාර්වරු කියලා- මේ අය වැය සම්බන්ධයෙන් විවේචන කරනවා. ඒගොල්ලන් ඉදිරිපත් කරපු විවේචන මොනවාද? හැබැයි, ඒගොල්ලන් උපුටා දක්වන්නේ 1970 දශකයේ උද්ධෘත සහ සිද්ධි. ඒගොල්ලන් අගය කරන්නේ 1970 දශකයේ ආර්ථික ප්‍රතිපත්ති. ඒගොල්ලන් පරමාදර්ශ ලෙස සලකන්නේ රොනී ද මැල් මහත්මයාගේ නව ලිබරල්වාදී ප්‍රතිපත්ති. නමුත්, අපි ඉන්නේ ඊට වඩා ගොඩක් නවීන යුගයක කියලා අපි කියනවා. අපි 1970 දශකය පහු කරලා සෑහෙන කාලයක් වනවා. එම නිසා ඒ ආර්ථික ඔස්තාර්වරු ඉදිරිපත් කරන එම ආර්ථික වැඩ පිළිවෙළවල් අපේ රට ඇතුළේ චිතරක් නොවෙයි, ලෝක පරිමාණයෙනුත්, ජාත්‍යන්තර පරිමාණයේත් යල් පැනලා බොහොම කල්. විපක්ෂයේ එම මහත්වරුන්ට අපි මතක් කරන්න කැමැතියි, දැන් නව ලිබරල්වාදයත් යල් පැන ගිහිල්ලා තිබෙන බව. දැන් ඇමෙරිකාව, එක්සත් රාජධානිය වාගේ රටවල් නව ලිබරල්වාදයත් අත්හරිමින් ආර්ථික ජාතිකවාදය කියන ආර්ථික ප්‍රතිපත්තියට අනුගත වෙමින් ඉන්නේ. ඒ නිසා ඔබතුමන්ලා ඔය හිස් මුදුනින් තියලා සලකන නව ලිබරල්වාදී ප්‍රතිපත්ති යල් පැන ගිය ප්‍රතිපත්ති. එම ප්‍රතිපත්ති ඔබ නියෝජනය කරන කඳවුරේ රටවල්වත් අනුගමනය කරන්නේ නැහැ.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා මෙම අය වැයෙන් ඉදිරිපත් කළේ "දාස් කැපිටාල්" පොතේ පිටකවරය දාලා, ඇඩම් ස්මිත්ගේ "The Wealth of Nations" කියන නව ලිබරල්වාදී වැඩ පිළිවෙළයි කියලා. නමුත්, එම මන්ත්‍රීවරයාට මම කියන්න කැමැතියි, ඇඩම් ස්මිත් "The Wealth of Nations" කියන පොත ලියන කාලයේ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්ති කියලා ආර්ථික ප්‍රතිපත්තියක් ලෝකය දැනගෙන තිබුණේ නැහැ කියලා.

එතකොට තිබුණේ ලිබරල්වාදය. නව ලිබරල්වාදය ආවේ 1970 දශකයෙන් පසුව. 1973 ලෝක ආර්ථික අර්බුදයෙන් පසුව තමයි නව ලිබරල්වාදී ප්‍රතිපත්ති ආවේ. මේක ගරු කටයුතු සභාවක්. ඒ නිසා ඔබතුමන්ලා මේ සභාව අමතනකොට, මේක ඇතුළේ අසත්‍ය ප්‍රකාශ කරන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි ඒ මන්ත්‍රීතුමා සඳහන් කළා, ලංකාවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ඉගෙන ගන්න චීනයෙන් ඩෙන් ෂියාඕපිං ආවා කියලා. ඒවා පට්ටපල් බොරු. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රොනී ද මැල් මහත්මයා ලංකාවට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් පළමු අය වැය ඉදිරිපත් කළේ 1977 නොවැම්බර් 07වැනි දා. ඒ අය වැය තෙවන වර කියවීම සිදුවුණේ 1977 දෙසැම්බර් 17වැනි දා. නමුත් චීනයේ socialist market economy එක විවෘත කරන ප්‍රතිපත්තියට අදාළ තීන්දු, තීරණ ගැනුණේ චීනයේ පැවැති 11වැනි ජාතික සම්මේලනය තුළදී. ඒක තිබුණේ 1977 අගෝස්තු 12-18 කාල වකවානුවේ. නමුත් මේ මහත්වරුන් මේ රටට අසත්‍ය කියමින් මේ අය වැය සම්බන්ධයෙන් අශුභවාදී මතයක් ජනතාව තුළ පැළ කරන්න උත්සාහ ගන්න බව අපට පෙනෙනවා. නමුත් අපි විශ්වාස කරනවා, ඒක සාර්ථක වෙන්නේ නැහැ කියලා.

ඒ වාගේම තමයි විපක්ෂයේ මහත්වරුන් පැවසුවා, මීට කලින් ඇන්.ඇම්. පෙරේරා, රොනී ද මැල් වාගේ මුදල් ඇමතිවරුන් තමන්ගේ අය වැය ප්‍රතිපත්ති ඉදිරිපත් කරද්දී ආර්ථික වැඩ පිළිවෙළ ගැන ඔවුන්ගේ පොදු මතය මුලින්ම ඉදිරිපත් කළා, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා එහෙම කළේ නැහැ කියලා. මේවා පට්ටපල් බොරු. මම ඔබට කියවන්නම්, 2025 අය වැය කථාව තුළ ඉදිරිපත් කළේ මොකක්ද කියලා. අය වැය කථාව - 2025, පිටු අංක 06 බලන්න. එහි මෙසේ සඳහන් වෙනවා:

"2025 අයවැයේ මූලධර්ම

> අයවැයක් යනු ඉදිරි වසර සඳහා වන ආදායම් සහ වියදම් යෝජනා මාලාවක් පමණක් නොවේ. එය ආර්ථිකය නගා සිටුවීමේ සහ සමස්ත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රජයේ ප්‍රවේශය පිළිබඳ පිළිබිඹුවක්. මෙම අයවැය තුළ ආර්ථික ප්‍රතිපත්ති අරමුණුවල සැපයුම් අංශයේ ප්‍රධාන අංශ තුනක් ඇතුළත් වෙනවා."

ඒ විධියට මුදල් ඇමතිවරයා හැටියට අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා අය වැයේ මූලික ප්‍රතිපත්ති පැහැදිලි කරමින් තමයි මේ අය වැය ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂය ජාතික ජන බලවේගය රජයේ මේ අය වැය සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කරන්නේ ඉතාම පටු අර්ථයකින්. නමුත් ජාතික ජන බලවේගයේ

අපට අය වැය කියන්නේ හුදු ආර්ථිකමය කරුණු පමණක් අඩංගු වැඩ පිළිවෙළක් නොවෙයි. ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ බඩු මිල අඩු කිරීම, වැඩි කිරීම, පඩි වැඩි කිරීම, අඩු කිරීම, මූල්‍ය ප්‍රතිපත්ති; fiscal ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම විතරක් නොවෙයි. ජාතික ජන බලවේගයේ අපට අය වැයක් කියන්නේ ඊට වඩා පුළුල් කාරණයක්. අපේ සමස්ත වැඩ පිළිවෙළම අදාළ කරගත් ප්‍රකාශනයක් තමයි අපි අය වැය ඇතුළේ ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේ, මේ රට ගොඩනගන වැඩ පිළිවෙළ ඇතුළේ අපි ඉදිරිපත් කළ සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, පාරිසරික කටයුතු, කාන්තා කටයුතු, ළමා කටයුතු, ජාතික සමගිය ආදී සෑම කරුණක්ම මේ අය වැය ඇතුළේ ආවරණය වෙලා තිබෙනවා. ඒක තමයි මේ අය වැයේ තිබෙන විශේෂත්වය.

මේ රට ඇතුළේ ජාතික සමගිය ඇති කිරීම, ශ්‍රී ලාංකික ජාතිය බිහි කිරීම අපි ප්‍රමුඛ කරගත් කාර්යයක්. ඒ සඳහා වන වැඩ පිළිවෙළ මේ අය වැය ඇතුළේ ප්‍රකාශයට පත් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එයට උදාහරණයක් දක්වනවා නම්, 2025 අය වැය කථාවේ අංක 20 දරන පිටුවේ අපි ඉදිරිපත් කර තිබෙනවා, යාපනය සහ අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල වැඩිදියුණු කිරීම සඳහා අපි ගෙන තිබෙන ක්‍රියාමාර්ග.

ඒ යටතේ මෙසේ සඳහන් වනවා:

> "යාපනයේ සහ අවට දූපත්වල පාසල් සිසුන් ඇතුළු පාඨකයන් විශාල පිරිසක් යාපනය පුස්තකාලය භාවිත කරනවා. නමුත් මෙම පාඨකයන්ගේ ප්‍රයෝජනය සඳහා යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය කර නැහැ. එම නිසා මෙම පුස්තකාලයට පරිගණක ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් ලබා දීමට මෙවර අය වැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා."

ඒ විධියට අපි යාපනය පුස්තකාලය ගැන ඒ වැඩසටහනේදී ප්‍රමුඛ කොට සලකන්නේ, ඒක අධ්‍යාපන කාර්යයක් ලෙස සලකා විතරක් නොවෙයි, මේ රටේ ජාතික සමගිය ගොඩනඟද්දී, ශ්‍රී ලාංකික ජාතිය ගොඩනඟද්දී සුවිශේෂී වැදගත්කමක් ඇති දෙයක් නිසායි. ඒ විතරක් නොවෙයි, උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග සහ පාලම් ගොඩනැඟීම වෙනුවෙන් සැලකිය යුතු මුදලක් අපි වෙන් කර තිබෙනවා. මුලතිව් වඩ්ඩුවාකල් පාලම ඉදි කිරීම සඳහා, නැඟෙනහිර පළාත සංවර්ධනය කිරීම සඳහා ඒ වාගේම "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ වැඩසටහන සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, "ශ්‍රී ලාංකික දිනය" ජාතික උත්සවය පැවැත්වීම සඳහා ද මේ අය වැය මඟින් අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අභ්‍යන්තරව අවතැන්වූවන් සඳහා විශේෂ මුදල් ප්‍රතිපාදන මේ අය වැය මඟින් වෙන් කර තිබෙනවා. ජාතික ඒකාබද්ධතාව වෙනුවෙන් රුපියල් බිලියන 2.1ක්ද, සියලුම ආගම්වල දහම් පාසල් සංවර්ධනය සඳහා රුපියල් බිලියන 1.3ක්ද, සියලු ආගම්වල ආගමික කටයුතු වැඩිදියුණු කිරීම සඳහා රුපියල් බිලියන 3.54ක්ද අපි වෙන් කර තිබෙනවා. ජාතික සමගිය ඇති කිරීම පැත්තෙන් පුළුල් ලෙස ආවරණය වෙච්ච වැඩ පිළිවෙළක් අපි මේ අය වැය තුළ ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා මේ අය වැය අපේ රටේ සුවිශේෂී අය වැයක්. මේ අය වැය තමයි අපේ රටේ ඉතිහාසයේ පළමුවරට හුදු ආර්ථික කරුණුවලින් ඔබ්බට ගිහිල්ලා, අපේ රටේ සමාජයීය ප්‍රශ්නත් අපේ රටේ සංවර්ධනයට අදාළ සියලු පැතිකඩත් ආවරණය වන විධියට, වැඩ පිළිවෙළක් සහිතව ඒ අවශ්‍ය කරන ප්‍රතිපාදන සහ දැක්ම ඉදිරිපත් කර තිබෙන අය වැය. ඒ කාරණය කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වර්තමාන ආණ්ඩුවේ 2025 වසර සඳහා වූ අය වැය පිළිබඳ විවාදයට එක්වීමට ලැබීම භාග්‍යයක් කොට සලකනවා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. වටිටපු රට ගොඩනැඟීම ඉලක්ක කරගෙන වර්තමාන ආණ්ඩුව විසින් දැවැන්ත වැඩ පිළිවෙළක් සහිතව, ඉදිරිගාමී දැක්මක් සහිතව මේ අය වැය ප්‍රකාශනය රට ඉදිරියේ තබනකොට, මේ රට විනාශ කරපු, නන්නත්තාර කරපු, මේ රට වටිටපු ප්‍රධාන විපක්ෂයේ කණ්ඩායම් තමයි අද ඒ සම්බන්ධයෙන් කලබල වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව, ජාතික ජන බලවේගය පිළිබඳව, අපේ වැඩ පිළිවෙළ පිළිබඳව, අපේ ඉදිරි දැක්ම පිළිබඳව අද අපට වඩා විපක්ෂය තමයි කරුණු කාරණා ඉදිරිපත් කරන්න පටන් ගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජන වහරේ කථාවක් තිබෙනවා, "කිකිළිට නැති අමාරුව බුරියගේ ගෑනිට" කියලා. ජාතික ජන බලවේගයේ අපි, අපේ දැක්ම පිළිබඳව, අපේ ගමන් මාර්ගය පිළිබඳව, මේ රට ගොඩ නැඟීම පිළිබඳව පැහැදිලි දැක්මක් සහිතව ගමනක් යනකොට ඒ වැඩ පිළිවෙළ දිරවා ගන්න බැරිව විපක්ෂය විවිධ ප්‍රබන්ධ ගොඩ නහන්න ලැහැස්ති වෙලා ඉන්නවා.

ජේවීපී එක එහෙම නොවෙයි, ඒක මීට අවුරුදු 60කට කලින් බිහි වුණේ, ඒකේ ප්‍රතිපත්ති මෙහෙමයි කියලා කතන්දර ගොඩ නහන්න අද විපක්ෂයේ මන්ත්‍රීවරු ලක ලැස්ති වෙලා ඉන්නවා. ඒ අය ගැන ඇත්තටම අපට කනගාටුයි. මේ තරම් අසරණභාවයට පත් වෙච්ච විපක්ෂයක් අපි මීට පෙර දැකලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අන්වීක්ෂ දාලා සොයනවා වාගේ දැන් ඒගොල්ලෝ සොයනවා මේ අය වැය ලේඛනයේ පොඩි හෝ වරදක්. මේ අය වැය ලේඛනය ගැන දැන් රටම ගුණ ගායනා කරනවා. අප අද ගම්වලට යන කොට, ඒ සමහර ගම් ඇතුළේ ඉන්න සමගි ජන බලවේගයේ සාමාජිකයින් කියනවා, "මන්ත්‍රීතුමා, මේක මාර අය වැයක්, අමතක නොවන අය වැයක්! අපි මෙච්චර එකක් ගැන හිතුවේවත් නැහැ" කියලා. එහෙමයි ගුණ කියන්නේ. සමහර රාජ්‍ය සේවකයෝ කියනවා, "ජීවිතයේ කවදාවත් මේ විධියට අපේ වැටුප් වර්ධකය වැඩි කරලා දීලා නැහැ" කියලා. තවත් සමහරු කියනවා, "මේක මාරයි, පට්ටයි මන්ත්‍රීතුමා. අපි දන්නවා, මේ රටේ මිනිස්සු ඔය කියන විපක්ෂයේ කණ්ඩායම්වලට ආයෙ නම් කවදාවත් ඉඩක් දෙන්නේ නැහැ" කියලා. ඒ තැනට මේ රට පත් වෙලා තිබෙන්නේ. විපක්ෂයට අද ඒක දරා ගන්න බැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ නිසා ඒ අය, "යුරේකා, යුරේකා" කියමින් හෙලුවෙන් දුවන මට්ටමට දැන් පත් වෙලා ඉන්නවා. ඒ අය අන්වීක්ෂ දාලා බලනවා වාගේ මේ අය වැය ලේඛනයේ වැරැදි සොයනවා. "ඔන්න මම මේක සොයා ගත්තා, මෙන්න මම මේක සොයා ගත්තා. මෙන්න මේවායි තිබෙන අඩු පාඩු" කියලා කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ තත්ත්වයට තමයි අද ඒ අය පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්න

[ගරු දේවානන්ද සුරවීර මහතා]

කැමැතියි, ඔබට මේ අය වැය පිළිබඳව සාධනීය විවේචනයක් වර්තමාන ආණ්ඩුවට එරෙහිව එල්ල කරන්න තවම බැරි වෙලා තිබෙන බව. ඉතිහාසය පුරාවට ඔබතුමන්ලාට කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ අප ගැන ප්‍රබන්ධ ගොඩ නහන්න විතරයි. මේ වර්තමාන ආණ්ඩුව බලයට එන්නට පෙරත්, බලයට ආවාට පසුවත් ඔබතුමන්ලා කළේ එයයි. ඒ වාගේම මේ අය වැය ලේඛනය පිළිබඳවත් ඔබතුමන්ලාට පුළුවන් වෙලා තිබෙන්නේ ප්‍රබන්ධ ගොඩ නහන එක විතරයි. ඔබතුමන්ලා තමයි මේ රට විනාශ කළේ. ඔබතුමන්ලා තමයි මේ රට කෑවේ. ඒ කාරණයත් මතක තබා ගන්න.

1948 ඉඳලා අද දක්වා අපේ රට මේ ආපු ගමන් මාර්ගය ගත්තොත්, විවිධ රජයන්, විශේෂයෙන්ම ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් විවිධ කණ්ඩායම් එකතු කරගෙන මේ රට පාලනය කළා. පුනරාවලෝකනය කරලා බලන්න, ඒ කාලවල මෙවැනි අය වැයක් ඉදිරිපත් කර තිබෙනවාද කියලා. මෙවැනි අය වැයක් කවරදාකවත් ඉදිරිපත් කරලා නැහැ. ඒගොල්ලන් මේ රටට ඉදිරිපත් කරපු අය වැය ලේඛනවල සහ මේ රටේ ජනතාව රවටන්න ගොඩ නහපු ප්‍රබන්ධ සහ බොරුවල ප්‍රතිඵලය තමයි, මේ රට ගොඩ නහන්න විවිධ විශේෂ අවස්ථා ආවත් ඒ අවස්ථා සියල්ල මහ හැරලා, ඒගොල්ලන් මේ රටට අත් කර දුන් තර්කානුකූල ප්‍රතිඵලය තමයි, ඒ අවිචාරවත් කළමනාකරණයේ සහ අවිචාරවත් පාලනයේ ප්‍රතිඵලය තමයි 2022දී මේ රට බංකොලොත් රාජ්‍යයක් බවට පත් කරපු එක. ඒක මතක තබා ගන්න. ඔබතුමන්ලා මේ රට බංකොලොත් රාජ්‍යයක් බවට පත් කළා; දූෂිතයින්ගේ දේශයක් බවට පත් කළා. ඒ විතරක් නොවෙයි, අපේ රට නන්නත්තාර කරලා, අපේ රටට තිබුණු මහා ගෞරවය විනාශ කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, එක යුගයකදී මේ රට "පෙරදිග ධාන්‍යාගාරය" ලෙසත්, තව කාලයක මේ දිවයින "රතු පස් දිවයින" ලෙසත්, තවත් කාලයක මේ රට "පෙරදිග මුතු ඇටය" ලෙසත් හඳුන්වපු බව. එහෙව් රට නන්නත්තාර කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද මේ අය වැය ලේඛනය ගැන විවිධ ප්‍රකාශ සිදු කරමින් ප්‍රබන්ධ ගොඩ නහන්න එනවා. මේ රට බංකොලොත් කළේ ඒගොල්ලෝ. මේ රට නන්නත්තාර කරලා දාලා තිබුණේ ඒගොල්ලෝ. ඒ නිසා අපි ඒ මහත්තුරුන්ට කියන්න කැමැතියි, ජාතික ජන බලවේගය, එහෙම නැත්නම් වර්තමාන ආණ්ඩුව මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ ඔබතුමන්ලා නිර්මාණය කරපු අර්බුදයෙන් ගොඩ ඒම ඉලක්ක කරගෙන බව.

වර්තමාන ආණ්ඩුවට තිබෙනවා වුවමනාවක්. වර්තමාන ආණ්ඩුව අපේ රටේ ජනතාවත් එක්ක සම්මුතියකට ඇවිත් තිබෙනවා. අපේ රටේ ජනතාවගෙන් අපි මේ බලය ඉල්ලුවේ, මේ රට ගොඩ නහන්නයි; මේ රට හදන්නයි. ඒ සඳහා යන ගමනේදී විශේෂයෙන් මේ රටේ ජනතාව දුන්නු ඒ ජන වරමට ගරු කරමින් තමයි සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි අප මේ අය වැය සකස් කර තිබෙන්නේ. මේ වන විට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු, ඇමතිවරු මේ අය වැය ලේඛනය පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කර තිබෙනවා.

ඒක බීරන්ට තමයි ඇහෙන්නේ නැත්තේ. මේ අය වැය ලේඛනයේ තිබෙන යහ ගුණ වාගේම අපේ රට ගොඩනඟන ගමනට මේ අය වැය ලේඛනය භාවිත කරන විධිය පිළිබඳව, ඒ සමස්ත ක්‍රියාවලිය පිළිබඳව විශේෂයෙන්ම මේ දින දෙක තුළ සංවාද ගොඩනැඟුවා. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඒක ඇහෙන්නේ නැහැ; බීරන් බවට පත් වෙලායි ඉන්නේ; හැම වෙලාවකම මෙහි අඩු පාඩු සොයන්න තමයි කල්පනා කරමින් ඉන්නේ. කිසිදු සාධනීය විවේචනයක් නැහැ.

පාසල් ගුරුවරයෙක්, එහෙම නැත්නම් ගෙදර අම්මා තමන්ගේ දරුවාට ගහන්නේ මොකටද කියන එක අපි දන්නවා; ඒක අපට හැඟෙනවා. පාරේ කොහේවත් යන රස්තියාදුකාරයෙක් දරුවෙකුට ගහන කොට ඒකේ වේදනාවත්, ඒ ගහන්නේ මොන කාරණාවට ද කියන එක ගැනත් තේරුම් ගන්න අපට පුළුවන්. අපට ඒ ගැනත් අදහසක් තිබෙනවා. වර්තමාන ආණ්ඩුව මේ රට රැගෙන යන ගමන පිළිබඳව ඒගොල්ලන්ට අදහසක් තිබෙනවා. නමුත් කුහකකම, වෛරය තමන්ගේ සිත තුළ දරාගෙන තමයි ඒගොල්ලන් මේ අය වැය විවේචනය කරන්නේ. නරුම ගණයේ, තක්කඩි ගණයේ විවේචන ඉදිරිපත් කරමින්, මේක නව ලිබරල්වාදී අය වැයක්, මේක වැඩකට නැති එකක්, මේක අපි ඉදිරිපත් කරන්න හිටපු එකක් වාගේ බයිලා කතන්දර කියන තත්ත්වයට විපක්ෂය අද පත් වෙලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ ජනතාවගේ ජීවිත දුක්ඛ දෝමනස්සයන්ගෙන් පිරී පවතින බව අපි හොඳින්ම දන්නවා. අපේ රටේ ජනතාවගේ ජීවිතවල සතුට තොර කරපු කණ්ඩායම්, අපේ රටේ මිනිසුන්ට ජීවිතයක් නැති කරපු අය, අපේ රටේ මිනිසුන්ට සතුට නැති කරපු අය සම්බන්ධයෙන් මේ රටේ මිනිස්සු තීන්දුවක් අරගෙන ජාතික ජන බලවේගයට විශේෂ ජන වරම් දෙකක් දීලා තිබෙනවා. දුකින් මිදීමේ එක් මාර්ගයක් හැටියට තමයි අප මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ රට ගොඩනඟන ක්‍රියාවලියේදී මේ අය වැයේ විශේෂ වැදගත්කමක් තිබෙනවා. ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමිය, අපේ කැබිනට් මණ්ඩලය ඇතුළු වර්තමාන ආණ්ඩුව අපේ රටේ රාජ්‍ය යන්ත්‍රණය කාර්යක්ෂම කිරීමට, ඵලදායී කිරීමට, අදූෂිත එකක් බවට පත් කිරීමට කටයුතු කරනවා. රාජ්‍ය අංශය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට එකතු කළ යුතු නිෂ්පාදන ආර්ථිකයක් පදනම් කරගෙන තමයි විශේෂයෙන්ම මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෙය, උත්ප්‍රේරණය, මැදිහත්වීම මඟින් ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම ඉලක්ක කරගත් අය වැයක්; අස්ථාන ආයෝජනය, අයෝග්‍ය සංග්‍රහය, සාවද්‍ය පරිභෝජනය වැළැක්වීම ඉලක්ක කරගත් අය වැයක්; ඒ වාගේම, ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන අය වැයක්.

වර්තමාන ආණ්ඩුව ජනතාවට ආදර්ශයක් ලබා දීලා තිබෙනවා. වර්තමාන ආණ්ඩුව ජනතාවට පටි තද කර ගන්න කියලා නැහැ. ජනතාවට පටි තද කර ගන්න කියනවා වෙනුවට වර්තමාන ආණ්ඩුව පටි තද කර ගනිමින් තමන්ගේ සියලු වරදාන, වරප්‍රසාද කප්පාදු කර ගනිමින් රටේ ජනතාවට අද ආදර්ශයක් දෙමින් ඉන්නවා. රාජ්‍ය වියදම ජනාධිපතිවරයාගේ ඉඳලාම අඩු කරලායි තිබෙන්නේ. රාජ්‍ය වියදම් සීමා කිරීම ඉලක්ක කර ගත් අය වැයක්, මෙය. ජාතික ආදායමේ රාජ්‍ය භාගය වන බදු ආදායම මුළුමනින් එකතු කර ගැනීම ඉලක්ක කර ගත්තු අය වැයක්, මෙය. වැඩ කරන ජනතාව එකතු කර ගැනීම ඉලක්ක කරගත් අය වැයක්, මෙය. ඒ වාගේම, අනාර්ථික හා අධිතක්සේරු ව්‍යාපෘති නැති, ප්‍රායෝගික, රටේ ජනතාවට දැනෙන, රටේ ජනතාව ආර්ථිකයට බද්ධ කර ගත්තු, ඒ ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට ගලා එන අය වැයක් බවට මේ අය වැය පත් කර තිබෙනවා. මේ අය වැය මේ රට ගොඩ නහන්න අලුත් පියවරක් තබන, වර්තමාන ආණ්ඩුවේ පදනම රටට, ජනතාවට, ලෝකයට පෙන්වන අය වැයක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව නතර කරනවා. බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම සඳහන් කළා.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
මම කාගේවත් නමක් සඳහන් කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාගේවත් නමක් සඳහන් වුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.30]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டத்தை - பாதீட்டை - நாம் மூன்று விதமாகப் பார்க்கலாம் என்று நினைக்கின்றேன். இந்த வரவு செலவுத்திட்டம் வரலாற்றில் முக்கிய இடம்பெற வேண்டுமென்று மக்கள் நினைக்கிறார்கள். அந்த வகையில் பார்க்கின்றபோது, ஓர் இடதுசாரி அமைப்பென்று சொல்லுகின்ற JVP கட்சியினரான நீங்கள், தேசிய மக்கள் சக்தி என்ற அடிப்படையில் இந்த வரவு செலவுத்திட்டத்தை முன்வைத்திருக்கிறீர்கள். ஏறத்தாழ 77 வருடங்களுக்குப் பின்னர் இந்தச் சம்பவம் நிகழ்ந்திருக்கின்றது. இதற்கு முன்பு இடதுசாரிக் கொள்கைகளைப் பின்பற்றிய the Hon. (Dr.) N.M. Perera, the Hon. (Dr.) Colvin R. de Silva போன்றவர்கள் முயற்சித்தும் அடையாத நிலையில், இதனை நீங்கள் செய்திருக்கின்றீர்கள். மார்க்சிச, லெனினிச, மாவோயிச சிந்தனையில் பயணித்த உங்களுடைய இந்த வரவு செலவுத்திட்டம் இனத்துவம், மதத்துவம், மொழித்துவம் கடந்து சமத்துவ ரீதியாக அமைந்திருக்க வேண்டுமென்று மக்கள் எதிர்பார்க்கிறார்கள்.

மொத்தமாக இந்த வரவு செலவுத்திட்டத்தைப் பார்க்கின்றபோது, இதில் சில முற்போக்கான விடயங்கள் இருக்கத்தான் செய்கின்றன. அந்த வகையில், மக்கள் சார்பான சலுகை என்ற விடயம், கல்வி, சுகாதாரத்திற்கான ஒதுக்கீடுகள் அதிகரிக்கப்பட்டிருக்கின்ற விடயம், பெருந்தோட்டத் தொழிலாளர்களுக்கான சம்பள உயர்ச்சி சம்பந்தமான விடயம், போதையற்ற ஒரு சமூகத்தை உருவாக்க வேண்டுமென்ற விடயம் என்பவற்றைக் குறிப்பிடலாம். அதேபோன்று, Clean Sri Lanka என்ற திட்டத்தைப் பற்றிச் சொல்லியிருக்கிறீர்கள். இன்னும் சொல்லப்போனால், 'அஸ்வெசும' திட்டத்தை விரிவாக்கம் செய்வது போன்ற விடயமெல்லாம் ஒட்டுமொத்த நாடு ரீதியாகப் பார்க்கின்றபோது மக்கள் விரும்புகின்ற விடயங்கள் என்பதை நாங்கள் மறுக்கவில்லை. இவை பொதுவாக தேச மட்டத்தில் நாங்கள் பார்க்கின்ற விடயங்கள்!

அடுத்த கட்டமாக நாங்கள் வடக்கு, கிழக்கு தொடர்பில் என்ன நடந்திருக்கின்றது என்ற விடயத்தைப் பார்க்க வேண்டும். வடக்கு, கிழக்கைப் பொறுத்தமட்டில், வடக்கில் இருந்த தெற்காசியாவில் முக்கியமானதாகக் கருதப்பட்ட ஒரு படிப்பகத்தை - நூலகத்தை - முன்னாள் அமைச்சராக இருந்த ஒருவர் தேர்தல் நோக்கத்திற்காக எரித்திருந்தார். அந்தக் காலத்தில் ஜே.ஆர். ஜயவர்தன அவர்களது செல்லப் பிள்ளைகளாக காமினி திஸாநாயக்க, அத்துலத் முதலி, ரணில் விக்கிரமசிங்ஹ ஆகிய மூன்று பேர் இருந்தார்கள். அதில் ஒருவரது மாய விளையாட்டாகத்தான் இது கருதப்படுகின்றது. அந்த நூலகத்தின் மேம்பாட்டுக்காக நீங்கள் 10 கோடி ரூபாயை ஒதுக்கியிருக்கின்றீர்கள். அதை வரவேற்கின்றோம், நல்ல விடயம்! அதேபோன்று, யுத்தத்தால் பாதிக்கப்பட்ட முல்லைத்தீவுப் பிரதேசத்தில் வட்டுவாகல் பாலத்தை அமைப்பதற்காக ஏறத்தாழ 100 கோடி ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது; அதனையும் நாங்கள் வரவேற்கின்றோம். அங்கு புனரமைப்புகளை மேற்கொள்வதற்காக நீங்கள் பணத்தை ஒதுக்கி இருக்கின்றீர்கள். அவற்றையெல்லாம் நாங்கள் நல்ல விடயமாகப் பார்க்கின்றோம்.

அதேநேரத்தில், மட்டக்களப்பைப் பிரதிநிதித்துவப் படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் நாங்கள் கிழக்கு மாகாணம் தொடர்பாகப் பார்த்தால், உங்களுடைய சொந்தத் தயாரிப்பில் கொண்டுவரப்பட்ட பாதீட்டில் ஒரு சுண்டலாவது எங்களுக்குக் கிடைத்திருக்கின்றதா? என்று பார்த்தால், இல்லையென்று சொல்லக்கூடிய விதத்தில்தான் அது அமைந்திருக்கிறது, அதாவது, "கிழக்கு மாகாணத்தின் அபிவிருத்தியைப் பக்கத்து வீட்டார் பார்த்துக்கொள்வார்கள், படையலுக்கு நீங்கள் பாத்திரத்தை எடுங்கள்!" என்ற அடிப்படையில்தான் அது அமைந்திருக்கின்றது. சுமார் 30 வருட கால யுத்தத்தில் வடக்கும் கிழக்கும் பாதிக்கப்பட்டது உங்களுக்குத் தெரியும். அடுத்த கட்டமாக, அண்மையில் ஏற்பட்ட வெள்ளப்பெருக்குக் காரணமாக பாரிய இழப்புகளை - உயிரிழப்புகளைக்கூட - மட்டக்களப்பு மாவட்டம் சந்தித்திருக்கின்றது. எனவே, சமத்துவம் பேணுகின்ற உங்களுடைய இந்த வரவு செலவுத்திட்டத்தின் ஊடாக மட்டக்களப்பு, திருகோணமலை, திகாமடுல்ல போன்ற மாவட்டங்களுக்கும் அபிவிருத்திக்கான ஒதுக்கீடுகள் இடம்பெற வேண்டுமென்று எமது மக்கள் எதிர்பார்ப்பது உங்களுக்கு ஆச்சரியமாக இருக்கப் போவதில்லை.

கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பை எடுத்துக்கொண்டால், அந்த மாவட்டம், படுவான்கரை, எழுவான்கரை என்று இரண்டு துண்டுகளாகப் பிரிக்கப்பட்டிருக்கின்றது. இந்த இரண்டு துண்டு நிலப்பரப்புகளையும் மட்டக்களப்பு வாவி பிரித்துச் செல்கின்றது. ஒரு காலத்தில் இராணுவக் கட்டுப்பாடு உள்ள பிரதேசம், இராணுவக் கட்டுப்பாடற்ற பிரதேசம் என்று பிரிந்து காணப்பட்டது. யுத்தத்தின் பின்னர் இந்த இரண்டு நிலப்பரப்பையும் இணைக்க வேண்டுமென்று நாங்கள் பல முயற்சிகளைச் செய்தோம். நல்லாட்சிக் காலத்திலும்கூட நாங்கள் இந்த விடயத்தினைப் பிரஸ்தாபித்திருந்தோம். நல்லாட்சிக் காலத்தில், ஐந்து பாலங்களை அமைத்துத் தந்தால் இந்த இரண்டு நிலப்பரப்பையும் இணைத்துப் போக்குவரத்தைச் சீர்படுத்தலாம், அடுத்த கட்டமாகப் பொருளாதார அபிவிருத்திச் செயற்பாடுகளையெல்லாம் நாங்கள் மேல்நோக்கிக் கொண்டுவரலாம் என்றெல்லாம் கனவு

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

කණ්ටෝම். අක්කාලත්තිල් இரண்டு பாலங்களை அமைப்பதற்காக, ஆரம்பகட்ட வேலைகளைக்கூட - borehole testing என்ற பாறையைக் கண்டறிகின்ற ஆராய்ச்சியைச் செய்து, நிதியும் செலவு செய்திருக்கின்றார்கள். ஆனால், பாலங்கள் கட்டப்படாமல் ஆராய்ச்சியோடு அந்தத் திட்டம் அரைகுறையாக நிறுத்தப்பட்டிருக்கின்றது.

வடக்கில் வட்டுவாகல் பாலம் கட்டப்படுவதை நாங்கள் மிகவும் மகிழ்ச்சியாக வரவேற்கின்றோம். அதேநேரத்தில் மட்டக்களப்பு, திருகோணமலை, திகாமடுல்ல ஆகிய பிரதேசங்களிலும் அதிகமாகப் பாதிக்கப்பட்ட பகுதிகள் காணப்படுகின்றன. அந்த இடங்களுக்கும் உங்களுடைய பார்வை சென்றடைய வேண்டும். மட்டக்களப்பில் நாங்கள் ஆறு பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கின்றோம். அதிலும் ஒரு சாதனை வெற்றிபெற்ற கந்தசாமி பிரபு அவர்கள் இருக்கின்றார். ஆனால், தற்போது நான் சொல்லக்கூடியது என்னவென்றால், கிழக்கின் அபிவிருத்தி என்ற விடயத்தைப் பக்கத்து நாடு பார்த்துக்கொள்ளும் என்பது போன்று சொல்லப்பட்டிருக்கின்ற அந்த விடயத்தினால் அவருக்கும் பாதிப்பு ஏற்படப் போகின்றது. ஏனென்றால், மக்கள் அவரிடமும் கேள்வி கேட்பார்கள், நாங்களும் கேட்போம். ஆகவே, நாங்கள் சொல்லக்கூடிய ஒரு விடயம் என்னவென்றால், கிழக்கு மாகாணத்திற்கும் அபிவிருத்தியின் பார்வை கட்டாயம் வரவேண்டும் என்பதுதான்.

"பச்சைக் கட்சி ஆட்சி செய்தது, நீலக் கட்சி ஆட்சி செய்தது; பச்சைக் கட்சி பாராபட்சம் செய்தது, நீலக் கட்சி நிம்மதியைக் குலைத்தது" என்று சொல்லிக்கொண்டிருக்கின்ற நாங்கள், இந்தச் சிவப்பு கட்சியின் ஆட்சியிலாவது சிறப்பான கருத்திட்டங்கள் அல்லது செயற்திட்டங்கள் கொண்டுவரப்பட வேண்டுமென்று எதிர்பார்க்கின்றோம். ஏனென்றால், நீங்கள் சமத்துவவாதிகள்; இனவாதம், மதவாதம் அற்றவர்கள் என்று நாங்கள் எதிர்பார்க்கின்றோம். ஆகவே, எங்களைப் பொறுத்தவரை இந்தக் கிழக்கின் அபிவிருத்தியென்பது மிக முக்கியமானதாக இருக்கிறது. குறிப்பாக, படுவான்கரை, எழுவான்கரை என்று சொல்லப்படுகின்ற இந்த நிலப் பிரதேசங்கள் இணைக்கப்படுவது அவசியமாகும். வரலாற்றில் வெள்ளைக்காரன் நாட்டைவிட்டுச் சென்ற காலத்திலிருந்து அவை துண்டங்களாகத்தான் கிடக்கின்றன. துண்டங்களாகக் கிடந்த அந்த நிலப்பரப்பின் ஒரு பகுதியை இராணுவக் கட்டுப்பாட்டற்ற பிரதேசம் என்று கூறி, அந்தப் பகுதியில் அபிவிருத்தியின் அரிச்சுவடிகூட நடைபெறவில்லை. கிழக்கின் ஏனைய பகுதிகளில் ஓரளவு அபிவிருத்திகள் நடைபெற்றன; இருந்தாலும், குறைவாகத்தான் இருந்தன.

யுத்தம் முடிந்து இப்போது கிட்டத்தட்ட 16 ஆண்டுகள் சென்றுவிட்டன. இந்த 16 ஆண்டுகளில் அந்தப் படுவான்கரைப் பிரதேசத்திலிருக்கின்ற மக்கள் தாங்கள் நிலத்தொடர்பால் இணைக்கப்பட வேண்டுமெனக் கோருகின்றார்கள். குறுகிய நேரத்தில் பயணம் செய்யவேண்டிய இடத்திற்கு நீண்டதூரம் சுற்றிவளைத்து வருகின்றார்கள். இதனால் பாடசாலை செல்கின்ற மாணவர்கள் பாதிக்கப்படுகின்றார்கள்; அரச உத்தியோகம் செய்கின்றவர்கள் பாதிக்கப்படுகின்றார்கள்; நோயாளிகளை ambulanceஇல் கொண்டுசெல்கின்றபோது மரணங்கள்கூட நடைபெறுகின்றன. ஆகவேதான், இந்தக் கிரான் பாலம் அமைக்கப்படுவது மிக முக்கியமானது என்று நாங்கள் எதிர்பார்க்கிறோம். அதனூடாக வெள்ளப்பெருக்கு ஏற்படுகின்றபோது படுவான்கரை, எழுவான்கரை ஆகிய இரண்டு பிரதேசங்களிலும் கிட்டத்தட்ட 30 கிராமங்கள் பாதிக்கப்படுகின்றன. 1970களில் கட்டப்பட்ட அந்தப் பாலம் அப்படியே இருக்கின்றது. ஓர் அணைக்கட்டைக் கட்டிவிட்டு ஒரு சிறிய பாலத்தை அமைத்திருக்கிறார்கள். அந்த இடத்தில் வெள்ளம் தேங்குகின்றபோது பல கிராமங்கள் வெள்ளத்தில் மூழ்கடிக்கப்படுகின்றன; பாதைகள் மூழ்கடிக்கப்படுகின்றன. அங்கும் ஒரு borehole testing செய்து பாறையைக் கண்டுபிடித்திருக்கின்றார்கள்; பாலம் அமைக்கப்படவில்லை.

இதேபோன்றுதான் நரிப்புல் தோட்டம் - பங்குடாவெளிப் பிரதேசங்களை இணைக்கின்ற ஒரு பாலத்தை அமைப்பதற்கு அங்கும் testing செய்திருக்கிறார்கள்; பாலம் அமைக்கப்படவில்லை. அதேபோன்று, திகிலிவட்டை - சந்திவெளி பிரதேசங்களை இணைக்கின்ற இடத்தில் testing நடக்கவில்லை; பாலமும் அமைக்கவில்லை. கிண்ணையடி - முருக்கந்தீவு பிரதேசங்களை இணைக்கின்ற பாலம் அமைக்கப்படவில்லை. மண்டூர் - குருமன்வெளியை இணைக்கின்ற பாலம் அமைக்கப்படவில்லை. காஞ்சிரங்குடா - முனைக்காடு பிரதேசங்களை இணைக்கின்ற பாலம் அமைக்கப்படவில்லை. ஒட்டுமொத்தமாகப் பார்க்கின்றபோது, இந்த நாடு சுதந்திரமடைந்த காலத்திலிருந்து இன்றுவரை அவற்றில் மாற்றங்கள் எதுவும் செய்யப்படவில்லை.

கடந்த காலத்தில் வலதுசாரியினர் ஆட்சி செய்தார்கள்; அவர்களிடம் இனவாதம், மதவாதம், மொழிவாதம் இருந்ததென்று சொல்லலாம். ஆனால், நீங்கள் வலதுசாரிகள் இல்லை; இடதுசாரிகள்! எல்லா மக்களையும் சமமாகப் பார்க்கவேண்டியவர்கள்; பார்க்க வேண்டும்! அந்த அடிப்படையில், இந்த விடயத்தை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டுமென்ற மக்களின் கோரிக்கையினை உங்களிடம் வேண்டுகோளாக விடுக்கின்றேன். இவ்வாறானவற்றில் நீங்கள் ஒன்றையாவது முதலில் செய்துகாட்டினால் உங்கள்மீது அந்த மக்கள் நம்பிக்கை கொள்வார்கள். கடந்த காலத்தவர்கள் தவறுகள் செய்தாலும் இப்போது இருக்கின்றவர்கள் எங்களைப் பற்றிச் சிந்திக்கின்றார்கள் என அந்த மக்களை எண்ணச் செய்வதற்கு ஒரு சந்தர்ப்பமாக அது அமையும். நான் நினைக்கின்றேன், உங்களுடைய தரப்பிலிருக்கின்ற எங்களுடைய மாவட்டத்தைப் பிரதிநிதித்துவம் செய்யும் பாராளுமன்ற உறுப்பினர் கௌரவ கந்தசாமி பிரபு அவர்களும் இந்தக் கருத்தை ஏற்றுக்கொள்வார் என்று. நாங்கள் 6 பேரும் இந்த அபிவிருத்தி விடயத்தில் முரண்பட்டு நிற்கவில்லை; ஒன்றாகவே சிந்திக்கின்றோம். அவரும் இந்த விடயத்தைக் கட்டாயம் சுட்டிக்காட்டிப் பேசுவார் என்று நினைக்கின்றேன். இந்த அபிவிருத்தி விடயத்தில் அவர் எங்களுடன் முரண்படுவதில்லை; இணைந்துதான் பயணிக்கின்றார். ஆகவே, அவருடைய குரலும் இங்கு ஒலிக்குமென்று நான் எதிர்பார்க்கின்றேன்.

இதைவிட, நான் இன்னுமொரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். அதாவது, நல்லிணக்கம் என்பது இதயசுத்தியுடன் ஏற்படுத்தப்படவேண்டிய ஒரு விடயம். அது வார்த்தைகளால் மட்டும் வடிக்கப்படுகின்ற விடயமாக இருக்க முடியாது. நல்லிணக்கம் என்ற அடிப்படையில் காணிகளை விடுவித்தல், வீடுகளைக் கட்டிக்கொடுத்தல் என்கின்ற இரண்டு உபாயங்கள் அல்லது உதவிகள் இங்கு சொல்லப்பட்டிருக்கின்றன. நாங்கள் உங்களுக்குச் சொல்லக்கூடிய ஒரு விடயம் என்னவென்றால், உண்மையில் வடக்கும் தெற்கும் பரிபூரணமான சகோதரத்துவத்தோடு கை கோர்ப்பதற்குரிய வழி என்னவென்றால், யுத்தத்தின்போது மறைக்கப்பட்டிருக்கின்ற பல உண்மைகள் வெளிக் கொணரப்பட வேண்டும்; அந்த உண்மைகள்

வெளிக்கொணரப்பட்டு, தங்களுக்கு ஒரு பரிகார நீதி கிடைக்க வேண்டுமென்ற ஏக்கத்தோடு இருக்கின்ற பாதிக்கப்பட்ட மக்களுக்கு நீதி வழங்கப்பட வேண்டும். மீண்டும் இப்படியான வன்முறைகள், அழிப்புகள், அநியாயங்கள் நடக்காமல் ஒரு நிலையான தீர்வு கிடைக்க வேண்டுமென்று அந்த மக்கள் எதிர்பார்க்கின்றார்கள். நான் முதலில் குறிப்பிட்டதுபோன்று நீங்கள் சமத்துவவாதிகள் என்றபடியால், உங்களுடைய கொள்கைகள் மகத்துவமிக்கதாக இருக்க வேண்டுமென்று நாங்கள் நினைக்கின்றோம்; இவற்றை நீங்கள் செய்துதர வேண்டுமென்று உங்களை அன்பாகக் கேட்டுக்கொள்கின்றோம்.

அடுத்ததாக, பெருந்தோட்டச் சமூகம் என்று சொல்லப்படுகின்ற மலையகச் சமூகம் எங்களுடைய சகோதர சமூகம். உண்மையில் இன்றும் அவர்கள் 'லயன்' அறைகள் என்ற 'லயத்தில்' வாழ்ந்துகொண்டு இருக்கிறார்கள்; அவர்களது உழைப்போடு விளையாடுகின்றவர்கள் 'நயத்தில்' வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். ஒரு பக்கம் பயத்தோடு வாழுகின்றார்கள், இன்னொரு பக்கம் சுயநலத்தோடு வாழுகின்றார்கள். இது 200 வருடங்களுக்கு முற்பட்ட பிரச்சினை. அவர்களுக்கு இதிலிருந்து விமோசனம் - விடிவு கிடைக்கவேண்டும். சுரண்டப்படுகின்ற தொழிலாளர் வர்க்கத்தைப் பற்றி நீங்கள் சிந்திக்கின்றீர்கள். தொடர்ந்தும் சுரண்டப்பட்டுக்கொண்டு இருக்கின்ற அவர்களும் சமத்துவமான பிரஜைகளாக மாறுகின்றபொழுதுதான் எங்களுடைய நாட்டின்மீது வீழ்த்தப்பட்டிருக்கின்ற அல்லது குறித்துரைக்கப்பட்டிருக்கின்ற சாபக்கேடு அழிந்துபோகும். ஏனென்றால், அவர்கள் உச்சமாக உழைக்கின்றார்கள்; உச்சமாகச் சுரண்டப்படுகின்றார்கள். அவர்களுக்கு 1,700 ரூபாய் அடிப்படைச் சம்பளம் கொடுப்பதை நாங்கள் வரவேற்கின்றோம். ஏனென்றால், அவர்கள் அதுவும்கூட இல்லாமல் கஷ்டப்பட்டவர்கள். ஆகவே, அவர்களுடைய வாழ்க்கையில் ஒரு மாற்றம் - விடிவு ஏற்படவேண்டுமென்று நாங்கள் விரும்புகின்றோம்; அதனை நீங்கள் செய்வீர்கள் என்றும் எதிர்பார்க்கின்றோம்.

அடுத்ததாக, நான் சொல்லக்கூடிய இன்னொரு விடயம், 'பாராளுமன்ற உறுப்பினர்களுக்குச் சலுகை குறைப்பு' என்பது தொடர்பானது. இந்த விடயத்தில் சில கேள்விகள் இருக்கின்றன. 'சலுகை குறைப்பு' என்ற இந்த விடயத்தில் 'பாதுகாப்பு' என்ற விடயமும் இருக்கின்றது. கடந்த காலத்தில் 'உயிர்த்த ஞாயிறு' தாக்குதலானது ஆட்சி மாற்றத்துக்காகச் செய்யப்பட்ட ஓர் உபாயமென்று சொல்லப்படுவது உங்களுக்குத் தெரியும். ஆகவே, நான் சொல்லும் விடயம் என்னவென்றால்,

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

பாராளுமன்ற உறுப்பினர்களுக்கான பாதுகாப்பு என்பது மிக முக்கியமானது. சிலவேளைகளில் உங்கள்மீது பிரச்சினைகளை உருவாக்குவதற்குகூட இந்தப் பாதுகாப்பு விடயத்தில் யாரோ பலியாக வேண்டிய ஒரு நிலைமை ஏற்படலாம். ஏனென்றால், கடந்த காலத்தில் அவ்வளவு பெரிய குண்டுத் தாக்குதலைக்கூடச் செய்திருந்தார்கள். அதுபோல், போராட்டமொன்று நடைபெறுகின்றபோது அல்லது வீதிகளை மறித்துப் போராட்டங்களைச் செய்யும் சந்தர்ப்பத்தில் அந்த வழியால் செல்லும் எங்களுக்குப் பாதுகாப்பு தேவை. எங்களைப் பொறுத்தமட்டில் சுதந்திரமாக நடமாடுவதற்கு நாங்கள் விருப்பமாக இருக்கிறோம். ஓர் உந்துருளியில் - துவிச்சக்கர வண்டியில், ஒரு மோட்டார் சைக்கிளில் செல்வதற்கு, ஏன் கால்நடையாகச் செல்வதற்கும்கூட நாங்கள் தயாராக இருக்கிறோம். ஆனால், பாதுகாப்பு என்பது பாராளுமன்ற உறுப்பினர்களுக்கு இருக்க வேண்டும். பழைய பாராளுமன்ற உறுப்பினர்களுக்குப் பாதுகாப்பு இருக்கிறது. புதிய பாராளுமன்ற உறுப்பினர்களுக்குப் பாதுகாப்பு இல்லாமல் இருப்பது சமத்துவமில்லாத ஒரு விடயமாக இருக்கிறது. எனவே, இந்த விடயத்திலும் நீங்கள் கவனம் செலுத்த வேண்டும். உங்களுடைய முற்போக்கான நல்ல விடயங்களைப் பாராட்டுகின்றோம், குறைபாடான விடயங்களைச் சுட்டிக்காட்டியிருக்கின்றோம். அதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறுகூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன் நன்றி.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔව්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු ශ්‍රීනේෂන් මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. එතුමා සඳහන් කළා, නැහෙනහිර පළාතට මුදල් වෙන් කරලා නැහැ, ඒ වෙනුවට පිට රටකින් තමයි මුදල් වෙන් කිරීම කෙරෙන්නේ කියලා. නමුත් ඔබතුමන්ලා දකින්න ඇති, ගරු ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කළ ආකාරයට, එම අයිතමයේ විශේෂයෙන්ම සඳහන් වෙලා තිබෙනවා, නැහෙනහිර පළාත සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් කර තිබෙන බව. එම විදේශ ආධාර ගැන recognition එකක් වශයෙන් තමයි ඒ රට පිළිබඳව; ඉන්දියාව පිළිබඳව සඳහන් කරලා තිබෙන්නේ. නැහෙනහිර පළාත සංවර්ධනයට අවශ්‍ය කරන ප්‍රතිපාදන මේ තුළින් අමතරව ලැබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ special item එකට අමතරව, සමස්ත අය වැය පුරා තිබෙන වැඩකටයුතුවලට වෙන් කර තිබෙන මුදලිනුත් අතිවිශාල මුදල් ප්‍රමාණයක් නැහෙනහිර පළාතේ සංවර්ධනයට ලැබෙනවා. මාර්ග පද්ධති සංවර්ධනය, අධ්‍යාපන කටයුතු සංවර්ධනය, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය, ධීවර කර්මාන්තයේ සංවර්ධනය යනාදී අංශ ගණනාවකට වෙන් කරලා තිබෙන මුදලිනුත් කොටසක් නැහෙනහිර පළාතට ලැබෙනවා.

ගරු කන්දසාමී ප්‍රභූ මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු කන්දසාමි ප්‍රභු මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
මගේ නම සඳහන් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු කන්දසාමි ප්‍රභු මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தில் அங்கம்வகிக்கும் மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினரான என்னுடைய பெயர் இங்கு குறிப்பிடப்பட்டது. கௌரவ ஸ்ரீநேசன் அவர்கள் குறிப்பிட்டதுபோல, இந்த வரவு செலவுத்திட்டத்தில் மட்டக்களப்பு மாவட்டத்துக்கென விசேடமாக எந்தவொரு நிதி ஒதுக்கீடும் மேற்கொள்ளப்படாமல் விட்டாலும் கூட, அனைத்துத் துறைகளிலும் தேசிய மக்கள் சக்தி அரசாங்கத்தினால் நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அந்தத் துறைகளுக்கூடாக எமது மாவட்ட மக்களுக்குச் சேரவேண்டிய அனைத்துத் திட்டங்களையும் நடைமுறைப்படுத்தும் விதமாக நிதி ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது.

விசேடமாக, மிக நீண்ட காலமாக நடைமுறைப்படுத்தப் படாமல் இருந்த முந்தனையாறு திட்டத்துக்குக்கூட இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதை நான் இந்த நேரத்தில் ஞாபகமூட்ட விரும்புகின்றேன். கௌரவ அமைச்சர் அவர்கள் குறிப்பிட்டதுபோன்று, அனைத்துத் துறைகளுக்குமான நிதி ஒதுக்கீட்டின்மூலம் எமது மாவட்டத்துக்கான நிதி வந்து சேரும் என்ற எதிர்பார்ப்புடன் நான் களத்தில் இருக்கின்றேன். இதை எமது மக்களும் எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றார்கள். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු පී. රුවන් සෙනරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය 17වැනි දා නව රජයේ මංගල අය වැය මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඊයේ ඉඳලා ඒ අය වැය පිළිබඳ විවාදය ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන් අපි දකිනවා, අපේ රටට පෙබරවාරි 17 කියන්නේ ඓතිහාසික දවසක් බව. මොකද, නව ආණ්ඩුවක් බලයට පත් වෙලා මේ රට ගොඩනඟන වැඩ පිළිවෙළ සහිත අය වැයක් ඉදිරිපත් කරපු දවස. ඒ නිසා පෙබරවාරි 17වැනි දා ජනතාවට ඓතිහාසික දවසක් වේවි කියලා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම එක රැයකින් ගොඩනැඟුණු ශ්‍රේෂ්ඨ රාජ්‍යයන් මේ ලෝකයේ කොහේවත් නැති බව අපි දන්නවා. ඒ සඳහා ඉවසීම සහ විනය ඉතාම අත්‍යවශ්‍ය බව අපි විශ්වාස කරනවා. ඉතින්, දශක ගණනාවක් රැවටුණු සමාජයක් වෙනස් කරන්න කාලයක් ගත වෙනවා කියලා අපි දන්නවා. ඒක ඉක්මනට කරන්න බැහැ. අපි කවුරුත් දන්නවා, සිංගප්පූරුව නැමති රට ගොඩනඟද්දී ඒ නායකයා වසර කිහිපයක් බැණුම් ඇහුවා කියන එක. හැබැයි, ඒ රට ගොඩනැඟුවා. ඒ වාගේම තමයි ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණයෙන් පසුව, එදා ජර්මනිය පහර දෙද්දී ළඳරු සෝවියට් දේශය රැක ගන්න එම නායකයාට සමහර වෙලාවට විවිධ කාරණා නිසා ගිවිසුම්ගත වෙන්න සිද්ධ වුණා. එහෙම කරලා එදා ඒ නායකයා සෝවියට් දේශය රැක ගත්තා. ඒ වාගේම තමයි හදපු සමහර සැලසුම් අසාර්ථක වෙද්දී, ඒවා සාර්ථක කර ගන්න ඒ නායකයන් පෙලඹුණා. එහෙම තමයි රටවල් ඉස්සරහට ආවේ. එච්චර විතරක් නොවෙයි. අද දවසේ මේ විවාදය ඇතුළෙත් විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගෙන් කියැවුණා, ලංකාවට ඩෙන් ෂියාඕ පිං ඇවිල්ලා ලංකාව දිහා බලලා ගිහිල්ලා චීනය හැදුවා කියලා.

ප්‍රශ්නයක් තිබෙනවා, ඒ නායකයා ලංකාව දිහා බලලා චීනයට ගිහිල්ලා මොකද කළේ කියන එක ගැන. අද චීනය කොතැනද තිබෙන්නේ? 1977න් පස්සේ මේ දක්වා ලංකාව පාලනය කළේ මාලිමාවේ ආණ්ඩුවක් වාගේ තමයි හරියට ඒගොල්ලන් මෙතැන කථා කරන්නේ; විවාද කරන්නේ. ඒගොල්ලන් මෙතැනදි අසත්‍ය කිව්වත්, අපේ දම්මික පටබැඳි ඇමතිතුමා ඒක නිවැරදි කරලා කිව්වා, 1977න් පස්සේ අපේ රටට මොකද වුණේ කියන එක. අපේ රට චීනයේ තත්ත්වයට ගියාද, එහෙම නැත්නම් බිමටම ඇද වැටිටුවාද කියන එක ගැන දැන් ආපහු කථා කරන්න වෙයි. ගොඩක් අය දන්නවා, අපි පාලන බලය ගත්තේ රටේ ආර්ථිකය බිමටම වටිටලා තියෙද්දි කියලා. ආර්ථිකය බිමටම වටිටලා තියෙද්දි පාලන බලය අරගෙන තමයි අපි ආර්ථිකය ගොඩනඟන්න සූදානම් වෙන්නේ. අද ලෝකයේ ආර්ථික බලවතා වන මහජන චීනය 1949දී බලය ලබාගෙන ආරම්භ කරපු සැලසුම්වලින් සමහර ඒවා සාර්ථක වුණා, සමහර ඒවා අසාර්ථක වුණා, නැවත වෙනස් වුණා, ඉදිරි ගමනක් ආවා. ලෝකයේ ගොඩනැඟුණාය සැලකෙන හැම දියුණු රාජ්‍යයකම නායකයෝ ඒ සඳහා අසීමිත වශයෙන් කැපකිරීම් කළා. ඒ වාගේම ඒ ජනතාවත් ඒ සඳහා අසීමිත වශයෙන් කැප කිරීම් කළා. ඒකාධිපති බැසිස්ටාගේ පාලනයේ තිබ්බිච කියුබාව කියන පුංචි රාජ්‍යය ෆිඩෙල් කැස්ත්‍රෝ, චේ ගුවේරා වැනි අයගේ නායකත්වයෙන් සටන් කරලා නිදහස් කර ගනිද්දි එදා ආර්ථික වශයෙන් ඒ රට බිඳ වටිටලා තිබුණේ, ඉතා දූෂිත රාජ්‍යයක් බවට පත් වෙලා තිබුණේ. හැබැයි, දශක ගණනාවක් තිස්සේ ඒ නායකයෝ ආදර්ශයන් දීලා, භාවිතාවෙන් ඔප්පු කරලා, ජනතාවත් සමඟ වැඩ කරලා, ඒ ජනතාවත් අසීමිත වශයෙන් කැපකිරීම් කරලා අද කියුබාව ලෝකයේ හොඳින් බැබළෙන පුංචි රාජ්‍යයක් බවට පත් වෙලා තිබෙනවා. ආර්ථිකයෙන් පොහොසත් නොවුණාට, අනික් හැම පැත්තෙන්ම පොහොසත්, ජනතාව සතුටින් ඉන්න රටක් විධියට කියුබාව ගොඩනඟන්න ඔවුන් සමත් වෙලා තිබෙනවා. ඒ නිසා ලෝකයේ වෙනත් රටවල් සම්බාධක දමද්දි, බාධා කරද්දි ඒ රටවල නායකයන් ජනතාව එකතු කරගෙන ඒ රටවල් ගොඩනඟන්න වැඩ කළා. ඒ නිසා තමයි අද ඒ රටවල් ලෝකයේ බැබළෙන රටවල ලැයිස්තුවේ ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අලුතෙන් පාලන බලය අරගෙන මේ රට ගොඩනඟන්න, මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න, මේ රටේ ජනතාවට ලස්සන ජීවිතයක් උදා කරන්න ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයේ ඇමතිවරුන්,

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි ජනතාවත් එක්ක එකතු වෙලා වැඩ කරන්න -දැනුත් අපි එහෙම තමයි මේ වැඩ කරන්නේ- තවදුරටත් සැලසුම් හදමින් තිබෙනවා.

මේ අය අද විපක්ෂයේ හිටියාට එදා ආණ්ඩුවේ ඉඳගෙන අපට මොනවාද කිව්වේ, අපට මොනවාද නොකිව්වේ, අපට මොනවාද කළේ, අපට මොනවාද නොකළේ? අපේ මේ ව්‍යාපාරය ගොඩනඟන කටයුතු ආරම්භ වුණු මොහොතේ සිටම මේ අය අපේ ගමන නතර කරන්න හැකි හැම සැලැස්මක්ම හැදුවා. අවලාද කළා, අපවාද නැඟුවා, අසත්‍ය ප්‍රචාර යැව්වා, මර්දනය දියත් කළා, වටිනා මිනිස්සු ඝාතනය කළා. එහෙම තමයි අපි ගොඩනැඟෙන එක වළක්වන්න මේ අය සැලසුම් කළේ. අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළාට, එහෙමයි එදා සිද්ධ වුණේ. හැබැයි අපි ඉතා ඉවසීමෙන්, ඉතා පරිස්සමෙන්, කල්පනාවෙන් වැඩ කරලා, මේ ව්‍යාපාරය ගොඩනඟලා පසුගිය 2024 සැප්තැම්බර් මාසයේ 21වෙනි දා අපි ඒ ඓතිහාසික ජයග්‍රහණය ලැබුවා.

අපි අවුරුදු 59ක් මේ රටේ දේශපාලනය කරලා, අත්දැකීම් සම්භාරයක් සහිත දේශපාලන ගමන් මඟක තමයි නියැළෙන්නේ. අපි මේ රටේ ජනතාවත් එක්ක මහ පොළොවේ වැඩ කරපු මිනිස්සු. අපි පෞද්ගලිකව කිසිවක් බලාපොරොත්තුවෙන් දේශපාලනය කරන්න ආපු මිනිස්සු නොවෙයි. ඒ නිසා අපි ආණ්ඩුව අරගෙන ඉදිරිපත් කරපු පළමුවැනි අය වැයෙන්ම රටේ භාණ්ඩාගාරයට ලැබෙන ධනය, රටට ලැබෙන ධනය, කිසිවක් ඉතිරි කර ගන්නේ නැතිව ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. මීට කලින් පැවති ආණ්ඩුත් අය වැය ඉදිරිපත් කළා. මීට කලින් පැවති ආණ්ඩු ඉදිරිපත් කරපු අය වැය අපි දැක තිබෙනවා. මීට පෙර පැවති ආණ්ඩු අය වැය ඉදිරිපත් කරපු ආකාරයත් අපි හොඳින් දැක තිබෙනවා. කොහොමද ඒගොල්ලන් කළේ? මහා briefcase එකක් අරගෙන සවස 1.00ට විතර සභාවට එනවා. රාත්‍රි 8.00, 9.00 විතර වෙනකම් අය වැය කියවනවා. මේ රටේ මිනිස්සු රූපවාහිනිය ඉස්සරහ වාඩිවෙලා කල්පනා කරමින් බලාගෙන ඉන්නවා, මොනවා හරි දෙයක් ඔවුන්ට ලැබෙයි කියලා. රාත්‍රි 7.00ට, 8.00ට විතර යාන්තම් රුපියල් 20කින්, 30කින් වැටුප් වැඩි කළා කියනවා. ඔන්න, ඊට පස්සේ තමන්ගේ පාක්ෂිකයන්ට කියනවා, රතිඤ්ඤා පත්තු කරපල්ලා කියලා. රුපියලකින් බදු අඩු කරලා, රුපියල් 25කින්, 30කින් තවත් බද්දක් වැඩි කරනවා. රුපියලකින් බදු අඩු කරපු එකට තමන්ගේ පාක්ෂිකයන්ට කියනවා, දැන් රතිඤ්ඤා පත්තු කරපල්ලා කියලා. ඒ කියන්නේ, ඒ අය වැයේ මොකක්ද තිබුණේ? තමන් සවල්වලින් බෙදාගෙන, ජනතාවට කන්හැන්දෙනුත් භාගයක් බෙදන අය වැයක් තමයි මේ අය ඉදිරිපත් කළේ. හැබැයි, අපි අය වැයක් ඉදිරිපත් කළා. දැන් ඒක ගැන විවාද කරනවා.

මේ ඉදිරිපත් කරපු අය වැය පිළිබඳව දැන් විපක්ෂයට මොනවාද කියන්න තිබෙන්නේ? ඔවුන් මේ අය වැය දිහා කට ඇරගෙන බලාගෙන හිටියා. අය වැයක් ඉදිරිපත් කරලා අවසන් වුණාම විපක්ෂයේ මන්ත්‍රීවරු හරිම කැමැතියි, මාධ්‍ය ඉස්සරහට යන්න. ඊයේ අපි දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරු මාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා කථා කරනවා ද, මාධ්‍ය මඟ හැර යනවා ද කියලා. අපිත් පස්සෙන් ගියා බලන්න. විපක්ෂයේ මන්ත්‍රීවරුන් පැනලා දුවන හැටි අපි දැක්කා. උත්තර දෙන්න තිබ්බිව අමාරුව අපි දැක්කා. ඔවුන් මොනවාද කිව්වේ? සමහර මන්ත්‍රීවරු කිව්වා, මේක IMF එකේ අය වැයක් කියලා. සමහර අය කිව්වා, මේක හොඳයි; අවුලක් නැහැ; ත්‍රිපෝෂ ටිකට සල්ලි දාලා කියලා. හැබැයි, මීට කලින් මේ අය මොනවාද කිව්වේ? ත්‍රිපෝෂ කොමිපැනිය වහනවා කිව්වා. මාලිමා ආණ්ඩුවේ සැලැස්ම ඒකයි කිව්වා. ඒ නිසා කට ඇරගෙන බලාගෙන හිටියා, මේ අය වැයට විරුද්ධව විවේචන ඉදිරිපත් කරන්න. හැබැයි, කියන්න කිසිවක් නැහැ. අද ඒ අය අසරණ වෙලා. මේ විවාදයේදී විපක්ෂයට විනාඩි 45ක් දෙනවා, පළමුවැනි කථාවේදීම මොකද වුණේ? මොනවාද අර කිව්වේ? කියාගන්න දෙයක් නැහැ. ඔහේ විකාර දොඩවනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය.

නැහෙනහිර පළාතේ මන්ත්‍රීවරයෙක් තමන්ගේ පළාතට මොකුත් නැහැ කියලා මේ අය වැය කථාව ඇතුළත් පොත දෙපාරක් මෙසය උඩ ගහනවා මම දැක්කා. මේ අය වැය ඉදිරිපත් කරන්නේ නැහෙනහිර පළාත වෙන් කරලා නොවෙයි. මේ අය වැයේ සෑම වාක්‍යයක් පාසාම රට පිළිබඳව සඳහන් කරලායි ඉදිරිපත් කර තිබෙන්නේ. එහෙම නැතිව මේ අය වැයේ හැම වාක්‍යයකින්ම මේකේ නැහෙනහිරට මොකුත් නැහැ; මේකේ නැහෙනහිරට මොකුත් නැහැ කියලා වෙන් කර නැහැ. මේ අය වැය රට වෙනුවෙනුයි ඉදිරිපත් කළේ. ඒ නිසා මේ රට ඇතුළේ දැන් උත්සාහ කරනවා, නැහෙනහිරට මොකුත් නැහැ, මුස්ලිම් ජනතාවට මොකුත් දුන්නේ නැහැ කියලා ජාතිවාදී පදනමින් මත ඉදිරිපත් කරන්න. අපි මේ ඉදිරිපත් කළේ නව අය වැයක්. ඒ, මේ රට හදන්නයි. මේ සඳහා අපි පටි තද කරගෙන ආදර්ශයක් දීලා තිබෙනවා, අපේ නායකයෝ ආදර්ශයක් දීලා තිබෙනවා. මේ රටේ ජනතාව පුබුදුවාලන්න, මේ රට නැවත ගොඩ නඟන්න, බලාපොරොත්තු බිඳ වැටිච්ච ජනතාවට බලාපොරොත්තු ඇති කරන්න මේ අය වැය අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා මේක තමයි අපේ අරමුණ. සමහරු කියනවා, system change එකක් නැහැ කියලා. ඔව්, කලබල වෙන්න එපා. මේක තමයි system change එක කියලා අපි මේ මොහොතේ පැහැදිලිවම කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.01]

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේක ඓතිහාසික මොහොතක්. මේක ලංකා ඉතිහාසයේ පළමු ජනතාවාදී ආණ්ඩුවක පළමු ජනතාවාදී අය වැය.

මේ ආණ්ඩුව පත් කර ගන්න රටේ සෑම ක්ෂේත්‍රයකම ජනතාව විශාල කැප කිරීමක් කළා. විශේෂයෙන්ම තරුණ පරම්පරාව ඒ වෙනුවෙන් ලොකු දායකත්වයක් ලබා දුන්නා. මෙවර අය වැයෙන් තරුණ තරුණියන් වෙනුවෙන් වාගේම, රටේ ජාතික අවශ්‍යතාවලට අනුකූල වන ව්‍යාපෘති සඳහා කරපු දායකත්වය පිළිබඳව කරුණු දක්වන්න අද මම අදහස් කරනවා.

වයස අවුරුදු 18ත්, 35ත් අතර පිරිස අපි තරුණයන් ලෙස හඳුන්වනවා. පසුගිය අවුරුදු 5 ඇතුළත ජීවන වියදම ශීඝ්‍ර ලෙස ඉහළ ගියත්, විශ්වවිද්‍යාල සිසුන්ට ලැබෙන ආධාරවල කිසිදු වැඩි වීමක් සිද්ධ වුණේ නැහැ. නමුත් මෙවර අය වැයෙන් ඒක වෙනස් කරන්න අපට පුළුවන් වුණා. අධ්‍යාපනය ලබන තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනයේදී ලබා දෙන ශිෂ්‍යාධාරය රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වාත්, මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වාත් වැඩි කරන්න මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා. ඒ වාගේම වෘත්තීය පුහුණුව ලබන ශිෂ්‍යයන්ට ලබා දෙන ආධාර මුදල රුපියල් 4,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කරන්නත් කටයුතු කර තිබෙනවා.

[ගරු ලසිත් භාෂණ ගමගේ මහතා]

තරුණ තරුණියන් වෙනුවෙන් තිබෙන තරුණ සේවා සභාවේ මුදල් රුපියල් මිලියන සිය ගණන් වියදම් කරමින් තරුණයන්ගේ ඡන්ද ගන්න සංගීත සන්දර්ශන පවත්වපු ආණ්ඩු අපි දැක්කා. ඒ වෙනුවට, මෙතෙක් මේ රට පාලනය කරපු ආණ්ඩුවලින් අත්හැර දමා සිටි අපේම සහෝදර සහෝදරියන්ට, මලයගම් තරුණ තරුණියන්ට වෘත්තිය පුහුණුව ලබා දෙන්න මේ අය වැයෙන් රුපියල් මිලියන 2,450ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, තරුණ කෘෂි ව්‍යවසායකයන් සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා කියලා ජනාධිපතිතුමාගේ මංගල අය වැයේදී සඳහන් කළා. මේ අය වැය ලේඛනයේ එම කොටස කියවද්දී ඇත්තටම මම, මගේ අතීතයට ගියා. මේ විෂයය ගැන මට පෞද්ගලික අත්දැකීමක් තිබෙනවා. මමත් මේ රටේ සාමාන්‍ය තරුණයකු විධියට මගේ ජීවිතය ගොඩනඟා ගන්න කටයුතු කරමින් සිටියා. 2020 වසරේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරලා, කෘෂි ගොවිපොළක් පටන් ගනිද්දී අමිහිරි අත්දැකීම් ගණනාවකට මුහුණ දෙන්න මටත් සිදු වුණා. අලුතින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට එන තරුණයකු විධියට මට පැනනැඟුණු ගැටලු දෙකක් තිබුණා. එකක් ඉඩම. අනෙක මුදල්. එවකට ලංකාවේ කිසිදු ඉඩම් ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. තිබුණු ඉඩම් සැලැස්ම අක්‍රමවත්. මා විසින් තෝරා ගත් ඉඩමක් නිරවුල් කර ගන්න එක් අවස්ථාවක මම ඉඩම් අමාත්‍යාංශයට ගියා. එතැන ඉඩම් ඇමතිවරයාත් සිටියා. මම මේ වෙලාවේ එතුමාගේ නම සඳහන් කරන්නේ නැහැ. මොකද, මෙතැන ඒ වාගේ අයගේ නම් සඳහන් කරලා වැඩක් නැහැ. කොහොම හරි මට මුලින්ම හමු වුණේ ඔහුගේ ලේකම්වරයෙක්. ඔහු පළමුවෙන්ම ඇහුවා, connection එකකින්ද ආවේ කියලා. මම කිව්වා, එහෙම connection එකකින් නොවෙයි ආවේ කියලා. ඊට පස්සේ මගේ project proposal එක භාර දුන්නා. නමුත් ඒක අතටවත් ගත්තේ නැහැ. පසුව වෙනත් ලේකම්වරයෙක් වෙත මා යොමු කළා. මම එතුමාත් එක්කත් කථා කරලා, මට මෙන්න මෙවැනි කාරණයක් ඉෂ්ට කර ගන්න තිබෙනවා කියලා project proposal එකත් අතට දීලා ඇහුවා, දැන් මොකක්ද කරන්න පුළුවන් කියලා. ඒත් කිසිදු උපදෙසක් නැහැ. අඩුම තරමින් project proposal එකේ එක පිටුවක්වත් දිග හැරියේවත් නැහැ. ඊට සති තුනකට විතර පස්සේ මම TV එකෙන් දැක්කා, අපේ රටේ කෘෂි කර්මාන්තය විනාශ කරපු ජනාධිපතිවරයෙක් එක්ක කෘෂි ව්‍යවසායකත්වය සම්බන්ධයෙන් වූ සාකච්ඡාවකටත් ඒ පිරිසම සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ වෙලාවේ මට හිතුණා, මොකක්ද මේ විහිළුව කියලා. ඇත්තටම තරුණයකු විධියට ඒ වෙලාවේ මේ දේශපාලන සංස්කෘතිය, ඒ වාගේම රාජ්‍ය යන්ත්‍රණයේ ඉහළ පෙළ පිළිබඳව මට පැනනැඟුණු චිත්‍රය පොදුවේ සියලු තරුණ තරුණියන් තුළ ඇඳෙන චිත්‍රයමයි කියලා මා විශ්වාස කරනවා.

මේ අය වැය නියමාකාරයෙන් කළමනාකරණය කරන්න, මේ ව්‍යාපෘති කරවන්න රාජ්‍ය නිලධාරීන්ට විශාල කාර්යභාරයක් පැවරෙනවා. මෙම ව්‍යාපෘති සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මීට පෙර කථා කරපු සජබය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් කිව්වා, මෙච්චර මුදලක් වියදම් කරන්න බැහැ, මේක තමයි යථාර්ථය කියලා. නමුත් කාර්යක්ෂමව සහ නිවැරදි කළමනාකරණයකින් යුතුව කළොත් මෙම මුදල වියදම් කරන්න පුළුවන්.

මේ රටේ ජනතාව දැන් වෙනස් වෙලා ඉන්නේ. එදා තිබුණු ආකල්ප දැන් වෙනස් වෙලා තිබෙන්නේ. මේ රටේ දේශපාලන සංස්කෘතිය දැන් වෙනස් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ ව්‍යාපෘති නියාමාකාරයෙන් කාර්යක්ෂමව ඉටු කරන්න අවශ්‍ය සහාය රාජ්‍ය නිලධාරීන්ගෙන් ලැබෙයි කියාත් මා විශ්වාස කරනවා. එදා මම තනියෙන් අක්කර 20ක්, 25ක් වගා කළත්, මේ වෙද්දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මේ රටේ ජනතාව නියෝජනය කරමින් ඇවිල්ලා ඉන්න ජනතා නියෝජිතයකු විධියට, සියලු ගොවීන්ගේ කෘෂි කාර්මික කටයුතු වෙනුවෙන් හඬක් නහන්න, වැඩ කරන්න මට අවස්ථාවක් ලැබී තිබෙනවා. ඒ ගැන මම ඇත්තටම නිහතමානීව ආඩම්බර වෙනවා. විශේෂයෙන්ම මම නියෝජනය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ආසනයේ විතරක් කුඹුරු අක්කර 4,500ක වාගේ ප්‍රමාණයක් තිබෙනවා. අපි තීරණයක් ගත්තා, එම විමධ්‍යගත අරමුදල ගම්පහ ආසනයේ, දිස්ත්‍රික්කයේ කෘෂි කාර්මික ආර්ථිකය ශක්තිමත් කරන්නත්, ගම්පහ දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වය කළමනාකරණය කරන්නත්- ඒක වඩා වැදගත්- ඊට අදාළව තිබෙන සියලු සුළු වාරිමාර්ග සංවර්ධන කටයුතු කරන්නත් යොදවන්න. ඒ තීරණය ඇත්තටම රටේ නිෂ්පාදන ආර්ථිකය දියුණු කිරීමට යන ගමනට දැවැන්ත පිටුවහලක් වෙනවා කියලා මා විශ්වාස කරනවා.

ඒ වාගේම, මේ සියලු ව්‍යාපෘති ගම දක්වා ගෙන යන්න දැවැන්ත රාජ්‍ය යන්ත්‍රණයක් තිබෙනවා. ඊට අවශ්‍ය ගමේ නිලධාරීන් ඉන්නවා; ක්ෂේත්‍ර නිලධාරීන් ඉන්නවා. ගමේ ජනතාවත් එක්ක ගැටෙන, ඒ ගමේ ගැටලු දන්නා නිලධාරීන් ඉන්නවා. ඔවුන්ට ඒ වෘත්තිය තෘප්තිමත්ව කරගෙන යන්න අවශ්‍ය වටපිටාව මේ අය වැයෙන් අපි යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වැටුප මෙවර අය වැයෙන් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ග්‍රාම නිලධාරීන්ගේ, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ, සමෘද්ධි නිලධාරීන්ගේ වාගේම සංවර්ධන නිලධාරීන්ගේ වැටුප වැඩි කරන්න යෝජනා කරලා තිබෙනවා. ඒ එක්කම රාජ්‍ය සේවයට අලුතින් 30,000ක් බඳවා ගන්න අවශ්‍ය කටයුතු කරන්නත් මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ අවස්ථාව තරුණයන්ට ලැබෙන්න නියමිතයි. ක්‍රමයේ වෙනසක් වෙනුවෙන්, සැබෑ වෙනසක් වෙනුවෙන් මේ ජනතාවාදී ආණ්ඩුව පත් කර ගන්න කැප වුණු තරුණ පරම්පරාවක් අපේ රටේ ඉන්නවා. දැන් ඔවුන්ට අවස්ථාවක් ලැබී තිබෙනවා, රාජ්‍ය සේවය තුළ ඔවුන් බලාපොරොත්තු වුණු ඒ වෙනස ඇති කරන්න. කිසිම දේශපාලන බලපෑමකින් තොරව විද්‍යානුකූලව හඳුනා ගත්ත පුරප්පාඩු සඳහා සාධාරණ ක්‍රමයකට ඉල්ලුම් කිරීමේ හැකියාව අපි ඒ තරුණ තරුණියන්ට ඇති කර දීලා තිබෙනවා. මීට පෙර තිබුණා, උස නම් එහෙමයි, මිටි නම් මෙහෙමයි කියලා jobs බෙදපු කාලයක්. ඒ සංස්කෘතිය අපි නවත්වලා තිබෙනවා.

Clean Sri Lanka ව්‍යාපෘතිය ගැනත් මම කියන්න ඕනෑ. Clean Sri Lanka ව්‍යාපෘතිය ගැන අපි ඇත්තටම මීට පෙරත් විවාදයක් කළා. Clean Sri Lanka ව්‍යාපෘතිය වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 5,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. එතැනත් අපට ලොකු අභියෝගයක් තිබෙනවා කියලා මම හිතනවා. මොකද, ඒක දැවැන්ත මුදලක්. ඒ නිසා Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ නිසියාකාරව, කළමනාකරණය කරමින් ඒ මුදල් යෙදවීමේ අවශ්‍යතාව තිබෙනවා. මමත්, අපේ ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමාත්, ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්දියාවේ තිබුණු BIMSTEC තරුණ සමුළුවට සම්බන්ධ වුණු අවස්ථාවේදී සාකච්ඡාවක් ඇති වුණා. ඉන්දියාවේත් තිබෙනවා, "Viksit Bharat" කියලා මෙවැනි ව්‍යාපෘතියක්. අපි ඒ වෙලාවේ ඔවුන්ගෙනුත් ඇහුවා, ඒ ව්‍යාපෘතිය ඉන්දියාවේ ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා. අපි ඉදිරියට බලාපොරොත්තු වෙනවා, ඔවුන් එක්ක ඒ ගැන සාකච්ඡා කරන්න. දැවැන්ත වැඩ කොටසක් කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් තමයි මේ Clean Sri Lanka ව්‍යාපෘතිය. මම හිතනවා, වර්ෂය පුරාම ඒ මුදල නිසියාකාරව කළමනාකරණය වෙයි කියලා.

ඒ වාගේම අපි මේ අය වැය ගෙනෙන්නේ මේ රට බංකොලොත් බවින් මුදාගෙන, පළමුවැනි අය වැය විධියටයි. මේ රට ගොඩනඟන්න පටන් ගන්නේ, මෙච්චර කාලයක් රට පාලනය කරලා බංකොලොත් රටක් අපට භාර දුන්නාට පසුවයි. ඒක කවුරුවත් අමතක කරන්න අවශ්‍යතාවක් නැහැ. මේ රටට අවශ්‍ය මූල්‍ය විනය අපි මේ අය වැයේදී පෙන්වලා තිබෙනවා. විවේචනය කරන්නත් විපක්ෂයට ක්‍රම දෙකක් තිබෙනවා. අපි කියනවා, constructive criticism සහ destructive criticism කියලා. ඒ නිසා මේකේ තිබෙන අනවශ්‍ය වියදම මොකක්ද කියන්න. වැඩිපුර මුදලක් වෙන් කරලා තිබෙන්නේ මොකකටද කියලා කියන්න. මේ ආදායම හොයන එකේ ගැටලුවක් තිබෙනවා නම් ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න. එහෙම නැතුව ඉවක් බවක් නැතුව ඔහේ කෑ ගහන එක නොවෙයි වෙන්න ඕනෑ. හැබැයි, විපක්ෂයට තිබෙන ලොකුම ගැටලුව වාහන පර්මිට් එක නැති කරපු එක කියායි මට නම් හිතෙන්නේ. ඒ වාගේම විපක්ෂයේ ඉන්න මේ න්‍යායාචාර්යවරු එතුමන්ලා කියවන පොත්වල, අපේ ආණ්ඩුවේ ආර්ථික මොඩලය මොකක්ද කියලා හොයා ගන්න බැරිව දහලන බවකුත් අපට පෙනෙනවා.

මම හිතන්නේ ඒ ප්‍රශ්නයත් තිබෙනවා. එහෙම නැතිව අය වැය සම්බන්ධයෙන් නොවෙයි ගැටලුව තිබෙන්නේ. මේ අය වැය මේ කාලයට සාපේක්ෂව, රටේ ආර්ථිකයට සාපේක්ෂව ගෙනාපු ඉහළම තත්ත්වයේ අය වැයක්. මේ අය වැය අනුව වැඩකටයුතු කළාම මේ රට විශාල පියවරකින්, පිම්මකින් ඉදිරියට ගත හැකි වේ යැයි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන් ආර්ථික හා සමාජයීය අංශයෙන්. මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්ඩලික කුලුක්කළින් පිරිත්ත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

Order, please! මෙම අවස්ථාවේදී, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික සට්ටත්තරණි සුනිල් වට්ටකල - පොතුමක්කළ් පාතුකාප්පු මර්‍රුම් පාරාළුමන්ර අලුවල්කළ් පිරිත් අමෙච්චර්)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් "ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(මාණ්ඩලික ඉහෙක්ටර් අප්පුහාමි)
(The Hon. Hector Appuhamy)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 4.12]

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයේ ප්‍රථම ජනතාවාදී, ඓතිහාසික අය වැය ගැන කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෙම අය වැය ගැන විශේෂයෙන් උගත්, බුද්ධිමත්, බහුශ්‍රැත යැයි හිතාගෙන ඉන්න මහත්වරුන්ගේ උඩුබිරීම්වලට අපි කලබල වෙන්නේ නැහැ. මේ පිළිබඳව අපේ සමාජ ව්‍යවහාරය තුළ තිබෙනවා යම් උපමා. මේ අය වැය පිළිබඳ විපක්ෂයේ සමහර උදවිය -අර මම කලින් කියපු විධියේ අය- හැසිරෙන ආකාරය දිහා බැලුවාම තමයි මට ඒ උපමා මතක් වෙන්නේ.

"බල්ලෝ බුරති එහෙත් ගහ ගලා බසී"; "බල්ලෝ බුරති සඳ බැබළෙති" වාගේ දේවල් අපට මතක් වෙනවා. ඒ වාගේම "බල්ලෝ බිරුවට කඳු පහත් වෙන්නේ නැහැ" යනුවෙන් කියමනක් තිබෙනවා. එවැනි උපහැරණ මතක් වෙන්නේ ඔබතුමන්ලාගේ ඒ භාවිතාව නිසායි.

අපි ඕනෑම ධනාත්මක විවේචනයක් භාර ගන්න ලෑස්තියි. හැබැයි බොරු විවේචන කරමින්, කුහකත්වයෙන් පිරුණු අදහස්වලින් හිත් පුරවාගෙන, හිතේ එකක් තියාගෙන, රටට සමාජයට තවත් දෙයක් මවා පෙන්වන්න උත්සාහ කිරීම පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ වාගේම, තවදුරටත් එළියේ සමාජයේ මේ සාම්ප්‍රදායික වැරදි, යල් පැන ගිය දේශපාලන මතවාද ඔළුවේ තියාගෙන ඉන්න කිහිප දෙනෙකුත් මේ විවේචන කරන්න ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් අපි කනගාටු වෙනවා. මේක රනිල්ගේ අය වැයක් ලු; සජබයේ දිගුවක් ලු; IMF එක, ලෝක බැංකුව කියන විධියට හදපු අය වැයක් ලු. අනේ, පව්! අපේ ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා මේ අය වැය බිහි වූ විධිය ඉතා පැහැදිලිව කියලා තිබෙනවා. මේ පොත කියවලා බලන්න. එහි 48වන පිටුවේ එතුමා මෙසේ කියා තිබෙනවා:

"...මෙම අය වැය ප්‍රකාශය බිහි වූයේ අපේ රටේ ඉතිහාසය අලුතින් හැඩගැස්වීමේ අවස්ථාවට දායක වූ ඉමහත් කැපවීමක් ඇති, අනුග්‍රහශීලී නිලධාරීන් හා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අත්දැකීම්වලින්. ඒ වාගේම තමන්ගේ වෘත්තීය ජීවිතය තුළ කීර්තිමත් වූ, දේශප්‍රේමී වෘත්තිකයින්ගේ ආත්ම විශ්වාසය හා ධෛර්යයෙන්. ඔවුන් ඉතිහාසයේ පළමු වතාවට පිරිසිදු, ක්‍රියාකාරී සහ හෘදයංගම බවින් පිරි පාලනයකට දායක විය හැකි බව දැඩිව විශ්වාස කරනවා..."

[ගරු වසන්ත පියතිස්ස මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමා තවදුරටත් මෙසේ කියා තිබෙනවා:

" ඔබ මෙම රජයේ පෙළගැස්ම දෙස බැලුවහොත්, ඔබට පෙනෙනු ඇත්තේ වඩාත්ම උද්‍යෝගශීලී හා විනයගරුක දේශපාලකයින් සහ තමන්ගේ වෘත්තීය ජීවිත, පවුල් සමඟ ගත කළ යුතු කාලය හා ව්‍යාපාරික උරුමය පවා තම රට වෙනුවෙන් කැපකළ, වඩාත්ම කීර්තිමත් විද්වතුන් හා වෘත්තිකයින්ගේ මිශ්‍රණයක්. අපි සියලු දෙනා එක්ව, දීර්ඝ අධිෂ්ඨානශීලී ගමනක් ආරම්භ කොට තිබෙනවා...."

ඒකයි කලබල. උගත්, බුද්ධිමත් විපක්ෂයේ මහත්වරුනි, ඔබ කලබල නොවුණොත් තමයි අපි පුදුම වෙන්නේ. ඇයි? මේ වර්තමාන රජය දීර්ඝ අධිෂ්ඨානශීලි ගමනක් ආරම්භ කොට තිබෙනවා. ඒ වාක්‍යයේ දේශපාලන විග්‍රහය පිළිබඳව අපට පොතක් ලියන්න තරම් අදහස්, කරුණු තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දවස පුරාමත්, ඊයේත් මේ අය වැය ලේඛනය පිළිබඳව බොහෝ අදහස් - උදහස් පළ වෙලා තිබෙනවා. ඒ අතරතුර යම් අදහස් කිහිපයක් පළ කරන්න අපිත් බලාපොරොත්තු වෙනවා. අපට මඩ, අවලාද නඟන අයගෙනුත්, ඒ වාගේම, මේ රටේ ආදරණීය ජනතාවගෙනුත් මම ඉල්ලා සිටිනවා, විවිධ මාධ්‍යවලින් ගහන මඩ, අවලාද දිහා අවධානය යොමු නොකර උගත්, බුද්ධිමත්, බහුශ්‍රැත යැයි කියාගෙන ඉන්න, හිතාගෙන ඉන්න මහත්වරුන්ගේ ඒ වදන්වලට සවන් නොදී, ජනාධිපති ගරු අනුර දිසානායක මහත්මයා මොනවාද කිව්වේ කියලා ඒ අය වැය කථාව සහිත පොත කියවා බලන්න කියලා. එවිට ඔබට සත්‍ය පැහැදිලි වනු ඇත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම ගැන බොහෝ සාවද්‍ය මත, වැරැදි - විකෘති මත ඉදිරිපත් වුණා. මම ඒ හැමෝටම එක උත්තරයක් දෙනවා. ජනාධිපතිතුමාගේ අය වැය කථාව පොතේ 43 සහ 44 පිටු කියවන්න. 43වන පිටුවේ සඳහන් වෙනවා, "මෙම වැටුප් වැඩිවීමේ සමස්ත ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 325ක් වනු ඇත" යනුවෙන්. රුපියල් බිලියන 325ක්. ඒ කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් කෝටි 32,500ක් වෙන් කරලා තිබෙනවා මේ වසර තුනට. පළමු වසර තුළදී රාජ්‍ය සේවකයන්ගේ අතට කොච්චර මුදලක් ලැබෙනවාද? රුපියල් බිලියන 110ක්. මේක බොරුවක්ද? රුපියල් බිලියන 110ක් කියන්නේ රුපියල් කෝටි 11,000ක්. තවදුරටත් විග්‍රහ කරනවා නම් මේ වැඩි කරපු විධිය, ආකාරය, ආකෘතිය, කොටස් වශයෙන් වෙන් කරපු විධිය තේරෙන්නේ නැත්නම්, ඒක මූලධර්මයක් විධියට අපි හිතුවොත් රුපියල් කෝටි 11,000ක් මේ වසර ඇතුළතදී තම තමන්ගේ දිස්ත්‍රික්කවල එක්කෝ ලංකා බැංකුවට, එක්කෝ මහජන බැංකුවට එනවා. ඒ කියන්නේ අතිවිශාල මුදලක්.

ඔබට බලාගන්න පුළුවන්, එහි ආරම්භක වැටුප අප්‍රේල් මාසයේදී ඔබගේ පඩිපතට වැටෙනවා. එතකොට වැටුප් කොයි තරම් ප්‍රමාණයකින් වැඩි වුණාද කියලා බලාගන්න පුළුවන්. ඊළඟ වසරේදීත් ඒ විධියට ලැබෙනවා. එතකොට දැන ගන්න පුළුවන්කම තිබෙනවා, මේක ඇත්තක්ද බොරුවක්ද කියලා. මේවා ලියලා තිබෙන්නේ. මේවා බොරු නොවෙයි. මේවා පොතේ print කරලා තිබෙනවා; අනෙකුත් ලේඛනවල සඳහන් කරලා තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය සේවකයන්ගේ ආපදා ණය සීමාව රුපියල් ලක්ෂ දෙකහමාරේ සිට රුපියල් ලක්ෂ හතර දක්වා වැඩි කරලා තිබෙනවා. වැටුප් වර්ධකය සියයට 80කින් වැඩි කරලා තිබෙනවා.

අපේ උගත්, බුද්ධිමත් යැයි කියා ගන්නා මහත්වරු කිව්වා, "මේ අය වැයට දැක්මක් නැහැ ලු. මේ අය වැයට අරමුණක් නැහැ ලු. ඉලක්කයක් නැහැ ලු. පන්සල මාරු වෙලා ලු. පල්ලිය මාරු වෙලා ලු. මේ අය වැය හාමුදුරුවෝ පල්ලියට බණ කියනවා වාගේ ලු." නමුත් මේක කියවලා බලන්න කුහක නැතුව. ඉස්සරහ පේළියේ හිටියා, ආර්ථික ඔස්තාර්ලා දෙන්නෙක්. එතුමන්ලා උදේ ඉඳන් මේ සභාවේ පෙනෙන්න නැහැ. කොහේ හරි ඉඳන් අහගෙන ඉන්නවා නම් මේක අහගන්න තමුන්නාන්සේලා. මේ පොත කියවලා බලන්න. නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, පුළුල් කිරීම අපේ ආර්ථිකයේ ප්‍රධාන දැක්ම.

අතිශයින් පළල් නිෂ්පාදන කාර්යයකට අපි යන්න ඕනෑ. මේ රට සංවර්ධනය කරනවා නම් ඒක අපේ පළමුවැනි ප්‍රතිපත්තිය; පළමු අරමුණ. දෙවැනි කාරණය, ඒ සඳහා ජනතාවගේ සහභාගිත්වය. ඈත එපිට දුෂ්කර ගම්මානවල අතිවිශාල ජනතාවක් -ලක්ෂ ගණන්, මිලියන ගණන්- මේ රටේ ආර්ථිකයෙන් පිටමං කරලා, රාජ්‍යයේ හවුහරණක් නැතුව, ආණ්ඩුවල හවුහරණක් නැතුව, මැති ඇමතිවරුන්ගේ හවුහරණක් නැතුව ඔහේ ජීවිත ගෙවනවා. ඒ ජනතාවට ජීවයේ හුස්ම පිඹින්න ඕනෑ. ඒ ජීවයේ හුස්ම පිඹින අය වැයක් මේක. ඒ නිෂ්පාදන ක්‍රියාවලියට ජනතා සහභාගිත්වය ඇති කරන්නා වූ අය වැයක් මේක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොච්චර නිෂ්පාදන කටයුතු කළත් වැඩක් නැහැ, කොච්චර සල්ලි හෙව්වත් වැඩක් නැහැ, රටක රාජ්‍ය ධනය සාධාරණ ලෙස සමාජය පුරා බෙදී යන්නේ නැත්නම්.

ගොවියාගේ පංගුව ගොවියාට යන්න ඕනෑ, කම්කරුවාගේ පංගුව කම්කරුවාට යන්න ඕනෑ, ධීවරයාගේ පංගුව ධීවරයාට යන්න ඕනෑ. ඒ වාගේම පාසල් දරුවන්ගේ පංගුව පාසල් දරුවන්ට යන්න ඕනෑ, වැඩිහිටි ජනතාවගේ පංගුව වැඩිහිටි ජනතාවට යන්න ඕනෑ, ආබාධිත දරුවන් ඇතුළු ආබාධිත ප්‍රජාවගේ පංගුව ඔහුට, ඇයට යන්න ඕනෑ. ඒ ආදි වශයෙන් ඒ සියලු ජනතාවට ඒ ප්‍රතිලාභ සාධාරණව බෙදෙන්න ඕනෑ. ඔය කියපු මූලික තේමා තුන තමයි අපේ මේ අය වැයේ මූලධර්ම බවට පත් වෙලා තිබෙන්නේ. විපක්ෂය ඒවා දකින්නේ නැහැ. ඒ අයට ඒවා පෙනෙන්නේ නැහැ. දැක්කත් ඒවා මත නොවෙයි එතුමන්ලා පදනම් වෙලා ඉන්නේ.

අපි රජය විධියට 2025 වර්ෂයේදී භාණ්ඩ හා සේවා අපනයනයෙන් ඩොලර් බිලියන 19කට ආසන්න වාර්තාගත ඉහළ යෑමක් අපේක්ෂා කරනවා. අපට ඒ සඳහා වන විශාල වැඩ පිළිවෙළක් තිබෙනවා. හැම ක්ෂේත්‍රයක් වෙනුවෙන්ම මැදිහත් වෙමින්, ඒවාට අදාළ අපනයනය සඳහා අපි මැදිහත් වෙනවා. අපි දන්නවා, මේ රටේ සමස්ත අපනයන ආදායමින් සියයට 90ක් තිබෙන්නේ පුද්ගලයන් 400 ගණනක් අතේ බව. නමුත්, ඈත ගම්බිම්වලින් ලෝක වෙළෙඳ පොළට යවන්න පුළුවන් බොහෝ නිෂ්පාදන තිබෙනවා. එම නිෂ්පාදන සඳහා ගොවි ජනතාව, ධීවර ජනතාව, තරුණ ව්‍යවසායකයන් සම්බන්ධ කරගෙන ඔවුන් අතටත් අපනයන ආදායම ලැබෙන ක්‍රමයක් සකස් කිරීම සඳහා අපට දැක්මක් තිබෙනවා; වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ අනුව තමයි ඩොලර් බිලියන 19ක ඉතිහාසගත ආදායමක් අපි බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජය සතු භාවිත නොකරන ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ඵලදායී ලෙස භාවිත කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා විශාල වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. අපේ සංචාරකයන්ගේ ගමනාන්තය මීට වඩා අර්ථවත් කරන්න අගය එකතු කරමින්, ඔවුන්ගේ ගමනාන්ත වෙනස් කරන්න සැලසුම් සකස් කර තිබෙනවා. ඒ සඳහා ද මේ අය වැය තුළ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

නැහෙනහිර පළාතේ අපේ සමහර මන්ත්‍රීවරු කරුණු ඉදිරිපත් කළා නැහෙනහිර පළාතට මොකුත් නැහැ කියලා. ඇත්තටම එහෙම අදහස් දැක්වීම ඒ තරම් නිවැරදි නැහැ කියලා අපි හිතනවා. පළාත අනුව, ගම අනුව, ජාතිකත්වය අනුව, ආගම් අනුව එසේ කථා කිරීමත් එච්චර සුදුසු නැහැ. නමුත්, උතුර කියන්නේ, අතිශයින් විශේෂ සහ සංවේදී පළාතක්. ඒ නිසා යම් යම් විශේෂ මැදිහත්වීම් සිදු කර තිබෙනවා.

නැහෙනහිර පළාත නියෝජනය කරන අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දැන් මෙතැන ඉන්නවා. ඔබතුමන්ලා දන්නවා, ඉන්දියානු ආධාර යටතේ රුපියල් මිලියන 3,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් නැහෙනහිර පළාතට ලැබිලා තිබෙන බව. ඒ බව තමයි ගරු ජනාධිපතිතුමා මතක් කළේ. ඒ වාගේම පළාත් සභා යටතේ නැහෙනහිර පළාතේ සියලු සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 3,000කට අසන්න මුදලක් ලැබිලා තිබෙනවා.

කෘෂි කර්මාන්තය, වාරිමාර්ග පද්ධතිය වැඩි දියුණු කරන්න අද විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ යටතේ පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 35,000ක්, ප්‍රමාණවත් වී ආරක්ෂිත සංචිතයක් සඳහා රුපියල් මිලියන 5,000ක් හා මුං, කවුපි, බඩ ඉරිඟු, සෝයා, රතු ලූනු ඇතුළු තෝරාගත් භෝග නිෂ්පාදනය සඳහා රුපියල් ලක්ෂ 5,000ක් වෙන් කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු වසන්ත පියතිස්ස මහතා
(මාණ්පුමිකු වසන්ත පියතිස්ස)
(The Hon. Wasantha Piyathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩියක කාලයක් දෙන්න.

තරුණ ව්‍යවසායකයන්ට නිෂ්පාදන සමුපකාර සමිති බිහි කිරීම සඳහා උදව් කිරීමට රුපියල් ලක්ෂ 1,000ක් වෙන් කරලා තිබෙනවා. කිරි නිෂ්පාදනය සඳහා රුපියල් ලක්ෂ 25,000ක් ද, වාරිමාර්ග අංශය දියුණු කරන්න රුපියල් මිලියන 78,000ක් හෙවත්, රුපියල් ලක්ෂයේ මිටි 780,000ක් වෙන් කර තිබෙනවා. ඒවාත් නැහෙනහිර පළාතට එනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම ගල්ඔය, රාජාංගනය, මින්නේරිය, හුරුළු වැව ආදී යෝජනා ක්‍රමවල පහළ සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ 20,000ක් වෙන් කරලා තිබෙනවා. දිගාමඩුල්ලේ ගල්ඔය ව්‍යාපාරයෙන් සිංහල, දෙමළ හා මුස්ලිම් කියන අපි කවුරුත් ප්‍රයෝජන ලබනවා. රුපියල් ලක්ෂ 5,000ක් ඒ සඳහා වෙන් වන බව අපට සහතිකයි.

මෙම අය වැය හරහා මේ විධියට විවිධාකාරයෙන් මුදල් වෙන් කර තිබෙනවා. සමස්තය විධියට ගත්තාම මේ රට සංවර්ධනය කරන්න, පොදු ජනතාවගේ ජීවිත නහා සිටුවන්න ඉතිහාසයේ බිහි වෙච්ච, ඉතිහාසයේ ප්‍රකාශයට පත් වෙච්ච පළමු අය වැය වන මෙය ජනතාවාදී අය වැයක් බව සිහිපත් කරන අතර, මට කථා කරන්න අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා.

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා
(මාණ්පුමිකු இස්මායිල් මුත්තු මොහම්මට්)
(The Hon. Ismail Muththu Mohamed)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்று முன்தினம் முதல் நடைபெற்றுவருகின்ற - *[இடையீடு]*

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. உதුමාலெப්පை)
(The Hon. M.S. Uthumalebbe)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. உதுමාலெப්පை)
(The Hon. M.S. Uthumalebbe)
මේකටම සම්බන්ධව කථා කරන්න ඕනෑ. අපේ ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා උතුරට සල්ලි වෙන් කරලා තිබෙනවා, නැගෙනහිරට අඩුයි කියලා අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මෙතැනදී සඳහන් කළා කියලා. *[බාධා කිරීමක්]* මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගොල්ලන් කියනවා, අපි උතුරට සල්ලි වෙන් කරපු,- *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා කථාව කරන්න. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.29]

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා
(මාණ්පුමිකු இස්මායිල් මුත්තු මොහම්මට්)
(The Hon. Ismail Muththu Mohamed)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இரண்டாவது நாளாக இடம்பெறுகின்ற 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்தில் நானும் உரையாற்றுவதில் சந்தோசமடைகின்றேன். மக்களும் புதிய அரசாங்கத்தின் வரவு செலவுத்திட்டத்தில் தங்களுக்குக் கிடைக்கவிருக்கின்ற நன்மைகள் என்ன, தங்களுடைய பிரச்சினைகள் தீர்க்கப்படுமா, தங்களுடைய வாழ்வாதாரம் வளங்கொழிக்குமா என்ற அங்கலாய்ப்போடும் ஆர்வத்தோடும் இதனை எதிர்பார்த்திருந்தார்கள். அந்த எதிர்பார்ப்புகளையும் தேவைகளையும் நிறைவேற்றுகின்ற வரவு செலவுத்திட்டமாக இது அமையும் என்பதில் நாங்கள் நம்பிக்கையோடு இருக்கின்றோம்.

விசேடமாக, இங்கு எங்களுடைய சக பாராளுமன்ற உறுப்பினர்கள் கூறியதுபோல, பல வழிகளிலும் மிகவும் பாதிப்படைந்த வடக்கு, கிழக்கு மக்கள் பல்வேறு தேவைகளுடனும் பிரச்சினைகளுடனும் இம்முறை வரவு செலவுத்திட்டத்தை எதிர்பார்த்துக் காத்திருந்தார்கள். அந்த வகையில், இம்முறை வரவு செலவுத்திட்டத்திலே கல்வித்துறை, சுகாதாரத்துறை, வீதிப் புனரமைப்பு,

[ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා]

විවසායත්துறை, யாழ். நூலக அபிவிருத்தி, வீடமைப்பு மற்றும் போதையற்ற சமூகத்தை உருவாக்குதல் போன்ற பல்வேறு அபிவிருத்தித் திட்டங்களுக்கு நிதியொதுக்கீடு செய்யப்பட்டிருப்பதை நாங்கள் மிகவும் சந்தோசத்தோடு வரவேற்கின்றோம். அதற்கேற்ப இந்த நிதி ஒதுக்கீட்டின்மூலம் அந்த மக்களுடைய தேவைகள் தீர்க்கப்படுவதற்காக நல்லதொரு கட்டமைப்பை ஏற்படுத்தி, உரிய காலத்தில் அதற்கான திட்டங்கள் அமுல்படுத்தப்பட வேண்டுமென நான் வேண்டிக் கொள்கின்றேன்.

கல்வியைப் பொறுத்தவரையிலே, நீண்ட காலம் சிறந்ததொரு கல்விச் சமூகமாக விளங்கிய வடக்கு, கிழக்கைச் சேர்ந்த சமூகம், 30 வருட கால யுத்தத்தினால் ஏற்பட்ட பாதிப்பினால் அகதிகளாக்கப்பட்டதனால், அவர்களுடைய கல்வித் தரம் சீரழிந்து பாடசாலைகளிலே மாணவர்கள் எந்த வளமுமற்ற நிலையிலே இருக்கின்றார்கள். அத்துடன் நாடு முழுவதிலுமுள்ள 10,126 பாடசாலைகளிலே 100க்குக் குறைவான மாணவர்களுள்ள பாடசாலைகள் சுமார் 3,000 இருக்கின்றன. 1,477 பாடசாலைகள் 50க்குக் குறைவான மாணவர்களுள்ள பாடசாலைகளாக இருக்கின்றன. இந்த வரவு செலவுத்திட்டத்திலே 3 கிலோ மீற்றர் தூரத்துக்குட்பட்ட பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்கான திட்டம் வந்திருப்பதையிட்டு நாங்கள் சந்தோசமடைகின்றோம்; வரவேற்கின்றோம். ஆனால், இந்த 3 கிலோ மீற்றர் தூரத்திலுள்ள பாடசாலைகளை அபிவிருத்தி செய்கின்ற ஒரு திட்டம் மிக அதிகமாக அமுல் செய்யப்படவேண்டிய பிரதேசமாக வடக்கு மாகாணம் காணப்படுகின்றது. அந்தப் பிரதேசத்தில் சில இடங்களில் மீள்குடியேற்றங்கள் நடைபெற்றிருக்கின்றன. மேலும் சில கிராமங்களிலே மீள்குடியேற்றம் நடைபெறாமல் இருக்கின்றது. ஆகவே, இந்தத் திட்டங்களின்மூலம் இந்தப் பாடசாலைகள் அபிவிருத்தி செய்யப்பட வேண்டுமென்று கேட்டுக் கொள்கின்றோம்.

அதுமாத்திரமல்லாமல், கடந்த காலத்திலே 'மஹிந்தோதய திட்டம்', 'அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை' என்ற திட்டங்களின் கீழே சில பாடசாலைகள் தெரிவு செய்யப்பட்டு அபிவிருத்தி வேலைகள் ஆரம்பிக்கப்பட்டாலும், அவை இடைநடுவிலே கைவிடப்பட்டதை நாங்கள் காண்கின்றோம். அவ்வாறு அபிவிருத்தி வேலைகள் இடைநடுவிலே கைவிடப்பட்டதனால், அந்தப் பாடசாலைகளில் இருக்கின்ற வளம் இல்லாமற்போய், குறித்த பாடசாலைகளிலிருந்து மாணவர்களுடைய இடைவிலகலும் பெற்றோருடைய வெறுப்பும் ஏற்பட்டிருப்பதைக் காண முடிகின்றது. கடந்த காலத்திலே இவ்வாறான அபிவிருத்தித் திட்டங்கள் தடைப்பட்டதனால், பெற்றோர் தமது பிள்ளைகளை வேறு பாடசாலைகளில் இணைப்பதில் ஆர்வம் கொண்டிருக்கிறார்கள். இதனால் அந்தக் கிராமப்புறப் பாடசாலைகள் மூடப்படவேண்டிய ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. அந்த நிலையைத் தவிர்த்து, சகல பாடசாலைகளையும் வளமான பாடசாலையாக்குவதற்கு இம்முறை வரவு செலவுத்திட்டத்தின் மூலமான நிதியொதுக்கீடு ஓர் உதவியாக இருக்குமென்று நான் நினைக்கின்றேன்.

அதுமாத்திரமல்லாமல், எங்களுடைய வட மாகாணத்தின் அநேகமான பாடசாலைகளிலே ஆசிரியர் விடுதிகளோ, அதிபர் விடுதிகளோ இல்லாத காரணத்தினால் தூர இடங்களிலிருந்து வருகின்ற அதிபர் மற்றும் ஆசிரியர்கள் அங்கு தங்குவதற்கு வசதியில்லாத காரணத்தினால், ஒவ்வொரு நாளும் நீண்ட தூரம் பிரயாணம் செய்யவேண்டிய ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. குறிப்பாக, ஆசிரியர்கள் 30 - 40 மைல் என மிக நீண்ட தூரம் சென்று கல்வி கற்பிக்க வேண்டிய ஒரு நிலை ஏற்பட்டிருக்கின்றது. இவ்வாறான குறைகளை நிவர்த்தி செய்தால் ஆசிரியர்கள் தியாக மனப்பான்மையுடன் தமது சேவையைத் திறம்படச் செய்யக்கூடிய ஒரு நல்ல சூழ்நிலை ஏற்படும். அந்தப் பிரதேசத்தில் அமைந்துள்ள கிராமப்புறப் பாடசாலைகளிலே மீத்திறன்கூடிய மாணவர்கள் இருக்கின்றார்கள். அவர்களை வழிநடத்தி உற்சாகப்படுத்தக்கூடிய செயற்திட்டங்கள் அதிகமாக உருவாக்கப்பட வேண்டும்.

அதுமாத்திரமன்றி, கடந்த காலத்திலே வவுனியா, மன்னார் போன்ற பிரதேசங்களில் மிகப் பின்தங்கிய ஆறு பாடசாலைகள் தெரிவு செய்யப்பட்டு, அப்பாடசாலைகளின் அபிவிருத்திக்கு சனாதிபதி நிதியத்திலிருந்து நிதி ஒதுக்கீடு செய்யப்பட்டு, கட்டிட வேலைக்கான விலைமனு கோரப்பட்ட நிலையில் வேலைகள் இடைநடுவே நிறுத்தப்பட்டன. பின்னர் இரண்டாவது முறை மீண்டும் tender கோரப்பட்டு, கட்டிட வேலைகள் செய்வதற்காக மணல், கல், சீமெந்து பறிக்கப்பட்டபோதும் ஒரு வருடகாலமாக வேலைகள் நடைபெறாதிருக்கின்றன. அண்மையில் அகில இலங்கை மக்கள் காங்கிரஸ் தலைவரும் பாராளுமன்ற உறுப்பினருமான றிஸாட் பதியுதீன் அவர்களும், நானும் கௌரவ கல்வி அமைச்சர் அவர்களைச் சந்தித்து இந்த விடயம் தொடர்பாக முறையிட்டிருந்தோம். அதற்குச் சாதகமானதோர் பதில் கிடைத்துள்ளது. ஆகவே, பாடசாலைகளின் அபிவிருத்தி விடயத்தில் இந்தப் பாடசாலைகளையும் இணைத்துக் கொள்ளுமாறு வேண்டிக் கொள்கின்றேன்.

அதுமாத்திரமன்றி, வவுனியா மாவட்டத்திலே அல் அக்ஸா மகா வித்தியாலயம் என்ற ஒரு பாடசாலை இருக்கிறது. 1924ஆம் ஆண்டு 06ஆம் மாதம் 04ஆம் திகதி ஆரம்பிக்கப்பட்ட இந்தப் பாடசாலையானது, 'மஹிந்தோதய' திட்டம் அல்லது 'அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை' என்ற எந்தத் திட்டத்தின்கீழும் உள்வாங்கப்படாத காரணத்தினால் வளங்குன்றிய நிலையில் இருக்கிறது. நான் அந்தப் பாடசாலையிலே படித்து, 1968ஆம் ஆண்டு ஜீ.சி.ஈ. சாதாரண தரப் பரீட்சையில் தோற்றிய மாணவன் என்ற வகையில் இப்பாடசாலையின் வளர்ச்சியை அதிகரித்து, ஒரு தேசியப் பாடசாலையாகத் தரம் உயர்த்துமாறு அன்பாக வேண்டி நிற்கின்றேன்.

அதுமாத்திரமன்றி, யுத்தத்தினால் பாதிப்படைந்த வவுனியா, மன்னார், முல்லைத்தீவு போன்ற பிரதேசங்களில் நடைபெற்றுவந்த மீள் குடியேற்றம் இடைநடுவில் நிறுத்தப்பட்டுள்ளது. மீள்குடியேறிய மக்களின் வீட்டுத் திட்ட உதவியாக தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையால் ஐந்து இலட்சம் ரூபாய் வழங்கப்பட்டிருந்தபோதும் அந்த வீட்டுத் திட்டங்கள் அத்திவாரத்தோடு அரைகுறையாகக் காணப்படுகின்றன. இது அந்த மக்களின் வாழ்வாதாரத்தில் பெரும் தாக்கத்தை ஏற்படுத்தியுள்ளதோடு, அவர்களிடத்திலே குடும்பப் பிரச்சினைகளையும் ஏற்படுத்தியிருக்கிறது. அந்த மக்கள் தமக்கான வீடில்லாத நிலையில் தங்களுடைய உற்றார், உறவினர் வீடுகளிலேதான் தங்கியிருக்கிறார்கள். அவர்களுக்கு அந்த வீட்டுத் திட்டங்களைச் செய்து முடிக்க முடியாத துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. சாதாரணமாக மேசன் ஒருவருடைய சம்பளம் 5,000 ரூபாயாகவும், ஒரு கூலியாளின் சம்பளம் 3,500 ரூபாயாகவும், சீமெந்தினுடைய விலை 1,800 ரூபாயாகவும் இருக்கும்போது, வீட்டுத் திட்டத்தின்மூலம் கிடைத்த வீட்டினை ஐந்து இலட்சம் ரூபாயில் கட்டி முடிக்க முடியாத ஒரு துர்ப்பாக்கிய நிலை

ඒ වාගේම රේයේත් කියනවා අපිට ඇහුණා, රනිල්ගේ අය වැයක් තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ කියලා. මේක රනිල්ගේ අය වැයක් කියන නිසා, ජාතික සම්පත් විකිණීමක් ගැන, ටෙලිකොම් එක විකිණීම ගැන, ශ්‍රීලන්කන් ගුවන් සේවය විකිණීම ගැන, මිල්කෝ එක විකිණීම ගැන මේ තුළ සඳහන් වෙලා තිබෙනවාද කියලා අපි බැලුවා. නමුත් ඒ මොකුත් නැහැ. එහෙම නැත්නම් මේකේ තිබෙනවාද, 100,000ක ආදායමක් උපයන අයගෙන් අය කරන PAYE Tax එක 50,000ක ආදායමක් උපයන අයගෙන් අය කරනවා කියලා? නැහැ, මේකේ එහෙම නැහැ. මේකේ සඳහන් වෙන්නේ 150,000ක ආදායමක් උපයන අයගෙන් ඒක අය කරනවා කියලායි. ඒ නිසා මොන හේතුවක් නිසා එහෙම කිව්වාද කියලා මම දන්නේ නැහැ. ඒ අනුව බලනකොට ඒගොල්ලන් අද සහ රේයේ කථා කළ දේවල්වල කිසිම හරයක් නැහැ. මේ වාගේ අය වැය විවාදයකදී විපක්ෂයේ අය කථා කළ යුතු විධිය දැන ගන්න ඕනෑ නම්, අපේ ජනාධිපති අනුර කුමාර සහෝදරයා ඒ කාලයේ කළ කථා අධ්‍යයනය කරන්න කියලා මම ඒගොල්ලන්ට කියනවා.

රේයේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කළා. එතුමාගේ actions හොඳයි. එහාට, මෙහාට වුණා. නමුත් ඒ කියපු දේවල්වල කිසිම හරයක් නැහැ. අද දවසේ කළ කථාත් එහෙමයි. පට්ටපල් බොරු කිව්වේ. කබීර් හෂීම් මන්ත්‍රීතුමා අද කිව්වා, මේ අය වැය තුළ පර්යේෂණ සඳහා මුදල් වෙන් කරලා නැති කථාවක්; මුදල් අඩු කරපු කථාවක්. රේයේ විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව තිබුණා. විපක්ෂයේ මන්ත්‍රීවරු ඒකට සහභාගි වුණාද කියලා මම දන්නේ නැහැ. එතැනට පැමිණි නිලධාරීන් මේ අය වැය වෙනුවෙන් රජයට ස්තුති කළා, ලබා දී තිබුණාට වඩා තුන්ගුණයක මුදලක් ඒ වෙනුවෙන් වෙන් කර තිබෙනවා කියලා. විද්‍යාත්මක පර්යේෂණ සඳහා මෙම අය වැයෙන් රුපියල් බිලියන 20.90ක පමණ ලොකු මුදලක් වෙන් කර තිබෙනවා. විවිධ අමාත්‍යාංශ හරහා තමයි මෙම මුදල එකතු වෙන්නේ. ඒ වාගේම විද්‍යාත්මක පර්යේෂණ සිදුකර, ඒවා වාණිජකරණය කරලා රටට ප්‍රයෝජනවත් ව්‍යාපෘති බිහි කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා.

මම හිතන විධියට මේ අය, අය වැය කියන එකයි, අය වැය කථාව කියන එකයි පටලවා ගෙන. අය වැය කියන්නේ එකක්, අය වැය කථාව කියන්නේ තව එකක්. ඔබතුමන්ලා බැලුවා නම්, "ජාතික අය වැය 2025 පුරවැසි අය වැය" කියන පොතේ සඳහන් කර තිබෙනවා, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා රුපියල් බිලියන 20.9ක් වෙන් කර තිබෙන බව. විවිධ අමාත්‍යාංශ සහ නියෝජිතායතන යටතේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා මෙම මුදල වෙන් කර තිබෙනවා. ඒ තුළ ජාතික විද්‍යා පදනමට - NSF එකට - සහ ජාතික පර්යේෂණ සභාවට - NRC එකට - අන් කවරදාටත් වඩා මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම රබර් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය වැනි ඒවාටත් මුදල් වෙන් කර තිබෙනවා.

මුලින්ම අපි මේවා හරියට අධ්‍යයනය කරන්න ඕනෑ. අය වැය විවාදයකදී කථා කරනකොට ඒ සියල්ල අධ්‍යයනය කරලා කරුණු සහිතව ඒවා කියන්න ඕනෑ. රේයේ තිබුණු අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් අපි විවිධ දේවල් දැක්කා. ඇත්තටම ලබා දුන් පේටන්ට් බලපත්‍ර වාණිජකරණය කරලා රටට වැඩදායී දේවල් ගන්න ඕනෑ. රිළවි, මොනරු වාගේ සතුන්ගෙන් සිදුවන හානි සම්බන්ධව යෙදිය හැකි දීර්ඝ කාලීන විසඳුම් වාගේම, කෙටි කාලීන විසඳුම් පිළිබඳව එතැනදී අදහස් ඉදිරිපත් වුණා. එම සතුන් වගා බිම්වලින් පලවා හැරීමට අවශ්‍ය විවිධ උපකරණ පවා දැනටමත් නිපදවා තිබෙනවා. ඒවා සම්බන්ධව මෙච්චර කාලයකට මැදිහත්වීමක් කර තිබුණේ නැහැ. නමුත් මෙම අය වැයෙන් එවැනි කටයුතු සඳහාත් වැඩිපුර මුදල් වෙන් කර තිබෙනවා.

ඒත්පට්ටුල්ලතු. ඉතිරකාකත් තංකලුටෙය තංක ආපරණංකළෙ අටකු වෙත්ත මක්කළ් අවර්රෙ මීට්ක මුටියාත නිලෙයිල් ඉරුක්කිරාර්කළ්. ආකවේ, පුතිය තිට්ටංකළෙත් තයාරික්කුම්පෝතු ඉවර්රිනෙක් කරුත්තිර්කොණ්ටු, වටක්කු මාකාණත්තිල් වීටිල්ලාතවර්කළුටෙය පිරච්චිනෙ තීර්ත්තු වෛක්කප්පට වේණ්ටුමෙන්රු වේණ්ටි නිර්කින්රේන්.

අතුමාත්තිරමල්ලාමල්, වට මාකාණත්තිල් කෛත්තොළිර්චාලෙකළ් ඉල්ලාත ඔරු පොිය කුරෙපාටාන නිලෙමෙ කාණප්පටුකින්රතු. වවුනියා වටක්කු පිරතේස චෙයලකප් පිරිවිලුම්, මුල්ලෛත්තීවිලුම් මන්නාර්, චිලාපත්තුරෙ පෝන්ර පිරතේසංකළිලුම් මක්කළ් චෙරින්තු වාළ්කින්රාර්කළ්. අන්තප් පිරතේසංකළිල් ආයිරත්තිර්කුම් මේර්පට්ට ඉළෙඥර්කළ් පිටිත්තුවිට්ටු වේලෙයිල්ලාමල් ඉරුක්කින්රාර්කළ්. ආකවේ, අංකු කෛත්තොළිර්පේට්ටෛකළෙ ආරම්පික්ක වේණ්ටිය ඔරු තේවෛප්පාටු ඉරුක්කින්රතු. කටන්ත කාලත්තිල් කෛත්තොළිල්, වර්ත්තක අමෛච්චු අව්වාරන ඔරු මුයර්චියෛච් චෙය්තපොළුතු වට මාකාණ චපෛ අතර්කු අනුමති වළංක මරුත්ත කාරණත්තිනාල් අන්තත් තිට්ටංකළ් නටෛමුරෛප්පටුත්තප්පටවිල්ලෛ. ආකවේ, අන්තප් පිරතේසංකළිල් කෛත්තොළිර්චාලෙකළෙ අමෛක්ක වේණ්ටුමෙන්රු කේට්ටු නිර්කින්රෝම්.

මේලුම්, එංකළුටෙය මීනවර්කළුටෙය පිරච්චිනෙ තොටර්පිල් කරුත්තුත් තොිවිත්ත එංකළුටෙය කටර්රොළිල් අමෛච්චර් අවර්කළ්, “තොප්පුල්කොටි උරවුකළ් එන්රු චොල්ලිවිට්ටු, එංකළුටෙය කටල් වළංකළෛත් තමිළක මීනවර්කළ් චූරෛයාටුකින්රාර්කළ්” එන්රු කූරියිරුන්තාර්. අතර්කාකක් කටර්රොළිල් අමෛච්චරුක්කු නාංකළ් නන්රි කූර වේණ්ටුම්. එංකළුටෙය මීනවර්කළින් නිලෛමෙ අව්වාරුතාන් ඉරුක්කින්රතු. අතුපෝල්, පේචාලෛ, වංකාලෛ, චිලාවත්තුරෛ, අරිප්පු පෝන්ර පිරතේසංකළිල් උළ්ළ මක්කළුම් තංකළුක්කු ඒර්පටුකින්ර තටෛකළ් තොටර්පිල් එංකළිටම් නේරටියාක මුරෛයිට්ටිරුක්කින්රාර්කළ්.

අතුමාත්තිරමල්ලාමල්, වට මාකාණත්තිල් ඉන්නුම් නන්නීර් මීන්පිටිත්ත තොළිලෛ අපිවිරුත්ති චෙය්යමුටියාත නිලෛ කාණප්පටුකින්රතු. වරුමෛක්කෝට්ටින්කීළ් උළ්ළවර්කළ්තාන් අංකු නන්නීර් මීන්පිටිත්ත තොළිලිල් ඈටුපට්ටිරුක්කිරාර්කළ්. ආකවේ, අවර්කළුක්කාන වාළ්වාතාර ঊක්කුවිප්පාක වළ්ළම් අල්ලතු වලෛ පෝන්රවර්රෛ වළංකි උතවි චෙය්තාල්, අවර්කළුටෙය වාළ්වාතාරත්තෛ වළප්පටුත්තක්කූටිය ඔරු නල්ල නිලෛ ඒර්පටුම්. ආකවේ, ඉන්ත වරවු චෙලවුත්තිට්ටත්තින්මූලම් ඒෙළ මක්කළුක්කු උතවි චෙය්ය වේණ්ටුමෙන්රු වේණ්ටි, විටෛපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(මාණ්පුමිකු රවීන්තිර පණ්ඩාර)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැය පිළිබඳවයි මගේ කථාව කරන්නේ. අපි දැක්කා, අද උදේ මේ සම්බන්ධව කබීර් හෂීම් මන්ත්‍රීතුමා කථා

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

විපක්ෂයේ මන්ත්‍රීතුමෙක් අද මොකක්ද සිංදුවකුත් කිව්වා. නමුත් මට මතක් වුණේ ගුණදාස කපුගේ මහත්මයා ගායනා කළ වෙනත් සිංදුවක්. ඒ තමයි, "දෙතොල නොකී දේ දෙනෙතේ කියැවෙනවා - වසං කරන සිත මුහුණේ ලියැවෙනවා" කියන ගීතය. ඒ ආකාරයට මේ අය මොන කතන්දර කිව්වත්, ඒ මුහුණුවල තිබෙන හැඟීම් අපි දැක්කා. ඇත්තටම ඔවුන් ප්‍රකාශ කරන දේ නොවෙයි, මුහුණුවලින් පෙනෙන්න තිබෙන්නේ. ඒගොල්ලන් හොල්මන් වෙලා ඉන්නේ. ඒගොල්ලන්ට හිතා ගන්න බැහැ, මේ අය වැය ගැන.

ඒ කාලයේ විපක්ෂ නායකතුමා, ඒ වාගේම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කියපු දෙයක් මට මතක් වෙනවා. මොකක්ද, එතුමන්ලා කිව්වේ? ත්‍රිපෝෂ සමාගම වහන්න යනවා කිව්වා; ත්‍රිපෝෂ කියන නමවත් නැහැ කිව්වා. මම දැක්කා, දවසක් අපේ විපක්ෂ නායකතුමා එක්ක අර ලොරි භාගෙක නැගලා කථා කළා, පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ කවුද සහෝදරයෙක්. ඒගොල්ලන් කිව්වේත් ත්‍රිපෝෂ සමාගම වහනවා කියලා. ඒ තමයි කියපු දේ. නමුත්, මේ අය වැය තුළ ත්‍රිපෝෂ වැඩසටහනට සහ ගැබිනි මාතාවන්ට පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා රුපියල් බිලියන 12.5ක් වෙන් කර තිබෙනවා. ඒ නිසා කරුණු කාරණා හරියට දැනගෙන, ප්‍රකාශ කරන දේ ගැන යම් වගකීමක් සහිතව අදහස් ප්‍රකාශ කරන්නය කියලා අපි එතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ අය වැය පිළිබඳ ගත්තත් ඒ වාගේමයි.

මේ අය වැය පිළිබඳව කථා කරනකොට විවිධ ක්ෂේත්‍ර ගැන අපේ මන්ත්‍රීවරුන්ගෙන් කියැවුණා. මෙතැන තිබෙනවා, විශේෂ දෙයක්. මා නියෝජනය කරන්නේ බදුල්ල දිස්ත්‍රික්කය. බදුල්ල දිස්ත්‍රික්කයේ මලයගම් ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වෙච්ච දේවල් ඔබතුමන්ලා දකින්න ඇති. මෙතෙක් කඳුකරය නියෝජනය කරපු දමිළ දේශපාලනඥයන් ඇත්තටම කනගාටු වෙන්න ඕනෑ මේ දේවල් නොකිරීම ගැන. අපි මලයගම් ජනතාව වෙනුවෙන් රුපියල් මිලියන 7,583ක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් වතු නිවාස සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 4,267ක් වෙන් කරලා තිබෙනවා.

වතු නිවාස ඉදිකිරීම දැනටමත් ආරම්භ කරලා තිබෙනවා. මා නියෝජනය කරන හපුතලේ ආසනයේ කබරගල කියන ප්‍රදේශයේ ඔබතුමන්ලාගේ කාලයේ නාය ගිය ස්ථානයක පදිංචිව සිටි ජනතාව අවුරුදු දෙකක් තිස්සේ තේ කර්මාන්තශාලාවක ඉන්නවා. ඒ තේ කර්මාන්තශාලාවේ අවුරුදු දෙකක් හිටපු ජනතාව වෙනුවෙන් දැන් නිවාස ඉදිකරන්න පටන් ගත්තා. එක නිවාසයක් ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 28ක් වෙන් කරනවා. ඒ නිවාසවලට විදුලිය, ජලය ඇතුළු සියලු යටිතල පහසුකම් ලබා දෙනවා; පාරවල් කපලා දෙනවා. ඒ වෙනුවෙන් ඒ අයගේ ශ්‍රමය ලබා ගන්නවා. යුද හමුදාවේ සහයෝගය ඇතිව තමයි ඒ නිවාස ඉදිකරන්නේ. ඒ වැඩසටහන දැන් පටන් අරගෙන තිබෙනවා. ඒ යටතේ මේ වසර ඇතුළත පහසුකම් සහිත නිවාස 1,000ක් ඉදි කරනවා.

ඒ වාගේම මලයගම් ජනතාව සඳහා ව්‍යක්තීය පුහුණුව, සුහුරු පාසල් ලබා දෙනවා. ව්‍යක්තීය පුහුණුව ලබන්නන්ට රුපියල් 2,450ක් සහ සුහුරු පාසල් සඳහා රුපියල් මිලියන 866ක් ලබා දෙනවා. දැන් මේ දේවල් හිතාගන්න බැහැ. ඒ දවස්වල හිතාගෙන හිටිය විධිය දන්නවා නේ. "උස නම් සිකියුරිටි, මිටි නම් කම්කරු, වතුවල නම් ගෙවල්වල වැඩ කරන්න" ඔන්න ඕක තමයි ඒ ගොල්ලන්ගේ ප්‍රතිපත්තිය වුණේ. ඉතින්, ඒවා වෙනස් වෙන්න ඕනෑ. ඒ දරුවෝත් ඉගෙන ගන්න ඕනෑ. ඒ අයත් මේ රටේ දරුවෝ. මලයගම් ජනතාව කියන්නේ කොවිඩ් කාලයේත්, ආර්ථික අර්බුදය තිබුණු කාලයෙත් වත්තේ වැඩ කරලා මේ රටට ඩොලර් ගෙනාපු කට්ටිය. ඒ වෙනුවෙන් ඒ ජනතාවට සලකලා තිබෙනවා. නැහෙනහිර, උතුර ගැන වෙනම කථා කරපු නිසායි මම මලයගම් ජනතාව ගැන කිව්වේ.

ඊයේ පිටි මිල රුපියල් 10කින් අඩු කරලා තිබෙනවා. කවුරුත් ඒ ගැන කථා කළේ නැහැ. පිටි මිල රුපියල් 10කින් අඩු කරලා තිබෙනවා. මලයගම් පිටි වැඩියෙන් පරිභෝජනය කරන අය. භූමිතෙල් පොඩි ගණනකින් හෝ වැඩි වුණු වෙලාවට අපේ අම්බිකා මන්ත්‍රීතුමියගේ නම සඳහන් කරලා posts දානවා. නමුත් ඊයේ පිටි අඩු වීම ගැන post එකක් නැහැ; භූමිතෙල් අඩු වෙනකොට posts නැහැ.

ඒ වාගේම, අපේ කොට්ටහව්වි මන්ත්‍රීතුමිය ගැනත් බොහොම අසත්‍ය ප්‍රකාශයක් ජනගත කරලා තිබෙනවා ඊයේ මම දැක්කා. ඒ වාගේ යම් යම් මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් aim කරලා කරන දේවල් හරි නැහැ. තව දේවල් අපට කියන්න තිබෙනවා. අපි දන්නවා, ඒ කාලයේ එක එක අප්පච්චිලා හිටිය බව. ඒ අප්පච්චිලාට බැරි වෙච්ච ගොඩක් දේවල් අපි මේ අය වැයෙන් කරලා තිබෙනවා. ඒ මොනවාද? ළමා නිවාසවල සිටින දරුවන්ට මාසිකව රුපියල් 5,000ක් දෙනවා. ඒ රුපියල් 5,000ත් රුපියල් 2,000ක් එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබා දෙන අතර, භාරකරුට රුපියල් 3,000ක් ලබා දෙනවා. ඒක ගිණුමට ලැබෙන විධියට සකස් කරලා තිබෙන්නේ. ඒ වාගේ දේවල් තිබෙනවා.

තව දෙයක් තිබෙනවා. ආපදාවකදී සිදුවන ජීවිත හානියකට - අලියෙක් ගැහුවාම, නැත්නම් නාය ගියාම- වන්දිය වශයෙන් ලබා දුන්නේ රුපියල් 250,000යි.

ඒක ලක්ෂ 10 දක්වා වැඩි කර තිබෙනවා. ගොඩක් අයට ඒවා පෙනෙන්නේ නැහැ; දැනෙන්නේ නැහැ. ඒවා දකිනකොට ඔවුන් නිර්විින්දනය වෙනවා. මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම රුපියල් 5,000 සිට 7,500 දක්වා සියයට 50කින් වැඩි කර තිබෙනවා. ශිෂ්‍යාධාර දීමනාවත් එහෙමයි. ශිෂ්‍යාධාර වශයෙන් ලබා දුන් රුපියල් 4,000 රුපියල් 6,500 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාවත් වැඩි කර තිබෙනවා. ඔන්න ඔය ආකාරයට තමයි මේ අය වැයේ විශේෂ වැඩ කටයුතු ක්‍රියාත්මක වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව කාරණයක් තිබෙනවා. අපි දන්නවා, ඉදිරියේ දී මැතිවරණයක් පැවැත්වෙන්නට තිබෙන බව. විපක්ෂයේ මන්ත්‍රීවරු යනවා, ප්‍රාදේශීය සභා මැතිවරණයට තව කල් ඕනෑය කියලා ඉල්ලන්න; මැතිවරණය කල් දමන්න කියනවා. ඔවුන් කියනවා, "මැතිවරණය පවත්වන්න අපි තමයි මුල් වුණේ" කියලා. හැබැයි දැන් කියනවා, මැතිවරණය කල් දමන්න ඕනෑ කියලා. එම මැතිවරණය පැවැත්වෙනවා. මැතිවරණ කල් දමන එක අපේ ප්‍රතිපත්තියක් නොවෙයි. බල්ලෙක් නාවන්න ගෙනියන්න හරි අමාරුයි. අන්න ඒ විධියට අපි විපක්ෂය අරගෙන ඇවිල්ලා, මේ මැතිවරණය පවත්වනවා. මොකද, ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන්න නම් මැතිවරණ තියන්න ඕනෑ. ඒක හොඳින් මතක තියාගන්න.

ඊළඟ කාරණය තමයි, ශ්‍රී ලාංකික දිනය. ශ්‍රී ලාංකික දිනය සඳහා රුපියල් මිලියන 300ක් වැය කර තිබෙනවා. අපේ ප්‍රතිපත්තිය තුළ තිබෙනවා, යළි මේ රටේ යුද්ධ නැහැ, යළි මේ රටේ ජාතිවාද නැහැ කියලා. ඒවා ඇති වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ ගැනත් අද කබීර් හෂීම් මන්ත්‍රීතුමා යම් යම් දේවල් කිව්වා. ඒ, ජාතිවාදය අවුස්සන හැම කාලයකම ඒවා නියෝජනය කරපු අය. අපි දන්නවා පාර්ලිමේන්තුවෙන් එළියේ හිටියත් ඔය පාඨලීලාට, වීරවංශලාට, ගම්මන්පිලලාට පැවැත්මක් නැහැ

කියලා. ජාතිවාදය නැති වෙනකොට ඒගොල්ලන්ට පැවැත්මක් නැහැ. ඒගොල්ලන් වෙන වෙන වේශවලින් එනවා. එක්කෙනෙක් අගමැතිතුමියට මඩ ගහනවා. තව එක්කෙනෙක් විදුලිබල මණ්ඩලය ගැන කියනවා. Solar energy කප්පාදු කරන්න යනවා කියලා පට්ටපල් බොරු කියනවා. ඒ පිළිබඳව අද අපේ බලශක්ති ඇමතිවරයා පැහැදිලි කළා.

මේක "එක රටක්, පාට ගොඩක්" කියන එක මතක තබා ගන්න. ජාතිවාදය අවුස්සපු හැටනව ලක්ෂයේ අය දෙකයි පනහට වැටුණු හැටි අපි දැක්කා. එවැනි තත්ත්වයක් තමයි තිබුණේ. "පුළුවන් ශ්‍රී ලංකා" කියපු අය අද හොයාගන්නත් නැහැ. ඒ තත්ත්වයට ඒගොල්ලන් වැටුණා. මේ සියලු කාරණාත් එක්ක අතිශය කැපවීම් කරපු පිරිසක් තමයි මේ ඉන්නේ. ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු කියන්නේ, කාර් පර්මිට් එක නැහැ කියනකොට, බාර් පර්මිට් එක නැහැ කියනකොට, වාහනය දෙන්නේ නැහැ කියනකොට අත්පුඩි ගහපු අය. අපි අත්පුඩි ගැහුවා. අපේ මන්ත්‍රීවරු සියල්ලම අත්පුඩි ගැහුවා. ඇයි ඒ? අපි ආවේ කැපවීම් කරලා. අපේ පැත්තෙන් කරන්න පුළුවන් කැපකිරීම් ටික කරලා මේ රටේ ජනතාවට යමක් දෙන්නයි අපි ආවේ. දැන් පඩි ගැනත් කියනවා නේ බොරු කථා ගොඩක්.

ගොඩක්දෙනා කථා වෙන නිසා මම වැටුප් ගැන කථා නොකර ඉන්නම්. නමුත්, මම එක දෙයක් කියන්නම්. මේගොල්ලන් කියනවා, වැටුප් වැඩිවීම සම්පූර්ණ වෙන්න අවුරුදු 3ක් යනවා කියලා. අවුරුදු 3ක් නොවෙයි, මාස 20කින් තමයි වැටුප් වැඩිවීම සම්පූර්ණ වෙන්නේ. මූලික වැටුපේ වැඩිවීම රුපියල් අටදහස් ගණනක් කියලාත් කිව්වා. එහෙම නම් අතීතයේ පස් වතාවකදී කළ වැටුප් වැඩි කිරීමේ දී වැඩි වුණේ සුළු ගණනක්. ඒ සියල්ල මතක තබාගන්න. දැන් වැඩි වෙන්නේ මූලික වැටුප. අවුරුදු 10ක විතර කාලයකට පසුවයි මේ වැඩිවීම කර තිබෙන්නේ. බැංකු ණයක් ගන්න ගියාම මෙය බලපානවා. විශ්‍රාම වැටුපට, OT එකට මෙය බලපානවා. මේ අය වැයෙන් වැටුප් වර්ධකයේ වටිනාකම සියයට 80ක් දක්වා වැඩි කරලා තිබෙනවා. හැබැයි, විපක්ෂ නායකතුමා ඇතුළු අය අපට සම්ප්‍රදායයන් කියලා දෙන්න එනවා. අපි ආවේ ඒ සම්ප්‍රදායයන් අතික්‍රමණය කරලා මේ රට හදන්නයි. ඔය කියන සම්ප්‍රදායයන්වලින් තමයි මේ රට ආපස්සට ගෙනිච්චේ. ඒ ආපස්සට ගෙනිච්ච රට ඉස්සරහට ගන්න තමයි අපි ආවේ. කුමන බාධක ආවත් අපි මේ ගමන යනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(*மாண்புமிகு ரவீந்திர பண்டார*)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වේලාවක් ලබා දෙන්න.

වත්මන් ජනාධිපතිවරයා විදේශ ගමන් යනකොට ටිකට් පතට විතරයි වියදම් කළේ. සමහර අවස්ථාවලදී ඒ වියදමවත් ගත්තේ නැහැ. එතුමා ඒ පැත්තෙනුත් ඉතිරි කළා. එතුමා හෙලිකොප්ටර් එකෙන් යන්නේ නැහැ කියනවා. හෙලිකොප්ටර් එකෙන් නොගිහින් ඒ මුදලත් ඉතිරි කරනවා. ඇමතිවරු නිල නිවාස ගන්නේ නැතිව ඉතිරි කරනවා. අපි ඒ ආකාරයට ආදර්ශ දෙනවා. අපි දන්නවා, අතීතයේ පවුල් පිටින් එහෙම ගිය බව. මේස් එක දාන්න වෙනම කට්ටිය ගියා. සාටකය දාන්න වෙනම කට්ටිය ගියා; පවුල් පිටින් ගියා. අන්න ඒ හැම දෙයකින්ම අපි ඉතිරි කරලා, මේ රට සංවර්ධනය කරලා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)
ගරු අතුල වෙළඳගොඩ මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු අතුල වෙළඳගොඩ මහතා
(*மாண்புமிகு அதுல வெலந்தகொட*)
(The Hon. Athula Welandagoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට පෙරේදා ඉදිරිපත් කරපු ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පළමුවැනි අය වැය සම්බන්ධයෙන් ඊයේත්, අද දවස පුරාමත් මේ පාර්ලිමේන්තුව තුළ විවිධ කථා ඉදිරිපත් වුණා. ජාතික ජන බලවේගය විධියට අපේ පැත්තෙන් අපි මේ අය වැය තුළ තිබෙන සාධනීය ලක්ෂණ සියල්ලක්ම ඒ ඒ විෂයයන් සහිතව, අංක -ඉලක්කම්- සහිතව රටේ ජනතාවට ඉදිරිපත් කළා.

ඒ ඉදිරිපත් කිරීම හමුවේ රටේ ජනතාවට මේ වෙනකොට පැහැදිලි අදහසක් තිබෙනවා, ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරපු මේ අය වැයේ තිබෙන ප්‍රතිලාභ ගැන. මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ දවසකට නොවෙයි, වර්ෂයකට. මේ ජන වරමේ අනාගත දැක්ම පිළිබඳව යම් කැඩපතක් විධියටයි, අපි මේ අය වැය හඳුනා ගන්නේ. මේ පිළිබඳව අදහස්-උදහස් ඉදිරිපත් කරද්දී, අපේ මතය පැහැදිලිවම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙනවා. හැබැයි, විපක්ෂය පැත්තෙන් මේ අය වැය සම්බන්ධයෙන් කිසිවක් ඉදිරිපත් කරනවාට වඩා, දිගටම කියනවා අපි දැක්කේ, මෙය ජන වරමට එකඟ අය වැයක් නොවෙයි කියන එක සහ ජන මතයට එකඟ නොවන අය වැයක් බවයි. ඒ වාගේම ඩිජිටල්කරණය කියන වචනයත් යොදාගෙන ඒක සමාජවාදී ක්‍රමයකට අයිති එකක් නොවෙයි කියන එකත් විපක්ෂය කිව්වා. ඒ වාගේ පටලැවිලිසහගත, විවිධ විකෘති ප්‍රකාශ කරමින්, මේ අය වැයේ අන්තර්ගතය සහ එහි තිබෙන කරුණුවලට අදාළව අදහස් හෝ විවේචන ඉදිරිපත් නොකර, මොකක් හරි පටලැවිල්ලක එතුමන්ලා ඉන්න බවක් ඉතා පැහැදිලිව අපට පෙනෙනවා. එතකොට ඒ පටලැවිල්ල මොකක්ද?

මට මතකයි, අප කුඩා කාලයේ සිට දැක තිබුණේ, මේ රටේ ඉදිරිපත් කළ හැම අය වැයකම මූලික ලක්ෂණය වුණේ, අය වැය ඉදිරිපත් කරද්දී බලන්න පුරුදු වෙලා තිබුණේ, මත්පැන් සහ සිගරට් වාගේ දේවල් කොච්චර මුදලකින් වැඩි වෙලාද, බදු කොච්චර ප්‍රමාණයක් එකතු වෙලාද, රජයේ සේවකයන්ගේ පඩි පතට කීයක් හරි එකතු කර තිබෙනවාද කියන දේවල් පිළිබඳව සොයා බලන එක. ඒවා තමයි ප්‍රධාන මාතෘකා බවට පත් වුණේ. එදා අය වැයෙන් ඉතිරි වුණේ එහෙම දෙයක්.

අද ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාත්, ඊයේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කළ කථාවල තිබුණේ මොනවාද? අවුරුදු 74ක ශාපයක් ගැන අපි කිව්වා, ඒ ශාපය පිළිබඳව නැවත සිතමින්, රට ගොඩනඟන්න අපට සිදු වෙලා තිබෙනවා, ඒක දෙවෙයේ සරදමක් බව කියන්න තමයි එතුමන්ලා උත්සාහ කළේ. මේ අය වැය පිළිබඳව හා එහි අන්තර්ගතය පිළිබඳව, විෂය කරුණු පිළිබඳව සැලකිලිමත් වෙන සාධනීය ඉදිරිපත් කිරීමකට වඩා, සිදු වෙච්ච කරුණු-කාරණා පිළිබඳව අපැහැදිලි චිත්‍රයක් තමයි එහා පැත්තෙන් ප්‍රකාශයට පත් වුණේ. ඇත්ත, අවුරුදු 74ක් පුරා ඉදිරිපත් කරපු අය වැය ඇතුළු මේ සියල්ල දිහා බැලුවාම අපට හරි පැහැදිලියි, 2022 අප්‍රේල් මාසයේ 12වැනි දා අපේ රට බංකොලොත් රටක් බවට නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන්න අවශ්‍ය කරුණු-කාරණා සිද්ධ වුණේ කොහොමද කියලා.

[ගරු අතුල වෙළඳගොඩ මහතා]

ඒ වාගේම, රටේ සමස්ත ජනතාවගේ ජන මතය නියෝජනය කරන මේ රටේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ කලින් පළ වුණු මත -අදහස්- දිහා බැලුවාම දැනුත් මම හිතන්නේ, මේ ජන මතය වෙනස්වීම පිළිබඳව විපක්ෂයට අදහසක් නැහැ කියන එකයි. ඒ ජන මතය වෙනස් කරලා අපේ 159දෙනෙකු පාර්ලිමේන්තුවට එවන්න, රට පුරා ජාති, ආගම් භේදයකින් තොරව, සියලු තත්ත්ව, භේද නොසලකා හරිමින් රටේ සමස්ත ජනතාව තීන්දුවක් ගත්තේ ඇයි? ඒ තීන්දුව ප්‍රකාරව, ජාතික ජන බලවේගය ජන වරමට එකඟ අය වැයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජන වරමට එකඟ නොවන අය වැයක් නම්, මේ අය වැය කාගේද? කවුද මේක හැදුවේ? මොකක්ද මේකේ උපයෝගිතාව?

අපට මෙතැනින් එහාට මේ රටේ ජනතාව වෙනුවෙන් ගත හැකි පියවර රාශියක් තිබෙනවා. අපට උතුරද, නැහෙනහිරද කියලා වෙන් කර ගන්න අවශ්‍ය නැහැ. එහෙම ප්‍රශ්නයකුත් කථා වෙනවා, නැහෙනහිරට මෙහෙම සලකලා තිබෙන්නේ, උතුරට මෙහෙම සලකලා තිබෙන්නේ කියලා. එහෙම භේද හඳන්නත් විපක්ෂය අද උත්සාහ කරනවා. ඒක තමයි කලිනුත් වුණේ. ජාතිකත්වය ඇතුළු විවිධ භේද ඇතිවන ආකාරයට කටයුතු කරපු ඉතිහාසයක් තමයි අපට තිබුණේ. අපි දැනුත් කථා කරන්නේ යාපනය පුස්තකාලය පිළිබඳව හා වෙනත් ජන වර්ග ගැන. කලින් තිබුණු ආණ්ඩු ජාතික සමගිය හැදුවේ නැහැ. ජාතික සමගිය මත රටක් නිර්මාණය කළේ නැහැ. අපෙන් යමක් අරගෙන ගිය චීනය, අද ලෝකයේ දැවැන්ත ආර්ථික පංගුව හොබවද්දී, අපේ රට බංකොලොත් ආර්ථිකයකට වැටුණේ කොහොමද?

අපි දන්නවා, මේ රටේ පාලකයන්ට සැලසුමක් තිබුණේ නැහැ, ජාතික ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ, ජාතික වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, ඒ නිසා ජාතික ආර්ථික අය වැයක් ඉදිරිපත් කළේ නැහැ කියලා. ජාතිය, ආගම වැනි විවිධ කාරණා මත විවිධ විධියට බෙදෙමින් මේ කුඩා රට කැලි කැලි කරමින්, අවුරුදු 74ක් පුරා මේ විනාශයට දක්කාගෙන ඇවිත්, අවසානයේදී බංකොලොත් කියන තැන දක්වා පල්ලම් බහින්න අපට සිද්ධ වුණා.

1948න් පසුව නැවත වතාවක් මේ 2025 අවුරුද්දේ ඓතිහාසික විධියට රටේ සමස්ත ජනතාවගේ එකතුවෙන් කටයුතු කරන්න දැන් අපි සූදානම් වෙනවා. අපි විශ්වාස කරනවා, අපේ රට තිරසාර සංවර්ධනයක් උදෙසා යන ගමනේදී මේ රට ගමන් කළ යුතු දිශාව මේ අය වැයෙන් පැහැදිලිවම ඉදිරිපත් කරලා තිබෙනවා කියලා. ඒ නිසා තමයි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තේමා පාඨය අපි මැතිවරණ වේදිකාවලදී ඉදිරිපත් කළේ. එය සටන් පාඨයක් විතරක් නොවෙයි. එය මේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න අවශ්‍ය සියලු ආකාරයේ හැකියාවන්ගෙන් යුතුව, ඒ දැක්ම සහිතව, ඒ අභිලාෂ පෙරමුණු කරගෙන තමයි අපි මේ අය වැය කෙටුම්පත් කළේ. මේ අය වැය යෝජනාවලට තව සංශෝධන අවශ්‍ය නම් ඒවා ඉදිරිපත් කරන්න, මේක තවත් පෝෂණය කරන්න, අඩුපාඩු තිබෙනවා නම් ඒ සියල්ල ඉදිරිපත් කරන්න අවශ්‍ය ඉඩකඩ අපි හරිගස්සලා තිබෙනවා, මාසයකට ආසන්න කාලයක් ලබා දීලා. අන්න ඒ නිසා විපක්ෂයට අවස්ථාවක් තිබෙනවා, ඒ සාධනීය යෝජනා ගෙනෙන්න. නමුත් අපි දැක්කේ නැහැ, එහෙම එකක්. අපි දැක්කේ නැහැ, විපක්ෂය එවැනි හැකියාවක් සහිතව කටයුතු කරන බවක්. අවුරුදු ගණනාවක් රට පාලනය කරපු උදවිය විධියටවත් අඩුම තරමින් නැවත නිවැරදි වීමේ දිශාවට එවැනි ප්‍රවිෂ්ටයක්වත් විපක්ෂය ලබා ගන්නවා අපි දැක්කේ නැහැ. ඒක අදත් විපක්ෂයට කරන්න බැරි වුණා කියා අපි විශ්වාස කරනවා. ඒක ජාතියේ අවාසනාව විධියට තමයි අපි හැම දාම දැක්කේ.

අපට මේ අය වැයෙන් ඉදිරිපත් කරන්න වෙන යෝජනා නැහැ. දැන් අපි කොහේටද ගමන් කරන්නේ? පසුගිය කාලයේ අපි දැක්කේ මොකක්ද? පසුගිය කාලය පුරා මේ පාර්ලිමේන්තුව තුළදීත්, මාධ්‍යවලට voice-cuts ලබා දෙමිනුත් විපක්ෂය මොකක්ද කිව්වේ? ඇත්තටම රටේ මූලික ප්‍රශ්න බවට හාල් ප්‍රශ්නය, රිළවු ප්‍රශ්නය, වඳුරු ප්‍රශ්නය, පොල් ප්‍රශ්නය මතු කරන්න ඔවුන් උත්සාහ කළා. මේවා seasonal ප්‍රශ්න. මේ ප්‍රශ්න කාලයකදි නැති වෙනවා, අඩු වෙනවා, වැඩි වෙනවා. නමුත් මේවා ජාතික ප්‍රශ්න බවට පත් කරන්න ඔවුන් උත්සාහ කළා. මේවා ජාතික ප්‍රශ්න බවට පත් කරලා ඒ ඔස්සේ යන්න පසුගිය කාලයේ ඔවුන් උත්සාහ කළා. නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, මේ රට ප්‍රතිපත්තිමය වශයෙන් ගොඩනැඟිය යුතු රටක් බව. බිඳ වැටුණු රටක් ගොඩනඟන්න අවශ්‍ය ජාතික ප්‍රතිපත්ති මත තමයි අපි ඒ සෑම ක්ෂේත්‍රයකටම අවශ්‍ය මූලික අඩිතාලම දමන්නේ, පියවර තබන්නේ. අපි මේ රට භාරගෙන තිබෙන්නේ අවුරුදු 5කට. ඒකෙන් තවම ගතවෙලා තිබෙන්නේ මාස 3ක පමණ කාලයක්. මේ, අපේ පළමු අය වැය. මේක තමයි අපේ රටේ ඉදිරිපත් කරපු පළමු ජාතික අය වැය. මේක පළමු ජාතික අය වැය මිස කණ්ඩායමකගේ අය වැයක් නොවෙයි. මෙතැනින් එහාට අපි කොහොමද මේ යෝජනා ඉස්සරහට අරගෙන යන්නේ? අපි කොහොමද මේ රට හදන්නේ?

පළමු දේ තමයි, අලි-මිනිස් ගැටුමට විසඳුම් ලබා දීම. මේ ප්‍රශ්නයත් විපක්ෂය දිගින් දිගටම ඉදිරිපත් කළා. අද කිලෝමීටර් 1,450කට වැඩි ප්‍රමාණයක අලි වැට සංවර්ධනය කිරීම වෙනුවෙන් රුපියල් බිලියන 20ක පමණ මුදලක් වෙන්කර තිබෙනවා. කවදාවත් මෙවැනි මුදලක් පරිසර අමාත්‍යාංශයට වෙන් වෙනවා මීට පෙර අපි දැක්කේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඒවාට හේතුවන මූලික ප්‍රශ්නවත් මීට පෙර පැවති රජයන් හඳුනා ගත්තේ නැහැ. ඒ නිසා තමයි අලි-මිනිස් ප්‍රශ්නය ගැටුමක් දක්වා වර්ධනය වුණේ. වඳුරු ප්‍රශ්නය, රිළවු ප්‍රශ්නය වාගේ ප්‍රශ්න ජාතික ප්‍රශ්න බවට පත් වුණේ ඒවා මූලදී නොසලකා හැරපු නිසායි. අපි විශ්වාස කරනවා, අපේ රටේ ජාතික ප්‍රශ්න වෙන්න ඕනෑ දේවල් යටට ගිහිල්ලා ජනතාවට අදාළ නැති ප්‍රශ්න ජාතික ප්‍රශ්න බවට පත් කරමින් අවුරුදු ගණනාවක් කටයුතු කරගෙන ගිහින් තිබෙනවා කියලා.

මේ ප්‍රශ්න විසඳන්න මූලික වශයෙන් අවශ්‍ය ලේඛන සහිතව, සැලසුම්සහගතව නොවෙයි මීට පෙර පැවති රජයන් අය වැය ඇතුළු මේ සියල්ලම ප්‍රතිපත්තිමය ලෙස සකස් කළේ. නමුත් අද අපි ඒ දේවල් කරන්නේ එහෙම නොවෙයි, සාකච්ඡාවෙන්, යෝජනාවෙන්. සියලු දිස්ත්‍රික්ක ඇතුළුව සියලු පළාත්වල තිබෙන වුවමනා හඳුනාගෙන, ජනතාවට අවශ්‍ය, ජනතාව තෘප්තිමත් වන ආකාරයට, ජන මතය පැහැදිලිව නිරූපණය වන ජනතා අය වැයක් තමයි පළමු වතාවට මෙවර අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ඒ පිළිබඳව අපි එක් පැත්තකින් සතුටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි අය වැයක් වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේදී විපක්ෂය දක්වන මහජන අදහස් අපි අගය කරනවා. අපි විශ්වාස කරනවා, හෙට දවසේ මේ පහසුකම් බිමට යනකොට, අපි ඒවාට සම්පූර්ණයෙන් දායකත්වය සපයනකොට, මේ ලේඛනය මත පදනම් වෙලා තමයි මේ රට අලුත් රටක් ලෙස නැවත පණ ලබන්නේ කියලා.

අපි හිතනවා, අපට අදත් ජාතික නිෂ්පාදනයෙන් වැඩි පංගුවක් ලැබෙන්නේ සංචාරක ක්ෂේත්‍රය හරහා කියලා. සීගිරියේ ටිකට් එකක් ගත්තොත්, අදත් රුපියල් 10,000කට වැඩියි. අද යාල ප්‍රදේශයට ගියත්, මහ මුහුදු බලන්න ගියත් ඒවා සොබාදහම දීපු දේවල්. මේ විධියට සොබාදහමෙන් පෝෂණය වෙන දේවල්වලින් අපට කොච්චර ඩොලර් ප්‍රමාණයක් ලැබෙනවාද? අවුරුදු 2,000කට කලින් අපි සීගිරිය හැදුවේ ලෝක බැංකුවෙන්

ණය අරගෙන නොවෙයි, ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය අරගෙන නොවෙයි. එදා ඒ විශාල චිත්‍ර ඇන්දේ සීගිරි ගල මුදුනට ගිහිල්ලා. සීගිරියේ සිංහ පාදය ගත්තත්, කුරුටු ගීත ගත්තත්, ආලකමන්දාව ගත්තත්, අදත් අපි පුදුමයට පත් වෙනවා. සීගිරියෙන් ලැබෙන ඩොලර් අපට ඊයේත් ලැබුණා, අදත් ලැබෙනවා, හෙටත් ලැබෙනවා. මේ විධියට අවුරුදු 2,000ක් පුරා සීගිරියෙන් අපේ ජාතික ආර්ථිකයට පණ දෙනවා.

අපි මොනවාද මේ රටේ හැදුවේ? නෙළුම් කුලුනෙන් අපට ශත පහක්වත් ලැබෙන්නේ නැහැ. අපි දන්නවා, නෙළුම් කුලුන හදන්න ගත්ත ණය වෙනුවෙන් ජාතික ආදායමින් සියයට 60කට වඩා ලොකු පංගුවක් අපි ගෙවන බව. හැබැයි, ඒ නෙළුම් කුලුනට ගෙවන ණයවලිනුත් වැඩි ප්‍රමාණයක් අපි ගෙවන්නේ සීගිරියෙන් ලැබෙන ඩොලර්වලින්. ඒ නිසා තමයි අද අපේ ජාතික සම්පත් රැක ගැනීම අවශ්‍ය වෙන්නේ. ඒවා විකුණන්න නොවෙයි, සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම වෙනුවෙන් ඒවා ප්‍රවර්ධනය කරන්න ඕනෑ. අපි විශ්වාස කරනවා, අපේ රටේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය වෙනුවෙන් මේ අය වැයෙන් ලොකු කාර්යභාරයක් කරමින්, විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා කියලා. ඒ සඳහා සොබාදහමෙන් දීපු දේවලුත් යොදා ගන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා. අපට සම්පත් අනූන දූපතක විශාල වත්කම් ප්‍රමාණයක් තිබෙනවා.

ඒ සඳහා සැලැස්මක් සහිතව ලබන අවුරුද්දේ ලක්ෂ 30කට වැඩි සංචාරකයන් ප්‍රමාණයක් මේ රටට ගේනකොට ආර්ථිකය කොච්චර ප්‍රසාරණය වෙනවාද, ආර්ථික අවස්ථා කොපමණ පහළට ගලාගෙන යනවාද? යටිතල පහසුකම් වෙනුවෙනුත් මෙවර අය වැය තුළ අවස්ථා ගොඩක් සලසා දී තිබෙනවා.

ඒ නිසා මේක එක දවසක්, එක කණ්ඩායමක් වෙනුවෙන් සකස් කරපු අය වැයක් නොවෙයි. මේක සෑහෙන කාලයක් ඉදිරිය දැකලා සකස් කරපු අය වැයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළින් අපේ දැක්ම, අපේ වැඩ පිළිවෙළ, මේ රට ගමන් කරන දිශාව පෙන්නුම් කරනවා. අපේ ආර්ථික ප්‍රතිපත්තිය සමාජවාදීද, ධනවාදීද, ලිබරල්ද කියන ඒ මොකක්වත් නොවෙයි, මේ පවතින තැනින් ගොඩ එන්න අවශ්‍ය කරන සෑම දැනුමක්ම සහ ඒ සඳහා අවශ්‍ය කරන සියලු දේවල් එකට එකතු කරගෙන මේ රට නහාසිටුවීම වෙනුවෙන් සකස් වෙච්ච වැඩ පිළිවෙළක් තමයි, මේ. ලස්සන රටක පොහොසත් ජීවිතයක් ලබා දීම සඳහා සකස් කරපු මේ අය වැය හරහා අපි ජනතාවට හැම පැත්තෙන්ම සාධාරණය ඉෂ්ට කරනවා. ඒ පිළිබඳව අපේ රටේ ජනතාවට කරුණු කියන්නට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධනුෂ්ක රංගනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.02]

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියවස් ගණනක් අප දුටු හීනයක් තිබුණා. සියවස් ගණනක් අප දුටු ඒ හීනය සැබෑ කර ගැනීම වෙනුවෙන් අපේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරනු ලබන මංගල අය වැය විවාදයේ දෙවන වෙන් කළ දිනයේ අදහස් පළ කිරීමට අවස්ථාවක් ලබා දීම වෙනුවෙන් ප්‍රථමයෙන් ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, අප බලාපොරොත්තු වෙච්ච සමාජයක් තිබෙන බව. අපි දන්නවා, පසුගිය මැතිවරණයේදී මේ රටේ දේශපාලන පරිවර්තනයක් සිද්ධ වුණු බව. ඒ දේශපාලන පරිවර්තනය එතැනින් නතර කරන්න අපේ සූදානමක් නැහැ. අපේ ඉලක්කය දේශපාලන පරිවර්තනයක් ඇති කරගෙන අපට මන්ත්‍රී ධුර, ඇමති ධුර අරගෙන එතැනින් නතර වෙන්න නොවෙයි. අපේ ඉලක්කය ඒ දේශපාලන පරිවර්තනයට එහා ගිහිල්ලා, මේ රටේ සමාජ පරිවර්තනයක් ඇති කර ගැනීමයි. මේ රටේ පවතින මේ සමාජය වෙනුවට ඊට වඩා යහපත් සමාජයක් ඇති කර ගැනීම තමයි අපේ අරමුණ; අපේ ඉලක්කය. අන්න ඒ සමාජ පරිවර්තනය සිදු කර ගැනීම වෙනුවෙන් සමාරම්භය දක්වන අය වැයක් විධියට මේ අය වැය සඳහන් කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රටේ බලය ලබා ගන්නකොට අපට ලේසි පහසු රටක් නොවෙයි භාර ගන්න වුණේ. .දේශපාලන, ආර්ථික, සමාජයීය වශයෙන් උපරිම ආකාරයෙන් වටිටපු රටක් තමයි අපට භාර දුන්නේ. මෙන්න මේ වටිටපු රට සාමූහික ප්‍රයත්නයක් හරහා ගොඩගන්නේ කෙසේද කියා පෙන්වා දෙන අය වැයක් තමයි මෙවර අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා විපක්ෂයේ අය මොන තරම් අන්දුන්කුන්දුන් වුණත්, මේ අය වැය තුළින් මේ රට ඉදිරියට ගෙනියන වැඩසටහන අපි ක්‍රියාත්මක කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා, මේ රටේ සෞඛ්‍යයට, අධ්‍යාපනයට වැඩිම මුදලක් වෙන් කරලා තිබෙන්නේ මේ අය වැයෙන් බව. මේ රටේ ජනතාවට වඩාත් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ලබාදීම වෙනුවෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ආරම්භයේ සිටම මේ රටේ ජනතාව පිළිබඳව සිතා බලා කටයුතු කරන අය වැයක් විධියට අපට මෙය හඳුන්වා දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළ ඇතුළත් වන සුවිශේෂී කරුණක් මම පැහැදිලි කර දෙන්න කැමැතියි. අපේ ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමියත් පැහැදිලි කළ ආකාරයටම මේ අය වැයෙන් මලයගම් දෙමළ ජනතාව වෙනුවෙන් වැඩි අවස්ථාවක් සලසා තිබෙනවා. මෙහිදී මම මතක් කරන්න ඕනෑ, කන්ද උඩරට වාගේම අනෙකුත් ප්‍රදේශවල ජීවත් වෙන මලයගම් ජනතාව වෙනුවෙන් මේ අය වැයෙන් අවස්ථා වැඩි ගණනක් ගොඩනඟලා තිබෙන බව. විශේෂයෙන්ම අපේ කළුතර දිස්ත්‍රික්කය වාගේ දිස්ත්‍රික්ක ගත්තාම, ඒවායේ 45,000කට ආසන්න මලයගම් ජනතාවක් ජීවත් වෙනවා. ඒ ජනතාව කෙරෙහි අවධානය යොමු කරලා, මේ අය වැයෙන් ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් රුපියල් මිලියන 7,583ක් වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා.

මෙහිදී විශේෂයෙන්ම අපි අවධාරණය කරගන්න ඕනෑ කරුණක් තිබෙනවා. ඔවුන්ගේ ජීවන තත්ත්වය අපේ අනෙකුත් සමාජවල ජීවන තත්ත්වය හා සමාන නැහැ. ඔවුන්ගේ ජීවන තත්ත්වය අපේ අනෙකුත් සමාජවල ජීවන තත්ත්වවලට වඩා පහතින් තිබෙන්නේ. ඒ නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වය අපේ අනෙක් සමාජවල ජීවන තත්ත්වය හා සමාන කරගන්න නම් ඔවුන් පිළිබඳව වෙනදාටත් වඩා සොයා බලන්න ඕනෑ. අන්න ඒ සොයා බැලීම සඳහා කටයුතු කරන අය වැයක් විධියට තමයි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ අනුව වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය කරන්න කටයුතු කරනවා. අපි දන්නවා, මේ වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය දෙයක් කියලා. වතු ආශ්‍රිත පාරවල්, වතුර, වැසිකිළි පහසුකම් සියල්ල බිඳ වැටිච්ච කාලයක් තමයි අපි පසු කරමින් යන්නේ. ඒ නිසා වතු අංශයේ යටිතල පහසුකම් සංවර්ධනයට මෙවර අය වැයෙන් මේ ආණ්ඩුව

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. වතු පාසල්වල සුභූරු පන්ති කාමර ඇති කරන්න වාගේම, වතු නිවාස වැඩසටහන් ඇති කරලා ඔවුන්ගේ නිවාස ගැටලුවට විසඳුමක් ලබා දෙන්නත් කටයුතු කරනවා. අපි දන්නවා, ඔවුන් අවම පහසුකම් සහිත නිවසක්වත් නැතුව ලැයිම් කාමරවලට හිර වෙච්ච ජීවිතයක් තමයි ගත කරන්නේ කියලා. ඒ නිසා ඔවුන්ට අවම පහසුකම් සහිත නිවාස වෙනුවට හොඳ පහසුකම් සහිත නිවාස ලබා දීමේ වැඩසටහන ආරම්භ කළ යුතුව තිබෙනවා.

ඒ වාගේම, වතු ප්‍රජාව සවිබලගන්වන්නත් ආණ්ඩුව මුදල් වෙන් කර තිබෙනවා. මලයගම් තරුණයන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමට මෙහිදී විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඔවුන්ට වෘත්තීය පුහුණුව ලබා දීමට බලපාන එක හේතුවක් තිබෙනවා. ඒකට හේතුව මෙයයි. ඔවුන් වත්ත තුළ ආර්ථික වශයෙන් පීඩාවට පත් වෙලා ඉන්න මොහොතේ ඔවුන්ගේ ශ්‍රමය වත්තෙන් එළියට අරගෙන යනවා. ඒ ශ්‍රමය එළියට අරගෙන යද්දී නොවිධිමත් ආර්ථිකය තුළ ඔවුන්ගේ ශ්‍රමය තවදුරටත් සූරාකෑමකට ලක් වෙනවා. හැබැයි, මෙන්න මේ ආකාරයෙන් මලයගම් තරුණයන්ට වෘත්තීමය වශයෙන් අධ්‍යාපනය ලබා දීලා, ඔවුන් වෘත්තිකයන් බවට පත් කරලා ආර්ථිකයට මුදා හැරියොත් ඒ තරුණයන්ට මීට වඩා හොඳ ආර්ථික තත්ත්වයක් ස්ථාපිත කරගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙන්න මේ ආකාරයට මේ ජනතාවට නිවාස ඉදි කර දීලා, නිවාස නැති අයට නිවාස අරගෙන දෙන්න වැඩ කටයුතු කරන්න හදද්දී විපක්ෂයෙන් තවදුරටත් කියන්න උත්සාහ කරනවා, මේක රනිල්ගේම ආණ්ඩුවක්, මේක රනිල්ගේ ප්‍රතිපත්ති සහිත අය වැයක් කියලා. ඒගොල්ලන්ට වැරදිලා. රනිල්ගේ ප්‍රතිපත්තිවල, රනිල්ගේ අය වැය තුළ වැඩ කළේ මෙහෙම නොවෙයි. රනිල් බෙදා ගත්තේ, ගෙවල් හදලා දුන්නේ ගජ මිතුරන්ට. රනිල් ගෙවල් හදලා දුන්නා විතරක් නොවෙයි. මතක ඇති නේ, ඒගොල්ලන් ගෙවල් පුච්චා ගත්ත හැටි. ඒගොල්ලන් පුච්චා ගත්ත ගෙවල් කීපයක් තිබුණා නේ. ඒ පුච්චා ගත්ත ගෙවල්වලට රුපියල් කෝටි ගණනක මුදලක් ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, රනිල් වික්‍රමසිංහ අපට පටි තද කරගන්න කියලා ඔහුගේ ගජ මිතුරන්ට රුපියල් කෝටි 122.41ක් වන්දි වශයෙන් බෙදා දුන්නු බව. අය වැය ඉදිරිපත් කරලා අපට පටි තද කරගන්න කියලා ඒ අය වැයවලින් ඔහුගේ ගජ මිතුරන්ට බැබළෙන්න විශාල මුදලක් වෙන් කර තිබෙනවා. එම නිසා මේක රනිල් වික්‍රමසිංහගේ අය වැයක් කියලා කියන ඒ මහත්වරුන්ට අපි ඒ කාරණයත් මතක් කරලා දෙන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි. මේක රනිල් වික්‍රමසිංහගේ අය වැයක් කියන මහත්වරුන්ට මේවාත් අමතක වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි vehicle permits නතර කර තිබෙනවා. මේ වසරේදී වාහන ගෙන්වන එක නතර කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මන්ත්‍රීවරයෙකුගේ රක්ෂණය රුපියල් ලක්ෂ 10 සිට ලක්ෂ 2 ½ දක්වා අඩු කරලා තිබෙනවා. ආණ්ඩුව මේ විධියට ආණ්ඩුවේ වරප්‍රසාද කප්පාදු කරගෙන ජනතාවට සහන දෙන්න කටයුතු කරද්දීත් මඩ ගහන්න හදනවා, මේක අරයාගේ අය වැයක්, මෙයාගේ අය වැයක් කියලා. එහෙම කියන්න හේතුවකුත් තිබෙනවා. මේ අය වැය ගැන ඒගොල්ලන්ට වෙන කියන්න දෙයක් නැති නිසා තමයි ඒවා මතුරමින් යන්නේ. ඒක පටන් ගත්තේම විපක්ෂය පැත්තේ ඉන්න අර ආර්ථික න්‍යායාචාර්යවරයා. මාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා ඔහු තමයි මේක රනිල්ගේ අය වැයක්, අරයාගේ අය වැයක් කියලා පෙන්වන්න හදන්නේ. නමුත් ඒ බොරු පුහු තර්කය මේ වෙනකොට බිඳ වැටිලා අවසන්.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අය වැය තුළින් Clean Sri Lanka වැඩසටහන සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. අපි දන්නවා, Clean Sri Lanka වැඩසටහන කියන්නේ මේ සමාජය පිම්මක් ඉදිරියට ගෙනියන්න පුළුවන් වැඩසටහනක් කියලා.

මම කලිනුත් කිව්වා, අපේ රට දේශපාලනික වශයෙන් වෙනස් කරගෙන තිබෙන බව. අපි අද ආර්ථික ස්ථාවරත්වයක් ඇති කරගෙන තිබෙනවා. එතැනින් එහාට ගිහිල්ලා අපට රට සමාජීය වශයෙන් ගොඩ නඟන්න අවශ්‍යයි - socially. එතැනින් එහාට රට පාරිසරික වශයෙන් ගොඩ නඟන්න අවශ්‍යයි - environmentally. අපි අපේ පරිසරය ගොඩ නඟාගන්න ඕනෑ. ඉන් අනතුරුව අපට අවශ්‍යයි ආචාර ධර්මිකව මේ රට ගොඩනඟා ගන්න - ethically. අන්න ඒ විධියට සමාජය, පරිසරය, ආචාර ධර්ම ගොඩ නඟන වැඩසටහන මේ රටේ ජනතාවත් ඒකාබද්ධ කරගෙන, සාමූහික ජනතා සහභාගිත්වයක් සහිත ව්‍යාපෘතියක් විධියට තමයි මේ Clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ.

ඔබතුමන්ලාට මතක ඇති, මේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳව අපි දින දෙකක් විවාද කළා. මේ Clean Sri Lanka වැඩසටහන පිළිබඳව විවාද කරද්දී විපක්ෂයේ මන්ත්‍රීවරු මේ විධියටම කිව්වා, මේක වෙන්නේ නැති වැඩක්, බොරු වැඩක්, මේක සැරසිල්ලක් විතරයි කියලා. එහෙම කියන්න හේතුත් ඒගොල්ලන් කිව්වා. ඒ අය කිව්වා, මේ වැඩසටහනට මුදල් වෙන් කරලා නැහැ කියලා. මේ මගේ අතේ තිබෙන්නේ ඒ හැන්සාඩ් වාර්තාව. ඒ කියපු දේවල් මේකේ සඳහන් වෙලා තිබෙනවා. "මේකට මුදල් වෙන් කරලා නැහැ, මේක ක්‍රියාත්මක වන එකක් නොවෙයි" කිව්වා. එහෙම බොරු කියලා තමයි ඒ අය ඒ විවාදයේදීත් කටයුතු කළේ. ඒ විවාදය කරලා මේ විවාදයට එද්දී ඒගොල්ලන්ට කියපුවා අමතක වෙලා තිබෙන්නේ. මේ වැඩසටහනට වෙන් කර තිබෙනවා, රුපියල් මිලියන 5,000ක්. ඒ නිසා දැන් ඒගොල්ලන්ට කියන්න වෙන දෙයක් නැහැ. ඒ නිසා තවදුරටත් බොරු ඇදබාමින් යන තත්ත්වයක තමයි ඒ අය ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අපි මතක් කර දෙන්න ඕනෑ, මේ අය වැයේදී ශ්‍රී ලාංකික දිනයක් ප්‍රකාශයට පත් කර තිබෙන බව. මේ "ශ්‍රී ලාංකික දිනය" -ජාතික උත්සවය- පැවැත්වීම අනාගතයේදී ක්‍රියාත්මක වේවි. ඒ සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා. මේ ශ්‍රී ලංකා දිනයේ සමාරම්භය තමයි පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය. ඒකට හේතුව මම කියන්නම්. මේ රටේ උතුර, නැඟෙනහිර, මධ්‍යම සහ දකුණේ සියලු ජනතාව එකට එකතුවෙලා ජාතිය ගොඩනඟා ගැනීම වෙනුවෙන් ඒ සියලු ජනතාවගේ සහභාගිත්වයෙන් ආණ්ඩුවක් ගොඩනඟා ගත්තා. ඒ තමයි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව. ඒ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව, සියලු ජනතාවට සංස්කෘතික වශයෙන් එකතු වෙන්න පුළුවන් දිනයක් වෙන්කර තිබෙනවා. අන්න ඒ දිනය තමයි "ශ්‍රී ලාංකික දිනය" විධියට ඉදිරියේදී පවත්වන්න කටයුතු කර තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් යෝජනා රැසක් මේ අය වැයේ තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(මාණ්පුමිකු තනුෂ්ක රංගනාත්)
(The Hon. Danushka Ranganath)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ජනතාවගේ සුඛසාධනය වෙනුවෙන් විශාල යෝජනා රැසක් ක්‍රියාත්මක කරගෙන යන්න මේ ආණ්ඩුව කටයුතු කරනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම මේ රටේ ජනතාවට "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ගොඩ නැඟීමට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කරනවා. එතැනින් එහාට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඉදිරියට යන එක කිසිවෙකුටත් නවත්වන්න බැහැ කියලා ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මොහමඩ් සාලි නලීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 5.15]

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(මාණ්පුමිකු මොහමට් සාලි නලීම්)
(The Hon. Mohamed Sali Naleem)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையிட்டு முதலில் இறைவனுக்கு நன்றி கூறுகின்றேன்.

இந்த நாட்டில் இனவாதம், பிரதேசவாதம், மதவாதம் என்பன புரையோடிப்போயிருந்த வேளையில், ஒரு மீட்சியாளராகத்தான் சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களை ஒட்டுமொத்த இலங்கை மக்களும் பார்த்தார்கள். கிழக்கு மாகாணம் தவிர்ந்த ஏனைய பகுதிகளுக்கு இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் பல்வேறு நன்மைகள் கிடைக்கப்பெற்றுள்ளன. நாங்களும் இலங்கையர்கள்தான்; இலங்கை மக்கள் வாழுகின்ற மாவட்டத்தைச் சேர்ந்தவர்கள்தான் என்ற அடிப்படையில், இந்த வரவு செலவுத்திட்டத்தில் கிழக்கு மாகாணம் புறக்கணிக்கப்பட்டு இருப்பதாகவே நாங்கள் கருதுகின்றோம். எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் வட மாகாணத்திலுள்ள கிராமிய வீதிகள் மற்றும் பாலங்களை மேம்படுத்துவதற்காக 5,000 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருக்கிறார். அங்கு வாழுகின்ற மக்கள் யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்கள்! அவர்களுக்கு இந்த வரவு செலவுத்திட்டத்தினூடாக இன்னும் அதிகளவு நிதியை ஒதுக்கலாம். அதில் எங்களுக்கு எந்தப் பிரச்சினையும் இல்லை. ஆனால், எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்ட உரையில் இந்திய அரசாங்கத்தால் கிடைக்கவிருக்கின்ற நிதி மூலமாகத்தான் கிழக்கு மாகாணம் அபிவிருத்தி செய்யப்படுமெனக் கூறினார். உண்மையிலே இது கவலைக்குரிய விடயமாகும். இது, "உயிரோடு இருக்கின்ற பிள்ளைக்கு உணவு கேட்டால், வயிற்றில் இருக்கின்ற பிள்ளை பிறக்கட்டும்; உணவு தருகிறோம்" என்ற கதைபோல் இருக்கின்றது. எனவே, இந்த நிலை மாற வேண்டும்.

கிழக்கு மாகாணமும் யுத்தத்தால் பாதிக்கப்பட்ட ஒரு பிரதேசம்! அங்கும் நிறையப் பிரச்சினைகள் இருக்கின்றன. கடந்த கால ஆட்சியாளர்கள் அங்கு திட்டமிட்டு இனவாதத்தையும் பிரதேசவாதத்தையும் மதவாதத்தையும் விதைத்தார்கள். அங்கு பிட்டும் தேங்காய்ப்பூவும் போல வாழ்ந்த முஸ்லிம், தமிழ், சிங்கள மக்கள் மத்தியில் இனவாதத்தை விதைத்து, அவர்களைப் பிரித்தாண்டார்கள். நகமும் சதையும் போல் வாழ்ந்த அந்த மக்களை எதிரிகளாக, சந்தேகக் கண்கொண்டு பார்ப்பவர்களாக, ஒருவர் மற்றையவரை கொலைகாரர் போன்று சித்திரிக்கின்றவர்களாக கடந்த ஆட்சியாளர்கள் மாற்றினார்கள். அதிலிருந்து அந்த மக்களை மீட்கின்ற ஒரு மீட்சியாளராகத்தான் நாங்கள் இன்று எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்களைப் பார்க்கின்றோம்.

மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டங்களாக இருக்கலாம், அங்கு நடைபெறுகின்ற தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் ஒட்டுமொத்த வேலைத்திட்டங்களாக இருக்கலாம். அவற்றை கௌரவமாக முன்னெடுக்கின்ற வகையில், கிழக்கு மாகாண ஆளுநர் பேராசிரியர் ஜயந்த லால் ரத்னசேகர அவர்களும் எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவராக இருக்கின்ற கௌரவ பிரதி அமைச்சர் அருண் ஹேமச்சந்திர அவர்களும் பிரதேச அபிவிருத்திக் குழுவின் தலைவராக இருக்கின்ற கௌரவ கந்தசாமி பிரபு அவர்களும் செயற்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். அவர்கள் இன, பிரதேச வாதங்களைக் கடந்து, நல்லாட்சியை ஏற்படுத்த வேண்டுமென்ற நோக்கிலேயே செயற்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். அதற்காக நான் இந்த இடத்தில் அவர்களுக்கு நன்றி கூறுகின்றேன்.

இந்த நாட்டின் தேசிய வருமானத்துக்கு கிழக்கு மாகாணம் 33,449.6 மில்லியன் ரூபாயைப் பெற்றுத் தருகின்றது என்பது உங்களுக்குத் தெரியும்! அப்படி இருக்கையில், எங்களுடைய பகுதியிலும் அபிவிருத்தி வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டுமென்ற நியாயமான கோரிக்கையைத்தான் நாங்கள் உங்களிடம் முன்வைக்கின்றோமே தவிர, அரசாங்கத்தை குற்றம் சொல்வதற்கோ அல்லது தேசிய மக்கள் சக்தியைப் பிழையான முறையில் சித்திரிப்பதற்கோ நாங்கள் முற்படவில்லை.

கடந்த ஆட்சியில் ஏறாவூர் பகுதியில் அமைந்திருக்கின்ற காதியார் வீதிக்கு சுமார் 120 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டது. அந்த வேலைத்திட்டத்துக்குரிய கேள்விமனு கோரப்படுவதில் ஏற்பட்ட கால தாமதத்தினால் அந்த நிதி திரும்பப் பெறப்பட்டு இருக்கின்றது. மேலும், அங்குள்ள அலிகார் தேசிய பாடசாலையின் உள்ளக விளையாட்டு மைதானத்துக்கென நிதி ஒதுக்கீடு செய்யப்பட்டபோதிலும், போதியளவு காலம் கிடைக்காத காரணத்தினால் அது அரைகுறையாகக் காணப்படுகின்றது. ஏறாவூர் வைத்தியசாலையில் இடநெருக்கடி காணப்படுகின்றது. இந்த வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின்மூலம் அதனையும் தீர்க்க வேண்டும்.

கடந்த கால ஆட்சியில் வீதி அபிவிருத்தி வேலைத்திட்டங்கள் செய்யப்பட்டபோதிலும், ஏறாவூர் பிரதான வீதியில் திருக்கொண்டியாமடுவில் இருந்து பொத்துவில் வரையான பகுதியை அகலமாக்குகின்ற வேலைத்திட்டம் அப்போதிருந்த ஆட்சியாளர்களின் அசமந்தப் போக்கின் காரணமாக கைவிடப்பட்டிருந்தது. அதன் மூலமாக அங்கு பாரிய accidents - விபத்துகள் - ஏற்படுகின்றன. அந்த நிலைமையை மாற்ற வேண்டுமானால், நிதி ஒதுக்கீடு

[ගරු මොහමඩ් සාලි නලීම් මහතා]

செய்யப்பட்டு அந்த வீதியின் இரண்டு பக்கங்களும் அகலமாக்கப்பட வேண்டும்.

திகாமடுல்ல தேர்தல் மாவட்டத்தில் ஒலுவில் துறைமுகம் அமைந்திருக்கிறது. இது எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் முன்னாள் தேசியத் தலைவர் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரப் அவர்களால் கொண்டுவரப்பட்ட வேலைத்திட்டம்! கடந்த கால ஆட்சியாளர்கள் இந்த வேலைத்திட்டத்தை இன ரீதியாகப் பார்த்ததனால், இன்று ஒலுவில், கல்முனை, அக்கரைப்பற்று, சம்மாந்துறை போன்ற கரையோரப் பகுதிகள் கடலரிப்பின் மூலமாகப் பாதிக்கப்பட்டு, நாளுக்கு நாள் அங்குள்ள மக்களின் நிலங்கள் கடலுக்குள் உள்வாங்கப்பட்டுக்கொண்டு இருக்கின்றன. கடந்த காலங்களில் ஆட்சியாளர்கள், பாராளுமன்ற உறுப்பினர்கள், அரச திணைக்களத் தலைவர்கள் அந்த இடத்துக்கு field visit செய்திருந்தாலும்கூட, அப்பொழுது இருந்த அரசாங்கம் இந்த வேலைத்திட்டத்தை இன ரீதியாகப் பார்த்து, அதற்கான நிதியை ஒதுக்கீடு செய்யவில்லை. அதன் காரணமாக இன்னமும் அந்த வேலைத்திட்டம் அரைகுறையாகவே இருக்கின்றது.

மேலும், கல்ஓயா, இகினியாகல போன்ற பகுதிகளில் இருந்து வருகின்ற நீர், களியோடை பாலத்தை ஊடறுத்து வருகின்ற சந்தர்ப்பத்தில், அந்த நீர் தென்கிழக்குப் பல்கலைக்கழகத்தினுள் உள்நுழைகின்றது. இதன்மூலமாக அந்தப் பல்கலைக்கழகத்தின் ஒட்டுமொத்தச் செயற்பாடுகளும் பாதிக்கப்படுகின்றன. அங்குள்ள வளங்கள், கட்டிடங்கள் பாதிக்கப்படுவதுடன், மாணவர்கள் கல்வி நடவடிக்கைகளில் ஈடுபட முடியாதளவுக்கு அசௌகரியங்களும் ஏற்படுகின்றன. எனவே, இதுதொடர்பில் முறையான ஒரு வேலைத்திட்டத்தை முன்னெடுக்க வேண்டும். அங்கு தடுப்பு அணையை அமைத்து, அந்தப் பல்கலைக்கழகத்தின் செயற்பாடுகளுக்கு இந்த அரசாங்கம் போதியளவு நிதி ஒதுக்கீட்டை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

புத்தளம் வாழ் மக்களின் பிரதிநிதியாகச் செயற்பட்ட முன்னாள் பிரதி அமைச்சர் மர்ஹூம் கே. பாயிஸ் அவர்கள் அம்மக்களுக்கு அளப்பரிய பணிகளை ஆற்றியிருக்கிறார். அன்னாருடைய 'கப்ரு' வாழ்க்கையை அல்லாஹுத்தஆலா பொருந்திக்கொள்ள வேண்டும். அன்னாரின் ஞாபகார்த்தமாக நிர்மாணிக்கப்பட்ட memorial hallஇன் - auditorium buildingஇன் - கூரை காற்றினால் சேதமடைந்து சுமார் ஆறு மாத காலமாகியும் இன்னமும் திருத்தப்படாத நிலையில் இருக்கின்றது. இதற்கு திட்டமிடப்படாத ஓர் அபிவிருத்தித் திட்டம்தான் காரணமாக இருக்கின்றது. அன்னார் புத்தளம் நகர சபைக்குரிய எல்லையில் 'அல்பா - பீற்றா' என்ற shopping complexஐ அமைத்திருந்தார். அதற்கான நிதியீட்டல் மூலமாக சுமார் 80 மில்லியன் ரூபாய் செலவு செய்தும் இன்னமும் அந்த வேலைத்திட்டம் முடிக்கப்படாத நிலையில் காணப்படுகின்றது. அதற்கான நிதிகளை வழங்கி, முடித்துத்தருமாறு நான் இந்த இடத்தில் வேண்டிக் கொள்கின்றேன்.

கிழக்குப் பல்கலைக்கழகத்துக்கு சுமார் 2.4 பில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. நல்ல விடயம்! அங்கு கற்கின்ற மருத்துவ பீட மாணவர்களின் நலனைக் கருத்திற்கொண்டு, மாண்புமிகு சனாதிபதி அவர்கள் அந்த நிதியை ஒதுக்கீடு செய்திருக்கிறார்கள். அதற்காக நான் அவருக்கு இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். கடந்த காலங்களில் Professorial Unit என்ற Unitக்கு MRI scannerஐ கொள்வனவு- purchasing - செய்வதற்கான கேள்வி விண்ணப்பங்கள் கோரப்பட்டும், வைத்தியத்துறையில் இருக்கின்ற சில மாபியாக்கள் காரணமாக அது தடைப்பட்டதாக அந்த மக்கள் விசனம் தெரிவிக்கின்றார்கள். அந்த MRI scanner கிடைத்திருந்தால், அங்கு கல்வி கற்கின்ற வைத்திய மாணவர்களுக்கு அது பிரயோசனமாக இருந்திருக்கும். இம்முறை ஒதுக்கப்பட்டிருக்கின்ற 2.4 பில்லியன் ரூபாயிலிருந்தாவது அந்த MRI scannerஐப் பெற்றுக்கொடுத்தால், அதன்மூலம் Professorial Unitஇல் கற்கின்ற ஒட்டுமொத்த வைத்திய மாணவர்களும் பிரயோசனமடைவார்கள் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த வரவு செலவுத்திட்டத்தில் ஊடகவியலாளர்களுக்கான வீடமைப்பு பற்றிக் குறிப்பிட்டது உங்களுக்குத் தெரியும்! கடந்த அரசாங்க காலத்தில் எங்களுடைய மாவட்டத்தில் இருக்கின்ற ஊடகவியலாளர்களுக்குக் காணிகள் வழங்கப்பட்டன. ஆனால், துரதிருஷ்டவசமாக எங்களுடைய முஸ்லிம் ஊடகவியலாளர்கள் அதில் புறக்கணிக்கப்பட்டு இருந்தார்கள். அந்த நிலைமை மாற வேண்டும். சிங்கள, தமிழ் ஊடகவியலாளர்களுக்கு காணி வழங்கியதை நான் பிழையெனச் சொல்லவில்லை. ஆனால், கடந்த ஆட்சியாளர்கள் திட்டமிட்டு இனவாதத்தைப் பரப்பும் நோக்கிலேயே முஸ்லிம் ஊடகவியலாளர்களுக்குக் காணிகளை வழங்கவில்லை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මොහමඩ් සාලි නලීම් මහතා
(மாண்புமிகு மொஹமட் சாலி நழீம்)
(The Hon. Mohamed Sali Naleem)
මට විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அந்த நிலையை மாற்றி, முஸ்லிம் ஊடகவியலாளர்களுக்கும் காணிகளை வழங்குமாறு நான் இந்த கௌரவ சபையில் கேட்டுக் கொள்கின்றேன். கடந்த தேர்தலில் இந்த நாட்டிலுள்ள கிட்டத்தட்ட 70 சதவீதமான முஸ்லிம் மக்கள் தேசிய மக்கள் சக்திக்கு வாக்களித்து இருந்தார்கள். குறிப்பாக, கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் 80,000க்கும் மேற்பட்ட முஸ்லிம்கள் வாக்களித்து இருந்தார்கள். எனவே, இந்த வரவு செலவுத்திட்டத்தின் மூலமாக கிழக்கு மாகாணத்துக்கு அதிகளவு நிதியை ஒதுக்கி, அங்கு அபிவிருத்தி வேலைத்திட்டங்களை முன்னெடுக்குமாறு கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.27]

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ 2025 වර්ෂයේ අය වැය පිළිබඳ විවාදය වෙනුවෙන් සහභාගි වෙන්න ලැබීම සුවිශේෂී අවස්ථාවක් කියලා මම විශ්වාස කරනවා. ඉදිරිපත් කරන ලද මේ අය වැය සම්ප්‍රදායයෙන් බැහැර වූ, ජනතාවාදී, ප්‍රගතිශීලී, විද්‍යාත්මක අය වැයක් කියා අපි විශ්වාස කරනවා - රට විශ්වාස කරනවා.

සාමාන්‍යයෙන් අය වැයකට විවේචනාත්මක ඉදිරිපත් කිරීමක් අවශ්‍යයි. නමුත්, මේ අය වැයට විවේචනාත්මක ඉදිරිපත් කිරීම් අඩුයි. අපි දන්නවා, මේ අය වැයේ පෙනුමත්, හරයත් දෙකම අන්තර්ගතයි කියලා. මේකට හොඳ පෙනුමක් තිබෙනවා වාගේම හොඳ හරයක් ද තිබෙනවා. මෙය, ලස්සන පෙනුමත්, හොඳ, ගුණාත්මක හරයත් සහිත දෙයක්. මෙය පොත්තත් ලස්සන, මදයත් ගුණවත්, රසවත්, කල් පැවැත්මක් තිබෙන අය වැයක් කියලායි අප විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැය කියන්නේ අපේ රජයේ පළමුවැනි අය වැයයි. අපේ slogan එක "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එකයි. අපේ මූලික වැඩ පිළිවෙළ ඒ වෙනුවෙනුයි. මේ සමස්ත අය වැය ලේඛනය දිහා බැලුවාට පසුව එය ඉතා මැනවින් පිළිබිඹු වෙනවා. අපි අපේ රටට සැලසුම් කර තිබෙන්නේ නිෂ්පාදන ආර්ථිකයක්; නිෂ්පාදන ආර්ථිකයට මහ ජනතා සහභාගිත්වයක්; නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව බෙදී යන වැඩ පිළිවෙළක්. ඊට අදාළ යෝජනා අන්තර්ගත වෙච්ච යථාර්ථවාදී අය වැයක්, මේ අය වැය. පසුගිය දවස්වල අපට විපක්ෂයෙන් ලැබුණු විවේචන ගෙන බැලුවාට පසුව, අපට ඒ විවේචනවල සාධනීය පැත්තක් දකින්න තිබුණේ නැහැ. එතුමන්ලාගේත් හෘදය සාක්ෂිය කියනවා, මේ අය වැයේ පෙනුමයි, හරයයි දෙකෙන්ම ඇත්ත දේ නිරූපණය වෙනවා කියලා; ලස්සන පිට පොත්තක් තිබෙන, මදයත් රසවත්, ගුණවත්, කල් පැවැත්මක් තිබෙන අය වැයක් කියලා.

අපේ ආර්ථික ප්‍රතිපත්තිය පදනම් කරගෙන තිබෙන්නේ නිෂ්පාදන ආර්ථිකයයි. අපේ රජය බලයට පත් වෙලා මාස 5ක වාගේ කාලයක් වෙන්නේ. මේ කාලය තුළ අපට ආර්ථිකයේ විවිධ ව්‍යසනවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. හාල් ප්‍රශ්න ආවා, පොල් ප්‍රශ්න ආවා. ඒ කියන්නේ, එක්තරා කාලයකට එන ප්‍රශ්න ආවා; කන්නයකට එන ප්‍රශ්නත් ආවා. අපි ඒ ප්‍රශ්නවලට මුහුණ දුන්නා; ඒ වගකීම් භාර ගත්තා. මේවා මීට පෙර වෙච්ච දේවල ප්‍රතිඵලයි කිය කියා අපි විවේචනය කරන්න ගියේ නැහැ. එම ගැටලු විසඳීමට අදාළව ඉදිරි සැලැස්මක් අපි මේ අය වැය තුළ හදලා තිබෙනවා. ඒක බොහොම පැහැදිලියි.

මෙවර අය වැය ගත්තාම පෙනෙනවා, වී වගාව වෙනුවෙන් අපට සැලැස්මක්, වැඩ පිළිවෙළක් තිබෙන බව. අනුර කුමාර දිසානායක මැතිතුමා බලයට පත් වෙච්ච මොහොතේ ඉඳලා මේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් සඳහා වන සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ඔස්සේ අපි ආවා. ඒ වැඩ පිළිවෙළ තුළ පළමුවෙනි මොහොතේ අමාත්‍යාංශ වෙන් කරන කොටම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්, වාරිමාර්ග කියන අමාත්‍යාංශ හතර එක අමාත්‍යාංශයකට ගත්තා. විද්‍යාත්මක පදනමකින් තමයි අපි මේ වැඩ පිළිවෙළට ප්‍රවේශ වුණේ. අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපතිවරණය ජයග්‍රහණය කරලා පළමුවෙනි දවස් 10 ඇතුළත මේ රටේ වී වගා කරන ගොවි ජනතාව වෙනුවෙන්, වගා කරන සෑම හෙක්ටෙයාරයකටම රුපියල් 25,000ක සහනාධාරයක් දුන්නේ ඇයි? මේ ආර්ථිකය හදන්නයි. මෙන්න, ඇත්ත තත්ත්වය. ධීවර ජනතාව වෙනුවෙන් ඉන්ධන සහනාධාරයක් ලබා දුන්නේ ඇයි? අපට දැක්මක් තිබෙනවා. ඒ දැක්මට අනුව වැඩ කරන්න තමයි අප මේ සූදානම් වන්නේ.

පසුගිය දවස්වල තවත් අර්බුදයක් ආවා. ඒ තමයි, කැකුළු හාල් අර්බුදය. අපි ඒක පිළිගත්තා. ඒක අපේ පාලනයක් තුළ වෙච්ච දෙයක් නොවෙයි. හැබැයි, අපේ රජය ඒක පිළිගත්තා. අපි ඒකට වැඩ පිළිවෙළක් හැදුවා. ඒ නිසා තමයි මේ වතාවේ මේ රාජ්‍ය අය වැය තුළින් වී වගාව සඳහා රුපියල් බිලියන 35ක් වෙන් කළේ. අපි ඒ වෙනුවෙන් රුපියල් මිලියන 35,000ක් වෙන් කර තිබෙනවා. 2025 වර්ෂය වෙනුවෙන් වී මිලදී ගැනීම සඳහා තවත් රුපියල් බිලියන 5ක්, -මිලියන 5,000ක්- වෙන් කර තිබෙනවා. ඊට අමතරව ගොවිතැන වෙනුවෙන්, කෘෂි කර්මාන්තය වෙනුවෙන් වාරිමාර්ග කටයුතු සඳහා 2025 වර්ෂයට රුපියල් බිලියන 78ක් වෙන් කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සැලැස්මකට තමයි යන්නේ මේ වැඩ පිළිවෙළ. දැන් අර කැකුළු හාල් ප්‍රශ්නයත් ඉවරයි නේ. ඉදිරියට එවැනි ප්‍රශ්නයක් ඇති වෙන්න ඉඩ තියන්නේ නැහැ. බොහොම පැහැදිලිව කියන්නේ, මේ රට අපි ගොඩ දානවා. මේ රට නිවැරදි තැනකට ගෙනියන්න අපි කටයුතු කරනවා. අපි රටවාසීන්ගෙන් ඉල්ලා සිටිනවා, මෙවර අය වැය ජනතාවාදී ප්‍රගතිශීලී අය වැයක් නිසා, පෙනුමත්, හරයත් එක හා සමාන නිසා අපිත් එක්ක අත්වැල් බැඳගෙන මේ ගමන යමු කියලා.

රටේ නිෂ්පාදන ආර්ථිකය වෙනුවෙන්, කෘෂි කර්මාන්තය වෙනුවෙන් දැවැන්ත සැලැස්මක් සහ වැඩ පිළිවෙළක් අපට තිබෙනවා. ඒ නිසා තමයි මේ වැඩ පිළිවෙළට ගොවි ජනතාව සහභාගි කරවා ගන්නේ. අපි දන්නවා, ගොවීන් නෙළා ගන්කා අස්වැන්න පාරිභෝගික ජනතාව කරා ගෙන යෑමේදී අර්බුදවලට මුහුණ පානවා. ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා තමයි නෙළා ගනු ලබන අස්වැන්න පාරිභෝගික ජනතාව කරා ගෙන යෑම දක්වා වන ප්‍රවාහන ගැටලුවට විසඳුමක් වශයෙන් දුම්රිය පද්ධතියක් ස්ථාපිත කරන්න අපි මෙවර අය වැය තුළ සැලසුම් හදලා තිබෙන්නේ. කල් පැවැත්මක් තිබෙන වැඩ පිළිවෙළක් සහිත ක්‍රමයක් තමයි මේ තිබෙන්නේ.

දැන් පොල් අර්බුදයක් ආවානේ. දැන් තිබෙන්නේ අපේ රජයක්නේ. අපි ඒක පිළිගත්තා. කලින් කරපු දේවල් නිසා තමයි මේ ප්‍රශ්න ඇතිවෙලා තිබෙන්නේ. නමුත් අපි ඒක පිළිගත්තා. අන්න ඒ නිසා අපි සැලැස්මක් හැදුවා. අපේ සැලැස්මට අනුව 2030 වෙනකොට තත්ත්වය කොහොමද? මේ රටට පොල් ගෙඩි මිලියන 4,500ක් අවශ්‍යයි. එයින් 1,800ක් ගෘහස්ථ පරිභෝජනයට. 2,700ක් කර්මාන්ත සඳහා. ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් ලෙස අපි සකස් කරලා තිබෙනවා "උතුරු පොල් ත්‍රිකෝණය" ආරම්භ කරන්න. උතුරු පොල් ත්‍රිකෝණය ආරම්භ කරලා ඒ කටයුතු කරන්න පළමු මොහොතේ අපි රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකයක් වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. මේක අපේ තමයි දැක්ම, මේක තමයි වැඩ පිළිවෙළ.

ඒ වාගේම ධීවර කර්මාන්තය ගැන කථා කළොත්, අපේ රට වටේම මුහුදක් තිබෙනවා. ඒ මුහුදෙන් මේ රටට අවශ්‍ය මත්ස්‍ය සම්පත නෙළා ගන්න පුළුවන්. ඒ සඳහා මේ කාලයේ වෙන් කරන්න පුළුවන් ඉහළම මුදල මෙවර අය වැයෙන් වෙන් කළා.

[ගරු රත්න ගමගේ මහතා]

අපි දැක්කා, ධීවර කර්මාන්තය සඳහා ගිය අවුරුද්දේ අය වැයෙන් වෙන් කර තිබුණේ රුපියල් මිලියන 7,000යි. 2025 රාජ්‍ය අය වැයෙන් ඒ සඳහා රුපියල් මිලියන 11,400ක්, ඒ කියන්නේ රුපියල් බිලියන 11.4ක් වෙන් කර තිබෙනවා. එතැන සියයට 62.85ක වර්ධනයක් තිබෙනවා. මේ තමයි අපේ නිෂ්පාදන ආර්ථිකය ඉදිරියට ගෙන යන සැලැස්ම. අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි දැක්මක් සහිතවයි ඉදිරියට යන්නේ. කෘෂි කර්මාන්තය, වැවිලි කර්මාන්තය, සත්ව සංවර්ධනය, ඒ වාගේම, කර්මාන්ත ක්ෂේත්‍රය ඇතුළු නිෂ්පාදන ආර්ථිකයට සැලකිය යුතු පංගුවක් වෙන් කර තිබෙනවා, මෙවර අය වැයෙන්.

මේ රටේ නිෂ්පාදනයත් එක්කම අපට වැදගත් වෙන්නේ, ජාතික ආර්ථිකය ගොඩනැඟීම සඳහා වන මහජන සහභාගිත්වයයි. ඒ වෙනුවෙන් වන කරුණු තමයි මේ රාජ්‍ය අය වැයේ සඳහන් කරලා තිබෙන්නේ. ජනතා සහභාගිත්වය ඇති කරන්නේ සමුපකාර පදනම් කරගෙන. අමුල් සමාගම, ෆොන්ටෙරා වාගේ New Zealand dairy cooperativesවලින් අපට ගන්න පුළුවන් ආදර්ශය තමයි, "එකා සැමටත්, සැම එකාටත්" කියන සංකල්පය. ඒ සංකල්පය යටතේ වූ සමුපකාරික ප්‍රතිපත්තිය පදනම් කරගත් ක්‍රමයක් තමයි මේ ආර්ථිකය ගොඩනැඟීමට අවශ්‍ය ජනතා සහභාගිත්වය සඳහා අපි ගොඩනඟලා තිබෙන්නේ. ආරම්භයේදී මෙවර අය වැයෙන් ඒ වෙනුවෙන් රුපියල් මිලියන 500ක වාගේ මුදලක් වෙන් කර තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකයට ජනතාව සහභාගි කරවා ගන්න ඕනෑ.

ඒ වාගේම මේ අවුරුද්දේ ඉදිරි කන්නවල වී අස්වැන්න නෙළාගන්න ගමේ සමිතිවලට අදාළ බලය දෙන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ගමේ සමිතිය හදනවා; වී මෝල් ස්ථාපිත කරනවා; ගොයම් ටික කපනවා; වී ටික ගේනවා; සහල් බවට පත් කරනවා; ජනතාවට බෙදා හරිනවා. අන්න, ජනතාව අතට තමයි ඒ බලය දීලා තිබෙන්නේ. ඒ තමයි මහජන සහභාගිත්වය. එම නිසා අපේ ආර්ථික සැලැස්ම තුළින් සමුපකාරය පදනම් කර ගත් ජනතා සහභාගිත්වය ඇති නිෂ්පාදන ආර්ථික වැඩ පිළිවෙළකට අපි ගමන් කරනවා.

ඒ වාගේම නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාව අතර සාධාරණ ලෙස බෙදී යා යුතුයි. කුඩා දරුවාගේ ඉඳලා වැඩිමහල් කෙනා දක්වා එම ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදී යෑමේ ක්‍රමයක් තමයි දැන් හදලා තිබෙන්නේ. අපි දැක්කා, පෙර පාසල් දරුවන්ගේ ආහාර වේල රුපියල් 60 සිට රුපියල් 100 දක්වා වැඩි කරලා තිබෙනවා. අන්න, පොඩි දරුවාටත් ඒ ප්‍රතිලාභ ලබා දුන්නා. පෙර පාසල් ගුරුතුමියගේ දීමනාව රුපියල් 1,000කින් වැඩි කර තිබෙනවා. මෙන්න, ප්‍රතිලාභ ජනතාවට බෙදාගෙන යන හැටි. පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවාගේ ශිෂ්‍යාධාර මුදල රුපියල් 750 සිට රුපියල් 1,500 දක්වා වැඩි කර තිබෙනවා. ඒක හොඳයිනේ. ක්‍රීඩා පාසල්වල දරුවන්ගේ පෝෂණ ආහාරය සඳහා වෙන් කරන මුදල රුපියල් 5,000 සිට රුපියල් 10,000 දක්වා දෙගුණයකින් වැඩි කර තිබෙනවා. හොඳයිනේ මේ තත්ත්වය. ඒ වාගේම මහපොළ ශිෂ්‍යත්වය රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වාත්, bursary එක රුපියල් 4,000 සිට රුපියල් 6,000 දක්වා වැඩි කර තිබෙනවා. මේ සෑම දෙයක් සඳහාම මුදල් වැය වෙනවා. වකුගඩු රෝගීන් සඳහා වන ආධාර මුදල රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වාත්, වැඩිහිටියන් සඳහා වන ආධාර මුදල රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වාත් වැඩි කර තිබෙනවා. මෙන්න, නිෂ්පාදන ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණ ලෙස ජනතාව අතර බෙදා හරින හැටි. ඒක හොඳයි නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න ඒක තමයි අපි කියන්නේ මේකේ පෙනුම ලස්සනයි, හරය ගුණයි, රසයි, කල් පැවැත්මයි කියලා. මෙවැනි අය වැයක් ඉතිහාසයේ කවදාවත් ඉදිරිපත් වුණේ නැත.

විපක්ෂයෙන් එක් එක් තැන්වලදී පොඩි පොඩි චෝදනා කළා; විවේචනය කළා. නමුත් අහෝ දුකකි, ඉරකි, තිතකි! දුක අය ඇති. ඔවුන් මේ අය වැයෙන් දුක් වෙනවා. ඒත් සාතිශය බහුතරයක් ජනතාව සතුටට පත් වෙනවා. ඉතින්, මරණයේ වේදනාව මිය යන්නාට නොව ජීවත් වන්නාටයි. ඒ ගැන අපගේ සාතිශය සංවේගය! ඔබට දුකයි. නමුත් සාතිශය බහුතරයක් ජනතාවට සතුටක් තිබෙනවා මේ අය වැය තුළින්. සාධාරණත්වයක් තිබෙන හොඳ සමාජයක් හදන්න තමයි මේ අය වැය ගෙනැල්ලා තිබෙන්නේ. ආර්ථිකය පැත්තෙන් බලන්න. අන්න, පොහොසත් රටක්. අන්න බලන්න, ලස්සන ජීවිතයක්. සමාජය පැත්තෙන් කොහොමද? Clean Sri Lanka වැඩසටහනට රුපියල් බිලියන 5ක් -මිලියන 5,000ක්- වෙන් කරලා තිබෙනවා.

මේ කියන්නේ මොකක්ද? පාරවල් සුද්ද කරන ඒවා, වෙරළ සුද්ද කරන ඒවා, එහෙම නැත්නම් කැළේ කපන ඒවාද? නැහැ ඒවා නොවෙයි. දන්නේ නැති අය ඒක තේරුම් ගන්න ඕනෑ. මේ සමස්ත පද්ධතිය හැදිලා තිබෙන්නේ කොහොමද? ද්‍රව්‍යමය හා සංකල්පමය වශයෙන්. එතකොට, ද්‍රව්‍යමය හා සංකල්පමය වශයෙන් තමයි පවිත්‍ර - clean - කරන්න ඕනෑ. අන්න එහෙම clean කරනකොට ද්‍රව්‍යමය පැත්ත - පාරවල් ටික - සුද්ද කර ගන්නවා, ජනතා සහභාගිත්වයෙන්. අන්න clean කළා. ජනතාවගේ හදවත් කොහොමද clean කරන්නේ? වැටුප් වැඩි කළාය කියලා, රුපියල් 8,250කින් වැඩි කළාය කියලා මෙතැන අප භූමිදාන කරන්න හැදුවා නේ, මදි මදි කියලා. හැබැයි මූලික වැටුප නොවෙයි නේ මෙතෙක් කල් වැඩි කළේ. හැමදාම වැටුපට කෑලි එල්ලුවා, එල්ලුවා. එල්ලලා හරි යන්නේ නැහැ. ඒ නිසා මූලික වැටුප - basic එක - අපි වැඩි කළා. ඒක තමයි රාජ්‍ය සේවකයෙකුට කළ යුතු දේ. පෞද්ගලික අංශයේ රුපියල් 21,000, රුපියල් 27,000 දක්වා වැඩි කරනවා. ලබන වර්ෂය වෙනකොට ඒක 30,000 දක්වා යනවා. වතු සේවකයන්ගේ දෛනික වැටුප, රුපියල් 1,000යි. ජනාධිපතිතුමා බලයට පත් වුණා, ඒක රුපියල් 1,350ක් වුණා. ඒක රුපියල් 1,700 දක්වා ගෙන යනවා. අන්න එතැනට පාර හැදුවේ, මේ වැඩ පිළිවෙළින්. ඒ නිසා මෙය ඉතා බලගතු වැඩක් වෙන්න ඕනෑ.

මේ රට ආර්ථිකය නමැති අයිස් වතුරේ ගිල්වලා හිරි වට්ටපු, අපේකම, තමන්ගේකම, පරාර්ථකාමිත්වය නැති කරපු, හිරි වට්ටපු සමාජයක හිරි අරින්නයි මේ අය වැය හදලා තිබෙන්නේ. දැන් මෙතුමන්ලා -විපක්ෂයෙන්- කිව්වා, අපේ පාලනයක් ආවොත් මොකද වෙන්නේ කියලා. අපේ පාලනයක් ආවාට පස්සේ පෙරහැර නවත්වයි කිව්වා, පන්සල්වල පිංකම් නැවතෙයි කිව්වා. හැබැයි බලන්න, සංස්කෘතික, බුද්ධ ශාසන, ආගමික කටයුතු අමාත්‍යාංශයට වෙන් කළ මුදල් ප්‍රමාණය. 2023 වසරේ රුපියල් බිලියන 7.9යි. 2024 වසරේ රුපියල් බිලියන 10.6යි. නමුත් මේ වතාවේ රුපියල් බිලියන 13.52ක් දක්වා සියයට 30කින් වැඩි වෙලා තිබෙනවා. මේ රටේ සංස්කෘතියට ආදරය කරන මිනිස්සු අපි. අපේ සංස්කෘතිය හැදෙන්න ඕනෑ. එතැනින් සුන්දර මිනිසෙක් හදන්න ඕනෑ, හොඳ හදවතක් තිබෙන මිනිසෙක් හදන්න ඕනෑ. මම, මට, මා කියලා හිතන මිනිස්සු නොවෙයි, අපි, අපට කියලා හිතන්න පුළුවන් පරාර්ථකාමී මිනිස්සු හදන්න ඕනෑ. මිනිස්සු ගහට කොළට, සතා සිවුපාවාට ආදරය කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා පරිසර අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙනවා සැලකිය යුතු මුදලක්. 2023දී වෙන් කරලා තිබුණේ රුපියල් බිලියන 8.6යි. 2024දී රුපියල් බිලියන 8.7යි. මෙන්න, අපේ රජයෙන් රුපියල් බිලියන 16.7ක් -දෙගුණයක්- ගහට කොළට, සතා සිවුපාවාට ආදරය කරන මිනිස්සු ටිකක් ගොඩ නහන්න වෙන් කරලා තිබෙනවා. මෙපමණ ප්‍රමාණයකින් ඒ ප්‍රතිපාදන වැඩි කරන්නේ ඇයි? ඒක ඉහළින් දෙන ආදර්ශය. ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය බලන්න. මේ වතාවේ රුපියල් බිලියන 2.9යි. ගිය අවුරුද්දේ? රුපියල් බිලියන 6.6යි. ජනාධිපතිතුමාගේ පැත්තෙන් කැපකිරීම් කරලා තිබෙනවා. ඒ වාගේම පාලක පක්ෂය පැත්තෙන් කැප කිරීම් කරලා තිබෙනවා. ඒක තමයි අපට උගන්වපු දේශපාලන දර්ශනය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ආදර්ශවත් වැඩ පිළිවෙළක් සහිත, නිවැරදි දැක්මක් සහිත, පෙනුමෙන් හා හරයෙන් ඇත්ත දේ පෙන්නුම් කරන අය වැයක් බව ප්‍රකාශ කරමින්, මේ රට හදන්න අප සමඟ එකතු වෙන්න කියලා මේ රටේ ජනතාවට ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.41]

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற வடக்கு மாகாணத்தில், குறிப்பாக யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங்களில் சமூக மற்றும் பொருளாதார ரீதியான பல்வேறு பிரச்சினைகள் காணப்படுகின்றன. குறிப்பாக, பொருளாதார ரீதியான முன்னேற்றம், மற்றும் வேலைவாய்ப்புத் தொடர்பில் பல்வேறு பிரச்சினைகளை அங்குள்ள மக்கள் எதிர்கொண்டு வருகிறார்கள். அதுபோன்று, கல்வி வசதி மற்றும் இளைஞரின் எதிர்காலம், அடிப்படை வசதிகளான வீடு, குடிநீர், மின்சார வசதியின்மை, காணிப் பிணக்குகள் போன்ற பல்வேறு பிரச்சினைகளாலும் விவசாயம் மற்றும் மீன்பிடித் தொழில் சம்பந்தமாகவும், போதைப் பொருள்களின் அதீதமான பரவல் காரணமாகவும் பாடசாலை மாணவர்களும் இளையோரும் பல்வேறு பிரச்சினைகளையும் சவால்களையும் எதிர்கொண்டு வருகின்றார்கள். அவ்வாறே அரசியல் மற்றும் நிர்வாக ரீதியாகவும் பல பிரச்சினைகளில் சிக்கி பல்வேறு அசௌகரியங்களை எங்களுடைய மக்கள் எதிர்கொள்கிறார்கள். குறிப்பாக, யுத்தத்தின் காரணமாகப் பிள்ளைகளை இழந்த பெற்றோரும், பெற்றோரை இழந்த பிள்ளைகளும், அங்கவீனமானவர்களும், காணிகள், வீடுகளை இழந்த மக்களும் கடந்த காலங்களிலே நிகழ்ந்த பல்வேறு பிரச்சினைகளின் காரணமாக இன்றுவரை அசௌகரியங்களை அனுபவித்து வருகின்றார்கள்.

இவற்றுக்கெல்லாம் பிரதானமாக இரண்டு காரணங்களைக் குறிப்பிடலாம். ஒன்று, 30 ஆண்டு காலமாக நடைபெற்ற உள்நாட்டு யுத்தம்; இன்னொன்று, கடந்த காலங்களிலே இந்த நாட்டை மாறிமாறி ஆட்சி செய்த அரசாங்கங்கள் பல்வேறு காரணங்களைச் சொல்லி எங்களுடைய மாவட்டங்களை அபிவிருத்தி செய்வதற்கு முன்வராமை. ஆனால், இந்தப் பிரச்சினைகளைக் கருத்திற்கொண்டு எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கமானது வடக்கு மாகாணத்தை, குறிப்பாக யாழ்ப்பாணம், கிளிநொச்சி மாவட்டங்களை அபிவிருத்தி செய்வதற்காக 2025ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டத்திலே அதிகளவான நிதியை ஒதுக்கியுள்ளமைக்காக, எங்கள் மக்கள் சார்பாக நாட்டின் சனாதிபதி அவர்களுக்கு நன்றியைத் தெரிவிப்பதில் நான் மகிழ்ச்சியடைகின்றேன்.

மேலும், வடக்கு மாகாணம் முன்புபோல் மொத்தத் தேசிய உற்பத்தியிலே பெருமளவிலான பங்களிப்பை வழங்க முடியாமைக்கு இரண்டு காரணங்கள் இருக்கின்றன. ஒன்று, கடந்த காலங்களிலே இருந்த அரசியல்வாதிகளின் செயற்பாடுகள்; இரண்டாவது, அவர்களுக்குத் துணையாக இருந்த அரச அதிகாரிகளின் செயற்பாடுகள். இன்றும்கூட முன்னைய அரசியல்வாதிகளுடைய பழக்கத்தைப் பின்பற்றுகின்ற அரச அதிகாரிகள் மக்களுக்கான வேலைத் திட்டங்களைச் செய்வதற்கு முன்வராத நிலை காணப்படுகிறது. யாழ்ப்பாண மாவட்டமானது யுத்தத்திற்கு முன்னர் விவசாயம், மீன்பிடி மற்றும் ஏனைய துறைகளில் நாட்டின் மொத்தத் தேசிய உற்பத்திற்குப் பாரிய பங்களிப்பை வழங்கிய ஒரு மாவட்டமாகும். அங்கு விவசாயம், மீன்பிடித் துறை போன்றே ஏனைய துறைகளின் அபிவிருத்திக்கும் காரணமாக அமையக்கூடிய சுற்றுலாத்துறை அமைவிடங்கள், விமான நிலையம் மற்றும் துறைமுகங்கள் காணப்படுகின்றன. அங்குள்ள கடற்றொழில் துறையானது பாரிய மீன் வளத்தைக்கொண்டு ஒரு செல்வங் கொழிக்கின்ற துறையாகக் காணப்படுவதோடு, உல்லாசப் பிரயாணிகளைக் கவருகின்ற இயற்கை எழில் கொஞ்சும் பிரதேசங்களைக் கொண்டதாகவும் அக்கடற் பிரதேசங்கள் காணப்படுகின்றன.

அதுபோல, கட்டுமானக் கைத்தொழில் துறைக்குப் பாரிய பங்களிப்பை வழங்கிய காங்கேசன்துறைச் சீமெந்துத் தொழிற்சாலை சிதைவடைந்துபோனமை அதன் தேசிய உற்பத்திற்குப் பங்களிப்பை வழங்கும் தன்மையை இல்லாமற் செய்துள்ளதுடன், அங்கு வேலை வாய்ப்பின்மை அதிகரிப்புக்கும் காரணமாகக் காணப்படுகின்றது. இதன் காரணமாக வேலைவாய்ப்பு மற்றும் வருமானத்தை அங்குள்ள மக்கள் இழந்திருக்கிறார்கள். கடந்த காலங்களிலே வளப் பங்கீடு சரியாக அமையவில்லை. கடந்த கால அரசாங்கங்கள் வீதிகளை அமைக்கின்றபொழுது அதன் இரண்டு பக்கங்களிலும் வடிகால்களை அமைக்காமல் அவசர அவசரமாகத் தார் வீதிகளை அமைத்ததன் காரணமாக யாழ்ப்பாணத்தில் மழைக் காலத்தில் வீடுகள் வெள்ளத்தில் மூழ்கிப் போகின்றன. சரியான திட்டமிடலின்றி இவற்றைச் செய்த காரணத்தினால்தான் இவ்வாறான தவறுகள் நிகழ்ந்திருக்கின்றன. இது மக்களுக்குப் பாரிய பிரச்சினையாக இருக்கின்றது.

குறிப்பாக, எமது மாகாணத்தில் உள்ள சர்வதேச விமான நிலையம், காங்கேசன்துறை கப்பல் துறைமுகம் ஆகியவை பொருளாதார மற்றும் சுற்றுலாத் துறைகளுக்குப் பாரிய பங்களிப்பைக் கடந்த காலங்களில் வழங்கியிருந்தன. ஆனால், அவற்றின் தற்போதைய நிலைமையோ மிகவும் மோசமானதாகக் காணப்படுகின்றது. எமது மாகாணத்தில் பொருளாதாரம், ஏற்றுமதி மற்றும் வேலைவாய்ப்புக்குப் பங்களிப்புச் செய்யக்கூடிய தொழில் துறைகளாக

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

காங்கேசன்துறைச் சீமெந்துத் தொழிற்சாலை, பரந்தன் இரசாயனத் தொழிற்சாலை, ஒட்டுசுட்டான் ஓட்டுத் தொழிற்சாலை, பண்டத்தரிப்பு நெசவுத் தொழிற்சாலை என்பன காணப்படுவதுடன், மீன்பிடி, கருவாடு, விவசாயம் - குறிப்பாக வெங்காயம், மிளகாய், வாழைப்பழ உற்பத்திகள் - மற்றும் பனை, தென்னை உற்பத்திகளும் காணப்படுகின்றன. இருந்தாலும், கடந்த காலத்தில் ஏற்பட்ட யுத்தம் மற்றும் இடப்பெயர்வு காரணமாக இந்தத் துறைகளில் பாரிய பின்னடைவு ஏற்பட்டுப் பொருளாதாரமும் வீழ்ச்சியடைந்தது. இவற்றைக் கருத்திற்கொண்டு, இந்தப் பிரதேசங்களை மீளவும் செழுமை பொருந்திய பிரதேசங்களாக மாற்றுவதற்கு இந்த அரசாங்கமானது வடக்கு மாகாணத்துக்கு அதிகமான நிதியை ஒதுக்கீடு செய்திருப்பது வரவேற்கக்கூடிய விடயமாகும்.

எமது மாகாணத்தில் இயற்கை எழில் சூழ்ந்த தீவுப் பிரதேசங்கள் காணப்படுகின்றன. குறிப்பாக அங்குள்ள நெடுந்தீவு, நயினாதீவு, அனலைதீவு, எழுவைதீவு, மண்டைதீவு, காரைநகர், வேலணை போன்ற தீவுப்பகுதிகளை அபிவிருத்தி செய்வதனூடாக எதிர்காலத்தில் அதிகளவான சுற்றுலாப் பிரயாணிகளைக் கவரும் இடங்களாக மாற்றி, எங்களுடைய பிரதேசங்களில் வேலைவாய்ப்பையும் இந்த நாட்டுக்கான அந்நியச் செலாவணி வருமானத்தையும் அதிகரிக்க முடியும். நாங்கள் அதற்கான வேலைத்திட்டங்களை விரைவில் முன்னெடுத்து, எமது மாகாணத்திலுள்ள மாவட்டங்களை அபிவிருத்தியடைந்த மாவட்டங்களாக மாற்ற வேண்டியிருக்கின்றது.

கடந்த காலங்களில் இந்தப் பிரதேசங்களுக்கு ஒதுக்கப் பட்ட நிதியானது பல்வேறு காரணங்களைக் காட்டி திருப்பி அனுப்பப்பட்டு, வேறு பிரதேசங்களின் அபிவிருத்திக்குப் பயன்படுத்தப்பட்டமையாலும் எங்களுடைய பிரதேசங்கள் பாரிய பின்னடைவைச் சந்தித்திருந்தன. இலங்கையின் சராசரி வேலையின்மை வீதத்தைவிட வடக்கு மாகாணத்தின் வேலையின்மை வீதம் அதிகமாக உள்ளது. கடந்தகால அறிக்கையின்படி யாழ்ப்பாண மாவட்டத்தில் வேலைவாய்ப்பின்மை 21 சதவீதத்தால் அதிகரித்துள்ளது. பதிவுசெய்யப்பட்ட தரவுகளின்படி 19,147 பேர் வேலைவாய்ப்புக்காக விண்ணப்பித்திருப்பதாக யாழ்ப்பாண மாவட்ட செயலகப் புள்ளிவிபரங்கள் தெரிவிக்கின்றன. அந்த வகையில், பல்வேறு அபிவிருத்திகளை ஏற்படுத்துவதனூடாக வேலைவாய்ப்புகளை உருவாக்கி, நாட்டிலே செழுமையான மக்கள் கூட்டத்தை உருவாக்குவதற்காக இந்த அரசாங்கம் பாடுபட்டுக் கொண்டிருக்கின்றது.

குறிப்பாக, எமது மாகாணத்திலே இளையோர் மத்தியில் பல்வேறு சமூகப் பிரச்சினைகள் காணப்படுகின்றன. போதைப்பொருள் பாவனை, மதுபானப் பாவனை, குழு மோதல்கள், சட்டவிரோதச் செயற்பாடுகள், மன விரக்திப் பாதிப்புகள், சமூகப் பிறழ்வுகள் போன்வற்றால் பெரும் பாதிப்பை எதிர்நோக்குகின்ற இளைஞர், யுவதிகள் பல பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். பாடசாலை மாணவர்கள் தொடக்கம் பல்கலைக்கழக மாணவர்கள் வரை இந்தப் போதைவஸ்துப் பாவனை மற்றும் ஏனைய பிரச்சினைகளால் பாதிக்கப்பட்டிருப்பது உங்களுக்குத் தெரியும். அவர்களை மீட்டெடுப்பதற்கு இந்த அரசாங்கம் ஏராளமான நிதியை ஒதுக்கியிருக்கின்றது. அதனை நாங்கள் சரியாகப் பயன்படுத்தி, இளைஞர்களையும் பாதிக்கப்பட்ட மக்களையும் மீட்கவேண்டிய தேவையிருக்கின்றது.

குறிப்பாக, இம்முறை வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின்மூலம் பொருளாதாரத்தில் 5 சதவீத அதிகரிப்பை ஏற்படுத்துவதனூடாக வரவு செலவுதிட்டப் பற்றாக்குறையை 6.7ஆகக் கட்டுப்படுத்தவும், முதன்மை நிதி நிலையினை 2.3 சதவீதமாக அதிகரிக்கவும் நாங்கள் எதிர்பார்த்திருக்கின்றோம். 2025இல் எமது ஏற்றுமதி வருமானம் சுமார் 19 பில்லியன் அமெரிக்க டொலராக இருக்குமென எதிர்வு கூறப்பட்டுள்ளது. அந்த வகையில், இளையோரை இலக்காகக்கொண்டு டிஜிட்டல் துறைக்கு 3,000 மில்லியன் ரூபாயும், Clean Sri Lanka வேலைத்திட்டத்திற்காக 5,000 மில்லியன் ரூபாயும், தெங்கு முக்கோண வலயத்திற்கு 500 மில்லியன் ரூபாயும் ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது.

அதுபோல், முல்லைத்தீவு மாவட்டத்திலே வட்டுவாகல் பாலத்தை அமைப்பதற்காக 100 கோடி ரூபாய் ஒதுக்கப் பட்டிருக்கின்றது. உண்மையிலே, இது அந்த மக்களால் மிகவும் வரவேற்கக்கூடிய ஒரு விடயம். அதேபோன்று, யாழ்ப்பாண நூல் நிலையத்தைப் புனரமைப்பதற்கு 100 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருப்பது தமிழ் மக்கள் மத்தியிலே பெரியதொரு வரவேற்பைப் பெற்றுள்ளதுடன், அவர்களுக்கு ஓர் ஆறுதலையும் அளித்துள்ளது. அதேபோன்று, விசேட அபிவிருத்தி என்ற அடிப்படையில், வடக்கிலே கிராமிய வீதிகள், பாலங்களை மேம்படுத்துவதற்காக 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. உண்மையிலே யாழ்ப்பாணம், கிளிநொச்சி போன்ற பிரதேசங்களிலே உள்ளக வீதிகள் மோசமாகப் பாதிப் படைந்திருக்கின்றன. அந்த வீதிகளைத் திருத்துவதனூடாக விவசாயத்துறை, மீன்பிடித்துறை மற்றும் உள்நாட்டு அபிவிருத்தி என்பவற்றை மேற்கொள்வது இலகுவாக இருக்கும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කෝසල නුවන් ජයවීර මහතා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.52]

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ NPP ආණ්ඩුව විසින් ඉදිරිපත් කරපු මංගල අය වැය පිළිබඳව තමයි අදත් සාකච්ඡාවට බඳුන් කරන්නේ. අපේ ගරු ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරලා ගතවන දෙවැනි දවසේ තමයි මේ විවාදය කරගෙන යන්නේ. පසුගිය කාලය තුළ මේ රටේ ඉදිරිපත් කරපු අය වැය දිහා බලමින්, මේ අය වැය ගැන මේ රටේ විද්වතුන් ඇතුළු සියලුදෙනාගේ comment එක, අදහස වෙලා තිබෙන්නේ මෙය අපේ රට වෙනත් තලයකට ඔසවා තබන්නට දරන වෑයමක් විධියටයි. මොකද, පසුගිය කාලය පුරාම මේ රටේ මිනිස්සු දුක්

මහන්සි වෙලා වැඩ කරලා සල්ලි හම්බ කළාට ඒවායේ ප්‍රතිලාභ ඔවුන්ට හම්බ වුණේ නැහැ. ඒ ප්‍රතිලාභ මේ රටේ ජනතාවට ලැබුණු අය වැයක්, එහෙමත් නැත්නම් පාලන ක්‍රමයක් නොවෙයි මෙතෙක් මේ රටේ තිබුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර නොමැති බැවින්, 2024.12.31 දිනැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී එළඹී තීරණය පරිදි න්‍යාය පත්‍රයේ විෂය අංක 01, විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම පිළිබඳ විවාදය අපර භාග 06.30 දක්වා පවත්වාගෙන යෑම සඳහා සභාවේ අනුමැතිය අපේක්ෂා කරමි.

සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට ඉහළින් ඔසවා තබන අය වැයක් විධියට තමයි මෙවර අය වැය අපේ රටේ ජනතාව දකින්නේ. මොකද, ගරු ජනාධිපතිතුමා විසින් මෙවර අය වැය ඉදිරිපත් කළේ මීට පෙර කවදාවත් නොබලපු ක්ෂේත්‍ර පිළිබඳව, මීට පෙර කවදාවත් අවධානය යොමු නොවුණු ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්, ජනතාවට සහන සලසමින්. මේ රටේ වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා, ඔවුන්ගේ වැටුප වැඩි කර ගැනීම සඳහා, ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා, මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කර ගැනීම සඳහා මහ පාරවල සටන් කරන යුගයක් තමයි අපි පසුගිය කාලයේ අය වැයක් කිට්ටු වෙනකොට, අය වැයක් ඉදිරිපත් කරනකොට දැක්කේ. පසුගිය කාලවල අය වැයක් කිට්ටු වෙනකොට වෘත්තීය සමිති එකතු වෙලා මාධ්‍ය සාකච්ඡා පවත්වනවා. එහෙමත් නැත්නම් ශිෂ්‍ය ව්‍යාපාරය සටන් බිමට ඇවිල්ලා මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කර දෙන්න කියලා ඉල්ලීම් කරනවා. එහෙම සටන් කරලා තමයි පසුගිය කාලයේ පැවති ආණ්ඩුවකින් මොනවා හරි දෙයක් ලැබුණා නම් මේ රටේ වැඩ කරන මිනිස්සුන්ට, මේ රටේ දුක් විඳින මිනිස්සුන්ට ලැබුණේ. හැබැයි, මේ අය වැය සම්බන්ධයෙනුත් ඊයේ ඉඳලා මේ විවේචනය කරනවා.

නමුත් මේ අය වැය දිහා ටිකක් බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ කියන්නේ, අපේ රටේ ශිෂ්‍ය ව්‍යාපාරය කියන්නේ, මේ රටේ විශ්වවිද්‍යාල ප්‍රජාව කියන්නේ ඉතාම අමාරුවෙන්, අපහසුවෙන් අධ්‍යාපනය ලබන කොටියාසයක් බව. හැබැයි, ගරු ජනාධිපතිතුමා මේ අලුත් ආණ්ඩුවෙන් - NPP එකෙන් - ඉදිරිපත් කළ පළමු අය වැයෙන් මුදල් වෙන් කරනකොට, ඔවුන් ගැන සලකා මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 7,500ක් දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම විශ්වවිද්‍යාලයෙන් ලැබෙන ශිෂ්‍යාධාර දීමනාවත් රුපියල් 6,500ක් දක්වා වැඩි කර තිබෙනවා.

ඒ වාගේම, මීට පෙර කවදාවත් වෙන් නොකරපු ආකාරයට සෞඛ්‍යය ක්ෂේත්‍රය සඳහා මෙවර මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන කටයුතු සඳහාත් මෙවර විශාල මුදලක් වෙන් කර තිබෙනවා. අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 615කට අධික මුදලක් වෙන් කරපු පළමු අය වැය විධියට තමයි වර්තමාන ආණ්ඩුවේ පළමු අය වැය ඉතිහාසගත වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. කලින් කථා කළ මන්ත්‍රීතුමන්ලා ඇමතිතුමන්ලා සඳහන් කළා වාගේ, මේ රටේ තනි වෙව්ව දරුවන් ගැන, රැකවරණය ලබමින් ඉන්න දරුවන් ගැන අවධානය යොමු කරපු ආණ්ඩුවක් මීට පෙර කවදාද තිබුණේ? ඒ රැකවරණය ලබන දරුවන්ට රුපියල් 5,000ක දීමනාවක් දෙන ගමන් ගරු ජනාධිපතිතුමා -මේ වර්තමාන ආණ්ඩුව- ඒ දරුවන්ගේ අනාගතයක් බලා තිබෙනවා. ඒ දීමනාවෙන් රුපියල් 2,000ක් ඒ දරුවන්ගේ account එකකටත් යනවා, ඒ දරුවන්ගේ අනාගතය වෙනුවෙන්. එතකොට ඒ දරුවෙකු විවාහ වෙන දවසට, එහෙම නැත්නම් ඒ රැඳවුම් නිවාසයෙන් එළියට යන කවදා හරි දවසක ඒ දරුවාගේ බැංකු ගිණුමේ තිබෙන යම් කිසි මුදල් ප්‍රමාණයකින් ඔවුන්ට ඕනෑ දෙයක් කර ගන්න පුළුවන්. ඒ අයට නිවසක් හදාගන්න, රැකියාවක් කරන්න, විවාහ කටයුත්තකට වැනි ඕනෑම දෙයක් සඳහා ප්‍රයෝජනවත් වන ආකාරයෙන් ඒ කටයුත්ත කරලා තිබෙනවා. ඒ අනුව මෙවර අය වැය ඉදිරිපත් කිරීමේ දී ඒ තරම් සංවේදී තැන්වලට පවා අවධානය යොමු කරලා තිබෙනවා. ඒ වාගේම, ආබාධිත පුද්ගලයන්, රැඳවියන්, කාන්තාවන් ඇතුළු ඒ සියලු කණ්ඩායම් ගැන අවධානය යොමු කරපු අය වැයක් විධියට තමයි මෙවර අය වැය මේ රටේ ජනතාව දකින්නේ.

ඒක හින්දා තමයි සමාජ මාධ්‍යවලින්, වෙනත් මාධ්‍යවලින් රටේ ජනතාව අපට කථා කරලා කියන්නේ මේ අය වැය හරහා මේ රට වෙනත් තලයකට ඔසවා තබන්න වර්තමාන රජය උත්සාහ දරා තිබෙනවා කියලා. වෙනසක් කරලා, පීඩාවට පත් වෙලා තිබුණු තත්ත්වයෙන් ඉහළ තලයකට මේ රට ඔසවා තබන්න දරපු උත්සාහයක් විධියට තමයි ඔවුන් මේ අය වැය දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයෙන් හැම ක්ෂේත්‍රයක් කෙරෙහිම අවධානය යොමු කරලා තිබෙනවා. වතුකරයේ ජනතාව ගැන, ඒ මාර්ග සංවර්ධනය ගැන විතරක් නොවෙයි, අවුරුදු 45කට කලින් ගිනිබත් කළ මේ රටේ සංස්කෘතික කේන්ද්‍රස්ථානයක් බවට පත් වෙලා තිබුණු, එහෙමත් නැත්නම් දැනුම ප්‍රචාරය කරන තැනක් බවට පත් වෙලා තිබුණු යාපනය පුස්තකාලය යථා තත්ත්වයට පත් කිරීමට පවා අවධානය යොමු කළ අය වැයක් විධියට තමයි මේ රටේ ජනතාව මේ අය වැය දකින්නේ. ඒක හින්දා තමයි මේ රටේ ජනතාව, මේ රටේ විද්වතුන් ඇතුළු සියලුදෙනා කියන්නේ මේ අය වැය අපේ රට තිබුණු තලයෙන් වෙනත් තලයකට ඔසවා තබන්නට දැරූ උත්සාහයක් කියලා. වෙන දා ආණ්ඩු පක්ෂයක් විසින් අය වැයක් ඉදිරිපත් කළාට පස්සේ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස්, comments අපි දකිනවා. හැබැයි, පුදුමාකාර විධියට විපක්ෂය අසරණ කළ අය වැයක් තමයි මෙවර ඉදිරිපත් කරලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද උදේ වරුවේ සහ දවල් වරුවේ විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරනකොට කියපු දේ තමයි, අය වැය නම් හොඳයි, මේක ඔවුන් ඉදිරිපත් කරන්න හිටපු අය වැය, මේක ඔවුන්ගේ අය වැය කියන එක. එහෙම තමයි අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් අද උදේ කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වේ. මේක ඔවුන්ගේ වැඩ පිළිවෙළ තමයි කිව්වා. දැන් ඒ අයට කියන්න දෙයක් නැහැ. දැන් මේ කරුණු මොන බයිබලයෙන්ද, මොන පොතෙන්ද ගත්තේ කියලා සොයන්න උත්සාහ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න දෙයක් නැතිව ඉතාම කනගාටුදායක තත්ත්වයක

[ගරු කෝසල නුවන් ජයවීර මහතා]

එතුමන්ලා දැන් ඉන්නේ. කෝ, රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි වුණාද, මෙන්න මේවාට බදු ගැහුවා, අරවාට බදු ගැහුවා කිය කියා වෙන දා voice-cuts දීදී යන විපක්ෂයට අද කියාගන්න දෙයක් නැහැ. ඒගොල්ලන් හිතනවා, මේ අය වැය දේශපාලන මූලධර්මවලට එරෙහියි කියලාවත් කියන්න ඕනෑ, නැත්නම් අපි මොකක්ද කියන්නේ, අපට කියන්න දෙයක් නැහැ, මේක අපි කරන්න හිටපු අය වැය, අපි කරන්න හිටපු වැඩ කියලා. එහෙම නම් මොකටද මේ අය වැයට කනස්සල්ල දක්වන්නේ? මොකටද මේකට දුක් වෙන්නේ? එහෙම නම් මේ අය වැය වෙනුවෙන් දුක් වෙන්න ඕනෑ නැහැනේ. ඔයගොල්ලන්ගේ වැඩ පිළිවෙළ නම් අපි කරන්නේ, මොකක්ද මේ කියන කථාව? අද එවැනි තත්ත්වයකට විපක්ෂය අසරණ කරන්න පුළුවන් තරමට අය වැයක් ඉදිරිපත් කරන්න හැකිවීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපි සතුටු වෙනවා.

උදේ වරුවේ අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරු කිහිපදෙනෙකු සභාවට ඇවිල්ලා අදහස් දැක්වුවා. එක මන්ත්‍රීවරයෙක් ලොකු වෙලාවක් අරගෙන හරිම ශෝකාකූල විධියට, හරිම අසරණ විධියට කථා කළා. හැබැයි එතුමා කිව්වා, 80 දශකයේ රට තිබුණේ කොහොමද කියලා. ඊට පස්සේ කියනවා, දැන් මේ තිබෙන්නේ එහෙම තිබුණු රටක් කියලා. හැබැයි එතුමාට අමතක වෙලා තිබෙනවා, එතුමාත් ඒ කාලයේ හිටපු ඇමතිවරයෙක් කියලා; මේ ළඟක් වෙනකම් හිටපු ඇමතිවරයෙක් කියලා; කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ ඇමතිවරයෙක් කියලා. ඔබතුමන්ලාට මතක ඇති, අරණායක ප්‍රදේශය නාය ගිහින් මහා බෙදවාචකයක් වූ වෙලාවේ ඒ මිනිස්සු අසරණ වෙලා හිටපු බව. සමහරු අද සභාවට ඇවිල්ලා බෝසත්කම් පාමින්, කිඹුල් කඳුළු හෙළමින් මහා විශාරදයෝ වාගේ කථා කළත්, එදා ඒ අසරණ වූ මිනිස්සු ඉන්න තැනක් නැතිව පිටිටනියක කූඩාරම් ගහගෙන අවුරුදු දෙකක් හිටියා. හැබැයි ඒ මන්ත්‍රීතුමාටයි, මස්සිනාටයි ඒ ප්‍රදේශයේ අක්කර 700ක් තිබෙනවා. ඔවුන් ඉඩම් තිබෙන අය. ඔවුන්ට ඉඩම් අක්කර 700ක් තිබුණා. නමුත් ඒ අවතැන් වූ ජනතාවට ඒ එක ඉඩම් කෑල්ලක පදිංචි වෙලා ඉන්න දුන්නාද? යටියන්තොට ප්‍රදේශයේ වතුකරයේ ජනතාව අවුරුදු භයක්, හතක් තිස්සේ කූඩාරම්වල ඉන්නවා. කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කළ ඒ හිටපු ඇමතිවරු ඒ අසරණ වී සිටින එක පුද්ගලයෙකුගේ එක ගෙයක් හදන්නවත් තඹ ශතයක් දුන්නාද? නැහැ, තඹ ශතයක් දුන්නේ නැහැ.

හැබැයි, අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මාස තුනයි. නාය යෑම්වලට ලක් වෙලා කූඩාරම්වල ඉන්න වතුකරයේ ජනතාවට අපි ගෙවල් හදලා දෙන්න පටන් අරගෙන ඉවරයි. මේ සතියේ සඳුදා ගිහිල්ලා, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගෙවල් හදන තැනුත් පෙන්වා දීලා, ඒ ගෙවල් හදන මූලික වැඩකටයුතුත් අපි පටන් අරගෙන තිබෙනවා. අපි කියනවා, මාධ්‍ය ඉස්සරහට එහෙම නැත්නම් ටීවී ඉස්සරහට ඇවිල්ලා කිව්වාට, ඔබතුමන්ලා ඒ ගම් ඇතුළේ කරපු දේවල් මේ රටේ ජනතාව දන්නා බව. ඒ නිසා මෙතැනට ඇවිල්ලා මහා විද්‍යාර්ථීන් බවට පත් වෙලා කථා කරන්න හදන්න එපා. එදා තමන්ට පුළුවන් දේ කළේ නැහැ, වුවමනා දේවල් කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ මේකයි. ඔය කථා කරන කවුරු කවුරුත් කරපු දේවල් අපි දන්නවා. මේ රට බංකොලොත් කළා. දරුවන්ට කරවල කෑල්ලක්, මාළු කෑල්ලක්, බිත්තරයක් අරගෙන දෙන්න බැරි තරමට මේ රට පත් කරලා, දැන් ඇවිල්ලා අපට උපදෙස් දෙනවා, "මේවා කළේ නැහැ නේ. මේවා කරන්න, මේවා කරන්න" කියලා. අපට ඔය උපදෙස් ඕනෑ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ ජනතාව ඉහළින් ඔසවා තබන්න පුළුවන් කියන විශ්වාසය සහිතව අපව බලයට ගෙනාපු මේ රටේ ජනතාව අපි ඉහළින් ඔසවා තබනවා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ඇති රටක් බවට මේ රට පත් කරන්න මුළු ජනතාවටම විශ්වාස කරන්න පුළුවන් අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒ අය වැය කෙරෙහි විශ්වාසය තබමින්, මේ රට ඉස්සරහට ගෙන යන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.04]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, 2025 අය වැය විවාදය පිළිබඳව කථා කරන දින කිහිපය තුළ අද දවසේ කථා කරන්න මට අවස්ථාව ලබා දීම වෙනුවෙන්. අද මම දැක්කා, ආණ්ඩු පක්ෂයේ අයට එතුමන්ලා ආණ්ඩුවේ කියලා අමතක වෙලා තිබෙන බව. මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා ආණ්ඩුවේ ඉන්නේ. අපි විපක්ෂයේ ඉන්නේ. උදේ ඉඳලා බණිනවා, බණිනවා ඉවරයක් නැහැ. ගෙදර ගිහිල්ලා නෝනා එක්ක ඒ වාගේ දේවල් කර ගත්තාට පාර්ලිමේන්තුවේ ඇවිල්ලා ඒවා කරන්න එපා. මොකද, මේක පාර්ලිමේන්තුව. ඔබතුමන්ලා කියන දේ විපක්ෂයෙන් තමයි කියන්න ඕනෑ. කබීර් හෂීම් මැතිතුමා උදේ හොඳ කථාවක් කළා. ඒ කථාව අහපු වෙලාවේ ඉඳලා භූමිතෙල් ගෑවුණු ගැරඩි වාගේ කියවනවා, කියවනවා ඉවරයක් නැහැ. දෙවියනේ, මේ අය වැයෙන් ජනතාවට කරන්න තිබෙන දේ කියන්න.

ධීවර ඇමතිතුමා මේ රටේ ජනතාවට කිව්වා, ධීවරයන්ට සල්ලි වෙන් කරලා කියලා. මොනවාද වෙන් කරලා තිබෙන්නේ? ධීවර ඇමතිතුමායි, නියෝජ්‍ය ඇමතිතුමායි සල්ලි වෙන් කරගෙන. නියෝජ්‍ය ඇමතිතුමා දකුණට වෙන් කරගෙන. ඇමතිතුමා උතුරට වෙන් කරගෙන. එතකොට අනෙක් ධීවරයන් මොක්කුද? ඒ අය වතු භාන්නද ඕනෑ? නැත්නම් ඒගොල්ලන් වෙන මොනවාද කරන්නේ? ධීවර වරායන් තුනකට හැර ඉතුරු සල්ලි ඔක්කෝම උතුරට. අනෙක් අය හාවෝද? පුත්තලම, කොළඹ, කළුතර වාගේ දිස්ත්‍රික්කවල ඉන්න අය ධීවරයෝ නොවේද? කෝ, ඒ අයට සහනාධාර? තිබෙනවාද ඒ අයට සහනාධාර? බොරුවට කට කියවන්න එපා. කට කියවන්න ඉස්සෙල්ලා මේ අය වැය හරියට කියවලා මොනවාද තිබෙන්නේ කියලා කියන්න.

"කාන්තාවන් එක මිටට" කිව්වා. කාන්තා ව්‍යවසායකයන්ට මේ අය වැයෙන් මොනවාද වෙන් කරලා තිබෙන්නේ? ඒගොල්ලන්ට දියුණු වෙන්න, ඒගොල්ලන්ට ස්වයං රැකියාවක් කර ගන්න මොනවාද දීලා තිබෙන්නේ? මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන අය වැයේ තිබෙන්නේ වියදම වාගේම, ආදායම ගන්නා විධිය. සියයට 80ක් ගන්නේ බදුවලින්. තමුන්නාන්සේලා බලයට ආවේ මේ රටේ මිනිසුන්ට බදු ගහන්නේ නැහැ කියලා. තමුන්නාන්සේලා මේ අය වැයේ වියදම පියවා ගන්න යන්නේ බදු ගහලා. ඔබතුමන්ලා රුපියල් බිලියන 4,000ක් ණය ගන්න සූදානමින් ඉන්නවා. හැබැයි, රුපියල් බිලියන 4,000ද, ඊට වඩා ණය ගන්නවා ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. අය වැයේ රුපියල් බිලියන 2,200ක හිඟයක් තිබෙනවා. ඒ හිඟය පියවා ගන්න ඔබතුමන්ලා උත්සාහ කරන්නේ වාහන ගෙන්වන එකෙන්. දැන් මිනිසුන්ට වාහන ගෙන්වන්න පුළුවන්ද? වාහන ගේන්න ගත්ත තීන්දුව මොකක්ද? අන්න ඒවා ගැන කථා කරන්නකෝ. අවුරුදු තුනකට වඩා පරණ නැති වාහන ගෙන්වූවාම මොකද වෙන්නේ? එතකොට සමහර වෙලාවට 2022දී නිෂ්පාදනය කළ වාහන අහුවෙන්නේත් නැහැ. ජපානයේ ඒවාට තිබෙන්නේ ඉතා ඉහළ මිලක්. ඒවාට tax ගහලා ගෙනෙනකොට තමයි මේ රටේදී වාහනයක මිල රුපියල් ලක්ෂ 200ක් වෙන්නේ. ඒ නිසා තමයි තමුන්නාන්සේලා රුපියල් ලක්ෂ 12ට, 14ට දෙනවා කියපු Vitz මෝටර් රථය අද රුපියල් ලක්ෂ 100ට ගිහිල්ලා තිබෙන්නේ.

තමුන්නාන්සේලා අභිංසක මිනිසුන් තුළ බලාපොරොත්තු ඇති කළා. විදේශ රටවල රැකියා කරන මේ රටේ ශ්‍රමිකයන් සියලුදෙනා, මේ රටේ ඉන්න ජනතාව තමුන්නාන්සේලා වෙනුවෙන් මැතිවරණ කටයුතු කළේ සහන බලාපොරොත්තුවෙන්. හැබැයි, තමුන්නාන්සේලා ගත්ත ක්‍රියාදාමය නිසා අද ඒ අයට වාහනයක් ගන්නත් බැහැ. අඩු ගණනේ අවුරුදු පහක් හෝ හයක් පරණ වාහන ගෙන්වන්න ඉඩ දුන්නා නම්, ඒ වාහනවල මිල අඩුයි. ඒකට තමුන්නාන්සේලාට tax එක ගහන්න තිබුණා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කෙනෙකුට දරා ගන්න පුළුවන් මුදලකට වාහනයක් ගෙන්වා ගන්න පුළුවන්ද? කෝ, තමුන්නාන්සේලා ඒ දුන්නු පොරොන්දුව ඉටු කරලා තිබෙනවාද? එහෙම නම් එදා තමුන්නාන්සේලා ජනතාවට වේදිකාවලදී කිව්වේ පට්ටපල් බොරු නේ.

දැන් බලන්න, කාන්තාවන්ගේ ප්‍රශ්නය, ධීවරයන්ගේ ප්‍රශ්නය. විදේශ රැකියා සම්බන්ධව ඔබතුමන්ලා අරගෙන තිබෙන තීන්දුව මොකක්ද? ඒ සම්බන්ධව ඔබතුමන්ලා මොනවාද කරලා තිබෙන්නේ? ඒ අය පුහුණු කිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා මොනවාද කරලා තිබෙන්නේ? මේ රටේ කරන්න ඕනෑ ඒවා ටිකයි. අපේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා ඔබතුමන්ලා අරගෙන තිබෙන පියවර මොනවාද? කාරක සභා අවස්ථාවේදී ඒ ගැන අපි කථා කරන්නම්. ඔබතුමන්ලාගේ කන් දෙක පිරෙන්න, බඩ පිරෙන්න කථා කරන්නම්. ඒ වනතුරු ඉන්න. තවම මේ කෙරෙන්නේ අය වැයේ මූලික විවාදය. මෙතැනදී අපට ලැබෙන්නේ පොඩි වෙලාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. අද රටේ ආරක්ෂාව දෙස බලන්න. අලුත්කඩේ අධිකරණය තුළදී විනිසුරු ඉස්සරහට ඇවිල්ලා තමයි විත්තිකරුට වෙඩි තියන්නේ. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි එවැනි සිදුවීමක් වුණේ. විනිසුරු ඉදිරියේ තමයි විත්තිකරුට වෙඩි තියන්නේ. මේ ගරු නියෝජ්‍ය අමාත්‍යවරයාත් ඒ වෙලාවේ එතැන. කෝ, මේ රටේ ආරක්ෂාව? ජාතික ආරක්ෂාව කෝ? අර ඒ ගැන ටියුෂන් දෙන්න හිටපු කෙනා කෝ? පසුවට ගහලා ටියුෂන් දෙන්න ගියේ, බංකුව උඩ ඉඳලා. එතකොට දැන් ඉන්නේ බංකුව යටද? මේ රටේ ජාතික ආරක්ෂාව සලසන්න බැරි නම් වහාම ඉල්ලා අස්වෙන්න කියලා අපි කියනවා. අධිකරණ අමාත්‍යතුමාත් ඉල්ලා අස්වෙන්න. අධිකරණයට ගෙනාපු හිරකරුවෙකුව වෙඩි තබා මරන්න බැහැ. ඔහු පාතාලයේ කෙනෙක් වෙන්න පුළුවන්, ඒක වෙනම කථාවක්. හැබැයි, වෙඩි තබා මැරුණා නම් එම වගකීම භාර ගන්න ඕනෑ අධිකරණ ඇමතිතුමායි.

ඒ විතරක් නොවෙයි. මහජන ආරක්ෂක ඇමතිවරයා හිටපු පොලීසියේ නිලධාරීන් ගැන කිව්වේ වෙන කථාවක්. අද මොකද වෙලා තිබෙන්නේ? මේ ගරු සභාවට ඇවිල්ලා ඒවාට උත්තර දෙන්න කියන්න. ඒවා නේ දැන් කථා කළ යුතු දේවල්. මේ රටේ තමුන්නාන්සේලාට ආරක්ෂාව තිබෙනවාද? තව ටිකක් කල් යනකොට තමුන්නාන්සේලාට තේරෙයි; හොඳට තේරෙයි. එදාට දුවගෙන ඇවිල්ලා කියයි. එතකොට ඔය කතන්දර, ඔය කයිවාරු, ඔය උද්ධච්චකම, ඔය ගණන්කාරකම නැහැ.

මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාට වාහනය හොයා ගන්න බැරිව හතරවටේ දුවලා බොහොම අමාරුවෙන් තමයි වාහනය හොයා ගත්තේ. ඇයි ඒ? ඩ්‍රයිවර් හොයා ගන්න බැරිව. අන්තිමට ඩ්‍රයිවර්ට කන පැළෙන්න බැන්නාම තමයි වාහනය අරගෙන ආවේ. ඒක තමයි තත්ත්වය. මේ රටේ අධිකරණ නියෝජ්‍ය ඇමතිවරයාට අධිකරණයට යන්න බැහැ. ඒකයි ඇත්ත කථාව. එහෙම තත්ත්වයක් තියාගෙන කයිවාරු ගහන්න එපා. කයිවාරු ගහන්න ඉස්සෙල්ලා කරන්න වැඩ ගොඩක් තිබෙනවා.

අද අපි ගමේ සංවර්ධනය ගැන බලමු. තමුන්නාන්සේලා මේ අය වැයෙන් ගමේ පුංචි ව්‍යාපාරිකයා - කර්මාන්තකරුවා, නිෂ්පාදකයා - වෙනුවෙන් කරපු දේ කියන්න බලන්න. ගමේ නිෂ්පාදකයා, කර්මාන්තකරුවා වෙනුවෙන් මොනවාද කරලා තිබෙන්නේ? ඒ අය ආරක්ෂා කරන්න කරපු වැඩ පිළිවෙළ මොකක්ද කියන්න. තෙල් මිල, විදුලි බිල, ප්‍රවාහන වියදම් හා පඩිනඩි ගෙව්වාම ඒ අයගේ අතේ සත පහක් ඉතුරු වෙන්නේ කොහොමද? සත පහක්වත් ඉතුරු වෙන්නේ නැහැ. ඔවුන්ට යම් හවිහරණක් දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලා හැදුවාද?

අඩු ගණනේ කාන්තාවන්ට ස්වයං රැකියාවක් කරන්න අවශ්‍ය වැඩසටහන ඔබතුමන්ලා හදන්න ඕනෑ. මුළු ලංකාවේම කාන්තාවෝ ටික එක මිටට එළියට බැස්සා. කුඩත් අරගෙන බැස්සා; පොලුත් අරගෙන බැස්සා; කොඩිත් අරගෙන බැස්සා; හැමදේම අරගෙන එළියට බැස්සා. හැබැයි, මොකක්ද වුණේ? ඒ අය වෙනුවෙන් ව්‍යාපෘතියක් යෝජනා කරලා තිබෙනවාද? පෙන්වන්න බලන්න, එවැනි ව්‍යාපෘතියක් යෝජනා කරලා තිබෙනවා නම්? ඒ නිසා කරුණාකරලා කථා කරන්න ඉස්සෙල්ලා මොනවාද කරන්නේ කියන එක බලන්න ඕනෑ.

දැන් අපනයන ක්ෂේත්‍රය උදාහරණයක් වශයෙන් ගන්න. තමුන්නාන්සේලා ආදායම් උත්පාදනය කරන්න හදන්නේ කොහොමද? මේ රටට ආදායම් උත්පාදනය කරන වැඩසටහනක් හදන්න ඕනෑ. එහෙම නැතුව වියදම් ඇස්තමේන්තුවක් දුන්නාට, ඒ වියදම දරන්නේ කොහොමද? ඒකට ආදායම උපයා ගන්න විධිය තිබෙන්න ඕනෑ. හොඳ වචන ටිකක් දාලා හොඳ කථාවක් පවත්වන්න පුළුවන්. ඔබතුමන්ලා සියලුදෙනා කථාවට හොඳ දක්ෂයෝ. ඔබතුමන්ලා හොඳට කථා කරනවා. කථාව නොවෙයි, ප්‍රායෝගිකව ඒවා ක්‍රියාවට නංවන්න.

අද මම ඔබතුමන්ලාට එක කාරණයක් කියන්නම්. අද පොරකකා කථා කරන තමුන්නාන්සේලා එක්කෙනෙක්වත් මේ අවුරුද්දේ අන්තිමට 2026 අය වැය ඉදිරිපත් කරනකොට කථා කරන්න එන්නේ නැහැ. ඇයි ඒ? මේ දේවල් කළාද, නැද්ද කියලා එතැනදී තමයි තමුන්නාන්සේලාගෙන් අහන්නේ. එතකොට තමුන්නාන්සේලාට උත්තර දෙන්න බැරි වෙනවා. මොකද, කියන

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

දේවලින් භාගෙට භාගයක් කරලා නැහැ. ඇයි ඒ? ඒවාට රටට ආදායම් ඇවිල්ලා නැහැ. හැම අවුරුද්දකම ණය ගන්න සීමාව පැනලා තමයි ණය අරගෙන තිබෙන්නේ.

මොකක්ද ඒකට හේතුව? හේතුව ඇස්තමේන්තු කරපු ආදායම් ටික නොලැබීමයි. ඒ නිසා තමුන්නාන්සේලා ආදායම් ටික වැඩි කර ගන්න නිවැරදි වැඩ පිළිවෙළක් හදන්න. ඒවාට මුදල් වෙන් කරන වැඩ පිළිවෙළක් හරියට හදන්න. තමුන්නාන්සේලාට ඕනෑ තරම් කථා පවත්වලා අනෙක් මිනිසුන්ට බණින්න පුළුවන්. හැබැයි තමුන්නාන්සේලාගෙන් අපි බලාපොරොත්තු වෙන්නේ ඒක නොවෙයි. මේ කාරණා එකින් එක ගන්න. ජනාධිපතිතුමා කියපු කාරණා ටික එකින් එක අරගෙන තමුන්නාන්සේලා කියන්නකෝ, "මෙන්න මේ මාතෘකාවෙන් මේකයි කරන්න යන්නේ" කියලා. තමුන්නාන්සේලාට එහෙම කියන්න පුළුවන්. හැබැයි තමුන්නාන්සේලා ඒක කියන්නේ නැහැ නේ. තමුන්නාන්සේලා බනීවි, ඒ කාලයේ මෙහෙම කළා කියයි. ඒවා කියන්නේ විපක්ෂයෙන්. වරද්ද ගන්න එපා, ඒවා කියන්නේ විපක්ෂයෙන්. ඒවා කියන්නේ ආණ්ඩුවෙන් නොවෙයි.

දැන් කියනවා මේක ඓතිහාසික අය වැයක් කියලා. මොකක්ද, අය වැයක තිබෙන ඓතිහාසිකකම? අය වැයක් ඓතිහාසික වෙන්නේ නැහැ. ඓතිහාසික වෙන්නේ රටේ තිබෙන වෙන වෙන දේවල්. ඊට වඩා වැදගත් ඓතිහාසික දේවල් තිබෙනවා. මේ අය වැය ඓතිහාසික නොවෙයි, මේක සත්‍ය කරගන්න; ඇත්ත කරගන්න. ප්‍රශ්න තිබෙන්න පුළුවන්. පසුගිය ආණ්ඩුවල ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි ඒවා නිවැරදි කරන්න අවශ්‍ය system එකක් ගැන කථා කරන්නයි තමුන්නාන්සේලා ආවේ. ඒකයි ඒ system එක ගැන විපක්ෂයෙන් අහන්නේ. තමුන්නාන්සේලා උත්තර දෙන්න, "හරි, අපි system එක මේ විධියට වෙනස් කරගෙන මේ විධියට කටයුතු කරනවා" කියලා.

දැන් ඩිජිටල්කරණය කරන්න ගියාම ප්‍රායෝගිකව ඒක කරන්න පුළුවන්ද බැරිද, කරන්න පුළුවන් අංශ මොනවාද, බැරි අංශ මොනවාද කියලා පෙන්වා දෙන්න. තර්කයක් එනවා නම් ඒ තර්කයට උත්තරයක් හොයන්න. ඒ උත්තරය හොයද්දී තමුන්නාන්සේලා විතරක් තනියම කටයුතු කරන්න ඕනෑ නැහැ. ආණ්ඩුවයි, විපක්ෂයයි ඔක්කොම එකතු වෙලා රටේ ආදායම වැඩිකර ගන්න, ආදායම් හංගන මිනිස්සු අල්ලන්න, ජාවාරම් කරන මිනිස්සු අල්ලන්න අවශ්‍ය වැඩසටහන හදන්න පුළුවන්. ඒ නිසා තමුන්නාන්සේලා ඒ ගැන කථා කරන්න.

සාමාන්‍යයෙන් අය වැයක් විවාද කරද්දී විපක්ෂය තමයි තමුන්නාන්සේලාට ඇඟිල්ල දිගු කරලා කරුණු කියන්නේ. තමුන්නාන්සේලා ඒවාට උත්තර දෙන්න ඕනෑ. තමුන්නාන්සේලාට ඇඟිල්ල දිගු කරලා කියන එකට තමුන්නාන්සේලා ආයේ ඇඟිල්ල දිගු කරන්නේ නැහැ. තමුන්නාන්සේලා කියන්න ඕනෑ, "ඔබතුමන්ලා ඔහොම කිව්වාට අපි කරන්නේ මෙහෙමයි" කියලා. ඒ විධියට එකින් එක හරියට පෙන්වලා දෙන්න. හැබැයි මහපොළොවේ යථාර්ථයක් වන විධියට ප්‍රායෝගික වෙන්න. නිකම් බොරුවට කියවලා ඒවා කරන්න බැරුව ගියොත් තමුන්නාන්සේලාටමයි පස්සේ උත්තර දෙන්න වෙන්නේ. මේ යෝජනා ඉදිරිපත් කරලා තව හය මාසයක්, හත් මාසයක් ගියාට පස්සේ කරගන්න බැරි වුණාම තමුන්නාන්සේලාට මේවා එකින් එකට උත්තර දෙන්න වෙනවා.

තමුන්නාන්සේලාගේ පක්ෂයේ ඉන්න දුර ඉඳලා එන ගරු මන්ත්‍රීතුමන්ලා ඇත්තටම අඬනවා, ඒගොල්ලන්ට එන්න විධියක් නැහැ කියලා. මොකක්ද අපි කරන්නේ කියලා හිතාගන්න බැරුව ඉන්නවා කියලා ඒ අය අපට කියනවා. අපට ඒ කාගේවත් නම් කියන්න අවශ්‍ය නැහැ. හැබැයි ඒ අය එහෙම කියනවා. ඉස්සෙල්ලා ඒ ප්‍රශ්න විසඳා ගන්න. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීතුමන්ලා ටික බලාගන්න. අපි ඒකට ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ සමහර අය ගමේදී තිබෙන කුහකකම මෙතැන පෙන්වනවා. ඒ ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය මෙතැනට ගෙනැල්ලා පෙන්වනවා. ඒවාට පුරුදු වෙච්ච මිනිස්සු ටිකක් ඉන්න පුළුවන්. හැබැයි ඔතැන හොඳ කණ්ඩායමකුත් ඉන්නවා. ඒක කියන්නත් එපායැ. එහෙම කටයුතු කරන්නේ නැති කණ්ඩායමකුත් ඉන්නවා. ජනතාවට ආදරය කරන, ඊර්ෂ්‍යාව, කුහකකම නැති, හැම තිස්සේම තව කෙනෙකුට බණින්න බලාගෙන ඉන්නේ නැති පිරිසක් ඔය පැත්තේ ඉන්නවා. ඒ විධියට කටයුතු කරන්නේ නැති කණ්ඩායම තමයි ගොඩක් වෙලාවට අර වාගේ කථා කියවන්නේ. ඒ නිසා කරුණාකරලා ප්‍රායෝගික වෙන්න. මේ අය වැයේදී තමුන්නාන්සේලා ඉස්සෙල්ලාම තීන්දු ගන්න ඕනෑ මොනවාද කරන්නේ කියලා.

දිළිඳුකම තුරන් කිරීම අස්වැසුමෙන් විතරක් කරන්න පුළුවන්ද? ඒ සඳහා තිබෙන ප්‍රායෝගික ක්‍රියාවලිය මොකක්ද? දිළිඳු මිනිසුන් ඉහළට නංවන වැඩසටහන කෝ? තමුන්නාන්සේලාට ඒක මේ වෙලාවේ පෙන්වන්න තිබුණා නේ. සමෘද්ධි වැඩසටහනේදී සමෘද්ධි සහනාධාරය දීලා දිළිඳුකම තුරන් කරන වැඩසටහන් රාශියක් එකතු කළා. එතැනදී දිළිඳු පුද්ගලයා ඉහළට නංවා ඔහු ව්‍යවසායකයෙක් බවට පත් කරනවා. ඒ ක්‍රමය තමයි සමෘද්ධි ව්‍යාපාරයේ තිබුණේ. හැබැයි තමුන්නාන්සේලා ඒ ක්‍රියාවලිය දැන් මේකට ඇතුළත් කරලා තිබෙනවාද?

තමුන්නාන්සේලා පළාත් පාලන ඡන්දය වෙනුවෙන්, ඡන්දය කරන අනෙක් අය වාගේම සිංහල අලුත් අවුරුද්දට ගමේ දිළිඳු අයට පාර්සල් ටිකක් බෙදන්න හදනවා. තමුන්නාන්සේලා පාර්සල් ටික බෙදලා මැතිවරණ ව්‍යාපාරය කරලා ඡන්දය ගත්තාට ඒ මිනිසුන්ගේ ජීවිතය හැදෙනවාද? ඒ මිනිසුන්ගේ ආදායම් තත්ත්වය වැඩි වෙනවාද? අස්වැසුම දුන්නා කියලා ආදායම් තත්ත්වය වැඩි වෙනවාද?

ණය ප්‍රතිව්‍යුහගත කිරීම තමුන්නාන්සේලා හොඳට කළා කිව්වා. නැහැ, හොඳට කළේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා කරපු එකක් තමුන්නාන්සේලා කළාය කියනවා.

එහෙම කළේ නැහැ. ඒ කාලයේ කරපු දේවල් ටිකම තමුන්නාන්සේලා ඉස්සරහට ගෙනියනවා. කමක් නැහැ. වෙන විකල්පයක් නැහැ කියලා අපි හිතමු. හැබැයි, කියපු හැම දේකටම වඩා, ප්‍රායෝගිකව තමුන්නාන්සේලා පෙනී සිටින සහ කරන දේ වෙනස්. ඒකයි අපි මේ තර්ක කරන්නේ. නැතුව වෙන තර්කයක් නැහැ. මේ විපක්ෂය පැත්තේ කවුරුවත් තමුන්නාන්සේලාට ඊර්ෂ්‍යා කරන්නේ නැහැ.

මතක තබා ගන්න, මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට නිල නිවාස ලබා දීලා තිබෙන්නේ වෙන කාරණාවක් නිසා නොවෙයි. ඔය නිල නිවාස තුළ බොහෝ වෙලාවට විදේශ රටවල නායකයන් එක්ක බොහෝ අය සාකච්ඡා පවත්වා තිබෙනවා. සමහර වෙලාවට එකට වාඩි වෙලා කථා කරලා, කෑම ටිකක් එහෙම කාලා ඒ ගන්නා තීන්දු-තීරණවලින් මේ රටට ගොඩක් දේවල් කළා. ඒ වාගේ දේවල්වලට තමයි ඒවා තිබෙන්නේ. ජාත්‍යන්තරය දිනා ගන්න අවශ්‍ය කරන වැඩසටහන එතැන තිබෙන්නේ. ආණ්ඩුවකින් නීතියක් විධියට ලිපියක් ලියා දුන්නා කියලා තමුන්නාන්සේලාට කිසි දෙයක් කවුරුවත් කරන්නේ නැහැ. එහෙම කරන්නේ නැහැ. අපි රටවල් එක්ක යාළු වෙන්න ඕනෑ. අපි ඒ නායකයන් එක්ක මිත්‍ර වෙන්න ඕනෑ. එහෙම මිත්‍ර වෙන්න නිකම් බැහැ. අපි මනුස්සකමත් එක්කයි වැඩ කරන්න ඕනෑ. අපි ඒ අයත් එක්ක

වාඩිවෙලා, කථා බහ කරලා ඒ අයගේ හිත දිනා ගන්න ඕනෑ. එහෙම හිත දිනා ගත්ත පරණ නායකයන් ගැන තමයි අපේ අය කිව්වේ. ඒ නිසා තමයි ගොඩක් දේවල් කරන්න හැකි වුණේ. ඒ නිසා ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, මඩ ගැසීම කියන හතරෙන් මේ රට හදන්න බැහැ කියන එක හොඳට මතක තබා ගන්න. මේ රට හදනවා නම් හදන්න වෙන්නේ ප්‍රායෝගිකව රටත්, ලෝකයත් හරියට හඳුනා ගෙන, ඒගොල්ලන් එක්ක අදහස් බෙදා හදා ගෙන, සාමූහිකත්වයෙන් යුතුව.

තුන්වැනි ලෝකයේ රටක් වන අපට ලෝකයේ අනෙක් රටවල්වලින් ගොඩක් දේවල් ගන්න තිබෙනවා. එහෙම නැත්නම් අපට ඉස්සරහට යන්න බැහැ. ඒ නිසා තමුන්නාන්සේලා මේ ගත්ත ඉලක්කය ඔය විධියට නම් ජීවිතේට ළඟා කරගන්න බැහැ කියන එක මතක තබා ගන්න. ඒ දේ කරනවා නම් බොහොම දැහැමි විධියට, රටට ආදරය කරන, මිනිස්සුන්ට ආදරය කරන විධියට හිත් ටික හදා ගන්න. කෲර විධියට හිත් හදා ගන්න එපා. වෛරයෙන් හිත් හදා ගන්න එපා. එහෙම වුණොත් තමුන්නාන්සේලාටත් තමුන්නාන්සේලාගේ ජීවිත ඉස්සරහට ගෙනියන්න බැරිව යනවා. ඒ ගැන තමයි මට කියන්න පුළුවන් පළමුවැනි වටයේදී. දෙවැනි වටයේදී කියන්නම් ඉතුරු ටික.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.20]

ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ විවාදය අවසන් කරන අවස්ථාවේ කරුණු කාරණා කිහිපයක් මේ ගරු සභාවට දැනුම් දෙන්න තිබෙනවා. විශේෂයෙන්ම අපට පෙනෙනවා, මෙවර අය වැයෙන් පිරිසකට රිදිලා තිබෙන බව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි විපක්ෂයේ මන්ත්‍රීවරු. හැබැයි, ජනතාවගේ පැත්තෙන් ගත්තොත් කිසිම ප්‍රශ්නයක් නැතුව ආදරයෙන් වැලඳ ගත් අය වැයක් මේක. ඒකට හේතුවක් තිබෙනවා. වෙන දා නම් අය වැයක් ඉදිරිපත් කළාට පසු මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන පොලිස් දෙපාර්තමේන්තුවට ගොඩක් වැඩ තිබුණා, පොල්දූව මංසන්ධියේ. මතකද ඔබතුමාට ඒ කාලය? ඒ කාලයේ ගරු මන්ත්‍රීවරුන්ට යන්න වෙනම ගේට්ටු නියම කළා, අසවල් ගේට්ටුවෙන් යන්න කියලා. මොකද, යන්න බැහැ විරෝධතාකරුවෝ ඇවිල්ලා පාරේ සිටියා. නමුත් මෙවර අය වැය ඉදිරිපත් කළාට පසුව හරිම සාමකාමී තත්ත්වයක් පැවතුණේ. ඒ, මේ අය වැය මේ රටේ ජනතාව වැලඳ ගත් අය වැයක් නිසා.

දැන් ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා තර්ක ගණනාවක් නැඟුවා. මුල්ම තර්කය වුණේ, ධීවර අමාත්‍යාංශය යටතේ තිබෙන දේවල් සමානව බෙදන්නේ නැත්තේ ඇයි කියන එක. මම ඒ ගැන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඇහුවා. එතුමා මෙතැන ඉන්නවා. එතුමා කිව්වා, මහනුවරට ධීවර වරායක් හදන්න බැහැ කියලා. *[බාධා කිරීම්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා එහෙම සමානව බෙදන්න බැහැ. ලංකාවේ ධීවර වරායවල් තිබෙන තැන්වලට, ඒවා දියුණු කරන්න පුළුවන් තැන්වලට ඒ අදාළ මැදිහත්වීම් කර තිබෙනවා. *[බාධා කිරීම්]* ඊට පසුව වාහන පිළිබඳව කථාවක් කිව්වා. මම කියන්නේ මන්ත්‍රීතුමා, අඩු ගණනේ සතුටු වෙන්නකෝ, අවුරුදු 6කට පසුව වාහන ගෙන්වන්න ජාතික ජන බලවේගයේ රජය තීරණයක් අරගෙන තිබීම ගැන. පුංචි හෝ කුහකකමක් නැත්නම් අඩු ගණනේ ඒ ගැන සතුටු වෙන්න එපායැ. ඒක තමයි අපට මූලිකව දැනුම් දෙන්න තිබෙන්නේ. *[බාධා කිරීම්]* හරි, හරි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා ඉදිරිපත් කළ මෙම අය වැය ඇතුළේ ඉතාම වැදගත් සංඛ්‍යා දත්තයක් තිබුණා. ඒ සංඛ්‍යා දත්තය පිළිබඳව මට පොඩි සැකයක් ඇති වුණා. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවෙන් යන්න කලින් මම එතුමාගෙන් ඇහුවා, මේ සංඛ්‍යා දත්තය ඇත්තද, එහෙම නැත්නම් එය මුද්‍රණ දෝෂයක් ද කියලා. මොකක්ද ඒ සංඛ්‍යා දත්තය? ඒ තමයි, ජනාධිපති වැය ශීර්ෂයේ පුනරාවර්තන වියදම් පිළිබඳ දත්තය. 2024 අවුරුද්දේ එය රුපියල් මිලියන 4,053යි. 2025 අවුරුද්දේ එය දෙකෙන් පංගුවකට ආසන්න ප්‍රමාණයකින් අඩු වෙලා. එනම්, රුපියල් මිලියන 2,546යි. ඒ එක්කම, මූලධන වියදමත් බලන්න. එය 2024 රනිල් වික්‍රමසිංහගේ කාලයේ රුපියල් මිලියන 34,547යි. මෙවර රුපියල් මිලියන 454යි. අර රුපියල් මිලියන 34,547 රුපියල් මිලියන 454ට අඩු වන කොට අපට ඒ පිළිබඳ පොඩි දෙගිඩියාවක් ඇති වුණා. නමුත්, කථාව ඇත්ත බව මුදල් නියෝජ්‍ය ඇමතිවරයා ප්‍රකාශ කළා. ඒ තමයි, ජාතික ජන බලවේගය රජයේ ජනාධිපතිවරයා කටයුතු කරන හැටි. අපට සතුටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන විදේශ ගමන් බලපත්‍ර ගැන කථා කළොත්, සැලකිය යුතු මුදලක් වෙන් කර තිබෙනවා, ඒ කටයුතු යළි හදන්න. එදා රනිල් වික්‍රමසිංහ රජයෙන් දායාදය කළේ මොකක්ද? එදා විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමේදී තිබුණු පෝලිම අද අපි නැති කරලා තිබෙනවා. Online ක්‍රමය යටතේ පමණක් නොවෙයි, දවස ගානේ ආපු අයට එවෙලේම පාස්පෝට් එක ගෙනියන්න පුළුවන් තත්ත්වයක් අපි අද ඇති කරලා තිබෙනවා. සතුටුයි කියන්න, අපි දැන් ඒ සේවාව පැය 24ම විවෘත කර තිබෙනවා. ඒ ගැන විපක්ෂයට කියන්න කාරණා නැහැ. අද වන කොට ඒ පෝලිම සම්පූර්ණයෙන් අහෝසි බව මේ ගරු සභාවට අපි දැනුම් දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාමල් රාජපක්ෂ මහත්මයාත්, හෙක්ටර් අප්පුහාමි මහත්මයාත් මෙහිදී ලොකුවට දුක් වුණා නේද, අද මහෙස්ත්‍රාත් උසාවියේ දී සිද්ධ වුණු ඝාතනයක් වෙනුවෙන්? දුක් වෙන්න එපායැ. හැබැයි, ඝාතනය තමන්ගේ ක්‍රමයක් විධියට අරගෙන ඇවිල්ලා, ඝාතනය තමන්ගේ සංස්කෘතිය බවට පත් කරගත්තු මහත්වරු දින 90 ආණ්ඩුවට අද ඇඟිල්ල දිගු කරනවා, "මාර විධියට ඝාතන රැල්ලක් යනවා නේ, දැන් ජාතික ආරක්ෂාව කෝ" කියමින්. 2023 ජනවාරි 02වන දා මොකද වුණේ? එදා කවුද මේ රට පාලනය කළේ? එදා රනිල් වික්‍රමසිංහ තමයි මහෙස්ත්‍රාත් උසාවියේ උදේට කෙරුණු පරීක්ෂා කිරීම් නතර කළේ. ඇත්ත වශයෙන්ම පොලිස් බල්ලන් යොදවලා, එතැනින් එහාට වෙනත් වෙනත් දේවල් පාවිච්චි කරලා අධිකරණය සුද්ද කරලා තමයි ගරු මහෙස්ත්‍රාත්වරුන්ට එදා ඒ අයිතිය දුන්නේ. නමුත්, ඒ ජනවාරි 02 වැනි දායින් පසුව ආපු මහෙස්ත්‍රාත්වරයාත් එක්ක ඒ පරීක්ෂණ කටයුත්ත අවසන් වුණා. එදා ඉඳලා අද දක්වා ඔය තත්ත්වය තමයි තිබුණේ. අපි කනගාටු වෙනවා, ඒ වෙච්ච සිද්ධිය වෙනුවෙන්. ඒ ඝාතකයා පුත්තලමේදී අත් අඩංගුවට අරගෙන තිබෙන බව දැන් අපට ආරංචි වෙලා තිබෙනවා. අදාළ අංශ ඉක්මනින් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඊට අදාළ ප්‍රතිකර්ම යොදා තිබෙනවා. හැබැයි, ඝාතනය තමන්ගේ සංස්කෘතිය කරගත්තු මහත්වරු අද මෙතැනට ඇවිල්ලා කිඹුල් කඳුළු හෙළනවා, "මාර ප්‍රශ්නයක් නේ වෙලා තිබෙන්නේ" කියලා.

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මිද්දෙනියේ ඝාතනය පිළිබඳව පරීක්ෂණයක් කරන්න ඕනෑ, ඒ ඝාතනය පිටුපස හිටියේ කවුද කියලා දැනගන්න. ඇයි ඒ? රාජපක්ෂවරුන්ගේ කොන්ත්‍රාත් කරලා කරලා, ඒ උදවිය ඊයේ පෙරේදා websitesවල interviews දෙනවා මම දැක්කා. දැන් ඒ අය - ඝාතනයට ලක් වෙච්ච අය - රාජපක්ෂවරුත් එක්ක තරහ වෙලා. ඒ නිසා යළි පරීක්ෂණ කරන්න ඕනෑ, ඒ ඝාතකයන් පිටුපස ඉන්නේ කවුද කියලා දැනගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාක්ෂි මරනවා. මෙය සංස්කෘතියක් වෙලා තිබෙනවා. අද නීතිපතිවරයාටත්, නීතිපති දෙපාර්තමේන්තුවටත් ඇති වෙලා තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි, සාක්ෂි මැරීම. ඇයි? මේවා දේශපාලන ඝාතන. ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් අද ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මොකක්ද? දැන් අවුරුදු 10ක්, 12ක් වෙනවා. ආණ්ඩු කළේ ඒගොල්ලෝ. ඒගොල්ලෝ ආණ්ඩු කරලා අවුරුදු 17කට පස්සේ අපට නඩුවක් දීලා අහනවා, "හා, දැන් මේ වැඩේ කරන්නේ කොහොමද?" කියලා. ඒ විතරක් නොවෙයි. ප්‍රගීත් එක්නැලිගොඩ පැහැර ගෙන යෑම සම්බන්ධයෙන් වන නඩුවේ සාක්ෂි අතුරුදහන් කරලායි තිබෙන්නේ. ලසන්ත වික්‍රමතුංග ඝාතනයේ සාක්ෂි අතුරුදහන් කරලායි තිබෙන්නේ. තාජුඩීන් ඝාතනයේ සාක්ෂි අතුරුදහන් කරලායි තිබෙන්නේ. කවුද, මේවා පිටුපස ඉන්න මහත්තුරු? ඇඟිල්ල දිගු කරලා තිබෙනවා "ඝාටක මහත්මයාට". අද ඇවිල්ලා "ඝාටක මහත්මයා" පුරසාරම් දොඩලා යනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ සුනිල් වටගල මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
රාජපක්ෂ පවුලට උරුම, එයට නැකම් කියන ඝාතන මේවා. නමුත්, දින 90 ආණ්ඩුවට අද ඇඟිල්ල දිගු කරනවා. ඒ විතරක් නොවෙයි. රිවඩ් ද සොයිසා ඝාතනය සිදු වෙලා, ඊයේයි අනුස්මරණ දිනය. ඒත් දේශපාලන ඝාතනයක්. කාගේද? ඒ නිසා දේශපාලන ඝාතනවලට උරුමකම් කියපු, දේශපාලන ඝාතන තමන්ගේ වැඩක් විධියට patent එක තබා ගෙන ඉන්න මහත්තුරු සිද්ධියක් වුණාට පස්සේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට අද ඇඟිල්ල දිගු කරමින් අහනවා, "මාර වැඩේ නේ. කෝ, ජාතික ආරක්ෂාව?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බෙරේ සද්දෙත් දන්නවා, දොරේ සද්දෙත් දන්නවා. ඒක නිසා මේ කලබල වෙන මහත්තුරුන්ට හරි පැහැදිලිව අපි කියනවා, මේ සාක්ෂි මැරීමේ ක්‍රියාවලිය පිටුපස ඒගොල්ලෝ තමයි ඉන්නේ කියන එක. හැබැයි, අපි ඒවා ගැන පුළුල් පරීක්ෂණ කරනවා. ඒ පුළුල් පරීක්ෂණ ඇතුළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු ආයතනවලට ස්වාධීනත්වය දීලා තිබෙනවා, ඒ වැඩකටයුතු කරන්න. ඉතිහාසයේ ප්‍රථම වතාවට ඒ පරීක්ෂණ කටයුතු කරගෙන යන්න අපි ඒ ආයතන ස්වාධීන කරලා තිබෙනවා. මීට කලින් ඒ සාක්ෂි මැරුවේ කොහොමද? සාක්ෂි මැරුවේ, උඩින් දේශපාලනය තබා ගෙනයි. අද අපි ඒ දේශපාලන අත පෙවීම ඉවත් කර තිබෙනවා. ආයතන අද ස්වාධීන වෙලා පරීක්ෂණ කටයුතු කරන්න පටන් ගෙන තිබෙනවා. ඒක නිසා විපක්ෂය මතක තබා ගන්න, අවුරුදු 17ක් නොවෙයි, අපරාධ නඩුවක් කාලාවරෝධය වෙන්න අවුරුදු 20ක් යන බව. ඒක හින්දා තවම කාලාවරෝධය වෙලා නැහැ ඔයගොල්ලන්ගේ වැඩ. අපි ඒ අදාළ ආයතන ස්වාධීන කිරීම තුළින් මේ පරීක්ෂණ සියල්ල කරනවා. ඒවා පටන් ගන්නවා විතරක් නොවෙයි, අවසන් කිරීමත් කරනවා. ඒක නිසා ඝාතනය දේශපාලන සංස්කෘතියක් කර ගත්තු උදවියට අපි කියනවා, බලාගෙන ඉන්න, අපි මේ පරීක්ෂණ ස්වාධීනව කරනවා කියන එක.

ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල්තබන ලදී.

එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 20වන බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.

අප්පොතු පි.ප. 6.30 මණියාකිවිඩවේ, අලුවල්கள් இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.
விவாதம், 2025 பெப்ருவரி 20, வியாழக்கிழமை மீளத் தொடங்கும்.

It being 6.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.
Debate to be resumed on Thursday, 20th February, 2025.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.30ට, 2025 පෙබරවාරි 06 වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 20 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.
அதன்படி பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 06ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 20, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 6.30 p.m.., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.
Parliament adjourned accordingly until 9.30 a..m. on Thursday 20th February, 2025, pursuant to the Resolution of Parliament of 06th February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

317වන කාණ්ඩය - 4වන කලාපය
தொகுதி 317 - இல. 4
Volume 317 - No. 4

2025 පෙබරවාරි 20වන බ්‍රහස්පතින්දා
2025 பெப்ருவரி 20, வியாழக்கிழமை
Thursday, 20th February, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 පෙබරවාරි 20වන බ්‍රහස්පතින්දා
2025 பெப்ருவரி 20, வியாழக்கிழமை
Thursday, 20th February, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 655 - 680]

වරප්‍රසාද:
2025.02.19 වන දින "ඩේලි මිරර්" සහ "ලංකාදීප" පුවත්පත් වාර්තා [තීරුව 681]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [තුන්වන වෙන් කළ දිනය]:
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 686-818]

කල් තැබීමේ යෝජනාව:
අම්පාර පෙරිය නිලාවනෙයි ප්‍රදේශයේ යෝජිත සුරාසල් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර අත්හිටුවීම [තීරු 818-829]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තීරු 829-834]

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 655-680]

சிறப்புரிமை:
2025.02.19ஆம் திகதிய "டெய்லி மிரர்" மற்றும் "லங்காதீப" பத்திரிகை அறிக்கைகள் [ப: 681]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட மூன்றாம் நாள்]:
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 686-818]

ஒத்திவைப்புப் பிரேரணை:
அம்பாறை, பெரிய நீலாவணை பிரதேசத்தில் உத்தேச மதுபானசாலை அனுமதிப்பத்திரங்களை இரத்துச் செய்தல் [ப: 818-829]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 829-834]

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Cols. 655-680]

PRIVILEGE:
Reports in "Daily Mirror" and "Lankadeepa" Newspapers of 19.02.2025 [Col. 681]

APPROPRIATION BILL, 2025- [Third Allotted Day]:
Second Reading - Debate Adjourned [Cols. 686-818]

ADJOURNMENT MOTION:
Cancellation of Permits for Proposed Liquor Shops in Periya Nilawanai, Ampara [Cols. 818-829]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 829-834]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි **20**වන බ්‍රහස්පතින්දා
2025 பெப்ருவரி 20, வியாழக்கிழமை
Thursday, 20th February, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, 2024 පළමු, දෙවන සහ තෙවන කාර්තු සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(මාණ්පුමිකු (කලානිති) හරිනි අමරසූරිය)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් මත බදු ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සම්බන්ධයෙන් 2013 ජූලි 26 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද්දාවූ, 2013 සැප්තැම්බර් 17 දිනැති අංක 1828/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දීය ජනරජයේ ආණ්ඩුව අතර එළඹී ගිවිසුම සංශෝධනය කරමින් 2024 දෙසැම්බර් 16 දින ඇති කරගත් සන්ධාන පත්‍රය මම ඉදිරිපත් කරමි.

මෙම සන්ධාන පත්‍රය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2022/2023 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වාර්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන්න කියලා තමයි ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් යෝජනා කළේ සහ ඔබතුමා නියෝගය දුන්නේ. ගරු කථානායකතුමනි, Standing Orders අනුව ඒ කමිටුව පිහිටුවන්න තිබෙනවා. මා දන්නා තරමින් ඒ කමිටුව තවම establish කරලා නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ඒ කමිටුව ඉතාම ඉක්මනින් establish කරන්න කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

අපි අද උදේත් ඒ ගැන කථා කළා. ඒ පිළිබඳව කඩිනමින් කටයුතු කරලා ඒ කමිටුව පිහිටුවනවා.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම යටතේ, ගරු මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බදුල්ල, මයිලගස්තැන්න, දළදා ඇළ පාර, අංක 40/8 දරන ස්ථානයෙහි පදිංචි ඒ.පී. රාජසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හාලිඇල, බෝගහමඩිත්ත, බෝ සෙවන යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්. හේමචන්ද්‍ර බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මාපලගම-මධ්‍යම, අලුත් ඉහළ, දෙහැත්තගෙවත්ත යන ලිපිනයෙහි පදිංචි ආරියදාස ගොඩගම මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) උඟරගස්මංහන්දිය, අඹගහහන්දිය, වල්ඉහුරුකැටිය පාර, "රංගවිලා" යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ. තාබ්‍රෙව් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) පිළිමතලාව, ගඩලාදෙණිය, අංක 333 දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. සෙනවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) ගම්පහ, වලව්වත්ත, අංක 313/54 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඒ.එස්. කෞෂල්‍යා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) ගම්පහ, මොරගොඩ, අංක 19 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්.එච්. පාලිත ධනපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ගම්පහ, මුදුන්ගොඩ, හෙනරත්ගොඩ, අංක 165 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ.ජේ. අබේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ඇල්ලගාව, මඩල, ජයවර්ධන මාවත, අංක 220 දරන ස්ථානයෙහි පදිංචි කේ.වී. අනුරකීර්ති මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) කිරිඳිවැල, කුට්ටිවිල, අංක 203 දරන ස්ථානයෙහි පදිංචි පී.පී. සරත් රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) ගනේමුල්ල, කොස්සින්න, අංක 281/සී දරන ස්ථානයෙහි පදිංචි සංජය හේවා බඹරන්දගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) ඉඹුල්ගොඩ, පහළ යාගොඩ, දඹුවත්ත, අංක 11 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ජේ.පී.සී.යූ. විජයතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) ගන්දර, තලල්ල දකුණ, වළේවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.එම්. නිලූකා සාමලී හේරත් මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) වැලිගම, කොක්මාදුව, ගොරකගහ කොරටුව යන ලිපිනයෙහි පදිංචි කේ.එල්.සී. නිශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) බඩල්ගම, නැඟෙනහිර ගොඩිගමුව, ගමගේ වත්ත, අංක 84 ඒ දරන ස්ථානයෙහි පදිංචි පී. සංජීව ප්‍රසාද් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) තිස්සමහාරාම, දෙබරවැව, ගහසිරිපුර, අංක 499 දරන ස්ථානයෙහි පදිංචි පී.එම්. ජයන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) කුරුණෑගල, මීගමු පාර, කප්රුකවත්ත, අලකොලදෙණිය, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි එස්.එම්. පියතිස්ස මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)

ගරු කථානායකතුමනි, වෙල්පල්ල, ගණන්කැටේ යන ලිපිනයෙහි පදිංචි එච්.ඩී. රන්ජන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කෝසල නුවන් ජයවීර මහතා
(மாண்புமிகு கோசல நுவன் ஜயவீர)
(The Hon. Kosala Nuwan Jayaweera)

ගරු කථානායකතුමනි, දෙහිඕවිට, අල්ගොඩ, දෙහිඕවිට කෝප් සිටිය බාරේ, දැහැමී සෙවන, අංක ඒ 58/2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජයන්ත වීරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, වැලිගම, හල්ලල, හේනවත්ත යන ලිපිනයෙහි පදිංචි සරත් හේවාපතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අහුන්ගල්ල, හෝටල් පාර, සිරිසෙවන යන ලිපිනයෙහි පදිංචි පී.ජී. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, කුලියාපිටිය, අනුක්කනේ, බෝධිමුල්ල, නෙත්මිණි උයන, අංක 270/8 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්.එල්. සමන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

විදේශ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන්: මුහුණ දෙන ගැටලු
வெளிநாட்டில் தொழில்புரியும் இலங்கையர்கள்: எதிர்நோக்கும் பிரச்சினைகள்
SRI LANKANS EMPLOYED IN FOREIGN COUNTRIES: ISSUES FACED

322/2024

1. ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් ඉතාලියේ රැකියා කරනු ලබන අතර ඔවුන්ගේ රියදුරු බලපත්‍ර අලුත් කර ගැනීමට නොහැකි වීම ප්‍රධාන ගැටලුවක් වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) විදේශීය රැකියාවල නිරත වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් අමානුෂික වද හිංසාවලට භාජන වන බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(v) විදේශ රැකියා ලබා දෙන බවට පොරොන්දු වී මුදල් වංචා කර සිටින ආයතන/පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(vi) වංචා කර ඇති මුදල් නැවත ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்திலுள்ள அதிகமானோர் இத்தாலியில் தொழில் புரிவதோடு அவர்களது சாரதி அனுமதிப்பத்திரத்தை புதுப்பித்துக் கொள்ள இயலாதுள்ளமை முக்கியமானதொரு பிரச்சினையாக மாறியுள்ளது என்பதை அவர் அறிவாரா;

(ii) ஆமெனில், அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(iii) வெளிநாட்டு வேலைவாய்ப்பில் ஈடுபட்டுள்ள இலங்கைப் பணியாளர்கள் மனிதாபிமானமற்ற சித்திரவதைகளுக்கு ஆளாக்கப்படுகின்றனர் என்பதை அறிவாரா;

(iv) ஆமெனில், அது தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(v) வெளிநாட்டில் வேலைவாய்ப்பு பெற்றுத்தருவதாக உறுதியளித்து, பணமோசடி செய்கின்ற நிறுவனங்கள்/நபர்களுக்கு எதிராகச் சட்டத்தை நடைமுறைப்படுத்துவதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

(vi) மோசடிசெய்துள்ள பணத்தை மீளப் பெற்றுக்கொள்வதற்காக மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that a large number of people from the Puttalam District work in Italy and that the inability to get their driving licences renewed has become a major issue for them;

(ii) if so, the steps that will be taken in that regard;

(iii) whether he is aware that Sri Lankan workers engaged in foreign employment are subjected to inhuman torture;

(iv) if so, the steps that will be taken in that regard;

(v) the measures that will be taken to enforce the law against institutions/individuals who have swindled money by making promises to provide foreign employment; and

(vi) the measures that will be taken to recover the money so swindled?

(b) If not, why?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්. ඉතාලියේ සේවය කරන බොහෝ ශ්‍රී ලාංකිකයන්ට මෑතක සිට ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍ර ඉතාලි රියැදුරු බලපත්‍ර බවට හැරවීමේදී ගැටලුවලට මුහුණදීමට සිදුවී තිබේ.

ශ්‍රී ලංකාව සහ ඉතාලිය අතර රියැදුරු බලපත්‍ර අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම සඳහා වන ද්වීපාර්ශ්වික ගිවිසුම මුලින්ම අත්සන් කරනු ලැබුවේ වර්ෂ 2011දී වන අතර, වසර 5ක් ඉකුත් වූ පසු රියැදුරු බලපත්‍රය අලුත් කිරීම සඳහා එම ගිවිසුමෙහි වගන්තියක් ඇත. ඉතාලියේ නාෂයාත්මක හා ප්‍රායෝගික පරීක්ෂණවලට මුහුණ නොදී වලංගු ඉතාලි රියැදුරු බලපත්‍රයක් ලබා ගැනීමට අවස්ථාව ලැබුණු බැවින් මෙම ගිවිසුම ශ්‍රී ලාංකිකයන්ට වඩාත් ප්‍රයෝජනවත් විය.

ගිවිසුමේ පළමු අලුත් කිරීම 2017 වසරේදී සිදු කරන ලද අතර, එහි කාලය අවසන් වීමෙන් පසු (2022 මාර්තු 3) ඉතාලි බලධාරිහු නව ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා කළහ.

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉතාලිය කියන්නේ අපේ රටට විදේශ විනිමය වැඩි වශයෙන් ගෙන එන රටක්. ඒ වාගේම, පුත්තලම දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් ඉතාලියේ රැකියාවල නිරත වෙලා ඉන්නවා. පසුගිය කාලය පුරාවටම ඒ ජනතාවගෙන් අපට චෝදනාවක් ආවා, මෙහෙම කරන්නේ ඇයි කියලා.

එහෙම නම්, පසුගිය ආණ්ඩු මේ සම්බන්ධව කටයුතු නොකළේ ඇයිද කියන කාරණාව මතු වෙනවා. මොකද, මේ ප්‍රශ්නය තවදුරටත් අපට කියමින් ඉන්නවා. එම නිසා පසුගිය ආණ්ඩුව විසින් මේ ප්‍රශ්නයට මැදිහත් නොවීමට හේතුව කවරේද කියලා අහනවා.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් ගිවිසුමක් ගත්තොත්, ඒක අවලංගු -lapse- වෙන්න කලින් අලුත් කරන කරන එක ලේසියි. පසුගිය කාලවකවානුව තුළ යම් තනතුරුවල හිටපු අයගේ අක්‍රමිකතා නිසා මේ ප්‍රශ්නය සිදු වෙලා තිබෙන ආකාරයක් තමයි අපි දකින්නේ. විශේෂයෙන්ම නිසි පරිදි, හරියාකාරව, වෙලාවට මේක අලුත් නොකිරීම තමයි මේ ප්‍රශ්නයට මූලික හේතුව වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි මේ සම්බන්ධව දැන් වැඩකටයුතු පටන් ගෙන තිබෙනවා. ඉතා කෙටි කාලයක් තුළ අපට මේ සම්බන්ධයෙන් හොඳ පිළිතුරක් ජනතාවට ලබා දෙන්න පුළුවන් වෙයි කියන විශ්වාසය තිබෙනවා.

(ii) - ඉතාලිය විසින් ඉදිරිපත් කරන ලද නව කෙටුම්පත පිළිබඳ සාකච්ඡා 2022 වසරේදී ආරම්භ විය.

- ප්‍රධාන ගිවිසුම පිළිබඳ සාකච්ඡා දැනට අවසන් කර ඇති අතර, එකඟ වූ පාඨය අත්සන් කිරීම සඳහා සූදානමින් පවතී.

- කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ රියදුරු බලපත්‍රයේ ආකෘතිය පස්වතාවක් වෙනස් කර ඇති බැවින්, ඉතාලි පාර්ශ්වය එම කාල පරතරයන් සම්බන්ධයෙන් අමතර තොරතුරු ඉල්ලා සිටින අතර එමඟින් පාඨය අත්සන් කිරීමට බාධා ඇති විය.

- මෑතකදී, 2024 ඔක්තෝබර් 21 වැනි දින, ඉතාලියේ යටිතල පහසුකම් සහ ප්‍රවාහන අමාත්‍යාංශය, රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා ගිවිසුමට අදාළ තවත් පැහැදිලි කිරීම් (රියදුරු බලපත්‍ර ආකෘති, පුද්ගලික දත්ත මාරු කිරීම පිළිබඳ රෙගුලාසි ආදිය සම්බන්ධයෙන්) ඉල්ලා සිටියේය. මෙයට අදාළ ප්‍රතිචාරය රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඉතාලි බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති අතර දැනට ඔවුන්ගේ සමාලෝචනය අපේක්ෂාවෙන් පසුවේ.

- මෑතකදී, 2024 ඔක්තෝබර් 21 වැනි දින, ඉතාලියේ යටිතල පහසුකම් සහ ප්‍රවාහන අමාත්‍යාංශය, රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා ගිවිසුමට අදාළ තවත් පැහැදිලි කිරීම් (රියදුරු බලපත්‍ර ආකෘති, පුද්ගලික දත්ත මාරු කිරීම පිළිබඳ රෙගුලාසි ආදිය සම්බන්ධයෙන්) ඉල්ලා සිටියේය. මෙයට අදාළ ප්‍රතිචාරය රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ඉතාලි බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති අතර දැනට ඔවුන්ගේ සමාලෝචනය අපේක්ෂාවෙන් පසුවේ.

- වැඩිදුර පැහැදිලි කිරීම්/විමසීම් අවශ්‍ය නොවන බව ඉතාලි පාර්ශ්වය තහවුරු කර ඇති බව රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය දන්වා ඇත. රියදුරු බලපත්‍ර කාණ්ඩ/සමානතා පිළිබඳ අවසාන වගුව පරීක්ෂා කර තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවට යවනු ලැබේ. ඒ පිළිබඳ තහවුරු කිරීම ලැබුණු පසු පහසු දිනයක ගිවිසුම අත්සන් කළ හැකිය. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සම්පූර්ණ පිළිතුර ලබා දෙන්න. පිළිතුර ලබා දුන් පසු අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

(iii) විදේශ රැකියාවල නිරත වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් අතරින් ගෘහස්ථ රැකියාවල නිරත කාන්තාවන් සීමිත සංඛ්‍යාවක් පමණක් අමානුෂික වධ හිංසාවලට ලක්වන බව නිරීක්ෂණය වේ.

වාර්ෂිකව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සමථ අංශය වෙත පැමිණිලි 3,000කට ආසන්න ප්‍රමාණයක් වාර්තා වන අතර, ඉන් වධ හිංසා - ශාරීරික, මානසික, ලිංගික වධ හිංසා- ගණයට අයත් වන පැමිණිලි වාර්තා වන්නේ 150කට අඩු ප්‍රමාණයක් වේ.

(iv) මේ සම්බන්ධව කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව -කාර්යාංශ පනත වගන්ති අංක 44, 65, 66 අනුව- ක්‍රියා කරනු ලැබේ. විගමණික ශ්‍රමිකයාට වන වධ හිංසා සම්බන්ධව මෙරට දේශීය රැකියා නියෝජිතායතනයක් මඟින් විදේශගත වී ඇත්නම් එම ආයතනය, පැමිණිලිකරු, එරට දූත මණ්ඩල විදේශ රැකියා නියෝජිතායතනයන් හාම්පුතා සමඟ අදාළ කටයුතු සිදු කර එම අවස්ථාවේදීම ගැටලුව විසඳීමට කටයුතු කරනු ලැබේ. මේ සම්බන්ධව අදාළ විධිවිධාන දීම, නඩු පැවරීම කාර්යාංශ පනතේ ප්‍රතිපාදන අනුව සිදු කරනු ලබයි.

මීට අමතරව ගැටලුව සමථයකට පත් නොවන්නේ නම් අදාළ දූත මණ්ඩල විසින් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් අවශ්‍ය මැදිහත්වීම් සිදු කරනු ලබයි.

සේවකයා විදේශගතව ඇත්තේ ස්වයං ලියාපදිංචිය තුළින් නම් අදාළ ශ්‍රී ලංකා දූත මණ්ඩලය සහ සේවා යෝජකයින් සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ පියවර ගනු ලැබේ.

මීට අමතරව, කාර්යාංශයේ ලියාපදිංචි නොවී විදේශගත වූ පුද්ගලයෙකු පැමිණිල්ලක් ඉදිරිපත් කළහොත්, කාර්යාංශයට සෘජුවම මැදිහත් විය නොහැක. එවැනි අවස්ථාවන්හිදී, පැමිණිල්ල විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ කොන්සියුලර් කටයුතු අංශයට යොමු කරනු ලැබේ.

(v) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 1994 අංක 09 හා 2009 අංක 56 යන පනත්වලින් සංශෝධිත 1985 අංක 21 දරන පනතේ ප්‍රතිපාදන අනුව ලියාපදිංචි විදේශ රැකියා නියෝජිත

ආයතනයක බලපත්‍රලාභීන්ගෙන් කාර්යාංශ පනතේ 64(අ) වගන්තිය යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීම සිදු කරනු ලබන අතර, කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රයක් නොමැති ආයතන හෝ පුද්ගලයින් විසින් මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් කාර්යාංශ පනතේ 64(ආ) වගන්තිය යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබේ.

(vi) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශයට පැමිණිල්ලක් යොමු කිරීමෙන් පසු දෙපාර්ශ්වයම කැඳවා පැමිණිලි පරීක්ෂණයක් පවත්වා වංචා කිරීමට අදාළ මුදල් සාක්ෂි සහිතව ඉදිරිපත් කළ පසු දෙපාර්ශ්වයම එකඟතාවකට පැමිණ මුදල් ලබා දීමෙන් ගැටලුව විසඳීමට කටයුතු කරන අතර, දෙපාර්ශ්වයම ගැටලුව විසඳීමට එකඟ නොවන අවස්ථාවන්හි මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීමක් සිදු කර අධිකරණ ක්‍රියාවලියකින් පසුව මහෙස්ත්‍රාත්තුමා ලබා දෙන නියෝගය අනුව නඩු කටයුතු අවසන් කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ගරු අජීත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අපි දන්නවා, රට පුරාම විදේශ රැකියා සම්බන්ධ වංචා සිදු වෙන බව, විදේශ රැකියාවලට යවනවා කියලා රුපියල් මිලියන ගණන් අරගන්න බව. එවැනි වංචාවලට හසු වූ විශාල පිරිසක් මේ වන විට අධිකරණ ක්‍රියාමාර්ගවලත් නියැළී ඉන්නවා. නමුත් ඒ අයට සාධාරණයක් ඉටු වෙනවාද කියන ප්‍රශ්නය මේ වෙද්දි තිබෙනවා. අසරණ වෙලා ඉන්න ඒ ජනතාවට සාධාරණය ඉටු කරන්නේ කොහොමද? එහෙම නැත්නම් ඒ සම්බන්ධයෙන් කඩිනමින් නෛතික ක්‍රියාමාර්ග ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහනවා, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය වශයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද කියලා.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු මන්ත්‍රීතුමනි, අදාළ නියෝජිත ආයතනය ලියාපදිංචි කරලා තිබෙනවා නම් ඒ සම්බන්ධව කටයුතු කරන්න ලෙහෙසියි. ලියාපදිංචි කරනවා කියන්නේ, SLBFE registration එකක් තිබෙන්නේ. යම් ආයතනයකට SLBFE registration එක තිබෙනවා නම්, පුද්ගලයෙකු ප්‍රශ්නවලට මුහුණ දෙනකොට trace කරගෙන අපට ඒ කටයුතු කරන්න ලෙහෙසියි. විශේෂයෙන් අපි පිළිගන්නා කාරණයක් තමයි, ආයතනය ලියාපදිංචි කරලා නැති වුණත්, ශ්‍රී ලංකා පුරවැසියන්ට අපි ඒ ආරක්ෂාව ලබා දිය යුතුයි කියන එක.

ඒ සම්බන්ධව ප්‍රතිපාදන ගොඩක් නොවූවත් විශේෂයෙන් අපි කොන්සියුලර් අංශය හරහා මේ පිළිබඳව කටයුතු කරනවා. එහෙත් තැන් කිහිපයක ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව අපි කටයුතු කරමින් සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

ගරු අජීත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පසුගිය රජයේ අමාත්‍යවරු මේ ප්‍රශ්නවලට මැදිහත් වීමක් වෙලා තිබුණු බව අපි දන්නවා. ඒක රටේ ප්‍රසිද්ධ කාරණාවක්. යම් මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ නම් පවා ඒවාට සම්බන්ධ වෙලා තිබුණා. විදේශ රැකියා ලබා දෙනවා කියලා වංචා කරපු සිද්ධීන්වලදී මේ පාර්ලිමේන්තුවේ හිටපු අමාත්‍යවරු ඒවාට සම්බන්ධයි කියලා අපි දන්නවා. ඒ පිළිබඳව පරීක්ෂණ කරලා ඊට අදාළව කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් අහනවා.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශයට පැමිණිල්ලක් යොමු කිරීමෙන් පසු දෙපාර්ශ්වයම කැඳවා පැමිණිලි පරීක්ෂණයක් පවත්වා වංචා කිරීමට අදාළ මුදල් සාක්ෂි සහිතව ඉදිරිපත් කළ පසු දෙපාර්ශ්වයේම එකඟතාවට පැමිණ මුදල් ලබා දීමෙන් ගැටලුව විසඳීමට කටයුතු කරන අතර, දෙපාර්ශ්වයම ගැටලුව විසඳීමට එකඟ නොවන අවස්ථාවන්හි මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු පැවරීමක් සිදු කර අධිකරණ ක්‍රියාවලියකින් පසුව මහෙස්ත්‍රාත්තුමා ලබා දෙන නියෝගය අනුව නඩු කටයුතු අවසන් කරනු ලබනවා.

බන්ධනාගාර සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන: විස්තර
சிறைச்சாலைகள் மற்றும் புனர்வாழ்வளிப்பு நிலையங்கள்: விபரம்
PRISONS AND REHABILITATION CENTRES: DETAILS

379/2025

2. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව එක් එක් බන්ධනාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බන්ධනාගාරවල යටිතල පහසුකම්වල මේ වනවිට පවතින අඩුපාඩු කවරේද;

(iii) බන්ධනාගාරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බන්ධනාගාරගත කරනු ලබන පුද්ගලයන් සඳහා පිහිටුවා ඇති පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුනරුත්ථාපන මධ්‍යස්ථානවල මේ වනවිට පුනරුත්ථාපනය කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් මධ්‍යස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් පුනරුත්ථාපනය කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள சிறைச்சாலைகளில் பணியாற்றும் அலுவலர்களின் எண்ணிக்கை ஒவ்வொரு சிறைச்சாலை வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(ii) அத்தகைய சிறைச்சாலைகளின் உட்கட்டமைப்பு வசதிகளில் தற்போது காணப்படுகின்ற குறைபாடுகள் யாவையென்பதையும்;

(iii) சிறைச்சாலைகளின் உட்கட்டமைப்பு வசதிகளை விருத்திசெய்வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சிறைச்சாலைகளில் தடுத்துவைக்கப்படும் நபர்களுக்காக அமைக்கப்பட்டுள்ள புனர்வாழ்வளிப்பு நிலையங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அத்தகைய புனர்வாழ்வளிப்பு நிலையங்களில் தற்போது புனர்வாழ்வளிக்கப்படும் நபர்களின் எண்ணிக்கை ஒவ்வொரு நிலையம் வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(iii) அவர்களுக்குப் புனர்வாழ்வளிக்கும்போது பின்பற்றப்படும் வழிமுறைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) number of officers serving in each prison in Sri Lanka, separately;

(ii) deficiencies in the infrastructure facilities of those prisons; and

(iii) steps that will be taken to develop the infrastructure facilities of those prisons?

(b) Will he also inform this House the -

(i) number of rehabilitation centres that have been established for imprisoned persons;

(ii) number of persons being rehabilitated in each of those rehabilitation centres, as of now, separately;

(iii) methods that have been used to rehabilitate them?

(c) If not, why?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ආයතන 31යි. නිලධාරීන් සංඛ්‍යාව 5,218යි.

අංකය	බන්ධනාගාර ආයතනය	සංඛ්‍යාව
1	පබෝධා මෙත් සෙවන - අඹේපුස්ස බන්ධනාගාරය	55
2	ත්‍රිකුණාමලය බන්ධනාගාරය	73
3	යාපනය බන්ධනාගාරය	132
4	කළුතර බන්ධනාගාරය	186
5	මීගමුව බන්ධනාගාරය හා හලාවත සිර මැදිරිය	206
6	කෑගල්ල බන්ධනාගාරය සහ කුරුණෑගල සිර මැදිරිය	167
7	නව මැගසින් බන්ධනාගාරය	154
8	වවුනියාව බන්ධනාගාරය සහ මන්නාරම සිර මැදිරිය	74
9	වැලිකඩ බන්ධනාගාරය	398
10	පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය	28
11	අනුරාධපුර බන්ධනාගාරය	206
12	තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය - දඵපත	69
13	වටරැක එළිමහන් කඳවුර	74
14	බූස්ස බන්ධනාගාරය	122
15	කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය	233
16	කුරුවිට බන්ධනාගාරය, අවිස්සාවේල්ල සිර මැදිරිය හා බලංගොඩ සිර මැදිරිය	239
17	වාරියපොල බන්ධනාගාරය, හංගංලිපොල සිර කඳවුර, මහව සිර මැදිරිය, කුලියාපිටිය සිර මැදිරිය, පුත්තලම සිර මැදිරිය	230
18	මාතර බන්ධනාගාරය	161
19	මොනරාගල බන්ධනාගාරය හා අම්පාර සිර මැදිරිය	121
20	මඩකලපුව බන්ධනාගාරය හා කල්මුනේ සිර මැදිරිය	127
21	බදුල්ල බන්ධනාගාරය හා නුවරඑළිය සිර මැදිරිය	153
22	බෝගම්බර බන්ධනාගාරය, මාතලේ සිර මැදිරිය, හැටන් සිර මැදිරිය, ගම්පොල සිර මැදිරිය	383
23	වීරවිල බන්ධනාගාරය	67
24	බන්ධනාගාර මූලස්ථානය	261
25	පොළොන්නරුව බන්ධනාගාරය	93
26	මහර බන්ධනාගාරය	283
27	පල්ලෙකැලේ බන්ධනාගාරය	116
28	ගාල්ල බන්ධනාගාරය	222
29	තල්දෙන බන්ධනාගාරය	68
30	අහුනකොළපැලැස්ස බන්ධනාගාරය, කඳුරුගස්ආර සිර මැදිරිය, හම්බන්තොට සිර මැදිරිය, ඇඹිලිපිටිය සිර මැදිරිය	285
31	හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය	232
	එකතුව	**5218**

(ii)
- මේ වනවිට සමස්ත බන්ධනාගාර ආයතනවල නේවාසිකයින් 29,000කට අධික ප්‍රමාණයක් රඳවා ඇති අතර, එය රඳවිය හැකි ප්‍රමාණය මෙන් තුන් ගුණයක් පමණ වන බැවින් අධික තදබදයක් නිර්මාණය වී ඇත. පවතින වාට්ටු හා සිරකරුවන් රඳවන ගොඩනැඟිලිවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විශේෂයෙන්ම මෙම තත්ත්වය කොළඹ හා එම තදාසන්න ආයතනවලට වැඩි වශයෙන් බලපා ඇත.
- කොළඹ බන්ධනාගාර සංකීර්ණය ආශ්‍රිතව හා කළුතර බන්ධනාගාරයේ ඇතැම් ගොඩනැඟිලි ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් එම ගොඩනැඟිලි භාවිතයෙන් ඉවත් කිරීම සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය වෙතින් ද ලද නිර්දේශ මත භාවිතයෙන් ඉවත් කිරීම මත ද පවතින ඉඩකඩ රඳවියන් රඳවීමට ප්‍රමාණවත් නොවීම.
- බන්ධනාගාර නේවාසිකයින්ගෙන් අමුත්තන් පෙන්වන ස්ථාන -visiting rooms- හා අමුත්තන් සඳහා රැඳී සිටින ස්ථාන පුළුල් කර වැඩිදියුණු කිරීම, පාර්සල් හා අනෙකුත් දෑ පරීක්ෂා කිරීම සඳහා දැනට පවතින ආරක්ෂිත උපකරණ ප්‍රමාණවත් නොවීම, රඳවියන් ප්‍රවාහනය සඳහා පවතින වාහන ප්‍රමාණවත් නොවීම හා ඇතැම් ඒවා පැරණි බස් රථ වීම.
- ලංකාවේ බන්ධනාගාර බොහොමයක් ඉතා පැරණි ඒවා බැවින් ඒවායේ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවීම හා අධික ජනගහනයට සරිලන සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- ආබාධිත රඳවියන් සඳහා ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, බන්ධනාගාරගත ගැබිනි මව්වරුන් හා කුඩා දරුවන් සඳහා සුරැකුම් මධ්‍යස්ථාන අවශ්‍ය බන්ධනාගාර සඳහා ඉදිකිරීම, දුරකථන ඇමතුම් ලබා ගැනීමේ පහසුකම් තවදුරටත් පුළුල් කිරීම.
- කොළඹ බන්ධනාගාර සංකීර්ණය තුළ සමස්ත නේවාසිකයින් ප්‍රමාණයෙන් සියයට 30ක ප්‍රමාණයක් රඳවා ඇති බැවින් නිලධාරීන්ද වැඩි පිරිසක් සේවය කරනු ලබන අතර, එහි සියලුම නිල නිවාස, තනිකඩ නිල නිවාසවල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- කාර්යාලවල පවතින පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීමට අවශ්‍ය වීම.

(iii) ඔව්.
- වාර්ෂිකව අය වැය මඟින් වෙන්වන ප්‍රතිපාදන සීමාව තුළ ප්‍රමුඛතාවයට අනුව හඳුනා ගන්නා ලද අලුත්වැඩියා හා වැඩිදියුණු කිරීම් සඳහා ගොඩනැඟිලි පුනරුත්ථාපන වැය ශීර්ෂය හා සුළු අලුත්වැඩියා කටයුතු වැය ශීර්ෂය යටතේ සිදුකර ඇති අතර, මෙම වසර සඳහා ද ඒ යටතේ සිදු කිරීමට අපේක්ෂිත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් හඳුනා ගනිමින් පවතී.
- නේවාසිකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇති අතර, ඒ යටතේ ජල නළ පද්ධති අලුත්වැඩියා, මල අපවහන පද්ධති අලුත්වැඩියා වැනි කාර්යයන් සිදුකර ඇති අතර, කුරුවිට, පොළොන්නරුව, මීගමුව, වාරියපොල බන්ධනාගාර ආශ්‍රිත මල හා අපජල පිරිපහදු පද්ධති ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.
- එමෙන්ම හඳුනා ගත් ආයතනවල නේවාසික ගොඩනැඟිලි ඉදිකිරීමට අවශ්‍ය ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර 2025 වසර සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට අය වැය යෝජනා සඳහා ඉදිරිපත් කර ඇත.
- ආයතන බොහොමයකම මුළුතැන්ගෙයි අලුත්වැඩියා හා නවීකරණ කටයුතු සිදුකර, බන්ධනාගාර ආයතන 03ක් සඳහා නව දර පිරිමැසුම්දායී උඳුන් සවිකර ඇති අතර, ඉතිරි බන්ධනාගාර සඳහා ද ඒවා ලබා දීමට ඉදිරියේදී සැලසුම් කර ඇත.
- ආයතන අවශ්‍යතාවන් අනුව නව නිලධාරි බැරක්ක ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, ඊට අදාළ ව්‍යාපෘති යෝජනාව මඟින් 2025 වසර සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට ද කටයුතු කර ඇත. වවුනියා බන්ධනාගාරයේ බැරක්කයක් අලුත්වැඩියා කිරීමට කටයුතු කරමින් පවතින අතර බදුල්ල බන්ධනාගාරය සඳහා බැරක්කයක් ඉදිකිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගෙන එය 2025 වසරේ ඉදිකිරීමට ද නියමිතයි.
- පවතින තදබදයට පිළියමක් ලෙස වටරැක එළිමහන් සිර කඳවුරේ අඩක් නිමකර ඇති වට තාප්පය නිමකර දෙමහල් සිර ගොඩනැඟිලි 02ක් ඉදිකිරීමට දළ ව්‍යාපෘති යෝජනාව ද 2025 වසර සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන් අය වැය යෝජනා සඳහා ඉදිරිපත් කර ඇත.
- එසේම බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා හා මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මඟින් කමිටුවක් පත් කර ඇති අතර, එමඟින් බන්ධනාගාර තදබදය අවම කර ගැනීමට අපේක්ෂා කරයි.
- වැලිකඩ බන්ධනාගාරයේ නේවාසික ගොඩනැඟිලි බොහොමයක් බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉදිකර ඇති ඒවා බැවින් දැනට අබලන්ව ඇති අතර එම ගොඩනැඟිලි යථාවත් කිරීමට හෝ පූර්ණ අලුත්වැඩියාවකට ලක් කළ යුතුය. ඇතැම් ගොඩනැඟිලි අලුත්වැඩියා කිරීමට වඩා නව ගොඩනැඟිලි ලෙස ඉදි කිරීමට අවශ්‍ය වේ. ඇතැම් ගොඩනැඟිලි ඉපැරණි පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු බැවින් ඒවා අලුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වී ඇත. එබැවින්, කොළඹ බන්ධනාගාර සංකීර්ණය හොරණ මිල්ලැව ප්‍රදේශයට විතැන් කිරීම - ස්ථාපිත කිරීම- සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සැලසුම් හා නිර්මාණ කටයුතු සිදු කර ඇති අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුව ඇත.
- එමෙන්ම, කොළඹ බන්ධනාගාර සංකීර්ණයේ ඇති බන්ධනාගාර නියාමක නිලධාරීන් වෙත වෙන් කර ඇති නිල නිවාස බොහොමයක් පූර්ණ අලුත්වැඩියා කළ යුතු මට්ටමක ඇත.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

පුනස්ථාපනය සඳහා වසර ගණනාවක සිට හඳුනා ගෙන පැවතීම මත මෙම ගොඩනැඟිලි ඉදිකිරීමට ප්‍රතිපාදන වෙන් නොවන ලදී. 2024 වසරේ එක් තට්ටු නිල නිවාසයක් අලුත්වැඩියා කිරීමට කටයුතු කරන ලදී.

- වාරියපොළ බන්ධනාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතියද එම බන්ධනාගාරයේ තදබදයට විසඳුමක් ලෙස හඳුනා ගෙන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ එකඟතාව හා අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබා ගෙන පැවතියද, ඊටද පසුගිය වසර කිහිපය තුළ අය වැය මඟින් ප්‍රතිපාදන වෙන් නොවීය. 2025 වසර සඳහාද ඊට ප්‍රතිපාදන සලසා ගැනීමට අය වැය යෝජනා සඳහා ඇතුළත් කර ඇත.
- නව දුම්බර බන්ධනාගාරයේ නිල නිවාස ඉදිකිරීම් කටයුතු 2024 වසරේදී නිම කර ඇති අතර, ජල ටැංකිය හා අනෙකුත් ඉතිරි සිර ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. එම ව්‍යාපෘතිය 2027 වසරේදී නිම කිරීමට නියමිතය.
- අනුරාධපුර හා අහුණුකොළපැලැස්ස බන්ධනාගාර ආයතනයන්හි සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනයට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
- වැලිකඩ කාන්තා අංශයේ මලඅපහවන පද්ධතිය ආශ්‍රිතව පැවති අවහිරතා ඉවත් කර එය කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන මලඅපවහන පද්ධතියට සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.
- මහර බන්ධනාගාරයේ ඇති වූ කැරැල්ල හේතුවෙන් විනාශ වී ගිය ගබඩාව හා පරිපාලන ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු 2024 වසරේ ආරම්භ කර ඇති අතර එය 2026 වසරේ නිම කිරීමට අපේක්ෂිතය.

(ආ) (i) 10යි.

(ii)
- අඹේපුස්ස - 92
- තල්දෙන - 149
- වීරවිල - 147
- පල්ලන්සේන - 00
- පල්ලේකැලේ - 455
- අනුරාධපුර - 18
- කන්දෙවත්ත - 10
- දුම්බර - 04
- මහර - 32
- වටරැක - 132

(iii) ඔව්.

- මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනයට බන්ධනාගාර පරිසරය උචිත නොවූවත් මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවන් මෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ වූවන් බොහෝමයක් බන්ධනාගාර වෙත පැමිණෙන බැවින් බන්ධනාගාර පද්ධතිය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය හා ප්‍රතිකාරාත්මක සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි. ඊට අනුකූලව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් අමදිවි රිද්ම ව්‍යාපෘතියද අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා එක්ව නමෝදිෂ්ඨ ප්‍රතිකාර මධ්‍යස්ථානයද මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන ව්‍යාපෘති වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

1. <u>අමදිවි රිද්ම ව්‍යාපෘතිය</u>

මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වන රැඳවියන් පහත පරිදි තෝරාගත් බන්ධනාගාර ආයතන කිහිපයක රඳවා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ඒ අනුව මොවුන් ආයතන වෙත වෙන් කර ඇති ආකාරය පහත පරිදි වේ.

1. අඹේපුස්ස බන්ධනාගාරය - වයස අවුරුදු 22 ට අඩු රැඳවියන්
2. තල්දෙන බන්ධනාගාරය - අවුරුදු22 -30 අතර තරුණ රැඳවියන්
3. වීරවිල බන්ධනාගාරය
4. පල්ලන්සේන බන්ධනාගාරය
5. පල්ලේකැලේ එළිමහන් සිර කඳවුර - ඉහත ගණයට අයත් නොවන සියලුම රැඳවියන්
6. අනුරාධපුර බන්ධනාගාර
7. කන්දෙවත්ත වැඩ කඳවුර
8. දුම්බර බන්ධනාගාරය - කාන්තා රැඳවියන් (ඉහත කාණ්ඩ තුනටම අයත්)
9. මහර බන්ධනාගාරය - කඳවුරු තුළට ඇතුළත් කළ නොහැකි අනෙකුත් රැඳවියන්

එම ආයතන 09 තුළ ඉහත පරිදි රැඳවියන් වර්ග කර එකිනෙක ආයතනවලට අනුගතව සකස් කළ විශේෂ දෛනික කාලසටහනකට අනුව බන්ධනාගාර නිලධාරීන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සම්පත්දායකත්වයෙන් විවිධ වූ මත් ද්‍රව්‍ය ප්‍රතිකාරාත්මක හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

<u>මෙම ව්‍යාපෘතියේ අරමුණු:</u>

- බන්ධනාගාර එළිමහන් සිර කඳවුරු තුළ මත් ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාරාත්මක පරිසරයක් නිර්මාණය කිරීම ඔස්සේ යහපත් පුරවැසියෙකු ලෙස සමාජගත කිරීම
- මත් ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් වෙනම රැඳවීම තුළ අනෙකුත් රැඳවියන් මත් ද්‍රව්‍ය කෙරෙහි නැඹුරුවීම අවම කර ගැනීම
- නැවත නැවත බන්ධනාගාරගතවීම අවම කර ගැනීම

- කෙටිකාලීන ප්‍රතිකාර සැලැස්මකට යොමු කිරීමට වඩා දීර්ඝ කාලීන ප්‍රතිකාර සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් මතින් නිදහස් කර ගැනීමට හා ඔවුන්ගේ ජීවිතවලට වටිනාකමක් ලබා දීමට දායකවීම

<u>ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන්වල අන්තර්ගතය:</u>

- **තනි පුද්ගල උපදේශනය**
- සමූහ උපදේශනය
- පවුල් උපදේශනය
- වෛද්‍ය පහසුකම් හා ප්‍රතිකාර
- සමබර ආහාර වේලක්
- අධ්‍යාත්මික සංවර්ධනය
- සතිමත් බව පුහුණු කිරීම
- සර්ව ආගමික කටයුතුවල නිරතවීම
- කෘෂි ප්‍රතිකාර ක්‍රමවේද හඳුන්වාදීම
- අධ්‍යාපන හා තොරතුරු
- විධිමත් අධ්‍යාපනය
- ක්‍රීඩා ආධාර සේවා
- වෘත්තීය මාර්ගෝපදේශනය
- ජීවන කුසලතා
- අවදානම් අවස්ථාවලට මුහුණදීම
- නැවත භාවිතය වැළැක්වීම
- පසු රැකවරණය

ඉහත කී ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන්වල අන්තර්ගතය ක්‍රියාවට නැංවීමේදී බන්ධනාගාර නිලධාරීන්ගේ සහාය මෙන්ම සිරකරු සුබසාධක සංගමය උප කමිටු, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ පුණ්‍ය ආයතනවල සම්පත්දායකත්වයෙන් යුතුව පුනරුත්ථාපන වැඩසටහන් රැසක් එකී ආයතන තුළ ක්‍රියාවට නංවනු ලබයි.

<u>2. නමෝදිෂ්ය ප්‍රතිකාර මධ්‍යස්ථාන ව්‍යාපෘතිය</u>

2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනතට ආනුෂංගිකව 2010 වර්ෂයේ නිකුත් කරන ලද අංක 1653/19 දරන ගැසට් පත්‍රයට අනුව මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන ලෙස නම් කර ඇති අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තාක්ෂණික උපදෙස් හා මහපෙන්වීමට අනුකූලව මෙම වැඩසටහන ක්‍රියාත්මක වන ආයතන පහත පරිදි වේ.

01) පල්ලේකැලේ එළිමහන් සිර කඳවුර
02) වටරැක බන්ධනාගාරය
03) තල්දෙන බන්ධනාගාරය
04) වීරවිල බන්ධනාගාරය
05) අනුරාධපුර බන්ධනාගාරය
06) පල්ලන්සේන බන්ධනාගාරය
07) කන්දෙවත්ත වැඩ කඳවුර
08) අඹේපුස්ස බන්ධනාගාරය

මෙම ව්‍යාපෘතිය සාර්ථකව එකී ආයතනයන් තුළ ක්‍රියාත්මක කිරීම උදෙසා මෙම ආයතනවල සේවය කරන සියලුම ශ්‍රේණිවලට අයත් බන්ධනාගාර නිලධාරීන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වෙත කැඳවා මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය සම්බන්ධයෙන් පවතින නවීන තාක්ෂණික ක්‍රමවේදවලට අදාළ පුහුණු වැඩසටහන්වලට යොමු කරමින් දැනුම යාවත්කාලීන කරනු ලබයි. එමෙන්ම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුබද්ධව සේවය කරනු ලබන උපදේශන නිලධාරීන් මෙම ආයතනයන්ට අනුයුක්ත කර ඔවුන් හරහා ද අවශ්‍ය ප්‍රතිකාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙයට අමතරව ශ්‍රී ලංකාව පුරා ඇති අනෙකුත් සියලු බන්ධනාගාර ආයතනයන්හි විවිධ වූ චෝදනාවන් සම්බන්ධයෙන් වැරදිකරුවන් වී රඳවා සිටින සියලුම සිර රැඳවියන් පුනරුත්ථාපනය කර සමාජයට වැඩදායී පුරවැසියන් ලෙස සමාජගත කිරීම උදෙසා සිරකරු සුභසාධක සංගමය උපකමිටු, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ පුණ්‍ය ආයතනවල සම්පත් දායකත්වයෙන් යුතුව පුනරුත්ථාපන වැඩසටහන් රැසක් එකී ආයතනයන් තුළ දෛනිකව ක්‍රියාවට නංවනු ලබයි. ඒ අනුව එකී ආයතනයන් තුළ පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක වේ.

1. ආධ්‍යාත්මික හා ආගමික වැඩසටහන්
   - සර්ව ආගමික වැඩසටහන් පැවැත්වීම
   - මානසික සංවර්ධනය හා උපදේශන වැඩසටහන් පැවැත්වීම
2. අධ්‍යාපන හා සුබසාධන වැඩසටහන්
   - නොවිධිමත් / අවිධිමත් අධ්‍යාපන වැඩසටහන්
   - වෘත්තීය පුහුණු වැඩසටහන්
   - පුස්තකාල කටයුතු
   - දහම් අධ්‍යාපනය
   - සෞන්දර්යාත්මක හා සංගීත වැඩසටහන්
   - සෞඛ්‍ය වැඩසටහන්
   - මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාරාත්මක වැඩසටහන්
   - නීති ආධාර වැඩසටහන්
   - නේවාසික පවුල් හමු වැඩසටහන්
   - විශේෂ දින සඳහා පැවැත්වෙන වැඩසටහන්/උත්සව

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

3. ක්‍රීඩා හා වෙනත් පහසුකම්
   - ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීම (සිරකරු අරමුදලෙන් හෝ රජයේ ඒකාබද්ධ අරමුදලෙන් ලබා ගැනීම)
   - දෛනික ක්‍රීඩා කටයුතු
   - අන්තර් බන්ධනාගාර තරගාවලි
   - අවුරුදු උත්සව
   - බාලදක්ෂ කටයුතු
   - වෙනත් ක්‍රීඩා කටයුතු
4. සිරකරුවන්ට ත්‍යාග දීම් (විශේෂ දක්ෂතා හා විශේෂ දින වෙනුවෙන් පවත්වන තරගාවලි සඳහා)
5. පශ්චාත්භාර කටයුතු
   - නිදහස් සිරකරුවන්ට වෘත්තීය ආධාර ලබා දී
   - පසුභාර කටයුතු (පසුවිපරම් කිරීම)
6. බලපත්‍ර මත මුදා හැරීම, නිවාස නිවාඩු යැවීම
   - අපරාධ වැළැක්වීම ආඥාපනත 11 වන වගන්තියට අනුව විෂයභාර ඇමතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව බන්ධනාගාරය තුළ යහපත් කල්ක්‍රියාවෙන් සිටින සහ පුනරුත්ථාපන ක්‍රියාවලියට දායක වූ රැඳවියන් බලපත්‍ර මත මුදා හැරීම
   - අපරාධ වැළැක්වීම ආඥාපනත 9 හා 10 වන වගන්තියට අනුකූලව තරුණ වැරදිකරුවන් බලපත්‍ර මත මුදා හැරීම
7. වැඩසහන සේවයේ යෙදවීම (දීමනාවක් සහිතව තෝරාගත් රැඳවියන් රජයේ ආයතනවල සේවයේ යෙදවීම)
8. විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ඇ) අදාළ නොවේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දුන් පිළිතුරට අදාළව මගේ පළමුවන අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. ඔබතුමාගේ පිළිතුර අනුව දිවයින පුරා බන්ධනාගාර 37ක මේ වන විට 30,000ක් පමණ සිරකරුවන් සහ සැකකරුවන් සිටිනවා. නිලධාරීන් 5,218ක්, සේවයේ යෙදී සිටිනවා, ගරු අමාත්‍යතුමනි. 5,218ක් සේවයේ යෙදී සිටිනවා කිව්වාට තවත් පුරප්පාඩු බොහොමයක් ඇති කියා මම හිතනවා. මගේ දැනීමේ හැටියට එකතුව 7,000කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කළ යුතුයි. නව රජය දැන් බඳවා ගැනීම් කරනවා කියලා ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා.

ගරු ඇමතිතුමනි, ඊයේ දවසේ අලුත්කඩේ උසාවියේ වූ සිදුවීම ඉතාම අවාසනාවන්ත සිදුවීමක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් එම ස්ථානයට ගිහිල්ලා තිබුණා. ඒ වෙච්ච සිදුවීමත් එක්ක බන්ධනාගාර නිලධාරීන්ගේත්, එම සේවකයන්ගේත් ආරක්ෂාව ගැන අපට බලන්න වෙනවා. ඉතිහාසයේ එහෙම සිදුවීම් වෙලා තිබෙනවා. අප නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ කළුතර බන්ධනාගාරයේත් රැඳවියන් ප්‍රවාහනය කරන අවස්ථාවේ ඒ වාගේ සිද්ධියක් වුණා. ඒ ඇති වූ තත්ත්වයත් එක්ක ඒ නිලධාරීන්ගේ ආරක්ෂාව ගැන ඔබතුමන්ලාගේ අවධානය විශේෂයෙන් යොමු කරන්න.

බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප් ගත්තොත්, බන්ධනාගාර නිලධාරීන්ට පොලිස් නිලධාරීන්ගේ වැටුපට වඩා අඩු වැටුපක් තිබෙන්නේ. නමුත්, බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප් අඩු වුණාට ඔවුන් පොලිස් නිලධාරීන් හා සමානයි. ගරු ඇමතිතුමනි, එම නිලධාරීන්ගේ වැටුප් සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔබතුමා මොන විධියට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවාද කියා අපි දැනගන්න කැමැතියි.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඔව්, ඊයේ වෙච්ච සිදුවීම, ඒ ඇති වෙච්ච තත්ත්වය ආණ්ඩුව වශයෙන් අපි ඉතාම ඕනෑකමින් සහ විශාල බරකින් ගන්නවා. ඒ සිද්ධිය සිදු වන්නේ උසාවියක් තුළ. ඔබතුමාත් දන්නවා, දැනට තිබෙන ක්‍රමවේදය අනුව උසාවිය තුළට ආයුධ සහිත නිලධාරීන් යන්නේ නැති බව. එවැනි තත්ත්වයක් යටතේ තමයි ඒ අනාරක්ෂිත සිද්ධිය උසාවියක් තුළ සිදු වන්නේ. ඒ වාගේම, **සැකකරු** නීතිඥවරයෙකු වශයෙන් වෙස් වලාගෙන ආපු තත්ත්වයකුත් තිබෙනවා. මෙතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා. අපි දැන් මේ කාරණය සම්බන්ධයෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා, IGP සහ ඒ බන්ධනාගාර නිලධාරිනුත්, අපිත් කල්පනා කරලා තිබෙනවා, සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කරලා ඔවුන්ගේ එකඟතාව මත විශේෂ රැඳවියන් විශේෂ අවස්ථාවලදී අධිකරණය තුළ සිටියදී arrmed guard එකක් ඉන්න තත්ත්වයකට ගේන්න අවශ්‍ය වෙනවා කියන එක ගැන. ඒක එකක්. ඊට අමතරව, යම් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් ද කරන්න ඕනෑ වෙනවා. ඉතින් අධිකරණ සේවා කොමිෂන් සභාවත්, පොලීසියත්, නීතිඥ සංගමයත් සාකච්ඡා කරලා අධිකරණය තුළ ආරක්ෂාව සහතික කරන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, ඔහු බූස්සේ ඉඳලායි ගෙනාවේ. පාරේදි කිසි කරදරයක් වුණේ නැහැ. ඒ කියන්නේ Department of Prisons ඒ කටයුත්ත හරියට කළා. හැබැයි, මම පිළිගන්නවා, ඔබතුමා කියන එක. මොකද, සමහර වෙලාවට මේ underworld තත්ත්වයන් නිසා prison officersලාගේ livesත් in danger වෙන වෙලාවල් තිබෙනවා. There are times when it happens. ඒ නිසා අපි මේ වන විට ඔවුන්ගේ ආරක්ෂාව ගැන සම්පූර්ණයෙන් අවධානය යොමු කර තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ සුබසාධනය ගැනත් අවධානය යොමු කරනවා. අර කිව්වා වාගේ පඩි-නඩිවල ප්‍රශ්නය යම් ප්‍රමාණයකට විසඳෙන්න පුළුවන් මේ වැටුප් වැඩි වීමෙන්. නමුත් ඔවුන් දරන අවදානමත් එක්ක ඔවුන්ට ඊට වඩා දීමනාවක් ලැබෙන්න ඕනෑ. ඒක හරි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, විෂය භාර අමාත්‍යවරයා වන ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. පොලිස් දෙපාර්තමේන්තුවත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවත් සමාන වැටුප් තලයකට ගෙන එන්න ඔබතුමාට පුළුවන් නම්, ඒක ඉතාම හොඳයි. මොකද, ඒ දෙපාර්තමේන්තු දෙකෙන්ම එක හා සමාන සේවයක් ඉටුවන නිසා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඒ යෝජනාවට අවධානය යොමු කරනවා අනිවාර්යයෙන්ම, ගරු මන්ත්‍රීතුමනි.

මේ අවාසනාවන්ත සිද්ධි නවත්වා ගන්න වෙන්නේ ඕනෑ තරම් ආරක්ෂාව දමාගෙන නොවෙයි. මොකද යුද්ධය පැවැති කාලයේදී වාගේ දැන් අපේ රටේ තැනින් තැන checkpoints දමන්න අවශ්‍ය වෙන්නේ නැහැ. නමුත් අධිකරණ පරිශ්‍ර යම් ප්‍රමාණයකට ආරක්ෂා කළ යුතු වෙනවා. ඒකට පියවර ගන්නට ඕනෑ. මේ හේතුව නිසාම තමයි ගරු මන්ත්‍රීතුමනි, අපි අපරාධ නඩු විධාන සංග්‍රහයට සංශෝධනයක් ගෙනෙන්න යන්නේ. ඒක කැබිනට් මණ්ඩලයටත් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ සංශෝධනය අපි කොහොම හරි මාර්තු-අප්‍රේල් වෙනකොටවත් පාර්ලිමේන්තුවට ගෙනෙන්න ඕනෑ, සම්මත කරගන්න. ඒකෙන් පස්සේ රැඳවියන් සාක්ෂි දෙන්න උසාවියට -උසාවි භූමියට- එන්න ඕනෑ නැහැ. Video links හරහා ඉන්න තැන ඉඳන්ම සාක්ෂි දෙන්න පුළුවන් ආකාරයේ සංශෝධනයක් තමයි අපි අපරාධ නඩු විධාන සංග්‍රහයට ගෙනෙන්නේ. ඒක වෙනත් සාක්ෂිකරුවන් වෙනුවෙනුත් පාවිච්චි කරන්න පුළුවන්, රටින් බැහැරව ඉන්න හෝ එන්න බැරි අයට. මම හිතන විධියට එවන් වැඩ පිළිවෙළක් යටතේම තමයි මේ සඳහා අපට අවසානාත්මක විසඳුමක් ලබාගන්න වෙන්නේ. ඒක තමයි මගේ උත්තරය.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා කිව්වා, බන්ධනාගාරවල තිබෙන තදබදය ගැන. උදාහරණයක් හැටියට ගත්තොත්, මහර බන්ධනාගාරයේ-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ඇමතිතුමන්ලාට මම කාරුණිකව දැනුම් දෙනවා, කාලය කළමනාකරණය පිළිබඳ බරපතළ ගැටලුවක් තිබෙන බව. එම නිසා ප්‍රශ්න ඇසීමේදී සහ පිළිතුරු දීමේදී කාලය පිළිබඳව දැඩි අවධානයක් යොමු කරනවා නම් වඩා හොඳයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු කථානායකතුමනි, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු හැටියට මම ඔබතුමාට බොහොම නිහතමානීව ඇහුම්කම් දෙනවා. නමුත් ගරු කථානායකතුමනි, ප්‍රශ්නය ගැනත් පොඩ්ඩක් බලන්න වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මතක තියාගන්න, අපි පැයක් ඇතුළත අහන්න ඕනෑ ප්‍රශ්න සංඛ්‍යාවක් තිබෙනවා. ඊට පසුව අපි දවසේ වැඩ වැඩකටයුතු පටන් ගන්න ඕනෑ. එක ප්‍රශ්නයකට විනාඩි 15ක් විතර ගත්තාම බරපතළ ගැටලුවක් මතු වෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
මම විනාඩි 15ක් ගත්තේ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙපැත්තටම මම කියන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
ඔව්. දෙපැත්තටම ඒ දැනුම් දීම කරනවා නම් හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පිළිතුරු දීම සහ ප්‍රශ්න ඇසීම සම්බන්ධයෙන් මම ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු ඇමතිතුමන්ලා සියලුදෙනාට තමයි ඒ දැනුම්දීම කළේ.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ප්‍රශ්නය අහන්න පුළුවන්. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
ඔබතුමාටත් මට පිළිතුරක් දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
මම පළමුවැනි අතුරු ප්‍රශ්නය ආණ්ඩුවෙන් ඇහුවා. එතකොට ඔබතුමාට මේ කියන වෙලාව ප්‍රශ්නයක් වුණේ නැහැ. මම ඕනෑ නම් ඔබතුමාට ඒ වෙලාවත් පෙන්වලා දෙන්නම්. මොකද හේතුව, අධිකරණ ඇමතිතුමා-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අහන සහ පිළිතුරු දෙන සියලුදෙනාගෙන් මම කාරුණිකව ඒ ඉල්ලීම කළේ. කරුණාකරලා ඔබතුමා දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අපේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)
හොඳයි.

ගරු අමාත්‍යතුමනි, මම කිව්වා බන්ධනාගාරවල තිබෙන තදබදය ගැන. 975දෙනෙකුට තමයි මහර බන්ධනාගාරයේ ඉන්න පුළුවන්. නමුත් අද වෙනකොට එහි සැකකරුවන් සහ වැරදිකරුවන් බවට පත් වෙච්ච අය 3,136ක් ඉන්නවා.

මේ එක බන්ධනාගාරයක්. ගරු ඇමතිතුමනි, ඔබතුමාම කියපු කොළඹ මැගසින් බන්ධනාගාරයේ, CRP එකේ, වැලිකඩ ඇතුළු මේ සියල්ලේම තත්ත්වය ඒකයි. මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ කළුතර බන්ධනාගාරය ගත්තොත්, එතැනත් 1,400ක් ඉන්නවා, 800යි එහි ඉන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේම දැනට ඒ හුහක් ගොඩනැඟිලි ඉවත් කරන්න කියලා තිබෙනවා. කළුතර බන්ධනාගාරයේ ගොඩනැඟිලි

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

දෙකක් ඉවත් කරන්න කියලා දැනට අවුරුදු 3ක් වෙනවා. මේ වසර තුළ නව ගොඩනැඟිලි ලබාදෙන්න කටයුතු කරනවාද කියන එකත්, මේ තදබදයට මොකක්ද කරන්නේ කියලාත් ඔතුමාගෙන් මම ප්‍රශ්න කරනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

මේ තදබදය ඇතිවීම පිළිබඳව සොයා බැලීමට අපි දැනට සති දෙකකට කලින් කමිටුවක් පත් කළා, බන්ධනාගාරය ඇතුළත්ව. ඒක ඊයේ රැස් වුණා. තව මාසයක් යන්න කලින් අධිකරණ, බන්ධනාගාර, පොලීසි ඇතුළු සියල්ල එකතු වෙලා මට වාර්තාවක් ලබා දෙයි, මේ තදබදය අඩු කිරීම සඳහා වූ යෝජනා ඇතුළත් කරලා. ඊට පස්සේ ඒවා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව තමයි මේ තදබදය අඩු කරන්න වෙන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
කළුතර,-

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

කළුතරත් එච්චරම තමයි. හැම තැනම එක විධියට නේ බලන්න වෙන්නේ; එකම කමිටුවෙන් නේ බලන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -422/2025- (1), ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -424/2025- (1), ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(මාණ්පුමිකු (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் இந்தக் கேள்வியை கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

2024 වර්ෂය තුළ සුනඛ සපා කෑම්වලට ලක් වූ පුද්ගලයන්: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
2024ஆம் ஆண்டில் நாய்க்கடிக்கு ஆளாகியவர்கள்: திருகோணமலை மாவட்டம்
PERSONS BITTEN BY DOGS DURING 2024: TRINCOMALEE DISTRICT

425/2025

5. ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වූ කාලය තුළ සුනඛයන් සපා කෑම හේතුවෙන් ප්‍රතිකාර ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ සුනඛයන්ගේ සපා කෑමට ලක්වූ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාලය තුළ අයාලේ යන සුනඛයන්ගේ සපා කෑමට ලක්වූ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පුද්ගලයන් සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයේ එක් එක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බලප්‍රදේශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාලය තුළ සුනඛයන්ගේ සපා කෑමට වැඩි වශයෙන් ලක්වූ පුද්ගලයන් වෙසෙන දිස්ත්‍රික්කය කවරේද;

(v) සුනඛයන්ගේ සපා කෑමට ලක්වන පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීම සඳහා වාර්ෂිකව වැයවන මුදල කොපමණද;

(vi) සුනඛයන් සපා කෑමේ ගැටලුව විසඳීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.01.01 தொடக்கம் 2024.12.31ஆம் திகதி வரையான காலப்பகுதியினுள் நாய்க்கடிக்கு ஆளாகி சிகிச்சை பெற்றவர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(ii) மேற்படி காலப்பகுதியினுள் நாய்க்கடிக்கு ஆளாகிய திருகோணமலை மாவட்டத்தில் வசிக்கும் நபர்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(iii) குறித்த காலப்பகுதியினுள் கட்டாக்காலி நாய்க்கடிக்கு ஆளாகிய திருகோணமலை மாவட்டத்தைச் சேர்ந்த நபர்களின் எண்ணிக்கை மேற்படி மாவட்டத்தின் ஒவ்வொரு சுகாதார வைத்திய அதிகாரி பிரதேசத்துக்கமைய வெவ்வேறாக எத்தனை என்பதையும்;

(iv) மேற்படி காலப்பகுதியினுள் நாய்க்கடிக்கு அதிகமாக ஆளாகிய நபர்கள் வசிக்கும் மாவட்டம் யாதென்பதையும்;

(v) நாய்க்கடிக்கு ஆளாகின்ற நபர்களுக்குச் சிகிச்சையளிப்பதற்காக வருடாந்தம் செலவு செய்யப்படும் பணத்தொகை எவ்வளவு என்பதையும்;

(vi) நாய்க்கடிப் பிரச்சினையைத் தீர்ப்பதற்கு அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

ask the Minister of Health and Mass Media:

(a) Will he inform this House the -

(i) number of persons who obtained treatment for dog bites during the period from 01.01.2024 to 31.12.2024;

(ii) number of persons in the Trincomalee District who were bitten by dogs during the aforesaid period;

(iii) number of persons who were bitten by stray dogs during the aforesaid period in each of the MOH Divisions in the Trincomalee District, separately;

(iv) name of the District in which the highest number of persons who were bitten by dogs during the aforesaid period reside;

(v) amount spent annually on treating persons who are bitten by dogs; and

(vi) measures that will be taken by the Government to solve the problem of dog bites?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) පුද්ගලයන් 184,926කි.

(ii) පුද්ගලයන් 4,035කි.

(iii)

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශයේ නම	අයාලයේ වන සුනඛයන්ගේ සපා කෑමට ලක් වූ ප්‍රමාණය	ගෘහස්ථ සුනඛයන්ගේ සපා කෑමට ලක් වූ ප්‍රමාණය	සුනඛයන්ගේ සපා කෑමට ලක් වූ මුළු ප්‍රමාණය
ඊච්චිලම්පත්තු	**237**	36	273
ගෝමරන්කඩවල	**162**	44	206
කන්තලේ	**340**	102	442
කින්නියා	**434**	42	476
කුච්චවෙලි	**159**	56	215
කුරින්චාකේර්නි	**220**	32	252
මුතූර්	**267**	89	356
පදවිශ්‍රීපුර	**151**	24	175
සේරුවිල	**316**	21	337
තඹලගමුව	**237**	89	326
ත්‍රිකුණාමලය	**351**	114	465
උප්පුවෙලි	**402**	110	512
එකතුව	**3,276**	759	4,035

(iv) ගම්පහ.

(v) මෙම පුද්ගලයන්ට ප්‍රතිකාර කිරීමේ එන්නත් සඳහා වාර්ෂිකව වැය කරන මුදල දළ වශයෙන් රුපියල් මිලියන 850ත්, රුපියල් මිලියන 1,000ත් අතර ප්‍රමාණයක් වෙනවා.

(vi) 1. 2024 වසරේදී ජලභීතිකා රෝගයට එරෙහිව ගෘහස්ථ හා අයාලේ යන සුනඛයින් 1,151,350 දෙනෙකුට ජලභීතිකා මර්දන එන්නත් ලබාදී ඇත.

2. සුනඛ ගහනය පාලනය කිරීම සඳහා 2024 වසරේදී ශ්‍රී ලංකාව තුළ සුනඛ ගැහැණු සතුන් 30,881 දෙනෙකු ශල්‍ය කර්ම මඟින් වන්ධ්‍යාකරණය කර ඇත.

3. මුළු දිවයිනම ආවරණය වන පරිදි සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පවත්වමින් පවතී.

4. ජලභීතිකා රෝග මර්දනයේදී මහ ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැනගැනීම සඳහා මම වැඩිමනත් වශයෙන් මේ කාරණාත් කියන්න කැමැතියි. සුනඛ සපාකෑම් ගැටලුවක් විධියට හඳුනාගෙන, අපි ඒ සඳහා විශේෂ මැදිහත්වීමක් කරමින් ඉන්නවා. මේ සඳහා අපි පැහි කිහිපයකින් කටයුතු කරන්නට ඕනෑ. එකක් තමයි, ගැහැනු සතුන් වන්ධ්‍යාකරණය. ඒ වාගේම, එන්නත්කරණය සහ සුනඛ සපාකෑම්වලට ලක්වන පුද්ගලයන්ට ජලභීතිකා එන්නත ලබාදීම වැනි කටයුතු අපි සිදු කරමින් පවතිනවා. මේ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් අපි සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා මාර්තු මාසයේදී දියත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

(ආ) පැන නොනඟී.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, சென்ற வருடம் நாய்க்கடிக்கு உள்ளானவர்களின் விபரங்களைக் கோரித்தான் நான் இந்தக் கேள்வியைக் கேட்டிருந்தேன். ஏனென்றால், இப்போது அதற்கான மருந்துத் தட்டுப்பாடு இருக்கின்ற காரணத்தால் பல்வேறு பிரச்சினைகள் எதிர்நோக்கப் படுகின்றன. குறிப்பாக, எல்லா மாவட்டங்களிலும் பெரும் பிரச்சினை காணப்படுகின்ற காரணத்தால், அரசாங்கம் இது சம்பந்தமாக ஏதாவது நடவடிக்கை எடுத்திருக்கின்றதா? என்ற கேள்வியையும் நான் கேட்டிருந்தேன். கௌரவ அமைச்சர் அவர்கள் சொன்னதுபோல, மிக விரைவில் அதற்கான தீர்வை வழங்க வேண்டும் என்பது என்னுடைய வேண்டுகோளாகும்.

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். இன்று சுகாதாரத் துறையில் சிற்றூழியர்கள் போதியளவு இல்லாமை பெரும் பிரச்சினையாகக் காணப்படுகின்றது. இப்பிரச்சினை எங்களுடைய மாவட்டத்தில் மாத்திரமல்ல, நாடளாவிய ரீதியிலும் காணப்படுகின்றது. சிற்றூழியர்கள் இன்மையால் ஏற்படுகின்ற சுகாதாரம் சம்பந்தமான விடயங்கள் -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

ගරු කථානායකතුමා, ඒක තමයි අහන්නේ. Labourersලා නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒකත් මේකට සම්බන්ධයක් තිබෙනවා. හැම රෝහලකම labourersලා නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට මොනවා හරි විසඳුමක් මේ ආණ්ඩුවෙන් අරගෙන තිබෙනවා ද? ඒ වාගේම, අවුරුදු 10ක්, 15ක් ස්වේච්ඡාවෙන් වැඩ කරපු කට්ටියක් ඉන්නවා. ඒ ගොල්ලන්ට job permanency දෙන මොනවා හරි වැඩ පිළිවෙළක් ආණ්ඩුව අරගෙන තිබෙනවා ද කියන එකත් දැනගන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, දළ වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලක්ෂ එකහමාරක් පමණ සේවය කරනවා. මෙතැන වැඩිපුරම සිටින්නේ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය, එහෙම නැත්නම් සෞඛ්‍ය කාර්ය සහායකයන්. ඇත්තටම ඒ, ඒ රෝහල්වල පවතින පුරප්පාඩු දිහා බලලා මේ අයව කඩිනමින් ස්ථාන මාරුවීම් කළ යුතුව තිබෙනවා. ඒක ඇත්ත. ඒ නිසා තමයි, පුරප්පාඩු සංඛ්‍යාවක් තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා, නමුත් පසුගිය ආණ්ඩු කිහිපයක්ම මේ අය බඳවා ගෙන තිබෙන්නේ ලංකාවේ සෑම පළාතක්ම, සෑම දිස්ත්‍රික්කයක්ම, සෑම ප්‍රදේශයක්ම නියෝජනය වන ආකාරයෙන් නොවෙයි. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය -සෞඛ්‍ය කාර්ය සහායකයන් - දිහා බැලුවොත් පොළොන්නරුවෙන් වැඩි ප්‍රමාණයක් ඉන්නවා. එතකොට ඒ ඉන්න ඔක්කොම අය ඉල්ලනවා, පොළොන්නරුවට ආසන්න ප්‍රදේශයකට යන්න. ඊළඟට, බදුල්ලේ අය ඉන්නවා. ඊළඟට, කළුතර, බේරුවල, අගලවත්ත, මතුගම පැතිවල අය ඉන්නවා. ඊළඟට, තවත් කොටසක් නුවරින් ඉන්නවා. මේ හැමෝම කැමැතියි, තමන්ගේ ප්‍රදේශයට ආසන්න රෝහල්වලට යන්න. විධිමත් ස්ථාන මාරු පටිපාටියක් හදා ගැනීමේදී මේක බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. නමුත්, මෙවර අපි යම් ප්‍රමාණයක් බඳවා ගැනීම් කරනවා. ඒ බඳවා ගැනීම් කරනකොට විධිමත් ක්‍රමවේදයක් යටතේ මේ අයට ස්ථාන මාරුවීම් ලබා දීලා පුරප්පාඩු පුරවන්න කටයුතු කරනවා. ඊට අමතරව, අපි උපස්ථායකයන් 1,000ක් කඩිනමින් බඳවා ගන්න කටයුතු කරනවා. එතකොට මේ ප්‍රශ්නයට සැලකිය යුතු මට්ටමක උත්තරයක් ලබා දෙන්න පුළුවන්කම ලැබේවි.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

டெங்கு பிரிவில் கடமையாற்றுகின்ற ஊழியர்கள் கடந்த காலங்களில் பல்வேறு பிரச்சினைகளுக்கு மத்தியில் தங்களது கடமைகளை மேற்கொண்டார்கள். குறிப்பாக, கொரோனா தொற்றுக் காலத்தில்கூட, அவர்கள் அதனைக் கட்டுப்படுத்துவதற்குப் பல தியாகங்களைச் செய்தார்கள். அவர்களை நிரந்தரமாக்குகின்ற விடயம்கூட, இன்னும் தாமதமாகவே இடம்பெறுகின்றது. அவர்களை நிரந்தரமாக்குவதற்கான ஏதாவது நடவடிக்கைகள் அரசாங்கத்தால் முன்னெடுக்கப்படுகின்றதா? என்பதை நான் இந்த இடத்தில் கேட்க விரும்புகின்றேன்.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඩෙංගු මර්දන සහායකයින් බඳවාගෙන අවුරුදු 8ක් වෙනවා. ඒ කාලය තුළ ආණ්ඩු කීයක් මාරු වුණාද, සෞඛ්‍ය ඇමතිවරුන් කීයක් පත් වුණාද? හැබැයි, ඒ අය ස්ථිර නොකර එතුමන්ලා හිටියා. හැම දාම පොරොන්දු දීලා තිබෙනවා. නමුත්, ඒ අය ස්ථිර කරලා නැහැ. දැන් අපි ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරගෙන යනවා. ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් කැබිනට් අනුකාරක සභාවක් තිබෙනවා. අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරී කමිටුවක් මේ ගැන සාකච්ඡා කරගෙන යනවා. අපි ඩෙංගු මර්දන සහායකයින් විසින් කරන ලද කාර්යභාරය වැදගත්කොට සලකනවා. ඒ නිසා ඒ අය ස්ථිර කරන්නට ඕනෑ. නමුත්, මෙවැනි ආකාරයට බඳවා ගැනීම් කරපු 7,000ක් විතර රාජ්‍ය සේවයේ ඉන්නවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ප්‍රවාහන අමාත්‍යාංශයේ, මේ ආදී වශයෙන් 7,000ක් පමණ ප්‍රමාණයක් ඉන්නවා. මේ සියල්ල සලකා බලමින් තමයි මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න වෙන්නේ.

එම නිසා ඉදිරි මාස තුන ඇතුළත ඩෙංගු මර්දන සහායකයින්ගේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

පළාත් සභාව සහ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් සහ සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන: කළුතර දිස්ත්‍රික්කය

மாகாண சபை மற்றும் நிரல் அமைச்சுக்குக் கீழுள்ள மருத்துவமனைகள் மற்றும் சுகாதார சேவை நிலையங்கள்: களுத்துறை மாவட்டம்

HOSPITALS AND HEALTH SERVICE CENTRES UNDER PROVINCIAL COUNCIL AND LINE MINISTRY: KALUTARA DISTRICT

422/2025

3. ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා (ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා වෙනුවට)
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி - மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி சார்பாக)
(The Hon. Champika Hettiarachchi on behalf of the Hon. Chandima Hettiaratchi)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ ඇති පළාත් සභාව සතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ, රෝහල් නොවන වෙනත් සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථාන/ආයතන පළාත් සභාව සතුව තිබේද;

(iii) එසේ නම්, එම මධ්‍යස්ථාන/ආයතන කවරේද;

(iv) කළුතර දිස්ත්‍රික්කයේ ඇති රේඛීය අමාත්‍යාංශය සතු රෝහල් සංඛ්‍යාව කොපමණද;

(v) එම දිස්ත්‍රික්කයේ, රෝහල් නොවන වෙනත් සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථාන/ආයතන රේඛීය අමාත්‍යාංශය සතුව තිබේද;

(vi) එසේ නම්, එම මධ්‍යස්ථාන/ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (ii) හා (v)හි සඳහන් මධ්‍යස්ථාන/ ආයතන තුළ බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර ඒකක පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාරම් මත්‍රුම් වෙකුසන ඌටක අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) කළුත්තුරෛ මාවට්ටත්තිලුළ්ළ මාකාණ සපෛක්කුච් චොන්තමාන මරුත්තුවමනෛකළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(ii) අන්ත මාවට්ටත්තිල් මරුත්තුවමනෛ චේවෛ අල්ලාත වේරු සුකාතාර චේවෛකළෛ වළංකුම් නිලෛයංකළ්/ නිරුවනංකළෛ මාකාණ සපෛ කොණ්ටුළ්ළතා එන්පතෛයුම්;

(iii) ආමෙනිල්, අන්ත නිලෛයංකළ්/නිරුවනංකළ් යාවෛයෙන්පතෛයුම්;

(iv) කළුත්තුරෛ මාවට්ටත්තිල් කාණප්පටුම් නිරල් අමෛච්චුක්කුච් චොන්තමාන මරුත්තුවමනෛකළින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(v) අන්ත මාවට්ටත්තිල් මරුත්තුවමනෛ චේවෛ අල්ලාත වේරු සුකාතාර චේවෛකළෛ වළංකුම් නිලෛයංකළ්/නිරුවනංකළෛ නිරල් අමෛච්චු කොණ්ටුළ්ළතා එන්පතෛයුම්;

(vi) ආමෙනිල්, අන්ත නිලෛයංකළ්/නිරුවනංකළ් යාවෛයෙන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) (i) මේලේ (අ)(ii) මත්‍රුම් (v)ඉල් කුරිප්පිටප්පට්ටුළ්ළ නිලෛයංකළ්/ නිරුවනංකළිල් තොට්රාත නෝය්කළුක්කාන චිකිච්චෛප් පිරිවුකළ් නිරුවප්පට්ටුළ්ළනවා එන්පතෛයුම්;

(ii) ආමෙනිල්, අවට්රින් එණ්ණික්කෛ යාතෙන්පතෛයුම්;

(iii) අවෛ නිරුවප්පට්ටුළ්ළ ඉටංකළ් යාවෛයෙන්පතෛයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of hospitals situated within the Kalutara District which belong to the Provincial Council;

(ii) whether the Provincial Council has any other centres/institutions which provide health services apart from hospitals in that district;

(iii) if so, what those centres/institutions are;

(iv) the number of hospitals situated within the Kalutara District which belong to the Line Ministry;

(v) whether the Line Ministry has any other centres/ institutions which provide health services apart from hospitals in that district; and

(vi) if so, what those centres/institutions are?

(b) Will he also inform this House -

(i) whether treatment units for non-communicable diseases have been established in the centres/institutions referred to in (a) (ii) and (v) above;

(ii) if so, the number of such units; and

(iii) the places they are located?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 28කි.

(ii) ඔව්.

(iii) 1. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල - අගලවත්ත, බණ්ඩාරගම, බුලත්සිංහල, දොඩංගොඩ, හොරණ, ඉංගිරිය, මදුරාවල, මතුගම, මීල්ලනිය, පාලින්දනුවර, පානදුර, වාද්දුව, වලල්ලාවිට

2. දිස්ත්‍රික් ළය චිකිත්සාගාරය - කළුතර

3. ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකය - කළුතර

4. බරවා රෝග මර්දන ඒකකය - කළුතර

5. බෝ නොවන රෝග ඒකකය - වාද්දුව

6. මානසික ප්‍රජා ඒකකය (සිසිලස) - පානදුර

7. ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය - වාද්දුව

8. ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් මධ්‍යස්ථානය - බැල්ලපිටිය, හොරණ

(iv) 15කි.

(v) ඔව්.

(vi) 1. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල - කළුතර, බේරුවල, පයාගල

2. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය

(ආ) (i) ඔව්.

(ii) 136කි.

(iii) ඇමුණුම** මඟින් දක්වා ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

වරප්‍රසාද: 2025.02.19වන දින "ඩේලි මිරර්" සහ "ලංකාදීප" පුවත්පත් වාර්තා

சிறப்புரிமை: 2025.02.19ஆம் திகதிய "டெய்லி மிரர்" மற்றும் "லங்காதீப" பத்திரிகை அறிக்கைகள்

PRIVILEGE: REPORTS IN "DAILY MIRROR" AND "LANKADEEPA" NEWSPAPERS OF 19.02.2025

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීමේ සිදු වීමක් සම්බන්ධයෙන් අද දින මෙම ගරු සභාවට මා කරුණු සැලකර සිටිනවා:

2025.02.19වන සඳුදා දින "ඩේලි මිරර්" ඉංග්‍රීසි පුවත් පත මා සම්බන්ධයෙන් අසත්‍ය පුවත් පත් වාර්තාකරණයක් සිදු කර තිබෙනවා.

එසේම, 2025.02.18වන දින "ඩේලි මිරර්" සමාජ මාධ්‍ය ගිණුමෙහි මෙලෙස සඳහන් කර තිබෙනවා, ගරු කථානායකතුමනි:

> "First time MP Nilanthi Kottahachchi has said that she was asked not to speak to the media by her party."

ගරු කථානායකතුමනි, 2025.02.19වන දින "ඩේලි මිරර්" ඉංග්‍රීසි පුවත් පතෙහි සේම, එදිනම "ලංකාදීප" පුවත් පතෙහිත්, 2025.02.18වන දින "ඩේලි මිරර්" සමාජ මාධ්‍ය ගිණුමෙහිත් මෙම අසත්‍ය පුවත කිසිදු කරුණු තහවුරු කර ගැනීමකින් තොරව පළ කර තිබෙනවා.

2025.02.19 දිනැති "ඩේලි මිරර්" පුවත් පත මා මේ මොහොතේ **සභාගත*** කරනවා.

කෙසේ වෙතත්, මා නියෝජනය කරන දේශපාලන පක්ෂය වන ජාතික ජන බලවේගය විසින් මාහට මාධ්‍යයන්ට අදහස් දැක්වීමේදී වාරණ පනවමින් උපදෙස් ලබා දී ඇති බවට අසත්‍ය ලෙස තොරතුරු වාර්තා කරමින් මේ අසත්‍ය පුවත පළ කර ඇති අතර, මේ වන විට සමාජ මාධ්‍ය හරහා විශාල පිරිසක් මෙම පුවත හුවමාරු කර ගනිමින්, බෙදා ගනිමින් විවිධ අදහස් පළ කර තිබෙනවා. ඒ වාගේම මෙම පුවත් පත හරහාද එම මුද්‍රිත අසත්‍ය පුවත සමාජගත වී තිබෙනවා.

ඒ වාගේම කරුණු තහවුරු කර ගැනීමකින් තොරව මෙම වගකීම් විරහිත සහ අපකීර්තිකර අසත්‍ය ප්‍රවෘත්ති වාර්තාකරණය මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක වශයෙන් මගේ වරප්‍රසාද උල්ලංඝනය වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව මඟින් විමසා බලා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස මා අයැදීමක් කර සිටිනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ පිළිබඳව වරප්‍රසාද කමිටුවට යොමු කිරීමට කටයුතු කරනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, හදිසි කරුණක් පිළිබඳව ඔබතුමාත්, මේ සභාවත් දැනුවත් කිරීම සඳහා මට අවස්ථාව දෙන්න.

විශේෂයෙන්ම ඔබතුමා දන්නවා, ඊයේ අධිකරණ භූමිය තුළ සිදු වුණු මිනී මැරුම උසාවිය පමණක් නොවෙයි, මුළු සමාජයම අනාරක්ෂිතභාවයට පත් කරන තත්ත්වයක් බව. විශේෂයෙන්ම මෙය ජාතික ආරක්ෂාවට සිදු වුණු බරපතළ බලපෑමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඔය කාරණාවම ඊයේත් මතු කළා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම වැදගත් කාරණාවක් කියන්න යන්නේ. පොඩ්ඩක් සවන් දෙන්න.

විශේෂයෙන්ම ජාතික ආරක්ෂාවට බරපතළ බලපෑමක් සිදු වුණේ අධිකරණ භූමිය තුළ සිදු වූ ඝාතනය නිසායි. එහි අනාරක්ෂිතභාවය තහවුරු වුණා. ගරු කථානායකතුමනි, මට දැන ගන්න ලැබී තිබෙනවා විශේෂයෙන්ම අධිකරණයේ විශාලතම කාර්යභාරය ඉෂ්ට කරන විනිසුරුවරුන්ට -විනිශ්චයකරතුමන්ලා සහ විනිශ්චයකාරතුමියලාට- යම් ආරක්ෂාවක් ලබා දීලා තිබෙනවා කියලා. හැබැයි, අධිකරණ පද්ධතියේ විනිශ්චයකාරවරුන්ට පසුගිය කාලයේ ලිඛිතව දැනුම් දීලා තිබෙනවා ඒ අයගේ ආරක්ෂාව ඉවත් කරනවා කියන කාරණාව. විශේෂයෙන්ම මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ අද සිවිල් පුරවැසියන්ටත් බරපතළ අනාරක්ෂිතභාවයක් තිබෙන තත්ත්වයක් තුළයි. ඒ වාගේම මාධ්‍යවේදීන්ටත් බරපතළ අනාරක්ෂිතභාවයක් තිබෙන තත්ත්වයක් තුළයි. මම විශේෂයෙන්ම මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. මාධ්‍ය ක්ෂේත්‍රයේ මාධ්‍යවේදීන් තමයි මේ විශේෂ කරුණු කාරණා පිළිබඳව වාර්තාකරණය කරන්නේ. ඒ අයටත් වාර්තා කිරීමේදී යම් යම් අනාරක්ෂිතභාවයන් ඇති වෙලා තිබෙනවා. උසාවි නියෝගයකින් චමුදිත කියන මාධ්‍යවේදියාට ආරක්ෂාව ලබා දීලා තිබුණත්, ඒ ආරක්ෂාව ඔහුගෙන් ඉවත් කර තිබෙන බවටත් මම

ඔබතුමාව දැනුවත් කරන්න කැමැතියි. විශේෂයෙන්ම විනිසුරුවන්ගේ ආරක්ෂාවත්, සිවිල් සමාජයේ ජනතාවගේ ආරක්ෂාවත්, මාධ්‍ය ක්ෂේත්‍රයේ අයගේ ආරක්ෂාවත් -මේ සමස්ත ජනතාවගේ ආරක්ෂාව - සම්බන්ධව රජයේ වැඩි අවධානය යොමු වන්නට ඕනෑ. මොකද, ඊයේ වූ සිද්ධිය අතිශය බරපතළ කාරණාවක්. මම හිතන විධියට, ඒ සිද්ධිය පිළිබඳව විශේෂ පරීක්ෂණයක් පවත්වලා නිසි පියවර ගන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. මහජන නියෝජිතයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව වගකීම තිබෙන්නේ ඔබතුමාට, ඒ සියලුදෙනාගේම භාරකරු හැටියට. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරලා නිසි පියවර ගන්න කටයුතු කරන්න.

විශේෂයෙන් මම ඒ කාරණය මතක් කළේ, අධිකරණ පද්ධතිය කඩා වැටෙන්නට ඉඩ හැරියොත් මුළු සමාජයම කඩා වැටීමකට, බිඳ වැටීමකට ලක් වෙනවා. විනිසුරුවරුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න කටයුතු කරන්න. මහජන ආරක්ෂක අමාත්‍යතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටිනවා. එතුමා දන්නවා ඇති, මම මේ කියන කාරණය මොකක්ද කියලා. විනිසුරුවරුන්ට ලබා දීලා තිබෙන ආරක්ෂාව ඉවත් කරන්න එපා; ඒක වැරදි ක්‍රියාවක්. සිවිල් සමාජයේ ආරක්ෂාව තහවුරු කරන්නට මීට වඩා වැඩි පියවර ගන්නට කටයුතු කරන්න කියලාත් මම ඉල්ලීමක් කරනවා. චමුදිත ඇතුළු මාධ්‍යවේදීන්ට එල්ල වී තිබෙන දැඩි තර්ජනාත්මක තත්ත්වය, අවදානම් සහිත තත්ත්වය නිසා ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න කටයුතු කරන්න. මහජන නියෝජිතයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න. සිවිල් සමාජයේ ආරක්ෂාව ශක්තිමත් කරනවා වාගේම, ඒකට ප්‍රමුඛතාව ලබා දෙනවා වාගේම මහජන නියෝජිතයන්ගේ ආරක්ෂාව තහවුරු කරන්නත් යම් විශේෂිත වූ පියවරක් ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

අපට පසුගිය කාල වකවානුව තුළ වේදිකාවල කියනවා අහන්න ලැබුණා, "මේසයයි, පුටුවයි අරගෙන එන්න, ජාතික ආරක්ෂාව පිළිබඳව ටියුෂන් එකක් දෙන්නම්" කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කෙටියෙන් කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම පෝය දෙකෙන් කුඩුකාරයෝ ටික ඉවර කරනවා කිව්වා. විශේෂයෙන්ම ජාතික ආරක්ෂාවට ඔබතුමන්ලා ප්‍රමුඛස්ථානය ලබා දීලා තිබෙනවා. එය වචනයෙන් කියනවා වාගේම ක්‍රියාවට නංවන්නත් කටයුතු කරන්න කියලා මේ රටේ සමස්ත පොදු ජනතාව වෙනුවෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි න්‍යාය පත්‍රයේ ඊළඟ ප්‍රධාන වැඩකටයුතුවලට යමු.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මතු කළ කාරණය සම්බන්ධයෙන් අදහස් දැක්වීමක් අවශ්‍යයි කියලා මා හිතනවා. විශේෂයෙන්ම ඊයේ දිනයේ අධිකරණයේ සිදු වූ අවාසනාවන්ත සිදුවීම පිළිබඳව අපගේ කනගාටුව පළ කරනවා.

විශේෂයෙන්ම පසුගිය දින කිහිපය පුරා සංවිධානාත්මක අපරාධ කල්ලි අතර ගැටුම් කිහිපයක් වාර්තා වුණා. ඊයේ දිනයේ සිදු වූ වෙඩි තැබීම සම්බන්ධයෙන් රජය දැඩිව අවධානය යොමු කර තිබෙනවා. ඒ පිළිබඳව අවශ්‍ය නීන්දු තීරණ අරගෙන තිබෙනවා වාගේම පැය කිහිපයක් ඇතුළත ඊයේ දිනයේ වෙඩි තැබීම සිදු කළ පුද්ගලයා, නැත්නම් සැකකරු අත්අඩංගුවට ගැනීමට හැකි වුණා. ඔහු, මහරගම පදිංචි සම්දු දිල්ෂාන් පියුමංග කඳනආරච්චි නැමති අයෙක්. පුත්තලම, පාලවී ප්‍රදේශයේදී ඊයේ සවස 4.30ට පමණ ඔහු අත්අඩංගුවට ගනු ලැබුවා. ඒ සම්බන්ධ විමර්ශන දිගටම සිදු කරමින් පවතිනවා. ඒ වාගේම ඔහු ගමන් කළ වැන් රථයත්, රියදුරුත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. තවත් සැක කටයුතු කාන්තාවක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු දිගටම සිදු කරමින් පවතිනවා. ජාතික ආරක්ෂාවට කිසිදු තර්ජනයක් හෝ බාධාවක් එල්ල වෙලා නැහැ. මේවා තැන තැන සිදුවන පාතාල ක්‍රියාකාරකම්, නැත්නම් සංවිධානාත්මක අපරාධ කල්ලි අතර සිදුවන ගැටුම්. මේවා දීර්ඝ කාලයක් තිස්සේ මේ සමාජයේ සිදු වුණා.

අද මේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියන බොහෝ අයගේ කාලවකවානු තුළ මාධ්‍ය ආයතන ගිනි ගත්තා; මාධ්‍යවේදීන් මහ පාරේ මිය ගියා; විශාල පිරිසක් ඝාතනයට ලක් වුණා. ඒ සමහර ඝාතන පිළිබඳව අවුරුදු 10ක්, 15ක් යනකල් සොයා ගන්න හැකියාවක් තිබුණේත් නැහැ. හැබැයි, අපි ඒ පසුගිය සිදුවීම් සම්බන්ධයෙනුත් විමර්ශන කරනවා. ඊයේ අත්අඩංගුවට ගත් සැකකරු පසුගිය සති දෙකකට ආසන්න කාලයේ සිදු වූ තවත් ඝාතන කිහිපයකට සම්බන්ධ බවට කරුණු අනාවරණය වෙලා තිබෙනවා. ඒ නිසා අපි ඝාතන සිදු වූ වහාම ඒවා වෙන වෙනම සිද්ධීන් හැටියට විමර්ශනය කරලා, අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ තනි සිදුවීමක්, දෙකක් ජාතික ආරක්ෂාවට බාධාවක් හැටියට සලකන්න අවශ්‍ය නැහැ කියලා රජයක් හැටියට අපි විශ්වාස කරනවා. රටේ සමස්ත ආරක්ෂාවත්, ජාතික ආරක්ෂාවත් තහවුරු කරලා තිබෙනවා. ඒ පිළිබඳව අපි විශ්වාසයෙන් ඔබට සහතිකයක් දෙනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

අපි දන්නවා, කාලයක් තිස්සේ මේ රටේ සිදු වෙච්ච ඝාතන සම්බන්ධයෙන් බොහෝ වෙලාවට සිදු වුණේ ඝාතකයෝ ආරක්ෂා කිරීමේ පිළිවෙතක් අනුගමනය කිරීම බව. මේ ආණ්ඩුව එවැනි තැනක නැහැ. ඒ කෙනා කවුරු වුණත් ඔවුන් නීතිය ඉදිරියට ගෙනෙන්න අපි කටයුතු කරනවා. ඒක ඝාතනයක් වෙන්න පුළුවන්; මිනී මැරුමක් වෙන්න පුළුවන්; එහෙම නැත්නම් අල්ලසක් ගැනීමක් වෙන්න පුළුවන්; දූෂණයක් වෙන්න පුළුවන්; මූල්‍ය අපරාධයක් වෙන්න පුළුවන්. ඊට අදාළ සියලු පුද්ගලයන් නීතිය ඉදිරියට ගෙනෙන්න අපි සැලසුම් සකස් කරලා තිබෙනවා.

ගරු විපක්ෂ නායකතුමා කිව්වා, අධිකරණ විනිසුරුවන් සම්බන්ධව; ඒ අයගේ ආරක්ෂාව අඩු කර තිබෙනවා, ඉවත් කරලා තිබෙනවා කියලා කිව්වා. ගරු විපක්ෂ නායකතුමනි, අධිකරණ කොට්ඨාසයේ අධිකරණ නිලධාරීන්ගේ ආරක්ෂාවේ කිසිම ඉවත් කිරීමක් හෝ අඩු කිරීමක් සිදු වෙලා නැහැ. ඒ අයට ඒ ආකාරයෙන්ම ආරක්ෂාව සපයලා තිබෙනවා.

ඒ වාගේම අධිකරණයේ ආරක්ෂාව, අවට ආරක්ෂාව සහ අධිකරණයේ ගේට්ටුවල ආරක්ෂාව පොලීසිය දිගින් දිගටම සැපයුවා. නමුත්, අභ්‍යන්තර ආරක්ෂාව සැපයීම පෞද්ගලික ආරක්ෂක අංශයක් විසින් තමයි සිදු කරනු ලැබුවේ. පොලිස් නිලධාරීන්ට අධිකරණය ඇතුළට ආයුධ රැගෙන යෑමේ ඉඩකඩක් තිබුණේ නැහැ. ඒක තමයි මෙම අවාසනාවන්ත සිදුවීමට මූලිකම හේතුව වුණේ. මෙම සැකකරු බූස්සේ ඉඳලා රැගෙන එනකොට STF එකේ ආරක්ෂාව ලබා දීලා තිබුණා. අධිකරණය ඇතුළේ වූ සිද්ධිය ඔබතුමන්ලා මේ වනකොට දන්නවා. කොහොම වුණත්, මේ වෙලාවේ මට රටට කියන්න අවශ්‍යයි, යම් පුද්ගලයෙකුට ආරක්ෂාව අවශ්‍ය නම්, විශේෂයෙන්ම මාධ්‍යවේදීන්ට ආරක්ෂාව අවශ්‍ය නම්, ඒ අයට ආරක්ෂාව සපයන්න අපි සූදානම් බව. මෙවැනි සිද්ධීන් වන සෑම අවස්ථාවකම රටේ මහජනයාගේ වාගේම ප්‍රභූවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ, අධිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයන්ගේ ආරක්ෂාව පිළිබඳව threat assessment එකක් කරනවා. එහෙම කරලා අවශ්‍ය අයට ආරක්ෂාව සපයන්නත් අපි සූදානම්. ඒ පිළිබඳව කිසිදු ගැටලුවක් නැහැ. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳව අපි සැලකිලිමත් විය යුතුයි. ඒ පිළිබඳව කිසි ගැටලුවක් නැහැ.

මම අවසාන වශයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි, මේ වනකොට ජාතික ආරක්ෂාව කිසිදු ආකාරයකින් බිඳ වැටීමක් සිදු වෙලා නැති බව. අප මේ සිදුවන හැම සිදුවීමක් ගැනම වෙන වෙනම විමර්ශනය කරලා, පාතාල ක්‍රියාකරුවන් ඇතුළු මත් ද්‍රව්‍ය වැරදිවලට සම්බන්ධවූවන් ඉතාම කඩිනමින් නීතිය ඉදිරියට ගේන්න කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීමේ විවාදය. තෙවන වෙන් කළ දිනය.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කල් තබන ලද විවාදය නවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.

ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]

"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ඉදිරිවෙක්කප්පட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [17th February]

"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]

Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීමට, the Hon. Dayasiri Jayasekara. You have 20 minutes.

[පූ.භා. 10.30]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පුනරුදය රජයේ පළමු අය වැය පිළිබඳව කථා කරන්න ලැබීම ගැන මම විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා.

අපිත් එක්ක අවුරුදු ගණනක් විපක්ෂයේ ඉඳගෙන වැඩ කරපු වත්මන් ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා වශයෙන් අය වැය කියවන්න එනකොට මම සතුටු වුණා. මොකද හේතුව, එතුමා අරගෙන ආවේ පන් මල්ලක්. මෙච්චර කාලයක් රහස් පෙට්ටියක දාලා අය වැය කථාව අරගෙන ආපු ක්‍රමය පැත්තකට දාලා, එතුමා ආවේ පන් මල්ලකුත් අරගෙන. අර තිබුණු ලිබරල් ධනවාදී රහස් පෙට්ටිය පැත්තකට දාලා අලුත් පන් මල්ලක් අරගෙන එතුමා එනකොට, මේක අලුත් පියවරක් ලෙසයි මම හිතුවේ. නමුත් එතුමා අය වැය කථාව කියවාගෙන යනකොට මට හිතුණා, 2004 වර්ෂයේ ඉඳලා පාර්ලිමේන්තුවේ මම දැකපු, අවුරුදු ගණනක් අපිත් එක්ක විපක්ෂයේ හිටපු, ඒ අනුර දිසානායක සහෝදරයා ද මෙය කියවන්නේ, ඒ වාගේම 1978 වර්ෂයේ ඉඳලා යැංකි ඩිකීගේ නව ලිබරල්වාදී වැඩ පිළිවෙළට එරෙහිව සටන් කරපු ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ද මෙය කියවන්නේ කියලා.

මේ අය වැය ගැන වඩාත්ම සතුටු වුණු පිරිස තමයි, නව ලිබරල්වාදීන්. නැත්නම් ධනවාදීන්. නැත්නම් සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය විකල්පය විධියට හිතන අය. මා මිත්‍ර අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා පුදුම සතුටකින්, ලොකු ගරුත්වයකින් අනුර දිසානායක මැතිතුමා ගැන කථා කළා. මොකද, එතුමා ඒ ආර්ථික ක්‍රමය දැඩි ලෙස විශ්වාස කරන සහ ඒකට කැප වෙලා වැඩ කරන ඒ වෙනුවෙන් ආණ්ඩුවක් අරගෙන හෝ වැඩ කරන්න කැමැති කෙනෙක්.

කබීර් හෂීම් මැතිතුමාත් ඊයේ පුදුම සතුටකින් කථා කරනවා අපි දැක්කා. ඒ වාගේම "ඇඩ්වකාටා" එකේ සභාපති මුර්ටාසා ජැෆර්ජී මැතිතුමා කියලා තිබුණා, මේ අය වැය ධනපතීන්ට හිතකර අය වැයක්, ඒකට ඔවුන්ට හරිම සතුටුයි කියලා. මට දැන්

ලාල් කාන්ත ඇමතිතුමාගෙන් අහන්න තිබෙන්නේ, ඔබට දැන් සතුටුයිද කියලා තමයි. අපි දැක්කා, ඒ කාලයේ IMF එක සම්බන්ධව අනුර දිසානායක මැතිතුමන්ලා පවත්වපු සම්මන්ත්‍රණ. IMF එකෙන් ගොඩ ගිය රටක් නැහැ කියලා තමයි එතුමන්ලා සම්මන්ත්‍රණ තිබ්බේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF එක - ගැනයි මම මේ කිව්වේ. මේ සම්බන්ධව ඉතිහාසයේ සිද්ධ වෙච්ච දූෂණ ගැන, රනිල් වික්‍රමසිංහ මහත්මයා IMF එක එක්ක එකතු වෙලා බදු පනවලා මේ රටේ ජනතාවට ඇති කරපු පීඩනය ගැන අපි පසුගිය කාලයේ කථා කළා. මේ සියල්ල මැද කියනවා, එතුමා ආර්ථිකය ස්ථාවර කළා කියලා. මටත් හිතාගන්න බැහැ, එතුමා පසුගිය මාස තුනෙන් මේ ආර්ථිකය ස්ථාවර කළේ කොහොමද කියලා.

පොල් ප්‍රශ්නය ආවාම කියනවා, ඒක ඉතිහාසය හා සම්බන්ධ ප්‍රශ්නයක් කියලා. ඒකට සම්බන්ධ කරන්නේ රිළවුන්. හාල් ප්‍රශ්නය ආවාම කියනවා, "දැන් මේ අපි බලයට ආපු ගමන්, හිතන්න එපා බැඳපු ගමන් බබාලා හම්බ වෙනවා කියලා, එහෙම කරන්න බැහැ, පොඩ්ඩක් ඉවසන්න" ඉන්න කියලා. රටේම විදුලිය විසන්ධි වෙනකොට ඒකටත් පළි වදුරා. තව ටික දවසක් යනකොට කියයි, මේක හිටපු ආණ්ඩු කරපු විනාශයේ ප්‍රතිඵල කියලා. පසුගිය ආණ්ඩුවලට තඩි බාපු මේ ආණ්ඩුවේ අනුර දිසානායක ජනාධිපතිතුමා කියනවා, මාස තුනෙන් එතුමන්ලා ආර්ථිකය ගොඩ දැම්මා කියලා. මම අහන්නේ කොහොමද මේ ආර්ථිකය ගොඩ දැම්මේ කියලායි. එක්කෝ ලජ්ජා නැතිව කියන්න, රනිල් වික්‍රමසිංහ මහත්මයා බදු ගහලා අපේ රටේ ජනතාව නොමරා මරලා ජනතාවට කරපු විනාශය නිසාවත් මේක සිද්ධ වුණා කියලා. එහෙම කියන්නේත් නැහැ. ඒ නිසා මම මේ වෙලාවේ මේ කාරණය කියන්න කැමැතියි. ප්‍රශ්න තිබුණා. අපි ඒක දන්නවා. නමුත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා යම් කාර්යභාරයක් ඉටු කළා කියන එක අපි මේ වෙලාවේ අවංකව පිළිගන්න ඕනෑ. බොරු කියන්න වුවමනා නැහැ නේ. මම ඒක කියන්නේ වෙන ප්‍රශ්නයක් නිසා නොවෙයි. එතුමා අමාරු වෙලාවේ මේ රට යම් කිසි විධියකට ගොඩ දමන්න මහන්සි වුණා.

ඒ හරහා විශාල අර්බුද ගණනාවකුත් අපට ඇති වුණා. අපි ඒවාට කෑ ගැහුවා; කථා කළා. තව ප්‍රශ්න තිබෙනවා. ඒවා විසඳා ගන්න ඕනෑ. හොරකම් සිද්ධ වුණා; බාර් පර්මිට් දුන්නා; ඒ සියල්ල කළා. තමන්ගේ පක්ෂයෙන් තනි පුද්ගලයෙක් විධියට පාර්ලිමේන්තුවට ඇවිල්ලා අනෙක් පක්ෂයෙන් ඔක්කෝම අල්ලා ගත්තා. හැබැයි, ඒගොල්ලන් ඔක්කෝම අන්තිමට ගෙදර ගියා. ඒ වෙලාවේ තව කවුද ඒකට සහයෝගය දුන්නේ? අපි ඒ අයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එක්කෙනෙක් තමයි, මහ බැංකු අධිපතිතුමා. ඒ තමයි, අනුර දිසානායක මහත්තයා ආපු ගමන් එල්ලනවාය කියපු කෙනා. එතුමා කරපු කාර්යභාරයත් මෙතැනදී අපි අනිවාර්යයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මහින්ද සිරිවර්ධන මහත්තයා ගැනත් සඳහන් කළ යුතුයි. ආපු ගමන් එතුමාත් හිරේ යවනවා කිව්වා. ඒ දෙදෙනාම තවම ඉන්නවා, මාස 5ක් තිස්සේ. මේ අය වැය හදා දෙන්නේත් මහින්ද සිරිවර්ධන මහත්තයා. මේ අය වැය හදන්න මහන්සි වෙන්නේත් අපේ නන්දලාල් වීරසිංහ මැතිතුමා. එතුමාගේ ළඟම ඥාතියෙක් JVP එක විසින් මරා දැම්මා. එම ඥාතියාගේ පුතාට නාරාසනයෙන් ඇන්නා. තව ටිකක් හිටියා නම් ඔහු මැරෙනවා. යන්තම් ඒ මනුස්සයා බේරුණා. අර මන්ත්‍රීතුමාගේ බෙල්ල කපා මරා දැම්මේ. ඒ මන්ත්‍රීතුමාගේ ඥාති පුතා තමයි මේ රට ගොඩදමන්න මහන්සි වුණේ. JVP එකෙන් තමයි ඒ මනුස්සයෝ මරා දැම්මේ. ඒ නිසා විශේෂයෙන්ම අර අයට ස්තුති කරන්න, තමන්ගේ කාර්යභාරය කරනකොට.

ඒ වාගේම මතක තබා ගන්න ඕනෑ, මේ රටේ 1987න් පටන් ගත් ව්‍යාපාරය පිළිබඳවත්. විශේෂයෙන්ම "ඉන්දියානු වඳුරු හමුදාව පන්නමු!" කියලා පටන් අරගෙන, "පළාත් සභා එපා!" කියලා පටන් අරගෙන, මේ රටේ කලාකරුවන්, විජය කුමාරණතුංග වාගේ අය මරා දමලා, සිවිල් සේවකයන් මරා දමලා, මහාචාර්යවරුන් මරා දමලා, ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන කථා කරලා ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික වෙනුවෙන් මරාගෙන මැරුණු මේ අය දැන් කියනවා, ඉන්දියාව සමඟ 50:50 - 49:51 නම් තව කමක් නැහැ. - ලෙස සම සමව තෙල් ටැංකි ටික බෙදාගෙන වැඩේ කරන්න අපි සූදානම් කියලා. ඒ කාලයේ මේවා වෙනුවෙන් මේ රටේ මිනිස්සු මැරුණා. මේ රට අවුරුදු ගණනක් ආපස්සට ගිය රටක්. අවුරුදු 70 නොවෙයි, අවුරුදු හැත්තෑවේත් කැලි සෑහෙන ප්‍රමාණයක් මේවාට වග කියන්න ඕනෑ. මට හිතුණා, ඒ අනුර දිසානායක සහෝදරයාද මේ කථා කරන්නේ කියලා. ආර්ථික පරිවර්තන පනත, ශ්‍රී ලංකා මහ බැංකු පනත ගෙනා අවස්ථාවල අනුර දිසානායක මැතිතුමන්ලා ගිහින් නඩු පැවරුවා. 2015දී රනිල් වික්‍රමසිංහ මහත්තයා Temasek Holdings ගැන කථා කළා. දැන් එවැනි holding company එකක් හදන්න කථා කරනවා, අනුර දිසානායක මැතිතුමා. ඒ වාගේම විදුලිබල මණ්ඩලය මස් කරපු ශ්‍රී ලංකා විදුලිබල පනත වැනි ඒවා ගෙනෙනකොට ඒවාට අපි විරුද්ධ වුණා. සමහර ඒවායේ තිබුණු කාරණාවලට අපි සම්පූර්ණයෙන් විරුද්ධ වුණා. දැන් මොකද කරන්න හදන්නේ? දැන් ඒකට අලුත් එකක් ගෙනෙනවා. හැබැයි, කිසි කෙනෙක් දන්නේ නැහැ. හොර රහසේ සාකච්ඡා කරනවා. දැන් ඒක ගෙනෙන්න හදනවා. ඒකේ පළමුවෙනි කාර්යභාරය මොකක්ද? ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට තිබුණු බලය සම්පූර්ණයෙන් අහිමි කරන වැඩ පිළිවෙළ තමයි මේ සකස් කරන්නේ.

ඒ වාගේම ඌන උපයෝජිත ඉඩම් බහුජාතික සමාගම්වලට පවරා දෙනවා කියලා ඒ කාලයේ කිව්වා. මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා, "ලූනු ලාභද, ලූනු කෑවාද?" කියලා අභය සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. එතුමා තමයි බහුජාතික සමාගම්වලට විරුද්ධව, මේවා Dole Company එකට දෙනවා කියලා පාරවල් දිගේ කෑ ගැහුවේ. ඒ කට්ටිය දැන් මොකද කරන්නේ? මේකෙන් කියනවා, ඌන උපයෝජිත ඉඩම් මේ සමාගම්වලට භාර දීලා වැඩ කරන්න සූදානම් කියලා. අනාගතයේදී කවුද මේවා දෙන්නේ කියලා අපි බලමු. ඊළඟට, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පවා නොකළ, මේ රටේ නිදහස් වෙළෙඳ කලාප විශේෂ නිදහස් වෙළෙඳ කලාප බවට පත් කරලා, විදේශ රටවල ඕනෑම කෙනෙකුට ඇවිල්ලා ඒවායේ ආයෝජනය කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කරනවා. ඒ විතරක් නොවෙයි. ආර්ථික පරිවර්තන පනතේ තිබෙනවා, දැන් තිබෙන BOI zones ටිකත් දෙන්න. මොකද, දැනට BOI zonesවල එහෙම කරන්න දෙන්නේ නැහැ. අපි මේ ගැන දිගටම කථා කළා. අද තත්ත්වය මොකක්ද? අලුත් අධ්‍යක්ෂක මණ්ඩල, සභාපතිවරු පත් කරලා ඒගොල්ලන්ට පඩි නඩි ඇතුළු සියලුම දේ දෙනවා, ගරු කථානායකතුමනි. ඇත්තටම අනුර දිසානායක මහත්තයා JVP ද කියලා මට හිතුණා. අනුර දිසානායක මහත්තයා JVP නොවෙයි. එතුමා JVP එකෙන් අයින් වෙලා දැන් ගොඩක් කල්. තවත් එක්කෙනෙක් දෙන්නෙක් අපට පෙනෙන්න ඉන්නවා; ලාල් කාන්ත මැතිතුමන්ලා වාගේ අපි ආදරය කරන මිනිස්සු එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා. සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා ගැනත් මට තවම ආදරයක් තිබෙනවා; ගෞරවයක් තිබෙනවා. අපේ වසන්ත සමරසිංහ මහත්තයාත් ඒකෙන් අයින් වෙලා ඉන්නේ. මොකද, අනුරාධපුරයේ නිසා එතුමාටත් ඒකෙන් අයින් වෙන්න සිද්ධ වෙලා තිබෙනවා. සමාවෙන්න ඕනෑ මම මෙහෙම කියනවාට. මට මේවා හිතා ගන්න බැහැ. මේ, බොරු JVP අය. ඇත්ත JVP අය තමයි, ගම්වල අහිංසක මිනිස්සු. වී මිලදී ගැනීම සම්බන්ධයෙන් කථා කරපු වෙලාවේ ඔවුන් ආණ්ඩුවට බණිනවා මම දැක්කා. අනුර දිසානායක මැතිතුමා ඇත්තටම JVPද, නැද්ද කියලා කරුණාකරලා මට කියන්න. එහෙම නැත්නම් හරිනි අමරසූරිය මැතිතුමියලා එක්ක ඒ අය වෙනම ලිබරල් ධනවාදී වෙලාද කියලා කියන්න.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ගරු කථානායකතුමනි, මිනිස්සුන්ව රවට්ටනවා කියන එක මේ තරම් කරන්න පුළුවන්ද? මේ ආණ්ඩුව තරම් බොරු කියපු ආණ්ඩුවක් තවත් නැහැ. ජාතික ආරක්ෂාව ගැන අපේ විපක්ෂ නායකතුමා කථා කළා. මොනවද කිව්වේ, මහජන ආරක්ෂක නියෝජ්‍ය ඇමතිවරයා? පෝය දෙකෙන් උගන්වන්නම්, පුටුවයි, බංකුවයි අරගෙන එන්න කිව්වා. කට්ටිය හෝ ගාලා අත්පුඩි ගැහුවා. පෝය දෙක නොවෙයි, පෝය හතරට පාතාලයේ වෙඩි තැබීම් 13යි, මරණ 12යි. ඒ අතර අහිංසක පොඩි ළමයි දෙදෙනෙකුත් ඉන්නවා. ඔවුන්ගේ තාත්තා පාතාලයේ වෙන්න පුළුවන්. නමුත් ඒ දරුවන් මරලා දැම්මා. ජාතික ආරක්ෂාව ගැන එහෙම ප්‍රශ්නයක් නැහැ ලු. විනිශ්චයකාරවරුන්ගේ ආරක්ෂාවත් අයින් කරනවාය කිව්වා. පුළුවන් නම්, එහෙම කිව්වේ නැහැයි කියලා කියන්න. එහෙම කියලා තිබුණා. එහෙම කියලා circular එක ගැහුවා. මේ රටේ විනිශ්චයකාරවරු අධිකරණයට ගිහිල්ලා කුඩුකාරයෙකු සම්බන්ධයෙන් තීන්දුවක් දෙන්නේ කොහොමද?

මිනීමරුවෙකු සම්බන්ධයෙන් තීන්දුවක් දෙන්නේ කොහොමද? ඒ නිසා තමයි ඒගොල්ලන්ට ආරක්ෂාව දුන්නේ. දැන් ඒ අයගේ ආරක්ෂාව ඉවත් කළාම, විනිශ්චයකාරවරු බයක් නැතුව ගිහිල්ලා තීන්දුවක් දෙන්නේ කොහොමද? සරත් අමුණුපිටිය විනිසුරුතුමාට වෙඩි තියලා මරපු හැටි අපිට මතකයි නේ. එහෙම ඉතිහාසයක් තිබුණේ. මේ රටේ ඒක තවම නතර කරලා නැහැ. හැබැයි, දැන් ඒ අයගේ ආරක්ෂාව ඉවත් කරන්න කටයුතු කරනවා.

ගරු කථානායකතුමනි, ඊයේ සිද්ධියේදී මැරුවේ උසාවියේ විත්ති කූඩුවක් ඇතුළේ මරපු පළමුවැනියා. ඊට කලින් උසාවිය ඇතුළේ මරලා දාලා තිබෙනවා. ඒක වෙනම කාරණයක්. විනිශ්චයකාරතුමිය ඉදිරියේ, විනිශ්චයකාරතුමිය නඩු අහමින් ඉන්න කොට මේ සිද්ධිය වුණේ. මේ විත්තිකරු අරගෙන එන්නේ STF එකෙන් හා පොලීසියෙන්. මේ වෙඩි තැබීම කරනතුරු ඒ අය බුදියගෙන හිටියාද? ඒ වෙඩි තැබීම කරලා යනතුරු ඒ පුද්ගලයාට වෙඩි තබා ගන්න බැරි වුණාද? මම බොහොම පැහැදිලිව කියනවා, අභ්‍යන්තරයේත් මේකට සම්බන්ධයක් තිබෙන අය ඇති කියලා. කරුණාකරලා මේ ගැන සොයා බලන්න. මේක විශාල අර්බුදයක්. මේක විහිළු වැඩක් නොවෙයි. පෙන්වූයේ නම් මේ ඔක්කොම මන්ත්‍රීවරු දඩ බඩ ගාලා ඒ සිද්ධිය වෙච්ච ස්ථානයට ගියා වාගේයි. මේ ඔක්කොම අය ඡන්දය දමන්නයි ගියේ. ඊයේ නීතිඥ සංගමයේ නිලවරණය තිබුණා. අධිකරණ ඇමතිතුමාත් ඡන්දය දෙන්න ගියා. පොලිස්පතිතුමා නීතිඥයෙක්. එතුමාත් ඡන්දය දෙන්න ගියා. අපේ සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා නම් සොයා ගන්න බැරිව ගියා. එතුමා අන්තිමට ඩ්‍රයිවර්ට "බූරුවා, බූරුවා" කිව්වා. මම දන්නේ නැහැ, ඒ වාහනය පදවන්නේ බූරුවෙක්ද කියලා. "මේ බූරුවා කොහේ ගියාද?" කියලා අහනවා. නියෝජ්‍ය ඇමතිවරයාගේ ඩ්‍රයිවර්ව පොලීසියෙන් එළවනවා. ඔහුව අඳුරන්නේ නැහැ. එතකොට සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමාගේ වාහනය පදවන්නේ බූරුවෙක්ද?

මේ රටේ ආරක්ෂාව විශාල අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂකයා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මොනවා හරි ප්‍රශ්නයක් වුණොත් මොකද කරන්නේ? දැන් අහයි, "ඔන්න ආරක්ෂාව ඉල්ලනවා, බය වෙලාද?" කියලා. අපි බය නැහැ. හැබැයි, කවුරු හරි මරලා දැම්මොත් අපිට කථා කරන්න බැහැ, ගරු කථානායකතුමනි. අද අපි කථා කරන සමහර ඒවා අපේ ජීවිත පිළිබඳ ප්‍රශ්න. මම අද ඔබතුමාට කියනවා, කවුරු හරි කෙනෙක් මරලා දැම්මොත්, කරුණාකරලා ඔබතුමා ඒ පිළිබඳ වගකීම භාර ගන්න කියලා. මොකද, මේ ආණ්ඩුවේ අයට ආරක්ෂකයෝ ඉන්නවා. අපි දන්නවා, අනුර දිසානායක මැතිතුමාට ඉස්සර ඉඳන්ම ඒගොල්ලන්ගේ ආරක්ෂකයෝ ඉන්නා බව. ගල්කටස්කාරයෝ, අවි ආයුධ හංගපු අය තවම ආරක්ෂාව දෙනවා. ඒ කාලයේ ගත්තේ නැහැ නේ. මෝටර් බයිසිකල් පිටුපසින් ඇවිල්ලා ආරක්ෂාව දෙනවා. අපිට එහෙම ආරක්ෂාව දෙන්න කිසිම කෙනෙක් නැහැ. වම් පැත්තෙන් හෝ දකුණු පැත්තෙන් ඇවිල්ලා වෙඩි තියලා මරලා දැම්මොත්, ඒකේ වගකීම කරුණාකරලා ඔබතුමා භාර ගන්න කියලා මම ඔබතුමාට කියනවා, ගරු කථානායකතුමනි. අපිට ආරක්ෂාව එපා. අපිට මෙහෙම ඉන්න දෙන්න. හැබැයි, තව කාගේ හරි වෙඩි කන්න අපි සූදානම් නැහැ. මොකද, එහෙම වෙඩි කාපු මිනිස්සු හිටියා නේ. විජය කුමාරණතුංග වාගේ අහිංසක මිනිහෙකුගේ මුහුණට වෙඩි තියලා මරලා දාපු මිනිස්සුන්ට, තව දහලන මිනිස්සු එක්කෙනෙකුට, දෙදෙනෙකුට වෙඩි තියන එක වැඩක් නොවෙයි. මොකද, තවම පරණ ගල්කටස් තිබෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි, ඒ ගැන කරුණාකර කල්පනාකාරී වෙන්න කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කඩුවෙල පැත්තෙන් අහන්න,වෙඩි තිබ්බේ කවුද කියලා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අනේ මහත්තයෝ, වී ටික ගන්න බැරුව,- *[බාධා කිරීම්]* ඉඳගන්න, කරුණාකරලා. බොරුවට කයිය ගහලා. පොළොන්නරුවට ගිහිල්ලා බොරුවට කයිය ගැහුවා. *[බාධා කිරීම්]* ගිහිල්ලා වී ටික ගන්න මහත්තයෝ, බොරුවට කයිය ගහන්නේ නැතුව. *[බාධා කිරීම්]* කරුණාකර, මට කථා කරන්න දෙන්න. ඔන්න, මේගොල්ලන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය. රෙද්ද පල්ලෙන් බේරෙනවා ප්‍රජාතන්ත්‍රවාදය. පළවෙනි මාසයේ හිටියා හොඳට. දැන් ඉන්න බැහැ. පරණ ගති තවම එනවා උඩට. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, ඊළඟට දෙවැනි කාරණය. ඇත්ත කියනකොට තරහා යනවා. පොඩ්ඩක් ඉවසන්න. *[බාධා කිරීම්]* ඒකයි මම එදාත් කිව්වේ. අර මහින්ද, - ඒ තව පොලිස් රාළහාමි කෙනෙක්. අර පොලිස් රාළහාමි කෙනෙක් පැන්නා ගිය සතියේ ගිහිල්ලා බෞද්ධ මධ්‍යස්ථානයකට. පැනලා බෞද්ධ මධ්‍යස්ථානයේ,-

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම එතුමාගේ නම කිව්වේ නැහැ, ගරු කථානායකතුමනි. මට කථා කරන්න දෙන්න. ඊළඟට, උපාධිධාරී ගුරු ගැටලුවට මම එන්නම්. *[බාධා කිරීම්]* පේනවා නේ, ගරු කථානායකතුමනි. මට කථා කරන්න දෙන්න කියන්න. Point of Order එකක් නැහැ.

[බාධා කිරීම්] ඔය කියන්නේ ගරු කථානායකතුමනි, අර, "පොලිස් රාළහාමි" කියලා කිව්වාම ඔන්න කථා කරනවා. අර බෞද්ධ මධ්‍යස්ථානයට පැනපු ඒවා කිව්වාම ඔන්න කථා කරනවා. ඔන්න, බෞද්ධ මධ්‍යස්ථානයට පැනපු "පොලිස් රාළහාමි" කථා කරන්න යන්නේ. රටේම ජනතාව දැනගන්නවා. ඒ නිසා ඉඳගන්න. මට කථා කරන්න දෙන්න.

ඊළඟට, උපාධිධාරීන්ගේ ගැටලුව ගැන බලමු. ගරු කථානායකතුමනි, මේ රටේ උපාධිධාරීන් රවටපු රැවටිල්ල බලන්න. අපේ හඳුන්නෙත්ති ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. උපාධිධාරීන්ව එකතු කෙරුවා, ලංකාවේම. ඒ අයව එකතු කරලා කිව්වා, 35,000ක් උපාධිධාරීන් ඉන්නවා, නුඔලාට රස්සා දෙන්නේ නැහැ කවුරුත්, අපි තමයි නුඔලාව බලාගන්නේ, සහෝදරවරුනි එකතු වෙන්න කියලා. හැම තැනින්ම එකතු වුණා, තරුණ සහෝදරවරු, සහෝදරියෝ 35,000ක්. ඒ මිනිස්සු මේ ගැන කල්පනා කළා.

ඒ අයට මොකක්ද කිව්වේ? කිව්වා, 20,000ක් ගුරු වෘත්තියට බඳවා ගන්නවා කියලා. විද්‍යා, තාක්ෂණික, ඉංජිනේරු, ගණිත - STEM - උපාධිධාරීන් 3,000ක්, STEM නොවන උපාධිධාරීන් 9,000ක් තොරතුරු තාක්ෂණයට බඳවා ගන්නවා කිව්වා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා රේගුවට, විදේශ සේවාවට, සංචාරක කර්මාන්තයට තවත් 3,000ක් බඳවා ගන්නවා කිව්වා. කාටද කිව්වේ? මේ ඔක්කොම -35,000ම- එකතු කරලා, රට වටේ උපාධිධාරීන් එකතු කරලා, එකතු කරලා ඔක්කොටම කිව්වා අපි මේ රැකියා ඔබතුමන්ලාට දෙනවා කියලා. දැන් මේ අය වැයෙන් මොකක්ද කියන්නේ? උපාධිධාරීන්ට සහ තරුණ, තරුණියන්ට රැකී රක්ෂා දීමේ වැඩ පිළිවෙළ යටතේ 30,000කට රස්සා දෙනවා කියලා කියනවා. ඒ 35,000 දැන් 30,000ක් දක්වා අඩු කරලා, 30,000කට රක්ෂා දෙනවාය කියනවා. ගරු කථානායකතුමනි, ඊයේ පෙරේදා මම ඇහුවා-*[බාධා කිරීම්]* අය වැය ගැනම තමයි මේ කථා කරන්නේ. උපාධිධාරි ගැටලුව ගැනයි මේ කථා කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතඅතරතුර, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දැන් මොකද වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? ඊයේ මම දැක්කා අපේ වෛද්‍ය නලීන් ඉන්දික මැතිතුමා කිව්වා, මේ රටේ තිබෙන විවිධ ක්ෂේත්‍රවලට,- *[බාධා කිරීමක්]* ඒක හොඳයි. ඒක කරන්න වෙනම. හැබැයි මේ රටේ උපාධිධාරීන්ට තමුන්නාන්සේලා කිව්වේ කොහොමද? "35,000ක් බඳවා ගන්නවා. බයවෙන්න එපා, ආපු ගමන් ඔයාලාට වෙනම scheme එකක් හදලා මාසිකව පඩියක් දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරනවා. ඒ අතර, ඔබතුමන්ලාට අපි වැඩ පිළිවෙළක් සකස් කරනවා විවිධ රැකී රක්ෂාවලට හෙමිහිට හෙමිහිට ගන්න" කිව්වා. දැන් ඒ වැඩ පිළිවෙළ නැහැ. දැන් ආයෙත් උපාධිධාරීන් අනාථයි. අවුරුදු 41 විතර වනකල් උපාධිධාරීන් ඉන්නවා. දැන් බණින්න එපා ඉතිහාසයේ ඉඳපු ආණ්ඩු තමයි මේවාට වග කියන්න ඕනෑ කියලා. අපි එනකොටත් ඔය ආණ්ඩු ඔහොම තිබුණා. 1994 වෙනකොට ඔය වාගේ අතිවිශාල ප්‍රමාණයක් සිටියා. උපාධිධාරීන් 60,000ක් ගත්තා මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ කාලයේ. අරගෙන තැන් තැන්වලට පිරෙව්වා. ඒ දේවල්වල වැරදි, ගොඩක් අඩුපාඩු තිබෙනවා. නමුත් ඒ මිනිස්සු ක්‍රමානුකූලව ඒක කළා. ප්‍රේමදාස මහත්මයා එනකොටත් ඔය ප්‍රශ්නය තිබුණා. එතුමා රුපියල් 1,000ක වැටුපට ගත්තේ පළමුවෙන්. අරගෙන හෙමින් හෙමින් තමයි ඒක ක්‍රියාත්මක කළේ. හැබැයි ඔබතුමන්ලා කිව්වා අලුත් scheme එකක් හදනවා, ඒ scheme එකට 35,000ම බඳවා ගන්නවා, ඒ 35,000 හෙමිහිට, ක්‍රමානුකූලව තැන් තැන්වලට දානවා කියලා. දැන් ඒ එකක්වත් වෙන්නේ නැහැ. අද ඒ මිනිස්සු අනාථ වෙලා ඉන්නේ, උපාධිධාරීන්. මම කියන්න කැමැතියි, කරුණාකරලා මේ අහිංසක මිනිස්සුන්ගේ ප්‍රශ්නය විසඳන්න. මොකද, ඔබතුමන්ලා කියපු ඉතාම දැවැන්ත බොරුවක් මේක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඊයේත් පළමු වතාවට අසත්‍යයක් කිව්වා විදුලිබල ඇමතිවරයා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පළමු වතාවට නොවෙයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පළමු වතාව නොවෙයි, දෙවැනි වතාවට. ගියවර කිව්වා රුපියල් බිලියන 232ක් අලාභයි කියලා. මම ඒක වරප්‍රසාද කමිටුවට යොමු කළා. වරප්‍රසාද කමිටුවට යොමු කළාම එතුමා කිව්වා නැහැ, එච්චර ගණනක් නැහැ කියලා. අපි ඒක කථා කරලා, තවත් ඒක ඇදගෙන යන්න වුවමනා වුණේ නැහැ. මොකද, විදුලිබල මණ්ඩලයේ මිනිස්සුත් මේකට ගෙන්වන්න ඕනෑ.

අන්තිමටම අපි යෝජනා කළා, කරුණාකර මේක කෝප් කමිටුවට යොමු කරලා කෝප් කමිටුවෙන් අපට වාර්තාවක් ලබා දෙන්න කියලා. මොකද, විදුලිබල මණ්ඩලය මේ එන එන ඇමතිවරුන් ඔක්කෝම රවටනවා. තමුන්නාන්සේලාට මේක තේරෙන්නේ නැහැ. ඇමතිවරුන් රවටන එකයි ඒ අය කරන්නේ. විදුලිබල මණ්ඩලය මොකක්ද කිව්වේ? මෙතුමා ඇවිල්ලා කිව්වා, "මෙහි එහෙම සිද්ධියක් වෙලා නැහැ; පුනර්ජනනීය බලශක්තිය සීමා කරන කිසිම වැඩ පිළිවෙළක් නැහැ; ඒ ඔක්කෝම බොරු; ඔය බොරු ගණන් ගන්න එපා" කියලා. දැන් මොකක්ද, වෙලා තිබෙන්නේ? කමිටුවක් පත් කරලා තිබෙනවා.

ජාතික ජන බලවේගයේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 165වන පිටුවේ මොකක්ද තිබෙන්නේ? සූර්ය බලශක්තියෙන් මෙගාවොට් 2,000ක් ජාතික පද්ධතියට එක් කර ගන්නවා කියලායි. දැනුත් මෙගාවොට් 1,500ක් තිබෙනවා. මෙහෙම තිබියදී, මේකට ගහනවා නම් මේ විධියට, තමුන්නාන්සේලා කොහොමද මෙගාවොට් 2,000ක් ජාතික පද්ධතියට එක් කරන්නේ? දැන් බලන්න, පත් කරලා තිබෙන කමිටුව මොකක්ද කියලා. ඒ තමයි, committee to design and implement NCRE generation curtailment mechanism. මොකක් කියලාද තිබෙන්නේ? Distribution Coordinating Committee කියලායි. මේ කමිටුවට කවුද පත්

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

කරන්නේ? මේ කමිටුවට පත් කරනවා, Additional General Manager වීරසිංහ මහත්මයා. කවදාද දිනය? පෙබරවාරි 07වන දා. Mr. W.A.R.S. Weeratunga, Chief Engineer (System Operations) තමයි මෙහි ප්‍රධානියා. ඊට අමතරව, නවදෙනෙකු පත් කරනවා, ලාල්කාන්ත ඇමතිතුමනි. පත් කරලා මොකද කරන්නේ? පත් කරලා පළමුවෙනි විසන්ධි කිරීම කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගයන්ත කරුණාතිලක මැතිතුමනි, මට තවත් විනාඩි කීපයක් දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමාට තවත් විනාඩි 4ක කාලයක් ලබා දෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පළමුවෙනි විදුලි විසන්ධි කිරීම කරනවා ගිය ඉරිදා. ගිය ඉරිදා විතරක් පැය 4ක් විදුලිය කපනවා. එහෙම විදුලිය කපලා මේගොල්ලන් ඒකට එකතු කරන්නේ මොකක්ද? පුනර්ජනනීය බලශක්තිය සම්පූර්ණයෙන් කපලා ඒකට ගන්නවා ඉන්ධනවලින් විදුලිය නිපදවන ඒවා. එතකොට කාටද වාසිය එන්නේ? එහි සිටින ඉංජිනේරුවන්ටයි. ඉංජිනේරුවන්ගේ මේ වැඩේට හසු වෙන්න එපා කියලා අපි දිගින් දිගටම තමුන්නාන්සේලාට කිව්වා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ.

ඊළඟට, මම අනික් කාරණය ගන්නවා. ඒ තමයි SVAT එක පිළිබඳ කාරණය. තමුන්නාන්සේලා SVAT එක අයින් කරන්න හදනවා. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම ආයතන ගණනාවක් ගැන කිව්වා. SVAT එක අයින් කළාම මොකද වෙන්නේ කියලා බලන්න. පොල් ආශ්‍රිත නිෂ්පාදනවලට වෙන්නේ මොකක්ද? සාමාන්‍යයෙන් මේ නිෂ්පාදන තිබුණේ SVAT එක යටතේ. මේගොල්ලෝ වැඩ පිළිවෙළක් සකස් කර තිබුණා, ඉස්සර තිබුණු SVAT එකට අනුව ගෙවීම් ටික කරලා මේක ආපසු අරගන්න. දැන් මොකක්ද කරන්න යන්නේ? සියයට 18ක වැට් එකක් ගහන්න යනවා. සියයට 18ක වැට් එක ගැහුවාම පැහැදිලිව මේ ආයතනවලට සිද්ධ වෙනවා, තමන්ගේ කාරක ප්‍රාග්ධනය සෑහෙන ප්‍රමාණයක් මේකට දෙන්න. කාරක ප්‍රාග්ධනය දැම්මාට පස්සේ විශේෂයෙන්ම වෙළෙඳ පොළ එක්ක තරග කරන්න බැරි තැනකට ඔවුන්ගේ නිෂ්පාදනය තල්ලු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මොකක්ද හේතුව? වැට් එක ආපසු ගන්න ගියාම ඒකට කාලයක් ගත වෙනවා. කියන්නේ නම් දවස් 45න් දෙන්නේ කියලා. නමුත් සමහර වැට් ආපසු ගෙවන්න ආදයම් බදු දෙපාර්තමේන්තුව අවුරුදු එකහමාරක් විතර ගන්නවා. ඒ නිසා මතක තියා ගන්න, මේ ක්‍රියාදාමය තුළ ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන -කොහු බත් එක්ක වෙන්න පුළුවන්- සම්පූර්ණයෙන් අපේ අසල්වැසි ඉන්දියාව මීට වඩා අඩු මිලට ලෝක වෙළෙඳ පොළට සපයන්න පුළුවන් තත්ත්වයට ගෙනෙනවා. ඒ ක්‍රියාදාමයයි මේ යන්නේ. ඒ නිසා ආදායම් බදු දෙපාර්තමේන්තුව කරන පිස්සු වැඩවලට තමුන්නාන්සේලා හසු වෙලා SVAT එක වෙනුවට වැට් එක ගෙනාපු ගමන් වෙන්නේ විශාල අර්බුදයක්.

ඇත්තටම ඇහලුම් ක්ෂේත්‍රයේත් මේ වාගේම ප්‍රශ්නයක් තිබෙනවා. ඇහලුම් ක්ෂේත්‍රය සඳහා ගෙන්වන අමුද්‍රව්‍ය සඳහාත් මේ නිසා අර්බුදයක් ඇති වෙලා තිබෙනවා; apparel industry එකත් අද විශාල අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විදුලි බිල් සහ ගෙවන්න තිබෙන අනික් සියලු ගෙවීම් එක්ක ගත්තාම, දැන් ඇහලුම් ක්ෂේත්‍රය බොහොම අමාරුවෙන් තමයි රැක ගෙන ඉන්නේ. දැන් තමුන්නාන්සේලා වැටුප් වැඩි කරන්න කියනවා, පෞද්ගලික අංශයටත්. ඉතින් ඒවාත් වැඩි කළාම, SVAT එකත් අයින් කළාම ඒගොල්ලන්ගේ කාරක ප්‍රාග්ධනයෙන් මේවා ගෙවලා කොහොමද මේවා ආපසු අය කර ගන්න කටයුතු කරන්නේ කියලායි ඒ අය අහන්නේ. මේකෙන් වෙන්නේ තිබෙන ආයෝජන ටිකත් ආපසු වෙනත් රටකට යෑමයි. දැනට බංග්ලාදේශයේ තිබෙන ඒවා ටික ලංකාවට ගෙන්වාගන්න පුළුවන් තැනකට අපි එමින් තිබෙන්නේ. නමුත් ඒකත් විනාශ වෙනවා, මේ ක්‍රියාදාමය තුළ. ඒ නිසා මම කියන්න කැමැතියි, කරුණාකර මේ සම්බන්ධව නිවැරදි තීන්දුවක් ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නියෝජ්‍ය ඇමති මහින්ද මැතිතුමාත් මේ වෙලාවේ සභාවේ සිටින නිසා විශේෂයෙන්ම ගුරු විදුහල්පති විශ්‍රාම වැටුප් ගැනත් මා සඳහන් කරන්න ඕනෑ. මා හිතන විධියට මහින්ද මැතිතුමා මේ ගැන ඉතාම හොඳින් දන්නවා. දැන් බලන්න, 2020ට පෙර විශ්‍රාම ලැබූ අයටත්, 2015ට පෙර විශ්‍රාම ලැබූ අයටත් අතීතයට බලපාන පරිදි ඔබතුමන්ලා සහනයක් ලබා දුන්නා. හැබැයි, 2020 සහ 2021දී විශ්‍රාම ලැබූ ගුරු විදුහල්පතිවරු මේකෙන් අයින් වෙලා තිබෙනවා.

කරුණාකර මේ සම්බන්ධව අවශ්‍ය කරන කටයුතු ටික කරන්න. 03/2016(IV) දරන 2022.01.05 දිනැති චක්‍රලේඛයට අනුව, පවතින ගුරු විදුහල්පති වැටුප් විෂමතාව අවම කිරීම සඳහා තුනෙන් එකක ප්‍රමාණයක් 2022න් පසුව ගුරු විදුහල්පතිවරුන්ට ලබා දී තිබෙනවා. ඒ අනුව අප ඉල්ලන්නේ එය ඉදිරියට ක්‍රියාත්මක කරන්න කියලායි; ඒ කියන්නේ, 2020-2021 දී විශ්‍රාම ලැබූ ගුරු විදුහල්පතිවරුන්ගේ ප්‍රශ්නය බෙරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලායි.

ඒ වාගේම, මේ වැටුප් විෂමතාවත් එක්ක 2021 සිට 2024 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය රජයේ නිලධාරීන්ට දැන් විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. 1994 වසරේදී සේවයට බැඳුණු විධායක ශ්‍රේණියේ එස්එල්-1 ශ්‍රේණියේ නිලධාරියෙකු වසර 60ක් සම්පූර්ණ වීම නිසා 2024 වසරේදී විශ්‍රාම ගිය විට ඔහුගේ මූලික වැටුප ලෙස අදාළ පියවරේ රුපියල් 101,095ක් ලැබුණු අතර ඊට අනුරූපව විශ්‍රාම වැටුප 100,000කට වඩා අඩු වෙනවා. ඒකෙන් විශාල අර්බුදයක් මතු වෙනවා. ඔවුන්ට රුපියල් 50,000කට වඩා ප්‍රමාණයකින් විශාල කඩා වැටීමක් ඇති වෙලා තිබෙනවා, මේ ක්‍රියාදාමයත් එක්ක.

ඒ විතරක් නොවෙයි. විශ්වවිද්‍යාලවලත් මේ තත්ත්වයම තමයි තිබෙන්නේ. වැඩ සහායකවරයකුගේ වැටුප ඔබතුමන්ලා මේ වැඩි කරපු වැටුපත් එක්ක ගෙන බලන්න. දැනට ලබමින් තිබෙන වැටුප

රුපියල් 49,591යි. හැබැයි, නව අය වැය යෝජනා අනුව ලැබෙන්න තිබෙනවා, රුපියල් 47,610ක්. හැබැයි ඔබතුමන්ලා මොකද කරලා තිබෙන්නේ? හිහහිටි දීමනාව සම්පූර්ණයෙන් අයින් කරලා තිබෙනවා. මාසික හිලව් දීමනාව 45 ඉඳලා 36ට අඩු කරලා තිබෙනවා. මේ අඩු කිරීම තුළ ඇත්තටම ලැබෙන්න ඕනෑ ගණන අය වැය යෝජනා අනුව රුපියල් 62,550යි. හැබැයි ලැබෙන්නේ, රුපියල් 47,610යි. ඒ කියන්නේ ලැබුණු ගණනටත් වඩා අඩු වෙලා තිබෙනවා. රුපියල් 49,591ක් දැනට ලැබෙනවා. නමුත් ලැබෙන්න නියමිතව තිබෙන්නේ රුපියල් 47,610යි. ඒ නිසා මේවා ගැන කරුණාකර තමුන්නාන්සේලා කල්පනා කර බලන්න.

අනෙක් කාරණය තමයි ගොවීන්ගේ ප්‍රශ්නය. ගොවීන්ගේ කෘෂි ආදායම බද්දෙන් නිදහස් කරලා තිබුණා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ. ඒ නිදහස් කිරීම ගිය අවුරුද්දේ අවසන් වුණා, ලාල්කාන්ත ඇමතිතුමා. මේ අවුරුද්දේ ඉඳලා ඒක ඉවත් කරනවාද නැද්ද කියන එක කරුණාකර අපට කියන්න. ඔබතුමා තර්ජනයක් දැම්මා වී ගොවියාට, තෙල් ටික දෙනවා, පොහොර ටික දෙනවා, ඒ වාගේම වතුර ටික දෙනවා, ඒ නිසා ලැහැස්ති වෙන්න කියලා. සඳහන් කර තිබෙනවා මම දැක්කා, පනත සංශෝධනය කරනවා කියලා. මේක රාජකාරී ක්‍රමය නොවෙයි, ඇමතිතුමා. මේක රාජකාරී ක්‍රමය නොවෙයි, ගොවීන් තමුන්නාන්සේලාට වී ටික ගෙනැල්ලා දෙන්න. එහෙම නම් තමුන්නාන්සේලා ලැහැස්ති වෙන්න ගොවි බිමට ගිහිල්ලා බඩු ටික මිල දී ගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකද, ඒ වී ටික තමුන්නාන්සේලාගේ අර සුද්ද කරපු ගබඩාවලට අරගෙන එන්න ගියාම ගොවීන්ට සෑහෙන මුදලක් වැය වෙනවා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත - කමත්තොෆිල්, කාල්නඩෙ වළංකළ්, කාණි මර්‍රුම් නීර්ප්පාසන අමෛච්චර්)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
තව පොඩ්ඩකින් ක්‍රමය කියන්නම්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කියලා දෙන්න. හොඳයි.

ඒ නිසා මම කියන්න කැමැතියි, මේක රාජකාරී ක්‍රමය නොවන බව. ගොවීන්ට තර්ජනය කරලා මේ අමාරුවේ වැටිලා ඉන්න ගොවීන් තවත් විනාශ කරන්න එපා කියා ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු කේ.ඩී. ලාල්කාන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජයසිංහ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජයසිංහ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සඳහන් කළා, මම පන්සලකට පනින්න ගියා කියලා. ඒක නිවැරදි කරන්න ඕනෑ. මොකද, මේ සිද්ධිය පදනම් කරගෙන මම දැක්කා සමහර මාධ්‍ය නාළිකාත් උදේට පත්තර කියවන ගමන් මට විවිධ ප්‍රහාර එල්ල කරලා තිබුණා. නමුත් මම ඒවාට උත්තර දෙන්න ගියේ නැහැ. හැබැයි දයාසිරි මන්ත්‍රීතුමා, එතැන වෙච්ච සිද්ධිය මේකයි. පසුගිය කාලයේ රාජ්‍ය බලය පාවිච්චි කරගෙන මහින්ද රාජපක්ෂ ජනතාවගෙන් බලහත්කාරයෙන් අත්පත් කර ගත්තු ඉඩම් ප්‍රමාණයක් තමයි එතැන තිබෙන්නේ. ඒ නිසා තමයි ඒ ප්‍රදේශයේ ජනතාව ඒ ඉඩම පිළිබඳව විවිධ ප්‍රශ්න මතු කළේ. අපේ ආණ්ඩුව ආවාට පස්සේ දිගින් දිගටම අපට ඒ සම්බන්ධයෙන් පැමිණිලි කළා. ඒ ඉඩම තුළ නිධානයක් තිබෙනවා කියන අදහස ඇතුව ඒ ඉඩම බලහත්කාරයෙන් අත්පත් කර ගත්තා, ඔබතුමන්ලාත් නියෝජනය කරපු ආණ්ඩුවේ ඒ කාලයේ ඔබතුමන්ලාගේ නායකයා, මහින්ද රාජපක්ෂ. ඒක ඒ මුළු ප්‍රදේශයේම ප්‍රසිද්ධ කාරණයක්. ඒ නිසා තමයි ඒ ස්ථානයට මම ගිහිල්ලා- මම කඩා පනින්න ගියේ නැහැ. එතැන අපට අවසර දුන්නේ නැහැ; ගේට්ටුව ඇරියේ නැහැ. සිවිල් ආරක්ෂකයන් හිටියේ. ඒ අනුව අපි ආපහු හැරිලා ආවා. හැබැයි ඒ සිද්ධියෙන් පස්සේ මොකද වුණේ? මට අවශ්‍ය නම් දැන් එකින් එක හඬ පට දමලා පෙන්වන්න පුළුවන්. ඒ සිද්ධියෙන් පස්සේ ඒ ස්ථානයේ හිටපු ඒ ස්ථානය ගැන දන්නා විශාල පිරිසක් -සමහර ස්වාමීන් වහන්සේලාත් ඇතුළුව විශාල පිරිසක්- මට තොරතුරු ලබා දීලා තිබෙනවා. ඒ නිසා කලබල වෙන්න එපා. ඒ සම්බන්ධයෙන් මම දැන් CID එකෙන් විමර්ශනයක් ඉල්ලා තිබෙනවා. ඒ වාගේම ඒ ඉඩම පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් වාර්තාවක් ඉල්ලා තිබෙනවා, ඒ ඉඩම කා සතුව ද තිබුණේ, අත්පත් කර ගත්තේ කොහොමද කියලා වාර්තාවක් දෙන්න කියලා. ඒ නිසා මොන විධියේ අවලාද නැඟුවත් මම නිහඬව හිටියේ ඒ තොරතුරු ලැබෙනතුරු. ඒ නිසා ඔබතුමාට කියන්න ඕනෑ, පත්තරවල කිව්වාට, මාධ්‍යවල කිව්වාට ඒවා අල්ලාගෙන මේ පාර්ලිමේන්තුවේ, මේ ගරු සභාවේ එහෙම චෝදනා කරන්න සූදානම් වෙන්න එපා කියලා.

අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට කිසි ලෙසකින්වත් බෞද්ධ සිද්ධස්ථානවලට හෝ වෙනත් ආගමික සිද්ධස්ථානවලට හෝ බලහත්කාරයෙන් කඩා පනින්න හෝ එවැනි කටයුතුවලට මැදිහත් වෙන්න, ඇඟිලි ගහන්න කටයුතු කරන්නේ නැහැ. ඒක මුළු රටම දන්නවා. ඒ ස්ථානයේ තිබෙන්නේ වෙනම තත්ත්වයක්, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා තමයි මට සිදු වුණේ ඒ අවස්ථාවට සහභාගි වෙන්න.

ඒ වාගේම, ඔබතුමා සඳහන් කළා වැටුප් විෂමතා සම්බන්ධයෙන්. ඔබතුමන්ලා නියෝජනය කරපු ආණ්ඩු ගුරුවරයාගේ අවුරුදු විසි ගණනක වැටුප් විෂමතා ප්‍රශ්නය විසඳන්න සත පහක්වත් වියදම් කළේ නැහැ; වෙන් කළේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නියෝජ්‍ය ඇමතිතුමාට මේ තරම් කාලය දෙන්නේ කොහොමද? එතුමා කථාවක් කරනවා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කෙටියෙන් කියලා අවසන් කරන්න.

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංහ)
(The Hon. Mahinda Jayasinghe)
එසේ මුදල් වෙන් නොකර වැටුප් විෂමතා ඉවත් නොකරපු නිසා තමයි අරගළ කරලා ඒ වැටුප් විෂමතාවෙන් කොටසක් දිනා ගත්තේ. ඉදිරියේදී ඉතිරි ප්‍රශ්නත් විසඳන්න අපි මැදිහත් වෙන බව මම පැහැදිලිව ප්‍රකාශ කරනවා. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමා කොහොමද මේ තරම් වෙලාවක් කථා කරන්නේ? *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
එතුමාගේ නම කියැවුණා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමාගේ කථාවේදී මගේ නම සඳහන් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, අදාළ දේට එතුමා ඔබතුමාට උත්තර දුන්නා නේ. *[බාධා කිරීම්]*

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංහ)
(The Hon. Mahinda Jayasinghe)
මොකක්ද මේ කරන්නේ? අපේ නම් සඳහන් කර කර-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා මගේ නම සඳහන් කළා නේ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(මාණ්පුමිකු මහින්ද ජූයසිංහ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා කියපු එකට නේ මම උත්තර දුන්නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලාල් කාන්ත ඇමතිතුමා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලාල්කාන්ත ඇමතිතුමා. ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ සභාව වැරදි විධියට මෙහෙයවන්න හදන්න එපා. කරුණාකර මට විනාඩියක් දෙන්න. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ පිළිතුර ලබා දුන්නා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙතුමාට කථා කරන්න අවස්ථාව දෙනවාට අපි විරුද්ධයි. *[බාධා කිරීම්]* එහෙම කරන්න බැහැ. *[බාධා කිරීම්]* අපි විරුද්ධයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ නම සඳහන් කළා. ඒකයි මම කියන්නේ. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
එහෙම කථා කරන්න බැහැ. අපි විරුද්ධයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් නිහඬ වෙන්න. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නේ. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එහෙම අවස්ථාව දෙන්න බැහැ. අපි විරුද්ධයි. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න. එතුමා මගේ නම සඳහන් කළා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
එහෙම දෙන්න බැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කරුණාකර මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ ගැටලුවට පිළිතුරක් ලබා දුන්නා නේ. *[බාධා කිරීම්]* ගරු ලාල් කාන්ත ඇමතිතුමා කථාව ආරම්භ කරන්න. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක වැරැදියි.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙවර අය වැය සම්බන්ධයෙන් කිඹුල් කඳුළු හෙළන අපේක්ෂා භංගත්වයට පත් වෙච්ච විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන්ට උත්තර දෙන්න අවශ්‍ය වෙනවා.*[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේක වැරැදියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීවරුනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකක්ද මේ කරන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ ගැටලුවට උත්තරයක් දුන්නා නේ.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)
බොහෝ දෙනෙක් කථා කරනවා මාලිමාවට ඡන්දය දීපු ඡන්ද දායකයන් මේ අය වැයෙන් පසුව කනගාටුවට පත් වෙලා ඉන්නවා කියලා. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
පැය ගණන් දෙන්න බැහැ කථා කරන්න. *[බාධා කිරීම්]* එතුමා මගේ නම කිව්වා. *[බාධා කිරීම්]*

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ - වර්ත්තක, වාණිප, උණවුප් පාතුකාප්පු මර්‍රුම් කූට්ටුරවු අපිවිරුත්ති අමైච්චර්)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මගේ නමත් කිව්වා නේ. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම නියෝජ්‍ය ඇමතිතුමාගේ නම කිව්වේ නැහැ . *[බාධා කිරීම්]*

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)
ඒ වාගේම, මේ පාර අය වැයෙන් අපේ ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් කනගාටුවට පත් වෙලා ඉන්නවා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු කිඹුල් කඳුළු හෙළනවා අපට ඇහෙනවා. *[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු සට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම එතුමාගේ නම කිව්වේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
නිහඬව ඉඳගන්න. සභාව නිහඬ වෙන්න. සභාව නිහඬ වෙන්න. *[බාධා කිරීම්]*

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)
ඒ වාගේම තමයි, විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු උත්සාහ කරනවා, මේ ආර්ථිකයේ මූලධර්මය මොකක්ද කියලා අහගන්න. *[බාධා කිරීම්]* මූලධර්මය ගැන පැටලිලා ඉන්න,-*[බාධා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කථාවේදී කාගේවත් නමක් කිව්වේ නැහැ. "රාළහාමි" කියලා කිව්වේ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
නම කියැවුණා. [බාධා කිරීම්] නම කියැවුණා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunathilleka)
"රාළහාමි" කියපු එකට නියෝජ්‍ය ඇමතිතුමාට සෑහෙන්න වෙලාවක් දුන්නා, කරුණු පැහැදිලි කරන්න. *[බාධා කිරීම්]* කරුණාකර ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
එතුමාගේ නම කියැවුණා. [බාධා කිරීම්] ගරු ලාල්කාන්ත ඇමතිතුමා කථාව කරගෙන යන්න. [බාධා කිරීම්] සභාව දැන් නිහඬ වෙන්න. ගරු ඇමතිතුමාගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සොයා ගන්න බැරි වෙලා තිබෙනවා, අපේ අය වැයේ ආර්ථික හැඩය මොකක්ද කියලා. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීවරුනි, නිහඬ වෙන්න. *[බාධා කිරීම්]* සභාව නිහඬ වෙන්න.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)
අපේ අය වැයේ ආර්ථික මූලධර්මය සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුට ප්‍රශ්න තිබෙන බව පෙනෙනවා. *[බාධා කිරීම්]* මම බලාපොරොත්තු වෙනවා, ඒ ප්‍රශ්නවලට එක්තරා ආකාරයක උත්තරයක් දෙන්න. මොකද, දිගින් දිගටම අසත්‍ය කරුණු ප්‍රකාශ කරමින්,-*[බාධා කිරීම්]*

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.- *[Interruption.]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92- *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම ඒ සිද්ධිය සම්බන්ධයෙන් කිසි විටෙක ඒ නියෝජ්‍ය ඇමතිතුමාගේ නම කිව්වේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
නම කියැවුණා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි තයාසිරි ජූයසේක්කර)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හැබැයි, එතුමාගේ නම මම කිව්වා. ඒ කිව්වේ ගුරුවරුන් සම්බන්ධව මතු වුණු කාරණයේදී. නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා ඒකට උත්තරයක් දෙන්න. *[බාධා කිරීම්]* ඒකයි මම කිව්වේ. "රාළහාමි" කිව්වාම නැතිවලා ඕක කියන්න යන්න එපා. මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ; "රාළහාමි" කියලා කිව්වේ. මම ඒකයි කියන්නේ. රාළහාමිගේ වැඩේ කරන්න යන්න එපා. *[බාධා කිරීම්]* රාළහාමිගේ වැඩේ ගිය පාරත් කරන්න ගියා, කිහිප දෙනෙක්. ඒක වැරදියි. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා, මේ සභාවේ කාලය අපතේ අරින්න එපා. ගරු ලාල්කාන්ත ඇමතිතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]*

[පූ.භා. 11.02]

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත)
(The Hon. K.D. Lal Kantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙවර අය වැය සම්බන්ධයෙන් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු වාගේම මේ අය වැයට විරුද්ධව කථා කරන බොහෝ දෙනෙක් අසත්‍ය මත පළ කරමින් සිටිනවා.

වෙලාවකට ඇඩම් ස්මිත් ගැන කියනවා. තව වෙලාවකට කාල් මාක්ස් ගැන කියනවා. ඊයේත් කියනවා මම අහගෙන හිටියා. ඒ වාගේම, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය පිළිබඳ මතය පිළිගන්න අය මේ ගැන හරි සතුටින් ඉන්නවා කියනවා. මේ විධියට අපේ ආර්ථික මොඩලය මොකක්ද, අපේ අය වැයේ ආර්ථික මූලධර්මය මොකක්ද කියලා අඳුරේ අත පත ගාමින් දඟලන, හිතා ගන්න බැරුව වහසි බස් දොඩවන අයට උත්තරයක් දෙන්න ඕනෑ කියලා මම කල්පනා කළා.

විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට සහ එළියේ කෑ ගහන සමහර අයට පළමුව කියන්න ඕනෑ, අපි ඇඩම් ස්මිත් ප්‍රතික්ෂේප කරලා ගොඩක් කල් කියලා. එයාගේ වැඩ පිළිවෙළ, එයාගේ ආර්ථික ලිබරල්වාදය ආවාට පස්සේ ඉතාම ටික කාලයකින් යුරෝපයේ ජනතාවම, යුරෝපයේ විද්වතුන්ම එයා - ඒ ආර්ථික මොඩලය - ප්‍රතික්ෂේප කළා. මොකක්ද ඒ මූලධර්මය? "රජය ආර්ථිකයට සම්බන්ධ වෙන්නේ නැත." ඒ, ඇඩම් ස්මිත්ගේ මූලධර්මය. යුරෝපයෙන්ම එයා පැන්නුවා; යුරෝපයම එයා ප්‍රතික්ෂේප කළා. ඒ මූලධර්මය අපි භාර අරගෙන නැහැ. ඒක, පළමුවෙනි දේ. අපේ අය වැය තුළ ඒක මුළමනින්ම ප්‍රතික්ෂේප කර තිබෙනවා. අපේ රජය ආර්ථිකයට සම්බන්ධ වෙනවා. ඒක ඉතා පැහැදිලියි. ඉතා

පැහැදිලිව, අපේ රජය ආර්ථිකයට සම්බන්ධ වෙනවා. අපේ අය වැය පුරාම රජය ආර්ථිකයට සම්බන්ධ වෙන හැටි ප්‍රකාශයට පත් කරල තිබෙනවා. ඒ වාගේම, ඊයේ කාල් මාක්ස් ගැනත් කිව්වා. කාල් මාක්ස්ගේ "ප්‍රාග්ධනය" කෘතිය බිහි වුණේත් ඇඩම් ස්මිත් අසාර්ථක වෙච්ච නිසා. ඇඩම් ස්මිත් තමයි කාල් මාක්ස්ගේ "ප්‍රාග්ධනය" නම් වූ කෘතිය ඇති වෙන්න පදනම දැම්මේ. ඒක තමයි කථාව. ඒ නිසා ඇඩම් ස්මිත් ප්‍රතික්ෂේප කළා එයාගේම ගෝලයෝ; ඇඩම් ස්මිත්ගේම ගෝලයෝ.

මේ අය වැය විවාදය තුළ ලිබරල්වාදී ආර්ථිකය ගැන මේ ගරු සභාවේ කියපු නිසායි මම මේ කියන්නේ. මේවා මම කියන්න හිතාගෙන හිටපු ඒවා නොවෙයි. නමුත්, දැන් ඇති වෙච්ච සාකච්ඡාව නිසායි මේ කියන්නේ. එයාගේම ගෝලයෝ -ඇඩම් ස්මිත්ගේම ගෝලයෝ- 1800 ගණන්වල අග හරියට යනකොට සමාජ ලිබරල්වාදයක් ගැන කථා කරන්න පටන් ගත්තා. රජය ආර්ථිකයේ අත්‍යවශ්‍ය දේවල්වලට යම් පමණකින් සම්බන්ධ වෙන්න ඕනෑ කියලා සමාජ ලිබරල්වාදයක් ගැන කථා කළා. සමාජ ලිබරල්වාදයක් ආවේම ඇඩම් ස්මිත් අසාර්ථක වෙච්ච නිසා; සමාජ ප්‍රශ්නවලට උත්තර තිබ්බේ නැති නිසා. ඒ නිසා අපේ අය වැයේ ඇඩම් ස්මිත්ගේ සම්භාව්‍ය ලිබරල්වාදය නැහැ. ඒක අපි අයින් කරලා තිබෙන්නේ. ඊළඟට සමාජ ලිබරල්වාදයත් නැහැ, අපේ අය වැයේ. ඒකත් අපි අයින් කරලා තිබෙන්නේ.

සමාජ ලිබරල්වාදී කථාව එක්කම යුරෝපයේ තව කථාවක් ආවා, රජය සම්පූර්ණයෙන්ම ආර්ථිකයට සම්බන්ධ වෙන්න ඕනෑ කියලා. ඒ, සෝවියට් දේශය මූලික කරගෙන. ඒකත් අපි පිළිගන්නේ නැහැ. අපේ අය වැය දිහා බැලුවාම, ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා රජය මුළුමනින්ම ආර්ථිකයට සම්බන්ධ වෙන්නේ නැහැ කියලා. ඒක ඉතා පැහැදිලිව පෙනෙනවා, අපේ වැඩ පිළිවෙළ දිහා බැලුවාම. ආර්ථිකයට අපේ රජයේ මැදිහත්වීමකුත් තිබෙනවා. ඒ වාගේ තවත් මැදිහත්වීම් තිබෙනවා.

ඊළඟ කාරණය හැටියට නව ලිබරල්වාදයක් ගැන කථා කරනවා. නව ලිබරල්වාදය ගැන කථා කරනකොට කියනවා, මේක නව ලිබරල්වාදී අය වැයක් ලු. ආපහු නව කවුදෝ එළියේ කියලා තිබෙනවා මම දැක්කා, රජය ගොඩක් දේවල්වලට සම්බන්ධ වෙලා ලු. ආයෙත් කියනවා, මේක නව ලිබරල්වාදී ලු. නව ලිබරල්වාදී නම් රජය කොහොමද ආර්ථිකයට සම්බන්ධ වෙන්නේ? අපි රජයේ පංගුව වැඩි කරලා තිබෙනවා. නව ලිබරල්වාදයේ මූලධර්මය විධියට මොකක්ද ජේ.ආර්. ජයවර්ධන ගෙනාවේ? ඒ තමයි, රජය ක්‍රමානුකූලව මුළුමනින්ම ආර්ථිකයෙන් ඉවත් වීම. මුළුමනින්ම! ඇඩම් ස්මිත් හිටපු තැනට ආපහු යන්න තමයි රනිල් වික්‍රමසිංහ, ජේ.ආර්. ජයවර්ධනගෙන් පටන් අරගෙන ඉස්සරහට ආවේ. ඉතින් කියනවා, මේක රනිල් වික්‍රමසිංහගේ අය වැය ලු. රනිල් වික්‍රමසිංහගේ වැඩ පිළිවෙළක් තිබුණාද රජයේ ආර්ථිකය තියා ගන්න? නැහැ. එතුමා රජයේ ආර්ථිකය අකුළමින් ගියේ. අපි රජය අකුළන්නේ නැති බව මේ අය වැයෙන් ඉතා මැනවින් පෙන්නුම් කර දීලා තිබෙනවා. රජයේ ආර්ථිකය අපි අකුළන්නේ නැහැ.

ඒ වාගේම, රජයේ සේවකයෝ වැඩියි කිය කියා කෑගැහුවා. ඒක ඇත්ත. රජයේ සේවකයෝ වැඩි වෙලා තිබෙන්නේ කොහේද? ඉතා පැහැදිලියි, එක එක ඇමතිවරු තම තමන්ගේ ප්‍රදේශවලින් තම තමන්ට ඕනෑ අය බඳවා ගත්තා. ඒකත් කියලාම තමයි කියන්න ඕනෑ රජයේ සේවකයෝ වැඩියි කියලා. නමුත්, අපි පෙන්වා දීලා තිබෙනවා, රජයේ සේවකයෝ අත්‍යවශ්‍ය තැන්වලට බඳවා ගන්නවා කියලා; අත්‍යවශ්‍ය පුරප්පාඩු පුරවනවා කියලා.

ඒ අත්‍යවශ්‍ය පුරප්පාඩු පුරවන්න තමයි මේ වතාවේ දී පමණක් 30,000ක් රාජ්‍ය සේවකයෝ බඳවා ගන්න වැඩ පිළිවෙළක් අපි ගෙනැල්ලා තිබෙන්නේ.

ඊළඟට කියන්න ඕනෑ අපේ ආර්ථික මූලධර්මය මොකක්ද කියලා. මොකද ඒ ගැන අහනවා නේ. අද සමාජ ලිබරල්වාදීන් හරි සතුටින් ඉන්නවා ලු. දෙවන ලෝක යුද්ධයෙන් පස්සේ බටහිර ජර්මනිය පැත්තෙන් ආපු සමාජ ලිබරල්වාදී සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය ගැන අදාළ අය සතුටින් ඉන්නවා ලු. ඒ අය ඔක්කෝටම කියන්න තිබෙන්නේ මෙකයි. දැන් මොකක්ද අපේ ආර්ථික ප්‍රතිපත්තිය, අපේ ආර්ථික මූලධර්මය? අපේ ආර්ථික මූලධර්මය තමයි, "ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය." ඒක තමයි අපේ ආර්ථික මූලධර්මය. අපේ මුළු අය වැය පුරාම තිබෙන්නේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය.

මෙච්චර කාලයක් ආර්ථිකයට ප්‍රජාතන්ත්‍රවාදයක් දීලා තිබුණේ නැහැ. ආර්ථිකය භදා ගත්තේ ඒකාධිකාරියෙන්. ආර්ථිකය දුන්නේ යාළු මිත්‍රයන්ට; ගජ මිතුරන්ට. පොල් තෙල් ගෙනෙන්න දුන්නේ කිහිප දෙනාටයි. මට ඒ නම්, ගම් එක්කම කියන්නත් පුළුවන්. හාල් ව්‍යාපාරය පවත්වා ගෙන යන්න දුන්නේ කිහිප දෙනාටයි. ඒ, ගජ මිතුරන්ට. එහෙම තමයි ඔයගොල්ලෝ වැඩ කළේ. ඒ නිසා අපි ගෙනැල්ලා තිබෙනවා හැම කෙනෙක්ම ආර්ථිකයට සම්බන්ධ කර ගන්න මූලධර්මය. ඒ තමයි ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියන මූලධර්මය. ඒ නිසා තමයි රජයේ පංගුවට රජය සම්බන්ධ වෙන්නේ. රජයත් කොටසක් කරනවා. ඒකට අදාළ රජයේ පංගුව රජය ගන්නවා. රජය සාධාරණව ඒ පංගුව ගන්නවා. අපි ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ඒකට.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම විදේශ ආයෝජකයන්ටත් එන්න පුළුවන්. අපි කවදාවත් ඒ අය ප්‍රතික්ෂේප කරලා නැහැ. ආර්ථිකයට විදේශ ආයෝජකයෝ සම්බන්ධ වුණාම ඒගොල්ලන්ගේ සාධාරණ පංගුව ඒ ගොල්ලන්ට ලබා ගන්න පුළුවන්. අපේ සාධාරණ පංගුව අපි ලබා ගන්නවා. මම ආර්ථික ප්‍රජාන්ත්‍රවාදයේ මූලධර්මය කියන්නම් කාටත් දැන ගන්නත් එක්ක. ඒක තමයි අපේ අය වැයේ තිබෙන්නේ. හැම කෙනෙකුටම ආර්ථිකයට සම්බන්ධ වෙන්න පුළුවන්. සම්බන්ධ වෙන්න බැරි කවුරුත් නැහැ. තනි තනි පුද්ගලයන්ටත් ආර්ථිකයට සම්බන්ධ වෙන්න පුළුවන්. ඒ වාගේම සමුපකාරවලටත් ආර්ථිකයට සම්බන්ධ වෙන්න පුළුවන්. ඒක අපේ අය වැයේ තිබෙනවා. පෞද්ගලික අංශය, රජය, සමුපකාර, තනි තනි පුද්ගලයෝ, විදේශ ආයෝජන කියන මේ ඔක්කෝටම ආර්ථිකයට සම්බන්ධ වෙන්න පුළුවන්. ඒ සම්බන්ධ වෙන හැමෝටම තමන්ගේ සාධාරණ පංගුව ලබා ගන්න පුළුවන්. ඒක තමයි ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මය. ඒ මූලධර්මය මත පදනම් වෙලා තමයි මුදල් ඇමතිතුමා -ගරු ජනාධිපතිතුමා- මෙවර අය වැය ඉදිරිපත් කළේ. ඒක තවදුරටත් තහවුරු කරන්න ඕනෑ නම් කරුණු කියන්නම්.

ඇයි රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළේ? පසුගිය කාලයේ වැටුප් වැඩි කළේ නැහැ, අත්හැරලා දාලා තිබුණේ. මූලික වැටුප එක තැනමයි තිබුණේ. රජයේ සේවකයෙකුට වැටුප් වැඩි කරන්න ඕනෑ ජීවන වියදම ඉහළ යනකොට. මේ රටේ ජීවන වියදම විශාල වශයෙන් ඉහළ ගියා. රජයේ සේවකයෙකුට තනියම වැටුප් වැඩි කර ගන්න බැහැ. එහෙම නම් රජය මැදිහත් වෙලා තමයි වැටුප වැඩි කරන්න ඕනෑ. අපි මූලික වැටුප ඉහළ දැම්මා විතරක් නොවෙයි, මූලික වැටුප ඉහළ දානකොට තව බොහෝ දේවල් ඉහළ යනවා; තව බොහෝ දේවල් ඉහළ යනවා. ඒ වාගේම පෞද්ගලික අංශයේ මූලික වැටුපත් ඉහළ දාලා තිබෙනවා. ඇයි ඒ? ඒ අයත් ආර්ථිකයට දායක වෙනවා. අන්න, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය. රජයේ සේවකයෝ ආර්ථිකයට දායක වෙනවා, සම්බන්ධ වෙනවා. අන්න, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය. ආර්ථිකයට සම්බන්ධ වෙන හැම කෙනෙකුටම සාධාරණ පංගුවක් ලැබෙන්න ඕනෑ. ඔවුන්ගේ සාධාරණ පංගුව මෙච්චර කල් ලැබුණේ නැහැ. රජයේ සේවකයාගේ සාධාරණ පංගුව ලැබුණේ නැහැ. පෞද්ගලික අංශයේ සේවකයාගේත් සාධාරණ පංගුව ලැබුණේ නැහැ, ඒ

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

ගොල්ලන් ආර්ථිකයට දායක වුණාට. අපේ වතු ජනතාවට සාධාරණ පංගුව හම්බ වුණේ නැහැ, ඔවුන් ආර්ථිකයට දායක වුණාට. ඒ වාගේම අපේ විශ්‍රාමිකයන්ට සාධාරණ පංගුව හම්බ වුණේ නැහැ. ඒ සාධාරණ පංගුව ඔවුන්ට ලබා දීම මූලික කරගෙන තමයි මෙවර විශ්‍රාමිකයන් ඇතුළු පෞද්ගලික අංශයේත්, වතු ක්ෂේත්‍රයේත්, රාජ්‍ය අංශයේත් හැමෝගේම වැටුප් වැඩි කිරීමක් කරලා තිබෙන්නේ අන්න ඒ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය මත. ඒක ඇඩම් ස්මිත්ගේ මොකක් හරි එකක් නොවෙයි. ඒක සමාජ ලිබරල්වාදීන්ගේ මොකක් හරි එකක් නොවෙයි. ඒක සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය පිළිගන්නා, මම ඉදිරියේ ඉන්න කෙනාගේ ජාතියේ එකක් නොවෙයි.

අපට පෙනෙනවා මුදල් ඇමතිවරු වෙන්න බලා ගෙන ඉඳලා අපේක්ෂා භංගත්වයට පත් වුණාට පස්සේ, අපේ සාමාජිකයෝ අපේක්ෂා භංගත්වයට පත් වෙලා ඉන්නවා කියලා මෙතැන කිඹුල් කඳුළු හලන අය. එහෙම අය අපට පෙනෙනවා. අපේ සාමාජිකත්වය හෝ මිය ගිය අය ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තමයි ඉල්ලුවේ. ඕනෑ නම් සමාජවාදයේ ආර්ථික මූලධර්මයත් කියන්නම්, අපේ අය දැන් සතුටින් ද ඉන්නේ අසතුටෙන්ද ඉන්නේ කියලා කියන්න.

සමාජවාදී ආර්ථික මූලධර්ම කියන්නේ මොකක්ද? ජනතාව ආර්ථිකයට සම්බන්ධ වෙනවා, තමන්ගේ සාධාරණ පංගුව තමන්ට ලැබෙනවා. ඒක තමයි සමාජවාදී ආර්ථික මූලධර්මය. ආර්ථිකයට හැමෝම සම්බන්ධ කර ගන්නවා, සම්බන්ධ කර ගන්නා අයට තමන්ගේ සාධාරණ පංගුව ලැබෙනවා. වෙන මොකවත් ලැබෙන්නේ නැහැ. වැඩිපුර ලැබෙන්නේත් නැහැ, අඩුවෙන් ලැබෙන්නේත් නැහැ. ඒක තමයි සමාජවාදී ආර්ථික මූලධර්මය. ඒක වාමාංශිකයි.

එතකොට, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය කියන්නේ මොකක්ද? හැම කෙනෙකුම ආර්ථිකයට සම්බන්ධ කර ගන්නවා, ඒ අයගේ සාධාරණ පංගුව ඒ අයට ලැබෙනවා. ඕනෑ නම් කෙනෙකුට කියන්න පුළුවන්නේ, "එහෙම නම් මේ අය වැයෙන් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ, සමාජවාදී ආර්ථික මූලධර්මය" කියලා. ආර්ථිකයට සම්බන්ධ වන අයට තමන්ගේ පංගුව ලැබෙන්න ඕනෑ. පසුගිය කාලයේ ලැබුණේ නැහැ. ඒ නිසා ආරම්භයක් විධියට, සමාජ අසාධාරණයන්ට ලක් වුණු සියලුම කණ්ඩායම්වලට සාධාරණය ඉෂ්ට කිරීමට අදාළ පළමු පියවර අපේ පළමු අය වැයෙන් තියලා තිබෙනවා. අපි ඊළඟ අය වැයෙන් දෙවැනි පියවරත් තියනවාය කියන කාරණය මේ අවස්ථාවේ හැමෝටම මතක් කරන්න ඕනෑ. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මය මත අපි ඒ ගමන ඉස්සරහට යනවා.

සමාජයේ අසාධාරණයට ලක්වෙලා හිටපු, පීඩාවට පත්වෙලා හිටපු සෑම ජන කොටසකටම මේ අය වැයෙන් ඔවුන්ට හිමි සාධාරණ පංගුව දෙන්න උත්සාහ කරලා තිබෙනවා. පොඩ්ඩක් අඩන අය සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඉන්නවා. ඒ වාගේම තවත් ක්ෂේත්‍රවල ඉන්නවා. ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නය වෙන මොකුත් නොවෙයි, ඒ ගොල්ලන්ට ලැබිලා තිබෙනවා, නමුත් සමහර අයට ලැබුණු ප්‍රමාණයට ඒ ගොල්ලන්ට ලැබිලා නැති වූ. සමහර වෙලාවට විශ්වවිද්‍යාල පැත්තෙනුත් ඒ වගේ කථාවක් ඇහෙනවා. මොකක්ද, ඇහෙන්නේ? තමන්ට ලැබිලා තිබෙනවා, වැඩිවෙලා තිබෙනවා. නමුත් තව සමහර අයට වැඩි වුණු විධියට ඒ ගොල්ලන්ට වැඩිවෙලා නැති වූ. ඒක තමයි අපේ මූලධර්මය. වැඩි වෙන්න ඕනෑ අයට වැඩි කරනවා. අසාධාරණයට ලක්වෙලා හිටපු අය ඒ අසාධාරණයෙන් මුදා ගන්න අමතර ගණනක් වැඩි කරනවා.

අද මෙතැන බොහෝ මන්ත්‍රීවරු නැඟිටලා කථා කළා. ඒ අතරින් මීට ටිකකට කලින් කථා කරපු එක් මන්ත්‍රීවරයෙක් කිව්වා, ගොවි ජනතාව අසාධාරණයට පත්වෙලා වූ; ගොවි ජනතාව පීඩාවට පත්වෙලා වූ. මෑත කාලයේ අපි ගත් උපක්‍රම මත - උපායමාර්ග මත- ගොවීන්ට වී කිලෝ එකකට ගන්න පුළුවන් වැඩිම මිල ලබා ගනිමින් ඉන්නවා. නිෂ්පාදන වියදමත් එක්ක බලනකොට මේ මාස් කන්නයේ ලාභය වශයෙන් ඔවුන්ට ලබාගත හැකි වැඩිම මිල මෙවර ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. 2024-2025 මාස් කන්නයේදී වී මිල අඩුවෙලා කියලා අඬන්නේ නැති ගොවි ජනතාවක් බිහි කරන්න වර්තමාන පාලනය යටතේ පළමුවැනි වතාවට පුළුවන් වෙලා තිබෙනවා. අපේ වී මිල අඩුයි කියලා කිසි කෙනෙක් එළියට බහින්නේ නැහැ; අපේ වී මිල ප්‍රමාණවත් නැහැ කියලා කිසි කෙනෙක් එළියට බහින්නේ නැහැ. එවැනි කිසි දෙයක් නැහැ. අපි මිල තීරණය කරලා තිබෙන්නේ කොහොමද? අන්න, ආර්ථිකය හසුරුවන්න රජය මැදිහත් වෙලා තිබෙනවා.

නාඩු වී කිලෝවක් රුපියල් 120ට වඩා අඩු වෙන්න බැහැ, වැඩි වෙන්න පුළුවන්. ඉතින්, ගොවියාට හොඳයි නේ. නාඩු සහල් කිලෝවක් රුපියල් 230ට වඩා වැඩි වෙන්න බැහැ. නමුත් අඩු වෙන්න පුළුවන්. ඉතින්, පාරිභෝගිකයාට හොඳයි නේ. කොහේදෝ ගොවි නායකයෙක් කියනවා මම දැක්කා, වී කිලෝ එකක් රුපියල් 120ට ගන්නකොට සහල් කිලෝවක් රුපියල් 230ට වඩා අඩුවෙන් විකුණන්න පුළුවන් ලු. 230ට වඩා අඩුවෙන් විකුණන්න පුළුවන් නම්, සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට වී ටික දෙන්න. ඒක හොඳයි නේ. ඒකට බාධාවක් නැහැනේ. එහෙම නම් අපි මාජින් එකක් තියලා තිබෙන්නේ, නිදහසේ හැසිරෙන්න පුළුවන් වන විධියට. නාඩු වී කිලෝවක් රුපියල් 120ට වඩා අඩු වෙන්න ඉඩ තියලා නැහැ, ඒ වාගේම නාඩු සහල් කිලෝවක් රුපියල් 230ට වඩා වැඩි වෙන්න ඉඩ තියලාත් නැහැ. එතකොට, ඒ අතර උච්ඡාවචනය වෙන්න -වෙළෙඳ පොළට හැසිරෙන්න- ඉඩ තියලා තිබෙනවා. ඒක තමයි මෙතැන තිබෙන වැඩ පිළිවෙළ. එවැනි වැඩ පිළිවෙළක් මීට කලින් ගෙනැල්ලා නැහැ.

සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය පිළිගන්න අයට කියන්න ඕනෑ, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් නම් තිබෙන්නේ; ඒ ක්‍රමය නම් ක්‍රියාත්මක කරන්නේ, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය යටතේ වී අලෙවි මණ්ඩලය වී මිලදී ගන්නේ නැහැ. එහෙම නම්, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය යටතේ මොකක්ද වෙන්නේ? මම දන්නේ නැහැ. ඝඅබයේ ආර්ථික ප්‍රතිපත්තිය, සමාජ වෙළෙඳ පොළ ආර්ථිකය කියලා ඇතැම් අවස්ථාවල කියන්න හදපු අය ඉන්නවා. සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් නම් තිබෙන්නේ, රජය ආර්ථිකයට යම් ආකාරයක මැදිහත් වීමක් කළත්, රජය සෘජුව මැදිහත් වෙලා ආර්ථිකයේ කොටස්කාරයෙක් බවට පත් වෙන්නේ නැහැ. ඒ නිසා මේක සමාජ වෙළෙඳ පොළ ආර්ථිකයක් නොවෙයි.

ඇඩම් ස්මිත්ගේ සම්භාව්‍ය ලිබරල්වාදයත් නොවෙයි; ඒ වාගේම සමාජ ලිබරල්වාදයත් නොවෙයි; මේක නව ලිබරල්වාදයත් නොවෙයි. රටම හොඳට අහගන්න. මේක "ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය". ලංකාවට ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ගෙනෙන්න ආරම්භ කරපු පළමුවැනි වාමාංශික, ජනතාවාදී, ප්‍රගතිශීලී අය වැය තමයි අපේ ජනාධිපතිතුමා මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා වටේ කැරකෙන්න හංගලා ගහන්න නෙමෙයි. පන්සල්, පල්ලි වැනි ආගමික මූලධර්ම ආර්ථිකයට ගළපන්න බැහැ. ඒවා ආගමට අදාළ ඒවා. ආගමික මූලධර්ම ආර්ථිකයට ගළපන්නේ කොහොමද? ආගමික උදාහරණ, ආර්ථිකයට උදාහරණ හැටියට ගෙනෙන්නේ කොහොමද ? ඒවා වලංගු නැහැ. ඒ නිසා ඉතා නිවැරදිව අපි මේකෙදි කටයුතු කරලා

තිබෙනවා. අසාධාරණයට ලක් වෙච්ච රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයෝ ඊට අමතරව සමාජය තුළ අධික ලෙස පීඩාවට පත් වෙලා සිටින ජන කණ්ඩායම් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වලා අවශ්‍ය කටයුතු ඉටු කර තිබෙනවා.

අපි හැම දාම පීඩිත ජනතාව නියෝජනය කළා. මාලිමාව බිහිවෙන්නේම පීඩිත ජනතාව මූලික කරගෙන, අයුක්තියට, අසාධාරණයට ලක් වෙච්ච ජනතාව මූලික කරගෙන. මේ අය වැය පුරාම ඒ ජනතාව කෙරෙහි තිබෙන අවධානය ඉතා මැනවින් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඒක තමයි මූලික පදනම. ඒ අනුව මේක පීඩිත ජනතාවගේ වුවමනාවන් ප්‍රමුඛ කොට ගත්ත අය වැයක් විධියටත් අවශ්‍ය නම් කෙනෙකුට අර්ථ දක්වන්න පුළුවන්. ධනපති පන්තිය දැන් සතුටු වෙනවා ලු. ඒ ගොල්ලො ලු දැන් මේකෙන් සතුටට පත් වෙලා තිබෙන්නේ. ඒ අයට සතුටට පත් වෙන්න අමුතු දෙයක් නැහැ. හැබැයි අපි ඒ ගොල්ලන්ව බැහැර කරලාත් නැහැ. ඒකත් අපි කියන්න ඕනෑ. මොනවා කළත්, ඒ ගොල්ලන්ව බැහැර කරලා නැහැ. විදේශ ආයෝජකයන්ට එන්න පුළුවන් නම්, දේශීය ආයෝජකයන්ට ඉදිරිපත් වෙන්න පුළුවන් නම්, ඒ ගොල්ලන්ට ඉඩ දීලා තිබෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කිව්වාම ඒ ගොල්ලන්ටත් හරි. ඒ ගොල්ලන්ගේ වැරැද්දක් නැහැ. ආර්ථික මූලධර්ම මොනවාද කියලා එහෙන් මෙහෙන් අතගාපු අයට තමයි අද මම මේ අය වැයෙන් උත්තර දුන්නේ.

ආර්ථික මූලධර්ම models ගණනාවක නම් කියනවා. ලෝකයේ ක්‍රියාත්මක වෙච්ච ඇඩම් ස්මිත්ගේ සම්භාව්‍ය ලිබරල්වාදය අපිට එපා. එයාගේම ගෝලයෝ ගෙනාපු සමාජ ලිබරල්වාදය අපට එපා. රනිල් වික්‍රමසිංහගේ ගෝලයෝ බවට පත් වෙලා හිටපු නව ලිබරල්වාදීන් අපට අදාළ නැහැ. ඒ එකක්වත් අපට අදාළ නැහැ. සමාජවාදය ලෙස එක කාලයක් ක්‍රියාත්මක වෙච්ච, රජය මුළුමනින්ම ආර්ථිකය බදාගන්න එකද - ඒකත් අපට අදාළ නැහැ. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය අපට අදාළයි. ලංකාවේ පළමුවැනි වතාවට ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය මූලධර්මය කරගත්ත, මූලධර්මය බවට පත් කරපු අය වැයක් ඉදිරිපත් කිරීමේ ගෞරවය අපේ ජනාධිපති; මුදල් ඇමති අනුර දිසානායක සහෝදරයාට හිමි වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කளின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් ලැබෙනවා.

[மு.ப. 11.23]

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 79ஆவது வரவு செலவுத்திட்டத்தின் இரண்டாம் மதிப்பீட்டின் மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தின் மொத்த ஒதுக்கீடான 4,218.2 பில்லியன் ரூபாயில் 69 சதவீதம் Recurrent Expenditure என்று சொல்லப்படுகின்ற நடைமுறைச் செலவுகளுக்கும், 31 சதவீதம் Capital Expenditureக்கும் ஒதுக்கப்பட்டு இருக்கின்றது. நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்காக இந்த வரவு செலவுத்திட்டத்தின் மூலம் எவ்வாறான செயற்றிட்டங்களுக்கு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது என்று பார்ப்போம். மிக முக்கியமாக, மொத்த ஒதுக்கீட்டில் சுகாதாரத்துறைக்கு 12 சதவீதத்தையும் கல்வித்துறைக்கு 6.4 சதவீதத்தையும் ஒதுக்கியதையும், அந்தத் துறைகளை அபிவிருத்தி செய்வதற்காக அரசாங்கம் மேற்கொண்டுள்ள முயற்சிகளையும் நான் வரவேற்கின்றேன். முப்பது வருடங்களுக்கும் மேலாக யுத்தத்தால் பாதிக்கப்பட்ட வட, கிழக்குப் பகுதிகளின் குறிப்பாக, வட பகுதியின் மீள்கட்டுமான நடவடிக்கைகளுக்காக நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. அதற்காக எனது நன்றியையும் பாராட்டுக்களையும் தெரிவித்துக் கொள்கின்றேன். அதனோடு இணைந்த கிழக்கு மாகாணத்தில் மட்டக்களப்பு மாவட்டத்துக்கும் அவ்வாறான நிதி ஒதுக்கீடு செய்யப்பட வேண்டிய தேவை இருக்கின்றது என்பதையும் நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இந்த அரசாங்கத்தின் வரவு செலவுத்திட்டத்தில் வட பகுதி மற்றும் மலையகப் பகுதிக்கு நிதி ஒதுக்கப்பட்டமையை உண்மையிலேயே நாங்கள் பாராட்ட வேண்டும். கடந்த காலங்களில் தட்டிக்கழிக்கப்பட்ட, ஒதுக்கப்பட்ட விடயங்களை முன்னுரிமைப்படுத்தியமைக்காக எனது பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். மேற்குறித்த பாதிப்பை கிழக்கு மாகாணமும் சந்தித்திருக்கிறது. குறிப்பாக, மட்டக்களப்பு மாவட்டம் சந்தித்திருக்கிறது. நேற்று எமது சக பாராளுமன்ற உறுப்பினர் அவர்கள், மட்டக்களப்பின் நில அமைப்பு மற்றும் அதன் பொருளாதார விடயங்கள் பற்றித் தெரிவித்திருந்தார். அந்த விடயங்களை நான் மீண்டுமொரு முறை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

மட்டக்களப்பு மாவட்டமானது மிகப் பெரிய நிலப்பரப்பைக் கொண்டிருக்கின்றது. மிக முக்கியமாக, அங்குள்ள கடல் நீரேரியானது அந்த மாவட்டத்தை இரண்டு பகுதிகளாகப் பிரித்திருக்கின்றது. அது கிழக்கு, மேற்காக அதாவது, எழுவான்கரை, படுவான்கரை எனப் பிரிக்கப்பட்டு இருக்கின்றது. மேற்குப் பகுதியான படுவான்கரை பிரதேசம் பாரிய நிலப்பரப்பைக் கொண்டிருக்கின்றது. அங்குதான் பாரிய வயல் நிலங்கள், குளங்கள் என்பன அதிகமாக இருக்கின்றன. கடந்த யுத்த காலத்தில் அந்தப் பகுதி அரசின் கட்டுப்பாட்டின்கீழ் இருக்காத காரணத்தால், அங்கு அபிவிருத்தித் திட்டங்கள் அதிகளவிலோ, முக்கியமான அடிப்படையிலோ இடம்பெற்று இருக்கவில்லை. நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்பவேண்டிய, எமது விவசாயத்துறையை மேம்படுத்தவேண்டிய தேவையிருக்கின்ற இந்தக் காலகட்டத்தில் விவசாயத் துறைக்கு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டத்தின் படுவான்கரை பகுதியில் இருக்கின்ற விவசாய நிலங்களை விஸ்தரிக்கவும் குளங்களைப் புனருத்தாரணம் செய்யவும் தேவையிருப்பதால், அந்தத் திட்டங்களுக்கு முன்னுரிமை அளிக்கவேண்டி இருக்கின்றது. படுவான்கரை, எழுவான்கரை பகுதிகளை அதாவது, மட்டக்களப்பின் கிழக்கு, மேற்குப் பகுதிகளை இணைப்பதற்கான பாலங்களை மிக உறுதியாகவும் நிரந்தரமாகவும் கட்டியமைக்க வேண்டும். மட்டக்களப்பின் படுவான்கரை, வாகரைப் பிரதேசங்களில் ஒன்றரை இலட்சத்துக்கும் மேற்பட்ட மக்கள் வாழுகின்ற காரணத்தாலும், அந்த இடங்களில் பொருளாதாரத்தை முன்னேற்றக்கூடிய வளங்கள் அதிகமாக இருக்கின்ற காரணத்தாலும், வரவு செலவுத்திட்டத்தின் மூலம் துறைசார்ந்த அமைச்சுகளினூடாக அதிகளவு நிதியை ஒதுக்கவேண்டிய தேவை இருக்கிறது என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

[ගරු (වෛද්‍ය) ඉලෙයතම්බි සිරිනාත් මහතා]

எமது பிரதேசமானது, வருடாந்தம் வெள்ள அனர்த்தத்துக்கு உட்படுகின்றது. இதனால் வெள்ள நிவாரணத்துக்கென அதிகளவு நிதியை ஒதுக்கீடு செய்யவேண்டிய தேவையிருக்கின்றது. நாம் கடந்த பல அமர்வுகளில் இது சம்பந்தமான ஒரு விடயத்தை முன்வைத்திருந்தோம். இந்த வெள்ள நிலைமையைக் கட்டுப்படுத்துவதற்குரிய நடவடிக்கையாக கித்துள், றூகம் ஆகிய குளங்களின் இணைப்பு முன்மொழியப்பட்டு இருந்தது. அதற்குரிய செயற்பாடுகள் இப்போது மந்த கதியிலேயே இடம்பெறுகின்றன. அதாவது, அதை நடைமுறைப்படுத்துவதற்கான சாத்தியம் இருப்பதாக ஒரு தெளிவான பதில் கிடைக்கவில்லை. இந்த கித்துள்-றூகம் திட்டத்தை முன்னெடுப்பதன்மூலம் எமது மாவட்டத்தில் மேலும் 8,000 - 10,000 ஏக்கர் காணியில் பயிர்ச்செய்கை மேற்கொள்ள முடியும். ஒவ்வொரு வருடமும் கித்துள், றூகம் குளங்களிலிருந்து அதிகளவு நீர் வெளியேற்றப்படுகின்றது. கடந்த வருடம் அவற்றிலிருந்து 85,000க்கும் மேற்பட்ட கனஅடி நீர் வெளியேற்றப்பட்டமையால், அங்கு பாரிய வெள்ளப்பெருக்கு ஏற்பட்டு, பல கிராமங்கள் வெள்ள நீரில் மூழ்கின. அதனால் பாரிய நட்டஈட்டைக் கொடுக்க வேண்டிய தேவையும் ஏற்பட்டது.

எதிர்காலத்தில் அங்கு குடிநீர்ப் பிரச்சினை பாரிய பிரச்சினையாக உருவெடுக்க இருக்கின்றது. ஏனெனில், அங்குள்ள மக்கள் உன்னிச்சைக் குள குடிநீர் திட்டத்தை மட்டுமே நம்பியிருக்கின்றார்கள். எனவே, அங்கு வெள்ள அனர்த்தத்தைத் தடுப்பதற்கும், பாரியளவில் பயிர்ச்செய்கையை மேற்கொள்வதற்கும், எதிர்காலத்தில் ஏற்பட இருக்கின்ற குடிநீர்ப் பிரச்சினையைத் தடுப்பதற்கும் கித்துள்-றூகம் திட்டத்தை வரவு செலவுத்திட்டத்தில் உள்வாங்கியிருக்க வேண்டும் என்பதே எங்களுடைய எதிர்பார்ப்பாக இருந்தது. அதற்குரிய செயற்பாடுகளை எதிர்வரும் காலங்களில் குறித்த அமைச்சினூடாக முன்னெடுக்க வேண்டும் என்ற கோரிக்கையை நான் இவ்விடத்தில் முன்வைக்க விரும்புகின்றேன்.

அங்கு வெள்ளப்பெருக்கு ஏற்படுவதற்கு இன்னுமொரு காரணம், அங்கிருக்கின்ற வாவியின் ஆழம் குறைந்திருப்பதுதான். வாவி அமைந்திருக்கின்ற பிரதேசம் பிரபல்யமான ஒரு சுற்றுலாத் தளமாகும். மட்டக்களப்பு என்று சொல்லும்போது 'பாடும் மீன்கள்' இருக்குமிடம் என்று சொல்வார்கள். அங்கு சுற்றுலாத்துறையை மேம்படுத்துவதற்காக அந்த வாவியைச் சுத்தப்படுத்தி, ஆழப்படுத்த வேண்டிய தேவை இருக்கின்றது. அதனோடு இணைந்ததாக கிரான் பாலம் ஓர் அணைக்கட்டு போன்று சிறிய குழாய்கள்மூலம் அமைக்கப்பட்டு இருக்கின்றது. அந்தப் பாலத்தை முறையாகச் செப்பனிடுவதன்மூலம் பாரிய வெள்ளப்பெருக்கைத் தவிர்க்கலாம். கித்துள், றூகம் குளங்களின் இணைப்புத் திட்டம், கிரான் பாலத்தை அபிவிருத்தி செய்தல், கடல் நீரேரியை ஆழப்படுத்துதல் அல்லது அதனைச் சுத்தப்படுத்துதல் ஆகியவற்றைச் செய்வதன்மூலம் அங்கு பாரிய வெள்ளப்பெருக்கு ஏற்படுவதைத் தவிர்க்க முடியும். அதனால் ஒவ்வொரு வருடமும் பாரிய நட்டஈட்டை அரசு செலுத்த வேண்டிய தேவை ஏற்படாது. இது தொடர்பில் ஆய்வு ரீதியான முடிவுகள் இருக்கின்றன. எனவே, இந்த விடயங்களை அரசு கருத்திற்கொள்ள வேண்டுமென நாங்கள் மிக விநயமாகக் கேட்டுக் கொள்கின்றோம்.

மட்டக்களப்பு மாவட்டத்தின் படுவான்கரை மக்கள் பல்வேறுபட்ட துன்பங்களை எதிர்கொண்டு இருக்கிறார்கள். யுத்த காலத்திலும் சரி, அனர்த்த காலங்களிலும் சரி, அவர்களுக்குத் தேவையான வசதிகள் செய்து கொடுக்கப்படவில்லை என்பதை நீங்கள் தெரிந்துகொள்ள வேண்டிய தேவை இருக்கின்றது. எமது மாவட்டம் பிரதானமாக விவசாயம், கடற்றொழில், கால்நடை வளர்ப்பு போன்றவற்றையே நம்பி இருக்கின்றது. இவ்வாறான பாரிய வளங்கள் இருக்கின்றபோதிலும் அந்த மாவட்டம் இன்னும் வறுமையிலேயே இருக்கின்றது. இதற்கான மூலோபாயத் திட்டங்கள் வகுக்கப்பட்டு, செயற்படுத்தப்பட்டு இருக்கின்றனவா அல்லது வளங்களைப் பயன்படுத்தி தேசியளவில் செயற்றிட்டங்கள் முன்னெடுக்கப்பட்டு இருக்கின்றனவா என்பது கேள்விக்குரியாகவே இருக்கின்றது. நீர்ப்பாசனக் குளங்களை அபிவிருத்தி செய்தல், வயல் நிலங்களுக்கு ஒழுங்கான நீர்ப்பாசன முறையைச் செய்தல் போன்ற செயற்றிட்டங்களூடாக அங்கு விவசாயச் செய்கையை மேம்படுத்த முடியும்.

அங்கு கடற்றொழில்சார் பிரச்சினைகளும் இருக்கின்றன. அது தொடர்பில் இங்கு எங்களுடைய பல உறுப்பினர்கள் பேசி இருக்கின்றார்கள். அங்கு வாழைச்சேனையில் மட்டும்தான் மீன்பிடித் துறைமுகம் ஒன்று இருக்கின்றது. மிக நீளமான கடற்பகுதியைக் கொண்டிருக்கின்ற மட்டக்களப்பு மாவட்டத்தின் பல்வேறு இடங்களிலும் மீன்பிடித் துறைமுகங்களை அமைக்கவேண்டிய தேவை இருக்கின்றது. வாகரை, களுவன்கேணி, களுவாஞ்சிக்குடியை அண்டிய பிரதேசங்களில் மீன்பிடித் துறைமுகங்களை அமைப்பதற்கான நடவடிக்கைகளையும் சாத்தியவள ஆய்வுகளையும் கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சு முன்னெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் கால்நடைகளின் உற்பத்தியைப் பெருக்குவதற்காக எந்தவிதமான நீண்டகாலத் திட்டமும் இல்லை. அங்கு கால்நடைகளுக்கான மேய்ச்சல் தரையே பாரிய பிரச்சினையாக இருக்கின்றது. அங்கு இலட்சக்கணக்கான கால்நடைகள் இருந்தும், அதற்குரிய பருவ காலங்களில் மேய்ச்சல் தரைகளைப் பெற்றுக்கொள்வது கடந்த அரசாங்க காலங்களில் பாரிய பிரச்சினையாக இருந்திருக்கிறது. மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரைப் பிரச்சினை இன்னும் முற்றுமுழுதாகத் தீர்க்கப்படவில்லை. இந்தப் புதிய அரசாங்கத்தில் அதற்குரிய தீர்வுகள் எட்டப்பட்டு, அதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டால், எமது கால்நடை வளத்தை அதிகரிக்க முடியும். அதன்மூலம் பால் உற்பத்தியைப் பெருக்கி, பொருளாதாரத்துக்குப் பாரிய பங்களிப்பைச் செய்யலாம் என்பதையும் நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

எங்களுடைய மாவட்டத்தில் ஒவ்வொரு வருடமும் மழை காலத்தில் மேட்டு நிலப் பயிர்ச்செய்கை அதிகளவு பாதிப்பைச் சந்திக்கின்றது. மரக்கறிச் செய்கை மற்றும் தென்னைச் செய்கைக்கு ஏற்படுகின்ற பாதிப்புகளுக்கு இழப்பீடு கொடுப்பதற்கு இதுவரை எந்தவிதமான நடைமுறையும் இல்லை.

கடந்த முறை எங்களுடைய மேட்டுநில மரக்கறிச் செய்கையாளர்கள் வெள்ள அனர்த்தத்தால் பாரிய நஷ்டங்களை எதிர்கொண்டார்கள். எனினும், அவர்களுக்கு எந்தவிதமான நட்டஈடும் கிடைக்கவில்லை. எனவே, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சினூடாக இதற்கென ஒரு தீர்வுத் திட்டம்

ஏற்படுத்தப்பட வேண்டும். மட்டக்களப்பு மாவட்டம் கரையோரப் பிரதேசமாக இருப்பதனாலும், ஒவ்வொரு வருடமும் பருவப்பெயர்ச்சி மழையின்போது ஏற்படுகின்ற வெள்ள அனர்த்தத்தாலும், இந்த மேட்டுநிலப் பயிர்ச்செய்கை பாரியளவில் பாதிக்கப்படுகின்றது. அந்த விவசாயிகள் ஒவ்வொரு முறையும் இழப்புகளைச் சந்தித்து வருகின்றார்கள். எனினும், அவர்களுக்கான இழப்பீடுகளை வழங்குவதற்கான எந்தத் திட்ட நடைமுறையும் இல்லை.

விவசாயம், மீன்பிடி, கால்நடை வளர்ப்பு ஆகியவற்றை நம்பியிருக்கின்ற எங்களுடைய மாவட்டத்தில், உற்பத்திப் பொருளாதாரத்தின் அடிப்படையில் காகிதத் தொழிற்சாலையொன்று கடந்த பல வருடங்களுக்கு முன்னர் இயங்கியது. இப்போது அது மந்த கதியிலேயே இயங்குகின்றது. அதாவது, வினைத்திறனான முறையில் இயங்குவதில்லை. இந்தக் காகித ஆலை தொடர்பில் பல சந்தர்ப்பங்களில் பல்வேறு விடயங்கள் முன்வைக்கப்பட்ட போதும், இந்த வரவு செலவுத்திட்டத்தில் அதற்கான ஏதாவது முன்னெடுப்பு எடுக்கப்பட்டிருக்கின்றதா என்பதற்கான உறுதிப்பாடுகள் எதுவும் எங்களுக்குத் தென்படவில்லை. வேலைவாய்ப்புகளைக் கொடுக்கக்கூடிய வகையிலும், நாட்டின் பொருளாதாரத்துக்கான செயற்றிட்டத்தை முன்னெடுக்கக்கூடிய வகையிலும், மாண்புமிகு சனாதிபதி அவர்களால் பல தொழிற்சாலைகள் தொடர்பில் முன்மொழிவுகள் முன்வைக்கப்பட்டுள்ள போதிலும், மட்டக்களப்பு மாவட்டத்தில் அவ்வாறான ஒரு நிலைமையை ஏற்படுத்துவதற்கான முன்மொழிவுகள் எதுவும் முன்வைக்கப்படவில்லை. குறிப்பாக, கடந்த காலத்தில் இயங்கிய தொழிற்சாலையைக்கூட திருத்தி, முழுமையாக இயங்கவைப்பதற்கான முன்மொழிவுகள் எதுவும் இல்லை. எமது மாவட்டத்திலுள்ள இளைஞர் - யுவதிகள் பொருளாதாரத்துக்காக மத்திய கிழக்கு நாடுகளுக்கும் ஏனைய நாடுகளுக்கும் செல்லவேண்டிய நிலை ஏற்பட்டு இருக்கின்றது. அவர்கள் தங்களது மாவட்டங்களில் தொழில் செய்து, தங்களது குடும்பத்துடன் இணைந்து வாழ்வதற்கு ஏற்ற வகையில், அங்கு தொழிற்சாலைகள் அமைக்கப்படல் வேண்டும். எதிர்காலத்தில் அதற்கான பூர்வாங்க திட்டமிடல்கள் முன்னெடுக்கப்பட வேண்டும்.

இந்தியாவின் உதவியுடன் கிழக்கு மாகாணத்தில் பல்வேறு அபிவிருத்தித் திட்டங்கள் முன்னெடுக்கப்பட இருப்பதாக இந்த வரவு செலவுத்திட்டத்தில் சொல்லப்பட்டு இருக்கின்றது. ஆனாலும், அது என்ன வகையானவை என்ற விபரம் முன்வைக்கப்பட்டு இருக்கவில்லை. அதை எங்களுடைய மாவட்ட மக்கள் எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றார்கள். அவர்கள் உங்களுடைய கட்சியினருக்கு தங்களுடைய வாக்குகளை அளித்து, பிரதிநிதிகளைத் தெரிவுசெய்து இருக்கிறார்கள். ஆகவே, இந்த வரவு செலவுத்திட்டத்தில் மட்டக்களப்பு மாவட்ட மக்களின் அபிவிருத்தி, பொருளாதார மேம்பாடு சம்பந்தமான விடயங்கள் உறுதியாகச் சொல்லப்பட வேண்டுமென நாங்கள் கேட்டுக் கொள்கின்றோம்.

இந்த வரவு செலவுத்திட்டத்தில் அத்தியாவசிய அரசாங்கத்துறைப் பதவிகளுக்கு 30,000 பேரை ஆட்சேர்ப்புச் செய்ய இருப்பதாகச் சொல்லப்பட்டுள்ளது.

கிழக்கு மாகாணத்தில், குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்தில் பல்வேறு துறைகளிலும் பல்வேறு வகையான வெற்றிடங்கள் நிலவுகின்றன. சுகாதாரத்துறையை எடுத்துக்கொண்டால், அங்குள்ள வைத்தியசாலைகளில் வைத்தியர், தாதியர், மருந்தாளர், ஆய்வுகூட தொழில்நுட்ப உதவியாளர், X-ray technician, சிற்றூழியர் ஆகியோருக்கான பற்றாக்குறை அதிகளவில் காணப்படுகின்றது. நாடு முழுவதும் சுகாதாரத்துறை ஊழியர்களுக்கான பற்றாக்குறை இருக்கின்றபொழுது, சில இடங்களில் மேலதிகமான ஊழியர்களுடனும் இன்னும் சில இடங்களில் பிரதேச ரீதியாக வேறுபட்ட வளப் பற்றாக்குறையுடனும் வைத்தியசாலைகள் இயங்குவதையும் நாம் காணக்கூடியதாக இருக்கிறது. உதாரணத்துக்கு, மருத்துவ மாதுகளை எடுத்துக்கொள்வோம். மட்டக்களப்பு மாவட்ட வைத்தியசாலைகளில் இவர்களுக்கான பற்றாக்குறை பாரியளவில் நிலவுகின்றது. இவ்வாறான நிலையில், சிறப்பான முறையில் சேவைகளைச் செய்வதற்கு முடியாமல் இருக்கிறது.

மிக முக்கியமாக படுவான்கரை பிரதேசத்திலுள்ள வைத்தியசாலைகள் இன்னும் தரமுயர்த்தப்படாமல் பற்றாக்குறையுடனேயே இயங்கி வருகின்றன. பாதை வசதிகள் இன்மையால் 'அம்பியுலன்ஸ்' வண்டிகள்கூட எழுவான்கரை பிரதேசத்துக்கு வருவது மிகச் சிரமமாக இருக்கின்றது. எனவே, அங்குள்ள வைத்தியசாலைகளைத் தரமுயர்த்துவதோடு, அதற்குரிய ஆளணியையும் ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அதுமாத்திரமல்ல, அங்குள்ள வைத்தியசாலைகளுக்கு நோயாளர் வருகின்ற பாதைகள் சீரமைக்கப்பட வேண்டும். இந்த வரவு செலவுத்திட்டத்தில் ஆயிரக்கணக்கான கிலோ மீற்றர் வீதி அபிவிருத்தித் திட்டங்கள் இருக்கின்றன. அதன்கீழ் எங்களுடைய படுவான்கரையையும் எழுவான்கரையையும் இணைக்கின்ற பாதைகளை மிகத் துரிதமாகச் செப்பனிடுவதற்கான ஏற்பாடுகள் செய்யப்பட வேண்டும். அத்தியாவசிய அரசாங்கத்துறைப் பதவிகளுக்கு 30,000 பேரை ஆட்சேர்ப்புச் செய்கின்ற விடயத்தில் மட்டக்களப்பு மாவட்டத்துக்கு முன்னுரிமை அளிக்கப்பட வேண்டும்.

கல்வித்துறையை எடுத்துக்கொண்டால், எங்களுடைய மட்டக்களப்பு மாவட்டத்தில் படுவான்கரை மற்றும் ஏனைய வலயங்களிலுள்ள பல பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றது. குறிப்பாக, கல்குடா வலயத்தை எடுத்துக்கொண்டால், அங்கு மிகப் பாரிய ஆளணிப் பற்றாக்குறை காணப்படுகிறது. இந்த விடயங்களை எதிர்காலத்திலே மிக உன்னிப்பாகக் கருத்திற்கொண்டு, அங்குள்ள ஆசிரியர் வளப் பற்றாக்குறையைத் தீர்க்க வேண்டும். எமது மாவட்டத்தில் Bachelor of Education படிப்பை முடித்த பட்டதாரிகள் இருக்கின்றார்கள். அவர்களுக்கான ஆட்சேர்ப்பு நடவடிக்கைகள் இன்னும் பூர்த்தி செய்யப்படவில்லை. இவ்விடயம் சம்பந்தமாக பல முறைப்பாடுகளை நாம் செய்திருக்கின்றோம். இவற்றை நிவர்த்தி செய்வதற்கு மிக விரைவானதொரு செயற்றிட்டத்தைச் செயற்படுத்த வேண்டும்.

மேலும், நல்லாட்சிக் காலத்திலே ஏற்படுத்தப்பட்ட நூற்றுக்கணக்கான வீடமைப்புத் திட்டங்கள் இன்னும் கட்டி முடிக்கப்படாமல் இருக்கின்றன. இந்த ஆண்டிற்கான வரவு செலவுத்திட்டத்திலே பல்வேறு வகையான வீடமைப்புத் திட்டங்கள் உள்வாங்கப்பட்டிருக்கின்றன. சீனாவின் உதவிமூலமான low-income குடும்பங்கள் மற்றும் பாதிக்கப்பட்டவர்களுக்கான வீட்டுத் திட்டங்கள் இருக்கின்றன. இவ்வாறு பூர்த்தி செய்யப்படாமல் இருக்கின்ற வீடுகளை குறித்த திட்டங்களின் ஊடாக கட்டி முடிப்பதற்கான முன்னெடுப்புகள் செய்யப்பட வேண்டும்.

மிக முக்கியமான ஒரு விடயத்தை நான் இங்கு சொல்ல விரும்புகின்றேன். பாதுகாப்பு என்பது மிகப் பிரதான பிரச்சினையாகக் காணப்படுவதோடு, பல சம்பவங்களும் இடம்

[ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා]

පෙට්‍රුණ්ණන. පාරාලුමන්ට්‍ර උරුප්පිනර්කළින් පාතුකාප්පු තොටර්පිල් පල පාරාලුමන්ට්‍ර උරුප්පිනර්කළ් පේසියිරුන්තාර්කළ්. කෞරව සපානායකර් ඌටාක පාතුකාප්පු අමෛච්චු මට්‍රුම් පොතු මක්කළ් පාතුකාප්පු අමෛච්චුක්කු ඉතු තොටර්පිල් නාංකළ් විණ්ණප්පිත්තිරුන්තුම්, අතට්කු මුන්නුරිමෛ වළංකප්පටවිල්ලෛ. පාරාලුමන්ට්‍ර උරුප්පිනර්කළින් පාතුකාප්පු කෞරව සපානායකර් අවර්කළින් කෛකළිලේ තංකියුළ්ළතු. නාළෛක්කු ඒතුම් විටයංකළ් නටෙපෙට්‍රතන් පින්නර් පාතුකාප්පු වළංකුවතෛවිට, මුන්නේට්‍රපාටාක ඉන්ත විටයත්තිල් සෙයට්පට වේණ්ටුම්. නාංකළ් පතවියේට්‍රු 100 නාට්කළෛ නෙරුංකික්කොණ්ටිරුක්කින්ට්‍ර වේළෛයිලේ, ඉතු සම්පන්තමාන තීර්මානංකළෛ එටුක්කාමල් ඉරුප්පතු මිකවුම් යෝසික්කවේණ්ටිය විටයමාක ඉරුක්කිරතු. පොතුමක්කළ් පාතුකාප්පු අමෛච්චරුම් සරි, කෞරව සපානායකරුම් සරි, ඉන්ත විටයත්තිලේ උරුතියාන ඔරු තීර්මානත්තෛ එටුක්ක වේණ්ටුම්. පාරාලුමන්ට්‍ර උරුප්පිනර්කළුක්කුම්කූට කටන්ත කාලකට්ටංකළිලේ පල අසෞකරියමාන සම්පවංකළ් ඒර්පට්ටිරුක්කින්ට්‍රන. පාතුකාප්පු උත්තියෝකත්තර්කළ් ඉරුන්තාල් අව්වාට්‍රාන නිලෛමෛකළ් ඒර්පට්ටිරුක්කාතු. ඉන්ත විටයම් තොටර්පිල් තෙළිවාක විළංකික්කොණ්ටු, අතට්කුරිය නටවටික්කෛයෛ එටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක්කොණ්ටු, සන්තර්ප්පත්තුක්කු නන්රිකූර්, මුටිත්තුක්කොළ්කින්ට්‍රේන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.40]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අය වැය ගැන විවාද කළ දින තුන තුළම සාකච්ඡාවට බඳුන් වෙච්ච කාරණයක් තමයි, මේ රජයේ අය වැයේ දෘෂ්ටිවාදය කුමක්ද, මේ අය වැය නව ලිබරල් ධනවාදී අය වැයක් ද කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අය වැය නව ලිබරල් ධනවාදීද, නැද්ද කියලා තීරණය කරන්න ඉස්සෙල්ලා මේ ගරු සභාවේ සිටින අපි හැමෝම නව ලිබරල් ධනවාදය කියන්නේ මොකක්ද කියන එක හදුනා ගන්න ඕනෑය කියා මම හිතනවා.

අපේ ලාල් කාන්ත ඇමතිතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා වාගේ නව ලිබරල් ධනවාදය කියන්නේ 1977න් පස්සේ ලංකාවේ ක්‍රියාත්මක වුණු, ඒ හා සමගාමීව යුරෝපයේ සහ ඇමෙරිකාවේ ආරම්භ කරපු දේශපාලන දෘෂ්ටිවාදයක්; දේශපාලන අදහසක්; ආර්ථික අදහසක්; දේශපාලන - ආර්ථික අදහසක්. එහි සරල අදහස මෙයයි. "රාජ්‍යය ආර්ථික කටයුතුවලින් ඉවත් විය යුතුයි. සම්පත් කළමනාකරණය කිරීමේදී, සම්පත් බෙදා වෙන් කර දීමේදී වෙළෙඳ පොළ බලවේගවලට පමණක් එය ප්‍රශස්ත ලෙස, අතිසාර්ථක ලෙස සිදු කිරීමේ හැකියාව තිබෙනවා. ඊට වඩා ප්‍රශස්ත ලෙස රජයේ මැදිහත් වීමකින් එය දියුණු කිරීමේ හැකියාවක් නැහැ" කියන අදහස තමයි අපි සරලව තේරුම් ගත්තොත් නව ලිබරල් ධනවාදය කියන එකේ කැටි කරගත් අදහස. 1977 ඉඳන්ම ලංකාවේ අඩුවැඩි වශයෙන් ක්‍රියාත්මක වුණේ නව ලිබරල් ධනවාදය තමයි. ලාල් කාන්ත ඇමතිතුමා මතක් කළා වාගේ, මේ ආර්ථික දර්ශනයේ තිබෙන මූලික කාරණය තමයි, රජය ආර්ථිකයෙන් ඉවත් වෙනවා, පෞද්ගලීකරණය එහෙම නැත්නම් වෙළෙඳ පොළ බලවේගවලට පමණක් ආර්ථිකය තුළ තීරණ ගැනීමේ ඉඩ කඩ සකස් කර දෙනවා කියන එක. ඒ අනුව පසුගිය දශක තුනක කාලය තුළ අපි දැක්කා, රජයේ ආයතන පෞද්ගලීකරණය කිරීම, නියාමන කාර්යභාරයෙන් රජය කෙමෙන් කෙමෙන් ඉවත්වීම. රජයක් හැටියටත්, දේශපාලන පක්ෂයක් හැටියටත් අපි හිතනවා, ලංකාව 2022 ආර්ථික අර්බුදයකට මුහුණ දීමට, බංකොලොත්භාවයට මුහුණ දීමට බලපෑ ප්‍රධාන ව්‍යුහාත්මක හේතුවක් තමයි මේ නව ලිබරල් ධනවාදී ආර්ථික පිළිවෙතේ ගමන් කිරීම කියන එක බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඊළඟට අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා, නව ලිබරල් ධනවාදය කිව්වාම ඒ වෙනුවෙන් ඉතා දැඩිව පෙනී සිටින දේශපාලන පක්ෂ සිටින බව; ඒවා වෙනුවෙන්ම ඒවා නියෝජනය කරන දේශපාලනඥයන් ලංකා ඉතිහාසයේ ඉඳලා තිබෙනවා. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්තයා කියන්නේ මේ නව ලිබරල් ධනවාදය වෙනුවෙන්ම පෙනී හිටපු ජනාධිපතිවරයෙක්; දේශපාලනඥයෙක්. එතුමාගේ දර්ශනයේ මූලිකම කාරණය තමයි පෞද්ගලීකරණය, රජය ආර්ථිකයෙන් ඉවත් වීම කියන එක. එතකොට දැන් අපට චෝදනාවක් එල්ල වෙනවා, අපිත් රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආර්ථික ප්‍රතිපත්තියම තමයි ඉස්සරහට ගෙන යන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි විපක්ෂයටත් සාධාරණ සැකයකට ඉඩ තියලා බැලුවොත් මම හිතන විධියට මේ චෝදනාව එල්ල වීමට ප්‍රධාන හේතුව තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පරාමිතීන් තුළ රජයට කටයුතු කරන්න සිදු වෙලා තිබීම. ඒ අනුව ඔවුන් කියන්න උත්සාහ කරනවා, රජය IMF Programme එක යටතේ සිටින නිසාම මේක නව ලිබරල් ධනවාදී ආර්ථික ප්‍රතිපත්තියක්, නව ලිබරල් ධනවාදී රජයක් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉතිහාසයේ වෙන කිසිදු රජයකට අය වැයක් ඉදිරිපත් කිරීමේදී නොතිබුණු සීමාවන් ප්‍රායෝගික මට්ටමිනුත්, නීතිමය මට්ටමිනුත් අපේ ආණ්ඩුවට තිබෙනවා. අපි බැලුවොත්, 2024 අගෝස්තු මාසයේදී මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් රජයට, ආර්ථිකයට වියදම් කිරීමේදී කරන්න පුළුවන් වියදම සීමා කොට තිබෙනවා. ඒ සීමාව නිශ්චිතව ගත්තොත්, රජයේ වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13කට සීමාවන්නට අවශ්‍යයි.

ඒ වාගේම රජයට ණය සපයා ගැනීමේදීත් පනත මඟින්ම සීමාකරණයක් කරලා තිබෙනවා. හිටපු කිසිම රජයක් රජයේ වියදම මේ ආකාරයෙන් නෛතික වශයෙන් සීමාකොට තිබෙන අවස්ථාවදී අය වැයක් සකස් කරලා නැහැ. අය වැය හිඟය කියන එක තමන්ට අවශ්‍ය මට්ටමක පවත්වා ගැනීමේ හැකියාවක් තිබියදී තමයි පසුගිය සියලු රජයන් අය වැය සකස් කරලා තිබෙන්නේ. නමුත් අපට නෛතික සීමාවක් තිබෙනවා රජයේ වියදම සියයට 13කට වඩා වැඩි වෙන්න බැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එසේ තිබියදී මේ රජයට පුළුවන් වෙලා තිබෙනවා අතිශය ජනතාවාදී, අතිශය ප්‍රජාතන්ත්‍රවාදී අය වැයක් ඉදිරිපත් කරන්නට. එතකොට අපි අර මුල් ප්‍රශ්නයට ගියොත්, නව ලිබරල්වාදීද මේ අය වැය කියන ප්‍රශ්නය ගත්තොත්, මම හිතන විධියට තීරණාත්මකව රජයේ කාර්යභාරය ආර්ථිකය තුළ නැවතත් ස්ථාපනය කරන, රජයේ කාර්යභාරය අවශ්‍යයි කියලා නැවතත් පිළිගන්නා අය වැයක් තමයි ජාතික ජන බලවේගය විසින් සීමාකම් යටතේ වුණත් මේ 2025 වර්ෂයට ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි ඒක නිශ්චිතව කොහොමද කියලා බැලුවොත්, 2025 වර්ෂයේ අය වැය තුළ විශේෂයෙන්ම සමාජ ආරක්ෂණ වියදම අතිවිශාල ලෙස වැඩි කරලා තිබෙනවා. ඒ, අය වැයේ අංක එකේ වියදම. The number one expenditure in this Budget, Madam Chairperson, is on social protection. සමාජ ආරක්ෂණ වියදම් වෙනුවෙන් තමයි අපි

වැඩිම වියදම කරන්නේ, රුපියල් බිලියන 749ක්. ඒ කියන්නේ අය වැය තුළම විස්තර කරලා තිබෙනවා වාගේ මේ රජය අස්වැසුම, අනාථ දරුවන් බලා ගැනීම, සිරකරුවන් වෙත පහසුකම් සැපයීම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් බලා ගැනීම, දරුවන් බලා ගැනීම වාගේ අතිවිශාල කලාපයක, අතිවිශාල පිරිසක් ආවරණය - cover - වෙන ආකාරයට සමාජ ආරක්ෂණ ජාලය -social safety net එක- පුළුල් කරලා තිබෙනවා.

සමාජ ආරක්ෂණ වියදම විතරක් නොවෙයි, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහාත් රජය දරන වියදම වැදගත් වෙනවා. මේ අවුරුද්දේ අය වැයේදී ඓතිහාසික ලෙස අතිවිශාල මුදලක් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට, -අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් සහ සෞඛ්‍යයට රුපියල් බිලියන 604ක්- වෙන් කරලා තිබෙනවා. මේ අය වැය තුළ සමස්ත සමාජය වෙනුවෙන්, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය සඳහා පමණක් කරන වියදම බැලුවොත් රුපියල් ට්‍රිලියන 1.9ක් පමණ වෙනවා. මේක සමාජය වෙනුවෙන් රජයක් කරන අතිවිශාල වියදමක්.

අපි පසුගිය රජයන්වල දෘෂ්ටිවාදයන් බැලුවොත්, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය බැලුවොත් සම්පූර්ණයෙන් මේකේ අනෙක් පැත්ත තිබුණේ. අධ්‍යාපනය සහ සෞඛ්‍ය ගැන විශේෂයෙන් බැලුවොත් ඒ රජයන් ක්‍රියාත්මක වුණේ අධ්‍යාපනයෙන් සහ සෞඛ්‍යයෙන් රජය ක්‍රමානුකූලව ඉවත් වෙමින් පෞද්ගලික අංශයට වැඩිපුර අවස්ථා සලසා දීමට, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පෞද්ගලීකරණය දිශාවට තල්ලු කිරීමට. අධ්‍යාපනය සහ සෞඛ්‍ය පෞද්ගලීකරණය දිශාවට තල්ලු කරමින්, රජය ආර්ථිකයෙන්, අධ්‍යාපනයෙන්, සෞඛ්‍යයෙන් ඉවත් වීම තමයි නව ලිබරල් ධනවාදය කියලා කියන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මේ අය වැය තුළ එය නිශ්චිතව වෙනස් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම අනෙක් වැදගත්ම කාරණය තමයි රාජ්‍ය ආයෝජනය වෙනුවෙන් මේ අය වැය තුළ කරලා තිබෙන වියදම. එය, රුපියල් ට්‍රිලියන 1.3ක්. ඒ වියදම තුළ මහා මාර්ග සංවර්ධනයට, කෘෂිකර්මය නවීකරණයට, ප්‍රවාහනය නවීකරණයට සහ ජල සැපයුම් පද්ධතිය නවීකරණයට සහ යළි යථාවත් කිරීමට රුපියල් බිලියන 766ක් වෙන් කරලා තිබෙනවා. එතකොට සමස්ත රාජ්‍ය ආයෝජනය තුළ අධ්‍යාපනය සහ සෞඛ්‍ය වෙනුවෙන් නැවතත් ප්‍රාග්ධන වියදම් ඉහළ දැමීමක් සිද්ධ කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ කියන්නේ මේ අය වැය තුළ අපට පැහැදිලිවම ජේනවා රජය ආර්ථිකයෙන් ඉවත්වීමේ, ආර්ථික කටයුතුවලින් ඉවත්වීමේ ප්‍රතිපත්තිය reverse කරමින් නැවතත් ආර්ථිකයට සම්බන්ධ වීමේ කටයුත්ත ජාතික ජන බලවේගයේ පළමුවෙනි අය වැය තුළින් ආරම්භ කරලා තිබෙන බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, financing විතරක් නොවෙයි, මූල්‍ය අරමුදල් සැපයීම විතරක් නොවෙයි නීතිමය ලෙස, නීතිය වෙනස් කිරීම තුළ ආර්ථිකයට රජය මැදිහත්වීමේ සුවිශේෂී ක්‍රියාමාර්ග මේ අය වැය තුළ සඳහන් කරලා තිබෙනවා. එකක් තමයි, විදුලිබල අංශය පෞද්ගලීකරණය කරමින් 2024 වර්ෂයේ ගෙනා විදුලිබල පනත අපි විදුලිබල අංශයේ පෞද්ගලීකරණය නවතා දමමින්, රාජ්‍ය අංශය ශක්තිමත් කරමින් වෙනස් කරන්න මේ අවුරුද්දේ අය වැය තුළින් කටයුතු කරනවා; ඒ ප්‍රතිපත්තිය අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ වාගේම වී වෙළෙඳ පොළ -paddy market එක- තුළ රජයේ ක්‍රියාකාරිත්වය තවත් ශක්තිමත් කරන්න යෝජනා කර තිබෙනවා. Paddy Marketing Board Act එක 1970 දශකයේ ඉදිරිපත් වුණු පනතක්; ඉතා හොඳ පනතක්. වරින් වර එම පනත අහෝසි කිරීමට, අකර්මණ්‍ය කිරීමට හිටපු හැම රජයක්ම වාගේ කටයුතු කළා. මෙම ආණ්ඩුව එම පනත තවත් ශක්තිමත් කිරීමට යෝජනා කර තිබෙනවා. රජයට වී වෙළෙඳපොළට සහභාගී වීමට ඇති හැකියාව පුළුල් කරමින්, තොග රැස් කරන්නන් සහ තොග පවත්වාගෙන යන්නන් ලියාපදිංචි -register- කිරීමට, පනත ශක්තිමත් කිරීමට අලුත් සංශෝධන ඉදිරිපත් කිරීමට යෝජනා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අනෙක් වැදගත්ම කාරණය තමයි, පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් රජය මෙම අය වැයෙන් මැදිහත් වීමක් කර තිබීම. මම හිතන්නේ නැහැ, පෞද්ගලික අංශයේ වැටුප් සම්බන්ධයෙන් කටයුතු කර තිබෙන, ඒ සම්බන්ධයෙන් වැඩ කර තිබෙන වෙනත් ආණ්ඩුවක් ඇති කියලා. ඕනෑම කෙනෙක් දන්නවා පෞද්ගලික අංශයේ වැටුප් කියන්නේ කිසිදු රජයක් අත තබන්නේ නැති කාරණයක් බව. මොකද, නව ලිබරල්වාදී රජයන් පෞද්ගලික අංශය සම්බන්ධ කටයුතුවලට මැදිහත් වන්නට ඉතා අකැමැතියි. නමුත්, ඒ ආකල්පය -attitude- වෙනස් කරමින් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වගකීමත් රජය මතට පවරා ගනිමින් මේ රජය තීරණාත්මක ලෙස පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීමට; වතු අංශයේ මෙන්ම අනෙකුත් පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීමට මැදිහත් වීම කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ සියල්ලටම වඩා මේ අය වැය තුළ බොහොම දීප්තිමත් ලෙස පෙනෙන කාරණය තමයි, මේ රජය ජනතාව වෙනුවෙන් ඉතාම කාරුණික ලෙස සලකා තිබීම. This is a compassionate Budget, Madam. We are restrained with funding, we are legally restrained, but still, the Government is acting very compassionately towards the people because this is a people's Government. අපි කිසිම කෙනෙකු අත් නොහැර ඉදිරියට යන ගමන මේ අය වැය තුළින් බොහොම පැහැදිලිව පෙන්වා තිබෙනවා. නමුත්, මෙම අය වැය නව ලිබරල් ධනවාදී යැයි කියන එක ඉතාම අසාධාරණ විවේචනයක්. ඒක වාමාංශිකයන්ගෙන් ආවත් දක්ෂිණාංශිකයන්ගෙන් ආවත් ඉතාම අසාධාරණ විවේචනයක්. නව ලිබරල් ධනවාදී ප්‍රතිපත්ති සහමුලින්ම අනෙක් පැත්ත හරවන අය වැයක් තමයි මෙම රජය ඉදිරිපත් කරලා තිබෙන්නේ කියමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.53]

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන රජය ඉදිරිපත් කළ පළමු අය වැය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මෙම අය වැය පිළිබඳව සහ අය වැයේ ඇති කරුණු කාරණා ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් මා මතක් කළ යුතු එක කාරණාවක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතියේ ආධිපත්‍යය ආරක්ෂා නොවන විට, මේ රටේ නිවැරදිව සහ නීත්‍යානුකූලව සාමය ස්ථාපිත නොවන විට, රට කොච්චර දුරට නිවැරදිව ඉදිරියට ගෙන යන්න පුළුවන් ද කියන ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණාව මතු කරන්නේ අද උදේ අපි දැකපු එක වාර්තාවක් පිළිබඳවයි. මම මේ වාර්තාව 2022 වර්ෂයේදීත් මේ විධියටම දැක්කා. පාස්කු ප්‍රහාරයේ අදාළ වූදිතයන් අධිකරණයට ගෙනෙන වෙලාවේදී බුද්ධි අංශවලට ලැබුණු වාර්තාවක් තිබෙනවා. මේකේ සඳහන් වනවා, "අදාළ නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවලදී නීතිඥවරුන්ගේ ස්වරූපයෙන් සැරසී අවි ආයුධ හෝ වෙනත් දෙයක් සහිතව යම් පුද්ගලයකු අධිකරණ ශාලාවට ඇතුළු වීමේ හැකියාව පවතින බැවින් නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවලදී අධිකරණ ශාලාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් තර්ජනාත්මක තත්ත්වයක් පවතින බව වැඩිදුරටත් පෙන්වා දී ඇත" කියලා. එතකොට මා අධිකරණ විෂය භාර රාජ්‍ය ඇමතිවරයා විධියටත් කටයුතු කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙලාවේ යම්කිසි සිද්ධියක් වෙන්න ඉඩ තිබුණා. නමුත්, එම වාර්තා ටික නිසා එය වළක්වා ගන්න පුළුවන්කම ලැබුණා. අද සමහර වෙලාවට කට්ටියගේ telelphone වලට alert එන්න පුළුවන්, "ජාතික ආරක්ෂාව හරි. කිසිදු ප්‍රශ්නයක් නැහැ" කියලා. සමහර උදවිය කියනවා, "ඩෙස්ක්, බංකු, පුටු අරගෙන එන්න. ජාතික ආරක්ෂාව පිළිබඳව කියලා දෙන්න" කියලා. හැබැයි, මේ කතන්දර කිව්වාට වැඩක් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කරන තැනටම පිස්තෝලයක් අරගෙන ඇවිල්ලා වෙඩි තියලා මරණ තත්ත්වයට රට ඇදගෙන වැටෙනවා නම්. අය වැය නොවෙයි, අය වැයේ කථා කරන මොන කරුණු කාරණා තිබුණත් වැඩක් වෙන්නේ නැහැ, මේවා රට තුළ ස්ථාපිත කරන්න පුළුවන් වෙන්නේ නැහැ.

මා පළමුව මේ කාරණය මතක් කළේ වෙන කිසිවක් නිසා නොවෙයි, ඊයේ සිද්ධිය එක්ක බලනකොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේම බන්ධනාගාර බස් රථයකට ගහලා බෝට්ටුවක් අරගෙන ඉන්දියාවට යන්න හදන බවට තොරතුරු ලැබුණා. හැබැයි එය වළක්වා ගන්න පුළුවන් වුණා. ඒ නිසා බුද්ධි අංශවලට ලැබෙන තොරතුරු ටික නියම විධියට අරගෙන, ඒවා නිවැරදි විධියට සමාලෝචනය කරලා, අවශ්‍ය පියවර ගන්න වැඩ පිළිවෙළක් ආණ්ඩුව හැදුවේ නැත්නම්, කයිවාරු විතරක් ගැහුවොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක බරපතළ ප්‍රශ්නයකට, අර්බුදයකට යනවා.

ඒක තමයි ඇත්ත. ගරු අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා අධිකරණ ශාලාව ඇතුළට යන කොට ඔබතුමාත් පරීක්ෂා කරනවා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා වැදගත් ඇමතිවරයෙක්. මෙතුමා පරීක්ෂා කරන්නේ ඇයි? මෙතුමා වෙඩි තියන්න යනවාද? කරන්න ඕනෑ වැඩ කොටස කළා නම්, මේ කටයුත්ත මීට වඩා සාර්ථකව ඉස්සරහට ගෙන යන්න පුළුවන් කියන කාරණය අපි විශේෂයෙන් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය පිළිබඳ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ මම මේ කාරණයත් කිව යුතුයි. අපි බොහෝ අවස්ථාවල රජය පිළිබඳ විවේචනය නොකර රජය කරගෙන යන වැඩ පිළිවෙළේ සුබවාදීව හොඳයි කියන්න පුළුවන් කාරණා ටික බොහොම විවෘතව පෙන්වා දීලා පැත්තකට වෙලා ඉන්නේ මොන ක්‍රමයෙන් හෝ කවුරු හෝ මේ රට ගොඩ දාලා නිවැරදිව ඉදිරියට ගෙන යන්න අවශ්‍ය නිසයි.

2022දී මේ රටේ පැන නැඟුණු බරපතළ ආර්ථික අර්බුදය -එම ප්‍රශ්නය- 2024 අග භාගය වන කොට යම් මට්ටමකට -සියයට සියයක් නොවෙයි- සමනය කර ගන්න පුළුවන්කම ලැබුණා. 2022 වර්ෂය වන කොට උද්ධමනය තිබුණේ කීයට ද? සියයට 70කට එහා ගිය උද්ධමනයක් තිබුණා. මෙවර ගරු ජනාධිපතිතුමා එතුමාගේ අය වැය කථාවේදී කිව්වා, 2022 මැද භාගය වන කොට මේ රටේ අවශ්‍ය ප්‍රතිසංස්කරණ වැඩකටයුතු ආරම්භ වුණා, 2024 දෙසැම්බර් වන කොට ඒක අවසන් කරන්න පුළුවන්කම ලැබුණා කියලා. එහෙම නම්, එතුමා නොවැම්බර් මාසයේ ජනාධිපති ධුරයට පත් වෙලා දෙසැම්බර් වන කොට සියලු දේ අවසන් කළා නොවෙයි. ඒ කරගෙන ආපු වැඩ පිළිවෙළ දෙසැම්බර් මාසයේදී සාර්ථකව අවසන් කරන්න එතුමා කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා සියයට 70ට තිබුණු උද්ධමනය නැවත වතාවක් තනි ඉලක්කමකට ආවා. සංචිත ටික නැති වුණු රටේ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6ක් දක්වා වැඩි වුණා. නැවත වතාවක් ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කර ගන්න පුළුවන්කම ලැබුණා. එහෙම නම් ඒ ගෙන ආ වැඩ පිළිවෙළ තවත් නිවැරදිව ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක පිළිබඳ නිවැරදි සැලැස්මක් ආණ්ඩුවට තිබිය යුතුයි. මොකද, අප අද ඉන්නේ මේක ලෙහෙසියෙන් හසුරවාගෙන යන්න පුළුවන් තැනක නොවෙයි. මම දන්නවා, ආණ්ඩුව ඒ පිළිබඳව දැනගෙන ඉන්නවා; තේරුම් අරගෙන ඉන්නවා කියලා. හැබැයි, ශක්තිමත්, නිවැරදි වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම් මොකද වෙන්නේ?

අද අය වැය පරතරය රුපියල් බිලියන 2,200යි. මේ රුපියල් බිලියන 2,200 හරියාකාරව උපයා ගන්නේ කොහොමද කියන එක පිළිබඳ නිවැරදි තොරතුරු මේ සභාවට ඉදිරිපත් වෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අය වැය පරතරය මේකයි කියලා පෙන්වන්න අපට පුළුවන්. හැම දාම අය වැය පරතරය පෙන්වනවා; උපයන හැටි කියනවා. හැබැයි, එයින් කොච්චර උපයන්න පුළුවන් ද කියන එක බරපතළ ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා අද තිබෙන සංචිත ප්‍රමාණය ගෙන බලන්න. අද ඩොලර් බිලියන 6ක සංචිත තිබෙනවා. ඩොලර් බිලියන 6ක් වන සංචිත ප්‍රමාණය ඊළඟ අවුරුද්ද වන කොට ඩොලර් බිලියන 8ක් වෙන්න ඕනෑ. ඊට පසුව ඒ ප්‍රමාණය ඩොලර් බිලියන 10ක් වෙන්න ඕනෑ. 2027 වන කොට ඩොලර් බිලියන 14ක සංචිත ප්‍රමාණයකට අපි යන්න ඕනෑ. ඩොලර් බිලියන 14ක සංචිත ප්‍රමාණයකට යන වෙලාවේ තමයි වාහන ආනයනය කරන්න බිලියන 1.5ක් වැය වෙනවා කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බිලියන 1.5ක් දාලා නැවත වතාවක් මේ තිබෙන tax එකම impose කළොත් වාහන ආනයනයෙන් ආණ්ඩුව බලාපොරොත්තු වන revenue එක ගන්න පුළුවන්ද කියා නිකමට කල්පනා කර බලන්න. ඔබතුමන්ලා සංඛ්‍යාලේඛන මේ පොත්වලට දමලා ඇති; මුදල් අමාත්‍යාංශය දෙන සංඛ්‍යාලේඛන මේ සභාවට ඉදිරිපත් කරලා ඇති. හැබැයි, මේ කරුණ මතක තියාගන්න. ඔය කියන වාහන ආනයනයෙන් ඔය කියන ආදායම මේ රටට ලැබෙන්නේ නැහැ. ඒ නිසා මීට වඩා සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර ගත්තේ නැත්නම් අපි බරපතළ ප්‍රශ්නයකට; අර්බුදයකට යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ජනාධිපතිතුමා සඳහන් කරනවා, අපනයනය ඩොලර් බිලියන 19කට ගෙන එන්න ඕනෑ කියලා. 2020 අවුරුද්දේ මේ රටේ අපනයනය ඩොලර් බිලියන 10යි; 2021 අවුරුද්දේ අපනයනය ඩොලර් බිලියන 12යි; 2022 අවුරුද්දේ අපනයනය ඩොලර් බිලියන 13යි; 2023 අවුරුද්දේ අපනයනය ඩොලර් බිලියන 11යි. 2024 අපි වැඩි ප්‍රමාණයකට යනවා. එය, ඩොලර් බිලියන 12.7යි. හැබැයි, ඔබතුමන්ලා අද කියනවා, ඩොලර් බිලියන 19ක ආදායමක් මේ රටට උපයා ගන්නවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක ඩොලර් බිලියන 19ක් නොවෙයි, ඩොලර් බිලියන 29ක් වෙනවා නම් අපි සතුටුයි. ඒක ඩොලර් බිලියන 30ක්, 40ක් කරන්න. හැබැයි, මේ සංඛ්‍යාලේඛන කිව්වාට මේ සංඛ්‍යාලේඛනවල සඳහන් මුදල අපේ මහා භාණ්ඩාගාරයට ඇත්තටම ගේන්න පුළුවන්ද කියලා දෙපාරක් කල්පනා කරලා බලන්න. මොකද, ඒ කියන සංඛ්‍යාලේඛන පදනම් කරගෙන නම් ඔබතුමන්ලා මේ වාර්තාව භදලා තිබෙන්නේ, නැවත වතාවක් කණ්ඩායමක්, රජයක් හැටියට බෝට්ටුවෙන් ගිහිල්ලා අසරණ වෙලා අතරමං වෙනවා හැරෙන්න වෙන විකල්පයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනට මේ රජය යෑමේ අවශ්‍යතාවක් අපට නැහැ. ඒකයි අප මේ කාරණය කියන්නේ. කවුරු හරි මේ රට භාර ගත්තු කෙනා මේ රට නිවැරදිව ගොඩ නඟන්න ඕනෑ. අපට නැවත වතාවක් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ අවස්ථාව හරියට කළමනාකරණය කර ගන්න නම් මේ සංඛ්‍යාලේඛන ටික නිවැරදිව තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක පැත්තකින්, අපනයනය ඩොලර් බිලියන 19කට යන බව කියනවා. අනෙක් පැත්තෙන්, පිටරටින් ලුණු ගේනවා; පොල් ගේනවා; හාල් ගේනවා. හැබැයි, අපනයනය ඩොලර් බිලියන 19කට ගෙන එනවා ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙනුවෙන් ආණ්ඩුව හැටියට දීර්ඝ කාලීන නිවැරදි වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම් අපි අර්බුදයකට, ප්‍රශ්නයකට යන එක වළක්වන්න පුළුවන්කමක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

කියන්න, ගරු සභානායකතුමා. මගේ වෙලාව අඩු වෙන්නේ නැහැ නේද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අපෙන් වෙලාව ගන්නම්. ඔබතුමා කියපු කාරණය පිළිබඳව මටත් යම් අවබෝධයක් තිබෙනවා.

මම දැන් Google search කරලායි මෙය කියන්නේ. "In 2024, Sri Lanka's export earnings reached US Dollars 16.17 billion, the highest-ever in the country's history" යනුවෙන් මෙහි සඳහන් වෙනවා. US Dollars 12 billion නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. නැවත පොඩ්ඩක් බලන්න. US Dollars 16.17 billion නිසා තමයි US Dollars 19 billion කියන target එක දමා තිබෙන්නේ. US Dollars 12 billion නම් ඇත්තටම ඔබතුමා කියන ඉලක්කමට යන්න බැහැ. ඔබතුමා එයට උත්තර දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ලබා ගත් වෙලාව අපේ පැත්තේ කාලයෙන් අඩු කරන්න.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ Research Division එකෙන් ලබා ගත් මේ විස්තර ඇතුළත් sheet එක මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

ගරු සභානායකතුමා, මම වැරදියට, ආවාට ගියාට තොරතුරු අරගෙන නොවෙයි කථා කළේ. පාර්ලිමේන්තුවේ Research Division එකෙන් ගත් තොරතුරු හා දත්ත පදනම් කරගෙන තමයි එම කරුණු ටික ඉදිරිපත් කළේ. ඒ research එකේ මොනවා හරි වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳව බලමු. හැබැයි, මට දීලා තිබෙන්නේ මේ වාර්තාවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. රජය ගන්නා සමහර තීන්දු පිළිබඳව එක පැත්තකින් අපි සතුටු වෙනවා. ඒවා අතරින් පළමුවැනි එක තමයි, එදා වේදිකාවල කියපු කාරණාවලට සීමා වෙන්නේ නැතුව ප්‍රායෝගික තැනට ඇවිල්ලා මේ රට පාලනය කරන්න රජය දැඩි උත්සාහයක නිරත වීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒකට ගෞරව කරනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රටට අහේනියක් වුණු ගිවිසුම සංශෝධනය කරනවා කිව්වා. හැබැයි, අද ඒ පිළිබඳව වචනයක්වත් කථා කරන්නේ නැහැ. ඒක ඒ විධියටම ඉස්සරහට අරගෙන යනවා. ඒක සුබවාදී දෙයක්. අපි ඒ පිළිබඳව ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඔබතුමා දන්නවා, මේ රට විනාශ වෙලා, නැති වෙන්න ගිය වෙලාවේ මේ රට භාරගත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් මහින්ද සිරිවර්ධන මැතිතුමා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ටිකදෙනෙකු ඉන්න බව. හැබැයි, අපට එදා වේදිකාවල ඇහුණේ ඒ අය පැය 24න් අත් අඩංගුවට ගන්නවා කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට සතුටට කරුණක් වුණා, පසුගිය දිනවල ගරු ජනාධිපතිතුමාගේ එහා පැත්තේ සිටිමින් මහින්ද සිරිවර්ධන මුදල් අමාත්‍යාංශ ලේකම්තුමා මේ අය වැය හදන කොට. අර කියපු කතන්දර ටික වේදිකාවට විතරක් සීමා කරලා; ඒ කතන්දර වේදිකාවට පමණක් තියලා ප්‍රායෝගිකව රට නිවැරදිව ගෙන යන්න ඔබතුමන්ලා ගන්නා උත්සාහය පිළිබඳව අපේ ගෞරවය හා ස්තුතිය පළමුවෙන්ම පුද කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ පවත්වා ගෙන යන සංචිත ප්‍රමාණය වර්ධනය කළ යුතුයි. අප බලාපොරොත්තු වන විධියට 2028 වන කොට නැවත වතාවක් ඒ ණය වාරික ටික ගෙවීම ආරම්භ කරනවා නම්, අවම වශයෙන් මේ ගැළපුම් ටික තියාගන්න නම් ඩොලර් බිලියන 1.5ක්වත් මේ රටේ ආර්ථිකයට එකතු කර ගන්න ඕනෑ. එසේ ඩොලර් බිලියන 1.5ක්වත් රටේ ආර්ථිකයට අලුතින් විදේශ ආයෝජන හැටියට එකතු කර ගත්තේ නැත්නම් අපි බරපතළ අර්බුදයකට, ප්‍රශ්නයකට යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන රජය බලයට ආවේ මේ රටේ සම්පූර්ණ වෙනසක් කරන්නයි. මේ පරිපාලන ක්‍රමවේදය දකින විධිය, මේ රට ඉදිරියට ගමන් කළ යුතු විධිය ආදි සියල්ල නිවැරදි කරන්න තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් හැදුවේ. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දකිනවා, අර

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුරාධ ජයරත්න මහතා]

පරණ කතන්දරයම සමහර තැන්වල ඒ විධියටම කියමින් කටයුතු කරගෙන යන බව. ඒකට හොඳම උදාහරණය මා කියන්නම්. අපි ස්වයං විවේචනයක් ඇතුවයි මේ කථා කරන්නේ. අපේ තිබුණු වැරදි හංගා ගෙන කථා කරනවා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එදා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා Port City ව්‍යාපෘතිය ගෙන ආවා. එතුමා චීන ජනාධිපති ෂී ජින් පිං මහත්මයා ගෙන්වා Port City ව්‍යාපෘතිය ආරම්භ කළා. හැබැයි, 2015දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඇවිල්ලා ඒක නතර කළා. ඊට පසුව එදා මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිතුමා ඩොලර් බිලියන 3ක විතර වටිනාකමක් ඇති Colombo Monorail ව්‍යාපෘතිය ගෙන ආවා. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ඇවිල්ලා ඒක නතර කළා. ඊට පසුව රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා බංකොලොත් වෙච්ච මේ රටට අදානිලා ගෙන්වා ඩොලර් බිලියන 1ක ආයෝජනයක් ගෙන ආවා. ඊට පසුව United Petroleum එක ආවා, ෂෙඩ් ටික හදන එකට. එයට ආයතන 26ක් ඉල්ලුම් කරලා තිබුණා. ඒවා අතරින් එක ආයතනයක් හැටියට තමයි United Petroleum එක තෝරා ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ෂෙඩ් භාර ගෙන මෙහෙයුම් කටයුතු කරන්න ආපු සමාගම් අතර හිටපු එක ආයතනයක් තමයි United Petroleum කියන්නේ. ඔවුන් විතරයි charging stations මුළු ලංකාව පුරා දමන්න ඕනෑ කියපු එකම ආයතනය. ඒක තමයි මේ රටේ අනාගතය; ඒක තමයි අපේ future එක. දුපතක් හැටියට තිබෙන මේ රටේ කිලෝමීටර 450ක විතර වාහන ධාවනය කරද්දී, charging stations ටිකත් ආවා නම්, ඩොලර් මිලියන 350ක් විතර පිට රටට ඉන්ධන වෙනුවෙන් දෙන මුදලින් සියයට 80ක් විතර ඉතිරි කර ගන්න අපට පුළුවන් වෙනවා. හැබැයි, ඒ විධියට future එකක් හදන්න ආපු United Petroleum එක අද අපට නැති වුණා. ඔවුන් එම කටයුත්තෙන් ඉවත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ බරපතළකම වන්නේ මොකක්ද? අදානි යන නොයන එක පිළිබඳව, එම ගිවිසුම පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා නම් ඒ පිළිබඳව විමර්ශනයක් කරන එක නොවෙයි, ප්‍රශ්නය. වැරදි කරපු කවුරුන් හෝ ඇමතිවරයෙකු වේවා, නිලධාරියෙකු වේවා ඉන්නවා නම් දඬුවම් කිරීම පිළිබඳව නොවෙයි, ප්‍රශ්නය. රොයිටර් පුවත් සේවයේ ප්‍රචාරය වුණාම, ලංකාවේ කරන ආයෝජනවලින් අදානි ඉවත් වෙනවා කියලා, ඒක මේ රට පිළිබඳ ප්‍රශ්නයක්. ඒක නතර කළේ මහින්ද රාජපක්ෂ ද, මෛත්‍රීපාල සිරිසේන ද, ගෝඨාභය ද, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ද කියන එක නොවෙයි ප්‍රශ්නය. ලෝකය අපව -ශ්‍රී ලංකාව- දකින්නේ ප්‍රතිපත්තියක් නැති රටක් හැටියට; අද දීපු අනුමැතිය හෙට අහිමි කරවන රටක් හැටියට; දීපු අනුමැතිය හරි ද කියලා සමාලෝචනය කරන්න කැබිනට් එකේ කමිටු පත් කරන රටක් හැටියට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කළාම මේ රටට නැවත ආයෝජන අරගෙන එන්නේ කවුද කියලා නිකමට හිතා බලන්න.

අද ආණ්ඩුවට අභියෝගයක් තිබෙනවා. අද අවම වශයෙන් ඩොලර් බිලියන 1.5ක inflow එකක් ඕනෑ. Inflow එක කෙසේ වෙතත් තිබිච්ච ආයෝජන ටිකක් නැති කරනවා නම්, ඉදිරියේදී බරපතළ ප්‍රශ්නයකට, අර්බුදයකට මේ රටට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ආණ්ඩුව හැටියට මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා අපි ගෞරවයෙන් ඉල්ලනවා. මේකට අනුර කුමාර දිසානායක මැතිතුමා, හිටපු අනෙකුත් ජනාධිපතිවරු, අරයා මෙයා කියලා චෝදනා කරන්න පුළුවන්. ඔබතුමන්ලා කියයි අපි රට කෑවා කියලා. අපි කියයි ඔබතුමන්ලා රට කෑවා කියලා. අවසානයේ මතක තබාගන්න, මේ රටට ආයෝජන ගෙනෙන මේ රට පිළිබඳව විශ්වාසය තබන සියලුදෙනා මේක ශ්‍රී ලංකාව හැටියටයි දකින්නේ. ඒ නිසා අපි එහේට මෙහේට ගහ ගෙන මරා ගත්තාට වැඩක් වෙන්නේ නැහැ. අපෙන් වෙච්ච වැරදි ටිකත් ඔබතුමන්ලා නිවැරදි කළේ නැත්නම් අපටත් වඩා බරපතළ අර්බුදයකට, ප්‍රශ්නයකට ඔබතුමන්ලාගේ රජය වැටෙනවා. ඒක තමයි ඇත්ත. ඒ නිසා අපි විශේෂයෙන් සිහිපත් කරනවා, මේ පිළිබඳව රජයක් හැටියට නිවැරදි අවධානය යොමු කරන්න කියලා.

ඊළඟ කාරණාව මෙයයි. අතිගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාව කියවනකොට අපි දැකපු එක දෙයක් තමයි, පහත් බිමක් සහිත බස් - low-floor buses - ගෙන්වන්න එතුමා රුපියල් බිලියන 3ක් වෙන් කර තිබෙන බව. ගරු සභානායකතුමනි, තව බස් 100ක් එකතු කරනවා කියලා ඔබතුමන්ලාගේ යෝජනාවක් තිබෙනවා. මේ කාරණාව හොඳයි, ගරු සභානායකතුමනි. ඒ පිළිබඳව අපට තර්කයක්, ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා ඒ උනන්දුව තිබෙන ඇමතිවරයෙක්. සුදුසු සභාපති කෙනෙක් පත් කර ගෙන ඔබතුමන්ලා ඉන්න තාක්කල් ඒ වැඩේ කරගෙන යයි. හැබැයි, අවසානයේ මේ ආයතනවලට මොකක්ද වෙන්නේ කියන එක පිළිබඳව අපි කල්පනා කර බලන්න ඕනෑ. ඒ නිසා මේ පිළිබඳව නිවැරදිව, අලුත් විධියකට සිතා බැලිය යුතුයි. ඩොලර් බිලියන 20ක් ගෙවලා SriLankan Airlines එක තියා ගන්න එක පිළිබඳව නොවෙයි මම කියන්නේ. අපි පසුගිය අවුරුද්දේ සමස්ත පාරවල් ටික හදන්නත් වෙන් කළේ ඩොලර් බිලියන 20යි. ඔබතුමන්ලාත් එහෙම කරනවා. ඔබතුමන්ලාටත් වෙන විකල්පයක් නැහැ. SriLankan Airlines එකේ ණය පියවමින් නැවත තබාගන්නවා කියන එක, ඒ අභියෝගය රජයකට මොන තරම් දුරට ගන්න පුළුවන්ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමන්ලා out-of-the-box හිතලා තීන්දු ගත්තේ නැත්නම් මේවා වෙනස් කරන්න බැහැ. අද පෞද්ගලික ආයෝජකයෝ කවුරු හරි ඉන්නවා නම්, සියයට 40ක් විතර ලංගම දෙන වැඩ පිළිවෙළක් හදන්න. මම කියන්නේ ඒකයි. සියල්ල ජනසතු වෙන එක ගැන නොවෙයි මම කියන්නේ. එතකොට ඔය low-floor buses එයි, Wi-Fi තියෙයි, A/Cත් තියෙයි, අලුතින් බස් 100ක්, 200ක් එකතු වෙයි. හැබැයි, රාමුවෙන් පිටම හිතලා ඔබතුමන්ලා මේකට විසඳුමක් හැදුවේ නැත්නම් *[බාධා කිරීමක්]* ඒ වාගේ සැලැස්මක් එක්ක යනවා නම් හොඳයි ගරු ඇමතිතුමනි. ඔබතුමන්ලා යම් දවසක්, කාලයක් ඇතුළත මේක හදයි. මම මේ කියන්නේ ඒ පිළිබඳව නොවෙයි. මම කියන්නේ, අවුරුද්දක් දෙකක් යනකොට මුහුණ දෙන්න වෙන තත්ත්වය ගැන. අපට අවදානම තිබෙන්නේ, 2028 වර්ෂයේ. 2028 වර්ෂයේ මේ ණය වාරික ගෙවා ගන්න බැරි තැනට රටේ සංචිත වැටුණොත්, මේ රටේ ව්‍යවසායකයන් ශක්තිමත් නොවුණොත්, අපි වැටෙන බරපතළ අනතුරුදායක තත්ත්වය අපි කාටවත් වෙනස් කරන්න බැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු කාරණා ටික සමස්තයක් හැටියට අය වැය ඉදිරිපත් කරන මේ වෙලාවේ අපි තේරුම් ගන්න ඕනෑ කියන එක සිහිපත් කරනවා.

ඊළඟට තිබෙන අභියෝගය මෙකයි. විදේශ ආයෝජන මේ රටට එනවා කියන කාරණාවටත් එහා ගිහින් දේශීය ව්‍යවසායකයන් ටික ආරක්ෂා කරගෙන ඔවුන්ට රට පිළිබඳ නැවත විශ්වාසයක් ගොඩ නැඟීම රජයට තිබෙන බරපතළ අභියෝගයක්. අපි පනවා තිබෙන tax ටික, අපි impose කරලා තිබෙන tax restrictions ඇතුළු මේ සියල්ල ගත්තාම, දේශීය ව්‍යවසායකයන් මේ රටට boost එකක් දෙන්න එකතු වෙයිද කියන එක පිළිබඳව අද ප්‍රශ්නයක් තිබෙනවා. අද රටේ වෙන ආයෝජන මොනවාද? රටේ අලුතින් වෙන නිෂ්පාදන මොනවාද? අපනයන ආදායම බිලියන 19කට ගේන්න, යටිතල පහසුකම් ටික - infrastructure - දියුණු කරන්න කොච්චර capital එකක් අපි ආයෝජනය කරන්න ඕනෑද? සමස්තයක් හැටියට මේ අය වැයෙන් මේ කාරණා ගැන හිතලා නිවැරදි තීන්දු තීරණ ගත්තේ නැත්නම්, සංඛ්‍යාලේඛන පොත ලස්සන වෙන්න පුළුවන්. හැබැයි,

ප්‍රායෝගිකව මහ පාරේදී, පොළොවේදී අපි සියලුදෙනාට බරපතළ අර්බුදයකට, ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා කියන එක මතක් කරමින් මේ වෙලාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Nishantha Samaraweera. You have ten minutes.

[අ.භා. 12.08]

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු අය වැය සම්බන්ධයෙන් විවාදය පැවැත්වෙන මේ මොහොතේ එයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම සතුටු වෙනවා.

මූලිකවම මේ අවස්ථාවේ මතු වෙච්ච කාරණා පිළිබඳවත් යම් අදහසක් ප්‍රකාශ කරන්න ඕනෑ. මීට කලින් කථා කළ විපක්ෂයේ ඒ කථිකයා අදහසක් ප්‍රකාශ කළා, අදානි සමාගම සම්බන්ධව. මම හිතන විධියට ඒ ගැනත් යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ආණ්ඩුවක් විධියට අපට මේ සමාගම සම්බන්ධ විශේෂ ගැටලුවක්, ප්‍රශ්නයක් නැහැ. හැබැයි, තොරතුරු සොයා බැලිය යුතුව තිබෙනවා. ඒ සියලු තොරතුරු ඇතුළත්ව තමයි මේ සාකච්ඡාව කරන්න ඕනෑ.

ඇමෙරිකාවෙත්, ඒ වාගේම තවත් රාජ්‍යවලත් ඒ සමාගමට එරෙහිව යම් නීතිමය ක්‍රියාමාර්ග පවතිනවා. ඒවා ඒ සමාගම විසින් උපයා ගත් දේවල් මිසක්, අප විසින් ගොඩනඟා දීපු දේවල් නොවෙයි. ලංකාව ඇතුළත අපට බලන්න තිබෙන්නේ, අපේ රටේ ඒ ආයෝජනයට ලබා දෙන ලංසුව අපේ ජනතාවට හිතකරද, නැද්ද කියන කාරණය විතරයි. ඒ අනුව තමයි, අපි කටයුතු කරලා තිබෙන්නේ. එහෙම නැතුව රජයක් විධියට අපි කිසිම ආයතනයක්, කිසිම සමාගමක් ආයෝජනවලින් එළවන්න කටයුතු කරලා නැහැ. ඒකත් මූලිකවම මතක් කරමින් තමයි මගේ කථාව පටන් ගන්න වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම අදත්, පසුගිය දවස් දෙක තුළත් සිදු වෙච්ච කථා බහ දිහා බැලුවාම, අපේ ප්‍රදේශවල තිබෙන කථාවක් මතක් වෙනවා. ගෙදරකට හදිසියේ ආවා ලු ටෙලිග්‍රෑම් එකක්. ඒකේ තිබුණා "රුපියල් පනහ ගත්තා" කියලා. නමුත්, ඒක කියවා ගත්තේ, "රපියෙල් පණ නහගත්තා" කියලා. ඒ මොහොතේ ඒ ගෙදරම මළ ගෙයක් බවට පත් වුණා. ඒ ජාතියේ විපක්ෂයක් තමයි අපට ඉන්නේ. අපි ඉදිරිපත් කරලා තිබෙනවා අය වැයක්. ඒ අය වැය නිසි කියවා ගැනීමකින් තොරව, අවබෝධ කර ගන්නේ නැතුව, ඇහැට දැකපු පමණින් ගොඩනඟන තර්ක ගණනාවක් මේ විවාදය ඇතුළේ අපි දකිනවා. අද උදේ මේ විවාදයට සම්බන්ධ වෙච්ච මන්ත්‍රීවරු ගොඩ නහපු සමහර තර්ක දිහා බැලුවොත්, අය වැය පිළිබඳ විවාදය පැත්තක තියලා මුළුමනින්ම කථා කළේ වෙනම ඒවා. ඒ නිසා අපි විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරන්න ඕනෑ, ඇත්තටම මේ විවාදය අය වැය විවාදයක් බවට පත් කර ගනිමු කියලා. ඒක අත්‍යවශ්‍ය කාරණයක්.

කොහොම වුණත් අපි දන්නා කාරණය හැටියට, මේ රටේ ජනතාව තමන්ගේ පරමාධිපත්‍ය බලය පාර්ලිමේන්තුවට පවරා තිබෙනවා. විශේෂයෙන්ම මුදල් පිළිබඳ සියලු කාර්යයන් මේ පාර්ලිමේන්තුව හරහා සම්මත වෙන්න ඕනෑ. ඒ ක්‍රියාවලියේදී මෙතෙක් පැවති ආණ්ඩු විසින් කරපු දේ තමයි, ඒ මුදල් බෙදා ගැනීමේ කටයුත්තේදී වැඩි පංගුව තමන් දෙසට තබා ගෙන ජනතාවට කන්හැන්දෙන් බෙදපු එක. ඒක තමයි මෙතෙක් තිබුණු සංස්කෘතිය. ඒක තමයි මෙතෙක් පවත්වාගෙන ආපු ආර්ථික වැඩ පිළිවෙළ. ඔය විවිධ නම්වලින් හැඳින්වූවත් ලංකාව ඇතුළත පැවති ආණ්ඩු විසින් පවත්වා ගෙන ගිය දේ තමයි, ආණ්ඩුව දෙසට වැඩියෙන් බෙදා ගෙන ජනතාවට දෙසට අඩුවෙන් බෙදපු එක. හැබැයි, අපි පළමුවැනි වතාවට තමන් දෙසට අඩුවෙන්ම බෙදාගෙන, තමන්ට තිබෙන සියලු වරප්‍රසාද අවලංගු කර ගනිමින් තමයි මේ ආර්ථික තත්ත්වය ඇතුළේ මේ තිබෙන, ශක්‍යතාව ඇතුළේ ජනතාවට දෙන්න පුළුවන් සියලු සහන සහ සියලු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න උත්සාහ කරමින් ඉන්නේ. ඒ නිසා මේක විශේෂිත අය වැයක්. ලංකා ඉතිහාසයේ මීට කලින් මෙහෙම අය වැයක් තිබිලා නැහැ. ඒ නිසා මේ අය වැය කියවාගන්න වෙන්නේම අන්න ඒ මූලික සන්දර්භය ඇතුළේ. ඒ නිසා සමහර අයට හිතේ අමාරු තිබෙන්න පුළුවන්. නමුත්, ඒක නොවෙයි ඇත්ත තත්ත්වය. මේ පාර්ලිමේන්තුව, එහෙම නැත්නම් මේ ආණ්ඩුව ලෙස අපි සියලුදෙනා තේරුම් ගන්න ඕනෑ දේ තමයි, මේ පාර්ලිමේන්තුවට පත් වෙච්ච කණ්ඩායම හෝ ඒ සියලුදෙනා විශේෂිත අය නොවෙයි කියන එක. හැබැයි, මෙතෙක් කාලයක් ඉදිරිපත් කරපු සියලු අය වැයවලදී කටයුතු කරලා තිබෙන්නේ, තමන් විශේෂිතයන් ලෙස සලකමින්. මෙවර ඒක අපි ඉවත් කරලා තිබෙනවා. ඒ වෙනුවට ජනතාව විශේෂිතයන් ලෙස සලකමින්, ජනතාවට සහන දීමේ වැඩ පිළිවෙළක් සහ රටේ ආර්ථික ක්‍රියාවලිය නැවත සක්‍රිය කිරීමේ දිශානතියට අපි කටයුතු කරමින් තිබෙනවා. අපි ආර්ථික යන්ත්‍රණය සක්‍රිය කරමින් ඉන්නේ. ඒ යන්ත්‍රය ක්‍රියාත්මක කරමින් ඉන්නේ. ක්‍රමානුකූලව ඒකේ වේගය වැඩි කර ගන්න උත්සාහ කරමින් ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අකර්මණ්‍ය වෙලා තිබෙන යන්ත්‍රයක් පණ ගන්වන්න ගියාම ඒක ලේසි වැඩක් නොවෙයි. තවම ඒකේ "කිරි කිරි" ශබ්ද තිබෙනවා. ඒකේ තවම මලකඩ කාපු තැන් තිබෙනවා. ඒකේ තවම අක්‍රිය තැන් තිබෙනවා. ඒ සියල්ල තිබියදී තමයි, මේ ආර්ථික යන්ත්‍රය පණ ගන්වන්න උත්සාහ කරමින් ඉන්නේ.

ඒ නිසා, අපි මේ අය වැය ඇතුළත යෝජනා කරපු බොහෝ දේවල් අන්න ඒ ආර්ථික යන්ත්‍රය සක්‍රිය කර ගැනීම සඳහා මැදිහත් වීම් ලෙස තමයි අපි දකින්න ඕනෑ. මෙතෙක් කාලයක් මොනවා හෝ නම්වලින් සඳහන් කළත්, ඒ මොන නම ඇතුළෙත් අක්‍රිය කරන ලද ආර්ථික ක්‍රියාවලියක තමයි මේ රට ගිලිලා තිබුණේ. ඇත්තටම විපක්ෂය මෙන්න මේ කාර්යභාරයේදී හැසිරෙන්නේ වගකීම් විරහිත විධියටයි. ඒක අද උදේත් දකින්න තිබුණා. මේ කෙළවරේ එක භූත කථාවක් කියනවා, අනෙක් කෙළවරෙන් තව භූත කථාවක් කියනවා. බහුභූත කථා තමයි තිබෙන්නේ. අපි යෝජනා කරනවා, ඇත්තටම බහුභූත නැතිව ඒකභූතවත් වෙන්න කියලා. හේතුව තමයි, අරමුණකට; ඉලක්කයකට යොමු වෙන්නේ නැති විසිරුණු විවාදයක් ඇතුළේ මේ රට ගොඩනඟා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන්න ලෙහෙසි වෙන්නේ නැහැ.

මේ අය වැය ඇතුළේ අපි බහුල ලෙස සාකච්ඡාවට ගත් කාරණයක් තමයි රාජ්‍ය සේවකයන්ගේ වැටුප. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ වෛද්‍යවරුන්, හෙද නිලධාරින් සහ එම කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගේම වැටුප් සම්බන්ධව බොහෝ සාකච්ඡා මතු වුණා. හැබැයි, අපි සියලුදෙනාම අමතක කරපු කාරණයක් තිබෙනවා. ඒ වාගේම සමාජයේත් - එළියේත් -

[ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා]

බොහෝ කණ්ඩායම් උත්සාහ කරමින් ඉන්නවා, මේ වැටුප් වැඩිවීම විශේෂිත දෙයක් නොවන ලෙස හඳුන්වා දෙන්න. නමුත් අපි පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ, extra duty paymentsවලින්, අතිකාල දීමනාවලින් වැටුප හදාගත්ත, ජීවත් වීමට සරිලන වැටුපක් ගොඩනඟාගන්න මහන්සි වෙච්ච වෛද්‍ය ප්‍රජාවක් සහ අනෙකුත් සමාජ කණ්ඩායම්වලට ඒකෙන් අත හැරිලා මූලික වැටුපෙන් තම වැටුප ගොඩනඟාගන්න පුළුවන් තත්ත්වයකට, දිශානතියකට අපි දැන් එය හරවා තිබෙන බව. විශේෂයෙන්ම 3/2016 චක්‍රලේඛය යටතේ අවසාන slab එක රුපියල් එක් ලක්ෂ හාරදහස් ගණනක් තිබුණු වෛද්‍යවරයාට මේ මාස 20ක කෙටි කාලය ඇතුළත - මහා කාලයක් නොවෙයි. අවුරුදු 2ක් කිව්වාට මාස 24කුත් නැහැ. ලබන අවුරුද්දේ නොවෙයි ඊළඟ අවුරුද්දේ ජනවාරි වෙනකොට - රුපියල් 184,000ට වැඩි වැටුපක් ලැබෙනවා. මූලික වැටුපට රුපියල් 80,000ක පමණ වැඩිවීමක් සිදු වෙනවා. ඒ වැඩිවීම, වැඩිවීමක් ලෙස දකින්න බැරි තරම් මේ සමාජය මේ තත්ත්වයට පත් වුණේ කොහොමද කියලා හිතාගන්න බැරි ප්‍රශ්නය තමයි අපට තිබෙන්නේ. විශේෂයෙන්ම incrementsවල වැඩිවීම් ආදී සියල්ලන් එක්ක ඔවුන්ගේ ජීවිතය ඉතාම හොඳ මට්ටමකට ගෙන යන දිශානතිය අපි ආරම්භ කරලා තිබෙනවා. දැන් ඒක ඇතුළේ බොහෝ විට සාකච්ඡාවට ගන්න උත්සාහ කරනවා, අර extra duty payment අනුපාතය, overtime payment අනුපාතය විවලනයට ලක් වෙලා තිබෙනවා කියන එක. හැබැයි, අපි සැලකිල්ලට ගන්න ඕනෑ කාරණය තමයි, ඒ වෙනස් වීම ඇතුළේ මෙතෙක් ලබපු අතිකාල දීමනාව හෝ අමතර රාජකාරී දීමනාව කිසිසේත්ම අඩුවක් වෙන්නේ නැහැ කියන එක. ඒ වෛද්‍යවරුන්ටත්, අනෙකුත් කණ්ඩායම්වලටත්, ව්‍යෘත්තීය සමිතිවලටත් තමන්ගේ කාර්යය සම්පූර්ණ කරගන්න බැරිවෙලා තිබෙන බව ඇත්ත.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා
(*மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர*)
(The Hon. (Dr.) Nishantha Samaraweera)
නමුත්, මේ මොහොතේ තිබෙන ආර්ථික තත්ත්වයට ගැළපෙන ලෙස, අපට දෙන්න පුළුවන් සියලුම දේවල්වලට ගැළපෙන ලෙස අපි සකස් කර දීලා තිබෙන මේ වැටුප් වැඩිවීම වෙනුවෙන් ඒ සියලු කටයුතු සූදානම් කර ගනිමු කියලා අපි ආරාධනා කරනවා. අපි කිසිසේත්ම බලාපොරොත්තු වෙන්නේ නැහැ, මේ තත්ත්වය මේ විධියට දිගටම ඉදිරියට ගෙන යන්න. මේ රටේ ආර්ථිකය යහපත් වෙනකොට මූලික වැටුප් ප්‍රමාණය තව තවත් වැඩි කර ගනිමින්, මූලික වැටුප සංවර්ධනය කර ගනිමින්, ජනතාවට ජීවත් වෙන්න පුළුවන් ආකාරයේ වැටුපක් - ඒ කියන්නේ අමතර කාලයක් වැය නොකොට පැය 8 හෝ පැය 6ක කාලය ඇතුළත තමන් කරන රාජකාරියට සරිලන ලෙස ජීවත් වීමට සුදුසු වැටුපක් - අත්පත් කර දීම දක්වා කටයුතු කරන්න මේ ආණ්ඩුව සූදානමින් ඉන්නවා. ඒ පිළිබඳව තමයි අපට සාකච්ඡා කරගන්න තිබෙන්නේ. මට අවස්ථාව ලබා දීම සම්බන්ධව බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Thilina Samarakoon. You have ten minutes.

[අ.භා. 12.19]

ගරු තිළිණ සමරකෝන් මහතා
(*மாண்புமிகு திலிண சமரக்கோன்*)
(The Hon. Thilina Samarakoon)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට පසුගිය දවසේ අය වැය ඉදිරිපත් කළාට පස්සේ විපක්ෂයේ මන්ත්‍රීවරු කථා බහ කරපු දෙයක් තමයි අපි වමට signal දාලා දකුණට හැරෙව්වාද, එහෙම නැත්නම් පසුගිය කාලයේ අපේ දේශපාලන ව්‍යාපාරය ඇතුළේ, ඒ වාගේම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයන් ඇතුළේ අපි කථා බහට ලක් කරපු දේවල් මේ අය වැයෙන් මඟ හැරියාද කියන දේ. ඇත්තටම එවැනි කිසිම මඟ හැරීමක් සිද්ධ කරලා නැහැ. ඔවුන් ලොකු ලොකු පොත්වල නම් කිය කියා ඉන්නවා වෙනුවට, අපේ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු මේ අය වැය ප්‍රකාශනය නිශ්චිතවම කියවා ගත්තා නම්, ඇත්තටම අපි රජයක් විධියට, නව ආණ්ඩුවක් විධියට කොයි තැනටද ගමන් කරමින් සිටින්නේ කියන දේ පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙනවා. ඉතින් ඔවුන් කළ යුතු වන්නේ වෙනත් ලොකු ලොකු theories ගැන කියනවා වෙනුවට, මේ අය වැය ලේඛනය හරියට අධ්‍යයනය කර බැලීමයි. එතකොට ඔවුන්ට යම් නිශ්චිත අදහසක් ලැබෙයි, ඇත්තටම අපි ඉදිරියේ කරන්නට බලාපොරොත්තු වෙන්නේ මොකක්ද, ඒ වාගේම අපේ අය වැය ඇතුළේ අපි සැබෑ ලෙසම බලාපොරොත්තු වුණු අරමුණු, ඉලක්ක මොනවාද කියන දේ පිළිබඳව. ඒ වාගේම මේක ඇතුළේ ඔවුන් අවබෝධ කරගත යුතු කාරණයක් තිබෙනවා. ඒ තමයි මේ වාගේ අසීරු අවස්ථාවක, මේ වාගේ අපේ ආර්ථිකය පහළට ගිය අවස්ථාවක, අවුරුදු ගණනාවක් පුරා අපේ රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙමින් ගමන් කර තිබූ මොහොතක ඉතාම උපක්‍රමශීලීව, ඉතාම නිවැරදිව අපේ අය වැය හිඟය යම්කිසි විධියකට ක්‍රමානුකූලව පවත්වා ගනිමින්, රටේ අනෙක් අවශ්‍යතා සඳහාත් මුදල් වෙන් කිරීම මේ විධියට කර ගැනීම ඇත්තටම ජයග්‍රහණයක් කියන කාරණය. ඉතින් මෙන්න මේ ජයග්‍රහණය පිළිබඳව, මේ යහපත් දේ පිළිබඳව ඔවුන් නිවැරදිව දකින්නට ඕනෑ කියන අදහස තමයි මේ අවස්ථාවේ මට ඉදිරිපත් කරන්න තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ අය වැය ඇතුළේ අපි අවබෝධ කරගත යුතු තවත් කාරණයක් තිබෙනවා. රජය මූලික කරගත්, එහෙම නැත්නම් රජය ප්‍රමුඛතම කාර්යයක් බවට පත් කර ගත් කාර්යයන් සඳහා අපි මුදල් වෙන් කළේ කොහොමද කියන දේ. ඒ පිළිබඳව යම්කිසි අවබෝධයක් ගත්තොත්, අපට මේවා තවත් වැටහේවි. විශේෂයෙන්ම සෞඛ්‍ය සම්බන්ධයෙන් ගත්තොත්, ඒ වෙනුවෙන් රුපියල් මිලියන 45,638ක් ගිය වර්ෂයට වඩා අපට වෙන් කර ගන්න හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම කෘෂිකර්ම හා පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කියන ක්ෂේත්‍ර සඳහා අපට රුපියල් මිලියන 54,000කට එහා ගිය මුදලක් වැඩිපුර වෙන් කර ගන්න හැකියාව ලැබිලා තිබෙනවා. ඒ වාගේම උසස් අධ්‍යාපන සහ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව රුපියල් මිලියන 12,000කට වඩා වැඩි ප්‍රමාණයක් ගිය අවුරුද්දට සාපේක්ෂව වෙන් කර ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම අපි සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා, ඒ අපේ රටේ ජනතාවගේ ආර්ථිකය. නිෂ්පාදන ආර්ථිකයක් දෙසට මේ ආර්ථිකය තල්ලු කරන මොහොතක කර්මාන්ත ක්ෂේත්‍රය සඳහාත් රුපියල් මිලියන 4,000කට වැඩි ප්‍රමාණයක් මේ අවුරුද්ද තුළ අපට වෙන් කර ගැනීමක් සිද්ධ කර ගන්නට පුළුවන් වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි මේ අය වැය තුළ සියලු ජන ප්‍රජාව ගැන සලකා බලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ අය වැයේ මම සංවේදී වෙච්ච තැනක් තිබෙනවා. ඒ තමයි යම් කිසි චෝදනාවන්වලට ලක් වෙච්ච බාල වයස්කාර චූදිත දරුවන් අධිකරණවලට රැගෙන යාමේ දී, ඒ

ප්‍රවාහන කටයුතු සඳහා අවශ්‍ය සුදුසු වාහන මිලදී ගන්නට රුපියල් මිලියන 250ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඉතිහාසය පුරා - 1948න් මෙහා - මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙච්ච අය වැයක් තුළ මෙවැනි කථා බහක් සිද්ධ වෙලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. ඉතින්, මෙන්න මේවා සමාජ සංවර්ධනයේ ප්‍රගමණයට ලක් කරන්නට පුළුවන් කාරණා. සාම්ප්‍රදායික විවේචන ඉදිරිපත් කරනවා වෙනුවට මෙන්න මේවා පිළිබඳව අවධානයට ලක් කරන්නට ඕනෑ.

ත්‍රිපෝෂ කර්මාන්තශාලාව දියුණු කරමින් ඉදිරියේ දී රටට අවශ්‍ය කරන ත්‍රිපෝෂ ප්‍රමාණය සැපයීම ගැනත්, ඒ වාගේම පෙර පාසල් දරුවන්ගේ කෑම වේල ගැනත්, පෙර පාසල් ගුරුවරියන්ගේ වැටුප් වැඩි කිරීමට අදාළ කාරණයන් ගැනත් මෙම අය වැයෙන් යෝජනා කර තිබෙනවා. 5 වසර සමත් ශිෂ්‍යාධාර ලබන දරුවන්ගේ මාසික දීමනාව රුපියල් 750 සිට 1500 දක්වා වර්ධනය කිරීමටත්, ඒ වාගේම වෘත්තීය අධ්‍යාපනය ලබන දරුවන්ට මාසිකව ලැබුණු රුපියල් 4,000 දීමනාව රුපියල් 5,000 දක්වා වැඩි කිරීමටත්, විශ්වවිද්‍යාල සිසුන් සඳහා ගෙවනු ලබන මහපොළ ආධාර වැඩි කිරීමටත්, ශිෂ්‍යාධාර - bursaries - රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කිරීමටත් යෝජනා කර තිබෙනවා. ඒ වාගේම වකුගඩු රෝගීන්ගේ මාසික දීමනාව රුපියල් 7,500 සිට 10,000 දක්වා වැඩි කිරීමටත්, වැඩිහිටි පුද්ගලයන් සඳහා වන මාසික දීමනාව රුපියල් 3,000 සිට 5,000 දක්වා වැඩි කිරීමටත්, ඒ වාගේම අනාථ දරුවන් විශේෂයෙන්ම රැඳවුම් නිවාස තුළ ජීවත් වෙන දරුවන්ට මාසිකව රුපියල් 5,000ක මුදලක් ගෙවීම වාගේ යෝජනා පිළිබඳව ගත්තාම, මේ අය වැය ඇතුළේ සියලු ජන ප්‍රජාව නියෝජනය කරමින්, ඒ වාගේම ඒ ජන ප්‍රජාවට අවශ්‍ය මූලික පහසුකම් සැපයීම සඳහා ආණ්ඩුව සැලකිය යුතු මැදිහත්වීමක් කර තිබෙන බව පෙනෙනවා. ඒ පිළිබඳව ඇත්තටම අපි සතුටු වෙන්නට ඕනෑ.

ඒ වාගේම පසුගිය අය වැයවලදී අපට අත්හැරුණු කාරණා තිබෙනවා. විශේෂයෙන්ම වී ගබඩා නවීකරණය සඳහා මෙවර අපි රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ආහාර සුරක්ෂිතතාවට අදාළව ගොවියෝ නිතරම කථා කරන ප්‍රශ්නයක් තිබෙනවා. ආහාර කල් තබා ගන්නේ කොහොමද, තමන් නිෂ්පාදනය කරන එළවලු ටික කල් තබා ගන්නේ කොහොමද කියන ගැටලුවට අද රටක් විධියට, සමාජයක් විධියට අපි මුහුණ දෙමින් තිබෙනවා. ඒ සඳහා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ cool room එකක් හදන්න රුපියල් මිලියන 100ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඇත්තටම ඒ ගැන අපි සතුටු වෙනවා. ඒ වාගේම හිඟුරක්ගොඩ වී මෝල් සංකීර්ණය නවීකරණය, පන්නෙගමුව වී මෝල් සංකීර්ණය නවීකරණය සඳහා රුපියල් මිලියන 25ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒවා ඇත්තටම සතුටු වෙන්න පුළුවන් කාරණා. පසුගිය කාලයේ රාජ්‍ය යන්ත්‍රණය තුළ බිඳ වැටෙමින් තිබුණු ව්‍යාපාර සහ ජනතාවගේ මූලික අවශ්‍යතා සැපිරීම සඳහා මේ ආණ්ඩුවේ මැදිහත්වීම පෙන්වන හොඳම තැන් තමයි ඒවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා රුපියල් බිලියන 38.6කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා, මේ අය වැය තුළ. ඒ වාගේම කිරි ගොවීන්ගේ ඵලදායීතාව සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 2,500ක්, ධීවර හා ජලජීවී වගාව සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේ විධියට ගත්තාම මේ අය වැය ඇතුළේ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීමට, අපගේ ගොවියා, ඒ වාගේම ධීවරයා, ඒ වාගේම වී මෝල් ආශ්‍රිත කර්මාන්ත පද්ධතිය ඉස්සරහට ගෙන යන්න අවශ්‍ය මැදිහත්වීම ආණ්ඩුවක් විධියට, රජයක් විධියට අපි සිද්ධ කරමින් ඉන්නවා. මෙන්න මේ දේවල් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අවබෝධ කරගෙනයි ඒ සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මතක් කළ යුතු තවත් වැදගත් කාරණයක් තිබෙනවා. කුරුණෑගල වෙන්න පුළුවන්, පොළොන්නරුව වෙන්න පුළුවන්, අනුරාධපුරය වෙන්න පුළුවන්, ඒ දිස්ත්‍රික්කවල මිනිසුන් සාමාන්‍ය ජන ජීවිතය ඇතුළේ මුහුණපාන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, වනඅලි ප්‍රශ්නය. ඒ වනඅලි ප්‍රශ්නය විසඳීම සඳහා කිලෝමීටර 1,456ක අලි වැට සංවර්ධනය කිරීම සඳහා ආණ්ඩුව විධියට අපි සැලකිය යුතු මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි වනාන්තරවල සීමා මායිම් ලකුණු කිරීමත්. පසුගිය අය වැය තුළ මේවා ගැන කථා බහ කළාද කියලාත් අපට සැකයක් තිබෙනවා. ඒ පිළිබඳවත් ආණ්ඩුව අවධානය යොමු කරලා තිබෙනවා. ඒ වාගේම තෘණ භූමි කළමනාකරණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ආණ්ඩුව විධියට සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කරලා, ජනතාවගේ අවශ්‍යතා සපුරන්න අවශ්‍ය මැදිහත්වීම මෙවර අපි කරලා තිබෙනවා.

පහුගිය කාලයේ අපේ දේශපාලන ව්‍යාපාරය සමාජය ඉදිරියේ නැඟී සිටි මොහොතක සමාජය තුළ සැකයක් ඇති වුණා, අපි ආගමට මොකක්ද කරන්නේ කියලා; ආගමට අපි ලබා දෙන තැන මොකක්ද කියලා. අපි ආගම නැති කරනවාද, ආගමට තිබෙන තැන විනාශ කරනවාද කියලා මතයක් අපේ විපක්ෂ මන්ත්‍රීවරු ඇතුළු කණ්ඩායම පසුගිය කාලයේ සමාජයට ගෙනහැර දැක්වුවා. හැබැයි අපි මේ අය වැය තුළ ඒවාටත් උත්තර දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව ආගමික කටයුතු සඳහා රුපියල් බිලියන 3.54ක් වෙන් කරලා තිබෙනවා. ඒ තුළ ආගමික ස්ථාන නඩත්තුව සහ සංවර්ධනය සඳහා විශාල මුදලක් වියදම් කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. සූර්යබල පද්ධති ගොඩනැඟීමට යෝජනා කරලා තිබෙනවා, ඒ වාගේම කැලණිය විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 130ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ආගමික ස්ථාන හා වන්දනාකරුවන් ගමන් කරන ස්ථාන සංවර්ධනය සඳහා රුපියල් බිලියන 1.27ක් වෙන් කරලා තිබෙනවා.

මෙන්න මේ විධියට අපට අය වැය තුළින් සියලු පාර්ශ්ව නියෝජනය වන විධියට, සියලු ජන ප්‍රජාවට අදාළ කාරණා සම්බන්ධයෙන් මුදල් වෙන් කරලා රට ඉදිරියට ගන්නට අවශ්‍ය මහ පාදා ගන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම මහා වාරිමාර්ග පද්ධති ගොඩනැඟීමටත්, එළවලු හා ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනයට අදාළ කාරණා හා ඒ සඳහා වන ස්ථාන සංවර්ධනයටත්, ජන ප්‍රජාවගේ ජීවිතයට ගැට ගැහෙන කාරණා සඳහාත් මෙවර මුදල් වෙන් කරන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ වාගේම ඊයේ අපේ ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා, ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා ආර්ථික සංවර්ධන බැංකුවක් ඇති කිරීම සම්බන්ධව මේ අය වැය තුළ කිසිම කථා බහක් සිද්ධ වෙලා නැහැ කියලා. ඒ සඳහා අපේ කර්මාන්ත විෂය භාර ඇමතිතුමා උත්තර දුන්නා. අපි මේ වන විටත් ව්‍යවසායකයන් ගොඩ නැංවීම සඳහා රාජ්‍ය බැංකු පද්ධතිය ආශ්‍රයෙන් ඒ කටයුතු සිද්ධ කරමින් තිබෙනවා. විශේෂයෙන්ම සංවර්ධනය සඳහා කැප වෙච්ච ප්‍රාදේශීය සංවර්ධන බැංකු ඉදිරියට ගෙනැල්ලා, ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා ව්‍යවසායකයන් 15,000කට වැඩි පිරිසක් ගොඩනඟන වැඩසටහන් අපි මේ තුළ ක්‍රියාත්මක කරමින් තිබෙනවා. ඒ සඳහා රුපියල් බිලියන 20කට වැඩි මුදලක් SME ණය යෝජනා ක්‍රමය සඳහා යෝජනා කරලා තිබෙනවා, රාජ්‍ය බැංකු පද්ධතිය හරහා ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න. ඒ නිසා නැවත බැංකු ආරම්භ කරනවා වෙනුවට රාජ්‍ය බැංකු පද්ධතිය හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්, ව්‍යවසායකයන් ගොඩනඟන වැඩ පිළිවෙළකට අදාළ අඩිතාලම අපි මේ වන විට දමා තිබෙනවා.

[ගරු තිළිණ සමරකෝන් මහතා]

ඒක නිසා නිශ්චිතයි, තහවුරුයි, අපේ ආර්ථිකය ඉදිරියට ගෙන යන වැඩ පිළිවෙළ අපි මේ අය වැය හරහා සිද්ධ කරලා තිබෙන බව. ඔබතුමන්ලා වෙන වෙන පොත්, වෙන වෙන ලොකු ලොකු theories කියවා ගන්නවා වෙනුවට අපේ ගරු අනුර දිසානායක ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු මේ අය වැය කියවාගන්න. ඒ තුළින් මේ අය වැය තුළ වූ අන්තර්ගතය හරියට හදුනාගන්න, කුහක නොවී මෙන්න මේ දේවල් හරියට අධ්‍යයනය කරන්න, අපි ජනතාවගේ ආර්ථිකය කොතැනටද ගෙනයන්නේ කියන දේ ගැන හරි අවබෝධයක් ගන්න. දැන් වෙන වෙන theories කියවනවා වෙනුවට, වෙන වෙන පොත් කියවනවා වෙනුවට අනාගත දිනයකදී මෙන්න මේ ගරු අනුර දිසානායක ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අය වැය කියවාගන්නට ඔබතුමන්ලාට සිද්ධ වෙයි කියන එක නිශ්චිතයි, තහවුරුයි, තීන්දුයි. මේ රට වෙනස් කරපු, මේ සමාජය ඉදිරියට ගෙන ගිය හොඳම අය වැය බවට නිශ්චිතවම මේ අය වැය පත් වෙනවා කියන අදහස මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Dilith Jayaweera. You have 17 minutes.

[අ.භා. 1.00]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය විසින් ඉදිරිපත් කරන ලද මංගල අය වැයෙහි විවාදයට සහභාගිවීමට ලැබීම සතුටට කරුණක්. මෙය සාම්ප්‍රදායික අය වැයක් වුණත්, සාම්ප්‍රදායික අර්ථයෙන් මෙය විවේචනය කිරීමට වඩා එයින් ඔබ්බට ගිය කරුණු කීපයක් මතු කිරීමට මා පළමුව කැමැතියි.

මෑතකදී අපේ අල්ලපු රටේ සීතාරාමන් මුදල් ඇමතිතුමිය අය වැයක් ඉදිරිපත් කළා. ඒ වාගේම සිංගප්පූරුවේ ලෝරන්ස් වොන්ග් මැතිතුමාත් අගමැතිවරයා වශයෙන් අය වැයක් ඉදිරිපත් කළා. මේ අය වැය දෙක දිහා බැලුවාම පේනවා, ඇත්තටම ඒ අය වැය ජාතිය පිළිබඳ ප්‍රකාශනයක්; ඔවුන්ගේ ජාතික විභවය, ශක්තිය, හැකියාව පිළිබඳව මුළු ලොවට හඬ ගා කියන ප්‍රකාශනයක් බව. ඒවායේ තිබෙන්නේ දර්ශනයක්. ඒවායේ තිබෙන්නේ ඔවුන්ගේ සමස්ත රාජ්‍යයම, සමස්ත ජාතියම ඉස්සරහට ගෙනයන වැඩ පිළිවෙළක්. ඇත්තටම මේ රටට ආදරය කරන, මේ රටේ මිනිස්සුන්ට ආදරය කරන දේශපාලනඥයන් හැටියට අපි බලාපොරොත්තු වෙන්නේ මේ රට යම් ගමනක් ඇවිල්ලා තිබෙනවා නම් ඒකෙන් ඉස්සරහට යන්නයි, to leapfrog; we have to go to the next level, Hon. Deputy Speaker. We have to think completely differently as to how to push our nation to the next level. I, of course, did not see any such elements in this Budget. I would like to give my point of view after studying how the developing countries and the developed countries are moving forward. ඔවුන් ඉදිරියට යන්නේ කොහොමද? විශේෂයෙන් අපේ අසල්වැසි රට කොහොමද මේ වේගයෙන් ඉදිරියට යන්නේ? මේ සඳහා තමයි අපි "ව්‍යවසායකත්ව රාජ්‍යය" කියන සංකල්පය ඉදිරිපත් කළේ. නැවත නැවතත් මා කියනවා, ව්‍යවසායකත්ව රාජ්‍යය යනු, ව්‍යවසායකයන් දියුණු කිරීම සඳහා පමණක් කටයුතු කරන රාජ්‍යයක්, ආණ්ඩුවක් නොව ඒ මනසින් කටයුතු කරන රාජ්‍යයකට කියන නමක් බව. That is, an entrepreneurial State. අපේ ජනතා විමුක්ති පෙරමුණ, එහෙම නැත්නම් NPP එක ඔවුන්ගේ දේශපාලන වේදිකාවේ මුලදී කියාගෙන ආවා, නිෂ්පාදන ආර්ථිකයක් මඟින් අපි මේ රට ඉස්සරහට ගෙනියනවා කියලා. ඊට පස්සේ ඔවුන් මේකට "ව්‍යවසායකත්වය" කියන වචනය යොදා ගත්තා. මම ඒ ගැන ගොඩක් සතුටු වෙනවා. හැබැයි, මේ "ව්‍යවසායකත්වය" කියන සංකල්පය වටහා නොගැනීම නිසා, එහෙමත් නැත්නම් අසද්භාවමය චේතනාවෙන්, with *mala fide* intention, that definition has completely gone in another direction.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට මෙම අය වැයෙන් වෙන් කර තිබෙනවා, රුපියල් බිලියන 13ක්. ආසන්න වශයෙන් දැන් අපේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ලක්ෂ 3ක් විතර වැහිලා ගිහිල්ලා තිබෙනවා. හදිසියේවත් වස බීලා මැරුණොත් ඒගොල්ලන්ට මිනී පෙට්ටියවත් ගන්න බැහැ. මොකද, ඒ ගණන බෙදුවාම එක් කෙනෙකුට රුපියල් 16,000ක් විතර තමයි හම්බ වෙන්නේ.

කොහොම වුණත්, මේ සමස්තය තේරුම් නොගැනීම තුළ තමයි මෙම ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ. ඒ වාගේම, අපේ මේ ව්‍යවසායකත්ව මනසින් කටයුතු කළා නම් මේ අය වැයේ තිබෙන්නට තිබුණු අර වෙනස ලගා කර ගැනීම සඳහා අවශ්‍ය වූ ඒ දර්ශනය කොතැනින් ද එන්නේ? දැන් මේ අය වැයට අදාළ පොත පත නිරීක්ෂණය කළාම හොඳටම පෙනෙනවා, මේක අපේ රනිල් වික්‍රමසිංහ මහත්මයා හදපු, ඒ ලේකම්තුමාම හදපු අය වැයේ ඒ columnsවලම තමයි තිබෙන්නේ කියලා. ඒක ටිකක් එහාට මෙහාට වෙනස් කරලා තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා කලින් තිබුණා, "විදාතා" කියලා එකක්. ඒක දැන් එතැනින් ඉවත් කරලා, වෙනත් තැනකට දාලා තිබෙනවා. මේ columns ටික එහෙමම තිබෙනවා. නමුත්, මට මේ දර්ශනය පෙනෙන්නේ නැහැ.

අනෙක් කාරණය මෙයයි. මම කියන මේ අනෙක් රටවලුත් සුබසාධනය සඳහා අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. නමුත්, අපේ අය වැයේ කොහොමද? මම හිතන විධියට මේක නුදුරු අනාගතයේ මැතිවරණයක් එන නිසා වෙන්නත් පුළුවන්. කොහොම වුණත් විශාල සුබසාධනයක් සඳහා ඒ වැය ශීර්ෂය තුළ ගොඩක් දේවල් පෙන්වාගෙන, පෙන්වාගෙන යනවා. නමුත්, එයින් අපේ රට ඉස්සරහට යන විධියක් පෙනෙන්නේ නැහැ. මේක මේ ආණ්ඩුවේ මංගල අය වැය නිසායි මම මෙහෙම කියන්නේ. අපේ රට ඉස්සරහට යන විධියක් ගැන මේ කිසිම ඉලක්කමක සඳහන් වෙලා නැහැ. ඒ නිසා නැති දෙයක් ගැන අපට සිහින මවන්නටත් බැහැ. එම නිසා මේ රටට ආදරය කරන සුභවසක් ශ්‍රී ලාංකිකයන්ගේ සිහින මේ අය වැය තුළින්ම මැරිලා ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ඔවුන්ට විශාල බලාපොරොත්තු ඇති කර ගන්නට බැහැ.

විශේෂයෙන්ම අපේ මහා පරිමාණ ව්‍යවසායකයෝ ගැන අපේ ගරු ඇමතිවරු, මන්ත්‍රීවරු දන්නවා. එතුමන්ලා ඒ ව්‍යවසායකයන් පෞද්ගලිකව හඳුනනවා. ඔවුන් මේ අය ළඟින් ආශ්‍රය කරනවා. ඒ ගොඩක් අය දැන් ද්විත්ව පුරවැසියෝ. ඒ ගොඩක් අය දැන් ලංකාවේ නැහැ. කොළඹ කේන්ද්‍රීය මහා පරිමාණ ව්‍යාපාරිකයෝ දැන් ඉන්නේ වෙන රටවල. නමුත්, ඔවුන් මෙහේ ව්‍යාපාර පවත්වාගෙන යනවා. හැබැයි, අපේ අපනයන ආදායමෙන් භාගයක් විතර ඒ රටවල නවතිනවා. කොහොම වුණත්, ඒ මිනිසුන්ටත් ආපහු ලංකාවට ඇවිල්ලා මේ රට නව ගමනක් යන්න ලෑස්ති වෙලා තිබෙනවා කියලා පෙනෙන්න ගත්තොත් තමයි, අපි කියන ඒ ගැම්මක් ඇති රටක් බිහි වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි උත්සාහ කරන්නට ඕනෑ, එකතු වෙලා වැඩ කරන්න. විපක්ෂයේ හිටියාට මම ඒකයි කියන්නේ, දැන් මේ ආණ්ඩුවට සුන්දරම අවස්ථාව ලැබිලා තිබෙනවාය කියලා. මේ ආණ්ඩුව බලයට පත් නොවී, මේ ආණ්ඩුවේ දැන් ඉන්න මන්ත්‍රීවරු කිහිපදෙනෙක් විපක්ෂයේ හිටියා නම්, මේ මාස 6ට අද වෙනකොට පෙළපාළි කීයක් පවත්වලාද? එහෙම වුණා නම් අද කොච්චර පෙරළි කරලාද? එහෙම නම් මේ අය වැය සම්බන්ධයෙන් ඔවුන් අද මෙතැන පෙරළි පෙරළී කොච්චර කෑ ගහයිද? කරන කරන කථාවට කෑ ගහන්නේ නැතිව ඉඳීවිද? නමුත්, අපි මේ ප්‍රශස්තව කරුණු දක්වමින් උත්සාහ කරන්නේ, අපි කොහොමද ඉස්සරහට යන්නේ කියන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ළඟ තිබෙන "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන පොතයි, අය වැය පොතයි කියන්නේ කිසිම සම්බන්ධයක් නැති පොත් දෙකක්. මේ පොතේ තිබෙන කිසිවක් අනෙක් පොතේ නැහැ. ඒක තමයි කියන්නේ, පිටකවරය විතරක් බලලා කියලා. කොහොම වුණත් මේ ව්‍යවසායකත්ව අභිප්‍රේරණය සඳහා වූ පරිසරයක් නිර්මාණය කර ගැනීමට ඔබ කලින් සිහින මවපු සමාජවාදී ආර්ථික ක්‍රමයත්, දැන් කියන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයත්, එහෙම නැත්නම් ඔබ නොදැනම රනිල් වික්‍රමසිංහ කියන ඔබතුමන්ලාගේ හාමු මහත්මයාගේ, ඔබතුමන්ලාගේ න්‍යායාචාර්යතුමාගේ ප්‍රතිපත්තියේ ගියත් කිසිම ගැටුමක් නැහැ. දැන් ඔබතුමන්ලා නියෝලිබරල්, සමාජවාදය පටලවා ගෙන කියන්න හදනවා මම දැක්කා, "නැහැ, නැහැ මේක සමාජවාදී අය වැයක්" කියලා. අපි කවුරුවත් බොරු කියන්නට ඕනෑ නැහැ. මේකේ කිසිම සමාජවාදයක් නැහැ. මේකේ සමාජවාදයක් තිබෙනවා නම්, මේ අය වැය කියෙවිවාට පස්සේ ගමේ ඉන්න නිර්ධන පාන්තිකයාට දැනෙන්නට ඕනෑ, අන්න අපේ අය වැයක් ලංකාවේ අවුරුදු 77කට පස්සේ ඇවිල්ලා තිබෙනවා කියලා. මේ පොතේ තිබෙන මොන ශීර්ෂය යටතේද ගමේ මිනිහාට මේක දැනෙන්නේ? අස්වැසුම සහනාධාරය රුපියල් 1,500ක් වැඩි කරපු නිසාද? එහෙම නැත්නම්, වකුගඩු රෝගීන්ට තවත් රුපියල් 2,000ක් දුන්නු නිසාද? මාසික වැටුප රුපියල් 900කින් වැඩි කරපු නිසාද? කොතැනටද දැනුණේ? කොහේටවත් දැනෙන්නේ නැහැ. ඒක නිසා මම දකින විධියට නම් මේක සම්පූර්ණයෙන්ම නියෝලිබරල් අය වැයක්. හැබැයි, අපට ප්‍රශ්නයක් නැහැ. ඒවා පරණ සාම්ප්‍රදායික වචන. ඒවා අත්හැරලා දාන්න. අපට ඕනෑ ව්‍යවසායකත්ව රාජ්‍යයක් හදලා මේ රටේ තාරුණ්‍යයට පණ දෙන්න; මේ රටේ තාරුණ්‍යයට අපේක්ෂා ඇති කරන්න; මේ රට හැර ගිය ව්‍යවසායකයන් නැවත ගෙන එන්න; මේ රටට ආයෝජන ගෙන එන්න සහ මේ රට ගැන විශ්වාසයක් ඇති කරන්න.

අපේ ජනාධිපතිතුමාගේ අය වැය කතාවේ තිබෙන කරුණු අතර සංචාරක ව්‍යාපාරය ගැන සඳහන් වනවා. මම දිගින් දිගටම කියන්නේ, සංචාරක ව්‍යාපාරය දිහා ව්‍යවසායකත්ව මනසකින් බලනවා නම්, we need to brand our destination. Tourists go behind a dream brand. අනුරාධපුරයේ බෝඩ් ගහලා මේක කරන්න බැහැ. ලෝකයේ අනෙකුත් තරගකාරී ගමනාන්ත - destinations - එක්ක, we need to compete. The Maldives is an example. Those destinations have become massive brands; ඒවා සන්නාම. අපේ රටට අද එන්නේ වියදම් කරන්න බැරි සංචාරකයන්. ඇයි ඒ? අපි අපේ ගමනාන්තය brand එකක් කරලා නැහැ. ඒ නිසා අපි කියනවා, අපේ මිතුරන්ට මේ ගැන හිතන්න කියලා. මේක සන්නාමයක් කරනතාක් කල් අපට එන්නේ ඩොලර් අඩුවෙන් වියදම් කරන සංචාරකයන්.

ඒ වාගේම මේ කාරණත් මම කියන්න ඕනෑ. අය වැය පරතරය ට්‍රිලියන 2.2ක්. විශාල අය වැය පරතරයක් තිබෙනවා. මේක පියවා ගන්න ක්‍රමයක් අපි සාකච්ඡා කරලා නැහැ. අපි අපේක්ෂා කරනවා, පිට රටින් ආධාර ගන්නට. දැන් අපට ආධාර දෙන්නෙත් නැහැ. ණය තමයි ගන්න තිබෙන්නේ. හැබැයි ණය ගන්න විධියකුත් නැහැ. මොකද, අපි ratingsවලත් bottom එකේ ඉන්න නිසා. තවත් අපට මේක කරගන්නට විධියක් නැහැ. මේ සඳහා වැඩ පිළිවෙළකුත් නැතිව අපි ඉස්සරහට යන්නේ කොහොමද? ඒකට සාධනීය කරුණු මේ අය වැයේ කොතැනද ඉදිරිපත් වුණේ, කොහොමද මේක වෙන්නේ කියලා.

මම හිතන්නේ, මේ අය වැය අනුව අපි උසස් අධ්‍යාපනයට වියදම් කරන්නේ රුපියල් බිලියන 118ක්. දැන් මේ රුපියල් බිලියන 118 වියදම් කරනකොට ඔබ ගණනය කර බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. We are spending almost Rs. 540 billion on sending our Sri Lankan students abroad. One can say that that is not on record. Of course, not. The money is being transferred by so many informal ways, including *"Undial"*. එතකොට මේ අය වැයෙන් යෝජනා කරන රුපියල් බිලියන 118 වාගේ තුන්හතර ගුණයක් අපේ ළමයින් විදේශයකට ගිහිල්ලා ඉගෙන ගන්න සහ ඒ ආශ්‍රිතව ඉගෙන ගන්න වියදම් කරනවා. අපි මේක ආරක්ෂා කර ගන්න අපේ අධ්‍යාපන පද්ධතියේ සුසමාදර්ශී විවෘත වෙනසක්, -අපේ ඔය වචන පැත්තකින් දාලා ඒකටත් මොකක් හරි වචනයක් දමන්න පුළුවන්. අපේ ලාල් කාන්ත ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ. නමුත්, එතුමා හිටියා නම් අපිට වචනයක් දමන්න තිබුණා. මේකට පෞද්ගලික අධ්‍යාපන ක්‍රමය නොකියා වෙන මොකක් හරි වචනයක් දමන්න පුළුවන්. විවිධ වචන දාලා නේ දැන් වැඩේ යන්නේ. ඒක කළේ නැත්නම් මේ රට වැටෙනවා. මේ සල්ලි දිගින් දිගටම පිට රටට යනවා. ළමයින් විතරක් නොවෙයි තාත්තලාත් ගිහිල්ලා. අපේ ආයෝජකයෝ, ව්‍යවසායකයෝ ඔක්කොම ළමයින් එක්ක පිට රට ඉන්නේ ඒකයි. ළමයින්ට එහේ උගන්වනවා. මොකද, මෙහේ විශ්වවිද්‍යාලවල ළමයින්ට ඉගෙන ගන්න දෙන්නේ නැහැ. කාලකණ්ණි නවක වධයක් තිබෙනවා, මෙතුමන්ලාගෙත් ආශීර්වාදය ඇතිව. ඒ වාගේම හැම දාම වැඩ වර්ජන තිබෙනවා. දෙයියනේ, කියලා දැන් නැහැ. ඒවා නැති නිසා ඉස්සරහට සාධනීය ලෙස බලන්න කියලා අපි ඒගොල්ලන්ට කියන්න ඕනෑ.

ඒ වාගේම මේ කාරණයත් මම කියන්න ඕනෑ. මේ රට ඉස්සරහට ගෙනියන්න කියලා ගෝමීක කියන අපේ මිතුරා පිට රට ඉඳලා පර්යේෂණ සඳහා ආවා මම දැක්කා, බිලියනයක් විතර දාලා තිබෙනවා. එතුමාගේ පඩි නඩි ටික ගෙවා ගන්නත් මදි. If we are to move forward progressively, Sir, we need to invest money in research and development and in data collection. Where do you have that cited in this Budget? People have been waiting for this Government to present a revolutionary, wholesome Budget for us to push this nation to the next level and which discusses how we can get the youth to participate in economic activities with vigour and energy.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බිලියන 7ක් විතර ගෙනෙන විදේශගත ශ්‍රමිකයාට මොකක් හෝ වැඩ පිළිවෙළක් සකස් කර

[ගරු දිලිත් ජයවීර මහතා]

දෙන්න තවම සාකච්ඡා කරමින් ඉන්නවා. අපි ඒගොල්ලන්ගෙන් රුපියල් 10ක් විතර ගන්නවා, මේක convert කරනකොට. වෙන රටවල රුපියල් දෙකයි. ශත 90 ගන්න ඒවාත් තිබෙනවා. ඒ වාගේ දේවල් කථා කරලා ඔවුන් උනන්දු කරවන්නට ඕනෑ. Duty-free allowance එක පොඩ්ඩක් වැඩි කරනවා කිව්වාට වැඩක් නැහැ. අපි කරන්න ඕනෑ ඒගොල්ලන්ට දැනෙන වෙනසක්. අපේ විදේශගත ශ්‍රමිකයා නොසිටින්නට දැනටමත් අපි වැටිලා ඉවරයි.

මේ රට ඉස්සරහට යනවා නම්, අර කියන සාම්ප්‍රදායික ක්‍රමය වෙනස් කරනවා නම්, ඒ වාගේම මේක ප්‍රශස්තව ගොඩනඟා ගන්න අපට අවශ්‍ය නම්, ඒ සඳහා අවශ්‍ය වන කේන්ද්‍රීය වෙනස මොකක්ද, කොහොමද ඒක වෙන්නේ, මෙන්න සිදු වන විධිය කියලා පෙන්වනවා නම්, අපට උදාහරණ ගොඩක් ඉදිරිපත් කරන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් බලන්න, ගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් සියයට 80ක් වියදම් කරනවා. එතුමා ඒ දවස්වල මෙතැනදී පොළොවේ හැපෙන්න ගත්තා, ජනාධිපති යටතේ සිදු කරන වැය වැඩියි කියලා. එතුමා යටතේ මුදල්, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය තිබෙනවා, ආරක්ෂක අමාත්‍යාංශය තිබෙනවා. මේ දෙක එකතු කරලා ගත්තාම හතෙන් පහක්, ඒ කියන්නේ ඒ දෙකට සියයට 80ක් වියදම් කරනවා. එතකොට කොහොමද වෙනස් වෙන්නේ? එතුමාට මම යෝජනා කරනවා, ඕක පැත්තකින් තියලා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ගන්න කියලා. අරගෙන වියදම් කරන්න මේ රටට පණ දෙන්න. මේ රටේ මිනිසුන්ට පණ දෙන්න. ක්ෂුද්‍ර හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින්ට පණ දෙන්න. ඒ සඳහා ඔබතුමා නායකත්වය දෙන්න. එතකොට අපි ඔබතුමාත් එක්ක හිටගන්නවා. එහෙම නැතුව ඔබතුමාත් පරණ විධියටම අර column එකෙන් ගළවලා මේ column එකට දාලා, එතැනින් හංගලා මෙතැනට දාලා කරනවා කියන්නේ මේක කෙරෙන වැඩක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව මම කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මේක පොඩි වැරදීමක්ද කියලා මම දන්නේ නැහැ. මට තේරෙන්නේ නැහැ, මේක වුණේ කොහොමද කියලා. ගරු ජනාධිපතිතුමාගේ Clean Sri Lanka වැඩ පිළිවෙළට රුපියල් මිලියන 50ක් වැය වෙනවා කියලා අය වැය ඇස්තමේන්තුවල තිබෙනවා. එතකොට, එතුමාගේ අය වැය කථාවේදී එතුමා කිව්වා, රුපියල් මිලියන 5,000ක් වෙන් කරනවා කියලා. මට වැරදුණාද, නැත්නම් printing mistake එකක්ද කියලා මම දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩ පිළිවෙළ වෙනුවෙන් ලබා දෙන්නේ රුපියල් මිලියන 50යි නම්, මට කියන්න ඕනෑ අර අපේ කාමර 150ක හෝටලයක් තිබුණා, ඒකේ හුණු ගාන්න; paint කරන්නත් ඒ ගණන මදි. මට පෙනෙන්නේ එක්කෝ ඒක වැරදීමක්, එහෙම නැත්නම් හිතා මතාම අර චාමර සම්පත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඇතුළේ ඉන්න නිලධාරීන් රුපියල් මිලියන 50ක් කියන්නේ අඩු ගණනක් නිසා එතුමාගේ කථාවට මිලියන 5,000ක් කියලා දාලා තිබෙනවා. එක් වතාවක් "ඉන්දියානු මහද්වීපය" කියලා කිව්වා වාගේ, එතුමාව අමාරුවේ දමන්න කථාව ලියලා දීලා වාගේ තමයි මට පෙනෙන්නේ.

ඒ කොහොම වුණත් ජනාධිපතිතුමාගේ මේ අය වැයෙන් අපි ඩිජිටල් වැඩ පිළිවෙළක් බලාපොරොත්තු වුණා. ඒ වැඩ පිළිවෙළ අපි යෝජනා කරපු එකක් බව ඇත්ත, අපි ඒක කරන්න හදපු බව ඇත්ත, අපේ හාන්ස් මැතිතුමාත් දැන් එතුමා ළඟ ඉන්න එකත් හොඳයි. හැබැයි, මේ අය වැය තුළ ඒ ඩිජිටල් වැඩ පිළිවෙළ මට පෙනෙන්නේ නැහැ. එවකට යෝජනා වෙලා තිබුණා MOSIP එක. ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉන්නකොට "ඉන්දියාවෙන්, දත්ත හොරකම් කරලා අපි මහා විනාශයකට ඇදගෙන යනවා" කිව්වත් දැන් එතුමා සම්පූර්ණයෙන් ඒකෙන් ඉවත් වෙලා කියනවා, ඒකම තමයි හොඳ කියලා. අපිත් කියනවා, ඒක හොඳයි. හැබැයි, ඒ වෙලාවේ ඒකට රුපියල් බිලියන 14ක් වියදම් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Hon. Deputy Speaker, please give me one more minute.

ඊට පස්සේ ඒක ප්‍රතිශෝධනය කළා, රුපියල් බිලියන 24කට. මම හිතන්නේ, දැන් ඒකට රුපියල් බිලියන 30ක් විතර වියදම් වෙයි. ඒක ඉන්දියාවෙන් ආධාරයක් හැටියට එනවා නම් හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙලාවේ යෝජනා කළේත් ආධාරයක් හැටියට තමයි. ඉතින් මම දන්නේ නැහැ දැන් අපේ ගරු ජනාධිපතිතුමාගේ ඒ තිබෙන අන්තර් අවබෝධය කොහොමද කියලා. කොහොම වුණත් එහෙම වෙනවා නම් හොඳයි.

Also, I must say sorry to the Hon. Deputy Speaker. Last time when I was speaking, I did not hear you when you asked me to conclude my speech. That did not go down very well on social media. So, I say sorry to you, Sir, and thank you for giving me time to speak.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sunil Rathnasiri?

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර දේවල් නොදැනුවත්කමින් වරදිනවා, සමහර දේවල් හිතා මතා වරද්දනවා. ඔය දෙකම අපට නිවැරදිව තේරුම් ගන්න පුළුවන්. Clean Sri Lanka වැඩසටහන සඳහා මූල්‍යමය දායකත්වය බැලුවොත්, 2025 වර්ෂයේ රාජ්‍ය අය වැය මඟින් ඒ සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වාගේම, මෙතුමාට අමතක වෙලා තිබෙනවා, 2024 වසරේ ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 3,773ක් වෙන් කරනකොට, 2025 වර්ෂයේ එය රුපියල් මිලියන 2,538ක් දක්වා අඩු කර තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මෙතුමන්ලාට අමතක වෙලා තිබෙනවා, එම වැය ශීර්ෂයේ ප්‍රාග්ධන ව්‍යයම් විධියට 2024 වර්ෂයේදී රුපියල් මිලියන 2,828ක් වෙන් කරලා තිබුණු බව. හැබැයි, අපේ ජනාධිපතිතුමා ඒ සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 454ක් විතරයි. සමස්තය ගත්තොත්, පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරයා එතුමාගේ වැය ශීර්ෂයට වෙන් කර ගත්තා රුපියල් මිලියන 6,601ක්. එදා රුපියල් මිලියන 6,601ක් වෙන් කරන කොට අත උස්සපු, ඒක අනුමත කරපු අය අද කෑ ගහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම වැය ශීර්ෂයට 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 2,992යි අපේ ජනාධිපතිතුමා වෙන් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could you make your comments short? We need to economize on time.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිතා මතා ඒ වැරැද්ද කළා කියන එක තමයි මට පැහැදිලි කරන්න වුවමනා වුණේ. බොහොම ස්තුතියි.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
I rise to a point of Order, Hon. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dilith Jayaweera?

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Sir, I was only seeking for a clarification because I cannot see the numbers in this book given to us. And, if he can show me the numbers, it will be helpful. Hon. Member, what you are saying must be there somewhere else, but as per this book given to us, it is not there. In the Budget Speech, it is mentioned. So, that is what I am showing you. Probably, the way I read it out was wrong, but I did not intend to mislead. Thank you very much.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Jagath Manuwarna. You have ten minutes.

[අ.භා. 1.21]

ගරු ජගත් මනුවර්ණ මහතා
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිතා මතා කරුණු විකෘති කරන එක රස්සාව කර ගත්තු අය පාර්ලිමේන්තුවට ආවාම මේවා සාමාන්‍යයි. රස්සාව විධියට හිතා මතා කරුණු විකෘති කරන එක television channels දමා ගෙනයි කළේ. එහෙම නේද? ඉතින් මෙතැනට ඇවිල්ලා පොඩ්ඩක් එහෙන් මෙහෙන් එකක් දෙකක් කිව්වාට අපි එච්චර ගණන් ගන්න ඕනෑ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොහොම වුණත් අද දවසේ මේ පාර්ලිමේන්තුවේදී අපේ ආණ්ඩුවේ මංගල අය වැය පිළිබඳව කරුණු දැක්වීමට මට වෙලාව වෙන් කර දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දවස උණුසුම් කළ ප්‍රවෘත්තියක් තිබෙන නිසා ඒ ගැනත් වචනයක් කියන්න ඕනෑ කියා මම කල්පනා කළා. ඊයේ දවසේ අලුත්කඩේ උසාවියේ දී ඉතාම බේදනීය සිදුවීමක් වුණා. අපරාධකරුවෙකු ලෙස චෝදනා ලැබූ පුද්ගලයෙකු උසාවිය තුළ දී තවත් වෙඩික්කරුවෙකු විසින් වෙඩි තබා ඝාතනය කෙරුණා. ඊයේත්, අදත් මේ පාර්ලිමේන්තුවේදී අපි දැක්කා, මෙය ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට වෙච්ච දෙයක් විධියට හුවා දක්වන්න විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් උත්සාහ ගනිමින් ඉන්න ආකාරය. නමුත් මෙය ලංකා ඉතිහාසයේ පළමු වතාවට වෙච්ච දෙයක් නොවෙයි. 2004 වර්ෂයේ මට මතක හැටියට ධම්මික අමරසිංහ කියන පාතාලයේ නම ගිය අපරාධකාරයෙකුට මේ ආකාරයෙන්ම උසාවිය ඇතුළේ දී නීතිඥවරයෙකු විධියටම වෙස් වලාගෙන ආපු පුද්ගලයෙකු විසින් වෙඩි තබා ඝාතනය කළා. එදා ඔහු උසාවියේ පෙනී සිටියේ එවකට ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සිදු වූ බරපතළ මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් හෝ කුමන හෝ වංචාකාරී කටයුත්තක් සම්බන්ධයෙන් උසාවියට තොරතුරු කියන්නයි. ඒ මොහොතේ ඔහුට වෙඩි තබා ඝාතනය කළා. ඝාතනය කළ පුද්ගලයා කිව්වේ මොකක්ද? ඔහු කිව්වේ, එවකට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිවරියගේ අරක්ෂාවේ යොදවා සිටි "බැද්දගාන සංජීව" ඝාතනය කිරීමේ පළිය ගන්න ආවා කියලායි. එතකොට අපට තේරෙන කාරණය තමයි එදා ඒ අපරාධකරුවන්, ඒ ඝාතකයින් රොක් වෙලා හිටියේ ඒ දේශපාලනඥයින් වටේයි කියන එක. ඊයේ වූ සිදුවීම අපි මේ රටේ ආණ්ඩුව භාර ගත්තාට පස්සේ අලුතින් වෙච්ච දෙයක් වාගේ හුවා දක්වන මන්ත්‍රීවරුන්ට - විරුද්ධ පක්ෂයේ සියලු දෙනාට- මම කියන්න කැමතියි ඉතිහාසය විසින් ගොඩ නඟපු ඒ අපරාධ රැල්ලේ යම් යම් අවතාර තවමත් මේ රටේ හොල්මන් කරමින් සිටින බව. අපි කියන්න කැමැතියි, අප බලය ගත්තේ ඒවා නවත්වන්නට බව.

ඊයේ මේ සිදුවීම වූ වහාම අපේ ගරු අධිකරණ අමාත්‍යතුමා ඒ පරිශ්‍රයට ගියා. පැය 24ක් යන්නට මත්තෙන් -පැය 6ක් ඇතුළත- ඒ වෙඩික්කරුවා අත්අඩංගුවට ගන්න අපි සමත් වෙලා තිබෙනවා. හැබැයි, මීට පෙරත් මේ රටේ ඝාතන සිද්ධ කරලා, අපරාධ සිද්ධ කරලා, බෝම්බ ගහලා, මිනිස්සු මරලා තිබෙනවා. අන්තිමේදී ඒ මිනිස්සු ආණ්ඩුත් කරලා තිබෙනවා. අවුරුදු ගණනක් ගිහිල්ලා ඒ අපරාධකරුවන් අදටත් අත්අඩංගුවට ගන්න බැරි තත්ත්වයට පත් කරලා තිබෙනවා. සමහර සාක්ෂි අතුරුදන් කරලා තිබෙනවා. ඒක නිසා අපි ඒ අයට කියනවා අප මේ ආණ්ඩුව ගත්තේ ඒ අපරාධ සංස්කෘතිය නවත්වන්න බව.

ඒකත් එක්කම කරළියට ආපු තවත් මාතෘකාවක් තමයි, "ජාතික ආරක්ෂාව අනතුරේ" කියන එක. ආපහු සැරයක් ඒ පරණ record එක අපට ඇහෙන්න ගත්තා. අපි ජාතික ආරක්ෂාවට වෙන් කරලා තිබෙන මුදල ප්‍රමාණවත් නැහැ, ඒකෙන් ජාතික ආරක්ෂාව තව තවත් අනතුරට යන්න පුළුවන් කියන සාකච්ඡාව නැවත ගේන්න යනවා. මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව මදි, ඒ නිසා ආරක්ෂාව ලබා දෙන්න කිව්වා. අපි එදාත් කිව්වා, අදත් කියනවා තුවක්කුවලින් විතරක් රටක මහජන ආරක්ෂාව තහවුරු කරන්න බැරි බව; ජාතික ආරක්ෂාව තහවුරු කරන්න බැරි බව. අපි රුපියල් බිලියන 404ක් ජාතික ආරක්ෂාව වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. මේ මුදල සම්බන්ධයෙන් කෙනෙකුට

[ගරු ජගත් මනුවර්ණ මහතා]

තර්ක කරන්න පුළුවන්, "මේක මදි, එහෙම නැත්නම්, මේක ප්‍රමාණවත් නැහැ" කියලා. හැබැයි අපි විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා "ජාතික අයවැය - 2025 පුරවැසි අයවැය" පොතෙහි "ජාතික ආරක්ෂාව" කියන පරිච්ඡේදයට කලින් පරිච්ඡේදයත් කියවා බලන්න කියලා. එම පරිච්ඡේදයේ මාතෘකාව තමයි, "සාමකාමී සහ සාධාරණ සමාජයක් සඳහා කැපවීම" කියන එක. මහජන ආරක්ෂාව ගැනත්, පුද්ගලයින් ලියාපදිංචි කිරීම ගැනත් එහි සඳහන් වෙනවා.

අපි ඊයේ පෙරේදා ඩිජිටල් හැඳුනුම්පත පිළිබඳ කාරණය සාකච්ඡාවට ගෙනාවා. ඔබතුමන්ලා ඊයේ දකින්න ඇති, උසාවියේ ඒ සිදුවීමට අදාළ වෙඩි තියපු පුද්ගලයා නීතිඥයකුගේ හැඳුනුම් පතක් පාවිච්චි කර තිබෙන බව. ඒකේ QR code එකකුත් තිබෙනවා. හැබැයි, අප හඳුන්වා දෙන්න හදන ඩිජිටල් හැඳුනුම් පත භාවිතයේ තිබුණා නම් ඒ උසාවි සංකීර්ණයට ඇතුළු වීමේදී වෙන්න පුළුවන්, තව තැනකට යන වෙලාවක වෙන්න පුළුවන් ඒ හැඳුනුම් පත පාවිච්චි කළා නම් ඔහුට ඔහුගේ අනන්‍යතාව සහවන්න බැරි වෙනවා. ඒක නිසා තමයි මා කියන්නේ ජාතික ආරක්ෂාවට වෙන් කරන මුදලට අදාළ ඉලක්කමෙන් විතරක් රටක ජාතික ආරක්ෂාව තක්සේරු කරන්න යන්න එපා කියලා. එතැනින් එහාට ගියාම, "සාමකාමී සහ සාධාරණ සමාජයක් සඳහා කැපවීම" කියන chapter එකේ තව කාරණා ගණනාවකට මුදල් වෙන් කර තිබෙනවා. පොලිස් සහ විශේෂ බලකා, නීතිය හා සාමය, අධිකරණය, ජාතික ඒකාබද්ධතාව, කාන්තා හා ළමා, බන්ධනාගාර, සංස්කෘතිය ආදිය ඒවායෙන් කීපයක්.

අපි හැම දාම කියන කාරණයක් තිබෙනවා. කලාව, සංස්කෘතිය වාගේ විෂයයන් ගැන අවධානය යොමු නොකිරීම හේතු කොට ගෙන මේ සමාජයේ සිදු වන දේවල් සම්බන්ධයෙන්, අනෙකා සම්බන්ධයෙන් සංවේදී බවක් නැති මිනිසුන් බිහි කිරීමත් එක්ක තමයි මේ විධියේ අනාරක්ෂිත තත්ත්වයක් රටක ගොඩ නැහෙන්නේ. අනෙකාට ආදරය කරන, අනෙකාට කරුණාව දක්වන, අනෙකාගේ දේවල් සම්බන්ධයෙන් සංවේදී සමාජයක් හදන්න නම් කලාව, සංස්කෘතිය වාගේ විෂයයන් සම්බන්ධයෙන් ද අපේ අවධානය යොමු වෙන්න ඕනෑ. මෙම අය වැය යෝජනා තුළම තිබෙනවා ජෝන් ද සිල්වා සමරු රඟහල අලුත්වැඩියා කිරීම සඳහා මුදල් වෙන් කිරීම ගැන. ඊට අදාළව තවත් එක කාරණයක් විතරයි මම මේ කියන්නේ. මමත් නාට්‍යකරුවෙක්. අපට මතකයි එදා අප නාට්‍යයක් පෙන්වන්න ඉතාම අඩු මුදලකට මේ රටේ නාට්‍ය ශාලාවක් කුලියට ගත්තා නම්, ඒ ජෝන් ද සිල්වා සමරු රඟහල බව. ඒක වහලා අදට අවුරුදු 20කට ආසන්නයි. තාමත් ඒකේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසාන කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. රටක නාට්‍ය කලාව වෙන්න පුළුවන්, සාහිත්‍යය වෙන්න පුළුවන්, සිනමාව වෙන්න පුළුවන්, ඒ වාගේ දේවල්වලින් තමයි මිනිසුන්ගේ හද මනස පෝෂණය කරන්නේ. ඒවා මඟින් තමයි රටක අපරාධ අඩු කරන්න පුළුවන් වන්නේ. එහෙම නැතිව මිනිසුන්ගේ අතට තුවක්කු දීලා, රටේ පොලීසිය, හමුදාව පාරවල් දිගේ දාලා ජාතික ආරක්ෂාව තහවුරු කරන්න පුළුවන් කියලා තවමත් හිතනවා නම්, ඒක අසත්‍යයක්. ඒක එහෙම නොවෙයි. අපි මේ රටේ මිනිසුන්ගේ සිත් සුවපත් කරන්න ඕනෑ.

ඔබතුමන්ලා දන්නවා ලෝකයේ 20වන සියවසේ සිදු වුණු විශාලම පුස්තකාල ගිනි තැබීම මොකක්ද කියලා. Biblioclasm කියලායි ඒකට කියන්නේ. මට මතක හැටියට ඒ biblioclasm එක සිද්ධ වුණේ 1981දියි. ඒ සිදුවීම තමයි යාපනය පුස්තකාලයට ගිනි තැබීම. යාපනය පුස්තකාලයට ගිනි තිබ්බා. 20වන සියවසේ ලෝකයේ සිදු වුණු බරපතළම පුස්තකාල ගිනි තැබීම විධියට එය ලෝක ඉතිහාසයේ සටහන් වෙලා තිබෙනවා. ඇයි අපි අපේ අය වැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කරන්නේ, යාපනය පුස්තකාලය ගොඩනඟන්න? අපට සිද්ධ වෙලා තිබෙනවා ඉතිහාසය විසින් අපට ඉතිරි කරලා ගිය දේවල්, ඉතිහාසය විසින් අපට ඉතිරි කරලා ගිය සිත් පැරවීම්, පරණ තුවාල, කාංසාවන්, ක්ෂතිමය මතකයන් සුවපත් කරන්න; අවසන් කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

ගරු ජගත් මනුවර්ණ මහතා
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)
හොඳමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපට සිද්ධ වෙලා තිබෙනවා ඒ පැරුණු සමාජය සුවපත් කරන්න. අය වැයක් කියන්නේ ඉලක්කම්, මුදල් පමණක් නොවෙයි. අර කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයයි, මේ අය වැයයි අතර ලොකු පරස්පරයක් තිබෙනවා කියලා. නැහැ, ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියපු දේවල්ම තමයි මේ අය වැයෙන් ක්‍රියාවට නංවන්නේ.

අපි කිව්වා සාධාරණ සමාජයක්, ඒ කියන්නේ කිසිම විධියකින් තමන්ගේ ජාතිය, ආගම, තමන් ජීවත් වන ප්‍රදේශය හේතු කොට ගෙන වෙනස් කොට සලකන්නේ නැති, සමාන කොට සලකන සමාජයක් හදනවා කියලා.

උතුර, දකුණ යා කරන ඒ වැඩේට වැදගත් වෙන්නේ නැද්ද යාපනය පුස්තකාලය නැවත ගොඩනැංවීම? මේවා දේශපාලනය විසින් ඉතිහාසයේ අපට ඉතුරු කරලා ගිය තුවාල. අපි මේවා සුවපත් කරන්න ඕනෑ නැද්ද? අය වැයක් කියන්නේ මිල, ඉලක්කම් පමණක් නොවෙයි කියලා මම කියන්නේ ඒ නිසායි.

නීතියේ බිඳ වැටීම, උසාවියේ සිදු වෙන අපරාධ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කථා කරන සමහර නීතිඥ මහත්වරු, ඊයේ උසාවියට නීතිඥයෙකු ලෙස වෙස් වලාගෙන ගිය පුද්ගලයා වාගේම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේත් වෙස් වලාගෙන. පාර්ලිමේන්තුවේත් ඉන්නවා, නීතිඥයෝ විධියට වෙස් වලාගෙන ආපු අය. අපි ඒ අයට කියන්න කැමැතියි, ඔබතුමන්ලාත් වග කියන්න ඕනෑ මේ රටේ නීතිය කෙරෙහි මිනිසුන්ගේ විශ්වාසය බිඳ වැටීම සම්බන්ධයෙන්.

අපි කිව්වේ නැහැ, පොහොසත් රට - ලස්සන ජීවිතය එක දවසින් ගොඩ නඟනවා කියලා. ඒක ක්‍රමිකව කරන්න ඕනෑ දෙයක්. ඒක කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීනව කරන්න ඕනෑ වැඩක්. මේ වසරේ අය වැය ඒ සඳහා ගන්න පුළුවන් සියලු උත්සාහය අරගෙන තිබෙන බව අපට විශ්වාසයක් තිබෙනවා. ඒක නිසා අපි විරුද්ධ පක්ෂයේ මහත්වරුන්ට කියනවා, කලබල වෙන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Jagath Manuwarna, your time is up.

ගරු ජගත් මනුවර්ණ මහතා
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපට මේ රටේ මිනිස්සු ජන වරමක් දීලා තිබෙන්නේ ඒ මිනිසුන්ගේ වුවමනා එපාකම් ඉෂ්ට කරන්න; ඒ ජනතා අභිලාෂය ඉෂ්ට කරන්න. ඒක නිසා විරුද්ධ පක්ෂයේ මහත්වරු කොච්චර කලබල වුණත් අපට කරන්න දෙයක් නැහැ. ජනතාව අපි කෙරෙහි විශ්වාසය තියලා තිබෙනවා. ඔවුන් අප කෙරෙහි තැබූ විශ්වාසය ඒ ආකාරයෙන්ම රකින බව පොරොන්දු වෙමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Muneer Mulaffer. You have 13 minutes.

[අ.භා. 1.31]

ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අප රජයේ මංගල අය වැය පිළිබඳ විවාදයේදී කථාවක් පැවැත්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. මේ සභාව තුළ මන්ත්‍රීවරයෙකු කළ කථාවකට සවන් දුන්නාම මට ශුද්ධ වූ "අල්-කුර්ආන්" පාඨයක් මතක් වුණා. ඒ තමයි, "ලීමා තකූලූන මාලා තඅලූන්" කියන එක. "ඔබලා නොකරන දේවල් පිළිබඳව ඔබ ඇයි හඬ නඟා කියන්නේ" එකයි එහි කියන්නේ.

අපි හැමකෙනාම දන්නවා, පාලකයා යනු සමස්ත පුරවැසියන්ම සතුටින් තබන කෙනාට කියලා. අය වැයක් ඉදිරිපත් කිරීමේදී සමස්ත රටවැසියා ගැනම හිතලා, සියලු ජන ප්‍රජාව ගැන හිතලා, ඒ සියලුදෙනාට සාධාරණයක් ඉෂ්ට වෙන විධියට ඒ අය වැය තිබෙන්න ඕනෑ. අපි හැමකෙනාම දන්නවා, අය වැයක් කියන්නේ රට මේ තිබෙන තත්ත්වයෙන් වෙනස් තත්ත්වයකට යොමු කිරීම සඳහා ඉදිරිපත් කරන දෙයක් කියලා. අද අපේ රට ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන්, දේශපාලන වශයෙන් තිබෙන තත්ත්වයට වඩා, ඊළඟ අවුරුද්දේ ඊටත් වඩා යහපත් තත්ත්වයකට අපේ රට පත්විය යුතුයි. හැබැයි, අපි සියලුදෙනාම දන්නවා, අපේ රටට නිදහස ලැබිලා අවුරුදු 76ක්, 77ක් වෙනවා කියලා. ඒ කාලය දෙස ආපසු හැරී බලනකොට අපි කොතැනද ඉන්නේ කියන එක අපි හැමකෙනාම හොඳින්ම දන්නවා.

පසුගිය කාලයේ අය වැය ලේඛනවලින් ඒ පාලකයා සතුටු කළේ තමන්ගේ පවුලේ අය, තමන්ගේ හෙංචයියන්, තමන් වටා හිටපු ඒ මාෆියා ව්‍යාපාරිකයන්. ඔවුන් සතුටු කරන අය වැය ඉදිරිපත් කළා. ඒකෙන් ඒ පාලකයන් සතුටට පත් වුණා. ඒ පවුලේ අය ධන කුවේරයන් බවට පත් වුණා. ඔවුන් වටා හිටපු ව්‍යාපාරිකයනුත් විශාල ලෙස හම්බ කර ගත්තා. හිරිකිතයි, කැතයි, මේ රටේ මහජනතාව රෝගවලින් සුවපත් කර ගන්න ලබා දෙන ඒ බෙහෙත්වලිනුත් හොරකම් කරන තත්ත්වයකට ඒ පාලකයෝ පත් වුණා.

මේ රටේ ජනතාවට මේ අය වැය කොහොමද දැනෙන්නේ කියන කාරණාව එක්තරා පුද්ගලයෙක් ලියලා තිබෙන කාරණාවක් උපුටා දක්වලා මම කියන්න කැමැතියි. ජනාධිපතිතුමන් ආමන්ත්‍රණය කරමින් ඔහු මෙසේ ලියා තිබුණා.

"ආදරණීය සහෝදරයා, ඔබතුමාගේ වැය ශීර්ෂය උපරිමයට කපාගෙන, ආරක්ෂාව අඩු කරගෙන, සුපිරි නිල නිවාස අතහැරලා, ජනතාව තෝරලා එවපු මන්ත්‍රී සහෝදරවරු එක්ක ගහන ගේම සෑහෙන්න දැනුණු දවසක්."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක බංකොලොත් වෙච්ච රටක්. මේ රට ආර්ථික වශයෙන් විශාල පීඩාවකට පත් වී තිබෙනවා. එවැනි තත්ත්වයකදී පවා පසුගිය පාලන සමය තුළ ඇමතිවරු කොතරම් මුදල් කොල්ලයක් කර තිබුණාද කියන එක මේ රටේ ජනතාව දන්නවා. වෙන දා ජනාධිපතිවරු තමන්ට වෙන් කර ගත් ප්‍රතිපාදන මදි කියලා නැවත නැවතත් ප්‍රතිපාදන වෙන් කර ගන්නා තත්ත්වයක් තිබුණේ. හැබැයි, අපේ ජනාධිපතිතුමන් එතුමාගේ වැය විශාල වශයෙන් කපා හැර තිබෙනවා.

මේ ගරු සභාව තුළ ආර්ථික මොඩල පිළිබඳව කථා කළා. විශේෂයෙන් ධනවාදය, සමාජවාදය කියන ආර්ථික මොඩල පිළිබඳව කථා කළා. ලෝකය තුළ විවිධ අවස්ථාවල, විවිධ ක්ෂේත්‍රවල, යුගයට ගැළපෙන මතවාද, දර්ශන ගොඩනැඟෙනවා. ඒක ආගමික ක්ෂේත්‍රවලත් වෙන්න පුළුවන්. ලෝකයට ගැළපෙන ලෙස අපි වෙනස් වෙන්න ඕනෑ. මම එයට උදාහරණයක් කියන්නම්. අපි හැමදෙනාම දන්නා ලෝක ප්‍රසිද්ධ ආයතනයක් තමයි, කොඩැක් අයතනය. 1997දී එම ආයතනයේ 160,000ක සේවක සංඛ්‍යාවක් හිටියා. 1990-2000 දශකයේ ලෝකයේ ඡායාරූපකරණයෙන් සියයට 85ක් පමණ සිදු කර ඇත්තේ කොඩැක් කැමරාවලින්. එය එතරම් ප්‍රසිද්ධ නිෂ්පාදනයක්. එය එතරම් ප්‍රසිද්ධ සමාගමක්. පසුගිය වසර කිහිපය තුළ ජංගම දුරකථන කැමරා භාවිතය ඉහළ යෑමත් සමඟ කොඩැක් කැමරා සමාගම වෙළෙඳපොළෙන් ඉවත් වුණා. සම්පූර්ණයෙන් බංකොලොත් වූ කොඩැක් සමාගම ඔවුන්ගේ සියලු සේවකයන් ඉවත් කළා. මම හිතන විධියට, ලෝකයට ගැළපෙන සේ අපි වෙනස් නොවෙනවා නම්, පරණ දේවල් නැවත නැවත මතක් කරමින්, තලු මරමින් අපි කටයුතු කරනවා නම් අපටත් ඒ තත්ත්වය ඇති වනවා. නිදහසෙන් පසුව අපේ රටේ තිබුණු ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකත් අද වනකොට බංකොලොත් තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

මෙම අය වැය පිළිබඳව ඊයේත්, අදත් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අදහස් සහ විවිධ කරුණු කාරණා දැක්වුවා. සමහර මන්ත්‍රීවරු රටේ අභිමානය පිළිබඳව වාගේම ආයෝජකයන් මේ රටින් හැරී යෑම පිළිබඳවත් කථා කළා. එතුමන්ලාට අමතක වෙලා එතුමන්ලාගේ ආණ්ඩු කාලයේ, එතුමන්ලාට බලය තිබුණු අවස්ථාවේ මේ රට සම්පූර්ණයෙන්ම බංකොලොත් කළ බව. අධිකරණයෙන් පවා ආර්ථික ඝාතකයන් ලෙස තීන්දු ලබපු පිරිස් අද රටේ අභිමානය ගැන, රටේ ආයෝජන අවස්ථා පිළිබඳව කථා කරනවා. රට බංකොලොත් කළාම ආයෝජකයෝ එනවාද? සාමාන්‍යයෙන් බංකොලොත් රටකට කවුරුවත් මූල්‍ය පහසුකම් සහ ආයෝජන අවස්ථා ලබා දෙන්නේ නැහැ. එතුමන්ලාට මම ඒක මතක් කර දෙන්න කැමැතියි.

තවත් සමහර ගරු මන්ත්‍රීවරු මීනී මැරුම් පිළිබඳව විශාල ලෙස හඬ නැගුවා. අපි අතීතය හාරඅවුස්සා බැලුවාම අපරාධකාරයන් පෝෂණය කරන දේශපාලන සංස්කෘතිය ගොඩනැඟුවේ කවුද කියන වග අද මේ මීනී මැරුම් පිළිබඳව කථා කරන අය මතක් කර බැලීම ඉතා වටිනවා. අපි හැමකෙනාම දන්නවා, තමන්ගේ පැවැත්ම වෙනුවෙන් සමහර අවස්ථාවලදී ප්‍රාදේශීය සභා, පළාත් සභා, පර්ලිමේන්තු වරම් ලබා දෙන තරමටම ඒ අපරාධකරුවන් පෝෂණය කළේ මොන දේශපාලන සංස්කෘතියෙන්ද කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා පසුගිය රජයන්වල සිටි ඇමතිවරු මොන තරම් රාජ්‍ය සම්පත් භුක්ති විඳින්නා ද කියලා. මේ රටේ ජනතාවට ඒක හොඳටම දැනෙනවා. ජනතාවට දැනෙන නිසා තමයි ඔවුන් පැහැදිලිවම ඒක කියන්නේ. අපත් මේ වෙර දරන්නේ අප වෙනුවෙන් යමක් එකතු කර ගන්න නොවෙයි. රටේ දියුණුවට අවශ්‍ය කරුණු කාරණා ඉෂ්ට කරගෙන, මේ රට යහපත් තැනකට පත් කර ගැනීම උදෙසායි අපි වෙර දරන්නේ.

[ගරු මුනීර් මුලාෆර් මහතා]

இந்தச் சபையில் கிழக்கு மாகாணம் சம்பந்தமாகப் பலரும் தமது கருத்துக்களை முன்வைத்தார்கள். வடக்கு மாகாணத்துக்கும் மலையகத்துக்கும் நிதியை அள்ளி வழங்கியிருக்கின்ற அரசு, கிழக்கு மண்ணைப் புறக்கணித்திருக்கிறது என்ற ஆதங்கத்தை எதிர்த்தரப்பினர் வெளிப்படுத்தினார்கள். பல வருட காலம் அமைச்சுப் பதவிகளில் அவர்கள் இருந்தபோது, கிழக்கு மாகாணத்துக்கு எத்தகைய அபிவிருத்தித் திட்டங்களை மேற்கொண்டார்கள் என்பதை நான் இந்த இடத்தில் வினவ ஆசைப்படுகின்றேன்.

இந்த நாட்டில் வாழுகின்ற அனைவரையும் உள்ளடக்கிய ஒரு வரவு செலவுத்திட்டமாகவே இந்த வரவு செலவுத்திட்டம் அமைந்துள்ளது. சந்தோசமான விடயம் யாதெனில், இந்த நாட்டில் தொடந்து புறக்கணிக்கப்பட்டு வந்த வடக்கு மற்றும் மலையக மக்களுக்கு நியாயம் கிடைத்துள்ளதுதான். இதனை இவர்கள் அங்கீகரிக்கின்றனரா? உண்மையிலேயே இந்த நாட்டில் வாழுகின்ற அனைவரையும் இலங்கையர்களாகப் பார்க்கின்ற அரசு என்ற அடிப்படையில், அனைவருக்கும் வாய்ப்புக் கொடுத்திருக்கின்றோம். கவலைக்குரிய விடயம் யாதெனில், இவர்கள் இந்த வரவு செலவுத்திட்டத்தைச் சரியாக வாசித்து விளங்கிக்கொள்ளவில்லை என்பதுதான். அவ்வாறுதான் எனக்குத் தோன்றுகின்றது. இந்த வரவு செலவுத்திட்டத்தைச் சரியாக வாசித்து விளங்கிக்கொண்டால், இந்த அரசாங்கம் கிழக்கு மாகாணத்துக்கு எந்தளவு நிதியை ஒதுக்கீடு செய்திருக்கிறது என்பதை அவர்கள் தெளிவாக விளங்கிக்கொள்வார்கள். கல்முனை பிரதேசத்தில் இருக்கின்ற விளையாட்டு அரங்கொன்றைப் பூர்த்திசெய்வதற்காக 150 மில்லியன் ரூபாயையும் Eastern Universityக்கு 450 மில்லியன் ரூபாயையும் ஒதுக்கியிருக்கிறது. திருகோணமலை மற்றும் அம்பாறையில் ETU building அமைப்பதற்காக ஒரு வைத்தியசாலைக்குத் தலா 300 மில்லியன் ரூபாய் வீதம் 600 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது. அதேபோன்று, திருகோணமலையில் dockyard அமைப்பதற்காக 1,500 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது.

மேலும், கிழக்கு மாகாணத்தின் உட்கட்டமைப்பு அபிவிருத்திக்கு கிட்டத்தட்ட 400 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது. சுவாமி விபுலானந்த அழகியல் கற்கைகள் நிறுவகத்துக்கு 300 மில்லியன் ரூபாயையும், அம்பாறையில் cardiology unit ஒன்றை ஆரம்பிப்பதற்காக 200 மில்லியன் ரூபாயையும் ஒதுக்கியிருக்கிறது. மேலும், உகனை - மகா ஓயா பாதையைப் புனர்நிர்மாணம் செய்வதற்குப் பாரியளவு நிதியை ஒதுக்கியிருக்கிறது. அதுமாத்திரமன்றி, கிழக்கு மாகாணத்தில் மழை நீரைச் சேமிப்பதற்கான திட்டத்துக்கும் இந்த அரசாங்கம் நிதி ஒதுக்கியிருக்கிறது. மீள்குடியேற்றத்துக்காகவும், மீன்பிடித்துறை சார்ந்து அந்தப் பிரதேசத்தில் அபிவிருத்திகளை மேற்கொள்வதற்காகவும் இந்த அரசாங்கம் பல மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறது. இவ்வாறு இந்த நாட்டின் அனைத்துப் பிரதேசங்களையும் -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Muneer Mulaffer, your time is up now.

ගරු මුනීර් මුලාෆර් මහතා
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
நன்றி! முடிக்கிறேன்.

மැතිවරණ වේදිකාවලදිත්, මේ අය වැය තුළිනුත් අපි පැහැදිලිව කියපු දෙයක් තමයි, රටේ විනාශයට ප්‍රධානම හේතුව දූෂණය, නාස්තිය, අල්ලස සහ අසමගියයි කියන එක. මේ රටේ ජනතාවට පොරොන්දු වෙච්ච විධියට අල්ලස පිටු දැකලා, දූෂණය මේ රටෙන් තුරන් කරලා, ජනතාවගේ බදු මුදල් ඉතාම පරිස්සමෙන් ආරක්ෂා කරමින් නිවැරදි තැන ආයෝජනය කරන වැඩ පිළිවෙළක් මේ අය වැය හරහා අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණය සඳහන් කරන්න කැමතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැම දාමත් මේ රටේ ප්‍රවෘත්ති විකෘති කරමින් ජාතිවාදය අවුස්සලා, ජාතිවාදය වෙනුවෙන් කඩේ ගිහින් මේ රට විනාශ කරපු අය අපේ අය වැයේ සමහර අඩු පාඩු හොයනවා. හැබැයි, ඔවුන්ට මේ රටේ ජනතාව හොඳ පාඩමක් උගන්වා තිබෙනවා. අපි මේ අය වැය හරහා මේ රට අලුත් තැනකට යොමු කරමු. මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have 13 minutes.

[பி.ப. 1.45]

ගරු (ආචාර්ය) වී.එස්. රාධාකෘෂ්ණන් මහතා
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இவ்வருட வரவு செலவுத்திட்டத்தின் இரண்டாவது வாசிப்புமீதான இன்றைய விவாதத்திலே கலந்துகொள்வதிலே மகிழ்ச்சியடைகின்றேன். தற்பொழுது பேசிய பாராளுமன்ற உறுப்பினர் அவர்கள் சொன்னார், "குற்றம் கண்டுபிடிப்பதைவிட எதிர்க்கட்சியினருக்கு வேறு வேலையில்லை" என்று. எதிர்க்கட்சியில் இருந்தால் கட்டாயம் அதனைச் செய்யத்தானே வேண்டும்! செய்யாமல் இருக்க முடியாதுதானே! அதற்குத்தான் எதிர்க்கட்சி இருக்கிறது. நீங்கள் ஒரு காலத்தில் எதிர்க்கட்சியினராக இருக்கும்போதும் இதனைத்தான் செய்தீர்கள். நாங்கள் தற்பொழுது எதிர்க்கட்சியினராக இருக்கும்போதும் அதனைச் செய்யத்தான் வேண்டும். அதற்காக, நீங்கள் கொண்டுவருகின்ற எல்லாத் திட்டங்களையும் அவமதிப்பதோ அல்லது அந்தத் திட்டங்களை இல்லாமற் செய்வதோ எங்களுடைய நோக்கமல்ல. நல்லவற்றுக்குக் கைகொடுப்போம்; எதிர்க்கவேண்டிய விடயத்தை எதிர்த்து நிற்போம். இதுதான் எங்களுடைய நோக்கம்!

இலங்கையின் வரலாற்றிலே, கம்யூனிஸ சித்தாந்தத்தின் அடிப்படையில் இந்த அரசாங்கத்தை அமைப்பது உங்களுடைய நோக்கமாக இருந்தாலும்கூட, சுதந்திரத்தின் பின் 77 ஆண்டுகளுக்குப் பின்னர் இன்று ஒரு புதிய வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பிக்கக் கூடிய சந்தர்ப்பம் உங்களுக்குக் கிடைத்திருக்கிறது. அதன் சித்தாந்தம் வேறாக இருக்கலாம்; இன்றுள்ள நடைமுறையிலே உங்களுடைய திட்டம் வேறாக இருக்கலாம். இன்று liberal கொள்கையைக் கடைப்பிடிக்க வேண்டிய சூழ்நிலை ஏற்பட்டுள்ளது. ஐம்பது வருடத்திற்கு முன்னர் digital என்றால் என்னவென்று எங்களுக்குத் தெரியாது. ஆனால், இன்றைய காலகட்டத்தில் digital தொழில்நுட்பமின்றி வேலை செய்யமுடியாத அளவுக்குச் சூழ்நிலை மாறியிருக்கிறது. அதுபோன்று உங்களுடைய

கொள்கைகளும் மாறலாம்! உங்களுடைய கொள்கை மாற்றத்திற்கு ஏற்ப இந்த வரவு செலவுத்திட்டத்தில் சில நல்ல விடயங்கள் இருக்கின்ற அதேநேரத்தில் சில குறைபாடுகளும் இருக்கிறது. குறை சொல்லுகின்றோம் என்று நினைக்க வேண்டாம்! அதற்குச் சில நல்ல ஆலோசனைகளை நாங்கள் சொல்கின்றோம், அவ்வளவுதான்!

இந்த வரவு செலவுத்திட்டத்திலே குறைந்த வருமானத்தைக் கொண்ட மக்களின் நலன்கள் பற்றிக் கரிசனை கொண்டுள்ள திட்டங்கள் அதிகமாக இருக்கின்றன; அதனை நாங்கள் வரவேற்கின்றோம். வறுமை என்பது இந்த நாட்டிலிருந்து ஒழிக்கப்பட வேண்டிய விடயம்; அதிலே நீங்களும் நாங்களும் அக்கறையாக இருக்கின்றோம். விசேடமாக, வறுமை நிலையிலுள்ளவர்களாகக் கிராமப்புறச் சிறுவர்கள், கர்ப்பிணித் தாய்மார், மலையகத்தைச் சேர்ந்த பிள்ளைகள் மற்றும் தோட்டத் தொழிலாளர்கள் எனப் பல்வேறு தரப்பினரையும் சொல்லலாம். நீங்கள் வறுமை ஒழிப்புத் திட்டங்களைக் கொண்டுவரும்போது, நிச்சயமாக நாங்கள் உங்களுக்குக் கைகொடுப்போம். அதுபோல், இன்றைக்கு எமது நாட்டில் போஷாக்கின்மை அதிகமாக இருக்கின்றது. அதிலும் குறிப்பாக, மலையகப் பெருந்தோட்ட மக்களின் போஷாக்கின்மை உயர்வடைந்திருக்கின்றது; அந்த மக்கள் நலிவடைந்து இருக்கிறார்கள். அதற்காக நீங்கள் எடுக்கும் நடவடிக்கைக்கு எங்களுடைய ஆதரவு எப்போதுமே இருக்கும்.

அடுத்து, சிறிய மற்றும் நடுத்தர அளவுப் பொருளாதார நடவடிக்கைகளை மேம்படுத்துவதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டும். நீங்கள் அதற்காக ஒரு தொகைப் பணத்தை ஒதுக்கியிருக்கின்றீர்கள். அது தொடர்பில் புதிதாக bank ஒன்றினை அறிமுகப்படுத்துவதாகவும் இந்த வரவு செலவுத்திட்டத்தில் குறிப்பிட்டிருக்கின்றது. சிறிய, நடுத்தர விவசாயிகளுடைய பொருளாதாரத்தை வளப்படுத்தக்கூடிய நடவடிக்கைளில் ஈடுபட்டால் மட்டுமே உள்ளூர் உற்பத்தியை அதிகரிக்க முடியும். உள்ளூர் உற்பத்தியை அதிகரிக்காத எந்தப் பொருளாதாரமும் சிறந்ததாக இருக்க முடியாது. இன்று நீங்கள் IMF சொல்வதையே செய்கிறீர்கள். IMFஇன் கருத்தை மீறிச் செயல்பட வேண்டுமானால், நாட்டின் பொருளாதார வளர்ச்சி வீதத்தை அதிகரித்துக் காட்ட வேண்டும். அதற்கு வட்டி வீதத்தைக் குறைக்க வேண்டும். இவற்றைச் செய்வதற்கு விடயம் தொிந்த நிபுணர்களை நியமித்து, அதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று நான் சொல்லிக்கொள்ள விரும்புகிறேன்.

இந்த நாட்டுக்குப் பாரிய முதலீட்டாளர்கள் வர வேண்டும். ஆனால், முதலீட்டாளர்கள் இங்கு வந்து முதலீடு செய்வதற்கு மிகமிகப் பயப்படுகின்றார்கள். இந்த நிலைமை கடந்த அரசாங்கக் காலத்திலும் இருந்தது; இப்போதும் இருக்கின்றது. அதானி குழுமம்கூட இன்று இங்கிருந்து போகின்ற சந்தர்ப்பம் உருவாக்கப்பட்டிருக்கின்றது. எமது கைக்குக் கிடைத்த சந்தர்ப்பத்தைத் தவற விடக்கூடாது. நாங்கள் முதலீட்டாளர்களை இங்கே தக்கவைத்துக்கொள்ள வேண்டும். அப்படிச் செய்தால்தான் எதிர்காலத்தில் இந்த நாட்டில் முதலீடுகளை அதிகரிக்க முடியும். இன்றைக்கு பங்களாதேஷ் பொருளாதார ரீதியாக வீழ்ச்சியடைந்திருக்கின்றது. அந்த நாட்டில் செய்யப்பட்ட முதலீடுகள் அனைத்தும் வேறு நாடுகளுக்குப் போகின்றது. தாய்லாந்துக்குப் போகின்றது; வியட்நாமுக்குப் போகின்றது. ஏன் அந்த முதலீடுகளை ஸ்ரீலங்காவிற்குள் ஈர்த்தெடுக்க முடியாது? அதை ஈர்த்தெடுப்பதற்கான வசதி வாய்ப்புகளை நாங்கள் உருவாக்க வேண்டும்.

ஆனால், இலஞ்சத்தை ஒழிப்பதற்காக நீங்கள் எடுத்திருக்கும் நடவடிக்கை நிச்சயமாகப் பாராட்டப்பட வேண்டும். கடந்த அரசாங்கத்திலும் அதற்கு முன்பிருந்த அரசாங்கத்திலும் இந்த நாட்டில் இலஞ்சம் ஒரு 'பேயாக' இருந்தது. இன்று அந்தப் பேய் விரட்டப்பட்டு வருகின்றது. முழுமையாக விரட்டப்படவில்லை; கொஞ்சமாகத்தான் விரட்டப்பட்டிருக்கின்றது. ஆகவே, அந்தப் பேயை முழுமையாக விரட்டுவதற்கான நடவடிக்கையை நீங்கள் எடுங்கள்! அதற்கு நாங்கள் உங்களுக்கு முழுமையான ஒத்துழைப்பை வழங்குவோம். இலஞ்சம், ஊழல், மோசடி போன்றவை இந்த நாட்டில் இருக்கக்கூடாது. அந்த விடயத்தை நாங்கள் செய்ய வேண்டும்.

பெருந்தோட்ட மக்களுடைய வாழ்க்கையைப் பற்றியும் ஒரு சில விடயங்களை இங்கே சொல்ல வேண்டும். அவர்களின் அடிப்படைச் சம்பளத்தை 1,700 ரூபாயாக அதிகரிப்பதாக நீங்கள் சொல்லியிருக்கின்றீர்கள். கடந்த தேர்தல் காலத்தில் ரணில் விக்கிரமசிங்க அவர்களும் இந்த விடயத்தைத் தெரிவித்திருந்தார். ஆனால், நடைமுறையில் சாத்தியப்படவில்லை. அதற்குக் காரணம், கம்பனிகள் அதைக் கொடுக்க உடன்படவில்லை. ஆகவே, கம்பனிகள் அதைக் கொடுக்க உடன்படுவதற்கான நடவடிக்கையை நீங்கள் எடுக்க வேண்டும். இந்த விடயத்தில் கம்பனிக்காரர்களுக்குத்தான் நீங்கள் அழுத்தம் கொடுக்க வேண்டும். ஏனென்றால், அது private sector. Government sector என்றால், நீங்கள் சொல்வதைச் செய்வார்கள்; Treasuryஇல் இருந்து பணம் கொடுக்கப்படும். ஆனால், private sector ஐப் பொறுத்தவரை அவர்களின் ஒத்துழைப்பு இல்லாமல் இதனைச் செய்ய முடியாது. ஆகவே, அந்த 22 private sector கம்பனிகளுக்கும் அரசாங்கக் கம்பனிகளுக்கும் நீங்கள் அழுத்தம் கொடுத்து, 1,700 ரூபாயை அடிப்படைச் சம்பளமாகக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். நான் ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். உங்களுடைய தேர்தல் பிரசாரத்தின்போது 2,000 ரூபாயை அடிப்படைச் சம்பளமாகப் பெற்றுத்தருவதாக நீங்கள் சொல்லியிருந்தீர்கள். இன்று உங்களாலும் அந்த 2,000 ரூபாயைப் பெற்றுக்கொடுக்க முடியவில்லை. அதற்குக் காரணம் இன்றைய பொருளாதாரத்திலுள்ள நடைமுறைச் சிக்கல். ஆகவே, நீங்கள் அதை எதிர்காலத்திலே கொடுத்தாலும்கூட, இந்த 1,700 ரூபாயையாவது உடனடியாகப் பெற்றுக் கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதை நான் உங்களுக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று வாழ்க்கைச் செலவு அதிகரித்திருக்கின்றது. ஒரு வீட்டிலே நான்கு பிள்ளைகள் இருந்தால் நால்வரையும் ஒரேமாதிரியாகக் கவனிக்க வேண்டும். ஒரு பிள்ளையைக் கூடுதலாகவும், மற்றைய பிள்ளையைக் குறைவாகவும் கவனிக்கக்கூடாது. அதாவது, ஏற்றத்தாழ்வு இருக்கக்கூடாது. அதனைச் சரியாகச் செய்வதற்கு அந்தக் குடும்பத்தினுடைய வருமானம் போதுமானதாக இருக்க வேண்டும். அவ்வாறு இல்லாவிட்டால் இந்தப் பிரச்சினை ஏற்படும். அவ்வாறுதான் இந்த நாட்டில் உள்ள மக்களும் கவனிக்கப்பட வேண்டும். இன்று கொழும்பில் இருக்கின்ற மக்களுடைய வாழ்க்கைத் தரம் உயர்ந்திருக்கின்றது. அதேநேரத்திலே யாழ்ப்பாணம், மலையகம் போன்ற பகுதிகளிலிருக்கின்ற மக்களுடைய வாழ்க்கைத் தரம் குறைந்திருக்கின்றது. எல்லோருடைய வாழ்க்கைத் தரமும் ஏற்றத்தாழ்வு இல்லாமல் சரியாகப் பேணப்பட வேண்டும். அதுதான் ஓர் ஆட்சியினுடைய முக்கிய குறிக்கோளாக இருக்கவேண்டும்.

[ගරු (ආචාර්ය) වී.එස්. රාධකිෂ්ණන් මහතා]

இந்த வரவு செலவுத்திட்டத்திலே, பெருந்தோட்ட வீடமைப்பு மற்றும் உட்கட்டமைப்பு அபிவிருத்திக்காக ஏறத்தாழ 4.2 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. அதேபோல, மலையகத் தமிழ் இளைஞர்களின் தொழிற்பயிற்சி, வாழ்வாதார மற்றும் உட்கட்டமைப்பு அபிவிருத்திக்காக ஏறத்தாழ 2.4 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இவை சந்தோஷத்திற்குரிய விடயங்கள்தான். ஆனால், இந்த 4.2 பில்லியன் ரூபாய் இந்தியாவினுடைய நிதியையும் உள்ளடக்கியதா அல்லது இலங்கை அரசாங்கம் மட்டும் இந்தத் தொகையை ஒதுக்கியிருக்கின்றதா? என்பதை நாங்கள் சற்றுப் பார்க்க வேண்டும்.

அதேபோல, அங்குள்ள பாடசாலைகள், hospitals எல்லாவற்றையும் Governmentஇன் கீழ்க் கொண்டுவருவதாகச் சொல்லியிருக்கிறார்கள்; ரொம்ப சந்தோஷமான விடயம். எங்களுடைய அரசாங்கக் காலத்திலும் வைத்தியசாலைகள் பலவற்றை நாம் அரசாங்கத்தின்கீழ்க் கொண்டுவந்தோம். அதனால் அவற்றை அபிவிருத்தி செய்வதற்கான சூழ்நிலை அந்த நேரத்திலே இருந்தது; சில பகுதிகளில் அதைச் செய்ய முடியாமற் போயிருந்தது. ஆகவே, வைத்தியசாலைகள், பாடசாலைகள் என்பவற்றை அபிவிருத்தி செய்வதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டுமென்றும் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக, இன்று NPPஇலிருந்து வந்திருக்கின்ற மலையகத் தமிழ் உறுப்பினர்கள், முன்னைய மலையகத் தலைவர்களை வசைபாடி, அவர்களை அவமானப்படுத்துவதாக நினைத்துக்கொண்டு மலையக மக்களை அவமானப்படுத்தி அவர்களுக்கு அனுதாபம் தேடுவதை விட்டுவிட்டு, அந்த மக்களுக்கான அங்கீகாரத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்பதைத்தான் மலையகப் பிரதிநிதி என்ற அடிப்படையில் நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். ஒவ்வொருவரையும் திட்டுவதில் அர்த்தமில்லை. நாங்கள் 76 வருடங்களாக ஒன்றுமே செய்யவில்லையென்று சொல்லக்கூடாது. ஏனென்றால், 76 வருடங்களாக இருந்த அரசாங்கங்களிலே எமது முன்னைய தலைவர்களும் நாங்களும் அமைச்சர்களாக, பிரதி அமைச்சர்களாக இருந்து, பல வேலைத்திட்டங்களை எங்களால் முடிந்தளவுக்குச் செய்திருக்கின்றோம். ஆகவே, நீங்கள் அதனைச் செய்து காட்டி, அந்த மக்களுக்கு விமோசனத்தைப் பெற்றுக்கொடுக்க வேண்டுமென்று கேட்டு, எனக்குச் சந்தர்ப்பமளித்ததற்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Priyantha Wijerathna. You have ten minutes.

[අ.භා. 1.54]

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி பிரியந்த விஜேரத்ன)
(The Hon. Priyantha Wijerathna, Attorney-at-Law)

අත්තනෝමතික රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, අසාර්ථක ආර්ථික සැලසුම් මෙන්ම දූෂිත දේශපාලනය විසින් බංකොලොත් කරන ලද මගේ රට 2024 සැප්තැම්බර් මාසයෙන් පසුව නැවතත් නැඟී සිටින්න පටන් ගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අනුව ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේ ඉදිරිපත් කරනු ලබන මංගල අය වැය සඳහා වූ විවාදයට කථිකයෙක් විධියට ඉදිරිපත් වීමට ලැබීම මා ලද භාග්‍යයක් විධියට සලකනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ඉතිහාසයේ පළමුවැනි වතාවට ජාතික ආර්ථිකයක් පදනම් කරගත් අය වැයක් වාගේම ඉතිහාසයේ පළමුවැනි වතාවට විපක්ෂය නිහඬ කළ අය වැයක් විධියටත් අපට හඳුන්වා දෙන්න පුළුවන්. තැන් තැන්වල හීන් කෙදිරිලි ඇහුණාට මේ අය වැයට විරුද්ධව සාර්ථක තර්කයක් ඉදිරිපත් කරන්න විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකුට මේ දක්වා හැකියාව ලැබිලා නැහැ. විපක්ෂය ඉදිරිපත් කරපු හීන් කෙදිරිලි අතර තිබෙනවා, මේ දීලා තිබෙන ඒවා මදි, තව දෙන්න පුළුවන්, තව දෙන්න ඕනෑ වාගේ කථාත්. හැබැයි, මා මුලින් කිව්වා වාගේම මේ අය වැය අපි සකස් කරලා තිබෙන්නේ, අත්තනෝමතික රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙන් තොරවයි. අපි විනයක් ඇති පක්ෂයක් වාගේම මේ අය වැයත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීම සඳහා විනයක් ඇතිව හදපු අය වැයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය සකස් වෙලා තිබෙන්නේ, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලවයි. එකී පනතේ 15වැනි වගන්තියේ සඳහන් වන ආකාරයට අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක් පමණයි ප්‍රාථමික වියදම් විධියට අපට වැය කරන්න හැකියාව ලැබෙන්නේ. ඒ සීමාව තුළ ඉඳලා තමයි ජනතාව වෙනුවෙන් ලබා දිය හැකි සියලු දේවල් අපි ලබා දීලා තිබෙන්නේ. මේ අවස්ථාවේදී රටේ ජනතාව සෑහීමකට පත් වෙනවා, මේ බංකොලොත් වෙච්ච රටේ, මේ නැඟී සිටින රටේ ඔවුන්ට ලැබිලා තිබෙන දේවල් සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඇසුණු තවත් කථාවක් තමයි, මේ අය වැයෙන් නැහෙනහිර පළාතට කිසිම දෙයක් දීලා නැහැ කියන එක. ඇත්තටම අය වැයක් කියන්නේ, පළාත් අනුව මුදල් වෙන් කිරීමක් නොවෙයි. හැබැයි, මේ අය වැය තුළින් ගරු ජනාධිපතිවරයා විසින් නැහෙනහිර පළාතට විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. අය වැය ලේඛනයේ 35වෙනි පිටුවේ 24වෙනි අය වැය යෝජනාව විධියට සඳහන් කරලා තිබෙන්නේ, නැහෙනහිර පළාතේ සංවර්ධනය සම්බන්ධයෙන්. ඒ අනුව අධ්‍යාපනය, සෞඛ්‍ය, කෘෂිකර්මය, ධීවර, සංචාරක, ප්‍රජා සවිබලගැන්වීම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් නැහෙනහිර පළාතේ පුළුල් සංවර්ධනයක් කරන්න අවශ්‍ය යෝජනා මේ අය වැය තුළ අන්තර්ගත කර තිබෙනවා. හැබැයි, විපක්ෂය නියෝජනය කරන නැහෙනහිර පළාතේ මන්ත්‍රීවරුන් තවමත් අර පරණ බංකොලොත් දේශපාලනයේ නිරත වන බව තමයි ඔවුන්ගේ කථාවලින් අපට පෙනෙන්නේ. ඔවුන් උත්සාහ කරන්නේ, මේ ආණ්ඩුව නැහෙනහිර පළාතට සලකන්නේ නැහැ කියන මතවාදය නැහෙනහිර පළාතේ ජීවත් වන මුස්ලිම්, දෙමළ සහෝදරයන්ගේ ඔළුවලට ඔබ්බවන්නයි.

හැබැයි, ඒක අසාර්ථකයි. අපි දන්නවා, පසුගිය මහ මැතිවරණයේදී මේ රටේ සමස්ත ජනතාව ජාතික ජන බලවේගය කෙරෙහි විශ්වාසය තැබූ බව. උතුර, නැහෙනහිර, දකුණ, බටහිර කියන සියලු පළාත්වල ජනතාව ජාතික ජන බලවේගයත් එක්ක එකතු වුණා. ඒ නිසා ජාතිවාදී අදහස්වලින් තවමත් ඔළු පුරවා ගෙන සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්න කැමැතියි, අපේ ආණ්ඩුව යටතේ තවදුරටත් ජාතිවාදී දේශපාලනය සඳහා කිසිම අවස්ථාවක් නැති බව. අපි ඒක නවත්වා තිබෙනවා. අපිත් නැහෙනහිර පළාත නියෝජනය කරන මන්ත්‍රීවරුන් තමයි. අපේ සහෝදර අතම්බාවා මන්ත්‍රීතුමා නැහෙනහිර පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් තමයි. හැබැයි, අපි ඔබට වඩා වෙනස්. ඒ වෙනස අපි හදා තිබෙන්නේ අපේ දේශපාලනය සඳහා කිසිම වෙලාවක ජාතිවාදය, ආගම්වාදය ගාව ගන්නේ නැතිකමින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ අය වැය යෝජනා යටතේ තරුණ කෘෂි ව්‍යවසායකයන් සංවර්ධනය සඳහා, ඒ කියන්නේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරන්න යෝජනා කර තිබෙන බව. මේ යෝජනාව දැක්කාම මට මතක් වුණේ, නැහෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ, උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බණ්ඩරවුව කියන ග්‍රාම නිලධාරී වසමේ, කළුගල් ඔය ප්‍රදේශයේ තරුණ පිරිස වෙනුවෙන් ක්‍රියාත්මක කරන ගොවිපොළයි. දැනට එම ගොවිපොළ ආරම්භ වෙලා තිබෙන්නේ. මේ වෙනකොට එම ගොවිපොළේ වියදමට අවශ්‍ය මුදල් ගොවිපොළ තුළම උපදවා ගන්න ක්‍රමවේදයත් හැදිලා තිබෙනවා. මම ආරාධනා කරනවා, අපේ උහන ප්‍රදේශයේ තරුණ තරුණියන්ට, අම්පාර දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන්ට, නැහෙනහිර පළාතේම වෙසෙන තරුණ තරුණියන්ට මේ ගොවිපොළට එන්න කියලා. ඔබට විශේෂ සහතිකයකුත් ඒ සඳහා පිරිනැමෙනවා. ඒ වාගේම ඔබට මේ හරහා නව කෘෂි තාක්ෂණය ඉගෙන ගන්න හැකියාව ලැබෙනවා. එය මනරම් භූමි භාගයක පිහිටා තිබෙන ගොවිපොළක්. මම මේ රටේ සියලු තරුණ ප්‍රජාවට ආරාධනා කරනවා, ඇවිත් එය බලන්න කියලා. ඒක හරි ලස්සන, හොඳ වැඩක්. මම මුලින් සඳහන් කළ ආකාරයට මේ අය වැයෙන් රුපියල් මිලියන 500ක මුදලක් කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නිරත වන තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා වෙන් කරන්න හැකියාව ලැබී තිබෙනවා.

නැහෙනහිර පළාත ගත්තාම, එම පළාත තුළ කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතුවල නියැළෙන විශාල පිරිසක් ඉන්නවා. සාම්ප්‍රදායිකව ගව පාලනය කරන විශාල කණ්ඩායමක් නැහෙනහිර පළාත පුරා ව්‍යාප්ත වෙලා ඉන්නවා. විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ උහන, මහඔය, දමන හා ලාහුගල වාගේ ප්‍රදේශවල කිරි ආශ්‍රිත නිෂ්පාදනවල නිරත වන කිරි ගොවීන් ගණනාවක් ඉන්නවා. අපගේ අය වැය යෝජනාව තුළ රුපියල් මිලියන 2,500ක මුදලක් වෙන් කර තිබෙනවා, කිරි නිෂ්පාදන කටයුතු සංවර්ධනය කිරීම සඳහා.

ඒ වාගේම නැහෙනහිර පළාතේ ජීවත් වන පිරිස විශේෂයෙන්ම මුහුණ දෙන ගැටලුවක් තමයි වනඅලි උවදුර. වනඅලි උවදුර සහ අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා අපේ අය වැයෙන් රුපියල් මිලියන 300ක මුදලක් වෙන් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය සමස්ත ලංකාව ගැනම හිතලා, සමස්ත ලංකාවේම සංවර්ධනය ගැන හිතලා හදපු අය වැයක් බව මා සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට තුළ මීට කලින් පැවැති ආණ්ඩු මේ රටේ පළාත් අතර දැවැන්ත ආර්ථික විෂමතාවක් ඇති කර තිබුණා. අපි දන්නවා, 2023 දත්තවලට අනුව සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය ලබා දීමේදී සියයට 43.7ක දායකත්වයක් බස්නාහිර පළාත ලබා දී තිබෙන බව. වයඹ පළාත ලබා දී තිබෙන දායකත්වය සියයට 10.9යි. මධ්‍යම පළාත සියයට 10.3ක දායකත්වයක් ලබා දී තිබෙනවා. අනෙක් සියලු පළාත්වල දායකත්වය තනි ඉලක්කමක් මත රැඳී පවතිනවා. ඒ නිසා මේ දැවැන්ත ආර්ථික විෂමතාව වෙනස් කිරීමේ වගකීමත් අපේ ආණ්ඩුවට පැවරී තිබෙනවා.

ඒ අනුව අපේ රටේ ජනතාව පසුගිය අරගළයෙන් පස්සේ තමන්ගේ දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්න කටයුතු කළා වාගේම මේ රටේ ජනතාවගේ ආර්ථික අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන්න කැප වෙන ආණ්ඩුවක් විධියට අපි කටයුතු කරන බවත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Mrs.) Nilanthi Kottahachchi.You have 10 minutes.

[අ.භා. 2.04]

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට මාස කිහිපයකට කලින්, පසුගිය වසරේ එංගලන්ත වයස අවුරුදු 19න් පහළ කාන්තා ක්‍රිකට් කණ්ඩායමට එරෙහිව ලංකාවේ බට්ටියක් කඩුලු පහක් දවා ගත්තා. ඇය ගැන ලංකාව වාගේම ජාත්‍යන්තරයම කථා බහ කරන්න පටන් ගත්තා. ඇය පසුගිය වසර වනකොට වයස අවුරුදු 14ක පුංචි දැරිවියක්. මොනරාගල දිස්ත්‍රික්කය තමයි ඇය නියෝජනය කරන්නේ. ඇය ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 19න් පහළ කාන්තා ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇය දවා ගත්ත කඩුල්ලක් ගණනේ කියන්නේ එකම එක පණිවුඩයක්. ලංකාවේ දුෂ්කර පළාත්වල සම්පත් සීමිත පාසල්වල අධ්‍යාපනය ලබන ක්‍රීඩා කෞශල්‍යය සහිත දරුවන්ට කොච්චර හීන තිබුණත්, ඒ හීන මල්ඵල ගන්වන්න මේ රට ඇතුළේ අවස්ථාවක් උදා වෙනවාද කියන ප්‍රශ්නාර්ථය තමයි ඇය දවා ගත්ත හැම කඩුල්ලක් ගානේම ලෝකයට කියන කථාව. ඊයේ දවසේ තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පැවැත්වුණා. එතැනට පැමිණි රාජ්‍ය නිලධාරීන් ඉදිරියේ මා පෞද්ගලිකව යම් කරුණු විමසීමක් කළා. ලංකාවේ සෑම පළාතකටම, සෑම දිස්ත්‍රික්කයකටම, සෑම පාසලකටම අදාළව ජාතික තොරතුරු පද්ධතියක් තිබෙනවාද, ඒ, ඒ පාසල්වල දරුවන්ට තිබෙන ක්‍රීඩා මොනවාද, ඒ ක්‍රීඩා කෞශල්‍යය නංවා ගන්න තිබෙන උපකරණ, පහසුකම් මොනවාද සහ ඒ දරුවන් ලබා ගත්ත ජාතික සහ ජාත්‍යන්තර ජයග්‍රහණ මොනවාද කියන දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් නැහැ. ඒ ගැන කනගාටුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

1948දී ඩන්කන් වයිට් ලංකාවට පළමුවැනි ඔලිම්පික් පදක්කම ගේනවා. අවුරුදු 52ක් ගත වෙනවා, කොස්, දෙල්, අල, බතල කාපු සුසන්තිකා ජයසිංහ ඊළඟට අපේ රටට ඔලිම්පික් පදක්කමක් ගේන්න. සුගත් තිලකරත්න, සුසන්තිකා ජයසිංහ, දමයන්ති දර්ශා වැනි ක්‍රීඩක ක්‍රීඩිකාවන් අපේ රටේ ජාතියේ පිනට පහළ වුණාට අපට තවදුරටත් ඒක බලාපොරොත්තු වෙන්න බැහැ. දැන් රජය අපියි. අපට වගකීමක් තිබෙනවා, කලින් ආණ්ඩු හදුනා ගත්තේ නැති කොටස් ආමන්ත්‍රණය කරන්න. අපි මෙවර අය වැයෙන් මේ රටේ ක්‍රීඩා කෞශල්‍යය සහිත දරුවන්ට ජාතික වශයෙන් වාගේම ජාත්‍යන්තර මට්ටමින් ලංකාව ජාත්‍යන්තරයට ගෙනයන්න පුළුවන් විධියට ප්‍රතිපාදන සලසා තිබෙනවා. පළාත් පහක විශේෂිත ක්‍රීඩා පාසල් ඉදිකිරීමට අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඹවට, උතුරට, උතුරු මැදට, මධ්‍යමට, බස්නාහිරට විතරක් නොවෙයි, රටේ සෑම පළාතකම සිටින ක්‍රීඩා කෞශල්‍යය සහිත දරුවන්ට විශේෂිත පහසුකම් සහිත ක්‍රීඩා පාසලක තමන්ගේ කුසලතා නංවා ගන්න අවස්ථාව ලබා දෙන එකයි අපේ බලාපොරොත්තුව. අපි ආරම්භයක් විධියට මෙවර අය වැයෙන් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, ඊයේ ක්‍රීඩා ඇමතිතුමා ඒ නිලධාරීන් ඉදිරියේ යම් කරුණු සැලකිරීමක් කළා. ඒ පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. උතුරේ වාගේම දකුණේ දරුවාටත් තිබෙන්නේ

[ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

එකම ප්‍රශ්නයක්. මොකක්ද ඒ ප්‍රශ්නය? තමන් බර ඉසිලීමේ ක්‍රීඩා පන්තිය යටතේ තරග වදින්න සුදානම්. නමුත්, ප්‍රධාන ගැටලු දෙකක් තිබෙනවා. මොකක්ද ගැටලු දෙක? එකක් තමයි, උපකරණ නැතිකම. අනෙක් එක තමයි, පෝෂ්‍යදායී ආහාර වේලක් නැතිකම. ක්‍රීඩා කෞශල්‍යය සහිත දරුවන්ට ලබා දෙන රුපියල් 5,000ක්ව පැවති මාසික පෝෂ්‍යදායී ආහාර දීමනාව දෙගුණයකින් වැඩි කරලා රුපියල් 10,000ක් දක්වා ඒ දීමනාව ඉහළ නංවා ලබා දෙන්න අපි ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා. මම හිතනවා, මේ අය වැයෙන් ක්‍රීඩා කෞශල්‍යය සහිත දරුවන්ට තමන්ගේ අනාගතය ගැන බලාපොරොත්තුවක් තබා ගන්න පුළුවන් කියලා. එමෙන්ම ඒ සිහින හඹා ගෙන යන්න පුළුවන් කියලා.

අපි දන්නවා, වැඩබිම ගත්තත්, නිවස ගත්තත්, ප්‍රජාව ගත්තත්, ඒ වාගේම දේශපාලනයේදී පවා ආන්තීකරණයට ලක් වෙන්නේ කාන්තාවන් බව. ඔවුන්ව නොසලකා හැර තිබෙනවා. කොනහ-කොනහා, කොනිත්ත කොනිත්ත කාන්තාවන්ට හිරිහැර කරන මේ සමාජය ඇතුළේ කාන්තාව සවිබලගන්වන්න මොනවාද අපි කරලා තිබෙන්නේ? අපි ළමා හා කාන්තා හිංසනය වැළැක්වීම, කාන්තාව සවිබලගැන්වීම සහ කාන්තාවට අවශ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් රුපියල් මිලියන 120ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, මේ කථා කරන මොහොතේදීත් මහ පොළොව එක්ක ගිනි අව්වේ ඔටවු වෙන ගැහැනු ඉන්නා බව. තමන්ගේ භාම්පුතාගේ ලිංගික හිංසා හදවතේ දරාගෙන, ඒ වේදනාව මැඩගෙන එදා වේල වෙනුවෙන් ඔටවු වෙන කාන්තාවෝ ඉන්නවා. තේ කූඩය පිටේ බැඳගෙන තේ පඳුරු අස්සේ කූඩැල්ලෝ කමින්, එදා වේල වෙනුවෙන් ඔටවු වෙන ගැහැනු ඉන්නවා. තිර පැකට් එක අඹරාගෙන, බස් එකක් බස් එකක් ගානේ, කඩයක් කඩයක් ගානේ මිනිසුන්ගේ පිටිපස්සෙන් ගිහින් ඒවා විකුණාගෙන එදා වේල සොයා ගන්න දුක් විඳින ගැහැනු ඉන්නවා. ඒ ගැහැනුන්ගේයි, පාර්ලිමේන්තුවේ සිටින මේ ගැහැනුන්ගේයි අතර තිබෙන වෙනස මොකක්ද? ඒ ගැහැනු දුක් විඳින්නේ ජීවන අරගළය වෙනුවෙන්. පාර්ලිමේන්තුවේ සිටින අපි ගැහැනු විධියට දුක් විඳිනවා, ඒ ගැහැනුන්ට ඒ ජීවන අරගළය දිනා ගන්න තවත් අරගළයක. එම නිසා ඒ ගැහැනුන්ගේයි, මේ ගැහැනුන්ගේයි කියලා වෙනසක් අපි දකින්නේ නැහැ. ඒ නිසා අපි මේ කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන් පෙර පැවති ආණ්ඩුවලට වඩා විශේෂ අවධානයක් යොමු කරනවා. ඒ වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, කාන්තාවකට අකටයුත්තක් වෙලා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට ගියාම, කාන්තාවකගේ ගැටලුවකට ඇහුම්කන් දෙන්න තරම් සංවේදී නිලධාරිනියන් ඇතැම්විට නැති බව. නිලධාරිනියන්ගේ භිඟයක් තිබෙනවා. මේ කාර්යාල ජාලය සක්‍රීයව නඩත්තු කරන්න අපිට ආණ්ඩුවක් විධියට කරන්න පුළුවන් දේ මොකක්ද? අපි ඒකට සංවේදී වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ කාර්යාල ජාලය පවත්වාගෙන යන්න මෙවර අය වැයෙන් රුපියල් මිලියන 720ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, දෛවයේ සරදමක් විධියට, ඉතා කුඩා වරදකින් යම් යම් අපරාධවල සැකකරුවන් විධියට නම් කෙරුණු අපේ රටේ වයස අවුරුදු 18 වයෝපූර්ණත්වයට පත් වෙච්ච නැති පුංචි දරුවෝ ඉන්නා බව. ඒ දරුවන්ටත් වුවමනාව තිබෙනවා, දෛවයේ ඒ සරදමින් මිදිලා, මේ පියවි ලෝකයට ඇවිල්ලා හොඳ වැඩිහිටියෙක් විධියට සමාජගත වෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දරුවන්ගේ දෙමව්පියන්ටත් සිහිනයක් තිබෙනවා, තමන්ගේ දරුවාව ඒ පාපයේ විපාකයෙන් මුදා ගන්න. හැබැයි, ඒකට අවශ්‍ය පරිසරය අපි හදලා තිබෙනවාද? කවදාවත් මේ රටේ ආණ්ඩුවක් හිතපු නැති පැත්තක් ගැන අපි හිතලා තිබෙනවා. ඒක සතුටුදායකයි. ඒ මොකක්ද? අපි වූදිත ළමයින්ව රැඳවුම් නිවාසවල ඉඳලා අධිකරණයට, අධිකරණයේ ඉඳලා ඒ අදාළ ආයතනවලට, නිවාසවලට රැගෙන යන්න අවශ්‍ය වෙනම පහසුකම් සහිත පරිසරයක් ගැන අවධානය ලක් කරලා තිබෙනවා. ඒ අනුව ළමා හිතකාමී ප්‍රවාහන ක්‍රමයක් සකසන්න රුපියල් මිලියන 250ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

දැන් අපිට කල්පනා කරන්න පුළුවන්, මේ අය වැය ලේඛනය පෙර පැවති අය වැය ලේඛන 78ටම වඩා වෙනස් වෙන්නේ ඇයි කියන එක. කොතැනින්ද මේක වෙනස් වෙන්නේ? විපක්ෂය මේක අතිසාර්ථක අය වැයක්ද, නැද්ද කියන තැන ඉඳලා තර්ක කරනවා නම්, මේක අතිසාර්ථක අය වැයක් කියලා තර්ක කරන්න අපිට කිසිම වුවමනාවක් නැහැ.

අපට තරගය තිබෙන්නේ විපක්ෂය එක්ක නොවෙයි. අපට තරගය තිබෙන්නේ අපි එක්කමයි. මොකක්ද තරගය? මේ රටේ දුක් විඳින මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය එක් අහලකින් හෝ උසස් තැනකට ගෙනෙන්න පුළුවන් නම්, ඒකට මේ අය වැය ලේඛනය පාදක කරගන්න පුළුවන් නම් අපට ඒ ඇති. අපට වෙන කිසිම තරගයක් නැහැ.

ඒ වාගේම, විපක්ෂය අහනවා නම් මේක ලිබරල්වාදී ද, නව ලිබරල්වාදී ද, සමාජවාදී ද, කොමියුනිස්ට්වාදී ද කියලා, අපි ඒ තර්ක චුට්ටකට අමතක කරමු. මේ අය වැය මානව හිතවාදී අය වැයක් නම් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවකට එය හොඳටම ප්‍රමාණවත්. මේක ජනතා හිතවාදී අය වැයක් නම්, අපට මේ අය වැය ලේඛනය හොඳටම ප්‍රමාණවත්. මේක පස් අවුරුදු සැලැස්මක්. ඒ සැලැස්මේ අපි පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ගොඩනහන්න බලාපොරොත්තු වෙනවා නම්, මම හිතනවා ඒකට අවශ්‍ය පදනම අපි මේ අය වැය තුළින් සකස් කරලා තිබෙනවා කියලා.

ඒ වාගේම, අපි දන්නවා පෝෂ්‍යදායී ආහාර වේලක් ගන්න බැරි, වේල් තුන වේල් දෙකට සීමා කරපු ගර්භිණී අම්මලා මේ රටේ ඉන්න බව. නාගරික මට්ටමින් ගත්තාම දිළිඳුකම සියයට 15ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම, ආහාර අනාරක්ෂිත බව නිසා අපේ රටේ අඩු බර උපත් ප්‍රමාණය සියයට 14.6ක අගයක පවතිනවා. මේක සතුටුදායක තත්ත්වයක් නොවෙයි. මේ සංඛ්‍යා දත්ත එක්ක අපි කල්පනා කරලා තිබෙනවා ත්‍රිපෝෂ වැඩසටහන සඳහා රුපියල් බිලියන 5ක මුදලක් වෙන් කරන්න. මම හිතන විධියට ඉතිහාසයේ කවදාවත් ඔටිසම් තත්ත්වයේ දරුවන්ට, ස්නායු ආබාධ සහිත දරුවන්ට කිසිම අය වැයකින් විශේෂ වරප්‍රසාද සහිතව යම් මුදලක් වෙන් කරලා නැහැ. සහකම්පනයක් සහිත ආණ්ඩුවක් විධියට අපි මේ රටේ සෑම අංශු මාත්‍රයකම පැතිකඩක් කෙරෙහි අවධානයට ලක් කරලා තමයි මේ අය වැය හදලා තිබෙන්නේ. මේක අතිසාර්ථක ද, නැද්ද කියන තැනට තර්ක කරනවාට වඩා මේ තුළින් ජනතාවගේ ජීවන මට්ටමේ ගුණාත්මක වෙනසක් ඇති කරන්න පුළුවන් නම් ඒක හොඳටම ප්‍රමාණවත් කියා මා හිතනවා.

අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයේ රජයේ පංගුව බිඳවැටිලා තිබෙන යුගයක අපි ගොඩනඟපු අය වැයක්, මේක. යැපුම්වාදී මානසිකත්වයෙන් ඉඳිකටුවේ ඉඳලා සියල්ල පිට රටින් ආනයනය කරන අවස්ථාවක අපි ගොඩනඟපු අය වැයක්, මේක. මේ කඩා වැටුණු ආර්ථිකය ඇතුළේ; සෑම අංශයක්ම, සෑම දේහයක්ම කඩා වැටිච්ච, ඕජස් ගලන මේ රට ඇතුළේ අපට ගොඩනැඟෙන්න අවශ්‍ය පාදම අපි මේ අය වැය ලේඛනය තුළින් ඉදිරිපත් කරලා තිබෙනවා කියා මම හිතනවා. ඒ නිසා විපක්ෂය ඇතුළු සියලුදෙනාගෙන් අපට ඉල්ලන්න තිබෙන්නේ එකම එක ඉල්ලීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Kottahachchi, your time is up.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විනිශ්චයන්ට එළඹෙන්න. ගැටලුවක් නැහැ. හැබැයි, විනිශ්චයන්ට එළඹෙන්න ඉක්මන් වෙන්න එපා. කාලයට ඉඩ දෙන්න. ඉවසීමෙන් බලාගෙන ඉන්න. මේ යන වැඩ පිළිවෙළ ඇතුළේ ඔබට දායක විය හැකි හැම ආකාරයකින්ම අපට දායක වෙන්න. මොකද, අපේ අවසන් ඉලක්කය මේ රට ගොඩනැඟීමම පමණයි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Rohini Kumari Wijerathna.You have 13 minutes.

[අ.භා. 2.15]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන පුනරුදයේ මංගල අය වැය ගැන කෙටියෙන් කිව්වොත්, ආදායම රුපියල් ට්‍රිලියන 5.1ක් තබාගෙන, රුපියල් ට්‍රිලියන 7.2ක් වියදම් කරන්න තව රුපියල් ට්‍රිලියන දෙකකට වඩා ණය මුදලක් ඉල්ලන්න හදපු කෙටුම්පතක් හැටියට මම මෙය දකිනවා. හැබැයි, මට එතකොට මතක් වෙනවා, ණය අරගෙන රටවල් කරන්න නම් ආණ්ඩු මොකටද කියලා වේදිකාවල අහපු හැටි. අපට ඒවා ඇහුණා. මේ අය වැය, අය නැති, වැය පමණක් දකින අය වැයක් හැටියට මම දකිනවා. මොකද, මේ වැය සඳහා ආදායම් උත්පාදනය කරන ක්‍රමවේදයන් මේ අය වැය තුළ දකින්න තිබෙනවා හරි අඩුයි. ඒ නිසා මම දකිනවා, මේ අය වැය තුළින් මේ ආණ්ඩුව පවත්වාගෙන යෑමේ නොහැකියාව පෙන්වනවා කියලා.

පළමු දවසේ ලංකාවේ රාජ්‍යකරණය පිළිබඳව, එහෙම නැත්නම් දියුණු රාජ්‍යයක් තිබුණා කියන එක පිළිගත්තා. ඒ වාගේම, ලංකාව දියුණු රාජ්‍ය යන්ත්‍රණයක් තිබෙන තැනක් හැටියට මම දකිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතිහාසයේ පණ්ඩුකාභය රජ දවස ගැන එදා මේ සභාවේ කථා කළා ආණ්ඩු පක්ෂයෙන්. ඒ වාගේම, ලංකාව කියන්නේ ක්ලෝඩියස් සීසර්ට රාජ සභාවට තානාපතිවරු යවපු රටක්. අද අපට තේරෙනවා මේ ආණ්ඩුවට මේ ලංකාව කියන දැවැන්ත රාජ්‍යය විශාල වැඩියි කියලා. ඒකයි කරගෙන යන්න වැඩ පිළිවෙළක් නැත්තේ. ඒකයි දැක්මක් නැත්තේ. ඒ නිසා අපි කියනවා, ඒකට රාජ්‍යය හකුළාගෙන හරියන්නේ නැහැ, එහෙම වුණාම අර්බුද පැන නඟීවි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අනු පරිච්ඡේද 39ක, ක්‍රියාකාරකම් 1,326ක් තිබුණා. මම අහනවා, මේ අය වැයට ඒ කියපු යෝජනාවලින් කොච්චර එකතු කරලා තිබෙනවාද කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දුසිමක්, දුසිම් දෙකක්? ඒ වෙච්ච පොරොන්දු මේ අය වැය ඇතුළේ තිබෙනවාද කියන එක ගැන මම ප්‍රශ්න කරනවා. ඒ නිසා මේ අය වැය ඔබතුමන්ලා අර කලින් කියපු කලිසම උස්ස උස්ස කියවපු එක්කෙනා වෙනුවට, බොත්තම් මාරු කර ගත්ත කෙනා කියවපු, එකම මාදිලියේ අය වැයක් විතරයි කියන එක තමයි කියන්න වෙන්නේ. මේක රනිල් වික්‍රමසිංහ, එහෙම නැත්නම් බැසිල් රාජපක්ෂ, එහෙමත් නැත්නම් මංගල සමරවීර, රොනී ද මැල් වාගේ මහත්වරුන්ගේ කටින් කියැවෙන මාදිලියේ අය වැයක්. කොටින්ම කිව්වොත්, මේක IMF එකේ පරාමිතීන්ට කොටුවෙලා මේ බංකොලොත් වෙච්ච රට වෙනුවෙන් පසුගිය රජයන් හදපු විධියේ අය වැයක් හැටියට තමයි මම දකින්නේ. හැබැයි, ඔයගොල්ලෝ වේදිකාවේ මොකක්ද කිව්වේ? IMF එකේ පදයට නටන්නේ නැහැයි කිව්වා. හැබැයි, අද අපි දකිනවා, ඒක වෙනස් වෙලා තිබෙනවා කියලා.

බලය ගන්න කලින් ඔබ කිව්වා, බලය ගත්තාම අය වැය හදන්නේ මාලිමාවේ ආර්ථික කවුන්සලයෙන් කියලා. නමුත් මම බලාගෙන හිටියා, ජනාධිපතිතුමා ආර්ථික කවුන්සලයට ස්තුති කරයිද කියලා. නමුත් වචනයක්වත් සඳහන් කළේ නැහැ. මොකද, අය වැය හදන්නට ආර්ථික කවුන්සලය හතර මායිමටවත් වද්ද ගත්තේ නැති නිසා. ඡන්දයට පෙර ආර්ථික කවුන්සලය පාවිච්චි කළේම ඡන්ද දායකයන්ට සුරංගනා කථා කියන්න විතරයි කියන එක තමයි මේ වෙලාවේ මට කියන්න තිබෙන්නේ. ඒ නිසා මේ අය වැය හැදුවේ, මේ ආර්ථික ප්‍රතිපත්තිය තීරණය කළේ IMF එක සහ මුදල් අමාත්‍යාංශය. ඒකයි මහ බැංකු අධිපතිතුමා කිව්වේ, ආණ්ඩුව වෙනස් වුණාට සාර්ව ආර්ථික ප්‍රතිපත්ති වෙනස් වෙලා නැහැ කියලා. කොටින්ම කිව්වොත්, ආර්ථික කවුන්සලය බෙල්ලෙන් අල්ලලා මුල්ලෙන් තියලයි තිබෙන්නේ. හැබැයි, දැන් දවස් තුනක් තිස්සේ මන්ත්‍රීවරු කියනවා, මේ අය වැයෙන් මාලිමාවේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනවා කියලා. නමුත් අපි දකිනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ තිබුණු යෝජනා තමයි මේකේ ක්‍රියාත්මක වෙන්නේ කියලා. මම උදාහරණ කිහිපයක් කියන්නම්. රේගුව ආශ්‍රිතව කරගෙන යන දියුණු කිරීම, වරාය පුළුල් කිරීම, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධන ව්‍යාපෘති, උතුරු නැගෙනහිර කාර්මීකරණ කටයුතු වාගේ දේවල්. ඉතින් මේවා ගත්තාම, අලුත් වැඩපිළිවෙළක් අපි දකින්නේ නැහැ.

ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා, මේ අය වැයට පදනම වෙන්නේ තමන්ගේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති; සහ ප්‍රතිපත්තිවලට ප්‍රවේශවීමේ පිළිබිඹුව මේ තුළ පෙන්වනවා කියලා. හැබැයි, අපට පෙනෙනවා, මතවාදය වෙනස් කරගෙන තිබෙන බව. ඒක බොහොම හොඳයි. මොකද, සමාජවාදී ප්‍රතිපත්ති තුළින් අද නව ලිබරල්වාදී ප්‍රතිපත්තිවලට විතැන් වෙලා තිබෙනවා. මම හිතනවා, ඒකේ ගෞරවය යන්න ඕනෑ, මේ වෙලාවේ මෙතැන නැතත් අගමැතිතුමියට කියලා. මොනවා වුණත්, මාලිමාව ඇතුළේ අගමැතිතුමිය ජයග්‍රහණය කරලා තිබෙනවා කියලා මේ අය වැයෙන් අපට පෙනෙනවා.

මට මතක් වෙනවා, ධම්ම පදයේ ගාථාවක කියනවා, "පමාදෝ මච්චුනෝ පදං" කියලා. ප්‍රමාද වූවන් මරණයට පත් වූවන් වැනිය. නැත්නම් "ප්‍රමාදය මරණයට හේතු වේ" කිව්වත් කමක් නැහැ. මේ ආණ්ඩුව, මේ රට බංකොලොත් වුණාට පස්සේ, මේ රට මරණයට පත් වුණාට පස්සේ අද වෙනස් වෙලා තිබෙනවා. මම ඒ ගැන සතුටු වෙනවා, පසුව හෝ වෙනස්වීම ගැන. උදාහරණ කිහිපයක් කිව්වොත්, මට මතකයි, 1980 ධවල පත්‍රිකාව එනකොට ඒ තුළින් ඉංග්‍රීසි අධ්‍යාපනය පාසල් පද්ධතියට එක් කරන්න යනකොට ඒකට විරුද්ධ වුණු ආකාරය. ඊට පසු කාලෙක මොනෑෂ් විශ්වවිද්‍යාලයේ ශාඛාවක් අපේ රටේ ස්ථාපිත කරන්න හදනකොට ඒකට විරුද්ධ වෙලා පාරට බැස්සා. ඒ විශ්වවිද්‍යාලයේ ශාඛාව මලයාසියාවට ගියා. අපේ ලංකාවේ දරුවෝ සල්ලි වියදම් කරලා පිටරටවල ඉගෙන ගන්න ගියා. දරුවන්ට මේ රටේ රුපියල්වලින්

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ඉගෙන ගන්න තිබුණු අවස්ථාව නැති කරලා දැම්මා, මේවාට විරුද්ධ වෙච්ච නිසා. හැබැයි, අද කියනවා ජාත්‍යන්තර අධ්‍යාපනයට තරුණයන්ට ප්‍රවේශය දෙනවා කියලා. ඒක ඉතාම හොඳයි. මෙහෙම වෙනස්වීම හොඳයි. හැබැයි, මීට කලින් වෙනස් වුණා නම්, තවත් හොඳයි.

ඊළඟ කාරණාව, අද සෘජු විදේශ ආයෝජන මේ රටේ සංවර්ධනයට අවශ්‍ය බව පිළිගෙන තිබෙනවා. අද එය පිළිගන්න ඔබ, එදා මොකක්ද කළේ? 1981දී නිදහස් වෙළඳ කලාපයට විරුද්ධ වුණා. නිදහස් වෙළඳ ගිවිසුම්වලට විරුද්ධ වුණා. 1981දී වාහන එකලස් කරන්න මැස්ඩා සමාගම, ටොයෝටා සමාගම එනකොට ඒවාට විරුද්ධ වුණා.

ඒවායින් වෙච්ච පාඩුව කොච්චර ද කියලා ගණන් බලන්න. ඔබතුමන්ලා අද 76 වසරක සාපයක් ගැන කියන කොට 65 වසරක සාපයකුත් ඊයේ පෙරේදා නිමා වුණු බව කියන්න ඕනෑ. මොකද, මෙවැනි යෝජනා ඔබතුමන්ලා ගෙනෙන කොට අපි මේ විපක්ෂයේ ඉඳලා ඒවාට කකුල් මාට්ටු දමන්නේ නැහැ; කකුලෙන් අදින්නේ නැහැ. රට ඉස්සරහට ගෙන යන ඕනෑම ව්‍යාපෘතියක් තිබෙනවා නම් අපි උදව් කරනවා. එදා ආණ්ඩුවේ ඒ යෝජනාවලට විරුද්ධ වන අතරේ රජයේ ආයතනවලට කොච්චර හානි කළා ද, කොච්චර නම් දේපළ ගිනි තැබුවා ද? ඒවාට විරෝධය පළ කරන්න අරගළ ඇති කරලා බැංකු මංකොල්ල කාපු කාලයක් තිබුණා. ඒවායේ පාඩුව කොච්චරද කියලාත් ගණන් බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමකාමීව අරඹපු අරගළය ප්‍රචණ්ඩත්වය තෙක් යොමු කළා. එහෙම නොකළා නම්, ගෙවල් ගිනි තැබීම් නොකළා නම්, අද ඔබතුමන්ලා කථා කරන ගෙවල් ගිනි තැබීම්වලට වන්දි ගෙවන්න සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා මම කියනවා, අද වාගේ වෙනස්ව හිතුවා නම්, ඔබතුමන්ලාට මේ රට මීට වඩා හොඳ තැනක ඉඳලා ඉස්සරහට ගෙන යන්න හැකියාව ලැබෙනවා කියලා. ඒ වාගේම මම කියනවා, අප්‍රමාදීව තව තවත් වෙනස් වෙන්න, මේ රට ඉදිරියට ගෙන යන්න කටයුතු කරන්න කියලා.

ඒ වාගේම මම ලොකු ස්තුතියක් කරනවා, මේ රටේ අවධානයට ලක් වෙච්ච නැති අංශ කිහිපයක් කෙරෙහි මෙවර අය වැයෙන් අවධානය යොමු වෙලා තිබීම ගැන. එකක් තමයි ඔටිසම් දරුවන් ගැන කථා කරපු එක. තවත් එකක්, ආබාධිත ප්‍රජාව සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාරය. තවත් එකක්, යහපාලන රජයෙන් වැටුප් වැඩි කළ, 2016-2020 විශ්‍රාම ගිය අයට ලබා දිය යුතුව තිබුණු නමුත් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා විසින් නවත්තපු ගෙවීම් නැවත වතාවක් දෙන්න කටයුතු කරපු එක. ඒ වාගේම තමයි, චතු රෝහල් පිළිබඳ යෝජනා. ඒවා ගැන අවධානය යොමු වෙච්ච එක ගැන මගේ සතුට ප්‍රකාශ කරන්න ඕනෑ. හැබැයි මේ අය අය වැයේ තිබෙනවා තවත් මරු කථා ටිකක්. එකක් තමයි, තඹුත්තේගම දුම්රිය ස්ථානයේ නවීකරණයට අදාළ ශක්‍යතා වාර්තාව ගන්න රුපියල් මිලියන 100ක් -කෝටි 10ක්- වෙන් කරලා තිබීම. හැබැයි කැලණිවැලි දුම්රිය මාර්ගය හා දුම්රිය ස්ථාන -එතැන තිබෙනවා දුම්රිය ස්ථාන 36ක්- හදන්න වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 250යි. ඒ කියන්නේ රුපියල් කෝටි 25යි. තඹුත්තේගම දුම්රිය ස්ථානයට අදාළ ශක්‍යතා වාර්තාව ගන්න රුපියල් කෝටි 10යි; දුම්රිය ස්ථාන 36ක් සමඟ පාර හදන්න රුපියල් කෝටි 25යි. මෙන්න, නොගැළපෙන තැන්.

උපාධිධාරීන් 30,000කට රැකියා දෙන්න රුපියල් මිලියන 10,000ක් වෙන් කළා කියනවා. මේ අය වැයෙන් යෝජනා කළ අවම වැටුප වන රුපියල් 40,000 වැඩි කරලා බලන්න, රුපියල් 30,000න්. ඒක එක මාසයක වැටුප. ඊට පස්සේ ඒක 12න් වැඩි කරලා බලන්න. එතකොට එනවා, රුපියල් මිලියන 14,400ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතකොට මේ රුපියල් මිලියන 10,000න් උපාධිධාරීන් 30,000කට රැකියා දෙන්නේ කොහොමද? මම අහනවා, සංවර්ධන නිලධාරියෙකුගේ අවම වැටුප කීයද කියලා. මා හිතන විධියට එදා කිව්වේ, රුපියල් 60,000යි කියලා. 60,000 කියන ඉලක්කම 30,000න් වැඩි කරලා, 12න් වැඩි කරලා බලන්න. මේ බොරු කරන එක ගැන, මැතිවරණයට පෙර කරපු බොරුවම නැවත වතාවත් ඉදිරියට ගෙන යන එක ගැන මම කනගාටු වෙනවා. ඒ වාගේම, මැතිවරණයේදී පොරොන්දු දුන්නේ, රැකියා විරහිත උපාධිධාරීන් 35,000ක් පද්ධතියට එකතු කර ගන්නවා කියලායි. ඒක කඩ වුණු පොරොන්දුවක් බවට අද පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මම බැලුවා, මධ්‍යම පළාතේ තිබෙන ගුරු හිඟය මඟ හරවන්න මුදල් වෙන් කරලා තිබෙනවද කියලා. අපේ රටේ 35,000කට, 45,000කට ආසන්න ගුරු හිඟයක් තිබෙනවා. ඒගොල්ලෝ බඳවා ගන්න ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා ද? ගුරු විභාගය සමත් උපාධිධාරීන් බඳවා ගන්න මුදල් වෙන් කරලා තිබෙනවා ද? සංවර්ධන නිලධාරීන් 15,000කට, 16,000කට අධික සංඛ්‍යාවක් පාසල්වල ඉන්නවා. ඒ අය තමයි ඒ පාසල් ටික කරගෙන යන්නේ. අද සමහර පාසල්වල විදුහල්පතිත්, සංවර්ධන නිලධාරීන් කිහිප දෙනෙකුත් පමණයි පාසල කරගෙන යන්නේ. ඉතින් ඒ අය අන්තර්ග්‍රහණය කර ගන්නට අවශ්‍ය ප්‍රතිපාදන මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා ද? ඒ වාගේම ඩෙංගු මර්දන බලකායේ ඉන්නවා, අට සමත් සහ හයෙන් දෙක සමත් කණ්ඩායමක්. ඒ අය ස්ථීර කරන්නට ගෙන තිබෙන වැඩ පිළිවෙළ මෙහි පැහැදිලි කරලා තිබෙනවාද කියලා මම අහනවා. ඒ වගේම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉන්න, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරපු අය ස්ථීර කරන්න ඔබතුමන්ලා පොරොන්දුවක් දීලා තිබෙනවා. ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න මේ තුළ කොතැන ද, කොයි පිටුවේ ද මුදල් වෙන් කරලා තිබෙන්නේ කියලා මම අහනවා.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ, විශ්‍රාමිකයන් ගැන. 2016 සිට 2020 වනතුරු විශ්‍රාම ගිය අයට 3/2016 චක්‍රලේඛය ප්‍රකාරව යහ පාලනයෙන් දීපු වැටුප ලබා දෙනවා. ඒක හොඳයි. හෙට අනිද්දා විශ්‍රාම යන අයටත් හොඳයි. හැබැයි 2020 පළමුවැනි මාසයේ 01වැනි දා ඉඳන් 2024.12.31 වන කල් විශ්‍රාම ගිය අය ගැන මේ අය වැයේ සඳහනක් නැහැ. ඒක අසාධාරණයි. ඒ අයට රුපියල් 20,000ක විතර වැටුප් විෂමතාවක් ඇති වෙනවා. මේක තුළ වෙනත් ප්‍රශ්නයකුත් ඇති වෙනවා. මොකද, 2027 වර්ෂයේ විශ්‍රාම යන්න ඉන්න අයත් 2025 වර්ෂයේ විශ්‍රාම ගියොත් එතැන හිඩැසක් ඇති වෙනවා. ඒ හිඩැස පුරවා ගන්නේ කොහොමද කියලා මම ප්‍රශ්න කරනවා. එහෙම නැත්නම් මෙය රාජ්‍ය සේවය හකුළුවන උපායක් ද, ඒ අය රාජ්‍ය සේවයෙන් අයින් කරන්නට ගහපු ගැටයක් ද, මේ ඒකේ පළමුවැනි පියවර ද කියලා මම මේ වෙලාවේ ප්‍රශ්න කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යහ පාලන ආණ්ඩුවෙන් වැටුප් වැඩි කිරීමක් කළා. එහිදී මූලික වැටුපට එකතු කිරීමක් කළා. සියයට 107 ඉඳන් ඉහළට වැටුප් වැඩි කළා. එදා නතර කරපු තැනින් පස්සේ අද ඔබතුමන්ලාගේ රජය යම්කිසි වැටුප් වැඩි කිරීමක් කරලා තිබෙනවා. ලිහලා බලන්න තිබෙන මල්ල ඔබලා බලන්න වැඩක් නැහැ. අප්‍රේල් මාසයේ අපට බලාගන්න පුළුවන්, මොකද වෙන්නේ කියලා. මම කියනවා, මූලික වැටුපට යම් ප්‍රමාණයක් එකතු කිරීමත් හොඳයි, වැටුප් වර්ධකය වැඩි කිරීමත් හොඳයි කියලා. ඒවා සේවක අයිතීන් ආරක්ෂා කරනවා; සේවක වරප්‍රසාද ද පුළුල් කරනවා. හැබැයි මම අහනවා, මේ වැඩි කරන රුපියල් 8,250 මේ ජීවන වියදමත් එක්ක සැහෙනවා ද කියලා. වේදිකාවේදී වැටුප් ගැන ප්‍රකාශ කරපු වෘත්තීය සිමිති නායකයෝ

ඔක්කෝම අද මේ ආණ්ඩු පක්ෂයේ වාඩි වෙලා ඉන්නවා. රුපියල් 20,000කින් වැටුප් වැඩි කරනවා කියලා අද ඔබතුමන්ලා මොන දෙයක් ද කරලා තිබෙන්නේ කියා මම ප්‍රශ්න කරනවා. මොකද, පොල් ගෙඩිය රුපියල් 250යි, හාල් කිලෝව රුපියල් 200යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Mrs.) Rohini Kumari Wijerathna, your time is up.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒත් එක්කම, පරිප්පු කිලෝ එකක් රුපියල් 300යි, බිත්තරයක් රුපියල් 30යි. කන එක විතරක් නොවෙයි. තවත් කරුණු කාරණා තිබෙනවා.

Clean Sri Lanka වැඩසටහන ගැන කථා කළොත්, ඒ සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. ඒකේ විසඳුම් ලබා දීමට බලාපොරොත්තු වන කරුණු හැටියට අංක එකට ඔබතුමන්ලා කියන්නේ Clean Sri Lanka වැඩසටහන ඇතුළේ මේ තිබෙන මුදල්වලින් රජය කෙරෙහි පවතින සෘණාත්මක හැඟීම වෙනස් කරන්නට කටයුතු කරනවා කියලායි. මෙය මුදල් අවභාවිතයක්. මොකද, ඒක රජය promote කරන වැඩසටහනක්.

මම අවසාන වශයෙන් යෝජනා කීපයක් කරනවා. පළමුව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කඩිනම් කරන්නට මේ අය වැය තුළින් මුදල් වෙන් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, විද්‍යාපීඨ විශ්වවිද්‍යාල දක්වා වැඩිදියුණු කරන්නට අවශ්‍ය ප්‍රතිපාදන සකස් කරන්න කියලාත් කියනවා. ඒ වාගේම, මාතලේ දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කරන්න කියාත් ඉල්ලා සිටිනවා. මාතලේ කියන්නේ සංචාරක පාරාදීසයක්. නකල්ස්, දඹුල්ල, මාතලේ, වස්ගමුව, ඇල්කඩුව, සෙම්බුවත්ත ආදිය ගත්තාම, ඒවා සංචාරක පාරාදීස. ඒ නිසා ඒ කටයුත්ත කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම මාතලේ දිස්ත්‍රික්කයේ-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Rohini Kumari Wijerathna, could you please wind up?

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රධාන රෝහල්වල සම්පත් ඌනතාවක් තිබෙනවා. ඒ නිසා ඒවා ගැන, මාතලේ දඹුල්ල, ලග්ගල රෝහල් ගැනත් කථා කරන්න ඕනෑ.

කළමනාකරණ සේවය තුළ ඉන්න MN-4 වැටුප් කාණ්ඩයට පහළ සමාන සුදුසුකම් සහිත උපාධිධාරීන් එම කාර්යයම කරමින් දැඩි අසාධාරණයකට ලක් වෙලා සිටිනවා. ඒ වාගේම, ප්‍රාථමික සේවා උපාධිධාරීන්ට නිසි වටිනාකමක් දෙන්න ඕනෑ. මොකද, අද උපාධිධාරීන් මුරකරුවන් සහ කම්කරුවන් හැටියට රැකියාවල යෙදී සිටිනවා. ගරු ජනාධිපතිතුමා මන්ත්‍රීවරයෙකු හැටියට ඉන්න කොට වෙච්ච පොරොන්දුවක් ඇතුළත් ලිපියක් මා ළඟ තිබෙනවා. ජනාධිපතිවරයා හැටියට පත් වුණාට පස්සේ ඒක ඉටු කරන බවට ඉඟියක් දීලා තිබෙනවා. 2024.09.10 දිනැති එම ලිපිය මම **සභාගත*** කරනවා.

2024.09.10 දිනැති එම ලිපියෙහි මෙසේ සඳහන් වෙනවා:

"අ.පො.ස. සාමාන්‍ය පෙළ වත් සමත් නැති, ඇමතිවරු යටතේ උපාධිධාරීන්ට කම්කරු රැකියාවල සේවය කිරීමට සිදුවීම, මේ තාක් අප රට පාලනය කළ පාලකයන් උගත් තරුණ පරපුරට අත්කර දී ඇති බේදනීය ඉරණම පිළිබඳ හොඳම සාක්ෂියකි. එමෙන්ම එය කනගාටුදායක තත්ත්වයකි.

අප පක්ෂය අතිශය කටුක අත් දැකීම් ලබමින් වෙහෙසෙන්නේ සියලු පුරවැසියන්ට සතුටින් ජීවත් විය හැකි රටක් ගොඩනැඟීම පිණිසයි."

මේ තිබෙන්නේ ජනාධිපතිතුමා මන්ත්‍රීවරයා හැටියට ඉදිරිපත් කරපු ලිපිය. මම ඒක සභාගත කළා. ගරු ජනාධිපතිතුමනි, මේ ප්‍රාථමික සේවාවල ඉන්න උපාධිධාරීන්ටත් සාධාරණය ඉෂ්ට කරන්න කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ajith Agalakada. You have ten minutes.

[අ.භා. 2.32]

ගරු අජිත් අගලකඩ මහතා
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා, අපි පුංචි කාලයේ අපේ අම්මලා තාත්තලා කොච්චර උනන්දුවෙන් අය වැයට සවන් දුන්නා ද කියලා. ඒ කාලයේ රූපවාහිනී යන්ත්‍ර ඇවිල්ලා තිබුණේ නැහැ. රේඩියෝ එක ළඟට වෙලා අපේ රටේ ගොඩක් පුරවැසියෝ අය වැයට ඇහුම්කන් දුන්නා, ඉතාම උනන්දුවෙන්. ඒ කාලයේ බඩු මිල එහා මෙහා වුණේ අවුරුද්දකට එක වතාවයි. ඒකත් ශත ගණන්වලින්. කාලය ගත වෙලා ඇවිල්ලා අද වෙනකොට අය වැයට කලින් දවසේයි, අය වැය දවසේයි, ඊට පස්සේයි අපේ රටේ භාණ්ඩ මිල සහ අනෙකුත් දේවල් වෙනස් වෙන තැනට පත් වෙලා තිබෙනවා. එහෙම කාලයක් ගත කරගෙන ඇවිල්ලා, අද අපි ජාතික ජන බලවේගයේ මංගල අය වැය ඉදිරිපත් කරනවා. අය වැය කියන්නේ බලය හොබවන දේශපාලන පක්ෂය, මේ රටේ ජීවත් වන ජනතාව අරගෙන යන ඉසව්ව. අය වැය කියන්නේ ජාත්‍යන්තරය තුළ අපේ රටත්, ජනතාවත් ස්ථානගත කරන තැන පිළිබඳ ලෝකයට, රටට හෙළිදරව් කරන ලියැවිල්ල.

අපි ඉදිරිපත් කරපු අය වැය ගැන පාර්ලිමේන්තුවේ ඉන්න අපට විරුද්ධ මත දරන ගරු මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සහ පාර්ලිමේන්තුව නියෝජනය නොකරන දේශපාලන පක්ෂවල නියෝජිතයනුත් විවිධ අදහස් ප්‍රකාශ කරමින් ඉන්න අවස්ථාවක් මේක. සමහරු කියනවා, මේක රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාගේ තුන්වැනි අය වැය කියලා. තව සමහර අය මේක නව ලිබරල්වාදී අය වැයක් කියලා හඳුන්වන්න උත්සාහ කරනවා. ඇත්තටම මේ අය වැය අපි මැතිවරණ වේදිකාවේ කියපු කථාවෙන් වෙනස් වෙච්ච එකක් ද? අපි මොනවාද මැතිවරණ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අජිත් අගලකඩ මහතා]

වේදිකාවේ කිව්වේ? පළමුව, අපි මැතිවරණ වේදිකාවේ කිව්වා අපි මේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් හදනවා කියලා. දෙවනුව, අපේ රටේ වැඩ කරන්න පුළුවන් සෑම කෙනෙක්ම ඒ නිෂ්පාදන ආර්ථිකයේ කොතැනට හෝ සම්බන්ධ කර ගන්නවා කිව්වා. අපි වැඩ කරන්න පුළුවන් කියන්නේ කාටද? විශේෂයෙන්ම, අපේ රටේ ළමයින්ගෙන් වැඩ ගන්නේ නැහැ, ඒ අය ඉගෙන ගන්න ඕනෑ. අපි වැඩිහිටියන්ගෙන් වැඩ ගන්නේ නැහැ, ඒ අය විවේකයෙන් ඉන්න ඕනෑ. ආබාධ සහිත පුරවැසියන් ඉන්නවා. අපි ඒ අයගෙන් වැඩ ගන්නේ නැහැ. ඉතිරි පිරිස වැඩ කළ හැකි අය. ඒ නිසා වැඩ කළ හැකි සෑම කෙනෙකුටම අපි හදන නිෂ්පාදන ආර්ථිකයට සම්බන්ධවීමට ස්ථානයක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ඒ නිෂ්පාදන ආර්ථිකයෙන් උපයන දැවැන්ත ධනය සාධාරණ පදනමකින් හැමෝටම බෙදිලා යන ක්‍රමයක් හදනවා කියලා අපි මැතිවරණයේදී කිව්වා. එතැන කාරණා තුනයි. පළමුවැනි කාරණය, අපි හදනවා නිෂ්පාදන ආර්ථිකයක්. දෙවැනි එක, ඒ නිෂ්පාදන ආර්ථිකයට රටේ වැඩ කරන්න පුළුවන් හැමෝම සම්බන්ධ කර ගන්නවා. තුන්වැනි එක, ඒ නිෂ්පාදන ක්‍රියාවලිය හරහා උපදන ධනය සාධාරණ පදනමකින් හැමෝටම බෙදිලා යනවා. එතකොට දැන් මේ ඉදිරිපත් කර තිබෙන අය වැය ඒ මූලධර්ම තුන මත පිහිටා තිබෙනවා ද? ඒකයි අපි විමසා බලන්න ඕනෑ.

පළමුවැනි කාරණයේදී අපි කිව්වා නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නඟනවා කියලා. මේ අය වැයෙන් අපි වාරිමාර්ග ක්ෂේත්‍රයට විතරක් ප්‍රාග්ධන වියදම් විධියට රුපියල් මිලියන 78,000ක් වෙන් කර තිබෙනවා. වාරිමාර්ග කටයුතු කාර්යක්ෂමව, පිළිවෙළකට කර ගන්නේ නැතිව, සංවිධානාත්මකව කර ගන්නේ නැතිව, ඒවායේ නව ඉදිකිරීම් වර්තමානයට ගැළපෙන පරිදි කර ගන්නේ නැතිව අපට කෘෂි කර්මාන්තයේ දියුණුවක් ගැන හිතන්න බැහැ. එහෙම නම්, කෘෂි කර්මාන්තයේ දියුණුව වෙනුවෙන්, කෘෂි කර්මාන්තයේ නිෂ්පාදන කටයුතු වර්ධනය කර ගැනීම වෙනුවෙන් අපි වාරිමාර්ග කටයුතු සඳහා රුපියල් මිලියන 78,000ක් වෙන් කර තිබෙනවා. අපි කිරි ගොවිපොළවල් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 2,500ක් වෙන් කර තිබෙනවා. අපි ඉන්දියාවේ අමුල් සමාගම ගැන කථා කර කර ඉඳලා වැඩක් නැහැ. ශ්‍රී ලංකාව කියන්නේ ඉන්දියාව වාගේම විභවතාවක් තිබෙන රටක් තමයි කිරි කර්මාන්තයෙන් ඉහළට යන්න. ඒ නිසා අපි කිරි ගොවි පොළවල් සංවර්ධනය කරන්න රුපියල් මිලියන 2,500ක් වෙන් කර තිබෙනවා.

නවෝත්පාදන ආශ්‍රිතව පේටන්ට් බලපත්‍ර 2020 අවුරුද්දේ 273ක් අරගෙන තිබෙනවා. ඒකෙන් 49යි අපට අයිති. අනෙක් ඒවා අනේවාසික පේටන්ට් බලපත්‍ර. ඒ නිසා නවෝත්පාදන ආශ්‍රිත ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම වෙනුවෙන් අපි රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා. අපි නිෂ්පාදන ආර්ථිකයකට යමින් ඉන්නවා.

ඒ වාගේම, පොල් ප්‍රශ්නයත් අපට පසුගිය දවස්වල තදින් දැණුනු දෙයක්. අපි ආණ්ඩුව බාර ගන්නකොටම මේ ප්‍රශ්නය මතු වුණා. පොල් සංවර්ධනය වෙනුවෙන් උතුරු පොල් ත්‍රිකෝණය යටතේ අක්කර 16,000ක් පොල් වගාවෙන් සම්පූර්ණ කරන්න අපි රුපියල් මිලියන 500ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, කෘෂිකාර්මික තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. තරුණ තරුණියන් අපේ කෘෂි කර්මාන්තයෙන් වේගයෙන් ඈත් වෙමින් ඉන්නවා. ඒ නිසා smart agriculture වෙනුවෙන්, තරුණ තරුණියන් මේ ක්ෂේත්‍රයට කැඳවීම වෙනුවෙන් අපි රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම ඩිජිටල්කරණය. කාර්මික, කෘෂි කාර්මික සහ සේවා කියන අංශ තුනෙහිම ඉහළම ප්‍රගතිය ලබන්න නම් අපි නව තාක්ෂණය හා මුසු විය යුතුයි. මේ සියල්ල එකට සම්බන්ධීකරණය කරන ඩිජිටල්කරණය අපිට අනිවාර්යයෙන් කරන්න වෙනවා. ලෝකයේ අනෙක් රටවල් එක්ක බැලුවාම දැනටත් අපි ඒ සඳහා ප්‍රමාද වෙලා ඉන්නවා. ඒ නිසා ඩිජිටල්කරණය වෙනුවෙන් අපි රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා.

අපේ අය වැයේ සඳහන් නොවුණත් මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. අපේ රටේ තෙල් පිරිපහදුව තාක්ෂණයෙන් යම් ප්‍රමාණයකට යල් පැනලා. ඒකත් පසුගිය කාලයේ අපි යලට-මහට තමයි පාවිච්චි කළේ. අපේ හිටපු පාලකයෝ උත්සාහ කළේ පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් වෙන වෙනම අරගෙන ඇවිල්ලා රටේ පරිභෝජනය කරන්නයි. ඒ නිසා අපි චීන රජයත් එක්ක එකතු වෙලා ඩොලර් බිලියන 3.7ක ආයෝජනයක් විධියට නව තෙල් පිරිපහදුවක් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු කරමින් ඉන්නවා. එහෙම නම්, මැතිවරණ වේදිකාවේ කථා කළ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩ නැඟීම කියන මූලික සංකල්පයෙන් අපි බැහැර වෙලා නැහැ. ඒ තුළ ඉඳගෙන අපි මේ අය වැය ඉදිරිපත් කර තිබෙනවා.

ඒ වාගේම, මේ නිෂ්පාදන ආර්ථිකයට අපේ රටේ වැඩ කරන්න පුළුවන් ජනතාව දායක කර ගන්නවා කියලා මැතිවරණ වේදිකාවේදී අපි කිව්වා. ඒ අනුව, මේ අය වැයෙන් රැකියා අවස්ථා 30,000ක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමිය කිව්වා, මේ රැකියා 30,000 ලබා දෙන්න රුපියල් මිලියන 10,000යි වෙන් කර තිබෙන්නේ කියලා. ඒක මාස 12කට වැඩි කරලා ගත්තාම රුපියල් මිලියන දහඅතර දහස් ගණනක් ඕනෑ කියලා. එතුමියට අමතකයි. අය වැය සම්මත වනකොට මාර්තු මාසය ඉවරයි. සම්මුඛ පරීක්ෂණ තියලා මේ අය බඳවා ගන්නකොට ජූනි මාසයත් ඉවරයි. එහෙම නම්, මාස 6කට වැටුප් ගෙවන්න විතරයි අපි මුදල් වෙන් කර ගන්න ඕනෑ. ඒ නිසා හිතාමතා අමතක කරන්නේ නැතිව, එතුමියට ආපහු ගණන් හදන හැටි ඉගෙන ගන්න වෙනවා.

ඊළඟට, අපි කෘෂි ව්‍යවසායකයෝ 10,000ක් නිර්මාණය කරන්න සැලසුම් සකස් කර තිබෙනවා, තරුණ පරම්පරාව කෘෂි කර්මාන්තයට සම්බන්ධ කර ගැනීම වෙනුවෙන්. ඒ කියන්නේ, අපේ රටේ ජනතාව නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්නවා කියන එකයි. දවසකට කිරි ලීටර් 20ක් ගන්නා ගොවීන් 4,000ක් සහ කිරි ලීටර් 40ක් ලබා ගන්නා මට්ටමේ ගොවීන් 3,500ක් සහිත කිරි ගොවීන් 7,500කට අවස්ථාව දිය හැකි කිරි ගොවිපළ නිර්මාණය කරන්න අපි සූදානම් කරගෙන ඉන්නවා.

ඒ වාගේම මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ හා ක්ෂුද්‍ර ව්‍යවසායකයෝ -කර්මාන්තකරුවෝ- 15,000ක් ඉදිරි වසර තුළ නිර්මාණය කරගෙන අපේ රටේ ආර්ථිකය දියුණු කරන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ විධියට අපි අපේ ජනතාව මේ ආර්ථිකයට සම්බන්ධ කර ගන්නවා.

නිෂ්පාදන ක්‍රියාවලියෙන් උපදවන ධනය සාධාරණ පදනමකින් බෙදී යෑමට අපි කටයුතු කර තිබෙනවා. වැටුප් වැඩි කිරීමට රුපියල් බිලියන 325ක් යනවා. මව්වරුන් හා දරුවන්ගේ පෝෂණය සඳහා ත්‍රිපෝෂ වැඩසටහනට රුපියල් මිලියන 5,000ක් යනවා. ගැබිණි මවුවරුන්ට පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා මාසික ආධාරයක් ලබා දෙන්න රුපියල් මිලියන 7,500ක් යනවා. ඔටිසම් ඇතුළු ස්නායු සම්බන්ධ ආබාධ සහිත දරුවන්ගේ ප්‍රතිකාර සඳහා රුපියල් මිලියන 200ක් යනවා. ඒ කියන්නේ, නිෂ්පාදනය කරලා හොයන ධනය ආපහු වතාවක් විවිධ ප්‍රතිලාභ විධියට ජනතාවගේ අතට ලැබෙන ආකාරයට අපි සැලසුම් සකස් කර තිබෙනවා. සමාජ ආරක්ෂණ කටයුතු වෙනුවෙන් විතරක් රුපියල් බිලියන 749ක් අපි වෙන් කර තිබෙනවා.

පළමුවෙනි වතාවට "මලයගම්" ජනතාවගේ ජීවන තත්ත්වය නහා සිටුවීම වෙනුවෙන් රුපියල් මිලියන 7,583ක් වාගේ දැවැන්ත මුදලක් අපි වෙන් කර තිබෙනවා. එහෙම නම්, අපි කියපු විධියටම නිෂ්පාදන ආර්ථිකය ගොඩ නහනවා. ඒ සඳහා හැකි සෑම කෙනෙකුම සම්බන්ධ කර ගන්නවා. ඒ හැමදෙනාටම මේ දැවැන්ත නිෂ්පාදන ක්‍රියාවලියෙන් උපදින ධනය බෙදිලා යන විධියේ අය වැයක් අපි හදලා තිබෙනවා. අපි මැතිවරණ වේදිකාවේදී කියපු මූලධර්ම මත පදනම් වෙලා මේ අය වැය ගොඩ නහා තිබෙනවා කියන එක පැහැදිලියි.

අපේ ප්‍රශ්නය තිබෙන්නේ, මේ අය වැයෙන් වෙන් කළ මුදල් අපට ලැබෙනවාද නැද්ද කියන එක නොවෙයි. ප්‍රාග්ධන වියදම් විධියට සමස්තය රුපියල් බිලියන 1,400කට ආසන්න මුදලක් වෙන් වෙලා තිබෙනවා, අය වැයෙන්. රුපියල් බිලියන 1,400 මේ මහ පොළොව මත විසුරුවා හරින්නේ කෙසේද කියන අභියෝගයයි අපේ මන්ත්‍රීවරු 159දෙනා සතුව තිබෙන්නේ. අවුරුද්දේ තව ඉතුරු වෙලා තිබෙන්නේ මාස 9ක කාලයක් විතරයි. ඒ මාස 9ක කාලය ඇතුළත දිසාපතිවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් රාජ්‍ය යන්ත්‍රණයට සම්බන්ධ කරගෙන මේ බිලියන 1,400ක මුදල මේ මහ පොළොව තුළ විසුරුවා හැරීමේ අභියෝගයට අපි මුහුණ දීලා තිබෙනවා. අපට විශ්වාසයි, අපේ 159දෙනාට ජනාධිපතිතුමා සමඟ එකතු වෙලා මේ කටයුත්ත සාර්ථකව කරන්න පුළුවන් වෙයි කියලා.

ඒ වාගේම විපක්ෂයේ මහත්වරුන්ට මේ කාරණයත් කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු අජිත් අගලකඩ මහතා
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

සියයට 3ක ඡන්ද ප්‍රමාණයක් තිබුණු දේශපාලන ව්‍යාපාරයක්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර තුනක් පමණක් අත් පත් කරගෙන තිබුණු දේශපාලන ව්‍යාපාරයක් ඔබේ සියලු බලාපොරොත්තු සුනු විසුනු කරමින්, ඔබේ බලකොටු සියල්ල මහ පොළොවට සමතලා කරමින්, මුළු ලෝකයේම අවධානය ශ්‍රී ලංකාව දෙසට යොමු කරමින් පසුගිය මැතිවරණයේදී බලය අත් පත් කර ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හා සමානවම අපි ඉදිරිපත් කර තිබෙන මංගල අය වැයෙන් තබන පියවර, අවසානයේ අපේ රටේ සියලුම ජනතාව අපි හිතාගෙන සිටින "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කරා අරගෙන යන ගමන සාර්ථක කිරීමෙන් මිසක් මෙපිට ආපසු හැරෙන්නේ නැහැයි කියන පණිවුඩය ලබා දෙමින්, මට කථා කරන්නට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Rathnasiri. You have 11 minutes.

Order, please! Before he starts, the Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair and THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.

[අ.භා. 2.42]

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඊයේ සහ අද දෙදින පුරා අපේ රටේ සිදු වූ ඝාතන රැල්ලක් සහ පවතින ඝාතන සංස්කෘතියක් පිළිබඳව විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් විවිධ අඬ ඇඬියාවන් සහ කෙඳිරිගෑම් සිද්ධ කළා. මේ අය වැය විවාදය අතරේ ඉතා කෙටියෙන් වුණත් ඒ අයට මතක් කළ යුතු කාරණයක් තිබෙනවා.

මීට මාස කිහිපයකට පෙරාතුව "ක්ලබ් වසන්ත" කියන තැනැත්තා ඝාතනයට ලක් වුණාට පස්සේ ඒ ඝාතනයේ ප්‍රධාන සැකකරුවෙක් බවට පත් වුණු, ඒ ඝාතනය සැලසුම් කළ බවට චෝදනා ලැබූ පුද්ගලයාම තමයි එදා වැඩියෙන්ම කෑ ගහලා ඇඬුවේ. එම නිසා විපක්ෂයේ ඇඬියාව සහ කෙඳිරිල්ල ඇහුණාම මට ක්ලබ් වසන්ත ඝාතනයට චෝදනා ලැබූ තරුණයා මතක් වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ ඝාතන රැල්ල පිළිබඳව හඬන, දොඩන විපක්ෂය සම්බන්ධයෙන් මට එපමණයි කථා කරන්නට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මුළු රටම ජාතික ජන බලවේගයේ මංගල අය වැයේ අන්තර්ගතය පිළිබඳව කථා කරමින් සිටින මොහොතක, විපක්ෂයේ මන්ත්‍රීවරු අද කථා කරන්නේ එහි අන්තර්ගතය සම්බන්ධයෙන් නොවෙයි. ඔවුන්ගේ සමස්ත කථාව සකස් වෙලා තිබෙන්නේ, මේ අය වැයට දාලා තිබෙන නම මොකක්ද, මේ අය වැයේ පිතෘත්වය කාගේද, මේ අය වැයෙන් දීලා තිබෙන සහන මොනවාද කියන කරුණු ගැන පමණයි. අපි කියනවා, අපි බබෙක් හදලා තිබෙනවා; දරුවෙක් හදලා තිබෙනවා. අපි ඥානවන්ත දරුවෙක්, ගුණවන්ත දරුවෙක්, රට ගොඩනඟන්න පුළුවන් දරුවෙක් හදලා තිබෙනවා. ඔබතුමන්ලා කැමති නමක් දමාගන්න. ඒක ධනවාදයද, සමාජවාදයද, ලිබරල්ද, නව ලිබරල්ද, ඒ කැමති නමක් ඔබතුමන්ලා දමාගන්න. හැබැයි, අපි මේ රට ගොඩනඟන්න පුළුවන් ආකාරයට ඥානවන්ත, ගුණවන්ත දරුවෙක් හදලා තිබෙනවා; වදලා තිබෙනවා.

ඒ වාගේම මේ ගොල්ලෝ පිතෘත්වය පිළිබඳව කථා කරනවා. එක වෙලාවක කියනවා, මේක හැදුවේ IMF එකෙන් කියලා. තව වෙලාවක කියනවා, මේක හැදුවේ රනිල් වික්‍රමසිංහ මහත්මයා කියලා. පිතෘත්වය පරීක්ෂා කරන්න, DNA පරීක්ෂාව කරන්න ඔබතුමන්ලා කලබල වෙන්න එපා කියලා අපි කියනවා. අපට තව අවුරුදු 5ක් තිබෙනවා. අන්න ඒ අවුරුදු පහ තුළ දරුවා හැදෙනකොට, වැඩෙනකොට ජනතාව තීන්දු කරයි පිතෘත්වය කාගේද කියලා. එම නිසා අපේ දරුවන්ට උප්පැන්න දෙන්න ඔබතුමන්ලා කලබල වෙන්න එපා කියන ඉල්ලීම අපි කරනවා.

ඊට පස්සේ, "සහන මදි, ගුරුවරුන්ට සහන දීලා නැහැ, වෛද්‍යවරුන්ට සහන දීලා නැහැ, ව්‍යාත්තිකයන්ට සහන මදි" කියලා විවිධ අඬ ඇඬියාවන් කරනවා. අපිත් කියනවා, ඔව්, මීට වඩා සහන දෙන්න තිබුණා නම් අපිත් සන්තෝෂ වෙනවා කියලා.

[ගරු සුනිල් රත්නසිරි මහතා]

ගුරුවරුන්ට, වෛද්‍යවරුන්ට, ඉංජිනේරුවන්ට, විවිධ වෘත්තිකයන්ට දෙන්න පුළුවන් සහන උපරිමයෙන්ම දීලා තිබෙනවා. හැත්තෑහය අවුරුද්දක් මේ රට කාබාසිනියා කරලා, ලෝකය ඉස්සරහා දණ ගස්සලා, නැති හංගස්ථාන කරලා තිබුණේ නැත්නම් මීටත් වඩා සහන දෙන්න තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මීට දින දෙකකට පෙරාතුව හර්ෂ ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා, "පූජකයාට වැරදිලා. මේ අය වැය ඇතුළේ ධම්මපදයත් තිබෙනවා, බයිබලයත් තිබෙනවා, කුරානයත් තිබෙනවා" කියලා. මම කියනවා, පූජකයාට වැරදිලා නැහැ. මේ අය වැය ඇතුළේ ධම්මපදයත් තිබෙනවා, කුරානයත් තිබෙනවා, බයිබලයත් තිබෙනවා. හැබැයි, සාතාන්ලාගේ ධර්මය මේක ඇතුළේ නැහැ. චැම්පයර්ස්ලාගේ, සාතන්ලාගේ ධර්මය මේක ඇතුළේ නැහැ. අපිට දීපු ජනවරම කියලා කියන්නේ ජාති, ආගම් භේදයකින් තොරව, කුල භේදයකින් තොරව වර්ගවාදීව බෙදෙන්නේ නැතිව දීපු ජනවරමක්. ඒ නිසා අපේ අය වැය ඇතුළේ උතුරටත්, දකුණටත්, රටේ සිව් කොණටත් සමාන ලෙස අපි සලකලා තිබෙනවා. හොය බලලා කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපි කියන්නට ඕනෑ ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, වාණිජ මණ්ඩලයේ හිටපු සභාපති දුමින්ද හුලංගමුව මහත්මා ජනාධිපති උපදේශකයෙක් ලෙස කටයුතු කරනවා කියලා. වැටුප් නොගෙන රට වෙනුවෙන් වැඩ කරන මේ චරිතවලට ආක්‍රෝස පරිභව කරන ගමන් එතුමාට අමතක වෙලා, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ උපදේශකවරියක් විධියට හිටපු රෝසි සේනානායකව. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා රට වෙනුවෙන්, පක්ෂය වෙනුවෙන් දිවි දීපු ආදරණීය සහෝදර සහෝදරියන්ට එරෙහි වෙච්ච අය වැයක් තමයි අපේ පක්ෂය ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. අපි ඉතාම කාරුණිකව කබීර් හෂීම් මහත්මයාට කියනවා, මහත්තයෝ, මේ අපි ලබපු ජයග්‍රහණය ඇතුළේ ජීවත් වෙලා ඉන්න පිරිස වාගේම මේ පක්ෂය වෙනුවෙන් මේ රට ගොඩනඟන්න, මේ රට අලුත් දිශානතියකට හරවන්න තමන්ගේ උතුම් වූ ජීවිතය දීපු දස දහස් ගණනක් මේ බිමේ වැළලිලා ඉන්න බව. තමුන්නාන්සේලාගේ විදුලි කියත්වලින් අතපය කපද්දී, දෙපළු කරද්දී, "මාතෘ භූමියට ජය වේවා!" කියලා මැරුණු තරුණයෝ දස දහස් ගණනක් සිටින පක්ෂයක් මේක. දණින් වැටිලා කල්පයක් ජීවත් වෙනවා වෙනුවට, දෙපයින් සිට මිය යාම උතුම් කොට සලකපු පරම්පරාවක් හිටපු පක්ෂයක් මේක. 60,000ක් තරුණයන්ව ඝාතනය කරනකොට නිහඬව හිටපු අය අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා ශෝක පණිවුඩ ලියනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ රට වෙනුවෙන් තමන්ගේ උතුම් ජීවිතය දීපු ඒ ආදරණීය තරුණ තරුණියන්ගේ සිතැඟියවක් තිබුණා, අපේක්ෂාවක් තිබුණා. අබමල් රොනකින් ඒ අපේක්ෂාව අපි පළඳු කරන්නේ නැහැ. ඔවුන් අපේක්ෂා කරපු ලෝකයේ රට තමයි මේ තනමින් සිටින්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා ඉතිහාසයේ පත් වෙච්ච සෑම ජනාධිපතිවරයෙකුටම අපි බැණ්ණා, අරගළ කළා, වෛරය වැපිරුවා කියලා. අපි කියනවා, 1977 ඉඳලා මේ රට පාලනය කළේ දූෂිත, ත්‍රාඩ දේශපාලනඥයෝ බව. 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය බලයට පත් වුණා. බලයට පත් වෙනකොට එතුමියට කිව්වා "නූතන විභාරමහා දේවි" කියලා. රුපියල් 3.50ට පාන් කන්න ඕනෑ වුණා. ඒ නිසා එතුමියට දෙවැනි ධුර කාලයත් දුන්නා. හැබැයි, එතුමිය බැහැලා යනකොට එතුමියට නමක් දෙනවා "චෞර රැජිණ" කියලා. එනකොට, "නූතන විභාරමහා දේවි" යනකොට, "චෞර රැජිණ". ඊට පස්සේ බණ්ඩාරනායක වළව්වේ තිබුණ කිරුළ අරගෙන මැදමුලනේ වලව්වට ගිහිල්ලා දුන්නා. මහින්ද මහත්තයා එනකොට "නූතන දුටුගැමුණු". එතුමාගේ දෙවැනි ධුර කාලයේ ලෝකයේ ලොකුම කැබිනට් එක හැදුවා. ලෝකයේ ලොකුම කැබිනට් එක හදලා වාර්තාවක් තිබ්බා. ඊට පස්සේ සුනාමියක් ආවා. සුනාමි සහනාධාර තමන්ගේ පෞද්ගලික ගිණුමකට බැර කර ගත්තා කියලා එතුමාට චෝදනාවක් ආවා "සුනාමි හොරා" කියලා. එනකොට, "නූතන දුටුගැමුණු". යනකොට, "සුනාමි හොරා". ඊට පස්සේ සුනාමි හොරාගෙන් රට බේරා ගන්න ඕනෑ වුණා. මහපොළොවෙන් උපන් මිනිහෙක් හෙව්වා. එයා පොළොන්නරුවේ මහ පොළොවෙන් ඉපදෙන්නත් ඕනෑ. එයාව ගෙනාවා. අන්ත දියාරු පාලනයක් තිබුණා. මහ බැංකුව කැඩුවා. පාස්කු ප්‍රහාරය සිද්ධ වුණා. දොන් ජුවන් ධර්මපාලගෙන් පස්සේ දියාරුම පාලනයක් තිබුණා. අඩුම ගණනේ අරගොල්ලන්ට නමක් හදලා තිබුණා.

එනකොට "නූතන විභාර මහාදේවි", යනකොට "චෞර රැජින". එනකොට "නූතන දුටුගැමුණු", යනකොට "සුනාමි හොරා". ඊට පසු ආ කෙනා එනකොටත් "හිටං", යනකොටත් "හිටං". ඊට පස්සේ හිටංගෙන් රට බේරා ගන්න ඕනෑ වුණා. හිටංගෙන් රට බේරා ගන්න, රට හදන්න විරුවෙක් ඕනෑ වුණා. හැබැයි අවුරුදු දෙකක් යනකොට ජනතාව දැනගත්තා, විරුවෙක් නොවෙයි ගෙනැල්ලා තිබෙන්නේ පඹයෙක් කියලා. එනකොට "විරුවා", යනකොට "පඹයා". ඊට පස්සේ පඹයාගෙන් රට බේරා ගන්න ඕනෑ වුණා. පඹයාගෙන් රට බේරා ගන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ 134ක් අත් උස්සලා තවත් ත්‍රාඩ දේශපාලනඥයෙක් තෝරා ගත්තා. ඒ, රනිල් වික්‍රමසිංහ. ඒ කෙනා එනකොට ආසියාවේ "මහා මොළය", යනකොට සියල්ල අඩපණ වුණු "සීයා". ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතැනින් පස්සේ 2024 සැප්තැම්බර් මාසයේ 21වෙනි දා මේ රටේ ජනතාව තීන්දුවක් අරගෙන, මේ රටේ දුක්විඳින ජනතාවගේ අපේක්ෂාව තමන්ගේ අපේක්ෂාව බවට පත් කර ගත්, දුක් විඳින ජනතාවගේ බලාපොරොත්තුව තමන්ගේ බලාපොරොත්තුව බවට පත් කර ගත් නායකයෙක් සොයා ගත්තා. ඒ තමයි, ජාතික ජන බලවේගයේ නායකයා; අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි රට භදන්න පටන් ගත්තේ ඉහළ සිට කැප කිරීම් කරලායි. අපි මේ කාරණා ටික මතක් කරන්න ඕනෑ. මෙවර අය වැයෙන් අපේ විශ්‍රාම වැටුප අහෝසි කරනවා. හැබැයි, පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන්ට ලබා දෙන දීමනාව රුපියල් 750 ඉඳලා රුපියල් 1,500 දක්වා වැඩි කරනවා. මන්ත්‍රී වාහන පර්මිට් එක අහෝසි කරනවා. හැබැයි, මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000 ඉඳලා රුපියල් 7,500 දක්වා වැඩි කරනවා. මේ වසරේ මන්ත්‍රීවරුන්ට වාහන දෙන්නේ නැහැ. හැබැයි, වැඩිහිටි දීමනාව රුපියල් 3,000 ඉඳලා රුපියල් 5,000 දක්වා වැඩි කරනවා. මන්ත්‍රී රක්ෂණය රුපියල් ලක්ෂ 10 ඉඳලා රුපියල් ලක්ෂ දෙකහමාර දක්වා අඩු කරනවා. හැබැයි, පෙර පාසල් ගුරුවරුන්ගේ දීමනාව තවත් රුපියල් 1,000කින් වැඩි කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඇමති නිල නිවාස අපි රජයේ කාර්යාල බවට පත් කළා. හැබැයි, වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,700 දක්වා ගෙන එන්න පියවර ගත්තා. ආණ්ඩු පක්ෂයට මන්ත්‍රී ධුර 159ක්

තිබුණත්, ඇමති ධුර සංඛ්‍යාව 21 දක්වා අඩු කළා. හැබැයි, පෙර පාසල් දරුවන්ගේ උදෑසන ආහාර වේල සඳහා ලබා දුන් රුපියල් 60ක මුදල රුපියල් 100 දක්වා වැඩි කළා. ජනාධිපති වැය ශීර්ෂය ඉතිහාසයේ අඩුම ජනාධිපති වැය ශීර්ෂය බවට පරිවර්තනය කරලා පෙන්වුවා. ඒ අතරේ රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප රුපියල් 24,250 ඉඳලා රුපියල් 40,000 දක්වා වැඩි කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ මංගල අය වැය කියන්නේ අවසාන අය වැය නොවෙයි. රට හදලා මිසක්, රට ගොඩනඟලා මිසක් අපි ආපස්සට හැරෙන්නේ නැති බව විපක්ෂයට සපථ කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.55]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වත්මන් ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා විධියට 79වැනි අය වැය ඉදිරිපත් කළ අවස්ථාවේ එහි ගුණාංග සහ වැරදි පෙන්වා දීම තමයි විපක්ෂයේ යුතුකම වෙන්නේ. මට පෙර කථා කළ මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු සෑම කෙනෙක්ම ඉස්සෙල්ලාම කිව්වේ වැටිච්ච රටක් ගත්තේ, බංකොලොත් කළ රටක් ගත්තේ, විනාශ වෙච්ච රටක් ගත්තේ කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම මේ විනාශ වුණු රට ගන්න පෙර මැතිවරණ වේදිකාවල කියපු දේවල් පොඩ්ඩක් මතක් කරලා බලමු, අපි මොනවාද කිව්වේ කියලා. ඒ කිව්ව දේවල් මේ අය වැයට ඇතුළත් වෙලා තිබෙනවාද?

මට මතකයි, වත්මන් ජනාධිපතිතුමා කිව්වා, මාස හයෙන් හයට රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කරනවා කියලා. විශේෂයෙන්ම මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් ඇතුළු රටේම ඉන්න ගොවීන්ට වී කිලෝවකට රුපියල් 154ක මිලක් ලබා දෙනවා කිව්වා. මේ වාගේ දේවල් ගණනාවක් රටේ ජනතාවට කිව්වා. හැබැයි එදා දැක්කේ නැහැ, මේ වැටුණු රට ගැන. දැන් අපේ වගකීම වෙන්නේ මැතිවරණ වේදිකාවල අපි දෙගොල්ලන්ම කියපු දේවල් මොනවාද කියලා මේ සභාවේ කියන එක නොවෙයි. දැන් අපට -225දෙනාටම- වගකීමක් පැවරිලා තිබෙනවා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මැති ඇමතිවරු වාගේම තමයි විපක්ෂය නියෝජනය කරන අපිත්. අපි මේ අය වැයේ තිබෙන හොඳ දේ ගැන කථා කරනවා, නරක දේ පෙන්වා දෙනවා. ඒවා නිවැරදි කර ගත්තොත් හොඳයි. වැරැදි දේ කරගෙන ගියොත් ජනතාව ඒකටත් පණිවුඩයක් ලබාදේවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඊයේ සමස්ත ලංකා ආපනශාලා හිමියන්ගේ සංගමයේ සභාපතිතුමා ප්‍රකාශ කරනවා, "මේ අය වැයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගැන, ඒ වාගේම පනවා තිබෙන බදු ගැන කිසිම දෙයක් කථා වුණේ නැහැ. ඒක නිසා අද රෑ ඉඳලා අපේ පීඩිත පන්තියේ ජනතාව පාවිච්චි කරන ප්ලේන්ටියක මිල, කොත්තුවක මිල වැඩි වෙනවා" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පවතින රජයේ වගකීම ගැන අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 ව්‍යවස්ථාව වන රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ සඳහන් කර තිබෙනවා. එහි (2) (ඇ) අනුව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස පහසුව සැලසීම රජය සතු වගකීමක් කියලා. ඒක අත්‍යවශ්‍ය සේවාවක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට පෙර කථා කරපු මන්ත්‍රීතුමාට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, ඒ කාලයේ අය වැය ඉදිරිපත් කරනකොට ගම්වල ජනතාව රේඩියෝ එක ළඟට ගිහිල්ලා අහගෙන ඉන්නවාය කියලා, අය වැයෙන් ලැබෙන සහන මොනවාද කියලා දැනගන්න. එතුමා කිව්වා, ඒ කාලයේ භාණ්ඩවල මිල වැඩි වුණේ අවුරුද්දකට සැරයක් කියලා. ඒ කාලයේ කියන්නේ අපේ කාලයේදීයි. ඒ වාගේ කාලයක් නැවත උදා වෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

අපි අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරනවා. පසුගිය කාලය ගැන කථා කරලා වැඩක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒවා හොඳ නැති නිසා තමයි මේ රටේ ජනතාව එදා අපට බලය දෙන්නේ නැතුව ඔබතුමන්ලාට බලය දීලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා මේ දේවල් ක්‍රියාත්මක කරන්න. අපි හොඳ දේ හොඳ විධියට දැකලා, ඒකට ඡන්දයක් ඕනෑ නම් ඒ ඡන්දයත් දෙන්නම්. මේ 225දෙනාගේම වගකීම තමයි මේ රට වෙනුවෙන්, මේ රටේ පුරවැසියන් වෙනුවෙන් වගකීමෙන් කටයුතු කිරීම. මෙතැන අපි දෙගොල්ලන් දෙපැත්තකට වෙලා විවාද කරගෙන, බැණගෙන වැඩක් නැහැ. විශේෂයෙන්ම මේ මන්ත්‍රීවරුන් 225දෙනා ඉස්සෙල්ලා එකමුතු වෙන්න ඕනෑ. අපි ගිහිල්ලා ඇමතිවරුන්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හම්බ වෙලා කථා කරන්න කොච්චර උත්සාහ කළත්, ඔවුන් අපේ මුහුණවත් බලන්නේ නැහැ; හිනා වෙන්නේත් නැහැ. එහෙම කරන්න එපා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම යෝජනා කරනවා, මේ අය වැයෙන් පස්සේ workshop එකක් තියන්න කියලා. Workshop එකක් තියලා අපි අතර තිබෙන බැඳීම, සම්බන්ධතාව ගොඩනඟා ගන්න වෙනවා. *[බාධා කිරීමක්]* අපි කොයි වෙලාවේත් හිනා වෙලා කථා කරනවා. අපේ පුරුද්ද ඒකයි. ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමනි, මම කියන්නේ අප අතර තිබෙන සම්බන්ධතාව ඉස්සෙල්ලා ගොඩනඟා ගන්න ඕනෑය කියන එකයි. මම යෝජනා කරනවා, මේ අය වැයෙන් පස්සේ මේ පාර්ලිමේන්තුවේ හරි workshop එකක් තියලා අපි දෙගොල්ලන් එකට ඉඳගෙන කථා කරමු කියලා.

අපි වී මිල ගැනත් කථා කළා. මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය නියෝජනය කරන්න අපේ ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු තව මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් ඉන්නවා. මා එක්ක හතරදෙනායි. මම තමයි පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් විපක්ෂය නියෝජනය කරන එකම මන්ත්‍රීතුමා. මම උඩුගං බලා පීනපු කෙනෙක්. අනෙක් පත් වෙච්ච මන්ත්‍රීවරුන් හතරදෙනාම ඔබතුමන්ලාගේ වචනවලින් කියනවා වාගේ ශ්‍රමදානයකින් පත් වෙලා ආ මන්ත්‍රීවරුන්. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියලා අපව අමතක කරන්න එපා. මහ වතුර පහරක් පහළට ගහගෙන යනකොට අපි උඩුගං බලා පීනපු අය. මේ පාර්ලිමේන්තුවට අපි එවලා තිබෙන්නේ අපේ රටේ ජනතාව. අපි මේ පාර්ලිමේන්තුවේදී කවදාවත් අනුන්ට මඩ ගහන්නේ නැහැ. අපි අනුන්ගේ දේවල් කථා කරන්නේ නැහැ. මේක සුදු හුනු ගාන තැනක් නොවෙයි. රටේ මහජනතාව අපි මෙතැනට එවලා තිබෙන්නේ රටේ ප්‍රශ්න විසඳන්නයි.

විශේෂයෙන් මුදල් ඇමතිතුමා වශයෙන් වත්මන් ජනාධිපතිතුමා පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 35,000ක් වෙන් කරලා තිබෙනවා. මේ පොහොර සහනාධාරය ලබා දීලා රජය බලාපොරොත්තු වෙනවා, රජය සතු ගබඩාවලට වී ටික පුරවයි කියලා. නමුත් එහෙම වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම උදාහරණයක් කියන්නම්. අපේ රටේ

[ගරු කිංස් නෙල්සන් මහතා]

අවුරුද්දකට වී මෙට්‍රික් ටොන් මිලියන 5ක විතර නිෂ්පාදනයක් වෙනවා. ලබා දීලා තිබෙන රුපියල් මිලියන 35,000ක සහනාධාරය වී කිලෝ ගණනින් බෙදලා ගත්තොත් වී කිලෝ එකකට රුපියල් 7ක් වාගේ තමයි පොහොර සහනාධාරය ලෙස ලැබෙන්නේ. එතකොට වී කිලෝ එකකට රුපියල් 7ක් ගොවියාට ලබා දීලා අපි බලාපොරොත්තු වෙනවා, රුපියල් 120ක සහතික මිලක් ලබා දීලා මේ වී ගබඩා පුරවයි කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, හැබැයි, මේ රටේ සමස්ත ගොවියෝ කවදාවත් නොමිලේ පොහොර ඉල්ලුවේ නැහැ. පවතින රජයන්වල නායකයෝ බලයට එන්න ගොවියා පාවිච්චි කළා. නොමිලේ පොහොර දෙනවා කිව්වා; රුපියල් 350ට පොහොර දෙනවා කිව්වා. තවත් නොයෙකුත් දේවල් කිව්වා.

හැබැයි, අද ගොවියා කියන්නේ මොකක්ද? ගොවියා කියන්නේ, ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් රුපියල් 5,000කට ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා වෙළෙඳ පොළට දමන්න කියායි. මෙන්න මෙච්චරයි කියන්නේ. රජය පොහොර සහනාධාරය සඳහා රුපියල් මිලියන 35,000ක් වෙන් කරන්න අවශ්‍ය නැහැ. කෘමි නාශක, වල් නාශකවල මිල අඩු කරන්න. වීවලට හොඳ මිලක් ලබා දෙන්න. ගොවියා කවදාවත් නොමිලේ පොහොර ඉල්ලුවේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එම නිසා මම යෝජනාවක් කරනවා. මේ අය වැයෙන් දැන් පොහොරවලට මුදල් වෙන් කරලා ඉවරයි. ඒ නිසා ඉදිරියේදීවත් ගුණාත්මකභාවයෙන් ඉහළ පොහොර මිටියක් රුපියල් 5,000ක් වැනි මිලකට ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා විවෘත වෙළෙඳ පොළට ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කිරි ගොවියා සඳහා රුපියල් මිලියන 2,500ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි ගොවීන්ගේ හරක් ටික දාන්න තැනක් නැහැ. ඒ හරක් දමන්න තණ බිම් තෝරා දීලා නැහැ. අපි පසුගිය රජයටත් මේ කාරණය පෙන්වා දුන්නා. විශේෂයෙන්ම හරකෙක් වනජීවී කලාපයට ගිහිල්ලා අල්ලාගෙන ගියොත් රුපියල් 35,000ක්, රුපියල් 50,000ක් දඩ ගහනවා. කිරි ගොවීන්ට මේක දරා ගන්න බැහැ. අය වැයෙන් කිරි ගොවීන් වෙනුවෙන් රුපියල් මිලියන 2,500ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ ගැන මම සතුටු වනවා. දේශීය කිරි ගොවියා සවිබලගන්වන්න රජය වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. හැබැයි, කිරි ගොවියා හරක් ටික කොහේද තියා ගන්නේ කියන එක තමයි වැදගත්ම දේ. එම නිසා සුදුසු තණ බිම් තෝරා දිය යුතුයි. කිරි ගොවියා එක තැනකත්, හරක් ටික තව තැනකත් තියා ගන්න බැහැ. එම නිසා හරක් සඳහා සුදුසු තණ බිම් අපට තෝරා දෙන්න වනවා. අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන්නේ ගරු ටී.බී. සරත් නියෝජ්‍ය ඇමතිතුමායි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉදිරියේදී අපි මේ ගැන කථා කරලා තණ බිම් සොයා දෙන්න කටයුතු කරමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි ඊයේ දැක්කා, අලි පස්දෙනෙක් දුම්රියකට හසු වෙලා මිය ගිහින් තිබෙනවා. අලි-මිනිස් ගැටුම දිගින් දිගටම තිබෙන ප්‍රශ්නයක්. අලි වැටවල් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 200ක් අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබුණාට ඊයේ දවසේම මම බැලුවා කොහේද, මොකටද රුපියල් මිලියන 200 වෙන් කරලා තිබෙන්නේ කියලා. අලුතින් අලි වැටවල් හැදෙනවාද, අගල් කැපෙනවාද, නැත්නම් එල්ලෙන අලි වැටක් දමනවාද කියලා කිසිම තැනක සටහන් වෙලා නැහැ. අපි කොහොමද අලි-මිනිස් ගැටුම අවම කරන්න කටයුතු කරන්නේ? අපේ රටේ තිබෙන විදුලි වැටවල් නැවත ශක්තිමත් කරනවාද, විදුලි වැටවල් නැවත අලුතින් හැදෙනවාද, නැද්ද කියන එක මේ අය වැයේ කොතැනකවත් සටහන් වෙලා නැහැ. ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා විධියට කියනවා, "රටේ කිලෝමීටර් 5,611ක් විදුලි වැටවල් තිබෙනවා. එම කිලෝමීටර් 5,611න් කිලෝමීටර් 1,456ක් අලුත්වැඩියා කරන්න රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා" කියලා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විතරක් කිලෝමීටර් 110ක අලි වැටවල් තිබෙනවා. හැබැයි, මේ අය වැයෙන් මුදල් වෙන් වන්නේ කිලෝමීටර් 1,456ක් සඳහායි. ඒ සඳහා රුපියල් මිලියන 200ක් වෙන් වනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 110ක අලි වැටවල් තිබෙනවා.

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)
රුපියල් මිලියන 300ක් වෙන් කරනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රුපියල් මිලියන 300ක් නොවෙයි. රුපියල් මිලියන 400ක් වෙන් වෙලා තිබෙනවා. රුපියල් මිලියන 200ක් අලි වැට සඳහා වෙන් වෙලා තිබෙනවා. ඉතුරු මුදල වෙන් වෙලා තිබෙන්නේ කාර්යාල, බීට්ටු නිලධාරීන් සඳහා. ඒ කියන්නේ, වාහන සහ සේවකයන්ගේ නඩත්තු කටයුතු සඳහා. අලි වැටවල් සඳහා වෙන් වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 200යි. හැබැයි, රුපියල් මිලියන 200 වෙන් වන්නේත් අලි වැටවල් හදන්න නොවෙයි, කිලෝමීටර් 1,456ක අලුත්වැඩියාව වෙනුවෙන්. නමුත් කිසිම තැනක අලුතින් අලි වැටක් ඉදි වෙන්නේ නැහැ. එම නිසා මම යෝජනාවක් කරනවා. අලි වැටවල් අලුතින් හැදෙන්න ඕනෑ තමයි; තිබෙන අලි වැටවල් නැවත අලුත්වැඩියා කරන්න ඕනෑ තමයි. හැබැයි, අපි තෝරා ගත් ගොවි බිම් තිබෙනවා. ඒ ගොවි බිම් ආරක්ෂා කරන්න අපට අලුතින් අලි වැටවල් ඉදි කරන්න වනවා. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබෙන අලි වැට කිලෝමීටර් 110න් මේ වනකොට භාගයක් වැඩ කරන්නේ නැහැ. ඒ අවශ්‍ය ධාරිතාව නැහැ. එම නිසා එක පැත්තකින් අලි මැරෙනවා. තව පැත්තකින් මිනිසුන් මැරෙනවා. ඊළඟට, දේපළ හානි වනවා. එම නිසා මේ ගැන අවධානය යොමු කරලා, අලුතින් අලි වැටවල් මේ අවුරුද්දේ ඉදි කරන්න කියා මම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ ජාතික වනෝද්‍යානවල සේවය කරන මාර්ගෝපදේශකවරු ඉන්නවා. අපි යාල වනෝද්‍යානයට ගියොත්, මින්නේරිය ජාතික වනෝද්‍යානයට ගියොත් දකිනවා, ඒවායේ ඉන්න මාර්ගෝපදේශකවරු තමයි එන සංචාරකයන් park එක ඇතුළේ ගෙනි යන්නේ කියලා. ඒ මාර්ගෝපදේශකවරු 450කට ආසන්න සංඛ්‍යාවක් හිටියා.

නමුත් දැන් ඉන්නේ 200කට ආසන්න පිරිසක්. ඒ ගොල්ලන්ගේ සේවය ස්ථිර කරලා නැහැ. අවුරුදු 12කට වැඩි කාලයක් ඒ ගොල්ලන් සේවය කරනවා. මේ මාර්ගෝපදේශකයන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා මෙම අය වැයෙන් පරිසර අමාත්‍යාංශයට මුදලක් වෙන් කරන්න කියා මම යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, පෞද්ගලික විශ්වවිද්‍යාල මේ රටට එනකොට එදා යම්කිසි පක්ෂයක් ඒ සඳහා විරුද්ධ වුණු බව. ජනාධිපතිතුමා අය වැය කථාවේදී කියනවා මම අහගෙන හිටියා, අපොස (උසස් පෙළ) විභාගය විශිෂ්ට ලෙස

සමත් වෙච්ච දරුවන්ට රටින් පිට ගිහින් විදේශ විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන්න scholarships දෙනවා කියලා. අපේ රටට විදේශ විශ්වවිද්‍යාල දෙකක් එන්න තිබුණා. නමුත් ඒ අවස්ථාව මලයාසියාව සහ තායිලන්තය ලබා ගත්තා. දැන් ජනාධිපතිතුමා අපේ රටේ අපොස (උසස් පෙළ) විභාගය විශිෂ්ට ලෙස සමත් වන දරුවන්ව scholarship එකක් දීලා රට යවන්න හදනවා. ඒක හොඳයි. අපේ රටේ දරුවෝ පිට රට ගිහින් ඒ තාක්ෂණය, ඒ දේවල් දැකලා ඒවා ලංකාවට ගෙනෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

හැබැයි, මේ දරුවන්ට scholarships දීලා පිට රටවලට යවන්න වෙන්නේ නැහැ, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල අපේ රටේ බිහි වුණා නම්. අද වනකොට අපේ දරුවන් කොච්චර ප්‍රමාණයක් මේ රට හැර දමා ගිහින් තිබෙනවාද? ඒ වෙනුවෙන් කොච්චර ලොකු වියදමක් අපේ රටේ දෙමව්පියන් දරනවාද? මේවා අපේ රටට එන්න තිබුණු සම්පත්. නමුත් තවමත් අපි පරක්කු නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ නිසා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවලට ආරාධනා කරන්න, අපේ රටට එන්න කියලා. අපේ රටේ ඕනෑ තරම් ගොඩනැගිලි තිබෙනවා; අපේ රටේ ඕනෑ තරම් බිම් තිබෙනවා. ඒ නිසා විශ්වවිද්‍යාල හදලා දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පරිසර අමාත්‍යාංශයෙන් ඇස්තමේන්තුව දෙනවා, පරිසර අමාත්‍යාංශයට රුපියල් බිලියන 5.3ක් වෙන් කර තිබෙනවාය කියලා. හැබැයි, මුදල් අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවේ තිබෙන්නේ රුපියල් බිලියන 5.9ක්. එතකොට මුදල් අමාත්‍යාංශයෙන් වැඩියෙන් සල්ලි දෙනවා. පරිසර අමාත්‍යාංශයේ ඇස්තමේන්තුවේ අඩුවෙන් කියනවා. ඒ නිසා පරිසර අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේදී ගරු ඇමතිතුමා මේ ගැන පැහැදිලි කිරීමක් කරයි කියා බලාපොරොත්තු වෙමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.10]

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නව රජයේ මංගල අය වැය සම්බන්ධයෙන් පැවැත්වෙන දෙවැනි වර කියවීමේ විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම භාග්‍යයක්කොට සලකනවා. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි. අද අපි දකිනවා, මේ අවස්ථාව අපේ රටට, අපේ රටේ ජනතාවට ඉතාම විශේෂ අවස්ථාවක් කියලා.

වසර 76ක් මේ රට පාලනය කරලා ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන්, දේශපාලන වශයෙන් බංකොලොත්භාවයට රට ඇද දමලා තිබුණු මොහොතක, ඒ බංකොලොත්භාවයට ඇද දමපු ඒ දූෂිත පාලකයන් සිංහාසනවලින් බිමට ඇද දාලා, ඒ වෙනුවට ජනතාවාදී පාලනයක් ආරම්භ කරලා, ජනතාව වෙනුවෙන් සකස් කරපු අය වැයක් මංගල අය වැය ලෙස ඉදිරිපත් වී තිබෙන මේ අවස්ථාව අපට ඉතාම විශේෂ අවස්ථාවක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අපි ඉතිහාසයේ ඉදිරිපත් කළ අය වැය දැකලා තිබෙනවා. මීට කලින් අවස්ථාවල ඉදිරිපත් වුණු අය වැයවලට අපි හැම දාමත් සවන් දීලා තිබෙනවා. හැබැයි, ඉතිහාසයේ ඉදිරිපත් කළ හැම අය වැයකටම වඩා මේ අය වැය වෙනස් වෙන්නේ ඒ ආණ්ඩු කරපු දේශපාලනඥයන් අය වැයෙන් තමන්ට වැඩිපුර බෙදා ගත්ත ක්‍රමය වෙනස් කරපු නිසායි. ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ රටේ සාමාන්‍ය ජනතාවට අය වැයෙන් සහන ලබා දීලා තිබෙනවා. මේ අය වැය මේ රටේ ජනතාවට අනාගතය පිළිබඳ සුබවාදී බලාපොරොත්තු තියා ගන්න පුළුවන් අය වැයක් නිසා මේක ඉතිහාසයේ වෙන අන් කවරදාටත් වඩා සුවිශේෂී අය වැයක් කියලා අපට හඳුනා ගන්න පුළුවන්කම තිබෙනවා.

අපේ රටේ ඈත ගම්මානවල ජීවත් වන මිනිස්සු වෙනුවෙන් රුපියල් බිලියන ගණන්, මිලියන ගණන් වෙන් වෙනකොට, පැවැති පාලනය වෙනස් කරන්න මැදිහත් වුණු, ඒකට නායකත්වය දුන් දේශපාලන ව්‍යාපාරයක නායකයන් ලෙස විතරක් නොවෙයි, ඒ දේශපාලන ව්‍යාපාරය වටා ඒකරාශී වුණු මිනිස්සුන්ට අපි ගොඩනඟපු පාලනය පිළිබඳව ඉතාම අභිමානයක් දැනෙන අවස්ථාවක් තමයි අපේ මේ මංගල අය වැය ඉදිරිපත් කිරීමේ අවස්ථාව. කවදාවත් සාමාන්‍ය ජනතාව වෙනුවෙන් ඒ විධියට මුදල් වෙන් කළේ නැතිව, පාලකයන්ට බැකෝවලින් බෙදා ගෙන, සාමාන්‍ය ජනතාවට කන් හැදිවලින් බෙදපු ඒ ඉතිහාසය වෙනස් කරලා, දේශපාලනඥයා කැප කිරීම් කරන කෙනෙකු බවට පත් වෙලා, අප භුක්ති විඳි සියල්ල කැප කරමින් ජනතාවට බැකෝවලින් බෙදන අය වැයක් බවට මේ අය වැය පත් වෙලා තිබෙන නිසා මේක ඉතාම සුවිශේෂී අය වැයක් විධියට අපි හඳුනා ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම ගත්තොත් මෙතෙක් කාලයක් පවත්වා ගෙන ආපු ක්‍රමය තවදුරටත් පවත්වා ගෙන යන එක නොවෙයි කරන්න ඕනෑකම තිබෙන්නේ. අවුරුදු 76ක් තිස්සේ අපි දැක්කේ ඒක; පැවතුණු ක්‍රමය ඒ විධියටම පවත්වා ගෙන යන එක. අන්න ඒ තිබුණු ක්‍රමයම පවත්වා ගෙන යෑම වෙනුවට, එය වෙනස් තලයකට ඔසවා තබන, වෙනස් මානයක් ඔස්සේ ඉදිරියට යන අය වැයක් බවට මේ අය වැය පත් වෙලා තිබෙන නිසා තමයි නව රජයේ මේ මංගල අය වැය අපට විශේෂ වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. රටක් ගොඩනඟන පැත්තට යෝධ පියවරක් තබන අපේ රටේ දේශපාලනයේ අලුත් හැරවීමක්, හැරවුම් ලක්ෂ්‍යයක් ගන්නා අය වැයක් නිසා තමයි ඒ වෙනුවෙන් කැප වුණු, මහන්සි වුණු මේ රටට ඒ දේශපාලන ආදර්ශය දුන් දේශපාලන නායකත්වයටත්, ඒ වටා පෙළ ගැසුණු මේ රටේ සුවහසක් ජනතාවටත් මේ අය වැය විශේෂ අය වැයක් වෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මොකක්ද මේ අය වැය කියන්නේ? අය වැයක් කියන්නේ ඉදිරි කාලය සඳහා වන ආදායම් සහ වියදම් පිළිබඳ යෝජනා මාලාවක් විතරක් නොවෙයි. රටේ අනාගතය, එහි ඉදිරි ගමන සම්බන්ධයෙන් වන රජයේ ප්‍රවේශය පිළිබඳව කෙරෙන පිළිබිඹුවක් තමයි අය වැයක් කියන්නේ. එහෙම නැතුව මේක හුදු වියදම් සහ ආදායම් පිළිබඳ වාර්තාවක් විතරක් නොවෙයි. ඒ නිසා

[ගරු ගයාන් ජනක මහතා]

රටේ ඉදිරි අනාගතය පිළිබඳව, අනාගත ගමන් මඟ පිළිබඳව නව රජයේ ප්‍රවේශය, නව රජයේ මැදිහත්වීම, එහි දිශාව පෙන්නුම් කරන, කැඩපතක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන අය වැය.

අපි මීට කලින් අසා තිබෙනවා, දැක තිබෙනවා දේශපාලන වේදිකාවල මොන තරම් කථා කිව්වාද කියලා. හැබැයි, ඒ මැතිවරණ වේදිකාවල මොන තරම් දේවල් කථා කළත් ඒවා වැඩ බවට පත් වෙලා අය වැය ලේඛනවලට ඇතුළත් වුණු බවක් අපි දැක්කේ නැහැ. අන්න ඒ ඉතිහාසය වෙනස් කරලා වසර ගණනාවක් මේ රටේ දේශපාලන වේදිකාවල කථා කරලා, ජනතාවත් එක්ක සම්බන්ධ වෙලා හදපු යෝජනා ඉතිහාසයේ ප්‍රථම වතාවට අය වැය ලේඛනයක් තුළ දකින්න තිබෙන අවස්ථාවක් තමයි මෙදා ඉදිරිපත් කර තිබෙන මේ අය වැය ලේඛනය. ඒ නිසා අපට මේක ඉතාම වැදගත් අවස්ථාවක්.

අපි වසර ගණනාවක් -දශකයකටත් වඩා වැඩි කාලයක්- තිස්සේ මේ රටේ ජනතාවත් එක්ක සම්මුඛව, ගැටෙමින් සිදු කළ කථා බහේ කූඨප්‍රාප්ති අවස්ථාව මෙයයි. ඒ නිසා පොහොසත් රටක් -ලස්සන ජීවිතයක් කියන ඒ බලාපොරොත්තුව පෙරදැරි කරගෙන වසර ගණනාවක් මේ රටේ ජනතාව එක්ක සංවාද කරමින් ජනතාව අතරට මේ වැඩ පිළිවෙළ අරගෙන ගිහිල්ලා ඔවුන්ගේ යෝජනා සහ අදහස් එකතු කරගෙන අපි ගෙන ආ වැඩ පිළිවෙළක දිගුවක් ලෙස තමයි මේ නව රජය, වර්තමාන ආණ්ඩුව මේ මංගල අය වැය රටට ඉදිරිපත් කර තිබෙන්නේ.

ඒ නිසා මැතිවරණ වේදිකාවක හුදෙක් කථා බහ කරපු, කථාවට පමණක් සීමා කර ගත්ත අය වැයක්, වැඩ පිළිවෙළක් වෙනුවට වසර ගණනාවක් මේ රටේ මිනිස්සුත් එක්ක සම්බන්ධ වෙමින්, අත්දැකීම් ඒකරාශී කර ගනිමින් ගොඩ නඟා ගත්ත වැඩ පිළිවෙළක දිගුවක් ලෙස මේ අය වැය හඳුන්වන්න පුළුවන්.

මේ ආණ්ඩුව -මේ රජය- ඉතාම හොඳින් තේරුම් ගෙන තිබෙනවා, අපි ඉස්සරහ තිබෙන අභියෝග මොනවාද කියලා. අපි භාර ගන්නකොට රට තිබුණේ කොතැනද, අපි ඉදිරියේ තිබෙන අභියෝග මොනවාද, මේ තත්ත්වය වඩා හොඳින් කළමනාකරණය කරගන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට හොඳ අවබෝධයක් තිබෙනවා. ඒ නිසා විපක්ෂයෙන් මොන විවේචන, චෝදනා ඉදිරිපත් කළත්, අපි භාර ගන්නකොට රට තිබුණු තැන පිළිබඳවත්, අපි ඉස්සරහ තිබෙන අභියෝග පිළිබඳවත් හොඳින් තේරුම් ගෙන, අවබෝධ කර ගෙන, ඒ අවශ්‍ය කටයුතු හොඳින් කළමනාකරණය කර ගෙන තමයි අපි අපේ මංගල අය වැය මේ රටට ඉදිරිපත් කර තිබෙන්නේ. ප්‍රමුඛතාව දෙන්න ඕනෑ මොන ඉසව් කෙරෙහිද, අපි වැඩි බරක් තබන්න ඕනෑ කුමන ක්ෂේත්‍ර කෙරෙහි ද කියන එක පිළිබඳව හොඳ අවබෝධයක් සහිතව තමයි වත්මන් ආණ්ඩුව මේ මංගල අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ආර්ථිකය ප්‍රසාරණය කිරීම සඳහා ආර්ථිකය ගමට තල්ලු කරන්නේ කොහොමද, ඒ සඳහා අධ්‍යාපනය සම්බන්ධ කරගන්නේ කොහොමද, පුරවැසියා ආර්ථිකයේ කොටස්කරුවෙකු බවට පත් කරගන්නේ කොහොමද, ඒ පුරවැසියාට ආර්ථිකයේ සාධාරණ පංගුව ගලා ගෙන එන්නේ කොහොමද කියන මේ සමස්ත කාරණා පිළිබඳව ඉතාම හොඳ අවබෝධයක් සහිතව ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළක් මෙය.

ඒ වාගේම සමාජයේ සෑම ස්තරයක්ම සම්බන්ධ කර ගනිමින් සෑම ස්තරයකටම සහන ලබා දෙමින් ඔවුන්ගේ අනාගතය පිළිබඳ බලාපොරොත්තු ඇති කරගන්න පුළුවන් විධියේ අය වැයක් තමයි අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. හැබැයි, විපක්ෂයේ අය කියනවා, මේ අය වැය තුළ කිසිම දෙයක් නැති ලු; තිබෙන ඒවා ක්‍රියාත්මක කරන්න බැරි ලු; 2026 අවුරුද්දේ අය වැය විවාදයට ඇවිල්ලා අපට කියන්න දෙයක් නැති වේවිලු. අපි ඔවුන්ට කියනවා, කලබල වෙන්න එපා, අපි සම්බන්ධයෙන් පුරෝකථනය දෙන්න ඉක්මන් වෙන්න එපා කියලා. මොකද, ඉතිහාසයේ ඔබලාගේ සියලු පුරෝකථන බොරු කරලා, අපි ගැන තිබුණු වැටහීම් වෙනස් කරලා, අලුත් දේශපාලන පරිච්ඡේදයක් ආරම්භ කරලා මේ රට කර ගෙන යන දේශපාලන ව්‍යාපාරයක් නිසා, අප සම්බන්ධයෙන් පූර්ව නිගමනවලට, පූර්ව කථා බහවලට එන්න කාලය වැඩියි කියන එක අපි විපක්ෂයට කියනවා.

අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි බලයට ඇවිල්ලා මේ වෙනකොට මාස 3යි. අය වැය තුළ තිබුණු ගොඩක් දේවල් මේ පාර්ලිමේන්තුව තුළ අපට අහන්න පුළුවන්කම ලැබුණා. ආණ්ඩු පක්ෂය විධියට මේ අය වැය තුළ අපි මොන තරම් දේවල් යෝජනා කර තිබෙනවාද කියලා අපට අහන්න පුළුවන්කම ලැබුණා. අය වැයට කලිනුත්, අය වැය දක්වාමත් විශාල සහන ප්‍රමාණයක් මේ බංකොලොත් කරපු රටේ ජනතාවට ලබා දෙන්න පුළුවන් වුණු රජයක් විධියට අපි ඉදිරි කාලය තුළත් ඉතාම ශක්තිමත් ලෙස අභියෝගවලට මුහුණ දෙමින්, මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න, මේ රටේ ජීවත් වන මිනිසුන්ට ලස්සන ජීවිතයක් උරුම කර දෙන්න, මේ අය වැය යථාර්ථයක් බවට පත් කරන්න ඉතාම ශක්තිමත්ව, අධිෂ්ඨානශීලිව කටයුතු කරනවා කියන පොරොන්දුව ලබා දෙමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඒ.එච්.එම්.එච්.අබයරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.22]

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මම ඔබතුමියගේ අවධානයට කාරණයක් යොමු කරන්න කැමැතියි. මීට දවස් 3කට කලින් අපි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කර ගත්තා. ඒ වෙලාවේ විපක්ෂයේ හිතවතුන්ගෙන් ප්‍රශ්නයක් මතු වුණා, ඒ මැතිවරණය කඩිනමින් තියන්න එපා, මේ අය වැය විවාදයට සම්බන්ධ වෙන්න ඕනෑ වාගේ කථාවක් කියමින්. හැබැයි, අද විපක්ෂයේ ආසන දිහා බලනකොට දැන්මම මැතිවරණ campaign එක ආරම්භ කරලාද කියලා මට හිතෙනවා. කොහොම වුණත් කමක් නැහැ, ඒ කාරණයත් මතක් කරමින් මම කැමැතියි, මේ 2025 වසර සඳහා ඉදිරිපත් කරපු අය වැයට අදාළව කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.

අද උදේ අපට අහන්න ලැබුණා, ඊයේ සිදු වුණු අවාසනාවන්ත සිදුවීම් පිළිබඳව. ඒ ගැනත් යමක් කියන්න ඕනෑ. පාතාලයේ ක්‍රියාකාරකම් පිළිබඳව දිගින් දිගට ඊයේ සාකච්ඡා වුණා. නමුත් මම ඒ ගැන නොවෙයි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට හිතෙනවා, අධිකරණයේදී සිදු වුණු එම අවාසනාවන්ත සිදුවීම - වෙඩි තැබීම - නිසා, ඊට කලින් දවසේ මීද්දෙනියේ සිදු වුණු ත්‍රිත්ව ඝාතනය පිළිබඳ සාකච්ඡාව යට වුණා ද කියලා. ඒක මේ වාගේම බැරෑරුම් සිදුවීමක්. ඒ සිදුවීම පිළිබඳවත් මහජන ආරක්ෂක ඇමතිතුමා විශේෂ අවධානය යොමු කළ යුතුයි කියලා මම විශ්වාස කරනවා. මහාචාර්ය ලියනගේ අමරකීර්ති මැතිතුමාගේ නවකථාවක් තිබෙනවා, "රතු ඉරි අඳින අත" කියලා. මේ සිදුවීම් දිහා බලන කොට මට ඒ නවකථාව මතක් වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. කොහොම වුණත්, ඊට වඩා දිගට මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

මේ ඉදිරිපත් කරපු අය වැය අප දකින්නේ සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගත් අය වැයක් හැටියටයි. විශේෂයෙන්ම වෘත්තීය සමිති සහිත ජන කණ්ඩායම්වලට -වෘත්තීය කණ්ඩායම්වලට- තමන්ගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න, තමන්ගේ වෘත්තිය සමිති - trade unions - හරහා අවස්ථාව තිබෙනවා. ඒගොල්ලන්ගේ ඉල්ලීම් ඉටු කර තිබෙනවා වාගේම, වෘත්තීය සමිති නැති ජනතාව සඳහාත්, විවිධ සමාජ කණ්ඩායම් කෙරෙහිත් මේ අය වැයේදී විශේෂ අවධානයක් යොමු කර තිබෙන බව ඉතා පැහැදිලියි. උදාහරණයක් තමයි, ත්‍රිපෝෂ වැඩසටහන. ඒ සඳහා 2023 වර්ෂයේ වෙන් කර ඇති මුදල රුපියල් බිලියන 1.3යි. ඒ කියන්නේ, රුපියල් මිලියන 1,306යි; 2024 වර්ෂයේ වෙන් කර ඇති මුදල රුපියල් බිලියන 1.7යි. 2025 අය වැයේදී ත්‍රිපෝෂ වැඩසටහන සඳහා රුපියල් බිලියන 5ක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් මිලියන 5,000ක්. ඒ වැඩසටහන් නවත්වයි, ඒවායෙන් සහනයක් ලැබෙන අයට ලොකු ප්‍රශ්නයක් මතු වෙනවා යනුවෙන් විවිධ සංවාද කරනවා අපි දැක්කා. හැබැයි, ඒ සංවාද සියල්ල බොරු කරමින්, රුපියල් බිලියන 5ක් ඒ වැඩසටහන වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා.

අපි දැක්කා, පසුගිය දවස්වල සෞඛ්‍ය අංශවලින් වාර්තා වුණා, දරු උපත් අඩුවීම පිළිබඳව. සාමාන්‍යයෙන් වාර්ෂිකව 50,000ක පමණ අඩුවීමක් තිබුණා. අපි සෞඛ්‍ය සේවය ගැන මොන තරම් කථා කළත්, වාර්ෂිකව දරු උපත් 50,000කට ආසන්න ප්‍රමාණයක් අඩු වෙලා තිබුණා. ජනතාවගේ ආර්ථිකය බිඳ වැටීමත් එක්කයි ඒ තත්ත්වය ඇති වුණේ. අපි හිතනවා, මෙන්න මේ වාගේ ක්‍රියාකාරකම් මඟින් සාමාන්‍ය ජන ජීවිතයේ ආර්ථික ශක්තිය වැඩි කරන්න අපට අවස්ථාව ලැබෙනවා කියලා. ඉතා අසීරු තත්ත්වයක, දුෂ්කර අඩියක ඉන්න ජනතාවට මේ සහන විශේෂ සහන හැටියට සලකන්න පුළුවන්. මේ වැඩි වීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 194කට වැඩියි; සියයට 200කට ආසන්නයි.

ඒ වාගේම තමයි, 265,000ක් පමණ වන ගර්භිණී මවුවරුන්ට පෝෂ්‍යදායක ආහාර මල්ලක් ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඒ සඳහා 2023දී වෙන් කරපු මුදල රුපියල් බිලියන 3යි; 2024දී රුපියල් බිලියන 5.4යි. මේ අය වැයේදී රුපියල් බිලියන 7.5ක් ඒ සඳහා වෙන් කර තිබෙනවා. මා කලින් කියපු විධියට වෘත්තීය සමිති නැති ප්‍රජාව වෙනුවෙන් කරන මේ වියදම්, ඔවුන් වෙනුවෙන් කරන මේ ප්‍රතිපාදන සැලසුම් විශේෂ අවධානයට ලක් කළ යුතු කාරණයක් හැටියට අපි දකිනවා.

ඊළඟට, පෙර පාසල් දරුවන්ගේ උදේ ආහාරය සඳහා 2023දී වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 308යි; 2024දී රුපියල් මිලියන 959යි. 2025දී ඒ සඳහා වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 3,200යි. ඒක විශේෂත්වයක්. ඒ නිසා ගැබිනි මවුවරුන්ගේ, කුඩා දරුවන්ගේ, පෙර පාසල් දරුවන්ගේ පෝෂණය සඳහා විශේෂ අවධානයක් යොමු කරපු අය වැයක් හැටියට මේ අය වැය හඳුන්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අධ්‍යාපනය සඳහා මේ අය වැයෙන් වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අධ්‍යාපනය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා තිබුණා. ඒ, සබුද්ධික දේශයක්, සබුද්ධික පුරවැසියෙකු වෙනුවෙන්. ඒ සබුද්ධික පුරවැසියා නිර්මාණය කිරීම සඳහා මෙවර අය වැයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබෙන බව අපට දකින්න පුළුවන්. ඒ සඳහා උදාහරණ කිහිපයක් කියන්න මම කැමැතියි.

නොමිලේ පෙළපොත් ලබා දීම වෙනුවෙන් රුපියල් බිලියන 15.5ක් වෙන් කරලා තිබෙනවා. ගිය වසරේ රුපියල් බිලියන 4.5යි. ඊට කලින් අවුරුද්දේ ඊට ටිකක් වැඩියි. පාසල් නිල ඇඳුම් සඳහා 2023දී රුපියල් බිලියන 2.5යි; 2024දී රුපියල් බිලියන එකයි; 2025 රුපියල් බිලියන 6.4යි. ඒක සියයට 500ක වැඩිවීමක්. පාසල් දරුවන්ට වෘත්තීය සමිති නැහැ. ඔවුන්ගේ නිහඬ හැඟීම් සතුටු කිරීම සඳහා, ඔවුන්ට අවශ්‍ය සහන ලබා දීම සඳහා මේ අය වැයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. ඒ වාගේම 5 වසර ශිෂ්‍යාධාර ලබා දීම සඳහා රුපියල් බිලියන 0.950ක් මේ අය වැයෙන් අපි වෙන් කරලා තිබෙනවා. ගිය වසරට සාපේක්ෂව ඒක සියයට 34ක වැඩිවීමක්.

ඒ වාගේම තමයි විශ්වවිද්‍යාල සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්වයේ විශේෂ වැඩි කිරීමක් අපි දකිනවා. මේ ගැන අපට හරිම සතුටුයි. මේ මහපොළ ශිෂ්‍යාධාර වැඩි කිරීමේ සතුට දැනෙන්නේ විශ්වවිද්‍යාලයේදී ආහාර වේලක් නැතුව, ආහාර වේලක් ගන්නේ කොහොමද කියලා කල්පනා කරමින් වේල් ගණන් කුසගින්නේ හිටපු, බනිස් ගෙඩියක් ගන්න බැරුව කැන්ටින් එකේදී කාගේ හෝ පිඟානක අඩුවක් අරගෙන හොදි ටිකක් දාලා කාපු ශිෂ්‍යයන්ට. ඒගොල්ලන් වෙනුවෙන් මෙවර මහපොළ දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා වැඩි කරලා ඒ වෙනුවෙන් රුපියල් බිලියන 4.6ක් වෙන් කර තිබෙනවා. ඒ මුදල ගිය අවුරුද්දේ රුපියල් 2.2යි. ඊට කලින් අවුරුද්දේ රුපියල් බිලියන 1.5යි. මෙවර රුපියල් බිලියන 4.6යි. ආසන්න වශයෙන් මේක සියයට 100ක වැඩිවීමක්. අපි හිතනවා රටේ අනාගතය තීරණය කිරීමේදී මෙන්න මේ අධ්‍යාපනය තීරණාත්මක සාධකයක් කියලා. මව් කුසේ සිට, පෙර පාසලේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා ජාතියේ අනාගතය නිර්මාණය කරන දරුවන්ගේ උන්නතිය වෙනුවෙන් මේ අය වැයේදී විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පෙර පාසල් ගුරුවරුන් සඳහා ගුරු අභිමානි දීමනා සඳහා සියයට 130ක වර්ධනයක් ඇතිව මෙවර ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය සාමාන්‍ය ජනතාව කේන්ද්‍ර කරගත්ත අය වැයක්.

මේ අය වැයේ නම පිළිබඳව ප්‍රශ්නයක් ආවා අපේ විපක්ෂයේ හිතවතුන්ගෙන්. නම කුමක් වුවත්, මේ අය වැය ඇතුළේ සාමාන්‍ය ජනතාවට විශේෂ සහන සලසපු බව සඳහන් කරන්න ඕනෑ. මේ නම පිළිබඳව ගරු ලාල් කාන්ත ඇමතිතුමා උදේ ඉතාම හොඳ පැහැදිලි කිරීමක් කළා.

ඒ විතරක් නොවෙයි, පාසල් දරුවන්ට නොමිලේ වාර ප්‍රවේශපත් -සීසන් ටිකට්- ලබා දීම සඳහා රුපියල් බිලියන 11.5ක් වෙන් කරලා තිබෙනවා. පසුගිය කාලයේ සති අන්ත දවස්වල වාර ප්‍රවේශපත්‍ර තිබෙන අය නංවාගත්තේ නැහැ, බස්වලට. දැනටත් සමහර තැන්වල බස් රථ දරුවන්ට නවත්වන්නේ නැතිව යනවා. ඒක නතර කිරීම සඳහාත් මෙවර අපි කටයුතු කරනවා. විශේෂයෙන් වාර ප්‍රවේශ පත්‍ර සඳහා ගිය අවුරුද්දට වඩා සියයට 47ක වැඩිවීමක් සිදුව තිබෙනවා. දහම් පාසල් ගුරුවරුන් ඇතුළු තවත් විවිධ කණ්ඩායම් ඉන්නවා සහන ලබන. මම මේ හැම එකක්ම දිගට සඳහන් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

නමුත්, අපි මේ අය වැය යෝජනාවලිය තුළින්, නිහඬව ඕනෑම දුකක් දරා ගන්නා මේ රටේ පුරවැසියන් ගැන හිතලා, ඔවුන් වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කරපු බව තමයි සඳහන් කරන්න තිබෙන්නේ.

ඒ වාගේම අස්වැසුම මුදල් ප්‍රදානය ගත්තොත්, ජීවත් වීම සඳහා ප්‍රමාණවත් ආදායමක් උපයාගන්න බැරි ප්‍රජාවට අස්වැසුම ප්‍රතිලාභ ලබා දෙනවා. මේ සඳහා පුද්ගලයන් තෝරා ගැනීම් ගැන විවිධ අදහස් තිබෙනවා. ඒවා සමහර අවස්ථාවලදී ඉතා සාධාරණ බවක් තිබෙනවා. සමහර අවස්ථාවලදී එහෙම නොවන බවක් තිබෙනවා. ඒ තෝරා ගැනීමේ ගැටලු තිබුණත් මේ අස්වැසුම හිමිකරුවන් සඳහා -අස්වැසුමලාභීන් සඳහා- රුපියල් බිලියන 232.5ක් වෙන් කර තිබෙනවා. එය ගිය වසරට සාපේක්ෂව සියයට 91ක වැඩිවීමක් පෙන්වා තිබෙනවා. මේ අය වැයෙන් අස්වැසුම ප්‍රදානය කරන අතරම, ඔවුන් සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම සඳහා කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, සත්ව පාලනය වාගේ ක්ෂේත්‍ර සඳහාත් විශේෂ අවධානය යොමු කරපු අය වැයක්. සාමාන්‍ය ජනතාව යැපුම් මානසිකත්වයෙන් ගොඩගෙන නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගැනීමේ මෙහෙයුමක් මේ අය වැයෙන් ආරම්භ කරලා තිබෙනවාය කියන කාරණය සඳහන් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඒ වාගේම අනාගත ශ්‍රී ලංකාව ගොඩනැගීමේදී නිෂ්පාදන ආර්ථිකයකට යා යුතු බව අපි පිළිගන්නවා. ඒ නිෂ්පාදන ආර්ථිකයට යෑම සඳහා තමයි මේ පදනම මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශ්‍රාමිකයන්ට, රාජ්‍ය සේවකයන්ට, අනෙක් හැමෝටම මේ අය වැයෙන් විශාල වශයෙන් සහන දීලා තිබෙනවා. උදාහරණයක් හැටියට, අපනයන භෝග සඳහා ගොවීන්ට සහන සැලසීම සඳහා රුපියල් බිලියනයක් වෙන් කරලා තිබෙනවා. 2024 අවුරුද්දේ ඒක රුපියල් බිලියන 0.170යි; 2023දී එය රුපියල් බිලියන 0.198යි. මෙහෙම තිබුණු එක තමයි දැන් බිලියනය දක්වා වැඩි කරලා තිබෙන්නේ. මේ නිසා බිඳ වැටුණු සාමාන්‍ය ජන ජීවිතය නගා සිටුවන්න හැකියාව ලැබෙනවා. අපි දන්නවා, මේ රටේ ජනතාව අපට ජනවරමක් දුන්නේ මේ ආර්ථිකය බිඳ වැටිලා, සමාජ ජීවිතය බිඳ වැටිලා ඔවුන්ට ජීවත් වෙන්න බැරි තරමටම දුෂ්කරතා පැවති අවස්ථාවක බව. විරුද්ධ පක්ෂයෙන් කථා කරපු අපේ හිතවතුන් කිව්වා, සාමාන්‍ය ජනතාව අපි පිළිබඳව තියපු විශ්වාසය අපි කඩලා තිබෙනවා, උල්ලංඝනය කරලා තිබෙනවා, අපේ පක්ෂවල හිටපු සාමාජිකයන්ගේ ජීවිත පරිත්‍යාගවලට අපහාස කරලා තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැයෙන් තමයි මේ රට වෙනස් කිරීම සඳහා ජීවිත පරිත්‍යාග කළ, මේ රටට ආදරය කරන ජනතාවට උපරිම සාධාරණය ඉෂ්ට වුණේ කියන කාරණය කලින් කථා කරපු අපේ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ ආකාරයටම මමත් සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම සෞඛ්‍ය සම්පන්න පුරවැසියෙක් බිහි කිරීම අරමුණ කර ගත්ත වැඩසටහනක් මේ අය වැයේ ඉදිරිපත් කරලා තිබෙනවා. හලාවත, අම්පාර, කෑගල්ල, මහනුවර, ත්‍රිකුණාමලය වාගේ රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක සඳහා රුපියල් බිලියන 1.5ක් -රුපියල් කෝටි 150ක්- වෙන් කරලා තිබෙනවා. කොළඹින් පිටත රෝහල්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා, ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ඒ ප්‍රදේශවලට සැපයීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ අය වැය ඇතුළේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රෝගීන් සඳහා වාගේම වෛද්‍යවරුන්ගේ පශ්චාත් උපාධි පුහුණුව සඳහා රුපියල් බිලියන 2ක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. අපි දැක්කා, පසුගිය දවස්වල වැටුප් වැඩි කිරීම් සම්බන්ධ යම් යම් දුක් ගැනවිලි ආවා. හැබැයි, ඒ අතරම, ඔවුන්ගේ පශ්චාත් උපාධි සඳහා සුදුසුකම් ලබා ගැනීමේ පුහුණුව සඳහා රුපියල් බිලියන 2ක් වෙන් කරලා තිබෙනවා. අපි කලින් කථා කරපු පාසල් අධ්‍යාපනයට අදාළව සබුද්ධික පුරවැසියෙක් බිහි කිරීමේ මෙහෙයුමේදී, පාසල් අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 456කුත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 135කුත් වෙන් කරලා තිබෙනවා. අලුත් විශ්වවිද්‍යාල පීඨ, වෙනත් පහසුකම් වැඩිදියුණු කිරීම, අලුත් ඉදිකිරීම් වාගේ කටයුතු සඳහා තමයි මේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන්නේ. මෙන්න මේ විධියට සමස්ත ප්‍රජාව ඉලක්ක කර ගත්ත වැඩසටහනක් මේ අය වැයෙන් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. මේකට එකඟ නොවෙනවා කියනවා ඇරෙන්න මම හිතන විධියට කියන්න වෙන වචනයක් නැහැ, විපක්ෂයේ හිතවතුන්ට. ඒ නිසා එතුමන්ලාගේ එ් අදහස් දැක්වීම අපට තේරුම් ගන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කඩවත-මීරිගම අධිවේගී මාර්ගය, මීරිගමින් එහාට කුරුණෑගල දක්වා තිබෙනවා. නමුත් වැඩිපුර රථවාහන ගැවසෙන ප්‍රදේශයේ කොටස ඉදිවෙලා නැහැ. ඒ ඉදිකිරීම් කළේ කවුද කියන එක පිළිබඳ කරුණුත් අපි පැහැදිලිව දන්නවා. මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත - මීරිගම කොටස සම්පූර්ණ කිරීම සඳහා රුපියල් බිලියන 81.3ක් වෙන් කරලා තිබෙනවා. මොකද, මේ මාර්ගය හදපු එකේ කිසිම ප්‍රයෝජනයක් තිබුණේ නැහැ, කඩවත - මීරිගම කොටස සම්පූර්ණ කරන්නේ නැතුව. ඒ වාගේම පොතුහැර - රඹුක්කන දක්වා කොටස සඳහා රුපියල් බිලියන 34ක් වෙන් කරලා තිබෙනවා. අපේ ආණ්ඩුව ආවාම මේවා ඔක්කෝම නතර වෙයි, කඩා වැටෙයි, බිඳ වැටෙයි කිව්වාට, එහෙම වෙන්නේ නැහැ. අපි ඒ කටයුතු ඉතාම හොඳින් අරපිරිමැස්මෙන් ඉදිරියට පවත්වාගෙන යනවා කියන කාරණය සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි මම අර කලින් කිව්වා වාගේ ගොවියාට විතරක් නොවෙයි, ධීවරයාට, කුරුඳු, රබර් වාගේ භෝග අපනයනය කරන ගොවීන්ට අවශ්‍ය අනුග්‍රහය දැක්වීම සඳහා මේ අය වැයෙන් ඉඩකඩ දීලා තිබෙනවා.

මේ සියලු කණ්ඩායම් සඳහා මෙහෙම අනුග්‍රහය ලබා දුන්නේ ඇයි? අර මුල්ම දවසේ විවාදය ආරම්භ කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වා, ආගම පැටලිලා, ධම්ම පදයයි බයිබලයයි පැටලිලා කියලා. නැහැ, එහෙම වෙලා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ මෙහෙම තිබෙනවා.

"අධනානං ධනේ අනනුප්පදීයමානේ දාළිද්දියං වේපුල්ලමගමාසි"

ඒ කියන්නේ, දිළිඳු ජනතාවට, ධනය නැති ජනතාවට ධනය උත්පාදනය නොවනකොට දරිද්‍රතාව වැඩි වෙනවා. මේක චක්කවත්ති සීහනාද සූත්‍රයේ තිබෙන්නේ.

ඊළඟට මෙහෙම තිබෙනවා.

"අදින්නාදානේ වේපුල්ලං ගතේ සත්ථං වේපුල්ලමගමාසි"

ඒ කියන්නේ, හොරකම වැඩි වුණාට පස්සේ අවි ආයුධ භාවිතය වැඩි වෙනවා. අපට ඒක හොඳට දකින්න පුළුවන්, මේ වර්තමාන සිදුවීම් එක්ක. අතීතයේ තමයි ඒවා ගොඩක්ම තිබුණේ.

"සත්ථේ වේපුල්ලං ගතේ පාණාතිපාතෝ" - අවි ආයුධ භාවිතය වැඩි වුණාම මරණ වැඩි වුණා.

මේක විෂම චක්‍රයක් හැටියට පැවතුණා. අන්න ඒ විෂම චක්‍රය බිඳ දැමීම සඳහා මෙවර අය වැයෙන් නිර්ධනීන්ට ධනය උත්පාදනය වෙන විධියේ සැලැස්මක් අපි හදලා තිබෙනවා.

ඒ වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කනගාටු වුණා, මේක ධනපතියන්ට දුන්න අය වැයක්ය කියලා. ඔව්, අපි ධනපතියන් විනාශ කරමින් මේ ආර්ථිකය බිඳ වට්ටන්නේ නැහැ. ඒගොල්ලනුත් ඉන්න ඕනෑ. ඒගොල්ලන්ට අවස්ථාව ඕනෑ තරම් දීලා තිබෙනවා. හැබැයි ධනය උත්පාදනය කරගන්න ශක්තියක් නැති ජනතාවට ධනය උත්පාදනය කර ගැනීමේ අවස්ථාවත් අපි හදලා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කෞටිල්‍ය ඇතුළු අපේ පෙරදිග නීති විශාරදයන්ගේ ප්‍රකාශයකින් මම කථාව අවසන් කරන්නම්. මේ වාගේ වැඩ කරනකොට කණ්ඩායම් ගණනාවක් හදලා තිබෙනවා. එක කණ්ඩායමක් තමයි, "අරි" - විපක්ෂය. ඊළඟට "මණ්ඩල න්‍යාය" කියලා එකක් තිබෙනවා මේ පෙරදිග දේශපාලන චින්තනයේ. අරි ළඟට ඉන්නවා, "අරි මිත්‍ර." විපක්ෂයේ මිතුරෝ. විවිධ හඬ නගමින්, විවිධ ආකාරයේ චෝදනා එල්ල කරමින් මේ වැඩසටහන වැළැක්වීම සඳහා අවතක්සේරුවට ලක් කරන්නන්. ඊළඟට ඉන්නවා, "අරි මිත්‍ර මිත්‍ර." සතුරාගේ මිතුරාගේ මිතුරෝ. සතුරා ඉන්නවා, සතුරාගේ මිතුරා ඉන්නවා, සතුරාගේ මිතුරාගේ මිතුරෝ ඉන්නවා. දේශීය වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් එහෙම අය ඕනෑ තරම් අපට හඳුනා ගන්න පුළුවන්. ඒ වාගේම තව ඉන්නවා "ආක්‍රාන්ත" කියලා කෙනෙක්, මණ්ඩල න්‍යායේ. ඒ අය විරුද්ධව හඬ නඟනවා, විවිධ මාධ්‍ය සාකච්ඡා තබමින්. වී මිල මදි, මීට වඩා දෙන්න තිබුණා කියලා කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ඊළඟට, "පාර්ශ්වීග්‍රාහ" කියලා තව කෙනෙක් ඉන්නවා. ඒ අය කකුලෙන් අදිනවා. අන්න ඒ වාගේ කණ්ඩායම්වලට මේ අය වැය පිළිබඳ වෙනත් විවේචනයක් නැහැ, මේ කියපු ආකාරයේ විවේචනයක් පමණයි තිබෙන්නේ. ඒ නිසා මෙවර මේ රටේ සාමාන්‍ය ජනතාව වාගේම සියලු කණ්ඩායම්, ව්‍යාපාරික ප්‍රජාව, මධ්‍යම පන්තිය -සියල්ල- ඉලක්ක කරගත්ත දැවැන්ත අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ අය වැය ක්‍රියාත්මක වීම තුළින් මේ රටේ අනාගතය වඩාත් සාධනීය තැනකට ගන්න පුළුවන් කියන කාරණය සඳහන් කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.40]

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මුළු රටම බලාගෙන හිටපු, ජාතික ජන බලවේගයේ 2025 අය වැය විවාදය පැවැත්වෙන මේ මොහොතේ මාගේ මංගල අය වැය කථාව කිරීමට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ඕනෑම රටක අය වැය කියන්නේ එම රටේ ඉදිරි අනාගතය, ඒ වාගේම රටේ පුරවැසියන්ගේ ජීවන රටාව, ජීවන තත්ත්වය තීරණය කරන ක්‍රියාදාමය කියලා ඉතා සරල වශයෙන් අපට හැඳින්විය හැකියි. ඒ අනුව 2025 වසර සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අය වැය සාරාංශයක් වශයෙන් ගත්තොත්, රුපියල් බිලියන 7,190ක වියදමක් දරන්නට රජය අපේක්ෂා කරනවා. ඒ වාගේම මේ වියදම පියවන්නට රජය අපේක්ෂා කරන ආදායම රුපියල් බිලියන 4,990යි. මෙවර අය වැයේ අපේක්ෂිත වියදම අපේක්ෂිත ආදායමට වඩා වැඩියි. ඒ අනුව රුපියල් බිලියන 2,200ක අය වැය හිඟයක් පෙන්නුම් කරනවා.

අපි මේ කථා කරන මොහොතේ IMF ගිවිසුමට යටත්ව IMF රාමුව යටතේ තමයි අපට කටයුතු කරන්න සිදු වෙලා තිබෙන්නේ කියලා අපි දන්නවා. අපේ රටේ ජනතාවගෙන් මේ ආදායම උපයන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් IMF එක කිසිම විටක කිසිම කොන්දේසියක් පනවා නැහැ. අපේ රටේ ආදායම උපයන්නේ කෙසේද යන්න තීරණය කිරීමට ආණ්ඩුවට පූර්ණ නිදහස ලබා දී තිබෙනවා. පසුගිය දිනවල කථා කරපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් කියනවා මම දැක්කා, මේක ජනතා හිතවාදී අය වැයක් කියලා. නමුත් අපි මේ 2025 අය වැය අනුව ආදායම උපයන්නේ කොහොමද කියලා බැලුවොත්, සියයට 50කට වඩා ආදායම උපයන්නේ ජනතාවගේ බදු මුදලින්. ආදායම් බදු, VAT, පසුගිය දෙසැම්බර් මාසයේ 18වැනි දා ආනයන භෝග සඳහා පනවපු විශේෂ බද්ද - Special Commodity Levy - යනාදී බදුවලින් තමයි රජයේ ආදායමින් සියයට 50කට වැඩි ප්‍රමාණයක් උපයා ගැනීමට තීරණය කර තිබෙන්නේ. ඒ අනුව මේක ජනතා හිතවාදී අය වැයක් නොවෙයි, ජනතාවගේ පැත්තෙන් බලනකොට තරමක් පසුගාමී අය වැයක් කියලා අපට කියන්න පුළුවන්.

විපක්ෂය වශයෙන් මේ සම්බන්ධයෙන් අපට තිබෙන මූලික ප්‍රශ්නය මෙයයි. "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" කියලා ප්‍රතිපත්ති ප්‍රකාශයක් ජාතික ජන බලවේගය ජනාධිපතිවරණ සමයේ මෙන්ම මහ මැතිවරණ සමයේ දීත් ඉදිරිපත් කළ බව අපි දන්නවා. මේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව දුන්න පොරොන්දු මත තමයි විශේෂයෙන්ම කාන්තාවන් -අපේ රටේ සියයට 52ක් ඉන්නේ කාන්තාවන්- විශාල සංඛ්‍යාවක් රොද බැඳගෙන "ගැහැනු අපි එක මිටට" යන තේමාව යටතේ ජාතික ජන බලවේගයත් එක්ක එකතු වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එම ප්‍රතිපත්ති ප්‍රකාශයේ 103වැනි පිටුවේ තිබෙනවා, අත්‍යවශ්‍ය භාණ්ඩවලට පනවා තිබෙන VAT එක මුළුමනින්ම අයින් කරනවා කියලා. ඒ වාගේම, පාසල් උපකරණ, අත්‍යවශ්‍ය ඖෂධ වෙනුවෙන් පනවා තිබෙන VAT එක මුළුමනින්ම අයින් කරනවා කියන පොරොන්දුව මත තමයි කාන්තාවන් විශාල වශයෙන් ජාතික ජන බලවේගයත් එක්ක එකතු වුණේ. මොකද, ගෙදරක ආර්ථිකය හැසිරවීමේ වගකීම මූලික වශයෙන්ම තිබෙන්නේ කාන්තාවට බව අපි දන්නවා. තමන්ගේ දරුවන්ට පෝෂ්‍යදායී ආහාරවේලක් ලබාදීමට නොහැකි තත්ත්වයක් යටතේ, මේ පොරොන්දුව මත කාන්තාවන් ඔබතුමන්ලාට විශාල වශයෙන් ඡන්දය දුන්නා. අපට තිබෙන විශාලම ගැටලුව තමයි, දුන්න ඒ පොරොන්දු අද වෙනකොට මේ අය වැයත් එක්ක කඩ කරලා තිබෙන එක. මොකද, ගිය මාසයේ මම මේ සභාවේ කථාවක් කරන අවස්ථාවේ ඒ පිළිබඳව කථා කරනකොට ආණ්ඩු පක්ෂයෙන් අපට කිව්වේ, "කලබල වෙන්න එපා. අපි පෙබරවාරි මාසයේ ඉදිරිපත් කරන අය වැයෙන් ඒකට උත්තරයක් දෙනවා" කියලායි. මේ අය වැයෙන්වත් ඒ අත්‍යවශ්‍ය භාණ්ඩවලට පනවා තිබෙන VAT එක අයින් කරලා නැති එක ගැන අපි කනගාටු වෙනවා.

අපේ ආදායම උපයාගන්නේ බදුවලින් නොවෙයි නම්, අපේ රටේ විදේශ විනිමය වැඩි කිරීම සඳහා අපනයන වැඩි කරන්න ඕනෑ. ඒ වාගේම විදේශ ආයෝජකයන් අපේ ලංකාවට ගෙන

[ගරු නීතිඥ වම්න්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය]

ඒමේ වැඩ පිළිවෙළක් අපි සංවිධානය කරන්නට ඕනෑ. ගිය ආණ්ඩුව අවුරුදු දෙකක් තිස්සේ රැස්වීම් 14ක් පවත්වා ඉන්දියාවේ අදානි සමූහ ව්‍යාපාරයත් එක්ක ගිවිසුම්ගත වෙලා, ඇමෙරිකානු ඩොලර් බිලියන 1ක විශාල ආයෝජනයක් ලංකාවට ගෙන ඒමට කටයුතු කරලා තිබුණු බව අපි දන්නවා. නමුත් ගිය සතියේ ඒ අදානි සමූහ ව්‍යාපාරය ලිපියක් මඟින් රජයට දැන්වූවා, ඒ ආයෝජනය ලංකාවට ගෙන එන්නේ නැහැ කියලා. අපි ආණ්ඩුවට කියන්න කැමැතියි, මේ විදේශ ආයෝජන පිළිබඳව හැම වෙලාවේම සැකයෙන් බලන්න එපා කියලා. මොකද, අපට ඒවා අවශ්‍යයි. ඒවා අපේ රටට අනිවාර්යයෙන්ම අවශ්‍ය දේවල්. සිංගප්පූරුව වාගේ රටවලට විදේශ ආයෝජකයන් එනකොට සතියක් අතුළත ඒ ක්‍රියාවලිය අවසන් කරන බව අපි දන්නවා.

අවුරුදු දෙකක් ගියත් අපේ රටේ මේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වීම ගැන අපි කනගාටු වෙනවා. විශේෂයෙන්ම one-stop shop කියන සංකල්පය යටතේ තමයි බොහෝ බටහිර රටවල් ආයෝජන සම්බන්ධයෙන් කටයුතු කරන්නේ. නමුත්, අපේ රටේ one-stop shop නොවෙයි, one-stop stop කියන සංකල්පය භාවිත කරන බව තමයි අපට පෙනී යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටට ආයෝජකයන් ගෙන ඒමට නම් නීතියේ උත්තරීතරභාවයත් ඉතාම වැදගත් කරුණක් වෙනවා. මොකද අපි දන්නවා, විදේශ ආයෝජකයන් යම්කිසි රටකට එනවා නම් ඒ රටේ නීතියේ උත්තරීතරභාවය පිළිබඳව සැලකිල්ලට ගෙන තමයි ඒ තීරණ ගන්නේ කියලා. අපේ ගරු අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. අපි මීට සති කිහිපයකට කලින් දැක්කා, නීතිපතිතුමාගේ නිර්දේශයකට දේශපාලන බලපෑමක් කරලා තිබුණු බව. විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්න කැමැතියි. නීතියක් තිබෙනවා, "Justice must not only be done, but it must also be seen to be done" කියලා. ඒකෙන් කියන්නේ, "යුක්තිය ඉටුවීම පමණක් නොව, බැලූ බැල්මට යුක්තිය ඉටුවන බවට ප්‍රදර්ශනය විය යුතුයි" කියන එක. විදේශ ආයෝජකයන් ලංකාවට එනකොට අනිවාර්යයෙන්ම මේ සංකල්පයට අනුව අපේ රටේ නීති රාමුව දිහා බලලා තමයි අපේ රටේ ආයෝජනය කරනවා ද, නැද්ද කියලා තීරණය කරන්නේ. එම නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, නීතියේ උත්තරීතරභාවය පිළිබඳවත් සැලකිල්ලට ගන්න කියලා.

අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් ඉන්නේ කාන්තාවන් කියලා අපි දන්නවා. මෙවර අය වැයෙන් රුපියල් බිලියන 1.4ක් ශිෂ්‍යාවන්ට සනීපාරක්ෂක තුවා ලබා දීම වෙනුවෙන් වෙන් කර තිබෙනවා. එ් ගැන අපි සන්තෝෂ වෙනවා. මොකද, අපේ සමගි ජන බලවේගයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා තමයි 2019දී මේ වෙනුවෙන් ප්‍රථමයෙන්ම රටේ කතිකාවක් ඇති කළේ. ඒ වාගේම අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා තමයි ගිය ආණ්ඩුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වශයෙන් කටයුතු කරනකොට මේ සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා, රජයට යෝජනා කළේ රුපියල් බිලියනයක් මේ සඳහා වෙන් කරන්න කියලා. පසුගිය ආණ්ඩුවෙන් පටන් ගත් මේ ක්‍රියාදාමය තවදුරටත් ඉදිරියට ගෙන යෑම පිළිබඳව මම සන්තෝෂ වෙනවා.

මා කලින් කියපු විධියට අපේ රටේ ජනගහනයෙන් සියයට 52ක් ඉන්නේ කාන්තාවන්. ඒ වාගේම දකුණු ආසියාවේ වැඩිම literacy rate එකක් තිබෙන්නේත් ලංකාවට. ඒක 92.4යි. නමුත්, අපි අපේ කාන්තාවකගේ ආර්ථික දායකත්වය ගැන කථා කළොත්, එය ඉතාම අඩු මට්ටමක තිබෙන්නේ. ලංකාවේ කාන්තාවන් ආර්ථිකයට දක්වන දායකත්වය තිබෙන්නේ සියයට 30ක මට්ටමක. විශේෂයෙන්ම Verite Research ආයතනය මඟින් කරනු ලබන සමීක්ෂණයකින් හෙළිදරව් වුණා, රැකියාවක් නැති කාන්තාවන්ගෙන් සියයට 80ක්ම ඉන්නේ අවුරුදු 20ත්, 39ත් අතර කාණ්ඩයේ කියලා. ඒකට හේතුවක් වශයෙන් මේ සමීක්ෂණයෙන් හෙළිදරව් වුණේ, විශේෂයෙන්ම ඒ වයස්වල පසුවන කාන්තාවන්ට ප්‍රසූත නිවාඩු දීමනා ලබා දීමට සිදුවීමයි. විශේෂයෙන්ම කාන්තාවක් රැකියාවකට ගත්තොත්, අනාගතයේ ඇයට ප්‍රසූත නිවාඩු දීමනාව ලබා දිය යුතු නිසා, රැකියාවලට බඳවා ගැනීමේදී කාන්තාවකට වඩා පිරිමි පක්ෂය වැඩිපුර බඳවා ගැනීමට කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවණතාවක් දක්වනවා.

ශ්‍රී ලංකාව ILO 1951 සම්මුතියට 1983දී අත්සන් කළා. එය අදාළ වෙන්නේ ප්‍රසූත නිවාඩු දීමනාව සම්බන්ධයෙන්. Verite Research ආයතනය යෝජනා කරන්නේ ප්‍රසූත නිවාඩු දීමනාවට යන වැය බර රජය විසින් පියවා ගන්න කියලායි. මේ දීමනාව රජය විසින් ගෙවනවා නම් දළ වශයෙන් රුපියල් බිලියන 7.4ක්, ඒ කියන්නේ රජයේ මුළු වියදමින් සියයට 0.001ක් තමයි ප්‍රසූත නිවාඩු දීමනාව වෙනුවෙන් රජයට ගෙවන්න වන්නේ. දැනට රටවල් 100කට අධික සංඛ්‍යාවක් මේ ප්‍රසූත නිවාඩු දීමනා ඒ රටවල රජය විසින් ගෙවනවා. විශේෂයෙන්ම මේක 2019 අය වැයේත් සඳහන් වුණාට, ඒක ඉදිරියට ගෙන යෑමට හැකියාවක් තිබුණේ නැහැ. අපේ කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය අද මෙම සභාවේ නැතත්, women's participation in workforce වැඩි කිරීම සඳහා ප්‍රසූත නිවාඩු දීමනා රජය විසින් ලබා දීමට කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට මේ වෙලාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියට ස්තූතිය පුද කරමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කන්දසාමි ප්‍රභු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 3.53]

ගරු කන්දසාමි ප්‍රභු මහතා
(මාණ්පුමිකු කන්තසාමි පිරපු)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தேசிய மக்கள் சக்தியின் கன்னி வரவு செலவுத்திட்ட விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் வழங்கியமைக்கு முதற்கண் நன்றியினைத் தெரிவித்துக்கொள்கின்றேன். இம்முறை எமது அரசாங்கத்தினால் முன்மொழியப்பட்ட வரவு செலவுத்திட்டத்தில் கிராமியப் பொருளாதார வளர்ச்சியினூடாகத் தேசிய பொருளாதாரத்திற்கு வலுச்சேர்க்கும் வகையிலான திட்டங்கள் உள்ளடக்கப்பட்டிருப்பதுடன், கல்வி, சுகாதாரம் மற்றும் விவசாயம் சார்ந்த துறைகளுக்கு அதிகளவான நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ளன. குறித்த ஒதுக்கீடுகளை மக்களின் பங்களிப்புடன் வினைத்திறனான முறையில் கையாள்வதன்மூலம், உத்தேசித்துள்ள இலக்கை அடைவதற்கான திட்டங்களை நடைமுறைப்படுத்த நாம் எதிர்பார்த்துள்ளோம். ஒவ்வொரு துறைசார்ந்தும் ஒதுக்கீடு செய்யப்பட்டுள்ள நிதியினை எமது அரசாங்கத்தின் அமைச்சுகளினூடாக மட்டக்களப்பு மாவட்டத்தின் துறைசார்ந்த அபிவிருத்திகளை மேற்கொள்வதற்கான கோரிக்கைகளை முன்மொழிவதன்மூலம் பயன்படுத்த எண்ணியுள்ளோம்.

மட்டக்களப்பு மாவட்டத்துக்குத் தேவையான அடிப்படை வசதிகள், வைத்தியசாலைகளின் புனரமைப்பு மற்றும் உள்ளூராட்சிச் சபைகள்மூலம் நடாத்தப்படும் 82க்கும் மேற்பட்ட பொது நூலகங்களிலுள்ள ஆளணிப் பற்றாக்குறையை நீக்குதல், அவற்றின் அடிப்படை வசதிகளை நிவர்த்திசெய்தல் ஆகியவற்றுக்கான ஆரம்ப கட்ட நடவடிக்கைகளை மேற்கொள்ளவிருக்கின்றோம். மட்டக்களப்பு மாவட்டத்தில் உள்ளூராட்சிச் சபைகளூடாகப் பதிவுசெய்யப்பட்ட 37க்கும் மேற்பட்ட முன்பள்ளிகள் இயங்கி வருகின்றபோதிலும், அங்கு கற்பிக்கும் ஆசிரியர்களுக்கான கொடுப்பனவு மற்றும் ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்திசெய்துகொள்வதற்கான நடவடிக்கைகளையும் மேற்கொள்வோம். கடந்த அரசாங்கத்தின் காலத்தில் மட்டக்களப்பு மாவட்டத்தில் இடம்பெற்ற ஒரு நிகழ்வின்போது முன்பள்ளி ஆசிரியர்கள் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமாகப் பேசப்பட்டிருந்தது. அங்கு ஓர் ஆசிரியர் தன் மனக்குமுறலை வெளிப்படுத்தியிருந்தார். எனினும், அவர்களின் குறைகள் நிவர்த்தி செய்யப்படாமலே அந்த அரசாங்கம் அவர்களைக் கைவிட்டுச் சென்றிருந்தது. அந்தக் குறைகளைத் தேசிய மக்கள் சக்தி அரசாங்கம் இம்முறை வரவு செலவுத்திட்டத்தினூடாக நிவர்த்தி செய்துகொள்ளவிருக்கின்றது.

அடுத்தாக, மட்டக்களப்பு மாவட்டத்தில் யானை - மனித மோதலைக் கட்டுப்படுத்தும் வேலைத்திட்டத்திற்கு அமைவாக கிரான், வாகரை, செங்கலடி போன்ற பிரதேச செயலாளர் பிரிவுகளை உள்ளடக்கிய 15 பிரதேசங்களில் சுமார் 83 கிலோமீற்றர் தூரத்திற்கு மின்சார வேலிகளை அமைப்பதற்கான திட்டம் முன்மொழியப்பட்டுள்ளது. அதற்கான நிதியினை உரிய காலத்திற்குள் பெற்று, உரிய நடவடிக்கைகளை மேற்கொள்ள எதிர்பார்த்துள்ளோம்.

மட்டக்களப்பு மாவட்டத்தில் தென்னை அபிவிருத்திச் சபைக்கு உரித்தான 288 ஏக்கர் நிலப்பரப்பு தற்போதுவரை தென்னை உற்பத்திக்காகப் பயன்படுத்தப்பட்டு வருகிறது. அங்கு கடந்த நான்கு வருடங்களில் 380,154 தென்னங்கன்றுகள் உற்பத்தி செய்யப்பட்டுள்ளதுடன், இதில் 153,500 தென்னங்கன்றுகள் மானிய அடிப்படையிலும், 45,200 தென்னங்கன்றுகள் விற்பனையூடாகவும் விநியோகிக்கப்பட்டுள்ளது. அத்துடன், மட்டக்களப்பு மாவட்டத்தின் கரையோரப் பிரதேசங்களை அண்டிய பகுதிகளில் தனியாருக்கான பல ஏக்கர் தென்னந் தோட்டங்கள் இருந்தபோதிலும், கடந்த ஆட்சிக் காலத்திலேற்பட்ட பசளை மற்றும் கிருமிநாசினிகளுக்கான தடை மற்றும் தட்டுப்பாடு காரணமாகத் தெங்கு உற்பத்தி பாரியளவில் வீழ்ச்சி கண்டிருக்கிறது. இனிவரும் காலங்களில் தென்னை அபிவிருத்திச் சபையின் உற்பத்திச் செயற்பாட்டினை அதிகரிப்பதற்கும், பயன்படுத்தப்படாதுள்ள அரச காணிகளைக் குத்தகை அடிப்படையில் தென்னை உற்பத்திக்காக வழங்குவதற்கும், தென்னை உற்பத்தியில் முதலீட்டாளர்களை ஊக்குவிப்பதற்கும் உரிய நடவடிக்கைகளைச் சம்பந்தப்பட்ட அமைச்சினூடாக மேற்கொள்ள எதிர்பார்த்துள்ளோம்.

அதேபோன்று, வைத்தியசாலைகளின் அடிப்படைத் தேவைகளை நிவர்த்தி, செய்து அதனூடாகக் கிராமப்புற மக்களுக்கு இலவச வைத்திய சேவையினைத் துரிதமாக வழங்கும் நோக்குடன், அடையாளம் காணப்பட்ட வைத்தியசாலைகளான வாழைச்சேனை ஆதார வைத்தியசாலை, செங்கலடிப் பிரதேச வைத்தியசாலை, ஏறாவூர் ஆதார வைத்தியசாலை, களுவாஞ்சிக்குடி ஆதார வைத்தியசாலை மற்றும் மட்டக்களப்பு போதனா வைத்தியசாலை போன்றவற்றுக்கான அடிப்படை உட்கட்டமைப்பு வசதிகள், ஆளணி, வைத்திய உபகரணங்கள் ஆகியவற்றின் பற்றாக்குறையினை நிவர்த்தி செய்தல் மற்றும் பிணவறை வசதிகளை விரிவுபடுத்தல் போன்ற கோரிக்கைகளை உரிய அமைச்சிடம் முன்வைத்து, அதற்கான தீர்வுகளை முடிந்தவரையில் விரைவாகப் பெற்றுக்கொடுக்க எதிர்பார்த்துள்ளோம்.

நெற்பயிர்ச் செய்கையினை ஊக்குவிப்பதுடன், அதற்கு மேலதிகமாகத் தானிய உற்பத்தியினை அபிவிருத்தி செய்யும் நோக்குடன் புதிய வேலைத்திட்டங்கள் மேற்கொள்ளப்படவுள்ளது. மட்டக்களப்பு மாவட்டத்தில் நன்னீர் மீன் வளர்ப்புடன் தொடர்புபட்டதாக வற்றாத குளங்களாக 21உம், பருவகாலக் குளங்களாக 72உம் அடையாளப்படுத்தப்பட்டுள்ளதுடன், அந்த வற்றாத குளங்கள் 21உம், பருவகால குளங்களில் 22உம் தற்போது பயன்பாட்டிலுள்ளன. ஏனைய குளங்களைப் புனரமைப்புச் செய்து, அரசாங்கக் காணிகளில் தானிய உற்பத்தியினை ஊக்குவிப்பதற்காக விவசாயிகளுக்கு வழங்குவதன்மூலம் உள்ளூர் உற்பத்தியினை அதிகரித்துக்கொள்வதற்குரிய வேலைத்திட்டங்களை ஆரம்பிக்க எதிர்பார்த்துள்ளோம். அத்துடன், நன்னீர் மீன் வளர்ப்புத் திட்டத்தினை ஊக்குவிப்பதும் எமது நோக்காக உள்ளது. மகாவலி 'பீ' வலயத்திற்கு உட்பட்ட தெரிவுசெய்யப்பட்ட பயனாளிகளுக்கு வாழ்வாதார உதவிகளாக, மீன்பிடி வள்ளங்கள் மற்றும் பண்ணையாளர்களுக்கான உபகரணங்களை வழங்கி அவர்களின் வாழ்வாதார நிலையினை மேம்படுத்த மகாவலி அதிகாரசபை நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது. அதனோடு இணைந்ததாக எதிர்காலத்தில் கிரான், செங்கலடி, வாழைச்சேனை, வாகரை, ஓட்டமாவடி போன்ற பிரதேச செயலாளர் பிரிவுகளின் எல்லைக் கிராமங்களை அண்டிய பயனாளிகளுக்கும் குறித்த திட்டத்தில் நன்மைகளை வழங்க எதிர்பார்த்துள்ளோம்.

மட்டக்களப்பு மாவட்டத்தில் தற்போதைய நிலையில் வாகரை, வாழைச்சேனை, ஏறாவூர், செங்கலடி, மட்டக்களப்பு, களுவாஞ்சிக்குடி, வெல்லாவெளி ஆகிய பிரதேச செயலகப் பிரிவுகளில் உள்ள 29 சிறுவர் இல்லங்களில் 412 பெண் பிள்ளைகளும், 255 ஆண் பிள்ளைகளும் பராமரிக்கப்பட்டு வருகின்றனர். குறித்த சிறுவர்களுக்கான அதிகரிக்கப்பட்ட மாதாந்தக் கொடுப்பனவுத் தொகையினை உரிய முறையில் பெற்றுக் கொடுப்பதற்கான ஏற்பாடுகளை மேற்கொள்வதுடன், நலிவடைந்த குடும்ப அங்கத்தவர்களின் விபரங்களைப் பெற்று, அவர்களுக்குத் தேவையான வீட்டு வசதியினைப் பெற்றுக் கொடுக்கவும் எதிர்பார்த்துள்ளோம்.

'அஸ்வெசும' பயனாளிகளை வலுவூட்டும் வேலைத்திட்டத்தின் ஊடாக, தெரிவுசெய்யப்பட்ட பயனாளிகளுக்குச் சுற்றுலாத் துறையுடன் சார்ந்ததான சிறிய கைத்தொழில் முயற்சி மற்றும் வேலைவாய்ப்புத் திட்டங்களை ஆரம்பிக்க எதிர்பார்த்துள்ளதுடன், கிராம மட்டத்தில் நெசவுக் கைத்தறித் தொழில்முயற்சியினை ஊக்குவிப்பதற்கான அடிப்படை விடயங்களையும் ஆரம்பித்துள்ளோம்.

மட்டக்களப்பு மாவட்டத்தில் கிராமப்புற மக்களினதும், தூரப் பிரதேசங்களுக்குக் கடமைகளுக்காகச் செல்லும் அரசாங்க உத்தியோகத்தர்களினதும், போக்குவரத்து வசதியினை மேம்படுத்தல் மற்றும் இலகுபடுத்தலை நோக்காகக்கொண்டு கிராமப்புற மக்களுக்கான பேருந்துச் சேவையினை மட்டக்களப்பு, ஏறாவூர் மற்றும் களுவாஞ்சிக்குடி சாலைகள் ஊடாகத் தற்பொழுது ஆரம்பித்துள்ளதுடன், எதிர்காலத்தில் அரசாங்க மற்றும் தனியார் உத்தியோகத்தர்களின் நன்மை கருதி நகரங்களுக்கு

[ගරු කන්දසාමි ප්‍රභූ මහතා]

இடையிலான போக்குவரத்து வசதிகளுக்காகக் குளிரூட்டப்பட்ட பேருந்துச் சேவைகளை அதிகரிப்பதற்கும் எதிர்பார்த்துள்ளோம்.

கடந்தகால வெள்ள அனர்த்தத்தின்போது கிரான், வெல்லாவெளி, வவுணதீவு, பட்டிப்பளை பிரதேச செயலகப் பிரிவுகளில் உள்ள வீதிகள் மற்றும் பாலங்கள் சேதமடைந்ததன் காரணமாக, அக்கிராமப்புறங்களுக்கான போக்குவரத்துச் சேவை துண்டிக்கப்பட்டிருந்தது. தற்போது உள்ளூராட்சிச் சபைகளின் பங்களிப்புடனும், வீதி அபிவிருத்தி அதிகாரசபை மூலமாகவும் அவை தற்காலிகமாகத் திருத்தம் செய்யப்பட்டுள்ளன. கடந்த 2023ஆம், 2024ஆம் ஆண்டு காலப்பகுதியில் பெருமளவிலான நிதி - கிட்டத்தட்ட 11,480 மில்லியன் ரூபாய் - மட்டக்களப்பு மாவட்ட வீதி அபிவிருத்தி மற்றும் பாலங்களை அமைப்பதற்காகச் செலவு செய்யப்பட்டிருந்ததை இந்நேரத்தில் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

தொடர்ச்சியாக அனர்த்தங்கள் இடம்பெறும்போது சேதங்கள் இடம்பெறுவதும் தொடர்ந்து கொண்டேயிருக்கின்றது. கடந்த காலங்களில் அபிவிருத்தி என்ற ரீதியில் மேற்கொள்ளப்பட்ட வேலைத்திட்டங்களுக்குரிய சாத்தியவள அறிக்கைகள் மற்றும் நிர்மாண வேலைகளில் இடம்பெற்ற கண்காணிப்புக் குறைபாடுகள் மற்றும் தரம் போன்றவை தொடர்பாக அரசாங்க அதிகாரிகள், அதனைச் செயற்படுத்திய நிறுவனங்கள், ஒதுக்கீடுகளை மேற்கொண்ட அரசியல்வாதிகள் தொடர்பான விமர்சனங்கள் தொடர்வதனால், அதுபற்றிய பரிசீலனையை எமது அரசாங்கத்தின் உரிய அமைச்சுக்கள் ஊடாக மேற்கொள்ள எதிர்பார்த்துள்ளதுடன், எதிர்வரும் காலங்களில் மட்டக்களப்பு மாவட்டத்தில் மேற்கொள்ளப்படவுள்ள அனைத்து அபிவிருத்தித் திட்டங்களையும் உரிய முறையில் மக்களின் முன்மொழிவுடன் செயற்படுத்தவும், அனைத்து திட்டங்களையும் பிரதேச அபிவிருத்திக் குழு மற்றும் மாவட்ட அபிவிருத்திக் குழுவின் ஊடாக உரிய அனுமதிகளைப் பெற்று நடைமுறைப்படுத்தவும் எதிர்பார்த்துள்ளோம்.

மட்டக்களப்பு வாவியை அண்டிய கண்டல் தாவரப் பகுதிகளில் இறால் உற்பத்தி இயற்கையாகவே காணப்படுவதால், அதனை அதிகரிக்கும் நோக்குடன் வாவியை அண்டிய பகுதிகளில் கண்டல் தாவரங்களை அழிக்கும் சட்ட விரோதச் செயற்பாடுகளைக் கட்டுப்படுத்த உரிய திணைக்களங்களின்மூலம் நடவடிக்கை மேற்கொள்ள எதிர்பார்த்துள்ளதுடன், கண்டல் தாவரங்களை நடுவதற்கான நடவடிக்கையினையும் மேற்கொண்டு, இறால் வளர்ப்புத் திட்டத்தில் ஆர்வம் உள்ள பயனாளிகளையும், முதலீட்டாளர்களையும் ஊக்குவிப்பதன்மூலம் எதிர்காலத்தில் இறால் வளர்ப்புத் திட்டங்களை மட்டக்களப்பு மாவட்டத்தில் விரிவுபடுத்தவும் எதிர்பார்த்துள்ளோம்.

தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் இந்த வரவு செலவுத்திட்டத்தின் ஊடாக கிழக்கு மாகாண மக்களுக்கு வரப்பிரசாதங்கள் கிடைக்கப்பெற்றிருக்கின்றது. இந்திய அரசாங்கத்தின் நிதி உதவியுடன் இந்த அபிவிருத்தித் திட்டங்கள் இடம்பெறவிருப்பதனூடாக, கிழக்கு மாகாண மக்களுக்கு இரட்டிப்பு நன்மை கிடைக்குமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். செழிப்பான ஒரு நாட்டை உருவாக்குவதற்காக அனைவரும் ஒன்று சேருவோம் என்று கூறி, எனக்கு இந்த வாய்ப்பினைத் தந்தமைக்கு நன்றி தெரிவித்து, விடைபெறுகிறேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ටී.බී. සරත් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.04]

ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙවර අය වැය ලේඛනය සම්බන්ධයෙන් සිදු කරන විවාදයේදී, විශේෂයෙන්ම විපක්ෂයෙන් මේ විවාදයට එකතු වන බොහෝ මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාව වුණේ මේ අය වැය රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැයක්, එහෙම නැත්නම් ඒකේ දිගුවක් කියන්නයි. නැත්නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අය වැයක්, ඒකේ දිගුවක් කියලා කියන්නයි. එහෙමත් නැත්නම් මෙය සමාජවාදී අය වැයක් නොව ධනවාදී අය වැයක්, ලිබරල් අය වැයක් කියන කාරණා ඉස්මතු කර ගන්න තමයි විපක්ෂය බොහෝ විට උත්සාහ ගත්තේ.

විපක්ෂයට එහෙම කියන්න සිද්ධ වුණේ වෙන කිසිවක් නිසා නොවෙයි. මේ අය වැය මහ පොළොවේ ක්‍රියාත්මක වනකොට, මේ රටේ ජනතාව අවුරුදු සිය ගණනක් තිස්සේ බලාපොරොත්තු වුණු සමාජ සාධාරණත්වය, ආර්ථික සාධාරණත්වය, දේශපාලන සාධාරණත්වය ඉෂ්ට වනවාය කියන කාරණාව ඒගොල්ලන්ගේ යටි සිත දන්නවා. ඒ නිසාම ඒගොල්ලන්ට වුවමනා විධියට මේ අය වැය අර්ථ කථනය කර ගන්න හදනවා. ඒගොල්ලන් අද ඊයේ ඉඳලා නොවෙයි, ඒගොල්ලන්ට වුවමනා විධියට අපේ පක්ෂයේ දේශපාලනය අර්ථ කථනය කළේ. 1965 ඉඳලාම ඒගොල්ලන් අපේ පක්ෂයේ දේශපාලනය අර්ථ කථනය කළේ ඒගොල්ලන්ට ඕනෑ විධියට. ඒගොල්ලන්ගේ පියවරු එක වෙලාවක කිව්වා, අපේ පක්ෂය බලයට ආවොත් වයස අවුරුදු 55ට වැඩි මිනිස්සු මරනවා කියලා. අන්න, එහෙමයි බය ගැන්වූයේ. එහෙම බය ගන්වපු අයගේ, ඒ පියවරුන්ගේ පුත්තු තමයි අද මේ ඉන්නේ.

විශේෂයෙන්ම හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා විනාඩි 45ක් අරගෙන විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදයේ පළමුවැනි දින විවාදය ආරම්භ කරනකොට, කබීර් හෂීම් මන්ත්‍රීතුමා විනාඩි 45ක් පමණ අරගෙන දෙවැනි දින විවාදය ආරම්භ කරනකොට, ඇත්තටම අපි හිතුවේ අය වැය පිළිබඳ උගත්, බුද්ධිමත් සංවාදයක් ඇති වෙයි කියලායි. කථාවක් තිබෙනවා, ගහපු පදයකුත් නැහැ, බෙරේ පලුවකුත් නැහැ කියලා. ඒ වාගේ දෙයක් තමයි අවසානයේ ඒ කථාවලින් සිද්ධ වුණේ. අපිත් බලාපොරොත්තු වුණා, ඉතා හොඳ සංවාදයක්, තර්කානුකූල විවාදයක් වාගේම, අදහස්වලින් පරිපූර්ණ වෙච්ච විවාදයක් ඇති වෙයි කියලා. නමුත්, මේ විවාදය පුරාවටම අපට ඒක දකින්න ලැබුණේ නැහැ.

විශේෂයෙන්ම මේ අය වැය සමාජවාදී අය වැයක් නොවෙයි කියලා කියන අයට අපි මේ කාරණය කියනවා. ලෝකයේ සමාජ ක්‍රමවල පරිණාමය ගත්තොත් ප්‍රාථමික හෞමික සමාජය තමයි, ආරම්භක ලෝකයේ සමාජය. ඊට පස්සේ වහල් සමාජය, වැඩවසම් සමාජය නිර්මාණය වුණා. දැන් තිබෙන්නේ අපි ජීවත් වන නූතන ධනේශ්වර සමාජය. මේක තමයි සමාජ පරිණාමය. ඊළඟ සමාජය හැටියට ලෝකයේ විද්වතුන් කථා කළේ කොමියුනිස්ට් සමාජය පිළිබඳවයි. කොමියුනිස්ට් සමාජයට යන අතරමඟ පාලම තමයි සමාජවාදය කියන්නේ. ඒක සමාජ ක්‍රමයක් නොවෙයි. එවැනි සමාජ ක්‍රමයක අය වැයක් ගැන අපට කථා කරන්න බැහැ. මොකද, මේ සමාජයේ ඉඳලා ඊළඟ සමාජය දක්වා පරිණාමය වන, සංක්‍රමණය වන කාල පරිච්ඡේදය තමයි සමාජවාදය කියන්නේ.

ඒක පටලවාගෙන තිබුණේ. නැත්නම් පටලවා ගත්තා, එක්කෝ පැටලුවා. සමහර විට විපක්ෂයට ඒ පිළිබඳව අවබෝධයක් නැති වෙන්න පුළුවන්. මොකද, විපක්ෂය ජීවත් වෙන්නේම නූතන ධනේෂ්වර සමාජය මත පදනම්ව විතරක් නිසා.

අපට මේ අය වැය තුළින් ඕනෑ වුණේත්, අපි බලයට ආවේත්, සියලු ජනතාවට සෙත සලසන්නයි. අපේ රටේ ජාතික ධනයෙන් සියයට 57ක්, සියයට 15ක් වන ඉහළම පවුල් බුක්ති විඳිනකොට, පහළම පවුල් සියයට 20 බුක්ති විඳින්නේ ජාතික ධනයෙන් සියයට 2.4යි. ඒ ආර්ථික අසමානතාව නිසා, ආර්ථිකය ගලාගෙන යන ඒ අසාධාරණ තත්ත්වය නිසා මේ රටේ සාතිශය බහුතරයක් දුක් විඳිනවා. මේ රටේ සාතිශය බහුතරයකට මූලික මිනිස් අයිතිවාසිකම්වත් සම්පූර්ණ කර ගන්න විධියක් නැහැ. මොනවාද, මූලික මිනිස් අයිතිවාසිකම් කියන්නේ? ඒ තමයි ආහාර පාන, ඇඳුම් පැලඳුම්, සෞඛ්‍ය, අධ්‍යාපනය, නීතියේ සාධාරණත්වය, සොබාව සෞන්දර්ය බුක්ති විඳින්න තිබෙන අයිතිය. අන්න ඒ මූලික මිනිස් අයිතිවාසිකම් සපුරා ගන්න සියයට 85ක් වන ජනතාවට හැකියාවක් නැහැ. ඒ ජනතාවට මූලික මිනිස් අයිතිවාසිකම් සම්පූර්ණ කර ගන්න පුළුවන් රටක් හදන එක තමයි අපේ අපේක්ෂාව. ඒකට සමාජවාදය කියන්නත් පුළුවන්. ඒ වාගේම ඒකට ඔය විපක්ෂය කියන ඕනෑම නමක් යොදන්නත් පුළුවන්.

ඒ මහා ගමනේ ආරම්භය තමයි මේ අය වැය තුළ තිබෙන්නේ. මේ අය වැය ඇතුළේ තිබෙන්නේ ඒ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය, ඒ ආර්ථික සාධාරණත්වය, ඒ දේශපාලන සාධාරණත්වය මෙන්ම සමාජ සාධාරණත්වය. මේ මුළු අය වැය පුරාම අපි ඒ ඒ ශීර්ෂවලට ප්‍රමාණවත් මුදල් වෙන් කරලා තිබෙනවා.

අය වැයකින් කියන්නේ, ඊළඟ අවුරුද්ද සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයට, අධ්‍යාපනයට, කෘෂි කර්මාන්තයට, ප්‍රවාහන පද්ධතියට මේ කියන දේවල්වලට -තව බොහෝ දේවල් තිබෙනවා- මුදල් වෙන් කරන ආකාරය. එහෙම නැත්නම් ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සම්පූර්ණ කර ගන්න මුදල් වෙන් කරන විධිය. අපි මේ අය වැයෙන් ඒ විධියට මුදල් වෙන් කරලා තිබෙනවා.

අය වැයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට රුපියල් බිලියන 634ක මුදලක් වෙන් වෙනකොට, අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක මුදලක් වෙන් වෙනකොට, පරිසර හිතකාමී රටක් හදන්න රුපියල් බිලියන 483ක් වෙන් වෙනකොට, නිවාස සඳහා රුපියල් බිලියන 190ක් වෙන් වෙනකොට, කෘෂි කර්මාන්තය සඳහා රුපියල් බිලියන 254ක් වෙන් වෙලා තිබෙනවා. ඒ සෑම ක්ෂේත්‍රයකටම සමබර විධියට මුදල් වෙන් කරන්න අපි මේ අය වැය ඇතුළේ කටයුතු කරලා තිබෙනවා. අපට ඕනෑ වුණේ, පළමු අය වැයේදීම මේ රටේ පොදු ජනතාවට සහන දෙන්නයි. අපි ඒ සහන ටික දුන්නා.

විපක්ෂය එක වෙලාවක මතු කළා, මේ අය වැයෙන් භාණ්ඩවල මිල අඩු කළේ නැහැ කියලා. මූලිකව ගත්තොත්, අපි ආපු දවසේ ඉඳලා ඩීසල් මිල රුපියල් 36කින් අඩුවෙලා තිබෙනවා, පෙට්‍රල් මිල රුපියල් 23කින් අඩුවෙලා තිබෙනවා. ඒ විධියට පොදු ජනතාව විශාල වශයෙන් භාවිත කරන ඉන්ධනවල මිල අපි අඩු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දැන් ඇහුවා, පාසල් උපකරණවල බදු අයින් කළාද කියලා. අපි පාසල් උපකරණවල බදු අයින් කරනවා වෙනුවට දරුවන්ට රුපියල් 6,000ක් වටිනා පාසල් උපකරණ ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම අපි අය වැයට කලින්ම විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි කළා. ඒ මොහොතේ රටේ තිබුණු ඒ ආර්ථික ඉරණමට මුහුණ දුන් ජනතාවට සාධාරණ ලෙස අපි ඒ විධියේ පොදු සහන ලබා දුන්නා. බරපතළ ලෙස ආර්ථිකය බිඳ වට්ටපු රටක් තමයි අපට ලැබුණේ. අන්න ඒ ආර්ථිකයට මුහුණ දුන් ජනතාවට සාධාරණ ලෙස සහන දෙන්න අපි මේ වෙලාවේ කටයුතු කර තිබෙනවා. හැබැයි, මේ සහන ප්‍රමාණවත් නැහැ. ඒක අපි පිළිගන්නවා. හැබැයි අපි සහන දීම ආරම්භ කරලා තිබෙනවා.

අපේ රටේ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය ගත්තොත් වැඩියෙන්ම විපක්ෂය කථා කරන්නේ සහල් මිල සහ වී මිල පිළිබඳවයි. අපි බලයට ආවාට පස්සේ මේ රටේ ගොවීන්ගේ පොහොර සහනාධාරය හෙක්ටෙයාරයකට රුපියල් 25,000 දක්වා වැඩි කළා. හෙක්ටෙයාරයකට රුපියල් 25,000 දක්වා වැඩි කරනකොට, තෙල් මිල -ඩීසල් මිල- රුපියල් 36කින් අඩු කළා. අපි එනකොට අපේ රටේ ගොවියෙකුට වී කිලෝවක් නිෂ්පාදනය සඳහා වැය වුණු මුදල රුපියල් 99.30යි. අපි එය රුපියල් 87ට අඩු කළා. අපි ජාතික ජන බලවේගය විධියටත්, සමස්ත ලංකා ගොවිජන සම්මේලනය විධියටත් - ජාතික ජන බලවේගය නියෝජනය කරන ප්‍රධාන ගොවි සංවිධානය - මේ රටේ ගොවි ජනතාවට කිව්වා, අපේ පාලනයකදී ඔබ වියදම් කරන මුදල තුනෙන් බෙදලා, ඒකෙන් එක පංගුවක් ලාභයට එකතු කරලා සහතික මිල දෙනවා කියලා. වියදම රුපියල් 90 කියලා අරගෙන තුනෙන් බෙදුවොත්, රුපියල් 30යි. ඒ රුපියල් 30ක මුදල රුපියල් 90ට එකතු කළාම, රුපියල් 120යි. අපි ඒ මිල නියම කර තිබෙනවා වී කිලෝවක මිල විධියට. ඒක මේ මොහොතේ ගොවීන්ට දෙන්න පුළුවන් ඉහළම සාධාරණ මිල.

ඇයි, අපි වී කිලෝවකට රුපියල් 120ක මිලක් තීන්දු කළේ? ඒක තීන්දු කළේ මේ රටේ පාරිභෝගිකයා සහල් පරිභෝජනය කරන්න ඕනෑ නිසායි. සහල් සඳහා රුපියල් 230ක මිලක් තීන්දු කළා. රුපියල් 230ට වඩා සහල් මිල වැඩි වෙන්නත් බැහැ. රුපියල් 120ට වඩා වී මිල අඩු වෙන්නත් බැහැ. ඊට වඩා වැඩියෙන් ගන්න ඕනෑ කෙනෙකුට වී කිලෝව ඒ විධියට විකුණන්න අවස්ථාව තිබෙනවා. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි රුපියල් 230ට වඩා වැඩි මිලට සහල් විකුණන්න බැහැ.

විපක්ෂයට සම්බන්ධ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රධාන සහල් නිෂ්පාදකයෙක් ඉන්නවා. මම ඒ මෝලේ නම සඳහන් කරන්නේ නැහැ. එයා ඊයේ-පෙරේදා ඇවිල්ලා විපක්ෂ නායකතුමාගේ කාර්යාලයත් වටලලා, රුපියල් කෝටි 50ක් වියදම් කළා මන්ත්‍රී ධුරයක් දුන්නේ නැහැ කියලා උද්ඝෝෂණයකුත් කළා. අනෙක් මෝල් හැම එකක්ම කිරි සම්බා රුපියල් 255ට දුන්නා. එයා දුන්නේ රුපියල් 300ට. අනෙක් මෝල් පෙරේදා රුපියල් 235ට සම්බා කිලෝව දෙනකොට එයා රුපියල් 280ට දුන්නේ. අනෙක් සියලු මෝල්වල රජයේ නියමිත මිලට සහල් දෙනවා. අද සමහරු සහල් මිල දේශපාලන වුවමනාව වෙනුවෙන්, මේ ජඩ දේශපාලන වුවමනාව වෙනුවෙන් පාවිච්චි කරනවා. තමන්ගේ මෝලේ තිබෙන සහල්වල මිල තමන්ගේ දේශපාලන පක්ෂයේ වුවමනාව වෙනුවෙන් පාවිච්චි කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒකට ඉදිරියේදී අපි ක්‍රියාමාර්ග ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ අය වැයේ සමස්තය නිර්මාණය වුණේ මේ රටේ පොදු ජනතාවට සහන ලබා දීම වෙනුවෙන්. අන්න, ඒ වුවමනාව වෙනුවෙන් සමස්ත අය වැය ඇතුළේ සෑම ක්ෂේත්‍රයකටම මුදල් වෙන් කරලා තිබෙනවා.

අලි-මිනිස් ගැටුම අවසන් කරන්න අපි කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ යටතේ අලි වැට කිලෝමීටර 1,456ක් ප්‍රතිසංස්කරණය කිරීම විතරක් නොවෙයි සිදු වන්නේ. මේ වෙනුවෙන් වනජීවී දෙපාර්තමේන්තුවට මුදල් වෙන් කර තිබෙනවා. ඊට අමතරව දිස්ත්‍රික්කවලට රුපියල් කෝටි 900 ගානේ වෙන් කරලා තිබෙනවා. ඊට අමතරව මහවැලි අමාත්‍යාංශයට මුදල් වෙන් කරලා තිබෙනවා. අද මහවැලි ප්‍රදේශවල අලි වැටවල් ගහන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය

[ගරු ටී.බී. සරත් මහතා]

යටතේ. ඒ විධියටත් අලි වැටවල් ගහනවා. වනජීවී එකත් මේකට මැදිහත් වෙනවා. ඒ වාගේම දිස්ත්‍රික් අරමුදලට වෙන් කරපු මුදල්වලිනුත් අපේ අවශ්‍යතාව මත මේ වෙනුවෙන් මුදල් වෙන් කරනවා. ඒ හරහා පහළට මුදල් ගලාගෙන යෑම වෙන කවරදාටවත් වඩා වැඩි කරලා තිබෙනවා.

අද වී නිෂ්පාදනය විතරක් නොවෙයි, මේ කන්නයේ බඩඉරිඟු නිෂ්පාදනය ලෙස මෙට්‍රික්ටොන් ලක්ෂ හයක් අපි බලාපොරොත්තු වෙනවා.

බඩඉරිඟු මෙට්‍රික්ටොන් ලක්ෂ 6ක් ගෙන්වන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 120ක් වියදම් කරන්න වෙනවා. මේ අවුරුද්දේ අන්න ඒ වියදම නවත්වන්න හෙක්ටෙයාර 30,000ක බඩඉරිඟු වගා කරන්න මේ අය වැය ඇතුළේ මුදල් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ටී.බී. සරත් මහතා
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම ඉක්මනින් කථාව නතර කරන්නම්. තවත් විනාඩියක කාලයක් දෙන්න.

මේ අය වැය ඇතුළේ ගොවි ගම්මාන හදන්න, තරුණ ගොවි ගම්මාන හදන්න, සමුපකාර ගොවි ගම්මාන හදන්න යෝජනා කර තිබෙනවා. මේ රටේ පහළ ආදායම් ලබන ජනතාවට, ගොවි ජනතාවට මුදල් ගලාගෙන යන වැඩ පිළිවෙළ මේ අය වැය ඇතුළේ තිබෙනවා. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, ඔය කියන විවේචන ගැන අපි ඉදිරි පළාත් පාලන මැතිවරණයේදී බලමු කියලා. මේ අය වැය හරිද වැරදි ද කියලා මේ රටේ ජනතාව තීන්දුවක් ගන්නවා, තව මාස දෙකතුනක් ඇතුළත තිබෙන පළාත් පාලන මැතිවරණයේදී. මේ රටේ ජනතාව මේ අය වැය දිහා බලලා තව මාස දෙකක් යන්න කලින් අපට අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා දෙනවා. එදාට තමයි විපක්ෂය පාඩම ඉගෙන ගන්නේ.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அரவிந்த சேனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

[අ.භා. 4.19]

ගරු බී. ආරියවංශ මහතා
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැය පිළිබඳව විපක්ෂයත්, ආණ්ඩු පක්ෂයත් අතර වාද විවාද පැවැත්වෙනවා. පසුගිය දිනක ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් කළා. මේ අය වැය ලේඛනයත් පසුගිය කාලවල මේ රටේ මුදල් ඇමතිවරුන් වසරක් පාසා ඉදිරිපත් කළ අය වැයවලට සමාන අය වැයක් කියලා කියන්න පුළුවන්. මොකද, මේක IMF රාමුව තුළ හිටගෙන හදපු අය වැයක්. රටේ ජනතාව බලාපොරොත්තු වුණු සංවර්ධනය, ඒ වාගේම පසුගිය ජනාධිපතිවරණයට කලින් ජාතික ජන බලවේගය "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඉදිරිපත් කළ යෝජනා මාලාව සහ මේ රටේ ජනතාවට දුන්නු පොරොන්දු ඉටු කරන ආකාරයක් අපට මේ අය වැය තුළින් දකින්නට නැහැ.

පසුගිය ආණ්ඩුව තුළ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගෙන ගිය වැඩ පිළිවෙළම මේ අය වැය තුළත් තිබෙනවා කියලා තමයි අපට දකින්න ලැබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය තුළ බිලියන 7,190ක් වියදම් වශයෙනුත්, බිලියන 4,990ක් ආදායම් වශයෙනුත් සඳහන් වනවා. අය වැය හිඟය වශයෙන් රුපියල් බිලියන 2,200ක් තිබෙනවා. අපි දකිනවා මේ අය වැය තුළ එක එක අමාත්‍යාංශ හරහා රටේ ජනතාවට විවිධ ආකාරයෙන් වැඩ කිරීම් කරලා, සහන ලබා දීලා තිබෙන බව. ජනතාවගේ පැත්තෙන් බලලා අපි ඒවා පිළිබඳව සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට යම් වසරකට අය වැය සකස් කළාම ඒ අය වැය තුළින් රටේ ජනතාවට, පාරිභෝගිකයන්ට විශේෂ සහනයක් සැලසෙන්න ඕනෑ. මීට මාස තුනකට කලින් අපේ රටේ නාඩු සහල් කිලෝවක් රුපියල් 170යි. පසුගිය දවස්වල කිලෝවක් රුපියල් 300 දක්වාත් ඉහළ ගියා. මාස තුනකට පසුව මේ වන කොට, ඔබතුමන්ලාගේ පාලන මිල කිලෝවකට රුපියල් 230යි. එතකොට රුපියල් 225කට, 230කට තමයි මේ රටේ පාරිභෝගිකයාට සහල් මිල දී ගන්න වෙන්නේ.

ඒ වාගේම, මීට මාස තුනකට ඉස්සෙල්ලා පොල් ගෙඩියක මිල තිබුණේ රුපියල් 100කට. රුපියල් 250කට වඩා වැඩි මුදලකට තමයි අද වෙළෙඳ පොළේ පොල් ගෙඩියක් අළෙවි වෙන්නේ. ඒ වාගේමයි, ලුණු. අද අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලේම මිල ඉහළ ගිහින් තිබෙනවා. මේ වන කොට -මේ මාස තුන ඇතුළත- එක පවුලක වියදම මාසයකට රුපියල් 10,000ක් විතර වැඩි වෙලා තිබෙනවා. ඒ තත්ත්වය දිහා බැලුවාම මේ රටේ ජනතාවට මේ අය වැය තුළින් ලැබෙන සහනය ප්‍රමාණවත් ද කියලා අපට හිතාගන්න පුළුවන්. "අස්වැසුම" වැඩසටහන තුළින් යම් මුදලක් වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේ වැඩි වීම් ගැනත් අපට කියන්න පුළුවන්.

අය වැය තුළින් සිංහල අවුරුද්දට සතොස හරහා ලබා දෙන සහන මල්ල සඳහා වෙන් කරපු මුදල් ප්‍රමාණය අනුව එක ග්‍රාම නිලධාරි වසමකින් පවුල් හතරකට පමණයි ඒ සහන මල්ල ලබා දෙන්න පුළුවන් වන්නේ. ඒක ප්‍රමාණවත් ද කියලා මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගෙන් අහනවා.

අපි විශේෂයෙන්ම කථා කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. මේ රටේ දුප්පත්ම ජනතාව භාවිත කරන්නේ බයිසිකලය. එහෙම නැත්නම්, ත්‍රිරෝද රථය. මේ රටේ 1,188,405ක් ත්‍රිරෝද රථ තිබෙනවා. මේ ත්‍රිරෝද රථවලින් පවුල් ලක්ෂ අටකට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙනවා. මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන බවක් මේ අය වැයේ සඳහන් වෙලා නැහැ. අපි දැක්කා, පසුගිය කාලයේ ඒ ත්‍රිරෝද රථවල පිටුපස සඳහන් කරගෙන ගිය වැකි. "දුප්පතාගේ හිතවතා" කියලා සඳහන් කර තිබුණා. සමහර අවස්ථාවල සඳහන් කර තිබුණා, "මග කියන මිතුරා" කියලා. පසුගිය ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා ගොඩක් ත්‍රිරෝද රථවල සඳහන් කර තිබෙනවා අප දැක්කේ, "අපි ඔක්කෝම මාලිමාවට" කියලායි. ඒවායේ සඳහන් වෙලා තිබුණේ එහෙමයි. ත්‍රිරෝද රථ රැකියාවේ නියැළෙන අය අද පාවිච්චි කරන්නේ වසර 15, 20 වාගේ පැරණි ත්‍රිරෝද රථ. බොහොම අමාරුවෙන් අමතර කොටස් සවි කරගෙනයි ඒවා ධාවනය කරන්නේ. පසු ගිය කාලයේ -අවුරුදු 5ක් පමණ- ත්‍රිරෝද රථ ආනයනය කරන එක නවත්වා තිබුණා. මේ වන කොට ආනයනය කරන ත්‍රිරෝද රථයක මිල කීයද බලන්න. පසුගිය කාලයේ රුපියල් ලක්ෂ 13කට තිබුණු ත්‍රිරෝද රථය මේ වන විට රුපියල් ලක්ෂ 20ක් දක්වා ඉහළ ගිහින් තිබෙනවා. අලුතින් ත්‍රිරෝද රථයක් මිල දී ගන්න බොහොම අමාරුයි. මේවාට යම් සහනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කළොත් හොඳයි. මොකද, ත්‍රිරෝද රථවලින් විශාල පිරිසක් ජීවත් වෙනවා. අපි දන්නවා, රාජ්‍ය සේවකයන් ලක්ෂ 15කට ආසන්න ප්‍රමාණයක් සිටින බව. පෞද්ගලික අංශයේ රැකියා කරන අයට යම් ප්‍රමාණයකින් වැටුප් වැඩි කරන්න මේ අය වැයෙන් යෝජනා කළා. නමුත්, ත්‍රිරෝද රථවලින් ජීවිකාව ගෙන යන අයට three-wheeler park එකට ගිහිල්ලා හයර් එකක් ආවොත් තමයි දවසකට කීයක් හරි හොයා ගන්න පුළුවන්. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියලා මා සඳහන් කරනවා. Clean Sri Lanka වැඩසටහන යටතේ රුපියල් මිලියන 5,000ක් පමණ වෙන් කර තිබෙනවා. මුදල් ප්‍රතිපාදන වෙන් කරලා වෙනත් අමාත්‍යාංශ හරහාත් ඔබතුමන්ලා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. ඒ මුදලින් හෝ කොටසක් ත්‍රිරෝද රථ සංගම් සඳහා, එහෙම නැත්නම් එම රැකියාවේ නියැළෙන අය සඳහා වෙන් කරන ලෙස මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

මා නියෝජනය කරන්නේ රත්නපුර දිස්ත්‍රික්කය. රත්නපුර දිස්ත්‍රික්කය ඌන සංවර්ධිත දිස්ත්‍රික්කයක්. එහි වතු කම්කරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා; යටිතල පහසුකම් දියුණු වෙලා නැහැ. නමුත්, එය මේ රටට අපනයන ආදායම් ගෙනෙන දිස්ත්‍රික්කයක්. මේ අය වැය තුළ මුදල් වෙන් කිරීමේදී උතුර සහ නැගෙනහිරට විශේෂ තැනක් දීලා තිබෙනවා අපි දැක්කා. ඒ වාගේම, වෙනත් දිස්ත්‍රික්කවලටත් -ජනාධිපතිතුමා, විවිධ ඇමතිවරුන් ඉන්න දිස්ත්‍රික්කවලටත්- වෙන වෙනම මුදල් වෙන් කරගෙන තිබෙනවා. නමුත්, සබරගමුව පළාතේ රත්නපුරය වැනි දිස්ත්‍රික්කවලට එහෙම මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා නැහැ.

විශේෂයෙන්ම කුරුඳුවලට අගය එකතු කරලා අපනයනය කරන්න යම් වැඩසටහනක් මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබෙනවා. කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි ඇතුළු අපනයන භෝග වගා කරන ගොවීන් විශාල ප්‍රමාණයක් රත්නපුර දිස්ත්‍රික්කයේ ඉන්නවා. ඒ අයටත් සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

අද රටේ දැවෙන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා, කරුංකා ප්‍රතිඅපනයනය. විශේෂයෙන් දකුණු පළාතේ, ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ කරුංකා නිෂ්පාදනය කෙරෙනවා. පුවක්වලින් කෙරෙන කරුංකා නිෂ්පාදනය මේ රටට දැවැන්ත අපනයන ආදායමක් ලබා දෙන වැඩසටහනක්. මේ වනකොට කරුංකා කිලෝවක් රුපියල් 500කටවත් අළෙවි කර ගන්න බැරිව ගොවියෝ ලොකු අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ අපේ රටින් වසරකට කරුංකා මෙට්‍රික්ටොන් 15,000ක් පමණ ඉන්දියාවට අපනයනය කළා. මීට මාස හයකට, අවුරුද්දකට කලින් කරුංකා කිලෝවක් රුපියල් 1,000කට, 1400කට වාගේ මිලකට අළෙවි වුණා. ගොවියාට හොඳ මිලක් ලැබුණා. අද කරුංකා කිලෝවක් රුපියල් 500 දක්වා අඩු වෙලා තිබෙනවා. මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ, ඉන්දුනීසියාවෙන් අපේ රටට කරුංකා ගෙනැල්ලා ඒ කරුංකා ඉන්දියාවට ප්‍රතිඅපනයනය කරන වැඩ පිළිවෙළක් නිසාය කියලා අපේ රටේ අපනයනකරුවන් ප්‍රකාශ කරලා තිබෙනවා. මෙම ක්‍රියාවලිය නවත්වලා අපේ රටේ කරුංකා නිෂ්පාදකයන්ට සාධාරණයක් ඉටු වන ආකාරයේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. අපට දැන ගන්න ලැබෙන ආකාරයට මේ වනකොට ඉන්දුනීසියාවෙන් කෙළින්ම කරුංකා ඉන්දියාවට ලබා ගන්නවා. යම් පිරිසක් ඉන්දුනීසියාවෙන් කරුංකා ගෙනැල්ලා අපේ රට හරහා ඉන්දියාවට යැවීමට කටයුතු කළත් ඉන්දියාව ඒවා ප්‍රතික්ෂේප කරලා ඉන්දුනීසියාවෙන් කෙළින්ම කරුංකා ලබා ගන්න වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන විශේෂයෙන්ම අපේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා දැනුවත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

අපේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ මැණික් කර්මාන්තය බහුලව කෙරෙනවා. අපට විශාල අපනයන ආදායමක් ලැබෙන කර්මාන්තයක් තමයි මැණික් කර්මාන්තය. මැණික් කර්මාන්තය වෙනුවෙන් අය වැයෙන් මුදලක් වෙන් නොකළත්, ඒ කර්මාන්තයේ නියැළෙන අයට සහනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කර දෙන්න ඕනෑ. විශේෂයෙන්ම නීතිමය ගැටලු රාශියක් තිබෙනවා. අද ගහට බහින්න විධියක් නැහැ. ඒ කියන්නේ, ඇදුමක්වත් හෝදා ගන්න ක්‍රමක් නැහැ. කෙනෙක් පොලීසියෙන් අල්ලන් ගිහිල්ලා උසාවියට ඉදිරිපත් කළාම දඩ මුදල විතරක් නොවෙයි ගෙවන්න සිදු වන්නේ. ඒ අයගේ ඇඟ බඳිනවා. නැවත වතාවක් අහු වුණොත් ඇප කැන්සල් කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තිබෙන නිසා අපේ මැණික් කර්මාන්තය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

අපට අය වැය පිළිබඳව කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. 76 වසරක ශාපය කියලා පසුගිය ආණ්ඩු කාලවලට මේ අය වැය තුළත් විවිධ කථා කියනවා. නමුත්, එදාත් මේ රට සංවර්ධනය වුණා. තුන් වේල කන්න පුළුවන් විධියට මේ රට සහලින් ස්වයංපෝෂිත කරන්න පසුගිය ආණ්ඩු කටයුතු කළා. වැව් හදලා, ඇළ වේලි හදලා මේ රට සංවර්ධනය කරගෙන ආවා. එම වැඩ පිළිවෙළ ඉදිරියේදීත් සාර්ථකව ක්‍රියාත්මක කරලා මේ රටේ ජනතාවට සහන සලසන වැඩ පිළිවෙළක් මෙම ආණ්ඩුවෙන් ඉදිරිපත් වේවා කියලා සඳහන් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.33]

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට ආර්ථික, සමාජයිය හා සංස්කෘතික වශයෙන් බිඳ වැටීමකට, අඳුරට, අගාධයට, බංකොලොත්භාවයට පත් වෙලා තිබෙන අවස්ථාවක, පොහොසත් රටක් හැදීමේ පළමු පියවර තබන්න මාලිමාවේ ආණ්ඩුව විසින් මෙම මංගල අය වැය ඉදිරිපත් කරනු ලැබුවා. අපේ අය වැය කොයි තරම් සාර්ථකද කියනවා නම් විපක්ෂයෙන් අපි බලාපොරොත්තු වුණේ මේ අය වැය පිළිබඳ එතුමන්ලාගේ අදහස්, යෝජනා සහ විවේචන තිබෙනවා නම් ඒ විවේචන. නමුත්, එතුමන්ලාගෙන් වැඩිපුරම ඇහෙන්න ගත්තේ අඳෝනා, කෙඳිරිලි සහ විලාප. ඒ තුළින්ම දිස් වෙනවා අපේ අය වැය කොයි තරම් සාර්ථක අය වැයක්ද කියලා.

එතුමන්ලා කථාව පටන් ගන්නේම අපි ඉදිරිපත් කරන්න සිටි අය වැයක් තමයි මාලිමාවේ ආණ්ඩුව ඉදිරිපත් කරලා තිබෙන්නේ, ඉස්සර ආණ්ඩුව ඉදිරිපත් කරන්න හිටපු අය වැයක් තමයි මාලිමාවේ ආණ්ඩුව ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලායි. ඉතින්, ඒ විවේචන හමුවේ අපි සතුටු වෙනවා. අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මාස තුනක් වාගේ කාලයක් තමයි ගත වෙලා තිබෙන්නේ. මේ මාස තුන ඇතුළත අපි ඉදිරිපත් කළ මේ මංගල අය වැයෙන් පොහොසත් රටක් හදන්න අවශ්‍ය පළමුවන පියවර හැටියට සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්තටම මහජනතාවගේ දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි, මහජනතාව, දේශපාලන අධිකාරිය සහ රාජ්‍ය නිලධාරීන් එක්ක එකතු වෙලා තමයි මේ සියලු සංවර්ධන යෝජනා ඇතුළුව මේ රට ගොඩ නහන ඒ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න පෙලඹිලා ඉන්නේ.

මම අද පොඩ්ඩක් අසනීප තත්ත්වයෙන් ඉන්නේ. මම බෙහෙත් ගන්න ගියා. ඒ අවස්ථාවේ එතැන හිටපු අය අපේ අය වැය ගැන කථා කරන්න පටන් ගත්තා. ඔවුන් කියනවා, ඉතිහාසයේ ප්‍රථම වතාවට මේ වාගේ අය වැයක් දැක්කේ කියලා. මොකද, මන්ත්‍රීවරු, මැති ඇමතිවරු, අගමැතිතුමිය, ජනාධිපතිතුමා තමන්ගේ වරප්‍රසාද සියල්ල කපාගෙන ඒ වරප්‍රසාද මහජනතාව වෙනුවෙන් කැප කරපු අය වැයක් තමයි මෙවර ඉදිරිපත් කළ අය වැය. මේ අය වැය දැක්මක් සහිතව හදපු අය වැයක් කියන එක මේ රටේ මහජනතාව තේරුම් අරගෙන ඉන්නවා.

අපි රාජ්‍ය අංශවල වැඩ කරන අය වෙනුවෙන් ඉතා හොඳ වැටුප් වැඩිවීමක් මේ අය වැයට ඉදිරිපත් කරලා තිබෙනවා. වැටුප් ලබන මොහොතේදී ඔවුන් ඉතාම සතුටට පත් වෙයි, මේ වරප්‍රසාදය ලැබීම පිළිබඳව. මොකද, ඔවුන්ගේ basic salary එක විතරක් නොවෙයි, ඒ හා සමගාමීව EPF, ETF, gratuity, විශ්‍රාම ගත්තාම ඔවුන්ට ලැබෙන වරප්‍රසාද සියල්ලක්ම වැඩි වෙලා තිබෙනවා, මේ වැටුප් වර්ධනයත් එක්කම.

පළමුවතාවට තමයි වතුකරයේ - වතු ක්ෂේත්‍රයේ - සහ පෞද්ගලික අංශයේ වැටුප් මේ විධියට වැඩි වෙන්නේ. සේවා යෝජකයන්ගේ සංගමය වතුවල හාමිපුතුන් එක්ක කථා කරලා ගත්ත තීන්දු තීරණ එක්ක තමයි වතු කම්කරු ක්ෂේත්‍රයට සහ පෞද්ගලික අංශයට වැටුප් වර්ධනය වීමක් සහිතව මේ අය වැය ඉදිරිපත් කළේ. මෙවර එවැනි වේලාසන එකඟතාවක් අරගෙන තමයි මේ අය වැය ඉදිරිපත් කළේ. ඉස්සර අය වැයවලදී අපි දැකලා තිබෙනවා, පෞද්ගලික අංශයෙන් හෝ වතු කම්කරු ක්ෂේත්‍රයෙන් මෙවැනි ඉල්ලීමක් පමණයි කළේ කියලා. අතීතයේ මේ විධියට වැටුප් වැඩි කරලා යෝජනා ඉදිරිපත් වුණේ නැහැ.

ඒ වාගේම සමාජය තුළ වැඩි අවධානයක් නොලැබෙන කණ්ඩායම් වෙත අපි දැඩිව අවධානය යොමු කරලා තිබෙනවා. ඒ අතර ආබාධිත දරුවන්, අසරණ වෙච්ච දෙමාපියන්, දෙමාපියන් නොමැති දරුවන්, ආන්තික ප්‍රජාව මෙන්ම සිරකරුවන්, ඔටිසම් දරුවන් වාගේ හැම ක්ෂේත්‍රයක් ගැනම සැලකිල්ලට අරගෙන තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අපි පසුගිය කාලයේ දැක්කා පාසල්වල දරුවන් කෑම ටිකක් කන්න විධියක් නැතුව, ඒ දරුවන්ගේ පෝෂණ අවශ්‍යතාව සපුරා ගන්න විධියක් නැතිව කොච්චර දුක් විඳිනවාද කියලා. ඒවා දැකලා ගුරුවරු කොයි තරම් පීඩනයට පත් වුණාද? අපි දන්න අපේ ප්‍රදේශයේ පාසල්වල මත්ද්‍රව්‍ය සංසරණය වෙනවා කියලා ලැබුණු තොරතුරු අනුව ඒ ගුරුවරු පාසලේ දරුවන්ගේ බෑග් check කරන්න පටන් ගත්තා. ඒ බෑග් ඇතුළේ තිබුණු කෑම පෙට්ටි ඇරලා බැලුවාම සමහර අයගේ කෑම පෙට්ටිවල තිබුණේ හාල්මැස්සන් දෙතුන් දෙනෙක් එක්ක බත් ටිකක්, එක්කෝ බිත්තර පලුවක් එක්ක බත් ටිකක්, මුකුණුවැන්න මාළුවක් එක්ක බත් ටිකක්. බොහෝ දරුවන් කෑම ගෙනැල්ලා තිබුණේ නැහැ. මේ වාගේ පීඩනයකට පත් වෙච්ච රටාවක් තමයි තිබුණේ. දරුවන්ට කන්න දෙන්න විධියක් නැතිව දෙමාපියන් සියදිවි නසාගත්ත රටක් මේ රට. ඒ විතරක් නොවෙයි. දෙමාපියන්ගෙන් සියයට 14ක් දරුවන්ට කන්න දෙන්න එක වේලක් හෝ බඩගින්නේ ඉඳපු රටක් මේ රට. දරුවන්ගෙන් තුනෙන් එකක් මන්දපෝෂණ තත්ත්වයට පත්වෙලා තිබුණු රටක් මෙක. එහෙම රටක් ක්‍රමානුකූලව පොහොසත් රටක් බවට පත් කරන්න තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ අය වැය තුළ පාසල් දරුවන්ගේ පෝෂණ වැඩසටහන සඳහා රුපියල් බිලියන 32.1ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම පෙර පාසල් දරුවන්ට උදෑසන ආහාරය ලබා දීම සඳහා රුපියල් බිලියන දශම 95ක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ශිෂ්‍යාවන්ට සනීපාරක්ෂක තුවා ලබා දීම සඳහා බිලියන 1.4ක් වෙන් කර තිබෙනවා. එහෙම දවස් ගැහැනු දරුවෙකුට sensitive දවස් කිහිපයක්. ඔවුන් වෙනුවෙන් පවා මේ ආණ්ඩුව හිතලා ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි දුෂ්කර, අතිදුෂ්කර පාසල්වල, පිරිවෙන්වල ඉගෙන ගන්න ළමයින්ට සපත්තු ලබා දීමට බිලියන 2.5ක් වෙන් කර තිබෙනවා. වෙනත් රටවල් හා එක්ව සිදු කරන ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කර තිබෙනවා. අපේ රටේ දරුවන්ට ගෝලීයකරණයත් එක්ක ලෝකය දිනා ගන්න නම් කුසලතා, ආකල්ප, තාක්ෂණය, නවෝත්පාදනය සඳහා අවශ්‍ය දැනුම ලෝකයේ අනෙක් රටවලින් ලබා ගන්න අවශ්‍යයි. අපේ රටේ දරුවන් ඒ රටවලට ගිහිල්ලා ඉගෙන ගෙන, ඒ දැනුම අපේ රටට අරගෙන ඇවිල්ලා අපේ දරුවන් එක්ක ඒ දැනුම බෙදා ගෙන මේ රට දියුණු කළ යුතුයි. ඒ නිසා දරුවන් ගැන හිතලා අපි ඒ වාගේ තීරණ ආණ්ඩුව විධියට අරගෙන තිබෙනවා.

දරුවන්ට කන්න, අඳින්න දෙන්න විධියක් නැතුව දෙමව්පියන්ගේ රත්තරන් බඩු උකස් තියපු රටක් මෙක. එහෙම අයට සහන සැලසීම සඳහා බිලියන 0.5ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. රටක ආර්ථිකය නගා සිටුවීමේදී නිෂ්පාදන කර්මාන්ත කියන්නේ විශාල සේවයක් කරන අංශයක්. අපේ රටේ ව්‍යවසායකයන් සියයට 2.8ක් වැනි ඉතා පොඩි ප්‍රමාණයක් තමයි ඉන්නේ. මොකද, ඒ risk එක ගන්න මිනිස්සු හරිම බයයි. ලංකාව වාගේ රටක එහෙම risk එකක් ගත්තාම, එම ව්‍යාපාර පවත්වා ගෙන යෑමේදී විවිධ ආකාරයේ බාධා එල්ල වෙනවා. ඒ නිසා අපි ඒවා තේරුම් අරගෙන රටේ ආර්ථික සහ සේවා ව්‍යවසායකත්වය වෙනුවෙන් බිලියන 99ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ආයෝජන ආකර්ෂණය සඳහා බිලියන 2.4ක් වෙන් කර තිබෙනවා. අපි දැක්කා, පසුගිය කාලය පුරාම ලංකාවට

ආයෝජකයෝ පැමිණි හැම අවස්ථාවකදීම මේ රට ගැන තිබුණු ප්‍රතිරූපය නිසා ඔවුන්ට එම ආයෝජන අවස්ථා මේ රට තුළ ස්ථාපිත කරන්න තිබුණු අවස්ථාව නැතුව ගියා. සමහර මැති-ඇමතිවරුන්ගේ නම් ඉස්සරහින් ඔවුන්ට ඕනෑ කරන percentage එක ලියා තිබුණා. ඒ නමින් තමයි ඔවුන් හඳුන්වා ගත්තේ. "Mr. Ten Per Cent"ලා පාලනය කරපු රටක් මේක. ඒ නිසා මේ රටට ආයෝජන ගෙන එන්නට පැමිණි ආයෝජකයන් රට තුළ ඒ ආයෝජන කරන්නේ නැතිව ආපසු හැරී යන්න ගියා.

මෙවර අය වැයෙන් ආයෝජකයන්ගේ ආකර්ෂණය සඳහා රුපියල් බිලියන 2.4ක් වෙන් කර තිබෙනවා. ලෝකයේ අනෙක් රටවලට පණිවුඩයක් ගිහින් තිබෙනවා, ලංකාව දැන් වෙනස්, rebrand වෙලා කියලා. වංචාව, දූෂණය, නාස්තිය, රක්ෂාව කරගත් පාලක පෙළැන්තියකින් මේ රට මුදා ගෙන සැබෑ වුවමනාවක් තිබෙන නායකයන් අතට මේ රටේ බලය පත් වුණාය කියන පණිවුඩය ලෝකයේ අනෙක් රටවලට යනවාත් එක්කම, ආයෝජන අවස්ථා ලංකාවට ළඟා වුණා. ඒ වාගේම නතර කර තිබුණු ව්‍යාපෘති 11ක් මේ වෙනකොට ජපානයෙන් නැවත ලංකාවට ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අලුත් කර්මාන්තපුර ඇති කිරීමට සහ දැනට තිබෙන කර්මාන්තපුර 32ක යටිතල පහසුකම් වැඩිදියුණු කරන්නට රුපියල් බිලියන 1.5ක් වෙන් කර තිබෙනවා. අපේ නිෂ්පාදන ආර්ථිකයට ශක්තියක් වන එක පුරුකක් තමයි මේ කර්මාන්තපුර.

මට මතකයි, මීට පෙර හිටපු එක කර්මාන්ත ඇමති කෙනෙක් කර්මාන්තපුරයකට ඇවිල්ලා කිව්වා, "ආයෝජකයෝ කියන්නේ, ව්‍යවසායකයෝ කියන්නේ සල්ලි තිබෙන මිනිස්සු. ඔය ගොල්ලන් ඔය ගොල්ලන්ගේ කර්මාන්ත දියුණු කරගන්න, ඒවා රටට බරක් කරන්න එපා. කර්මාන්ත අමාත්‍යාංශයේ සල්ලි නැහැ. ඔය ගොල්ලන් ඔය ගොල්ලන්ගේ වැඩ කරගන්න, ඔය ගොල්ලන් ඔය ගොල්ලන්ගේ පාරවල් හදාගන්න" කියලා. නමුත් අපේ ආණ්ඩුව කර්මාන්තකරුවන් ගැන හිතලා ඒ ආයෝජන කලාප දියුණු කිරීම වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. සාමාන්‍යයෙන් කර්මාන්තපුරයකට අවශ්‍ය ඉඩමක් මිලදී ගැනීමේදී ඒකට අදාළ deed එක ගන්න ආයතන ගණනාවකට ෆයිල් මීටි ඔසවා ගෙන ගිහින් රස්තියාදු වෙන ව්‍යවසායකයන් මේ රටේ ඉන්නවා.

ඒ ආයතන එකකට එකක් link කරලා නැහැ. එක වෙලාවකට ෆයිල් එක අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යනවා. තව වෙලාවකට කර්මාන්ත අමාත්‍යාංශයට යනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ලැබී තිබෙන කාලය අවසන්.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විධියට ආයෝජකයන්ට නව භාණ්ඩ හා සේවා සපයන්න අලුතින් හිතන්න තිබෙන කාලය නිරපරාදේ රස්තියාදු වෙච්ච යුගයක් තමයි අපි හමාර කළේ. රට ඩිජිටල්කරණය කිරීම හරහා මේ අයහපත් තත්ත්වයෙන් මිදිලා ව්‍යාපාර කරගෙන යන්න අපට අවස්ථාව ලැබෙනවා. ඒ නිසා කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා රුපියල් බිලියන 7.9කුත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධනයට රුපියල් බිලියන 38.6කුත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වන ණය යෝජනා ක්‍රමයකට රුපියල් බිලියන 6.8කුත් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ව්‍යාපාරයක් කරන ආයෝජකයෙක් බැංකුවකට ගිහිල්ලා ණයක් ගනිද්දී ඔහුගේ security එක ලෙස ඔහුට තිබෙන වත්කම් ප්‍රමාණයයි බැංකුවෙන් බලන්නේ. එහෙම දෙයක් බලන්නේ නැතුව ඔවුන්ගේ ව්‍යාපෘතිවලට ණය ගැනීමේ යෝජනා ක්‍රමයක් අපි මේ අය වැයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ජාතික ගම්මාන සවිබල ගැන්වීම, සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම වෙනුවෙන් අපි මුදල් වෙන් කරලා තිබෙනවා. බඩගින්නට මාළුවෙක් දෙනවා වෙනුවට බිළී පිත්තක් දීලා ආර්ථිකයත් ශක්තිමත් කරගෙන, බඩගින්නත් නිවාගන්න පුළුවන් ක්‍රමයක් තමයි මේ අය වැයෙන් අපි සකස් කරලා තිබෙන්නේ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වෙනුවෙන් අපි මේ ඉදිරිපත් කර තිබෙන අය වැයට අපේ රටේ සුවහසක් ජනතාවගේ ශුභාශිංසන එකතු කරලා තිබෙනවා. විපක්ෂයේ කණ්ඩායම්වල තිබෙන මැසිවිලි, අඳෝනා, කෙඳිරිලි සියල්ලක්ම ඉවත් කරලා මෙවන් හොඳ අය වැයක් වෙනුවෙන් ජනතාව සහයෝගය ලබා දෙයි කියලා අපි හිතනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ඩී. සූරියබණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.46]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය විසින් 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ මංගල අය වැයෙහි දෙවැනි වර කියැවීමේ විවාදයේදී අදහස් එක් කරන්නට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා.

ඇත්තටම මීට ස්වල්ප මොහොතකට පෙර මේ සභාව ආමන්ත්‍රණය කරපු ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ පරිදිම රටේ බහුතර ජනතාව අපේ රජයේ මේ අය වැය පිළිබඳව ඉතාම තෘප්තිමත්ව -ප්‍රසාදයකින්- කථා කරනවා. අපේ රජයේ වැඩ පිළිවෙළ පිළිබඳව ඉතාම සුබවාදීව කථා කරනවා අපට ඇහිලා තිබෙනවා. නමුත්, මේ උත්තරීතර සභාව නියෝජනය කරන විපක්ෂයේ මහජන නියෝජිතයන් වරින් වර විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලටත්, ඒ වාගේම මේ උත්තරීතර සභාව තුළදීත් ප්‍රකාශ කරන කරුණුවලට අවධානය යොමු කළොත්, එතුමන්ලා ප්‍රකාශ කරන්නේ කුමක්ද කියන එක ඇත්තටම තේරුම් ගන්න හරි අමාරුයි. විශේෂයෙන්ම එතුමන්ලා උත්සාහ කරනවා, අපි ඉදිරිපත් කරපු මේ අය වැයට model එකක් දෙන්න. මෙය, ධනවාදී අය වැයක් කියන අර්ථනිරූපණය දෙන්නත් ඒ අය උත්සාහ කරනවා.

ඒ වාගේම මේ අය වැය ජනතාවාදී අය වැයක් නොවෙයි කියන අදහසත් මේ ගරු සභාව තුළ ප්‍රකාශ කරන්න විපක්ෂය උත්සාහ කරනවා. නමුත් මට කාරණයක් කියන්න තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතුමන්ලා දන්නවා, අපි ඉදිරිපත් කරපු මේ මංගල අය වැය ඉතාම සාර්ථක අය වැයක්, ජනතාවට සහන රාශියක් ඒ මඟින් ලැබෙනවා කියන එක. ඔවුන් නොකියා කියන්නේ අන්න ඒ කාරණයයි.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා]

මෑතකදී ගරු ජනාධිපතිතුමා චීනයේ කළ සංචාරයේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 3.7ක ඍජු විදෙස් ආයෝජනයකට ගිවිසුම්ගත වුණා. ඒ අවස්ථාවේදී විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් ලංකාවේ ඉඳන් ප්‍රකාශ කළා, එතුමන්ලා අත්සන් කරන්න සිටි ආයෝජන ගිවිසුමකටයි ගරු ජනාධිපතිතුමා අත්සන් කළේ කියලා. ඒ කියන්නේ සෑම සුබවාදී දෙයකදීම, සෑම හොඳ කටයුත්තකදීම ඒක අපෙන් අරගෙන, එය ඔවුන්ගේ දෙයක් බවට වූ මතයක් පළ කරන්න විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් උත්සාහ කරනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය, නැත්නම් යථාර්ථය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයේදී තිබෙන සීමිත කාල සීමාවත් එක්ක සම්පූර්ණ අය වැය පිළිබඳවම අදහස් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ නිසා මම ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව මගේ අදහස් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් බොහෝ පිරිසක් මේ ගරු සභාවේදී කථා කළා, අදහස් ප්‍රකාශ කළා. ඒ කථාවලදී ඒකේ ගුණ-අගුණ පිළිබඳව අපට ඇඟුම්කන් දෙන්න පුළුවන් වුණා. විශේෂයෙන්ම මම කථා කරන්න යන්නේ විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩිවීම සම්බන්ධවයි. අපි කවුරුත් දන්නවා, ආර්ථික අර්බුදයත් එක්ක පසුගිය කාලයේ විශ්‍රාමිකයින් විශාල පීඩනයකට ලක් වෙලා සිටි බව. විශේෂයෙන්ම 2020 වර්ෂයට ප්‍රථම විශ්‍රාම ගිය විශ්‍රාමිකයින් බහුතරයක් ගත්ත ඒ සොච්චම් විශ්‍රාම වැටුපෙන් තම ජීවිකාව ගෙන යන්න ඔවුන් ලොකු සටනක් කරගෙන ගියා. මෙවර අය වැයෙන් 2020 වර්ෂයට කලින් ඔවුන් ලබා ගත් විශ්‍රාම වැටුප වැඩි කරලා, 2020 වර්ෂයේ වැටුප් තලයට එම විශ්‍රාම වැටුප රැගෙන ඒම තුළින් ඔවුන්ට විශාල සහනයක් ලැබිලා තිබෙනවා කියන එකත් මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ තිබුණු යුද්ධය 2009 වර්ෂයේදී අවසාන වුණාට පස්සේ දේශපාලනයේ ලොකු ප්‍රවණතාවක් ඇති වුණු බව අපි දැක්කා. රණවිරුවන් සම්බන්ධයෙන් හිටපු දේශපාලකයෝ ලොකුවට කථා කළා. රණවිරුවන් මාර්කට් කරලා ඡන්ද ලබාගෙන මැතිවරණ ජයග්‍රහණය කරගෙන බලය තහවුරු කර ගත් කාල සීමාවක් පසුගිය කාලයේ තිබුණා. ඒ වාගේම අපි දැක්කා, විශ්‍රාමික හමුදා නිලධාරීන් ආරක්ෂක ලේකම්වරුන් වශයෙන් පත් වෙනවා. ඒ වාගේම විශ්‍රාමික හමුදා නිලධාරීන් ජනාධිපතිවරුන් වශයෙන් පත් වෙනවා. ඒ වාගේම මට මතකයි, 2019 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයට කලින්, කොටුවේ පැවති ආබාධිත සෙබළුන්ගේ උද්ඝෝෂණයකදී, පසුව ආරක්ෂක ලේකම්වරයෙක් බවට පත් වුණු එක්තරා හමුදා නිලධාරියෙක් ගිහිල්ලා පොරොන්දුවක් දුන් බව, බලය ලබා ගත්තාට පස්සේ ඔවුන් සම්බන්ධයෙන් සොයා බලනවා, ඔවුන්ට සහන දෙනවා කියලා. නමුත් ඇත්තටම කියන්න කනගාටුයි, රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින් වාගේම අපේ විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයිනුත් පසුගිය කාලයේ විශාල පීඩනයකට ලක් වෙලා සිටියා. ඔවුන් රටට විශාල සේවයක් කරපු පිරිසක්. පසු කාලීනව ඔවුන්ට ඒ විශ්‍රාම වැටුපෙන් ජීවත් වෙන්න බැරි නිසා, කුලී වැඩ කරන තත්ත්වයට පවා ඔවුන් පත් වෙලා තිබුණා. ඒ වාගේම තමයි, පසුගිය ජනාධිපතිවරණය කාලයේදී විපක්ෂයේ එක්තරා ජනාධිපති අපේක්ෂයෙක් විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ඉලක්ක කරගෙන ඔවුන්ට පොරොන්දුවක් ලබා දීලා තිබුණා, ඔවුන් බලයට ආවොත් "One Rank, One Pension" කියන concept එක ක්‍රියාත්මක කරනවා කියලා.

මම දැක්කා, ඔවුන් ඒ සඳහා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන් එක්ක ගිවිසුම්ගත වෙනවා. ඒ අවස්ථාවේ අපටත් නොයෙක් යෝජනා ඉදිරිපත් වුණා. අපටත් කිව්වා, විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට කියන්න කියලා අපි ආවාට පස්සේ මෙහෙම වරප්‍රසාද දෙන්න පොරොන්දු වෙන්න කියලා. නමුත්, අපේ කිසිම කෙනෙක් ඒ වාගේ පොරොන්දුවක් දෙන්න ගියේ නැහැ. මොකද, ජනතාවාදී දේශපාලනයක් කරන දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් අපි හැම වෙලාවේම කල්පනා කරන්නේ, හැම වෙලාවේම කරන්නේ ජනතාවට හොඳ දෙයක්.

මට මතකයි, ජනාධිපති අපේක්ෂකයෙකු වශයෙන් සිටියදී ගරු අනුර කුමාර දිසානායක මහතා 2024 අගෝස්තු මාසයේ 04වෙනි දා මාළිගාවත්ත පී.ඩී. සිරිසේන ක්‍රීඩාංගණයේ පැවති විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ ජාතික සමුළුවේදී විශේෂ ප්‍රකාශයක් කළ බව, අපේ විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට ආත්ම ගෞරවයෙන් යුතුව ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් හදනවා කියලා. ඒ ආත්ම ගෞරවයෙන් යුතුව ඔවුන්ට හොඳින් ජීවත් වෙන්න පුළුවන් පරිසරය ඇත්තටම අපි මෙවර අය වැයෙන් නිර්මාණය කර දීලා තිබෙනවා. ඒ අනුව අර "One Rank, One Pension" කියන concept එක අපි මේ අය වැයෙන් යථාර්ථයක් බවට පත් කළා.

ඒ වාගේම තව කරුණු දෙකක් පිළිබඳව මට කථා කරන්න අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා නියෝජනය කරන්නේ කුලියාපිටිය ආසනයේ ජනතාව. කුලියාපිටිය ආසනයේ බහුතරයක් ඉන්නේ කෘෂි කර්මාන්තය ආශ්‍රිතව ජීවිකාව ගෙන යන ජනතාව. කෘෂි කර්මාන්තයට අදාළව ඔවුන්ට ඇතිවන ගැටලු අපි දැකලා තිබෙනවා. පසුගිය කාලයේ කෘෂි කර්මාන්තයට අවශ්‍ය වැව් අමුණුවල කිසිම නඩත්තුවක් කරලා නැහැ. මෙවර අය වැයෙන් අපි රුපියල් බිලියන 254ක් වෙන් කරලා තිබෙනවා, කෘෂි කර්මාන්තය නහාසිටුවීම සඳහා. විශේෂයෙන්ම අපි බලාපොරොත්තු වෙනවා, අත්හැර දමා තිබෙන සුළු, මධ්‍ය සහ මහ වැව් ප්‍රතිසංස්කරණය කරන්නට. ඒ යටතේ මසුරන්කෝට්ටේ වැව ප්‍රතිසංස්කරණය කරලා ජනතාවට එහි ප්‍රතිලාභ ලබා දෙන්නට අවශ්‍ය වැඩ කටයුතු අපි කරනවා. ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමු කර තිබෙනවා.

ඒ වාගේම තමයි, සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල බරක් මේ අය වැයෙන් අපි දරා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරනකොට කුලියාපිටිය ආසනයේ තිබෙන රෝහල්වල විශාල අඩුපාඩු පවතින බව අපි හඳුනාගෙන තිබෙනවා. ඉදිරියේදී එම අඩුපාඩු සම්පූර්ණ කරන්නටත් අපි පියවර ගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුලියාපිටිය ආසනයේ තිබෙන ශික්ෂණ රෝහල, නාමිකව ශික්ෂණ රෝහලක් බවට පත් කරලායි තිබෙන්නේ. එහි තවත් බොහොමයක් සම්පත් සහ යටිතල පහසුකම් දියුණු කරන්න අවශ්‍යයි. අපි ඒවා හඳුනාගෙන

තිබෙනවා. මෑතකදී එම රෝහලේ සංචාරය කිරීමේදී මට ඒවා දැකගන්නට ලැබුණා. ඇත්තටම ඒ අඩුපාඩු පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යතුමා දැනුවත් කරලා, සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කඩිනමින් ඒ අවශ්‍යතා සම්පූර්ණ කර දෙන්න අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම phacoemulsifier machine එකක්, anaesthesia machines දෙකක්, ambulances, තවත් වාට්ටු සංකීර්ණයක් වාගේ එම ශික්ෂණ රෝහලට අවශ්‍ය පහසුකම් ක්‍රමානුකූලව වැඩිදියුණු කරන්නට කටයුතු කළ යුතු වෙනවා. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගන්නවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි සැලසුම් කරපු ඉලක්කගත වැඩ පිළිවෙළක් තිබෙනවා. මේ අය වැයෙන් අපි ඒ ඉලක්කය මහ හැරලා නැහැ. ඒ ඉලක්ක කරා අපි ගමන් කරනවා. මේක ආරම්භය පමණයි. අපට තව අවුරුදු 5ක කාල සීමාවක් තිබෙනවා. ඒ අවුරුදු 5ක කාලය තුළ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ඉලක්ක කරා ගමන් කරලා රටේ ජනතාවට ජීවත් වෙන්න සුදුසු පරිසරයක් නිර්මාණය කරනවා කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් ලැබෙනවා.

[ප.ප. 4.58]

ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, දේශීය මක්කළ් ශක්ති අරසාංගත්තාල් මුන්වෛක්කප්පට්ටුළ්ළ 2025ආම් ආණ්ඩුක්කාන වරවු සෙලවුත්තිට්ටත්තින් ඉරණ්ඩාම් මතිප්පීටු මීතාන විවාතත්තිල් කලන්තුකොණ්ඩු කරුත්තුක්කළෛ මුන්වෛප්පතිල් අකමකිළ්වු අටෛකින්රේන්. ඉන්ත නාට්ටු මක්කළ් පයන්පෙර වේණ්ඩුමෙන්ර නෝක්කිල්, පල තරප්පට්ට නිකළ්ච්චිත්තිට්ටංකළෛ උළ්ළටක්කි ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තෛ අරසාංකම් මුන්වෛත්තිරුක්කිරතු. ඉතිල් පල විටයංකළ් උළ්ළටක්කප්පට්ටු ඉරුක්කින්රන. කුරිප්පාක, මලෛයක මක්කළුක්කුම් වට මාකාණ මක්කළුක්කුම් කූටුතලාන නිති ඔදුක්කීටු සෙය්යප්පට්ටු ඉරුක්කින්රතු. අතර්කාක ඉන්ත අරසාංකත්තුක්කු එනතු නන්රියෛත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්.

කිළක්කු මාකාණත්තින් අම්පාරෛ මාවට්ටත්තෛප් පිරතිනිත්තුවප්පටුත්තියේ නාන් ඉන්තප් පාරාළුමන්රත්තුක්කු වරුකෛ තන්තිරුක්කින්රේන්. නාන් චාර්න්ත පිරතේචම් විවචායම්, කටර්කොළිල් මේර්කොළ්ළප්පටුකින්ර පාරිය පිරතේචමාකුම්. ඉන්ත නාට්ටින් මොත්ත නෙල් උර්පත්තියිල් 1/4 පංකෛ වකික්කින්ර එමතු මාකාණම්, ඉන්ත නාට්ටින් තේචිය උර්පත්තික්කු 35 චතවීතමාන පංකළිප්පෛ වළංකුකින්රතු. චේනානායක්ක චමුත්තිරත්තින් නීර් වළංකලෛක්කොණ්ටේ අංකු විවචායම් මේර්කොළ්ළප්පටුකින්රතු. චේනානායක්ක චමුත්තිරත්තින් නීර් නේරටියාක කටලුක්කුච් චෙන්රුවිටාමල්, ඉරණ්ටු පෝකංකළුම් විවචායම් චෙය්යක්කූටිය වකෛයිලාන ඔරු වේලෛත්තිට්ටම් ඉන්තප් පාතීට්ටිල් උළ්ළටක්කප්පට්ටු ඉරුක්කින්රතා? එන්පතෛ නාන් ඉන්තච් චපෛයිල් කේට්ක විරුම්පුකින්රේන්. ඒනෙනිල්, ඒර්කෙනවේ මූන්රු තටවෛ චේනානායක්ක චමුත්තිරත්තිලිරුන්තු නීරෛ වෙළියේර්රියතන් මූලම් අන්තප් පිරතේචත්තිලුළ්ළ විවචාය මක්කළ් කූටුතලාකප් පාතිප්පුක්කු උළ්ළාකි ඉරුක්කින්රනර්. එනවේ, අංකුළ්ළ විවචායිකළුක්කුත් තේවෛයාන වේලෛත්තිට්ටංකළෛච් චෙය්තු කොටුක්කවේණ්ටිය කටමෛප්පාටු ඉන්ත අරචාංකත්තුක්කු ඉරුක්කින්රතු.

කිළක්කු මාකාණමානතු පාරිය නිලප්පරප්පෛක්කොණ්ට ඔරු පිරතේචමාකුම්. පාණමෛ තොටක්කම් පුල්මෝට්ටෛ වරෛ චුමාර් 10,000 චතුර කිලෝමීර්රර් පරප්පළවු නිල වළත්තෛ අතු කොණ්ටුළ්ළතු. ඉන්ත නාට්ටුක්කු වරුමානත්තෛප් පෙර්රුක්කොළ්වතර්කාක ඉන්තප් පිරතේචත්තෛප් පයන්පටුත්ත වේණ්ටිය කට්ටාය තේවෛප්පාටු ඉරුක්කින්රතු. කුරිප්පාක, විවචායම්, මීන්පිටියෛ මෛයප්පටුත්ති, ඉන්තප් පිරතේචත්තිල් පල්වේරු වේලෛත්තිට්ටංකළෛ මුන්නෙටුප්පතර්කු වාය්ප්පු ඉරුක්කින්රතු. කිළක්කු මාකාණත්තිල් පාරිය ඉරණ්ටු තුරෛමුකංකළ් කාණප්පටුකින්රන. ඔන්රු, තිරුකෝණමලෛ තුරෛමුකම්. මර්රෛයතු, ඔළුවිල් තුරෛමුකම්. ඔළුවිලිල් වර්ත්තක රීතියාන තුරෛමුකමොන්රු අමෛක්කප්පට්ටුළ්ළතුටන්, මීන්පිටිත් තුරෛමුකමොන්රුම් අමෛක්කප්පට්ටුළ්ළතු. ආනාල්, ඉන්රුවරෛ අන්ත ඉරණ්ටු තුරෛමුකංකළුම් කෛවිටප්පට්ට නිලෛයිලේයේ කාණප්පටුකින්රන. චිරිතු කාලම් අන්ත මීන්පිටිත් තුරෛමුකම් ඉයංකි වන්තාලුම්, අංකු කටල් මණ් කුවින්තිරුප්පතාල් අතු පාතිප්පටෛන්තු ඉන්රුවරෛ චෙයලිළන්තු කාණප්පටුකින්රතු. ඉන්තත් තුරෛමුකත්තිනූටාක නේරටියාක නන්මෛයටෛන්තු වන්ත 15,000ක්කුම් මේර්පට්ට කුටුම්පංකළ් ඉන්රු අතෛ ඉළන්තිරුක්කින්රන. අංකු ඉටම්පෙරුම් කටලරිප්පු කාරණමාක කරෛයෝරත්තිල් ඉරුක්කින්ර චාතාරණ මීන්පිටි මක්කළුම් පාතික්කප්පට්ටු ඉරුක්කින්රාර්කළ්. ඉවර්රෛච් චරිචෙය්වතර්කු ඉන්තප් පාතීට්ටිල් නිති ඔදුක්කප්පට්ටුළ්ළතා? එන නාන් කේට්ක විරුම්පුකින්රේන්.

ඉන්තප් පිරතේචත්තිල් කාණප්පටුකින්ර අතිකමාන කාණිකළ් Archaeology Department, Forest Department, Wildlife Conservation Department මර්රුම් පාතුකාප්පුත් තරප්පිනරාල් කෛයකප්පටුත්තප්පට්ටු ඉරුක්කින්රන. ඉතනාල් අවර්රිල් පයිර්ච්චෙය්කෛ පණ්ණමුටියාත නිලෛමෛ කාණප්පටුකින්රතු. කුරිප්පාක, පොත්තුවිල් පිරතේචත්තිල් ඉරුක්කින්ර අව්වාරාන කාණිකළ් විවචායච් චෙය්කෛක්කුත් තටෛයාකක් කාණප්පටුකින්රන. එනවේ, අන්තක් කාණිකළෛ උටනටියාක කාණිච් චොන්තක්කාරර්කළුක්කු වළංක වේණ්ටුම්. යුත්ත කාලත්තුක්කු මුන්නර්, ඉන්තක් කාණිකළ් පොතුමක්කළාල් පයන්පටුත්තප්පට්ටවෛ. මුප්පතු වරුට කාල යුත්තත්තුක්කුප් පින්නර්, කෛවිටප්පට්ටිරුන්ත අන්තක් කාණිකළිල් පාරිය මරංකළ් වළර්න්තිරුන්තතනාල් අවර්රෛ අරචාංකම් කාටාක gazette පණ්ණියිරුක්කිරතු. අන්තක් කාණිකළෛ විටුවික්කින්ර වේලෛත්තිට්ටංකළෛ අරචාංකම් චෙය්ය වේණ්ටුම්. අවර්රෛ මක්කළිටම් කෛයළිත්තාල්, අන්තප් පිරතේචත්තිල් ඉන්නුම් කූටුතලාක විවචායච් චෙය්කෛයෛ මේර්කොළ්ළ මුටියුම්.

අටුත්තු, පොත්තුවිල් පිරතේච මක්කළුක්කුක් කුටිනීරෛප් පෙර්රුක්කොටුක්කක්කූටිය ෂොට ඔයා කුටිනීර් තිට්ටත්තෛ නටෛමුරෛප්පටුත්තුවතාක මික නීණ්ට කාලමාක චොල්ලප්පට්ටු වරුකින්රතු. ඔව්වෝර් අරචාංකමුම් ඉතනෛච් චෙය්වතාක පේච්චළවිල් චොල්ලි වරුකින්රතේ තවිර, ඉන්නුම් අතර්කාන වේලෛකළ් ආරම්පික්කප්පටවිල්ලෛ. ඉන්තත් තිට්ටත්තෛ නටෛමුරෛප්පටුත්තුවතන්මූලම් ඉරණ්ටු තරප්පිනර් නන්මෛ අටෛවාර්කළ්. ඔන්රු, පොත්තුවිල් පිරතේචත්තුක්කු වරුකින්ර

[ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා]

සුර්‌ුලාප් පයණිකළ්. අදුත්තු, අංකුළ්ළ මක්කළ්. ඒනෙනිල්, අවර්කළුක්කු අංකු කුඩිනීර් පිරච්චිනෙ කාණප්පටුකින්රතු. ஹෙඩ ඔයා කුඩිනීර් තිට්ටත්තින්මූලම් ඉන්තප් පිරච්චිනෙයෙත් තීර්ප්පතර්කු වාය්ප්පු ඉරුක්කින්රතු.

එංකළුටෙය පිරතේසත්තිලුළ්ළ අතිකමාන මක්කළින් වාළ්වාතාරමාක නන්නීර් මීන්පිඩිත් තොළිල් කාණප්පටුකින්රතු. ඉතිල් කුළංකළ් මුක්කිය පංකු වකික්කින්රන. කටන්ත කාලංකළිල් තිණෙක්කළංකළ් අවර්කළුක්කු මීන් කුඤ්චකළෙ වළංකි ඉරුන්තපෝතිලුම්, තර්පොළුතු අතු කුරෙවාකවේ කාණප්පටුකින්රතු. පොත්තුවිල් පිරතේසත්තිල් ඉරුක්කින්ර සිරිය කුළංකළෙත් තුප්පුරවු සෙය්තාල්, අවර්රිල් නන්නීර් මීන්පිඩිත් තොළිලෙ මේර්කොළ්වතර්කු වාය්ප්පු ඒර්පටුම්.

එංකළුටෙය පිරතේසත්තිල් උට්කට්ටමෙප්පු වසතිකළ් චාර්න්තු පල්වේරු තේවෙකළ් කාණප්පටුකින්රන. කුරිප්පාක, චම්මාන්තුරෙ පිරතේසත්තෙ අණ්ඩියිරුක්කින්ර සිරිය කිරාමංකළාන නෙනාකාටු, මජීත්පුරම්, වළත්තාප්පිට්ටියිලුම් නාවිතන්වෙළි, පොත්තුවිල්, අට්ටාළෙච්චේනෙ ආකිය පිරතේසංකළිලුළ්ළ වීතිකළෙ අපිවිරුත්ති සෙය්යවේන්ටිය තේවෙ ඉරුක්කින්රතු. මේලුම්, වෙළ්ළප්පෙරුක්කාල් අතික පාතිප්පුක්කු උට්පටුකින්ර කිට්ටංකිප් පාලත්තෙයුම් මාවට්ටප්පළ්ළිප් පාලත්තෙයුම් පුනරමෙක්කවේන්ටිය තේවෙ ඉරුක්කින්රතු. කටන්ත කාලත්තිල් ඉන්තප් පාරාළුමන්රත්තිලුම් ඉතු චම්පන්තමාකප් පේචප්පට්ටතු. කාරණම්, කොළුම්පු, යාළ්ප්පාණම්, තෙන් මාකාණම් පෝන්ර තූර ඉටංකළිල් ඉරුන්තු කිළක්කු මාකාණත්තින් අම්පාරෙක්කු වරුකින්රවර්කළිල් අතිකමානවර්කළ් ඉන්ත ඉරණ්ටු පාලංකළෙයුම් කටන්තේ වර වේන්ටුම්.

අටුත්තු, එංකළුටෙය පිරතේසත්තිලුළ්ළ සුකාතාරත් තේවෙකළ් පර්රිච් චොල්ල වේන්ටුම්. අංකු වෛත්තියචාලෙකළ් ඉරුක්කින්රන. එනිනුම්, අවර්රිල් උළ්ළකත් තේවෙකළ් අතිකමාකක් කාණප්පටුකින්රන. ඉතනෙක් කවනත්තිල් එටුක්ක වේන්ටුම්. ඉතර්කුරිය නිති ඉන්තප් පාතීට්ටිල් ඔතුක්කප්පට්ටු ඉරුක්කින්රතා? එන නාන් ඉව්විටත්තිල් කේට්ක විරුම්පුකින්රේන්. අතේපෝන්රු, අංකිරුක්කින්ර තේචිය පාටචාලෙකළිලුම් මාකාණප් පාටචාලෙකළිලුම් 50-60 වරුටංකළුක්කු මුන්නර් කට්ටප්පට්ට මිකවුම් පළමෙවාය්න්ත කට්ටිටංකළේ කාණප්පටුකින්රන. අත්තෝටු, අවර්රුක්කු උළ්ළකක් කට්ටමෙප්පුකළුම් තේවෙයාක ඉරුක්කින්රන.

අටුත්තු, එංකළුටෙය පිරතේසත්තිල් ඉරුක්කින්ර තෙන්කිළක්කුප් පල්කලෙක්කළකම් පර්රික් කූර වේන්ටුම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(මාණ්පුමිකු එම්.ඒ.එම්. තාහිර්)
(The Hon. M.A.M. Thahir)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

අංකු මරුත්තුව පීටමොන්රෙ අමෙත්තුත් තරුවතාක මික නීණ්ට කාලමාක ඔව්වෝර් අරචාංකමුම් වාක්කුරුති අළිත්තු වරුකින්රතු. ආනාල්, ඉතුවරෙ අතු අමෙක්කප්පටවිල්ලෙ. ඉන්තප් පාතීට්ටිල් අතු උළ්වාංකප්පටුම් එන්ර එතිර්පාර්ප්පු ඉරුන්තපෝතිලුම්, අප්පටි නටක්කවිල්ලෙ. එංකළුටෙය පිරතේසම් විවචායත්තුක්කුප් පෙයර්පෝන පිරතේසමාක ඉරුප්පතනාල්, ඉන්තප් පල්කලෙක්කළකත්තුක්කු විවචාය පීටමොන්රෙප් පෙර්රුක්කොටුක්කුමාරු නාන් ඉන්තච් චන්තර්ප්පත්තිල් කේට්ටුක් කොළ්කින්රේන්.

කිළක්කු මාකාණත්තිල් චුර්‌ුලාත්තුරෙයෙ මේම්පටුත්තුවතර්කාක අංකු පෝක්කුවරත්තු වචතිකළෙ විස්තරික්කවේන්ටිය තේවෙ ඉරුක්කින්රතු. අතන් අටිප්පටෙයිල්, මට්ටක්කළප්පු වරෙ ඉරුක්කින්ර පුකෙයිරත චේවෙයෙ අරුකම්පෙ වරෙ නීටික්ක වේන්ටුමෙනක් කේට්ටුක්කොළ්කින්රේන්.

අත්තෝටු, මට්ටක්කළප්පු පුකෙයිරත නිලෙයත්තිලිරුන්තු මක්කළ් තංකළතු වීටුකළුක්කුච් චෙල්වතර්කු ඒර්ර වකෙයිල්, පොත්තුවිල් වරෙ පෝක්කුවරත්තු වචතිකළෙ ඉලංකෙ පෝක්කුවරත්තුච් චපෙ - SLTB - චෙය්තු කොටුක්ක වේන්ටුම්. මාණ්පුමිකු චනාතිපතියාල් මුන්නෙටුක්කප්පටවුළ්ළ තිට්ටත්තින්කීළ් අතර්කාන පස්කළෙප් පෙර්රුක්කොටුක්කුමාරු කේට්ටුක්කොළ්කින්රේන්. එමතු මාකාණත්තිල් චුර්‌ුලාත්තුරෙ චාර්න්ත ඉටංකළ් අතිකමාක ඉරුක්කින්රන. අවර්රෙක් කවනත්තිර්කොණ්ටු, එංකළුටෙය මාකාණත්තුක්කු මේලතික නිතියෙ ඔතුක්කුමාරු කේට්ටුක්කොළ්කින්රේන්. ඉන්තිය අරචාංකත්තාලුම් නිති වළංකප්පටවුළ්ළතු. අතනෙයුම් ඉණෙත්තු කූටුතලාන නිතියෙ වළංකුමාරු කේට්ටු, වාය්ප්පළිත්තමෙක්කු නන්රි කූරි විටෙපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.08]

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු චම්පික හෙට්ටිආරච්චි)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ නොහොත් අපේ ආණ්ඩුවේ මංගල අය වැය වෙනුවෙන් කථා කරන්න ලැබීම භාග්‍යයක් කොට සලකනවා. ඒ වාගේම මේ අය වැය කියන්නේ මැතිවරණයේදී දුන්නු පොරොන්දුවක්. ඉතිහාසයේ පළමුවෙනි වතාවට පොරොන්දුවට අනුව යමින් සකස් කරපු අය වැයක් තමයි මේ අය වැය. ඒ නිසා විශේෂයෙන්ම මේ අය වැය ඓතිහාසික අය වැයක් වෙනවා.

ඒ වාගේම මේ අය වැය සම බර අය වැයක්. හැම ක්ෂේත්‍රයක් ගැනම සලකා බලපු, හැම පුද්ගල කණ්ඩායමක් ගැනම සලකා බලපු, හැම ආර්ථික මට්ටමක් ගැනම සලකා බලපු, හැම භූමියක් ගැනම සලකා බලපු අය වැයක් නිසා මෙය විශේෂ අය වැයක් වෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවකයන්ගේ වැටුපට විශාල ප්‍රමාණයකින් මූලික වැටුප් වැඩිවීමක් එකතු වෙච්ච අය වැයක් බවට මේ අය වැය පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ කඩා වැටුණු රාජ්‍යයන් ඉතා දිගු කාලයක් පොරබදලා තමයි නැවත ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත් කර ගන්නේ. නමුත් අපි පත් වෙලා ඉතාම කෙටි කාලයක් ඇතුළත ආර්ථිකය ශක්තිමත් කරලා, ජනතාවට ප්‍රතිලාභ ලැබෙන විධියට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම

උද්ධමනය පාලනය කරලා, විශේෂයෙන්ම ඩොලරයේ මිල පාලනය කරලා, ආර්ථිකය යම් ප්‍රමාණයකට ගොඩ අරගෙන හදපු අය වැයක් නිසා මේ අය වැය විශේෂ අය වැයක් වෙනවා.

අපි දැක්කා, මේ අය වැය සකස් කිරීමට පෙර ගරු ජනාධිපතිතුමා පෞද්ගලිකවම යාපනය ප්‍රදේශයේ සංචාරය කළ බව. එතුමා බිමේ ජනතාවත් එක්ක සාකච්ඡා කරලා බිමට දැනෙන විධියට, බිම හඳුනාගෙන සකස් කරපු අය වැයක් මේක. පසුගිය ආණ්ඩු අවුරුදු ගණනාවක් තිස්සේ ඉදිරිපත් කරනවා දැක්කේ, විශේෂයෙන් පහළ ජනතාවට, දුප්පත් ජනතාවට පටි තද කර ගන්නට සිදු වෙන, නැත්නම් ඔවුන්ගේ සුබසාධන වියදම්, ඔවුන්ගේ සුබසාධනය කපා හැරපු අය වැය. නමුත් මුල් වතාවට මෙවර උඩින් ආදර්ශය දීලා තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයේ සිට අගමැතිතුමියගේ, ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ වැය ශීර්ෂ පවා අඩු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි දැක්කා, මන්ත්‍රීවරුන්ගේ වාහන බලපත්‍රය, වාහන දීමනාව පවා මේ වසරේ අත්හිටුවා තිබෙනවාය කියන කාරණය. ඒ නිසා මේක ඓතිහාසික අය වැයක්. මම දැක්කා, ඊයේ එක අප්පුහාමි කෙනෙක් කියනවා, මේක ඓතිහාසික අය වැයක් නොවෙයි කියලා. නමුත් මා සඳහන් කළ ඔය කරුණු අනුව සලකා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේක ඓතිහාසික අය වැයක්.

මේ අය වැයේ විශේෂයෙන් පෙනෙන කාරණාවක් තමයි රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම. අපි දැක්කා, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩිවීම ගැන කථා කරද්දී, විශේෂයෙන්ම කළමනාකරණ ශ්‍රේණියේ සිට පහළම සේවකයාගේ වැටුප ගැන කථා කළ බව. අපි දන්නවා පහළම සේවකයාට පවා සේවා කාලය දිගු වෙන්න, දිගු වෙන්න ඔවුන්ට තිබෙන ප්‍රශ්න, ඔවුන්ට දරන්න වෙන වියදම් වැඩි බව. ඒ නිසා ක්ෂේත්‍රයේ ඉහළට යන්න යන්න, තනතුර ඉහළට යන්න යන්න ඔවුන්ගේ වැටුප් වැඩිවීමත් විශාල වැටුප් වැඩිවීමක් ලෙස දකින්න තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය සේවකයන්ට ලබා දෙන ආපදා ණය කියන්නේ විශේෂ කොට සලකන දෙයක්. ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්, නැත්නම් විශේෂ සෞඛ්‍ය පහසුකමක්, ශල්‍යකර්මයක් වෙනුවෙන් ඔවුන් මේ ආපදා ණය තමයි පාවිච්චි කරන්නේ. මේ වැටුප් වැඩිවීම නිසා ඒ ආපදා ණය සීමාවත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. විශ්‍රාම වැටුපත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. බැංකු ණයක් ගැනීමේදී ඔවුන්ට ලැබෙන වැටුප සලකා තමයි බැංකු ණය පවා අනුමත කරන්නේ. ඒ අවශ්‍ය සියලු දේවල් ඉහළ ගිහිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩි වෙනවා කියන්නේ නැවත වතාවක් ඔවුන්ගේ වැටුප වෙළඳපොළට එනවා කියන එකයි. එහෙම නැත්නම් ආර්ථිකයට එකතු වෙනවා. ආර්ථිකයට එකතු වෙනවා කියන්නේ, රටේ නිෂ්පාදනය වැඩි වෙනවා. රටේ කර්මාන්තශාලාවල නිෂ්පාදනය වැඩි වෙනකොට මොකද වෙන්නේ? පෞද්ගලික අංශයේ කර්මාන්තශාලා නැවත පිබිදෙනවා; ආර්ථිකය නැවත ශක්තිමත් වෙනවා. කඩා වැටිච්ච කර්මාන්තශාලා නැවත පණ ගහලා ශක්තිමත් වුණාම වෙන දේට තමයි ආර්ථිකය ප්‍රසාරණය වෙනවා කියන්නේ. එහෙම නම් මේ වැටුප් වැඩිවීම ඇතුළේ නැවත වතාවක් පෞද්ගලික කර්මාන්තශාලා ශක්තිමත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, පසුගිය කාලයේ අපි විදුලි බිල විශාල ප්‍රමාණයකින් අඩු කළා. මේ අය වැයට කලින් ඒ සහනය දීලා තිබෙන්නේ. අන්න ඒ සහනයත් අරගෙන නිෂ්පාදනය වැඩි වෙලා, කර්මාන්තශාලාවල ලාභය වැඩි වෙනකොට පෞද්ගලික අංශයේ සේවකයාගේ වැටුපත් වැඩි කිරීමේ හැකියාව තිබෙනවා.

අපි දන්නවා, විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල වැටුප තිබෙන්නේ ඉතා පහළ අගයක. නමුත් මේ වැටුප් වැඩිවීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ යනවා. මම නිකම් සලකා බැලුවාම පෙනී ගියා, සාමාන්‍යයෙන් රුපියල් 21,000ක මූලික වැටුපක හිටපු කෙනෙකුගේ අතිරේක වැඩිවීම රුපියල් 9,000ක් කියලා සැලකුවොත්, ඔහුට අතිකාල වෙනුවෙන් රුපියල් 3,750ක් වැනි මුදලකුත්, අර මූලික වැටුපත් එකතු කළාම ඔහුගේ වැටුප රුපියල් 12,375කට ආසන්න ප්‍රමාණයකින් වැඩි වෙනවා. ඒ නිසා මේක පෞද්ගලික අංශයට සලකපු අය වැයක්.

ඒ වාගේම මේ අය වැයේදී සෞඛ්‍ය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. මට මතකයි, 2019දී ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ගැබිනි මාතාවන්ට සහන මල්ලක් දෙනවා කියලා මැතිවරණ වේදිකාවේ පොරොන්දුවක් දුන්නා. ඒත් එතුමා පත් වෙලා, ජනතාව විසින් පන්නනකම් ඒ සහන මල්ල දෙන්න බැරි වුණා. නමුත් අපි ඒක යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගැබිනි මාතාවන් 265,000ක ප්‍රමාණයකට ඒ සහනය ලබාදීම වෙනුවෙන් රුපියල් බිලියන 7.5ක් මේ අය වැයෙන් අපි වෙන් කරලා තිබෙනවා. අන්න එහෙමයි රටට, ජාතියට ආදරය කරන ජනාධිපතිවරයෙක් වැඩ කරන්න ඕනෑ විධිය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය ගත්තොත්, පසුගිය කාලයේ හැමෝටම සම අධ්‍යාපනයක් තිබුණේ නැහැ. අධ්‍යාපනයේ අවස්ථා ගොඩක් දෙනෙකුට අහිමි වෙලා ගියා. 2019න් පස්සේ පාසල් පද්ධතිය තුළ අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ වෙලා තිබුණේ නැහැ. මේ අය වැය ඒකත් සැලකිල්ලට අරගෙන තිබෙනවා. 2019 ඉදලා පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනයට වෙන් නොකළ නිසා ඒ වෙනුවෙන් රුපියල් මිලියන 10,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ පසුගිය ආණ්ඩුවල බරත් අරගෙන තමයි අපි මේ ගමන් කරමින් ඉන්නේ.

මාධ්‍ය තුළින් අපි හැම දාම දකිනවා, විශේෂ සංවේදී සිදුවීමක්. ඒක නිතර නිතර අපට අහන්න, දකින්න ලැබුණු දෙයක්. ග්‍රාමීය වශයෙන් වෙන්න පුළුවන්, නාගරික වශයෙන් වෙන්න පුළුවන්, ඒ හැම තැනම අපි ඒක දකිනවා. ඒ තමයි, හිල් වෙච්ච සපත්තු කුට්ටමක් දමාගෙන, එහෙම නැත්නම් සෙරෙප්පු කැලි දෙකක් දමාගෙන පාසල් යන දරුවෝ අපට මාධ්‍යයෙන් දකින්න ලැබෙනවා. අන්න, ඒ දරුවන්ට නිල ඇඳුමට අවශ්‍ය සපත්තු ලබාදීම සඳහා රුපියල් බිලියන 2.5ක් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ කාරණයක් තිබෙනවා කියන්න. ඡන්දය වෙලාවේ විපක්ෂයේ උදව්ය අපට චෝදනා කළා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ආවාට පස්සේ පන්සල් යන්න වෙන්නේ නැහැ, පෙරහැර කරන්න වෙන්නේ නැහැ, ආගමික ස්ථානවලට යන්න වෙන්නේ නැහැ කියලා. අන්න ඒකටත් මේ අය වැයෙන් උත්තරයක් දීලා තිබෙනවා. දහම් පාසල් අධ්‍යාපනය වෙනුවෙන්, දහම්පාසල් වෙනුවෙන් මේ අය වැයෙන් රුපියල් බිලියන 1.3ක් නැත්නම් රුපියල් මිලියන 1,300ක් වෙන් කර තිබෙනවා. ඔවුන්ගේ බොරුවලටත් මේ අය වැය උත්තර දීලා තිබෙනවා. ඒක තමයි ඔවුන්ට එච්චර රිදෙන්නේ. ඒ වාගේම සංචාරක කර්මාන්තය පිළිබඳවත් මේ අය වැය තුළ විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. අපි දන්නවා, ගෙවල් උකස් තියලා, ඉඩම් උකස් තියලා, වාහන අරගෙන අන්තිමට ඒ වාහනත් ෆිනෑන්ස් කොම්පැනිවලින් උස්සලා සංචාරක ව්‍යාපාරයේ නිරත වෙච්ච පිරිස් කබලෙන් ලිපට වැටිලා හිටියේ. අන්න, ඔවුන් ගැනත් සලකා බලා තිබෙනවා. අපි දැක්කා, හිටපු ඇමතිවරයෙක් පගාව ඉල්ලීම නිසා වහලා ගිය ජපානයේ ජයිකා ව්‍යාපෘතියක් වන ගුවන් තොටුපොළේ මගී පර්යන්තය ඉදි කිරීම නැවත පටන් ගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. හරියටම උපාය මාර්ගයත් එක්ක සමපාත වෙච්ච අය වැයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

[ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා]

ඒ විතරක් නොවෙයි, සංචාරකයෝ ඇවිල්ලා සමහර ස්ථානවලදී ටිකට් පත් ලබා ගැනීමට පෝලිමේ ඉන්නවා අපි දැක තිබෙනවා. ඔවුන්ට සංචාරය එපා වෙන මට්ටමට පෝලිම් හැදිච්ච යුගයක් තිබුණේ.

එම තත්ත්වය අඩු කරන්නත් අපේ ආණ්ඩුවේ ප්‍රධාන ප්‍රතිපත්තියක් වන ඩිජිටල්කරණය හරහා ඩිජිටල් ටිකට් එක ප්‍රවර්ධනය කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මට තවත් විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මේ අය වැය අපේ ප්‍රතිපත්තියත් එක්ක ගැළපුණු, ඒ වාගේම රටේ ආර්ථිකයේ සියලු කාරණා සැලකිල්ලට ගත්තු අය වැයක්. හැබැයි මේ අය වැයට විවිධ අර්ථකථන දෙන්න උත්සාහ කරනවා, විපක්ෂයේ උදවිය. විපක්ෂයේ උදවිය විශේෂයෙන්ම එළඹෙන පළාත් පාලන මැතිවරණය ඉලක්ක කරගෙන බංකොලොත් වෙච්ච දේශපාලනය වහ ගන්න මඩ, අවලාද පාවිච්චි කරමින්, මේ අය වැයෙන් අප යටපත් කරන්න තමයි උත්සාහ කරන්නේ. එහෙත් ජනතාව මේ බව තේරුම් ගෙන ඉවරයි. අපි බිම් මට්ටමට යන කොට දැනෙනවා, ජනතාව මේ අය වැය තේරුම් අරගෙනයි ඉන්නේ කියලා. ඒ නිසා විපක්ෂයට කියන්නේ, ඔය සෙල්ලම් හරි යන්නේ නැහැ කියලායි. ඒ වාගේම තමයි බංකොලොත් වෙච්ච ඇතැම් වෘත්තීය සමිති කිහිපයකුත් මෙහි එක එක කාරණා අල්ලාගෙන දුවනවා; සමාජය, කම්කරුවන් ඇතුළු සේවකයන් අවුස්සන්න උත්සාහ කරනවා. ඒවාත් වලංගු වෙන්නේ නැහැ කියලා කියමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අරුන් හේමවන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.19]

ගරු අරුන් හේමවන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් අය වැයක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම මේ අය වැය ඉදිරිපත් කරපු පසුබිම ගෙන බලමු. අපේ රට දැන් බංකොලොත්භාවයෙන් එළියට ඇවිල්ලා යම්කිසි හුස්මක් ගන්න වෙලාවක් මේක. මේ රටේ සිද්ධ වෙච්ච දූෂණ, වංචා, නාස්තිය, අක්‍රමිකතා, වැරදි දේශපාලන සංස්කෘතිය ඇතුළු බොහෝ දේවල් තමයි පසුගිය කාල වකවානුව තුළ මේ රට මුහුණ දීපු ඒ අර්බුදයට මූලික හේතුව වුණේ.

පසුගිය දා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය ගත්තොත්, එහි ඉතාමත් balanced approach එකක් තිබෙනවා. අපි මීට කලින් බොහෝ අය වැය දැකලා තිබෙනවා. ඒ සමහර ඒවා මේ රට බංකොලොත්භාවයට පත් කරපු අය වැයයි. ඒ වාගේම සමහර ඒවා ගත්තොත්, ඒ approach එක ගත්තොත්, ජනතාවට කිසිසේත් දරා ගන්න බැරි, ඒ වාගේම සැහෙන බදු පටවපු ඒවායි. නමුත් මේ අය වැය ඉතාම විශේෂයි. දේශපාලනඥයන්ට මීට කලින් තිබුණු සුඛෝපභෝගී ජීවිතය කප්පාදු කරලා, විශේෂයෙන්ම වාහන පර්මිට් වාගේ දේවල් අහෝසි කරලා, ඒ වාගේම බොහෝ දේවල් සම්බන්ධව checks and balances ඇති කරමින්, ජනතාවගේ ජීවිතයට ප්‍රමුඛතාව දීලා තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක ඉතා සුවිශේෂ දෙයක්. මෑත ඉතිහාසයේ සිද්ධ වෙච්ච වැඩිම පඩි වැඩි වීම මේ අය වැයෙන් සිද්ධ වෙලා තිබෙනවා. ඉතින් ඒක වැදගත්. මම දන්නේ නැහැ, විපක්ෂය ඒක අගය කරන්නේ නැත්තේ ඇයි කියලා. ඒ වාගේම දෙමව්පියන් නැති ළමයින්ට දෙන දීමනාව වාගේ බොහෝ දේවල් ගැන ද සඳහන්ව තිබෙනවා.

ඩිජිටල්කරණයට -digitalization සඳහා- ඉතා වැදගත් ප්‍රමුඛත්වයක් දීලා තිබෙනවා. සති කිහිපයකට පෙරයි ඒ ක්‍රියාවලිය හරියාකාරයෙන් පටන් ගෙනයි තිබෙන්නේ. විශේෂයෙන්ම කොළඹට සීමා වෙච්ච ජනාධිපති අරමුදල දැන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමට විමධ්‍යගත කරලා තිබෙනවා. ඒ වාගේම අපේ තානාපති කාර්යාලවල, මහ කොමසාරිස් කාර්යාලවල, consular කාර්යාලවල consular සේවාව ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඩිජිටල්කරණය හරහා දැන් ඇති කරලා තිබෙනවා. ඒ වාගේම තමයි Government Payment System - GovPay - එක. ඉතින් ඒ වාගේ දේවල් කරන්න මේ අය වැය ඉදිරිපත් කරන්න කලින්ම කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මේ අය වැය හරහාත් තාක්ෂණයේ සැහෙන දියුණුවක් ඇති කරන යෝජනා දකින්න පුළුවන් අවස්ථා, ඉඩ කඩ තිබෙනවා.

මේ අය වැයට අදාළව මමත් යම්කිසි අධ්‍යයනයක් කරන කොට මට ලිපි ලේඛන ගොඩක් හම්බ වුණා. අපි දිගටම කියපු කාරණාවක් තමයි මේ රට කබලෙන් ලිපට වැටෙන්න මූලික හේතුවක් වුණේ මේ රටේ තිබිච්ච දේශපාලන සංස්කෘතියයි කියන එක. ඒ නිසා ජාතික ජන බලවේගය ප්‍රමුඛ මේ ආණ්ඩුව ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න පටන් ගත්තු එක ගැනත් දැන් සමහර අයට රිදිලා තිබෙනවා. ඒකට හේතු වුණු කාරණාවක් තිබෙනවා. මම ඒ හැම ලිපි ලේඛනයක්ම දැන් කියවන්න යන්නේ නැහැ - වෙලාවත් නැහැ. තෝරා ගත්තු ලිපි ලේඛනවලිනුත් තවත් තෝරා ගත්තු කිහිපයක් තමයි දැන් මා අතට ගත්තේ.

හිටපු ජනාධිපතිවරුන්ගේ විදෙස් ගමන්වලට අදාළ තොරතුරු ටිකක් දැන් මා ළඟ තිබෙනවා.

එකක් තමයි, Official Visit of H.E. the President to India on 08th and 09th February, 2013". 2013දී හිටපු ජනාධිපතිතුමා දින දෙකක සංචාරයක් සඳහා ඉන්දියාවට ගිහිල්ලා තිබෙනවා. ඒ ගමනට හැත්තෑදෙදෙනෙක් ගිහින් තිබෙනවා. මෙහි වැදගත්ම කාරණාව මොකක්ද? Official delegation කියන කොටස ගත්තොත්, එතැන ඉන්නවා 12 දෙනෙක්. ඊට අමතරව තවත් delegation එකක් තිබෙනවා - එතැන 11 දෙනෙක් ඉන්නවා. Ladies-in-attendance කියලා 5 දෙනෙක් ඉන්නවා. Medical staff කියලා එක්කෙනෙක් ඉන්නවා. Security staffවල advanced security - Army කියලා යම්කිසි කණ්ඩායමක් ගිහින් තිබෙනවා. පොලීසියෙන් තවත් පිරිසක් ගිහින් තිබෙනවා. Accompanying security කියලා තවත් පිරිසක් ගිහින් තිබෙනවා. ඒ වාගේම, personal aide, media personnel, First Ladyගේ list එක වෙනම තිබෙනවා. First Ladyගේ ආරක්ෂාවටත් Air

Force, Army, Police කියලා වෙනම කාණ්ඩයක් තිබෙනවා. එතකොට ඩොලරයේ අගය මේ තරම් වැඩි වෙලා තිබුණේ නැහැ. සාමාන්‍යයෙන් රුපියල් මිලියන 9.54ක විතර වියදමක් ඒ කාලයේ ගිහින් තිබෙනවා. ඒ මුදල ඒ කාලයේ හැටියට ගත්තොත් ඉතා විශාල මුදලක්.

2013දී New Yorkවලට ගිහින් තිබෙනවා, 83 දෙනෙක්. President, First Lady and MPs විධියට ගත්තොත් ගිහින් තිබෙනවා, 11 දෙනෙක්. Delegation එකට තවත් 31 දෙනෙක්. ඒ වාගේම, ආරක්ෂාව සපයන්න 28 දෙනෙක්. මාධ්‍යයෙන් 13 දෙනෙක්. කාගේ සල්ලි ද ඒවා? මේ විධියට කියනවා නම් තවත් බොහෝ දේවල්, බොහෝ උදාහරණ තිබෙනවා. මට තවත් උදාහරණයක් කියන්න පුළුවන්. 2018දී සමස්තයක් විධියට ඇමෙරිකාවට 77 දෙනෙක් ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපති, ජනාධිපති ආර්යාව ඇතුළු මන්ත්‍රීවරු පිරිස ගත්තොත්, 9දෙනෙක් ගිහිල්ලා තිබෙනවා. Delegation එකට තවත් 28ක්, protocol officersලා දෙදෙනෙක්, security එකේ 13 දෙනෙක්, මාධ්‍ය නියෝජනය කරමින් 25 දෙනෙක් ගිහින් තිබෙනවා. ඒකට සමස්තයක් විධියට ඒ කාලයේ රුපියල් මිලියන 50.4ක විතර වියදමක් ගිහින් තිබෙනවා.

ඇත්තටම ගත්තොත්, අපි දැන් ඒ දේශපාලන සංස්කෘතිය තමයි වෙනස් කරන්න උත්සාහ කරන්නේ. මම මෙතැන සඳහන් කළේ පොඩි උදාහරණ කීපයක් විතරයි. පසුගිය කාලයේ අපේ රටේ ජනතාව පෝලිම්වල හිටියා; සැහෙන්න ප්‍රශ්නවලට මුහුණ දුන්නා. නමුත්, ඒ තත්ත්වය ක්‍රමානුකූලව වෙනස් කරමින් ඉස්සරහට එනකොට ඔන්න දැන් අපට පහර එල්ල කරනවා. අපට මේක කිසිසේත් අනුමත කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ජනතාව ඒක අනිවාර්යයෙන් තේරුම් ගනීවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු රහිත වාහන බලපත්‍ර සංස්කෘතියත් අපි දැන් අහෝසි කර තිබෙනවා. ඒක ඉතාම වැදගත් දෙයක්. පසුගිය කාල වකවානු තුළ එහි දැවැන්ත දූෂණ, වංචා සිදු වුණා. ඒකට කියන්නේ "blank cheque corruption" කියලා. වාහනයක් ආනයනය කරපු දවසේම, ඒ වාහනය තවත් කෙනෙකුගේ නමකට හරවන්න පුළුවන් සංස්කෘතියක් තිබුණා. සාමාන්‍යයෙන් ඉතිහාසයේ බදු රහිත වාහන ගෙන්වන ක්‍රමයක් - permit system එකක් - තිබිලා තියෙනවා. නමුත්, යම්කිසි කාලයක් යනතුරු ඒ වාහනය වෙනත් කෙනෙකුගේ නමකට හරවන්න බැහැ; ඒක ඇවිල්ලා transferable නොවෙයි. නමුත්, පසුගිය කාලයේ transferable vehicle permits issue කරලා තිබුණා. අද පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉස්සරහින් වාඩි වෙලා ඉන්න සමහර අය ඒ ලැයිස්තුවල ඉඳලාත් තිබෙනවා. මෙවැනි දේවල් කිසිසේත් අනුමත කරන්න පුළුවන් දේවල් නොවෙයි. එවැනි සංස්කෘතියක් තමයි අපි දැන් වෙනස් කරන්නේ. අපි ඒවා වෙනස් කරමින් සිටින්නේ. විශේෂයෙන්ම රටක් විධියට අපට ඉදිරියට යන්න ඕනෑ නම් මේ වාගේ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. ඒ කප්පාදුව අපි අපෙන්ම පටන් ගෙන තිබෙනවා. විශේෂයෙන් ජාතික ජන බලවේගය නියෝජනය කරන අපි -මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු සියලුදෙනා-අපේ කප්පාදුව ස්වයංව සිදු කිරීමට පටන් ගෙන තිබෙනවා. ඒක ඉතාම වැදගත් දෙයක්. ඒ වාගේ විශේෂ බොහෝ දේවල් මේ අය වැය තුළ තිබෙනවා.

පසුගිය අවස්ථා කිහිපයකදීම මේ අය වැය සම්බන්ධයෙන් විවිධ කතිකා, විවිධ මාතෘකා නිර්මාණය කරගෙන හිටපු ආකාරය මම දැක්කා. විශේෂයෙන් මා නියෝජනය කරන නැඟෙනහිර පළාතට කිසිම ප්‍රමුඛතාවක් දීලා නැති කථාවක් කියැවුණා. දේශපාලන පළපුරුද්ද තිබෙනවා කියන මන්ත්‍රීවරුන්ගේ සමහර භාවිතාව ගෙන බලන්න. අය වැය පොත වුණත් උස්සලා මේසයට ගහන තත්ත්වයට පත් වුණා. ඒවා කිසිසේත් අනුමත කරන්න බැරි දේවල්.

එහෙම හැසිරීමක් තිබුණා. මම දන්නේ නැහැ, ඒ ගොල්ලන් ඒක අර්ථකථනය කරන්නේ කොහොමද කියලා. එකම දේශපාලන කණ්ඩායම නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට තිබුණේ විවිධ මත. එතැන පොදු මතයක්වත් තිබුණේ නැහැ. විවිධ අය එහෙම විවිධ මත සඳහන් කරලා තිබුණා. ඒක ඉතා කනගාටුදායක දෙයක්. විශේෂයෙන් නැඟෙනහිර පළාත වෙනුවෙන් මේ අය වැයේ සඳහන් වෙලා තිබෙන, වැදගත් විශේෂ වැඩ පිළිවෙළ වෙනුවෙන් වෙන් කර තිබෙන මුදල් සම්බන්ධවත් මේ මොහොතේ තොරතුරු සභාගත කරන්න ඕනෑ. එය අත්‍යවශ්‍ය දෙයක් කියා මම විශ්වාස කරනවා.

கடந்த காலங்களில் பல்வேறுபட்ட விடயங்கள் இந்தச் சபையில் பேசப்பட்டன. இந்த வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டதன் பின்னர், பலரும் பல்வேறுபட்ட கோணங்களில் இதற்கு எதிரான கருத்துக்களை முன்வைத்தார்கள். அரசாங்கம் என்ற ரீதியில், நாங்கள் அவற்றை ஏற்றுக்கொள்வதற்குத் தயாராக இருக்கின்றோம். எனினும், அடிப்படையில்லாத எந்தக் கருத்தையும் நாங்கள் ஏற்றுக்கொள்வதற்குத் தயாராக இல்லை. குறிப்பாக, கிழக்கு மாகாணத்துக்கு எந்தவித நிதி ஒதுக்கீடும் செய்யப்படவில்லை என்ற அடிப்படையில், சிலர் இந்த வரவு செலவுத்திட்டம் தொடர்பில் பிழையான கருத்துக்களை விதைத்துக்கொண்டு இருந்தார்கள். இந்த வரவு செலவுத்திட்டத்தில் குறிப்பிடப்பட்டுள்ள ஒருசில வேலைத்திட்டங்களை இங்கு குறிப்பிடலாமென நினைக்கின்றேன்.

Trincomalee Campus - Rs. 450 million;

Construction of ETU buildings for Trincomalee and Ampara Hospitals - Rs. 600 million (Rs. 300 million per hospital);

Construction of quay at dockyard, Trincomalee - Rs. 1,500 million;

Construction of building in Swamy Vipulananda Institute of Aesthetic Studies, Batticaloa - Rs. 300 million;

Cardiology unit with cath lab at DGH Ampara - Rs. 200 million;

Rehabilitation/ Improvement of Ampara-Uhana-Mahaoya-Chenkaladi Junction;

Rehabilitation/ Improvement of Lunugala-Bibila Road - Rs. 2714 million;

Establish 1000 rainwater harvesting tanks covering Northern Province, North-Central Province, North-Western Province and Ampara District of the Eastern Province - Rs. 50 million;

Completing the resettlement of persons displaced due to the conflict in the Northern and Eastern Provinces with 6,759 housing units - Rs. 3,500 million;

Preparation of master plan for development in Eastern, Western Provinces and Hambanthota District - Rs. 215 million;

Fisheries community development in Northern and Eastern Provinces - Rs. 50 million.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා වෙලාව අවසන්.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Building complex for Faculty of Health Care Sciences, Eastern University - Rs. 2,400 million;

Development of infrastructure facilities and facilitate research activities in Eastern University of Sri Lanka - Rs. 250 million; and

Development of infrastructure facilities and facilitate research activities in South Eastern University of Sri Lanka - Rs. 400 million.

Completion of sports stadium, Kalmunai - Rs. 150 million.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Deputy Minister, I want to get something clarified.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට නියමිත වේලාව අවසන්. ඒ නිසා සංවාදයකට නොයා ඉමු. අපි ඊළඟ මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙමු.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට පැහැදිලි කර ගන්න ඉඩ දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තත්පර 30ක කාලයකින් කියලා අවසන් කරන්න.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் இங்கு குறிப்பிட்ட இந்தத் திட்டங்கள் இந்திய அரசாங்கத்தின் விசேட நிதி ஊடாக அல்லது கிழக்கு மாகாணத்துக்கு வந்த grant ஊடாக நடைமுறைப்படுத்துவதற்கு இருக்கும் திட்டங்களா? அல்லது மக்களுடைய வரிப் பணத்தினூடாக அரசாங்கம் இந்த வருடம் செய்யவிருக்கும் திட்டங்களா? என்பதுதான் என்னுடைய கேள்வி. ஏனென்றால், 2021ஆம் ஆண்டு நாங்கள் - தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் மற்றும் ஏனைய தமிழ்க் கட்சியினர் - இந்திய தூதுவரைச் சந்தித்தபோது, இந்திய அரசாங்கத்தால் வட மாகாணத்துக்கு அதிகளவு நிதி ஒதுக்கீடு செய்யப்படுவதால், எதிர்வரும் ஆண்டுகளில் கிழக்கு மாகாணத்துக்கும் நிதி ஒதுக்கீடு செய்யுமாறு கேட்டிருந்தோம்.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, தற்பொழுது நீங்கள் இந்திய அரசாங்கத்தினூடாக வந்த நிதியைப் பங்கீடுசெய்த பட்டியலை வாசித்தீர்களா? அல்லது இலங்கை அரசாங்கத்தின் வரவு செலவுத்திட்டத்தில் குறிப்பிடப்பட்டுள்ள மக்களின் வரிப் பணம்மூலம் மேற்கொள்ளப்பட இருக்கின்ற திட்டங்களை வாசித்தீர்களா? என்பதைத் தெளிவுபடுத்த வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
இலங்கை மக்களுக்கு நிதி ஒதுக்கீடுகளைச் செய்வது இலங்கை அரசாங்கம்! அந்த வகையில், இலங்கை அரசாங்கத்தால் மேற்கொள்ளப்பட்ட நிதி ஒதுக்கீடுகளின் பிரகாரம்தான் இவற்றுக்கு நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றன.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Is that not a grant?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
That is allocated by the Government of Sri Lanka. - *[Interruption.]*

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Yes. But, it is based on a grant.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
That is allocated by the Government of Sri Lanka. That is all. -*[Interruption.]* No, no. The Indian Government cannot allocate a budget for Sri Lankan people.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
That is a grant.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
That is allocated by the Government of Sri Lanka to the people of Sri Lanka.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
That is an Indian grant.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු විත්තාල් ප්‍රනාන්දු මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.34]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුනරුද ආණ්ඩුවේ පුනරුද අය වැය ගැන වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම පිළිබඳව මම සන්තෝෂ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පුනරුදය" කියන වචනය ගත්තොත් ඒකෙන් අදහස් වෙන්නේ "අලුත්" කියන එක. මේ කියන්න හදන්නේ, අලුත් ආණ්ඩුවක්, අලුත් අය වැයක්, අලුත් සමාජයක්, අලුත් රටක් කියන එක තමයි. මම මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා ටිකක් අරගෙන පසුගිය ටිකේ කියවා කියවා සිටියදී මට හම්බ වුණා, 2006 අය වැය සම්බන්ධයෙන් වූ විවාදයේදී ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කියපු ටිකක්. ඒත් කථා කරන්නේත් අලුත් අය වැයක් ගැන, අලුත් ආණ්ඩුවක් ගැන, අලුත් මිනිස්සු ගැන, අලුත් සමාජයක් ගැන තමයි. ඒ කථාවේ සඳහන් කාරණාවලින් මම පොඩ්ඩක් කියන්නම්.

"... තමන් අලුත් නායකයෙක් බවත්, තමන් මෙහෙයවන්නේ අලුත් කැබිනට් එකක් බවත්, තමන් අලුත් ආණ්ඩුවකට නායකත්වය දෙන බවත්, ඒ වාගේම තමන් අලුත් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නහන බවත් මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වා. නොවැම්බර් 08 වැනි දා අය වැයක් ඉදිරිපත් කර තිබුණු තත්ත්වයක් තුළ වුවත් නැවත අය වැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න සිදු වුණේම මෙන්න මේ නැවුම්භාවය, මේ අලුත්භාවය, තමන්ගේ ප්‍රතිපත්ති තුළ, තමනේග් වැඩ පිළිවෙළ තුළ, තමන්ගේ ආණ්ඩුව තුළ ක්‍රියාත්මක වන බව මුළු මහත් රටට දැනෙන ආකාරයට..."

තව ගොඩක් කාරණා සඳහන් වනවා. නමුත්, මම ඒවා කියවන්නේ නැහැ.

තවදුරටත් මෙසේ සඳහන් වනවා.

"... මේ අය වැය යෝජනා තුළින් පෙනෙනවා, අලුත් ගමනකට ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සූදානම් බව..."

මෙච්චර ආදරයක් මට තේරෙන්නේ නැහැ. ඊළඟට මෙහෙම කියනවා. මෙච්චර ආදරයක් නම් මට තේරෙන්නේ නැහැ.

"... තමන්ම මුදල් අමාත්‍යවරයා හැටියට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොහොම සුභදශීලිව, නිහතමානීව මේ අය වැය ඉදිරිපත් කිරීමෙන් ඒක අපට පෙනෙන්න තිබෙනවා..."

මේ ඉස්සරහ පුටු පේළියේ ඉන්න සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා තමයි එහෙම කියා තිබෙන්නේ. මේ වෙලාවේ එතුමා ගරු සභාවේ නැහැ. මේ විධියටම තමයි එදාත් බෙර ගහලා ආවේ; මේ විධියටම තමයි කිව්වේ. අලුත් බලාපොරොත්තු තිබෙනවා කියලා තමයි ඒ වෙලාවෙත් කිව්වේ.

මට කලින් කථා කරපු තරුණ නියෝජ්‍ය ඇමතිතුමා මම බොහොම කැමැති ඇමතිතුමෙක්. හැබැයි, එතුමා කියනවා, නිවියෝර්ක්වලට ගිහිල්ලා මෙච්චරක් වියදම් වුණා, අරහෙට ගිහිල්ලා මෙච්චරක් වියදම් වුණා, ආර්යාවට මෙච්චරක් වියදම් වුණා කියලා. ඔය මෝඩ වැඩ කළේ නැත්නම් තමන්ගේ ජනාධිපති අපේක්ෂකයෙක් දාලා ඉල්ලුවා නම්, අද ඔහොම කෙදිරි ගාන්න වෙන්නේ නැහැ කියලා. නමුත් එදාත් ඔබතුමන්ලා තමයි මේ පාපයට කර තිබ්බේ. අපි මේවාට කවදාවත් අත තියලා නැහැ කියන එක මම කියන්න කැමැතියි.

ඒ වාගේම තමයි ජාතිවාදය ගැනත්. හැම දාම මම කියනවා වාගේ දැන් ඇවිල්ලා අපට බණිනවා. ඔය ප්‍රශ්න වෙන්නේ නැහැ, එදා තමන්ගේ අපේක්ෂකයෙක් ඉදිරිපත් කරලා, දිනුවත්, පැරදුණත් තමන්ගේ පක්ෂය ආරක්ෂා කර ගත්තා නම්. නමුත් දැන් අපට ඒවා කියන්න එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සන්ධාන හැදීම ගැනත් මම කියන්න කැමැතියි. මේ අය ලංකාවේ තිබෙන සියලු දේශපාලන පක්ෂ එක්ක සන්ධාන හදලා ඇවිල්ලා අද අපට කියනවා, "එක්සත් ජාතික පක්ෂයත් එක්ක සන්ධානගත වෙන්න හදනවා, ගහපල්ලා" කියලා.

මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ගේ නායකයා තමයි විපක්ෂ නායකතුමා. එහෙම නේද ගරු මන්ත්‍රීතුමා? අපේ අර්ච්චුනා මන්ත්‍රීතුමාත් ඇතුළුව. අර්ච්චුනා මන්ත්‍රීතුමා දැන් මේ සභාවේ නැහැ. හිටියා නම් වෙන ප්‍රශ්නයක්. එතුමාත් ඇතුළුව තමයි මම කිව්වේ. ඉතින්, මේ මන්ත්‍රීවරු ටික කැඳවලා විපක්ෂ නායක කාර්යාලයේ මොකක් හෝ කථාවක් කළාම, පාර්ලිමේන්තුවේ වැඩකටයුතු ගැන කථා කළාම, cadre එකට අණ දෙනවා, "මෙන්න මේ අය සන්ධානගත වෙන්න යන්නේ, ගහපල්ලා" කියලා. ලංකාවේ සියලුදෙනා එක්ක සන්ධානගත වෙලා තමයි අද මෙතැනට ඇවිල්ලා ඉන්නේ. ඒක නිසා මේවා ගැන කථා කිරීමේ කිසිම තේරුමක් නැහැ.

ඊළඟට, මේක ලිබරල්ද, මේක සමාජවාදීද කියලා ලොකු ප්‍රශ්නයක් යනවා. අනේ මහත්වරුනේ, ඔබතුමන්ලා කියන එක කියන්න නොවෙයි අපි මෙතැනට ඇවිල්ලා ඉන්නේ. ඒක හොඳට මතක තියාගන්න. අපට පෙනෙන දේවල් තිබෙනවා. එම නිසා අපට පෙනෙන දේ අපි කියනවා. අපේ ආර්ථික විශේෂඥයෝ ඉන්නවා. ඒ අය නිකම් හොරට ආචාර්ය උපාධි ගත් මිනිස්සු නොවෙයිනේ. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක ප්‍රශ්න කරන්න. එතකොට ඒ ගොල්ලෝ ඒවා ඉදිරිපත් කරයි.

අනුර කුමාර දිසානායක මැතිතුමා 2006 අය වැය විවාදයේදී කළ කථාවකුත් මගේ ළඟ තිබෙනවා. මට මේක සම්පූර්ණයෙන් කියවන්න බැහැ. මොකද, කාලය ගතවෙන නිසා. ඒක නිසා මම ඉතාම කෙටියෙන් කියන්නම්.

"නූතන යැයි කියා හඳුන්වන ඒ ආර්ථික ගමනට-1977, විශේෂයෙන්ම 1978 ඒ ආර්ථික ගමනට- අවශ්‍ය වන මූලික පියවරයන් එක්සත් ජාතික පක්ෂ රජය තැබුවා. ඒ පියවරයන් විතරක් නොවෙයි, ඒකට අවශ්‍ය වන යටිතල පහසුකම් සංවර්ධනය, ඒකට අවශ්‍ය නීතිමය රාමුවේ වෙනස් කිරීම, ඒකට අවශ්‍ය වන සමාජ සංස්කෘතිය මේ සියල්ලටම, ඒ ආර්ථික ගමනට අවශ්‍ය පරිදි එක්සත් ජාතික පක්ෂය 1978 මූලික පියවර තැබුවා. 2004 වන කොට ඒ ආර්ථික ගමනට අවුරුදු 26යි."

2005දී තමයි මේක කියන්නේ. 1977 ඉඳලා දැන් අවුරුදු 47ක් ගතවෙලා තිබෙනවා. එහෙම බැලුවොත් මහින්ද රාජපක්ෂ මහත්මයා හොඳයිනේ. වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාම එදා කියනවා.

"එක්සත් ජාතික පක්ෂයේ මූලික ආර්ථික දර්ශනය සමඟ සංසන්දනය කර බලන විට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අය වැය විශාල වූ වෙනස්කමක්."

ඒ කියන්නේ, මහින්ද රාජපක්ෂ හොඳයි. අවුරුදු 47කට පස්සේත් ඒ ප්‍රතිපත්තියම තිබෙන අය වැයක් තමයි අද ගෙනැවිත් තිබෙන්නේ. අවුරුදු 20ක් මෙතැන ඉඳගෙන කියවලා, කියවලා අන්තිමට ජනාධිපති වුණාට පස්සේ අද ගෙනැල්ලා තිබෙන්නේ

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

ඒකටම ගැළපෙන, ඒ හා සමානම අය වැයක්. එහෙම බලද්දී වර්තමාන ජනාධිපතිවරයා කියන විධියටම මහින්ද රාජපක්ෂ හොඳයි. ඔව්, මහින්ද හොඳයි. ඒ කාරණය තමයි මම කියන්න බලාපොරොත්තු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අය වැයවලට අදාළ හැන්සාඩ් වාර්තා කියවාගෙන, කියවාගෙන එනකොට 2016 අය වැය විවාදයේ කථාවකුත් මට හම්බවුණා. මම මෙහෙම කියනකොට ඔබතුමාටත් හිතා. නමුත්, මට මේක කියන්න සිද්ධ වෙනවා. මේ කථා කරන්නේත් සුනිල් හඳුන්නෙත්ති ඇමතිවරයාමයි. මේක එතුමාගේ mike එක off කරන්න කලින් කතන්දරයක්. ඉස්සර mike එක දෙනවානේ. දැන් දුන්නොත් ඉවරයි. එතුමා මෙහෙම කියනවා.

"පසුගිය රාජපක්ෂ පාලනය ඇතුළේ ජේමිස් පැකර්ලා ලංකාවට එන්න උත්සාහ කරනකොට අපි ඒකට විරෝධය පෑවා. ඒ, අපේ දේශීය කර්මාන්ත ව්‍යාපාර වාගේම ආර්ථිකයේ ජාතික පැවැත්ම ආරක්ෂා කර ගැනීම වෙනුවෙන්."

මේ ජේමිස් පැකර් කියන්නේ මොනවා කරන කෙනෙක්ද? ජේමිස් පැකර් කියන්නේ කැසිනෝ ව්‍යාපාරිකයෙක්. එතකොට, ජේමිස් පැකර් ලංකාවට ගේන එකට විරුද්ධ වෙලා, අපි රැක ගත්ත දේශීය කර්මාන්තය මොකක්ද? කාගේද ඒ දේශීය කර්මාන්තය. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් දැන් මෙතැන ඉන්නවානේ. ඒ කර්මාන්තය කාගේද කියලා කියන්න. පුළුවන් නම් ඒ නම කියන්න. ඔබතුමන්ලාගේ හොඳ මිත්‍රයෙක්; ගජ මිත්‍රයෙක්. ඒක ධම්මික පෙරේරාගේ. එතුමා තමයි මේ දේශීය කර්මාන්තය, මේ ව්‍යාපාරය නහා සිටුවන්නේ. ජේමිස් පැකර් ආපු නැති එකෙන් වාසියක් වුණා නම්, ඒ ධම්මික පෙරේරාට විතරයි.

හැබැයි, මේක මේ විධියට කිව්වාම, අදානි ගැන මොකක්ද කියන්න තිබෙන්නේ කියලා බලමු. මුලින් අදානි පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. ආණ්ඩු බලය ගන්න කලින් කියනවා, අදානි අවශ්‍ය නැහැ කියලා. ආණ්ඩු බලය ගත්තාට පස්සේ කියනවා, "අපි කැමැතියි, අපි ඉස්සරහට යනවා" කියලා. ලංකාවේ සුළං විදුලි බලාගාර කරන්න බැහැ කියලා අදානි දමලා ගහලා ගියාට පස්සේ, නැවත පස්සෙන් ගිහිල්ලා සාකච්ඡා කරන්න කටයුතු කරනවා. මේ විධියට ආයෝජකයෝ එයිද? මේවාට කියන්නේ double standard නොවෙයිනේ. මේවාට standards 5ක් විතර තිබෙනවා. එක වෙලාවකට එකක් කියන්නේ නැහැ. ඒක නිසා අපට කියන්නට තිබෙන්නේ, එක ස්ථාවරයක් අරගෙන ආණ්ඩුව මෙහෙයවන්න, අය වැය ගේන්න කියන එකයි. නමුත් මේ අය වැය එහෙම නැහැ කියන එක අපට ඉතාම හොඳින් පැහැදිලි වෙනවා.

අදානි සමාගම සම්බන්ධ මෙම ව්‍යාපෘතිය ගැන කථා කරද්දී විශේෂයෙන් කිව යුතු කාරණයක් තිබෙනවා. ඒ ව්‍යාපෘතිය දාලා ගිය එක වෙනම කථාවක්. හැබැයි, ජනාධිපතිවරයා මෙතැනට ඇවිල්ලා ඉතාම ලොකුවට කථා කළා. මම ඒකත් කියන්නම්. ඒ ඔක්කෝම මගේ ළඟ තිබෙනවා. එතුමා මෙහෙම කියනවා.

"සුළං බලයෙන් විදුලිය ජනනය කිරීමේ මෙගාවොට් 50ක ව්‍යාපෘතියකට අදාළව විදුලි ඒකකයක් සඳහා ඇමරිකානු ඩොලර් ශත 4.65ක මිලකට පසුගිය දා ටෙන්ඩරයක් ප්‍රදානය කළා."

ඒක කියලා තව මෙහෙමත් කිව්වා. "මේවා කරන්න දේශීය ව්‍යාපාරිකයොත් ඉන්නවා. මොකටද මේ ගණනට දෙන්නේ" කියලා. දැන් මට කියන්නකෝ, ඒ දේශීය ව්‍යාපාරිකයා කවුද කියලා? කවුද ඒ දේශීය ව්‍යාපාරිකයා? ඒත් ධම්මික පෙරේරා. ඒක තමයි ඇත්ත කථාව. හේලීස් සමාගමට තමයි දීලා තිබෙන්නේ.

එතකොට, කල්පනා කරලා බලන්න. අදානි හදන්නේ 500 MW project එකක්. මේ, 50 MW project එකක්. එවැනි 500 MW project එකක් හදන්න කියලා, ධම්මික පෙරේරාට කියන්න කෝ, ඇමරිකානු ඩොලර් ශත 4.65ක මිලකට විදුලි ඒකකයක් දෙයි ද කියලා බලන්න. මේ එකම නම නැවත නැවත මතු වෙනවා. මම දන්නේ නැහැ, ඔබතුමන්ලාට මොකක් හරි තේරෙනවාද කියලා. මේක පුදුම ආදරයක් නේ. ඒක තමයි මට කියන්න තිබෙන්නේ. එදා ජේමිස් පැකර් එද්දී ඉඳලා තවමත් බේරා ගන්නේ එකම එක මනුස්සයෙක්ද කියලා මට තේරෙන්නේ නැහැ.

මීටත් වඩා කරුණු මගේ ළඟ තිබෙනවා. නමුත්, වෙලාව යන නිසා මට කියන්න බැහැ. මම දන්නේ නැහැ මැතිවරණ ව්‍යාපාරයට උදව් කරලා ද, එහෙම නැත්නම් මොකක්ද මේ කියලා. ඔන්න, මම නම් ටික කිව්වා. අදානිගේ project එක වෙනයි; මේ 50 MW project එක වෙනයි. ජනාධිපතිතුමා ඉතා ලස්සනට මේ දෙක පටලවලා කථාව කළා. "හැබැයි, මතක තියා ගන්න! අපි මොකටද පිට රටකට දෙන්නේ, අපේ දේශීය ව්‍යාපාරිකයෙකුට දෙනවා නේ විදුලි ඒකකයක් ඇමෙරිකානු ඩොලර් ශත 4.65 ගණනේ" කියලා. ඔන්න ඒකත් මම කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මේ ගැනත් මතක් කරන්න කැමැතියි. අපේ හලාවත මන්ත්‍රීතුමා ඉන්නවා. ඉතාලියේ ප්‍රශ්නයක් මේ ගරු සභාවේ දී කථා වෙලා තිබෙනවා. ඒ සම්බන්ධ කරුණු අය වැය ලේඛනයටත් ඇතුළත් කරලා තිබෙනවා.

ජනාධිපතිතුමා අය වැය ලේඛනයේ "විදෙස්ගත ශ්‍රී ලාංකික ප්‍රජාව" යටතේ මෙසේ සඳහන් කර තිබෙනවා :

> "...මෙම වැදගත් ශ්‍රී ලාංකික ප්‍රජාව දිරිගැන්වීමේ සහ ත්‍යාග පිරිනැමීමේ ක්‍රම අපි ගවේෂණය කරමින් සිටිනවා..."

ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා අද උදේ ප්‍රශ්නයක් ඇහුවා; ගරු ඇමතිතුමා නැඟිටලා ගියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්නය ඇහුවාම ගරු ඇමතිතුමා නැඟිටලා ගියා. ඔබතුමාත් ප්‍රශ්නය ඇහුවා බාගෙට, බාගෙට වාගේ. එතුමාත් ගොත ගගහා මොනවාද, මොනවාද කිව්වා. ඒකට උත්තරය ආවේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. අපිත් ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන්නප්පුවේ ජනතාව එක්ලක්ෂ ගණනක් ඉතාලියේ ඉන්නවා. ඒ, මම නියෝජනය කරන ආසනයේ, මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ජනතාව. ඒක විදේශ විනිමය විශාල ප්‍රමාණයක් මේ රටට එන ප්‍රදේශයක්. 2022 ඉඳලා මේ මිනිස්සු මාර පීඩාවක් විඳිනවා, ඉතාලි රියදුරු බලපත්‍රය සම්බන්ධව. ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමනි, පුත්තලම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට ඒ ගැන කථා කළාට ඔබතුමාට ස්තුතියි. මොකක්ද මේ උත්තරයෙන් කියන්නේ? දින වකවානු කිසිවක් නැහැ, ඉදිරියේ දී අපි මේ ගැන සලකා බලන්නම් කියලායි

කියන්නේ. ඒක තමයි දෙන උත්තරය. ඒ නිසා ඒ පිළිතුර හරියන්නේ නැහැ. කරුණාකරලා මේ ප්‍රශ්නය ඉතාලි රජයත් සමඟ සාකච්ඡා කරන්න. ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයේ දී ඇහුවේ පැවැතිච්ච රජයන් මේවා කළේ නැහැ නේද කියලායි. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම පැවති රජයන් තමයි මේවා කරලා තිබෙන්නේ. ඒ, 2011දී. ඉතින් ඒ පැවති රජයන්වලට බැණ බැණ ඉඳලා වැඩක් නැහැ. මේ කටයුත්ත කරුණාකරලා කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මේ වෙන්නප්පුවේ පිරිස දීපු ඡන්දවල ප්‍රතිඵලය බලන්න. වෙන්නප්පුව මන්ත්‍රීතුමා දන්නවා නේ. ඒ සියලු බලපෑම් ඇති වුණේ ඉතාලියෙන්. ඉතාලියේ ජීවත් වෙන මේ පිරිස - බහුතරයක් - සම්පූර්ණයෙන්ම ඔබතුමන්ලාගේ ආණ්ඩුවට උදව් කළා. අපට ඒ ඡන්දය හම්බවුණාද නැද්ද කියන එක නොවෙයි වැදගත්. මේ රටට විදේශ විනිමය ගෙනෙන මිනිස්සුන්ට උදව් කරන්න. Tourist visaවලට විතරක් මේ දවස් කිහිපයේ වාහන එළවන්න දෙනවා. Tourist visa ගත්ත අය වාහන එළෙව්වා කියලා ලංකාවට මුදල් එන්නේ නැහැ නේ. ඒ නිසා ඒ වැඩ කරන මිනිස්සුන්ට කරුණාකරලා උදව් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් ලබා දෙන්න කියලා ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන් කෑම මිල, වාහන, ආරක්ෂාව, රක්ෂණය සම්බන්ධව විශාල සංදර්ශනයක් පෙන්වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම පළාත් සභාවෙන් දේශපාලනය පටන් ගත්ත කෙනෙක්. පළාත් සභා මැතිවරණය එපා කියලා මේ ගොල්ලෝ මේ රටේ මොන ඩෙහාවක් නැටුවාද? හැබැයි, පළාත් සභාව ඇතුළට ඇවිල්ලා විශාල කර්තව්‍යයක් කළා නේ. අපි අපේ ඇස් දෙකෙන් බලාගෙන හිටියා. මේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා පළාත් සභාවේ මට එහා පැත්තෙන් හිටියේ. එතුමා පළාතට ලොකු සේවයක් කළා, එපා, එපා කියලා කෑ ගැහුවාට. හැබැයි, මම නැවත නැවතත් කියනවා, මේ ප්‍රශ්න ගැන ඇමතිතුමා ගිහිල්ලා කථා කරන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් කිව්වා, පර්මිට් එක ගැන. පළාත් සභාවේ දී ඔය ගොල්ලොත් අවුරුදු විසි ගණනක් පර්මිට් ගත්තා. හැබැයි මතක තියා ගන්න, මම අරගෙන නැහැ. ඔබතුමන්ලා කියන ඒවා සම්පූර්ණයෙන් බොරු. පර්මිට් නැවැත්තුවේ ඔබතුමන්ලා නොවෙයි. 2013 ඉඳලා පළාත් සභාවේ පර්මිට් එක නවත්වලා තිබෙනවා. 2020 ඉඳලා තමයි පාර්ලිමේන්තුවේ පර්මිට් එක නවත්වලා තිබෙන්නේ. ඒ නිසා බොරු කියන්න එපා කියලා මම ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ ගැනත් කිව යුතුයි. ජනාධිපති කාර්යාලය විසින් සුඛෝපභෝගී වාහනවලට ටෙන්ඩර් දැන්වීමක් දාලා තිබෙනවා. වාහන තිබෙන්නේ, 18යි. වසන්ත සමරසිංහ ඇමතිතුමා විසින් එළියට දාපු වාහන 107ක් ගැන තොරතුරු මා ළඟ තිබෙනවා. ආණ්ඩු මාරු වුණු ගමන් ගෝල් ෆේස් එකට වාහන ටික දාලා නැටුවේ. ඒ ඉතිරි වාහන ටික කෝ?

රේන්ජ් රෝවර් එකක් දෙකක් නැති වුණු එක ගැන මට හිතා ගන්න පුළුවන්. එතකොට අනෙක් ටිකට මොකද වුණේ කියලා මම ඉතාම ආදරයෙන්, ගෞරවයෙන් අහනවා. එතුමා දැන් මේ සභාවේ නැහැ.

මන්ත්‍රීවරුන්ගේ ඉන්ෂුවරන්ස් එක ගැන හිතන්න. ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා කියනවා, ඒක ලක්ෂ දහයේ ඉඳලා ලක්ෂ දෙකහමාරට අඩු කරනවා ලු. එළියේ බලාගෙන ඉන්න මිනිස්සු හිතනවා, "අප්පා, ලක්ෂ හතහමාරක්, ලොකු ඉතුරුවක්!" කියලා. ලක්ෂ හතහමාරක් ඉතුරු වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක ඒ කොම්පැනියෙන් එවන ගණන. කීයක්ද වාරිකය අඩු වුණේ කියලා කියන්න. ඒක බොහොම සොච්චම් ගාණක්. අපට ලක්ෂ දෙකහමාරක් දෙනකොට, ලක්ෂ හතහමාරක් අඩු වෙන්නේ නැහැ. ඔය ලක්ෂ දෙකහමාරත් තියා ගන්න. මොකද, දැන් තිබෙන වෛද්‍ය වියදම් එක්ක, ඔය ලක්ෂ දෙකහමාරෙන් කරන්න පුළුවන් දෙයක් නැහැ. එහෙම නේද, ප්‍රධාන සංවිධායකතුමනි? ඒකත් තියා ගන්න කියලා මම යෝජනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගෞරව කරමින්, මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නතර වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 17ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.46]

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ පළමුවෙනි අය වැය ලේඛනය, මංගල අය වැය ලේඛනය ගැනයි අපි විවාදයේ නිරත වෙන්නේ. මේක අපට මංගල කාරණයක්. ඒ වාගේම මේ මංගල අය වැය ලේඛනය රටේ ජනතාවටත් බොහෝසෙයින් මංගල කාරණයක් කියලා මම හිතනවා. හැබැයි මේක අපට මංගල්‍යයක් වුණාට විපක්ෂයට අවමංගල්‍යයක් වෙලා තිබෙනවා. කථා කරන මන්ත්‍රීවරුන් හඬා වැලපෙන ආකාරය, විලාප දෙන ආකාරය, කෙඳිරි ගාන ආකාරය දිහා බැලුවාම, මේක ඔවුන්ට අවමංගල්‍යයක් බව අපට තේරෙනවා. මම හිතනවා තවම අවමංගල්‍යයක් බවට පත් වුණේ නැහැ කියලා. මේක ක්‍රියාත්මක වෙලා ප්‍රතිඵල බිමට එනකොට, ජනතාවට මේකේ ප්‍රතිලාභ එනකොට, මේ වසර ගණනාව යනකොට කොහොමටත් විපක්ෂයට මේක අවමංගල්‍යයක් වෙනවා. පසුගිය මැතිවරණ කිහිපයේ දීත් ඔබතුමන්ලාට ඒ ඉරණම අත් වුණා.

ඔබතුමන්ලා බුද්ධිමත් විධියට මේ අය වැය ලේඛනය පිළිබඳ විවාදයට ආවා නම්, මේකේ සාධනීය බොහෝ දේවල් ඔබතුමන්ලාට දකින්න පුළුවන් වෙන්න ඕනෑ. සමහරු මේකේ අන්තර්ගතය දකින්නේ නැතිව මතුපිටින් අතගාන ස්වභාවයක් අපි දකිනවා. මේකෙන් ජනතාවට එන ප්‍රතිලාභය, රටේ ආර්ථික වර්ධනය සහ සමාජයේ සිදුවෙන වෙනස්කම්වලට වඩා සමහරු හෙව්වේ මේක වමද, දකුණද කියලා. මේකේ වම දකුණ හෙව්වාට ඔබතුමන්ලාට දැන් යන එන මං නැති ස්වභාවයක් තිබෙන බව අපට පෙනෙනවා. යන එන මං නැති ස්වභාවයක් පෙනෙනවා. දැන් සමහරු නෙළුම් මාවතේ කාර්යාලයට යනකොට, සමහරු

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

සිරිකොතේ කාර්යාලයට යන ස්වභාවයක් අපට පෙනෙනවා. මේකේ වම දකුණ සොයනවාට වඩා ඔබතුමන්ලාට යන්න තිබෙන මාර්ගය සොයා ගැනීම වටිනවා කියලා මම හිතනවා. මොකද, ඔබතුමන්ලාට මාර්ගයක් අහිමි වුණු ස්වභාවයක් පෙනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්ෂයක් තුළ අපේ ආර්ථික කළමනාකරණය තමයි අය වැය ලේඛනයකින් පෙන්වන්නේ. ඕනෑම ආණ්ඩුවක් ඒ වර්ෂය තුළ තමන්ගේ ආර්ථික කළමනාකරණය පෙන්නුම් කරලා දෙනවා, ඒ වර්ෂය තුළ ආර්ථිකය කළමනාකරණය කරන්නේ කොහොමද කියලා. ඒ වාගේම නව රජයක් හැටියට අපි යන්න හදන දිශානතිය පෙන්නුම් කරන්න, අපේ ආර්ථිකය කොයි වාගේ දිශානතියකට ගෙන යන්න හදනවාද කියලා පෙන්වන්න, අපි මේ අය වැය ලේඛනයෙන් බලාපොරොත්තු වෙනවා. අපි මේකෙන් ආර්ථිකය ගැන විතරක් කියන්න හදනවා නොවෙයි. අපි සමාජය ගෙන යන්න හදන්නේ කොයි පැත්තටද, මේ රටේ දේශපාලනය ගෙන යන්න හදන්නේ කොයි පැත්තටද, මේ system එක වෙනස් කරන්න හදන්නේ කොයි විධියට කියන එකත් මේ අය වැයේ ගැබ්වෙලා තිබුණා. ඒක දකින්නේ නැතිව, සමහරු අඳුරේ අතපත ගාන ස්වභාවයක් අපි දැක්කා.

කොහොම වුණත්, ඔබතුමන්ලාගේ කථා දිහා බැලුවාම මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් ගැඹුරක්, ගත යුතු විශේෂ යමක් ඔබතුමන්ලාගේ පැත්තෙන් අපේ පැත්තට ආවේ නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. එවැනි උත්සාහයක් ඔබතුමන්ලා ගත්තේ නැහැ කියලා අපට පෙනෙනවා. කොහොම නමුත්, මේ අය වැය සම්බන්ධව මුල සිටම අදහස් දැක්වූ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා සෑහෙන ප්‍රමාණයකට ඇහුම් කන් දුන්නාට පස්සේ අපට තේරුණා, ඒවායේ තිබුණේ ආණ්ඩුව තබපු පියවර සම්බන්ධයෙන් යම් බියක් කියලා. අපි මේ යන ගමන තුළ ඔබතුමන්ලාට අත්වෙන ඉරණම ගැන යම් ඉඟියක් දැනුණා කියලා අපට පෙනෙනවා. මේ සභාවේ සිටින විපක්ෂයේ මන්ත්‍රීවරු දේශපාලනයේ බොහෝ පරිණතයි. ඒ නිසා ඒ බව අපට දැනෙනවා. කබීර්ගේ කථාවේ තක්බීර් ස්වභාවයක් පෙන්නුම් කළා. හර්ෂගේ කථාව කර්කෂ ස්වභාවයක් පෙන්නුම් කළා. අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමත් එක්ක එතුමා කර්කෂභාවයට පත් වෙලා කියලා පෙනෙනවා. දයාගේ කථාව ඇහුවාම නයෙක් බවට පත්වෙලා තිබෙන ස්වභාවයක් පෙන්නුම් කළා. ඒ කථාවලින් අපට පෙනෙන්නේ එවැනි තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ තුළින් නව ආර්ථික ගමනක් යන්න අපි උත්සාහ ගත්තා. අපි දන්නවා, පසුගිය කාලයේ මේ රටේ ආර්ථිකය බිඳවැටිලා තිබුණු බව. ඔබතුමන්ලා අපට ලබා දුන්නේ පිරී ඉතිරී ගිය භාණ්ඩාගාරයක් සහිත ආර්ථිකයක් නොවෙයි. මේ රටේ ජනතාව තේරුම් ගනිවි කියලා අපි හිතනවා, මේ අපේ පළමුවැනි අය වැය ලේඛනය බව. අපට ජන වරම ලැබුණේ අය වැය ලේඛන පහකට යන්න. පළමුවෙනි එකෙන්ම, අවුරුදු පහම මනින්න පුළුවන්කමක් නැහැ කියන එක ජනතාව දන්නවා. ඔබතුමන්ලාගේ සමහරු බැලුවේ ඒ අය වැය පහේම දේවල් පළමුවෙනි අය වැයෙන් සොයා ගන්න. එහෙම පුළුවන්කමක් නැහැ. ඔබතුමන්ලාට මම නැවත කියනවා, පිරී ඉතිරී ගිය භාණ්ඩාගාරයක් අපට ලබා දුන්නේ නැහැ.

බොහොම හිස් වෙච්ච භාණ්ඩාගාරයක් අපට ලබා දුන්නා. තවම මේ රට තිබෙන්නේ විශාල ණය අර්බුදයක. තවම අපට කටයුතු කරන්න සිදු වෙලා තිබෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පරාමිතීන් අතර ඉඳගෙන. අපි ඒවා මේ මැනිවරණයේදී කිව්වා, මේ තත්ත්වයත් එක්ක අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කටයුතු කරන්න වෙනවා කියලා. ආර්ථිකය බිඳ වැටුණු රටක, මහා හාස්කමක් කරන්න බැරි වුණත්, අද වෙනකොට මේ රටේ ජනතාව පිළිගන්නවා, මේ අය වැයෙන් විශාල හාස්කමක්, හිතාගන්න බැරි දේවල් සිදු වෙලා තිබෙනවා කියලා.

ඉහළ නිලධාරියෙක් මගෙන් ඇහුවා, මෙච්චර මුදල් ඔබතුමන්ලා සම්පාදනය කළේ කොහොමද, මේ අය වැය ලේඛනයේ තිබෙන සංඛ්‍යා ඇත්තද, මෙවා කරන්න පුළුවන්ද, ඇත්තටම ඔච්චර මුදලක් භාණ්ඩාගාරය තුළ සම්පාදනය කර ගන්න පුළුවන්ද කියලා. එතුමාට අපි කිව්වා, මේවා බොරුවට දාපු සංඛ්‍යාලේඛන නොවෙයි, මේවා මේ රටේ ඇත්තටම, අනිවාර්යයෙන්ම ඉෂ්ට වෙන දේවල් කියලා. මම හිතනවා, මේ අය වැය ලේඛනයේ පශ්චාත් පරීක්ෂණය කරන්න වෙන්නේ ලබන වසර වෙනකොට කියලා. මේ සංඛ්‍යා ඉදිරිපත් කළේ ඔබතුමන්ලාගේ සංඛ්‍යා විද්‍යාව විධියට නොවෙන තැනකට නොවෙයි. බොරු -මුසාවාදා- මේ අය වැයේ නැහැ, කෙරෙන දේවල් තිබෙන්නේ. අපි මේ රටේ ආර්ථිකය නව ගමනකට ගෙන යන්න නම්, මේ රටේ බිඳ වැටුපු ආර්ථිකය නැවත නිෂ්පාදන ආර්ථිකයක්, අපනයන ආර්ථිකයක් බවට පත් කරන්න නම්, එහි ප්‍රතිඵල නෙළා ගන්න නම් මේ රටේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් විශාල ආයෝජනයක් කරන්න ඕනෑ.

මේ රටේ විශාල ම ආයෝජකයා වෙන්නේ ආණ්ඩුවයි. අපි ඒ ආයෝජනය කරලා තිබෙනවා. මේ රටේ වාරිමාර්ග ක්ෂේත්‍රයට රුපියල් මිලියන 78,000ක් දාලා තිබෙන්නේ කෘෂි කර්මාන්තය ගැන මේ වසරේ අපි ලොකු බලාපොරොත්තුවක් තියාගෙනයි. මේ රටේ ධීවර කර්මාන්තය වෙනුවෙන් රුපියල් මිලියන 5,200ක් යොදවා තිබෙන්නේ, මේ රටේ ධීවරයාට සහන දීලා, විශාල මත්ස්‍ය අස්වැන්නක් නෙළාගෙන, මේ රටේ ආර්ථික ප්‍රබෝධයක්, වර්ධනයක් ඇති කර ගැනීමේ බලාපොරොත්තුවෙන්. වටිටලා තිබෙන මේ රටේ පශු සම්පත් ක්ෂේත්‍රය වෙනුවෙන් ආණ්ඩුව රුපියල් මිලියන 2,600ක් ආයෝජනය කරලා තිබෙනවා. එයින් අපි බලාපොරොත්තු වෙන්නේ, කිරි ආශ්‍රිත නිෂ්පාදන ගෙනෙන්න මේ රටින් ඇදගෙන යන විශාල විදේශ විනිමය ප්‍රමාණයෙන් යම් පංගුවක් හෝ රට තුළ නවත්වාගන්නයි; මේ රටේ ආයෝජකයන්ට අවස්ථාව දෙන්නයි; මේ රටේ රැකී රක්ෂා උත්පාදනය කරගන්නයි.

වැවිලි කර්මාන්තය තිබෙන්නේ මගේ අමාත්‍යාංශය යටතේ. එය මේ රටට විශාල අපනයන ආදායමක් ගෙනැත් දෙනවා. අපි මෙවර රුපියල් මිලියන 5,900ක් ඒ සඳහා යොදවා තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් අපි රුපියල් මිලියන 35,750ක් යොදවා තිබෙනවා. අපි මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ක්ෂුද්‍ර කර්මාන්ත වෙනුවෙන් විශාල ආයෝජනයක් කරනවා. ඒ වාගේම අපි සංචාරක ව්‍යාපාරය ගැන විශාල බලාපොරොත්තුවක් තියාගෙන ඉන්නවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 12,660ක ආයෝජනයක් වෙන් කරනවා. විශාල කර්මාන්ත ප්‍රවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 2,990ක් අපි මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

මේ අය වැය තුළ තිබෙන්නේ නව ගමනක්. ඒක කියවා ගන්න බැරි වීම ගැන අපට කනගාටුවක් නැහැ. සමහර දක්ෂිණාංශික පක්ෂ මේ අය වැයේ පිල්ල පැනලා කියලා අපි දකිනවා. අන්ත වාමාංශික සමහර සුළු පක්ෂත් පිලි පැනලා කියලා කියනවා. අපට කියන්න තිබෙන්නේ, ඔබතුමන්ලාගේ පිල්ල හරියට දාගන්න කියලායි. හරි පිල්ලේ ආවා නම්, මෙවැනි ඉරණමක් විපක්ෂයට අත් වෙන්නේ නැහැ කියන එකත් මම මතක් කරන්න කැමැතියි. කොහොම වුණත්, ඔබතුමන්ලාගේ විපක්ෂයේ තිබෙන පක්ෂ දිහා බැලුවාම -සජිත්ගේ පක්ෂය බැලුවත්, රාජපක්ෂලාගේ පක්ෂය බැලුවත්, රනිල්ගේ පක්ෂය බැලුවත්- අලියා ගිලපු දිවුල් ගෙඩිය වාගේයි තිබෙන්නේ. පිටින් ගෙඩියක් තිබුණාට ඇතුළේ මදයක්

නැහැ. ඔය පක්ෂ ඇතුළේ තිබෙන්නේ බොහොම හිස්භාවයක්. ජනතාව දැන් ඒක තේරුම් අරගෙන තිබෙන්නේ. මාධ්‍ය ඇතුළේ විපක්ෂයක් පෙනුණාට, සමාජ මාධ්‍ය ඇතුළේ විපක්ෂයක් පෙනුණාට, "පාර්ලිමේන්තුවේ" කියන කෑල්ලක් මාධ්‍යයේ දා ගත්තාට මහ පොළොවේ විපක්ෂයක් හොයා ගන්න තැනක් නැහැ. මහ පොළොවේ තිබෙන්නේ ජාතික ජන බලවේගය කියන දේශපාලන ව්‍යාපාරය. ඒක පසුගිය ජනාධිපතිවරණයේදී පෙන්වූවා. ඒක පසුගිය මහ මැතිවරණයේදී පෙන්වූවා. ඒ වාගේම ඉදිරි පළාත් පාලන මැතිවරණයේදීත් සුවිශේෂ ජයග්‍රහණයක් ලබලා ජාතික ජන බලවේගය ඒක පෙන්වන්න සූදානම් කියන පණිවුඩය අපි ඔබතුමන්ලාට දෙන්න සූදානම්.

ඒ හින්දා අපි ආර්ථික ගමන අලුත් පාරකට ගෙනැල්ලා තිබෙනවා. පාරේ තිබුණු අඩ කොට අයින් කරලා තිබෙන්නේ. රනිල්ගේ කොටේ අයින් වුණා. රාජපක්ෂගේ කොටේ අයින් වුණා. කෘෂි කර්මාන්තය ඉදිරියේදී ඉස්සරහට යනවා. කර්මාන්ත ක්ෂේත්‍රය ඉස්සරහට යනවා. ඒවා ඒ විධියට ඉස්සරහට යන එක නවත්වන්න ඔබතුමන්ලාට පුළුවන්කමක් නැහැ. අපි මේ රට අලුත් ගමනකට ගෙනැල්ලා තිබෙනවා. අපි අපනයනය නිකම්ම නඟා සිටුවනවා නොවෙයි. අපේ ජනාධිපතිතුමා කිව්වා, ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් මේ අවුරුද්ද වනකොට හදන බව. කොතැනටද අපි අපනයනය ගෙනෙන්නේ කියන එක සැලසුම් කරනවා. මෙය සැලැස්මක් ඇතුව යන ගමනක්. ඔබතුමන්ලා අඳුරේ අත පත ගාගෙන ගිහිල්ලා මේ රට වැටිටුවාට ජාතික ජන බලවේගය මේ රට ක්‍රමානුකූලව ගොඩ නඟන්න සූදානම්.

මේ රටේ දේශපාලන ස්ථාවරත්වයක් මේ වනකොට අපි ගොඩනඟා තිබෙනවා. ඒ දේශපාලන ස්ථාවරත්වය නැමති අත්තිවාරම මත අපි නව ආර්ථිකයක්, නව සමාජයක්, නව දේශපාලනයක් ගොඩනඟන්න සූදානම් වෙනවා. ඒ අත්තිවාරම සමඟරුන්ට හඳුනා ගන්න බැරි වුණාට අපි මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, විශාල ලෙස බිඳ වැටිච්ච රටක, ඉතා දුෂ්කර තත්ත්ව තුළ අපි විශාල ගමනක් යන්න අත්තිවාරමක් පමණයි දැම්මේ කියා. මේ අත්තිවාරම මත ඉදිවන මනරම් මන්දිරය, මේ අත්තිවාරම මත ඉදිවන මනරම් පොහොසත් රාජ්‍ය, ලස්සන ජීවිතය අත් පත් කර ගන්න ඉවසීමෙන් ඉමු කියලා අපි මේ රටේ ජනතාවට මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අපි තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි, ඔබතුමන්ලා ආණ්ඩු කරනකොට බලය තිබෙන අයට ලොකුවට බෙදා ගත්තා, හඬ නඟන අයට ලොකුවට බෙදා ගත්තා, හඬ නඟන්න බැරි මිනිසුන්ට බොහොම සොච්චම් විධියට බෙදුවේ කියන එක. හැබැයි, ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මේ රජය හඬ නඟන්න බැරි මිනිසුන්ටත් බෙදපු බව ඔබතුමන්ලාට හොඳින් මතක් කරන්න කැමැතියි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතුවලට ගෙවපු පොලිය ඔබතුමන්ලා අඩු කළා. අපි ඒ පොලිය සියයට තුනකින් වැඩි කළා. රුපියල් 3,000ක තිබුණු වැඩිහිටි දීමනාව රුපියල් 5,000ට වැඩි කළා. ඔවුන්ට හඬක් නඟන්න බැහැ. ඔවුන්ට බලයක් නැහැ. රුපියල් 5,000ක් ගෙවපු මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 7,500ට ගෙනාවා. විශ්වවිද්‍යාල සිසුන්ට ලබා දුන් රුපියල් 4,000ක ශිෂ්‍යාධාරය රුපියල් 6,500ට ගෙනිච්චා. වකුගඩු ආබාධිත මිනිසුන් වෙනුවෙන් දීපු රුපියල් 7,500ක මාසික දීමනාව රුපියල් 10,000ක් දක්වා ගෙනිච්චා. පහ වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ට මාසිකව දෙන රුපියල් 750ක දීමනාව රුපියල් 1,500ක් කළා. රෑඳවුම් නිවාසවල රඳවා සිටින දරුවන් වෙනුවෙන් මාසයකට රුපියල් 5,000ක් දෙන්න තීන්දු කළා. ආපදා නිසා සිදු වන මරණ හා පූර්ණ ආබාධිත තත්ත්ව සඳහා තමුන්නාන්සේලා දුන්නේ රුපියල් ලක්ෂ දෙකහමාරයි. හැබැයි, ඔබතුමන්ලා ජනාධිපති අරමුදලේ මුදල් රුපියල් ලක්ෂ 200, 300 බෙදා ගත්තා. ඒ, අසරණයන්ට දෙන්න තිබුණු සල්ලි. නිවාස ගිනි ගත්තාට පස්සේ විශාල මුදලක් ඔබතුමන්ලාගේ සාක්කුවලට, ගිණුම්වලට දා ගත්තා. හැබැයි, ආපදා නිසා පූර්ණ ආබාධිත වෙච්ච මිනිසුන්ට දුන්නේ රුපියල් ලක්ෂ දෙකහමාරයි. ඒක මේ රජය රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කළා.

ඊළඟට, රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කළා. වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා විශාල හඬක් නඟන්න පටන්ගෙන තිබෙනවා, වැටුප් හරියට වැඩි වුණේ නැහැ කියලා. හැබැයි, ඔබතුමන්ලාට මුල අමතක වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩු පැවති පසුගිය කාලයේ රජයේ සේවකයන්ට වැටුප් ගෙවන්න බැරිව දවස් ගණන් පරක්කු වුණා. මුදල් අච්චු ගහලායි වැටුප් ගෙව්වේ. රාජ්‍ය සේවය අකර්මණ්‍ය කළා. රාජ්‍ය සේවයට බඳවා ගැනීම නැවැත්වූවා. හැබැයි මේ රජය තීන්දු කළා, රාජ්‍ය සේවය නැවත ශක්තිමත් කරන්න; ඒ එන්ජිම පණ ගන්වන්න. අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප වැඩි කළා. රාජ්‍ය සේවයට නැවත බඳවා ගන්න තීන්දු කළා. අපි රාජ්‍ය සේවයට ගෞරවයක් අරගෙන දුන්නා. අපි ඒක කළා. ඔබතුමන්ලා රාජ්‍ය සේවය නැති කළා. එය මතක තියාගන්න කියලා අපි කියනවා.

මේ රටේ හඬක් නඟන්න බැරි මිනිස්සු විශාල වශයෙන් ඉන්නවා. එවැනි මිනිසුන් කොටසක් තමයි, අපේ කඳුකරයේ ඉන්න මලයගම් ප්‍රජාව. ඔවුන් වෙනුවෙන් රුපියල් මිලියන 7,583ක් මෙවර අය වැයෙන් වෙන් කළා. ඒ මිනිසුන්ට ගෙයක් දෙන්න, ඒ මිනිසුන්ට ඉඩමක් දෙන්න, ඒ මිනිසුන්ට ලිපිනයක් දෙන්න, ඒ මිනිසුන්ට උප්පැන්නයක් දෙන්න, හැඳුනුම්පතක් දෙන්න ඔබතුමන්ලා කෙකර ගගා අවුරුදු 76ක් ගත කළා. ඔබතුමන්ලාට ඒවා කරන්න බැරි වුණා. අපි ඒක කළා. ඒක නිසා ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ, රජයක් හැටියට අපි ඒ ක්‍රියාමාර්ග ගත්තා කියලා.

මම කිව්වේ, සමාජ ගමන වෙනස් කරන්න මේ අය වැය ලේඛනයෙන් අපි පටන් ගත්ත හැටි. මම නැවත මතක් කරනවා, මේ අය වැය ලේඛනයෙන් ආර්ථික ගමන වෙනස් කරන්නත් අපි තීන්දු ගත්ත බව. මෙතෙක් පැවති සමාජ ගමන වෙනස් කරන්න, මේ රටේ පැවති දූෂිත දේශපාලන ක්‍රමය වෙනස් කරන්න මේ අය වැය ලේඛනයෙන් අපි තීන්දු අරගෙන තිබෙනවා.

මෙතුවක් කල් ඔබතුමන්ලා - මේ රටේ පාලකයෝ - දිව්‍ය ලෝක සැප චින්දා, ඡන්දදායකයෝ අපාගත කරලා. අන්න ඒ සැප ඔබතුමන්ලාට දැන් අහිමි වෙලා තිබෙනවා. ආපහු කවදා හෝ බලය ගත්තත්, අනාගතයේදීවත් ඔබතුමන්ලාට ආපහු දිව්‍ය ලෝක සැප විඳින්න බැරි විධියට අපි මේ රටේ ව්‍යවස්ථාව හදනවා. ජනතාවට කන් හැන්දෙන් බෙදලා, පාලකයෝ මුලදී සවලෙන් ගත්තා. ඊට පස්සේ ගත්තා බැකෝවලින්. අන්න ඒවා අඩු වනකොට, නැති වනකොට ඔබතුමන්ලාට එන වේදනාව එක පැත්තකින් සාධාරණයි කියලා දකිනවා, විපක්ෂයේ කෝණයෙන් හිතුවොත්. නමුත්, කරන්න දෙයක් නැහැ. මම මුලින් කිව්වා වාගේ මේක රටට මංගල්‍යයක්, ඔබතුමන්ලාට අවමංගල්‍යයක් වෙච්ච එකට අපට තිබෙන්නේ, අනිච්චාවත සංඛාරා කියලා ප්‍රාර්ථනය කරන්න විතරයි. ඔය දේශපාලන ගමන අවසන්. අපි ඇමති මණ්ඩලය 21ට බැස්සුවා. පසුගිය කාලවල ඇමති මණ්ඩලයේ 80, 100 හිටියා. ඔබතුමන්ලාට ආපහු ඒ සැප විඳින්න වෙන්නේ නැහැ. අලුතින් එන ව්‍යවස්ථාවල ඒවා සීමා කරලා දාන්න අනිවාර්යයෙන්ම අපි තීන්දු කරනවා.

ආපහු වාහන පර්මිට් එක ලැබෙන්නේ නැහැ, වාහනයක් දෙන්නේ නැහැ කියනකොට ඉතින් අඬන එක හරි. වැලපෙන එක හරි. විපක්ෂයට තිබුණු සැප සම්පත් අහිමි කරලා. මේ ඔක්කොගෙන්ම ඉතුරු පහදු වෙන ඒවා තමයි ගොවිතැනට යෙදෙව්වේ; හඬක් නඟන්න බැරි මිනිසුන් වෙනුවෙන් යෙදෙව්වේ; මේ රටේ කර්මාන්ත නඟාසිටුවන්න යෙදෙව්වේ.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ 10ක රක්ෂණයක් තිබුණා. ඔබතුමන්ලා ලොකු හැදිවලින් බෙදාගෙන තිබුණේ. ඒක රුපියල් ලක්ෂ දෙකහමාරට බැස්සුවා. ඔබතුමන්ලා පසුගිය කාලයේ ආණ්ඩු කරනකොට හිටපු මාළිගා අපේ ආර්ථික කටයුතු සඳහා යොදා ගත්තා. ඔය ජනාධිපති මන්දිරවල, ඔබතුමන්ලා හිටපු අමාත්‍ය මන්දිරවල,- *[බාධා කිරීමක්]*

අද දොඩනවා, අඩනවා. මේ රටේ පාතාලය මිනී මැරුම් කරනකොට, මැරීමට එනකොට හැඩූ කඳුළින් දැන් කථා කරනවා. ඔය පාතාලයට කිරි පෙව්වේ ඔබතුමන්ලා. ඔබතුමන්ලා තමයි පාතාලය රැක්කේ. පාතාලයෙන් ඒ දේශපාලනය රැකුණා. ඒ දේශපාලනය පාතාලයෙන් රැක්කා. කාලයක ඔය පාතාලය අරලියගහ මන්දිරයේ හිටියා; කාලයක ඔය පාතාලය ජනාධිපති මන්දිරයේ හිටියා; ඔය පාතාලය ඔබතුමන්ලාගේ අමාත්‍ය මන්දිරවල හිටියා. දැන් පාතාලයත්, ඔබත් - දෙගොල්ලන්ම - අසරණ වෙලා. දෙගොල්ලන්ම කා කොටා ගන්නා තත්ත්වයට පත් වෙලා. පාතාලයේ සමහර මිනිස්සු මැරෙන්නේ දේශපාලන අනුග්‍රහය සහිතවද කියලා මට හිතෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(මාණ්පුමිකු කේ.වී. සමන්ත විත්‍යාරත්න)
(The Hon. K.V. Samantha Viddyarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

ඔය මන්ත්‍රීවරු රොත්ත බුරුත්තගේම විශ්‍රාම වැටුප අහෝසි කරනවා කියලා අපි පොරොන්දුවක් දීලා තිබෙනවා, ජාතික ජන බලවේගය හැටියට. මේ පළමුවැනි පියවර. දෙවැනි, තුන්වැනි පියවරවලදී ඒවා අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලා පිනට කකා හිටපු, අභිංසක මිනිසුන්ට කන්න බැරි කෑම වේල රුපියල් 2,000 දක්වා වැඩි කර තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ අරමුදල අපි අඩු කරනු ලැබුවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, පස්වරු 6.00ට සභාවේ කටයුතු නවත්වන්න ඕනෑ. ඔබතුමාට ලැබී ඇති වෙලාව අවසන්.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(මාණ්පුමිකු කේ.වී. සමන්ත විත්‍යාරත්න)
(The Hon. K.V. Samantha Viddyarathna)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලාට මේ කාරණයත් මම මතක් කරන්න කැමතියි. මේ අය වැය ලේඛනයෙන් අපි ගමන ආරම්භ කළා. අපි මේ රටේ ජනතාවට පොරොන්දු වෙව්ව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වසර 5ක් යනකොට අනිවාර්යයෙන්ම උදා කරදීමේ පළමුවැනි පියවර තැබුවාය කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 21වන සිකුරාදා පවත්වනු ලැබේ.

අප්පොතු පි.ප. 6.00 මණියාකිවිටවේ, අලුවල්කළ් ඉටෛනිරුත්තප්පට්ටු විවාතම් ඔත්තිවෛක්කප්පට්ටතු.

විවාතම්, 2025 පෙප්රුවරි 21, වෙළ්ළික්කිළමෛ මීළත් තොටංකුම්.

It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Friday, 21st February, 2025.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(මාණ්පුමිකු කේ.වී. සමන්ත විත්‍යාරත්න)
(The Hon. K.V. Samantha Viddyarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එටුත්තියම්පප්පෙට්රතු.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

අම්පාර පෙරිය නිලාවනෙයි ප්‍රදේශයේ යෝජිත සුරාසල් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර අත්හිටුවීම
அம்பாறை, பெரிய நீலாவணை பிரதேசத்தில் உத்தேச மதுபானசாலை அனுமதிப்பத்திரங்களை இரத்துச் செய்தல்
CANCELLATION OF PERMITS FOR PROPOSED LIQUOR SHOPS IN PERIYA NILAWANAI, AMPARA

[අ.භා. 6.02]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම්)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පසුගිය රජය සමයේදී අල්ලස් ලෙස දිවයින පුරා නීති විරෝධී සුරාසැල් බලපත්‍ර ලබා දුන් බවට වත්මන් ජනාධිපතිවරයා දේශපාලන වේදිකාවල ප්‍රකාශ කළේය. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීමට බොහෝ සංවර්ධන කටයුතු තිබියදී මෙම සුරාසැල් බලපත්‍ර ලබා දීම පිළිබඳව අප දිගින් දිගටම විරෝධය පළ කළෙමු. මෙවන් තත්ත්වයක් උඩ අම්පාර, පෙරිය නිලාවනෙයි ප්‍රදේශයේ සුරාසැල් ආරම්භ කිරීමට වත්මන් ආණ්ඩුව යටතේ දැනට සියලු වැඩකටයුතු සූදානම් වෙමින් පවතින බවට දැනගන්නට ලැබී ඇත.

මෙයට විරුද්ධව පසුගිය සතියේ විශාල ජනතා විරෝධයක් ද සිදු විය. පසුගිය රජයේ දේශපාලනඥයින්ට අල්ලස් ලෙස විශාල සුරාසැල් බලපත්‍ර ප්‍රමාණයක් ලබා දී ඇති බවට සෞඛ්‍ය අමාත්‍ය ගරු නලින්ද ජයතිස්ස

මහතා විසින් නම් ලැයිස්තුවක් ද ගරු පාර්ලිමේන්තුවේදී හෙළි කළේය. මෙම බලපත්‍ර සඳහා නිර්දේශ කළ දේශපාලනඥයින්ගේ නම් මෙතෙක් හෙළි කර නැත. නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ලබා දෙන ලද මෙවැනි සුරාසැල් බලපත්‍ර අහෝසි කිරීමට හෝ ඒ සඳහා සුදුසු පියවරක් ගැනීමට හෝ මේ වනතෙක් පවතින රජය විසින් කිසිදු පියවරක් ගෙන නොමැති බව පෙනේ.

සුරාසැල් අධික වීමෙන් එම ප්‍රදේශයේ ජනතාව මත්පැන්වලට ඇබ්බැහි වන ප්‍රමාණය බහුල වන බවත්, ඒ නිසා ඔවුන්ගේ ආර්ථික තත්ත්වයටද දැඩි බලපෑමක් එල්ල වන බවත් පැහැදිලි වේ.

එබැවින් මේ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කර මැතිවරණ සමයේ දුන් පොරොන්දු ඉෂ්ට වන ආකාරයෙන් මෙම අම්පාර, පෙරිය නිලාවනෙයි සුරාසැල් බලපත්‍ර අත්හිටුවීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාවට යෝජනා කර සිටිමි."

කඩන්ත තේර්තල් කාලත්තිල් තර්පෝතු නාට්ටින් සනාතිපති යාක ඉරුක්කුම් මාණ්පුමිකු අනුර කුමාර තිසානායක්ක අවර්කළ් මේටෙ මේටෙයාකච් චෙන්රු, මතුපානසාලෙ අනුමතිප්පත්තිරංකළ් ඉලඤ්චමාක වළංකප්පට්ටතෙනච් චොල්ලියිරුන්තාර්. අතර්කු මුන්නරේ එංකළුක්කු ඉන්ත විටයම් තෙරියුම්! ඒනෙන්රාල්, "මතුපානසාලෙ අනුමතිප්පත්තිරම් වේණ්ටුමා?" එන එංකළිටමුම් කේට්ටාර්කළ්. නාංකළ් අතෙ එටුක්කවිල්ලෙ. ආනාල්, තර්පෝතෙය සනාතිපති අවර්කළ් තේර්තල් මේටෙකළිල් චොන්නාර්, ඉලඤ්චමාක මතුපාන සාලෙ අනුමතිප්පත්තිරංකළ් වළංකප්පට්ටන එන්රු.

ජනාධිපතිතුමා වේදිකාවල ප්‍රකාශ කළා, විශාල වශයෙන් සුරාසැල් අවසර පත්‍ර දේශපාලන අල්ලස් වශයෙන් ලබා දුන්නා කියලා. ඒ වාගේම එවකට පැවැති රජයේ ප්‍රතිපත්තියක් වශයෙන් කිව්වේ උතුරු නැහෙනහිර ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න තමයි මේ සුරාසැල් දුන්නේ කියලා. මම නිතරම කියනවා, මඩකලපුවේ දකින්න ඉන්න එකම සුද්දා, සුදු හම තිබෙන එකම කෙනා මම කියලා. මොකද, ගමනාගමන පහසුකම් නැති නිසා සුද්දෝ ඒ පැත්තට එන්නේ නැහැ. එවන් තත්ත්වයක් තිබෙනකොට සංචාරකයන් එන්නේ නැති ප්‍රදේශයක සංචාරක කර්මාන්තය දියුණු කරන්න සුරාසැල් පමණක් ලබා දීලා බැහැ. හැබැයි, එවකට කිව්වේ මොනවාද? සංචාරක කර්මාන්තය දියුණු කරන්න මේවා කරනවා කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මඩකලපුව දිස්ත්‍රික්කයේ මේ වාගේ සුරාසැල් අටක් විතර විවෘත කරනවාය කිව්වාම අපි පාරවල් පාරවල් ගානේ ගිහින් උද්ඝෝෂණ කරලා, ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලපෑම් කරපු නිසා මඩකලපුවේ එක සුරාසැලයි විවෘත කළේ. ඒකත් මම හිතන විධියට රෙස්ටුරන්ට් එකක්. එක ප්‍රදේශයක පමණයි ඒක විවෘත කළේ. ඊට අමතරව අපි මඩකලපුවේ සුරාසැල් විවෘත කරන්න ඉඩ දුන්නේ නැහැ. මෙවන් තත්ත්වයක් මත ජාතික ජන බලවේගය රජය බලයට ආවට පස්සේ අම්පාර පෙරිය නිලාවනෙයි ප්‍රදේශයේ සුරාසැලක් අලුතින් විවෘත කිරීමට දැනට ක්‍රියාමාර්ග ගනිමින් යනවා.

මේ බලපත්‍ර පසුගිය කාලයේ දුන්නු ඒවා වෙන්න ඇති. අලුතින් දුන්නාද කියන්න මම දන්නේ නැහැ. මම හිතන විධියට පසුගිය කාලයේ දුන්නු ඒවා වෙන්න ඇති. මේකත් අල්ලස් ලෙස දුන්නු එකක් වෙන්න ඇති. හැබැයි, දැන් එම සුරාසැල විවෘත කරන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙසැම්බර් මාසයේ 04වැනි දා ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා මේ සභාවට ලැයිස්තුවක් ඉදිරිපත් කළා. එම ලැයිස්තුවේ තිබෙන්නේ බාර් පර්මිට්වලට අදාළ සුරාසැල් තිබෙන තැනයි, නමයි, address එකයි. RTI application එකක් දැම්මොත් අපටත් ඒ addresses ටික ගන්න පුළුවන්. අලුතින් දමපු බාර් ලැයිස්තුව රජය පැත්තෙන් මැදිහත් වෙලා ක්‍රියාත්මක කරන්න කිසිම අවශ්‍යතාවක් නැහැ. හැබැයි, එදාම මම මේ සභාවේදී මේ ගැන ඇහුවා. මොකද, ජනාධිපතිතුමා කිව්වා, මේවා දේශපාලන අල්ලස් ලෙස දුන් ඒවා බව. මේ බාර් පර්මිට් දුන්නේ කවුද, මේවා ගත්ත දේශපාලනඥයන්ගේ නම් හෙළි කරනවාද කියලා මම ඇහුවා. එතකොට කිව්වා, පරීක්ෂණයක් පවත්වනවා කියලා. මම එදාම ඇහුවා, එම පරීක්ෂණය පවත්වන්නේ කවුද, - CID එකෙන්ද, පොලීසියෙන්ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන්ද, ජනාධිපති ලේකම් කාර්යාලයෙන්ද - කියලා. හැබැයි, අද වනතුරු ඒකට කිසිදු පිළිතුරක් ලැබිලා නැහැ. හැබැයි, මේ වෙනකොටත් අල්ලස් ලෙස දුන්නා කියන මේ බාර් පර්මිට් අනුව ඒවා විවෘත වෙනවා.

මම මේ කාරණය ඉතා පැහැදිලිව මේ අවස්ථාවේ කියන්න කැමතියි. මොකද, මම දැක්කා ඇමතිවරයෙක් -මම හිතන විධියට ඔහු ඇමතිවරයෙක්- කියනවා, මේ සුරාසැල් බලපත්‍ර දැන් දීලා ඉවරයි, මේවා නීත්‍යානුකූලව දීලා තිබෙන්නේ, අපිට මේවා cancel කරන්න බැහැ කියලා. හැබැයි, දේශපාලන වේදිකාවල කිව්වේ එහෙම නොවෙයි. අල්ලස් වශයෙන් දුන්නා කියනවා නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට හෝ යොමු කරලා මේවා නවත්වන්න.

උතුර සහ නැහෙනහිර පළාත් ගත්තාම, මේ වෙනකොට කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ජන්දදායකයන් 5,000කට එක බාර් එකක් තිබෙනවා. උතුරු පළාත නියෝජනය කරන කැබිනට් අමාත්‍ය, චන්ද්‍රසේකර් මැතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාත් පිළිගන්නවා ඇති, මිනිස්සු 5,000කට එක බාර් එකකුත් වැඩියි කියන එක. මිනිස්සු 5,000කට, ජන්දදායකයන් 5,000කට එක බාර් එකක්! කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ මිනිසුන්ට සංවර්ධනය කියන දෙයක් පෙන්වලාවත් නැහැ. හැබැයි, ජන්දදායකයෝ 5,000කට එක බාර් එකක්! ප්‍රධාන වශයෙන් අනෙකුත් බාර් පවා වහන්න ඕනෑ. මොකද, ජන ජීවිතයට මේක විශාල ප්‍රශ්නයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම මේ කාරණයත් කියලා විනාඩි දෙකකින් මගේ කථාව අවසන් කරනවා.

මගේ මේ යෝජනාව ස්ථිර කරන ගරු මන්ත්‍රීතුමා අම්පාර ප්‍රදේශයේ තිබෙන බාර් ගැන වැඩි විස්තර කියයි. මොකද, මේක එතුමාගේ ආසනයේ තිබෙන බාර් එකක්.

මම මේ යෝජනාව ඉදිරිපත් කරන ගමන් තවත් ප්‍රධාන කාරණයක් සඳහන් කරන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා සැප්තැම්බර් මාසයේ 21වැනි දා බලයට ආවා. ඔක්තෝබර් මාසයේ 05වැනි දා වෙනකම් අර මන්ත්‍රීවරුන් නිර්දේශ කරලා දීපු ඒ ලියුම් ටික තිබුණේ Excise Department එකේ. ඒවා ඇස්වලින් දැකපු කට්ටිය හිටියා. "මෙන්න මේ මන්ත්‍රීතුමා මේක යෝජනා කරනවා" කියලා ඇස්වලින් දැකපු කට්ටිය හිටියා. ඒවායේ photo එකක් proof හැටියට ඉදිරිපත් කරන්න බැහැ. හැබැයි, අපි ඒවා ඇස් දෙකට දැක්කා. ජනාධිපතිතුමාට දුන් ලියුමේ උඩින් එහෙම recommend කරලා, "මේ මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව කරන්න"

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

කියලා ලියපු ඒවා තිබුණා. ඒ ලියුම් ටික Excise Department එකේ තිබුණා. ඒ ටික ඔක්තෝබර් මාසයේ 05වැනි දා ජනාධිපති ලේකම් කාර්යාලය ලබා ගත්තා. මගේ ඉල්ලීම මේකයි. "බාර් පර්මිට් අල්ලස් ලෙස දුන්නා, අපි ආවාම ඒවා වහනවා, අපි ආවාම ඒවා ඔක්කෝම නවත්වනවා, අල්ලනවා" කිව්වා. දැන් ලැයිස්තුවක් දීලා තිබෙනවා, පර්මිට් ලබා දීපු බාර් කොහේද තිබෙන්නේ කියලා. මේ රටේ ජනතාවට දීපු පොරොන්දු ඉෂ්ට කරන්න. නැත්නම් අපිට හිතන්න තිබෙන්නේ ඒ දේශපාලනඥයන්ගේ බලපෑම්වලට මේ ආණ්ඩුවත් අහුවෙලා ඉන්නේ කියන එකයි, නැත්නම් ඒ දේශපාලනඥයන් අල්ලස් දීලා තිබෙනවාද කියන එකයි. මොකද, රටේ ජනතාව බලාපොරොත්තු වෙනවා, මේ බාර් පර්මිට් ගත්ත කට්ටිය කවුද කියලා රටේ ජනතාවට හෙළි කරන්න ආණ්ඩුවට තිබෙන වගකීම අනුව කටයුතු කරයි කියලා. මොකද, ඒක අල්ලසක්.

එපමණක් නොවෙයි. පසුගිය කාලයේ අපි දැක්කා, ගෙවල් ගිනි තියපු අය ලබා ගත් වන්දි list එකක් දමනවා.

ඒ list එක විතරක් මදි. ඒගොල්ලන් වැරදි විධියට ඒවා අරගෙන තිබෙනවා නම්, ඒ සල්ලි ආපහු ගන්න. අපි දැක්කා, ජනාධිපති අරමුදලින් සල්ලි ගත්ත අයගේ list එකක්. ඒ අයට දුන්නු සල්ලි ආපසු ගන්න. ඒ list එක දැක්කාම අපට ජේනවා නේ, ඒවා ගන්න බැරි කට්ටිය,-

අද සභාව කල් තැබීමේ යෝජනාව මම ඉදිරිපත් කළේ සුරා අලෙවිසැල් ගැන. අම්පාර, පෙරිය නිලාවනෙයි ප්‍රදේශයේ සුරා අලෙවිසැල තවම විවෘත කරලා නැහැ. ඒක විවෘත කරන්න ඉඩ දෙන්න එපා. ඒ වාගේම පගා ලෙස බාර් පර්මිට් ගත්ත මන්ත්‍රීවරුන්ගේ නම් හෙළි කිරීමේ වගකීමත් මේ ආණ්ඩුවට පැවරී තිබෙනවා. මේ ආණ්ඩුව ඒ වගකීම ඉෂ්ට කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ජනතාවගේ විශ්වාසය දිගටම තබා ගන්න. මැතිවරණ කාලයේ දුන්නු පොරොන්දු ඉෂ්ට කරන්න කියමින් මගේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් තිබෙනවා.

[පි.ප. 6.10]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(මාණ්පුමිකු කවීන්දිරන් කෝඩීස්වරන්)
(The Hon. Kaveenthiran Kodeeswaran)
කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, කෞරව සාණක්කියන් ඉරාසමාණික්කම් අවර්කළාල් කොණ්ඩුවරප්පට්ට ඉන්දප් පිරේරණෛයෛ නාන් වළිමොළිකිරේන්. විසේසමාක, පෙරිය නීලාවණෛ පිරදේසත්තිල් අමෛක්කප්පට්ටුල්ළ මදුපානෛසාලෛයෛ අන්දප් පිරදේස මක්කළ් එදිර්ක්කින්රනර්. Bar අමෛක්කප් පට්ටදර්කු එදිරාක මක්කළ් තොදර්ච්චියාක වීදියිල් පෝරාදික්කොණ්ඩිරුක්කින්ර ඔරු නිලෛමෛ අංගු කාණප්පඩුකින්රදු.

කඩන්ත ජනාධිපතිත් තේර්තල් කාලත්තිල් ඉන්රෛය ජනාධිපති අවර්කළ්, තාන් ජනාධිපතියාක වන්තාල් ඉන්ත මදුපානසාලෛයෛ ඔළිප්පතාකක් කූරියිරුන්තාර්. අදුපෝල්, අවර් ජනාධිපතියාක වන්ත පින්නර් තනදු උරෛයිලේ තමදු කට්සිප් පාරාළුමන්රත්තිලේ කූටුතලාන ආසනංකළෛප් පෙර්රාල් පුතිය මදුපානසාලෛකළෛ ඔළිප්පතාකක් කූරියිරුන්තාර්. උණ්මෛයිල් ජනාධිපති අවර්කළුක්කු මුළු අතිකාරමුම් ඉරුක්කින්රදු. ඔර් ආණෛප් පෙණ්ණාකවුම් පෙණ්ණෛ ආණාකවුම් මාර්ර මට්ටුමේ මුඩියාදු. ඉරුන්තාලුම්, ජනාධිපති අවර්කළ් අව්වාරු අතිකාරංකළෛප් පයන්පටුත්තුපවර් අල්ල. ආනාල්, තාම් ආට්සික්කු වන්තාල්, පුතිතාක වළංකප්පට්ට bar permits අනෛත්තෛයුම් ඉරත්තුච් සෙය්වතාකක් කූරිය ජනාධිපති අවර්කළාල් නිච්සයමාක අතෛච් සෙය්ය මුඩියුම්. ඒනෙන්රාල්, වර්ත්තමානියිලේ පිරසුරික්කප්පට්ට විටයංකළෛක්කූට ඉරත්තුච් සෙය්වතර්කාන අතිකාරම් නිරෛවේර්රු අතිකාරම් කොණ්ට ජනාධිපතික්කු ඉරුක්කින්රදු.

උණ්මෛයාක ඉන්ත මදුපානසාලෛකළ් නාට්ටුක්කුප් පාරිය තීය විළෛවෛ ඒර්පටුත්තුවතෝටු, එතිර්කාලච් චන්තති යිනරෛයුම් පාතික්කුම් ඔරු විටයමාකක් කාණප්පටුකින්රදු. මදුපානසාලෛකළෛ අමෛක්කවේණ්ටුමෙන්රාල්, සුර්රුලාප් පිරදේසංකළිල් අවර්රෛ අමෛත්තුක් කොළ්ළුංකළ්! ඉන්රු වටක්කු, කිළක්කිලේ කූටුතලාක මදුපානසාලෛකළ් අමෛක්කප් පට්ටිරුක්කින්රන. ඉව්වාරු පොදුමක්කළ් වාළුකින්ර පිරදේසංකළිල් මදුපානසාලෛකළෛ අමෛක්කුම්පෝදු, අදු අවර්කළුදෛය පොරුළාදාරත්තිලේ පාරිය තාක්කත්තෛ ඒර්පටුත්තුම්. ඉතනාල් ඔරුපුරම් අරසාංකත්තිර්කු වරුමානම් කිටෛක්කුම්. ආනාල්, අරසාංකත්තිර්කු වරුමානම් කිටෛක්ක වේණ්ටුමෙන්පතර්කාක ඒළෛ මක්කළින් වාළ්ක්කෛයිලේ, පොරුළාදාරත්තිලේ පාතිප්පෛ ඒර්පටුත්තුකින්ර ඔන්රාක ඉරුක්කින්ර මදුපානසාලෛකළෛ එල්ලා ඉටංකළිලුම් අමෛක්ක මුඩියුමා? අදුමට්ටුමල්ල, ඉන්රු 159 ආසනංකළෛප් පෙර්රු, පාරාළුමන්රත්තිලේ මූන්රිලිරණ්ටු පෙරුම්පාන්මෛයුඩන් ඉරුක්කින්ර ඉන්ත අරසාංකම් නිනෛත්තාල් පුතිතාක වළංකප්පට්ට මදුපානසාලෛ අනුමතිප්පත්තිරංකළෛ ඉරත්තුච්සෙය්ය මුඩියුම්. අන්ත වකෛයිල්, ඉරණ්ටු වකෛයිලුම් - මාණ්පුමිකු ජනාධිපති අවර්කළුක්කුම්, අති උයර් සපෛයාන ඉන්ත පාරාළුමන්රත්තිර්කුම් - ඉරුක්කින්ර අතිකාරත්තෛක්කොණ්ටු නීංකළ් ඉතනෛ නිරුත්ත මුඩියුම්.

නීලාවණෛප් පිරදේසත්තිල් අමෛක්කප්පට්ට මදුපාන සාලෛයිනාලේ අන්ත මක්කළ් - අන්රාටම් කූලිත්තොළිල් සෙය්තු උළෛක්කින්ර වර්ක්කත්තිනර් - මිකුන්ත පාතිප්පුක්කුම්, කෂ්ටමාන නිලෛක්කුම් උළ්ළාක්කප්පට්ටිරුක්කින්රාර්කළ්. මිකක් කුරෛන්ත වරුමානත්තෛප් පෙරුම් අප්පිරදේස මක්කළ්, තමදු පණත්තෛක් කොණ්ටුපෝය් මදුපානසාලෛයිලේ මදුපානත්තෛ වාංකුවතනාල්, අවර්කළාල් තමදු අන්රාට වාළ්ක්කෛයෛ නටත්ත මුඩියාත නිලෛ කාණප්පටුකින්රදු. ඉතනාල් කුටුම්පත්තිර්කුළ් සණ්ටෛ, සච්සරවු එන්රු පල පිරච්සිනෛකළ් ඒර්පටුකින්රන; මාණවර්කළ් පාතික්කප් පටුකින්රාර්කළ්. විසේසමාක, වටක්කු, කිළක්කිලේ කූටුතලාන මදුපානසාලෛකළ් අමෛක්කප්පට්ටිරුක්කින්රන. ඉන්ත මදුපානසාලෛකළෛක් කළෛයිරික්ක වේණ්ටුමෙන්පතෛ ඉන්ත ඉටත්තිල් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්. මදුපාන සාලෛකළෛ අමෛක්ක වේණ්ටුමෙන්රාල් සුර්රුලාප් පිරදේසංකළිල් අමෛත්තුක් කොළ්ළුංකළ්; ඒළෛ මක්කළ් වාළුකින්ර පිරදේසංකළිල් අමෛක්ක වේණ්ටාම් එන්පතෛක් කූරික්කොණ්ටු, නීලාවණෛයිල් අමෛක්කප්පට්ට මදුපාන සාලෛයෛ මට්ටුමන්රිත් තමිළර්කළ්, සිංකළවර්කළ් වාළුකින්ර ඒනෛය පිරදේසංකළිල් තේවෛයිල්ලාදු අමෛක්කප්පට්ට මදුපානසාලෛකළුක්කාන අනුමතිප්පත්තිරංකළෛයුම් ඉරත්තුච්සෙය්ය වේණ්ටුමෙන්රු ඉන්ත ඉටත්තිල් කේට්ටුක් කොළ්ළ විරුම්පුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.14]

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුරා සැල් බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මැතිතුමා විසින් අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළා. මේ රටේ තිබුණු පැරණි දේශපාලන සංස්කෘතිය තුළ හැමදාම සුරා සැල් බලපත්‍ර ලබා දීලා තිබෙන්නේ, දේශපාලනඥයන්ට ලබා දෙන අල්ලස් විධියට. මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුත්, මේ සාකච්ඡාව අහගෙන ඉන්න මේ රටේ ජනතාවත් දන්නවා, තමන්ගේ ප්‍රදේශයේ මත්පැන් හල අයිති කාටද කියලා. හොයලා බැලුවොත්, දේශපාලන සම්බන්ධතාවක් මත තමයි ඒවා ලබාගෙන තිබෙන්නේ. එක් පක්ෂයකින් තවත් පක්ෂයකට මන්ත්‍රීවරුන් බාගන්නත්, මන්ත්‍රීවරයාට නිල වශයෙන් ලැබෙන වැටුප හෝ යම් වරප්‍රසාදයක් තිබෙනවා නම් ඒවාට අමතරව, ජීවිත කාලය පුරා මුදල් උපයා ගන්නත් දීපු අල්ලසක් විධියට තමයි මේ සුරා සැල් බලපත්‍ර අතීතය පුරාම දීලා තිබෙන්නේ. එවැනි තත්ත්වයක් තුළ තමයි, කලින් රජය විසින් දේශපාලනඥයන්ට හෝ වෙනත් පුද්ගලයන්ට අල්ලස් ලෙස ලබා දුන්නාය කියන සුරා සැල් බලපත්‍ර සම්බන්ධයෙන් මේ මොහොතේ මේ ප්‍රශ්න කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි බලපත්‍ර දෙනකොට සලකා බැලිය යුතු කාරණා තිබෙනවා. ඒ ප්‍රදේශයට එවැනි අවශ්‍යතාවක් තිබෙනවාද, ඒ ප්‍රදේශයේ ආර්ථික මට්ටම මොකක්ද, තිබෙන සංස්කෘතික, සමාජයීය තත්ත්වය මොකක්ද කියන කරුණු සලකා බලා තමයි එවැනි ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. නමුත් අපි දැක්කා, පසුගිය රජය විසින් මැතිවරණයක් කිට්ටු කරලා මැතිවරණයේ පටු දේශපාලන වාසි ලබා ගැනීම උදෙසා තමයි ඉතාම කෙටි කාලයක් ඇතුළත සුරා සැල් බලපත්‍ර විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙන්නේ. ඒ බලපත්‍රලාභීන් කවුද කියන එක දැනටමත් මේ පාර්ලිමේන්තුවට නම් වශයෙන් හෙළි කරලාත් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වත්මන් රජය විමර්ශනයක් කරමින් තිබෙනවා. අදාළ නිර්දේශ අනුගමනය කරමින්ද මේ බලපත්‍ර දීලා තිබෙන්නේ, අවශ්‍ය නෛතික ප්‍රතිපාදන අනුවද මේ කටයුත්ත කරලා තිබෙන්නේ කියන කරුණු සම්බන්ධයෙන් විමර්ශනයක් සිද්ධ වෙමින් පවතින මොහොතකයි අද මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ.

ජාතික ජන බලවේගය විධියට, ශ්‍රී ලංකාවේ වත්මන් රජය විධියට අපි මේ රටේ ජනතාවටත්, මේ පාර්ලිමේන්තුවටත් මේ මොහොතේ පැහැදිලි ප්‍රකාශයක් කරනවා, පැවැති පරණ දේශපාලන සංස්කෘතිය අනුව යමින් අල්ලස් ලෙස එහෙම නැත්නම් මන්ත්‍රීවරයෙකුට හෝ වෙනත් පුද්ගලයෙකුට ලබා දෙන වරප්‍රසාදයක් විධියට කිසිදු සුරා සැල් බලපත්‍රයක් ජාතික ජන බලවේගය රජය යටතේ මෙතෙක් ලබා දීලාත් නැහැ, ලබා දෙන්නේත් නැහැ කියලා. යම් බලපත්‍රයක් දැනටමත් නිකුත් කර තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් අදාළ නිර්දේශ මත කටයුතු කර තිබෙනවාද, නෛතික අවශ්‍යතා සම්පූර්ණ කර තිබෙනවාද කියන එක පිළිබඳවත් විමර්ශනයක් පවත්වනවා.

විමර්ශනයක් පවත්වා, ඒ සම්බන්ධයෙන් යම් පුද්ගලයෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුව තිබෙනවා නම්, ඒ නීතිමය ක්‍රියා මාර්ග ගන්නවා. ඒ වාගේම, එවැනි නිශ්චිත උපමාන ඉෂ්ට කරලා නැත්නම්, ඒවා අවලංගු කිරීමේ හැකියාව පවතින අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් ද කටයුතු කරනවා. එසේ ක්‍රියා කිරීමට ජාතික ජන බලවේගය රජය පසුබට වන්නේ නැහැ කියන එක අවසාන වශයෙන් මා ප්‍රකාශ කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.18]

ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව අපේ පැත්තෙන් යම් කරුණු දැක්වීමක් කරන්න මම කැමැතියි. ඒ ගරු මන්ත්‍රීතුමා මොනවා කිව්වත්, අපේ දේශපාලන භාවිතාව පිළිබඳව එතුමාටත් යම් අදහසක් තිබෙනවා කියා මා හිතනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව ලෙස අපි දන්නවා, බාර් දේශපාලන සංස්කෘතිය මොකක්ද කියලා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළා වාගේම අපේ රටේ හැමදාම තිබුණු ඒ තත්ත්වය, සිංහල, දෙමළ, මුස්ලිම් මන්ත්‍රීවරුන් අතර විතරක් තිබුණු තත්ත්වයක් කියලා මා විශ්වාස කරන්නේ නැහැ. අපේ රටේ දේශපාලන සංස්කෘතිය තුළ, දේශපාලන පක්ෂවලින් එන මන්ත්‍රීවරුන්ගේ ඊළඟ බලාපොරොත්තුව වුණේ, බාර් පර්මිට් එකක් ගන්නා එක. ඒක තමයි අපේ රටේ තිබුණු දේශපාලන සංස්කෘතිය. ඒ බාර් පර්මිට් එක ලබා ගැනීම තමන්ගේ ඊළඟ මැතිවරණ ව්‍යාපෘතියේ, එහෙම නැත්නම් තමන්ගේ ඊළඟ මැතිවරණ project එකේ අංගයක් ලෙස තමයි තිබුණේ. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පිළිගන්නවා ඇති, අපි ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කර තිබෙන බව.

ඔබතුමා මතු කළා වාගේම, ඔබතුමාගේ යෝජනාව ස්ථිර කරපු ගරු මන්ත්‍රීතුමා මතු කළා වාගේම, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව - මේ ජනතාවාදී ආණ්ඩුව - ආපු ගමන් පළමු පියවරේදීම කළ දෙයක් තිබෙනවා. අපට කළ හැකිව තිබූ පළමුවැනි දේ තමයි, මෙතැනින් එහාට විමර්ශනයකින් තොරව, ආර්ථික වශයෙන් වටිනාකම් පිළිබඳ අදහසක් නොමැතිව, සංචාරක කර්මාන්තය පිළිබඳ අදහසක් නොමැතිව බාර් පර්මිට් ලබා දීම නතර කිරීම. නීත්‍යානුකූලව මිනිසුන්ට මත් වෙන්න තිබෙන අයිතියත් අපි පිළිගන්නවා.

ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු එරංග ගුණසේකර මහතා
(මාණ්පුමිකු එරංක ගුණසේකර)
(The Hon. Eranga Gunasekara)
ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වෙලාවක් තිබෙන්නේ.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කිරීමක් කරගන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කැමැතියි. මට මයික් එක පොඩ්ඩක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තත්පර 30 කාලයක් දෙන්නම්.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පැහැදිලි කිරීම මේකයි. ඔය කථා ඔක්කොම අපිත් ඇහුවා, රටේ ජනතාවත් ඇහුවා. රටේ ජනතාව ඒක නේ ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ. රටේ ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දුන්නා. හැම මන්ත්‍රීවරයාම බාර් පර්මිට් ගත්තු අය නෙවෙයි. ඒක නිසා තමයි, ඔබතුමන්ලා දිස්ත්‍රික්ක ගොඩක් දිනන කොට, මඩකලපුව දිස්ත්‍රික්කයෙන් අපිවත් දිනවලා පාර්ලිමේන්තුවට එව්වේ. ඒක නිසා හැමෝම ඒ සංස්කෘතියේ නැහැ. අපේ පැහැදිලි කිරීම මේකයි. ජනාධිපතිවරයා රැස්වීම්වලදී කිව්වා, අපි ආපු ගමන් මේ බාර් පර්මිට් ඔක්කොම cancel කරනවා කියලා. ඒක කරලා නැහැ. ඒකයි මම කියන්නේ. ඉතින් ආපහු ආපහු ඒ කථාවම කියලා වැඩක් නැහැ නේ.

ගරු එරංග ගුණසේකර මහතා
(මාණ්පුමිකු එරංක ගුණසේකර)
(The Hon. Eranga Gunasekara)
ඒක තමයි මම මේ කියන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විධියට ඔබතුමාට අදහසක් එන්න ඕනෑ, අපි මේ කර ගෙන යන්නේ මොකක්ද කියලා. අපි බලයට ඇවිල්ලා මාස දෙකහමාරක් වෙනවා. ඒ වාගේම, අපි දැන් අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ අය වැය ඉදිරිපත් කිරීම තුළින් ඔබතුමා දරන අදහසම තමයි අපිත් දරන්නේ. ඒ ගැන කිසිදු ගැටලුවක් අපට නැහැ. *[බාධා කිරීමක්]* එහෙම නම්, අපි මේ කරන්නේ මොකක්ද? ඕනෑ නම් අපට පුළුවන්කම තිබුණා, අප ආපු ගමන් මේ ආණ්ඩුව තුළින් නැවත බාර් පර්මිට් දෙන්න. නමුත්, අපි බලයට ආපු පළමුවැනි අවස්ථාවේම ජනාධිපතිවරයා විසින් ඒක නතර කරලා තිබෙනවා. ඒ වාගේම, මිනිහෙකුට මත් වෙන්න තිබෙන අයිතියත් අපි පිළිගන්නවා. හැබැයි, ඔබතුමා මතු කළා වාගේම, මෙහිදී අල්ලස් ලබා දීමක් සිදු වෙලා තිබෙනවා. අපි ආපු විගස ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ඒ අදාළ නම් ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඔබතුමා කිව්වා වාගේම ඒ තිබෙන්නේ නම් ටිකක් විතරක් තමයි. එතැනින් එහාට අපි මොකක්ද කරන්න ඕනෑ? එතැනින් එහාට කරන්න ඕනෑ අදාළ විමර්ශන කටයුතු ආරම්භ කිරීමයි. අපි දැන් එය ආරම්භ කරලා තිබෙනවා. ඒ විමර්ශන කටයුතු ආරම්භ කරලා, ඔබතුමා කිව්වා වාගේම,-

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
කවුද විමර්ශනය කරන්නේ?

ගරු එරංග ගුණසේකර මහතා
(මාණ්පුමිකු එරංක ගුණසේකර)
(The Hon. Eranga Gunasekara)
විමර්ශනය මේ රජයෙන් කරනවා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(මාණ්පුමිකු චාණක්කියන් රාජපුත්තිරන් இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ආයතනය මොකක්ද?

ගරු එරංග ගුණසේකර මහතා
(මාණ්පුමිකු එරංක ගුණසේකර)
(The Hon. Eranga Gunasekara)
විමර්ශනය මේ රජයෙන් කරනවා. අපේ අමාත්‍යාංශයෙන් ඒකට අදාළ පිළිතුර ඔබතුමාට ලැබෙයි. ඒ ගැන කිසිදු සැකයක් හිතන්න එපා. අපි ජාතික ජන බලවේගය විධියට වගකීම් සහගතව මේ පාර්ලිමේන්තුවේදී ඔබතුමාට කියනවා, ඒ නම් අපි මීට පෙර ඉදිරිපත් කළා, ඒ නම් අනුව අනිවාර්යයෙන් දේශපාලන අල්ලස් ලබා දීමක් තමයි සිදු වෙලා තිබෙන්නේ, ඒ පිළිබඳ විමර්ශන කටයුත්තක් කරනවා, ඒ විමර්ශන කටයුතු කරලා ඔබතුමා කිව්වා වාගේ ඒ නමට උඩින් තිබෙන දේශපාලනඥයාගේ නම අපි මේ පාර්ලිමේන්තුවේදී අනිවාර්යයෙන් හෙළිදරව් කරනවා කියලා. අපි ඒ පණිවුඩය ලබා දෙනවා; අපි ඒක කරනවා.

ඒ වාගේම අපි ඔබතුමාට කියනවා, අපි මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරමින් සිටින බව. අපේ ජනාධිපතිවරයාත්, අපේ රටේ මන්ත්‍රීවරුත්, අපේ ඇමතිවරුත් බාර් පර්මිට් දීලා නැහැ. හැබැයි, ඔබතුමාත් දන්නවා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ එවැනි මන්ත්‍රීවරයෙක් හිටපු බව. දැන් නම් ඔහු පරාදයි. හැබැයි, මොකක්ද ඔහු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහිල්ලා කිව්වේ? මම පරම්පරා අරක්කුකාරයෙක් කිව්වා. සල්ලි හොයන විධිය මගෙන් අහන්න එපා කිව්වා. කුරුණෑගල රාජ්‍ය අමාත්‍යවරයෙකුත් හිටියා. ඔබතුමාත් දන්නවා ඇති, සාමාන්‍යයෙන් බාර් පර්මිට් එකක් ගනිද්දී මූලික නිර්දේශ තිබෙන බව. හැබැයි, ඒ අදාළ මන්ත්‍රීවරයාගේ පුතාගේ -ඔහු බාල වයස්කාරයෙක්- නමට පර්මිට් අරගෙන තිබුණා. එවැනි දේශපාලන සංස්කෘතියක් තිබුණේ.

ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ අපට විවාදයක් නැහැ. එතුමාගේ මැදිහත් වීම පිළිබඳව විවාදයක් අපට නැහැ. නමුත්, අප කරුණු දැක්විය යුතුයි, ඔබතුමාගේ කරුණු දැක්වීම ඇතුළේ අසාධාරණ විධියට කියැවෙන දේවල් ගැන. ඒවා තමයි, අපේ ආණ්ඩුව ඇවිල්ලා මේ ගැන හොයන්නේ නැහැ, අපි හංගාගෙන ඉන්න හදනවා, අපි ගේමක් ගහනවා වාගේ කාරණා. හැබැයි, ඔබතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා අපි එහෙම කරන්නේ නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ හඬම තමයි අප අතර තිබෙන්නේත්. ඔබතුමා මතු කරන අදහසම තමයි අපට තිබෙන්නේත්. වෙනත් කිසිදු දෙයක් නැහැ. ඒ නිසා අපි මේ දේවල් හෙළිදරව් කරනවා; මේ වෙනුවෙන් මැදිහත් වෙනවා. ඒ නිසා මේ පිළිබඳ වැරදි අර්ථකථනයක් ගෙනෙන්න එපා. අපි මෙහි තිබෙන ආර්ථික වටිනාකමත්, මිනිසුන්ට මත් වෙන්න තිබෙන අයිතියත් පිළිගන්නා අතරම, නිවැරදි විමර්ශනයක් තුළින් මේ පිළිබඳ අල්ලස් ක්‍රියාවලිය ඇතුළු ඊට මැදිහත් වෙලා ඉන්න දේශපාලනඥයන්ගේ නම් අනිවාර්යයෙන් මේ පාර්ලිමේන්තුවට හෙළිදරව් කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මැදිහත් වීම අපි අගය කරනවා. නමුත්, ඒක ඇතුළේ පොඩි කුහක අදහසකුත් තිබෙනවා කියන එක තමයි මට හිතුණේ. ඒ පිළිබඳ මගේ විරෝධය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.24]

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සඳහා පිළිතුර මෙසේයි.

(52 වන අධිකාරිය වූ) සුරාබදු ආඥාපනත යටතේ 28(අ)(1) වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් ප්‍රධාන අධිකාරියට බලපත්‍රයක් ප්‍රදානය කිරීමට හෝ බලපත්‍රයක් අලුත් කිරීමට, බලපත්‍රයක් අවලංගු කිරීමට විධානය කරනු ලැබිය හැකි අතර, ඒ අධිකාරිය විසින් ඒ විධාන බලාත්මක කළ යුතුයි.

අම්පාර, පෙරියනීලමණී ප්‍රදේශයේ පවතින ස්ථානයක් සඳහා කෑගල්ල බෙවරේජස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙත ර.බී. 04 -රට බීම- සුරාබදු බලපත්‍රයක්, එහෙම නැත්නම් මත්පැන් සිල්ලරට විකිණීමේ සුරාබදු බලපත්‍රයක් ලබා දීම සඳහා එවකට මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අනුමැතිය ලබා දී තිබෙනවා. වත්මන් ගරු ජනාධිපතිවරයා වන අනුර කුමාර දිසානායක මැතිතුමා මුදල් අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දුන් පසු කිසිදු සුරාබදු බලපත්‍රයක් මෙතෙක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා, යම්කිසි ආයතනයක් පටන්ගන්න යනවා කියලා. නමුත්, මා සඳහන් කළා වාගේ වර්තමාන ජනාධිපතිවරයා දිවුරුම් දීමෙන් පසුව කිසිදු සුරාබදු බලපත්‍රයක් මෙතෙක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී නැහැ. කෙසේ වෙතත්, පසුගිය රජය යටතේ නිකුත් කර ඇති බලපත්‍ර සම්බන්ධයෙන් සොයා බැලීමට වත්මන් රජය විසින් මේ වන විටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව තවදුරටත් දන්වා සිටිනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධ විමර්ශනයක් සිදු වන බැවින්, අදාළ ආයතන ඒකට සම්බන්ධ වෙලා, අදාළ resources ඒකට යොමු කරවා තිබෙන බැවින්, ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු හෙළි කිරීම සුදුසු නැති බව ඔබතුමාත් පිළිගන්නවා ඇතැයි මම හිතනවා.

නමුත්, මේ වර්තමාන දේශපාලන සංස්කෘතිය, ජාතික ජන බලවේගය මේ ඉදිරිපත් කරපු ක්‍රමය ජනතාව පිළිගත්තාට පස්සේ දේශපාලනඥයන් නීතිය අතට අරගෙන ක්‍රියා කරන වැඩ පිළිවෙළක් නොවෙයි රටේ තිබෙන්නේ. හිතු මතයට දීපු ඒවා තහනම් කරන එක හෝ හිතු මතයට දෙන එක හෝ වෙනුවට නීතියට අනුව අදාළ විමර්ශන කඩිනමින් සිදු කරනවා. ඒකට සුදුසු නිලධාරීන් සම්බන්ධ කරගෙන, අපක්ෂපාතී නිලධාරීන් සම්බන්ධ කරගෙන ඒ වැඩ කටයුතු කිරීමට වර්තමාන රජය බැඳී සිටිනවා. ඒ වාගේම, ඔබතුමා සඳහන් කළා, ඒ පළාතේ සංචාරක ව්‍යාපාරයට අයත් නොවන අයටත් බාර් පර්මිට් දීලා තිබෙනවා කියලා. සංචාරක ව්‍යාපාරය නහා සිටුවන්න,- *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දෙන්න. මේ පිළිතුර අහගෙන ඉන්න පොඩ්ඩක්. සංචාරක ව්‍යාපාරය නහා සිටුවීමට වර්තමාන රජය විශාල වැඩ පිළිවෙළක් සූදානම් කර තිබෙනවා.

[බාධා කිරීමක්] බාර් පර්මිට් දීලා සංචාරක ව්‍යාපාරය අම්පාරේ කරන එක නොවෙයි වර්තමාන රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. වර්තමාන රජයේ ප්‍රතිපත්තිය වී තිබෙන්නේ ඒ පළාත නහා සිටුවන්න, දිස්ත්‍රික්ක නහා සිටුවන්න අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීලා වැඩ කටයුතු සාර්ථකව කරගෙන යෑමයි. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, එතුමාට බාධා නොකරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

උදාහරණයක් ගනිමු. මේ අය වැයෙන් නැගෙනහිර පළාත සංවර්ධනය කිරීම සඳහා බාර් පර්මිට් දීලා නොවෙයි මේ ආණ්ඩුව සල්ලි හොයන්නේ. ඒ පළාත සංවර්ධනය කරන්නට, දරුවන්ට ක්‍රමයක් හදලා දෙන්නට, සෞඛ්‍යයට රුපියල් බිලියන 604ක් වෙන් කරලා තිබෙනවා, අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් වෙන් කරලා තිබෙනවා. පාරවලට රුපියල් බිලියන 355ක් වෙන් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ වාගේම තමයි මේ නව නගර සංකල්පය අනුව නව සංචාරක ව්‍යාපාර දියුණු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළත් යෝජනා කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීතුමා, කලින් කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම අපේ සංස්කෘතිය වී තිබෙන්නේ, බාර් පර්මිට් පාවිච්චි කරලා දේශපාලනය කරන ක්‍රමයක් නොවෙයි. *[බාධා කිරීමක්]* අපේ ක්‍රමය තමයි වැරදි සිදු වෙලා තිබෙනවා නම්, ඒවාට අවශ්‍ය විමර්ශන නිසි කලට වේලාවට කරලා, ඒ විමර්ශනවලට අනුව කටයුතු කිරීමයි. ඒවා හදිසියට කරන්න පුළුවන් දේවල් නොවෙයි. මොකද, මුදල් ඇමතිවරයෙකු ලබා දීපු බලපත්‍රයක් පිළිබඳවයි මේ කථා කරන්නේ. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, එතුමාට දිගින් දිගටම බාධා කරන්න එපා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තවත් මිනිත්තුවක කාලයක් තිබෙන්නේ.

ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Presiding Member, I rise to a point of Order. - *[Interruption.]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙපැත්තම බලන්න ඕනෑ.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *[බාධා කිරීමක්]* ඒ අවශ්‍ය විමර්ශන අවසන් කිරීමෙන් පසුව මේ ගරු සභාවට නිසි දැනුවත් කිරීම් කරන්න බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි. *[බාධා කිරීමක්]*

ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෙමෙතාන්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 පෙබරවාරි 06 වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 21 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොළුතු, පි.ප 6.30 මණියාකිවිටවේ මාණ්ඩලික තලෙමෙතාන්කුම් උරුප්පිනර් අවර්කළ් විනා විටුක්කාමලේයේ පාරාළුමන්රත්තෛ ඔත්තිවෛත්තාර්.

අතන්පටි පාරාළුමන්රම්, අතනුටෙ 2025 පෙට්‍රුවාරි 06ආම් තිකතිය තීර්මානත්තිර්කිණංක, 2025 පෙට්‍රුවාරි 21, වෙළ්ළික්කිළමෛ මු.ප. 9.30 මණිවරෙ ඔත්තිවෛක්කප්පට්ටතු.

It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned until 9.30 a.m. on Friday, 21st February, 2025 pursuant to the Resolution of Parliament of 06th February, 2025.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

කේ.ඒ. නිහාල් මහතාගේ විශ්‍රාම වැටුප: ප්‍රමාදය
திரு. கே.ஏ. நிஹாலின் ஓய்வூதியம்: தாமதம்
PENSION OF MR. K.A. NIHAL: DELAY

487/2025

1. ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(මාණ්ඩලික ෆී.කේ. ජයසුන්දර)
(The Hon. T.K. Jayasundara)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1984.07.03 සිට 2020.03.18 දක්වා වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයකු ලෙස සේවය කර විශ්‍රාම ගෙන ඇති කහවුව ආරච්චිගේ නිහාල් මහතාගේ විශ්‍රාම වැටුප ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරාපිටිය ශික්ෂණ රෝහල මඟින් මේ දක්වා ඉටුකර නොමැති බවත්;

(ii) ඒ මහතා විශ්‍රාම ගෙන වර්ෂ 05ක් ගත වුවත්, ඔහුගේ විශ්‍රාම වැටුපට අදාළ කටයුතු අවසන් නොකිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ දුර්වලතාවක් බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) කරාපිටිය රෝහල් අධ්‍යක්ෂකගේ අංක: FQ/02/2018 හා 2023.12.08 දිනැති ලිපිය අනුව පත්කර ඇති මූලික විමර්ශන මණ්ඩලයේ වාර්තාව පිළිගෙන, අදාළ අයකිරීම් කර, විශ්‍රාම කටයුතු සඳහා ලේඛන නිදහස් නොකිරීමට හේතුව;

(ii) එම වාර්තාව සම්බන්ධයෙන් නිහාල් මහතා දැනුවත් නොකිරීමට හේතුව;

(iii) ඉහත (i)හි සඳහන් වාර්තාව පිළිනොගන්නේ නම්, ඊට හේතුව;

(iv) එසේ නම්, මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග;

(v) එම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිහාල් මහතා දැනුවත් නොකිරීමට හේතුව;

(vi) 2020 වර්ෂයේ සිට පාකින්සන් රෝගයෙන් පෙළෙන නිහාල් මහතාගේ විශ්‍රාම වැටුප සකස් කිරීම ප්‍රමාද කරන නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්න මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1984.07.03ஆம் திகதி முதல் 2020.03.18ஆம் திகதி வரையில் மருத்துவ ஆய்வுகூடத் தொழில்நுட்ப வல்லுநராகப் பணியாற்றி ஓய்வுபெற்றுள்ள கஹதுவ ஆராச்சிகே நிஹால் என்பவர் அவரது ஓய்வூதியத்தைப் பெறுவதற்குத் தேவையான நடவடிக்கைகள் கராப்பிட்டிய போதனா வைத்தியசாலையால் இதுவரை மேற்கொள்ளப்படவில்லை என்பதையும்;

(ii) இவர் ஓய்வுபெற்று 5 வருடங்கள் கழிந்துள்ளபோதிலும், இவரது ஓய்வூதியம் தொடர்பான பணிகளை நிறைவுசெய்யாமை சுகாதார அமைச்சின் பலவீனம் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) கராப்பிட்டிய வைத்தியசாலைப் பணிப்பாளரின் FQ/02/2018 இலக்கம்கொண்ட 2023.12.08ஆம் திகதிய கடிதத்திற்கமைய நியமிக்கப்பட்டுள்ள பூர்வாங்க விசாரணைக் குழுவின் அறிக்கையினை ஏற்று, உரிய அறவீடுகளை மேற்கொண்டு, ஓய்வூதிய விடயங்களுக்காக ஆவணங்களை விடுவிக்காமல் இருப்பதற்கான காரணம் யாதென்பதையும்;

(ii) மேற்படி அறிக்கை தொடர்பில் நிஹால் அவர்களுக்கு அறிவிக்காமல் இருப்பதற்கான காரணம் யாதென்பதையும்;

(iii) மேலே (i)இல் குறிப்பிடப்பட்ட அறிக்கையை ஏற்றுக்கொள்ளவில்லை எனில், அதற்கான காரணம் யாதென்பதையும்;

(iv) அவ்வாறாயின், இது தொடர்பாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(v) மேற்படி நடவடிக்கைகள் குறித்து நிஹால் அவர்களுக்கு அறிவிக்காமல் இருப்பதற்கான காரணம் யாதென்பதையும்;

(vi) 2020ஆம் ஆண்டு முதல் பார்க்கின்சன் நோயினால் பாதிக்கப்பட்டுள்ள நிஹால் அவர்களின் ஓய்வூதியத்தைத் தயார்படுத்துவதற்குத் தாமதப்படுத்தும் அலுவலர்களுக்கு எதிராக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he accept that -

(i) the Karapitiya Teaching Hospital has not yet carried out the necessary steps to enable Mr. Kahaduwa Arachchige Nihal, who had served as a Medical Laboratory Technologist from 03.07.1984 and retired on 18.03.2020, to obtain his pension; and

(ii) even though 05 years has lapsed since his retirement, leaving the work relating to the payment of his pension incomplete is a weakness of the Ministry of Health?

(b) Will he inform this House-

(i) the reason for not accepting the report of the Preliminary Inquiry Board appointed pursuant to the letter No. FQ/02/2018 of the Director of Karapitiya Hospital dated 08.12.2023 and releasing the documents required for his retirement after charging him the relevant dues;

(ii) the reason for not informing Mr. Nihal about the said report;

(iii) if the report mentioned in (i) above is not accepted, the reason for that;

(iv) if so, the actions that have been taken in this regard;

(v) the reasons for not informing Mr. Nihal about the actions concerned; and

(vi) the actions that will be taken against the officers who are delaying the processing of the pension of Mr. Nihal, who is suffering from Parkinson's disease since the year 2020?

(c) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

(අ) (i) වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ කේ.ඒ. නිහාල් මහතා ගාල්ල ජාතික රෝහලේ ප්‍රධාන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ලෙස 2016 මාර්තු මස සිට 2020.03.17 දින දක්වා සේවය කර ඇත. එම කාල සීමාවේ ඔහු රෝහල් රසායනාගාරයේ පාරිභෝජ්‍ය ගබඩා භාරව ද කටයුතු කර ඇත. එහිදී රෝහල් ගබඩාවෙහි පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, යන්ත්‍ර, විශේෂිත ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩවල පොත්වල පැවති ශේෂයන් හා භෞතික ශේෂයේ වෙනසක් නිරීක්ෂණය වී ඇති අතර ඒ පිළිබඳව මූලික පරීක්ෂාවක් සිදු කර ඇත. ඉන් අනතුරුව පොත්වල පැවති ශේෂයේ හා භෞතික ශේෂයේ නොගැළපීම් හඳුනාගෙන ඇති අතර, ඒ මහතාගෙන් අය කරගත යුතු මුදල නිශ්චය කර ගැනීම සඳහා මුදල් රෙගුලාසි 104(4) යටතේ පරීක්ෂණයක් 2024.09.09 දින ආරම්භ කර ඇති අතර අදාළ පරීක්ෂණය අවසන් වීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය.

(ii) නැත.

(ආ) (i) ඉහත අ (i)හි දක්වා ඇති පරිදි, රජයේ මුදල් රෙගුලාසිවලට අනුව රජයට සිදු වූ අලාභ හානි හඳුනාගැනීම සඳහා මුදල් රෙගුලාසි 104(4) යටතේ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබා ගත යුතුය.

(ii) මූලික පරීක්ෂණ වාර්තාව අදාළ නිලධාරියා වෙත ලබාදීමක් සිදු නොකරන අතර අවසන් අදියරේ පවතින පූර්ණ පරීක්ෂාව අවසානයේදී ඔහුට අදාළව ලබා දෙන නිර්දේශ ලිඛිතව දැනුම් දීම සිදු කිරීමට නියමිත වේ. එහෙත් ඔහු සහ ඔහුගේ බිරිඳ මෙම කරුණ පිළිබඳව ගාල්ල ජාතික රෝහලෙන් දුරකථනයෙන් විමසූ විට පරීක්ෂණවල ප්‍රගතිය ඔවුන් වෙත දැනුම් දී ඇත.

(iii) රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ, මුදල් රෙගුලාසි 104(4) අනුව අලාභ හානි ගණනය සඳහා පරීක්ෂණයක් සිදු කළ යුතු බැවිනි.

(iv) ඉහත අ (i)හි දක්වා ඇත.

(v) ඉහත ආ (ii)හි දක්වා ඇති පරිදි.

(vi) කේ. ඒ. නිහාල් මහතාගෙන් අය විය යුතු අලාභ ගණනය කිරීම සම්බන්ධ පරීක්ෂණ සිදු කිරීම සංකීර්ණ කටයුත්තක් වී ඇති බැවින් (වර්ෂ ගණනාවක ඉන්වෙන්ට්‍රි ලේඛන, ලිපිගොනු, බිල්පත් අධ්‍යයනය හා පරීක්ෂා කිරීම සිදු කළ යුතුය) ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වී ඇත.

තවද පරීක්ෂණයට අදාළ කමිටු වාර්තාව 2025 පළමු කාර්තුව තුළ ලැබීමට නියමිත බැවින්, ඒ අනුව විශ්‍රාම වැටුප් සකස් කිරීමට අදාළ කටයුතු නොපමාව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

(அ) (i) மருத்துவ ஆய்வுகூடத் தொழில்நுட்பவியலாளர் திரு.கே.ஏ. நிஹால் அவர்கள் காலி தேசிய வைத்தியசாலையில் பிரதான மருத்துவ ஆய்வுகூடத் தொழில்நுட்பவியலாளராக 2016 மார்ச் மாதம் முதல் 2020.03.17ஆம் திகதி வரை பணியாற்றியுள்ளார். அந்தக் கால கட்டத்தில் அவர் வைத்தியசாலை ஆய்வுகூடத்தில் நுகர்வுப் பொருட்கள் களஞ்சியத்திற்கும் பொறுப்பாளராகச் செயற்பட்டுள்ளார். அதன்போது வைத்தியசாலைக் களஞ்சியத்தின் நுகர்வுப் பொருட்கள், இயந்திரங்கள், விஷேட பொருட்கள் மற்றும் கண்ணாடிப் பொருட்கள் என்பனவற்றின் புத்தக இருப்புக்கும் பௌதிக இருப்புக்கும் இடையில் மாற்றம் அவதானிக்கப்பட்டுள்ளதுடன், அதுதொடர்பில் ஆரம்பகட்ட ஆய்வு நடத்தப்பட்டது. அதைத் தொடர்ந்து, புத்தகங்களில் உள்ள இருப்புக்கும் பௌதிக இருப்புக்கும் இடையிலான முரண்பாடுகள் அடையாளம் காணப்பட்டு, அவரிடமிருந்து அறவிடப்பட வேண்டிய தொகையைத் தீர்மானிப்பதற்காக நிதி ஒழுங்குவிதி 104 (4)இன் கீழ் ஒரு விசாரணை 2024.09.09ஆம் திகதி ஆரம்பிக்கப்

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

පට්ටුල්ලතුඩන්, උරිය විසාරණෙ නිරෙවඩෙන්දතුම් ඔය්වුදියම් වළඞ්ගුවදු තොඩර්බාග නඩවඩික්කෙ එඩුක්ක මුඩියුම්.

(ii) ඉල්ලෙ.

(ආ) (i) මේලෙ අ(i)ඉල් කුරිප්පිඩප්පට්ටුල්ලවාරු, අරස නිදි ඔළුඞ්ගුවිදිකළින්බඩි අරසාඞ්කත්තිර්කු ඒර්පට්ට ඉළප්පු මර්රුම් නට්ටත්තෙ ඉනඞ්කාණ්බදර්කු නිදි ඔළුඞ්ගුවිදි 104(4)ඉන් කීළ් විසාරණෙ නඩත්තප්පට්ටු ඕර් අරික්කෙ පෙරප්පඩල් වේණ්ඩුම්.

(ii) ආරම්ප විසාරණෙ අරික්කෙ සම්පන්දප්පට්ට උත්තියෝකත්තරුක්කු වළඞ්කප්පඩමාට්ටාදු එන්බදුඩන්, ඉරුදික් කට්ටත්තිල් ඉරුක්කුම් මුළු විසාරණෙයින් ඉරුදියිල් තොඩර්පුඩෙය පරින්දුරෙකළ් කුරිත්දු අවරුක්කු එළුත්දුමූලමාග අරිවික්කප්පඩුම්. ඉරුප්පිනුම්, අවරුම් අවරදු මනෙවියුම් ඉන්ද විඩයම් කුරිත්දුත් තොලෛපේසියිල් කාලි දේසිය වෛත්තියසාලෙයිල් විසාරිත්තපෝදු විසාරණෙකළින් මුන්නේර්රම් කුරිත්දු අවර්කළුක්කුත් තෙරිවික්කප්පට්ටදු.

(iii) අරස නිදි ඔළුඞ්ගුවිදිකළ් කෝවෛයින්, නිදි ඔළුඞ්ගුවිදි 104(4)ඉන්පඩි, ඉළප්පුකළෛක් කණක්කිඩ ඔරු විසාරණෙ නඩත්තප්පඩ වේණ්ඩුම්.

(iv) මේලෙ අ (i) ඉල් කුරිප්පිඩප්පට්ටුල්ලදු.

(v) මේලෙ ආ (ii) ඉල් කුරිප්පිඩප්පට්ටුල්ලවාරු.

(vi) තිරු. කේ.ඒ. නිහාල් අවර්කළිඩමිරුන්දු අරවිඩ වේණ්ඩිය ඉළප්පුකළෛක් කණක්කිඩුවදු තොඩර්පාන විසාරණෙ ඔරු සික්කලාන පණියාග ඉරුප්පදාල් (පල ආණ්ඩුකළුක්කුරිය ඉරුප්පුප් පදිවේඩුකළ්, කෝප්පුකළ්, පිල්කළෛ ආරාය්දල් මර්රුම් සෝදනෙ මේර්කොළ්ළප්පඩ වේණ්ඩුම්.) අදර්කාග ඔරු කුරිප්පිඩත්තක්ක කාලම් එඩුත්තුළ්ළදු.

මේලුම්, විසාරණෙ තොඩර්පාන කුළුවින් අරික්කෙ 2025ආම් ආණ්ඩින් මුදල් කාලාණ්ඩිල් පෙරප්පඩ උළ්ළදාල්, අදර්කේර්ප ඔය්වුදියත්දෛත් දයාරිප්පදර්කුත් දේවෙයාන නඩවඩික්කෛකළ් දාමදමින්රි මේර්කොළ්ළප්පඩුම්.

(இ) එළවිල්ලෙ.

(a) (i) Mr. K.A. Nihal, Medical Laboratory Technologist, had been serving as the Chief Medical Laboratory Technologist in the National Hospital, Galle from March, 2016 to 17.03.2020. In the course of that time, he was also in charge of the Consumable Stores in the Laboratory of the Hospital. A difference between the ledger balance and the physical balance of consumables, machineries, special materials and glassware items in the stores of the Hospital had been observed and a preliminary inspection had been conducted. Thereafter, after identifying the inconsistencies between the ledger balance and the physical balance, an investigation has been commenced to ascertain the amount to be recovered from the officer in terms of Financial Regulation No. 104(4) on 09.09.2024. Payment of the pension can be dealt with after completion of the relevant investigation.

(ii) No.

(b) (i) As stated in (a)(i) above, in accordance with the Government Financial Regulations, an inquiry has to be conducted under Financial Regulation No. 104(4) to identify the losses and damages occurred and a report should be obtained in this regard.

(ii) The report of the preliminary investigation is not provided to the relevant officer and at the end of the final investigation, which is in the final stage, the officer will be notified in writing of the recommendations given in that regard. However, when the officer and his wife enquired in this regard through telephone from the National Hospital, Galle, they were informed about the progress of the investigation.

(iii) Since an inquiry has to be conducted in terms of the Financial Regulation No. 104(4) of the Government Financial Regulations to calculate the losses and damages.

(iv) Stated in (a)(i) above.

(v) Stated in (b)(ii) above.

(vi) Since the investigation related to the calculation of the losses and damages by Mr. K.A. Nihal has become a complex affair, (inventory documents, files and receipts of many years have to be checked) it has taken a considerable period of time.

Further, the committee report relevant to the investigation is to be received during the first quarter of 2025 and activities related to the preparation of the pension will be carried out without delay.

(c) Does not arise.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

317 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 317 - இல. 05
Volume 317 - No. 05

2025 පෙබරවාරි 21වන සිකුරාදා
2025 பெப்ருவரி 21, வெள்ளிக்கிழமை
Friday, 21st February, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 පෙබරවාරි 21වන සිකුරාදා
2025 பெப்ருவரி 21, வெள்ளிக்கிழமை
Friday, 21st February, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා පත් කළ විශේෂ කමිටුවේ වාර්තාව [පිටුව 835]

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග [පිටුව 836]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 839-859]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

විදේශ සංචිත ඉලක්ක සහ ණය සේවා ලබා ගැනීම සඳහා සැලසුම් [පිටුව 859]

කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ හා මීද්දෙනියේ සිදු වූ වෙඩි තැබීම්:

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 861]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [හතරවන වෙන් කළ දිනය]:

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [පිටු 873 - 984]

කල් තැබීමේ යෝජනාව:

දුම්රියේ ගැටීමෙන් සිදුවන වනඇලි මරණ වැළැක්වීම [පිටු 985 - 998]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனாவின் நடத்தை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காக நியமிக்கப்பட்ட விசேட குழுவின் அறிக்கை [ப: 835]

பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதிசெய்ய எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் [ப: 836]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப:839- 859]

தனி அறிவித்தல் மூல வினா:

வெளிநாட்டு ஒதுக்க இலக்குகளை அடைவதற்கும் கடன் சேவைகளைப் பெறுவதற்குமான திட்டங்கள் [ப: 859]

கொழும்பு நீதவான் நீதிமன்ற வளாகத்திலும் மித்தெனியவிலும் இடம்பெற்ற துப்பாக்கிச் சூடுகள்:

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 861]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட நான்காம் நாள்]:

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 873 - 984]

ஒத்திவைப்புப் பிரேரணை:

புகையிரதம் மோதி யானைகள் இறப்பதைத் தடுத்தல் [ப: 985 - 998]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Report of Special Committee to Investigate into Complaints Regarding Conduct of Hon. (Dr.) Ramanathan Archchuna [Col. 835]

Measures Taken to Assure Security of Members of Parliament [Col. 836]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 839-859]

QUESTION BY PRIVATE NOTICE:

Plans for Achieving Foreign Reserve Targets and Debt Servicing [Col. 859]

SHOOTING INCIDENTS IN COLOMBO MAGISTRATE'S COURT AND MIDDENIYA:

Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 861]

APPROPRIATION BILL, 2025- [Fourth Allotted Day]:

Second Reading - Debate Adjourned [Cols. 873– 984]

ADJOURNMENT MOTION:

Prevention of Elephant Deaths Due to Collision with Trains [Cols. 985 - 998]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි 21වන සිකුරාදා
2025 பெப்ருவரி 21, வெள்ளிக்கிழமை
Friday, 21st February, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා පත් කළ විශේෂ කමිටුවේ වාර්තාව
மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனாவின் நடத்தை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காக நியமிக்கப்பட்ட விசேட குழுவின் அறிக்கை
REPORT OF SPECIAL COMMITTEE TO INVESTIGATE INTO COMPLAINTS REGARDING CONDUCT OF HON. (DR.) RAMANATHAN ARCHCHUNA

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මා වෙත ලද පැමිණිලි සැලකිල්ලට ගෙන ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා නියෝජ්‍ය කාරක සභා සභාපති ගරු හේමාලි වීරසේකර මහත්මියගේ සභාපතිත්වයෙන්, ගරු විජිත හේරත් මහතාගේ සහ ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ සාමාජිකත්වයෙන් යුත් මා විසින් පත් කරන ලද විශේෂ කමිටුවේ වාර්තාව සභාගත කරමි.

මෙම වාර්තාව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන බව දන්වනු කැමැත්තෙමි.

II

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
பாராளுமன்ற உறுப்பினர்களின் பாதுகாப்பை உறுதிசெய்ய எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள்
MEASURES TAKEN TO ASSURE SECURITY OF MEMBERS OF PARLIAMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලමින් වරින් වර මා වෙත යොමු කරන ලද ඉල්ලීම් පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව, ඒ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැඩ බලන පොලිස්පතිවරයා වෙත එම ඉල්ලීම යොමු කර ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු කථානායකතුමනි, ඉඹුල්ගොඩ, අමුණුගොඩ, කළුවල පාර, අංක 3බී දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඩී. ප්‍රේමතිලක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්නමි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, කොට්ටුකච්චිය, පුරාණගම යන ලිපිනයෙහි පදිංචි එන්.සී.එස්. ප්‍රේමලාල් මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, ඇඹිලිපිටිය, මොරකැටිය, නුගේ හරස් පාර, අංක 3393/5 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එදිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අශෝක ගුණසේන මහතා
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අලව්ව, පහළ වළකුඹුර, බලගල්ල වත්ත දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජී. ධර්මසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අලව්ව, පහළ වළකුඹුර, අංක 312/3 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එච්.ජී. හේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නන්දන පත්මකුමාර මහතා
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් අට පිළිගන්වමි.

(1) බණ්ඩාරගම, අටුළුගම, අඹගහවත්ත, අංක 52/ඩී දරන ස්ථානයෙහි පදිංචි අබ්දුල් රසීදු පාතුම්මා රාණි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) පයාගල, කව්වාගොඩ දරන ස්ථානයෙහි පදිංචි ඩී.එස්. විජේසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) නාගොඩ, බෝඹුවල පාර, පරණ පොලිස්වත්ත, අංක 49 දරන ස්ථානයෙහි පදිංචි ඊ.ඩී. නන්දසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) පානදුර, පිටවල, අළුබෝගහවත්ත, අංක 11/7 ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. ලලිත් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) කළුතර, කලමුල්ල, 29 කණුව අසල දරන ස්ථානයෙහි පදිංචි එම්.පී. ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) පොකුණුවිට, හේනේගම, බණ්ඩාරවත්ත, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි නුවන් මුහන්දිරම් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) බොරලැස්ගමුව, වැව පාර, එගොඩවත්ත පාර, අංක 23/30 දරන ස්ථානයෙහි පදිංචි තිලකා හේවාවිතාරණ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(8) වාද්දුව, හබරලගහලන්ද, සඳකැලුම් මාවත, අංක 65 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්. ගාමිණී නානායක්කාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු රුවන් මාපලගම මහතා
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දහතුන පිළිගන්වමි.

(1) රඹුක්කන, හුරීමළුව, මස්කඩේ වත්ත, අංක ඩී 92/2 දරන ස්ථානයෙහි පදිංචි අකුරන්ගේ චන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) ගෝනවිල, මාකඳුර (වයඹ), පන්සල පාර, අංක 349 දරන ස්ථානයෙහි පදිංචි බී.ඒ.ඒ. විමලවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) පිළියන්දල, මාම්පේ, වවනවත්ත පාර, අංක 306/බී දරන ස්ථානයෙහි පදිංචි ජී.පී.ටී.පී. වීරසේකර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) ගනේමුල්ල, ගලහිටියාව, අංක 139 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ. රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) රාගම, වල්පොල, උග්ගස්හේන, අංක 44/8 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ.යූ.ඒ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) නිට්ටඹුව, රන්පොකුණුගම 11 අදියර, අංක එෆ්/226 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ආර්.එස්. රූපසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) කොටුගොඩ, මිලේනියම් සිටි, කලාප 01, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. ක්‍රිෂාන්ති ෂ්‍යාමිනි මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(8) ගම්පහ, පෙතියාගොඩ, ඇහැලගහහේන, අංක 448 එන් 6 දරන ස්ථානයෙහි පදිංචි පී.සී.එස්. වීරසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) වේයන්ගොඩ, එස්සැල්ල, නයිවල, ජනඋදාන ගම, අංක 92 දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී.එන්. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(10) රාගම, වල්පොල පාර, අංක 128 දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී.පී. කුමාර ධර්මසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(11) මාබොදල, මාබොදල වත්ත, අංක 154/3/සී දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ.එම්. රණබාහු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(12) දෙවලපොළ, වල්පිටමුල්ල, අංක 137/1 බී දරන ස්ථානයේ පදිංචි ටී.ඒ. අයිරාංගනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(13) වැබඩ (උතුර), අංක 397/1 දරන ස්ථානයේ පදිංචි විජිතා කුමාරි වීරසූරිය මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු කංචන වැලිපිටිය මහතා
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) බෙලිගල, ඉහළ කලුගල, කරපනේ හන්දිය යන ලිපිනයේ පදිංචි බී.එස්. විජේකෝන් කුලතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොටියාකුඹුර, මත්තමගොඩ, "රත්නවාස", අංක ඒ 432 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.ඩී. වික්‍රමනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) නාවල, කොස්වත්ත පාර, අංක 160/4 දරන ස්ථානයේ පදිංචි ඒ.එස්. හෙට්ටිආරච්චි මහතාගෙන් ලැබණු පෙත්සම;

(2) හෝමාගම, පිටිපන උතුර, අංක 50/1 දරන ස්ථානයේ පදිංචි කේ.කේ. මාතාංග පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) පන්නිපිටිය, ඇරැව්වල, බෝකුන්දර පාර, අංක 525/1 සී දරන ස්ථානයේ පදිංචි කේ.එස්. අතුල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) හොරණ, නර්තනගල, 03වන අදියර, අංක 81 දරන ස්ථානයේ පදිංචි එන්.එස්. රත්නවීර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) හම්බන්තොට, මිරිජ්ජවිල, අඩි 100 පාර, අංක 261 දරන ස්ථානයේ පදිංචි පී. ලොකුහෙට්ටි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) කෝට්ටේ, මාදිවෙල, සිගේරා පාර, අංක 115/1/1 දරන ස්ථානයේ පදිංචි ආර්. උපුල් නිශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) පන්නිපිටිය, පරණ පාර, අංක 32 වත්තේගෙදර බාහිර තැන්පත්කරුවන්ගේ සමිතියේ සාමාජිකත්වය දරන සුසිල් විජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2017 සිට ස්වාභාවික ආපදා හේතුවෙන් හානි වූ ජීවිත සහ දේපළ: වන්දි
2017 முதல் இயற்கை அனர்த்தங்களால் ஏற்பட்ட உயிர்ச்சேதம் மற்றும் அழிவடைந்த சொத்துக்கள்: இழப்பீடு
LOSS OF LIVES AND PROPERTY DUE TO NATURAL DISASTERS FROM 2017: COMPENSATION

384/2025

1. ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2017 වර්ෂයේ සිට මේ දක්වා විවිධ ස්වාභාවික ආපදා හේතුවෙන් හානි වූ ජීවිත, විනාශ වූ දේපළ සහ ව්‍යාපාර වෙනුවෙන් ගෙවූ වන්දි මුදල සහ ගෙවීමට ඇති හිඟ වන්දි මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ආරම්භ කරන ලද රක්ෂණ ක්‍රමය, අංක 03/2016 දරන චක්‍රලේඛය මඟින් ස්ථාපිත කරන ලද අතර එය ආපදාවන්ට ලක් වූ ජනතාවට විශාල සහනයක් බව පිළිගන්නේද;

(iii) අංක 01/2020 දරන චක්‍රලේඛය මඟින් රු. 10,000ට වැඩි වන්දි සඳහා ඉඩමේ අයිතිය සනාථ කළ යුතු බව නියම කිරීම හේතුවෙන් විශාල පවුල් සංඛ්‍යාවකට වන්දි මුදල් නොලැබුණු බව දන්නේද;

(iv) ආපදා හේතුවෙන් පීඩාවට පත් වූ පවුලකට වියළි සහ පිසූ ආහාර ලබා දීම සඳහා දිනකට වෙන් කර ඇති මුදල ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(v) ආපදා වන්දි තක්සේරු කිරීමේදී, 2020.09.09 දිනැති NBRO/FL/DA/IN/R5 චක්‍රලේඛය මඟින් නියම කරන ලද තක්සේරු වටිනාකම ප්‍රමාණවත් නොවන බැවින් තක්සේරු වටිනාකම වැඩි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පාතුකාප්පු අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) 2017ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை பல்வேறு இயற்கை அனர்த்தங்களால் ஏற்பட்ட உயிர்ச்சேதம், அழிவடைந்த சொத்துக்கள் மற்றும் தொழில்முயற்சிகளுக்காகச் செலுத்தப் பட்ட இழப்பீட்டுத் தொகை மற்றும் செலுத்தவேண்டியுள்ள இழப்பீட்டு நிலுவை ஒவ்வொரு மாவட்டத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாதென்பதையும்;

(ii) தேசிய காப்புறுதி நம்பிக்கைப் பொறுப்பு நிதியத்தின்கீழ் ஆரம்பிக்கப்பட்ட காப்புறுதித் திட்டமானது, 03/2016ஆம் இலக்க சுற்றறிக்கை யின்மூலம் தாபிக்கப்பட்டுள்ளதுடன், அது அனர்த்தங்களை எதிர்கொண்டுள்ள மக்களுக்குப் பெரும் நிவாரணமாக அமைந்துள்ளதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) இலக்கம் 01/2020 கொண்ட சுற்றறிக்கையின்மூலம் ரூபாய் 10,000இலும் கூடிய இழப்பீட்டுத் தொகையைப் பெற காணி உரிமையை அத்தாட்சிப்படுத்த வேண்டுமென பணிக்கப்பட்டுள்ளதால் பெரும் எண்ணிக்கையான குடும்பங்களுக்கு இழப்பீடு கிடைக்காததை அறிவாரா என்பதையும்;

(iv) அனர்த்தங்களால் பாதிக்கப்படுகின்ற குடும்பம் ஒன்றுக்குத் தேவையான உலர் மற்றும் சமைத்த உணவுகளை வழங்க, நாளொன்றுக்கு ஒதுக்கப்பட்டுள்ள தொகை போதாததை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) அனர்த்த இழப்பீட்டு மதிப்பீடு நிமித்தம், 2020.09.09ஆம் திகதிய, NBRO/FL/DA/IN/R 5ஆம் இலக்க சுற்றறிக்கையின்மூலம் நிர்ணயிக்கப்பட்டுள்ள மதிப்பீட்டுப் பெறுமதி போதுமானதாக இல்லை என்பதால், மதிப்பீட்டுப் பெறுமதியை அதிகரிப்பதற்கான நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the amount of compensation paid and the outstanding compensation yet to be paid for the lives lost and the properties and businesses devastated owing to various natural disasters in each year from 2017 until now district-wise, separately;

(ii) whether he admits that the insurance scheme introduced under the National Insurance Trust Fund and established by Circular No. 03/2016 is a great relief for the victims of the disasters;

(iii) whether he is aware that a considerable number of families have not received the said compensation due to the requirement made through Circular No. 01/2020 to the effect that the ownership of land should be established for compensation above Rs.10,000;

(iv) whether he admits that the amount allocated per day is insufficient to provide dry rations and cooked food to a family affected by disasters; and

(v) whether measures will be taken to increase the assessment value related to disaster compensation on account of the inadequacy of assessment value prescribed by Circular NBRO/FL/DA/IN/R5 dated 09.09.2020?

(b) If not, why?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ස්වාභාවික ආපදා හේතුවෙන් විනාශ වූ දේපොළ හා ව්‍යාපාර සඳහා ගෙවූ වන්දි මුදල් පිළිබඳ තොරතුරු දිස්ත්‍රික් වශයෙන් ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත

[ගරු අරුණ ජයසේකර මහතා]

ඇමුණුම 01

නිවාස හා ව්‍යාපාර වන්දි ලබා දීම

	දිස්ත්‍රික්කය	2017	2018	2019	2020	2021	2022	2023	2024	දිස්ත්‍රිකයට අදාළ සමස්ථ වියදම
1	කොළඹ	124,741,197.00	40,963,682.56	27,075,911.50	22,848,175.07	22,932,886.22	9,283,148.86	9,813,786.47	102,691,993.05	360,350,780.73
2	ගම්පහ	21,136,080.40	53,191,806.10	21,882,666.87	19,547,423.34	51,651,777.26	5,680,786.28	27,842,812.10	44,702,302.15	245,635,654.50
3	කළුතර	387,493,694.50	28,329,390.00	22,039,841.50	15,672,826.46	18,935,109.58	19,023,028.23	16,856,507.28	50,506,689.89	558,857,087.44
4	මහනුවර	12,748,355.00	9,085,671.00	12,854,270.00	16,062,650.95	34,892,103.93	1,077,323.60	21,941,077.33	42,614,956.96	151,276,408.77
5	මාතලේ	3,917,780.00	2,872,955.00	6,847,700.00	5,951,996.82	8,417,006.13	4,637,213.84	9,602,135.03	12,842,287.07	55,089,073.89
6	නුවරඑළිය	2,608,040.00	7,113,100.00	3,996,000.00	10,342,233.99	5,934,876.15	24,957,936.35	7,921,165.38	17,848,328.45	80,721,680.32
7	ගාල්ල	333,429,830.80	26,960,880.00	35,208,452.00	24,320,863.21	34,199,032.61	13,208,097.03	28,183,808.97	73,826,481.26	569,337,445.88
8	මාතර	606,809,682.90	2,853,157.50	18,629,970.00	13,216,409.30	13,819,439.21	3,443,757.04	21,893,000.02	72,629,194.20	753,294,610.17
9	හම්බන්තොට	24,184,455.00	3,252,260.00	8,903,714.00	8,493,468.55	4,923,820.12	3,434,470.53	5,765,210.23	12,370,523.36	71,327,921.79
10	යාපනය	4,110,000.00	15,238,650.00	3,990,000.00	2,670,727.78	17,667,046.13	11,303,930.40	3,414,733.66	4,787,469.01	63,182,556.98
11	වවුනියා	699,100.00	310,000.00	1,645,800.00	2,586,190.15	334,680.00	17,168,142.85	1,342,297.01	2,623,302.08	26,709,512.01
12	මඩකලපුව	400,500.00	2,740,150.00	3,921,260.00	931,400.00	1,564,900.00	27,307,655.01	1,815,324.40	2,707,566.25	41,388,755.66
13	අම්පාර	4,041,480.00	14,143,377.00	12,692,456.00	6,568,384.22	5,978,138.82	1,406,850.00	10,237,423.43	15,983,930.52	71,052,039.99
14	ත්‍රිකුණාමලය	1,910,000.00	1,112,500.00	3,360,000.00	4,763,957.36	1,624,107.63	16,812,290.87	2,896,813.50	2,638,485.55	35,118,154.91
15	කුරුණෑගල	4,220,710.00	30,354,552.58	12,278,917.58	16,398,791.99	35,120,383.32	144,764.72	20,419,470.94	41,820,117.14	160,757,708.27
16	පුත්තලම	55,000.00	21,896,135.00	16,352,186.00	12,722,484.00	9,019,510.55	7,779,668.86	2,120,981.09	8,900,285.31	78,846,250.81
17	අනුරාධපුර	5,015,300.00	5,848,650.00	10,991,884.63	15,086,390.06	9,610,841.98	11,472,628.31	10,101,284.10	17,216,202.56	85,343,181.64
18	පොළොන්නරුව	14,614,777.00	2,967,245.00	11,628,090.00	7,512,218.27	5,346,337.64	27,412,868.71	8,158,205.30	7,861,930.00	85,501,671.92
19	බදුල්ල	21,063,318.00	11,390,170.50	13,609,255.00	9,508,522.70	16,579,299.59	2,312,065.91	28,610,717.56	37,108,997.47	140,182,346.73
20	මොනරාගල	12,941,956.00	7,723,050.00	13,612,692.00	9,464,628.64	11,377,695.21	7,723,123.21	22,404,333.09	34,806,616.29	120,054,094.44
21	රත්නපුර	421,647,702.90	19,442,763.00	16,986,054.00	56,997,995.33	31,200,945.12	2,505,140.27	37,361,158.36	148,740,060.86	734,881,819.84
22	කෑගල්ල	23,352,688.02	22,281,862.00	7,396,520.00	28,260,532.21	34,676,550.56	3,743,490.13	22,951,611.80	47,196,581.10	189,859,835.82
23	මන්නාරම	0.00	0.00	40,000.00	5,819,765.00	459,040.00	33,281,659.76	198,864.81	364,960.00	40,164,289.57
24	මුලතිව්	462,975.00	29,556,000.00	604,850.00	1,075,384.06	339,782.00	2,651,496.15	2,298,986.04	1,354,668.94	38,344,142.19
25	කිලිනොච්චි	0.00	39,870,000.00	1,430,000.00	3,937,670.00	755,000.00	955,780.00	1,457,306.30	1,868,269.44	50,274,025.74
		2,031,604,622.52	**399,498,007.24**	**287,978,491.08**	**320,761,089.46**	**377,360,309.76**	**258,727,316.92**	**325,609,014.20**	**806,012,198.91**	
	2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සමස්ථ දේපල හා නිවාස හානි සඳහා සමස්ථ වියදම									**4,201,564,614.86**

ස්වාභාවික ආපදා හේතුවෙන් සිදු වූ ජීවිත හානි සඳහා වන්දි ගෙවීම පිළිබඳ විස්තර දිස්ත්‍රික් අනුව සකස් කර ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 02

මරණ වන්දි ලබා දීම

	දිස්ත්‍රික්කය	2017	2018	2019	2020	2021	2022	2023	2024	දිස්ත්‍රිකයට අදාළ සමස්ථ වියදම
1	කොළඹ	3,000,000.00	85,000.00	100,000.00	250,000.00	250,000.00			750,000.00	4,435,000.00
2	ගම්පහ				475,000.00	1,150,000.00		925,000.00	725,000.00	3,275,000.00
3	කළුතර		100,000.00	3,700,000.00		1,210,000.00			250,000.00	5,260,000.00
4	මහනුවර	400,000.00	300,000.00	250,000.00	45,000.00	250,000.00	750,000.00	2,150,000.00	2,475,000.00	6,620,000.00
5	මාතලේ	100,000.00			500,000.00	225,000.00		225,000.00	500,000.00	1,550,000.00
6	නුවරඑළිය	400,000.00					1,600,000.00	475,000.00	1,025,000.00	3,500,000.00
7	ගාල්ල				460,000.00	1,185,000.00	675,000.00	450,000.00	1,750,000.00	4,520,000.00
8	මාතර				485,000.00	725,000.00	250,000.00	1,625,000.00	2,000,000.00	5,085,000.00
9	හම්බන්තොට				250,000.00	1,225,000.00	500,000.00		275,000.00	2,250,000.00
10	යාපනය					250,000.00	525,000.00	225,000.00		1,000,000.00
11	වවුනියා				475,000.00	225,000.00			500,000.00	1,200,000.00
12	මඩකලපුව					250,000.00			500,000.00	750,000.00
13	අම්පාර					750,000.00	250,000.00	500,000.00	2,500,000.00	4,000,000.00
14	ත්‍රිකුණාමලය					750,000.00	250,000.00	250,000.00	250,000.00	1,500,000.00
15	කුරුණෑගල		200,000.00	250,000.00	250,000.00	750,000.00	2,625,000.00	1,425,000.00	225,000.00	5,725,000.00
16	පුත්තලම		400,000.00	250,000.00		975,000.00	2,425,000.00	250,000.00	1,750,000.00	6,050,000.00
17	අනුරාධපුර		200,000.00	250,000.00	250,000.00	725,000.00	750,000.00	2,000,000.00	750,000.00	4,925,000.00
18	පොළොන්නරුව	100,000.00	501,400.00	100,000.00	725,000.00	475,000.00	250,000.00	1,000,000.00	250,000.00	3,401,400.00
19	බදුල්ල		730,000.00	170,000.00	250,000.00		1,660,000.00	700,000.00	1,900,000.00	5,410,000.00
20	මොනරාගල	300,000.00	185,000.00	600,000.00	500,000.00	500,000.00	725,000.00	975,000.00	7,250,000.00	11,035,000.00
21	රත්නපුර	100,000.00	685,000.00	550,000.00	500,000.00	1,735,000.00	1,600,000.00	2,050,000.00	4,150,000.00	11,370,000.00
22	කෑගල්ල		700,000.00		925,000.00	1,175,000.00	1,625,000.00	950,000.00	250,000.00	5,625,000.00
23	මන්නාරම				250,000.00			225,000.00		475,000.00
24	මුලතිව්				500,000.00		675,000.00		25,000.00	1,200,000.00
25	කිලිනොච්චි					250,000.00			250,000.00	500,000.00
		4,400,000.00	**4,086,400.00**	**6,120,000.00**	**7,090,000.00**	**15,030,000.00**	**17,135,000.00**	**16,400,000.00**	**30,300,000.00**	
	2017 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා මරණ වන්දි ගෙවීම් සඳහා සමස්ථ වියදම									**100,561,400.00**

2024 වර්ෂය අවසන් වන විට 2017 වර්ෂයේ සිට ඇස්තමේන්තු කර අවසන් සියලු නිවාස සඳහා වන්දි මුදල් ගෙවා අවසන් කර ඇත.

විශේෂයෙන් දිස්ත්‍රික් ලේකම්වරු මහින් ගෙවීම් කිරීමට යොමු කර ඇති අදාළ ප්‍රතිපාදන ඉතිරි වී ඇති බැවින් හිඟ ගෙවීම් නොමැති බවට නිරීක්ෂණ අප වෙත ලැබී තිබෙනවා. එසේම ඇස්තමේන්තු කිරීමේ ප්‍රමාදයෙන් හෝ වෙනත් ලියකියවිලිවල අඩු පාඩු හේතුවෙන් ගෙවීම් කිරීමට පවතී නම් එම අවශ්‍ය ප්‍රතිපාදන 2025.02.28 දිනට ප්‍රථම ඉල්ලුම් කරන ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත දැනුම් දී තිබෙනවා.

(ii) පිළිගනිමි.

(iii) රුපියල් 10,000ට වැඩි ගෙවීම් යනු සාපේක්ෂව වැඩි අගයක් ගන්නා ඇස්තමේන්තු වන බැවින් ඉඩමේ අයිතිය නිසි පරිදි තහවුරු කර ගැනීම සඳහා කරුණු රාශියක් බලපානවා. ඔබතුමාට ඒ පිළිබඳව අවබෝධයක් ඇති කියලා හිතනවා.

- ප්‍රතිලාභ ලැබිය යුතු පුද්ගලයා ප්‍රතිලාභ ලැබීම තහවුරු වීම. ඒක අත්‍යවශ්‍යයි.
- නඩු, ආරවුල් පවතින ඉඩම් සඳහා ද වන්දි මුදල් අයකුම් කරන බැවින් වන්දිය ලැබිය යුතු නිශ්චිත පාර්ශ්වය හඳුනා ගත යුතුයි.
- අනවසර ලෙස ඉදිකර ඇති දේපළ සඳහා අයිතිය විමසීමකින් තොරව වන්දි ලබා දීම එම නීති විරෝධී බව තහවුරු කිරීමක් වීම.
- ඇතැම් පුද්ගලයන් වංචනික ලෙස වන්දි ලබා ගැනීමට උත්සාහ කිරීම අගතියට පත් පාර්ශ්වයට ප්‍රතිලාභ හිමිකම් ලැබීම අවිනිශ්චිත වීම.
- ඒ හේතුවෙන් රක්ෂිත සහ අනවසර පදිංචිකරුවන් සහ නීතිමය ගැටලු සහිත සිද්ධීන් හැරුණු කොට අයිතිය සනාථ කිරීමට නීතිමය ලියකියවිලි නොමැති වුවද, පදිංචි කාලය ඒ වාගේම වෙනත් හිමිකරුවන් ඉදිරිපත් නොවීම ආදී කරුණු සලකා බලා නිවාස හානි ප්‍රතිපූර්ණය කිරීමට දිස්ත්‍රික් ලේකම්ට හැකියාවක් පවතිනවා. එසේම, අදාළ දේපළෙහි වත්මන් අයිතිකරුගේ අවසරය මත ද පදිංචිකරුවන්ට වන්දි මුදල් ගෙවීමේ කටයුතු සිදු කරනවා.

(iv) පුද්ගලයන් වෙත පිසූ ආහාර ලබා දීමේදී සුරක්ෂිත මධ්‍යස්ථානයන් තුළ හෝ ඒ ආසන්න ස්ථානයක තොග වශයෙන් ද්‍රව්‍ය මිලදී ගෙන එහි සිටින පුද්ගලයන්ගේද සහාය ඇතිව ආහාර පිසීම සිදු කරන බැවින් අඩු පිරිවැයක් යටතේ ආහාර ලබා දීම සිදු කළ හැකි වේ.

ඒකයි දැනට අපි කරගෙන යන පිළිවෙත.

ඒ අනුව පිසූ ආහාර ලබා දීම සඳහා එක් පුද්ගලයෙකුට දිනකට රුපියල් 600ක මුදලක් මේ වන විට ගෙවීම් කටයුතු ලෙස සිදු කරනු ලබයි.

වියළි සලාක ලබා දීමේදී, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පමණක් වියළි සලාක ලෙස ලබා දෙන බැවින් 2024.06.05 දිනැති ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 (II) මඟින් ඉදිරිපත් කරන ලද සංශෝධිත නව මිල ගණන් යටතේ ප්‍රමාණවත් වියළි සලාකයක් ලබා දිය හැකිය.

ඒ අනුව වියළි සලාක සඳහා සතියකට,

තනි පුද්ගලයෙකුට රු. 1,800.00

සාමාජිකයන් දෙදෙනෙකුගෙන් යුතු පවුලකට රු. 2,400.00

සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් යුතු පවුලකට රු. 2,800.00

සාමාජිකයන් හතරදෙනෙකුගෙන් යුතු පවුලකට රු. 3,200.00

සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුතු පවුලකට රු..3,600.00

ලෙස මේ වන විට ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි.

(v) ඔව්,

2020.09.09 දිනැතිව දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කරන ලද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් සකස් කළ දේපළ හානි ප්‍රතිපූරණ පිරිවැය ඇස්තමේන්තුව මේ දක්වා භාවිත වන අතර, ගොඩනැඟිලි ද්‍රව්‍ය මිල ගණන්හි ඇති වූ මිල ඉහළ යෑමත් සමඟ මෙම ඇස්තමේන්තුව සංශෝධනය කිරීමත් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මේ වන විට සිදු කර ඇත. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තු අගයන් සහිත නව පිරිවැය ඇස්තමේන්තුව අනුමැතියට යොමු කර තිබෙනවා. එම අනුමැතිය ලැබුණාට පසුව ඒ අනුව අපි මිල සංශෝධන සමඟ තක්සේරු වටිනාකම් ලබා දීමට කටයුතු කරනවා.

(ආ) පැන නොනඟී.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදාවට ලක්වන ගම්මාන කිහිපයක් තිබෙනවා. ඒ අනුව ඇහැලියගොඩ, රත්නපුර, ඇලපාත, පැල්මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවට නිවාස ලබා දීලා තිබෙනවා. නමුත් මේ නිවාස ලබා දීපු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කරන්න බැරි වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. ඒ කියන්නේ පානීය ජලය, මාර්ග යන මූලික අවශ්‍යතා එම ගම්මානවලට ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. එම නිසා ජනතාව මේ ගම්මානවල පදිංචි වීමේ ප්‍රවණතාව නැති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමා මේ වර්ෂයේදී යම් වැඩසටහනක් සකස් කරන්න බලාපොරොත්තු වෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමා හරි. පසුගිය මාස එකහමාරක විතර කාලයක් තිස්සේ මේ ගැන දිස්ත්‍රික් ලේකම්වරුන් එක්ක අපි සාකච්ඡා කළා. අපේ ආපදා කළමනාකරණ ජාතික කමිටුවත් හෙට අනිද්දා රැස් කරනවා. ඊයේ පැවති ආරක්ෂක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදීත් ඒ කාරණය මතු කළා. අනෙකුත් රේඛීය අමාත්‍යාංශ සමඟ එකතුව ආපදාවට ලක් වෙච්ච ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා කටයුතු කරන්න අපි විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ ගැන කැබිනට් පත්‍රිකා මහින් ද දැනුම්දීමට අපි කටයුතු සැලසුම් කරගෙන යනවා.

ගරු වරුණ ලියනගේ මහතා
(மாண்புமிகு வருண லியனகே)
(The Hon. Waruna Liyanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලයේ රක්ෂණ අරමුදල යටතේ යම් වැඩසටහනක් ක්‍රියාත්මක කරලා විශාල ශක්තියක් ලබා දුන්නා, ආපදාවට ලක් වෙච්ච ජනතාවට. ඒක හොඳ ක්‍රමයක් කියලා ඔබතුමාත් පිළිගත්තා. ඇත්තටම මම විශ්වාස කළා, මේ ආණ්ඩුවත් ඒ රක්ෂණ වැඩසටහන ඉදිරියට කරගෙන යයි කියලා. මොකද, අපි IMF එකත් එක්ක කථා කළා නම් ඒ රක්ෂණ අරමුදලට මුදල් ලබා ගන්න තිබුණා කියලා මම විශ්වාස කරනවා. අපි බලාපොරොත්තු වුණා, ඔබතුමන්ලා ඒ දේ ඉෂ්ට කරයි කියලා. නමුත් ඒක වුණේ නැහැ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, රත්නපුර දිස්ත්‍රික්කය කියන්නේ හැම වසරකම ජලයෙන් යටවන දිස්ත්‍රික්කයක්. තව මාස දෙකකින් පස්සේත් මේ දිස්ත්‍රික්කය ජලයෙන් යට වෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කර, ලබන අවුරුද්දේ අය වැයට හෝ ඉදිරිපත් කර එම රක්ෂණ වැඩසටහන ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ඒ ගැන අපි සටහන් කර ගන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -386/2025- (1), ගරු වානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මත්තේගොඩ නිවාස සංකීර්ණයේ මලාපවහන පද්ධතිය වටා වැටක් ඉදිකිරීම: විස්තර
மத்தேகொட வீடமைப்புக் கட்டிடத்தொகுதியின் மலக்கழிவு அகற்றும் முறைமையைச் சுற்றி வேலி அமைத்தல்: விபரம்
FENCING OF SEWERAGE SYSTEM AT MATHTHEGODA HOUSING SCHEME: DETAILS

417/2025

3. ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හෝමාගම, මත්තේගොඩ නිවාස සංකීර්ණයේ මලාපවහන පල්දෝරු පද්ධතිය වර්ෂ ගණනාවක සිට අකර්මණ්‍ය වී ඇති බවත්;

(ii) එම පල්දෝරු පද්ධතිය වටා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මේ වන විට වැටක් ඉදිකරමින් සිටින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් වැට ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

(ii) එහි ඉදිකිරීම් ආරම්භ කරන ලද දිනය හා ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා තෝරා ගෙන ඇති කොන්ත්‍රාත් ආයතනය කවරේද;

(iv) එම කොන්ත්‍රාත් ආයතනය තෝරා ගැනීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(v) එම වැට ඉදිකිරීම හේතුවෙන් ජනතාව විසින් වර්ෂ 40ක පමණ කාලයක සිට භාවිත කරනු ලබන මාර්ග සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බව දන්නේද;

(vi) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹோமாகம, மத்தேகொட வீடமைப்புக் கட்டிடத்தொகுதியின் மலக்கழிவு அகற்றும் முறைமை பல வருடங்களாக செயலிழந்துள்ளது என்பதையும்;

(ii) தற்போது மேற்படி மலக்கழிவு அகற்றும் முறைமையைச் சுற்றி தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை வேலியொன்றை நிர்மாணித்து வருகின்றது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வேலியை நிர்மாணிப்பதற்கான மதிப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(ii) அதன் நிர்மாணப் பணிகளை ஆரம்பித்த திகதி மற்றும் நிறைவு செய்யவேண்டிய திகதி என்பன வெவ்வேறாக யாதென்பதையும்;

(iii) அதற்காகத் தெரிவுசெய்யப்பட்டுள்ள ஒப்பந்த நிறுவனம் யாதென்பதையும்;

(iv) மேற்படி ஒப்பந்த நிறுவனத்தைத் தெரிவுசெய்யும்போது, உரிய கேள்விப்பத்திர நடைமுறை பின்பற்றப்பட்டுள்ளதா என்பதையும்;

(v) மேற்படி வேலியை நிர்மாணிப்பதால் பொதுமக்கள் சுமார் 40 வருடங்களாகப் பயன்படுத்தி வருகின்ற வீதிக்கு அது முழுமையாக இடையூறாக உள்ளதை அறிவாரா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி நிலைமையைச் சீர்செய்வதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Is he aware that the -

(i) drainage sewerage system at the Maththegoda Housing Scheme, Homagama, has been defunct for a number of years now; and

(ii) National Water Supply and Drainage Board is constructing a fence around this sewerage system at present?

(b) Will he inform this House -

(i) the amount estimated for the construction of the fence referred to above;

(ii) the date on which its construction was commenced and date on which the construction is supposed to be completed, separately;

(iii) the construction firm that has been selected for the construction;

(iv) whether the specified tender procedure has been followed in selecting the firm concerned;

(v) whether he is aware that the roads that people had been using for around 40 years have been obstructed completely because of the construction of the fence; and

(vi) if so, the measures that will be taken to rectify this situation?

(c) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)

(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)

(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු වන්නේ හෝමාගම, මත්තේගොඩ නිවාස සංකීර්ණයේ මලාපවහන පල්දෝරු පද්ධතිය සම්බන්ධයෙන්. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම මලාපවහන පිරිපහදු තටාක පද්ධතිය මඟින් මත්තේගොඩ නිවාස සංකීර්ණයේ සහ කලාපුරයේ නිවාසවල අපජලය පිරිපහදු කිරීම සිදු කෙරෙන බව ජල සම්පාදන මණ්ඩලය විසින් දන්වා තිබෙනවා.

මෙම තටාක පද්ධතිය වසර 40කටත් වඩා පැරණි වන අතර, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 1998.05.22 දිනැති ලිපිය මඟින් ක්‍රියාත්මක හා නඩත්තු කටයුතු සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා තිබෙනවා. මණ්ඩලයේ අධීක්ෂණය යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ පරාමිතීන්ට අනුකූලව පිරිපහදු කරන අපජලය ක්ලෝනීකරණයෙන් පසුව පරිසරයට මුදාහරින අතර ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙන් සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් මෙහි තත්ත්ව පරීක්ෂාව නිරන්තරයෙන්ම සිදු කරනවා.

ඒ අනුව මෙම මලාපවහන පද්ධතිය පූර්ණ වශයෙන් අකර්මණ්‍ය වී නොමැති බව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දන්වා තිබෙනවා.

මෙම මලාපවහන පද්ධතියේ යම් කොටස් ප්‍රතිසංස්කරණය කළ යුතු අතර, ඒ සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන වෙන් කිරීමට සැලසුම් කර ඇති බව දන්වා සිටිනවා.

(ii) ඔව්. වැටක් ඉදිකරමින් පවතිනවා.

එම මලාපවහන තටාකය හරහා හා එය වටා ඇති මාර්ගය උපයෝගී කර ගනිමින් ප්‍රදේශවාසීන් ගමන් කිරීම සිදු කරනවා. ඒ වාගේම බර වාහන ගමන් කිරීමත් සිද්ධ කරනවා. එමෙන්ම 2023දී තටාකය තුළට ප්‍රදේශවාසියෙක් වැටිලා මිය ගිහිල්ලා තිබෙනවා. ඒ මිය ගිය පුද්ගලයාගේ පෙණහලු තුළට අපජලය ඇතුළුවීම හේතුවෙන් ඇති වූ ආසාදන තත්ත්වය ඔහුගේ මරණයට හේතු වූ බව මරණ පරීක්ෂණ වාර්තාවට අනුව තහවුරු වෙලා තිබෙනවා.

මෙම මලාපවහන තටාකය දැනට අවුරුදු 40ක් පමණ පැරණි වන අතර ප්‍රදේශවාසීන් විසින් බර වාහන මඟින් ගමන් කිරීම හේතුවෙන් එහි පැති බැම්ම දුර්වල වී ඇති අතර, නීති විරෝධී කටයුතු සඳහා සහ වාහන මඟින් අපජලය හා කසළ බැහැර කිරීම සඳහා ද මෙම මලාපවහන තටාකය හා තටාක භූමිය භාවිත කරනු ලබන බව ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය දන්වා සිටිනවා.

ඒ අනුව මත්තේගොඩ මලාපවහන තටාකය හා එම භූමිය දැනට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් නඩත්තු කරනු ලබනවා. එම මලාපවහන තටාක භූමිය අවට පරිසරයේ නිවාස කිහිපයක් තිබෙනවා. එම ඇතැම් නිවාසවලින් බැහැර කරනු ලබන කසළ බැහැර කිරීමට ද මලාපවහන තටාකය භාවිත කරනු ලබන අතර මණ්ඩලය විසින් දෛනිකව සිදු කරනු ලබන නඩත්තු කටයුතුවලට එමඟින් බාධා සිදු වෙනවා. ඒ අනුව මලාපවහන තටාකය සහ එය පිහිටි භූමිය උපයෝගී කර ගනිමින් ප්‍රදේශවාසීන් ඔවුන්ගේ දෛනික කටයුතු පවත්වාගෙන යනු ලබන නමුත් යම්කිසි අකටයුත්තක් හෝ ජීවිත හානියක් සිදුවුවහොත් එහි දෝෂාරෝපණය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත එල්ල කරන බැවින් ඒ කටයුතු වැළැක්වීම සඳහා වැටක් ඉදිකරන්න කටයුතු කරලා තිබෙනවා.

(ආ) (i) රුපියල් 1,000,000.00 + 7,100,850.00

Provisional Sum + සියයට 10ක අමතර වියදම්

(ii) කොන්ත්‍රාත්තුව ආරම්භ කළ දිනය 2024.10.30 වන අතර අවසන් කළ යුතු දිනය 2025.01.12 වන නමුත් 2024.12.12 දින ප්‍රදේශවාසීන්ගේ විරෝධය හේතුවෙන් ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වය සමතයකට පත් වන තෙක් හෝමාගම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ තීරණයක් අනුව එම ඉදිකිරීම් කටයුතු මේ වනවිට අත්හිටුවා ඇත.

(iii) M/s Meth Construction

261, 10/C1, පංචවත්ත, හිඹුටාන, අංගොඩ.

(iv) ඔව්. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල පිළිසැකසුම් අංශයෙහි ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව - RPC-WR - විසින් නිවැරදි ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කටයුතු කර ඇති බව එම මණ්ඩලය විසින් දන්වා ඇත.

(v) මෙම වැට ඉදිකිරීම හේතුවෙන් තටාක පද්ධතියෙහි පහළ කොටස වටා ඇති මාර්ගය අවහිර වේ.

(vi) මේ සම්බන්ධව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සහ ක්ෂේත්‍ර පරීක්ෂා කිහිපයකදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර ඒ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරුණ පනාගොඩ මහතා, හෝමාගම ප්‍රාදේශීය ලේකම්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, හෝමාගම ප්‍රාදේශීය සභාව සහ පොලිසිය සහභාගී වී ඇත.

[ගරු අනුර කරුණාතිලක මහතා]

එහිදී අදාළ මාර්ගය සඳහා විකල්ප මාර්ගයක් යෝජනා වූ අතර, එම මාර්ගයේ ඉදිකිරීම් අවසන් වන තුරු වැට ඉදිකිරීමේදී මාර්ගය අවහිර වන සේ ඉදිකිරීම් අත්හිටුවා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු අරුණ පනාගොඩ මහතා
(மாண்புமிகு அருண பனாகொட)
(The Hon. Aruna Panagoda)

ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන් පසුගිය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ගණනාවකදී මේ කාරණය පිළිබඳව සාකච්ඡාවට ගත්තා. මෙතැන ගැටලුව මතු වෙලා තිබෙන්නේ මෙවැනි වැටක් ඉදිකරන්න කිසිම කෙනෙක් ඉල්ලීමක් කරලා නැති නිසායි. මහ ජනතාවගේ පැත්තෙන් එහෙම අවශ්‍යතාවක් මතු වෙලාත් නැහැ; මහජන නියෝජිතයන්ගේ පැත්තෙන් එහෙම අවශ්‍යතාවක් මතු වෙලාත් නැහැ. මේක අත්තනෝමතික විධියට හිතලා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගත්ත තීරණයක්. ඒ අයගෙන් ප්‍රශ්න කළාම ඒ අය කියන්නේ, මේකට කෙනෙක් වැටෙන්න පුළුවන් කියායි. එතකොට නිසා වැවටත් යම්කිසි කෙනෙක් වැටෙන්න පුළුවන් නේ, ගරු ඇමතිතුමනි. මොකද, නිසා වැව වටේ වැටක් ගහලා නැහැ.

අවුරුදු හතළිස් ගණනක් තිස්සේ මේ පල්දෝරු පද්ධතිය මේ විධියට තිබෙනවා. සිය දිවි නසා ගන්න කැමැති කෙනෙක් මේකට පැනලා මැරිලා තිබෙනවා. මේ වැට ගැහුවාය කියලා නැහැ, සිය දිවි නසා ගන්නා කෙනෙකුට ඕනෑ නම් ඒකෙන් පනින්නත් පුළුවන්, ගරු ඇමතිතුමනි. මෙතැන මතු වෙලා තිබෙන ගැටලුව මේකයි. මේ නිලධාරීන් ඉතා අත්තනෝමතික විධියට තමයි මේ වැට ඉදි කරන්නේ කියන එක ඔබතුමා දන්නවාද දන්නේ නැහැ. ජනතාවට විශාල ගැටලුවක්, පීඩාවක් මතු වෙලා තිබෙනවා, අවුරුදු 40ක් තිස්සේ මේ මාර්ගය වසා දැමීම සම්බන්ධයෙන්. ඒ අයගේ ඉල්ලීම වෙන්නේ ඒ අයට මේ භාවිත කරපු මාර්ගයේ යන්න නිසි පරිදි අවස්ථාව දීලා, ගේට්ටු දමාගෙන සුදුසු වෙලාවට ඒ කටයුතු කළාට කිසිදු බාධාවක් තමන්ගෙන් එන්නේ නැහැ කියන එකයි. මම හිතන විධියට ඒ නිලධාරීන්ට ඕනෑ වෙලා තිබෙන්නේ වැට ගහන එක මිස මේ කටයුතු ආරක්ෂා කර ගැනීම නොවෙයි කියන පැහැදිලි අදහස අපිටත් තිබෙනවා.

ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා මැදිහත් වෙලා හෝ කමක් නැහැ මේ පිළිබඳව නැවතත් පරීක්ෂා කරලා මේ තත්ත්වය නිවැරදි කරන්න කියලා.

ඊළඟට, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් මම මේ ගමන්ම අහන්නම්, ගරු අමාත්‍යතුමනි. ඒ පල්දෝරු පද්ධතිය අවුරුදු හතළිස් ගණනක් පරණයි. මේ වෙනකොට එහි බැම්මේ පෙරළිලා තිබෙන්නේ. එහි පිරිපහදු තත්ත්වයන් හරියට කෙරෙන්නේ නැහැ. පිරිපහදුවට පිටින් තමයි බැම්ම හිල් කරගෙන වතුර කාන්දු වෙන්නේ කුඹුරු යායට. ඒ නිසා මේ නිලධාරීන් ඉදිරිපත් කරලා තිබෙන වාර්තා ඒ විධියටම පිළිගන්න බැහැ. මේ අවස්ථාවේදී ඒ කාරණාවත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු අමාත්‍යතුමනි, මේ සම්බන්ධයෙන් නැවත සොයා බලා මැදිහත්වීමක් වෙන්න කියලා මේ වෙලාවේ මම මතක් කරනවා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔව්, මට ලැබිලා තිබෙන වාර්තාව අනුව තමයි පිළිතුරු සපයන්න වෙන්නේ. දෙවැනි කාරණයේදී ඔබතුමාගේ ප්‍රශ්නයක් තිබුණේ නැහැ. නමුත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිළිගන්නවා, මේ මලාපවහන පද්ධතියේ යම් කොටස් ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ කියලා. ඒ අනුව ජාතික ජලසම්පාදන මණ්ඩලය විසින් සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරලා ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පාර සම්බන්ධයෙන් තිබෙන තොරතුරුවලදී සඳහන් වනවා, අදාළ පාර්ශ්ව එක්ක සාකච්ඡාවලින් පසුව විකල්ප මාර්ගයක් යෝජනා වූ අතර, එම මාර්ගයේ ඉදිකිරීම් අවසන් වන තෙක් තමයි වැටේ කටයුතු අවසන් කරලා තිබෙන්නේ කියා. කොහොම වුණත්, ඔබතුමා සඳහන් කළ පරිදි මේ පිළිබඳ වැඩි තොරතුරු සොයා බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නම්.

වනඇලින්: ගහනය සහ ක්‍රියාකාරකම්
காட்டு யானைகள்: எண்ணிக்கை மற்றும் செயற்பாடுகள்
WILD ELEPHANTS: POPULATION AND ACTIVITIES

420/2025

4. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) ඒ අතරින් වනඇලින්ට ජීවත් වීම සඳහා සුදුසු වාතාවරණයක් සහිත වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම වනාන්තරවල ජීවත්වන වනඇලින් සංඛ්‍යාව කොපමණද;

(iv) වනඇලින් විසින් මිනිසුන් සහ ඔවුන්ගේ දේපළ විනාශ කරන බව දන්නේද;

(v) වර්ෂ 2020 සිට 2024 දක්වා වනඇලි ප්‍රහාරයන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව, එම ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගිය වනඇලින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වන සනත්වයට ඔරොත්තු නොදෙන වනඇලි ගහනයක් සිටින බව දන්නේද;

(ii) වන සනත්වයට උචිත පරිදි වනඇලි ගහනය පාලනය කිරීමට සිදුව තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා පවතින යන්ත්‍රණ කවරේද;

(iv) ඒවා ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, වනඇලින් සිදු කරනු ලබන විනාශය පාලනය කිරීම සඳහා යම් ක්‍රමවේදයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුබෝධාදල් අමාත්‍යාංශ ලේකම්තුමා මගින් කේට්ට විනා:

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) ඒ අතරින් වනඇලින්ට ජීවත් වීම සඳහා සුදුසු වාතාවරණයක් සහිත වනාන්තර ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) එම වනාන්තරවල ජීවත්වන වනඇලින් සංඛ්‍යාව කොපමණද;

(iv) වනඇලින් විසින් මිනිසුන් සහ ඔවුන්ගේ දේපළ විනාශ කරන බව දන්නේද;

(v) වර්ෂ 2020 සිට 2024 දක්වා වනඇලි ප්‍රහාරයන්ට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව, එම ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ අලි-මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගිය වනඇලින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වන සනත්වයට ඔරොත්තු නොදෙන වනඇලි ගහනයක් සිටින බව දන්නේද;

(ii) වන සනත්වයට උචිත පරිදි වනඇලි ගහනය පාලනය කිරීමට සිදුව තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා පවතින යන්ත්‍රණ කවරේද;

(iv) ඒවා ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, වනඇලින් සිදු කරනු ලබන විනාශය පාලනය කිරීම සඳහා යම් ක්‍රමවේදයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

සුබෝධාදල් අමාත්‍යාංශ ලේකම්තුමා මගින් කේට්ට විනා:

(අ) (i) ඉලංගෙයිලුල්ල කාටුකලින් අළවු ඒක්කර් කලිල් යාදෙන්බදෙයුම්;

(ii) අවට්‍රුල් කාට්ටු යානෙකල් වාළ්වදර්කුප් පොරුත්තමාන සූළලෙක්කොණ්ඩ කාටුකලින් අළවු ඒක්කර්කලිල් යාදෙන්බදෙයුම්;

(iii) அக்காடுகளில் வாழும் காட்டு யானைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) காட்டு யானைகள் மனிதர்களுக்கும் அவர்களுடைய உடைமைகளுக்கும் அழிவை ஏற்படுத்துகின்றன என்பதை அறிவாரா என்பதையும்;

(v) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை காட்டு யானைகளால் தாக்கப்பட்டவர் களின் எண்ணிக்கை, அத்தாக்குதல் காரணமாக இறந்தவர்களின் எண்ணிக்கை மற்றும் யானை-மனித மோதல் காரணமாக இறந்த காட்டு யானைகளின் எண்ணிக்கை என்பன வெவ் வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) காடுகளின் அடர்த்தியைவிடவும் அதிகமான காட்டு யானைகள் காடுகளில் வாழ்வதை அறிவாரா என்பதையும்;

(ii) காடுகளின் அடர்த்திக்கு ஏற்ப காட்டு யானை களின் பெருக்கத்தைக் கட்டுப்படுத்த வேண்டி யேற்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்கான பொறிமுறைகள் யாதென்பதையும்;

(iv) அது எதிர்காலத்தில் நடைமுறைப்படுத்தப்படுமா என்பதையும்;

(v) ஆமெனில், காட்டு யானைகளால் ஏற்படும் அழிவுகளை கட்டுப்படுத்த ஏதேனுமொரு வழிமுறை உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the extent of forests in Sri Lanka in acres;

(ii) the extent of forests having an environment conducive for wild elephants to live within the aforesaid extent;

(iii) the number of wild elephants living in such forests;

(iv) whether he is aware that wild elephants kill humans and destroy their properties; and

(v) the number of persons attacked by wild elephants, the number of those who were killed by those attacks and the number of wild elephants that were killed in the human -elephant conflicts from the year 2020 to the year 2024, separately?

(b) Will he also inform this House -

(i) whether he is aware that an elephant population overwhelming the forest cover is in existence; and

(ii) whether wild elephant population has to be controlled proportionate to the forest cover;

(iii) if so, the mechanisms available for it;

(iv) whether they will be implemented in future; and

(v) if so, whether there is any methodology for controlling the destruction caused by wild elephants?

(c) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2020 වර්ෂයේ වන සංගණනය අනුව,

විස්තරය	ප්‍රමාණය (අක්කර)
ශ්‍රී ලංකාවේ මුළු වන ආවරණය (ස්වාභාවික වන ආවරණය අනුව)	4,717,222.78

(ii) වනඅලින් ජීවත් වන දිස්ත්‍රික්කවල පිහිටි සියලුම වනාන්තර එම සතුන්ට යෝග්‍යය. එම ප්‍රමාණය අක්කර 4,553,641 වේ. ඉතිරි වනාන්තර තෙත් කලාපයේ හා කඳුකර ප්‍රදේශවල පිහිටා ඇති අතර එම වනාන්තරවල වනඅලින් වාසය නොකරයි.

(iii) වනාන්තර යනුවෙන් ගැනෙන පරිසර පද්ධතිය තුළ ජීවත් වන අලි සංඛ්‍යාව වෙන් වශයෙන් ගණනය කර නොමැත. 2011 වර්ෂයේ දී සිදු කරන ලද වනඅලි සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ වනඅලි ගහනය අවම වශයෙන් 5,879කි.

(iv) ඔව්.

(v)

වර්ෂය	වනඅලි ප්‍රහාරයන්ට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව	එම වනඅලි ප්‍රහාර හේතුවෙන් මරණයට පත් වූ පුද්ගලයින් සංඛ්‍යාව	වනඅලි-මිනිස් ගැටුම් හේතුවෙන් මිය ගිය වනඅලින් සංඛ්‍යාව
2020	236	112	328
2021	212	142	375
2022	353	146	439
2023	423	184	488
2024	354	155	388

(ආ) (i) එක් එක් පරිසර පද්ධතිවලට දැරිය හැකි අලි ගහනය සම්බන්ධයෙන් යම් අදහස් ප්‍රකාශ වී තිබුණද, මෙරට සමස්ත අලි ගහනය පවත්නා ස්වාභාවික පරිසර පද්ධතියට දැරිය හැකිදැයි යන්න සම්බන්ධයෙන් අධ්‍යයන වාර්තා මෙතෙක් එළි දක්වා නොමැත.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

[ගරු දම්මික පටබැඳි මහතා]

(v) ඔව්.

වනඅලින් මිනිසුන් සමඟ ඇතිවන ගැටුම හේතුවෙන් ඇතිවන විනාශය පාලනය කිරීම පිණිස පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- වනඅලි විසින් සිදුකරන වගා හානි, දේපළ හානි, ජීවිත හානි අවම කිරීම සඳහා 2024 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර විදුලි වැට ඉදිකිරීමේ කටයුතු මේ වන තෙක් කි.මී. 5,612ක ඉදිකර ඇති අතර වනජීවී කලාප දකුණ, උඟව, නැඟෙනහිර, මධ්‍යම, වයඹ, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, වව්නියාව, කිලිනොච්චිය හා පොළොන්නරුව ආවරණය වන පරිදි කි.මී. 588ක් විදුලි වැට ඉදිකරමින් පවතී.
- දැනට ඉදිකර ඇති විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීම සඳහා සිවිල් ආරක්ෂක භටයින් 4,005ක් යොදවා ඇත.
- වනඅලි හානි බහුලව සිදුවන ස්ථානවල වනඅලි පලවා හැරීම සඳහා මුරපොළවල් ස්ථාපිත කර සිවිල් ආරක්ෂක භටයින් 737ක් යොදවා ඇත.
- දිවා, රාත්‍රී අඛණ්ඩව විදුලි වැට නඩත්තුව හා ආරක්ෂා කිරීමේ කටයුතු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයන් 3,647ක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
- වනජීවී කලාපවල වනඅලි විසින් සිදු කරන වගා හානි අවම කිරීමටත් දෛනිකව වනඅලි පලවා හැරීමේ කටයුතු සඳහාත් වාර්ෂිකව 1,620,000ක් අලි වෙඩි මිලදී ගෙන බෙදා හැරීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා වියදම රුපියල් මිලියන 350කි.
- වනඅලි විසින් සිදු කරන ජීවිත හානි, දේපළ හානි සඳහා වන්දි ගෙවීම සඳහා 2023 වර්ෂයේ රුපියල් මිලියන 380ක් හා 2024 වර්ෂයට අදාළව මේ දක්වා ලබා දී ඇති තොරතුරු අනුව රුපියල් මිලියන 372ක්ද ලබා දී ඇත.
- වන අලින්ගේ සංචරණ රටාවන් හඳුනා ගැනීම සඳහා GPS කරපටි යොදවා විද්‍යාත්මක පර්යේෂණ සිදුකර ඇති අතර මෙම දත්ත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශවල භාවිත කරමින් පවතී.
- හානිදායක වශයෙන් හඳුනාගත් වනඅලින් අල්ලා ඉවත් කිරීම සිදුකොට ඇත.
- වන අලින්ගේ සංචරණවලට වන බාධා ඉවත් කිරීම සඳහා වනඅලි සංක්‍රමණ මාර්ග (අලිමංකඩ) හඳුනා ගැනීම හා ඒවායේ වනඅලින්ගේ සංක්‍රමණවලට සිදුවන බාධා ඉවත් කිරීමට හා ආරක්ෂා කිරීමට කටයුතු කරමින් පවතී.
- 2023 වර්ෂයේ සිට වනඅලින්ගෙන් සිදුවන ජීවිත හානි අවම කිරීම සඳහා කළමනාකරණ ක්‍රමවේද කලාප මට්ටමින් ප්‍රායෝගිකව අනුගමනය කර ගනිමින් වනඅලි විසින් ජීවිත හානි සිදු කරන ග්‍රාම නිලධාරී වසම් හඳුනාගෙන ගම්වාසීන්, ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් හා අදාළ ප්‍රාදේශීය සභා සම්බන්ධ කර ගනිමින් ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර වනඅලින් සැරිසරන අතුරු මාර්ගයේ වනඅලින් දර්ශනය වන අයුරින් යටි පඳුරු ඉවත් කිරීම හා අතුරු මාර්ගවල අඳුරු සහිත ස්ථානවල වීදි ලාම්පු සවි කිරීමට කටයුතු කර ඇත.
- වාසස්ථාන සුපෝෂණ කටයුතු 2023-2024

වර්ෂය	ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම (හෙක්.)	තෘණ භූමි කළමනාකරණය (හෙක්.)	මාර්ග දෙපස යටි රෝපණ ඉවත් කිරීම (හෙක්.)	ජල මූලාශ්‍ර වැඩිදියුණු කිරීම (සංඛ්‍යාව)
2023	386.9	258.27	118.64	9
2024	105	222	365	5

- වනඅලි හානි අවම කිරීම සඳහා සාර්ථක හා අසාර්ථක භාවය අධ්‍යයනය සඳහා පහත සඳහන් නව තාක්ෂණය යොදා ගැනීම අත්හදා බලා ඇත.
  1. ලංකාවේ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද energizers භාවිත කරමින් උඩවලව, අම්පාර, පුත්තලම යන ප්‍රදේශවල ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
  2. අලින්ට අප්‍රිය පරිදි තරංග නිකුත් කරන උපකරණ භාවිත කරමින් අම්පාර, ගල්ගමුව, පොළොන්නරුව වනජීවී කලාපවල වනඅලින් පලවා හැරීම හා වනඅලින් ගම්මානවලට ඇතුළු වීම වැළැක්වීම සඳහා මෙම උපකරණ යොදා ගනිමින් අත්හදා බැලීම් සිදුකර ඇත.
  3. නාවික හා ගුවන් හමුදාවන් සම්බන්ධ කරගෙන ඩ්‍රෝන යාත්‍රාවන් යොදා ගනිමින් වනඅලි පලවා හැරීමේ කටයුතු පුත්තලම, අනුරාධපුර දකුණ යන වනජීවී කලාපවල සිදු කර ඇත.
  4. මීමැසි පාලනය උපයෝගී කරගෙන මීමැස්සන්ගේ ශබ්ද තරංග භාවිත කරමින් මාදුරුඔය, අම්පාර කලාපවල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.
  5. කළුතෙල් කලවම් කර කඹ පිලිස්සීමෙන් ඇතිවන දුම උපයෝගී කරගෙන වනඅලි විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කර ඇත.
  6. උඩවලව ජාතික උද්‍යානයේ ප්‍රධාන විදුලි වැට කඩා බිඳිමින් ගම්මානවලට පැමිණෙන මාර්ග හඳුනාගෙන එම ස්ථානවල කොන්ක්‍රීට් තැටි සකස් කර බිම ඇතිරීමෙන් අධ්‍යයනයන් සිදු කර ඇත.
  7. ඖෂධ ගැල් වූ හඳුන්කුරු වර්ගයකින් නිකුත් වන දුම උපයෝගී කරගෙන වනඅලින් විකර්ෂණය කිරීම සඳහා අත්හදා බැලීමක් සිදු කර ඇත.
  8. දැනට භාවිත කරන විදුලි වැට ව්‍යූහයේ වැඩිදියුණු කිරීම් සිදු කර ඒවායේ කාර්යක්ෂමතාව ඉහළ දැමීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் ஓரளவுக்கு எனது கேள்விகளுக்குரிய பதிலைத் தந்துள்ளீர்கள். இருப்பினும் எமது மக்கள் தற்போது நடைமுறையில் எதிர்நோக்குகின்ற பிரச்சினைகள் சம்பந்தமாக உங்களுக்குச் சில தகவல்களைத் தரலாம் என்று நினைக்கின்றேன். அந்த அடிப்படையில், விஞ்ஞானரீதியாகப் பார்க்கின்றபோது, விலங்குகளின் எண்ணிக்கையைக் கட்டுப்படுத்தக்கூடிய விதத்தில் இரைகவ்விகள் இருக்கின்றன. உதாரணமாக, மான் இனம் அதிகரிக்குமாக இருந்தால் அதனை வேட்டையாடி உண்ணக்கூடிய விலங்குகள் இருக்கின்றன; உணவுச் சங்கிலி இவ்வாறுதான் காணப்படுகிறது. ஆனால், யானையைப் பொறுத்தமட்டில் அதனை வேட்டையாடி உண்ணக்கூடிய விலங்குகளோ அல்லது யானை இனத்தை அழிக்கக்கூடிய சந்தர்ப்பங்களோ குறைவாகத்தான் இருக்கிறது.

எமது மாவட்டத்தில் யானை இனத்தின் பெருக்கமானது காடுகளின் அளவைவிட அதிகமாகி விட்டதன் காரணமாக யானைகள் தற்போது காடுகளை விட்டு வெளியேறி, கிராமங்களைக் கடந்து, பயிர்ச்செய்கை நிலங்களைக் கடந்து, நகரங்களுக்குள் பிரவேசிக்கக்கூடிய நிலை ஏற்பட்டுள்ளது. அண்மையில் கொக்கட்டிச்சோலை பிரதேசத்திற்குள் இரண்டு - மூன்று யானைகள் பிரவேசித்திருந்தபோது, நான் வனஜீவ ராசிகள் பாதுகாப்பு அதிகாரிகளுக்கு அறிவித்திருந்தேன். ஆனால், அவர்கள் குறித்த இடத்திற்குச் சென்றடைவதற்கான வாகனங்களும், சாரதிகளும் இல்லை என்ற குறைபாட்டைச் சொல்லியிருந்தார்கள். அதேபோன்று சித்தாண்டிப் பிரதேசக் கிராமத்தினுள் நுழைந்த யானைகள் இரண்டு குழந்தைகளைத் தாக்கிவிட்டுச் சென்றிருந்தன. ஆனால், தெய்வாதீனமாக அந்தக் குழந்தைகள் உயிர்தப்பியிருந்தார்கள்.

மேலும், மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில் வனசீவராசித் திணைக்கள அலுவலகங்கள் - பிரதான அலுவலகம் கல்லடியிலும், கிரான் பகுதியில் ஒன்றும் வெல்லாவெளியில் ஒன்றுமாக மூன்று மாத்திரமே இருக்கின்றன. அம்பாறை மாவட்டத்துடன் ஒப்பிட்டுப் பார்க்கின்றபோது, அங்கு 7 அல்லது 8 அலுவலகங்களும் அதனைக் கண்காணிப்பதற்காக அதிகமான காவலர்கள் அல்லது அலுவலர்களும் இருக்கிறார்கள். அம்பாறை மாவட்டத்திலும் யானைகளின் தாக்குதல் நடைபெறுகின்ற படியால் அங்கும் அதிகமான அலுவலர்களும் பாதுகாப்பு உத்தியோகத்தர்களும் தேவை. ஆனால், மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டில் அலுவலர்கள் அல்லது காவலர்கள், சாரதிகள், வாகனங்கள் ஆகியவை இல்லாத குறைபாடு காணப்படுகிறது. கடந்த காலத்தில் ஓரிலட்சம் வேலைத்திட்டம் உருவாக்கப்பட்டு, அதன்மூலம் இந்த யானைகளின் தாக்கத்தைக் கட்டுப்படுத்தக்கூடிய உத்தியோகத்தர்கள் நியமிக்கப்படுவார்கள் என்று கூறப்பட்டபோதும் அது நடைபெறவில்லை. எனவே, நான் கூற விரும்புவது என்னவென்றால், மக்களின் உயிர் முக்கியமானது; அவர்களுடைய உடைமைகள் முக்கியமானது. யானைகளின் தொல்லையால் அந்த மக்கள் பயிர்ச்செய்கையில் ஈடுபடமுடியாத ஓர் அச்ச நிலையில் இருப்பதனால் மட்டக்களப்பு மாவட்டத்தில் வன சீவராசித் திணைக்கள அலுவலகங்கள் மற்றும் உத்தியோகத்தர்கள் அல்லது காவலர்களின் எண்ணிக்கை அதிகரிக்கப்படுவதுடன், அந்த அலுவலகங்களின் வாகனங்கள், சாரதிகளின் பற்றாக்குறை நிறைவு செய்யப்படுவது அவசியமாகவிருக்கின்றது. அவற்றை அங்கு விரைவாக வழங்கினால் மக்களின் உயிரிழப்புகளையும் உடைமை இழப்புகளையும் நாங்கள் கட்டுப்படுத்த முடியும்.

இது தொடர்பில் ஒரு விடயத்தைத் தங்களின் தகவலுக்குத் தருகின்றேன். அவுஸ்திரேலியாவில் கங்காருகளின் எண்ணிக்கை அளவுக்கதிகமாக அதிகரித்தபோது, அவை மக்களுக்குத் தொந்தரவாக இருந்தபடியால், அவர்கள் மேலதிகமானவற்றை அழித்தார்கள். அதேபோன்றுதான், மத்திய கிழக்குப் பிரதேசத்தில் ஒட்டகங்கள் அதிகரித்தபோது, அவை அதிகளவு நீரைக் குடிப்பதன் விளைவாக நிலத்தடி நீர்ப் பற்றாக்குறை ஏற்பட்டதன் காரணமாக, அந்நாட்டவர்கள் மனிதர்களின் தேவை கருதி மேலதிகமான ஒட்டகங்களை அழித்தார்கள். அதற்காக நான் யானைகளை அழிக்கச் சொல்லவில்லை. ஆனால், மனிதத் தேவை கருதி இவற்றின் பெருக்கத்தைக் கட்டுப்படுத்துவதற்கான அறிவியல் சார்ந்த - விஞ்ஞான பூர்வமான ஏதாவது பொறிமுறை ஒன்றைக் கண்டுபிடிக்கமுடியுமா? என நீங்கள் ஆலோசிக்க வேண்டும். இவ்வாறான விடயங்களைக் கவனத்திற்கொண்டு, எதிர்காலத்தில் மட்டக்களப்பு மாவட்டத்தில் மட்டுமல்ல, யானைகளால் பாதிக்கப்படுகின்ற ஏனைய மாவட்டங்களிலிருக்கின்ற மக்களையும் பாதுகாப்பதற்குரிய நடவடிக்கையை நீங்கள் எடுக்க வேண்டுமென்று மிகவும் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
බොහොම ස්තුතියි, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා.

ඔබතුමා ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙන්නම්. අපි මෙවර අය වැයෙනුත් මේ ප්‍රශ්නය ගැන විශේෂයෙන්ම සලකලා, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙනදාට වඩා අපි ටිකක් වැඩිපුර වෙන් කර තිබෙනවා. අපට මේ ප්‍රශ්නය ගැන විශේෂයෙන්ම සලකා බැලිය යුතු වෙනවා. මොකද, එක පැත්තකින් මිනිස් ජීවිත සහ දේපළ විනාශය සිදු වන අතරේම, අනෙක් පැත්තෙන් වනඅලි මියයෑමත් සිද්ධ වෙනවා. අලි-ඇතුන් කියන්නේ අපේ රටේ සංරක්ෂණය කළ යුතු සත්ව කොටසක්. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඕස්ට්‍රේලියාවේ කැන්ගරුවන් සම්බන්ධයෙන් හෝ සවුදිඅරාබියේ ඔටුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්ති, අපේ රටේ අලි-ඇතුන් සම්බන්ධයෙන් අනුගමනය කරන්න බැහැ. අපි අලි-ඇතුන් සංරක්ෂණය වෙනුවෙන් තමයි පෙනී සිටින්නේ. නමුත්, මිනිස් ජීවිත හානි, දේපළ හානි සම්බන්ධයෙන් සහ වනඅලි සංරක්ෂණය සම්බන්ධයෙන්, -ඒ හැම පැත්තක්ම සලකා බලා තමයි- අපට මෙහිදී මැදිහත් වෙන්න සිද්ධ වෙන්නේ. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල තිබෙන මේ ප්‍රශ්නය ගැන අපි අවධානය යොමු කරන්නම්. අපි මේ සඳහා විශාල මැදිහත්වීමක් කර තිබෙනවා සහ කරමින් තිබෙනවා. මේ ප්‍රශ්නයට ස්ථිරසාර සහ විද්‍යාත්මක විසඳුමක් ලබා ගන්න අපි ඔබතුමන්ලාගේ සහායත් අපේක්ෂා කරනවා.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே, திருகோணமலையிலும் பாதிப்பு இருக்கின்றது. எனினும், மட்டக்களப்பு மாவட்டத்துக்கான அலுவலகங்களினதும் உத்தியோகத்தர்களினதும் வாகனங்களினதும் சாரதிகளினதும் எண்ணிக்கையை அதிகரிக்குமாறு நான் உங்களிடம் அவசர உதவியாகக் கேட்டு நிற்கின்றேன்.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ஹොඳයි, ගරු මන්ත්‍රීතුමා, අපි ඒ සඳහා මැදිහත්වීමක් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි වටය.

E-8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීමට වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන්: මතුව ඇති බාධා

E-8 வீசா முறையின்கீழ் தென் கொரியாவில் தொழில்புரிய வீசா பெற்ற இலங்கையர்கள்: ஏற்பட்ட தடைகள்

SRI LANKANS WITH E-8 VISA LEAVING FOR JOBS IN SOUTH KOREA: OBSTRUCTIONS ARISEN

386/2025

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chanaka Madugoda)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලෝකයේ රටවල් ගණනාවක පුරවැසියන් E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා සඳහා යොමු වන බව දන්නේද;

(ii) E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන් කටුනායක ගුවන් තොටුපළේදී නැවත හරවා එවීමට හේතු කවරේද;

(iii) එම ශ්‍රී ලාංකිකයන්ට දකුණු කොරියාවේ රැකියා කිරීමට ඇති බාධා කවරේද;

(iv) E - 8 වීසා ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා වීසා ලැබූ ශ්‍රී ලාංකිකයන් සඳහා සාධාරණත්වය ඉටු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உலகின் பல நாடுகளைச் சேர்ந்த பிரஜைகள் E-8 வீசா முறையின்கீழ் தென் கொரியாவுக்குத் தொழில் நிமித்தம் செல்வதை அறிவாரா என்பதையும்;

(ii) E-8 வீசா முறையின்கீழ் தென் கொரிய தொழில் வீசா பெற்ற இலங்கையர்கள் கட்டுநாயக்க விமான நிலையத்தில் திருப்பி அனுப்பப்பட்ட மைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி இலங்கையர்களுக்குத் தென் கொரியாவில் தொழில்புரிவதில் காணப்படு கின்ற தடைகள் யாவை என்பதையும்;

(iv) E-8 வீசா முறையின்கீழ் தென் கொரியாவில் தொழில்புரிய வீசா பெற்ற இலங்கையர்களுக்கு நியாயத்தை நிலைநாட்ட மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) whether he is aware that the citizens of many countries of the world find employment in South Korea under the E-8 visa scheme;

(ii) the reasons for turning the Sri Lankans who have obtained work visas for South Korea under the E-8 visa scheme back at the Katunayake Airport ;

(iii) the barriers for aforesaid Sri Lankans to work in South Korea; and

(iv) the measures that are being taken to accord justice to the Sri Lankans who have obtained visas to work in South Korea under the E-8 visa scheme?

(b) If not, why?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ශ්‍රී ලංකා රජය E-8 වීසා ක්‍රමය යටතේ ශ්‍රී ලාංකිකයන් හට දකුණු කොරියාවේ රැකියා කිරීම සඳහා කොරියානු රජය සමඟ විධිමත් පරිදි ගිවිසුමකට එළඹ නොමැත. එසේම, E - 8 කාණ්ඩය යටතේ වූ වීසා මත බඳවා ගැනීම් රජයන් දෙකක් අතර සිදුවන ක්‍රියාවලියක් වන අතර, එය පෞද්ගලික පාර්ශ්වයක් මඟින් සිදු කළ නොහැක්කකි. එබැවින්, අදාළ වීසා කාණ්ඩය යටතේ රැකියා සඳහා විදේශගත වීමට පැමිණි පුද්ගලයන් ගුවන් තොටුපළේදී හරවා යැවීමට සිදුවිය.

(iii) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත අනුව ලියාපදිංචිවීමට නොහැකි බැවින් රැකියා සඳහා E-8 වීසා කාණ්ඩය යටතේ විදේශගත වීමට නොහැක. E-8 වීසා යනු කෙටිකාලීන (මාස 5-8) සෘතුමය වීසා වන බැවින්, රැකියාව ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මුදල සහ අදාළ රැකියාව මඟින් කෙටි කාලයක් තුළ උපයා ගනු ලබන ආදායම සැලකීමේදී මෙමඟින් ලැබෙන ප්‍රතිලාභය පිරිවැයට සාපේක්ෂව අඩු අගයක් වේ. කාර්යාංශයේ විමර්ශනවලින් අනාවරණය වන පරිදි මෙම එක් ශ්‍රමිකයකුගෙන් රුපියල් 1,200,000ක් වැනි අධික මුදලක් අය කරගෙන අදාළ රැකියා සපයා දී ඇත. එම කාල පරිච්ඡේදයෙන් පසු ඔවුන් නැවත මව් රටට පැමිණිය යුතු අතර, ඉන්පසු ඊළඟ සෘතුවේ රැකියා සඳහා පිටත්වීම මෙහි ස්වභාවය වුවද, තමන් වියදම් කරන ලද මුදල ආවරණය කර ගැනීම සඳහා වලංගු වීසා කාලයෙන් පසුව නැවත මව් රටට නොපැමිණ නීතිගතිම් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් තවදුරටත් එරට රැඳී සිටීමේ අවදානමක් ඇති අතර, එය 2004 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ශ්‍රී ලාංකික තරුණ තරුණියන් 6,000කට පමණ රැකියා අවස්ථා ලබාදෙන ශ්‍රී ලංකා ජනරජය හා කොරියානු ජනරජය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන රැකියා අවසර පත් ක්‍රමය (Employment Permit System) වෙත දැඩි අභිතකර

බලපෑමක් සිදු විය හැකි අතර, එමඟින් ලබා දෙනු ලබන රැකියා කෝටාව අඩු කිරීම හෝ අත්හිටුවීමේ අවදානමක් මෙමඟින් ඇති කරනු ලබයි.

(iv) අනීතිකව දකුණු කොරියාවේ රැකියා සඳහා යොමු කිරීමට උත්සාහ ගත් 07 දෙනෙකු සම්බන්ධයෙන් ඔවුන් විසින් ගෙවා ඇති සම්පූර්ණ මුදල නීතිමය ක්‍රියා මාර්ග තුළින් අදාළ ආයතනයෙන් අය කරදී ඇති අතර, එම ආයතනයේ බලපත්‍රය අත්හිටුවා ඇත. මෙම මුදල රුපියල් මිලියන 7.1ක් පමණ වන අතර, මෙලෙස මුදල් ගෙවා ඇති තවත් පාර්ශ්වයන් සිටී නම් නිසි ලෙස සාක්ෂි සහිතව එම අය කාර්යාංශයේ පැමිණිලි කරන්නේ නම්, එවැනි අයට ද අදාළ මුදල නීතිමය ක්‍රියා මාර්ග තුළින් අය කරදීමේ හැකියාවක් පවතී. මෙම වීසා කාණ්ඩය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රමිකයන් කොරියාව වෙත විදේශගත කිරීම සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් සහ සංකල්ප පත්‍රිකාවක් (Concept Report) සකස් කර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

විදේශ සංචිත ඉලක්ක සහ ණය සේවා ලබා ගැනීම සඳහා සැලසුම්
வெளிநாட்டு ஒதுக்க இலக்குகளை அடைவதற்கும் கடன் சேவைகளைப் பெறுவதற்குமான திட்டங்கள்
PLANS FOR ACHIEVING FOREIGN RESERVE TARGETS AND DEBT SERVICING

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්තුතියි, ගරු කථානායකතුමනි. ස්ථාවර නියෝග 27(2) යටතේ මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

(අ) මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි 2024 අවසානයේ නිල සංචිත වත්කම් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 6,122ක් වූ අතර 2023 අවසානයේදී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 4,392ක් විය. අමාත්‍යවරයා විසින්,

1. 2023 සහ 2024 අවසානයේදී සංචිතවලට දායක වූ මූලාශ්‍ර හා අදාළ ප්‍රමාණය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් වෙන වෙනම මාසික පදනමින් දක්වන්නේද?
2. 2024 අවසානයේදී රජයේ මුළු විදේශ ණය තොගය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් වටිනාකමින් කොපමණද?
3. 2024 අවසානයේ පැවති මුළු විදේශ ණය සංයුතිය මත පදනම්ව, 2025, 2026, 2027 සහ 2028 සඳහා රජයේ මුළු විදේශ ණය සේවා වාර්ෂික මුදල් ප්‍රමාණය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් දක්වන්නේද?
4. ඉහත සඳහන් ණය සේවා ගෙවීම් සඳහා විදේශ විනිමය සැපයීමේ හෝ සැකසීමේ වගකීම දරන්නේ මහ බැංකුවද නැතහොත් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයද යන්න පැහැදිලි කරන්නේද?
5. 2025-2028 සහ 2028-2033 කාලය සඳහා ණය සේවා ගෙවීම් වෙනුවෙන් ප්‍රමාණවත් විදේශ විනිමය සම්පාදනය කිරීමට - sourcing foreign currency - රජය සතුව නිශ්චිත සැලසුම් තිබේද?
6. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය වැඩසටහන අනුව, කාල සීමාව අවසානයේ භාවිත කළ හැකි නිල සංචිත වත්කම් 2025දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 8,520ක් ද, 2026 දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 10,888ක්ද, 2027 දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 14,208ක්ද, 2028දී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 15,875ක්ද වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කර රජය විසින් එකඟ වී ඇති මෙම සංචිත වත්කම් ඉලක්කවලට අනුකූලවීම සඳහා මහ බැංකුව සතුව ස්වාධීන මූල්‍ය ප්‍රතිපත්ති මෙවලම් තිබේද යන්න මුදල් අමාත්‍යවරයා පැහැදිලි කරන්නේද?

(ආ) 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත - Public Debt Management Act - අනුව දේශීය වෙළෙඳ පොළේ රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමේ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සතු වුවද, මහ බැංකුවේ පුවත් පත් නිවේදන අනුව භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම, වෙන්දේසි හා තැන්පතු, ලංසු භාර ගැනීම හා ඵලදායී අනුපාත -yield rate- තීරණය කිරීම මහ බැංකුව විසින් සිදු කරනු ලබයි.

1. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන පැවතියදී ද, මහ බැංකුව විසින් රාජ්‍ය සුරැකුම් පත් නිකුත් කිරීම නොකඩවා සිදු කරනු ලැබීමට හේතුව මුදල් අමාත්‍යවරයා පැහැදිලි කරන්නේද?
2. මහ බැංකුව විසින් වෙන්දේසි හා තැන්පතු මඟින් සිදු කරනු ලබන රාජ්‍ය සුරැකුම් පත් නිකුත් කිරීමේ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් රජය වගකීම භාර ගන්නේද?
3. ණය කළමනාකරණ කාර්යාලයේ සේවය කරන්නේ කවුරුන්ද?
4. 2025 ජනවාරි සිට මේ දක්වා ගතයුතු ණය ප්‍රමාණය දැනුම් දෙන්නේ කවුරුන්ද, කෙසේද යන්නත්, මෙතෙක් නිර්මාණය කර ඇති ණය ප්‍රමාණය, භාවිත කර ඇති මූල්‍ය උපකරණ ප්‍රමාණය හා අනුපාත කවරේද යන්නත් පැහැදිලි කරන්නේද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු රවී කරුණානායක මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට මුදල් නියෝජ්‍ය අමාත්‍ය ගරු මහාචාර්ය අනිල් ජයන්ත මැතිතුමා සූදානම්ව සිටියා. නමුත්, අද උදේ වරුවේ හදිසි

[ගරු බිමල් රත්නායක මහතා]

අවශ්‍යතාවක් වෙනුවෙන් පිටත් වෙන්න සිදු වූ නිසා, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කරලා එතුමාට දැනුම් දී තිබෙනවා, හෙට උදේ මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම් කියලා. එම නිසා ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලැබූ මෙම ප්‍රශ්නයට එතුමා හෙට උදේ පිළිතුර ලබා දෙයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම ඒක පිළිගන්නවා. ඒක ප්‍රශ්නයක් නැහැ.

ගරු බලශක්ති ඇමතිවරයාත් ප්‍රශ්නයකට උත්තරයක් ලබා දෙන්න තිබෙනවා. නමුත්, එතුමා තවමත් පිළිතුරක් දීලා නැහැ. කරුණාකරලා ඒකටත් උත්තරයක් දුන්නොත් හොඳයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
එතුමාගේ පිළිතුර හෙට දිනයේ ලබා දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදනය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා.

කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ හා මිද්දෙනියේ සිදු වූ වෙඩි තැබීම්: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

கொழும்பு நீதவான் நீதிமன்ற வளாகத்திலும் மித்தெனியவிலும் இடம்பெற்ற துப்பாக்கிச் சூடுகள்: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று

SHOOTING INCEDENTS IN COLOMBO MAGISTRATE'S COURT AND MIDDENIYA: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, පසුගිය 19වැනි දින කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ සිදු වූ වෙඩි තැබීමත්, ඒ වාගේම මිද්දෙණියේදී සිදු වූ වෙඩි තැබීමත් සම්බන්ධයෙන් පසුගිය දින දෙක පුරාවට මේ සභාව තුළ විවිධ කාරණා මතු වුණා. ඒ වාගේම මේ සිද්ධි නිසා ජාතික ආරක්ෂාව බිඳ වැටී ඇති බවත් විපක්ෂය විසින් චෝදනා කරනු ලැබුවා. මීට අනුගතව විනිසුරුවන්ගේ ආරක්ෂාව අඩු කර තිබෙනවාය කියන කාරණය පිළිබඳවත් යම් යම් කරුණු සහ මතවාද මේ ගරු සභාව තුළදී ඉදිරිපත් කරනු ලැබුවා.

ගරු කථානායකතුමනි, 2025.02.19වෙනි දින කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේදී සිදු වූ වෙඩි තැබීම ගැන පාර්ලිමේන්තුවේදී විපක්ෂය මතු කළ ප්‍රශ්න කිහිපයක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කිරීමට මම කැමැතියි.

මුලින්ම මම ප්‍රකාශ කරන්න කැමැතියි, පසු ගිය දා අධිකරණයේ සිදු වූ ඒ වෙඩිතැබීම පිළිබඳව රජය වශයෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරන බව. මෙම සිදුවීම පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය විසින් නිසි පරීක්ෂණ පවත්වලා වෙඩිතැබීම සිදු කළා යැයි සැක කරන පුද්ගලයා වෙඩි තබා පැය 8ක් ගතවීමටත් පෙර අත්අඩංගුවගෙන තිබෙනවා. මෙහිදී විශේෂයෙන් ශ්‍රී ලංකා පොලීසියේ කැපවීම, දක්ෂතාව අගය කළ යුතු දෙයක් ලෙස මම දකිනවා. අපේ රටේ පසුගිය කාලවල සිදු වූ සමහර අපරාධ තිබෙනවා, අද වෙනකම් කිසිදු සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ අපරාධ ලෙස. ඒවා සියල්ලම දේශපාලන සම්බන්ධතා මත සිදු වූ අපරාධ කියලා අපි කවුරුත් දන්නවා. නමුත් ශ්‍රී ලංකා පොලීසියේ දක්ෂ නිලධාරීන්ට පරීක්ෂණ සඳහා අවශ්‍ය නිදහස අපි රජයක් විධියට ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපරාධ සම්බන්ධයෙන් කාර්යක්ෂම පරීක්ෂණ ඉතා ශක්තිමත්ව සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, පසුගිය දිනකදී මිද්දෙනියේදී අරුණ ප්‍රියන්ත විදානගමගේ මහතා සහ ඔහුගේ දරුවන් දෙදෙනා ඝාතනය කිරීමේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් මීට පැයකට පමණ පෙර අත්අඩංගුවට ගැනීමට හැකියාව ලැබුණා. ඒ සිද්ධිය සම්බන්ධ තිදෙනෙකු මේ වන විට අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ සිද්ධියට සම්බන්ධ යැයි සැක කරලා ජීවන් ප්‍රසාද් කුමාර, ප්‍රභාත් තුෂාර සහ පොලිස් කොස්තාපල් 82493 අයි.එල්. ජනක ප්‍රසාද් මීට ස්වල්ප මොහොතකට පෙර අත්අඩංගුවට ගත්තා.

මම මේ සභාවට කියන්න කැමැතියි, යම් සිද්ධියක් වුණොත් අපි ඒ පිළිබඳව වහාම පරීක්ෂණ පවත්වලා අදාළ සැකකරුවන් නීතියේ රැහැනට කොටු කර ගැනීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා බව. ඒ සම්බන්ධයෙන් මේ ගරු සභාව දැනුවත් කරන්න කැමැතියි. විශේෂයෙන්ම මේ සිදුවීම් හරහා ජාතික ආරක්ෂාවට තර්ජනයක් පවතින බවට සමාජයට බොරු බිල්ලෙක් නිර්මාණය කරන්න විපක්ෂයේ සමහර කණ්ඩායම් උත්සාහ දරමින් ඉන්නවා. ඉතිහාසය පුරාම කළ දෙයක් තමයි ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් සැකයක්, කැලඹීමක් සමාජය තුළ නිර්මාණය කිරීම. මේ සිදුවීම අධිකරණය ඇතුළේ සිද්ධ වුණු පළමුවෙනි වෙඩිතැබීම නොවෙයි. හැබැයි එහෙම කියලා මේ සිද්ධිය ලඝු කරන්න අපි සූදානම් නැහැ. මේ පිළිබඳව රජය බරපතළ ලෙස අවධානය යොමු කරලා තිබෙනවා. මේ පිළිබඳව රජයේ දැඩි කැපවීම, මැදිහත්වීම සිද්ධ කරලා තිබෙනවා.

අපි දන්නවා පසුගිය දශක දෙක තුනක කාලය පුරාම පාතාලය කොහොමද වර්ධනය වුණේ කියලා. මේ පාතාල කල්ලි නිර්මාණය වුණේ දේශපාලන අනුග්‍රහය ඇතිව. ඒ පාතාල කල්ලිවලට දේශපාලන රැකවරණ ලබා දීලා තිබුණා. ඒ චිතරක් නොවෙයි. මේ පාතාලයන් එක්ක මත්ද්‍රව්‍ය ජාවාරම ඇතුළු විවිධ හොරකම්, මැරකම්, ජාවාරම් සම්බන්ධයි. ඒවා එකිනෙකට සම්බන්ධයි. ඒ සේරම පිටුපස දේශපාලන රැකවරණය තිබුණා. ඒ වාගේම මෙහිදී සිහිපත් කරන්න කැමැතියි, පසුගිය සමයේ මේ විධියට විටින් විට වාර්තා වූ වෙඩිතැබීම්, පාතාල ක්‍රියාකාරකම් සිදු වුණේ විවිධ පාතාල කල්ලි සහ පුද්ගලයන් අතර සිදු වූ ගැටුම් විධියට බව.

එම ගැටුම් නිසා මිය ගිය අය අතර පාතාල නායකයන් විධියට නම් දරපු පුද්ගලයෝ ඉන්නවා. ඔවුන් එහෙම ඝාතනය වීම අපි කිසිසේත්ම සාධාරණීකරණය කරන්නේ නැහැ. නමුත් එලෙස මිය යන අය අතර මනුෂ්‍ය ඝාතන විශාල ප්‍රමාණයක් කිරීම සම්බන්ධයෙන් චෝදනා තිබෙන පුද්ගලයන් ඉන්නවා. මම මෙයින් මතු කරන්න උත්සාහ කරන්නේ වෙනත් කිසිවක් නොවෙයි, මනුෂ්‍ය ඝාතන විශාල ප්‍රමාණයක් කරපු පුද්ගලයන් පසුගිය කාලයේ මේ රට තුළ බිහි වුණේ කොහොමද කියන කාරණාවයි.

එම පුද්ගලයන් බිහි වුණේ, දැන් විපක්ෂයේ සිටින - ඔවුන්ගේ ආණ්ඩු කාලයේ බලය හොබවපු - සමහර කණ්ඩායම්වල අනුග්‍රහයෙන්. එම පිරිස් දැන් විශාල සෝෂාවක් කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය සමයේ පැවති ආණ්ඩුවල, ඒ කියන්නේ දැන් විපක්ෂයේ සිටින සමහර කණ්ඩායම් බලය හොබවන කාලයේදී සිදු වුණු පාතාල ක්‍රියාකාරකම්, මිනීමැරුම් මොනවාද කියලා අපට මතකයි. සමහර ක්‍රීඩකයෝ, මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් ඝාතනය වුණා; අතුරුදහන් වුණා. ඒ විතරක් නොවෙයි. සමහරුන්ගේ අත පය කඩා දැම්මා. ඒ සිදුවීම් පිළිබඳවත් අද මේ විපක්ෂයේ ඉඳගෙන ජාතික ආරක්ෂාව යැයි කියමින් කෑ කෝ ගසන කිසිම කෙනෙක් ඔවුන්ගේ ආණ්ඩු කාලයේ කිසිම සාධනීය මැදිහත්වීමක් කළේ නැහැ. ඔවුන්ගේ කාලයේ තමයි ලංකා දේශපාලනයේ කළු පැල්ලම් බඳු ඒ සිදුවීම් සිදු වුණේ. අද වෙනකල් ඒ අපරාධවල චින්දිතයන්ට යුක්තිය ඉෂ්ට වෙලා නැහැ. ඒ චින්දිතයන්ට යුක්තිය ඉෂ්ට කිරීමට අපි මැදිහත් වන බව මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න මා කැමැතියි.

ජාතික ජන බලවේගය බලයට පත් වුණාට පස්සේ, පසුගිය සමයේ මෙම පාතාලයට තිබුණු දේශපාලන රැකවරණ සියල්ලම සම්පූර්ණයෙන් ඉවත් කරලා තිබෙනවා. අපේ කිසිම මන්ත්‍රීවරයකු, ඇමතිවරයකු කිසිදු පාතාල කණ්ඩායමක් සමඟ සම්බන්ධකම් පවත්වන්නේ නැහැ. පාතාල සාමාජිකයන් සම්බන්ධයෙන් කටයුතු කරන්න අපි පොලීසියට නිදහස ලබා දීලා තිබෙනවා. ඒ වාගේම කිසිදු දේශපාලන බලපෑමක් පොලීසියට සිදු කරන්නේ නැහැ. පරීක්ෂණ දේශපාලනීකරණයෙන් තොරව සිදු වෙමින් පවතිනවා.

විපක්ෂය විසින් විවිධ අවස්ථාවලදී මතු කරපු තවත් ප්‍රශ්නයක් තමයි, විනිසුරුතුමන්ලාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වන කාරණය. පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති 2011 දෙසැම්බර් 03වැනි දින චක්‍රලේඛය ප්‍රකාරව මේ වනවිට විනිසුරුතුමන්ලාගේ ආරක්ෂක රාජකාරිය විධිමත්ව සිදුවන බව මේ ගරු පාර්ලිමේන්තුවට අවධාරණය කරන්න කැමැතියි. ඒ අනුව ආරක්ෂාවේ කිසිදු වෙනස්කමක් සිදු කරලා නැහැ. එතුමන්ලාගේ ආරක්ෂාව ඒ ආකාරයෙන්ම ලබා දීලා තිබෙනවා. ඒ අනුව මහෙස්ත්‍රාත්වරයෙකු, අතිරේක මහෙස්ත්‍රාත්වරයෙකු, දිසා විනිසුරුවරයෙකු, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා, නියෝජ්‍ය ලේකම්වරයා, සහකාර ලේකම්වරුන්, මහාධිකරණ විනිසුරුවන්, පළාත්බද සිවිල් අභියාචනාධිකරණ විනිසුරුවන්, වාණිජ මහාධිකරණ විනිසුරුවන්, අභියාචනාධිකරණ විනිසුරුවන්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් කියන සියලුදෙනාට පෙර පැවති ආරක්ෂාව එලෙසම පවත්වාගෙන යනවා. 2011.12.03වැනි දා නිකුත් කරපු චක්‍රලේඛයේ ඒ පිළිබඳව පැහැදිලිව සඳහන් වෙනවා. කිසිවකු, කිසිම විනිසුරුතුමෙකුගේ ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් මතු කරලා නැහැ. මම එහෙම කියන්නේ මේ නිසායි. පොලිස්පතිවරයා විසින් දෙසැම්බර් මාසයේ නිවේදනයක්, නැත්නම් චක්‍රලේඛයක් නිකුත් කරලා මහාධිකරණ විනිසුරුවන් ඇතුළු අනෙකුත් විනිසුරුවන්ගේ ආරක්ෂාව සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙකු පොලීසිය පැත්තෙන් පත් කරලා තිබෙනවා.

යම් ගැටලුවක් තිබෙනවා නම් එතුමා හරහා සම්බන්ධීකරණය කිරීම සඳහාත් පසුගිය දෙසැම්බර් මාසයේ පියවර අරගෙන තිබෙනවා. එම නිසා විනිසුරුවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව ගරු සභාවේ මතු කරපු කාරණා සත්‍යයෙන් තොරයි කියා මමත් ප්‍රකාශ කරන්න කැමැතියි.

19වැනි දා මහෙස්ත්‍රාත් අධිකරණයේ සිදු වුණු සිද්ධිය සම්බන්ධයෙන් පොලිස්පතිතුමා මා වෙත වාර්තාවක් ලබා දී තිබෙනවා. ඒ අනුව, 19වන දින කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ සිදු වුණු අපරාධය සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්, පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්, ඒ වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ව තොරතුරු හුවමාරු කරමින් විමර්ශන පවත්වාගෙන යනවා. ඒ අනුව අංක 202, 1/ඒ, දඹහේන පාර, මහරගම පදිංචි, වයස අවුරුදු 27ක් වන සමිඳු දිල්ෂාන් පියුමංග කඳනආරච්චි යන සැකකරු පාලවිය හන්දිය ප්‍රදේශයේදී පැය 16.30ට පුත්තලම පොලීසියේ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් විසින් මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන තිබෙනවා. වැඩිදුර පරීක්ෂා කිරීමේදී සැකකරු සන්තකයේ තිබුණු ගමන් මල්ලේ විදේශ රටක නිෂ්පාදිත කොළ පැහැති ජීව අත්බෝම්බයක් හමු වී ඇති අතර, එය නඩු භාණ්ඩ වශයෙන් පොලිස් නිලධාරීන් භාරයට ගෙන තිබෙනවා. ඊට අමතරව NW PE 5293 දරන KDH වර්ගයේ වෑන් රථයේ රියැදුරු වශයෙන් සිටි ගල්ගොඩැල්ලහේන, මිල්ලෑව ලිපිනයේ පදිංචි, වයස අවුරුදු 47ක් වන මහේෂ් සම්පත් ප්‍රියදර්ශන කියන සැකකරු අපරාධයේ වෙඩික්කරුට අපරාධය සම්බන්ධයෙන් ආධාර අනුබල දීම චෝදනාව යටතේ අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඔහුගේ අංක NW PE 5293 දරන වෑන් රථය මේ වනකොට පොලිස් භාරයට ගෙන තිබෙනවා. වෙඩික්කරුගෙන් ප්‍රශ්න කරන විට, අපරාධය සිදු කරන විට ඇඳ සිටි ඇඳුම්, බෑගයක දමා කොච්චිකඩේ රිදීවැල්ල මාර්ගයේ දමා ගිය බවට අනාවරණය කරගෙන තිබෙනවා. මේ වනකොට එම බෑගය පොලිස් නිලධාරීන්ගේ භාරයට ගෙන තිබෙනවා. වෙඩික්කරු සමඟින් අපරාධය සඳහා පැමිණි බවට හඳුනාගෙන ඇති, කටුවැල්ලේගම පාර, මීගමුව පදිංචි, වයස අවුරුදු 25ක් වන ඉෂාරා සෙව්වන්දි වීරසිංහ නමැති සැකකාරිය අත්අඩංගුවට ගැනීමට විමර්ශන නිලධාරීන් විමර්ශන පවත්වමින් සිටිනවා. විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරු අනුව එම සැකකාරිය සමඟින් අපරාධයට පෙර සහ පසුව සබඳතා පවත්වන ලද මීගමුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කරනු ලබන වේපත් අංග, පාදෙනිය ලිපිනයේ පදිංචි පොලිස් කොස්තාපල් 102216 ලඟිරු ප්‍රසන්න ඇතුගල යන නිලධාරියා එම වෙඩි තැබීම සහ මනුෂ්‍ය ඝාතනය සිදු කිරීමේ අපරාධය සඳහා ආධාර සහ අනුබල දීම සම්බන්ධයෙන් ඊයේ දිනයේ අත්අඩංගුවට ගනු ලැබුවා. අපි පොලිස් නිලධාරියෙක් ද, හමුදා නිලධාරියෙක් ද, අපරාධකරුවෙක්ද කියන පදනමකින් තොරව -කිසිදු භේදයකින් තොරව- ඕනෑම සිද්ධියකට සම්බන්ධ ඕනෑම කෙනෙක් අත්අඩංගුවට ගැනීමට පසුබට වන්නේ නැහැ.

ඒ අනුව මෙම පොලිස් නිලධාරියා ඊයේ දිනයේදී අත්අඩංගුවට ගනු ලැබුවා. අපරාධයෙන් පසුව අධිකරණ භූමියෙන් පලා ගිය වෙඩික්කරු "පික්මී" කුලී ගමන් ත්‍රිරෝද රථයක නැඟී ගමන් කර ඇති අතර, කඩොල්කැලේ හන්දිය අසලට ගොස් නිල් පැහැති ත්‍රිරෝද රථයක නැඟ ගොස් කොච්චිකඩේ, රිදීවැල්ල මාර්ගයේ නැවතී සිට ඇති අතර, සැකකරු අපරාධය සිදු කරන අවස්ථාවේ ඇඳ සිටි ඇඳුම් බෑගය පාළු ස්ථානයකට විසිකර තිබියදී ඉහත භාරයට ගෙන තිබෙනවා. මෙම සැකකරු සිටින ස්ථානයට ඉහත සැකකාරිය වෙනත් ත්‍රිරෝද රථයකින් පැමිණ ඇති අතර, ඒ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අනාවරණය කරමින් විමර්ශන කටයුතු සිදුවෙමින් පවතිනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

මෙම වෙඩික්කරු 2019.12.12 දින ශ්‍රී ලංකා යුද හමුදාවේ තුන්වන කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත බැඳී, සෙබළ අංක 559189 යටතේ රාජකාරි කර 2024 මැයි මාසයේදී පොදු සමාව යටතේ ඉන් ඉවත්ව සිටි බව සඳහන් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කරුණු තහවුරු කර ගැනීම සඳහා පනාගොඩ යුද හමුදා වැටුප් හා ලේඛන අංශයට වාර්තාව යොමු කරලා තිබෙනවා. අත්අඩංගුවට ගන්නා ලද අංක NW PE 5293 දරන KDH වෑන් රථය පරීක්ෂා කිරීමේදී එහි තිබී වාහන සේවා කිරීමට අදාළ බිල්පතක් හමු වී තිබෙනවා. එම බිල්පතේ අංක PF 7824 යනුවෙන් සඳහන් වෙලා තිබෙනවා. ඒ අනුව එහි හිමිකාරිත්වය සම්බන්ධයෙන් කරුණු තහවුරු කර ගැනීමට විමර්ශන පවත්වමින් තිබෙනවා. ඒ අනුව භාරයට ගත් වෑන් රථයේ එන්ජින් අංකයට සහ චැසි අංකයට අදාළව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂා කිරීමේදී ඊට අදාළ නිවැරදි ලියාපදිංචි අංකය වෑන් රථය තුළ තිබූ රිසිට් පතේ සඳහන් PF 7824 දරන අංකය බවට අනාවරණය කර ගන්නා ලද අතර, වෑන් රථයේ සවි කර ඇති අංක NW PE 5293 දරන අංක තහඩුව ව්‍යාජ එකක් බවට අනාවරණය වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපරාධය සිදු කිරීමට පෙර වෙඩික්කරු සහ ඔහු සමඟ පැමිණි කාන්තාව ලැගුම් ගෙන සිටි කඩුවෙල පිහිටි ලැගුම්හලක් පරීක්ෂා කළා. එහි කාමරයක් වෙත නුගේගොඩ අපරාධ ස්ථානයේ පරීක්ෂණ නිලධාරීන් ගොස් ඇඟිලි සටහන් පරීක්ෂක කැඳවා එම ස්ථානය නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක් කරලා තිබෙනවා. ලැගුම්හලේ CCTV දර්ශන පරීක්ෂා කිරීමේදී සැකකරු සහ සැකකාරිය අපරාධ ස්ථානයට රැගෙන ඒමට භාවිත කරන ලද හොන්ඩා ෆිට් වර්ගයේ සුදු පැහැති කාර් රථයේ ලියාපදිංචි අංකය WP CAC 8711 බවට අනාවරණය වෙලා තිබෙනවා. මේ වෙනකොට එම කාර් රථය නඩු භාණ්ඩයක් වශයෙන් භාරයට ගෙන තිබෙනවා. එහි ලියාපදිංචි අංකයේ නිවැරදිතාව සහ හිමිකාරිත්වය සම්බන්ධයෙන් අනාවරණය කර ගැනීමට වැඩිදුර පරීක්ෂණ පවත්වනවා. අපරාධයට පෙර දින ඉහත කාර් රථයෙන් පැමිණි අයෙකු විසින් මෙම ලැගුම්හලේ සිටි සැකකරුට සහ සැකකාරියට පාර්සලයක් ලබා දී ඇති බවත්, එම අපරාධයට යොදා ගත් ගිනි අවිය සහ සැකකරු අපරාධය සිදු කිරීමට ඇඳ සිටි නීතිඥයකුගේ ඇඳුමට සමාන ඇඳුමද එහි අඩංගුව තිබී ඇති බවත් සැකකරුගේ ප්‍රකාශ සහ මහ පෙන්වීම යටතේ අනාවරණය කරගෙන තිබෙනවා.

අපරාධය සිදු වුණු අවස්ථාවේ අධිකරණ භූමියේ අංක 5 මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජකාරියේ නිරතව සිටි පොලිස් නිලධාරීන්, අධිකරණ කටයුතු සඳහා පැමිණි පොලිස් නිලධාරීන්, අධිකරණයේ සේවය කරන නිලධාරීන් සහ නීතිඥයන් සහ අධිකරණයේ ප්‍රධාන දොරටුවේ ආරක්ෂක රාජකාරි සඳහා යොදවා සිටි පෞද්ගලික ආරක්ෂක අංශයේ නිලධාරීන්ගේ ප්‍රකාශ මේ වනකොට සටහන් කරගෙන තිබෙනවා. ඒ වාගේම මේ සිද්ධිය සම්බන්ධයෙන් තවත් පුද්ගලයන් කිහිප දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට අවශ්‍යව තිබෙනවා.

වෙඩි තැබීමෙන් මිය ගිය සංජීව කුමාර සමරරත්න නොහොත් "ගනේමුල්ලේ සංජීව" යන අයගේ පශ්චාත් මරණ පරීක්ෂණය කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයේදී සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි දුලංග බලල්ල මහතා විසින් 2025.02.20 දින, එනම් ඊයේ දින සිදු කෙරුවා. මෘත දේහය මරණකරුගේ මව වන අංක 141/බී, මාකිලංගමුව, ගනේමුල්ල යන ලිපිනයේ පදිංචි ඇලන් නෝනා මෙන්ඩිස් යන අයට භාර දීමට කටයුතු කර තිබෙනවා. ඒ අනුව දැනට සැකකරුවන් රඳවුම් නියෝග මත රඳවා ගෙන තවදුරටත් විමර්ශනය කරමින් පවතිනවා. මෙම වාර්තාව පොලිස්පතිතුමන් විසින් මා වෙත ඉදිරිපත් කර තිබුණා.

ඒ වාගේම මිද්දෙනිය සිද්ධියේ සැකකරුවනුත් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. එම සැකකරුවන් අතරත් පොලිස් නිලධාරියෙක් සිටින බව පැහැදිලි වෙලා තිබෙනවා. ඊයේ දිනයේදී ගරු ජනාධිපතිතුමා උපදේශක කාරක සභාවේදී අවධාරණය කළා වාගේම මේ පාතාල ක්‍රියාකාරකම් සඳහා සමහර රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලැබෙන බවත් පැහැදිලියි. විශේෂයෙන්ම පොලීසියේ. පොලීසිය භාර, එහෙම නැත්නම් මහජන ආරක්ෂක ඇමතිවරයා හැටියට මා ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කර තිබෙනවා. ඒ පිළිබඳව තීන්දු තීරණ අරගෙනත් තිබෙනවා. ඉදිරියටත් එවැනි තීන්දු තීරණ ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම මේ ගරු සභාවට කියන්න කැමැතියි, කිසි ලෙසකින් -බිඳකින්- හෝ මේ රටේ ජාතික ආරක්ෂාවට බාධාවක් වෙන්න අපි ඉඩකඩ තබන්නේ නැති බව. මේවා තැන තැන සිදු වන පාතාල ක්‍රියාකාරකම් හැටියට සහ සංවිධානාත්මක අපරාධකරුවන්ගේ අපරාධ හැටියට තමයි අපි හඳුනාගෙන තිබෙන්නේ. ඒවා මර්දනය කිරීමට අවශ්‍ය සෑම වැඩ පිළිවෙළක්ම මේ ආණ්ඩුව ඉදිරියේදී ගන්නා බවත්, මේ වෙනකොටත් බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවත් මා සඳහන් කරන්න කැමැතියි. එම විමර්ශනවලට බාධා වෙන නිසා ඒ සමහර දේවල් මේ සභාවට ප්‍රකාශ කරන්න අපහසුයි. එහෙත් එම විමර්ශනවල ප්‍රගතිය වරින් වර ඔබතුමන්ලාට; මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අදහස් කරනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, -

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, එම පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කෙසේ කිව්වත් ජාතික ආරක්ෂාව පිළිබඳව ලොකු ගැටලුවක් මේ රටේ ජනතාවට තිබෙනවා. මොකද, දිගින් දිගටම ඇති වන මේ තත්ත්වය නිසා.

කෙසේ වෙතත්, ඔබතුමා පැහැදිලි කළා, මේක අද ඊයේ වෙච්ච දෙයක් නොවෙයි, දිගින් දිගටම වෙච්ච දෙයක් කියලා. ඔව්. හැබැයි, ඔබතුමා ඒ අතරතුර චෝදනාවකුත් එල්ල කළා, පසුගිය රජයන් නියෝජනය කරපු දේශපාලනඥයන් මේවාට සම්බන්ධයි කියලා. ඒ ප්‍රකාශය පොදුවේ කිරීමේදී අපි හැමෝටම ඇඟිල්ල දිගු වෙනවා. එම නිසා ඔබතුමා ඉතා පැහැදිලිව කියන්න, පසුගිය රජයන් නියෝජනය කරපු ඒ දේශපාලනඥයන් කවුද, ඔවුන්ට පාතාලයත් එක්ක තිබෙන සම්බන්ධය මොකක්ද කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ සිද්ධියත් එක්ක මත් ද්‍රව්‍යවල සම්බන්ධතාවක් තිබෙනවා කියලා. ඒ කාරණාවලට සම්බන්ධ වෙලා තිබෙන දේශපාලනඥයන් නීතිය හමුවට ගෙනැල්ලා කරුණාකරලා අපි හැමෝටම සාධාරණයක් ඉටු කරන්න. ඔබතුමන්ලා හැම දේකටම පසුගිය අවුරුදු 75ක, 76ක කාලයේ පැවති ආණ්ඩුවල වෙච්ච සිදුවීම් කියලා කිව්වාට, ඒක හේතුවක් කරගන්න එපා අනාගතයේ වෙන දේවල්වලට. ඔබතුමන්ලා අතීතයට චෝදනා කරන එක නතර කරලා, මේවාට මැදිහත් වෙලා ඉන්න දේශපාලන අධිකාරිය කවුද කියන එක ඉතාම පැහැදිලිව මේ රටට ප්‍රකාශ කරලා, ඒ අය සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ සිදුවීමේ බරපතළකම, බැරෑරුම්සහගතභාවය අපි තේරුම් ගෙන තිබෙනවා. ඒ ගැන අපි පරීක්ෂණ කරගෙන යන බව ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් තහවුරු වුණා. අමාත්‍යවරයා ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළා. අමාත්‍යතුමාගේ ප්‍රකාශය සම්බන්ධයෙන් මේ වෙලාවේ වාදයකට යන්න බැහැ. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා points of Order මතු කරනවා නම් ඒ කුමන කාරණයටද කියලා පැහැදිලි කරන්න. එහෙම නැතිව මේක වාදයක් කරගන්න බැහැ. ඔබතුමන්ලාට මේ ගැන කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව තිබෙනවා. ඒ නිසා ඒ පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් අනුගමනය කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, පොලිසිය භාර ඇමතිතුමාගෙන් තමයි මම මේ කාරණය අහන්නේ. පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඒ සිද්ධියට අදාළ අපරාධකරු පැය 8ක් තුළ දක්ෂ ලෙස අත්අඩංගුවට ගැනීම ගැන අපි සතුටු වෙනවා. හැබැයි, සිද්ධියට සම්බන්ධ කාන්තාව තවම අත්අඩංගුවට අරගෙන නැහැ. කාන්තාවයි, වෙඩික්කරුයි මීගමුවට ගිහිල්ලා තිබෙනවා. ඊට පස්සේ දෙන්නා බෙදිලා ගිහින් -කාන්තාව අයින් වෙලා, වෙඩික්කරු තමයි ගියේ- තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙහෙම කිව්වාට ඊයේ රාත්‍රී ප්‍රවෘත්තිවලදී කිව්වා, ඩුබායිවල ඉඳන් කෙනෙක් වෙඩික්කරු පාවාදුන් හින්දා තමයි ඔහු ඇල්ලුවේ කියලා. වෙඩික්කරු ඇල්ලුවේ අපේ ආරක්ෂක අංශවල දක්ෂකමට නොවෙයි. ඩුබායිවල ඉන්න පාතාලයේම කෙනෙකු ඔහුව පාවා දුන්නා කිව්වා. ඒක ගැන මම දන්නේ නැහැ. හැබැයි, ඩුබායිවල ඉන්න කෙනාගේ දක්ෂතාවෙන් මේ අත්අඩංගුවට ගැනීම වුණා කියලායි මාධ්‍යයෙන් කියන්නේ. එතකොට අපේ ආරක්ෂක අංශවල දක්ෂතාවෙන් නොවෙයි, ඩුබායිවල ඉන්න අයගේ දක්ෂතාවෙන් තමයි ඒ වෙඩික්කරු අල්ලාගෙන තිබෙන්නේ. ඒක තමයි කියන්නේ. හැබැයි, තවමත් ඒ කාන්තාව අල්ලා ගන්න බැරි වුණා නේ.

ඊළඟ කාරණය මෙයයි. මොන දේ කළත් ෆොටෝ දාලා සැකකරු රටට වීරයෙක් කළා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, point of Order එකට අදාළව කථා කරන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු ඇමතිතුමනි, ෆොටෝ දමන්න දෙන්න එපා. ෆොටෝ දමන්න දෙන්නේ නැතුව පොඩ්ඩක් ඒ ගැන සොයා බලන්න කියන්න. දැක්කාද? එයා අත්අඩංගුවට ගත්ත ගමන්ම නිකම් "ලව්" කරනවා වාගේ ෆොටෝ දාලා තිබෙනවා. ඒවා වැරැදියි. කවුද එහෙම දමන්නේ? අනික, එච්චර ලොකු අපරාධකාරයෙක්! ඒ ෆොටෝවලින් අපි දැක්කා, "ලව්" කරනවා වාගේ නේ වැන් එක ඇතුළේ ඒ පුද්ගලයා හිටියේ. ඒකාව නිකම් වීරයෙක් කළා. එහෙම කරන්න එපා කියන්න. ඒ ගැන ඔබතුමා පරීක්ෂණයක් පවත්වන්න.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, සමහර ඡායාරූප මාධ්‍යයට එන්නේ AI තාක්ෂණය ඔස්සේ. ඒවා පිළිබඳව පොඩ්ඩක් අවබෝධ කර ගන්න අවශ්‍යයි. මාධ්‍යයේ යන හැම එකකින්ම සත්‍ය දේ කියැවෙනවා, වෙනවා කියලා අදහස් කරගෙන, මේ පාර්ලිමේන්තුවට ඒවා කියන්න එපා. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමනි, AI තාක්ෂණය පිළිබඳව ටිකක් අවබෝධ කරගන්න.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා, විපක්ෂයේ දේශපාලන පක්ෂ ගැන මම කිව්වා කියලා. මම කිව්වේ, සමහර දේශපාලනඥයෝ කියලායි. මීද්දෙනියේ සිද්ධිය සම්බන්ධව ඕනෑ තරම් තොරතුරු සමාජ මාධ්‍යවල සංසරණය වෙනවා. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාට ඒ සමහර තොරතුරු ලැබිලාත් ඇති. මම දන්නේ නැහැ, ඒවා කොහොමද ලැබුණේ කියලා. මාධ්‍යවල යන හැම තොරතුරක්ම සත්‍යයි කියලා මට මේ වෙලාවේ ප්‍රකාශ කරන්න බැහැ. අපි මේ තොරතුරු කිව්වේ, පොලීසියේ විමර්ශන ආශ්‍රයෙනුයි.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ප්‍රවෘත්තිවලට කිව්වේ.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ප්‍රවෘත්තිවල කියන හැම දෙයක් පිළිබඳවම අපට වගකීමක් නැහැ. ඔබතුමාට වගකීමක් ඇති. ඒක මම දන්නේ නැහැ. මම වගකීමක් ඇතිවයි මගේ ප්‍රකාශය කළේ. *[බාධා කිරීමක්]* ඒ නිසා කාන්තාවක්ද, පිරිමියෙක්ද කියලා නැහැ, පොලිස් නිලධාරීන් ඒ සියලුදෙනා අත්අඩංගුවට ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අවශ්‍ය නම් ඉදිරියේදී වැඩිදුර තොරතුරු බලාගන්න පුළුවන්. අවශ්‍ය නම් අපට සතිපතා ඒ විමර්ශන පිළිබඳ තොරතුරු ලබා දෙන්නත් පුළුවන්. ඒ නිසා පොලීසිය ගන්නා ක්‍රියාමාර්ග ලඝු කරන්නවත්, ඒවා අවතක්සේරු කරන්නවත් ඔය වාගේ ප්‍රකාශ කරන්න එපා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම කිව්වේ මාධ්‍යයේ ගිය තොරතුරු.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මාධ්‍යයේ බොහෝ දේ යනවා. Social mediaවලත් තව බොහෝ දේ යනවා නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපට පෙරවරු 10.30ට ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න තිබෙනවා. මේ සිද්ධිය පිළිබඳව ගරු ඇමතිතුමා ප්‍රකාශයක් කළා. ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුත් දැනට ඒ සම්බන්ධයෙන් මැදිහත් වී තිබෙනවා. අනෙක් එක, මේක අපරාධයක් සම්බන්ධයෙන් පවත්වන පරීක්ෂණයක්. ඒ නිසා අනවශ්‍ය ලෙස හෙළිදරව් කර ගන්න හදන මේ සමහර කරුණුවලින් ඒ පරීක්ෂණයට අනවශ්‍ය බාධා ඇති වෙන්න පුළුවන්. ඊට අමතරව, පාර්ලිමේන්තුවේ ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කිරීමේ අවශ්‍යතාවත් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් කථා කරන්න ඔබතුමා ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට අවස්ථාව ලබා දුන්නා. අපි ආණ්ඩුව වශයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා සභාවේ ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න කියලා. මොකද, අනෙක් කටයුතු සියල්ල මේ නිසා ප්‍රමාද වෙනවා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මම බොහොම වැදගත් කාරණයක් මේ මතු කරන්නේ. මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්නේ මොන ස්ථාවර නියෝගය යටතේද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ.

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ කරුණු දෙකක්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 92(2) (ආ) මොකක්ද කියන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට කරුණු දෙකක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියන්න, ස්ථාවර නියෝග 92(2)(ආ)හි සඳහන් වෙන්නේ මොකක්ද කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ සඳහන් වෙන්නේ මොකක්ද කියලා කියන්න. පාසල් දරුවෝත් ගැලරියේ ඉන්නවා. ඒ අයටත් අහගන්න පුළුවන්.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි මම මේ කියන්නේ, 92(2)(ආ) යටතේ. විනාඩියක් අපිට කථා කරන්න ඉඩ තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. නැහැ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක වැදගත් කාරණයක්. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, මේ නීතිඥයා,- *[බාධා කිරීමක්]* ඊයේ අනුරාධ ජයරත්න මැතිතුමා මේ සම්බන්ධව,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 92 (ආ)හි තිබෙන්නේ,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)හි තිබෙන්නේ රීති ප්‍රශ්න සම්බන්ධයෙන්. රීති ප්‍රශ්නයක් යටතේ මට මේ කාරණය අහන්නත් බැරි නම් ඉතින් වැඩක් නැහැ නේ. මම කියන්නේ ඔබතුමාට,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, ඔබතුමා එය කියවන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා කියවා ගන්න. මම ගරු ඇමතිතුමාගෙන් වැදගත් ප්‍රශ්නයක් අහන්නේ, නීතිඥවරයෙක් විධියට.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම එය කියවන්නම්. "රීති ප්‍රශ්නයක් මතු කිරීමේදී,...-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"රීති ප්‍රශ්නයක් මතු කිරීමේ දී, මන්ත්‍රීවරයෙකුට මිනිත්තු එකකට වඩා කථා කරනු ලැබිය නොහැකි අතර සැලකිල්ලට භාජනය කරනු ලබමින් තිබෙන ප්‍රශ්නයක් පිළිබඳව කථා කරනු ලැබිය නොහැකි වන්නේ ය."

ඊළඟට, ස්ථාවර නියෝග 92(2)(අ) යටතේ සඳහන් වන කාරණයත් මම කියන්නම්.

එහි මෙසේ සඳහන් වෙනවා:

"ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද ...."

මම අහන්නේ ඒකයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා රීති ප්‍රශ්නය මතු කරන්නේ ස්ථාවර නියෝග 92(2)(අ) යටතේද, 92(2)(ආ) යටතේද?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ දෙකටම අදාළයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ Standing Order එක මෙතුමා කථා කරන එකට විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන එකට එය විරුද්ධයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ Standing Order එක මෙතුමා කථා කරන එකට විරුද්ධයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා මට කියලා දෙන්න ඕනෑ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කවුරුත් කියන්න ඕනෑ නැහැ. මේ ස්ථාවර නියෝග පොත තිබෙනවා නේ. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(5)හි විධිවිධාන ප්‍රකාරව, 2025 පෙබරවාරි 27 බ්‍රහස්පතින්දා, 28 සිකුරාදා සහ 2025 මාර්තු 01 සෙනසුරාදා, 03 සඳුදා, 04 අඟහරුවාදා, 05 බදාදා, 06 බ්‍රහස්පතින්දා, 07 සිකුරාදා, 08 සෙනසුරාදා, 10 සඳුදා, 11 අඟහරුවාදා, 12 බදාදා, 14 සිකුරාදා, 15 සෙනසුරාදා, 17 සඳුදා, 18 අඟහරුවාදා, 19 බදාදා, 20 බ්‍රහස්පතින්දා සහ 21 සිකුරාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 පෙබරවාරි 27 බ්‍රහස්පතින්දා සහ 2025 මාර්තු 01 සෙනසුරාදා, 03 සඳුදා සිට 06 බ්‍රහස්පතින්දා දක්වා, 08 සෙනසුරාදා, 10 සඳුදා සිට 12 බදාදා දක්වා, 15 සෙනසුරාදා සහ 17 සඳුදා සිට 20 බ්‍රහස්පතින්දා දක්වා යන වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 පෙබරවාරි 28 සිකුරාදා, 2025 මාර්තු 07 සිකුරාදා සහ 14 සිකුරාදා යන වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා 2025 මාර්තු 21 සිකුරාදා වෙන් කළ දිනයෙහි පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1. විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීම. සිව්වැනි වෙන් කළ දිනය.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.

ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]

"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ඉත්තිවෙක්කප්පට්ට විවාදම් මීළඟ් තොටංකුදර්කාන කට්ටළෙ වාසික්කප්පට්ටදු.

சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக".- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [17th February]

"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]

Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විවාදය ආරම්භ කිරීම, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 45ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 10.40]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, 2025 අය වැය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ විශේෂයෙන්ම මේ අය වැය තුළින් රටට ලබා දිය යුතු විසඳුම පිළිබඳව විශ්ලේෂණයක් කරනකොට ඉතාම වැදගත් වෙනවා, මෙවන් අය වැයක් ක්‍රියාත්මක කරන්නට ලැබුණු වරම සහ ඒ වරම ක්‍රියාත්මක කිරීම පිළිබඳව සන්සන්දනයක් කිරීම. "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්; රට අනුරට" කියන මේවා යටතේ තමයි එදා ජන වරමට ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති මාලාව සැකසුණේ.

අපි බලන්න ඕනෑ, මේ ප්‍රතිපත්ති මාලාවේ තිබෙන ඒ ගුණාංගයන්, කර්තව්‍යයන් 2025 අය වැය කථාවේ කොතෙක් දුරට අඩංගු වී තිබෙනවාද කියන කාරණාවයි. විශේෂයෙන්ම අය වැය ගැන කථා කරනකොට, මේ අය වැයේ රාමුව දිහා බැලුවොත්; නිර්මාතෘත්වය දිහා බැලුවොත්; ඉදිරිපත් කිරීම දිහා බැලුවොත්; එළිදැක්වීම දිහා බැලුවොත් ඉතාම පැහැදිලියි, පොරොන්දු වුණු ආකාරයට, ලබා ගත්ත වරමට සරිලන ආකාරයට මේ අය වැය නිර්මාණය වෙලා නැහැ කියන එක. ඒක තමයි අපේ අදහස. මම කැමැතියි, ඒ තර්කය සාක්ෂි සහිතව, දත්ත සහිතව ඔප්පු කරන්න.

විශේෂයෙන්ම මේ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාවේ 105වැනි පිටුවේ තිබෙනවා, වත්මන් රජය බලයට පත් වනකොට විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙල කිරීම පිළිබඳව. ඉංග්‍රීසියෙන් කියනවා නම්, Alternative Debt Sustainability Analysis. ඒ පොරොන්දුව සහමුලින්ම බැහැර කරලා මොකක්ද අද සිදු වෙලා තිබෙන්නේ? අද සිදු වෙලා තිබෙන්නේ ජනතාව මත අසීමිත පීඩනයක් පටවන; අසහනයක් පටවන; ජනතාවට ලබා දිය යුතු ප්‍රතිලාභ සීමා කෙරෙන තත්ත්වයක් ඇති කර තිබීම. 2024 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව ප්‍රාථමික වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් හැටියට සියයට 13ට සීමා කරලා, ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3කට සීමා කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශ්ලේෂණයක් කරලා තිබෙනවා, ලෝකයේ රටවල් 106ක. රටවල් 10යි එහෙම සීමා කරලා තිබෙන්නේ. ඒ තමයි, ග්වාතමාලාව, ඉතියෝපියාව, ශ්‍රී ලංකාව, වෙනිසියුලාව, නයිජීරියාව, ඉරානය, යේමනය, බංග්ලාදේශය, ලෙබනනය, හයිටිය කියන රටවල්. එහෙම සීමා කරලා තිබෙන්නේ ඒ රටවල් ටික විතරයි. එතකොට දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් හැටියට සියයට 13ක ප්‍රාථමික වියදම කියන්නේ රජයේ මැතිවරණ පොරොන්දුවක් නොවෙයි; දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් හැටියට සියයට 2.3ක ප්‍රාථමික ශේෂය කියන්නේ මැතිවරණ පොරොන්දුවක් නොවෙයි. ඒක වරම ක්‍රියාත්මක කිරීමක් නොවෙයි.

ඒක ඇත්තවශයෙන්ම ඔබතුමන්ලා ලබපු වරම පාවාදීමක්. ඒ වරම සහමුලින්ම විනාශ කරලා, කියපු දේවල් ඔක්කෝම අමතක කරලා තිබෙනවා. අපි විශ්වාස කරන ආකාරයට ඒ IMF

එකඟතාව; ඒ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර එකඟතාව දැඩි ලෙස පීඩාකාරී, අසහනකාරී ගිවිසුමක්. එයින් අපි කිසිසේත්ම අදහස් කරන්නේ නැහැ, මේ IMF වැඩ පිළිවෙළෙන් ඉවත් වෙන්න කියලා. ඒක නොවෙයි අපි අදහස් කරන්නේ. ජනතාවගේ පැත්තෙනුත් හිතලා බලලා වඩාත් ජනතාවාදී, මානුෂීයවාදී අලුත් ගමනකට ප්‍රවේශ වන්න තිබුණා.

දැන් මොකක්ද මේ සීමාවන් තුළ වෙන්නේ? මේ සීමාවන් තුළ බාහිරතාවලට අදාළ නිවැරදි කිරීම කරගන්න බැරි වෙනවා; you cannot correct the externalities. සමාජ පිරිවැයක් නිර්මාණය වෙනවා, ඒ සමාජ පිරිවැය මහහරවා ගන්නට බැරි වෙනවා. Providing public goods will be impacted. රජයක වගකීමක් තමයි, පොදු භාණ්ඩ - public goods - සැපයීම. ඒකට මේ සීමාවන් බාධාවක් වෙනවා. ඒ වාගේම, සමාජමය පුනර් බෙදා හැරීමත් - social redistribution - වැළැක්වෙනවා.

ඕනෑ තරම් තිබෙනවා, ජාත්‍යන්තරව කරපු සමීක්ෂණ. ඒ හැම එකකින්ම පෙන්වලා දෙන්නේ මේ විධියට ප්‍රාථමික වියදම් සහ ප්‍රාථමික ශේෂය සීමා කරනකොට ඒක රටක දියුණුවට අගතිගාමී වෙනවා, සෘණාත්මක බලපෑමක් වෙනවා කියලායි. එදා කිව්වා, නැවත සාකච්ඡා කරනවා, - renegotiate කරනවා - අලුත් ගිවිසුමකට යනවා කියලා. ජනතාවගේ වරමෙන් බලය ලබාගත්ත වර්තමාන රජය ඒ ඔක්කෝම අමතක කරලා, ඒ ජනවරම සම්පූර්ණයෙන්ම පාවාදීලා තිබෙනවා කියන එක තමයි මට මේ අවස්ථාවේ කියන්න සිද්ධ වෙන්නේ. විශේෂයෙන්ම මේ අවස්ථාවේ වැදගත් වෙනවා, ජෝන් එෆ්. කෙනඩි ජනාධිපතිතුමා එක්තරා අවස්ථාවක කරපු ප්‍රකාශයක්: "The great enemy of the truth is very often not the lie, deliberate, contrived and dishonest, but the myth, persistent, persuasive and unrealistic". ඒ කියන්නේ, "සත්‍යයේ මහා සතුරා වනුයේ, බොහෝ විට සිතාමතා සැලසුම්සහගත සහ වංක ලෙස ප්‍රකාශ කරනු ලබන අසත්‍ය නොව, අඛණ්ඩව පවත්වන්නා වූ ඒත්තු ගැන්වීමේ හැකියාව සහිත යථාර්ථවාදී නොවන මිථ්‍යාව වේ" යන්නයි. මම හිතන විධියට එතුමාගේ ප්‍රකාශය අද දවසට විශේෂයෙන්ම වැදගත් වෙනවා.

දැන් අද සමාජයේ බොහෝදෙනා මැසිවිලි නඟනවා. වැටුප් වැඩිවීම තේරෙන්නේ නැහැ, වැටුප් වැඩි වුණේ කොච්චර ප්‍රමාණයකින්ද, වැටුප වැඩි වුණාද, දීමනාවලට මොකක්ද වෙන්නේ, දීමනා ටික කොහොමද හැඩ ගැහෙන්නේ කියන කරුණු ගැන සම්පූර්ණයෙන්ම ව්‍යාකූලත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ ව්‍යාකූලත්වය අපි තේරුම් ගන්නට ඕනෑ. මේ අය වැය සකස් වෙලා තිබෙන්නේ මේ සියයට 13ක ප්‍රාථමික වියදම් සීමාව තුළ, සියයට 2.3ක ප්‍රාථමික ශේෂය තුළ. ඇත්තවශයෙන්ම ඉතාම සොච්චම් ප්‍රමාණයක් තමයි ලැබිලා තිබෙන්නේ රට ගොඩනඟන්න, ජනතාවට ශක්තිය, රැකවරණය, ආරක්ෂාව ලබා දෙන්න.

මම මේ අවස්ථාවේ බොහොම පැහැදිලිව මේ කාරණය කියන්න කැමැතියි. අපි විටින් විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයින්ව හමු වුණා; පීටර් බෘවර් මැතිතුමාව හමු වුණා. මමත්, හර්ෂ ද සිල්වා මැතිතුමාත්, කබීර් හෂිම් මැතිතුමාත්, ඉරාන් වික්‍රමරත්න මැතිතුමාත්, අපේ තවත් ගරු මන්ත්‍රීවරුනුත්, ආර්ථික විශේෂඥයෝත් ඉතාම පැහැදිලිව කිව්වා, IMF එකත් එක්ක තමයි අපි වැඩ කරන්නේ, IMF වැඩ පිළිවෙළේ තමයි අපි යන්නේ, හැබැයි අපි කියන කියන පදයට නටන්න සූදානම් නැහැ කියලා. අපි පිළිගන්නවා, IMF වැඩසටහනක් තුළ අසහනය නිර්මාණය වෙනවා, පීඩනය නිර්මාණය වෙනවා, යම්කිසි පිරිවැයක් යනවා කියලා. ඒ අසහනය, පීඩනය පුළුවන් තරම් දුරකට අවම කරන්න ඕනෑ.

ඒක තුනී කරන්නට ඕනෑ. නමුත් මොකක්ද සිද්ධ වුණේ? ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා දසවැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය විවෘත කරමින් මොනවාද කිව්වේ? එතුමා අර වේදිකාවල කරපු ප්‍රකාශ ඔක්කෝම ටික අමතක කරලා, ජන පීඩනය, ජන දුක, ජන කඳුළු, ජන වේදනාව, ඒ අසීමිත පීඩනයන් තුළ තැළුණු, පොඩි වුණු ඒ ජන ජීවිතවල, ඒ දුෂ්කරතා, ඒ ගැටලු සියල්ල අමතක කරලා, 2024 නොවැම්බර් 21වැනි දා ජනාධිපතිතුමා විධියට කියනවා, "ඉතාම සියුම් හුයකින් එල්ලා තිබෙන ආර්ථිකයක් අප හමුවේ තිබෙන්නේ. මේ ආර්ථිකයට විශාල කම්පන ඔරොත්තු දෙන්නේ නැහැ" කියලා. එසේ කියලා එතුමා ගෙඩිය පිටින්ම බාර ගන්නවා රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා සාකච්ඡා කරපු ඒ ගිවිසුම්. අපි දකිනවා, එක පැත්තකින් ඒක ජනවරම පාවාදීමක් හැටියට. තවත් පැත්තකින් රටේ ජනතාව ඇන්දවීමක්.

ඒ වාගේම එතුමා කථා කරනවා, අහිමි වුණු දශක පිළිබඳව. මේ ගත්ත තීන්දුවෙන් අපට දශක කීයක් අහිමි වෙයි ද කියලා පොඩ්ඩක් හිතලා බලන්න. රට වෙනුවෙන් අපට තිබුණා මීට වඩා වාසිදායක තීන්දුවක් ගන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාස කරනවා, ඓතිහාසික වරදක් සිදු වෙලා තිබෙනවා කියලා. ජනාධිපතිතුමා අහිමි වුණු දශක ගැන කථා කරනකොට මේ ගත්ත තීන්දු තුළ දශක කීයක් අපට අහිමි වෙයිද කියන එක ගැන පොඩ්ඩක් කල්පනා කර බලන්න. රට වෙනුවෙන් මීට වඩා වාසිදායක තීන්දුවක් ගන්නට තිබුණා. ජනතාවට වැඩි පීඩනය වෙනුවට අඩු පීඩනය; වැඩි අසහනය වෙනුවට යම් සහනයක්; මේ මහා ජනතා මැසිවිල්ලට යම් ප්‍රමාණයක විසඳුමක් ලබා දෙන්නට පුළුවන්කම තිබුණා. මේ ප්‍රාථමික ශේෂය, ප්‍රාථමික වියදම් පිළිබඳව රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා එකඟ වුණු අවබෝධතා බැහැර කරලා, වඩාත් මානුෂීය වැඩ පිළිවෙළකට ප්‍රවේශ වන්නට තිබුණා.

දැන් මම කැමැතියි, විශේෂයෙන්ම අපේ ගරු සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත්, රටේ ජනතාවටත් අතිවැදගත් කාරණාවක් කියන්න. ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා අය වැය කථාවේදී බොහොම ස්ථිර ලෙස කිව්වා, "2028 වෙනකොට අපි සූදානම් ණය ගෙවන්න" කියලා. ඒක බොහොම හොඳයි. අපෙත් ප්‍රාර්ථනාව ඒ දේ කරන්නට පුළුවන් වෙන්න කියායි. ඒක අවංකවමයි කියන්නේ. මොකද, රට තුළ තවත් ව්‍යසනයක් නිර්මාණය කරලා, බලහුවමාරු කරන ඒ ගෝත්‍රික දේශපාලන සංස්කෘතිය අපි කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ. හැබැයි, මතක තබා ගන්න, 2028දී ණය ගෙවන්නට නම්, අනිවාර්යයෙන්ම ආර්ථික වර්ධනය ඉහළ මට්ටමකට ගෙන එන්නට ඕනෑ බව. ඒක

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නැතිව ඒ කාර්යය කරන්න බැහැ. රාජ්‍ය ආදායම ඉහළ මට්ටමකට ගෙනෙන්නට ඕනෑ. ඒක නැතිව කරන්නටත් බැහැ. දැන් කවුරුත් නොකියන කාරණාවක් තිබෙනවා. ඒක මේ සභාවේත් වැඩිය කියන්නේ නැහැ, රටටත් කියන්නේ නැහැ, මේක හැමෝම හංගාගෙන ඉන්නවා. හැමෝම නොවෙයි, මේ දත්ත පිළිබඳව අවබෝධයක් තිබෙන අය මේක හංගාගෙන ඉන්නවා.

මෙන්න මේක පොඩ්ඩක් අහගන්න. 1975 ඉඳලා මේ දක්වා IMF ගිවිසුම් ක්‍රියාත්මක වුණු රටවල් 75ක් තිබෙනවා. මේ රටවල් 75න් සියයට 59කට අනිවාර්යයෙන්ම යන්න සිද්ධ වෙලා තිබෙනවා දෙවැනි, තුන්වැනි, හතරවැනි ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන්වලට.

මේක කවුරුවත් කියන්නේ නැහැ. මේක රටේ ජනතාවට කියන්නේ නැහැ. එක ගිවිසුමකින්, එක ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් එම කටයුත්ත හරි ගිහිල්ලා තිබෙන්නේ රටවල් 75න් සියයට 41කට පමණයි. අපි අවංකවම ප්‍රාර්ථනා කරනවා, අපට ඒ සියයට 41 කොටසේ ඉන්න ලැබේවා කියලා; එනම්, ආපහු ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යන්නට සිදු නොවේවා කියලා. ඒ මොකද, එසේ කළොත් ඒක බරපතළ ආර්ථික විනාශයක් -ව්‍යසනයක්- බවට පත් වෙනවා. හැබැයි, අද දවසේත් ණය තිරසරකරණ - debt sustainability - රේඛාව දිහා බැලුවොත්, ඒ debt sustainability රේඛාවේ, ඒ curve එකේ අපේ රට ඉන්න ඕනෑ. නමුත්, අපේ රට එතැන නැහැ; එයින් බැහැරව ඉන්නේ. ඇයි, එයින් බැහැරව ඉන්නේ? අපේ රටට මීට වඩා ආර්ථික වර්ධන වේගයක් අවශ්‍යයි; මීට වඩා රාජ්‍ය ආදායම එකතු කර ගැනීම අවශ්‍යයි. එසේ නොකළහොත් ලැබෙන ඵල විපාකය රටත් දැන ගන්නට ඕනෑ. ඒ තමයි, තව ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යෑමට සිදු වීම. කරුණාකර කියන්න එපා, මම බිල්ලෙකු මවා පානවා කියලා. මේ තොරතුරු, කරුණු කාරණා අපට අනාවරණය වුණේ, වර්තමාන IMF ගිවිසුම නිර්මාණය කරන්නට, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිර්මාණය කරන්නට පසුගිය රජයට අවසාන මොහොත වන තෙක් උපදෙස් දුන් කණ්ඩායමක් Chatham House Rules මත කරපු සාකච්ඡාවකට මමත් සහභාගි වුණු නිසා. අපට ඒ නම් ගම් කියන්නට බැහැ. නමුත්, ඒ සිදු වුණු දේවල් මම කියන්නම්. බැරි වෙලාවත් අපට ණය තිරසර කරන රේඛාවේ ඉන්න බැරි වුණොත් අපට යන්න වෙනවා, දෙවැනි තුන්වැනි හතරවැනි restructuring එකකට. එවැනි restructuring එකකට යන්න වුණොත් අපි ලොකු අමාරුවක වැටෙනවා. එසේ නොකරන්නට නම් අපි ආර්ථිකය වේගවත්ව වර්ධනය කරන්නට ඕනෑ, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නට ඕනෑ.

ඇත්තවශයෙන්ම අපේ රටේ දත්ත පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. මම උදාහරණයක් පෙන්වන්නම්. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා, 2025 වසරේ සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්නවා කියලා. බොහොම හොඳයි, ඒක ලබා ගන්න පුළුවන් නම්. හැබැයි, ජනාධිපතිතුමාගේ කථාවේම කියනවා, ලෝක බැංකුව සඳහන් කරන ආකාරයට අපේ රටේ දුප්පත්කම සියයට 25.9යි කියලා. මේවා, අය වැය කථාවේදී ජනාධිපතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යාලේඛන. ජනාධිපතිතුමා කියනවා, 2025 වසරේ ආර්ථික වර්ධන වේගය සියයට 5ක් අපේක්ෂා කරනවා කියලා. ලෝක බැංකුව කියනවා, 2023දී දුප්පත්කම සියයට 25.9යි කියලා. හැබැයි අනුර කුමාර දිසානායක මැතිතුමනි, දරිද්‍රතාව පිළිබඳ ලෝක බැංකුවේ සංඛ්‍යාලේඛන පිළිගන්නා ගමන්ම පොඩ්ඩක් හොයලා බලන්න, ලෝක බැංකුව 2025දී අපේ රටේ ආර්ථික වර්ධන වේගය ගැන මොකක්ද කියන්නේ කියලා. ලෝක බැංකුව තමයි 2025 ජනවාරි මාසයේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා කියන්නේ. ඒකත් එක්ක තර්ක කරන්න බැහැ නේ. මොකද, අනුර කුමාර දිසානායක මැතිතුමා ලෝක බැංකුවේ සංඛ්‍යාලේඛන උපුටා දක්වමින් 2023දී දුප්පත්භාවය සියයට 25.9යි කියන එක පිළිගෙන තිබෙනවා. මම මේක පෙන්වන්න හදන්නේ ජනාධිපතිතුමාට සංඛ්‍යාලේඛන වැරදුණා වාගේ තර්කයක් ගොඩ නඟන්න නොවෙයි. ජනාධිපතිතුමා කියන ආකාරයට 2025දී ආර්ථික වර්ධන වේගය සියයට 5යි. ලෝක බැංකුව කියනවා, 2025දී -ජනවාරි මාසයේ පෙනෙන ආකාරයට- ආර්ථික වර්ධන වේගය සියයට 3.5යි කියලා. එහෙම කියන කොට ආර්ථික වර්ධන වේගයේ බරපතළ gap එකක් තිබෙනවා, විෂමතාවක් තිබෙනවා, ඌනතාවක් තිබෙනවා. ඒ gap එක bridge කර ගත්තේ නැත්නම් අපි ලොකු අමාරුවක වැටෙනවා. ඒ නිසා මෙය ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. අනිවාර්යයෙන් ශීඝ්‍ර ආර්ථික වර්ධනයකට රටක් හැටියට අපි යන්නට ඕනෑ. හැබැයි, ඒ යන ආකාරය මේ අය වැයේ නම් පැහැදිලිව සඳහන් වෙලා නැහැ කියන එක මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

අපි දළ දේශීය නිෂ්පාදිතය - GDP එක - වැඩි කර ගන්නට ඕනෑ. දැන් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්නට expenditure approach එක තිබෙනවා, income approach එක තිබෙනවා, production approach එක තිබෙනවා. දැන් ඒ වැඩ පිළිවෙළ තුනම -වියදම් ක්‍රමවේදය, ආදායම් ක්‍රමවේදය, නිෂ්පාදන ක්‍රමවේදය- ගත්තොත්, මේ අය වැයෙන් පැහැදිලි කරලා නැහැ, 2028 ණය ටික ගෙවීම ආරම්භ කිරීම සඳහා අපි ඉහළ ආර්ථික වර්ධන වේගයක් නඩත්තු කරගෙන යන්නේ කොහොමද, ඉහළ ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යන්නේ කොහොමද, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නේ කොහොමද කියලා. එම කාරණාව පිළිබඳව කිසිම පැහැදිලිතාවක් මේ අය වැයෙහි නැහැ. සංඛ්‍යාලේඛන නම් ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. අප නම් දකින්නේ ඒවා ඔක්කෝම සුරංගනා කථා ලෙසයි. ඒවා යථාර්ථවාදී නැහැ. සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන කොට අපි සත්‍යවාදී වෙන්නට ඕනෑ, යථාර්ථවාදී වෙන්නට ඕනෑ.

ප්‍රාථමික ශේෂය සහ ප්‍රාථමික වියදම් පිළිබඳව වැරදි එකඟතාවකට ආපු නිසා අද රටම මැසිවිලි නඟනවා. මම ඒ ගැන පැහැදිලි කර දුන්නා. වැටුප් වැඩි කිරීම් ගැන තේරුම් ගන්න බැහැ. එහි ව්‍යාකූලත්වයක් තිබෙන්නේ. ඒ ඒ ශ්‍රේණිවලට, ඒ ඒ තලවලට කොහොමද වැටුප ලැබෙන්නේ, මේ අවුරුද්දේ කීයක් හම්බ වෙනවා ද, ලබන අවුරුද්දේ කීයක් හම්බ වෙනවා ද, ඊළඟ අවුරුද්දේ කීයක් හම්බ වෙනවා ද, කොහොමද මේවා ගළපා ගන්නේ, වැටුපට අමුණලා ද, නැත්නම් එල්ලලා ද, එහෙම නැත්නම් මූලික වැටුපට දාලා ද කියලා හිතා ගන්න බැහැ. හැම තැනකම ව්‍යාකූලත්වයක් තිබෙන්නේ. සාමාන්‍යයෙන් අය වැය කථාව කියෙව්වාම රටේ සාමාන්‍ය ජනතාවට තේරෙන්න ඕනෑ, මොකක්ද මේ වෙන්නේ කියලා. මම විශේෂයෙන්ම වැටුප් ගැනයි මේ කියන්නේ. ඒ ගැන කිසිම පැහැදිලි කිරීමක් නැහැ. මම කියන්නේ, ශීඝ්‍ර ලෙස ආර්ථිකය වර්ධනය වන ආකාරය ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ, රාජ්‍ය ආදායම වැඩි කර ගන්නා ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ කියලායි.

ඒ වාගේම මම මේ ගරු සභාවට කියන්න කැමැතියි, IMF ගිවිසුමටයි, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ගිවිසුමටයි ප්‍රවේශ වෙලා තිබෙන්නේ scenarios කිහිපයක් මත පදනම්ව බව. අවශ්‍ය නම් ඔබතුමන්ලා ඒ ගැන මුදල් ඇමතිතුමාගෙන් හෝ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න. මම හිතන විධියට scenarios 6ක් ද කොණේද තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා ද, මේ ගිවිසුම පදනම්

කර ගත් ඒ scenario එක සම්පූර්ණයෙන් වැරදියි කියලා? ඒකයි අපි කිව්වේ, අලුත් negotiation එකකට යන්නට ඕනෑ කියලා; අලුත් සාකච්ඡාවකට යන්නට ඕනෑ කියලා. මොකද, මේ ගිවිසුම පදනම් කරගෙන හදපු මේ ක්‍රියාවලිය, ආර්ථික වර්ධන වේගයක් සපුරා ගන්නට බැරි යථාර්ථවාදී නොවන ඉලක්කයක් නිර්මාණය කර තිබෙනවා. රාජ්‍ය ආදායම පිළිබඳව යථාර්ථවාදී නොවන ඉලක්කයක් සඳහා තමයි එකඟතාවකට ඇවිල්ලා තිබෙන්නේ. ඒකට ප්‍රධානතම හේතුව තමයි, ඔබතුමන්ලාත් negotiate කර ගන්නේ දුර්වල ගිවිසුමක් සම්බන්ධයෙන් වීම. ඇත්ත වශයෙන්ම ඒක ගෙඩිය පිටින්ම භාරගෙන හිටපු ජනාධිපතිවරයාගේ අඩි පාරේ යන ගමනක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ නිසා මම මේ කාරණය ඔබතුමන්ලාට කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරණ ජයග්‍රහණයත් එක්ක ජනාධිපතිතුමාගේ පාර්ශ්වය මන්ත්‍රීවරු 159දෙනෙක් පත් කර ගන්නා කාල වකවානුව දක්වා දළ වශයෙන් මාස දෙකක කාලයක් තිබුණා. ඒ මාස දෙකක කාලය තුළ IMF එකත් එක්ක සාකච්ඡා කරලා, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර හිමියන් එක්ක සාකච්ඡා කරලා, "අපි අලුත් ආණ්ඩුවක්, අපි ආවේ ජනතා වරමකින්, දැන් පාර්ලිමේන්තු එකැනදීත් ජනතාවගේ හඬ ඉස්මතු වෙයි" කියලා, වහාම මේ ගිවිසුම් වෙනස් කරලා ජනතාව මත අඩු පීඩනයක්, වැඩි සහනයක් සහ අඩු අසහනයක්, වැඩි ශක්තියක් ලබා දෙන අලුත් ගිවිසුමකට යන්න තිබුණා. දැන්වත් ඒක ගැන පොඩ්ඩක් හිතලා බලන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා. දැනටත් ප්‍රමාද ද දන්නේ නැහැ. විස්තීර්ණ ණය පහසුකම - Extended Fund Facility එක - ගැනම හිතමින් ඉන්නේ නැතුව වහාම IMF එකත් එක්ක සාකච්ඡා කරන්න. මොකද, මේ ආර්ථික වර්ධන ඉලක්ක යථාර්ථවාදී නැහැ, රාජ්‍ය ආදායම් ඉලක්ක යථාර්ථවාදී නැහැ, ප්‍රාථමික ශේෂය, ප්‍රාථමික මැතිවරණයකුත් පැවැත්වෙනවා, වියදම් පිළිබඳ ඉලක්ක යථාර්ථවාදී නැහැ. ඔබතුමන්ලා දන්නවා ද, අර සාකච්ඡාවේදී මේ ගිවිසුමට උපදෙස් දුන් කණ්ඩායම මහා භයානක කථාවක් කිව්වා.

ඒ තමයි, 2028දී ණය ගෙවන්න ඉස්සෙල්ලා අපේ රටට සිද්ධ වෙයි දෙවෙනි ණය ප්‍රතිව්‍යුහගතකරණයකට - second debt restructuring එකකට - යන්න. ඒක බරපතළ තත්ත්වයක්. ඒ නිසා මම රජය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට, - ඒ කණ්ඩායමට - යෝජනා කරනවා, මේ පිළිබඳව හොඳට සාකච්ඡා කරලා බලන්න කියලා. මොකද, මේ යන්නේ බොහොම අමාරු තැනකට, මේ යන්නේ බොහොම වැරදි තැනකට. අපි මේ බිල්ලෝ මවනවා නොවෙයි. අපි මේ ඇත්ත කථාව කියන්නේ. මේ කථාව කියන්නේ IMF ගිවිසුම්, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ගිවිසුම් මේ විධියට නිර්මාණය කරන්න උපදෙස් දුන්නු කණ්ඩායම. ඇත්ත වශයෙන්ම අහගෙන ඉන්නකොට මම තිගැස්සුණා. ඇයි? ගිවිසුම අවසානය ගැන කථා කරලා මාස තුනක්වත් ගිහිල්ලා නැහැ, ඒගොල්ලන් ආපහු කියනවා ණය ප්‍රතිව්‍යුහගතකරණයකට යන්න ඕනෑ කියලා. ඒකට කියන්නේ pre-emptive restructuring කියලා. ඒ කියන්නේ ණය ගෙවෙන්නේ නැහැ කියලා, ණය moratorium එකකට යන්න ඉස්සෙල්ලා වේලාසනින්ම යන්න ලු, ණය ප්‍රතිව්‍යුහගතකරණයට. මේවා විහිළු කථා නොවෙයි; සෙල්ලම් කථා නොවෙයි. ඇත්ත වශයෙන්ම මේවායින් අසහනයට, පීඩනයට පත් වෙන්නේ අපේ රටේ ජනතාවයි.

මම වැඩ කරන ජනතාව වෙනුවෙන් රජයෙන් අහන්න කැමැති කාරණයක් තිබෙනවා. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී EPF එකට සහ ETF එකට තට්ටු කළා. දැන් ඔබතුමන්ලාට තිබෙනවා විශාල වරමක්; මන්ත්‍රීවරු 159දෙනෙක්. ඇයි මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා ඒ EPF එකේයි, ETF එකේයි තිබෙන වැඩ කරන ජනතාවගේ ඉතිරි කිරීම්වලට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්නට බැරි?

දැන් විශේෂයෙන්ම කථා කරනවා දරිද්‍රතාව ගැන. ජනාධිපතිතුමාත් ඒ ගැන කථා කරනවා. නමුත් අස්වැසුම දරිද්‍රතාව තුරන් කරන්න විසඳුමක් නොවෙයි. දුප්පත්කම තුරන් කරන්න නම් නිෂ්පාදන වැඩසටහනක් තිබෙන්න ඕනෑ, ආයෝජන වැඩසටහනක් තිබෙන්න ඕනෑ, පාරිභෝජන වැඩසටහනක් තිබෙන්න ඕනෑ, ඉතිරි කිරීමේ වැඩසටහනක් තිබෙන්න ඕනෑ, අපනයන වැඩසටහනක් තිබෙන්න ඕනෑ. නමුත් ඒ එකක්වත් නැහැ. එතකොට අස්වැසුමට තෝරා ගැනීම්, බැහැර කිරීම් ගැන බලමු. දරිද්‍රතා රේඛාව හඳුනා ගන්නේ නැතිව, ගෘහයක ආදායම් වියදම් සමීක්ෂණය කරන්නේ නැතිව, දුප්පත්කම දිහා බලන්නේ නැතිව, ආහාර වියදම්, ආහාර නොවන වියදම් පිළිබඳ තොරතුරු නොදැන කොහොමද දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නේ කියන එක අපි හැමෝටම ප්‍රහේලිකාවක්.

ඔබතුමන්ලා විසින්ම නිර්මාණය කර ගත්ත සීමා තුළ අද බරපතළ ප්‍රශ්න තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හෙද නිලධාරීන්ගේ, වෛද්‍ය නිලධාරීන්ගේ, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ, කම්කරුවන්ගේ සහ කාර්යාල කාර්ය සහායක සේවය වාගේ හැම සේවයකම බරපතළ ව්‍යාකූලත්වයක් තිබෙනවා. රජයටත් පොරොන්දු වුණු ආකාරයට 20,000ක වැටුප් වැඩිවීම දෙන්න බැරි වෙලා තිබෙනවා. මොකක්ද හේතුව? හේතුව තමයි ප්‍රාථමික වියදම් කිරීමේ සීමාව. ඒක සියයට 13යි. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ක්; ප්‍රාථමික ගිණුමෙහි 2.3ක අතිරික්තයක් පවත්වා ගැනීම. ඒ සීමාව තුළ ඔබතුමන්ලා පොරොන්දු වුණු "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්; රට අනුරට" ප්‍රතිපත්තිය කිසිසේත්ම ක්‍රියාත්මක කරන්න බැහැ. ඇයි? ඒක ක්‍රියාත්මක නොකරන්න අවශ්‍ය සීමා ටික ඔබතුමන්ලාම දාලා, ඔබතුමන්ලාම හිරකාරයෝ වෙලා සිටිනවා, මේ අඩු සම්පත් ප්‍රමාණය තුළ.

වැඩිහිටි විශ්‍රාමික ප්‍රජාවගේ ඉතිරි කිරීම්වලට කාලයක් මුළුල්ලේ සියයට 15ක් ලැබුණා, ලක්ෂ 15ක deposit එකට. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඒක ලක්ෂ 10ට අඩු කරලා, ඒ ඉතිරිකිරීමේ පොලී අනුපාතය සියයට 3කින් වැඩි කිරීම නිසා දැන් සියයට 10ක් වාගේ හම්බ වෙනවා. ලක්ෂ සංඛ්‍යාත වැඩිහිටි ප්‍රජාවට මේක බරපතළ ප්‍රශ්නයක්.

ඊළඟට, කාන්තාවන් වෙනුවෙන් යම් යම් ප්‍රතිලාභ ලබා දීලා තිබෙනවා, ගර්භිණී මව්වරුන්ගේ පෝෂණ සලාකය යනාදී වශයෙන්. ඒවා ගැන හොඳ කියනවා, අපි. හැබැයි, බරපතළම ප්‍රශ්නය තමයි ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ සහභාගිත්වය. එය සියයට 33යි, 34යි.

අපි ඒක සියයට 45කට ගෙනෙන්නට ඕනෑ. ඒ සඳහා Verité Research ආයතනය දත්ත කේන්ද්‍රීයව සකස් කරලා තිබෙනවා, ඒ මව්වරුන්ගේ ප්‍රසූත දීමනාව රාජ්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරන්න කියලා. ඒ අය ගණනය කර තිබෙන ආකාරයට රුපියල් බිලියන 6ක්, 7ක් වාගේ වැය වෙනවා ඒකට. ඒ වාගේ මුදල් ප්‍රමාණයක් වැය කළොත් පුළුවන්කම ලැබෙනවා, ශ්‍රම බලකායේ කාන්තාවගේ සහභාගිත්වය ඉහළ මට්ටමකට ගෙනෙන්න.

ඒ වාගේම අපි අවංකව හදවතට තට්ටු කරලා මේ ගැන අහන්න ඕනෑ. මත්පැන්, සිගරට් නිෂ්පාදනය කරන ආයතනවලින් ඇත්ත වශයෙන්ම අය විය යුතු බදු මුදල් ටික අය වෙන්නේ නැහැ. එතැන වැරදි බදු සූත්‍රයක් ක්‍රියාත්මක වෙන්නේ. අන්න ඒක ගැන සොයා බලා රාජ්‍ය ආදායම වැඩි කර ගන්නට මද්‍යසාර සහ දුම්කොළ සමාගම්වල අයත් එක්ක සාකච්ඡා කරලා ඒ අයගෙන් අය විය යුතු ඒ බදු ප්‍රමාණය අය කර ගන්න කටයුතු කරන්න. එතකොට පුළුවන් රාජ්‍ය ආදායම ඉහළට දමා ගන්න.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පෙර පාසල් පද්ධතියට උදව් කරන්නට මේ අය වැයේ යෝජනා තිබෙනවා. පෙර පාසල් ගුරුතුමියලාගේ, සහායක ගුරුතුමියලාගේ දීමනා වැඩි කරනවා කියලා තිබෙනවා. හැබැයි, මේ රටේ රාජ්‍ය ක්ෂේත්‍රය තුළ කීයද පෙර පාසල් තිබෙන්නේ? සුළු ප්‍රමාණයක්. පෙර පාසල් දරුවාට උදව් කරන කොට, පෙර පාසල් ගුරුවරුන්ට උදව් කරන කොට තෝරලා බේරලා කරන්න එපා. ඒක සමස්ත වැඩසටහනක් හැටියට ක්‍රියාත්මක කරන්නට ඕනෑ. අපි සතුටු වෙනවා මහපොළ ආධාරය වැඩි කිරීම ගැන. හැබැයි, ඔබතුමන්ලා දන්නවාද පසුගිය මාස කීපයක් මහපොළ ආධාරය ගෙවලාත් නැහැ කියලා? එතකොට නොගෙවපු ආධාරයක් වැඩි කරනවා කියනවා. වැඩි කරන එක හොඳයි. මම ඉල්ලීමක් කරනවා, ඒ වැඩි කිරීම් වාගේම නොගෙවපු මහපොළත් ගෙවන්න කටයුතු කරන්න කියලා.

අද ගොවි ජනතාව ලොකු පීඩනයකට ලක් වෙලා තිබෙනවා. වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය පමණක් නොවෙයි, අනෙකුත් භවභෝග මිලදී ගැනීමේ ක්‍රියාවලිය නිසා ඔවුන් ලොකු පීඩනයක ඉන්නේ. මේ චෝදනා මම මේ රජයට විතරක් කරන්නේ නැහැ. පැවැති ආණ්ඩු සියල්ලක්ම ඇත්ත වශයෙන්ම හරියාකාර වගා සූත්‍රයක් ක්‍රියාත්මක කළේ නැහැ. ඒ කියන්නේ වගා කිරීම, වගාවට යෙදවුම් දැමීම, නිෂ්පාදනය, නිෂ්පාදනය වූ ඒ නිෂ්පාදන ටික සහතික මිලකට මිලදී ගැනීම ක්‍රියාත්මක කළේ නැහැ. මේක පිළිබඳ පැහැදිලි වක්‍රයක් නැහැ. අපි යෝජනා කරනවා, මෙය නීතිගත කළ යුතුමයි කියලා. ඒවා පාර්ලිමේන්තු පනතකින් නීතිගත කරන්නට ඕනෑ. මතකයි නේ, නාමල් කරුණාරත්න මැතිතුමනි, මමත් ඔබතුමාට සහයෝගය දුන්නා, දැනට අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා ස්ථාවර මිල නීතිගත කළ යුතුයි කියලා. ඒක අපි හැමෝම එකඟ වුණු යෝජනාවක්. දැන් ඒක ක්‍රියාත්මක කරන්නට ඔබතුමන්ලාට තිබෙනවා, කදිම අවස්ථාවක්. අපි ඒ දේ ඉෂ්ට සිද්ධ කරමු.

ධීවර ජනතාව බලාගෙන ඉන්නවා තෙල් සහනාධාරය ලැබෙනකල්. විශාල ප්‍රමාණයක් ධීවර ප්‍රජාව රැකියාවට යන්නේ නැහැ. ඒ අය අනාථ වෙලා.

ඒ වාගේම "මලයගම" ප්‍රජාවගේ වැටුප් දීමනා ගැන කථා කළා. අපි විශ්වාස කරනවා, එයින් ඔබ්බට ගිහිල්ලා කටයුතු කරන්න ඕනෑ. ඒ "මලයගම" ප්‍රජාවට ඉඩම් අයිතියක් නැහැ. නිවසක අයිතියක් නැහැ. වගා කිරීමේ ඉඩමක අයිතියක්, තමන්ගේ නිවාසයක ජීවත්වීමේ අයිතියක් ලබා දීමට ඒ අය සවිබලගැන්වීමක් කරන්නට ඕනෑ. එතකොට ඒ ඉඩම්වලින් සියයට 40ක් පමණ පරිහරණය කරලා තමන්ගේම කුඩා තේ වත්තෙන් මේ රටේ ජාතික නිෂ්පාදනයට සියයට 60ක, 70ක දායකත්වය ලබා දෙන කුඩා තේ වතු හිමියකු බවට ඒ ප්‍රජාව පත් කරන්න පුළුවන්. ඔවුන් පමණක් නොවෙයි, රැකියා විරහිත තරුණ ප්‍රජාවටත් වගා නොකරපු භූමි ප්‍රමාණයක් යම්කිසි ක්‍රමයකට බෙදා දීම තුළ අපට තිරසර විසඳුමකට එන්නට පුළුවන්. මෙවන් ක්‍රියාදාමයක් තුළ ජාතික නිෂ්පාදනයට එකතුවක් වෙනවා කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ අයගේ වැටුප් වැඩි කිරීමටත් වැඩිය ඒක වටිනවා.

මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. ජන සමාජයේ විශාල ප්‍රමාණයක් හෙදියන් හැටියට පුහුණු වෙලා පත්වීම් ලැබෙන කල් බලාගෙන ඉන්නවා.

පවුල් සෞඛ්‍ය ක්ෂේත්‍රයේත් එසේමයි. රැකියා විරහිත උපාධිධාරීන් 35,000ක්, 40,000ක් පමණ ඉන්නවා. අපි හැමෝම දන්නවා අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ප්‍රමුඛ ඔබතුමන්ලාගේ රජය පොරොන්දු වුණා, රැකියා විරහිත උපාධිධාරීන් 35,000කට වැඩ පිළිවෙළක් සකස් කරනවා කියලා. එය ඉටු කරන්න. රජයේ අත්‍යවශ්‍ය රැකියා පුරප්පාඩු 30,000ක් පුරවනවාය කියන එක හරි. නමුත්, රැකියා විරහිත උපාධිධාරීන් 35,000කට, 40,000කට ලබා දුන් පොරොන්දුව කරුණාකරලා අමතක කරන්න එපා. එය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න.

ඒ වාගේම මම කියන්නට ඕනෑ, විමධ්‍යගත අරමුදල් ගැනත්. ඔබතුමන්ලා බලයට ආවේ system එක change කරනවා කියලා. දැන් මෙතැන system change එකක් නැහැ. මෙතැන තිබෙන්නේ ගෝඨාභය රාජපක්ෂ, මහින්ද රාජපක්ෂ ප්‍රතිපත්තිය නේ. මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. මන්ත්‍රීවරු 225දෙනාට ලක්ෂ 100 ගණනේ වෙන් කරනවා. මම දන්නේ නැහැ, රාජ්‍ය පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය මොකක්ද කියලා. මන්ත්‍රීවරයෙකුට විමධ්‍යගත අරමුදල් වෙන් කිරීමේ වැඩ පිළිවෙළක්, ක්‍රමවේදයක් නැහැ. අපට පෙනෙන විධියට එක් මන්ත්‍රීවරයෙකුට මිලියන 10 - ලක්ෂ 100 - ගණනේ මන්ත්‍රීවරු 225දෙනා වෙනුවෙන් වෙන් කරලා ඒ මුදල් ටික දිස්ත්‍රික්ක මට්ටමින් pool කරලා, මන්ත්‍රීවරු 159කගේ අභිමතය පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් තිබෙන්නේ. කෝ, මෙතැන system change එකක්? මේක ගෝඨාභයගේ system එක නේ; මේක මහින්ද රාජපක්ෂගේ system එක නේ. ඒකෙන් බැහැර වෙන්න, එතැනට යන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව කාරණයක් කියන්න කැමැතියි. මම මෙය සාක්ෂි සහිතව කියන්නේ. බරපතළ ලෙස දේශපාලන පළිගැනීම් සිද්ධ වනවා. මම උදාහරණ සහිතව කියන්නම්. සබරගමුව පළාතේ ප්‍රධාන ලේකම් මහින්ද වීරසූරිය. එයාව pool එකට දැම්මා. දැන් එයා විශ්‍රාම ගිහිල්ලා. වයඹ පළාතේ ප්‍රධාන ලේකම් දීපිකා ගුණරත්න මහත්මිය. එතුමියවත් pool එකට දාලා තිබෙන්නේ. ඌව පළාතේ ප්‍රධාන ලේකම් දමයන්ති පරණගම මහත්මිය. එතුමියව ප්‍රධාන ලේකම් ධුරයෙන් ඉවත් කරලා. ප්‍රධාන ලේකම්වරුන්ගෙන් කරන එම පළිගැනීම් නතර වෙලා නැහැ. දිසාපතිවරුනුත් අයින් කරලා. නුවරඑළියේ දිසාපති, නන්දන ගලගොඩ. ඔහුත් ඉවත් කරලා. රත්නපුර දිසාපති, වසන්ත ගුණරත්න. ඔහුත් ඉවත් කරලා. මාතර දිසාපති, ගනේෂ් අමරසිංහ. ඔහුත් ඉවත් කරලා. ඇයි මෙහෙම කරන්නේ? රාජ්‍ය සේවකයින් අතිවිශාල ප්‍රමාණයක්, මම හිතන විධියට ඓතිහාසික ප්‍රමාණයක් ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ මේ වාගේ දේශපාලන පළිගැනීම් කරන්න නොවෙයි. මේක වැරදියි. මේ ක්‍රියාදාමයට ඔබතුමන්ලා කොටු වෙන්න එපා. මේ පළිගැනීම් නතර කරන්න. රාජ්‍ය සේවකයින් හිංසනයට ලක් කිරීම නතර කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් මට තව කරුණු දෙකක් කියන්න තිබෙනවා. මේ අය වැය සාර්ථක වේවා කියලා මම අවංකව ප්‍රාර්ථනා කරනවා. ඒ විතරක් නොවෙයි. මෙහි තිබෙන සාධනීය ජනතාවාදී, ජනහිතකාමී ප්‍රතිපාදන ක්‍රියාත්මක කරන්නට අපිත් සහයෝගය දෙන්නම්; අපිත් හවුල් වෙන්නම්. රටට වටිනාකමක් එකතු කරන්න අපිත් ශක්තිය දෙන්නම්. කරුණාකරලා විමධ්‍යගත මුදල් ලබා දෙනකොට ඒ චින්තනයෙන්, ඒ spirit එකෙන් අපි කටයුතු කරමු. අලුත් වැඩ පිළිවෙළක් තුළින් අපි කටයුතු කරමු. හැබැයි, මේ අය වැය කථාවේ බරපතළම ප්‍රශ්නය මොකක්ද? බාහිර පරිසරය ගැන කිසිම අවබෝධයක් නැහැ. Taking due recognition and cognizance of the external environment කියලා ඒකට කියනවා. පොඩ්ඩක් හිතලා බලන්න. මොකක්ද අද ලෝකයේ වෙන්නේ? මොකක්ද අද ලෝකයේ වෙළෙඳ ක්ෂේත්‍රය තුළ වෙන්නේ? ඇමෙරිකානු ජනාධිපතිතුමාට වරමක් ලැබුණා. ඒක එතුමා ලබපු වරම. ඇමෙරිකාවේ ජනාධිපතිතුමා බහුතර ඡන්දයෙන් පත් වුණා. මොකක්ද ඒ ප්‍රතිපත්තිය? දැන් ක්‍රමානුකූලව ඒ අය සංවෘත වෙනවා.

දැන් විවිධ රටවලට ආරක්ෂක බදු - ඒවාට කියනවා, protective tariffs කියලා - පනවලා තිබෙනවා. ඒ ඒ රටවල අපනයන ඇමෙරිකා එක්සත් ජනපදයට එනවා. මෙහෙම යනකොට අපේ රටේ අපනයනවලට මොකක්ද වෙන්නේ? ඒවා පිළිබඳව පුරෝකථනයක් කරලා තිබෙනවාද; හිතලා තිබෙනවාද; analysis එකක් කරලා තිබෙනවාද? American market එක අපට අහිමි වෙනකොට අපේ garmentsවලට සිද්ධ වෙන්නේ මොකක්ද? ඔබතුමා දන්නවා, ඇඟලුම් කම්හල් 200 වැඩසටහන ගැන. මේ රටේ ආර්ථික වර්ධනයට රුකුලක් වුණු, දුප්පත්කම තුරන් කරන්නට රුකුලක් වුණු, රැකී රක්ෂා බිහි කරන්නට ශක්තියක් වුණු එම ක්ෂේත්‍රයේ අපනයනවලට, කිසිම දවසක protective tariff බලපෑමක් අපේ රටට එන්න එපා කියලා මම ප්‍රාර්ථනා කරනවා. නමුත් අපේ ඇස් ඉදිරියේ අද මොකක්ද වෙන්නේ? කැනඩාවට tariffs ගහලා තිබෙනවා; මෙක්සිකෝවට ගහලා තිබෙනවා; චීනයට ගහලා තිබෙනවා. තවත් රටවල් ගණනාවකට වැදිලා තිබෙනවා. මම අහන්නේ ඒ පිළිබඳව - external environment එක පිළිබඳව - මේ අය වැය කථාවට අවබෝධයක් අරගෙන නැද්ද කියලායි. ඒක බරපතළ ගැටලුවක්. අපනයන වෙළෙඳ පොළ විවිධාංගීකරණයකට යන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. ඇමෙරිකා එක්සත් ජනපදය වේවා, යුරෝපය වේවා, එක්සත් රාජධානිය වේවා, export markets කිහිපයකින් අපි depend වෙනවා. African Continent එක, Latin America, South America, ASEAN States යනාදි අනෙකුත් බලප්‍රදේශවල අපනයන ගමනාන්ත විවිධාංගීකරණ - export destination diversification - වැඩසටහනකට යන්න අපට පුළුවන්. ඒක මම මේ අය වැය කථාවේ දකින්නේ නැහැ.

ඒ වාගේම අපි යෝජනා කරනවා, මේ රට ගොඩගන්නට නම් අනිවාර්යයෙන්ම විශාල වශයෙන් සෘජු විදේශ ආයෝජන අපේ රටට ගෙන්වා ගන්නට ඕනෑ කියලා. ඒ සඳහා විශේෂිත වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. සෘජු විදේශ ආයෝජන මෙරටට ගෙන්වා ගන්න අපේ සහයෝගයත් ලබා දෙන්න අපි සූදානම්. නිකම් බලාගෙන සිටියාට සෘජු විදේශ ආයෝජන එන්නේ නැහැ. දැන් විවිධ බදු ක්‍රමවේද මත යම් යම් රටවලින් කර්මාන්තශාලා ඉවත් වෙලා එනකොට ඒවා අපේ රටට ගෙන්වා ගන්නට අපට තරගයක් කරන්නට තිබෙන බව මතක තියා ගන්න. අපි වියට්නාමය එක්ක තරග කරන්නට ඕනෑ; Cambodia එක්ක තරග කරන්නට ඕනෑ. Indonesia, Malaysia, India, Singapore යන රටවල් එක්ක තරග කරලා තමයි ආයෝජකයන් අපේ රටට ගෙන්වා ගන්න ඕනෑ. ඒවා පිළිබඳව පැහැදිලි වැඩසටහනක් මම මේ අය වැය කථාවේ දකින්නේ නැහැ.

ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. ආර්ථික දැක්ම, ආර්ථික වැඩ පිළිවෙළ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා වෙනවා අපි දැක්කා. අපි අනුගමනය කරන දේශපාලන ප්‍රතිපත්තිය තුළ; දස වැදෑරුම් ක්‍රමවේදය තුළ අපි අනුගමනය කරන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළයි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙළ තුළ රටක ධනය උත්පාදනය කරන්නට මානුෂීය ධනවාදය අවශ්‍යයි. මානුෂීය ධනවාදය තුළ ඇති වෙන අසමබරතා, අසමතුලිතතා නිවැරදි කරන්නට සීමාසහිත රාජ්‍ය මැදිහත්වීම අවශ්‍යයි. සුබසාධන රාජ්‍යය රැකගනිමින්, එහි කාර්යක්ෂමභාවය වැඩි කරමින් එයට සම්පත් ලබා දීම වැඩි වැඩියෙන් ක්‍රියාත්මක කළ යුතුයි. ප්‍රතිඵල කේන්ද්‍රීය කාල වකවානු සහිත දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. රටේ පළාත් නවයේම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ මට්ටමින් සමබර ආර්ථික වර්ධනයක්, ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය ලබා දීමක් සිදු විය යුතුයි. නව තාක්ෂණයෙන් පරිපූර්ණ වූ කෘෂි කර්මාන්තයක්, ධීවර ක්ෂේත්‍රයක්, කර්මාන්ත ක්ෂේත්‍රයක් අපි නිර්මාණය කළ යුතුයි. වෙනස්කමකින් තොරව සියලු දෙනාම ශ්‍රී ලාංකිකයින් ලෙස සවිබලගැන්විය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය සවිබලගැන්විය යුතුයි. තිරසර සංවර්ධනය ශක්තිමත් විය යුතුයි.

තිරසර සංවර්ධනය ගැන කථා කරනකොට මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල වනජීවී ක්ෂේත්‍රයට ලොකු අගයක් දීලා තිබෙනවා අපි දැක්කා.

ජනාධිපතිතුමාත් කථා කළා, වනෝද්‍යාන පිළිබඳව. විශේෂයෙන්ම දුම්රිය මාර්ගවල සිදු වන අනතුරු ගත්තාම, පසුගිය දවසක අපි දැක්කා, දුම්රියක ගැටීමෙන් වනඇලි 5ක්, 6ක් පමණ මිය ගොස් තිබුණු ආකාරය. අපි පරිසර කේන්ද්‍රීය තිරසර සංවර්ධනය - environmental sustainable development - ගැන කථා කරනවා වාගේම, ඒක ක්‍රියාවෙනුත් ඔප්පු කරන්නට ඕනෑ.

10වැනි point එක, රටට අගයක් එකතු කරන විදේශ සම්බන්ධතා ක්‍රියාත්මක කිරීම. මෙන්න මේක තමයි දස වැදෑරුම් වැඩසටහන; අපේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී වැඩසටහන; අපි අනුගමනය කරන වැඩසටහන. ඒ රාමුව තුළ හිඳිමින් මේ රට ගොඩනඟන්නට අපි අනිවාර්යයෙන්ම අපේ ශක්තිය ලබා දෙනවා.

ඊයේ දවසේද කොහේද කියනවා මට ඇහුණා, මේ රජයේ න්‍යාය ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයයි කියලා. මට ඒක හිතාගන්න අමාරුයි. මොකද, මේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තුළ ගුරුවරුන්, හෙද-හෙදියන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, වෛද්‍යවරුන් ඇතුළු මුළුමහත් රාජ්‍ය සේවයම අසරණ වෙලා තිබෙනවා. මම අහන්න කැමැතියි, ඒකද ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියලා. ගොවීන්ට, ධීවරයන්ට, කම්කරුවන්ට, දුප්පතුන්ට, ක්ෂුද්‍ර-කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට පොරොන්දු වුණු ඒ සහන ටික ලැබී නැහැ. අපි නහපු හඬ තුළ එදා නිර්මාණය වුණු පරාටේ නීතිය තාවකාලිකව අත්හිටුවීම පමණයි මේ වන විට ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. සැලකිය යුතු ප්‍රමාණයකින් ඒ අයගේ දඩ පොලිය ඉවත් කිරීම, පොලී සහන ලබා දීම සිදු විය යුතුයි. එසේ කෙරෙන දේවල් ද මේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය නමින් හඳුන්වන්නේ කියන එක මම අහන්නට කැමැතියි.

අවසාන වශයෙන්, ඒබ්‍රහම් ලින්කන් මැතිතුමාගේ ප්‍රකාශයකින් මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. එතුමා එක් අවස්ථාවක ප්‍රකාශ කර තිබෙනවා, "You can fool some of the people all of the time, and all of the people some of the time, but you cannot fool all of the people all of the time" යනුවෙන්. ඒ කියන්නේ, "ඔබට ඇතැමෙකු සෑම කල්හිමද, සියලුදෙනා යම් කලකටද රැවටිය හැකි නමුත් සියල්ලන් සියලු කල්හි රැවටීම සිදු කළ නොහැක" කියන එකයි.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Samanmali Gunasingha. You have 12 minutes.

[පූ.භා. 11.27]

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මම වර්තමාන ජාතික ජන බලවේග ආණ්ඩුවේ පළමු අය වැය ලේඛනය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් මතු කරන්න කැමැතියි. මොකද,

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

අපට කලින් අවුරුදු ගණනාවක් මේ රටේ පාලනයට හවුල් වුණු අද විපක්ෂයේ ඉන්න කණ්ඩායම් මේ විවාදයේදී ඉතාම හොඳ අනුශාසනා, මහ පෙන්වීම්, ආර්ථික දත්ත, විශ්ලේෂණ ගොඩක් ඉදිරිපත් කරමින් සිටිනවා. එම ආර්ථික දත්ත අනුව, එම විශ්ලේෂණ අනුව හැදුණු රටක් තුළ නේ අපි මේ ඉන්නේ. ඒ දැක්ම අනුව, ඒ න්‍යාය අනුව, ඒ ආර්ථික විශ්ලේෂණ අනුව ඔවුන් බංකොලොත් කළ, කඩාවට්ටපු, IMF එකේ සරණ යන්න වුණු, ඒ වාගේම ලෝකයේ රටවල් අතර ආර්ථික වර්ධන වේගය අතින් පහළට වැටුණු ආර්ථිකයකින් සහ සමාජ ප්‍රශ්නවලින් මිරිකී ගිය පරිසරයක් තුළ තමයි අපි මේ ඉන්නේ.

විපක්ෂය ඉතාම ලස්සන තර්ක මතු කරමින්, ගළපමින් කියන්න හදන්නේ IMF එක හරහා අපි නොමඟ යනවා කියන එකයි. මම හිතන විධියට මේක ඔවුන් හැම දාමත් කියන කථාවක්. ඔවුන් එයින් පිටත ගිහිල්ලා පසුගිය කාලයේ ක්‍රියාත්මක කළ ඔවුන්ගේ ආර්ථික වැඩ පිළිවෙළත් අපි දැක්කා. ඔවුන් උත්සාහ කළේ දිගින් දිගටම රාජ්‍ය පංගුව අහිමි කරගන්නයි.

ඔවුන්ගේ වැඩ පිළිවෙළ තුළ අපි දැක්කේ නැහැ, අපේ රටේ අපනයන ආදායම, දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමක්. ඒ වාගේම තරගකාරී විධියට ලෝක වෙළෙඳ පොළේ කොටස තහවුරු කර ගන්නේ කොහොමද කියලා අපි දැක්කේ නැහැ. ඔය කියන ඒවා එම වැඩ පිළිවෙළ තුළ අපි දකින්න ඕනෑ නේ. හැබැයි, අපි එහෙම දෙයක් දැක්කේ නැහැ. ඒ වෙනුවට පසුගිය කාලයේ තිබුණේ අකාර්යක්ෂම ආර්ථික ප්‍රතිපත්තියක්. ඒ වාගේම පසුගිය කාලයේ මූල්‍ය විනයක් තිබුණේත් නැහැ. ඔබතුමන්ලා හිටපු ඒ පාලන කාලයේ මූල්‍ය විනයක් තිබුණා නම්, ආර්ථික ප්‍රතිපත්තිය කාර්යක්ෂම වුණා නම්, දූෂණය, වංචාව තිබුණේ නැත්නම් අද මෙතැන නොවෙයි මේ රට තිබෙන්නේ. එතකොට අපට වෙනස් කරන්න වෙන්නේ ඒ තිබුණු තැන ඉඳලායි. අපි ළිඳට වැටිලා ඉන්නවා නම්, ළිංකටෙන්ම තමයි ගොඩ එන්න වෙන්නේ. හැබැයි, අපි ළිංකටෙන් ගොඩ එනවා. අකාර්යක්ෂම, වැරදි ආර්ථික ප්‍රතිපත්ති අපි නිවැරදි කරගන්නවා. ආර්ථික උපාය මාර්ග අපි නිවැරදි කරගන්නවා; වෙනස් කර ගන්නවා. ඒ වාගේම දූෂණය ඉහ වහා ගිය රාජ්‍ය කොටස වෙනුවට ජනතාවට වග කියන, රාජ්‍යයට වග කියන කාර්යක්ෂම රාජ්‍ය ප්‍රතිපත්තියකුත් අපි අනුගමනය කරනවා. ඒක තමයි වෙනස වෙන්නේ.

අපේ රටේ එකතු කර ගත් බදු මුදල්වලට පසුගිය කාලයේ මොකද වුණේ? ඒ බදුවලින් වැඩිම කොටසක් කා ළඟද තිබුණේ? කවුරු වෙනුවෙන්ද වියදම් කළේ? තමන්ගේ ළඟ හැන්ද තිබෙද්දී තමන්ට ඕනෑ ඕනෑ විධියට ඒවා බෙදා ගත්තා. එහෙම තමයි ඒවා ක්‍රියාත්මක වුණේ. ඒ නිසා තමයි මේ රට මෙච්චර දුප්පත් වුණේ. දැන් කියනවා, දුප්පත්කම මෙච්චරයි කියලා. අපි අවුරුදු 5ක් මේ රට පාලනය කරලා දුප්පත්කම මෙච්චරයි කියලා පෙන්වනවා නම් කමක් නැහැ. ඔවුන් පාලනය කරපු, ඔවුන් හවුල් වුණු, ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්ති අනුව වැඩ කරපු, හදපු රට තුළ දුප්පත්කම ගැන ඔවුන්ම කථා කරනවා. ඔව්, ඔබතුමන්ලා ප්‍රශ්න ඇති කළා; ඒ ආර්ථිකය තුළ ප්‍රශ්න වැඩි වුණා; ඒ ආර්ථිකය තුළ ජනතාව හිර වුණා. හැබැයි, අපි ආවේ ඒවාට විසඳුම් දෙන්න. එතකොට අපේ ආර්ථික ප්‍රතිපත්තිය ඔබතුමන්ලාට දරාගන්න බැරි වෙනවා. ඒ ආර්ථික ප්‍රතිපත්තිය ගම, නගරය, උතුර, දකුණ, නැගෙනහිර, බටහිර දක්වා අපි ක්‍රියාත්මක කරනවා. ඒ හැම අංශයක්ම පදනම් කරගෙන තමයි මේ අය වැය තුළ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. උතුරට කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවාද? රජරටට, වාරි කර්මාන්තයට කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවාද? ඒ වාගේම කොළඹ නගරයේ ඉන්න ජනතාවගේ ප්‍රශ්නවලට කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද? යටිතල පහසුකම්වලට වාගේම කර්මාන්ත දියුණු කරන්න අපි කොච්චර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවාද? ඒවා කිසිම දෙයක් දකින්නේ නැතුව, IMF එකේ ඊළඟ වටයට අපට යන්න වෙනවා ලු. ඒ, ඔබතුමන්ලාගේ ප්‍රාර්ථනාව වුණාට මේ රටේ කිසිම කෙනෙකුගේ ප්‍රාර්ථනාව නොවෙයි, IMF එකේ දෙවැනි ණය ප්‍රතිව්‍යුහගතකරණයට යෑම.

ඔබතුමන්ලාට හිතාගන්න බැරි විධියට ඉතාම කෙටි කාලයක් තුළ බංකොලොත්භාවයෙන් නිදහස් වුණා කියන තැනට අපට මේ රට ගේන්න පුළුවන් වුණේ මේ රටේ ජනතාවගේ, නිලධාරීන්ගේ කැප කිරීම නිසා නොවෙයිද? ඒ, අකාර්යක්ෂමතාව, හොරකම නවත්වා වැරදි track එකේ ඉඳන් නිවැරදි track එකට මේ රට දැම්ම නිසා නොවෙයිද? ඒ ගැන අදහාගන්නත් බැරි වුණාම, හිතාගන්නත් බැරි වුණාම ඔබතුමන්ලා තව ප්‍රාර්ථනාවකුත් කරනවා. දෙවැනි වටයටත් යන්න වෙයිද දන්නේ නැහැ කියනවා. රටවල් 55ක් අසාර්ථක වෙලා දෙවැනි වටයට යන්න වුණාට අපි මේ ලබාගෙන තිබෙන කෙටි කාලීන ආර්ථික වර්ධනය තුළ ජනතාව එකතු කරගත් ආර්ථික වැඩ පිළිවෙළ තුළ අපි හිතනවා, ඉතාම කෙටි කාලයකින් මේ බංකොලොත්භාවයෙන් මිදුණා වාගේම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙනුත් ඉක්මනට නිදහස් වෙලා අපි බලාපොරොත්තු වෙන අපේ දේශීය නිෂ්පාදනයේ, ජාතික නිෂ්පාදනයේ වැඩි කරගත් කොටස අත්පත් කර ගැනීමේ ආර්ථික වෙනසකට යන්න පුළුවන් වෙයි කියලා. ඒ විශ්වාසය අපට තිබෙනවා. මේ රටේ ජනතාව ඒකට සූදානම්. ඔබතුමන්ලා අසාර්ථක නිසා, ඔබතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්ති අසාර්ථක නිසා තමයි ජනතාව අපට මේ රට දුන්නේ, අලුත් ආර්ථික වැඩ පිළිවෙළකට යන්න. දැන් ඒ රට අපි හොඳට කරගෙන යනවා.

අපි රට එහෙම පවත්වාගෙන යද්දී ආර්ථික වර්ධනය කලින් අවුරුද්දට වඩා වැඩි වුණේ නැද්ද? ඒ විධියට ආර්ථික වර්ධනය වැඩි වෙනවා. ඒ වාගේම, දැන් මෙතුමන්ලාට ඉවසා ගන්න බැරි වෙලා තිබෙන්නේ මෙවර අය වැය තුළින් ඉතා විශාල සහන ප්‍රමාණයකුත් ජනතාවට ලබා දුන්නු නිසායි. "කොහොමද ඒක කරන්නේ?" කියලා අහනවා. මේ තරම් වැටුප් වැඩි කරන්නේ කොහොමද, ජනතාවට මෙච්චර සහන දෙන්නේ කොහොමද කියලා අහනවා. ඊට පස්සේ කියනවා, "මේක සහන අය වැයක් නේ" කියලා. "කෝ, නිෂ්පාදන අංශයට මොනවාද තිබුණේ?" කියලා අහනවා. නිෂ්පාදන අංශයට තිබෙන සහන මොනවාද කියන එක ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ කථාවේදී කිව්වා. ඒ වාගේම, මමත් ඔබතුමන්ලාට ඒ ගැන කියන්නම්. කාන්තාව ආර්ථිකයට හවුල් කර ගන්නේ කොහොමද කියාත් ඇහුවා.

කුරුඳු කර්මාන්තය යළි පණගැන්වීම සඳහා ඒ කර්මාන්තයේ නිරත අයට සහාය දීමට, කුඩා තේ වතු සංවර්ධනය කිරීමට, පොල් නිෂ්පාදනය හා කෘෂි කාර්මික නිෂ්පාදනයේ ඉහළ ඵලදායීතාවක් ගැනීමට, වැවිලි ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා. කුරුඳු ආදී කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට රුපියල් බිලියන 11.3කුත් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. මම ඒ කිව්වේ එකක් ගැන විතරයි. ගමේ ජනතාව, ප්‍රාදේශීය ජනතාව මේ ආර්ථිකයට එකතු කර ගන්න, කාන්තාවන් එකතු කර ගන්න, කාන්තා ශ්‍රමය එකතු කර ගන්න, ඔවුන්ට අගයක් එකතු කරන්න තමයි මෙවැනි ආකාරයට රුපියල් බිලියන 11.3ක් වැවිලි කර්මාන්තයේ එක අයිතමයක් සඳහා වෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා මේවා දකින්නේ නැතුව, අර හැමදාම කියන කථා කිය කියා යනවාට වඩා, මේ පෙනෙන වෙනස, එහෙම නැත්නම් මේ අය වැය තුළින් අපි මතු කර ගන්න හදන, ජනතාව පුල පුලා බලා සිටි ආකාරයට ඒ ජනතාවට සහන දෙද්දී, ඒ ගැන ජනතාව සතුටු වෙද්දී විපක්ෂය අසතුටු වෙන එක විපක්ෂයේ රාජකාරියක්. ඒකට කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය මොන වාගේ අය වැයක්ද කියලා මා කියන්න කැමැතියි. නව රජයේ පළමු අය වැය මට හඳුන්වන්න පුළුවන්, කාන්තාවාදී අය වැයක් කියලා; නව රජයේ පළමු අය වැය කාන්තාවාදී අය වැයක්. ඇයි, අපි එහෙම කියන්නේ? විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහත්මයාටත් දැන් පිළිගන්න සිද්ධ වුණා නේ, ගර්භිණී මව්වරුන්ට පෝෂ්‍යදායී ආහාර ලබා දීම සඳහා මාසික ආධාරයක් ලබා දුන්නු එක හොඳයි, ත්‍රිපෝෂ වැඩසටහන වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කරපු එක හොඳයි කියලා. ඔව්. මොකද, අපි අය එකතු කර ගන්නේ දේශීය හා විදේශීය වශයෙන් නම්, රාජ්‍ය ආදායම එකතු කර ගන්නේ විවිධ බදුවලින් නම්, ඒවා යන්න ඕනෑ කාටද? ඒවා යන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මැති ඇමතිවරුන්ට නොවෙයි. ඒගොල්ලන්ගේ ගෙවල් හදා ගන්න නොවෙයි. ඒගොල්ලන්ට වාහන ගන්න නොවෙයි. කාටද ඒවා යන්න ඕනෑ? ඒවා යන්න ඕනෑ තැනින් තමයි අපි මේ පටන් අරගෙන තිබෙන්නේ. ගැබිනි මව්වරුන්ගේ පෝෂණ ආහාර සඳහා රුපියල් බිලියන 7.5ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ත්‍රිපෝෂ වැඩසටහන ගැන ගොඩක් අය අඬ අඬා සිටියා නේ. ඒ වෙනුවෙනුත් අපි රුපියල් බිලියන 5ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, ග්‍රාමීය රෝහල් දියුණු කිරීම සඳහා රුපියල් බිලියන 9.9ක් වෙන් කරලා තිබෙනවා. ඒවා දියුණු කිරීම සඳහා වත්කම් වැඩිදියුණු කිරීමට තවත් රුපියල් බිලියන 3.8ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, මුල් ළමාවිය දරුවන් ගැන කථා කළා. පෙර පාසල් ගුරුවරියන් හා දෙමව්පියන් පසු ගිය කාලයේ පැවති ආණ්ඩුවලින් ඉල්ලුවා, තමන්ගේ දරුවෝ වෙනුවෙන් උදෑසන ආහාර වේල සැපයීමේ වැඩසටහන සඳහා වෙන් කරපු මුදල වැඩි කරලා දෙන්න කියලා. ඒ උදෑසන ආහාර වේල සැපයීමේ වැඩසටහන යටතේ එක් ආහාර වේලකට කරනු ලබන ගෙවීම රුපියල් 60 සිට රුපියල් 100ක් දක්වා මේ අය වැයෙන් වැඩි කරලා තිබෙනවා. පෙර පාසල් ගුරුවරියකට දැනට ලැබෙන දීමනාවට රුපියල් 1,000ක් එකතු කරලා තිබෙනවා.

ඒ වාගේම, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ ශිෂ්‍යාධාර මුදල රුපියල් 750 සිට රුපියල් 1,500ක් දක්වා වැඩි කරලා තිබෙනවා. එමෙන්ම, ක්‍රීඩා කරන දරුවන්ට ලබා දෙන මාසික පෝෂ්‍යදායී ආහාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම, කවුරුත් අගය කරන විශ්වවිද්‍යාල සිසුන් සඳහා ගෙවනු ලබන මහපොළ ශිෂ්‍යාධාර ගෙවීම රුපියල් 5,000 සිට රුපියල් 7,500ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ශිෂ්‍යාධාර දීමනා රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කරලා තිබෙනවා. මේ මම කථා කළේ කිහිපයක් ගැන විතරයි. මේ සියල්ල දැනෙන්නේ කාටද? මේ සියල්ල දැනෙන්නේ ගැහැනියට; අම්මාට.

මේ රටේ කිසිම නායකයෙකුට අහු වුණේ නැති කාන්තාවන්ගේ සංවේදී ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න වර්තමාන ජනාධිපතිතුමාට මේ අය වැය තුළින් පුළුවන් වෙලා තිබෙනවා. එවැනි අය වැයක් නිසා තමයි මම කියන්නේ මේ අය වැය කාන්තාවාදී අය වැයක් කියලා. කොහොමද එහෙම කියන්නේ? ඔබතුමන්ලා දන්නවා, ඔටිසම් වාගේ ස්නායු රෝගවලින් පීඩාවට පත් වෙන දරුවෙක් ඉන්න අම්මා කෙනෙකුට මොකද වෙන්නේ කියලා. මම ඒ ගැන දන්නවා, මගේ යාළුවෙකුට එවැනි දරුවෙක් සිටින නිසා. ඒ අම්මාට සිද්ධ වුණා, දරුවා අරගෙන පිට රට යන්න. මොකද, දරුවාට උගන්වන්න, ලෙඩවලට බෙහෙත් ගන්න ලංකාවේ පහසුකම් නැහැ. ඒ පවුල ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් නැහැ. එම නිසා එවැනි හැකියාව තිබෙන දෙමව්පියෝ තමන්ගේ දරුවන් අරගෙන පිට රටවලට ගියා. සමහර අය අතරමං වෙලා ඉන්නවා, මේ ප්‍රශ්නය ගැන දන්නේත් නැතිව. එවැනි අය සඳහා අවුරුදු 5ක ජාතික වැඩ පිළිවෙළක් මෙවර අය වැය තුළින් සකසා තිබෙනවා. මොන තරම් පතුලටම ගිහිල්ලාද, මේ ප්‍රශ්න පිළිබඳව දකින්න? ඒක අවුරුදු 5ක ජාතික වැඩ පිළිවෙළක්. ඒ වැඩ පිළිවෙළ අපි පටන් ගන්නවා, රිජ්වේ ආර්යා ළමා රෝහලෙන්. ඒ වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් මිලියන 200ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ඊට පස්සේ ඒ දරුවන් වෙනුවෙන් ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඇති කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Samanmali Gunasingha, your time is up.

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඉන් එහාට ගිහිල්ලා මෙවැනි දරුවන්ට දෙන්න ඕනෑ පහසුකම් ටික, දෙමව්පියන්ට දෙන්න ඕනෑ පහසුකම් ටික වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරනවා. ඒ වාගේම උප්පැන්නයක් නැති, නමක් නැති, රැකවරණයක් නැති දරුවෝ අනන්තවත් අනාථ නිවාසවල, පරිවාස නිවාසවල සහ විවිධ රැඳවුම් මධ්‍යස්ථානවල ඉන්නවා. රැඳවුම් මධ්‍යස්ථානවල ඉන්නා ඒ දරුවෝ ගැන කථා කරපු නායකයෙක් අපි මීට කලින් දැකලා නැහැ. ඔවුන් වෙනුවෙන් හැදුණු වැඩ පිළිවෙළක් අපි මීට කලින් දැකලා නැහැ. හැබැයි, ඒ දරුවන්ට මෙවර අය වැය තුළින් වටිනාකමක් ලබා දීලා තිබෙනවා. අම්මලාට බරක් වුණු, අතරමං වුණු, අම්මා කෙනෙක් නැති, සමහර විට උප්පැන්න නැති දරුවන්ට උප්පැන්නයක් විතරක් නොවෙයි, ඔවුන්ට අනාගතයක් හදන්න රුපියල් 5,000ක දීමනාවක් එක දරුවෙක් සඳහා මාසයකට වෙන් කරන්න තරම් කාන්තාවාදී අය වැයක් බවට පත් වෙලා තිබෙනවා, මේ අය වැය. මේක, කාන්තාවගේ බර කරට අරගෙන තිබෙන අය වැයක්.

ඔබතුමන්ලා දකින්න ඇති, ගනේමුල්ලේ සංජීවගේ මිනිය අන්තිමට භාර ගන්න වුණේ ඔහුගේ අම්මාටයි, නංගිටයි බව. මොන අපරාධකරුවෙක් එක්ක එකට හිටියත්, පාතාලයේ අයත් එක්ක එකට වැඩ කළත් අන්තිමට අසරණ තත්ත්වයට පත් වුණාම අම්මාටයි, එහෙම නැත්නම් පවුලටයි තමයි ඔවුන් භාර ගන්න වෙන්නේ. ඒ නිසා මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. එලෙස පවුලට, අම්මාට බරක් විධියට හැදෙන පාතාලය වෙනස් කිරීම වෙනුවෙන් වැඩ පිළිවෙළක් ගෙනාපු අය වැයක් තමයි මේ අය වැය. ඒ නිසා තමයි මෙවර අය වැයට කාන්තාවාදී අය වැයක් කියන්නේ. අය වැය කියන එකට වෙනස්ම අර්ථ කථනයක් දුන්නු අප රජයේ 2025 පළමු අය වැය ජනතාවට අලුතෙන් හිතන්න පුළුවන් අය වැයක් කියලායි මම හඳුන්වන්නේ.

මට කථා කරන්න වේලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Prof.) Sena Nanayakkara. - *[Not in the Chamber.]*

Next, the Hon. Kaveenthiran Kodeeswaran. You have 16 minutes.

[மு.ப. 11.42]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, புதிய அரசாங்கத்தினால் கொண்டுவரப்பட்ட 2025ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்ட விவாதத்திலே

[ගරු කවීන්දිරන් කෝඩීශ්වරන් මහතා]

கலந்துகொள்வதற்கு இன்றைய தினம் எனக்கும் சந்தர்ப்பத்தை வழங்கியமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். விசேடமாக, NPP அரசாங்கத்தினால் கொண்டுவரப்பட்ட இந்த ஆண்டுக்கான வரவு செலவுத்திட்டமானது அதிகளவான நன்மைகளைப் பயக்கின்ற அதேவேளையில், மேலும் சில விடயங்கள் தொடர்பிலும் கவனம் செலுத்தவேண்டிய கடமைப்பாடு இருக்கின்றது. இதிலே பல நல்ல விடயங்கள் முன்மொழியப்பட்டிருக்கின்றன. ஆனாலும், திருத்தப்பட வேண்டிய சில விடயங்களும் உள்ளதென்பதை நான் இந்த இடத்திலே தெளிவாகக் கூற விரும்புகின்றேன்.

மிகவும் முக்கியமாக, கிழக்கு மாகாணம் தொடர்பில் இங்கே ஒரு கருத்தைத் தெரிவிக்கலாமென்று நான் நினைக்கின்றேன். இம்முறை வரவு செலவுத்திட்டத்தில் கிழக்கு மாகாணத்திற் கெனச் சில விடயங்களுக்கு நிதியொதுக்கப்பட்டிருக்கின்றது. அதாவது, ஏற்கனவே ஒப்பந்தங்கள் மேற்கொள்ளப்பட்ட வேலைத்திட்டங்களுக்கு அவற்றின் மிகுதி வேலைக்கான நிதி ஒதுக்கப்பட்டிருப்பதுடன், புதிய வேலைத்திட்டங்களுக்கான நிதியும் ஒதுக்கப்பட்டிருக்கின்றது. ஆனாலும், ஒதுக்கப்பட்ட இந்த நிதியிலே எந்தளவு அம்பாறை மாவட்டத் தமிழ்ப் பிரதேசங்களுக்கு ஒதுக்கப்பட்டதென்பது ஒரு கேள்விக் குறியாகவே இருக்கின்றது. மேலும், இந்திய அரசாங்கத்தின் அனுசரணையுடன், கிழக்கு மாகாணத்திற்கான அபிவிருத்தி வேலைத்திட்டங்களை முன்னெடுப்பதற்காக நிதியொதுக்கீடு செய்யப்படுவதாகக் கூறப்பட்டிருக்கின்றது. அவ்வாறு ஒதுக்கப்பட்ட நிதி எவ்வளவு? அவை எந்தெந்தக் கருத்திட்டங்களுக்கு - Projectக்கு - ஒதுக்கப்பட்டிருக்கின்றன? எந்தெந்தப் பிரதேசங்களுக்கு ஒதுக்கப்பட்டிருக்கின்றன? இது எங்களுடைய மக்களுக்கு எந்தவிதத்திலே பயனளிக்கப் போகின்றது? என்ற விடயம் இந்த வரவு செலவுத்திட்டத்திலே குறிப்பிடப்படவில்லை.

விசேடமாக, அம்பாறை மாவட்டத்திலே அதிகளவான பிரச்சினைகள் காணப்படுகின்றன. கிழக்கு மாகாணத்திற்கு ரூபாய் 75 கோடி INR நிதி இந்திய அரசாங்கத்தினாலே ஒதுக்கப்பட்டுள்ளதாக நாங்கள் அறிகின்றோம். அதற்கான MoU கூட இன்னும் sign பண்ணப்படவில்லை. அதற்காக உண்மையாகவே இந்த இடத்திலே இந்திய அரசுக்கு எங்களுடைய நன்றியைத் தெரிவிக்க வேண்டிய கடமைப்பாடு இருக்கிறது. அவ்வாறு இந்திய அரசாங்கத்தினாலே ஒதுக்கப் பட்ட நிதியினை இலங்கை அரசாங்கம் கையாளுகின்ற பொழுது அம்பாறை மாவட்டத்திலே காணப்படுகின்ற பிரச்சினைகளைக் கவனத்திற்கொள்ள வேண்டும்.

திருக்கோவிலிலே ஓர் ஆதார வைத்தியசாலை காணப்படுகிறது. இந்த ஆதார வைத்தியசாலைக்காக ஒதுக்கப் பட்ட நிதி கடந்தகால அரசின் ஆட்சியாளர்களால் - அரசியல்வாதிகளால் - தடுத்து நிறுத்தப்பட்டிருந்தது. அம்பாறை மாவட்டத்திலே அதிகளவான ஆதார வைத்திய சாலைகள் இருக்கின்றது. ஏனைய ஆதார வைத்தியசாலை களுக்கு குவைத் fund அல்லது ஐக்கிய அரபு இராச்சியங்களிலே இருந்து வருகின்ற ஒதுக்கீடுகளின்மூலம் நிதியுதவி வழங்கப்படுகிறது; அங்குள்ள அரசியல்வாதிகளினாலே இது கொண்டுசெல்லப்பட்டிருக்கின்றது. ஆனால், தமிழ்ப் பிரதேசத்திலே இருக்கின்ற மிக முக்கியமான ஆதார வைத்தியசாலையான திருக்கோவில் வைத்தியசாலைக்கு நிதி ஒதுக்கப்படவில்லை.

பழைமை வாய்ந்த அந்த ஆதார வைத்தியசாலை, இன்றும்கூட எந்த அபிவிருத்தியும் இல்லாமல், எந்தவிதமான நவீன செயற்பாடுகளுமற்ற நிலையிலே குறைந்தளவு வசதிகளுடன் காணப்படுகின்றது. வைத்திய உபகரணங்கள் இருந்தும்கூட அதற்கான கட்டிட வசதிகள் இல்லை; வைத்தியர்கள் இல்லை. சுமார் 26 வைத்தியர்கள் இருக்க வேண்டிய நிலையிலே, வெறுமனே 6 வைத்தியர்கள்தான் அந்த வைத்தியசாலையிலே இருக்கிறார்கள். அங்கே VOG இல்லை; ஆனால், cadre இருக்கின்றது. Specialist எவரும் இல்லை; கிட்டத்தட்ட 6 பேருக்கான cadre இருந்தும் விசேட வைத்தியர்கள் எவரும் இல்லாத வெறும் வைத்தியசாலையாகத் திருக்கோவில் ஆதார வைத்தியசாலை இருக்கின்றது. அதனால் அங்கு பல உயிரிழப்புகள் ஏற்படுகின்றன. அதிகளவான நோயாளர்கள் தங்களுக்குரிய சேவையைப் பெறமுடியாமல் திரும்பிப் போகின்ற துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. அங்கு சிகிச்சைபெற வருகின்ற நோயாளர்கள் ஏனைய வைத்தியசாலைகளுக்கு மாற்றப்படுகின்ற சந்தர்ப்பங்கள்தான் கூடுதலாகக் காணப்படுகின்றது. நான் நேற்றைய தினம் சிற்றுண்டிச்சாலையிலே ஜனாதிபதி அவர்களையும் சுகாதார அமைச்சர் அவர்களையும் சந்தித்தபோதுகூட இந்த விடயத்தைச் சுட்டிக்காட்டியிருந்தேன். இருவரும் அதனைச் செய்வோம் என்று சொன்னார்கள்; இது மூன்றாவது தடவையாகின்றது. எங்களது வரிப்பணத்திலிருந்து அந்த வைத்தியசாலையை அபிவிருத்தி செய்யாவிட்டாலும், Indian Governmentஆல் வழங்கப்படுகின்ற நிதியிலிருந்தாவது திருக்கோவில் ஆதார வைத்தியசாலைக்கு நிதியொதுக்கீடு செய்யும்படி கேட்டுக்கொள்கின்றேன்.

கடந்த 10 - 15 வருடங்களாக 500 மில்லியன், 700 மில்லியன், 1,000 மில்லியன், 1,800 மில்லியன் என்று அம்பாறை மாவட்டத்திலிருக்கின்ற அனைத்து ஆதார வைத்தியசாலைகளுக்கும் வழங்கப்பட்டிருக்கின்றது. மாவட்ட வைத்தியசாலைக்கும் கோடிக்கணக்கான பணம் வழங்கப் பட்டிருக்கின்றது. ஆனால், திருக்கோவில் ஆதார வைத்தியசாலை புறக்கணிக்கப்பட்டிருக்கின்றது. இது திட்டமிடப்பட்ட முறையிலே ஆட்சியில் இருந்த அரசியல்வாதிகளினாலே தங்களது நோக்கத்தை அடைவதற்காக மேற்கொள்ளப்பட்டிருக்கின்றது. மனித உயிர்கள் காவுகொள்ளப்பட்டாலும் பரவாயில்லை என்ற அடிப்படையில் அந்த வைத்தியசாலையின் உயர்வைத் தடுத்திருக்கிறார்கள். அதனை இந்த அரசு நிவர்த்தி செய்ய வேண்டும். ஏனென்றால், இந்த அரசுக்கு எமது மக்கள் வாக்களித்ததன் நோக்கமே, கடந்தகால அரசு விட்ட தவறுகளைத் திருத்த வேண்டும் என்பதுதான்.

இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் உண்மையாகச் சில நல்ல விடயங்கள் முன்னெடுக்கப்பட்டிருப்பதற்காக இந்த அரசை நான் பாராட்டுகின்றேன். அரசின் டிஜிட்டல் பொருளாதாரம், உற்பத்தி விடயங்கள், கைத்தொழில் விடயங்கள் போன்றவற்றை நாங்கள் ஊக்குவிக்க வேண்டியவர்களாக இருக்கின்றோம். இந்த நாடு சிறந்த ஒரு பொருளாதார வளர்ச்சியை அடைய வேண்டும். உற்பத்திப் பொருளாதாரத்திலே நாங்கள் முன்னோக்கி நகரவேண்டியவர் களாக இருக்கின்றோம். இன்று பல வளர்ச்சியடைந்த நாடுகளைப் பார்த்தால், அவர்கள் உற்பத்திப் பொருளா தாரத்தைச் சிறந்த முறையிலே கட்டியெழுப்பியிருக்கிறார்கள்; கைத்தொழிலைச் சிறந்த முறையிலே கட்டியெழுப்பி யிருக்கிறார்கள்; டிஜிட்டல் பொருளாதாரத்தைக் கட்டியெழுப்பி யிருக்கிறார்கள். அந்த வகையில், ஏற்றுமதியை நோக்கமாகக் கொண்ட உற்பத்திப் பொருளாதாரத் திட்டங்களை இந்த வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கி அவற்றை நெறிப்படுத்த வேண்டும் என்பதுதான் எங்களது நோக்கமாக இருக்கின்றது.

அடுத்ததாக, அம்பாறை மாவட்டத்திலே செய்யப்பட வேண்டிய பல விடயங்கள் இருக்கின்றன. ஏற்கனவே Indian High Commission ஊடாக, National Planning Department

ஊடாக நாங்கள் 2017, 2018இல் அதிகளவான proposalsஐக் கொடுத்திருந்தோம். அவற்றிலுள்ள சில விடயங்களையாவது செய்யுங்கள் என்றுதான் நாங்கள் கேட்கின்றோம். எங்களது வரிப்பணத்தில் செய்யாவிட்டாலும், இந்திய அரசினால் வழங்கப்படவிருக்கின்ற நிதியிலிருந்தாவது எங்களுக்கு இந்த விடயங்களைச் செய்து தாருங்கள்!

கல்முனையிலே இருக்கின்ற கலாசார மண்டபம் தொடர்பான சகல விடயங்களையும் National Planning Department ஊடாக, Indian High Commission ஊடாக நாங்கள் முன்னெடுத்திருக்கின்றோம். அதனையும் செய்து தாருங்கள்!

இந்திய அரசாங்கம் வடக்கிலே அதிகளவான விடயங்களைச் செய்திருக்கின்றது; அதுபோல் மலையகத்திலும் செய்திருக்கின்றது; தற்போது கிழக்கிலும் தங்களது முன்னெடுப்புகளை அது செய்து வருகின்றது. இதற்காக உண்மையாகவே இந்திய அரசை நான் பாராட்டுகின்றேன். இந்திய அரசு இலங்கைக்குப் பெரும் பலமாக இருக்கின்றது. இந்திய அரசின் ஒத்துழைப்பை நாங்கள் தொடர்ச்சியாகப் பெற வேண்டியவர்களாக இருக்கின்றோம்.

விசேடமாக, இந்த வரவு செலவுத்திட்டத்தில் பண்ணையாளர்களைப் பாதுகாக்கின்ற, ஊக்குவிக்கின்ற விடயங்கள் பற்றிக் கூறப்பட்டிருக்கின்றது. இன்று உள்நாட்டுப் பால் உற்பத்தியானது எமது நுகர்வுத் தேவையில் 45 சதவீதத்தையே பூர்த்தி செய்கிறது. மிகுதி 55 சதவீதமான பால் உற்பத்தியையும் வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்ய வேண்டிய நிலைக்கு நாங்கள் தள்ளப்பட்டு இருக்கின்றோம். அந்த வகையில், அரசானது பாற் பண்ணையாளர்களை ஊக்குவிக்கின்ற விதத்தில், பால் உற்பத்தியை அதிகரிக்கும் விதத்தில் சிறந்த செயற்பாடுகளை இதில் உள்வாங்கியிருப்பதை நான் உண்மையாகவே பாராட்டுகின்றேன்.

அத்தோடு, ஊழலற்ற பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கான செயற்பாடுகளும் மேற்கொள்ளப்படவிருப்பதை நான் உண்மையில் பாராட்டுகின்றேன். அதுபோல், 'டிஜிட்டல்' பொருளாதாரத்தை வலுப்படுத்துவதற்கான செயற்பாடுகளும் உள்வாங்கப்பட்டு இருக்கின்றன. இவ்வாறு இந்த வரவு செலவுத்திட்டத்தில் நன்மை பயக்கின்ற பல விடயங்கள் உள்ளடக்கப்பட்டிருக்கின்றன.

ஆனாலும், இன்று எங்களுடைய பிரதேசங்களின் தேவைப்பாடுகள் கூடுதலாக இருக்கின்றது. இந்த நாட்டிலுள்ள தமிழர்கள் கடந்தகால அரசினால், ஆட்சியாளர்களினால், அரசியல்வாதிகளினால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்; வலுவிழந்து இருக்கின்றார்கள்; திட்டமிடப்பட்ட முறையில் பின்தள்ளப்பட்டு இருக்கின்றார்கள். அதிலும் விசேடமாக அம்பாறை மாவட்டத் தமிழ் மக்கள் பல அடிபாடுகளை, பல பிரச்சினைகளைச் சந்தித்தவர்களாக இருக்கின்றார்கள். அதனால் கூடுதலான நிதி ஒதுக்கீடுகளை அந்தப் பிரதேசங்களுக்குச் செய்ய வேண்டியிருக்கின்றது. அங்கிருக்கின்ற அடிமட்ட மக்களின் வாழ்வாதாரத்தை உயர்த்த வேண்டிய கடமையும் பொறுப்பும் இந்த அரசுக்கு இருக்கின்றது. ஏனென்றால், இந்த அரசாங்கம் கடந்தகால அரசுகள் விட்ட தவறுகளிலிருந்து நீங்கி, புதிய, புத்துணர்ச்சியான ஆட்சியைக் கட்டியெழுப்ப வேண்டுமென்ற நோக்கத்துடன் அதிகாரத்துக்கு வந்திருக்கின்றது.

இந்த நாட்டில் பால் உற்பத்தியை அதிகரிக்கவேண்டுமானால், நீங்கள் பாற் பண்ணையாளர்களைப் பாதுகாக்க வேண்டும். அவர்களது கால்நடைக்கான மேய்ச்சல் தரைக் காணியை ஒதுக்க வேண்டிய கடமையும் பொறுப்பும் உங்களுக்கு இருக்கின்றது. குறிப்பாக, அம்பாறை மாவட்டத்தின் வட்டமடு பிரதேசத்தில் உள்ள 4,000 ஏக்கர் காணி 1976ஆம் ஆண்டு மேய்ச்சல் தரைக்கென்று gazette பண்ணப்பட்டு இருக்கின்றது. ஆனால், 2010ஆம் ஆண்டு Forest Departmentஆனது forest காணியுடன் அந்த மேய்ச்சல் தரைக்குரிய காணியையும் சேர்த்து எல்லை நிர்ணயம் செய்து, gazette பண்ணியிருக்கின்றது. கடந்த வெள்ள அனர்த்தம் காரணமாக இலட்சக்கணக்கான கால்நடைகள் உயிரிழந்திருந்தன. இதனால் பண்ணையாளர்கள் மிகவும் பாதிக்கப்பட்டார்கள். இன்று அங்கு மேய்ச்சல் தரைக்கான இடம் போதாமலிருக்கின்றது. ஏனென்றால், அந்த 4,000 ஏக்கர் மேய்ச்சல் தரைக் காணியிலே தற்போது காடு வளர்ந்திருக்கின்றது. அந்தக் காடுகளை, மரங்களைக் குறைத்து அவற்றை புற்றரையாக மாற்ற வேண்டும். ஆனால், Forest Department அதற்கான அனுமதியைக் கொடுப்பதில்லை. பண்ணையாளர்கள் அந்த இடத்துக்குப் போனால், அவர்களைக் கைது செய்கின்றார்கள். அந்த நிலைமையை மாற்ற வேண்டிய கடமைப்பாடு உங்களுக்கு இருக்கின்றது. நிச்சயமாக 4,000 ஏக்கர் காணியானது மேய்ச்சல் தரைக்குப் போதாமல் இருக்கின்றது. ஏனென்றால், அம்பாறை மாவட்டத்திலே 150,000க்கும் மேற்பட்ட கால்நடைகள் இருக்கின்றன. ஆனால், அங்குள்ள ஒரேயொரு மேய்ச்சல் தரையாக வட்டமடு காணி மட்டுமே இருக்கின்றது. ஆகவே, அங்கிருக்கின்ற பண்ணையாளர்களை நீங்கள் பாதுகாத்துக் கொள்ளுங்கள்! அந்தக் கடமையும் பொறுப்பும் உங்களுக்கு இருக்கின்றது. அவர்களின் வாழ்க்கையில் நீங்களும் பங்குதாரராக மாற வேண்டும். அவர்களுக்கு கடன் உதவிகளைச் செய்யுங்கள்! நட்டம் ஏற்பட்டால் இழப்பீட்டைக் கொடுங்கள்! மிருக வைத்தியர்களை அந்த இடங்களுக்கு நியமியுங்கள்! அப்பொழுதுதான் கால்நடைகளைப் பாதுகாத்து, பண்ணையாளர்களை ஊக்குவிக்க முடியும்.

மீள்குடியேற்றம் - resettlement செய்வதற்கு இதில் நிதியொதுக்கப்பட்டிருக்கின்றது. இன்று கிட்டத்தட்ட 40 வருடங்களாகியும்கூட அங்கிருந்து இடம்பெயர்ந்து மீளக் குடியமர்த்தப்பட்டவர்களுக்கான எந்த அடிப்படை வசதியும் செய்து கொடுக்கப்படவில்லை. அண்மையிலே பொத்துவிலில் உள்ள கனகர் கிராமத்தில் மீளக்குடியமர்ந்த 196 பேரில் 76 பேருக்குத்தான் காணி அனுமதிப் பத்திரம் கொடுக்கப் பட்டிருக்கின்றது. மிகுதியானவர்களுக்குக் கொடுக்கப் படவில்லை; அவர்களுக்கும் கொடுக்கப்பட வேண்டும். அவ்வாறு 76 பேருக்கு மீள்குடியமர்வதற்கு அனுமதி கொடுக்கப்பட்டாலும், அவர்களுக்கு எந்தவித அடிப்படை வசதிகளும் செய்து கொடுக்கப்படவில்லை. குறிப்பாக, வீட்டு வசதி, குடிநீர் வசதி, வீதி அபிவிருத்தி போன்றவற்றுக்கான எந்த வேலைத்திட்டமும் செய்து கொடுக்கப்படவில்லை.

அந்தப் பிரதேசங்கள் வெறுமனே காடுகளாகக் காணப்படுகின்றன. அவர்கள் தாங்களே அந்தப் பிரதேசத்தைத் துப்புரவு செய்திருக்கின்றார்கள். அவர்கள் மிகவும் கஷ்டமான நிலையில், விவசாயத்தை நம்பியிருக்கின்றவர்கள். வாழ்வாதாரத்திலே அடிமட்டத்திலிருக்கின்ற அவர்கள், பொருளாதாரத்திலும் குறைந்த மட்டத்தில் இருக்கின்றார்கள். எனவே, அவர்களுக்கான அடிப்படை வசதிகளை நீங்கள் செய்து கொடுக்க வேண்டும். அவர்கள் கிட்டத்தட்ட 400 நாட்களாக உண்ணாவிரதப் போராட்டத்தை மேற்கொண்ட பின்னர்தான் அந்த 76 பேருக்கும் அனுமதிப் பத்திரம் கிடைத்தது. மீதிப் பேருக்கு அது கிடைக்கவில்லை. எனவே, அவர்களுக்கான வீட்டுத் திட்டத்தை வழங்கி, அடிப்படை வசதிகளைச் செய்து கொடுங்கள்! அந்தப் பொத்துவில், கனகர் கிராமத்து மக்கள் என்றும் உங்களுக்கு விசுவாசமாக

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

இருப்பார்கள். அதேபோலதான், மேலும் அதிகளவான வேலைத்திட்டங்களை அங்கு செய்யவேண்டியிருக்கின்றது.

நீர் வழங்கல் திட்டத்திற்குக் கூடுதலான பணத்தை இந்த அரசாங்கம் ஒதுக்கியிருக்கின்றது; உண்மையாக அதைப் பாராட்டுகின்றேன். அவ்வாறு ஒதுக்கப்பட்ட நிதியிலிருந்து அம்பாறை மாவட்டத்தில் இருக்கின்ற தமிழ்ப் பிரதேசங்களுக்கும் நீர் வழங்கல் வேலைத்திட்டத்தைச் செய்ய வேண்டும். கடந்தகால ஆட்சியாளர்களால் குறிப்பாக அங்குள்ள தமிழ்ப் பிரதேசங்கள் புறக்கணிக்கப் பட்டிருக்கின்றன. நான் கடந்த காலத்தில் நீர் வழங்கல் அமைச்சராகவிருந்த ரஊப் ஹகீம் மற்றும் ஏனைய அமைச்சர்களுடன், "ஏன் எங்களது தமிழ்ப் பிரதேசத்தைப் புறக்கணித்தீர்கள்" என்று விவாதித்திருக்கின்றேன். ஆனால், இனம், மதம், ஜாதி பார்க்காமல் செயற்பாடுகளை முன்னெடுக்கக் கருதுகின்ற அரசாங்கமாக இருப்பதனால் எங்களுடைய அம்பாறை மாவட்டத்தில் நீர் வழங்கலைச் செய்ய வேண்டிய தேவை இருக்கின்ற பல இடங்களிலும் தங்களுடைய அரசாங்கத்தின்மூலம் நீங்கள் நீர் வழங்கலைச் செய்வீர்கள் என்று நான் நம்புகின்றேன். நீங்கள் கட்டாயமாக அவற்றைச் செய்ய வேண்டுமென்று இந்த இடத்திலே வலியுறுத்திக் கேட்கின்றேன். கௌரவ அமைச்சரவர்கள் இங்கே இருக்கின்றீர்கள்! நிச்சயமாக, நீங்கள் இதற்கான பதிலை வழங்க வேண்டும்.

அத்துடன், ஏற்கெனவே NHDAஇன் வீட்டுத் திட்டத்தின்கீழ் அமைக்கப்பட்ட வீடுகள் அரைகுறையாக இருக்கின்றன. அவ்வாறு அரைகுறையாகவிருக்கின்ற வீடுகளையும் பூரணமாகக் கட்டிமுடிப்பதற்கு நீங்கள் உங்களால் இயன்ற நிதியுதவிகளை வழங்கி, அவர்களை வலுப்படுத்த வேண்டுமென்று கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Prof.) Sena Nanayakkara. You have 12 minutes.

[පූ.භා. 11.59]

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අප සංවාදයට ලක් කරන්නේ මෑත කාලීන ලංකීය දේශපාලන ඉතිහාසයේ සුවිශේෂතම අය වැයක් ගැනයි කියන කාරණය ඉතා පැහැදිලියි. විශේෂයෙන්ම නිදහසින් පසු ලංකීය දේශපාලන, සමාජ, ආර්ථිකය තුළ ඇති වෙච්ච ඉතාම ගැඹුරු, වඩාත්ම සංකීර්ණ සමාජ ඛේදවාචක රාශියකට මුහුණ දුන් අපේ රටේ ජනතාව ඉතා විශාල විපත්ති, ව්‍යසන රාශියකටත් මුහුණ දුන්නා. ඉන් අනතුරුව රට කොයි තරම් විපතකට පත් වුණා ද කියතොත්, අපේ රට ලෝකය ඉදිරියේ හෙළිදරව් වුණේ බංකොලොත් රාජ්‍යයක් විධියටයි. ඒ තත්ත්වය තුළ මේ රටේ සාතිශය බහුතර ජනතාව විඳපු පීඩාව, ගත කරපු දුක්බර ජීවිතය ඉතාම ඛේදනීයයි. ඒ ඇති වෙච්ච තත්ත්වයෙන් මේ රට මුදා ගන්න තමයි නව දේශපාලන ව්‍යාපාරයක් විධියට, පුළුල් මහජන ව්‍යාපාරයක් විධියට ජාතික ජන බලවේගය මහජනතාව එක්ක එකතු වෙලා ඒ නව ජාතික පුනරුදය සඳහා සටන් වැදුණේ. කාලාන්තරයක් තිස්සේ මේ රට පාලනය කරපු වැරදි දේශපාලන ක්‍රමය, අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති, වගකීම් විරහිත දුර්වල මූල්‍ය කළමනාකරණය වැනි කාරණා නිසා ජාතික ජන බලවේගය විධියට අපි මේ වන කොට තීරණය වෙලා තිබෙනවා, මේ රටට ඉතාම යහපත් අනාගතයක් උදා කිරීමේ වැඩකටයුතු රාශියක් පැහැදිලිවම දියත් කරන්නට. මම විශ්වාස කරනවා මේ ඉදිරිපත් කරපු 2025 අය වැය ප්‍රකාශය ඒ සඳහා ඉතාම සාධනීය ප්‍රවේශ මාර්ගයක් කියලා. ඒකයි මම විශ්වාස කරන්නේ මේ අය වැය ප්‍රකාශය මේ ජාතියට, මේ දේශයට යහපත් අනාගතයක් පිරිනමන්න කෙරෙන වඩා යහපත් ප්‍රවේශ මාර්ගයක් කියලා.

එදා අපේ රටේ මිනිසුන් කොයි තරම් අර්බුදයට පත් වුණා ද කියතොත්, පැය ගණන්, වරු ගණන්, දින ගණන් පෝලිම්වල හිර වෙච්ච මිනිසුන්ට සමහර විට ශාරීරිකව වාගේම මානසිකව බෙලහීනව එතැනම -පෝලිම්වලම- වැටිලා මියැදෙන්නට සිද්ධ වුණා. ඒ ඛේදනීය ඉරණමෙන් මේ රට ගලවා ගන්න තමයි ජාතික ජන බලවේග රජය මේ වන කොට මේ පිඹුරුපත් සකසා තිබෙන්නේ. ඒකට හොඳම උදාහරණය තමයි මේ ඉදිරිපත් කරපු 2025 අය වැය. මේ අය වැය තුළ වඩාත් විශේෂතම කාරණය විධියට අපි දකිනවා, මේ රටේ ප්‍රජාතාන්ත්‍රික තත්ත්වය ආරක්ෂා කර ගනිමින්, සාමාන්‍ය පොදු ජනතාවගේ සුබසිද්ධිය අභිලාෂ කොට ගනිමින් මේ හදලා තිබෙන සැලැස්ම. හරිම හාස්‍යජනකයි, මේ වන කොට විපක්ෂයේ අසුන් සියල්ල හිස් වෙලා ගිහින්. අප මේ රට කොයි තරම් දුරට යහපත් කරන්න උත්සාහ කළත්, කිඹුල් කඳුළු හෙළන විපක්ෂය මේ මොහොතේ මේ සභාවේ නැති එක බොහොම කනගාටුදායකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළු අය වැය ප්‍රකාශය පිළිබඳවම මම මගේ අවධානය යොමු කරන්නේ නැහැ. නමුත්, මගේ අවධානය දිනාගත් ඉතාම වැදගත්, සුවිශේෂ කාරණයක් පිළිබඳව පමණක් ගැඹුරින් කල්පනා කරන්න හිතුවා. ඒ, අධ්‍යාපනය කියන කාරණයයි. අධ්‍යාපනය කියන එක රටක අනාගතය තීරණය කෙරෙන වඩාත් සුවිශේෂතම, ප්‍රබලතම සාධකය විධියට තමයි අප ගණන් ගන්නේ. රටක අධ්‍යාපනය දුර්වල වුණොත් ඒ රටේ ජනතාව බුද්ධිමත්කමින් හීන වෙනවා, ඥානයෙන් අඩු වෙනවා, කාලීන අවබෝධයෙන් තොර වෙනවා, තමන්ට එළඹෙන අභියෝගයන්ට මුහුණ දිය නොහැකි වෙනවා. කොටින්ම කියතොත්, රටේ ජනතාව බුද්ධිමත්කමින් හීන වෙනවා. ඇත්ත වශයෙන්ම මේ රට ඉතාම ඉක්මනින් දීන රාජ්‍යයක් බවට පත් වන ලකුණු, අනුන්ගේ වහලුන් බවට පත් වන ලකුණු අපේ රටේ තිබෙනවා. ඒ තත්ත්වය මඟ හැර ගන්න තමයි අපි මෙවර අය වැයෙන් මේ රටේ ජනතාව සබුද්ධික ජනතාවක් වශයෙන් නිර්මාණය කරන්නට පිඹුරුපත් සකසා තිබෙන්නේ.

අධ්‍යාපනය කියන කාරණය ගත්තාම, අපේ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයේත් සඳහන් වෙනවා සබුද්ධික සමාජයක් නිර්මාණය කිරීම ගැන. ඒ තුළත්, විශේෂයෙන් අය වැය තුළත් අවධාරණය කරන කාරණා දෙකක් තිබෙනවා.

එකක් තමයි, මේ ජාතියේ දරුවන් සියලු දෙනාට අධ්‍යාපනය හිමියි, එය ඔවුන් සතු අනුල්ලංඝනීය අයිතියක් කියන කාරණය. දෙවැනි කාරණය තමයි, ඒ අයිතිය සපුරා ක්‍රියාත්මක කළ යුත්තේ රජය විසිනුයි කියන එක. රජයේ වගකීමක් තමයි ජාතියේ සියලු දරුවන්ට අධ්‍යාපනය ලබා දීම. මෙන්න මේ කියන කාරණය ඔස්සේ මෙම අය වැය තුළින් අධ්‍යාපනය කියන කාරණය ඉතා මැනවින් ස්පර්ශ කර තිබෙනවා; ආමන්ත්‍රණය කර තිබෙනවා කියා ඔප්පු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් අප අහලා තිබෙන, ලංකාවේ මේ දක්වාම ප්‍රචලිත කියමනක් තිබෙනවා. ඒ තමයි, 'ළඟම පාසල-හොඳම පාසල' කියන එක. එය මෙතෙක් -දශක ගණනාවක්- මේ මහ පොළොව තුළ පිළිගත්තු කාරණාවක්. නමුත්, දරුවෙකු මවගේ කුසෙහි පිළිසිඳ ගත් දා ඉඳන්ම ඒ අම්මයි තාත්තයි දෙන්නාම පුළුවන් තරම් බොරු ගොතලා, බොරු හදලා

උත්සාහ කරන්නේ තමන්ගේ දරුවා උසස් පාසලකට; ජනප්‍රිය පාසලකට අතුළත් කරන්නයි. ඒ බව අපි පැහැදිලිවම දන්නවා. අධ්‍යාපනයේ ඒ විෂමතාව මේ රටේ මේ මහ පොළොව මත ඉතා බරපතළ විධියට දකින්න ලැබෙනවා. එය මේ රට විනාශකාරී මාවතකට යොමු කරන්න පුළුවන් කාරණයක් විධියට තමයි අප දකින්නේ.

රටේ සංවර්ධනය, අනාගතය සම්බන්ධයෙන් සලකා බලනකොට, අධ්‍යාපනයේ ඛේදවාචකය යනු, ඉතා ප්‍රබල කාරණයක්. ලංකාවේ පාසල් 10,126න් පාසල් 1,500ක් තිබෙනවා, සිසුන් 50ට අඩු සංඛ්‍යාවක් ඉන්න. ඒවා කිසිම පහසුකමක් නැති පාසල්. මා ඉන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවර කලාවිය දුෂ්කර කොටු ගම්මානයකයි. ඒවායේ සමහර පාසල් තිබෙනවා, වැසිකිළියක් පවා නැති. ඉතින්, අපේ ආදරණීය අම්මාට, තාත්තාට හිතන්න වෙනවා මගේ දරුවා 'අ' යන්න 'ආ' යන්න කියන්න යන්නේ වැසිකිළියක් නැති පාසලකටයි කියලා. මෙය ඉතා ඛේදනීය තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර පාසල්වලට පිහිනුම් තටාක තිබෙනවා, සමහර පාසල්වලට අවම වශයෙන් වැසිකිළියක්වත් නැහැ. මේක තමයි සාමාන්‍ය තත්ත්වය. ඉතින්, අපේ අය වැය ප්‍රකාශනය තුළින්, ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ආමන්ත්‍රණය කරපු ඒ කිලෝමීටර 3කට ආසන්න වපසරියක් තුළ පාසලක් පිහිටුවිය යුතුයි කියන කාරණය කියැවෙනවා. විශේෂයෙන්ම මේ කාරණාව විතරක් නොවෙයි, පෙර පාසල් වියේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වාත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන්, පශ්චාත් උපාධිය දක්වාත් අය වැය ප්‍රකාශනය තුළින් වෙන් කෙරෙන ප්‍රතිපාදන ඉතාම ප්‍රබලයි. එය ඉතාම වැදගත් කාරණාවක් විධියට අපි සලකනවා. ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍යාධාරයේ ඉඳලා ඒ සියලු දීමනා වැඩි කරලා තිබෙනවා. ඍත්තීය අධ්‍යාපනයේ යෙදෙන ශිෂ්‍යයන්ට ලබාදෙන ශිෂ්‍යාධාරය රුපියල් 4,000 සිට 5,000 දක්වා වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල සිසුන්ගේ මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යාධාරය රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාලවල ගුණාත්මකභාවය වර්ධනය සඳහා රුපියල් මිලියන 135,000ක් වෙන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 135,000ක් කියන්නේ ඉතා සුවිශාල මුදලක්. රටේ විශ්වවිද්‍යාලවල පර්යේෂණ කටයුතු සඳහා, ගුණාත්මක තත්ත්වය වර්ධනය සඳහා මෙතරම් සුවිශාල මුදලක් වෙන් කළ පළමු අය වැය විධියට තමයි අපි මේක දකින්නේ.

ඊට අමතරව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උතුර, උතුරු මැද, ඌව, මධ්‍යම හා බස්නාහිර පළාත්වල ක්‍රීඩා පාසල් සංවර්ධනයට රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා. යාපනය පුස්තකාලය සංවර්ධනයට රුපියල් මිලියන 100ක්, අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල සංවර්ධනයට රුපියල් මිලියන 200ක් යනාදී වශයෙන් ඉතා සුවිශාල මුදලක් මේ රටේ අධ්‍යාපනයේ තිරසාර සංවර්ධනය සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ අභිලාෂය පෙරදැරි කරගෙන සකස් කළ අය වැයක් විධියට තමයි අපි මේ අය වැය දකින්නේ. අධ්‍යාපනය වෙනුවෙන් පැහැදිලිවම මේ වෙනකොට රුපියල් බිලියන 619කට වැඩි මුදලක් අපි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වශයෙන් වෙන් කරලා තිබෙනවා. මේක ඉතාම සාධාරණ, විශිෂ්ට අය වැයක් විධියට අපි සලකන්නේ, මේ රටේ සබුද්ධික සමාජයක් ගොඩනැගීමෙහිලා අත්‍යවශ්‍ය ඒ සාර්ථක, ජව සම්පන්න, ශක්ති සම්පන්න පදනම නිර්මාණය කරන තත්ත්වය යටතේ.

මට පුදුමයි කියන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගෞරවනීය විපක්ෂ නායකතුමා පැහැදිලිවම කියනවා, system change එකක් ගැන. System change එකක් කරන්න පැහැදිලිවම අපට පුළුවන් වෙන්නේ මේ සියල්ල වෙනස් කිරීම තුළින් පමණයි. හැබැයි, එතුමා දේශපාලන පළි ගැනීම් කියලා කිඹුල් කඳුළු හෙළනවා, අපි යම් යම් වෙනස් කිරීම් කරනකොට. ඉතින් මේක ඉතාම පැහැදිලි තර්කයක් නැති තර්කයක්. ඒ නිසා මට හිතෙනවා, එතුමා කියපු දස වැදෑරුම් රාජ්‍ය තාන්ත්‍රික ලක්ෂණ අපේ අය වැය තුළ පැහැදිලිව තිබෙනවා කියලා. ඒ නිසා මෙය ඉතාම හොඳින් කියවන්න කියලා අපි ආරාධනා කරනවා. ජාතික ජන බලවේගය ඉදිරිපත් කරන මේ යම් යම් සාධනීය යෝජනා, සාධනීය වැඩ සැලසුම්, මඩ, අවලාද, බොරු ප්‍රචාර ඔස්සේ අවතක්සේරු කරන්න උත්සාහ කරන ඒ සියලුදෙනාට මම මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. අපේ සුභාෂිතයේ තිබෙනවා, කාව්‍යයක්; කවි කඩක්. ඒ තමයි,

"දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ

සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි සුවඳ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන් සඳුන් කඳක් නිකම් තිබුණාට සුවඳවත් වෙන්නේ නැහැ. ඒ සඳහා ඒකට ගහන්න ඕනෑ, තලන්න ඕනෑ, කඩන්න ඕනෑ, කුඩු කරන්න ඕනෑ. ඒ තත්ත්වය යටතේ තමයි සඳුන් කඳ වඩාත් ලෝකය පුරා සුවඳවත් වෙන්නේ. ඉතින් මම හිතන විධියට ජාතික ජන බලවේගයත් ඒ වාගේයි. ජාතික ජන බලවේගය මේ සියලු වෝදනාවලින් පැහැදිලිවම සැලෙන්නේ නැහැ. අධ්‍යාපන ප්‍රතිපත්තිය මූලිකකොටගත් මේ අය වැය ප්‍රකාශනය මේ රටට පැහැදිලි තිරසාර සංවර්ධනයක්, යහපත් අනාගතයක් නිර්මාණය කරනවාය කියන කාරණය අවධාරණය කරමින් මා නිහඬ වෙනවා. ඔබතුමා මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rohitha Abeygunawardhana. You have 17 minutes.

[අ.භා. 12.10]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ මංගල අය වැය ඉදිරිපත් කරලා, ඒ අය වැයේ දෙවන වර කියැවීමේ විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. අවුරුදු 24ක් එක දිගටම මේ පාර්ලිමේන්තුව තුළ අය වැය 24කට සම්බන්ධ වෙලා 25වෙනි අය වැය විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැනත් මම සතුටු වෙනවා.

ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරපු මේ අය වැය පිළිබඳව නොයෙකුත් අදහස් මේ සභාව තුළ ඉදිරිපත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දකින විධියට මේ අය වැය තුළ තිබෙන හොඳ-නරක, ජනතාවට තිබෙන වාසි, ජනතාවට තිබෙන අවාසි කියන දෙක ගැන අපට දැකගන්න පුළුවන් වෙන්නේ අද හෙට නොවෙයි. මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ අවුරුද්දකටත් නොවෙයි, මාස 9කට. වෙන රජයන්වලින් ඉදිරිපත් කරපු අය වැය ඉදිරිපත් කළේ මාස 12කට. නමුත් මේ අය වැය ඉදිරිපත් කරන්නේ මාස 9කට - මේ අය වැය ක්‍රියාත්මක වෙන්නේ ලබන අප්‍රේල් මාසයේ 01වැනි දා ඉඳන් ලබන දෙසැම්බර් මාසයේ 31 වැනි දා දක්වා. මේ අය වැයේ හොඳ, නරක දෙක දැකගන්න අපට පුළුවන්කම ලැබෙන්නේ මේක ක්‍රියාත්මක වීමෙදී. මේ ලියවිල්ල සමාජයේ, මේ පොළොවේ පැළ කරලා ප්‍රතිලාභය දැනෙනකොට තමයි මේක හොඳද, නරකද කියන්න පුළුවන්. ඒ නිසා දැන් මේක හොඳද, නරකද කියලා කියන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

මේකේ තිබෙනවා හොඳ යෝජනා, හොඳ වැඩ පිළිවෙළ, නව අදහස්. ඒ වාගේම, සමාජය තුළ කවදාවත් සැලකිල්ලට නොගැණුනු යම් යම් සමාජ ක්ෂේත්‍රවල ඉන්න අය ගැන සොයා බැලීම් මේක තුළ තිබෙනවා. ඒ සොයාබැලීම් ගැන තිබෙනවා වාගේම, මේකේ ඇත්ත තත්ත්වය දැනගන්න පුළුවන් වෙන්නේ මේ වසරේ -2025 වර්ෂයේ- අවසානයේ; දෙසැම්බර් මාසයේ අවසානය වෙනකොට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ මේ කාරණය මම දකිනවා. මේ රටේ ලක්ෂ 16ක පමණ රාජ්‍ය සේවකයෝ ලොකු බලාපොරොත්තුවක් ඇතුව තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් මේ රට තුළ පිහිටුවාගන්න කැමැත්ත පළ කරලා ජනවරම ලබා දුන්නේ. ඒ ජනවරම ලැබීමෙන් පසු මේ අය වැය ලේඛනය තුළ වැටුප් වැඩිවීමක් ගැන පැහැදිලිව සඳහන් කර තිබෙනවා. මේ වැටුප් වැඩිවීම ගැන පෞද්ගලිකව මම හරි සතුටු වෙනවා. මොකද, මේ තිබෙන ජීවන බරත් එක්ක, මේ තිබෙන ජීවන වියදමත් එක්ක රාජ්‍ය සේවයේ ඉන්න අයට ඔවුන්ගේ පඩි පැකට් එක ගළපාගන්නේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. අන්න ඒ නිසා මේ වැටුප් වැඩිවීම ගැන මම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය යෝජනා අනුව, 2025 වර්ෂය, 2026 වර්ෂය, 2027 වර්ෂය කියන කාලය තුළ අවුරුදු තුනක සැලැස්මක් අනුව, මූලික වැටුප වැඩි කිරීමක් වෙලා තිබෙනවා. වැටුපට එල්ලලා තිබිච්ච මුදල් ටික වැටුපට එකතු කරලා තිබෙනවා. අවුරුදු තුනක් යනකොට තමයි මේ මුළු මුදල සියයට 100කින් රාජ්‍ය සේවකයාට ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැටුප් වැඩිවීමෙන් 2025 වර්ෂයේ සියයට 30ක්, ආපහු 2026 වර්ෂයේ සියයට 30ක්, 2027 වර්ෂයේ සියයට 40ක් වාගේ පෙන්නුම් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2027 වර්ෂය වෙනකොට බිලියන 325ක් රජය මේ රාජ්‍ය සේවකයා වෙනුවෙන් වියදම් කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු හැටියට මම කිව්වේ ඒකයි. පසුගිය අය වැය ඉදිරිපත් කළේ ඒ වසරට. ඒ අවුරුද්දට දෙන වැටුප ගැන තමයි සේවකයන්ගේ අවධානය යොමු කරලා තිබුණේ. එවකට හිටපු මුදල් ඇමතිවරයා, ජනාධිපතිවරයා කියනවා, අපි රුපියල් 10,000කින් පඩිය වැඩි කරනවා කියලා. එක්කෝ ඒක වැටුපට එල්ලනවා. නැත්නම් මූලික වැටුපට එකතු කරනවා. හැබැයි දැන් මෙන්න මේ ප්‍රශ්නය මුළු රට තුළ තිබෙනවා. මොකක්ද ප්‍රශ්නය ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මම මේ පාර්ලිමේන්තුවට ඇතුළු වෙනකොට පාර්ලිමේන්තුවේ අප පරීක්ෂාවට ලක් කරන පොලිස් නිලධාරි සාජන් මහත්තයාගෙන් මම ඇහුවා, "සාජන් මහත්තයා. කීයකින්ද, පඩි වැඩි වෙලා තිබෙන්නේ" කියලා. "දන්නේ නැහැ මන්ත්‍රීතුමා" කිව්වා. ඔහු දන්නේ නැහැ. මම පාර්ලිමේන්තුවේ කාර්යාල කාර්ය සේවකයෙකුගෙනුත් ඇහුවා. ඔහුත් දන්නේ නැහැ. හුඟක් වෙලාවට මම ගුරුවරුන්ගෙන් කථා කරලා අහනවා; විදුහල්පතිවරුන්ගෙන් අහනවා. ඒ අය කියනවා, "අනේ තවම දන්නේ නැහැ" කියලා. අප්‍රේල් මාසයේ සිංහල අවුරුද්දෙන් පස්සේ 22, 23 දින වෙනකොට වැටුප අතට ගන්නකොට තමයි ඒ අයට කොපමණ ප්‍රමාණයකින් පඩි වැඩි වෙලා තිබෙනවාද කියලා දැනගන්න පුළුවන්කමක් ලැබෙන්නේ.

වෛද්‍යවරයකුගේ වැටුප කොපමණ වැඩිවෙලා තිබෙනවා ද? ගුරුවරයකුගේ වැටුප කොපමණ වැඩි වෙලා තිබෙනවා ද? කාර්යාල කාර්ය සහායකයකුගේ වැටුප කොපමණ වැඩිවෙලා තිබෙනවා ද? හමුදා නිලධාරියකුගේ වැටුප කොපමණ වැඩි වෙලා තිබෙනවා ද? ඒ නිලධරයන්ගේ රැකියාවේ තිබෙන ස්වභාවයත් එක්ක කොපමණ වැටුප් වැඩිවෙලා තිබෙනවා ද කියලා බලාගන්න පුළුවන්කමක් ලැබෙයි. මේ ප්‍රශ්නාර්ථය රටේ තිබෙනවා. මේක තමයි ඇත්ත. රජය මේක තේරුම් ගන්න ඕනෑ. මේ වැටුප හරියාකාරව මෙන්න වෙච්චරයි වැඩි වෙන්නේ කියන එක ගැන ප්‍රශ්නයක් මුළු රට පුරාම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය සද්භාවයෙන් කරලා තිබෙන විධියටම ඒ වැටුප රාජ්‍ය සේවකයාට ලැබිය යුතුයි කියලා මම ප්‍රාර්ථනා කරනවා. සද්භාවයෙන් මම මේක කියන්නේ. ගරු ඇමතිතුමනි, කසාද බඳින්න ඉස්සෙල්ලා මනමාල පාර්ශ්වයයි, මනමාලිගේ පාර්ශ්වයයි දෙපැත්ත කථා කර ගන්නවා. ඊට පස්සේ පොරොන්දම් බලනවා. පොරොන්දම් ගැළපුනාට පස්සේ කසාදය තීන්දු කරනවා. කසාදය තීන්දු කරන්න ඉස්සෙල්ලා දැවැද්ද ගැන කථා කරනවා. මනමාලයාගේ පැත්තෙන් අහනවා, දැවැද්ද කොච්චර දෙනවා ද කියලා. එතකොට මනමාලිගේ පැත්තෙන් කියනවා, අපි මෙච්චර ගෙවල් දෙනවා; ඉඩම් දෙනවා; වාහන දෙනවා කියලා. එසේ කියලා විවාහය ලියා පදිංචි කරනවා; කසාද බඳිනවා; wedding එක තියෙනවා; homecoming එකත් තියෙනවා. Homecoming එකෙන් පස්සේ හුඟක් තැන්වල පොරොන්දු වෙච්ච දැවැද්දෙන් සියයට 10යි දෙන්නේ. කුඹුරු ටික විතරයි දෙන්නේ, ගේ දෙන්නේ නැහැ. ඒක ඊළඟ අවුරුද්දේ දෙන්නම් කියනවා. දෙන්නම් කියලා තව පොරොන්දු වෙච්ච ඒවා තිබෙනවා නේ. ඒවා ඊළඟ අවුරුද්දේ දෙන්නම් කියලා කියනවා. මෙහෙම වෙච්ච කසාද අපේ ගම්වල තිබෙනවා. එහෙම තිබුණා වාගේ නොවෙයි. සමහර වෙලාවට අපි හිතමු කසාද බැන්දා කියලා. බැඳලා ඉවර වුණාට පස්සේ අවුරුද්දෙන් නේ ඊළඟ ඒවා හම්බ වෙන්නේ. බැඳලා අවුරුද්දක් දෙකක් යනවා, ළමයි නැහැ. එතකොට පොරොන්දු වෙච්ච දැවැද්ද දෙන්නේ නැහැ. එහෙමත් වෙනවා නේ. දැන් wedding එකත් ඉවරයි.

රාජ්‍ය සේවකයෝ ජාතික ජන බලවේගයට ඡන්දය දුන්නා. මීට වැඩිය බලාපොරොත්තු ඇතිවයි ඔවුන් ඡන්දය දුන්නේ. දැන් wedding එක ඉවරයි. ඊට පස්සේ පාර්ලිමේන්තු මැතිවරණය කියන homecoming එකත් ජයට ගත්තා. මොකද හේතුව, දැවැද්ද ෂුවර්. දැවැද්ද ෂුවර් නිසා wedding එක අරගෙන, දැන් කියපු දේවල් ලබා දෙන්න අවුරුදු 3ක කාලයක් දීලා තිබෙනවා. අවුරුදු 3ක් දීලා තිබෙනකොට දැන් ඉදිරියේදී පළාත් පාලන මැතිවරණයත් එනවා නේ. පළාත් පාලන මැතිවරණයෙන් යම් විධියකින් ආණ්ඩුවට අඩු ප්‍රතිශතයක් හම්බ වුණොත්, මම කිව්වා වාගේ ළමයි නැති නිසා දැවැද්ද අයින් කළොත් එහෙම මොකද වෙන්නෙ? එහෙමත් වෙනවා නේ. ඒ නිසා එහෙම වෙන්න දෙන්න එපා. ඒ රාජ්‍ය සේවකයාගේ බලාපොරොත්තුව සුනුවිසුනු කරන්න එපා කියලා බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* බොහොම හොඳයි, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි. අන්න එහෙම තමයි ඉන්න ඕනෑ. ඒ බලාපොරොත්තුව ඉටු කරන්න. මොකද හේතුව, දැන් තමුන්නාන්සේලා අපි දෙපැත්තේ ඉන්නවා නේ. එහෙත් හිටියා,-*[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

අපි ඒ වැඩේ අනිවාර්යයෙන්ම කරනවා, ගරු මන්ත්‍රීතුමා. ඒ ගැන සැකයක් තියා ගන්න එපා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

බොහොම හොඳයි. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම කියන්නේ,- මම කියන දේ තමුන්නාන්සේලා පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් දෙන අවවාද අනුශාසනා පිළිගැනීම වටිනවා නේ. හොඳයි නේද? *[බාධා කිරීමක්]* හොඳයි. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ මේ සභාවේ ඔය පුටුවට ඇවිල්ලා 2026 අවුරුද්ද

වෙනුවෙනුත් අය වැය ඉදිරිපත් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමා. අන්න ඒ වෙලාවටත් පොඩි අත්පුඩියක් ගහන්න කික් එකක් එන්න එපැයි. මොකක්ද ඒ කික් එක? ඒ කික් එක තමයි මම කිව්වේ වේලාසනින් දීලා තිබෙනවා කියලා. ඒක තියාගත්තා නම් හරි නේ 2026 අවුරුද්දට, 2027 අවුරුද්දට. එහෙම නම් 2026ට, 2027ට උත්සාහයක යෙදෙන්න, තව වැටුප් වැඩි කරන්න. ඒක එක. ගරු අමාත්‍යතුමනි, දෙවැනි එක තමයි මේ වෙනුවෙන් රුපියල් බිලියන 325ක මුදලක් වෙන් කරනවා. මුදල් වෙන් කිරීම විතරක් නොවෙයි, මුදල් හම්බ කරන්නත් ඕනෑ. මේ වියදම්. අපි හොයන්න ඕනෑ ආදායම්. මේවා වියදම්; අපි හොයන්න ඕනෑ ආදායම්. ඒකයි මම කිව්වේ, අපි ඔය පැත්තේ සිටියදී අවුරුදු 24ක් මේ පාර්ලිමේන්තුවේ අය වැයවල - සමහර නිලධාරීන් අපට, - *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔය මුදල රුපියල් බිලියන 325ටත් වඩා වැඩි වෙනවා. මොකද හේතුව, මේ අවුරුද්දත්, ලබන අවුරුද්දත් අවසන් වෙනකොට තව 30,000කට වැඩියෙන් රාජ්‍ය සේවයට එකතු වෙනවා. ඒ එකතු වුණාම මීටත් වඩා ටිකක් වැඩි වෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(*மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன*)
(The Hon. Rohitha Abeygunawardhana)

බොහොම සතුටුයි. ඔන්න ඔහොම තමයි ඉන්න ඕනෑ. එහෙම ඉන්න ඕනෑ. හැබැයි මතක තියා ගන්න ගරු ඇමතිතුමනි, මේ හැම එකක්ම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙනවා කියලා.

මොකද, හේතුව පෙර කථා, - *[බාධා කිරීමක්]* මගේ වෙලාව දෙන්න. මම තවම කියලා ඉවර නැහැ. පෙර කථා - අවදානමෙන් කථා කරන්න එපා. පෙර කථා ඉතාම හොඳයි. අපේ ආණ්ඩුවේ අපට වෙච්ච දේවල් මම කියන්නම් කෝ. ගරු ඇමතිතුමාට මතකයි නේ. අපි හදා ගත්තා වියත් මහක්. මතකයි නේ, ඔබතුමාට. අපි හදා ගත්තා, වියත් මහක්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔහොම ඉන්න කියනකල්. *[බාධා කිරීමක්]* දාලා ගියේ නැහැ. පොඩ්ඩක් ඔහොම ඉන්න. වියත් මහක් අපි හදා ගත්තා. ගම්වල දේශපාලනය කරපු නායකයෝ ඔක්කොම පැත්තකට දාලා වියත් මහෙන් ඇවිල්ලා මේ පාර්ලිමේන්තුව පිරෙන්න ආණ්ඩු පාර්ශ්වයේ හිටියා. බුදු අම්මේ! ආපු ගමන් අපටත් කියලා දුන්නා, මෙන්න මෙහෙමයි දිශානතිය, මෙන්න ආර්ථික වැඩ පිළිවෙළ කියලා. මට එක්කෙනෙකුව හොයලා දෙන්න, දැන් බෙහෙතකට අඹරා ගන්න. මේ විපක්ෂයෙන් එක වියතෙක් මට හොයලා දෙන්න, බෙහෙතකට අඹරා ගන්න. මට එක්කෙනෙකුව හොයලා දෙන්න, පින් සිද්ධ වෙනවා. *[බාධා කිරීමක්]* අද වියත් මහත් නැහැ, අපිත් මහ මහ; ගෝඨාභය මහත්මයාත් මහ මහ. සමාවෙන්න! මෙන්න, වැරදිච්ච හැටි. මම මේ කියන්නේ වැරදිච්ච හැටි. හැබැයි, මම කියන්නේ ඒක ඔබට නොවේවා කියලායි. හේතුව, මතක තබා ගන්න, බලය හැම දාම නැහැ කියන එක. ජනතාවගේ අතේ තමයි අපි ගැන තීන්දුව තිබෙන්නේ. ජනතාව අපි දිහා හොඳට බලාගෙන ඉන්නවා. ඒ නිසා පරිස්සමෙන් වැඩ කිරීම තමයි හොඳ වෙන්නේ.

ඒ වාගේම මම තව අවවාදයක් දෙන්නම් කෝ, පරණ මිනිහෙක් විධියට. ඔබතුමන්ලාගේ 159දෙනෙකු මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ 159න් ජ්‍යෙෂ්ඨයෝ ඉන්නවා, කලින් පාර්ලිමේන්තුවේ හිටපු. අපි එකට හිටපු අය. අලුත් අය ඔක්කොම ආධුනිකයි. මම ඉල්ලීමක් කරනවා, පරිස්සමින්ම කථා කරන්න කියලා. මොකද, මාධ්‍යයට පරිස්සමෙන් කථා කරන්න. අපේ පාර්ශ්වයේ මම කියපු අයට වුණේ, කට ඇරපු තරමට බඩු බිම. කට අරින තරමට ඡන්ද නැත. ඒ නිසා හැම වෙලාවේම කට අරිනවාද, නැද්ද කියලා පරිස්සම් වෙන්න. මොකද, මාධ්‍යයත් එකක් කිව්වාම දෙකක් අහනවා නේ. මම මේ අවවාද දෙන්නේ, මේවා වෛරයෙන්, ක්‍රෝධයෙන්, කුහකත්වයකින් කියන ඒවා නොවෙයි. අපි ඇත්ත ඇති සැටියෙන් කථා කරන මිනිස්සු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආදායම් හොයන තැන් ගැන මම කියන්න ඕනෑ. සුරාබදුවලින්, රේගුවෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන්, අපනයනයෙන්, සංචාරක ව්‍යාපාරයෙන් ආදායම හොයන්න ඕනෑය කියන එක තමුන්නාන්සේලා දන්නවා. හැබැයි, මේ දේශපාලන ඉතිහාසයේ කවදාද අය වැය පොතට මේ අය කියපු ඉලක්කම් අපට සපුරා දුන්නේ? මට පෙන්වන්න. මේ අය වැය ඉවර වෙන්න ඉස්සෙල්ලා පෙන්වන්න. ආණ්ඩු කරපු අපේ දෙගොල්ලන්ම මේ ගරු සභාවේ ඉන්නවා. හැබැයි, මේ කියන අය මේ ආයතනවලින් අපට ආදායම් උපයා දුන්නේ කවදාද? ඒ, ආයතනවලින් සියයට සියයක් ආදායම් ගෙනැවිත් දීලා නැහැ. *[බාධා කිරීමක්]* ඔව්, 2025 හොඳයි. බලමු, අපි දෙගොල්ලන්ම ඉන්නවා නේ.

මම කියන්නේ පරිස්සම් වෙන්න ඕනෑ කියලායි. මේක අවදානම් සහගත ගමනක්. හේතුව, පඩි වැඩි කිරීම් සහ මේ සියල්ල ගලේ කෙටුවා වාගෙයි. මේක ගලක කොටලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක reverse කරන්න බැහැ; ආපහු ඇද ගන්නත් බැහැ. අපි ආර්ථිකයෙන් වැටුණු රටක් නිසා මුදල් කළමනාකරණය ගැන දැඩි අවධානයක් යොමු කරන්න වෙනවා. ආදායම් නාවොත් මොකද කරන්නේ, ගරු ඇමතිතුමනි? එතකොට වෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා මේ අය වැයෙන් බදුවලට අත තියලා නැහැ. ඒක බොහොම හොඳයි. හැබැයි, ආදායම් එන්නේ නැති වුණොත් මොකක්ද කරන්න තිබෙන්නේ? අකැමැති වුණත්, බදු වැඩි කරන්න වෙනවා. මේක තමයි තිත්ත ඇත්ත. ඒ නිසා පරිස්සම් වෙන්න වෙනවා. මේ කියපු දේවල් දෙන්නේ කොහොමද කියන එක ගැන ඔබතුමන්ලා අවධානය යොමු කරන්න ඕනෑ.

එක කාරණයක් මම තමුන්නාන්සේලාට කියන්නම්. තමුන්නාන්සේලා වාහන ආනයනය කරනවා. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා, සහ ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමන්ලා මේක හොඳට අහගෙන ඉඳලා මේ ගැන කැබිනට් එකේ කථා කරන්න. ඔබතුමන්ලා දැන් වාහන ආනයනය කරනවා. පසුගිය රජය වාහන ආනයනය නැවැත්තුවා, රටේ ආර්ථික තත්ත්වයත් එක්ක. වත්මන් වෙළෙඳ පොළේ තත්ත්වය බැලුවාට පස්සේ එන්ජින් ධාරිතාව 660cc සහිත Wagon R එකක් ලංකාවට ආනයනය කරනකොට ලක්ෂ 80න් ඉහළට යනවා. ඒ කියන්නේ, තිබුණු ගණනට වඩා සියයට සියයක් වැඩි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් Vitz car එකක් ලක්ෂ 90ක් විතර වෙනවා, Yaris එකක් ලක්ෂ 100ක් විතර වෙනවා. සාමාන්‍යයෙන් වැඩිම භාවිතය තිබෙන Vezel එකක් ලක්ෂ 180ක්, 190ක් බවට පරිවර්තනය වෙනවා. මේ තමයි අලුත් බදුවල ක්‍රියාත්මක වීම. එතකොට මේ බදු ක්‍රියාත්මක වෙනවාත් එක්කම අධිසුඛෝපභෝගී වාහන වන V8 එකක, Prado 150 එකක මිල, - V8 එකේ එන්ජින් ධාරිතාව 4,500cc. Prado 150 එකේ එන්ජින් ධාරිතාව 2,700cc. ගරු ඇමතිතුමනි, වත්මන් වෙළෙඳ පොළේ තිබෙන මිල ගණන් එක්ක පොඩි වාහනවල මිල ගණන් ඉහළ යනවා. වත්මන් වෙළෙඳ පොළේ ලොකු වාහනවල මිල අඩු වෙනවා.

ඒ ගැන හොයලා බලන්න. වාහන ආනයනයේදී ඔබ ලබා දුන් නිර්ණායක ගැන හොයලා බලන්න. කවුද V8 පාවිච්චි කරන්නේ? කවුද BMW 7 Series පාවිච්චි කරන්නේ? කවුද Prado 150 පාවිච්චි කරන්නේ? කවුද Audi පාවිච්චි කරන්නේ? ඒ, මේ රටේ සුඛෝපභෝගී ජීවිත ගතකරන යමක් කමක් තිබෙන මිනිස්සු. ඒ නිසා ඒවායේ මිල ගණන් වැඩි වුණාට කමක් නැහැනේ, ගරු

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ඇමතිතුමනි. එහෙම නම් අපට බැරිද, ලොකු වාහනවල මිල වැඩි කරලා ඒකෙන් පොඩි වාහනවල මිල අඩු කරන්න? ඇයි, අපි පොඩි වාහනවලට වැඩියෙන් බදු ගහන්නේ? පොඩි මිනිහා පාවිච්චි කරන Wagon R එකට, Vessel එකට, Prius එකට, Vitz එකට වැඩි බද්දක් නොගහා ලොකු වාහනවලට වැඩියෙන් බදු ගහන්න.

ජනාධිපතිතුමා මෙතැනදී කිව්වා, රජයට අයත් මම කියපු වර්ගයේ ලොකු වාහන ටික වෙන්දේසි කරනවා කියලා. එහෙම වෙන්දේසි කරන්නේත් ආනයනය කරන වාහන ලංකාවට ආවට පස්සේ කියලායි එතුමා කිව්වේ. හැබැයි ජනාධිපතිතුමාට පැහැදිලි කරලා දෙන්න, ඒ කාලය වෙනකොට ඔය වෙන්දේසි කරන වාහනවල මිල තවත් අඩු වෙනවා කියලා. දැන් වෙන්දේසි කළොත් මිල වැඩියි. සාමාන්‍යයෙන් 2017, 2018, ඒ වාගේම 2020 වර්ෂයේ ලංකාවට ආපු V8 එකක් මේ වෙනකොට වෙළෙඳ පොළේ රුපියල් ලක්ෂ 1,200ට, රුපියල් ලක්ෂ 1,300ට යනවා. හැබැයි, අලුත් වාහන ටික ආවට පස්සේ මිල අඩු වෙනවා. මොකද, ඒ වෙනකොට ඒ වාහනවල කාලය අවුරුදු 12, අවුරුදු 15 ඉක්මවනවා. ඒක ඔබතුමන්ලා දන්නවා ඇතිනේ. එතකොට වෙන්නේ, මේ වාහන ඒ මිලට දෙන්න බැරිවෙන එක. ඒ නිසා මේ ගැනත් අවධානය යොමු කරන්න. මම මේ කථා කරන්නේ, පොඩි මිනිහෙකුට වාහනයක් ගන්න තිබෙන අවස්ථාව ගැනයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ගැන වැඩි අවධානයක් යොමු කරන්න කියලා මම කියනවා.

ඊළඟට, ගොවි ජනතාව ගැනත් මම කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. මම දකින විධියට ගොවි ජනතාව කියන්නේ මේ රටේ ආණ්ඩු හදන, ඒ වාගේම හදපු ආණ්ඩු ගෙදර යවන පිරිසක්. ඒ නිසා අපට ඒගොල්ලන්ට ඇහුම්කන් දෙන්න වෙනවා.

ඉතිහාසය අරගෙන බලන්න. 2005දී වේළුපිල්ලේ ප්‍රභාකරන් මාවිල්ආරු සොරොව්ව වහලා ගොවි ජනතාවට යම්කිසි විධියකින් පහර ගැහුවා. මාවිල්ආරු සොරොව්ව වහපු නිසා සිංහල විතරක් නොවෙයි, දෙමළ ඇතුළු එතැන හිටපු සියලුම ගොවි ජනතාවට ඔවුන්ගේ ගොවිතැන් කටයුතු කරන්න බැරිව ගියා. අවසානයේ මොකක්ද සිද්ධ වුණේ? මේ රටේ ජනතාව විශාල වශයෙන් මරපු වේළුපිල්ලේ ප්‍රභාකරන්ට 2009 මැයි මාසයේ 19වැනි දා තමන්ගේ සංවිධානයත් නැතුව මැරිලා යන්න සිද්ධ වුණා. ඒ, ගොවි ජනතාවට පහර ගහපු නිසා.

අපේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගැනත් මම කියන්නම්. අපිත් එතුමාගේ කැබිනට් මණ්ඩලයේ හිටියා. අපි එපා කියද්දී එක රැයකින් රසායනික පොහොර ආනයනය අයින් කරලා කාබනික පොහොර ගෙනාවා. අවුරුදු 5කට ගත්ත ආණ්ඩුව සෙත්තපෝව්වි; ජනාධිපති ගෙදර. දන්නේත් නැහැ, ගෙදර. අඩු ගණනේ අවුරුදු පහ ඉඳලාවත් යන්න වුණා නම්, හොඳයි. නමුත් අවුරුදු පහත් නැහැ, ගුටිත් කාලා, ගෙවලුත් නැතුව තමයි අන්තිමට ගියේ.

දැන් තිබෙන්නේ තුන්වැනි එක. ඒ තුන්වැනි එක ගැනත් මම කියන්නම්. හැම වෙලාවේම ගොවි ජනතාවට ඇහුම්කන් දෙන්න, ඔවුන් ගැන හිතන්න. ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාත් දැන් මේ සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා ගොවි ජනතාව ගැන හිතන්න. මොකද, නැත්නම් මම කියපු විධියට ඔබතුමන්ලාටත් ඒක කරකැවිලා එන්න පුළුවන්. පෙර අත්දැකීම් මම මේ කියන්නේ. ගොවි ජනතාවට කියන්න යන්න එපා, වතුර දෙන්නේ අපි, පොහොර දෙන්නේ අපි, ඒ නිසා අනිවාර්යයෙන් අපට වී ලබා දිය යුතුයි කියලා. එහෙම කියන්න එපා. ආණ්ඩු දඩබ්බර වීම නොවෙයි හොඳ. ආණ්ඩු ඇහුම්කන් දීමයි හොඳ. දඩබ්බර වුණු ආණ්ඩු හැමදාම ගෙදර ගියා. දඩබ්බර වුණු ආණ්ඩුවලට මිනිස්සු ගහන්නේ දැන් නොවෙයි, වැටෙනකල් ඉඳලා ගහන්නේ. එහෙමයි හැටි. ඒ නිසා ඒ අයව බලාගන්න. එක පැත්තකින් ඒ කාරණය තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rohitha Abeygunawardhana, your time is up.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මගේ කථාව විනාඩියකින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාට මම විශේෂයෙන් මේ කාරණය කියනවා. ඇමතිතුමනි, පුළුවන් තරම් පාරිභෝගිකයා ආරක්ෂා කර ගන්න බලන්න. මොකද, එක පැත්තකින් අපි ගොවි මහත්තයාට වී සඳහා සහතික මිලක් දෙන්න ඕනෑ. හැබැයි, ඒ සහතික මිල දෙන ගමන් අපි මේ රටේ පාරිභෝගිකයාත් ආරක්ෂා කරන්න ඕනෑ. අපි තුන්වේල බත් කන මිනිස්සුනේ. ඔය මොනවා කිව්වත්, කොළඹ ඉන්න කිහිපදෙනෙක් රෑට එහෙන් මෙහෙන් එළවලු ටිකක් කෑවට, ගමේ අපි තුන්වේලම බත්නේ කන්නේ. මම කියන දේ හරිනේ. ඒ නිසා කරුණාකරලා මේ කාරණය ගැනත් බලන්න. හැබැයි, මේ රටට සහල් ආනයනය කරන්න ඉඩ තියන්න එපා. සහල් ආනයනය පුරුද්දකට ගියොත්, ඔබතුමන්ලා කොච්චර හොඳට, කොච්චර විනිවිදභාවයකින් කටයුතු කළත්, කොහෙන් හරි මාෆියාවක් ඇවිල්ලා මැද්දට රිංගනවා. මේ සම්බන්ධයෙන් තිබෙන්නේ මාෆියාවක්. ඒවා කඩන්න ලෙහෙසි නැහැ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සමහර දේවල්වලට එක පාරටම ගොවියා ප්‍රතිචාර දක්වන්නේ කොහොමද? ගොවියා හැදිලා තිබෙන්නේ මොන වාගේ ක්‍රමවේදයකටද? ගොවියා හැදිලා තිබෙන්නේ මෙහෙමයි. වගාව සඳහා කුඹුර මඩ කරනකොට වී කිලෝ එකක් සඳහා වී මෝල් හිමියන්ගෙන් රුපියල් 20ක් ඔවුන් අරන් ඉවරයි. මම කළුතර ඉපදුණාට ඒ ගැන දන්නවා. ඊළඟට, වී ටික ඉහිනකොට තව රුපියල් 10ක් අරන් ඉවරයි. එහෙමනේ වෙන්නේ. අනේ, ගොයම් ටික කැපෙනකොට ගන්න තිබෙන්නේ වී කිලෝවක් සඳහා රුපියල් 5යි, නැත්නම් රුපියල් 7යි. මේක තමයි තිබෙන ක්‍රමවේදය.

එතකොට අපි බලන්න ඕනෑ මේ ක්‍රමවේදය වෙනස් කරන්නේ කොහොමද කියලායි. හැබැයි, ගොවියාට රිද්දලා ඒක කරන්න බැහැ. ගොවියාට රිද්දලා ඒක කරන්න ගියොත් එක්කෝ වේළුපිල්ලේ ප්‍රභාකරන්ට වුණු දේ වෙනවා. එහෙම නැත්නම් ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව දාලා ගියා වාගේ තමුන්නාන්සේලාටත් ඒක කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න. එහෙම විශේෂ අවධානයක් යොමු කිරීමෙන් තමයි තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබෙන්නේ ඒ ක්‍රමවේදය වෙනස් කරන්න.

මේ අය වැය ගැන මගේ පැහැදිලි අදහසයි මම මේ කිව්වේ. මේ අය වැය ගැන අපි නැවත කථා කරනවා, දෙසැම්බර් මාසයේ 31. අර මම කියපු විධියට දෑවැද්ද දුන්නාද, පොරොන්දු වෙච්ච විධියට ආවාද, කසාදය තිබෙනවාද, කසාදය ආරක්ෂා වෙනවාද කියන එක ගැන එතකොට කථා කරමු. මම ප්‍රාර්ථනා කරනවා, මේ අය වැයේ තිබෙන හොඳ දේවල් හොඳින් කරන්න ලැබේවා කියලා.

බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please state your point of Order, Hon. Member. We have to suspend the Sitting for lunch.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I represent the people of the North. I would like to make some points very clear. එතුමා අපේ නායකයා වන ප්‍රභාකරන් ගැන කථා කළා. 2009 වර්ෂය වෙද්දි ඔහුව නැති කළා කියලාත් කිව්වා. එහෙම නම් අද වෙනකම් PTA එක අයින් කළේ නැත්තේ ඇයි කියලා අපි අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, that is not a point of Order.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා point of Order එකක් කියලා ඕනෑ නැති සාකච්ඡාවක් හදනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We have to suspend the Sitting for lunch, Hon. Member. Could you please state it quickly? Hon. Rohitha Abeygunawardhana, please make it short.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
Yes, I will.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිසි දවසක මෙතුමන්ලාගේ නායකයා කියලා හැඳින්වූයේ නැහැ, වේළුපිල්ලේ ප්‍රභාකරන්ව. ඕනෑ නම් හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. මට කාගේවත් නායකයෙක් කියන්න ඕනෑ නැහැ ඔහුව; ඒ ත්‍රස්තවාදියෙක්. එදත් ත්‍රස්තවාදියා; අදත් ත්‍රස්තවාදියා; හෙටත් ත්‍රස්තවාදියා; කොටියා. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order please! The Sitting will be suspended till 1.30 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පසු, අමාර්ගු පි.ප. 1.30 මණිවරෙ ඉිටෙනිරුත්තප්පට්ටු මීණ්ටුන් තොටංකිර්රු. කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා. [බාධා කිරීමක්]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Madam, for granting me this opportunity. I would like to make something very clear. The Hon. Member who made the last speech before lunch targeted the Tamil community saying that Prabhakaran stopped the water flow of Mavil Aru anicut in 2006. I would like to make some points clear.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක point of Order එකක් නොවෙයි නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I am speaking under Standing Order No. 92(2).

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක Standing Orders violate කිරීමක්.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I am a Party Leader. So, let me speak for one minute.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එතැන point of Order එකක් නැහැ නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
You are granting opportunities to other Members to raise points of Order. But, when it comes to the Tamil minority, you look at the Standing Orders. Why is this happening in our country? You should allow us to speak. That day, another Member was allowed to speak. So, you are allowing other Members to speak, but -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි. ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 1.31]

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2025 අය වැය ලේඛනය අපි පසුගිය මැතිවරණ දෙකේදී ලබා ගත් ජන වරමේ අභිලාෂය හොඳින් තේරුම්ගෙන එය ඉටු කිරීමේ පදනම දැමීම සඳහා ඉදිරිපත් කළ අය වැයක් හැටියට අපට හඳුනා ගන්න පුළුවන්. විශේෂයෙන් මේ අය වැය ලේඛනයේ තිබෙන කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණය තමයි ජනතාව මත කිසිදු බදු බරක් පටවන්නේ නැතිව ජනතාවාදීව එය සකස් කිරීම. අපි දන්නවා, පසුගිය කාලය පුරාම සම්ප්‍රදායිකව අය වැය ලේඛන ඉදිරිපත් කරනකොට ප්‍රධාන වශයෙන්ම එම අය වැය ලේඛනවල තිබුණේ ජනතාවට සහන සලසනවාට වඩා ජනතාව මත බදු බර පැටවීමක් බව. ඇති තරම් බදු බර ජනතාව මත පටවනවා. ඒ විතරක් නොවෙයි. *[බාධා කිරීමක්]*

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාවෙන් පස්සේ ඉදිරිපත් කරන්න.

ආදායම් උපයා ගැනීම සඳහා රජයේ සම්පත් අළෙවි කිරීම, රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය, රජය සතු වතු විකිණීම, බදු දීම වැනි දේවල් තමයි බොහෝදුරට පසුගිය අය වැය ලේඛන තුළ අපට දකින්නට ලැබුණේ.

එහෙත් මෙවර අය වැය ලේඛනය ජනතාව මත බදු බර නොපටවා, රටේ ජනතාවට සහන සැලසූ විශිෂ්ට අය වැයක් ලෙස තමයි මම දකින්නේ. විශේෂයෙන්ම මේක ජනතාවාදී, ප්‍රගතිශීලී අය වැයක්. රට බංකොලොත් වෙලා ආර්ථික වශයෙන් බිඳ වැටිලා තිබියදී තමයි අපි මේ රට භාර ගත්තේ. ඒ අවස්ථාවේ - පසුගිය මාස දෙක, තුනක කාලය තුළ - අපට දකින්න ලැබුණේ, අපට කටයුතු කරන්න ලැබුණේ, අපට විසඳන්න තිබුණේ ගොඩගැහිලා තිබුණු ප්‍රශ්න රාශියක්. අමාත්‍යාංශවල වුණත්, ආයතනවල වුණත් ඒ තිබෙන ගැටලු විසඳා ගැනීම සඳහා මාස දෙක තුනක් වැනි දීර්ඝ කාලයක් ගත කරන්න සිදු වුණා. ඒ අතරතුර තමයි මේ සාධනීය අය වැය ලේඛනය ඉදිරිපත් වෙන්නේ. ආර්ථික වශයෙන් විතරක් නොවෙයි රට බංකොලොත් වෙලා තිබුණේ. ආර්ථික වශයෙන් ඇති වුණු බංකොලොත්භාවයට අමතරව සමාජ, දේශපාලන පරිහානියකුත් ඒ තුළ තිබුණා. සෑම සමාජ තීරුවක්ම බිඳ වැටිලා තිබුණා; පරිහානියට පත් වෙලා තිබුණා. ඒ විතරක් නොවෙයි. නීතියේ ආධිපත්‍යය බිඳ වැටිලා තිබුණා. අල්ලස, දූෂණය රජ කරමින් තිබුණු රටක් බවට මේ රට පත් වෙලා තිබුණා. නීතියේ ආධිපත්‍යය විශාල වශයෙන් පරිහානියට ලක් වෙලා තිබුණා. සමාජ, ආර්ථික, දේශපාලන කියන හැම පැත්තෙන්ම ඇද වැටුණු රටක් තමයි අපි භාර ගන්න අවස්ථාවේ තිබුණේ. අපි පසුගිය මාස දෙක තුනක කාලය තුළ ක්‍රමක්‍රමයෙන් මේ රට යථාවත් කිරීම සඳහා පදනමක් දැම්මා. 2025 අය වැය ලේඛනය එහි මූලික අවස්ථාව හැටියට තමයි මම දකින්නේ. එහි පදනම අපි දාලා තිබෙනවා, 2025 අය වැය ලේඛනයේ. ජන වරමේ අභිලාෂය හොඳින් තේරුම්ගෙන, ඒ ජන වරමේ අභිලාෂය ඉෂ්ට කිරීම සඳහා පදනම දැමූ අය වැයක් විධියට තමයි අපි මේ අය වැය හඳුනා ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටේ ආර්ථිකය සංකෝචනය වෙමින් තිබුණා. ඒ සංකෝචනය වෙමින් තිබෙන ආර්ථිකය ප්‍රසාරණය කර ගැනීම සඳහා පියවර රාශියක් ගත් අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය හඳුනා ගන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කරලා, ග්‍රාමීය ජනතාව සවිබලගන්වමින් ඔවුන්ගේ ආර්ථික, සමාජ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා පියවර ගැන්වූ අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය සමස්තයක් හැටියට දකින්නේ.

ඒ වාගේම මානව සම්පත සංවර්ධනය කිරීම අපේ ප්‍රතිපත්ති මාලාවේ ප්‍රධාන උපාය මාර්ගයක් හැටියට අපි හඳුනාගෙන තිබුණා. විශේෂයෙන් අපි අධ්‍යාපනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමක් සිදු කළා. මේ රටේ මානව සම්පත සංවර්ධනය කරන්න අවශ්‍යයි. අපට ඒ සම්පත සංවර්ධනය කර ගැනීම සඳහා ඉහළ විභවතාවක් තිබෙනවා. ඒ සඳහා අපි මූලික වැඩසටහන් රාශියක් හඳුන්වා දෙනවා වාගේම අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වැය කරන්නත් තීන්දු කරලා තිබෙනවා. ඒ සඳහා මේ අය වැයෙන් පදනම දාලා තිබෙනවා, ඒ හැරවුම් ලක්ෂ්‍යය සනිටුහන් කරලා තිබෙනවා කියලා මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි.

ඔබතුමන්ලා දන්නවා, අපේ ගමේ සිටින අම්මා, තාත්තාගේ සෞඛ්‍ය රැකවරණය, සෞඛ්‍ය ආරක්ෂාව බිඳ වැටිලා තිබුණු බව. බාල ඖෂධ වාගේම තිබෙන ඖෂධවල මිලත් විශාල ලෙස ඉහළ ගිහින් තිබුණා. දැන් අපේ රජය ගුණාත්මක ඖෂධ සෑම රෝහලකටම සපයන්නත්, ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය කරන්නත් අවශ්‍ය පියවර රාශියක් අරගෙන තිබෙනවා. මේ අය වැය ලේඛනයේ ඒ බව සනිටුහන් කරලා තිබෙනවා. මේ ආකාරයෙන් අපි කටයුතු කරන්නේ විශේෂයෙන් මේ රටේ සමස්ත ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් සහ සහන අවශ්‍ය සුවිශේෂ කොටස් හඳුනාගෙන ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙන්ම ඔවුන්ගේ ඉදිරි ගමන් මඟ වෙනුවෙනුයි. ඒ වාගේම සමාජයේ සෑම සමාජ තීරුවක්ම ඉහළින් ඔසවා තැබීමේ අවශ්‍යතාවක් තිබෙනවා. මොකද, මම මුලින් කිව්වා වාගේම සමස්තයක් හැටියට සමාජය පරිහානියට ගිහිල්ලා තිබුණු අවස්ථාවක තමයි මේ බල හුවමාරුව සිදු වුණේ. ඒ සමස්ත පරිහානියෙන් ක්‍රමක්‍රමයෙන් මේ රට ගොඩ ගැනීමේ අවශ්‍යතාව පදනම් කරගෙන තමයි 2025 අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් ඔබතුමන්ලා දන්නවා, Clean Sri Lanka වැඩසටහන යටතේ සෑම සමාජ තීරුවක්ම ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරන බව. අපේ රජයේ ප්‍රමුඛ පෙළේ, ඉතා සාධනීය වැඩසටහනක් හැටියට අපට Clean Sri Lanka වැඩසටහන හඳුන්වන්න පුළුවන්. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හැටියට අපි ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයන්හි විශාල පරිවර්තනයක් ඒ තුළින් කරන්න පුළුවන් බව අපට පැහැදිලියි. විශේෂයෙන් මත්ද්‍රව්‍ය නිවාරණය වාගේ කාර්යයන්වලදී මේ රටට සුවිශාල සේවාවක් Clean Sri Lanka වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන්න ඉඩ ලැබිලා තිබෙනවා.

මොකද, මත් ද්‍රව්‍ය උවදුර රටේ සෑම අස්සක් මුල්ලක් නෑරම පැතිරී තිබෙනවා. එම උවදුරෙන් රටේ වැඩිහිටියන් වාගේම, ළමා පරපුරත් විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවා. මෙම වැඩසටහන හරහා මත් ද්‍රව්‍ය උවදුර නැති කිරීම සඳහා කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා.

ඒ වාගේම Clean Sri Lanka වැඩසටහන යටතේ අපි විනයගරුක රියැදුරෙක් හදනවා. රියැදුරන්ගේ ආරක්ෂාව, මගීන්ගේ ආරක්ෂාව හා පදිකයින්ගේ ආරක්ෂාව හැදෙන වැඩ පිළිවෙළක් Clean Sri Lanka වැඩසටහන යටතේ අපි ක්‍රියාත්මක කරන්න සූදානම් කරලා තිබෙනවා. විනයගරුක රියැදුරෙක් හැදුවාම රියැදුරන්ගේ රැකවරණයත්, මගීන්ගේ රැකවරණයත් වාගේම පදිකයින්ගේ රැකවරණයත් සලසා ගන්න හැකියාව තිබෙනවා.

ඒ වාගේම බිඳ වැටිලා තිබෙන නීතිය යළි ශක්තිමත් කරන්න ඕනෑ. විශේෂයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල විශාල පරිහානියක් තිබෙනවා. සිදු වුණු සමහර සිද්ධීන් දිහා බැලුවාම, එම පරිහානිය අපට නැවත නැවතත් සක් සුදක් සේ -මැනවින්- පැහැදිලි වනවා. එම නිසා නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. රටට නීති හදලා දෙන්න අවශ්‍යයි. මෙම භූමියට යුක්තිය ගෙනෙන්න අවශ්‍යයි; සාධාරණත්වය ගෙනෙන්න අවශ්‍යයි. අන්න ඒ වෙනුවෙන් නීති රීති හදා ගන්න, තිබෙන නීති රීති යථාවත් කර ගන්න අවශ්‍යයි. මේ රටේ සමස්ත ජනයාට නීතියේ රැකවරණය සැලසෙන, නීතියේ ආධිපත්‍යය සහිත රටක්, විනයගරුක රටක් හදන්න මෙම අය වැයෙන් පදනම දමා තිබෙනවා Clean Sri Lanka වැඩසටහන යටතේ.

මෙම අය වැයේ තවත් සුවිශේෂී දිශානතියක් තමයි, ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා පියවර ගැනීම. ඒ වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. රාජ්‍ය සේවයට තාක්ෂණය කැඳවීම අත්‍යවශ්‍ය කාරණයක්. රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන්න අවශ්‍යයි. අපි දන්නවා, රාජ්‍ය සේවකයන් විශාල ප්‍රමාණයක් කැපවීමෙන්, මැදිහත්වීමෙන් සහ වුවමනාවෙන් වැඩ කළත් රාජ්‍ය සේවය සඳහා ලැබී තිබෙන ලේබලය එතරම් හොඳ එකක් නොවන බව. එක පැත්තකින් කියනවා දූෂිතයි කියලා. තව පැත්තකින් කියනවා එය අකාර්යක්ෂමයි කියලා. නමුත් රාජ්‍ය සේවය තුළ ඉතාම කැපවීමෙන්, මැදිහත්වීමෙන් සහ අධිෂ්ඨානශීලීත්වයෙන් වැඩ කරන්න පුළුවන් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන් මේ වෙලාවේ සක්‍රිය කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. අපගේ ජයග්‍රහණයෙන් පසුව මේ වනකොටත් ඔවුන් සක්‍රිය වෙලා රටට ලොකු දායකත්වයක් ලබා දෙනවා. ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සහ රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න ඔවුන් විශාල දායකත්වයක් ලබා දෙමින් සිටිනවා.

මෙම අය වැය ලේඛනයේ තවත් විශේෂ කාරණා රාශියක් මා දකිනවා. එකක් තමයි, දුප්පත් ජනතාව වෙනුවෙන් මැදිහත් වෙලා තිබීම. බිමේ සහන ලැබිය යුතු කණ්ඩායම් හොඳින් හඳුනාගෙන, සමාජයේ පහළ ස්තරවල ඉන්න කණ්ඩායම් හොඳින් හඳුනාගෙන ඔවුන්ට සහන ලබා දීම සඳහා කටයුතු කර තිබෙන අය වැයක්, මෙක. ඔබතුමන්ලා දන්නවා, අස්වැසුම වැඩසටහනට රුපියල් බිලියන 232ක් වෙන් කර තිබෙන බව. විශේෂයෙන් පසුගිය කාලය පුරා සහන ලැබිය යුතු වුවත්, එම සහන වැඩ පිළිවෙළින් විතැන් කරලා, ඉවත් කරලා යම් යම් දේශපාලන හේතු මත අහිමි කර තිබූ සහනාධාර ඒ ජනතාවට ලබා දීම අපි මේ වනකොට ආරම්භ කර තිබෙනවා. දේශපාලන පක්ෂ, පාට භේදවලින් සහ වෙනත් භේදවලින් තොරව එම සහනාධාර ලබා දෙනවා. විශේෂයෙන් මේ වැඩසටහන සඳහා සුදුසුකම් ලබන, මින් ඉවත් කර තිබුණු දුප්පත් ජනතාව නැවත මෙම වැඩසටහනට ඇතුළු කර ගැනීම අපේ අරමුණක්. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 232ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම එම වැඩසටහනට ඇතුළත් විය යුතු පිරිස් හඳුනා ගන්නත් මේ වනකොට කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ඒ විතරක් නොවෙයි. කාන්තා, ළමා සහ ආබාධිත ප්‍රජාව ඇතුළු සහන සැලසිය යුතු -මම සමස්තයක් හැටියටයි මේ විග්‍රහය කරන්නේ- විශාල පිරිසකට ඒ අවස්ථා, අවශ්‍ය රැකවරණය තහවුරු කරන්න රජය හැටියට අපි මෙම අය වැය ලේඛනයෙන් පදනම දමා තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබීමත් මේ අය වැයේ සුවිශේෂී කාරණාවක්. මොකද, සෞඛ්‍යයට වැය වන මුදලත්, අධ්‍යාපනයට වැය වන මුදලත් අවසානයේ දිගු කාලීන ආයෝජනයක් වෙනවා ආර්ථික සංවර්ධනයට. එහෙම නැත්නම් අධ්‍යාපනය සහ සෞඛ්‍ය වෙනුවෙන් වෙන් කරන මුදල් දිගු කාලීන ආයෝජනයක් හැටියටයි අපට හඳුනා ගන්න වෙන්නේ.

ඒ වාගේම මේ අය වැය තුළ තිබෙන තවත් සුවිශේෂී ලක්ෂණයක් තමයි උතුරු, නැගෙනහිර පළාත් පාදක කර ගනිමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබීම. විශේෂයෙන් උතුරු පළාතේ ජනතාව පසුගිය මැතිවරණයේදී සියලුම සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ පරදවමින් සුවිශාල ජයග්‍රහණයක් අපට ලබා දුන්නා. ඔවුන්ගේ කැපවීම, ශ්‍රී ලාංකීය ජාතිය හැටියට එකට ජීවත් වෙන්න ඔවුන්ට තිබෙන අභිලාෂය, වුවමනාව ඔවුන් මැනවින් ප්‍රදර්ශනය කළා. ඒ කැපවීම අපි මේ වෙලාවේ අතිශයින් අගය කළ යුතු වෙනවා. උතුරේ ජනතාවගේ ආර්ථික දියුණුව, ආර්ථික සංවර්ධනය වෙනුවෙන් රජය හැටියට අපි විශාල මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒකත් සුවිශේෂී ලක්ෂණයක් හැටියට අපි හඳුනා ගන්නවා.

මීට පෙර කථා කළ ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කරණා කිහිපයක් පිළිබඳවත් අදහස් දක්වන්න මම කැමැතියි. එතුමා කිව්වා, රාජ්‍ය නිලධාරීන් විශාල වශයෙන් පළිගැනීම්වලට ලක් වෙලා කියලා. අපි මේ රජය භාර ගත්තේ කිසිම කෙනෙකුගෙන් පළිගැනීම් සඳහා නොවෙයි. ඔබතුමන්ලා දැක්කා, මැතිවරණ දිනයන් තුළ අපි මේ රටේ ජනතාවට ආරක්ෂාව සැපයූ ආකාරය, කිසිදු දේශපාලන පළිගැනීමකට ඉඩ නොදුන් ආකාරය. ඒක ඒ ආකාරයෙන් ඉදිරියටත් ක්‍රියාත්මක කරන්න රජය සියලු පියවර අරගෙන තිබෙනවා. ඒ නිසා කිසිදු නිලධාරියෙකුට දේශපාලන පළිගැනීම් හෝ වෙනත් පළිගැනීම් මත ස්ථාන මාරුවීම් ලබා දෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සේවා අවශ්‍යතාව පරිදි යම් යම් ස්ථාන මාරුවීම් සිද්ධ වෙනවා. ඒත් කිසිදු දේශපාලන පළිගැනීමක් නැහැ. ඒවා සේවා අවශ්‍යතාව පරිදි සිදුවන ස්ථාන මාරුවීම් පමණයි. ඒක සාමාන්‍ය තත්ත්වයක්.

ඒ වාගේම බදු එකතු කර ගැනීමට නොහැකි බවට චෝදනාවක්, එහෙම නැත්නම් ඒ සඳහා ක්‍රමවේදයක් නැහැ, බදු එකතු කර ගැනීමට අසමත් වෙලාය වාගේ අදහසක් විපක්ෂ නායකතුමා මේ සභාවට ඉදිරිපත් කළා. ඔබතුමන්ලා දන්නවා, පහුගිය කාලය පුරාම එහෙම තත්ත්වයක් තිබුණා කියලා. නමුත් අපි බලයට ආවාට පස්සේ පසුගිය මාස දෙක තුන ගත්තාම, -අදට ඇත්තටම අපේ රජයට මාස තුනයි. අද 21වැනි දා- පසුගිය කාර්තුව -2024 අවසන් කාර්තුව- ගත්තාම බදු එකතු කර ගැනීම වේගයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. කෙනෙකුට හිතෙන්න පුළුවන්, "මේ අය වැයෙන් මෙතරම් සහන දෙනවා. හැබැයි අලුතින් බදු පනවලා නැහැ. ජනතාව පිට බදු පනවලා නැහැ. ව්‍යාපාරික ප්‍රජාව පිට බදු පනවලා නැහැ. එහෙමනම් කොහොමද මේ සහන දෙන්නේ?" කියලා. ඔබතුමන්ලා දන්නවාද, අපි මේ වෙනකොට බදු යන්ත්‍රණය කාර්යක්ෂම කරලා බදු එකතු කර ගැනීම කාර්යක්ෂම කරලා

[ගරු ආනන්ද විජේපාල මහතා]

තිබෙන බව? දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2023 වසරට සාපේක්ෂව 2024 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 104කින් බදු ආදායම වැඩි කර ගෙන තිබෙනවා. 2023 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 319යි; 2024 අවසන් කාර්තුවේ රුපියල් බිලියන 504යි. බදු එකතු කිරීම කළමනාකරණය කරලා බදු එකතු කිරීම මගින් අපි බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. රේගු ආදායම 2023 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 322යි; 2024 අවසන් කාර්තුවේ රුපියල් බිලියන 392යි. රුපියල් බිලියන 70කින් ආදායම වැඩිකරගෙන තිබෙනවා. අපි මේ විධියට බදු ආදායම් වැඩිකර ගන්නේ බදු කළමනාකාරිත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමෙන්.

සුරාබදු ආදායම 2023 අවසාන කාර්තුවේ රුපියල් බිලියන 47යි. ගිය අවුරුද්දේ, නැත්නම් 2024 අවසන් කාර්තුවේ -අපි බලයට පත් වුණාට පස්සේ- රුපියල් බිලියන 14කින් එය වැඩි කරලා රුපියල් බිලියන 61ක් කරලා තිබෙනවා. අපි බදු ආදායම එකතු කිරීම කාර්යක්ෂම කරලා තිබෙනවා. ඒ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට අපි අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

ඒ වාගේම තවත් සුවිශේෂ කාරණයක් විපක්ෂ නායකතුමාත්, අපේ රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාත් මතු කළා. වැටුප් වැඩිකිරීම පිළිබඳ ලොකු ව්‍යාකූලත්වයක් තිබෙනවා කියලා කිව්වා. වැටුප් වැඩි කිරීමට අපි ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒකට අදාළ table එකකුත් තිබෙනවා, අය වැය පොතේ. ඊට අමතරව රජය මඟින් වක්‍රලේඛ නිකුත් කරයි. කාලයකට පස්සේ මූලික වැටුප වැඩි කරලා තිබෙනවා. මූලික වැටුප වැඩි වීමත් සමඟ වැඩි වෙන බොහෝ දේ තිබෙනවා. මූලික වැටුප වැඩි වෙලා තිබෙනවා. වැටුප් වර්ධක වැඩි වෙලා තිබෙනවා. ආපදා ණය මුදල් වැඩි වෙලා තිබෙනවා. දේපළ ණය මුදල් වැඩි වෙලා තිබෙනවා. විශ්‍රාම වැටුපට සුවිශාල බලපෑමක් සිදු වෙලා තිබෙනවා. සමහරු මේ පිළිබඳව විවිධ සැක සංකා පළ කරනවා.

සමස්තයක් වශයෙන් මේ වැටුප් වැඩි වීමට රුපියල් බිලියන 325ක් වැය වෙනවා. මේ අවුරුද්දේ වැටුප් වැඩි වීමට රුපියල් බිලියන 110ක් වැය වෙනවා. සමස්තයක් හැටියට අවුරුද්දකට වැය වෙනවා, රුපියල් බිලියන 1,232ක්. මේ අවුරුද්දේ වැටුප් ගෙවීම සඳහා සමස්ත ඇස්තමේන්තුව රුපියල් බිලියන 1,232යි. ඒ රුපියල් බිලියන 1,232ට අමතරව මේ අවුරුද්දේ වැය වෙනවා, රුපියල් බිලියන 110ක්. මෙතැන කෙනෙකුට නගන්න මහා ලොකු තර්කයක් නැහැ. සරල තර්කයක් තිබෙන්නේ. රුපියල් බිලියන 110ක් -රුපියල් මිලියන 110,000ක්- අමතරව වෙන් කරලායි තිබෙන්නේ, මේ වැටුප් වැඩි වීම් සඳහා. ඒ අනුව පහළම ශ්‍රේණියක කෙනෙකුගේ අවම වැටුප මේ අවුරුද්දේ විතරක් රුපියල් 5,975කින් වැඩි වෙනවා. ඒ නිසා කිසිදු දෙගිඩියාවක් තබා ගන්න අවශ්‍ය නැහැ. මේ රුපියල් බිලියන 110 -රුපියල් මිලියන 110,000 - කියන්නේ මේ අවුරුද්දේ වැටුප් වැඩි වීමට වෙන් කළ මුදලයි. ඒ ආකාරයට මේ රටේ රාජ්‍ය සේවකයන්ට සුවිශාල වැටුප් වැඩි වීමක් මේ රජය ලබා දී තිබෙනවා.

සමස්තයක් හැටියට ගත්තාම, මේ අය වැය මෙකී සුවිශේෂතා රාශියම අන්තර්ගත වුණු ඉතාම සාධනීය අය වැයක්, මේ රටේ අනාගත දිශානතිය තීරණය කරන අය වැයක්, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හැරවුම් ලක්ෂ්‍යයට පදනම දමපු අය වැයක් හැටියට හඳුන්වා දෙන්න පුළුවන්. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.50]

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මුලින්ම කියන්න ඕනෑ, විපක්ෂයේ ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයක් ගැන. ඒ ප්‍රකාශය ගැන සඳහන් කරමින් මගේ කථාව ආරම්භ කරන්නම්. වැටුප් වැඩි වීම පිළිබඳව කථා කරමින් ඒ ගරු මන්ත්‍රීතුමා කසාද බැඳීම සහ වැටුප් වැඩි වීම කියන කාරණා දෙක සම්බන්ධ කරගෙන ප්‍රකාශයක් කළා. මා හිතන විධියට තමන්ගේ දරුවන් කසාද බන්දන කොට තමන් කටයුතු කරන ආකාරය තමයි, ඒ සඳහා තමන් පෙළඹෙන ආකාරය තමයි එතුමා මේ ගරු සභාවට ප්‍රකාශ කළේ. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ වැටුප් වැඩි වීම සම්බන්ධයෙන් මේ ගරු සභාවටත්, මුළු රටටත් අය වැය කථාවේදී අපේ ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළ බව. ඒ වාගේම පසුගිය දවස් කිහිපයේම පැවැති විවාදයේදී වැටුප් වැඩි වන ආකාරය පිළිබඳව අපි බොහොම පැහැදිලිව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එහෙම නැතුව, එතුමා කියන ආකාරයේ වැටුප් වැඩි වීමක් සම්බන්ධයෙන්; ඒ කියන ආකාරයේ දෙයක් සම්බන්ධයෙන් අපි පැහැදිලි කළේ නැහැ.

අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, "වැටුප් වැඩි වෙන්නේ නැහැ" කියමින් විපක්ෂයේ මේ මන්ත්‍රීවරුන් එළියේ තැන් තැන්වල බිල්ලෙකු මවන බව. එහිදී පසුගිය කාලයේ වැටුපට ගෙවමින් තිබුණු -මුලින් නොගෙවපු රුපියල් 5,000- කොටසක් ගැනත් කියනවා. "ඒක කොහොමත් තිබුණා" කියනවා. ඒ මුලින් නොගෙවපු 5,000 කොටස තමයි පසුව ගෙවමින් සිටියේ. නමුත්, අපි මෙවර අය වැය තුළින් විශේෂයෙන්ම රුපියල් 5,000ක් මූලික වැටුපට එකතු කරමින්, රාජ්‍ය සේවකයාගේ අතට ලබා දෙන වැටුප ස්ථිරව වැඩි කරමින් තිබෙනවා. එතකොට පහළම මට්ටමේ සිටින රාජ්‍ය සේවකයාට පවා රුපියල් 5,975ක් වැඩි වෙනවා, මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ සිට. ලබන 2026 අවුරුද්දට නැවත අය වැයක් ඉදිරිපත් කරනවා. ඒ අය වැය තුළිනුත් අපි එකතු කරනවා, ඊළඟ සියයට 35. එතැනින් පසුව 2027 අය වැයේදී එකතු වෙනවා ඊළඟ සියයට 35. සමස්තයක් විධියට ගත්තාම අවුරුදු 3ක් ගැන කථා කළාට, මාස 20ක් ඇතුළත තමයි මේ සම්පූර්ණ වැඩි වීම සිදු වෙන්නේ. ඒ බව මතක් කරන්න ඕනෑ. තවත් මාස 8කින් එන අය වැයෙන් මූලික වැටුපට ඊළඟ කොටසත් එකතු වෙන බව අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

වැටුප් වැඩි වීමකදී මූලික වැටුප වැඩි වෙනවා කියන එකේ විශේෂත්වයක් තිබෙනවා. අතට එන මුදල විතරක් නොවෙයි එයින් වැඩි වෙන්නේ. යම් කෙනෙකු විශ්‍රාම යන කොට, ඒ විශ්‍රාම වැටුපත් වැඩි වෙනවා. ඒ වාගේම, යම් කෙනෙක් ණය මුදලක් ලබා ගන්නවා නම්, ඔහුට වැඩි මුදලක් ලබා ගන්න පුළුවන් වෙනවා. ඒ මුදල ඔහුට යම් ආයෝජනයකට හෝ වෙනත් කටයුත්තකට යොදා ගන්න පුළුවන්. ඒ වාගේම ten-month distress loan එකෙන් ලබා දෙන මුදල ද වැඩි කර තිබෙනවා. ඒ වාගේම OT වාගේ දේවලුත් මේ වැටුප් වැඩි වීම හරහා වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවකයාට අවශ්‍ය කරන ගරුත්වය ලබා දීපු එකම ආණ්ඩුව ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ලෙස මේ රටේ ජනතාව අද දවස වන විට පිළිගෙන තිබෙනවා.

අපි දන්නවා, පසුගිය කාල වකවානුව පුරාම මේ රටේ රාජ්‍ය සේවකයාගේ අඩුම මූලික වැටුප වශයෙන් තිබුණේ, රුපියල් විසිහතරදහස් ගණනයි කියන එක. හැබැයි, අපි ඇවිල්ලා පළමු අය වැය -මංගල අය වැය- තුළින්ම එම මූලික වැටුප රුපියල් පහළොස්දහස් ගණනකින් වැඩි කරන්න සමත් වෙලා තිබෙනවා. අපි එවැනි අය වැයක් ගෙනැල්ලා තිබෙනවා. ඒ අනුව ගත්තාම, මෙය අපේ රටේ රාජ්‍ය සේවකයාගේ පැත්තෙන් ඉතා විශිෂ්ට අය වැයක් බව විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මෙය, රාජ්‍ය සේවකයා ගැන හිතපු අය වැයක්.

පසුගිය කාලයේ මේ රටේ අය වැය රාශියක් ගෙනැල්ලා තිබුණා. අප ඒ ගෙනාපු අය වැය රාශිය සලකා බැලුවොත්, මේ රටේ ජනතාවට සහන ලබා දීලා කර්මාන්ත නඟා සිටුවනවා වෙනුවට ඒවායෙන් හැමදාම සිදු වුණේ මේ රටේ පාලකයන්ට විශේෂ වරප්‍රසාද ලබා ගැනීමයි. එවැනි අය වැය රාශියක් තමයි අපි පසුගිය කාලය පුරාම දැක්කේ. ඉතිහාසය පුරාවට පාලකයා සුර සැප විඳින ආකාරයෙන් වරප්‍රසාද වැඩි කර ගත්තා. හැබැයි, ඉතිහාසයේ පළමු වතාවට මේ ආණ්ඩුව නියෝජනය කරන අගමැතිතුමිය ද ඇතුළුව ජනාධිපතිවරයාගේ ඉඳලා සියලු මැති ඇමතිවරුන්ගේ වරප්‍රසාද කප්පාදු කර ගනිමින්, ඒ සියල්ල දරා ගනිමින් ජනතාවට සහන ලබා දෙන, මේ රට ගොඩ නඟන සැබෑම අය වැයක් අපි ගෙනැල්ලා තිබෙනවා.

අපි මේ රටේ බලයට පත් වෙන්න කලින් ජනතාවට කිව්වා, ඔබ ගොඩ නඟන්න අපි සහතික වශයෙන්ම ජනතාවාදී ආණ්ඩුවක් හදනවා කියලා; ඒ ජනතාවාදී ආණ්ඩුවෙන් ජනතාවාදී අය වැයක් ගෙනෙනවා කියලා. අපි අන්න එය සහතික කර කිව්වා. අපි ජනතාවාදී අය වැයක් ගෙනැල්ලා තිබෙනවා. ඉතිහාසයේ පළමු වතාවට මේ රටේ ජනතාව ගැන හිතන එකම අය වැය බවට මෙය පත් වෙලා තිබෙනවා. වෙනදා පාලකයා තමන්ට අවශ්‍ය වන ආකාරයට තමන්ගේ සියලු වරප්‍රසාද වැඩි කර ගත්තා. තමන්ට වාහන ගෙන්වන්න ඕනෑ වන කොට, වාහන ගෙන්වන්න අවශ්‍ය කරන මුදල් වෙන් කර ගත්තා; වාහන පර්මිට් ලබා ගත්තා; ඉන්ධන සහනාධාර ඇතුළු අනෙකුත් දීමනා සියල්ල ලබා ගත්තා. හැබැයි, අපි ඒ සියල්ල මෙවර අය වැයෙන් කප්පාදු කර ගෙන තිබෙනවා. මේ රටේ ජනතාවට මේ රටේ පාලකයන් හැමදාම කිව්වේ, පටි තද කර ගන්න කියලායි. පාලකයා බදු වැඩි කළා; බදු පිට බදු ගැහුවා. හැබැයි, පාලකයා පටි තද කර ගත්තේ නැහැ. ජනතාවට කන් හැන්දෙන් බෙදන කොට මේ රටේ පාලකයා බැංකෝ පාරවලින්, සවල් පාරවලින් තමයි බෙදා ගත්තේ. අන්න, ඒ ක්‍රමය අපි වෙනස් කරලා තිබෙනවා. ඒ ක්‍රමය වෙනස් කරපු ජනතාවාදී එකම අය වැය බවට මෙවර අය වැය පත් වෙලා තිබෙනවා.

අපට අය වැයක් හොඳ වෙන්නේ කොහොමද කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. අය වැයක් හොඳ වෙන්නේ, ඒකේ තිබෙන වැය, එහෙම නැත්නම් වැටුප් වැඩි වීම ආදි කාරණා නිසා පමණක් නොවෙයි. මේ අය වැය තුළ වැය වාගේම අයත් තිබෙනවා. පසුගිය කාලයේ වැටුප් වැඩි කිරීම් සිදු වුණාම නම් මොකක් ද කළේ කියලා අපි දන්නවා. ඒ හැම වැටුප් වැඩි කිරීමකටම අදාළව බදු සංශෝධනය කරපු බව, බදු පිට බදු ගහපු බව අපි දන්නවා. අපේ රටේ සාමාන්‍ය අඟ්ඝක ජනතාවට ඒක දරා ගන්න සිදු වුණා. රාජ්‍ය සේවකයාට ගෙවන වැටුප ජනතාව මත පටවපු බදු බරක් බවට පත් වුණා. එක පැත්තකින් රාජ්‍ය සේවකයා තමන්ගේ වැටුප ගන්න කොට අනෙක් පැත්තෙන් භාණ්ඩ මිල ඉහළ යෑම තුළ ඔවුන්ගේ වැටුප නැවත වියදම් වුණා.

මුදල් ආදායමට වඩා වැදගත් වෙන්නේ, මූර්ත වැටුපයි. මූර්ත වැටුප කියන්නේ, මුදල් ආදායමෙන් මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය- *[බාධා කිරීමක්]* විශේෂයෙන්ම මූර්ත වැටුප වැඩි වුණොත්, අපේ භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව වැඩි වෙනවා. අනෙක් පැත්තෙන්, බදු පිට බදු ගහලා ඒ මුදල සොයනවා. ඒ වාගේම රටේ සමස්ත ඉල්ලුම ඉහළ යෑම තුළ භාණ්ඩවල මිල ගණන් ඉහළ ගියොත් අන්න ඒ වැටුප් වැඩි වීම ප්‍රමාණවත් වන්නේ නැහැ; වැඩක් වෙන්නේ නැහැ.

ඒ නිසා අපි මෙවර අය වැය තුළින් ආර්ථිකය ස්ථායීකරණය කරලා තිබෙනවා. ආර්ථිකය ස්ථායීකරණය කරලා, භාණ්ඩවල මිල ඉහළ යන එක වළක්වලා, ඒ ස්ථායීකරණය ඇතුළේ තමයි මේ සියල්ල අපි සලකා බලා තිබෙන්නේ. එහෙම නැතුව මේ අය වැය හිතුමනාපයට හදපු අය වැයක් නොවෙයි. අවුරුදු ගණනක් මේ රටේ ඉදිරි අනාගතය ගැන හිතලා, අනාගත දරු පරම්පරාවට වාසියක් ගෙන දෙන්න, ඔවුන්ගේ අනාගතය හදන අය වැයක් විධියට තමයි අපි මේ අය වැය හදලා තිබෙන්නේ.

ඒ වාගේම අපි කොටස් වශයෙන් ගත්තාම, මේ අය වැයෙන් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා රුපියල් බිලියන 619ක්. මේ රටේ බලය ලබා ගන්නකොට අපි කිව්වා, අංක එකටත් අධ්‍යාපනය, දෙකටත් අධ්‍යාපනය, තුනටත් අධ්‍යාපනය කියලා. අන්න, ඒ තැන අපි අධ්‍යාපනයට දීලා තිබෙනවා. මේ රටේ ඈත පිටිසර ගම්වල අඟ්ඝක, දුප්පත් දරුවන් ඉන්නවා. ඔවුන්ට ඉගෙන ගන්න හරිහමන් පාසලක් නැහැ, පාසල් පද්ධතිය තුළ පහසුකමක් නැහැ. ඔවුන්ට පාසලකට යන්න අවශ්‍ය මූලික පහසුකම් නැහැ. මෙවර අය වැය තුළින් ඒ දරුවන්ගේ පාසල් පද්ධතිය නඟා සිටුවන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ හරහා අපි සැමට සමාන අධ්‍යාපනයක් ලබා දෙන අය වැයක් ගෙනැල්ලා තිබෙනවා. විශේෂයෙන්ම ඉතිහාසයේ වැඩිම මුදල් වෙන් කිරීම ඒ වෙනුවෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම, සෞඛ්‍ය ක්ෂේත්‍රයටත් අපි විශේෂ තැනක් දීලා තිබෙනවා. රුපියල් බිලියන 604ක් සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කරලා තිබෙනවා. මේ හැම ප්‍රතිපාදන වෙන් කිරීමක් තුළින්ම මේ රටේ සියලුදෙනාට නැවත ප්‍රතිලාභ ගලා ගෙන යනවා. ඒ නිසා මෙතැනදී වැටුප් වැඩිවීම පමණක්ම ඉලක්ක කර ගන්න එපා. අධ්‍යාපන ක්ෂේත්‍රය හදනවා කියන්නේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය හදනවා කියන්නේ, ඒවාට වෙන දා අපේ අතින් වියදම් කරපු මුදල් ඉතිරි වෙන එක. එතකොට ඒක තවත් පැත්තකින් අපට ආදායමක් බවට පත් වෙනවා.

මාසික ආදායම රුපියල් ලක්ෂය ඉක්ම වූ අයට PAYE Tax එක පැනවූවා. අද ඒ සීමාව රුපියල් 150,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ තුළින් ඔවුන්ට ඉතිරි වෙන මුදලකුත් තිබෙනවා. ඒ තමයි කලින් බදු ගෙවපු මුදල් ප්‍රමාණය. අපි මතක් කරනවා නම්, පසු ගිය කාලයේ මේ රටේ පාලකයෝ බදු මුදල් පරිහරණය කළ විධිය ගැන කථා කළොත්, පසු ගිය කාලයේ ජනාධිපති පුතාලාගේ දොළ දුක සන්සිඳුවා ගන්න රොකට් යවන්න ඩොලර් මිලියන 326ක් වාගේ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. මේ රටේ ජනතාවගේ බදු මුදල්වලින් රොකට් යැව්වා. ඔවුන් එහෙමයි හැසිරුණේ. හැබැයි, අපි එහෙම කරන්නේ නැහැ. අද ඒ යවපු රොකට් එක සොයා ගන්නත් නැහැ. ඒකෙන් මේ රටට කිසිදු වාසියක් වෙලා නැහැ. ඒවා ජනතාවට නිකම්ම නිකම් පීඩනයක් බවට පත් වුණා විතරයි. අපි පසු ගිය කාලයේ තෙල් නැවක් ගෙන්වා ගන්න බැරිව දුක් වින්දා. හැබැයි, ඒ ගොල්ලෝ රොකට් යවන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 326ක් මේ රටේ ජනතාවගේ බදු මුදල් වියදම් කළා. එහෙමයි, මේ රටේ පාලකයන් හැසිරුණේ. එදා වැලි කොට්ට ගහලා, පාරවල් වහලා රේස් පැදපු අය හිටියේ. හැබැයි, අද වන විට අපි පාලකයෝ විධියට, ආණ්ඩුවක් විධියට මේ සියල්ල දරාගෙන,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

ඒ ගොල්ලෝ මේ බදු මුදල් පරිස්සමින් පාවිච්චි කළේ නැහැ. හැබැයි, අපි මේ බදු මුදල් ඉතා පරිස්සමින් පාවිච්චි කරනවා. ඒ වාගේම, මේ වියදම් සෑම එකක්ම කර්මාන්තවලට, ග්‍රාමීය ජනතාව අතරට අරගෙන ගිහිල්ලා තිබෙනවා. සියලු ජනතාව, විශේෂයෙන්ම වතු කම්කරු ජනතාව ගැන අපි හිතලා තිබෙනවා. ඒ වාගේම, අපේ රටට, ජාතික ධනය උත්පාදනයට ඒ ජනතාව එකතු කර ගෙන, ඒ ජනතාව නඟා සිටුවන්න පුළුවන් වැඩසටහනක් අපි මේ අය වැය තුළ සනිටුහන් කරලා තිබෙනවා. අපේ මංගල අය වැයේ තිබෙන මේ යෝජනා ක්‍රියාත්මක කරලා, ඊළඟට ගෙන එන අය වැයත් එක්ක ඉදිරියේදී අපි හඳන පොහොසත් රටක් ලස්සන ජීවිතයක් මේ රටේ ජනතාවට උදා කරලා දෙනවා කියලා සහතිකයක් මේ මොහොතේ දීලා තිබෙනවා. ඒ කාරණාවත් මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියට ස්තූතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.00]

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම මම සතුටු වෙනවා, අපේ රටේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කරමින්, එක්තරා ආකාරයක නවතම අය වැයක් ඉදිරිපත් කරන අවස්ථාවේ, ඒ වෙනුවෙන් කථා කරන්න ලැබීම ගැන. ඒකට හේතුව තමයි, පසු ගිය දශක ගණනාව තුළම අපිත් ඉතා උනන්දුවෙන් අය වැය ලේඛනය ඉදිරිපත් කරන කාලයට අය වැය අහනවා; අය වැය ලේඛනය ගැන අවධානය යොමු කරනවා. ඒ වාගේම තමයි, අපේ රටේ ජනතාව අය වැය ගැන හුඟක් උනන්දුයි. ඒ උනන්දුව ඇති වෙලා තිබෙන්නේ කොහොමද කියලා හිතුවොත්, විවිධ ක්ෂේත්‍රවල ජනතාව -ගොවිතැන් කරන ජනතාව, රජයේ සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්, කර්මාන්ත කරන අය- අය වැය දිහා බලන්නේ තමන්ගේ ක්ෂේත්‍රයට අය වැයෙන් වෙන් වෙලා තිබෙන්නේ මොනවාද කියලායි. මොනවාද, තමන්ගේ ක්ෂේත්‍රයට අය වැයෙන් ලැබිලා තිබෙන ප්‍රතිලාභ කියලායි. අපට දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන අත්දැකීම තමයි, අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයන් සහ ජනතාව අය වැය එනතුරුම බලා ගෙන ඉන්නවා, තමන්ගේ ක්ෂේත්‍රයට ලැබිලා තිබෙන්නේ මොනවාද කියලා සොයා ගන්න.

එක්තරා ආකාරයකින් රටේ කාරණා, අය වැය ගැන ජනතාවගේ අවධානය වැඩිවීම හොඳයි. හැබැයි, පසු ගිය කාල සීමාව පුරාම අපට තිබෙන නිරීක්ෂණය තමයි, ජනතාව වැඩි උනන්දුවක් දක්වන්නේ තමන්ට ලැබිලා තිබෙන්නේ මොනවාද කියලා බලාගන්න තමයි. ඒකෙන් තේරෙන දේ තමයි, පසු ගිය දශක ගණනාව තුළම නොවිසඳුණු ප්‍රශ්න පිළිබඳව, ඔවුන්ගේ ක්ෂේත්‍රයට අවශ්‍ය දේවල් නොලැබීම පිළිබඳව, ආර්ථිකයට ප්‍රවේශයක් නැතිකම නිසා ඔවුන්ට ලැබෙන්නේ මොනවාද කියලා නොදැනීම පිළිබඳව ජනතාව ඉතා උනන්දුවෙන් පසු ගිය අය වැය ලේඛන දිහා බලාගෙන හිටපු බවයි. එතැනට තමයි, පසු ගිය පාලකයෝ මේ ජනතාව කොටු කරලා තිබුණේ.

අද විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් අපේ පොරොන්දු ගැන කථා කරනවා. හැබැයි, ඒ ගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා, අද රටේ දේශපාලනය වෙනස් වෙලා කියලා.

දේශපාලනය වෙනස් වීම නිසා තමයි ජනතාවාදී පාලනයක් බිහි වෙලා තිබෙන්නේ. දේශපාලනය නිකම් වෙනස් වෙන්නේ නැහැ නේ. ඒගොල්ලන් කාලයක් තිස්සේ රටේ ජනතාවට කියපු දේවල්, කරපු දේවල් හොඳට අත්දැකලා තමයි ජනතාව මේ පාලනය වෙනස් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි හදලා තිබෙන්නේ පොරොන්දු දේශපාලන ආණ්ඩුවක් නොවෙයි. ජනතාව හා අපි අතර ගනුදෙනුවක්, කොන්ත්‍රාත් එකක් නැහැ. අපි බලය ලබා ගන්න කලින් මේ ව්‍යාපාරය ගොඩනඟද්දී දේශපාලන වේදිකාවල ජනතාව එක්ක කථා කළේ මොනවාද? මේ වෙනස ඇති කර ගන්න ඕනෑ කොහොමද කියලා තමයි අපි කථා කළේ. ඒ නිසා ජනතාවටත් මේ ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. අපි අතර තිබෙන්නේ සම්මුතියක්. ජනතාව සහ මේ හදපු නව පාලනය -ජනතාවාදී පාලනය- අතර තිබෙන්නේ සම්මුතියක්. ඒ නිසා තමයි මේ සියලු ක්ෂේත්‍ර ගැන පුළුල්ව හිතපු, මූලිකව මේ රට ව්‍යුහාත්මක සහ සංවර්ධනාත්මක පැත්තට ගෙන යන, මේ සමාජය තව මට්ටමකට ඉහළට ඔසවන අය වැයක් අපට ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ජනතාව බලාපොරොත්තු වුණේත් ඒක තමයි. ඒක ඇතුළේ අපි සමත් වෙලා තිබෙනවා මේ සියලු බාධා මැද හැකි තරම් ප්‍රතිලාභ, සහන හැම පැත්තෙන්ම ජනතාවට ලබා දෙන්න.

අපි දන්නවා මේ අය වැය ක්‍රියාත්මක කරන්න මාස 8ක් තමයි අපට කාලය තිබෙන්නේ. කෙසේ වෙතත්, ගොඩක් කල් රට පාලනය කරපු සමහර දේශපාලන පක්ෂ, ගොඩක් ප්‍රගතිශීලියි කියන අය, නවීන ලෝකයේ ආර්ථික මොඩල ගැන කථා කරන අය, අපි මේ ආවරණය කරලා තිබෙන මේ ක්ෂේත්‍ර ඉතිහාසයේ කවදාවත් අල්ලලාවත් තිබුණේ නැති ක්ෂේත්‍ර. හැබැයි, අපි අද වෙනකොට අපේ අය වැය හරහා ඒ මොඩල ගැන මේ සියලු ක්ෂේත්‍රවල ජනතාවට ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ වාගේම තමයි අපි උතුර, නැගෙනහිර, දකුණ, බටහිර, කඳුකරය යන මේ කිසිම ප්‍රදේශයක ජනතාව අත්හැරලා නැහැ. අපි ඒ වාගේ දේශපාලනයකට ගිහිල්ලා නැහැ. අපි මේ රට සමස්තයක් විධියට ගොඩනඟන්නයි කටයුතු කරලා තිබෙන්නේ. සියලුදෙනාම ශ්‍රී ලාංකිකයන් විධියට ගොඩ නඟන්න පුළුවන් අය වැයක් තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ රටේ හිටපු ආණ්ඩුවලට ඕනෑ තරම් කාලයක් තිබුණානේ උතුරු-නැගෙනහිර ජනතාවට සේවය සලසන්න. නමුත් ඒ සමහර තැන්වලට පාලමක් හදා ගන්න බැරි වෙලා තිබෙනවා නේ. අපි අද කොයි තරම් දේවල් කරලා තිබෙනවාද උතුරු පළාතත් මේ ආර්ථිකයට සම්බන්ධ කරන්න. හුදෙකලා පිරිසක් විධියට ඒ ජනතාව තවදුරටත් ඒ ප්‍රදේශවල තියන්න සුදුසු නැහැ. කඳුකරයේ ජනතාවත් එහෙම තමයි. පරිවර්තනයේ හැරවුම් ලක්ෂ්‍ය විධියට තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ අය වැයේ ගැඹුරින්ම තිබෙන දේ තමයි මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම. දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම නිසා ඒ මොහොතේම ලැබෙන දේ ගැන හොඳ අවබෝධයක් අපට තිබෙනවා. මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම නිසාම, ජනතාව ඒ තීරණය ගත්ත නිසාම, අතිවිශාල නාස්තියක් කරමින් ඉලක්කයක් නැතිව ගිය රට, ඉලක්කසහගත, සැලසුම් සහගත සංවිධානාත්මක තැනකට ගෙනෙන්න, නාස්තිය නැති කරන්න පුළුවන් දේශපාලන අධිකාරියකට අද බලය පැවරිලා තිබෙනවා. ගොඩක් අය අහනවා, "මේවා කරන්න සල්ලි කොහෙන්ද" කියලා. රටේ සල්ලි තිබෙනවා, හොයා ගන්න පුළුවන්. හැබැයි, නාස්තිය වළක්වන්න ඕනෑ. අපේ මන්ත්‍රීවරු ප්‍රකාශ කළා වාගේම, ඒ වෙනුවෙන් ආණ්ඩුව පැත්තෙන් කළ හැකි සියලු කැපකිරීම් කරන්න අපි සූදානම්. අපි එහෙම කරන්න

පුළුවන් දේශපාලන ව්‍යාපාරයක්. ඉතිහාසයේ පළමු වතාවට ආණ්ඩුවක් කැප කිරීම් කරමින් ජනතාව වෙනුවෙන් වැඩ කරන යුගයක් මේක. කවදද, එහෙම ආණ්ඩුවක් හදන්න පුළුවන් වෙලා තිබුණේ? කවදද එහෙම කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ? මහජනතාව සක්‍රියව මේ රට දියුණු කරන්න දායක කර ගන්න, ඒකට ආධ්‍යාත්මික වශයෙන් බද්ධ කරගන්න පුළුවන් වුණේ කොයි ආණ්ඩුවකටද? එහෙම බැරි වෙලා තිබෙනවා නේ, මෙච්චර කාලයකට. එහෙම තිබුණා නම්, මෙහෙම සාකච්ඡා කරන්න මේ ප්‍රශ්න එන්නේ නැහැ නේ.

අද අපට කථා කරන්න වෙලා තිබෙන්නේ මොනවාද? රැකියා ප්‍රශ්න ගැන අපට කථා කරන්න වෙලා තිබෙනවා. ප්‍රවාහන ප්‍රශ්න ගැන අපට කථා කරන්න වෙලා තිබෙනවා. සනීපාරක්ෂාව ගැන අපට කථා කරන්න වෙලා තිබෙනවා. කොටුව දුම්රිය ස්ථානයේ කාන්තාවන්ට යන්න පුළුවන් හොඳ වැසිකිළිලියක් -සනීපාරක්ෂක ස්ථානයක්- තිබුණේ නැහැ නේ. ඒකත් අපේ ආණ්ඩුව ඇවිල්ලානේ හැදුවේ. ඒවා පොඩි දේවල් තමයි. ඒ වුණාට ඒවා ගැන හිතලා තිබුණේ නැහැනේ. දැන් අපි කල්පනා කරලා තිබෙනවා නේ මේ රටේ සියලු ප්‍රධාන ස්ථානවල, මාර්ගවල - ප්‍රවාහනයට සම්බන්ධ තැන්වල- කාන්තාවන්ට හා දරුවන්ට හොඳ සනීපාරක්ෂක ස්ථාන හදා දෙන්න ඕනෑ කියලා. ඒවා ගැන මීට කලින් කල්පනා කරන්න බැරි වෙලා තිබෙනවා නේ. ඒවාට අපේ ආණ්ඩුව එනකන්ම ඉන්න ඕනෑ වුණා ද? ඒ නිසා ජනතාව දන්නවා මේ වෙන්නේ මොකක්ද කියලා.

එක පැත්තකින් ගත්තොත් අපි දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා තිබෙනවා. නාස්තිය නැති කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිලාභ රටටත්, ජනතාවටත් තමයි. අපි බලයට එන්න කලින් අපි ගැන භයක් ඇති කරමින් හිටියානේ. අපට ජාත්‍යන්තර සබඳතා නැති වෙයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපිත් එක්ක වැඩ කරන්නේ නැති වෙයි, ඩොලර් එක රුපියල් 400න් එහාට යයි කියමින් එක එක භය හද හදා හිටියානේ. නමුත්, ජනතාව ඒවා ගණන් ගත්තේ නැහැ. ඒවා අත් හැරලා ජනතාව අපිත් එක්ක ඒකතු වුණා. දැන් නැවත වතාවක් මතයක් හදන්න යනවා, "මේ ආර්ථික මොඩල් එක අපි දන්නේ නැහැනේ. මොනවා වෙයිද දන්නේ නැහැ, NPP ආණ්ඩුව මේ විධියට වැඩ කරද්දි" කියමින්. හැබැයි, අපි නම් බිම් මට්ටමේ ඉන්න ජනතාවත් එක්ක වැඩ කරන අය.

අපි පාර්ලිමේන්තුවේත් වැඩ කරන ගමන්, නිරන්තරයෙන් ජනතාව එක්කත් වැඩ කරනවා. අපි ඡන්දයට කලින් විතරක් නොවෙයි, ඡන්දයක් තිබුණත් නැතත් කොහොමත් ජනතාවත් එක්ක වැඩ කරනවා. ජනතාවත් එක්ක වැඩ කරද්දී තවම නම්, කවුරුවත් අපෙන් අහලා නැහැ ඔයගොල්ලන්ගේ ආර්ථික මොඩලය මොකක්ද කියලා. මොකද, මේකේ ගති ලක්ෂණ දැක්කාම, ජනතාවාදී, ප්‍රගතිශීලී, ඒ වාගේම පුළුල් ආර්ථික පරිවර්තනයක් සහිත, ජනතාවට යහපත් ආර්ථිකයක් ළඟා කරවන වෙනසක් ගෙනෙන අය වැයක් සහ ක්‍රමවේදයක් තමයි අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන කාරණය ජනතාවට තේරුණා. ඒක නොදන්නවා නොවෙයි නේ, විපක්ෂය. ඒක දැනගෙන මෙතුමන්ලා අපි ගැන වෙන අදහසක් හදලා, ඒ අදහසට පහර දෙනවා. ඕක තමයි පසුගිය කාල සීමාවේම - මාස තුනේදීම - පාර්ලිමේන්තුවේ කළේ. අපි නොකියපු ඒවා, අපි ගැන ඒගොල්ලෝ කියලා තිබෙන ඒවා දිහා බැලුවොත්, විශේෂයෙන් විපක්ෂය මෙතැන අපි ගැන වෙනත් චිත්‍රයක් මවන්න උත්සාහ කරන බවක් තමයි පෙනෙන්නේ. අපේ මතවාද සම්බන්ධයෙන්, අපේ මූලධර්ම සම්බන්ධයෙන්, සංකල්ප සම්බන්ධයෙන්, අපි ආර්ථිකය හසුරුවන ආකාරය සම්බන්ධයෙන්,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ඒ නිසා, එහෙම උත්සාහ කළාට අද රටේ ජනතාව සිටින්නේ කොතැනද කියලා අපි හැම දෙනාම දන්නවා. විශේෂයෙන් ලබා දිය හැකි සියලු ප්‍රතිලාභ, සහන අපි ජනතාවට දීලා තිබෙනවා. අපි ඒවා හිරකරගෙන, නතර කරගෙන හිටියේ නැහැ නේ, අය වැයට එල්ලන්න කියලා. අපි ගොවි ජනතාවගේ ප්‍රතිලාභ වැඩි කරලා දීලා, පොහොර සහනාධාරය වැඩි කළා. ඒ වාගේම පාසල් සිසු දරුවන්ට සහන සලසන්න අපි අය වැය එනතුරු හිටියේ නැහැ නේ. සහනය අවශ්‍ය දරුවන්ට පාසල් වාරය පටන් ගන්නකොටම ඒ ප්‍රතිලාභ ලබා දුන්නා, ලිපි ද්‍රව්‍ය ලබා ගන්න. ඉතින්, අපි එහෙම කටයුතු කරලා නැහැ.

ඒ වාගේම අපි විශ්‍රාමිකයන්ට රුපියල් 3,000ක් වැඩි කළේ, මේ අය වැය ඉදිරිපත් කරන්න කලිනුයි. එහෙම තමයි ජනතාවාදී ආණ්ඩු වැඩ කරන්නේ. ඒ නිසා මේ අය වැයෙනුත් ඉදිරිපත් කර තිබෙනවා වාගේම ඉදිරි කාල සීමාවේදී අපේ සියලු අමාත්‍යාංශවල වැඩකටයුතු සිදු වන්නේ ග්‍රාමීය දුප්පත්කම තුරන් කරන්න, ඒ වාගේම ආර්ථිකය වඩ වඩාත් ජනතාව අතරට ගෙනෙන්න, ඩිජිටල්කරණය හරහා, රජයේ සේවකයන්ට පැටවිලා තිබෙන බරත්, ඒ වාගේම ජනතාවගේ කාලයත් ඉතුරු කරන හොඳ තැනකට ගෙන යන්න, ඒ වාගේම Clean Sri Lanka ව්‍යාපෘතිය හරහා ජීවත් වෙන්න පුළුවන් සුපිරිසිදු වාගේම සුවපහසු පරිසරයක් සහිත රටක් ගොඩනඟන්නයි. ඉතින් ඉලක්කම්වල, ප්‍රස්ථාරවල විතරක් නොවෙයි ජීවිතය තිබෙන්නේ. ඉලක්කම්වලින්, ප්‍රස්ථාරවලින් විතරක් මිනිස්සුන්ගේ ජීවිතය මනින්නේ කොහොමද? ඒක ආර්ථිකයේ එක පැත්තක්. හැබැයි, සමාජ ආරක්ෂාව, ප්‍රවාහන පහසුකම් යනාදිය වර්ධනය කරන්න තමයි අපි ඔක්කෝම සැලසුම් සකස් කරලා තිබෙන්නේ. පසුගිය දශක ගණනාවක් තිස්සේ විනාශ කරපු ප්‍රවාහන පද්ධතියක් තමයි තිබෙන්නේ. කිසිම ලෙසකින් ඒවා ගැන බලලා නැහැ. අපි රටේ කිසිම සම්පතක් විකුණන්නේ නැතුව නේ, මේවා කරන්නේ. හැබැයි, මාර ආර්ථික විශේෂඥයෝ ටිකක් තමයි පසුගිය ආණ්ඩුවල හිටියේ. රටේ සම්පත් ඔක්කෝම විකුණන්න දාලා නේ තිබුණේ. ඒවා විකුණලා නිෂ්පාදන ආර්ථිකයක් හදන්නේ කොහොමද? මිල්කෝ එක විකුණන්න හදපු එක නවත්වලා, රජය මැදිහත් වෙලා දැන් එය කරගෙන යනවා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මා අවසන් කරනවා.

අපි නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරලා මේ රටේ ජනතාව අතට මුදලුත්, යහපත් රටකුත් ඇති කරනවා. සමාජය තව අදියරයකට ඔසවන ක්‍රියාදාමයක අපි නිරත වෙනවා. ඒ වෙනුවෙන් අපි සියලු දෙනා කැප වෙලා වැඩ කරනවාය කියන එක ප්‍රකාශ කරන්න කැමැතියි. ඔබ සියලු දෙනාටම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් කරුණාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැය පිළිබඳ විවාදයට සම්බන්ධ වෙද්දි මම මුලින්ම මතක් කරන්න ඕනෑ, ජනතාව අපේ ආණ්ඩුවට අවුරුදු 5කට තමයි බලය දීලා තිබෙන්නේ කියන එක. මේ, අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය. අපි ජනතාවට ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි ජනතාවට දුන් පොරොන්දු ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ඉෂ්ට සිද්ධ කරන්න කාලය තිබෙනවා. තව මේකෙන් පස්සේ අය වැය හතරක් එනවා. එම කාලපරාසය තුළ අපේ වැඩ පිළිවෙළ අපි නිසියාකාරව ඉෂ්ට කරනවාය කියන කාරණයත් මම මතක් කරනවා.

අද උදේ විපක්ෂ නායකතුමා කථා කරනකොට සඳහන් කළා, මේ අය වැය ජනතාවට පීඩනය එල්ල කරපු අය වැයක් කියලා. ඔව්, එක්තරා සුළු කණ්ඩායමක් පීඩනයට ලක් කරලා තිබෙනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ අය වැය තුළින් මේ රටේ පොදු ජනතාව කිසිම පීඩනයකට ලක් කරලා නැති බව.

ඒ අනුව පොදු ජනතාවට අස්වැසුම ප්‍රතිලාභ වැඩි කරලා තිබෙනවා. අපේ පාසල් දරුවන් ඇවිත් ඉන්නවා මේ ගැලරියේ. අපේ පුංචි දරු පැටවුන්ට පොතපත ලබා ගැනීම සඳහා විශේෂ ආධාර වැඩසටහන් හඳුන්වා දීලා තිබෙනවා. මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කළා. ඒ වාගේම රාජ්‍ය අංශයේ සේවකයින්ට, පෞද්ගලික අංශයේ සේවකයින්ට ඉතිහාසයේ කවදාවත් නැති විධියට වැටුප් වැඩි කළා. රජයේ සේවකයින්ගේ මූලික වැටුප වැඩි කරලා තිබෙනවා. පෙර පාසල් පාලිකාවන්ට ආධාර වැඩසටහන් හඳුන්වා දීලා තිබෙනවා. ළමා නිවාසවල දරුවන්ට වෙනම ආධාර වැඩසටහන් වාගේම, අවුරුදු 18න් පසුව ඒ දරුවන් තවත් අනාථ කරන්නේ නැතුව ඒ දරුවන්ගේ වගකීම මේ අය වැය ඇතුළේ තහවුරු කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

ආබාධිත අය සඳහා විශේෂ ආධාර වැඩසටහන් පළමු වතාවට මේ අය වැය ඇතුළේ යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම, ගොවි ජනතාවගේ පොහොර සහනාධාරය හෙක්ටෙයාර දෙකක් සඳහා රුපියල් 20,000කින් වැඩි කරලා තිබෙනවා. වැඩිහිටි ආධාර වැඩි කරලා තිබෙනවා. වකුගඩු රෝගීන්ට දෙන ආධාර වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම තමයි අද ඉන්ධන මිල අඩු වෙලා තිබෙනවා. අපි ආණ්ඩුව භාරගන්නකොට රුපියල් තුන්සිය හැට ගණන්වලට තිබුණු ඉන්ධන මිල මේ වෙනකොට රුපියල් දෙසිය අසූ ගණන් දක්වා අඩු කරලා තිබෙනවා. ඉතින්, විපක්ෂ නායකතුමා කියන ආකාරයට ඒ විධියට තමයි ජනතාවට පීඩනය එල්ල කරලා තිබෙන්නේ. විදුලි බිල සියයට 20කින් අඩු කර තිබෙනවා. කර්මාන්ත සඳහා සියයට 30කින් විදුලි බිල අඩු කරලා තිබෙනවා. ගර්භිණී මව්වරුන්ට විශේෂ ආධාර වැඩසටහන් යෝජනා කර තිබෙනවා. මේ අය වැයෙන් ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ත්‍රිපෝෂ ආයතනය විකුණන්න තමයි සැලසුම් කරලා තිබුණේ. නමුත්, ඒ ආයතනය නැවත ආරම්භ කරලා, ත්‍රිපෝෂ සඳහා රුපියල් බිලියන 5ක් වෙනම වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය සමත් වුණු දරුවන්ගේ ශිෂ්‍යාධාර මුදල දෙගුණයකින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම, දරුවන්ගේ ආහාර සලාකයත් වැඩි කරලා තිබෙනවා.

ඊළඟට, මේ රටේ වැව්, අමුණු ගොඩනැඟීම සඳහා; ප්‍රතිසංස්කරණය කිරීම සඳහා, ජලාශ ඉදිකිරීම සඳහා රුපියල් කෝටි 7,800ක් මාස 8ක් ඇතුළත වියදම් කරන්න මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. මේ ඔක්කොටම සම්බන්ධ වෙන්නේ සාමාන්‍ය ජනතාව, ග්‍රාමීය ජනතාව. අන්න ඒ විධියට තමයි මේ අය වැය ඇතුළේ සාමාන්‍ය ජනතාවට පීඩනය එල්ල කරලා තිබෙන්නේ. ව්‍යාත්තීය අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට ලබාදෙන ආධාර මුදල් ද වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජන ගැනීම සඳහා කොන්දේසි අඩුවෙන්, ඉතාම පහසු විධියට තමන්ගේ ව්‍යවසායක කටයුතු කර ගැනීම සඳහා, ණය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසෙන සංවර්ධන බැංකුවක් පිහිටුවීමට මේ අය වැය තුළ යෝජනා කරලා තිබෙනවා. විශේෂයෙන්ම ග්‍රාමීය ආර්ථිකය නහා සිටුවීමට අදාළව මේ වාගේ විශාල වැඩ කොටසක් මේ අය වැය ඇතුළේ යෝජනා කරලා තිබෙනවා. අපේ ආචාර්යතුමා; විෂය භාර ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එම අමාත්‍යාංශය යටතේ තව විශාල වැඩ කොටසක් සිදු වෙනවා.

ඒ වාගේම අධ්‍යාපනය සහ සෞඛ්‍යයටත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. කෘෂි කර්මාන්තය ගත්තාම ඒ වෙනුවෙනුත් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ සෑම ක්ෂේත්‍රයකටම මේ අය වැයෙන් විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. ඔන්න ඔය විධියට තමයි මේ අය වැය ජනතාවට පීඩනය එල්ල කරන අය වැයක් බවට පත් වෙන්නේ. හැබැයි, ඉතිහාසයේ කවදාවත් නැති විධියට මේ රටේ සාමාන්‍ය ජනතාවට ආධාර ගොන්නක් ලබාදෙන, ඔවුන්ගේ ආර්ථිකය නහාසිටුවීමට අදාළ සවිය, ශක්තිය නිර්මාණය කරන වැඩසටහන් විශාල ප්‍රමාණයක් සහ ඒ වෙනුවෙන් මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරපු අය වැයක් බවට මේ අය වැය ඉතිහාසගත වෙලා අවසානයි. ඔව්, මේකෙන් පීඩනයක් එල්ල වෙලා තිබෙනවා. කොටද?

ඊළඟට, මේ අය වැය ගත්තාම මහින්ද රාජපක්ෂගේ, ගෝඨාභය රාජපක්ෂගේ අය වැයවලට සමානත්වයක් මේකේ තිබෙනවාය කියලා විපක්ෂ නායකතුමා කිව්වා. ඔව්, ඇත්තටම ඒ අය වැය කිහිපය ගත්තොත්, ඒවා පවුලට සල්ලි බෙදාගත් අය වැය බව අපට මතකයි. පවුලේ ඇමතිවරු ගොඩක් හිටියා, ඒ අය සඳහා සල්ලි විශාල ප්‍රමාණයක් වෙන් කර ගත් අය වැය තමයි ඒ කාලයේ ඉදිරිපත් වුණේ. ඒගොල්ලන් ඇති හැකි පරිදි බෙදා හදා ගත්තා. හැබැයි, මේ අය වැය ඇතුළේ එහෙම එකක් නැහැ.

මම විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අපි ඡන්දයට එන්න කලිනුත්, ඡන්දය වෙලාවේත් රටට ප්‍රකාශ කළා, මේ රටේ පවතින දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කරනවාය කියලා.

එම දේශපාලන සංස්කෘතිය උඩු යටිකුරු කරනවා කියලා අපි කිව්වා. දැනුත් ඒක අපි කරලා තිබෙන්නේ. ඉදිරි කාලය තුළ මේ කටයුත්ත නීත්‍යානුකූලවම අපි කරනවා. එහෙම නම් දැන් කප්පාදුවට ලක් කරලා තිබෙන්නේ කවුද? කාගේ වරප්‍රසාද ද කප්පාදුවට ලක් කරලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද වෙනකොට මහ පාරේ රථ පෙරහැරවල් දකින්න ලැබෙන්නේ නැහැ; ඇමතිවරු පිරිවරාගත් රථ පෙළපාළි දකින්න ලැබෙන්නේ නැහැ. ඒ වාගේම අපේ කිසිම ඇමතිවරයෙක් එතුමන්ලාට හිමි නිල බංගලා භාර ගත්තේ නැහැ. ඒ වාගේම වාහන පාවිච්චියේදී එතුමන්ලා පෙන්නුම් කරපු සදාචාරය බලන්න. අසීමිත ලෙස භුක්ති විඳපු අනෙකුත් වරප්‍රසාද සියල්ල අප විසින්ම කප්පාදු කරගෙන තිබෙනවා; අප විසින්ම අහෝසි කරගෙන තිබෙනවා. ජනාධිපතිවරයාගේ සිට මන්ත්‍රීවරයෙකු දක්වාම ඒ අසීමිත වරප්‍රසාද භුක්ති විඳීම කප්පාදුවට ලක් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිවරයෙකුට නීත්‍යානුකූලව භුක්ති විඳීමට ලැබෙන වරප්‍රසාද සියල්ල අද අසීමිතව කප්පාදුවට ලක් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ඒවා

ඉවත් කිරීමට මේ වෙනකොට නීත්‍යානුකූලව කටයුතු කරගෙන එනවා. මෙන්න මේ පරිසරය තුළ ඉහළින් සිටි ජනාධිපතිවරු, අගමැතිවරු, මැති ඇමතිවරු පසුගිය අය වැයවලින් යහමින් සල්ලි වෙන්කර ගත්තා, ඒ අයගේ වැය ශීර්ෂ සඳහා. ඒ, රුපියල් කෝටි, ප්‍රකෝටි ගණනින්. අන්න ඒ සංස්කෘතිය මේ අය වැය ඇතුළේ වෙනස් කරලා තිබෙනවා. ඒවා කප්පාදු කරලා තිබෙනවා. මේ අය වැය ඇතුළේ යමෙකු පීඩනයට ලක් කළාය කියලා කියනවා නම්, එලෙස පීඩනයට ලක් කරලා තිබෙන්නේ අන්න ඒ අයයි. මොකද, අපි ඒ අයගේ වරප්‍රසාද කප්පාදු කරලා තිබෙනවා. පාලකයන්ගේ වරප්‍රසාද කප්පාදු කරලා, ඔවුන්ට වෙන් වන මුදල් කප්පාදු කරලා ඒ මුදල් බෙදලා තිබෙනවා, මේ ගැලරියේ ඉන්න පුංචි දරු පැටවුන්ගේ අනාගතය වෙනුවෙන්, මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන්. තැළෙන, පොඩි වෙන, පෑගෙන මිනිස්සු වෙනුවෙන් අන්න ඒ මුදල් වෙන් කරලා තිබෙනවා; අත දිග හැරලා වෙන් කරලා තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, ඉතිහාසයේ පළමුවැනි වතාවට ජනතාවගේ පැත්ත බලාගෙන, ජනතාවට වරප්‍රසාද වැඩියෙන් ලැබෙන අය වැයක් තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා.

ඊළඟට මෙතැනදී කථා කළා, IMF එක ගැන. ඔව්, මීට කලින් අපි IMF එකට 16 වතාවක් ගිහින් තිබෙනවා. හැබැයි ගොඩ ගිහිල්ලා නම් නැහැ. අපි IMF එකට ගියා නොවෙයි, අපි ආණ්ඩුව ගන්නකොට IMF එක ඇතුළේ අපි හිර වෙලා හිටියේ. ඒ තත්ත්වය තුළ -මේ පරිසරය ඇතුළේ- තමයි අපට දැන් ඉදිරියට යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඇයි, අපට IMF එකට යන්න වුණේ? ඇයි අපට එතැනට යන්න වුණේ? මේ ප්‍රශ්නයට අපි උත්තර හොයන්න ඕනෑ.

මට විශේෂයෙන්ම කියන්න ඕනෑකම තිබෙනවා, අද මේ අය වැයට තඩිබාන විපක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගේ පියතුමන්ලා, එතුමන්ලාගේ නායකයෝ තමයි මෙතෙක් මේ රට පාලනය කළේ කියන එක. පියාණෝ ගත්තොත්, 1977 සිට 1993 මැයි 01වැනි දා වෙනකම් ප්‍රධාන නායකයා, නියෝජ්‍ය නායකයා විධියට මේ රට පාලනය කරන්න සම්බන්ධ වුණා. ඒ කාලය තුළ අය වැය ගණනාවක් ඉදිරිපත් කෙරුණා. ඒ වාගේම තමයි, පුතාණෝත් ඇවිල්ලා පසුගිය ආණ්ඩුවක තුන්වැනියා විධියට වැඩකටයුතු කෙරුවා; ඒ ආණ්ඩුවේ වගකීම් දැරුවා. එහෙම නම්, මේ රට මෙතෙක් පාලනය කරපු අය තමයි රට ආර්ථික වශයෙන් බංකොලොත් කළේ.

2022 අප්‍රේල් 12වැනි දා ජාත්‍යන්තරයට නිවේදනය කරනවා, අපේ රට බංකොලොත් රටක් විධියට. අපේ රට බංකොලොත් රටක් විධියට නිවේදනය කරන තැනට රට පත් කළේ කවුද? අපිද? ඒ තත්ත්වය තුළ තමයි අද අපට මේ හැම දෙයකටම මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. මේක ශ්‍රේෂ්ඨාධිකරණයේදීත් සාකච්ඡාවට භාජන වුණා. අපේ රටේ ආර්ථිකය බංකොලොත් කිරීමට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිර්දේශයක් නිකුත් කළා. ඒ නිර්දේශය ඇතුළේ රාජපක්ෂවරුන් කිහිපදෙනෙකුගේම නම් කියැවෙනවා.

ඒකේ තව තව අයගේ නම් කියැවෙනවා. ඉතින්, මෙතෙක් රට පාලනය කරපු සියලුදෙනාම අඩු වැඩි වශයෙන් එකතුවෙලා තමයි අපේ රට බංකොලොත්භාවයට පත් කෙරුවේ. එහෙම නම්, ඒ බංකොලොත්භාවයට පත් කිරීමට අදාළව විපක්ෂයේ සිටින ඔබතුමන්ලා මීට පෙර ඉදිරිපත් කරපු අය වැය සියල්ලට කොච්චර දායක වුණා ද? ඔබතුමන්ලා ඉදිරිපත් කරපු අය වැය සියල්ලේ ප්‍රතිඵලයක් විධියට තමයි අපේ රට බංකොලොත් වුණේ. ඔබතුමන්ලා බංකොලොත් කරපු අන්න ඒ රට මීට මාස දෙකකට පෙරාතුව අපි ඒ බංකොලොත්භාවයෙන් නිදහස් කර ගත්තා. අලුත් ආණ්ඩුව යටතේ ඒක අපි ලබපු ලොකු ජයග්‍රහණයක්. ඔබ විනාශ කරපු රට, බංකොලොත්භාවයට පත් කරපු රට සුරක්ෂිත කරමින් ඉදිරියට අරගෙන යන්න අපි මේ පටන් ගත්තා විතරයි, මහත්වරුනි. අනේ, මේ ආණ්ඩුව හදලා තවම දවස් කිහිපයයි. ඒ නිසා මේ ආණ්ඩුවට අවුරුදු 5ක්, 6ක් ගියා වාගේ අදහසක ඉඳන් ඇඟිල්ල දිගු කරන්න එපා කියලා අපි මතක් කරනවා. මේ ඉදිරිපත් කරන්නේ අපේ පළමුවැනි අය වැය බවත් අපි මතක් කරනවා. මේ පළමුවැනි අය වැය ඉදිරිපත් කරනකොට මහා ළිං පතුලකට දාලා තිබුණු රට යාන්තම් ළිං ගැටිටට ගත්තා විතරයි. හැබැයි, ඊළඟ අය වැය ඉදිරිපත් කරනකොට මේ තත්ත්වය මීට වඩා වෙනස් වෙයි.

ආණ්ඩුවක් විධියට අපි තව අය වැය 4ක් ඉදිරිපත් කරනවා. 4වැනි අය වැය ඉදිරිපත් කරනකොට ඔබ කාට කාටත් කටඋත්තර නැති වෙන විධියට, මේ රට කෙළින් හිටවපු, මේ රට නැඟිටිටවපු, ඉතාම සතුටුදායක පරිසරයක් ඇතුළේ ඒ අය වැය ඉදිරිපත් කරනවා. ඒ තැනට මේ රට අනිවාර්යයෙන්ම අපි ගේනවා. ඒ තැනට මේ රට ගේන්න අදාළ ශක්තිය අපට තිබෙනවා කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක සම්පත් මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද දවසේත් අපි එකතු වෙලා තිබෙන්නේ වත්මන් ආණ්ඩුවේ මංගල අය වැය ලේඛනය සම්බන්ධයෙන් විවාද කරන්නයි. අපි පළමුවෙන්ම විපක්ෂය විධියට ඒ අය වැය ලේඛනය ඉතාම සුබවාදීව දකිනවා. හැබැයි, අපි මේ අය වැය සුබවාදීව දකිනවා වාගේම අපි ඒ සම්බන්ධයෙන් එල්ල කරන විවේචනත්, විවේචන විධියටම දකින්න එපා කියන ඉල්ලීමත් කරනවා. ඒ විවේචන ඔබගේ අය වැය ලේඛනයේ ඉදිරි කටයුතු වෙනුවෙන්, ඉදිරි ප්‍රගමනය වෙනුවෙන් පාවිච්චි කරන්න උත්සාහ ගන්නවා නම් වටිනවා කියන කාරණයත් මේ මොහොතේ මා සිහිපත් කරනවා.

රාජ්‍ය සේවකයන්ගේ වැටුප පිළිබඳව අපි හැමෝම කථා කළා. පළමුවෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා, රාජ්‍ය සේවකයාගේ මූලික වැටුප වැඩි කිරීම සම්බන්ධයෙන්. ඒ පිළිබඳව අපේ යම් සතුටක් තිබෙනවා. හැබැයි ඔබ පසුගිය කාලයේ, ඔබ රජය භාර ගන්න පෙර ඔබේ වේදිකාවල රාජ්‍ය සේවකයන්ගේ වැටුප පිළිබඳව කථා කළේ කොහොමද කියන කාරණය පැහැදිලි කරන්න මම අමුතුවෙන් උත්සාහ ගන්නේ නැහැ. ඒ කාරණය පිළිබඳව රාජ්‍ය සේවක මහත්ම මහත්මීන් ඉන්නේ සතුටින් ද කියන කාරණය අපට ඔවුන්ගෙන්ම දැනගන්න ලැබෙයි, දකින්න ලැබෙයි, ඔවුන් අප්‍රේල් මාසයේ වැටුප ලබා ගන්නා දිනයේදී. එම නිසා මම ඒ පිළිබඳව මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ.

අපි පෞද්ගලික අංශයේ සේවය කරන මහත්ම මහත්මීන් පිළිබඳවත් කථා කරන්න ඕනෑ. ඔවුන්ගේ මූලික වැටුප රුපියල් 27,000කට ගෙනාවා කියලා අය වැය ලේඛනය තුළින් ඉදිරිපත් කළා. හැබැයි අපි විශ්වාස කරනවා, මේ රටේ ගොඩක් පෞද්ගලික ආයතනවල දැනට සේවය කරන මහත්ම මහත්මීන්ගේ මූලික වැටුප රුපියල් 27,000ක සීමාවේ තිබෙනවා කියලා. ඔබතුමන්ලා සඳහන් කළා, එම මූලික වැටුප 2026 වසරේදී රුපියල් 30,000 දක්වා ගෙන එනවා කියලා. හැබැයි, රුපියල් 27,000ක් කියන

[ගරු වානක මාදුගොඩ මහතා]

මූලික වැටුප පෞද්ගලික අංශයේ සේවක මහත්ම මහත්මීන්ට ප්‍රමාණවත් ද කියන කාරණය පිළිබඳව අපි ඔබෙන් විමසනවා. ඒ වාගේම අපට මතකයි, පසුගිය ආණ්ඩුව වතු සේවක මහත්ම මහත්මීන්ගේ දෛනික වැටුප රුපියල් 2,700 දක්වා ගෙන එන්න එකඟතා හඳාගෙන, කටයුතු කරමින් සිටි බව. නමුත්, මෙවර අය වැය ලේඛනයෙන් වතු සේවක මහත්ම මහත්මීන්ගේ දෛනික වැටුප රුපියල් 1,300 දක්වා පහළට රැගෙනවිත් තිබෙනවා. එම මුදල වතු සේවක මහත්ම මහත්මීන්ට ප්‍රමාණවත් ද කියන කාරණයත් මම මේ මොහොතේ මතක් කරනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලාට මතක ඇති, උපාධිධාරීන් කියන්නේ ඔබේ ආණ්ඩුව බලයට ගේන්න වැඩියෙන්ම කැප වුණු පිරිසක් බව. අද ඔවුන්ගේ ඒ විශ්වාසය, ඔබ ඔවුන් කෙරෙහි තබපු පොරොන්දු මේ අය වැය ලේඛනයේ තිබෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. මොකද, රැකියා 30,000 පිළිබඳව අය වැය ලේඛනයේ ඔබ සඳහන් කර තිබෙන්නේ හඳුනා ගත් විවිධ ක්ෂේත්‍ර සඳහා බඳවා ගැනීම් සිදු කරනවා කියන කාරණය පමණයි. නමුත්, උපාධිධාරීන් 20,000ක් ගුරු වෘත්තියටත්, විශේෂයෙන්ම රේගුව, වරාය ඇතුළු විවිධ ක්ෂේත්‍රවලට 35,000කුත් බඳවා ගන්නවාය කියා පසුගිය ජනාධිපතිවරණයේදී ඔබ උපාධිධාරී සංගම්වලට පොරොන්දුවක් ලබා දී තිබෙනවා. ඒ නිසා මේ මොහොත වනවිට ඒක දැවැන්ත ප්‍රශ්නයක් බවට මේ සමාජය තුළ ගොඩනැහෙමින් තිබෙනවා. ඒ පිළිබඳවත් මම මේ මොහොතේ ගරු සභාවට සිහිපත් කරනවා. ඒ කාරණා පිළිබඳව දීර්ඝව කථා කරන්න මම කාලය වැය කරන්නේ නැහැ.

ඔබට මතක ඇති, අපේ ආණ්ඩුව හම්බන්තොට සංවර්ධනය කරනකොට, අධිවේගී මාර්ග හදනකොට අද බලයේ ඉන්න ජනාධිපතිවරයා එදා විපක්ෂයේ කටයුතු කරමින් මොනවාද කිව්වේ කියලා. ඒ කාරණය පිළිබඳව මේ සමාජයට අමතක කරන්න බැහැ. එදා කිව්වා, රාජපක්ෂවරුන්ට ඇඹුල්තියල් ගෙනියන්න අධිවේගී මාර්ග හදනවා කියලා. අද අපි සතුටු වෙනවා, වත්මන් ජනාධිපතිවරයා තමන්ගේ ගම වන තඹුත්තේගමට යම් වැඩ කොටසක් කරන්න මේ අය වැය ලේඛනයෙන් මුදල් වෙන් කර තිබීම පිළිබඳව. ඒක වෙන්න ඕනෑ දෙයක්. රටේ ජනාධිපතිවරයා තමන් බලයට පත් කරපු, තමන් දේශපාලනයට ගෙනා ප්‍රදේශයේ ජනතාවට කෘතගුණ දැක්වීම වටිනා කාරණයක්. එතුමා විශේෂයෙන්ම තඹුත්තේගම දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යයනයට රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. අපි ඒවා අසුබවාදීව දකින්නේ නැහැ. ජනාධිපතිවරයෙක් විධියට රටට වග කියනවා වාගේම තමන්ගේ ප්‍රදේශයටත් යුතුකම් ඉටු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම අය වැය ලේඛනයේ අපි දැක්කා, වැවිලි ක්ෂේත්‍රය වෙනුවෙන් උතුරු පොල් ත්‍රිකෝණයේ වගාකරුවන්ට ඉහළ අස්වැන්නක් සහිත පොල් පැළ ලබා දීමට සහ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒක ඉතා හොඳ කාරණයක්. පසුගිය ආණ්ඩුව ආරම්භ කළ වැඩ පිළිවෙළක් තමයි, උතුරු පොල් ත්‍රිකෝණය. ඒක දිගුවක් විධියට ඉදිරියට ගෙනියන්න ඔබ සූදානම් වෙලා තිබෙනවා. ඒ සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන 500න් ඔබ බලාපොරොත්තු වන සංවර්ධනය කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. හැබැයි, ගැටලුව මෙකයි. වැවිලි ක්ෂේත්‍රයේ අනෙකුත් අපනයන භෝග සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 250යි. රුපියල් මිලියන 250ක මුදල ඒ සඳහා ප්‍රමාණවත් ද කියන කාරණය මේ අවස්ථාවේ කල්පනා කර බලන්න ඕනෑ.

මම නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් 90,000ක් ඉන්නවා. විශේෂයෙන්ම ගාල්ල දිස්ත්‍රික්කය කුරුඳු වගාවට ප්‍රචලිතයි. කුරුඳු වගාවේ නියැළෙන වැඩි පිරිසක් ගාල්ල ප්‍රදේශයේ ඉන්නවා. ඔබගේ අය වැය ලේඛනයෙන් කුඩා තේ වතු හිමියන්ට -කුරුඳු වගාව ඇතුළු අනෙකුත් වගාවන්ට- වෙන් කර ඇති රුපියල් මිලියන 250ක මුදල ප්‍රමාණවත්ද කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරනවා.

මේ ආණ්ඩුව මෙවර අය වැය ලේඛනයෙන් -මීට පෙර කථා කළ ගරු ඇමතිතුමාත් ඒ පිළිබඳව සිහිපත් කළා- ළමුන්ට ලබා දුන් දීමනා පිළිබඳව අපි සතුටු වනවා. ඒ හැම දෙයක්ම දිනා ගත්තේ පසුගිය ආණ්ඩුවල අය වැය ලේඛනවලින් කියන කාරණය ඔබට අමතක කරන්න බැහැ. වකුගඩු රෝගීන්ට දෙන දීමනාව, ළමා නිවාසවල සිටින ළමුන්ට ලබා දෙන දීමනාව, ශිෂ්‍යත්වය සමත් දරුවන්ට ලබා දෙන දීමනාව, අස්වැසුම ප්‍රතිලාභය, වැඩිහිටි දීමනාව ඇතුළු මේ කියන හැම දීමනාවක්ම මේ රටට දායාද කර දුන්නේ, මේ රටට දිනා දුන්නේ පසුගිය ආණ්ඩුයි කියන කාරණය අමතක කරමින් අපට මේ අය වැය කථාව ඉදිරියට ගෙනයන්න බැහැ. ඔබ ඊට එකතුවක් කර තිබෙනවා. ඒ, පසුගිය ආණ්ඩු මේ රටට ගෙනාපු සුබසාධන කටයුතුවලට ඔබ තව මුදලක් එකතු කිරීම. ඒ පිළිබඳව අපි සතුටු වනවාය කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම මතු කළ යුතු තවත් කරුණක් තිබෙනවා. මේ අය වැය ලේඛනයෙන් "ශ්‍රී ලාංකික දිනය" වෙනුවෙන් රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා. මම ඒ පිළිබඳව දීර්ඝව කථා කරන්න උත්සාහ ගන්නේ නැහැ. රුපියල් මිලියන 300ක් "ශ්‍රී ලාංකික දිනය" වෙනුවෙන් අය වැය ලේඛනයෙන් වෙන් කරනකොට ඔබේම වැඩසටහනක් වන Clean Sri Lanka වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීම තුළ තිබෙනවා, ජාතීන් අතර සමගිය ඇති කිරීම වෙනුවෙන් සියලු ජන කොටස්වලට එක්ව සතුටු විය හැකි වැඩසටහනක් වෙනුවෙනුත් මුදල් වෙන් කරනවාය කියලා. මම විශ්වාස කරන විධියට මේ වැඩසටහන් දෙකම එකක්. ජාතීන් අතර සමගිය ගැන කථා කරන මේ වෙලාවේ නැවත මේ උත්සාහ කරන්නේ ජාතීන් අතර අසමගියක් තිබෙනවාය කියලා ඉස්මතු කරන්නද කියලා අපට හිතෙනවා.

මම විශ්වාස කරනවා, අපි අතර එවැනි අසමගියක් නැහැ කියලා. අපි ගාල්ලේ හින්දු කෝවිලට, මුස්ලිම් පල්ලියට යනවා. අපේ සංස්කෘතික බැඳීම්, ආගම් බැඳීම් ගාල්ල තුළ අපි ඉතා හොඳින් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. අපි අමතක කරන්න ඕනෑකම තිබෙන ආගම් අතර, ජාතීන් අතර ඇති වන කාරණයක් නැවත මේ රට තුළ ඉස්මතු කරන්න උත්සාහ කරමින්, "ශ්‍රී ලාංකික දිනයක්" එහෙම නැත්නම් ඔවුන්ගේ හිත් සුවපත් කිරීමේ දිනයක් වෙනුවෙන් අමතරව මුදල් වැය කරන්න මෙවර අය වැය තුළින් යෝජනා කර තිබෙනවා. එසේ කරනවාට වඩා ඔවුන්ගේ ඒ ගැටලු වෙනුවෙන් - භාෂාමය ගැටලු වෙනුවෙන් වෙන්න පුළුවන්; පරිපාලනමය ගැටලු වෙනුවෙන් වෙන්න පුළුවන් - මේ අය වැය ලේඛනයෙන් වෙන් කරන එම මුදල යොදවන්න පුළුවන් නම් එය ඉතා වටිනවාය කියන කාරණය මම මේ මොහොතේ විශේෂයෙන් සිහිපත් කරනවා.

විශේෂයෙන්ම අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ඔබතුමන්ලා ඩිජිටල්කරණය පිළිබඳවත් සිහිපත් කළා. එය ඉතාම වැදගත් කාරණයක්. මම මේ කාරණා සන්සන්දනය කරන්න උත්සාහ කළත්, අපි මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ එකිනෙකාට චෝදනා කර ගන්න නොවෙයි කියන එකත් කියන්න ඕනෑ. නමුත්, හැමදාම එකිනෙකාට චෝදනා කර ගැනීම් තමයි අපි දකින්නේ. අපි එහෙම චෝදනා කර ගන්නේ නැතුව මේ අය වැය ලේඛනය ගැන කථා කරන්න උත්සාහ ගන්නවා. විශේෂයෙන්ම ඔබට මතක ඇති, ඩිජිටල්කරණය ගැන කියනකොට එදා විපක්ෂයේ හිටපු ඔබේ වත්මන් ජනාධිපතිවරයා ඉන්දියාවට දත්ත

ගෙනයන්න වැඩ කරනවාය කියූ බව. හැබැයි, එහෙම කියපු ජනාධිපතිවරයාම තමන්ගේ අය වැය ලේඛනයෙන් මෙවර ඩිජිටල්කරණයට මුදලක් වෙන් කර දීම පිළිබඳව අපි සතුටු වෙනවා. මේක රටේ අනාගතයට ඉතාම වැදගත් කාරණයක්.

ඒ වාගේම මම තවත් කාරණයක් මතක් කළ යුතුයි. උතුරට, නැඟෙනහිරට මුදල් වෙන් කරනකොට අපි නම්වලින් "උතුර" නැත්නම් "නැඟෙනහිර" කියන්න උත්සාහ ගත්තත්, මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, ඒක වෙනත් අර්ථයකට අරගෙන යන්න හදන්න එපා කියලා. උතුරද, දකුණද, නැඟෙනහිරද කියන කාරණයට වඩා මෙය අපි රටක් විධියට ශ්‍රී ලංකාව ගැන කථා කරන මොහොතක්. හැබැයි, ගාල්ලට මේ අය වැය ලේඛනයෙන් මුදලක් වෙන් වුණේ නැහැයි කියන කාරණය ගාල්ල නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මම සිහිපත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගාල්ලේ ජනතාවට දැවෙන ප්‍රශ්න තිබෙනවා. මහ ගාල්ල ජල යෝජනා ක්‍රමයේ දෙවන අදියර ක්‍රියාත්මක කරන්න වසර 15ක්, 20ක් තිස්සේ අපි උත්සාහ ගනිමින් ඉන්නවා. අද ගාල්ලට එන සංචාරකයන්ට වතුර නැහැ. ගාල්ලේ මිනිසුන්ට වතුර නැහැ. එම නිසා මේ අය වැය ලේඛනයෙන් ඒ සඳහාත් යම් මුදලක් වෙන් වුණා නම් හොඳයි කියන කාරණය ගාල්ල නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මම සිහිපත් කරනවා. ඒ වාගේම ගාල්ල වරාය සංවර්ධනයට, ගාල්ල මධ්‍යයේ යෝජිත මිශ්‍ර ව්‍යාපෘතියට, එමෙන්ම අබලන් තත්ත්වයේ පවතින එවකට ලංකාවේ දිගම පාලම වුණු වක්වැල්ල පාලමට මුදලක් වෙන් කළා නම් ඉතාම වටිනවා. ගාල්ලට මේ අය වැය ලේඛනයෙන් විශේෂ මුදලක් වෙන් කරලා නැහැ කියන කාරණය මම සිහිපත් කරන්නේ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙම අය වැය ලේඛනය පිළිබඳව කථා කළ යුතු කරුණු තව ගොඩක් තිබුණත්, වාහන ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න මම මේ මොහොත යොදා ගන්නවා. ඒ පිළිබඳව හැමදාම මේ සභාවේ කථා කරනවා. රදල පන්තියෙන්, එහෙම නැත්නම් රටේ සිටින ධනපති පන්තියෙන් සාමාන්‍ය ජනතාව අතරට, නැත්නම් මධ්‍යම පන්තියට බලය හුවමාරු වුණා කියලා අද කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, නමුත් සාමාන්‍ය ජනතාව අතට බලය හුවමාරු වෙලාද කියන කාරණය අපි මේ මොහොතේ විමසන්නට ඕනෑ. අද වාහනයක් නැති මන්ත්‍රීවරයෙකුට කොළඹට ඇවිල්ලා පාර්ලිමේන්තුවට එන්න වටපිටාවක් නැහැ. අපි මේවා කථා කරන්නේ මට වාහනයක් ලබා ගැනීම වෙනුවෙන් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පහළ පන්තියේ සාමාජිකයෙක්, මධ්‍යම පාන්තිකයෙක්, එහෙම නැත්නම් ජීවන ශක්තියක් නැති, ව්‍යාපාරික ශක්තියක් නැති, එහෙමත් නැත්නම් ධනවත්කමක් නැති මන්ත්‍රීවරයෙක් අනාගතයේ කවදා හෝ මේ පාර්ලිමේන්තුවට පත් වුණොත්, එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිත් කටයුතු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතුව තිබෙනවා. අද මේ රටේ ජනප්‍රිය මාතෘකාවක් විධියට අරගෙන තිබෙන වාහන ප්‍රශ්නය, අනාගතයේ කවදා හෝ දවසක මේ පාර්ලිමේන්තුව තුළ නැවත කථා කරාවි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එම නිසා මම පෞද්ගලිකව මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරන්න කැමතියි. මට ගාල්ලේ ඉඳලා බස් එකෙන් ඇවිල්ලා බහින්න පුළුවන්. හැබැයි, ගාල්ලේ ඉඳලා බස් එකෙන් ඇවිල්ලා බැස්සාම, ඒ බැහැපු තැන ඉඳලා පාර්ලිමේන්තුවට එන්න ක්‍රමවේදයක් අපට මේ පාර්ලිමේන්තුව තුළින් ලබා දෙනවා නම් වටිනවා. ඒ වාගේම ඔබ බලාපොරොත්තු වුණු, බස් එකෙන් පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරු නිර්මාණය කරන තැනට මේ පාර්ලිමේන්තුව අපට ගෙනියන්න පුළුවන්ය කියන කාරණයත් සිහිපත් කරමින්, විශේෂයෙන්ම මෙම අය වැය ලේඛනයේ සාධනීය කාරණා සාර්ථක කර ගන්න හැකි වේවා කියාත් මම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම ළිං ගැටිටේ ඉන්න කථාවක් ගරු ඇමතිතුමා කිව්වා. ළිං ගැටිටෙන් ළිඳට වැටෙන්නේ නැතුව අපේ ගෞරවනීය ජනතාව මතට බරක් පැටවෙන්නේ නැතිව, මිනිස්සු සතුටු වන, මිනිස්සු සුවපත් වන, රටට හොඳක් වන දේවල් මේ අය වැය ලේඛනය තුළින් අනාගතයේ දකින්න ලැබෙවා කියාත් ප්‍රාර්ථනා කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

ගරු සුජීව දිසානායක මහතා
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගයේ මංගල අය වැය දෙවැනි වර කියවීමේ විවාදයට සම්බන්ධ වීමට ඉඩ කඩ ලැබීම ඉතාම වටිනා අවස්ථාවක් ලෙස සලකනවා. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ඉඳන් 2025 මේ පාර්ලිමේන්තුව දක්වා ලංකාවට අය වැය ලේඛන ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. 1948 ඉඳන් 2025 දක්වා වූ කාලය; නිදහස ලබා ගෙවුණු අවුරුදු 77ක කාලය තුළ ඉදිරිපත් කළ අය වැය ලේඛන ගත්තොත්, වඩාත් හොඳ, ජනතාවගේ පැත්තෙන් හිතපු, පාලක පන්තියට කිසිදෙයක් නොලැබෙන ආකාරයේ, පුරවැසි අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ මෙවරයි කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන වගකීම තමයි රටේ අනාගතයට වාර්ෂික අය වැය ලේඛනය සකස් කිරීම සහ අතිරේක වැය ලේඛන සකස් කිරීම.

මේ සභාවේ මහජන ගැලරියේ මේ මොහොතේ ඉන්නවා අපේ රටේ අනාගතය බාර ගන්න ඉන්න දරුවන්. ආදරණීය දරුවනේ, ඔබ මතක තියා ගන්න ඔබලාට මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා ලාංකීය ඉතිහාසයේ එතෙක් මෙතෙක් වෙන් කරන ලද විශාලම මුදල් ප්‍රමාණය; බිලියන 619ක්. බිලියන 619ක වැය ශීර්ෂයක් වෙන් කරලා තිබෙනවා මේ රටේ අධ්‍යාපනය වෙනුවෙන්; මේ රටේ අනාගතය බාර ගන්න ඉන්නා ආදරණීය දරුවන් වෙනුවෙන්.

1931 ඉඳන් මේ දක්වා අපේ රට පාලනය කළ පාලකයන් පාරවල් හදන්න, ඉස්කෝල හදන්න, රැකියා දෙන්න, විදුලිය දෙන්න, බෙහෙත් දෙන්න විවිධාකාරයේ ක්‍රියාමාර්ග තේරුවා. හැබැයි පසුගිය අවුරුදු දෙකකට පිටුපස්සට ගියොත්, අපේ රට ලෝකයේ බංකොලොත් රාජ්‍යයක් වුණා, අසාර්ථක රාජ්‍යයක් වුණා. එහෙම වෙන්න හේතුව මොකක්ද? අවුරුදු 77කට ආසන්න කාලයක් මේ රට පාලනය කළ පාලකයන් මේ රට ඉදිරියට ගෙනාවා නම් රට එතැනට යන්නේ කොහොමද? මතක තියා ගන්න, මේ රටේ අධ්‍යාපනය, මේ රටේ ඉගෙනීම, කියවීම විනාශ කරන්න යම් උත්සාහයන් ගත් පාලක පන්තියක් අපේ රටේ සිටි බව. 1981 මැයි මාසයේ 31- ජූනි මාසයේ 01වෙනි දා අතර කාලය තුළ කලබල ඇති කරලා දකුණු ආසියාවේ විශාලතම පුස්තකාලය; පොත් පිටපත් 97,000ක් තිබුණු පුස්තකාලයට ගිනි

[ගරු සුජීව දිසානායක මහතා]

තැබුවා. ගාමිණිලා තුන්දෙනෙක් දකුණෙන් උතුරට ගිහිල්ලා, සංවර්ධන සභා ඡන්දය ඉලක්ක කරගෙන, මේ රටේ තිබුණු විශාලතම පුස්තකාලය විනාශ කළා. පේරාදෙණිය පුස්තකාලය හැරුණුවිට ශ්‍රී ලංකාවේ වැඩිම පොත් පිටපත් සංඛ්‍යාවක් තිබුණේ යාපනය පුස්තකාලයේ.

පසුගිය පෙබරවාරි 17වැනි දා අපේ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ඒ මංගල අය වැය මඟින් විශේෂයෙන් යාපනය පුස්තකාලය වැඩිදියුණු කිරීම වෙනුවෙන් සහ අපේ රටේ දරුවන් ඇතුළු පාඨක ජනතාව භාවිත කරන වෙනත් පුස්තකාල වෙනුවෙන් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2025 අය වැය කථාවේ 20වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"යාපනය සහ අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල වැඩිදියුණු කිරීම යාපනයේ සහ අවට දූපත්වල පාසල් සිසුන් ඇතුළු පාඨකයන් විශාල පිරිසක් යාපනය පුස්තකාලය භාවිත කරනවා. නමුත් මෙම පාඨකයන්ගේ ප්‍රයෝජනය සඳහා යටිතල පහසුකම් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය කර නැහැ. එම නිසා මෙම පුස්තකාලයට පරිගණක ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් ලබාදීමට මෙවර අයවැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා. ඊට අමතරව, අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල සංවර්ධනය සඳහා මෙම අයවැය යටතේ තවත් රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා."

අපි මේ රටේ අනාගතය ගොඩ නඟන ආණ්ඩුව. අවුරුදු 77ක් තිස්සේ පාලනය කළ පාලකයෝ අපේ රට අසාර්ථක රාජ්‍යයක්, බංකොලොත් රාජ්‍යයක් බවට පත් කරලා තිබුණා. ඒ බංකොලොත් වුණු රාජ්‍යය ඉස්සරහට ගෙනියන්න මේ රටේ ජනතාව අපට වගකීමක්, කාර්යභාරයක් පවරලා තිබෙනවා මේ රටේ ජනතාව. ඒ ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්, ඔවුන්ගේ කියැවීම වෙනුවෙන් අපි මැදිහත් වෙන්න ඕනෑ, ඒ වෙනුවෙන් වැඩ කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපේ අනුර දිසානායක ජනාධිපතිතුමා යාපනය පුස්තකාලය ඇතුළු වෙනත් පුස්තකාල වැඩිදියුණු කරන්න රුපියල් මිලියන 100ක් වෙන් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මතකයි මෑත ඉතිහාසයේ අවුරුදු 27කට ආසන්න කාලයක් අපේ රටේ බෙදුම්වාදී යුද්ධයක් තිබුණු බව. යාපනය පුස්තකාලය ගිනි තිබ්බ දවසේ එක ද්‍රවිඩ සහෝදරයෙක් ගිහිල්ලා ලියනවා, "මෙතැනින් පටන් ගන්නේ අපේ රටක් වෙනුවෙන්, අපේ ජාතිය වෙනුවෙන් රාජ්‍යයක් නිර්මාණය කිරීමේ සටන" කියලා. අධ්‍යාපනය විනාශ කිරීම තුළින් වුණේ ඒක. ඒ නිසා මේ රටේ හිටපු පාලක පන්තියට අපි කියනවා අධ්‍යාපනය විනාශ කරන්න එපා කියලා. ලාංකීය ඉතිහාසයේ වැඩිම මුදල් ප්‍රමාණය වූ රුපියල් බිලියන 619කට ආසන්න ප්‍රමාණයක් අධ්‍යාපනය වෙනුවෙන් අපි මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

පසුගිය කාලයේ හිටපු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා "Smart Youth" වෙනුවෙන් වෙන් කළා රුපියල් මිලියන 188ක්. ඡන්දය හෙට, අද වවුචර් 52ක් අත්සන් කරවනවා, සේවකයන් භය ගන්වලා, තර්ජනය කරලා, මාරු කරනවා කියලා. ඒ විධියට "Smart Youth" වැඩසටහනට වෙන් කරනවා, රුපියල් මිලියන 188ක්; හොරකම් කරනවා. ආදරණීය දරුවනේ, ඔබට වෙන් කරන්න තිබුණු රුපියල් 10, එහෙම හොරකම් කළා මේ පාලකයෝ.

ඊයේ-පෙරේදා දවසක COPE එකේදි හෙළිවෙනවා, ලක්ෂ 638ක් ප්‍රෞඪ ඉතිහාසයක් නඟා සිටුවන්න වෙන් කරගෙන කියලා. අපේ රටේ ජාතික අභිමානය නඟා සිටුවන්න ලු, එ් මුදල් වෙන් කළේ. ඒකට ලක්ෂ 638ක් වෙන් කර තිබෙනවා. හාඩ්වෙයාර් එකකින් ටී- ෂර්ට් ගහනවා. එහෙම පාලකයෝ, අධ්‍යාපනය ගැන කථා කරනවා. මේ රටේ ජනතාවගේ සල්ලි හොරකම් කළ, මේ රටේ දරුවන්ට වෙන් කරන්න තිබුණු මුදල් හොරකම් කළ, ඔවුන්ගේ ගෝලයන්ට, ඔවුන්ගේ හිතවතුන්ට හොරකම් කරන්න ඉඩ දුන්නු පාලනයක් තිබුණේ. ඒ පාලනය තමයි මේ රටේ ජනතාව අවසන් කළේ. මේ පාර්ලිමේන්තුවට අපේ පක්ෂයෙන් මහජන නියෝජිතයෝ 159දෙනෙක් එව්වේ ඒ වෙනුවෙන්. විශ්වවිද්‍යාල මහාචාර්යවරු, ආචාර්යවරු, ඉංජිනේරුවන්, පරිගණක ඉංජිනේරුවන්, ලක්ෂ 25, 30 වැටුප් ගත්ත මිනිස්සු මෙතැන ඉන්නවා. ඒ අය අද ශත පහක් ඉල්ලන්නේ නැහැ. එහෙම කැප කිරීම් කරලායි අපි ආවේ. එහෙම කැප කරලා ආපු මිනිස්සු විධියට තමයි මේ රටේ අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් වෙන් කරන්නේ.

මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා "ශ්‍රී ලාංකික දිනය" ගැන කිව්වා. ඇත්තටම මම ලැහැස්ති වෙලා ආවේ මේ රටේ "ශ්‍රී ලාංකික දිනය" පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න, කාගෙන්වත් අදහසක් ඉදිරිපත් නොවෙයි කියලා හිතලා. අපේ අනුර දිසානායක ජනාධිපතිතුමා අය වැය කථාවේ 40වන පිටුවේ 33 ඡේදය යටතේ "ශ්‍රී ලාංකික දිනය" ගැන මෙසේ සඳහන් කරනවා:

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති රාමුව, ප්‍රජාවන් අතර පරතරයන් පියවීමට කැප වී, සංහිඳියාවෙන් යුත් ශ්‍රී ලංකාවක් සඳහා දැක්මක් ඉදිරිපත් කරයි. එබැවින්, "ශ්‍රී ලාංකික දිනය" ජාතික උත්සවය පැවැත්වීමට මා යෝජනා කරනවා. මෙම උත්සවය පෞද්ගලික අංශයේ ද සහභාගිත්වයෙන් සංවර්ධනය කෙරේ. මේ සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ශ්‍රී ලංකාව කියන්නේ ආගමෙන්, භාෂාවෙන්, ජාතියෙන් විවිධ මිනිස්සු ජීවත් වෙන සුන්දර රටක්. ඒකට තවත් වටිනාකමක් එකතු කර තිබෙනවා, අපේ රටේ ස්වාභාවික පරිසරය. කඳු වැටි, දිය ඇලි ඒ වාගේම පෞරාණික රාජධානි, මේ විවිධ දේවල් අපේ රටේ තිබෙනවා. ලෝකයේ කිසිම රටක් අපේ රට වාගේ නැහැ. මේ රටේ කාන්තාර නැහැ; ගිනිකඳු නැහැ; මහා පරිමාණ නාය යාම් නැහැ; දරුණු ස්වාභාවික විපත් අපේ රටේ වෙන්නේ නැහැ. අපේ රට සමකයට ආසන්නයි. එහෙත් සෞම්‍ය දේශගුණයක් තිබෙනවා. රට මැද්දේ කඳුකරයක්; හතර පැත්තට වැටෙන ගංගාධාර -ගංගාධාර 103ක්- තිබෙනවා. අපේ රටේ මිනිස්සු එදා ඉඳන් එකට එකතු වෙලා හිටියේ.

ලාංකීය ඉතිහාසයේ කියැවෙන විජය රජ්ජුරුවෝ උතුරු ඉන්දියාවේ අයෙක්. එතුමාට ආර්ය ප්‍රභවයක් තිබුණේ. විජයගේ බිරිඳ විජායි, දකුණු ඉන්දියාවේ තම්ල්නාඩුවේ. එතැනින් පටන් ගත්තා සංහිඳියාව. අපේ රට පාලනය කරපු පාලකයෝ අවුරුදු 77ක් මොකක්ද කළේ? ඒ සංහිඳියාව එකින් එක, එකින් එක බින්දා. 1956දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කළා. දෙමළ මනුෂ්‍යයා ඉන්න, මුස්ලිම් මනුෂ්‍යයා ඉන්න රටේ ජාතිවාදය ඇවිස්සුවා, 1956 ඉඳන්. සුද්දා 1833 ඉඳන් ඇවිස්සුවා. ජාතීන් අනුව බෙදුවා. සිංහල, දෙමළ, බර්ගර් ජාතිකයන් විතරයි 1833 ව්‍යවස්ථාදායකය නියෝජනය කළේ. සුද්දා මුස්ලිම් ජනතාවට කිසිදු අවස්ථාවක් දුන්නේ නැහැ.

1956 ඉඳන් මේ රටේ ජාතිවාදය වැපිරුවා. ඒ ජාතිවාදයේ එක් අවස්ථාවක් තමයි, 1981 සංවර්ධන සභා ඡන්දයට ගිහිල්ලා මේ රටේ තිබුණු ලොකුම පුස්තකාලයට ගිනි තියපු එක. එතකොට අපේ රටේ සිංහල ජනතාව සියයට 75ක්, ශ්‍රී ලාංකික ද්‍රවිඩ ජනතාව

සියයට 12ක්, ඉන්දියානු ද්‍රවිඩ ජනතාව සියයට 4ක්, මුස්ලිම් ජාතිකයන් සියයට 9ක්, මැලේ, බර්ගර්, වැදි ආදී විවිධ ජන කොටස් ඉන්නවා. අපේ රට සුන්දර රටක්. ඔවුන්ටම ආවේණික වෙච්ච සංස්කෘතික උත්සව, හැමෝම එකට එකතු වෙලා සමරනවා. විශේෂයෙන් සිංහල - හින්දු අලුත් අවුරුද්ද සිංහල ජනතාව, හින්දු ජනතාව එකට සමරන උත්සවයක්. ඒක අපේ රටේ සංස්කෘතිය. විජයබාහු රජ්ජුරුවන්ගේ කාලයේ ඉඳන් සිංහල අවුරුද්ද සැමරුවා කියලා පෙන්වන්න සාක්ෂි තිබෙනවා, ඉතිහාසගත ලේඛනවල. ඒ වාගේම මහා ශිව රාත්‍රී දිනය, රාමසාන් දිනය, හජ් වන්දනාව, වෙසක්, පොසොන්, ඇසළ ආගමික උත්සව පවත්වන රටක්, මෙක. එහෙම රටකට මොකක්ද කළේ?

මේ රටේ කතෝලිකයන්ගේ ශුද්ධ දිනයක්, පාස්කු ඉරිදා දිනය. තමන්ගේ බලය වෙනුවෙන් ඒ ශුද්ධ වූ දිනය කේන්ද්‍ර කරගෙන මිනිස්සු 350කට වඩා මරලා බලයට ආවා සමහරු. එතැනින් බෙදීමක් ඇති වුණා. මතක ද ඔබතුමන්ලාට, මෙහි හිටපු ඇතැම් නායකයෝ ගර්භාෂ යුද්ධ ගැන කථා කෙරුවා? මම නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල මහ රෝහලේ හිටපු වෛද්‍යවරයෙක් කාන්තාවන්ගේ පැලෝපීය නාළය damage කරලා ඔවුන් වඳ කරන්න කටයුතු කළා කියලායි කිව්වේ. එතැනට හදපු ජාතිවාදය වෙනස් කරන්න ඕනෑ; ආගම්වාදය වෙනස් කරන්න ඕනෑ.

අපි ඔක්කෝම එකම රටේ මිනිස්සු. ලංකාව සුන්දර රටක්. ලෝකයේ විවිධ ජාතීන් මේ රට විවිධ ආකාරයෙන් හැඳින්වුවා. මේක, "රත්නදීපයක්". මේක, මැණික් රටක්. ඉතිහාසයේ චීන ජාතිකයන් මේ රට දැක්කේ එහෙමයි. හියුං සියැං හාමුදුරුවෝ, පාහියන් හාමුදුරුවෝ තමන් වහන්සේලාගේ පොත්වල අපේ රට හැඳින්වූයේ, "රත්නදීප" කියලා. අරාබි ජාතිකයන් ශ්‍රී ලංකාව හැඳින්වූයේ, "සෙරන්ඩිබ්" කියලා. මිහිබට සුරපුරය, ඕජදීප, වරදීප, මණ්ඩදීප, සිහලදීප, තැප්‍රොබේන්, තම්බපණ්ණි, සිලෝන්, සෙයිලාන් කියන නම්වලිනුයි අපේ රට හැඳින්වූයේ. අපේ රටට කියා තිබෙන නම් ටික ගත්තොත්, ලෝකයේ එහෙම හඳුන්වපු වෙනත් එක රටක්වත් නැහැ. එහෙම රටක තමයි ජාතිවාදය වැපිරුවේ; ආගම්වාදය වැපිරුවේ; මිනිසුන් බෙදා වෙන් කළේ. අන්න ඒ වෙන් වුණු, තැළිච්ච, තුවාල වෙච්ච හදවත් සුවපත් කරන්න තමයි, මේ අය වැයෙන් "ශ්‍රී ලාංකික දිනයක්" යෝජනා කර තිබෙන්නේ. අපි කියනවා, අපට ශ්‍රී ලාංකික දිනයක් ඕනෑ කියලා. ශ්‍රී ලංකාවට brand එකක් ඕනෑ. ඒක මතක තබා ගන්න. ජපානයේ තිබෙනවා, "ටොයොටා". ඉන්දියාවට තිබෙනවා, "බජාජ්". ඇයි අපට brand එකක් නැත්තේ? අපේ රටේ brand එක අනිවාර්යයෙන්, ලංකාවේ භූමියයි. මේ භූමියට අපි සංචාරකයන් ආකර්ෂණය කරවා ගන්න ඕනෑ. මේ භූමියේ සංහිඳියාව හදන්න ඕනෑ; ජාතීන් අතර සමගිය ඇති කරන්න ඕනෑ. ආගම් අතර සහජීවනය නිර්මාණය වෙන්න ඕනෑ. එහෙම වුණොත් ලෝකයේ විවිධ රටවල සංචාරකයන් මේ රටට එයි.

මේ රට පාලනය කරපු පාලකයෝ අපෙන් අහනවා, "කොහොමද අය වැය පරතරය පියවා ගන්නේ?" කියලා. මතක තබා ගන්න, ලංකාවට එන විදේශීය ජාතිකයෙකුගෙන් ඩොලර් 500ක්, 600ක් අපේ රටට ගන්න පුළුවන් නම්, අන්න එය ආදායම් උපයන මාර්ගයක්. අපේ ඉලක්කය, 2025දී සංචාරකයන් ලක්ෂ 30ක්. ඒ එක් මනුස්සයකුට ඩොලර් 500ක් අපේ රට තුළ වියදම් කරන්න පුළුවන් නම්, අන්න එය අපේ රට තුළ ආදායම් උපයන්න පුළුවන් මාර්ගයක්. එහෙමයි මේ ආර්ථිකය නිර්මාණය වෙන්නේ. වැය විතරක් නොවෙයි. එදා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ අය වැය කථාවයි. අය වැය ඇස්තමේන්තුව මෙහි තිබෙනවා. වියදම් සහ ආදායම් තත්ත්වය එහි සඳහන් වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි කඩා වැටුණු මේ රට හදන්න ඕනෑ. අපට බලය දුන්නේ ඒකට. 159ක බහුතර බලයක්, තුනෙන් දෙකකට එහා බලයක් ජනතාව අපට ලබා දුන්නා. එම නිසා අපි මේ රට නිර්මාණය කරනවා; අපි මේ රට හදනවා. ඒ හදන්නේ අපේ රටේ අනාගතය භාර ගන්න සිටින ආදරණීය දූ දරුවන් වෙනුවෙන් බව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ලුතිනන් කමාන්ඩර් ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.50]

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මුලින්ම ගරු වානක මාදුගොඩ මන්ත්‍රීතුමාට පිළිතුරක් දීලා මගේ කථාව පටන් ගන්න කැමැතියි. එතුමා ප්‍රකාශ කළා, අතිගරු ජනාධිපතිතුමා තමන්ගේ ගමේ, Thambuththegama Railway Station එක පාදක කරගෙන ශක්‍යතා අධ්‍යයනයක් කරන්න විශාල මුදලක් වෙන් කර තිබෙනවා කියලා. ඇත්තටම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, Thambuththegama Railway Station එක කියන්නේ ආර්ථික මධ්‍යස්ථානයක් ළඟම තිබෙන දුම්රිය ස්ථානයක්. අය වැයෙන් එම වෙන් කිරීම කරලා තිබෙන්නේ, කෘෂිකාර්මික නිෂ්පාදන දුම්රිය ඔස්සේ ප්‍රවාහනය කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කරන්නයි. අපි දන්නවා, තඹුත්තේගම ප්‍රදේශයේ පිහිටි තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය කියන්නේ කෘෂිකාර්මික නිෂ්පාදන එන කේන්ද්‍රස්ථානයක් බව. කෘෂි කාර්මික නිෂ්පාදන මහාමාර්ග ඔස්සේ ප්‍රවාහනය කරද්දී විශාල වශයෙන් පසු අස්වනු හානියක් සිදු වෙනවා. නමුත්, ඒවා දුම්රිය මඟින් ප්‍රවාහනය කරද්දී පසු අස්වනු හානිය අවම කරන්න අපට පුළුවන්. ඒ කියන්නේ, අස්වනු අඩු වීම එමඟින් ද පාලනය කර ගන්න අපට පුළුවන්. කොළඹ, මාතර ඇතුළුව රට වටේටම දුම්රිය මාර්ග ඔස්සේ කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනය කිරීමට ඇති හැකියාව තමයි සොයා බලන්නේ. එතකොට අපට එකී භාණ්ඩවල මිල අඩු කර ගන්න, මාර්ග තදබදය අඩු කර ගන්න පුළුවන්. අය වැයෙන් එම මුදල් වෙන් කිරීම නිකම්ම කළ දෙයක් නොවෙයි. දුම්රියෙන් කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනයේදී අපට ලැබෙන strengths මොනවා ද, එහි තිබෙන weaknesses මොනවා ද, එය කළාම අපට ලැබෙන opportunities මොනවා ද, අපට තිබෙන threats මොනවා ද කියලා SWOT analysis එකක් ආදිය කරලා ශක්‍යතා අධ්‍යයනයක් කරන්න තමයි එම මුදල් වෙන් කිරීම කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පෙරේදා මහාධිකරණයේ වූ සිදුවීම ගැන කිහිප දෙනෙක් අදහස් දැක්වූවා; ජාතික ආරක්ෂාවට යම්කිසි බලපෑමක් වෙලා තිබෙන බව කිව්වා. හැබැයි මම අහන්න කැමතියි, මිලේනියම් සිටිවල ස්ථානගත කරලා සිටි බුද්ධි අංශ කිසිම සොයා බැලීමකින් තොරව සමාජයට විවරණය කරද්දී ජාතික ආරක්ෂාව ගැන හිතුවාද කියලා.

සමහර වෙලාවට ත්‍රිවිධ හමුදාවල ඉන්න පුද්ගලයන් කොළඹ ආදි ප්‍රදේශවලට සේවා ස්ථාන මාරුවක් අරගෙන එන්නේ පෞද්ගලික, අතිශය සානුකම්පික හේතූන් මත කර ගත යුතු වැඩ රාජකාරි කර ගන්නයි. පසුගිය කාලවල සිටි පාලකයන්ගේ සමහර

[ගරු ප්‍රගීත් මධුරංග මහතා]

පුත්‍ර කුමාරවරුන්ගේ rugger matches තිබුණේ සෙනසුරාදාට, ඉරිදාට. සෙනසුරාදා, ඉරිදා තිබෙන ඒ rugger matchesවලට කට්ටිය උද්‍යෝගීමත් කරන්න cheer කරන්න සිකුරාදා ඉඳන් තමයි cheering parties දාලා ලැහැස්ති වුණේ. එතකොට හමුදාවල හිටපු, පොලීසියේ හිටපු කට්ටියගේ මානසික ඒකාග්‍රතාව, තමන්ගේ රැකියාව පිළිබඳව තිබෙන අභිමානය බිඳුණේ නැද්ද? ඒ තුළින් ජාතික ආරක්ෂාවට හානියක් වුණේ නැද්ද? මට මතකයි, එක කාලයක canal party කියලා කානු ශුද්ධ කරන්න පමණක් යොදවපු පිරිසක් සිටි බව. එතකොට ජාතික ආරක්ෂාවට හානියක් වුණේ නැද්ද? මෙය ජාතික ආරක්ෂාව ඇතුළේ තිබෙන මහජන ආරක්ෂාව සම්බන්ධ සිදුවීමක්. නමුත් මේක අපි ලඝු කොට තකන්නේ නැහැ. මේ වෙද්දී ඒ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබෙනවා. මේ වාගේ සිදුවීම් ලෝකයේ සමහර රටවලත් සිදු වෙලා තිබෙනවා. ලෝකයේ සමහර දියුණු රටවල, ජාතික ආරක්ෂාව හොඳින්ම තිබෙන රටවල පවා මානසික ආතතියෙන් පෙළෙන පුද්ගලයන් සමහර වෙලාවට ගුවන් තොටුපළවල, මහ පාරේ වාහන අනතුරු සිදු කරලා, එහෙම නැත්නම් මෙවැනි වෙඩි තැබීම් කරලා පුද්ගල ඝාතන විශාල වශයෙන් සිදු කරලා තිබෙනවා. මෙම සිදුවීම නිසා ජාතික ආරක්ෂාව බිඳ වැටීමක් කිසි ලෙසකින්වත් වෙන්නේ නැහැ. ජාතික ආරක්ෂාවට හානියක් වෙන්න ජාතික ජන බලවේගය රජය ඉඩ තියන්නෙත් නැහැ; ඉඩ තියලාත් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ අය වැය ගැන කථා කළොත්, මේ අය වැයෙන් ජාතික ආරක්ෂාව වෙනුවෙන් රුපියල් බිලියන 404ක් වෙන් කරලා තිබෙනවා. විපක්ෂයේ ඉන්න සමහර මන්ත්‍රීවරු කියනවා, ජාතික ආරක්ෂාවට වෙන් කරලා තිබෙන මුදල අඩුයි කියලා. ජාතික ආරක්ෂාව අඩු වෙන්නේ නැහැ, ඒ වෙන් කරපු මුදල අඩුයි කියලා කිව්වාට. PSD එකට, MSD එකට එක එක අයගේ මාළිගා ආරක්ෂා කරන්න, තනි පුද්ගලයන් ආරක්ෂා කරන්න, පොල් වතු රකින්න, පොල් කඩන්න, බල්ලෝ නාවන්න, බල්ලෝ බලා ගන්න වාගේ ඒවාට තමයි වෙනදා අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලා තිබුණේ. ඒ ටික අඩු කළාම තමයි වෙන් කරපු මුදල අඩු වෙලා වාගේ පෙනෙන්නේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මා කියන්න කැමතියි, ඒ රුපියල් බිලියන 404 මොනවාට ද වෙන් කරලා තිබෙන්නේ කියලා "අය වැය ඇස්තමේන්තුව 2025" කියන පොතේ සඳහන් කරලා තිබෙන බව. ලබන අවුරුද්ද තුළ Y-12 සැහැල්ලු ප්‍රවාහන ගුවන් යානා දෙකක් මිල දී ගැනීම, ඇමෙරිකාවේ නිෂ්පාදිත නෞකාවක් ගැනීම වාගේ ඉතාම සාධනීය කරුණුවලට ජාතික ආරක්ෂාව වෙනුවෙන් මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. කරුණාකර "අය වැය ඇස්තමේන්තුව 2025" කියවන්න. මෙම අය වැයෙන් ජාතික ආරක්ෂාවට කිසිම අඩුවක් වෙන්නේ නැහැ. පසුගිය රජයන් කරපු නාස්තිය, දූෂණය, අවභාවිතය නොකරන අපේ රජය ඒවා සිදු නොකර ඉතිරි කර ගත්තු මුදල් තමයි මෙහිදී අඩු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2016 වසරේ මේ රටේ දරිද්‍රතාව සියයට 4ට තිබුණේ. නමුත් අර්බුදය තුළින් ඇති කළ දරිද්‍රතාව, එහෙම නැත්නම් crisis-driven poverty, 2023 වෙද්දී සියයට 25.9ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ස්වෛරීත්ව ණය පැහැර හැරීමට ලක් වූ රටවල් දරිද්‍රතාව සම්බන්ධව දිගු කාලයක් තිස්සේ ඉතාම දරුණු අත්දැකීම්වලට මුහුණ පානවා. නමුත් ජාතික ජන බලවේගය රජය තුළ නිසි මුදල් කළමනාකරණය, වගකීමෙන් යුතු ණය කළමනාකරණය, ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාල පද්ධති ඇති කිරීම, ව්‍යවසායකත්වය, නව ව්‍යාපාර ඇරඹීම සඳහා පහසුකම් සැලසීම, අප කරගෙන යන දූෂණ විරෝධී ක්‍රියාමාර්ග, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය මඟින් ලංකා ආර්ථිකයෙහි පරිවර්තනීය වෙනසක් ඇති කරන්න අපි බලාපොරොත්තු වෙනවා. රටක් දරිද්‍රතාවෙන් මිදීමට නම් ඒ රටට යම්කිසි ආර්ථික වර්ධන වේගයක් අවශ්‍ය වෙනවා. නමුත්, ඍණ මට්ටමක පැවැති ලංකාවේ ආර්ථික වර්ධන වේගය ධන ආර්ථික වර්ධන වේගයක් බවට පත් කරලා සියයට 5ක වර්ධන වේගයක් ලබා ගන්නට අපි මේ වර්ෂය තුළ බලාපොරොත්තු වෙනවා.

ඒත් එක්කම, මම මීට කලින් කියපු crisis-driven poverty හේතුවෙන්, එහෙම නැත්නම් මේ අර්බුදය තුළින් ඇති කරපු තත්ත්වය හේතුවෙන් දරිද්‍රතාවට පත් වුණු ජනතාවට ජීවත් වෙන්න අවස්ථාවක් අපි ලබා දෙන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ සඳහා 2025දී රුපියල් බිලියන 232.5ක මුදලක් සමාජ ආරක්ෂණය වෙනුවෙන් වෙන් කර තිබෙනවා. එහිදී දුප්පත් කියන සමාජ කාණ්ඩය වෙනුවෙන් අස්වැසුම ප්‍රතිලාභ වශයෙන් ලබා දුන් රුපියල් 8,500ක මුදල රුපියල් 10,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම අන්ත දුප්පත් කියන කාණ්ඩය වෙනුවෙන් වෙන් කර තිබුණු රුපියල් 15,000 දීමනාව රුපියල් 17,500 දක්වා වැඩි කර තිබෙනවා, 2025 ජනවාරි ඉඳලා. නමුත් මේ අස්වැසුම වැනි සමාජ ආරක්ෂණ දීමනා දිගින් දිගටම ලබා දෙනවාට වඩා, අපි තිරසාර වෙනසක් සඳහා සමාජ සවිබලගැන්වීමක් කරන්න අවශ්‍යයි. මොකද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සිදු කර තිබුණු ආර්ථික කඩා වැටීම තුළ සමහර වෙලාවට ජනතාව දුප්පත් වෙලා අස්වැසුම ගන්නා තත්ත්වයට පත් වෙලා ඉන්න පුළුවන්. කුකුළු ගොවිපොළක් කරපු කෙනෙක් මේ ආර්ථික කඩා වැටීම තුළ දුප්පත් වෙලා තිබෙන්න පුළුවන්. ඒ වාගේ කෙනෙකුට නැවත ඒ ව්‍යාපාරය ආරම්භ කරන්න අවශ්‍ය මූලික ප්‍රාග්ධනය ලබා දෙන්න අපට පුළුවන් නම්, ඔහු ඒ දුප්පත්කමින් මුදා ගන්න අපට පුළුවන්. අන්න ඒ සඳහා, ඒ කියන්නේ සමාජය සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අපි රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. 2025.03.31 දින වනවිට අස්වැසුම ගෙවීම් අවසන් කරන්නට තිබුණු අන්ත දුප්පත් තලයට නොවැටුණු නමුත් සංක්‍රාන්ති මට්ටමේ හිටපු දුප්පත් කණ්ඩායමට අදාළ ගෙවීම් කාල සීමාව 2025.04.30 දක්වා දීර්ඝ කරන්න යෝජනා කර තිබෙනවා. එමෙන්ම, අස්වැසුම වැඩ පිළිවෙළ සඳහා ඇතුළත්වීමට සුදුසුකම් ලබා තිබෙන අය සඳහා තවත් අවස්ථාවක් ලබා දීලා තිබෙනවා, එම සමාජ ආරක්ෂණ පද්ධතියට ඇතුළත් වෙන්න. අපි බලාපොරොත්තු වෙනවා, 2025 මැයි මාසයේදී ඒ අලුත් පිරිස එම වැඩසටහනට එකතු කරගන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටක ආර්ථික වර්ධනය සඳහා, රටක දියුණුව සඳහා, දරිද්‍රතාව අඩු කිරීම සඳහා අපට යහපත් මානසිකත්වයකින්, යහපත් සෞඛ්‍යයකින්, යහපත් කායික ශක්තියකින් හෙබි ශ්‍රම බලකායක් අවශ්‍යයි. දීර්ඝ කාලීනව එවැනි ශ්‍රම බලකායක් ඇති කිරීම සඳහා නිදහස් සෞඛ්‍ය සේවාව, නිදහස් අධ්‍යාපනය සඳහා මුදල් වෙන් කිරීම අවශ්‍ය වෙනවා. ඒ අනුව අපි සෞඛ්‍ය සේවාව සඳහා රුපියල් බිලියන 604ක්, 2025 අය වැය තුළින් වෙන් කර තිබෙනවා. එසේ කර තිබෙන්නේ මානසිකව, කායිකව ශක්තිමත්, දියුණු ශ්‍රම බලකායක් ඉදිරියේදී ශ්‍රී ලංකාව තුළ ඇති කරන්නයි. ඒ වාගේම අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 619ක් වෙන් කර තිබෙනවා, දැනුමෙන්, කුසලතාවෙන්, ආකල්පවලින් පිරිපුන් ශ්‍රම බලකායක් ඇති කරන්න. අධ්‍යාපනයට, සෞඛ්‍යයට වෙන් කරන මේ මුදල්වලින් අපට හෙට ප්‍රතිඵල නොලැබුණාට, ඒ තුළින් තව අවුරුදු 5ක්, 10ක් යද්දී අපේ ශ්‍රම බලකාය ඉතාම ශක්තිමත් ශ්‍රම බලකායක් බවට පත් කර ගැනීමට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම රටක දරිද්‍රතාව අඩු කරන්නට, රටට සෘජු විදෙස් ආයෝජන අවශ්‍ය වෙනවා. ආසියාතික රටක් විධියට පසුගිය කාලයේ ශ්‍රී ලංකාවට සෘජු විදෙස් ආයෝජන ලැබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. වංචාව, දූෂණය පැවතීම, ආයෝජකයින් අපේ රටට එද්දී ඒ අයගෙන් කොමිස් ඉල්ලීම, එක එක පුද්ගලයන් ඒවායේ ලාභාංශ ඉල්ලීම වැනි දේවල් නිසා තමයි අපට සෘජු විදෙස් ආයෝජන නොලැබුණේ. නමුත් ආයෝජන සඳහා පෞද්ගලිකව කිසිම මැදිහත්වීමක් කරන්නේ නැතිව, රටේ අවශ්‍යතාව සඳහා, නිෂ්පාදන ආර්ථිකයක් සඳහා වැඩකටයුතු කරන බැවින් ජාතික ජන බලවේග රජයේ අපට සෘජු විදෙස් ආයෝජන ලංකාවට ලබා ගන්නට පුළුවන්.

මේ වෙද්දී ජාත්‍යන්තරය පවා පිළිගෙන තිබෙනවා, දූෂණය, වංචාව, නාස්තිය, අවභාවිතයෙන් තොර රජයක් තමයි මේ පත් වෙලා තිබෙන්නේ කියලා.

අවසන් වශයෙන්, අපි පොරොන්දු වෙච්ච ආකාරයට යහපත් රටක්, ලස්සන රටක්, පොහොසත් රටක් හදනවා. ඒ පොහොසත් රට තුළ ඉපදිලා, ඒ රටේ ප්‍රධාන පුරවැසියා බවට ඉදලා ඒ රට අතහැර වෙනත් රටකට යන්නේ නැතුව ඒ රටේම ජීවත් වෙන්න අවස්ථාව සලසා දීලා ලස්සන ජීවිතයක් ගත කිරීමේ අවස්ථාව අපේ ශ්‍රී ලාංකික පුරවැසියාට නිර්මාණය කර දෙනවා. ඒ සඳහා 2025 වසර සඳහා ඉදිරිපත් කරන ලද මේ අය වැය ඉතාම සාධනීය අය වැයක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.04]

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙච්චර කාලයක් මේ රට පාලනය කරපු පාලකයෝ රාජ්‍ය මුදල් පරිහරණය කළේ කොහොමද කියලා අපි දන්නවා. ඒගොල්ලන් රාජ්‍ය මුදල් පරිහරණය කළේ ඔවුන්ගේ පවුල්වල බූදලයක් විධියට. ඒ පාලකයන් වටා ඉන්න කණ්ඩායම්වලට සුඛ විහරණ ලබා දෙන්න අවශ්‍ය බූදලයක් විධියටයි මෙච්චර කාලයක් මේ රටේ මුදල් මේ පාලකයන් පාවිච්චි කළේ. එහි අන්තිම ප්‍රතිඵලය තමයි උපදින දරුවා පවා ලක්ෂ ගණනක ණයකරුවෙක් කරවන රාජ්‍යයක් බිහි කරපු එක. මේ මිනිස්සු කවුරුවත් ලයිට් බිල නොගෙවා ඉඳලා නැහැ. වතුර බිල නොගෙවා ඉඳලා නැහැ. හොරෙන් බස් එකේ ගිහිල්ලා නැහැ. හොරෙන් තෙල් ගහලා නැහැ. හැබැයි, ඒ අය ණයකරුවන් වෙලා තිබෙනවා. අපේ රට සම්පත් බහුල රටක්. අපේ රටේ විශාල ස්වාභාවික ආපදා නැහැ. එහෙත්, අපේ රටේ තනි තනි මිනිස්සුත් ණයකරුවන් වෙලා තිබෙනවා. අපේ රටේ සාමාන්‍ය මිනිස්සු ණයකරුවන් වුණාට, අපේ රට දුප්පත් වුණාට, මේ රටේ හිටපු දේශපාලනඥයන් පොහොසත්. දේශපාලනඥයන් තරු පහේ හතේ හෝටල්වලින් කද්දී ඡන්දදායකයන් මන්දපෝෂණයෙන් පෙළෙනවා. විශේෂයෙන්ම මාතෘ මන්දපෝෂණය, ළමා මන්ද පෝෂණය වේගයෙන් ඉහළ ගිය රටක්, මේක. දේශපාලනඥයන් ලංකාවේ තිබෙන හොඳම රෝහල්වලින් ඖෂධ ගනිද්දී, ලෝකයේ තිබෙන හොඳම රෝහල්වලට ඒ සඳහා යද්දී ඡන්දදායකන් OPD එකේ පෝලිමේ ඉන්නවා. ඔවුන්ට ඖෂධ ගැන විශ්වාසයක් නැති වෙලා තිබෙනවා. දේශපාලනඥයන්ගේ පුත්තු ලංකාවේ තිබෙන හොඳම පාසල්වලට යද්දී, ලෝකයේ තිබෙන හොඳම විශ්වවිද්‍යාලවලට යද්දී අපේ රටේ නගරයේ පාසල් හා ගමේ පාසල් අතර විශාල විෂමතාවක් නිර්මාණය වෙලා තිබෙනවා. අවුරුදු හතරක, පහක කාලයක් තුළ දේශපාලනඥයන් තට්ටු පහේ හයේ ගෙවල් හදද්දී, ඡන්දදායකයන් ගෙයක් හදන්න පටන් ගත්තොත් මැරෙනකල්ම ඒ ගේ හදනවා. නමුත්, ඒ ගේ හදාගෙන ඉවර කරගන්න වෙන්නේ නැහැ. එහෙම නැත්නම් පරම්පරාවක්, දෙකක් ඒ ගේ හදනවා. දේශපාලනඥයන් ලෝකයේ තිබෙන සැපම වාහනවල යද්දී ඡන්දදායකයන්ට පදින්න වාහන ගෙන්වන්නෙත් නැහැ. අපේ දිස්ත්‍රික්කයේ ඉන්න මිනිස්සු නම් දන්නවා, යන වාහනවල ස්වරූපයෙන්, යන වාහනවල ප්‍රමාණයෙන් ඒ යන්නේ තාත්තාද, පුතාද, බාප්පාද, ලේලිද, නෝනලාද කියලා. දේශපාලනඥයන් හැසිරුණේ එහෙමයි. ඒගොල්ලන් වටේ හිටපු කණ්ඩායම් විශාල ව්‍යාපාරවල හිමිකරුවන් බවට පත් වුණා. හැබැයි, ඡන්දදායකයන් පාර ඉස්සරහ ආප්ප කඩයක් පටන් ගත්තොත්, ව්‍යාපාරයක් කළොත් ඒක කඩාගෙන වැටෙනවා. එහෙම තත්ත්වයක් තමයි උදා වෙලා තිබුණේ. සාමාන්‍ය මිනිස්සු වැටුප ගන්නකොටත් ණය වෙලා. පසුගිය දවස්වල අධිකරණය ඉස්සරහ හෙළි වුණා හිටපු ජනාධිපති පුත්තු අවුරුදු පහ, දහය තිස්සේ තමන්ගේ වැටුප අරගෙන නැහැ කියලා. හැබැයි, ඒගොල්ලන් ගෙවපු සැපවත් ජීවිත ගැන අපි හැමෝම දන්නවා. දේශපාලනඥයන්ගේ භාර්යාවන් රත්‍රන්වලින් සිරුරු වහ ගනිද්දී අහිංසක ගොවීන්ගේ කන කර බඩු තිබුණේ බැංකුවල. ඒ නිසා මේ රට පාලනය කරපු දේශපාලනඥයන් හා ඒගොල්ලන්ට ඡන්ද දීපු ඡන්දදායකයන් අතර විශාල පරතරයක් නිර්මාණය වුණා. එහෙම වුණේ මෙච්චර කාලයක් මේ දේශපාලනඥයෝ රටේ බදු මුදල් ටික, රටේ ධනය තමන්ගේ සහ තමන් වටා ඉන්න කල්ලියකගේ සුඛ විහරණයට භාවිත කරපු නිසා. නමුත් මම හිතන විධියට ලංකා ඉතිහාසයේ පළමු වතාවට තමයි ලංකාවේ හැම ස්තරයක්ම නියෝජනය කරන, ලංකාවේ හැම ස්තරයකම අවශ්‍යතා ඉටු කරන මෙවැනි අය වැයක් යෝජනා වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, එතෙක් මෙතෙක් සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කරපු වැඩිම මුදල වන රුපියල් බිලියන 604ක මුදලක් සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් මෙවර වෙන් කරලා තිබෙනවා. මීට කලින් හිටපු පාලකයෝ කොවිඩ් වසංගතය කාලයේ ගංගාවලට මුට්ටි දාලා, පැණි වර්ග promote කරලා, ලංකාවේ සෞඛ්‍ය සේවාව හෑල්ලු කළා. සෞඛ්‍ය වෘත්තිකයන්ගේ තත්ත්වයත්, ඒ වාගේම ලංකාවේ සෞඛ්‍ය සේවාවත් හෑල්ලු වෙන්නේ ඒ වාගේ අමනෝඥ ක්‍රියාකාරකම් නිසා කියලා මම හිතනවා. ගුණාත්මක ඖෂධ හා වෛද්‍ය සැපයුම් වෙනුවෙන් රුපියල් බිලියන 185ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. කලින් ආණ්ඩු ඖෂධ ගෙන්වූයේ කොහොමද කියලා අපි දැක්කා. සමහර මාධ්‍යවල සඳහන් වුණා, හෝටල්වල බිල් එක රෑයට රුපියල් ලක්ෂ හතරයි, පහයි කියලා. කොම්පැනි එක්ක ඩීල් දාලා, බාල ඖෂධ ගෙනැල්ලා, රෝගීන්ගේ ඇස් අන්ධ කළා. පිළිකා රෝගීන්ට බාල ඖෂධ ගෙනාවා. පිළිකා රෝගියෙක් කියලා කියන්නේ, හෙට දවස ගැන මහා බලාපොරොත්තු තිබෙන මිනිහෙක් නොවෙයි. එහෙම රෝගීන්ටත් බාල ඖෂධ ගෙනැවිත් දුන්නා නම්, ඒ වාගේ ඇමතිවරු මිනිස්සු වෙන්න පුළුවන්ද? එහෙම සෞඛ්‍ය ඇමතිවරු තමයි හිටියේ. අය වැයෙන් ඖෂධ සඳහා වෙන් කළ මුදල් ඒ විධියට තමයි නාස්ති කළේ. ඒ නිසා මේ ආණ්ඩුව ගුණාත්මක ඖෂධ හා වෛද්‍ය සැපයුම් වෙනුවෙන් මේ අය වැයෙන් රුපියල් බිලියන 185ක මුදලක් වෙන් කරනවා.

ඒ වාගේම, මේ රටේ සෞඛ්‍ය සේවකයන් අපහසුතා රාශියක් මැද්දේ තමයි තමන්ගේ සේවාව ලබා දෙන්නේ කියලා අපි දන්නවා. විශේෂයෙන්ම සෞඛ්‍ය සේවයේ උග්‍ර සේවක හිඟයක්

[ගරු සඳරුවන් මදරසිංහ මහතා]

තිබෙනවා. එම කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය වෙනුවෙන් මෙවර අය වැයෙන් රුපියල් බිලියන 22.4ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පුහුණුව නිම කරපු විවිධ අංශවල - හෙද හෙදියන් වෙන්න පුළුවන්, MLTsලා වෙන්න පුළුවන්, අතුරු වෛද්‍ය වෙන්න පුළුවන් - 10,000ක පමණ ප්‍රමාණයක් සේවයට බඳවා ගන්න අපි ඉස්සරහට කටයුතු කරමින් ඉන්නවා. එහෙම තිබියදී තමයි මේ වැටුප් වැඩි කිරීමකුත් සෞඛ්‍ය සේවකයින්ට ලබා දෙන්නේ. 2025 අය වැය ඉදිරිපත් කරමින් ගරු ජනාධිපතිතුමා කළ කථාවේදී සෞඛ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම ගැන සඳහන් කරන්න විශේෂිත වූ කාලයක් වෙන් කර ගත් බව අපි දැක්කා. හැබැයි, මීට කලින් ඉදිරිපත් කරපු අය වැය යෝජනා පිළිබඳව ගත්තොත්, 2020 අය වැය කථාවේදී සෞඛ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීමක් හෝ ඒ අය වෙනුවෙන් කථා කරන්න විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2021දීත් විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2022දීත් විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2023දීත් සෞඛ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කිරීම වෙනුවෙන් කථා කරන්න විනාඩියක්වත් වෙන් වෙලා තිබිලා නැහැ. 2024 වර්ෂයේ දීත් නැහැ.

මේ අය වැය යෝජනා සම්බන්ධයෙන් අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපේ රට මුළු ලෝකයටම ණය වෙලා, ඒ ණය ගෙවා ගන්න බැරිව ලතැවෙන රටක්. ලෝකයේ තිබෙන පොහොසත් රාජ්‍යයක් නොවෙයි. අනෙක් පැත්තෙන් අපේ රටේ සෞඛ්‍ය සේවකයන් නිදහස් සෞඛ්‍ය සේවාවක් පවත්වා ගෙන යන්න අසීමාන්තික කැප කිරීමක් කරන බව අපි දන්නවා. ඔවුන්ගේ කැප කිරීම අපි අගය කරනවා. ඒ නිසා මේ වැටුප් වැඩි කිරීමේදී ඔවුන්ගේ මූලික වැටුප, ඒ වාගේම extra duty එක, ඒ වාගේම නිවාඩු දවස්වලට දෙන දීමනා කියන තුනම සංඛ්‍යාත්මකව වැඩි වෙලා තිබෙනවා. ඒ වැඩිවීම වෙනුවෙන් මාස 20ක කාලයකට රජය රුපියල් බිලියන 325ක මුදලක් වෙන් කරනවා. අපිට එක අවුරුද්දකට ඒක වෙන් කර ගන්න අමාරුයි. මොකද, මේ රටේ දුප්පත්භාවය නිසා. ඒ නිසා මේ වසරට රුපියල් බිලියන 110ක් වෙන් කරනවා.

ඒ වාගේම සෞඛ්‍ය සේවකයන් අතර යම් විවාදයක් ඇති වෙලා තිබෙනවා, මේ extra duty එක පිළිබඳව. ඒක ගලේ කෙටූ අකුරක් වාගේ එකක් නොවෙයි. අපිත් කැමැතියි, 1/80ක දීමනාවක් 1/60ක් කරනවා නම්. අපිත් කැමැතියි, 1/160ක දීමනාවක් 1/140 කරනවා නම්. අපිත් කැමැතියි, තව තව දීමනා සෞඛ්‍ය සේවකයන්ට ලබා දෙන්න, ඔවුන්ගේ කැපවීම අනුව. නමුත්, අපි ඔබෙන් ඉල්ලීමක් කරනවා. ඔබ තේරුම් ගන්න, මේ රට බංකොලොත් රටක් කියන එක. බංකොලොත් කරපු රටක්. ලෝකයේ දියුණු රටක් නොවෙයි. අපේ පළමුවැනි අය වැය තමයි මේ. අපේ ගරු නාමල් කරුණාරත්න ඇමතිතුමා සඳහන් කළා වාගේ, අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය. අපි ඉදිරි අය වැයවලදී සාකච්ඡාවක් කරමු, මේ 1/80 දීමනාව 1/60 කර ගන්නේ කොහොමද කියලා, මේ 1/140 දීමනාව 1/120 කර ගන්නේ කොහොමද කියලා. ඒ වෙනුවෙන් අපි ආණ්ඩුවක් විධියට ඔබත් එක්ක වැඩ කරන්න සූදානම්. ඒ නිසා සෞඛ්‍ය සේවා ඇතුළු අනෙක් සියලු වෘත්තිකයන් මේ ආණ්ඩුව පත් කරන්න මැදිහත් වුණා සේම ඉදිරියටත් මේ ආණ්ඩුව එක්ක එකතු වෙලා ඉදියි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත්, එතෙක් මෙතෙක් වෙන් කරලා තිබෙන වැඩිම මුදල - රුපියල් බිලියන 619ක් - අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. ලංකාවේ පාසල් 10,126ක් තිබෙනවා. මේ ප්‍රමාණයෙන් ළමයි 100කට අඩු පාසල් 3,000ක් තිබෙනවා. ග්‍රාමීය ප්‍රදේශවලට ගියාට පස්සේ, නගරයේ පාසලයි, ගමේ පාසලයි අතර විශාල විෂමතාවක් තිබෙනවා කියන එක අපි දන්නවා. ගමේ පාසල්වල ඉන්න ළමයින්ට ඒගොල්ලන්ගේ අනාගතය ගැන තිබෙන හීනය පටුයි. ඒගොල්ලන්ට තාක්ෂණික විෂයයන් එක්ක ඉස්සරහට යන්න ගුරුවරු නැහැ, පහසුකම් නැහැ. චෙස් ක්‍රීඩාව, ෆුට්බෝල් ක්‍රීඩාව දැකලාවත් නැහැ. දැක්කොත්, TV එකෙන් තමයි. මේ පාසල් අතර තිබෙන විෂමතාව අවම කර ගන්න ඕනෑ. බොහෝ ග්‍රාමීය පාසල්වල දරුවන්ගේ හීනය වෙලා තිබෙන්නේ එක්කෝ වෛද්‍යවරයෙක්, එක්කෝ ඉංජිනේරුවෙක්, එක්කෝ නීතිඥයෙක් වෙන එක. ඉන් එහාට හීනයක් මේ ළමයින්ට නැහැ. මේ අය වැයෙන් පාසල් පද්ධතිය සමාලෝචනය කර යළි ස්ථානගත කිරීමට අවශ්‍ය ජාතික වැඩ පිළිවෙළක් හදන්න රුපියල් මිලියන 500ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම 2019 ඉඳලා මේ පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කරලා නැහැ. ඒ වෙනුවට බොහෝ පාසල්වල දෙමව්පියන් මත අධ්‍යාපනය බරක් පටවමින් මුදල් එකතු කරමින් ඉන්නවා. ඒ මුදල් එකතු කිරීම සිදු කරන්නේ 1 වසරට දරුවා ඇතුළත් කරනකොට වෙන්න පුළුවන්. නැත්නම්, 6 වසරට දරුවා ඇතුළත් කරනකොට වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සංවර්ධන කටයුත්තකට වෙන්න පුළුවන්. දරුවන්ට උගන්වන එක දෙමව්පියන්ට මහා බරක් වෙලා තිබෙනවා. ඒක වළක්වන්න අපි පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 10,000ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ගත්තත් එහෙම තමයි. විශ්වවිද්‍යාල තුළ ගුණාත්මක වර්ධනය කිරීම සඳහා රුපියල් බිලියන 135ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා වැඩි කරලා තිබෙනවා. අපි දන්නවා ශිෂ්‍ය ව්‍යාපාරය ගැන. අපි ශිෂ්‍යයන් විධියට සිටියදීත් විශාල වශයෙන් අරගළ කරලා තමයි මේ දීමනා රැක ගත්තේ. ඒ නිසා මේ රජය ශිෂ්‍යයන්ගේ පැත්තෙන් හිතන රජයක් විධියට මහපොළ ශිෂ්‍යාධාර දීමනාවත් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු සඳහා උපාධිධාරීන් 30,000ක් සඳහා රැකියා ලබා දෙන්න රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා තිබෙනවා. මීට කලින් උපාධිධාරීන්ට රැකියා ලබා දුන්නේ කොහොමද කියලා අපි දැක්කා. විශ්වවිද්‍යාලයට ගිහිල්ලා අමාරුවෙන් උපාධිය ගත්තාට රැකියාව මොකක්ද කියලා තීරණය කළේ ප්‍රදේශයේ සිටින දේශපාලනඥයන්. මම හිතන විධියට මෙන්න මේ පාර තමයි දේශපාලනඥයන්ගේ මැදිහත්වීමෙන් තොරව උපාධියට සරිලන රැකියාවක් ගන්න පුළුවන් විධියට අය වැයෙන් සල්ලි වෙන් වෙන්නේ.

අපි දන්නවා, අපේ ප්‍රදේශවල වුණත් මත්ද්‍රව්‍යයන් එක්ක බැඳුණු පාතාලය, මිනී මැරුම් එක්ක බද්ධ වෙලා තිබෙන බව. පසුගිය දවසක අපි නියෝජනය කරන මිද්දෙනියේ දී අරුණ විදානගමගේ කියලා කියන පුද්ගලයා හා ඔහුගේ දරුවන් දෙදෙනා අවාසනාවන්ත ලෙස මරා දැම්මා. මම උපුටා ගැනීමක් කරන්න කැමැතියි. ඒ අරුණ විදානගමගේ කියන පුද්ගලයා "ටෝක් විත් චමුදිත" කියන වැඩසටහනේ දී චමුදිත සමරවික්‍රම කියන මාධ්‍යවේදියාත් එක්ක මෙහෙම කියා තිබෙනවා; "රජපක්ෂලාට විරුද්ධ පිලේ මම විතරයි මේ මරණ වරෙන්තුව අතේ තියා ගෙන ඉන්නේ. ඒ මිනිස්සු නිහඬව හිටියාට මට කරන්න දෙයක් නැහැ. ඒ අය ඇවිල්ලා කථා කරනවා, අනෙක් මිනිස්සු නිහඬව ඉන්නේ. තවත් මරණ වරෙන්තු තිබෙන කට්ටිය ඉන්නවා. මේ දැන් යනකොට මරා දැම්මොත් මගේ මරණයේ සම්පූර්ණ වගකීම මහින්ද රාජපක්ෂ, චමල් රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ, නාමල් රාජපක්ෂ, ශෂේන්ද්‍ර රාජපක්ෂ, කපිල දිසානායක ගන්න ඕනෑ." ඔහු මාධ්‍යවේදියාත් එක්ක කිව්වේ එහෙමයි. ඔහු මෙහෙමත් කියා තිබෙනවා; "චමුදිත, රාජපක්ෂලා වටේ ඉන්නේ ලයිසන් මිනීමරුවෝ" කියලා. ඊට පස්සේ චමුදිත අහනවා, "මිනී මරුවෝ ද?" කියලා. ඊට පස්සේ ඔහු කියනවා, "ඔව්, මිනීමරුවෝ තමයි

ඔක්කෝම ඉන්නේ. ඒ කට්ටිය වැඩේ කරගෙන උන් අතුරුදන් කරනවා" කියලා. ඉතින් මේවා බරපතළ ප්‍රකාශ. අද උදෙන් මන්ත්‍රීවරයෙක් ඇහුවා, "කවුද, දේශපාලනඥයා?" කියලා. මේ, මීය ගිය පුද්ගලයාම අවුරුද්දකට කලින් මාධ්‍ය හමුවේ ප්‍රසිද්ධියේ කරපු ප්‍රකාශයක්. එහෙම තමයි ඒගොල්ලන්ගේ කල්ක්‍රියාව දිස්ත්‍රික්කය ඇතුළේ සිද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කථාව අවසන් කරන්න කලින් මම මේ කාරණයත් කියන්න කැමතියි. අපේ රට දුප්පත් රටක්. මේ රට පොහොසත් කිරීමේ වගකීම තමයි අපේ කරපිට පැටවිලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් ආණ්ඩුවක් විධියට, ආණ්ඩුවේ මැති ඇමතිවරු විධියට, අපි සියලු කැපකිරීම් කරනවා. අපව පත් කරන්න තිබුණු උද්‍යෝගයෙන්ම, මේ රට සංවර්ධනය කරන්න අපි පත් කරපු හැමෝම අපිත් එක්ක එකට එකතු වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ බලාපොරොත්තුවත් එක්ක මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවුරුදු 77ක් පුරාවටම මෙරට ක්‍රියාත්මක වුණු ආර්ථික ක්‍රම සම්බන්ධව බරපතළ බාධා ඇති කරමින්, බරපතළ විවේචන ඇති කරමින්, එම ආර්ථික ක්‍රම ඉදිරියට ගෙන යෑමට, ආර්ථික ප්‍රතිසංස්කරණ ඉදිරියට පවත්වාගෙන යෑමට විශාල ලෙස බාධා කරපු ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක ගරු ජනාධිපතිතුමා විසින් නිදහස් ශ්‍රී ලංකාවේ 79වෙනි අය වැය මේ සභාවට ඉදිරිපත් කළා.

විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, අවුරුදු 78කට පසු එතුමා විසින් මේ අය වැය මේ ගරු සභාවට ඉදිරිපත් කරන වෙලාවේදී, මේ ආර්ථික ක්‍රම ඉස්සරහට අරගෙන ගිහිල්ලා, මේ රටේ ජනතාවට දෙන්න ඕනෑ පහසුකම් ටික දෙන්න, හොඳ ආර්ථික තත්ත්වයක් ඇති කරන්නට, ඒවාට බාධා කරන්නේ නැතුව මේ ආර්ථික ක්‍රමයෙන් ඉස්සරහට යන්න පුළුවන් රටක් බවට මේ රට පත් කිරීම මේ රට ලබා ගත් විශාල ජයග්‍රහණයක් බව. මොකද, පසුගිය කාලයේ තිබුණු ඒ බාධා කිරීම් දැන් අවසානයි. දැන් අපි ඔක්කෝටම එකතු වෙලා මේ රට ඉස්සරහට අරගෙන යන්න පුළුවන්. මොකද, ඒ ආර්ථික ක්‍රමවලට එදා බාධා කළත්, දැන් ඒ ආර්ථික තත්ත්වයන් තුළින්ම ඉස්සරහට යන්න පුළුවන් කියන කාරණයත් මම මතක් කරනවා. ඒ ආර්ථික ප්‍රතිසංස්කරණ දැන් මේ මාලිමා ආණ්ඩුවට ඉස්සරහට කරගෙන යන්න පුළුවන්. ඒක මේ රටේ ජනතාව ලැබූ ජයග්‍රහණයක් කියලා විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ.

අය වැය කථාව කරමින් ජනාධිපතිවරයා එහි පූර්විකාවේ මෙසේ ප්‍රකාශ කරනවා, "... අර්බුදයට බලපෑ කරුණු ඓතිහාසික මෙන්ම ව්‍යුහාත්මකයි. දූෂිත පාලනයන්, අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තීන් සහ වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය මෙම අර්බුදයේ මූලයයි ..." කියලා. එතුමා කියපු ඒ අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට එතුමන්ලාත් පසුගිය දශක දෙකක තුනක කාලය ඇතුළත දායකත්වය දුන්නා කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. 1994 වර්ෂයේ සිට මේ රටේ හිටපු විධායක ජනාධිපතිවරුන් වන චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ජනාධිපතිවරුන් මේ රටේ බිහි කරන්නටත්, ඒ ආණ්ඩුවල ඇමතිකම් දරමින් මේ රටේ අසාර්ථක මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නටත් මේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු කණ්ඩායම ක්‍රියා කළා කියන කාරණයත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන් එතුමා විශාල චෝදනාවක් කළා, වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය පිළිබඳව. අපි මතක් කරන්න ඕනෑ, එතුමා පසුගිය කාලයේ වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය කියලා ප්‍රකාශ කරපු මේ රටේ හිටපු ඒ රාජ්‍ය නිලධාරින්ම තමයි මේ අය වැයත් සකස් කරන්නේ කියන කාරණය. අපි අහන්න කැමැතියි, එතුමා මේ අසාර්ථක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළා කියලා චෝදනා කරන්නේ පසුගිය කාලයේ මේ රටේ ආර්ථික ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රතිපත්ති හදපු මහ බැංකු අධිපතිවරයාටද, නැත්නම් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාටද කියා. හැබැයි, අද ඒ නිලධාරින්ම තමයි මාලිමා ආණ්ඩුවේ මේ අය වැය යෝජනා සකස් කරලා තිබෙන්නේ. ඒ නිසා වගකීමකින් තොරව කරන එවැනි ප්‍රකාශ පිළිබඳව අපි කනගාටුවට පත් වෙනවා.

ඒ වාගේම දිගින් දිගටම චෝදනා කළා, මීට කලින් අදහස් ඉදිරිපත් කරපු ඇමතිවරයෙකුත් කිව්වා, එතුමන්ලා භාර ගත්තේ බංකොලොත් රාජ්‍යයක් කියලා. ඒ බංකොලොත්භාවයේ තිබුණු රට භාර අරගෙන මාස දෙකෙන් ගොඩ දැම්මා කියලාත් ඒ අය කිව්වා. හැබැයි මම කියනවා, ඒ වාගේ වගකීම් විරහිත ප්‍රකාශ, ඒ වාගේ බොරු, තමන්ට ලකුණු දමා ගැනීම් තැන තැන කරන්න එපා කියලා. මොකද, මේ ජනාධිපතිවරයා විසින් මේ රටේ මුදල් ඇමතිවරයා විධියට "අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව" ඉදිරිපත් කළා. ඒ වාර්තාවේ එතුමා පැහැදිලිවම ප්‍රකාශ කරනවා, "2023 වසරේ දෙවන භාගයේ සිට ආර්ථිකය ප්‍රකෘතිමත්වීමත් සමඟ 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සාධනීය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2023 වසරේ තුන්වන කාර්තුව තුළ වාර්තා වූ සියයට 1.6ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ආර්ථිකය සියයට 5.5කින් වර්ධනය විය. 2024 වසරේ පළමු කාර්තු තුන තුළ ආර්ථික වර්ධනය සියයට 5.2ක් වූ අතර එය ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශවල සිදු වන කැපී පෙනෙන වර්ධනයේ ප්‍රතිඵලයකි" කියලා.

ජනාධිපතිවරයා මුදල් ඇමතිවරයා විධියටයි මේ වාර්තාව නිකුත් කරන්නේ. එහෙම නම් ඔබතුමන්ලාට කිසිම වෙලාවක කියන්න බැහැ, අපි බංකොලොත් රාජ්‍යයක් භාර ගත්තා, ඒ බංකොලොත් රාජ්‍යය අපි තමයි ගොඩ දැම්මේ කියලා. මේ, ජනාධිපතිවරයා ඉදිරිපත් කරපු මූල්‍ය ප්‍රකාශනයක්. ඒ නිසා අපි විශේෂයෙන් ඉල්ලනවා, ඔබතුමන්ලා හොඳ වැඩ කරනවා නම්, මේ රට ඉස්සරහට අරගෙන යන්න ධනාත්මක දේවල් කරනවා නම්, ඒකේ ප්‍රතිඵලය ඔබතුමන්ලා ගන්න, හැබැයි ඔබතුමන්ලා කරපු නැති දේවල්වල ප්‍රතිඵලය ගන්න එපා කියලා. මුළු රටම ඒ පිළිබඳව දන්නවා කියන කාරණයත් අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

අපි දැන් මේ අය වැය ලේඛනය දිහා බලමු. මේ අය වැය ලේඛනයට අනුව රජයේ සමස්ත ආදායම රුපියල් බිලියන 4,960යි. හැබැයි, රජයේ පුනරාවර්තන වියදම -රජයේ එදිනෙදා වියදම- රුපියල් බිලියන 5,886ක් වෙනවා. මේ ප්‍රාථමික ගිණුමේම රුපියල් බිලියන 926ක් තිබෙනවා. එතකොට අපි අහනවා, විධිමත් මූල්‍ය කළමනාකරණයක් කරන්නට බලාපොරොත්තු වන ඔබතුමන්ලාගේ මේ අය වැයේ කොතැනද මේ ප්‍රාථමික ගිණුමේ ශේෂය හරියට තිබෙන්නේ කියලා. ඊළඟ අවුරුදු දෙක තුනේ මේ

[ගරු සුරංග රත්නායක මහතා]

ආර්ථිකය කළමනාකරණය කරන්න පුළුවන් සැලසුම් මොනවාද තිබෙන්නේ? මේ Budget එකේ ඒ සැලසුම් මොකුත්ම නැහැ. හැබැයි, Budget Speech එකේ වෙන වෙන කථා නම් ගොඩක් කිව්වා; ඉතිහාසය ගැන, රජවරු ගැන, රටේ ලෝකයේ නැති දේවල් කිව්වා. හැබැයි, මේ අය වැයේ තිබෙන දුර්වලතා පිළිබඳව බොහෝදෙනා කථා කරන්නේ නැහැ කියන කාරණයත් අපි කියන්න ඕනෑ.

ඒ වාගේම රටේ සමස්ත ආදායම ගැන සැලකිලිමත් වෙද්දී අපට පෙනෙන්න තිබෙනවා, රටේ සමස්ත ආදායමෙන් සෘජු ආදායම් බදුවලින් ආණ්ඩුව මෙවර රුපියල් බිලියන 1,167ක් බලාපොරොත්තු වන බව. රුපියල් බිලියන 1,167ක් කියන්නේ 2024දී සෘජු ආදායම් බදුවලින් බලාපොරොත්තු වුණු ගණනට වඩා රුපියල් බිලියන 141ක වැඩිවීමක්. ඒක ගිය වසරට වඩා සියයට 14ක වැඩිවීමක්. ඒ සෘජු ආදායම් බදු නිසා අපට ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ආණ්ඩුව භාණ්ඩ හා සේවා මත පනවන ලද බදුවලින් බලාපොරොත්තු වෙනවා, රුපියල් බිලියන 2,772ක්. පසුගිය අය වැයේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ආණ්ඩුව සමස්ත භාණ්ඩ හා සේවා මත බදු පනවා ලබා ගත් ආදායම රුපියල් බිලියන 2,201යි. භාණ්ඩ හා සේවා මත බදු පනවලා; එහෙම නැත්නම් වක්‍ර බදු පනවලා ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා, අමතර රුපියල් බිලියන 501ක්. මේ අමතර රුපියල් බිලියන 501ක් වක්‍ර බදු ගහලා ගන්නවා නම්, ඒක ගිය වර රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අය වැයට වඩා සියයට 26ක වැඩිවීමක්. එහෙමනම්, සියයට 26ක් - තවත් රුපියල් බිලියන 501ක්- ගන්න ඕනෑ නම් වක්‍ර බදු ගහන්න වෙන්නේ මේ රටේ අහිංසක පුරවැසියාට; දුප්පත් ජනතාවට. උදේට තේ කහට කෝප්පය බීලා, කුලී වැඩ කරලා, හරියට කෑමක් නැතුව, එහෙම නැත්නම් වඩේ ටිකක් විකුණාගෙන, කැඳ කෝප්පයක් විකුණාගෙන, එදිනෙදා තුන්වේල හරියට කන්න බැරිව අදටත් ඉතාම දුක්බිත තත්ත්වයෙන් ජීවත් වන සාමාන්‍ය ජනතාවගෙන් තමයි ඔබතුමන්ලා රුපියල් බිලියන 501ක් ගන්න හදන්නේ. ඒ බදු ආදායමේ වැඩිවීම තිබෙනවා, රුපියල් බිලියන 747ක්. ඒක රුපියල් කෝටි 74,700ක්. ඒ අනුව රුපියල් කෝටි 74,000ක් මේ අය වැයෙන් අලුතින් බදු විධියට එකතු කර ගන්නට ඔබතුමන්ලා යෝජනා කරනවා. හැබැයි, ඔබතුමන්ලා රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවීම දෙන්න රුපියල් බිලියන 110ක් වෙන් කර තිබෙනවා. මේ විධියට රුපියල් කෝටි 11,000ක් ලබා දෙද්දී, රුපියල් කෝටි 74,000ක් ආණ්ඩුව ආපසු එකතු කර ගන්නවා, දුප්පත් මිනිස්සුන්ගෙන්. හැබැයි, රුපියල් 5,975ක් රජයේ සේවකයන්ට මේ සාක්කුවෙන් දීලා රුපියල් 8,000ක්, 9,000ක් අනික් අතින් ඔබතුමන්ලා උදුරාගන්නවා. ඒ නිසා රුපියල් 5,975ක් දීලා තව කොච්චර ප්‍රමාණයක් රාජ්‍ය සේවකයාගෙන් බදු විධියට ගන්නවාද කියලා තව මාස 6ක් යද්දි ඔවුන්ට දැනේවි. බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන පරිදි, "මල නොතළා රොන් ගන්නා බඹරෙකු සේ" බදු අය කරගත යුතුයි. හැබැයි ඔබතුමන්ලා මල පොඩි පට්ටම් කරලා, තළා, ඒකේ සාරය උරා බීලා, මේ රටේ ජනතාව බිමට සමතලා කරලායි මේ බදු අය කර ගන්නේ කියන කාරණය විශේෂයෙන් අපි මතක් කරනවා. ඉදිරියේදී මේ රටේ ජනතාවට ඒ පිළිබඳව වැටහීම ඇති වෙයි කියලා අපි හිතනවා.

මේ අය වැයේ තිබෙන, ආණ්ඩුව කරන හොඳ දේවල් ගැනත් අපි කියන්න ඕනෑ. මොකද, පසුගිය වසරට සාපේක්ෂව රාජ්‍ය වියදම් ඒ ආකාරයෙන්ම මේ ආණ්ඩුව පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒක ගැන අපි ආණ්ඩුවට credit එක දෙන්න ඕනෑ. ඒක ප්‍රශ්නයක් නැහැ. මේ තත්ත්වයත් තුළ ඒ credit එක දෙනවා වාගේම විශේෂයෙන්ම අපි කියනවා, ණය ගැනීම ගැනත්. ණය ගෙවන්නට නැවත ණය ගන්න නම් ආණ්ඩු මොකටද කියලා ඔබතුමන්ලා පසුගිය කාලයේ ඇහුවා. හැබැයි ඔබතුමන්ලා රුපියල් බිලියන 4,000ක ණය අලුතින් ගන්නට බලාපොරොත්තු වෙනවා කියලා මේ අය වැයේ සඳහන් කරලා තිබෙනවා. කොහෙන්ද මේ රුපියල් බිලියන 4,000ක් ගන්නේ? ඒක මේ රටේ ජනතාවට බරක්, මේ රටේ ඊළඟ ආණ්ඩුවලට බරක්. කොහොමද මේක දරාගන්නේ? ඒක නිසා ඔබතුමන්ලා කියපු කාරණා නැවත නැවත ඔබතුමන්ලාට පාරා වළල්ලක් වෙනවා කියන කාරණයත් විශේෂයෙන් අපි මතක් කරන්න ඕනෑ.

පසුගිය වර්ෂයේ අවසාන කාර්තුවේදී මේ රටේ කෘෂි කර්මාන්තය සියයට 1.6කින් පහත වැටිලා තිබෙනවා. ඒකට හේතුව තමයි, කෘෂි කර්මාන්තයේ ඉන්න ගොවීන්ට හරි වෙලාවට පොහොර සහනාධාරය ලබා නොදීම. ඒ වාගේම අද ගොවි ජනතාව ගොවිතැනින් ඈත් වෙනවා. මොකද, අද වීවලට සාධාරණ මිලක් ලැබිලා නැහැ. එම නිසා ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ අවධානය යොමු කරන්න කියන කාරණය විශේෂයෙන් අපි මතක් කරනවා. "රුපියල් බිලියන 5ක් දීලා මොනවා කරන්නද, වී මිලදී ගන්න රුපියල් බිලියන 325ක් ඕනෑ, අපි බලමු කරන විධිය" කියලා ඊයේ දවසේ ඩඩ්ලි සිරිසේන ඔබතුමන්ලාට අභියෝග කළා. හැබැයි, ඔබතුමන්ලා රුපියල් බිලියන 5ක් දීලා වී මෙට්‍රික් ටොන් 40,000ක් අරගෙන මේ රටේ සහල් මාෆියාව විසඳන්න පුළුවන් කියලා කියනවා. ඒවා ඇත්ත නොදන්න ජනතාවට කියන්න පුළුවන් කාරණා. හැබැයි අපි කියනවා, ජනතාව එන්න එන්න දේශපාලන සාක්ෂරතාව සහ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධයකට එනවා කියලා. ජනතාවට බොරු කියලා ටිකදෙනෙක් බොහෝ කාලයක් රවටිටන්න පුළුවන්, බොහෝදෙනෙක් ටික කාලයක් රවටිටන්න පුළුවන්, හැබැයි බොහෝදෙනෙක් බොහෝ කාලයක් රවටිටන්න බැහැ කියන එකත් මේ වෙලාවේ මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මන්ත්‍රීවරුන්ට වරප්‍රසාද දෙන්නේ නැහැ, පර්මිට් දෙන්නේ නැහැ කියලා ජනාධිපතිවරයා කියපු කාරණය මත වෙන්න ඇති, අද ඇමතිවරු ප්‍රවාහනය සඳහා බූරුවන්ව පාවිච්චි කරන්නේ කියන කාරණයත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ක්‍රිෂාන් කලෙයිවෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[பி.ப. 3.32]

ගරු කිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය

(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)

(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பத்தாவது பாராளுமன்றத்தில் நடைபெறும் இந்த ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்தில், விசேடமாக நான் வாழும் மாவட்டமான நுவரெலியா மாவட்ட மக்கள் சார்பாகப் பேசுவதற்கு வாய்ப்பளித்ததையிட்டு நான் பெருமகிழ்ச்சியடைகின்றேன். இவ்வரவு செலவுத்திட்டம் உண்மையிலேயே இந்த நாட்டில் வாழுகின்ற மக்கள், விசேடமாக மலையகம் வாழ் தமிழ் மக்கள் சந்தோஷப்பட வேண்டிய உள்ளடக்கங்களைக் கொண்டிருப்பது மிக முக்கியமான ஒரு விடயமாகும். இதற்கு முன்பிருந்த 9 பாராளுமன்றத்திலும் இருந்த உறுப்பினர்களும் சரி, ஆட்சியாளர்களும் சரி, மலையகம் வாழ் தமிழ் மக்களுக்கு எதனைப் பெற்றுக்கொடுத்திருக்கிறார்கள்? என்பது பற்றிய கேள்விக்குறி எம்மத்தியில் இருக்கின்றது. அதனடிப்படையில் பார்க்கும்போது, சுதந்திரத்தின் பின்னரான 76 வருட கால ஆட்சியின் கீழ், எந்தவொரு பாராளுமன்றத்திலும் 202 வருட கால வரலாற்றைக் கொண்ட எமது மக்கள் தொடர்பாக தேசிய ரீதியான தீர்மானங்களை எடுக்காதபோது, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் இந்தப் பத்தாவது பாராளுமன்றத்தில் எமது ஜனாதிபதியும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சருமான மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களால் முன்வைக்கப்பட்ட வரவு செலவுத்திட்டத்தில் 'மலையகம்', 'மலையகம் வாழ் தமிழ் மக்கள்' என்ற வகையில் முதன்முறையாக எமக்கு ஓர் அங்கீகாரத்தைப் பெற்றுக்கொடுத்திருப்பது மிகவும் சந்தோஷப்படவேண்டிய விடயம்.

அதுமாத்திரமல்ல, எதிர்க்கட்சியிலுள்ள அநேகமான உறுப்பினர்கள் - மலையக மக்களுக்குத் தலைமைத்துவம் கொடுக்கும் உறுப்பினர்கள் - தலைமைத்துவம் கொடுப்பதாகக் கூறிக்கொண்டிருக்கும் தலைவர்கள், "இந்த வரவு செலவுத்திட்டத்தில் எமக்கு என்ன கிடைத்துள்ளது? எமது மக்கள் சார்பான தேவைகளை நிறைவேற்றக்கூடிய வகையில் இதில் எதுவும் குறிப்பிடப்படவில்லை" என்று கூக்குரலிட்டார்கள். மலையக மக்களின் சகல பிரச்சினைகளுக்கும் தோட்டக் கம்பனிகளுடன் இணைந்துதான் தீர்வு காணப்பட வேண்டும். அவ்வாறின்றி இந்நிறுவனங்களின்மீது பழிசுமத்தி இவர்கள் மேற்கொண்ட நடவடிக்கைகள் மலையக மக்களின் பலவிதமான உரிமைகள் இல்லாதொழியக் காரணமாகும். அதனடிப்படையில் பார்க்கும்போது, இந்த நாட்டில் உழைக்கும் மக்கள் என்ற அடிப்படையில் தேசிய ரீதியாக மலையக மக்களுக்குப் பலவிதமான சலுகைகளைப் பெற்றுக்கொடுப்பதற்கு இந்தப் பத்தாவது பாராளுமன்றம் தீர்மானித்துள்ளமை மிகவும் சந்தோஷப்பட வேண்டிய விஷயமாகும்.

எமது எதிர்க்கட்சி உறுப்பினர்கள் அநேகமானோர் கூறினார்கள், "மலையக மக்களுக்கு விசேடமாக வீட்டுப் பிரச்சினை இருக்கின்றது, சம்பளப் பிரச்சினை இருக்கின்றது, சுகாதாரம், கல்வி போன்ற சகல துறைகள் தொடர்பாகவும் பிரச்சினைகள் இருக்கின்றன; இந்தப் பிரச்சினைகளுக்கு கட்டாயம் தேசிய மக்கள் சக்தி அரசாங்கம் பொறுப்புக்கூற வேண்டும்" என்று. உண்மை! ஆனால், இந்த 76 வருட காலத்தில் மலையக மக்கள் சம்பந்தமாக இந்தப் பாராளுமன்றத்தில் என்னவிதமான தீர்மானங்கள் எடுக்கப்பட்டிருக்கின்றன? தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை தொடர்பாக இந்தப் பாராளுமன்றத்தில் தீர்க்கமான முடிவு எடுக்கப்பட்டுள்ளதா? அவர்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கு ஏதாவது தீர்மானம் எடுக்கப்பட்டுள்ளதா? அவர்களது சுகாதாரப் பிரச்சினைகள் சம்பந்தமாக ஏதாவது தீர்மானம் எடுக்கப்பட்டுள்ளதா? அவர்களது உட்கட்டமைப்புப் பிரச்சினைகளுக்கு ஏதாவது தீர்மானம் எடுக்கப்பட்டுள்ளதா? எதுவுமே இல்லை! இவை அனைத்தையும் தொடர்ந்துகொண்டே இன்று எதிர்க்கட்சியிலிருந்து கூக்குரலிடும் உறுப்பினர்கள் தேசிய மக்கள் சக்தி அரசாங்கத்திற்கு எச்சரிக்கையாக இவற்றைக் கூறுகின்றார்கள். இவை அனைத்தையும் கண்டறிந்த ஓர் அரசாங்கம்தான் தேசிய மக்கள் சக்தி அரசாங்கம்!

இன்று நாங்கள் நுவரெலியா மாவட்டத்திலுள்ள டயகம, மஸ்கெலியா, பொகவந்தலாவை போன்ற பிரதேசங்களையும் அதுபோல், பதுளை மாவட்டத்தில் மலையக மக்கள் வாழும் பிரதேசங்களையும் எடுத்துக்கொண்டால், குறிப்பாக அங்குள்ள உட்கட்டமைப்பு வசதிகள் மிகவும் மோசமான நிலையில் இருப்பதையே பார்க்கக்கூடியதாக இருக்கிறது. அவர்கள் போக்குவரத்தை மேற்கொள்வதற்கு ஒழுங்கான வீதிகள் கிடையாது. அங்குள்ள வீதிகளில் லாடம் பூட்டிய குதிரைகளால்கூட போகமுடியாது. எந்தவிதத்திலும் அவர்களது உரிமைகள் பெற்றுக் கொடுக்கப்படவில்லை. இந்த 76 வருட காலத்தில் அவர்களது வாழ்க்கையை மேம்படுத்துவதற்கு ஏதுவாக அவர்களது சம்பளப் பிரச்சினையாவது சரியாகத் தீர்த்துக் கொடுக்கப்படவில்லை. அதுமாத்திரமல்ல, அங்கு தகுதிவாய்ந்த வைத்தியர்களைக்கொண்ட ஒரு hospital - வைத்தியசாலை கிடையாது. தரம்வாய்ந்த ஒரு வைத்தியர்கூட இல்லாத தோட்டப்புறங்கள்தான் நிறையவே இருக்கின்றன.

தோட்டப்புறங்களிலுள்ள பெண்கள் முகங்காடுக்கும் பிரச்சினைகள் அதையும்விட மேலானது. அவர்கள் தம் வேலைத்தலங்களுக்குச் செல்லும்போது தங்களது அடிப்படைத் தேவைகளைப் பூர்த்திசெய்வதற்கான வசதிகளைக்கூடப் பெற்றுக்கொடுக்க இன்று எதிர்க்கட்சியிலிருந்து கூக்குரலிடும் உறுப்பினர்களால் முடியாமற்போயுள்ளது. இன்று நீங்கள் என்ன கூக்குரலிட்டாலும், தேசிய மக்கள் சக்தி அரசாங்கம் - எமது உறுப்பினர்கள் தோட்டப்புறங்களுக்குச் சென்று அவர்களது உண்மையான பிரச்சினைகளைக் கண்டறிந்ததன் அதனடிப்படையில், இம்முறை வரவு செலவுத்திட்டத்தில் எமது சனாதிபதி அவர்கள் விசேடமாகக் குறிப்பிட்ட ஒன்றுதான் பெருந்தோட்ட மக்களுக்கிருக்கின்ற வீடில்லாப் பிரச்சினைக்குரிய தீர்வைக் குறுகிய காலத்திலும் நீண்ட காலத்திலுமாகப் பெற்றுக்கொடுப்பதென்ற விடயம். அதனடிப்படையில்தான் பெருந்தோட்ட மக்களின் வீடமைப்பு மற்றும் உட்கட்டமைப்பு அபிவிருத்திக்காக இம்முறை வரவு செலவுத்திட்டத்தில் 4,267 மில்லியன் ரூபாய் பணத்தை மாண்புமிகு சனாதிபதியவர்கள் ஒதுக்கியுள்ளார்.

அதுமாத்திரமல்ல, மலையகத்தில் வாழும் தமிழ் இளைஞர்கள் இன்று தொழிலற்று, தமது எதிர்கால வாழ்க்கை தொடர்பாக ஒரு நம்பிக்கையில்லாது வாழ்ந்துவருகின்ற நிலையில், அவர்களது தொழிற்பயிற்சி, வாழ்வாதாரம் மற்றும்

[ගරු ක්‍රිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය]

උට්කට්ටමைப்பු අபිවිරුත්තියை මේම්පටුත්ති, අවර්කළින් වාழ්ක්කෙයෙ අழකානතාක්කුවතර්කාක 2,450 මිල්ලියන් රූපාය් පණම් ඔතුක්කප්පට්ටුළ්ළතු.

අතුමාත්තිරමල්ල, නම් අනෙවරුක්කුම් තෙරියුම්, මලෙයකත්තිලිරුක්කුම් පාටසාලෙකළ් කුටිප්පතර්කුත් තණ්ණීර්, මලසලකූට වසතිකළ් පෝන්ර අටිප්පටෙ වසතිකළ් එතුවුම් ඉල්ලාත මිකමික මෝසමාන නිලෙයිල්තාන් කාණප්පටුකින්රන එන්පතු. අතනෙක් කණ්ටරින්ත එමතු අරසාංකම් ඉන්ත වරවු සෙලවුත්තිට්ටත්තිලේ මලෙයකප් පාටසාලෙකළිල් 'ස්මාර්ට්' වකුප්පරෙකළෙ අමෙප්පතර්කු රූපාය් 866 මිල්ලියනෙ ඔතුක්කියුළ්ළතු.

අතුමාත්තිරමන්රි, වරලාට්රිල් මුතන්මුතලාකප් පෙරුන්තෝට්ටත් තොළිලාළර්කළින් නාළාන්තච් චම්පළත්තෙ එන්ත අළවුක්කු උයර්ත්තුවතු එන්පතු පර්රිප් පාරාළුමන්රත්තිල් කුරිප්පිටප්පට්ටු, 1,700 රූපායෙප් පෙර්රුක් කොටුප්පතර්කාන සකල වේලෙත්තිට්ටංකළුම් අරසාංකත්තිනාල් නටෙමුරෙප්පටුත්තප්පට්ටුක් කොණ්ටිරුක්කින්රතු. පෙරුන්තෝට්ටත් තොළිලාළර්කළින් චම්පළත්තෙ උයර්ත්ත වේණ්ටුමානාල් කම්පනිකළෝටු - පෙරුන්තෝට්ට නිරුවනංකළෝටු කතෙත්තු, ඉරුතියිල් 100 රූපාය් - 200 රූපාය් අතිකරිප්පෙන්ර තීර්මානත්තිර්කු වන්තු අවර්කළාල් අන්ත විටයම් මුටිත්තු වෛක්කප්පටුවතු එමක්කුත් තෙරියුම්. අන්ත සිරිය තොකෙයෛක්කූට එමතු මක්කළ් වීතියිල් ඉරංකි මාතක් කණක්කාකප් පෝරාටියේ පෙර්රුක් කොළ්ළ වේණ්ටුම්. ආනාල්, ඉන්ත මක්කළින් වාழ්ක්කෙයෙ මේම්පටුත්තුවතර්කාක 1,700 රූපාය් නාළාන්ත චම්පළත්තෛප් පෙර්රුක්කොටුක්ක අරසාංකම් තීර්මානිත්තුළ්ළතු. අන්ත අටිප්පටෙයිලේයේ තෝට්ටත් තොළිලාළර්කළින් චම්පළත්තෙ උයර්ත්තුවතෙන්ර තීර්මානත්තෙ කෙළරව සනාතිපති අනුර කුමාර තිසානායක්ක අවර්කළ් චෙන්ර 17ආම් තිකති 2025ආම් ආණ්ටුක්කාන වරවු සෙලවුත්තිට්ටත්තෛච් සපෙයිල් අරික්කෙයිටුම්පොළුතු වෙළියිට්ටුළ්ළාර්.

නාංකළ් මිකවුම් කුරිප්පාක එතිර්ක්කට්චියින් මලෙයක උරුප්පිනර්කළුක්කුක් කූරුකින්රෝම්, මලෙයක මක්කළින් 202 වරුටකාල වරලාට්රිල් අන්ත මක්කළින් චාර්පිල් කිට්ටත්තට්ට 77 වරුට කාලම් ඉන්තප් පාරාළුමන්රත්තිල් අණ්ණන්, තම්පි, තාත්තා, පාට්ටන් එන්රු අනෙවරුම් පතවි වකිත්තපෝතුම්, ඉන්ත වරුටත්තෛත් තවිර, ඔව්වොරු 5 වරුටත්තිර්කු ඔරුමුරෙ ඉන්ත නාට්ටිල් ආට්චිපීටම් එරුම් ඔව්වොරු කට්චියින් අරසාංකත්තිලුම් අමෙච්චුප් පතවිකළිල් ඉරුන්තපෝතුම්, මලෙයක මක්කළින් වාழ්ක්කෙයෙ මේම්පටුත්තුවතර්කාකෝ, කුරෙන්තපච්චම් මලෙයක මක්කළ් එන්ර අන්තස්තෛක්කූටප් පෙර්රුක්කොටුප්පතර්කාකෝ උංකළාල් මුටියාමර්පෝය් විට්ටතු. ඉන්රු මලෙයක මක්කළින් පිරච්චිනෙ තොටර්පාක මිකවුම් අන්පාකවුම් ආරවාරමාකවුම් ආතරවාකවුම් එතිර්ක්කට්චි උරුප්පිනර්කළ් - විසේටමාක මලෙයකත්තෛප් පිරතිනිතිත්තුවප්පටුත්තුම් උරුප්පිනර්කළ් - පේසුකිරාර්කළ්. ආනාල්, ඉවර්කළාල් අවර්කළතු උරිමෙ එන්තවිතත්තිලුම් පෙර්රුක් කොටුක්කප්පටවිල්ලෙ. අතර්කු ඉන්රුවරෙයුම් ආට්චියිලිරුන්ත මලෙයක උරුප්පිනර්කළ්, ආට්චියාළර්කළ් කට්ටායම් පතිල් චොල්ල වේණ්ටුම්.

තේචිය මක්කළ් චක්ති අරසාංකමානතු ඉන්ත නාට්ටිල් උළ්ළ විවචායිකළ්, අරස තුරෙ මර්රුම් තනියාර් තුරෙ ඌළියර්කළ්, ඉළෛඤර්කළ්, පෙණ්කළ්, චිරුවර්කළ් එන අනෙවරෙයුම් තේචිය රීතියාකක් කරුත්තිල් එටුප්පතුපෝලවේ මලෙයකත් තෝට්ට වාழ් මක්කළෛයුම් තේචිය රීතියාක ඉණෛත්තුක් කොණ්ටුළ්ළතු. අතන් අටිප්පටෙයිල්තාන් ඉන්ත වරවු සෙලවුත්තිට්ට අරික්කෙයිල් මලෙයක මක්කළුක්කුම් තනිත්තුවමාන ඔරිටම් කොටුක්කප්පට්ටුළ්ළතු. ඉතුවරෙයුම් ඉප්පටියාන ඔන්රෙ ඉවර්කළාල් චෙය්ය මුටියාමර්පෝනතු.

ඉංකුළ්ළ එතිර්ක්කට්චි උරුප්පිනර්කළ් ඉන්ත වරවු සෙලවුත්තිට්ටම් තොටර්පාකප් පාරිය විමර්චනංකළෛ වෛත්තුක් කොණ්ටිරුක්කිරාර්කළ්. ඉවර්කළ් එන්ත විමර්චනංකළෛ වෛත්තාලුම් කට්ටායමාක තේචිය මක්කළ් චක්ති අරසාංකත්තින් උරුප්පිනර්කළාකිය නාංකළ්, එමතු මලෙයක වාழ් මක්කළින් උරිමෙකළෛප් පටිප්පටියාකප් පෙර්රුක් කොටුප්පතෝතු, අවර්කළුටෙය සකල පිරච්චිනෙකළුක්කුමාන තීර්වුකළෛයුම් පටිප්පටියාකප් පෙර්රුක් කොටුප්පෝම් එන්රු උරුතියාකක් කූරුකින්රෝම්. අතනාල්තාන් විසේටමාක උංකළෛයුම් තේචිය රීතියාක ඉණෛත්තුක්කොණ්ටුළ්ළ, උංකළතු උරිමෙයෛප් පෙර්රුක්කොටුක්කක්කූටිය ඔරේ අරසාංකමාන තේචිය මක්කළ් චක්ති අරසාංකත්තුටන් ඉණෛන්තු චෙයර්පටුමාරු මලෙයක මක්කළුක්කු නාංකළ් අළෛප්පු විටුක්කින්රෝම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මේ රටේ ජීවත් වන ලක්ෂ 20කට ආසන්න අපේ වතු කම්කරු ජනතාව ගැනත් වවන කිහිපයක් කථා කරන්න කැමැතියි. මොකද, වතු කම්කරු ජනතාව අවුරුදු 202ක පමණ ඉතිහාසය තුළ මේ රටේ විශාල දුකක් විඳලා. නිදහසින් පසු ගතවූ අවුරුදු 76ක කාලය තුළ වතු කම්කරු ජනතාව මේ පාර්ලිමේන්තුවේ "අපේ" යැයි කියා ගත් මන්ත්‍රීවරු විශාල පිරිසක් සිටියා. හැබැයි, ඒ මන්ත්‍රීවරු අපේ වතු කම්කරු ජනතාව වෙනුවෙන් ලබා දීලා තිබෙන අයිතිවාසිකම් මොනවාද? අදටත් මේ ජනතාව පාවිච්චි කරන්නේ ඡන්ද මැෂිමක් විධියට විතරයි. සමහර අය දැන් නම් බොහොම ආදරයෙන් වතු කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳව කථා කරනවා. හැබැයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව වතුකරයේ ජනතාව; කඳුකරයේ ජනතාව, "මලයගම්" ජනතාව කියන එක පිළිගෙන තිබෙන එක පවා වතුකරයේ ජනතාවට ලොකු දෙයක්. අපට ඒක කරගන්න පුළුවන් වුණේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියට නියමිත කාලය දැන් අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමියට තවත් විනාඩි 3ක් ආණ්ඩු පක්ෂයේ කාලයෙන් ලබා දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමිය කථාව කරගෙන යන්න.

ගරු ක්‍රිෂ්ණන් කලෙයිවෙල්වි මෙනෙවිය
(මාණ්පුමිකු (සෙල්වි) කිරුෂ්ණන් කලෛච්චෙල්වි)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ ජනතාව අවුරුදු 76ක් තිස්සේ නොවෙයි, අවුරුදු 202ක් තිස්සේ ඉතාම දුක්ඛිත ජීවිත ගත කරන්නේ. ඒක හොඳටම දැනගත්ත ආණ්ඩුව තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව. ඒ නිසාම තමයි වතුකරයේ

ජනතාවගේ ජීවිතය නහා සිටුවන්න, අධ්‍යාපනය නහා සිටුවන්න, සංස්කෘතිය, සදාචාරය, සෞඛ්‍ය නහා සිටුවන්න, මේ සියලු දේවල් හොයා බලමින් ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අද කටයුතු කරමින් ඉන්නේ.

අපේ වතුකරයේ ජනතාව නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවේ තාත්තලා, පුතාලා, සීයලා සියලු දෙනාම හිටියත්, මෙතුවක් කල් වතුකරයේ, කඳුකරයේ ජීවත් වන ජනතාව identify කර තිබුණේ නැහැ; හඳුනා ගැනීමක් තිබුණේ නැහැ. ඒක කරගන්න පුළුවන් වුණේත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවෙන්. ඒ තමයි, **'மலையகத் தமிழ் மக்கள்'**; මලයගම් දෙමළ ජනතාව විධියට.

ඒ විතරක් නොවෙයි. මේගොල්ලන් කියන ආකාරයට වතුකරයේ පාරවල් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා; නිවාස සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා; වැටුප් සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. මේ සියල්ල විසඳන්න ඕනෑ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව. ඇත්ත, අපි අනිවාර්යයෙන්ම ඒ ප්‍රශ්න විසඳනවා. ඒකේ දෙකක් නැහැ. අනිවාර්යයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුව වතුකරයේ ජනතාවගේ ප්‍රශ්න විසඳනවා. මූලික අදියර විධියට මේ අය වැයේදී අපේ ජනතාවගේ නිවාස ප්‍රශ්න විසඳන්න, යටිතල පහසුකම් පිළිබඳ ප්‍රශ්න විසඳන්න රුපියල් මිලියන 4,267ක් වෙන් කර තිබෙනවා. එවැනි දෙයක් මේ පාර්ලිමේන්තුවේ මීට කලින් සිදු වුණේ නැහැ. ජාතික වශයෙන් වතු කම්කරුවන්ගේ ප්‍රශ්න කථා කළේ නැහැ. ප්‍රශ්නවලට උත්තර දුන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතුකරයේ ඉන්න, කඳුකරයේ ඉන්න දෙමළ තරුණ තරුණියෝ; අපේ සහෝදර සහෝදරියන් අදටත් ජීවිතය ගෙවන්නේ අපේක්ෂා භංගත්වයෙන්. මොකද, ඔවුන්ට රැකියාවක් නැහැ; යන්න තැනක් නැහැ. පෞද්ගලික ආයතනයකට ගියත් නිසි වැටුපක් නැහැ. ඒ නිසාම වතුකරයේ ඉන්න තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා මේ ආණ්ඩුව රුපියල් මිලියන 2,450ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වතුකරයේ තිබෙන පාසල් ඉතාම පහළ මට්ටමක තිබෙන්නේ. අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමාත් නියෝජනය කරන්නේ අපේ දිස්ත්‍රික්කය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වතුවල තිබෙන පාසල්වල කිසිම පහසුකමක් නැහැ.

ඒ නිසා තමයි "මලයගම්" දෙමළ ප්‍රජාවේ පාසල් සඳහා සුහුරු පන්ති කාමර හදන්න රුපියල් මිලියන 866ක් වෙන් කර තිබෙන්නේ. හැබැයි, මේ කිසිවක් මීට කලින් හිටපු මන්ත්‍රීවරු, මේ පාලකයෝ මේ පාර්ලිමේන්තුවේදී අපට වෙන් කර දුන්නේ නැහැ. "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවිත නහා සිටුවන්න තිබෙන එකම ආණ්ඩුව මේකයි. ඒ මිනිසුන්ගේ ජීවිත සම්බන්ධව හොඳම තීන්දුව ගත්තු පාර්ලිමේන්තුව දසවැනි පාර්ලිමේන්තුව හෙවත් ජාතික ජන බලවේගය ආණ්ඩුව සහිත පාර්ලිමේන්තුවයි කියන එකත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.50]

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 සැප්තැම්බර් 21වන දා මේ රටේ ජනතාව ඉතිහාසයේ ප්‍රථම වතාවට ඓතිහාසික තීන්දුවක් ගත්තා, සියලු ජනතාව නියෝජනය කරමින් එකම රටක් යටතේ එක ජනාධිපතිවරයකුගේ පාලනයට මේ රට ලක් කර ගන්නට. විශේෂයෙන් උතුර, නැගෙනහිර ඇතුළු සියලු ජනතාවගේ අපේක්ෂාව වුණේ නව වැඩ පිළිවෙළක් එක්ක ඉදිරියට යන රජයක්. ඒක රටක් විධියට ගනු ලැබූ ඓතිහාසික තීරණයක්.

අපි ඉදිරිපත් කළා, මේ රට හදන වැඩ පිළිවෙළ; ජාතික ජන බලවේගයේ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගොඩ නඟන වැඩ පිළිවෙළ. මේ වැඩ පිළිවෙළ ඇතුළේ පුරවැසි ක්‍රියාකාරිත්වය, සාමූහික මැදිහත්වීම්, සමාජ සාධාරණත්වය, යහපාලන මූලධර්ම භාවිත කරන නව යුගයක් ආරම්භ කිරීම අපේක්ෂා කරනවා. මේ සියලු මූලධර්ම පදනම් කරගත් නව රජයේ මංගල අය වැය පිළිබඳවයි අද මේ ගරු පාර්ලිමේන්තුව ඇතුළේ සාකච්ඡා වෙමින් පවතින්නේ. විශේෂයෙන් මේ රටේ සියලු පුරවැසියන්ට රටේ ආර්ථික ක්‍රියාවලියට සක්‍රියව දායක විය හැකි පරිදි අවස්ථා වැඩි දියුණු කිරීමත්, ඒ අවස්ථා තුළින් ලැබෙන ආර්ථිකමය ප්‍රතිඵල සමාජයේ සෑම ස්තරයකටම සාධාරණ ලෙස ලබා ගත හැකි පරිදි ආර්ථිකය වර්ධනය කිරීමත් මේ අය වැයේ මූලික අපේක්ෂාවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, පසුගිය කාල සීමාව පුරාවටම මේ රටේ ආර්ථික ක්‍රියාවලිය කොහොමද හැසිරුණේ කියලා. ආර්ථිකයේ වැඩි පංගුවක් හැම වෙලේම අත්පත් කර ගත්තේ සීමිත පිරිසක්, එහෙමත් නැත්නම් අතළොස්සක්. අපේ අරමුණ වන්නේ රටක් වශයෙන් ඉදිරියට යෑම නම්, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය, එහෙමත් නැත්නම් මේ රටේ ආර්ථික ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව අතරට වාගේම මේ රටේ සෑම පුරවැසියෙකු අතරටම බෙදී යෑම අත්‍යවශ්‍යයි. මේක රටේ ඉදිරි දැක්මට සෘජුව බලපාන ක්‍රියාවලියක්. ඒ සියලු අරමුණු හොඳින් තහවුරු කර ගනිමින් රටේ පවත්නා ගැටලුවලට තාර්කික විසඳුම් ලබා දෙන අය වැයක් මෙවර ජාතික ජන බලවේගය රජය සිය මංගල අය වැය විධියට, එහෙමත් නැත්නම් අපේ පළමු අය වැය විධියට ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන් මෙම තත්ත්වය හොඳින් වටහා ගත හැකිව තිබුණත්, විපක්ෂය දිගින් දිගටම අසත්‍ය කරුණු මත පදනම් වෙලා, සාධාරණත්වය මත, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය මත අප ගොඩ නඟන්න උත්සාහ කරන මේ වැඩ පිළිවෙළ ගැන විවේචනය කරමින්, සමාජය තුළ අසත්‍ය පතුරුවමින් අසත්‍ය කරුණු සමාජගත කරන්න උත්සාහ කරනවා. මෙක හරියට දිය කොරහෙත් කිඹුල්ලු දකිනවා වාගෙයි. විශේෂයෙන් මේ අය වැයේ අන්තර්ගතය සම්බන්ධයෙන් සැබෑ දැක්මක් තිබුණත්, සැබෑ අවබෝධයක් තිබුණත්, මෙය දෝෂ දර්ශනයට ලක් කරමින් ඒ හරහා අසත්‍ය කරුණු සමාජගත කිරීම විපක්ෂය දිගින් දිගටම සිදු කරනවා. මේ අය වැය විශේෂයෙන් ජනහිතකාමී අය වැයක්. මේ අය වැය රටේ ජනතාව වෙනුවෙන් සකස් කරන ලද අය වැයක්.

මට පෙර විපක්ෂයෙන් කථා කළ මන්ත්‍රීවරයකු දිගින් දිගටම පැහැදිලි කරන්න උත්සාහ කළා, මේ අය වැය හරහා අය කරන බදු ක්‍රියාවලිය ඇතුළේ පෙරට වඩා ජනතාව පීඩාවට පත් වෙනවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, අපි අපේක්ෂා කරන්නේ ප්‍රසාරණය වුණු ආර්ථිකයක් ඇතුළේ බදු අය කිරීමේ ක්‍රියාවලියක්. මා එය උදාහරණයකින් කියන්නම්. අප පාන් රාත්තලකින් එක පාන් පෙත්තක් ගත්තත්, පාන් රාත්තල් දෙකකින් පාන් පෙති දෙකක් ගත්තත් කාරණා දෙකම එකයි.

[ගරු සාගරිකා අතාවුද මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඇතුළේ අපි ඉදිරිපත් කළ රටේ ජනතාවගේ, විශේෂයෙන් ළමා පරපුරේ ආරක්ෂාව, රැකවරණය මේ අය වැය තුළ සහතික කර තිබෙනවා.

අප හඳුන්වන ඒ වැඩ පිළිවෙළ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ විස්තර කරනවා, "සුරක්ෂිත ළමා ලෝකයක්, නිර්මාණශීලී අනාගත පරපුරක්" කියන මාතෘකාව යටතේ. මේ කාරණය සනාථ කරමින් එහි මූලධර්ම වශයෙන් දක්වන කාරණයත් මම උපුටා දක්වන්නම්.

"පෝෂ්‍යදායී ආහාර සැපයීම ඇතුළු සමස්ත ළමා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් ජාත්‍යන්තර සහ දේශීය ආයතනවල සහාය ඇතිව ප්‍රජාව, පවුල සහ පාසල් පදනම් කර ගත් සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම."

මේ අරමුණ සංතෘප්ත වන ආකාරයට මෙවර අය වැයෙන් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා වෙනුවෙන් රජය වැඩි සැලකිල්ලක් දක්වා තිබෙනවා. මේ අය වැය තුළින් පෝෂණ ඌනතාව ඇති දරුවන්ට සහ ගැබිනි මව්වරුන්ට ත්‍රිපෝෂ ලබා දීමේ වැඩසටහන සඳහා පමණක් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබීම විශේෂත්වයක්. ඒ වාගේම ගර්භිණී මව්වරුන්ට ලබා දෙන පෝෂණ ආහාර මල්ල සඳහා රුපියල් මිලියන 7,500ක් වෙන් කිරීම, පෙර පාසල් දරුවන්ගේ ආහාර වේලක් වෙනුවෙන් මෙතෙක් වියදම් කළ රුපියල් 60ක මුදල වෙනුවට රුපියල් 100ක මුදලක් වෙන් කිරීම ආදිය තුළින් නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අපේක්ෂා කළ අරමුණට මෙහෙයවීමක් දකින්න ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ළමයින් ගැන කථා කරන කොට අපට පූර්ව ළමාවිය සංවර්ධනය අමතක කරන්න බැහැ. විශේෂයෙන් පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා වැඩි දායකත්වයක් ලබා දීම තුළින් අප අපේක්ෂා කරන්නේ වර්තමානයේ ලැබෙන ප්‍රතිලාභ නොවෙයි. ඒ තුළින් අප අපේක්ෂා කරන්නේ අනාගත ආයෝජනයක්. තව වසර ගණනාවකින් මේ රටේ නීරෝගිමත්, බුද්ධිමත්, දක්ෂ දරු පරපුරක් බිහි කිරීම අපේ අපේක්ෂාවයි. ඒ සඳහා අඩිතාලම දමමින්ම පෙර පාසල් ගුරුවරුන් සඳහා මෙතෙක් ලබා දුන් දීමනාවට රුපියල් 1,000ක අමතර දීමනාවක් අපි වෙන් කර තිබෙනවා. සමස්ත අය වැයේම තිබෙන විශේෂත්වය වන්නේ, මේ අය වැය තුළින් සමාජයේ සෑම කොටියාසයක්ම ආවරණය කිරීමට රජය කටයුතු කර තිබීමයි.

කාන්තාවන් විධියට අපි දන්නවා, ගෙදරක දරුවෙකු අසනීප තත්ත්වයෙන් පසු වුණොත් අපට අපේ කාර්යභාරයන් සිදු කර ගන්න කෙතරම් අපහසුද කියලා. ඔටිසම් වැනි ස්නායු ආශ්‍රිත ආබාධ තිබෙන දරුවන් ඇති මව්වරුන්ට තමන්ගේ ජීවිත කාලයම ඒ දරුවන් වෙනුවෙන් කැප කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ රජය එවැනි සියුම් තත්ත්වයන් ගැන පවා අය වැය තුළින් අවධානය යොමු කරලා, විශේෂයෙන් ඔටිසම් වැනි ස්නායු ආබාධ සහිත දරුවන්ට අවශ්‍ය රැකවරණය ලබා දීම ගැන වාගේම, ඔවුන්ට විශේෂ පහසුකම් සැලසීම ගැනත් කථා කරන්නේ ඉතිහාසයේ පළමුවැනි වතාවටයි. මේ කාරණය නිසාම මේ රටේ සමස්ත ජනගහනයෙන් අඩකටත් වඩා සිටින කාන්තාවන්ට තමන්ගේ ගෙදර දොර වැඩ කටයුතු වාගේම, ඇතැම් විට සක්‍රිය ලෙස ජාතික ආර්ථිකයට දායක වෙන්න තිබෙන අවස්ථාවත් අහිමි වෙලා තිබෙනවා. ඉතින්, මෙවැනි සියුම් තැන් නිරීක්ෂණය කරමින් ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කිරීම මේ අය වැය තුළ අපට දකින්න ලැබෙනවා. ඒ අනුව මෙවර අය වැයෙන් ඔටිසම් වැනි ස්නායු ආබාධ සහිත දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය නහා සිටුවීමටත්, ඒ වෙනුවෙන් අවශ්‍ය සෞඛ්‍යය, අධ්‍යාපනය ඇතුළු අනෙකුත් සේවාවන් සඳහා අවශ්‍ය ජාතික වැඩසටහනක් සම්පාදනය කිරීමටත් මුදල් වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 200ක් ඒ වෙනුවෙන් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ඉදිරි වසර 5 තුළ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරන්න අපි මේ තුළින් අපේක්ෂා කරනවා. එවැනි දරුවන් වෙනුවෙන් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක්, ඒ වාගේම පහසුකම් සහිත දිවා සුරැකුම් මධ්‍යස්ථාන සකස් කිරීමේ වැඩ පිළිවෙළ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළින් නව රජයේ මානුෂීය ගුණාංග වඩාත් පැහැදිලි වෙනවා.

කාන්තාවන් කියන්නේ, ඕනෑම තත්ත්වයකදී සමාජයේ අභියෝගාත්මක අවස්ථාවලට දීර්ඝ ලෙස පෙනී සිටින්න හැකි පිරිසක් වුවත්, හිංසනයට ලක් වන, ඒ සියල්ල නිහඬව දරාගෙන සිටින කාන්තාවන් බහුතරයක් අපේ රටේ ඉන්නවා. මෙවැනි තැන් පවා ස්පර්ශ කරමින් මෙම අය වැය සකස් කර තිබෙනවා. "කාන්තා හිංසනය" කියන්නේ, ආර්ථික ක්‍රියාවලිය තුළ, නිවස තුළ, සමාජය තුළ ඇතැම් අවස්ථාවල පොදුවේ අපට දකින්නට ලැබෙන මානෘකාවක්.

එවැනි කාන්තාවන් සමාජයත් එක්ක ගනුදෙනු කරන්නේ හරිම පරිස්සමින්. ඒ නිසාම ඔවුන් ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්න තිබෙන ඉඩ කඩ ඇහිරී යන අවස්ථා තිබෙනවා. නව රජය ස්ත්‍රියකගේ ආරක්ෂාව, ඇයට එරෙහිව සිදු වන හිංසනය වැළැක්වීම වෙනුවෙන් මෙවර අය වැයෙන් වෙන් කර ඇති මුදල් රුපියල මිලියන 120ක්. විශේෂයෙන් වේගවත් පිම්මක් ගන්නට සූදානම් වන රජය විශ්වාස කරනවා, සවිබලගැන්වුණු කාන්තාව ජාතික ආර්ථිකයට දායක කර ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් විධියට.

නිෂ්පාදන ආර්ථිකයත් එක්ක පුනරුදය ප්‍රධාන අභිලාෂය කර ගත් රජයක ව්‍යවසායකයන් යනු සම්පතක්. ඒ ව්‍යවසායකයන් ගොඩ නැඟීම රටකට අත්‍යවශ්‍යයි. නව ව්‍යවසායකයන් ගොඩ නැඟීම ඇතුළේ පමණයි රටක ආර්ථික ක්‍රියාවලිය වේගවත්ව ඉදිරියට අරගෙන යන්න පුළුවන් වෙන්නේ. ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් සියයට 38ක් තරුණ ප්‍රජාව. තාරුණ්‍යය නිදහසෙන් පසු දැඩි අසීරු, අනෘජ්තිමත් කාලයක් ගත කරනු දකින්න ලැබුණා. ඒ සඳහා ඕනෑ තරම් උදාහරණ අපට ඉතිහාසයේ දකින්න ලැබෙනවා. විශේෂයෙන් තරුණයන්ට අධ්‍යාපනයේ අවස්ථා අඩුකම, ආර්ථිකයට සක්‍රිය ලෙස දායක වීමට අවස්ථා අඩුකම, තාක්ෂණික හා සන්නිවේදන දියුණුවේ කොටස්කරුවන් වීමට අවස්ථා නොමැතිකම, කොටින්ම කිව්වොත් ගෞරවනීය විධියට ජීවත්වීමට නොහැකිවීම අපේ රටේ තාරුණ්‍යය පසුගිය කාල සීමාව තුළ මුහුණ දුන් අමිහිරි සිදුවීම්. මේ රට තවදුරටත් අනාගත සංවර්ධනය කරා යන ගමනේදී තාරුණ්‍යයේ දායකත්වය අත්‍යවශ්‍යයි. විශේෂයෙන් දියුණු, බලසම්පන්න බලවේගයක් වන තරුණ ප්‍රජාව තවදුරටත් අවවරප්‍රසාදිත කොටසක් බවට අත්හැර දාන්න බැහැ, ඔවුන් මේ රටේ ජාතික ආර්ථිකයට දායක කර ගන්න ඕනෑ.

සමුපකාර ක්‍රමය හරහා විකල්ප නිෂ්පාදන ප්‍රවේශයක් අනුගමනය කරමින් තරුණ ව්‍යවසායකයන් ගොඩනැඟීම වෙනුවෙන් මේ වසරට පමණක් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක මේ රට අනාගත පුනරුදයක් කරා යන ගමනේ දීර්ඝ කාලීන ආයෝජනයක්. මේ අය වැය තුළ තරුණයන් ඇතුළු සමාජයේ සෑම කොටසක් ගැනම සෘජුව කථා කරන අතර, අමතක වුණු තවත් කොටසක් ඉන්නවා. ඒ තමයි රැකවරණ නිවාසවල සිටින දරුවන්. ඔවුන්ද මේ සමාජයේ අනෙක් දරුවන් හා සමානවම කොටස්කරුවන්. ඔවුන්ද ඉදිරි කාල සීමාවේ මේ රට බාර ගන්න ඉන්න පුරවැසියන්. ඔවුන් පිළිබඳවත් මේ රජයේ වැඩ පිළිවෙළ තුළ සාකච්ඡා කරනවා. විශේෂයෙන්

අපේ රජයේ ප්‍රතිපත්තියක් තිබෙනවා සෑම පුරවැසියෙකුටම ගෞරවාන්විත හා සුරක්ෂිත ජීවිතයක් ගත කිරීමට ඇති අවස්ථාව තහවුරු කිරීමේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය කියන්නේ මේ රටේ අස්සක් මුල්ලක් නැර සෑම ජන කොටසක් ගැනම සාකච්ඡා කරන, ඒ වාගේම මේ රටේ සෑම ජන කොටසකගේම අවශ්‍යතා මනා ලෙස විශ්ලේෂණය කරලා ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සකස් කරන ලද අය වැයක්. අන්තර්ගතය ගැන වැටහීමක් ඇතිව බැලුවොත් අපට පැහැදිලි වෙනවා කුඩා දරුවාගේ ඉඳලා සෑම පුරවැසි කොට්ඨාසයක් වෙනුවෙන්ම කුමන හෝ වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ අන්තර්ගත වෙලා තිබෙනවා කියලා. අපි හැම දාම මේ රටේ දැක්කේ ඒකාකාරී විධියට ගමන් කළ අය වැය ලේඛන. අපි පසුගිය කාලයේ දිගින් දිගටම දැක්කා හිතවතුන්ට, ගජමිතුරන්ට සහන දෙන්න මුදල් වෙන් කර ගත්ත අය වැය ලේඛන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය හරහා ජාතික ජන බලවේගය මූල්‍ය විනයක්, ආර්ථික දැක්මක් සහ මග පෙන්වීමක් ඇතිව අය වැයක් ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා පෙන්වලා තිබෙනවා. මේ රටේ ජනතාව තවදුරටත් අප ගැන විශ්වාස කරමින්, මේ අය වැය හරහා ලබා දෙන සහන ඔස්සේ අපි බලාපොරොත්තු වෙන පොහොසත් රට ගොඩනඟනකම් බලාගෙන ඉන්න බව විශ්වාසයි.

ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 4.03]

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(මාණ්ඩලික සභාපතිතුමා)
(The Hon. Fasmin Sharif)
කෞරව තලෙමෙතාඞ්කුම් උරුප්පිනර් අවර්කළේ, ඉලංකෙයින් වරලාට්රිල් මුතර් තටවෙයාක සනාතිපතියුම් නිති, තිට්ටමිටල් මට්රුම් පොරුළාතාර අපිවිරුත්ති අමෙච්චරුමාන මාණ්ඩලික අනුර කුමාර තිසානායක්ක අවර්කළාල් මුන්වෛක්කප්පට්ටුළ්ළ වරවු චෙලවුත්තිට්ටමානතු එල්ලා මක්කළුක්කුම් පොරුන්තක්කූටියතාක ඉරුක්කින්රතු. 2025ආම් ආණ්ටුක්කාන Budgetමූලම් එංකළුටෙය නාටු පෙරුම් මුන්නේට්රම් අටෙයුමෙන නාම් එතිර්පාර්ක්කින්රෝම්. ඉන්ත Budgetආනතු, නාට්ටින් වළර්ච්චික්කුම් මක්කළින් වාළ්වාතාරත්තෛ මේම්පටුත්තුවතර්කුම් මික මුක්කිය පංකු වකික්කුම්.

කම්පළෙයිලිරුන්තු නුවරෙලියාවුක්කු 50 කිලෝමීට්රර් තූරම් ඉරුක්කින්රතු. අතිකළවු tourists වරක්කූටිය නකරමාක කම්පළෙ නකරම් කාණප්පට්ටාලුම්, අංකු ඉතුවරෛ dry toilet ඔන්රුකූට ඉල්ලාත නිලෛමෛ කාණප්පටුකින්රතු. ඉන්ත නිලෛමෛයෛ මුන්පිරුන්ත අරසාංකංකළේ ඒර්පටුත්තියුළ්ළන. කම්පළෙයිලුළ්ළ අම්පුලුවාව පිරතේසම් අතිකළවු tourists වරක්කූටිය ඔර් ඉටමාක ඉරුක්කින්රතු. එනිනුම්, කම්පළෙ නකරිල් එන්තවිත අපිවිරුත්තියුම් ඒර්පටවිල්ලෛ. අතේනේරම්, කම්පළෙප් පිරතේසම් කුටිනීර් තට්ටුප්පාටුළ්ළ ඔරු පිරතේසමාකවුම් ඉරුක්කින්රතු. ඉන්ත නාට්ටින් පිරතම මන්තිරියාක ඉරුන්ත ඔරුවර් වාළ්න්ත තොලුව පිරතේසත්තිලුම් ඉන්ත නිලෛමෛ කාණප්පටුකින්රතු. ඉන්ත මුරෛ වරවු චෙලවුත්තිට්ටත්තිල් මාණ්ඩලික සනාතිපති අවර්කළ් කුටිනීර් වසතික්කුක් කූටුතලාන නිතියෛ ඔතුක්කියුළ්ළාර්.

ඉම්මුරෛ ආළුම් කට්චිප් පාරාළුමන්ර උරුප්පිනර්කළ් තංකළුක්කාන චිරප්පුරිමෛකළෛක් කුරෛත්තු, නාට්ටින් නලන්කාක්ක මුන්වන්තුළ්ළනර්. කුරිප්පාක, මාණ්ඩලික සනාතිපති, කෞරව පිරතමර් මට්රුම් පාරාළුමන්ර උරුප්පිනර්කළ් තූය්මෛයාන ඉලංකෛයෛ - Clean Sri Lanka - අමෛක්කුම් මුයර්චියිල් ඈටුපට්ටුළ්ළනර්. ඉවර්කළ් චුට්රුච්චූළල් පාතුකාප්පු, තූය්මෛ, පරාමරිප්පු විටයංකළිල් මුන්මාතිරියාකච් චෙයර්පටුකින්රාර්කළ්. ඉතු එංකළතු නාට්ටිලුළ්ළ චමුතායත්තෛ මුට්රිලුම් මාට්රියමෛක්ක උතවුම් එන්පතෛ නාන් ඉංකු උරුතියාකත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්.

අණ්මෛයිල් අක්කුරණෛයිල් වෙළ්ළම් ඒර්පට්ටපෝතු, නාංකළ් කෞරව රියාස් පාරූක් අවර්කළුටනුම් ඉන්නුම් චිල උරුප්පිනර්කළුටනුම් අතනෛප් පාර්වෛයිටච් චෙන්රෝම්. අප්පෝතු, මණල් පෝටක්කූටිය චිරියතෝර් ඉටත්තෛ අරස උත්තියෝකත්තර්කළ් තෙරිවු චෙය්තිරුන්තතෛ නාංකළ් කණ්ටෝම්. අතු පර්රි නාංකළ් විනවියපෝතු, අව්විටත්තුක්කු ඔව්වොරු මාතමුම් 172,000 රූපාය් කොටුප්පතාකච් චොන්නාර්කළ්. අප්පෝතු නාන් අංකිරුන්ත අතිකාරියිටම්, "ඉන්ත ඉටත්තිල් එව්වළවු තොකෛක්කු මණල් ඉරුක්කින්රතු" එන්රු කේට්ටේන්. අතර්කු අවර්, "150,000 රූපාය් පෙරුමතියුළ්ළ මණල් කුවිත්තු වෛක්කප්පට්ටුළ්ළතු" එන්රු කූරිනාර්. අප්පෝතු නාන්, අන්ත ඉටත්තිලුළ්ළ මණලෛ ඉලවසමාකක් කොටුත්තුවිට්ටු, අන්ත ඉටත්තුක්කුරිය කූලියෛ ඉරත්තුච් චෙය්තාල්කූට, අරසාංකත්තුක්කුප් පාරියතොරු තොකෛප් පණම් මීතමාකුමෙනක් කූරියපෝතු, අන්ත අතිකාරි මෙණමාක ඉරුන්තාර්. ඉව්වාරු චිල ඉටංකළිල් මුන්පිරුන්ත අරස අතිකාරිකළ් ඉතුපෝන්ර තවරාන චෙයලුක්කු උටන්තෛයාක ඉරුන්තිරුක්කිරාර්කළ්. අතනාල්තාන් අක්කුරණෛ පිරතේසත්තිල් ඒර්පටුම් වෙළ්ළම් මක්කළුක්කු අතික චේතත්තෛ ඒර්පටුත්තක්කූටිය වකෛයිල් ඉරුක්කින්රතු. ඉතනාල් වරුටාන්තම් චුමාර් 30 කෝටි රූපාය් නට්ටම් ඒර්පටුකින්රතු. එනවේ, ඉතු චම්පන්තමාකක් කවනම් චෙලුත්తి, උරිය නටවටික්කෛ එටුක්කුමාරු නාන් කෞරව අමෙච්චර් අවර්කළෛ කේට්ටුක්කොළ්කින්රේන්.

මේලුම්, තේවෛයුටෛයෝරෛ අටෛයාළම් කාණ්ටු 'අස්වෙසම' කොටුප්පනවෛක් කොටුප්පතර්කුම්, චිරේෂ්ට පිරජෛකළුක්කාන වට්ටි මානියත්තුක්කුම් ඉම්මුරෛ වරවු චෙලවුත්තිට්ටත්තිල් නිති ඔතුක්කීටු චෙය්යප්පට්ටුළ්ළතු. එමතු අරසාංකම්, තේවෛයුටෛය මක්කළින් නලනුක්කාකප් පල්වේරු තිට්ටංකළෛ වකුත්තුළ්ළමෛ මනතුක්කු චන්තෝෂත්තෛ තරුකින්රතු. අත්තෝටු, චිරිය මට්රුම් නටුත්තර තොළිට්රුමුරෛයෛ ঊක්කුවිත්තල්, පොතුප් පෝක්කුවරත්තු, කිරාමප්පුර අපිවිරුත්ති, විවචායප් පුත්තෙළුච්චි, උළ්ළූර් තොළිල්මුනෛවු, ආරාය්ච්චියෛ වණිකමයමාක්කුතල් මට්රුම් තටෛයට්ර උළ්නාට්টු, වෙළිනාට්টු ඒට්රුමති චාර්න්ත උට්පත්తి ආකියවට්රුක්කු වළංකළෛ ඔතුක්කියුළ්ළතන්මූලම් නාටු පෙරුම් අපිවිරුත්තියෛ අටෛයුමෙන නාම් එතිර්පාර්ක්කින්රෝම්. අරස ঊළියර්කළින් ආකක් කුරෛන්ත මාතාන්ත අටිප්පටෛච් චම්පළම් 24,250 රූපායිලිරුන්තු 40,000 රූපාය් වරෛ, 15,750 රූපායාල් අතිකරික්කප්පට්ටුළ්ළතු. නාට්ටින් පොරුළාතාර නිලෛ කරුති අතනෛක් කට්టංකට්టමාක වළංකුවතර්කු නටවටික්කෛ එටුක්කප්පට්ටුළ්ළතු.

[ගරු ෆස්මින් ෂරීෆ් මහතා]

මලෙයක මක්කළින් වාෂ්වාතාරත්තෙ මේම්පටුත්තුවතර්කාක 7,583 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටුළ්ළතු. මලෙයක මක්කළින් වීටමෙප්පු වසතික්කාක 4,267 මිල්ලියන් රූපායුම්, මලෙයක තමිල් ඉළෙඤර්කළින් තොෂිර්පයිර්චික්කාක 2,450 මිල්ලියන් රූපායුම් ඔතුක්කප්පට්ටුළ්ළ අතේනේරම්, තෝට්ටත් තොෂිලාළර්කළින් නාට්චම්පළත්තෙ 1,700 රූපායාක අතිකරිප්පතර්කුම් අරචාංකම් මුන්වන්තුළ්ළතු. මේලුම්, කණ්ටි 'කුට්චෙට්' පස් තරිප්පිටත්තින් අපිවිරුත්තික්කාක 7.7 පිල්ලියන් රූපායුම්, පස් කොළ්වනවුක්කාක 3,000 මිල්ලියන් රූපායුම් ඔතුක්කප්පට්ටුළ්ළතු. මේලුම්, විවචායත්තුක්කු 54,000 මිල්ලියන් රූපායුම්, කල්වික්කු 12,000 මිල්ලියන් රූපායුම් ඔතුක්කප්පට්ටුළ්ළතු. විවචායිකළින් නලන්කරුති තම්පුත්තේකමවිල් කළඥ්චිය වසතිකළ් අමෙප්පතර්කාක 100 මිල්ලියන් රූපායුම් ඔතුක්කප්පට්ටුළ්ළතු.

ඉන්ත වරවු චෙලවුත්තිට්ටත්තිල් මූලතනච් චෙලවුක්කාක මොත්ත උළ්නාට්ටු උර්පත්තියිල් 4 චතවීතම් ඔතුක්කප්පට්ටුළ්ළතු. ඉතු පොරුළාතාර වළර්ච්චියෙ මුන්නකර්ත්තුවතර්කාන අරචාංකත්තින් මුක්කිය පංකළිප්පාකුම්. ඉන්ත ආණ්ටිල් පොරුට්කළ් මර්රුම් චේවෛකළිනි එර්රුමතිමූලම් කිට්ටත්තට්ට 19 පිල්ලියන් ටොලරුක්කු අණ්මිත්ත වරුමානත්තෙ - මුන්නොරුපෝතුම් ඉල්ලාත උයර්වෙ - අටෙයලාමෙන නාංකළ් එතිර්පාර්ක්කින්රෝම්. මක්කළින් අටිප්පටෙත් තේවෛකළාන පාතෙ, මින්චාරම්, කුටිනීර් පෝන්ර වසතිකළෙක්කූට, චෙන්ර අරචාංකංකළාල් මක්කළුක්කුප් පෝතියළවු පෙර්රුක්කොටුක්ක මුටියවිල්ලෙ. කෙරවලප්පිට්ටි චුංක කණ්කාණිප්පු නිලෙයම් මර්රුම් පූළුමෙණ්ටල් චරක්කු පෝක්කුවරත්තුප් පූංකා කාණි කෙයකප්පටුත්තල් චෙයල්මුරෙ මර්රුම් ආරම්ප ආයත්තප් පණිකළුක්කාක 500 මිල්ලියන් රූපාය් ඔතුක්කප්පට්ටුළ්ළතු. ඉන්තච් චන්තර්ප්පත්තිල් ඉන්නොරු විටයත්තෙ ඥාපකප්පටුත්ත විරුම්පුකින්රේන්. අතාවතු, NLDBක්කුච් චොන්තමාන තෝට්ටංකළ්, Ridiyagama Farm පෝන්රවර්රෙ හරි ජයවර්ත්තනා අවර්කළ් විර්පතර්කු මුටිවු චෙය්තිරුන්තාර්. ඉන්රු එමතු අරචාංකම් ආට්චියිල් ඉල්ලාතු ඉරුන්තිරුන්තාල්, අවර් අවර්රෙ විර්රිරුප්පාර් එන්පතෙ නාන් ඉංකු කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්.

කම්පළෙ නකරමානතු, වෙළිනාට්ටු චුර්රුලාප් පයණිකළ් වන්තුචෙල්ලක්කූටිය ඔරු මුක්කිය ඉටමාක ඉරුක්කින්රතු. එතිර්කාලත්තිල් නාංකළ් කම්පළෙ නකරත්තිල් tourist hotels, spice gardens මර්රුම් තේවෛයාන අනෙත්තු වේලෛත්තිට්ටංකළෙයුම් මේර්කොළ්වතර්කු ඉන්ත අරචාංකත්තින්මූලම් පාරිය මුයර්චිකළෙ එටුක්කවුළ්ළෝම්. ඉනිවරුම් කාලංකළිල් එංකළුටෙය මාණ්පුමිකු චනාතිපති අවර්කළ් කම්පළෙක්කු කූටුතලාන නිතියෙ ඔතුක්කි, අංකු අපිවිරුත්ති වේලෛකළෙච් චෙය්තු තරුවාරෙන නාංකළ් එතිර්පාර්ක්කින්රෝම්.

මේලුම්, අත්තියාවචිය අරචාංකත්තුරෙප් පතවිකළුක්කු 30,000 පේරෙ ආට්චේර්ප්පුච් චෙය්යවුම් එමතු අරචාංකම් තීර්මානිත්තුළ්ළතු. අරච උත්තියෝකත්තර්කළින් වාෂ්වාතාරත්තෙ මේම්පටුත්තුම් නෝක්කිල්, අවර්කළුටෙය චම්පළත්තෙ උයර්ත්තික්කොටුත්තු, අවර්කළින් වාෂ්ක්කෙයිල් ඒර්පච්චම් ඒර්පට වළිචෙය්තුළ්ළතු. කොළුම්පු - කණ්ටි අතිවේකප් පාතෙ නිර්මාණප් පණියින් රම්පුක්කනෙ වරෙයාන පාතෙ නිර්මාණිප්පුක්කු නිති ඔතුක්කියුළ්ළමෙ කණ්ටි වාෂ් මක්කළින් පොරුළාතාරත්තිල් පෙරුම් එළුච්චියෙ ඒර්පටුත්තුම් එන්පතිල් ඉයමිල්ලෙ එන්පතෙ නාන් කණ්ටි මාවට්ට මක්කළ් පිරතිනිති එන්ර වකෙයිල් කූරුකින්රේන්. ඉන්ත වරවු චෙලවුත්තිට්ටත්තිල් නකර අපිවිරුත්තික්කාකප් පෙරුමළවු නිති ඔතුක්කප්පට්ටුළ්ළමෙ මුක්කියමානතොරු විටයමාක උළ්ළතු.

ඒ වාෂ්මේ මම මේ කාරණෙයත් කියන්න කැමැතියි. ගම්පොළ නගරය කියන්නේ විශේෂ නගරයක්. සංචාරකයන් විශාල ප්‍රමාණයක් එන ප්‍රදේශයක් වන ගම්පොළ නගරයේ ටොයිලට් එකක් නැති තත්ත්වයක් තමයි තිබුණේ. අපි ඉදිරියේ දී එහි spice gardens, ඒ වාගේම tourist hotels හදන්න බලාපොරොත්තු වෙනවා. අම්බුළුවාව කියන්නේ ලංකාවේ සුවිශේෂ ස්ථානයක්. අපි ඉදිරි කාලයේදී ඒ තැන්වල සියලු සංවර්ධන වැඩකටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ගම්පොළ ඉඳලා නුවරඑළියට කිලෝ මීටර් 50ක දුරක් තිබෙනවා. ගම්පොළ නගරයේ ඉඳලා පුස්සැල්ලාව නගරයට යනකල් අපේ සහෝදර දෙමළ ජනතාව ජීවත් වෙනවා. ඒ ලස්සන ප්‍රදේශය ඉදිරි කාලයේදී සියලු පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒකට අපේ ඇමතිවරුන්ගෙනුත්, මේ රජයෙනුත් අපි උදවු උපකාර බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලා දන්නවා, ගම්පොළ නගරය කියන්නේ අගමැති කෙනෙක් හිටපු නගරයක් බව. අගමැති කෙනෙක් හිටපු නගරයක් වුණත් දොළුව ප්‍රදේශයේ ගෙවල්වලට තවම වතුර නැතුව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගම්පොළ ප්‍රදේශයට ලොකු වතුර ව්‍යාපෘතියක් ලබා දෙන ලෙස. ඒ වාගේම ඉඩම් ප්‍රශ්න තිබෙනවා. ලැයිම්වල ජීවත්වන ජනතාව බලන්න මම හුහක් තැන්වලට ගිහිල්ලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(මාණ්පුමිකු පස්මින් ෂරීප්)
(The Hon. Fasmin Sharif)
වතුවල ටොයිලට් සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම බඹරු ගහලා ගම්පොළ ප්‍රදේශයේ පුස්සැල්ලාවේ මෑනකදී එක් අයෙකුගේ ජීවිතය නැති වුණා. ඊට කලින්, වයස අවුරුදු අටක ළමයකුගේ ජීවිතය නැති වුණා. ඒ ගැටලු විසඳා ගැනීමටත් මේ රජයෙන් අපට උදවු කරන්න කියලා ඉල්ලමින්, මට මේ අවස්ථාව ලබා දීපු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට බොහොම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි විසිදෙකක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.16]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි අර්ජූන සුජීව සේනසිංහ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු කිහිපයකට පස්සේ තමයි මට පාර්ලිමේන්තුවේදී නැවත කථා කරන්න අවස්ථාව ලැබෙන්නේ. මේ, ජනතා විමුක්ති පෙරමුණේ සහ මාලිමාවේ මංගල අය වැය. මා ප්‍රථමයෙන්ම ජනාධිපතිවරයාට සුබ පතනවා. ඒ වාගේම අපේ පරණ මිත්‍රයන් වන බිමල් රත්නායක මැතිතුමා, හඳුන්නෙත්ති මැතිතුමා, විජිත හේරත් මැතිතුමා අද ඇමතිවරු

බවට පත් වෙලා ඉන්නවා. ඒ ගැන සන්තෝෂයි. ඒ වාගේම අනෙකුත් ඇමතිවරු ඉන්නවා. මන්ත්‍රීවරුන් 159ක තුනෙන් දෙකක බලයක් ලබා ගැනීමට ඔබතුමන්ලාට හැකියාව ලැබුණා. පාර්ලිමේන්තුවට පැමිණි ඒ සියලු මන්ත්‍රීවරුන්ට මා සුබ පතනවා. අපේ රටට හොඳ අනාගතයක් උරුම කරන්නට වාසනාව ලැබෙන්න කියලා ඒ ගොල්ලන්ට සුබ ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ගැන කථා කරන කොට මම මුලින්ම මේ කාරණය කියන්න ඕනෑ. මම පාර්ලිමේන්තුවේ මීට කලින් සිටි කාලයේ -මා ඇමතිවරයකු වශයෙන් කටයුතු කළ කාලයේ- ජනතා විමුක්ති පෙරමුණත් එක්ක ඉතා ළඟින් කටයුතු කළා. මම ඇමතිවරයකු වශයෙන් කටයුතු කරන කොට කවදාවත් මගේ අමාත්‍යාංශ සම්බන්ධයෙන්, මගේ කල්ක්‍රියාව සම්බන්ධයෙන් කිසිම වෙලාවක ඒ මන්ත්‍රීවරු විවේචනයක් ඉදිරිපත් කළේ නැහැ. මම අභියෝග කරනවා, එහෙම කරලා තිබෙනවා නම් හැන්සාඩ් වාර්තාවෙන් ඒක පෙන්වන්න කියලා. විරුද්ධ පක්ෂයේ ඕනෑම මන්ත්‍රීවරයෙක් ආණ්ඩුවේ ඇමතිවරුන්ට චෝදනා ඉදිරිපත් කරනවා. හැබැයි, මට විරුද්ධව කිසිම චෝදනාවක් ඒ අවුරුදු ගණන තුළ ඒ මන්ත්‍රීවරු ඉදිරිපත් කළේ නැහැ. ඒකේ ප්‍රශංසාව මා එතුමන්ලාට දෙනවා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළදී අවශ්‍ය තැන්වල පමණක් ඒ ආකාරයෙන්ම සාධනීය ලෙස එතුමන්ලා විවේචනය කරන්නත්, හොඳ දෙයක් වෙනවා නම් ඒ හොඳ කියන්නත් මම බලාපෙරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්දය කාලයේ ඡන්ද බිමේ හැසිරෙන්නේ කොහොමද කියන එක ගැන මට හොඳට තේරෙනවා. පසුගිය අගෝස්තු මාසයේ ඉඳලා ජනතා විමුක්ති පෙරමුණ ටිකින් ටික ජනතාවට ළං වෙන්න පටන් ගත්තා. විශේෂයෙන් අනුර දිසානායක මැතිතුමා ඒ ඡන්ද ව්‍යාපාරයේදී ජනතාව අතරට ආවා. ඒ මන්ත්‍රීවරු ගොඩක් කථා කළා, දූෂණය ගැන. විශේෂයෙන්ම රාජපක්ෂ යුගයේ දූෂණ ගැන විශාල ලෙස කථා කරපු පුද්ගලයෙක් තමයි, මම. ඔවුන්ගේ කාලයේ දූෂණය ඉහවහා ගිහිල්ලා තිබුණා. රට බංකොලොත් වෙන තරමට ඒ පාලනය මේ රටේ අනාගතය විනාශ කරලා දැම්මා. ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා -අනුර දිසානායක මැතිතුමා- ඒ තත්ත්වය හොඳට පාවිච්චි කළා.

මම ඒක දැක්කා. සාමාන්‍යයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයෝ දේශපාලන වශයෙන් මට පහර ගහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි එතුමන්ලා පරාජය කරන්න මම උත්සාහ කළේ, ඒ අයගේ පවුල්, ඒ අයගේ පෞද්ගලික ජීවිතය, එහෙම නැත්නම් 88-89 කාලය ගැනවත් කියලා නොවෙයි, ඒ අයගේ නොහැකියාව සම්බන්ධව කියලායි. ආණ්ඩුවක් භාර ගත්තොත් ඒ ආණ්ඩුවට රට දියුණු කරන්න අවශ්‍ය ශක්තිය, දක්ෂතාව සහ පළපුරුද්ද අවශ්‍ය බව සහ ඔවුන්ට එය නැති වීම පිළිබඳවයි මම කථා කළේ. මම මේ මාස ගණනම නිහඬව හිටියා. මොකද මම එතුමන්ලාට සාධාරණ අවස්ථාවක් ලබා දුන්නා, රටේ දියුණුවක් පෙන්වන්න.

නමුත්, කියන්න කනගාටුයි. මේ අය වැය දැක්කා නම් රෝහණ විජේවීර මැතිතුමා අඬයිද, නැත්නම් හිනාවෙයිද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. සෝමවංශ අමරසිංහ මැතිතුමාගේ කථා අසා තිබෙන නිසා මම දන්නවා, මේ අය වැය දැක්කා නම්, එතුමා අනිවාර්යයෙන්ම මේ ගැන කනගාටු වන බව. මොකද, ජනතා විමුක්ති පෙරමුණ -මාලිමා ආණ්ඩුව- කෙළින්ම ලොකු විපර්යාසයක් ඔවුන්ගේ දේශපාලන දර්ශනයේ ඇති කරගෙන තිබෙනවා. ඒක U-turn එකකට වැඩිය V-turn එකක් වාගේ ලොකු විපර්යාසයක්. ඒ ගැන මම සන්තෝෂ වෙනවා. මොකද, අපේ සමහර ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේම එය සාධනීය තත්ත්වයක්. ඉදිරියේදී මේ රට දියුණු කරන්න පුළුවන් වපසරිය මේකෙන් හැදෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මොකද, ඉතිහාසය තුළම මේ රටේ සංවර්ධනයට ජනතා විමුක්ති පෙරමුණ බාධා කළා. විශේෂයෙන්ම පෞද්ගලීකරණය, විවෘත ආර්ථිකය, ලිබරල්වාදය යනාදියට විශාල ලෙස පහර ගැහුවේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා. අපි විජේවීර සහෝදරයාගේ කථා අසා තිබෙනවා. එකවරක් එතුමා එක හෙළාම කිව්වා, ඔවුන් අනුගමනය කළ සමාජවාදී, මාක්ස්වාදී දර්ශනය අත හැරියොත් ඒක පාවාදීමක් කියලා. එම පාවාදීම පක්ෂයට හොඳ නොවුණත්, මම හිතන හැටියට එම වෙනස් වීම අපේ රටට නම් ඉතාම සාධනීය තත්ත්වයක්. එතුමන්ලා විපක්ෂට ගිය දවසක වුණත්, දූෂණයෙන් තොරව, හරියට ආණ්ඩුවක් කරන දක්ෂ කණ්ඩායමකට නැවත මේ රට භාරදෙන්න පුළුවන් වපසරිය මේ වෙනකොට ඇති වෙලා තිබෙනවා.

මම දැක්කා මේ මන්ත්‍රීවරු ගොඩක් වෙලාවට කියන්න හදනවා, මේ තත්ත්වයට වග කියන්න ඕනෑ පසුගිය රජයන්, පසුගිය පාලකයන් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි එතුමන්ලාට අමතක වනවා, ඒ සියලු පාලකයන්ට ජනතා විමුක්ති පෙරමුණ එක හෙළා සහයෝගය ලබා දුන් බව. චන්ද්‍රිකා කුමාරතුංගට අපි සහයෝගය දුන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ යම් විනාශයක් කළා නම්, හොරකම් කළා නම්, දූෂණ කළා නම්, එතුමාගේ පවුලේ උදවිය සහ සගයන් යම් විනාශයක් කළා නම්, ඒකට කෙළින්ම මේ මන්ත්‍රීවරුත් වගකියන්න ඕනෑ. මේ වෙලාවේ ගරු බිමල් රත්නායක සහෝදර ඇමතිතුමා හිටියා නම් මම සන්තෝෂ වනවා. Facebook එක බලනකොට මම දැක්කා, එතුමා ඉතා තරුණ කාලයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ගුණ, ඒ ආණ්ඩුවේ ගුණ වර්ණනා කර තිබෙනවා. එහෙම නම් එතුමන්ලාට බැහැ, අපට අත දික් කරන්න හෝ ඇඟිල්ල දික් කරන්න. චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරුන්ගේ කාලවල තිබුණු සියලු ආණ්ඩුවලටත්, ෆොන්සේකාටත් ජනතා විමුක්ති පෙරමුණ කෙළින්ම සහයෝගය දීලා තිබෙනවා. නමුත් අපි ඒ ආණ්ඩුවල හිටියේ නැහැ. අවුරුදු 20ක ඒ පාලන කාලයේ රටේ ව්‍යසනයක් වුණා නම්, ඒ ආණ්ඩුවල අපි හිටියේ නැහැ.

ජේ.ආර්. ජයවර්ධන, ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, ගාමිණී දිසානායක කියන අපේ නායකයෝ සියලුදෙනා ගැන අපි ඉතා ආඩම්බර වනවා. ඒ කාලයේ කරපු සංවර්ධන කටයුතු තමයි අදටත් පවතින්නේ. මේ ආණ්ඩුව යම් සංවර්ධනයක් කරන්න බලාපොරොත්තු වනවා නම්, ඇඟලුම් කර්මාන්තයට ඒ සහන ලබා දෙන්න කියා මම කියනවා. පසුගිය වසරේ ඇඟලුම් කාර්මාන්තයෙන් ලැබුණු ආදායම ඩොලර් බිලියන 4යි. මෙතුමන්ලාට මෙවැනි අය වැයක් ඉදිරිපත් කරන්නවත් පුළුවන් වුණේත්, අපේ නායකයෝ කරපු දේවල් නිසායි. අතීතයට බැණ බැණ, මේ අය වැය ඉදිරිපත් කළත් ඔබතුමන්ලාට අය වැය ඉදිරිපත් කරන්න ඩොලර් බිලියන 4ක් ලැබෙන්නේ අපේ නායකයෝ කරපු සංවර්ධනය නිසායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මහවැලි ව්‍යාපාරය ගන්න. අපේ නායකයෝ 80 දශකයේ තමයි එම කාර්යභාරය කළේ. මෙච්චර කල් ගිහිල්ලාත් ලංකාවට අවශ්‍ය විදුලි බලයෙන් තවමත් සියයට 50කට වැඩිය උත්පාදනය කරන්නේ මහවැලියෙන්. එහි වටිනාකම ගණනය කළොත් ඩොලර් බිලියන 10කට ආසන්න වෙයි. ඒ නිසා මම හිතන හැටියට ජනතා විමුක්ති පෙරමුණේ නායකයා වන ජනාධිපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් තුළ ඒ කුහකත්වය නැති වෙන්න ඕනෑ. අන්න, ඒ මිනිසුන් හොඳ දෙයක් කළා කියලා කියන්න පුළුවන් වෙන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ දූෂණයට විරුද්ධව සටන් කිරීම ගැන අපි සන්තෝෂයි. දූෂණය පැත්තෙන් ගත්තොත් ඔවුන්ට

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

කාලයක් තිබුණේ නැහැ, දූෂණ කරන්න සහ යම් දෙයකට දායක වෙන්න. හැබැයි මේ මාස 5 තුළ නම් අපට දකින්න ලුළුවන් වුණා, විශේෂයෙන්ම කන්ටේනර් තුන්සිය ගණනක් මුදා හැරීම, Technical Evaluation Committee එකෙන් reject කරපු සමාගමකට මෙගාවොට 50ක් ලබා ගත හැකි සුළං විදුලි බලාගාර ව්‍යාපෘතියකට අවසර දෙන එක. ඒවා ගැන අපි ඉදිරියේදී කථා කරමු. මම මේ කථා කරන්න පටන් ගත්තා විතරයි. ඒ අවස්ථාව අපි ලබා දෙනවා ජනතා විමුක්ති පෙරමුණට; මාලිමා ආණ්ඩුවට. දූෂණ සම්බන්ධයෙන් එතුමන්ලාගේ කල් ක්‍රියාව යම් ආකාරයකින් අපි පැසසුමට ලක් කරනවා. අපි කුහක වෙන්නේ නැහැ, හොඳ දෙයට හොඳයි කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ මේ කාලය තුළ වෙනස් වෙලා කියලා හඳුන්නෙත්ති මැතිතුමා කියනවා මම දැක්කා. ඔබතුමන්ලා අගය කරන ලිබරල්වාදය අපි වැලඳගෙන ඉන්නවා, ඒ අනුව තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරන්නේ කියලා එතුමා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මම එක කරුණක් කියන්න ඕනෑ. එතුමාගේ ඒ පිළිගැනීම සම්බන්ධයෙන් අපි සන්තෝෂ වෙනවා. හැබැයි, එකක් තිබෙනවා. එතුමා අහනවා, හර්ෂ, සුජීව ඇතුළු ඔබතුමන්ලා ඇයි මේ අය වැයට විරුද්ධ වෙන්නේ, එහෙම නම් මේ අය වැයට සහයෝගය දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කාරණය හිතේ තියාගන්න ඕනෑ. සාමාන්‍යයෙන් සුද්දෝ සූට් අඳිනවා. සුද්දා තමයි සූට් අඳින්න පටන් ගත්තේ. ඔවුන්ගේ බෙල්ල දිගයි. මම හිතන විධියට shoulder එකත් අහල් 40ක් විතර තිබෙනවා, ඉණ සාමාන්‍යයෙන් අහල් 28ක් විතර තිබෙනවා. සුද්දන්ට සූට් එක ඇන්දාම ලස්සනයි. සුද්දෝ ඇන්දාට පස්සේ තමයි අපිත් සූට් එක අඳින්න පටන් ගත්තේ. හැබැයි, අපට මේ සූට් එක එච්චරම ලස්සන නැහැ. මොකද, අපේ ඉණ අහල් 40ක් විතර වෙනවා, shoulder එක අහල් 25ක් විතර වෙනවා. ඒ නිසා අපට ඒ සූට් එක ගැළපෙන්නේ නැහැ. හැබැයි, අපි ඒ සූට් එක ඇඳගෙන ඉන්නවා.

ඒ වාගේම තමයි මේ විවෘත ආර්ථිකයත්, ලිබරල් ආර්ථිකයත්. මෙතුමන්ලා ඒක ඇඳ ගත්තාට මෙතුමන්ලාට ඒක ලස්සන නැහැ. ඒක අපේ ඇඳුම. ජේ.ආර්. ජයවර්ධන මහත්මයලා ඒක ගෙනාවේ. ඊට පස්සේ චන්ද්‍රිකාලා ඒකට මඩ ගැහුවා. රාජපක්ෂලා ඒකට මඩ ගැහුවා. හැබැයි, අද ලෝකයම ලිබරල් ආර්ථිකය පිළිගෙන තිබෙනවා. මම දැක්කා ලාල් කාන්ත ඇමතිතුමා කියනවා, මේක මාක්ස්වාදය නොවෙයි, මේක ලිබරල්වාදය නොවෙයි, අපි ආණ්ඩුවේ සහයෝගය ඇතිව සාධනීය ලෙස මේ විවෘත ආර්ථිකය සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා. චන්ද්‍රිකාත් ආවේ ඔහොමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ලෝකයේ ඔක්කෝම රටවල ක්‍රියාත්මක වෙන්නේ මේ විවෘත ආර්ථිකය. ඉන්දියාව, චීනය, රුසියාව යන සියලු රටවල් ක්‍රියාත්මක කරන්නේ, මඩේ දදා හෝද හෝදා ක්‍රියාත්මක කරන්නේ විවෘත ආර්ථිකය. හැම රටකම ඒ සඳහා රජයේ මැදිහත්වීමක් තිබෙනවා. අපි ඉතිහාසය දිහා බැලුවොත්, චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ කියන ඔය හැමෝම මේ ක්‍රමය වෙනස් කළේ නැහැ.

හැබැයි, අපි කරපු දේ කරන්න බැරි වුණා. අපි ඉතා සුළු කාලයක් තුළ මහවැලිය, ඇහලුම් කර්මාන්තය දියුණු කළා. ඒ, යුද්ධ දෙකක් රටේ තිබියදී. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ ඒ කාලය තුළ කරපු විනාශය බලන්න. මම ඉතිහාසය කථා කරන්න කැමැති නැහැ. හැබැයි, ආර්ථිකය ගැන කථා කරපු නිසායි මම මේක කියන්නේ. ඒ විනාශය ඩොලර් බිලියන 150කට වැඩියි. එදා private medical collages නැවැත්වූවා. පෞද්ගලික විශ්වවිද්‍යාල නැවැත්වූවා. පෞද්ගලික රෝහල් නැවැත්වූවා. සියලු සංවර්ධන ව්‍යාපෘතිවලට, විදේශ රටවල් සමඟ කරපු ආයෝජනවලට විරුද්ධ වුණා. ඒ වාගේම විශාල ව්‍යසනයක් ඇති වුණා; ජන ජීවිත නැති වුණා; දේපළ විනාශ වුණා. ඒ විනාශය විතරක් ගණන් හැදුවොත් කොපමණද? LTTE සංවිධානය කළ විනාශය ඩොලර් බිලියන 250කට ආසන්නයි කියලා ගණන් හදලා තිබෙනවා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ විනාශයත් ඩොලර් බිලියන 150කට ආසන්නයි කියලා ගණන් හදලා තිබෙනවා. එතකොට අපි සාධාරණ වෙන්න ඕනෑ. අපි මේ දේවල් විවේචනය කළාට අපි අතිනුත් වැරදි වෙලා තිබෙන්න පුළුවන්.

ජේ.ආර්. ජයවර්ධන මහත්මයා පිළිබඳ මට විවේචනයක් තිබෙනවා. එතුමා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කළ එකට මම විරුද්ධයි. එතුමාගේ කළගෙඩි-ලාම්පු සෙල්ලමටත් -ජන මත විචාරණයට- අපි විරුද්ධයි. හැබැයි, එතුමා කරලා තිබෙන කාර්යභාරය කොතරමිද? එතුමාට "ජේ.ආර්. ගේ ආර්ථිකය" කිය කියා බණිනවා. ජේ.ආර්. තමයි මේ විවෘත ආර්ථික ක්‍රමය ආරම්භ කළේ. චීනය, සිංගප්පූරුව වැනි රටවල් ජේ.ආර්. දිහා බලලා තමයි ඒ විවෘත ආර්ථිකය ගැන ඉගෙන ගත්තේ. ඒ මහත්වරු නියම මහත්වරු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමුන්ගේ දේපළ -වෝඩ් පෙදෙසේ තිබුණු පර්චස් 80ක් වාගේ ප්‍රමාණයක්- පවා ජනතාවට පරිත්‍යාග කරලායි අපේ නායකයෝ ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්මයා සම්බන්ධව අපට වෙනම සිද්ධියක් තිබෙනවා. අපට සෑහෙන විනාශයක් වුණා, අවුරුදු 35ක් තුළ. ඒක ගැන අපි කනගාටු වෙනවා. නමුත් එතුමා හොඳ දේවල් කරලා තිබෙනවා. මේ ආර්ථිකය තුළ ඔබතුමන්ලාට මේ අය වැය ඉදිරිපත් කරගන්න පවා එතුමා යම් කාර්යභාරයක් කරලා තිබෙනවා. බංකොලොත්භාවයෙන් එළියට ආපු රටවල් අතරින් අපි ලෝකයේ ප්‍රධාන රටක්. ඒ ගෞරවය එතුමාට යන්න ඕනෑ. හැබැයි, හොරකම් සම්බන්ධයෙන් සහ අනෙක් දූෂණ සම්බන්ධයෙන් එතුමාට ගොඩක් විවේචන පටබැඳිලා තිබෙනවා, රාජපක්ෂවරු එක්ක එකතු වීම තුළින්. අපි කෙළින් කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජිත් ප්‍රේමදාස මහත්මයා කියන්නේ හොරෙක් නොවෙයි. සජිත් ප්‍රේමදාස මහත්මයා දක්ෂයෙක්; තරුණයෙක්. එතුමාගේ කණ්ඩායම බැලුවොත්, ඉතා දක්ෂ කණ්ඩායමක්. ඔබතුමන්ලා හැම වෙලාවේම ඇඟිල්ල දිගු කරන්නේ විපක්ෂය කියලායි. රාජපක්ෂවරුන්ගේ යුගය ගැන අපට ඇඟිල්ල දිගු කරන්න එපා. ඒවාට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් එක්ක එකතුව සටන් කළේ අපි. අජිත්ලා, අපි, මේ මන්ත්‍රීවරු -අපි ඔක්කෝම-ඒ කාලයේ සටන් කළා. ඒ හින්දා ඔබතුමන්ලා කථා කරද්දි ඔක්කෝම එකට දමන්නේ නැතිව සාධාරණ ලෙස ඒ දේවල් කියන්න ඕනෑ. යම් චෝදනාවක් තිබෙනවා නම්, අපි උත්තර දෙන්න සූදානම්. හැබැයි ඒ දූෂණවලට සම්බන්ධ පුද්ගලයන් කවුද කියලා ඔබතුමන්ලා අවබෝධ කර ගන්න. අපේ පක්ෂය වන සමගි ජන බලවේගය අපි හදලා තිබෙන්නේ, පිරිසිදු, වැඩක් කරන්න පුළුවන්, දක්ෂතා තිබෙන, පළපුරුද්ද තිබෙන කණ්ඩායමක් විධියට.

මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා රාජ්‍ය සේවක වැටුප ගැන සඳහන් කළා. මම කෙළින්ම කියන්නම්, අය වැයේ තිබෙන රාජ්‍ය සේවක වැටුප ගැන. මම ඒ වැටුප් වැඩි වීම ගණනය කළා. නියෝජ්‍ය ඇමතිතුමනි, මට ලැබිලා තිබෙන දත්ත අනුව Primary Level-unskilled සඳහා වැඩි වෙන්නේ රුපියල් 5,900යි. 2025 වර්ෂය ඉවර වෙනකොට Management Assistant MN-1 ශ්‍රේණියට වැඩි වෙන්නේ රුපියල් 6,777යි.

Associate officerලාට වැඩි වෙන්නේ රුපියල් 7,700යි. ඒ වාගේම nursesලාට වැඩි වෙන්නේ රුපියල් 7,900යි. මේ ආකාරයෙන් රුපියල් 5,000, 6,000, 7,000 ගණන්වලින් වැටුප් වැඩි වෙනවා. අවුරුදු 3ක් යනකොට - 2028ට විතර ළඟා වෙනකොට - තව රුපියල් 8,000ක් විතර වැඩි වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි, අපි භාණ්ඩවල මිල ගණන් අරගෙන බලමු. මේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා, සියයට 5ක උද්ධමනයක්. හැබැයි, සියයට 5 උද්ධමනය සියයට 15කට, 20කට වැඩි වෙනවා, අවුරුදු 3කින්. මේ භාණ්ඩ මිල ගණන් දිහා බැලුවාම ඔබතුමන්ලාට ඒක පෙනේවි. මේ රටේ දුප්පත් ජනතාව වෙනුවෙන් තමයි ජනතා විමුක්ති පෙරමුණ කථා කළේ. හැබැයි, දුප්පත් ජනතාවත් එක්ක අපේ තමයි ඒ සහෝදරත්වය තිබෙන්නේ. මම දැක්කා, නියෝජ්‍ය ඇමතිවරයෙක් ඩ්‍රයිවර් මහත්තයාට බූරුවා කියලා කථා කරනවා. ඇවිල්ලා බලන්න, අපිත් එක්ක වැඩ කරන අපේ සගයන් ගැන. ඒගොල්ලන් කෑවාට පසුව තමයි අපි කන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ඔය කථා කරන මිනිස්සු දුප්පත් ජනතාව වෙනුවෙන් කඳුළු හෙළුවාට ඒක ඒ අයගේ බොක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අය වැය හදනකොටත් අනුර කුමාර ජනාධිපතිතුමා ලොකු යූ ටර්න් එකක් ගසා තිබෙනවා. එතුමාටත් අමතක වෙලා තිබෙනවා, මේ දුප්පත් ජනතාව. මේ දුප්පත් ජනතාව කන්නේ, බොන්නේ කොහොමද කියලා පොඩ්ඩක් හිතා බලන්න. එතුමන්ලා කියපු බොරු තොගය මම පෙන්වන්නම්. ඔබතුමාට පෙන්වන්නම්, රටට දුන් පොරොන්දු ප්‍රමාණය. 2019දී පරිප්පු කිලෝවක මිල රුපියල් 147යි; දැන් රුපියල් 349යි; 2025 අග වෙනකොට සියයට 5 උද්ධමනයත් එක්ක පරිප්පු කිලෝවක මිල රුපියල් 366ට ඉහළ යනවා. පාන් පිටි කිලෝවක මිල 2019දී රුපියල් 91යි; දැන් රුපියල් 183යි; සියයට 5 උද්ධමනයත් එක්ක 2025දී රුපියල් 192ට ඉහළ යනවා; 2028 වෙනකොට රුපියල් 230ක් වෙනවා. සීනි කිලෝවක් 2019දී රුපියල් 105යි; දැන් රුපියල් 289යි; ඊළඟ අවුරුද්දේ රුපියල් 303ක් වෙනවා; 2028දී රුපියල් 355ක් වෙනවා. සම්බා සහල් කිලෝවක් රුපියල් 100යි, ඒ කාලයේ; අද රුපියල් 265යි; එන අවුරුද්දේ රුපියල් 278යි; අවුරුදු 3කින් රුපියල් 330යි. මම මේ වාගේ භාණ්ඩ වර්ග 10ක විතර මිල ගණන් බැලුවා. මෙම ලේඛනය මම සභාගත කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කාලයේ මේ භාණ්ඩ ඔක්කෝම මිලදී ගන්න වැය වුණේ රුපියල් 2,900යි. නමුත් මේ අවුරුද්දේ ඒ සඳහා වැය වෙනවා, රුපියල් 6,719ක්. 2028 වෙනකොට වැය වෙනවා, රුපියල් 7,918ක්. ඒ කියන්නේ මේ අවුරුද්දට වඩා 2028 වෙනකොට රුපියල් 2,000කට ආසන්න මුදලක් වැය වෙනවා, මේ භාණ්ඩ ප්‍රමාණයට විතරක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට පඩි වැඩි කළත් ඒ උද්ධමනයත් එක්ක බැලුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙනවා. මම හිතන විධියට ජනාධිපතිතුමා ඒක හොඳින් අවබෝධ කර ගත්තා.

එතුමා කියනවා, "ආර්ථික අතින් ඉතා අධික ලෙස පහතට වැටීම නිසා රටේ ජනතාව දිළිඳුකමට පත්වී තිබෙනවා, ඒක නවත්වා ගන්නයි අපි උත්සාහ කරන්නේ." කියලා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැටී ඉන්න තැනින් ඒ අය උඩට ගන්න දෙයක් ගැන එතුමන්ලා විශ්ලේෂණය කරන්නේ නැහැ. මොකද, ඒක කරගන්න බැහැ; ඒ හැකියාව නැහැ. විශේෂයෙන්ම සංවර්ධනය පිළිබඳව කථා කළොත් සංවර්ධනය නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළත් වෙන්න කිසිම දෙයක්,-

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාවෙලා කියන්න, මට තව විනාඩි කීයක් තිබෙනවාද කියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි පහයි තිබෙන්නේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තව ගොඩක් කාරණා ගැන කියන්න තිබුණත් මට ඒවා කියන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අවුරුද්ද අවසන් වෙනකොට ඩොලර් බිලියන 5කට ආසන්න ප්‍රමාණයක් ණය ගෙවන්න සිදු වෙනවා. එතකොට මේ අය වැය අතිරික්තයෙන් ඩොලර් බිලියන 7 ½ක් වාගේ ප්‍රමාණයක්,- ඩොලර් බිලියන 12 ½ක් ඔබතුමන්ලා හොයන්නේ කොහොමද? කිසිම තැනක සඳහන් කරලා නැහැ, කර්මාන්ත පටන් ගන්නේ කොහේද කියලා. මම ඔබතුමාට සැලැස්මක් පෙන්වන්නම්. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. අපි එකතු වෙලා ඔබතුමන්ලාට උදව් කරන්නම්. අපි කුහක වෙන්නේ නැහැ.

මමත්, අජිත් පී. පෙරේරා මහත්මයාත් එකතු වෙලා තමයි මිල්ලනිය ප්‍රදේශයේ industrial zone එකක් පටන් ගැනීමට කටයුතු ආරම්භ කළේ. මේ සඳහා ඩොලර් මිලියන 500ක් ආයෝජනය කළා, රෝජනා සමාගම. මලික් සමරවික්‍රම මහත්මයායි, රනිල් වික්‍රමසිංහ මහත්මයායි අපට ඒක කරන්න ඉඩ දුන්නේ නැහැ. හැබැයි, අපි ගේට්ටුවටම හදලා ඉවරයි. කර්මාන්ත 200කට අවශ්‍ය ඉඩමත් වෙන් කරලා. ඒ වෙනුවෙන් මම ගරු ගයන්ත කරුණාතිලක මහත්මයාට ස්තුතිවන්ත වෙනවා. මොකද, මාසයකින් මට ඒ ඉඩම වෙන් කර දුන්නා. මට කිව්වා, ඉඩම වෙන් කරගන්න - divest කරගන්න - අවුරුදු 2ක් යනවා කියලා ධම්මික පෙරේරාගෙනුයි, දම්රෝ ආයතනයෙනුයි. නමුත් ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මට "දැන් එන්න මල්ලි" කියලා ඒ කටයුත්ත කරලා දුන්නා. ඒ අනුව මාසයක් ඇතුළත අපි ඒ ඉඩම වෙන් කර ගත්තා. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ගිහිල්ලා ගමේ කට්ටියට කථා කරලා ඒ පැත්ත ෂේප් කර ගත්තා. එතැනට JVP එකෙන් ගිහින් උද්ඝෝෂණයක් පටන් ගත්තා, මම හිතන විධියට ගෙවල් එකසිය ගණනක පිරිස එක්ක. අපි ගිහිල්ලා ඒකත් ෂේප් කර ගත්තා. දැනටත් ඒ කටයුතු පිළියෙල කරලා ඉවරයි. ඒක කරන්න අපි ඔබතුමන්ලාට සහයෝගය දෙන්නම්. ඔබතුමන්ලාට මේ වාගේ සැලැස්මක් නැහැ.

මගේ අතේ මේ තිබෙන්නේ National Export Strategy of Sri Lanka කියන සැලැස්ම. මම රාජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ මේ සඳහා යූරෝ මිලියන 5ක් ආධාර ලැබුණා. මේවා ණය නොවෙයි, තෑගි. ඔබතුමන්ලා දැන් plans හදන්න පටන් ගත්තොත්, ආදායමක් උපයන්න පටන් ගන්නකොට තව අවුරුදු 4ක්, 5ක් යයි. නමුත් මේ අවුරුද්ද අවසන් වෙනකොට ඩොලර් බිලියන 12ක් වැඩියෙන් හොයන්න ඕනෑ. ඊළඟ අවුරුද්ද වෙනකොට ඩොලර් බිලියන 15ක් හොයන්න ඕනෑ. 2028 වෙනකොට ඇඩ්‍රස් නැති වෙනවා, plan එකක් තිබුණේ නැත්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සියලු අමාත්‍යාංශවලට අදාළව මෙය සැලසුම් කර තිබෙනවා. මේක ක්‍රියාත්මක කිරීමට අපි උදව් කරන්නම්. අපිට කිසිම ගෙවීමක් අවශ්‍ය නැහැ. අපි ස්වේච්ඡාවෙන් ඔබතුමන්ලාට උදව් කරන්නම්, මේ රට ගොඩ දමන්න. නැත්නම් අපි ඔක්කෝම ඉවරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරු පොරොන්දු දීලා මේ විධියට ගියොත් මොකක්ද වෙන්නේ? ඩොලර් බිලියන 19ක් බලාපොරොත්තු වෙනවා, අපනයනවලින්. කොහොමද, එහෙම ආදායමක් ගෙනෙන්නේ? කොහෙන්ද, මේ අපනයන ආදායම එන්නේ? අවුරුදු 4ක්, 5ක් එක දිගටම ඩොලර් බිලියන 11 ½ ක් තිබෙන්නේ.

[ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා]

ඒ, අපේ දක්ෂතාවෙන් නොවෙයි, මේ රටේ වැඩ කරන, මහන්සි වෙන ව්‍යාපාරිකයන්ගේ දක්ෂතාවෙන්. මේ ආණ්ඩුවට විශේෂ සැලසුමක් නැහැ, මේ රට දියුණු කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි normal විධියට කරපුවාම ව්‍යාපාරිකයෝ ඒවා දියුණු කරගෙන යනවා. ඒ සංවර්ධනය තමයි ඔය සියයට 3.4, සියයට 5 කියලා පෙන්වන්නේ. හැබැයි, අපි එකතු වෙලා මේවා සංවර්ධනය කරන්න පුළුවන් මහකට යොමු කළොත්, මේ National Export Strategy of Sri Lanka ක්‍රියාත්මක කළොත් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. ඒක ක්‍රියාත්මක කරලාත් අවුරුද්දක් ගත වෙනවා, ප්‍රතිඵල ලැබෙන්න. මේ තිබෙන්නේ, හදපු සැලැස්ම. මේක හදන්නත් අවුරුදු 2ක් ගත වුණා. National Export Strategy of Sri Lanka සඳහා හාවර්ඩ් විශ්වවිද්‍යාලයෙන්, McKinsey and Company එකෙන් වාගේම European Economic Community එකෙන් විවිධ උපකාර ලැබෙනවා. European Economic Community එකෙන් තමයි අපට මේ යුරෝ මිලියන 5ක ආධාරය ලැබුණේ. ඊළඟට තිබෙනවා, Trade Information and Promotion Strategy එක. මේක පොඩ්ඩක් අලුත් කරගන්න ඕනෑ. මේක, 2022 වර්ෂයේ එක. ඊළඟට, Electrical and Electronic Components Strategy. සියලු අමාත්‍යාංශවලින් කරන්න ඕනෑ කාර්යභාරය මේකේ සඳහන් වෙනවා. හැම අමාත්‍යාංශයක්ම එකින් එකට සම්බන්ධ වෙලා, ඒ ආයතන කොහොමද වැඩ කරන්නේ, කොහොමද දියුණු කරන්නේ කියලා මේකේ සඳහන් වෙනවා.

ඊළඟට තිබෙනවා, Logistics Strategy. මේ, ඔබතුමන්ලා බලාපොරොත්තු වන සංවර්ධන ව්‍යාපෘති: Wellness Tourism Strategy, Boat Building Strategy, Information Technology Strategy. විශේෂ අධ්‍යයනයක් කරලා තමයි අපි මේ ටික ඉවර කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් මම සජිත් ප්‍රේමදාස මහත්මයාගෙන් අවසර ඉල්ලාගෙන තමයි මේ ටික ඉදිරිපත් කළේ. එතුමා කිව්වා, "මල්ලි, මේ ටික ඔයා දෙන්න" කියලා. හැබැයි, සමහර මන්ත්‍රීවරු කිව්වා, "දෙන්න එපා. මේ අපි කරපු වැඩේ. මේක තියා ගන්න" කියලා. එතකොට අපේ නායකතුමා කිව්වා, "මේක දෙන්න. පෙන්වන්න, අපි මේ ආණ්ඩුවට සහයෝගය ලබා දෙන්න කැමැතියි, රට දියුණු කරන්න කැමැතියි" කියලා. ඒ නිසා අපි එහෙම කුහක වෙන්නේ නැහැ. හොඳ දෙයට හොඳයි කියනවා. නරක දෙයට නරකයි කියනවා.

මගේ නඩු ගැන මම මේ සභාවේදී කථා කරන්නේ නැහැ. උසාවියේදී ඒ ගැන බලා ගනිමු. හැබැයි, මට මඩ ගැහුවොත් ඉතුරු කරන්නේත් නැහැ. මම අනිවාර්යයෙන් උසාවි යනවා. මම ඕනෑම කෙනෙකුට අභියෝග කරනවා, පුළුවන් නම් මට විරුද්ධව - මම දැක්කා, එහෙන් මෙහෙන් මට විරුද්ධව පොඩි පොඩි ෂොට් ගහනවා - පුළුවන් නම්, එළියට ඇවිල්ලා මට චෝදනා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු මොනවා කිව්වත් අපි පැකිළෙන්නේ නැහැ; ඇඹරෙන්නේ නැහැ. මොකද, අපි බය නම් සොහොනේ ගෙවල් හදන්නේත් නැහැ. අපි හොඳයි කියන ඕනෑම දෙයකට සහයෝගය දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අර මිනී මරපු පුද්ගලයා අල්ලාගෙන ඉන්න අවස්ථාව love scene එකක් වාගේයි. හැබැයි, CID එකෙන් අපේ ගෙවල්වලට 10ක්, 15ක් එන්නේ යක්කු වාගේ. අපේ ගෙවල්වලට එන්නේ එහෙමයි. මගේ වාහනයේ licence එක check කරන්න CID එකෙන් ආවා. ඒ, අවුරුදු 10කට කලින් මම transfer කරපු signature එක හරිද කියලා බලන්න. දේශපාලන වශයෙන් ඔබතුමන්ලා පළිගන්න එන්න එපා. අපේ වරදක් තිබෙනවා නම් ඒ වරද මොකක්ද කියලා ඔබතුමන්ලා කරුණු ඉදිරිපත් කරන්න. මේ වනකොට මම නඩු 4කට වඩා දාලා තිබෙනවා. Damages claim කරලා තිබෙනවා, Rs. 100 million against the Acting IGP.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමන්ලා කරන වැඩකටයුතුවලට සහයෝගය දෙන්නම්. අපි කථා නොකර හිටියේ බයට නොවෙයි. අපි කථා නොකර හිටියේ ගරු කිරීමක් වශයෙන්. මේ ආණ්ඩුවට අපි සහයෝගය දෙන්න ඕනෑ. සහෝදරයෝ හොඳයි; හිටපු මන්ත්‍රීවරු හොඳයි. හොරකම් කරලා නැති ගොඩක් කට්ටිය මේ ආණ්ඩුවේ ඉන්නවා. ඒ අතරේ හොරකම් කරන්න පුළුවන්, ඒ look එක තිබෙන දෙදෙනෙක්, තුන්දෙනෙකුත් එහෙන් මෙහෙන් ඉන්නවා. ඒ වුණත්, ඔක්කොම ගැන හිතුවාම ඒ කට්ටියට සහයෝගයක් දෙන්න පුළුවන් හැකියාව තිබෙනවා. ඒ හින්දා කුහක වෙන්න එපා. අධ්‍යයනය කරපු මේ සියලු පොත් ටික මම දෙන්නම්. මගේ නම දාන්නත් එපා. ඔබතුමන්ලාට සහයෝගය දෙන්න අපි සූදානම්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව වෙලාව ඕනෑද?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට තව විනාඩි 2ක් දෙන්න, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කාලයෙන් තව විනාඩි 2ක් එතුමාට ලබා දෙනවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමන්ලා විපක්ෂයේ කාර්යභාරය දිගටම කරන්න එපා කියායි අපි විශේෂයෙන් කියන්නේ. හිටපු ආණ්ඩු මම දැක්කා,- විශේෂයෙන්ම පොලීසිය භාර ඇමතිතුමාට කිසිම ගණුනක් නැහැ. කොහේද කියලා නම් මම දන්නේ නැහැ, අදත් වෙරළක් අයිනේ වෙඩි තියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජාඇල.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
පොලීසිය භාර ඇමතිතුමා කියනවා, ජාතික ආරක්ෂාවට තර්ජනයක් නැහැ ලු. ජාතික ආරක්ෂාව කියන්නේ, LTTE එකෙන් ඇවිල්ලා ගහන එකට නොවෙයි. මෙහෙම දේවල් වෙන්න පුළුවන්. මොන ආණ්ඩුව තිබුණත් මෙහෙම දේවල් වෙන්න පුළුවන්. නමුත් නලින්ද ජයතිස්ස ඇමතිතුමා හරියට තේරුම් ගත්තා, මේක භයානක තත්ත්වයක් කියලා. හැබැයි, පොලීසිය භාර ඇමතිවරයා පොලීසියේ හිටපු කෙනෙකු වෙලාත් කියනවා, මේක ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් නොවෙයි කියලා. එහෙම කියන්නේ, STF එකේ 15ක් විතර guard කරද්දීත් කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය ඇතුළට දවල් ඇවිල්ලා වෙඩි තියලා තිබියදී. මේක විශාල තර්ජනයක්. මන්ත්‍රීවරුන්ට මොන guard එකක්වත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ කථා කරන දේවල්වලට උරණ වන පුද්ගලයන් කොච්චර ප්‍රමාණයක් එළියේ ඉන්නවාද? ඒ නිසා අපි කථානායකතුමාට මේ

කාරණය කියනවා. මට නම් එහෙම ප්‍රශ්නයක් නැහැ. Guard එක තිබුණත් මම අරගෙන යන්නේ නැහැ. හැබැයි, guard එක අවශ්‍ය මන්ත්‍රීවරු ඉන්නවා. ඒ හින්දා විශේෂයෙන්ම අපි මේ මන්ත්‍රීවරුන්ට මතක් කර සිටිනවා, පසුගිය දේවල්. අපි දන්නවා, කාලයක් රාජපක්ෂ පාලනය තුළ විශාල වශයෙන් දූෂණ සිද්ධ වුණු බව. ඔබතුමන්ලා, අපි ඔක්කොම එකතු වෙලා ඒවාට සම්බන්ධ අයට දඬුවම් කරන්න විශාල උත්සාහයක් දැරුවා. ඒවාට විරුද්ධව තමයි අපි සටන් කළේ. හැබැයි, ඒ ගැන කියමින් මේ රට පල්ලෙහාට, අගාධයට දාලා හරි යන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම විශේෂයෙන්ම මේ කාරණයත් සඳහන් කරනවා. සජිත් ප්‍රේමදාස මහත්තයා කියන්නේ, පිරිසිදු නායකයෙක්; වැඩක් කරන්න පුළුවන් නායකයෙක්. ඒ වාගේම එතුමා බොරු කියන්නේ නැහැ. තමුන්නාන්සේලා කියපු බොරු ලැයිස්තුව මට කියන්න බැරි වුණා, වෙලාව නැති නිසා. කියපු බොරු ටික ගත්තොත්, ජනාධිපතිතුමා ඇතුළු කණ්ඩායම කිව්වේම පව. හැම දෙයක්ම සම්බන්ධයෙන් කිව්වේ පව. ජනතාවට බොරු පොරොන්දු දුන්නා. ඒ පොරොන්දුවලට අදාළ උත්තර ඉදිරි අනාගතයේදී ජනතාවගෙන් හම්බ වෙයි.

හැබැයි, අපි කියන්න කැමැතියි වගකිව යුතු විපක්ෂයක් ලෙස අපට දක්ෂ කණ්ඩායමක් ඉන්නවා කියන එක. හොර බොරු නැහැ, කෙළින් වැඩ කරන, නිර්මාණාත්මකභාවය, දක්ෂතාව, අවබෝධය, වැඩ කරන්න පුළුවන්කම -මේ සියල්ල- තිබෙන විශාල කණ්ඩායමක් අපට ඉන්නවා; දක්ෂ කණ්ඩායමක් ඉන්නවා. අපට ඒ වෙලාවේ වෛරය, ක්‍රෝධය අවුස්සලා ඡන්දය ලබා ගන්න අවස්ථාව උදා වුණා. නමුත් අපි එහෙම කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතයේදී අපි බලාපොරොත්තු වෙනවා, ජනතාවට මේවා ගැන හරියට දැනුවත් කරලා කටයුතු කරන්න. ඒ වාගේම ඉදිරි අනාගතයේදී ඔබතුමන්ලා හොඳ දෙයක් කරනවා නම්, ඒකටත් සහයෝගය දීලා, මේ රටේ මේ දේශපාලන පසුබිම ඉදිරියේදී වෙනස් කරන්න ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇතුළු අපේ කණ්ඩායම කැප වෙනවා කියන එක කියමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැටුප් ගැන සඳහන් කළා. මම එදා මගේ කථාවේදී දීර්ඝ ලෙස මේ ගැන එකින් එක පැහැදිලි කළා. ඒ නිසා මේ ගරු සභාවට, රටට බොරු කියන්න එපා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මම මේක පර්යේෂණ අංශයෙන් ගත්තේ.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම පොඩ්ඩක් කියන්නම්. එතකොට ඒක වැරැදි නම්, ඔබතුමා ඔය කියන පර්යේෂණ අංශයෙන් දීපු එකත් එක්ක බලන්න.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මට මේ ලේඛනය පර්යේෂණ අංශයෙන් ලැබුණු එකක්. එතුමා මේක වැරැදියි කියනවා නම්, මම පිළිගන්නවා. මම මේක ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. මේකේ වැරැද්දක් තිබෙනවා නම්, ඔබතුමා හරි දේ සම්බන්ධයෙන්,-

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා කියපු සීමා කිහිපයක් තිබුණා නේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔව්, මම මේ list එක ඔබතුමාට දෙන්නම්. මේක පාර්ලිමේන්තුවෙන් ගත්තේ. මේක වැරැදි නම් මම,-

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මොකද දන්නවාද? ඔබතුමන්ලා පළමුවැනි දවසේ කියපු ඒවා එක්ක රටේ වැඩ කරන ජනතාව සෑහෙන්න කලබල වුණා. හැබැයි, අපි ඒක නිවැරැදි කළා. පළමුවැනි දවසේ බොරු කියලා වැඩ කරන ජනතාව අවුස්සන්න සෑහෙන්න උත්සාහ කළා. නමුත්, ඒක වුණේ නැහැ. ඊටපස්සේ අපි නිවැරැදි ලෙස සංඛ්‍යාලේඛන කිව්වාට පස්සේ, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා තේරුම් අරගෙන තිබෙනවා. හරි පැහැදිලියි, හැම වෙලාවේම වැරැදි මතයක් යවන්න උත්සාහ කරනවා, මේ වැඩ් කරනවා කියපු එක නැහැ කියලා. නමුත්, කාර්යාල කාර්ය සහායකයෙකුගේ වැටුප අපි ඉතා පැහැදිලිව කිව්වා. අපේ ජනාධිපතිතුමා කිව්වා, රුපියල් 8,250කින් මාස 20ක් ඇතුළත - 2027 ජනවාරි- වැටුප වැඩි වෙනවා කියන එක. ඊට පස්සේ *[බාධා කිරීමක්]* හරි, හරි. නමුත්, ඔබතුමා ඔය කියපු සංඛ්‍යාලේඛන වැරැදියි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මේක පාර්ලිමේන්තුවෙන් ගත්තේ. වැරැදි නම්-*[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපට තිබෙන කාලය සීමිතයි.

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා Research Unit එකෙන් ගත්ත ලේඛනය මට දෙන්න. මම ඊට පස්සේ ප්‍රකාශයක් කරනවා,- *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ අපැහැදිලිකම එන්නේ නැහැ, හරියටම අවුරුද්දෙන් අවුරුද්දට වැඩි වෙන ගණන කීයද කියලා කිව්වා නම්. මේක සංකීර්ණයි නේ. සොයා ගන්න බැහැ. මිනිස්සු මඤ්ඤං වෙලා ඉන්නේ. ගොඩක් අය මේ සම්බන්ධයෙන් ලොකු ප්‍රහේලිකාවක ඉන්නේ. මම මේ staff එකෙන් ඇහුවා. "අපි දන්නේ නැහැ සර්, සොයා ගන්නත් බැහැ, හිතා ගන්නත් බැහැ" කියලා පාර්ලිමේන්තු staff එකත් කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, අපෙට තිබෙන කාලය සීමාසහිතයි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

හරි, මේක මම භාර දෙන්නම්. *[බාධා කිරීමක්]*

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඉතා පැහැදිලිව මේ අය වැයේ Annexure V වල ඒ ඒ වැටුප් කාණ්ඩවල වැටුප තිබෙනවා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මේ කාර්ය මණ්ඩලයේ අයට කියන්න-

ගරු මහින්ද ජයසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

එතුමන්ලාටත් මම ගණන් හදලා කියන්නම්. හරි, කාලය මදි නිසා මම වැඩිය තර්ක කරන්න යන්නේ නැහැ. නමුත්, Research Unit එකෙන් දීපු ලේඛනය දෙන්න. මම ඉදිරියේදී ඒක හරියට අධ්‍යයනය කරලා නිවැරැදි කිරීමක් කරන්නම්.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.43]

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගෙවෙමින් පවතින මොහොත, දින, මාස, ඇතුළු 2025 වර්ෂය, ලෝකයේ දේශපාලනය පැත්තෙන් ගත්තොත් ශීඝ්‍ර වෙනස්වීමකට භාජන වෙන කාලයක්. මෙවැනි මොහොතක අපේ රටේ ජනාධිපතිතුමා, මුදල් ඇමතිවරයා විධියට ඒ වෙනස් වෙන ලෝකයට ගැළපෙන ආකාරයට අපේ රටේ ජනතාව, අපේ රටේ පුරවැසියන් සූදානම් කිරීම වෙනුවෙන් මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ජනතාවාදී අය වැයකට එහා ගිහිල්ලා පුරවැසි අය වැයක් විධියට මේ අය වැය ඉදිරිපත් කරන්නේ එවැනි ලෝක වාතාවරණයකට අපේ රටේ ජනතාවත්, අපේ රටේ සමාජයත්, අපේ රටේ ආර්ථිකයත් මෙහෙයවීමේ උසස් පරමාර්ථයෙන් කියලා.

එවැනි අය වැයක් තුළදී ඒ පුරවැසියාගේ ප්‍රධානතම, ප්‍රමුඛතම කැටපත බවට පත් වෙලා තිබෙන රාජ්‍ය සේවය, රාජ්‍ය සේවකයා, නිලධාරීන්, වෘත්තිකයන්, පෞද්ගලික අංශයේ සේවකයා, පෞද්ගලික අංශයේ වෘත්තිකයන් යන සියල්ලෝම අවුරුදු 20ක කාලපරිච්ඡේදයක් තුළම තමන්ගේ වැටුප සම්බන්ධව අවිනිශ්චිත තත්ත්වයකින් තමයි පසු වුණේ. වෘත්තීය සමිති ක්‍රියාකාරකයන්, වෘත්තීය සමිති නායකයන් ඒ වැටුප වැඩි කර ගන්න සෑම අවුරුද්දකම අය වැයට පෙර බරපතළ පරිශ්‍රමයක් දරා තිබෙනවා. අය වැයට පෙර භාණ්ඩාගාරය එක්ක, අදාළ ප්‍රධානීන් එක්ක සාකච්ඡා කරලා එවැනි පරිශ්‍රමයක් දැරුවත් ඔවුන්ට ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට අය වැය තුළ ඒ වැටුප වැඩි කර ගන්න බැරි වුණා. මූලික වැටුප මත තමයි ඒ සියලු සේවකයන්ගේ, සියලු වැඩ කරන ජනතාවගේ, සියලු වෘත්තිකයන්ගේ අභිමානය සාධම්බරය රඳා පැවතිලා තිබෙන්නේ. රාජ්‍ය අංශයට සේවකයකු බඳවා ගනිද්දී, වෘත්තිකයෙකු රාජ්‍ය අංශයට බඳවා ගනිද්දී, පෞද්ගලික අංශයේ සේවකයෙකු සේවයට බඳවා ගනිද්දී, ඔහුගේ මූලික වැටුප, වසරක කාල පරිච්ඡේදයෙන් පසු වාර්ෂික වැටුප් වැඩිවීම ආදිය පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. මේක තමයි ඒ වෘත්තිකයාගේ, ඒ සේවකයාගේ ඒ සියලුදෙනාගේම ගෞරවය රැකෙන ආකාරය. ඒකට අපි කියනවා, dignity of labour කියලා. ඒ සාධම්බරය, ඒ වෘත්තිකයාගේ සාධම්බරය, රාජ්‍ය නිලධාරියාගේ සාධම්බරය, ශ්‍රමිකයාගේ සාධම්බරය රඳා පවතින්නේ නිකම්ම නිකම් පුරාජේරුවලින් නොවෙයි.

ලෝකයේ ඕනෑම රටක ඒ ඒ වෘත්තියට අදාළ වැටුපක් නියම කර තිබෙනවා. ඒ වැටුප අනුව තමයි ඒ වෘත්තියට බැඳෙන්නේ. හැබැයි, අද වෙනකොට රාජ්‍ය සේවකයාට, වෘත්තිකයන්ට එහෙම වැටුපක් පෙන්වන්න බැරි මට්ටමට තමයි පසුවුණු අවුරුදු 20ක කාලපරිච්ඡේදය තුළ ඇද වට්ටලා තිබුණේ. ඒක තමයි අපේ රටේ වැටුප් ඉතිහාසය. මොකද, මූලික වැටුප වැඩි කරන්නේ නැහැ. අපි වෘත්තීය සමිති විධියට මහා භාණ්ඩාගාරයේ ප්‍රධානීන් එක්ක සාකච්ඡා සඳහා ගියාම අපි දකින කාරණය තමයි පැය ගණන් සාකච්ඡා කළාම, වැටුපට ඕනෑ නම් රුපියල් 300ක් එල්ලන්නම් කියනවා. ඒත් මූලික වැටුපට නොවෙයි. එහෙම නැත්නම් රුපියල් 1,000ක් එල්ලන්නම් කියනවා. කථා කරලා, කථා කරලා අවසානයේදී එකඟතාවට එන්නේ කොහොමද? Overtime කරන්න ඉඩ දෙන්නම්; එහෙම නැත්නම් overtime වල ratio එක වෙනස් කරලා දෙන්නම් කියලායි. අන්න ඒ කාරණය හරහා අපේ රටේ රාජ්‍ය සේවකයාට, පෞද්ගලික අංශයේ සේවකයාට ගෙවල්වලට වෙලා ඉන්න තිබෙන කාලපරිච්ඡේදය වැඩපළ ඇතුළේ, නැත්නම් කාර්යාලය ඇතුළේ ඉන්න වෙන මට්ටමට තමයි ඇද වැට්ටුවේ. ඒ සියලු සේවකයන්ට බල කළා, වෘත්තිකයන්ට බල කළා, ඔවුන්ගේ මූලික වැටුප් වැඩි කරන්නේ නැතුව වැඩපළ ඇතුළේ වැඩි පැය ගණනක් ඉඳලා තමන්ට ඕනෑ මුදල් ප්‍රමාණය එකතු කර ගන්නට. එහෙම තත්ත්වයක් තමයි පසුවුණු අවුරුදු 20 තුළම තිබුණේ.

අද මෙතැන කථා කරනවා, සේවකයාට බදු ගහලා ඔවුන්ගේ වැටුපත් අහිමි වෙනවා කියලා. ඒ වාගේම සොච්චම් වැටුප් වැඩි කිරීමක් කරලා තිබෙන්නේ කියලා කථා කරනවා. මම අහනවා, මේ මෑත ඉතිහාසයේදී -පසුවුණු අවුරුදු 20 තුළදී- මූලික වැටුප වැඩි කරන්න මෙවැනි ආකාරයට කටයුතු කර තිබෙනවාද කියලා. එහෙම ඉතිහාසයක් මෑතක දකින්න ලැබෙන්නේ නැහැ. වෘත්තිකයන්ගේ මූලික වැටුප තව කෙනෙකුට කියන්න ලජ්ජාවෙන් හිටියේ. මන්ත්‍රීවරුන්ගේ වැටුප ශීඝ්‍ර ලෙස වැඩි කර ගත්තත්, මේ රටේ වෘත්තිකයන්ගේ මූලික වැටුප් වැඩි කර ගන්න බැරි වුණා. වැටුපට දීමනා ලෙස එල්ලලා තමයි තිබෙන්නේ. ඉතින් මේ වැටුප මදි නිසා, ගෙදර ලයිට් බිල ගෙවා ගන්න අපහසු නිසා, වාහනයට ඉන්ධන ගහ ගන්න බැරි නිසා ඔහුට වැඩි කාලයක් අතිකාල සේවයේ යෙදෙමින් සේවා ස්ථානයේ රැඳී

සිටින්නත් සිද්ධ වුණා. මේ නිසා ඔවුන්ගේ පවුල් ජීවිත තුළ නොයෙකුත් ආරාවුල් ඇති වෙන්න පටන් ගත්තා. මේක තමයි වෘත්තිකයා ඇද වටිටලා තිබුණු තැන. මේක තමයි රජයේ සේවකයා ඇද වටිටලා තිබුණු ඇත්ත තැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ තමයි අපේ රට ඒ අයට ජාත්‍යන්තරයට යන්න බල කරලා තිබුණු තත්ත්වය ඇති වුණේ. අපට යන්න පුළුවන්ද?

ලෝකයේ ඕනෑම වෘත්තියකට, ඕනෑම විදේශ රටකට යන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒ වෘත්තිය සම්බන්ධව තිබෙන මූලික වැටුප මොකක්ද, එය අවුරුද්දක් ගාණේ වැඩි වෙන්නේ කොහොමද කියලා ප්‍රබල නිර්ණායක තිබෙනවා.

ඒ නිර්ණායක එකක්වත් පසුගිය අවුරුදු 20 තුළ සලකා බැලුවේ නැහැ. ඒ විතරක් නොවෙයි, වැටුපට අදාළ වන අතිකාල දීමනා ගැන සලකා, ඒ අතිකාල දීමනාව ගන්න ටිකක් කල් වැඩ කරගෙන යද්දී ඔන්න ආයතනවලට චක්‍රලේඛනයක් එනවා, අතිකාල කප්පාදු කරලා කියා. අතිකාල සේවාව පැය 20කට වඩා කරන්න බැහැ, පැය 80කට වඩා කරන්න බැහැ, පැය 120කට වඩා කරන්න බැහැ කියලා චක්‍රලේඛ එනවා. නැවත වරක් ඒ වෘත්තිකයන්ට, ඒ සේවකයන්ට අරගළ කරන්න සිදු වෙනවා, "අපිට කොහොම හරි අතිකාල ලබා දෙන්න" කියලා. මේවා තමයි සටන් බවට පරිවර්තනය වෙලා තිබුණේ. හැබැයි, අද වන විට මේ වෘත්තිකයන්ගේ මූලික වැටුපම වැඩි කර තිබෙනවා, අපට හිතා ගන්න බැරි ආකාරයට. ඒක තමයි අවුලට පත් වෙලා සිටියේ, අපේ සුජීව සේනසිංහ මහත්මයා. එතුමාට තේරුම් ගන්න බැරි වුණා ඒ වැඩි වීම වුණේ කොහොමද, ඒ වැඩි කිරීම කළේ කොහොමද, ඒ හරහා වෘත්තිකයාට තමන්ගේ ආයතන තුළ ලැබෙන ගෞරවය මොකක්ද කියලා. හැබැයි, පහුගිය කාල සීමාව තුළම ඒ වෘත්තිකයන්ට, ඒ සේවකයන්ට අමතක වෙලා තිබුණා, තමන්ගේ මූලික වැටුප වැඩි වීම තමයි තමන්ගේ අභිමානය කියන එක. ඔවුන් ඇද වටිටලා තිබුණා, වැටුපේ ප්‍රතිශතයක් විධියට පැයකට ගන්නා අතිකාල මුදල කොපමණද කියා හිතන තැනට. මේක තමයි ඇත්ත දේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, අපි 2015දී සියයට 107කින් මූලික වැටුප වැඩි කළා.

ගරු අසෝක සපුමල් රන්වල මහතා
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
අපි ඒක පස්සේ කථා කරමු. ඒ වැඩි කරපු එක ගැන, මොනවාද වැඩි කළේ කියන එක ගැන අපි හොඳට දන්නවා. ඒ ගැන කථා කරන්න ගියොත් හුහක් දේවල් කථා කරන්න පුළුවන්. එදා සේවකයන්ගේ දීමනා කැපුවා නොවෙයි, අහිමි කළා. ඒවා අහිමි කරපු ඉතිහාසයක් තමයි පසුගිය අවුරුදු 20 පුරාවට දිව යන්නේ. *[බාධා කිරීමක්]* එහි ඇත්ත තත්ත්වය මෙක තමයි, ගරු මන්ත්‍රීතුමනි. මේ විධියට අපේ රටේ රාජ්‍ය සේවකයාට තිබුණු අභිමානය, ඝාඩම්බර බව නැති කරලා අපේ රටේ රාජ්‍ය සේවකයා අත් හැර දමලා විදේශ රටවලට යන තත්ත්වයට එම සේවය ඇද වටිටලා තිබුණා. ඒක තමයි ඇත්ත ඉතිහාසය. මීට පෙර රාජ්‍ය සේවකයන්ට, වෘත්තිකයන්ට හොඳම ආකාරයට වැටුප් වැඩි කළා නම් ඒ අයගේ වැටුප මන්ත්‍රීවරයෙකුගේ වැටුපට වඩා වැඩි වෙන්න ඕනෑ. හැබැයි, එහෙම කරන්න කලින් පැවැති ආණ්ඩු අසමත් වුණා.

කෙසේ වෙතත්, රාජ්‍ය සේවකයාට -වෘත්තිකයාට- හිතා ගන්න බැරි තැනකට අද ඔහුගේ මූලික වැටුප ගෙනැවිත් තිබෙනවා. මොකද, මූලික වැටුප විශ්‍රාම වැටුපට අදාළ වෙනවා; මූලික වැටුප අතිකාල දීමනාවට අදාළ වෙනවා; මූලික වැටුප නිසා වැන්දඹු හා අනත්දරු අරමුදලට යන ගණන වැඩි වෙනවා. එහෙම නම්, මූලික වැටුප වැඩි කිරීම තමයි ඇත්ත අර්ථයෙන් වැටුප් වැඩි කිරීම කියන්නේ. ඒ නිසා අද මේ රටේ වෘත්තිකයන්ට, මේ රටේ රාජ්‍ය සේවකයන්ට නව පුනරුදයක් ඇති වෙලා තිබෙනවා. ඔවුන්ට අභිමානවත් මූලික වැටුපකට උරුමකම් කියන්න පුළුවන් හැකියාව අත් පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මෙය පුරවැසි අය වැයක් බවට පත් වෙන්නේ. පුරවැසියා නිර්මාණය වන්නේ මෙහෙමයි. පුරවැසියා සතු අයිතිවාසිකම් සුරක්ෂිත වන්නේ මෙහෙමයි. අප Members' Dining Restaurant එකට ගියාම එතැන ඉන්න සේවකයන් අපත් එක්ක කථා කරලා කියන්නේ මොකක්ද? "අපිට හරි සතුටුයි. ඉතිහාසයේ කවදාවත් නැති ආකාරයට අපේ මූලික වැටුප වැඩි වෙලා තිබෙනවා. ඉතිහාසය තුළ අපිට එහෙම දෙයක් අහන්න ලැබුණේ නැහැ" කියලායි ඒ අය අපිත් එක්ක ප්‍රකාශ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ විධියට මේ අය වැය ජනතාවාදී අය වැයකට වඩා එහාට ගිහින් පුරවැසි අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම විවිධ තැන්වල දී කථා කළා මේ අය වැය තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට මොනවාද හම්බ වෙලා තිබෙන්නේ කියලා. ඇයි එහෙම කියන්නේ? මීට පෙර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අය වැයෙන් ලබා දීලා තිබුණු සහනය තමයි, ණය මුදලක් අරගෙන දෙන එක. බැංකුවල ණයකරුවන් බවට පත් වෙලා අවුරුදු දෙකක්, තුනක් යන කොට ඒ ව්‍යාපාරය බැංකුවට සින්න වන මට්ටමට ඇද වැටිලා තිබුණා. හැබැයි, ඒ ව්‍යාපාරිකයා රැක බලා ගන්නා වැඩ පිළිවෙළක් ඒ කිසිම අය වැයක තිබුණේ නැහැ. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ගැන වෙන වෙනම කථා කරන්නේ නැතිව, අලුතින් බිහි වන කර්මාන්තකරුවන් සුරක්ෂිත කරන්න, ඔවුන්ගේ වාණිජ ව්‍යාපාර නවෝත්පාදන විධියට ඉස්සරහට ගෙන යන්න වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ නිර්මාණය කර තිබෙනවා. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ තිබෙන National Science Foundation - NSF - එකට අදාළව ප්‍රතිපාදන තුන් ගුණයකින් වැඩි කරලා තිබෙනවා. වෙන වෙනම බැංකුවලට ණය දීලා, මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි ණය අරගෙන දීලා ණයකරුවෙකු බවට පත් කරලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා සුළු කාලයකින් ඇද වටිටන එක ද, එහෙම නැත්නම් ඒ ව්‍යාපාරිකයා වාණිජ කර්මාන්තයක් විධියට දීර්ඝ කාලීනව අරගෙන යන සාර්ථක ව්‍යාපාරයක ඝාඩම්බරකරුවෙකු බවට පත් කරන එක ද වඩා හොඳ? දෙවැන්න තමයි වඩා හොඳ. එයයි සැබෑ අය වැයක පරමාර්ථය. ඒ පරමාර්ථය තුළ තමයි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විවිධ අංශවලට තුන්ගුණයකින් ප්‍රතිපාදන වැඩි කරලා තිබෙන්නේ. ඒ වාගේම, අපේ රටේ වාරි පද්ධතිය පිළිබඳවත් මෙවර අය වැයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

මේ සභාවේ ගරු මන්ත්‍රීවරු කලින් ප්‍රකාශ කරපු විධියට, ඉතිහාසය තුළ දීර්ඝ කාලීනව සොයා බලා දැවැන්ත ව්‍යාපෘති මේ රටේ ක්‍රියාත්මක කර තිබෙනවා. ඇත්ත තමයි. ඒවා හොඳයි.

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

හැබැයි, මෑත ඉතිහාසය තුළ එවැනි දීර්ඝ කාලීන සැලසුම් සහිතව මේ රටේ වාරි පද්ධතියට හෝ වෙනත් ව්‍යාපෘතිවලට හෝ මුදල් වෙන් කරලා තිබුණේ නැහැ. ප්‍රාග්ධන වියදම් විධියට, එහෙම නැත්නම් කාරක ප්‍රාග්ධන වියදම් විධියට වරින් වර මුදල් ප්‍රමාණයක් වෙන් කරලා වාරි පද්ධතිය යම් පමණකට නඩත්තු කළා විතරයි. හැබැයි, ඒ නඩත්තු වියදම් ඒ ආකාරයෙන්ම තබාගෙන වාරි පද්ධතිය වෙන වෙනම නොගෙන කටයුතු කිරීම නිසා ඒවා අද පත් වෙලා තිබෙන ශෝචනීය ඉරණමෙන් ගලවා ගන්න, මෙම අය වැයෙන් ඒවාට වෙන වෙනම මුදල් වෙන් කර තිබෙනවා. උදාහරණයක් විධියට ගල්ඔය, රාජාංගනය, මින්නේරිය සහ හුරුළු වැව යෝජනා ක්‍රමවල පහළ සංවර්ධන කටයුතු ප්‍රතිසංස්කරණය කිරීම, ඒවා නවීකරණය කරලා ගැමි ජනතාවට වඩාත් හොඳින් තමන්ගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරා ගැනීම කියන අරමුණ මේ යෝජනා ක්‍රමය තුළ බලාත්මක කර තිබෙනවා. ඒ බව මෙම අය වැයෙන් තහවුරු වෙනවා. අන්න, එතැනදී තමයි අපේ රටේ පුරවැසියන් විධියට ගොවි ජනතාව තුළ ගෞරවය ඇති වන්නේ.

පහුගිය කාල පරිච්ඡේදය පුරාවට අපේ රටේ ජනතාව ආපදාවට පත් වුණාට පසුව තමයි ඒ ආණ්ඩු ඒවාට පිළියම් සෙව්වේ. මම කැලණි ගඟ අසබඩ ජීවත් වන්නේ. කැලණියේ ගං වතුර ගැලුවාට පසුව තමයි අපට මතක් වෙන්නේ, මේ ගංවතුරෙන් බේරෙන්නේ කොහොමද කියලා සොයා බලන්න. ඒ වෙලාවට තමයි රජයට මතක් වෙන්නේ, ගංවතුරෙන් යට වෙච්ච මිනිසුන් ආපදාවෙන් මුදා ගන්න මැදිහත් වෙන්නේ කොහොමද කියලා සොයා බලන්න. ඒ තත්ත්වය වෙනස් කරන්න මෙවර අය වැය තුළ කටයුතු කර තිබෙනවා. නම් වශයෙන්ම ගංගා නම් කරලා එම ආපදා වළක්වා කැලණි ගං නිම්නයේ ජනතාව සුරක්ෂිත කරන්නේ කොහොමද කියන කාරණා ටිකක් පළමු වතාවට මෙවර අය වැයට ඇතුළත් කර තිබෙනවා. අන්න, ඒ නිසා තමයි මේක පුරවැසි අය වැයක් බවට පත් වන්නේ. ඒ පුරවැසියන්ගේ සාඩම්බරකම රකින්න, ගංවතුරක් වෙලාවට අසරණ වන පුරවැසියන් මුදා ගන්න අවශ්‍ය කාරණා දුර දක්නා නුවණින්, කල් වේලා ඇතිව මෙවර අය වැයට ඇතුළත් කර තිබෙනවා. මා හිතන්නේ ඒ කාරණා වෙනම සඳහන් කළොත් හොඳයි කියලායි.

නමුත් අය වැය කථාවකින් එහාට ගිහිල්ලා එවැනි කාරණාත් මෙවර අය වැයේ අන්තර්ගත වෙලා තිබෙනවා. දේශගුණයට ඔරොත්තු දීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය යටතේ කැළණි ගංගා නිම්නයේ ගංවතුර කළමනාකරණය, කාලගුණ විද්‍යා පද්ධතිය නවීකරණය, ආපදා සඳහා පූර්ව සූදානම සහ ක්‍රියාකාරී සූදානම, ගංවතුර පුරෝකථනය වැඩිදියුණු කිරීම සහ නාය යෑමේ පුරෝකථනය වැඩිදියුණු කිරීම සඳහා රුපියල් බිලියන 9ක් වෙන් කර තිබෙනවා. මෙය කැලණි ගඟ ආශ්‍රිතව ජීවත් වන ජනතාවට මහත් අස්වැසිල්ලක්, ඔවුන්ගේ ජීවිත අවදානමින් බේරා ගන්න මහත් අස්වැසිල්ලක්, ඔවුන්ගේ දේපළ බේරා ගන්න මහත් අස්වැසිල්ලක් බවට පත් වෙලා තිබෙනවා. මේ සියලු අර්ථයෙන් ගත් කල මේ අය වැය පුරවැසි අය වැයක් බවට පත් වෙලා තිබෙනවා; මේ අය වැය ජනතාවාදී අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. එවැනි අය වැයක් ගෙන ඒම සම්බන්ධයෙන් ස්තුති කරමින් මා නතර වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.57]

ගරු උපුල් කිත්සිරි මහතා
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා ලෙස ඉදිරි මාස 9කට අදාළව 2025 අය වැය පසුගිය දිනෙක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. අප මේ අය වැය ඉදිරිපත් කළාට පසුව, පසුගිය දිනවල විපක්ෂයේ මන්ත්‍රීවරුන් කළ කතා අහද්දී අපට දැනුණේ, ජාතික ජන බලවේගය ආණ්ඩුව අවුරුදු 5ක් ආණ්ඩු කරලා ගෙනාපු අවසාන අය වැය වාගේ සලකා එතුමන්ලා මේ අය වැය ගැන කථා කළ බවක්. හැබැයි, අපි මේ අය වැය ගෙනෙන්නේ මේ ආණ්ඩුව පත් වෙලා මාස 3කින්. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා අදට හරියටම මාස 3යි. මේ රටේ ඉදිරි සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කරන අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය ගෙනැල්ලා තිබෙන්නේ. නමුත්, අපේ ආණ්ඩුව අවුරුදු 5ක් කරගෙන ගිහිල්ලාත් ඒ අවුරුදු 5ට මොකවත් කළේ නැහැ, ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැ කියලා හිතාගෙන තමයි විපක්ෂය නිතරම කථා කළේ.

ගරු විපක්ෂ නායකතුමා අද උදේ විනාඩි 45ක වාගේ කාලයක් මේ අය වැය පිළිබඳව කථා කරමින් විවිධ කාරණා මතු කළා. එතුමා ඒ කථාව ඇතුළේ නිතරම මතක් කරන්න ගිය දේ තමයි, පරණ කතන්දර නොවෙයි, අලුත් වැඩ පිළිවෙළ ගැන කථා කරන්න කියන එක. ඉදිරි වැඩ පිළිවෙළ, මේ රට ගෙනියන්නේ මොන දිසාවකටද කියන එක මේ පළමුවැනි අය වැය තුළින් අපි පෙන්වලා තිබෙනවා. පරණ දේවල් කථා කරන්න එපා කිව්වාට විපක්ෂ නායකතුමාට අපි මේ කාරණය කියන්න ඕනෑ. අපි ගම්වල විවිධ ව්‍යාපෘති කරන්න ගියාම අපේ කාර්යාලවලට අදටත් එනවා, ව්‍යාපාරිකයන්. මීට අවුරුදු 10කට, 15කට පෙර කරපු කර්මාන්තවලට තවම මුදල් ගෙවන්න තිබෙනවා. මීට අවුරුදු 12කට, 13කට උඩදී නිවාස සංවර්ධන අධිකාරියේ මඟ නතර වෙච්ච නිවාස ව්‍යාපෘතිවල, ඒ කාලයේ බිලියන ගණන් සල්ලි ගෙවලා නැති ව්‍යාපෘතිවල බිල් අද අපට ගෙවන්න වෙලා තිබෙනවා. ඒ නිසා පසුගිය දේවල් කථා කරන්න එපා කිව්වත්, මම හිතන හැටියට ඒ වාගේ ඒවා අපි එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ. ඒ වාගේම තමයි, එතුමා නිතරම කියන්න ගියේ වැටුප් පිළිබඳ ව්‍යාකූලතාවක් රටේ නිර්මාණය වෙලා තිබෙනවා කියලා. ආණ්ඩුවක් හැටියට අපි සන්තෝෂ වෙනවා, අය වැය ඉදිරිපත් කළ දවසේ ඉඳලාම රාජ්‍ය සේවකයා වැටුප පිළිබඳ කථා කරන්න වෙනදාට වඩා උනන්දු වෙන එක ගැන.

රජයේ සේවකයෝ හැටියට හිටපු අපිත් මේ වැටුප් වැඩිවීම් පිළිබඳව විවිධ අවස්ථාවලදී මහා මාර්ගවල අනන්තවත් අරගළ කරලා තිබෙනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි වැටුප් වර්ධකය දෙගුණයකට ආසන්නවත්, ඒ වාගේම මූලික වැටුප ඉතා විශාල අගයකින් වැඩිවෙන්නේ. ඒ වැටුප් වැඩිවීම කියන්නේ එසේ මෙසේ වැඩිවීමක් නොවෙයි. විශ්‍රාම යද්දී මොනතරම් ප්‍රමාණයකින් ඒ මුදල් අපට නැවත දායක මුදලක් හැටියට ලබාගන්න පුළුවන්ද කියන එක ඒ වැටුප හරහා අපි දකිනවා. මම හිතන්නේ එතුමාට ප්‍රශ්නයක් ඇති, මේ වැටුප කොහොමද හැදෙන්නේ කියලා. මේ Phoneවලත් ඊට අදාළ apps දාලා තිබෙනවා. ඒ appsවලින් ඉතා ලේසියෙන් හොයාගන්න පුළුවන් තමන්ගේ වැටුප කොච්චර වැඩි වෙනවාද, 2025දී කොච්චර වැඩි වෙනවාද, 2026දී කොච්චර වැඩි වෙනවාද, 2027දී කොච්චර වැඩි වෙනවාද කියලා. මම හිතන්නේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට හොයාගන්න බැරුව ඇති තමන්ගේ වැටුප කීයක් වැඩි වෙනවාද කියලා. විපක්ෂ නායකතුමාටත් පුළුවන් ඕනෑ නම් ඒ app එක දාගෙන තමන්ගේ වැටුප කීයද කියලා හොයාගන්න.

එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට දෙන විමධ්‍යගත ප්‍රතිපාදන මුදල වන රුපියල් මිලියන 10 පිළිබඳව කථා කළා. ඒ රුපියල් මිලියන 10 ගැන කථා කරද්දී එතුමා නිරන්තරයෙන් කියන්න උත්සාහ කළේ ඒක අපට තනියෙන් වියදම් කරන්න දෙන්නේ නැහැ කියලා. අපි ඒ ඉතිහාසය හොඳට දන්නවා. ඒවා රජයේ මුදල්. ඉතිහාසයේ වුණේ ඒකයි. මන්ත්‍රීවරයාට සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිසාපති කාර්යාල හරහා තමයි ඒ මුදල් වියදම් කරන්නේ. අපට ඒ මුදල්වලට සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා එතුමන්ලාට දෙන සල්ලිවලට, එතුමන්ලාට දෙන ප්‍රතිපාදනවලට එතුමන්ලාට යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. ඒවායේ වෙනසක් නැහැ. ඒක එහෙම තමයි. නමුත් කාටවත් පෞද්ගලිකව මේ මුදල් වියදම් කරන්න බැහැ. පෞද්ගලිකව ඒ මුදල් වියදම් කළ ඉතිහාසය අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගත්තොත් මේ අය වැය ඇතුළේ විදේශ ආයෝජන නැහැ, කොහොමද ඩොලර් හොයන්නේ, 2028 වෙනකොට කොහොමද ඩොලර් හොයන්නේ, අපේ රටේ ණය ගෙවන්නේ කොහොමද යන කරුණු පිළිබඳව කථා කරනවා. පසුගිය කාලය තුළ අපේ ජනාධිපතිතුමා කළ ඉන්දීය සංචාරයේදී, චීන සංචාරයේදී මේ රටට ඩොලර් බිලියන ගණන් විදේශ ආයෝජන ආපු ආකාරය අපි දැක්කා. ඒ නිසා කලබල වෙන්න එපා. තව කාලයක් තිබෙනවා. ලෝකයේ නායකයන්, ලෝකයේ අනෙකුත් රටවල් අප පිළිබඳව පූර්ණ විශ්වාසය තියලා තිබෙනවා. ඒ නිසා ඉතා කෙටි කාලයක් ඇතුළත මේ රටට විදේශ ආයෝජකයෝ විශාල වශයෙන් එනවා කියන විශ්වාසය අපට තිබෙනවා.

ඒ වාගේම, මේ අය වැය පිළිබඳව ඔබතුමන්ලා නොයෙක් දේවල් කථා කළා. නමුත් ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ අය වැය තුළින් කථා කරපු කාරණා කිහිපයක් තිබෙනවා. අපි නොදැකපු පැනි ගණනාවක් අපි මේ අය වැය ඇතුළේ දැක්කා. විශේෂයෙන්ම ආබාධිත පුද්ගලයන් සඳහා මේ අය වැයෙන් රුපියල් මිලියන 100ක් වෙන් වෙනවා. ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි අය වැයකට එවැනි ආකාරයේ යෝජනාවක් ඉදිරිපත් වන්නේ. නමුත් ඔබතුමන්ලා මේවා ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමන්ලාට මේවා පෙනුණේ නැහැ. ඒ නිසා මේවා ගැන කියන්න බැහැ.

ඒ වාගේම, රෑඳවුම් නිවාසවල සිටින සෑම දරුවෙකුටම මාසිකව රුපියල් 5,000ක් වෙන් කරන්නත්, ඒ රුපියල් 5,000න්, රුපියල් 2,000ක් බැංකු ගිණුමට යන්නත්, ඉතිරි රුපියල් 3,000 ඔවුන්ගේ මාසික වියදම් සඳහා වෙන් කරන්නත් ආණ්ඩුව කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, එවැනි දරුවෙක් අවුරුදු 18 සම්පූර්ණ වුණාම ඒ රෑඳවුම් නිවාසවලින් එළියට යන්න ඕනෑ. නමුත්, ඔවුන් සමාජගත වෙනකම් තවදුරටත් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ඒ රෑඳවුම් නිවාසවලම ඉන්න අවස්ථාව ලබා දෙනවා. එපමණක් නොවෙයි, ඒ දරුවන් සමාජගත වෙද්දී ඔවුන්ට කියලා නිවසක් හදා ගන්නවා නම්, ඒ වෙනුවෙන් රුපියල් දසලක්ෂයක මූල්‍යාධාරයක් කරන්නත් ආණ්ඩුව මේ අය වැයෙන් යෝජනා කරලා, ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ නිසා අපි විපක්ෂයේ හැමෝටම කියනවා, මේවා දකින්න කියලා. ඉතිහාසයේ පළමුවැනි වතාවට මෙවැනි කාරණා අපේ රටේ අය වැයක් තුළින් දකින්න.

අපේ රටේ ගෙවී ගිය සෑම අවුරුද්දකම සියදිවි හානිකර ගැනීම් 3,000කට වඩා වැඩි ප්‍රමාණයක් සිදුවෙලා තිබෙනවා. සියදිවි හානිකර ගැනීමට උත්සාහ කරපු අවස්ථා අවුරුද්දකට 5,000කට වඩා වැඩි ප්‍රමාණයක් වාර්තා වෙනවා. අපේ ආණ්ඩුව රුපියල් මිලියන 250ක් වෙන් කළා, මානසික තැවුලට පත්වන ඒ අය මුදා ගැනීම සඳහා, ඒ වෙනුවෙන් වැඩසටහන් සකස් කිරීම සඳහා. විපක්ෂයේ සිටින ඔබතුමන්ලාට ඒවා පෙනුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් කාලයක් එතුමන්ලා අපේ රට පාලනය කළා කිව්වාට, ග්‍රාමීය ප්‍රදේශවල සිටින ජනතාවගෙන්, ඒ පවුල්වලින් සියයට 60කට, 70කට වඩා වැඩි ප්‍රමාණයකට පිරිසිදු පානීය ජලය ලබා ගන්න බැහැ. අපි මේ අය වැය ඇතුළේ ප්‍රාග්ධන වියදම් හැටියට රුපියල් බිලියන 107.9ක් වෙන් කර තිබෙනවා, ග්‍රාමීය ජල පහසුකම් ලබාදීම සඳහා. ඒ වාගේම, අපේ රටේ ග්‍රාමීය මාර්ග විශාල ප්‍රමාණයක් තවමත් හදන්න තිබෙනවා. විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රදේශවල තිබෙන මාර්ග ඉතාම අබලන් තත්ත්වයේ තිබෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ග්‍රාමීය මාර්ග සංවර්ධනයට පමණක් රුපියල් මිලියන 4,000ක පමණ මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. එම මුදල ග්‍රාමීය මාර්ග හදන්න විතරයි. එය සැලකිය යුතු මුදලක් කියන එක අපි මේ සභාවට පෙන්වා දෙනවා.

අපේ රටේ කෘෂි කර්මාන්තය ගත්තොත්, අපට අපනයන කෘෂි කර්මාන්තය දක්වා යන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, අපේ රටේ අවශ්‍යතාවට වඩා වැඩියෙන් අපි කෙසෙල් නිෂ්පාදනය කරනවා. අපි අතිරික්ත කෙසෙල් නිෂ්පාදනයක් කළොත්, අපට ලෝක වෙළෙඳ පොළේ ඉල්ලුමට අවශ්‍ය කෙසෙල් ප්‍රමාණයක් ලබා දෙන්න පුළුවන්. අපි ඒ බව දන්නවා. නමුත්, අවශ්‍යතාව තිබුණාට, ලෝක වෙළෙඳ පොළේ ඉල්ලුමට අපි කෙසෙල් නිෂ්පාදනය කරන්නේ නැහැ. ඒ නිසා ඉදිරි කාලය තුළ අපි බලාපොරොත්තු වෙනවා, ඒ අපනයන කෘෂි කර්මාන්තය පදනම් කරගෙන දැවැන්ත ව්‍යාපෘති ආරම්භ කරන්න. මම උදාහරණයක් හැටියට කෙසෙල් කර්මාන්තය ගැන කිව්වේ ඒකයි. ඒ වෙනුවෙන් අපි විශාල මුදලක් විශේෂයෙන්ම වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් තිබෙනවා. ඊට අමතරව, කුරුඳු, තේ, ගම්මිරිස් වැනි භෝග තිබෙනවා. නමුත් අපේ ඛනිජ සම්පත්වලට තවම නිසි මිලක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ අය වැය තුළිනුත් ප්‍රධාන වශයෙන් මුදල් වෙන් කරලා, ඒ අපනයන තත්ත්වය පිළිබඳව හොඳට හිතා බලා, අපේ රටට ඩොලර් ගේන්න අවශ්‍ය ඒ ක්‍රියා මාර්ග ගනිමින් ඉන්නවා. ඒ නිසා අපි ආණ්ඩුවක් හැටියට ඉදිරිපත් කළ පළමුවැනි අය වැය ගැන අපි විශේෂයෙන්ම සතුටු වෙනවා. ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා අපි ගත්ත ඒ උත්සාහයට අපි විශේෂයෙන්ම සතුටු වෙනවා.

මීට පෙර ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. එතුමා කියා සිටියා, එතුමා මේ පාර්ලිමේන්තුව ඇතුළට එනකොට පාර්ලිමේන්තුවේ සේවය කරන නිලධාරි මහත්වරුන්ගෙන් වැඩි වෙව්ව වැටුප ගැන ඇහුවාම, ඔවුන් වැටුප් වැඩි වුණු ආකාරය දන්නේ නැහැ කිව්වා, පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්න පොලිස් නිලධාරීන්ගෙන් වැඩි වෙව්ව වැටුප ගැන ඇහුවාම, ඔවුනුත් වැටුප් වැඩි වුණු ආකාරය දන්නේ නැහැ කිව්වා කියලා.

අපි එතුමාට කියන්න කැමැතියි, මේ නිලධාරීන් වැටුප් වැඩිවීම ගැන දන්නා බව. හැබැයි, එතුමාට ඒ පඩිය කීයද කියලා කියන්න භය වුණාද කියලා අපට සැකයි. ඒ කියන්නේ, එතුමාගේ ඉතිහාසය ඒ වාගේ නිසා මේ නිලධාරීන් එතුමාට ඒක කියන්න භය වුණාද කියලා අපට සැකයි. එළියේ ඉන්න ගොඩක් අය පඩිය ගැන දන්නවා. නමුත්, එතුමාට කියන්න භය වෙන්න ඇති කියලා අපට හිතෙනවා. අවුරුදු 25ක් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙක් කියලා එතුමා අපට අවවාද, අනුශාසනා සෑහෙන

[ගරු උපුල් කිත්සිරි මහතා]

ප්‍රමාණයක් දෙනවා අපි දැක්කා. මේ සියලු තත්ත්වය, බිම් මට්ටම හොඳින් හඳුනාගෙන ආපු කණ්ඩායමක් තමයි ජාතික ජන බලවේග ආණ්ඩුව කියන එක අපි පැහැදිලිව කියනවා.

ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමෙක් කථා කළා. එතුමා කිව්වා, ගාල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් මොකුත් කරලා නැහැ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

ගරු උපුල් කිත්සිරි මහතා
(මාණ්පුමිකු උපුල් කිත්සිරි)
(The Hon. Upul Kithsiri)
ඔබතුමා අය වැය ලේඛනයේ ඇතුළ බලන්න. ගාල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් සංවර්ධන යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳවත් හොයලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. පසුගිය දවස්වල බොහෝදෙනෙක් කිව්වා, අපට දිනන්න බැහැ කියලා. දිනන්න බැහැ කියපු අයට දිනලා පෙන්නපු අපි, හදන්න බැහැ කියන රට හදලා පෙන්වනවාය කියන එකත් සහතික කර කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු චානක මාදුගොඩ මහතා
(මාණ්පුමිකු චානක මාදුකොඩ)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමා. මොකක්ද point of Order එක?

ගරු චානක මාදුගොඩ මහතා
(මාණ්පුමිකු චානක මාදුකොඩ)
(The Hon. Chanaka Madugoda)
එතුමා මා ගැන සඳහන් කළා. ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට මම විතරයි මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ නේ.

ගරු උපුල් කිත්සිරි මහතා
(මාණ්පුමිකු උපුල් කිත්සිරි)
(The Hon. Upul Kithsiri)
ගාල්ලේ මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා.

ගරු චානක මාදුගොඩ මහතා
(මාණ්පුමිකු චානක මාදුකොඩ)
(The Hon. Chanaka Madugoda)
ගාල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු මොනවාද කියලා කියන්න පුළුවන් නම් වටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.00]

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(මාණ්පුමිකු චුසන්ත කුමාර නවරත්න)
(The Hon. Susantha Kumara Nawarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂයට අදාළව ඉදිරිපත් කළ අය වැය ලේඛනය ගැන මේ සභා ගර්භයේ බොහෝ මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළා. ඒ වාගේම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුත් බොහෝ අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම වසර ගණනාවක් ආපස්සට ගිහින් තිබෙන අපේ රටේ ආර්ථිකය, බිඳ වැටුණු ආර්ථිකය නැවත ස්ථාවර කර ගන්නේ කොහොමද, නැවත ශක්තිමත් කර ගන්නේ කොහොමද කියන අදහස ඇතිව ඉතාම කල්පනාකාරීව මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. අය වැය ඉදිරිපත් කරන මොහොතේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සමහර ක්ෂේත්‍ර වෙනුවෙන් මුදල් වෙන් කරනකොට නැඟිටලා ආවාර කළ ආකාරය අපි දැක්කා. අපි දන්නවා, පසුගිය ඉතිහාසය පුරාවට අපේ රටේ අය වැයක් ඉදිරිපත් කරනකොට උතුර අමතක කර තිබුණු බව. ඒ නිසා උතුරු පළාත ගැන විශේෂ අවධානය යොමු කරපු එකත් මේ අය වැයේ විශේෂ කාරණයක් ලෙස මතු කරන්න පුළුවන්.

විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් ජන දුක ගැන කථා කරනවා. ඒ ගැන මාර වේදනාවකට පත් වෙලා, දැන් විවිධ අදහස් ප්‍රකාශ කරමින් ඉන්නවා. අපි දැක්කා, පසුගිය කාලයේ මොළ හතක් තිබෙනවා යයි කියපු ආර්ථික විශේෂඥයෝ ප්‍රකාශ කළා, වට්ටක්කා ඇටයක් වීසි කරලා, කම්මැලිකමින් හිටියොත් ගොවි ජනතාවට අස්වැන්නක් ගන්න බැහැ කියලා. එහෙම කියපු අතීතයක් තිබුණා. ගොවි ජනතාවට අවමන් කළා. ඒ නිසා ගොවි ජනතාව කනස්සල්ලට පත් වුණා. හැබැයි, අනුර කුමාර දිසානායක අපේ ජනාධිපති සහෝදරයා මේ ඉදිරිපත් කරපු අය වැය ඇතුළේ බිඳ වැටුණු කෘෂි කර්මාන්තය නැවත ගොඩ ගන්නේ කොහොමද කියන එක පෙන්වා දීලා, ඒ සඳහා වැඩිපුර ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

විශේෂයෙන් ගත්තොත්, අපේ රටේ කෘෂි කර්මාන්තය සඳහා රුපියල් ලක්ෂ 56,000ක් වෙන් කරලා තිබෙනවා. මෙහි තිබෙන විශේෂ කාරණා කිහිපයක් මතු කරලා පෙන්වන්න පුළුවන්. එකක් තමයි, අපේ රටේ කෘෂි කර්මාන්තය ඉදිරියට ගෙනයන්න, නවීකරණය කරන්න, තාක්ෂණය එකතු කරන්න ආණ්ඩුවක් විධියට අපි බලාපොරොත්තු වෙනවා. තාක්ෂණයෙන් දශක දෙකක් විතර ආපස්සටය ගිහිල්ලා තිබෙන අපේ රට, තාක්ෂණයෙන් පිම්මක් ගණනාවක් ඉදිරියට ගෙන යෑම වෙනුවෙන් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,250ක් වෙන් කරලා තිබෙනවා. එය විශේෂ කාරණයක් ලෙස පෙන්වා දෙන්න පුළුවන්. අපි දන්නවා, අපේ ගම්වල ගොවි ජනතාව තවමත් දණිස දක්වා එරි-එරී කුඹුරට තෙල් ගහනවා. තවමත් ඉතාම ප්‍රාථමික විධියටයි කෘෂි කර්මාන්තයේ නියැළෙන්නේ. එම නිසා ඉදිරියේදී අපේ රටේ ගොවි ජනතාවට අලුත් තාක්ෂණය වැඩි වැඩියෙන් හඳුන්වා දෙන්නට ඕනෑය කියන අදහස සහිතව ඒ මැදිහත් වීම කරන්න අපි සූදානම්.

ඒ වාගේම කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන්වත් ශක්තිමත් කරන්න ඕනෑ. අලුත් ව්‍යවසායකයන් හඳුන්වා දෙන්න ඕනෑකම තිබෙනවා. අපි අපටම ආහාර නිෂ්පාදනය කර ගන්නවා වෙනුවට

භාණ්ඩාගාරයේ ඩොලර් සංචිතය තව තවත් තර කර ගැනීම වෙනුවෙන් අනාගතයේදී අපේ රටේ ගොවි ජනතාව නිෂ්පාදනය කරන අස්වැන්න අපනයනය කරලා, මහා භාණ්ඩාගාරයට තව තවත් වැඩියෙන් ඩොලර් එකතු කරන්න පුළුවන් මට්ටමට අපි අපේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කරන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 3,470ක් වෙන් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නහා සිටුවීමේ වැඩසටහන යටතේ අපි තවත් රුපියල් මිලියන 5,947ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, අපේ රටේ අතිරේක බෝග වගාව විශාල ලෙස කඩාගෙන වැටීම. ඒ නිසා අපේ රටේ කෘෂි කර්මාන්තයේ තුන්වැනි කන්නයක් ගැන, එහෙම නැත්නම් අතරමැදි කන්නයක් ගැන ආණ්ඩුවක් විධියට අපි කල්පනා කරනවා. එම අතරමැදි කන්නය ගැන අපි අතීතයේ ඕනෑ තරම් අහලා තිබෙනවා. හැබැයි, දැන් අතරමැදි කන්නයක් ගැන කථා ඉවත් වෙලා තිබෙනවා. එහෙමත් තැනක තමයි මැදි කන්නය, අතරමැදි කන්නය වගා කරන්නේ. අතරමැදි කන්නයේ තමයි අපේ රටේ අතිරේක බෝග වැඩි වශයෙන් වගා කර ගන්න ඉඩ කඩ තිබෙන්නේ. එම නිසා අතිරේක බෝග වගා වැඩසටහනට රුපියල් මිලියන 150ක් වෙන් කර තිබෙනවා. අපි මේ වර්ෂය ඇතුළේ අතිරේක බෝග වැඩිපුර වගා කරලා, පිට රටින් අපේ රට ඇතුළට ගෙනෙන අතිරේක ආහාර ටික අඩු කර ගන්න ඕනෑය කියා අපි කල්පනා කරනවා.

අනෙක් පැත්තෙන් ගත්තාම ප්‍රධාන කාරණයක් ලෙස ජාතික බීජ නිෂ්පාදන සහ මිලදී ගැනීමේ වැඩසටහන පෙන්වා දෙන්න පුළුවන්. අපි කවුරුත් දන්නවා, කෘෂි කර්මාන්තයේ යෙදෙන අපේ රටේ ගොවි ජනතාවට අධික වැය බරක් දරලා බීජ ටික මිලදී ගන්න සිදු වෙලා තිබෙන බව. ඒ නිසා අනාගතයේදී අපේ රටේ ගොවි ජනතාවට ඕනෑ කරන බීජ ටික අපේ රට ඇතුළේම නිෂ්පාදනය කරලා සහන මිලට ලබා දෙන්න ආණ්ඩුවක් විධියට අපි කල්පනා කරනවා. අපේ රටේ බීජ පර්යේෂණායතන තිබෙනවා. ඒවාට ඕනෑ කරන පහසුකම් ටික දෙන්න ඕනෑකම තිබෙනවා. බීජ පර්යේෂකයෝ ඉන්නවා. ඒ පර්යේෂකයන්ට ඕනෑ කරන පහසුකම් ටික දෙන්න ඕනෑකම තිබෙනවා. ඒ වාගේම බීජ ගොවිපොළවල් තිබෙනවා. ඒ බීජ ගොවිපොළවල්වලට දෙන්න ඕනෑ පහසුකම් ටික දෙන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 1,250ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම කඩිනම් බීජ ගොවිපොළ සංවර්ධන වැඩසටහනත් ඒකටම අදාළයි. දැනට තිබෙන බීජ ගොවිපොළවල්වලින් විතරක් අපේ බීජ අවශ්‍යතාව සපුරාගන්න බැහැ කියලා අපි දන්නවා. රට පුරා ගොවි ජනතාව විශාල පිරිසක් මෙම බීජ නිෂ්පාදනය වෙනුවෙන් එකතුවෙලා ඉන්නවා. ඒ නිසා, අපට වැඩි අස්වැන්නක් ගන්නට නම් ඒ සඳහා කුඩා කණ්ඩායම් දායක කර ගන්නවා වාගේම, ගොවි ජනතාව තවත් වැඩි වශයෙන් බීජ නිෂ්පාදන කටයුතු වෙනුවෙන් දායක කරගෙන අපට අවශ්‍ය බීජ නිෂ්පාදනය වේගවත් කරන්න ඕනෑය කියලා අපි ආණ්ඩුවක් විධියට කල්පනා කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි රුපියල් මිලියන 600ක් වෙන් කරලා තිබෙනවා. ඒ විධියට අපේ රටේ බිඳ වැටී තිබෙන කෘෂි කර්මාන්තය නැවත නහා සිටුවීම වෙනුවෙන් අපි වැඩි වැඩියෙන් මුදල් වෙන් කර තිබෙනවා.

අනෙක් පැත්තෙන් අපේ රටේ තිබෙන ප්‍රධාන අංශයක් තමයි පශු සම්පත් ක්ෂේත්‍රය. අපේ රටේ බිඳ වැටී තිබෙන පශු සම්පත් ක්ෂේත්‍රය නැවත ගොඩනඟලා ඉදිරියට ගෙන යෑම වෙනුවෙන් සැලසුම් හදලා ඒ සඳහා 2025 වර්ෂයට රුපියල් ලක්ෂ 26,000ක් වෙන් කරලා තිබෙනවා. අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 45යි අපේ රට තුළ නිෂ්පාදනය කරන්නේ. ඉතිරි සියයට 55 ගෙනෙන්නේ පිට රටින්. අපට අවශ්‍ය කිරි පිටි ටික අපි පිට රටින් ගෙනැල්ලා ඩොලර් වැය කරනවා වෙනුවට, ඒ ඩොලර් ටික භාණ්ඩාගාරයේ ඉතිරි කර ගන්න ඕනෑ නම්, අපේ රට ඇතුළේ කිරි නිෂ්පාදනයට දායක වන ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් ටික සපයන්න ඕනෑකම තිබෙනවා.

ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය තාක්ෂණය සපයන්නත් ඕනෑකම තිබෙනවා. මේ ආදී ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳීමේ ඕනෑකම අපට තිබෙනවා. අපි දැක්කා, පෙර වරුවේ කථා කළ සමහර මන්ත්‍රීවරු සත්ව පාලනයේ යෙදිලා ඉන්න ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරනවා. ආණ්ඩුවක් විධියට අපි රටේ පශු සම්පත් ක්ෂේත්‍රය ගොඩනැඟීම පිළිබඳව අවධානයෙන් යුතුව ඒ වෙනුවෙන් මැදිහත්වෙමින් ඉන්නවා. වැඩිපුර මුදල් වෙන් කරලා, අලුත් තාක්ෂණය ගමට ගෙනිහිල්ලා, මේ කර්මාන්තයේ යෙදෙමින් තැන තැන විසිරිලා ඉන්න ගොවි ජනතාව එකතු කරලා ඔවුන්ට විශ්වාසවන්තව ඒ කටයුත්ත කරගෙන යෑමට අවශ්‍ය මැදිහත්වීම අපි කරනවා.

එදා හිටපු සමහර මන්ත්‍රීවරු, ඇමතිවරු ඇහුවා, "ඔක්සිජන් කන්නද" කියලා. දැන් අපේ රටේ බොහෝදෙනෙක් හාගෙට හුස්ම අරගෙන ඉන්නේ කියලා අපි දන්නවා. මොකද, දැන් පිරිසිදු වාතාශ්‍රය ලබා ගන්න බැරි මට්ටමට අපේ රටේ වනාන්තර විනාශ වෙලා තිබෙනවා. ඒ කියන්නේ අද අපට අවශ්‍ය ප්‍රමාණයට වනාන්තර නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවක් විධියට කල්පනා කරලා තිබෙනවා, අපේ රටේ පරිසර පද්ධතිය සුපෝෂණය කරන්න ඕනෑ, වනාන්තර පද්ධතිය ආරක්ෂා කර ගන්න ඕනෑ කියලා. අපි ඒ වෙනුවෙනුත් වැඩි අවධානයක් යොමු කරමින් මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි දන්නවා, පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරුන්ගේ පුත්තු රොකට් යැව්වා කියලා. ජනතාවට සිහින පෙන්වලා, ජනතාවගේ සිහින විනාශ කරලා රොකට් යවපු ඉතිහාසයක් අපට තිබෙනවා. හැබැයි, අපි අලුත් බලාපොරොත්තු සහිතව ගම්වල ජීවත් වන නව නිර්මාණකරුවන්ට, පාසල්වල ඉගෙන ගන්නා නව නිර්මාණකරුවන්ට, පර්යේෂකයන්ට වැඩි ඉඩ කඩ දීලා තිබෙනවා, වැඩි අවස්ථා දීලා තිබෙනවා. ඒ අනුව තාක්ෂණයේ පිම්මක් ඉදිරියට යන්න කල්පනා කරන මේ මොහොතේ තරුණ පරම්පරාවට, දුවා දරුවන්ට, ජනතාවට රටේ අනාගතය ගැන බලාපොරොත්තු සහිතව ජීවත් වෙන්න පුළුවන් අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

මේ රටේ ජනතාවට කියන්න තවත් කාරණයක් තිබෙනවා. දැන් විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු විවිධ කථා, විවිධ අදෝනා ගම්වල ඉන්න ජනතාවට ප්‍රකාශ කරමින් ඉන්නවා, මාධ්‍ය තුළ විවිධ අදහස් ප්‍රකාශ කරමින් ඉන්නවා. ඒ වාගේම ඔවුන් අද රාජ්‍ය සේවකයන්ගේ වැටුප ගැන විවිධ මත හඳන්න උක්සාහ කරමින් ඉන්නවා. සමහර මන්ත්‍රීවරු කියනවා, රනිල් වික්‍රමසිංහ මහත්තයා ගිය වැල් පාලමේම අපිත් යන්න හදනවා කියලා. සීයා ගිය පාරේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කොහොමත් යන්න සූදානම් නැහැ. අපි ආවේ system change එකකට, සමාජ පරිවර්තනයක් වෙනුවෙන්, මේ රටේ ජීවත් වන ජනතාවට අලුත් බලාපොරොත්තු සහිතව සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කිරීම වෙනුවෙන්. ඒ මියැදුණු වැල් පාලමේ යන්න, ජනතාව ප්‍රතික්ෂේප කළ වැල් පාලමේ යන්න ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ අපි සූදානම් නැහැ. අපි අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න, අලුත් තාක්ෂණය එකතු කරලා නව කර්මාන්තකරුවන්ට ඒ සඳහා අවස්ථාව හදලා දෙනවා. ඒ වාගේම ජනතාවට නීරෝගීව ජීවත් වෙන්න පුළුවන් රටක් අපි නිර්මාණය කරනවා.

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

අපේ රටේ අධ්‍යාපනය බිඳ වැටිලා තිබෙන බව ඇත ගම්මානවලට යනකොට අපට පෙනෙනවා. මැදවච්චිය, පදවිය, කැබිතිගොල්ලෑව, රඹෑව වාගේ ඇත ගම්මානවල ඉන්න දුවා දරුවන්ට අධ්‍යාපනය සම්බන්ධ බරපතළ ප්‍රශ්න තිබෙනවා. වසර ගණනාවක් තිස්සේ අධ්‍යාපනයේ විෂමතා නිර්මාණය කළ පාලකයෝ දැන් කියනවා, මේ අය වැයෙන් ඒ දරුවන්ගේ ප්‍රශ්න ගැන, අධ්‍යාපනය ගැන අවධානයක් යොමු කරලා නැහැ, ගම්වල ඉන්න ජනතාවගේ ප්‍රශ්න ගැන අවධානයක් යොමු කරලා නැහැ කියලා. නමුත් අපි අධ්‍යාපනයට වැඩි වැඩියෙන් මුදල් වෙන් කරලා අධ්‍යාපන ක්ෂේත්‍රය තවත් විධිමත් කරන්න අවධානය යොමු කරලා තිබෙනවා. සෑම ක්ෂේත්‍රයක් ඇතුළේම, තරුණයා වෙන්න පුළුවන්, ධීවර ජනතාව වෙන්න පුළුවන්, කාන්තාව වෙන්න පුළුවන්, මේ හැම කෙනාගේම ප්‍රශ්න ගැන අපි අවධානය යොමු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව ඇතුළේ මන්ත්‍රීවරු 159ක් නියෝජනය කරමින් අපි ගෙන යන මේ සටන මේ රටේ ජනතාවට සුඛිත මුදිත ජීවිතයක් අත්පත් කර දීමකින් තොරව අත්හරින්නේ නැහැ කියන ප්‍රකාශය කරමින් මම නවතිනවා. මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය පිළිබඳව වචන කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අය වැය ගැන ලොකු ලොකු කථා ඇහෙනවා. මේ අය වැය ගැන කථා කරනකොට, අය වැය කොහොමද කියලා නොවෙයි, අය වැය කථාව කොහොමද කියලා ඇහුවොත් අපට දෙන්න පුළුවන් ලකුණු 100න් 100ම.

ඒක පාර්ලිමේන්තු ඉතිහාසයේ හොඳම ඉදිරිපත් කිරීම. ඒක ගැන විවාදයක් නැහැ. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා වේදිකාවේදී රටේ ජනතාව ඇන්දුවා වාගේම පාර්ලිමේන්තුවේදීත් ඒ කටයුත්ත ලස්සනට හොඳට හැඩදාලා, වැඩදාලා ඉදිරිපත් කළා. ඒකට අපට දෙන්න පුළුවන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා දෙන්න අපි සූදානම්. ඒකේ විවාදයක් නැහැ. හැබැයි, අය වැය කොහොමද කියලා ඇහුවොත් මේකට අපේ ගමේ භාෂාවෙන් කියන්න තිබෙන්නේ, "තක්කඩි අය වැයක්" කියලායි. මේක ඉතිහාසයේ වාගේම ජනතාවට සිහින පෙන්නපු අය වැයක්. සුරංගනා කථා ගොඩක් එල්ලපු අය වැයක්. සියල්ලම තීරණය කරන සාධකය මුදල් වනකොට, ඒ ඔක්කෝටම රුපියල් මිලියන 100යි, රුපියල් මිලියන 50යි වාගේ බොහොම සොච්චම් ගණන්. නමුත්, අවසානයේ ලොකු කතන්දර ගොඩක් මවලා තිබෙනවා.

දැන් මේ අය වැය ගැන ලොකුවට කථා කරනවා. මේ අය වැයේ ලොකුම කතිකාව බවට පත් වුණේ රාජ්‍ය සේවක වැටුප් වැඩිවීමයි. ඉතිහාසයේ ලොකුම වැටුප් වැඩි කිරීම, කිසිම රජයක් රාජ්‍ය සේවකයෝ දිහා බැලුවේ නැති වුණාම අපට තමයි රාජ්‍ය සේවකයන් ගැන කැක්කුම ඇති වුණේ කිව්වා. ඒක අනිවාර්යයෙන්ම වෙන්න ඕනෑ. සියයට 80ක් රාජ්‍ය සේවකයෝ කටකපලා ඡන්දය දුන්නා. Canvassing කරලා ගමම එකතු කරලා දුන්නා. එ් නිසා රාජ්‍ය සේවකයන්ට හොඳට සලකන්න ඕනෑ. මේ අයට නොසලකා ඉන්න බැහැ. හැබැයි, සැලකුවේ කොහොමද? ඒකත් තල්ලු කරලා දැම්මේ, අනාගත ආණ්ඩුවකට. මූලික වැටුපට එකතු කරලා, එකතු කරලා මෙන්න කියලා පෙන්නුවා. හැබැයි, රාජ්‍ය සේවකයාට සොච්චම් වැටුපක් ලබා දෙන්න තමයි කටයුතු කරලා තිබෙන්නේ. තව කාලයකින් මේ ආණ්ඩුව ඉවර වෙනවා කියලා දන්නවා. මේ පව් ටික අනාගත ආණ්ඩුවකට භාර දීලා මේ අය මෙතැන පම්පෝරි ගහනවා. රාජ්‍ය සේවකයන්ට පෙන්වනවා, වැටුප් වැඩි කරලා දෙනවා කියලා. හැබැයි, එල්ලලා තිබුණු මුදල මූලික වැටුපට දාලා තිබෙනවා. මූලික වැටුපට දැම්මාම, විවිධ දේවල්වලට කැපෙනකොට අතට එන මුදල කොච්චරද?

හැබැයි, මේ රටේ රාජ්‍ය සේවකයන්ට වැඩ කළේ නැහැ කියලා කියන යහ පාලන රජය කොහොමද වැටුප් වැඩි කළේ? මේ අයත් යහ පාලන රජයේ අයිතිකාරයෝ. ඒක නැහැයි කියන්න බැහැ. යහ පාලන රජය ගෙනෙන්න වේදිකා ගණනේ ආවා. රනිල් වික්‍රමසිංහගෙන් දින 52ක් ආණ්ඩුව හොරකම් කර ගත්තාම, ඔළුවේ අත ගහගෙන වටේ දුවලා අනුර කුමාර දිසානායක තමයි ඒ ආණ්ඩුව නැවත ගෙනෙන්න කටයුතු කළේ. ඒ යහ පාලන රජයේ කොටස්කාරයෝ විධියට එතුමන්ලා ඉන්නකොට සියයට 107කින් වැටුප් වැඩි වීමක් දීලා ඒක මූලික වැටුපටත් එකතු කරලා දුන් නිසා තමයි ලංකාවේ වාහනවලට බදු ගහන එක වැඩි කරන්න අපට සිදු වුණේ. ගෙදර නෝනයි, මහත්තයායි රාජ්‍ය සේවයේ ඉන්නවා නම් ඔවුන් වාහනයක් ගත්තා, ඒ වැඩි වෙච්ච වැටුපට හරියන විධියට ලීසිං එකක් දාගෙන ගෙවන්න. ඇල්ටෝ, මරුටි වාහන විශාල ප්‍රමාණයක් එක වර අපේ රටට ඇතුළු වුණේ කොයි කාලයේද කියලා ඔබතුමන්ලා හොයලා බලන්න.

අපි ඒ කාලයේ සලකපු හැටි රාජ්‍ය සේවයේ මහත්වරුන්ට ටික කාලයක් යනකොට අමතක වුණා. ඊට වැඩිය අපි දෙන්නම් කියලා කථා ගොඩක් මවලා ආපු ආණ්ඩුව මේ විධියට සොච්චමක් දීලා රාජ්‍ය සේවකයෝ තුට්ටුවට දාපු එක ගැන රාජ්‍ය සේවක මහත්වරු අප්‍රේල් මාසයේ වැටුප ලැබුණාම ආණ්ඩුව ගැන කතිකාව ඇති කර ගනීවි. දැන් මේ කියන කතන්දර ඔක්කෝම අපි අහගෙන ඉන්නවා. මට කලින් කථා කරපු මන්ත්‍රීතුමෙකුත් ඒ ගැන විග්‍රහ කළා. එතුමාටත් චෝදනාවක් තිබෙනවා, මැතිවරණයට ඉදිරිපත් වෙද්දි තඹුත්තේගම කාර්යාලයකින් මාසික වැටුපත් ගත්තා කියලා. ඒ පිළිබඳව විමසන්න අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. මේ අය වැය ගැන විවිධ කතන්දර ඇති කර ගන්න පුළුවන්. මේ අය වැයේ තිබෙන දේවල් ඉදිරි කාලය තුළ ක්‍රියාත්මක කරයි කියලා දෙන්න පුළුවන් විශ්වාසය මොකක්ද? ඒවා මේ රටේ යථාර්ථයක් බවට පත් වෙනවා කියන එකට දෙන්න පුළුවන් සහතිකය මොකක්ද?

ඔබතුමන්ලා ආවේ ජාතික ආරක්ෂාව පිළිබඳව අපට lectures දෙන්න. ඒක අහගන්න බංකු අරගෙන ඇවිල්ලා වාඩිවෙන්න කිව්වා. ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරලා දෙන්නම් කියලායි කථා කළේ. දැන් ජාතික ආරක්ෂාව ඉගෙන ගන්න වෙලා තිබෙන්නේ අපට නොවෙයි. ජාතික ආරක්ෂාව සහතික කරන්න ආපු අයගේ බංකු අස්සේ රිංගලා අපේ ආරක්ෂාව තහවුරු කරගන්නයි දැන් වෙලා තිබෙන්නේ. රටේ ආරක්ෂාව දැන් ඒ තැනට පත්ව තිබෙනවා.

දැන් පම්පෝරි ගහනවා, ඒ වෙඩි තියපු පුද්ගලයා අපි අල්ලගත්තා කියලා. වෙඩි තියපු පුද්ගලයා අල්ලගන්න අවශ්‍ය තොරතුරු මේ රටේ බුද්ධි අංශ තහවුරු කළා, මීට සති ගණනකට පෙර මෙවැනි කාරණයකට අධිකරණය තුළ ලෑස්ති වෙනවා

කියලා. මේක සහරාන්ගේ ප්‍රහාරය වාගේ තවත් එකක් විතරයි. සියලු බුද්ධි තොරතුරු ලැබිලා තිබෙද්දී ඒ පිළිබඳව ක්‍රියාත්මක වෙන්නේ නැතුව සහරාන්ලාට ගහන්න ඉඩහැරියා -පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වෙන්න ඉඩ හැරියා- වාගේ එකක දෙවැනි අදියර තමයි මේක. ඒකේ දෙවැනි පිටපත තමයි මේක. මේ සම්බන්ධ සියලු තොරතුරු ලබා දීලා තිබුණා. ඒ කාන්තාවගේ නමත් ලබා දීලා තිබුණා. පින්පුර දේවගේ ඉෂාරා සෙව්වන්දි කියන මේ කාන්තාව කාලයක් තිස්සේ මේ කටයුත්තට සූදානම් වෙනවා කියලා බුද්ධි අංශ තහවුරු කර දීලා තිබෙද්දී තමයි මේ සිද්ධිය වුණේ. ඔවුන් අධිකරණය ඇතුළට ඇවිල්ලා වෙඩි තියලා යනකල් ආරක්ෂාවේ කප්පිත්තෝ කියපු අයට ඔවුන්ගේ එක මයිලක්වත් හොයා ගන්න පුළුවන් වුණාද? ඒ කාන්තාව එතැනට ඇවිල්ලා පිස්තෝලයත් ගෙනැල්ලා දීලා පිට වෙලා ගියා. අද වෙනකොට ඉන්න තැනක් දන්නේත් නැහැ.

මුදල්වලට තිබෙන පෙරේතකමට, පොරොන්දු වෙච්ච මුදල දෙන්න තිබෙන කෑදරකමට ඩුබායිවල ඉන්න ඒ පාතාලයේ මිනිස්සුම මේ අය ගැන ඔත්තුව දුන්නා. වාහනේ නොම්මරයත් එක්ක දුන්නාම STF එක සිවිල් පිට ගිහිල්ලා එතැන නතර වෙලා ඉන්නවා. නතර වෙලා ඉඳගෙන ඒ පුද්ගලයාත් එක්ක සතුටු සාමීචියේ යෙදෙනවා. ඒ, ඇයි? Uniform නැතුව අත්අඩංගුවට ගන්න බැහැ. සැකකරු අල්ලා ගත්තාට පස්සේ uniform ඇඳගත් කණ්ඩායමක් එනකල් සතුටු සාමීචියේ යෙදෙනවා.

වෙන කෙනෙක්ව අල්ලා ගත්තා නම් කොහොමද? ගහලා, මුහුණු වහගෙන අරගෙන යන්නේ. හැබැයි, ඒ කට්ටිය කැමරාත් අරගෙන ගිහිල්ලා. මේ අපවාදයෙන් බේරෙන්න STF එක කැමරාත් අරගෙන ගිහිල්ලා තමයි ඔහුව අත්අඩංගුවට ගන්නේ. ඔහු ප්‍රධාන චූදිතයෙක්; ප්‍රධාන වරදකාරයෙක්. ඔහුව ඉදිරිපත් කරන්න ඕනෑ, හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට. දැන් ආපසු මොකටද ඔහු හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කරන්නේ? සියල්ලම විවර වෙලා ඉවරයි. මේ සියල්ලටම හේතුව ආණ්ඩුවේ නොහැකියාව.

ඒ වාගේම මේ රටේ සමස්ත ක්‍රිස්තියානි ජනතාව මත මෙතුමන්ලා විශාල විශ්වාසයක් ගොඩනැඟුවා, "අපි පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවෝ අල්ලනවා, අල්ලනවා, අල්ලනවාමයි" කියලා. හැබැයි, අපි ඒ අය අල්ලලා දෙනවා කියලා මෙතුමන්ලා ඒක යටපත් කළා. පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවෝ කවුද මහත්තයෝ, අධිආරක්ෂිත කලාපය ඇතුළට රිංගලා, STF එකත් සිවිද්දී වෙඩි තබා මරා දමා ගිය මිනිහාව අල්ලා ගන්න බැරිව. එම අපරාධයේ සැබෑ මහ මොළකරු අතුරුදහන්. ඔත්තුව දුන්නාම ඒ shooter විතරක් අල්ලා ගත්තා. හැබැයි, ඒ අපරාධයට සම්බන්ධ කාන්තාව අද වනතෙක් ආගිය අතක් නැහැ. ඔබතුමන්ලාගේ බුද්ධි අංශවලට, ඔබතුමන්ලාගේ ආරක්ෂක අංශවලට වැඩිය පාතාලයේ ඒ කාන්තාව ශක්තිමත්. ඇය දන්නවා, මිය ගිය ඒ පාතාලකරුවා එදින අංක 09 අධිකරණ ශාලාවේ පැවති නඩුවකට ගෙනෙනවා කියලා. එම නඩුවේ කට උත්තරය Zoom හරහා ගන්න පුළුවන්කම තිබෙද්දී, එසේ නොකර භෞතිකව පෙනී සිටින්න කියලා අංක 09 අධිකරණ ශාලාවෙන් නියෝගයක් දීලා තිබෙනවා. අපරාධකරුව අංක 09 අධිකරණ ශාලාවට ගෙනෙනකොට එදිනම අංක 05 අධිකරණ ශාලාවේ තවත් නඩුවක් තිබෙනවා. ඒ නිසා අංක 09 අධිකරණ ශාලාවේදී ඔහුව ඝාතනය කරන්න බැහැ. හැබැයි, ඔහුව ඝාතනය කරන්න පුළුවන් අංක 05 අධිකරණ ශාලාවේදී කියන එක ඔබතුමන්ලාට වැඩිය හොඳට මේ රටේ පාතාලය අතරට ගිහිල්ලා තිබෙනවා. පාතාලය එතැන ඉඳලා සැලසුම් කරලා එම ඝාතනය කරවලා තිබෙනවා. එහෙම තිබෙද්දී ජාතික ආරක්ෂාව තහවුරු කරන්න එනවා.

අද පාර්ලිමේන්තුවට, ගොඩනැඟිලිවලට ආරක්ෂාව දීලා. මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දෙන්න බැහැ. බංකුවේ ඉඳගෙන lectures අහන්න ආපු කට්ටිය බංකුව අස්සේ. හැබැයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නොවෙයි නේ ආරක්ෂාව ඕනෑ. දැන් පාර්ලිමේන්තුව වටේ ඉන්න STF එක වැඩි කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව වටේ ඉන්න පොලීසිය වැඩි කරලා තිබෙනවා. අපේ මාදිවෙල නිවාස සංකීර්ණයට STF එකේ නිලධාරීන් දමා තිබෙනවා. ඒ, ගොඩනැඟිලි රකින්නද? එම නිලධාරීන් දාලා තිබෙන්නේ ගොඩනැඟිලි ආරක්ෂා කරන්නද? ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. හෙට මහ පාරේ මේ රටේ මන්ත්‍රීවරයෙකුත් මරා යන කල්ද බලාගෙන ඉන්නේ? ආරක්ෂාව තුට්ටු දෙකට දමලා, තමන්ගේ දේශපාලන වෛරය නඩත්තු කරන්න උත්සාහ කරනවා. හෙට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඝාතනයට ලක් වුණොත් එහි සම්පූර්ණ වගකීම මේ ආණ්ඩුව භාර ගත යුතු වෙනවා; ඒ සියල්ලම ආණ්ඩුවට භාර ගන්න වෙනවා. වැඩි කාලයක් නොගිහින් ආරක්ෂාව ඕනෑ වෙන්නේ ඔබතුමන්ලාටමයි.

මතක තබා ගන්න, අපට ප්‍රශ්නයක් නැහැ. අපට අදටත් ප්‍රශ්නයක් නැහැ. ඉදිරියටත් අපට ගැටලුවක් නැහැ. මොකද, අපි ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ. මම මේ කථා කරන්නේ රෝහණ බණ්ඩාරගේ ප්‍රශ්න නොවෙයි. මේ රටේ ජනතාවගේ ප්‍රශ්න. රටේ ජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරනකොට අපට පාතාලයට විරුද්ධව කථා කරන්න සිද්ධ වෙනවා. කුඩු ජාවාරම්කාරයන්ට විරුද්ධව කථා කරන්න වෙනවා. ඒ වාගේම සමහර ජාවාරම්කාරයන්ගේ හිත සුව පිණිස නොවන දේවල් අපි මෙතැන කථා කරනවා. එහෙම කථා කරන නිසා රෝහණ බණ්ඩාරට නම් පෞද්ගලිකව ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ලක්ෂ 225ක් නියෝජනය කරන්න සිටින ගරු මන්ත්‍රීවරු 225දෙනා මේ රටේ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන්, ජනතාවගේ අනාගත උන්නතිය වෙනුවෙන් තීන්දු තීරණ ගන්න කථා කරනකොට එය මේ රටේ ජාවාරම්කාරයන්ට තර්ජනයක් වෙනවා. අන්න ඒ නිසායි උත්තරීතර පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දෙන්න කියන්නේ. එහෙම නැතුව මේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලිකත්වයට නොවෙයි, ආරක්ෂාව දෙන්න කියන්නේ. මේ රටේ උත්තරීතරභාවය පිළිබඳව තීන්දු තීරණ ගන්න, මේ රටේ චංචල සහ නිශ්චල දේපළ පිළිබඳව තීන්දු තීරණ ගන්න පිරිසටයි ආරක්ෂාව දෙන්න කියන්නේ. ඒ නිසා මන්ත්‍රීවරුන්ගේ උත්තරීතරභාවය ආරක්ෂා කරන්න. ඒක කෙලෙසලා ඔබතුමන්ලා බලයට ගත්ත එක හරි. හැබැයි, එහෙම කරලා ඔබතුමන්ලා මේ මොනවාද කරගෙන යන්නේ? වගකීමෙන් යුතුව ජනතාවට කථා කරනවාද? අද ජාතික ආරක්ෂාව සම්පූර්ණයෙන්ම ගිලිහී ගිහිල්ලා.

පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කරනවා කියන එක රජයට බරක්ද? එය රජයට තව වාසියක්. ETF හා EPF හරහා එන සල්ලි ටිකෙන් තවත් ණය ගන්න පුළුවන්. පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම මාසික වැටුප රුපියල් 21,000ට, රුපියල් 30,000ට තිබුණේ මේ මෑතක. ඔය වැටුපටද මේ රටේ පෞද්ගලික අංශයේ සේවකයෙක් වැඩ කරන්නේ? රුපියල් 30,000ට වැඩ කරන සේවකයෝ ඉන්නවා නම් අපට ගෙනැල්ලා දෙන්න. රුපියල් 30,000ට වැඩ කරන සේවකයෝ කොහේද ඉන්නේ? මේ කථා පම්පෝරි ගහන්න හොඳයි. මේවා මහ පොළොවේ යථාර්ථය නොවෙයි. මාසික අවම වැටුප රුපියල් 30,000ට වැඩි කළාම වෙන්නේ ETF සහ EPF වෙනුවෙන් ගෙවන මුදල වැඩි වන එකයි. මාසික වැටුපෙන් හදාගෙන හිටපු වියදම් රාමුව වෙනස් වීම විතරයි වෙන්නේ. ETF සහ EPF ලබන සමහර කට්ටිය අපි ළඟත් වැඩ කරනවා. ඔවුන් කියන්නේ, අනේ මහත්තයෝ මගේ වැටුපෙන් නම් ETF සහ EPF අය කරන්න එපා කියායි. කම්කරු දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න ඇති වන නිසා අපි සේවකයන්ව ලියාපදිංචි කරලා ETF සහ EPF වෙනුවෙන් වැටුපෙන් කපනවා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

අනේ, ETF සහ EPF වැටුපෙන් කපන්න එපා කියලා අඬන කම්කරු මහත්වරු ඉන්නේ. එම නිසා අවම වැටුප වැඩි කළා කියලා ඔබතුමන්ලා පම්පෝරි ගහන්න එපා. මෙම යෝජනාව තුළ ඔබතුමන්ලා කරපු විශේෂ කාර්යභාරයක් නැහැ.

ප්‍රවාහනය පිළිබඳ කාරණයේදී අනුරාධපුරය ගැන කථා කිරීම සම්බන්ධයෙන් සතුටුයි. ජනාධිපතිතුමාගේ ගෙදර ලිපිනය ගැන, තඹුත්තේගම සිග්නල් කණු ගැන කථා වන නිසා මම කියන්න කැමතියි, තඹුත්තේගම දුම්රිය ස්ථානය සංවර්ධනය කරන්න නොවෙයි, එහි මූලික කර්තව්‍යය සඳහා සහාය දැක්වීමට ශක්‍යතා අධ්‍යයනයක් කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 100ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙන බව. ඒකට හේතුව වශයෙන් මොකක්ද පෙන්වන්නේ? ආර්ථික මධ්‍යස්ථානයක් ළඟම තිබෙන දුම්රිය ස්ථානය වීම. අපේ රටේ දුම්රිය ප්‍රවාහනය ගැන ඔබතුමන්ලාට ආපසු අමුතුවෙන් මම කියන්න ඕනෑ නැහැ. තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයට ගිහින් එළවලු ටික අරගෙන තඹුත්තේගම ස්ටේෂන් එකට ගෙනෙන්න වාහනයක් ඕනෑ. ඊට පසුව දුම්රියෙන් ඒවා කොටුව ස්ටේෂන් එකට ගේන්න ඕනෑ. එතැනින් පැලියගොඩ මැනිං මාර්කට් එකට එළවලු ටික ගෙනියන්න තව වාහනයක් ඕනෑ. කෘෂිකර්ම ඇමතිතුමනි, එළවලු හත් අටපොළකින් මාරු කරනකොට ඒවායේ තත්ත්වය මොකක්ද? අපේ දුම්රියවල තිබෙන යකඩ මැදිරිවල දොර වහලා තිබ්බාම එළවලුවල තත්ත්වය මොකක්ද? තඹුත්තේගමට, අනුරාධපුරයට කරන්න කෝටියක් දේවල් තිබෙනවා. ඔබතුමාත් ඒ ගැන දන්නවා නේ, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනුරාධපුර දිස්ත්‍රික්කය තමයි ලංකාවේ ලොකුම දිස්ත්‍රික්කය. නමුත්, අනුරාධපුර දිස්ත්‍රික්කය කාලයක් තිස්සේ කුඩම්මාගේ සැලකිලිත් එක්ක අභාවයට ගිහින් තිබෙන්නේ. දැන් අපේ ජනාධිපතිවරයෙක් පත් වෙලා ඉන්නේ. අපට ඒ ගැන සතුටුයි. හැබැයි, නිවැරදි තැනට වියදම් කරන්න. තමන්ගේ ගෙදර ඇඩ්‍රස් එකේ තඹුත්තේගම කියන නම සඳහන්ව තිබෙන නිසා මේ දුම්රිය ස්ථානය තෝරාගෙන සංවර්ධනය කරලා වැඩක් නැහැ. කෝච්චි පිලි පනිනවා, කෙළවරක් නැහැ. කෝච්චිය වෙලාවට එනවාද කියලා ෂුවර් එකක් නැහැ. අලි හැපිලා කෝච්චි නතර වෙනවා. තඹුත්තේගමින් එළවලු ටික පටවලා බස් එකක ඇවිල්ලා පැය ගණනක් ඔවුන් ඉන්න ඕනෑ, කෝච්චිය එනකම්. අන්තිමට බලනකොට කෝච්චිය පීලි පැනලා. කෝච්චියේ අලියෙක් වැදිලා අද එන්නේ නැහැ කියනවා. එතකොට එළවලු ටික අලින්ට කන්න දමන්නද? ඒ නිසා ප්‍රායෝගික වැඩ පිළිවෙළවලට යන්න. ජනාධිපතිතුමා ඉගෙන ගත්ත තඹුත්තේගම ඉස්කෝලය ගොඩනඟන්න. ඒකෙන් දැයේ දු දරුවන් බිහි කරන්න. තඹුත්තේගමින් අධ්‍යාපනය ලබලා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ශිෂ්‍ය ප්‍රමාණය තව වැඩි කරන්න. අපේ දරුවන්ට ගෞරවනීය විධියට ක්‍රීඩාවලට යන්න අවශ්‍ය ශක්තිය ලබා දීම කෙරෙහි අවධානය යොමු කරන්න. තමන්ගේ ලිපිනයේ දුම්රිය ස්ථානය පිහිටි ප්‍රදේශයේ නම සටහන් වුණා කියලා අනුරාධපුරයට යමක් කළා, මගේ ගමට යමක් කළා කියලා සතුටු වෙනවාට වැඩිය ගමට කරන්න බොහෝ දේවල් තිබෙනවා. අපි ඒවා සාකච්ඡා කරලා කරමු. අපි ඒ ගැන කියන්නම්. අපි ඒ වෙනුවෙන් දෙන්න පුළුවන් සහයෝගය ලබා දෙන්නම්. ඇමතිතුමන්ලා ගිහින් වැව් සුද්ද කළා නේ. එහෙම අවස්ථාවක් දුන්නොත් තමයි අපටත් ඒ වැඩකටයුතු කරන්න පුළුවන් වෙන්නේ. එතකොට අපිත් ඇවිත් ශ්‍රමදානයට දායක වෙන්නම්. කරන්න මෙච්චර වැඩ තිබියදී ෂෝ නේ දමන්නේ. ඒ වාගේ ෂෝ දාලා වැඩක් නැහැ. ඒ නිසා අපි ඉල්ලනවා, ඔබතුමන්ලා වෙන් කරන මුදල් ප්‍රායෝගිකව වැඩක් ඇති දෙයකට යොදවන්න කියලා.

ඒ වාගේම ඉඩම් සම්බන්ධව කථා කළා. "උරුමය" වැඩසටහන යටතේ ඔප්පු ලබා දෙන එක දැන් නතර කරලා තිබෙන්නේ. ඔබතුමන්ලා දන්නවා, තමන්ට කියා ඉඩමක අයිතිය ලබා ගන්න එක මේ රටේ හැම කෙනෙකුගේම සිහිනයක් බව. තමන්ගේ ද්‍රවශීලතාව වැඩිකර ගන්න තිබෙන එක වත්කමක් තමයි ඉඩම. ස්වර්ණ භූමි, ජය භූමි ඔප්පුවක් පවරන්න ගියාම ගොවි පන්තියේ වෙන්න ඕනෑ; ඒකට හොර සහතිකය හදන්න වෙනම සොච්චමක් දෙන්න ඕනෑ; ගතමන්ට් එකක් දෙන්න ඕනෑ; ඒක අරගෙන වටයක් ගහලා යන්න ඕනෑ. එතකොට ඒ ඉඩමේ තිබෙන වටිනාකම බාල්දු වෙනවා. ඉඩම්වල ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය හින්දා ලු, මේවා නතර කළේ. කවුරු හරි ඉඩම කර තියාගෙන ඉන්නවාද? අපට කියන්නකෝ, සුද්දෙක් ලංකාවේ ඉඩමක් හොරකම් කරගෙන ගිය අවස්ථාවක් ගැන. සුද්දෝ ඇවිත් වසර ගණනාවක් තිස්සේ මේ රටේ දේපළ හොරකම් කරගෙන ගියා තමයි. පෘතුගීසින්, ලන්දේසින්, ඉංග්‍රීසින් එක බිම් අගලක් හොරකම් කරගෙන ගිහින් තිබෙනවාද? බොරු කරලා, දුෂිතයින්ට තවත් ඉදිරියට දූෂණ කරගෙන යන්න තමන්ගේ බිම් ලබා ගන්න තිබුණු අයිතිය නතර කරන්න එපා. ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න. ඒකට ඔබතුමන්ලාගේ ලස්සන නමක් දමා ගන්න. ජාතික ජන බලවේගයට සම්බන්ධ එකක් හරි, අනුර කුමාර සහෝදරතුමාගේ නමට සම්බන්ධ වෙන විධියට හරි නමක් දාලා නම වෙනස් කරන්න. හැබැයි, මේ ඉඩම්වල සින්නක්කර අයිතිය දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන කාරණය මම ඔබතුමන්ලාට මතක් කරන්න කැමතියි.

අධ්‍යාපනය සම්බන්ධව කථා කළ යුතු කරුණු ගොඩක් තිබෙනවා. නමුත් මට තව විනාඩි දෙකයි නේ තිබෙන්නේ. ඒ නිසා මම කෘෂිකර්මය ගැන කියන්න කැමතියි. අපේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා කථා කරනවා මම අහගෙන හිටියා. මම හිතුවේ එතුමා ගොවියාගේ අනාගතය ගැන කියයි කියලා. එතුමාට දැන් රුපියල් 10,000 කියලා කියන්නත් ලජ්ජයි. පොහොර සහනාධාරය වෙනුවෙන් හෙක්ටෙයාර දෙකකට රුපියල් 20,000ක් දෙනවා ලු. හෙක්ටෙයාර දෙකේ කථාව කොහේද තිබුණේ? අපේ මහවැලියේම ඉඩම් දීලා තිබෙන්නේ හෙක්ටෙයාර එක ගණනේ. ඒ අනුව හෙක්ටෙයාර එකේ කුඹුරු තමයි තිබෙන්නේ. මෙතුමා ගණන් ලොකු කරලා පෙන්වන්න කියනවා, හෙක්ටෙයාර දෙකකට රුපියල් 20,000ක පොහොර සහනාධාරයක් අපි ලබා දෙනවා කියලා. ඒ හැර එතුමා ගොවියා ගැන මොනවාද කථා කළේ? ඉස්සර අඹරං මාමලාත් එක්ක කුඹුරු ගණනේ ගිහින් කථා කළා. ඔබතුමන්ලා දැන් වී මෙට්‍රික්ටොන් කොච්චර ප්‍රමාණයක් අරගෙන තිබෙනවාද? මම කට කැඩෙනකම් ඒවා ගැන කිව්වා. හාල් ප්‍රශ්නය ගැන කථා කරනකොට අනෙක් පැත්තට කථා කළේ වී ප්‍රශ්නය ගැන. වී මිලදී ගැනීමට ඔබතුමන්ලාට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද, ඔබතුමන්ලා දෙන සාධාරණ මුදල කීයද කියලා මම ඇහුවා. අපි ඒක විද්‍යාත්මකව පෙන්වන්නම් කිව්වා. දුන්නු මිලට දැන් වී ලැබෙනවාද? යහ පාලනයට බැන්නා නේ. හැබැයි, යහ පාලන රජය පැවති වෙලාවේ දීපු මිලත් එක්ක වී ගබඩා කරන්න ගබඩා මදි වුණා. මත්තල වී ගබඩා කරන්න තරම් ගොවියෝ වී දුන්නා. ඒ මොකද? හොඳ මිලක්, සාධාරණ මිලක් දුන්නු හින්දා. හැබැයි, ඔබතුමන්ලා විද්‍යාත්මක පදනම මත එදා රුපියල් 157ට තිබුණු වී කිලෝවක මිල අද රුපියල් 120ට අඩු කරලා මිල නියම කළා.

වී කිලෝ 670 ගණනක් එනකොට යනවා පිළිගන්න. අර ඉස්සර තෙල් නැව් එනකොට කට්ටිය මල් මාලා දමා පිළිගන්න ගියා වාගේ, වී අලෙවි මණ්ඩලයට වී කිලෝ 675ක් එනකොට, කට්ටියක් ගියා පිළිගන්න. මෙන්න, ලංකාවේ ප්‍රධාන ප්‍රවෘත්තිය. ඇමතිවරු ගණනාවක් ගිහිල්ලා වී කිලෝ හයසිය ගණනේ මුට්ට කර ගහන්න. අයියෝ! ලංකාවේ ප්‍රවෘත්තිවලට ගිය කල. මාලිමාව 70 වසරක සාපය නිමා කරන්න ආවේ. ගොවීන්ට හම්බ වුණු

සහනය මොකක්ද? බඩඉරිහු ගොවීන්ට මිලක් දුන්නාද, උඳු ගොවීන්ට සහනයක් හම්බ වුණාද? උඳු ටික විකුණා ගන්න බැරුව ඉන්නවා. මොනවාටද, ඔබතුමන්ලා මැදිහත් වුණේ?

අද බඩඉරිහු මිල ගැන කථා කරනවාද? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉස්සර නම් ඔබතුමා කුඹුරෙන් එළියට ගන්න හම්බ වුණේ නැහැ, හේනෙන් එළියට ගන්න හම්බ වුණේ නැහැ. ගිහිල්ලා ඒ මිනිස්සුන්ගේ බුලත් විටටත් කෙළලා, බත් මුලටත් කෙළලා ආවා මීසක් මේ අය වැයෙන් ශත පහක සහනයක් ගොවීන්ගේ පැත්තට ඉෂ්ට කරලා නැහැ කියන එකයි අපට කියන්න තිබෙන්නේ. ඔහොම කරන්න එපා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. ඒ, ඔබතුමන්ලා වෙනුවෙන් පෙනී හිටපු, ඔබතුමන්ලා බලයට ගෙනෙන්න වැඩි ශක්තියක් දුන් කඳවුරු. රාජ්‍ය සේවකයා වාගේම ගොවියා ඔබතුමන්ලා බලයට ගෙනෙන්න කටයුතු කළා.

මේ රටේ කෘෂිකර්මාන්තය ගැන කියද්දී අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා කියනවා, "අපට වී දෙන්න ඕනෑ අනිවාර්යයෙන්. අපි රජය විධියට මෙච්චර මුදලක් මේකට වියදම් කරනවා" කියලා. ඔබතුමන්ලා ලංකාවේ කෘෂිකර්මාන්තයට වියදම් කරපු පළමුවෙනි රජය කියලාද, හිතා ගෙන ඉන්නේ? "ඇළ වේලි හදන්න, වාරි මාර්ගය වෙනුවෙන් අපි බිලියන මෙච්චරක් වෙන් කරලා වියදම් කරනවා" ලු. මහවැලිය හැදුවේ කවුද? මහවැලි ව්‍යාපාරය යටතේ මහා ජලාශ හැදුවේ කවුද? මේ ඔක්කෝම හැදුවේ ඔබතුමන්ලාද? එහෙම නැත්නම් ඒවා ඉබේ පහළ වෙලාද; ස්වයංජාත වෙලාද? සුද්දාත් මේ රටේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් කටයුතු කළා. සුද්දා කාලයකදී ඒවා විනාශ කරලා දැම්මා තමයි. හැබැයි, නිදහස ලබපු තැන ඉඳලා; ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ ඉඳලා මේ වෙනකම් හැම කෙනෙකුම මේ රට කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත කරන්න වියදම් කරලා තිබෙනවා. එහෙම කරන්නේ මේ රටේ සහල් පරිභෝජනය වැඩි නිසා; අපේ ප්‍රධාන ආහාරය බත් නිසා. එම කටයුතු සිදු කිරීම රජයක වගකීමක්. ඒක ඉෂ්ට කළ යුතුයි. ඒ නිසා ඒ කටයුතු වෙනුවෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියන කාරණය මතක් කරමින් වේලාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ක්‍රිෂාන්ත අබේසේන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.41]

ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. Chrishantha Abeysena - Minister of Science and Technology)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම කාරණයක් කියන්න කැමැතියි. දැන් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ ජනාධිපතිතුමා බොහොම හොඳ අය වැය කථාවක් ඉදිරිපත් කළාය කියලා. මම කියනවා, ඒ කථාව වාගේ සිය ගුණයකින් අපි වැඩ පෙන්වනවා කියලා. මොකද, මේක අපේ පළමුවෙනි අය වැය. මේකෙන් පසුව තමයි අපි වැඩ පටන් ගන්නේ.

ඒ වාගේම එතුමා පාස්කු ප්‍රහාරය ගැනත් සඳහන් කළා. පාස්කු ප්‍රහාරය එල්ල වුණේ යහ පාලනය කාලයේදී. ඉතින් ඒ කාලයේ ඒගොල්ලන්ට තිබුණා නේ, ඒ සම්බන්ධව කටයුතු කරන්න. එහෙම කරන්නේ නැතුව පාස්කු ප්‍රහාරය වුණේ අපේ කාලයේ වාගේයි දැන් ඒ අය කථා කරන්නේ. ඒ වාගේම යහ පාලන කාලයේ තමයි ලංකාවේ බුද්ධි අංශ පතුලටම වැටුණාය කියන්නේ; එහෙම යුගයක් තිබුණේ. ඉතින් ඒ වාගේ තමයි එතුමන්ලාගේ හැම තර්කයක්ම.

අපේ රට 2022 වෙනකොට ආර්ථිකමය වශයෙන් කඩා වැටුණා. මේ ආර්ථික කඩා වැටීම ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ වුණාට ඒකේ මුල් දිවෙනවා, අවුරුදු ගණනකට. අපි අවුරුදු 76ක් ගැන කථා කළාට, අපිට වඩාත් හොඳින් කථා කරන්න පුළුවන්, පසුගිය අවුරුදු 30-40ක කාලය ගැන.

දැන් එක මන්ත්‍රීතුමෙක් අපට මතක් කළා, 1980ගණන්වල ආර්ථිකය ගැන. 1980ගණන්වල ජේ.ආර්. ජයවර්ධන පාලන කාලයේ ආර්ථිකය පොඩ්ඩක් උඩට ආවා. ඒක පවත්වා ගෙන ගියේ නැහැ. ඒක එහෙමම අනෙක් පැත්තට ගියා. එදා ඉඳලා අපේ රටේ තිබුණේ එක තැන පල් වෙන ආර්ථිකයක්. ඔය කාලය ගැන කථා කරද්දී, "ජේ.ආර්.- ප්‍රේමදාස - රනිල් වික්‍රමසිංහ යුගය" කියන්නේ, භීෂණ යුගය; ප්‍රධාන කොටම රාජ්‍ය ත්‍රස්තවාදය ඇති කරපු යුගය; ප්‍රජාතන්ත්‍රවාදය නැති කරපු යුගය. එදා -1980 ගණන්වල- ඉඳලා තමයි අපේ රට තවදුරටත් බංකොලොත්භාවයට පත් කළේ.

පසුගිය කාලය වෙනකොට උද්ධමනය සියයට 70ට වැඩි වුණා. රාජ්‍ය සේවකයාගේ මූර්ත වැටුප අඩු වුණා. ඒ වාගේම දිළිඳුකම, දරිද්‍රතාවේ අනුපාතය සියයට 25.9 දක්වා වැඩි වුණා. මිනිස්සු දුප්පත්, රටත් දුප්පත්. අපි හැමෝම හිහා කන තත්ත්වයට පත් කළා.

ඒ වාගේම අපේ රටේ වෘත්තියවේදීන් රට හැර දමා ගියා. ඇයි ඒ? දේශපාලන නායකත්වයක් නැහැ; රටට අනාගතයක් නැහැ. තමන්ගේ දුවලා පුතාලට මේ රටේ ජීවත් වෙලා කළ හැකි දෙයක් තිබෙනවාද කියලා අවිශ්වාසයක් තිබුණා. ඒ නිසා ඔවුන් රට දාලා ගියා. ඒ වාගේම වෘත්තිකයන්ට සැලකුවේ නැහැ. වෘත්තිකයන්ගේ වැටුප - salary එක - ජීවන වියදමත් එක්ක බැලුවාම කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ඒ නිසායි වෘත්තියවේදීන් රට දාලා ගියේ.

අපි කථා කළා පසුගිය අවුරුදු 30, 40 ගැන. WHO survey එකක කියනවා, වර්ෂ 2000දී අපේ රටේ සෞඛ්‍ය පද්ධතිය සම්බන්ධයෙන් rank එක තිබුණේ 80 කියලා. හොඳ තත්ත්වයක නොවෙයි, අපි 2000 වර්ෂයේ හිටියේත්. ඒ කියන්නේ, මීට අවුරුදු 24කට ඉස්සෙල්ලා. අද ඒ තත්ත්වය තවත් පහළ වැටී තිබෙනවා. 100ට විතර ගිහිල්ලා තිබෙනවා, rank එක. රටවල් 100ක් විතර අපට වඩා උඩින් ඉන්නවා. නීති පද්ධතිය ගත්තත් එහෙමයි. නීති පද්ධතිය සම්බන්ධයෙන් ගත්තොත් rank එක 70 වාගේයි තිබෙන්නේ. ඉස්සෙල්ලා තිබුණෙත් එහෙමයි. ආර්ථිකය එක තැන පල් වුණා වාගේ නීතියත් එහෙමයි, සෞඛ්‍යයත් එහෙමයි. හැම අංශයක්ම එහෙමයි. රාජ්‍ය පරිපාලනයත් එහෙමයි. විනිවිදභාවයක් තිබුණේ නැහැ. කඩා වැටිච්ච රාජ්‍ය පාලනයක් තිබුණේ. එහෙම ඉතිහාසයක් තිබෙන්නේ.

ඒ වාගේම පක්ෂ ගත්තොත්, යූඑන්පී - සජබයේ බලවේගයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - පොහොට්ටුව බලවේගයත් මාරුවෙන් මාරුවට ආවා. ඒගොල්ලන්ව පත් කළා ජනතාව. ඒ ජනතාවම තමයි අපිටත් මෙවර ඡන්දය දුන්නේ. ජනතාව දැන් අපෙන් අහනවා, නොයෙක් නොයෙක් ප්‍රශ්න. ඒ ගැනත් අපි කියන්න ඕනෑ.

අපේ ප්‍රධාන අරමුණක් තමයි අපේ රටේ ආර්ථිකය ස්ථායීකරණය කිරීම; කර්මාන්ත, කෘෂි කර්මාන්ත අංශවල නිෂ්පාදනය වැඩි කිරීම. ඒ සඳහා අපට දිගු කාලීන වැඩ පිළිවෙළක්

[ගරු ක්‍රිෂාන්ත අබේසේන මහතා]

තිබෙනවා. විශේෂයෙන් කර්මාන්ත, කෘෂිකාර්මික අංශවල නිෂ්පාදනයේ ඵලදායිතාව ඉහළ නංවන්න, exports වැඩි කර ගන්න අපි විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙනවා. ඒ අනුව රුපියල් බිලියන 20.9ක් විද්‍යාව හා තාක්ෂණය වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ අතර අපේ අමාත්‍යාංශයට බිලියන 5ක් වෙන් කර තිබෙනවා. වෙනත් අමාත්‍යාංශවලටත් යම් යම් මුදල් ප්‍රමාණයන් වෙන් කර තිබෙනවා.

උදාහරණයක් හැටියට සෞඛ්‍ය සම්බන්ධ පරීක්ෂණ සඳහා රුපියල් බිලියන 0.9ක්, වැවිලි කර්මාන්තයට බිලියන 0.5ක්, රබර් කර්මාන්තයට බිලියන 0.5ක්, තේ කර්මාන්තයට බිලියන 0.7ක්, පොල් කර්මාන්තයට බිලියන 0.45ක්, ජලජ සම්පත් වෙනුවෙන් බිලියන 0.8ක්, ගොවි කටයුතු වෙනුවෙන් බිලියන 0.2ක්, උක් වගාව වෙනුවෙන් බිලියන 0.39ක්, විශ්වවිද්‍යාල වෙනුවෙන් බිලියන 0.1ක් වෙන් කර තිබෙනවා. ඒවාට වඩා ලොකු ප්‍රමාණයක් විද්‍යාව හා තාක්ෂණයට වෙන් කරලා තිබෙනවා. ඇයි ඒ? අපි විශ්වාස කරනවා, විද්‍යාව හා තාක්ෂණය මාර්ගයෙන් අපේ නිෂ්පාදනයේ ඵලදායිතාව වැඩි කරන්න පුළුවන් කියලා.

විපක්ෂ නායකතුමා කිව්වා, වැටුප් ගැන පැහැදිලි නැහැ කියලා. එතුමාට පැහැදිලි නැතුව ඇති. මම හිතන විධියට එතුමාට කිසිම දෙයක් පැහැදිලි නැහැ. දේශපාලනය ගැනත් එහෙමයි. අටවලායි කිව්වා තිබෙන්නේ. අපි නොවෙයි ඇටෙව්වේ. පසුගිය ආණ්ඩුවලින් තමයි අටවා අටවා වැටුප් වැඩි කළේ. මූලික වැටුප වැඩි කළේ නැහැ. එක එක කැලි ඇමුණුවා. වැටුප් විෂමතා ඇති කළා. සමහර අය විශේෂයෙන් නීති අංශවලින්, ඒ වාගේම පරිපාලන සේවාවලින් -මම දන්නේ නැහැ, සමහර අය කියන විධියට- අනිසි විධියට වැටුප් වැඩි කරගන්නවා. ඒගොල්ලන් නේ මේවා තීරණය කරන්නේ. එහෙම වෙනවා. එහෙම කොටස් ඉන්නවා. තවත් සමහරු වැටුප් වැඩි කරගන්නවා, වෘත්තීය අරගළවලින්. සමහර අයට තිබෙන්න ඕනෑ බලවත් වෘත්තීය සමිති. ඒවා තිබෙනවා නම් ඒගොල්ලන් වැටුප් වැඩි කරගන්නවා. එහෙම නැත්නම්, ඒ අයට මොකුත් නැහැ. එහෙම තමයි ලංකාවේ සමහර වෘත්තීයවේදීන් වැටුප් වැඩි කරගෙන තිබෙන්නේ.

වැටුප් ගැන කථා කරපු නිසාත්, හිටපු වෘත්තිකයෙකු වන නිසාත් මම යම් දෙයක් කියන්න ඕනෑ. MBBS උපාධිය තිබෙන වෛද්‍යවරයෙකු ගත්තොත්, වෛද්‍ය උපාධිය ගන්න අවුරුදු 6ක් වියදම් කරන්න ඕනෑ කියලා අපි දන්නවා. අවුරුදු 5යි, internship අවුරුදු 1යි, අවුරුදු 6යි. එහෙම නැත්නම් practise කරන්න බැහැ. ඒ වාගේම, ඒ අවුරුදු 5 තුළ අවුරුද්දකට credit values 30යි තිබෙන්න ඕනෑ. නමුත්, අනෙක් courses එක්ක compare කරලා නිවැරදි විධියට calculate කළොත්, අවුරුද්දකට 30ක් නොවෙයි ඊට වඩා ලොකු ගණනක් වෙනවා. මා හිතන විධියට ඒ කාලය තුළ වෛද්‍ය සිසුන් පැය 5ක්වත් නිදා ගන්නේ නැහැ. ඒ අය ඒ විධියට වැඩ කරනවා; ඒ අයට ඒ විධියට වැඩ කරන්න සිදු වෙලා තිබෙනවා.

ඒ වාගේම, MD - Doctor of Medicine - උපාධිය කරන්න අඩුම ගණනේ අවුරුදු 5ක් හෝ 7ක් යනවා. ඒකත් පූර්ණ කාලීනව කටයුතු කළ යුතු කාලයක්. ඒ කාලය තුළ ඒ අයට private practise කරන්නත් බැහැ. ඒ අයට පැය 24ම වාට්ටුවල වැඩ කරන්න වෙලා තිබෙනවා. Part-time කරන්න පුළුවන් master's degrees තිබෙනවා. ඒ වාගේම doctorate degrees තිබෙනවා, part -time three years කරන්න පුළුවන්. අපේ පශ්චාත් උපාධි ආයතනවල එවැනි අවස්ථා තිබෙනවා. මේක එහෙම එකක් නොවෙයි කියන එක මතක් කර දෙන්නයි මම මෙය කිව්වේ.

Salaries ගැන කථා කරද්දී සමහරු කියනවා, වැඩි කළ salary එක අපි අවුරුදු 3ක් තිස්සේයි දෙන්නේ කියලා. ඒක වැරැදියි. අප්‍රේල් මාසයේ සිට ගත්තාම මේ අවුරුද්දට තවත් මාස 9යි තිබෙන්නේ. මාස 9කින් ඊළඟ වැටුප් වැඩි වීම සිදු වෙනවා. මේ, 2025 අවුරුද්ද. 2026 අවුරුද්දට තිබෙන්නේ තවත් මාස 9යි. ඊට පස්සේ, 2027 අවුරුද්ද. එහෙම නම්, අවුරුද්දකුත් මාස 9යි යන්නේ. අවුරුදු 3ක් නොවෙයි, අවුරුද්දකුත් මාස 9ක් ඇතුළත තමයි මේ සම්පූර්ණ වැටුප් වැඩි වීම සිදු වන්නේ. අපි වැටුප් වැඩි කළා මීසක මේ අය වැය තුළින් කාගේවත් බදු වැඩි කළා ද? අපි කිසිම බද්දක් වැඩි කරලා නැහැ. බදු අඩු කරලා තිබෙනවා. PAYE Tax එක අඩු කළා. ගෙවල්වලට පනවපු බද්ද -ගෙවල් කුලී බද්ද- නැති කළා. අපි කාටවත් බදු වැඩි කරලා නැහැ. මේ අය වැයෙන් සහන විතරයි දීලා තිබෙන්නේ.

වැටුප ගැන කථා කරද්දී මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපි දන්නවා රාජ්‍ය සේවයේ අවම මූලික වැටුප රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා වැඩි කළා කියලා. ඒ කියන්නේ, අඩුම grade එකේ ඉන්න සේවකයාගේ වැටුප රුපියල් 15,750කින් වැඩි කළා. ඒ වාගේම, සෑම රජයේ සේවකයෙකුගේම වාර්ෂික වැටුප් වර්ධකයේ වටිනාකම සියයට 80කින් වැඩි කළා. ඒ කියන්නේ වාර්ෂික අඩුම වැටුප් වර්ධකය රුපියල් 250ක් නම්, ඒක රුපියල් 450ක් දක්වා වැඩි වෙනවා. ඒ වාගේම, ආපදා ණය සීමාව රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා වැඩි කළා. අපි දන්නවා, වෛද්‍ය වෘත්තිකයන් අතරත්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අතරත් වැටුප් පිළිබඳව ලොකු ලොකු විවාද පැවැත්වෙන බව. පළමුවෙන්ම ඒගොල්ලෝ කිව්වා, අපි වැටුප් වැඩි කරලා නැහැ, වැටුප් අඩු කරලා නේ කියලා. අපි කාගේද වැටුප් අඩු කරලා තිබෙන්නේ? කවුද දන්නේ නැහැ, මේ වාගේ ප්‍රචාර ගෙන යන්නේ. මම උදාහරණයක් කියන්නම්. මමත් Senior Professor කෙනෙකු විධියට හිටියා. Senior professor කෙනෙකුගේ මූලික වැටුප රුපියල් 98,000කින් වැඩි වෙනවා. ඒ කියන්නේ, 2027 ජනවාරි වෙද්දී මූලික වැටුප අද තිබෙන වැටුපට වඩා රුපියල් 98,000කින් වැඩි වෙනවා. සියයට 35ක්ව තිබුණු research allowance එක සියයට 20ට අඩු කළා. ඒ වාගේම, percentage එකක් විධියට 209ක්ව තිබුණු academic allowance එක 112ට අඩු කළා. හැබැයි, ඒවා අඩු කරන්නේ අද තිබෙන මූලික වැටුපෙන් නොවෙයි. ඒවා ගණනය කරන්නේ අද තිබෙන මූලික වැටුපට නොවෙයි. ඒවා ගණනය කරන්නේ, 2027 අවුරුද්දේ වැඩි වන මූලික වැටුපට.

ඒ නිසා ඒ සියයට ගණන 35 ඉඳන් 20ට අඩු වුණා කියලා කිසිම කෙනෙකුගේ වැටුප අඩු වීමක් වෙන්නේ නැහැ; වැටුපට එකතු වන ගණන අඩු වෙන්නේ නැහැ. මොකද, අපි ගණන් බලන්නේ 2027 වැටුපෙන්. එතකොට තමන්ට අද ලැබෙන ගණනට වඩා වැඩිපුර ගණනක් හම්බ වෙනවා. එහෙම ගත්තාම senior professor කෙනෙකුට රුපියල් 60,000කින් salary වැඩි වෙනවා. Net salary increase එක ගත්තොත්, රුපියල් 80,000ක්, 90,000ක් විතර මාසයකට වැඩි වෙනවා. ඒ කියන්නේ, senior professor කෙනෙකුට රුපියල් 80,000ක්, 90,000ක් විතර මාසයකට වැඩි වෙනවා. ඊට අමතරව, අපි PAYE Tax එක අඩු කළා. PAYE Tax එක අඩු කිරීමෙන් ලැබෙන ආදායම රුපියල් 20,500ක් වනවා. මේක එක් උදාහරණයක් විතරයි. එහෙම නම්, මේ වැටුප් වැඩි කිරීම ලොකු වැඩි කිරීමක්; රාජ්‍ය සේවයට ලොකු වැඩි කිරීමක්.

ඒ වාගේම මම කියන්න කැමතියි, තවත් උදාහරණයක්. Senior Lecturer - Grade II, ගත්තොත්, ඒ තැනැත්තාගේ වැටුප වැඩි වෙනවා රුපියල් 55,000කින් විතර. මම මේ කියන්නේ දළ වශයෙන්. ඒ වාගේම gross salary එක වැඩි වෙනවා රුපියල් 30,000කින් විතර. Net salary එක වැඩි වෙනවා, රුපියල්

49,000ක, 50,000ක විතර ගණනකින්. එතකොට PAYE Tax එක නිසා ඇති වන ඉතිරිය රුපියල් 16,000ක් විතර වනවා. Senior lecturer කෙනෙකුගේ වැටුපට සමාන්තරව තිබෙනවා consultant කෙනෙකුගේ වැටුප. Consultant කෙනෙකුගේ මූලික වැටුප අද වන විට රුපියල් 156,000යි. ඒක රුපියල් 214,000 ගණනක් වනකල් වැඩි වෙනවා. ඉතිරිය රුපියල් 54,000 ගණනකින් විතර වැඩි වෙනවා. ඒ වාගේම PAYE Tax එක තවත් අඩු වෙනවා. එමඟිනුත් ඉතිරියක් ඇති වෙනවා. ඒ විතරක් නොවෙයි, මූලික වැටුප වැඩි කළාම ඒකෙන් තමයි pension එකට අදාළව ගණන් හදන්නේ. එතකොට මේ හැම රාජ්‍ය සේවකයෙකුගේම pension එක වැඩි වෙනවා. ඒවාත් ඉතිරියි.

Nurse කෙනෙකුගේ වැටුප ගත්තොත්, මාසයකට රුපියල් 45,000ක් විතර වැඩි වීමක් වෙනවා, 2027 අවුරුද්ද වෙද්දී. Paramedic කෙනෙකු ගත්තත්, වැටුප මාසයකට රුපියල් 45,000ක් විතර වැඩි වෙනවා. MO කෙනෙකු ගත්තොත්, මාසයේ වැටුප රුපියල් 90,000ක් විතර වැඩි වෙනවා, 2027 අවුරුද්දට අදාළ ගණනය කිරීම ගත්තාම. අපි දන්නවා, ඒ වැඩි කිරීම දෙන්නේ බෙදිල්ල - මා ඉස්සෙල්ලාත් කිව්වා වාගේ - අවුරුද්දකුත් මාස 9යි තිබෙන්නේ.

මම තවත් විශේෂ දෙයක් ගැන කියන්න කැමතියි. එ් තමයි, MOsලාගේ extra duties ගැන. MOsලාගේ extra duties ගත්තාම, අමතර රාජකාරී දීමනාව සඳහා පැයක ගාස්තුව මාසික මූලික වැටුපෙන් 1/80 සිට මාසික මූලික වැටුපෙන් 1/120 දක්වා සංශෝධනය වුණා. ඒ වාගේම nursesලාගේ අමතර රාජකාරී දීමනාව මූලික වැටුපෙන් 1/160 සිට මාසික මූලික වැටුපෙන් 1/200 වනකල් සංශෝධනය වුණා. හැබැයි, මේවා ගණනය කරන්නේත් 2027 අලුත් salary structure එකටයි. එහෙම ගත්තාම අර කියන විධියේ අඩු වීමක් නැහැ. හැබැයි, අපි holiday allowance එක ගැනත් කියන්න ඕනෑ. මාසික මූලික වැටුපෙන් 1/20ක දෛනික වැටුප් දීමනාව මාසික මූලික වැටුපෙන් 1/30ක් ලෙස සංශෝධනය වුණා. එහෙම වුණත් ඒවා calculate කරන්නේත් 2027 ගණනට. ඒ නිසා වැටුප්වල කිසිම අඩු වීමක් වෙලා නැහැ.

පෞද්ගලික අංශය ගත්තත්, අපි ඒ අයගේ වැටුප වැඩි කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මෙවර අය වැය තුළින් හැම ක්ෂේත්‍රයකටම, හැම ක්ෂේත්‍රයක කෙනෙකුටම සහන දීලා තිබෙනවා. අපි හදලා තිබෙනවා ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක 1,000ක්, අපේ ගම්වල සෞඛ්‍ය තත්ත්වය - health - වැඩි දියුණු කරන්න. ඒ වාගේම ඔටිසම් තත්ත්වයේ පසුවන ළමුන් වෙනුවෙන් ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. වකුගඩු ආබාධවලින් පෙළෙන්නන්ගේ මාසික දීමනාව රුපියල් 7,500 සිට රුපියල් 10,000 වන කල් වැඩි කළා. වැඩිහිටි දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කළා. අස්වැසුම ප්‍රතිලාභීන් මිලියන 1.2ක් ඉන්නවා. 'අස්වැසුම', කියන්නේ අපේ ප්‍රතිපත්තියක් නොවෙයි. ඒක තාවකාලික දෙයක්. අපි ඒගොල්ලන් සවිබලගන්වන්න ඕනෑ. ඒගොල්ලන් සවිබලගැන්වීම වෙනුවෙන් අපි රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන් උතුරු, නැගෙනහිර අවතැන් වූවන් සඳහා නිවාස වැඩසටහන වේගවත් කිරීම ඇතුළු කාරණා වෙනුවෙන් රුපියල් මිලියන 1,500ක් අය වැයෙන් වෙන් කර තිබෙනවා.

එදා යාපනය පුස්තකාලයට ගිනි තිබ්බා, අර ත්‍රස්තවාදී ආණ්ඩුව. ජේආර්-ප්‍රේමදාස-රනිල් ආණ්ඩුව එම පුස්තකාලයට ගිනි තිබ්බා. එම පුස්තකාලයට අත්‍යවශ්‍ය පහසුකම් ලබා දෙන්න රුපියල් මිලියන 100ක් වෙන් කළා. "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ වැඩසටහනට රුපියල් මිලියන 7,583ක් වෙන් කළා. ළමයින්ගේ සුරැකුම් මධ්‍යස්ථානවල ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කළා. වූදිත ළමයින් අධිකරණයට සහ එහි සිට විධිමත්ව ප්‍රවාහනය කිරීමේ පහසුකම් සැලසීමට රුපියල් මිලියන 250ක් වෙන් කළා.

රැඳවුම් නිවාසවල සිටින අනාථ දරුවෙකුට රුපියල් 5,000ක මාසික දීමනාවක් දෙන්න මුදල් වෙන් කරලා තිබෙනවා. මේ අය වැයේ මේ වාගේ ගොඩක් ප්‍රතිලාභ තිබෙනවා. ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ පුළුල් දත්ත සමුදායක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 100ක්, ආපදා නිසා ජීවිත අහිමි වන, පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වන පුද්ගලයන් සඳහා වන්දිය රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කළා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොලී අනුපාතය සියයට 3කින් වැඩි කළා. සිරකරුවන්ට ව්‍යක්තිය පුහුණුව ලබාදීමට රුපියල් මිලියන 100ක් වෙන් කළා. ඉතින් මේ ඔක්කෝම සුබසාධනත් නොවෙයි, වරප්‍රසාදත් නොවෙයි. මේවා අයිතිවාසිකම්. මේවා සිරකරුවන්ගේ අයිතිවාසිකම්; දරුවන්ගේ අයිතිවාසිකම්. මේ විධියට තමයි අපි හැම ක්ෂේත්‍රයක්ම මේ අය වැය මඟින් ආවරණය කරලා තිබෙන්නේ. ඉතින් මේක තමයි සමාජ සාධාරණත්වය දීලා තිබෙන අය වැය. මේක තමයි සමාජ සාධාරණත්වය ස්ථිර කරපු අය වැය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ කථාව මෙතැනින් අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 22 වන සෙනසුරාදා පවත්වනු ලැබේ.

අප්පෝතු පි. ප. 6.00 මණියාකිවිටවේ, අලුවල්කள් இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பட்டது.

விவாதம் 2025 பெப்ருவரி 22, சனிக்கிழமை மீளத் தொடங்கும்.

It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Saturday, 22nd February, 2025.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

දුම්රියේ ගැටීමෙන් සිදුවන වනඅලි මරණ වැළැක්වීම
புகையிரதம் மோதி யானைகள் இறப்பதைத் தடுத்தல்
PREVENTION OF ELEPHANT DEATHS DUE TO COLLISION WITH TRAINS

[අ.භා. 6.00]

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"වන අලි දුම්රියේ ගැටීම් හේතුවෙන් වසරකට වන අලි මරණ විශාල ප්‍රමාණයක් වාර්තා වන අතර, එම තත්ත්වයට නිසි පියවර නොගැනීම හේතුවෙන් එම ප්‍රශ්නය දිනෙන් දින උග්‍රවෙමින් පවතී.

විශේෂයෙන්ම උතුරු මැද, මධ්‍යම සහ නැගෙනහිර පළාත්වල පවතින දුම්රිය මාර්ගවල ඇතිවන අනතුරු වාර්තා වන අතර සියලු වගකිවයුතු අංශයන් හි අවධානය ඒ කෙරෙහි යොමු විය යුතුය.

මේ සඳහා විවිධ හේතු බලපා ඇති අතර එම තත්ත්වයන් ද සැලකිල්ලට ගනිමින් වගකිව යුතු සියලු අංශ සම්බන්ධ කර ගනිමින් කඩිනම් විසඳුම් කෙරෙහි යොමුවිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ වෙලාවේ මේ යෝජනාව ඉදිරිපත් කරන්න අදහස් කළේ ඊයේ පෙරේදා අපට අහන්න ලැබිච්ච වේදනාත්මක සිදුවීමක් නිසා. ඊයේ උදැසන වෙනකොට අපට වාර්තා වුණා, වන අලි මරණ 5ක් පිළිබඳව. මේ වන අලි මරණ 5 සිදු වෙන්නේ මහව - මඩකලපුව දුම්රිය මාර්ගයේ ගල්ඔය කියන ප්‍රදේශයේදී සිදුවෙච්ච මේ අනතුර පෙරේදා විතරක් සිදු වෙච්ච අනතුරක් නොවෙයි; පළමු අවස්ථාවත් නොවෙයි. මෙය වසර ගණනාවක් තිස්සේ දිගින් දිගටම සිදුවෙන අනතුරක්.

පසුගිය වසර හතරක් පහක් ආපස්සට බලනකොට දුම්රියේ ගැටීම නිසා වන අලි විශාල ප්‍රමාණයක් විනාශ වෙලා තිබෙනවා. 2018 වර්ෂයේ වන අලි 9දෙනෙක්, 2019 වර්ෂයේ 4ක්, 2020 වර්ෂයේ වන අලි 3දෙනෙක්, 2021 වර්ෂයේ වන අලි 7දෙනෙක්, 2022 වර්ෂයේ වන අලි 10දෙනෙක්, 2023 වර්ෂයේ 12දෙනෙක්, 2024 වර්ෂයේ 7 දෙනෙක්, ඒ වාගේම 2025 වර්ෂයේ ආරම්භක මාස දෙක තුන වෙනකොට පෙරේදා අපට අහන්න ලැබෙනවා වන අලි 5 දෙනෙක් මරණයට පත් වුණු බව. මීට පෙරත් ජනවාරි මාසයේ වන අලියෙක් මරණයට පත් වුණා.

විශේෂයෙන්ම මේ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කිරීම වෙනුවෙන් පසුගිය කාලයේ ප්‍රවාහන ඇමතිතුමාත් අවධානය යොමු කරලා තිබෙනවා. හැබැයි, ඒත් අවධානය යොමු වෙලා නැහැ. අපේ රටේ අලි - මිනිස් ගැටුමකුත් තිබෙන අතරේ, තවත් ප්‍රධාන ප්‍රශ්නයක් බවට මේකත් පත් වෙලා තිබෙනවා. අපේ රටේ ආරක්ෂා කර ගන්න ඕනෑ සතුන් අතරින් විශේෂිත සත්වයෙකු ලෙස අපේ රටේ අලියා අපි හඳුනාගෙන තිබෙනවා.

එය එක පැත්තකින් අපට සංචාරක ව්‍යාපාරයට විශේෂ වශයෙන් දායක වෙනවා. ඒ වාගේම, අපේ පරිසරයේ සමතුලිතතාව ආරක්ෂා කරගන්න දායක වෙනවා. මේ සියලු හේතු කාරණා නිසා අපි අපේ රටේ වනජීවීන් ආරක්ෂා කරගන්න ඕනෑ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව පැත්තෙනුත් පසුගිය කාලය පුරාවට වනජීවී කළමනාකරණය සම්බන්ධයෙන් අවධානය යොමු වෙලා නැහැ. විශේෂයෙන්ම, මේ ගල් ඔය කියන ප්‍රදේශය පිළිබඳව අධ්‍යයනය කරලා බලනකොට තිබෙන ප්‍රධාන හේතුවක් තමයි මේ දුම්රිය මාර්ගයේ දෙපස, දුම්රිය මාර්ගය ආසන්නයට වෙනකල් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්ව තිබෙන කැලෑ ප්‍රදේශය. ඒක සුද්ද කරගන්න ඕනෑකම තිබෙනවා. හැබැයි, දිගින් දිගටම යෝජනා කළත් ඒ සඳහා අවධානය යොමු වෙලා නැහැ. ඒ නිසා දුම්රිය දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියන ආයතන මැදිහත් වෙලා, දවසින් දවස ඉහළයන වසරක් පාසා දුම්රියේ ගැටීම නිසා සිදුවන වන අලි මරණ ප්‍රමාණය නැවැත්වීම වෙනුවෙන් විශේෂිත පියවර ගන්න ඕනෑ.

අද ලෝකයේ තාක්ෂණය වේගයෙන් දියුණු වෙමින් තිබෙනවා. මේක නවත්වාගන්න ඒ තාක්ෂණය භාවිත කරන්න පුළුවන්. නමුත්, අවාසනාවක මහත! ඒ තාක්ෂණය ගැන ඉතිහාසයේ බොහෝ දේවල් කථා කරලා තිබුණාට, වර්තමානය වෙනකොට ඒ තාක්ෂණය පාවිච්චි කිරීම වෙනුවෙන් සමහර බලධාරීන් මැදිහත් වෙලා නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඕනෑකම තිබෙනවා. දියුණු ගණයේ තාක්ෂණික උපකරණ අපේ රටෙත් දැන් තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල් ඒවා පාවිච්චි කරනවා. නමුත්, අපේ රටේ ඒ සඳහා අවධානය යොමු කරලා, මුදල් වෙන් කරලා ඒ මැදිහත් වීම කරලා නැහැ. ඒ නිසාම දවසින් දවස වන අලි දුම්රියේ ගැටීමෙන් සිදුවන මරණ සංඛ්‍යාව වැඩිවෙමින් තිබෙනවා. පසුගිය වසර 5ක කාලය තුළ 50ත්, 60ත් අතර ප්‍රමාණයක් වන අලි මරණ සිද්ධ වෙනකොට දුම්රිය දෙපාර්තමේන්තුවේ සමහර ඉහළම නිලධාරීන් ඒකට අවධානය යොමු කරන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අපි මේ අවස්ථාවේදී මේ යෝජනාව කරනු ලබන්නේ ඉතාම කාලෝචිත විධියට. මේ මොහොතේ අපට මතුවෙච්ච ප්‍රධාන කාරණාවක් විධියට මෙයට පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා, දවසින් දවස සිදුවන වන අලි මරණ ප්‍රමාණය නවත්වා ගැනීම වෙනුවෙන්, අපි මේ ආයතන සියල්ල සම්බන්ධීකරණය කරගෙන විධිමත් මැදිහත්වීමක් කර ගැනීම වෙනුවෙන් මේ මොහොතේ මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරමින් මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම සඳහා ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.07]

ගරු සුදත් බලගල්ල මහතා
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදැසන සිටම විපක්ෂය සෑහෙන සද්දයක් දැම්මත්, දැන් ඒ මන්ත්‍රීවරු 66දෙනාගෙන් එක් කෙනෙක් විතරයි මෙතැන ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව අනුව අලි ප්‍රශ්නයක් තිබෙනවා. අවුරුදු 76ක් තිස්සේ මේ අලි ඇවිල්ලා. විපක්ෂයේ ඉන්න මේ මහත්වරුන්ගෙන් එදා සමෘද්ධිය ඉල්ලුවේ නැහැ, අස්වැසුම ඉල්ලුවේ නැහැ, ගෙවල් හදාගන්න ඉල්ලුවේ නැහැ, අලියාගේ පැටවා ඉස්කෝලෙට දාලා දෙන්න කියලා ඉල්ලුවේ නැහැ. ඒ සතුන්ට තිබෙන්නේ වුවමනා තුනයි. අවුරුදු 76ක් ඒ වුවමනා තුන සපුරන්න බැරි වුණු විපක්ෂය අද කිඹුල් කඳුළු වෙනුවට අලින්ගේ කඳුළු හලන්න පටන් අරගෙන තිබෙනවා. සතුන්ට වුවමනා වුණේ නිදහසේ ජීවත් වෙන්න පුළුවන් වාසස්ථානයක්. ඔවුන්ට ඇත්තටම දෙන්න තිබුණා උරුමයක්. අර හොර උරුමය ඔප්පුව නොවෙයි, සතුන්ට අවශ්‍ය උරුමය ඒ සතුන්ට දෙන්න තිබුණා.

ඒක දුන්නේ නැහැ අවුරුදු 76ක්. සතුන් ඉල්ලුවේ ජීවිතය පවත්වාගෙන යන්න ජලය. සතුන් ඉල්ලුවේ ජීවිතය පවත්වාගෙන යන්න ආහාර. ආහාර, ජලය සහ වර්ගයා බෝ කරගැනීම සඳහා අවශ්‍ය නිවහල් පරිසරයක් විතරයි සතුන් ඉල්ලුවේ. ඒ කාරණා තුන ලබා දෙන්න බැරි වුණු විපක්ෂය දැන් අපට චෝදනා කරනවා මේ සතුන්ගේ මරණයේ වගකීම භාරගන්න කියලා. ඔව්, අපි භාරගන්නවා. බල්ලාගේ, පූසාගේ, හරකාගේ වගකීම මේ රටේ මහජනතාව භාර ගන්නවා වාගේම, වනයේ ඉන්න සතාගේ වගකීම රජයක් විධියට අපි භාර ගන්නවා. ඒක විපක්ෂය අත් හැරලා තිබුණා අවුරුදු 76ක්. අලි භයදෙනෙක්, හත්දෙනෙක් එතැන මැරෙනකොට - අද මේ මොහොතේ මගේ ගමේ අලි ගහලා මැරුණු දෙදෙනෙකුගේ සිරුරු භූමදානය වෙනවා. විපක්ෂය අවුරුදු 76ක් මිනිස්සුන්ගේ ජීවත් වීමේ අයිතිය වාගේම සතුන්ගේ ජීවත් වීමේ අයිතියත් විනාශ කරලා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, අපි අනිවාර්යයෙන්ම ඉදිරි කාලය තුළ ඒ සතාට අවශ්‍ය භූමිය සුපෝෂිත කරන්න සූදානම්.

ඒ වනයේ වැව් ටික හදලා, ආහාර ටික සම්පාදනය කරන ජාතික ආණ්ඩුවක් තමයි මේ හදලා තිබෙන්නේ. සතාගේ අයිතිය විනාශ කරපු විපක්ෂය වෙනුවට සතාගේ අයිතිය සනාථ කරන ආණ්ඩුවක් තමයි මේ හදලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා වසර 76ක් තිස්සේ මෙතුමන්ලා නොකරපු වැඩ ටික කරන්න තමයි ජාතික ජන බලවේග ආණ්ඩුවේ අපි බලය ගත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එක මහත්තයෙක් දැන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කෑ ගහලා ගියා නේ. එතුමා කිව්වා, මේ ආණ්ඩුවේ වී මිල සම්බන්ධයෙනුත්. හැබැයි වී ඇටයක් මිලදී නොගත්ත ඒ මහත්තුරු දැන් අපේ ආණ්ඩුවේ වී මිල ගැන ප්‍රශ්න කරනවා. දැන් දෙකොන පත්තු වෙලා තිබෙන්නේ. හිතාගන්න බැහැ, මොකක්ද මේ කරන්නේ කියලා. අය වැය ආවාට පස්සේ ඇත්තටම රිදුණේ ජනතාවට නොවෙයි, විපක්ෂයට. හරියට මතවාදීව, තර්කානුකූලව ආණ්ඩුවට එරෙහිව මතයක් ගොඩනහන්න බැරි තත්ත්වයට විපක්ෂය අද පත් වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ සත්ව ප්‍රශ්නයේදී -අලින් මිය යාම සම්බන්ධයෙන්- විද්‍යාත්මක උත්තරයක් අපි ළඟ තිබෙනවා. ඔව්, අපි අවුරුදු 50ක් විතර සතා සිවුපාවා වෙනුවෙන් වාගේම මිනිස්සු වෙනුවෙන් මහ පාරේ අරගළයක් කළා. ඒ අරගළය ඇතුළේ අත්දැකීමෙන් අපි මේකට උත්තර හොයගත්තා. ඒ උත්තර මේ අවුරුදු 5 ඇතුළත මේ සමාජයේ අපි සමාජගත කරනවා. අපි අලියාට අවශ්‍ය කැළේ; සතා සිවුපාවාට අවශ්‍ය කැළේ අනිවාර්යයෙන්ම හදනවා. අලිමංකඩවල් 12ක් තිබිලා ඒ අලිමංකඩවල් 12න් 8ක් මේ වෙනකොට වැහිලා ඉවරයි. ඒවා ගැසට් කළේ නැහැ. අලියා යන එන පාරේ නිල් පාට, කොළ පාට මහත්තුරු මාරුවෙන් මාරුවට ඉඩකඩම් දීලා අලිමංකඩවල් වැහුවා. අද අලියාට යනඑන මං නැහැ, සතා සිවුපාවාට යන එන මං නැහැ. මිනිහාට එතැන ඉන්න විධියකුත් නැහැ. මිනිස් ජීවිත විනාශ කළා වාගේම සත්ව ජීවිතත් විනාශ කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ගාණටම මේ විපක්ෂය වැටිලා තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වචනය පාවිච්චි කරන එක හොඳ නැති වෙන්න පුළුවන්. හැබැයි ඊට වඩා සත්තු හොඳයි. සමහර සත්තු මිනිස්සුන්ගේ ජීවිත විනාශ නොකර යනවා. හැබැයි අවුරුදු 76ක් තිස්සේ සතා සිවුපාවා වාගේම අපේ මිනිස්සුන්ගේ ජීවිතත් විනාශ කරපු මේ විපක්ෂයට අපි උත්තර දෙන්න සූදානම්. අපි මිනිස්සුන්ට වාගේම සතා සිවුපාවාටත් ජීවත් වෙන්න පුළුවන් යහපත් රටක්, යහපත් සමාජයක් හදනවා කියමින්, මේ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.12]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කනගාටුදායක සිදුවීමකින් පස්සේ ගරු සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු මේ කාලීන යෝජනාව පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලැබීම සතුටක්.

මට කලින් මේ යෝජනාව ස්ථිර කරමින් කථා කළ ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා බොහොම හැඟීම්බරව අය වැය ගැනත් සඳහන් කරලා මේ අලි-මිනිස් ගැටුම විසඳීමට ගන්නා වූ විද්‍යාත්මක පියවර ගැනත් සඳහන් කළා. මා ළඟ තිබෙනවා, 2025 අය වැය කථාව. ඒකේ 38වැනි පිටුවේ 29වැනි අයිතමයේ තිබෙනවා, "අලි-මිනිස් ගැටුම අවම කිරීම සහ වන සංරක්ෂණය" ගැන. අපි කවුරුත් දන්නවා, සංවර්ධන ක්‍රියාදාමයන් එක්ක වනය එළි කරලා ගොවිතැනට ජලාශ හැදුවා, ගොවිබිම් හැදුවා, ගොඩමඩ දෙක වගා කළා, මෙරට සහලින් ස්වයංපෝෂිත කළා කියලා. හැබැයි අලියාට තැනක් නැති වුණා. අලි-මිනිස් ගැටුම ඉතා බරපතළ දෙයක්. ඊයේ අපේ පක්ෂයේ ආසන සංවිධායකවරයෙකුත් අලියා ගහලා මැරුණා. ඒ නිසා ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කථාවක් නැහැ, අලියාට. ආසන සංවිධායකව මැරුවේ. ගමේ සාමාන්‍ය අහිංසක ගොවියෙක් මැරෙන එක අපි දැකලා තිබෙනවා. ඊයේ අපේ පක්ෂයේ ආසන සංවිධායකව මැරුවා. අලින්ට තේරුමක් නැහැ; පක්ෂයක්, පාටක් නැහැ. 76 අවුරුද්දක් මේ රටට මොකුත් කළේ නැහැ කියලා තමයි කථා කරන්නේ. ඩී.එස්. සේනානායක මහත්මයා ගල්ඔය යෝජනා ක්‍රමය හැදුවේ නැත්නම් ඔය පළාත් අලින්ට නොවෙයි, කොටින්ට ගිහිල්ලා. ඩී.එස්. සේනානායක මහත්මයා, ඩඩ්ලි සේනානායක මහත්මයා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා, ඒ පරම්පරාවේ මිනිස්සු මේ රට - උතුරු මැද පළාතේ පොළොන්නරුව, අනුරාධපුරය - අස්වැද්දුවේ නැත්නම් බඩගින්නේ මැරෙන්න තමයි වෙන්නේ. අඩුපාඩු තිබෙනවා. සියල්ල සම්පූර්ණ නැහැ. ඒ නිසා අලි-මිනිස් ගැටුමට අපි හැමෝම වග කියන්න ඕනෑ. ඒ වාගේම අලින්ට සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. එක පැත්තකින් අලින්ගේ පැත්තෙන් හිතලා අනෙක් පැත්තෙන් රටේ ආර්ථිකය ගැන හිතන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ අය වැයේ අලි-මිනිස් ගැටුම ගැන තිබෙන්නේ මොකක්ද? අපි කවුරුත් දන්න මේ ප්‍රශ්නය විසඳන්න මේ අය වැයෙන් එක රුපියලක් වෙන් කරලා තිබෙනවාද?

මේ ප්‍රශ්නය විසඳීම සඳහා නවීන තාක්ෂණයක් තිබෙනවා කියලා කිව්වා නේ. මේ ප්‍රශ්නය විසඳන්න දන්නවා කියලා කිව්වා නේ. ගරු ඇමතිතුමනි, දන්නා තාක්ෂණය මොකක්ද කියලා කරුණාකරලා කියන්න බලන්න. ඔබතුමාගේ පක්ෂයේ නායකයා,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මුදල් ඇමති අනුර කුමාර දිසානායක මහත්මයා මේ අය වැය ඉදිරිපත් කරන්න කලින් ගිහිල්ලා එහෙම දෙයක් කිව්වේ නැද්ද? "අපි දන්නවා නියම ක්‍රමයක්; ඒක විසඳන්න මේ ක්‍රමය පාවිච්චි කරන්න ඕනෑ. අපි තමයි ගමේ ඉන්න මිනිස්සු. අලි එක්ක හැප්පෙන්නේ අපි" කියලා අනුර කුමාර මහත්මයාට ගිහිල්ලා කිව්වාද? මේ ප්‍රශ්නය විසඳන්න මේ අය වැයේ යෝජනා තිබෙන්නේ කොහේද? මේ වෙනුවෙන් එක රුපියලක් වෙන් කරලා තිබෙනවා ද? ඊයේ නොවෙයි, මේ ප්‍රශ්නය ඇති වුණේ. ඒක ඇත්ත. දශක ගණනක් තිස්සේ මේ ප්‍රශ්නය තිබෙනවා. ඒක තමයි ඇත්ත. අලි මැරෙනවා; මිනිස්සු මැරෙනවා. මේ වෙනුවෙන් සාධාරණ විසඳුමක් කවුරුවත් දීලා නැහැ. අපි ඒක පිළිගන්නවා. අය වැය ලේඛනයේ සඳහන් 29වන අයිතමයේ මේ වෙනුවෙන් එක රුපියලක් වෙන් කරලා නැහැ. මොනවාද මේ කථා කරන්නේ? මෙතැනදී ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ කියලා කථාවක් නැහැ. හැමෝම එකතුවෙලා වැඩ කරලා මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් හොයා ගන්නට ඕනෑ.

ඔව්, මේ සඳහා තාක්ෂණික විසඳුම් තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ සඳහා ආයෝජනය කරන්නට ඕනෑ. ඒ වාගේම, දේශීය තත්ත්වයන්ට ගැළපෙන විධියට අපි මේ ප්‍රශ්නයට පිළිතුරු සොයන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාක්ෂණික ලෝකයේ වෙනත් රටවල තිබෙන ප්‍රශ්නත්, අපේ ප්‍රශ්නත් අතර වෙනසක් තිබෙනවා. ඒ තාක්ෂණික විසඳුම් සෙවීම සඳහා අපි විද්‍යාඥයන් එක්ක කථා කරලා, දුම්රිය විශේෂඥයන් එක්ක කථා කරලා, වන සංරක්ෂණය පිළිබඳ විශේෂඥයන් එක්ක කථා කරලා විසඳුම් සොයා ගන්නට ඕනෑ. කැලෑ ආරක්ෂාව පිළිබඳව ලොකු සටනක් තිබෙනවා නේ. ඒ කියන්නේ, මේ වනසතුන් සම්බන්ධයෙන් වග කියන දෙපාර්තමේන්තු එක ගහක්, එක තණකොළයක් කපන්න දෙන්නේ නැහැ. දුම්රිය දෙපාර්තමේන්තුව එක ආකල්පයක ඉන්නවා. සංචාරක අමාත්‍යාංශය තව ආකල්පයක ඉන්නවා. මේ හැමෝම එකතුවෙලා, ආණ්ඩු පක්ෂය, විපක්ෂය එකතුවෙලා මේක විසඳා ගන්නට ඕනෑ. මේක ආණ්ඩු පක්ෂයේ විතරක් ප්‍රශ්නයක් නොවෙයි. තමුන්නාන්සේලාට දුර දැක්මක් නැති බව මේ අය වැය යෝජනාවෙන් පේනවා. අලි-මිනිස් ගැටුම ගැන කියලා තිබෙන මෙහි 29වන පරිච්ඡේදයේ, දුම්රියේ ගැටී අලින් මිය යාම වැළැක්වීම සඳහා ලබා දෙන විසඳුම මොකක්ද කියලා තමුන්නාන්සේලා කියලා තිබෙන්නේ කොතැනද? ඒ වෙනුවෙන් වෙන් කරපු මුදල කීයද කියලා පුළුවන් නම් මට පෙන්වන්න. එක රුපියලක් වෙන් කරලා නැහැ. ඒ නිසා අපි කවුරුත් අවංකව කථා කරමු; ප්‍රශ්නය තේරුම් ගනිමු. මේක වැදගත් ප්‍රශ්නයක්. මේක පක්ෂ, පාට භේද නැති ප්‍රශ්නයක්. අපි එකතු වෙලා වැඩ කරලා වනඅලින්ටත්, සමාජයටත්, රටටත්, අපේ ආර්ථිකයටත් සාධාරණයක් ඉෂ්ට කරමු. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[ප.ව. 6.16]

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නන්‍රි, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன්றைய தினம் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையூடாக மிக முக්කියமானதொரு பிரச්சினை முன்வைக்கப்பட்டு இருக்கின்றது. நான் இந்த ஒத்திவைப்புப் பிரேரணையில் பேசுவதற்கு முக්කිය காரணம், மட்டக්களப்பிலிருந்து கொழும்பு நோக்கி வந்த புகையிரதத்தில் யானைகள் மோதுண்டு இறந்திருப்பதுதான். இது இன்று நேற்று நடைபெறுகின்ற ஒரு விடயமல්ல. மாறாக, காலாகாலமாக நடந்துவருகின்ற ஒரு விடயம்! மட்டக්களப்பு மாவட்டத்தில் யானைகளைக் கட்டுப்படுத்துவதில் பாரிய பிரச්சினை இருக்கின்றது. மட்டக්களப்பில் யானை வெடிகள் இல්லை என்றுதான் நாங்கள் கடைசியாகக் கேள்விப்பட்டோம். அறுவடை செய்கின்ற காலப்பகுதியில் யானைகள் பெருமளவாக வந்து பயிர்களை அழிக்கின்றன. இதனால் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் நேரடியாகச் சென்று அதிகாரிகளிடம் யானை வெடிகளைக் கேட்டால், சனவரி மாதம் tender போட්ட பிறகுதான் யானை வெடிகளைத் தரலாமென்று சொல்கிறார்கள். இதுதான் இன்று நாட්டிலுள්ள நிலைமை!

கடந்த ஆட්சிக் காலப்பகுதியிலும் எத්தனையோ இலட්சம் ரூபாய் செலவில் புதிதாக யானை வேலிகளை அமைப்பதாகச் சொல්லப்பட්டது. ஆனால், மட්டக්களப்பில் எந்தவொரு யானை வேலியும் அமைக்கப்படவில්லை. நாங்கள் wildlife officersஐப் பாராட්ட வேண்டும். மட්டக්களப்பு மாவட්டத்தில் wildlife officer ஒருவர் யானையைத் துரத්திச் செல්லும்போது, மிதிபட්டு இறந්தார். அவரது குடும்பத்தினருக்கு இந்த இடத்தில் எங்களுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள්கின்றோம். கடந்த வருடம் இந்தச் சம்பவம் நடந்தது.

நான் ஆளும் கட්சியைச் சேர்ந்த - NPP அரசாங்கத்தைச் சேர்ந்த - உறுப்பினர்களிடம் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். இப்பொழுது நீங்கள் அரசாங்கத் தரப்பில் இருக்கின்றீர்கள். இந்த ஒத්திவைப்புப் பிரேரணையினூடாக நீங்கள் சொல்கின்ற விடயங்களைப் பார்த்தால், ஏதோ நீங்கள் எதிர்க்கட්சியில் இருப்பதுபோலத்தான் தெரிகின்றது. மட්டக්களப்பு மாவட්ட அபிவிருத්திக் குழுக் கூட්டத்தில் நாங்கள் யானை வேலிகளை அமைப்பது பற்றி ஒரு தீர්மானத்தை எடுத්து, அதை உங்களுக்கு அனுப්பினால், அதை நடைமுறைப்படுத்தலாமா, இல්லையா? என்பதைத்தான் நீங்கள் இந்தச் சபையில் சொல்ல வேண்டும்.

අපේ ගරු සභානායකතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. යම් මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ එම ගැටලුවට යම් විසඳුමක් ලබා ගන්න එකයි. අද මම විශේෂයෙන්ම ආවේ මේ කාරණය සම්බන්ධයෙන් කථා කරන්නයි. මේ වනඅලි ගැටී තිබෙන්නේ ඊයේ මඩකලපුවේ සිට ආපු කෝච්චියේ. මඩකලපුවත් එක්ක මේක සම්බන්ධයි. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් අපි ඉදිරිපත් කරන්නේ, ඒ අවස්ථාවේ ඇතිවෙලා තිබෙන හදිසි තත්ත්වයක්, ගැටලුවක් පිළිබඳව ආණ්ඩුවෙන් පිළිතුරක් ලබා ගන්නයි. හැබැයි, ඊයේ දවසේ වෙච්ච සිදුවීම ඉතාම කනගාටුදායකයි. ඊයේ දවසේ සභාව කල් තබන අවස්ථාවේදී අපි අම්පාරේ බාර් එකක් සම්බන්ධයෙන් ගෙනාපු යෝජනාවට, ඇමතිවරයා දේශපාලන වේදිකාවල දෙන පිළිතුරක් ලබා දීලා ගියා. අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට මේ ඇමතිවරයා මොන විධියේ පිළිතුරක් දෙයි ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, දෙන පිළිතුර සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ගන්න ඉඩක් දෙන්න තරම්වත් භය ඇමතිවරයෙක් තමයි ඊයේ පිළිතුරු දුන්නේ. එහෙම නම් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට පිළිතුරු දෙන්න එපා. අපි යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නිවැරදි පිළිතුරක් බලාපොරොත්තුවෙන්. අද දවසේත් මඩකලපුව දිස්ත්‍රික්කයේ අලි වෙඩි නැහැ. අලි වෙඩි අවශ්‍යයි කිව්වාම, ඒක ජනවාරිවලින් පස්සේ තමයි එන්නේ, ඇඟවුම්

කරලා; ටෙන්ඩර් කරලා ගන්න ඕනෑ කියනවා. මම මේ සභාව ඇතුළට ඇවිදගෙන එනකොට කථා කරපු මන්ත්‍රීවරයා විපක්ෂයේ මොනවාදෝ මිනී මැරුම් ගැන කියනවා මට ඇහුණා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගැන කථා කරන වෙලාවට දේශපාලනය කරන්න එපා. දැන් ඔබතුමන්ලා බලයේ ඉන්නේ. ඔබතුමන්ලාට දැන් තුනෙන් දෙකක බලයක් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙන්නේ මොනවාද? අනාගතයේදී දුම්රිය මාර්ගවලට වනඅලි එනවා නම්, අපි මේ රේල් පාරේ sensors සවි කරමු. Sensor එකක් සවි කරලා වනඅලි එනවා කියන එක කලින්ම හඳුනා ගනිමු. මම Batticaloa Station Master එක්කත් කථා කළා. වංගුවක් ගන්නකොට, වංගුවේ ගල්පරත් එක්ක එතැන වනඅලි ඉන්නවා කියන එක පෙනෙන්නේ නැති නිසා තමයි මේ අනතුර සිදු වුණේ කියලා කියා තිබෙනවා. එවන් කාරණයක් විසඳා ගන්නවා මිසක්, මෙතැනට ඇවිල්ලා විපක්ෂයේ මිනී මැරුම් කරපු ඒවා ගැන කථා කරන එක අදාළ නැති කතන්දරයක්.

ආණ්ඩු පක්ෂයට මම කියනවා, මේක තේරුම් ගන්න කියලා. ඔබතුමන්ලා තමයි දැන් බලයේ ඉන්නේ. දිගින් දිගටම දේශපාලන වේදිකාවල කථා කළා වාගේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවලදීත් කථා කරන්න ලැහැස්ති වෙන්න එපා. ඊයේ දවසේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ වෙලාවේ ලද අත්දැකීම නිසායි මම මෙහෙම කථා කරන්නේ. සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවකින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ටයි, මන්ත්‍රීවරුන්ටයි තමයි මම මේක කියන්නේ. ඔයගොල්ලන්ට ආණ්ඩු බලය හම්බ වුණේ, අපේ පංගුවකුත් ඒකේ තිබුණු නිසායි. අද විපක්ෂයේ හිටියාට එදා අපිත් අරගළ කළා. අපිත් ලංකාව පුරා උද්ඝෝෂණ කළා. අපිත් "Go home, Gota!" කියලා කිව්වා. අපේත් පංගුවක් තිබුණු නිසා තමයි අද මෙච්චර බලයක් ඔබතුමන්ලාට ලැබුණේ. අපි අද විපක්ෂයේ ඉන්නවා කියලා අපි කියන හැම දෙයක්ම හෑල්ලුවට ලක් කරන්න එපා. වනඅලි සම්බන්ධව ගැටලුවක් තිබෙනවා නම් මේ ගරු සභාව ඇතුළේ ඒ සම්බන්ධව ප්‍රගතිශීලි අදහස් මන්ත්‍රීවරුන්ට ඉදිරිපත් කරන්න කියන්න, ගරු සභානායකතුමනි. එහෙම නැතිව, විපක්ෂය මිනී මැරුම් කළා, අරවා මේවා කළා කියන එක නොවෙයි බලාපොරොත්තු වෙන්නේ. අපි sensors සවි කරමු. එහෙම නැත්නම් එතැන high focus lights දමමු. මේ වාගේ ප්‍රගතිශීලි අදහස් කියන්න. එහෙම නොවුණොත් ජනතාවටත් මේක එපා වෙනවා.

ඊයේ බාර් පර්මිට් ගැන කථා කරද්දි අපි කිව්වේ, තවම ඒ බාර් එක විවෘත කරලා නැහැ, ඒ බාර් එක සම්බන්ධයෙන් ජනතා විරෝධයක් තිබෙන නිසා ඒ බාර් එක විවෘත කරන්නේ නැතිව මේ ගැන අධ්‍යයනය කරලා, විවෘත කරමු කියලායි. මොකද, බාර් එකක් විවෘත කළාට පස්සේ වහන්න අමාරුයි නේ. ඇමතිවරයාත් ලියාගෙන ආපු කථාවක් තමයි කියෙව්වේ. මේ, ලොකු පොරවල්. මම කියන්නේ මේකයි. උද්ධච්චකමක් පෙනෙනවා; අපේ ඇමතිවරුන් දැන් උද්ධච්චකමක් පෙන්වනවා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මුහුණ නැත්නම් ඇමතිවරුනුත් නැහැ, මන්ත්‍රීවරුනුත් නැහැ. ඒක මතක තබා ගන්න. රටේ මිනිස්සු ඡන්දය දුන්නේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ මුහුණට. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා අපිත් එක්ක මේ ගරු සභාවේ වාඩිවෙලා හිටියා. විපක්ෂයේ නවක මන්ත්‍රීවරයෙකු වන මට එතුමා ගොඩක් උපදෙස් දීලා තිබෙනවා; "ඡාණක්කියන්, ඔබ කථා කරද්දි මේකත් එක්ක මේ කාරණයත් එකතු කර ගත්තා නම් ඔබගේ කථාව තවත් හොඳයි" කියලා මට කියලා තිබෙනවා. එහෙම තමයි අපි හිටියේ. ඇමතිකම් ගත්තා කියලා, තුනෙන් දෙකක බලයක් තිබෙන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කියලා, කරුණාකරලා උද්ධච්ච වෙන්න එපා. අපිත් එකතු වෙලා මේ කාරණය පිළිබඳව ප්‍රගතිශීලි විසඳුමක් හොයන්න ලැහැස්තියි.

ජනාධිපතිතුමාත් ඊයේ ගිය Innovation Island Summit එකේ ඉඳලායි මම අද ආවේ. Innovative ideas ගොඩක් තිබෙනවා. අන්න ඒ වාගේ දේවල් කථා කරමු. නිකම් විපක්ෂයට බැණ බැණ කාලය නාස්ති කරන්න එපා. දැන් මැතිවරණය ඉවරයි. මම දන්නේ නැහැ, මම මේ කථාව කළේ ඇමතිවරයාගේ කථාවේදී පැහැදිලි කිරීමක්වත් කර ගන්න අවස්ථාවක් නැති වන නිසායි. අද පිළිතුරු කථාව කරන ඇමතිවරයාගේ උත්තරය සමහර විට ප්‍රගතිශීලි උත්තරයක් වෙන්න පුළුවන්. කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරු කථාව කරන්නේ දම්මික පටබැඳි ඇමතිතුමා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථා දෙකක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

[අ.භා. 6.23]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මුලින්ම මම සුසන්ත කුමාර නවරත්න මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, සභාව කල්තබන අවස්ථාවේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ආණ්ඩු පක්ෂයටත්, විපක්ෂයටත් කල්තැබීමේ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට හැකියාවක් නැහැ, උදේ වරුවේ මාධ්‍යවේදීන් කැමරා යොමු කරගෙන ඉන්න වෙලාවට විතරක් නිකම් නැඟිටලා ප්‍රශ්න ගැන කථා කරන්න. අපට තමයි අද දවසේ කල්තැබීමේ විවාදය තිබෙන්නේ. ඒ නිසා තමයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. ඒ විවාදය අවසන් වෙන්න කලින් මැදින් පැනලා තමන්ට කවදා හරි වෙච්ච අත්දැකීමක් මත පදනම් වෙලා මුළු ආණ්ඩුවක් විවේචනය කරන එකත් වැරදියි.

රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම මම කියනවා. මම කියන්නේ මේකයි. මමත් පිළිගන්නවා, යෝජනාව ස්ථිර කරපු කථාවේදී අදාළ මන්ත්‍රීවරයාගේ පැත්තෙන් මෙවැනි කල්තැබීමේ යෝජනාවකට අවශ්‍ය කරන ගුණය රැකුණේ නැහැ කියලා. අපි ඇත්තටම මෙතැනදී ඒ ගැන සාකච්ඡා කළා. නමුත් ඒකෙන් කියවෙන්නේ නැහැ, රාසමාණික්කම් මන්ත්‍රීතුමා අපට උපදෙස් දීම අවශ්‍යයි කියලා. මම එහෙම කියන්නේ මේ නිසායි. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා කියන්නේත් ජනතා විමුක්ති පෙරමුණේ, එහෙම නැත්නම් ජාතික ජන බලවේගයේ

[ගරු බිමල් රත්නායක මහතා]

සාමාජිකයෙක්. ඒ නිසා එතුමා චිතරක් හොඳයි, අනෙක් ඔක්කෝම නරකයි කියන එකත් එච්චර සාර්ථක තර්කයක් නොවෙයි. මේ ගරු සභාවේ ඉන්න කිසිම ඇමතිවරයකු ඉදිමිලා නැහැ. මෙතැන තිබෙන ඇත්ත ප්‍රශ්නය මෙයයි. මෙතැන විපක්ෂයේ යම් පිරිසක් ඉන්නවා, ඒගොල්ලන්ගේ ego එක වැඩියි. ඒගොල්ලන්ට දරාගන්න බැහැ, උගත්, සාමාන්‍ය පවුල්වලින් ආපු අය ඇමතිකම් කරන එකට. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒක දරාගන්න පුළුවන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසකුත් ඉන්නවා. ඒ නිසා යෝජනාවට පිළිතුරු දෙන්න කලින් එහෙම කියන එක වැරදියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිසර ඇමතිතුමා මේ යෝජනාව සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙනවා. ප්‍රවාහන විෂයය භාර ඇමතිවරයා සහ දුම්රිය සේවය භාර ඇමතිවරයා විධියට පළමුවෙන්ම මම මේ අනතුර පිළිබඳව සමාව ඉල්ලා සිටිනවා, කනගාටු වෙනවා.

මම වනඅලි ගැන විශේෂ අවබෝධයක් තිබෙන පුද්ගලයෙක් නොවෙයි. වනඅලි දුම්රියේ වැදී මැරෙන එක සම්බන්ධයෙන් අපි හරියටම දෙසැම්බර් 9, දෙසැම්බර් 30 සහ ජනවාරි 03 කියන දිනවලදී සාකච්ඡා කළා. එම දිනවලදී අපි දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ කළ සාකච්ඡාවලදී කිව්වා, දුම්රිය මාර්ගය හරහා යන වනඅලි දුම්රියේ ගැටෙන ප්‍රදේශ හඳුනාගෙන ඒ සඳහා විසඳුම් සොයන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා යෝජනා කරලා තිබෙන්නේ විශාල වියදමක් යන flyovers හදන ක්‍රම. ඒ නිසා අපි කිව්වා, අධික වියදම් යන යෝජනා ගැන පසුව බලමු, ප්‍රජාව සම්බන්ධ කරගෙන මේ සඳහා විසඳුම් සොයමු කියලා. මොකද, ගම්මාන 10ක පමණ තමයි අලි මාරුවන ස්ථාන තිබෙන්නේ. ඒ තැන්වලදී තමයි අලි දුම්රියේ ගැටිලා මැරෙන්නේ. ඒ ගම්මාන 10 පිළිබඳ විස්තර පරිසර අමාත්‍යාංශයේත්, දුම්රිය දෙපාර්තමේන්තුවේත් තිබෙනවා.

මේ සැරේ අලි හැප්පුණු ගල්ඔය ප්‍රදේශය ගත්තොත්, එම දුම්රිය මාර්ගයේ 133 සැතපුම් කණුවේ ඉඳලා 141 සැතපුම් කණුව දක්වා ප්‍රදේශයේ අලි හැප්පෙන තැන් හොඳින්ම mark කරලා තිබෙනවා. එම නිසා අපි අවස්ථා තුනකදීම දුම්රිය දෙපාර්තමේන්තුවට යෝජනා කළා, කරුණාකරලා මේ ගම්මාන දහයේ සිටින ජනතාව සම්බන්ධ කරගෙන මේ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා. ජාතික ජන බලවේගයේ කොටියාස සභාවල අතිවිශාල පිරිසක් ඉන්නවා, ස්වේච්ඡාවෙන් වැඩ කරන. ඔවුන්ගේ උදව්වත්, ගම්මුන්ගේ උදව්වත්, ග්‍රාම නිලධාරී මහත්වරුන්ගේ උදව්වත් අරගෙන, කෝච්චි පාර ආසන්නයේ අලි ගැවසෙනවා නම්, දුම්රිය රියදුරන්ට දැන්වීම සඳහා අදාළ station masterට කථා කරලා කියන්න කියලා, මෙහෙම අලි රංචුවක් මේ ප්‍රදේශයේ ඉන්නවා කියලා. ඇත්තටම මේ සිද්ධිය ගැන අපි කනගාටු වෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුව කියන්නේ අවුරුදු 160ක් පැරණි දෙපාර්තමේන්තුවක්. මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා නොදුන් නිසා, ජනවාරි 8වැනි දා අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා දුම්රිය සාමාන්‍යාධිකාරිට ලිපියක් යවනවා. එයට පිළිතුරු ලැබෙන්නේ පෙබරවාරි 6වැනි දා. පෙබරවාරි 6වැනි දා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් පිළිතුරේත් තිබෙනවා, "දෙපස වන ආවරණ ඉවත් කිරීමෙන් පසු මන්නාරම මාර්ගයේ කිසිදු වනඅලි ගැටීමක් මේ වන තෙක් වාර්තා වී නොමැත" කියලා. ඊයේ උදේ තමයි අපි මේ සිද්ධිය දැනගන්නේ. ඊට පස්සේ ඊයේ හවස පරිසර අමාත්‍යතුමාත් සමඟ අපි සියලුම නිලධාරීන් එකතු කරලා, සාකච්ඡාවක් කරලා, මේ සම්බන්ධයෙන් ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග ගණනාවක් හඳුනා ගත්තා. පරිසර ඇමතිතුමා ඒ ගැන කියාවි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

මට කියන්න තිබෙන්නේ මෙයයි. දුම්රියේ ගැටී වනඅලි මැරෙන එක වළක්වා ගැනීම සඳහා කළ යුතු ප්‍රධාන දේවල් පිළිබඳව දුම්රිය සේවයේ නියුතු අයට අවබෝධයක් තිබෙනවා. ඒ අයට අවුරුදු ගණනාවක් තිස්සේ ඒ අවබෝධය තිබිලා තිබෙනවා. ප්‍රශ්නය වෙන්නේ, ඒ අවබෝධයට අනුව අදාළ ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීමයි. නැත්නම් ක්‍රියාමාර්ග නොගැනීමයි. එම නිසා මෙතැන rocket science මොකුත් නැහැ. ඒකයි මම කියන්නේ, ප්‍රශ්නය දැකලා, ප්‍රශ්නයට උත්තර සොයන්න මහන්සි වෙලා තිබියදී මෙම බෙදවාචකය සිදු වීම සම්බන්ධයෙන් ඇත්තටම අපි කනගාටු වෙනවා. ඒ ගැන කලකිරීමක් තිබෙනවා. ඒ නිසා අපි ඊයේම මේ සඳහා මැදිහත් වෙලා මේ ප්‍රශ්නය විසඳන්න අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් ගත්තා. අපි ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව ගරු දම්මික පටබැඳි ඇමතිතුමා එතුමාගේ කථාවේදී පැහැදිලි කරාවි. එම නිසා අලි ඇතුළු වනසතුන් දුම්රියේ වැදිලා මිය යෑම වැළැක්වීම වෙනුවෙන් අපේ උපරිමය යොදා කටයුතු කරන බවට මේ රටේ ජනතාවට මේ අවස්ථාවේදී මා පොරොන්දු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සභානායකතුමා මගේ නම සඳහන් කරපු නිසා මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු සභානායකතුමනි, මටත් කිසිම ego එකක් නැහැ. මමත් ගමේ අවුරුදු 8ක් ඇවිදලා කරලා තමයි 2020 දී පාර්ලිමේන්තුවට ආවේ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඊයේ දවසේ ඉදිරිපත් කරපු සභාව කල්තැබීමේ විවාදයේදී සිදු වුණු දේ බලන්න කියලා. ඒක ගැන විතරයි මම කිව්වේ. ඒ හැර මට වෙනත් කිසිම ගැටලුවක් නැහැ. අපිත් Adjournment Motion එකක් ගේන්නේ ගැටලුවක් විසඳාගන්න මිසක් ගැටුමක් ඇති කර ගන්න නොවෙයි. එච්චරයි මම ඔබතුමාට කියන්නේ. එහෙම නැතුව අනුර කුමාර දිසානායක සහෝදරයා විතරයි හොඳ, ඔබතුමන්ලා නරකයි කියලා මම කිව්වේ නැහැ. මම කිව්වේ, මැතිවරණය වෙලාවේ වුණේ ඒක කියලායි. එච්චරයි මම කිව්වේ. I do not want to mislead the House with wrong information. That is all.

Thank you.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කිව්ව දේ සම්බන්ධයෙන් තමයි මම පැහැදිලි කළේ. Ego ප්‍රශ්නවලට අපට උත්තර නැහැ. අපි ego ප්‍රශ්න පොඩ්ඩක්වත් care කරන්නේත් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.29]

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (වෛත්තියර්) තම්මික පට්ටපෙන්දි - සුට්රාටල් අමෛච්චර්)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළමුවෙන්ම මම ඒ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම 19වැනි දා රාත්‍රියේ - 20වැනි දා අලුයම - තමයි මින්නේරිය සහ ගල්ඔය අතර තිබෙන 140 සහ 141 කිලෝමීටර් කණු අසලදී අලින් 7දෙනෙක් "මීනගයා" දුම්රියේ ගැටෙන්නේ. ඒ අලි 7දෙනා මියගොස් තිබෙනවා. එම සිදුවීම අපි කවුරුත් කම්පා කරපු සිදුවීමක්. ඒ වාගේම සිදු නොවිය යුතු දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් පසුගිය කාලය මුළුල්ලේ මේ විධියට වනඅලි දුම්රියේ ගැටිලා මරණයට පත් වුණු ඉතිහාසයක් තිබෙනවා. ඒක අපි වළක්වා ගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් රජයක් හැටියට, විශේෂයෙන්ම පරිසර අමාත්‍යාංශය සහ ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයත්, දුම්රිය දෙපාර්තමේන්තුවත් මැදිහත් වෙලා කටයුතු කරන්න අපි අදහස් කරනවා.

දුම්රියේ ගැටීමෙන් මේ අලි මරණ සිදු වූ වහාම අපේ බිමල් රත්නායක ඇමතිතුමා මැදිහත් වෙලා ඊයේ හවස 4.00ට අදාළ පාර්ශ්ව පාර්ලිමේන්තුවට කැඳවලා, ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද කියලා සාකච්ඡා කළා. එම අවස්ථාවට පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු ඒ සියලු අංශවල නිලධාරීන් සම්බන්ධ වුණා. ඒ වාගේම, පරිසර නියෝජ්‍ය අමාත්‍යවරයා සම්බන්ධ වුණා; මේ සම්බන්ධයෙන් විශේෂඥතාව දක්වන පරිසරවේදීන් ඒ අවස්ථාවට කැඳවුවා. ඒ වාගේම දුම්රියේ අලි හැපෙන, ඒ ගැටුම් ඇති වන පොළොන්නරුව සහ අනුරාධපුර ප්‍රදේශ නියෝජනය කරන ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු ඒ අවස්ථාවට කැඳවා ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව අපි එතැනට විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ නිලධාරිනුත් විශේෂයෙන්ම කැඳවුවා, මේ සම්බන්ධව ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ නිලධාරිනුත් ඒ අවස්ථාවට කැඳවලා තමයි ඒ සාකච්ඡාව අපි කළේ. ඒ සාකච්ඡාව තුළ අපි ගත්ත තීරණ ප්‍රමාණයක් තිබෙනවා. මම ඒ ටික සඳහන් කරන්නම්.

මීට පෙර විපක්ෂයෙන් කථා කළ මන්ත්‍රීතුමා චෝදනාවක් ඉදිරිපත් කළා, මේ අය වැයෙන් අපි කිසිදු මුදලක් මේ වෙනුවෙන් වෙන් කරලා නැහැ කියලා. අය වැය කථාවේ 38වෙනි පිටුවේ, 29වෙනි අංකය දරන "අලි - මිනිස් ගැටුම් අවම කිරීම සහ වන සංරක්ෂණය" කියන මාතෘකාව යටතේ කරන පැහැදිලි කිරීමේදී මේ ගැන සඳහන් කරලා නැහැ, අපි මුදලක් වෙන් කරලා නැහැ කියලා එතුමා කිව්වා. ඒ නිසා මේ රටේ ජනතාවට සහ මේ ගරු සභාවට අපි ඒ සම්බන්ධයෙන් අවබෝධ කර දෙන්න ඕනෑ. මොකද, ඒ අයව නොමඟ යවන්න දෙන්න බැහැ. ඒ ඡේදයේ තිබෙනවා, "මෙම උත්සාහයන් සඳහා රුපියල් මිලියන 300ක් දැනටමත් අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අලි-මිනිස් ගැටුම කියලා හඳුන්වන එක ඇතුළේ දුම්රියේ ගැටිලා අලි මරණ සිදු වන එකත් තිබෙනවා. ඒකටත් එක්ක තමයි අපි ඒ මුදල වෙන් කරලා තිබෙන්නේ. ඊට අමතරව සමස්තයක් හැටියට ගත්තොත්, අලි සංරක්ෂණයට අදාළ වන ක්ෂේත්‍රය, විශේෂයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ කාර්යාල 270ක ධාරිතාව වැඩිදියුණු කිරීමට අපි රුපියල් මිලියන 100ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මේ කටයුතු සඳහා මුළු ගණන ලෙස රුපියල් මිලියන 640ක් අපි වෙන් කරලා තිබෙනවා. ඒ නිසා නොමඟ යවනසුලු ප්‍රචාර, පැහැදිලි කිරීම් පිළිගන්න එපා කියලා මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙනත් සංවාදයකුත් ගිය නිසා අපට සභාවේ කාලය විනාඩි කිහිපයකින් දිර්ඝ කර ගන්න පුළුවන් නම් හොඳයි. මොකද, ඇමතිතුමා සතුව සවිස්තරාත්මක පිළිතුරක් තිබෙනවා. ඒක රටට වැදගත් නිසා එය ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙනවා නම් හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාව අවසාන වන තෙක් කාලය දිර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා විනාඩි 5කින් පමණ කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) තම්මික පට්ටපෙන්දි)
(The Hon. (Dr.) Dammika Patabendi)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊයේ දිනයේ පරිසරවේදීන්, පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන්, දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වාගේම ප්‍රදේශයේ මන්ත්‍රීවරු ඇතුළු සියලුදෙනා එකතුවෙලා, සාකච්ඡා කරලා මේ ගැටුම් ඇති වෙන්න බලපාන ප්‍රධාන හේතු ටික හඳුනා ගත්තා.

මන්ත්‍රීවරුන් එම සාකච්ඡාවේදී කරුණු ඉදිරිපත් කළා වාගේ, වංගුවේදී දුම්රිය මාර්ගයේ ඉන්න අලියා දර්ශනය නොවීම, මාර්ගය අසල සිටින අලි දුම්රිය පැමිණෙන විට බියවී මාර්ගයට පැමිණීම, මාර්ගය දෙපස වැවී ඇති ලඳු කැලෑ, මානා, ඉලුක් වැනි යටි ආවරණ නිසා අලි දර්ශනය නොවීම වැනි හේතු මේ සඳහා බලපානවා කියලා එතැනදී අපි හඳුනා ගත්තා. ඒ හේතු හඳුනාගෙන ඒවා නැති කිරීම සඳහා අවශ්‍ය කරන ක්‍රියාමාර්ග

[ගරු දම්මික පටබැඳි මහතා]

ගැනත් අපි එහිදී සාකච්ඡා කළා. අපි ඒ වෙනුවෙන් කෙටිකාලීන ක්‍රියාමාර්ග හැටියට ඉක්මනින්ම පාර දෙපස සුද්ද කරලා, ඒ මාර්ගයේ වනඅලි සිටිනවා නම් ඒ බව හඳුනා ගැනීම සඳහා ඉක්මන් මැදිහත්වීමක් කරන්නත් කටයුතු යොදා ගත්තා. ඒ වාගේම හෙට ඒ ප්‍රදේශය නිරීක්ෂණය කරන්න දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වෙනවා. ඒ ප්‍රදේශය නිරීක්ෂණය කරලා, ඒ ප්‍රදේශයට අදාළව අපට කෙටිකාලීනව ගත හැකි හදිසි ක්‍රියාමාර්ග මොනවාද කියන්න් එහිදී අපි හඳුනා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වනඅලි සහ දුම්රිය ගැටුම් ඇතිවෙන අධිඅවදානම් කලාප අපි හඳුනාගෙන තිබෙනවා. ඒ කලාපය තුළ කිලෝමීටර 104ක වාගේ දුරක් තිබෙනවා. ඒ කිලෝමීටර 104ට අදාළ දුර ඇතුළත තමයි වැඩිපුරම අනතුරු සිදු වෙන්නේ. ඒකට අදාළව මොකක්ද අපට කරන්න පුළුවන් මැදිහත්වීම් කියන්න් එහිදී සාකච්ඡා කළා. ඒ වාගේම මේ ප්‍රදේශයේ දුම්රිය සමඟ අලි ගැටුම් සිදු වෙන්නේ විශේෂයෙන් රාත්‍රී 10.00ත්, උදෑසන 4.00ත් අතර කාලය තුළයි. විශේෂයෙන් දුම්රිය හතරක් තමයි මේ කාලය තුළ ගමන් කරන්නේ. ඒ දුම්රිය සම්බන්ධ කරගෙන අපි කොහොමද ඒ සඳහා පිළිතුරු සොයන්නේ කියන එක පිළිබඳවත් එහිදී සාකච්ඡා කළා.

මීට කලින් ආණ්ඩු පැවති කාලවලදීත් මේ ප්‍රශ්නයට විවිධ උත්තර හොයලා තිබෙනවා. ඒ හැම උත්තරයක්ම ඒ මොහොතේ සාකච්ඡා කරලා තිබෙනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. සමහර ක්‍රියාමාර්ග සතියක්, දෙකක් ඇතුළත අවසන් වෙලා තිබෙනවා. නමුත් ඒවා අඛණ්ඩව සිදු වෙලා නැහැ. පසුගිය රජයන් විසින් ඒ මොහොතේ ඇති වන කම්පනයට කිසියම් ක්‍රියාමාර්ගයක් තෝරා ගත්තාට, ඒවා අඛණ්ඩව පවත්වාගෙන ගිහිල්ලා නැහැ; ඒවා තිරසාර කරලා නැහැ; ඒ සඳහා අවශ්‍ය කරන දිගුකාලීන මැදිහත්වීම් කරලා නැහැ. අපි ඊයේ තිබුණු සාකච්ඡාවේදී ඒ තත්ත්වයන් හඳුනාගෙන ඒ සඳහා ලබා දෙන කෙටිකාලීන පිළිතුරු කාලයක් තිස්සේ පවත්වාගෙන යන්නේ කොහොමද කියන එක ගැනත් සාකච්ඡා කළා. විශේෂයෙන්ම ඒ සාකච්ඡාවේදී අලි දුම්රියේ ගැටීම වළක්වන්න ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරුනුත්, ඒ ප්‍රදේශයේ ජනතාවත් ක්‍රියාකාරීව සහභාගි කිරීම සම්බන්ධයෙනුත් විශේෂ අවධානයක් යොමු කළා. කිලෝමීටර 104ක් කියන ඒ ප්‍රදේශයට අදාළ ග්‍රාම නිලධාරි වසම් ටික දින දෙකක් ඇතුළත හඳුනාගෙන, ඒ ග්‍රාම නිලධාරි වසම්වල ජීවත් වෙන ජනතාව සමඟ දුම්රියේ අලි ගැටුම් ඇති වෙන කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, එය වැළැක්වීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම් කරන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම අලි සම්බන්ධයෙන් සැලකිලිමත් වන, අලි සංරක්ෂණය සම්බන්ධයෙන් ඉදිරිපත් වන සංවිධානත් ඒ සඳහා සම්බන්ධ කරගෙන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ අනුව පරිසර අමාත්‍යාංශයත්, දුම්රිය දෙපාර්තමේන්තුවත්, දේශපාලන අධිකාරියත්, සාමාන්‍ය ජනතාවත්, අලි සංරක්ෂණය සම්බන්ධයෙන් සැලකිලිමත් වන සියලුදෙනාත් සම්බන්ධ කරගෙන ක්‍රියාමාර්ගයකට යන්න අපි කටයුතු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් දිගුකාලීන පියවරක් හැටියට sensors සවි කරන්නත් අපි එහිදී සාකච්ඡා කර ගත්තා. පැති කිහිපයකින් ඒ කටයුත්ත සිදු කරනවා. දුම්රිය ස්ථාන වාගේම දුම්රිය සම්බන්ධ කරගෙන දුම්රිය මාර්ගය දෙපස sensors සවි කරලා අලි ගැවසෙන මොහොතවල් සම්බන්ධව ඒ දුම්රිය රියදුරන්ට දැනුම් දීමේ ක්‍රමවේදයක් ඇති කරන්න කටයුතු කරනවා. ඒ වාගේම දුම්රිය එන මොහොතක නම් අලින් පලවා හැරීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් සෑදීමටත් එහිදී සාකච්ඡා කළා. එතැනදී කරුණු ඉදිරිපත් වුණා, එවැනි sensors මීට කලිනුත් හඳුන්වා දෙන්න උත්සාහ කරලා තිබුණාය කියලා. නමුත් ඒවා ඒ මොහොතේ ඒ බලධාරීන් විසින් නොසලකා හැර තිබෙනවා. එවැනි අවස්ථා කිහිපයක් සම්බන්ධයෙනුත් ඒ අවස්ථාවේදී සාකච්ඡා වුණා. අපි එතැනදී පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මූලිකත්වයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ නිලධාරීන් සම්බන්ධ කරගනිමින් දිගුකාලීන පියවරක් හැටියට විශේෂ කමිටුවක් පත් කර ගත්තා.

මේ සඳහා නවීන තාක්ෂණය යොදාගෙන, දුම්රිය මාර්ගයේ වනඅලි සිටිනවා නම් දුම්රිය රියැදුරන්ට එය දැනුම් දීම සඳහා ක්‍රමයක් හැදීම පිළිබඳව, ඒ වාගේම දුම්රියක් එන මොහොතකදී අලින් පලවා හැරීම සඳහා මේ තාක්ෂණය පාවිච්චි කර ගන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් ඉක්මන් වැඩ පිළිවෙළක් හඳුන්වා දීම පිළිබඳවත් එතැනදී සාකච්ඡා කර ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වුණු සිදුවීම අපි කවුරුත් කම්පා කරවපු සිදුවීමක්. අපේ බලාපොරොත්තුව, එය අවසන් සිදුවීම බවට පත් කර ගන්නයි. ඒ සම්බන්ධයෙන් ක්ෂණිකව මැදිහත් වීම පිළිබඳව ගරු බිමල් රත්නායක ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම ඒ සඳහා දායකත්වය ලබා දෙන්න ඉතා ක්‍රියාශීලීව හා ක්ෂණිකව මැදිහත් වුණු පරිසරවේදීන් සහ අමාත්‍යාංශ නිලධාරීන් අපි අගය කරන්න ඕනෑ. අපි සූදානම් අපේ රජය යටතේ පළමු මොහොතේදීම මේ සඳහා මැදිහත් වෙලා දුම්රියවල ගැටිලා අලින් මිය යෑම නවතා දමන්න. ඒ සඳහා අපි දැනට කෙටි කාලීන සහ දිගු කාලීන වශයෙන් ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. අපි මේ රටේ ජනතාවගෙන්, පරිසරවේදීන්ගෙන් සහ අලි සංරක්ෂණය සම්බන්ධයෙන් සැලකිලිමත් වන සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා අපි සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කරන්න කියලා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
වෙඩි බෙහෙතුත් දෙන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
අපි ඒ ගැනත් සලකා බලන්නම්. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, අපි මේ මොහොතේ කථා කරන්නේ, අලින් දුම්රියවල ගැටීම නිසා සිදුවන අනතුරු පිළිබඳවයි. මේ කාරණය සම්බන්ධයෙන් රජයක් හැටියට උපරිම මැදිහත්වීම් කරන්න අපි සූදානම්. අපි මේ සඳහා ඔබ සියලුදෙනාගේ සහාය ඉල්ලා සිටිනවා. අපි මේ අනතුරු වළක්වා අපේ රටේ සම්පතක් හැටියට සලකන අලි ඇතුන් ආරක්ෂා කිරීම සඳහා මැදිහත් වෙමු කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.42ට, 2025 පෙබරවාරි 06 වන දින සභා සම්මතය අනුව, 2025 පෙබරවාරි 22 වන සෙනසුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.42க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 06ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 22, சனிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.42 p.m until 9.30 a.m. on Saturday, 22nd February, 2025, pursuant to the Resolution of Parliament of 06th February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

317 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 317 - இல. 6
Volume 317 - No. 6

2025 පෙබරවාරි 22වන සෙනසුරාදා
2025 பெப்ருவரி 22, சனிக்கிழமை
Saturday, 22nd February, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 පෙබරවාරි 22වන සෙනසුරාදා
2025 பெப்ருவரி 22, சனிக்கிழமை
Saturday, 22nd February, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම [පිටුව 999]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [පිටු 1002-1019]

දුම්රියේ ගැටීමෙන් සිදුවන වනඅලි මරණ වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග:

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 1019]

මැතකදී දිවයින පුරා සිදු වූ විදුලිය බිඳවැටීම:

බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 1024]

විදේශ සංචිත ඉලක්ක සහ ණය සේවා ලබා ගැනීම සඳහා සැලසුම්:

කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [පිටුව 1028]

වරප්‍රසාද යෝජනා:

2025.02.19වන දින "ඩේලි මිරර්" සහ "ලංකාදීප"පුවත්පත් වාර්තා [පිටුව 1032]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 - [පස්වන වෙන් කළ දිනය]:

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [පිටු 1037-1167]

කල් තැබීමේ යෝජනාව:

උතුරු පළාතේ නීති විරෝධී ධීවර ක්‍රියාකාරකම් වැළැක්වීම [පිටු 1168-1178]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

அரசியலமைப்பு அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம் [ப: 999]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1002-1019]

புகையிரதம் மோதி யானைகள் இறப்பதைத் தடுப்பதற்கான நடவடிக்கை:

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று [ப: 1019]

நாடளாவிய ரீதியில் அண்மையில் ஏற்பட்ட மின்தடை:

வலுசக்தி அமைச்சரினது கூற்று [ப: 1024]

வெளிநாட்டு ஒதுக்க இலக்குகளை அடைவதற்கும் கடன் சேவைகளைப் பெறுவதற்குமான திட்டங்கள்:

தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சருமானவரினது கூற்று [ப: 1028]

சிறப்புரிமைப் பிரேரணைகள்:

2025.02.19ஆம் திகதிய "டெய்லி மிரர்" மற்றும் "லங்காதீப" பத்திரிகை அறிக்கைகள் [ப: 1032]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட ஐந்தாம் நாள்]:

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 1037-1167]

ஒத்திவைப்புப் பிரேரணை:

வடக்கில் சட்டவிரோத மீன்பிடியைத் தடுத்தல் [ப: 1168–1178]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Committee on Constitutional Affairs: Nomination of Members [Col. 999]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1002–1019]

MEASURES TO PREVENT ELEPHANT DEATHS DUE TO COLLISIONS WITH TRAINS:
Statement by Minister of Transport, Highways, Ports and Civil Aviation [Col. 1019]

RECENT ISLANDWIDE POWER OUTAGE:
Statement by Minister of Energy [Col. 1024]

PLANS FOR ACHIEVING FOREIGN RESERVE TARGETS AND DEBT SERVICING:
Statement by Minister of Labour and Deputy Minister of Economic Development [Col. 1028]

PRIVILEGE MOTION:
Reports in “Daily Mirror” and “Lankadeepa” Newspapers of 19.02.2025 [Col. 1032]

APPROPRIATION BILL, 2025- [Fifth Allotted Day]:
Second Reading - Debate Adjourned [Cols. 1037–1167]

ADJOURNMENT MOTION:
Prevention of Unlawful Fishing Activities in the North [Cols. 1168-1178]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි 22වන සෙනසුරාදා
2025 பெப்ருவரி 22, சனிக்கிழமை
Saturday, 22nd February, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
அரசியலமைப்பு அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
COMMITTEE ON CONSTITUTIONAL AFFAIRS: NOMINATION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 126(1)හි විධිවිධාන ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, කථානායකවරයා සභාපතිවරයා වූ ද, අග්‍රාමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සමඟ මතු සඳහන් මන්ත්‍රීවරයන් තිදෙනා මවිසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

II

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 පෙබරවාරි 22වන සෙනසුරාදා, එනම් අද දින පූර්ව භාග 11.00 ට පාර්ලිමේන්තුවේ පක්ෂ නායකවරයන් හා ඔවුන්ගේ නියෝජිතයන් සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයන් සහභාගි වන විශේෂ රැස්වීමක් සහ එය අවසන් වූ වහාම, තේරීම් කාරක සභාවේ රැස්වීමක් මාගේ ප්‍රධානත්වයෙන් කාරක සභා කාමර අංක 2 හි දී පැවැත්වීමට නියමිත බැවින් අදාළ රැස්වීම් සඳහා පැමිණ සහභාගි වන ලෙස ආරාධනා ලැබ ඇති සියලු මන්ත්‍රීවරයන්ට දැනුම්දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the University of Peradeniya for the year 2023.

I move that this Report be referred to the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 112 read with Section 16 of the Insurance Industry Act, No. 43 of 2000 and published in Gazette Extraordinary No. 2415/79 of 22nd December, 2024.

I move that these Regulations be referred to the Committee on Public Finance.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

Sir, I present the Report on the submission of observations and steps taken in terms of the Standing Order 119(4) of Parliament with regard to the matters mentioned on the Ministry of Water Supply and Infrastructure Development in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) පානදුර, කෙසෙල්වත්ත, හොරේතුඩුව, චන්ද්‍රසේකර පාර, අංක 216 දරන ස්ථානයෙහි පදිංචි එම්.ආර්. නදීක ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කළුතර - දකුණ, මපුර් ක්‍රසන්ට්, අංක 117/29 බී දරන ස්ථානයෙහි පදිංචි එම්.එස්.එෆ්. රිහානා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) බණ්ඩාරගම, අටළුගම, මීගහමුල, අංක 95/ඒ දරන ස්ථානයෙහි පදිංචි පී. නිලන්ති පෙරේරා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) බණ්ඩාරගම, බණ්ඩාරගම බටහිර, අංක 173 දරන ස්ථානයෙහි පදිංචි ආර්.කේ. අශෝකා රංජනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු කථානායකතුමනි, පුහුල්වැල්ල, කිරින්ද, පහළ අරඹ යන ලිපිනයෙහි පදිංචි එම්.එම්. ස්වර්ණා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) කුරුණෑගල ශික්ෂණ රෝහල යන ලිපිනයෙහි සේවයේ නියුතු අජිත් ජයසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කුරුණෑගල, අලකොළදෙනිය, මීගමු පාර, යටිවැහැර නිවාස යෝජනා ක්‍රමය, අංක 03 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.සී.ජී.බී. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) කුරුණෑගල, කොස්කුඹුර, තෝරයාය යන ලිපිනයෙහි පදිංචි කේ.ආරියරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) බෝයගනේ, රෙග්ලන් වත්ත, 12 වැනි පටුමග යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. රාජසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මාවතගම, වික්‍රමසිංහපුර, අංක 73 දරන ස්ථානයෙහි පදිංචි කේ.එල්.එන්. සහබන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) පේරාදෙණිය, උඩරිරියගම, ප්‍රගති මාවත, අංක 35/බී/2 දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ.බී. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) මාස්පොත, බමුණුස්ස, දෙවැනි පියවර, නදී උයන, අංක 442/53 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.අයි.ආර්. චන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කඩුවෙල, ඉහළ බෝමිරිය, අංක 255/1/8 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.එම්.සී. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අතුරුගිරිය, 5 වැනි පටුමග, ලේක් ටෙරස්, අංක 723/29 දරන ස්ථානයෙහි පදිංචි කේ.ආර්.පී. දුල්වල මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බියගම, බණ්ඩාරවත්ත, වීරසේකර පෙදෙස අංක 169/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි පී.යූ.ඩී. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, ඉසුරුපුර, විජය මාවත, අංක 21/123 ඩී යන ලිපිනයෙහි පදිංචි එස්.සී. සෙනවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

තේ කර්මාන්තය ආශ්‍රිත "ස්ටාර්" ව්‍යාපෘතිය: විස්තර
தேயிலை கைத்தொழிற்றுறை சார் 'ஸ்டார்' கருத்திட்டம்: விபரம்
"STARR" PROJECT IN RELATION TO TEA INDUSTRY : DETAILS

423/2025

1. ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය බිඳ වැටෙමින් පවතින බව පිළිගන්නේද;

(ii) තේ නැවත වගාව සඳහා ක්‍රියාත්මක වූ "ස්ටාර්" ව්‍යාපෘතියට මුදල් සැපයූ ආයතනය කවරේද;

(iii) සැපයූ මුළු මුදල කොපමණද;

(iv) එය ණයක්ද, නොඑසේ නම්, ප්‍රදානයක්ද;

(v) ණයක් නම්, වාර්ෂික පොලී අනුපාතය කොපමණද;

(vi) එම ණය ගෙවා අවසන් වන වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ පරිපාලන ව්‍යුහය හා ඊට සම්බන්ධ පුද්ගලයන් කවරේද;

(ii) එමඟින් තේ නැවත වගාව සිදු කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් තේ පරීක්ෂක කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ව්‍යාපෘතිය යටතේ තේ නැවත වගා කරන ඉඩම් අක්කරයකට ගෙවූ මුදල හා පරිපාලන වියදම්වලට

වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) මේ වනවිට එම ව්‍යාපෘතිය අවසන් කර තිබේ නම්, එම දිනය කවරේද;

(ii) වගාකරුවන්ට හිඟ මුදල් ගෙවිය යුතුව තිබේ නම්, එය එක් එක් තේ පරීක්ෂක කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ විගණන වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ට මෙන්ම සමූහ උට්කට්ටමෙප්පු වසතිකල් අමෛච්චරෛක් කේට්ට විනා:

(අ) (i) ඉලංකෛයින් තේයිලෛක් කෛත්තොළිර්රුරෛ 2010ආම් ආණ්ටු තොටක්කම් වීළ්ච්චියටෛන්තු වරුකින්රතු එන්පතෛ ඒර්රුක්කොළ්වාරා එන්පතෛයුම්;

(ii) තේයිලෛ මීළ්චෙය්කෛක්කාක නටෛමුරෛප් පටුත්තප්පට්ට 'ස්ටාර්' කරුත්තිට්ටත්තුක්කු නිති වළංකිය නිරුවනම් යාතෙන්පතෛයුම්;

(iii) වළංකප්පට්ට මොත්තප් පණත්තොකෛ එව්වළවු එන්පතෛයුම්;

(iv) අතු කටනාකවා ඉන්රේල්, නන්කොටෛයාකවා වළංකප්පට්ටතු එන්පතෛයුම්;

(v) කටනාක ඉරුප්පින්, වරුටාන්ත වට්ටි වීතම් යාතෙන්පතෛයුම්;

(vi) මේර්පටි කටන් තොකෛයෛච් චෙලුත්ති මුටික්කුම් වරුටම් යාතෙන්පතෛයුම්;

අවර් තෙරිවිප්පාරා?

(ආ) (i) මේර්පටි කරුත්තිට්ටත්තින් නිරුවාකක් කට්ටමෛප්පු මර්රුම් අතනුටන් තොටර්පුටෛය ආට්කළ් යාවර් එන්පතෛයුම්;

(ii) අතනූටාක තේයිලෛ මීළ්චෙය්කෛ මේර් කොණ්ටුළ්ළ කාණියින් අළවු, ඔව්වොරු තේයිලෛප් පරිචෝතකර් පිරිවුක්කමෛවාක වෙව්වේරාක යාතෙන්පතෛයුම්;

(iii) කරුත්තිට්ටත්තින්කීළ්, තේයිලෛ මීළ්චෙය්කෛ මේර්කොළ්ළුම් ඕර් ඒක්කර් කාණික්කුච් චෙලුත්තප් පට්ට පණත්තොකෛ මර්රුම් නිරුවාකච් චෙලවු කළුක්කාක ඔතුක්කප්පට්ට පණත්තොකෛ වෙව්වේරාක යාතෙන්පතෛයුම්;

අවර් තෙරිවිප්පාරා?

(இ) (i) இன்றளவில் மேற்படி கருத்திட்டத்தை நிறைவு செய்திருப்பின், அதனை நிறைவுசெய்த திகதி யாதென்பதையும்;

(ii) செய்கையாளர்களுக்கு நிலுவைப் பணம் செலுத்தவேண்டியிருப்பின், அது ஒவ்வொரு தேயிலைப் பரிசோதகர் பிரிவுக்கமைவாக வெவ் வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்தின் கணக்காய்வு அறிக்கை சமர்ப்பிக்கப்படுமா என்பதையும்;

அவர் மேலும் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he state -

(i) whether he admits that the tea industry in Sri Lanka has been collapsing since 2010;

(ii) the institution which provided funds for the "STaRR" Project, which was implemented for re-cultivation of tea;

(iii) the total amount of funds provided for it;

(iv) whether it is a loan or a grant;

(v) if it is a loan, the annual interest rate; and

(vi) the year in which the said loan will be paid off ?

(b) Will he also state the -

(i) administrative structure of that project and the names of the persons who are involved in it;

(ii) extent of land that has undergone tea re-cultivation through that project in each tea inspector's division, separately; and

(iii) amount paid per acre of land for re-cultivating tea under the project and the amount allocated for administrative expenses, separately?

(c) Will he further state -

(i) if the said project has been completed by now, the date on which it was completed;

(ii) if there are outstanding amounts payable to tea planters, the amounts payable as per each of the tea inspector's divisions, separately; and

(iii) whether the audit report on the project will be submitted?

(d) If not, why?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කර්මාන්තයේ යම් පසුබෑමක් ඇති බව නිරීක්ෂණය කරමි. නමුත්, 2024 වර්ෂයේදී සමස්ත තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 262 දක්වා වර්ධනය වී ඇත. එය පසුගිය වසර තුනට සාපේක්ෂව වැඩි අගයකි.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

(ii) කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල - International Fund for Agricultural Development, IFAD - හා ශ්‍රී ලංකා රජය.

(iii) 2024.04.19 දින වන විට රුපියල් මිලියන 8,703.71ක් වැය කර ඇත.

(iv) ණයකි.

(v) පොලී අනුපාතය සියයට 1.25ක් හා සේවා ගාස්තු සියයට 0.75කි.

වාර්ෂිකව සියයට 1.25ක ස්ථාවර අනුපාතයක් සහ සියයට 0.75ක සේවා ගාස්තුවක් සමඟින්, ඉතිරිව ඇති ප්‍රදාන මුදල - principal amount - සඳහා පොලිය සමඟ මිශ්‍ර කොන්දේසි - blended terms - මත ණය ලබා දී ඇත.

(vi) 2040 වර්ෂයේ දී.

(ආ) (i) අමාත්‍යාංශය සතු ලිපි ලේඛන අනුව, 2023.06.15 දින වන විට කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතියෙහි - STaRR Projectහි - පරිපාලනය සම්බන්ධයෙන් කටයුතු කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	නම
01	ව්‍යාපෘති අධ්‍යක්ෂ - Project Director	ඒ.ජේ.එල්.පී. අමරසිංහ මයා
02	මූල්‍ය කළමනාකරු - Finance Manager	ආර්.එච්.එස්.පී. රණසිංහ මිය
03	අභ්‍යන්තර විගණක - Internal Auditor	රවීන් ඕවිටිගල මයා
04	ව්‍යාපෘති ගණකාධිකාරී - Project Accountant	ඩබ්.ජී. සාගර මයා
05	ආයතනික සංවර්ධන සම්බන්ධීකාරක - Institutional Development Coordinator	ඒ. හේවගේ කුලරත්න මයා
06	ධාරිතා ගොඩනැංවීම හා මානව සම්පත් සම්බන්ධීකාරක - Capacity Building and Human Resource Coordinator	ශිරෝමී කුමාරි හේරත් මිය
07	ICT නිලධාරි-MIS - ICT Officer-MIS	ඩබ්.ජී.එච්. ප්‍රියංගිකා මිය
08	ICT නිලධාරි-GIS - ICT Officer-GIS	ජී.ඒ.එම්.ඩී. ගුණරත්න මයා
09	ප්‍රජා සංවර්ධන නිලධාරි - Community Development Officer	එම්.ඩබ්.ඩී. නිශාන්ත මයා
10		එන්.එච්.ඒ.ආර්. ස්වර්ණපාලි මයා
11		කේ.එම්.එම්.ඩී.පී. කෝණාර මයා
12		ඩී.බී.ධර්මකීර්ති මයා
13	ව්‍යාපාර සංවර්ධන නිලධාරි - Business Development Officer	වී.ජී. චිත්‍රසේන මයා
14		ඩී.එස්. පත්මසිරි මයා
15		අජන්ත ශාන්ත කුමාර මයා
16	ආයතනික සංවර්ධන නිලධාරි - Institutional Development Officer	සුරංග සෙනෙවිරත්න මයා
17	ව්‍යාපෘති ලේකම් - Project Secretary	රෝහිනී පෙරේරා මිය

(ii) තේ නැවත වගාව සිදු කළ මුළු ඉඩම් ප්‍රමාණය - හෙක්ටෙයාර 4131.79කි.

දිස්ත්‍රික්කය	පැළ සිටුවීම ප්‍රමාණය (හෙක්ටෙයාර)
ගාල්ල	1122.85
මාතර	1177.28
රත්නපුර	1036.34
බදුල්ල	334.88
මහනුවර	358.78
නුවරඑළිය	101.66
එකතුව	4131.79

(තේ පරීක්ෂක කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් තොරතුරු ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත)

(iii) තේ නැවත වගා කරන ඉඩම් අක්කරයකට ගෙවා ඇති මුදල රුපියල් 325,765.00කි.

පරිපාලන වියදම්වලට වෙන් කළ මුදල රුපියල් මිලියන 621.38කි. (2024.04.19 දින වන වියදම් කර ඇති මුදල රුපියල් මිලියන 538.61කි)

(ඇ) (i) 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දින ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු අවසන් කළ අතර, 2024.03.31 දිනෙන් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

(ii) සහනාධාර වැඩසටහන අනුව වගාකරුවන්ට හිඟ මුදල් ගෙවීමට ඇත.

වැඩිමනත් විස්තර ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) ඔව්, ඇමුණුම 03 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(ඈ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. තේ කර්මාන්තය නැවත පුනර්ජීවනය කිරීමේ අරමුණින් තමයි මේ STaRR Project එක පටන් ගත්තේ. ඒ තුළින් අවශ්‍ය අරමුණට ගිහිල්ලා තිබෙනවාද, එහි ඵලදායීතාව කොච්චර වැඩි වෙලා තිබෙනවාද, අපි බලාපොරොත්තු වෙච්ච අරමුණට එය ගිහිල්ලා තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි. ඒ වාගේම ඒ තුළ යම් අක්‍රමිකතා වැනි දේවල් සිද්ධ වෙලා තිබෙනවාද, ඒවා හඳුනාගෙන තිබෙනවාද, එහෙම වුණා නම් ඒ සම්බන්ධව ගන්නා ක්‍රියා මාර්ග මොනවාද කියලාත් ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, තේ හා රබර් කර්මාන්තය සම්බන්ධයෙන් මේ ව්‍යාපෘතියේ යම් පුළුල් අරමුණක් තිබිලා තිබෙනවා. මේ වාර්තා අධ්‍යයනය කරනකොට අපට පෙනෙනවා, අරමුණ සියයට 100ක් සපුරා ගන්න බැරි වෙලා තිබෙන බව. ඒ වාගේම ඔබතුමාගේ පළමු අතුරු ප්‍රශ්නයේ දෙවන කොටස හැටියට ඇහුවා, යම් අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවාද, ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නවාද කියලා. දැනට වාර්තා වෙලා තිබෙන තොරතුරු අනුව යම් ගැටලු සහගත තැන් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී යම් විමර්ශනයක් කිරීමේ බලාපොරොත්තුවක් අමාත්‍යාංශය තුළ තිබෙනවා.

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේකත් තේ කර්මාන්තයට අදාළයි. මේ මොහොතේ, අය වැය ලේඛනය පිළිබඳ සංවාදයක් රට පුරා ගොඩනැඟිලා තිබෙනවා. මෙම අය වැය ලේඛනය තුළ තේ කර්මාන්තය සම්බන්ධයෙන් දක්වපු දායකත්වය පිළිබඳව යම් යම් අය විවිධ ප්‍රශ්න නඟනවා. මේ අය වැය ලේඛනය ඇතුළේ තේ කර්මාන්තය සම්බන්ධයෙන් අරගෙන තිබෙන පියවරයන් මොනවාද, එහි ඉදිරි ගමන් මඟ කුමක්ද කියන එක මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, යම් යම් අය මේ ගැන විමසනවා මම දැක්කා. 2025 අය වැයෙන් තේ කර්මාන්තය සඳහා මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් කුඩා තේ වතු හිමියන් මාධ්‍ය සාකච්ඡා කිහිපයකුත් පැවැත්වුවා.

ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට කරපු අය වැය කථාවේ සාමාන්‍යයෙන් තිබෙන්නේ සංක්ෂිප්තයක් සහ මූලික කාරණා ප්‍රමාණයක්. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට උත්තරයක් හැටියට සහ රටේ තේ කර්මාන්තය ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ අවබෝධය සඳහා මම මේ කරුණු කිහිපය ඉදිරිපත් කරන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය හැටියට තේ කර්මාන්තය නහාසිටුවීමට 2025 වර්ෂයට මෙන්න මේ ආකාරයට මුදල් වෙන් කරලා තිබෙනවා.

කුඩා තේ වතු නැවත වගාව පළමු අදියරේ සහනාධාර වැඩසටහන කියලා අපි රුපියල් ලක්ෂ 3,450ක් වෙන් කරලා තිබෙනවා. ඒකෙම දෙවැනි අදියර සඳහා අපි රුපියල් ලක්ෂ 175ක් මේ වර්ෂයට වෙන් කරලා තිබෙනවා. පසුගිය වර්ෂයේ නැවත වගා සඳහා හිඟ ගෙවීම් මේ වර්ෂයේ අපට කරන්න තිබෙනවා. ඒ සඳහා අපි රුපියල් ලක්ෂ 2,230ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අපි මේ වර්ෂයේ සැලසුම් කරලා තිබෙනවා, අලුත් බිම්වල නැවත අලුත් වගාවන් කිරීම සඳහා. ඒ සඳහා අපි වෙන් කරලා තිබෙනවා, තේ කර්මාන්තය වෙනුවෙන් රුපියල් ලක්ෂ 2,742ක්. ඒ වාගේම සමහර වතුවල පාළු තිබෙනවා. පාළු සිටුවීම සඳහා මෙවර භෝග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ අපි රුපියල් ලක්ෂ 5,500ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ඍජු තේ වගාව සඳහා සහනාධාර ව්‍යාපෘතිය කියලා තවත් ව්‍යාපෘතියක් යටතේ අපි රුපියල් ලක්ෂ 600ක් වෙන් කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘතිය යටතේත් පාළු සිටුවීමට සහනාධාර ව්‍යාපෘතියකුත් අපි ඒ යටතේ ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා තවත් රුපියල් ලක්ෂ 262ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, යාන්ත්‍රීකරණය අරමුණු කරගත් තේ වගාව සඳහා සහනාධාර කියලා අලුත් ව්‍යාපෘතියක් ආරම්භ වෙනවා. ඒ සඳහා අපි රුපියල් ලක්ෂ 625ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අක්කර 10ට වැඩි ඉඩම්වල ජල සම්පාදනය ඇති කරන්න අපි සහනාධාර ව්‍යාපෘතියක් හදලා තිබෙනවා. ඒ සඳහා අපි රුපියල් ලක්ෂ 100ක් වෙන් කරලා තිබෙනවා. ගුණාත්මක තේ දලුවල අවශ්‍යතාවක් තිබෙනවා, තේ නිෂ්පාදනය සඳහා. ඒ සඳහා අමු තේ දලු ප්‍රවාහනයට ප්ලාස්ටික් පෙට්ටි සහ නයිලෝන් බෑග් සැපයීමේ සහනාධාර ක්‍රමයක් අපි සූදානම් කරලා තිබෙනවා. ඒකට රුපියල් ලක්ෂ 350ක් වෙන් කරලා තිබෙනවා.

කුඩා තේ වතු හිමියන්ගේ ධාරිතා සංවර්ධනය සම්බන්ධයෙන් අවබෝධය ලබා දීම සඳහා අපි වැඩසටහනක් හදලා තිබෙනවා. ඒ සඳහා රුපියල් ලක්ෂ 30ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම සුහුරු දලු නෙළීමේ කණ්ඩායම් සහ යන්ත්‍රෝපකරණ සුහුරු දලු නෙළීමට ලබා දෙන්න අපි රුපියල් ලක්ෂ 350ක් වෙන් කරලා තිබෙනවා. තේ කම්හල් හා ගබඩාවල වහල මත සූර්ය පැනල සවි කරලා ඔවුන්ගේ විදුලි බිල අඩු කරලා දෙන්න අපි සහනාධාර ක්‍රමයක් ඇති කරලා තිබෙනවා. ඒ සඳහා 2025 වර්ෂයට රුපියල් ලක්ෂ 200ක් වෙන් කරලා තිබෙනවා. තේ පැළ තවාන් ව්‍යාපෘතියක් ආරම්භ වෙනවා. ඒ සඳහාත් අපි රුපියල් ලක්ෂ 175ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මේ තේ අතින් සාදන කුඩා පරිමාණයේ තේ කර්මාන්තශාලා ප්‍රමාණයක් තිබෙනවා. ඒ සඳහා තේ වියළීම් යන්ත්‍ර 25ක් ලබා දෙන්න අපි රුපියල් ලක්ෂ 50ක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මේ වර්ෂයේදී අපි තේ වගාව වෙනුවෙන් රජයක් හැටියට විශාල ආයෝජනයක් කරන්න සූදානම් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

කළුතර දිස්ත්‍රික්කයේ KL-2 ව්‍යාපෘතිය: වත්මන් තත්ත්වය
களுத்துறை மாவட்டத்தில் KL-2 கருத்திட்டம்: தற்போதைய நிலை
KL-2 PROJECT IN KALUTARA DISTRICT: CURRENT STATUS

431/2025

2. ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, අයි-රෝඩ් ව්‍යාපෘතිය යටතේ KL-2 ව්‍යාපෘතිය (කළුතර පැකේජ් 2) නමින් ව්‍යාපෘතියක් තිබූ බවත්;

(ii) අදාළ කොන්ත්‍රාත් සමාගම නීතිමය ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීම හේතුවෙන් ඉහත ව්‍යාපෘතිය අතරමඟ නවතා ඇති බවත්;

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

(iii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවකට පත් වී සිටින බවත්; එතුමා දන්නේද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ අගලවත්ත සහ මතුගම මැතිවරණ බලප්‍රදේශ තුළ සංවර්ධනය කිරීමට නියමිතව තිබූ මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත් සමාගම/ සමාගම් කවරේද;

(iii) එම සමාගමේ/සමාගම්වල හිමිකාරිත්වය කවරේද;

(iv) ඉහත නීතිමය ක්‍රියා මාර්ගයේ වර්තමාන තත්ත්වය කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු, නෙටුංචාලෙකළ්, තුරෙමුකංකළ් මට්‍රුම් සිවිල් විමාන සේවෙකළ් අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) කළුත්තුරෙ මාවට්ටත්තිල් 'ඉ-රෝට්' කරුත්තිට්ටත්තින්කීළ් KL-2 කරුත්තිට්ටම් (කළුත්තුරෙ පෙකේජ් 2) එන්ර පෙයරිල් ඔරු කරුත්තිට්ටම් ඉරුන්තතෙන්පතෙයුම්;

(ii) සම්පන්තප්පට්ට ඔප්පන්ත නිරුවනංකළ් චට්ට නටවටික්කෛ මේර්කොණ්ටතන් විළෛවාක මේර්පටි කරුත්තිට්ටමානතු ඉටෛනටුවිල් නිරුත්තප්පට්ටුළ්ළතු එන්පතෙයුම්;

(iii) ඉතන් කාරණමාක අප්පිරතේච මක්කළ් කටුමෛයාන පාතිප්පුක්කු උළ්ළාකියුළ්ළනර් එන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) මේර්පටි කරුත්තිට්ටත්තින්කීළ් අකලවත්තෛ මට්‍රුම් මත්තුකම තේර්තල් තොකුතිකළිල් අපිවිරුත්ති සෙය්වතර්කු උත්තේසික්කප්පට්ටිරුන්ත වීතිකළින් එණ්ණික්කෛ යාතෙන්පතෙයුම්;

(ii) මේර්පටි කරුත්තිට්ටත්තුටන් තොටර්පුටෛය ඔප්පන්ත නිරුවනම්/නිරුවනංකළ් යාතෙන් පතෙයුම්;

(iii) අන්ත නිරුවනත්තින් / නිරුවනංකළින් උරිමෛ යාළර්කළ් යාවරෙන්පතෙයුම්;

(iv) මේර්පටි චට්ට නටවටික්කෛකළින් තර්පෝතෛය නිලෛ යාතෙන්පතෙයුම්;

(v) මේර්පටි කරුත්තිට්ටත්තෛප් පූර්ත්තිසෙය්වතර්කු නටවටික්කෛ එටුක්කප්පටුමා එන්පතෙයුම්;

අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Is he aware that -

(i) there was a project named KL-2 (Kalutara Package 2) Project under the iRoad Project in Kalutara District;

(ii) the above named project has been suspended partway as the relevant contractor company has initiated legal proceedings; and

(iii) the residents of the area have been subjected to serious inconvenience because of that?

(b) Will he inform this House -

(i) the number of roads in Agalawatte and Matugama Electoral Divisions, which were due to be developed under that project;

(ii) the names of the contractor company/ companies pertaining to that project;

(iii) the ownership of those company/ companies;

(iv) the present status of the above-mentioned legal proceedings; and

(v) whether steps will be taken to complete the project concerned?

(c) If not, why?

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

ආසියානු සංවර්ධන බැංකුවේ - ADB - අරමුදල් මඟින් ක්‍රියාත්මක වූ iRoad-1 වැඩසටහන යටතේ කළුතර දිස්ත්‍රික්කයට අදාළව KL-01, KL-02, KL-03 නමින් ව්‍යාපෘති 03ක් ආරම්භ විය.

පැකේජය	ඇස්තමේන්තු වටිනාකම (රුපියල් මිලියන)
KL-01	1,912.46
KL-02	1,811.35
KL-03	1,817.75

ඒ අතුරින් KL-02 පැකේජයට අදාළ කොන්ත්‍රාත්තුව Olympus Construction (Pvt.) Ltd. සහ Rani Construction (Pvt.) Ltd. හවුල් ව්‍යාපාරයට 2016 අගෝස්තු 31වැනි දා ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කළේ 2016 සැප්තැම්බර් 29වැනි දාය.

කොන්ත්‍රාත්තුවට අදාළ මාර්ග සංඛ්‍යාව 19ක් වන අතර මුළු දිග ප්‍රමාණය කිලෝමීටර 89කි. එහි කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 1,811.35ක් පමණ වේ.

(ii) ඔව්.

KL-02 පැකේජය 2019 ජූලි 19වැනි දා කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය - poor performance - හේතුකොටගෙන කොන්ත්‍රාත්තුව

අවසන් කරන ලදී; contract was terminated. එසේ වුවද, මහජනතාවට සිදුවන අපහසුතා සැලකිල්ලට ගනිමින් මාර්ග සංවර්ධන අධිකාරිය - RDA - KL-02 පැකේජයේ ඉතිරි කටයුතු නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් - rebidding - මඟින් සම්පූර්ණ කිරීමට තීරණය කළේය. KL-02 පැකේජය නැවත ප්‍රසම්පාදන නාම යෝජනා කැඳවීමේ කටයුතු ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලිය - NCB - යටතේ සිදු කරන ලදී.

නමුත්, ප්‍රසම්පාදන ආරාධනය - bid invitation - කළ වහාම, කොන්ත්‍රාත්කරු වාණිජ මහාධිකරණය වෙත පැමිණිලි කර, KL-02 ගිවිසුමේ ඉතිරි වැඩකටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය - RDA - විසින් අවසන් කිරීම වැළැක්වීමට නියෝගයක් ඉල්ලීය. ඒ අනුව වාණිජ මහාධිකරණය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත injunction නියෝගයක් නිකුත් කර, KL-02 ගිවිසුමේ ඉතිරි වැඩකටයුතු නැවත ප්‍රසම්පාදනය කිරීම - rebidding - වැළැක්වීය.

එයට අදාළ නඩු කටයුත්ත HC Civil 193/2020 MR දරන අංක යටතේ වාණිජ මහාධිකරණයේ - Commercial High Court එකේ - විභාග වූ අතර, නඩු තීන්දුව 2024 දෙසැම්බර් 18 දින ලබා දුනි. ඒ, අවුරුදු 5කට පසුව. නඩුව නිෂ්ප්‍රභ විය. නමුත්, ව්‍යාපෘතියේ වැඩකටයුතු 2024.09.30 දිනෙන් අවසන් වූ අතර, එය මූල්‍යමය වශයෙන් 2024.12.31 දින අවසන් වූ නිසා මෙම මාර්ගවල සංවර්ධන කටයුතු අවසන් කිරීමට නොහැකි වූ බව කාරුණිකව දන්වමි.

(iii) ඔව්, ජනතාව පීඩාවට පත්වී තිබෙන බව දන්නවා.

KL-02 පැකේජයට අදාළව ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කිරීමට නියමිතව තිබූ මුළු කිලෝමීටර 88.44ක් වූ ප්‍රමාණයෙන් සංවර්ධනය කර ඇත්තේ කිලෝමීටර 34.63ක් පමණක් බවත්, ඉතිරි කිලෝමීටර 53.81ක ප්‍රමාණය සංවර්ධනය කිරීම නොකළ බවත්, එබැවින් මෙම ප්‍රදේශයේ ජනතාව පීඩාවට පත්වී ඇති බවත් දනිමි.

(ආ) (i) මතුගම මැතිවරණ බලප්‍රදේශයට අයත් මාර්ග 6ක් සහ අගලවත්ත මැතිවරණ බලප්‍රදේශයට අයත් මාර්ග 3ක් KL-02 පැකේජය යටතේ සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි. KL-02 පැකේජයේ මාර්ග ලැයිස්තුව ඇමුණුමක් වශයෙන් ඉදිරිපත් කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඇමුණුම **සභාගත*** කරමි.

(ii) Olympus Construction (Pvt.) Ltd. සහ Rani Construction (Pvt.) Ltd. (India) හවුල් ව්‍යාපාරය.

(iii)

- දයා කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
- රානි ඉන්ෆ්‍රාස්ට්‍රක්චර් ඩිවලොප්මන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ්
- එවකට සිටි කොන්ත්‍රාත් ගිවිසුමේ බලයලත් නියෝජිතයා වූයේ ජී.එස්. ජයරත්න මහතා (කළමනාකරණ අධ්‍යක්ෂ)
- දෙවනුව දයා කන්ස්ට්‍රක්ෂන් වෙනුවෙන් එහි බලයලත් නියෝජිතයා ලෙස නම් කර ඇත්තේ චමින්ද්‍ර ගමගේ මහතාය.

(iv) නඩුව (නඩු අංක HC Civil 193/2020 MR - වාණිජ මහාධිකරණය) 2024.12.18 දින නිෂ්ප්‍රභ විය.

(v) නඩුව නිෂ්ප්‍රභ වීමෙන් පසු කොන්ත්‍රාත්කරුගේ කාර්ය සාධන බැඳුම්කරය - Performance Bond එක - සඳහා ලබා ගත් සම්පූර්ණ මුදල භාණ්ඩාගාර තැන්පතු ගිණුමට ප්‍රේෂණයකොට ඇති අතර - භාණ්ඩාගාරයට දීලා තිබෙනවා - එම මුදල් නැවත KL-02 පැකේජය යටතේ යෝජනා වී තිබූ මතුගම සහ අගලවත්ත මැතිවරණ බලප්‍රදේශවලට අදාළ මාර්ග නවයෙහි ඉතිරි සංවර්ධන කටයුතු සඳහා දේශීය අරමුදල් ලෙස යොදා ගැනීමට යෝජිතය.

(ඇ) අදාළ නොවේ.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට යොමු කරන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ කාරණය මූලික කරගෙන මගේ අතුරු ප්‍රශ්නය යොමු කරන්නම්. අගලවත්ත සහ මතුගම ආසනවල -විශේෂයෙන්ම අගලවත්ත ආසනය තුළ- ග්‍රාමීය මාර්ග පද්ධතිය දැඩි දුෂ්කරතාවක පවතිනවා.

අගලවත්ත ආසනයේ විතරක් නොවෙයි, මේ මොහොත රටේම ග්‍රාමීය මාර්ග පද්ධතිය විශාල ගැටලුකාරී තත්ත්වයන්ට ලක් වුණු මොහොතක්. ඒ නිසාම ග්‍රාමීයව ජීවත් වන ජනතාවගේ අධ්‍යාපනය, සෞඛ්‍ය, ආර්ථිකය, සමාජ රැකවරණය කියන සියලු කටයුතුවලට ග්‍රාමීය මාර්ගවල තිබෙන දුෂ්කරතාව බලපෑම් කරලා තිබෙනවා. ඒ නිසා ග්‍රාමීය මාර්ග සංවර්ධනය කෙරෙහි මේ අය වැයෙන් වැඩි අවස්ථාවක් යොමු කර තිබෙනවාද කියන එක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපේ අය වැයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනයට විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ වන විවාදයේදී ඒ සම්බන්ධයෙන් ඔබතුමාව දැනුවත් කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. නමුත් ඔබතුමාට අපි කියන්න කැමැතියි, මෙම නිශ්චිත මාර්ග ඉදිකිරීම් සම්බන්ධ ප්‍රශ්නයට අදාළව ගත්තොත්, මාර්ග සංවර්ධන කටයුතු නතර කරන්නේ 2019 ජූලි 19වැනි දා මෙම කොන්ත්‍රාත්කරුවන්ගේ - Olympus Construction (Pvt.) Ltd. in joint venture with Rani Construction (Pvt.) Ltd. (India) - දුර්වල කාර්ය සාධනය නිසා බව. ගරු කථානායකතුමනි, ඉන් පසුව එම ඉදිකිරීම් කටයුතු ජනතාව වෙනුවෙන් සිදු කරන්න RDA එක උත්සාහ කරලා තිබෙනවා. නමුත්, එවකට හිටපු අමාත්‍යවරයා වන මංගල සමරවීර මැතිතුමා විසින් 2019 වර්ෂයේම අගෝස්තු 08වැනි දා කැබිනට් පත්‍රිකාවක් දමලා තිබෙනවා. ඒ කැබිනට් පත්‍රිකාවේ decision එක තමයි, "...to award the balance works of the underperforming contracts for the same contractors for a workable rate updated based on highways schedule rates of 2019 through the finding arrangements of local banks." ගරු කථානායකතුමනි, කොන්ත්‍රාත්කරුවා ඒක කළේ නැති නිසා, ඔහුගේ poor performance මත, ජූලි 19වැනි දා ඒක නතර කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

හැබැයි, අගෝස්තු 08වැනි දා - මාසයක් යන්න කලින් - කැබිනට් මණ්ඩලය තීන්දු කරනවා, නැවත ඔහුටම local banksවල ණය මත මේ ව්‍යාපෘතිය දෙන්න කියලා. මේ, Daya Constructions (Pvt.) Ltd. අපි කවුරුත් දන්නවා, මේ මොන දයාද කියලා. කිසිම දයාවක් නැති දයා කෙනෙක්. ගරු කථානායකතුමනි, ඔහු ඒ පිළිබඳව නඩුවකුත් දමනවා. ඒ නඩුව දැමීම නිසා අවුරුදු 5ක් මේ කටයුතු ප්‍රමාද වෙනවා. ඒ නිසා තමයි ජනතාව මේ පීඩාවට පත් වෙලා තිබෙන්නේ.

අපට කරන්න පුළුවන් දේ මේකයි. ඔබතුමන්ලාට දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යෝජනාවක් ලෙස මේක ගේන්න පුළුවන් නම් හොඳයි. රජය සතුව performance bond එකේ රුපියල් මිලියන 400ක් තිබෙනවා. අපි ඒ ගැන rough calculation එකක් කළා. මේ කිලෝමීටර ප්‍රමාණය සාමාන්‍යයෙන් රුපියල් මිලියන 390ක් වාගේ මුදලකින් හදන්න පුළුවන්. ඒ අනුව එම රුපියල් මිලියන 400 ලබාගෙන මේ පාරවල් ටික හදන්න අපි උත්සාහ කරනවා. එයට DDC එකේ උදවු අරගෙන දෙන්න කියන ඉල්ලීමත් අපි කරන්න කැමැතියි.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කිව්ව ආකාරයටම මේ අයි-රෝඩ් ව්‍යාපෘතිය නිසා අද වනවිටත් ඒ මාර්ග දැඩි අර්බුදකාරී තත්ත්වයක තිබෙන්නේ. මේ නඩු කටයුත්ත නිසා වසර ගණනාවක්ම ඒ පාරවල්වල නඩත්තු කටයුත්තක් හෝ සිදු කර ගන්න බැරි වෙලා තිබෙනවා. අඩුම වශයෙන් ප්‍රාදේශීය සභා වැනි ආයතනවල උපකරණ භාවිත කරලා හෝ මේවායේ අවම නඩත්තු කටයුත්තක්වත් සිදු කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ සමහර පාරවල්වල දැනටත් බස් රථ පවා ධාවනය වෙනවා. ඒ නිසා යම් මොහොතක මේ හරහා අනතුරක් සිදුවීමේ අවස්ථා වැඩියි. එම නිසා මේ ක්‍රියාවලිය සිදු වෙනකම් තාවකාලික විසඳුමක් හෝ ලබා දෙන්න හැකියාවක් තිබෙනවාද? තාවකාලික විසඳුමකට එහා ගිහින් නිශ්චිත වශයෙන් මේ සංවර්ධන ව්‍යාපෘතිය කරද්දී ප්‍රමුඛතා පදනම් කරගෙන එය කළ හැකිද කියාත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු මන්ත්‍රීතුමනි, අපට මේ සඳහා යෝජනා තුනක් තිබෙනවා. එක යෝජනාවක් තමයි, ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කයේත් උදවු ඇතිව කැබිනට් මණ්ඩලයෙන් ඒ මිලියන 400 නැවත ලබා ගෙන ඒ පාරවල් ඉදිකිරීම. දෙවැනි යෝජනාව තමයි, මෙවැනි දුර්වල ලෙස කටයුතු කරන කොන්ත්‍රාත්කරුවන්ට අදාළව නීතිය ක්‍රියාත්මක කරන්න ආයතන තිබෙනවා, ඒවාට යොමු කිරීම. තුන්වැනි එක තමයි, අප මේක COPE එකට යොමු කරනවා, ගරු කථානායකතුමනි, ඔබතුමා මාර්ගයෙන්. මොකද, පැහැදිලිව එහි වංචාවක් තිබෙනවා. කැබිනට් මණ්ඩලය ඇතුළේ කොන්ත්‍රාත්කරුවෝ ඉඳගෙන, යහ පාලන කාලයේ තහනම් කරපු ව්‍යාපෘති කොහොමද කැබිනට් මණ්ඩලයෙන් නැවත අනුමත කළේ කියන එක පිළිබඳව සොයා බලන්න එය COPE එකට යොමු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -433/2025- (1), ගරු දිනිඳු සමන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් : ඇල්පිටිය ප්‍රා.ලේ. කොට්ඨාසය

காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள்: எல்பிட்டிய பிரதேச செயலாளர் பிரிவு

LANDS OWNED BY LAND REFORM COMMISSION: ELPITIYA DS DIVISION

438/2025

4. ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරී වසම අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් අතරින් දෙවන පාර්ශ්ව වෙත ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම ඉඩම් ලබා දී ඇති දෙවන පාර්ශ්වයේ නම, එම එක් එක් පාර්ශ්වයට ඉඩම් ලබාදී ඇති ග්‍රාම නිලධාරී වසම සහ ඉඩම් ලබා දී ඇති පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எல்பிட்டிய பிரதேச செயலாளர் பிரிவிலுள்ள காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளின் அளவு ஏக்கர்களில் எவ்வளவென்பதையும்;

(ii) அந்த அளவு ஒவ்வொரு கிராம உத்தியோகத்தர் பிரிவு வாரியாக ஏக்கர்களில் வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) அக்காணிகளில் இரண்டாம் தரப்புகளுக்கு வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு ஏக்கர்களில் எவ்வளவென்பதையும்;

(iv) மேற்படி காணிகள் வழங்கப்பட்டுள்ள இரண்டாம் தரப்பினரின் பெயர், அந்த ஒவ்வொரு தரப்புக்கும் காணிகள் வழங்கப் பட்டுள்ள கிராம உத்தியோகத்தர் பிரிவு மற்றும் காணிகள் வழங்கப்பட்டதன் அடிப்படை வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) extent of land owned by the Land Reform Commission in the Elpitiya Divisional Secretary's Division in acres;

(ii) said extent in acres for each Grama Niladhari Division,separately;

(iii) extent of lands granted to a second party, out of the said lands in acres; and

(iv) names of the second party grantees of the said lands, the Grama Niladhari Division from which the lands have been given, and the basis of granting lands to each party, separately?

(b) If not, why?

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ගොඩ ඉඩම් - අක්කර 4099යි, රූඩ් 1යි, පර්චස් 21.50යි.

කුඹුරු ඉඩම් - අක්කර 35යි, රූඩ් 3යි, පර්චස් 12යි.

(ii) ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 01)

මේ සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් තිබෙනවා. අනු අංක යටතේ තොරතුරු සඳහන් කර තිබෙනවා.

(iii) නීතිමය බැඳීම් සඳහා (2016 සිට 2024 දක්වා) - අක්කර 15ක් වෙන් කර තිබෙනවා.

ව්‍යාපෘති සඳහා (ඇමුණුම් 03හි සඳහන් වර්ෂයන්හි දී) - අක්කර 10යි, රූඩ් 1යි, පර්චස් 32ක් වෙන් කරලා තිබෙනවා.

නිවාස අරමුණුවලට විකිණීම සඳහා (2016-2024 කාලය ඇතුළත) - අක්කර 47යි, පර්චස් 35යි.

ඔක්කොම අක්කර 72යි, රූඩ් 2යි, පර්චස් 27ක් වෙන් කරලා තිබෙනවා. මේ විස්තර ඇමුණුම් අංක 03හි සඳහන් වෙලා තිබෙනවා.

(iv) ලේඛන අමුණා ඇත. (ඇමුණුම් 02, 03 හා 04) අනු අංක යටතේ ඒ විස්තර සඳහන් කර තිබෙනවා.

ඇමුණුම් 01,02,03 සහ 04 **සභාගත*** කරනවා.

(ආ) අදාළ නොවේ.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒරමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ඒ ඉඩම යම් පුද්ගලයෙකුට ලබා දීලා තිබෙනවාද, එම ඉඩම ලබා දීලා තිබෙනවා නම් මොන පදනමකින්ද ලබා දීලා තිබෙන්නේ? මොකද, එය LRC ඉඩමක්. මගේ අවබෝධයේ හැටියට එය අක්කර 7ක, 8ක විතර විශාල ඉඩමක්. මේ වනකොට එම ඉඩම කැබලි කරලා රුපියල් 125,000ට, 100,000ට, රුපියල් 75,000ට විකුණනවා. ගරු කථානායකතුමනි, අපි දන්නවා මේ සමහර ගෙවල්වල පවුල් තුන හතර එකට ජීවත් වෙන බව. හැබැයි එම ඉඩම කැබලි කරලා විකුණනවා ලක්ෂ ගණන්වලට. එම ඉඩම ලබා දීලා තිබෙනවාද? ලබා දීලා තිබෙනවා නම් ඒ කාටද, මොන පදනමකින්ද දීලා තිබෙන්නේ කියලා අපි දැනගන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ඒරමුල්ල කියන ග්‍රාම නිලධාරී වසමේ අක්කර 10ක් ලබා දීලා තිබෙනවා, දුර්ගාදේවි අබේරත්න මිය යන අයට. ඒ ගැන කොමිෂන් සභාවෙන් විමසීම් කළාම ඒක ලබා දීලා තිබෙන්නේ ඔවුන්ගේ පවුල තුළ පැවරෙන විකල්ප කියන පදනම යටතේ. ඒ කියන්නේ, ඔවුන්ගෙන් ඉඩම් පවරාගෙන නැවත ඔවුන්ගේ අවශ්‍යතා සඳහා නීතිමය විධියට අක්කර 10ක් නිදහස් කරලා තිබෙනවා.

එතකොට ඒ අක්කර 10 ඔවුන්ට නීත්‍යානුකූලව අයිතියි. ඒක බෙදා වෙන් කරනවාද කියන එක ඔවුන් සතු දෙයක්. ඒ නිසා කොමිෂන් සභාව පැත්තෙන් කිව්වේ, ඔවුන්ට අවශ්‍ය විධියට කටයුතු කර ගන්න නීතිමය අයිතියක් ඔවුන්ට තිබෙන බවයි.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගොළුවාමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ඉඩම් රජයේ අවශ්‍යතාවකට ලබා දීලා තිබෙනවා ද, එසේ ලබා දීලා තිබෙනවා නම් ඒ කුමකට ද? මගේ අවබෝධයේ හැටියට, එතැන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට - LRC එකට - අයිති ඉඩම් අක්කර 75ක වාගේ ප්‍රමාණයක් තිබෙනවා. ඒවායෙන් අක්කර 64ක වාගේ ප්‍රමාණයක් රජයේ අවශ්‍යතාවට - කර්මාන්ත සඳහා - දීලා තිබෙනවා. ක්‍රීඩා පිටියකට අක්කර භාගයක් දීලා තිබෙනවා. අක්කර 10කට ආසන්න භූමි ප්‍රමාණයක දැන් කුරුඳු වගා කරනවා. ඒක කරන්නේ කවුද, මොනවාද කරන්නේ කියන එක සම්බන්ධව දැනගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මිරිස්වත්ත ඉඩම වුණත් කොයි කාලයේ දීලා තිබෙනවා ද දන්නේ නැහැ. හැබැයි, මේ වනකොට ඒවා කැබැලි කරලා විකුණනවා.

ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඒ කියන ප්‍රදේශයේ ඒ ග්‍රාම නිලධාරී වසමට අදාළව ඔය කියන කර්මාන්තපුරය ආශ්‍රිත ප්‍රශ්නය නිශ්චිතව ඇහුවා නම්, නිශ්චිතව උත්තරය ගන්න පුළුවන්. නමුත් කොමිෂන් සභාව පැත්තෙන් තොරතුරු වාර්තා කළේ, කර්මාන්තපුරයක් සඳහා අක්කර 60ක් ලබා දීලා තිබෙනවා, ඒකට යාබදව අක්කර 10ක ප්‍රමාණයක් තිබෙනවා, ඒ අක්කර 10න් අක්කර 5ක් නැවත -අර මම ඉස්සර වෙලා කියපු විධියට- නීත්‍යානුකූලවම ඒ පවුල් වෙත මුදා හැර -නිදහස් කරලා- තිබෙනවා, ඒ නිසා එහි වගා කටයුතු කරන්න ඔවුන්ට බැඳීමක්, හිමිකමක් තිබෙනවා කියලායි. ඒ අර්ථයෙන් තමයි එහි වගා කටයුතු කරන්නේ. එහි සම්පූර්ණ විස්තර අවශ්‍ය නම් නැවත කොමිෂන් සභාවෙන් විමසා කරුණු ඉදිරිපත් කරන්න මට පුළුවන්. දැනට ලබා දිය හැකි පිළිතුර තමයි මේක.

ගරු කථානායකතුමනි, ඒත් එක්කම මම ස්තුතිවන්ත වෙනවා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ - LRC එකේ - ඉඩම් පිළිබඳව ප්‍රශ්න නැඟීම සම්බන්ධයෙන්. ඒක විශාල ආන්දෝලනයකට සහ සාකච්ඡාවට ලක් වෙච්ච විෂයයක්; ආයතනයක්. ඊට අදාළ විමර්ශන කටයුතු සහ අනික් කටයුතු පවත්වා ගෙන යෑම සඳහා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න ඉදිරිපත් කිරීම

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

ඉතා වැදගත්. ඒ නිසා LRC එකේ Chairman මට විශේෂයෙන්ම කිව්වා, මේ ප්‍රශ්න ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙන්න කියලා. එය ඔවුන්ට ඔවුන්ගේ කටයුතු පහසු කිරීමක් වන බව කිව්වා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන වටය.

බදුල්ල, මීගහකිවුල බස් නැවතුම්පොළ: ප්‍රයෝජනයට නොගැනීම

පතුළෑ, මීකහකිවුල පස් තරිප්පිටම්: පයන්පටුත්තප්පටාමෛ
MEEGAHAKIULA BUS STATION IN BADULLA: NON-UTILIZATION

433/2025

3. ගරු මනෝජ් රාජපක්ෂ මහතා (ගරු දිනිඳු සමන් මහතා වෙනුවට)
(මාණ්පුමිකු මනෝජ් රාජපක්ෂ - මාණ්පුමිකු තිනින්දු සමන් සාර්පාක)
(The Hon. Manoj Rajapaksha on behalf of the Hon. Dinindu Saman)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බදුල්ල, මීගහකිවුල නව නගරය ඉදිකිරීමට සමගාමීව මීගහකිවුල බස් නැවතුම්පොළ ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) මේ දක්වා එම බස් නැවතුම්පොළ භාවිතයට ගෙන නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඉහත බස් නැවතුම්පොළ ජනතාවගේ භාවිතය සඳහා ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම බස් නැවතුම්පොළ සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉහත බස් නැවතුම්පොළ ප්‍රයෝජනවත් නොවන ඉදිකිරීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට වග කිව යුතු පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීම පිණිස පළාත් පාලන ආයතනවලට කරනු ලබන මග පෙන්වීම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිරුවාහ, මාකාණ සපෙකළ් මත්‍රුම් උළ්ලූරාට්චි අමෛච්චරෙක් කේට්ට වීනා:

(අ) (i) පතුළෑ, මීකහකිවුල පුතිය නකර නිර්මාණත්තුක්කු ඉණෛයාක මීකහකිවුල පස් තරිප්පිටත්තෛ අමෛප්පතර්කාකච් චෙලවිටප්පට්ට තොකෛ යාතු;

(ii) ඉතුවරෛ මේර්පටි පස් තරිප්පිටම් පයන් පාට්ටුක්කු උට්පටුත්තප්පටවිල්ලෛ එන්පතෛ අරිවාරා;

(iii) අව්වාරායින්, අතර්කාන කාරණංකළ් යාවෛ;

(iv) මේර්පටි පස් තරිප්පිටත්තෛ මක්කළින් පාවනෛක්කාක වළංකුවතර්කු මේර්කොළ්ළප් පටුම් නටවටික්කෛකළ් යාවෛ;

(v) මේර්පටි පස් තරිප්පිටත්තුක්කාන නුළෛවුප් පාතෛයෛ නිර්මාණික්ක එටුක්කප්පටවුළ්ළ නටවටික්කෛකළ් යාවෛ;

එන්පතෛ අවර් තෙරිවිප්පාරා?

(ஆ) (i) මේර්පටි පස් තරිප්පිටම් පයනර්ර ඔරු නිර්මාණම් එන්පතෛ ඒර්රුක්කොළ්වාරා?

(ii) අව්වාරායින්, අතර්කුප් පොරුප්පුක්කූර වේණ්ටිය නපර්කළුක්කු එතිරාක මේර්කොළ්ළප් පටුම් නටවටික්කෛකළ් යාවෛ;

(iii) එතිර්කාලත්තිල් ඉත්තකෛය නිලෛමෛකළ් ඒර්පටාමලිරුක්ක උළ්ලූරාට්චි නිරුවනඞ් කළුක්කු වළංකුම් වළිකාට්ටල්කළ් යාවෛ;

එන්පතෛ අවර් මේලුම් තෙරිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he state -
(i) the amount spent on the construction of the Meegahakiula Bus Station concurrent with the construction of the Meegahakiula New Town in Badulla;
(ii) whether he is aware that the said bus station has not been used up to now;
(iii) if so, the reasons for that;
(iv) the steps that will be taken to make the said bus station available for public use; and
(v) the measures that have been taken to construct the access road to the said bus station?

(b) Will he also state -
(i) whether he accepts that the said bus station is an unproductive construction;
(ii) if so, the actions that will be taken against those responsible; and
(iii) the guidelines that will be provided to local government institutions to prevent such situations in the future?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (පේරාසිරියර්) ඒ.එච්.එම්.එච්. අපයරත්න - පොදු නිරුවාහ, මාකාණ සපෙකළ් මත්‍රුම් උළ්ලූරාට්චි අමෛච්චර්)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රුපියල් 17,870,884.60යි.

(ii) ඔව්.

(iii) බස් නැවතුම්පොළ සඳහා එක් ප්‍රවේශ මාර්ගයක් පවතින අතර, බස් රථ පැමිණීම හා පිටවීම සඳහා එම ප්‍රවේශ මාර්ගය ප්‍රමාණවත් නොවන බැවින් බස් නැවතුම්පොළ භාවිතයට ගැනීම සඳහා තවත් ප්‍රවේශ මාර්ගයක් ලබාගත යුතුව ඇත. එම අමතර ප්‍රවේශ මාර්ගය ලබා ගැනීමේ ගැටලු හේතුවෙන් බස් නැවතුම්පොළ මේ දක්වා භාවිතයට ගැනීමට නොහැකි වී ඇත.

(iv) මීගහකිවුල රෝහල සිට බස් නැවතුම්පොළ දක්වා නව ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම පිණිස ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කිරීමට 2025.01.30 දින අදාළ පාර්ශ්ව සමඟ පැවැති සාකච්ඡාවකදී තීරණය කර ඇත. එතෙක් මෙම බස් නැවතුම්පොළට ප්‍රවේශ වීමට යොදා ගත හැකි විකල්ප ක්‍රමවේද සම්බන්ධව අවධානය යොමු කිරීමට තීරණය කර ඇත.

(v) ප්‍රවේශ මාර්ගය ඉදි කිරීමට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

(ආ) (i) නැත. අමතර ප්‍රවේශ මාර්ගය ලබා ගැනීමෙන් පසු මෙම බස් නැවතුම්පොළ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි වේ.

(ii) අදාළ නොවේ.

(iii) සෑම සංචර්ධන ව්‍යාපාරයක්ම ආරම්භ කිරීමට ප්‍රථම ඊට ආළ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඒ ප්‍රතිඵල අනුව නිවැරදි සැලැස්මක් සහිතව කටයුතු කළ යුතු බවට පළාත් පාලන ආයතන වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු බිමල් රත්නායක මැතිතුමා.

දුම්රියේ ගැටීමෙන් සිදුවන වනඅලි මරණ වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග: ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

புகையிரதம் மோதி யானைகள் இறப்பதைத் தடுப்பதற்கான நடவடிக்கை: போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரினது கூற்று

MEASURES TO PREVENT ELEPHANT DEATHS DUE TO COLLISIONS WITH TRAINS: STATEMENT BY MINISTER OF TRANSPORT, HIGHWAYS, PORTS AND CIVIL AVIATION

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පසුගිය 20වන දා අලුයම "මීනගයා" දුම්රියේ ගැටී වන අලි හත්දෙනෙකු මිය යෑම සම්බන්ධව ඊයේ දිනයේදී සභාව කල් තැබීමේ යෝජනාව අවස්ථාවේදී මෙන්ම විවිධ අවස්ථාවලදී පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් ඉතා සංවේදී නමුත් වැදගත් කතිකාවක් ගොඩනැඟී තිබුණා.

අප ආණ්ඩුව බලයට පත්වීමට පෙර සිටම මෙලෙස අලි සමූහ වශයෙන් දුම්රියේ ගැටීම අප රට තුළ පැවැති බේදවාචකයක්. කෙසේ වුවත්, දුම්රිය දෙපාර්තමේන්තුව රටේ ආර්ථිකයට සහ ජනතාවගේ එදිනෙදා ජීවිතයට අතිශයින් වැදගත් දෙපාර්තමේන්තුවක්. එමෙන්ම අලි සම්පත ද දුම්රිය සේවය මෙන්ම අප රටට ඉතා වැදගත් ස්වාභාවික සම්පතක්. මෙලෙස වනඅලි දුම්රියේ ගැටීම පිළිබඳ ගැටලුවට ස්ථිරසාර විසඳුමක් ලබා දීමට අපොහොසත් වීම පිළිබඳව වසර 160ක් පැරණි දුම්රිය විෂයය භාර, එම වගකීම දරන අමාත්‍යාංශයේ අය ලෙස මෙම අවස්ථාවේදී අපි කනගාටු වෙනවා. එමෙන්ම එය ප්‍රමුඛ කාර්යයක් බවට පත්කොට ගෙන මෙම බේදනීය ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දීම අමාත්‍යාංශය වශයෙන් අපේ අරමුණයි.

ගරු කථානායකතුමනි, පසුගිය වසර 10 තුළ වනඅලි සැලකිය යුතු ප්‍රමාණයක් දුම්රියේ හැපිලා මිය ගිහින් තිබෙනවා. ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට පහසු වීම සඳහා 2013-2025 දක්වා දුම්රියේ ගැටීමෙන් මිය ගිය අලින් සංඛ්‍යාව පිළිබඳ දත්ත ඇතුළත් වාර්තාවක් මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුව පැත්තෙන් ගත්තොත්, මේ පිළිබඳව ගත හැකි විසඳුම් පිළිබඳ සාකච්ඡා තුනක් මෙම සිද්ධියට පෙර අපි පවත්වා තිබෙනවා. පළමුවන සාකච්ඡාව දෙසැම්බර් මස 9වැනි දා අප විසින් සිදු කළා. දුම්රිය මාර්ගය හරහා යන වනඅලින් දුම්රියේ ගැටෙන ප්‍රදේශ හඳුනාගෙන ඒ ආශ්‍රිත ගම්වාසීන් සමඟ කමිටුවක් ස්ථාපිත කිරීමට යෝජනා කළා. එම තොරතුරු නොලැබීම නිසා දෙසැම්බර් මස 30වැනි දා නැවත වතාවක් එම ගම්මානවල විස්තර ලබා ගැනීමට අපි දුම්රිය සේවය දැනුවත් කළා. නැවත වතාවක් ජනවාරි මස 03වැනි දාත් එම තොරතුරු ලබා ගැනීමට අපි දුම්රිය සේවය දැනුවත් කළා.

ගරු කථානායකතුමනි, වනඅලින් දුම්රියේ ගැටීම පිළිබඳ ප්‍රශ්නය විසඳීම සඳහා හුදු තාක්ෂණික පියවර පමණක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියන කාරණය අපේ රටේ මේ පිළිබඳව විශාල අත්දැකීම් තිබෙන දුම්රිය දෙපාර්තමේන්තුවත් දන්නවා; පරිසර අමාත්‍යාංශයත් දන්නවා; ස්වාධීන පරිසරවේදීනුත් දන්නවා. අලින් රේල් පාර කිට්ටුව ඉන්න වෙලාවලදී ජනතාව සම්බන්ධ කරගෙන, ගම්මු සම්බන්ධ කරගෙන ළඟම තිබෙන railway station එක දැනුවත් කරන්න කියලා මා ඊයේ යෝජනා කළාම, social mediaවල posts දමලා තිබෙනවා මම දැක්කා, එහෙම කරන්න පුළුවන්ද යනාදි වශයෙන් සඳහන් කරමින්. අපි කවුරුත් අලින්ට ආදරෙයි. නමුත් අපි අලින් ගැන දන්නේ නැහැ. ඒ නිසා අපි මේ සම්බන්ධ විවිධ සංවිධාන පසුගිය දා පාර්ලිමේන්තුවට කැඳෙව්වා, ගරු පරිසර ඇමතිතුමාත් සමඟ. මේ පිළිබඳ අත්හදා බැලීම් කරලා තිබෙනවා, වසර 10කට, 15කට පෙර සිට. මේ Holistic Community Development Project එක අපි කරපු එකක් නොවෙයි, සියඹලන්ගමුවේ කරපු එකක්. ඉරෝෂ් පෙරේරා කියලා මහත්මයෙක් තමයි එය කරලා තිබෙන්නේ. එම ව්‍යාපෘතිය සාර්ථක වීම පිළිබඳ වාර්තාව මා ළඟ තිබෙනවා. මා එම වාර්තාව **සභාගත*** කරනවා.

ඒ වාගේම "ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ගයන්හි වනඅලි ගැටීම වැළැක්වීමේ වැඩසටහන" කියලා ආචාර්ය ෂෆීවිරාජ් ප්‍රනාන්දු මහත්මයා ඇතුළු කණ්ඩායම ඉදිරිපත් කළ වාර්තාවක් තිබෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

මේ හැම එකේම මහජන සහභාගිත්වය ගැන සඳහන්ව තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ පිළිබඳව තිබෙන තාක්ෂණික සහ අනෙකුත් ක්‍රියාමාර්ග ඇතුළේ මහජන සහභාගිත්වය යොදා ගන්න අපි උත්සාහ කළා. ඒ ගැන නොදැන ඒක හැල්ලු කිරීම සුදුසු නැහැ කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, මෙම වාර්තා පසු ගිය පෙබරවාරි මාසයේ 6වැනි දා අපට ලැබුණාට පසු අප හදුනා ගත්තා, ලංකාවේ වනඅලින් දුම්රියවල ගැටෙන තැන් ගණනාවක් තිබෙන බව. ඒවා හඳුනාගෙන තිබෙනවා. ඒවායින් ඉතාම විශේෂ ස්ථානයක් වන්නේ මෑතකදී අලින් දුම්රියේ ගැටුණු පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මායිමේ තිබෙන ගල්ඔය හන්දිය කියන ස්ථානය.

ඒකට අනුව ගත්තොත්, පසුගිය වසර 5 තුළ වැඩිම වනඅලි සංඛ්‍යාවක් දුම්රියේ ගැටී මිය ගිය සිද්ධි වාර්තා වී ඇති ප්‍රදේශය ලෙස මඩකලපුව මාර්ගයේ 133 සැතපුම් කණුව ආසන්නයේ ඇති තලපතකන්ද ප්‍රදේශය හඳුනා ගෙන තිබෙනවා. තවද, 2009 වර්ෂයේ ජනවාරි සිට 2024 වර්ෂයේ දෙසැම්බර් දක්වා කාලය තුළ වනඅලි ගැටීම් වාර්තා වෙලා තිබෙනවා. මේ සම්බන්ධ සියලු තොරතුරු දුම්රිය දෙපාර්තමේන්තුව සහ පරිසර අමාත්‍යාංශය සතුවත් තිබෙනවා. අපි මේ පිළිබඳව ඉදිරිපත් කරන විසඳුම් ගැන ඊයේත් සාකච්ඡා කළ නිසා විශාල කාලයක් ගන්නේ නැතුව මගේ අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරන්නට කැමැතියි, අමාත්‍යාංශය පැත්තෙන්.

ගරු කථානායකතුමනි, අපි එම සිද්ධිය වුණු දවසේම සවස් වරුවේදී පරිසර අමාත්‍යාංශයත්, පරිසරවේදිනුත්, දුම්රිය දෙපාර්තමේන්තුවත්, ස්වාධීන පරිසරවේදිනුත්, විශේෂයෙන්ම දුම්රිය රියැදුරන්, ජ්‍යෙෂ්ඨ දුම්රිය රියැදුරන් ගෙන්වා මේ පිළිබඳව පුළුල් සාකච්ඡාවක් කරලා ක්ෂණික සහ දිගු කාලීන විසඳුම් ප්‍රමාණයක් හඳුනා ගත්තා. මම වෙලාව යන නිසා ඒ ගැන කියන්නේ නැහැ. වනඅලි දුම්රියේ හැපී මිය යෑමට අදාළ ප්‍රධාන හේතු 20ක් පමණ හඳුනා ගෙන තිබෙනවා. මම එම ලේඛනය **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, අපි කෙටි කාලීන සහ මැද කාලීන විසඳුම් ප්‍රමාණයක් යෝජනා කර තිබෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුව වසර 160ක් තිස්සේ දන්නා ඉතාම පැහැදිලි ක්‍රමය තමයි දුම්රිය මාර්ගය දෙපස යම් ප්‍රමාණයකට පරිස්සමින් කැලෑව එළි කරලා visibility එක වැඩි කරන එක. ඒකට නිශ්චිත සාක්ෂියක් තිබෙනවා. මන්නාරම් දුම්රිය මාර්ගයේ එහෙම කළාට පසු පසුගිය වසර කිහිපය තුළදී කිසිදු වනඅලි ගැටුමක් වෙලා නැහැ, දුම්රියත් එක්ක. ඒ නිසා quantum physicsවල solutions නොවෙයි, common senseවලින් ගන්න පුළුවන් සරල විසඳුම් තිබෙනවා. දුම්රිය පාර දෙපැත්තේ වන ආවරණය ඉවත් කර, පිරිසුදු කර තිබුණා නම්, දුම්රිය රියැදුරාට හොඳින් දුම්රිය මාර්ගය බලා ගන්න පුළුවන්. ඒක තමයි අංක 1ට යෝජනා කරන්නේ.

2වැනි එක තමයි දුම්රිය මාර්ගය ඔස්සේ දැනට ඉදිකර ඇති පාලම් හා බෝක්කු නිසි උසකින් හා පළලකින් යුතුව අලින්හට ගමන් කළ හැකි පරිදි ප්‍රතිෂ්ඨාපනය කිරීම.

3වැනි එක, මෙම කටයුත්තට ජනතාව සම්බන්ධ කර ගැනීම. අලි හැම වෙලාවේම එහේ මෙහේ යන්නේ නැහැ. ජනතාව දන්නවා, ගම් ආශ්‍රිතව අලි ඉන්නවා නම්. එතකොට ඔවුන්ට ඒ ගැන දැනුම් දෙන එක අමාරු දෙයක් නොවෙයි. ඒ නිසා ඒකත් - community participationත් - වැදගත්.

ගරු කථානායකතුමනි, මීනගයා දුම්රියේ හැපී වනඅලි මිය යෑමේ සිදුවීම ගැන කිව්වොත්, අලින් ඒ කෝච්චි පාර දිගේ මීටර් 450කට, 500කට ආසන්න දුර ප්‍රමාණයක් යනවා, වැවට යන්න. අපට කලින් කෝච්චියේ හඬ අලින්ට ඇහෙනවා. අධිධ්වනි සංඛ්‍යාතවලින් ඒ සතුන් ඇහුම්කන් දෙන්නේ. ඒ නිසා අපට කලින් ඒ සතුන්ට කෝච්චිය එන බව දැනෙනවා. එහෙම දැනුණත් ඒ සතුන්ට එතැනින් අයින් වෙන්න ඉඩක් නැහැ මොකද, එතැන කෝච්චි පාරේ ඉඩක් නැහැ. අපි කවුරුත් ඒ photos දැක්කා. ඒ බෙදනීය සිදුවීමට අදාළ photosවල තිබෙන විධියට අලින්ට කරන්න දෙයක් නැහැ කෝච්චිය එනකොට. මේ වෙලාවේ කවුඩුල්ල වනජීවී කාර්යාලයේදී සාකච්ඡාවක් පැවැත්වෙනවා. එම සාකච්ඡාවෙන් පසුව අපි බලාපොරොත්තු වෙනවා, පරිසර නියමවලට අනුව පරිස්සමින් ඒ ස්ථානය පුළුල් කරන්න. එතකොට අලින්ට පුළුවන්කම තිබෙනවා, දුම්රිය එන බව දැනුණාම පාරෙන් ඉවත් වෙන්න. ඒ වාගේම, sensors සවි කිරීම පිළිබඳවත් සාකච්ඡා කිරීමට කටයුතු යොදා ගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ආකාරයට අපි උපරිම උත්සාහයක් ගනිමින් ඉන්නවා, ඉතාම ඉක්මනින් මේ ක්‍රියාමාර්ග ගන්නත්, එහෙම කරලා වනඅලි මිය යන එක අවම කරගන්නත්. ඒ වාගේම ජනතාවගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් ඔවුන් දන්නා කියන වඩා හොඳ solutions තිබෙනවා නම් ඒවා අප වෙත ලබා දෙන්නත් කියලා.

බොහොම ස්තුතියි.

* ***සභාමේසය මත තබන ලද ලේඛනය:***
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:
Document tabled:

1. වංගුවලදී දුම්රිය මාර්ගයේ සිටින අලියා දර්ශනය නොවීම.
2. මාර්ගය අසල සිටින අලි දුම්රිය පැමිණෙන විටම වාගේ මාර්ගයට ඇතුළුවීම.
3. අලි දර්ශනය වූවත් දුම්රියේ බර සමඟ තිරිංග යෙදීමෙදී දුම්රිය නතරවීමට ගත වන දුර වැඩි වීම.
4. මාර්ගයේ දෙපස වැවී ඇති ලඳු කැලෑ, මානා, ඉලුක් වැනි යටි ආවරණ නිසා අලි දර්ශනය නොවීම.
5. ඇතැම් දුම්රියවල ඉදිරිපස ලාම්පුවල ආලෝකය වනගත කලාපය සඳහා ප්‍රමාණවත් නොවීම.
6. ඇතැම් දුම්රිය ධාවන වන පස වෙනස් කිරීමට නොහැකි වුවහොත් ඉදිරිපස පෙනීම අඩුවීම -Long Hood-, ඇතැම් දුම්රියවල ධාවන පස වෙනස් කිරීමට ගමනාන්ත දුම්රිය ස්ථානවල පහසුකම් නොමැති වීම.
7. මාර්ගයේ කඳු හා පල්ලම් නිසා එන්ජිමට අඩු වේග සීමාවල ධාවනය කිරීමට අපහසු වීම.
8. භූමියේ පිහිටි කඳු හා පල්ලම් කලාප තුළ ගැවසෙන වනඅලි නිසි ලෙස දර්ශනය නොවීම.
9. දුම්රිය මාර්ගයේ ඇති නිමින කලාප - cuttings - තුළ දුම්රියක් පැමිණෙන විට අලින්ට ඉවත්වීමට නොහැකි වීම.
10. මෝසම් සමයේ සවස් කාලයන්හි ඇති වෙන වර්ෂාව දුම්රිය මාර්ගයට ඇද හැළුණු විට දුම්රිය මාර්ගයේ උණුසුම නිසා ඇති වන මීදුමක් සමඟ මාර්ගය නිසියාකාරව දර්ශනය නොවීම.
11. සාමාන්‍ය දුම්රිය ධාවන වේලාවන් හුරු වූ අලි වෙනත් වේලාවන් තුළ මාර්ගයට පැමිණීම.
12. දුම්රියක් පැමිණෙන විට මාර්ගයේ සිටිනා පැටවුන් දුම්රියෙන් ආරක්ෂා කිරීමට අනෙක් වනඅලි මාර්ගයට පැමිණීම.
13. දුම්රිය මාර්ගයේ සිල්පර අතර හිස් ඇති තැන්වලින් වනඅලින්ට මාර්ගය හරහා යාම අපහසු වන බැවින් දුම්රියක් පැමිණෙන විට අලින්ට මාර්ගයෙන් ක්ෂණිකව ඉවත්වීමට නොහැකි වීම.
14. දුම්රිය මාර්ගය සාමාන්‍ය භූමියෙන් උස්ව පිහිටා ඇති ස්ථානවලදී අලියාට එයින් ඉක්මනින් බැස යාමේ අපහසුතාව.

---

* ***කථාව අවසානයේ පළ කර ඇත.***
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

15. වංගුවලදී දුම්රියේ ප්‍රධාන ලාම්පුව මාර්ගයෙන් ඉවත සිටින අලින්ට වැදුණු විට දුම්රිය ඔවුන් දෙසට පැමිණෙන්නේ යයි සිතා අලි මාර්ගය දෙසට පැමිණීම.

16. මාර්ගයේ පසෙක ඇති විදුලි හෝ වෙනයම් මිනිසුන් තැනූ බාධක වැට වැනි අවහිරතා නිසා මාර්ගයෙන් අලින්ට ඉවත්වීම අපහසු වීම.

17. ගම් වැදී හා හේන්වල සිටින වනඅලි, අලි වෙඩි හෝ වෙනත් ක්‍රමවලින් පලවා හැරීමෙදී දුම්රිය නොතකා මාර්ගයට පැමිණීම.

18. දුම්රියේ ශබ්දය හෝ එහි නළාවේ ශබ්දය අනුව එය තම ප්‍රදේශයට ඇතුළු වූ සතුරෙක් ලෙස සලකා පහර දීමට ඉදිරිපත් වීම.

19. වර්ෂා කාලය තුළ දුම්රිය මාර්ගයේ වැවෙන තණකොළ කෑම සඳහා මාර්ගයට ඇතුළු වීම හා මාර්ගය ඔස්සේ ගමන් කිරීම.

20. දුම්රිය මාර්ගයට මඟින් විසින් වීසි කරනු ලබන කසළ ආහාරයට ගැනීමට පැමිණීම.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමා, ඔබතුමා ලබා දුන් පිළිතුරට බොහොම ස්තුතියි. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී යෝජනාවක් කරනවා. ලෝකය තුළ වනඅලි සහ දුම්රිය අතර ගැටුම් සාර්ථකව - successfully - නිරාකරණය කරපු අවස්ථා රැසක් තිබෙනවා.

විශේෂයෙන්ම මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි මේ කාරණය වෙත. Indian Railways එක Wildlife Institute of India එක්ක එකතුව "Gajraj" කියලා alert system එකක් සාර්ථකව ක්‍රියාත්මක කරනවා. ඒකට thermal cameras and sensors භාවිත කරනවා. මම යෝජනා කරනවා ඔබතුමාගේ අවධානය එයට යොමු කරන්න කියලා. ඒ වාගේම Kavach system කියලාත් එකක් තිබෙනවා. මම හිතන විධියට, මේ පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කිරීම වැදගත්. ඇත්ත වශයෙන්ම හබරණ ප්‍රදේශයේ, අපේ රටේත් infrared sensors ක්‍රමෙයක් ක්‍රියාත්මක වෙනවා. ඒකේත් සාර්ථක අසාර්ථකභාවය ගැන සොයා බැලීම ඉතාම වැදගත්. මම දන්නේ නැහැ මේ යෝජනාව අපේ රටට සුදුසුද නැද්ද කියලා. හැබැයි, කෙන්යාව වාගේ රටවල යෝජනා වෙලා තිබෙනවා, elevated railway lines and underpasses. ඒකත් එක විසඳුමක්. හැබැයි ඉතින් ඒක අපේ රටේ ප්‍රශ්නයට විසඳුමක්ද නැද්ද කියලා හොයලා බලන්න ඕනෑ. ඒකට භූගෝලීය වටපිටාව, පරිසරය පිළිබඳව හොයා බලන්න ඕනෑ. ඒකත් එක විසඳුමක්. ඒ වාගේම ඉන්දියාවේ අසාම්වල තිබෙනවා, honeybee sound repellents. ඒ කියන්නේ, මී මැසි ගහනය වැඩි කිරීම තුළින් සහ මී මැස්සන්ගේ ශබ්දයෙන්, ඒ sound system එක හරහාත් මෙය පාලනය කරන ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේම ජපානය නිර්මාණය කරලා තිබෙනවා, LED lights and devices emitting the sounds of lion. එවැනි විසඳුම් රාශියක් තිබෙනවා. හැබැයි මම ඔබතුමාට යෝජනා කරනවා, මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා යම්කිසි ඒකාග්‍රතාවක් ඇති වෙන ඒකාබද්ධ වැඩසටහනකට යා යුතුයි කියලා. ඔබතුමාගේ අමාත්‍යාංශයත්, වනජීවී ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශත් හොඳ standard steering committee එකක් හරහා විද්වතුන්ගේ, විශේෂඥයන්ගේ, රාජ්‍ය නිලධාරීන්ගේ වාගේම දේශපාලන අධිකාරියේත් අදහස් ලබා ගත යුතුයි. Budget රැස්වීම් ක්‍රියාත්මක වෙන මේ කාල වකවානුව තුළ Committee Room එකක් වෙන් කරලා සුළු වේලාවක් ඇතුළතදී හරි මේ පිළිබඳව අපේ අදහස් ලබා ගන්නට ඔබතුමාට පුළුවන් නම්, මම හිතනවා, මේ ප්‍රශ්නයට යම්කිසි විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. මේ ප්‍රශ්නයට දේශපාලනයක් නැහැ. මේ ප්‍රශ්නයට විසඳුමක් තමයි අවශ්‍ය. අපිත් සූදානම්, මේ සඳහා අපේ අදහස් වඩාත් පුළුල්ව ලබා දෙන්න.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මැතිතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඊට පෙර මට අවස්ථාවක් දෙන්න. ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු අදහස් අපි අගය කරනවා. මේ ප්‍රශ්නයට එක එක විසඳුම් තිබෙනවා, එක එක රටවල, එක එක ස්ථානවලට අනුව. අපි ඇත්තටම ගත්තේ holistic approach එකක් තමයි.

ඒ නිසා අපි අමාත්‍යාංශය පමණක් නොවෙයි, තව ආයතන එකතු කර ගත්තා. ගරු කථානායකතුමනි, අපි මේ ගත්ත තීන්දු ඉස්සෙල්ලා ක්‍රියාත්මක කරන්න බලන්නම්. මොකද, ප්‍රශ්නයක් වුණාම සංවේදී වෙලා, දුම්රිය දෙපාර්තමේන්තුව මීට කලිනුත් මේවා කරලා තිබෙනවා. හැබැයි, ඒවා ඒ වෙලාවෙන් පස්සේ නතර වෙනවා. අපට තිබෙන ප්‍රශ්නය තමයි කොහොමද මේක new normal එකක් බවට පත් කරන්නේ කියන එක. ඒ නිසා මේ ක්‍රියාමාර්ග මාසයක් දෙකක් ඇතුළත implement වෙන්නේ කොහොමද කියලා බලලා, ගරු විපක්ෂ නායකතුමා කියන පුළුල් තත්ත්වයට යමු කියන එක තමයි අපේ අදහස.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, බලශක්ති අමාත්‍ය ගරු කුමාර ජයකොඩි මැතිතුමා.

මෑතකදී දිවයින පුරා සිදු වූ විදුලිය බිඳවැටීම: බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රකාශය
நாடளாவிய ரீதியில் அண்மையில் ஏற்பட்ட மின்தடை: வலுசக்தி அமைச்சரினது கூற்று
RECENT ISLANDWIDE POWER OUTAGE: STATEMENT BY MINISTER OF ENERGY

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, 2025.02.18වැනි දින ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. පානදුර ග්‍රිඩ් උප පොළෙහි කිලෝවෝල්ට් 33ක busbar එකක වූ හදිසි බිඳ වැටීමක් හේතුවෙන් පද්ධතියේ සංඛ්‍යාතය පහත වැටීම දිගින් දිගටම සිදු වෙමින් පැවතීම මත ලක්විජය, නව ලක්ෂපාන, පැරණි ලක්ෂපාන, පොල්පිටිය, වික්ටෝරියා සහ උමා ඔය විදුලි බලාගාර අව-සංඛ්‍යාත ආරක්ෂණය නිසා විසන්ධි විය.

[ගරු කුමාර ජයකොඩි මහතා]

2. සම්පූර්ණ බිඳ වැටීම අවසන් වූ වහාම පද්ධතිය නැවත ප්‍රතිස්ථාපනය කිරීම ආරම්භ කළ අතර, ප්‍රථම උත්සාහයේ දී බියගම, සපුගස්කන්ද සහ කැලණිය ග්‍රිඩ් උප පොළවල් ඉහළ කොත්මලේ බලාගාරය මඟින් ප්‍රතිස්ථාපනය කළද අනපේක්ෂිත ඉල්ලුම් ධාරිතාවෙහි වූ වෙනස් වීම් මත නැවත විසන්ධි විය. නැවත ඉහළ කොත්මලේ, කොත්මලේ සහ වික්ටෝරියා බලාගාර මඟින් මූලිකව බියගම, සපුගස්කන්ද, කැලණිය, කොටුගොඩ සහ කැලණිතිස්ස (කොළඹ ජාතික රෝහල ප්‍රමුඛව) ප්‍රතිස්ථාපනය කළ අතර පූර්ණ පද්ධතිය සම්පූර්ණයෙන්ම සවස 3.45 වන විට මහවැලි බලාගාර පද්ධතිය මඟින් ප්‍රතිස්ථාපනය කරන ලදී.

3. ඉතා ඉක්මණින් ගත යුතු ක්‍රියාමාර්ගයක් ලෙස Battery Energy Storage System එකක් සමඟ Renewable Energy Desk එකක් ඇති කිරීම සහ ඒ මඟින් ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානය තුළ පුනර්ජනනීය බලශක්ති වඩාත් දෘශ්‍යව පුරෝකථනය පාලනය හා නිරීක්ෂණය කිරීම කළ හැක. මෙම කාර්යය සඳහා 2024 දෙසැම්බර් මස අප විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟතා ගිවිසුමකට එළඹ ඇත. එහි කටයුතු වඩාත් කඩිනම් කිරීමට අවශ්‍ය මැදිහත්වීම් බලශක්ති අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතී.

4. පද්ධතිය තුළ තිබිය යුතු ඉහත සඳහන් කළ RE Desk එකක් හා ඊට සමාන පහසුකම් නොපැවතීම මත පෙර අවදානම නිසි පරිදි දැන ගැනීමේ ක්‍රමවේදයක් ඒ වන විට නොපැවතුණි.

5. මෙදින සිදුවිය හැකි ආර්ථිකමය හානිය ගණනය කිරීම සඳහා රට පුරා ඇති ග්‍රිඩ් උප පොළවල්වලට සම්බන්ධ ඒ ඒ බෙදා හැරීම්වල පෙර හා පසු ධාරිතාවන් ලබා ගත යුතු අතර, ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය දැනට අවශ්‍ය කටයුතු කර ගෙන යනු ලැබේ.

6. බලශක්ති අමාත්‍යාංශය පත් කළ කමිටුව මඟින් සිදු කළ මූලික විමර්ශනයේදී මෙම බිඳ වැටීමට කිසිදු නොසලකා හැරීමක් හෝ කඩාකප්පල්කාරී ක්‍රියාවක් සිදු වී නොමැති බවට හඳුනාගෙන ඇති අතර, තවදුරටත් විමර්ශනය සඳහා අභ්‍යන්තර ස්වාධීන කමිටුවක් මෙය විමර්ශනය සඳහා පත්කර දැනටමත් එහි කටයුතු කෙරෙමින් පවතී. එහි සම්පූර්ණ වාර්තාවක් ඉදිරියේ දී ලැබීමට නියමිතය.

7.

Year 2024	September	October	November	Total	Average and Generator cost
Generator Cost (@ government point) Rs. Million	29,984	34,875	25,392	85,217	28,417

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා අද සැබෑ තත්ත්වය හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙනවා. හිටපු බලශක්ති ඇමති වශයෙන් මම පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. එම ආයතනයේ සිටින ඉංජිනේරුවරු දෙන උත්තරයට වඩා ඔබතුමා දැනුවත්ව දෙන උත්තරය වඩාත් හොඳයි. දැන් මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාට කරන්න තිබෙන වැදගත්ම කටයුත්ත වන්නේ අඛණ්ඩව විදුලිය සැපයීමයි. නමුත්, බැරිවෙලාවකවත් විදුලිය විසන්ධි වුණොත් පාරිභෝගිකයාට ඇති වන ප්‍රශ්න ගැන තවම කථා කරන්නේ නැහැ. පාරිභෝගිකයන් ලක්ෂ 65ක් ලංකාවේ ඉන්නවා. බැරි වෙලාවත් විදුලි බිලක් ගෙවන්න සුමාන දෙකකින් බැරි වුණොත් විදුලිය විසන්ධි කරනවා. ඒ නිසා ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වෙනවා. විදුලිබල මණ්ඩලය අඛණ්ඩව power supply එක දෙනකොට, ප්‍රාථමික හේතුවක් නිසා විදුලිය විසන්ධි වුණා නම් ඒ සම්බන්ධයෙන් ඒ අයට මූල්‍යමය වශයෙන් උපකාරයක් කරන්නේ කොහොමද? මොකද, බැරි වෙලාවත් විදුලි බිල ගෙවන්න සුමාන දෙකකින් බැරි වුණොත් සහනයක් දෙන්නේ නැහැ. ඉතින් මේ විදුලිය විසන්ධි වෙන එක සම්බන්ධයෙන් බලන්න ඕනෑ. ඉරිදා දිනවලට අඩු ගණනේ හතර පස් වතාවක් විදුලිය විසන්ධි වෙනවා. නමුත් පාරිභෝගිකයාට වෙන හානිය ගැන කවුරුත් කථා කරන්නේ නැහැ.

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, ඇත්තටම අපිත් ඕක නිරීක්ෂණය කරලා තිබෙනවා. ඒ වාගේ ගොඩක් කාරණා තිබෙනවා. ඇත්තටම පසුගිය දා මේ විදුලිය විසන්ධි වීමට ප්‍රථම පවා මම ඒ ගැන තොරතුරු විමසලා සාකච්ඡා කරලා තිබෙනවා. මොකද, ඇත්තටම දැන් අපේ රජය වුණත්, people-centric Government එකක් විධියට, people-centric energy transition එකකට අපි යන්නේ. ඒ අරමුණෙන් තමයි වැඩ කරන්නේ. එතැනදී ඇත්තටම අපිත් දකින, මම පෞද්ගලිකවත් අත්දකින ලොකු ප්‍රශ්න ටිකක් තිබෙනවා. මහජනතාවට ළංවීමේ සහ ඈත්වීමේ ප්‍රවණතාවක් මේ සේවයේ තිබෙනවා. ඇත්තටම අපි ඒවා ගොඩක් නිරාකරණය කර ගන්න දැන් සැලසුම් සකස් කර ගනිමින්, ඒවා පිළිබඳ තොරතුරු රැස් කරමින් වැඩකටයුතු කරගෙන යනවා. අපට ටික කාලයක් දෙන්න. ඔය ප්‍රශ්න ටික ගොඩක්දුරට විසඳන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රවී කරුණානායක මැතිතුමා ඊයේත් මේ සම්පූර්ණ ප්‍රශ්නය ඇහුවා. *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමා දැන් උත්තර දුන්නා නේ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒකට නැවත reply කළා. ඇත්තටම ස්ථාවර නියෝග 27(2) යටතේ තිබෙන්නේ ප්‍රශ්නය ඇහුවාම උත්තර දෙන්න. ඒකේ නැවත dialogue එකක් නැහැ. *[බාධා කිරීමක්]* එක සැරයක් ප්‍රකාශ කළා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ගරු මහාචාර්ය අනිල් ජයන්ත මහතා, - *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීතුමා, ස්ථාවර නියෝග 27(2) යටතේ අදාළ අමාත්‍යවරයා පැහැදිලි කිරීම කළා. ඊට පස්සේ අතුරු ප්‍රශ්න නැහැ නේ එතැන.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක්. වදුරා පිළිබඳ සැබෑ තත්ත්වය සොයා ගැනීම. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග 27(2) යටතේ අදාළ පැහැදිලි කිරීම කළාට පසුව නැවත අතුරු ප්‍රශ්න අහන්න බැහැ. කරුණාකර මන්ත්‍රීතුමා වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද වැදගත් ප්‍රශ්නයකට උත්තරයක් ලැබුණාට පසුව ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ගැනීමට හැකියාව පාර්ලිමේන්තුවේ තිබෙනවා. මේක නගර සභාවක් නොවෙයි නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පැහැදිලි කිරීමක් කර ගත්තා නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේකේ තිබෙන ප්‍රශ්න 5න් එක කොටසකට තමයි උත්තර ලැබුණේ. ඉතින්, ඒ සම්බන්ධයෙන් මම නැවත අහනවා. මේ සම්බන්ධයෙන් අද ලංකා විදුලිබල මණ්ඩලය ඉතාම අමාරු ප්‍රශ්නයකට තමයි මුහුණ දී තිබෙන්නේ. මේක unions දෙකක් අතර තිබෙන ප්‍රශ්නයක්. පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ කාරණයයි, ඒකට විරුද්ධව unions දෙක අතර තිබෙන ප්‍රශ්නයයි මේ තිබෙන්නේ. මේක වදුරෙකුගේ ප්‍රශ්නයක් නොවෙයි. ඉතින්, ඒ සම්බන්ධයෙන් තමයි මම උදවු කරන්නේ. මොකද, මමත් එතැන හිටපු නිසා දන්නවා, ඒ ප්‍රශ්නය අමාරුයි. කංචන විජේසේකර හිටපු ඇමතිතුමාත් ඒ වාගේම කටයුතු කළා. කාලාන්තරයක් ගියාට පසුව පෙනේවි මේ සම්බන්ධයෙන් මේ දෙපැත්තෙන් කරන බොරුව. මේ ප්‍රශ්නය මට වඩා ඔබතුමන්ලාට වැදගත්. මේ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ප්‍රශ්නය ගත්තාම, අද මේ කථා කරන මොහොතේ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ඒකකයක් රුපියල් 78යි. හැබැයි, පුනර්ජනනීය බලශක්ති ඒකකයකට රුපියල් 29යි ගෙවන්නේ. ඉතින්, මේක නවත්වන්න ගිහිල්ලා අර තෙල් මාෆියාවට යටපත් වෙනවාද කියන එක තමයි මම ඔබතුමන්ලාගෙන් අහන්නේ. මොකද, රුපියල් බිලියන 185ක ලාභයක් තිබුණා මාස හයට. දැන් ඒක අලාභයකට හැරෙනවා. ඊයේ සාමාන්‍යාධිකාරීවරයා එක්ක තිබුණු meeting එකකදී හෙළි වුණා, මාස දෙකකදී රුපියල් බිලියන 40ක අලාභයක් සිදු වෙන බව. එතකොට ඔබතුමන්ලාට විදුලි බිල් වැඩි කරන්න වෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බලශක්ති අමාත්‍යතුමා, ඒකට පිළිතුරක් ලබා දෙනවාද?

ගරු කුමාර ජයකොඩි මහතා
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඇත්තටම එතුමා අහපු ප්‍රශ්නය ගැන තවදුරටත් කථා කරනවා නම්, අපි මහජනතාව ගැන හිතලා සාමාන්‍යයෙන් පැය 4ක් ඇතුළත විදුලිය නැවත ලබා දුන්නා. A/L විභාගය තිබෙනකොට විදුලිය කපන්න අපි ඉඩ තබන්නේ නැහැ. ඒ වාගේම පැය 14ක් විදුලිය කැපුණු ශ්‍රී ලංකාවක් මේ තිබෙන්නේ. අපි මේ රට එතැනට ගෙන යන්නේ නැහැ. අපි මේ වෙනුවෙන් වැඩ කරනවා. අපි ජනතාවගේ පැත්තෙන් වැඩ කරන්නේ. ඒ නිසා ඒකට අවශ්‍ය කටයුතු කරගෙන යනවා. මොකද, අපි මේ ආණ්ඩුව භාරගෙන තවම ගත වෙලා තිබෙන්නේ මාස තුනයි. අපි ගොඩක් දේවල් අධ්‍යයනය කරමින් යනවා. ඒවාට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මොකද, මේ ක්ෂේත්‍රයේ ක්‍රියාමාර්ග ගන්න පොඩි කාලයක් යනවා. මොකද, ඔය කවුරු හෝ කලින් හිටපු ඇමතිවරු කළාය කියන දේවල් කෙරිලා නැහැ නේ. ඒක නේ වෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ඒ දේවල් දවසින් දෙකෙන් කරන්න තිබුණා. ඔබතුමන්ලා ඇහුවා, හැම ඉරිදාම විදුලිය කැපෙයිද කියලා. මේ ඉරිදාත් ඒ තර්ජනය ආවා. අපි ඒවාට solutions අරගෙන අපට පුළුවන් විධියට වියදම් නොකර යම් මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. ඒකෙදි customersලාට යම් යම් ප්‍රශ්න මතුවෙන්න පුළුවන්. මොකද, ඒවා හදලා තිබෙන්නේ අපි නොවෙයි. මේවා අවුරුදු ගාණක් කරපුවා. ඒ නිසා අපි හැමෝම පොඩිඩක් සහයෝගයෙන් මේක ඉස්සරහට ගනිමු. ඔබතුමන්ලා තේරුම් ගනියි කියලා මම හිතනවා. මොකද, අපට මේකේ වංගු නැහැ, ඩීල් නැහැ. මේක හරිගස්සන්න විතරයි අපි හදන්නේ. ඒක හින්දා අපි එම අධ්‍යයනය කරගෙන යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මැතිතුමා.

විදේශ සංචිත ඉලක්ක සහ ණය සේවා ලබා ගැනීම සඳහා සැලසුම්: කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

வெளிநாட்டு ஒதுக்க இலக்குகளை அடைவதற்கும் கடன் சேவைகளைப் பெறுவதற்குமான திட்டங்கள்: தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சருமானவரினது கூற்று

PLANS FOR ACHIEVING FOREIGN RESERVE TARGETS AND DEBT SERVICING: STATEMENT BY MINISTER OF LABOUR AND DEPUTY MINISTER OF ECONOMIC DEVELOPMENT

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, 2025.02.21වැනි දින ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

මෙහි ප්‍රශ්න කාණ්ඩ දෙකක් තිබෙනවා, (අ) සහ (ආ) වශයෙන්. (අ) කොටසෙන් විදේශීය සංචිත ගොඩනැඟීම පිළිබඳවත්, එහි මූලාශ්‍ර පිළිබඳවත් අසා තිබෙනවා.

(අ) 1. ඒ අනුව මෙම කාල සීමාව ඇතුළතදී ඒ දළ නිල සංචිත වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ දේශීය වශයෙන් විදේශ විනිමය වෙළෙඳ පොළෙන් මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමේ පළමු, දෙවන සහ

[ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා]

තෙවන වාරික ලැබීම්, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුපාර්ශ්වික මූල්‍ය ආයතනවලින් සහ ද්විපාර්ශ්වික මූලාශ්‍රවලින් ව්‍යාපෘති සහ වැඩසටහන් ආශ්‍රිත ණය ලැබීම් ය. ඒවායෙන් ලැබුණු මුදල්වලින් තමයි මේ සංචිත ගොඩනැඟිලා තිබෙන්නේ.

මේ සංයුතිය 2023 දෙසැම්බර් අවසානය වෙනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 4,392කුත්, 2024 දෙසැම්බර් අවසානය වෙනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 6,122කුත් වෙනවා. නිල සංචිත වැඩි වී ඇති ආකාරය සඳහන් කර ඇති වගුව ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

2. 2024 අවසානයේදී මුළු විදේශ ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 100,294ක් වෙනවා. ඒ කියන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 100කට මදක් වැඩි ප්‍රමාණයක්. එය රුපියල්වලින් නම්, රුපියල් ට්‍රිලියන 29කට වැඩි ප්‍රමාණයක්.

3. ඊළඟට අහලා තිබෙන්නේ ණය සේවාකරණය ගැන. විශේෂයෙන් 2025, 2026, 2027 සහ 2028 වර්ෂවල විදේශ ණය සේවාකරණය ගැන අහලා තිබෙනවා. ණය සේවාකරණයේ අඩංගු ණය වාරික ප්‍රමාණය 2025 වර්ෂයේ සිට 2028 වර්ෂය දක්වා පිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,369ක්, 1,191ක් 1,196ක් සහ 2,133ක් වෙනවා. ඒ වාගේම එම කාලය සඳහා පොලිය පිළිවෙළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,085ක්, 931ක්, 893ක් සහ 974ක් වෙනවා.

4. රජයේ ණය සේවාකරණ ගෙවීම්වල මූලික වගකීම දරන්නේ රජය. කෙසේ වෙතත් රජයට ණය සේවාකරණයේ බැඳීම් සපුරාලීමට ප්‍රමාණවත් විදේශ විනිමය නොතිබෙන අවස්ථාවලදී රජයේ ඉල්ලීම පරිදි රජයේ බැංකුකරුවා විධියට මහ බැංකුව තමන් සතුව තිබෙන සංචිත අදාළ පරිදි නිදහස් කරලා ඒ සහයෝගය ලබා දෙනවා.

5,6 ප්‍රශ්නයේ මෙම කොටස් දෙකම එකට ගත්තාම ඒවායෙන් අහලා තිබෙන්නේ 2028 වර්ෂය දක්වා දළ සංචිත පවත්වා ගැනීම පිළිබඳවයි. ඒ වාගේම ඒ සඳහා සැලසුම් තිබෙනවාද කියන කාරණයත් අසා තිබෙනවා.

ඇත්තටම 2024 ජූනි මාසයේ ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩල වාර්තාවට අනුව පුරෝකථනය කරන ලද නිල සංචිත ප්‍රමාණය බැලුවාම ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ යොමු කර තිබුණු තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයක් තිබෙන්නේ. ඒක 2025 වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 7,174ක්; 2026 වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 9,262ක්; 2027 වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 13,466ක් සහ 2028 වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 15,105ක් වශයෙන් තිබෙන්නේ. මෙම දත්ත උපුටා ගත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩල වාර්තාවෙන්.

ඇත්තටම මෙම පුරෝකථන පදනම් වෙලා තිබෙන්නේ macroeconomic assumptions මත. ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ සංචිත ගොඩනැඟීමට අදාළ deterministic targets නොවෙයි මේ තිබෙන්නේ, පවතින economic variables වෙනස් වෙන විධියට සෑම සමාලෝචනයකදීම මෙම අගයන් නැවත ගණනය කෙරෙනවා.

සංචිත ගොඩනැංවීම සඳහා අදාළ වන ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක - quantitative performance criteria - යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන විසින් නියම කර තිබෙන ඉලක්කය වන්නේ වැඩසටහනේ ශුද්ධ ජාත්‍යන්තර සංචිත - net international reserves - සාක්ෂාත් කර ගැනීමයි.

විශේෂයෙන්ම මෙය අපි එකහතාවන් මත ආපු එකක්. ඒක තමයි එතැනදී විදේශීය වත්කම්වලින් බැරකම් අඩු කරලා ශුද්ධ ප්‍රමාණය අරගෙන තිබෙන්නේ. මේ වෙනකොට වැඩසටහනට අනුව අන්න ඒ ඉලක්ක අපි නිසි පරිදි සාක්ෂාත් කරගෙන තිබෙනවා. එක් එක් සමාලෝචන යටතේ විදේශ විනිමය වෙළෙඳ පොළෙන් මහ බැංකුව විසින් මිලදී ගැනීම්වලින් මේ දේවල් අපි කළමනාකරණය කරනවා. ඒ අනුව මේ දක්වා සිදු වෙච්ච සමාලෝචන තුනේදීම මේ ඉලක්ක අපි අඛණ්ඩව අත්පත් කරගෙන තිබෙනවා.

(ආ) 1, 2 සහ 4.

මේ කොටස් කිහිපයටම අදාළ පිළිතුරු මම සාරාංශගත කර ඉදිරිපත් කරන්නම්.

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 37වැනි වගන්තියට අනුව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් අන්තර්කාලීන විධිවිධාන සඳහන් කරලා තිබෙනවා. ඒ අනුව රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක වෙච්ච දිනයේ - 2024 නොවැම්බර් 25වන දින- සිට ඒ සියලු වගකීම්, කළ යුතු කාර්යයන්, ණය පිළිබඳ පුරෝකථන ආදී සියල්ල රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේයි සිද්ධ කරන්නේ.

කෙසේ වෙතත්, මෙතැන තාක්ෂණික කාරණා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම bidding system එකට ගියාට පස්සේ ඒක තවමත් තිබෙන්නේ මහ බැංකුව යටතේ ක්‍රියාත්මක වෙමින්. ඒ නිසා අන්‍යෝන්‍ය වශයෙන් අපි මාස 18ක කාලයක් ශ්‍රී ලංකා මහ බැංකුවත් එක්ක එකට කටයුතු කරමින්, ක්‍රමිකව මෙතැනට පරිවර්තනය කර ගන්න තමයි බලාපොරොත්තුව තිබෙන්නේ.

3. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය තුළ දීපව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධාරීන් 12දෙනෙක් සහ ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් 11දෙනෙක් ඇතුළුව මුළු නිලධාරීන් 23දෙනෙක් දැනට සේවය කරනවා.

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම පැහැදිලි කිරීම් 3ක් කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙවැනි බැරෑරුම් ප්‍රශ්නයකට උත්තරයක් සපයා දීම මා අගය කරනවා. නමුත් ඔබතුමාටත් පෙනෙනවා ඇති, මහ බැංකුව අද ස්වාධීන ආයතනයක් වුණත්, එය ක්‍රියාත්මක වන ආකාරය අනුව තවමත් ඒ ආයතනයේ වැඩකටයුතුවලට ඇඟිලි ගැසීම් සිදුවන බව. මේ ගැන අපි එදා -2016දී- කිව්වාට ඒ දේ පිළිපැද්දේ නැහැ. කරුණාකරලා ඔබතුමා ඉතාම ඕනෑකමින් මේ ආයතනය යථා තත්ත්වයට පත් කරලා, මුදල් අමාත්‍යාංශය යටතට මේ ආයතනය භාර දීලා ඒකේ වගකීම ගන්න කියලා මම ඉතාම ඕනෑකමින් ඉල්ලනවා.

දෙවැනි කරුණ මෙයයි. ඔබතුමාගේ හෙළිදරව්ව තුළින් පෙනෙනවා, 2024 සැප්තැම්බර් මාසයේ 30 දිනට සම්පූර්ණ ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 29ක් -28.8ක්- බව. මාස 4කට මේ සම්පූර්ණ ණයබරතාව රුපියල් ට්‍රිලියන 1.2කින් වැඩි වෙලා තිබෙනවා. මම මේ ප්‍රශ්නය අහන්නේ කුහකකමකින් නොවෙයි. මේකෙන් පෙනෙන්නේ මෙයයි. ආණ්ඩුවක් ගෙනියනවා කියන්නේ නිකම් relay එකක් දුවනවා වාගේ වැඩක් නමයි. මීට පෙර අහලා තිබුණා, මේ මාස 5, 6 තුළ මොකුත් සංවර්ධනයක් වෙලා නැතිව ණය වැඩි වෙන්නේ කොහොමද කියලා. රුපියල අවප්‍රමාණය වීම තුළ මේ ණය ප්‍රමාණය තව රුපියල් ට්‍රිලියන 1.2ක් වැඩි වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට ඔබතුමා කරුණු පැහැදිලි කළා නේ. තව පැහැදිලි කිරීම් කරන්න ගියොත් කාලය සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඉතාම ඉක්මනට, බිම් බෝම්බයක් නොවන විධියට මේ ප්‍රශ්නය අහන්නම්. මම හිතන විධියට, ඇමතිතුමාට මේක උදව් වේවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔබතුමා එය එතුමාට දැනුම් දෙන්න.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

2025.02.19වන දින "ඩේලි මිරර්" සහ "ලංකාදීප" පුවත්පත් වාර්තා
2025.02.19ஆம் திகதிய "டெய்லி மிரர்" மற்றும் "லங்காதீப" பத்திரிகை அறிக்கைகள்
REPORTS IN "DAILY MIRROR" AND "LANKADEEPA" NEWSPAPERS OF 19.02.2025

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 පෙබරවාරි 20 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මහජන ආරක්ෂක ඇමතිතුමාත් ගරු සභාවේ සිටින මේ මොහොතේ මම මේ කාරණය අහන්න කැමැතියි. ඝාතන රැල්ලට, ඝාතන සංස්කෘතියට නිමක් නැහැ. ඊයේත් මිනී මැරුමක් සිද්ධ වුණා.

එවන් තත්ත්වයක් තුළ විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව, ජන සමාජයේ ජනතාවගේ ආරක්ෂාව, විනිසුරුවරුන්ගේ ආරක්ෂාව, සිවිල් සමාජයේ ආරක්ෂාව වාගේම අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු මහජන නියෝජිතයින්ගේ ආරක්ෂාව පිළිබඳව අපේ මහජන ආරක්ෂක ඇමතිතුමාට යම්කිසි පැහැදිලි හා විධිමත් වැඩ පිළිවෙළක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න සිද්ධ වේවි කියා මම හිතනවා. මෙය තවදුරටත් ප්‍රමාද කරන්න බැහැ. මේ ඝාතන රැල්ල, මේ මිනී මැරුම් සංස්කෘතිය දිනෙන් දින ප්‍රවර්ධනය වෙනවා. ඒ තුළ ජන සමාජයේ කුඩා දරුවාගේ ඉඳලා සියලුදෙනාම දැඩි පීඩනයකට, දැඩි අවදානමකට ලක් වෙනවා. ඒ නිසා, ජන සමාජයේ ආරක්ෂාව තහවුරු කරන්න, පොදු ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරන්න, දරු පරපුරේ සිට සියලුදෙනාම ආවරණය වන විධියට, විනිසුරුවරු ආවරණය වන විධියට අඩුම ගණනේ ලබන සඳුදා දවසේ හෝ විධිමත් සැලැස්මක් ඉදිරිපත්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. Marawila Bar එකේ විනිසුරුවරුන් අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. ඒගොල්ලනුත් පාර්ලිමේන්තුවේ ඉඳගෙන මේක අහගෙන ඉන්නවා ඒගොල්ලනුත් බලාපොරොත්තුවෙන් ඉන්නවා, මේ සඳහා රජය ලබා දෙන විසඳුම මොකක්ද කියලා. විනිසුරුවරුන්ගේ ආරක්ෂාවට දැන් බරපතළ තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා.

මොකක්දෝ කැලෑ පත්‍රයක් කේන්ද්‍ර කරගෙන Judicial Service Commission එකෙන් judgesලාට යවලා තිබෙනවා, ඒගොල්ලන්ගේ ආරක්ෂාව අවදානමට ලක්වෙලා කියලා පණිවුඩයක්. ඒ ගැන බොහෝ දුරට සමාජයේ කථා වෙනවා. ඒක වැරැදියි. මේ රජයේ සියලුදෙනාගේම අවබෝධය පිණිස මම මෙම ලේඛනය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරන්න මොකක්ද ගනු ලබන පියවර කියන එක සම්බන්ධයෙන් ඔබතුමා අඩු ගණනේ සඳුදා දවසේ හෝ පිළිතුරක් ලබා දෙන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේකටම අදාළවද ඔබතුමා ඔය කාරණය අහන්නේ?

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඊයේත් මම මේ කාරණය ඔබතුමාගෙන් ඇහුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන්ම තමයි. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, ගරු විනිශ්චයකාරතුමන්ලාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මම ඊයේ දින පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරනු ලැබුවා. *[බාධා කිරීමක්]* ගරු විනිශ්චයකාරතුමන්ලාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කිසිදු අඩු කිරීමක් කරලා නැහැ. දිගින් දිගටම ලබා දුන් ආරක්ෂාව ඒ අයුරින්ම ලබා දෙනවා. ඒ පිළිබඳව මම ඊයේ දිනයේදීත් මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කිරීමක් කරනු ලැබුවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියන පරිදිම පසුගිය දිනවල දිගින් දිගටම ස්ථාන කිහිපයක - විශේෂයෙන් උස්වැටකෙයියාව, කොටහේන, මීගමුව වාගේ ස්ථානවලත්, ඊට පෙරාතුව මිද්දෙනිය, කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ - වෙඩි තැබීම් සිද්ධ වුණා. ඒවායේ මුල් සිද්ධීන් සම්බන්ධයෙන් ඊයේ දිනයේ පැහැදිලි කිරීමක් කරනු ලැබුවා. විශේෂයෙන් මේ හැම වෙඩි තැබීමක් සම්බන්ධයෙන්ම විමර්ශනයක් සිදු වෙමින් පවතිනවා. සමහර කරුණුවල විමර්ශන දිගින් දිගටම පවත්වාගෙන යන තත්ත්වයක් තුළ පැහැදිලි කිරීම් කරන්න අමාරුයි.

කෙසේ වෙතත්, සමහර ඝාතන සම්බන්ධයෙන් එම පුද්ගලයන් ඝාතනය වීමට පෙරාතුව නිකුත් කරන ලද වීඩියෝ පට හරහා යම් යම් කාරණා අනාවරණ වුණා. දැනටත් ඒවා සමාජ මාධ්‍ය හරහා සංසරණය වෙනවා. දැන් ඒ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරලා විමර්ශන සිදු කරනවා.

ඒ වාගේම මෙලෙස තැන තැන සිදු වූ පාතාල ක්‍රියාකාරකම් එක්තරා සංවිධානාත්මක කල්ලියක වුවමනාව මත සිදු වන බවට මේ වනවිට තොරතුරු ලැබිලා තිබෙනවා. විශේෂයෙන් අත්අඩංගුවට ගත් අයගේ දුරකථන සහ ඔවුන් හරහා ලබා ගත් තොරතුරු අනුව සංවිධානාත්මක කණ්ඩායමක් විසින් මේවා මෙහෙයවන බවට මේ වනවිට තහවුරු වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් විමර්ශන සිද්ධ කරමින් පවතිනවා.

මේ මොහොත වනවිට රාජ්‍ය ආරක්ෂක ලේකම්තුමා මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් සිටිනවා. එතුමා ඒ විමර්ශනය සහ සිද්ධි පිළිබඳ කරුණු අද අනාවරණය කරාවි. මට ඒ විමර්ශන සම්බන්ධව දීර්ඝ වශයෙන් මේ සභාවට කරුණු ඉදිරිපත් කරන්න හැකියාවක් නැහැ, විමර්ශන තවදුරටත් සිදු වන බැවින්. කොහොම වුණත් මහජන ආරක්ෂාව, ජාතික ආරක්ෂාව පිළිබඳ වගකීම අපි දරනවා. කිසිසේත් එය බිඳවැටීමට අපි ඉඩ දෙන්නේ නැහැ.

ඒ වාගේම සංවිධානාත්මක කණ්ඩායමක් විසින් පාතාල ක්‍රියාකාරකම් උත්සන්න කර තිබීම ගැන රජයේ දැඩි අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් ගැඹුරු විමර්ශනයක් මේ වෙනකොට දියත් කරලා තිබෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මේ කාරණයට අදාළව නම් කරුණාකරලා,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ කාරණයටම අදාළව තමයි. *[බාධා කිරීමක්]*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු විපක්ෂයේ සංවිධායකතුමනි, මේ සභාවේ එක විපක්ෂ නායකවරයායි, විපක්ෂයේ එක සංවිධායකවරයෙකුයි තමයි ඉන්නේ කියලා අපි හිතාගෙන ඉන්නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම කියලා නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ජාතික වැදගත්කමක් තිබෙන ප්‍රශ්නයක් ඇහුවා. *[බාධා කිරීමක්]* දැන් මේ බාධා කිරීම පුරුද්දක් වෙලා තිබෙනවා. තමන්ට අගමැති සිහින තිබිලා ඒවා නැති වුණු කට්ටිය, සජබයේ බලය අල්ලන්න ගිහිල්ලා ඒකත් බැරි වෙලා දැන් මේ සභාවේ හැම දාම රඟපාන්න පටන් අරගෙන තිබෙනවා. විපක්ෂ නායකතුමා ප්‍රශ්නයක් ඇහුවා. විපක්ෂයේ සංවිධායක කෙනෙක් ඉන්නවා. සජබයේ තව නායකයෝ ඉන්නවා. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? *[බාධා කිරීමක්]* මොකක්ද? ගරු කථානායකතුමනි, අපි ඇලෝෂියස්ගෙන් සල්ලි අරගෙන නැහැ. නමුත් ඒ ප්‍රශ්නය වෙනම බෙරා ගනිමු. මම විපක්ෂ නායකතුමාගෙන් අහන්න කැමැතියි, මේ සභාවේ ඔබතුමාට අමතරව තවත් විපක්ෂ නායක කෙනෙක් ඉන්නවාද කියලා. තව විපක්ෂයේ සංවිධායක කෙනෙක් ඉන්නවාද? ඔබතුමා ඒ ගැන දන්නවා. ඔබතුමා මම කියන දෙයට ඇහුම්කන් දෙන්නකෝ,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් මම කියන දෙයට ඇහුම්කන් දෙන්නකෝ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, සමාවෙන්න, ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. දයාසිරි ජයසේකර මැතිතුමාත් සමඟි ජන බලවේගයේ නායකයෙක්; එතුමාත් නායකයෙක් අපේ සමඟි ජන බලවේගයේ. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නායකයෙක් නේ; නායකයෙක් නේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාට අයිතිය තිබෙනවා, මේ සභාවේ ප්‍රශ්න අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නායකයෙක් නේ; a Leader, not the Leader.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාත් හොඳ නායකයෙක්. අපි දෙදෙනාම එකට හිටියේ එක්තරා තැනක. අදත් ඉන්නවා. *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපට ඇත්තටම මේ ego ප්‍රශ්නවලට උත්තර නැහැ. *[බාධා කිරීමක්]* ඒක නිසා අපට කියන්න තිබෙන්නේ මේකයි. ස්ථාවර නියෝගවලට පිටින් ඔබතුමා විපක්ෂ නායකතුමාට දැන් අවස්ථා ගණනාවක් ලබා දුන්නා. ඒක ඔබතුමාගේ අයිතිය. නමුත්, අපටත් ඒ විධියටම සම්බන්ධ වෙන්න පුළුවන්. අපටත් ඕනෑ තරම් ආරක්ෂාව ගැන කථා කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* අපියි ආණ්ඩුව කරන්නේ. අපි ඔබතුමාට කියනවා, මෙන්න මේ ego ප්‍රශ්නයට ඔබතුමා මානසික රෝහලකට එතුමාව යොමු කරන්න කියලා.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමාට එක විනාඩියක් දෙන්න බැරි නම්,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැත්නම් සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමා එතුමාට මොනවා හරි තනතුරක් දෙන්න. *[බාධා කිරීමක්]* මොකක්ද මේ වෙලා තිබෙන්නේ? විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, මොකක්ද එතුමා මේ කරන්නේ කියලා අපි අහන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආරක්ෂාව සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා කථා කළා. මන්ත්‍රීවරුන් පස් හය දෙනෙකු කථා කළා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හැම දාම මේ නාඩගම කරන්න ඕනෑද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සභාව පවත්වාගෙන යන්න අවශ්‍යයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. මම ඊයේ ඉඳන් ඔබතුමාගෙන් වෙලාව ඉල්ලනවා. මට මේ කාරණය කියන්න දෙන්න. උසාවිය ඇතුළේ වෙඩි තියලා මරපු මනුස්සයාව, -*[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, 09වැනි අධිකරණ කාමරයට ගෙනාපු කෙනා 05වැනි අධිකරණ කාමරයට ගෙනාවේ කොහොමද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මෙතුමාගේ ego ප්‍රශ්නය විසඳෙන කල් විපක්ෂයේ Lobby එකේ කැමරාවකුයි, මයික් එකකුයි සවි කරලා දෙන්න කියලා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන චැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීමේ විවාදය. පස්වන වෙන් කළ දිනය.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කල් තබන ලද විවාදය නවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.
ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]
"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]
ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.
சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]
"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக".- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [17th February]
"That the Bill be now read a Second time".- [The Hon. Anura Kumara Dissanayake]
Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීමට, the Hon. Ajith P. Perera. You have 25 minutes.

[ප.භා. 10.43]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මේ අය වැය මේ රජයේ පළමුවැනි අය වැය. මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න මේ ආණ්ඩුව බැඳිලා ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ අපිත් එක්ක දීර්ඝ කාලයක් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් හිටපු අනුර කුමාර දිසානායක මැතිතුමා දැන් මේ රටේ ජනාධිපතිවරයා. අපට ඒ ගැන සතුටුයි. එතුමා විපක්ෂයේ වගකීම් මැනවින් ඉෂ්ට කරලා, ජනතාවගේ විශ්වාසය දිනාගෙන, මේ රටේ ජනාධිපති බවට පත් වුණා. මට මතකයි, පසුගිය කාලයේ මේ රටේ පාතාලයේ අපරාධ වැඩි වෙනකොට ඒ පාතාලය මර්දනය කරන්න නිසි ක්‍රමවේද නැති වෙනකොට, පොලිස් කාර්ය පටිපාටීන් හරියාකාරව කරන්න බැරි වෙනකොට ඒ පිළිබඳව අසාර්ථක වුණු රජයන් විසින් ඒ අත්අඩංගුවට ගන්නා සැකකරුවන් මරා දමන්න කටයුතු කළ ආකාරය.

දැන් මේ රජයට පාතාලය මර්දනය කිරීමට පිළිගත්ත ක්‍රමවේදයක් නැහැ; වැඩ පිළිවෙළක් නැහැ. හැබැයි, ඊයේ අපි දැක්කා, අපරාධකරුවන්ව අත්අඩංගුවට ගන්නවා; ඔවුන් පණ පිටින් සමාජ මාධ්‍යවල පෙන්වනවා; හැබැයි, රාත්‍රී වනකොට එම අපරාධකරුවන් පොලිස් අත්අඩංගුවේදී මැරෙනවා. අපි දන්නා විපක්ෂයේ හිටපු ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වේ, "අත්අඩංගුවේ ඉන්න සැකකරුවෝ මැරෙනවා නම් මොකටද ඒ ආණ්ඩුව? අත්අඩංගුවේ ඉන්න සැකකරුවන් බලා ගන්න බැරි නම් මොකටද ඒ ආණ්ඩුව? පාතාලය මර්දනය කරන්න නීතියේ ආධිපත්‍යයට අනුව නියමාකාරව කටයුතු කරන්න බැරි නම් මොකටද ඒ ආණ්ඩුව?" කියායි. එහෙමයි කිව්වේ. වෙන කවුරුවත් නොවෙයි, වත්මන් ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා එදා විපක්ෂයේ මෙතැන ඉඳගෙනයි ඒක කිව්වේ. මේක තමයි තත්ත්වය. එම නිසා පාතාලයට විරුද්ධව දැඩිව ක්‍රියා කරන්න ඕනෑ. පාතාලයේ ඉන්න අපරාධකරුවෝ කිසිවෙක් එළියේ සිටිය යුතු පුද්ගලයෝ නොවෙයි. මේ රටේ නීතිය ප්‍රකාරව පාතාලය හා සම්බන්ධ අපරාධකරුවන් සියලුදෙනාටම ඔවුන් කරන වරදේ ප්‍රමාණයට දඬුවම් කළ යුතුයි; දැඩි දඬුවම් කළ යුතුයි. නඩු විභාග ඉක්මන් කළ යුතුයි. හැබැයි, අනුර කුමාර දිසානායක මහත්මයාගේ ආණ්ඩුව නීතියේ ආධිපත්‍යය අමතක කරලා අද වනකොට අර පරණ, අසාර්ථක වුණු - 76 අවුරුද්දක් අසාර්ථක වුණු ක්‍රමය තිබෙනවා නේ - ඒ ක්‍රමයටම නේ මේ යන්නේ. 76 අවුරුද්දකට බණිනවා නේ. මේ රටේ නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්න බැරි වුණා කියලා පසුගිය ආණ්ඩුවලට බණිනවා නේ. පසුගිය ආණ්ඩුවලට extra judicial killingsවලට බණිනවා නේ. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ව අත්අඩංගුවට අරගෙන අනීතිකව මරා දැමීම ගැන,- අපි එදා ජනතා විමුක්ති පෙරමුණේ ඒ සාමාජිකයන් වෙනුවෙන් අධිකරණයේ පෙනී හිටපු අය. අපි එදාත් විරුද්ධ වුණා. අදත් විරුද්ධයි. පාතාලය මර්දනය කළ යුතුයි; දැඩිව මර්දනය කළ යුතුයි. හැබැයි, මර්දනය කරන්න ඕනෑ, රටේ නීතියට අනුව. එහෙම නොවුණොත් මේ රටේ නීතියක් නැති තත්ත්වයට පත් වෙනවා, ගරු කථානායකතුමනි. කථානායකතුමා හැටියට, ව්‍යවස්ථාදායකයේ නායකයා හැටියට ඔබතුමාට වගකීමක් තිබෙනවා, මේ ගැන සොයා බලන්න. ඒ වාගේම අපට කථා කරන්න අවස්ථාව දෙන්නත් වගකීමක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාවට විශාල අභිලාෂයක් තිබුණා, විප්ලවීය ආරම්භයක් මේ අලුත් ආණ්ඩුව අරගෙන දෙයි කියලා. මේ රටේ පවතින ජරාජීර්ණ වෙච්ච, අසාර්ථක වෙච්ච ක්‍රමවේදය වෙනුවට මේ රටට අලුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එන්න පොරොන්දු වුණා, මා මිත්‍ර නලින්ද ජයතිස්ස ඇමතිතුමනි. අපි ඔක්කෝම විපක්ෂයේ හිටපු කාලයේත්, දෙගොල්ලන් ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ හිටපු කාලයේත් අපි විශ්වාස කරපු දෙයක් තමයි, මේ රටට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියන කාරණය. සංශෝධන විශාල ප්‍රමාණයකින් විකෘති වුණු මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විකල්පයක් ඕනෑ.

පසුගිය ජනාධිපතිවරණයේදී අනුර කුමාර දිසානායක මැතිතුමාත්, සජිත් ප්‍රේමදාස මැතිතුමාත් දෙදෙනාම කිව්වේ, මේ රටට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එනවා, අලුත් පාලන ක්‍රමයක් අරගෙන එනවාය කියලා. ජයග්‍රහණය කළේ, ජන වරම ලබා ගත්තේ, අනුර කුමාර දිසානායක මහත්මයා. එතුමාගේ "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ "අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්" කියන එක යටතේ 193වැනි පිටුවේ බොහොම පැහැදිලිව කියනවා, අලුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රැගෙන එනවාය කියලා.

ගරු කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මැතිතුමා මේ සභාවට ඇවිල්ලා දවස් තුනක් කථා කළා. අලුත් පාර්ලිමේන්තුවේ නව සැසි වාරය ආරම්භ කරන්න එතුමා පාර්ලිමේන්තුවට ආවා. එහිදී අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන එතුමා වචනයක්වත් කිව්වේ නැහැ. ඊට පස්සේ පාර්ලිමේන්තුවේ එතුමාගේ ආසනයේ

ඉඳලා දීර්ඝ කථාවක් කරලා කිව්වා, "මගේ ඉදිරි වැඩ පිළිවෙළ මේකයි, අපි ඒ පිළිබඳව ක්‍රියා කරනවා" කියලා. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන එතැනදිත් වචනයක්වත් කිව්වේ නැහැ.

ඊළඟට අලුත් ආරම්භයක් දෙන්න ලැබෙන පළමුවැනි අවස්ථාව, විධිමත් අවස්ථාව තමයි මේ අය වැය විවාදය. එතුමා තමන්ගේ අය වැය කථාවේ කිසිම තැනක අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කිව්වේ නැහැ. නිදහස් දින කථාවේදීත් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කිව්වේ නැහැ. කාදිනල්තුමා මතක් කරලා දුන්නා, මේ ජරාජීර්ණ වෙච්ච, යල් පැනපු පාලන ක්‍රමය වෙනස් කරන්න අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එන්න ඔබතුමා පොරොන්දු වෙලා තිබෙනවාය කියලා. ඒ ගැන වචනයක්වත් කථා කළේ නැහැ, ගරු කථානායකතුමනි. මොකද මේ? විපක්ෂයේ හිටපු අනුර කුමාර දිසානායක මැතිතුමා නොවෙයිද, අද මේ රටේ ජනාධිපති වෙලා ඉන්නේ? ජනතාවට වෙච්ච පොරොන්දු අමු අමුවේ කඩ කරනවා.

එහෙම බලාපොරොත්තුවක් තිබෙනවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන කමිටුවක් ආරම්භ වෙන්න ඕනෑ. එහෙම එකක් කරලා නැහැ. එහෙම බලාපොරොත්තුවක් තිබෙනවා නම්, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරන්න අනිවාර්යයෙන්ම ජනමත විචාරණයක් අවශ්‍ය නිසාත්, ලෝකයේ ව්‍යවස්ථාදායකවල අත්දැකීම අනුව පළමුවැනි අවුරුද්ද දෙක ඇතුළත ජනමත විචාරණයක් නොතිබුණොත් හොඳම දෙයක් වුණත් සම්මත කර ගන්න බැරි වෙන නිසාත්, තුනෙන් දෙකක බලයක් අවශ්‍ය වන නිසාත් මේ අලුත් ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාදාමය කඩිනමින් ආරම්භ කරලා කඩිනමින් අවසන් කළ යුතුයි. අපත් ලැහැස්තියි සහයෝගය ලබා දෙන්න, රටට ගැළපෙන වැදගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා.

ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වෙන්න ඕනෑ. විශේෂඥයන්ගේ සහාය ලබා ගන්න ඕනෑ. ව්‍යවස්ථා සම්පාදනය විශේෂඥයන්ගේ වැඩක්. ඒකට පාර්ලිමේන්තුවේ ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා වාගේම ඉන් පිටත ඉන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ විශේෂඥයන් සම්බන්ධ වෙන්න ඕනෑ. එහෙමයි ඒ වැඩේ කෙරෙන්න ඕනෑ. ඒවාට ප්‍රතිපාදන වෙන් වෙන්න ඕනෑ. මේ අය වැයෙන් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරලා නැහැ, ගරු කථානායකතුමනි. ඔබතුමාත්, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ 159ක් මන්ත්‍රීවරුනුත්, ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් වැඩි සංඛ්‍යාවකුත් -සියලුදෙනාම- විශ්වාස කරනවා, මේ රටට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියලා. නමුත් අපට පෙනෙනවා, දැන් බලය ලැබුණාට පස්සේ ඒ බලයෙන් මත්වෙලා ඒ බලය තුළ තවත් වරක් විධායක ජනාධිපති වෙන්න හිතන බව.

විධායක ජනාධිපතිකම අහෝසි කරනවාය කිව්වා. එහෙම නේ කිව්වේ? පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් අරගෙන එනවාය කිව්වා. අපත් ලැහැස්තියි. ඒක තමයි අපේත් ප්‍රතිපත්තිය. හැබැයි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න දැන් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ලැහැස්ති නැහැ. ඒක තමයි දෙවෙයේ සරදම. ඒක තමයි රැවටීම. ඒක තමයි ලජ්ජා සහගත කාරණය. තවත් කාලයක් තිබෙනවා, කරුණාකරලා දැන්වත් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ කටයුත්තට අවංකව ඉඩ සලසා දෙන්න. විපක්ෂය කියන නිසා නොවෙයි, කාදිනල්තුමා පසුගිය ජනවාරි 01වැනි දා කියපු නිසා නොවෙයි, මේ රටේ විද්වතුන් නැවත මතක් කරන නිසා නොවෙයි, ඔබතුමන්ලාට ලැබුණු අති සුවිශේෂ වූ ජන වරම ලැබුණේ, මේ රටේ මිනිස්සු තුනෙන් දෙකක බලයක් ඔබතුමන්ලාට දුන්නේ, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අරගෙන එන්න; රටේ වෙනසක් කරන්න; විප්ලවීය වෙනසක් කරන්න.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා 159දෙනෙක් මේ සභාවේ ඉන්නවා. මම මේ කාරණය අහනවා. ඔබතුමන්ලා ගමට ගිහිල්ලා කිව්වේ, "පරණ පක්ෂ දෙකම අසාර්ථකයි, අපට බලය දෙන්න, අපි වෙනසක් කරනවා, විප්ලවීය වෙනසක් කරනවා, ඒ විප්ලවීය වෙනසේ පදනම තමයි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙන ඒම" කියලා නේද? කෝ? ඔබතුමන්ලාගේ පක්ෂය ඇතුළේ කථා කරනවාද මේවා ගැන? ඔබතුමන්ලා එළියේ මාධ්‍ය ඉදිරියේදී කථා කරනවාද මේ ගැන? මේ පාර්ලිමේන්තුව තුළ ඉන්න ආණ්ඩු පක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් අද වෙනකල් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑ කියලා කථා කළාද? වචනයක් කිව්වේ නැහැ. ඉතින් මොකටද, මේ 159දෙනෙක් ඇවිල්ලා? මේක තමයි ප්‍රධාන පදනම. *[බාධා කිරීමක්]* බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමාටත් කියන්න තිබෙන්නේ එච්චර තමයි. ඔබතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගැන දන්නවා. ඔබතුමාට පළපුරුද්ද තිබෙනවා. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරනවා නම් පළමු සැසි වාර දෙක තුළ ඒක කරන්න ඕනෑ. එහෙම කරන්න පුළුවන් ශක්තිය තිබෙද්දීත් කරන්නේ නැත්තේ අර කියපු කාරණය නිසායි. *[බාධා කිරීමක්]* අපට වුවමනාව තිබුණා. අපට ඒක කර ගන්න බැරි වුණා.

අපට තුනෙන් දෙකක බලය නැති වුණා. හැබැයි, දැන් ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයත් තිබෙනවා; විධායක ජනාධිපතිකමත් තිබෙනවා; පාර්ලිමේන්තුවේ බහුතරයකට රටේ කැමැත්තත් තිබෙනවා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් වෙනස් කරන්න ලැහැස්ති නැහැ. ඒක තමයි වැඩේ. ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණත්, NPP පක්ෂයත්, අපි හැමෝමත් නිදහස් අධ්‍යාපනය විශ්වාස කරන අය. මේ කථා කරන මමත් නිදහස් අධ්‍යාපනයේ පිහිටෙන්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැමෝම නිදහස් අධ්‍යාපනය ගැන විශ්වාස කරනවා. නිදහස් අධ්‍යාපනය සුරක්ෂාකොට පෝෂණය කරන්න ඕනෑ කියලා විශ්වාස කරනවා. මම පළමුව එක්සත් ජාතික පාක්ෂිකයෙක්. දිවංගත සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනය කියන ඒ සංකල්පය ආරක්ෂා කරලා, එය රටේ නීතිය බවට පත් කරලා මේ රටේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරපු නිසා තමයි අද මාත් ඇතුළුව මේ පාර්ලිමේන්තුවේ ඉන්න බහුතරයක් මන්ත්‍රීවරු මේ ස්ථානයේ ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහස් අධ්‍යාපනය සුරක්ෂාකොට පෝෂණය කරනවා කියලා ජනතා විමුක්ති පෙරමුණේ "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරලා තිබෙනවා. මිනිස්සු විශ්වාස කළා, අපිටත් වඩා නිදහස් අධ්‍යාපනය සුරක්ෂාකොට පෝෂණය කරයි කියලා, ඔබතුමන්ලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

පුදුම වෙයි, මේ අය වැය කථාවේ කිසිම තැනක නිදහස් අධ්‍යාපනය සුරක්ෂාකොට පෝෂණය කිරීම ගැන වචනයක්වත් නැහැ.

අධ්‍යාපන ඇමතිතුමිය කියයි කවදාකවත් නැති තරම් අපි මුදල් වෙන් කළා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් වෙන් කිරීමෙන් පමණක් අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙන්නේ නැහැ. අපට අවශ්‍ය වෙන්නේ අධ්‍යාපන ක්‍රමයේ වෙනසක්. ගරු අගමැතිතුමියනි, අධ්‍යාපන ක්‍රමයේ විප්ලවයක්, අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිපත්තිමය විප්ලවයක් අවශ්‍යයි. විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ වේවා, පාසල් අධ්‍යාපනයේ වේවා, අධ්‍යාපනයේ විප්ලවයක් අවශ්‍යයි. එදා කන්නන්ගර මැතිතුමා හඳුන්වා දුන් නිදහස් අධ්‍යාපනය යථාර්ථවත් කළ යුතුයි; තත්කාලීන කළ යුතුයි. ඒ සඳහා අපි හැමෝම එකතු වෙලා ඉදිරියට යා යුතුයි. ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ ආණ්ඩුව ඉදිරිපත් කළ මෙම අය වැය කථාවේ කිසිම තැනක නිදහස් අධ්‍යාපනය සුරක්ෂාකොට පෝෂණය කිරීම ගැන වචනයක්වත් නැහැ. අඩු ගණනේ වචනය කියන්නකෝ. ඒකත් නැහැ. IMF එක නේද කිව්වේ දමන්න එපා කියලා? IMF එක නේද කිව්වේ? නිදහස් අධ්‍යාපනය කියන වචනයටත් බයයි දැන්.

නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් ජීවිතය පිදුවේ අපේ පරම්පරාවේ තරුණයින්. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපි ඉන්නකොට අපිත් එක්ක ඉගෙන ගත්ත ළමයි තමන්ගේ ජීවිතය පිදුවේ ඔවුන් විශ්වාස කරපු ක්‍රමයට අනුව නිදහස් අධ්‍යාපනය වෙනුවෙන්. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? අද ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුවක් ඇවිල්ලා, NPP ආණ්ඩුවක් ඇවිල්ලා තමන්ගේ මංගල අය වැය ඉදිරිපත් කරද්දි ඒකේ නිදහස් අධ්‍යාපනය පෝෂණයකොට සුරක්ෂා කිරීම ගැන සඳහනක්වත් නැහැ.

එපමණක් නොවෙයි. කෝ, විප්ලවීය වැඩ පිළිවෙළ? මොකක්ද programme එක? පරණ ක්‍රමය ඒ විධියටම ඉදිරියට අරගෙන යන්න, පරණ ක්‍රමයටම "මේකට, මේකට, මේකට මේ" කියලා මුදල් වෙන් කරන එකද ගරු අගමැතිතුමියනි, විප්ලවය කියන්නේ? ඕකද විප්ලවය? ඒවාට කවුද විප්ලව කියන්නේ? ඒ විප්ලවය මොකක්ද? එදා කන්නන්ගර මැතිතුමා විප්ලවයක් කළා. මේ 76 අවුරුද්ද තුළ මේ රට මෙහෙම හරි තිබෙන්නේ ඒ විප්ලවය නිසායි. හැබැයි, අද කෝ ඒ විප්ලවය? ඒ විප්ලවකාරී කණ්ඩායම්, අලුත් වෙනසක් කරන්න ආපු කණ්ඩායම් අරගෙන එන විකල්ප අධ්‍යාපන ප්‍රතිපත්තිය මොකක්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේවා ගැන රටේ ජනතාව දැනගත යුතුව තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. නිදහස් සෞඛ්‍යය සම්බන්ධයෙන් ජනතාව දිනාගත්ත අයිතියක් තිබෙනවා. නිදහස් සෞඛ්‍යය සම්බන්ධයෙන් ජනතාව දිනාගත්ත අයිතිය සුරක්ෂාකොට පෝෂණය කිරීම අපේ වගකීමක් වෙනවා. තමන්ගේ මංගල අය වැයෙන් ඒ නිදහස් සෞඛ්‍ය පිළිබඳ අයිතිය සම්බන්ධයෙන් ඇති කරන විප්ලවීය වෙනස පිළිබඳ දළ හඳුන්වා දීමක්වත් කරන එක ආණ්ඩුවේ යුතුකම; මුදල් ඇමතිවරයාගේ යුතුකම. හැබැයි, මේ අය වැය යෝජනාවල නිදහස් සෞඛ්‍ය ගැනත් වචනාර්ථයක්වත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නිදහස් සෞඛ්‍ය - free healthcare - ගැන වචනයක්වත් නැහැ. ඒ ඇයි? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලපෑම නිසා ඒ වචනය කියන්නත් ලජ්ජයි, මේගොල්ලන්. වචනය කියන්නත් ලජ්ජයි. කියනකොට කියන්න පුළුවන්, අපි සෞඛ්‍ය වෙනුවෙන් වැඩි මුදලක් වෙන් කර තිබෙනවා කියලා.

හැබැයි, වෙනදාට වඩා දැන් යම් මුදලක් වෙන් කළා කියලා නිදහස් සෞඛ්‍යය සුරක්ෂා වෙන්නේ කොහොමද? ඒ වෙනුවෙන් වූ ප්‍රතිපත්තිය මොකක්ද? මුදල් වෙන් කිරීමෙන් පමණක් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ විප්ලවයක් ඇති වන්නේ නැහැ. දැන් ඒ පිළිබඳව සංවේදී වන මන්ත්‍රීතුමන්ලාගෙන් අප අහන ප්‍රශ්නයක් තිබෙනවා. කෝ, ඔබතුමන්ලාගේ අලුත් ප්‍රතිපත්තිය? පරණ ප්‍රතිපත්තියම නේද; ඔබතුමන්ලා බණින ජේ.ආර්. ජයවර්ධනගේ ප්‍රතිපත්තියම, ප්‍රේමදාසගේ ප්‍රතිපත්තියම, රනිල් වික්‍රමසිංහගේ ප්‍රතිපත්තියම, චන්ද්‍රිකාගේ ප්‍රතිපත්තියම, රාජපක්ෂගේ ප්‍රතිපත්තියම නේද මේ අරගෙන යන්නේ? කොහේද තිබෙන්නේ, සෞඛ්‍යය පිළිබඳ අලුත් ප්‍රතිපත්තිය, අලුත් වැඩ පිළිවෙළ? එහෙම එකක් හැදෙනවා ද? කොහේද එය තිබෙන්නේ? කරුණාකර එය පැහැදිලි කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හරිම පුදුමයි. මොකද, මේ වාගේ විප්ලවීය පක්ෂයක්, විප්ලවීය නායකයන් මේ ආකාරයට අපටත් වඩා ලිබරල් කරලා, අපටත් වඩා ධනවාදී කරලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කටයුතු කරනවා. අපි නම් ඔහොම කරන්නේ නැහැ, අපි නම් එකඟ වෙන්නේ නැහැ. බොහෝ දෙනෙක් අහනවා, දැන් මොකක්ද තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය කියලා; ධනවාදය ද තිබෙන්නේ, ලිබරල්වාදය ද තිබෙන්නේ, සමාජවාදය ද තිබෙන්නේ කියලා අහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක මහත්මයාගේ අය වැයේ තිබෙන්නේ මුසාවාදය. වෙන දෙයක් නොවෙයි, මුසාවාදය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Clean Sri Lanka වැඩ පිළිවෙළ ඉතා වැදගත් එකක්. පරිසරය ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යය විසින් කරන ආයෝජනය වැදගත්. මම ඒක අගය කරනවා. Clean Sri Lanka වැඩ පිළිවෙළ සඳහා වන කාර්ය සාධක බලකාය පිහිටුවන ලද ගැසට් නිවේදනයේ තිබෙනවා, එහි අරමුණ මොකක්ද කියලා. ඒක නීත්‍යානුකූල ලියවිල්ලක්. නමුත්, හරි පුදුමයි, මේ අය වැය තුළ -සමහර විට ගරු ජනාධිපතිතුමාගේ අවධානයත් යොමු වෙලා නැතුව ඇති,- එතුමා කියනවා, මේ Clean Sri Lanka වැඩ පිළිවෙළ තුළ දූෂණ විරෝධී ක්‍රියාදාමයක් තිබෙනවා කියලා. අදාළ ගැසට් නිවේදනයේ කොහේද තිබෙන්නේ, දූෂණ විරෝධී - anti-corruption - වැඩ පිළිවෙළක් සම්බන්ධව? එවැන්නක් තිබෙනවා නම් කියන්න කියලා මම අභියෝග කරනවා. ඒකේ තිබෙන්නේ, පරිසරය ආරක්ෂා කිරීම ගැන, ඒ පිළිබඳ ආකල්ප වෙනස් කිරීම ගැන පමණයි. ඒක වැදගත්. ඒක කළ යුතුයි. ආයෝජනයත් වැදගත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි එහි කිසිම තැනක දූෂණ විරෝධී - anti-corruption - වැඩ පිළිවෙළක් පිළිබඳව සඳහන් වෙලා නැහැ. මේක නොමඟ යැවීමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනපතිතුමා කියනවා, Clean Sri Lanka වැඩසටහනේ අභිලාෂ ගැන. පළමුවැනි එක තමයි, යහපත් ආණ්ඩුකරණය සඳහා වන ප්‍රතිසංස්කරණය. දෙවැනි එක, දූෂණ විරෝධී ක්‍රියාමාර්ග. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ Clean Sri Lanka වැඩ පිළිවෙළ යටතට මේවා අරගෙන එන එක පුදුමයි. Clean Sri Lanka වැඩ පිළිවෙළ හොඳයි. පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් කරන ආයෝජනය වැදගත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් වැදගත් දෙයක් තිබෙනවා. ඒ තමයි, මේ රටේ අල්ලස හා දූෂණය මැඩලීම ප්‍රමුඛතාව දිය යුතු කාරණයක්ය කියන එක. ඒ සඳහා ක්‍රියාමාර්ග දෙකක් ගන්න පුළුවන්. එකක් තමයි, දූෂණයට තිබෙන ඉඩ කඩ ඩිජිටල්කරණ ක්‍රියාදාමය හරහා නැති කිරීම. අපේ සියලු පද්ධති - අපේ තොරතුරු පද්ධති, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු හා සම්බන්ධ පද්ධති - එක platform එකකට ගන්න පුළුවන් නම්,

දූෂණය අවම කරන්න පුළුවන්, බදුකරණය ශක්තිමත් කරන්න පුළුවන්, රාජ්‍ය ආදායම වැඩි කර ගන්න පුළුවන්. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ඒ වාගේම, මේ රටේ නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හරහා දූෂණය, අල්ලස නතර කළ හැකියි, මර්දනය කළ හැකියි. නමුත් අවාසනාවකට මේ අය වැය කථාවේ කිසිම තැනක දූෂණය නතර කිරීමට, ඒ වාගේම අල්ලසට, දූෂණයට එරෙහි ආයතන ශක්තිමත් කිරීමට නව වැඩ පිළිවෙළක් නැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තිබෙනවා. ඒකට කවදත් හැම ආණ්ඩුවක්ම මුදල් වෙන් කළා. එම නිලධාරීන්ට පඩි නඩි ගෙවනවා, කුලී ගෙවනවා. ඒවා ඔක්කෝම හරි. නමුත්, මොකක්ද අලුත් programme එක? මොකක්ද අලුත් වැඩ පිළිවෙළ? එහෙම එකක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපට මේ ගැන කථා කරන්න අයිතියක් තිබෙනවා. මේ රටේ අල්ලස හා දූෂණය පිළිබඳ නඩු විභාග කිරීම පිළිබඳව තිබෙන ප්‍රශ්න විසඳන්න 2018දී අපි මැදිහත් වුණා. මේ පාර්ලිමේන්තුවේ නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව තුළ සාකච්ඡා කරලා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ අදහස් එකතු කරලා එයට මැදිහත් වෙන්න අපට එදා හැකියාව ලැබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණයට අදාළව ක්‍රියාමාර්ග කිහිපයක් ගත යුතුයි. 2018 අංක 9 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යටතේ දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයක් පිහිටෙව්වා. ඒ, පළමුවෙනි එක.

අල්ලස් හා දූෂණ නඩු පමණක් දිනපතා විභාග කරන්න - day-to-day trial - බලය දුන්නා. මෙක වැදගත් දෙයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ බල ප්‍රදේශයේ ශ්‍රී ලංකා නීති විද්‍යාලය ඉස්සරහ දැන් වසා දමා තිබෙන ස්ථානයේ තමයි එම ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටා තිබෙන්නේ. අද ඒකේ වැඩකටයුතු කරන්නේ නැහැ. දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය වසා දමලා. එහි නඩු අහන්නේ නැහැ. ඒවා ආරම්භ කරන්න අප කටයුතු කළත්, එයට නඩු යොමු කර නැහැ පසුගිය අවුරුදු ගණනාවටම. විශාල තරගයක් දීලා අපි ඒවා ඇති කළා. ඒ කටයුත්ත ප්‍රමාද වෙච්ච නිසා, නඩු විභාග වෙන කොට ආණ්ඩු මාරු වෙච්ච නිසා ඒ අධිකරණය අකර්මණ්‍ය වුණා. ඇත්ත හොරු, ඇත්ත දූෂිතයන් හිරගෙවල්වලට යවන්න අවංක වුවමනාවක් තිබෙනවා නම් එහි දිනපතා නඩු අහලා එම කටයුතු ඉක්මනින් අවසන් කරන්න පුළුවන්. දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ එකක් නොවෙයි තුනක් ඇති කරන්නයි අපි යෝජනා කළේ. එකක් හැදුවා. අනෙක් දෙක හැදුවේ නැහැ. එම මහාධිකරණ තුනම හදලා දිනපතා නඩු විභාග කරලා ඒ කටයුතු ඉක්මනින් අවසන් කරන්න පුළුවන්කම තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ රටේ මහාධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ අඩුවක් තිබුණා. අපි ඒ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව 35කින් වැඩි කළා. අපි 2017 අංක 26 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත මඟින් මේ රටට අවශ්‍ය මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ උපරිම සංඛ්‍යාව 110ක් දක්වා වැඩි කළා. තවමත් 110ක් පත් කරලා නැහැ. මහාධිකරණ විනිශ්චයකාරවරුන් වැඩිපුර පත් කරලා තිබෙන නිසා මේ රටේ මහාධිකරණවල නඩු කටයුතු කාර්යක්ෂමව සහ වේගවත්ව කරගෙන යෑමේ අවස්ථාව දැන් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය නීතිමය පරිසරය හදලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ගැන පසුගිය කාලයේ විශාල විවාදයක් ඇති වුණා. අපි බලයට පත් වූ 2015 කාලයේ නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමත කරපු රජයේ අධිනීතිඥවරුන්ගේ සංඛ්‍යාව - approved cadre එක - 118යි. අපට පුළුවන්කම ලැබුණා, පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා ඒ 118, 218ක් බවට පත් කරන්න; 100කින් වැඩි කරන්න. ඒ වාගේම ඔවුන්ගේ වැටුප් සහ දීමනා කලින් ලබපු ප්‍රමාණය වාගේ තුන් ගුණයක් කළා. ස්වාධීනත්වය ඇති කරන්න වාගේම ශක්තියක් ලබා දෙන්නත් අපට හැකියාව ලැබුණා. දැන් කරන්න ඕනෑ නීතිපති දෙපාර්තමේන්තුව අධෛර්යවත් කරන එක නොවෙයි; නීතිපති දෙපාර්තමේන්තුවට අපවාද කරන එක නොවෙයි. දැන් කරන්න ඕනෑ නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත්ව ස්වාධීන ආයතනයක් හැටියට ගෙන යන්න පුළුවන් මාර්ගය සකස් කිරීමයි. මේ රටේ ප්‍රධානම ප්‍රශ්නය තමයි පරීක්ෂණ සිදු වුණාට, නඩු පැවරුවාට නඩු අහන්නේ නැති එක; නඩු ඇසීමේ ප්‍රමාදය. මේක බරපතළ ප්‍රශ්නයක්. මේ ගැටලුව විසඳීමට අවශ්‍ය පියවර කිසිවක් කෙරෙහි මේ අය වැයෙන් අවධානය යොමු කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුර කුමාර දිසානායක වර්තමාන මුදල් ඇමතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ කාලයේ මේ පාර්ලිමේන්තුවේ ඉදිරි පෙළේ ඉඳගෙන මේ හැම දෙයක් ගැනම කථා කළා. බොහොම සද්දෙන් කථා කළා; ලස්සනට කථා කළා. හැබැයි, අද වන කොට දූෂණ විරෝධී වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් එතුමා කියපු දේ එතුමාට අමතක වෙලා. එතුමාගේ අය වැය කථාවේ අලුත් දූෂණ විරෝධී වැඩ පිළිවෙළක් නැහැ. එතුමා ඒක සම්බන්ධ කරන්නේ Clean Sri Lanka වැඩසටහනට. Clean Sri Lanka වැඩසටහනේ අරමුණුවල දූෂණ විරෝධය - anti-corruption - නැහැ. ඒ නිසා ඒක විහිළුවක්. Clean Sri Lanka වැඩසටහන හොඳයි. හැබැයි, Clean Sri Lanka වැඩසටහනට දාලා දූෂණ විරෝධය ගළපන්න බැහැ. ඒක බරපතළ දෙයක්. ඒ සඳහා වෙනම පියවර ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මිලියන 2ක විතර අහිංසක මිනිස්සු පිරිසක් ඉන්නවා, විශේෂයෙන්ම රජයට අයිති ඉඩම් පරම්පරා ගණනක් තිස්සේ අස්වද්දා ගෙන ජීවත් වන. ඒ මිනිස්සු විශේෂයෙන්ම ඈත පළාත්වල, එනම් උතුරු මැද, නැගෙනහිර, වයඹ විතරක් නොවෙයි, දකුණ, බස්නාහිර, සබරගමුව, මධ්‍යම පළාත තුළත් ඉන්නවා. රජයට අයිති ඉඩම් අස්වද්දා ගෙන ජීවත් වෙච්ච ඒ මිනිසුන්ට ඒ ඉඩම්වලට අදාළව නිසි අයිතියක් නැහැ; ඒවා තමන්ගේ දරුවෙකුට දෙන්න පුළුවන්කමක් නැහැ; හදිසියේ ණය මුදලක් ගන්න ඒවා උගස් කර ගන්න පුළුවන් කමක් නැහැ; හොඳ මිලකට විකුණලා වෙන පළාතකින් ගෙයක් ගන්න ඕනෑ නම් ඒකට ද අවකාශයක් නැහැ. මේ සඳහා තමයි පසුගිය රජය ආරම්භ කළේ "උරුමය" වැඩසටහන. රජයේ ඉඩම්වල දීර්ඝ කාලයක් තිස්සේ නීත්‍යානුකූලව භුක්තියේ ඉන්න අයට සින්නක්කර ඔප්පු ලබා දෙන වැඩසටහනක් තමයි "උරුමය" වැඩසටහන. අද මේ රජය උරුමය වැඩසටහන අහෝසි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "උරුමය" කියන වැදගත් වූ වැඩ පිළිවෙළ අහෝසි කිරීම බොහොම වැරදියි. ඒ උරුමය වැඩසටහන අහෝසි කිරීම සාධාරණීකරණය කරන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම්, මම ආසයි ඒ කථාව අහන්න; ඒ තර්කය මොකක්ද කියලා අහන්න. ඒ විතරක් නොවෙයි, එතුමාගේ කථාවේ තිබෙනවා, "බිම් සවිය" වැඩ පිළිවෙළ දිරිමත් කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුදුමය මෙකයි. ඒ ඉලක්කය කොච්චර ද? මේ වසරට බිම් සවිය ඔප්පු 2,000යි, ඉලක්කය. වසරකට බිම් සවිය ඔප්පු 2,000යි. මේ රටේ ජනතාවට වසරකට ඔප්පු 2,000ක් ගණනේ දෙන්න ගියොත්, ඉහත කී සියලුදෙනාට එම ඔප්පු දෙන්න අවුරුදු 1,000ක් විතර යාවි.

මොනවාද මේ කථා? මේවා ගැන සලකා බලන්නේ කවුද? මේවා සැලසුම් කරන්නේ කවුද? කවුද මේවා ක්‍රියාත්මක කරන්නේ? මේ විෂය භාර ඇමතිවරු මොකටද ඉන්නේ? මේ වසරේ ඉලක්කය ඔප්පු 2,000යි! මොන විහිළුවක්ද? ඔප්පු ලක්ෂ 20ක් විතර දෙන්න තිබෙනවා. මේවා කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්න. ඒවා යම් ප්‍රමාණයකට විසඳිලා තිබෙනවා, තව කරන්න තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ බිම් සවිය පිළිබඳ ප්‍රශ්නය ඊටත්

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

වඩා බරපතළ ප්‍රශ්නයක්. බිම් සවිය කියලා කියන්නේ ඉතා වැදගත් වැඩ පිළිවෙළක්. "උරුමය" හා "බිම් සවිය" මාරු කර ගන්නා අයටයි මේ කියන්නේ. "උරුමය" කියන්නේ, රජයේ ඉඩම්වල භුක්තිකරුවන්ට සින්නක්කර ඔප්පු දෙන වැඩ පිළිවෙළ. "බිම් සවිය" කියන්නේ, පෞද්ගලිකව පුරවැසියන්ට අයිති ඉඩම් රජයෙන් මැනලා, රජයෙන් පිඹුරුපත් හදලා, ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරලා, සහතියක් දෙන වැඩ පිළිවෙළ. ඒක වැදගත් වැඩ පිළිවෙළක්. එහෙම කළාම මායිම් පිළිබඳ ප්‍රශ්න විසඳෙනවා, අයිතිය පිළිබඳ ප්‍රශ්න විසඳෙනවා, පාරවල් පිළිබඳ ප්‍රශ්න විසඳෙනවා විතරක් නොවෙයි, නඩු හබ අඩු වෙනවා. දැනට සාර්ථකව බිම් සවිය ක්‍රියාත්මක වෙච්ච ප්‍රදේශවල තිබෙන දිසා අධිකරණවල නඩු සංඛ්‍යාව සියයට 50කින්, සියයට 75කින් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මම රජයට යෝජනාවක් කරනවා. මේ බිම් සවිය කියන්නේ වැදගත් වැඩ පිළිවෙළක්. ඒ සඳහා කලින් ඕස්ට්‍රේලියානු රජය ආධාර කළා. ඕස්ට්‍රේලියාව හෝ වෙනත් රජයක ආධාර ලබා ගෙන, ප්‍රමුඛතාවක් දීලා බිම් සවිය ඔප්පු ලබා දීම ක්‍රියාත්මක කරන්න කියලා මා කියා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන්මම තව එක දෙයක් කියන්නම්. ඩිජිටල්කරණය ගැන කථා කරනවා. හැබැයි, මේ රටේ යුක්තිය පසිඳලීම පිළිබඳව තිබෙන වැදගත් වැඩ පිළිවෙළක් තමයි, court automation කියන්නේ. මම තොරතුරු තාක්ෂණ ඇමතිවරයා හැටියට සිටියදීත්, ඊට පසු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ court automation පිළිබඳ කම්ටුවේ සභාපති හැටියටත්, පසු ගිය රජය සමඟ කටයුතු කළා. ඒක සැලසුම් කරලා අවසන් වුණු වැඩසටහනක්, mature project එකක්. ඒ සඳහා යන වියදම දන්නවා, කරන විධිය දන්නවා, ප්‍රතිඵලය දන්නවා. මේ කලාපයේ හැම රටක්ම court automation හරහා ඉහළ සාර්ථකත්වයක් අරගෙන තිබෙනවා. හැබැයි, කනගාටුදායකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතාම වැදගත්, යුක්තිය පසිඳලීම සඳහා ඉවහල් වන, අතිශයින් වැදගත් මේ වැඩසටහන පිළිබඳ මේ අය වැයේ කිසිම සඳහනක් නැහැ. ඒවා ගැනවත් සඳහන් නොකර මොකක්ද මේ කථා කරන්නේ? ඒ නිසා බොහොම කනගාටුයි. තමුන්නාන්සේලාට විශාල ජන වරමක් ලැබුණා. ඒ ජන වරමට අපි ගරු කරනවා. අපි කැමැතියි, වැදගත් දෙයට, යහපත් දෙයට සහයෝගය දෙන්න. හැබැයි, මේ විධියට යන්නන්වාලේ පරණ ක්‍රමයටම යනවා නම්, විප්ලවයත් නැහැ, ධනවාදයත් නැහැ. ලිබරල්වාදයත් නැහැ, සමාජවාදයත් නැහැ, මුසාවාදය පමණයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම කනගාටුයි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, could you please raise your point of Order and make it short because we have to economize on time?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, please give me just ten seconds.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මගේ කථාවේදී වැටුප් සම්බන්ධ ලියවිල්ලක් ඉදිරිපත් කරද්දී මම ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාට කිව්වා ඒක Parliament එකේ Research Division එකෙන් දුන්නේ කියලා. ඒ පිළිබඳව ආණ්ඩු පක්ෂයෙන් සහ නොයෙකුත් අංශවලින් Parliament එකේ Research Division එකෙන් අහලා තිබෙනවා, ඒක දුන්නේ ඔවුන්ද කියලා. ඇත්තටම ඒක මට ලැබුණේ, විපක්ෂයේ Research Unit එකෙන්. එහි සඳහන් කරුණු සියල්ල නිවැරැදියි. ඉතා උගත් මහත්මියක් විසින් ඒක සම්පාදනය කරලා තිබෙන්නේ. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වේ, 2027 වර්ෂයේ අග භාගයේ තිබෙන වැටුප් ගැන. මම කියන්නේ, මට ලැබුණු ලේඛනය අනුව 2026 අවුරුද්දේ වැටුප් ගැන. 2026 අවුරුද්දේ එකත් තිබෙනවා, 2027 අවුරුද්දේ එකත් තිබෙනවා. Parliament එකේ Research Division එකෙන් නොවෙයි, ඒක දුන්නේ. ඒක නිවැරැදි කරන්න. ඒගොල්ලන් මගෙන් ඉල්ලීමක් කළා, මට පුළුවන් නම් ඒ clarification එක කරන්න කියලා. මම ඒ clarification එක තමයි මේ කරන්නේ. මම ඒ ලේඛනය ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමාට ඊයේ භාර දුන්නා, එතුමා ඒක අධ්‍යයනය කරලා උත්තරයක් දෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Vijitha Herath. You have 20 minutes.

[පූ.භා. 11.10]

ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළු රටටම ජනතාව දන්නවා, අපි භාර ගත්තේ බංකොලොත් වෙච්ච රටක් බව. නිල වශයෙන් ප්‍රකාශයට පත් කරපු, ආර්ථික වශයෙන් බංකොලොත්භාවයට පත් වෙච්ච රටක්; පත් කරපු රටක්. නමුත්, නව රජය සමත් වුණා, කෙටි කාලීන වැඩ පිළිවෙළක් තුළින් ඒ තත්ත්වය වෙනස් කරලා, රට බංකොලොත් තත්ත්වයෙන් මුදා ගෙන, කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන වැඩ පිළිවෙළක් සහිත අලුත් ආරම්භයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රට ස්ථාවර ආර්ථික තත්ත්වයකට ගෙනෙන්න නිෂ්පාදනය මත පදනම් වෙච්ච ආර්ථික වැඩ පිළිවෙළක් අත්‍යවශ්‍යයි. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය මත පදනම් වුණු, දිගු කාලීන වැඩ පිළිවෙළක අවශ්‍යතාව අපි කවුරුත් දැකලා තිබෙනවා. ජාතික ජන බලවේගයේ නව රජයේ ප්‍රතිපත්තිය ඒක. අපි ඒ දිගු කාලීනව නිෂ්පාදන ඉලක්ක කර ගත් වැඩ පිළිවෙළක ආරම්භක අවස්ථාවේ ඉන්නේ. ඒ සඳහා තමයි, පසුගිය කාලය තුළ වැදගත් තීන්දු කිහිපයක් ගත්තේ. ඒවා නිෂ්පාදනය සඳහා වැය වන පිරිවැය අඩු කර ගැනීම සඳහා ගත්ත තීන්දු.

කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ, කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීම සඳහා වූ වැදගත් තීන්දු කිහිපයක්ම අපි අරගෙන තිබෙනවා. ඒ තමයි, විදුලිබිල අඩු කිරීම - විශේෂයෙන්ම සංචාරක සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ විදුලි බිල අඩු කිරීම, කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා වැය වන පිරිවැය අඩු කිරීම සඳහා පොහොර සහනාධාර ලබා දීම. ඒවා හරහා අපි බලාපොරොත්තු වෙන්නේ දිගු කාලීන නිෂ්පාදනය මත පදනම් වූ ආර්ථික වැඩ පිළිවෙළට මූලික පදනම සකස් කර ගන්න.

ඒ වාගේම අපි දන්නවා මේ මොහොතේ අපි මුහුණ දෙන ආර්ථික අර්බුද තත්ත්වය ගැන. අන්න, ඒ ආර්ථික අර්බුද

තත්ත්වය කළමණාකරණය කර ගන්න තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක අපි වැඩසටහනකට ගිහිල්ලා තිබෙන්නේ. ඒ වැඩසටහන හරහා තාවකාලිකව මේ ආර්ථිකය කළමනාකරණය කර ගැනීමක් කරනවා. අපි දන්නවා, ඒ වැඩසටහනින් දිගු කාලීන ආර්ථික ඉලක්ක ජයග්‍රහණය කරන්න අමාරුයි. හැබැයි, ඒ වැඩසටහනින් තමයි අප වටිටලා තිබෙන තත්ත්වයෙන් ගොඩ එන්න ක්‍රියාමාර්ග ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා තමයි අපි ඒ කළමනාකරණ ඉලක්ක කර ගත්ත වැඩසටහන්වලට ගිහිල්ලා බොහෝ ඉලක්ක සම්පූර්ණ කරමින් යන්නේ. ඉතින්, ඒ වැඩසටහනේ තවත් අදියරක් විධියට මේ මාසයේ 28වෙනි දා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තුන්වෙනි සමාලෝචනය ඉදිරිපත් වෙනවා. ඒ තුන්වෙනි සමාලෝචනය සම්මත වුණාට පස්සේ ලංකාවට ලැබිය යුතු හතරවෙනි වාරිකය -තවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 335ක මුදලක්- ලැබෙන්න නියමිතව තිබෙනවා. අපි සුබවාදීව බලාපොරොත්තු වෙනවා ඒ තත්ත්වයට එන්න පුළුවන් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනටමත් අපේ විදේශ සංචිතය ඩොලර් බිලියන 6.1ක ස්ථාවරව ශක්තිමත්ව පවත්වා ගෙන යනවා. පසුගිය කාලයේ මේවා වැටිලා තිබුණේ. අද සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ක ඉලක්කයක් අපි හඹාගෙන යනවා. 2025 අවුරුද්දේ, අපේ වැඩසටහන තිබෙන්නේ එතැන. ඒකත් එක්කම, මූලික ප්‍රාග්ධන වියදම් සියයට 4කට සීමා කරලා අපි ඒකත් කළමනාකරණය කරගෙන යනවා. ඒ නිසා විපක්ෂයේ අය අදුරේ අත පත ගෑවාට, කලබල වුණාට, කර කියා ගන්න දෙයක් නැතිව ඔහේ යන්නන් වාලේ මොන මොනවා හරි කිව්වාට අපි ඒවාට කලබල වෙන්නේ නැහැ; කලබල විය යුතු නැහැ. අපි යන්නේ දිගු කාලීන ගමනක්; උපායමාර්ගික ගමනක්. ඒ නිසා අපි අපේ ගමන ඉතාම ශක්තිමත්ව ස්ථාවරව යනවා. ඒක ඔය අදෝනාවලින්, කෑ ගැසීම්වලින් ආපස්සට හරවන්නත් බැහැ. අපි ඉතා ශක්තිමත්ව ඒ ගමන යනවා. මේ රටේ ජනතාව ඒ සඳහා ජනවරම අපට දීලා තිබෙන්නේ. ජනතාවගේ ජනවරමට අනුකූල වෙච්ච ගමනක් අපි යන්නේ. ඒකට පටහැනි කිසිවක් අපි කරන්නේ නැහැ. ජනතාව බලාපොරොත්තු වෙච්ච දේවල් ටිකක් තිබෙනවා. ඒ බලාපොරොත්තු, ඒ අපේක්ෂා ඉෂ්ට කරමින් තමයි අපි මේ ගමන් මාර්ගයේ ගමන් කරමින් තිබෙන්නේ.

ඒ වාගේම ජනතාව බලාපොරොත්තු වුණා දූෂණය, වංචාව, නාස්තිය නැති කරපු දූෂණය, වංචාව, නාස්තිය අහෝසි කරපු පිරිසිදු පාලනයක් සහිත රටක්. ඒ සඳහා අවශ්‍ය මූලික අඩිතාලම අපි දැනටමත් දාලා තිබෙන්නේ. ඔබ-අපි කවුරුත් දන්නවා, ලංකා ඉතිහාසයේ පළමු වතාවට කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් නැතිව ඉතාම සාමාකාමීව හා නිදහස්ව පැවැති ජනාධිපතිවරණය, මහමැතිවරණය ගැන. කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් නැති, පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් නැති මැතිවරණ දෙකක් පවත්වන්න නව රජය සමත් වුණා. ඒකෙන් මුළු ලෝකයටම අපි ආදර්ශයක් ලබා දුන්නා. ඒ ආදර්ශය අපි ඉතා පැහැදිලිව ඔප්පු කරලා තිබෙනවා.

ඒත් එක්කම උතුරේ ජනතාවට, නැගෙනහිර ජනතාවට, වතුකරයේ ජනතාවට, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලු ජාතිකයන්ට සාමකාමීව, ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වෙන්න පුළුවන් අලුත් වාතාවරණයක් අපි ඇති කරමින් තිබෙනවා. ඒ සඳහා මූලික අඩිතාලම අපි යොදලා තිබෙනවා. එහිදී අපේ ආර්ථිකය බංකොලොත් කරන්න මැදිහත් වෙච්ච අයට, දූෂණ-වංචාවලට, ඝාතනවලට සම්බන්ධ වෙච්ච අයට ඉතා පැහැදිලි පරීක්ෂණ යාන්ත්‍රණයක් අපි ආරම්භ කරලා ඒ පරීක්ෂණ කටයුතු ඉතා සියුම්ව පවත්වාගෙන යනවා. අපි කලබල වෙන්නේ නැහැ; අපි හදිසි වෙන්නේ නැහැ. නීත්‍යානුකූලව, නිවැරදි ක්‍රමයට යටත්ව අපි ඒ නීති ක්‍රියාමාර්ග නිසි කලට නිසි පරිදි ගන්නවා. ඒ නිසා අපි මේ රටේ ජනතාවට සහතිකයක් දෙනවා ඒ පරීක්ෂණ අවසන් වෙනකොට රටේ ආර්ථිකය බංකොලොත් කරපු, රටේ එවැනි වැරදි දේශපාලන සංස්කෘතියක් ඇති කරපු අයට එරෙහිව නීතිය නිසි වෙලාවට ක්‍රියාත්මක වනවා. ඒ පරීක්ෂණ අවසන් වුණාට පස්සේ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග හරහා ඒ දේවල් හරියාකාරව සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රට තුළ ඇති වෙච්ච දේශපාලන ස්ථාවරත්වය, පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීවරුන්ගෙන් යුක්ත ස්ථාවර ශක්තිමත් දේශපාලන තත්ත්වයක් ඇතුළේ රට තුළ ඇති වෙලා තිබෙන දේශපාලන ස්ථාවරත්වය, මුළු ලෝකයම අද අලුත් අත්දැකීමක් විධියට ලබා ගනිමින් තිබෙනවා. ඒ නිසා අද අපේ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය කරන ආයෝජන අපේ ලංකාවේ ආයෝජනය කරන්න දැන් ආයෝජකයන් අපේ රටට එන්න පටන් ගෙන තිබෙනවා. මොකද, ආර්ථිකය ක්‍රමානුකූලව වර්ධනය වෙන මාවතක් පෙන්නුම් කරන්නට ඒ ගොල්ලන්ට අවශ්‍ය වුණා. ඉතින් අපි ඒක පෙන්නුම් කරලා තිබෙනවා. ටික ටික ආර්ථිකය ශක්තිමත් වෙමින් යනවා, ධනාත්මක පැත්තට. ඒ වාගේම දේශපාලන ස්ථාවරත්වය ශක්තිමත් වෙලා තිබෙනවා. ඒ නිසා ආයෝජකයන්ට අවශ්‍ය කරන මූලික පසුබිම සකස් වෙලා තිබෙනවා. දැන් ඉන්දියාව, චීනය, මැද පෙරදිග රටවල, ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා රටවල ආයෝජකයෝ අපේ රටේ ආයෝජනය කරන්න එන්න පටන් අරන් තිබෙනවා. ඒ සඳහා මූලික පදනම සකස් වෙමින් තිබෙනවා. ඒ ආයෝජකයන් ඇවිල්ලා සාකච්ඡා කරලා ඒවා කෙටි කාලයක් තුළ ආරම්භ කරන්නට බොහෝ එකඟතාවන්ට ඇවිල්ලා තිබෙනවා.

මම කියන්න සන්තෝෂයි, දැන් රුසියානු - යුක්‍රේන යුද්ධය නතර කිරීම සඳහා වෙච්ච නව ප්‍රවේශයක් ඇමෙරිකා එක්සත් ජනපදයේ නව ට්‍රම්ප් පාලනය හරහා යෝජනා කරන්න ලැහැස්ති වෙනවා. යුක්‍රේනය හා රුසියාව අතර පවතින යුද ගැටුම්කාරී තත්ත්වය ලෝක ආර්ථිකයට, ලෝක සාමයට බලපා තිබෙනවා. ඒ නිසා ඇමෙරිකාව පැත්තෙන්ම තව නොබෝ දිනකින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට යෝජනාවක් ඉදිරිපත් වෙන්න නියමිතව තිබෙනවා, සාමකාමී ගෝලීය පරිසරයක් ඇති කර ගැනීම සඳහා ප්‍රවේශයක් ගන්නට. ඒක බොහොම හොඳයි. සුබවාදී දෙයක්. මොකද, එවැනි තත්ත්වයක් ඇතුළේ, ලෝක සාමය බිහිවීම තුළ තමයි අපේ රටටත්, අපේ ආර්ථිකයටත් ශක්තිමත් තත්ත්වයක් එන්නේ.

ඒ නිසා එවැනි තත්ත්වයන් ලෝකය තුළ මතු වෙද්දී, ඒ සියලු රාජ්‍යයන්වල සහයෝගය අන්තර් ජාතික වශයෙන් අපට ලැබෙමින් තිබෙනවා. එදා විපක්ෂයේ අය බොරු බිල්ලෝ මැව්වා, අනුර කුමාර දිසානායක අපේ ජනාධිපතිතුමා බලයට ආවාට පස්සේ ජාත්‍යන්තර සහයෝගය ගන්න බැහැ; ජාත්‍යන්තර සහයෝගය නැහැ කියලා. ඒක තිබෙන්නේ අහවල් අහවල් අයට විතරයි කියලා කිව්වා. නමුත් අද අපි මේ කෙටි කාලය තුළ ඉතා ශක්තිමත්ව පැහැදිලිව ඔප්පු කරලා පෙන්වලා තිබෙනවා, ඉන්දියාව, චීනය, ඇමෙරිකාව, මැදපෙරදිග, යුරෝපය කියන ඒ හැම රටක් එක්කම ඉතාම සමීප රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවක් ශක්තිමත්ව ගොඩනඟා ගනිමින් තිබෙන බව. ඒ සියලුදෙනාගේ සහයෝගය තුළ ජාතික ජන බලවේග ආණ්ඩුව ඉතාම ශක්තිමත් ජාත්‍යන්තර සම්බන්ධතාවක් ගොඩනඟමින් ඉස්සරහට යනවා.

දැන් මේ රටේ ජනතාව තුළ ඒ විශ්වාසය ඉතා පැහැදිලිව ඇති වෙලා තිබෙනවා. ඉතින් ඒ අයගේ ආයෝජන ස්ථාවර කරන්න, ආයෝජන ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා - investment promotion and protection සඳහා- ඒ agreementsවලට අත්සන් කළා. පසුගිය කෙටි කාලය තුළ එක්සත්

[ගරු විජිත හේරත් මහතා]

අරාබි එමීර් රාජ්‍යයක් එක්ක අපි මේ ගිය පළමු ගමනේදීම ආයෝජන ප්‍රවර්ධන ශක්තිමත් කිරීමේ කොමිසමක් පිහිටුවන්නට ගිවිසුම් අත්සන් කළා. මේ අය වැය කථාවේ ඉතා පැහැදිලිව ජනාධිපතිතුමා සඳහන් කරලා තිබෙනවා, ලංකාවට එන සියලු ආයෝජන ආරක්ෂා කිරීම සඳහා investment promotion and protection සඳහා වන නීතිය ශක්තිමත් කරන්න සියලු රාජ්‍යයන් සමඟ කටයුතු කරන්නට අවශ්‍ය නීතිමය තත්ත්වයන් ඇති කරනවා කියලා. ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? මම අර කියපු දිගුකාලීන ගමන යාම සඳහා වෙච්ච, විදේශ ආයෝජන කැඳවා ගෙන, ඒ ආයෝජනවල ස්ථාවරත්වයේ ශක්තිමත්භාවය රැකගෙන ඉස්සරහට යන වැඩපිළිවෙළ තමයි ඒක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ තිබෙන ආර්ථික තත්ත්වය කළමනාකරණය කරගෙන යද්දී, කෙටි කාලීනව අපේ විදේශ සංචිත වැඩි කර ගන්න, විදේශ විනිමය ලබා ගන්න, විදේශ ප්‍රේෂණ ලබා ගැනීමේ ඉලක්ක සහිතව සංචාරක ක්ෂේත්‍රය, ඒ වාගේම විදේශ රැකියා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා අපි පියවර ගණනාවක් තැබුවා.

පසුගිය කාලයේ සංචාරක ක්ෂේත්‍රය හොඳටම කඩාගෙන වැටිලා තිබුණා කියන එක අපි කවුරුත් දන්නවා. COVID-19 වසංගතය, පාස්කු ප්‍රහාරය, ආර්ථික අර්බුදය, ඒ වාගේම පාලනයේ තිබුණු දුෂිතභාවය නිසා පසුගිය කාලය පුරාවට සංචාරකයන් ලංකාවට ආවේ නැහැ. හැබැයි, කියන්න සන්තෝෂයි, කියන්න ආඩම්බරයි. ජනවාරි මාසය තුළ පමණක් සංචාරකයන් 253,000ක් ලංකාවට ආවා. මේ ගෙවුණු මාස එකහමාරක කාලය තුළ විදේශ සංචාරකයන් 315,000ක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා.

එසේ සංචාරක පැමිණීම වැඩිවෙනකොට, සංචාරක ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය නඟා සිටුවීම සඳහා අපි පියවර ගණනාවක් ගනිමින් තිබෙනවා. මේ සඳහා අවශ්‍ය කරන අලුත් නීතිමය පසුබිම් හදන්න අපි මූලික අඩිතාලම දමා තිබෙනවා. ඒ කියන්නේ මොකක්ද? ජාතික සංචාරක කොමිසමක් පත් කරන්න කටයුතු කරනවා. අද සීගිරියට ගියාම, යාලට ගියාම මේ සංචාරකයන්ගේ වැඩිවීමත් එක්ක, ඒ අවශ්‍ය කරන යටිතල පහසුකම් එක්ක වේගවත් වර්ධනයක් අපි ලබාගත යුතුව තිබෙනවා; අත්පත් කරගත යුතුව තිබෙනවා. ඒ සඳහා මේ සියලු අමාත්‍යාංශ, ආයතන ඒකාබද්ධ කරන්න ඕනෑ. සංචාරක අමාත්‍යාංශය, වනජීවී අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, අදාළ බල ප්‍රදේශවල පළාත් පාලන ආයතන, සංචාරක පොලීසිය, සංචාරක ක්ෂේත්‍රයට බලපාන මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි මේ සංචාරක කර්මාන්තය නඟාසිටුවීමට අවශ්‍ය වන ආයතන ගණනාවක් තිබෙනවා. ඒ සියලු ආයතන ඒකාබද්ධ කර ගත් ජාතික කොමිසමක් පිහිටුවීම සඳහා අවශ්‍ය කරන නීතිමය පසුබිම හදන්න අපි දැනටමත් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම කැබිනට් පත්‍රිකාව සම්මත වුණාම ඒකත් එක්ක අවශ්‍ය කරන නව පනත් කෙටුම්පතක් අපි සම්පාදනය කරනවා. එම පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ මුළු රටේම සංචාරක කර්මාන්තයේ වර්ධනය සඳහා කටයුතු කිරීමට ජාතික සංචාරක කොමිසම අපි පිහිටුවනවා.

ඊට අනුබද්ධව සංචාරක කලාප ඉලක්ක කර ගත් ප්‍රාදේශීය සංචාරක සංවර්ධන කමිටු පත් කරනවා. උදාහරණයක් විධියට ඇල්ල, සීගිරිය, නුවරඑළිය, මීගමුව වැනි කලාප තිබෙනවා. ඒ කලාපවල සංචාරක ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා මම මුලින් සඳහන් කරපු සියලුම ආයතන ඒකාබද්ධ කර ගත් ප්‍රාදේශීය සංචාරක සංවර්ධන කමිටු පිහිටුවනවා. එතකොට ඒ කලාපයේ සංචාරක වර්ධනය සඳහා ඒකාබද්ධ මෙහෙයුමක්, ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න පුළුවන්. අපි මේ ප්‍රශ්නය හඳුනාගෙන තිබෙනවා. මොකද, එකපාරට කියනවා සීගිරියේ ටිකට් එක දෙන එක ප්‍රමාදයි, එහෙම නැත්නම් වැසිකිළි පහසුකම් අඩුයි කියලා. ඒවා සම්පාදනය කිරීම සංචාරක අමාත්‍යාංශයට විතරක් කරන්න බැහැ. මේ සියලු ආයතන ඒකාබද්ධ වුණාම ඉතා පහසුවෙන්, කඩිනමින් තීන්දු-තීරණ ගන්න පුළුවන්. ඒ තීන්දු-තීරණ එක්ක මෙක වේගයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන්.

ඒ වාගේම මේ සංචාරක ක්ෂේත්‍රයේ විවිධ තලවල විවිධ අය මැදිහත් වෙනවා. අලුත් ආයෝජන අවශ්‍ය වෙනවා. අලුත් හෝටල් අවශ්‍ය වෙනවා. අපි ඒ සඳහා අවශ්‍ය කරන පියවර දැන් ගනිමින් තිබෙනවා. ඒ වාගේම සංචාරක ක්ෂේත්‍රයේ බිම් මට්ටමේ කටයුතු කරන සංචාරක මාර්ගෝපදේශකයන්ගේ, රියදුරන්ගේ, විවිධ වෘත්තීන්වල නියැළෙන අයගේ ජීවිතවලට ආරක්ෂණයක් නැහැ. අපි දැනටමත් ඒ සියලුදෙනා සඳහාම රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්න අවශ්‍ය කරන මූලික කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, ඒ සියලුදෙනාටම විශ්‍රාම වැටුපක් ලබා දීම සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමවේදය හඳුන්වා දෙන්න අවශ්‍ය කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා. ඉතා නොබෝ දිනකින් අපි ඒක ක්‍රියාවට නඟන්න අවශ්‍ය නීතිමය කටයුතු සම්පාදනය කර ගන්නවා. එතකොට සියලුදෙනාට -මාර්ගෝපදේශකයන්ට, රියදුරන්ට, විවිධ ක්ෂේත්‍රවල නියුතු අයට- තමන්ගේ දායකත්වයෙන් දායක විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමයක් හඳුන්වා දුන්නාම, ඔවුන්ට වයසට යනකොට ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය ඇතුළේ විශ්‍රාම වැටුපක් ගන්න පුළුවන්. එවැනි ස්ථිරසාර ක්‍රමවේදයක් අපි සකස් කරමින් තිබෙනවා.

අද ලෝක බාලදක්ෂ දිනය. කියන්න සන්තෝෂයි, ලෝක බාලදක්ෂ දිනය වෙනුවෙන් අද දවස පුරා ලංකාවේ විවිධ ප්‍රදේශවල පිහිටි දුම්රිය ස්ථාන 110ක් පිරිසිදු කිරීමේ කටයුත්තට සියලුම බාලදක්ෂයින් මැදිහත් වෙනවා. ඒ හරහා අපේ දුම්රිය ස්ථාන පිරිසිදු වෙනවා. මේවා සංචාරකයන්ට පහසු ස්ථාන බවට පත් වෙනවා. එවැනි දායකත්වයක් ලබාදෙන බාලදක්ෂයින්ට අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම, සංචාරක ක්ෂේත්‍රයේ තිබෙන යම් ප්‍රමාදවීම් වැළැක්වීම සඳහා digital technology හඳුන්වා දීමේ ක්‍රමවේදය අපි දැනටමත් ආරම්භ කර තිබෙනවා. ඒ හරහා ටිකට් පත් ලබා දීම සහ අනෙකුත් දේවල් ඩිජිටල් ක්‍රමය හරහා ලබා දීමේ මූලික පියවර අපි දැනටමත් ආරම්භ කර තිබෙනවා. මේ ලබාගත් ජයග්‍රහණ තුළින් ගිය අවුරුද්දේ අපි සංචාරකයින් මිලියන 2ක ඉලක්කයකට ආවා. ඇත්තටම ගත්තොත් මිලියන 2.2ක්. මේ 2025 වසරේ සංචාරකයන්ගේ පැමිණීම ලක්ෂ 30 දක්වා -මිලියන 3 දක්වා- වැඩි කරගන්න අපි අනිවාර්යයෙන්ම මැදිහත් වෙනවා. මේ රටේ ජනතාවට එයින් විශාල වාසි ප්‍රමාණයක් ලැබෙනවා. රැකියා අවස්ථා පුළුල් වෙනවා. අපේ ආර්ථිකය ශක්තිමත් වෙනවා. කඩිනම් ක්‍රියා මාර්ග හරහා අපි එතැනට යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පසුගිය කාලය පුරාවටම අපේ විදේශ රැකියා ක්ෂේත්‍රය වංචාවෙන්, දූෂණයෙන් පිරිලා තිබුණා.

හිටපු ඇමතිවරුන් සහ අතළොස්සක් වෙච්ච සමහර නිලධාරීන් මේ දූෂිත යන්ත්‍රණය ක්‍රියාත්මක කරලා, විවිධ දූෂණ ක්‍රියාවලට මැදිහත් වෙලා තිබුණා. එහි කුපක්‍රට සිදුවීමක් තමයි, E8 වීසා ක්‍රමය. කිසිදු කැබිනට් අනුමැතියක්, ඒ වාගේම දෙපාර්තමේන්තු අනුමැතියක් නැතිව ඇමතිවරයා පෞද්ගලිකව තනි කැමැත්ත, වුවමනාව මත ගිවිසුම් අත්සන් කරලා තිබුණා. අපි ඒවා වෙනස් කරලා පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේදී අනුමැතියක්ම ලබාගත්තා, නිවැරදි ක්‍රමවේදයට අනුව E8 වීසා

ක්‍රමයට ශ්‍රී ලාංකිකයින් නැවත විදෙස් රැකියාවලට යවන්න. අපි ඒ තීන්දුව අරගෙන තිබෙනවා, නීත්‍යානුකූල ක්‍රමවේදයකින්. අපි බලාපොරොත්තු වෙනවා, මාර්තු මාසය අග වෙනකොට ඒ ඍතු ක්‍රමවේදයට විදේශ රැකියා සඳහා කොරියාවට ශ්‍රමිකයින් යවන එක ආරම්භ කරන්න පුළුවන් වෙයි කියලා. කැබිනට් මණ්ඩලය ඒ ක්‍රමවේදය අනුමත කළා. ශ්‍රී ලංකා රජය මැදිහත් වෙලා කොරියාවේ විවිධ ප්‍රාන්තත් එක්ක ගිවිසුම් අත්සන් කරලා පෞද්ගලිකව එක එක්කෙනාට සල්ලි දීලා අමාරුවේ වැටෙන තත්ත්වය ඇති නොවෙන්න රජයේ ආයතනයක් වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා 5,000කට ආසන්න පිරිසක් මේ ඍතුවේ රැකියා සඳහා දකුණු කොරියාවට යවන්න අපි දැන් කටයුතු කරලා තිබෙනවා. ලබන මාර්තු මාසය අග වෙනකොට ඒ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ලබන මාර්තු මාසයේ තමයි ඒක පටන් ගන්නේ. ඒ ක්‍රමවේදය ඇතුළේ පළමුවැනි වතාවට කෙටි කාලයකට කොරියාවට ගියාම ඔවුන්ට තුන් වතාවක් ලංකාවට ඇවිල්ලා නැවත කොරියාවට යෑමේ අවස්ථාව අපි සකස් කරනවා. ඒ නිසා කොරියාවට ගිහිල්ලා මාස අටකට පසුව නැවත ලංකාවට එන්න පුළුවන්. ඇවිල්ලා ආපහු යන්නත් පුළුවන්. ඒ අවස්ථාව ඇති කළාට පස්සේ ඒ ඇති වෙන විශ්වාසය සහ ඒ දිගු කාලීන ක්‍රියාමාර්ගය ඇතුළේ ස්ථාවරව කොරියාවේ රැකියා කිරීමේ අවස්ථාව තවත් පුළුල් වෙනවා. ඒකට නිවැරදි ක්‍රමවේදයක් අපි හදලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ, ධීවර ක්ෂේත්‍රයේ නියුතු තරුණයින්ට ලබන මාර්තු මාසය අග වෙනකොට E8 වීසා ක්‍රමය යටතේ රජය මඟින් කොරියාවේ රැකියා අවස්ථා 5,000ක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න, ජාතික සමඟිය ගොඩනඟන්න අපි පසුගිය කාලයේ විවිධ ක්‍රියාමාර්ග ගත්තා. ඒ වාගේම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරලා ඉදිරිපත් කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ඒක මේ පුන පුනා කිය කියා ඉන්න ඕනෑ දෙයක් නොවෙයි. ඒක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, අපේ පැහැදිලි වැඩ පිළිවෙළ තුළ ඉතාම පැහැදිලිව කියලා තිබෙන දෙයක්. ඒක අපි නිසි කලට කරනවා. මේ අය වැය ඉදිරිපත් කරද්දි මේකට නිසි ක්‍රමවේදයක් තිබුණා. ඒ අනුව අපේ ආර්ථික දැක්ම ඉදිරිපත් කළා. ඒ වාගේම තමයි ජාතික සමඟිය ගොඩනැඟීමත්. මේ යල් පැන ගිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දීම වෙන්නේ මේ රටේ ජනතාවගේ කැමැත්තෙන්. මෙතෙක් කල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හැදුණේ බලහත්කාරයෙන්. දැන් ඔය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගැන කථා කරන ඔස්තාර් මහත්වරුන්ට මතක ඇති, ඉතිහාසය. 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගත්තාම, බලහත්කාරයෙන් තමයි ජේ. ආර්ලා ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හදලා සම්මත කරගත්තේ. එතකොට මේ රටේ ජනතාවගේ ජන මතය විචාරණයකට ලක් කළේ නැහැ. ඒ නිසා අපි ඉතා පැහැදිලිව මේ රටේ ජනතාවගේ කැමැත්තෙන්; ජන මත විචාරණයකින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරලා ඉදිරිපත් කරනවා. ඒක අපි නිසි කලට, නිසි වෙලාවට කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනටමත් ක්‍රියාත්මක වෙන මර්දන නීති තිබෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, Online Safety Bill එක පසුගිය කාලයේ සම්මත කරගත් අණ පනත්. ඒවා හරහා අපේ මාධ්‍ය නිදහස නැති කරන තත්ත්වයන් පවා ඇති වුණා. ඒ අණ පනත් වෙනස් කිරීම සඳහා අපි දැනටමත් කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥ රියෙන්සි අර්සකුලරත්න මහත්මයාගේ මූලිකත්වයෙන් කමිටුවක් පත්කරලා අපි ඒ කටයුත්ත කරගෙන යනවා. Online Safety Bill එක ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දීපු නියෝගවලට යටත්ව තව අලුත් අදහසුත් ඉදිරිපත් කර ගනිමින්, සාකච්ඡාවට භාජන කරලා එය සංශෝධනය කරන්න අවශ්‍ය පියවර අපි දැනටමත් අරගෙන තිබෙනවා. යාපනය පුස්තකාලය නැවත පිළිසකර කරලා, නවීකරණය කරන්න අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම උතුරු පළාත තුළ නව ආයෝජන කලාප තුනක් බිහි කරලා, උතුරේ තරුණ තරුණියන්ට නව රැකියා අවස්ථා, ආයෝජන අවස්ථා ලබා දෙන්නත් අපි කටයුතු කරමින් තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

මෙච්චර කාලයක් වතුකරයේ ජනතාව සම්බන්ධයෙන් නිවැරදි ආර්ථික දැක්මකින් කටයුතු කරන්න කිසිදු රජයක් මැදිහත් වුණේ නැහැ. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි රාජ්‍ය නායකයෙක් ඒ මලයගම් දම්ළ ජනතාව වෙනම හඳුනාගෙන, ඒ සංස්කෘතික අනන්‍යතාව හඳුනාගෙන, ඔවුන් වෙනම සංස්කෘතියක් සහිත ජනතාවක් බවට පිළිගෙන අද ඒ සඳහා වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Vijitha Herath, your time is up.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Okay, Sir.

ඒ ජාතික සමඟිය ගොඩනැඟීම සඳහා වෙච්ච ක්‍රියාමාර්ග හරහා අපි ඉදිරිපත් කරලා තිබෙන මේ අය වැය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ජනතාවාදී අය වැයක්.

මේක අරවාදය, මේ වාදය නොවෙයි. මෙතැන තිබෙන්නේ පැහැදිලිවම ජනතාවාදය; මේක ජනතාවාදය. එක එක්කෙනාට වෙන වෙන වාද හදාගන්න පුළුවන්. හැබැයි, මේක ජනතාවාදී අය වැයක්. ඒ කියන්නේ, අපි ඉදිරිපත් කර තිබෙන්නේ ජනතාවාදය මත පදනම් වෙච්ච අය වැයක්. මේ රටේ ජනතාවගේ ජන මතයට අනුකූලව ජනතාවගේ ආශීර්වාදයෙන් දිගු කාලීන ඉලක්ක සහගතව අපි ගමනක් යනවා. බල්ලෝ බුරද්දෙන්, තවලම ඉදිරියට ඇදෙනවා, කාටවත් ඒක නතර කරන්න බැහැ. ඒ අනුව ශක්තිමත් ගමනක් අපි යනවා කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have 22 minutes.

[පූ.භා. 11.31]

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට අපි ඇත්තටම හිතුවේ සාමාන්‍ය අය වැයක් අධ්‍යයනය කරනවාට වඩා විශාල අධ්‍යයනයක් මේ සම්බන්ධයෙන් කරන්න වෙයි කියලායි. මොකද, සාමාන්‍ය අය වැයකට වඩා ගොඩක් වෙනස් දේවල් මේ අය වැය තුළින් ඇති වෙයි කියලායි අපි හිතුවේ. මොකද NPP ආණ්ඩුවක, වෙනස් ප්‍රතිපත්ති තිබෙන දේශපාලන පක්ෂයක අය වැයක් එනකොට අපට අධ්‍යයනය කරන්න ගොඩක් දේවල් වෙනස් විධියට තියේවි කියලා අපි හිතුවා. හැබැයි, සුපුරුදු අය වැයක් අධ්‍යයනය කරන විධියටම මේ

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

අය වැයේත් තිබෙන ඉලක්කම් විතරයි අපට අධ්‍යයනය කරන්න තිබුණේ. මම හිතන විධියට policies වශයෙන් විශාල වෙනසක් මේ අය වැයේ නැහැ. අපි හිතුවේ සමහර ප්‍රතිපත්ති - policies - අංශක 180කින් වෙනස් වෙයි කියලායි. නමුත්, එවැනි වෙනසක් මෙහි නැහැ. ඒ නිසා මේ අය වැය සම්බන්ධයෙන් කථා කරන්න අපට වැඩිය සොයා බලන්න දෙයක් තිබුණේත් නැහැ. හැබැයි, විශේෂයෙන්ම මේ අය වැයේදී දැකපු යම් කරුණු කිහිපයක් අනිවාර්යයෙන්ම මේ අවස්ථාවේදී මම මතු කරන්න ඕනෑ.

මේ අය වැය ඇතුළේ අපි දකිනවා, revenue එක විධියට Rs. 4.9 trillion තිබෙන බව. වියදම් - expenditure - විධියට තිබෙන්නේ Rs. 7.1 trillion. එතකොට Budget එකේ deficit එකක් තිබෙනවා, රුපියල් ට්‍රිලියන 2.2ක. සාමාන්‍යයෙන් මෙවැනි Budget එකක deficit එකක් තිබුණාම, Government එකේ ප්‍රතිපත්තිය වෙන්නේ Treasury Bonds ණයට අරගෙන මේ අය වැයේ තිබෙන හිඟය පියවා ගන්න එකද දන්නේ නැහැ. අය වැයේ තිබෙන මේ වෙනස, පරතරය හදන්න Treasury Bonds හරි මොනවා හරි එකක් දීලා ණය අරගෙන මේ අය වැයේ තිබෙන හිඟය හදාගන්න බලාපොරොත්තු වෙනවා ද, නැද්ද කියන එක මම දන්නේ නැහැ. මට පෙනෙන විධියට මේ ගරු සභාවේ දැන් මුදල් ඇමතිවරයා හෝ නියෝජ්‍ය මුදල් ඇමතිවරයා නැහැ. Budget Debate එකකදි, එහෙම නැත්නම් මුදල් සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ ගරු සභාවේ නියෝජ්‍ය මුදල් ඇමතිවරයෙකුවත් නැහැ. දැන් කියනවා, කෝච්චි පාරවල් හදනවා, පාලම් හදනවා, ඉස්පිරිතාල හදනවා කියලා. මේ ඔක්කෝම Capital Expenditure. අය වැයක තිබෙන පරතරය අඩු කරන්න Capital Expenditure තමයි සාමාන්‍යයෙන් අඩුවෙන් කරන්නේ. එතකොට අය වැය ලේඛනය, අය වැය කථාව කියවනකොට ලංකාවේ ඉන්න සියලුදෙනාම බලනවා, හරි මේ අවුරුද්දේ රුපියල් බිලියන මෙච්චර ප්‍රමාණයක් වියදම් කරලා පාරවල් හදනවා, රුපියල් බිලියන මෙච්චර ප්‍රමාණයක් වියදම් කරලා ඉස්පිරිතාල හදනවා කියලා. දැන් මේ ආණ්ඩුව කියන්න පුළුවන්, නැහැ, නැහැ, ගිය ආණ්ඩුවලට වඩා අපි වෙනස් කියලා. හැබැයි ඉතින් Budget එක බලද්දී නම් එහෙම දෙයක් පෙනෙන්නේ නැහැ.

2015 සිට 2024 අවුරුද්ද දක්වා ඉදිරිපත් කළ සෑම අය වැයක්ම ගත්තාම Capital Expenditure එකෙන් සියයට 58ක ප්‍රමාණයක් තමයි වියදම් කර තිබෙන්නේ. 2024 අවුරුද්ද ගත්තාම රුපියල් බිලියන 1,260ක් Capital Expenditure සඳහා වියදම් කරනවා කිව්වාට, රුපියල් බිලියන 791යි වියදම් කරලා තිබෙන්නේ. දැන් මේ අය වැය ලේඛනය කියවලා, අය වැය කථාව අහලා මේ capital developments වෙයි කියලා ඉතා සතුටින් ඉන්න සමහර දිස්ත්‍රික්කවල ජනතාවට, අවුරුද්ද අන්තිමට දැකගන්න වෙන්නේ Capital Expenditure වියදම් කරලා නැහැ, මේ කියන සංවර්ධනය වෙලා නැහැ කියන එකයි. මොකද, මේක ඇතුළේ තිබෙන Recurrent Expenditure ඉදිරියේදී වෙනස් වෙනවා. 2024 අවුරුද්දට Budget එක ඉදිරිපත් කරනකොට ගෙවන්න අනුමාන කරපු පොලියට වඩා වැඩි ප්‍රමාණයක් 2024 අවුරුද්දේදී අපට පොලිය විධියට ගෙවන්න සිදු වුණා. එතකොට මේ Recurrent Expenditureවලත් වෙනස්කම් සිද්ධ වෙනවා. එතකොට අනිවාර්යයෙන්ම මම හිතන්නේ ගිය පාර අය වැයේ සිදු වුණා වාගේම මේ අවුරුද්ද අවසාන වෙනකොට එහෙම නැත්නම් ලබන අවුරුද්ද මුල වෙනකොට අපට දැකගන්න පුළුවන් වෙයි, මේ කියපු පොරොන්දු ඉෂ්ට කරන්න බැරිවෙන බව; Capital Expenditure අඩු කරන්න වෙන බව. අපිත් කැමැතියි, මේ දේවල් කරලා දෙනවා නම්. මේවා කරන්න හොඳ නැහැ කියලා නොවෙයි අපි කියන්නේ. අපි මේ Budget එකේ තිබෙන අඩු පාඩු පෙන්වා දෙන්න තමයි උත්සාහ කරන්නේ. අය වැයකදි සාමාන්‍යයෙන් මේ අඩු පාඩු සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම, අරසාංගම් இந்த வரவு செலவுத் திட்டத்தினூடாகப் பாரிய அபிவிருத்தித் திட்டங்களை முன்னெடுப்பதாகச் சொல்லியிருக்கின்றது. நான் இப்போது வரலாற்றில் இருக்கின்ற உதாரணங்களைத்தான் எடுத்துச் சொன்னேன். பெரும்பாலும் வழமையாக பாரிய அபிவிருத்தித் திட்டங்களுக்கான ஒதுக்கீடுகளில் 58 சதவீதந்தான் முழுமையாகப் பயன்படுத்தப்பட்டிருக்கின்றது; இது இலங்கையின் வரலாறு. அந்த வகையிலே, இன்று இந்த அரசாங்கம் தன்னுடைய வரவு செலவுத்திட்டத்திலே, இத்தனை ஆயிரம் பில்லியனை நாங்கள் இதற்கு ஒதுக்குகிறோம், இத்தனை ஆயிரம் பில்லியனை அதற்கு ஒதுக்குகிறோம் என்று சொன்னாலும்கூட, வருட இறுதியில் எங்களுக்குத் தெரியவரும், இவ்வாறு சொல்லப்பட்ட ஒதுக்கீடுகள் எதையுமே இவர்களால் முழுமையாகச் செய்ய முடியவில்லை என்பது. ஏனென்றால், அதற்குப் பல காரணங்கள் இருக்கின்றன. உதாரணமாகச் சொல்லப் போனால், இந்த வரவு செலவுத்திட்டத்தில் வட மாகாண கிராமிய வீதிகள் மற்றும் பாலங்களின் அபிவிருத்திக்கு 5 பில்லியன் ரூபாய் ஒதுக்கியிருப்பதாகச் சொல்கிறார்கள். ஆனால், வருட இறுதியில் பார்க்கும்போது, பொதுவாக கடந்த காலங்களிலே இவ்வாறு கூறப்பட்ட நிதி ஒதுக்கீடு பின்னர் மேற் கொள்ளப்படவில்லை என்பது தொியவரும்.

அதேபோலத்தான் எங்களுடைய சக பாராளுமன்ற உறுப்பினர் அண்ணன் ரவிகரன் அவர்கள் ஜனாதிபதியைச் சந்தித்தபொழுது முன்வைத்த, நீண்ட காலமாகத் தேவைப்பட்ட ஒரு விடயமான முல்லைத்தீவு மாவட்டத்திலே உள்ள வட்டுவாகல் பால நிர்மாணம் தொடர்பான கோரிக்கைக்கு அமைய ஒரு பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது; அதை நாங்கள் வரவேற்கிறோம். அதேபோல் யாழ்ப்பாண நூலகத்திற்கு 100 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டதாகச் சொல்லப்பட்டிருக்கின்றது. இந்த NPPஅரசாங்கத்திற்கு வட மாகாண மக்கள் வாக்களித்ததைப் பார்த்தால், நான் நினைத்தேன் இம்முறை எக்கச்சக்கமான நிதி வட மாகாணத்திற்கு ஒதுக்கப்படுமென்று. ஆனால், மொத்த Budgetஇல் காட்டப்பட்டிருக்கும் 7.2 ாில்லியன் - 7,200 பில்லியன் செலவின ஒதுக்கீட்டில் வெறும் 6 பில்லியன்தான் வட மாகாணத்திற்கு ஒதுக்கப்பட்டிருக்கின்றது. ஒரு தென்னிலங்கைக் கட்சிக்கு இத்தனை ஆயிரம் மக்கள் வட மாகாணத்திலே வாக்களித்திருக்கிறார்கள்; இது வரலாற்றிலே பெரிய ஒரு மாற்றம்! ஆனால், அதற்காக இந்த அரசாங்கம் வழங்கியிருப்பது அவ்வளவுதான்!

வட மாகாணம் என்றாலும் ஓரளவு பரவாயில்லை! ஆனால், கிழக்கு மாகாணத்திலே NPPக்கு வாக்களித்த தமிழ் மக்களுக்கு என்ன கிடைத்தது? நான் இரண்டு நாட்களுக்கு முன்பு முகநூலில் பதிவு ஒன்றைப் பார்த்திருந்தேன், அது கிழக்கு மாகாணத்திலே இந்த அரசாங்கத்துக்கு வாக்களித்தவர்களைப் பற்றியது. அதில் ஒரு சகோதரர் பதிவிட்டிருக்கின்றார், "கிழக்கு மாகாணத்திலே NPPக்கு வாக்களித்த முஸ்லிம் மக்களுக்காவது தேசியப் பட்டியல் ஊடாக ஆகம்பாவா MP கிடைத்திருக்கிறார். ஆனால், கிழக்கு மாகாணத்தில் இருக்கின்ற தமிழ் மக்களுக்கு வழங்கியது என்னவென்று எங்களுக்குத் தெரியாது" என்று. அந்த வகையிலே, ஒதுக்கீடுகள் Budgetஇல் இருக்கும்; ஆனால், நடைமுறையில் வராது. இவ்வாறுதான் எத்தனையோ கோடிக்கணக்கான ஒதுக்கீடுகள் நல்லாட்சிக் காலப்பகுதியில் 'கம்பெரலிய' வேலைத்திட்டத்தினூடாகச் செய்யப்பட்டது. ஆகவே, NPP அரசாங்கம் 5 - 6 பில்லியன் ரூபாய் நிதியை

ඔතුක්කි වටක්කු මක්කළෙත් තොටර්ච්චියාක ඒමාත්ර මුටියාතෙන්පතෙ මනතිල් වෛත්තිරුක්ක වේණ්ටුම්.

වටක්කිලේ පල පිරච්චිනෙකළ් ඉරුක්කින්රන. වටක්කිලේ කාණාමලාක්කප්පට්ටවර්කළ් තොටර්පාකත් තොටර්ච්චියාක නටත්තුම් පෝරාට්ටම් උලකත්තිලේයේ මික නීණ්ට කාලමාක නටත්තප්පටුම් ඔරු පෝරාට්ටම්. ඇතු 2,900 නාට්කළෛත් තාණ්ටි ඉන්රුවරෛක්කුම් නටෛපෙරුකින්රතු. ඉන්ත විටයම් තොටර්පාක NPP අරචාංකත්තාල් ඔරු මුන්මොළිවෛක්කූටච් චෙය්ය මුටියාමල් පෝයිරුක්කින්රතු.

මේලුම්, එංකළුටෙය අරචියල් කෛතිකළ් තොටර්පාන විටයත්තෛ එටුත්තුක්කොණ්ටාල්, "ඉන්ත නාට්ටිලේ අරචියල් කෛතිකළ් එන්රු එවරුමේ ඉල්ලෛ" එන්රු එංකළුටෙය නීති අමෛච්චර් අවර්කළ් චොල්කිරාර්. එන්නිටම් අතුචම්පන්තමාන පට්ටියලෛත් තරච්චොල්ලික් කේට්කිරාර්. නාන් නීති අමෛච්චරා, අවර් නීති අමෛච්චරා? අටුත්තු, එංකළුටෙය පිරතේචත්තිලේ කොල්ලප්පට්ට මක්කළ් තොටර්පාක නීති වේණ්ටුම්. On the human skeletons the Northern Tamil people found, they want to see the results. Otherwise, do not be fooled. නීඞ්කළ් නිනෛක්කක්කූටාතු, අපිවිරුත්තියෛච් චෙය්තු අල්ලතු ඉප්පටියාන විටයඞ්කළෛච් චෙය්තු මක්කළෛක් කවරලාම් එන්රු. අප්පටිප් පාර්ත්තාල්, මහින්ත රාජපක්ෂ අවර්කළ්කූට එත්තනෛයෝ කෝටික්කණක්කාන පෙරුමතිමික්ක අපිවිරුත්ති කළෛච් චෙය්තවර්. ඉන්ත මුරෛ උඞ්කළුටෙය චෙයර් පාට්ටෛප් පාර්ප්පතර්කු මක්කළ් උඞ්කළුක්කු ඔරු චන්තර්ප්පම් කොටුත්තිරුක්කිරාර්කළ්. ඉතෛ ඔරු නිරන්තරමාන ආතරවාක නීඞ්කළ් නිනෛත්තුවිටාතීර්කළ්! ඉන්ත නාට්ටිලේ ඔරු පුතිය අරචියලමෛප්පෛක් කොණ්ටුවරාවිට්ටාල්, ඉන්ත මක්කළුටෙය පිරච්චිනෛක්කු නිරන්තරමාන ඔරු තීර්වෛක් කාණ මුටියාතු.

වට මාකාණ මක්කළෛප් පොරුත්තවරෛයිල් ඉන්ත වරවු චෙලවුත්තිට්ටත්තිලේ චිල විටයඞ්කළෛ නීඞ්කළ් තමිල් මක්කළ් චාර්පිලේ කුරිප්පිටාතු විට්ටතර්කු උළ්ළූරාට්චි මන්රත් තේර්තලිලේ අවර්කළ් උඞ්කළුක්කුච් චරියාන පතිලෛ අළිප්පාර්කළ්. අන්ත වකෛයිල්, කිළක්කු මාකාණ මක්කළ් තමක්කු ඔතුක්කීටු ඉල්ලෛයෙන යෝචික්ක මාට්ටාර්කළ්. ඔර් අතිකාරප් පකිර්වින් ඌටාක නිරන්තරමාන අරචියල් තීර්වෛ, නාඞ්කළේ එංකළෛ ආළක්කූටිය වකෛයාන ඔරු නිර්වාකක් කට්ටමෛප්පෛප් පෙරුවතන්මූලම් මට්ටුන්තාන් එංකළුටෙය මක්කළින් පිරච්චිනෛකළෛ මුළුමෛයාකත් තීර්ත්තුක්කොළ්ළ මුටියුම්. උළ්ළූරාට්චිත් තේර්තලෛ නටත්තුකින්ර අතේ වේකත්තිල් මාකාණ චපෛත් තේර්තලෛයුම් උටනටියාක නටත්තුඞ්කළ්! එන්න කාරණත්තිනාල් අතර්කුප් පින්නටික්කිරීර්කළ්? ඉන්ත නාට්ටිලේ චනාතිපති අවර්කළ් උටනටියාක පුතිය අරචියල් අමෛප්පෛක් කොණ්ටුවන්තු ඔරු මාර්රත්තෛක් කොණ්ටුවරලාම්. ආනාල්, අතෛප් පර්රිය පේච්චෛ, පොරුළාතාරත්තෛක් කට්ටි එළුප්පියතර්කුප් පින්නර් තාන් මුන්නෙටුක්කලාම් එන්රු චොල්කිරාර්කළ්. අතනෛ ඔත්තිවෛත්තුක් කොණ්ටිරුක්කුම් වරෛක්කුම් ඉන්ත නාට්ටින් පොරුළාතාරත්තෛක් කට්ටි එළුප්ප මුටියාතු එන්පතෛ නීඞ්කළ් මනතිලේ පතිය වෛත්තුක්කොළ්ළුඞ්කළ්!

විශේෂයෙන්ම රටේ තිබෙන මේ ජාතික පුශ්නයට විසඳුමක් හොයන්නේ නැතිව, දේශපාලන වශයෙන් විසඳුමක් හොයන්නේ නැතිව, අලුත් ව්‍යවස්ථාවක් ගෙනෙන්නේ නැතිව මේ රටේ ආර්ථිකය හදන්න පුළුවන් කියලා හීනෙන් හෝ හිතනවා නම්, ඒක වෙන්නේ නැති බව මතක තබා ගන්න. ඒක ඉතා පැහැදිලියි. මොකද, මේ රට තුළට Foreign Direct Investment - FDI - ගෙනෙන්න පුළුවන් එක ක්‍රමවේදයක් මේ Budget එකේ නැහැ. ඔක්කොම දේශීය ආදායම් පිළිබඳව තමයි තිබෙන්නේ.

මම තව උදාහරණයක් කියන්නම්. ජනතාව හිතුවේ මේ ආණ්ඩුව - NPP ආණ්ඩුව - පොඩි මිනිහාගේ ආණ්ඩුවක් කියලා. මම දන්නා, මාත් එක්ක ආශ්‍රය කරන ගොඩක් අය ඡන්දය දුන්නා, NPP එකට. දකුණේත් එහෙමයි. ඇයි, එහෙම ඡන්දය දුන්නේ? ඔවුන් හිතුවේ මේක පොඩි මිනිහාගේ ආණ්ඩුවක් කියලා. හැබැයි, බලන්න බදු සහන - tax exemptions - පිළිබඳව. ඊයේ පෙරේදා මට නියෝජ්‍ය ඇමති කෙනෙකු කිව්වා, අපි චණ්ඩිකම් කරලා මේ දේවල් කරන්නේ නැහැ කියලා. චණ්ඩිකම් නොවෙයි, තිබෙන බලය පාවිච්චි කරන්න. තුනෙන් දෙකක බලයක් තිබෙනවා; විධායක බලතල තිබෙනවා. තුනෙන් දෙකක බලයකුයි, විධායක බලතලයි තිබෙනවා නම් ඒ දේවල් කරන්න. පසුගිය ආණ්ඩුවලින් තමන්ගේ හිත මිතුරන්ට බදු සහන දුන්නා. ඒ දීපු බදු සහන cancel කරන්න. පසුගිය රජයන් දීලා තිබෙන බදු සහන ටික මේ රජයෙන් cancel කරලා තිබුණා නම්, රුපියල් බිලියන 966කට වැඩි ආදායමක් ආණ්ඩුවට හොයා ගන්න තිබුණා. මම පෙන්වන්නම්, රුපියල් බිලියන 966කින් කරන්න පුළුවන් දේවල්. "Aswesuma" Programme එකට වෙන් කර තිබෙන්නේ රුපියල් බිලියන 233යි; ඒ "Aswesuma" benefits තුන්වතාවක් දෙන්න පුළුවන්, අර මුදලින්. Pension and gratuity ගත්තොත්, රජයේ ඉන්න pensionersලාට pension එක දෙවතාවක් ගෙවන්න පුළුවන්; ඒකට වැය වෙන්නේ රුපියල් බිලියන 480යි. Health සඳහා Budgetary allocation එක රුපියල් බිලියන 604යි; ඒක තව සියයට 50කින් වැඩි කරන්න පුළුවන්. සමාවෙන්න, සියයට 50කින් නොවෙයි, සියයට 150කින් වැඩි කරන්න පුළුවන්. Education සඳහා Budgetary allocation එක රුපියල් බිලියන 619යි. හැබැයි, පසුගිය කාලයේ බදු සහන වශයෙන් රුපියල් බිලියන 966ක් දුන්නා. පොඩි මිනිහාගේ කියලා ආපු NPP ආණ්ඩුව යටතේත් ඒ බදු සහන දීලා තිබෙනවාය කියන එකයි මම කියන්නේ. මම ඊයේ පෙරේදා මේ වාගේ කථාවක් කියනකොට නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, අපි එහෙම චණ්ඩි පාට් දාලා මේ දේවල් කරන්නේ නැහැ කියලා. චණ්ඩි පාට් දමන්න නොවෙයි, තිබෙන බලය පාවිච්චි කරන්න දැනගන්න. පොඩි මිනිහාට කියලා ආණ්ඩුවෙන් කරන පුතිපත්ති මොනවාද? එතැනින් තව ඉස්සරහට අපි යමු.

දැන් බලන්න, සිගරට් බද්ද. මම 2020 ඉඳලා මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. 2020 ඉඳලා හැම අය වැයකදීම කියනවා, cigarette companiesවලින් පවතින ආණ්ඩුවට ලොකු පගාවක් දෙනවා බදු වැඩි කරන්නේ නැති වෙන්න කියලා. මේ ආණ්ඩුවේ පුතිපත්ති යටතේ,- මේ ආණ්ඩුවටත් එහෙනම් cigarette companiesවලින් පගාව දීලා ද කියලා මට අහන්න වෙනවා. පසුගිය සතියේ Public Finance Committee - COPF - එකේදී මම ඇහුවා, ඇයි, cigarette tax එක සියයට 5.9ක තිබෙන්නේ කියලා. නැහැ, ඒක indexation කිව්වා. අපිත් දන්නවා, indexation ගැන. මේ ආණ්ඩුවේ ඉන්නා සමහර ඇමතිවරුන්ට මම කියන්න ඕනෑ හිතන්න එපා,- පසුගිය ආණ්ඩුවෙනුත් මේක වුණා. 2020දීත් ගෝඨාභය රාජපක්ෂ බලයට ආවාම පුාදේශීය සභාවල හිටපු මන්ත්‍රීවරු, පස් කපමින් හිටපු අය, කැලෑ කපමින් හිටපු අය සෙට් එකම පාර්ලිමේන්තුවට ආවා. ඇයි, ඒ? රැල්ල. ගෝඨාභයගේ රැල්ලෙන් පාර්ලිමේන්තුවට ආවා. මේ වතාවේ නම් උගත් මන්ත්‍රීවරු ගොඩක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා සිටින බව මම කියනවා. ඒක මම අගය කරනවා. හැබැයි, මන්ත්‍රීවරුන්ගේ attitude එක පොඩ්ඩක් හදා ගන්න. ඊයේ කිව්වා, මේක ego පුශ්නයක් කියලා. අපට ego පුශ්නයක් නැහැ; මට හිතෙන විධියට මේක inferiority complex එකක්. The Government face an inferiority complex when we raise some issues. There is no ego problem here. When we raise a point, if credit is

[ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

due to that point and if there is value in it, try to understand it and implement it. Do not dismiss it just because you have a two-thirds majority.

Tax පිළිබඳව කථා කරනකොට මම කියන්න කැමතියි, සියයට 5.9කින් බදු වැඩි කළ බව. ලංකාව තුළ තිබෙන සියලුම products, ඒ කියන්නේ 2020 සිට 2025 දක්වා කාලය තුළ ලංකාවේ තිබෙන භාණ්ඩ හා සේවාවල මිල සියයට 90කින්, සියයට 100කින් වැඩි වෙලා තිබෙනවා. ඊට සාපේක්ෂව සියලු භාණ්ඩ හා සේවාවල tax එක සියයට 90කින් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, 2020 සිට 2025 දක්වා සිගරට්වල පමණක් මිල සියයට 100කින් වැඩි වෙලා තිබුණාට සිගරට් එකෙන් අය කරන බදු වැඩි වෙලා තිබෙන්නේ සියයට 66ක් විතරයි. මොකක්ද ඒකට හේතුව? පසුගිය කාලයේ කිව්වේ Health Minister පගාව ගත්තා කියලා. මේ, පසුගිය කාලයේ කියපු දේවල්. එතුමා මේවා වැඩි කරන්නේ නැහැ කිව්වා. ආණ්ඩුවේ ඉන්න කට්ටිය පගාව අරගෙන මේවා වැඩි කරන්නේ නැහැ කිව්වා. එතකොට අදත් ඒකද කියන්න තිබෙන්නේ? Revenue target එක අනුව සිගරට්වලින් ලැබෙන්න තිබෙන Excise Duty එක රුපියල් බිලියන 130යි. පසුගිය අවුරුද්දේත් මෙහෙම revenue target එකක් දාලා තිබුණා. හැබැයි, රුපියල් බිලියන 140න්, රුපියල් බිලියන 117ක් ලැබිලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔව්, වසන්ත සමරසිංහ ඇමතිතුමනි, මමත් බැලුවේ මුදල් නියෝජ්‍ය ඇමතිවරයෙක් හෝ ගරු සභාවේ හිටියා නම් මොනවා හරි කියයි කියලා. ඒත් නැහැ නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

නැහැ, නැහැ, ඔබතුමා කියන්න එපා. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවාද කියලා බැලුවේ.

සිගරට්වල මිල අරගෙන බැලුවොත්, කැප්ස්ටන් සිගරට් එකක මිල වැඩි කිරීම තුළින් රජයට ලැබී තිබෙන ආදායම සියයට 8යි. නමුත් CTC එකට සියයට 28ක් ලැබිලා තිබෙනවා. පගාව දෙනවා කියන කාරණය මම මීට ඉස්සරත් පිළිගත්තේ නැහැ. හැබැයි, පගාව දෙනවා කියලා කියපු කට්ටිය අද ඔය පැත්තේ ඉන්නවා. මම අහන්නේ, අදටත් පගාව දෙනවාද? ඒකද ඇත්ත? පගාව දෙන්නේ නැත්නම් ඇය මෙහෙම වෙන්නේ? පොඩි මිනිහාට බදු ගහනකොට ඇයි මේවාට ගහන බද්ද වැඩි කරන්නේ නැත්තේ? අසාධාරණ බද්දක් ගහන්න කියලා නොවෙයි මේ කියන්නේ. අනික් හැම product එකකින්ම සියයට 90ක් යනකොට ඇයි මේකෙන් විතරක් සියයට 66ක්?

අපි සිගරට් එක පිළිබඳ කථාව පැත්තකින් තියමුකෝ. අපි දැන් Defence Ministry එකේ allocation එක ගනිමුකෝ. Defence Ministry එකේ allocation එක ඇතුළේ විශාල හොරකම් වෙනවා කියලා පසුගිය කාලයේ විශාල ප්‍රශ්නයක් ඇති වුණා. ඒ සම්බන්ධයෙන් "ඩෙලි මිරර්" පත්තරේ තිබෙන article එකක තිබෙනවා, මේ අවුරුද්දේ Defence Ministry එකේ Budgetary allocation එකෙන් diets and uniformsවලට රුපියල් බිලියන 135ක් වෙන්වෙලා තිබෙනවා කියලා. This article states that the amount rose from Rs. 70.7 billion in 2023 to Rs. 101 billion in 2024 and to Rs. 135 billion in 2025; ඒ කියන්නේ, 2023දී රුපියල් බිලියන 70ක් වෙන්වෙලා තිබෙනවා; 2024දී රුපියල් බිලියන 101ක් වෙන්වෙලා තිබෙනවා; 2025 දී රුපියල් බිලියන 135ක් වෙන්වෙලා තිබෙනවා. එතකොට, මේ Defence Ministry allocation එකේ සියයට 33ක වර්ධනයක් තිබෙනවා. ඒකේ caption එක "diets and uniforms". මට මතකයි, 2022 දී කිව්වා, ශවේන්ද්‍ර සිල්වාට ප්‍රංශයේ ඉඳලා uniforms ගෙනැල්ලා තිබෙනවා කියලා. බලන්න, එක් item එකක් වෙනුවෙන් රුපියල් බිලියන 35ක් වැඩිවෙලා තිබෙනවා. Defence Ministry එකේ වැය ශීර්ෂය පිළිබඳව විවාද කරනකොට අපි මෙය තවත් අධ්‍යයනය කරලා කථා කරමු. මේක වැඩි වෙන්නේ ඇයි කියලා අපි දන්නවා. මේක වැඩිවෙලා තිබෙන හේතුව මම දන්නවා. මම ඒක දැන් මේ සභාවේ කියන්නේ නැහැ. Defence Ministry එක ගැන කථා කරද්දී මෙම විෂයම වැඩිවෙලා තිබෙන හේතුව මම පැහැදිලිව කියන්නම්. Hon. Deputy Speaker, could you please tell me how much more time I have?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have seven minutes more.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Thank you, Sir.

ඊළඟට, තෙල් මිල ගැනත් කථා කරන්න වෙනවා. Fuel prices අරගෙන බැලුවාම, මැතිවරණ සමයේදී ආණ්ඩුව මොනවාද කිව්වේ?

මේ අය මැතිවරණ සමයේ කිව්වා, "අපි ආපු ගමන් fuel pricesවලට ගහලා තිබෙන tax ඔක්කෝම අයින් කරනවා" කියලා. නමුත්, fuel pricesවලට ගහලා තිබෙන tax අඩු කළේ නැහැ. හැබැයි, පසුගිය සතියේ කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා කියනවා මම දැක්කා, ඒක මේ අවුරුද්දේ අඩු කරනවා කියලා. ඒක හොඳයි. අපි කියන්නේත් අඩු කරන්න කියන එක තමයි. දීපු පොරොන්දු ඉෂ්ට කරන්න. හැබැයි, 2024 අවුරුද්දේ fuelවලට ගහපු බදුවලින් රුපියල් බිලියන 200ක මුදලක් Budget එකට ඇවිල්ලා තිබෙනවා. මේ අවුරුද්දේ රුපියල් බිලියන 230ක් ඇවිල්ලා තිබෙනවා. මෙහි ඇති වැදගත්ම කාරණය මේකයි. IMF Agreement එක අනුව, GDP එකෙන් සියයට 15.1ක් අපේ revenue targets තිබෙන්න ඕනෑ. මේ අවුරුද්දේ Budget එකේත් සියයට 15.1ක් තමයි හරියටම තිබෙන්නේ. එතකොට, කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා, ඒ ඇමතිතුමා කියන විධියට fuel taxes අඩු කළොත් ආණ්ඩුවේ revenue targets miss වෙනවා. මේ මාසයේ පෙබරවාරි 28වැනිදා IMF එකේ තුන්වැනි Executive Board meeting එක තිබෙනවා. එතැනදී ඒක අත්සන් කරයි. මොකද, මේ අය වැයේ සියයට 15.1ක් විධියට සඳහන් කරලා තිබෙන නිසා. ඔබතුමන්ලා අඩු කරනවා කියලා කියනවා. අපටත් ඕනෑ ජනතාවට සහන දෙන්න. හැබැයි, කරන්න බැරි දේවල් නේ කියලා තිබෙන්නේ.

මම දැක්කා, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කියලා තිබෙනවා, වෙළෙඳ පොළ හැසිරීම මත පදනම්ව ඉදිරියේදී වාහන නිරූ බදු අඩු විය හැකියි කියලා. මම ඒකේ screenshot එකක් අරගෙන ආවා. මේවා අඩු කරන එක හොඳයි. මේවා අඩු කරනවා

නම්, Budget එකේ තිබෙන revenue targets miss වෙනවා නේ. එහෙම නම් කොයි එකද බොරුව? මොකද, VAT එකේ breakdown එකක් මේකේ සඳහන් වෙන්නේ නැහැ. VAT කියලා විතරයි තිබෙන්නේ. කාර්වලින් කීයද, taxවලින් කීයද, පෙට්‍රල්වලින් කීයද කියලා මේකේ සඳහන් වෙන්නේ නැහැ.

අපි වාහන අරගෙන බලමු. Vehicle importation ගත්තොත්, එක් article එකක තිබුණු කාරණයක් මම කියන්නම්. මම ඒ article එක අරගෙනත් ආවා. මම මේ articles අරගෙන එන්නේ, මේ කියන ඒවා බොරුයි කියන නිසා. 2025 පෙබරවාරි 03 දින "Daily FT"හි article එකක් තිබෙනවා, "Sri Lanka ends five-year vehicle import ban sparking mixed concerns" කියලා. මේකේ තිබෙන විධියට Vehicle Importers' Association එකෙන් කියනවා, පසුගිය කාලයේ අවුරුදු 5ක් පරණ වාහන ගෙන්වන්න දුන්නා, දැන් ඒක අවුරුදු 3කට හිර කරලා තිබෙනවා කියලා. ඒ නිසා වෙලා තිබෙන්නේ මොකක්ද? පොඩි මිනිහාට කාර් එකක් ගන්න බැහැ. බජාජ් ත්‍රී වීලර් එකක් රුපියල් මිලියන 1.9යි. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 19යි. තමන්ගේ වී ටික හොඳ මිලකට විකුණලා, ඒ සල්ලිවලින් "ඇක්ටා" කාර් එකක් අරගෙන, ලාබෙට පෙට්‍රල් ටිකක් ගහලා කඩේ යන්න හිටපු මනුස්සයාට තමයි අද මේ ආණ්ඩුවෙන් ගහලා තිබෙන්නේ. කලින් අවුරුදු 5ක් පැරණි වාහන ගේන්න දුන්නත්, දැන් අවුරුදු 3ක් පරණ වාහන තමයි ගේන්න දෙන්නේ. මට මේ පිළිබඳව තව ගොඩක් දේවල් කථා කරන්න තිබෙනවා. නමුත් වේලාව පිළිබඳ ගැටලුවක් තිබෙන නිසා මම අවසාන වශයෙන් තව එක කාරණයක් කියන්නම්.

බැසිල් රාජපක්ෂ මුදල් ඇමති කාලයේත් පාර්ලිමේන්තුව ඇතුළේ මෙහෙමම තමයි. එතුමා ඇවිල්ලා මොනවා හෝ දෙයක් කියලා ගියාම එතුමාගේ පිටුපස ඉන්න මන්ත්‍රීවරු ඔක්කෝම කට්ටිය ගිරවුන් වාගේ ඒකම කියනවා. මම දැක්කා, ඊයේ පෙරේදා ජනාධිපතිවරයා කියනවා අපේ foreign reserves ඩොලර් බිලියන 6.1ක් තිබෙනවා කියලා. ඒක බොරු. ඩොලර් බිලියන 6.1න් අපට භාවිත කරන්න පුළුවන් බිලියන 4.1යි. අනික් බිලියන දෙකම තිබෙන්නේ debt swaps.

චීනයෙන් මොනවා හරි ගේන්වා ගන්නවා නම් පුළුවන්; නැත්නම් ඉන්දියාවෙන් හරි බංග්ලාදේශයෙන් හරි ගේන්වා ගන්න පුළුවන්. Debt swap එකක් කියන්නේ reserve එකක් නොවෙයි. Foreign reserves ඩොලර් බිලියන 6ක් තිබෙනවා කියන්නේ ඉතා පැහැදිලිව මේ සභාව නොමඟ යැවීමක්. ඒකෙන් අපට භාවිත කරන්න පුළුවන් වෙන්නේ බිලියන 4.1යි. ඒක අහගෙන මන්ත්‍රීවරු ඒක කියනවා.

දැන් බලන්න, ගුරුවරු කියා තිබෙනවා සුබෝධනී කමිටු වාර්තාවෙන් කියපු තුනෙන් දෙකක වැටුප් වැඩිවීම දෙන්න කියලා. ගුරුවරුත් ඉතා අප්‍රසාදයෙන් ඉන්නේ. වැටුප වැඩි කරලා තිබෙනවා අවුරුද්දෙන් අවුරුද්ද වශයෙන්, අවුරුදු තුනකදී. මේවා ගැන ගොඩක් මන්ත්‍රීවරු කථා කළා, ඒ නිසා මම මේ ගැන කථා කළේ. වතුකරයේ දෙමළ ජනතාවගේ දෛනික වැටුප රුපියල් 1,700ක් ගෙවනවා කිව්වා. හැම ආණ්ඩුවෙන්ම ඒක කියනවා. නමුත් companiesවලින් වැඩි කරන්නේ නැහැ. එතකොට මොනවාද එළියට ඇවිල්ලා කියන්නේ? "Companiesවලින් වැඩි කළේ නැහැ, අපි මොනවා කරන්නද?" කියලා අහනවා. පුළුවන් නම් රජයෙන් දෙන්න රුපියල් 200ක්. අපි දැක්කා වතුකරයේ දෙමළ ජනතාව පළමු වරට වෙනත් පක්ෂවලට ඡන්දය දීලා මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට එවලා තිබෙනවා. මෙහෙමද ඒ ජනතාවට සලකන්නේ? 1,700ක් දෙන්න බැහැ කියලා දන්නවා, companies ගෙවන්නේ නැහැ. එහෙම නම් හැම කෙනාටම රුපියල් 200ක් Budget එකෙන් allocate කරන්න, ඒ මිනිස්සුන්ට සලකනවා නම්. මේ අය වැයේ කාරක සභා අවස්ථාවේදී අපි මේ පිළිබඳව තව ගොඩක් දුරට කථා කරමු.

මම තව එක ප්‍රධාන කාරණයක් කියන්න ඕනෑ. මම දැක්කා, කිරි නිෂ්පාදනය වැඩි කිරීම පිළිබඳව ජනාධිපතිතුමා Budget Speech එකේ කියලා තිබෙනවා. එතුමා කියා තිබෙනවා, "...to increase the dairy production, we are going to allocate Rs. 2,500 million" කියලා.

கௌரவ ஜனாதிபதி அவர்களின் வரவு செலவுத்திட்ட உரையிலே 2,500 மில்லியன் ரூபாய் பால் உற்பத்தி அதிகரிப்புக்கு ஒதுக்கப்படுவதாகக் கூறியிருக்கிறார். நீங்கள் எதுவுமே ஒதுக்கத் தேவையில்லை. அங்குள்ள மேய்ச்சல் தரைகளை வர்த்தமானி அறிவித்தல்மூலம் ஒதுக்கித் தாருங்கள்! பால் தரும் கறவை மாடுகள் கொலை செய்யப்படும் நிலையில்தான் வடக்கு, கிழக்கில் தமிழ் பண்ணையாளர்கள் மேய்ச்சல் தரை இல்லாமல் வாழ்ந்து கொண்டிருக்கிறார்கள்.

மேலும், 'பிம்சவிய' திட்டத்தின்கீழ் காணிகளுக்கு உரித்து வழங்கப்படுமாம். உண்மையில் இது முடிவடைந்த ஒரு விடயம். Forest காணிகளை 1983ஆம் ஆண்டின் வரைபடத்துக்கு அமைவாக எல்லைப்படுத்திய ஒரு report தயார் நிலையில் இருக்கிறது. அதனை அமுல்படுத்தினாலே அந்த மக்கள் தங்களுடைய சொந்தக் காணிகளுக்குள் போகலாம்; வடக்கு, கிழக்கிலே இருக்கின்ற மக்களுக்கு இந்த 'பிம்சவிய' எல்லாம் தேவையில்லை.

அதுபோல், அடையாளப்படுத்தப்பட்ட இராணுவ முகாம்களை அகற்றுவதைப் பற்றி ஐந்தாறு மாதங்களாகியும் எந்த நடவடிக்கையும் இல்லை. ஜனாதிபதி அவர்கள் பதவிக்கு வந்தவுடன் ஏழு ஏக்கர் காணியை விடுவித்தார்; அவ்வளவுதான்! *[இடையீடு]* ஏழு ஏக்கர் என்று சொல்லப் பட்டது; அதுவும் விடப்படவில்லை. அதைவிட, வடக்கு, கிழக்கில் எங்களுடைய மக்களுடைய நிலங்களை தொல்பொருள் திணைக்களத்தினரும் பறித்துக் கொண்டிருக் கிறார்கள். இந்த அரசாங்கத்தின் காலத்திலும் இது நடக்கிறது. திருகோணமலை குச்சவெளிப் பிரதேசத்திலே இப்பொழுதும் நடந்துகொண்டிருக்கிறது. இதையெல்லாம் நிறுத்தாமல் நல்லிணக்கத்தைப்பற்றி நீங்கள் பேசக் கூடாது.

இன்று வடக்கு மக்கள் உங்களுக்கு வாக்களித்திருக் கிறார்கள். மிக விரைவில் மக்கள் தங்களது முடிவு தவறென்று உள்ளூராட்சித் தேர்தலில் அந்த முடிவை மாற்றியமைப்பார்கள். இந்த வரவு செலவுத்திட்டத்தில் 5 பில்லியன் வீதி அபிவிருத்திக்கு ஒதுக்கப்பட்டிருக்கிறதென்றால், இதைவிட எக்கச்சக்கமான அபிவிருத்திகள் கடந்த காலத்தில் செய்யப் பட்டிருக்கின்றன. துறைமுகங்கள் விருத்தி செய்யப்பட்டிருக்கின்றன. பாரிய அபிவிருத்தித் திட்டங்களைச் செய்திருக்கிறார்கள். ஆனால், அடிப்படைப் பிரச்சினையான தமிழ் மக்களின் தேசிய இனப் பிரச்சினைக்கு ஒரு தீர்வைக் காணாமல் நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியாது.

ஜனாதிபதி அவர்கள் தனது தேர்தல் விஞ்ஞாபனத்தில் ஒரு புதிய அரசியலமைப்பைக் கொண்டுவருவது பற்றித் தெளிவாகச் சொல்லியிருந்தார். எங்களுடைய மக்கள் அதை நம்பிக்கூட வாக்களித்திருக்கலாம். இன்று 'சமத்துவம்' என்று சொல்லி அதை நீங்கள் மூடிமறைக்க முடியாது. எங்களுடைய மக்களின் அடிப்படைப் பிரச்சினை, நாங்களே எங்களை ஆளக்கூடிய வகையான ஒரு நிருவாகக் கட்டமைப்பு எமக்குத் தேவை என்பதுதான். அந்த மக்களுக்கு நீதி கிடைக்க வேண்டும். இந்த இரண்டு விடயங்களிலும் எங்களுடைய மக்கள் பின்வாங்கப் போவதில்லை. வடக்கு கிழக்கு மக்களுக்கு சோறும் தண்ணீரும்தான் பிரச்சினை என்று கடந்த காலத்திலே சொன்ன அமைச்சர்கள் இந்த முறை பாராளுமன்றத்தை எட்டிப் பார்க்கக்கூட முடியாதளவுக்குத் தோல்வியடைந்திருக் கிறார்கள்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, thank you, Sir.

මෙලුම් පල විටයංකළ් පේසුවතර්කු ඉරුන්තාලුම්කූට නේරත්තිනෙක් කරුත්තිර්කොණ්ටු මීණ්ටුම් ඉරුතියාක ඔරේයොරු කෝරික්කෙයිනෙ මට්ටුම් වෙළිවිවකාර අමෙච්චරුම් සපෙයිල් ඉරුක්කින්ර ඉන්ත නේරත්තිල් නාන් අරසාංකත්තිටම්, මුන්වෛක්ක විරුම්පුකිරේන්. ඉන්ත නාට්ටිලේ ඔරු පුතිය අරසියලමෛප්පු උරුවාක්කත්තෛ නීංකළ් එව්වළවු කාලත්තිර්කුත් තළ්ළිප් පෝටුකින්රීර්කළෝ අන්තක් කාලප්පකුති වරෛක්කුම් නාට්ටිනුටෛය පොරුළාතාරත්තෛක් කට්ටි එළුප්පුවතර්කු වාය්ප්පුක් කිටෛක්කාතු. ඉන්ත නාට්ටිනුටෛය පොරුළාතාරත්තෛක් කට්ටි එළුප්පුවතර්කාක වටක්කු, කිළක්කිලේ විසේට නිතියම් ඔන්රෛ උරුවාක්කුවතර්කුකූට නාංකළ් තයාරාක ඉරුක්කින්රෝම්; එංකළുටන් චේර්ന්තු ඉයංකුකින්ර නාටුකළ් පාර්ත්තුක්කොණ්ටු ඉරුක්කින්රන. ඉන්ත නාට්ටිලේ ඔරු පුතිය අරසියලමෛප්පෛක් කොණ්ටුවරාමල් කාලංකටත්ති ඉන්නොරු තේර්තලුක්කුප් පෝකලාම් එන්රු නීංකළ් නිනෛත්තාල් කෝට්ටාපය රාජපක්ෂ අරසාංකත්තෛවිට මික මෝසමාන නිලෛයිලේතාන් නීංකළුම් වීට්ටුක්කුච් චෙල්වීර්කළ් එන්පතෛ උංකළ් මනතිලේ පතිවුචෙය්තු වෛත්තිරුක්ක වේණ්ටුම් එන්රු චොල්ලි, ඉන්ත වරවු චෙලවුත්තිට්ටම් තොටර්පාන විවාතත්තිලේ පේසුවතර්කු නේරමළිත්ත පිරති චපානායකර් අවර්කළുක්කු නන්රි කූරි, එන්නුටෛය උරෛයෛ මුටිත්තුක්කොළ්කින්රේන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is Hon. Kitnan Selvaraj. You have 11 minutes.

[மு.ப. 11.56]

ගරු කිටනන් සෙල්වරාජ් මහතා
(மாண்புமிகு கிட்ணன் செல்வராஜ்)
(The Hon. Kitnan Selvaraj)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த அதியுயர் சபையில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டுள்ள 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் தொடர்பில் என்னுடைய கருத்துக்களை முன்வைப்பதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் முன்வைக்கப்பட்டுள்ள 2025ஆம் ஆண்டுக்கான மக்கள் நலன் வரவு செலவுத்திட்டத்தை எதிர்க்கட்சியினர் புரட்சிகரமான மாற்றத்தை ஏற்படுத்தாத ஒன்றாகவே பார்க்கின்றார்கள். கடந்த காலங்களில் இந்த நாடு வங்குரோத்து நிலையை அடைந்திருந்தது நம் அனைவருக்கும் தெரியும். நாட்டை வங்குரோத்து நிலையிலிருந்து மீட்டெடுப்ப தற்கான வேலைத்திட்டத்தை, நாட்டு மக்களோடு இணைந்து செயற்பட முடியாத கடந்தகால அரசாங்கங்களும், அவற்றின் வால்களாக இருந்த தலைவர்களும் முன்வைக்காததன் பிரதிபலனாக, இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் இந்த நாட்டு மக்களின் பொருளாதார அபிவிருத்தியை மட்டுமல்ல, அவர்களுடைய உளவியல் அபிவிருத்தியையும் கருத்திற் கொண்டு, தனது முதலாவது வரவு செலவுத்திட்டத்தை முன்வைத்திருக்கின்றபொழுது, அதனை விளங்கிக்கொள்ள முடியாத எதிர்க்கட்சியைப் பிரதிநிதித்துவப்படுத்தக்கூடிய ஆளுமையற்ற சிலர் கதறுவதை நாங்கள் பார்க்கின்றோம்.

இந்த வரவு செலவுத்திட்டத்தில் மலையக சமூகத்தின் மேம்பாட்டுக்கான அநேக முன்மொழிவுகள் முன்வைக்கப்பட்டு இருக்கின்றன. இந்த நாட்டில் 200 வருட காலமாக என்னுடைய சமூகத்துக்கு ஓர் அடையாளம் இல்லாமல் இருந்தது. எமது சமூகத்துக்கான அடையாளத்தை இந்த வரவு செலவுத்திட்டம்மூலம் எங்களுடைய மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் உறுதிப்படுத்தி இருக்கிறார். அதாவது, 'மலையக சமூகம்' என்று குறிப்பிட்டிருக்கிறார். இதுவரை காலமும் நாடற்றவர்களாகவும் இந்திய வம்சாவளியினராவும் தோட்டக்காட்டானாகவும் நிழல்படுத்தப்பட்டிருந்த என்னுடைய சமூகத்துக்கு இந்த வரவு செலவுத்திட்டத்தினூடாக ஓர் அந்தஸ்து வழங்கப்பட்டு இருக்கின்றது. அதற்காக இந்த வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்திருக்கின்ற இந்த அரசாங்கத்துக்கு மலையக மக்களின் பிரதிநிதி என்ற வகையில், என்னுடைய அகவணக்கத்தைச் செலுத்துகின்றேன். அரசாங்கமானது மலையகத்தின் கல்வி நிலையைக் கருத்திற்கொண்டு, இந்த வரவு செலவுத்திட்டத்தினூடாக விசேட வேலைத்திட்டங்களை முன்மொழிந்து இருக்கின்றது.

අදත් මෙවැනි සිද්ධීන් වෙන කොට අපේ රටේ ජාතික ආරක්ෂාව කොහේද තිබෙන්නේ කියලා මම අහන්න කැමැතියි. මේ මැරුම් කෑ පුද්ගලයා, අරුණ විදානගමගේ. ඔහුට "කජ්ජා" කියලාත් කියනවා. "කජ්ජාගේ" ඩිෆෙන්ඩර් එක ඇතුළේ බංකරයක් තිබෙනවා. ඒ බංකරයේ තිබිලා ටී-56 වර්ගයේ ගිනි අවි දෙකක් හසු වෙලා තිබෙනවා. ඊයේයි ඒවා හසු වුණේ සහ අත්අඩංගුවට ගත්තේ. චූදිතයන් තවමත් අත්අඩංගුවට ගනිමින් ඉන්නවා. ඒ පුද්ගලයා දේශපාලනය කළේ රාජපක්ෂ පවුලට. නමුත්, පසුගිය ජනාධිපතිවරණයේදී ඔහු කපිල දිසානායකගෙන් අයින් වුණා. අයින් වෙලා රාජපක්ෂ පවුලේ රහස්,- මැදමුලනේ චින්තක කියලා කෙනෙක් ඉන්නවා. ඒ, මැදමුලනේ හිටපු අපේ සංවිධායක. අපිත් සමඟයි හිටියේ. ඊට පස්සේ ඔහු අපෙන් ඉවත් වුණා. ඒ පුද්ගලයා එයත් එක්ක එකතු වෙලා වෙනත් පක්ෂයකට ගියා. අපිත් එක්ක එකතු වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, "කජ්ජා" කියන පුද්ගලයාගේ මරණය අභිරහසක් බව. මම ඉල්ලීමක් කරනවා, ඒ මරණය සම්බන්ධයෙන් හරියාකාරව පරීක්ෂණයක් කරන්න කියලා; හරියාකාරව සොයන්න කියලා. සමහරුන් අතර මතවාදයක් යනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රහස් හෙළි වෙයි කියලා මොහු ඝාතනය කළා කියා. තවත් සමහරු කියනවා, JVP එකේ ගුරු සංගමයේ ඉස්කෝලේ මහත්තයා ඝාතනය කළ නිසා මොහු ඝාතනය කළා කියලා. එදා ඒ අරගළය සංවිධානය කළේ භික්ෂු පෙරමුණේ හාමුදුරුවන් වහන්සේනමක්; වීරකැටිය පන්සලේ උදිත

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

හාමුරුවෝ. ඒ හාමුදුරුවන් වහන්සේ එක්ක තමයි ඒ ගුරුතුමා හිටියේ. ඔහු JVP එකේ කෙනෙක්. තවත් කට්ටියක් කියනවා, JVP එකෙන් ඝාතනය කළා කියලා. තවත් සමහර කට්ටියක් කියනවා, එයා මංකොල්ලකාරයෙක් කියලා. ඔහු ටී-56 ගිනි අවියක් අරගෙන,- *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)

(මාණ්පුමිකු වසන්ත සමරසිංහ - වර්ත්තක, වාණිප, උණවුප් පාතුකාප්පු මර්‍රුම් කූට්ටුරවු අපිවිරුත්ති අමైච්චර්)

(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු දිලිප් වෙදආරච්චි මහතා

(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)

(The Hon. Dilip Wedaarachchi)

ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මේ, මගේ වෙලාව. පසුව උත්තර දෙන්න.

ගරු වසන්ත සමරසිංහ මහතා

(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)

(The Hon. Wasantha Samarasinghe)

මේ වන කොට සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබෙනවා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා

(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)

(The Hon. Dilip Wedaarachchi)

හරි, හරි, මම දන්නවා. මම තංගල්ලේ නේ.

ගරු මන්ත්‍රීවරයෙක්

(මාණ්පුමිකු උරුප්පිනර් ඔරුවර්)

(An Hon. Member)

ඒ, සැකකරුවන් නේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා

(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)

(The Hon. Dilip Wedaarachchi)

පොඩ්ඩක් ඉන්න, මම කියන්නම්. තවත් සමහරු කියනවා, ඒ පුද්ගලයා සූදු මංකොල්ලකරුවෙක් කියලා. පොලිසියේ තිබෙන handcuffs පොලිසියෙන් කොහොම හරි අරගෙන, ටී-56 ගිනි අවි අරගෙන, camo kits දමාගෙන සූදු පිටිවලට පනිනවා ලු.

ගරු මන්ත්‍රීවරයෙක්

(මාණ්පුමිකු උරුප්පිනර් ඔරුවර්)

(An Hon. Member)

කජ්ජා?

ගරු දිලිප් වෙදආරච්චි මහතා

(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)

(The Hon. Dilip Wedaarachchi)

ඔව්, කජ්ජා. ඒ වාගේම පසුගිය කාලයේ රත්නපුරයට ගිහිල්ලා මැණික් ව්‍යාපාරිකයන්ගේ සූදුවක් මංකොල්ල කාලා තිබෙනවා. ඒ නිසා ඒ ඝාතනය එහෙන් සිද්ධ වුණා ද දන්නේත් නැහැ. රාජපක්ෂවරුන්ගේ තොරතුරු එළි වෙනවා කියලා එය සිද්ධ වුණා ද දන්නේත් නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ ගුරුවරයා මරපු නිසා ඒ දේ සිද්ධ වුණා ද දන්නේත් නැහැ. අන්න ඒකයි මට දැනගන්න ඕනෑ, ගරු ඇමතිතුමා. ඒ දේ කොහෙන් සිදු වුණා ද දන්නේ නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා

(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)

(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, දැන් අපරාධකරුවන් අල්ලලා තිබෙනවා නේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා

(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)

(The Hon. Dilip Wedaarachchi)

ඒ සැකකරුවෝ; තවම සැකකරුවෝ. තවම shooter අල්ලලා නැහැ, මහ මොළකාරයෝ අල්ලලා නැහැ. මහ මොළකාරයෝ අල්ලන්න කියලා මම කියන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා

(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)

(The Hon. Wasantha Samarasinghe)

අල්ලන්න තමයි පරීක්ෂණ කරන්නේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා

(මාණ්පුමිකු දිලිප් වෙදආරච්චි)

(The Hon. Dilip Wedaarachchi)

ඒක තමයි මම මේ කියන්නේ. මගේ දිස්ත්‍රික්කයේ වෙන දේවල් ගැන මම මේ ප්‍රකාශ කරන්නේ. *[බාධා කිරීමක්]* අපි ඔය වාගේ ජඩ වැඩ කරන්න මිනිස්සු නොවෙයි. අපි ගහනවා නම් ගහන්නේ කෙළින්, හැංගිලා ගහන්නේ නැහැ. අපි ඔය වාගේ ජඩ වැඩ කරන මිනිස්සු නොවෙයි. *[බාධා කිරීමක්]* මේක හොඳට අහගන්න.

ගරු ඇමතිතුමනි, මට ඕනෑ කරන්නේ කොහෙන්ද මේක සිද්ධ වුණේ කියලා දැන ගන්නයි. ඒක තමයි අපෙන් ජනතාව බලාපොරොත්තු වෙන්නේ. කලින් නම් පොලීසියෙන් විත්තිකාරයෝ හොයලා, කවුරු හරි හොයලා ඉදිරිපත් කරනවා. දැන් ඒ දේ සිද්ධ වෙන්නේ නැහැ. ඒකයි මම කියන්නේ, හරියාකාරව මේ දේ සිද්ධ වුණේ කොහෙන්ද කියන එක අපටත්, රටේ ජනතාවටත් හෙළි කරන්න කියලා. මේ ගැන සැකය තුන් හතර පැත්තකට තිබෙනවා. හැබැයි, මොන පැත්තෙන් වුණාද කියලා හොයා ගන්න ඕනෑ. අන්න ඒ දේ හොයා දෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙරේදා ටී 56 දෙකක් හසු වුණා. 2000 වර්ෂයේ ඉඳලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලන පාතාල නායකයෝ හිටියා. "චණ්ඩි මල්ලි" කියලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් හිටියා. "ආමී ජිනේ" කියලා හිටියා. "වම්බොට්ටා" කියලා හිටියා. "ජූලම්පිටියේ අමරේ" කියලා හිටියා. "චන්ද්‍ර පුෂ්ප" කියලා හිටියා. "පස්සර ගුණයා" කියලා හිටියා. "කුමාරයා" කියලා හිටියා. මේ දිස්ත්‍රික්කයේ අවුරුදු 20ක් තිස්සේ ඒ විධියේ දේශපාලනඥයන්ගේ පාතාල නායකයෝ හිටියා. *[බාධා කිරීමක්]* අපි ඒවා කරන මිනිස්සු නොවෙයි. පොඩ්ඩක් කට වහගෙන අහගෙන ඉන්න. ඒ පාතාල නායකයෝ මැරිලා තිබෙනවා; මරලා තිබෙනවා. හිර ගෙදර දෙදෙනෙක් ඉන්නවා. දැන් ජූලම්පිටියේ අමරේ දැන් හිර ගෙදර. දැන් චන්ද්‍ර පුෂ්ප හිර ගෙදර. ඒ සමහර අය මරලා තිබෙනවා; සමහර අය මැරිලා තිබෙනවා. ඒ කාගෙත් ආයුධ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙනවා, අද වනතුරුත් අත්අඩංගුවට ගත්තේ නැහැ. මම ඒකයි කියන්නේ. ජනාධිපතිතුමා කිව්වේ, රටේ සියලු මිනිස්සු ළඟ තිබෙන ආයුධ අත්අඩංගුවට ගන්නවා කියලා. එහෙම ගන්නේ නැහැ. ඒවාට පරීක්ෂණයක් කරන්නේ නැහැ, ඒවා හොයන්නේ නැහැ.

පසු ගිය අරගළය වෙලාවේ අපේ මන්ත්‍රීවරයෙක් ඝාතනය කළා. ජනාධිපති හිටියේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමා සියලු මන්ත්‍රීවරුන්ට, ව්‍යාපාරිකයන්ට තමන්ගේ දේපළ ආරක්ෂා කර

ගන්න, තමන්ගේ ජීවිත ආරක්ෂා කර ගන්න repeater guns දෙක, දෙක තමන්ගේ පෞද්ගලික මුදලින් ලබා ගන්න licences ලබා දුන්නා. අපේ licensed පිස්තෝලය අපි ලබා ගත්තා, අපේ ජීවිත ආරක්ෂාවට, අපේ දේපළ ආරක්ෂාවට. දැන් අපේ ආරක්ෂාව ඉවත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආරක්ෂාව ඉවත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආරක්ෂාවත් ඉවත් කරලා, ගම් දනව්වල පාතාල මිනිස්සු ළඟ තිබෙන ආයුධ තවම අත්අඩංගුවට අරගෙන නැහැ. අපේ ආරක්ෂාවට දීපු ගිනි අවි දෙක license නොකර, ආරක්ෂක ලේකම්තුමාට භාර දෙන්න කිව්වා. ඒ මන්ත්‍රීවරුන්ගේ ඒවා විතරයි. අපේ ආරක්ෂාවට තිබුණු ඒවා අපි ගිහිල්ලා භාර දුන්නා. මම කරුණාකරලා ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ ආරක්ෂාව පිළිබඳ අපට ප්‍රශ්නයක් නැහැ, අපි භය නැහැ. ඒ වුණාට අපේ ආරක්ෂාවට ලබා දීපු ගිනි අවි දෙක අපේ මුදලින් රුපියල් ලක්ෂ හතක් වියදම් කරලා ලබා ගත්තේ. එහෙම ලබා ගත්තේ අපේ ජීවිත ආරක්ෂාවට; අපේ දේපළ ආරක්ෂාවට. මන්ත්‍රීවරුන්ට ලබා දුන් ගිනි අවි දෙක අපට ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, මම කථානායකතුමාට 2025.01.07වැනි දා ලිපියක් ඉදිරිපත් කළා, මගේ ආරක්ෂාව ඉවත් කළා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ වාගේ පාතාල මැරවරයෝ ඉන්නවා මට ආරක්ෂාව දෙන්න කියලා. ඒ ලිපිය අනුව ගරු කථානායකතුමා ආරක්ෂාව දෙන්න කියලා පොලිස්පතිතුමාට යවලා තිබුණා. අද වනතුරුත් ආරක්ෂාව දුන්නේ නැහැ. ඒ නිසා මගේ ජීවිතයට ප්‍රශ්නයක් වුණොත්, කථානායකතුමා වග කියන්න ඕනෑ, ආරක්ෂක ලේකම්තුමා වග කියන්න ඕනෑ, මේ රජය වග කියන්න ඕනෑ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව ඉවත් කරලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යම් කිසි කරදරයක් වුණොත්, ඒකට වග කියන්න ඕනෑ කියන එක මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රජයේ මංගල අය වැය ඉදිරිපත් කර ඇති අවස්ථාවේ අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් සභාව අමතන කොට, අවුරුදු 77ක ශාපයක් ගැන කියලා තමයි අමතන්නේ. ඒ අවුරුදු 77 ශාපයෙන් මේ රට ගොඩ ගන්න ඕනෑ, මේ රට කාබාසිනියා කළා, මේ රට විනාශ කළා, මේ රට නැත්තටම නැති කළා, රට ගොඩ ගන්න අද අපි ඇවිල්ලා ඉන්නවා කියලා, අවුරුදු 77ක් මේ රට විනාශ කළා කියලා අපට බැණලා තමයි කථාව පටන් ගන්නේ. ඔබතුමන්ලා එහෙම කථා කරනවා නම් ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයෝ කරපු වැරදිවලට,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් දෙන්න.

හැම ආණ්ඩුවකම ඒ අය හිටියා. අපේ පක්ෂයේ නායකවරු විශාල සේවාවක් ඉෂ්ට කර තිබෙනවා. 1948දී ඩී.එස්. සේනානායක මැතිතුමා මේ රටට නිදහස ලබාගෙන තිබෙනවා. සේනානායක සමුද්‍රය, ගල්ඔය ව්‍යාපාරය, ගොවිජනපද ඇති කරලා තිබෙනවා. ඒ වාගේම උඩවලවේ, පොල්ගොල්ල, වික්ටෝරියා, මාදුරුඔය, කොත්මලේ, රන්දෙනිගල, උල්හිටිය, රන්ටැඹේ ජලාශ ඉදි කරලා විදුලිය උත්පාදනය කරලා කර්මාන්ත ඇති කරලා තිබෙනවා. 1977 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විවෘත ආර්ථිකය ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම විදේශීය ආයෝජන රටට ගෙන්වලා තිබෙනවා. ලලිත් ඇතුළත්මුදලි මහත්මයා මහපොළ ශිෂ්‍යත්වය ආරම්භ කරලා තිබෙනවා. ගාමිණී දිසානායක මහත්මයා ලුණුගම්වෙහෙර ව්‍යාපාරය, මහවැලි ව්‍යාපාරය ආරම්භ කරලා තිබෙනවා. ජනාධිපති ආර්.ප්‍රේමදාස මැතිතුමා දරුවන්ට නිල ඇඳුම් ලබා දීලා තිබෙනවා; දිවා ආහාර වේල ලබා දීලා තිබෙනවා; ගම්උදා ආරම්භ කරලා තිබෙනවා; හිසට සෙවණක් ලබා දීලා තිබෙනවා. දැන් විදේශ විනිමය රටට ගෙනෙන්නේ ඇඟලුම් කම්හල් 200ක් ආරම්භ කරලා සුද්දන්ට ජංගි මහපු නිසා. එදා කිව්වේ ඒවායේ සුද්දන්ට ජංගි මහනවා කියලා. අද රට දුවන්නේ ඒ විදේශ විනිමය හැටියට ලැබෙන සල්ලිවලින්; ඇඟලුම් කර්මාන්තය 200ක් ආරම්භ කරපු නිසා. ඒ වාගේම ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනය හදලා තිබෙනවා. මෙවැනි විශාල සංවර්ධනයක් කරලා තිබෙනවා. අවුරුදු 76ක් තිස්සේ රට විනාශ කළේ කවුද කියලා ඔබතුමන්ලාගේ හිත දන්නවා. ඔබතුමන්ලා දන්නවා 1988-1989 කාලයේ මේ රට විනාශ කළේ කවුද කියලා. ඒ නිසා මෙහෙම දොස් කියන්න එපා. ඔබතුමන්ලා දැන් ආණ්ඩුවක් අරගෙන තිබෙනවා, රටේ පාලනය අරගෙන තිබෙනවා. අපිත් කැමැතියි උදව් කරන්න. මේ රට ගොඩ ගන්න උදව් කරන්න කැමැතියි. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, වැඩ කරන්න කියලා. අපි උදව් කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපතිවරණ වේදිකාවක් වේදිකාවක් පාසා පොරොන්දු දුන්නා. ගොවියාට වීවලට රුපියල් 154ක මිලක් ලබා දෙනවා කිව්වා. ධීවරයාට රුපියල් 150ක ඩීසල් සහනාධාරයක් දෙනවා කිව්වා. උපාධිධාරීන් 3,500කට රැකියා දෙනවා කිව්වා. නමුත් මේවාට මුදල් වෙන් කරලා නැහැ. මාස හයෙන් හයට රස්සා දෙනවා කිව්වා. දේශීය නිෂ්පාදනය දියුණු කරනවා කිව්වා. ගොවියාට පොහොරවලට නම් රුපියල් මිලියන 35,000ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ගොවියා ඒ පොහොර ඉල්ලුවේ නැහැ. ගොවියා ඉල්ලුවේ හොඳ ගුණාත්මක පොහොර මිටියක් ලබා දෙන්න කියලා. තවම පොහොර නැහැ; ආධාර නැහැ; සල්ලි ලැබිලාත් නැහැ. එදා දේශපාලනඥයන් රුපියල් 3,350ට පොහොර දෙන්න පටන් ගත්තා. ගොවියා ඒ පොහොර ඉල්ලුවේ නැහැ. ගොවියා ඉල්ලන්නේ ගුණාත්මක පොහොර මිටියක් ලබා දෙන්න කියලා.

හැබැයි, වෙනත් ආධාර ලබා දීලා තිබෙනවා. වකුගඩු රෝගීන් සඳහා ආධාර ලබා දීලා තිබෙනවා. වැඩිහිටි දීමනාවට, පෙර පාසල් දරුවන්ට, පෙර පාසල් ගුරුවරුන්ට, ගර්භිණී මව්වරුන්ට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒක බොහොම හොඳයි.

ඒ වාගේම අලි-මිනිස් ගැටුම නිසා වන අලින්ගෙන් සිදු වන අපරාධ, ජීවිත හානි, දේපොළ හානි වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. විදුලි වැටවල් කිලෝමීටර් 5611ක් හදන්න මුදල් වෙන් කරලා තිබෙනවා. එයිනුත් කිලෝමීටර් 1456ක් ප්‍රතිසංස්කරණය කරන්න සහ තවත් කටයුතුවලට රුපියල් මිලියන 300යි වෙන් කරලා තිබෙන්නේ. ඉතින් රුපියල් මිලියන 300කින් පුළුවන් ද මේ කටයුතු කරන්න? අද රටේ මිනිස්සු මැරෙනවා, අලි මැරෙනවා, ගොවිතැන් විනාශ කරනවා, දේපොළ විනාශ කරනවා. Clean Sri Lanka වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. අන්න, ඒ 5,000ත් මිලියන 2,500ක් වෙන් කරලා මේ රටේ ගොවි ජනතාව වෙනුවෙන්, මේ රටේ අහිංසක මිනිස්සු වෙනුවෙන් -මේ අලින්ගෙන් වන උවදුරු නතර කර ගන්න, ගොඩ ගොවියන්ගේ ජීවිත බේරා ගන්න- මේ මුදල ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත මුදල් ලෙස රුපියල් ලක්ෂ 100ක් ලබා දීමටත්, ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා වෙන්කොට ඇති රුපියල් මිලියන 11,250න් ඒ මුදල් ලබා ගන්නා බව කියනවා.

ඒ කියන්නේ හැම දිස්ත්‍රික්කයකම ආර්ථිකය දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 11,250ක් වෙන් කරලා තිබෙනවා, ඒ අපේ විමධ්‍යගත මුදල් රුපියල් ලක්ෂ 100ත් එක්ක. පසුගිය කාලයේ රාජපක්ෂවරු ආණ්ඩු කරනකොට ඒවා දිස්ත්‍රික් කමිටුවලට දාලා, ඒ ආකාරයට කටයුතු කළා. මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත මුදල් ලබා දුන්නේ නැහැ. එදා තමුන්නාන්සේලාත් සටන් කළා; අපිත් සටන් කළා, අපේ මුදල් ගන්න. අද තමුන්නාන්සේලාත් කරන්නේ ඒකමද කියලා මම අහන්න කැමැතියි. මේකද ඒ system change එක? ඔබතුමන්ලා බලාපොරොත්තු වුණා, system එක change කරන්න. එදා ජනතාවගේ ඉල්ලීම් වෙනුවෙන් ඒ විමධ්‍යගත මුදල් ලබා ගන්න අපි රාජපක්ෂවරු එක්ක සටන් කළා; තමුන්නාන්සේලාත් සටන් කළා. නමුත් අද ඔබතුමන්ලාත් කරන්නේ ඒකමද කියලා මම අහන්න කැමැතියි. මේකද system change එක? අපට ලබා දෙන මුදල් ලබා දීලා, අපේ යෝජනා ඉදිරිපත් කරන්න අපට අවස්ථාව ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලාට බලය ලබා දුන් රාජ්‍ය සේවකයන්ට ඔබතුමන්ලා වැටුප් වැඩි කිරීමක් කළා. ඒ වැටුප් වැඩි කිරීම බොහොම හොඳයි. අපේ රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කිරීම ගැන අපි සතුටු වෙනවා. අපේ ආර්ථික විශේෂඥ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඒ වැටුප් වැඩිවීම ගැන රටේ ජනතාවට එකින් එකට කරුණු පහදා දුන්නා. හැබැයි, මේ රජය දුප්පත් ජනතාවට කිසිම දෙයක් වෙන් කරලා නැහැ. ඒ මිනිස්සුන්ට අද ජීවත් වෙන්න විධියක් නැහැ; අද ඒ මිනිස්සුන්ට කන්න බොන්න විධියක් නැහැ. එදා රුපියල් 190ට තිබුණු හාල් කිලෝව අද රුපියල් 280යි. රුපියල් 80ට තිබුණු පොල් ගෙඩිය රුපියල් 240යි. රුපියල් 80ට තිබුණු ලුණු පැකට් එක අද රුපියල් 220යි. ලුණු ලේවායක් තිබෙන හම්බන්තොට අපි, ලුණු පැකට් එක ගන්නේ රුපියල් 220ට. මේ මාස තුනට මෙන්න වෙනස. ඒ වාගේම අනෙක් බඩුවල මිලත් වැඩි වෙනවා. අහිංසක, දුප්පත් කම්කරු මිනිහාට අද ජීවත් වෙන්න විධියක් නැහැ. ආදායමක් නැහැ. ඉතින්, ඒ අහිංසක මිනිස්සුන්ට වැඩක් කරනවා කියලා ආපු ආණ්ඩුවෙන් මම අහන්න කැමැතියි, මේ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද, මේ මිනිස්සු කන්නේ කොහොමද කියලා. මේ මිනිස්සුන්ටත් ඒ සහන ලබා දෙන්න. 2019-2023 කාලයේ දේශපාලනඥයන්ගේ වුවමනාකම්වලට හදපු ලැයිස්තුවලට තමයි අස්වැසුම ලබා දුන්නේ. දැනුත් ඒක එහෙමම දෙනවා. අහිංසක, දුප්පත් මිනිස්සුන්ට අස්වැසුම ලැබෙන්නේ නැහැ. ඒවා සාධාරණ විධියට ලබා දෙන්න. අද මේ රටේ දුප්පත් ජනතාවට මම කියනවා,"මේගොල්ලෝ රට ගොඩගන්න තුරු අපි හොදියි, බතුයි, ලුණුයි, පොලුයි කාලා ඉඳිමු රත්තරන්" කියලා. ඔබතුමන්ලාට රට ගොඩගන්න අපි උදව් කරනවා. අපි හොදියි, බතුයි, ලුණුයි, පොලුයි කාලා හරි එම සහයෝගය ලබා දෙනවා. ඔබතුමන්ලාට ජයවේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. T.K. Jayasundara. You have 11 minutes.

[අ.භා. 1.43]

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. නියමිත මාතෘකාවට පිවිසෙන්න කලින්, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කියපු කරුණුවලට උත්තර දෙන්න ඕනෑ වුණත්, ඒ කථා දෙස බැලුවාම මට මතක් වෙන දෙයක් ගැන කියන්න ඕනෑ. මස් ගෙන යන ලොරි තිබෙනවා, ඉස්සරහ "බුදු සරණයි, දෙවිපිහිටයි" කියලා ගහගෙන. නැත්නම්, එහෙම ගහගෙන කසිප්පු අදින ලොරි තිබෙනවා. මේ කථාත් බැලුවාම ඒ වාගේ තමයි. මොකද, කථාවෙන් හරිම ලස්සනයි. "බුදුසරණයි, දෙවි පිහිටයි" කියන ගමන් ඇතුළේ තිබෙන්නේ කුහකකමයි, නරුමකමයි. සියලු නරුම දේවල් ඉතිහාසයේ කරලා, කරලා දැන් මෙතැන කඳුළු හළමින් කථා කරනවා. ඉතින්, ඒ වාගේ කථාවලට උත්තර දෙන්න යන එකත් එච්චර හොඳ ලක්ෂණයක් නොවෙයි කියලා තමයි මම හිතන්නේ. නමුත්, මම පසුව ටික ටික මේ ගැන කියන්නම්.

අපට මේ රටේ ජනතාවට කියන්න ඕනෑකම තිබෙනවා, අපේ ගමන් මඟ මොකක්ද, අපි දැන් කරන්න හදන කාර්යභාරය මොකක්ද, අපේ රජයේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා. පසුගිය අවුරුද්දේ මාස හතරක කාලය ඇතුළත මේ රටේ දැවැන්ත දේශපාලන පෙරළියක් සිද්ධ වුණා. ඒ දේශපාලන පෙරළිය නිසා ලැබිච්ච ප්‍රතිලාභය තමයි දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොර ආණ්ඩුවක් බිහි කර ගන්න පුළුවන් වීම. දෙවෙනි එක තමයි, ජාතිවාදය නැති ආණ්ඩුවක් බිහි කර ගන්න පුළුවන් වීම. තුන්වෙනි එක තමයි දූෂණ නැති ආණ්ඩුවක් බිහි කර ගන්න පුළුවන් වීම. පසුගිය වසර අවසානයේ ඒ දැවැන්ත දේශපාලන පෙරළිය අපේ රටේ සිද්ධ කළා. ඒක මේ රටේ ජනතාව ලබපු විශාල ජයග්‍රහණයක්. මීට පෙර කථා කළ මන්ත්‍රීවරයෙකු කිව්වා, අවුරුදු හැත්තෑ ගණනක් ගැන කියන්න එපා කියලා. ඒවා කියන්න එපා කිව්වාට, ඒ අවුරුදු හැත්තෑ ගාණක් තිස්සේ කරන්න බැරි වෙච්ච දැවැන්ත දේශපාලන පෙරළිය පසුගිය අවුරුද්දේ සිද්ධ වුණා.

එහෙම සිද්ධ වුණාට පස්සේ, මේ රට ඒකෙන් ලබපු ප්‍රතිඵලය මොකක්ද? මේ නිසාම දැන් අපේ රට ජාත්‍යන්තරයේ ගෞරවය ලබන රටක් බවට පත් වෙලා තිබෙනවා. ඒක සුවිශේෂ කාරණයක්. මෙතෙක් කල් අපේ රටින් පිට රට යන කෙනෙකුට තමන්ගේ පාස්පෝට් එක පෙන්වන්න බැරි තරමට ලජ්ජා හිතෙන යුගයක් තිබුණේ. දැන් ඒක වෙනස් වෙලා අපට ජාත්‍යන්තර ගෞරවය ලැබිලා තිබෙනවා. දෙවැනි එක, එහි ප්‍රතිඵලයක් විධියට මේ රජය කෙරෙහි විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය ඇති වෙලා තිබෙනවා. එසේ විශ්වාසය ඇතිවීමත් එක්ක දැන් අපේ රටට නව යුගයක් ගැන අලුතින් හිතන්න පුළුවන් වෙලා තිබෙනවා. තුන්වැනි එක, මෙන්න මේ නිසා අපේ රටේ නව බිමක් හැදිලා තිබෙනවා. විශේෂයෙන්ම ව්‍යවසායකයන්ට සහ ආයෝජකයන්ට සම බිමක් ඇති වෙලා තිබෙනවා. මෙතෙක් කල් ඔවුන්ට අපේ රටේ සම බිමක් තිබුණේ නැහැ. පුළුවන් අය පුළුවන් විධියට දේශපාලන හයිය මත, තමන්ගේ විවිධ හැකියාවන් මත තමන්ගේ ආයෝජන කරගත්තා මිසක් සාමාන්‍ය ජනතාවට, සාමාන්‍ය ව්‍යවසායකයාට මේ රට විවෘත වෙලා තිබුණේ නැහැ. දැන් අපි නව යුගයකට ඇවිල්ලා තිබෙනවා. අපේ රටේ ව්‍යවසායකයන්ට සහ විදේශීය ආයෝජකයන්ට, ව්‍යවසායකයන්ට මේ රටේ සම බිමක් ඇති කරලා තිබෙනවා. මෙන්න මේ අලුත් තත්ත්වයත් එක්ක, දේශපාලන ජයග්‍රහණය ලබා ගත්තාට පස්සේ දැන් අපේ රට නව පිම්මක් පනින්න යනවා. නව ආර්ථික පිම්මක් පැනලා, නව ආර්ථික ජයග්‍රහණ ලබා ගෙන, නව ආර්ථික යුගයක්

උදා කරන්න ඕනෑකම තිබෙනවා. අන්න ඒ සඳහා කෙරෙන මහ පෙන්වීම තමයි ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාගේ කථාවෙන් නිරූපණය වෙන්නේ. ඒක සම්පූර්ණ ආර්ථික හැරවුමක්; මේ රටේ නව ගමනක්. ඉතින්, විපක්ෂයේ අයට මේක තේරුම් ගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවියක් රස විඳින්න ගියාම, කවියක තිබෙනවා වචනාර්ථය කියලා එකක්. කවියක වචනාර්ථය විතරක් තේරුම් අරගෙන බැහැ. කවියේ ඇත්ත රස විඳින්න නම් ගම්‍යාර්ථයත් ඉගෙන ගන්න ඕනෑ. ගම්‍යාර්ථය දන්නේ නැතිව වචනාර්ථයෙන් විතරක් මේක කරන්න බැහැ. ඒ නිසා අඩු ගණනේ අපේ ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අය වැය කථාවේ වචනාර්ථයවත් තේරුම් ගන්න බැරිව එහි ගම්‍යාර්ථය කොහොමවත් හිතාගන්න බැහැ. අද උදේ මේ සභාවේදී නීතිඥවරයකු යයි කියන මන්ත්‍රීතුමෙක්, විප්ලවය කියන වචනය ගැන කථා කරනවා මම දැක්කා. එතුමා හිතාගෙන ඇති, රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් සජිත් ප්‍රේමදාස මහත්මයාට ආවාම ඒක තමයි විප්ලවය කියලා. එහෙම නැත්නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පොහොට්ටුවට ආවාම ඒක තමයි විප්ලවය කියලා හිතාගෙන ඇති. එහෙම සරල විධියට තමයි ඒගොල්ලන් විප්ලවය කියන වචනය දකින්නේ. අපි දකිනවා, එතුමා මේ විප්ලවය කියන වචනයම තේරුම් ගෙන නැති බව. විප්ලවය කියන්නේ ඇත්තටම මිනිස්සුන්ගේ අධ්‍යාත්මය එක්ක, හෘදය සාක්ෂිය එක්ක ඇති වන දෙයක්. ඒක සමාජයක් විධියට වෙනස් වෙන දෙයක්.

තව කෙනෙක් කිව්වා නිදහස ගැන; නිදහස් අධ්‍යාපනය ගැන. නිදහස් අධ්‍යාපනය කියන්නේ වචනයෙන් කියන එකක් නොවෙයි. නිදහස් අධ්‍යාපනය කියන දේ බිමට දැනෙන්න ඕනෑ. ඒක ගුරුවරයාට දැනෙන්න ඕනෑ, ළමයාට දැනෙන්න ඕනෑ, දෙමව්පියන්ට දැනෙන්න ඕනෑ. අන්න, ඒක තමයි නිදහස් අධ්‍යාපනය කියන්නේ. එහෙම නැතුව නමින් නිදහස් අධ්‍යාපනය හොයන්න බැහැ.

අපේ රටට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය කියලා කියනවා. නමුත්, මේ රට ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය බිහි වුණාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. නම තිබුණාට වැඩක් නැහැ, මහ පොළොවේ ඒ දේ නැත්නම්. මෙවර අධ්‍යාපනයට වෙන් කරපු මුදල්වලින්, සෞඛ්‍යයට වෙන් කරපු මුදල්වලින් අන්න, ඇත්ත දේ කථා කරනවා. ඇත්ත දේ මේ මහ පොළොවට එනවා. හැබැයි, ඒගොල්ලන් ඒක වචන අස්සේ හොයන්න යනවා. වචනවලින් හොයලා විතරක් බැහැ.

අද උදේ අපේ බිමල් රත්නායක ඇමතිතුමා කියනවා මම අහගෙන සිටියා, "නමින් බැලුවාම දයා" කියලා. හැබැයි, වැඩවල මොන දයාවක්ද? මිනිස්සුන්ගේ රීරි මාංශය උරා බීපු, සම්පූර්ණ දේපළ තමන්ගේ අතට ගත්ත ව්‍යාපාර, ඒ. මේ රටේ මිනිස්සුන්ට පාරේ යන්න තිබෙන අයිතිය, පාරක් හදලා දෙන්න තිබෙන අයිතිය නැති කරපු ව්‍යාපාර. නමින්, "දයා". වැඩවලින් කොහොමද? ඒ නිසා නමින් මේවා ගැන බලන්න බැහැ. ඇත්තටම වැඩ පිළිවෙළ ඇතුළට ගිහිල්ලා, ඒකේ ගම්‍ය වන දේවල් තේරුම් අරගෙන මේ ක්‍රියාවලිය හඳුනාගන්න පුළුවන් වෙන්න ඕනෑ. හැබැයි, මේගොල්ලන් ඒක හඳුනාගන්නේ නැහැ. මොකද හේතුව, තමන්ගේ දේශපාලන බලය තමයි දවසින් දවස ගැලවිලා යන්නේ. එහෙම නම් මේ ආර්ථික ගමන ඇතුළේ තිබෙන ඊළඟ මහ මොකක්ද? ප්‍රධාන මාර්ග දෙකක් මම දකිනවා, වෙන්න ඕනෑ දේවල් දෙකක්; ප්‍රධාන කරුණු දෙකක්. මේ සාකච්ඡාවේ වැදගත්ම දේ තමයි, අපි මානවවාදී සමාජයක් හදන්න ඕනෑ. මානවවාදී සමාජයක් කියන මාතෘකාව එන්නේ ඇයි? ඒක නැති නිසා. ඒක නැති කළේ කවුද? ඉතිහාසය නැති කරපු, ඉතිහාසය ඉගෙන ගන්න එපා කියපු, සංස්කෘතිය ඉගෙන ගන්න එපා කියපු, භාෂා වැදගත් නැහැ කියපු, මේ රටේ ප්‍රචණ්ඩ දේශපාලනය ගෙනාපු නරුම යුගයක් පසුගිය කාලවල අපි පසු කළා. නායකයෝ ධර්මිෂ්ඨ කියලා ගහගෙන, යටින් අධර්මිෂ්ඨ වැඩ කරපු යුගයක් තිබුණා. ඒ මිනිස්සු අපේ මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන්ට, එදිරිවීර සරච්චන්ද්‍ර වාගේ උගතුන්ට පහර දෙන යුගයක් මේ රටේ තිබුණා.

එදා ඒ විධියට අපේ රටේ මානවවාදය බිඳ දැමුවා. ඒ නිසා දැන් නැවත වතාවක් මානවවාදය කියන මාතෘකාව ගේන්න ඕනෑ. අපට නැවත මානවවාදී සමාජයක් ආරම්භ කරන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා පළමුවැනි කාරණය, මානවවාදී සමාජයක් පිළිබඳ සංවාදයක් මේ රටට ගේන්න ඕනෑ කියන එකයි.

දෙවැන්න, තිරසාර ආර්ථික සංවර්ධනයක් ගේන්න ඕනෑ කියන එකයි. ඒක තිරසාර ආර්ථික සංවර්ධනයක්, හැම දාම පවතින ආර්ථික සංවර්ධනයක්, පරිසරය රකින ආර්ථික සංවර්ධනයක්, සෑම මිනිහෙකුටම බෙදී ගිය සමබිමක් සහිත ආර්ථික සංවර්ධනයක් වෙන්න ඕනෑ. ඒ නිසා මෙන්න මේ ප්‍රධාන කාරණා දෙක නැත්නම් ඒ සංවර්ධනයෙන් වැඩක් නැහැ. මානවවාදී සමාජයක් ගොඩනඟන, තිරසාර ආර්ථික සංවර්ධනයකුත් තිබෙන සමාජයක් විතරයි දීර්ඝ කාලීනව පවතින්නේ. ඒ නිසා මේ කරුණු දෙක පරායත්තයි; මේවා එකිනෙකින් වෙන් කරන්න බැහැ. මානවවාදී සමාජයක් නැතුව තිරසාර ආර්ථික සංවර්ධනයක් වෙන්නේත් නැහැ. තිරසාර ආර්ථික සංවර්ධනයක් නැතුව මානවවාදී සමාජයක් බිහි වෙන්නේත් නැහැ. ඒ නිසා මේ දෙක පරායත්ත කාරණා දෙකක්. මෙන්න මේ කාරණා දෙකටම පොදු වෙච්ච කාරණය විධියට අපි මේ රටට ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ගේන්න ඕනෑ. ඒ නිසා යමක් තිබෙන අයට විතරක්, දේශපාලන හිතවත්කම් තිබෙන අයට විතරක් ආර්ථිකයේ අවස්ථා ලබා දෙන ක්‍රමය වෙනස් කරලා සාධාරණ සමබිමක් මේ රටට ගේන්න ඕනෑ. ඒ නිසා අපි කියනවා, ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරපු ආර්ථික වැඩ පිළිවෙළ ඇතුළේ අන්න ඒ දේ; ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒම තිබෙනවා කියලා. මේකට ජන සහභාගිත්වය අවශ්‍යයි. එම නිසා අපි ජන සහභාගිත්ව ආර්ථික සංවර්ධනයක් ගේන්න ඕනෑ.

දැන් අපේ ඉලක්කය මොකක්ද? 2024දී ඩොලර් බිලියන 12.7ක් වෙච්ච අපනයන ආදායම 2025 වර්ෂයේදී ඩොලර් බිලියන 19ක් දක්වා වැඩි කර ගැනීමේ ඉලක්කයකට අපි යනවා. ඒක ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. ඒක සමස්ත සමාජයත් එක්ක එකතු වෙලා -බද්ධ වෙලා- අරමුණුසහගතව සියලුදෙනාම ඉතා වේගයෙන් අත්පත් කරගත යුතු දෙයක්. ඒක විපක්ෂයට තේරෙන්නේ නැහැ. අමාරුයි කියලා කරන දේවල්වලින් තමයි ලෝකය වෙනස් කළේ. එහෙම නැතිව සරල, සුමට කරුණුවලින් නොවෙයි ලෝකය වෙනස් කළේ.

උදාහරණයක් වශයෙන් ගත්තොත්, අපි යෝජනා කර තිබෙනවා, මේ වර්ෂයේ විදේශීය සංචාරකයන් ලක්ෂ 30ක් ගේන්න. ඊළඟට අපි මේක ලක්ෂ 80 දක්වා වැඩි කරනවා. මට පොඩ්ඩක් මේ ගැන පැහැදිලි කරන්න ඕනෑ. මම මෙච්චර කරුණු පැහැදිලි කරන්නේම මේ රටේ ජනතාවත් හඳුනාගන්න ඕනෑ දෙයක් තිබෙන නිසායි. ඒ මොකක්ද? උදාහරණයක් හැටියට ගනිමු, මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කය. ගාල්ල දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය බෙන්තර සිට හබරාදුව දක්වා මුහුදු තීරයට තමයි සීමා වෙලා තිබුණේ. නමුත් අපි දන්නවා, අපේ සංචාරක ව්‍යාපාරය ඊට වඩා දැවැන්ත ව්‍යාපාරයක් බවට පත් කරන්න පුළුවන් කියලා. ගාල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, සිංහරාජය, කන්නෙලිය, හිනිදුම කඳුවැටිය අයිති සර්ම කලාපීය සදාහරිත තෙත් වනාන්තරයක් තිබෙනවා. අපි මෙච්චර කල් ඒවා ආමන්ත්‍රණය කළේ නැහැ, සංචාරකයෝ ඒ තැන්වලට ගෙනිච්චේ නැහැ, ඒගොල්ලන්ට එන්න පහසුකම් සැපයුවේ නැහැ. ඒ විතරක්

[ගරු ටී.කේ. ජයසුන්දර මහතා]

නොවෙයි. ඇල්පිටිය, කරන්දෙනිය, හිනිදුම, නෙළුව වාගේ ප්‍රදේශවල තේ බිම්, කුරුඳු බිම් සංචාරක ගමනාන්ත බවට පත් කරන්න අපට පුළුවන්. අපේ මේ සංචාරක ඉලක්කය ඇතුළේ සංචාරකයා මේ සර්ම කලාපීය සදාහරිත තෙත් වනාන්තර බලන්න එනකොට අපේ ගමේ දුප්පත් ජනතාවට වෙළෙඳ පොළක් ලැබෙනවා. සංචාරකයන් පැමිණීම හරහා ඔවුන්ට විදේශ ධනයක් හොයන්න පුළුවන්කම ලැබෙනවා. මේ තුළින් කොළඹ කේන්ද්‍රගත වෙච්ච ආර්ථිකය ගමට ගෙනියනවා, ගමේ ජනතාවට සමබිමක් ඇති වෙනවා, ඔවුන්ගේ ආර්ථික අවස්ථා සපුරාගන්න අවස්ථාව ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ තුළින් සංචාරක කර්මාන්තය, තේ කර්මාන්තය, කුරුඳු කර්මාන්තය, කිතුල් කර්මාන්තය වාගේ දේවල් නව ව්‍යවසායකත්ව චින්තනයට ඇතුළත් කරගන්න ගමේ තරුණයාට අවස්ථාව ලැබෙනවා. මෙච්චර කල් ඒවා ඔවුන්ගෙන් ඈත් වෙලායි තිබුණේ. දැන් ගමේ තරුණයෙකුට නව ව්‍යවසායක චින්තනයක් ගොඩනහන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. අන්න ඒකට තමයි අපි කියන්නේ දුප්පත්කම නැති කිරීමේ වැඩ පිළිවෙළ; ග්‍රාමීය දුප්පත්කම නැති කිරීමේ වැඩ පිළිවෙළ ඇති වෙනවා කියලා. මේක Clean Sri Lanka වැඩසටහනත් එක්ක සම්බන්ධයි. මානවවාදී සමාජයක් නැතුව මේක කරන්න බැහැ. මේක කරන්න නම් අපි Clean Sri Lanka වැඩසටහන හරහා මානවවාදී සමාජයක් ගොඩනහන්න උත්සාහ කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, ග්‍රාමීය දුප්පත්කම නැති කිරීමේ වැඩ පිළිවෙළ ඇතුළේ ආර්ථික අවස්ථාත් අපි උත්පාදනය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Jayasundara, your time is up.

ගරු ටී.කේ. ජයසුන්දර මහතා
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

අපි මෙවර අය වැය තුළ කුඩා තේවතු හිමියන් ගැනත් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. 2023 වර්ෂයේ කුඩා තේ වතු හිමියන්ට වෙන් කරලා තිබුණේ රුපියල් මිලියන 1,115යි. මේ 2025 වර්ෂයේ රුපියල් මිලියන 1,355ක් දක්වා අපි ඒ මුදල වැඩි කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. තේ පර්යේෂණ කටයුතු සඳහා 2023දී වෙන් කරලා තිබුණේ රුපියල් මිලියන 465යි. මේ අවුරුද්දේ අපි ඒ සඳහා රුපියල් මිලියන 705ක් වෙන් කරලා තිබෙනවා. අපි තේ කර්මාන්තයේ නව පිම්මක් පනින්න අවශ්‍ය යටිතල පහසුකම් ටික හදා ගනිමින් එම වැඩ කටයුතු කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්න ඕනෑ මේ කාරණයත්. දැන් මේ පාර්ලිමේන්තුවේ නැති, කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් විපක්ෂයේ සිටි මන්ත්‍රීතුමියක් තමන්ගේ මාධ්‍ය සාකච්ඡාවකදී කියලා තිබුණා, එතුමියලාගේ පක්ෂවල ඉන්නේ සර්පයෝ කියලා.

ඒ සර්පයෝ ඉන්න පක්ෂය නියෝජනය කරන අය තමයි කලින් කථා කළේ. එතුමිය කියනවා, අපේ පක්ෂවල පුදුම තරම් සර්පයෝ ඉන්නවා, කොහොමද වැඩ කරන්නේ, කොළඹ දිස්ත්‍රික්කයේ පුදුම අවුල් ගොඩක් තිබෙන්නේ කියලා. ඒ නිසා සර්පයන්ගෙන් මේ රට බේරාගන්න එකත් ලොකු කාර්යභාරයක්. ඒකත් අපේ Clean Sri Lanka වැඩසටහන ඇතුළේ කරනවා. අසරණ වෙච්ච විපක්ෂයේ ඒ මන්ත්‍රීවරුන්ටත් අවසානයේ සහනය ලැබෙන්නේ මෙන්න මේ Clean Sri Lanka වැඩසටහන සහ අපේ ආණ්ඩුවේ ආර්ථික වැඩ පිළිවෙළ ඇතුළේයි කියන එකත් මතක් කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chaminda Lalith Kumara. You have 11 minutes.

[අ.භා. 1.55]

ගරු චමින්ද ලලිත් කුමාර මහතා
(மாண்புமிகு சமிந்த லலித் குமார)
(The Hon. Chaminda Lalith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නව රජය 2025 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැය පිළිබඳව විවිධ අදහස් උදහස් ඉදිරිපත් කරන වෙලාවේ, ඒ අය වැය සම්බන්ධයෙන් අපේ ඇහට දැනෙන, හිතට දැනෙන සතුටක් තිබෙනවා. මේ රටේ ජනතාව තමන් බලාපොරොත්තු වෙච්ච පාලනයක් හදලා, අපි ඉල්ලුවාටත් වඩා වැඩි ප්‍රමාණයක පාර්ලිමේන්තු බලයක් ලබා දීලා ශක්තිමත් රජයක් හදන්න අවශ්‍ය කටයුතු කළා. ඒ කාලයේ කවුරු මොනවා කිව්වත්, මොන බොරු ප්‍රචාර යැව්වත්, ජනතාව තමන්ගේ වගකීම හරියට ඉෂ්ට කරලා, මංමුළාවැල්වල පැටලෙන්නේ නැතිව අපට ලොකු බලයක් දුන්නා. ඒ වාගේම අපේ ගරු ජනාධිපතිතුමා, අපේ අමාත්‍ය මණ්ඩලය, අපේ අනෙකුත් මන්ත්‍රීවරුන්, අපේ කාර්ය මණ්ඩල විතරක් නොවෙයි, රට පුරා විහිදිලා ඉන්න ලක්ෂ සංඛ්‍යාත වූ අපේ පක්ෂ ක්‍රියාකාරිකයෝ, සාමාජිකයෝ ස්වේච්ඡාවෙන් කරන දැවැන්ත වැඩ කොටසක් දිහා බලාගෙන ඒකත් එක්ක එකතු වෙච්ච අය සහ අපට ඡන්දයක් නොදුන් අය පවා අද මෙම අය වැය තුළින් බොහොම සතුටක් ලබනවා. මොකද, ඔවුන් බලාපොරොත්තු වෙච්ච අරමුණ ඉෂ්ට කර දෙමින්, අපේ පළමු අය වැය තුළින් ඉතිහාසයේ කවදාවත් නොලැබුණු පහසුකම් ගොඩක් අපි මේ රටේ ජනතාවට ලබා දීලා තිබෙනවා. ඒ අනුව මේ රජය තමන්ගේ යුතුකම්, වගකීම් ඉෂ්ට කිරීම ආරම්භ කර තිබෙනවා. අපි ලබා දීපු මේ දේවල් ජනතාවට කොයි තරම් වටිනවා ද කියන්න ලොකු උදාහරණ අවශ්‍ය නැහැ. අපි උදේට පාර්ලිමේන්තුවට එද්දි පළමු පිවිසුමේ ඉඳලා පාර්ලිමේන්තුව ඇතුළට එනකම් අපට හමුවන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලවල නිලධාරීන් කථා කරන විධිය දැක්කාම -කථා නොකළත් අපේ මහ ලේකම්තුමියගේ ඉඳන් ගත්තාම- ඔවුන් අද බොහොම සතුටින් ඉන්න බව පෙනෙනවා, තමන්ගේ රැකියාවට සාධාරණ වැටුප් වැඩිවීමක් ලැබී තිබෙන එක සම්බන්ධව. අපි දන්නවා, ඔවුන්ට අවශ්‍ය සම්පූර්ණ වැටුප් වැඩිවීම නොවෙයි මේ ලැබුණේ කියලා. මේ රජය තව ඉස්සරහට යද්දි රටේ නිෂ්පාදන වැඩි වෙනකොට, ආදායම් වැඩි වෙනකොට, අංක එකට රාජ්‍ය සේවය වාගේම පෞද්ගලික අංශය හරහා රට වෙනුවෙන් මහන්සි වෙන සියලුදෙනාටම තව සහන ලබා දෙන්න සූදානම්.

අපේ රට වෙනුවෙන් ජනාධිපතිතුමාගේ ඉඳන් කරන කැපකිරීම් ගණනාවක් තිබෙනවා. අපට ආණ්ඩුව ලැබිච්ච පළියට අපට ලැබෙන පහසුකම් සියල්ල අපි භුක්ති විඳින්නේ නැහැ; වරප්‍රසාද භුක්ති විඳින්නේ නැහැ. හමුදාව පිරිවරාගෙන, පවුල් බලය පෙන්වාගෙන, සාමාන්‍ය මනුස්සයෙක් පාරකට බැස්සාම පාරේ යන්න බැරි තරමට ආරක්ෂකයින් පිරිවරාගෙන හැසිරිච්ච, අපේ රටේ මහා ධනයක් නාස්ති කරපු ඒ පාලන රටාවෙන් මිදිලා, ඒ සියල්ල ජනතාව වෙනුවෙන් කැප කරන්න පුළුවන් ආණ්ඩුවක්

අද බලයට පත් වෙලා ඉන්නවා. ඒ වෙනුවෙන් අංක එකටම රාජ්‍ය සේවයටත්, පෞද්ගලික අංශයටත්, රට හදන්න මහන්සි වෙන සියලු දෙනාටත් වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් කරන්න තිබෙන පළමුවැනි වගකීම ඉෂ්ට කරලා තමයි අපේ රජය මේ අය වැය ඉදිරිපත් කළේ. ඒ වාගේම අපේ දේශීය කර්මාන්ත පිළිබඳවත්, අපේ දේශීයත්වය පිළිබඳවත්, අපේ රටේ නිෂ්පාදන පිළිබඳවත් සලකා බලා, ඒ වෙනුවෙන් දායක වෙන්න පුළුවන්, මහ පෙන්වන්න පුළුවන් හැම ආකාරයක්ම දිහා බලලා තමයි අපේ රජය මේ අය වැය ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂි කර්මාන්තය පිළිබඳව කථා කරද්දී අපට අංක එකට තිබෙන්නේ අපේ රටේ ජනතාවගේ බඩගින්න නිවාගන්න පුළුවන් ආකාරයට අපේ කෘෂි කර්මාන්තය දියුණු කරන එකයි. ඒ අනුව අපේ රටේ වගා කරන වෙනත් භෝග සම්බන්ධවත් අපි අවධානය යොමු කර තිබෙනවා. මොකද, වෙනත් භෝගවලින් අපේ රටට ලැබෙන්නේ බොහොම අඩු නිෂ්පාදනයක්. අඩුවෙන් නිෂ්පාදනය කරන භෝග පවා අපට නිවැරදිව කළමනාකරණය කර ගන්න බැරි තැනකට අද කෘෂි කර්මාන්තය පත්ව තිබෙනවා. අපේ රටේ ජනතාවට අවශ්‍ය පෝෂණය හැකි තරම් අපේ රටේ මහ පොළොවෙන්ම ලබා ගන්නා වැඩ පිළිවෙළක් අපි ඇති කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් නිවැරදි මහ පෙන්වීමක් අවශ්‍ය වෙනවා. නමුත්, පසුගිය ආණ්ඩුවල එවැනි සැලසුමක් කෘෂි කර්මාන්තය පැත්තෙන් තිබුණේ නැහැ. ඒ වෙනුවෙන් අංක එකටම අපේ රජය කෘෂි කර්මාන්තය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් වැඩිවීම කළා වාගේම අනෙක් පැත්තෙන් කෘෂි කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය මහ පෙන්වීම ගොවියාගේ ඉදන් ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි සකස් කළා. මේ අය වැය ඉදිරිපත් කරන්නත් කලින් අපි පොහොර සහනාධාරය වැඩි කර දුන්නා. අපේ ආණ්ඩුව කරපු ඒ කටයුත්ත ඔබ කවුරුත් දැක්කා. ඒ විතරක් නොවෙයි. වාරිමාර්ග පැත්තෙන් ගත්තත්, අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළුව රටේ නොයෙකුත් දිස්ත්‍රික්කවල විවිධ වාරි ව්‍යාපෘති වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් අපි මෙවර අය වැයෙන් වෙන් කළා.

අපි විශ්වාස කරනවා, බොහෝ විට ඉන්න නිලධාරින්ට අවශ්‍ය වැඩකටයුතු කර ගන්න කාලය මදි වෙයි කියලා. මොකද, මේ අය වැයෙන් වෙන් කරන මුදල් වියදම් කරන්න මාස 8ක කාලයක් විතරයි ඉස්සරහට තිබෙන්නේ. මේ රජය, ඉන්න නිලධාරින්ට කාර්යක්ෂමව වැඩ කරන්න වාගේම රටේ අනාගතය සඳහා, එහෙම නැත්නම් ජනතාවගේ මානෘ භූමිය සංවර්ධනය කිරීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් මෙවර අය වැය තුළින් වෙන් කර තිබෙනවා. හැබැයි, මේවා දකිනකොට නොයෙක් විවේචන ඉදිරිපත් කරනවා. තමන් ඉදිරිපත් කරපු අය වැයවලින් එදා රටට බොරු කළා වාගේ අපිත් ඒ බොරුව කරයි කියලා සමහර මන්ත්‍රීවරු මේ ගරු සභාවේ අදහස් දැක්වුවා. අපි දැක්කා, එදා අපේ හිටපු සංඛ්‍යාවටත් වඩා විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීම සඳහා ගනිපු ඡන්දයේදී මට මතක විධියට ඡන්ද 187ක්ද කොහේද දීලා ඒකට සහයෝගය දුන් ආකාරය. ඒ වාගේම අකැමැත්තෙන් වුණත් තම යුතුකම ඉටු කරමින් තමන්ගේ පක්ෂය වෙනුවෙන් බොහෝ අය අදහස් දැක්වුවාට මේකේ ඇත්ත කථාව තමයි, බොහෝ අයට මේ අය වැයෙන් මේ රටට කොහොම සේවයක් වෙයිද කියලා දැනෙනවා කියන එක. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, විවේචන කරමින් ඉන්නේ නැතිව, මේ රට හදා ගන්න දායක වෙන්න කියලා. මොකද, මේ රට අපි හදා ගන්න ඕනෑ. වැටිලා තිබෙන්නේ යූඑන්පීද, පොහොට්ටුවද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද කියනවාට වඩා වැටිලා තිබෙන්නේ මේ රට කියන එක තේරුම්ගෙන තමයි ගමේ ජනතාව අපිත් එක්ක එක්කහු වුණේ. තමන් විඳපු කටුක අත්දැකීම් නිසා තමයි ජාතික ජන බලවේගයත් එක්ක මේ රට හදා ගන්න ඕනෑ කියලා ඔවුන් අපිත් සමඟ එකතු වුණේ. අනාගත පරපුරට රටක් අහිමි වෙන්න යනවා, රටේ ජනතාවට පෝෂණයක් නොලැබී යනවා, ලෝකයක් ඉස්සරහ මේ රට අවමානයට ලක් වෙලා තිබෙනවා කියන තැනින් ඉහළට මේ රට ගොඩනඟන්න ඕනෑ නිසා තමයි ගමේ සාමාජිකයෝ අපිත් එක්ක එක්කාසු වුණේ. ඒ සාමාජිකයන්ට වග කියන්න වාගේම මේ රට ලෝකය ඉස්සරහ ඉහළින් තියන්න මේ රජය උපරිම මහන්සි ගන්නවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා සැකයක් තබා ගන්න එපා. ඔබතුමන්ලා දෙන සහයෝගයක් ලබා දෙන්න. විවේචන කරන්න. ඒකට කමක් නැහැ. ඒ විවේචනවලට දෙන උත්තර හරහාත් ආපහු ජනතාවම තමයි දැනුවත් වෙන්නේ.

මේ ආණ්ඩුව ගන්න කලින් වුණත් ඉතිහාසය පුරාම අපි කරපු කැප කිරීම් තිබුණා. මේ රට දියුණු කරන්න එදා කැප කිරීම් කරපු ආරම්භකයෝ වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ හිටියා. මෙතුමන්ලා දැනටත් ජනතා විමුක්ති පෙරමුණ රජය කියලා කියන්නේ වෙනත් කුහක අදහසකින්. මේක ජාතික ජන බලවේගය කියලා නොකියා ඉන්න තරමට ඒගොල්ලන් කැමැතියි. ඒක තමයි තිබෙන රහස. ඔය විධියටම අපේ පක්ෂයේ නිර්මාතෘගේ නම හරියට කියා ගන්න බැරි රටේ නායකයෙක් එදා හිටියා. එතුමාත් කිව්වේ, රොහාන් විජේවීර කියලා. රෝහණ විජේවීරගේ නම බැරිකමකට නොවෙයි, හිතලා කිව්වේ නැහැ. ඒ සාස්තරයත් අපි දන්නවා. කොහොම වුණත් ජාතික ජන බලවේගය රජය පාලකයෝ හැටියට ඔවුන්ගෙන් ඒ අත්දැකීම් ඉගෙන ගත් නිසා තමයි ජනතාව මේ විධියට පෙළ ගස්වලා, දැනුවත් කරලා මේ බලය ලබා ගත්තේ. ඒ බලය ගත්තා වාගේම ඡන්දය දුන් ජනතාවට, අපිව විශ්වාසය කරපු ජනතාවට අබමල් රේණුවක තරම්වත් වරදක් නොකර මේ කටයුත්ත හරියට කරන්න අපි වග වෙනවා.

ඊයේ අපේ මන්ත්‍රීතුමෙකු කියනවා මට ඇහුණා, අපි සන්ධාන හදලා විවිධාකාරයෙන් මේ රට විකෘති කළා කියලා. ඔව්, අපි සන්ධාන හැදුවා තමයි; අපි සන්ධාන හැදුවා. හැබැයි, 2001, 2002 කාලය වනකොට මේ රට ගෙනියන්න ගිය පාර අපි දැක්කා නේ. අද තමුන්නාන්සේලාගේ ලකුණුත් නැහැ; පුටුවත් නැහැ; ලොවෙත් නැද්ද දන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ නායකයා එදා අගමැතිකම් කරද්දී, සන්ධානයක් හදලා, නැත්නම් පරිවාස ආණ්ඩු හදලා බිලි දෙන්න ගිය මේ රට ඔවුන්ගෙන් බේරා ගන්න, එහෙම නැත්නම් ගිවිසුම් ගහලා ජාත්‍යන්තර වශයෙන් කඩන්න ගිය මේ රට බේරා ගන්න ඒ වෙලාවේ අපි කටයුතු කළා. ඒවායේ වටිනාකම් අනාගතයට තිබුණා. ඒ විතරක් නොවෙයි. චන්ද්‍රිකා මැතිනියත් එක්ක ගහපු සන්ධාන ආණ්ඩුවල කෘෂිකර්ම අමාත්‍යවරයෙකු හිටියා ඔබට මතක ඇති. ඒ, අද ජනාධිපතිවරයා වෙලා ඉන්න අපේ ආදරණීය අනුර දිසානායක සහෝදරයා. මතකද, පොහොර සහනාධාරය විතරක් අරගෙන දෙන්න දඟලපු මහන්සිය? බල්ලෝ නාවන්න යනවා වාගේ අමාරුවෙන් ඇදගෙන ගිහිල්ලා තමයි එදා ගොවි ජනතාවට පොහොර සහනාධාරය අරගෙන දුන්නේ. එදා එහෙම අමාරුවෙන් අරගෙන දුන් පොහොර සහනාධාරය පස්සේ "මහින්ද චින්තනය" කියලා වෙනත් විධියකට ආවා. එහෙම ඉතිහාසයක් තුළ අපට කරන්න පුළුවන් කැපකිරීම් අපි කළා. හොඳ හෝ නරක විධියට ගන්න පුළුවන් අත්දැකීම් ද අරගෙන ඒවායින් පාඩමක් ඉගෙනගෙන අපි ජාතික ජන බලවේගය විධියට ඇවිල්ලා මෙවන් ජයග්‍රහණයක් ලබා ගත්තේ, රටේ ජනතාව ඉස්සරහ සෙල්ලම් කරන්න නොවෙයි.

තමුන්නාන්සේලා විවිධ විවේචන කරනකොට ඇයි එහෙම කරන්නේ කියලා පොඩි කම්පාවකුත් ඇති වෙනවා. කොහොම වුණත්, ඇත්ත ඇති සැටියෙන් දැකලා මේක තේරුම් ගන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

මොකද, අපි එහෙම ඉල්ලන්නේ මේ නිසා. කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් වෙන්න පුළුවන්; ප්‍රවාහන ක්ෂේත්‍රයෙන් වෙන්න

[ගරු චමින්ද ලලිත් කුමාර මහතා]

පුළුවන්; අනෙක් පැත්තෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයෙන්, අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් වෙන්නත් පුළුවන්; මේ හැම පැත්තකින්ම මේ රට කඩාගෙන වැටිලා තිබෙන්නේ. වැටුණු රටක් ගොඩනඟන්න තමයි අපි මේ කටයුතු කරන්නේ. පාරට බැස්සාම පාසලට යන්න බස් එකක් නැති තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම, ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ පහසුකම් නැතුව අපේ පොදු ජනතාව විවිධ අමාරු අත්දැකීම්වලට මුහුණ දෙනවා. එම නිසා ප්‍රවාහන ක්ෂේත්‍රයත් සංවර්ධනය කරන්න ඕනෑ. ඒ සඳහා මෙවර අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. හැමෝටම අය වැය ඇස්තමේන්තුව දීලා තිබෙන නිසා මම ඊට අදාළ ඉලක්කම් අමුතුවෙන් කියන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කොහොම වුණත් මීරිගම ජීවත් වන මටත් අත්දැකීම් ප්‍රමාණයක් තිබෙනවා. 999 කියන්නේ, මීරිගම ඉඳලා ගිරිඋල්ල දක්වා යන බස් මාර්ග අංකය. නමුත්, ඒ පාරට SLTB එකෙන් බස් එකක් දාලා නැහැ. 999 කියන්නේ ලංකාවේ අවසන් බස් මාර්ග අංකය. බස් එකක් සොයන්න මම නිට්ටඹුව ඩිපෝවටත් ගියා; ගිරිඋල්ල ඩිපෝවටත් ගියා. නමුත් බස් එකක් සොයා ගන්න නැහැ. අමාරුවෙන් හරි බස් එකක් සොයා ගත්තොත්, රියදුරෙකුත් නැහැ; කොන්දොස්තරවරයෙකුත් නැහැ. ඩිපෝවලට ගියාම අපට ඒවායේ සිටින නිලධාරීන් විඳින අපහසුකම් දකින්න පුළුවන්. එතකොට අපි ගිය වාහනයත් දීලා එන්න හිතෙනවා, මේක ඔයාලම තියා ගන්න කියලා. අපේ ප්‍රවාහන පද්ධතිය එවැනි තැනකට පත්වෙලා තිබෙනවා. ඒ වාගේම, රෝහලකට ගියාමත් අපට එවැනි තත්ත්වයන්ම තමයි අත්විඳින්නට ලැබෙන්නේ. ඒ ආකාරයෙන් ගත්තාම, අපට මෙතැන විනාඩි 10කින්, 15කින් කථා කරලා ඉවර කරන්න බැරි තරමට මේ රටේ හැම ක්ෂේත්‍රයක්ම බිඳ වැටිලා තිබෙනවා. ඇස් ඇරලා බලනකොට අපි කාටත් පෙනෙනවා, මෙහෙම තත්ත්වයක් තමයි උදාවෙලා තිබෙන්නේ කියලා. මේ තත්ත්වය වහාම වෙනස් කරන්න ඕනෑ නිසා ගරු ජනාධිපතිතුමා උදාර අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ජනාධිපතිතුමාගේ ඉඳලා විෂය දැනුමක් ඇති, හැම පැත්තෙන්ම කැපවෙලා කටයුතු කරපු නිලධාරීන් දක්වපු සහයෝගයත් එක්ක රට ගැන හිතපු අය වැයක් ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. මෙම අය වැය හරහා තම බලාපොරොත්තු ඉෂ්ට කර ගන්න රටේ කවුරුත් දැස් දල්වාගෙන බලාගෙන ඉන්නවා වාගේම, ඒ බලාපොරොත්තු ඉෂ්ට කරන්න අපේ ශක්තිය හා ධෛර්යය අපි හැම පැත්තෙන්ම එකතු කරනවා. ඒ වාගේම විපක්ෂයේ ඔබතුමන්ලාටත් කියා සිටිනවා, විවේචනවලට ගිහිල්ලා මේ වටිනා අවස්ථාව රටට අහිමි කරන්න වචනයක් හරි එකතු කරනවාට වඩා, මෙය නිවැරදිව තේරුම් අරගෙන රටට හරි මතයක් හදන්න කටයුතු කරන්න කියලා. එම ඉල්ලීම කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. K. Sujith Sanjaya Perera. You have 12 minutes.

[අ.භා. 2.07]

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන ආණ්ඩුවේ මංගල අය වැය පිළිබඳ දෙවනවර කියවීමේ විවාදයේදී අදහස් කිහිපයක් එකතු කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. අපි දන්නවා, පසුගිය දින කිහිපය තුළදීම විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂය වාගේම විපක්ෂයත් මේ අය වැය පිළිබඳව අදහස් උදහස් ඉදිරිපත් කරන්න කටයුතු කළ බව. "මේක තමයි ලංකා ඉතිහාසයේ ඉදිරිපත් කරපු හොඳම අය වැය" කියලා තමයි සාමාන්‍යයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මේ වනතුරු අදහස් දැක්වූවේ. අපි දන්නවා, මීට ඉස්සෙල්ලාත් අය වැය ලේඛන ඉදිරිපත් කරලා තිබෙන බව. මේක ලංකාවේ පළමුවැනි අය වැය ලේඛනය නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. යම් ආණ්ඩුවක් අය වැය ලේඛනයක් වාර්ෂිකව ඉදිරිපත් කළාට, අපි ඈත අතීතය දිහා බලනකොට දැකපු දෙයක් තමයි, සංවර්ධන කාර්යයන් ඇතුළුව අය වැයෙන් යෝජනා කරන කාර්යයන්වලින් සියයට 50ක්වත් ඉෂ්ට කර ගන්න කිසිම ආණ්ඩුවකට පුළුවන්කමක් ලැබී නැහැ කියන එක.

විශේෂයෙන්ම වර්තමාන ආණ්ඩුව බලයට එනකොට මොන තරම් දේවල් පොරොන්දු වුණාද කියලා අපි දැක්කා. මේ රටේ ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න, ජනතාවගේ බඩු මිල අඩු කරන්න, ඉන්ධන මිල අඩු කරන්න, විදුලි බිල අඩු කරන්න ආදී පොරොන්දු රාශියක් දීලා තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය මාස තුනේදී ජනතාව බලාගෙන සිටියා, "කමක් නැහැ, ආණ්ඩුව අලුත්වෙලා තිබෙන්නේ, ඒ නිසා අය වැයෙන් හරි ඒ අය පොරොන්දු වුණු දේවල් ඉෂ්ට කරලා අපට යම්කිසි සහනයක් සලසා දෙයි" කියලා. එහෙම තමයි ජනතාව බලාපොරොත්තුවෙන් සිටියේ. නමුත්, මේ අය වැය පිළිබඳව අපි ජනතාවගේ පැත්තෙන් බැලුවොත්, ඒ කිසිම සහනයක් ලබා දෙන්න, ඒ වාගේම ක්ෂණික සහන ලබා දෙන්න අවශ්‍ය කටයුතු සිද්ධවෙලා නැහැ. අපි දන්නවා, පාරිභෝගික ද්‍රව්‍යවල මිල තමන්ට දරාගන්න පුළුවන්කමක් නැතිව සිටි අවස්ථාවේ මේ රටේ ජනතාව මේ අය කියපු දේවල් අය වැය තුළින් ඒ ආකාරයෙන්ම ලබා දෙයි කියලා බලාපොරොත්තුවෙන් හිටපු බව. විශේෂයෙන්ම මේ රටේ ජනතාවගේ ආර්ථිකය අද ඉතා පහළ මට්ටමකට වැටිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා ඒ කාලයේ කිව්වේ මොකක්ද? අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලට පනවා තිබෙන VAT, එහෙම නැත්නම් බදු ටික අඩු කරලා ජනතාවට සහන දෙනවාය කිව්වා. නමුත්, මේ අය වැයේ එක තැනකවත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල VAT එක අඩු කරන්න කටයුතු කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. අපට මතකයි, ඒ කාලයේ ඉන්ධනවලට රජය අය කරන බදු ගැන කථා කළා. ඩීසල්වලින් බදු වශයෙන් මෙච්චර අය කරනවා, පෙට්ල්වලින් බදු වශයෙන් මෙච්චර අය කරනවාය කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් බලන්න, මේ අය වැයෙන් එතුමන්ලා කියපු දේවල් එකක්වත් ඉෂ්ට කරලා නැහැ. ඉන්ධනවලට සහනයක් ලබා දෙන්න, විදුලි බිලට සහනයක් දෙන්න කටයුතු කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට, පොත් පත් ඇතුළු දරුවන්ට අවශ්‍ය ලිපි ලේඛනවලට යම්කිසි සහනයක් ලබා දෙනවාය කියලා තමයි එදා කථා කළේ. මේ ගරු සභාවේදීත් කිව්වේ මොකක්ද? දරුවන්ගේ පාසල් උපකරණවලට පනවා තිබෙන VAT එක අඩු කරනවාය කිව්වා. නමුත්, මේ අය වැයෙන් එවැනි කිසිම යෝජනාවක් ඉදිරිපත් කරලා නැහැ.

අපට පේනවා ඔබතුමන්ලා යෝජනා ගෙනැල්ලා තිබෙනවා හැම පැත්තෙන්ම. හැම ක්ෂේත්‍රයක්ම ආවරණය කරන්න උත්සාහ දරලා තිබෙනවා. ඒ කියන්නේ සම්පූර්ණ වශයෙන් නොවෙයි, එක් එක් ක්ෂේත්‍රවල ඉන්න හැම කෙනාම සතුටු කිරීමේ අය වැයක් ඉදිරිපත් කරන්න කටයුතු කරලා තිබෙන බව තමයි මේ අය වැය ලේඛනය දිහා බලපුවාම පේන්නේ. අපේ රටේ ජනතාව අද අය වැයෙන් බලාපොරොත්තු වෙන්නේ දිගුකාලීන පොරොන්දු, එහෙම නැත්නම් දෙනවා කියන පොරොන්දුවලට වඩා ක්ෂණිකව යම්කිසි සහනයක්. ඒ බලාපොරොත්තුවෙන්

තමයි ජනතාව ඉන්නේ. අද ඒ ජනතාවගේ අපේක්ෂා සහ බලාපොරොත්තු කඩ වෙලා තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් පැත්තෙන් අපි බලමු වැටුප් සම්බන්ධයෙන්. වැටුප් සම්බන්ධයෙන් රජයේ සේවකයන්ට ලොකු බලාපොරොත්තුවක් දුන්නා. රජයේ සේවකයන්ට කිව්වේ මොකක්ද? ඇඟට දැනෙන, එහෙම නැත්නම් වැටුප් පතට දැනෙන සැලකිය යුතු ප්‍රමාණයකින් වැටුප් වැඩි කරන්න කටයුතු කරනවා කියලා තමයි ප්‍රකාශ කළේ. නමුත් අපි දන්නා තරමින් ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ටත් පුළුවන්කමක් නැහැ, රජයේ සේවකයන්ට ඉදිරිපත් කරපු වැටුප් වැඩිවීම කොයි ආකාරයෙන්ද බලපාන්නේ කියන එක පිළිබඳව පැහැදිලි කර ගන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපටත් ඒක තේරුම් ගන්න පුළුවන්කමක් නැහැ. එතුමන්ලා කියනවා මේ ප්‍රමාණයෙන් වැඩි වෙනවා, එහෙම නැත්නම් 15,000කින් වැඩි වෙනවා, O/Tවලින් වැඩි වෙනවා කියලා; නොයෙකුත් ආකාරයෙන් වැඩි වීම් ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පෙනී යන ආකාරයට නම් රුපියල් 5,700ක වැටුප් වැඩි වීමක් තමයි මේ වසරේ රජයේ සේවකයන්ට බලාපොරොත්තු වෙන්න වෙන්නේ. ඔබතුමන්ලා රුපියල් 15,000කින් වැඩි කළා කිව්වාට අපට පේන හැටියට, අපට තේරෙන හැටියට රජයේ සේවකයන්ට ඒක ගන්න 2027, 2028 වෙනකම් බලාගෙන ඉන්න වෙනවා කියන එකත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. ඉතින් මට හිතා ගන්න පුළුවන්කමක් නැහැ මේවා කොයි ආකාරයෙන් කරයිද කියලා.

අපි දන්නවා අද වෙනකොට අය වැය හිඟය රුපියල් බිලියන 2,200ක්. ඔබතුමන්ලා හැම එකක් ගැනම යෝජනා ගෙනැල්ලා තිබුණාට, සංවර්ධනය ගැන ලොකුවට කථා කරලා තිබුණාට ඒවා ඉෂ්ට කර ගන්නත් ඕනෑ. ඒවා ඉෂ්ට කර ගන්න නම් අනිවාර්යයෙන්ම ඒ අය වැය හිඟය පියවා ගන්න ඕනෑ, ඒ සඳහා අවශ්‍ය මුදල් සොයා ගන්න ඕනෑ. ඔබතුමන්ලා ප්‍රකාශ කරන්නේ, දේශීය වශයෙන් ණය අරගෙන, එහෙම නැත්නම් විදේශීය වශයෙන් ලැබෙන ප්‍රදාන හෝ අනෙකුත් ආදායම්වලින් මේ අය වැය හිඟය පියවා ගන්න උත්සාහ කරනවා කියලායි. එහෙම තමයි පසුගිය කාල සීමාවල හිටපු ඒ ඒ මුදල් ඇමතිවරුත් කිව්වේ. නමුත් ඒවා එකක්වත් ඒ ආකාරයෙන් ඉටු වුණේ නැහැ. ඉතින් මට කියන්න තිබෙන්නේ, මේ අය වැය සම්බන්ධයෙන් අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අනිවාර්යයෙන්ම මේ අය වැයෙන් සිද්ධ වෙන්නේ ජනතාවට තවත් අතිරේක බදු මුදල් ගෙවන්න වෙන එක, එහෙම නැත්නම් වෙනත් දේවල්වලට බදු ගෙවන්න වෙන එක කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන යෝජනා ගොඩක් තිබුණත් මට ඒ සියල්ලම ගැන කථා කරන්න වේලාවක් නැති නිසා අපේ ප්‍රදේශවලට බලපාන කරුණු කිහිපයක් සම්බන්ධයෙන් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. එකක් තමයි වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි වීම පිළිබඳ කාරණය. මම දැක්කා මේ අය වැය ලේඛනයේදී අනුර කුමාර දිසානායක මැතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් 1,700 දක්වා වැඩි කරන්න කටයුතු කරනවා කියලා. අපට මතකයි එතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නම් තිබුණේ එය රුපියල් 2,000 දක්වා ගෙනයනවා කියලා. නමුත් දැන් කියලා තිබෙන්නේ 1,700 දක්වා වැඩි කරන්න සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. වැඩි කරනවා කියලා කොහේවත් කියලා නැහැ, සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා කියන එක තමයි එතුමා ප්‍රකාශ කරලා තිබෙන්නේ. මුලින්ම මේ සම්බන්ධව කථා කළේ අපේ ගරු රනිල් වික්‍රමසිංහ මහත්තයා. එතුමා තමයි ජනාධිපති හැටියට ඕට අවුරුද්දකට, එකහමාරකට විතර කලින් වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් 1,700ක් කරනවා කියලා කිව්වේ. නමුත් එතුමාටත් ඒක කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අවසාන කාලයේ, ආණ්ඩුව ඉවර වෙනකොටම තමයි එතුමා වතු සමාගම් එක්ක සාකච්ඡා කරලා ඒ වැටුප 1,350ක් දක්වා වැඩි කරන්න කටයුතු කළේ. මම දන්නා තරමින් මේ වැඩිවීම කරන්න පුළුවන් වෙයිද කියන එක ගැන ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ නිසා දැන් මේක බලාපොරොත්තුවෙන් ඉන්න එක විතරයි කරන්න තිබෙන්නේ. වතු කම්කරු ජනතාවට ලොකු විශ්වාසයක් තියා ගන්න පුළුවන්කමක් නැහැ, රජය පැත්තෙන් මේ වැටුප් වැඩිවීම ලබා ගන්න පුළුවන්කම ලැබෙයි කියලා.

අනෙක් පැත්තෙන් ඔබතුමන්ලා නිවාස ප්‍රශ්නය ගැන කථා කළා. මම දැක්කා වතුකරය නියෝජනය කරන මැති ඇමතිවරු ගණනාවක් පාර්ලිමේන්තු මැතිවරණය අවස්ථාවේදී වතු කම්කරුවාට තිබෙන ගැටලු -ප්‍රශ්න- ගැන, වතු කම්කරුවන්ගේ නිවාස ගැන බොහෝම සංවේදීව කථා කළා. ඒවාට පුළුල් ප්‍රචාරයක් දෙන්නත් කටයුතු කළා. මේ අය වැයෙන් අපට දැක ගන්න තිබෙනවා වතු කම්කරුවන්ට රුපියල් මිලියන 4,000කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ මිලියන 4,000 වෙන් කරලා තිබෙන්නේ නිවාස ව්‍යාපෘති සඳහා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිලියන 4,000ක් මුදල් වෙන් කරලා ගෙවල් කීයක්ද හදන්න පුළුවන්? අද කාලේ තිබෙන වියදමත් එක්ක බලනකොට රුපියල් ලක්ෂ 25කින් ගෙයක් හදන්න බැහැ. මම හිතන්නේ ලක්ෂ 25ක් එක ගෙයකට වියදම් කළත් ගෙවල් එක්දහස් ගාණකට වඩා හදන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමන්ලා කිව්වා මහල් නිවාස හදනවා කියලා. *[බාධා කිරීමක්]* අපි දන්නේ නැහැ, ඔබතුමන්ලා මොනවාද කරන්න හදන්නේ කියලා. ගරු සභානායකතුමනි, මොන ගෙයක් හැදුවත්, අද කාලයේ රුපියල් 25,000කින් ගෙයක් හදන්න බැහැ නේ. සෙල්ලම් ගෙයක් හදන්න පුළුවන්. ඉතින් මේ වාගේ මුදලක් වෙන් කරලා වසරකට ගෙවල් 1,000ක්වත් හදාගන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. වතු ක්ෂේත්‍රයට සම්බන්ධ, වතු කම්කරුවෝ හැටියට දැනට පවුල් ලක්ෂයක් විතර ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතින් වතුවල පදිංචිවෙලා ඉන්න අයත් එක්ක ගත්තොත් පවුල් ලක්ෂ හතරක්, පහක් විතර වතුකරයේ ජනතාව ජීවත් වෙනවා. ඒ නිසා ඒ අයට සාධාරණයක් කරනවා නම් මේ මුදල කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. ඔබතුමන්ලා කිව්වේ නම් මොකක්ද? "වතු කම්කරුවන් මෙහෙමයි ජීවත් වෙන්නේ. එක ගෙදර පවුල් තුන, හතර ඉන්නවා. අපි කඩිනමින් විසඳුම් ලබා දෙනවා" කියලා නේ කිව්වේ. නමුත් මම හිතන්නේ නැහැ, මේ මුදල් ප්‍රමාණයෙන් ඔබතුමන්ලාට මේ අවුරුද්දේ ගෙවල් 1,000ක්වත් හදලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙයි කියලා. අපි කියන්නේ වතු කම්කරුවන්ට වඩා වත්තේ සේවය නොකරන පිරිස වතුවල ජීවත් වෙනවා වැඩියි. ඒ නිසා ඔබතුමන්ලා යම්කිසි විසඳුමක් ලබා දෙනවා නම් අපි යෝජනාවක් කරන්න කැමැතියි, ගරු ඇමතිතුමනි. පුළුවන් නම් ඒ අයට පර්චස් හතක් වෙන් කරලා දෙන්න.

අපි දුන්නා. ඔබතුමන්ලාටත් තිබෙන්නේ වතු සමාගම් එක්ක සාකච්ඡා කරලා සුදුසු පරිදි පර්චස් හතක් දෙන්න. එහෙම ලැබුණොත් අද වතුවල සේවය කරන පිරිස් කෙසේ වෙතත්, පිට වැඩ කරන අයට පුළුවන්කම ලැබෙනවා, තමන්ට කියලා ගෙයක් හදාගන්න. කොළඹ ප්‍රදේශයේත්, විවිධ තැන්වලත් වෙළඳ ව්‍යාපාරවල විශාල පිරිසක් සේවය කරනවා. ඒ අයට පුළුවන්කම තිබෙනවා, තමන්ට ඉඩම තිබෙනවා නම් ගේ හදා ගන්න. ඒගොල්ලන් කැමැත්තෙන් ඉන්නවා. ඒ කාලයේ ඉඩම් ඇමතිවරයා හැටියට අපේ ගයන්ත කරුණාතිලක මැතිතුමා ඒ

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

අයට සින්නක්කර අයිතිය දුන්නා. එතුමා ඒ සම්බන්ධව සාකච්ඡා කරලා ඒ වතුවල තිබුණු ඉඩම්වලටත් ඒ වාගේම අලුතින් ඉඩම්වලටත් ඒ කටයුත්ත කරන්න එතුමා කටයුතු කෙරුවා. *[බාධා කිරීමක්]* මගේ වතු එකක්වත් නැහැ. අපේ වතු තිබුණා. දේශපාලනය හින්දාම තමයි අපේ වතු ටික ඔක්කෝම ඉවර වුණේ. වෙන මිනිසුන්ට නම් කියන්න පුළුවන් දේශපාලනය කරලා හම්බ කරගත්තා, වතු පිටි ගත්තා කියලා. නමුත් අපි තිබෙන දේවල් විකුණලා තමයි දේශපාලන කටයුතු කෙරුවේ, ගරු ඇමතිතුමනි. ඒකත් ඔබතුමා අහපු නිසා කිව්වේ.

මේ සම්බන්ධව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා වතු කම්කරුවන්ට සද්භාවයෙන් ඒ දේ කරන්න ඕනෑ නම් අනිවාර්යයෙන්ම පර්චස් හතක්වත් දෙන්න ඕනෑ. එහෙම දුන්නොත් යම්තාක් දුරට මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. එහෙම නැත්නම් මේ වතු කම්කරුවන්ගේ නිවාස ප්‍රශ්නය අවුරුදු 100ක් ගියත් විසඳන්න ලැබෙන්නේ නැහැ කියලා මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම කුඩා තේ වතු හිමියන් ගැන කොයිම අවස්ථාවකවත් කථා කෙරුවේ නැහැ. මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා නම් කිව්වා කුඩා තේ වතු හිමියන්ට මෙච්චර වෙන් කරලා තිබෙනවා, අච්චර වෙන් කරලා තිබෙනවා කියලා. නමුත් මේ අය වැය කථාවේ ඒ ගැන සඳහනක් නැහැ. අපි දන්නේ නැහැ, ඔබතුමන්ලා ඒ සල්ලි ටික කොහෙන් වෙන් කරලා තිබෙනවාද කියලා. කුරුඳු ගැන විතරයි සඳහන් කරලා තිබෙන්නේ. අපි දන්නවා, මේ රටේ හතරවැනියට විදේශ විනිමය ගෙනෙන ව්‍යාපාරයක් තමයි තේ වගාව. තේ වගාවට සම්බන්ධ අවධානය යොමු කරලා තිබෙනවා නම් හොඳයි. නමුත් මට පෙනෙන හැටියට නම්, ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙන ආකාරය ගැන අපට පැහැදිලිතාවක් නැහැ. අපි දන්නවා, දැන් කුඩා තේ වතු හිමියෝ අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා කියලා.

විශේෂයෙන් මේ වියළි කාලගුණයත් එක්ක අද වනවිට කුඩා තේ වතු හිමියන්ට ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ. තේ දලුවල මිල බොහොම පහළ බැහැලා තිබෙනවා. සාමාන්‍යයෙන් ගත්තොත් රුපියල් 150ටවත් තේ දලු කිලෝ එකක් විකුණන්න පුළුවන්කමක් නැහැ. ඒ තත්ත්වයට තමයි කුඩා තේ වතුහිමියෝ අද වනවිට පත් වෙලා තිබෙන්නේ. අනෙක් පැත්තෙන් ගත්තොත් පොහොර මිල රුපියල් 9,000යි, 11,000යි. ඒ පොහොරත් ප්‍රමිතියෙන් යුතුව නැහැ කියලා කුඩා තේ වතු හිමියෝ මැසිවිලි නඟනවා. ඒ ප්‍රදේශ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඉන්නවා නම් තමුන්නාන්සේලා ඒ ගැන හොයලා බලන්න. කුඩා තේ වතු හිමියන් එක්ක සාකච්ඡා කරලා බලන්න, ඔබතුමන්ලාට කියන්නේ මොකක්ද කියලා. රජය පැත්තෙන් වැවිලි කර්මාන්ත ඇමතිතුමා මේ සභාවේ හිටියා නම් හොඳයි. ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා නම් කුඩා තේ වතු හිමියන්ට උදව් කරන්න අනිවාර්යයෙන්ම පොහොර මිල අඩු කරලා දෙන්න.

වී වගාව කරන අයට පොහොර සහනාධාරයක් ලබා දෙනවා. මම යෝජනා කරන්න කැමැතියි, කුඩා තේ වතු හිමියන්ටත් ඒ සහනාධාරය ලබා දෙන්න කියලා. අපේ කාලයේ අපි ලබා දෙන්න කටයුතු කෙරුවා. ඒක ඉතා වැදගත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පොහොර ටික ලබා දෙන්න කටයුතු කරන්න. එහෙම නැත්නම් අඩුම ගණනේ සහනාධාරය ලබා දෙන්න කටයුතු කරන්න. ඒ විතරක් නොවෙයි, පළිබෝධ නාශක ගත්තොත් ඒවායේ මිලත් අධිකයි. තේ ගොවියාට ඒවා යොදලා වල් මර්දනය කරන්න, කෘමීන් මර්දනය කරන්න, ඒ කිසි දෙයක් කරන්න පුළුවන්කමක් නැහැ. අනෙක් පැත්තෙන් තේ කර්මාන්තශාලාකරුවෝ අද ඉතා අසරණ තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. ඔවුන්ට විදුලිය බිල දරාගන්න බැහැ. කර්මාන්තශාලා හිමියෝ මට කියනවා, මේ විදුලිය බිල අපි කොහොමද දරන්නේ කියලා. ඒ වාගේම ඉන්ධන මිල. අපි දන්නවා, කර්මාන්තශාලා ඉන්ධන දහනය කරලා පවත්වාගෙන යන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ඉන්ධන මිලත් දරා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ බර ඔක්කෝම අවසානයේ එන්නේ කුඩා තේ වතු හිමියන්ට. මොකද, කර්මාන්තශාලා හිමියන් ඒවා දරන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
වැඩියෙන්ම නිෂ්පාදන දායකත්වයක් ලබා දෙන්නේ කුඩා තේ වතු හිමියෝ.

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මේ රටේ තේ අපනයනයේදී සියයට 75ක දායකත්වය දෙන්නේ කුඩා තේ වතු හිමියෝ. එම නිසා රජය හැටියට තමුන්නාන්සේලාට යුතුකමක් සහ වගකීමක් තිබෙනවා මේ සා විශාල විදේශ විනිමයක් රටට ගෙනෙන තේ කර්මාන්තය සම්බන්ධව සොයා බලා, ඒ අයට අවශ්‍ය කරන සහන ලබා දීමට. මම මේ අවස්ථාවේ එම යෝජනාවත් කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Harshana Suriyapperuma?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
Sir, I would just like to make a clarification on the matter raised by the Hon. Member.

Hon. Member, වතු නිවාස සංවර්ධනයට කර තිබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මදි බව ඔබතුමා සඳහන් කළා. වැරදි අදහසක් තමයි ඔබතුමා සමාජගත කරන්න උත්සාහ කරන්නේ. ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේත් පැහැදිලිව සඳහන් වෙලා

තිබෙනවා, වතු නිවාස සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 4,267ක් වෙන් කරන බව. මේ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් කර තිබෙන්නේ මෙම වසරේ හදන නිවාසවලට විතරක් නොවෙයි. මේ projects සියල්ල, on-going projects. පසුගිය වසරවල භාගෙට හදපු නිවාස තිබෙනවා. ඒවායේ වැඩ නිම කිරීම, අලුතින් නිවාස සෑදීම ආරම්භ කිරීම වාගේ projectවලට යන ප්‍රමාණය තමයි අදහස් කෙරෙන්නේ. මේ යටතේ නිවාස 1,300ක වැඩ අවසන් කරන්නටත් මේ වසරේ බලාපොරොත්තු වන බව සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Ramalingam Chandrasekar. You have 17 minutes.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please raise your point of Order, Hon. Member.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, was there a point of Order raised for the Hon. Deputy Minister to make that statement?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Since the Hon. Deputy Minister was here, he made a clarification.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
That is not included in the Standing Orders, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He had to clarify it since that was a concern of the Hon. K. Sujith Sanjaya Perera. Fortunately, Hon. Deputy Minister was here, and he clarified it very briefly.

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. K. Sujith Sanjaya Perera?

ගරු කේ. සුජීත් සංජය පෙරේරා මහතා
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම සම්බන්ධයෙනුයි මම මේ කියන්නේ. මම කිව්වේත් ඒකයි. රුපියල් මිලියන 4,000ක් පමණ වෙන් කරලා තිබෙනවා. පසුගිය කාලයේ පටන් අරගෙන වැඩ ඉවර කරන්න බැරි වුණු ගෙවල්වලටත් ඒකෙන් සල්ලි වියදම් කරන්න ඕනෑ; ඒ වාගේම, අලුතින් ගෙවල් ටික හදා ගන්නත් ඕනෑ. ඔය මොන දේ කළත් ගෙවල් 1,500කට 2,000කට වඩා හදන්න බැහැ කියන එකයි මම පැහැදිලි කළේ. මේ ගැන දිගින් දිගට වාද කිරීමේ තේරුමක් නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒක තමයි යථාර්ථය.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
Hon. Deputy Speaker, I would like to make another small clarification.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Harshana Suriyapperuma?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් වශයෙන් ගත්තොත්, මෙම වසර තුළ සියලු ප්‍රාදේශිකයන්ගේ නිවාස 182,370ක වැඩ අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒවා අතර නගරබද නිවාස තිබෙනවා. ගැටුම්වලින් බලපෑමට ලක් වූ පවුල්වලට ස්ථිර නිවාස ලබා දීමට තිබෙනවා. දකුණු පළාතේ දැනට අරම්භ කරලා තිබෙන නිවාසවල වැඩ අවසන් කිරීමට තිබෙනවා. ඒ වාගේම වතු අංශයේ නිවාස 10,000ක් සඳහාත් මේ තුළින් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ 10,000න් 1,300ක වැඩ කඩිනමින් අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම පිණිසයි මා එය සඳහන් කළේ.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ramalingam Chandrasekar, you may proceed with your speech now.

[பி.ப. 2.23]

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் கன்னி வரவு செலவுத்திட்டம் சம்பந்தமாகச் கருத்துச் சொல்வதற்கு இன்று எனக்கும் சந்தர்ப்பம் கிடைத்தமைக்குப் பெருமகிழ்ச்சி அடைகின்றேன். கடந்த 17ஆம் திகதி எங்களுடைய மாண்புமிகு ஜனாதிபதி அவர்கள் இந்தச் சபையிலே வரவு செலவுத்திட்ட உரையை ஆற்றியிருந்தார். இந்த வரவு செலவுத்திட்டத்தின் தூரநோக்கு என்ன? இதன்மூலமாக நாங்கள் செய்யப்போவது என்ன? கடந்த காலங்களில் எமது நாடு ஏன் இந்த நிலைக்கு வீழ்ந்தது? வீழ்ந்திருக்கின்ற இந்த நாட்டை நாங்கள் எப்படி மீட்பது? என்ற விடயங்கள் தொடர்பாக மிகவும் ஆழமாகவும், அர்த்தபுஷ்டியாகவும் சுமார் 2 மணித்தியாலங்களுக்கும் மேலாக இந்தச் சபையிலே உரையாற்றியிருந்தார். அந்த உரை சம்பந்தமான விவாதம்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

இன்றோடு 5 நாட்களாக இந்த மன்றத்தில் இடம்பெற்று வருகின்றது. இந்த விவாதத்தின்போது எதிர்க்கட்சியைச் சார்ந்த உறுப்பினர்கள் முன்வைக்கின்ற கருத்துகளை நாங்கள் பார்க்கின்றபோது, இவர்கள் ஆழ்ந்த உறக்கத்திலிருந்து விழித்தெழுந்தவர்களா? என்ற கேள்வி எழுகின்றது. ஏனென்றால், இந்த நாடு பொருளாதார ரீதியாக, அரசியல் ரீதியாக, சமூக ரீதியாக எல்லா வழிகளிலும் உடைந்து விழுந்த ஒரு நாடு என்பது எல்லோருக்குமே நன்றாகத் தெரியும். அத்தோடு, 2022ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 12ஆம் திகதி இந்த நாடு வங்குரோத்து அடைந்துவிட்டதாக அறிவிக்கப்பட்ட நாடாகும். அதற்கு முன்பு பொருளாதார நெருக்கடியின் காரணமாக முழு நாடே செயலிழந்துபோன ஒரு நிலைமை காணப்பட்டது. இவ்வாறான நிலைமையிலேயே எங்களிடம் இந்த நாடு ஒப்படைக்கப்பட்டது.

அப்படி அதனைப் பொறுப்பேற்றுக்கொண்ட வேளையில் எங்களுடைய மாண்புமிகு ஜனாதிபதி அவர்கள் ஆற்றிய உரையென்பது, வரலாற்றுச் சிறப்பு வாய்ந்த ஒன்று என்பது மாத்திரமல்ல, இந்த வேளையில் இவ்வாறான ஒரு வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பிப்பதற்கான காரணமும் வரலாற்றுச் சிறப்பு மிக்கது. அந்த மூலகாரணம் வேறெதுவுமில்லை, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! கடந்த வருடம் செப்ரெம்பர் மாதமும் நவம்பர் மாதமும் இந்த நாட்டிலே வாழுகின்ற அனைத்து மக்களும் - அது தமிழரா, சிங்களவரா, முஸ்லிம்களா என்ற பேதங்கள் இன்றி, வடக்கா, தெற்கா, கிழக்கா, மேற்கா என்கின்ற பேதங்கள் இன்றி - ஒன்று சேர்ந்து இந்த நாட்டில் ஒரு புதிய மாற்றம் வேண்டுமென எங்களைத் தொிவுசெய்தமைதான் என்பது எல்லோருக்குமே தெரியும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அந்த வகையில் இந்த நாட்டில் வாழுகின்ற அனைத்து மக்களும் எந்தவிதமான ஜாதி, இன, மத, குல பேதங்களின்றி ஒன்றுசேர்ந்து எங்களைத் தெரிவு செய்திருக்கின்றார்கள். அது மக்களின் வரலாற்றுச் சிறப்பு மிக்க முடிவு! வரலாற்றுச் சிறப்பு மிக்க மக்களின் ஆணை! இவ்வளவு நாட்களாக இந்த நாட்டில் அசைக்க முடியாது என்று நினைத்துக் கொண்டிருந்த பாராம்பரியக் கட்சிகளுக்கு மாத்திரமே தங்களுடைய வாக்குகளை வழங்கி, அதன்மூலமாகத் தாங்கள் வாழுகின்ற பிரதேசத்தில் இருந்த அரசியல்வாதிகளை மாத்திரம் தெரிவுசெய்த மக்கள் எல்லோரும் ஒன்றுசேர்ந்து, இம்முறை தேசிய மக்கள் சக்தி அரசாங்கத்தைத் தெரிவு செய்திருக்கின்றார்கள். அந்த வகையில், ஒரு வரலாற்று மாற்றமாக, ஒரு திருப்புமுனையாக அமைகின்ற முடிவினையே மக்கள் எடுத்தார்கள். நாட்டில் ஒரு மாற்றத்தினை ஏற்படுத்து வதற்காக அவ்வாறு முடிவெடுத்து எமக்கு வாக்களித்த மக்களுக்கு மீண்டும் மீண்டும் நாங்கள் எங்கள் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

இன்று நாடு எவ்வாறான நிலைமையில் இருக்கின்றது என்பது எங்கள் எல்லோருக்கும் தெரியும். இந்த வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டுள்ள இந்தச் சந்தர்ப்பத்திலும் கூட நாடு தழுவியரீதியில் மக்கள் எதிர்கொள்கின்ற பொருளாதார ரீதியான பிரச்சினைகள், ஏனைய சமூகப் பிரச்சினைகள் என்பன இன்னும் புரையோடிப் போயிருக்கின்ற நிலைதான் காணப்படுகின்றது. இதில் மாற்றம் வேண்டுமென்று மக்கள் விரும்பினார்கள். இன்று தேசிய மக்கள் சக்தி அரசாங்கம் அந்த மாற்றத்தினை உருவாக்குகின்ற பணியில் தனது முதலாவது அடியை எடுத்து வைத்திருக்கின்றது. இந்த முதல் அடியை எடுத்து வைத்து நகர்கின்றபோது, இந்தப் பாராளுமன்றத்திலுள்ள எதிரணி சார்ந்த உறுப்பினர்கள், "இதோ! தேசிய மக்கள் சக்தி அரசாங்கம் அல்லது மக்கள் விடுதலை முன்னணி, தனது பழைய கொள்கைகளைக் கைவிட்டுவிட்டது. இந்த நாட்டை நாசமாக்கிய முதலாளித்துவக் கொள்கையைக் கடைப்பிடிக்கின்றது. அவர்களால் முன்மொழியப்பட்டுப் போராடப்பட்டு வந்த சோசலிஷக் கொள்கை இல்லாது போய் விட்டது. அதுமாத்திரமல்லாது, நவ லிபரல் வாதத்துக்கு எதிராகப் பேசியவர்கள் இன்றைக்கு அதை அவ்வாறு தழுவிக் கொள்கின்றவர்களாக மாறி விட்டார்கள்; ஏகாதிபத்தியவாதி களிடம் சரணடைந்து விட்டார்கள். உலக வங்கி அல்லது சர்வதேச நாணய நிதியம் போன்றவற்றிடம் சரணடைந்து விட்டார்கள்" என்று கூறுகின்ற வாக்கியங்களை இந்தச் சபையில் நாங்கள் கேட்கக்கூடியதாக இருக்கின்றது.

நான் அவர்களுக்கு ஒரு விடயத்தை மாத்திரம் சொல்கின்றேன், இன்று காலையில் இங்கு பேசிய எதிரணியைச் சார்ந்த ஒரு சிலர் - விசேடமாக சஜித் பிரேமதாஸ அவர்களின் அணியைச் சார்ந்தவர்கள் - எங்களால் முன்வைக்கப்பட்ட கல்விக் கொள்கை தொடர்பில் கடுமையாக விமர்சித்ததுடன், சுகாதாரக் கொள்கையைப் பற்றியும் கணிசமான விமர்சனங்களை முன்வைத்ததைக் காணக் கூடியதாக இருந்தது. கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 5/6 பெரும்பான்மையைக் கொண்டிருந்த அவர்களுடைய ஆட்சிக் காலத்தில், இந்த இலவசக் கல்வி குழி தோண்டிப் புதைக்கப்பட்டதும் இலவசக் கல்வி உரிமை களுக்காகப் போராடிய மாணவர்கள் மாத்திரமன்றி, இலவச வைத்திய சேவையைப் பாதுகாத்துக் கொள்வதற்காகப் போராடிய மாணவர்கள் படுகொலை செய்யப்பட்டதும் இப்பொழுது எனக்கு ஞாபகம் வருகின்றது. அந்தப் படுகொலைகளின் காரணகர்த்தாக்களாக இருந்த அந்தக் கட்சியியைச் சார்ந்தவர்கள் இன்று வடிப்பது நீலிக் கண்ணீரா அல்லது முதலைக் கண்ணீரா? என்று என்னால் கூற முடியாது. ஆனால், இவர்களுடைய இவ்வாறான கருத்துகள் இனியும் மக்கள் மத்தியில் எடுபடாது என்ற விடயம் மாத்திரம் உண்மை என்பது எங்களுக்கு நன்றாகத் தெரியும். ஏனென்றால், மக்கள் இன்றைக்கு மிகவும் தெளிவாக இருக்கின்றார்கள். சுமார் 76 வருட சாபக்கேடு என்பது வேறு எதுவுமல்ல, 76 வருடங்களாக இவர்கள் செய்த அல்லது செய்வதற்கு உடந்தையாக இருந்த செயல்களின் விளைவே இன்றைய இலங்கையின் நிலைமையாகக் காணப்படுகிறது.

கௌரவ குழுக்களின் பிரதி தவிசாளர் அவர்களே, சதாகாலமும் இவர்களுடைய குறைகளைக் கூறுவது மாத்திரமல்ல எங்களுடைய அரசாங்கத்தின் வேலை. இன்று மக்கள் எமக்குப் பொறுப்பை அளித்து நாட்டை எம்மிடம் ஒப்படைத்திருக்கிறார்கள்; இந்த நாட்டைக் கட்டியெழுப்புங்கள் என்று கேட்டிருக்கின்றார்கள். அந்த வகையில் விசேடமாக வடக்கு, கிழக்கைச் சார்ந்த மக்கள் எங்களுக்கு வரலாறு காணாத வெற்றியைப் பெற்றுக் கொடுத்தார்கள். அதிலும் யாழ்ப்பாணம் மாவட்டத்தைச் சார்ந்த மக்கள் நாட்டில் ஒரு திருப்புமுனையாக அமைகின்ற முடிவினை வழங்கி யிருக்கின்றார்கள். இதுநாள் வரைக்கும் யாராலும் நினைத்துப் பார்க்க முடியாத, யாராலும் அசைக்க முடியாது என்று நினைத்துக் கொண்டிருந்த அனைத்திற்கும் முற்றுப்புள்ளி வைத்துவிட்டு எங்களிடம் பூரணமாக யாழ். மாவட்டத்தை ஒப்படைத்திருக்கின்றார்கள். யாழ்ப்பாணம் மாவட்டத்தை மாத்திரமல்ல, வன்னியை எடுத்துக் கொண்டாலும் சரி, கிழக்கு மாகாணத்தை எடுத்துக் கொண்டாலும் சரி, மலையகத்தை எடுத்துக் கொண்டாலும் சரி அல்லது ஏனைய மாகாணங்களை எடுத்துக் கொண்டாலும் சரி, சகல மாகாணங்களையும் எங்களிடம் ஒப்படைத்திருக்கின்றனர். விசேடமாக, தமிழ் மக்கள் கூடுதலாக வாழுகின்ற பிரதேசங்கள் தங்களுடைய பாட்டனுடைய உரிமை, தங்கள் அப்பாவினுடைய உரிமை, தங்கள் குடும்பத்தினுடைய உரிமை, தங்களுடைய சொத்து என்று நினைத்துக் கொண்டிருந்தவர்கள் அனைவருக்கும் மக்கள் இம்முறை புதிய பாடத்தினைக் கற்றுக் கொடுத்து, அவர்களை வீட்டுக்கு அனுப்பி வைத்திருக்கின்றார்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் வட மாகாணத்தில் யாழ்ப்பாண மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்றவன் என்ற வகையிலும், யாழ். மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவர் என்ற வகையிலும், கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் என்ற வகையிலும் எனக்கு ஒரு பாரிய பொறுப்பு இருக்கின்றது; ஒரு தேவை இருக்கின்றது. விசேடமாக, வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற மீனவர்களுடைய வாழ்க்கையில் ஒரு புதிய யுகத்தினை ஏற்படுத்த வேண்டிய தேவை யிருக்கின்றது. அந்தப் புதிய யுகத்தினை ஏற்படுத்துவதற்காக எங்களால் இயன்ற அனைத்துச் செயற்பாடுகளும் முன்னெடுக்கப்பட்டு வருகின்றது.

இதுநாள் வரைக்கும் இருந்த அமைச்சுக்கள் தொடர்பாகப் பார்க்கின்றபோது, அவற்றின் செயற்பாடுகள் பொதுவாக நாட்டினுடைய பொருளாதாரம் எவ்வாறு சீரழிந்து பின்னடைவுக்கு உள்ளாகக் காரணமாயிருந்ததோ, அதேயளவு மாற்றம் எதுவும் இல்லாது கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சின் செயற்பாடுகளும் சகல வழிகளிலும் சீரழிவுக்குக் காரணமாயிருந்தது. இவ்வாறு தவறான வழியில் சென்றுகொண்டிருந்த எங்களுடைய கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சைச் சரியான பாதையில் இட்டுச் செல்வது எப்படி என்ற வேலைத்திட்டத்திற்கான பொறிமுறையை அமைத்துக்கொள்வதற்கு நாங்கள் ஆட்சிபீடத்திற்கு வந்து கடந்த மூன்று மாதங்களாக, இரவு, பகலாக உழைத்துக்கொண்டிருந்தோம். அதனை நாம் ஓரளவு திருப்திகரமான முறையில் ஒழுங்குபடுத்தி, ஒருநிலைப்படுத்தி, சரியான அணுகுமுறையை நோக்கி நகர்த்தியிருக்கின்றோம் என்பதை இந்த இடத்தில் நான் சுட்டிக்காட்ட வேண்டும்.

அதேபோன்று எங்களுக்குத் தெரியும், தேர்தல் கால கட்டங்களில் எங்களுடைய நாட்டு மக்களுக்கு நாம் அளித்த பிரதான வாக்குறுதிகள் நிறைவேற்றப்பட வேண்டுமென்பது. விசேடமாக, இந்த நாடு இன்று வறுமையால் பீடிக்கப் பட்டிருக்கின்றது. பெரும்பாலான மக்கள் இன்றைக்குப் பசியால், பட்டினியால் வாடுகின்ற ஒரு நிலை ஏற்பட்டிருக்கின்றது. கடந்த காலங்களில் 17,000 ரூபாய்க்குக் குறைவான வருமானத்தைப் பெறுகின்ற 25.2%ஆன மக்கள் வறுமைக்கோட்டின்கீழ் வாழுகின்றவர்களாக அடையாளம் காணப்பட்டார்கள். நான்கு பேர் கொண்ட குடும்பமொன்றுக்கு 90,000 ரூபாய்க்கும் அதிகமான வருமானம் தேவை என மத்திய வங்கி அறிக்கை கூறுகின்றது. அந்த வகையில், இந்த வறுமை நிலையிலிருந்து மக்களை மீட்டெடுக்க வேண்டும் என்பது எங்களுடைய பிரதான குறிக்கோள்களில் ஒன்றாகும்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வறுமையில் வாடுகின்ற அதிகமானவர்கள் எங்கே யிருக்கின்றார்கள் என்று பார்ப்போம். கடந்த காலத்தில் அது ஊவா மாகாணமாகவிருந்தது; இன்று அது நான் பிரதிநிதித்துவம் செய்கின்ற வட மாகாணமாக மாறி யிருகின்றது. கடந்த காலத்தில் வறுமை நிலையிலுள்ள முதலாவது மாவட்டமாகப் பதுளை மாவட்டம் இருந்தது; இன்றைக்கு முல்லைத்தீவு மாவட்டம் அந்த நிலைக்கு மாறியிருக்கின்றது. வறுமை நிலையிலுள்ள 2ஆவது மாவட்ட மாகக் கிளிநொச்சி மாறியிருக்கின்றது. அந்த வகையில், இன்று வறுமையில் வாடுகின்றவர்கள் எங்கேயிருக்கின்றார்கள் என்றால், எங்களுடைய வட மாகாணத்திலாகும். இந்த வறுமை நிலையிலிருந்து அவர்களை மீட்டெடுக்க வேண்டிய தேவை எங்களுக்கிருக்கின்றது. அந்தத் தேவையின் அடிப்படையில் இம்முறை வரவு செலவுத்திட்ட ஒதுக்கீடுகளின் மூலம் கிராமங்களை நோக்கி நிதிப் பாய்ச்சல் செய்கின்ற திட்டங்களை நாம் முன்னெடுக்கவிருக்கின்றோம். கிராமங் களுக்கு முதலிடம் கொடுக்கின்றவகையில், கிராமங்களி லிருக்கின்ற பாடசாலைகள், வீதிகள், அங்கிருக்கின்ற குளங்கள் அனைத்தையும் புனர்நிர்மாணம் செய்கின்ற நடவடிக்கைகளை முன்னெடுப்பதற்கான முன்மொழிவுகள் இந்த வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கப்பட்டிருக்கின்றன.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நிச்சயமாக எதிர்வரும் காலங்களில் இந்த வறுமையை ஒழிக்காது, வறுமையில் வாடுகின்ற மக்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்தாது நாட்டினுடைய முன்னேற்றம் என்பதை நினைத்துக்கூடப் பார்க்க முடியாதென நாங்கள் நம்புகின்றோம். வறுமையோடு பின்னிப்பிணைக்கப் பட்டிருப்பவர்கள் குறிப்பாகக் கல்வியில் பின்தள்ளப்பட்டிருக் கின்றார்கள். மேலும், போதைப்பொருள் பாவிக்கின்ற இளைஞர், யுவதிகள் இந்த வறுமையான குடும்பங்களைச் சேர்ந்தவர்களாகத்தான் இருக்கிறார்கள். அந்த வகையில், இந்த வறுமையோடு பல்வேறு பிரச்சினைகள் பின்னிப் பிணைந்திருக்கின்றன. வறுமையை ஒழிக்கின்றபோது, நிச்சயமாக இந்த நிலைமைகள் அனைத்துக்கும் முற்றுப்புள்ளி வைத்து, சரியான திசையை நோக்கி அந்த மக்களை நகர்த்த முடியுமென்கின்ற திடமான நம்பிக்கை எங்களுக்கிருக்கின்றது. கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! அந்த வகையில், இங்கு முன்வைக்கப்பட்டிருப்பது தமிழ், சிங்கள, முஸ்லிம் என்ற பேதமில்லாமல், வடக்கு, கிழக்கு என்கின்ற பேதமில்லாமல், முழு நாட்டு மக்களும் எதிர்காலத்தில் சந்தோசமாகச் சிரிக்கக்கூடிய ஒரு புதிய எதிர்காலத்தை நோக்கி அடியெடுத்து வைப்பதற்கான வரவு செலவுத்திட்டம் என்று கூறிக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රියාස් ෆාරූක් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.41]

ගරු රියාස් ෆාරූක් මහතා
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය පිළිබඳව කරුණු දැක්වීමට වේලාව වෙන් කර දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ඊයේ අපේ ආණ්ඩුවේ ඇමතිවරු සහ මන්ත්‍රීවරු පරණ ආණ්ඩුවල වැරැදි දේවල් පෙන්නුම් කරලා දෙනකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට තරහා යනවා මම දැක්කා. ඇත්තටම අපි වැරැදි විතරක් පෙන්වලා දෙන්නේ නැහැ. ඒවා නිරවුල් කරගෙන නිවැරදි මාවතක යනවා. ඒ වාගේම වැඩ පිළිවෙළ හදාගෙන යනවා. අද උදේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අධ්‍යාපනය ගැනත්, සෞඛ්‍යය ගැනත් ගොඩක් කථා කළා. නිදහස් අධ්‍යාපනය ගැනත් ගොඩක් දේවල් කිව්වා. උදාහරණයක් වශයෙන් අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත්, 2010දී "මහින්ද චින්තන ඉදිරි දැක්ම" කියලා concept එකක් ගෙනාවා. ඒ concept එක යටතේ 2012දී පටන් ගත්තා, 2016 වෙනකොට රටේ පාසල් වර්ග දෙකයි තිබෙන්න ඕනෑ කියලා වැඩසටහනක්. එක පාසල් වර්ගයක් තමයි පළමු වසරේ සිට පහ වසර දක්වා පන්ති තිබෙන පාසල්. අනෙක් පාසල් වර්ගය තමයි හය වසරේ සිට දහතුන වසර දක්වා පන්ති තිබෙන පාසල්. ඒකට නමක් තිබ්බා, "ජාතික පාසල් 1000 වැඩසටහන" -"1000 National Schools Programme"- කියලා. ඒකට ජාතික පාසල් 1,000ක් ගන්නවා. ඒවා develop කරන්න ප්‍රාථමික පාසල් 5,000ක් ගන්නවා. 1 වසරේ සිට 10 වසර දක්වා පන්ති තිබුණු පාසලුත් primary schools කළා. 1 සිට 5 වසර දක්වා අඩු කරලා, එක ජාතික පාසලකට පාසල් පහක් දෙනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ජාතික පාසල් දෙකක් නැත්නම් තුනක් දෙනවා. ඒකට තව ප්‍රාථමික පාසල් පහක් ලබා දෙනවා.

මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල් තුනක් ගැන මම කියන්නම්. මේකට අකුරණ අල් අස්හාර් ජාතික පාසලයි, සහිරා පාසලයි දෙකම තේරුණා. සහිරා විද්‍යාලයට ප්‍රාථමික පාසල් පහක් දුන්නා. අස්හාර් විද්‍යාලයට පාසල් පහක් දුන්නා. ඒකෙන් නිරැල්ල මුස්ලිම් විද්‍යාලය කියන පාසල අස්හාර් විද්‍යාලයේ වැටේම තිබෙන එකක්. අස්හාර් විද්‍යාලය ඉදිරියේ පාරක් තිබෙනවා. පාරෙන් එහා පැත්තේ ඇළක් තිබෙනවා. ඇළෙන් එහා පැතේ නිරැල්ල විද්‍යාලය තිබෙනවා. උඩට ගියාම සහිරා එකට අයිතියි. දැන් ඒ පාසලේ parentsලා 2012 වසරේ ඉඳලා අද වෙනකම් අධ්‍යාපන කාර්යාලයට ගිහින් කථා කරනවා. එතැනින් මොකුත් වෙන්නේ නැහැ. ඊට පස්සේ Human Rights Commission එකට ගියා. තුනෙන් දෙකක් සහිරා එකට යනවා. එක කොටසක් ළඟම තිබෙන අස්හාර් විද්‍යාලයට යනවා. ඒගොල්ලන් Human Rights Commission එකට ගියාම තුනෙන් එකක් බඳවා ගන්න කිව්වා. ළමයි 20ක්, 30ක් විතර අස්හාර් විද්‍යාලයට ගන්න කියලා තිබෙනවා. එතකොට කාලය මාස හයක් ඉවරයි. තෙළඹුගහවත්ත මුස්ලිම් විද්‍යාලය අස්හාර් විද්‍යාලයට දීලා තිබුණේ. ඒ ළමයිනුත් මේ වසරේ අස්හාර් විද්‍යාලයට ගන්නේ නැහැ. වෙන පාසලක් ඒගොල්ලන්ට දීලාත් නැහැ. දෙසැම්බර් මාසයේ නුවර DCC එකේදී අපි ඒ ගැන අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් විමසුවා. එතුමා ඒ ගැන දන්නේ නැහැ කිව්වා. පසුව කථා කරමු කියලා කිව්වා. January මාසයේ DCC එකේදී අපි නැවතත් ඇහුවා. එතුමා පිළිතුරු දුන්නා, මේ සැරේ පාසල් තුනක් තිබෙනවා කියලා.

අස්හාර් විද්‍යාලයට ළමයි බඳවා ගන්නා විධියට පාසල් 3ක් තිබෙනවා කියලා කිව්වා. එතකොට මම ඇහුවා, 2012දී එම පාසල පටන් ගන්නකොට ඒකට ළමයින් බඳවා ගන්නා පාසල් තිබුණේ කීයද කියලා. 5ක් තිබ්බා තියෙනවා. 2024 වසරේත් තෙළඹුගහවත්ත මුස්ලිම් විද්‍යාලය අස්හාර් එකට අයත්ව තිබුණා. මේ අවුරුද්දේ පාසල් කීයක්ද තිබෙනවා කිව්වේ? 3යි කියලා කිව්වා. එතකොට අනෙක් 2කට මොනවාද වෙන්නේ? ඒ දරුවන් කොයි ඉස්කෝලෙටද බඳවා ගන්නේ? දන්නේ නැහැ. දැන් තිබෙන්නේ admissions භාරගන්නා කාලය වුණත්, තවම මේකට විකල්පයක් නැතුව ඒ ගැන හොයා ගෙන යන ගමන් තිබෙන්නේ. මම මේ කියන්නේ මේක අවුල් කර තිබෙන විධියයි. මේ පාසල් පද්ධතිය තමයි අපි හදන්න යන්නේ. ඒ වෙනුවෙන් තමයි සෞඛ්‍යයට සහ අධ්‍යාපනයට අපි ලොකු මුදලක් වෙන් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පූජාපිටිය DCC සභාපතිවරයා විධියට කටයුතු කරද්දී ප්‍රශ්නයක් ආවා, අංකුඹුර ජාතික පාසලේ. එතැන විදුහල්පති, ගුරුවරු, දෙමව්පියන් කියන හැමෝම ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒක පොලීසිය දක්වා ගියා. අපි DCC එකේදී තීරණයක් ගත්තා, ඒ ස්ථානයට ගිහිල්ලා හැමෝම එක්ක කථා කරමු කියලා. එතැනට ගිහිල්ලා කථා කරනකොටත් අපට තේරුම් ගියා, 1000 National Schools Programme එක නිසා තමයි අවුල පටන් අරගෙන තිබෙන්නේ කියලා. එතැනට primary schools වෙනුවට පාසල් 5ක් දීලා තිබෙනවා, secondary schools 4යි, primary school එකයි වශයෙන්. ළමයින් දෙදහස් ගණනක් හිටපු ඒ ජාතික පාසලේ දැන් ළමයින් පන්සිය ගණනයි ඉන්නේ. ඒ විධියට එම පාසලේ ළමයින් ගණන අඩු වෙලා, අඩු වෙලා යනකොට, විදුහල්පතිට ඉස්කෝලේ පවත්වා ගෙන යන්න බැහැ වාගේ කථාවක් ඇවිල්ලා තමයි ඒ ප්‍රශ්නය මතු වෙලා තිබුණේ. ඒ වාගේ හැම පැත්තකම ප්‍රශ්න තිබෙනවා. මම දැන් කියපු ඔක්කෝම එකම zone එකේ තිබෙන ප්‍රශ්න.

ඒ කාලයේ මන්ත්‍රීවරු මැදිහත් වුණු විධිය ගැනත් මම සඳහන් කළ යුතුයි. තව project එකක් තිබුණා, "ළඟම පාසල-හොඳම පාසල" කියලා. උදේ මන්ත්‍රීවරයෙක් ඒ ගැන කථා කළා. එතුමා පසුගිය දවසකත් ඒ ගැන කථා කළා. මම හිතන විධියට එක ඉස්කෝලෙකට මිලියන 28ක් වෙන් කරනවා. ඒ මිලියන 28 මදි කියලා එතුමා කිව්වා. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හලීම් මැතිතුමාත් මගේ ආසනයේ. එතුමාගේ ගෙදරට අල්ලපු වැටේ පාසලක් තිබෙනවා, Kurugoda Boys Muslim Vidyalaya කියලා. ඒකට මුදල් වෙන් වුණා. නමුත් එතුමාට දේශපාලනය කරන්න ඕනෑ නිසා ඒ මුදල පාසල් කිහිපයකට - 4කට, 5කට - වෙන් කරලා බෙදා දෙන්න ගිහිල්ලා, අන්තිමට ඒ පාසල් එකකටවත් සල්ලි හම්බ වුණේ නැහැ; අර පාසල develop වුණේත් නැහැ.

අපේ අධ්‍යාපන අමාත්‍යතුමිය කිව්වා, ගොඩක් transfers සිදු වෙනවා, එතුමිය ඒවාට මැදිහත් වුණේම නැහැ, transfers සිදු කරන board එකෙන් තමයි ඒවා කරන්නේ කියලා. නමුත් පසුගිය කාලයේ ඒවා වුණේ කොහොමද? 2015දී අස්හාර් ජාතික පාසලේ හිටපු විදුහල්පති කෙනෙකු transfer කළා. කවුද කළේ? එවකට ඇමතිවරයෙකු වූ හලීම් මැතිතුමාගේ මස්සිනා. ඒ transfer එක වුණාට පසුව ඉස්කෝලේ ටක් ගාලා වැටෙන්න පටන් ගත්තා. ඊට පසුව parentsලා ගිහිල්ලා කථා කළා, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා එක්ක. එතකොට ඔහු කිව්වේ හලීම් මැතිතුමාගේ අර කාර් සේල් තියාගෙන සිටින මස්සිනා කියපු නිසා අපි transfer කළා කියලායි. ඒ වාගේ තත්ත්වයක් තමයි පාසල් සම්බන්ධව තිබුණේ.

මේ වාගේ දේවල් සිද්ධ වන hospitals පවා තිබෙනවා. ඒවා ගැන පසුව කියන්න පුළුවන්. මම කියන්නේ මේකයි. ඒ වාගේ තත්ත්වයක තිබුණු රටක් තමයි අපි භාර අරගෙන හැම පැත්තටම, හැම අංශයටම මුදල් වෙන් කරගෙන මේ දියුණු කරන්න යන්නේ. අපි දෙන්නම්, හදිසි වෙන්න එපා.

විපක්ෂයේ ගොඩක් කට්ටිය; නියෝජිතයෝ අපට කෝල් කරනවා. කෝල් කරලා සමහර වැඩ ගැන කියනවා. අපිට කියනවා, "එක කෝල් එකකින් මේක කරන්න පුළුවන්, මන්ත්‍රීතුමා. එක කෝල් එකකින් කරන්න පුළුවන්, ඒක කරලා දෙන්න" කියලා. ඒ සංස්කෘතිය නැති කරන්න තමයි අපි ඇවිල්ලා තිබෙන්නේ. අපි දැක්කා, අධ්‍යාපනයට මුදල් ලොකු ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම මම තව කාරණාවක් කියන්න ඕනෑ. ඔබතුමන්ලා හිතන්න එපා, මගේ ආසනයේ තිබෙන ප්‍රශ්න ගැන විතරක් කියනවා කියලා. දිස්ත්‍රික්කය තුළ හැම තැනම ප්‍රශ්න තිබෙනවා. වෙලාව මදි, ඒවා ගැන කියන්න. මම ගියේ අස්හාර් ජාතික පාසලට. හලීම් මැතිතුමාත් නියෝජනය කරපු ආසනයේ තිබෙන එම පාසලේ පන්ති කාමර 8ක් සහිත "A Hall" කියන බිල්ඩින් එක කඩා වැටිලා දැනට අවුරුදු 5ක් වෙනවා.

ඒ ගැන කවුරුවත් බැලුවේත් නැහැ; දැක්කේත් නැහැ. සමහර වෙලාවට හිටපු කැබිනට් ඇමතිවරුන් කථා කරනවා, අකුරණ කියලා points දමා ගන්න, ඡන්දය ගන්න. ඒගොල්ලන් දන්නේවත් නැහැ, මම කිව්ව ඉස්කෝලයේ ඒ බිල්ඩින් එක කඩන් වැටිලා තිබෙන එක. මම ඊයේ නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍යතුමා එක්කත් මේ ගැන කථා කළා. මේ අවුරුද්දේ ඒකෙන් කොටසක් හරි හදලා දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේ දේවල් ගොඩක් තිබෙනවා. එතැන බිල්ඩින් එකක් නැති නිසා ගොඩක් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. දැන් ඒ ඉස්කෝලෙට ළමයි ගන්න බැහැ. ළමයි දෙදහස්දෙසිය ගණනක් හිටපු ඉස්කෝලේ දැන් ඉන්නේ 1,700යි. ඉතුරු ළමයි කැමැත්තෙන් හරි අකමැත්තෙන් හරි international schoolsවලට තමයි යන්නේ. ඒ වාගේම admissions සම්බන්ධවත් categories තිබෙනවා. එතැනදී distance එක අනුව ළමයෙක් ඉස්කෝලයකට ඇතුළත් කර ගන්නවා නම්, අනිවාර්යයෙන්ම ඔප්පුවක් හරි, agreement එකක් හරි තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු රියාස් ෆාරූක් මහතා
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

නමුත් ආර්ථික වශයෙන් ඉතාම පහළ තත්ත්වයක ඉන්න අයට ඒ වාගේ ලේඛන නැහැ, ඔප්පු නැහැ, agreements නැහැ. ඊට පස්සේ voters' register එක ඕනෑ වෙනවා. ඒ අයට ඒකත් නැහැ. එතකොට ආර්ථිකයේ අන්තිම අඩියේ ඉන්න අයගේ දරුවන් නිකම්ම කැපෙනවා. ඒ වාගේම තමයි OGA සහ OBA category එකත්. එතැනදී තමන්ගේ ශ්‍රමයෙන් ඒ ඉස්කෝලවලට උදව් කරන අයට points ලැබෙනවා. ඒකට දැන් මොනවාද කරන්නේ? සල්ලි දීලා points ගන්නවා. ආර්ථික වශයෙන් අන්තිම අඩියේ ඉන්න අය එතකොටත් අමාරු තත්ත්වයකට පත් වෙනවා. ඒ හැම එකක්ම නිරවුල් කරන්න අපි දැන් සාකච්ඡා කරගෙන යනවා. ලබන අවුරුද්ද වෙනකොට අපි හොඳ අධ්‍යාපන ක්‍රමයක් හදලා දෙන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.53]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා 2025 වසරට අදාළ අය වැය ඉදිරිපත් කරලා ගෙවෙන හයවැනි දවසේ මේ විවාදයට එකතු වෙන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මට ඇත්තටම අය වැය කථාව අහන්න එන්න බැරි වුණා; ආවේ නැහැ. ඒකට හේතුව මෙයයි. කථාවෙන් ජනතාව මෝහනය කරන්න පුළුවන් එකම ඓතිහාසික දේශපාලන නායකයා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා බව අපි දන්න නිසායි එහෙම කළේ. එතුමාගේ කථාවට මේ රටේ බොහෝදෙනා මෝහනය වෙලා එතුමන්ලාට බලය දීලා, අද ඒ මෝහනයෙන් ගැලවිලා, වෙන්නේ මොනවාද, රටට අනාගතයක් තිබෙනවාද කියන එක පිළිබඳව සැකයෙන් ඉන්නවා. අම්මපා, බොරු කියන තරම්! අර අපේ මන්ත්‍රීතුමියක් කිව්වා, ඉතිහාසයේ හිටපු රජෙකු කිව්ව බොරුවලට පස්සේ කියන බොරු තමයි මේ කියලා.

මේ අය වැය පොත ඇතුළේ මොනවාද තිබෙන්නේ? අපි මාධ්‍යයෙන් දැක්කා, එතුමා පන්වලින් ගොතපු මල්ලක දමාගෙන අය වැය ලේඛනය ගෙනාවාය කියලා. එහෙම කරන්න ඇත්තේ ජාතිකත්වය, දේශීයත්වය පිළිබිඹු කරන්න වෙන්න ඕනෑ. දීර්ඝ කාලයක් තිස්සේ තිබිච්ච ඒ මතවාදයේ වෙනස පෙන්වන්න, ජාතියේ ආරක්ෂාව සහ ජාතියේ වැඩ පිළිවෙළ පිළිබඳව පෙන්වන්න පන් මල්ලත් අරගෙන චේත්‍රධාරිතුමා එක්ක ජනාධිපතිතුමා පඩිපෙළ බැහැගෙන බැහැගෙන එන පොඩි වීඩියෝ එකක් නම් මාධ්‍යයෙන් දැක්කා. පරණ මුදල් ඇමතිවරුනුත් බෑග් එකක දමාගෙන තමයි අය වැය කථාව ගෙනාවේ. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා දේශීයත්වය පිළිබිඹු කරමින් පන් මල්ලක දමාගෙන තමයි එතුමාගේ අය වැය කථාව අරගෙන ආවේ. නමුත් දිග ඇරියේ මොකක්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? සමාජවාදයෙන් ඈත් වෙච්ච, ලිබරල්වාදයට ගිය, ධනවාදයට ගිය අය වැයක්. 76 අවුරුද්දක් තිස්සේ ධනවාදයට, ලිබරල්වාදයට බැණලා, ධනවාදයෙන් මේ රට විනාශ කළාය කියපු ඒ කාරණා සියල්ලම අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාත් කිව්වා.

මේ වෙලාවේ මට සින්දුවක් මතක් වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ සින්දුවේ තිබෙන්නේ මොකක්ද? "පිට කවරය බලලා චරිතේ ලියන බොහෝදෙනාට කෝමා" කියලායි. ඒ නිසා මම NPP ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට කියනවා, පිට කවරය බලලා කෑ ගහලා, මොර දාන, ඔය හැමෝටම කෝමා කියලා. ඒක මතක තබාගන්න. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාගේ භාෂාවෙන් කිව්වොත්, ඒක මතක තබාගන්න! ඔය කෝමා තත්ත්වයෙන් මිදෙන්න. අපිත් ඔහොම ආණ්ඩුවල හිටියා. අපේ සමහරු කියන හැම දේටම අපිත් අත්පුඩි ගැහුවා.

මෙතැන ඉන්නවා, ජේවීපී එක නියෝජනය කරන බොහෝදෙනෙක්. මුලසුනේ සිටින ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය වාගේ NPP එක නියෝජනය කරන, සැබැවින්ම මේ රට නිවැරදි දිශානතියකට ගෙනියන්න පුළුවන් කියලා ජේවීපී එක කියපු බොහෝ දේවල් විශ්වාස කරලා, පරිත්‍යාගශීලීව සියලු දේවල් කරලා ඒ වෙනුවෙන් පෙනී හිටින්න ආපු බොහෝදෙනෙකුත් මෙතැන ඉන්නවා. ඒ අයටයි මම මේක කියන්නේ. ඒ අය හොඳින් මතක තබාගන්න, තේරුම් ගන්න, අර පිරිස කියන්නේ බොරු බව. ඒක ඔප්පු වෙලා ඉවරයි නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ ඉදිරිපත් කර තිබෙන්නේ 79වෙනි අය වැය. අය වැය ලේඛන78කටම බැණලා

[ගරු වමින්ද විජේසිරි මහතා]

බැණලා, ධනවාදයට බැණලා, ලිබරල්වාදයට බැණලා ඒකම කියවනවා නම්, මෙතුමන්ලාගේ ප්‍රතිපත්තිය ඒකම නම් අපි අහනවා, ජේවීපී එකේ ප්‍රතිපත්ති අද කොහේද තිබෙන්නේ කියලා. ජේවීපී එකේ අනුර කුමාර දිසානායක මහත්තයා බලය ගන්න ජේවීපී එකේ ප්‍රතිපත්ති ප්‍රකාශ කළාට, බලය ලැබුණාට පස්සේ ඒ සියලු දේවල් කඩලා බිඳලා විනාශ කර දාලා නැවත රනිල් වික්‍රමසිංහලා, මහින්ද රාජපක්ෂලා ගිය පාරේ යනකොට අර තමන්ගේ දැනුමත් එක්ක මේ රට ගොඩ ගන්න ආපු උදව්යට වරදින කොට යන්න තැන් මදි වෙනවා. එහෙම වුණා, ගෝඨාභය රාජපක්ෂ දිනවන්න ආපු වියතුන්ට, උගතුන්ට, බුද්ධිමතුන්ට. අපට වාගේ ඔවුන්ටත් සැබැවින්ම අවශ්‍යතාව තිබුණේ, මේ රට කොතැනින් හෝ ගලවා ගන්න; ඒ සඳහා තමන්ගේ දැනුම පාවිච්චි කරන්න. ඒ සැබෑ දේශපාලන ක්‍රියාකාරකම් සිද්ධ කරන්න ඕනෑය කියලායි ඔවුන් මේ පාර්ලිමේන්තුවට ආවේ. නමුත්, එහෙම වෙන්නේ නැහැ. පිට කවරය පන් මල්ලෙන් හදලා ගෙනාවාට අවසානයේ ඔබතුමන්ලාටත් මේ අය වැය පරතරය පියවා ගන්න රුපියල් මිලියන 2,200ක ණය නැවත ගන්න වෙනවා.

ඉතිහාසයේ සිද්ධ වෙච්ච දේවල්ම අනුර කුමාර ජනාධිපතිතුමාත් සිද්ධ කරන බව අපට ජේනවා. ඒ නිසා අපට කියන්න සිද්ධ වෙන්නේ මෙවැනි ක්‍රමවේදයකින් මිදිලා ඉදිරියට යන්න පුළුවන් ආර්ථික වැඩ පිළිවෙළක් මෙහි නැති බවයි. ඔබ කියපු බොහෝ දේවල් සමාජයට, රටට ගැළපෙනවා නම්, ඒකට අපි සහයෝගය දෙන්න සූදානම්. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ අය වැය එතුමන්ලාට හිතට, ඇහට දැනෙනවා කියලා. මහත්තයෝ, ඔබතුමන්ලාට එළියේ ඉන්න ජනතාව විඳින දුක දැනෙන්නේ නැහැ. ඔවුන්ට තවමත් තුන්වේල කන්න බැරිවයි ඉන්නේ. වී ටික තවමත් වී අලෙවි මණ්ඩලයට අරගෙන නැහැ. අප්‍රේල් මාසයේදී ආණ්ඩුවෙන් හාල් දෙනවා කිව්වා. හබැයි, තවමත් වී අලෙවි මණ්ඩලය වී ඇටයක්වත් අරගෙන නැහැ. අරගෙන තිබෙනවා නම් අරන් තිබෙන්නේ, සොච්චම ප්‍රමාණයක්. අප්‍රේල්වලට තව තිබෙන්නේ, මාස දෙකයි. මේ රටේ හාල් මිල පාලනය කරලා, හාල් මිල අඩු කරලා ජනතාවට අලුත් අවුරුද්ද සමරන්න පුළුවන් විධියේ, ජනතාවට ඇහට දැනෙන විධියේ වැඩ පිළිවෙළක් මේ අය වැය තුළින් ඔබතුමන්ලා හදලා නැහැ. කවුරු හරි ඇමතිවරයෙක් උදේ කිව්වා, මෙය ජනතාවාදී අය වැයක් කියලා. එහෙම නම්, ඒ ජනතාවාදී අය වැය රනිල් වික්‍රමසිංහගේ ඉතුරු ටික නම්, රාජපක්ෂවරු හදපු අය වැය මේ අය වැයේත් ඒ විධියටම තිබෙනවා නම්, ඔබතුමන්ලා පසුගිය 78 අවුරුද්දක් තිස්සේ කිව්ව බොරුව, රහපෑම, මුසාව කියන කාරණය සමාජය කල්පනා කර බැලුවොත් අපි කියන එක වැරදි නැහැ නේ. ඒකයි අපි මේ කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පරණ ටිකම මේ පොතට එකතු කරලා සුපුරුදු විධියටම ඒ ගමන යන වැඩ පිළිවෙළක් තුළද NPP ආණ්ඩුව මේ රටේ ඉදිරි ගමන නිර්මාණය කර තිබෙන්නේ කියන කාරණය මම කියනවා.

රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩිවීම ගැන කථා කළොත්, ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මම කියපු විධියට ඔබතුමන්ලා කථාවෙන් මෝහනය කරලා තිබෙනවා; කථාවෙන් විකෘති කරලා තිබෙනවා; කථාවෙන් අවබෝධය දෙන්න බැරි තැනකට පත් කරලා තිබෙනවා. ජීවන වියදම මූලික වැටුපට එකතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජීවන වියදම කියන්නේ, අඛණ්ඩව හැම රජයක්ම රාජ්‍ය සේවකයාට දීපු දෙයක්. හැම ආණ්ඩුවක්ම ජීවන වියදම් දීමනාව මූලික වැටුපට එකතු කරලා තිබුණේ නැහැ. හැබැයි, වැටුපට ඒක ලැබුණා. දැන් මූලික වැටුපත් එක්ක ඒක ලැබෙනවා. අපි අහන්නේ මෙයයි. ඒ දීපු ජීවන වියදම් දීමනාව මූලික වැටුපට එකතු වෙලා ජීවන වියදම සඳහා තවත් මුදලක් දෙනවා නම්, අන්න අපට සතුටු වෙන්න පුළුවන්. හැබැයි, මෙතෙක් දීපු දීමනාවක් මූලික වැටුපට එකතු කරලා ඒක ඔබතුමන්ලා දුන්නාය කියලා කියන්න යන්න එපා.

මට තේරෙන විධියට මම මේ කියන්නේ. ජීවන වියදම් දීමනාව මූලික වැටුපට එකතු කරලා තිබෙනවා. ඒක හොඳයි. වැටුප් වැඩිවීම එතැනින් පෙන්වනවා. හැබැයි, කලින් ආණ්ඩුව දීපු ජීවන වියදම් දීමනාව අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මූලික වැටුපට එකතු කරලා, "අපි දුන්නා" කියන එක වැරැදියි. හැබැයි, නැවත ඒ ජීවන වියදම් දීමනාව ලෙස තිබුණා වූ මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවකයාට එකතු වෙනවා නම් රාජ්‍ය සේවකයෝ සතුටු වෙයි. අපි දන්නා විධියට රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ රාජ්‍ය සේවකයන්ට දෙන්න පොරොන්දු වූ තව රුපියල් 5,000ක් තිබෙනවා. නමුත් ඒක රාජ්‍ය සේවකයාට ලැබෙන්නේ නැහැ. ඊළඟට, බැසිල් රාජපක්ෂ, මොළ හතාණෝගේ ආණ්ඩුවෙන් දීපු මුදලකුත් ලැබෙන්න තිබෙනවා. ඒක ලැබෙන්නේත් නැහැ. මොකද, එතුමන්ලා දැන් ආණ්ඩුවේ නැහැ. එතුමන්ලාගේ ආණ්ඩුව නැති නිසා ඔබතුමන්ලා ඒක දෙන්නේ නැහැ. හැබැයි, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යෝජනා කරලා තිබෙන මුදල 2027 අවුරුද්ද වෙනකොට තමයි සම්පූර්ණයෙන් රාජ්‍ය සේවකයාට ලැබෙන්නේ.

අපට මේක කියලා දෙන්න. 2025දී ලැබෙන ආදායම වියදම් කරනවා නම් පමණයි, අපට අය වැය විවාදයේ අවසාන දවසේ, කාරක සභා අවස්ථාවේදී කථා කරලා මේ අය වැය සම්මත කරන්න පුළුවන් වෙන්නේ. 2026 අවුරුද්දට වැටුප අනුමත කරන්න බැහැ, 2025 අය වැය ලේඛනයෙන්. 2025 අවුරුද්දේ ලැබෙන ආදායම, 2027 අවුරුද්දේ වැටුප් ගෙවීමට යොදා ගන්න බැහැ. එහෙම නම් තව අවුරුද්දකින්, අවුරුදු එකහමාරකින් ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයේ නැතුව තිබුණොත්, ඒක වෙන්නේත් නැහැ. ඒ නිසා මේ වාගේ මෝහනයක් කරන්නේ, ඔබතුමන්ලා වෙනුවෙන් වෙනස් වෙච්ච මේ රටේ බුද්ධිමතුන්ට බව මතක තබා ගන්න. මිනී මරපු බව දැන-දැන, හන්දියක් හන්දියක් ගණනේ මිනිසුන්ගේ ඔළු පුච්චපු බව දැන-දැන, තමන්ගේ අම්මා, තාත්තා, සහෝදරයා මරපු ඒ කුරිරු ඉතිහාසය මේ රටේ රාජ්‍ය සේවකයෝ අමතක කළා, NPP එක බලයට ගෙන එන්න; රට හදා ගන්න. රට හදා ගන්න හරි දේ හරි තැනකට ගෙනියයි කියලා තමයි රාජ්‍ය සේවකයෝ ඒ විධියට කටයුතු කළේ. අද අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඇතුළු තමුන්නාන්සේලා ඒ රාජ්‍ය සේවකයෝ අන්දන තැනට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පිටකොටුවේ වෙළෙඳාම් කරන මේ විධියේ පිරිසක් ඉන්නවා. ඒ වෙළෙන්දෝ හරි සූක්ෂ්මයි, ඒ භාණ්ඩ අලෙවි කර ගන්න. ඔවුන් පිටකොටුවේ ප්‍රධාන වීදියක් අයිනට තමන් අලෙවි කරන භාණ්ඩය ගෙනැල්ලා, ඒක අලෙවි කරන්න උප්පරවැට්ටියක් පාවිච්චි කරනවා. අපි හිතමු, ඒ භාණ්ඩය ෂර්ට් එකක් කියලා. "පිට නෑ, පිට නෑ, පිට නෑ, ලාභයි, ලාභයි, ලාභයි" කියලා කෑ ගහනවා. බැලුවාම හොඳයි; මිලෙන් අඩුයි; අදින්න පුළුවන් ෂර්ට් එකක්. හැබැයි, එතැනදී අදින්න බැහැ. ගෙදර ගිහිල්ලා ඇඳලා බලනකොට පිට නැහැ. ඒ විධියට තමයි, රාජ්‍ය සේවකයාට මේ වැටුප් වැඩි කිරීම කරලා තිබෙන්නේ. අප්‍රේල් මාසයේ වැටුප අතට ගන්නකොට අර පිටකොටුවේ කපටි වෙළෙඳුන් ඇඳුම් විකුණනවා වාගේ, පිට නැති ෂර්ට් එක ඇන්දා වාගේ රාජ්‍ය සේවකයන්ට තේරෙනවා, තමුන්නාන්සේලාගේ බොරුව. දවසට, දෙකට, මාසයට බොරු කියන්න කටයුතු කරන්නේ ඇයි? ඇයි, තමුන්නාන්සේලා වෙනුවෙන් දර දිය ඇද්ද මේ උගතුන් බොරු කියලා රවට්ටන්න

හඳන්නේ? කවුද, රැවටෙන්නේ? ඒ නිසා ඒවා කරන්න එපා. මහත්වරුනි, අපි කියන්නේ, tie, coat ඇඳලා ඉන්නවා නම් මහත්වරු වෙන්න කියන එකයි. Tie, coat ඇඳලා ඇවිල්ලා බොරු කියලා රටේ ජනතාව රවටලා, රට විනාශ කරන තැනට ගෙනියන්න එපා. ඒ නිසා මේ අය වැය ඉදිරිපත් කරලා, තමුන්නාන්සේලා කියපු ඒ මහ යනවා කියලා හිතනවා නම් එහෙම වෙන්නේ නැහැ කියන එක මම කියන්න ඕනෑ. එහෙම කරන්න තමුන්නාන්සේලා සිහිනයකින්වත් හිතලා නැහැ කියන කාරණයත් මම කියන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තටම අපි හිතුවා, ඔබතුමන්ලා පසුගිය කාලයේ කියපු විධියට, කථා කරපු විධියට මේ පාර්ලිමේන්තු සංස්කෘතිය, දේශපාලන සංස්කෘතිය වෙනස් වෙයි කියලා. නමුත් අද ඒවා වෙන්නේ නැහැ. දැන් රාජ්‍යයේ ආරක්ෂාව පිළිබඳව, ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් නැහැ කියලා මහජන ආරක්ෂක ඇමතිවරයා කියනවා. අවි ආයුධ අරගෙන ගිහිල්ලා අපේ රටේ ප්‍රධාන අධිකරණයකදී මිනිස්සු මරනකොට, ඒ අවි ආයුධ එවැනි අධිආරක්ෂිත කලාපවලට ගෙනියන්න පුළුවන් ඒ මානසිකත්වය, ලිහිල්භාවය, ඒ සරලකම නිර්මාණය වෙලා තිබෙන බව අපට පෙනෙනවා. පයින් යනවා, තනියෙන් වාහනයේ දොර ඇර ගන්නවා, තනියෙන් කනවා, කෙහෙල් කොළයේ බත් කනවා. එහෙම කියපු ඉතිහාසය තුළ මොකක්ද රටට වුණේ? පාස්කු ප්‍රහාරය සිද්ධ වෙලා, දැන-දැනම මේ රටේ මිනිස් සංහාරයක් වෙලා ඒකෙන් කාලකණ්ණි විධියට බලය අල්ලා ගන්නා වැඩ පිළිවෙළක් සිද්ධ වුණා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා සරල වෙන්න කියලා කෙහෙල් කොළයේ බත් කෑවේ. අපි කියන්නේ නැහැ, අනුර කුමාර දිසානායක මහත්මයාට කෙහෙල් කොළයේ බත් කන්න කියලා. හැබැයි, ඒ සරල වීමේ ප්‍රතිඵලයේ භයානකත්වය නිසා, එක පැත්තකින් පාතාලය රට ගිල ගන්නවා වාගේම, මිලේච්ඡ, අන්තවාදී ත්‍රස්තවාදය හිස එසවීමේ එක මාවතක් බවට අපේ රට නිර්මාණය වෙලා තිබෙනවා. ඔබතුමන්ලා හිතන විධියට නොවෙයි, අද රට ගමන් කරන්නේ.

අම්මා, තාත්තා දරුවෝ එක්ක අද මහ පාරේ වෙඩි තියලා මරා දමනවා. එවැනි තත්ත්වයක් අද වනකොට උදා වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා බලයට පත් වෙලා ඉතා කෙටි කාලයක් තුළ මේ රටේ ජනතාවට මහ පාරේ ගිහිල්ලා ගෙදරට එන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. තාත්තා වැඩට ගියාම ගෙදර එයිද, නැද්ද කියන තැනට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම කියනවා, මේක හිතට ගන්න කියලා. මේක සැහැල්ලුවෙන් හිතන්න එපා. මේවා පාතාලයටම ලඝු කරලා බලන්න හදන්න එපා. ඊට එහා ගිය මේ මිලේච්ඡ අන්තවාදය තුළ, තමන්ගේ ඒ ගෝත්‍රීය දේශපාලන අවශ්‍යතාව ඉටු කර ගන්න කඳවුරු මේ රටේ ඉතිහාසයේ සිට ඉන්නවා. ඒ උදවියත් කල්යල් බල-බලා ඉන්නවා ඔබතුමන්ලාගේ දුර්වලතාව හරහා, ඔබතුමන්ලාගේ නොහැකියාව හරහා මේ රටේ නැවත ඒ අඳුරු යුගය නිර්මාණය කරන්න. පාස්කු ප්‍රහාරයෙන් පටන් ගත්ත ඒ ආර්ථික ඝාතනය හේතුවෙන් ඇති වූ ආර්ථිකය බිඳ වැටීමේ ප්‍රතිඵලවලට අද අපට - ඔබට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා, ගරු ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිතුමනි. ඒ නිසා මේ කාරණය සම්බන්ධයෙන් අවධානය යොමු කරලා කටයුතු කරන්න කියන කාරණය මම කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ පළාතේ ඉන්නා සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැතත් මම මේ කාරණය කියන්න කැමතියි. එතුමා පසුගිය කාලයේ විශේෂයෙන්ම අපේ එළවලු ගොවීන් ගැන කථා කළා. හැබැයි, එළවලු ගොවීන්ට අද කිසිම සහනයක් දෙන්න පුළුවන් තැනක මේ ආණ්ඩුව නැහැ. අපට තිබෙන ප්‍රශ්නය මේකයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. වී ගොවියාට සහන දෙනකොට එළවලු ගොවීන්ට කිසිම සහනයක් නැහැ; පොහොර සහනාධාරය නැහැ. ඒ වාගේම ගංවතුර, නියං ආධාර කිසිවක් දෙන්නේ නැහැ. එවැනි අවධිවල සමන්ත විද්‍යාරත්න මහත්මයලා හිටියේ අල ගොවීන්ගේ ගොවිපළවල. ඒ ගොවිපළවල් ළඟට ගිහිල්ලා කිව්වා, "අල ගොවීන්ට සහනයක් දීපියෝ. එළවලු ගොවියාට සහනයක් දීපියෝ. ආධාරයක් දීපියෝ" කියලා පපුවට ගහගෙන, ඒ ගොවියෝත් එක්ක ගොවි පොළවල්වල ඉඳලා කෑ ගහමින් අඬපු උදවියගෙන් අපි අහනවා, අනුර කුමාර ජනාධිපතිතුමාගේ මේ අය වැය ලේඛනය තුළ එළවලු ගොවියාගේ ආරක්ෂාව වෙනුවෙන්, එළවලු ගොවියා වෙනුවෙන් ඉදිරි වැඩ පිළිවෙළක් හඳලා තිබෙනවාද කියලා. බදුල්ලේ හැදෙන එළවලු ටික මේ රටේ ජනතාවගේ කුසගින්න නිවන්න කොළඹට ආරක්ෂිතව ගෙන යන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් මේ අය වැය ලේඛනය තුළ ඉදිරිපත් වෙලා නැහැ. ගොවීන් වෙනුවෙන් කෑ මොර ගහපු මේ ආණ්ඩුව නියෝජනය කරන විශාල පිරිස ඒ වෙනුවෙන් සහනදායී වැඩ පිළිවෙළක් හදයි කියලා අපි හිතුවා. අපි කෑ ගැහුවාට අපිත් එවැනි දෙයක් බලාපොරොත්තු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

දැන් අපේ සමගි ජන බලවේගයේ නායකතුමාගේ "දස වැදෑරුම් ප්‍රතිපත්තිය" අනුව රටක දියුණුව වෙනුවෙන් අවැසි මානුෂීය ධනවාදය කියන මාතෘකාවක් ගැන කථා කළා. අපි උත්සාහ කරනවා, මේ රටේ පැවැත්ම වෙනුවෙන් අනාගතය ගොඩනඟන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සමගි ජන බලවේගය තුළ හදන්න. මේ සඳහා ප්‍රායෝගිකව රටට ගැළපෙන විධියේ පෙනී හිටීම චමින්ද විජේසිරි සිද්ධ කරනවා. මොකද, ඔබ වාගේම, ඔබේ සමහර කඳවුරු වාගේම අපි හඳන්නේ රටට අවැසි, නිවැරදිව රට ගොඩනඟන්න පුළුවන් ඒ පාලනය. එය සමගි ජන බලවේගය තුළින් ඉදිරියේදී නිර්මාණය කරන්න අපි උත්සාහ දරනවා කියන කාරණය මතක් කරමින්, මේ කාල වේලාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුති වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.10]

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අය වැය දෙවැනිවර කියවීමේ විවාදයට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව මුලින්ම මා සතුටු වෙනවා. මට ප්‍රථමයෙන් මේ සභාව ආමන්ත්‍රණය කළ ගරු මන්ත්‍රීතුමාගේ අදහස් සම්බන්ධයෙනුත් යම් ප්‍රකාශයක් කරලා මගේ පැහැදිලි කිරීම් කළා නම් හොඳයි කියන අදහසයි මට තිබෙන්නේ.

සාමාන්‍යයෙන් රටක අය වැය කියන්නේ ආණ්ඩුවක් පලවා හැරලා ඊට පස්සේ අලුත් ආණ්ඩුවක් ආවාම, ඒ ආණ්ඩුව තනියෙන් කල්පනා කරලා, තනියෙන් හිතලා ඒ ආණ්ඩුවේ තිබෙන වුවමනාකම් ඔක්කොම එක දවසින් හෙළි කරවා ගැනීම සඳහා ඉදිරිපත් කරන ප්‍රකාශයක් නොවෙයි. මීට පෙර මේ රට පාලනය කරනු ලැබූ, ඒ වාගේම ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලැබූ නායකයන්ගේ ආණ්ඩුවලින් ගන්නා ලද ක්‍රියාමාර්ග එක්ක ඒ අය

[ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා]

වැය බැඳිලා තිබෙනවා; ඔවුන් ගන්නා ලද ආර්ථික වැඩ පිළිවෙළත් එක්ක බැඳිලා තිබෙනවා; මේ රටේ කරනු ලැබූ ආර්ථික කළමනාකරණය එක්කත් බැඳිලා තිබෙනවා. එහෙම නැතිව අලුතින් ආණ්ඩුවක් ආවාට පස්සේ මීට පෙර තිබූ සියලු ආර්ථික සාධක කල්පනා නොකර, අමතක කරලා අය වැය හදන්න ඒ ආණ්ඩුවට බැහැ. විශාල ධනස්කන්ධයක් එක්ක අලුතින් රටක් නිර්මාණය කරනවා නම් එහෙම කරන්න පුළුවන්.

ඊට මෙහා, අතීතයේ සිද්ධ වෙච්ච කාරණා ගැන නොසැලකිලිමත්ව, කථා නොකරමින් ඉදිරි ආර්ථිකයක් ගැන කථා කරන්න බැහැ. ඒ නිසා තමයි අපට අතීතයේ මේ පාලකයන් විසින්, ඒ වාගේම ඔය කථා කරන ලද සමහර මන්ත්‍රීවරුන් නියෝජනය කරන කණ්ඩායම් විසින් රට පාලනය කරපු අවස්ථාවලදී ගනු ලැබූ ආර්ථික ක්‍රියාමාර්ග, කරනු ලැබූ ඇතැම් ක්‍රියා සම්බන්ධයෙන් කථා කරන්න වෙන්නේ.

ඒ වාගේම, මට කථා කරන්න හිතෙනවා, මේ පාර්ලිමේන්තුව ඇතුළේ අපි උදේ සිට හැන්දෑ වෙනතුරු බලාගෙන ඉඳිද්දී, පෙනෙන්න තිබෙන භාවිතාව සම්බන්ධයෙන්. විශේෂයෙන් එතුමන්ලාගෙන් වැඩිපුරම ඇහෙන දේ තමයි පළපුරුදු අය ගැන කථා කිරීම. පළපුරුදු නායකයන් ගැන සාකච්ඡාවක් නිරන්තරයෙන් දේශපාලන වේදිකාවලත්, මේ ගරු සභාව ඇතුළෙත් ඇහෙනවා. පළපුරුද්ද තිබෙන්න ඕනෑ කියලා කියනවා. නමුත් අපට උදේම දකින්න ලැබෙනවා, පළපුරුද්ද තිබෙනවා කියලා කියා ගන්නා සමහර අය නැඟිටිනවා, "point of Order" කියනවා, ව්‍යාකූලතාවක් නිර්මාණය කරනවා. ඒ ව්‍යාකූලතාව ප්‍රයෝජනයට අරගෙන මාධ්‍යයට යමක් කියා ගන්න උත්සාහ කරනවා; තමන් දේශපාලනයේ නොනැසී ඉන්නා බව පෙන්වන්න හදනවා; ගෙදර යනවා. ඒ අය point of Order කියන එකේ තේරුම විධියට හිතාගෙන ඉන්නේ, මටත් දෙයක් කියන්න පුළුවන්, කියන්න ඕනෑ කියලා කියනවා වාගේ අදහසක්. නමුත් point of Order එක මොකක්ද කියලා අහපුවාම ඒකට උත්තරයක් දී ගන්න බැහැ. ඉතින් ඒකෙන්ම තේරෙනවා ප්‍රාථමිකභාවය. අඩුම තරමින් අවුරුදු ගණනක් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා point of Order එකක් කියන්නේ මොකක්ද කියන එකවත්, එකේ තේරුමවත් දන්නේ නැහැ කියන එක තමයි අපට නම් පිටුපස්සේ ඉඳගෙන බලාගෙන ඉඳිද්දී තේරුම් යන්නේ. ඒ නිසා මම හිතනවා, ඒ තුළ ඔවුන් උත්සාහ කරන්නේ, අර දේශපාලනයේ නොනැසී ඉන්නවා, තමන් පෙනෙන්න ඉන්නවාය කියන වුවමනාව සංතෘප්ත කරවා ගැනීමයි. ඒ සඳහා තමයි දඟලන්නේ. ඒ පිළිබඳව මට වෙලාවකට ලජ්ජාවකුත් හිතෙනවා.

ඊළඟට, ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට එන්න කලින් කියපු කාරණා, ඒ වාගේම කරන්න හිතාගෙන ඉන්න කාරණා ගැන විවිධ විධියට පැහැදිලි කිරීම් මට කලින් කථා කරපු මන්ත්‍රීතුමාත් කියන්න උත්සාහ කළා. එතුමාගේ කථාවේ මූල මැද අග ගළපා බැලුවාම, අය වැයේ තිබෙන කිසිදු කාරණයක් පැහැදිලිව නිර්වචනය කර ගත්තාය කියන එක නම් මට පෙනෙන්න තිබුණේ නැහැ. කෙසේ වෙතත්, එතුමා පැහැදිලි විධියට කිව්වා කියලා කියූ නිසා මට කියන්න තිබෙන්නේ, දැන් අපි ගැන අපි කියන දේට අමතරව, යමක් කියන්න උත්සාහ කරනවා, විපක්ෂයේ ඉන්න අය. නමුත් මම විශ්වාස කරනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට එන්න කලින්, ජාතික ජන බලවේගය ආණ්ඩු බලයට ආවාට පසුව, මෙන්න මෙහෙම දේවල් ටිකක් වෙයි කියලා ඔය විපක්ෂයේ කණ්ඩායම බොහෝ කාලයක් තිස්සේ කියාගෙන ආවා. එකක්, අපි ආවොත් රටේ ආර්ථිකය කඩා වැටෙනවා; විනාශ වෙනවා; ආගමික අන්තවාදයක් ඇති වෙනවා; ඒ නිසා ප්‍රශ්න ඇති වෙනවා කිව්වා.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ නම කියැවුණේ නැහැ නේ, මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමාට කථාව කරන්න ඉඩ දෙන්න.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(*மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்*)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
මම නමක් කිව්වේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කරපු කෙනා ඔබතුමා වෙන්නත් පුළුවන්, වෙන කෙනෙක් වෙන්නත් පුළුවන්. මම නමක් සඳහන් කළේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. නමක් සඳහන් කළා නම්, නමක් කියූ පමණින්ම කථා කරන්නත් බැහැ. ඒ බව ස්ථාවර නියෝගවල පැහැදිලිව තිබෙනවා. නමක් කියූ පමණින් කථා කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. *[බාධා කිරීමක්]* මම නමක් කියලා කිසිදු ආකාරයක පැහැදිලි කිරීමක් කළේ නැහැ. ඒ නිසා මගේ පැහැදිලි කිරීමට ඉඩ දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ කාලය ගන්නවා නම්, මට ඒ කාලය ලබා දෙන්න. *[බාධා කිරීමක්]* මම නමක් කියලා කිසිවක් quote කළේ නැහැ. *[බාධා කිරීමක්]* මම නමක් කියලා හෝ කිසිවක් quote කරලා කථා කළේ නැහැ. මම හිතනවා, විපක්ෂය අලුතින් දේශපාලනය පටන් ගන්න ඕනෑ කියලා. එකක් තමයි අපි ආවාම රැවුල කපයි කියන බයට, රැවුල වවන්න දෙන්නේ නැති වෙයි කියන බයට සමහරු අපට ඡන්දය දුන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, එතුමාට කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 86. (අ) යටතේ,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
මම ඒක බලලා කියන්නම්.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(*மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்*)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)
වාඩි වෙන්න, වාඩි වෙන්න.*[බාධා කිරීමක්]* අපි ආවාට පස්සේ දානය ලැබෙන්නේ නැති වෙයි කියලා බයට ඡන්දය දුන්නේ නැහැ.*[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමා ඉඳගන්න. මම ස්ථාවර නියෝගය බලලා අවස්ථාව දෙන්නම්. එතුමාට කථාව කරන්න ඉඩ දෙන්න.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(*மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்*)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

අපි ආවාට පසුව ආර්ථිකය කඩා වැටෙයි කියන බයට අපට ඡන්දය නොදී ඔය කියන කණ්ඩායමට ඡන්දය දීපු කොටසක් හිටියා. *[බාධා කිරීමක්]* අපි ආවාට පස්සේ රටේ ලොකු විනාශයක් ඇති වෙයි කියන බයට අපට ඡන්දය නොදී, ඒ කියන කථාව පිළිඅරගෙන ඔවුන් විශ්වාස කරමින් ඡන්දය දීපු පිරිසක් හිටියා. පළමුවෙනි වැඩේ තමයි දශක ගණනක් අපි සම්බන්ධයෙන් පවත්වාගෙන ආපු, නඩත්තු කරගෙන ආපු මතවාදයක්, එනම් ප්‍රචණ්ඩකාරිත්වය ගැනත්, ආර්ථිකය ගැනත්, විවිධ ආගමික අන්තවාද ගැනත් ගෙනාපු මතවාදය බලය අරගෙන පැය විසිහතරක් යන්න කලින් පරාජයට පත් වුණා.*[බාධා කිරීමක්]*

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම විනාඩියයි ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, කියන්න. විනාඩියයි.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු මන්ත්‍රීතුමා, විවාද රීතියේ 86. (අ) යටතේ තිබෙනවා,- ඇත්තටම මෙතුමාට කලින් කථා කළේ මම. එතකොට නම කියන්න ඕනෑ නැහැ. කලින් කථා කළේ මම නම්, ඒ මම. මම ඇත්තටම කිව්වේ මේකයි. ඔබතුමා කියන්න, මේ අය වැය ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය සේවකයාට පඩි වැඩිවීම පිළිබඳව,- මම අය වැය ගැන දන්නේ නැහැ කියලා එතුමා කිව්වා නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා කියන්න, මේ රාජ්‍ය සේවකයාගේ පඩි වැඩිවීම පිළිබඳව මම කථා කරපු එක වැරදිද, නිවැරදිද කියලා. එච්චරයි. ඔබතුමා ටයි කෝට් ඇඳගෙන බුද්ධිමතකු හැටියට, වියතකු හැටියට පණ්ඩිතයෙක් නොවී පඩි වැඩිවීම ගැන කියන්න කෝ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, අලුත් කාරණා ඉදිරිපත් කරන්න බැහැ.

ගරු භාග්‍ය ශ්‍රී හේරත් මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
(*மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்*)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ආගමික අන්තවාදයකට බියේ, ආර්ථිකය කඩා වැටෙයි කියන බයට, සමාජ ව්‍යාකූලතාවක් ඇති වෙයි කියන බයට ඒ ගැන පැහැදිලි කරපු ඔය විපක්ෂයේ කණ්ඩායම් විශ්වාස කරලා පිරිසක් එතුමන්ලාට ඡන්දය දුන්නා. දැන් එතුමන්ලාට වගකීමක් තිබෙනවා. අපි ගැන කථා කරන්න කලින්, එතුමන්ලා විශ්වාස කරලා ඡන්දය දුන් අයට පැහැදිලි කරන්න ඕනෑ, මුලින් අපි මෙහෙම දෙයක් කිව්වා තමයි, හැබැයි ඒක වුණේ නැහැ, ඒකට හේතුව මේකයි කියලා. දේශපාලනයට එනවා නම් මුලින් පැහැදිලි කරන්න ඕනෑ ඒක. එතුමන්ලා විශ්වාස කරමින්, එතුමන්ලාට ඡන්දය දුන්නා පිරිසක්, රැවුල වවන්න දෙන්නේ නැති වෙයි කියන බයට, දානය දෙන්නේ නැති වෙයි කියන බයට. දැන් විපක්ෂය ඒ අයට පැහැදිලි කරන්න ඕනෑ, අපි මෙහෙම දෙයක් කිව්වා තමයි, හැබැයි ඒක වුණේ නැත්තේ මෙන්න මේ හේතුව නිසා කියලා. ඒ ගැන නොකියා අපි ගැන පැහැදිලි කිරීම් කරන්න ඒ ගොල්ලන්ට කිසිදු සදාචාරාත්මක අයිතියක් නැහැ. අයිතියක් තිබෙනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට එන්න කලින් අපි මෙහෙම කිව්වා තමයි, ඒ කියපු කථා දැන් වැරදියි කියලා, බොරු කියලා ඔප්පු වෙලා තිබෙනවා, ඒකට හේතුව මේකයි කියලා කියන්න. ඒ පැහැදිලි කිරීම කරලා අපේ අය වැය ගැන හරි, අපේ භාවිතාව ගැන හරි ප්‍රශ්න කළා නම්, ප්‍රකාශ කළා නම් මීට වඩා යුක්තිගරුකයි. දැනුත් ඇවිල්ලා මුලක්, මැදක්, අගක් නැතිව බොරු කිව්වා කියනවා, අපට ස්ථාවරයක් නැහැ කියලා කියව කියවා යනවා. මේ අය වැයේදී කියපු කථාවක් අරගෙන, අය වැයේ තිබෙන ප්‍රතිපත්තියක් අරගෙන ඊට කලින් කරපු ප්‍රකාශයක් එක්ක ගළපලා කථා කරන්නේ නැහැ. බොරු කිව්වා, බොරු කිව්වා කියලා කියාගෙන යනවා. ඒ නිසා මම හිතන්නේ එතුමන්ලාට දේශපාලන වශයෙන් කිසිදු අයිතිවාසිකමක් නැහැ, එතුමන්ලා කරපු බොරුව සහ ඒක කිරීමට හේතුව ගැන සමාජයට කියන්නේ නැතුව, අප විවේචනය කරන්නවත්, ප්‍රශ්න කරන්නවත්. මේ කියන එක අහගෙන ඉන්නවත් කවුරුත් නැහැ මෙතැන.

කොහොම වුණත්, අපි බලයට එන්න කලිනුත්, වර්තමානයේදීත් අපේ මතවාදයක් විධියට කියන්නේ මොකක්ද? මේ රටට ආර්ථික වශයෙන් නව පරිවර්තනයක් ඕනෑ. සමාජයීය වශයෙන් පරිවර්තනයක් ඕනෑ. අපි බලය ලබාගන්නා මොහොතේත් පැහැදිලි කළා, ඒ පරිවර්තනය ඇතුළේ අපි සියලුදෙනා එකතු වෙලා කැපකිරීම් කරමින්, සාමූහිකව මේ රට ගොඩනඟන්න ඕනෑ කියලා. අපි කළේ එහෙම පැහැදිලි කිරීමක්. අපේ වේදිකාව ළඟට එන, අපට ඡන්දය දෙන, අපට සහයෝගය දෙන පිරිසට "අපට සහයෝගය දීම රැකියාවක් ලබා ගැනීමට හේතුවක් නොවෙයි" කියලා අපි වේදිකාවල කියද්දී මිනිස්සු තව තවත් අපි එක්ක එකතු වුණා. හැබැයි, ඊට කලින් ගස්, ගල් ළඟට ගිහිල්ලා, කොට කලිසම් ගහගෙන උස ද, මිටි ද කියලා බල බලා රැකියා දුන්න මිනිස්සුන්ට නම් මේ ගැන පුදුමයි. අපි කියන්නේ මොකක්ද? අපි ළඟට ආවාට, ඒක රැකියාවක් ලබාගන්න සුදුසුකමක් නොවෙයි. එහෙමයි අපි අපේ සංස්කෘතිය පෙන්නුවේ. අපි කිව්වේ සාමූහිකව එකතු වෙලා මේ රට ගොඩනඟමු කියලා. ඒ මතවාදය තමයි තවමත් අපි ඉදිරියට අරගෙන යන්නේ. අපි පැහැදිලි කළේ සාමූහිකව කැපකිරීම් කරමින් මේ රට නැවත ගොඩනඟමු කියලා. ඇයි ඒ? මේ රට වැටිලා තිබෙන නිසා.

හැබැයි, දැන් මේ අය වැය ගැන කථා කරන අය නැවත කථා කරන්න උත්සාහ කරන්නේ තනි පුද්ගලයෙකුට තිබෙන වාසියක් ගැන. වැටුප්වල විෂමතා තිබෙන්න පුළුවන්. වැටුප්වල වෙනස්කම් තිබෙන්න පුළුවන්. නැවතත් ආත්මාර්ථකාමිත්වය සමාජගත කරලා, අපි ගොඩනඟමින් ඇවිල්ලා තිබෙන මේ සමාජ මතවාදය, අපේ මතවාදය විනාශ කරන්න ඔවුන් උත්සාහ කරනවා. නමුත් මේ සමාජය ඒකට එකතු නැති බව පෙනෙන්න තිබෙනවා. මේ සභාවට එවලා තිබෙන ඒ මන්ත්‍රීවරු ප්‍රමාණයෙන්ම පැහැදිලියි මේ සමාජය ඒ මතවාදයට එකඟ නොවන බව. අපි එහෙම තමයි අපේ මතවාදය ගොඩනඟලා තිබෙන්නේ. අපේ ආර්ථික වැඩ පිළිවෙළ තිබෙන්නේත් ඒ සාමූහිකත්වය පදනම් කරගෙන. අපේ අය වැය ගොඩනැඟෙන්නේත් ඒ සාමූහිකත්වය, කැප කිරීම පදනම් කරගෙන. මේ රට කාලාන්තරයක් තිස්සේ කඩා වැටිලා තිබෙන්නේ. ඒ නිසා එය ගොඩනැංවීමේ අවශ්‍යතාව තිබෙනවා.

මට කලින් කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා, රටේ ජාතික ආරක්ෂාව ප්‍රශ්නයකට ලක්වෙලා තිබෙන්නේ කියලා. ජාතික ආරක්ෂාව කියන්නේ මොකක්ද කියලාවත් එතුමන්ලා දන්නේ නැහැ. ඒකයි ඒකෙන් පැහැදිලි වෙන්නේ. කොහේ හෝ තැනක සිද්ධ වෙන වෙඩි තැබීමකින් තර්ජනයක් තිබෙනවා තමයි. නමුත් සාමාන්‍යයෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස සලකන්න

[ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා]

නම්, එක්කෝ ත්‍රස්තවාදී කණ්ඩායමක් මැදිහත් වෙලා තිබෙන්න ඕනෑ, නැත්නම් අන්තවාදී ආගම්වාදී ප්‍රශ්නයක් මතුවෙලා තිබෙන්න ඕනෑ, එහෙම නැත්නම් ජාත්‍යන්තර වශයෙන් මැදිහත් වීමක් තිබෙන්න ඕනෑ, එහෙම නැත්නම් ඒ රටේ සමාජයේ වෙනත් ව්‍යාකූලතාවක් නිර්මාණය වෙලා තිබෙන්න ඕනෑ, එහෙම නැත්නම් ඒ රටේ ඉන්න ප්‍රභූන් ඉලක්ක කරගෙන සිද්ධ වෙන ඝාතන රැල්ලක් තිබෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස සලකන්නේ, ලෝකය. හැබැයි, කොහේ හෝ සිද්ධියක් වුණාම ඒ සිද්ධිය ජාතික ආරක්ෂාවට ගළපන්න හදනවා. ඒවාට ජාතික ආරක්ෂාව කියන වචනය භාවිත කරන්නත් බැහැ. ජාතික ආරක්ෂාව කියන්නේ එහෙම එකක් නොවෙයි.

ඒ වාගේම තමයි ඔය සිදු වෙලා තිබෙන සිදුවීම ගැන අපි සොයා බැලුවොත්, පසුගිය දවසක අවාසනාවන්ත විධියට පුද්ගලයෙක් ඝාතනයට ලක් වෙනවා අධිකරණයක් ඇතුළේ. ඒක සිද්ධ නොවිය යුතුයි තමයි. හැබැයි අපි දැක්කා, ඒ ඝාතනයෙන් පස්සේ ඔහුගේ දේහය ගෙනයන්න ආවේ ඔහුගේ අම්මා; ඇය අඩා වැළපෙමින් එනවා. ඊයේ අපි දැක්කා, වෙරළකදී පුද්ගලයෙක් ඝාතනයට ලක් වෙලා තිබෙනවා; ඔහුගේ අම්මා අඩා වැළපෙනවා. ඔය මිය ගිය හැම පුද්ගලයෙක් පිටුපසම ආදරණීය අම්මෙක් ඉන්නවා. ඔය මිය ගිය හැම පුද්ගලයෙක් පිටුපසම සහෝදරයෙක් ඉන්නවා, බිරිඳක් ඉන්නවා. ඔවුන් අඩා වැළපෙනවා. ඒකෙන් කියවෙන්නේ මොකක්ද? මේ හැම මිනිහෙකුටම පවුලක් තිබිලා තිබෙනවා. ඒ අය ආදරය, කරුණාවත් එක්ක ජීවත් වෙච්ච මිනිස්සු. කාලාන්තරයක් තිස්සේ ගොඩ නැඟිච්ච මේ සමාජය ඇතුළේයි එවැනි මිනිස්සු නිර්මාණය වෙලා තිබෙන්නේ. ආර්ථිකයත්, අධ්‍යාපනයත්, කලාවත්, සාහිත්‍යයත් නැති, ඒවා විනාශ වෙච්ච රටක මේ වාගේ සිදුවීම් වෙන්න පුළුවන්. මෙය ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවුණත්, බරින් ගන්න ඕනෑ කාරණයක් තමයි. හැබැයි ඒක එක රැයකින් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. එය විසඳන්න නම් හැමෝම එකතු වෙලා මේ කඩා වැටිලා තිබෙන ආර්ථිකයත්, මේ කඩා වැටිලා තිබෙන සමාජයත් හෙමින් හෙමින් නැවත ගොඩනඟන්න ඕනෑ. එහෙම ගොඩනැඟුවාම තමයි ඔය කියන රට නිර්මාණය කර ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නොකර, කොහේ හරි වන සිදුවීමක් ඉලක්ක කරගෙන එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියලා කියන්න උත්සාහ කරන අයට කියන්න තිබෙන්නේ, "ජාතික ආරක්ෂාව කියන්නේ ඊට එහා ගිය ගැඹුරු කථාවක්" කියලායි. ඒ නිසා ඒ විවිධ කථා එකතු කරමින් ආණ්ඩුවට මඩ ගහන්න, අස්ථාවරභාවයක් නිර්මාණය කරන්න හැදුවත්, කියන්න තිබෙන්නේ, ඔය කථාවලට එළියේ, සමාජයේ ඉඩක් නැති බවයි. මේ සභාවේ නම් වෙලාව දෙන නිසා ඒ සඳහා යම් ප්‍රමාණයකට ඉඩක් තිබෙනවා. ඒ මිස එළියේ සමාජයේ ඒවාට ඉඩක් නැහැ කියන කාරණය කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් ලැබී තිබෙනවා.

[අ.භා. 3.22]

ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ආණ්ඩුව කරවන උතුම් පාර්ලිමේන්තුවේ මේ අවස්ථාවේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් දෙදෙනෙකු පමණක් ඉන්නවා වාගෙයි මට පෙනෙන්නේ. එච්චරටම එතුමන්ලා උනන්දුයි. මා හිතන විධියට, එතුමන්ලාට අය වැය ගැන කියන්න තරම් දෙයක් ඉතුරු වෙලා නැතුවා වාගෙයි. එතුමන්ලා උදේ වරුවේ ආරක්ෂාව ගැනයි, වෙනත් යම් යම් මාතෘකා ගැනයි කලකෝලාහල කරලා, මේ අය වැය ගැන කියන්න කිසිම අඩුවක් නැති හින්දා ද කොහේදෝ, මහ හැරලාම ගිහින් වාගේ පෙනෙනවා.

අපේ ආණ්ඩුවේ 2025 අය වැය මූලධර්මවල මූලික සිද්ධාන්තයක් විධියට සඳහන් කර තිබෙනවා, කර්මාන්ත, සේවා හා කෘෂිකර්මාන්ත අංශවල නිෂ්පාදනයේ වර්ධනය පිළිබඳව. මෙම නිෂ්පාදනය ජනතාවගේ සක්‍රිය දායකත්වය සහ සහභාගිත්වය මත සිදු විය යුතු වීම, නිෂ්පාදනයෙන් ලැබෙන ප්‍රතිලාභ සහ වර්ධනය සමාජය පුරා සාධාරණව බෙදී යා යුතු වීම යන මූලික මූලධර්ම ඔස්සේ අපි මෙම අය වැය ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා අපි අපේ රටේ ජනතාව, මානව සම්පත දියුණු කිරීම, දැනුවත්භාවයට පත් කිරීම මෙන්ම යාවත්කාලීන කිරීම ද ප්‍රමුඛ කාර්යයක් සේ සලකනවා. එහිදී විශේෂයෙන්ම රට ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය නව තාක්ෂණය හා දැනුමෙන් සන්නද්ධ අධ්‍යාපනයක් ලබා දීම, කාර්යක්ෂමව, ඵලදායී ලෙස වැඩ කළ හැකි සෞඛ්‍ය සම්පන්න ජනතාවක් ගොඩ නැඟීම, ඉහළ උපයෝගිතාවක් සහිත ඉඩම් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැඟීම මෙන්ම කාර්යක්ෂම ආනයන, අපනයන පද්ධතියක්, ඩිජිටල් තාක්ෂණය මත පදනම් වූ මූල්‍ය පද්ධතියක්, කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය කිරීම මෙන්ම සාධාරණ මිලකට සහ ආරක්ෂිතව සපයන්න පුළුවන් බලශක්තිය පහසුවෙන් මහ ජනයාට මෙන්ම කර්මාන්තවලට ලබා දීම වගකීමක් ලෙස සලකා ඒවාට අදාළව අපි මේ අය වැයෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඔව්, අපි ඒ දේවල් සංවර්ධනය කර ගන්න, ඉහළ ඵලදායිතාවක් පවත්වා ගෙන යන්න තමයි මෙම අය වැය තුළින් විශාල ලෙස මුදල් වෙන් කර තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ රටේ ජනතාවගේ බදු මුදලින්, නිදහස් අධ්‍යාපනය තුළින් ගොඩනැඟෙන බොහෝ විද්වතුන් මේ රටේ දියුණුවට, ආර්ථිකය නඟා සිටුවීමට කාර්යක්ෂමව යොදවා ගැනීම අපේ අරමුණයි. පසුගිය කාලය තුළ අප දැක්කේ ජනතාවගේ බදු මුදලින් බිහි වූ එවන් විද්වතුන් මේ රට හැර යෑම පමණයි. උදාහරණයක් විධියට ගත්තොත්, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවල ඉංජිනේරු වෘත්තිකයන්ම 200කට ආසන්න ප්‍රමාණයක හිඟයක් දැනට පවතිනවා. පසුගිය කාලයේ තිබිච්ච ආර්ථික අවපාතය වාගේම වෘත්තිකයන්ගෙන් අධික බදු මුදලක් අය කර ගැනීම නිසා එම ආයතන ඉතා දරුණු ලෙස කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. අපි අය වැයෙන් ඒ කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා, රාජ්‍ය සේවකයන්ට මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයන්ට ද ඔවුන්ගේ මූලික වැටුප පදනම්ව ඉතා විශාල ලෙසින් වැටුප් වැඩි වීමක් ලබා දුන්නා. ඒ වාගේම, උපයන විට ගෙවීමේ බදු මට්ටම ඉහළ දැමීම වාගේ දේවලින් තමයි අපි මේ බුද්ධි ගලනය නවතාලන්න උත්සාහ කර තිබෙන්නේ. අපි දැන් සෑම වෘත්තිකයෙකුගෙන්ම ඉල්ලා සිටිනවා, අප සමඟ එක් වී රට ගොඩ නඟන්න ඔබේ වටිනා දැනුම, පළපුරුද්ද ලබා දෙන්න කියලා. අපේ රටේ නිදහස් අධ්‍යාපනයෙන්, අපේ රටේ ජනතාවගේ බදු මුදලින් ඉගෙන ගත්තු, දැනුම වර්ධනය කර ගත්තු, දැනුම දීපු අය වෘත්තිකයන් විධියට අපේ රටේ තියා ගන්න ඕනෑ. මොකද, ඒ අය නැතිව අපට මේ රට සංවර්ධනය කරන්න බැහැ. අපි එම අඩිතාලම ආරක්ෂා කර ගන්න ඕනෑ. එහෙම නැතිව ඇත්තටම මේ රට දියුණු කරන්න බැහැ. ඒ නිසා මෙම අය වැය ජනතාවාදී ප්‍රගතිශීලී අය වැයක් වන විධියට තමයි අපි ගොඩ නඟා තිබෙන්නේ.

කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවයක් අපේ රටට අවශ්‍යයි. මොකද, ජනතාවට එහා මෙහා යන්න වාගේම භාණ්ඩ ප්‍රවාහනයටත් කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවයක් අපේ රටේ ඇති කරන්න ඕනෑ. ඇත්තටම ඒක ආර්ථික දියුණුවේ ප්‍රධාන

අංගයක් ලෙස අපි දකිනවා. ඒකටත් ලොකු මුදල් ප්‍රමාණයක් මෙවර අය වැයෙන් අපි වෙන් කර තිබෙනවා. ඒ අනුව නවීන තාක්ෂණය සමඟ මුසු වූ මහා මාර්ග හා දුම්රිය මාර්ග පද්ධතියක් හරහා එය දියුණු කිරීම අපේ අරමුණයි. එහිදී විශේෂයෙන්ම කොළඹ නගර ප්‍රදේශය තුළ ප්‍රධාන මාර්ග, corridors 3ක් ඔස්සේ මගී ප්‍රවාහනය සඳහා පහත් පතුල සහිත - low-floor - බස් රථ 100ක් යෙදවීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා. එම බස් රථ සේවාව අලුතින් ස්ථාපිත කිරීමට නියමිත බස් සමාගමක් යටතේ ක්‍රියාත්මක කරනවා. විශේෂිත සේවාවක් විධියට එම සේවය ජනතාවට සපයන්න අපි බලාපොරොත්තු වනවා.

ඊළඟට දුම්රිය සේවය ගැන කියන්න ඕනෑ. අපේ වාගේ රටක පවතින ප්‍රවාහන ගැටලු විසඳන්න නම් දුම්රිය සේවය කාර්යක්ෂම කිරීම හා දියුණු කිරීම කළ යුතුමයි. ඒ සඳහා මෙම අය වැයෙනුත් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. දුම්රිය මාර්ග ඉදි කිරීම, ඒවා සංවර්ධනය කිරීම, දුම්රිය මැදිරි නිෂ්පාදනය කිරීම සඳහා අපි කටයුතු කරනවා. ඒ වාගේම, විදුලි දුම්රිය කිහිපයක් අපි කොළඹ නගරයට ආසන්නයෙන් යෙදවීමට දැනටමත් කටයුතු කරගෙන යනවා. දුම්රිය සේවය නවීකරණය කරලා, ජනතාව ආකර්ෂණය වන දුම්රිය සේවයක් අපි ඇති කරනවා. බස් රථවලින් පමණක් රටක ප්‍රවාහනය දියුණු කරන්න අමාරුයි. දියුණු වෙච්ච රටවල් එකකවත් බස් රථවලින් පමණක් ප්‍රවාහන ක්ෂේත්‍රය දියුණු කරලා නැහැ. එහිදී දුම්රිය සේවය විශේෂයෙන්ම ප්‍රධාන තැනක් ගන්නවා. ඒකට මේ අය වැයෙන් පමණක් -මේ අවුරුද්ද සඳහා පමණක්- රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා.

රටක් විධියට අපි බොහෝ භාණ්ඩ ආනයනයට පුරුදු වෙලා තිබෙනවා. රටක් විධියට දියුණු වෙන්න නම්, අපට නිෂ්පාදන කරන්න පුළුවන් දේවල් අපේ රට ඇතුළේ නිෂ්පාදනය කර ගත යුතුමයි. එහෙම නොකර අපි හැම දේම ආනයනය කළොත් අපට විදේශ විනිමය ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වෙනවා වාගේම, අපේ නිෂ්පාදන දියුණු නොවීම නිසා අප ආර්ථික වශයෙන් තවත් අගාධයට යන ප්‍රවණතාව වැඩි වෙනවා. එම නිසා නිෂ්පාදනය වැඩි කරලා ආනයන සීමා කිරීමටයි අප කටයුතු කරන්න ඕනෑ. ඊට අවශ්‍ය දැවැන්ත පියවරක් ලෙස මෙරට තුළ මෝටර් රථ සහ රබර් නිෂ්පාදන සඳහාම වෙන් වූ කාර්මික කලාපයක් ආරම්භ කිරීමට රුපියල් මිලියන 1,500ක් මෙවර අය වැයෙන් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. ඇත්තටම ඒ වාගේ විශේෂිත වූ නිෂ්පාදනවලට අපි යොමු වෙන්න ඕනෑ. හැම රටකම නිපදවන කරන භාණ්ඩ නිෂ්පාදනය කරලා අපට ලෝක වෙළෙඳ පොළේ තරග කරන්න බැහැ. විශේෂයෙන්ම අපි ස්වාභාවික රබර් නිෂ්පාදනය කරන රටක් විධියට අපට ඒ නිෂ්පාදනවලට හොඳ මිලක් ලබා ගන්නත් පුළුවන්. අපි ගොඩක් වෙලාවට කරන්නේ ඒවා අමු ද්‍රව්‍ය විධියට පිට රටවලට පටවන එක විතරයි. අපි ඒවායෙන් නිෂ්පාදන කරනවා බොහොම අඩුයි. ඒ නිසා විශේෂයෙන්ම රබර් ආශ්‍රිත නිෂ්පාදන දියුණු කරලා, ඒ හරහා වෙළෙඳ පොළක් හදලා, ඒකෙන් කර්මාන්ත දියුණු කරන්න අපි සැලසුම් කර තිබෙනවා. අපි විශේෂයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ පමණක් ආනයනය කිරීම අරමුණු කරගෙන තමයි ඒ කටයුත්ත කරලා තිබෙන්නේ.

ඊළඟට, මගේ විෂයයට අදාළ බලශක්ති ක්ෂේත්‍රය ගන්නම්. බලශක්ති ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 21,140ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒක ඇත්තටම ඉතා වැදගත් දෙයක්.

එහිදී ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් ජාලය හා කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 7,670ක් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම නගරවල ඇති වෙලා තිබෙන ලොකුම ගැටලුවක් තමයි, සන අපද්‍රව්‍ය බැහැර කිරීම. ඒ සඳහා අපි කොළඹ නගරය විතරක් අරමුණු කරගෙන සන අපද්‍රව්‍ය බලශක්තිය බවට පත් කිරීමේ බලාගාරයක් ස්ථාපනය කිරීම සඳහා රුපියල් මිලියන 1,200ක් ද, රජයේ ගොඩනැඟිලි අඩු ආදායම්ලාභී නිවාස, ආගමික ස්ථාන, ජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා සූර්යකෝෂ කට්ටල සැපයීම සඳහා රුපියල් මිලියන 290ක් ද, විශේෂයෙන්ම උතුරු පළාතට ආසන්න ඩෙල්ෆ්ට්, අනතනිව්, නයිනතිව් දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 3,000ක් ද, ලංකා විදුලිබල මණ්ඩලයේ ධාරිතාව සංවර්ධනය සඳහා රුපියල් මිලියන 290ක් ද වෙන් කර තිබෙනවා.

විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේද අපි පැහැදිලිව සඳහන් කර තිබෙනවා, බලශක්ති ක්ෂේත්‍රය තුළින් න්‍යාෂ්ටික බලශක්ති නිෂ්පාදනයට යොමු විය යුතුයි කියලා. ඇත්තටම ඒ සඳහා අවශ්‍ය පසුබිම හදා ගන්න අවුරුදු 15ක් විතර අපට ගත කරන්න වෙයි. ඒක අරමුණු කරගෙන දැනට ලංකාවේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ධාරිතාව සහ ශක්‍යතාව පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 160ක් ද, කෙරවලපිටිය සිට කොළඹ වරාය අතර දෙවන සම්ප්‍රේෂණ මාර්ගය ස්ථාපනය කිරීම සඳහා රුපියල් මිලියන 7,000ක් ද වෙන් කර තිබෙනවා.

ඇත්තටම මේ අය වැයෙන් අපි බලාපොරොත්තු වන දෙයක් තමයි, රටේ මානව සම්පත දියුණු කිරීම, සෞඛ්‍ය සේවය නහා සිටුවීම, අධ්‍යාපනය දියුණු කිරීම. මොකද, අධ්‍යාපනය දියුණු කිරීමෙන් තමයි අපේ කර්මාන්තවලට, අපේ ව්‍යාපාරවලට අපේ සේවා සපයන්න අපට හොඳ වෘත්තිකයෝ ටිකක් හදාගන්න පුළුවන් වෙන්නේ. අපි ඇත්තටම ඒකට මේ අය වැයෙන් ලොකු තැනක් දීලා තිබෙනවා. ඇත්තටම ඒ ටික තමයි මූලික අඩිතාලම වෙන්නේ. ඒ තමයි, අපේ ආණ්ඩුවේ පළමුවෙනි වසර තුළ අපි ඇති කර ගන්න තහවුරුව. ඒ හරහා තමයි අපට ඉතුරු සංවර්ධන ව්‍යාපෘතිවලට යන්න පුළුවන් වෙන්නේ. මොකද, අපේ වෘත්තිකයෝ ගොඩක් දෙනෙක් දැන් රට හැර ගිහිල්ලා තිබෙනවා. එතකොට අපට වෘත්තිකයෝ ලොකු ප්‍රමාණයක අඩුවක් තිබෙනවා. ඒ හින්දා තමයි අපි මේ අය වැයෙන් ඒ තැන්වලට විශේෂ තැනක් දීලා කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි හැමෝටම පඩි වැඩි කරලා, taxes අඩු කරලා, tax level එක උඩට අරගෙන අවශ්‍ය පහසුකම් ටික දීලා තිබෙන්නේ. ඇත්තටම ඒකෙන් තමයි රට ඉස්සරහට ගන්න නිෂ්පාදනය වැඩි කර ගන්න, කර්මාන්ත දියුණු කර ගන්න අපට පුළුවන් වෙන්නේ. බලශක්තිය ප්‍රධාන industry එකක් විධියට නොසලකා, ප්‍රධාන industry එකක් විධියට භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි අපි අවධානය යොමු කර, ඒකට අවශ්‍ය supportive industry එකක් විධියට බලශක්ති ක්ෂේත්‍රය දියුණු කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ සඳහා අපි අය වැයෙන් වෙන් කළ මුදල්වලට අමතරව විදේශ ආධාර, ප්‍රදාන මත ගොඩක් සැලසුම් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම දැන් ඒවා ආරම්භ කරලාත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැයෙන් අපි ඇත්තටම බලාපොරොත්තු වෙන්නේ, අපේ ප්‍රතිපත්ති සංග්‍රහය බලාත්මක කරලා, ඒකට හොඳ අඩිතාලමක් දාලා ඉස්සරට ගෙනියන්න. ඇත්තටම අපට විපක්ෂයෙන් ඒ ගැන සාධනීය විවේචනයක් - constructive criticism - නොවෙයි තිබෙන්නේ. ඒගොල්ලන් පරණ දේවල් ඔක්කොම ඇදලා ගන්නවා අපි මෙහෙමයි හිතුවේ, අරකයි, මේකයි කියලා. හැබැයි, ඒගොල්ලන්ට මේ ගැන හරියට විවේචනයක් කරන්නවත් අපහසු හින්දා වෙන්න ඇති දැන් ගොඩක් අය මඟ ඇරලා ඉන්නේ. මෙච්චර කල් කරපු විධියට නොවෙයි, දූෂණය, නාස්තිය දැනටමත් අපි අඩු කරගෙන යනවා. ඒකෙන් තමයි අපි ජනතාවට සහන දෙන්නේ, රටේ සංවර්ධනයට මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඇත්තටම මාස 3ක් ඇතුළත ඒකට අවශ්‍ය මාර්ගය අපි හදාගෙන

[ගරු කුමාර ජයකොඩි මහතා]

තිබෙනවා. ඉතුරු කටයුතු ඉදිරියේදී දැඩිව ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සැලසුම් සකස් කරගෙන යනවා. ඒ නිසා අපි සියලු ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ, ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයෙන් ගමේ පාලනයද ජාතික ජන බලවේගය වෙත ලබා දෙන ලෙසයි. පළාත් පාලන ආයතනවල බලයත් ජාතික ජන බලවේගයට ලබා දී මේ අය වැය තුළින් අපි අපේක්ෂා කරන ආර්ථික, සමාජයීය මෙන්ම සංස්කෘතික පුනරුදය ළඟා කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. අපි හිතනවා, ජනතාව ඒක තේරුම් අරගෙන තිබෙනවා කියලා.

අද විපක්ෂයේ බොහෝදෙනා media showsවලට විතරක් එනවා. ඒගොල්ලෝ වෙන කිසිම දෙයක් කථා කරන්නේවත්, මේවායේ අඩු පාඩුවක් පෙන්වා දෙන්නේවත් නැහැ. රටේ ජනතාව ලොකු අවදානමක් අරගෙන අපට බලය දුන්නා වාගේම, ගම් මට්ටමින් පළාත් පාලන ආයතනවල බලයත් ලබා දීලා, තහවුරු වූ ඒ බලයක් එක්ක ඉදිරි කටයුතු කරමින් ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන්න අපට අවස්ථාව උදා වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් பிரதித් தவிசாளர් அவர්கள්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.37]

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் வිதான)
(The Hon. Jagath Vithana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ වෙලාවේ අය වැය ලේඛනය ගැන අදහස් ප්‍රකාශ කරන්න කලින් මේ කාරණය කියනවා. වත්මන් ජනාධිපතිවරයා සහ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් නිතර කියන දෙයක් තමයි, අපි භාර ගත්තේ බංකොලොත් රටක් කියන එක. එහෙම නේ, කියන්නේ. නමුත්, "අය වැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025" කියන පොතේ සඳහන් වෙනවා මෙන්න මෙහෙම දෙයක්. මම එය කියවන්නම්:

> "2023 වසරේ දෙවන භාගයේ සිට ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟ 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සාධනීය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2023 වසරේ තුන්වන කාර්තුව තුළ වාර්තා වූ සියයට 1.6ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ආර්ථිකය සියයට 5.5කින් වර්ධනය විය."

මේ කියන්නේ, "අය වැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025" වාර්තාවේ.

ඊළඟට, මට පැහැදිලි කරගත යුතු කාරණයක් තිබෙනවා. මම ඔබතුමන්ලාගෙන් අහනවා. අදාළ ඇමතිවරු ඉන්නවා නම් මට උත්තරයක් දෙන්න. මට මේක අහන්න අයිතියක් තිබෙනවා සහ මට දැන ගන්නත් අවශ්‍යතාව තිබෙනවා.

Budget Speech - 2025හි, Annexure IV එකේ VAT arrears, නොගෙවූ VAT පිළිබඳව මෙන්න මෙහෙම කොටසක් තිබෙනවා: "Value Added Tax Arrears as per records of Commissioner General of Inland Revenue in respect of projects carried out by construction contractors of Tsunami projects, will be written off." සුනාමි ව්‍යාපෘතිවල ඉදිකිරීම් කරපු සමාගම්වල බදු කපා හරිනවා කියනවා. හැබැයි, මේ ප්‍රකාශය ඉංග්‍රීසියෙන් විතරයි තිබෙන්නේ.

වත්මන් ජනාධිපතිතුමා මේ කාලයේ කැබිනට් ඇමතිවරයෙක්. කවුද මේ සමාගම්වල අයිතිකාරයන්? අපට මේ පිළිබඳව සාධාරණ සැකයක් තිබෙනවා. මට තිබෙනවා, ඒක දැන ගැනීමේ අයිතියක්.

මේ බදු කපා හරින්න තීරණය කරලා තිබෙනවා කියලා 2025 අය වැය වාර්තාවේ තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநිதி) ஹர்ஷண சூரியப்பெருම)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநිதி) ஹர்ஷண சூரியப்பெருම)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මම ඒ ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. සුනාමි ව්‍යසනයෙන් පස්සේ ලංකාවට අතිවිශාල ආධාර ප්‍රමාණයක් ලැබිලා, රට නැවත ගොඩනඟන්න ඒ පැමිණි පුද්ගලයන්ගෙන් charge කරලා තිබෙන tax එකෙන් කොටසක් arrears වෙලා මේ වෙනකොට අවුරුදු ගණනාවක් ගත වෙලා තිබෙනවා. ඒකෙන් වෙලා තිබෙන්නේ dispute එකක් විතරයි. සුනාමියන් පසු ඒ වැඩ පිළිවෙළින් රට ගොඩ දමන්න ආපු පිරිසකගේ බදුවලින් කොටසක් තමයි ඒ මන්ත්‍රීතුමා කියපු කාරණයේ සඳහන් වෙන්නේ. ඒවා recover වෙන්නේ නැතුව වසර ගණනක් dispute වෙමින් තිබෙනවා. ඒකට විසඳුමක් විධියට තමයි මේ යෝජනාව කරලා තිබෙන්නේ. එහෙම නැතුව මේක ව්‍යාපාරිකයන්ට බදු සහන දීමක් නොවෙයි. මම ඔබතුමාට එය පැහැදිලි කරනවා.

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத් வිதான)
(The Hon. Jagath Vithana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒවා ආයතනද, නැත්නම් පුද්ගලයන්ද? අපට ඒක දැනගන්න පුළුවන්ද ඉදිරියේදී?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநිதி) ஹர்ஷண சூரியப்பெருම)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ඒ පිළිබඳව දැනුවත් කරන්නම්.

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத් வිதான)
(The Hon. Jagath Vithana)
ඒ සහනය කොපමණ මුදලක්ද? වටිනාකම කොච්චරද?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநිதி) ஹர்ஷண சூரியப்பெருම)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව දැනුවත් කරන්න පුළුවන්. මම පැහැදිලි කළා වාගේ මේක පුද්ගලයෙක් ඉලක්ක කරගෙන, ආයතනයක් ඉලක්ක කරගෙන ලබාදෙන සහනයක් නොවෙයි.

සුනාමි වැඩ පිළිවෙළේදී රට නැවත ගොඩනැඟීම සඳහා දායක වෙලා, විදේශවලින් ආධාර ගෙනැල්ලා, රටේ වැඩකටයුතු කරපු පිරිසට, ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, ආම්පන්න, යන්ත්‍ර සූත්‍ර ගෙනාපු වෙලාවේ ඒවාට charge කරපු taxes කිහිපයක් තිබෙනවා, අය නොවී. ඒ අය මේ රට වෙනුවෙන් කරපු සේවය වෙනුවෙන් තමයි මේ සහනය දීලා තිබෙන්නේ.

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

මොකද, මම මේ වාර්තාව බලාගෙන කථා කරන්නේ VAT සහනය අපේ ජනතාවට ලැබුණේ නැති නිසායි. මාලිමා ආණ්ඩුව, NPP ආණ්ඩුව පොරොන්දු වුණා, වැට් සහනය ලබා දීලා ජීවන බර අඩු කරන්න; බඩු මිල අඩු කරන්න; පොහොර මිල අඩු කරන්න. නමුත් මේ අය වැය ලේඛනයේ කිසිම තැනක එය සඳහන් නොවීම, ඒ වාගේ ප්‍රකාශයක් මේ අය වැයේ සඳහන් නොවීම නිසා තමයි මට පුදුම හිතුනේ, ඒ වාගේ දෙයක් කොහොමද සිද්ධ වුණේ කියලා. මේ සම්බන්ධ ගණනය කිරීම් කළ ඒ විශේෂිත පුද්ගලයෝ කවුද කියලා ඉදිරියේදී අපට දැනගන්න ලැබෙයි. ඒ එක්කම මට කියන්න තිබෙන්නේ පහළට ගිහිල්ලා බැලුවොත්, ඒ කියන්නේ සමාජයට ගියොත්, බිම් මට්ටමට ගියොත්, ඇත්ත වශයෙන්ම ජීවත් වෙන්න අමාරුයි. බඩු මිල වැඩියි. මිනිස්සු පුදුමාකාර විධියට අසරණ වෙලා ඉන්නේ. ඒක අපි සියලුදෙනා පිළිගන්න ඕනෑ. කොයි ආණ්ඩුව තිබුණත් බිමේ ඇත්ත තමයි ඒක.

දැන් මේ දවස්වල ලොකු භීතිකාවක් ඇති වෙලා තිබෙනවා. හැමදෙනාම ඉන්නේ බියපත් වෙලා. ජාතික ආරක්ෂාව ගැන මම කියන්න යන්නේ නැහැ. මීට පෙර කථා කළ මන්ත්‍රීතුමා කියපු එකම මම කියනවා නොවෙයි. මම ඒ ගැන හොඳට අත්දැකීම් ලබපු පුද්ගලයෙක්. මට පාතාලයෙන් වෙඩි තියලා දැනට අවුරුදු 22ක් වෙනවා. ඒ වෙඩි උණ්ඩ මගේ ශරීරයේ එක පැත්තකින් ඇතුළු වෙලා අනෙක් පැත්තෙන් ආවා. ඒ වෙඩි තියපු 9 mm උණ්ඩ පොලීසියෙන් සොයා ගත්තා; T56 අල්ලා ගත්තා. මම නාවික හමුදාවේ හිටපු නිසා එදා face to face ගහලා ජීවිතය ආරක්ෂා කර ගත්තා. අදටත් ඒ වෙඩි තියපු පුද්ගලයෝ නිදැල්ලේ ඉන්නවා. අධිකරණ ඇමතිතුමා දැන් සභාවේ හිටියා නම් හොඳයි. අධිකරණ පද්ධතියේ ප්‍රමාදය නිසා, අවුරුදු 22ක් ගත වෙලාත් මට වෙඩි තියපු අය නිදැල්ලේ ඉන්නවා. මට පේන්න ඉන්නවා ඒ පාතාල කණ්ඩායම්. එතකොට කෝ ආරක්ෂාව? ඔබතුමන්ලාට තුනෙන් දෙකකටත් එහා ගිය බලයක් තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුවට කියනවා, විශේෂිත වූ අධිකරණයක් හෝ පිහිටුවා, ඒ නඩු කඩිනම් කරන්න කියලා. එහෙම නැත්නම් අවුරුදු හතරක් පහක් ඇතුළතවත් මේ වාගේ මිනී මරන පාතාලය මර්දනය කරන්න කටයුතු කරන්න.

මම පෞද්ගලිකව තවත් යෝජනාවක් කරනවා. සමහර විට ඊළඟ බිල්ල මම වෙන්න පුළුවන්. මම පෞද්ගලිකව යෝජනා කරනවා, මිනී මරලා ඔප්පු වුණොත් අනිවාර්යයෙන් මරණීය දණ්ඩය නියම කළ යුතුයි කියලා. එහෙම නොකර මේ රට මුදා ගන්න බැහැ. මම ඒක වගකීමෙක් කරන ප්‍රකාශයක්. අපි මිනී මරන්න දීලා ශබ්ද නොකර ඉන්නේ ඇයි? හැම ජනාධිපතිවරයෙකුම මරණීය දණ්ඩනය දෙන්න කියලා අත්සන් කරන්නේ නැතිව ඉන්නවා. ඒක අත්සන් නොකිරීම තුළ මේ රටේ පාතාල කණ්ඩායම් බිහි වෙනවා, මිනී මරන්න භය නැති වෙනවා. හරියට සතුන් ඝාතනය කරනවා වාගේ මිනිස්සු මහ මහ ඝාතනය කරනවා. දැන් ඝාතන කීයක් සිද්ධ වෙලා තිබෙනවාද? ඊයේ පෙරේදා ඝාතන කීයක් සිද්ධ කළාද? මගේ ජීවිතය නැති වුණත්, ඊළඟ බිල්ල මම වුණත්, මම වගකීමෙන් යුතුව ඒ ඉල්ලීම කරනවා. මම පාතාලයේ ඉලක්කයක් වෙලා තිබෙන මනුස්සයෙක්. මම ව්‍යාපාරිකයෙක්. මම කප්පම් දෙන්නේ නැහැ. ඒක තමයි මා ඉලක්ක වෙලා තිබෙන්නේ. මම අවුරුදු 22ක් තිස්සේ බලාගෙන ඉන්නවා, සාධාරණය ඉටු වෙනකම්. ඒ කාරණය ආණ්ඩුවකට ලඝු වෙන්නේ නැහැ; කිසිම ආණ්ඩුවකට ලඝු වෙන්නේ නැහැ. මම කියන්නේ ඔබතුමන්ලාට අසීමිත බලයක් තිබෙන නිසා ඒ කටයුත්ත කරන්න කියලායි.

මම දැන් අස්වැසුම ගැන කථා කරනවා. අපේ සභාපතිතුමා, අගලවත්තේ මන්ත්‍රීතුමා සභාවේ ඉන්නවා. ඔබතුමන්ලා ඩිජිටල්කරණය කරනවා කියනවා. ඒක හැකි ඉක්මනින් පටන් ගන්න. පටන් අරගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි, බැංකුවයි එකට එකතු කරන්න. මොකද දන්නවාද? අස්වැසුම ගන්න අය මාස 10කට, 11කට සැරයක් ගිහිල්ලා අස්වැසුම දීමනාව අරගෙන එනවා. ඒ මනුස්සයාට ලක්ෂ 40, 50, 60 ස්ථිර තැන්පතු ඒ බැංකුවේම තිබෙනවා. ඒ බැංකුවේ නිලධාරීන් මගෙන් අහනවා, "ජගත් මහත්මයා කොහොමද අපි වැඩ කරන්නේ, මේක අසාධාරණයි. අර මනුස්සයා අච්චර ගාණක් ගන්නවා, ස්ථිර තැන්පතුවකුත් තිබියදී අස්වැසුම අරගෙන එළියට බැහැලා යනකොට, අපි කොහොමද වැඩ කරන්නේ? අපෙන් උපයන විට බද්ද කැපෙනවා. අර මනුස්සයා ඒ පහසුකම, රුපියල් 15,000ක් ගන්නවා" කියලා. ඒ නිසා මේ අසාධාරණය නවත්වන්නම ඕනෑ. ඇත්ත වශයෙන්ම අස්වැසුම ලැබෙන්න ඕනෑ මිනිහාට ලැබෙන්න ඕනෑ. ඒක තමයි අපි බලාපොරොත්තු වෙන දේ. ඒ නිසා මෙන්න මේ දේවල් නිවැරදි කිරීම කඩිනම් කරන්න ඕනෑ. අපි මේවා පෙන්වලා දුන්නාට වැඩක් නැහැ, මේවාට හරි උත්තරයක් ලැබෙන්නේ නැත්නම්. අපි මෙන්න මේවා සොයමු. අපි ඒ සඳහා උපරිම දායකත්වය දක්වන්නම්. මම නම් පාර්ලිමේන්තුවට ආවේ කිසිම වරප්‍රසාදයක් ගන්න නොවෙයි. මම ඒක මගේ පළමුවෙනි කථාවේදීම කිව්වා. මගේ ඉලක්ක හැමදේම මම සම්පූර්ණ කරගෙන ඉවරයි. මට මැරෙන්න විතරයි තිබෙන්නේ. කොයි වෙලාවක හරි මැරෙනවා කියලා මම දන්නවා. අපේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කප්පාදු වෙනවා මගේ ඇස් දෙකට දකින කොට මට වේදනාවක් දැනෙනවා. ඒ මගේ වරප්‍රසාද නොවෙයි. විපක්ෂය ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. අපේ මන්ත්‍රීවරුන් අවතක්සේරු කරලා ඉවරයි. හැම තිස්සේම මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ අපේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කපන එක ගැන. මේ සභාවේ අභිංසක මන්ත්‍රීවරුන් කොච්චර ඉන්නවාද? මම ඒ අයගේ නම් කියන්නේ නැහැ. අද ඒ අයට වාහනයක් ගන්න පුළුවන්ද? එහෙම නැත්නම් රජයේ සේවකයෙකුට වාහනයක් ගන්න පුළුවන්ද? මෝටර් සයිකලයක් ගන්න පුළුවන්ද? ත්‍රීවීල් එකක් ගන්න පුළුවන්ද? ත්‍රීවීල් එකක් රුපියල් ලක්ෂ 20යි. "Vezel" එකක් රුපියල් ලක්ෂ 250යි. රජයේ සේවකයෙක් ඒ ගැන හිතන්නේවත් කොහොමද? ඒක නිසා මෙන්න මේවා සාධාරණීකරණය වෙන්න ඕනෑ. අපි අපටම වෛර කරලා වැඩක් නැහැ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ අපි අපටම වෛර කර ගන්නවා. කෑම වේලට පවා. මම ඒක දකිනවා. කමක් නැහැ, අපි සල්ලි දීලා කෑම කන්නම්. ඒ වාගේම රක්ෂණය ගැන කථා වුණා. රක්ෂණය අඩු කරලා දානවා ලු. මට නම් රක්ෂණයෙන් ශත පහක් ඕනෑ නැහැ. මම ගැන නොවෙයි, මම කථා කරන්නේ, අපි සියලුදෙනා වෙනුවෙන්. ඒ රක්ෂණය නවත්වා ගන්න එපා. මේ කාල සීමාවේ මන්ත්‍රීවරුන් කී දෙනෙක් අනතුරුවලට භාජන වුණාද? ඒ මිනිස්සු කොහොමද ඒ මිනිසුන්ගේ ජීවිත බේරා ගන්නේ? ඒක නිසා ඒ පහසුකම් ටික දෙන්න. ඔබතුමන්ලාට නේ වැඩියෙන් ලැබෙන්නේ. අපට වඩා ආණ්ඩු පක්ෂයට නේ වැඩියෙන් ලැබෙන්නේ. අපි ඒ ගැන කථා කරන්න ඕනෑ. මන්ත්‍රීවරුන්ගේ අගය වැඩි වෙන්න ඕනෑ. ඒ කියන්නේ සැප සම්පත් භුක්ති විඳිනවා කියන එක නොවෙයි. මෙන්න මේ ටික තමයි මට කියා ගන්න ඕනෑකම තිබුණේ.

තමුන්නාන්සේලා වරදවා හිතන්න එපා. මම කියන්නේ මේ ප්‍රායෝගික තත්ත්වය. මම දේශපාලනයට ආවේ ප්‍රාදේශීය සභාවේ, පළාත් සභාවේ ඉඳලා. මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ බොහොම දුක්, කරදර මැද්දේ. ඒ වාගේම ලොකු කැපකිරීම් කරලා. මේ අය වැය ලේඛනයේ පඩි වැඩි කිරීම ගැන කිව්වා නේ. පඩි වැඩි කිරීම පිළිබඳව ඇත්තම දත්ත ටික එන්න නම් ලබන මාසයේ පඩිය රාජ්‍ය සේවකයන් අතට එන්න ඕනෑ. කොයියම්

[ගරු ජගත් විතාන මහතා]

ආකාරයකටවත් අවුරුදු තුනකට මේ වැටුප මීසක් අවුරුදු තුනකට පඩි වැඩිවෙන්නේ නැහැ කියන එක තමයි මේ කියන්නේ. මහින්ද සිරිවර්ධන තමයි මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා. එතුමා නේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත් අය වැය හැදුවේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් අය වැය හැදුවේ එතුමා. අද අනුර දිසානායක මැතිතුමාටත් අය වැය හදලා තිබෙන්නේ එතුමා කියලා එතුමාට ස්තුති කළා. හැබැයි, මම එතුමාට කියනවා, "ඔබතුමා අය වැය ලේඛනය හැදුවා. ඔබතුමා වැය හැදුවා, අය හැදුවේ නැහැ" කියලා. කියවලා බලන්න. මම මේක කියවනවා. මට තව කල් ඕනෑ මේක කියවන්න. මේකේ අය නැහැ නේ. වැය නම් හදලා තිබෙනවා. කාටද බැරි වැය හදන්න. ඒ වාගේම අය හදා ගන්නත් ඕනෑ නේ. ඒක නිසා මේ රට යන්නේ කොයි දිශාවකටද කියලා අපට හිතා ගන්න බැහැ.

අපේ ගරු ප්‍රවාහන ඇමතිතුමා හොඳ තීරණයක් අරගෙන තිබෙනවා. මම ඒ ගැන සන්තෝෂ වෙනවා. පෞද්ගලික අංශයේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ මම කටයුතු කරන්නේ. මෙට්‍රෝ සමාගම කියලා පෞද්ගලික බස් සමාගමක් ඇති කරලා සුඛෝපභෝගී බස් රථ 300ක් ළඟදීම ලංකාවට ගෙන්වනවා. ඒවා අවශ්‍ය මාර්ග හතක්, අටක් ගැනත් කිව්වා. ඒ දේවල්වලට අපි උදව් කරනවා. පෞද්ගලික අංශයත්, ලංකා ගමනාගමන මණ්ඩලයත් ප්‍රවාහන කටයුතුවලදී එකට එකතු වෙන්න ඕනෑ. ඉස්සර අවුරුදු ගණනක් වෙනකල් පෞද්ගලික බස්වලටයි, ලංකා ගමනාගමන මණ්ඩලයටයි ඇමතිවරු දෙන්නෙක් හිටියා. අද වනකොට ඒ දෙකටම එක ඇමතිවරයායි ඉන්නේ. අපි ඊට අදාළ කාරක සභාවේ ඉන්නවා. අපි සියලුදෙනාට එකතු වෙලා එතැනදී මේවා කථා කරන්න පුළුවන්. මම දන්නවා, බස්වල ප්‍රායෝගික තත්ත්වය.

ඇමතිතුමාත් බොහොම හොඳට ඇහුම්කන් දෙන ඇමතිවරයෙක් නිසා, මේක ඉතා සාර්ථකව කරගෙන යන්න අපට පුළුවන්. මේ අවස්ථාවේ කාල වේලාව මදි නිසා මම නිහඬ වෙනවා. කියන්න බොහෝ දේවල් තිබෙනවා. අවසාන වශයෙන් මම කියනවා, මිනිසුන්ට සහන දෙමු; බඩු මිල අඩු කරමු; පොහොර මිල අඩු කරමු කියලා. තේ ගොවියා ගැන අනුකම්පා කරන්න; පොහොර සහනාධාරය දෙන්න. ඒක අපේ පැත්තල අයට තිබෙන ලොකු අඩු පාඩුවක්. කළුතර දිස්ත්‍රික්කයේ අපේ මිනිස්සු ජීවත් වෙන්නේ වැවිලි ආර්ථිකයෙන්. ඒ ගොල්ලන්ට කිසිම සහනයක් නැහැ. ඒ ගොල්ලන් වෙනුවෙන් මොනවා හරි කරන්න කියලා යෝජනා කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නන්දන පද්මකුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
ඛිනා විදුක්කප්පට්ටු ඒற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 3.50]

ගරු නන්දන පත්මකුමාර මහතා
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ විවිධ ආගම් තිබෙනවා. ඒ සෑම ආගමකම අවසාන බලාපොරොත්තුව, අවසාන අරමුණ තමයි, යහපත් මිනිසෙක්, යහපත් සමාජයක් ගොඩනැඟීම. ඒ අතරින් අපට වඩාත්ම සමීප බුදු දහම විශේෂයෙන්ම මිනිසාගේ නිරෝගිභාවය, යහපැවැත්ම, සතුට හා සැනසුම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළා. ඒ සියල්ල පදනම් වෙච්ච ලාංකීය සමාජය වෙනස් මාවතකට යොමු කරන්න, වෙනස් මාවතකට රැගෙන යන්න තමයි, "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ඉලක්ක කර ගත් අය වැයක් ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මුදල් ඇමතිවරයා හැටියට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

රටේ ජනතාව දැන් දැස් දල්වා බලාගෙන ඉන්නේ ඇයි? ඒ, රට ඉදිරියට යන කල්. රටේ ජනතාව දැන් බලාපොරොත්තු තබාගෙන බලාගෙන ඉන්නේ ඇයි? ඒ මේ රට සංවර්ධනය කරා ගමන් කරයි කියලායි. අන්න එහෙම රටේ ජනතාව බලාපොරොත්තු තබාගෙන අරමුණක් ඇතිව වැඩ කරද්දි, බලාපොරොත්තු තබාගෙන ඉදිරියට යද්දි, අපේ රටේ විපක්ෂය දැන් කෙඳිරිගාන්න පටන් අරගෙන තිබෙනවා. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි, එතුමන්ලා බය වෙලා ඉන්න නිසායි. මොකද, එතුමන්ලා ජනාධිපතිවරණය පරාදයි, ඉන් පසුව තිබුණු මහ මැතිවරණයත් පරාදයි. ඉදිරියේදී පවත්වන්න නියමිතයි, පළාත් පාලන මැතිවරණය. එතුමන්ලා දන්නවා, මේ අය වැයෙන් ජනතාවට ලබා දෙන සහනත්, ඒ වාගේම රටේ ජනතාව තුළ රජය කෙරෙහි තිබෙන විශ්වාසයත් නිසා රටේ ජනතාව නැවත නැවතත් විපක්ෂය පරාජය කරවන බව. ඉදිරි පළාත් පාලන මැතිවරණය තුළින් එතුමන්ලා කුණීත වනවා කියලා දන්න නිසා තමයි දැන් එතුමන්ලා හයියෙන් සද්දෙ දාලා කෙඳිරිගාන්න පටන් අරගෙන තිබෙන්නේ. එතුමන්ලා ඒ සද්දෙ දාන්නේ, කෙඳිරිගාන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, එතුමන්ලා මෙතැන කෑ ගහන මොකක් හරි කෑල්ලක් හවසට TV එකේ දා ගන්නයි. ඔය සද්දෙයි, කෙඳිරිල්ලයි අපට හොඳටම තේරිලා තිබෙන්නේ. රටේ ජනතාව දන්නවා, දැන් විපක්ෂයට අත් වෙලා තිබෙන ඉරණම. විපක්ෂයට අත් වෙලා තිබෙන ඉරණම පිළිබඳව රටේ ජනතාවට වාගේම අපටත් පුංචි දුකක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුදුන් වහන්සේ දේශනා කරලා තිබෙනවා, "ආරෝග්‍ය පරමා ලාභා සන්තුට්ඨි පරමං ධනං - විස්වාසා පරමා ඤාති නිබ්බානං පරමං සුඛං" කියලා. මිනිසාගේ ලොකුම ලාභය තමයි, නිරෝගිභාවය. යහපත් සමාජ සංවර්ධනයක් සඳහා නිරෝගි බව මොන තරම් වැදගත් ද කියලා අපි දන්නවා. ඒ නිසා තමයි සුවපත් සමාජයක්, නිරෝගි දිවි පෙවෙතක් පදනම් වුණු සෞඛ්‍ය ක්ෂේත්‍රයට මේ අය වැය තුළ විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙන්නේ. අපි දන්නවා, පසුගිය කාලයේ විපක්ෂය විශාල සද්දයක් දැම්මා, අපේ රටේ දරුවන් වෙනුවෙන් තිබෙන, දරුවන්ගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම වෙනුවෙන් තිබෙන ත්‍රිපෝෂ කම්හල වහනවා

කියලා. ත්‍රිපෝෂ කමිහල වහනවා වෙනුවට ත්‍රිපෝෂ ඇතුළු පෝෂ්‍යදායී ආහාර ලබා දීමේ වැඩසටහන් සඳහා රුපියල් බිලියන 12.5ක විශාල මුදල් ප්‍රමාණයක් මෙවර අය වැයෙන් අපි වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන විශාල ගැටලුවක් තමයි, බෝ නොවන රෝගීන් ඉහළ යෑම. මේ වන විට සමාජයේ වැඩිහිටි ජනගහනය විශාල ලෙස වැඩි වෙලා තිබෙනවා. එම වැඩිහිටි ජනගහනයට බහුලව තිබෙන රෝග තමයි, බෝ නොවන රෝග. බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කිරීම වෙනුවෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල මුදල් ප්‍රමාණයක් මේ අය වැය තුළින් වෙන් කරලා තිබෙනවා. "සුවසැරිය" ගිලන්රථ සේවයටත්, රෝහල් මෙහෙයුම් කම්ටු සඳහාත් සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල මුදල් ප්‍රමාණයක් අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. මේවා ඇහෙනකොට, මේවා දකිනකොට තමයි අද විපක්ෂයට සද්ද දාන්න, කෙඳිරිගාන්න වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව තුළ නිරෝගිකම, සතුට සහ විශ්වාසය ගොඩනැඟුණොත් තමයි රටකට ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. අද රටේ සිටින කුඩා දරුවාගේ සිට වැඩිහිටි මිනිසා දක්වා සතුටින්, විශ්වාසයෙන් තමයි ජීවත් වෙන්නේ. නිරෝගිකම, සතුට සහ විශ්වාසය වාගේම හොඳ අධ්‍යාපනයක් ලබා දීමේ අදහසින් තමයි මෙම අය වැය තුළින් අපි විශාල මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනයට වෙන් කළේ. පෙර පාසලේ සිට පාසල් අධ්‍යාපනය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය හා පල්ලියේ, පන්සලේ හා කෝවිලේ දහම් අධ්‍යාපනය තුළින් ආකල්ප සංවර්ධනයෙන් යුතු, මනුෂ්‍යත්වයේ ගුණ නැණ බලයෙන් යුතු මිනිසෙක් රටට, සමාජයට නිර්මාණය කිරීම සඳහා තමයි අපි මෙම අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් අධ්‍යාපන ක්ෂේත්‍රයට වෙන් කළේ.

පසුගිය කාලය තුළ අපේ රටේ මිනිසුන් තමන් ගැන විතරයි හිතුවේ. තමන්ට ලැබෙන දේ ගැන විතරයි හිතුවේ. හැම තිස්සේම හිතුවේ, හැම තිස්සේම උත්සාහ කළේ, අනෙකා පරාජය කරලා තමන් දිනන්නයි. අන්න එවැනි සමාජයක් තමයි අපි දැන් වෙනස් කරලා වෙනස් මාවතක් කරා රැගෙන යන්න උත්සාහ දරමින් ඉන්නේ. අපට ඕනෑ මේ රටට ආදරය කරන මිනිසෙක්. සතා සීපාවාට, ඇළට දොළට, ගහට ආදරය කරන දරුවෙක්, මිනිසෙක් අපට ඕනෑ. ඒ අරමුණින් අපි මේ රට වෙනස් දිශාවකට ගෙන යන්න උත්සාහ දරන මොහොතේ විපක්ෂය බය වෙලා ඉන්නවා කියන එක අපි දන්නවා. මේ සියලු වැඩ පිළිවෙළ එක්ක බද්ධ වුණු Clean Sri Lanka වැඩසටහන අද අපේ රටේ සමාජයේ බොහෝදෙනා භාර ගනිමින් ඉන්නවා. පසුගිය ආණ්ඩුත් විශේෂ වැඩ පිළිවෙළ ගෙනාවා. ඒ බොහෝ දේ සමාජයට ඉදිරිපත් කළා. නමුත්, සමාජය ඒවා භාර ගත්තේ නැහැ. අද Clean Sri Lanka වැඩ පිළිවෙළ සමාජයේ සෑම කොටසක්ම භාර ගනිමින් ඉන්නවා. මේ Clean Sri Lanka වැඩ පිළිවෙළ යටතේ බොහෝ පන්සල්වල, පාසල්වල, රෝහල්වල හා රාජ්‍ය ආයතනවල අද බොහෝ වෙනස්කම් සිදු වෙමින් පවතින බව අපි දන්නවා. ඒ වාගේම අද රටේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ, ආර්ථික ක්ෂේත්‍රයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ, සංස්කෘතික ක්ෂේත්‍රයේ වෙනස් විධියේ ඉදිරි වැඩ පිළිවෙළ සකස් වෙමින් තිබෙනවා. අපට මතකයි, පසුගිය දවස්වල Clean Sri Lanka වැඩ පිළිවෙළ යටතේ රට වටා තිබෙන මුහුදු වෙරළ සුද්ධ පවිත්‍ර කළ ආකාරය. ඒ සුද්ද පවිත්‍ර කළා වාගේම ඒ තැන් ඒ විධියටම ඉදිරියට පවත්වාගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළත් අපි සකස් කරලා තිබෙනවා. අද අපේ රටේ ජනතාවට වාගේම රටට එන විදේශිකයන්ටත් Clean Sri Lanka වැඩසටහන නිසා ලස්සන මුහුදු වෙරළක් නරඹන්න පුළුවන් වෙලා තිබෙනවා; ලස්සන මුහුදු වෙරළක ඇවිදින්න අවස්ථාව ලැබිලා තිබෙනවා.

ඒ සියලු වැඩ පිළිවෙළ අතරේ අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා, "එක මිටට ගොවි බිමට" කියන කෘෂිකාර්මික වැඩ පිළිවෙළට. අපි දන්නවා, අපේ රටේ කෘෂි කර්මාන්තයට විශේෂ තැනක් දීලා ඉහළට ඔසවා තබන්න ඕනෑ බව. අපි දන්නවා, අද අපේ රටට අවශ්‍ය කිරි ටික, මස් ටික, සහල් ටික අපේ රටේ නිෂ්පාදනය වෙන්නේ නැති බව. රටක් හැටියට ගත්තාම පසුගිය කාලය පුරාම මේ රටේ පාලකයෝ කෘෂි කර්මාන්තය අත්හැරියා මිසක් ඒ ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වැඩසටහන් හැදුවේ නැහැ. ඒ නිසා දවසින් දවස ගොවිබිමෙන් ගොවියා ඇත් වුණා මිසක්, ගොවියාගේ දරුවා ගොවිබිමෙන් ඇත් වුණා මිසක් ක්ෂේත්‍රයට අලුතින් කෙනෙක් එකතු වුණේත් නැහැ; කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය ඉදිරියට ගියේත් නැහැ. ඒ නිසා අපට විශාල වැඩ පිළිවෙළක් තිබෙනවා, කෘෂිකර්ම ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යන්න. ඒ නිසා තමයි අපි කෘෂිකර්ම ක්ෂේත්‍රයේ "එක මිටට ගොවි බිමට" කියන වැඩසටහන පටන් අරගෙන ඉදිරියට යමින් තිබෙන්නේ.

ඒ වාගේම මේ රටේ සියලු ක්ෂේත්‍ර සංවර්ධනය කරන ගමන් විශාල වෙනසක් ඇති කිරීම සඳහා ආකල්ප සංවර්ධනය පිළිබඳවත් අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ බොහෝ සේවාවල තිබෙන තත්ත්වය පිළිබඳව. අපි දන්නවා, ආයතනයකට ගියාම සුහදභාවයක් නැහැ; කාර්යක්ෂමභාවයක් නැහැ කියා. රස්තියාදුව තමයි ඒ බොහෝ තැන්වල තිබෙන්නේ. අන්න ඒ නිසා තමයි අපි ආකල්ප සංවර්ධනය තුළින් අනෙකුත් සියලු වැඩසටහන් සමඟ බද්ධ වෙමින් කටයුතු කරන්නේ.

අනුර කුමාර දිසානායක සහෝදරයා කිව්වා වාගේ අපි මේ උත්සාහ දරන්නේ වෙන කිසිවකටත් නොවෙයි, ලෝකයේ දියුණු රටක් බවට අපේ ලංකාව පත් කරන්න නොවෙයි, ලෝකයේ පොහොසත් රට බවට අපේ ලංකාව පත් කරන්නයි. ඒ නිසා මේ සෑම වැඩ පිළිවෙළක් තුළම තිබෙන්නේ, අන්න ඒ පොහොසත් රට ගොඩනැඟීමේ වැඩ පිළිවෙළයි. අන්න ඒ පොහොසත් රට ගොඩනඟන ගමන් අපේ රටේ ජනතාවගේ ජීවිත වෙනස් කරන්න, ජීවිත ලස්සන කරන්න, ජීවිත සුන්දර කරන්න අපි මේ සෑම වැඩසටහනක්ම ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා මේ අය වැය තුළ වෙන්වෙලා තිබෙන සියලු මුදල් මේ වසර තුළ කාර්යක්ෂම ලෙස යොදවලා මිනිසුන්ගේ ජීවිත වෙනස් කරන්න අවශ්‍ය සියලු කටයුතු අපි සූදානම් කරලා තිබෙනවා.

අපි දන්නවා, ඉදිරියේදී පළාත් පාලන මැතිවරණය පැවැත්වෙන බව. ඒ පළාත් පාලන මැතිවරණයේදී අපි අනිවාර්යයෙන් විශාල ජයග්‍රහණයක් ලබනවා. ඒ ජයග්‍රහණය ලබන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, රටේ ජනතාව මේ ආණ්ඩුව කෙරෙහි තබා තිබෙන විශ්වාසය, මේ වැඩ පිළිවෙළ කෙරෙහි තබා තිබෙන විශ්වාසය නිසාය කියලා අපි දන්නවා. මේ සෑම වැඩ පිළිවෙළක් තුළම, රට ගොඩනැඟීමේ සෑම වැඩ පිළිවෙළක් තුළම අපි අපේ රටේ දරුවන්, කාන්තාවන්, වැඩිහිටියන් ඇතුළු සියලුදෙනා කෙරෙහිත්, සියලු අංශ කෙරෙහිත් අවධානය යොමු කරන්න කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, ක්‍රීඩා ක්ෂේත්‍රය ඉහළ තැනකට ගෙනෙන්න අපට පුළුවන් කියලා. පසුගිය කාලය තුළ අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳව ලොකු විශ්වාසයක් තිබුණේ නැහැ. මැව් එකක් ගහන්න යනකොට, අනිවාර්යයෙන් ඒක අපි පරදිනවා කියන විශ්වාසය තමයි ජනතාව තුළ ගොඩනැඟිලා තිබුණේ. අපි කුඩා කාලයේ ටීවී එකේ මැව් එකක් බැලුවේ ගොඩක් ආශාවෙන්. විශේෂයන්ම අපි ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරපු රටක්. පසුගිය කාලය තුළ වුණේ මොකක්ද? ඒ සියලු ක්‍රීඩාවලින් ජනතාව ඇත් වුණා. ඒ වාගේම ක්‍රීඩකයාත් ක්‍රීඩාවෙන් ඇත් වුණා. ඒ නිසා ඒ

[ගරු නන්දන පත්මකුමාර මහතා]

සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවම දැන් අපි අවධානය යොමු කරලා තිබෙනවා. ඒ සියලු ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරලා, කෘෂි කර්මාන්තය, සෞඛ්‍යය, අධ්‍යාපනය, ක්‍රීඩා ඇතුළු සියලු ක්ෂේත්‍ර ඒකාබද්ධ කරගත් වැඩසටහනක් යටතේ ''පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්'' අනිවාර්යයෙන් ගොඩනඟන බව මේ මොහොතේදී නැවත නැවතත් සිහිපත් කරමින්, මේ රට ගොඩනැඟීම සඳහා මේ රටේ සියලු ජනතාවට ආරාධනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.02]

ගරු කංචන වැලිපිටිය මහතා
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැය දෙවැනි වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ මොහොතේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් ඊට එක් වීමට අවස්ථාව ලැබීම ගැන මම මුලින්ම සතුටු වෙනවා. මොකද, අපේ රට පුනරුදු යුගයක් කරා ගමන් කිරීමේ මූලික අඩිතාලම තමයි අපි මේ අය වැයෙන් දමා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් වාගේම මේ පාර්ලිමේන්තුවෙන් පිටත ඉන්න අයත් විවිධ මත පළ කරන්න පටන් අරගෙන තිබෙනවා. සමහර අය මේ අය වැය රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැයක් කියලා විග්‍රහ කරනවා. ඒ වාගේම ඊයේ මම දැක්කා, පොහොට්ටු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් මේ අය වැය මහින්ද රාජපක්ෂ මහත්තයා කරගෙන ගිය වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යන අය වැයක් කියලා විග්‍රහ කරනවා. මේ අය වැය සම්බන්ධයෙන් විවිධ අයට විවිධ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි, මේ අය වැය අපේ ජාතික ජන බලවේගයේ මංගල අය වැය වාගේම, මේ රට ගොඩනඟන දිශානතිය තීරණය කරන අය වැය හැටියටත් අපි විග්‍රහ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අය වැය ඉදිරිපත් කරනකොට අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මාස පහයි. 2024 සැප්තැම්බර් මාසයේ 21වැනි දා තමයි ජනාධිපතිවරණය තිබුණේ. අද 2025 පෙබරවාරි මාසයේ 22වැනි දා. හරියටම මාස පහයි අද වනකොට ගත වෙලා තිබෙන්නේ, ජනාධිපතිවරණය පවත්වලා. මාස පහක ජනාධිපතිවරයෙක් අපට ඉන්නේ. ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වුවේ 2024 නොවැම්බර් මාසයේ 14වැනි දා. මේ පාර්ලිමේන්තුව පිහිටෙව්වේ 2024 නොවැම්බර් මාසයේ 21වැනි දා. අද 2025 පෙබරවාරි මාසයේ 22වැනි දා. මාස තුනයි මේ ආණ්ඩුවට ගත වෙලා තිබෙන්නේ. ඒ නිසා ජාතික ජන බලවේගයේ අපටම අනන්‍ය වූ වැඩ පිළිවෙළක් එක්ක වැඩ කාලයක් මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න බැරි වුණා. ඒ නිසා 2025 අවුරුද්දේ මේ ඉතුරු මාස 10 තුළ අරගෙන යන වැඩ පිළිවෙළ තුළින් තමයි ජාතික ජන බලවේගයේ අපේම වූ වැඩ පිළිවෙළක් අපට අරගෙන යන්න පුළුවන් වෙන්නේ. ඒ අනුව, මේ ඉදිරිපත් කරලා තිබෙන අය වැය ඉදිරි කාලය සඳහා පුරෝකථනය කරලා හදපු අය වැයක්. මේ අය වැය උපයෝගි කර ගනිමින් අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා, 2026 අවුරුද්දට ඉදිරිපත් කරන අය වැයේදී තමයි ජාතික ජන බලවේගයේ අපේ ප්‍රතිපත්තිවල, වැඩ පිළිවෙළට අනන්‍ය අය වැයක් අපට ඉදිරිපත් කර ගන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කොහොම වුණත් අපේ රටේ මොන දුෂ්කරතා තිබුණත්, අපි කවුරුත් කැප කිරීම් කරලා ඉතා හොඳ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මොකද, අපේ ජනාධිපතිවරයාගේ ඉඳලා අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දැවැන්ත කැප කිරීමක් කරලා තිබෙනවා. මේ අය වැයේ තිබෙනවා, ජනාධිපතිවරයාගේ වියදම රුපියල් බිලියන 2.9යි කියලා. හැබැයි, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා 2024 අවුරුද්ද වෙනුවෙන් රුපියල් බිලියන 6.6ක මුදලක් වියදම් වෙනුවෙන් අරගෙන තිබෙනවා. ඒ අනුව අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ වියදම රුපියල් බිලියන 3.7කින් මෙවර අය වැය තුළින් අඩු කරගෙන තිබෙනවා. එහෙම කැප කිරීම් කරන පාලකයන් තමයි අපේ මේ ආණ්ඩුවේ ඉන්නේ.

ඒ වාගේම තමයි අපේ ඇමතිවරුන්ට ලබා දෙන ඉන්ධන සහනය. පසුගිය කාලයේ ඇමතිවරයෙකුට ඉන්ධන ලීටර් 1,950ක් ලබා දුන්නත්, අද අපේ ඇමතිවරයෙකුට ඉන්ධන ලීටර් 900යි ලබා දෙන්නේ. ඒ වියදම් කප්පාදු කරලා, ඒ මුදල් ජනතාව වෙනුවෙන් යොමු කරලා තිබෙනවා. ඒ වාගේම කලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රුපියල් මිලියනයක රක්ෂණාවරණයක් තිබුණා. දැන් ඒක රුපියල් 250,000ට අඩු කරලා තිබෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු රුපියල් 450කට කාපු ආහාර වේල දැන් රුපියල් 2,000ක් වෙනවා. ඒ කියන්නේ ආහාරවල වියදම දරා ගන්න තරමට ඒ මුදල පත් කරලා තිබෙනවා.

අපි දැක තිබෙනවා, පසුගිය ආණ්ඩු පැවැති කාලවල ගොඩක් අමාත්‍යාංශ පවත්වාගෙන ගියේ පෞද්ගලික අංශයට අයත් බිල්ඩින්වල බව. හැබැයි, දැන් අපේ ආණ්ඩුව යටතේ ක්‍රමානුකූලව එම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සියල්ල රජය සතු බිල්ඩින්වලට ගන්නවා, වියදම අඩු කර ගැනීම වෙනුවෙන්.

අපේ ජනාධිපතිවරයා පසුගිය කාල සීමාවේදී විදේශ සංචාර 3කට සහභාගි වූ බව අපි කවුරුත් දන්නවා. මේ දවස්වල ඒ සම්බන්ධයෙන් කථා බහ වෙනවා. සාමාන්‍යයෙන් ජනාධිපතිවරයෙකුට ඒ සඳහා භාණ්ඩාගාරයෙන් මුදලක් වෙන් කරනවා. අපේ ජනාධිපතිවරයා මුලින්ම ඉන්දියාවට ගියා. ඒකට ගියේ ටිකට් එකේ වියදම විතරයි, වෙන මොකුත් නැහැ; වෙන වියදම් නැහැ. ඊළඟට, චීනයට ගියා. ඒ අවස්ථාවේදීත් ටිකට් එකේ වියදම විතරයි, වෙන මොකුත් නැහැ; වෙන වියදම් නැහැ. ඊට පසුව මැද පෙරදිග රටකට ගියා. ඒකට ටිකට් එකේ වියදමවත් නැහැ. ඒ මුදල් ටික ඉතුරු කරලා මහා භාණ්ඩාගාරයට දුන්නා. අපේ පාලකයෝ, අපේ ජනාධිපතිවරුන් වැඩ කරන්නේ එහෙමයි.

හැබැයි, අපි දැක තිබෙනවා, පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරුන් එහෙම නොවෙයි කටයුතු කළේ කියන එක. ඒගොල්ලන් විදේශ සංචාර ගිහිල්ලා සැප වින්දා. මම දැක්කා, අපේ ඇමතිවරයෙක් ළඟදී වාර්තාවක් එළි දක්වා තිබෙනවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්තයා ඉන්දියාවේ දින 2ක සංචාරයක් සඳහා රුපියල් බිලියන 2ක් වියදම් කර තිබුණා කියලා. ඒ වාගේම අපි දැක්කා, පසුගිය වසර 2 ½ක පමණ කාලය තුළ හිටපු ජනාධිපතිවරයා කසුම කාලා තිබුණා, රුපියල් කෝටි 4 ½ක. එහෙම කාලයක් තමයි තිබුණේ. අන්න ඒ ඉතිහාසය වෙනස් කරලා අලුත් දිශානතියකට මේ රට ගෙන යෑම වෙනුවෙන් කරන්න පුළුවන් කැප කිරීම් සියල්ල කරමින් තමයි මේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ.

අභියෝග තිබුණත්, බිඳ වැටුණු රටක් වුණත් මේ අය වැයෙන් රටේ ජනතාවට ලබා දෙන ප්‍රතිලාභ කිසිවක් කප්පාදු කරලා නැහැ. අපි දින කිහිපයක් තිස්සේ මේ අය වැය සම්බන්ධයෙන් සංවාද කරනවා; සාකච්ඡා කරනවා. මෙම අය වැයෙන් අපේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප වැඩි කර තිබෙනවා. ඒ වාගේම ඉතිහාසයේ පළමුවෙනි වතාවට පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුපත් වැඩි කර තිබෙනවා. ඒ වාගේම ග්‍රාමීය දුප්පත්කම තුරන් කිරීම වෙනුවෙන් වැඩසටහන් නිර්මාණය කර තිබෙනවා. වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් 1,700ක් කරන්න මේ අය වැය තුළින් යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම විශ්‍රාමිකයන් සඳහා දෙන විශ්‍රාම වැටුප් වැඩි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 1990 ගණන්වල විශ්‍රාම ගියත්, ඒ අය 2020 වසරේ විශ්‍රාම ගියා සේ සලකා ඒ අයගේ විශ්‍රාම වැටුප 2020 වසරේ වැටුප් පරිමාණයන්ට ගළපා තිබෙනවා. කොච්චර කයිවාරු ගැහුවත් ඉතිහාසයේ කවදාවත් කිසිම පාලකයෙක් නොකළ දෙයක් තමයි අපි මේ කර තිබෙන්නේ. 1990 ගණන්වල විශ්‍රාම ගිය අය අතර විශ්‍රාම වැටුප විධියට රුපියල් 17,000 ලබා ගත් අයත් හිටියා. හැබැයි, දැන් ඒගොල්ලන් 2020 වසරේ විශ්‍රාම ගියා සේ සලකා ඔවුන්ට විශ්‍රාම වැටුප් ලබා දෙන්න යෝජනා කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ අය වැයෙන් වැඩිහිටි දීමනාව රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කර තිබෙනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා දෙන පොලිය වැඩි කර තිබෙනවා. ඒ වාගේම අපි ගොඩක් කථා කළා, අපේ ගම්වල ඉන්න අහිංසක දුප්පත් දරුවන් ගැන. ඒ දුප්පත් දරුවන් ශිෂ්‍යත්වය පාස් වෙලා නගරයේ පාසල්වලට යනවා. හැබැයි, ඔවුන්ගේ වියදම ගෙවල්වලට දරා ගන්න බැහැ. ඒ වෙනුවෙන් මෙතෙක් ශිෂ්‍යාධාරය හැටියට දුන්නේ රුපියල් 750යි. හැබැයි, අපේ ආණ්ඩුව යෝජනාවක් කර තිබෙනවා, ඒ වෙනුවෙන් රුපියල් 1,500ක මුදලක් ලබා දෙන්න. ඒ ආකාරයට ගමේ ඉන්න දුප්පත්, අහිංසක දරුවන් ගැන හිතපු අය වැයක්, මේක.

ඒ වාගේම ක්‍රීඩා පාසල්වල දරුවන්ට ලබා දෙන මාසික පෝෂ්‍යදායී ආහාර දීමනාව වෙනුවෙන් වෙන දා ලැබුණේ රුපියල් 5,000යි. ඒ මුදල රුපියල් 10,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම වෘත්තීය අධ්‍යාපනය ලබන දරුවන්ට ලබා දෙන මාසික දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 5,000 දක්වා වැඩි කර තිබෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ලබා දෙන මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කර තිබෙනවා. ඔවුන්ගේ ශිෂ්‍යාධාර දීමනාවත් මෙවර අය වැය තුළින් වැඩි කර තිබෙනවා.

ඒ ආකාරයට විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන සියලුදෙනා ගැනම හිතපු, ඒ සියලුදෙනා වෙනුවෙන් කටයුතු කරන අය වැයක් තමයි අපි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. අපේ රටේ අනාගතය සුබවාදී දිසාවකට අරගෙන යද්දී, ඒ සුබවාදී දිසාවට අරගෙන යන වැඩ පිළිවෙළ තුළ අපේ රටේ උතුරේ ජනතාවත්, දකුණේ ජනතාවත්, නැඟෙනහිර-බටහිර සියලු ජනතාවත් එකට එකතු කරගෙන "ශ්‍රී ලාංකීය පුරවැසියෝ" කියන අභිමානයෙන් කටයුතු කරන්න පුළුවන් විධියේ අය වැයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ අය වැය හරහා මේ වසර අවසන් වෙනකොට අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය පුළුල් කරනවා වාගේම, විවිධ ව්‍යවසායකයන් ගොඩ නඟලා ඒ හරහා අපේ රටේ නිෂ්පාදනයත් මීට වඩා ගොඩක් පුළුල් කරනවා. මේ රට අපි කියපු පුනරුද යුගයක් කරා ගෙන යන ගමන ආරම්භ කරන අය වැය තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. මෙතැනින් ඉදිරියට තව අය වැය හතරක් තිබෙනවා. ඒ අය වැය හතර ඉදිරිපත් කිරීම හරහා අනාගතයේ අපි කවුරුත් ප්‍රාර්ථනා කරන, සතුටින් හිනා වෙලා ජීවත් වන්න පුළුවන් රටක් නිර්මාණය කරන වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යනවා. 2025 සඳහා ඉදිරිපත් කරපු මේ අය වැය ඒ වෙනුවෙන් පිටුවහලක් වෙනවාය කියන එක මතක් කරමින්, මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.13]

ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ 40 වන මුදල් ඇමතිවරයා හැටියට මේ ඉදිරිපත් කළ 79වන අය වැය ලේඛනය සම්බන්ධයෙන් සාකච්ඡා කරද්දී රටේ ඉතාම වාසනාවන්ත තත්ත්වයක් උදා වෙලා තිබෙනවා කියලා මට හිතෙනවා. මේ රටේ අනාගතය උදෙසා මේ අය වැය තුළින් යෝධ මංගල පියවරක් තැබුවා කියන විශ්වාසය අපට තිබෙනවා. මේ රට ලෝකය ඇතුළේ වඩාත්ම ධනවත්ම රට බවට පරිවර්තනය කරන්න අපට බැහැ. ඒක ටිකක් අසීරු කාර්යයක්. හැබැයි, අපට ඉලක්කයක් තිබෙනවා, අපට වැඩ පිළිවෙළක් තිබෙනවා, අපට දර්ශනයක් තිබෙනවා, අපට ව්‍යවමනාවක් තිබෙනවා, මේ රට ලෝකයේ happiest country එක බවට පත් කරන්න. The wealthiest country? I think that cannot be achieved. මේ රට ලෝකයේ සතුටින් ඉන්න, සාමදානයෙන් ඉන්න happiest country එක බවට පත් කරන්න පුළුවන්. අන්න ඒ සඳහා තමයි අපි මේ යෝධ මංගල පියවර මේ අය වැයෙන් තබා තිබෙන්නේ.

විපක්ෂය මේ අය වැයේ සාර්ව විග්‍රහයක් දකින්නේ නැහැ. ඒක වරදක් නොවෙයි. තමන්ගේ මොළයේ ප්‍රමාණයට අනුව තමයි ඔවුන්ට තීරණය කරන්න වෙන්නේ; මේවා දකින්න වෙන්නේ. ඉතාම කුඩා කුඩා සිද්ධිවලට තමයි ඒ අය මේ අය වැය ලඝු කරන්නේ. ඉතිහාසයේ අධ්‍යාපනයට වෙන් කරන ලද වැඩිම මුදල මේ අය වැයෙන් වෙන් කරලා තිබෙද්දී, උදැසන එක්තරා නීතිඥ මන්ත්‍රීතුමෙක් කිව්වා, මේ අය වැයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් එක වචනයක් සඳහන් වෙලා නැහැ කියලා. ඉතාම කුඩාම කොටස් තමයි ඒ අය මෙකෙන් අල්ලා ගෙන තිබෙන්නේ. අද මේ අය වැයට විපක්ෂය තරම් කලබල වෙච්ච වෙනත් කවුරුවත් නැහැ. ඉතිහාසයේ අය වැය විවාදවල දී මම මෙහෙම හැසිරීමක් දැකලා නැහැ. අද විපක්ෂයට දැවැන්ත කලබලයක් තිබෙනවා. ඇයි කලබල වෙලා තිබෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ" කියන ප්‍රස්තාව පිරුළ අපි අසා තිබෙනවා. විපක්ෂයේ මේ කලබල වීමත් එක්ක මම හිතන්නේ දැන් ඒක වෙනස් වෙලා තිබෙනවා, "පසුගිය ඡන්දයෙන් සෙත්තපෝච්චි වෙන්න ගෙදර යවපු විපක්ෂයට අය වැය කෙළ මෝලෙන් ඇන්නා සේ" කියලා. එහෙම තමයි ඒ අයට දැන් දැනිලා තිබෙන්නේ. ඒ නිසා ඉතා විශාල කලබලයක් තිබෙනවා.

ඒකත් උදේට විතරයි. උදේ එක්කෙනෙක් ඉන්නවා - ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. එතුමාට රෝගයක් වැලඳිලා තිබෙන්නේ. මම දන්න විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් ඇහුවා,

[ගරු නලින් හේවගේ මහතා]

මෙන්න මෙහෙම ලක්ෂණ තිබෙන මනුස්සයෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා, මොකක්ද මේ රෝගය කියලා. ඇත්තටම ඒ අයට හඳුනා ගන්න බැහැ ඒ රෝගය. ඉතින් මට එතුමා ගැන දුක හිතිලා මම Internet එකෙන් බැලුවා ඒ රෝගය මොකක්ද කියලා. බලනකොට ඒ රෝගය මොකක්ද කියලා අහු වුණා. ඒක හඳුන්වලා තිබෙන්නේ, "MM" කියලා; ඒ රෝගය "MM". දිගට බලනකොට ඒක හඳුන්වන්නේ "Media Mania" කියලා. එහි රෝග ලක්ෂණ තමයි මයික් එකක් දකිනකොට, කැමරාවක් දකිනකොට පුටුවේ ඉන්න බැහැ. කෑ ගහන්නමයි හිතෙන්නේ. දැන් නැහැ නේ; No "Media Mania". උදේ විතරයි ඉන්නේ. එහෙම විපක්ෂයක් තමයි දැන් තිබෙන්නේ. *[බාධා කිරීමක්]* එතුමාගෙන් බෝ වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔව්. දැන් එහෙම විපක්ෂයක් තිබෙන්නේ.

මේ අය වැය පිළිබඳව මීට වඩා පළල් අර්ථයකින් බැලිය යුතුයි. යෝධ ගමනක ආරම්භක මංගල පියවර මේ තබා තිබෙන්නේ. පසුගිය කාලයේ මහා ආර්ථික ඔස්තාර්ලා, ධනවාදයේ කප්පිත්තෝ, න්‍යායාචාර්යවරු රට කොතැනටද ගෙනාවේ? ඩොලර් මිලියන 20ක් නැතුව තෙල් නැව් හරවලා යවනකොට, ගෑස් ටික ගේන්න බැරි වෙනකොට, මිනිස්සු පෝලිම්වල මැරෙනකොට, රට බංකොලොත් කියලා ලෝකය හඳුන්වනකොට, රට කොතැනටද පත් වුණේ? එහෙම මහා ජරාජීර්ණ රටක් තමයි ඒ අය නිර්මාණය කළේ. කොළ පාටින් වෙන්න පුළුවන්, නිල් පාටින් වෙන්න පුළුවන්, මේ ඔස්තාර්ලා අන්තිමට රට ගෙනාවේ ඒ තැනට. ලංකාවට සීල් ගැහුවා, බංකොලොත් රාජ්‍යයක් කියලා. එහෙම රටක් මේක. එතුමන්ලා දැන් හිතනවා, කේතුමතී පුරවරය වාගේ, භාණ්ඩාගාරය ඔක්කොම පුරවලා ගියේ, ගත්ත ගමන් ඇයි බෙදන්නේ නැත්තේ කියලා. බෙදන්න දෙයක් තිබුණේ නැහැ. දංකුඩ ටිකත්, ලොඳ ටිකත් හූරලා කාපු, කට්ටක් ඉතුරු කරපු රටක් අපේ අතේ තිබ්බේ. එහෙම තත්ත්වයක් තිබුණේ. ඒක දවසකින් දෙකකින් වෙනස් කරන්න බැහැ. දැන් අහනවා, "අරක කළාද, මේක කළාද, දිනේ හරිද" කියලා. කරනවා මහත්වරුනි, භය වෙන්න එපා. අපි බලය ගත්තේ අවුරුදු පහකට. ඒ අවුරුදු පහ කරනකොට, අවුරුදු 25කින් අපේ පක්ෂය ගෙදර යවන්නේ නැහැ කියන එක මතක තබා ගන්න. අවුරුදු පහක් කරනකොට විපක්ෂය ආයෙත් සෙත්තපෝච්චිම තමයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විපක්ෂය පහ වෙනවා.

ගරු නලින් හේවගේ මහතා
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
විපක්ෂය පහ වෙන්න තියා ඉතුරු වෙන්නේත් නැහැ. විපක්ෂයක් ඉතුරු වෙන්නේත් නැහැ. 2029 නොවැම්බර් මාසයේ 15වැනි දා ලංකාවේ මරණ දැන්වීමක් ඇලවෙයි. ඒ මරණ දැන්වීම මොකක්ද කියන්නද? "1947දී උපත ලබා අවුරුදු 83ක් කල් ගෙවන ලද විපක්ෂය අභාවප්‍රාප්ත වූ හෙයින්, අවමංගල්‍ය කටයුතු මැදමුලන කනත්තේ, සිරිකොත ආදාහනාගාරයේදී අපරභාග 4.30ට සිදු කරනු ලැබේ. මල්වඩම් අනවශ්‍යයි. රතිඤ්ඤා අවශ්‍යයි." විපක්ෂය එතැනින් ඉවරයි. ඊළඟ මැතිවරණයෙන් විපක්ෂයක් එයිද? එහෙම එන්නේ නැහැ. මේ වැඩ ටික කරනකොට එහෙම එන්නේ නැහැ.

ඒ නිසා අපට දැන් බරපතළ වගකීමක් තිබෙනවා. පසුගිය කාලයේ ආර්ථිකය බරපතළ හැකිළීමකට ලක් කළා - shrink කළා. ඒක ඇත්ත. ආර්ථික අර්බුදයක් ආවා. ආර්ථික අර්බුදයක් එනකොට ආර්ථිකය හකුළන්න ඕනෑ. ඒක හරි. ඒ නිසා පසු ගිය කාලයේ හැකුළුවා. හැබැයි, ඒ හැකිළීම දිගටම තබා ගෙන ගියොත් මොකද වෙන්නේ? රැකියා නැති වෙනවා; වෙළෙඳ පොළ හැකිළෙනවා; භාණ්ඩ මිල ඉහළ යනවා; නිෂ්පාදනය කඩා ගෙන වැටෙනවා. එහෙමයි වෙන්නේ. අර්බුදයක් වෙලාවට ආර්ථිකය හකුළන එක හරි. හැබැයි, ඒක දිගටම එහෙම තබා ගෙන යන්න බැහැ.

ධනය තමයි ප්‍රධානම කාරණාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චක්කවත්ති සීහනාද සූත්‍රයේ බුදුහාමුදුරුවෝ දේශනා කරනවා. "..අධනානං ධනේ අනනුප්පදීයමානේ දාළිද්දියං වේපුල්ලමගමාසි" කියලා. මොකක්ද බුදුහාමුදුරුවෝ කියන්නේ? දිළින්දන්ට ධනය නුපදිනා කල්හි, දිළින්දන් හොරකම් කරනවා, ගහගන්නවා. මරා ගන්නවා, ඇන කොටා ගන්නවා, සමාජයක් විනාශ වෙනවා. ඒ නිසා ප්‍රධානම කාරණාව ධනය.

මට මතකයි, යුරෝපයේ මෙහෙම අර්බුදයක් ආපු වෙලාවේ හැමෝම එකතු වෙලා ගියා කේන්ස් හමු වෙන්න. ඒ මහා දාර්ශනිකයා, ආර්ථික විද්‍යාඥයා හමු වෙන්න ගියා. කේන්ස් ළඟට ගිහිල්ලා කියනවා, දැන් මෙහෙම ලොකු අර්බුදයක් තිබෙනවා කියලා. බඩු මිල වැඩි වෙලා, රක්ෂා නැති වෙලා, ආර්ථිකය හැකිළිලා, දැන් මොකද කරන්නේ කියලා අහනවා. අන්න ඒ වෙලාවේ කේන්ස් කියනවා, ඔය ඔක්කොම ජනතාව ගේන්න හයිඩ් පිටියට. ගෙනැල්ලා මොකද කරන්නේ? උදේ ඉඳලා දවල් 12.00 වෙනතුරු වළවල් හාරන්න කියන්න. ඊට පස්සේ දවල්ට කන්න දෙන්න. ඊට පස්සේ මොකද කරන්නේ? අර හාරපු වළවල් ටික වහන්න කියන්න. සවස මොකද කරන්නේ? ඒ මිනිස්සුන්ට පඩි ගෙවන්න. ඊට පසුදාත් ඒක කරන්න. ඊට පසුදාත් ඒක කරන්න. ඊට පස්සේ කේන්ස් කියනවා, තුන්වැනි දවස, හතරවෙනි දවස වෙනකොට මිනිස්සුන්ට මුදල් එනවා. මුදල් එනකොට අතින් වළවල් හාරන්න බැහැ. එතකොට gloves ඉල්ලනවා. සීතලේ ඉන්න බැහැ, සපත්තු ඉල්ලනවා. අලවංගු ඉල්ලනවා, උදලු ඉල්ලනවා, වටිටි ඉල්ලනවා. අන්න එහෙම තමයි ඉල්ලුමක් ඇති වෙන්නේ. ඊට පස්සේ තමයි ඒකට සැපයුමක් ඇති වෙන්නේ.

යම් වෙලාවක ආර්ථික අර්බුදයක් ආවාට පස්සේ, ඒක හකුළන්න ඕනෑ බව සැබෑව. හැබැයි, හැමදාම හකුළාගෙන ඉන්න බැහැ. ඒ ආර්ථිකය ප්‍රසාරණය කරන්න ඕනෑ - expand කරන්න ඕනෑ. අන්න ඒක තමයි, අනුර කුමාර දිසානායක ජනාධිපති සහෝදරයා අද මේ දැවැන්ත අය වැය තුළින් බලාපොරොත්තු වෙන්නේ; ආර්ථිකය ප්‍රසාරණය කරන්න. දැන් ඒක කරන්න පුළුවන්. සංචාරකයෝ එනවා. සංචාරක ආදායම වැඩි වෙනවා. විදේශීය ප්‍රේෂණ එනවා. ඒවා වැඩි වෙනවා. අපේ සංචිත ප්‍රමාණය වැඩි වෙනවා. විදේශීය සබඳතා දැන් හරියනවා.

අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්නවා. නම කිව්වොත් නැඟිටින නිසා මම මෙහෙම කියන්නම්. ආර්ථික ඔස්තාර්ලා ඉන්නවා. එතකොට කවුරුත් දන්නවා, නම කියන්න ඕනෑ නැහැ. ආර්ථික ඔස්තාර්ලා ඉන්නවා. ඔය ඔස්තාර්ලා කිව්වා, "අපි නැත්නම් මේ රට හදන්න බැහැ. අපට තමයි ජාත්‍යන්තරය තිබෙන්නේ" කියලා. බලන්න, 1978 ඉඳලා 2020 වෙනකොට - අවුරුදු 40කට වැඩි කාලයක් යනකොට - foreign direct investments ලංකාවට ඇවිල්ලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 22යි. අපි ජාත්‍යන්තරය ගැන දන්නවා ලු, අපි ආර්ථික ඔස්තාර්ලා ලු, අපේ ක්‍රමය තමයි ලු හරි, වහලා බැරි ලු, ඇරලා තිබෙන්න ඕනෑ ලු. ඔය ආර්ථික ඔස්තාර්ලා ඔය ඔක්කොම කරලා අවුරුදු 40ක් යනකොට ලංකාවට foreign direct investments ආවේ ඇමෙරිකානු ඩොලර් බිලියන 22යි. වියට්නාමයට ගිය අවුරුද්දේ පමණක් ඇමෙරිකානු ඩොලර් මිලියන 23ක් ගියා. ලංකාවට එන්නේ foreign direct investments දශම 6යි, 7යි,

8යි. හැබැයි, ඊයේ පෙරේදා අනුර කුමාර සහෝදරයා ගියා චීනයට. එහිදී එක විට ලංකාවට දුන්නා ඩොලර් බිලියන 3.7ක්. ඩොලර් බිලියන 3.7ක්! ඒ, එක ව්‍යාපෘතියකට. ඔය ඔස්තාර්ලා අවුරුදු 5ක්, 6ක් තිස්සේ ගත්තු මුදල අපට එක ව්‍යාපෘතියකට හම්බ වුණා. ඒ නිසා දැන් ආර්ථිකයේ යම් ප්‍රසාරණයක් කරන්න ඕනෑ. අපේ රටේ මිනිසුන්ගේ අතට සල්ලි ලැබෙන්න සලස්වන්න ඕනෑ. ඒ නිසා තමයි අද කොළඹ මන්දිරයේ ඉඳලා, වත්තේ ඉන්න අපේ අභිංසක සහෝදරයාගේ පැල්පත දක්වා හැම තැනටම මුදල් බෙදිලා යන ආකාරයකට මෙම අය වැය හැදුවේ. ආර්ථිකයට මිනිසුන් සම්බන්ධ කර ගන්න ඕනෑ වාගේම, ඒ ආර්ථිකයේ මුදල් හැම තැනටම ගලා යන්න සලස්වන්නත් ඕනෑ. දැන් මේ මුදල් ගලාගෙන යමින් තිබෙනවා.

එහෙම මුදල් ගලාගෙන යනකොට මොකද වෙන්නේ? අද සංචාරක ව්‍යාපාරයට සල්ලි හම්බ වෙන කොට, පඩි වැඩි වන කොට ඒ පඩිය අරගෙන ගිහින් ගෙදර තියා ගෙන ඉන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පඩිය ගෙනිහින් washroom එකක් හදා ගන්න හදනවා, තාප්පය පේන්ට් කර ගන්න හදනවා. එහෙම නැත්නම්, පොඩි කඩ කාමර කැල්ලක් හදනවා. පොඩි කඩ කාමර කැල්ලක් හදනකොට මොකද වෙන්නේ? අන්න එතකොට වැලි ඕනෑ වෙනවා; වැලි ගොඩ දාන මල්ලිට බිස්නස් එක හැදෙනවා. අන්න එතකොට ගල් ඕනෑ වෙනවා; ගල් කොටන මල්ලිට බිස්නස් එක හැදෙනවා. අන්න එතකොට සිමෙන්ති ඕනෑ වෙනවා; හාඩ්වෙයාර් එකේ සිමෙන්ති ටික විකිණෙනවා. ගත්තු සිමෙන්ති ටික ගෙන යන්න ඕනෑ; හන්දියේ ඉන්න මල්ලිට භයර් එක හැදෙනවා. එහෙමයි මේ සල්ලි ගලා ගෙන යන්නේ. ඉහළ සිට පහළ දක්වා හැම දෙනාටම මේ මුදල් ගලාගෙන යනවා. උඩට දැම්මාට පස්සේ මුදල් ටික පහළට යනවා. එහෙම තමයි වෙන්නේ. මේ මුදල් ටික දැන් රට පුරා ගලාගෙන යන කොට හැම කෙනාගේම අතට සල්ලි හම්බ වෙනවා; හැම ව්‍යාපාරයක්ම සරු වෙනවා. එහෙම තමයි අපට ආර්ථිකය හදා ගන්න ඕනෑ. ඒ නිසා තමයි මේ වාගේ දැවැන්ත වෙනසක් කරන්න ඇත්තටම මැදිහත් වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය දැන් අපට කියනවා එයාලාගෙන් උපදෙස් ගන්න ඕනෑ ලු. මාර කට්ටියක් තමයි අපට උපදෙස් දෙන්න අහන්නේ! 2015 ආණ්ඩුවේ මේ ඔස්තාර්ලා ටික ඔක්කෝම හිටියා. 2015 ආණ්ඩුවෙන් ඔය ඉන්න ඔක්කෝම අය හිටියා. 2015 අවුරුද්දේ මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5යි; 2016 සියයට 4.5යි; 2017 සියයට 3.6යි; 2018 සියයට 3.2යි. ආණ්ඩුව දාලා බැහැලා යන කොට ආර්ථික වර්ධන වේගය සියයට 2.2යි. ඉතින් අපි උපදෙස් ගන්න එයාලාගෙන්! සියයට 5ක වර්ධන වේගයක් තිබුණු ආර්ථිකයක් තමයි එතුමන්ලා වැට්ටුවේ. එදා ත්‍රස්තවාදි උවදුර තිබුණේ නැහැ; ගං වතුර උවදුර තිබුණේ නැහැ; වෙනත් ව්‍යවසන තිබුණේත් නැහැ. 2015 වර්ෂයේ තිබුණේ සියයට 5ක ආර්ථික වර්ධන වේගයක්. ඊට පසුව එය සියයට 4.5ට දැම්මා, 3.6ට දැම්මා, 3.2ට දැම්මා, 2.2ටත් දැම්මා. දැන් එනවා අපට ආර්ථිකය හදන හැටි කියන්න.

මේ ආර්ථික ඔස්තාර්ලා 2015දී බලය ගන්නකොට මේ රටේ ණය තිබුණේ බිලියන 7,983යි. ආණ්ඩුවෙන් යන කොට බිලියන 14,100යි. කෝටි හයලක්ෂයක් ණය ගත්තා. කෝටි හයලක්ෂයක්! කෝටි හයලක්ෂය බෙදන්න අවුරුදු පහෙන්. එක අවුරුද්දක් ගියේ කෝටි 120,000ක් ණය වෙලා. එයාලා කළා ලු. කළා තමයි, මහා දැවැන්ත ණය කන්දක් ගොඩ ගහලා. ඒක හරියට "ඕනෑම මිනිහෙකුට යුද්ධ කරන්න පුළුවන්" කිව්වා වාගෙයි. මෙහෙම ණය අරගෙන නම් ඕනෑම මිනිහෙකුට ආර්ථිකයක් කරගෙන යන්න පුළුවන්. තමුන්නාන්සේලා හැදුවා ද ආර්ථිකයක්? ඒ විතරක් නොවෙයි, 2015දී බලය ගන්න කොට ඩොලරයකට ගෙව්වේ රුපියල් 131යි. රුපියල ශක්තිමත් කර ගන්න බැරිව ඒ devaluation එකෙන් පමණක් අපේ ණය බර වැඩි වුණා, කෝටි 172,000ක්. එදා බලය ගන්නකොට ඩොලර් එකකට රුපියල් 131යි. ආණ්ඩුවෙන් බැහැලා යන කොට ඩොලර් එක රුපියල් 185යි. ඒකෙන් ණය බර වැඩි වුණා, කෝටි 172,000ක්. ඒ, අලුතින් ණය අරගෙන නොවෙයි. *[බාධා කිරීමක්]* අහගෙන ඉන්න මන්ත්‍රීතුමන්ලා. ඔස්තාර්ලා අහ ගන්න. ඔන්න ඔහොමයි ණය බර වැඩි වුණේ.

මම කියන්නේ බොරු නම් 2020.08.08 වෙනි දා හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. කෝටි 172,000කින් ණය බර වැඩි වුණා. සියයට 5ක ආර්ථික වර්ධනය සියයට 2ට දැම්මා. කෝටි 600,000කින් ණය බර වැඩි වුණා. Devaluation එකෙන් කෝටි 172,000ක් අහිමි වුණා. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා එනවා නම් පෙන්වන්නම්, මූලික ආර්ථික දර්ශක 30ක්. ඔබතුමන්ලා වැසිකිළියක් හදලා විවෘත කරලා ආර්ථිකය හැදුවා කියලා පම්පෝරි ගහනවා. එහෙම නොවෙයි ආර්ථිකය හදන්නේ. ප්‍රධාන ආර්ථික දර්ශක 30ක් ගත්තොත්, 2015 ඉඳලා 2019 වන කොට ඒවායින් 26ක් බිඳ වට්ටලායි තිබෙන්නේ. ආර්ථිකය හැදුවා කියන්න ඕනෑ රට එම දර්ශකවලින් ඉදිරියට ගෙනැල්ලායි. එහෙම නැතුව මේ නිකම් සෙල්ලම් දාලා, පපඩම් සන්දර්ශන දාලා නොවෙයි ඒක කරන්නේ.

ප්‍රධානම ආර්ථික දර්ශක 30ක් ගත්තොත්, පසුගිය රනිල්ලාගේ ආණ්ඩුව -ඔය සජිත්ලාත් හිටපු ආණ්ඩුව- ඒවායෙන් 26ක් බිඳ වැට්ටුවා. දැන් එනවා අපට උපදෙස් දෙන්න! ඔබතුමන්ලාගෙන් උපදෙස් ගන්න අපි? ඔබතුමන්ලා හොඳයි රටක් මස්තබාල්දු කරන්න උපදෙස් ගන්න. එහෙමයි ඔබතුමන්ලා ආර්ථිකය හැසිරෙව්වේ. ඒ විතරක් නොවෙයි, රට හදන්න තිබුණු හම්බන්තොට වරාය වික්කා. ඒ විතරක් නොවෙයි, මහ බැංකුවම කැඩුවා. මහ බැංකුවම කැඩුවා! මහ දවාලේ මහ බැංකුවම කැඩුවා. එහෙමයි ඔබතුමන්ලා කළේ. එහෙමයි රට විනාශ කළේ. විකුණන්නත් ඔබතුමන්ලා දන්නවා ලු. ඔබතුමන්ලා ආර්ථිකයේ මහා දක්ෂ අය ලු. ධනවාදයට තමයි ලු පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015දී මෙතුමන්ලා බලය ගන්න කොට ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකය - Ease of Doing Business Index - අනුව ලංකාව සිටියේ කොතැනද? 2015දී මෙතුමන්ලා බලය ගන්න කොට ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකය අනුව ශ්‍රී ලංකාව සිටියේ 88වන ස්ථානයේ. මෙතුමන්ලා තමයි ලු, ධනවාදය දන්නේ; මෙතුමන්ලා තමයි ලු, ලෝකය හඳුනන්නේ. 88 ලෙස තිබිච්ච ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකය 111 දක්වා කඩා වැට්ටුවා. මෙන්න මිනිස්සු! මෙතුමන්ලා යන කොට ඒ අගය 111යි. එහෙමයි කළේ.

ඊට පස්සේ, සහරාන්ලා ගහනවා කියලා තිබියදීත්, මෙලෝ වගක් නැතුව ගහන්න දුන්නා. ඒකෙන් සංචාරක ව්‍යාපාරය බිඳ වැටුණා. මේ රට ලෝකයේ blacklist වෙච්ච රටක් බවට පත් වුණා. එහෙමයි කළේ.

ඒ විතරක් නොවෙයි. ගිංතොට තුනී ලෑලි කම්හලට මොකද කළේ? එය ගාල්ලේ පිහිටි දැවැන්ත කම්හලක්. ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරු කීපදෙනෙක්ම ඔය ඉස්සරහ පේළියේ ඉන්නවා. ඒ තුනී ලෑලි කම්හල 2018දී ඔබතුමන්ලාගේ ආණ්ඩුව තුට්ටු දෙකට විකුණුවේ. මේවා privatization නොවෙයි. පුද්ගලීකරණයට අපි එකඟයි; එකඟ නැත්තේ නැහැ. පුද්ගලීකරණයේ යම් යම් වාසි ගන්න පුළුවන්. ඒක හැබෑව. නමුත් මේ කරපු දේවල් පුද්ගලීකරණය නොවෙයි. අක්කර 15ක දැවැන්ත ඉඩමක් එක්ක දැවැන්ත තුනී ලෑලි කම්හලක් සින්නක්කර විකුණලා තිබෙනවා. මේ තිබෙන්නේ, ඒ ඔප්පුවේ පිටපතක්. මම මෙය **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු නලින් හේවගේ මහතා]

ඒ අක්කර 15ම සින්නක්කර විකුණනවා, රුපියල් ලක්ෂ 87කට. ඒක ගත්තු පුද්ගලයා අද ඒ factory එක හදන්නේ නැහැ. ලෑන්ඩ් සේල් කරන්න දාල. අපරාධකාරයෝ! ආර්ථික ඝාතකයෝ! ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ගොඩක් මන්ත්‍රීවරු එදා හිටියා. නමුත් ඒ අය ඒ ගැන එක වචනයක්වත් මේ පාර්ලිමේන්තුවේදී කථා කළේ නැහැ. අපි අහනවා, ඔබට කීයක් ලැබුණාද කියලා. ගාල්ලෙන් ආපු මන්ත්‍රීවරුන්ට, ගාල්ලෙන් ආපු සංවිධායකවරුන්ට, ගාල්ලෙන් ආපු කට්ටියට ඒකෙන් කොච්චර ලැබුණා ද? බබ්බු ද මේ? පර්චස් 10ක් ගන්න බැරි මුදලට, අක්කර 15ක් සින්නක්කර විකුණන්න තරම් බබ්බු ද මේ ඉන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා එතුමන්ලාට මේ ආර්ථිකය හදන්න බැහැ. එතුමන්ලාට මේ ආර්ථිකය හදන්න බැහැ. එතුමන්ලා ආර්ථිකය දැවැන්ත ආකාරයෙන් බිඳ වැටිටුවා. ඊට පස්සේ ආපු කට්ටියත් එහෙමයි. නාමල් රාජපක්ෂ මහත්මයලා දැන් කියනවා, "අපෙන් උපදෙස් ගන්න" කියලා. එතුමන්ලාගෙන් උපදෙස් ගන්න, අපි?

2016 මහ බැංකු වාර්තාවේ තිබෙනවා, NEET නමින් දර්ශකයක්. ඒ දර්ශකය හඳුන්වන්නේ, NEET කියලා. මහ බැංකු වාර්තාව අරගෙන බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීතුමන්ලා කියනවා, "අපි ආර්ථිකය හැදුවා" කියලා. එතුමන්ලා තරුණයන් ගැන කථා කරනවා. 2016 මහ බැංකු වාර්තාවේ තිබෙන, NEET කියන දර්ශකයෙන් මොකක්ද කියන්නේ - "Not in Employment, Education or Training" . මෙය තිබෙන්නේ Central Bank එකේ වාර්තාවේ. මේකෙන් මොකක්ද කියන්නේ? 2015 වන කොට ලංකාවේ තරුණයන්ගෙන් සියයට 40ක් රැකියාවක යෙදෙන්නේ නැහැ, පුහුණුවක යෙදෙන්නේ නැහැ, එහෙම නැත්නම් අධ්‍යාපනයක නියැළෙන්නේ නැහැ - Not in Employment, Education or Training. ලංකාවේ තරුණයන්ගෙන් සියයට 40ක් අධ්‍යාපනයක නියැළෙන්නේ නැහැ, පුහුණුවක නියැළෙන්නේ නැහැ, රැකියාවක නියැළෙන්නේ නැහැ. හැබැයි, "තාරුණ්‍යයට හෙටක්" හැදුවේ. තාරුණ්‍යයට හෙටක් නොවෙයි, හොට බිම ඇනෙන්නයි වැඩ කළේ. තරුණයන්ගෙන් සියයට 40ක් අධ්‍යාපනයක නියැළෙන්නේ නැත්නම් මොකක්ද ඇති වන තත්ත්වය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සාහිත්‍යධරයෙක්. අධ්‍යාපනයක නියැළෙන දරුවෙක් නම් හිතනවා, මට මින් පසුව මොනවා හරි හම්බ වෙයි කියලා. පුහුණුවක නියැළෙන කෙනෙකු නම් හිතනවා, මේ පුහුණුවෙන් පසුව මට certificate එකක් හම්බ වෙනවා, ඒක රැකියාවක දොරක් ඇර ගන්න මාවතක් කියලා. යමෙක් රැකියාවක් කරනවා නම් ඔහු වැරැද්දක් කරන්නේ නැහැ. පුහුණුවක් නැති, රැකියාවක් නැති, අධ්‍යාපනයක් නැති සියයට 40ක් ගල්කටස් අරගෙන පාරට බැසීම වරදක් නොවෙයි. මා එය හොඳයි කියනවා නොවෙයි. පාතාලය බිහි වෙන්නේ එතැනින්.

ඊයේ පෙරේදා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කියනවා මම දැක්කා, මම Vitz කාර් ගැන කිව්වා කියලා. Vitz කාර් ගැන මම දන්නේ නැහැ. අපේ අයගෙන් කථා කළේ මම විතරයි. එතුමා මාධ්‍ය සාකච්ඡාවකදීත් ඒ කතාව කියනවා මම දැක්කා. මේ පාර්ලිමේන්තුවෙදීත් ඒක කිව්වා. මම දන්නේ නැහැ, මෙහෙම කෙප්ප කෙබර, බොරු බේගල් කියන්න පුළුවන් මනුස්සයෙක් ඉන්නවාද කියලා. Vitz කාර් සම්බන්ධයෙන් මා කියපු එක ඉතාම පැහැදිලිව Internet එකේ තිබෙනවා, ඔබතුමන්ලාට බලා ගන්න පුළුවන්. මම කිව්වා, අවුරුදු 10ක් යන කොට අපි ආර්ථිකය හදනවා කියලා. අපට මේ රටේ ජනතාව ගැන දුකක් තිබෙනවා. හැම කෙනාටම වාහනයක් ඕනෑ. පිටරට නම් එක මාසයක පඩියකින් වාහනයක් ගන්න පුළුවන්. අපි කිව්වා, ඉතා පැහැදිලිවම වසර 10ක් යන කොට රටේ ආර්ථිකය හදනවා කියලා; හැම ගෙදරටම වාහන ගන්න පුළුවන් ආර්ථිකයක් හදනවා කියලා. ඒකයි කිව්වේ. අද වල්ගය පටලවාගෙන වාගේ මොනවාදෝ කියනවා. මොකද, ඒ ගොල්ලන්ට අද මහා දුකක් තිබෙනවා. ඒ ගොල්ලෝ, ලක්ෂ 27ක මහුල් කාලා බිල් ගෙවපු නැති මිනිස්සු. ඒවා බොරු නොවෙයි. ලක්ෂ 27ක wedding එකක් කරලා, බිල් ගෙවපු නැති මිනිස්සු. අපි මේ කථා කරන්නේ නිකම් නොවෙයි.

ඒ විතරක් නොවෙයි, අපි විශේෂයෙන්ම ලොකු බරක් තබා තිබෙනවා, ප්‍රවාහනයට. තඹුත්තේගම දුම්රිය ස්ථානයට අදාළව මුදල් වෙන් කරපු එක ගැන මන්ත්‍රීතුමියක් -රෝහිණී කවිරත්න - කියනවා මම දැක්කා. මම පෙරේදා පත්තරේ දැක්කා, නම වෙනස් කරපු දැන්වීමක්,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

කියලා. එතුමිය කියපු කථාවක් කියන්න ද? එතුමිය කියනවා, ලංකාවේ railway stations ඔක්කෝටම වෙන් කළේ පොඩි ගණනයි, තඹුත්තේගමට ලොකු ගණනක් වෙන් කළා කියලා. ඇයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දුම්රිය ප්‍රවාහනයට ගොඩක් මුදල් වෙන් කරන්නේ? ලංකාවට ඩොලර් බිලියන 20ක විතර භාණ්ඩ ගෙන්වනවා. ඩොලර් බිලියන 6කින්ම ගෙන්වන්නේ ඉන්ධන.

මේකේ වියදම් අඩු කරගන්න ඕනෑ. එහෙම නම්, හොඳම ප්‍රවාහන සේවය මොකක්ද? හොඳම ප්‍රවාහන සේවය ලෙස ලෝකයේ වැඩියෙන්ම පාවිච්චි කරන්නේ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ගරු නලින් හේවගේ මහතා
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දුම්රිය සේවාව තමයි හොඳම ප්‍රවාහන සේවය. මහ පාරේ ටොන් එකක් අදින්න අශ්ව බල 10ක් යනවා. රේල් පාරේ ඝර්ෂණය - friction - නැහැ. රෝදයත් යකඩ; පිල්ලත් යකඩ. ඒ නිසා ටොන් එකක් අදින්න යන්නේ අශ්ව බල එකයි. මහ පාරේ ඝර්ෂණය වැඩියි, රළු බව වැඩියි. ඒ නිසා මහ පාරේ ටොන් එකක් අදින්න අශ්ව බල 10ක් යනවා, රේල් පාරේ ටොන් එකක් අදින්න අශ්ව බල එකක් යනවා. ඒ නිසා මහ පාරට වඩා දහ ගුණයකින් රේල් පාර ලාභයි. අද මෙහේ ඉඳලා දඹුල්ල දක්වා, මෙහේ ඉඳලා බදුල්ල දක්වා යනවා ලොරි. Empty ලොරියක් යන්නේ. ඒක පුරවාගෙන එළවලු ගෙනෙන්න ඕනෑ. ඒ නිසා තමයි තඹුත්තේගම දුම්රිය ස්ථානයට ළඟම ආර්ථික මධ්‍යස්ථානයත් එක්ක එකතු වෙලා අපි බලන්නේ එළවලු ටික ප්‍රවාහනය කරලා දෙන්න. අනුරාධපුරයේ ඉඳලා එන්න ඕනෑද වැලි ලොරි 200ක්, කොළඹට? ඒක කෝච්චියෙන් ගෙන්වන්න පුළුවන්. හම්බන්තොට ඉඳලා එන්න ඕනෑද බවුසර්, කොළඹට? බවුසර් ආවේ නැහැ කොළඹට. හැබැයි, මේ මන්ත්‍රීවරු, ඇමතිවරු තෙල් ෂෙඩ් ටික ගත්තා; බවුසර් ටික ගත්තා. දැන් empty බවුසරයක් එනවා.

මම උදාහරණයක් විධියට මේ කාරණය කියලා කථාව අවසන් කරන්නම්. ඔබතුමන්ලා දැකලා ඇති එක්තරා වී මෝල් හිමියෙක්, විශේෂයෙන්ම - කමක් නැහැ, මම නම කියන්නම් - අරලිය. එයාගේ හාල් ලොරි ලංකාව පුරාම යනවා. ඇත්තටම අපට

බැරිද මේ ටික කෝච්චියෙන් ඇදලා දෙන්න? මෙන්න මෙහෙම දිගු කාලීන වැඩකට තමයි මේ අත ගහලා තිබෙන්නේ. අපි පොදු ප්‍රවාහන සේවාව හඳන්න ඕනෑ. විශේෂයෙන්ම කෝච්චි ප්‍රවාහන සේවාව දියුණු කරන්න ඕනෑ. රෑ එළි වෙනකල් මේ කෝච්චි පාරවල් නිකම් තිබෙන්නේ. මම හිතන්නේ යාපනයේ ඉඳලා හිස් ලොරියක් කොළඹට එන්න ඕනෑ නැහැ මේ වැඩවලට. දුම්රියෙන් යකඩ ටික ගෙනයන්න පුළුවන්, රෙදි ටික ගෙනයන්න පුළුවන්, සිමෙන්ති ටික ගෙනයන්න පුළුවන්. එහෙම පළල් දැක්මක් සහිතවයි මේ වැඩ කරන්නේ. ඉතින්, ළමාරත්නලාට මේක තේරෙන්නේ නැහැ. ඒ නිසා එයාලා විවේචනය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ වාගේ ඉතාම හොඳ ගමනක් යන්න තමයි මේ වැඩේ ආරම්භ කළේ. මේ ගමන ඉතාම හොඳින් ස්ථාවරව යනවා කියන එක ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔව්, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I would like to raise a point of Order under Standing Order 82(1). The Standing Order states, I quote:

> "Any Member who has used objectionable words in debate which are improper and unparliamentary ....."

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී කවිරත්න මැතිනිය, "රෝහිණී ළමාරත්න" යනුවෙන් නම වෙනස් කළා කියලා එතුමා කිව්වා. එහෙම කිව්වේ වගකීමකින්ද? එහෙම නැත්නම් වෙන මොකක් හෝ බලාපොරොත්තුවෙන්ද? කරුණාකර, ඒ ගැන දැනගන්න අවශ්‍යයි. මොකද, මා දන්නා විධියට ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය නම වෙනස් කරලා නැහැ. මෙතුමාට කිසිම අයිතියක් නැහැ එතුමිය නම වෙනස් කළා කියලා කියන්න.

ගරු නලින් හේවගේ මහතා
(මාණ්පුමිකු නලින් හේවකේ)
(The Hon. Nalin Hewage)
ඔබතුමා හොඳට අහගෙන හිටියා නම් මතක ඇති. මම කිව්වේ, "රෝහිණී කවිරත්න කියලා කෙනෙක්" කියලා. නැතුව මන්ත්‍රීතුමිය කියලා කිව්වේ නැහැ. රෝහිණී කවිරත්න කියලා කෙනෙක්. *[බාධා කිරීමක්]* මම හිතා මතා - purposelyම - තමයි කිව්වේ, මම කථාව දැනගෙන තමයි කිව්වේ, "රෝහිණී කවිරත්න" කියලා කෙනෙක් නම වෙනස් කරලා පත්තරේ තිබුණා දැක්කා කියලා. ඒක ඔබතුමන්ලාගේ කෙනාට අදාළ නම්, ඒක මට අදාළ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඉරුවර්)
(An Hon. Member)
ඔස්නාද් කියලා තව නමකුත් කිව්වා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මගේ පක්ෂයේ මන්ත්‍රීවරියක් පිළිබඳව කරපු අසත්‍ය ප්‍රකාශයක් පිළිබඳව කථා කරන්න මට අයිතිවාසිකමක් තිබෙනවා. මම පක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මගේ කණ්ඩායමේ මන්ත්‍රීවරියකට අපහාස කරන එක සුදුසු නැහැ. රෝහිණී කවිරත්න කියලා අපි කවුරුත් දන්නේ මාතලේ දිස්ත්‍රික්කයේ අපේ ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය. ඒ නිසා කරුණාකර, ඒ ප්‍රකාශය ඉල්ලා අස්කරගන්න. *[බාධා කිරීමක්]* ඔයගොල්ලන්ට කට තිබුණු පළියට ඔහොම මිනිස්සුන්ට අපහාස කරන්න බැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.*[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමන්ලාට එහෙම අපහාස කරන්න බැහැ.*[බාධා කිරීමක්]*

ගරු නලින් හේවගේ මහතා
(මාණ්පුමිකු නලින් හේවකේ)
(The Hon. Nalin Hewage)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම අපහාස කළේ නැහැ. "කෙනෙක්" කියලා කිව්වේ. ඔබතුමා හොඳට කථාව අහන්න. *[බාධා කිරීමක්]* මම එකඟයි, කථාව අහන්න. කථාව අහන්න ඔබතුමා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කරුණාකර, නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීමක්]* ඒ වාක්‍ය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට අවශ්‍ය නම් හෙට දින ඒ සඳහා අවශ්‍ය කටයුතු අපි සාකච්ඡා කරනවා. *[බාධා කිරීමක්]* දැන් නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order. - *[Interruption.]* You just keep quiet and sit down! - *[Interruption.]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
දැන් නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I am on a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

අපි ඔබතුමාට ගරු කරනවා. මොකද, ඔබතුමා ඉන්නේ ආණ්ඩු පක්ෂයේවත්, විපක්ෂයේවත් නොවෙයි. අපි හැම දෙනාගේම වගකීම තිබෙන්නේ ඔබතුමා ළඟ. ඔබතුමා ගත්ත තීරණය නිවැරදියි. ඔබතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. පොඩ්ඩක් ඉන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තව කාරණයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
අපි හෙට ගරු කථානායකතුමාට කථා කරලා මේ ගැන සාකච්ඡා කරලා තීරණයකට එමු.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
නැහැ, නැහැ. ඔබතුමා තීරණය ගත්තා. ආයේ ඒක වෙනස් කරන්න එපා. ඔබතුමා කිව්වා.*[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
නැහැ. නැහැ.*[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
නැහැ, නැහැ, නැහැ. ඔබතුමා කිව්වා, ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා කියලා. ආයේ කථා කරන්නේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි. හොඳයි, අපි සලකා බලන්නම්.*[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
නැහැ, නැහැ. සලකා බලනවා කියලා ඔබතුමා කිව්වේ නැහැ. *[බාධා කිරීම්]* ඔබතුමා කිව්වා. [බාධා කිරීම්] ඔබතුමා කිව්වා, ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා කියලා. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මෙහෙමයි. දැන් අපට මේ විවාදයේ කටයුතු ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය වෙනවා. *[බාධා කිරීමක්]*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔබතුමා කිව්වා, ඉවත් කරනවා කියලා. ඔබතුමා කිව්වා ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා කියලා. දැන් ඒක වෙනස් කරන්න බැහැ. එහෙම කරන්න බැහැ.*[බාධා කිරීමක්]* එහෙම කියන්න අයිතියක් නැහැ. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වෙන්න. නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* Record එක බලන්න. හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න අවශ්‍ය නම් සාකච්ඡා කරනවා කියන කාරණයයි කිව්වේ. *[බාධා කිරීම්]* නැහැ. හරි. ඒක පරීක්ෂා කරලා බලන්න. පරීක්ෂා කරලා බලන්න. *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(මාණ්පුමිකු (වෛද්‍යවර්) නළින්ද ජයතිස්ස - සුකාතාරම් මත්‍රුම් වෙකුසන ඌටක අමෛච්චරුම් අරසාංගක් කට්චියින් මුතන්මෛච්චරානුම්)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍යවර්) නළින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමා කරපු ප්‍රකාශයෙන් රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියට යම් අගතියක් සිදු වුණා නම්, එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරගන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම ස්තුතියි. අන්න මිනිස්සු!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, I am still on my point of Order.

ගරු නලින් හේවගේ මහතා
(මාණ්පුමිකු නලින් හෙවගේ)
(The Hon. Nalin Hewage)
හරි. හරි. දැන් වාඩි වෙන්න ඉතින්.*[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හරි. දැන් නිශ්ශබ්ද වෙන්න. දැන් නිශ්ශබ්ද වෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
පොඩ්ඩක් ඉන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]* Sir, I am still on my point of Order. Please give me time to finish it. පොඩ්ඩක් ඉන්න!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha de Silva)
බොහොම ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අන්න මිනිස්සු; වැදගත් මිනිස්සු. ඒ, ආණ්ඩුවේ ප්‍රධාන සංවිධායකතුමා.

නලින් හේවගේ මන්ත්‍රීතුමා කිව්වා, එතුමා කිව්වේ නැහැලු, Vitz එකක් රුපියල් ලක්ෂ 12ට දෙනවා කියලා. මෙන්න මේ 2024.11.02 දිනැති, Newswire article එක මම **සභාගත*** කරනවා.

මේකේ කියනවා, "Vitz එකක් ගේන්න පුළුවන් ලක්ෂ 12ට. *[බාධා කිරීම්]* හැබැයි, බදු ගහලා තිබෙන නිසා තමයි ගේන්න බැරි. *[බාධා කිරීම්]* අපි බදු අයින් කරනවා කියලා" මේ තිබෙන්නේ. ඕනෑ නම් මට මෙහි තිබෙන video එක play කරන්න පුළුවන්. මට ඕනෑ නැහැ, මේක play කරන්න. මම එච්චර පල්ලෙහාට වැටෙන්නේ නැහැ. ඒ නිසා කට තිබුණු පළියට බොරු කියන්න එපා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, අපි විවාදයේ කටයුතු ආරම්භ කරනවා නැවතත්. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විචුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විචුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විචුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Standing Ordersවල 91. (h) වගන්තියේ මෙසේ සඳහන්ව තිබෙනවා. මම මේක චුට්ටක් කියවන්නම්.

> "No Member shall make any imputation of improper motives against another Member, or make reference to personal affairs of another Member. "

මම අද දැක්කා -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි. ඒක දැන් අපි සාකච්ඡා කළා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විචුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ, නැහැ. පොඩ්ඩක් කියන්න දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක දවසක් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා මට පිස්සු කියලා. මම ඒක ගණන් ගත්තේ නැහැ. හැබැයි, අද මෙතුමා කියනවා තව කෙනෙකුට පිස්සු කියලා. ඊට පස්සේ මෙතැන තව -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඒ කථාව අවසානයි, ගරු අර්විචුනා මන්ත්‍රීතුමා. ඒ කථාව අවසානයි. *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විචුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට කථා කරන්න දෙන්න. කරුණාකරලා මට කථා කරන්න දෙන්න. කරුණාකරලා කථා කරන්න දෙන්න. එතකොට, -*[බාධා කිරීමක්]*

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන්, කථාවෙන් පස්සේ රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය ගැන සඳහන් කරපු එක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා. ඔබතුමා කිව්වා ඒක ඉවත් කරනවා කියලා. අත් දැකීම් ඇති ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් හැටියට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඒ පිළිබඳව කරුණු සඳහන් කළා. ඒ නිසා කරුණාකරලා ඒක හැන්සාඩ් වාර්තාවට දාන්න එපා. හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න. නැවත සලකා බැලීම් අවශ්‍ය නැහැ. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපේ සංවිධායකතුමා ඒක, -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එතුමිය telephone එකෙන් call කරලා කියනවා. එතුමිය බලන් ඉන්නවා. එතුමියට අගතියක් වෙලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. දැන් ඒ ප්‍රශ්නය විසඳුණා නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
දැන් ඒක ඉවත් කරනවා නේද? *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්. දැන් ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා කිව්වා නේ. කිව්වා. *[බාධා කිරීම්]*

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* සියලුදෙනා නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]* කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විජය කුමාරතුංගගේ මූණට වෙඩි තියලා - *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]*

ගරු නලින් හේවගේ මහතා
(මාණ්පුමිකු නලින් හෙවකේ)
(The Hon. Nalin Hewage)
ඔස්තාද්. මහ ඔස්තාද්. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීතුමිය. ඔබතුමියගේ කථාව පටන් ගන්න. *[බාධා කිරීම්]*

[අ.භා. 4.42]

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) නිලූෂා ලක්මාලි කමකේ)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ජනතාවට හිමි කරදීමේ බලාපොරොත්තුවෙන් ආර්ථිකය නහා සිටුවීමේ සහ සමස්ත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රජයේ ප්‍රවේශය මේ මංගල අය වැයෙන් එළිදැක්වෙනවා. *[බාධා කිරීම්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) නිලූෂා ලක්මාලි කමකේ)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage)
මෙම අය වැය, මේ තරම් කාලයක් පාර්ලිමේන්තු ඉතිහාසය තුළ ඉදිරිපත් කළ, ජනතාව වෙනුවෙන්ම වන "පුරවැසි අය වැයක්" විධියට හඳුන්වන්න පුළුවන්. මෙම අය වැය මඟින් සියලු පුරවැසියන්, ක්‍රියාකාරී සහභාගිවන්නන්, ක්‍රියාකාරී පාර්ශ්වකරුවන් සහ ක්‍රියාකාරී ප්‍රතිලාභීන් වන ආර්ථිකයක් සඳහා පදනම සකස් කර තිබෙනවා. කර්මාන්ත සේවා, කෘෂි කර්මාන්ත අංශවල නිෂ්පාදන වර්ධනයක් මෙමඟින් බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ජනතාවගේ සක්‍රිය දායකත්වයක් වාගේම, නිෂ්පාදනයෙන් ලැබෙන ප්‍රතිලාභ සමාජය පුරා සාධාරණව බෙදීයෑමත් මෙයින් අපේක්ෂා කරනවා.

ඇත්තටම සියලු පුරවැසියන් ක්‍රියාකාරීව ආර්ථිකයට දායක කර ගැනීමට අවශ්‍ය නම් මුලින්ම ඔවුන්ට නීරෝගි කායික සහ මානසික වටපිටාවක් මෙන්ම නීරෝගි දිවිපෙවෙතක් ලබා දිය යුතුයි. එවැනි සුවපත් සමාජයක් මඟින් පුරවැසියාගේ ආර්ථික සහභාගිත්වය සහ අඛණ්ඩ දායකත්වය ලබා ගැනීමට හැකියාව ලැබෙනවා. එවැනි සුවපත් සමාජයක් අපේක්ෂාවෙන් මෙවර අය වැය මඟින් රුපියල් බිලියන 604ක් සෞඛ්‍ය අංශය සඳහා වෙන් කර තිබෙනවා. ඇත්තටම අපි දන්නවා, ගෙදර රෝගියෙක් සිටිද්දී ගෙදර ආර්ථිකයට කොපමණ බලපෑමක් සිද්ධ වෙනවාද කියලා. එහිදී තමන් ජීවත් වෙන ප්‍රදේශයේ රෝහලින් අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට නොහැකිව රෝගියාට එකී වෛද්‍ය පහසුකම් ඇති රෝහලක් වෙත ගෙන යන්න සිදු වුණොත් එය රෝගියාගේ පවුලේ අය කබලෙන් ලිපට වැටීමක් වෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ජීවත් වන පිළිකා රෝගීන්ටත් අත්වෙලා තිබෙන්නේ එවැනි ඉරණමක්. රත්නපුර දිස්ත්‍රික්කයේ ඈත ගමක සිටින රෝගියෙක් මහරගම පිළිකා රෝහලට ගෙන එන්න විශාල වියදමක් දරන්න සිද්ධ වෙනවා. නමුත්, මෙවර අය වැය මඟින් රත්නපුර ශික්ෂණ රෝහලට පිළිකාවේදී ඒකකයක් ඉදිකිරීම සඳහා රුපියල් බිලියන 1.5ක් ලබාදීමෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට විශාල සහනයක් සැලසෙනවා. ඒ වාගේම, රත්නපුර හෘදය සත්කාරක සංකීර්ණය ඉදිකිරීම සඳහා ද රුපියල් බිලියන 0.4ක් මෙම අය වැය මඟින් වෙන් කර තිබෙනවා. ඒ පිළිබඳව රත්නපුර ජනතාව වෙනුවෙන් ජනාධිපතිතුමාට මාගේ ස්තුතිය මෙම අවස්ථාවේ පුද කරන්න කැමැතියි.

ඒ වාගේම, ආබාධ සහිත පුද්ගලයන් සඳහා සහායක උපකරණ ඉතා වැදගත් වෙනවා. ඒවා ඔවුන්ගේ ශරීරයේ කොටසක් විධියට සලකන්න පුළුවන්. සියලු පළාත්වල මෙම උපකරණ දේශීයව නිෂ්පාදනය කිරීමේ පහසුකම් පුළුල් කිරීම සඳහා පුළුල් වැඩසටහනක් අවශ්‍ය බව අවබෝධ කරගෙන, මෙම අය වැයෙන් රුපියල් මිලියන 500ක් ඒ සඳහා වෙන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය මඟින් රටේ අනාගත පරපුර වන දරුවන් වෙනුවෙන්, ඔවුන්ගේ පෝෂණය, අධ්‍යාපනය, මානසික සහ ශාරීරික වර්ධනය පිළිබඳව වැඩි අවධානයක් යොමු කර තිබීමත් ප්‍රශංසාත්මකව සඳහන් කළ යුතුම වෙනවා. දරුවන්ගේ පෝෂණය පටන් ගන්නේ මවගේ මව් කුසේ පිළිසිඳ ගත් දින සිට. ඒ අනුව, ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීමට රුපියල් බිලියන 7.5ක් සහ ත්‍රිපෝෂ ලබාදීම සඳහා රුපියල් බිලියන 5ක් වෙන් කිරීම මඟින් රජය විසින් ඒ සඳහා අඩිතාලම දමා තිබෙනවා. ඒ වාගේම, පෙර පාසල් උදැසන ආහාර වේල සැපයීමේ වැඩසටහන යටතේ එක් ආහාර වේලකට කරනු ලබන ගෙවීම රුපියල් 60 සිට රුපියල් 100 දක්වා වැඩි කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, අධ්‍යාපනයේ ගුණාත්මක බව සමානාත්මතාව සහ විශිෂ්ඨත්වය සඳහා විශේෂයෙන්ම මෙම අය වැයෙන් රුපියල් බිලියන 619ක් වෙන් කර තිබෙනවා. එය මෙතරම් කාලයකට අය වැයක් මඟින් අධ්‍යාපනය සඳහා වෙන් කළ වැඩිම මුදල් ප්‍රතිපාදනය වෙනවා. රට තුළ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් 2019 වර්ෂයේ සිට පාසල් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමක් සිදුවෙලා නැහැ. ඒ සඳහා මෙම 2025 අය වැය තුළින් රුපියල් මිලියන 10,000ක් වෙන් කර තිබෙනවා. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා රුපියල් මිලියන 135,000ක් වෙන් කර තිබෙනවා. පදිංචි ස්ථානයේ සිට කිලෝමීටර් 3ක් ඇතුළත ප්‍රදේශය තුළ ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීම අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් ප්‍රතිපත්තියයි. රට පුරා රජයේ පාසල් 10,126ක් තිබෙනවා. එයින් 3,946ක් ප්‍රාථමික පාසල්. ඒ අතරින් ළමුන් 100ට අඩු පාසල් 3,000කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. මෙම පාසල් බොහොමයක් ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති පාසල්. ඒ පාසල් අතර ඇති විෂමතාව සමාලෝචනය කොට යළි ස්ථානගත කිරීමට අවශ්‍ය යාන්ත්‍රික සැලැස්මක් සකස් කිරීම සඳහා රුපියල් මිලියන 500ක් මෙම අය වැයෙන් වෙන්කොට තිබෙනවා.

දරුවන්ගේ ක්‍රීඩා කෞෂල්‍යය නැංවීම සඳහා ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීමටත්, යාපනය සහ අනෙකුත් ප්‍රාදේශීය පුස්තකාල වැඩිදියුණු කිරීම සඳහා අය වැය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම දරුවන් තුළ ආකල්ප සංවර්ධනය සඳහා හේතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපගේ දරුවන් වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු කිරීම ජාතික අවශ්‍යතාවක්. දරුවන් සාමාන්‍ය පෙළ අවසන් කිරීමටත් පෙර පාසල් හැරයාමට වැඩි නැඹුරුතාවක් පවතින බව පසුගිය වසර කිහිපය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී හෙළි වන සත්‍යයක්. ගෙදර පවතින දැඩි ආර්ථික අගහිඟකම් හමුවේ දරුවන් මෙලෙස පාසල් හැර යනවා. රත්නපුර ප්‍රදේශයේ බොහෝ දුරට පතල් කර්මාන්තය සඳහා

යොමු වන දරුවන් වැඩි වෙලා තිබෙනවා. මේ නිසා දරුවන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම ඉතා වැදගත්. මේ අදහසින් වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු වන දරුවන්ට ලබාදෙන මාසික දීමනාව රුපියල් 4,000 සිට 5,000 දක්වා වැඩි කිරීමට යෝජනා කර තිබීම ප්‍රශංසාවට ලක් විය යුතුමයි. ඒ වාගේම දරුවන්ගේ වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීම සඳහා අය වැය මඟින් රුපියල් බිලියන 15.4ක් වෙන් කර ඇති බවත් විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප රටේ ග්‍රාමීය ආර්ථිකය කෘෂි කර්මාන්තය මත පදනම්ව ගොඩ නැඟී තිබෙනවා. මෙම අය වැය මඟින් කෘෂි කර්මාන්තයේ ඵලදායිතාව වැඩි කිරීමේ අරමුණින් වී ගොවීන් සඳහා ලබාදෙන පොහොර සහනාධාරය අඛණ්ඩව ලබා දීමට රුපියල් මිලියන 35,000ක් අය වැය මඟින් වෙන් කර තිබෙනවා. එමෙන්ම, සමුපකාර යන්ත්‍රණය දියුණු කරන විකල්ප නිෂ්පාදන ප්‍රවේශයක් ඇති කිරීමටත්, තරුණ ව්‍යවසායකයන් ඒ සඳහා නැඹුරු කිරීමටත් රජය අවධානය යොමු කොට තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ඉඩම්, කෘෂි කාර්මික ව්‍යාප්ති සහ සේවා, වෙනත් ආධාර සැපයීමට රජය මෙම අය වැය මඟින් යෝජනා කරනවා පමණක් නොව, ඒ සඳහා අවශ්‍ය නීතිමය රාමුව ශක්තිමත් කිරීමටත්, අවශ්‍ය යටිතල පහසුකම් සහ මූල්‍ය දිරිගැන්වීම් ලබා දීම සඳහාත් මෙම අය වැය මඟින් රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා.

එසේම කෘෂි කර්මාන්තය පදනම් කර ගත් ව්‍යාපාර ආරම්භ කිරීමට මුල පුරන සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයන් සඳහා කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. කුරුඳු, ගම්මිරිස් වැනි සුළු අපනයන භෝග මත අගය එකතු කිරීම පුළුල් කිරීම මඟින් වැඩි අපනයන ආදායමක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු රජය මඟින් සලසමින් සිටිනවා. එම නිෂ්පාදන අළෙවිකරණය සහ ප්‍රවර්ධනය ශ්‍රී ලංකා තානාපති කාර්යාල හරහා වැඩිදියුණු කිරීමට අවශ්‍ය සහාය ලබා දෙනවා පමණක් නොවෙයි, එම සැපයුම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ජාත්‍යන්තර හවුල් ව්‍යාපාර හරහා අගය එකතු කළ අපනයනකරුවන් සමඟ සම්බන්ධවීමට රජය පහසුකම් සලසනවා. ඒ වාගේම අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමත් සිදු කරනවා.

ඒ වාගේම සමාජ ආරක්ෂණය යටතේ, පරිවාස, පුනරුත්ථාපන ආයතනවල, සහනික ලත් පාසල්වල, රිමාන්ඩ් භාරයේ සහ ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින ළමුන්ගේ සුබසාධනය වැඩිදියුණු කිරීම සඳහා එකී මධ්‍යස්ථානවල ධාරිතාව භෞතික වශයෙන් සහ මානව සම්පත් සංවර්ධනය යන අංශවලින් වැඩිදියුණු කිරීමටත් මෙවර අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. ඒ වාගේම වුදිත ළමුන් අධිකරණවලට සහ අධිකරණවල සිට නැවත ප්‍රවාහනය කිරීමේදී ඒ ළමුන් සඳහා ළමා හිතකාමී ප්‍රවාහන ක්‍රමයක් ස්ථාපනය කිරීමත් මේ අය වැය මඟින් බලාපොරොත්තු වනවා. යම් පුද්ගලයෙකුට දුෂ්කර ප්‍රදේශයක ජීවත් වීම හේතුවෙන්, ආබාධිතභාවය හේතුවෙන්, අධ්‍යාපන අවස්ථා හිඟකම හේතුවෙන්, එහෙමත් නැත්නම් මූලික යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන් ආර්ථික හැකියාව සපුරා ගැනීමට නොහැකි වීම ඇත්තටම අසාධාරණයක්. මේ නිසා අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සෑම පුරවැසියෙකුටම ගෞරවාන්විතව සහ සුරක්ෂිත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබා දීම සහනික කිරීම රජය දක්වන කැප වීම මෙම අය වැය පුරා නිදර්ශන මඟින් පෙන්වා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය හැම වෙලාවේම ජාතික ජන බලවේගය ආණ්ඩුව බොරු පොරොන්දු දුන්නා කියලා කියනවා. මේ අය වැය පුරාවටම ආණ්ඩුව දුන් පොරොන්දු ඉෂ්ට කිරීමට කටයුතු කිරීමේ පරමාර්ථයෙන්ම අය වැය ඉදිරිපත් කළ බව පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. විපක්ෂයට ඒක නොතේරුණත් ජනතාව ඒක තේරුම්ගෙන තිබෙනවා. පොරොන්දු වූ විලසටම ආණ්ඩුවේ සිටින අපි සියලුදෙනාම එක්ව මේ රට ගොඩ නහන බව සපථ කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කර සිටිනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Presiding Member, this is regarding Standing Order No. 91(h). Please kindly read it. It states, I quote:

> "No Member shall make any imputation of improper motives against another Member, or make reference to personal affairs of another Member."

But, today, one Hon. Member of Parliament referred to the Hon. Dayasiri Jayasekara as a media mania, which is very wrong.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඒක මෙතැනට අදාළ වෙන්නේ නැහැ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, we have to remove that from Hansard.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, නැහැ. ඒ මන්ත්‍රීතුමා දැන් සභාවෙන් පිට වුණා. අපි වෙන වෙලාවක ඒක සාකච්ඡා කරමු. දැන් මෙතැනදී ඒක ගැන කථා කරන්න බැහැ.

ගරු ලාල් ප්‍රේමනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.52]

ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට රටේ 79වැනි අය වැය ඉදිරිපත් කර තිබෙන වෙලාවේ, ජාතික ජන බලවේගයේ මංගල අය වැය ඉදිරිපත් කර තිබෙන වෙලාවේ ඒ පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන උදක්ම සතුටු වෙමින් මගේ කථාව ආරම්භ කරනවා.

විශේෂයෙන්ම අපි දන්නවා, පසුගිය කාලයේ නව ආණ්ඩුව බලයට පත් කරන්න විශාල ජනතාවක් පෙළ ගැහුණු බව. ඔවුන්

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

එසේ පෙළ ගැහුණු අවස්ථාවේ ජාතික ජන බලවේගයේ නායකයා වන වත්මන් ජනාධිපතිතුමා සහ අප කණ්ඩායම විසින් මේ රටේ ජනතාවට ඉදිරිපත් කළ ලිඛිත ප්‍රකාශනය සහ පසුව ඉදිරිපත් කළ ප්‍රකාශන දෙක දැන් මගේ අතේ තිබෙනවා.

ඉන් එකක් තමයි, දසවන පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය විවෘත කරමින් ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විසින් 2024.11.21වැනි දින ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනය. අපට මේ අය වැය විවාදයේදී ඒක වැදගත් වෙනවා. තව එකක් තමයි, එතුමා විසින් පසුගිය පෙබරවාරි 17වැනි දා ඉදිරිපත් කළ අය වැය කථාව. අනික, පසුගිය කාලය පුරා මේ වෙනස වෙනුවෙන්, මේ පුනරුදය වෙනුවෙන් අපි ගෙයක් ගෙයක් ගානේ ගිහිල්ලා ජනතාව දැනුවත් කරද්දී, ජනතාව අවදි කරද්දී ඔවුන්ට ඉදිරිපත් කළ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය.

අපි මේ ප්‍රකාශන තුනම එකට එකතු කරලා ගත්තාම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරන පරිදි එකිනෙකට පරස්පර කිසිවක් අපේ ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අය වැය කථාවේ අඩංගු වෙන්නේ නැහැ. මුලින් ඉදිරිපත් කළ ලේඛන දෙකට ගැළපෙන පරිදි මේ රට ගොඩනැඟීමේ වැඩ පිළිවෙළට අනුගත වන අය වැයක් තමයි එතුමා ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ මැතිවරණ ප්‍රකාශනය තුළින් අපි දිගින් දිගටම කිව්වේ, පොහොසත් රටක් ගොඩනඟා මේ රටේ ජීවත් වන පුරවැසියන්ට ලස්සන ජීවිතයක් ලබා දෙනවා කියන කාරණයයි. ඒ කියන්නේ, පොහොසත් රටක් තුළ ලස්සන ජීවිතයක්. එය ඉටු කිරීම සඳහා වන මාර්ගය හැටියට අපි තෙවැදෑරුම් වැඩ පිළිවෙළක් රටට ඉදිරිපත් කළා.

පළමුවැනි එක, මේ රටේ ජනතාව ඉතා දීර්ඝ කාලයක් තිස්සේ පීඩා විඳින දුප්පත්කම තුරන් කිරීම. දෙවැනි එක, භෞතික වේවා, සමාජයීය වේවා, ආධ්‍යාත්මික වේවා රටේ ජනතාව තුළ සහ මේ රටේ සෑම තැනකම අපිරිසිදු යමක් වේද, ඒ සියල්ල clean කිරීමේ Clean Sri Lanka වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම. ඊළඟට, රටට ඩොලර් බිලියන ගණන් ආදායම උපද්දවන්න පුළුවන් අරමුණක් සහිත digital ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා වන මාර්ගය. මේ ආකාරයෙන් තමයි අපි පසුගිය කාලයේ ජනතාව ඉදිරියේ පොරොන්දු දුන්නේ. අපි විශ්වාස කරනවා, ඒ දුන් පොරොන්දුවලට අනුව මේ අය වැය ලේඛනය ගොඩනැඟිලා තිබෙනවා කියලා. විපක්ෂය කවර කථා කිව්වත්, මේ ලේඛන තුන නැවත අධ්‍යයනය කරලා බලන්න කියලා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට මම ආරාධනා කරනවා.

ඒ වාගේම සිය ගණනක් වූ කැබිනට් අමාත්‍යාංශ ටික 24ක් වැනි කුඩා සංඛ්‍යාවකට ගෙනැල්ලා, මෙම අය වැය ඇස්තමේන්තු තුළින් එම කැබිනට් අමාත්‍යාංශ 24 සඳහා සහ දෙපාර්තමේන්තු 134ක් සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අය වැයේ සමාලෝචනයක් ගත්තොත්, පොඩි සාරාංශයක් ගත්තොත් අපට මෙහෙම කියන්න පුළුවන්. සුවපත් සමාජයක් සඳහා නීරෝගී දිවිපෙවෙතක් කියන තේමාව යටතේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට රුපියල් බිලියන 604ක් -ඉතිහාසයේ වෙන් කරන ලද වැඩිම මුදල- මෙවර අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපනයේ ගුණාත්මක බව, සමානාත්මතාව සහ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා රුපියල් බිලියන 619ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ආරක්ෂිත, කාර්යක්ෂම, පරිසර හිතකාමී සහ තිරසර ප්‍රවාහන සේවයක් සඳහා මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා, රුපියල් බිලියන 483ක්. අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා නිතරම කථා කළා, -මීට ටික වෙලාවකට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරයෙකුත් සඳහන් කළා- ප්‍රවාහන සේවය ගැන. යහපත් සුවපහසු දිවියක් ගත කිරීමේ අපේක්ෂාව මල්ඵල ගැන්වීම සඳහා මේ අය වැයෙන් රුපියල් බිලියන 190ක් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආහාර කියන්නේ රටකට වැදගත්ම දෙයක්. සුරක්ෂිත ආහාර වේලක් සඳහා අපි දිවුරුම් දුන්නා; අපි එය ඉටු කරනවා. රටේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සඳහා සහ ඵලදාව නවීකරණය සහ තිරසාර කෘෂි කර්මාන්තයක් වෙනුවෙන් රුපියල් බිලියන 254ක් වෙන් කරලා තිබෙනවා. පරිසරය සම්බන්ධව ගත්තොත්, රටක් හැටියට අපි නරක තැනක ඉන්නේ. අපට මතකයි, කුණු කඳුවලට යටවෙලා මිනිස්සු මිය ගිය අතීතයක් මේ රටට තිබෙන බව. ඒ නිසා පරිසරය ඇතුළු සදාහරිත ජීවිතයක් සඳහා සහාය වීම සඳහා රුපියල් බිලියන 44ක් අපි වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම සාමකාමී, සාධාරණ සමාජයක් ගොඩ නැඟීම කියන තේමාව වෙනුවෙන් රුපියල් බිලියන 278ක් වෙන් කරලා තිබෙනවා.

අපි දන්නවා, මේ රටේ මිනිස්සු කොයි තරම් stress එකකද ඉන්නේ කියලා. බස් එකකදී, පාරකදී මිනිස්සු පොඩි වචනයක් එහෙ මෙහෙ වුණු ගමන් මිනී මරා ගන්නා තැනට පත් වෙලා තිබෙනවා. මේ රට ඒ තරම් දැඩි මානසික පීඩනයකින් යුතු මිනිසුන් ඉන්න රටක්. ඒ නිසා මේ අය වැය එවැනි දේ ගැන කල්පනා කළ අය වැයක්. ගොඩනැඟිලි හදලා, මහා කුලුනු හදලා ඒ කුලුනු උඩින් පැනලා මිය යන දරුවන් ඉන්න රටක් ගොඩ නඟනවා වෙනුවට, හදවතේ තෙතමනයක් ඇති, සමාජයට ආදරය කරන, සහෝදර පුරවැසියන්ට ආදරය කරන සමාජයක් අපි ගොඩනඟා ගන්න ඕනෑ. අය වැයක් තුළින් බලාපොරොත්තු වෙන්නේ ඒක. මුදල් වෙන් කරලා, ගොඩනැඟිලි ඉදි කරලා, කොන්ක්‍රීට් වනාන්තර හදලා ඒවායෙන් සතුටු වෙන අය වැයක් නොවෙයි මේ අය වැය. අවශ්‍ය ගොඩනැඟිලි ඉදිකිරීම වැනි දේ වෙනුවෙන් රුපියල් බිලියන 278ක්, ජාතික ආරක්ෂාව වෙනුවෙන් රුපියල් බිලියන 404ක්, ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය වෙනුවෙන් රුපියල් බිලියන 99ක් සහ තිරසර හා ආරක්ෂිත බලශක්ති සැපයුමක් වෙනුවෙන් රුපියල් බිලියන 21ක් අපි වෙන් කරනවා.

අපි ජනතා හිතවාදී රාජ්‍ය සේවයක් ඇති කර ගත යුතුයි. හැම තිස්සේම අපේ රටේ ඇහෙන දෙයක් තමයි, රාජ්‍ය සේවය සම්බන්ධව තිබෙන ප්‍රබල විවේචනය. රාජ්‍ය සේවය අපේ; ආණ්ඩුව ඒකට වග කියන්න ඕනෑ. ඒ රාජ්‍ය සේවය නිවැරදි කිරීම සඳහා පියවර ගැනීම ආණ්ඩුවේ වගකීමක්. අපි ඒක පිළිගන්නවා. ඒ නිසා ඒ සඳහා වන අරමුණු වෙනුවෙන් රුපියල් බිලියන 296ක් වෙන් කරනවා. ඒ වාගේම සියල්ලන්ම ආවරණය වන සමාජ ආරක්ෂණ ක්‍රමයක් වෙනුවෙන් රුපියල් බිලියන 749ක් වෙන් කරනවා. මේ අය වැය එවැනි අරමුණුකින් හදපු අය වැයක්. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කිසිම සාධාරණ හේතුවක් නොමැතිව දිගින් දිගටම මේ අය වැය විවේචනය කරමින් ඉන්නවා. මේ අය වැය ගැන දැක්මක් නැතිව, මේ අය වැයෙන් අපි බලාපොරොත්තු වන අරමුණු ගැන සිතුවිල්ලක්වත් නැතිව එතුමන්ලා පැය ගණන් කථා කරමින් කාලය නාස්ති කරනවා.

එහෙම දැක්මක්වත් නැතුව ඔවුන් මේ අය වැය විවේචනය කිරීමට පමණක් මැදිහත් වෙමින් ඉන්නවා. මේ රට දැවැන්ත ආර්ථික පරිහානියක තිබුණු බව අපි දන්නවා; ඒ වාගේම සමාජයීය පරිහානියක තිබුණා; අධ්‍යාත්මික පරිහානියක තිබුණා. මේ ආර්ථික, සමාජයීය, අධ්‍යාත්මික පරිහානියෙන් මේ රට ගලවා ගැනීමේ වගකීම තමයි අපි භාරගෙන තිබෙන්නේ. අද ඔබතුමන්ලා බොහෝ දේවල් ගැන ප්‍රශ්න කරනවා. හැබැයි, ඔබතුමන්ලා ප්‍රශ්න කරන්නේ අතීතයේ ඔබතුමන්ලා නායකත්වය දුන්, ඔබතුමන්ලා

පාලනය කරපු සමාජය, ආර්ථිකය, රට පිළිබඳව. අපි තව මාස දෙක තුනක් ඇතුළත මේ දැවැන්ත අර්බුදයට පිළියම් සෙවීම සඳහා තමයි මේ පියවර තබමින් ඉන්නේ; ඒ සඳහා ජනතාව පෙළගස්වමින් ඉන්නේ. නව සිතුවිලි, නව ආකල්ප, නව දැක්මක් සහිතව අලුතින් හිතන්න විධියක් අපි පුරුදු කරමින් ඉන්නේ. අපි විපක්ෂයටත් කියන්නේ ඒ පුරුද්ද ඇති කර ගන්න වෙයි කියායි. ඔබතුමන්ලාට මින් පස්සේ විපක්ෂයේ කාර්යභාරය කරන්න වෙන්නේ වෙන දා තිබුණු ආණ්ඩු පක්ෂය එක්ක නොවෙයි. ඊට එහා ගිය ප්‍රතාපවත් හැකියාවක්, දැක්මක්, දැනුමක්, සහෝදරත්වයක් තිබෙන විවිධ ප්‍රදේශවලින් ආපු, විවිධ ජන කොටස්, විවිධ සේවාවන් නියෝජනය කරන විවිධත්වයේ, ඒකත්වයේ අසිරිමත් බවකින් යුත් ආණ්ඩු පක්ෂයක් එක්ක තමයි ඔබතුමන්ලාට හැප්පෙන්න වෙන්නේ. ඒ නිසා ආණ්ඩු පක්ෂය ලේසියෙන් වටිටන්න බැහැ; වචනවලින් වටිටන්න බැහැ. මේ අය වැය පිළිබඳව ගැඹුරු අර්ථයකින් හිතලා කටයුතු කරන්න, අපිත් එක්ක ඉදිරි වසර පහ තුළ එකතු වෙන්න කියලා විපක්ෂයෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.04]

ගරු(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජය ඉදිරිපත් කරපු ප්‍රථම අය වැය දෙවන වර කියවීමේ විවාදයේදී මගේත් අදහස් පළ කරන්නට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම කැමතියි, ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනයට අය වැයෙන් වෙන් කරන ලද ඉලක්කම්වලට පිවිසෙන්න කලින් ඉතා වැදගත් ප්‍රවේශයක් සටහන් කරන්න. ඒ තමයි, මුදල් අමාත්‍යවරයා, එහෙම නැත්නම් අපේ රටේ ජනාධිපතිවරයා ඉදිරිපත් කරන ලද මේ විශිෂ්ට අය වැයට මූලික වන, පසුබිම් වන, පදනම් වන අය වැය කථාවේ දර්ශනය. මේක ඉතා වැදගත් දෙයක් හැටියටයි මා සලකන්නේ. ඒක, මේ සෝෂා මැද්දේ සමහර විට සාකච්ඡා කරන්න, අවධාරණය කරන්න අපට අමතක වන දෙයක්.

මේ අය වැය කථාවේ පදනම් මූලධර්ම බොහෝ වෙලාවට මේ සභාවේ විවාද කෙරෙනවා දැක්කේ අඩුවෙන්. අය වැය කථාවේදී මුදල් අමාත්‍යවරයා අවධාරණය කළා, මේ අය වැයේදී එතුමාගේ කේන්ද්‍රීය වුවමනාව වෙන්නේ ශ්‍රී ලාංකීය සමාජය ඔසවා තබන්න කියලා. ඒ කාරණය මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. ඒ කේන්ද්‍රීය තර්කනය සාක්ෂාත් කර ගැනීම සඳහා තමයි සකලවිධ වෙන් කිරීම්, ඒවායේ අනුපාත සටහන් වෙන්නේ. ශ්‍රී ලංකාවේ මනුෂ්‍යත්වය, මිනිස් නිදහස ඔසවා තබන්න ඕනෑ. ඒවා බොහොම නිර්ලජ්ජිත මට්ටමට බිඳ වැටිලා තිබෙන්නේ. ඒ නිසා මිනිස් නිදහස ඔසවා තබා ගැනීම සඳහා මුදල් වෙන් කිරීම, ඒ වෙනුවෙන් අවධානය යොමු කිරීම රජයක වගකීමක් වෙනවා. ඒ වාගේම සමාජ තීරු කිසිවක් අත්නොහැර මේ අය වැය සකස් කිරීම සඳහා අවධානය යොමු කිරීමත් අපි සාකච්ඡා කරන්නට ඕනෑ කාරණයක්. මේ සමාජ තීරු අතරේ සිරකරුවන්, ආබාධිත දරුවන්, ආබාධිත පිරිස්, ළමා නිවාසවල ඉන්න දරුවන්, කාන්තාවන් කියන සියලුදෙනා අවධානයට අරගෙන තිබුණා. ඒක ඉතා වැදගත් දර්ශකයක්. දියුණු රටක් පිළිබඳ අපේ රටේ මිනිසුන්ට අදහසක් තිබුණා. මේ රට බිඳ වැටෙනකොට දියුණු යැයි සම්මත, එහෙම නැත්නම් සංවර්ධිත රටවල් හොයාගෙන, යුරෝපය ඉලක්ක කරගෙන අපේ රටේ මිනිසුන් රට අත්හැර දමා යමින් හිටියා. ඇයි, ඒ? එහෙම අපේ රට අත්හැර ගියේ ඒ දියුණු රටවල තිබෙන උසස් මිනිස් සමාජයේ අවකාශය පතාගෙනයි. අන්න ඒ වාගේ වෙන්න, එබඳු රටක් වෙන්න, ඒ වාගේ රටක පරාමිතීන් අත්පත් කර ගන්න, දර්ශක අත්පත් කර ගන්න බරපතළ වුවමනාවක් මේ අය වැය දර්ශනය තුළ දකින්නට තිබෙනවා. අන්න ඒ කාරණය අපි අවධාරණය කරන්නම ඕනෑ.

පොදු ප්‍රවාහනය උසස් මට්ටමේ තිබෙන රටක් කියන්නේ අපි ජීවත් වෙන්න කැමැති රටක්. ඒ නිසා තමයි ප්‍රවාහනය පිළිබඳ විශේෂ ශීර්ෂයක් යටතේ අය වැය කථාවේදී අවධාරණය කෙරුණේ, මොන වාගේ මුදල් වෙන් කිරීමක්ද, මොන වාගේ අවධානය යොමු කිරීමක් ද කරන්න යන්නේ කියලා. ජලය, ආහාර වාගේ මූලික අවශ්‍යතා නැතිව කිසිවෙකු නොමැරෙන රටක් අපි හදා ගන්න ඕනෑ. මම නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ආසනයේ අද ජල භීතියක් තිබෙනවා. මේ වෙලාවේදීත් ප්‍රාදේශීය සභාවේ සීමිතව තිබෙන බවුසර් පාවිච්චි කරලා, ඇහැලියගොඩ ජනතාවට පානීය ජලය බෙදනවා. මේක තමයි අපට භාර වුණු රටට අත් වෙලා තිබෙන තත්ත්වය. ඒ සියල්ලටම පදනම් වෙන්නේ ස්වාභාවික නියඟය -වැස්ස අඩු වීම- කියන කාරණා විතරක් නොවෙයි. කාලාන්තරයක් තිස්සේ නීති රීති කිසිවක් නොසලකා මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර පරිහරණය කරමින් කරන පරිසර විනාශය, පතල් කැණීම, නාය යෑම ආදී සියලු දේවල් ඊට බලපානවා. ඒ කාරණාවලට මුදල් වෙන් වනකොට ඒක උසස් සමාජයකට යන්න පාර කැපෙන තැනක් වනවා. කුල මල භේද නොසලකන, උඩ රට, පහත රට භේද නොසලකන, ප්‍රාදේශීය වාද නොසලකන රටක් අපි හදා ගන්නට ඕනෑ. මේවා සංකල්ප, වචන හැටියට ඔබට පෙනුණාට, මේවා මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වෙන්නේ යම්කිසි ප්‍රතිපාදනත් එක්ක වැඩ කරලා; මිනිසුන්ගේ මනස වෙනස් කරලා. ඒක කරන්න වෙන්නේ, අධ්‍යාපනය හරහා; දීර්ඝ සංවාද හරහා. ඒ නිසා ඒ කලාපවලට වෙන් කර තිබෙන ප්‍රතිපාදන, එහෙම නැත්නම් වැය ශීර්ෂ පිළිබඳව අපි දවස් ගණන් වෙනම සාකච්ඡා කළ යුතුයි. මිනිස් ජීවිතය මෙසේ විය යුතුයි කියන ආදර්ශ රූපය මේ අය වැය කථාවේ තිබෙනවා. අපි ඒක මතු කරන්න ඕනෑ. ඒක තිබෙන්නේ අය වැය දර්ශනයේ; Budget philosophy එකේ. අඩු තරමින් මෙබඳු දියුණු රටක් මම පරිකල්පනය කරනවා, මගේ රටට. අපි ආණ්ඩුවක් හැටියට මේ අය වැයෙන් ඒකට පාර කපනවා. මොන විවාද ආවත් අන්න එතැනට වැඩ කරනවා, වියදම් කරනවා කියලා හිතපු එකම ජයග්‍රහණයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මුළු අය වැයම, මේ උපාය මාර්ග සියල්ලම මුහුණ දුන් කේන්ද්‍රීය අභියෝගය අමතක කරන්න හොඳ නැහැ. අපි මුහුණ දීපු අභියෝගය අද විපක්ෂය විවිධ දේවල් කියලා අමතක කරන්න හදනවා. මොකද, ඔබ දන්නවා බලගතු ක්ෂතිමය අත්දැකීමක - traumatic experience එකක - තිබෙන ලක්ෂණයක් තමයි, අපි ඒක අමතක කරන්න හදන එක. මම හිතන විධියට, අපට භාර දීපු, බිඳ වටිටපු, අගාධගත කරපු, අශිෂ්ටත්වය කරා මෙහෙයවපු රට කියන්නේ ශ්‍රී ලංකාව මුහුණ දීපු ක්ෂතිමය අත්දැකීමක්. ඒ නිසා ඒකට මුහුණ දෙන එක, ඒකට අභිමුඛ වන එක, ඒකත් එක්ක පොර බදන එක, ඒකට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන එක මේ අය වැයේ තිබෙන විශිෂ්ටත්වයේ ලක්ෂණයක් හැටියට මම දකිනවා. බිඳ වටිටවන ලද මේ ආර්ථික යථාව - economic reality එක - මුදල් අමාත්‍යවරයා විශේෂ යෙදුමකින් සඳහන් කළා. එතුමා කිව්වා, "අපට සිද්ධ වෙන්නේ අහිමි දශකයක් මැදින් යන්න" කියලා. "අහිමි දශකයක්", එහෙම නැත්නම්, "lost decade" එකක්. මේ, අහිමි දශකයක් මැදින් යන්න වනවා කියන්නේ මොකක්ද?

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

මේ වෙන් කරන ලද ප්‍රතිපාදන හරහා අපේ රට ගොඩනැඟීම කරන්න වෙන්නේම අර අහිමි දශකය මැද ඉඳන්. ඒක මේ කියන තරම් පහසු කාරණයක් නොවෙයි. අපහාස කරන්න, නින්දා කරන්න කෙනෙකුට පහසු වෙන්න පුළුවන්. නමුත්, මේ ඇත්තට මුහුණ දුන්නොත් මේ දශකය එක්ක පොර බඳිමින් තමයි අපට මෙම පරිවර්තනය කරන්න සිද්ධ වෙන්නේ. මේ "අහිමි දශකය" කියන්නේ, අපි ආසන්න වශයෙන් පසුකර ආපු කාලය. මේ immediate past එක, අපට එහා පැත්තෙන් තිබෙන දශකය හෝ දශක දෙක අපේ රට මේ තරම් අඳුරට දමන්න බරපතළ විධියට ඉවහල් වුණා. ඒ වකවානුවේ දේශපාලන දර්ශනය ඊට ඉවහල් වුණා. දැන් නිතර නිතර ඇහෙනවා, අතීතය අමතක කරමු කියන කියමන. අතීතය අමතක කරමු කියන එකට ඕනෑ තරම් උදාහරණ විපක්ෂය පැත්තෙන් ඇහෙනවා. රට හදන හැටි කියන්න, ඇයි මේ වැරදි, වංචා සහ ඒ කාලයේ සිදු වුණු දූෂණ ගැන නිතර නිතර, නැවත නැවත කියන්න වාගේ කථා ඇහෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් පසුගිය දවසක කිව්වා, විදුහල්පතිනිය දණ ගස්වපු එක පිළිබඳ කථාව දැන් පරණ වැඩියි ලු. දැන් ඒක කියන්න එපා කියලා එතුමාම යෝජනා කළා. අපේ ජීවිත අගාධයට ඇදලා දමපු ඒ කළු පාලනය, අඳුරු පාලනය ගැන මේ රට හැදෙන තුරුම අපි මතක් කර දෙන බව කියන්න ඕනෑ. ඒක අමතක කරන්නේ නැහැ අපි; දිනපතා එය මතක් කරනවා. අපේ ජීවිත පාරට ඇද දමපු, දස දහස් ගණනකගේ ජීවිත දර්ශක බිම වට්ටපු, මේ රටෙන් පලා යන්න සලස්වපු ඒ අතීතය අමතක නොකර මේ රට හදනතුරුම මතක් කරලා දෙන බව කියන්නට ඕනෑ. ඒක මිහිරි නැහැ තමයි අහගෙන ඉන්න. නමුත්, ඇයි මම එහෙම කියන්නේ?

මට මතක් වෙනවා, සුප්‍රකට චිත්‍රපටයක් තිබෙනවා, "ඇමිස්ටඩ්" කියලා. මේ "ඇමිස්ටඩ්" කියන චිත්‍රපටයේ තිබෙන්නේ මොකක්ද? "ඇමිස්ටඩ්" කියන්නේ, ස්පාඤ්ඤ යුද වහල් ජනතාව ප්‍රවාහනය කරපු නැවක්; නැවක නමක්. ඒක අත්පත් කර ගන්නවා, ඇමෙරිකාව. ඒගොල්ලන් එහාට ගෙනිහිල්ලා නඩුවක් අහනවා. මේ කළු ජාතික මිනිසුන්ගේ නිදහස වෙනුවෙන් කිසිම නීතිඥවරයෙක් හොයා ගන්න හම්බ වෙන්නේ නැහැ. නමුත් අන්තිමට එක්තරා විශිෂ්ට තරුණයෙකුගේ මැදිහත් වීම නිසා කිසිවෙකු අපේක්ෂා නොකළ නීතිඥයෙක් උසාවියට යනවා. ඒ තමයි ඇමෙරිකාවේ හිටපු ජනාධිපතිවරයෙකු වන ජෝන් ක්වින්සි ඇඩම්ස්. මේ ජෝන් ක්වින්සි ඇඩම්ස්ගේ අධිකරණයේ කථාව, සත්‍ය කථාව ප්‍රසිද්ධයි; ඔබට ඕනෑ නම් හොයලා බලන්න පුළුවන්. එතුමා මොකක්ද කියන්නේ? එතුමා ඒ වහලුන්ගේ නිදහස වෙනුවෙන් කථා කරමින් අධිකරණයේ ඇවිදගෙන යන ගමන් දකිනවා, හිටපු ජනපතිවරුන්ගේ කිරිගරුඬ ප්‍රතිමා. ඔහු ගිහිල්ලා අභිමුඛ වෙනවා, ඔහුගේ ප්‍රතිමාවට. ඔහු හිටපු ජනාධිපතිවරයෙක්. ඔහු මොකක්ද ඒ ප්‍රතිමාවෙන් ඇහුවේ? ඔහු අහනවා, "මොන වාගේ රටක්ද තමුන් හැදුවේ, මොන වාගේ ඇමෙරිකාවක්ද හැදුවේ?" කියලා. නිදහස පිළිබඳ ප්‍රකාශනය ඔහු උසාවියේදී ඉරලා පෙන්වනවා, "අපි හදපු නිදහස මේක නම්, මේ කළු ජාතික මිනිසුන්ට මීට වඩා ගෞරවයක් අත්වෙන්න ඕනෑ" කියලා. මම මේ මතක් කරන්නේ, අපට උරුම කරලා දීපු අපේ රටේ ඉතිහාසය, අතීතය, ඒ කළු දශකය, කළු දශක දෙක තුන, ඒ අහිමි දශකය. ඒක මැදින් තමයි අපට මේ බාධක මැද්දෙන් යන්න වෙලා තිබෙන්නේ. ජෝන් ක්වින්සි ඇඩම්ස් එතැනදී කියනවා, "Who we are is, who we were." යනුවෙන්. වර්තමානයේ ඉන්න අපි කියන්නේ, අතීතයේ හිටපු අපි. ඒ අතීතය අමතක කරලා වර්තමානයේ කරන්න පුළුවන් තර්කයක්, සෝෂාවක්, අපහාසයක් ඉතිරි වෙලා නැහැ. ඒ නිසා මම මගේ මේ අදහස් දැක්වීමේදී උත්සාහ කරන්නේ දත්ත අරගෙන පෙන්වා දෙනවාට වඩා -අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කාරක සභා අවස්ථාවේ විවාදයට ගනිද්දී ඒ සඳහා අපට කාලය ලැබෙයි- මෙන්න මේ දර්ශනය අවධාරණය කරන්නයි.

අඩුම තරමේ ඒ ජෝන් ක්වින්සි ඇඩම්ස්ට හෘදය සාක්ෂියක් තිබුණා, "අපට නිදහස් රටක් හදන්න බැරි වුණා" කියලා කියන්න. ඒ නිසා මම හිතන විධියට විපක්ෂයේ අසුන්ගත්ත පමණින් අතීතය අමතක කරන්නේ නැතුව, අපහාස කරන්නේ නැතුව, චෝදනා කරන්නේ නැතුව තමන් වපුරපු විෂ ගැන කල්පනා කරන්න වෙනවා.

මහ දවල් අධිකරණයේ මිනී මරනවා ලු. ඔව්. ඒක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඒක තමයි ගරු මන්ත්‍රීතුමනි, විපාකය. හැබැයි ඔබ සියලුදෙනා ඒකේ නිධානය අමතක කරනවා. කවුද මේ විෂ වැපිරුවේ? මේ විෂ ඉවත් කරන සැත්කම, වපුරපු තරම් ලෙහෙසි නැති බව මුළුමහත් ශ්‍රී ලංකාවම දැන් පිළිගන්නවා. මේකයි අභියෝගය.

ගරු අගමැතිතුමියත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ඊයේ පෙරේදා මට ඇහුණා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, අධ්‍යාපනයට සියයට 6ක් ඉල්ලලා අගමැතිනියත් ගාල්ලේ ඉඳලා කොළඹට පා ගමනින් ආවාය කියලා. අපි ආවා තමයි. ඒක අපේ ජීවිතයේ කරපු සුන්දරම සටනක්. මම ගාල්ලේ ඉඳලා කොළඹට හරියටම ඒ කිලෝමීටර ගණනම පයින් ආපු විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක්. එවැනි ආචාර්යවරු රාශියක් මේ සභාවේ ඉන්නවා. ඒක සතුටක්.

සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා කියපු අගමැතිනියට දැන් ඒක අමතක වෙලාය කියලා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මතක් කරලා දෙනවා. අධ්‍යාපනයට දැන් වෙන් කරලා තිබෙන්නේ සියයට 2කට කිට්ටු ගණනක් කියලා කියනවා ඇහුණා. බුද්ධිමත්ව කල්පනා කරලා බැලුවොත්, ඇත්තටම මේවාට විහිළු කියන්නත් බැහැ; මේවා බොහොම භයානක විහිළු. අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න අපට අමතක වෙලා වාගේයි හරියට කථා කරන්නේ. එතුමන්ලා ක්‍රමානුකූලව මේ අගය වැඩි කරගෙන ඇවිල්ලා, ගිය අවුරුද්දේ සියයට 5ක වාගේ ඉලක්කමක තියලා, ඊට පසුව අපට මේක සියයට 6ක් කරන්න අමතක වෙලා වාගේ තමයි කථා කරන්නේ. නමුත් අධ්‍යාපන ක්ෂේත්‍රයෙන් ආපු, විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය නියෝජනය කළ, ශාස්ත්‍රාලය නියෝජනය කළ කෙනෙක් හැටියට මම දන්නවා, මේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන බේදවාචකය කොයි වාගේද කියලා. ඉදිරියේදී අපට පුළුවන්, ක්‍රමානුකූලව විමර්ශනය කරලා බලන්න. සමහර සිදුවීම් ඉදිරියේදී හෙළිදරව් වෙයි. සමහර ජනාධිපතිවරුන්ගේ පුත්තු සමහර පාඨමාලාවලට ඇතුළත් වෙච්ච විධිය හෙළිදරව් වෙයි. ඒ පාඨමාලාවලට ඇතුළත් වෙන්න අතිවිශේෂ ගැසට් පත්‍ර ගහලා සමහර පාඨමාලා නම් කළේ කොහොමද දන්නවාද? උසස් පෙළ විභාගය සමත් වෙලා විශ්වවිද්‍යාලයට යන්න පුළුවන් තරුණ තරුණියන්ට අදාළ පාඨමාලා රහසේම ගැසට් කළා, උපාධි නොවන පාඨමාලා - non-degree programmes - විධියට. මේ, සාමාන්‍ය පෙළවත් සමත් නැති කුමාරවරු. එහෙමයි අධ්‍යාපනයට කළේ. ඒ නිසා මේ නිධාන කථාව අමතක කරලා වචනයක්වත් කථා කරන්න අපට ඉඩක් නැති බව අවධාරණය කරන්න ඕනෑ.

මේ අය වැය සාක්ෂරතාව ගැනත් අදහසක් පළ කරන්නට ඕනෑ. අපි මූලිකවම විසඳාගත යුතු ගැටලුවක් මේක. මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවෙන් පස්සේ ඒ මොහොතේම සමස්ත සමාජයම මේ අය වැය ගැන කථා කරන්න පටන් ගත්තා. මේ අය වැයේ තිබෙන, මම ඔබට අවධාරණය කරමින් ඉන්න මේ විශිෂ්ටත්වයේ දර්ශක මතු කරන්නට බොහෝ පිරිස් උනන්දු වුණේ නැහැ.

ලංකාවේ ආර්ථිකයේ රේඛීය ගමනේ - linear development එකේ - 2025 මංසන්ධියේ තමයි අපි නතර වෙලා ඉන්නේ. ඒක අහසින් පහළ වෙච්ච එකක් නොවෙයි. 2025 මංසන්ධියේ ඉන්නකොට අපට ආපස්සට පෙනෙන්නට ඕනෑ, 2024ට පෙර ගමනේ තාර්කික ඵලය තමයි මේ 2025 අය වැය කියන එක බව. ඒ තාර්කික ඵලය ඇතුළේ අතීතයෙන් උරුම වුණු කුමානුකූල ඵලයට අමතරව, අපේ රජය මම අර කලින් කියපු විශිෂ්ට දර්ශක මේකට එකතු කරලා මේ අය වැය වෙනස් විධියේ අය වැයක් බවට පත් කරලා තිබෙනවා. මේ කරුණු තමයි අපි එළියට ගන්න ඕනෑ.

දැන් අය වැය පිළිබඳ විශ්ලේෂකයන් හැම තැන ඉන්නවා. සමාජ ජාල යුගයක ජීවත් වෙන අපි මේ සමාජ ජාල ඇතුළේ ගලාගෙන යන නියාමනය නොකරන ලද දසදහස් සංඛ්‍යාත තොරතුරුවලින් වැහිලා අගාධයක ගසාගෙන යමින්, මහෝඝයක ගසාගෙන යමින් ඉන්නේ. මේ මූල්‍ය ක්ෂේත්‍රය පහසු ක්ෂේත්‍රයක් නොවෙයි. අය වැය සම්බන්ධ මූල්‍ය සූත්‍ර - formulas - සරල නැහැ. ඇත්තටම මේ විවාදවලදී මේ මූල්‍ය සූත්‍ර ලිහලා පැහැදිලි කරගන්න එකයි අපි කරන්නට ඕනෑ, ඒ සම්බන්ධ විචක්ෂණභාවය පළ කරන අය හැටියට. ඕනෑම කෙනෙකුට මේක අර්ථ කථනය කරන්න බැහැ. මේ කාර්යයට උදවු ඕනෑ වෙනවා. වැටුප් වැඩි කිරීම් පිළිබඳ අය වැය කථාවෙන් විනාඩි කිහිපයකට පස්සේ සමාජයේ ජනිත වෙච්ච වැරැදි අර්ථකථන තමයි මේකට හොඳ නිදර්ශනය. ඒ, ඒ සංවාදවල, WhatsApp groupsවල හවස් වරුවේ පළ වූ අදහස් දිහා බැලුවාම ඔවුන්ටම ඒත්තු ගිහින් තිබෙනවා මොකක්ද ඇත්තටම සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා මේ අය වැය සාක්ෂරතාව කියන එක ගැනත් අපි කල්පනා කරන්නට ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, තව විනාඩි දෙකක කාලයක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.
ඒ වාගේම මේ විග්‍රහය කරන අයගේ අභිලාෂත් වැදගත්. විනාශයක් මවලා, අසන්නා මුළා කරලා, පුළුල් දේශපාලන ක්‍රීඩාවක් ඕනෑ නම් මේක අස්සේ කරන්නත් පුළුවන්. උදේ වරුවේ මේ පාර්ලිමේන්තුවේ අපේ ගරු මන්ත්‍රීවරු ගෙනාපු තර්ක හවස් වෙනකොට විකෘති කරලා මාධ්‍ය හරහා විසුරුවා හරිමින් ඉන්නවා. මේවා පිටුපස ඉන්න අය කවුද කියලා, ඒ පණිවිඩය දිහා බැලුව ගමන් කෙනෙකුට හඳුනා ගන්න පුළුවන්. ඒ නිසා මේ ප්‍රවේශවලින් අපි මිදෙන්නට ඕනෑ.

මුදල් අමාත්‍යවරයා එදා පාර්ලිමේන්තුවේදී කරපු කථාවේ තිබුණේ කේන්ද්‍රීය කරුණු පමණයි. සමහරු ඒ කේන්ද්‍රීය දළ වැකිවල එල්ලිලා විකෘති තර්ක හදලා තිබුණා. ඒ නිසා මේ දීර්ඝ විග්‍රහය ඇතුළේ තමයි ඇත්ත තිබෙන්නේ. අය වැය ඇස්තමේන්තුව කියන පිටු ගණනාවක් තිබෙන දීර්ඝ විග්‍රහය ඇතුළේ තමයි ඇත්ත තිබෙන්නේ.

අපේ අය වැය ලේඛනය ඇතුළේ විශාලම මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙන්නේ සුබසාධන කටයුතු සඳහා. ඒක අපි පිළිගන්නට ඕනෑ. ඒක අපි රජයක් විධියට භාරගෙන තිබෙන යථාර්ථයක්. විශ්‍රාම වැටුප් - pension payments - සඳහා තමයි මේ සුබසාධන කොටසේ තිබෙන ඉහළම ඉලක්කම තිබෙන්නේ; ඉහළම මිලියන ගණන තිබෙන්නේ. ඒක රුපියල් මිලියන 441,300ක් -බිලියන 441ක්- වෙනවා. අස්වැසුම යනාදී වශයෙන් කියාගෙන, කියාගෙන යන්න පුළුවන්. කෙනෙකුට බැලුවොත් තේරෙන්නට ඕනෑ, පොහොර සහනාධාරයට වඩා ඉහළින් තමයි තිබෙන්නේ මිය ගිය සහ තුවාල ලැබූ සොල්දාදුවන් වෙනුවෙන් කරන ගෙවීම්වලට යන මුදල. එහෙම රටක් අපි භාර ගත්තේ. අපි හරි නම් උනන්දු වෙන්නට ඕනෑ, අද ඔක්කොම පැත්තකින් තියලා නිෂ්පාදන ආර්ථිකය වෙනුවෙන් පොර බඳලා ඒක වැඩි කර ගන්න. හැබැයි, අපට අමතක කරන්න බැහැ, අර මනුෂ්‍යත්වය ඔසවා තැබීම කියන කාරණයත් එක්ක අර වැදගත් කොටස් ටික. එම කටයුතුවලට මහන්සි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙනුවෙන් රුපියල් බිලියන 13.6ක් වෙන් කර තිබෙනවා. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය බලාපොරොත්තු වන ප්‍රතිඵලය මහ පොළොවේ පැළ කිරීමෙන් තමයි අපට පුළුවන් වන්නේ, නිදහස පිරුණු රටකට යන්න. දිනපතා කඩදාසි එක්ක ඔට්ටු වන, අපහසුකම් නිසා මිනිසුන් කාර්යාලවලින් දිනපතා හැරිලා එන තත්ත්වයක් තමයි දකින්න තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම නොවන සමාජයක් බිහි කර ගන්න වෙන්නේ මෙන්න මේ වාගේ මුදල් වෙන් කිරීම්වලිනුයි. අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කර තිබෙනවා රුපියල් බිලියන 271ක්. මා හිතන විධියට අපේ ජීවිතයේ අප මුහුණ දෙන වැදගත්ම අවස්ථාවක් තමයි අධ්‍යාපනය කියන්නේ. ඒ නිසා අධ්‍යාපනය දියුණු කිරීමට කරන සටන තමයි අප විසින් කලින් කියන ලද සියලු ගැටලු විසඳා ගැනීම සඳහා ගන්න තිබෙන පියවර.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ අදහස් ටික පළ කරන්න මාහට අවකාශය ලබා දීම ගැන. අපේ රජය ඉදිරිපත් කරපු ප්‍රථම අය වැය තුළ මනුෂ්‍යත්වය ඉහළින් පරිකල්පනය කළ සමාජයක් වෙනුවෙන් කර තිබෙන බර තැබීම, එහි දර්ශනය නොවළහා වටහා ගැනීම අප සියලුදෙනාගේ යුතුකම හා වගකීම බව අවධාරණය කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 5.24]

ගරු ඉම්රාන් මහරූෆ් මහතා
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

"இந்த நாட்டின் 75 வருட சாபத்தைப் போக்க எமக்கு ஆட்சியைத் தாருங்கள்!" என்று கேட்டு ஆட்சிக்கு வந்த மக்கள் விடுதலை முன்னணியின் முதலாவது பாதீட்டு விவாதத்திலே உரையாற்றுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். குறிப்பாக, முன்னைய ஆட்சியாளர்கள் 75 வருட சாபத்தை

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

உருவாக்கியதாகக் கூறியவர்களின் இந்த முதலாவது பாதீடு, அவர்கள் போராடிய இடதுசாரித் திட்டங்களைக் கொண்டதாக இருக்கின்றதா? என்ற கேள்வி எங்களிடம் காணப்படுகின்றது. உங்கள் இடதுசாரிப் பாதீடு எங்கே போனது? என்பதை இந்த இடத்திலே நாங்கள் கேட்க விரும்புகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்தில் இடம்பெறும் வரவு செலவுத்திட்ட விவாதங்களின்பொழுது, குறிப்பாக ஆளுந்தரப்பிலே அரசாங்கத்தைச் சார்ந்திருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் "இதுதான் வரலாற்றிலே மிகச் சிறந்த பாதீடு, இதைப்போன்றதொரு பாதீட்டை யாராலும் சமர்ப்பிக்க முடியாது" என்றவாறும் அதேபோன்று, எதிர்க்கட்சியிலே இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் எல்லோரும் அந்தப் பாதீட்டிலே இருக்கின்ற குறைகளைச் சொல்லி அதை விமர்சித்து, "இது ஒரு மோசமான பாதீடு" என்றும் சொல்லுகின்ற வழக்கத்தை இங்கு தொடர்ச்சியாக நாங்கள் பார்த்துக்கொண்டிருக்கின்றோம்.

குறிப்பாக, இந்த அரசாங்கத்தினால் முன்வைக்கப்பட்டிருக்கின்ற இந்த வரவு செலவுத்திட்டத்திலே என்னென்ன புதிய விடயங்கள் உள்ளடக்கப்பட்டிருக்கின்றன என்பதைத் தெளிவாக நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். இன்று உங்களுடைய தேசிய மக்கள் சக்தி கட்சியிலே இருக்கின்ற சிலர் இவ்வளவு காலமும் எதிர்க்கட்சியிலே - இப்பொழுது நாங்கள் இருக்கின்ற பக்கத்திலே - இருந்து பல உரைகளை ஆற்றியவர்கள். எத்தனை வரவு செலவுத்திட்ட விவாதத்திலே உங்களுடைய சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் பேசியிருப்பார் என்பதை நீங்கள் சிந்திக்க வேண்டும். அவ்வாறு அன்று உங்களுடைய தலைவர் - இந்த நாட்டினுடைய இன்றைய சனாதிபதியவர்கள் ஒவ்வோர் அரசாங்கமும் கொண்டுவந்த வரவு செலவுத்திட்ட விவாதங்களில் எத்தகைய கருத்துகளை முன்வைத்திருந்தார் என்பதை நீங்கள் சிந்திக்க வேண்டும். ஏனென்றால், இங்கிருக்கின்ற தேசிய மக்கள் சக்தியின் உறுப்பினர்கள் - நான் எல்லோரையும் சொல்ல வில்லை - பழைய விடயங்களை மறந்தவர்களாகப் பேசுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. ஏன் நான் இதை இங்கே சொல்கிறேனென்றால், சென்ற பாராளுமன்றத்தில் இருந்த 225 பாராளுமன்ற உறுப்பினர்களும் மோசமான நிலைப்பாடுகளைக் கொண்டவர்கள் என்ற விமர்சனத்தை ஏற்படுத்தியவர்கள் நீங்கள். இன்று மக்கள் அந்த உறுப்பினர்களில் இருந்துதான் ஜனாதிபதியைத் தெரிவு செய்திருக்கின்றார்கள்; பிரதமர் தெரிவு செய்யப் பட்டிருக்கின்றார்; அமைச்சர் தெரிவு செய்யப்பட்டிருக்கிறார். நீங்கள் சொன்னபடி அந்த 225 பாராளுமன்ற உறுப்பினர்களும் தவறானவர்கள் என்ற வாக்கியத்தை நாம் எடுத்துக் கொள்வோமாக இருந்தால், எப்படி அந்த உறுப்பினர்களில் இருந்து ஜனாதிபதியைத் தெரிவு செய்ய முடியும்? எப்படி ஒரு பிரதமரைத் தெரிவு செய்ய முடியும்? அமைச்சரைத் தெரிவு செய்ய முடியும்? ஆகையால், ஒரு மாற்றத்தை எதிர்பார்த்திருப்பவர்கள் என்ற அடிப்படையில்தான் மக்கள் உங்களுக்கு வாக்களித்திருக்கிறார்கள். அதனால், அந்த மாற்றத்தைக் கொடுக்க வேண்டிய பொறுப்பு உங்களிடம் காணப்படுகின்றது. ஆனால், இங்கிருக்கின்ற எத்தனை பேர் அந்த விடயத்தை முன்னெடுக்கின்றீர்கள் என்பதை நீங்களாகவே கேட்டுக் கொள்ளுங்கள்!

கௌரவ அமைச்சர் அவர்களே, இழுவை மடிப்படகு முறை என்பது சட்ட விரோதமான ஒரு முறைதான். இலங்கைக் குள்ளேயே இழுவை மடிப் படகுத் தொழில் செய்பவர்களை முதலில் நீங்கள் நிறுத்திக் காட்டுங்கள்! அவர்களையும் நிறுத்த வேண்டும். சட்ட விரோதமான முறையில் இழுவை மடிப்படகு மூலம் மீன்பிடிக்கும் அனைவரையும் நிறுத்தச் சொல்லித்தான் நாங்கள் கேட்கின்றோம்.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ சாணக்கியன் அவர்களே, நான் என்ன சொல்கின்றேன் என்றால், உண்மையிலே இலங்கையிலும் 700க்கும் அதிகமான இழுவை மடிப் படகுகள் இருக்கின்றன. இது சம்பந்தமாக அண்மையில் ஒரு கணக்கீடு செய்யப்பட்டு, அது சம்பந்தமாக நடவடிக்கையும் எடுக்கப்பட்டது. அதுமாத்திர மல்ல, எதிர்வரும் காலங்களில் கொண்டுவரப்படவுள்ள புதிய சட்டமூலத்தினூடாகவும் இது சம்பந்தமாக ஒரு முடிவு எடுக்க எண்ணியிருக்கின்றோம். இதுபற்றி எதிர்வரும் காலங்களில் நாட்டில் இருக்கின்ற மீனவ மக்களோடும், மீனவனத் தலைவர்களோடும் கலந்துரையாடப்படும். அவ்வாறான இழுவைமடிப் படகுகளுக்கென்று குறித்து ஒதுக்கப் பட்டிருக்கின்ற பிரதேசங்களில் மாத்திரமே மீன்பிடிப்பதற் கான அனுமதி வழங்குவதற்கான நடவடிக்கை அந்தச் சட்டமூலத்தில் முன்மொழியப்பட்டிருக்கின்றது. அனைவரின் விருப்பத்துடன் அச்சட்டமூலத்தை நிறைவேற்றவேண்டிய தேவையிருக்கின்றது.

இன்றும், இந்த நிமிடத்திலும்கூட கட்டைக்காடு, சுண்டிக்குளம் போன்ற பிரதேசங்களில் 'டைனமைற்' மூலமாக, light coarse மூலமாக, சுருக்கு வலை பாவிப்பதன் மூலமாக ஒற்றை மடி வலை பாவிப்பதன் மூலமாக, சிலிண்டர் பாவிப்பதன் மூலமாக மீன்பிடி நடவடிக்கைகள் மேற் கொள்ளப்படுவது எங்கள் எல்லோருக்கும் தெரியும். இவை சட்ட விரோதமான முறைகள் என்பது மாத்திரமல்ல, எங்கள் கடற்பரப்பில் இருக்கின்ற மீன் குஞ்சுகள், வளங்கள் அனைத்தையும் அழித்தொழிக்கின்ற நடவடிக்கை என்பதிலும் அவற்றைத் தடுத்து நிறுத்த வேண்டுமென்பதிலும் மாற்றுக் கருத்துக்கு இடமில்லை என்பது கௌரவ ரவிகரன் அவர்களுக்கும் நன்றாகத் தொியும். கடற்றொழில் அமைச்சு என்ற வகையிலும், அரசாங்கம் என்ற வகையிலும் நிச்சயமாக இவைகளைத் தடுத்து நிறுத்துவதற்கான நடவடிக்கைகளை நாங்கள் முன்னெடுத்து வருகின்றோம். விசேடமாக, 2023ஆம் ஆண்டில்கூட சட்ட விரோதமாகத் தொழில் செய்த படகுகள் - முல்லைத்தீவில் 35, யாழ்ப்பாணத்தில் 203, கிளிநொச்சியில் 23, மன்னாரில் 20 என்ற வகையில் - கைப்பற்றப்பட்டிருக் கின்றன. அதுபோல, 2025ஆம் ஆண்டு யாழ்ப்பாணத்தில் 10, முல்லைத்தீவில் 15, கிளிநொச்சியில் 8, மன்னாரில் 12 என்ற வகையில் சட்டவிரோத மீன்பிடிப் படகுகள் கைப்பற்றப்பட்டு, உரிய சட்ட நடவடிக்கை எடுக்கப்பட்டு வருகின்றது. ஆனால், நிச்சயமாக இந்த நடவடிக்கையின் மூலம் மாத்திரம் இதனைத் தடுத்து நிறுத்த முடியாதென நான் நம்புகின்றேன். சட்ட விரோதமான மீன்பிடி முறைகள் மீனவர்களுக்கு மட்டுமன்றி, நாட்டுக்கும் மக்களுக்கும் கேடு விளைவிக்கின்ற விடயம் என்பதை மக்களிடம் கொண்டுசெல்ல வேண்டிய தேவை இருக்கின்றது. அதற்குரிய செயற்பாடுகளையும் நாங்கள் செய்ய விருக்கின்றோம். அதற்கு எதிர்வரும் காலங்களில் உங்களின் உதவியும் எங்களுக்குத் தேவையாக இருக்கிறது. அதனால், நாங்கள் - நீங்கள் எல்லோருமே சேர்ந்து இந்தச் சட்ட விரோத மீன்பிடி முறையைத் தடுப்பதற்கு ஏதுவான நடவடிக்கையை முன்னெடுப்போமென்று கேட்டுக்கொண்டு, இந்தப் பிரேரணையைக் கொண்டுவந்தமைக்கு நன்றி தெரிவித்து, எனது உரையை முடிக்கின்றேன். வணக்கம்.

එකල්හී වේලාව අ.භ. 6.30 වූයෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 පෙබරවාරි 06වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 24වන සඳුදා පූ.භ. 9.30 වන තෙක් කල් තියේ ය.

அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 06ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 24, திங்கட்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned until 9.30 a.m. on Monday, 24th February, 2025, pursuant to the Resolution of Parliament of 06th February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

317 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 317 - இல. 07
Volume 317 - No. 07

2025 පෙබරවාරි 24 වන සඳුදා
2025 பெப்ருவரி 24, திங்கட்கிழமை
Monday, 24th February, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 පෙබරවාරි 24 වන සඳුදා
2025 பெப்ருவரி 24, திங்கட்கிழமை
Monday, 24th February, 2025

අන්තර්ගත ප්‍රධාන කරුණු

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා [තීරුව 1179]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 1181 - 1196]

2025.02.05 දින ගරු රවී කරුණානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය:
ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 1197]

උසස් නිලතල පිළිබඳ කාරක සභාව:
සභාපති ධුරය [තීරුව 1208]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 – [හයවන වෙන් කළ දිනය]:
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 1211 - 1340]

කල්තැබීමේ යෝජනාව:
ආබාධිත ප්‍රජාව පිළිබඳ ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් [තීරු 1341 - 1354]

பிரதான உள்ளடக்கம்

அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள் [ப: 1179]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1181 - 1196]

2025.02.05ஆம் திகதி மாண்புமிகு ரவி கருணாநாயக்கவால் கேட்கப்பட்ட வினா:
மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று [ப: 1197]

உயர் பதவிகள் பற்றிய குழு:
தவிசாளர் பதவி [ப: 1208]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட ஆறாம் நாள்]:
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 1211 - 1340]

ஒத்திவைப்புப் பிரேரணை:
மாற்றுத்திறனாளிகளுக்கான கொள்கைசார் வேலைத் திட்டம் [ப: 1341 - 1354]

PRINCIPAL CONTENTS

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1179]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1181-1196]

QUESTION POSED BY HON. RAVI KARUNANAYAKE ON 05.02.2025:
Statement by Hon. Prime Minister [Col. 1197]

COMMITTEE ON HIGH POSTS:
Chairmanship [Col. 1208]

APPROPRIATION BILL, 2025 – [Sixth Allotted Day]:
Second Reading–Debate Adjourned [Cols. 1211-1340]

ADJOURNMENT MOTION:
A Policy-driven Programme for the Disabled [Cols. 1341-1354]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි 24 වන සඳුදා
2025 பெப்ருவரி 24, திங்கட்கிழமை
Monday, 24th February, 2025

පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

ගරු (වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Dr.) Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු කථානායකතුමනි, විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද, 2022 වර්ෂය සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුරාධ ජයරත්න මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු කථානායකතුමනි, නැබඩ, වරකාගොඩ, පහළ කරන්නාගොඩ, අංක 96/03/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. නිශාන්ත කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) මිනුවන්ගොඩ, පත්තඩුවන, අංක 97/සී දරන ස්ථානයෙහි පදිංචි ඩී. සමන්ත පෙරමුණුගම මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ගම්පහ, පහළගම, ජා ඇල පාර, අංක 106/ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්.ඒ. අනුර ප්‍රියශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාකවිට, තම්මිට, අංක 194 දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ.ඩී. වික්‍රමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) ගම්පහ, මොරගොඩ, අංක 19 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.ඩබ්ලිව්. පාලිත ධනපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මිනුවන්ගොඩ, පමුණුව, අංක 166/ඒ/1 දරන ස්ථානයෙහි පදිංචි රසිකා ක්‍රිෂාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(6) උඩුගම්පල, දොරණාගොඩ, අංක 125/ඒ/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ. අනුර ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) හෙයියන්තුඩුව, ඔබවත්ත, අංක 545/5 දරන ස්ථානයෙහි පදිංචි වයි.ආර්. වජිර ප්‍රේමවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් පහ පිළිගන්වමි.

(1) කුරුණෑගල පාර, ගලගෙදර, උණපතයාය, අංක 185/බී දරන ස්ථානයෙහි පදිංචි ජී.ජී. සුභද්‍රා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) කුණ්ඩසාලේ, වරාපිටිය, විදුරුගෙවත්ත, අංක 9 ඩී දරන ස්ථානයෙහි පදිංචි ජී.එම්. ලයනල් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මහනුවර, අස්ගිරිය, පොලිස් නිවාස, අංක 77/5ඒ/2 දරන ස්ථානයෙහි පදිංචි පී.ආර්.එස්.ඩී.ඩබ්ලිව්.එම්.එන්. ලක්ෂ්මි පලිපාන මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(4) හොඩියාදෙණිය, කොටගල්ඔළුව, අංක 90 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඩී. වසන්තා කුමාරි අනුරුද්ධිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(5) හත්තාන, පැරඩයිස් පාක්, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩබ්ලිව්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මහව, රන්දෙනිගම, ජේ.පී. මන්සිල් දරන ස්ථානයෙහි පදිංචි ඒ. පකීර් මීදින් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කෝන්වැව, ඉහළ නෙත්තිපලගම, පිස්කල් නිවස යන ලිපිනයෙහි පදිංචි පී.එම්. මුතුමැණිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුරිඤ්ඤම්පිටිය, කල්පිටිය පාර, අංක 20 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එච්.එම්. රාෆි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පුත්තලම, පාලාවි, නාගවිල්ලු, එරුක්කලම්පිඩ්ඩි, අංක 107 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.වයි. මාහිර් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1-445/2025- (1), ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ආරක්ෂක කවුන්සලයට සහභාගි වෙලා ඉන්නේ. ගරු මන්ත්‍රීතුමා කැමති නම් මට පිළිතුර කියවන්න පුළුවන්. එහෙම නැත්නම් එතුමා ඉන්න වෙලාවක අතුරු ප්‍රශ්නත් සහිතව මේ ප්‍රශ්නය අහන්න ඔබතුමාට අවස්ථාව හදලා දෙන්නත් පුළුවන්.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේ සිටින වෙනත් දිනයක මට කඩිනමින්ම මේ ප්‍රශ්නය එතුමාගෙන් අහන්න අවස්ථාව ලබා දෙනවා නම් කැමැතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කර්මාන්තපුරවල නව කර්මාන්ත ආරම්භය: අනවශ්‍ය ප්‍රමාදය වැළැක්වීම
கைத்தொழில் பேட்டைகளில் புதிய கைத்தொழில்களை ஆரம்பித்தல்: தேவையற்ற தாமதத்தைத் தடுத்தல்
START OF NEW INDUSTRIES IN INDUSTRIAL ZONES: PREVENTION OF UNDUE DELAY

446/2025

2. ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ නව කර්මාන්තපුර ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

(iii) කර්මාන්තපුරවල කල්බදු පදනම මත කර්මාන්ත ස්ථාපිත කිරීමේදී, විවිධ ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම සඳහා ආයෝජකයන්ට විශාල කාලයක් ගතවන බව දන්නේද;

(iv) එසේ නම්, එම කල්බදු ගිවිසුම් සකස් කිරීමේ ක්‍රියාවලියේ පවතින අනවශ්‍ය ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) අදාළ සියලු ආයතන ඒකාබද්ධ කර පහසු ක්‍රමයක් සකස් කිරීමේ හැකියාවක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමය සකස් කිරීම සඳහා ගතවිය හැකි කාල වකවානුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කෛත්තොළිල් මට්‍රුම් තොළිල්මුයට්සියාණ්මෛ අපිවිරුත්‌ති අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) இலங்கையில் புதிய கைத்தொழில் பேட்டைகளை ஆரம்பிப்பதற்கு திட்டமிடப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அத்திட்டங்கள் யாவை என்பதையும்;

(iii) கைத்தொழில் பேட்டைகளில் குத்தகை அடிப் படையில் கைத்தொழில்களை நிறுவுகையில், பல்வேறு நிறுவனங்களிடமிருந்து அங்கீகாரத் தைப் பெறுவதற்கு முதலீட்டாளர்கள் நீண்ட காலம் காத்திருக்க வேண்டியுள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி குத்தகை உடன்படிக் கைகளைத் தயாரிக்கும் செயற்பாடுகளில் காணப்படும் தேவையற்ற தாமதத்தை தடுப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

(v) சம்பந்தப்பட்ட சகல நிறுவனங்களையும் இணைத்து இலகுவான செயன் முறையொன்றைத் தயாரிப்பதற்கான இயலுமை உள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி செயன்முறையைத் தயாரிப்பதற்கு எவ்வளவு காலம் எடுக்கும் என்பதையும்;

அவர் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he state -

(i) whether new industrial zones have been planned to be started in Sri Lanka;

(ii) if so, what those plans are;

(iii) whether he is aware that it takes a long time for the investors to obtain approval from various institutions when industries are established in industrial zones on a lease basis;

(iv) if so, the measures that will be taken to prevent unnecessary delays in the process of preparing those lease agreements;

(v) whether there is a possibility to establish a convenient process by linking all the relevant institutions;

(iv) if so, the time frame required to prepare that process?

(b) If not, why?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය මෙන්ම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින්ද නව කර්මාන්තපුර කිහිපයක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ.

(ii) විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය යටතේ දැනටමත් යටිතල පහසුකම් සංවර්ධනය කරමින් පවතින අළුතැපොල, දඹුල්ල, සඳමල්ගම, සූරියවැව සහ රයිගම යන කර්මාන්තපුරවල සංවර්ධන කටයුතු වසර 2025 අවසන් වන විට නිම කිරීමට බලාපොරොත්තු වෙනවා.

එමෙන්ම, නව අංශ පදනම් කර ගත් නිෂ්පාදන සඳහා වන කර්මාන්තපුර හැටියට විශේෂිත කර්මාන්තපුර කිහිපයක් හඳුනාගෙන තිබෙනවා.

ඉංගිරිය, රයිගම මිල්ලනිය (අදියර II), වාලච්චේන, පුලියන්කුලම, ආරච්චිකට්ටුව, තිහගොඩ, මාවතගම, ඇළයාපත්තුව සහ බිංගිරිය යන ප්‍රදේශ ආවරණය කරමින් අක්කර 370ක භූමි ප්‍රමාණයකින් යුතුව නව කර්මාන්තපුර 09ක යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට නියමිතය. ඒ වාගේම අපි මේ වන විට කන්කසන්තුරේ කර්මාන්තපුරයක් ආරම්භ කිරීමට සැලසුම් කරලා තිබෙනවා.

මෙරට කාර්මික අංශයේ උපරිම ඵලදායිතාවක් ලබා ගැනීම සඳහා ඉදිරි වසර තුළ අවම වශයෙන් ආයෝජකයින් 50දෙනෙකු වෙත කර්මාන්තපුරවල ඉඩම් කට්ටි වෙන් කිරීමටද අපේක්ෂා කෙරේ.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මේ වන විට ආරම්භ කිරීමට සැලසුම් කර ඇති කර්මාන්ත ජනපද සංඛ්‍යාව 6ක් වන අතර, ඒවා ගාල්ල ඇල්පිටිය කාර්මික ජනපදය, මාතර කඹුරුපිටිය කාර්මික ජනපදය, හම්බන්තොට වීරකැටිය කාර්මික ජනපදය, කළුතර දොඩංගොඩ කාර්මික ජනපදය, මහනුවර පොත්තපිටිය කාර්මික ජනපදය හා මඩකලපුව වාලච්චේන කාර්මික ජනපදය වේ. මෙම කාර්මික ජනපදවලට අදාළ පිඹුරුපත් සකස් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම හා අදාළ ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම් වැනි කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(iii) ඔව්.

(iv) ගරු කථානායකතුමනි, මේක දීර්ඝ කටයුත්තක්.

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් මේ දක්වා කර්මාන්තපුර සියල්ල ස්ථාපිත කර ඇත්තේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය හිමිකාරිත්වය දරනු ලබන ඉඩම්වල වේ.

ඒ ඉඩම් ප්‍රාදේශීය මට්ටමින් සංවර්ධනය කරලා ජාතික ආදායමට ආදායම් එකතු කරන සැලැස්මක් යටතේ තමයි ඉදිකිරීම් කටයුතු සිද්ධ වෙන්නේ.

විශේෂයෙන්ම ආයෝජකයා විසින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාළ ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතුවලින් සියයට 75ක් පමණ සම්පූර්ණ කළාට පසුව කල්බදු ගිවිසුම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලෙස අදාළ ආයතනයට දැනුම් දීලා ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු ආරම්භ කළාට පසුව තමයි ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතුවලට අමාත්‍යාංශය එකඟතාව ලබා දෙන්නේ. බදු ගිවිසුම් සකස් කිරීම මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය මත පමණක් පදනම් නොවන අතර ඉඩමේ හිමිකාරිත්වය දරනු ලබන ආයතන මඟින් අදාළ ඉඩම් කොටස් සඳහා බදු ගිවිසුම් සකස් කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. ප්‍රාදේශීය ලේකම් හිමිකාරිත්වය දරනු ලබන ඉඩම් සඳහා බදු

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඔප්පු සැකසීමේ ක්‍රියාවලිය ඇමුණුම මඟින් ඉදිරිපත් කරලා තිබෙනවා. එහි අදියර 15ක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එම ඇමුණුම **සභාගත*** කරනවා.

කර්මාන්තපුරවලින් ඉඩම් වෙන් කර දී ඇති, එහෙත් බදු ගිවිසුම් තවමත් සකස් වී නොමැති ආයෝජකයන්ගේ බදු ගිවිසුම් කඩිනමින් සකස් කර දීම සඳහා කර්මාන්තපුර මට්ටමින් ජංගම සේවා පැවැත්වීමට අවශ්‍ය කටයුතු මෙම අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කිරීම කරනු ලබන අතර, ඒ සඳහා ඉඩමේ භීමිකාරිත්වය දරන ආයතනය ඇතුළුව අදාළ සියලු රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා කර්මාන්තපුරවල සියලු ආයෝජකයන් සහභාගි වේ. මේ ක්‍රියාවලිය පහසුකර ගැනීම සඳහා කර්මාන්තපුර මට්ටමින් ජංගම සේවා කටයුතු ආරම්භ කරන්නත්, ඒවා අමාත්‍යාංශයෙන් සම්බන්ධීකරණය කරලා අදාළ ආයතන ඔක්කෝම කැඳවලා ගතවන කාලය කෙටි කර ගන්නත් කටයුතු කරනවා. මේ වනවිට ලබා දී තිබෙන බදු ඔප්පු ප්‍රමාණය 206ක් වන අතර බදු ඔප්පු සකස් කිරීමට ඇති ප්‍රමාණය 176ක් වෙලා තිබෙනවා.

(v) ඔව්. දැනට අපේ අමාත්‍යාංශය මේ කටයුතු අධ්‍යයනය කරන්න Investor Facilitation Committee එකක් පිහිටුවලා තිබෙනවා. ඒ කමිටුවේ නිර්දේශ අනුව අපි බලාපොරොත්තු වෙනවා, ගරු කථානායකතුමනි, ඉඩම් වෙන් කර දීම දින 22ක් තුළ සිදු කිරීමටත්, බදු ඔප්පු ලබා දීම දින 62ක් තුළ සිදු කිරීමටත්. ඊට අවශ්‍ය නිදේශය හා යෝජනා මෙම කමිටුව මඟින් ලබා දී ඇත.

(vi) ඉහත සඳහන් කර ඇති කමිටුව මඟින් ලබා දී ඇති යෝජනා හා නිරීක්ෂණ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර එහි අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට නියමිතය. මූලිකව දින 22කුත්, අවසානයේදී දින 62කුත් දක්වා කාලය කෙටි කරන්න අපට පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා.

(ආ) පැන නොනඟී.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. බදු ඔප්පුවක් ලබා ගැනීමේදී ගතවන කාලය දීර්ඝ වීම නිසා එකතු වෙන බදු ප්‍රමාණය එකවර ගෙවිය නොහැකි විශාල මුදල් ප්‍රමාණයක් ගෙවන්න ආයෝජකයාට සිදු වෙනවා.

ඒ නිසා කර්මාන්තකරුවන් දැඩි අපහසුතාවකට පත් වී තිබෙනවා වාගේම, බදු ඔප්පුව ලබා ගැනීම සඳහා සමහර ආයෝජකයන්ට වසර 15, 20, 25 වාගේ කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ කාලය තුළ තව නිෂ්පාදනයකට යන්න, ව්‍යාපාරයක් expand කර ගන්න තිබෙන අවස්ථාව නැති වෙලා තිබෙනවා. මොකද, bank එකකට ගිහිල්ලා loan එකක් ගන්න apply කළාම security එකක් විධියට තියන්න විධියක් නැහැ, බදු ඔප්පුව නොමැති නිසා. ඒ සම්බන්ධව ඔබතුමාගේ අමාත්‍යාංශ විසින් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවාද, ඒ මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, ඒක ඇත්ත. ඔප්පුව ලබා ගැනීමට ගත වන කාලය වැඩි වන නිසා මුලදී කර්මාන්තපුරයට ආපු කෙනා නොවෙයි, දැන් කර්මාන්තපුරයේ ඉන්නේ. එම නිසා කර්මාන්තපුරවල බොහෝ වෙලාවට ව්‍යාපාර ආරම්භ කරන්න ධෛර්යය නැති වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමිය කිව්ව ආකාරයට, 2019 දී ආරම්භ කරපු කර්මාන්තපුරයේ සමහර අයට තවම බදුකරය ලැබිලා නැහැ. ඒක නිසා දැන් කර්මාන්තය බවට පත් වෙලා තිබෙන්නේ ඒ ව්‍යාපාරය වෙන අයට පවරන එක. සමහර අය ඉන්නවා කර්මාන්තයක් ආරම්භ කරන්නේ නැහැ, ඒක වෙන අයට පවරන එක තමයි ඔවුන් කර්මාන්තය බවට පත් කරගෙන තිබෙන්නේ. ඒක නිසා දැන් අපට හොයා ගන්න බැහැ සමහර තැන්වල ඉන්න ඇත්ත ආයෝජකයා කවුද කියලා. ඒ වාගේ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. එම නිසා මම කලින් කියපු ආකාරයට බදුකර ඉතා ඉක්මනින් ලබා දෙන්න ජංගම සේවාවක් අපි ආරම්භ කරනවා අදාළ ආයතනත් කැඳවලා. මේක සංකීර්ණ ක්‍රියාවලියක් වෙලා තිබෙන්නේ ගරු කථානායකතුමනි, විවිධ ආයතනවලින් අනුමැතිය ලැබෙන්න තිබෙන නිසා. ඇත්තටම කළ යුතුව තිබෙන්නේ රජයේ කර්මාන්තපුරයක් නම් ආරම්භ කරන්නේ, රජයේ අනෙකුත් ආයතනවල සාමාන්‍ය ක්‍රමයට එහා ගිහිල්ලා ඉස්සෙල්ලා අවසර අරගෙන තමයි කර්මාන්තපුරයට කර්මාන්තකරුවන් කැඳවන්න ඕනෑ. නමුත්, රට තුළ සාමාන්‍ය ව්‍යාපාරයක් පටන් ගන්නවා වාගේම තමයි කර්මාන්තපුරවලට කර්මාන්තකරුවන් කැඳවන්නෙත්, පැවරීම් කටයුතු කරන්නෙත්.

ඇත්තටම කර්මාන්තපුරවල විශේෂත්වයක් නැහැ. ඒක නිසා, දින 22කින් අනුමැතිය ලබාගෙන, දින 62ක් ඇතුළත මේ ක්‍රියාවලිය සම්පූර්ණ කරලා කර්මාන්තකරුවන්ට බදුකරය භාර දෙන්න අපි දැන් බලාපොරොත්තු වෙනවා.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අලුතින් කර්මාන්තපුර ඇති කරන්නත්, දැනට තිබෙන කර්මාන්තපුර 32ක යටිතල පහසුකම් දියුණු කරන්නත් රුපියල් බිලියන 1.5ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, කර්මාන්තපුරවල නඩත්තු කටයුතු පසුගිය කාලය පුරාවටම සිද්ධ වුණේ නැහැ. පසුගිය කාලය පුරාවටම සැබෑ වුවමනාවක් තිබෙන ආයෝජකයන්ට එන්න තිබෙන අවස්ථා නැතිවෙලා ගියා. සමහර ඉඩම් මිනිස්සු අත්පත් කරගෙන ඉන්නවා. සමහර වෙලාවට කර්මාන්තපුරවල මිනිස්සු පදිංචි වෙලා ඉන්නවා. මේ සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද? ඒ වාගේම, අතුරු බදුදීම් සම්බන්ධයෙන් ඔබතුමා මුලිනුත් සඳහන් කළා. ඒ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලාත් දැන ගන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මේ ක්‍රියාවලිය steps 15ක් යටතේයි යන්නේ කියලා ඔබතුමා සඳහන් කළා. ඒ ටික ඉක්මනින් අඩු කරගෙන, දැනට තිබෙන කර්මාන්තශාලා ඉක්මනින් පවත්වාගෙන යෑම සඳහා රජය පහසුකම් සලස්වන්නෙක් විධියට කටයුතු කරන ආකාරය ගැනත් දැන ගන්න කැමැතියි. මොකද, පසුගිය කාලය පුරාවටම කර්මාන්තශාලා ආරම්භ කිරීම වෙනුවට විශාල ප්‍රමාණයක් වැහිලා

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගිය ආකාරය අපි දැක්කා. මේ වෙනුවෙන් රුපියල් බිලියන 99ක් වෙන් කර තිබෙනවා. ඒ තුළින් විශාල අවස්ථාවක් ලැබිලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් තොරතුරු දැනගන්න මම කැමැතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු මන්ත්‍රීතුමිය ප්‍රශ්නයක් නොවෙයි, ප්‍රශ්න පත්‍රයක් ඉදිරිපත් කළේ. ගරු කථානායකතුමනි, මෙහි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මෙකයි. කර්මාන්තපුරය අපේ අමාත්‍යාංශයෙන් හැදුවාට; යටිතල පහසුකම් සකස් කළාට, එහි භාරකාරත්වය දෙන්නේ ප්‍රාදේශීය ලේකම්වරයාට. එතකොට ප්‍රාදේශීය ලේකම්වරයා තමයි බදු අය කිරීමේ ක්‍රියාවලිය සහ අනෙකුත් කටයුතු සිද්ධ කරන්නේ.

හැබැයි, ප්‍රාදේශීය ලේකම්වරයාට මේකේ කිසිම වගකීමක් නැහැ. ඔහුට අධ්‍යයනයක් නැහැ, මේ ගැන අවබෝධයක් නැහැ. ඒ නිසා, කර්මාන්තපුර සෘජුව කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සහ කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේම පවත්වා ගන්න දැන් අපි බලාපොරොත්තු වෙනවා. මොකද, ඒවායේ යටිතල පහසුකම් සැකසීම සහ අනෙකුත් දේවල් සිදු කිරීමේ වගකීම තිබෙන්නේ කර්මාන්ත අමාත්‍යාංශයට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඒවායේ බදු එකතු කිරීම විතරයි කරන්නේ. අපි හොයලා බැලුවාම, නුහක් තැන්වල බදු එකතු කරලාත් නැහැ.

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියපු ආකාරයට ඊළඟට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය, අතුරු බදු දෙන එක. අතුරු බදු දෙන්න බැහැ, කර්මාන්ත අමාත්‍යාංශයේ එකඟතාවක් නැතිව. මම දන්නවා, වැදගත්ම කර්මාන්තපුරවල වාණිජමය වටිනාකමක් තිබෙන ඉඩම් බදු දීලා තිබෙනවා, පළමු කෙනාගෙන් අනෙක් කෙනාට මාසයකට ඩොලර් 5,000ක් ගන්න. ඩොලර් 5,000ක් ගණනේ බදු දීපු අය ඉන්නවා. ඒවා රජයට ලැබෙන්න තිබෙන ආදායම්. රජය බිලියන ගණනක් වියදම් කරලා කර්මාන්තපුර හදනවා. හැබැයි, ව්‍යාපාරයක් හැටියට බදු දෙන්නේ වෙන අය. ඒ නිසා අතුරු බදු දීම කරන්න බැහැ. දෙනවා නම්, ඒක දෙන්න ඕනෑ කර්මාන්ත අමාත්‍යාංශයේ වගවීම යටතේ. කර්මාන්ත අමාත්‍යාංශය එක්ක ගිවිසුම අත්සන් කරන්න ඕනෑ. ඒ සිදුවීම වෙන්නේම ප්‍රාදේශීය ලේකම් හරහා මේ ක්‍රියාවලිය විධිමත් නැති නිසායි. ඉතින්, ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් හරහා මේ කටයුතු විධිමත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මම ඉදිරිපත් කරපු මේ පැහැදිලි කිරීම තුළ අනෙකුත් කටයුතු පිළිබඳව ඔබතුමියට අවශ්‍ය පිළිතුරු තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම්: විස්තර
வனப் பாதுகாப்புத் திணைக்களத்துக்குச் சொந்தமான காணிகள்: விபரம்
LANDS UNDER DEPARTMENT OF FOREST CONSERVATION: DETAILS

447/2025

3. ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2020 සිට 2024 දක්වා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පැවති ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාරවලින් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් ප්‍රමාණයේ වෙනස්වීම් සඳහා බලපා ඇති මූලික හේතු සාධක කවරේද;

(iii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය කවරේද;

(iv) එම දෙපාර්තමේන්තුව සතු ඉඩම් මහජන භාවිතයන් සඳහා යොදා ගතහැකි ප්‍රතිපාදන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரையில் வனப் பாதுகாப்புத் திணைக்களத்துக்குச் சொந்தமாகவிருந்த காணியின் அளவு ஆண்டுவாரியாக ஹெக்டெயார்களில் வெவ்வேறாக எவ்வளவு;

(ii) வனப் பாதுகாப்புத் திணைக்களத்துக்குச் சொந்தமாகவிருந்த காணியின் அளவில் மாற்றங்கள் ஏற்படுவதில் தாக்கம் செலுத்திய அடிப்படைக் காரணிகள் யாவை;

(iii) வனப் பாதுகாப்புத் திணைக்களத்தின் அடிப்படைப் பணிப்பொறுப்பு யாது;

(iv) மேற்படி திணைக்களத்துக்குச் சொந்தமான காணிகளைப் பொதுமக்களின் பாவனைக்கு ஈடுபடுத்துவதற்கு ஏதுவான ஏற்பாடுகள் உள்ளதா;

என்பதை அவர் தெரிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he state -
  (i) the extent of land which belonged to the Department of Forest Conservation from 2020 to 2024 in hectares in relation to each year, separately;
  (ii) the reasons that have led to the change of the extent of land belonging to the Department of Forest Conservation;
  (iii) the primary role of the Department of Forest Conservation; and
  (iv) whether there are provisions for the lands of that Department to be used for common public purposes?

(b) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ වන ආවරණය සංගණනය කරනු ලබන්නේ වසර 5කට වරක් වන අතර මේ දක්වා 1992, 1999, 2010, 2015 හා 2020 අවුරුදුවල වන සංගණනය සිදුකර ඇත.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

ඒ නිසා 2020-2024 අතර කාලයේ සංගණනයක් සිදු වෙලා නැහැ.

2020දී මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද වන සංගණනය අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර 1,704,279.92කි. එහි විස්තර පහත වගුව මඟින් දක්වා ඇත.

විස්තරය	ප්‍රමාණය (හෙක්.)
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු මුළු ස්වාභාවික වනාන්තර ප්‍රමාණය (ස්වාභාවික වන ආවරණය අනුව)	1,397,211.18
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන ආවරණය සියයට 10ට අඩු කටුපඳුරු සහිත ඉඩම්	238,348.17
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු මුළු වන වගා ප්‍රමාණය	68,720.57
ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු මුළු වනාන්තර ප්‍රමාණය (ස්වාභාවික වන ආවරණය + වන ආවරණය සියයට 10ට අඩු කටුපඳුරු සහිත ඉඩම් + වන වගා)	1,704,279.92

* ආරම්භයේ දී වසර 10කට වරක් සිදුකරන ලද මෙම සංගණනය 2010 වර්ෂයේ සිට වසර 5ක කාල ප්‍රාන්තරයක් තුළ දී සිදු කිරීමට තීරණය කර ඇත. ඒ අනුව දත්ත ඉදිරිපත් කිරීමේ දී 2020 වර්ෂයට අදාළ සංගණනයේ දත්ත පමණක් ඉදිරිපත් කළ හැකිය. 2021, 2022, 2023, හා 2024 වර්ෂවල වන සංගණනයන් සිදුකර නොමැත. ඊළඟ වන සංගණනය 2025 වර්ෂයේ දී සිදුකිරීමට නියමිතව ඇත.

(ii) ජනගහන වර්ධනය සමඟ මිනිසාගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට හා විශේෂ සංවර්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මෙන්ම රජයේ වෙනත් කටයුතු සඳහා ද ඉඩම් බැහැර කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ඒ හේතුව තමයි ඒ ඉඩම් ප්‍රමාණය වෙනස් වෙන්න බලපා තිබෙන්නේ.

(iii)

- මනා දේශගුණික තත්ත්වයන් මෙන්ම පස, ජල සම්පත්, සතුන් හා වෘක්ෂලතා සංරක්ෂණය හා රටෙහි සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, ඓතිහාසික හා සමාජ ආර්ථික අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රශස්ත හා ප්‍රමාණවත් වන ආවරණයක් දිවයිනෙහි පවත්වාගෙන යාම.
- වන බිම් සතු භූමි ලක්ෂණ, වන සතුන් හා වෘක්ෂලතා, ඓතිහාසික, සෞන්දර්යාත්මක, විද්‍යාත්මක, පාරිසරික හා සමාජයීය ලක්ෂණ සැලකීමට ගත් ඒකාබද්ධ භූමි පරිශීලනය මඟින් වන බිම් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.
- වන වගා බිම් සංවර්ධනය මඟින් දේශීය පරිභෝජනය සඳහා මෙන්ම අපනයනය සඳහා අවශ්‍ය වන දැව නිෂ්පාදනය වර්ධනය කිරීම සහ එමඟින් පාංශු හා ජල සම්පත් සංරක්ෂණය සහතික කිරීම.
- අනාගත දැව අවශ්‍යතා අඛණ්ඩව සපුරා ගැනීම උදෙසා වන සම්පත් විද්‍යාත්මක පදනමින් කළමනාකරණය කිරීම සහ ඒවායේ තිරසාර සංවර්ධනය සහතික කිරීම.
- සියලු වන සම්පත් සංවර්ධනයට මෙන්ම භාවිතයට ගන්නා අවස්ථාවලදී ජෛව හා ජාන විවිධත්වය රැක ගැනීම සහ පාංශු හා ජල සම්පත් සංරක්ෂණය උදෙසා අවශ්‍ය පාරිසරික ආරක්ෂණ ක්‍රම යොදා ගන්නා බවට වගබලා ගැනීම.
- වන සම්පත් තිරසාර සංවර්ධනයට ලක් කිරීම සඳහා අවශ්‍ය වන, වන විද්‍යා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.
- වන සම්පත් සංවර්ධනය උදෙසා දායක වන්නා වූ අනෙකුත් ආයතන සමඟ ව්‍යාත්තීය මට්ටමින් සම්බන්ධතා පවත්වාගෙන යාම.
- ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නංවාලීම උදෙසා වන සංරක්ෂණය, කළමනාකරණය හා සංවර්ධනය ඉලක්ක කොටගත් ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- වන සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ අවබෝධය හා හැකියාවන් ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනික හා ව්‍යාප්ති වැඩසටහන් මෙහෙයවීම.
- තත්කාලීනව බලපවත්නා වන සංරක්ෂණ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව වන සම්පත් ආරක්ෂා කිරීම.
- ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කොට, සංරක්ෂණ ක්‍රියාවලියට අවහිර නොවන අයුරින් පරිසර සංචාරක කටයුතු පවත්වාගෙන යාම.
- පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් වන සංවර්ධන ක්‍රියාවලීන් ප්‍රවර්ධනයට පියවර ගැනීම.

(iv) ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තියේ සහ වන සංරක්ෂක ආඥාපනත අනුව වන සම්පත් ස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම හා ඒවායේ තිරසර කළමනාකරණය සඳහා ද මහජනතාවට වනජ ද්‍රව්‍ය තිරසරව භාවිත කිරීමට ද ප්‍රතිපාදන සලසා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට ඉතා පැහැදිලි පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, මා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කය ගත්තත්, ඉන් පිටත ගත්තත් අපි දකින දෙයක් තමයි,

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබෙන ඉඩම් ගොවීන් සහ විවිධ පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කර ගැනීම. මේ ක්‍රියාවලියේ තිබෙන ඉතාම බේදනීය කාරණය තමයි, ඒ අත්පත් කර ගන්නා ඉඩම් ඒ පුද්ගලයන් විසින් පිටස්තර පුද්ගලයන්ට -විශේෂයෙන්ම දිස්ත්‍රික්කයෙන් පිටත ඉන්න පුද්ගලයන්ට- විකිණීම. එහිදී අක්කරයේ ඉඳලා අක්කර 50, 60, 100 දක්වා වූ විශාල ඉඩම් විකිණීම් එක්තරා අන්දමකට ජාවාරමක් විධියටත් ක්‍රියාත්මක වෙනවා. එතැනදි තවත් බරපතළ දෙයක් සිදුවනවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව තිබෙන ඒ ඉඩම් විශාල ප්‍රමාණයෙන් අත්පත් කර ගන්නා පුද්ගලයින් එම ඉඩම් වට කරලා ඔවුන්ගේ මායිම -සීමාව- දක්වමින් පෞද්ගලිකව විදුලි වැටවල් ඉදිකිරීමේ ක්‍රියාවලියකුත් සිද්ධ වෙනවා. ඒ නිසා වනඅලින්ගේ සංචරණයට දැඩි බාධා සිද්ධ වෙනවා. අපේ දිස්ත්‍රික්කය තුළ විශාල වනඅලි ගැටලුවක් නිර්මාණය වෙන්න ඒකත් බලපා තිබෙනවා. මේ තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා ගන්නා පියවර සහ ක්‍රියාමාර්ග මොනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉඩම් නීති විරෝධීව අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් අපි නිරීක්ෂණය කරලා තිබෙනවා. නීති විරෝධීව ඒ ඉඩම් අත්පත් කර ගන්නා පිරිස්වලට විරුද්ධව නීතිමය කටයුතු කරලා, ඒ ඉඩම් නැවත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ලබා ගැනීමටත්, ඒ වාගේම ඒ ඉඩම්වල වන වගා කටයුතු සිදු කිරීමටත් අපි කටයුතු කරනවා. ඔබතුමා කිව්වා වාගේම, මෙය පසුගිය කාලයේ ටිකක් බරපතළ විධියට සිදු වෙලා තිබෙනවා. ඒ නිසාම සැලකිය යුතු තරම් වන ආවරණ ප්‍රමාණයක් විනාශයට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම ඔබතුමා කියපු ආකාරයට වනඅලි ගැටලුවත් තිබුණාට වඩා වැඩි වෙලා -තීව්‍ර වෙලා- තිබෙනවා. අපි පරිසර අමාත්‍යාංශය හැටියටත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හැටියටත් ඒක විශේෂ ගැටලුවක් හැටියට හඳුනාගෙන තිබෙනවා. ඒ නිසා එක පැත්තකින් මේ ඉඩම් ඉක්මනින්ම යළි අත්පත් කරගෙන, ඒ අයට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නත්, එම ඉඩම්වල යළි වන වගා කරන්නත් කටයුතු කරනවා. ඒ වාගේම අලි කොරිඩෝ ඇති කිරීම සඳහා වෙන් කරපු ඉඩම් හඳුනා ගෙන, අලි ඇතුන් සංරක්ෂණයට අවශ්‍ය ක්‍රියාමාර්ග සහ අලි-මිනිස් ගැටුම අවම කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙනුත් අපි සැලකිලිමත් වෙලා තිබෙනවා.

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ක වනඅලි ගැටලුව සහ වන ඉඩම් ගැටලුව සම්බන්ධව කථා කරනකොට අපි දැකපු දේ තමයි, ඔවුන් සතුව ඉන්න නිලධාරීන් සංඛ්‍යාවේ අඩුවක් තිබෙනවා කියන එක. විශේෂයෙන්ම "වන ක්ෂේත්‍ර නිලධාරී" කියන තනතුර හොබවන නිලධාරීන් සංඛ්‍යාව භාගයකටත් වඩා අඩුවෙන් තමයි ඔවුන් සතුව ඉන්නේ.

ඒ නිසා ඔවුන්ට විශේෂයෙන් වන ආරක්ෂණ කටයුතු, වනය ආරක්ෂා කර ගැනීමේ කටයුතු සම්බන්ධව බරපතළ අභියෝගයක් එල්ල වෙලා තිබෙන බව තමයි ඔවුන් ප්‍රකාශ කළේ. ඒ එක්කම ඔවුන්ට ලබා දෙන ඉන්ධන ප්‍රමාණය හා විවිධ පහසුකම්වලත් යම් ආකාරයක වැඩි කිරීමක් කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් හොඳයි කියාත් ඔවුන් ප්‍රකාශ කළා. මේ නිසා, විශේෂයෙන්ම වන ක්ෂේත්‍ර නිලධාරීන් ඇතුළුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තිබෙන පුරප්පාඩු පිරවීම සඳහා යම් ක්‍රමවේදයක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හිඟය සම්බන්ධයෙන් මතු වී ඇති ගැටලුව අපි පසුගිය කාලයේ විශේෂ ගැටලුවක් ලෙස හඳුනා ගත්තා. ප්‍රමාණවත් මානව සම්පතක් ඒ දෙපාර්තමේන්තුව සතුව නැහැ. ඒ නිසා අපි මේ සම්බන්ධයෙන් රජයත් සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. කොයි තරම් පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙනවාද සහ ප්‍රශස්ත ලෙස මේ කටයුතු ඉටු කරද්දි තවත් කොයි තරම් ප්‍රමාණයක් අවශ්‍ය ද කියන එක පිළිබඳව අවබෝධය ඇතිව මේ වනවිටත් ඒ සඳහා බඳවා ගැනීම් කරන්න ඉල්ලීම් කරලා තිබෙනවා. රජයේ අවසරය ලැබුණු වහාම ඒ සඳහා අපි කටයුතු කරනවා. ඔබතුමා කිව්වා වාගේ මානව සම්පත් හිඟයක් තිබෙනවා. නමුත් අපි ඒකට මැදිහත්ව ඉන්නවා. රජයේ අවසරය ලැබුණු වහාම අපි ඒ බඳවා ගැනීම් කරන්න සූදානම්. ඒ වාගේම දීමනා සම්බන්ධයෙන් ඔබතුමාගේ යෝජනාව අපි සලකා බලන්නම්. ඒ තිබෙන දුෂ්කරතා මොනවාද කියලා යළි හඳුනා ගැනීමක් කරගෙන ඔවුන් සමඟ සාකච්ඡා කරලා, ඒ සම්බන්ධයෙනුත් දෙන්න පුළුවන් සහනය මොකක්ද කියලා සලකා බලන්න අපි පොරොන්දු වෙනවා.

මෝදර සහ මාලිගාවත්ත ප්‍රදීපා ශාලා: බදුදීම
மோதர மற்றும் மாளிகாவத்தையிலுள்ள பிரதீபா மண்டபங்கள்: குத்தகை
PRADEEPA HALLS IN MODARA AND MALIGAWATTA: LEASE

449/2025

4. ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු මෝදර සහ මාලිගාවත්ත පිහිටි ප්‍රදීපා ශාලා වසර 30ක කාලයක් සඳහා බදු පදනම මත දේශපාලන හිතවතුන්ට ලබා දී තිබේද;

(ii) ඒවා බදු පදනම මත ලබා දීමට පෙර රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ඒවායේ තක්සේරු වටිනාකම් ලබාගෙන තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ප්‍රදීපා ශාලාවේ තක්සේරු වටිනාකම් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ප්‍රදීපා ශාලා බදු දීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ, මත්තේගොඩ නිවාස සංකීර්ණයේ, බෞද්ධ මන්දිරයට යාබදව පිහිටි පර්චස් 116ක් විශාලත්වයෙන් යුතු ඉඩමේ පර්චසයක් රුපියල් ලක්ෂ 5 බැගින් ලබා දී තිබේද;

(ii) එම ඉඩම් කොටස් ලබා දී ඇත්තේ කවුරුන් වෙතද;

(iii) ඒවා නිවාස සැදීමේ අරමුණ සඳහා ලබා දී තිබේද;

(iv) ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන තක්සේරු කරුගෙන් තක්සේරු වටිනාකම් ලබාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු පද්මසිරි බණ්ඩාර මහතා]

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான மோதர மற்றும் மாளிகாவத்தையில் அமைந்துள்ள பிரதீபா மண்டபங்கள் அரசியல் ஆதரவாளர்களுக்கு 30 வருட காலத்துக்குக் குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ளனவா;

(ii) இவற்றை குத்தகை அடிப்படையில் வழங்குவதற்கு முன்னர், இவற்றின் மதிப்பீட்டுப் பெறுமதி அரசாங்கத்தின் பிரதம மதிப்பீட் டாளரிடமிருந்து பெற்றுக்கொள்ளப்பட்டுள்ளதா;

(iii) ஆமெனில், மேற்படி ஒவ்வொரு பிரதீபா மண்டபத்தினதும் மதிப்பீட்டுப் பெறுமதி தனித்தனியாக யாது;

(iv) மேற்படி பிரதீபா மண்டபங்களை குத்தகைக்கு வழங்குகையில் முறையான பெறுகைச் செயன்முறை பின்பற்றப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையின் மத்தேகொட வீடமைப்புத் தொகுதியில் பௌத்த மையத்துக்கு அண்மித்தாக அமைந்துள்ள 116 பேர்ச்சஸ் பரப்பளவிலான காணியில் ஒரு பேர்ச்சஸ் தலா ரூ. 5 இலட்சத்துக்கு வழங்கப்பட்டுள்ளதா:

(ii) மேற்படி காணித் துண்டுகள் யாருக்கு வழங்கப்பட்டுள்ளன;

(iii) இவை வீடுகளை நிர்மாணிக்கும் நோக் கத்துக்காக வழங்கப்பட்டுள்ளனவா;

(iv) இது தொடர்பில் அரசாங்கத்தின் பிரதம மதிப்பீட்டாளரிடமிருந்து மதிப்பீட்டுப் பெறுமதி பெற்றுக்கொள்ளப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether Pradeepa Halls located in Modara and Maligawatta, which belong to the National Housing Development Authority, have been leased out to political cronies for a period of 30 years;

(ii) whether valuation assessments of the said halls had been obtained from the Government Chief Valuer before they were leased out;

(iii) if so, the assessed value of each of those Pradeepa Halls, separately; and

(iv) whether a formal procurement procedure had been adopted in leasing out the said Pradeepa Halls?

(b) Will he also inform this House -

(i) whether the 116-perch land adjacent to the Buddhist Centre in the Maththegoda Housing Complex of the National Housing Development Authority had been sold at Rs. 500,000 per perch;

(ii) the names of the persons to whom the said plots of land had been sold;

(iii) whether those lands had been sold to be used for the purpose of building houses; and

(iv) whether valuation assessments had been obtained in that regard from the Government Chief Valuer?

(c) If not, why?

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) මෝදර ප්‍රදීපා ශාලාව - රජයේ තක්සේරුව ලබාගෙන නැත. (ප්‍රදීපා ශාලාව පිහිටි ඉඩමේ අයිතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත සම්පූර්ණයෙන්ම පැවරී නොමැති බැවින් රජයේ තක්සේරුව ලබා ගැනීමට නොහැකි වී ඇත.)

මාලිගාවත්ත ප්‍රදීපා ශාලාව - රජයේ තක්සේරුව ලබාගෙන නැත. (මේ වනවිට දේපළට අදාළ තක්සේරු වටිනාකම ලබා ගැනීම සඳහා අවශ්‍ය මූනුම් සිතියම් සකස් කර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.)

(iii) මෙතෙක් තක්සේරු වටිනාකම ලැබී නැත.

(iv) නියමිත පරිදි ඉඩමේ අයිතිය හා පැවරීම් කටයුතු සිදුව නොමැති බැවින් -ජාතික නිවාස සංවර්ධන අධිකාරියට පැවරිලා නැති නිසා- ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නැත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ප්‍රදීපා ශාලා බදු බදනම් මත ලබා දීමට කටයුතු කර ඇත.

(ආ) (i) නැත. වාර්ෂික බදු කුලිය රුපියල් 453,000.00ක් වන සේ පර්චස් 109.71ක බිම් ප්‍රමාණයක් බදු පදනම් මත ලබා දී ඇත.

(ii) "පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි පදනම්" වෙත තමයි භාර දීලා තිබෙන්නේ.

(iii) නැත.

නමුත් සාමාන්‍යයෙන් නිවාස ව්‍යාපෘතියක් භදනකොට ඒ නිවාස ව්‍යාපෘතියේ අයගේ සුබසාධන කටයුතු, ආගමික කටයුතු සඳහාත් වෙන් කරන්න අවශ්‍යයි. ඒ අනුව මත්තේගොඩ නිවාස සංකීර්ණයේ පිහිටි බෞද්ධ මධ්‍යස්ථානය හා ඊට අනුබද්ධව පවත්වාගෙන යනු ලබන සිරිසුමන දහම් පාසලේ කාර්යයන් වඩාත් පුළුල්ව පවත්වාගෙන යෑම සඳහා තමයි ඒ බදු පදනම්න් ලබා දීලා තිබෙන්නේ.

(iv) ඔව්.

කලින් පැහැදිලි කළ විධියට ලබාගෙන තිබෙනවා. බදු පදනමින් ලබා දීම සඳහා රජයේ තක්සේරුකරුගේ බදු තක්සේරුව 2023.01.25 දිනැතිව ලබාගෙන, ඒ අනුව ගිවිසුම්ගතව ඇත. එහි වාර්ෂික බදු කුලිය රුපියල් 453,000.00කි.

(ඇ) අදාළ නොවේ.

ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)

ගරු ඇමතිතුමනි, පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි. මට අහන්න අතුරු ප්‍රශ්න නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -453/2025- (1), ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

වතුකරයේ නිවාස නොමැති පවුල්: නිවාස ලබා දීම
தோட்டப் பகுதிகளிலுள்ள வீடற்ற குடும்பங்கள்: வீடுகள் வழங்குதல்
HOMELESS FAMILIES IN ESTATE AREAS: PROVISION OF HOUSES

453/2025

5. ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය (ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය වෙනුවට)
(மாண்புமிகு (திருமதி) நிலூஷா லக்மாலி கமகே - மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல் சார்பாக)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage on behalf of the Hon. (Ms.) Ambika Samivel)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විවිධ ස්වාභාවික සහ සමාජ ගැටලු හේතුවෙන් කඳුකරයේ වතු ආශ්‍රිතව ජීවත් වන ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වී සිටින බව දන්නේද;

(ii) එම ජනතාවගෙන් නිවාස අහිමි පුද්ගලයන් සහ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් තාවකාලික නිවාසවල පදිංචි වී සිටින කාලය කොපමණද;

(iv) එම ජනතාවට නිවාස ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல்வேறு இயற்கை மற்றும் சமூகப் பிரச்சினைகள் காரணமாக மலையகப் பெருந்தோட்டங்களில் வசிக்கின்ற மக்கள் பாரிய அளவில் பாதிக்கப்பட்டுள்ளனர் என்பதையும்;

(ii) பாதிக்கப்பட்டவர்களில் வீடுகளை இழந்த தனிநபர்கள் மற்றும் குடும்பங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) அவர்கள் எவ்வளவு காலமாக தற்காலிக வீடுகளில் வசித்து வருகின்றனர் என்பதையும்;

(iv) மேற்படி மக்களுக்கு வீடுகளை நிர்மாணித்துக் கொடுப்பதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether he is aware that the people living in the estate areas of the hill country are severely affected by various natural and social problems;

(ii) the number of homeless individuals and families among the aforementioned community, separately;

(iii) the duration which they have been residing in temporary houses; and

(iv) the measures that will be taken to provide those people with housing?

(b) If not, why?

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්, අප ඒ පිළිබඳව දැනුවත්.

(ii)
- කැගල්ල : ලැවන්ටි වතුයාය - පවුල් 22
- බදුල්ල : පූනාගල වතුයාය - පවුල් 51
  දබෙතැන්න වතුයාය - පවුල් 65
- නුවරඑළිය : වෙදමුල්ල වතුයාය - පවුල් 105

(iii) වසර 2 -5 අතර කාලයක් පමණ.

(iv)
- මෙම වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ආපදා අවදානම් නිවාසවල ජීවත් වන පවුල් 3,627ක් සඳහා නිවාස ඉදිකිරීමට යෝජනා කර ඇත.
- ඒ අතරින් ලැවන්ටි සහ පූනාගල වතුයායේ නිවාස ව්‍යාපෘති ශ්‍රී ලංකා රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

2025.02.05 දින ගරු රවි කරුණානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රකාශය

2025.02.05ஆம் திகதி மாண்புமிகு ரவி கருணாநாயக்கவால் கேட்கப்பட்ட வினா: மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

QUESTION POSED BY HON. RAVI KARUNANAYAKE ON 05.02.2025: STATEMENT BY HON. PRIME MINISTER

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රවී කරුණානායක මැතිතුමා විසින් 2025.02.05 දින අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට මම කල් ගත්තා. දැන් එම පිළිතුර ලබා දීමට මම බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, වර්තමානයේ මුහුණ දී ඇති ණය අර්බුදයෙන් මිදීමට ඇති එකම මාර්ගය අපනයන වර්ධනය කිරීම පමණක් නොවන අතර, විදේශ විනිමය උපයා ගැනීම සඳහා භාවිත කළ හැකි අනෙකුත් විකල්ප මාර්ගයන් පිළිබඳව රජය විසින් අවධානය යොමු කරමින් පවතී.

අපනයනකරුවන් මුහුණ දෙන විවිධ ගැටලු සඳහා විසඳුම් ලබා දීමට රජය විසින් පියවර ගනිමින් සිටින අතර, ඒ සඳහා 2025 අය වැය තුළින් ද විශේෂ අවධානය යොමු කර අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට බලාපොරොත්තු වේ.

ගරු කථානායකතුමනි,

01. දේශීය මිල ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇති ව්‍යවස්ථාපිත ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවයි. රටේ පොලී අනුපාතික බොහෝ දුරට තීරණය වන්නේ මහ බැංකුව විසින් ගනු ලබන එවැනි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මඟිනි.

- ශ්‍රී ලංකා මහ බැංකුව අඩු උද්ධමන පිඩනය මධ්‍යයේ සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල යථා තත්ත්වයට පත්වීමට සහාය දැක්වීමේ අරමුණින් 2023 ජූනි මාසයේ සිට ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කර ඇත. ඒ අනුව, 2023 ජූනි මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික සියයට 7.75කින් අඩු කර ඇත.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින්, ඉතිහාසයේ පැවති සාමාන්‍යයන් කරා ළඟා වෙමින්, වෙළෙඳ පොළ පොලී අනුපාතික සැලකිය යුතු අඩුවීමක් වාර්තා කරමින් බොහෝ දුරට සාමාන්‍යකරණය වී ඇත.
- අඩු පොලී අනුපාතිකවල බලපෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ණය ගැනීමේ පිරිවැය අඩුවීම මෙන්ම ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2024 වසර තුළදී රුපියල් බිලියන 790කින් පමණ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.
- 2024 තුළදී ආර්ථිකය සියයට 5කින් පමණ වර්ධනය වී ඇතැයි අපේක්ෂා කෙරේ.
- පොලී අනුපාතික තවදුරටත් අඩු කිරීම සඳහා වන ප්‍රතිපත්ති තීරණ ප්‍රධාන වශයෙන් උද්ධමනයේ වර්ධනයන්, උද්ධමන අපේක්ෂා සහ රටේ සාර්ව ආර්ථික වර්ධනයන් මත තීරණය වේ.
- වෙළෙඳ පොළ ණය පොලී අනුපාතික සහ තැන්පතු අනුපාතික එකිනෙකට සම්බන්ධ වේ. වෙළෙඳ පොළ ණය පොලී අනුපාතික අඩු කිරීම අරමුණු කර ගත් ඕනෑම ප්‍රතිපත්තිමය පියවරක් වෙළෙඳ පොළ තැන්පතු පොලී අනුපාතික අඩු කරයි. එබැවින්, එවැනි අඩු වෙළෙඳ පොළ පොලී අනුපාතික ස්ථාවර ආදායම් ලබන්නන්ට, විශේෂයෙන්ම පොලී ආදායම මත යැපෙන ජනගහනයට බලපානු ඇත.
- ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක පොලී අනුපාත මට්ටම තීරණය වන්නේ ආර්ථික සාධක ගණනාවක එකතුවකිනි. එම ආර්ථික සාධක අතරට ජාත්‍යන්තර ආයෝජකයන් විසින් රටට නියම කරන ලද අවදානම් අධි මිල, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, රජයේ ණය ගැනීම් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, වෙළෙඳ පොළ තත්ත්වයන්, රටේ ණය ශ්‍රේණිගත කිරීම්, ගෝලීය පොලී අනුපතික ප්‍රවණතා සහ ප්‍රාග්ධන ප්‍රවාහ වැනි බාහිර විදේශීය සාධක ඇතුළත් වේ.

ගරු කථානායකතුමනි, දෙවැනි ප්‍රශ්නයට ගරු ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා ඇමතිතුමාත් කිහිප වතාවක් උත්තර දුන්නා. නමුත්, මම තව විස්තර ඉදිරිපත් කරන්නම්.

02. කොළඹ වරායේ සිට බහලුම්ගත භාණ්ඩ නිශ්කාසනයේදී සිදු වන ප්‍රමාදයන් පිළිබඳ ගැටලු සඳහා පිළියම් ලෙස රජය විසින් පහත පරිදි කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇත.

<u>කෙටි කාලීන ක්‍රියාමාර්ග</u>

(i) සතියේ සෑම දිනකම දවසේ පැය 24 පුරා භාණ්ඩ පරීක්ෂා කිරීමේ අංගණ මෙහෙයුම් කිරීම සහ රේගු කාර්යමණ්ඩලය සහ භාණ්ඩ නිෂ්කාසන ක්‍රියාවලියට අදාළ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් ඒ සඳහා යෙදවීම.

(ii) රේගු නිෂ්කාසන ක්‍රියාවලිය සිදු කළ යුතු බහලුම් රඳවා ගැනීම සඳහා පෑලියගොඩ පිහිටි ඒෂියන් බහලුම් අංගනයේ -Asian Container Yard හි- ඇති ඉඩ පහසුකම් භාවිතයට ගැනීම.

(iii) රේගුවේ භාණ්ඩ නිෂ්කාසනය කඩිනම් කිරීම සඳහා සහාය වීමට සියලු පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම.

(iv) භෞතික පරීක්ෂා කිරීම සිදු කිරීමට අවශ්‍ය බහලුම් ධාරිතාව අඩු කිරීම සඳහා රේගුවේ අවදානම් කළමනාකරණ පද්ධතියේ ඇති වරණීයතා ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.

<u>මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග</u>

(i) අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසුව නිදහස් කිරීමට ඇති බහලුම් පටවන ලද ලොරි නවතා තැබීම සඳහා වරායේ පිටවන ගේට්ටුව ආසන්නයේ ඇති බලූමැන්ඩල් ප්‍රදේශයේ ඉඩමක් වෙන් කිරීම.

(ii) රේගුවෙන් සහ අනෙකුත් රාජ්‍ය ආයතන මඟින් නිෂ්කාසනය කළ යුතු වන බහලුම් රඳවා තැබීම සඳහා අමතර ඉඩමක් අත් පත් කර ගැනීමේ හැකියාව සොයා බැලීම.

<u>දිගු කාලීන ක්‍රියාමාර්ග</u>

(i) රේගුව සඳහා අතිනවීන බහලුම් පරීක්ෂා කිරීමේ පහසුකමක් කෙරවලපිටියේ ඉදිකිරීම.

(ii) අධිඅවදානම් බහලුම් වරණීයතා ක්‍රියාවලියේ ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ඇති අවදානම් කළමනාකරණ පද්ධතිය ස්වයංක්‍රියකරණය.

(iii) බහලුම්වල අඩංගු භාණ්ඩ හඳුනා ගැනීමේ නිරවද්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා දැනට භාවිත කරන බහලුම් පරිලෝකන යන්ත්‍රවලට - container scanners - කෘත්‍රිම බුද්ධිය ඒකාබද්ධ කිරීම.

(iv) බහලුම් පරිලෝකනය කිරීමේ ධාරිතාව අපේක්ෂිත මට්ටමට වැඩි දියුණු කිරීම සඳහා රේගුව සඳහා අමතර පරිලෝකන යන්ත්‍ර ලබා ගැනීම.

03. 2025 ජනවාරි 29වන දින ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලද පරිදි "ව්‍යාපාර කිරීමේ පහසුව" -ease of doing business- කඩිනම්කරණය සඳහා රජය විසින් ගනු ලබන පියවර පහත පරිදි දක්වමි.

රාජ්‍ය ආයතන සහ ඒ ආශ්‍රිත ආයතන ශීඝ්‍රයෙන් ඩිජිටල්කරණය කිරීම රටේ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම ආයතන ඔවුන්ගේ තාක්ෂණික හැකියාවන් මත පදනම්ව කොටස් දෙකකට වර්ග කළ හැකි ය. එනම්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ - ICT - යටිතල පහසුකම් සංවර්ධනය කර ඇති සහ එවැනි පහසුකම් නොමැති ආයතනය.

ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහිත සමහර රාජ්‍ය ආයතන ජාතික ගෙවීම් පද්ධතියට සම්බන්ධ කර ඇත. ජංගම ගිණුම් සහ ඉතිරි කිරීමේ ගිණුම් -CASA - හරහා බාධාවකින් තොරව මහ ජනතාවට ඩිජිටල් ගනුදෙනු ආකාරයට මෙම ආයතන වෙත ගෙවීම් කිරීමට හැකියාව ඇත.

2024 වසරේදී මෙම ආයතනවලට ලැබුණු ඩිජිටල් ගෙවීම්වල මුළු වටිනාකම රුපියල් ට්‍රිලියන 1.78ක් සහ 2023 වසරේදී රුපියල් බිලියන 828කි. ඒ අනුව 2024දී මෙම ආයතනවලට ලද ඩිජිටල් ගනුදෙනුවල වටිනාකම 2023 වසරට සාපේක්ෂව සියයට 100ටත් වඩා වැඩි අගයක් ගනී. ජාතික ගෙවීම් පද්ධතියට සම්බන්ධ ප්‍රධාන රාජ්‍ය ආයතන කිහිපයක් සහ 2024 වසරේදී ඒවාට ලද ඩිජිටල් ගෙවීම් පහත පරිදි වේ.

ආයතනය	මුදල (රුපියල් බිලියන)
ශ්‍රී ලංකා රේගුව	1,100
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	618
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	19
සේවක අර්ථසාධක අරමුදල	41

රාජ්‍ය ආයතන සහ සාමාන්‍ය ජනතාව අතර මුදල් රහිත ගනුදෙනු තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව -GovPay- හඳුන්වා දී ඇත. මෙම වේදිකාව මාර්ගගත ගෙවීම් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ හැකියාවන් තවමත් නොමැති ආයතන සඳහා ඩිජිටල් ගෙවීම් ලබා ගැනීම සඳහා පහසුකම් සපයයි. ගරු ජනාධිපතිතුමා 2025 පෙබරවාරි 07 වන දින මෙම පද්ධතිය නිල වශයෙන් දියත් කර ඇත.

ඩිජිටල් ගෙවීම් භාවිතය වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ආයතන සමඟ එක්ව ඩිජිටල් ගෙවීම් පිළිබඳ දැනුවත්භාවය සහ භාවිතය වැඩි කිරීම අරමුණු කරගත් ප්‍රවර්ධන වැඩසටහන් අඛණ්ඩව සිදු කරයි.

ආයෝජකයන් සඳහා සේවා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ආයෝජන අනුමැතියේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ආයෝජන මණ්ඩලය ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ 27වන මහලේ ආයෝජක පහසුකම් මධ්‍යස්ථානය - IFC - පිහිටුවා ඇත. ආයෝජකයන් සඳහා පළමු සම්බන්ධතා සිදු වන ස්ථානය ලෙස IFC ක්‍රියා කරන අතර, එහිදී ආයෝජන මණ්ඩලයේ අදාළ නිලධාරීන් එක් ස්ථානයකදී ආයෝජකයන් හමු වී ව්‍යාපෘති අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය සහාය සහ මග පෙන්වීම සපයයි.

ආයතන කිහිපයක අනුමැතීන් අවශ්‍ය සංකීර්ණ ව්‍යාපෘති සඳහා ආයෝජක පහසුකම් සම්බන්ධීකරණය කිරීමේ කමිටුව - IFCC - අදාළ රාජ්‍ය ආයතන සමඟ සන්ධානය වී අනුමැතීන් වේගවත් කිරීමට කටයුතු කරයි. මධ්‍යගත වේදිකාවක් ලෙස ක්‍රියා කරමින් IFCC ආයෝජනයන්ට නැවත නැවත භෞතිකව රේඛීය ආයතන වෙත නොයා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට පහසුකම් සලසයි.

කෙසේ වෙතත්, සමහර ආයෝජන සම්බන්ධ අනුමැතීන් සඳහා ඉහළ පෙළේ රජයේ මැදිහත් වීමක් අවශ්‍ය විය හැක. මෙවැනි අවස්ථා විසඳීමට ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැබිනට් උපකමිටුවක් පිහිටුවන ලෙස යෝජනා කර ඇත. මෙම උපකමිටුව කාර්තුවකට වරක් රැස්වීමට නියමිතය.

තවද, ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඩිජිටල්කරණය කිරීමට ආයෝජන මණ්ඩලය විසින් ආරම්භ කර ඇති අතර, එහිදී ආයෝජකයාට තම ආයෝජන ඉල්ලුම් පතෙහි වර්තමාන ප්‍රගතිය පරීක්ෂා කිරීමේ පද්ධතිය ඇතුළුව ආයෝජන අයදුම් පත් මාර්ගගතව ඉදිරිපත් කිරීමේ පහසුකම ලබා ගත හැකිය.

04. දවසේ පැය 24 පුරා බහලුම් මුදා හැරීම හෙවත් භාණ්ඩ නිෂ්කාශනය සඳහා අවසර ලබා දිය හැකිය. කෙසේ වුවද, මෙම කාර්යය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව යෙදවීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වැඩි කළ යුතුය.

භාණ්ඩ මෙරටට ළඟා වීමට පෙර නිෂ්කාශනය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් ශ්‍රී ලංකා රේගුවේ පවතී. කෙසේ වුවද, දැනට පවත්නා නීති රීති මඟින් එකී ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසෙන්නේ නැත. ශ්‍රී ලංකා රේගුව දැනටමත් මේ සඳහා රේගු ආඥාපනතට අවශ්‍ය සංශෝධන කෙටුම්පත් කර ඇති අතර, පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා එය මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කෙරෙමින් පවතී. වෙළෙඳාම පහසු කරන මෙවලමක් ලෙස පශ්චාත් නිෂ්කාසන විගණනය දැනටමත් ශ්‍රී ලංකා රේගුවේ සිදු කෙරෙමින් පවතින අතර, අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශය විසින් එකී කාර්යයන් ක්‍රියාත්මක කරයි.

ඊළඟට, ගරු රවි කරුණානායක මැතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයේ 05වැනි කොටසට පිළිතුර,-

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු අගමැතිතුමියනි, මීට පෙර ඒ සම්බන්ධයෙන් මට සවිස්තරව තොරතුරු දීලා තිබෙන නිසා මේ වෙලාවේ කාරණා දෙකක් ගැන මට ඔබතුමියගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන් නම් හොඳයි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
පැහැදිලි කරගන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා.

ඔබතුමා එදා තවත් අතුරු ප්‍රශ්නයක් මට යොමු කළා. ඒ ප්‍රශ්නයට ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දෙයි. ඊට පස්සේ ඔබතුමාගේ කාරණා දෙක පැහැදිලි කරගන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, ගරු අගමැතිතුමියනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් 2025.02.05වන දින ස්ථාවර නියෝග 38 යටතේ ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කරනු ලැබූ ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය සඳහා නව ස්වයංක්‍රිය පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයේ අංක 1540 දරන යෝජනාව සම්මත කර ඇත. එම යෝජනාවේ අවශ්‍යතාව සපුරාලීම සඳහා ආධාර සැපයීම අරමුණු කොට ගෙන එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන අපනයන පාලන හා ආශ්‍රිත දේශ සීමා ආරක්ෂක කාර්යාංශය විසින් පරිත්‍යාගයක් ලෙස අවශ්‍ය දෘඪාංග සහිත මෘදුකාංගයක් ලබා දීමට කටයුතු කර ඇත. එම පද්ධතිය ලබා දීම සඳහා 2023 ජනවාරි 23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර, ඊට පෙර 2019.09.03 දින එම වැඩසටහන වෙතින් අවශ්‍ය පුහුණු හා තාක්ෂණික උපදෙස් ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණ හා පත්‍රිකා ඇමුණුම 1 හා 2 ලෙස **සභාගත*** කරමි.

ගරු කථානායකතුමනි, USAID එකෙන් ලැබුණු ආධාරයක් පිළිබඳව ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම තවත් පැහැදිලි කිරීමක් කරන්නම්.

යොමුගත පරිත්‍යාගයට අනුව 2024 වර්ෂය තුළ ආනයන හා අපනයන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් රුපියල් මිලියන 6.18ක් වටිනා ලැප්ටොප් පරිගණක 20හි වටිනාකම ගිණුම්ගත කිරීමටත්, පළමු අදියරෙහි මෘදුකාංග සංවර්ධන කටයුතු අවසාන කිරීම වෙනුවෙන් දරන ලද රුපියල් මිලියන 13.69ක පිරිවැය ගිණුම්ගත කිරීමටත්, වත්කම් රජයේ පොත්වලට ඇතුළත් කිරීමටත් හැකි වන පරිදි මූල්‍යකරණ 13හි විදේශ ප්‍රදාන යටතේ රුපියල් මිලියන 19.88ක ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවා තිබූ ඉල්ලීම සලකා බලා 2024.12.19 දිනැති අමතර අය වැය ප්‍රතිපාදන ලිපි අංක 1601 නිකුත් කර ඇත.

එම ලේඛනය ඇමුණුම 03 ලෙස **සභාගත*** කරමි.

ගරු කථානායකතුමනි, ඒ අනුව, යොමුගත අමතර ප්‍රතිපාදන, ඒ වන විටත් ලැබී තිබූ ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ලබා දී ඇති බව සඳහන් කරමි. එසේම එම ප්‍රතිපාදන අදාළ වන්නේ 2024 වර්ෂය සඳහා බවත් සඳහන් කරමි.

ගරු කථානායකතුමනි, තවද, ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපතිතුමාගේ ආධාර සැපයීම සම්බන්ධ වන විධායක නියෝගය හේතුවෙන් USAID මඟින් ශ්‍රී ලංකා රජය වෙත සපයනු ලබන ආධාරවලට සිදු වන බලපෑම සම්බන්ධව මෙතෙක් USAID වෙතින් ශ්‍රී ලංකා රජය වෙත ලිඛිත දැනුම් දීමක් ලබා දී නොමැත. ආධාර ලබා ගැනීමේදී USAID සමඟ එළඹී ඇති ගිවිසුම් ප්‍රකාරව එවැනි අත්හිටුවීමක් කරන්නේ නම් ශ්‍රී ලංකා රජය වෙත ලිඛිත දැනුම් දීමක් සිදු කිරීමට USAID විසින් එකඟ වී ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු අගමැතිතුමියනි, ඔබතුමිය මගේ පළමු ප්‍රශ්නයට දෙන ලද උත්තරයේ කිව්වා, මේ රටේ පොලී අනුපාතය සියයට 7.75කින් අඩු වෙලා තිබෙනවා කියලා. නමුත්, පොලී අනුපාතය තිබුණේ සියයට 11ට නම් සියයට 30 දක්වා වැඩි වෙලා, දැන් අඩු වෙලා තිබෙන්නේ සියයට 7ත්, 8ත් අතර ප්‍රමාණයකට. අපි තරග කරන කලාපයේ ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය වාගේ රටවල සියයට 5ත්, 7ත් අතර පොලී අනුපාතයක් තිබෙනකොට අපේ පොලී අනුපාතය තවම සියයට 16ත්, 20ත් අතර ප්‍රමාණයක්. ගරු අගමැතිතුමියනි, මේ රටේ නිෂ්පාදකයන්ට තරගකාරීත්වයක් ඇති කරන්න මීට වැඩිය අඩු පොලී අනුපාතයක් ඇති කරන්න පුළුවන් ස්වරූපය ඇති කරන්නේ කොහොමද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා, එතුමාට තව විස්තර සපයන ලෙස.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මීට පෙර වතාවකත් අපෙන් මේ සම්බන්ධ විමසීම් කළා, ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව සම්බන්ධයෙන්. එම ප්‍රශ්නවලටත් පිළිතුරු දීම තුළින් අපි සඳහන් කරන්නට යෙදුණේ, වර්තමාන රජයේ බලාපොරොත්තුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයාට විශේෂයෙන්ම හැකියාව ලැබෙන පරිදි financing cost එක මූල්‍යනය කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දීමට. ඒ තුළින් ව්‍යාපාර ප්‍රසාරණය කිරීමට, අලුතින් ආයෝජනය කිරීමට, අලුත් වෙළෙඳ පොළවල් -markets- සොයාගෙන යෑමට හැකිවන පරිදි එම පොලී අනුපාතය අඩු කිරීමට.

ඒ සඳහා සාකච්ඡා අපි ආරම්භ කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ඉදිරියේදී ක්‍රියාත්මක කෙරෙනවා. ඔබතුමා සඳහන් කරන විධියටම අපේත් බලාපොරොත්තුව, අපේ නිෂ්පාදන ආර්ථික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන්, පොලිය සඳහා දෙන්න පුළුවන් උපරිම සහනය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ලබාදීම තමයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට ඊළඟට පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ මේ කාරණයයි. වරාය ඇතුළේ දැනට ඉතාම හොඳ තත්ත්වයක් ඇති වෙලා තිබුණාට, නැවත පැරණි තත්ත්වයක් ඇතිවීමේ ස්වරූප පේන්න තිබෙනවා. මම පැය 24ක් යන සංකල්පය ගැන උත්තරයක් ලබා දෙන්න කිව්වේ, Sri Lanka Customs පැය 24 වැඩ කිරීම ගැන නොවෙයි. පැය 24ක් clearance වැඩ කරන්න පුළුවන් විධියටද නෛතිකභාවයක් ඇති කළේ? මම මේ ගැන ගරු ඇමතිතුමා එක්ක කථා කරලා තිබෙන්නේ. ඒගොල්ලන් කොහොමත් පැය 24ක් වැඩ කරන එක එදා ඉඳන්ම තිබුණාට, පරිපාලන වැඩ කරන්නේ උදේ 8.00 සිට සවස 5.00 වෙනකම් විතරයි. නිවාඩු දවසුත් වහලා තිබෙන්නේ. දැන් Singapore, Port Klang and Dubai වාගේ අපි තරග කරන වරායන් එක්ක බැලුවාම, ඔවුන් පැය 24ම නිරන්තරයෙන් වැඩ කරනවා. අන්න ඒ සංකල්පය කොළඹ වරායටත් එකතු කරන්න ඕනෑ කියන එක තමයි මම ඉදිරිපත් කළේ. මම දන්නවා, ජනාධිපති ඩුබායිවලදීයි, කොළඹ ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලයත් එක්කයි මේ ගැන කිව්වා. ගරු අගමැතිතුමියනි, ඒක සාක්ෂාත් කරන්න ආණ්ඩුවක් වශයෙන් කරන්න පුළුවන් මොනවාද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒක තමයි මම ඉදිරිපත් කළේ කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන වැඩ පිළිවෙළක්. එතැන කාර්ය මණ්ඩලය වැඩි කිරීමටත් අපි කටයුතු කරනවා. ඒ සඳහා අපි තව ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නවා. ඒ පිළිබඳවත් වැඩි විස්තර ඉදිරිපත් කරන මෙන් මම වරාය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, කොළඹ වරායේ ඇති වෙච්ච ගැටලුවට අපි විසඳුම් සොයද්දී, වරාය පැය 24ම, දින 7ම වැඩ කරන බව ඇත්ත. දිගටම ඒ කටයුතු කෙරෙනවා. නමුත්, container clearance කියන එක සිද්ධ වුණේ නැහැ. අපි ගත්ත පියවරත් එක්ක දැන් එය පටන් අරගෙන තිබෙනවා. උදාහරණයක් හැටියට, පෞද්ගලික අංශය පැත්තෙන් ගත්තොත් shipping lines කිසිසේත්ම සති අන්තයේ වැඩ කළේ නැහැ. අද සති අන්තයේත් shipping lines මේ වෙනුවෙන් කටයුතු කරගෙන යනවා. මම කිව්වේ පෞද්ගලික අංශය පැත්තෙන්. ඒ වාගේම, රේගු දෙපාර්තමේන්තුව සේවක හිඟයත් තබාගෙන මේ clearanceවලට සම්බන්ධ වෙනවා. ඒ නිසා තමයි දැන් යම් ප්‍රමාණයකට ඒ backlog එක ඉවර වෙලා තිබෙන්නේ. තව මේකේ ගොඩනැගෙන්න ඕනෑ පැති තිබෙනවා. මේකේ ප්‍රශ්නයක් තිබුණා. නමුත්, පොදුවේ ගත්තොත්, අපි ආණ්ඩුව වශයෙන් පොරොන්දු වෙච්ච සියලු දේවල්, - රේගුව නොවන දෙපාර්තමේන්තුත් තිබෙනවා, Food Control Department, SLSI, Plant Quarantine Service, Animal Quarantine Department කියලා.

මේ ආයතනවල සිටියේ අඩු නිලධාරීන් ප්‍රමාණයක්. ඔවුන්ට සති අන්තයේ වැඩ කරන්න තිබුණේ නැහැ. අපි අද වන විට කොන්ත්‍රාත් පදනමින් සහ ස්ථාවරව මේ ආයතනවලට නිලධාරීන් බොහෝ අය බඳවාගෙන අවසානයි. සමහර පුරප්පාඩු ඉතාම කෙටි දවසකින් සම්පූර්ණ වෙනවා. ඒ නිසා ඒ සියලු ආයතනවල පරීක්ෂණ සඳහා අවශ්‍ය නිලධාරීන් 24/7 අනුයුක්ත කරලා තිබෙනවා.

ඒ වාගේම, ඇතුළේ තදබදය ඇති වීමට බලපාපු එක් කාරණයක් තමයි, දිගු කාලීන පරීක්ෂණ සඳහා අවශ්‍ය ඉඩකඩක් සහ යම් කාලයක් යන එක. ඒවා එතෙක් ඇතුළේ තබාගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් අපි වරායෙන් පොරොන්දු වුණා, අක්කර 2ක භූමියක් බිලූමැන්ඩල් ප්‍රදේශයේ ගොඩනඟලා දෙනවා කියලා. අපි ඒක හරියටම පෙබරවාරි 03වැනි දා රේගුවට handover කරලා තිබෙනවා. නමුත්, තවම කන්ටේනර් එකක්වත් එතැනට එවලා නැහැ. ඒකට හේතුව අපි බලන්න ඕනෑ, Food Control Department එකට අදාළ කන්ටේනර් ආවේ නැද්ද කියලා. ඒ ප්‍රශ්නය වෙනම හොයන්න තිබෙනවා. නමුත්, අපි ආණ්ඩුවක් වශයෙන් වරායෙන් භාරගත්ත වගකීම ඉටු කරලා තිබෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා වරායේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා එතැන යම්කිසි dashboard එකක් වාගේ සකස් කරන්න. දැනට ආණ්ඩුව පැත්තෙන් ගන්න තිබෙන මූලික ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් අපි පොරොන්දු වූ විධියට අරගෙන තිබෙනවා, කෙටි කාලීනව. ඒ නිසා දැනට backlog එකක් නැහැ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, මම කියන්නේ කරුණාකරලා මේක නිසි පරිදි, - *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මොකක්ද මන්ත්‍රීතුමනි? *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් තුන්වැනි ප්‍රශ්නය අහන්නේ. ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එය ගරු අගමැතිතුමියගෙන් අහපු ප්‍රශ්නයක් නිසා ඔබතුමා කැමැති නම් මම කැමැතියි එතුමාට උත්තර දෙන්න. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා අවසාන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පැය 24 කියන්නේ වැඩ කිරීම නොවෙයි, clear කරන්න පුළුවන් හැකියාව. ඒ කියන්නේ Customs inquiries දැම්මාම ඒක සිකුරාදා සවස 5.00 වෙනකොට නැවතෙනවා. ඒ නිසා සිකුරාදා හැන්දෑවේ, සෙනසුරාදා, ඉරිදා, මහ පෝය දිනයකත් clear කරන්න පුළුවන් හැකියාව තමයි පැය 24 සංකල්පය කියන්නේ. අපි ඒක කරන්න බැලුවා 2015 ඉඳන් 2020 වෙනකල්. නමුත්, බැරි වුණා. ඒ නිසා කරුණාකර, මේකේ තිබෙන ඒ විරෝධතාව නැති කරන්න කටයුතු කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විරෝධතාවක් නැහැ. මොකද, crisis එකක් කියන්නේ සමහරවිට opportunity එකක්. අපි ඇත්තටම මේ crisis එක opportunity එකක් කරගත්තා. වරාය 24/7 වැඩ කරලා තිබුණේ නැහැ, clearance part එකේදී. දැන් මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි හිටපු ඇමතිතුමනි. ඔබතුමා දන්නවා වරාය සහ රේගුව වැඩ කළාට මදි, banking facility එක දෙන්න පුළුවන් බැංකු ආයතනත් වැඩ කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඒ නිසා සමහර බැංකුවලින් ඒකට අදාළ දේවල් කරගත යුතුව තිබෙනවා.

ASYCUDA එකෙන් ඒගොල්ලන්ට සමහර ඒවා comply කරගන්න තිබුණා, සමහර ආයතනත් එක්ක. මම හිතන විධියට දැනට මුලික දෙවල් සම්පූර්ණ කරලා තිබෙනවා. වරාය related family එකේ සමහර associations ඉන්නවා. ඒගොල්ලන්ගේ පැත්තෙන් තවම අවශ්‍ය කැපවීම මදි බව පෙනෙනවා. ඒ වාගේම ඔබතුමා කිව්වා, 4.00ට ඉවර වෙනවා කියලා. නැහැ, අපේ වැඩිම containers ප්‍රමාණය clear වෙන්නේ ඇත්තටම සවසට සහ රෑට. ඔබතුමා මට වඩා මේ ව්‍යාපාරය ගැන දන්නවා නේ. ඔබතුමාගේ ඉදිරිපත් වීම අපි අගය කරනවා.

ගරු කථානායකතුමනි, අපට මේ රටට කියන්න තිබෙන්නේ මෙන්න මේකයි. මේ ප්‍රශ්නය විසඳීම සඳහා ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් අපි සැලකිය යුතු ප්‍රමාණයක් ඉදිරියට ගිහින් තිබෙනවා. තවත් ඉතිරි වෙච්ච කොටසක් තිබේවි. ඒවා ඉතාම ඉක්මනින් නිවැරදි කරන්න අපි කටයුතු කරනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයේ 05වන කොටසට අදාළ පිළිතුර මම **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:
Rest of the Answer tabled:

05. රජයේ ප්‍රතිපත්ති ස්වයංක්‍රියව ක්‍රියාත්මක කිරීම සහ පුරවැසියන් සහ ව්‍යාපාර සඳහා බාධාවකින් තොරව රාජ්‍ය සේවාවන් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වන අතර එහි පසුබිම පහත පරිදි දක්වමි.

- ආර්ථිකයේ ඩිජිටල්කරණය පිළිබඳ හැඳින්වීම

  ඩිජිටල්කරණය ලොව පුරා ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව ඇති අතර වර්තමාන රජය සිය ආර්ථිකය නවීකරණය සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීමට පියවර රැසක් ගෙන ඇත. ඒ අනුව රජයේ ඩිජිටල් ප්‍රතිපත්තිය මහජන සේවාවන් රැසක් ඩිජිටල්කරණය කිරීම සහ මුදල් රහිත ගනුදෙනු (Cashless Transactions) ප්‍රචලිත කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. ඩිජිටල් තාක්ෂණයන් සඳහා වෙගවත් අනුගත වීම තුළින් වඩාත් කාර්යක්ෂම, විනිවිද පෙනෙන සහ තරගකාරී ආර්ථිකයක් පෝෂණය කිරීම අපගේ අරමුණයි.

- නුවුවමනා රෙගුලාසිකරණයන් සහ නිලධාරිවාදය මුලිනුපුටා දැමීමේදී ඩිජිටල්කරණයේ කාර්යභාරය

  ඩිජිටල්කරණ ක්‍රියාවලිය වෙගවත් කිරීම තුළින් දිගු කලක් තිස්සේ අභියෝගයක්ව පවතින අකාර්යක්ෂමතාවන් විසඳීමට රජයට උපකාරී වනු ඇත. මෙසේ ඩිජිටල්කරණයට පරිවර්තනය වීමෙන් ඇති ප්‍රධාන ප්‍රතිලාභ වන්නේ,

  - රාජ්‍ය සේවා විධිමත් කිරීම

    රාජ්‍ය සේවා සහ ගෙවීම් ඩිජිටල්කරණය කිරීමෙන් පොරොත්තු කාලය සැලකිය යුතු ලෙස අඩු කර සේවා සැපයීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ හැකිය.

  - පරිපාලන ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම

    ඩිජිටල් තාක්ෂණ වේදිකාවලට විවිධ ලේඛන සත්‍යාපනය සහ අනුමත කාර්ය ප්‍රවාහයන් වැනි කාර්යයන් ස්වයංක්‍රීය තත්ත්වයට පරිවර්තනය කළ හැකි අතර දැනට ආකාර කිහිපයකින් පියවර වැඩිවීම් සහ කාලය ගතවීම් සිදුවන ක්‍රියා පටිපාටි මෙමඟින් වැඩි දියුණු කළ හැකි වේ.

  - වැඩිදියුණු කළ විනිවිදභාවය

    ගනුදෙනු ඩිජිටල්කරණය කිරීම මඟින් ක්‍රියාවලි නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම, වගවීම ප්‍රවර්ධනය කිරීම සහ දූෂණයට ඇති හැකියාව අවම කිරීම යන කාරණා පහසු කරයි.

  - තීරණ ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම

    තත්‍ය කාලීන දත්ත සහ ඩිජිටල් මෙවලම් සමඟින් රාජ්‍ය ආයතනවලට ඉක්මන් සහ වඩාත් දැනුවත් තීරණ ගත හැකි අතර එමඟින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් අවම කිරීමට උපකාරී වේ.

- ඩිජිටල්කරණය සඳහා වූ රජයේ උපාය මාර්ග

  වත්මන් රජය විසින් පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘති වහාම ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

  - ශ්‍රී ලංකා එකීය ඩිජිටල් අනන්‍යතාවය (SLUDI)

    මෙම ව්‍යාපෘතිය මඟින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ E-NIC ව්‍යාපෘතිය සමඟ සම්බන්ධීකරණයෙන් ඩිජිටල් අනන්‍යතා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ ජෛවමිතික දත්ත, එනම් ඇඟිලි සලකුණු, මුහුණු හඳුනා ගැනීම සහ ඇසෙහි කණිනිකාව (Iris) හඳුනා ගැනීම භාවිත කරමින් ආරක්ෂිත, සත්‍යාපනය කළ හැකි සහ විශාල ජනගහනයක් ඇතුළත් කළ හැකි පුරවැසියන් හඳුනා ගැනීම සහතික කිරීම සඳහා MOSIP තාක්ෂණ වේදිකාව E-NIC සමඟ ඒකාබද්ධ කිරීම ආරම්භ කෙරේ. මෙම ඩිජිටල් අනන්‍යතා හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, රියැදුරු බලපත්‍රය, බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN) සහ වෙනත් විවිධ පද්ධති සමඟ සම්බන්ධ කරනු ලබන අතර පුරවැසියන් විසින් වෙන වෙනම හඳුනා ගැනීම් ක්‍රමවේදයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ඉවත් කරයි. තවද, ජෛවමිතික සත්‍යාපනය මඟින් අනුපිටපත් හෝ ව්‍යාජ අනන්‍යතා ඉවත් කරනු ඇති අතර මෙමඟින් සැබෑ ප්‍රතිලාභීන්ට සම්පත් වෙන් කිරීම සහතික කෙරේ. මෙම පද්ධතිය 2025 පළමු කාර්තුවේදී දියත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.

  - උප්පැන්න, විවාහ සහ මරණ සහතික ලබා ගැනීම සඳහා වන මාර්ගගත වේදිකාව

    මෙම සේවාව 2025 පෙබරවාරි මස 07 වන දින ගරු ජනාධිපතිවරයා විසින් දියත් කර ඇති අතර, එමඟින්

විදේශගත ශ්‍රී ලාංකිකයන්හට ලොව පුරා පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල හරහා උප්පැන්න, විවාහ සහ මරණ සහතික මාර්ගගතව ලබා ගැනීමට පහසුකම් සලසයි. මෙම සේවා ලබා ගැනීම සඳහා විදේශගත ශ්‍රී ලාංකිකයන් පෞද්ගලිකවම පැමිණීමේ හෝ ලිපි ලේඛන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව ඉවත් කිරීමෙන් ක්‍රියාවලිය සරල කරනු ඇත. අත්‍යවශ්‍ය ලියකියවිලි සඳහා ඉක්මන් ප්‍රවේශය සහතික කරනු ලබන අතර, පරිපාලනමය ක්‍රියාවලීන් පහසු කිරීම සහ විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා පහසුව ප්‍රවර්ධනය කරයි. ඊට අමතරව එය කොන්සියුලර් සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කරන අතර ඩිජිටල්කරණයෙන් වඩාත් බලගැන්වූ සහ ප්‍රවේශ විය හැකි රාජ්‍ය සේවා පද්ධතියක් පෝෂණය කිරීමේ රජයේ ඉලක්කයට සහාය වේ. මෙම මූලපිරීම විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ ඔවුන්ගේ මව් රට අතර සම්බන්ධතාව ශක්තිමත් කරන අතරම නීතිමය සහ පරිපාලන ක්‍රියාවලීන්ගේ සුමටභාවය සහතික කරයි.

- ජනාධිපති අරමුදල සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත වේදිකාව

  2025 පෙබරවාරි මස 07 වන දින ගරු ජනාධිපතිවරයා විසින් මෙම සේවාව ද දියත් කර ඇති අතර එමඟින් පුරවැසියන්ට ජනාධිපති අරමුදල සඳහා අයදුම්පත් මාර්ගගතව ඉදිරිපත් කිරීමට ඉඩ සලසයි. මෙම සේවාව අයදුම් කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම, වේගවත්, වඩාත් ප්‍රවේශ විය හැකි සහ දෝෂවලට ඇති ඉඩ කඩ අවම කරන නවාංග රැසකින් සමන්විත ය. පුරවැසියන්ට තවදුරටත් රජයේ කාර්යාලවලට පෞද්ගලිකව පැමිණීමට අවශ්‍ය නොවන අතර කඩදාසි මත පදනම් වූ ඉදිරිපත් කිරීම් හා සම්බන්ධ කාලය සහ පිරිවැය අඩු කරයි. ඩිජිටල් වේදිකාව අරමුදල් වෙන් කිරීමේ ක්‍රියාවලියේ වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් ද සහතික කරයි. අවසාන වශයෙන් මෙම සේවාව මූල්‍ය ආධාර වඩාත් කාර්යක්ෂමව සහ සාධාරණව ලබා ගැනීමට පුරවැසියන් බලගන්වයි.

- ආර්ථික වර්ධනයේදී මුදල් රහිත ගනුදෙනුවල (Cashless Transactions) කාර්යභාරය

  ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකයක් කරා යන ගමනේ ප්‍රධාන අංගයක් වන්නේ ගනුදෙනු මුදල් රහිතව සිදු කිරීමේ තත්ත්වයන් වර්ධනය කිරීමය. භෞතික මුදල් මත යැපීම අඩු කිරීමෙන්, ඩිජිටල් ගෙවීම්වලට පහත කාර්යයන් සිදු කිරීමේ හැකියාව ලැබේ.

  - ප්‍රවේශ්‍යතාව වැඩි කිරීම

    ජංගම මුදල් පසුම්බි සහ ඩිජිටල් කාඩ්පත් වැනි මුදල් රහිත පද්ධති, දුරස්ථ ප්‍රදේශවල සිටින අය ඇතුළුව, අඩු පහසුකම් සහිත ජනතාවට මූල්‍ය සේවා වඩාත් ප්‍රවේශ විය හැකි තත්ත්වයට ගෙන ඒම.

  - කාර්යක්ෂමතාව වැඩි කිරීම

    ඩිජිටල් ගෙවීම් වේගවත් හා ලාභදායී වන අතර භෞතික මුදල් හැසිරවීමේ පරිපාලනමය ආයාසයන් අඩු කිරීම.

  - නුවුවමනා රෙගුලාසිකරණයන් සහ නිලධාරිවාදය අඩු කිරීම

    සාම්ප්‍රදායික නිලධාරිවාදී ක්‍රියාවලීන් බොහෝ විට ලේඛන කටයුතු භෞතිකව සිදු කරනු ලබන සහ සේවාලාභීන් හට දිගු කාලයක් බලා සිටීමේ කාලයන් ඇතුළත් ඒවා වේ. ගෙවීම් සහ සේවා ඩිජිටල්කරණය කිරීමෙන් ශ්‍රී ලංකාවට මෙම ක්‍රියාවලීන් විධිමත් කිරීමට, මානව දෝෂ අඩු කිරීමට සහ අකාර්යක්ෂමතා ඉවත් කිරීමට හැකිය.

- මුදල් රහිත සමාජයක් නිර්මාණය කිරීම සඳහා රජයේ උපායමාර්ගය

  වර්තමාන රජය ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද ජනප්‍රිය කිරීම සඳහා මුදල් රහිත සමාජයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන ක්‍රියාවලි කිහිපයක යෙදී සිටී. ඒවා අතරින් කිහිපයක් නම්,

  - GovPay සේවා වැඩිදියුණු කිරීම

    2025 පෙබරවාරි මස 07 වන දින ගරු ජනාධිපතිවරයා විසින් වැඩිදියුණු කරන ලද GovPay සේවාව දියත් කර ඇති අතර එමඟින් පුරවැසියන්ට රජයේ සේවාවන් සඳහා ඩිජිටල් ආකාරයෙන් ගෙවීමට හැකි වේ. මුලදී රජයේ සේවාවන් 16ක් ඩිජිටල් ගෙවීම් මඟින් ලබා ගත හැකි අතර 2025 අප්‍රේල් වන විට තවත් සේවා 30ක් ඊට එකතු කිරීමට සැලසුම් කර ඇත. නව ක්‍රමය වැඩි වැඩියෙන් භාවිත කිරීමට දිරිගැන්වීම සඳහා ගනුදෙනු ගාස්තුව ලෙස පෙර තිබූ රුපියල් 50 සිට රුපියල් 15 දක්වා අඩු කිරීමට පියවර ගනු ලැබේ.

  - ලංකා QR- පාදක ගෙවීම් ප්‍රවර්ධනය කිරීම

    QR ගෙවීම් ව්‍යාපාර සහ පාරිභෝගිකයන් සඳහා විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) සඳහා ආරක්ෂිත, කාර්යක්ෂම, පහසු සහ ලාභදායී විසඳුමක් ලබා දෙයි. ඊට අමතරව මෙම QR ගෙවීම් විනිවිදභාවය වැඩිදියුණු කරන වංචා අවදානම් අවම කරන සහ ඩිජිටල් පරිවර්තනය සහ නවීකරණය කරන ලද මූල්‍ය පරිසර පද්ධතියක් සඳහා රටේ දැක්ම සමඟ සමපාත වේ. දැනුවත්භාවය වැඩි කිරීමෙන් සහ ගනුදෙනු ගාස්තු අඩු කිරීමෙන් මෙම ගෙවීම් ක්‍රමය වෙත වැඩි පිරිසක් යොමු කිරීමට රජය අරමුණු කරයි. මුලින් සේවා ගාස්තුව සියයට 1ක් ලෙස නියම කර තිබුණ ද, COVID-19 කාලය තුළ එය තාවකාලිකව සියයට 0.5 දක්වා අඩු කරන ලදී. කෙසේ වෙතත් පසුව ගාස්තුව නැවතත් සියයට 1 දක්වා ඉහළ නංවන ලදී. භාවිතය තවදුරටත් වැඩි කිරීම සඳහා, ඉන්දියාවේ තත්ත්වයට සමානව මෙම ගාස්තුව ශූන්‍යයට ආසන්නව අඩු කිරීමට රජය කටයුතු කරමින් සිටින අතර මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා විවිධ විකල්ප ක්‍රමවේද රජය විසින් අධ්‍යයනය කරමින් සිටී.

  - දේශීය ගනුදෙනු සඳහා ඩිජිටල් ගෙවීම් කාඩ්පත්

    දෛනික ගනුදෙනුවලදී මුදල් රහිත ගෙවීම් වැඩිදියුණු කිරීම සඳහා බස් රථ, දුම්රිය සහ මහාමාර්ග ගාස්තු ගෙවීම් වැනි ප්‍රවාහන සේවා ඉලක්ක කර ගනිමින් දේශීය ගෙවීම් සඳහා ඩිජිටල් ගෙවීම් කාඩ්පතක් හඳුන්වා දීමට රජය සැලසුම් කරයි. මෙය පුරවැසියන්ට පොදු ප්‍රවාහන සේවා සඳහා ඩිජිටල් ආකාරයෙන් ගෙවීමට පහසුකම් ඇති කරනු ලබන අතර එමඟින් භෞතික මුදලක් මත යැපීම අඩු වනු ඇත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

උසස් නිලතල පිළිබඳ කාරක සභාව
உயர் பதவிகள் பற்றிய குழு
COMMITTEE ON HIGH POSTS

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127 හි විධිවිධානවල සහ 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2025 පෙබරවාරි 22 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය අග්‍රාමාත්‍යතුමිය විසින් දැරිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු කථානායකතුමනි.

ගරු අග්‍රාමාත්‍යතුමිය සභාවේ සිටින මේ මොහොතේ මම මේ කාරණාව ඉදිරිපත් කරන්නට කැමැතියි. මම ඔබතුමියගෙන් පිළිතුරකුත් බලාපොරොත්තු වෙනවා. පසුගිය 18 සිට 21 දක්වා දින 4 තුළ මිනිස් ඝාතන 8ක් සිදු වෙලා තිබෙනවා. එය ඇත්තවශයෙන්ම ජාතික ආරක්ෂාවට ලොකු ගැටලුවක්. ගරු ජනාධිපතිතුමා සඳහන් කරලා තිබෙනවා, මේක ජාතික ආරක්ෂාවට ගැටලුවක් නොවෙයි කියලා. පාතාල කල්ලි අතර ඝාතන සංස්කෘතිය ක්‍රියාත්මක වීම සත්‍ය වශයෙන්ම ජාතික ආරක්ෂාවට ලොකු ගැටලුවක්. මම ඔබතුමියට පොඩි කාරණාවක් කියන්නම්. ඒ මිලේච්ඡ මිනීමැරුම අධිකරණ ශාලාව තුළ සිදු වූ දවසේ දවල් මාධ්‍ය අංශ ගණනාවක් එයට සම්බන්ධ වුණු ඒ කාන්තාවගේ colour photo එකක් එක්ක, -ඒ කියන්නේ, ඒ colour photo එකක් එක්ක තිබුණේ බුද්ධි අංශයේ වාර්තාවක්. ඇත්ත වශයෙන්ම ඒ බුද්ධි අංශයේ වාර්තාව ආරක්ෂක අංශවලට, නීතිය හා සාමය පිළිබඳ අංශවලට ලැබිලා තිබුණා. මේ සභාවේ කියැවුණා, මේ ප්‍රහාරය එල්ල කරන්නට තිබුණේ ගම්පහ ප්‍රදේශයේදී කියලා. ඇත්තවශයෙන්ම මේක බරපතළ ප්‍රශ්නයක්. ජාතික ආරක්ෂාව පිළිබඳව තොරතුරු ලැබී තිබියදී, ඒ කාන්තාවගේ වර්ණ ඡායාරූපයකුත් සමඟ වාර්තාවක් ලැබී තිබියදී මෙවැනි ආරක්ෂක බිඳ වැටීමක් සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් රටටත් අවශ්‍යයි; මේ සභාවටත් අවශ්‍යයි.

විශේෂයෙන්ම මේ කොල්ලකාරී මැර කල්ලි, මිලේච්ඡ මිනීමරුවන්ගේ ක්‍රියාදාමය ඇත්තවශයෙන්ම ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක්. මේකට පැහැදිලි විග්‍රහයක්, විස්තරයක් ලබා දෙන්න. ඒ වාගේම බුද්ධි අංශ තොරතුරු ලැබුණාම ඒ පිළිබඳව මීට වඩා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය පිළිබඳව අදාළ අමාත්‍යවරයා කිහිප වතාවක්ම පැහැදිලි කිරීම් කළා. ගරු ජනාධිපතිතුමාත් ඒ සම්බන්ධව කියා තිබෙනවා. අපි මේ සම්බන්ධව බැරෑරුම් ලෙස බලනවා. මේක ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් වෙනකම් වර්ධනය වෙන්න අපි කිසිසේත්ම ඉඩ තබන්නේ නැහැ. අපි ඒකට නිසි පියවර කිහිපයක් අරගෙන තිබෙනවා, ඒ වාගේම ගනිමිනුත් ඉන්නවා. ඒ පිළිබඳව නිරන්තර අවධානයකින් අපි වැඩකටයුතු කරනවා. ගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපේ අදාළ ඇමතිවරුන් ඒකට මැදිහත් වෙනවා.

විපක්ෂ නායකතුමා මේ හා සම්බන්ධව මතු කළ මාධ්‍ය තුළින් සංසරණය වන වෙනත් කරුණු පිළිබඳවත් අපි අවධානය යොමු කරනවා. ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව ජනමාධ්‍ය ඇමතිතුමාටත් කියන්න යමක් තිබෙන නිසා මම එතුමාට අවස්ථාව ලබා දෙන්නම්, පොඩි පැහැදිලි කිරීමක් කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, බුද්ධි අංශවල ක්‍රියාකාරිත්වය, කාර්යක්ෂමතාව වාගේම බුද්ධි තොරතුරු විශ්ලේෂණය කිරීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තුවේදී අපේ ගරු මන්ත්‍රීවරයෙක් තමයි පළමුවෙනි වතාවට කිව්වේ, කලින් තොරතුරු ලැබී තිබෙනවා කියලා. එතකොට පොලිස්පතිතුමා කිව්වා, "ඔව්. කලින් තොරතුරු ලැබුණා, ගම්පහදී මරන්න හදනවා කියලා. හැබැයි, කොළඹ සිදුවීම සම්බන්ධව තොරතුරක් ලැබුණේ නැහැ" කියලා.

ගරු අගමැතිතුමියනි, පාස්කු ප්‍රහාරය එල්ල වුණු වෙලාවේ ඒ සම්බන්ධ තොරතුරු ලැබී තිබියදීත් ප්‍රතිචාර දක්වන්න ප්‍රමාද වුණු බව අපි දන්නවා. මේක මොන level එකේ එකක්ද, ජාතික ආරක්ෂාව සම්බන්ධ එකක්ද, එහෙම නැත්නම් ඊට වඩා අඩු මට්ටමක එකක්ද කියන ප්‍රශ්නයට වඩා බුද්ධි තොරතුරු විශ්ලේෂණය කිරීම පිළිබඳ ගැටලුවකුත් මෙතැන තිබෙනවා. ඒ නිසා මේ ගැන ඔබතුමන්ලාගේ රජය විශේෂ අවධානය යොමු කළ යුතුයි කියලා මම කියා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා ආරක්ෂක ඇමතිවරයා හැටියට අවස්ථා කිහිපයකදී මේ පිළිබඳව ප්‍රකාශ කළා. මේ සිදුවීමෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් ඇති වෙලා නැහැ. රටේ ජනතාවගේ ආරක්ෂාව -ජාතික ආරක්ෂාව- අපි උපරිමයෙන් සලසනවා. මේ සංවිධානාත්මක අපරාධ කල්ලි අතර සිදු වන ගැටුම් පිළිබඳව ජනාධිපතිවරයා ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් කරුණු පැහැදිලි කළා. ඒ වාගේම ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාත් ඒ සම්බන්ධව මේ සභාවට කරුණු ඉදිරිපත් කළා. ඔබතුමන්ලාට පෙනෙනවා ඇති, විමර්ශන කරගෙන යන බව. ඒ නිසා විමර්ශනවල සියලු තොරතුරු පාර්ලිමේන්තුවට කියලා විමර්ශන අවුල් කරන්න අවශ්‍යතාවක් නැහැ නේ.

ඔබතුමන්ලා දන්නවා, මේ සිද්ධියට සම්බන්ධ පොලිසියේ වැඩ කරන -ආරක්ෂක අංශවලට සම්බන්ධ- අය පවා මේ වෙනකොට අත්අඩංගුවට ගෙන තිබෙන බව. ඔවුන්ගෙන් ප්‍රශ්න කරමින් තිබෙනවා. ඒ වාගේම අධිකරණයට සම්බන්ධ තවත් කිහිප දෙනෙකුගෙන් ද ප්‍රශ්න කරන්න නියමිතව තිබෙනවා. මේවාට අදාළ තොරතුරු විටින් විට අවශ්‍ය ප්‍රමාණයට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. වැඩිමනක් තොරතුරු අවශ්‍ය නම්, 28වැනි දා ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙනවා. එතැනදීත් අපි විමර්ශනවලට බාධා නොවන තොරතුරු මේ සභාවට ඉදිරිපත් කරන්නම්. ඒ නිසා විමර්ශන ගැන විශ්වාස කරන්න. ඒකට අදාළ කරන සියලු පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම් සහ පරීක්ෂණ කටයුතු සිදු වෙන බව මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීමේ විවාදය. හයවන වෙන් කළ දිනය.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.

ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]

"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය"- [ගරු අනුර කුමාර දිසානායක මහතා]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]

"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக".- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [17th February]

"That the Bill be now read a Second time". - [The Hon. Anura Kumara Dissanayake]

Question again proposed.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකයා)
(The Hon. Speaker)
The Hon. Ravi Karunanayake to start the Debate. You have 23 minutes.

[ප.භා. 10.31]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ජනාධිපති අනුර දිසානායක මැතිතුමාගේ මංගල අය වැය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. සීමිත සම්පත්, අසීමිත ඉල්ලීම් ප්‍රමුඛත්වය අනුව බෙදා ගැනීම තමයි අය වැයක් කියන්නේ. අය වැයක් මඟින් කළ යුත්තේ ආර්ථිකය සවිබලගැන්වීම තුළින් දුප්පත්කම නැති කරලා, හැම දෙනාටම තිබෙන ඒ පීඩනය පුළුවන් තරම් අඩු කිරීමයි. ස්වයං රැකියා වාගේම රැකී රක්ෂා, කෘෂිකාර්මික ඵලදායිතාව ඇති කිරීම, ආර්ථිකය ප්‍රසාරණය කිරීම, ගෙවල් ලබා දීම, මන්දපෝෂණය නැති කිරීම ආදිය තමයි මේ තුළින් අපි බලන්නේ. මේ සම්බන්ධයෙන් කථා කරනකොට මගේ සිත යොමු වන්නේ 2015, 2016 සහ 2017 අය වැය වෙතයි. 2023 - 2024 කාලය තුළ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා එයට නැවත පුනර්ජීවනයක් දුන්නා.

මුදල් අමාත්‍යාංශයේ වැඩ කරන ඉතා දක්ෂ සේවක පිරිසක් ඉන්නවා. මුදල් අමාත්‍යාංශයේ දැන් සිටින ලේකම් මහින්ද සිරිවර්ධන, හිටපු DST, ඒ.කේ. සෙනෙවිරත්න යන අය ඉතා දක්ෂ ලෙස අය වැයවල් හදලා තිබෙනවා. ඒ ගැන මම ඉතාම සතුටු වනවා. අනුර දිසානායක ජනාධිපතිගේ අය වැයත් ඒ ආකාරයෙන්ම හදලා තිබෙනවා. ඒකේ continuity එකක් තිබෙනවා. ඉදිරි දැක්මක් සහිතව ගමන් කිරීමක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, හැම වෙලාවේම අවුරුදු 76ක ඉතිහාසයක් ගැන කියන නිසා 1948 නිදහසින් පසුව යූඑන්පී එකේ ඩී.එස්. සේනානායක මැතිතුමා අනුගමනය කරපු වැඩ පිළිවෙළ ගැනත් මතක් කිරීමක් කරන්න අවශ්‍යයි කියලා මම හිතුවා. සුද්දන්ගෙන් බලය අරගෙන ලාංකිකයන් තුළින් රට ඉදිරියට ගෙන යාමක් තිබුණා. 1977දී යූඑන්පී එකේ ජේ.ආර්. ජයවර්ධන බලයත් රැකගෙන ලංකාව ලෝකයට විවෘත කළා. ඒ විවෘත ආර්ථිකය තුළින් රට ඉදිරියට ගෙන යන්න පුළුවන් හැකියාව ඇති වුණා. ඒ වාගේම 2022දී මේ රටේ පෝලිම් යුගයක් තිබෙනකොට, මේ රටේ ආර්ථිකය කඩා වැටෙනකොට, කවුරුත් ඒකට නායකත්වය දෙන්නේ නැති වෙනකොට, එක්සත් ජාතික පක්ෂයේ හිටපු නායක අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ආර්ථිකය භාර ගත්තා. ස්ථායීකරණයක් ඇති කරගෙන, ඒ සම්බන්ධ ඉදිරි දැක්මක් ලෙස රට කොයි ආකාරයෙන්ද ගෙනියන්න අවශ්‍ය වන්නේ කියලා එතුමා පෙන්වා දී තිබුණා.

එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන්, එක්සත් ජාතික පක්ෂය මේ රටට කරලා තිබෙන සේවාව ගැන මම කියන්න ඕනෑ. අපේ හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ගෙවල් ලක්ෂ 10ක් හදලා තිබෙනවා. ඒ වාගේම, ගාමිණී දිසානායක මැතිතුමා මහවැලි ව්‍යාපාරය ඇති කරලා තිබෙනවා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා වරාය සංවර්ධනය කළා වාගේම, මහපොළ ශිෂ්‍යාධාරය ලබා දුන්නා. ඒ වාගේම රූපවාහිනී හා පරිගණක යන්ත්‍ර ගෙනැල්ලා දුන්නා. SriLankan Airlines එක ඇති කරලා දුන්නා. ඒ වාගේම නිදහස් වෙළෙඳ කලාප, විදුලි බලාගාර - වික්ටෝරියා, රන්දෙණිගල, මාදුරු ඔය - ඇති කරලා තිබෙනවා. රටේ සංවර්ධනයක් ඇති කරලා තිබෙනවා කියන එක ජනතාව අතර මතක තිබෙන විධියට කටයුතු කරලා තිබෙනවා. ඒ විධියට ආර්ථික ස්ථායීකරණයක් ඇති කරලා තිබුණා. නමුත්, මේ ඔක්කොම සමඟ අලුත් දේශපාලන ගමනක් බිහි වුණා. අපිට පෙනෙන විධියට ජනතාව තුළ එදා යම් විධියක අවිශ්වාසයක් තිබුණා, මේ පාලනය හරියට ගෙනියන්නේ නැහැ කියලා. ඒ නිසා අද ජාතික ජන බලවේගය නියෝජනය කරමින්, ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජයග්‍රහණය කරලා තිබෙනවා.

දැන් අලුතින් හිතන්න අවස්ථාව ඇවිල්ලා තිබෙනවා. එහිදී පරණ දේශපාලන අදහස් - old political ideas - අපි පැත්තකට දමන්න අවශ්‍යයි. Be new, be daring and be bold! You cannot follow; you must lead.

මම මේ අවස්ථාවේදී මගේ දේශපාලන නායක, ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා කියපු සටන් පාඨයක් මතක් කරන්න කැමැතියි. මෙහිදී කවුරු හරිද නොවෙයි, කුමක් හරිද කියන දෘෂ්ටි කෝණයෙන් බලලා අපි උත්තර දිය යුතුයි. මූල්‍ය විනයත් එක්ක

[ගරු රවී කරුණානායක මහතා]

මම අගය කරන දෙයක් තිබෙනවා. මේ රටේ ආර්ථිකය කඩා වැටෙන තෙක් මේ රටේ ඉදිරි ගමන සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය අත්‍යවශ්‍ය රටක් නොවෙයි, අපි. නමුත්, මේ රටේ ආර්ථිකය කඩා වැටුණාට පසුව, ඒකෙන් පුළුවන් තරම් ඉක්මනින් එළියට එන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යා යුතුයි. නමුත්, ඒ අය කියන හැම දෙයක්ම කරන්න අවශ්‍යතාවක් නැහැ කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි.

මම මේ අවස්ථාවේදී ජනාධිපති, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා 2025 පෙබරවාරි 07වැනි දා කියපු දෙයක් "ඩේලි මිරර්" පුවත්පත පසුදා වාර්තා කළ ආකාරය උපුටා දක්නවා:

> "Sri Lanka's only viable recovery avenue is to continue the current IMF-backed path:"

මා හිතන විධියට ඒක හරි මාර්ගයක්. එක්සත් ජාතික පක්ෂය තමයි ඒ සම්බන්ධයෙන් එදත්, අදත්, ඉදිරියටත් කටයුතු කරන්නේ. නමුත්, ඒ අය කියන හැම දෙයක්ම අපි පිළිපදින්න අවශ්‍ය නැහැ. 17වැනි වරට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පවත්වන සාකච්ඡාව තමයි මේ කරගෙන යන්නේ. 16වැනි වතාවේ තිබුණු සාකච්ඡාවලදී හිටපු මුදල් ඇමතිවරයා මමයි. ඒ අය ඇවිල්ලා අදහස් දුන්නාට පස්සේ, අපේ මුදල් අමාත්‍යාංශයේ සිටින දැනුවත්කමක් තිබෙන පුද්ගලයන්ට, විද්වතුන්ට, ඒ සුද්දන්ට වැඩිය හොඳ උත්තරයක් දෙන්න පුළුවන් කියන එක මම මතක් කරන්න අවශ්‍යයි. මම එහෙම කියන්නේ ඇයි කියන එක ඉදිරියට පෙන්වා දෙන්නම්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මේ වැඩ පිළිවෙළ ඒ ආකාරයෙන් ඉදිරියට ගෙන යෑම මම අගය කරනවා. මම එහෙම කියන්නේ ඇයි? ඒ පිළිබඳව විශ්වාසයක් තිබෙන නිසායි.

ජනතාවට මොනවා කියලා බලය ගත්තත්, අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට බොරු කරන්නේ නැතිව මේ කටයුතු ඉදිරියට ගෙන යෑම තමයි ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන් එකම ගමන කියලා මා හිතනවා. එක්සත් ජාතික පක්ෂය විවෘත ආර්ථිකය, මූල්‍ය විනය, ආර්ථිකය ප්‍රසාරණය කිරීම ආදී වශයෙන් සෙසු සංවර්ධනයන්ට යොමු කරන්න පුළුවන් ව්‍යාපෘති ගණනාවක් ඇති කරලා තිබෙනවා. දැන් අපට අලුතින් හිතන්න තිබෙන දේ මොකක්ද? අපි ව්‍යාපෘතියකට යන වියදම සියයට 8ද, සියයට 10ද කියලා බලන්නේ නැතිව ඒකේ ඵලදායීතාව මොකක්ද කියන එක බලන්න ඕනෑ. Cost-benefit analysis එක මොකක්ද? Economic rate of return මොකක්ද? යම් පාරක් හැදුවාම ඒකේ වටිනාකම ඉබේම ලැබෙන්නේ නැති වුණාට, එහි economic rate of return එකයි, cost-benefit analysis එකයි බලන්න අවශ්‍යයි. ඒ වාගේම ආර්ථික විවිධාංගීකරණයක් - economic diversification - ඇති කරන්න අවශ්‍යයි. Trade facilitation අවශ්‍යයි. මම මේ අය වැය තුළ දැක්කා, එවැනි නැඹුරුවීමක් තිබෙන බව. ඒ වාගේම මේ දේවල් digitization කළ යුතු වෙනවා. මේ තුළින් තමයි ලංකාව පුළුවන් තරම් ඉක්මනට ලෝකයේ දියුණු වෙන රටක් ලෙස ඉදිරියට ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිර්මාණ තීන්දු ගැනීමට දැන් අවස්ථාව ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේ මම මතක් කරන්නේ, අපි කොයි ආකාරයෙන්ද අපේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය වන්නේ කියන එක පිළිබඳව අප කල්පනා කරන්න අවශ්‍ය බවයි.

ගරු කථානායකතුමනි, අය වැයක් ඉදිරිපත් කරනකොට එහි කොටස් දෙකක් තිබෙනවා. එකක්, මේ අවුරුද්දේ තිබෙන අය. අනෙක, ව්‍යවස්ථානුකූලව එකතු වන වැය. ඒ දෙකම එකතු වුණාම මේ රටේ පුනරාවර්තන වියදම රුපියල් බිලියන 5,920ක් වන අතර ප්‍රාග්ධන වියදම - රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ - විධියට සියයට 4ක් වෙන් කරන්න අවශ්‍යයි. මේ වෙන් කිරීම විතරක් නොවෙයි, මම ඉතාම ඕනෑකමින් ඔබ සියලුදෙනාගෙන් ඉල්ලන්නේ මේකයි. වියදම් කිරීම ගත්තාම, අද අපි කරන ආයෝජන තමයි හෙට අපට ලැබෙන ආදායම ලෙස අපි මේ අවස්ථාවේ පාවිච්චි කරන්න අවශ්‍ය වන්නේ. මේකේ සාමාන්‍ය සිරිත වන්නේ සියලු පුනරාවර්තන වියදම් කරගෙන යනකොට අන්තිමට ප්‍රාග්ධන වියදම් නැති කරලා තිබීම. ප්‍රාථමික ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇති කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මේ කටයුතු කළමනාකරණය කරන්න ඕනෑ. මේ රුපියල් බිලියන 1,315ක මුදල ප්‍රාග්ධන වියදම් සඳහා වැය කරන එක අනිවාර්යයෙන් කළ යුතුමයි. ඒ වාගේම capital amortization රුපියල් බිලියන 1,600යි. සමස්ත වියදම රුපියල් බිලියන 8,835යි. මේ දේවල් කරනකොට අය වැය හිඟය වශයෙන් රුපියල් බිලියන 2,900ක් එකතු වෙනවා, අපේ ණයබරතාවට. මා හිතන විධියට සියලුදෙනා මේකේ පරිපාලනය භාර අරගෙන තිබෙන නිසා මීට පෙර පැවති තත්ත්වය අනුව ප්‍රශ්න අහනවා, මේ පරිච්ඡේදයේ ණය අරගෙන තිබෙනවා, මොනවාද කරලා තිබෙන ව්‍යාපෘති කියලා. 2024 සැප්තැම්බර් මාසයේ කොතරම් ණය ප්‍රමාණයක් අරගෙන තිබෙනවාද කියලා මම ඇහුවාම, නියෝජ්‍ය මුදල් ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේදී උත්තරයක් දුන්නා, රුපියල් ට්‍රිලියන 29ක් තිබෙනවා කියලා.

ඊට පසුව මම ඇහුවා, අද තිබෙන ණයබරතාව කීයද කියලා. ඒ නියෝජ්‍ය ඇමතිවරයාම උත්තර දුන්නා, රුපියල් ට්‍රිලියන 31ක් කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය. දැන් තේරෙනවා, සභාය දිවීමේ තරගයක් ලෙස මේක එක තැනකින් පටන් ගන්න ගමනක් නොවෙයි කියන එක. ඒ නිසා අප සියලුදෙනාම ඒක රාශි වෙලා මේ වැටිච්ච රට නැවත වැටෙන්නේ නැති විධියට ආර්ථික මූල්‍ය විනයක් සහිතව ඉදිරියට ගෙන යන්නට වැඩ පිළිවෙළක් ඇති කරන එක අත්‍යවශ්‍යයි. මේ සඳහා අපි යොදා ගත යුත්තේ දේශයේ සිටින විද්වතුන්. මොකද ඒ අය මේ පිළිබඳව නොදන්නවා නොවෙයි, ඔවුන්ට අවස්ථාව ලබා දෙන්නේ නැති එකයි ප්‍රශ්නය. සමහර වෙලාවට දේශපාලන තීන්දු ගන්නේ නැති වුණාම, රාජ්‍ය නිලධාරීන් ඒවාට අත්සන දමන්න බය වෙලා තිබෙනවා. අද තිබෙන තත්ත්වය අනුව නිර්මාණශීලි ඇමතිවරයෙක් තීන්දුවක් ගත්තත්, අවුරුදු පහකට පසුව ඒ සම්බන්ධයෙන් උත්තර දෙන්න සිද්ධ වුණාම ඒ රාජ්‍ය නිලධාරීන් හිතනවා, මොකටද අපි රටක සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරලා අන්තිමට ඒ හිසරදය කරගහගෙන යන්නේ කියලා. ඒ නිසා ආණ්ඩුවක් වශයෙන් ඔබතුමන්ලා Cabinet decisions අරගෙන, නිර්භීත තීන්දු අරගෙන මේ වැටිලා තිබෙන ආර්ථිකය ගොඩගන්න අවශ්‍යයි. එදා රනිල් වික්‍රමසිංහ භය නැතුව තීන්දු ගත්තා වාගේ කටයුතු කරන්න අවශ්‍යයි. එතුමා ඒ තීන්දු ගත්තේ මේ රටේ අනාගතය වෙනුවෙන්. එතුමා හිතුවේ නැහැ, ඉදිරියට එන මැතිවරණ ගැන. අන්න ඒ තීන්දු නැවත අපි ගන්නට අවශ්‍යයි. මේ රටේ මේ මොහොතේ අපි ණය පොලී වශයෙන් රුපියල් බිලියන 2,958ක් ගෙවනවා. මේක රටේ සමස්ත වියදමත් එක්ක සංසන්දනය කළොත්, සියයට 45ක්. ආදායම එක්ක සංසන්දනය කළොත්, සියයට 62ක්. ලෝකයේ වැඩිම ණය පොලී ගෙවන රටක් ලෙස තමයි අද අපේ රට පිළිබඳව වාර්තා වෙලා තිබෙන්නේ.

මේ අය වැය මූලික සිද්ධාන්ත, උපකල්පන 5ක් ඔස්සේ තමයි තිබෙන්නේ. සියයට 5ක වර්ධන වේගයක්, අපේ සම්පූර්ණ දළ දේශීය නිෂ්පාදනය රුපියල් ට්‍රිලියන 33ක්, ඒ වාගේම Incremental Capital Output Ratio එක සියයට 1:6ක් වශයෙන් තමයි මේ අය වැය හදලා තිබෙන්නේ.

මේ අය වැය පදනම් වෙච්ච මූලික අංග දෙකක් තිබෙනවා. එකක් තමයි, IMF parameters. දෙවැනි එක තමයි, මාලිමාව දුන් මැතිවරණ පොරොන්දු. මේවා තමයි මෙහි ප්‍රායෝගිකව තිබෙන

දේ. අද මේ තිබෙන වියදම දෙසත්, අපේ ආදායම දෙසත් බැලුවාම, මෙහි දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.1ක ආදායම් ඉලක්ක සපුරා ගැනීමට සමත් වෙනකොට ආදායම රුපියල් මිලියන 5,000ක් වෙනවා. ඒ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2024 වර්ෂයේ රුපියල් බිලියන 1,950ක්ව තිබෙන බදු ආදායම මේ වර්ෂයේ සියයට 17කින් වැඩි වෙනු ඇතැයි කියා පුරෝකථනය කරලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 2,250යි. ඒ වාගේම 2024දී අපේ රේගු දෙපාර්තමේන්තුවේ තිබුණු රුපියල් බිලියන 1,550ක ආදායම සියයට 35කින් වර්ධනය වෙලා රුපියල් බිලියන 2,070ක් ලබා ගන්න පුළුවන් හැකියාව ඇති වෙලා තිබෙනවා.

ඒ වාගේම සුරාබදුවලින් 2024දී ලැබුණු රුපියල් බිලියන 214ක ආදායම සියයට 12කින් වර්ධනය වෙනවාය කියලා තමයි ඇස්තමේන්තු කරලා තිබෙන්නේ. ඒ අනුව තමයි රුපියල් බිලියන 5,100ක් ලබා ගන්න හැකියාව ලැබෙන්නේ. මේක එසේ මෙසේ ගමනක් නොවෙයි. නමුත්, ආර්ථිකය වර්ධනය කරන්නම අවශ්‍යයි. මේක ආදායම මත රඳා පවතින අය වැයක් නොවෙයි. පළමු වතාවට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඉදිරිපත් කරලා තිබෙන මේ අය වැයේ පදනම වෙන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ක බදු ආදායමක් ලබා ගැනීමයි. ආදායම වැඩි වුණාම fiscal space එක අනුව වියදම් කිරීමේ හැකියාවට බාධාවක් ඇති වෙලා තිබෙනවා. මේවා තමයි අපි ප්‍රායෝගිකව බලන්න ඕනෑ. ඒකයි මම කිව්වේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියපු හැම දේකටම නටන්න අවශ්‍යතාවක් නැහැ කියලා. මම මේක කියන්නේ අද නොවෙයි. මුදල් ඇමතිවරයා වශයෙන් සිටියදී එදාත් මම මේක ප්‍රකාශ කළා. මොකද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අවශ්‍ය වන්නේ මේ කටයුත්ත ඉදිරියට ගෙන යෑම, අපව නිහඬනේ ගෙන යෑම මිසක් අපේ රටේ සංවර්ධනය නොවෙයි. සංවර්ධනය කියලා සමහර වෙලාවට ඔවුන් අපට අමාරු තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. IMF එකේ උදව් තුළින් සාර්ථකව එළියට ඇවිල්ලා තිබෙන රටක් වන්නේ කොරියාව විතරයි. යම්තාක් දුරකට අර්බුදයෙන් එළියට ආ තවත් රටවල් තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අපි තර්ක විතර්ක කරලා පෙන්නුවොත් මෙහෙම තමයි රට ගෙන යන්න ඕනෑ කියලා, මම හිතන විධියට ඒගොල්ලනුත් මීට වඩා ඕනෑකමින් අපට උත්තර ලබාදේවි.

2024 වර්ෂයේ පුනරාවර්තන වියදම ලෙස රුපියල් බිලියන 2,604ක් වැය කරලා තිබෙනවා. ඒක මේ වර්ෂයේදී - 2025දී - රුපියල් බිලියන 2,970යි. ඔබතුමන්ලා සියලුදෙනාම එදා කිව්වේ එවකට පැවති රජයේ වියදම් අධික මට්ටමක තිබෙනවාය කියලායි. මම මේ කියන්නේ ප්‍රායෝගික වශයෙන් අය වැයක් ඉදිරිපත් කරනකොට තිබෙන ප්‍රශ්න පිළිබඳවයි. එදා ඇමතිවරු 35ක්, 40ක් සිටිනවාය කියලා, ඇමතිවරු දුසිම් ගණන් සිටිනවාය කියලා, ඒ අය කපු කෑවා අරවා කෑවා මේවා කෑවා කියලා ජනතාවට වෙන චිත්‍රයක් මවලා, අද ඒ මුදල් ඉතුරු කරනවා කිව්වා. නමුත් වියදම රුපියල් බිලියන 310කින් වැඩි වෙලා තිබෙනවා. වැටුප්වලට රුපියල් බිලියන 110ක් වැඩි කළාම ඉතිරිකිරීම් කොහේද ගිහිල්ලා තිබෙන්නේ? මේවා තමයි සැබෑ ප්‍රායෝගික ප්‍රශ්න. මම එදා අගමැති මෙතැන ඉන්නකොට කිව්වා, ජනාධිපති යාපනයට යනකොට මහ පාරෙන් යන්න පැය 7ක් ගතවන නිසා පාරෙන් යන්නේ නැතුව හෙලිකොප්ටරයේ යන්නේ කුහකකමකට නොවෙයි, රටේ සංවර්ධනයට ඕනෑ නිසාය කියලා. මොකද, ඡන්දයක් ගන්න එහෙම කිව්වාට රටක් පාලනය කරද්දී එහෙම කටයුතු කරන්න බැහැ. ජනාධිපති පැය 6ක් පාරේ ඉන්නවාය කියන්නේ තීන්දු ගැනීමට තිබෙන පැය 6ක කාලය නැති වෙන එකයි. ඉතින් කරුණාකරලා මේකවත් පාදක කරගෙන ඒ දේ රට වෙනුවෙන් ඉදිරියට කරගෙන යන්න.

කථානායකතුමාගේ නිල නිවස තිබෙන්නේ මගේ ගෙදර ආසන්නයේ. ඇයි, ඒක වහලා තිබෙන්නේ? ඒක තිබෙන්නේ පාවිච්චි කරන්න. ඒක පාවිච්චි කළේ නැහැ කියලා වියදම අඩු වෙනවාද? නැහැ. මම හිතන විධියට, ඒ නිල නිවස පාවිච්චි නොකිරීමෙන් මාසයකට රුපියල් මිලියන දෙක තුනක්වත් ඉතුරු වෙන්නේ නැහැ. ඉතින් කරුණාකරලා ඒක හෙට ඉඳන් ම පාවිච්චි කළොත් ඒක රටේ ඉදිරි ගමනට උදව් වෙනවා. ඒ නිසා අපි කියන්නේ මේ සම්පත් ඇති කරලා තිබෙන්නේ පාවිච්චි කරන්න මිසක් කෞතුකාගාර වාගේ තියාගෙන ඉන්න නොවෙයි කියලායි.

ඒ නිසා මා මේ අවස්ථාවේදී රටේ ප්‍රායෝගිකව කරන්න තිබෙන වැඩ සම්බන්ධයෙන් තමයි අදහස් ඉදිරිපත් කරන්නේ. අවුරුදු 76ක ශාපය කියලා කිව්වාට මේ අවුරුද්දේ ඒක සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවාද? නැහැ, ගරු කථානායකතුමනි. අද ජීවන වියදම ගැන කථා කරනවා. නමුත් ඒ සම්බන්ධයෙන් කථා කරන්න මම වෙලාව මිඩංගු කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, ඒක උච්චාවචනය වෙනවා. අද වැඩි වෙන එක හෙට අඩු වෙනවා. නමුත් ජනතාව තුළ ඒ ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා රට භාර දෙනකොට රුපියල් 125ට තිබුණු හාල් කිලෝවක මිල අද රුපියල් 250ක් වෙලා. ඒ මිල තවත් වැඩි වෙනවාය කියනකොට කොහොමද ඒකට උත්තර දෙන්නේ? පොල් ගෙඩිය අරයා කෑවාද, මෙයා කෑවාද, රිළවා කෑවාද කියන එක නොවෙයි තිබෙන ප්‍රශ්නය. අන්තිමට රුපියල් 120ට තිබුණු පොල් ගෙඩියක මිල අද වනකොට රුපියල් 250යි, රුපියල් 260යි. ඒ වාගේ තත්ත්වයක් ඇති වෙනකොට ඒකට කොහොමද උත්තර දෙන්නේ? අවුරුදු 76ක ශාපය මොකක්ද කියන එක මේ අවස්ථාවේදී අපි පෙන්වන්න අවශ්‍යයි. මම පෙන්වපු ඉදිරි සංවර්ධන ගමන ඇති වෙලා තිබෙන්නේත් මේ ශාපය තුළින් නම් දැන් මොනවාද තව වෙන්න තිබෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙතැන ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනෙක් හිටියාට විපක්ෂය ඊට වැඩිය ශක්තිමත්ව සිටිනවා. එවැනි අවස්ථාවක මේ පරිපාලනය ගෙනියන්න අවශ්‍ය වන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් මිස පැලවත්ත කාර්යාලයෙන් නොවෙයි කියන එක මම නැවත මතක් කරන්නේ මේ රටේ අභිවෘද්ධිය වෙනුවෙනුයි. සමහර වෙලාවට විපක්ෂයෙන් බලයි, මොකක්ද මේ කියන්නේ කියලා. අපි කියන්නේ මේකයි. රටක් පාලනය කරනවා කිව්වාම ඒකෙන් අදහස් වෙන්නේ රටක් පාලනය කරනවා මිස ප්‍රාදේශීය සභාවක් පාලනය කරන එක නොවෙයි. මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඒ වාගේ තැනකට

[ගරු රවී කරුණානායක මහතා]

පත් වුණා. එම නිසා නැවත ඒ විශ්වාසය ඇති කරන්න තමයි මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් නැති කරනවාය කියන යෝජනාව ගෙනාවේ. ඒ වාගේම, මේ අවස්ථාවේදී තනි පුද්ගලයෙකු වශයෙන් නොවෙයි, රටක් ඉදිරියට ගෙනියන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන එකයි කරන්න තිබෙන්නේ. එමෙන්ම අපි සියයට 2.3ක ප්‍රාථමික ශිෂ්‍යමේ අතිරික්තයක් තියාගෙන සියයට 15ක ආදායම හොයනකොට; රුපියල් බිලියන 4,100, රුපියල් බිලියන 5,000 තෙක් වැඩි කරමින් රුපියල් බිලියන 900ක් හොයා ගන්න එක ලේසි දෙයක් නොවෙයි. මේක අද කිව්වාට දැනටම මේ අවුරුද්දේ දවස් 50ක් ගත වෙලා තිබෙන්නේ.

ඊළඟට බලන්න, අද වාහන ආනයනය කිරීම ගැන. එදා මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු සහ ඇමතිවරු පොරොන්දු වුණා, රුපියල් ලක්ෂ 12කට කාර් එකක් ගේන්න පුළුවන් කියලා. නමුත් motorbike එකක් රුපියල් ලක්ෂ 12ක් වෙනවා කියලා තමයි අන්තිමට ඊයේ හෙළිදරව් වුණේ. අපිට මේ මිල ප්‍රමාණය වැඩිවීම තුළින්ම ආදායමක් ලැබෙන්නේ නැහැ. මා දන්නා විධියට ඇමෙරිකානු ඩොලර් මිලියන 82ක තමයි දැනට මේ රටේ LCs විවෘත කරලා තිබෙන්නේ. ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක් - ඇමෙරිකානු ඩොලර් බිලියන 1ක්- වෙන් කරලා තිබෙනකොට ඒකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 82ක් කියන්නේ, සියයට 8යි විවෘත කරලා තිබෙන්නේ. මම හිතන විධියට ලොකු වෙනසක් ඇති කරන්න අවශ්‍යයි, මේ සම්බන්ධයෙන්. ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් යම්කිසි විධියක ප්‍රකාශයක් කරලා තිබුණා. එය අඩු වෙනවාද, නැද්ද කියන එක වෙනම දෙයක්. හැබැයි, මා හිතන විධියට ජපානයේ රුපියල් ලක්ෂ 20කට තිබෙන කාර් එකක් මෙහාට එනකොට රුපියල් මිලියන 20ක් වීම ප්‍රායෝගිකව දරා ගන්න බැහැ. මොකද, බදු තුළින් කෘත්‍රිම වශයෙන් රුපියල් මිලියන 18ක් එකතු කිරීම එසේ මෙසේ කටයුත්තක් නොවෙයි. මීට වැඩිය ඕනෑකමින් මේවා ගැන බලන්න අවශ්‍යයි. මොකද, බැරි වෙලාවත් ඒ ආදායම ලැබුණේ නැත්නම් වියදම් කිරීමට ඒක සම්පූර්ණයෙන් බාධාවක් වෙනවා.

ඒ වාගේම තමයි, මේ අවස්ථාවේදී ජපානය අපේ බැංකුවෙන් ඉදිරිපත් කරලා තිබෙන ණයවර ලිපි පිළිගෙන නැහැ. අපි ගෙන්වන්න යන vehiclesවලට අදාළ ණයවර ලිපි සම්බන්ධයෙන් වන කටයුතු ඒගොල්ලන්ට එහේ ක්‍රියාත්මක කරන්න නොහැකි වීම නිසා තවත් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මම මේ කාරණය ඇමතිතුමාට ඉදිරිපත් කරන්නම්. "The Colombo Post" එකට අනුව පසුගිය සිකුරාදා වෙනකම් ඒ ණයවර ලිපි විවෘත කරන්න බැරි වෙලා තිබෙනවා.

ඒ වාගේම මේ අය වැය තුළ තවත් සුවිශේෂී කාරණයක් තිබුණා. ඒ තමයි, ශ්‍රීලන්කන් ගුවන් සමාගමට ණය ආපසු ගෙවීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් බිලියන 20ක් -රුපියල් කෝටි 2,000ක්- වෙන් කර තිබෙනවා. මේ දසවන පාර්ලිමේන්තුවේ පළමුවැනි වතාවට කථා කරන අවස්ථාවේදී මම ප්‍රායෝගික දැනුවත්කම තුළින් කිව්වා, ශ්‍රීලන්කන් ගුවන් සේවය ගැන කියනවා නම් චීනයේ ඉන්න Mr. Chu එංගලන්තයට යනකොට අපේ ශ්‍රී ලංකාවේ බදු ගෙවන්නා ඒ සඳහා බදු ගෙවන්න අවශ්‍ය වෙන්නේ නැහැ; පාඩු විඳින්න අවශ්‍ය නැහැ කියලා.

නමුත්, මේ සඳහා රුපියල් බිලියන 20ක් වෙන් කරලා, ඒ තුළින් ප්‍රශ්නය සදාකාලයටම විසඳන්න පුළුවන් නම් අපි සතුටු වෙනවා. 2023 මැයි මාසයේ සිට 2024 සැප්තැම්බර් මාසය වනකල් රුපියල් බිලියන 102ක් වෙන් කර තිබෙනවා, මේ ණය ටික ගෙවන්න. ඒත් ප්‍රශ්නය විසඳලා නැහැ. මූල්‍ය තත්ත්වය හොඳ වේගෙන යනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සභාපති විධියට සරත් ගනේගොඩ මැතිතුමා පත් වෙලා තිබෙනවා. ඔහු අපේ යාළුවෙක්; ඔහු වරලත් ගණකාධිකාරිවරයෙක්. හැබැයි, ඒක නොවෙයි උත්තරය. බැරි වෙලාවත් මැද පෙරදිග හෝ කොහේ හෝ රටකට බෝම්බයක් ගහලා තෙල් මිල වැඩි වුණාම ඒක අපේ රටටත් බලපානවා. එතකොට කොහොමද ඒකේ අලාභය පියවන්නේ? ජනාධිපතිතුමා ගරු සභාවට ඇවිල්ලා අය වැය ලේඛනය කියවනකොට කිව්වා, ශ්‍රීලන්කන් ගුවන් සමාගම ඉදිරියට ගෙන යන්න තඹ සතයක් වෙන් කරන්නේ නැහැ කියලා. මෙහෙමම තමයි මීට පෙරත් කියලා තිබෙන්නේ. ඒ නිසා public-private partnership කරුණාකරලා පාවිච්චි කරන්න. ඇමතිවරයා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. අපි එදා මේ සම්බන්ධයෙන් හොයා බැලුවා. මේ රටට ආයෝජකයන් එනවා; බලනවා. හැබැයි, මේක loss leader strategy එකක් හැටියට ගෙනියන්න කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත්, ඒ කටයුතු කරන අවස්ථාවේ මේකේ පරිපාලනය පෞද්ගලීකරණය කිරීම හොඳයි කියලා මම මේ අවස්ථාවේදී නිර්භීතව කියන්නේ, රටේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙය ඉදිරියට ගෙන යෑමේ හැකියාවක් තිබෙන නිසායි. ඒ නිසා ශේෂ පත්‍රයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 900ක, නැතහොත් රුපියල් බිලියන 270ක ණයක් තවම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට විනාඩි 28ක් තිබුණා නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩි 23ක් කියලා තමයි,-

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මගේ වෙලාව,-

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට විනාඩි 25ක් තිබුණා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙහෙම කළාම කථාවට බාධා වෙනවා නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩි 25, විනාඩි 23කට අඩු වෙලා තිබෙනවා, කරීක ලැයිස්තුවේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විවාදය පටන් ගන්න කලින් මම ප්‍රශ්න අහනකොටත් මිනිත්තු 5ක් ඉතුරු කරලා දුන්නා නේ. ඒකත් මගේ කථාවට බාධාවක් වෙලා තිබෙනවා. විවාදය පටන් ගන්න වෙලාවේම කාලය අඩු වෙනවා කියන්නේ එතැනම කළමනාකරණයක්,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය කළමනාකරණය කරගන්න,-

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම විවාදය පටන් ගන්න කලින් මිනිත්තු පහක් ඉතුරු කරලා දුන්නා. ඒ කාලයවත් මගේ වාසියට ලබා දෙන්න.

අමතර බදු, ඩිජිටල්කරණය, public-private partnerships, ADB එකෙන් small and medium-term loans ගෙවීම, ඊට පස්සේ port development සඳහා, National Credit Gurantee Institution වාගේ වැඩ පිළිවෙළවල් ADB එක තුළින් ඉදිරියට ගෙන යෑම, එමෙන්ම State-owned enterprise නිවැරදි කිරීම වාගේ දේවල් මම හිතන්නේ රටේ අභිවෘද්ධියට හොඳයි කියායි. හැබැයි, මේ රටේ thrust industry එකක් වන සංචාරක කර්මාන්තයට තඹ සතයක්වත් වෙන් කරලා නැහැ.

ඊළඟට බලමු, අපේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රය දිහා. මම හිතන විධියට මහ කන්නයේ සම්පූර්ණ වී අස්වැන්න මෙට්‍රික් ටොන් මිලියන 2.4ක් වෙනවා. එහි මූල්‍ය වටිනාකම රුපියල් බිලියන 345ක් පමණ වෙනවා. ඒකෙන් රුපියල් බිලියන 5ක් කියන්නේ සියයට 1.2යි. කිසිසේත්ම මේක market orientation එකක් ඇති වන තත්ත්වයක් නොවෙයි. මේ සම්බන්ධයෙන් මීට වඩා උනන්දුවෙන් කටයුතු කළ යුතුයි. මේ සම්බන්ධයෙන් බැංකු විවෘත කරනවා කියලා සඳහන් කර තිබෙනවා. ඒක බොහොම හොඳයි. ඒ ලේඛනයට සාපේක්ෂව රුපියල් මිලියන 5,000ක ප්‍රාග්ධනයක් ඇති කරන්න පුළුවන් වෙන් කිරීමක් කොහේද කරලා තිබෙන්නේ?

ඒ වාගේම තමයි, ආයෝජනය. මේ රටේ ආයෝජන තමයි අතිවිශේෂ. මේ රටේ ආර්ථිකය ප්‍රසාරණය කරන්න ආයෝජන වැඩි කරන්න අවශ්‍යයි. ආයෝජන වැඩි කරන්න අවශ්‍ය නම් පුරෝකථනය කර තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 19ක්. ඒ කියන්නේ, සේවා අංශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක්, භාණ්ඩවලින් ඇමෙරිකානු ඩොලර් බිලියන 13ක් ලෙස අපනයන ආදායම හොයා ගන්න. ඒකට වැඩි කරන්න පුළුවන් ප්‍රාග්ධන වියදමක් කොයි ක්ෂේත්‍රයේද වෙන් කර තිබෙන්නේ? පොලී අනුපාතය පිළිබඳව තමයි මම ගරු අගමැතිතුමියගෙන් ඇහුවේ. සියයට 15ක පොලී අනුපාතයක් තිබුණාම කවුද මේ රටට ඇවිල්ලා ආයෝජන කරන්නේ? මොකද, වෙනත් රටවල සියයට 10ක ලාභයක් තිබියදී ඉන්දියාවයි, අපියි අතර තරගකාරී තත්ත්වයක් ඇති වනකොට, ඒගොල්ලන් සියයට 6ක පොලී අනුපාතයක් ගෙවනවා. එතකොට අපි සියයට 16ක පොලී අනුපාතයක් බැංකුවට ගෙවනවා. සියයට 10 තිබෙන්නේ බැංකුව වර්ධනය වීමට. පළපුරුද්දක් සහිතව ව්‍යාපාර කරලා තිබෙන නිසා තමයි අපි අහන්නේ කොහොමද ඒක මෙහෙයවන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු 4ක් තිබෙනවා. මම ඒක ලබා ගන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එතුමාට තව කාලය ලබා දෙනවාද, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විනාඩියක් ලබා දෙනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඌන සංවර්ධන සහිත ප්‍රදේශ දියුණු කරන්නේ කොහොමද? SVAT එක කොහොමද අපි නවත්වන්නේ? එය නවත්වනවා නම් කරුණාකර ඒක ආයෝජකයාට දෙන්න පුළුවන් විධියට කටයුතු කරන්න. මොකද, බැරි වෙලාවත් SVAT එක නතර කළොත් කවුරුවත් ආයෝජන කරන්නේ නැති වෙනවා. මොකද, වියදම අද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලේසියෙන් ලැබෙන්නේ නැහැ. One-stop shop කිව්වාට, BOI එක, Colombo Port City එක ඇතුළු මේ ඔක්කොම ආයතනවල කටයුතුවලට අවුරුදු ගණන් යනවා. ඒ නිසා කරුණාකර මේ සම්බන්ධයෙන් හොයා බලන්න.

මම මේ අවස්ථාවේදී 2025 ජනවාරි 16වන දින "ඩේලි මිරර්" පුවත් පතේ සඳහන් උපුටා දැක්වීමක් කෙරෙහි අවධානය යොමු කරවනවා. එහි සඳහන් වෙනවා, "Sigiriya not open for night visits,.." කියලා. මේ කාරණය මම පෙන්නුවේ මෙන්න මේ වාගේ දේවල්වලට රජයේ නිලධාරීන් තුළ උනන්දුවක් ඇති කරන්න අවශ්‍ය නිසායි. මේ වාගේ ස්ථාන පරිපාලනමය වශයෙන් බාධකයක් වෙන්නේ නැති වන විධියට සංචාරක කර්මාන්තයට විවෘත කරන්න.

අද ලෝකයේම ඉතා වැදගත් ස්ථානයක් ගන්නවා සීගිරිය. නමුත් රජයේ නිලධාරීන්ට සවස 5න් පසුව වැඩ කරන්න බැරි වුණාම සීගිරිය තුළ අපේ රටට එන ආදායම කොතරම් නැති වෙනවාද? ඒ වාගේම මේ රටේ ජනාධිපතිවරයාම කියලා තිබෙනවා, "Bottlenecks galore for investors approval needed from 82 institutions" කියලා. එක් අවසරයක් ගන්න මාස 24ක් යනවා ලු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දන්නවා, මට බාධා කරන්න හදනවා කියලා. තව මිනිත්තු දෙකක කාලයක් දුන්නොත් මගේ කථාව ඊට පස්සේ නවත්වන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඔබතුමාට අමතරව ලබා දුන් කාලයත් ඉවරවෙලා තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කලින් මිනිත්තු 5ක කාලයක් ඉතිරි වුණ එක තමයි මම මේ අවස්ථාවට ආයෝජනයක් ලෙස ගන්නේ.

මේ වාගේ container clearance delays අපි පුළුවන් තරම් නවත්වන්න අවශ්‍යයි. මොකද, මේ ප්‍රශ්නය ඉදිරියට යන එක ආයෝජකයන්ට ලොකු ප්‍රශ්නයක් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපි විදේශ ශ්‍රමිකයන්ට කිසිම දෙයක් ලබා දීලා නැහැ. මා හිතන විධියට මේ අවස්ථාවේ අය වැයක් වශයෙන් ඉදිරිපත් කරලා තිබෙන මෙම ලේඛනයේ අයක් තිබෙනවා, ඒ වාගේම වැයක් තිබෙනවා. මේකෙන් හැම තැනම අත පත ගාලා තිබෙනවා. හැබැයි, දැනෙන විධියට නොවෙයි. එම නිසා පෞද්ගලික අංශයේ මැදිහත් වීමක් තුළ අපි ඔක්කෝම ඒක රාශි වෙලා මේ රටේ ආර්ථිකය සවිශක්තිමත් කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදන එක පුළුවන් තරම් ඉක්මනට කරන්න ඕනෑය කියන කාරණය මතක් කරන්නට ඕනෑ. අපි ආර්ථිකය ජය ගනිමු. නමුත් එතැනදී අපි අතීතයට බණිමින් නොව, අනාගතයට -ඉදිරියට- ගමන් කරමින් තමයි වැඩ කරන්න අවශ්‍ය වෙන්නේ. බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සඳහන් කරපු ගණන නොවෙයි, Budget deficit එක තිබෙන්නේ රුපියල් බිලියන 2,200යි. එතුමා සඳහන් කළේ වෙනත් ගණනක්. එතුමා රුපියල් බිලියන 2,900 ගණනක් සඳහන් කරනවා වාගේ තමයි මට ඇහුණේ. නමුත්, correct amount එක රුපියල් බිලියන 2,200යි. Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 10.58]

ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

සාමාන්‍යයෙන් මේ විවාදයේදී අප විසින් විමර්ශනය කළ යුතු කරුණු කිහිපයක් තිබෙනවා. රටක් හැටියට, ඒ වාගේම සමාජයක් හැටියට අපි මුහුණ දී තිබෙන විවිධ සමාජ, ආර්ථික ගැටලුවලට මේ ඉදිරිපත් කර තිබෙන අය වැය තුළින් කිසියම් විධියක විසඳුමක් ලැබෙනවාද, ඒ වාගේම රටක් හැටියට, සමාජයක් හැටියට ඉදිරියට යෑම සඳහා මේ අය වැය යෝජනා සමත්වෙලා තිබෙනවාද කියන එක මේ විවාදයේදී අප විසින් සලකා බැලිය යුතුව තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මුදල් ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා තමන්ගේ අය වැය ප්‍රකාශනය ඉදිරිපත් කරනකොට ඒ ප්‍රකාශනයත් එක්ක රජයේ බලාපොරොත්තු සහ අරමුණු ඉදිරිපත් කරලා තිබෙනවා. එතැනදී අපි විශ්ලේෂණය කරලා බලන්න ඕනෑ; සැලකිල්ලට ලක් කරන්නට ඕනෑ, රජයේ අරමුණු සහ බලාපොරොත්තු එක්ක සමපාත වන යෝජනා එතුමා ඉදිරිපත් කළ අය වැය ප්‍රකාශනයේ යෝජනා තුළ අඩංගුවෙලා තිබෙනවාද කියලා.

විශේෂයෙන් මේ අය වැය, ජාතික ජන බලවේගය හැටියට අපි රජයක් පිහිටුවලා ඉදිරිපත් කරන පළමුවැනි අය වැය; මංගල අය වැය. අපි මැතිවරණ කාලයේත්, ඊට කලිනුත් ජනතාවට පොරොන්දුවක් දුන්නා, කිසියම් විධියක සමාජ පරිවර්තනයක් ඇති කරලා හැමෝටම පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදනවා කියලා. ජනතාවට ලබා දුන් ඒ බලාපොරොත්තු ඉෂ්ට කරලීම සඳහා අවශ්‍ය පදනම සකස් වන පරිදියි කටයුතු කළ යුත්තේ. සමහර වෙලාවට ඒ යෝජනාවලිය අවුරුද්දකින් දෙකකින් සියයට 100ක්ම ඉටු කරන්න බැරි වෙයි. නමුත්, එම දිශානතිය වෙනුවෙන් ඒකට පදනම සකස් වන යෝජනාවලියක් මේ අය වැය තුළ අඩංගු වෙනවාද කියන එක අප විසින් විමසා බැලිය යුතුව තිබෙනවා. ඔන්න ඔය වාගේ කරුණු සැලකිල්ලට අරගෙන තමයි අපි මේ අය වැය දිහා බලන්න ඕනෑ. ඒ අනුව තමයි මේ අය වැයත් එක්ක අපි එකඟ වෙනවාද, නැද්ද කියන එක තීරණය කරන්න වෙන්නේ.

අපි දන්නවා, විශේෂයෙන් පසුගිය වසර කිහිපය තුළ තීව්‍ර වුණු ආර්ථික අර්බුදය ඇති වෙන්න ප්‍රධාන හේතුව තමයි, රට තුළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ප්‍රමාණවත් තරමට පුළුල් නොවී, රට තුළ මූල්‍ය උත්පාදනයක් සිදු නොවීම. අන්න ඒ මූල්‍ය උත්පාදනය සිදු නොවීමත්, ඒ අතරේ අතුරු කාරණා හැටියට නාස්තිය, දූෂණය, වංචාව ඒ වාගේම ප්‍රමුඛතාව හඳුනා නොගත් මහා පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් කරපු ආයෝජනත් මේ ආර්ථික අර්බුදය තීව්‍ර කරන්න හේතු වුණා. මේ ආර්ථික ආර්බුදයෙන් කිසියම් විධියක පියමංවීමක් අපි කල්පනා කරනවා නම් වැදගත් වන කරුණ තමයි නිෂ්පාදන සහ සේවා පුළුල් කිරීම සඳහා කොයිතරම් දුරට ප්‍රාග්ධනය කැඳවනවාද කියන එක.

මේ අය වැය දිහා බලද්දී, -ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධව සඳහන් කළා- අපට පේනවා අපේ දළ ජාතික නිෂ්පාදනයෙන් කොතරම් මුදලක්, කොයිතරම් ප්‍රතිශතයක් ප්‍රාග්ධනය සඳහා වෙන් කරලා තිබෙනවාද කියලා. රුපියල් බිලියන 1,315ක් 2025 අය වැය තුළ ප්‍රාග්ධනය සඳහා

වෙන් වෙනවා. ඔබතුමා නිවැරදිව සඳහන් කළා වාගේ ඒක දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 4ක්. ඒ වාගේම 2024ට සාපේක්ෂව ගත්තොත් එය සියයට 1.4ක වැඩිවීමක්. ඒ වාගේම මේ ප්‍රාග්ධනය සඳහා වියදම දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට 2026 සහ 2027දී සියයට 4.1 සහ සියයට 4.2 වශයෙන් ප්‍රතිශතයක් ලෙස වැඩි කළ යුතුයි කියන පුරෝකථනය මේ අය වැය යෝජනා තුළ ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය සංවර්ධනය සඳහා තවත් රුපියල් මිලියන 11,280ක් වෙන් කරලා තිබෙනවා. ඉතින් පෙනෙන කාරණය තමයි, අය වැය යෝජනා තුළින් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වෙන් කරලා තිබෙන මුදල නිසි පරිදි කළමනාකරණය කළොත් ඒ ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම සඳහා අපට සැලකිය යුතු බලපෑමක් ඉටු කරන්න පුළුවන්කම තිබෙනවා කියන එක. ඒ අනුව මේ අය වැය තුළ තිබෙන ප්‍රධාන කරුණක් හැටියට අපට දකින්න පුළුවන්, ප්‍රාග්ධනය කැඳවමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා අවධානය යොමු කර තිබෙනවා කියන එක.

ඒ වාගේම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සඳහන් කළා, පුනරාවර්තන වියදම සඳහා තිබෙන මුදල. ඔව්, ඇත්ත. 2024දී ඒක දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට 17.0ක්. හැබැයි 2025දී ඒක 17.8ට වැඩි වෙලා තිබෙනවා. ඔබතුමා බැලුවොත්, අපි ඉදිරිපත් කරලා තිබෙන, "ජාතික අයවැය 2025, පුරවැසි අයවැය" කියන පොත් පිංචේ මේක 2026දී සියයට 15.5ට, 2027දී සියයට 15කට සහ 2028දී 14.8ට අඩු කළ යුතු යැයි කියන පුරෝකථනය ඒ තුළ තිබෙනවා. ඒ කියන්නේ, මේ පුනරාවර්තන වියදම් ප්‍රතිශතයක් හැටියට ක්‍රම ක්‍රමයෙන් අවම කර ගැනීම සඳහා අවශ්‍ය වෙන යෝජනා මේ තුළ අඩංගු වෙලා තිබෙනවා.

ඊළඟට අපේ අවධානය යොමු කළ යුත්තේ ආර්ථික අර්බුදය නිසා පීඩාවට පත් වුණු සමාජ තීරුවලට ඔවුන්ගේ ආර්ථික පීඩනය අවම කර ගැනීම සඳහා මේ අය වැය යෝජනා තුළ කිසියම් අවධානයක් යොමු වෙලා තිබෙනවාද කියලා. ඒ අනුව බැලුවාම අපට පේනවා, සමාජ ආරක්ෂණය සඳහා රුපියල් බිලියන 749ක් මේ අය වැය යෝජනා තුළ වෙන් කරලා තිබෙන බව, අස්වැසුම සඳහා රුපියල් බිලියන 232ක්, විශ්‍රාම වැටුප් සඳහා වාගේම අනෙකුත් සුබසාධන සඳහා ආදී වශයෙන්. ආර්ථික අර්බුදය නිසා පීඩාවට පත් වුණු සමාජ තීරු ආමන්ත්‍රණය කරමින් ඔවුන්ට කිසියම් විධියකට ඉලක්ක සහගතව සහන සැලසීම සඳහා මේ අය වැය තුළ යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. අපේ මූල්‍ය කළමනාකරණය තුළ මීටත් වඩා මුදලක් වෙන් කරන්න පුළුවන්කම තිබුණා නම් හොඳයි. හැබැයි ඒ මූල්‍ය කළමනාකරණය තුළ උපරිම වශයෙන් අවධානය යොමු කරමින් කටයුතු කළ බව මේ අය වැය යෝජනා නිවැරදි විධියට විශ්ලේෂණය කිරීමෙන් අපට බලා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම අපි දන්නවා ආර්ථික අර්බුදයෙන් පීඩාවට ලක් වෙන්නේ දිළිඳුම කණ්ඩායම් විතරක් නොවෙයි කියන එක. විශේෂයෙන් මේ ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වුණු දිළිඳු කණ්ඩායම්වලට අමතරව මේ රටේ වෘත්තිකයනුත් හිටියා. විශේෂයෙන් පසුගිය කාලවල අසාධාරණ විධියට හඳුන්වා දීපු උපයන විට ගෙවීමේ බදු නිසා ඒ අය යම් පීඩාවකට පත් වුණා. අපි දන්නවා ඒ වෘත්තිකයන් තමන්ගේ ජීවන තත්ත්වය යම් මට්ටමකට පවත්වා ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් කරන බව. සුව පහසු නිවසක්, -වර්ග අඩි 30,000ක් තිබෙන මන්දිර නොවෙයි-, ඒ වාගේම ඒගොල්ලන් වාහනයක් පාවිච්චි කරනවා. මේවා කරනකොට තමන්ට ලැබෙන වැටුප අනුව ඒකට සරිලන ජීවිතයකට ඒ අය සූදානම් වෙනවා. ඇත්තටම මේ වාගේ වෘත්තිකයන්, ඉහළ අධ්‍යාපන සුදුසුකම් තිබෙන, ඉහළ වෘත්තීය හැකියා තිබෙන අය මේ රට තුළ, අපි වාගේ සමාජ, ආර්ථික තත්ත්වයක් තිබෙන රටක රඳවා ගන්න නම් ඔවුන් සම්බන්ධයෙන් අපි කිසියම් අවධානයකින් කටයුතු කළ යුතුයි.

ලෝකය කියන්නේ අද පුංචි තැනක්. ලෝකයේ රැකියා වෙළෙඳ පොළ තුළ ඔවුන්ට අවස්ථා තිබෙනවා, තමන්ගේ වෘත්තීය සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් අනුව වෙනත් රටකට යන්න. හැබැයි, අපේ රටේ මහජන සේවාවන් පවත්වා ගෙන යන්න, අපේ රටේ සංවර්ධනය සඳහා ඒ අයගේ දායකත්වය ලබා ගන්න නම් අපි කිසියම් අවධානයක් ඔවුන් වෙත යොමු කරන්න ඕනෑ.

අපි දන්නවා, මෙම අය වැයෙන් වැටුප් වැඩි කිරීමක් කර තිබෙන බව. ඒ වැටුප් වැඩි කිරීම යටතේ, එක් එක් තීරු වෙන වෙනම අවධානයට ලක් කරමින්, වෙන වෙනම ආමන්ත්‍රණය කරමින් වැටුප් විෂමතාව අවම වන විධියට, මෑත ඉතිහාසයේ මූලික වැටුපේ ඉඳන් ලබා දෙන්න පුළුවන් ඉහළම ප්‍රතිශතයකින් වැඩි කර වැටුප් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. වැටුප් සම්බන්ධයෙන් ගොඩක් කථා කරපු නිසා මම ගොඩක් detailsවලට යන්නේ නැහැ. හැබැයි, මේ වැටුප් ගැන කථා කරද්දී සමහර අයට ප්‍රශ්න තිබෙනවා. වැටුප් ගණනය කිරීම් සංකීර්ණයි ආදී විවිධ දුර්මත සමහර අවස්ථාවල ඔවුන්ට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බලන්න, මගේ අතේ මේ තිබෙන්නේ මමත් කාලයක් නියෝජනය කරපු විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ මහාචාර්යවරයෙකුගේ වැටුප මේ යෝජනාවලට අනුව වෙනස් වන්නේ කොහොමද කියන එකට අදාළ ගණනය කිරීමයි. දැන් මහාචාර්යවරයෙකුගේ ආරම්භක වැටුප රුපියල් 117,350යි. හැබැයි, මේ අවුරුද්දේ අප්‍රේල් 01වැනි දාට පස්සේ ඒ ප්‍රමාණය 175,681.50 දක්වා වැඩි වෙනවා. 2027දී මූලික වැටුප රුපියල් 237,537 දක්වා වැඩි වෙනවා. ඒ වාගේම තමයි විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා වන අධ්‍යයන දීමනාව - academic allowance එක - ද වැඩි වෙනවා. සාමාන්‍යයෙන් මහාචාර්යවරයකුට අදාළව දැන් එය තිබෙන්නේ සියයට 203ක් ලෙසයි. ඔව්, ඒ ප්‍රමාණය දැන් වෙනස් වෙලා තිබෙනවා, සියයට 112ක් සහ තවත් රුපියල් 50,000ක් වශයෙන්. කලින් තිබුණු මූලික වැටුප අනුව අධ්‍යයන දීමනාව ගණනය කළොත්, මහාචාර්යවරයෙකුට ලැබෙන්නේ රුපියල් 238,220.50ක්. හැබැයි, නව වැටුප් වැඩි වීමත් එක්ක විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙකු සඳහා ලැබෙන අධ්‍යයන දීමනාව රුපියල් 316,033.60ක් දක්වා වැඩි වෙනවා. පර්යේෂණ දීමනාව ලෙස දැන් තිබෙන්නේ රුපියල් 41,072.50යි. අලුත් වැටුප් සංශෝධනයත් එක්ක පර්යේෂණ දීමනාව රුපියල් 48,506ක් දක්වා වැඩි වෙනවා. මම උදාහරණයට ගත්තේ තනතුරෙහි ආරම්භක අවස්ථාවේ ඉන්න මහාචාර්යවරයෙකුගේ වැටුපයි. මීට අනුරූපී ලෙස විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින සියලු අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට, විධායක ශ්‍රේණිවලට, වෛද්‍යවරුන් ඇතුළු සියලු වෘත්තීන්ට අදාළ වැටුප් වැඩි වීම ගණනය කර බලන්න අපට පුළුවන්.

මෙතැන පවතින දුර්මතයක් තිබෙනවා. බොහෝ වෘත්තීන්වලට තමන්ගේ මූලික වැටුපට අමතරව තවත් දීමනා ගණනාවක් තිබෙනවා. ඒ දීමනා ගණනය කරන කොට උපකල්පනය කරන්න ඕනෑ, තමන්ගේ මූලික වැටුප 2027 තිබෙන මූලික වැටුපයි කියලා. OT ගණනය කරනකොට, ඒ වාගේම පර්යේෂණ දීමනා, අධ්‍යයන දීමනා ගණනය කරනකොට, day's pay ගණනය කරනකොට සමහර අය දැනුවත්ව, සමහර අය නොදැනුවත්ව කර ගන්නා වරදක් තමයි මූලික වැටුප හැටියට 2025 ආරම්භක වැටුප; 2025 අප්‍රේල් මාසයේ වැටුප සැලකීම. ඇත්තටම ඒ සඳහා ගණනය කිරීමේ පදනම හැටියට ගන්න ඕනෑ 2027දී වැඩි වන මූලික වැටුපයි. එයට අනුව ගණනය කළාම කිසිම වෘත්තියක OT පැයකට ලැබෙන මුදල, day off එකට ලැබෙන පැය ගණන, අධ්‍යයන දීමනා, පර්යේෂණ දීමනා ආදි කිසිවක් අඩු වෙන්නේ නැහැ. ඇත්තටම සිදු වන්නේ ඒවා පවතින වැටුප් ප්‍රමාණයට වඩා වැඩි වන එකයි. සමහර අය වෙනත් වුවමනාවන් නිසා හෝ නොදැනුවත්කම නිසා හෝ මෙය වැරදි ලෙස ගණනය කරලා - calculations කරලා - විවිධ සමාජ මාධ්‍ය තුළ, groups

[ගරු අනුර කරුණාතිලක මහතා]

තුළ තොරතුරු ඉදිරිපත් කරනවා. හැබැයි, ඒ තොරතුරු වැරැදියි. නිවැරැදි ගණනය කිරීම සඳහා අපට අවස්ථාව තිබෙනවා.

මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෘත්තීය සමිතිවලට මේ වෙලාවේ මම මතක් කරන්න කැමැතියි, මේ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයත් එක්ක, විශේෂයෙන් අදාළ නියෝජ්‍ය ඇමතිවරුන් එක්ක ප්‍රමාණවත් පරිදි සාකච්ඡාවක් සිදු කරන්න කියලා. මේක rocket science නොවෙයි. මෙම ගණනය කිරීම මොකක්ද කියලා බලන්න quantum physics දැන ගන්න අවශ්‍ය නැහැ. ඇත්තටම විනාඩි 15ක්, විනාඩි 20ක්, පැය භාගයක් මේ කෙරෙහි අවධානය යොමු කළොත් කිසි ගැටලුවක් නැතුව ඒ පිළිබඳ නිවැරදි තත්ත්වය තේරුම් ගන්න පුළුවන්. අපි වෘත්තීය සමිතිවලට සහ අනෙකුත් කණ්ඩායම්වලට ආරාධනා කරනවා, ඔබතුමන්ලාට කිසියම් ගැටලුවක් තිබෙනවා නම්, කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම්, අපේ නියෝජ්‍ය ඇමතිවරුන් එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරන්න කියලා. අපි සාකච්ඡාව සඳහා විවෘතයි. මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම් එහිදී අපට නිරාකරණය කර ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පසුගිය කාලයේ වෘත්තිකයන් මුහුණ දුන් තවත් ගැටලුවක් තමයි, මා මුලිනුත් සඳහන් කළ උපයන විට ගෙවීම් සඳහා පනවා තිබුණු ආදායම් බද්ද. උපයන විට බද්ද විශාල වශයෙන් වැඩි කරනකොට මේ රටේ වෘත්තිකයන් ඉල්ලීමක් කළා, "මේ අසාධාරණ බද්ද, සාධාරණව ඉදිරිපත් කරන්න" කියලා. ඔබතුමන්ලාට එය මතක ඇති. ඔවුන් කිසි විටෙකත් කිව්වේ නැහැ, තමන් බදු ගෙවන්න සූදානම් නැහැ කියලා. ඔවුන් කියපු දේ තමයි, "අපි බදු ගෙවන්න කැමැතියි. හැබැයි, ඒ සඳහා සාධාරණ බදු ක්‍රමයක් දෙන්න. ඒ වාගේම, අපි ගෙවන බදු විනිවිදභාවයෙන් භාවිත කරන්න. ඒ පිළිබඳව අපට අවබෝධයක් දෙන්න" කියන එක. මේ අය වැය යෝජනා තුළ ආදායම් බද්ද කිසියම් සාධාරණ තලයකට ගෙනැල්ලා තිබෙන බව අපි දන්නවා. උදාහරණයක් හැටියට, මා නැවත වතාවක් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයම ගන්නම්. ආරම්භක තලයේ ඉන්න ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් 2025 මාර්තු මාසය වනකොට තමන්ගේ ආදායම් බදු හැටියට රුපියල් 140,245.20ක් ගෙවන්න ඕනෑ. හැබැයි, අප්‍රේල් මාසයේ tax revision එකෙන් පසුව ආදායම් බද්ද සාධාරණ තලයට ගෙනාවාට පසුව ඔහු ගෙවිය යුත්තේ රුපියල් 122,745.20ක් විතරයි. ඒ අනුව ඔහුට ලැබෙන වාසිය රුපියල් 20,500යි. ඒ වාගේම මහාචාර්යවරයෙකුගේත් ආදායම් බදුවල අඩු වීම රුපියල් 20,500ක් වනවා. එනම්, බදු ගෙවන්න තිබෙන ප්‍රමාණයේ අඩු වීමක් සිදු වනවා. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණියේ ඉන්න කෙනෙකුගේ රුපියල් 19,214ක්, ආධුනික කථිකාචාර්යවරයෙකුගේ රුපියල් 11,551ක් වශයෙන් තමන් ගෙවන්න තිබෙන ආදායම් බදුවල ප්‍රමාණය ප්‍රමාණාත්මකව අඩු වෙනවා කියන එක අපි මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

මෙතැනදී ඉදිරිපත් වන එක තර්කයක් තමයි, "මේ ඉදිරිපත් වෙලා තිබෙන අය වැය රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැයක්. ඒ වාගේම IMF එකේ යෝජනා මත ඉදිරිපත් වුණු අය වැයක්" කියන එක. මේක IMF එකේ යෝජනා මත ඉදිරිපත් වුණු අය වැයක් වුණා නම්, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැයක් වුණා නම්, මේ විධියේ සාධාරණ බදු ක්‍රමයක් හඳුන්වා දෙන එක සිද්ධ වෙන්නේ නැහැ. ඒ වාගේම තමයි, රාජ්‍ය සේවය ආරක්ෂා කරන්න, රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න හොඳ වැටුප් තලයක් හඳුන්වා දෙන එක සිද්ධ වෙන්නේත් නැහැ. අපට මතකයි මේ අසාධාරණ බදු ක්‍රමය රටට හඳුන්වා දුන් මොහොතේදී වෘත්තිකයන් එකතු වෙලා PTUA කියලා සන්ධානයක් හදලා මේ රටේ එවකට මුදල් අමාත්‍යවරයාගෙන් -ජනාධිපතිවරයාගෙන්- ඉල්ලීමක් කළ බව. ඒ වාගේම උද්ඝෝෂණත් කළා. මෙතැන ඉන්න අපේ බොහෝදෙනෙකුත් එම උද්ඝෝෂණවල හිටියා. හැබැයි, ඒ උද්ඝෝෂණවලට පිළිතුරු හැටියට ආවේ මොනවාද? කඳුළු ගෑස්, බැටන් පොල්ල, පොලිස් ප්‍රහාර. සාධාරණ ඇහුම්කන් දීමක් කළේ නැහැ. එතුමා කියපු දේ තමයි, "මට කරන්න දෙයක් නැහැ. බදු අඩු කරනවාට IMF එක විරුද්ධයි. ඕනෑ නම් IMF එකත් එක්ක සාකච්ඡා කරලා මෙම ප්‍රශ්නය විසඳා ගන්න" කියන එක. හැබැයි අපේ ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට ඉදිරිපත් කරපු අය වැය තුළ IMF එකත් එක්ක සාකච්ඡා කරලා නොවෙයි, මේ බදු අඩු කිරීම කළේ. එතුමා ඉතා නිවැරදිව දැනගෙන හිටියා, වෘත්තිකයන්ගේ සාධාරණ හඬට ඇහුම්කන් දීලා ඒ අනුව කටයුතු කරන්න ඕනෑ කියලා. ඒ අනුව බැලුවාම, එක පැත්තකින් ආර්ථික අර්බුදය නිසා පීඩාවට පත් වෙලා ඉන්න දිළිඳු කණ්ඩායම්, ඒ වාගේම සමාජයේ අනෙකුත් තීරු ආමන්ත්‍රණය කරමින් ඔවුන්ට අවශ්‍ය වන සාධාරණය ඉටු කරන්න මේ අය වැය යෝජනා සමත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම තවත් එක කරුණක් සඳහන් කරලා කථාව අවසන් කරන්නම්. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි පොරොන්දු වුණා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ලබා දීම සඳහා. ජාතික ජන බලවේගයේ ඒ පොරොන්දු අනුව විශේෂයෙන් අපි අවධානය යොමු කළ කාරණයක් තමයි, උසස් ගුණාත්මක ජීවිතයක් මිනිසුන්ට ලබා දෙනවා කියන එක. ඒ අනුව ශිෂ්ටසම්පන්න පුරවැසියෙකු, දියුණු මානව සම්පතක් ඇති කරලීම වෙනුවෙන් අප අධ්‍යාපනය සඳහා විශාල අවධානයක් යොමු කරනවා කියා අපි මේ රටේ ජනතාවට පොරොන්දු වුණා.

ඒ හරහා පාසල් අතර තිබෙන විෂමතාව ඉවත් කර ගැනීම සඳහා අපි කටයුතු කරනවා. අපේ රටේ පාසල් 10,126ක් තිබෙනවා. ළමයි 200ට අඩු පාසල් තිබෙනවා සියයට 51.4ක්. ඒ කියන්නේ, පාසල් 5,204ක්. එතකොට ලංකාවේ සමස්ත පාසල් සංඛ්‍යාවෙන් භාගයකට ආසන්න ප්‍රමාණයක ඉන්නේ ළමයි 200ට වඩා අඩුවෙන්. විවිධ හේතු නිසා අවශ්‍ය භෞතික සම්පත්, අවශ්‍ය මානව සම්පත් නැතිකම නිසා මේ වාගේ පාසලකට තමන්ගේ දරුවා ඇතුළත් කරලා ගුණාත්මක අධ්‍යාපනයක් ලැබෙයි කියලා මේ රටේ දෙමව්පියන් විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා අපේ රටේ පාසල් පද්ධතිය සම්බන්ධයෙන් තිබෙන විශ්වාසය බිඳිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමාට නියමිත කාලය දැන් අවසානයි.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඒ නිසා මෙන්න මේ පාසල් පද්ධතිය නැවත වරක් සුදුසු ලෙස ස්ථාපිත කිරීම සඳහා කිලෝමීටර 3ක් ඇතුළත හොඳ පාසලක් ලැබෙන පාසල් පද්ධතියක් ඇති කරලීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, සමස්ත අධ්‍යාපනය සඳහා මෑත කාලයේ වෙන් කරපු විශාලම මුදල් ප්‍රමාණය හැටියට රුපියල් බිලියන 619ක මුදල අපට හඳුන්වන්න පුළුවන්. පාසල් අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 456කුත්, උසස් අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 135කුත්, පූර්ව ප්‍රාථමික අවධිය සඳහා

රුපියල් බිලියන 4.4ක් ආදී වශයෙන් අධ්‍යාපනය සඳහා විශාල මුදලක් වෙන් කරන්න කටයුතු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
තව එක කරුණක් කියලා, විනාඩියකින් මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ අය වැය සම්බන්ධයෙන් එන තවත් විවේචනයක් තමයි, සුබසාධනය සහ යටිතල පහසුකම් සඳහා අධික වියදමක් දැරීම නිසා මේ අය වැය හිඟය ඇතිවෙලා තිබෙනවා ද කියන එක. නමුත්, මේ අය වැය විශ්ලේෂණය කරලා බැලුවොත් අපට පෙනෙනවා, සමස්ත ආදායම රුපියල් බිලියන 4,999ක් සහ ප්‍රාථමික වියදම රුපියල් බිලියන 4,240ක් බව. ඒ අනුව සුබසාධනය සඳහා වියදම් කර තිබෙන්නේ රුපියල් බිලියන 719යි. ප්‍රාග්ධන වියදමට රුපියල් බිලියන 1,315යි. ඇත්තටම ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ලැබෙන විධියට මේ අය වැය යෝජනා සකස් කරන්න මුදල් ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා සමත් වෙලා තිබෙනවා, රුපියල් බිලියන 750ක්. හැබැයි, මේ අය වැය හිඟය ප්‍රධාන වශයෙන් ඇති වන්නේ ණය හා ගෙවීම සඳහා වියදම් කරන රුපියල් බිලියන 2,950ත් එක්ක.

මේ අය වැය පිළිබඳව විපක්ෂය හැටියට, ආණ්ඩු පක්ෂය හැටියට විවිධ දෘෂ්ටිකෝණවලින් බලන්න පුළුවන්. හැබැයි, නිවැරදි පුරවැසි වගකීම්සහගත මහජන නියෝජිතයකු හැටියට කල්පනා කරලා බැලුවොත්, සාධනීය ලක්ෂණ ගණනාවක් අඩංගු අය වැයක් ඉදිරිපත් කරන්න මුදල් ඇමතිවරයා සමත් වෙලා තිබෙන බව පෙනෙනවා. ඒ නිසා මේ රටේ මහජන නියෝජිතයන්ගේ වගකීම තමයි මෙවන් අය වැයක් ඉදිරිපත් කිරීමට සහයෝගය දීලා, මේ ඉදිරිපත් කර තිබෙන සාධනීය යෝජනා ක්‍රියාත්මක කරගෙන අපේ රට මීට වඩා හොඳ තැනක් බවට පත් කර ගැනීම සඳහා එකට එකතුවෙලා වැඩ කරන එක. ඒකට ආණ්ඩු පක්ෂය ද, විපක්ෂය ද කියන එක අදාළ නැහැ. හැමෝම එකතු වෙලා වගකීම්සහගතව වැඩ කළොත් මහජන නියෝජිතයන් හැටියට අපට මීට වඩා හොඳ සමාජයක්, හොඳ රටක් හදා ගන්න පුළුවන්. ඒ සඳහා එකතු වන්න කියලා ආරාධනා කරමින් මම නිහඬ වෙනවා. මේ කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් ලැබෙනවා.

[ප.භා. 11.19]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අර බොහොම සුන්දර සින්දුවක් තිබෙනවා නේ. එහි තැනක සඳහන් වෙනවා, "අපි පොතට කලින් හැමදාමත් පිටකවරෙම බැලුවේ" කියලා. මමත් මේ අය වැය පොතේ පිටකවරේ මුලින් බැලුවා. බැලුවාම මට පෙනුණා, අනුර කුමාර දිසානායක මහත්මයාගේ "අයවැය කථාව - 2025" කියලා සඳහන්ව තිබෙනවා. හැබැයි, පොත පෙරළලා බලපුවාම ඒක අනුර කුමාර දිසානායක මහත්මයාගේ අය වැය නොවෙයි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ. ඒ නිසා දැන් මේ අය වැය විවාදයේදී අපි කථා කරන්න ඕනෑ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අය වැය ගැන ද, අනුර කුමාර දිසානායක මහත්මයාගේ පිටකවරය ගැන ද කියලා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

1970දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය ඉදිරිපත් කළේ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා. එතුමා ඉදිරිපත් කරපු ඒ අය වැය ලේඛනය ගෙන්වා ගෙන මම ඒක පොඩ්ඩක් බැලුවා. එදා අපි එකඟ වුණත් නැතත්, තිබුණු ආර්ථික වැඩ පිළිවෙළට සම්පූර්ණ විරුද්ධ අය වැයක් තමයි එදා ආවේ. ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ අවසාන ආණ්ඩුවේ අය වැයට ප්‍රතිවිරුද්ධ අය වැයක් තමයි ආවේ. 1977දීත් එහෙම වුණා. රොනී ද මැල් මැතිතුමා ගෙනාපු අය වැය 70-77 ආර්ථික වැඩ පිළිවෙළ කුඩුපට්ටම් කරපු, ප්‍රතික්ෂේප කරපු, කණපිට හරවපු අය වැයක්. හැබැයි, අනුර කුමාර දිසානායක ජනාධිපති සහෝදරයාගේ අය වැය පිටකවරේ විතරක් වෙනස් කරලා ගෙනාපු අය වැයක් විධියට තමයි අපි දකින්නේ.

අපි මේ දවස්වල හැමදාමත් අහන කතන්දරයක් තිබෙනවා. ඒ තමයි 76 වසරක ශාපය ගැන. ඒ ගැන මම ටිකක් කථා කරන්නම්. ඒ ගැන තවත් මෙතැන කථා කරන්න එපා කියලා තමයි මට හිතෙන්නේ. දැන් ඒ 76 වසරක ශාපය ගැන අපි කථා කළා ඇති.

අපට මතකයි, 1947 වෙනකොට -මතකයි කියන්නේ ඒ වෙනකොට අපි ඉපදිලා නැහැ. නමුත්, අපි අහලා තිබෙනවා.- අපේ රටේ ප්‍රධාන ප්‍රශ්නය හැටියට අපට තිබුණේ කෘෂිකාර්මික ප්‍රශ්නයක්. එවකට අපේ රටේ හිටපු ජනගහනයෙන් තුනෙන් එකකට තමයි හාල් නිෂ්පාදනය තිබුණේ. ඒ නිසා ඩී.එස්. සේනානායක මැතිතුමා මූලික අවධානය යොමු කළේ කෘෂි කර්මාන්තයට. දැන් ඔය 76 වසරක ශාපය ගැන කථා කළාට ඩී.එස්. සේනානායක මැතිතුමාගේ ගල් ඔය ව්‍යාපාරය නැත්නම් අම්පාර දිස්ත්‍රික්කයත් නැහැ. අම්පාර නගරය කියන්නේ බොහොම හොඳ, අලංකාර විතරක් නොවෙයි, බොහොම පුළුල්ව විහිදුණු නව නගරයක්. ගල් ඔය ව්‍යාපාරය නොතිබෙන්න ඒ නව නගරය නැහැ. එදා ඩී.එස්. සේනානායක මැතිතුමා ආරම්භ කරපු ඒ වැඩ පිළිවෙළ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මහවැලියෙන් අවසන් කළා. ඒ ආරම්භ කරපු කෘෂිකර්ම ප්‍රතිපත්තිය නිසා අපේ රටේ වාරි පද්ධතිය සහ කෘෂිකර්ම තාක්ෂණයේ දියුණුවත් එක්ක අපට පුළුවන් වුණා සහලින් ස්වයංපෝෂිත වෙන්න. ඒ 76 වසර තුළ ඇති වුණු කෘෂිකර්මයේ ප්‍රබෝධය නිසා, කෘෂිකර්මයෙන් අපේ රට සහලින් ස්වයංපෝෂණය වීම නිසා, ඒක 76 වසරක ශාපයක් විධියට අපට දකින්න අපට බැහැ.

ඒ වාගේම අපි දන්නවා එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා කර්මාන්තකරණයට පිවිසියා. හැබැයි, ඒ කර්මාන්ත කරණය මූලික වුණේ ආනයන ආදේශ කර්මාන්ත විධියට. එහෙම නැතුව අපි ලෝකය ජයගන්න, ලෝකයට භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත දක්වා ගියේ නැහැ. මම දකින විධියට ඒ 76 වසර තුළ සිදු වුණු ප්‍රධාන ශාපයක් තමයි එදා කැල්ටෙක්ස් සහ ඇසෝ සමාගම් 1965ද කොහේද අපේ රටින් එළවා දමපු එක. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඒ එළවපු කර්මාන්තශාලා ගිහිල්ලා සිංගප්පූරුවේ Jurong Islandවල ඒ කර්මාන්ත ආරම්භ කළා. තෙල් බින්දුවක්වත් නැති සිංගප්පූරුවට පුළුවන් වුණා, ලෝකයේ ඛනිජ තෙල් වෙළඳාම අත්පත් කර ගන්න, මිල තීන්දු කරන්න සහ තෙල් වෙළෙඳාමේ මූලික hub එකක් බවට පත්වෙන්න. එදා ඒ සමාගම්

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

අපේ රටින් එළවලා අපට තිබුණු opportunity එකක් තමයි අපි නැති කරගත්තේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අන්න ඒක 76 වසරක ශාපයට හේතු වූ කාරණයක්.

ඒ වාගේම, මට මතකයි අපේ බිංගිරිය ආසනයේ උඩුබද්දාවේ තිබුණා, "ලංකා මාතා" කියලා බස් සේවාවක්; පෞද්ගලික සමාගමක්. ඒක කොළඹ තිබුණ මෙන්ඩිස් බස් සමාගම වාගේ බොහොම තරගකාරී සමාගමක්. එදා බස් 100ක් විතර තිබිලා තිබෙනවා. උඩුබද්දාවේ දැනටත් තිබෙන SLTB වැඩපොළ එතකොට ඒ ගොල්ලන්ගේ වැඩපොළ. ඒවා සේරම ජනසතු කළා. ජනසතු කළාට අපේ SLTB එක ආවාද සිංගප්පූරුවේ, මැලේසියාවේ තිබෙන ප්‍රවාහන ආයතන මට්ටමට? නැහැ. හැබැයි, එදා තිබුණු ඒ සමාගම් අද දක්වා ආවා නම්, දැන් ඔබතුමන්ලා මේ අය වැයෙන් මුදල් වෙන් කරන low-floor buses ගෙනෙන තත්ත්වයට පත් වෙන්න හැකියාව අපේ රටේ ඒ සමාගම්වලට තිබුණා. හැබැයි, ඒවා කළේ නැහැ. ඒවා තමයි අපේ රටේ 76 වසරක ශාපයට හේතු වුණු වැරදි තීන්දු - ජනසතුකරණය. අපේ පොල් වතු ටික පෞද්ගලික ව්‍යාපාරිකයන් සතුව තිබියදී හොඳට අස්වැන්න ලැබුණා. ඒවා ආණ්ඩුවට ගත්තාට පසුව මොකද වුණේ? ඒවා විනාශ වෙලා ගියා. එවැනි වැරදි තීන්දු ගැනීම ඒ 76 වසරක කාලය තුළත් සිදු වුණා.

ඒ වාගේම, ඒ 76 වසරක කාලය තුළ හොඳ දේවලුත් සිදු වුණා. අපි දන්නවා, 1977 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බලයට පැමිණිලා, චීනයට කලින් මුලින්ම නිදහස් වෙළඳ කලාප - BOI zones - හැදුවා. චීනයෙන් ඇවිල්ලා අපේ බියගම, කටුනායක නිදහස් වෙළඳ කලාප බලලා ගියා. එදා අපි ගෝලීය වෙළෙඳ පොළට පිවිසියා. ඒ BOI zonesවලට අවශ්‍ය නීති-රීති හැදුවා. BOI zonesවලට පහසුකම් ටික දුන්නා. ප්‍රේමදාස ජනාධිපතිතුමා BOI zone එකෙන් එළියට ගිහින් ගමට කර්මාන්තශාලා ගෙන ගියා. ඒ වෙලාවේ තිබුණු හොඳ වෙළෙඳ පොළක් අපි ආකර්ෂණය කර ගත්තා. ලංකාව ලෝකයේ හොඳම ඇඟලුම්කරු බවට පත් වුණා. ඒවා මේ 76 වසරක කාලය තුළ සිදු වුණු හොඳ දේවල්.

හැබැයි, අපි එතැනින් එහාට ගියාද? 1993න් පස්සේ ඇඟලුම්වලින් ඔබ්බට ගියාද අපේ නිෂ්පාදන? මොකක්ද අපි අත්පත් කරගත් වෙළඳ පොළ? ඒ කිසිවක් වුණේ නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය ඇවිල්ලා නැවත ආර්ථික වැඩ පිළිවෙළ වෙනස් කළා. එදා -1977- පටන් ගත්ත ආර්ථික වැඩ පිළිවෙළ 1993න් එහාට ගියා නම්,- හොඳයි. ඔබතුමන්ලා මේක ඉස්සරහට අරගෙන යනවා නම් හොඳයි. මේ රට දියුණු වෙනවා නම්, ඒක නලින්ද ජයතිස්සටත් අයිතියි; නලින්ටත් ඒකේ පංගුකාරයෙක් වෙන්න පුළුවන්. ඔබතුමා ඇමති, මම පාර්ලිමේන්තු මන්ත්‍රී කියලා නැහැ, අපි දියුණු වෙද්දී *[බාධා කිරීමක්]* "නලින්ද ද, නලින්ද බණ්ඩාර ද" කියලා ප්‍රශ්නයක් නැහැ, ඒක කාටත් සමව බෙදිලා යනවා මම හිතන හැටියට. අපට ඕනෑ එතැනට යන්නයි.

මේ අවුරුදු 76 ශාපලත් දේවල් තිබුණා. ඒ වාගේම මේ අවුරුදු 76 තුළ මේ රට ඉදිරියට අරගෙන ගිය දේවලුත් තිබුණා. අපේ අධ්‍යාපන වෙළෙඳ පොළ, එහෙම නැත්නම් අපේ උසස් අධ්‍යාපනය සඳහා තිබුණු hub එක මැලේසියාවට ගියා. ඒක අපේ රටට අත්පත් කර ගන්න අපට බැරිව ගියා. අද මැලේසියාව ඒක අත්පත් කරගෙන තිබෙනවා. අද අපේ දරුවොත් මැලේසියාවට ගිහින් ඉගෙන ගන්නවා. ඒක අපේ රටට තිබුණු හොඳ opportunity එකක්. ඒක අහිමි වුණේ මොකද? ඔබතුමන්ලාත් ඒකට වගකියන්න ඕනෑ. පෞද්ගලික විශ්වවිද්‍යාලවලට විරුද්ධව ඔබතුමන්ලා මහ පාරේමයි හිටියේ. SAITM එක වෙන්න පුළුවන්, සියලු ප්‍රතිපත්තිවලට විරුද්ධව ඔබතුමන්ලා පාරට බැස්සා. ඒ නිසා අපට තිබුණු අවස්ථා අපට උකහා ගන්න බැරිව ගියා. අපට අවශ්‍ය වෙළෙඳ පොළ අත්පත් කර ගන්න බැරිව ගියා. ඉන්දියානු වෙළෙඳ ගිවිසුම එනකොට, සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම එනකොට ඔබතුමන්ලා යක්කු, බිල්ලෝ මැව්වා. ඒ නිසා අපට තිබුණු ගෝලීය ඉඩ කඩ අපට අත්පත් කර ගන්න බැරිව ගියා. ඒවා අපි ලබාගත් ශාපයන් විධියට අපි දකිනවා.

ඒ වාගේම මහින්ද රාජපක්ෂ මහත්මයා ඇවිත් මොකක්ද කළේ? එතුමා ආර්ථික වැඩ පිළිවෙළක් නොවෙයි ක්‍රියාත්මක කළේ. එතුමාගෙන් වුණේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දියුණුවක් විතරයි. ඉදිකිරීම් මූලික වුණු ආර්ථිකයක්. අපි දන්නවා, ඒක නරක නැහැ කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා කරපු සමහර හොඳ දේවලුත් අපි කියන්න ඕනෑ. හරි හෝ වැරදි හෝ, කොමිස් ගැහුවා හෝ නැතා හෝ එදා නොරොච්චෝලේ බලාගාරය හදපු එක හොඳ දෙයක්. ඒක ඒ වෙලාවේ ගත්ත හොඳ තීන්දුවක්. විරෝධතා තිබුණා. හැබැයි, ඒක එතුමා කරපු හොඳ වැඩක් විධියට අපි දකිනවා. හැබැයි, එතුමා non-tradable sectors තමයි දියුණු කළේ. අරවා හැදුවා, මේවා හැදුවා. ඒවා ඕනෑවට වඩා හදන්න ගියා. ඒවායින් කොමිස් ගැහුවා, හොරකම් කළා. ඒවා වෙනම දේවල්. හැබැයි, ඒවා කරන්න මහින්ද රාජපක්ෂ මහත්මයාව බලයට ගෙනෙන්න දායක වුණේ ඔබතුමන්ලා. එතකොට ඔබතුමන්ලාත් ඒවාට පංගුකාරයෝ නොවෙයිද? 2005 මහින්ද රාජපක්ෂ මහත්මයා දිනුව එකේ ගෞරවය, අයිතිය, වටිනාකම සියයට සියයක් යන්න ඕනෑ, ජේවීපී එකට. මේ 76 ශාපයට මහින්ද රාජපක්ෂ මහත්මයාගේ දායකත්වය ඉතාම ඉහළයි. ඒ දායකත්වයට නායකත්වය දුන්නේ කවුද? ජේවීපී එක නේ. එතකොට ඔබතුමන්ලාත් 76 ශාපයේ පංගුකාරයෝ නේ.

1988-89 මේ රටේ ඇතිවුණු තත්ත්වය මොකක්ද? අද ඔබතුමන්ලා උතුර ගැන ඉතාම සුබවාදීව දකිනවා. ද්‍රවිඩ ජනතාව ගැන සුබවාදීව කථා කරනවා. ඉන්දු-ලංකා ගිවිසුම ගැන, ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන ඔබතුමන්ලා ඒ දවස්වල කථා කරපුවා බොහොම ආකර්ෂණීයයි. ඒවාත් එක්ක තරුණයන් ගොනු කරගෙන 1988-89 මේ රට ගිනි තිබ්බා. මේ 76 ශාපයට මේවාත් වලංගුයි නේ. ඒ නිසා මම කියනවා, මේ 76 කතන්දරේ අපි දැන් නවත්වමු කියලා. අපි එතැනින් එහාට යමු. එතැනින් එහාට මේ රට ගෙන යමු. ඒ හරහා අපි මේ රට දියුණු කරන තැනට අරගෙන යන්න කටයුතු කරමු.

මේ අය වැයෙන් ඔබතුමන්ලා යාපනය පුස්තකාලයට මුදල් වෙන් කරලා තිබෙනවා මම දැක්කා. ඒක නොවෙයි වෙන්න ඕනෑ කියලා මම හිතනවා. ඒකත් හොඳයි. හැබැයි, උතුරු නැහෙනහිර, යාපනයේ මිනිස්සු ඊට වඩා දෙයක් ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලා ව්‍යවස්ථා සංශෝධනයක් ගැන පොරොන්දුවක් දුන්නා, Thirteen plus - 13ට එහා ගිය - බලය බෙදීමක් ගැන. මම අහනවා, ඔබතුමන්ලා ඒ ගැන මේ අය වැයෙන් තීන්දු තීරණ අරගෙන තිබෙනවාද; ඒ සඳහා අඩිතාලම දමලා තිබෙනවාද; ඒ ගැන කථා වුණාද කියලා. යාපනය පුස්තකාලය නොවෙයි, අද උතුරු නැහෙනහිර මිනිස්සු ඉල්ලන්නේ. යාපනය පුස්තකාලයෙන් එහා ගිය බලය බෙදීමක්, ඒ මිනිසුන්ගේ අයිතිවාසිකම් තව සුරක්ෂිත වෙන වැඩ පිළිවෙළක් ඒ අය බලාපොරොත්තු වෙනවා. අන්න ඒකට වැඩ කටයුතු කරන්න.

ඔබතුමන්ලා "මලයගම්" කියන වචනය පාවිච්චි කරලා අපේ කඳුකරයේ ජනතාව ගැන බැලුවා; අවධානය යොමු කළා කියලා කියනවා මම දැක්කා. දැන් ඔබතුමන්ලාගේ සමාජවාදී ප්‍රතිපත්ති නැතත්, ඒවා අගය කළ අය හැටියට ඔබතුමන්ලා මුලින්ම ලයින් කාමර ටික අයින් කරන්න මුදල් යොදවන්න. මේ ලයින් කාමර ජීවිත අයින් කරන්න. ඒ මිනිස්සු විඳින දුක මම දැකලා තිබෙනවා. ඔබතුමන්ලා වැඩි මුදලක් වෙන් කරලා මේ ලයින් කාමර ටික මේ

අවුරුදු තුන, හතර, පහ තුළ ඉවත් කරන්න. ඒ ජනතාවට අවම පහසුකමක් තිබෙන ජීවිතයක් අත්පත් කර ගන්න මුදල් වෙන් කරන්න. "මලයගම්" කියන නම දැම්මාට ඒ ජනතාවගේ ජීවිත උසස් වෙන්නේ නැහැ නේ. ඒ ජීවන තත්ත්වය උසස් වෙන්නේ නැහැ නේ.

ගරු අගමැතිතුමියනි, උඩරට කඳුකරයේ අවුරුදු 200ක් ජීවත් වුණු මිනිස්සු, ඒ අවුරුදු 200ම හිටියේ ලයින් කාමරවල. ඒ මිනිසුන්ගේ ජන ජීවිතය උසස් කරන්න නම් ලයින් කාමර මේ රටෙන් ඉවත් කරන්න ඕනෑ. ලැයින් කාමරවලින් බැහැර වුණු ජනතාවක් මේ රටේ ජීවත් වෙනවා නම් ඒක තමයි ඒ ජනතාවට දෙන්න පුළුවන් ලොකුම ගෞරවය විධියට මම දකින්නේ. අපේ රටේ කඳුකරයේ ජනතාව මේ රටේ ආර්ථිකයට දැවැන්ත ශක්තියක් ලබා දුන් ජනතාවක්.

ඒ වාගේම ඔබතුමන්ලා ඒ කාලයේ සඳහන් කළ ප්‍රතිපත්තිවලට පටහැනිව දැන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බවක් අපි දැක්කා. SriLankan Airlines එකට විශාල මුදලක් වෙන් කර තිබෙනවා අපි දැක්කා. එසේ මුදල් වෙන් කළාට, ඒ මුදලින් SriLankan Airlines එක නඩත්තු කරගෙන යන්න ඔබතුමන්ලාට බැහැ. SriLankan Airlines එක පෞද්ගලික අංශයට දෙනවාද, එහෙම නැත්නම් රජය විසින් පවත්වා ගෙන යනවාද කියන එක ගැන තීන්දුවක් ගන්න ඕනෑ. ඔබතුමන්ලා කියා තිබෙන්නේ රජය විසින් පවත්වා ගෙන යනවා කියලායි. හැබැයි, රජය විසින් පවත්වා ගෙන යනවා නම් ඒකට අවශ්‍ය මුදල් තිබෙන්න ඕනෑ. හැබැයි, ඒකට අවශ්‍ය මුදල් වෙන් කිරීමක් කර තිබෙනවා කියලා අපට පෙනෙන්නේ නැහැ. ඒ නිසා ඒ සම්බන්ධවත් ඔබතුමන්ලා දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ.

මේ අය වැය සම්බන්ධයෙන් යම් කණ්ඩායම් 2ක් තමයි මට වැඩියෙන්ම කථා කළේ, message කළේ. එයින් එක් කණ්ඩායමක් තමයි ඌන සේවා උපාධිධාරීන්. නලින්ද ජයතිස්ස මැතිතුමනි, එතැන 1,000ක්වත් නැහැ. ගරු අගමැතිතුමියනි, ඔබතුමියගේ අවධානයත් මේ සම්බන්ධව යොමු කරන්න. ඌන සේවා උපාධිධාරීන් ඉන්නේ පහළ ශ්‍රේණිවල. ඒගොල්ලන් උපාධියට ගැළපෙන රැකියාවක ස්ථානගත කරන්න. මම දැක්කා, ඔබතුමන්ලා ඒ සඳහා විභාග ක්‍රමයක් යෝජනා කරලා යම් කමිටුවකින් - ඒකේ ඇත්ත නැත්ත මම දන්නේ නැහැ. එහෙම කරන්න එපා. 1,000කට අඩු ප්‍රමාණයක් තමයි එතැන ඉන්නේ. ඒගොල්ලන් උපාධියට ගැළපෙන රැකියාවක ස්ථානගත කරන්න. මොකද, ඒ ගොඩක් අයට දැන් වයස අවුරුදු 50ටත් ආසන්න වෙලා තිබෙනවා. ඒ අයට සාධාරණය ඉෂ්ට කරන්න.

ඒ වාගේම රැකියා විරහිත උපාධිධාරීන් ගැන ඔබතුමන්ලා විශාල හඬක් නැඟුවා. ඔබතුමන්ලාගේ මැතිවරණ ව්‍යාපාරයට ලැබුණු ඒගොල්ලන්ගේ දායකත්වය ඉතා පුළුල්. මම හිතන විධියට රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් සියයට 1ක්වත් අපට ඡන්දය දුන්නේ නැතිව ඇති. ඒ අය ඔබතුමන්ලා ගැන දැඩි විශ්වාසයකින් හිටියා; ඔබතුමන්ලා එක්ක වැඩ කළා. සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා රට පුරා ගිහින් සමුළු තිබ්බා. නමුත් මේ අය වැය ලේඛනය තුළ ඒ අයට සාධාරණයක් කර තිබෙනවා කියා පෙනෙන්න නැහැ. රැකියා විරහිත උපාධිධාරීන් 35,000ක් ඉන්නවා. මම හිතන විධියට ඔබතුමන්ලාගේ අය වැය - ඔබතුමන්ලාගේද, කාගේද කියන එක මම දන්නේ නැහැ - පිට කවරය අනුව ඔබතුමන්ලාගේ වන අය වැය ලේඛනයේ සඳහන් රැකියා අවස්ථාවලින් 10,000ක්-15,000ක්වත් මේ අයට දෙන්න බැහැ. මොකද, ඔබතුමන්ලා උපාධිධාරී, උසස් පෙළ ආදී හැම ක්ෂේත්‍රයක්ම ආවරණය වන විධියට තමයි රැකියා අවස්ථා 30,000ක්ද කොහේද දක්වා තිබෙන්නේ, ඒ සඳහා මුදල් වෙන් කර තිබෙන්නේ. ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා වහාම ක්‍රියාත්මක වන පරිදි කාරක සභා අවස්ථාවේදී හෝ සංශෝධන ගෙනැල්ලා රැකියා විරහිත උපාධිධාරීන්ට ඔබතුමන්ලා දුන් පොරොන්දු ඉටු කිරීමට කටයුතු කරන්න. මොකද, ඔබතුමන්ලා ගුරු සේවයට 20,000ක් ගන්නවා කිව්වා, IT සහ වෙනත් ක්ෂේත්‍රවලට අනෙක් අය බඳවා ගන්නවා කිව්වා. එතෙක් දීමනා ගෙවනවා කිව්වා. ඒ නිසා රැකියා විරහිත උපාධිධාරීන් ගැනත් ඔබතුමන්ලා දැඩි අවධානයක් යොමු කරන්න.

ඒ වාගේම ඔබතුමන්ලා වෛද්‍යවරුන්, හෙද සේවාව - අපි දන්නවා, ඔබතුමන්ලා හෙද සමුළුවක් තිබ්බා. විශාල වශයෙන් ආන්දෝලනයට තුඩු දුන් හෙද සමුළුවක් තිබ්බා. අපේ ලාල් කාන්ත මහත්තයා එහෙම ගිහිල්ලා හොඳ කථාවකුත් කළා, ලස්සන හෙදියෝ දැකලා කලබල වෙලා. හෙද-හෙදියන්ගේ වාගේම වෛද්‍යවරුන්ගේ වැටුප් සම්බන්ධ කාරණය ගැන බලන්න. ඉස්සෙල්ලා කථා කළ කථිකයාත් මේ ගැන කිව්වා. GMOA එකෙන් මට ඊයේත් විස්තරයක් දුන්නා. එහි, "Salary revision of medical officers through Budget 2025" යනුවෙන් සඳහන් වෙනවා. ඒගොල්ලන් දකින්නේ නැහැ, ඒගොල්ලන්ට සාධාරණය ඉෂ්ට වෙලා කියලා. ඔබතුමන්ලා ඒ අයගේ 1/80 වන අනිකාල දීමනාව 1/120 දක්වා අඩු කර තිබෙනවා. ඒක අඩු කර තිබෙන්නේ වෛද්‍ය සේවයේ, nursesලාගේ, MLTs ඇතුළු සහායක සේවාවල නිරත අයගේ. හැබැයි, රෝහල් තුළ සිටින පරිපාලන සේවයේ ගණකාධිකාරිවරුන්ගේ එහෙම අඩු කරලා නැහැ. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, පැය 24ම සේවාවක් ලබා දෙන ඔබතුමාට භාර පිරිසක් තමයි මේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්නේ කියලා අපි දන්නවා. ඔවුන්ගේ ගණනය කිරීම් අනුව පැහැදිලිවම ඔවුන්ට වැටුප් අඩු වෙලා තිබෙනවා; ඔවුන්ගේ ලැබීම් අඩු වෙලා තිබෙනවා. ඒ අලුත් ක්‍රමය යෝජනා කිරීම හරහා; 1/80 කියන එක 1/120 කිරීම හරහා 2027 ජූනි වෙනකොට මුලින්ම වෛද්‍යවරයෙක් විධියට සම්බන්ධ වෙන කෙනෙකුට දැන් තිබෙන ක්‍රමයට වඩා 52,000ක විතර loss එකක් වන බව ඔවුන් ගණනය කර තිබෙනවා. ඒ කියන්නේ අතට ලැබෙන ප්‍රමාණයේ අඩුවීමක් වෙනවා කියලා ගණනය කර තිබෙනවා. විශේෂඥ වෛද්‍යවරුන්ගේ - consultantsලාගේ - තත්ත්වයත් ඒකයි.

මම හිතන විධියට ඔබතුමන්ලා මෙතැනදී අර රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කාලයේ පත් කළ උදය සෙනෙවිරත්න කමිටු වාර්තාවෙන් කැලි කැලි එකතු කරලා තමයි මේ වැටුප් වැඩි කිරීම හෝ අඩු කිරීම කර තිබෙන්නේ. අප්‍රේල් වෙනකොට කට්ටිය දැන ගනීවි වැටුප් වැඩි වෙලාද, අඩු වෙලාද කියලා. මට ඊයේ ගල්ගමුවේදී සුළු සේවයේ සිටින රාජ්‍ය සේවකයෙක් හමු වුණා. ඔහු කිව්වා, රුපියල් 900යි වැඩි වෙලා තිබෙන්නේ කියලා. "හැබැයි, සර් මට 60 පැන්නාම මගේ පෙන්ෂන් එක නම් හරි" කියලා කිව්වා. ඒ කියන්නේ ඔබතුමන්ලා පෙන්ෂන් එකට සාධාරණය ඉෂ්ට කර තිබෙනවා. හැබැයි, ඉතින් පෙන්ෂන් එක ගෙවන්න වෙන්නේ අනාගතයේදී. ඔබතුමන්ලාටත් යම් දායකත්වයක් දෙන්න වෙයි. අපේ අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ අවුරුදු 20ක්-25ක් ආණ්ඩුවේ හිටියොත් ඔබතුමන්ලාට ගෙවන්න වෙයි.

හොඳයි, ඉන්න පුළුවන් නම් ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඉන්නවා කියලා නම් කියන්න එපා. සමහරු කියනවා, අවුරුදු 20ක් ඉන්නවා, 30ක් ඉන්නවා කියලා. ගෝඨාත් ඔහොම තමයි කිය කියා ආවේ. ඉන්න, වැඩ කරන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ. මේ ආණ්ඩුව හොඳට කරනවා නම්, හැමදාම මේ ආණ්ඩුව තිබුණත් අපට කමක් නැහැ. අපේ රට නේ. හැබැයි, ඒවා කියලා නිකම් පොරොට්ටක් දෙන්න එපා. එහෙමනේද, ගරු මනෝ ගනේසන් මැතිතුමනි? කියන්න ඕනෑ නෑ, කරන්න. කියන ඒවා අනුව කටයුතු කරන්න.

විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍යවරුන්ගේ ප්‍රවාහන දීමනාව සම්බන්ධයෙන් මම මීට කලින් ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමාගෙන් ප්‍රශ්නයකුත් ඇහුවා. ඒ සම්බන්ධයෙන් මේ අය වැයේදී අවධානය යොමු කරපු බවක් පේන්නේ නැහැ. විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. පර්යන්ත රෝහල්වල

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

විශේෂඥ වෛද්‍යවරුන් අඩුයි. අනුරාධපුර රෝහලේ විශේෂඥ වෛද්‍යවරයා තමයි මුලතිව් රෝහලේත් කටයුතු කරන්නේ. ඔවුන්ට ප්‍රවාහන දීමනාවක් ගෙවන්නේ නැහැ. ඔවුන්ට සමාන්තර ශ්‍රේණිවල සිටින වෙනත් නිලධාරීන්ට ප්‍රවාහන පහසුකම් හම්බ වෙනවා; වාහන හම්බ වෙනවා; දීමනා හම්බ වෙනවා. හැබැයි, විශේෂඥ වෛද්‍යවරුන්ට ඒ අවස්ථාව උදා වුණේ නැත්නම්, ඔවුන්ගේ වැටුප් විෂමතාව නිවැරදි කළේ නැත්නම් මම හිතන විධියට විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව තවත් අඩු වෙයි. ඒ වාගේම ඔය උදය සෙනෙවිරත්න කමිටු වාර්තාව අල්ලා වීසි කරන්න. ඔබතුමන්ලාගේ ආණ්ඩුවයි දැන් තිබෙන්නේ; බිමල් රත්නායක මහත්තයලාගේ ආණ්ඩුවයි දැන් තිබෙන්නේ. උදය සෙනෙවිරත්න මහත්තයාගේ කමිටු වාර්තාවේ කැලි ඇඟිදලා මේ අය වැය තුළට දමන්නේ නැතුව අලුත් කමිටුවක් පත් කරන්න. හැම ශ්‍රේණියක්ම සමනය වෙන්න පුළුවන්, තුලනය වෙන්න පුළුවන් ආකාරයට වැටුප් වැඩි කිරීම නිවැරදිව කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

බන්ධනාගාර සම්බන්ධවත් පසුගිය දවස්වල කථා කළා. පාතාලය ගැනත් කථා කළා. අපටත් ආරක්ෂාව ඕනෑ. ලොකු පොත් ගේනකොටත් ඇතුළ බලන්න ඕනෑ. පොත ඇතුළේ කොටසක් කපලා ගෙනාවොත් එහෙම? පාතාලයේ අයත් එක්ක වැඩියෙන්ම ආශ්‍රය කරන පිරිස තමයි බන්ධනාගාර නිලධාරීන්. අපි දන්න විධියට බන්ධනාගාරයේ සහ පොලිසියේ -දෙගොල්ලන්ගේම- වැටුප් ශ්‍රේණි සමාන්තරයි. හැබැයි, දැන් ඒක නැහැ. පොලිසියට සාපේක්ෂව බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප් අඩුයි. ඒකත් නිවැරදි කළ යුතුයි. ඒකෙන් මම කියන්නේ නැහැ, පොලිස් නිලධාරීන්ගේ වැටුප් ප්‍රමාණවත් කියලා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම කියන්නේ, තුලිත කරන්න කියලායි. *[බාධා කිරීමක්]* පොලිස් නිලධාරීන්ගේ වැටුප් අඩු කරන්න කියලා නොවෙයි මම කියන්නේ. අඩුම ගානේ බන්ධනාගාර නිලධාරීන්ගේ වැටුප පොලිස් නිලධාරීන්ගේ වැටුප ගණනට ගේන්න. පොලිස් නිලධාරීන්ටත් තව කීයක් හරි වැඩි කරන්න, ගරු බිමල් රත්නායක ඇමතිතුමනි. මොකද, පොලීසියේ ඉන්න ඕනෑ ගණනෙන් සියයට 70ක්වත් අද නැහැ. එම නිසා එක් නිලධාරියෙකුට රාජකාරි විශාල ප්‍රමාණයක් ආවරණය කරන්න සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මගේ කථාව ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
2,000ක් දුන්නත්, -

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඒත් ප්‍රමාණවත් නැහැ, ගරු ඇමතිතුමනි. ඒක ලබා දීම හොඳයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තව 180ක් එනවා නේ, -

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔව්. කමක් නැහැ, දෙන්න. පොලීසියට වැඩිපුර දෙන්න. පොලිස් නිලධාරීන්, OIC මහත්වරු බොහොම කම්පාවෙන් ඉන්නේ. ඔබතුමන්ලා එකසිය අසූ ගණනක් මාරු කරලා රට පුරා යැව්වා. එහෙම මාරු කරපු නිසා පාතාලය වැඩි වුණාදෝ කියලාත් අපට සැකයක් තිබෙනවා. එහෙම ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා පොලිස් නිලධාරීන්ගේත්, බන්ධනාගාර නිලධාරීන්ගේත් වැටුප් වැඩිවීම සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන එක ඉතාම වටිනවා.

අද පාතාලය හිස ඔසවා තිබෙනවා. මම කියන්නේ නැහැ, මේවාට ඔබතුමන්ලා වගකිව යුතුයි කියලා. හැබැයි, ඒ තත්ත්වය මර්දනය කරගන්න බැරි මට්ටමකට අද පත්ව තිබෙනවා. ඔබතුමන්ලාම කිව්වා, අත්අඩංගුවට ගත් අය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. ආයුධ පෙන්වන්න ගිහිල්ලා මැරෙනවා නම් රටක් ඕනෑද කියලා පසුගිය කාලයේ ඔබතුමන්ලා ඇහුවා. ආයුධ පෙන්වන්න ගිහිල්ලා ඉස්සෙල්ලාම ඝාතනය කළේ ඔබතුමන්ලාගේ හිටපු නායකයා; විජේවීර. ඔහුත් ඔහොම කියලා නේ ඝාතනය කළේ. ඒ නිසා ඒ මට්ටමට ඔබතුමන්ලා වැටෙන්න එපා. නිවැරදි තැනට මේ රට ගෙනියන්න නම් හැම ක්ෂේත්‍රයක් ගැනම දැඩි අවධානයක් යොමු කරන්න වෙනවා.

මේ වෙලාවේ ඔබතුමන්ලාගේ අවධානය යොමු නොවුණුම පිරිස තමයි, පෞද්ගලික අංශයේ රැකියා කරන ලක්ෂ 60කට 65කට ආසන්න පිරිස. මට මතකයි, අරගළයට ගහනකොට මාත් අපේ බුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාත් -අපි දෙන්නා- කලින් ගිහිල්ලා එනැන හිටපු බව. අපි ගිය වෙලාවේ අපේ නායකතුමන්ලා ඇතුළු කණ්ඩායම ගියා නම් සමහර විට අද ආණ්ඩුව අපේ වෙන්නත් පුළුවන්. එහෙමනේද, මුජිබුර් මන්ත්‍රීතුමනි?

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, ඔව්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපි ගිය වෙලාවේ ඒ අය ගියේ නැහැ. අපි ඉස්සෙල්ලාම අරගළයට යනකොට, අපි වාගේම ආපු පිරිස තමයි කොළඹ වටේ ඉන්න පෞද්ගලික අංශයේ රැකියා කරන අය, officeවල වැඩ කරන අය; WTCඑකේ, කොළඹ කොටුවේ වටේම පිරිස ආවා, අරගළය ආරක්ෂා කරන්න. හැබැයි, ඒ අයට වැටුප් වැඩිවීමක් වෙලා තිබෙනවාද? *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, මම හිතන්නේ නැහැ, ඒ අයට සාධාරණයක් වෙලා කියලා. ඒගොල්ලන් තමයි මේ රටේ ආර්ථිකයට විශාල කාර්ය භාරයක්, පංගුවක්, දායකත්වයක් දෙන්නේ. ඒ නිසා පෞද්ගලික අංශයේ අයටත් ඒ සාධාරණය ඉෂ්ට කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම මේ අය වැය ලේඛනයෙන් බිංගිරිය අපනයන සැකසුම් කලාපයට මුදල් වෙන් කරලා තිබෙනවා කියලා පෙනෙන්නේ නැහැ. වයඹ ඇළ ව්‍යාපෘතියට මුදල් වෙන් කරලා කියලා පෙනෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඒ ගැනත් අවධානය යොමු කරමින්, මම නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 19ක කාලයක් ලැබෙනවා.

[පූ.භා. 11.41]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැයේදී කැබිනට් අමාත්‍යවරයෙකු හැටියට මට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. 2015 වර්ෂයේදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට ඔය පැත්තේ වාඩිවෙලා ඉන්නකොට, මගේ පළමුවැනි අය වැය විවාදයට සම්බන්ධ වෙමින්, මම කථාව පටන් ගත්තේ, 1977දී පැවති ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයා ලෙස පත්වීම් ලැබ, මංගල අය වැය ඉදිරිපත් කරමින් කථා කරපු ගරු රොනී ද මැල් ඇමතිතුමාගේ ප්‍රකාශයක් උපුටා දක්වමිනුයි. මම කැමැතියි, අදත් ඒ ප්‍රකාශය උපුටා දක්වන්න.

1978 වර්ෂයට අදාළ විසර්ජන පනත ඉදිරිපත් කරමින් 1977.11.15වෙනි දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 19-20හි එතුමා මේ විධියට කියනවා:

> "ආර්ථික පරිහානියේ ඝනාන්ධකාරයක මධ්‍ය වගුරක් තුළ සදාකාලිකව ගත කිරීමට අපට පුළුවන්කමක් නැහැ. ජාත්‍යන්තර හිඟන්නන් වගේ සදාකාලිකව ම ලෝකය වටා හිඟමනේ යන්න අපට බැහැ. දේශීය හා විදේශීය වශයෙන් මහ මෙර උසට ණයතුරුස් ඉහළ යද්දී, එකම තැන පල් වෙවී ඇති දුප්පත්කමේ විසම කවය තුළින් අප වහා ඉවතට පැනිය යුතුයි. මේ ගරු සභාවටත් මේ රටේ මහ ජනයා වෙනත් මේ අයවැය ඉදිරිපත් කිරීමේ අරමුණ එයයි. මෙරට වැටී ඇති පාතාලයෙන් නැවත වරක් ගොඩ ගැනීම සඳහා දරන පළමුවැනි උත්සාහය වන මෙම අයවැය මේ ගරු සභාවටත්, රටේ පොදු මහජනතාවටත්, මම ඉත සිතින් පිළිගන්වමි."

එසේ කියමින් තමයි, එදා ගරු රොනී ද මැල් මුදල් ඇමතිවරයා අය වැය කථාව පටන් ගන්නේ. ඊට පස්සේ එතුමා තවත් අය වැය ලේඛන ගණනාවක් ඉදිරිපත් කළා. අපේ දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ආසනයේ තිබෙන ගී කියන කන්ද වත්තේ ඉඳන් තමයි, එතුමා ගොඩක් අය වැය ලේඛන හැදුවා කියන්නේ. හැබැයි, එදා ඒ ඉදිරිපත් කරපු අය වැය දර්ශනයක් හැටියට පිළිඅරගෙන, ඒක ක්‍රියාමාර්ග බවට පත් කරමින් අය වැය ලේඛන ගණනාවක් ඉදිරිපත් කරලා, අවුරුදු 45ක් ගත වුණාට පස්සේ අපේ රටේ ශේෂ පත්‍රය දිහා බැලුවොත්, ඔබතුමන්ලා ඒ මාර්ගයේ ගිහිල්ලා රටට මොකක්ද ගෙනාවේ?

2022 වර්ෂය වෙනකොට රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් - GDP එකෙන් - සියයට 7.2ක් දක්වා වටිටපු රටක්. ණය ගෙවා ගන්න බැහැ කියලා නිල වශයෙන් ප්‍රකාශයට පත් කරපු, බංකොලොත්භාවය පිළිගත්ත රටක්. පෝලිම්වල මිනිස්සු තියපු, පෝලිම්වල මිනිස්සු මරපු රටක්. ඒ වාගේම ඒ අතරතුර Indian Credit Line එකෙන් ලැබුණු මුදල්වලින් බාල ඖෂධ ගෙනැල්ලා මිනිස්සුන්ගේ ඇස් අන්ධ කරපු, ඒකෙන් හොරකම් කරපු, ගසා කාපු රටක්. ඒ ආදී වශයෙන් ඔබතුමන්ලා ඒ මාර්ගයේ ගිහිල්ලා ගෙනාවේ මේ රටයි. ඒ, දූෂණය ඉහ වහා ගිය රටක්. ලෝකයේ අනෙක් රටවල් අපට වීසා නොදෙන තැනකට අපේ රටේ ප්‍රතිරූපය බිඳ වටිටපු රටක්. සංචිත වටිටපු රටක්. මට මතකයි, එක වෙලාවකදී අලි සබ්රි මහතා මුදල් ඇමතිවරයා හැටියට පාර්ලිමේන්තුවට කිව්වා, ඒ තිබුණු සංචිත ගැන කිව්වොත් එහෙම සමහරු ක්ලාන්තය දාලා වැටෙයි කියලා. එහෙම තිබුණු රටක් තමයි, විශ්වාසයක් සහිතව මේ රටේ ජනතාව අපට භාර දුන්නේ. ඒ ජනතාවට අපි ඉදිරිපත් කරපු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය ළඟ ළඟ ආපු ජනාධිපතිවරණයේදී හා මහ මැතිවරණයේදී ජනතාව අනුමත කළා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනය මත පදනම් වෙලා තමයි, අපි මේ අය වැය ලේඛනය සකස් කරලා තිබෙන්නේ.

දැන් මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්, ඒ කියන්නේ පසුගිය කාලයේ ආණ්ඩුකරණයට දායක වුණු, ආණ්ඩුවේ කැබිනට් ඇමති ධුර, රාජ්‍ය ඇමති ධුර දරපු අය අද කියන කථාව බැලුවාම, - විශේෂයෙන් මම මේ කියන්නේ විපක්ෂ නායකතුමාගේ පක්ෂයේ කණ්ඩායම ගැන- එතුමන්ලා කියන්නේ එකම කථාවක්. ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කිව්වෙත් ඒ කථාවම තමයි. ඒ වාගේම ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, "මේක රනිල්ගේ අය වැය වගෙයි" කියලා. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියනවා, "මාක්ස්වාදයට, සමාජවාදයට කැප වූ හිටපු ජවිපෙ නායකයන් හා සාමාජිකයන් අය වැයෙන් පාවා දීලා" කියලා. ආයෙත් වරක් ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියනවා, "විවෘත ආර්ථික මොඩලයට යන අය වැයක්" කියලා. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කියනවා, "අති දක්ෂිණාංශික අය වැයක්" කියලා. නැවතත් ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියනවා, "අය වැයට සමාජවාදී ආවරණයක් දෙන්න උත්සාහ කළත්, නව ලිබරල් පිවිසුමක් ඇති අය වැයක් කියලා පැහැදිලියි" කියලා.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා, "NPP ජනපති ධනවාදී ද, සමාජවාදී ද කියලා හිතා ගන්න බැහැ" කියලා. ඒ ආදී වශයෙන් මේ කියන කරුණුවල එක සාම්‍යයක් තිබෙනවා. චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය කියනවා, "මේක ජනතාවාදී අය වැයක් නොවෙයි, පසුගාමී අය වැයක්" කියලා. ඒක පැත්තකින් තිබ්බොත් එහෙම පොදුවේ කියන එකම දෙයක් තිබෙනවා, ඒගොල්ලන්ට මේ අය වැය හිතා ගන්න බැහැ, ඒගොල්ලන් අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තිය වාගේ එකක් තමයි මේ අය වැයේ තිබෙන්නේ වාගේ එකක් කියලා. ඒ කියන්නේ මේ අය වැය ලියවිල්ලට තමුන්නාන්සේලා ආසයි.

ගරු මනෝ ගනේසන් මහතා

(மாண்புமிகு மனோ கணேசன்)

(The Hon. Mano Ganesan)

ඒකට ඉරිසියාවයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr.) Nalinda Jayatissa)

අන්න හරි, මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඒක තමයි. මේ අය වැය ලියවිල්ලට තමුන්නාන්සේලා ආසයි. ආසාව තිබෙනවා. හැබැයි, අර ආසයි හයයි බෝට්ටුවේ නමයි වාගේ, මේ අය වැය ලියවිල්ල ක්‍රියාත්මක කරයි කියලා භයයි. අපි මේ අය වැය ලියවිල්ල ක්‍රියාත්මක නොකිරීම තමයි එතුමන්ලාගේ ප්‍රාර්ථනාව. මේක අපි ක්‍රියාත්මක කරලා මේ රට ගොඩගනීවි, ජනතාවගේ ජීවිත ඉහළට ඔසවා තබයි, රට සංවර්ධනය කරා අරගෙන යයි කියලා භයක් තිබෙනවා. නැත්නම් මේ ලේඛනයට ඇත්තටම බරපතළ විවේචනයක් නැහැ නේ. මේ කියන්නේ මොකක්ද? "අපිත් හදන්න හිටියේ මේ වාගේ එකක්. අපේ දේවල් තමයි මේකේ තිබෙන්නේ. මේක අපිට හිතා ගන්න බැහැ, මොකක්ද කියලා" වාගේ දේවල් තමයි කියන්නේ. මේ ලියවිල්ලට ආසයි. හැබැයි, ලියවිල්ල ක්‍රියාත්මක කරයි කියලා භයයි. ඕක තමයි තිබෙන ප්‍රශ්නය. ඇයි, ඒ?

අපිට භාර දුන්නේ - අපි භාර ගත්තේ - පසුගිය ආණ්ඩු විසින් වළකට වටිටපු රටක්. රට වළකට වටිටලා තිබෙන්නේ. අපි දැන් මේ කර ගහලා, ලණු දාලා මේ වළකට වැටිච්ච රට ගොඩ ගන්න උත්සාහ කරමින් ඉන්නවා. ගොඩ ගන්න වෙන්නේ වළ කටින්ම

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තමයි. වළ කටින් ගොඩ ගන්න හදනකොට ඔබතුමන්ලා කියන්න හදන්නේ "අපිත් එහෙම තමයි කරන්න හිටියේ" කියායි. නමුත්, කරන්න බැරි වුණා; එතුමන්ලාට කරන්න බැරි වුණා. ඒ නිසා තමයි ජනතාව අපිට භාර දුන්නේ. මේ අය වැය ලේඛනය ගැන ගොඩක් විග්‍රහ අවශ්‍ය නැහැ. මම හිතන්නේ මෙන්න මේ තනි වාක්‍යය තමයි තමුන්නාන්සේලාට කර ගන්න බැරි වුණේ සහ දැනුත් තේරුම් ගන්න බැරි.

අය වැය කථාවේ "2025 අය වැයේ මූලධර්ම" යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "සැමට සම අවස්ථා නිර්මාණය කරන වෙළෙඳ පොළ බලයේ අධික සංකේන්ද්‍රණයක් නොමැති ලෙස තරගය සාධාරණ වන බවට රජය විසින් සහතික කළ යුතුය."

කෙටියෙන් කිව්වොත් එහෙම ආර්ථික ප්‍රජාතන්ත්‍රීකරණය කරනවා. මේක තමුන්නාන්සේට කවදාවත් කරගන්න බැරි වුණා. කරනවා, කරනවා කියලා මොන වචනවලින් කියන්න හැදුවත් හැම දාම ඔබතුමන්ලා ෆේල් වුණේ මෙන්න මෙතැනින්. ඒ කියන්නේ, සැමට සම අවස්ථා, ආර්ථිකයට දායක වෙන්න, ආර්ථිකයේ ප්‍රතිලාභ ලබා ගන්න; සම අවස්ථා නිර්මාණය කරන වෙළෙඳ පොළ බලයේ අධික සංකේන්ද්‍රණයක් නොමැති වන බවට,- ඒක තහවුරු කරන්න ඕනෑ රජය. අන්න, ඒ වැඩය තමයි අපිත් මූලිකත්වය දීලා කටයුතු කරමින් යන්නේ.

දැන් මේ ගරු සභාවේ ඉන්න විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරු දේශපාලනය කරනවාට අමතරව ව්‍යාපාර කරනවා නේ. ඇමතිකම් කරපු කාලයේත් ව්‍යාපාර කළා නේ. ඒ කාලයේ ඕනෑ නම් ළඟැදියාවන් අතර ගැටුමක් එයි කියලා සමහර විට කෙටිකාලීනව ඒ ව්‍යාපාර තමන්ගේ දරුවාගේ හෝ වෙනත් ඥාතියෙකුගේ නමට පවරන්න ඇති. හැබැයි, ව්‍යාපාර කළා. දැන් ඔබතුමන්ලාගේ ව්‍යාපාර පාඩුයිද? එහෙම පාඩු නැහැ, මම හිතන්නේ. දැන් ව්‍යාපාර පාඩු නැහැ නේ, නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි? බිස්නස් එක පාඩු නැහැ නේ. පාඩුයිද? ඔබතුමන්ලා ව්‍යාපාර ලාභ කර ගන්නවා. හැබැයි, ඔබතුමන්ලා අමාත්‍ය ධුර දරලා රජයක් කරනකොට, රටට පාඩුයි; ඒ ආයතනවලට පාඩුයි; ඒ අමාත්‍යාංශවලට පාඩුයි. ඇයි, ඒ? මේ කරලා තිබෙන්නේ මොකක්ද? බලය පාවිච්චි කරලා, ඇමතිකම පාවිච්චි කරලා, අර සැමට සාධාරණ අවස්ථා කියන සංකල්පය උල්ලංඝනය කරලා තිබෙනවා. මුදල් ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු තමන්ගේ බලය පාවිච්චි කරලා තිබෙනවා, තමන්ගේ ව්‍යාපාර ඉහළ නංවා ගන්න සහ ඒ ව්‍යාපාරයේ යෙදෙන්න සාධාරණ අවස්ථා බලාගෙන ඉන්න මේ රටේ පුරවැසියාට එතැනට එන්න ඉඩ නොදෙන්න. ඒ නිසා තමයි තමුන්නාන්සේලාගේ ව්‍යාපාර ලාභ වෙලා, රටේ ව්‍යාපාර පාඩු වෙන්නේ; රාජ්‍යය පාඩු වෙන්නේ; අමාත්‍යාංශ පාඩු වෙන්නේ.

අපි ඒක තමයි මේ අනෙක් පැත්ත ගහන්න හදන්නේ. ඒකයි මේ අය වැය ලේඛනයෙන් ආර්ථික ප්‍රජාතන්ත්‍රීකරණයට මෙතරම් බරක් තියලා තිබෙන්නේ. අපි ඒ වැඩය කරනවා. අපට ඒක කරන්න පුළුවන්. ඒක කරන්න පුළුවන් වෙන මූලිකම හේතුව මෙයයි. මේ කිසිවෙක් පෞද්ගලික ප්‍රතිලාභ බලාපොරොත්තුවෙන් තමන්ගේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීකම, තමන්ගේ නියෝජ්‍ය ඇමතිකම, තමන්ගේ කැබිනට් ඇමතිකම තමන්ගේ පෞද්ගලික ව්‍යාපාර හෝ පෞද්ගලික අරමුණුවලට යොදවන්නේ නැතිව සමූහයක් හැටියට රට ගොඩනඟන්න වෙන කැපවීමම තමයි මේ රට ගොඩ යන්න අංක එකේ හේතුව වෙන්නේ. මේ ලියවිල්ල සාර්ථක වීමේ රහස තිබෙන්නේ එතැනයි.

මේ කවුරුවත් මැතිවරණයට කලින් තමන්ට මේ ඇමතිකම ලැබෙයි, තමන් නියෝජ්‍ය ඇමති කෙනෙක් වෙයි, තමන් පාර්ලිමේන්තුවට යයි කියන බලාපොරොත්තුවෙන් වැඩ කරපු අය නොවෙයි. මේ හැමදෙනාටම අරමුණක් තිබුණා, බලය ලබා ගැනීම සඳහා. ඒ වෙනුවෙන් තනි තනිව, සංවිධානාත්මකව, සාමූහිකව වැඩ කළා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට ආණ්ඩු බලය ලබා ගත්තා. ඔබතුමන්ලා පසුගිය ජනාධිපතිවරණයේදී, මහ මැතිවරණයේදී අපි ඡන්ද කොච්චර ගනීවිද කියලා අහනකොට, අපි ඒ ගැන කියන්න ගියේ නැහැ. අපි ඒ වෙනුවට මොකද කළේ? අපි වැඩ කළා. අපි දැනගෙන හිටියා, ඒ ප්‍රමාණාත්මක මැදිහත්වීම කවදා හරි එක වෙලාවක ගුණාත්මක පරිවර්තනයක් බවට පත් වෙනවා කියලා. අන්න ඒක තමයි සිද්ධ වුණේ. ඒක නිසා අපේ පක්ෂයට එක මොහොතකදී සියයට 3ක් ලැබිච්ච ඡන්ද ප්‍රමාණය ඡන්ද ලක්ෂ 68 දක්වා වර්ධනය වීම ඔබතුමන්ලාට තේරුම් ගන්න බැරි වෙන්නේ, ඒ අපේ මැදිහත්වීමේ තිබුණු ස්වභාවයේ වෙනස නිසායි. දැන් කවුරු හරි අපටත් සියයට දෙකහමාරක් තිබෙනවා, අපටත් බලය ගන්න පුළුවන් කියලා හිතනවා නම් ඒවා හදේ. ඒවා කරන්න බැහැ. ඒවා කරන්න බැරි වෙන්නේ මේ මැදිහත්වීම වෙනස් නිසායි. අපි බලය ලබා ගැනීම සඳහා මේ රටේ ජනතාවට විශ්වාසය හදන්න ඒ කරපු කැප කිරීම ඊටත් වඩා වැඩියෙන් මේ රාජ්‍ය බලය සහිතව රට ගොඩනඟන්න අනිවාර්යයෙන් යොදවනවා. ඒක තමයි මේ ලියවිල්ල යථාර්ථයක් බවට පත් වෙන රහස. වෙන මුකුත් නොවෙයි. වෙන මොනවත් මැජික් එකක් නැහැ. ඒ කරන අවංක මැදිහත්වීම, කැපවීම තමයි රහස. තමුන්නාන්සේලාට ව්‍යාපාරත් කරගෙන, වෙන වෙන දේවලුත් කරගෙන, මේ අමාත්‍යාංශ කරන්න පුළුවන් නම්, -එහෙම නේද- අපිට අපේ සම්පූර්ණ කැපවීම කරලා ඊට වඩා දස ගුණයක, විසි ගුණයක ප්‍රතිඵල පෙන්වන්න පුළුවන්. අපි ඒක කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දිගටම මම අහගෙන හිටියා, මේ අය වැයේ ව්‍යවස්ථා සංශෝධනය නැහැ, අලුත් ව්‍යවස්ථාව ගැන නැහැ කියලා කියනවා. මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එහෙම කිව්වා. අපි මොකක්ද කිව්වේ? ජනාධිපතිවරණය, මහ මැතිවරණය කාලයේ බොහොම පැහැදිලිව අපි කිව්වා, අලුත් ව්‍යවස්ථාවක් සකස් කරන තෙක් පවතින මේ ව්‍යවස්ථාව නැත්නම් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වැඩි කරන්නේත් නැතුව, අඩු කරන්නේත් නැතුව කරගෙන යනවාය කියලා. අපට අවස්ථාවක් ලැබෙන පළමුවෙනි මොහොතේදී මහ ජනතාවගේ අදහස් උදහස්වලට ඇහුම්කන් දෙන්නට ප්‍රමාණවත් කාලයක් ලබා දීලා, මේ පාර්ලිමේන්තුවේ ප්‍රමාණවත් තරම් කාලයක් සංවාද කරලා, ඒ අලුත් ව්‍යවස්ථාව ගේන්න අපි සූදානම්. නමුත් ඊට කලින් ඔබ හැමදෙනාම විසින් ආණ්ඩු කරලා වට්ටපු රට එක තැනකට ගේන්න වුවමනාවක් අපට තිබෙනවා. ඒක අපි කරන්නට ඕනෑ. මේ ව්‍යාපාර, අපේ රටේ ආර්ථිකය නංවන්නට ඕනෑ; කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයා ශක්තිමත් කරන්න ඕනෑ; ජනතාවට සහන දෙන්න ඕනෑ; සංචිත ශක්තිමත් කර ගන්න ඕනෑ. ඒ සියල්ල කරගෙන අපි ඊළඟට ඔබතුමන්ලාගේ අදහස් උදහස් සහිතව ව්‍යවස්ථාවට අත තියමු. පරණ සාකච්ඡා වාර්තා ඔක්කෝමත් අරගෙන අපි එතැනට යමු. හැබැයි, මේ අය වැය ලේඛනයේ ඒක නැහැ කියන එක මහා ලොකුවට කේන්තියෙන් කථා කරන්න ඕනෑ එකක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඊළඟට, මට ලැබී තිබෙන වේලාව මම යොදා ගන්න කැමැතියි, සමහර කණ්ඩායම් වැටුප් වැඩිවීම සම්බන්ධයෙන් හදන වැරදි මතයට උත්තරයක් ලබා දෙන්න. අපේ නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාත් කිව්වා, අප්‍රේල් මාසය වනතුරු බලන්න, සමහර අයට ලැබෙන වැටුප අඩු වෙයි කියලා. සමස්ත වැටුප් වැඩිවීමට රුපියල් බිලියන 325ක් යොදවන්න බලාපොරොත්තු වන අතරේ, මේ වසරේදී රුපියල් බිලියන 110ක් වෙන් කරනවා, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම

සඳහා පමණක්. එතකොට මූලික වැටුප් වැඩිවීමක් ලබා දිය යුතුයි. මේ රටේ රාජ්‍ය සේවකයාට පසුගිය කාලයේ එහෙම මූලික වැටුප් වැඩිවීමක් ලැබුණේ නැහැ. රාජ්‍ය සේවකයා දන්නවා, මූලික වැටුප් වැඩි වුණාට පසුව ඒක තමන්ගේ දළ වැටුපට, සමස්ත වැටුපට බලපාන්නේ කොහොමද කියලා. OT එකට, extra duty එකට, PH එකට, day's pay එකට, බැංකුවෙන් ණයක් ගන්න ගියාම -මේ ආදී හැම දෙයකටම- ඒ මූලික වැටුප් වැඩිවීම තමයි බලපාන්නේ. ඒ නිසා රාජ්‍ය සේවකයා මේ මූලික වැටුප් වැඩිවීම බොහොම ආදරයෙන්, ගෞරවයෙන් පිළිගෙන තිබෙනවා. ඒගොල්ලන්ගේ ප්‍රතිචාරය ඉතාම ඉහළින් තිබෙනවා. ගොඩක් රාජ්‍ය සේවකයෝ අපෙන් අහන දේ තමයි මෙච්චර ප්‍රමාණයකින් වැටුප් වැඩි කරන්න කොහේද මුදල් තිබුණේ කියන එක. ඒගොල්ලන් ඇත්තටම සාධාරණ ප්‍රශ්නයක් අහනවා. ඔබතුමන්ලාත් ආණ්ඩු කළා නේ. හැබැයි, මේ ප්‍රමාණයට රාජ්‍ය සේවක වැටුප් වැඩි කරන්න බැරි වුණා නේ. ඒගොල්ලන් අහන්නේ කොහේද මේ මුදල් තිබුණේ කියායි. අපේ ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට භාණ්ඩාගාර නිලධාරීන් එක්ක මේ මූලික වැටුප වැඩි කිරීම ගැන සාකච්ඡා ගණනාවක් පවත්වලා තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ඒ වැටුප් වැඩි කිරීම ලබා දෙනවා. එතකොට මේ කිසිවෙකුගේ වැටුප් අඩු වෙන්නේ නැහැ.

මම උදාහරණ කීපයක් කියන්නම්. විශේෂයෙන්ම අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වැටුප් වැඩිවීම් ගැන මම කියන්න කැමතියි.

ඊට කලින් මේ කාරණය කියන්න ඕනෑ. පසුගිය අර්බුද සමයේ -කොවිඩ් කාලයේදී, ආර්ථික අර්බුදය හමුවේ- දේශපාලන අධිකාරිය වැරදි දේශපාලන තීන්දු ගනිද්දී සෞඛ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධ අපේ කාර්ය මණ්ඩලය දැඩි කැපකිරීමක් කළ නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රය මේ තත්ත්වයෙන් හරි පවත්වාගෙන යනවා. අපි ඒ අයට ඒ ගෞරවය දෙන්න ඕනෑ. OT එක පැය 120ක් දැම්මාට සමහර කෙනෙක් ඊට වඩා වැඩි කාලයක් වැඩ කරලා තමයි සෞඛ්‍ය සේවය මේ තරමින් පවත්වාගෙන යන්නේ. ඒ වාගේම තමන්ට හිමි වරප්‍රසාද අඩු වෙද්දී පවා, ලොකු tax එකක් ඒ අය මත පටවා තිබෙද්දී පවා, රට පිළිබඳ විශ්වාසය අහිමි වෙලා තිබෙද්දී පවා රට හැදෙයි, තමන් ඉගෙන ගත්ත තැනට තමන් සේවය කරන තැනට වැඩි සේවයක් කරන්න ඕනෑ කියලා මේ රටේ රෑදී හිටපු අයට අපි විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. ගිය අයටත් අපි කියන්නේ, කරුණාකරලා එන්න, රට හොඳ පැත්තට හැරෙමින් තිබෙන්නේ. එවැනි වෙලාවක අපි ඒ අයටත් වැටුප් වැඩිවීම ඉහළින්ම ලබා දීලා තිබෙනවා.

මම උදාහරණ කිහිපයක් කියන්නම්. Paramedical Service එකේ MT 6 වැටුප් ශ්‍රේණියේ, Paramedical Service එකේ Grade IIIවලට තිබුණු මූලික වැටුප රුපියල් 32,080යි. ඒක රුපියල් 54,120 දක්වා වැඩි වෙනවා. ඒ තිබුණු වැටුප අනුව ඒ ගොල්ලන්ට සාමාන්‍යයෙන් දළ වැටුප වශයෙන් රුපියල් 103,480ක් ලැබුණා. මේ කියන්නේ Paramedical Service එකේ Grade III කෙනෙකුට. මේ වැටුප් වැඩිවීමත් එක්ක ඒ ගොල්ලන්ගේ දළ වැටුප රුපියල් 132,040ක් දක්වා වැඩි වෙනවා. ඒ කියන්නේ මූලික වැටුපේ විතරක් රුපියල් 22,040ක වැඩිවීමක්; දළ වැටුපේ රුපියල් 28,560ක වැඩි වීමක්. වැඩිවෙලා තිබෙන්නේ.

ඊළඟට? Grade IIIවල, MT 7 හෙදියකගේ මූලික වැටුප වුණේ රුපියල් 32,525යි. ඒක රුපියල් 54,920 දක්වා වැඩි වෙනවා. දළ වැටුප වුණේ, රුපියල් 104,481යි. ඒක රුපියල් 133,640 දක්වා වැඩි වෙනවා. ඒ කියන්නේ මූලික වැටුප විතරක් රුපියල් 22,395කින් වැඩි වෙනවා; දළ වැටුප රුපියල් 29,159කින් වැඩි වෙනවා. මේ කියන්නේ අතුරු වෛද්‍ය සේවාවේ සහ හෙද සේවයේ සාමාන්‍ය කෙනෙකුගේ වැටුප. අතුරු වෛද්‍ය සේවාවේ Special Grade එකේ කෙනෙකුගේ මූලික වැටුප දැන් රුපියල් 51,545යි. ඒක රුපියල් 56,800 දක්වා වැඩි වෙනවා. හෙද සේවයේ Special Grade එකේ ඉන්න කෙනෙකුගේ දැන් තිබෙන මූලික වැටුප වන රුපියල් 54,235 රුපියල් 86,800 දක්වා වැඩි වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම විනාඩි පහක කාලයක් ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

වෛද්‍යවරයෙකුගේ- වෛද්‍යවරුන්ගේ ශ්‍රේණි ගණනාවක් තිබෙනවා. සාමාන්‍ය වෛද්‍යවරයෙකුගේ දැන් තිබෙන මූලික වැටුප රුපියල් 54,290යි. ඒක වැඩි වෙනවා, රුපියල් 94,150 දක්වා. දැනට ලැබෙන දළ වැටුප රුපියල් 232,725යි. ඒක රුපියල් 277,800 දක්වා වැඩි වෙනවා. ඒ කියන්නේ මූලික වැටුප් වැඩිවීම විතරක් රුපියල් 39,860යි; දළ වැටුප් වැඩිවීම රුපියල් 45,075යි. ඒ නිසා කාටවත් කියන්න බැහැ, වැටුප් වැඩි වුණේ නැහැ කියලා. වැටුප් ඉහළින්ම වැඩි වෙලා තිබෙනවා. ඒක එක.

දෙවැනි කාරණය, මේ මූලික වැටුපට අදාළ extra duty allowance එක, OT එක, PH allowance එක ආදී දීමනා ගණනය කිරීම සම්බන්ධයෙන් යම් සැකයක් මතු කරලා තිබෙනවා. මම කියන්න කැමැතියි, ආණ්ඩුව තීන්දුවක් ගත්තා මූලික වැටුප් වැඩි කිරීමට. ඒ මූලික වැටුප් වැඩි වෙන්නේ මේ තිබෙන ආර්ථික තත්ත්වය, භාණ්ඩාගාරයේ තත්ත්වය අනුව අදියර තුනකින්. ලබන අප්‍රේල් මාසයේදී පළමුවැනි අදියර, 2026 ජනවාරි මාසයේදී දෙවැනි අදියර, 2027 ජනවාරි මාසයේදී තුන්වැනි අදියර වශයෙන්. එතකොට 2027 ජනවාරි මාසයේදී තමයි මූලික වැටුප් වැඩිවීම සම්පූර්ණ වෙන්නේ. හැබැයි 2027 ජනවාරි මාසයේදී සම්පූර්ණ වන මූලික වැටුප් වැඩිවීමට අදාළව තමයි ලබන අප්‍රේල් මාසයේ ඉඳලා අර දීමනා ගණන් හැදෙන්නේ. Extra Duty Allowance එක, OT allowance එක, PH allowance එක, day's pay එක ආදී හැම දෙයක්ම ගණන් හැදෙන්නේ, 2027 ජනවාරි මාසයේදී, තුන්වැනි අදියරේ මූලික වැටුපට එකතු වන එකත් එක්ක මීසක් ලබන අප්‍රේල් මාසයේදී වැඩි වන කොටසට අදාළව නොවෙයි.

ඒ නිසා මතක තියා ගන්න, මේවා හැම ආණ්ඩුවක්ම කරපු දේවල් නොවෙයි. අපි බොහොම පැහැදිලිව ඒ වැටුප් වැඩි වීම ලබා දීලා තිබෙනවා. සමස්ත මූලික වැටුපෙන් තමයි අර දීමනා සකස් වෙන්නේ. ඒ අනුව ගත්තාම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අතුරු වෛද්‍ය සේවාවේ ඉන්න කෙනෙකුට දැනට අතිකාල දීමනාව හැටියට ලැබෙන රුපියල් 198 රුපියල් 267ක් දක්වා වැඩි වෙනවා. අතුරු වෛද්‍ය සේවාවේ ඉන්න කෙනෙකුට අතිකාල දීමනාව හැටියට පැයකට ලැබෙන රුපියල් 198 රුපියල් 267 දක්වා වැඩි වෙනවා.

පරිපූරක වෛද්‍ය සේවාවේ ඉන්න කෙනෙකුට පැයකට ලැබෙන OT එක රුපියල් 201 ඉඳන් රුපියල් 271 දක්වා වැඩි වෙනවා. හෙද නිලධාරියෙකුට දැන් පැයකට ලැබෙන රුපියල් 203 රුපියල් 275 දක්වා වැඩි වෙනවා. වෛද්‍ය නිලධාරියෙකුට දැන් ලැබෙන රුපියල් 679 රුපියල් 765 දක්වා වැඩි වෙනවා. ඒ කියන්නේ ඒ ගොල්ලන්ට පැයකට ලැබෙන OT එක හරි extra duty allowance එක හරි ඒත් වැඩි වෙලා තිබෙන්නේ.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ඊළඟට day's pay allowance එක හරි PH allowance එක - මේ ගැන සමහරු කියනවානේ විස්සෙන් එක තිහෙන් එක වෙච්ච එක සම්බන්ධයෙන් - මම කියන්නම් ගණන් ටික. අතුරු වෛද්‍ය සේවයේ දැන් පැයකට ලැබෙන රුපියල් 1,582 රුපියල් 1,777 වෙනකම් වැඩි වෙනවා. පරිපූරක වෘත්තිකයන්ගේ දැන් පැයකට ලැබෙන රුපියල් 1,604 රුපියල් 1,804 වෙනකම් වැඩි වෙනවා. හෙද නිලධාරියෙකුගේ දැන් පැයකට ලැබෙන රුපියල් 1,626 රුපියල් 1,831ක් වෙනවා. වෛද්‍ය නිලධාරියෙකුට දැන් පැයකට ලැබෙන රුපියල් 2,715 රුපියල් 3,058 වෙනකම් වැඩි වෙනවා. මේක day's pay allowance එක. Day's pay allowance එක නැත්නම් PH allowance එකත් මේ විධියට වැඩි වෙනවා. OT එකත්, extra duty allowance එකත් වැඩි වෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමීයනි, මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, GMOA එකමයි මේ letter එක මට ඊයේ දුන්නේ. මේකේ Presidentට address කරලා තිබෙන්නේ. එක්කෝ ඔබතුමන්ලා GMOA එකට මේක පැහැදිලි කරන්න ඕනෑ. මොකද, GMOA එක වෙන අවබෝධයක ඉන්නේ. මම හිතන්නේ මෙතැන මොකක් හරි පරස්පරයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා එකක් කියනවා. මේ ගොල්ලෝ එකක් කියනවා. ගරු ඇමතිතුමනි, මම මේ ලිපිය ඔබතුමාට එවනවා. ඒ වාගේම මම මේක **සභාගත*** කරනවා.

ඔබතුමන්ලා GMOA එකට අවස්ථාවක් දෙන්න. එතකොට සාකච්ඡා කරලා මේක විසඳාගන්න පුළුවන්. බොහොම සරලයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ සාකච්ඡා ලබා දී තිබෙනවා. ලබන 27වැනි දා සවස 5.00ට ජනාධිපතිතුමාත් එක්කත් ඒ ගොල්ලන්ට සාකච්ඡාවක් දීලා තිබෙනවා. අද දවල් 12.00ට අතුරු වෛද්‍යවරු එක්ක මම සාකච්ඡා කරනවා. කවුරුහරි කියන්න හදනවා නම්, ඒ ගොල්ලන් ගෙදර ගෙනියන වැටුප අඩු වෙලාය කියලා ඒක පට්ටපල් බොරුවක්. මූලික වැටුපත් වැඩි වෙලා තිබෙනවා. මූලික වැටුප ගණන් හදන්නේ 2027 ජනවාරිවල ලැබෙන මූලික වැටුපට අදාළව නිසා, එන අප්‍රේල් මාසයේ ඉඳලා extra duty allowance එක, OT allowance එක, PH allowance එක, day's pay allowance එක ආදී සියලු දේවල් වැඩි වෙනවා.

ඊළඟට වැටුප් වර්ධකය ගත්තාම, මේ හැම කෙනාගේම වැටුප් වර්ධකය සියයට 80කින් වැඩි වෙනවා. ඒ කියන්නේ රුපියල් 250 තිබුණු එක රුපියල් 450 වෙනවා. එතකොට වැටුප් වර්ධකත් වැඩි වෙනවා. වැටුප් වර්ධක වැඩි වෙනකොට මම මේ කියපු ගණන්වලටත් වඩා වැඩි වනවා, මේ එකිනෙකාගේ ගණන් හැදුවාම. ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, මේ ඔක්කෝම ගණන් හදන්න බැරි මොකද දන්නවාද? එකිනෙකාගේ වැටුප් categories වෙනස් නිසා මම මේ average එක කියන්නේ. එතකොට මේ අයගේ මූලික වැටුප් වැඩිවීමත් මේකට එකතු වෙනවා.

එපමණක් නොවෙයි, දැන් සමහරු තව තැනක හදනවා කථාවක්, extra duty allowance එකේ හරි OT එකේ හරි මොකක් හරි වෙනසක් කළාම ඒ ගොල්ලන්ගේ මාණ්ඩලික තත්ත්වය වෙනස් වෙනවාය කියලා. එහෙම එකක් වෙන්නේ නැහැ. කෙනෙක් මාණ්ඩලිකද, නැද්ද කියලා තීන්දු කරන්නේ ඒ ලැබෙන 160න් එක හරි, 200න් එක හරි, 80න් එක හරි, 120න් එක හරි මත නොවෙයි. ඒක නිසා ඒ මාණ්ඩලික තත්ත්වයෙන් කවුරුහරි වෙනස් වෙනවාය කියන එක පට්ටපල් බොරුවක්. එහෙම වෙන්නේ නැහැ. රාජ්‍ය පරිපාලන ඇමතිතුමා ඒකට සහතික වේවි. අපි ඒක ගැන හොයලා බැලුවා. එහෙම කිසිම දෙයක් වෙන්නේ නැහැ. මාණ්ඩලික තත්ත්වයේ ඉන්න අය මාණ්ඩලික තත්ත්වයේ ඉන්නවා. ඒකට මේ සංශෝධනය අදාළ වෙන්නේ නැහැ.

ඊළඟට තව කියන දෙයක් තිබෙනවා. අවුරුදු 10න් 10ට ලබාදෙන උසස්වීම් සම්බන්ධයෙන් යෝජනාවක් මේකේ ඉදිරිපත් කරලා තිබෙනවා. දැනට හෙද සේවය ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න අයට ඒක අදාළ වෙන්නේ නැහැ. ඒ ගොල්ලන්ට අවුරුදු 5න් සහ 7න් ලැබෙන උසස්වීම් ඒ විධියට ලැබෙනවා. ඒක වෙනස් වෙන්නේ නැහැ.

එපමණක් නොවෙයි, මේ කාරණයත් මම කියන්න කැමැතියි. පසුගිය කාලයේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ළඟ ඉඳලා, දවස් 7න් මෙහෙන් පර්මිට් අරගෙන අරවා මේවා කරලා, මන්ත්‍රීකම් නැති වුණාම අධ්‍යක්ෂ ජනරාල්වරු වෙලා හිටපු කට්ටිය මාධ්‍යවලට පට්ටපල් බොරු කිය කියා යනවා, මේක ලැබෙන්නෙ අවුරුදු තුනකින් කියලා. මේ වැටුප් වැඩිවීමේ පළමුවැනි වැටුප් වැඩිවීම මේ එන අප්‍රේල්වල ලැබෙනවා. දෙවැනි එක ලැබෙන්නේ මාස 8කින්. ඊළඟ වැටුප් වැඩිවීම ඊළඟ අවුරුද්දේ ජනවාරිවල හම්බ වෙනවා. ඊළඟට මාස 12කින් තව වැටුප් වැඩිවීමක් හම්බ වෙනවා. මාස 20ක් යනකොට මූලික වැටුප් වැඩිවීම සම්පූර්ණ වෙනවා. අවුරුදු තුනේ කථාවක් නැහැ. මාස 20කින් මේක සම්පූර්ණ වෙනවා.

රුපියල් බිලියන 110ක් වෙන් කරලා මෙය ලබා දීලා තිබෙන්නේ, අපට අවශ්‍යයි රාජ්‍ය සේවයේ වැඩි මැදිහත්වීමක්. ඒ නිසා මේ වැටුප් වැඩිවීමත් එක්ක අපි මේ ඉල්ලීමත් කරනවා. අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේම මේකත් එක්ක අපි ප්‍රාග්ධන වියදම් හරහා ආර්ථිකයේ එක පිම්මක් පනින්න උත්සාහ කරනවා; අපේ GDP එක වැඩි කරගන්න හදනවා. එහෙම කරලා ආර්ථිකය ප්‍රසාරණය වෙනකොට ඒ ප්‍රතිලාභ ජනතාවට තව ගලාගෙන එන්න අවස්ථාව හදනවා. බය වෙන්න එපා කවුරුවත්. ඒවා හදනවා. දැන් තිබෙන ආර්ථික තත්ත්වය මත ලබා දිය හැකි ඉහළ වැටුප් වැඩිවීමක් ලබා දීලා තිබෙනවා. ඒකත් එක්ක අපි ඉස්සරහට යමු කියලා ඒ අයගෙන් මම ඉල්ලන්න කැමැතියි. ඒ නිසා මේ බොරු බේගල්වලට අහු වෙන්නට එපා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි,-

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වැඩි කළ වැටුප් සඳහා රුපියල් බිලියන 110ක් වෙන් කර තිබෙනවා කියලා. ඒක තමයි අය වැයෙන් පෙන්වා තිබෙන්නේ. නමුත්, අපි 2015දී රුපියල් 10,000කින් පඩි වැඩි කරනකොට රුපියල් බිලියන 136ක් වෙන් කළා. මා හිතන්නේ, එක්කෝ අලුතින් බදවා ගන්න ඒවා ටිකක් කොහෙන් හරි අද අඩු වෙලා තිබෙනවා. ඒක නොවෙයි තිබෙන ප්‍රශ්නය. බලන්න, මේ කියන එකතු කිරීම ඒ කියන හැම තැනටම ගිහිල්ලා තිබෙනවාද කියලා. මා දන්නා විධියට ඕකයි මුදල් අමාත්‍යාංශය කියන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්. කවුරු හරි කෙනෙකුට දැන් තමන්ගේ අතට ලැබෙන වැටුපට වඩා, දැන් ගෙදර ගෙන යන වැටුපට වඩා අප්‍රේල් මාසයේ ගෙදර ගෙන යන වැටුප අඩු වුණොත්, කරුණාකර අපට ඇවිල්ලා කියන්න, මන්ත්‍රීවරුනි. අපි බලන්නම්, මොකද වෙලා තිබෙන්නේ කියලා; ගෙදර ගෙන යන්න තිබෙන වැටුප කොහේ හරි අතර මග නතර වෙලාද කියලා. හැමෝටම ගෙදර ගෙන යන්න ඉහළ වැටුපක් ලබා දෙන්න මේ ආණ්ඩුව අද කටයුතු කර තිබෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.07]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ JVP-NPP ආණ්ඩුවේ මංගල අය වැය දෙවැනි වර කියැවීමේ විවාදයට පුරා සතියක් තිස්සේ අප සහභාගි වෙද්දී හිටපු මුදල් ඇමතිවරුන් දෙදෙනෙකුගේ නම් අපට නිතර අහන්න ලැබුණා. 1970- 1977 කාලයේ ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ අය වැය ඉදිරිපත් කරපු හැටි අපට මතකයි. එතුමා ඉදිරිපත් කළේ සමාජවාදයට නැඹුරු වුණු වාමාංශික අය වැයක්. එදා එන්.එම්. පෙරේරා මැතිතුමාගේ ඒ සංවෘත ආර්ථික ප්‍රතිපත්තියට අනන්ත අප්‍රමාණ විවේචන එල්ල වුණා. ඒ වාගේම ඒ ආර්ථික ප්‍රතිපත්තිය නිසා විවිධ දුෂ්කරතාවලට රටටත්, ජනතාවට විතරක් නොවෙයි, බණ්ඩාරනායක මැතිනියටත්, ආණ්ඩුවටත් මුහුණ දෙන්න සිද්ධ වුණා. හැබැයි, තමන් පෙනී හිටපු ප්‍රතිපත්තිය වෙනුවෙන් පෙනී ඉන්න බණ්ඩාරනායක මැතිනියට කශේරුකාවක් තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඊට පස්සේ 1977 ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ආණ්ඩුවක් පිහිටෙව්වේ හයෙන් පහක ජන වරමක් එක්ක. ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුවේ මංගල අය වැය ඉදිරිපත් කළේ මුදල් ඇමති රොනී ද මැල් මැතිතුමා. එතුමා දක්ෂිණාංශික අය වැයක් ඉදිරිපත් කරමින් තමයි විවෘත ආර්ථිකය එදා හඳුන්වා දුන්නේ. ඒ හඳුන්වා දුන්නු වෙළෙඳ පොළ ආර්ථිකයටත් අනන්ත අප්‍රමාණ විවේචන ආවා. හැබැයි, ඒ නායකයන්ට ඒ වෙනුවෙන් පෙනී සිටින්න කශේරුකාවක් තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද වමට සිග්නල් දාලා දකුණට හරවලා "IMF මාර්ගය හැර අපට වෙන මාර්ගයක් නැතෝ" කියමින් ඉදිරිපත් කරපු අය වැයක් ගැන තමයි අපට මේ ගරු සභාවේ කථා කරන්න වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැය ගැන කථා කරනකොට මෙන්න මේ ලියවිලි දෙකම අවශ්‍ය වෙනවා. එකක් තමයි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන, ඡන්දෙට පෙර පෙන්වපු මේ "ඛබල් පොකට්" ලියවිල්ල. අනෙක් එක තමයි, අය වැය කථාව සහිත මේ "පික්පොකට්" ලියවිල්ල. මේ දෙක අමතක කරලා අපට කථා කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මුලින්ම අපේ රට ගැන කථා කළොත්, අපේ රටේ විවිධ ජාතීන් ජීවත් වෙනවා; විවිධ ආගම් අදහන පිරිස් ජීවත් වෙනවා. විශේෂයෙන්ම මේ කාලය ගැන සඳහන් කළොත්, අපේ රටේ සාරධර්ම විශාල පිරිහීමකට ලක් වෙලා තිබෙන බව අපට වාර්තා වෙනවා. මෙවැනි කාලයක බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් ආගම්වල උන්නතිය වෙනුවෙන් අය වැයෙන් ප්‍රමාණවත් පරිදි අවධානය යොමු කර තිබෙනවාද කියන ප්‍රශ්නය මේ අය වැය දිහා බලද්දී මට මතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා, අපි ගම්වල මිනිස්සු බව. අපේ ගම්වල අදටත් බහුතරයක් උදේ පාන්දර පිරිත් අහලා තමයි වැඩ පටන් ගන්නේ. හතර පෝයට සිල් ගන්න උපාසක උපාසිකාවෝ ඉන්න රටක්, මෙක. බුදුන් තුන්වරක් වැඩම කළ රටක්, මෙක. අටමස්ථාන, සොළොස්මස්ථාන වඳින ජනතාවක් ඉන්න රටක්, මෙක. බුදු දහමට ප්‍රමුඛත්වය දී පෝෂණය කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන නිසා අය වැයෙන් බුදු දහම කෙරෙහි මීට වඩා අවධානයක් යොමු කරයි කියලා මම හිතාගෙන හිටියා.

ඒ වාගේමයි අනෙක් ආගමික වැඩවලටත්. ලංකාව ගත්තොත්, බෞද්ධාගාමික මධ්‍යස්ථාන 12,940ක් තිබෙනවා; ස්වාමීන් වහන්සේලා 43,000 නමක් විතර වැඩවාසය කරනවා; බෞද්ධ දහම් පාසල් 10,646ක් තිබෙනවා. දහඅටලක්ෂ ගණනක් දරුවෝ බෞද්ධ දහම් පාසල්වල ඉගෙන ගන්නවා. 123,000ක් ගුරු භවතුන් ඉරිදාට ලංකාවේ දහම් පාසල්වල උගන්වනවා. ඒ වාගේම, හින්දු ආගමික ස්ථාන 7,150ක් තිබෙනවා. මේ රට තුළ හින්දු දහම් පාසල් 2,000ක්, 2,500ක් පමණ තිබෙනවා. කතෝලික දහම් පාසල් 1,600ක් විතර තිබෙනවා. ඉස්ලාම් ඇතුළු ආගම් සියල්ලට අයත් දහම් පාසල් 17,000ක් විතර ලංකාවේ තිබුණත්, අය වැයෙන් ඒ සියලු ආගම්වල දහම් අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 1.3යි. රටේ දහම් අධ්‍යාපනය වෙනුවෙන් මීට වඩා වැඩි අවධානයක් යොමු කළා නම් හොඳයි කියා මම කල්පනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද උදේ පුවත් පත් දැක්කාම මම සතුටු වුණා, වසර 16කට පසු දළ දා වහන්සේ ප්‍රදර්ශනය සඳහා ජනාධිපතිතුමා කළ ඉල්ලීමට මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ කැමැත්ත පළ වුණා කියා සඳහන්ව තිබුණු නිසා. අපි ඒ ගැන සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අය වැය කථාව අහගෙන ඉන්නකොට ජනතා විමුක්ති පෙරමුණ බොහෝ දේවලදී කෙළින්ම U-turn එකක් ගහලා තිබෙන බව පෙනෙනවා. රාජ්‍ය දේපළ පෞද්ගලීකරණයට එරෙහිව එදා පෙනී සිටි ජේවීපී එක,

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මෙවර අය වැයේදී පෞද්ගලික අංශය පිළිබඳව විශ්වාසය තබා තිබෙන බව අය වැය කථාවෙන් පැහැදිලි වෙනවා. අය වැයෙහි බොහෝ යෝජනාවලින් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳව, එහෙම නැත්නම් පූර්ණ පෞද්ගලීකරණය පිළිබඳව විශ්වාසය තබා තිබෙන හැටි ඒ කථාව පුරාවට අපට ඇහුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒකට හොඳ උදාහරණයක් තමයි, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණය ගැන කියපු කථාව. එදා පැවැති රජයයන් පෞද්ගලික අංශයේ සහාය ඇතිව තෙල් ටැංකි සඳහා ආයෝජනය කරන්න හදද්දී ජේවීපී එක ඊට විරුද්ධව විශාල බිල්ලෝ මැව්වා, මිනිස්සු පාරට බැස්වුවා, විරුද්ධත්වය ප්‍රකාශ කළා. නමුත් ජේවීපී ප්‍රතිපත්ති සම්පූර්ණයෙන් කණපිට ගහමින් අද ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ජාත්‍යන්තර ආයෝජකයන් සමඟ ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස පටන් ගන්න යෝජනා කර තිබෙන බව අය වැය කථාවේදී අපට දකින්නට ලැබුණා.

පසුගිය රජයයන් ලෝකයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාල මේ රටට ගේන්න හදනකොට පෞද්ගලික විශ්වවිද්‍යාලවලට එරෙහිව ජේවීපී එක දරුවන් පාරට බැස්වුවා. ඒ දරුවන්ට බැටන් ප්‍රහාරවලට, කඳුළු ගෑස් ප්‍රහාරවලට, ජල ප්‍රහාරවලට ලක් වෙන්න වාගේම, රිමාඩ් භාරයට යන්නත් සිද්ධ වුණා. එදා ඒ දේවල් කරන්න ඉඩ දුන්නේ නැහැ. නමුත්, අද සම්පූර්ණයෙන් U-turn එකක් ගහලා ඒවා පිළිබඳව කථා කරන්න පටන් ගෙන තිබෙනවා. මෙවර අය වැයෙන් පෞද්ගලික විශ්වවිද්‍යාල පිළිබඳව විශ්වාසය පළ කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මම දැක්කා, අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ),-

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු ඇමතිතුමා, මට බාධා කරන්නේ නැතුව මගේ කථාව ඉවර වුණාම කථා කරන්න. *[බාධා කිරීමක්]* හැබැයි, ඔබතුමන්ලාගේ පැත්තෙන් වෙලාව ගන්න. නැත්නම් අපේ කාලය අඩු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා.

ගරු අනුර කරුණාතිලක මහතා
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සම්බන්ධයෙන් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටු අංක 166හි සඳහන් වෙනවා. ඔබතුමා එය කියවන්න. තෙල් ටැංකි සංකීර්ණය ගැන කියන විස්තරයක් ඇතුළේ ඉතා පැහැදිලිව සඳහන් වනවා, "...ජාතික ආර්ථිකයට වාසිදායක ව්‍යාපෘති ආකෘතියක් සැකසීම" යනුවෙන්. එම නිසා මේ පොතේ තිබෙන දේවල් සම්බන්ධයෙන් අපි අකුරක් නැර වග කියනවා. මේ පොත අනුව තමයි අපේ අය වැය යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

මම කිව්වෙත් ඒකම තමයි. එදා කියපු දේත් එක්ක බැලුවාම, අද U-turn ගහපු එක ගැන අපි සතුටු වෙනවා.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) ඉහළ ලෙස සමත් වුණු දරුවන්ට විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දීම ගැන අය වැයේ කියා තිබෙනවා. ඒක බොහොම හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම ඉඩම්වලට අදාළවත් ජේවීපී මතවාදය වෙනස් වුණු බව අපට පෙනෙන්නට තිබෙනවා. එදා ආයෝජකයන්ට අපේ රටේ ඉඩම් නිදහස් කරද්දී මෙතුමන්ලා විරුද්ධ වුණා; ඒකට එරෙහිව පාරට බැස්සා.

මේ අය වැයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් සතු ඉඩම් පෞද්ගලික අංශයේ ආයෝජනයට ලබා දෙන්න යෝජනා කරලා තිබෙනවා. ඒ පිළිබඳව එදා තිබුණු මතය වෙනස් වෙච්ච එක ගැන අපි සතුටු වෙනවා.

වෙන දා නම් අවුරුදු මාසයට බක් මාසය කියලා කියන්නේ. දැන් ඒක ඡන්ද මාසයක් වෙලා තිබෙනවා. අවුරුදු මාසය, -පළාත් පාලන ඡන්දය තියන මාසය- ඉලක්ක කරලා අඩු ආදායම්ලාභීන්ට සතොස හරහා සහන බඩු මල්ලක් දෙන්න මුදලක් වෙන් කරලා තිබෙනවා. මම දැක්කා එක මන්ත්‍රීවරයෙක් ඒ මුදල බෙදලා පෙන්වනවා. එතකොට එක ගමකට ලැබෙන්නේ සොච්චමයි, පවුල් කිහිපයකට විතරයි ලැබෙන්නේ කිව්වා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල වැට් එක සම්පූර්ණයෙන්ම ඉවත් කරනවා කියලා තමයි අනුර කරුණාතිලක ඇමතිතුමනි ඔබතුමා පෙන්වපු ඔය පොතේ තිබෙන්නේ. ඔබතුමා ඒකත් හොඳට බලලා කියවනවා නම් මගේ කාලය දෙන්නම් ඔබතුමාට කථා කරන්න. ඔබතුමා ඒකත් කියෙව්වා නම් හොඳයි. ඔය ලස්සන පොතේ තිබෙනවා වැට් එක බින්දුවට ගේනවා කියලා. ඒ බද්ද සම්පූර්ණයෙන් ඉවත් කරනවා කියපු එක කළා නම් මේ වාගේ පවුල් කිහිපයකට නොවෙයි රටේම පාරිභෝගිකයන්ට ඒ ප්‍රතිලාභය දෙන්න තිබුණා. නමුත් තමුන්නාන්සේලා ඒක අමතක කළා.

තමුන්නාන්සේලාගේ දේශපාලන ව්‍යාපාරය ගැන කථා කරනකොට අදටත් අපේ ගම්වල මිනිස්සු මතක් කරන දෙයක් තමයි, ජේවීපී එක හැදුනුම්පත ගන්න ගෙවල්වලට ඇවිල්ලා කරපු දේවල්. අතීතය අමතක වෙන්නේ නැහැනේ මිනිස්සුන්ට. හැබැයි අද දෙවෙයේ සරදමක් වෙලා තමුන්නාන්සේලා අවුරුදු ගාණකට පස්සේ මංගල අය වැය ගේනකොට ඩිජිටල් හැඳුනුම්පතක් ගැන කථා කරනවා අපට අහන්න ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" පෙන්වලා තුනෙන් දෙකකට එහා ගිය ජන වරමක් තමුන්නාන්සේලා ලබාගෙන බලයට ආවා. නමුත් ගරු ඇමතිතුමා කියවපු, මේ ලස්සන පොතේ තිබෙන බොහෝ දේවල් තමුන්නාන්සේලාට මංගල අය වැය හදද්දී අමතක වෙලා තිබෙනවා කියන එකට උදාහරණ එකක් දෙකක් මතක් කරන්න මම කැමැතියි. එදා තමුන්නාන්සේලා අත්‍යවශ්‍ය ආහාර ගැන කිව්වා. දේශීයව නිෂ්පාදනය කරන කිරි, බිත්තර, ළදරු කිරි ගැන කථා කළා. බෙහෙත් ගැන, ඖෂධවල වැට් එක අඩු කරන එක ගැන කිව්වා. පාසල් පොත් සහ පාසල් උපකරණවල මිල අඩු කරන එක ගැන බලාපොරොත්තුවක් දුන්නා. ඒ වාගේම, කෘෂි උපකරණ ගැන කිව්වා; පොහොර ගැන කිව්වා. මෙන්න මේ වාගේ දේවල්වලට ගහපු වැට් එක සියයට බින්දුව දක්වා අඩු කරනවා

කිව්වා. නමුත් ඒ කිසිම දෙයක්, වැටි එක අඩු කිරීම ගැන වචනයක්වත් මේ අය වැයේ සඳහන් කරලා නැතිවීම ගැන අපි කනගාටු වෙනවා.

ඊළඟට, අග්‍රහාර රක්ෂණ ප්‍රතිලාභ ශක්තිමත් කරනවා කිව්වා. රාජ්‍ය සේවකයෝ තමුන්නාන්සේලාට උඩින් බලය දුන්නේ. නමුත් ඒ රක්ෂණය ගැන කිසිවක් අය වැයේ සඳහන් කරලා නැහැ. රාජ්‍ය සේවකයන්ට හිමි වූ වෛද්‍ය රක්ෂණය යාවත්කාලීන කරන්න අය වැය කථාවේදී අමතකවීම ගැන අපි කනගාටු වෙනවා.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" පොතේ පිටු අංක 114හි තිබෙනවා වසර තුනක් තුළ තේ වගාවේ අස්වැන්න දෙගුණ කිරීම සඳහා තාක්ෂණික, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් දෙනවා කියලා. මම නියෝජනය කරන්නේ තේ වගාකරුවන් සිටින දිස්ත්‍රික්කයක්. ලංකාවේ කුඩා තේ වතු හිමියන් වැඩිම ප්‍රමාණයක් සිටින දිස්ත්‍රික්ක දෙක තුනෙන් එකක් මම නියෝජනය කරන්නේ. නමුත් අය වැයේ තේ කර්මාන්තය අමතක කරලා තිබෙනවා. මෑත කාලයේ කිසිම අය වැයක් ඉදිරිපත් කරනකොට මේ වාගේ තේ කර්මාන්තය අමතක වුණේ නැහැ. කුරුඳු සහ අනෙකුත් අපනයන භෝග සඳහා රුපියල් මිලියන 250ක සොච්චමක් විතරයි අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ. මේ තත්ත්වය මත කුඩා තේ වතු හිමියන්ගේ පොහොර ප්‍රශ්නයට, අස්වැන්න අඩුවීමේ ප්‍රශ්නයට, සාධාරණ මිලක් නොලැබීමේ ප්‍රශ්නයට, නිෂ්පාදන වියදම වැඩිවීමේ ප්‍රශ්නයට කිසිම පිළිතුරක් දෙන්නට අය වැයෙන් බැරි වෙලා තිබෙන එක ගැන මම මතක් කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ රටේ වෙසෙන ඉතාම අහිංසක, වැදගත්ම, සම්භාවනීයම පුරවැසියන් ලෙස අපි දකින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වෙච්ච පොරොන්දුත් අමතක කරලා තිබෙනවා මේ අය වැයෙන්. විශේෂයෙන් පෞද්ගලික අංශයේ වැඩ කරලා සේවක අර්ථ සාධක අරමුදල තැන්පත් කරගෙන හිටපු අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අපේ ආණ්ඩුව තිබෙනකොට සියයට 15ක විතර පොලියක් ලැබුණා, උපරිමය ලක්ෂ 15කට.

පසුගිය කාලයේ රට බංකොලොත් වුණාට පසුව මෑත දක්වා සියයට 7.5 දක්වා ඒ පොලිය පල්ලම් බැස්සා. ඒ මිනිස්සු අත්ත අසරණ තත්ත්වයට පත් වුණා. මම මාස කිහිපයකට ඉස්සර පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවාම සභානායකතුමා උත්තරයක් දුන්නා, "අය වැය ආවාම අපි ඒක ඉෂ්ට කරනවා" කියලා. ඒ මිනිසුන්ට කිව්වා, සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වැඩියෙන් අමතරව සියයට 5ක් අය වැයෙන් වෙන් කරනවා කියලා. අද ඒ සියයට 5 සම්පූර්ණයෙන් යටපත් කරලා තිබෙනවා; අමතක කරලා තිබෙනවා. ඇස්බැන්දුමක් දාලා සියයට 3ක සොච්චමකින් වැඩි කරලා තිබෙනවා. ඇයි මෙහෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ රවටටන්නේ? ඒ අහිංසක මිනිසුන්ගේ ආශීර්වාදය ඇයි තමුන්නාන්සේලා අහක දාන්නේ? ඒ මිනිස්සු පෙළපාළි යන්නේ නැහැ; උද්ඝෝෂණවලට යන්නේ නැහැ. ඒ මිනිස්සු ඒ පොලියෙන් තමයි බෙහෙත් ටික ගන්නේ; කෑම ටික ගන්නේ; වන්දනාවක් යන්නේ; පිනක් දහමක් කරන්නේ; දරුවන්ට යුතුකම් ඉටු කරන්නේ. මේ සේරම කරන්නේ ඒ ස්ථාවර තැන්පත්වල පොලියෙන්. අද වෙනකොට ඒ ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ අමතක කරලා තිබෙනවා; රවටලා තිබෙනවා. ඒක පාපකර්මයක්. ලස්සන ජීවිතයක් ගත කරන්න ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට හොඳ නැහැයි කියලාද තමුන්නාන්සේලා හිතන්නේ?

තමුන්නාන්සේලා බලයට ගෙනෙන්න සුවිශේෂ සහායක් දීපු පිරිස තමයි තරුණ පිරිස. අද ඒ තරුණයෝ අමතක කරලා. විවාහක තරුණ පිරිස් සඳහා නව නිවෙසක් මිලදී ගැනීමට හෝ නිවෙසක් ඉදි කරගැනීමට මූල්‍ය පහසුකම් ලබා දෙනවා කියලා පොරොන්දු වුණා. අද ඒවා හීන බවට පත් වෙලා. මේ අය වැයෙන් පස්සේ තරුණ විවාහකයන්ගේ නිවාස සිහිනය බොඳ වෙලා පමණක් නොවෙයි, විවාහ වෙන්න බලාගෙන ඉන්න තරුණයන්ටත් අද වෙලා තිබෙන්නේ මේ පොත බලබලා නන්දා මාලනී ශූරීනිය ගායනා කරන "යනවා නම් අනේ මං අරන්, යන තැනකට යන්න රත්තරං" කියන ගීතය මුමුණන්නයි.

ලක්ෂ 14කට Vitz car එකක් ගන්න හැටි මවලා පෙන්නුවා. වාහන ගෙවල්වලට ගෙනැල්ලා නවත්වලා තිබෙන හැටි තමයි මවලා පෙන්නුවේ. දේශපාලන වේදිකාවේ ඒවා පිළිබඳව රසවත්ව කථා කළා. අද වෙනකොට ඒ තරුණයන්ට ඒ බලාපොරොත්තුව සිහිනයක් පමණක් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව තියන තාක්කල් සෙල්ලම් කාර් එකක් හැර වෙන කාර් එකක් ගන්න බැරිය කියන අදහස අද ඔවුන්ගේ ඔළුවට ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මාසික විදුලි පරිභෝජනය ඒකක 60ට අඩු ගෘහස්ථ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නව විදුලිය ලබා ගැනීමට හෝ විසන්ධි කළ සම්බන්ධතා යළි ලබා ගැනීමට වාරික වශයෙන් -කොටස් වශයෙන්- ගෙවන්න පහසුකම් දෙනවා කියලා මෙන්න මේ "ඩබල් පොකට්" පොතේ -ලියවිල්ලේ- ලස්සනට කියලා තිබෙනවා. හැබැයි, ආර්ථික අර්බුදයත් එක්ක දකුණු ආසියාවේ වැඩිම විදුලිබිල ගෙවන රට බවට අපේ රට පත් වුණා. 2023දී විදුලි පාරිභෝගිකයන්ගෙන් 970,000කගේ විදුලිය බිල ගෙවා ගන්න බැරුව විදුලිය විසන්ධි කළා. ඒක 2024 මුල් මාස හය වෙනකොට තව ටිකක් දිග් ගැස්සුණා. ඒ මුල් මාස හයේ විතරක් 628,000ගේ විදුලිය කැපුණා, බිල ගෙවා ගන්න බැරුව. මේ පිරිසට නැවත විදුලිය ලබා ගන්න ලබා දෙනවා කියපු සහනය, වාරික ලෙස මාස් පතා ලබා දෙනවා කියපු ආකර්ෂණීය පොරොන්දුව ජනාධිපතිතුමාට අය වැය භදනකොට අමතක වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ ලස්සන පොතේ කියපු දේවල් අමතක වෙච්ච එකක්, දෙකක් විතරක් මම මතක් කරනවා. ගුරු විදුහල්පතිවරුන්ගේ වැටුප් විසමතාව කඩිනමින් ඉවතට කියලා තිබෙනවා. ගුරු වෘත්තිය ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10ක් අතරට ගෙනෙනවා කියලා තමයි ඡන්දයට ඉස්සෙල්ලා ඩබල් පොකට් ලියවිල්ලේ සඳහන් කරලා තිබෙන්නේ. ගුරුවරුන්ට දෙන්න පුළුවන් උපරිම සහයෝගය මේ ආණ්ඩුව බලයට ගෙනෙන්න දුන්නා. මෙච්චර කල් කිසිම ආණ්ඩුවක් ගෙනෙන්න ගුරුවරුන් මේ තරම් බරක් කරට ගෙන වැඩ කළේ නැහැ. දරුවෝ හරහා ගෙවල්වල දෙමව්පියන්ට පවා පණිවුඩ එව්වා, "රට අනුරට දෙන්න" කියලා. ඒ අය හිතුවා, ඒ දුන්නු සහයෝගයේ හැටියට හැරෙන තැපෑලෙන් ඒ අයට මේවා ලැබෙයි කියලා. නමුත් අය වැයෙන් ඒවා අමතක කරලා තිබෙනවා.

රාජ්‍ය සේවක වැටුප් වැඩි වීමක් ගැන අද දෙපැත්තෙන්ම කථා වෙනවා. විපක්ෂයෙන් ඒක ගැන අපැහැදිලිකම් ගැන කියනවා. ආණ්ඩුවෙන් ඒක පැහැදිලි කරන්න භදනවා. රාජ්‍ය සේවකයන් බොහෝ දෙනෙකුගෙන් වැටුප් වැඩි වීම ගැන අහනකොට, ඔවුන්ට ඒක අපහාසයක් වෙලා.

එය තනිකර ඇස් බැන්දුමක් කියලා සමහරු කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පඩි වැඩි වීමත් reload ක්‍රමයට තමයි කරන්න භදන්නේ. අවුරුදු තුනකින් තමයි ඒක එල්ලන්න භදන්නේ. එහෙම කළේ මොකද කියලා මම දන්නේ නැහැ. ඊළඟ වසර දෙකේ පඩි වැඩි වන හැටිත් මේ අය වැයේම දැම්මේ, ඒක ලොකු පඩි වැඩි වීමක් හැටියට පුම්බලා පෙන්වන්නද කියන එකත් මම දන්නේ නැහැ. එහෙම නැත්නම්, ඊළඟ අවුරුදු දෙකේ අය වැය ඉදිරිපත් කරන්න අදහසක් නැද්ද කියලාත් මට සැකයක් තිබෙනවා. එහෙමත් නැත්නම්, තව අවුරුදු දෙකක් මේ ආණ්ඩුව

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

පවතීද කියන විශ්වාසය නැතිකම නිසාද මෙහෙම අප්‍රභංශ විධියට, අපහැදිලි විධියට මේවා දාලා තිබෙන්නේ කියලා මට අහන්න සිද්ධ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැයේ වියදම් ගැන කථා ගොඩක් තිබුණත්, ආදායම උපයන්නේ කොහොමද කියන එක හරියට සඳහන් කරලා නැහැ. අවසාන විනාඩි දෙකේ මම කියන්න කැමැතියි, මෙතුමන්ලා එදා ණය ගෙවන හැටි කිව්වේ කොහොමද කියලා. බොහොම සිම්පල් කතන්දරයක් කියලා නේ පෙන්වූයේ. එදා ඇහුවා, "ණය ගෙවන එක කජ්ජක්ද?" කියලා. අද ඒවාට සල්ලි උපයන විධිය සඳහන් කරන්න බැරි වෙලා තිබෙනවා. එදා කිව්වා, "පිට රට ඉන්න යාළුවෝ, අපේ සහෝදරයෝ සල්ලි එවන හැටි අපි පෙන්වන්නම්" කියලා. මාලිමා ආණ්ඩුව ආපු ගමන් පිට රටවල ඉන්න billionairesලා, millionairesලා ඇවිත් ඩොලර් වැසි වස්සන හැටි ගැන තමයි කථා කළේ. දැන් කියනවා, "IMF එක හැර විකල්පයක් නම් අපට නැත" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කීර්තිමත් දකුණු අප්‍රිකානු නායකයකු වන නෙල්සන් මැන්ඩෙලා වරෙක ප්‍රකාශ කළා, "අසාර්ථක පාලකයින් හඳුනා ගන්න වෙන්නේ ඔවුන්ට බලය ලැබුණු පසුවයි" කියලා - "බලය ලැබුණු දවසේ ඉඳලා"යි කියලා. තමුන්නාන්සේලාගේ පාලනය යටතේ මේ මාස කිහිපය තුළ පුනරුදය උදා වෙලා තිබෙන්නේ කාටද කියලා අපට කරුණාකරලා කියන්න. අඩු ගණනේ, "මේ පාර අපි මාලිමාවට" කියලා ත්‍රිවිලර්වල ගහගෙන ගිය ත්‍රිවිලර් රියැදුරන්ට පුනරුදයක් උදා වෙලා තිබෙනවාද? වීවලට රුපියල් 154ක සහතික මිලක් ගෙවනවා කියද්දි ඔබේ වේදිකාව ඉස්සරහා ඉඳගෙන අත්පුඩි ගහපු ගොවි ජනතාවට මේ අය වැයෙන්වත් පුනරුදයක් උදා වෙලා තිබෙනවාද? අත්‍යවශ්‍ය ආහාරවලට, බෙහෙත්වලට ගහන VAT එක ඉවත් කරයි කියලා බලාගෙන හිටපු පාරිභෝගිකයන්ට උදා වුණු පුනරුදයක් තිබෙනවාද? පාසල් උපකරණ ඇතුළු අධ්‍යාපනයට සහන ලැබෙයි කියලා බලාගෙන හිටපු දෙමව්පියන්ට උදා වුණු පුනරුදයක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම විනාඩි දෙකෙන් අවසන් කරනවා.

අපේ ගම්වල කුඩා තේ වතු හිමියන්ට, කුරුඳු ගොවියන්ට, අනෙකුත් අතුරු භෝග වගාකරුවන්ට උදා වුණු පුනරුදයක් තිබෙනවාද? භූමිතෙල් සාධාරණ මිලට ලැබෙයි, මුහුදු යන්න පුළුවන් වෙයි කියලා හිතාගෙන හිටපු ධීවරයාට ලැබුණු පුනරුදයක් තිබෙනවාද? අඩු ගණනේ එක පැන් පහරින් ගුරු වැටුප් විෂමතාව ඉවත් වෙයි කියලා බලාගෙන හිටපු ගුරුවරයාට මෙම අය වැයෙන් ලැබුණු පුනරුදයක් තිබෙනවාද කියා මම අහන්න කැමැතියි. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. නිල ඇඳුමෙන් ඇවිල්ලා ඔබතුමන්ලාගේ රැස්වීම්වල වාඩි වෙලා හිටපු හෙදියන්ට මේ අය වැයෙන් ලැබුණු පුනරුදයක් තිබෙනවාද? එහෙම නැත්නම් තිබුණු දීමනාවල අඩු වීමක් වෙලා තිබෙනවා කියලා ඒගොල්ලෝ කියනවාද බලන්න.

ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා බලයට ආවාට පසුව පුනරුදය උදා වෙලා තිබෙන්නේ වර්තමානයේ දකින දේවල් අනුව පාතාලයට විතරමයි. සුවිශේෂ වර්ධනයක්, නැඟී සිටීමක් පෙන්වලා තිබෙන්නේ පාතාලයේ විතරයි. ඒකත් වුණේ ජාතික ආරක්ෂාව පිළිබඳව ටියුෂන් දිය හැකි විශේෂඥයෙක් මහජන ආරක්ෂාව භාර නියෝජ්‍ය ඇමතිවරයා ලෙස සිටියදී වීම අපට පුදුම හිතෙනවා. එම නිසා "අසාර්ථක පාලකයින් හඳුනාගත හැක්කේ ඔවුන්ට බලය ලැබුණු පසුව"යි කියන නෙල්සන් මැන්ඩෙලාගේ කියමන පමණයි මේ රජය මේ මාස තුන තුළ ඔප්පු කරලා තිබෙන්නේ කියන එක මට මතක් කරන්න සිද්ධ වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ වෙලාව අවසන් කියලා ඔබතුමිය කියනවා. "කොකාගේ සුදු පෙනෙන්නේ ඉගිළෙන කොට" කිව්වා වාගේ, ඔබතුමන්ලාගේ පරණ කියුම්, වර්තමාන කෙරුම්, මේ රටේ ජනතාව අවදියෙන් බලාගෙන ඉන්නවා. මේ අය වැයේදී ඉටු වෙයි කියලා විශාල පිරිසක් බලාගෙන හිටපු ඔවුන්ගේ බලාපොරොත්තු තමුන්නාන්සේලා සුන් කර තිබෙනවා කියන එක ප්‍රකාශ කරමින්, මට කාලය ලබා දීම ගැන ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! දිවා ආහාර විවේකය සඳහා පාර්ලිමේන්තුවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත් හිටවනු ලැබේ.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி. ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට පත්වෙලා ඉදිරිපත් කරපු මංගල අය වැය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ මංගල අය වැය විවාදය අතරතුරදී අපට විපක්ෂය පැත්තෙන් එන චෝදනාව තමයි, ඉතිහාසය ගැන කථා කරන්න එපා කියන එක. අපි දන්නවා, ඉතිහාසයක් නැතිව වර්තමානයක් නැහැ, වර්තමානයක් නැතිව අනාගතයක් නැහැ කියා. ඒ ඉතිහාසය සුබවාදී නැති නිසා තමයි අපි අද බලයේ ඉන්නේ. අපේ ඉදිරිපිට විපක්ෂයේ ඉන්න මේ උදවිය එදා ආණ්ඩු බලයේ සිටියදී හරියට ආණ්ඩු කළා නම්, ජනතාව ඒ පාලකයන් ගෙදර යවන්නේ නැහැ; ගෙදර එළවන්නේ නැහැ. ඒ බව එතුමන්ලාට අමතක වෙලා තිබෙනවා.

අපට ලැබුණේ මොන වාගේ රටක් ද? මීට මාස 4කට කලින් ජාතික ජන බලවේගයට භාර දුන්නේ මොන වාගේ රටක්ද කියන එක ඒ අයට අමතක වෙලා තිබෙනවා. අපේ රටේ ආර්ථිකය

පතුලටම වැටිටුවා. මහ බැංකුව බිඳලා, ආර්ථිකය පතුලටම වට්ටලා තමයි අපට රට භාර දුන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔවුන් වැට්ටුවේ මේ රටේ ආර්ථිකය විතරක් නොවෙයි. ඔවුන් මේ රටේ සෞඛ්‍යය වැට්ටුවා; අධ්‍යාපනය වැට්ටුවා; කෘෂි කර්මාන්තය වැට්ටුවා; තේ කර්මාන්තය වැට්ටුවා; සියල්ල වැට්ටුවා. සියල්ල විනාශ කළා. කෘෂි කර්මාන්තය වට්ටලා ගොවියා මහ පාරට ඇදලා දැම්මා. තේ ගොවියාට පොහොර ටික නැති කරලා තේ කර්මාන්තය වැට්ටුවා. ඒ විතරක් නොවෙයි. සෞඛ්‍යය වැට්ටුවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රජයේ රෝහල්වලට යන්න මිනිස්සු භය වුණා. රෝහලට ගියොත් මිනීපෙට්ටියෙන් තමයි ගෙදර එන්න වෙන්නේ කියන තැනට මිනිස්සු භය වුණා. ඒ තැනට මේ රට ඇද වැට්ටුවා. සෞඛ්‍ය ඇමති නතර වුණේ හිර ගෙදර. එවැනි ඉතිහාසයක් තිබෙන්නේ. අපට ඒවා මතකයි. දැන් අපට කියනවා, ඒ ඉතිහාසය අමතක කරලා කථා කරන්න කියලා. ඉතිහාසයක් නැතිව වර්තමානයක් බිහි වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

1948දී මේගොල්ලන්ට මේ රට භාර දෙනකොට අපේ රට එංගලන්තයේ ණය පියවන්න මැදිහත් වෙච්ච රටක්. ඉන්දියන් සාගරයේ මුතු ඇටය විධියට හඳුන්වපු රට 1948 ඉඳලා 2005 වර්ෂය වෙනකම් මේගොල්ලන්ට භාර දීලා තිබුණේ. 2005 වර්ෂය වෙනකොට අපේ රටේ ණය පංගුව රුපියල් කෝටි 222,000යි. 2005දී නැවතත් මේගොල්ලන්ගේ උදවිය අපේ රට භාර ගත්තා. 2014 වර්ෂය වෙනකොට අපේ රටේ ණය පංගුව රුපියල් කෝටි 783,000යි. 2015දී නැවත මේගොල්ලන් රට භාර ගත්තා. 2019 වර්ෂය වෙනකොට අපේ රටේ ණය පංගුව රුපියල් කෝටි 1,390,000යි. ඒ, යහ පාලන ආණ්ඩුව කාලයේ; දැන් විපක්ෂයේ ඉන්න මේගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ; දැන් අපට ඉතිහාසය මතක් කරන්න එපා කියලා කියපු ඒගොල්ලන්ගේ කාලයේ. ඊට පස්සේ 2019 සිට 2021 වර්ෂය දක්වා ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඉන්නකොට මේ රට රුපියල් කෝටි 1,627,000ක් ණය කළා. ණය කරලා මොනවාද කළේ? ඒක හරියට වත්ත බද්දට දීලා ඇස්සට දත නියවනවා වාගේ මේ රටේ තිබුණු සියල්ල විකිණුවා. විකුණලා ඊට පස්සේ කරපු දේත් අපට මතකයි. ඊට පස්සේ වැල් පාලමෙන් එතෙර කරන්න කියලා මේ උදවිය මේගොල්ලන්ගේ නායකයාට රට භාර දුන්නා. 2021 සිට 2024 කාලය තුළ වැල් පාලමෙන් මේ රට එතෙර කරන්න භාර දීලා අපේ රට රුපියල් කෝටි 3,300,000ක් ණය කළා. ඒ තරම් මුදලක් ණය කරලා තමයි ගියේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ තරම් මුදලක් ණය කරලා සහන දුන්නේ කාටද? සහන දුන්නේ අපේ ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම්පත්තුවේ ඉන්න තේ වගාකරුවාට ද? කුරුඳු වගාකරුවාට ද? නැහැ. අනුරාධපුරයේ ඉන්න වී ගොවියාට ද? හම්බන්තොට ඉන්න වී ගොවියාට ද? නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. සහන හැදුවේ කාටද? අර්ජුන් ඇලෝසියස්ලාට. මහ බැංකුව බිඳපු උදවියට බදු සහන දුන්නා. වයඹ අරක්කු හඳන සමාගම කාගේද? ඒගොල්ලන්ට බදු සහන දුන්නා. මෙන්ඩිස් සමාගම කාගේද? ඒ උදවියට බදු සහන දුන්නා. වයඹ අරක්කු හඳන සමාගම ජොන්ස්ටන් හිටපු ඇමතිතුමාගේ. මෙන්ඩිස් සමාගම අර්ජුන් ඇලෝසියස්ලාගේ. දීපු බදු සහනය කෝටි කීයක්ද? රුපියල් බිලියන 468ක බදු සහන දුන්නා.

කෝටිවලින් ගත්තොත්, රුපියල් කෝටි 46,800ක බදු සහන දුන්නා. මේගොල්ලන් බදු සහන දුන්නේ එහෙමයි. මේගොල්ලන් එහෙම බදු සහන දීලා අපට කියනවා, ඉතිහාසය මතක් කරන්න එපා කියලා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මේ රට මෙතැනට වැටුණේ ඒ නිසායි.

වර්තමාන ආණ්ඩුව දැන් මේ රට පුනරුද යුගයකට ගෙනයන්න ඕනෑ; නිෂ්පාදන ආර්ථිකයකට ගෙනයන්න ඕනෑ; රටට ඩොලර් එන ආර්ථිකයක් හදන්න ඕනෑ. ඒ නිසා තමයි ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා විසින් මේ පුනරුදයේ අය වැය ගෙනාවේ. අපට මතකයි, සීනි බදු වංචාව ගැන. සීනි බදු වංචාව රුපියල් මිලියන කීයද? රුපියල් මිලියන 16,000ක්. Highway එකේ ගලගෙදර ඉඳලා රඹුක්කන දක්වා වූ කොටස හදනකොට සිදු වූ වංචාව කීයද? රුපියල් කෝටි 16,000යි. මධ්‍යම අධිවේගී මාර්ගයේ ගලගෙදර ඉඳලා රඹුක්කන දක්වා වූ කොටස හදද්දි රුපියල් කෝටි 16,000ක් මහ පාරෙන් ගිලලා. ඒගොල්ලන් කිරි කෑවා, ජනතාව ලෙවකෑවා. මේවා කළේ කවුද කියලා විපක්ෂය දන්නවා. දන්නෝ දනිති, ඒ කවුද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙහෙම තමයි ඒගොල්ලන් රට කළේ. දැන් අපට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ඒගොල්ලන් එතැනට ගෙනාපු රට; ඒගොල්ලන් සවලෙන් ගහලා හදාගනිපු රට; ඒගොල්ලන්ට බෙදාගනිපු රට නැවත අපි ගොඩනඟන්නට ඕනෑ, දුක් විඳින මේ රටේ සිටින බහුතර ජනතාව වෙනුවෙන්. ගමට ගෙනයන්න පුළුවන් ආර්ථිකයක් අපි හදන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අය වැයෙන් ප්‍රාග්ධන වියදම්වලට රුපියල් බිලියන 1,400ක් වෙන් කළේ මොකටද? මේ අය වැයෙන් වෙන් කරලා තිබෙන සල්ලි ගමට ගෙනයන්න ඕනෑ. ගමට සල්ලි යනකොට මේ ආර්ථිකය ගමට යනවා. මේ ආර්ථිකය ගමට ගියායින් පසු හැකුළුණු ආර්ථිකය ප්‍රසාරණය වෙනවා. එතකොට මේ රට නැවත පුනරුද යුගයකට යනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. 2025 අය වැය කියන්නේ මේ රට පුනරුද යුගයකට ගෙන යන, අපේ රට නැවත තලයකට ඔසවා තබන අය වැයක් කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. "Clean Sri Lanka" වැඩ පිළිවෙළ ඇතුළේ මේ රට නැවත තව වටයකින් ඔසවා තබනවා. මානව දයාවෙන් පිරුණු මිනිස්සු අපි හදන්න ඕනෑ. මානව දයාවෙන් පිරුණු මිනිස්සු ඉන්න රටක් හදන්න ඕනෑ. "Clean Sri Lanka" වැඩසටහන ඇතුළේ ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනයනවා. ඩිජිටල්කරණය ඇතුළේ ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනයනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අපට දැන් චෝදනා කරනවා, අපි හැදුනුම්පත් එක්කහු කළා කියලා. අය වැය විවාදය ඇතුළේ හැඳුනුම්පතක් ගැන කියනවා. හැඳුනුම්පත් ඒගොල්ලන්ටත් එකතු කරන්න වෙන්නේ නැහැ, ඒකට තමයි අපි මේ ඩිජිටල්කරණය ගෙනෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මේ අය වැයෙන් අලුතින් කිසිදු බදු අය කිරීමක් කරලා නැහැ. බදු නැති අය වැයක් විධියට; අලුතින් බදු එකතු කරපු නැති අය වැයක් විධියට අපි මේ අය වැය ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවේ වියදම් සියයට 100ක් අඩු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි වංචාවට, දූෂණයට, නාස්තියට හිත තබා තිබෙනවා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයෙන් සියයට 100ක් කපා හැරලා තිබෙනවා. අගමැතිතුමියගේ, මැති ඇමතිවරුන්ගේ වැය ශීර්ෂ කපා හැර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ලංකා ඉතිහාසයේ මොන ජනාධිපතිවරයාද තමන්ට විදේශ ගමන්වලට දීපු travel allowance එක, දීපු ඩොලර් ටික ඉතිරි කරලා ඒ මුදල් නැවත ගෙනැල්ලා මහා භාණ්ඩාගාරයට දීලා තිබෙන්නේ? අපි අභියෝග කරනවා, එහෙම කෙනෙක් ඉන්නවා නම් කියන්න කියලා. මතක ඇති, ඒගොල්ලන් පවුල් පිටින්, planes පිටින් තමයි රට ගියේ කියලා. වියදම කීයද? දවස් දෙකේ සංචාරයේ වියදම රුපියල් බිලියන 5යි. එතකොට ආණ්ඩු පක්ෂ, විපක්ෂ කියලා භේදයක් නැහැ. එතකොට එක plane එකේ, කණ්ඩායමක් එක්ක එකට ගියේ. එකට ගිහිල්ලා මෙහේ ආවා. අපේ ජනාධිපතිතුමා කටයුතු කරන්නේ කොහොමද? අපේ ජනාධිපතිතුමා ලෝකයටම ආදර්ශයක් සපයා තිබෙනවා. ඔයගොල්ලන්ට ඒ තැනට කිට්ටු වෙන්න බැහැ. ජනාධිපතිවරයා තමන්ට වියදමට දීපු ඩොලර් ටික නැවත මහා භාණ්ඩාගාරයට ගෙනැල්ලා දෙනවා. දෙයියන්ගේ හාල් වාගේ මේ රටේ සල්ලි ප්‍රවේශම් කරන ජනාධිපතිවරයෙක් තමයි දැන් ඉන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එතුමා ඉතිහාසගත වෙන්නේ එහෙමයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ විපක්ෂයට බැහැ, මේකට එක්කහු වෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. තේ වගාව ගැන කිව්වා. ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, එතුමා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හිටපු සභාපතිවරයෙක් කියලා. 1977න් පස්සේ මේ සියල්ල විනාශ කළා. අපට මතකයි, රාජ්‍ය වැවිලි සංස්ථාව විනාශ වුණා; ජනවසම විනාශ වුණා; උඩරට වතු විනාශ වුණා; කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විනාශ වුණා; ඒ සියල්ල විනාශ වුණා; කුඩා තේ වතු ටික විනාශ වුණා; ෆැක්ටරි ටික විනාශ වුණා; තේ ශක්ති අරමුදල විනාශ වුණා. අපිත් තේ ශක්ති අරමුදලේ කොටස්කාරයෝ. ජනතාවගේ මුදල් විනාශ වුණා; තේ කර්මාන්තය විනාශ වුණා. නැවත ගමට ආර්ථිකය ගෙන යන්න, ගමේ ආර්ථිකය ශක්තිමත් කරලා ගාල්ල දිස්ත්‍රික්කයේ, මාතර දිස්ත්‍රික්කයේ තේ ගොවියා ඉහළට ඔසවා තියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අපේ මේ අය වැය තුළින් කුඩා තේ වතු හිමියා නැවත පුනරුද යුගයකට ගෙනියන්න ඕනෑ. මහ පාරට ඇද දමපු කුඩා තේ වතු හිමියාගේ තේ වගාව සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ 175ක් වෙන් කරලා තිබෙනවා. තේ තවාන්කරුවා, වගාකරුවා වෙනුවෙන් රුපියල් ලක්ෂ 2,742කුත්, පාළු වගාවට රුපියල් ලක්ෂ 5,500කුත් වෙන් කරලා තිබෙනවා. අලුත් ඍජු තේ වගාව සඳහා රුපියල් ලක්ෂ 600ක් වෙන් කරලා තිබෙනවා. ඒක අලුත් ව්‍යාපෘතියක්. යාන්ත්‍රීකරණය සඳහා රුපියල් ලක්ෂ 625ක්, කර්මාන්තශාලා හිමියන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට සූර්ය පැනල ව්‍යාපෘතිය සඳහා රුපියල් ලක්ෂ 200ක් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වැවිලි කර්මාන්තය යටතේ රත්නපුරය, ගාල්ල, මාතර ප්‍රදේශවල සිටින කුඩා තේ වතු හිමියා ඉහළට ඔසවා තබා මේ රටට ඩොලර් ගේන්න, නැවත පුනරුද යුගයකට යන්න මුදල් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේගොල්ලන් පාතාලය ගැන කියනවා; ජාතික ආරක්ෂාව ගැන කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ආරක්ෂාව ගැන කිව්වොත්, අපට මතකයි ගෝනවල සුනිල්ලා, සොත්ති උපාලිලා ගැන. සොත්ති උපාලි කියන්නේ කවුද? මේගොල්ලන් තමයි සොත්ති උපාලිලා හැදුවේ. ගෝනවල සුනිල්ලා, පූලම්පිටියේ අමරේලා හදලා ඇති දැඩි කරලා, පෝෂණය කරලා දැන් අපෙන් අහනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.12]

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජනාධිපතිවරයා ඉදිරිපත් කළ මේ අය වැයත් එක්ක අවුරුදු 48ක තත්ත්වයක් තමයි මේ වෙනස් වෙන්නේ. ඒ නිසා තමයි ජනාධිපතිවරයා "අයවැය කථාව - 2025" පොතේ 1වන පිටුවේම ඒ බව සඳහන් කර තිබෙන්නේ. එහි මෙසේ සඳහන් වනවා:

> "ශ්‍රී ලංකාව 2022 වසරේ දී නිදහසින් පසු එහි ගැඹුරුතම හා සංකීර්ණතම සමාජ, ආර්ථික හා දේශපාලනික අර්බුදයට මුහුණ දුන්නා. අර්බුදය 2022 වසරේ දී එහි දරුණුතම අවස්ථාවට පැමිණියත්, අර්බුදයට බලපෑ කරුණු වෙතිහාසික මෙන්ම ව්‍යුහාත්මකයි. දූෂිත පාලනයන්, අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තීන් සහ වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය කළමනාකාරිත්වය මෙම අර්බුදයේ මූලයයි. "

මේක කවුරුත් පිළිගන්නවා. මේක නැහැ කියන්නේ නැහැ. ඒක ඇත්ත. ඔක නිතරම කියන්න එපා කියන එක තමයි කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් මේ කාරණය යම් ප්‍රමාණයකින් උපුටා දැක්වුවා. පසුගිය අවුරුදු 48 නිර්මාණය කරන්න බලපෑ තත්ත්වය පිළිබඳව රොනී ද මැල් හිටපු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා 1977 නොවැම්බර් 15වන දින ඉදිරිපත් කළ අය වැය කථාවේ ආරම්භක සටහන මම උපුටා දක්වනවා.

1977 නොවැම්බර් 15වන දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 15 සහ 16 මෙසේ සඳහන් වනවා:

> "ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ විශිෂ්ට නායකත්වය යටතේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවේ මංගල අය වැය කථාව ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම මගේ විශේෂ භාග්‍යයක් සහ ගෞරවයක් ලෙස මම සලකමි. මේ රට නව මාවතකට යොමු කිරීමේ අධිෂ්ඨානයෙන් ඉදිරිපත් කරන මේ අය වැයෙන් සහ ත්‍රිවිධ රත්නයේ සරණින් නුදුරු අනාගතයේ දී අපේ මහ ජනතාවට සැප සතුට ළඟා වේවා! සමෘද්ධිය උදා වේවා! යි මම ඉත සිතින් පතමි."

එතැනින් තමයි රොනී ද මැල් මැතිතුමා විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ විවාදය පටන් ගත්තේ. එතුමා කියන අනාගතයේ සැප සතුට තමයි මේ හදන්නේ. ඒක තමයි අවසානයේ පසුගිය කාලයේ දෝරේ ගැලුවේ. එතුමා අය වැය කථාවේ තව තැනක මෙහෙම කියා තිබෙනවා.

එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 15 සහ 16 තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> ".... කිසිම බියක් සැකක් නැතිව නිදහස් නිවහල් සමාජයක් ගොඩනැඟීම සඳහා එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන හැටියට ස්ථීර වරමක් ඔවුන් විසින් එක්සත් ජාතික පක්ෂයට ලබා දී තිබේ. එපමණක් නොව, මහජනයා තමන්ගේ ඒ කීන්දුවෙන් 1970 සිට 1977 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළහ."

රොනී ද මැල් මහත්තයා කියන එක ඇත්ත. 1970 සිට 1977 දක්වා ක්‍රියාත්මක වුණු ඒ රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයෙන් හෙම්බත් වෙලා හිටපු මිනිස්සු ඒ වෙලාවේ රොනී ද මැල් මහත්තයලාට ඡන්දය දුන්නා; ජේ.ආර්. ජයවර්ධන මහත්තයලාට ඡන්දය දුන්නා. එම නිසා ඒ කියන කාරණය සත්‍යයක්. නමුත් ඉන්පසු තත්ත්වය මොකක්ද? ඇත්තටම 1977දී ඒ පූර්විකාව හරියට හරි. ඒ අය වැය කථාවේ තව තැනක කියා තිබෙන දෙයක් මම උපුටා දක්වනවා, ඒක බොහොම වැදගත් නිසා. මොකද, විපක්ෂය විසින් පසුගිය කාලයේ වත්මන් ජනාධිපතිතුමාගේ අය

වැය කථාව සම්බන්ධව කථා කළේ අපි වෙන වැඩක් කරනවා වාගේයි. නැහැ. 1977දී අර අවුරුදු හතේ ඉතිහාසය මැල් මහත්තයලාට අමතක කරන්න බැරි වුණා. එහෙම නම් මේ රට මේ තත්ත්වයට පත් කළ අවුරුදු 48ක ඉතිහාසය අමතක කරලා අපටත් ඉස්සරහට යන්න බැහැ.

එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 17 සහ 18 මෙසේ සඳහන් වනවා:

"....5/6 ක වැඩි ඡන්ද බලයක් පමණක් නොවෙයි...."

තවදුරටත් එහි මෙසේ සඳහන් වනවා:

"....තනි පක්ෂයක් විසින් ලබාගන්නා ලද ඒක පාක්ෂික ජයග්‍රහණයකි."

ඇත්ත. අපි අද ලබා තිබෙන ජයග්‍රහණය වාගේ තමයි. එදා 5/6ක බලයක් හම්බ වුණා, රොනී ද මැල් මහත්තයලාට. අද අපිට හම්බ වෙලා තිබෙනවා, 2/3ක බලයක්; ඒ වාගේම තනි පක්ෂ පාලනයක්. අපි -ජාතික ජන බලවේගය- කාත් එක්කවත් හවුල් නැහැ නේ. ඒ පාලනය තමයි මේ තිබෙන්නේ. රොනී ද මැල් මහත්තයාගේ මේ අය වැය කථාව ඇතුළේ 3/4ක්ම තිබෙන්නේ 1970 ඉඳලා 1977 තෙක් පැවැති පාලනය සම්බන්ධයෙන් වන විවේචනයක්. ඇත්තටම අනුර දිසානායක ජනාධිපතිවරයා ඉදිරිපත් කළ අය වැය තුළ එහෙම විවේචනයක් නැහැ. එතුමාගේ අය වැය කථාවේ මුල් කොටසින් මා උපුටා දැක්වූ පේළි 4 තුළ විතරයි එවැන්නක් සඳහන් වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

එම හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 19 සහ 20 මෙසේ සඳහන් වනවා:

"සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුවෙන් අපට ලැබුණු බූදලය කුමක් ද? පසුගිය හත් අවුරුද්ද මුළුල්ලේ සම්පූර්ණයෙන් ම බංකොලොත් කර තිබුණු ආර්ථිකයක් හා රටක් පමණක් ඔවුන් අපට ඉතිරි කර ගිය බව ඉතාමත් කනගාටුවෙන් වුවත් ප්‍රකාශ කරන්නට සිදු වී ඇත. ඒ ආණ්ඩුව විසින් අපේ ආර්ථිකය දිරාපත් වී බිඳ හැලෙන සීමාන්තයන් දක්වා පහතට ඇද දමනු ලැබී ය. මේ රටේ ප්‍රධාන ආර්ථික අංශවල නිෂ්පාදනය වේගයෙන් පහළ වැටුණි. සාමාන්‍ය ජනතාවගේ ජීවන වියදම රොකට්ටුවක වේගයෙන් ඉහළ ගියා. මූර්ත වැටුප් පහත බැස්සා. පෝලිම් දිග්ගැස්සුණා. කුසගින්නෙන් රට මහත් සේ පීඩා වින්දා. මහජනයා කුසට ආහාර සඳහා යමක් අවුලා ගන්නට කුණු බාල්දි අතගාද්දි...."

රොනී ද මැල් මහත්තයාගේ අය වැය කථාවේ 3/4ක් ඔය සම්බන්ධව තිබෙන්නේ. නමුත් එහෙම විවේචනයක් අපේ නැහැ. හැබැයි, අපි මේ අය වැය තුළ ඉදිරිය සම්බන්ධව කථා කරනවා. මේ අය වැය තුළ තිබෙන්නේ මොකක්ද? ඇත්තටම කියනවා නම්, තමුන්නාන්සේලාගේ පැත්තෙන් අරක නැහැ, මේක නැහැ, අහවල් දේ නැහැ කියා ඔය කියන එක ඇත්ත. ඇයි, ඒ? අපි මේ සංවර්ධන අය වැයක් සඳහා පළමු පියවර තබපු පළමුවෙනි අය වැය තමයි මෙය. මේකෙන් අපට ලොකු දේවල් කරන්න බැහැ. අපි අර කියපු ලස්සන ජීවිතයක් 2028-2029 වෙනකොට මිනිස්සුන්ට ගොඩනැඟීම සඳහා අවශ්‍ය සුඛෝපභෝගී නිවස හදනවා. මේ දමා තිබෙන්නේ මොකක්ද? මේ දමා තිබෙන්නේ එහි අත්තිවාරම. මේ අය වැය කියන්නේ ඊට අදාළ අත්තිවාරම. මේ අපි කථා කරන්නේ අත්තිවාරම ගැන. හැබැයි, විපක්ෂයෙන් කියන්නේ මොකක්ද? විපක්ෂයෙන් කියනවා, අර ගේ හදන්න වෙන්කර තිබෙන මුදල තුළ CCTV කැමරාවලට මුදල් වෙන් කරලා නැහැලු. අපි මේ අත්තිවාරමට නේ, මුදල් වෙන් කර තිබෙන්නේ. CCTV කැමරා සවි කරන්න මුදල් වෙන් කරලා නැහැ, මේකෙන්. හැබැයි, අපි CCTV කැමරා සවි කරනවා. කවදාද? 2028දී සුඛෝපභෝගී ගේ හදලා අවසන් කරනකොට; ජනතාවගේ ගේ හදලා අවසන් කරනකොට.

ඇත්තටම පසුගිය කාලය තිස්සේම විපක්ෂයේ මෙගොල්ලන් බේරා ගත්තේ මට හිතන විධියට ගනේමුල්ලේ සංජීවගේ ඝාතනයයි, මිද්දෙණියේ සිදු වුණු ඝාතනයයි. ගනේමුල්ලේ සංජීවගේ ඝාතනයයි, මිද්දෙණියේ සිදු වුණු ඝාතනයයි කියන දෙක එකට පැටලීම නිසා ඇති වුණු අර්බුදයකුත් විපක්ෂය තුළ තිබෙනවා. මිද්දෙණියයි, ගනේමුල්ලයි එකට එකතු කරන්න ගියාම හරි අමාරුයි. එකට එකක් වෙනස්. අවුලක පැටලෙනවා. ඒක තමයි මේ මුහුණ දීලා තිබෙන අවුල. මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් ඔළුව වනනවා.

පාතාලය පටන් ගත්තේ බයිසිකල් චේන්වලින්. පාතාලය පටන් ගත්තේ කොතැනින්ද? 1977 ආණ්ඩුව පත් වුණා. 1980 ජූලි වර්ජනය ආවා. මොකටද? අද මේ රාජ්‍ය සේවකයින්ගේ වැටුප ගැන කථා කරනවා. 1977 තිබුණු ඒ පීඩාකාරී තත්ත්වයෙන් මිනිස්සු හෙම්බත් වෙලායි හිටියේ. 1977 රොනී ද මැල් මහත්තයා කියන සැප සතුට ඒ අය වැයේ තිබෙනවාද, තමන්ට පඩිය වැඩි වෙයිද කියලා ඔවුන් බැලුවා. නැහැ. 1978 වැඩි වුණේත් නැහැ. 1979 වැඩි වුණේත් නැහැ. 1980දී රාජ්‍ය සේවකයන් එළියට බහින්නේ මොකද? රාජ්‍ය සේවකයන් එළියට බහින්නේ "අපට රුපියල් 10ක් දවසකට දියල්ලා" කියලායි. මොකක්ද, ජේ.ආර්. ජයවර්ධන මහත්තයාලා කළේ? 1980 ජූලි වර්ජනය සම්පූර්ණයෙන්ම මර්දනය කළා. කවුද ඒකට යොදා ගත්තේ? බයිසිකල් චේන්කාරයෝ යොදා ගත්තේ. ඒ මර්දනය සඳහා යොදා ගත්තු බයිසිකල් චේන්කාරයින්ගේ පාතාලය තමයි මේ විධියට ඉස්සරහට ගිහිල්ලා තිබෙන්නේ. එහෙම නැතුව වෙන කවුරුවත් හදපු එකක් නොවෙයි. මේ එතැනින් පටන් ගත්ත ගමන.

කවුද ඒවායේ හිටියේ? ජේ.ආර්, ප්‍රේමදාස ආණ්ඩුවක් තමයි තිබුණේ. සමහර වෙලාවට අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඒ නාත්තලාගේ පුතාලා දන්නේ නැද්ද, තේරෙන්නේ නැද්ද - මට තේරෙන්නේ නැහැ මොකක්ද ඒ වෙලා තිබෙන්නේ කියලා. ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුවේ පාතාලය තමයි සොන්ති උපාලි. චන්ද්‍රිකාගේ පාලන කාලයේ කවුද? බැද්දගානේ සංජීව. රාජපක්ෂලාගේ කාලයේ, ජූලම්පිටියේ අමරේලා. ඊටපස්සේ වම්බොට්ටලා, බෝංචි රංජීලා, කැරට් විමලෙලා. හැම එළවලුවකටම පාතාලයේ කාගේ හරි නමක් සම්බන්ධ කරලා තිබුණා. එළවලුවල නම කියැවෙනකොට පාතාලයේ කාගේ හරි නමක් කියැවුණා. එහෙම ආපු ගමනක් තිබෙන්නේ.

ජාතික ආරක්ෂාව සම්බන්ධව මොකක්ද මේ කියන්නේ? අර හාමුදුරුවන්ට බෙදන්න කියලායි කියන්නේ. ඇත්තටම පාතාලය හා පාතාලය අතර ගැටුමක් නම් තිබෙන්නේ, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු බයවෙන්නේ මොකටද? මාර වැඩක් නේ මේක. පාතාලේ පාතාලේ ගහ ගන්නවා. ඇයි මොකටද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ආරක්ෂාව? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම පිළියන්දල හන්දියේ පයින් ඇවිදිනවා තනියම. ඉතින් එහෙම නම් මටත් එහෙම දැනෙන්න එපායැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කෙනෙකු වෙලත් මම එහෙම යනවා. මම පාතාලය එක්ක සම්බන්ධ නැහැ නේ. එහෙම නම් පාතාලය පාතාලය අතර ගැටුමක් තිබෙද්දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා බය වෙන්නේ මොකටද? මාර වැඩක් නේ. ඔප්පු කරනවා නේ පාතාලය හා දේශපාලකයා අතර සම්බන්ධයක් තිබෙනවා කියලා.

පසුගිය දවස් කිහිපයේම මේ මන්ත්‍රීවරු මොනවාද කථා කළේ? ප්‍රතිපත්තිමය කාරණා නේ මේ විවාදයේ තිබෙන්න ඕනෑ. හැබැයි, මොනවද කියන්නේ? Insurance එක කපලාලු. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, "Insurance එක කපලා. මට නම් ඒක ප්‍රශ්නයක් නැහැ. ඒ වුණාට මේ අනෙක් මන්ත්‍රීවරු ගැන හිතන්න ඕනෑ" කියලා. අර හාමුදුරුවෝ ගැන හිතන්න ඕනෑය කියනවා. අපි පෞද්ගලික ආයතනයක හෝ කොහේ හරි සේවය කළා නම්,

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

එතැනින් ලැබෙන ඒවා අපට මදි නම් මොකද වෙන්නේ? වැටුප මදි නම් මොකද කරන්න ඕනෑ? ඒකෙන් insurance එකක් හම්බ වෙන්නේ නැත්නම් මොකද කරන්න ඕනෑ? Job එක දාලා වෙන එකක් හොයාගෙන යන්න ඕනෑ. මන්ත්‍රීවරු හැටියට අපිත් කල්පනා කරනවා නම්, මේක වැඩක් නැහැ දැන්, insurance එක හම්බ වෙන්නේත් නැහැ, පඩියත් අඩුයි, මොකුත් නැහැ කියලා, අපි වෙන job එකක් හොයා ගෙන යමු. එච්චරයි මට යෝජනා කරන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.24]

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ පැරණි මිත්‍රයා ගරු නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාගේ කථාව මම අහගෙන හිටියා. එතුමාගේ කථාවේ රසවත් කාරණා ටිකක් තිබුණා. එතුමා රොනී ද මැල් හිටපු ඇමතිතුමාගේ කථා උපුටා දැක්වුවා. බොහොම හොඳයි. ඊට පෙර කථා කළා, ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ජාතික ජන බලවේගයේ නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව දැන් විවෘත ආර්ථිකය ගැන සලකා බලා, ගමනක් පටන් අරගෙන තිබෙන බව අපිට පෙනෙනවා. හැබැයි, ඒක පිළිගන්නට ආණ්ඩුවට පොඩි ලජ්ජාවකුත් තිබෙනවා. භාර ගන්නත් බැහැ. ඒකයි ප්‍රශ්නය. ගරු නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා, ඉතිහාසය ගැන කථා කරන්න එපා කියලා විපක්ෂයේ අපි කියනවා කියලා. මම නම් කියන්නේ නැහැ. අපි කවුරුත් එහෙම කියන්නේ නැහැ. ඉතිහාසය දිහා බලන්න ඕනෑ. ඉතිහාසයේ ඔක්කොම වරද්දා ගත්තා. ඒ නිසා තමයි ඒ ආණ්ඩු මේ වෙනකොට වැටිලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ නිසා ඉතිහාසය දිහා බැලුවොත් තමයි, අපේ වැරැදි හදා ගන්න පුළුවන් වෙන්නේ; ඒවා හදා ගෙන ඉස්සරහට හරි පාරේ යන්න පුළුවන් වෙන්නේ. ඒ වැරැදි හදා ගන්න ඕනෑ.

ඊළඟට, ඉතිහාසය ගැන කියනකොට, හිතන්න එපා ජාතික ජන බලවේගයට, නැත්නම් ජනතා විමුක්ති පෙරමුණට ඉතිහාසයක් නැහැ කියලා. ඔබතුමන්ලාට කළු ඉතිහාසයක් තිබෙනවා. ඒක කවුරුත් දන්නවා. හංගන්න හදන්න එපා. ඒක අපි දන්නවා. අපිටත් තිබෙනවා, ඔබතුමන්ලාටත් තිබෙනවා. කාටත් ඉතිහාසයක් තිබෙනවා, ප්‍රශ්නයක් නැහැ. ඔක්කොම අය වැරැදි කළා. ඔබතුමන්ලා දැන් අවුරුදු 76ක ශාපය කියලා බේරෙන්න හදන්න එපා. එහෙම නොවෙයි. ඒ අවුරුදු 76ක කාලය තුළ මේ රටේ සංවර්ධනය නවත්වන්න විශාල කාර්යයක් කළා. මම දන්නා විධියට අවුරුදු 76ක ශාපය කියලා කියනවා නම්, ඔබතුමන්ලා සියයට 51ක් භාර ගන්න ඕනෑ, අපි නොවෙයි. ඇත්ත ඒකයි. දැන් ඔබතුමන්ලා ඒක හරවා ගෙන ඇවිල්ලා තිබෙනවා.

මම අහගෙන හිටියා, හම්බන්තොට ගැන කථා වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ත්‍රිකුණාමලය ගැන කථා වුණා. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ගැන කථා කරනකොට, විෂය භාර ඇමතිතුමා නැඟිටලා උත්තරයක් දුන්නා. හරි. ඒක ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රකාශනයේ තිබුණ. ඒ මෑත ඉතිහාසයේ නේ. තෙල් ටැංකි ගැන කථා කරනකොට, ඔබතුමන්ලාගේ පක්ෂයේ මහ ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා පාරට බැහැලා උද්ඝෝෂණය කළා. ඔබතුමන්ලා දැන් ඒක වෙනස් කර ගත්තා. ඒ වාගේම, හම්බන්තොට ගැනත් එහෙමයි. ප්‍රශ්නයක් නැහැ, කරගෙන යමු. අනෙක් එක තමයි, ඔබතුමන්ලාගේ මංගල අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. මම නම් කවදාවත් කියන්නේ නැහැ, ආපු ගමන් සෑහෙන්න ප්‍රශ්නවලට උත්තර ලැබෙන්න ඕනෑ කියලා.

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා, මගේ මිත්‍රයා කිව්වා, අත්තිවාරම් දැම්මා කියලා. හොඳයි, අත්තිවාරම් දමන්න. ගරු මන්ත්‍රීතුමනි, ඒක අපිට ප්‍රශ්නයක් නැහැ. අත්තිවාරම ශක්තිමත්ද කියලා බලන්න ඕනෑ. එච්චරයි අපි කියන්නේ. අත්තිවාරම ශක්තිමත් වෙන්න එපායැ. ශක්තිමත් නැත්නම් වැඩක් නැහැ නේ. එච්චරයි බලන්නේ, වෙන මොනවත් බලන්නේ නැහැ. බොහොම ස්තුතියි. මම දෙමළ භාෂාවෙන් කථා කරන්න ඕනෑ.

நிதி அமைச்சரான மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்தப் புதிய அரசாங்கத்தின் கன்னி வரவு செலவுத்திட்டத்தைச் சமர்ப்பித்து உரையாற்றும்போது, பின்தங்கிய மக்கள், குறைந்த வருமானமுடைய மக்கள், கஷ்டப்படும் மக்கள் சம்பந்தமாகக் குறிப்பிட்டு, அப்படியான மக்கள் பிரிவினர் இந்த நாட்டில் இருப்பதாகச் சொன்னார். நான் அவருடைய கவனத்துக்கு ஒரு விடயத்தைக் கொண்டுவர விரும்புகின்றேன். இலங்கையில் அரசியல், சமூக, பொருளாதார, கலாசார ரீதியாக மிகவும் பின்தங்கிய நிலையில் இருப்பது வேறு யாருமல்ல, பெருந்தோட்ட மக்களாவர். இது அவருக்குத் தெரியும்; தெரியாமல் இருக்க முடியாது.

அரசாங்கம் பெருந்தோட்ட மக்கள் தொடர்பில் இந்த வரவு செலவுத்திட்டத்தில் என்னென்ன முன்மொழிவுகளைச் செய்திருக்கிறது என்பது தொடர்பில் இப்பொழுது நான் கவனம் செலுத்த விரும்புகின்றேன். ஏறக்குறைய 7,322 மில்லியன் ரூபாயை பின்தங்கிய மக்களான பெருந்தோட்ட மக்களுக்கு ஒதுக்கியிருப்பதாகக் கூறி, அதனை வர்ணவேடிக்கை செய்துகொண்டு இருக்கின்றது. ஆனால், உண்மை என்ன? சிந்தித்துப் பாருங்கள்! தோட்டப்புற மக்களின் வீடமைப்பு வசதிக்காக 3,500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கிறது. அந்த 3,500 மில்லியன் ரூபாயானது இந்திய அரசாங்கத்தால் வழங்கப்பட்ட கடப்பாடு - commitment. இலங்கை அரசாங்கத்தால் 767 மில்லியன் ரூபாய் வழங்கப்பட்டு இருக்கிறது. அதுதவிர, 'ஸ்மாட்' வகுப்பறைகளை அமைக்க 600 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இந்த 600 மில்லியன் ரூபாய் இலங்கை அரசாங்கத்தால் ஒதுக்கப்பட்டது என்று சொன்னாலும்கூட, இது இந்திய அரசாங்கத்தால் வழங்கப்பட்ட commitment. தோட்டத்துறையின் உட்கட்டமைப்பு அபிவிருத்திக்காக இலங்கை அரசாங்கத்தால் 1,800 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது.

Estate Sector Community Empowermentக்கு 650 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கிறது. NVEDAக்கு - New Villages Estate Development Authorityக்கு - அரசாங்கம் 50 இலட்சம் ரூபாயைத்தான் ஒதுக்கியிருக்கிறது. Saumyamoorthi Thondaman Memorial Foundationக்கு ஒரு சதம்கூட ஒதுக்கப்படவில்லை. மலையக இளைஞர்களின் தொழிற்பயிற்சிக்காக - technical trainingஆக - இந்த அரசாங்கம் பாரிய நிதி ஒதுக்கீட்டைச் செய்துள்ளதாகச் சொல்கின்றார்கள். அதனை நான் தேடிப் பார்த்தேன். எனினும், எங்கேயும் காணவில்லை. அது எங்கு இருக்கிறது என்பதை அமைச்சர் அவர்கள் சொல்ல வேண்டும். இவற்றை

எல்லாம் ஒப்பிட்டுப் பார்க்கும்போது, 7,322 மில்லியன் ரூபாயில் 4,100 மில்லியன் ரூபாய் - 56 சதவீதம் - இந்திய அரசாங்கத்தால் வழங்கப்பட்டது என்பதை நாங்கள் மறந்துவிடக் கூடாது. இலங்கை அரசாங்கத்தால் 3,222 மில்லியன் ரூபாய்தான் ஒதுக்கப்பட்டுள்ளது.

'நல்லாட்சி' அரசாங்க காலத்தில் இந்தியப் பிரதமர் நரேந்திர மோடி, இந்திய வெளியுறவுத்துறை அமைச்சர் ஜெய்சங்கர், இலங்கையில் இருந்த இந்தியத் தூதுவர்களுடன் பேச்சுவார்த்தை நடாத்தியே இந்தத் தொகையை 10,000 வீடுகளை அமைக்கும் திட்டத்துக்காக நாங்கள் பெற்றுக் கொடுத்தோம். இந்திய அரசாங்கத்தால் வழங்கப்பட்ட 14,000 வீடுகளில் 4,000 வீடுகளை மறைந்த நண்பர் ஆறுமுகன் தொண்டமான் அவர்கள் பெற்றுக் கொடுத்தார். எனினும், அந்த வீடுகள் கட்டப்படவில்லை. எங்களுடைய 'நல்லாட்சி' அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர், தம்பி திகாம்பரம் அவர்கள் அந்தத் துறைக்குப் பொறுப்பான அமைச்சராக நியமிக்கப்பட்டு, அந்த வேலைகள் முன்னெடுக்கப்பட்டன. இந்திய அரசாங்கத்துடன் பேச்சுவார்த்தை நடத்தி, எங்களுடைய மக்களின் கஷ்ட நிலைமையை எடுத்துக்கூறி, இந்த 14,000 வீடமைப்புத் திட்டத்தைப் பெற்றுக்கொடுத்த பெருமை -credit- எங்களையே சாரும்.

மலையக மாணவர்களுக்கான smart classroomக்கு ஒதுக்கப்பட்டுள்ள 600 மில்லியன் ரூபாய்கூட, கடந்த அரசாங்க காலப் பகுதியில் இந்திய அரசாங்கத்தால் ஒதுக்கப்பட்டது. இந்திய அரசாங்கத்திடமிருந்து 4,100 மில்லியன் ரூபாயை பெற்றுக்கொண்டு, மேலதிகமாக 3,222 மில்லியன் ரூபாயை வழங்கித்தான் மொத்தம் 7,322 மில்லியன் ரூபாயென எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் அழகாகச் சொன்னார். பரவாயில்லை! உண்மையைப் புரிந்துகொள்ள வேண்டும். இதில் 56 சதவீதம் இந்திய அரசாங்கத்தின் கடப்பாடு. அதற்காக இந்திய அரசாங்கத்துக்கு தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் என்ற வகையில் நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

தற்பொழுது, இச்சபையில் கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் இருக்கிறார். கௌரவ அமைச்சர் சரோஜா சாவித்திரி அவர்கள் இருக்கிறார். கௌரவ பிரதி அமைச்சர் சுந்தரலிங்கம் பிரதீப் அவர்கள் இருக்கிறார். அவர்களைத் தவிர, இன்னும் மூன்று பாராளுமன்ற உறுப்பினர்கள் இருக்கிறார்கள். இந்த ஆறு பேரும் மலையகத்தைச் சார்ந்தவர்கள். அவர்கள் மலையகத்தை மட்டும் பிரதிநிதித்துவப்படுத்தவில்லை. எனினும், மலையகத்தைச் சார்ந்தவர்கள் என்ற அடிப்படையில், அவர்களுக்கு மலையக மக்கள் தொடர்பில் பாரிய பொறுப்பு இருக்கிறது. இந்த ஆறு பேரும் இங்கு வந்து, தேர்தல் காலங்களில்போல கடந்த காலத்தில் மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்திய கட்சிகளையும் பாராளுமன்ற உறுப்பினர்களையும் முன்னாள் அமைச்சர்களையும் குறைசொல்லிக்கொண்டு இருக் கின்றார்கள். தயவுசெய்து, குறைசொல்வதை நிறுத்துங்கள்! எதிர்காலத்தைப் பார்த்து முன்னோக்கி நகருமாறு கேட்டுக் கொள்கின்றேன்.

தமிழ் முற்போக்குக் கூட்டணியினராகிய நாங்கள் 'சும்மா' இருக்கவில்லை. நாங்கள் எங்களுடைய மக்களுக்கு ஒன்றும் செய்யவில்லை என்று சொல்ல வராதீர்கள்! 2015ஆம் ஆண்டு தமிழ் முற்போக்குக் கூட்டணி உருவாக்கப்பட்டபிறகு, நுவரெலியா மாவட்டத்தில் ஆறு புதிய பிரதேச சபைகளை உருவாக்கி இருக்கிறோம். இலங்கையில் பிரதேச சபைகளை இலகுவாக உருவாக்க முடியாது. ஒரு பிரதேச சபையையேனும் உருவாக்க முடியாத காலகட்டத்தில், நாங்கள் ஆறு பிரதேச சபைகளை உருவாக்கி, சாதித்துக்காட்டி இருக்கிறோம். அது சாதனை இல்லையா? சாதனை! தேசிய அரசியல் அதிகாரப்பகிர்வுக்குச் சமமாக பிரதேச சபைகளைப்போல பிரதேச செயலகங்களும் உருவாக்கப்பட வேண்டும். என்னைப் பொறுத்தவரையில், ஒவ்வொரு பிரதேச சபைக்கும் ஒரு பிரதேச செயலகம் இருக்க வேண்டும். வர்த்தமானிமூலம் பிரகடனம்செய்து, நாங்கள் அதற்கான அத்திவாரத்தை இட்டிருக்கிறோம். இரத்தினபுரி, காலி மாவட்டங்களில் புதிதாக பிரதேச செயலங்களை உருவாக்கிய அரசாங்கம், இனவாத அடிப்படையில் நுவரெலியா மாவட்டத்துக்கு முழுமையான பிரதேச செயலகங்களைத் தர மறுத்தது. அதையும் கவனத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

தோட்டப்புறங்களில் வாழுகின்ற மக்களுக்குத் தலா ஏழு பேர்ச்சஸ் காணி சொந்தமாக வழங்கப்பட வேண்டும் என்பதற்காக நாங்கள் முதன்முதலாக அமைச்சரவைப் பத்திரம் சமர்ப்பித்து, அதைச் சட்டமாக்கினோம். அதுதான் ஆரம்பம்! அதற்கு முன்னர் காணி வழங்கப்பட்டிருந்தாலும்கூட, அதுதான் ஆரம்பம்! அதாவது, முதற்தடவையாக அமைச்சரவையில் ஏற்றுக் கொள்ளப்பட்டது. அது கடந்த அரசாங்க காலத்தில் பத்து பேர்ச்சஸ் வரை உயர்த்தப்பட்டு இருக்கிறது. மலையகத்தில் பத்து பேர்ச்சஸ் காணி என்பது, வீடு கட்டும் காணியாக அடையாளப்படுத்தப்பட்டு இருக்கின்றது. அந்தக் காணியில் நாங்கள் தோட்டத் தொழிலாளர்களுக்குத் தனி வீடு கட்டியிருக்கிறோம். அந்தத் தனி வீடுகளை ஒன்றாகச் சேர்த்து, 'மலையகத் தமிழ் கிராமங்கள்' என நாங்கள் அதைப் பிரகடனம் செய்திருக்கிறோம். அதைப் புரிந்துகொள்ள வேண்டும்! மலையக மக்களின் வாக்குகளால் தெரிவு செய்யப்படும் பிரதேச சபைகளுக்கு, தோட்டப்புறங்களின் அபிவிருத்திக்கு நிதி ஒதுக்கீடு செய்ய முடியாதென பிரதேச சபைச் சட்டம் ஒன்று இருந்தது. இந்தத் துறைக்குப் பொறுப்பான அமைச்சரும் நண்பருமான கௌரவ சமந்த வித்யாரத்ன அவர்கள் பேசும்போதுகூட, அங்குள்ள பிரதேச சபைகளுக்குத் தோட்டங்களில் இருக்கக்கூடிய வீதிகள் சம்பந்தமான அதிகாரமில்லை என்பதாகச் சொன்னார். அப்படியல்ல! அவற்றுக்கு அதற்கான அதிகாரம் இருக்கிறது. பிரதேச சபைச் சட்டத்தின் 33ஆம் சரத்தைத் திருத்தி, அந்தப் பிரதேச சபைகளுக்கு வாக்களிக்கும் மக்களுக்கான அபிவிருத்தியைச் செய்வதற்கான அதிகாரத்தை நாங்கள் அவற்றுக்குப் பெற்றுக்கொடுத்து இருக்கிறோம். அதை மறந்துவிடக் கூடாது! எனவே, நீங்கள் அதைச் செய்ய வேண்டும்.

அடுத்து, நாங்கள் மலையக அபிவிருத்திக்கென தனியானதோர் அதிகாரசபையை உருவாக்கி இருக்கிறோம். அந்த அதிகாரசபை பற்றி நீண்ட நேரம் பேசலாம். ஏனெனில், நாங்கள் அதில் நிறைய விஷயங்களை உள்ளடக்கி இருக்கிறோம். அந்த அதிகாரசபை மூலமாகப் பல காரியங்களைச் செய்ய முடியும். எனினும், இந்த முறை அந்த அதிகாரசபைக்கு வெறும் 50 இலட்சம் ரூபாய்தான் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கின்றது. அதை வைத்து என்ன செய்ய முடியுமென்று எனக்குத் தெரியாது! அந்த அதிகாரசபையின் தாற்பரியம், வரலாறு, அதிகாரங்கள் எதுவும் இந்த அரசாங்கத்துக்குத் தெரியாமல் இருப்பதையிட்டு நான் கவலையடைகின்றேன்.

அது மட்டுமல்ல, 300 தோட்டப்புறப் பாடசாலைகளுக்கு தேவையானால் அண்மித்திருக்கின்ற காணியில் இரண்டு ஏக்கர் வரை சுவீகரித்து, பாடசாலையின் தேவைகளுக்குப் பயன்படுத்த முடியும் என்ற ஏற்பாட்டை நாங்கள் செய்துகொடுத்து இருக்கிறோம். மலையக மக்கள் என்பது,

[ගරු මනෝ ගනේසන් මහතා]

'பெருந்தோட்டத் தொழிலாளர்கள்' என்ற அடையாளத்தை மாற்றி, அவர்கள் 'தனித் தேசிய இனம்' என்ற அரசியல் கருத்தை நாங்கள் தேசிய ரீதியாகவும் சர்வதேச ரீதியாகவும் முன்கொண்டு சென்றிருக்கின்றோம். அதை நீங்கள் மறந்துவிட வேண்டாம்! அன்று மாண்புமிகு சனாதிபதி அவர்கள் உரையாற்றும்போது, 'மலையகம்' என்ற வார்த்தையைப் பயன்படுத்தினார். அப்போது, நான் உடனே எழுந்து அவருக்கு நன்றி தெரிவித்தேன்; பாராட்டுத் தெரிவித்தேன். ஏனெனில், நான் எதையும் அரசியல் ரீதியாகப் பார்ப்பதுமில்லை; நல்லவற்றைச் செய்பவர்களைப் பாராட்டுவதற்குத் தயங்குவதுமில்லை. 'மலையகம்' என்ற வார்த்தையை அதிகாரபூர்வமான ஆவணத்தில் நாங்கள்தான் சேர்த்தோம். கடந்த காலங்களில் இந்த நாட்டில் தேசிய ரீதியில் நடைபெற்ற சனத்தொகை கணக்கெடுப்பின்போது, மலையகத் தமிழ் மக்களை 'இந்தியத் தமிழர்கள்' என்ற பிரிவுக்குள்ளேயே சேர்த்தார்கள். அதை நாங்கள் 'இந்தியத் தமிழர்கள்/ மலையக மக்கள்' என மாற்றியிருக்கிறோம். நான் எதிர்க்கட்சியில் இருந்தபோதிலும், கடந்த அரசாங்கத்துடன் பேச்சுவார்த்தை நடத்தி, அந்த மாற்றத்தைக் கொண்டுவந்து இருக்கிறேன். 'மலையக மக்கள்' என்ற அடையாளத்தை முதன்முறையாக இலங்கையில் அரசியல் ரீதியாக அதிகாரபூர்வமான ஆவணத்தில் கொண்டுவந்தது நாங்கள்தான். அதை இப்பொழுது இந்த அரசாங்கமும் முன்னெடுக்கிறது. பிரச்சினையில்லை! நாங்கள் சந்தோசமடைகின்றோம்.

பெருந்தோட்டத்துறையின் மறுசீரமைப்பு இலக்கில், தோட்டத் தொழிலாளர்களின் வருமானத்தை அதிகரிக்கும் நோக்கில், கூட்டுறவு முறையில் - co-operatives - அவர்கள் தொழிலாளர்களாக அல்லாமல், பங்காளிகளாக மாறக்கூடிய ஒரு முறைமையை நாங்கள் முன்னெடுத்தோம். அதை இந்த அரசாங்கம் கவனத்தில் எடுக்க வேண்டும். வெறுமனே தோட்டத் தொழிலாளர்களின் சம்பளம் பற்றிப் பேசி இதைச் செய்ய முடியாது. சம்பளத்தால் மட்டும் தோட்டத் தொழிலாளர்கள் வளர முடியாது என்பது நன்றாகத் தெரியும். இங்கு எனக்கு முன்னர் பல அமைச்சர்கள் பேசினார்கள்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

அவர்கள் அரச ஊழியர்கள் பற்றி பேசினார்கள்; வைத்தியர்கள் பற்றி பேசினார்கள்; மீனவர்கள் பற்றி பேசினார்கள். அதுமாத்திரமன்றி, சம்பள உயர்வு வழங்கப்பட்டு இருப்பதாக மார்தட்டிப் பேசினார்கள். உண்மைதான்! ஆனால், எல்லோரும் சேர்ந்து மிகக் குறைந்த வருமானம்கொண்ட மக்களான தோட்டத் தொழிலாளர்களை மறந்து விட்டார்கள். சகோதரர் அநுர குமார திஸாநாயக்க அவர்கள் பேசும்போது, தோட்டத் தொழிலாளர்களின் நாட் சம்பளத்தை 1,700 ரூபாயென நிர்ணயித்து, அதைப் பிரேரித்து, அது சம்பந்தமாக தோட்டக் கம்பனிகளுடன் பேசுவதாகச் சொன்னார். அவ்வாறு பேசுவதால் அது சாத்தியப்படாது என்பது எனக்குத் தெரியும். அதைச் சம்பள நோக்கில் மாத்திரம் பார்க்காமல், தோட்ட முறைமையை மாற்றி, system changeஐக் கொண்டுவாருங்கள்! அப்போதுதான் அது சாத்தியமாகும்.

இங்கு பேசிய கௌரவ உறுப்பினர் ஒருவர், 32 வருடங்களுக்கு முன்னர் மறைந்த ரணசிங்க பிரேமதாஸ அவர்கள் நாட்டு மக்களுக்கு வீடுகளைக் கட்டிக்கொடுத்தபோதும், மலையக மக்களுக்கு வீடுகளைக் கட்டிக்கொடுக்கவில்லை என்றும் அதற்காக தற்பொழுது இங்கிருக்கின்ற அவருடைய மகன் மன்னிப்புக் கேட்க வேண்டுமென்றும் சொல்லியிருந்தார். இது வேடிக்கையாக இருக்கிறது. அவர் வீடுகளை மாத்திரம் கட்டவில்லை. ஆடை தொழிற்சாலைகளையும் அமைத்தார். அவற்றில் அதிகமான மலையக இளைஞர், யுவதிகள் வேலை செய்கிறார்கள். எனவே, அவ்வாறு சொல்வது தவறு! தயவுசெய்து, நடக்க இருக்கும் விடயங்களைப் பாருங்கள்! எங்களுடைய மக்களுக்கு உடனடியாக காணி வழங்க வேண்டும் என்றோ, வீடு கட்டிக்கொடுக்க வேண்டும் என்றோ நாங்கள் சொல்லவில்லை. ஏனெனில், இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து மூன்று மாதங்களே ஆகின்றன. எனவே, அவற்றை உடனடியாகச் செய்ய முடியாது. உங்களுடைய காணிக் கொள்கை என்ன என்பதைச் சொல்லுங்கள்! நாங்கள் ஏழு பேர்ச்சஸ் என்று சொன்னோம்; பத்து பேர்ச்சஸ் என்று சொன்னோம். எத்தனை பேர்ச்சஸ் காணி கொடுப்பீர்கள் என்பதை நீங்கள் சொல்லுங்கள்! வீடு கட்டுவதற்கு எத்தனை பேர்ச்சஸ் காணி, வாழ்வாதாரத்துக்கு எத்தனை பேர்ச்சஸ் காணி என்பதைச் சொல்லுங்கள்! அதுமட்டுமல்ல, நீங்கள் கட்டும் வீடு, தனி வீடா, மாடி வீடா என்பதையும் சொல்லுங்கள்! அதைச் சொல்ல மறுக்கிறீர்கள்! அதை மூடி மறைத்துவிட்டுப் பதிலளிக்க வேண்டாம்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

ගරු මනෝ ගනේසන් මහතා
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
තව පොඩි වෙලාවක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

சுமார் 32 வருடங்களுக்கு முன் மறைந்துபோன ரணசிங்க பிரேமதாஸ அவர்களை இழுத்து, அவர் சார்பாக அவரது மகன் மன்னிப்புக் கேட்க வேண்டுமெனச் சொல்வது வெட்கமாக இருக்கின்றது; வேதனையாக இருக்கின்றது. அவ்வாறு செய்ய வேண்டாம். யாரையும் திட்டித் தீர்க்காமல், தேர்தல் காலங்களில் பேசியதுபோல் பேசாமல், அழுது ஒப்பாரி வைக்காமல், ஓலமிடாமல், தயவுசெய்து நீங்கள் என்ன செய்யப் போகிறீர்கள் என்பதைச் சொல்லுங்கள்! நீங்கள் இதுவரை மலையக மக்களுக்கு ஒன்றும் செய்யவில்லை. பேச்சு மாத்திரம்தான். பேச்சிலாவது கொள்கையை அறிவியுங்கள்! உங்களுடைய காணிக்கொள்கை என்ன? வீட்டுக் கொள்கை என்ன? மாடி வீடா, கோடி வீடா? எத்தனை பேர்ச்சஸ் காணி கொடுப்பீர்கள்? என்பதைச் சொல்லுமாறு கேட்டு, விடைபெறுகிறேன். நன்றி. வணக்கம்!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.40]

ගරු සුදත් බලගල්ල මහතා
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අපේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කළ 2025 - මංගල අය වැය. මගේත් පළමු කථාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මේ විවාදයේදී අවධානය යොමු කරන්න වෙලා තිබෙන කාරණා මොනවාද? විපක්ෂයෙන් අපට කියන කාරණා ටිකක් කියනවා, මේකට ඔබ මුදල් වෙන් කළාද, මේකට ඔබ මුදල් වෙන් කළාද කියලා. ඇයි, අපට මෙහෙම මුදල් වෙන් කරන්න සිද්ධ වුණේ? එහෙම වුණේ, පසුගිය කාලය පුරාවටම මේ රට පාලනය කරපු පාලකයෝ අපේ රටේ අපට අදාළ නිශ්චිත ප්‍රශ්නවලට උත්තර දුන්නේ නැති නිසා. ඒ නිසා ඒ ප්‍රශ්නය ඔබට අපෙන් අහන්න සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය පාලන ක්‍රමය ඇතුළේ අපේ රටේ මුළු මහත් සමාජය ආපදාවට ලක් කළා. ඒ සමාජය ඇතුළේ තමන්ගේ ලෙයින් උපන් දරුවා දූෂණය කරන පියවරු හැදුවා. තමන්ගේ ලෙයින් උපන් දරුවා මරලා කුණු කූඩයට දාන මව්වරු හැදුවා. මුළු මහත් සමාජය හෙරොයින් -කුඩු- වැනි මත්ද්‍රව්‍යවලින් පුරවලා දැම්මා. ඒ සමාජය ඇතුළේ මිනිහෙකුට ජීවත් වෙන්න පුළුවන් වටපිටාවක් නැති කළා. ඒ පාලන ක්‍රමය ඇතුළේ අපේ මුළු මහත් අධ්‍යාපනය විනාශ කළා. මම මේ ගැන මගේ කථාවේ දී කියන්නම්. අපේ සෞඛ්‍ය පද්ධතිය කඩා වැටිටුවා. ඒ නිසා මේ අයට අපෙන් අහන්න සිද්ධ වෙලා තිබෙනවා, වත්තේ රෝහල හැදුවාද කියලා. අවුරුදු 76ක් රට පාලනය කළ අයට අපෙන් අහන්න සිද්ධ වෙලා තිබෙනවා, වත්තේ රෝහල හැදුවා ද කියලා. මුළු මහත් රාජ්‍ය සේවය බිඳ වැටිටුවා. ඒ තුළ අල්ලස, දූෂණය වැපිරුවා. තමන්ගේ හොරකම වහගන්න රාජ්‍ය නිලධාරීන් පවා ඒකට යොමු කළා. ඒ විතරක් නොවෙයි, අපේ රටේ මුළු මහත් කර්මාන්ත පද්ධතිය වැටිටුවා; ආපදාවට ලක් කළා; ව්‍යසනයට ලක් කළා. වසර 2500ක් ඉතිහාසයක තිබුණු කෘෂිකර්මාන්තය විනාශ කළා. මනරම් දේශයක මහත් වූ පරිසරය දූෂණයට ලක් කළා. අපේ රටේ සත්ත්ව-සිව්පාවුන්ට පවා ඉන්න හිටින්න තැනක් නැති කළා. ඒ නිසා මේ අය වැයෙන්, "කෝ, ඒවාට මුදල්?" කියලා අහන්න සිද්ධ වෙලා තිබෙනවා, මේ මහත්තුරුන්ට.

දැන් අපේ ආණ්ඩුවේ වගකීම මොකක්ද? ඒ තමයි විනාශ කරපු, ව්‍යසනයට ලක් කරපු මේ සමාජය නැවත ගොඩනඟන එක. අපි ඒක කරනවා. අපි ඒකයි කිව්වේ, අපේ ප්‍රධාන සටන් පාඨය අනුව අපි පොහොසත් රටක් හදනවා කියලා. මේ රටේ මිනිස්සුන්ට ලස්සන ජීවිතයක් අරගෙන දෙනවා.

අධ්‍යාපනය ගැන හිතලා බලන්න. මම නියෝජනය කරන්නේ වෙල්ලස්සේ බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගන ආසනය. ඒ ප්‍රදේශයේ එක ගමක් තිබෙනවා, කලුකැලේ කියලා. කිලෝමීටර් 5ක් උඩට පයින් යන්න ඕනෑ ඒ ගමට යන්න. ඒ පාසලේ ඉන්නේ දරුවෝ ඔක්කෝම 13දෙනායි. 5 පන්තියට යනතෙක් විතරයි අධ්‍යාපනය තිබෙන්නේ. ඒ දරුවෝ කිලෝමීටර් 5ක් පල්ලෙහාට කන්ද බැහැලා, තවත් කිලෝමීටර් දෙකහමාරක් යන්න තිබෙනවා "අරාව" පාසලට. බස් එකක් තිබුණොත් යන්න පුළුවන්. නැත්නම් කිලෝමීටර් හතහමාරක් ඇවිල්ලා අරාව ඉස්කෝලේ ඉගෙන ගන්න ඕනෑ. ඔන්න, අවුරුදු 76ක් හදපු රටේ පාසල! ඒ දරුවන්ට නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් පවත්වන්න විධියක් නැහැ. නිවාසවලට බෙදන්න ළමයි නැහැ. ඔන්න, ඒ අධ්‍යාපනයේ හදපු තැන! ඒ ඔබතුමන්ලා හදපු අධ්‍යාපනයේ තැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ අධ්‍යාපනය ඇතුළේ ඒ දරුවන්ට පාසල් විතරක් නොවෙයි, ගුරුවරුත් නැහැ; අනධ්‍යයන සේවකයෝ නැහැ. අපට මෙතුමන්ලා අධ්‍යාපනය ඇතුළේ සමානව බෙදුවේ ප්‍රශ්න පත්‍රය විතරයි. සාමාන්‍ය පෙළට, උසස් පෙළට, ශිෂ්‍යත්වයට අපට ප්‍රශ්න පත්‍රය විතරයි සමානව බෙදුවේ. අන් සියල්ල අසමානව බෙදලා මොනරාගල දිස්ත්‍රික්කයේ, බදුල්ල දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ගැන දැන් කථා කරනවා. අපේ අම්මලා, තාත්තලාට අපට උගන්වන්න ආසාව තිබුණත්, ඒ ආසාව ඉෂ්ට සිද්ධ කරන්න පුළුවන් අධ්‍යාපන පසුබිමක් ඔබතුමන්ලා හැදුවේ නැහැ. ඔබතුමන්ලාට ඒක දැනෙන්නේ නැහැ. ඇයි ඒ? අපේ දිස්ත්‍රික්කයේ හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරුන්ගේ හා ඉන්න මන්ත්‍රීවරු, ඇමතිවරුන්ගේ කවුරුවත් දරුවෙක් ඒ ගමේ පාසලකට ගියේ නැහැ. ඒ නිසා පාසලේ ගුරුවරයා නැති එකේ වේදනාව ඒ ඇමතිවරුන්ට දැනුණේ නැහැ.

අපේ රටේ සෞඛ්‍ය පද්ධතියත් එහෙම තමයි. පසුගිය කාලයේ ඉන්ජෙක්ෂන් ගහලා ඇස් අන්ධ වෙච්ච එක සොහොයුරෙක් ඉන්නවා, අපේ ගමේ. ඒත් මේ ගොල්ලන්ට සෞඛ්‍ය අඩුපාඩුකම දැනුණේ නැහැ. ඇයි? මේ ගොල්ලන්ගේ මායියලා කවදාවත් රෝහලක පෝලිමේ ඉඳලා බෙහෙත් ගත්තේ නැහැ. ඒ නිසා රෝහලේ බෙහෙත්වල අඩුව, රෝහලේ සැත්කම්වල තිබෙන ප්‍රමාදය, අඩුව ඒ ගොල්ලන්ට දැනුණේ නැහැ. ඒ ගොල්ලන් මහ පොළොවත් එක්ක ජීවත් වෙච්ච අය නොවෙයි. ඒ ගොල්ලන් උඩින් හිටියේ. ඒ නිසා ඒ ගොල්ලන්ට ඒවා දැනුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ ගොල්ලන් අපේ කෘෂිකර්මාන්තයත් විනාශ කළා. වසර 2500ක ප්‍රෞඪ ඉතිහාසයක් තිබ්බිච කෘෂිකර්මාන්තය විනාශ කළා. එදා මහා වෙල්ලස්ස කියලා කිව්වේ. ඒක වැව් තිස්දහසක් තිබ්බිව රටක්. ඒක කෙත් යායවල් ලක්ෂයක් අස්වද්දපු බිමක්. ඒක සුද්දාට අවසානයේ යටත් කර ගන්න සිද්ධ වෙච්ච බිම; මහා වෙල්ලස්ස. ඒ වෙල්ලස්ස 1818 කැරැල්ලෙන් විනාශ වෙනකොට, ඒකෙන් විනාශ වෙච්ච වැව් පද්ධතිය හදා ගන්න බැරි වුණා. හැබැයි, අන්න ඒ කෘෂිකර්මාන්තයට දැන් මේ ජාතික ජන බලවේග ආණ්ඩුව උත්තර දෙනවා. අපි දන්නවා, කෘෂිකාර්මාන්තයේ යෙදෙන ගොවීන්ට ප්‍රධාන කාරණා තුනක් වැදගත් වෙනවා. එකක් තමයි ජලය. ඒ වාගේම ඉඩම, බීජ. හතරවෙනි කාරණය තමයි මිල. එදා ඔය පාලකයෝ වතුර දෙන්න ඇති. ඔය පාලකයෝ ඉඩම් දෙන්නත් ඇති. ඔය පාලකයෝ බීජ දෙන්නත් ඇති. හැබැයි, ගොවීන්ට මිල නීන්දු කරන්න අයිතියක් දුන්නේ නැහැ. දැන් අපි margin එකක් දැම්මා නේ, වී කිලෝවක මිල රුපියල් 120යි කියලා. කොහොමද, ඒකට කෑ ගහපු කෑ ගැහිල්ල. රුපියල් 120ට හම්බ වෙන්නේ නැති වෙයි, දැන් රුපියල් 130ට විකුණන්නේ; රුපියල් 140ට ගන්නේ කිව්වා. නැහැ. අන්න දැන් ගොයම් කැපෙන මහවැලි සී කලාපයේ වී කිලෝවක් රුපියල් 110ට බස්සලා තිබෙන්නේ. ඔය මහා ව්‍යාපාරිකයෝ, සහල් මාෆියාකාරයෝ දැන් ඒක බස්සලා තිබෙන්නේ රුපියල් 110ට. අන්න දැන් ආණ්ඩුවෙන් ගෙවනවා, margin එක හැටියට රුපියල් 120ක්. දැන් අපේ ගබඩාවලට වී ටික එන්න ඕනෑ; එනවා. අපි සහල් සුරක්ෂිත රටක් බවට පත් කරනවා. ඒක අපට කරන්න පුළුවන්.

ඒ වාගේම අපි මේ කෘෂිකර්මාන්තය නවීන කෘෂිකර්මාන්තයක් බවටත් පත් කරනවා. පසුගිය කාලයේ අක්කර 65,000ක් අපේ වෙල්ලස්සේ ඉඩම් විකුණන්න හැදුවා, මේ ආණ්ඩු දෙකේම ජනාධිපතිවරු හතර දෙනෙක්. අපි අවුරුදු 17ක් ඒ වෙනුවෙන් මහ පොළොවේ අරගළ කළා. මටත් තවම ඒ නඩු තිබෙනවා, උසාවියේ. හැබැයි, අපි ඒ බිම රැක්කා. අන්න ඒ බිමට අපි පණ දෙනවා. ඒ බිම, අපේ රටේ මිනිස්සුන්ගේ ලේ දහදිය කඳුළු මතින් පෝෂණය වෙච්ච සරුසාර බිමක් බවට අපි පත් කරනවා. ඒ නිසා ඔබ හිතන විධියට නොවෙයි, අපි මේ ආණ්ඩුව අරගෙන යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් මේ ගොල්ලෝ සතුන් ගැන කථා කරනවා. අපට කියනවා, රිළා ප්‍රශ්නය, අලි ප්‍රශ්නය ගැන. ඔව්, තිබෙනවා. කවුද මේ ප්‍රශ්නය හැදුවේ? ඒ සත්තුන්ට ඉන්න තැන නැති කළේ කවුද? මිනිස්සුන්ට ඉන්න තැන

[ගරු සුදත් බලගල්ල මහතා]

නැති කළේ කවුද? මගේ ගමේ ග්‍රාම නිලධාරි වසම් තුනක වන අලි 38 දෙනෙක් ඉන්නවා. ගිය සතියේ සඳුදා එක පුද්ගලයෙක් පාගලා මැරුවා. ඊට දවස් තුනකට පස්සේ තව පුද්ගලයෙක් පාගලා අතක් කඩනවා. ඔහු බදුල්ල රෝහලේ ඉන්නවා. ඊටත් දවස් හතරකට පස්සේ තව පුද්ගලයෙක් නැවත පාගලා මරනවා. අපි දන්නවා, සත්ව සංවිධාන තිබෙනවා. එයාලාට සත්තු ගැන දුකයි; අපටත් දුකයි. අපි ඒ සතාගෙන් පීඩාවට ලක් වෙච්ච මිනිස්සු. අපි ඒ සතාට ආදරය කරන මිනිස්සු. ඇණයක් ඇනිලා අලියෙක් එහේ මෙහේ ඇවිදිනවා. ඒ සතාට කන්න දුන්නේ ඒ සතා විසින්ම ගේ කඩපු මනුස්සයා. ඒ නිසා ව්‍යාජ, බොරු රංගන ආදාරයක් නොවෙයි සතා ගැන අපේ ළඟ තිබෙන්නේ. ඒක සැබෑ ආදරයක්.

හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සතාගෙන් දැන් බිමට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය බේරන්න නම්, අපි ඒ සතාගේ නිවහන නැවත හදන්න ඕනෑ. අපි ඒක හදනවා. මේ අය වැයේ ඒකට මුදල් වෙන් කරලා තිබෙනවා. බලන්න මහත්වරුනි, මේ රටේ රක්ෂිත ටික නැවත සතා සිවුපාවාගේ ජලය තිබෙන බිම් බවට පත් කරන්න ඕනෑ. ඒවා ඔවුන්ගේ ආහාර තිබෙන බිම් බවට පත් කරන්න ඕනෑ. සත්තු කැමැත්තෙන් අපේ ගමට ආවේ නැහැ. උන් කැමැත්තෙන් අලි වෙඩි කන්නේ නැහැ. උන් කැමැත්තෙන් වෙඩි පාරවල් කන්නේ නැහැ. කන්න නැතිකමට එනවා. ඒ නිසා උන් හොරා කනවා, අපේ භූමිය. මේ ගොල්ලන් හොරා කෑවා අපේ රට. සතුන් දැන් හොරා කනවා, අපේ භූමිය. ඒකෙන් පීඩාවට ලක් වෙලා තිබෙනවා, අපි. ඉතින් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, දැන් මේ රට හදන්න ජාතික ජන බලවේගයේ අපි සූදානම්. දැන් මේ මහත්වරු ටිකක් බය වෙලා තිබෙනවා. මොකක්ද මේ බය? දැන් මේ මාස තුනක ආණ්ඩුවට "අරක කළේ නැහැ, මේක කළේ නැහැ, අරක වැඩ කළේ නැහැ, මේක වැඩ කළේ නැහැ" කියනවා. ඇයි මේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු සුදත් බලගල්ල මහතා
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)

මේ ගොල්ලන් හොඳට දන්නවා, සියයට 3 හිටපු අපි. අවුරුදු 59ක අත්දැකීම් සහිත මිනිස්සු අපි.

අපි මේ රටේ මහජනතාවට දැවැන්ත ජයග්‍රහණයක් අත් පත් කර දුන්නා. ඒ ජයග්‍රහණය ඇතුළේ ඔබතුමන්ලාට නැති වෙච්ච ගොඩක් දේවල් තිබෙනවා. ඒ මොනවාද? ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ මේ පුටුවල බලය පාවිච්චි කරලා පර්මිට් එකක් ගත්තා. අන්න, අපි ඒක කැපුවා. ජනතාව සඳහා වාහන ගෙන්වන්න අවසර දුන්නා. ඔබතුමන්ලා මේ පුටුවල බලය පාවිච්චි කරලා, පසු ගිය කාලයේ විශ්‍රාම වැටුපක් හදා ගත්තා. ලේ දහඩිය බිමට හෙළපු ගොවියාගේ විශ්‍රාම වැටුප කප්පාදු කරනකොට, ඔබතුමන්ලා විශ්‍රාම වැටුපක් හදා ගත්තා. අපි ඒක කැපුවා. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා ප්‍රභූන් විධියට ගමට බැස්සේ, backup වාහන එක්ක ගියේ. එදා මළ ගෙදර යනකොට මිනිය විතරයි නැඟිටවේ නැත්තේ. ඒ ඉස්සර. දැන් පස්දෙනෙක්වත් නැඟිටින්නේ නැහැ. අන්න ඒ ප්‍රභූකම අපි කුඩුපට්ටම් කළා. ඒක නිසා ඔබතුමන්ලාට රිදිලා.

පසු ගිය කාලයේ කැන්ටිමේ අපේ කෑම ගැන කිව්වා නේ. වටලප්පමේ වාටියවත් නැහැ කියලා නේ, කිව්වේ. දැන් කවුරුවත් ඒක කියනවාද? දැන් ඔබතුමන්ලා කැන්ටිමේ පෙනෙන්න නැහැ. ඇයි? රුපියල් 400, රුපියල් 2,000 කරනකොට ඔබතුමන්ලා කැන්ටිමේ නැහැ. අපි ඒ මුදල වැඩි කළා. දැන් ඔබතුමන්ලා කැන්ටිමේ නැහැ. ඊට පස්සේ දැන් කොමිස්, පගාව ගැනීම ඉවරයි. දැන් මන්ත්‍රීකමේ වැටුප විතරයි. දැන් ඒ වැටුප විතරයි. දැන් පාරෙන් අරකෙන් මේකෙන් ගත්ත කොමිස් නැහැ. අන්න ඒ විධියට ඒවා අපි කැපුවා. ජනාධිපති අරමුදලින් ඇති පදමට බෙදා ගත්තා. අපි ඒක බිම් මට්ටමට යැව්වා. 2009දී මගේ ගෙදර කුඩුපට්ටම් කළා. මගේ අප්පච්චිගේ කකුල් දෙක කැඩුවා; වන්දි නැහැ. හැබැයි, ඔබතුමන්ලා කෝටි ප්‍රකෝටි ගණන් වන්දි ගත්තා. අන්න ඒවා අපි නැති කළා. අන්න ඒ රිදිල්ල තමයි, කෙඳිරියක් බවට මේ පත්වෙන්නේ. ඒ නිසා මහත්වරුනි, අපි ඔබතුමන්ලාට කියනවා, අපි මහන්සි වුණා මේ පක්ෂය හදන්න. අපි මහන්සි වුණා මේ බලය ගන්න. අපේ ඒ මහන්සිය උපරිම ලෙස මේ රට හදන්න දායාද කරනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.51]

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික ජන බලවේගයේ මංගල අය වැය පසුගිය 17වැනි දා මුදල් අමාත්‍ය, අතිගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ව්‍යවස්ථානුකූලව සෑම වසරක් සඳහාම අය වැය ලේඛනයක් ආණ්ඩුව ඉදිරිපත් කළ යුතු වෙනවා. රටේ ආර්ථික ගමන් මඟ, රටේ ආර්ථික දිශානතිය තීන්දු කරන්න ආණ්ඩුව ඉදිරිපත් කරන අය වැය ලේඛනය හේතු වෙනවා. ඒ නිසා අපි අපේ පැත්තෙන් දශක ගණනාවක දේශපාලන ව්‍යාපාරය මහ පොළොව මත දියත් කරලා ලබා ගත් අත්දැකීම් මත ඉඳගෙන, මේ රටේ ජන කණ්ඩායම් එක්ක විඳ ගත්ත දුක්ඛ දෝමනස්සයන් සංසිඳුවලා ජනතාවට සහන ලබාදීම සඳහා, ජනතාවට මේ රටේ ආර්ථිකය හදාදීම සඳහා, ජනතාවත් එක්ක එකතු වෙලා මේ රට අභිමානවත් දේශයක් බවට පත් කිරීම සඳහා අපේ මංගල අය වැය ලේඛනය පසුගිය 17වැනි දා ඉදිරිපත් කළා. මේ අය වැය ලේඛනය තුළ අපට අවශ්‍ය වුණා, මේ රට නිෂ්පාදන ආර්ථිකයකට මෙහෙයවා ගන්න. හැමදාම බලය ගත්ත දේශපාලන පක්ෂ, වසර 76ක් තිස්සේ කයිවාරු ගහලා, ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරලා, තුනෙන් දෙකේ බලයක්, හයෙන් පහේ බලයක් -කුමන ආකාරයේ බලයක්- ගත්ත මේ රටේ පැවැති ආණ්ඩු මේ රටේ ආර්ථිකය නිෂ්පාදන ආර්ථිකයකට මෙහෙයවා ගන්න අසමත් වෙලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට 2022 වෙනකොට ලෝකයේ දුප්පත්ම රටවල් දෙක අතරට අපි වැටෙනවා. ග්‍රාමීය කර්මාන්ත පද්ධතිය කඩාගෙන වැටෙනවා. දේශපාලන යන්ත්‍රණය විතරක් නොවෙයි, සෞඛ්‍යය, අධ්‍යාපනය කියන සමස්ත ක්‍රියාවලිය බිඳ වැටෙනවා. ඒ නිසා අපි දේශපාලන ව්‍යාපාරයක් විධියට ගත වෙච්ච අවුරුදු දෙක ඇතුළත ජනතාවත් එක්ක වැඩි වැඩියෙන් දේශපාලනය කරමින්, වැඩි වැඩියෙන් සාකච්ඡා කරමින් මේ බිම ගොඩ නැඟීමට අවශ්‍ය සැලසුම් සකස් කරලා, ඒ සැලසුම් යථාර්ථයක් බවට පත් කිරීම සඳහා වන මංගල අය වැය ලේඛනය ඉදිරිපත් කළා. මේ අය වැය ලේඛනය අපේ රටේ ආර්ථික දිශානතිය තීන්දු කරන්න සමත් වුණා කියන විශ්වාසය අපට මේ වෙනකොටත් ඇතිවෙලා තිබෙනවා. මේ අය වැය ලේඛනය පිළිබඳ විවේචන ඉදිරිපත්

කරන, මේ පිළිබඳ විවාදයට එකතු වෙන විපක්ෂයේ සියලුදෙනා මේ අය වැය ලේඛනයේ සාර්ථකත්වය දැකලා කෙදිරිලි, මඩ අවලාද නඟනවා. ඔවුන්ට තමන් ගත කරපු දේශපාලන ඉතිහාසය තුළ ළඟා කර ගන්න බැරි වුණු ජයග්‍රහණ මේ අය වැය ලේඛනයෙන් ලැබෙන බව පෙනෙද්දී වේදනාවට පත්වෙලා කෑ ගහන්න පටන් අරගෙන තිබෙනවා. ඒ අනුව විපක්ෂයේ මහත්වරු මේ අය වැය ලේඛනය පිළිබඳව සාධනීය විවේචනයක් ඉදිරිපත් කරන්න සමත් වෙලා නැහැ.

පසුගිය 18වැනි දා තමයි අය වැය විවාදය පටන් ගත්තේ. අද එම විවාදයේ හයවැනි දිනය. මම හිතන විධියට අය වැය විවාදයේ අද වෙනකල් විපක්ෂය ඉදිරිපත් කළ කථා අතරින් මේ අය වැය ලේඛනය පිළිබඳව සාධනීය විවේචනයක් ඉදිරිපත් කරපු කථා අතේ ඇඟිලි ගණනටත් වඩා අඩුයි. මේක නොවෙයි, මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වෙන දේශපාලන සංස්කෘතිය. මේ රටේ මිනිස්සු තුනෙන් දෙකක බලයක් අපට දීලා, විපක්ෂය අදාළ තැන ස්ථානගත කරලා, ආණ්ඩුව ඉදිරිපත් කළ අය වැය ලේඛනයට විපක්ෂය පැත්තෙන් සාධනීය විවේචනයක් බලාගෙන ඉන්නවා. එතකොට තමයි අය වැය ලේඛනය විධිමත්ව බිම තුළ ක්‍රියාත්මක කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ සාධනීය විවේචනත් එක්ක තමයි එහි ප්‍රතිලාභ ජනතාවට එන්නේ. හැබැයි විපක්ෂය ඉදිරිපත් කරන ඔය සියලු විවේචන, කුහකකමින් ඉදිරිපත් කරන විවේචන බවට අද පත්වෙලා තිබෙනවා. මේ අය වැය ලේඛනයට අද ජනතාව හැම පැත්තෙන්ම සුබ පැතුම් එක් කරනවා.

මේ අය වැය යෝජනා ඇතුළේ ඉතා වැදගත් යෝජනා ගණනාවක් තිබෙනවා. මට ලැබුණු වෙලාව තුළ මම ඒ අතරින් කිහිපයක් පිළිබඳව මතක් කරන්න ඕනෑ. භාණ්ඩ හා සේවා අපනයනය පුළුල් කිරීම සඳහා මේ අය වැය යෝජනා ඇතුළේ විධිමත් සැලැස්මක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ආයෝජන ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම සඳහා වූ මූලික අඩිතාලම දමන්න අවශ්‍ය කටයුතු සම්බන්ධයෙන් යෝජනා කරලා තිබෙනවා. 1977න් පස්සේ විවෘත ආර්ථිකය හඳුන්වා දීලා අපේ කර්මාන්ත පද්ධතිය කඩා වට්ටලා තිබෙනවා. ආයෝජන ගෙනෙනවාය කිව්වාට, අසමත් වෙච්ච ආයෝජන සැලසුම් ඇතුළේ මේ රට වැටෙද්දී අපි පළමුවැනි මංගල අය වැයෙන් ආයෝජන ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම සඳහා වූ මූලික අඩිතාලම දමන්න අවශ්‍ය මැදිහත්වීම කරලා තිබෙනවා.

ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගොඩනැඟීම කියන්නේත් ඉතා වැදගත් කාරණයක්. පසුගිය වසර දෙක තුන ඇතුළත පැවැති ආණ්ඩු අපේ දැවැන්ත කර්මාන්ත පද්ධතිය විනාශ කරලා, පෞද්ගලීකරණය කරලා බිමට සමතලා කරද්දී ඇති වෙච්ච ආර්ථික අර්බුදය ඇතුළේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කඩාගෙන වැටුණා.

හැබැයි මේ ගත වෙච්ච අවුරුදු දෙකේ හිටපු ආණ්ඩුවලට මේ ව්‍යාපාර ගොඩනඟන්න සැලැස්මක් තිබුණේ නැහැ. අපි අය වැය යෝජනා ඇතුළේ මේ සඳහා වැඩි බර තැබීමක් කරලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෝ මේ රටේ ආර්ථිකයට සම්බන්ධ කරගන්න වැඩ පිළිවෙළ හඳුන්වලා දීලා තිබෙනවා. මේක ආර්ථිකයේ වැදගත්ම කොටසක්. ඒ නිසා තමයි අපි ඒ සඳහා වැඩි අවධානයක් යොමු කරලා තිබෙන්නේ. ඒ වාගේම නවෝත්පාදන හා ව්‍යවසායකත්වයන් පෝෂණය කිරීම සඳහා රටේ බොහෝ විපක්ෂ කණ්ඩායම් ව්‍යවසායකත්වයන් පිළිබඳව, ව්‍යවසායකත්ව ගම්මාන පිළිබඳව රොටිය කකා කිව්වාට, ඒ මහත්තුරු බලයට පත් කරපු කණ්ඩායම්, ඒ මහත්තුරුන් එක්ක එකතුවෙලා හදපු ආණ්ඩු "ව්‍යවසායකත්වය" කියන සංකල්පය අපේ රටට සිහිනයක් බවට පත් කළා. අපේ රටේ අලුතෙන් ව්‍යවසායකයෙක් ගොඩනැඟෙන්නේ නැහැ. අලුත් ව්‍යවසායකයෙක් ගොඩනඟන්න ආර්ථික සැලැස්මක් තිබුණේ නැති ආණ්ඩු තමයි තිබුණේ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව අලුතෙන් ව්‍යවසායකත්වය ගොඩනඟලා, ව්‍යවසායකත්ව උත්මාදයක් හදලා එය මේ රටේ සංවර්ධනයේ කොදු නාරටිය බවට පත් කරන්න පළමුවැනි අය වැයෙන් සැලසුම් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය වියදම් කළමනාකරණය ගත්තොත්, 76 වසර ඇතුළේ විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරු, ගොඩක් අත්දැකීම් තිබෙනවා කියලා කියපු අය ඉදිරිපත් කරපු දේශපාලන විවේචන ඇතුළේ තමන්ට හසු කරගන්න බැරි වෙච්ච වැදගත්ම කාරණයක් තිබෙනවා. ඔවුන්ට මේක කරගන්න බැරි වුණා. මේ කාරණයේදී ඔවුන් අසමත් වුණා. ආණ්ඩුවක් විධියට අපි ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉදිරිපත් කරපු සියලු ප්‍රතිපත්තිවලට අදාළ කරුණු එකිනෙක ගෙනහැර අවධානය යොමු කරමින් ඊට අදාළ අය වැය ලේඛනය අපි ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරු 21ක් දක්වා අඩු කරලා තිබෙනවා. අපි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද අහිමි කරලා තිබෙනවා. මේ සියල්ල කරලා රාජ්‍ය වියදම් කළමනාකරණය කරමින්, රටේ ජනතාවට උපරිම සහන ගෙනෙන්න පුළුවන් අය වැය යෝජනා ගණනාවක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සුදත් බලගල්ල මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේකෙන් තමයි රට හදන ගමනේ, රට හදන දැවැන්ත වැඩ පිළිවෙළේ අත්තිවාරම අපි සපයන්නේ. අපේ ආණ්ඩුව 2024 සැප්තැම්බර් මාසයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කළේ, 2025 පෙබරවාරි මාසයේ 17වැනි දා ඉදිරිපත් කරන අය වැය ලේඛනයේ තිබෙන සියල්ල කරලා හමාර කරලා, අවුරුද්දෙන් මේ වැඩේ අවසන් කරන්න නොවෙයි.

අපි ආණ්ඩුවක බලය ගන්නේ අවුරුදු 5කට. ඒ සැලසුම් ක්‍රියාත්මක කරද්දි ප්‍රතිපත්ති ප්‍රකාශයට මූලික අවධානය යොමු කරමින් ජනතා විශ්වාසය දිනාගන්න පුළුවන් විධියට මුල්ම අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. කල්පනා කරලා බලන්න, මේ අය වැය ගැන මේ රටේ අවධානය යොමු වෙලා තිබෙනවා. හැම පුරවැසියෙකුම, හැම රාජ්‍ය සේවකයෙකුම මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. සමහරු මේ අය වැයට නමක් කියන්න හදනවා, මේක වාමවාදීද, දක්ෂිණාංශිකද කියලා. ඒක බලාගන්න. ජාතික ජන බලවේගය ගොඩනැඟෙන්නේම සාමූහික පුරවැසියන් මතින්. මේක ඇතුළේ තිබෙන්නේ වැඩ කරන පන්තිය, ගොවියා නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා ගොවියා, කම්කරුවා, රාජ්‍ය සේවකයා නියෝජනය කරන අය වැයක් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. මේක වැඩ කරන පන්තියට ගෞරවය, අභිමානය ගෙනෙන අය වැයක්. මේ තුළින් පිරිවෙන් ගුරුවරුන්ගේ වැටුප් වැඩි කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. ගුරු උපදේශකවරු, ගුරු අධ්‍යාපනඥ සේවය ඇතුළු සමස්ත අධ්‍යාපන පද්ධතියේ, වෛද්‍යවරු, හෙදියන්, පරිපාලන නිලධාරීන්, කළමනාකරණ සේවය ඇතුළු සමස්ත රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම මාලිමාවේ ආණ්ඩුවෙන් අපි ලබා දෙනවා. එහෙම දෙන්නේ මේ රට ගොඩනඟද්දි ඉතිහාසයේ කළා වාගේම දැවැන්ත කැප කිරීමක් කරන පිරිස විධියට රාජ්‍ය නිලධාරීන් පිළිබඳ විශ්වාසය තියලා ඔවුන්ව සතුටු කරන්න, ඔවුන් මේ ක්‍රියාවලියට බද්ධ කරගන්න. ආණ්ඩුවක් විධියට අපි ඔවුන්ට වැඩ කරන ප්‍රමාණයට වැටුප් ගෙවන්න ඕනෑ. ඒ සඳහා අපි සැලසුම් ඉදිරිපත් කරලා තිබෙනවා.

ඒ වාගේම විශ්‍රාමිකයන්ට ඉතිහාසයේ හොඳම සැලකිල්ල, හොඳම වටිනාකම දුන්නේ මාලිමාවේ ආණ්ඩුවෙන්. අපේ ආණ්ඩුවෙන් ගොවියාට සලකලා තිබෙනවා. පොහොර සහනාධාරය දෙන්න, වාරිකර්මාන්තයට වැඩිම මුදලක් වෙන් කරන්න ජාතික ජන බලවේග ආණ්ඩුවේ පළමු අය වැයෙන් සමත්

[ගරු අරවින්ද සෙනරත් මහතා]

වෙලා තිබෙනවා. ඒ වාගේම හොඳ බීජ ටිකක් දෙන්න, වී අස්වැන්නට හොඳ මිලක් දෙන්න, ජාතික ජන බලවේගය සැලසුම් හදමින් තිබෙනවා. මෙන්න මේ වාගේ දැවැන්ත වැඩ පිළිවෙළක් ගොවි කම්කරුවන් වෙනුවෙන් මේ ආණ්ඩුව ඉෂ්ට කරමින් තිබෙනවා.

ඒ වාගේම, ඉතිහාසයේ කවදාවත් නොලැබුණු සහන ප්‍රමාණයක් වතුකරයට ලබා දී තිබෙනවා. වතුකරයේ ජනතාව වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළන මහත්තුරුන්ට අපි කියනවා, වතුකරය අමතක කරපු දේශපාලන ඉතිහාසයේ ඒ පරාජය මාලිමා ආණ්ඩුව විසින් තවදුරටත් පරාජයට පත් කරමින් සිටින බව. වතුකරයේ අම්මා, තාත්තා, ආදරණීය සහෝදරයන්ගේ ජන ජීවිතය ගොඩනහන්න ජයග්‍රාහී මාලිමාවේ පළමුවැනි අය වැයෙන් දැවැන්ත මුදලක් වෙන් කරලා, සැලසුම් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ආණ්ඩුව මොන ආණ්ඩුවක්ද? මේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක්. මේක වාමවාදී දේශපාලන ව්‍යාපාරයක්. ගොවි කම්කරුවාට, මේ රට ගොඩනහන්න දහඩිය හෙළන මිනිස්සුන්ට සලකපු පළමුවැනි අය වැය අපි ගෙනැල්ලා තිබෙනවා,

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මේ අය වැය තුළින් අධ්‍යාපනයට ඉතිහාසයේ වැඩිම මුදල වෙන් කරලා තිබෙනවා. ඒ, රුපියල් බිලියන 619ක්. ගමේ පාසලේ දරුවාට තමන්ගේ පහසුකම් ටික නැහැ. ඔවුන්ගේ අධ්‍යාපනය දෙමව්පියන් මත යැපෙන අධ්‍යාපනයක් බවට පත් වෙලා තිබෙනවා. මෙම අය වැයෙන් අපි රුපියල් බිලියන 619ක් අධ්‍යාපනයට වෙන් කරලා තිබෙනවා. මේක ඇතුළේ ස්වර්ණමය අවස්ථාවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

පෙර පාසල් දරුවන්ට පෝෂණය ලබා දීම, ශිෂ්‍යත්වය සමත් දරුවන්ට ශිෂ්‍යාධාර මුදල් ලබා දීම, පාසල් දරුවන්ට ලිපිද්‍රව්‍ය සහ පොත්පත් මිලදී ගැනීම සඳහා මුදල් ලබා දීම, සපත්තු මිලදී ගැනීම සඳහා වවුචරයක් ලබා දීම, ආබාධ සහිත දරුවන් සඳහා, විශ්වවිද්‍යාල සිසුන් සඳහා, ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම ඇතුළු සමස්ත පාසල් පද්ධතිය ඉතිහාසයේ පළමුවැනි වතාවට ස්වර්ණමය යුගයකට ගෙන යෑම සඳහා රුපියල් බිලියන 619ක් අපි මෙවර වෙන් කර තිබෙනවා. මේක තමයි අපි අධ්‍යාපනයට කරපු සේවාව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
මම තව තත්පර 30ක් ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙනුත් ඉතිහාසයේ වැඩිම මුදල මෙවර අපි වෙන් කර තිබෙනවා. මේ වාගේ දැවැන්ත ක්‍රියාවලියක් ඉටු කළ අය වැයක් විධියට අපි මේ අය වැය හඳුනා ගන්නවා. මේ සියල්ල සිදු වෙද්දී විපක්ෂය ගොඩක් කලබල වෙලා තිබෙනවා. අය වැය නොවෙයි, විපක්ෂයට අදාළ. තමන්ගේ ආරක්ෂාව ගැන තහවුරු කර ගන්න ඔවුන් දැන් පාතාල සිදුවීම් මතු කරමින් ඉන්නවා. මම එක කාරණයක් මතක් කරන්නම්.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තිබෙන කාලයෙන් විනාඩි දෙකක් එතුමාට ලබා දෙනවා.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

විපක්ෂයේ කණ්ඩායම් ඉතිහාසය මතක් කරමින්, ආරක්ෂාව සම්බන්ධයෙන් කථා කරමින් ඉන්නවා. පාතාලය පිළිබඳව අපි හොඳට කියවලා තිබෙනවා. මේ සමාජයේ භාවිතයත් එක්ක මේ ක්‍රියාවලිය අපි දැකලා තිබෙනවා. අපේ රටේ පාතාලය තිබෙනවා. අපේ රටට සුනාමිය ආවා, අපි යුද්ධය අවසන් කළා, අපේ රටට පාස්කු ඉරිදා ප්‍රහාරයත් එල්ල වුණා. මේ සියලු අවස්ථාවලදී මොකක්ද වුණේ? සුනාමිය ආපු වෙලාවේ අපි දේශපාලන වශයෙන් බෙදුණා. ආණ්ඩුව නියෝජනය කරන පිරිස වරප්‍රසාද ගත්තා. යුද්ධය අවසන් කළා. ජනතාවගේ ප්‍රශ්න විසඳන්න ආණ්ඩුව බෙදුණා. එහිදීත් ආණ්ඩුව නියෝජනය කරන පිරිස වරප්‍රසාද ගත්තා. පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය එල්ල වුණාට පස්සේ, පළමු පැයේම කෙනෙක් ඇවිල්ලා කිව්වා, "රටේ ආරක්ෂාව නැහැ, මම සූදානම් බලය ගන්න" කියලා. මේවා සැලසුම් සහගතව කරපු ප්‍රකාශ. ඒ වාගේම තමයි පාතාලයේ සිදුවීම් ගණනාවක් වුණා. ඒ සිදුවීම් වෙනකොටම මේ පරාජිත දේශපාලකයෝ ඉතිහාසයේදී වාගේම ඒකේ වාසි ගන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා ඔය මහත්වරුන්ට මම මේ කාරණයත් කියන්න ඕනෑ.

අපේ රටේ පාතාලය නිර්මාණය කළේ නිදහස් වෙළෙඳ පොළ ආර්ථිකය අපේ රටට හඳුන්වා දුන් එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ කණ්ඩායම්. 1977දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා "සොත්ති උපාලි" ගොඩනැඟුවා; චන්ද්‍රිකා නෝනලා "බැද්දගානේ සංජීව" වැනි අය ගොඩනැඟුවා; මහින්ද රාජපක්ෂලා "වම්බොට්ට"ලා, "ජූලම්පිටියෙ අමරේ"ලා ගොඩනැඟුවා. ඒ වාගේම සජබයේ මහත්වරුනුත් මේ කාරණය මතක තබාගන්න ඕනෑ. 2015දී හම්බන්තොට දිස්ත්‍රික්කයේ කප්පම් ගන්න පුද්ගලයන් නිර්මාණය කළා. 2015දී highway එකට පස් ටික දෙනකොට, ගල් ටික දෙනකොට සජබයේ මන්ත්‍රීවරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්ලා දාලා කප්පම්කාරයෝ නිර්මාණය කළා. ඒ නිසා ඔය මහත්වරුන්ට පාතාලය ගැන කථා කරලා ඇහ බේරා ගන්න අපි ඉඩ තියන්නේ නැහැ. මේ තත්ත්වය අපි වෙනස් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි රටට සහතිකයක් දෙනවා. පාතාලය රටේ තිබෙන නීතියට අනුව පාලනය කරන්න ඕනෑ වාගේම ඒ පාතාලයන් එක්ක එකතු වෙලා ඉන්න විපක්ෂයත් අපි නීත්‍යානුකූලව පාලනය කරන්න ඕනෑ කියන කාරණයත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තව එක කාරණයක් මතක් කරලා මම කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ සියලු කාරණා අපි හොඳින් තේරුම් ගන්න ඕනෑ. මේ, ඓතිහාසික අවස්ථාවක්; රට ගොඩනඟන අවස්ථාවක්. මේ රට ගොඩ නැඟීමට දැවැන්ත කැප කිරීමක් කරන පුරවැසියන්ට, මේ රට ගොඩනඟන්න අත්වැල් බැඳ ගන්න වැඩ පිළිවෙළක් හදපු තරුණයන්ට මේ රටට දායක වෙන්න අවස්ථාව හදපු අය වැයක් තමයි මේ අය වැය. ඒ නිසා මේ ස්වර්ණමය අවස්ථාව රටේ පුරවැසියන් එක්ක අත්වැල් බැඳගෙන ගොඩනඟනවාය කියන විශ්වාසය අපි තහවුරු කරනවා. මේ අය වැය ජනතාවාදී අය වැයක්. මේ අය වැයට අපේ රට ගොඩ නඟන්න ශක්තිය, ධෛර්යය තිබෙනවා කියන දැඩි විශ්වාසය ඇතිව මම නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.05]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙතුමන්ලා මැතිවරණ දෙකක් ජයග්‍රහණය කළා. ජනාධිපතිවරණයත්, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ලබා ගන්නත් මෙතුමන්ලාට හැකි වුණේ පසුගිය කාල සීමාවේදී අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරපු නිසායි. අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරන මේ ආණ්ඩුවට ඉතා දක්ෂ ලෙස වෛරය පතුරුවන්න පුළුවන් වෙලා තිබෙනවා. අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරලා මේ රටේ ජනතාවගේ ඔළු සේදුවා. වෛරය ගැන කථා කරන මෙම ආණ්ඩුවට මම ඉස්සෙල්ලාම කියන්න ඕනෑ, අවුරුදු 76ක කාලය තුළ යම් විනාශයක් මේ රටේ ඇති වුණා නම් ඒ ඇති වීමට ඍජුව හා වක්‍රව ජනතා විමුක්ති පෙරමුණත් සම්බන්ධයි කියන එක. 1994දී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුවේ මැති ඇමතිකම් ගත්තේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝයි. ඒ විතරක් නොවෙයි. 2005දී මහින්ද රාජපක්ෂ කියන චරිතය මේ රටේ ජනාධිපති බවට පත් කරන්න වැඩිම දායකත්වයක් ලබා දුන්නේත් ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලායි. තමුන්නාන්සේලා මහින්ද චින්තනය ලිව්වා.

මහින්ද චින්තනය ලියපු තමුන්නාන්සේලා දැන් කියනවා, මේ ආණ්ඩුව කරන කවුරුවත් පසුගිය අවුරුදු 76ක පාලනයට සම්බන්ධ වෙලා නැහැයි කියලා. ඒ විතරක් නොවෙයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාව නිර්මාණය කරලා, මැතිවරණවලදී එතුමාව ජයග්‍රහණය කෙරෙව්වා විතරක් නොවෙයි, ඊට පස්සේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ ජයග්‍රහණය වෙනුවෙනුත් ඍජුවම දායකත්වය ලබා දුන්නා. සරත් ෆොන්සේකා මැතිතුමාගේ වේදිකාවලට නැග්ගා. ඒ හැම මැතිවරණයකදීම ඔවුන්ට දායකත්වයක් ලබා දුන්නා. විශේෂයෙන්ම 1994න් පස්සේ. 1994න් පස්සේ දායකත්වය ලබා දුන්නා වාගේම, 1994ට කලින් මොකද වුණේ? ඔබතුමන්ලා දැන් අවුරුදු 76ක් ගැන කථා කළාට, 88-89 කාලයේ ආර්ථිකමය වශයෙන් මේ රටට දැවැන්ත විනාශයක් කළා. ඒක නැහැයි කියන්න බැහැ. විවේචනය කරනවා නම්, අපි සාධාරණව ඒ විවේචනය කරමු. 88-89 කාලයේ ආණ්ඩු පැත්තෙන් හරි දේවලුත් වෙලා තිබෙනවා, වැරදි දේවලුත් වෙලා තිබෙනවා. මෙතුමන්ලාගේ පැත්තෙන් දැවැන්ත විනාශයක් වුණා; ජීවිත 60,000කට වඩා විනාශ වුණා. එහි යම් යම් ගැටලුකාරී තත්ත්වයන් තිබුණා. නමුත් ඒක වුණා. ඒ දේවල්වලට තමුන්නාන්සේලා ඍජුවම වගකියන්න ඕනෑ. 1971දීත් ඒක වුණා. ඒක නිසා තමුන්නාන්සේලාට අවුරුදු 76ක අතීතය ගැන කියලා අත හෝදගන්න කිසිසේත්ම හැකියාවක් නැහැ. පසුගිය අවුරුදු 76ක සිදුවීම් පිළිබඳව තමුන්නාන්සේලා යම් යම් ආකාරයෙන් ඍජුව සහ වක්‍රව වගකීම් භාර ගන්න අවශ්‍යයි.

වුණු දේ වුණා කියලා දැන් අපි කියමුකෝ. දැන් තමුන්නාන්සේලාට තුනෙන් දෙකක ආණ්ඩු බලයක් ලබා දීලා තිබෙනවා නේ. තමුන්නාන්සේලා කියනවා, අපි කෙඳිරිගානවා කියලා. අපේ නොවෙයි, තමුන්නාන්සේලාගේ කෙඳිරිගෑම නතර කරන්නකෝ. කරුණාකරලා අවුරුදු 76ක් ගැන කරන කෙඳිරිල්ල නතර කරන්න. අපි මොකක් හරි විවේචනයක් කළොත් තමුන්නාන්සේලා කියන්නේ වෙන මොකුත් නොවෙයි, මේ අවුරුදු 76ක කථාව. එක් මන්ත්‍රීවරයෙක් පාතාලය ගැන කථා කළා. පාතාලයේ සිදු වීමක් වෙලා තිබෙනවා. ඔව්, පාතාලයේ යම් නැඟිටීමක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා කථා කරලා කියනවා, පසුගිය ආණ්ඩු දේශපාලන වශයෙන් ශක්තිය ලබා දුන් නිසා තමයි පාතාලය මෙතරම් මතුව තිබෙන්නේ කියලා. විපක්ෂයේ සියලුදෙනාට සාධාරණයක් වෙන්න ඕනෑ නිසා මම ඒ වෙලාවේ නැඟිටලා කිව්වා, මේ පාර්ලිමේන්තුව තුළ පාතාලයට සම්බන්ධ වෙලා සිටින කවුරුන් හෝ දේශපාලනඥයෙක් ඉන්නවා නම්, ඔහුව නම් කරන්න, නම් කරලා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. දේශපාලනඥයෝ, පහුගිය ආණ්ඩු, පහුගිය ඇමතිවරු මේවාට වග කියන්න ඕනෑය කියලා තමුන්නාන්සේලා හැමදාම බෝලය පාස් කරන එක නතර කරන්න. දැන් මේ රටේ ජනතාවටත් ඒක අහලා එපාවෙලා. ඒක හින්දා කවුරු හරි පාතාලයට සම්බන්ධ නම්, ඔහුව නම් කරන්න. ඒ තුළින් මත් ද්‍රව්‍යවලට සම්බන්ධ කෙනෙක් ඉන්නවා නම්, ඔහුවත් නම් කරන්න, නීතිය ක්‍රියාත්මක කරන්න. *[බාධා කිරීමක්]* නැහැ, අපට කිසිම ගැටලුවක් නැහැ. අපට ඒක අදාළ නැහැ. කවුරු වුණත් කමක් නැහැ, ඒ කාටත් නීතිය ක්‍රියාත්මක කරන්න.

තමුන්නාන්සේලා තමයි රාජපක්ෂවරු බලයට ගෙනාවේ. මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජනාධිපති කරන්න තමුන්නාන්සේලා තමයි වේදිකාවට නැග්ගේ. අනුර කුමාර දිසානායක මැතිතුමා මේ පාර්ලිමේන්තුවේදීත් කියලා තිබෙනවා, ඒ මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමාට වැඩිම දායකත්වය ලබා දුන්නේ ජනතා විමුක්ති පෙරමුණ කියලා. තමුන්නාන්සේලා දැන් අපට කියනවා, රාජපක්ෂවරුන් ගැන. අපි රාජපක්ෂලාගේ වේදිකාවට නැග්ගේ නැහැ, තමුන්නාන්සේලා නැග්ගා. තමුන්නාන්සේලා ඡන්දය දුන්නා. අපි ඡන්දය දුන්නේත් නැහැ, අපි ඒ වේදිකාවලට නැග්ගේත් නැහැ. අපට එදා ඉඳලා ඒක විවේචනය කරන්න පුළුවන් වුණා. තමුන්නාන්සේලා දැන් ආණ්ඩුවේ ඉන්නේ, විපක්ෂයේ නොවෙයි. ගරු බිමල් ඇමතිතුමා ඇතුළු කණ්ඩායමම ඒකට උපරිම දායකත්වය ලබා දුන්නා. ඒක හින්දා කරුණාකරලා තමුන්නාන්සේලා කියන ඒ කථාව නතර කරගන්න.

තව කාරණයක් ගැනත් මම කියන්නම්. දැන් අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා නේ. මේ අය වැයේ පිටකවරය විතරයි අනුර කුමාර දිසානායක මැතිතුමාගේ. ඇතුළේ තිබෙන හැම දෙයක්ම IMF එකට ඕනෑ කරන විධියට තමයි සිදු කරලා තිබෙන්නේ. නමුත්, තමුන්නාන්සේලා වේදිකාවේ මොනවාද කිව්වේ? IMF එක දණ ගස්වනවා කිව්වා, IMF එකට කොන්දේසි දානවා කිව්වා.

IMF එක කියන-කියන විධියට අපි වැඩ කරන්නේ නැහැ කිව්වා. හැබැයි, ඇත්තටම අද IMF එකට ඕනෑ විධියට හැම දෙයක්ම සිදු වෙලා තිබෙනවා. IMF එක එක්ක කිසිම සාකච්ඡාවක් නැහැ, මේ ණය පිළිබඳව යම් යම් වෙනස්කම් සිදු කර ගන්න. වේදිකාවල කිව්ව දේවල් අද අපට මේ අය වැයේ දකින්න ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේලා ඉතා පැහැදිලිවම

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

කිව්වා, බදු අඩු කරනවා කියලා; ඒ, විශේෂයෙන්ම කෘෂි කාර්මික ක්ෂේත්‍රයට, - කෘෂි කාර්මික උපකරණවලට - සෞඛ්‍ය ක්ෂේත්‍රයට, අධ්‍යාපන ක්ෂේත්‍රයට. තමුන්නාන්සේලා අනුරාධපුරයේ වේදිකාවට නැඟලා කිව්වේ මොකක්ද? මෙන්න මෙච්චර ප්‍රමාණයක් -වැට් එක ඇතුළු- බදු ගහලා තිබෙනවා, අපේ ගොවි ජනතාව රැක ගන්න නම් අනුර කුමාර දිසානායක ජනාධිපති වෙන්න ඕනෑ, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ඇති වෙන්න ඕනෑ, එතකොට අපි ඉස්සෙල්ලාම එක පැන් පාරින්, -එහෙම නේ කිව්වේ- පළමුවෙනි අය වැයෙන්, -එහෙමයි කිව්වේ- ඒවා නැති කරනවාය කිව්වා. දැන් පළමුවෙනි අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, අර පැන් පාර ගහ ගන්න පැන සොයා ගන්න බැරි වෙලාද කියලා. නමුත්, අද තමුන්නාන්සේලාට ඒ කිව්ව දේවල් ඉටු කර ගන්න බැරි වෙලා තිබෙනවා.

කෘෂි කර්මාන්තයේ යෙදෙන ගොවි ජනතාවට ඒ සහන ටික ලබා දෙන්නේ නැත්තේ ඇයි? තමුන්නාන්සේලා ඇවිල්ලා කිව්වේ මොකක්ද? මේ සහල් මාෆියාව නැති කරනවා කිව්වා. ලජ්ජයි කියන්න, මහා පරිමාණ මෝල් හිමියෝ අද තමුන්නාන්සේලාට පාට් එක දානවා. එදා තමුන්නාන්සේලා කිව්වේ මහා පරිමාණ මෝල් හිමියන්ගේ මාෆියාව නැති කරලා ඒ අයව දණ ගස්සනවා, ඒවා වටලනවා, ආණ්ඩුවට ගන්නවා කියලා. අද ඒ මාෆියාවේ ඉන්න ගෝඩ්ෆාදර්ලා ටික කියනවා, තමුන්නාන්සේලාව control කරන්නේ ඒගොල්ලන් කියලා. ඒගොල්ලන් පාට් එක දානවා. තමුන්නාන්සේලාට ඒකට කර ගන්න දෙයක් නැති වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා කිව්වා, සෞඛ්‍ය ක්ෂේත්‍රයට බදු සහන ටික ලබා දෙන්න කටයුතු කරනවා කියලා. ඒ වාගේම තමුන්නාන්සේලා කිව්වා, බෙහෙත් ටික ගන්න විධියක් නැතිව මෙච්චර ප්‍රමාණයක් මිය යනවා, නොමිලේ බෙහෙත් ටික දෙන එක නතර වෙලා තිබෙනවාය කියලා. ඉතාම කනගාටුයි කියන්න, Cancer Hospital එකට අවශ්‍ය බෙහෙත් ටික ලබා දෙන්න තවම කටයුතු කරලා නැහැ. මෙන්න මේ වාගේ තත්ත්වයකට අද අපේ රට පත් වෙලා තිබෙනවා. බදු ටික අඩු කරන්න කටයුතු කරලා නැහැ.

තමුන්නාන්සේලා කිව්වා, අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව පැනට, පැන්සලට පනවා තිබෙන වැට් එක ඇතුළු බදු පළමුවෙනි අය වැයෙන්ම සම්පූර්ණයෙන් අඩු කරනවා කියලා. හැබැයි, එහෙම අඩු කරලා තිබෙනවාද? අද තමුන්නාන්සේලා ඒවා සියල්ලම අමතක කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ අභිංසක ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තමුන්නාන්සේලාට ඡන්දය ලබා දුන්නා. ඒ අය පුළුවන් කාලයේ රැකියා කරලා මේ රටට ලබා දෙන්න පුළුවන් උපරිම දායකත්වය ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ විශ්‍රාමිකයන් සතුටින් ජීවත් වෙන්න තමුන්නාන්සේලාට ඡන්දය ලබා දුන්නා. ඒ, මොකද? විශේෂයෙන් ඒගොල්ලන්ගේ බලාපොරොත්තුව තමයි ඒ අයගේ ප්‍රධාන ඉතුරුම්වලට සාධාරණ පොලියක් ලබා ගැනීම. මොකද, ඒගොල්ලන්ට රැකියාවක් කරන්න විධියක් නැහැ. ඒගොල්ලන් සතුව යම් මුදලක් ඉතුරු කරලා තිබෙනවා; ඒවා බැංකුවේ දාලා තිබෙන්නේ. ඒ අය බැංකුවේ දාලා තිබෙන මුදලට සාධාරණ පොලියක් ලබා දීමට කටයුතු කරන්න. විශේෂයෙන්ම ඒගොල්ලන්ගේ ඉල්ලීම සියයට 15ක පොලියක්වත් ලබා දෙන්න කියන එකයි. සියයට 15ක පොලියක් ලබා දෙන්න කටයුතු කළ යුතුයි; ඒක සාධාරණයි. මුළු ප්‍රමාණයට නොවෙයි රුපියල් ලක්ෂ 10කට, 20කට හෝ 30කට. ඒ වාගේ යම් ඉතුරුම් ප්‍රමාණයකට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සියයට 15ක පොලියක් ලබා දීමට කටයුතු කරන්න කියලා අපි යෝජනා කරනවා.

තමුන්නාන්සේලා දන්නවා, රාජපක්ෂ ආණ්ඩුව කාලයේ විශාල බදු වැඩි කිරීමක් සිදු වුණු බව. ඒ බදු වැඩි කිරීම සිදු වුණේ පසුගිය කාල සීමාවේදී.

පසුගිය කාල සීමාවේදී සිදු කරපු ඒ බදු වැඩි කිරීමට විරුද්ධව තමුන්නාන්සේලා සෘජුවම පෙනී සිටියා. තමුන්නාන්සේලා වැඩ කරන ජනතාවට කිව්වා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවකදී PAYE Tax එක අඩු කරනවා කියලා. PAYE Tax එක රුපියල් ලක්ෂ දෙකක base එකකට යනවා කිව්වා. ඒවා තමුන්නාන්සේලා වේදිකාවල කියපු දේවල්. ඒ වේලාවේදී කිව්වේ නැහැ, අපි පළමුවැනි අවුරුද්දේ කරන්නේ නැහැ, දෙවැනි අවුරුද්දේ, තුන්වැනි අවුරුද්දේ තමයි කරන්නේ කියලා. එහෙම කිව්වේ නැහැ. තමුන්නාන්සේලා කිව්වේ ආපු විගසම ඒවා ඉටු කරනවා කියලා. නමුත් රුපියල් ලක්ෂ දෙකේ base එකට PAYE Tax එක වැඩි කරලා නැහැ. එහෙම කරන්න කටයුතු කරලා නැහැ. මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය ලබා දෙනකොට මෙන්න මේවා ගැන කථා කළා.

ඒ විතරක් නොවෙයි. අපි කවුරුත් දන්නවා, පසුගිය කාල සීමාවේ ජීවන වියදම සමස්තයක් හැටියට දරා ගන්න බැරි මට්ටමකට පත් වුණා කියලා. ඒ ගැන කථා දෙකක් නැහැ. ජීවන වියදම අඩු කරන්න තමුන්නාන්සේලාට වුවමනාවක් තිබෙනවාද? අපි දිගින් දිගටම කිව්වා, විදුලි බිල අඩු කරන්න ඕනෑ කියලා. තමුන්නාන්සේලාත් කිව්වා, විදුලි බිල අඩු කරනවා කියලා; තුනෙන් එකකින් අඩු කරනවාය කිව්වා. විදුලි බිල තුනෙන් එකකින් අඩු කරන්න ආපු මේ ආණ්ඩුව ඉස්සෙල්ලාම එය අඩු කරන්න අවස්ථාවක් ආවාම ඇමතිවරයා මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වේ මොකක්ද? අඩු කරන්න බැහැ, වැඩි කරන්න වේවි කියලා එතුමා පැහැදිලිව ප්‍රකාශ කළා. විදුලි බිල අඩු කරන්න බැහැ කියන එක එතුමා ප්‍රකාශ කළා. හැබැයි, තමුන්නාන්සේලාට වුවමනාව නැති වුණාට ඒ කටයුත්ත ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් සිදු වුණා; ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් ඒ කටයුත්ත වුණා. හැබැයි, තමුන්නාන්සේලාට ඒකට ආශිර්වාදයක් ලබා දුන්නේ නැහැ.

පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිල ගණන් අඩු කරනවා කිව්වා, රුපියල් 100කින්. ඇමතිවරුන්ට මෙන්න මෙච්චර ගණනක් යනවා, ඒවා නතර වෙනවාය කිව්වා. ඒවා නතර කරලා පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිල ගණන් අඩු කරනවා කිව්වා. හැබැයි, තමුන්නාන්සේලාට එහෙම හැකියාවක් නැහැ. මිල සූත්‍රය නැති කරනවා කිව්වා. මිල සූත්‍රය අසාධාරණයි කිව්වා. ඒ මිල සූත්‍රය නේද, තවමත් පාවිච්චි කරන්නේ? තවම මිල සූත්‍රයට අනුව නේද ක්‍රියාත්මක කරන්නේ? තමුන්නාන්සේලාට පුළුවන් නම් මිල සූත්‍රය අයින් කරලා, බදු ටික අයින් කරලා මේ අය වැයේදී පෙන්වන්න, තමුන්නාන්සේලා කිව්ව දේවල් කරන්න පුළුවන් ආණ්ඩුවක් කියලා. හැබැයි, තවමත් මේ රටේ ජනතාවට මේ ආණ්ඩුව ගැන විශ්වාසයක් නැහැ. මොකද, ඔබතුමන්ලාට කිව්ව දේ කරගන්න බැරි වෙලා තිබෙන නිසා. අපි රටේ ජනතාව වෙනුවෙන් තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඔබතුමන්ලා වේදිකාවල කිව්ව දේවල් කරන්න කියලා. විපක්ෂය හැටියට අපි තමුන්නාන්සේලාට ඒ වෙනුවෙන් ආශිර්වාද කරනවා. ජනතාව වෙනුවෙන් සහයෝගය ලබා දෙන්න අපි කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.20]

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)

(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජාතික ජන බලවේග රජයේ මංගල අය වැය අපේ ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා විධියට ඉදිරිපත් කරලා, ඒ පිළිබඳව සිදුවෙන මේ දෙවනවර කියවීමේ විවාදයේදී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට මේ වනකොට අපේ අය වැය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න විවාදයක්, ඒ පිළිබඳව විවේචනයක් නැහැ. ඒ නිසා මේගොල්ලන් සුපුරුදු 88-89 මන්තරය ජප කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒක මේ රටේ ජනතාවට හොඳට පුරුදුයි. මේ මන්තරය අවුරුදු ගණනාවක් මේගොල්ලන් මැතිරුවා. සමහර මන්ත්‍රීවරු 88-89 මන්තරයෙන් එහාට ගිහිල්ලා, 71 මන්තරයත් මතුරන්න පටන් අරගෙන තිබෙනවා. මැතිවරණ කාලයේදීත් මේ වාගේ එක එක මන්තර ජප කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. නමුත් අපි මේ රටේ ජනතාවට ඉදිරිපත් කරපු කිසියම් වැඩ පිළිවෙළක් තිබෙනවා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියලා. මෙන්න මේ වැඩ පිළිවෙළට තමයි අපට මේ රටේ ජනතාව ජන වරමක් ලබා දුන්නේ. අන්න ඒ ජන වරමට අනුව යමින් තමයි අපේ රජය මේ මංගල අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ අය වැය පුරා දිවෙන අපේ වැඩ පිළිවෙළ කුමක්ද කියන එක ගැන තමයි අපි විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕනෑ. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අපේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව ප්‍රශ්න කළා. සමහර අය අපේ දර්ශනය වෙනස් කළ බව මතු කරන්න උත්සාහ කළා. නමුත්, ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ 6වන පිටුවේ මේ විධියට සඳහන් කර තිබෙනවා:

> "අය වැයක් යනු ඉදිරි වසර සඳහා වන ආදායම් සහ වියදම් යෝජනා මාලාවක් පමණක් නොවේ. එය ආර්ථිකය නගා සිටුවීමේ සහ සමස්ත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රජයේ ප්‍රවේශය පිළිබඳ පිළිබිඹුවක්."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ආර්ථික ප්‍රතිපත්තිය කුමක්ද? අපි ඉතා පැහැදිලිව අපේ වැඩ පිළිවෙළ තුළ ඉදිරිපත් කරලා තිබෙන අපේ ආර්ථිකය ප්‍රතිපත්තියේ ප්‍රධාන මූලධර්ම තුනයි තිබෙන්නේ. එකක් තමයි, අපේ නිෂ්පාදනය ඉහළ නැංවීම. එතකොට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා තමයි අපේ ආර්ථික ප්‍රතිපත්තියේ එක ප්‍රධානතම මූලධර්මයක් වන්නේ. දෙවැනි එක කුමක්ද? ඒ තමයි, නිෂ්පාදන ක්‍රියාවලියට හැකිතාක් දුරට ජනතාව සම්බන්ධ කර ගැනීම. තුන්වැනි මූලධර්මය තමයි, නිෂ්පාදනයේ ඇති වන ඒ වර්ධනයේ ප්‍රතිඵල හැකිතාක් සාධාරණ ලෙස ජනතාවට බෙදා හැරීම. මෙන්න මේ සඳහා තමයි අපේ මේ සමස්ත අය වැය ලියවිල්ලම ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපේ රටේ නිෂ්පාදනය අපි ඉහළ නංවන්න ඕනෑ.

අපේ රටේ නිෂ්පාදනය පිළිබඳ කථා කරනකොට අපට අමතක කරන්න බැහැ අපේ රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය. අපේ රටේ පවුල්වලින් සියයට 24ක් පමණ අද වනකොටත් තමන්ගේ ප්‍රධාන ජීවිකාව -වෘත්තිය- කරගෙන තිබෙන්නේ කෘෂි කර්මාන්තයයි. නමුත්, කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් අපේ රටේ දළ ජාතික නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය සියයට 6ක, සියයට 7ක වාගේ අගයක තිබෙන්නේ. මේ නිසා අපට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පුළුල් වර්ධනයක් ඇති කර ගන්න ඕනෑ; පුළුල් දියුණුවක් ඇති කර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට මේ අය වැයෙන් විශාල වශයෙන් ආයෝජන වැඩි කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම වාරිමාර්ග ක්ෂේත්‍රය දියුණු කරන්න, ප්‍රධාන වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කරන්න, ඒ වාගේම පොහොර සහනාධාරය සඳහා ආදී වශයෙන් අපි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට රුපියල් බිලියන 254ක් මෙවර අය වැයෙන් වෙන් කරන්නේ මෙන්න මේ ක්ෂේත්‍රයේ පුළුල් වර්ධනයක් ඇති කර ගන්න. වී ගොවිතැන වෙන්න පුළුවන්, විශේෂයෙන්ම කුරුඳු, ගම්මිරිස් වාගේ අනෙකුත් සුළු අපනයන භෝග වෙන්න පුළුවන් මේවායේ පුළුල් වර්ධනයක් ඇති කර ගත යුතුයි.

ඒ වාගේම පසුගිය කාලයේ අපේ රටේ ඇති වුණු කථා බහත් එක්ක අපේ රටේ පොල් නිෂ්පාදනය වර්ධනය කරන්න අපි කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම උතුරු පළාතේ පොල් ත්‍රිකෝණයක් සඳහා අපි අක්කර 16,000ක් වෙන් කර අලුතෙන් පොල් වගා කිරීම සඳහා මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ ඔස්සේ අපේ රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නවෝදයක් ඇති කරන්න තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

කෘෂිකාර්මික ක්ෂේත්‍රය විතරක් නොවෙයි, සේවා ක්ෂේත්‍රයේත් නිෂ්පාදනය ඉහළ නංවන්න ඕනෑ. භාණ්ඩවලින් විතරක් නොවෙයි, භාණ්ඩ හා සේවා ක්ෂේත්‍රයේත් විශාල වර්ධනයක් අපි මේ අය වැය ඔස්සේ අපේක්ෂා කරනවා. විශේෂයෙන්ම අපේ සංචාරක ක්ෂේත්‍රය ගත්තොත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ ඉහළම ආදායම ලැබුවේ 2018 වර්ෂයේ. 2018 වර්ෂයේ සංචාරකයින් ලක්ෂ 24ක් පමණ අපේ රටට පැමිණියා. ඒ අනුව ඩොලර් බිලියන 4.48ක පමණ ආදායමක් අපට ලැබුණා. ඔබතුමන්ලා දකින්න ඇති, අපේ ජනාධිපතිතුමා අය වැය කථාවේදී ඉදිරිපත් කළා, "නව සංචාරක ගමනාන්ත අපි පුළුල් කර ගන්න අවශ්‍යයි; ඒවා විවෘත කර ගන්න අවශ්‍යයි" කියලා. අන්න ඒ හරහා 2025 වර්ෂයේදී ලංකාවට සංචාරකයන් මිලියන 3ක් කැඳවාගෙන ඇවිල්ලා අපි ඉතා කෙටි කාලයකින් ඩොලර් බිලියන 8ක ආර්ථිකයක් දක්වා ගමන් කිරීමේ ප්‍රවේශය සඳහා තමයි සේවා ක්ෂේත්‍රයේ වර්ධනයත් මෙවර අය වැයට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම මේ ආර්ථිකයේ ඇති වන වර්ධනයේදී ජනතාව ඒ හා සම්බන්ධ වෙන්නට, මේ තිබෙන ඇති නැති පරතරය අඩු කරන්න තමයි අපි විශේෂයෙන්ම ප්‍රාදේශීය සංවර්ධනයටත්, දිස්ත්‍රික් සංවර්ධනයටත් මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙන්නේ. උතුරු පළාත වෙන්න පුළුවන්, නැඟෙනහිර පළාත වෙන්න පුළුවන්, දකුණු පළාත වෙන්න පුළුවන්, මධ්‍යම කඳුකරය වෙන්න පුළුවන්, බස්නාහිර පළාත වෙන්න පුළුවන් අපේ රටේ විශාල වශයෙන් තිබෙන ප්‍රාදේශීය විෂමතා අඩු කර ගැනීම සඳහා තමයි අපි විශේෂයෙන්ම ප්‍රාදේශීය සංවර්ධනය සඳහා රුපියල් මිලියන 11,250කුත්, දිස්ත්‍රික් සංවර්ධනය සඳහා තවත් රුපියල් මිලියන 2,000කුත් විධියට රුපියල් මිලියන 13,250ක් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් සංවර්ධනය සඳහා වෙන් කරන්නේ.

අපේ රටේ ආර්ථිකය ගත්තාම, බස්නාහිර පළාතෙන් අපේ දළ ජාතික නිෂ්පාදිතයට සියයට 44ක් විතර පැමිණෙනවා. ඒ වාගේම, ඌව පළාත, නැඟෙනහිර පළාත, උතුරු පළාත වැනි පළාත්වලින් දළ ජාතික නිෂ්පාදනයට ලැබෙන දායකත්වය ඉතාම අඩු මට්ටමක තිබෙන්නේ. මෙන්න මේ නිසා තමයි අපට ඒ ප්‍රාදේශීය විෂමතා පුළුවන් තරම් අවම කිරීම සඳහා කටයුතු කරන්නට අවශ්‍ය වෙලා තිබෙන්නේ. අන්න ඒ වෙනුවෙන් තමයි අපේ මේ මංගල අය වැයෙන් ප්‍රවේශයක් අරන් තිබෙන්නේ.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ජාතික ජන බලවේගය රජයේ තවත් ප්‍රධාන මූලධර්ම කිහිපයක් තිබෙනවා. ඉන් එකක් තමයි, පොදු සේවාවන් සඳහා විශාල වශයෙන් අපි ආයෝජනය කර තිබෙනවා. ඒ සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම අපි රජයක් විධියට අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ප්‍රවාහනය පොදු සේවාවන් විධියට සලකනවා. අධ්‍යාපනය කියලා කියන්නේ අපේ සමාජයේ යම් පුද්ගලයෙකුට, යම් දරුවෙකුට ඉහළට ගමන් කිරීමට තිබෙන ප්‍රධානතම ඉණිමග බව අපි දන්නවා. අපි සමාජ විද්‍යාවේදී කියනවා, සමාජ සංචලනාව - social mobility - කියලා. උඩුකුරු සංචලනාව සහ යටිකුරු සංචලනාව කියලා සංචලනා වර්ග දෙකක් තිබෙනවා. යම්කිසි පවුලක සාමාජිකයෙකුට උඩුකුරු සංචලනාව සඳහා, උඩු අතට ගමන් කිරීම සඳහා ඉතාම වැදගත් වන දෙයක් තමයි මේ අධ්‍යාපනය. අධ්‍යාපනය තුළින් තමයි ඔවුන්ට ඉහළට යන්න පුළුවන් වන්නේ.

අපේ රටේ පාසල් 10,126ක් පමණ තිබෙනවා. නමුත්, අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයෝජන පසුගිය දශක කිහිපයේම අපි වැය කළේ බොහෝ වෙලාවට ලංකාවේ තිබෙන ජාතික පාසල් 373ක් හෝ ඒ වාගේ ප්‍රධාන පාසල් කිහිපයක් පදනම් කරගෙනයි. නමුත්, මේ අය වැයේදී අපි විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුළුල් පරිවර්තනයක් සඳහා ආයෝජනය කර තිබෙනවා. ඒ සඳහා අපි මුදල් වෙන් කළා.

විශේෂයෙන්ම මම තවත් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. අපිට ජනවරම ලබා දුන්නු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපි ඉදිරිපත් කළා, සෑම දරුවෙකුටම තමන් පදිංචි ස්ථානයේ හෝ තමන්ගේ සේවා ස්ථානයේ සිට තමන් කැමැති පරිදි ආසන්න කිලෝමීටර 3ක් ඇතුළත සියලු පහසුකම් සහිත පාසලක් ලබා දෙනවා කියලා. ඒ පාසල් ලබාදීම සඳහා, ඒ අවශ්‍ය ප්‍රතිසංස්කරණ කිරීම සඳහා අපි මේ අය වැයෙන් අමතරව මුදල් වෙන් කර තිබෙනවා. අන්න ඒ නිසා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයක් වෙනුවෙන් අපි මේ අය වැය ඉදිරිපත් කර තිබෙනවා.

පාසල් අධ්‍යාපනය විතරක් නොවෙයි, උසස් අධ්‍යාපනය ගත්තත්, අපේ රටේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන විශ්වවිද්‍යාල 17ක් තිබෙනවා. මේ විශ්වවිද්‍යාලවලට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන්නත් අපි අවධානය යොමු කර තිබෙනවා. ඒ වාගේම, බොහෝ අය කථා කළේ නැති කාරණයක් තිබෙනවා. ඒ තමයි, අද විශ්වවිද්‍යාල ළමයින්; ඒ විද්‍යාර්ථීන් උසස් අධ්‍යාපනය ලබන්නේ ඉතාමත් අඩු පහසුකම් යටතේ. ඒ යටිතල පහසුකම් වර්ධනය කිරීමට වාගේම විශ්වවිද්‍යාල සිසුන් සඳහා ගෙවනු ලබන මහපොළ ශිෂ්‍යාධාරයත් රුපියල් 2,500කින් වැඩි කිරීම සඳහා අපි යෝජනා කර තිබෙනවා. ඒ වාගේම, විශ්වවිද්‍යාල දරුවන්ට දෙන ශිෂ්‍යාධාර දීමනා රුපියල් 2,500කින් වැඩි කර තිබෙනවා. ඒ අනුව, මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 7,500ක් දක්වාත්, ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 6,500ක් දක්වාත් ඉහළ නංවා තිබෙනවා. මේ සියල්ලෙන් පාසල් අධ්‍යාපනයත්, ඒ වාගේම විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් ඉහළ නංවලා, සමාජයේ උඩුකුරු සංචලනාවට අවශ්‍ය පසුබිම සකස් කිරීම තමයි අපි මේ අය වැය තුළින් සිදු කර තිබෙන්නේ.

අපේ පොදු සේවාවන්වල ඊළඟ කාරණය තමයි සෞඛ්‍ය කියන එක. අපි මැතිවරණ ක්‍රියාවලිය තුළදීත් මේ පිළිබඳව සාකච්ඡා කළා. අපි සඳහන් කළා, යම්කිසි පුද්ගලයෙකුගේ අතේ මුදල් තිබෙනවාද, නැද්ද කියන එක මත ඒ පුද්ගලයා ජීවත් වෙනවාද, නැද්ද කියන එක තීරණය විය යුතු නැහැ කියලා. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. යම්කිසි පුද්ගලයෙකු අත මුදල් තිබෙනවාද, නැද්ද කියන එක මත ඔහු ජීවත් වෙනවාද, නැද්ද කියන එක තීරණය කරන්න ඔහුට ඉඩ දෙන්න ඕනෑ නැහැ. එය විය යුතු දෙයක් නොවෙයි, අපේ සමාජයේ. අන්න, ඒ ප්‍රතිපත්තිය අනුව යමින් තමයි අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පුළුල් සංවර්ධනයක් සඳහා මුදල් වෙන් කරලා තිබෙන්නේ.

අපේ රටට නිදහස ලැබුණු දවසේ ඉඳලාම අපට නිදහස් සෞඛ්‍යයක් තිබෙනවා කියලා අපි දන්නවා. නමුත්, අපි මෙහි ප්‍රායෝගික යථාර්ථයත් දන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපේ රටේ සාමාන්‍ය රෝගීන්ගෙන් සියයට 55කට ආසන්න ප්‍රමාණයකට අදත් ප්‍රතිකාර ලබා ගැනීමට සිදු වෙලා තිබෙන්නේ පෞද්ගලිකව තමන්ගේ අතේ තිබෙන මුදල්වලින්. ප්‍රායෝගික යථාර්ථය තමයි, ඒක. වෛද්‍යවරයෙකු හමු වුණාම සති දෙකකට, තුනකට බෙහෙත් ලියා දුන්නත් සමහර වෙලාවට දවස් දෙකකට, තුනකට බෙහෙත් අරගෙන එන අය මම මගේ ඇස් දෙකෙන් දැකලා තිබෙනවා. එවැනි සමාජයකයි අපි ජීවත් වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එවැනි තත්ත්වයන් අපි මේ සමාජයේ අත් විඳිනවා. මේ සමාජයේ අප පසු කර ගෙන ආපු පසුගිය කාලවල පැවැති ආණ්ඩු ගත්තාම, සමහර වෙලාවල බෙහෙත් කියලා වතුර විදපු පුද්ගලයෝ සිටියා; ඒවාට දායක වෙච්ච ඇමතිවරු සිටියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුවත් එයට සාක්ෂියි. එවැනි අය එවැනි බෙහෙත් ගෙනැල්ලා අපේ රෝගී ජනතාවට දීලා ඒ ජනතාවගේ ඇස් අන්ධ වුණාට පස්සේ, ජනතාව මිය ගියාට පස්සේ ඒවාට ලැබුණු පිළිතුරු ඉතාම දුක්ඛදායකයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. සමහර වෙලාවල කිව්වා, රෝහල් ආසන්නයේ මල්ශාලාවක් තිබෙන්නේ ඒ නිසාය කියලා. ඉතින් ඒ තත්ත්වය ඉතාම කනගාටුදායකයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. එවැනි සමාජයක් පසු කරමින් නිදහස් සෞඛ්‍යයක් සඳහා, සියලු දෙනාට හොඳ සෞඛ්‍ය සේවයක් ලබා දීම සඳහා සෞඛ්‍යයට අදාළ වැය ශීර්ෂවලට අපි විශාල වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා.

මෙහිදී විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සඳහන් කළා, අද ඖෂධ සඳහා VAT අය කරනවා කියලා. එය සම්පූර්ණයෙන් වැරැදි අදහසක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ලංකාවේ ඖෂධ සඳහා VAT අය කරන්නේ නැහැ. අපේ ආණ්ඩුව බලයට පත් වන කොට දේශීයව නිෂ්පාදනය කරන සමහර ඖෂධවල ඇසුරුම් ද්‍රව්‍ය සඳහා VAT අය කරලා තිබුණා. අපේ ආණ්ඩුව ඒ බද්දත් අහෝසි කළා. ඒ අනුව, ඖෂධ සඳහා බද්දක් අය කරන්නේ නැහැ. අපි මේ වර්ෂයේදී ඖෂධ මිල දී ගැනීමේ කටයුතු පහසු කිරීම සඳහා පමණක් රුපියල් බිලියන 165ක් මේ අය වැයෙන් වෙන් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අන්න ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. නිෂ්පාදන ආර්ථිකයක් ඇති කිරීම, පොදු සේවා ශක්තිමත් කිරීම, අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය ආදී ක්ෂේත්‍ර දියුණු කිරීම අපේ අරමුණයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. සමාජ ආරක්ෂණය අපේ ආණ්ඩුවේ තවත් එක් ප්‍රධාන මූලධර්මයක්. සමාජයේ විවිධ ජන කොටස් ඉන්නවා. ඔවුන්ගේ සමාජ ආරක්ෂණය අත්‍යවශ්‍යයි. අඩු ආදායම්ලාභී පවුල් වෙන්න පුළුවන්; වැඩිහිටියන් වෙන්න පුළුවන්; ආබාධ සහිත පුද්ගලයන් වෙන්න පුළුවන්; වකුගඩු රෝග වැනි විවිධ රෝගාබාධයන්ට ලක් වුණු අය වෙන්න පුළුවන්; ළමයින් වෙන්න පුළුවන්; ළමා නිවාසවල ජීවත් වන අය වෙන්නත් පුළුවන්; මේ සියලු දෙනා රැක බලා ගැනීමට, සමාජ සුබසාධනය සහ සමාජ ආරක්ෂණය සඳහා අපි මේ අය වැයෙන් දැවැන්ත මුදලක් -රුපියල් බිලියන 700කට වඩා වැඩි මුදලක්- වෙන් කර තිබෙනවා. අපි මේ ඔස්සේ මේ වන විටත්,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමාට තවත් විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියත් දන්නවා, මේ වන විටත් අපි සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ යටතේ ජනතාවට ලබා දෙන සහන වැඩි කර තිබෙන බව. රුපියල් 8,500ක්ව තිබූ "අස්වැසුම" මාසික ප්‍රතිලාභ දීමනාව අපි රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඒ වාගේම, අනෙක් සමාජ කණ්ඩායම සඳහා රුපියල් 15,000ක්ව තිබූ මාසික ප්‍රතිලාභ දීමනාව අපි රුපියල් 17,500 දක්වා වැඩි කළා. විශේෂයෙන්ම ආබාධ සහිත පුද්ගලයින්ට ලබා දී තිබුණු රුපියල් 7,500ක මාසික දීමනාව අපි මේ අය වැයෙන් රුපියල් 10,000 දක්වා වැඩි කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. ඒ වාගේම, වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන දීමනාව අපි මේ අය වැයෙන් අප්‍රේල් මාසයේ සිට රුපියල් 10,000 දක්වා වැඩි කළා. අන්න ඒ අනුව පෙනෙනවා, සමාජ ආරක්ෂණය අපේ ආණ්ඩුවේ මූලික ප්‍රතිපත්තියක් බව.

මම මෙතැනදී මූලික වශයෙන් සඳහන් කළේ මෙයයි. අපේ ආර්ථික දැක්ම කුමක්ද, අන්න ඒ ප්‍රවේශය සඳහා තමයි අපේ මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. පොදු සේවාවන් ශක්තිමත් කිරීම තමයි අපේ මේ අය වැයේ මූලධර්මය වන්නේ. ඒ වාගේම, රටේ අත්‍යවශ්‍ය පුද්ගලයන්ට සමාජ ආරක්ෂණය ලබා දීමත් අපේ අරමුණක්. මෙන්න මේ සියල්ල සම්පිණ්ඩනය කරගත් ඉතාම සාර්ථක අය වැයක් මේ වසරේ ඉදිරිපත් කරන්න අපට අවස්ථාව ලැබුණා. විශේෂයෙන් මේ සමාජය සැකසී තිබෙන social order එක, සමාජ පර්යාය, සමාජ දේහයම වෙනස් කිරීම සඳහා, ඒකට අවශ්‍ය ව්‍යුහාත්මක වෙනසක් සඳහා තමයි අප මේ පළමුවැනි පියවර තබා තිබෙන්නේ. ජාතික ජන බලවේගය ඉදිරි වසර කිහිපය තුළ මේ සමාජයේ සමස්ත පරිවර්තනයක් සඳහා අවශ්‍ය පියවර ගන්නා බව සඳහන් කරමින් මම නිහඬ වෙනවා. බෙහෙවින් ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝජ් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 2.38]

ගරු මනෝජ් රාජපක්ෂ මහතා
(மாண்புமிகு மனோஜ் ராஜபக்ஷ)
(The Hon. Manoj Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වසරේ අපේ ආණ්ඩුවේ මංගල අය වැය විවාදයට ගන්නා මේ මොහොතේ මීට සුළු මොහොතකට කලින් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු මේ අය වැය ගැන ඉදිරිපත් කළ අදහස සම්බන්ධව යම් කරුණුක් ඉදිරිපත් කරලාම අය වැය පිළිබඳ මගේ කථාව ඉදිරිපත් කරන්න මම නිතුවා. විපක්ෂයේ ඇතැම් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්, අත්දැකීම් සහිත මන්ත්‍රීවරුන් විධියට අය වැය කථාවක් කියන්නේ මොකක්ද, එහි පදනම් වී තිබෙන කාරණා මොනවාද යනාදිය සම්බන්ධව අය වැය ඉදිරිපත් කළ ආණ්ඩු පක්ෂයට කරුණු ඉදිරිපත් කරන ක්‍රමයවත් හරියට තේරුම් ගත් බවක් මම දැක්කේ නැහැ. වෛරය වැපිරීම කියන තැනින් තමයි අය වැය විවාදය පටන් ගත්තේ. එම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් අපි අහනවා, අපේ රටේ ආර්ථිකය සහමුලින් බිඳ වැටිටවීම පිළිබඳව ජනතාවට අප කරුණු සහිතව හෙළි කිරීම වෛරය වැපිරවීමක් ද කියලා. ඒ වාගේම, කෘෂි කර්මාන්තය කඩා බිඳ වැටිටවීම, ඒ හරහා අපේ රටේ ගොවි ජනතාවගේ ජීවිත, ඔවුන්ගේ දු දරුවන්ගේ ජීවිත පවත්වා ගෙන යෑම අපහසු තත්ත්වයට පත් කිරීම පිළිබඳව මේ රටේ ගොවි ජනතාවට පෙන්වා දීම වෛරය වැපිරවීමක් ද? අපේ රටේ අනාගතය හිමි දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය අහිමි කිරීම, දුබල කිරීම, බිඳ වැටිටවීම පිළිබඳව අප ඒ සමාජ ස්තරයත් එක්ක සාකච්ඡා කිරීම වෛරය වැපිරවීමක් ද? මීට පෙර කථා කළ මන්ත්‍රීවරයෙක් ගොඩක් පරණ කථා කිව්වා. අපි දන්නවා, ඒ මන්ත්‍රීවරයා කියපු කථා දැන් ගොඩක් පරණයි කියලා. ඒ පරණ තැටි නැවත, නැවත වාදනය කිරීම හැර ඔවුන්ට මෙම අය වැය විවාදයේදී අලුත් යෝජනාවක්වත් ඉදිරිපත් කරන්න තිබෙනවා කියන එක නම් දැනුණේ නැහැ.

2025 වසර සඳහා අප ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය ඉතා හොඳින් පිරික්සමින් එහි යම් අඩු පාඩුවක්, එහෙම නැත්නම් ඇතුළත් විය යුතු යම් කාරණයක් තිබෙනවා නම් එය පෙන්වා දීම තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කාර්යභාරය විය යුත්තේ. ඔවුන් ඒ කාර්යභාරයවත් හරියට තේරුම් ගන්නේ නැතිව තමයි කරුණු ඉදිරිපත් කළේ.

[ගරු මනෝජ් රාජපක්ෂ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ අය වැය ඉදිරිපත් කරන්න වුණේ බිඳ වටිටපු ආර්ථිකයක් තුළයි; බිඳ වටිටපු රටක් තුළයි. සෑම සියලු ක්ෂේත්‍රයකම බිඳ වැටීම් තමයි තිබුණේ. සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික පරිහානිය කියන භතර නස්පැත්තියම මේ රට වෙළාගෙන තිබෙන තත්ත්වයක් ඇතුළේ තමයි අලුත් ආණ්ඩුව විධියට -නව රජය විධියට- අපි 2025 වසර සඳහා මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මීට මොහොතකට කලින් අදහස් ඉදිරිපත් කළ අපේ උපාලි පන්නිලගේ අමාත්‍යවරයා යම් ආරම්භයක් ගනිමින් කිව්වා මේ අය වැය සකස් කළේ යම්කිසි මූලධර්ම මත පදනම් වෙලායි කියලා. විශේෂයෙන් ප්‍රධාන මූලධර්ම තුනක් යටතේ මේ අය වැය සකස් කරලා තිබෙනවා. ඒවා මීට කලින් ද අපේ ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ පැත්තෙන් ඉදිරිපත් වුණා.

"මෙවර අය වැය මෙම මූලධර්ම මත පදනම්ව සකස් කර තිබෙන අතර, සියලු පුරවැසියන් ක්‍රියාකාරී සහභාගිවන්නන්, ක්‍රියාකාරී පාර්ශ්වකරුවන් සහ ක්‍රියාකාරී ප්‍රතිලාභීන් වන ආර්ථිකයක් නිර්මාණය කිරීමට පදනමක් සැකසීමට අප අදහස් කරනවා." කියා තමයි මුදල් අමාත්‍යවරයා විධියට ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා මෙම සභාව ඉදිරිපිට ප්‍රකාශ කර සිටියේ.

විශේෂයෙන්ම විනාශ වූ මේ ආර්ථිකය යළි ගොඩ ගැනීම සඳහා, වැටුණු තැනින් මේ ආර්ථිකය යළි ගොඩ ගැනීම සඳහා ඉතා පුළුල් කියවීමක් සහිතව, දිගු කාලීන ඉලක්ක සහිතව, එහෙත් කෙටි කාලීනව අත්පත් කරගත යුතු ආර්ථික වර්ධනය ගැනත් හිතමින් අපේ අය වැය සකස් කරන්නට අපට ඕනෑකම තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් මෙතෙක් මේ රට පාලනය කළ පාලකයන් ඔවුන්ගේ හෙලුව වහ ගන්න, නොහැකියාව වහ ගන්න මේ සභා ගර්භය තුළදී මේ අය වැයේ පිටු, කඩදාසි පාවිච්චි කරන විධියක් තමයි පොදුවේ අපට දකින්න හම්බ වුණේ.

අපි කවුරුත් දන්නවා, අය වැයක් සකස් කිරීමේදී අලුත් තැනකින්ම පටන් ගන්න බැහැ කියලා. මොකද, දශක ගණනාවක් අපේ රටේ ආර්ථිකය ඇතුළු අනෙකුත් සෑම සියලු ක්ෂේත්‍රයක්ම බිඳ වැටීම්වලට ලක් වෙලා තිබුණේ. ඒ ගැනත් හිතමින් ඒ පාලනයේ තිබුණු අඩු පාඩු වාගේම, ඒ දුබලතා මහඟරවමින්, ඉදිරියේදී මේ රට අරගෙන යන්න ඕනෑ නිවැරදි දිශානතිය ගැන හිතමින් තමයි අපට අය වැය සකස් කරන්න වුණේ. ඒ නිසා මේ අය වැය සකස් කිරීමේදී මෙතෙක් පැවති පාලනයන් විසින් අපට අහිමි කරපු දේවල් ගැන හිතමින්, අපේ රට බිඳ වටිටවා තිබුණු තැන ඉදිමින් තමයි අපට කල්පනා කරන්න වුණේ. අද උදේ වරුවේ අපේ නලින්ද ජයතිස්ස අමාත්‍යවරයා ඉතා හොඳින් පැහැදිලි කළා, අපේ රටේ ආර්ථිකය මොන තැනට වටිටලා තිබුණාද කියලා. අන්න එතැන ඉඳලා රට ගොඩනහන්න අවශ්‍ය සැලැස්මක්, දැක්මක් සහිත අය වැයක් තමයි අපට ඉදිරිපත් කරන්න වෙලා තිබෙන්නේ. ඒක නිසා මෙය මේ වර්ෂයේ අප්‍රේල් සිට ඉදිරි මාස 9ක කාලය තුළ අපේ ඉදිරි දීර්ඝ කාලීන සැලැස්මේ එක් පියවරක් සම්පූර්ණ කරගැනීම වෙනුවෙන් ඉලක්ක සහිතව සකස් කරපු අය වැයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මේ අය වැය සාකච්ඡාව අතරතුර බොහෝ අතුරු කාරණා මතු වුණා. මේ රටේ ඇති වුණු ප්‍රශ්නවලට, ගොඩ නැගී තිබෙන මේ සමහර කාරණාවලට සෘජු හා වක්‍ර විධියට මැදිහත් වුණු, ඒවාට උදව් වුණු සමහර මන්ත්‍රීවරුන් එළියේදී මාධ්‍යවලට කියන්න පටන් ගත්තා, මේ යන විධියට ආණ්ඩුවට තව ටික දවසකින් කෙදිරි ගෑවෙයි කියලා. එහෙම කිව්වේ මීට සති ගණනකට කලින්. මේ හා සමාන කථාවක් ඊයේ පෙරේදාත් ඇහුණා. අපි කවුරුත් ජනමාධ්‍ය හරහා දැක්කා, අර මහෙස්ත්‍රාත් උසාවි සංකීර්ණය ඇතුළේ වෙඩි තැබීම සිද්ධ වුණාට පස්සේ, ඒ වෙඩි තැබීම කළ මිනීමරුවා වෙඩි තියනවෝ, වෙඩි තියනවෝ කියමින් තමයි එතැනින් පලා ගියේ. ඒ වාගේම අපට ජනමාධ්‍ය හරහා ඇහුණු තව දෙයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ඇතැම් මන්ත්‍රීවරුන්ගෙනුත් එළියේදී වචනයක් කියැවෙනවා ඇහුණා, මිනී මරනවෝ, මිනී මරනවෝ කියලා. වෙඩි තියනවෝ, වෙඩි තියනවෝ කියමින් අර සාතකයා පලා යනකොට, ඇතැමෙක් කියන්න පටන් ගත්තා, මිනී මරනවෝ, මිනී මරනවෝ කියලා. ඒ අතර යම් සමානකමක් තිබෙනවා කියලා දැනෙනවා. ඒ අදහසේ සමානකමක් තිබෙනවා. ඒ නිසා සති ගණනකට කලින් "ආණ්ඩුවට කෙදිරි ගෑවෙයි" කියලා කිව්වේ කොහොමද කියා මම කල්පනා කළා. ඒක නිසා අපි ඒ ගැන ඉතා සියුම්ව නිරීක්ෂණය කරන්න ඕනෑකම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් දන්නා විධියට, මේ අය වැය බොහෝ පුළුල් පරාසයක් ගැන හිතමින් තමයි සකස් කර තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ රටේ තිබෙන දැවෙන ප්‍රශ්නයක් තමයි ප්‍රවාහන ප්‍රශ්නය. අපේ රටේ ඈත ගම් නියම්ගම්වල, දුෂ්කර පළාත්වල ජීවත් වන දුප්පත් ජනතාවට මේ ප්‍රවාහන ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මෙම ප්‍රවාහන ගැටලුව විසඳීම ප්‍රධාන වශයෙන් ඉලක්ක කර මෙම අය වැයෙන් රුපියල් බිලියන 483කට ආසන්න මුදලක් වෙන් කර තිබෙනවා. මේක සුළුපටු දෙයක් නොවෙයි. අපේ ආණ්ඩුව නිවැරදිව තේරුම් අරගෙන තිබෙනවා, මේ රටේ පොදු ජනතාව මුහුණ දෙන ගැටලු මොනවාද, ඒවාට ලබා දිය යුතු විසඳුම් මොනවාද, ප්‍රමුඛතාව දිය යුත්තේ මොනවාටද කියලා.

මොකද, මේ රටේ ජනතාවගෙන් සාතිශය බහුතරයක් අපේ පාලනය, අපේ ආර්ථික ප්‍රතිපත්ති, අපේ දැක්ම, අපි සමාජයේ ජනගත කරපු කාරණා අනුමත කර තිබෙනවා. ඒ නිසා අපි මේ ගරු සභාව තුළ වග වෙන්නේ, රජයක්, ආණ්ඩුවක් විධියට අපි වැඩ කරන්නේ, අප කෙරෙහි විශ්වාසය තැබූ මේ රටේ සුවහසක් වූ ජනතාවගේ අභිප්‍රායයන් හා අරමුණු ඉෂ්ට කරන්න මිසක්, මේ රටේ ජනතාව විසින් පරාජයට පත් කරලා කුපීත වෙච්ච විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ගෝරනාඩුවලට සවන් දීලා ආපස්සට හැරෙන්න නොවෙයි. ඒ වෙනුවෙන් අපි පෙනී හිටින්නේ නැහැ. අපි මේ රටේ ජනතාවගේ පොදු අවශ්‍යතා වෙනුවෙන්, ඔවුන්ගේ ජන ජීවිතය උසස් කිරීම වෙනුවෙන් තමයි පෙනී සිටින්නේ. ඒ අරමුණු සහිතව තමයි අපේ අය වැය නිර්මාණය වෙලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි අධ්‍යාපනය. රටක දියුණුව, සංවර්ධනය කියාපාන කැඩපත බවට පත් වෙන්නේ ඒ රටේ අධ්‍යාපනය මොන මට්ටටමේ තිබෙනවාද කියන කරුණ. ඒ සෑම සියලු ක්ෂේත්‍රයකටම මේ අය වැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන තත්ත්වයක් තුළ, ඉදිරි මාස 9 වෙනුවෙන් මේ අය වැය ඉදිරිපත් කරලා ඒ ගැන මේ සභා ගර්භයේ විවාද කරමින් සිටින්නේ, ඒ ඉලක්කගත සංවර්ධනය අත්පත් කර ගැනීමේ අරමුණු සහිතවයි. ආණ්ඩුවෙන් ඉදිරිපත් කරපු මේ අය වැයට ඒ අරමුණු කරා යන්න හැකි වෙයි කියන විශ්වාසය සහිතව මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.48]

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்தில் பேசச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். இந்த வரவு செலவுத்திட்டம் தொடர்பில் ஆளும் தரப்பினர் புகழ்ந்தும் எதிர்த்தரப்பினர் அதற்கு நேர்மாறாகவும் கருத்துகளை முன்வைக்கின்ற நிலையை இங்கு தொடர்ந்தேர்ச்சியாக நாங்கள் பார்க்கிறோம். பல விடயங்களை மாற்றி, எழுபத்தாறு வருட சாபத்தை முடிவுக்குக் கொண்டுவருவதாகச் சொல்லித்தான் இன்று 159 பாராளுமன்ற உறுப்பினர்களோடு நீங்கள் இந்த ஆட்சியை அமைத்திருக்கிறீர்கள். சாதாரண மக்கள், கட்சி பேதங்களுக்கு அப்பால், இன, மத பேதங்களுக்கு அப்பால் பாரிய எதிர்பார்ப்போடுதான் உங்களை ஆட்சி பீடத்தில் அமர்த்தி யிருக்கிறார்கள். அது வடக்காக இருக்கலாம், கிழக்காக இருக் கலாம், மலையகமாக இருக்கலாம் அல்லது தென்பகுதியாக இருக்கலாம், எல்லா மக்களும் எந்தப் பாகுபாடுமில்லாமல் உங்களின்மீது அதிக மதிப்பும் மரியாதையும் நம்பிக்கையும் வைத்து உங்களுக்கு இந்தச் சந்தர்ப்பத்தைத் தந்தார்கள். எனவே, நீங்கள் கூறியவற்றை நிறைவேற்ற வேண்டிய தார்மீகப் பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. நீங்களும் கடந்த கால ஆட்சியாளர்களைப் போல பேசிக்கொண்டும், அவ்வாறான செயற்பாடுகளைச் செய்துகொண்டும் இருக்கக்கூடாது என்பதுதான் மக்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது. எனவே, நீங்கள் அந்த விடயத்தில் கவனமாக இருக்கவேண்டுமென அவர்கள் எதிர்பார்க்கிறார்கள்.

இந்த வருட DCBக்கு ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருக்கும் 10 மில்லியன் ஒதுக்கப்பட்டிருப்பதாக ஜனாதிபதி அவர்களுடைய வரவு செலவுத்திட்ட உரையிலே சொல்லப்பட்டிருந்தது. அந்தந்தப் பகுதிப் பாராளுமன்ற உறுப் பினர்களுடைய கருத்துக்களையும் உள்வாங்கி, அதற்குரிய வேலைகளைச் செய்வீர்கள் என்று நாங்கள் எதிர்பார்க்கிறோம். கடந்த காலங்களிலும் அவ்வாறுதான் நடைபெற்றது. ஒரேயொரு முறைதான் ஆட்சியாளர்கள் வித்தியாசமான பார்வையுடன் அதை வேறுமுறையில் செய்தார்கள். நீங்கள் அதைப் பின்பற்றாமல், 225 பாராளுமன்ற உறுப்பினர் களுடைய கருத்துகளையும் உள்வாங்கி, அதனைச் செயற் படுத்த வேண்டுமென்று முதலில் வேண்டுகோள் விடுக்கிறேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் கல்விக்காக, விவசாயத்துக் காக, சுகாதாரத்துக்காக அதிக நிதியை ஒதுக்கியிருப்பதாகச் சொல்லியிருக்கிறீர்கள். இன்று எமது நாட்டினுடைய பொருளாதாரத்திற்கு முதுகெலும்பாக இருக்கின்ற விவசாயத்தை மேற்கொள்ளுகின்ற விவசாயிகள் நொந்து போயிருக்கிறார்கள். எனவே, அவர்களுடைய விஷயத்திலே கவனஞ்செலுத்தி, அவர்களுடைய நலனுக்கான திட்டங்களை வகுத்து, அவர்களுடைய முன்னேற்றத்திற்காக நல்ல செயற்றிட்டங்களைச் செயற்படுத்துங்கள் என்று நாங்கள் வேண்டுகோள் விடுகின்றோம்.

இந்த வரவு செலவுத்திட்டத்திலே எங்களுடைய முல்லைத்தீவு மாவட்டத்தில் நீண்டகாலத் தேவையாக இருந்த வட்டுவாகல் பால நிர்மாணத்திற்கு 1,000 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கின்றீர்கள். அதற்கு எங்களுடைய மனமார்ந்த நன்றியை நாங்கள் இந்தச் சபையிலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றோம்.

அதேபோல, மன்னார் - புத்தளம் பாதை முக்கியமான ஒரு பாதையாகும். கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் கூட கடந்த காலங்களிலே அந்தப் பகுதிகளுக்கு வந்து போயிருக்கின்றார். வடக்கையும் தெற்கையும் இணைக்கும் அந்தப் பாதையை நீங்கள் புனரமைத்துத் தந்தால் 100 கிலோமீற்றர் தூரப் பிரயாணத்தை மிச்சப்படுத்தலாம். அதிலுள்ள 3 பாலங்கள்தான் உடைந்திருக்கின்றன. அந்தப் பாலங்களைப் புனரமைத்தால் அந்தப் பாதையைப் பயன்படுத்த முடியும்.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Hon. Member, what about a ferry service from Mannar to Puttalam? Is it viable?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
It is viable, but this is also very -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Many people want to restart a ferry service from Mannar to -

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Mannar to Kalpitiya.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Yes.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
That is also a good suggestion. But, I think, we need a Mannar-Puttalam road also. That is 100 kilometres less than the other roads.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
I will ask the RDA Secretary to prepare a report.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Okay. I will also send some details about that.

அந்த வகையிலே, மன்னார் - புத்தளம் பாதையை விரைவாகத் திறந்து மக்கள் பாவனைக்காக விடுகின்ற பொழுது, உற்பத்திப் பொருட்களைக் குறைந்த செலவிலே கொண்டுசெல்ல முடியும்; மக்களின் பயணமும் இலகு வாக்கப்படும் என்பதை நான் இந்த உயர் சபையிலே சொல்லிவைக்க விரும்புகின்றேன்.

சிலாவத்துறையிலே ஒரு கலாசார மண்டபத்தைக் கட்டுவதற்கு நடவடிக்கை எடுத்தோம். அதில் 20 சதவீத வேலை முடிந்திருக்கின்றது. மிகுதி வேலை முடியாத நிலையில்

[ගරු රිෂාඩ් බදියුදීන් මහතා]

කඩන්ත අරසාංකම් 4 වරුඩංකළාක අතනත ඒරිට්ටුම් පාර්ක්කාමල් විට්ටිරුන්තු. තයවුසෙය්තු අතෙයුම් මුටිත්තුත් තාරුංකළ් එන්රු ඉන්තච් චපෙයිලේ උංකළිටම් වේණ්ටුකෝළ් විටුක්කින්රේන්.

වෛත්තියචාලෙකළ් චම්පන්තමාක ඉංකු චිල suggestions චොල්ලප්පට්ටිරුක්කින්රතු; 5-6 වෛත්තියචාලෙකළින් පෙයර් කුරිප්පිටප්පට්ටු, අවර්රෙ මුන්නේර්ර නටවටික්කෙ යෙටුප්පතාකච් චොල්ලප්පට්ටිරුක්කින්රතු. පුත්තළම්, මන්නාර් වෛත්තියචාලෙකළ්, කල්මුනෙ, අෂ්රප් වෛත්තියචාලෙ පෝන්රවෙකූට නිරෙය මක්කළ් පයන්පෙරුකින්ර වෛත්තිය චාලෙකළාක ඉරුක්කින්රන. අවර්රුක්කුත් තේවෙයාන වළංකළෛප් පෙර්රුක්කොටුත්තු අවර්රෙයුම් අපිවිරුත්ති චෙය්යුංකළ් එන්රු ඉන්තච් චපෙයිලේ නාංකළ් කේට්টුක් කොළ්ළ විරුම්පුකිරෝම්.

යුත්තත්තාල් වටක්කු, කිළක්කු පාතික්කප්පට්ටපෝතු, වටක්කිලිරුන්තු ඉටම්පෙයර්ක්කප්පට්ට ඔරිලට්චම් මක්කළුම් පුත්තළත්තුක්කු වන්තමෙයාල් පුත්තළම් වෛත්තියචාලෙ මිකවුම් ඉටප්පර්රාක්කුරෙයෝටුම් වළප් පර්රාක්කුරෙ යෝටුම් කාණප්පටුකිරතු. අතෙ අපිවිරුත්ති චෙය්වතර්කාක නාංකළ් 2018ඉල් CECBඉන් ঊටාක ඔරු තිට්টත්තෙ මුන්මොළින්තෝම්. ආනාල්, ඉතුවරෙ අතු නටෙමුරෙප් පටුත්තප්පටවිල්ලෙ. අතෙයුම් නීංකළ් කවනත්තිලේ එටුත්තුක් කොළ්ළුංකළ් එන්රු උංකළිටත්තිලේ අන්පාක වේණ්ටුකෝළ් විටුකින්රේන්.

අතේපෝල, යාළ්ප්පාණ මාවට්ටත්තිලෙයිරුන්තු ඉටම් පෙයර්න්තු වන්ත මුස්ලිම් මක්කළ් අංකු මීළ්කුටියේරච් චෙන්ර නිලෙයිල්, අවර්කළ් යාරුම් කණ්ටුකොළ්ළාත ඔරු චමූකමාක, කෂ්ටත්තෝටු ඉරුක්කිරාර්කළ්. තර්පෝතු ඔරු private කාණියිලේ කුටියේර්රප්පට්ටු, කොට්ටිල්කළිලේ ඉරුක් කිරාර්කළ්. යාරුම් අවර්කළෛප් පෝය්ප් පාර්ප්පතිල්ලෙ. නාන් උංකළුටෙය NPP පාරාළුමන්ර උරුප්පිනර්කළ් මූවරෙයුම් අළෛත්තුක්කොණ්ටුපෝය් අවර්කළුටෙය නිලෙමෙයෙක් කාණ්පිත්තේන්. කටන්ත අරසාංකත්තිලේ අවර්කළුටෙය ඉටත්තිර්කාන පාතෙ මර්රුම් වාය්ක්කාල්කළෛච් චීරමෙප් පතර්කාක ඔතුක්කීටු චෙය්යප්පට්ට 8 කෝටි රූපාය් පණම් තිරුම්පප් පෙරප්පට්ටිරුක්කින්රතු. කෙළරව අමෙච්චර් රාමලිංකම් චන්තිරචේකර් අවර්කළ් ඉන්ත වරුෂත්තිලේ අතෙ මීළප් පෙර්රුත් තරුවතාකච් චොන්නාර්. කෙළරව අමෙච්චර් අවර්කළ් DCC තලෛවරාකවුම් ඉරුක්කින්රාර්. ආකවේ, අවර් කෙළරව අමෙච්චර් පිමල් රත්නායක්ක අවර්කළෝටුම් මීළ්කුටියේර්රත්තිර්කුප් පොරුප්පාන අමෙච්චරෝටුම් කතෛත්තු, තයවුසෙය්තු අතෙ මීළප් පෙර්රුක්කොටුක්ක වේණ්ටුමෙන්රු නාන් ඉන්ත ඉටත්තිලේ වේණ්ටුකෝළ් විටුක්කින්රේන්.

ඉටම්පෙයර්න්ත මක්කළ් පුත්තළත්තිලුම් තිල්ලෙයටි පෝන්ර ඉටංකළිල් පල මුකාම්කළෛ අමෙත්තු වාழ්න්තාර්කළ්. අන්තප් පකුතිකළිලේ පාතෙකළ් නීණ්ට කාලමාකප් පුනරමෙක්කප් පටාමල් මික මෝචමාන නිලෙයිලේ ඉරුක්කින්රන. අතර්කාක නාන් කටන්ත අරසාංකත්තිලේ කතෛත්තු 15 කෝටි රූපාය් පෙර්රුක් කොටුත්තිරුන්තේන්. පුතිය අරසාංකම් වන්තතෝටු අන්තප් පණත්තෙයුම් මීළප් පෙර්රුවිට්টාර්කළ්. අතෙ අන්ත මක්කළුක්කුප් පෙර්රුක්කොටුංකළ් එන්රු පුතිය DCC Chairman ඉටත්තිල් නාන් වේණ්ටුකෝළ් විටුත්තේන්. තයවුසෙය්තු අතෙ අන්ත මක්කළුක්කුප් පෙර්රුක්කොටුංකළ් එන්රු උංකළිටත් තිලුම් නාන් වේණ්ටුකෝළ් විටුක්කින්රේන්.

இம்முறை வரவு செலவுத்திட்டத்தில் கிழக்கு மாகாணத்துக் கான நிதி ஒதுக்கீடு போதாதென்பதை இங்கு எல்லோரும் ஒரு பெரிய குறையாகச் சொன்னார்கள். அதுபற்றி மக்கள் மத்தியிலே பரவலாகப் பேசப்படுகின்ற ஒரு நிலைப்பாட்டை இன்று சில ஊடகங்கள் முன்னெடுத்துச் செல்கின்றன. கிழக்கு மாகாணமும் வடக்கைப்போல யுத்தத்தால் பாதிக்கப்பட்ட ஒரு பிரதேசம். கிழக்கு மாகாணத்தினுடைய நலனுக்காக இந்திய அரசாங்கம் உதவி செய்வதாக சனாதிபதி அவர்கள் இங்கே பேசும்போது சொன்னார். எனவே, அந்தத் திட்டங்களை அவசர அவசரமாக நடைமுறைப்படுத்துவதற்கான வேலைத் திட்டங்களை முன்னெடுங்கள்!

கிழக்கு மாகாணத்திலே கிட்டங்கிப்பாலம், மாவடிப்பள்ளிப் பாலம் உள்ளிட்ட பல பாலங்கள் நீண்டகாலமாகப் புனரமைக்கப்படாமல் இருக்கின்றன. நீங்கள் புதிதாகத்தான் ஆட்சிக்கு வந்திருந்தாலும், அந்த விஷயத்திலே கவனஞ் செலுத்தி, அரச பணத்தைப் பயன்படுத்த முடியாவிட்டாலும் வெளிநாட்டு உதவிகளைப் பெற்றாவது அந்தப் பாலங்களைப் புனரமைக்க நடவடிக்கை எடுக்குமாறு அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன். ஏனென்றால், இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த புதிதில் மாவடிப்பள்ளிப் பாலத்தில் ஏற்பட்ட வெள்ள அனர்த்தம் காரணமாக மாணவர்கள் உட்பட எட்டு உயிர்கள் பலியாக்கப்பட்ட துயரம் இடம்பெற்றிருந்தது. அந்த இடத்தில் வெள்ள அனர்த்தம் ஏற்படும் ஒவ்வொரு தடவையும் மரணங்கள் ஏற்படுவது வழமையாகிவிட்டது. எனவே, அந்தப் பாலம் அத்தியாவசியமாகப் புனரமைக்கப்பட வேண்டியிருக்கிறது.

அதேபோல, சேனநாயக்க சமுத்திரம் பற்றிய விடயத்தையும் இங்கு பலர் பேசினார்கள். அதை ஆழமாக்க வேண்டிய தேவையிருக்கிறது. ஏனென்றால், அதனால் ஏற்படும் வெள்ளப்பெருக்குக் காரணமாக ஒவ்வொரு போகத்தின்போதும் அரசாங்கம் 30 கோடி ரூபாய், 50 கோடி ரூபாய், 60 கோடி ரூபாய் என்ற வகையில் நஷ்டஈடுகளை விவசாயிகளுக்குக் கொடுக்க வேண்டியிருக்கிறது. உண்மையில் விவசாயிகளுக்கு அதைவிடக் கூடுதலான பணம் நஷ்டமேற்படுகின்றது. எனவே, அதன் ஐம்பது கிலோ மீற்றர் தூரத்தையும் ஒரே தடவையில் செய்ய முடியாவிட்டாலும், ஒவ்வொரு வருடமும் 10 கிலோமீற்றர் வீதமாகத் தோண்டி, இரண்டு sideஇலும் bund அமைப்பதன்மூலம் அந்தச் சமுத்திரத்திலிருந்து வரக்கூடிய நீரை விவசாயத்திற்குப் பயன்படுத்த முடியும். இன்று விவசாயத்தை நாசப்படுத்துகின்ற வகையில் வெளியேற்றப்படுகின்ற அந்த நீரை விவசாயத்திற்கே பயனுள்ளதாக மாற்றம் செய்யமுடியும். அதற்கான வேலைத்திட்டத்தையும் முன்னெடுக்குமாறு இந்த அரசாங்கத்திடம் நாங்கள் வேண்டுகோள் விடுக்கின்றோம்.

வெள்ள நிலைமைகளின்போது, ஒலுவில் universityகூட 2-3 மாதங்களுக்கு மூடப்படுகின்ற நிலையை நாங்கள் பார்க்கிறோம். அதேபோல, மக்களால் பயன்படுத்தப்படுகின்ற பல பாலங்கள், பாதைகள் எல்லாம் சேதப்படுத்தப்பட்டு நாசப்படுத்தப்பட்டிருப்பதை இம்முறை நான் பார்த்தேன். எனவே, இது சம்பந்தமாகவும் நீங்கள் கூடிய கவனஞ்செலுத்தி, அவற்றையும் புனரமைத்துத் தருமாறு வேண்டுகோள் விடுக்கின்றோம்.

அதேபோல, 270 ஆகவிருந்த 'சதொச' நிறுவனங்கள் நான் அமைச்சராகவிருந்தபோது 470ஆக அதிகரிக்கப்பட்டது. ஆனால், அதன்பின் வந்த கோட்டாபய ராஜபக்ஷவின் அரசாங்கம் கிழக்கு மாகாணத்தில் திறக்கப்பட்ட ''சதொச' நிறுவனங்கள் எல்லாவற்றையும் மூடியது. என்மீதுள்ள

கோபத்தினாலோ என்னமோ தெரியவில்லை, சிறுபிள்ளைத் தனமான செயலாக மூடப்பட்ட அந்த 'சதொச' நிறுவனங்கள் இன்னும் திறக்கப்படாமலிருக்கின்றன. இப்பொழுது அரிசி போன்ற சில அத்தியாவசியப் பொருட்களுக்குத் தட்டுப்பாடு வருகின்றபொழுது, 'சதொச'வினூடாக அதனை மக்களுக்கு வழங்குகின்றபோது, கிழக்கு மாகாண மக்கள் அதைப் பெறுவதில் கஷ்டங்களை எதிர்நோக்குகிறார்கள். எனவே, மூடிய அந்த 'சதொச'களை மீண்டும் ஆரம்பித்து, அதன்மூலம் மக்கள் பயனடையச் செய்யுமாறு நான் உங்களிடம் வேண்டுகோள் விடுக்கின்றேன்.

விவசாயத் துறையைப்போல SME sectorஉம் இந்த நாட்டினுடைய முதுகெலும்பாகக் காணப்படுகின்றது. எனவே, அதனையும் பலப்படுத்தவேண்டிய தேவையிருக்கின்றது. இம்முறை வரவு செலவுத்திட்டத்திலே அது தொடர்பான சில விஷயங்கள் சொல்லப்பட்டாலும், அதை நடைமுறைப்படுத்தி, அந்த SME sectorஐ வளப்படுத்துவதனூடக எமது மக்களுடைய பொருளாதாரத்தை மேம்படுத்துங்கள் என்று நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

இந்திய அரசாங்கம் மன்னார் வைத்தியசாலையின் Emergency Unitக்காக 600 மில்லியன் டொலரை ஒதுக்கியதாகக் கேள்விப்படுகின்றோம்; நாங்கள் முன்னர் அதுபற்றி வேண்டுகோளை விடுத்ததன் அடிப்படையில் அந்நிதி வழங்கப்பட்டிருக்கின்றது. மன்னார் வைத்திய சாலையின் Emergency Unit அத்தியாவசிய தேவையாக இருக்கிறது. ஆனால், அதிகாரிகளுடைய காலதாமதத்தினால் அது இன்னமும் நடைமுறைப்படுத்தப்படாமல் இருக்கிறது. எனவே, தயவுசெய்து அதிலே கவனஞ்செலுத்தி, அந்த Emergency Unitஇற்கான வசதியை ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்று நாங்கள் சுகாதார அமைச்சரவர்களிடம் வேண்டுகோள் விடுக்கின்றோம்.

அதேபோல, மன்னாரில் excellence centre for aquaculture க்காக 10 மில்லியன் டொலரை இந்திய அரசாங்கம் தருவதாகச் சொல்லி, அதற்கான நிதியை ஒதுக்கியிருக்கிறது. எனவே, மீன்பிடி அமைச்சு உடனடியாக அதற்கான tenderஐ வழங்கி, அதை நடைமுறைப்படுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், இன்று உலக நாடுகளோடு ஒப்பிடுகின்றபோது, எங்களுடைய நாடு வளமான ஒரு islandஆக இருந்தும் மீனுக்குத் தட்டுப்பாடு ஏற்பட்டு, அதிக விலைகொடுத்து அதனைப் பெறுகின்ற ஒரு நிலை ஏற்பட்டிருக்கிறது. எனவே, நாங்கள் இந்த நவீன திட்டங்களைப் பயன்படுத்துவதனூடாக, எமது நாட்டினுடைய பொருளாதாரம், மீனவர்களுடைய வளம் மற்றும் மீனவர்களுடைய எதிர்காலம் என்பவற்றை முன்னேற்றக் கூடியதாகவிருக்கும் என்பதை உங்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேபோல, இந்த நாட்டை முன்னேற்றக்கூடிய முக்கியமான ஒரு துறையாகச் சுற்றுலாத்துறை விளங்குகிறது. எனக்கு முன்னர் பேசிய உறுப்பினரும் அது சம்பந்தமாகப் பேசினார். 2018இல்தான் அதிக சுற்றுலாப் பயணிகள் இலங்கைக்கு வந்தார்கள். எமது மன்னார் மாவட்டம் சுற்றுலாத் துறைக்கான வளங்களைக் கொண்டிருக்கிறது. ஆனால், அங்கே இருக்கின்ற ஒரு islandஇல் கனிய மண் அகழ்வுக்காகப் பல கம்பனிகளுக்கு அனுமதி கொடுக்கப்பட்டிருக்கின்றது. நீங்கள் அல்ல, உங்களுக்கு முன்பு இருந்தவர்களால் கொடுக்கப்பட்டிருக்கின்ற அந்த அனுமதியினால் இன்று அந்தப் பகுதிகளில் உள்ள வளங்கள் அனைத்தும் சூறையாடப் படுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. எனவே, தயவுசெய்து அந்த விடயத்திலும் கவனம் செலுத்துங்கள்! எதிர்காலத்தில் மன்னார் islandஐ சுற்றுலாத் துறைக்குரியதாக வளப்படுத்த முடியும். இந்தியாவின் இராமேஸ்வரத்துக்கான ferry service தலைமன்னாரினூடாக நடந்தபோது, அந்த மாவட்டம் பொருளாதாரத்தில் மேம்பட்ட ஒரு மாவட்டமாக இருந்தது. அதனால், அந்த மாவட்டத்தில் சுற்றுலாத்துறையை மேம்படுத்துவதற்கான திட்டங்களை முன்னெடுத்து அதனை வளப்படுத்துங்கள் என்று உங்களிடத்தில் வேண்டுகோள் விடுக்கின்றோம்.

அடுத்து, වනජීවී දෙපාර්තමේන්තුව - Forest Department பற்றியும் குறிப்பிட வேண்டும். இங்கிருக்கின்ற எங்களுடைய DCC Chairman உபாலி சமரசிங்க அவர்களுக்கும் இந்தப் பிரச்சினை பற்றி நன்றாகத் தெரியும். ஏனென்றால், வவுனியாவிலோ, மன்னாரிலோ, முல்லைத்தீவிலோ நடைபெறுகின்ற DCC கூட்டங்களிலெல்லாம் அங்கு வனவளத் திணைக்களத்தினால் ஏற்படும் ஆபத்தைப் பற்றித்தான் பேசுகிறார்கள். கடந்த ரணில் விக்கிரமசிங்க அரசாங்கம் 1984ஆம் ஆண்டுக்குப் பிறகு வனவளத் திணைக்களத்துக் குரியதாக gazette பண்ணப்பட்ட எல்லாக் காணிகளையும் விடுவிப்பதாக முடிவெடுத்து, அதற்கான திட்டங்களை வகுத்தும் கடைசியில் அதனைச் செயற்படுத்த முடியாமல் போய்விட்டது. இன்று மேய்ச்சல் தரைக்குக் காணி இல்லை. விவசாயிகள் விவசாயம் செய்வதற்கு வழியில்லாமல் கூலி வேலை செய்கிறார்கள். அரச காணிகளை எல்லாம் வனவளத் திணைக்களத்தினர் கொழும்பில் இருந்துகொண்டு GPSமூலம் நில அளவை செய்து அவை தமக்குரியதென்று gazette பண்ணியிருக்கிறார்கள். மன்னார், பெரியமடு பிரதேசத்தில் உள்ள உறுதிக் காணிகளைக்கூட வனவளத் திணைக் களத்தினர் அடைத்து வைத்திருக்கின்றார்கள். அதேபோல, அம்பாறை, திருகோணமலை, மட்டக்களப்பு மற்றும் வவுனியா, மன்னார் முல்லைத்தீவு, கிளிநொச்சி, யாழ்ப்பாணம் ஆகிய எல்லா இடங்களிலும் இவ்வாறான பிரச்சினை இருக்கின்றது. ஆகவே, தயவுசெய்து நீங்கள் அந்தக் காணிகளை விடுவித்து மக்களுக்குக் கொடுங்கள்! இந்த விடயத்தில் அரசாங்கம் கவனம் செலுத்தி, அதற்கான வேலைத்திட்டத்தை முன்னெடுக்க வேண்டுமென இந்த உயர் சபையிலே கேட்டுக் கொள்கிறேன்.

கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் இங்கு கூறப்படுகின்ற விடயங்களைச் செவிமடுத்துக் கொண்டிருக் கிறார். யுத்தத்தால் பாதிக்கப்பட்ட வட மாகாண அபிவிருத்திக்காக 5,000 மில்லியன் ரூபாயை நீங்கள் ஒதுக்கியிருக்கிறீர்கள்; நாங்கள் அதற்கு நன்றியைத் தெரிவிக் கின்றோம். அதேபோல கிழக்கு மாகாணமும் யுத்தத்தால் மிகவும் பாதிக்கப்பட்ட ஒரு பிரதேசம். அத்தோடு, யுத்தத்தில் நேரடியாகச் சம்பந்தப்படாவிட்டாலும் புத்தளம் மாவட்டம் யுத்த அகதிகளினால் நிறையப் பாதிப்புகளையும் கஷ்டங்களையும் அனுபவித்து வருகின்றது. அந்த மாவட்டம் தொடர்பிலும் கவனம் செலுத்துங்கள் என்று கேட்டு, விடைபெறுகிறேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(*மாண்புமிகு அஜந்த கம்மெத்தெகே*)
(The Hon. Ajantha Gammeddage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ මංගල අය වැය වෙනුවෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ කථාව ඉදිරිපත් කරන්නට කලින් අද දවසේ මේ අය වැය විවාදයට එකතු වුණු විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ අය වැය ගැන දක්වපු අදහස් ගත්තාම ඇත්තටම අපට හිතෙනවා, ඒවා ඉතාම ලාමකයි, බොළඳයි කියලා. ගොඩක් අය පරණ තැනටම හිර වෙලායි මේ අය වැය ගැන කථා කළේ. මේ ආණ්ඩුව සම්බන්ධයෙන් විපක්ෂයේ ඔබතුමන්ලා ඉදිරිපත් කරන විවේචන 2ක් තිබෙනවා. එකක් තමයි, මේ අය වැය පරණ විධියටම ආපු අය වැයක් කියන එක. මේ අය වැය රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ දිගුවක් කියලායි ඔබතුමන්ලා සඳහන් කරන්න හදන්නේ. එහෙම තර්කයක් ගොඩ නහන්න උත්සාහ කරනවා. හැබැයි අපි දන්නවා, මේ අය වැය අලුත් විධියට හිතන, අලුත් විධියට අත්දැකීම් එකතු කරගත් ආණ්ඩුවක අය වැයක් කියන එක. අපේ ගරු ජනාධිපතිතුමා -අනුර දිසානායක සහෝදරයා- මේ අය වැය ඉදිරිපත් කරන්න කලින් දසවැනි පාර්ලිමේන්තුවේ මංගල සැසිවාරය අමතා කථාවක් කළා. ඒ කථාවේදී එතුමා කිව්වා, රටේ ආර්ථිකය මොන වාගේ දිශාවකටද ගෙනියන්න ඕනෑ කියලා. මම ඒ කථාවෙන් කොටසක් උපුටා දක්වන්නම්.

ඒ අනුව, 2024.11.21 දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 33හි ගරු ජනාධිපතිතුමා මෙසේ සඳහන් කරනවා:

> "...මේ ආණ්ඩුව අපට ලැබෙන කොට, අපි විපක්ෂයේ දේශපාලනයේ නිරත වෙමින් සිටියා. අපේ ආර්ථිකයේ තිබෙන ගැඹුරේ ප්‍රමාණය අපි දැන ගෙන හිටියා. අපේ ආර්ථිකය විශාල ගැඹුරක සහ විශාල ප්‍රමාණාත්මක පැතිරීමක හිර වී තිබෙන ආර්ථිකයක්. ඉතාම සියුම් නූයකින් එල්ලා තිබෙන ආර්ථිකයක් අපි හමුවේ තිබෙන්නේ. මේ ආර්ථිකයට විශාල කම්පන ඔරොත්තු දෙන්නේ නැහැ. මේ ආර්ථිකයට විශාල හැරවුම් ඔරොත්තු දෙන්නේ නැහැ. ඒ නිසා බලය ගත් විගස අපේ අපේක්ෂාව බවට පත් වුණේ, ආර්ථිකයේ ස්ථාවරත්වය සහ ආර්ථිකය කෙරෙහි ඊට අදාළ කණ්ඩායම්වල විශ්වාසය තහවුරු කිරීමයි. ..."

ඉතින්, අපි ඔබට කියන්නේ ඒකයි. අපි මේ තත්ත්වය හරියට තේරුම් අරගෙනයි හිටියේ. ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකයට කරපු විනාශය අපි තේරුම් අරගෙනයි හිටියේ. නිදහසින් පසුව අවුරුදු 76ක් මේ රට පාලනය කරපු ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකයට කරපු විනාශය ගැන අපි හරියට දැනගෙන හිටියා. ඒ නිසා තමයි මේ ආර්ථිකය සියුම්ව වෙනස් කරන්න අපි කටයුතු කරන්නේ. භය වෙන්න එපා, අපි මේ ආර්ථිකය නිවැරදිව හදනවා කියන දැක්ම සහිත අය වැයක් තමයි ඔබතුමන්ලාට, මේ රටට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, මේක රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ අය වැයක් නොවෙයි කියලා. මෙය, අලුත් විධියට හිතන, මේ සමාජය අලුත් දිශාවකට ගෙනියන්න කැස කවන අය වැයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අය වැය ඇතුළේ ගජ මිතුරන්ට සහන දුන්නේ නැහැ. පසුගිය කාලයේ ඉදිරිපත් කළ අය වැය අපි දැක තිබෙනවා. ඒ හැම අය වැයක් තුළින්ම ගජ මිතුරන්ට සහන දීලා, ගජ මිතුරන් පෝෂණය කරපු හැටි අපි දැක්කා. හැබැයි, මේ අය වැය ඇතුළේ එහෙම ඒවා නැහැ. අපි මේ රටේ අහිංසක, දුප්පත් ගමේ ජනතාව දක්වා ආර්ථිකය ගෙනියන්න පුළුවන් විධියට මේ අය වැයෙන් හරියට මුදල් කළමනාකරණය කරලා තිබෙනවා. ඒ වාගේම අපි නිවැරදිව රාජ්‍ය වියදම කළමනාකරණය කරලා තිබෙනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කථාවක් තිබෙනවා. ඒ තමයි ගම්, නගර කියන මේ රටේ හතර කොනේ ඉඳපු හැම මනුෂ්‍යයෙක්ම අපිත් එක්ක අත්වැල් බැඳගෙන අපි බලයට ගෙන එන්න මහන්සි වුණා, දායකත්වය දුන්නා, මැදිහත් වුණා, ඡන්දය දුන්නා කියන එක. එම නිසා ඒ හැම කෙනෙක් ගැනම හිතපු අය වැයක් තමයි අපි මෙවර ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ, ලංකා ඉතිහාසයේ කවදාවත් නැති විධියට සෞඛ්‍යය සඳහා අතිවිශාල මුදලක් අපි මෙවර වෙන් කර තිබෙන බව. සුවපත් සමාජයක් සඳහා, ජනතාවට නිරෝගී දිවිපෙවෙතක් ගත කිරීම සඳහා රුපියල් බිලියන 604ක් අපි මෙවර සෞඛ්‍යයට වෙන් කර තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් මෙතරම් මුදලක් සෞඛ්‍යයට වෙන් කරලා නැහැ. අපි ඒ තරම් මුදලක් සෞඛ්‍යයට වෙන් කරන්නේ ඇයි? අපි දන්නවා, ගම්වල ජීවත් වන අහිංසක ජනතාව අද කුරුඳු ගේනත් එක්ක, තේ වත්තත් එක්ක බද්ධ වෙලා, ගැටගැහිලා, ඒවාත් එක්ක පොර බදලා, මේ ආර්ථිකයට ලොකු දායකත්වයක් සපයන බව. ඔවුන්ගේ සෞඛ්‍යය තත්ත්වය ගත්තාම, ඉතා පහළ මට්ටමක තිබෙන්නේ. ඔවුන්ට යන්න හරියට ඉස්පිරිතාලයක් නැහැ. හරියට බෙහෙත් ටිකක් ගන්න නැහැ. ඒ වාගේම ශල්‍යකර්මයක් කරගන්න ගියොත් අවුරුදු ගානක් පෝලිමේ ඉන්න ඕනෑ. අන්න ඒවා නවත්වන්න ඕනෑ. ඒවා නවත්වන්න නම්, සෞඛ්‍යය සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න ඕනෑ. අපි එහෙම සොයා බලා තමයි, මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ. අපි දන්නවා, විපක්ෂයේ මහත්වරුන්ට මේවා දැක්කාම ගොඩක් රිදෙන බව. ඒ රිදෙන්නේ ඇයි? ගොඩක් මහත්වරුන් තමන් ළඟ හැන්ද තිබෙන වෙලාවේ තමන්ට බෙදා ගත්තා. එහෙම ඉතිහාසයක් තමයි අපි දැක්කේ. ඒවා මේ අය වැයෙන් වෙනස් කරලා තිබෙනවා.

අපි දන්නවා, සාමාන්‍යයෙන් ඈත පිටිසර ගම්වල දරුවන් අධ්‍යාපනයට වැඩි නැඹුරුතාවක් දක්වන බව. හැබැයි, ඒ දෙමව්පියන් තමන්ගේ දරුවාට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න බොහෝ වෙහෙස මහන්සි වෙනවා. ඔවුන් කුරුඳු ටික විකුණලා, තේ ටික විකුණලා ලැබෙන ආදායමෙන් වැඩි කොටසක් වෙන් කරන්නේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහායි. ඒ වාගේම ගමේ තිබෙන පාසලේ හරියට ඩෙස්ක් නැහැ, පුටු නැහැ, ගොඩනැඟිලි නැහැ. එම පාසල තුළ නිසි ලෙස අධ්‍යාපනය ලබන්න අවශ්‍ය පහසුකම් දරුවාට නැහැ. අපි දන්නවා, ඒවා වෙනස් කරන්න ඕනෑය කියලා. ඒවා වෙනස් කිරීමේ අරමුණින් අපි අධ්‍යාපනය සඳහා විශාල මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 619ක විශාල මුදලක් අපි මෙවර වෙන් කරලා තිබෙනවා. මේ අය වැය ප්‍රධාන වශයෙන් සෞඛ්‍යයත්, අධ්‍යාපනයත් ඉලක්ක කර ගත් අය වැයක්. මේ රටේ සමස්ත සමාජය වෙනස් කරන්න නම්, නිරෝගී ජනතාවක්, ඒ වාගේම බුද්ධිමත් ජන කණ්ඩායමක් බිහි වෙන්න ඕනෑ කියන පරමාර්ථයේ ඉඳගෙන, අපි මේ අය වැය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, මේ අය වැයේ ප්‍රතිලාභ ගමට ගියාට පස්සේ ගමේ ජනතාවට එය හොඳින් දැනෙනවා කියලා.

පසුගිය දිනවල මේ පාර්ලිමේන්තුවේදී අය වැය විවාදය අහගෙන ඉන්නකොට, මේ අය වැය මිනිස්සු අතරට, ජනතාව අතරට ගියේ නැති අය වැයක්ද කියලා අපට හිතුණා. ඊයේ නිවාඩු දවසක් නිසා, අපි ගම්වල ටිකක් ඇවිද්දා. මම මාතර දිස්ත්‍රික්කයේ මෙහා කොනේ ඉඳලා එහා කොනේ තිබෙන දෙනියාය දක්වා ගිහිල්ලා, ඒ ගම්වල ඇවිදලා ජනතාව එක්ක සාකච්ඡා කළා, කථා කළා. එහෙම කථා කරනකොට ඒ හැම තැනකම සිටින ජනතාව අපට කිව්වේ, කවදාවත් මෙහෙම අය වැයක් ගැන අහන්න ලැබුණේ නැහැ, මේ අය වැයෙන් ඔවුන්ට මේච්චර සහන ලැබෙයි කියලා ඔවුන් හිතුවේ නැහැ කියලායි. ඒ මතය තමයි ජනතාවට තිබෙන්නේ. ඒ නිසා අපි කියනවා, මේ අය වැය මේ රටේ ඈත

එපිට දුක් විඳින ජනතාව වෙනුවෙන් හඳපු අය වැයක් බව. මේ අය වැය නිර්මාණය කිරීම සම්බන්ධයෙන්, මෙවැනි දැක්මක් සහිත අය වැයක් ගොඩනැඟීම සම්බන්ධයෙන්, මුදල් ඇමතිවරයා විධියට ජනාධිපතිතුමාට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

විපක්ෂය ඊළඟට එල්ල කළ ලොකුම චෝදනාව තමයි, මේ ආණ්ඩුව අසත්‍ය කියපු ආණ්ඩුවක් කියන එක. අපි අසත්‍ය කියලා කවදාවත් බලය ගත්තේ නැහැ. අපි මේ රටේ ජනතාවට ඉදිරිපත් කළා, "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් අපි ඉදිරිපත් කළේ අපේ දැක්ම. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට පිටින් ගිය කිසිදු කාරණයක් මේ අය වැයේ අන්තර්ගත වෙන්නේ නැහැ.

අපි ඒක නිවැරදිව මේ රටේ ජනතාවට කියලා තිබෙනවා. මැතිවරණ කාලයේ හැම ගමකටම ගිහිල්ලා, රැස්වීම් පවත්වලා අපි මේ ජනතාවට කිව්වේ මෙන්න මේ කාරණා ටික තමයි. ඒ නිසා අපි දන්නවා, මේ රට වෙනස් කරන්න ඕනෑ කියලා. ඒ වෙනස් කිරීමට අදාළ කර්තව්‍යයන් අපි හරියට තේරුම් අරගෙන ඉදිරිපත් කරපු අය වැයක්, මේ අය වැය. ඒ නිසා බොහෝදෙනා ඒ ගැන ගොඩක් විවේචන කරාවි. හැබැයි, ඒ විවේචන ඇතුළේ අපි දන්නවා, සමහර අය සාධනීය විවේචන කළ බව. ඒ සියලු මහත්වරුන්ට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අවසාන වශයෙන් මා කියනවා, මේ අය වැය අපි යන දිගු ගමනක අඩිතාලමක් විතරයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චීන දාර්ශනිකයෙක් හිටියා, "ලාඔට්සු" කියලා. ඒ දාර්ශනිකයා කියා තිබෙනවා, "සැතපුම් දහස් ගණනක ගමනක් ආරම්භ කරන්නේ එක් කුඩා පා සටහනකින්" කියලා. ඒ වාගේම අප යන මේ ගමන ආරම්භක අවස්ථාවක් විතරයි, ඒ සැතපුම් දහස් ගණනක ගමන ඉතා තීරණාත්මකව, ඉලක්කය දක්වා යමින් ඉතා සාර්ථකව නිමා කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මේ අවස්ථාව ලබා දුන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(*மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்*)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.13]

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(*மாண்புமிகு மஞ்ஜுல சுரவீர ஆரச்சி*)
(The Hon. Manjula Suraweera Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැය දෙවැනිවර කියවීමේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම ගැන මම සතුටට පත් වනවා. රටේ ජනතාව විශාල වශයෙන් බලාපොරොත්තු ගොන්නක් තියාගෙන තමයි අය වැය විවාදය සාවධානව අහගෙන ඉන්නේ; බලාගෙන ඉන්නේ. ආණ්ඩු පක්ෂය වාගේම විපක්ෂය එකතු වෙලා සංවාද-විවාද කරලා ජනතාවට ලැබෙන පංගුව මොකක්ද කියන එක පිළිබඳව තමයි ජනතාව කිරා මැන බලමින් ඉන්නේ. මේ මොහොත වනවිටත් විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ පීඩිත ජනතාව මහත් දුක් දෝමනස්සයන් විඳිමින් ජාතික ආර්ථිකයට දායක වෙනවා කියන එක අපි දන්නවා. කඳු නැඟලා, පල්ලම් බැහැලා, රොටිය කමින්, සොබා දහමේ දැඩි දුෂ්කරතා විඳිමින් දැඩි පීඩනයන් මැද ඔවුන් දිනකට අමු තේ දළු කිලෝග්‍රෑම් ලක්ෂ පහමාරක් නෙළනවා. හැන්දෑවට නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිබෙන තේ ෆැක්ටරි 110ට ගිහිල්ලා, ඊළඟ දවසේ උදේ වනකොට වියළි තේ කුඩු කිලෝග්‍රෑම් 110,000ක් නිෂ්පාදනය කරන ජනතාවක් අපේ රටේ ඉන්නවා. ඒ වාගේම දිනකට දියර කිරි ලීටර් 185,000ක් දොවලා, බවුසර්වලට පටවලා, කොළඹට, කොත්මලේට, අඹේවෙලට යවලා ඊළඟ දවසේ උදේ වනකොට වීස්, යෝගට්, බටර්, කිරි පිටි නිෂ්පාදනය කරමින් ජාතික ආර්ථිකයේ පංගුවකට දායක වන ජන කණ්ඩායමක් තමයි නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉන්නේ. ඒ වාගේම අපි දන්නවා, උඩරට එළවලු තිබෙන බව. නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වාර්ෂිකව කැරට් මෙට්‍රික් ටොන් 95,000ක් විතර ගලවනවා. කොහේ හෝ තැනක කොත්තු රොටියක්, ෆ්‍රයිඩ් රයිස් එකක් හදනවා නම් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කැරට් අලයක් ඒ සඳහා යොදා ගන්නවා. ආර්ථිකයට දායක වන, විශාල ශ්‍රම මෙහෙයුමක් ලබා දෙන වැඩ බිමක් තමයි නුවරඑළිය දිස්ත්‍රික්කය කියන්නේ; ඒ වාගේම එය දැඩි සීතලටත්, සොබා දහමේ පීඩාවන්ටත් යටත් වෙමින් දෛනිකව වෙහෙසෙන මිනිස්සු ටිකක් ඉන්න දිස්ත්‍රික්කයක්. ඒ වාගේම ඒ දිස්ත්‍රික්කයේ සියලුදෙනා සිංහල, දෙමළ, මුස්ලිම් භේදයකින් තොරව මහන්සි වෙමින් ආර්ථිකයට දායක වෙනවා. අපි දන්නවා, ලීක්ස්, බෝංචි හැදෙන්නේ නුවරඑළියේ කියලා. රටේ අර්තාපල් අවශ්‍යතාවෙන් තුනෙන් එකක් -මෙට්‍රික් ටොන් 50,000ක්- වාර්ෂිකව ගලවලා දෙන දිස්ත්‍රික්කයක් තමයි නුවරඑළිය දිස්ත්‍රික්කය. විශේෂයෙන් කුළු බඩු ගත්තොත්, ඒත් මේ වාගේමයි. ඒ දිස්ත්‍රික්කයේ ජනතාව වසරකට ගම්මිරිස් කිලෝග්‍රෑම් ලක්ෂ හතරක්, හතරහමාරක් ඔවුන්ගේ ඇඟිලි තුඩුවලින් මලුවලට පටවලා ජාතික ආර්ථිකයට දායක වෙනවා. ඒ වාගේම කරාබු නැටි කිලෝග්‍රෑම් 150,000ක් විතර කඩනවා. මේ වාගේ නොවිඳිනා දුක් විඳිමින් ජාතික ආර්ථිකයට දායක වන ජනතාව බලාගෙන ඉන්නවා, මෙවර අය වැය හරහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවට වාගේම රටේ ජනතාවට මොනවාද ලැබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය ඉතිහාසය පුරා මහත් පුරාජේරුවෙන් කථා කරන, ඓතිහාසික ශ්‍රී විභූතිය ලංකාවට ගෙනෙනවා කියලා පාරම්බාන විපක්ෂයේ මහත්වරු නුවරඑළිය දිස්ත්‍රික්කයට අත්කර දීලා තිබෙන ඉරණම අපි භාවිතාවෙන් අත්විඳලා තිබෙනවා. අපි ඒ පීඩාවේ ගොදුරු බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පාසල් 549ක් තිබෙනවා. මේ වනවිට මධ්‍යම පළාතට ගුරුවරු 6,200ක් අඩුයි. ඒ පාසල් අතරත් විශේෂයෙන්ම 1AB පාසල්, උසස් පෙළ ගණිත අංශයෙන්, විද්‍යා අංශයෙන් ඉගෙන ගන්න පුළුවන් ජාතික පාසල් තිබෙන්නේ 8ක් බව අපි දන්නවා. පාසල් 550කින් එවැනි පාසල් 8යි තිබෙන්නේ. පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වෙන 1AB පාසල් 28ක් තිබෙනවා. ඒවා ජාතික පාසල් නොවෙයි. ඒවායේ අදාළ පහසුකම් නැහැ. අනෙකුත් පාසල් සියල්ලම ගත්තාම, නගරයට ඉතා දුරින් තිබෙන මූලික අවශ්‍යතාවත් සම්පූර්ණ කර ගන්න බැරි පාසල් පද්ධතියක් ඉතුරු කරලා තිබෙනවා. දරුවෝ 160,000කට ආසන්න ප්‍රමාණයකට ඉගෙන ගන්න නුවරඑළිය දිස්ත්‍රික්කයට පාසල් පද්ධතියක් නැහැ. ඒ නිසා ගුරුවරු නැති, විදුහල්පති හිටියොත් විද්‍යා ගුරුවරයා නැති, විද්‍යා ගුරුවරයා හිටියොත් lab එකක් නැති, lab එකක් තිබුණොත් ක්‍රීඩා පිටියක් නැති, මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගන්න අවශ්‍ය කරන පානීය ජලය ටිකවත් නැති පාසල් පද්ධතියක් ඉතුරු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෝහල් 48ක් තිබෙනවා. මේ රෝහල් 48 ඇතුළේ දරු ප්‍රසූතියක් කරන්න පහසුකම් තිබෙන රෝහල් තිබෙන්නේ 3යි. නමුත් ඉතිහාසය ගැන කථා කරනවා. අපි කෙරුවා කියලා ලොකුවට පම්පෝරි ගහනවා. දරු ප්‍රසූතියක් සඳහා සිසේරියන් සැත්කමක් කරන්න පුළුවන් රෝහල් තුනයි නම් තිබෙන්නේ, මොනවාද කරලා තිබෙන්නේ? රෝහල් පද්ධතිය තුළ සිටින වෛද්‍යවරු ප්‍රමාණය 250කට, 300කට අඩුයි. ඒවායේ දියුණු උපකරණ නැහැ. ඒ වාගේම ambulance එකක් නැහැ. මේ වාගේ තත්ත්වයක තමයි රෝහල් පද්ධතිය තිබෙන්නේ.

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

අනෙක් පැත්තෙන් ගත්තොත්, ජාතික ආර්ථිකයට දායක වෙන මිනිස්සු සිටින දිස්ත්‍රික්කයක පැල්පත්වාසීන්, මුඩුක්කුවාසීන්, ලැයිම් කාමරවල සිටින අය ලක්ෂයකට වඩා වැඩියි. හද්දා පිටිසර ගම්මානවල කඳු මුදුන්හි ඉටි කොළ ඔතා ගත්ත, ගෝනි පඩංගු එළා ගත්ත, ටකරන් කැලි වට කර ගත්ත, පිටලෑලි කැලිවලින් වට කර ගත්ත නිවාස පද්ධතියක් තිබෙනවා. මෙවාට විසඳුම් ලැබුණේ නැහැ.

අනෙක් පැත්තෙන් ගත්තොත්, මහා මාර්ග පද්ධතියම අබලන් වෙලා තිබෙන්නේ. RDA එකේ වේවා, PRDA එකේ වේවා, පළාත් පාලන ආයතන 12 තුළ වේවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ අපට තවදුරටත් හදන්න තිබෙන පාරවල් ප්‍රමාණය ගත්තොත් එය දළ වශයෙන් කිලෝමීටර 3,000කට වැඩියි. ගලින් ගලට පැන-පැන යන, ත්‍රී වීලරයක්වත් යන්න බැරි පාරවල් කිලෝමීටර 2,500කට වැඩිය හදන්න තිබෙනවා. ඉතිහාසය ගැන කථා කරනවා. ඉතිහාසයේ මේ අඳුරු පීඩාව වෙනස් කරන්න තමයි ජාතික ජන බලවේගය - ජනතා විමුක්ති පෙරමුණ - නියෝජනය කරමින් අපි දේශපාලනය කරලා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. එහෙම නැතුව සැප ගන්න නොවෙයි. අපි ඒ දේශපාලනය නිමා කරලා තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. නිෂ්පාදනයට දායක වෙන ආර්ථිකයේ පංගුව ජනතාවට බෙදා දීමේ අරමුණින් පමණයි අපි මේ දේශපාලනය කරන්නේ. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙනුයි අපි දේශපාලනය කරන්නේ. කොන්ත්‍රාත් කරන, හොරකම් කරන, යටිමඩි ගහන, ගේම් ගහන දේශපාලනයක් නොවෙයි, අපි කරන්නේ. ඒ නිසා මේ අය වැය අපට වැදගත්. ලංකා ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක්, දේශපාලන පරිවර්තනයක් සඳහා ඉදිරිපත් කරපු අය වැය ලේඛනයක්, මෙක. 2025 අය වැය තුළ තිබෙන විශේෂයෙන්ම සාධනීය ලක්ෂණ විශාල ප්‍රමාණයක් පිළිබඳව කියන්න තිබෙනවා. විශේෂයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය කියන කාරණා දෙක මූලික වශයෙන් ගත්තොත්, 2021දී අධ්‍යාපනය සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 165යි; 2022දී රුපියල් බිලියන 193යි; 2023දී රුපියල් බිලියන 232යි; 2024දී රුපියල් බිලියන 237යි. 2025 මේ ආරම්භක අය වැයෙන් අපි රටේ ජනතාවට නිවැරැදි මාවත පෙන්වලා තිබෙනවා; අපි ඔවුන්ට වඩා වෙනස් කියලා පෙන්වලා තිබෙනවා. ඒ අනුව අපි අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා, රුපියල් බිලියන 619ක්. ඕක තමයි වෙනස.

ඒ වාගේමයි සෞඛ්‍ය ක්ෂේත්‍රය. දැඩි පීඩාවකට පත් වෙච්ච දිස්ත්‍රික්කයක ජනතාව විධියට අපි සතුටු වෙනවා, මෙවර අය වැය සම්බන්ධයෙන්. 2021දී රුපියල් බිලියන 176ක් සෞඛ්‍ය ක්ෂේත්‍රයට වෙන් කරලා තිබෙනවා; 2022දී රුපියල් බිලියන 168යි; 2023දී රුපියල් බිලියන 322යි; 2024දී රුපියල් බිලියන 410යි. ජාතික ජන බලවේගයේ පළමු අය වැය තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා රුපියල් බිලියන 604ක් ජනතාව වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. ඒ ප්‍රවේශයම ඇති, අපි යන මේ මාවත පැහැදිලි කරලා දෙන්න. ඒ නිසා ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට මේ අය වැය ඇතුළේ අපේ හැරවුම් ලක්ෂ්‍යය මනාව පෙන්නුම් කරන තවත් අවස්ථා ගොඩක් තිබෙනවා. නමුත් මේ මොහොතේ දීර්ඝ කථාවක් කරන්න වෙලාවක් නැහැ.

සුවපත් සමාජයක් වෙනුවෙන් රුපියල් බිලියන 604ක් වෙන්කර තිබෙනවා. ඒ ඇතුළේ ගර්භිණී මව්වරු 265,000ක් වෙනුවෙන් පෝෂණ මල්ලක් දීම සඳහා රුපියල් බිලියන 7.5ක් වෙන්කරලා තිබෙනවා. රටේ ජනතාවගේ පෝෂණ තත්ත්වය වැදගත්. නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තොත්, මන්දපෝෂණයෙන් යුත් ළමයි ඉන්නවා, සියයට 50කට ආසන්න ප්‍රමාණයක්. රැස්වීමක විනාඩි 5ක් හිටගෙන ඉන්න බැහැ; ක්ලාන්තය හැදිලා වැටෙන ළමයින් ඉන්නවා. ඔවුන් වෙනුවෙන් මූලික පදනම දාන්න නම්, නීරෝගී ජාතියක් හදන්න නම් දෙමව්පියන්ට පෝෂණීය වටපිටාවක් හදන්න ඕනෑ. අන්න, ආණ්ඩුව ඒක තේරුම් අරගෙන තිබෙනවා. ඒ නිසා ගර්භිණී මව්වරු වෙනුවෙන් රුපියල් බිලියන 7.5ක් වෙන්කරලා තිබෙනවා. ත්‍රිපෝෂ වැඩසටහන සඳහා රුපියල් බිලියන 5ක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේමයි, අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව විශේෂ කාරණා ටිකක් තිබෙනවා මට මතු කරගන්න. එකක් තමයි, පාසල් දරුවන්ගේ පෝෂණ වැඩසටහන සඳහා රුපියල් බිලියන 32.1ක් වෙන්කරලා තිබෙනවා. ඒක ඉතා වැදගත්. ඒ වාගේමයි, පාසල් දරුවන්ගේ නිල ඇඳුම් සඳහා රුපියල් බිලියන 6.4ක් වෙන්කරලා තිබෙනවා. මිරිවැඩි සහලක් මිලදී ගන්න බැරි; සපත්තු කුට්ටමක් මිලදී ගන්න බැරි දුෂ්කරතා සහිත දරුවෝ ඉන්නවා. අපේ පාසල් පද්ධතිය ඇතුළේ ඒ වාගේ දරුවෝ ටිකක් තමයි ඉන්නේ. අන්න ඒ දරුවෝ වෙනුවෙන් මේ අය වැය හරහා රුපියල් බිලියන 2.5ක් වෙන්කරලා දෙන්න සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම, පෙර පාසල් දරුවන්ට උදේ ආහාරය ලබාදීම සඳහා රුපියල් බිලියන 3.2ක් වෙන්කරලා තිබෙනවා.

ඊළඟට ප්‍රවාහන සේවය ගත්තොත්, ගුණාත්මක ප්‍රවාහන සේවයක්, වගකීමසහගත ප්‍රවාහන සේවයක් වෙනුවෙන් මෙම අය වැයෙන් රුපියල් බිලියන 483ක් වෙන්කරලා තිබෙනවා. එහිදීත් විශේෂ කාරණයක් තිබෙනවා. විශේෂයෙන් ආර්ථික වශයෙන් ලාභදායී නොවන මාර්ගවල කිලෝමීටර 275,000ක් පමණ දෛනිකව ගමනාගමනය සඳහා ලංගම බස්රථ 1,500ක් වෙනුවෙන් රුපියල් බිලියන 2ක් වෙන්කරලා තිබෙනවා. අන්න, ගමේ මිනිස්සු ගැන හිතපු විධිය. හැන්දෑ වෙනකොට ගමට යන්න බස් එකක් නැහැ. ත්‍රී වීලර් එකක් අරගෙන තමයි යන්න වෙන්නේ. ඒ ගැන කල්පනා කරලා තිබෙනවා.

ඒ වාගේමයි, "අස්වැසුම" වෙනුවෙන් රුපියල් බිලියන 232.5ක් වෙන්කරලා තිබෙනවා. රටේ විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්න විසඳුවේ නැහැ කියලා කියනවා. විශ්‍රාමිකයන් වෙනුවෙනුත් රුපියල් බිලියන 311.7ක් වෙන්කරන්න සමත් වෙලා තිබෙනවා. 2016 ඉඳලා බලපාපු ප්‍රශ්න වෙනුවෙන් උත්තර හොයන්න උත්සාහයක් අරගෙන තිබෙනවා. හොඳම දේ දෙන්න බැරි වෙලා තිබෙනවා කියලා අපි දන්නවා. ඒක ඇත්ත.

විශේෂයෙන්ම වැන්දඹු හා අනත්දරු දායක මුදල් වෙනුවෙන් රුපියල් බිලියන 77ක මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න සමත් වෙලා තිබෙනවා. මිය ගිය හා තුවාල ලැබූ සොල්දාදුවන්ට වන්දි වශයෙන් රුපියල් බිලියන 49ක් වෙන්කර තිබෙනවා. මට තව ප්‍රමාණවත් කාලයක් ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙලාව කොච්චර අවශ්‍යයිද?

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜுல சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
මට විනාඩි 5ක් වාගේ කාලයක් දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට විනාඩි 5ක් දෙන්න. අපේ සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය ඇමතිතුමාගේ කාලය ඉතුරු වෙනවා. එතුමාගේ කාලයෙන් වෙලාව ලබා දෙන්න.

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(மாண்புமிகு மஞ்ஜூல சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

මෙතුමන්ලා රණ විරුවන් ගැන කථා කළා. සොල්දාදුවන් ගැන කථා කරමින් හිටියා. ඔන්න, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පළමුවැනි අය වැයෙන් මේ රට බේරා ගැනීම වෙනුවෙන් කටයුතු කළ සොල්දාදුවන් වෙනුවෙන් රුපියල් බිලියන 49ක් වෙන්කරලා තිබෙනවා. කියනවා, මොකුත් කළේ නැහැ ලු.

ඒ අතරේ, 1971 කාලය ගැන කථා කරනවා. ඔය මහත්තුරුන්ගෙන් මම අහන්න කැමැතියි, 1971දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය රෝහණ විජේවීර සහෝදරයාට දාපු නඩුව මොකක්ද, චෝදනාව මොකක්ද කියලා. දන්නේ නැත්නම් අහගන්න ඕනෑ. බ්‍රිතාන්‍ය රැජිනගේ ආණ්ඩුව සාපරාධී ලෙස බිය වැද්දීම හා පෙරළා දැමීමට කුමන්ත්‍රණය කිරීම වෙනුවෙන් තමයි විජේවීර සහෝදරයාට එරෙහිව නඩු දාලා තිබෙන්නේ. තවමත් ඒක අනුමත කරනවා, මහ ලොකුවට.

ඒ වාගේම, ඩිජිටල්කරණය හරහා සමාජ පරිවර්තනයක් වෙනුවෙන් රුපියල් බිලියන 21ක් වෙන් කරලා තිබෙනවා. ඒ ගැන අපි සතුටු වෙනවා. මේ හොරකම, නාස්තිය, දූෂණය, වංචාවත් එක්ක ගැට ගැහිලා තිබෙන රාජ්‍ය සේවය වාගේම මේ ශ්‍රී ලංකාව නැවත ස්ථාපිත කිරීමේ නව ආරම්භයක් සඳහා ඩිජිටල්කරණය වෙනුවෙන් රුපියල් බිලියන 21ක් වෙන් කිරීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා.

ඒක අපි අනිවාර්යයෙන්ම බලාපොරොත්තු වෙච්ච වෙනසක්. ඒ වාගේම 2025 වර්ෂය සඳහා ප්‍රධාන උප අංශ 7ක් -මාර්ග, පාලම්, වාරිමාර්ග, පාසල්, රෝහල්, දුම්රිය වාගේ අංශ 7ක් - නඩත්තුව, ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම් වෙනුවෙන් රුපියල් බිලියන 190ක් වෙන් කර තිබෙනවා. හැබැයි, මොකුත් වෙන් කරලා නැහැ කියනවා. නමුත්, රුපියල් බිලියන 190ක් වෙන් කර තිබෙනවා. අපි දන්නවා, ඒ ප්‍රමාණය මදි කියලා.

කුමාරතුංග මුනිදාස ප්‍රාඥයාගේ -වියතාගේ- වැදගත් ප්‍රකාශයක් අපි අහලා තිබෙනවා. ඒ තමයි, "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනඟී" කියන එක. අයාලේ ගිය රටකට අලුත් මාවතක් දෙන්න ඕනෑ නිසා අපි මේ අය වැයෙන් වෙනසක් කර තිබෙනවා. ඒ තමයි, පර්යේෂණ සහ සංවර්ධනය වෙනුවෙන් රුපියල් බිලියන 20.90ක් වෙන් කර තිබෙනවා. අලුත් පර්යේෂණ තුළින් තමයි මේ රට ඉස්සරහට යන්නේ. පර්යේෂණ බිඳ වටිටලා ඒවාට ප්‍රතිපාදන වෙන් නොකර, රටේ ජනතාවගෙන් භාණ්ඩාගාරයට එකතු කරපු මහා ධනස්කන්ධය නාස්ති කරලා, කාබාසිනියා කරලා, හොරකම් කරපු යුගය නිමා කරන්න ගැළපෙන අය වැයක් ගෙනැවිත් තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම විපක්ෂයේ අයටත්, රටේ සමහර ජනතාවටත් මතක් කරන්න ඕනෑ, බලය මාරු කළ පමණින් ධනය මාරු වෙන්නේ නැහැ කියලා. බලය මාරු කළ පමණින් රටේ බංකොලොත්භාවය අහෝසි වෙන්නේ නැහැ. බලය මාරු කළ පමණින් අපේ රටේ තිබෙන ණය බර නිදහස් වෙන්නේ නැහැ. සංචිත පිරෙන්නේ නැහැ. අපි බලය මාරු කළේ ධනය මාරු කර ගන්න තමයි. බලය මාරු කළේ මේ රට නිවැරදි දිසාවට ගෙනියන්න තමයි. ඒ නිවැරදි දිසාවට ගෙන යෑමට අදාළ මූලික පියවර අපි තබා තිබෙනවා.

අදූෂිත දේශපාලන සංස්කෘතියක් අපි ගොඩනඟලා තිබෙනවා. ඒ මත ඉඳගෙන තමයි අපේ ඉදිරි අවුරුදු පහ තුළ ජාතික ඉලක්කවලට අපි පය තබන්න පටන් අරගෙන තිබෙන්නේ. ඒ ගමනේ පළමුවෙනි පියවර තමයි අපි මේ අය වැයෙන් තබන්නේ. ඒ අය වැය තුළින් අපි ඉතා සාර්ථක ආරම්භයක් අරගෙන තිබෙනවා. හැබැයි, අපි දන්නවා, මේ මොන ආරම්භය ගත්තත් විපක්ෂයට කෙදිරිල්ලක් තිබෙන බව; අඳෝනාවක් තිබෙන බව. අපි මෙහෙම කියනවා. අපි මේ දේශපාලනය පැරැද්දුවාට ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් නවත්තලා නැහැ. බංකොලොත් විපක්ෂය දේශපාලන වශයෙන් පැරැද්දුවාට ඔවුන්ගේ දේශපාලනය නවත්තලා නැහැ. ඒ නිසා ඔවුන් ප්‍රතිවිප්ලවය කැඳවමින් ඉන්නවා. ඒකට විටෙක පරණ, පැරදිච්ච, හොර, තක්කඩි දේශපාලන කල්ලි ඔක්කොම එකට එකතුවෙමින් තිබෙන බව අපි දන්නවා. අපට ඒවා ඇස් පනා පිට දකින්න පුළුවන්. ඒ වාගේම සමහර කුජීත මාධ්‍ය ආයතනත් ඒ ප්‍රතිවිප්ලවයේ කොටස්කාරයෝ වෙන්න කටයුතු කරමින් ඉන්නවා. සාතිශය බහුතරයක් රටේ ප්‍රගමනයට අදාළ මාධ්‍යකරණයක යෙදෙද්දී කුජීත දේශපාලනඥයෝ ඒ ගමනට අදාළ අත්වැල් සපයමින් ඉන්නවා. ඒත් එක්කම කූට ව්‍යාපාරිකයෝ මේ ප්‍රතිවිප්ලවය කැඳවමින් තිබෙනවා, ඒකට අදාළ උත්සාහයන් ගනිමින් ඉන්නවා. අපි කියන්න කැමැතියි, ඒ කටයුතු එකක්වත් සාර්ථක කර ගන්න හම්බ වෙන්නේ නැහැ කියන එක. ඒ වාගේම දූෂිත රාජ්‍ය නිලධාරීන් අතළොස්සක් එකතු වෙමින් තිබෙනවා, මේ ප්‍රතිවිප්ලවය සඳහා. මේ මොහොතේ තවදුරටත් බළඇණියක් එකතු කර ගන්න ඔවුන් උත්සාහ කරමින් ඉන්නවා. පාතාලය විසින් තැන තැන සිද්ධ කරන ඝාතන රැල්ල හේතුවෙන් යම් දේශපාලන වටපිටාවක් නිර්මාණය වෙමින් තිබෙනවා. රට අරාජිකයි, රට අස්ථාවරයි කියන දේශපාලනය හරහා ජනතාවගේ මතය වෙන පැත්තකට හරවලා දේශපාලන වාසි ගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ නිසා අපි විපක්ෂයේ අයට කියනවා, ඔබගේ දේශපාලන උත්සාහයන් කිසිවක් සාර්ථක වෙන්නේ නැහැ කියලා. ජාතික ජන බලවේගය වටා ජනතාව එකට පෙළ ගැහිලා ඉන්නවා. මේ ගෙනැල්ලා තිබෙන්නේ සියලු ජනතාව රකින, සියලු ජනතාව වෙනුවෙන් ජීවිතය දෙන්න අදාළ වටිනාකම් එකතු කරන අය වැයක්. 2025 අය වැය තුළින් මේ රට නිවැරදි මාවතට ගන්නවා. ඒ වෙනුවෙන් ජාතික ජන බලවේගය ලෙස අපට කළ හැකි උපරිම කාර්යභාරය කරමින් ඊට දායක වනවාය කියා ප්‍රකාශ කරමින් මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.31]

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අය වැය පිළිබඳ මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි, ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ප්‍රකාශනයේ ආරම්භයේ සඳහනක් සමඟින්. අය වැය මූලධර්ම විධියට එතුමා මේ ගරු සභාවට සඳහන් කළා, කර්මාන්ත, සේවා හා කෘෂි කර්මාන්ත අංශවල නිෂ්පාදනයේ වර්ධනය, මෙම නිෂ්පාදනය සඳහා ජනතාවගේ සක්‍රීය දායකත්වය සහ සහභාගිත්වය ඇතිව සිදු විය යුතු වීම සහ නිෂ්පාදනයෙන් ලැබෙන ප්‍රතිලාභ සහ වර්ධනයන් සමාජය පුරා සාධාරණව බෙදී යා යුතු වීම යන කාරණා. එක පැත්තකින්, අය වැය මූලධර්මවලම කියනවා, ජන සහභාගිත්ව ආර්ථික ක්‍රමයකට, ආර්ථික සංවර්ධනයකට තමයි අප යන්නේ කියලා. ඒ විතරක් නොවෙයි, එතුමා අවධාරණය කරනවා, ඒ සියලු ප්‍රතිලාභ සාධාරණව සියලු ජන කොටස් වෙත බෙදී යා යුතුය කියලා. මෙම මූලධර්ම ගැන සඳහන් කරමින් තමයි ජනාධිපතිතුමා අය වැය කථාව ආරම්භ කරන්නේ.

[ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි මගේ දිස්ත්‍රික්කය වන රත්නපුර දිස්ත්‍රික්කයෙන්ම උදාහරණයක් ගනිමින් මගේ කථාව වැඩි දුරටත් කරගෙන යන්න. අපේ දිස්ත්‍රික්කය සිංහල, දෙමළ, මුස්ලිම් ආදරණීය සහෝදර ජනතාව ජීවත් වන ප්‍රදේශයක්. අපේ ඒ ජනතාව වසර 50ක් තිස්සේ -දශක 5ක් තිස්සේ - දැකපු සිහිනයක් තිබුණා. ඒ සිහිනය තමයි තම ප්‍රදේශය හරහා යළි දුම්රිය ගමනාගමනය ආරම්භ කිරීම. ඉංග්‍රීසින් විසින් ඉදි කරපු ඒ දුම්රිය මාර්ගය වසා දමා එම දුම්රිය මීට අවුරුදු 50කට, 52කට කලින් නතර කර තිබුණා. එය නැවත ආරම්භ කිරීමේ සිහිනය රත්නපුරයේ සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන්ට තිබුණා. ඒ මිනිස්සු එය සැබෑ කර ගැනීම වෙනුවෙන් කටයුතු කළා; ඒ වෙනුවෙන් අරගළ කළා, ලිපි ලිව්වා, රචනා ලිව්වා, විවිධ කටයුතු කළා.

ඒ අය අතර අමතක කරන්න බැරි චරිතත් තිබෙනවා. මේ ගරු සභාවට අපි ඉතාම නිහතමානීව ඒ නම්වලින් කිහිපයක් සඳහන් කරන්න ඕනෑ. අපට මතකයි, ගීත් මානවමිත්‍ර කියලා රසායන විද්‍යා ගුරුවරයෙක් සිටියා. ඇත්තටම ඔහු හොඳ මානව මිත්‍රයෙක්ම තමයි. ඒ වාගේමයි, වෛද්‍ය තුෂාර ජයසූරිය. දුම්රිය නැවත රත්නපුරයට ළඟා කරවා ගන්න ඔවුන් ලොකු මහන්සියක් ගත්තා. අපට මතකයි, මීට අවුරුදු තුනකට වගේ කලින් වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා හමු වෙන්න ඇවිල්ලා කැලණිවැලි දුම්රිය මාර්ගය යළිත් රත්නපුරය දක්වා දීර්ඝ කරන්න ඔවුන් ලොකු යෝජනාවලියක් ලබා දුන්නා. කියන්න සතුටුයි, කැලණිවැලි දුම්රිය මාර්ගය නැවත රත්නපුරය දක්වා දීර්ඝ කිරීමට චිතරක් නොවෙයි, පළමු අදියර රත්නපුරයටත්, දෙවැනි අදියර කහවත්තටත්, තුන්වැනි අදියර ඇඹිලිපිටිය, සූරියවැව හරහා දකුණු දුම්රිය මාර්ගයට යා කරන්නත් අවශ්‍ය මූලික පියවර ජාතික ජන බලවේගයේ මංගල අය වැයෙන්ම ඉදිරිපත් කර තිබෙනවා. එහි මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. ඒ අනුව, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුරය දක්වා දීර්ඝ කිරීමට හැකි වනවා. එම නිසා රත්නපුරයේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව වෙනුවෙන් ගරු ජනාධිපතිතුමාට මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි.

ඒ චිතරක් නොවෙයි, අපි මේ දුම්රිය මාර්ගය නිර්මාණය කරනකොට එයින් අපහසුතාවට පත් වන ජනතාවක් වෙසෙනවා. අවුරුදු 50ක් තිස්සේ ඒ දුම්රිය මාර්ගය වසා දමා තිබීම නිසා එය නැවත ඉදි වෙයි කියලා ඔවුන්ට බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. එම නිසා එම මාර්ගයේ ඉදි කිරීම් කරලා තිබෙනවා. දැන් එම මාර්ගයේ මිනිස්සු ජීවත් වෙනවා. ඒක ඒ අයගේ ප්‍රශ්නයක් නොවෙයි. අවුරුදු 50ක් තිස්සේ එම දුම්රිය මාර්ගයේ දුම්රියක් ගමන් කරලා නැහැ. එම නිසා ඒ දුම්රිය මාර්ගය නැවත නිර්මාණය වනකොට ඔවුන්ගේ දේපළවලට හානියක් වෙන්න පුළුවන්. හැබැයි, ඒ ජනතාවට අපි ඉතාම වගකීමෙන් කියනවා, ඔබ පිහිටුවා ගත් ආණ්ඩුවයි මේ තිබෙන්නේ, ඔබේ ආණ්ඩුවයි මේ තිබෙන්නේ, ඒ ජනතාවාදී ආණ්ඩුවයි මේ තිබෙන්නේ, කිසිසේත් ඔබ බිය විය යුතු නැහැ, ඔබේ දේපළ උපරිමයෙන්ම ආරක්ෂා කරමින් ඒ දුම්රිය මාර්ගය ඉදි කරන්න අපි සැලසුම් කරනවා කියලා. මේ අය වැය විවාදයේදී මම ඒ ජනතාවට ඒ බව කියනවා. ඒ චිතරක් නොවෙයි, යම් හෙයකින් දේපළක් අත් පත් කර ගන්න වුණොත්, ඔබට සාධාරණ වන්දියක් ලබා දීමට අපි මැදිහත් වෙනවා. අන්න ඒ ප්‍රකාශයත් මම මේ ගරු සභාවට කරනවා.

ඊළඟට, මේ අය වැය තුළ මා දකින අපේ හදවත ස්පර්ශ කරන කාරණා කිහිපයක් ගැන මේ ගරු සභාවට මතක් කර දෙන්න මම කැමැතියි. සත්‍ය වශයෙන්ම අපිවත් හිතුවේ නැහැ, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැය තුළ මේ වාගේ ලක්ෂණ ටිකක් දකින්න ලැබෙයි කියලා. එකක් තමයි, ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සම්බන්ධයෙන් කර ඇති යෝජනා. මෙතෙක් අය වැයක නොදුටු ලක්ෂයක් තමයි එය. ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් වෙනුවෙන් ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 250ක් අපේ ආණ්ඩුවේ අය වැයෙන් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, රැඳවුම් නිවාසවල සිටින දරුවන්, පරිවාස භාරයේ සිටින දරුවන්, අනාථ නිවාසවල සිටින දරුවන් වෙනුවෙන්, එක දරුවෙකුට මාසිකව රුපියල් 5,000ක මුදලක් බැගින් වෙන් කරන්නත්, ඒ රුපියල් 5,000ක මුදලෙන් රුපියල් 2,000ක් ඔවුන් වෙනුවෙන් ගිණුම් ආරම්භ කරලා ගිණුම්ගත කරන්නත්, අනෙක් රුපියල් 3,000 ඒ අදාළ ආයතනවලට පවරන්නත් කටයුතු කරනවා. ඒවා හදවත ස්පර්ශ කරන, මානව දයාවෙන් පරිපූර්ණ වූ කාරණා.

ඒ චිතරක් නොවෙයි. "මලයගම්" ජනතාව ගැනත් අය වැයෙහි සඳහන් කර තිබෙනවා. ගරු ජනාධිපතිතුමා මේ සභාවට අය වැය ප්‍රකාශය ඉදිරිපත් කරන වෙලාවේදීම ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් තමන්ගේ ප්‍රසාදය පිරිනැමුවා. "මලයගම්" කියන නාමකරණය කළේ මීට අවුරුද්දකට කලින්. ජාතික ජන බලවේගය විධියට අපට ඒ ගැන නිහතමානී ආඩම්බරයක් තිබෙනවා. ඒ චිතරක් නොවෙයි. "මලයගම්" දෙමළ ජනතාව ගැන කථා කරමින් විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, නම චිතරයි තිබෙන්නේ, ඒ ජනතාව වෙනුවෙන් වැඩක් කරන්නේ නැහැ කියලා. මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, 2025 අය වැය කථාවේ 35 වැනි පිටුව කෙරෙහි. එහි සඳහන් වනවා, "මලයගම්" දෙමළ ජනතාවගේ ජීවනෝපාය තවමත් ගෞරවනීය ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට වඩා පහළින් පවතින බවත්, එම නිසා මුලපිරීම් තුනක් සඳහා දැනටමත් රුපියල් මිලියන 7,583ක් වෙන් කර තිබෙන බවත්. එතරම් මුදලක් වෙන් කරනවා, මේ මංගල අය වැයෙන් චිතරක්. ඒ අනුව, ආදරණීය "මලයගම්" දෙමළ ජනතාව වෙනුවෙන් වතු නිවාස සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 4,267ක් වෙන් කර තිබෙනවා. ඒ චිතරක් නොවෙයි, "මලයගම්" දෙමළ තරුණයන්ගේ වෘත්තීය පුහුණුව, ජීවනෝපාය සංවර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 2,450ක් වෙන් කර තිබෙනවා. ඊළඟට, "මලයගම්" දෙමළ ප්‍රජාවේ පාසල් සඳහා නවීන/ සුහුරු පන්ති කාමර ලබා දීම සඳහා රුපියල් මිලියන 866ක් වෙන් කර තිබෙනවා. හැබැයි අද දවසේ අය වැය විවාදය ආරම්භ කරපු ගරු මන්ත්‍රීතුමා කථාව පටන් ගත්තේ, ජනතාව පොතට කලින් පිට කවරය බලපු එකක් ගැන සඳහන් කරලා. එතුමා කිව්වා, පිට කවරෙත් කියෙව්වා, පොතත් කියෙව්වා කියලා. හැබැයි ඒ ගරු මන්ත්‍රීතුමාට මම කියනවා, ඔබතුමා පිට කවරය විතරයි කියවලා තිබෙන්නේ කියා. පොතත් කියවන්න කියලා මම එතුමාට යෝජනා කරනවා. ඒ චිතරක් නොවෙයි. පොත කියෙව්වා කියපු එතුමා තමාගේ කථාවේදී මේ අය වැය සම්බන්ධව වචනයක්වත් කථා කළේ නැහැ. එතුමා කිව්වේ ඩී.එස්. සේනානායක මහත්මයාගේ කාලයේ කාරණා ගැන; ඩඩ්ලි සේනානායක මහත්මයාගේ කාලයේ කාරණා ගැන; සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ කාරණා ගැන. ඒ කාරණා තමයි කිව්වේ. මේ අය වැය ගැන කිව්වේ නැහැ. ඊට පස්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ කාරණා ගැන තමයි කිව්වේ. මට හිතෙන්නේ එතුමන්ලාගේ පොතේ පිට කවරය විතරයි අපේ. ඒක ඇතුළේ තිබිලා තියෙන්නේ රනිල්ගේ, ඩී.එස්.ගේ කාරණා. මා හිතන්නේ විපක්ෂයේ ඉන්න ගරු රවි කරුණානායක මහත්මයාගේ මන්ත්‍රීවරු අපේ පිට කවරෙ මැදට ඔවුන්ගේ පක්ෂයේ කාරණා, ඒ පොත රිංගවලා තිබෙනවා කියලායි. ඒ නිසා මම ගරු සභාවට යෝජනා කරනවා, ජාතික ජන බලවේගයේ අපේ අය

වැය පොත, පිට කවරය ගැන කියපු ඒ මන්ත්‍රීතුමාට ලබා දෙන්න කියලා. අපි එතුමාට කියනවා, එහි පිට කවරය විතරක් නොවෙයි, ඇතුළත් කියවන්න කියලා.

ඊළඟ කාරණය -ලස්සනම දේ- මේකයි. අපේ සිහිනයක් තිබුණා, ජාතික සමඟිය නිර්මාණය වෙන්න ඕනෑ කියලා. ඒ වෙනුවෙන් ඒ දිශාවට පියවර තබපු අය වැයක් මේක. අපට මතකයි, 1982 දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්දය කොල්ල කෑවා. තවම ඡන්ද පෙට්ටි 9ක් අතුරුදහන්, යාපනයේ. ඒ විතරක් නොවෙයි. ආසියාවේ විශාලම පුස්තකාලයට -යාපනය පුස්තකාලයට- ගිනි තැබුවා, ගරු අර්විවුනා මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ හිටපු, මෙතුමන්ලාගේ පක්ෂ නායකයෝ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන්ලා, නන්ද මැතිවිලා, නන්ද මැතිවිගේ පියා සිරිල් මැතිව් ඇතුළු අයයි ඒ වැඩේ කළේ. ඒක, ආසියාවේ ලොකුම පුස්තකාලය. ඒ විතරක් නොවෙයි, අපි අහලා තිබෙනවා, ඒ පුස්තකාලයට ගිනි තබපු ආරංචිය අහලා ඒ ආසන්නයේ පල්ලියක හිටපු පියතුමෙකු හදවත පුපුරලා මිය ගිහින් තිබෙනවා කියලා. එවැනි කම්පනයක් ඇති කර තිබුණේ. අපට සිහිනයක් තිබුණා, අපේ ආණ්ඩුවක් තුළ නැවත ඒක ඉදි කරන්න ඕනෑ, ඒකට අවස්ථාව දෙන්න ඕනෑ කියලා. මංගල අය වැයෙන්ම අර්විවුනා මන්ත්‍රීතුමනි, අපි ඒ සඳහා -පුස්තකාලය නැවත ගොඩනඟන්න- රුපියල් මිලියන 100ක් වෙන් කළා.

ඒ විතරක් නොවෙයි. විපක්ෂය විසින් ඉදිරිපත් කළ කාරණා කිහිපයකට උත්තර දෙන්න විනාඩි කිහිපයක් ලබා දෙනවා නම් ඔබතුමාට ගරු කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රකාශ කළ එක කාරණයක් තමයි රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීම. දැන් රජයේ සේවකයෝ ගැන කිඹුල් කඳුළු හෙළනවා. එදා 1980 ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ ආණ්ඩුව කාලයේ රජයේ සේවකයෝ ඉතාම සොච්චම් මුදලකින් වැටුප් වැඩි කරන්න කියලා වැඩ වර්ජනය කළා. මොකක්ද කළේ මේගොල්ලන්ගේ පියතුමන්ලා? 114,000ක් රැකියාවලින් දොට්ට දැම්මා. 114,000ක්! 114,000ක් දොට්ට දාලා කිව්වා, මේ වැනුවේ අලියාගේ වලිගය විතරයි කියලා. එහෙම කළ අයගේ පුතාලා, මුනුපුරෝ දැන් අහනවා රජයේ සේවකයන්ට මොකක්ද කළේ කියලා. මාස තුනයි දින දෙකයි තවම අපි බලයට පත්වෙලා. අපි මොකක්ද කළේ කියලා මෙන්න අය වැයේ තිබෙනවා.

මමත් ගුරු සේවයේ හිටියා වසර විසි ගාණක්. ඒ නිසා ගුරු සේවය සම්බන්ධයෙන් මටත් යම් පරිචයක් තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. ගුරු සේවයේ සේවා 5ක් තිබෙනවා. ගුරු සේවයේ 2-II ශ්‍රේණියේ ඉන්න ගුරුවරයකුට දැනට වැටුප 64,986යි. හැබැයි මෙවර අය වැයෙන් ඒක වැඩි වෙනවා 74,100ට. ඒ විතරක් නොවෙයි. මේ අප්‍රේල් මාසයේ 1වෙනි දා වෙනකොට ඔහුගේ වැටුප වැඩි වෙනවා රුපියල් 9,114.28කින්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තව මාස 20කින් 2-II ශ්‍රේණියට 47,615ක් ලෙස තිබුණු වැටුප 66,880 වෙනවා. ඒ කියන්නේ වැටුප 19,265කින් වැඩි වෙනවා තව මාස 20කින්. 2-I ශ්‍රේණියට 62,595යි, ආරම්භක පියවර. තව මාස 20කින් ඒක 81,780ක් වෙනවා. ඒක රුපියල් 19,185කින් වැඩි වෙනවා තව මාස 20කින්. ගුරු සේවයේ I ශ්‍රේණියේ ගුරුවරයෙකු දැන් ඉන්නේ 76,175 වැටුපේ. ඒක 98,580 වෙනවා; 22,405කින් වැඩි වෙනවා. මම ගුරු සේවයේ හිටියා නම් මට වැඩි වෙනවා රුපියල් 78,000ක්, තව මාස 20කින්. ඉතින් කොහොමද කියන්නේ රජයේ සේවකයන්ට වැටුප් වැඩි වෙන්නේ නැහැ කියලා; ගුරුවරුන්ගේ වැටුප් වැඩි වෙන්නේ නැහැ කියලා?

තව පොඩි කාලයක් අරගෙන මම තව එක කාරණයක් කියන්නම්. දැන් කියනවා පාසල් උපකරණවල වැට් එක අඩු කළේ නැහැලු. හැබැයි රුපියල් 6,000ක් දෙනවා පාසල් උපකරණ ගන්න. ඒ 6,000ක වාසිය වැට් බද්ද අඩු කළාට වඩා වැඩියි. සියයට 18 වැට් එක අඩු කළත් දරුවෙක් රුපියල් 30,000කට වඩා පාසල් උපකරණ ගන්න ඕනෑ රුපියල් 6,000ක වාසියක් ලබන්න. හැබැයි දැන් රුපියල් 6,000ක් දෙනවා. අපි දන්නවා සාමාන්‍ය දුප්පත් පවුලක දරුවෙකුට රුපියල් 30,000ක් දක්වා පාසල් උපකරණ ගන්න බැහැ. 30,000ක ගත්තොත් බඩු ගත්තොත් තමයි වැට් වාසිය 6,000ක් ලැබෙන්නේ. හැබැයි අපි දැන් රුපියල් 6,000ක් දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මංගල අය වැයෙන්ම මේ රටේ දිශානතිය වෙනස් කරන, ඒ වෙනස, ක්‍රම වෙනස පෙන්වූවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මට තව එක යෝජනාවක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න. කාලය සීමාසහිතයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මම සංචාරක ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න ඕනෑ. රත්නපුර දිස්ත්‍රික්කය සංචාරක කලාපයකට ඉතා හොඳයි. සංචාරක ගමනාන්තයක් විධියට රත්නපුර දිස්ත්‍රික්කය නම් කරන්න කියන, -අපේ නියෝජ්‍ය අමාත්‍ය රුවන් රණසිංහ මැතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා-යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12 කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.45]

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 වර්ෂය වෙනුවෙන් වර්තමාන රජය ඉදිරිපත් කළ මංගල අය වැය පිළිබඳව අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ රජයට ලැබුණු ජන වරම ගැන සඳහන් කළොත්, ගිය සැප්තැම්බර් මාසයේදී මේ රටේ ජනතාවගේ සුළුතර බලයකින් මේ රටේ වර්තමාන ජනාධිපතිතුමා පත් වුණත්, ඉන් පසුව නොවැම්බර් මාසයේ පැවැත්වූ මැතිවරණයේදී අති බහුතරයක් ජනතාව තීන්දු කරනවා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකට වැඩි බහුතරයක් වර්තමාන ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට ලබා

[ගරු චතුර ගලප්පත්ති මහතා]

දෙන්න. ඒ බලය ලබා දීමේ මූලික අරමුණ වන්නේ, 2022දී මේ රටේ ඇති වුණු ආර්ථික අර්බුදයත් එක්ක මතවාදයක් ගොඩනැහෙනවා, "76 වසරක සාපයක් තිබෙනවා, මේ 225දෙනාම වග කියන්න ඕනෑ, උනුත් එකයි මුනුත් එකයි" කියලා. ඒ concept එක වර්තමාන රජය විසින්ම තමයි ගෙන ආවේ. ඔවුන් ජනාධිපතිවරණයේදී කිව්වා නව ආර්ථික මොඩලයක් හදුන්වා දෙනවා කියලා.

මෙතුමන්ලා අවුරුදු ගණනක් 1977 විවෘත ආර්ථිකයට බැණ වැදුණා. 1977 දී ගෙනාපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විවේචනය කළා. මෙතුමන්ලා කිව්වා, "අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන්න ඕනෑ, අලුත් ආර්ථික මොඩලයක් ගෙනෙන්න ඕනෑ" කියලා. එතුමන්ලා system change එකක් වෙනුවෙන් තමයි ඒ මැතිවරණය ගෙනාවේ. මැතිවරණයේදී මේ රටේ ජනතාව ඡන්දය පාවිච්චි කළේ system change එකක් වෙනුවෙන්. නමුත් ඒ system change එක මේ අය වැය තුළින් සිදු වුණාද කියන කාරණාව අපි බලන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවේ පූර්විකාවේ 3වන පිටුවේ සඳහන් කරනවා මෙන්න මේ විධියට:

"ඇත්තෙන්ම අප බලයට පත්වන විට රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ නිරත වෙමින් සිටි අතර එයට සැලකිය යුතු වෙනසක් සිදු වුවහොත් එමඟින් ආර්ථිකය අස්ථාවර වීමට ඇති විය හැකි බලපෑම හමුවේ ඊට බාධා කිරීමට අපට අවශ්‍ය වූයේ නැහැ."

මෙතුමන්ලා කොච්චර තර්ක-විතර්ක ගෙනාවාත් මේ කථාවෙන් පිළිගෙන තිබෙනවා, තිබුණු ක්‍රමයට තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. කොටින්ම කියනවා නම්, මේක IMF එකට එකඟව ඉදිරිපත් කරපු අය වැයක්. ඒ විතරක් නොවෙයි, පසුගිය රජය ඇතුළු කලින් රජයන්ට සමාන්තරව ගෙනිච්ච අය වැයක්. යම් යම් කාරණා වෙනස් වෙලා තිබෙනවා. නමුත් සමස්තයක් විධියට මේ අය වැයක් එක මානයක යන අය වැයක්. ඒක නිසා මෙතුමන්ලා මොන තර්ක-විතර්ක කළත් මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ system change එකක් වෙනුවෙන්. ඒ system change එක කරන්න මේ මංගල අය වැය අසාර්ථක වෙලා කියන කාරණාව අපට පිළිගන්න වෙලා තිබෙන්නේ. මොකද ජනාධිපතිතුමාගේ කථාවෙන් එතුමා ඒක පිළිගන්න නිසා. එතුමන්ලා කිව්වේ පළමුවැනි අය වැයේදී ඒ වෙනස්කම් කරන්න පටන් ගන්නවා කියලායි. එහෙම තමයි වේදිකාවල කථා කළේ. නමුත් මේ මංගල අය වැයේ පූර්විකාවෙන් ඒ කාරණාව වෙනස් වෙලා තිබෙනවා.

මේ වාගේ බලයක් තමුන්නාන්සේලාට ලැබෙන්න හේතුව තමයි 2022දී මේ රටේ ඇති වෙච්ච ආර්ථික අර්බුදය. ආර්ථිකය අර්බුදය ඇති වෙන්න ළඟම හේතුව තමයි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගත්තු වැරදි තීන්දු තීරණ. එතුමා ඒ ගත්ත වැරදි තීන්දු තීරණත් එක්ක පෝලිම් යුගයක් ඇති වුණා. මේ රටේ මිනිසුන්ට එදිනෙදා ජීවත් වෙන්න බැරි වුණා. ඒ නිසා ජනතාවට මානසික පීඩනයක් ඇති වුණා. ජනතාව ගෑස් පෝලිම්වල, තෙල් පෝලිම්වල, සතොසේ පෝලිම්වල හිටියා. රට අත්හැරලා දාලා යන්න තරුණයෝ පාස්පෝට් පෝලිම්වල හිටියා. ඒ පෝලිම්වල හිටපු ජනතාව විශාල දුකක් වින්දා. සමහර අවස්ථාවල උදේ ගිය මනුස්සයා හවස ගෙදර එන්නේ නැහැ. හේතුව, කොහේ හරි පෝලිමකදී මැරිලා වැටිලා. ඒවා ඇස් දෙකෙන් දැකපු ජනතාව මේ රටේ තිබුණු system එකට වෛර කළා. අන්න ඒ වෛරයට කථා කරපු කණ්ඩායමක් තමයි අද මේ රටේ අති බහුතර බලයක් අරගෙන මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ. මේ අය අවුරුදු 76ක ශාපයක් ගැන කථා කළා. මම මේ පාර්ලිමේන්තුව තුළ 76ක ශාපය ගැන කථා නොකරන්නයි හිටියේ. ඒක ජනාධිපතිවරණයේදීත් කථා කළා, පාර්ලිමේන්තු මැතිවරණයේදීත් කථා කළා. අද මේ අය වැය විවාද වෙන මොහොතේ පවා අපේ ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු ඉතිහාසයේ වෙච්ච කාරණා මතක් කරමින් තමයි කථා කරන්නේ. නමුත් මම පැහැදිලිව කියනවා, අවුරුදු 76ක ශාපය කියන්නේ ගොඩ නහපු මතවාදයක් කියලා. බොරුවක් තමයි ඒ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් 1948දී මේ රටේ තිබුණු පරිසරය ගැන මතක් කරගනිමු. මම ඉතිහාසය ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරන අවසාන කථාව වෙයි මේක. මෙතැනින් පසු අපි ඉතිහාසය ගැන කථා කරලා වැඩක් නැහැ, අනාගතය ගැන කථා කරන්න ඕනෑ. නමුත් මම මේ මොහොත ප්‍රයෝජනයට ගන්නවා, මෙතුමන්ලා දිගින් දිගටම අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරන නිසා ඒ ගැන කියන්න. සොල්බරි සාමිවරයාගේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා, 1948ට කලින් මේ රටේ තිබුණු වාතාවරණය. මේ රටේ තිබුණේ වැඩවසම් ක්‍රමයක්. ඒ වාගේම දිළිඳුභාවයෙන් යුක්ත, වහල්භාවයෙන් යුක්ත සමාජයක් තමයි තිබුණේ. ඒ වාගේ සමාජයක් තිබුණු පරිසරයකට, රටකට තමයි 1948දී ඩී.එස්. සේනානායක මහත්තයා මේ රටට නිදහස අරගෙන දෙන්නේ. 1948 නිදහස අරගෙන දීලා, 1994 වෙන කොට දකුණු ආසියාවේ ශීඝ්‍රයෙන් දියුණු වන රට බවට පරිවර්තනය වෙනවා. 1948ට කලින් ඒ වාගේ පරිසරයක් තිබිලා 1994දී මේ රට දකුණු ආසියාවේ ශීඝ්‍රයෙන් දියුණු වන රටක් බවට පරිවර්තනය කරන්න මේ රටේ හිටපු නායකයෝ යම් හොඳ තීන්දු තීරණ අරගෙන තිබෙනවා. අපි ඒවා දර්ශක එක්ක කථා කරමු.

1948ට කලින් අධ්‍යාපන මට්ටම ගත්තොත්, අධ්‍යාපන සාක්ෂරතාව සියයට 35යි. ඒ කියන්නේ මේ රටේ අකුරු ලියන්න පුළුවන්, කියවන්න පුළුවන් ජනතාව සියයට 35යි හිටියේ. හැබැයි, 1994 වනකොට ඒක සියයට 95ක් දක්වා වැඩි වෙනවා. සියයට 35ක තිබුණු සාක්ෂරතාව සියයට 95 දක්වා වැඩි වෙන්නේ ඒක කවුරුවත් දීපු දෙයක් නිසා නොවෙයි, දෙයියෝ දීපු දෙයක් නිසා නොවෙයි, මේ රටේ පාලකයෝ ගත්තු නිවැරදි තීන්දු තීරණ නිසා. මේ රටේ නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් ඒ මිනිස්සු සටන් කළා; පෙනී හිටියා. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි මා ඇතුළු මෙතැන ඉන්න බොහෝදෙනෙක් මේ රටේ නිදහස් අධ්‍යාපනය තුළින් මතු වෙච්ච චරිත බවට පත් වෙලා තිබෙන්නේ. මේ රටේ සියලුදෙනාම වාගේ නිදහස් අධ්‍යාපනයෙන් බිහි වූ අය.

ඒ වාගේම සෞඛ්‍ය ගත්තොත්, 1948ට කලින් සාමාන්‍ය මනුස්සයෙකුගේ ආයු කාලය වයස අවුරුදු 45යි. ඒ කාලයේ යම් වසංගතයක් හැදුණොත් මුළු සනුහරේම නැත්තට නැති වෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. හැබැයි, වයස අවුරුදු 45ට තිබුණු ආයු කාලය, 1994 වෙනකොට වයස අවුරුදු 75 දක්වා වැඩි වෙනවා. ඉතිහාසයේ මේ රටේ හිටපු අපේ නායකයන් ගත්ත තීන්දු තීරණවලට පින් සිදු වන්න තමයි අද අපි හැමෝම ඒ ආයු කාලයට සමාන ආයු කාලයක් භුක්ති විඳින්නේ.

කෘෂි කර්මාන්තය පැත්තෙන් ගත්තොත්, අද ආහාර නිෂ්පාදනය ගැන කථා කරනවා. ඒ වාගේම ආහාර සුරක්ෂිතතාව ගැන කථා කරනවා. ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් එදා හිටපු නායකයෝ ගත්ත වැදගත්ම තීන්දුව තමයි, මේ රටේ වාරි කර්මාන්තය දියුණු කිරීම. වාරි කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් විශේෂයෙන්ම ගල් ඔය, මිනිපේ ඇළ, මින්නේරිය වැව, තබ්බෝව වැව, යෝධ වැව හා මහවැලිය වැනි යෝධ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කළා. ඒකේ ප්‍රතිඵලයක් විධියට නිදහසෙන් පසුව පළමු වතාවට 80 දශකයේ මේ රට සහලින් ස්වයංපෝෂිත කරන්න

අවස්ථාව හිමි වුණා. ඒක තවත් සරලව කිව්වොත්, 1948දී මේ රටේ හිටිය ජනගහනය ලක්ෂ 60යි. එතකොට දේශීය නිෂ්පාදනය තිබුණා සියයට 36ක්. පිට රටින් ආනයනය කළා සියයට 64ක්. 1948දී හෙක්ටෙයාරයකින් වී කිලෝග්‍රෑම් 650යි ගන්න පුළුවන් වුණේ. හැබැයි, 1994 වනකොට හෙක්ටෙයාරකින් වී කිලෝග්‍රෑම් 3,500ක අස්වැන්න ගත්තා. එතකොට ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, මේ රටේ හිටපු නායකයෝ කොච්චර සේවයක් කරලා තිබෙනවාද කියලා.

ඒ විතරක් නොවෙයි. මහවැලිය ආරම්භ කළේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් වුණත්, 1994 වනකොට මහවැලියට පින් සිද්ධ වෙන්න තමයි සියයට සියයක් ජල විදුලිය නිෂ්පාදනය කළේ. ඒ වනකොට තේ, පොල්, රබර් අපනයන ආදායම වැඩි කරන්නත් කටයුතු කළා. විශේෂයෙන්ම ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මේ රටට හඳුන්වා දීම තුළ නිදහස් වෙළෙඳ කලාප ආරම්භ වුණා. නිදහස් වෙළෙඳ කලාප ආරම්භ කිරීමත් එක්ක මේ රටේ දියුණුව, සංවර්ධනය දැකලා එදා චීනයේ හිටපු අගමැතිතුමා ලංකාවට විශේෂඥයෝ කණ්ඩායමක් එව්වා, ලංකාව කොහොමද මෙච්චර ශීඝ්‍රයෙන් දියුණු වෙන්නේ කියලා හොයලා බලන්න. අපේ නිදහස් වෙළෙඳ කලාප සංකල්පය තමයි චීනයට අරගෙන ගියේ. නමුත් අද ඔවුන් සිටින තැන බලන්න. එදා මේ රටේ ඒ වාගේ තත්ත්වයක් තමයි තිබුණේ.

ඒ විතරක් නොවෙයි. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා නිකම් හිටියේ නැහැ. විදේශ රටවල් එක්ක රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ සම්බන්ධතා හදා ගත්තා. විදේශ තානාපති කාර්යාල මේ රටේ ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් විධියට මොකක්ද වුණේ? විදේශ රැකියා මේ රටට විවෘත වුණා. ඒ නිසා ඩොලර් එන්න පටන් ගත්තා. ඒ විතරක් නොවෙයි. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ රටේ අහිංසක, දුප්පත් ජනතාව වෙනුවෙන් විශාල වැඩකොටසක් කරපු නායකයෙක්. මේ රටේ ආර්ථිකය වෙනුවෙන් එතුමා එදා ඇහලුම් කර්මාන්ත 200ක් ආරම්භ කළා. විවිධ බාධක, මැතිමතාන්තර ආවත් එතුමා ඒ කටයුත්ත කළා. ඉන් පසුව මේ රටට ඩොලර් එන්න පටන් ගත්තා. ඉතින්, කවුරු හෝ කියනවා නම් 1948 ඉඳන් 1994 දක්වා ශාපයක් තිබුණා කියලා, ඒක වැරදියි. මම කලින් කිව්වා, 1948ට කලින් මේ රට වහල්භාවයෙන් යුක්ත රටක්; අධික දිළිඳුභාවයෙන් යුක්ත රටක් කියලා. හැබැයි, 1994 වනකොට දකුණු ආසියාවේ ශීඝ්‍රයෙන්ම දියුණු වුණු රටක්. මෙතැන සිටින කවුරු හෝ කෙනෙකුට කොන්ද කෙළින් තබාගෙන කියන්න පුළුවන් නම්, 1948 සිට 1994 දක්වා මේ රටේ ශාපයක් තිබුණා කියලා, කරුණාකරලා නැඟිටින්න. අපි තර්ක කරමු. හැබැයි, හොඳ වාගේම යම් නරක තීන්දු තීරණත් ගෙන තිබෙන්න පුළුවන්. අපි ඒක භාර ගන්න සූදානම්. මොකද, 1948 සිට 1994 දක්වා මේ රට පාලනය කළේ අපේ මතවාදය අනුව අපේ දේශපාලන පක්ෂ. ඒ කියන්නේ, 1948 ඉඳලා 1994 දක්වා වැඩි කාලයක් මේ රට පාලනය කළේ; මේ රටේ ක්‍රියාත්මක වුණේ අපේ දේශපාලන මතවාදය. හැබැයි, 1994න් පසුව මේ මොහොත දක්වා විශේෂයෙන්ම අප නියෝජනය කරන දේශපාලන කඳවුරෙන් ජාතික නායකයෙක් බිහි කර ගන්න අපට අවස්ථාව ලැබුණේ නැහැ. ඇතැම් අය කියනවා, අපි දෙපාරක් ආණ්ඩු කළා කියලා. ඔව්, 2001දී අපි ආණ්ඩුව භාර ගත්තා, 2003දී ආණ්ඩු බලය දීලා යන්න වුණා. නැවත 2015දී ආණ්ඩු බලය ගත්තා, 2019දී ආණ්ඩුව දීලා යන්න වුණා. ඒකට හේතුව තමයි, වාමාංශික කඳවුරේ නායකයෙක් එක්ක තමයි අපි ආණ්ඩු කරන්න ගත්තේ.

1994 ඉඳලා මේ මොහොත දක්වා දිගටම මේ රටේ පත් වෙලා තිබෙන්නේ වාමාංශික කඳවුරුවල සිටි නායකයෝ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ විවෘත ආර්ථික වැඩ පිළිවෙළත් එක්ක, එයට ඔරොත්තු නොදෙන වාමාංශික නායකයෝ මේ රටේ පාලනයට ආපු නිසා තමයි අද මේ රටට මේ භානිය සිදු වෙලා තිබෙන්නේ. ඇත්තටම මේ රටේ 2022දී ආර්ථික අර්බුදයක් ඇති වුණා. මේ රටේ ආර්ථික අර්බුදයක් ඇති වෙන්න ප්‍රධානම හේතුව මොකක්ද? මෙය, මම කියන දෙයක් නොවෙයි. මේ රටේ සිටින විශේෂඥ කණ්ඩායමක් කියන දෙයක්. වර්තමාන මහ බැංකු අධිපතිවරයා, මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මැතිතුමා, ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂණ රාජ්‍ය ආයතනය, 2022 ලෝක බැංකු වාර්තාව හා පාර්ලිමේන්තු ආර්ථික ස්ථායිකරණ කමිටුව කියන මේ සියලුදෙනා සාක්ෂිත් එක්ක ඉදිරිපත් කරලා තිබෙනවා, 2022දී මේ රටේ ආර්ථික අර්බුදයක් ඇති වෙන්නේ අවුරුදු 76 ගණනක කතන්දරයක් නිසා නොවෙයි, 2004 ඉඳලා මේ රටේ නායකයන් ගත්ත වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසායි කියලා; ඒ නිසායි මේ රට මේ තැනට වැටිලා තිබෙන්නේ කියලා. මම මතක් කරලා දෙන්න කැමැතියි, 2004 අපේ ආණ්ඩුව තිබෙන වෙලාවේදී අපි ජනප්‍රිය නොවන ඇතැම් තීන්දු තීරණ ගන්න හදපු බව. අපි ගන්න හදපු ජනප්‍රිය නොවන තීන්දු තීරණ මොනවාද? දේශපාලන පත්වීම් මත රාජ්‍ය සේවය සඳහා බඳවා ගැනීම් නවත්වන්න අපි තීන්දුවක් ගත්තා. රාජ්‍ය සේවය කාර්යක්ෂමව වර්ධනය කිරීම සහ රාජ්‍ය සේවය තුළ VRS ක්‍රමය ක්‍රියාත්මක කරන්න තීන්දුවක් ගන්න හැදුවා.

ඒ වාගේම ලංකා විදුලිබල මණ්ඩලය තුළ නිෂ්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරන්න අපි සැලසුම් කළා. ඒ වාගේම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරන්න බැලුවා. ඒ වාගේම රේගු දෙපාර්තමේන්තුව, ආදායම් බදු දෙපාර්තමේන්තුව, රේගුව සහ ආදායම් බදු අධිකාරිය ලෙස ප්‍රතිසංස්කරණය කරන්න අපි යෝජනා කළා. ඒ වාගේම, රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරන්න ගත්තා. අපි මේ කථා කරන්නේ 2004 අපේ ආණ්ඩුවේදී අපි ක්‍රියාත්මක කරන්න හදපු කාරණා. හැබැයි, අවාසනාව වන්නේ එම යෝජනා ඒ වචනවලින් නොවුණත් මේ අය වැය තුළත් ක්‍රියාත්මක වෙමින් තිබීමයි. එතකොට 2004දී ඒ ආණ්ඩුව වැට්ටුවේ කවුද? ඒ ආණ්ඩුව වැට්ටුවේ වෙන කවුරුවත් නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණ. විශේෂයෙන්ම එදා රාජපක්ෂ මැතිතුමන්ලාට උදව් කළේ වෙන කවුරුවත් නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණ. අද අවුරුදු 76ක ශාපයක් ගැන කථා කරනවා. හැබැයි, 1994දී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය බලයට ගෙනෙන්නත්, ඒ වාගේම 2005දී මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයට ගෙනෙන්නත්, 2015දී චක්‍රව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බලයට ගෙනෙන්නත් කටයුතු කළේ ජනතා විමුක්ති පෙරමුණ. ඒ නිසා මගේ සහෝදර ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේ අවුරුදු 76ක ශාපයක් කියන කථාව දැන් ඇති. දැන් ඔබතුමුන්නාන්සේලාට බලය ලැබිලා තිබෙනවා. මේ රටේ ජනතාව ඔබතුමන්ලාට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් දීලා තිබෙනවා. ඒ තුනෙන් දෙකක බලයක් ලබා දුන්නේ ඇයි? මේ අවුරුදු පහ අවසානයේදී ඔබතුමන්ලාට කියන්න හේතු නැහැ. මොකද, මේ රටේ ජනතාවට ඔබතුමන්ලා කියන්න ඕනෑ, ඔබතුමන්ලාගේ ආර්ථික මොඩලය මොකක්ද කියලා. ඔබතුමන්ලා විශ්වාස කරන න්‍යාය තුළ මේ රට සංවර්ධනය කරන්නේ කොහොමද කියන කාරණා ඔප්පු කරන්නයි අද මේ අය වැය තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙන්නේ. මේ අය වැය තුළ තමුන්නාන්සේලාගේ ඒ න්‍යායවත්, මතවාදයවත් ඉෂ්ට වෙලා නැහැ කියලා තමයි අපට පෙනෙන්නේ. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(*மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்*)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව රජයේ මංගල අය වැය; ජනතාවාදී අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. පසුගිය දින කිහිපය තුළ විශේෂයෙන්ම අපේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා මේ අය වැය පිළිබඳව හරයාත්මක දේවල් කථා කරන එක වෙනුවට, ජනප්‍රියවාදී කථාවලට මූලිකත්වය දෙමින් අදහස් දක්වන ආකාරයක් තමයි අපි දැක්කේ. අපි හැමදාමත් කියනවා වාගේ ඉදිරියටත් මේ කථාව අනිවාර්යයෙන්ම කිව යුතුව තිබෙනවා. වසර ගණනාවක් තිස්සේ මේ දෙගොල්ලන් එකතු වෙලා රට පාලනය කරලා, ආර්ථික වශයෙන් රට බංකොලොත් කරලා, ආර්ථික අගාධයකට රට ඇද දමලා, සමස්ත සමාජ පද්ධතියම කඩා බිඳවට්ටලා, සුනු විසුනු කරලා තිබුණු තත්ත්වයක් ඇතුළේ තමයි ජාතික ජන බලවේගයේ අපි මේ රට භාරගත්තේ. එහෙව් තත්ත්වයක් ඇතුළේ මේ විපක්ෂය නියෝජනය කරන බොහෝ දෙනාට මේ අය වැයේ තිබෙන යහපත් තත්ත්වයන් පිළිබඳව සාකච්ඡා කිරීම වෙනුවට ජනප්‍රියවාදී කථා කියමින් මේ අය වැය හැල්ලුවට ලක් කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. මම හිතන විධියට ජනතාව විසින් දෙකයි දශම පහට ඇදලා දාපු එහෙව් අයගෙන් ඊට වඩා යමක් අපට බලාපොරොත්තු වෙන්නත් බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි මේ අය වැය ඉදිරිපත් කරන වෙලාවේ විශේෂයෙන් වැඩි අවධානයක් යොමු කරපු ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. වාරිමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම පිළිබඳව මේ අය වැයේ විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. අපේ මහා වාරිමාර්ග පද්ධතිය, සුළු වාරිමාර්ග පද්ධතිය, ග්‍රාමීය මට්ටමේ වාරිමාර්ග පද්ධතිය දියුණු කිරීම ප්‍රධාන අරමුණක් කරගෙන අපි මේ අය වැය තුළ ඒ වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, කෘෂි කර්මාන්තය නඟා සිටුවීම. කෘෂිකාර්මික වශයෙන් අපේ රට දියුණු තැනකට ඔසවා තබන එක තමයි අපේ නව රජයේ මූලික දැක්ම. ඒ වෙනුවෙන් වන ඉතාම ප්‍රායෝගික වැඩ පිළිවෙළ ගණනාවක් මේ අය වැය තුළ අපි යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම තමයි අපේ රජයේ මූලික වැඩ පිළිවෙළ ඇතුළේ ග්‍රාමීය ජන ජීවිතය නඟා සිටුවීම සඳහා වන වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවා.

එක පැත්තකින් "Clean Sri Lanka" වැඩසටහන ඉස්සරහට යන අතර, රාජ්‍ය සේවා පද්ධතිය වාගේම අනෙකුත් සේවා අදාළ කරගත් ඩිජිටල්කරණ වැඩසටහනත්, ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීමේ වැඩසටහනත් ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා විශේෂ මැදිහත්වීම් ගණනාවක් මේ අය වැය තුළින් අපි යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නඟාසිටුවීම සඳහාත් මෙවර අය වැයෙන් අපි වැඩ පිළිවෙළක් යෝජනා කරනවා. මේ බිඳ වට්ටපු ආර්ථිකය අපි දෙගොල්ලන්ම එකතු වෙලා ඉහළට ඔසවා තබනවා නම්, ඒ ඔසවා තැබීමේ කාර්යයේදී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන්න පුළුවන් කණ්ඩායමක් හැටියට අපි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හඳුනාගෙන තිබෙනවා. ඔවුන් වෙනුවෙන් වෙච්ච සුවිශේෂ වැඩ පිළිවෙළ ගණනාවක් අපි මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ, වතු ක්ෂේත්‍රයේ සේවකයන් සම්බන්ධව විශේෂම අවධානයක් යොමු කරලා, ඔවුන් වෙනුවෙන් අවශ්‍ය මැදිහත්වීමත් මේ අය වැය යෝජනා තුළ අපි අන්තර්ගත කරලා තිබෙනවා.

මීට පෙරාතුව අපේ මන්ත්‍රීවරුන් ගණනාවක් සඳහන් කළා, අපේ රටේ විශේෂ ජන ප්‍රජාවක් හැටියට මෙතෙක් අපි සලකපු "මලයගම්" ජනතාව ඉලක්ක කරගෙන ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය, සුඛසාධනය වාගේ පැති පිළිබඳව විශේෂ අවධානයක්, සැලකිල්ලක් අපි යොමු කර තිබෙනවා කියලා. ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රයටත්, සෞඛ්‍යය ක්ෂේත්‍රයටත් සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයකුත් අපි මෙවර වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ අපි බලය ගොඩනැඟුවේ සමස්ත රටම නියෝජනය වන විධියටයි. උතුරේ ජනතාවත්, දකුණේ ජනතාවත්, නැගෙනහිර ජනතාවත්, බටහිර ජනතාවත් -සමස්ත ජනයාම- එකතු වෙලා ගොඩනඟපු මේ බලයට සාධාරණයක් ඉෂ්ට කිරීම අත්‍යවශ්‍යයි. කුහකකමක් නැත්නම් සියලුදෙනාම පිළිගන්නවා ඇති, සියලු පළාත්වලට ජාති භේදයක් නැතිව සංවර්ධන කටයුතු වෙනුවෙන් විශාල මැදිහත් වීමක් කරන්න අපි මේ අය වැය තුළ සමත් වෙලා තිබෙන බව. ඒ විතරක් නොවෙයි.

සමාජය තුළ විවිධ ස්තර නියෝජනය කරන කණ්ඩායම් වෙනුවෙන් අපේ අවධානය මේ වෙද්දි යොමු කර තිබෙනවා. අපි දන්නවා, ලංකාවේ බොහෝ ප්‍රදේශවල සිටින වකුගඩු රෝගීන් විශාල පීඩනයකට ලක් වෙලා ඉන්න බව. ඔවුන්ට අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීම ඉතාම දුෂ්කර කටයුත්තක් වෙලා තිබෙනවා. විශේෂම අවධානයක් යොමු කරලා, මෙවර අය වැයෙන් ඔවුන් වෙනුවෙන් සැලකිය යුතු ප්‍රතිපාදනයක් වෙන් කරන්නත් අපි සමත් වෙලා තිබෙනවා.

ආබාධ සහිත පුද්ගලයන් කියන්නේ, විශේෂයෙන් අපේ අවධානයට ලක් විය යුතු, ලක් කළ යුතු කණ්ඩායමක්. හැබැයි, ඒ අය සමාජයේ බොහෝදෙනාගේ අවධානයට යොමු වෙන්නේ නැහැ. නමුත්, මේ ජනතාවාදී රජය ඒ ආබාධිත ප්‍රජාව වෙනුවෙන් ප්‍රමුඛ අවධානයක් යොමු කරලා ඔවුන්ගේ කාර්යයන් වෙනුවෙන් විශේෂ මැදිහත් වීමක් කරන්න මේ අය වැයෙන් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සහ රැඳවුම් භාරයේ ඉන්න ළමුන් ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න මෙවර අය වැයෙන් අපි සමත් වෙලා තිබෙනවා. මේ වාගේ ඉතාම සාධනීය, ඉතාම ප්‍රබල, බොහෝදෙනාගේ අවධානය යොමු නොවන ක්ෂේත්‍ර පිළිබඳව අපේ අය වැයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. විපක්ෂය මේ තත්ත්වය පිළිබඳව සාධනීයව බලන්නේ නැතිව සාම්ප්‍රදායිකව හැම දාම තිබෙන ඔවුන්ගේ විවේචනය ඉදිරිපත් කරන්න තමයි පෙලඹිලා තිබෙන්නේ. අපි පසුගිය දවස්වලත් ඒ තත්ත්වය දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය පසුගිය දින කිහිපය තුළ බොහෝදෙනා සාකච්ඡා කරපු මාතෘකාවක්. රාජ්‍ය සේවාවේ වැඩි පංගුවක් නියෝජනය කරන කොටස තමයි, ගුරුවරුන් සහ විදුහල්පතිවරුන්. රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව ලක්ෂ 14කට ආසන්නව තිබියදී, ඒ අතරින් ලක්ෂ දෙකහමාරක් විතර නියෝජනය වෙන්නේ අපේ රටේ ගුරුවරුන්ගෙන් සහ විදුහල්පතිවරුන්ගෙන්.

පසුගිය කාලයේ විපක්ෂය විසින් මතයක් හදන්න උත්සාහ කළා, ඒ වාගේම විපක්ෂය විසින් හදන මතයට සමාන්තරව එළියේ ඉන්න ඔවුන්ගේ කණ්ඩායම විසින් ක්ෂේත්‍රය තුළ මතයක් හදන්න උත්සාහ කළා, ගුරුවරුන්ට අවශ්‍ය වැටුප් වැඩිවීම සිද්ධ වුණේ නැති බවත්, ගුරුවරුන් බලාපොරොත්තු වූ පරිදි විෂමතාව ඉවත් වුණේ නැහැ කියාත්. ඔවුන් එවැනි මතයක් සමාජය තුළ හදන්න උත්සාහයක් ගත්තා. මමත් ගුරු සේවාව තුළ අවුරුදු 25කට වැඩි කාලයක් කටයුතු කරපු කෙනෙක්. මේ වැටුප් වැඩිවීමේ තත්ත්වය හරියටම ගළපා ගත්තාම මේ වෙනස්කම තේරුම් ගන්න පුළුවන්කම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් අය වැය ලේඛනයක් ඉදිරිපත් කරනකොට සාම්ප්‍රදායිකව අපි දැකපු කාරණයක් තිබෙනවා. මුදල් අමාත්‍යවරයා විසින් අය වැය කථාව කියවනකොට, රාජ්‍ය සේවකයාගේ වැටුප රුපියල් 5,000කින් වැඩි කරනු ලැබේ කියලා කියනවා. ඔක තමයි සාමාන්‍ය සම්ප්‍රදාය. එහෙම කිව්වා නම් එය රාජ්‍ය සේවකයාට තේරෙනවා. හැබැයි, අපේ රජය රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩිවීම සම්බන්ධ කාරණය විද්‍යාත්මක ක්‍රමවේදයකට ගළපා, විධිමත් ආකාරයකට සකස් කරලා, ක්‍රමානුකූලව, පියවරෙන් පියවර අදියර කිහිපයක් යටතේ එය සිද්ධ වෙන්නේ කොහොමද කියලා පැහැදිලි කළාම බොහෝදෙනාට ඒක තේරුම් ගන්න අමාරුයි. පසුගිය කාලයේ අපි ගුරුවරුන්, විදුහල්පතිවරුන් හැටියට පාරට බැහැලා විශාල අරගළයක් කළා, ගුරුවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න කියා. ඒ විෂමතාව ඉවත් කරන්න කියලා අපි ඉල්ලා සිටි පදනමක් තිබුණා. ඒ පදනමේ හැටියට ගත්තාම, මේ අය වැය ලේඛනය ඇතුළේ ඒ බලාපොරොත්තු වුණු සීමාවත් ඉක්මවා ගිය වැටුප් වැඩිවීමක් පෙනෙන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේදී මම ගුරු සේවාව තුළින් ඊට උදාහරණ කිහිපයක් දක්වන්න කැමැතියි. ගුරු සේවය තුළ 2 පන්තිය-II ශ්‍රේණියට අයත් ගුරුවරයෙකුගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න කියලා ඉල්ලා සිටි ගණන තමයි, රුපියල් 47,615. ගුරු සේවය තුළ වැටුප් විෂමතාවක් තිබෙනවා. ඒ විෂමතාව ඉවත් කරන්න ගුරු සේවයේ 2 පන්තිය-II ශ්‍රේණියට අයත් ගුරුවරයෙකුට රුපියල් 47,615ක වැටුපක් දෙන්න කියලා ඉල්ලුවා. නමුත්, මේ අය වැය තුළ ඒ අයට රුපියල් 66,880ක් යෝජනා කර තිබෙනවා. මෙන්න මේකයි අපි තේරුම් ගන්න ඕනෑ. විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ වෙලාවේ සභාවේ නැහැ. කොහේ හරි තැනක ඉඳලා එතුමන්ලා අහගෙන ඉන්නවා නම් හෝ පස්සේ වෙලාවකදී මේ කථාව අහනවා නම් හෝ මේ වෙනස තේරුම් ගන්න පුළුවන්. වැටුප් විෂමතාව ඉවත් කිරීමේදී ඒ අයගේ වැටුප රුපියල් 47,615ට ගෙනෙන්න කියලායි ඉල්ලුවේ. නමුත්, අපි යෝජනා කරන මේ වැටුප් වැඩිවීම ඇතුළේ එය රුපියල් 66,880ක් දක්වා වැඩි වෙනවා. වෙනස්කම රුපියල් 19,265යි.

ඊළඟට, ගුරු සේවයේ 2 පන්තිය-I ශ්‍රේණියට අයත් ගුරුවරයෙකුගේ වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා ඉල්ලා සිටි වැටුප් තලය තමයි රුපියල් 62,595. අපි මෙම අය වැය තුළ යෝජනා කර තිබෙන්නේ එය රුපියල් 81,780ට ගෙන එන්නයි. එතකොට ඒ වෙනස රුපියල් 19,185යි. ගුරු සේවයේ 1 පන්තියට අයත් ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කරන්න කියලා ගුරු-විදුහල්පති සේවාවලින් ඉදිරිපත් වූ යෝජනාව තමයි, රුපියල් 76,175. නමුත්, අපේ මේ යෝජනාවලියට අනුව එම වැටුප රුපියල් 98,580ක් දක්වා වැඩි වෙනවා. ඒ අනුව රුපියල් 22,405කින් අපි අර බලාපොරොත්තු වුණු සීමාව ඉක්මවා යනවා. මීට අමතරව සාමාන්‍යයෙන් පොදුවේ රාජ්‍ය සේවකයන් සියලුදෙනාගේ වාර්ෂික වැටුප් වර්ධකය සියයට 80කින් වැඩි වෙනවා. ඒ තුළත් ඔවුන්ට ප්‍රතිලාභයක් ලැබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු ගමගෙදර දිසානායක මහතා
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන විනාඩි කිහිපයේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය දවස්වල විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් මතු වුණු කාරණා කිහිපයක් මෙතැනදී විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. පසුගිය දවසක අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක් මේ සභාවේදී බොහොම සැර විධියට ප්‍රජාතන්ත්‍රවාදය වැළලෙනවෝ කියලා කථා කළ ආකාරය අපි දැක්කා. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව මුර දේවතාවුන් වාගේ කථා කරන මේ අය ඒ කාල වකවානුවල කටයුතු කළේ කොහොමද කියන එකට සාක්ෂි මම මේ ජංගම දුරකථනය තුළින් පෙන්වන මේ ඡායාරූපවල තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔය කථා කරපු කෙනාගේ තාත්තා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එක්තරා යුගයක ඔහු පාර්ලිමේන්තු මැතිවරණයට තරග කළ අවස්ථාවක බැනර් එකක් දැම්මා, "ලග්ගලින් විජය දිනවමු" කියලා.

යම්කිසි ප්‍රතිවිරුද්ධවාදී කණ්ඩායමක් ගිහිල්ලා ඒ බැනර් එක ඉවත් කළා. ඒ බැනර් එක ඉවත් කළාට පසුව ඔය කියන ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මොර දෙන එතුමියගේ තාත්තා මැර කණ්ඩායම් දාලා එක දවසක රාත්‍රියේ 8දෙනෙක් ඝාතනය කළා. ඔන්න, ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් කථා කරන අයගේ කෙරුවාව. එහෙව් අය තමයි අද මේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සළුපිළි පොරවාගෙන ප්‍රජාතන්ත්‍රවාදය විනාශයි කියලා කෑ මොර දෙන්න පටන්ගෙන තිබෙන්නේ. මේ වාගේ සිද්ධි ගණනාවක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඔය කියන කෙනාගේම තාත්තා මාතලන් කියන ඩ්‍රයිවර්ට යම් සිද්ධියක් වුණාට පසුව - එතුමියගේ පියාගේ රියදුරු තමයි මාතලන් - රටම දන්නා සිද්ධියක් වුණා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ "අල්විස් පොකුණ" කියලා එකක් තිබෙනවා. අපි කවුරුත් එය "අල්විස් පොන්ඩ්" එක කියලා හඳුන්වනවා. එක දවසක රාත්‍රියේ තරුණ ජීවිත 24ක් ඝාතනය කළා. බෙල්ල දක්වා කපලා ඒ ඔළු ගෙනැල්ලා ගහලා තිබුණා, ඒ අල්විස් පොන්ඩ් එක වටේට. ඔන්න, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කෑ මොර දුන්නු නෝනලාගේ තාත්තලාගේ වැඩ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහොම තමයි ඒගොල්ලන්ගේ බලය පාවිච්චි වුණේ. තරුණයින් විශාල වශයෙන් සංහාරය කළා. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව දැන් ඒ අයට හඬා වැටෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගහන්න එපා කියන පණිවුඩය ඒ අයට දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නව රජයක් හැටියට අපි පුරවැසි අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ පුරවැසි අය වැය ඉදිරි මාස කිහිපය තුළ ක්‍රියාත්මක කරලා, මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ගොඩනඟන්න අපි නව රජයක් හැටියට මොන බාධක, අභියෝග ආවත් ඇප කැප වෙනවා, මැදිහත් වෙනවා කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.13]

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තූතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ රටේ ආර්ථික, සමාජයීය, දේශපාලන පරිවර්තනයක් බලාපොරොත්තු වන, ජනතා සිතුම් පැතුම් මල්ඵල ගැන්වෙන අය වැයක්. ඒ අය වැය ලේඛනය දෙවනවර කියවීම සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේදී

[ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය]

මීට ප්‍රථම මේ රටේ පැවැති තත්ත්වය අපට අමතක කරන්න බැහැ. මේ රටේ පැවැති බංකොලොත්භාවය නිසා ව්‍යත්තිකයන් ශීඝ්‍රයෙන් රට අත්හැර යන තත්ත්වයක් තිබුණා. මෙවර අය වැයෙන් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීමක් වෙලා තිබෙනවා. රජයේ සේවකයන් දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලා සිටි වැටුප් වැඩිවීමක් තමයි මෙවර අය වැයෙන් ලබා දී තිබෙන්නේ. මොකද, ඔවුන් ඉල්ලා සිටියේ වෙනත් දීමනා වශයෙන් වෙන වෙනම එල්ලා නොවෙයි, මූලික වැටුපට වැටුප් වැඩිවීමක් කරන්න කියායි. පොදුවේ හැම රජයේ සේවකයෙකුගේම ඒ ඉල්ලීම මෙවර අය වැය තුළින් ඉටු වෙලා තිබෙනවා. ඒ වැටුප් වැඩිවීම නිසාම අපි දන්නවා, යම්කිසි කෙනෙකුට ණය මුදලක් ඉල්ලන්න පුළුවන් බව. ණය මුදලක් ඉල්ලන්න ගියාම යම්කිසි වැටුප් සීමාවකට, මූල්‍යමය සීමාවකට යටත්ව තමයි ඒ ණය මුදල් අනුමත වෙන්නේ. මම නීතිඥ ව්‍යත්තියේ යෙදිලා සිටින නිසා දන්නවා, රජයේ සේවකයෙක් රාජ්‍ය බැංකුවකින් ණයක් ගන්න ගියාම වැටුප් වාර්තා අරගෙන එන බව. නමුත්, සියලුම ලේඛන -හැම දෙයක්ම- නිවැරදි පරිදි තිබියදීත් වැටුප් සීමාව ඉක්මවා නැති නිසාත්, වැටුපේ සුළු මුදලක -රුපියල් එකසිය ගණනක වාගේ- අඩුවක් නිසාත් ඇතැම් අවස්ථාවල ඒ ණය ඉල්ලුම්පත ප්‍රතික්ෂේප වෙනවා. එය මගේ අත්දැකීමෙන්ම දන්නවා. එහෙම වුණාම ඒ අය වෙනත් පෞද්ගලික බැංකුවක් හෝ පෞද්ගලික මූල්‍ය ආයතනයක් හරහා රාජ්‍ය බැංකුවේ තිබෙන පොලියට වඩා සියයට 5ක, 6ක අධික පොලියකට ගිවිසුම්ගත වෙන්න පෙලඹෙනවා. ඇයි, ඒ? වැටුප් වැඩිවීම් මූලික වැටුපට එකතු වෙලා නොතිබීම මත තමයි රාජ්‍ය බැංකුවකින් ඒ ණය මුදල ලබා ගන්න නුසුදුස්සෙක් බවට ඒ පුද්ගලයා පත් වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය කාන්තාවන්ට විශේෂයෙන්ම බලපාන කාරණයක්.

අපි පසුගිය කාලයේ දීර්ඝව කථා කරපු කාරණයක් තිබුණා. ඒ තමයි, කාන්තාවන් ණයක් ලබා ගන්න ගියාම ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලට හසුවීම සම්බන්ධ කාරණය. කාන්තාවන් මෙවැනි තත්ත්වයට පත් වෙන්නේ ඇයි? මම කලින් කිව්වා වාගේ රජයේ සේවකයෙක් හෝ පෞද්ගලික අංශයේ සේවකයෙක් ණයක් ලබා ගන්නේ ඔවුන්ගේ යම්කිසි මූලික අවශ්‍යතාවක් සම්පූර්ණ කර ගන්නයි. ඒ අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම සඳහා ඔවුන් ඒ අවස්ථාවේ අත ළඟ තිබෙන පහසු විසඳුමකට පෙලඹෙන එක නිරායාසයෙන්ම ස්වාභාවිකයි. එවැනි ණයක් ගත්තාම ඒක අධික පොලියත් එක්ක ගෙවා ගන්න බැරි වීම නිසා කාන්තාවන් සිය දිවි නසා ගැනීම දක්වාම ඒ තත්ත්වය ඉහළ ගිහින් තිබෙනවා. මේ හේතුව නිසා පවුල් ජීවිත බිඳ වැටීම, ලිංගික අල්ලස් ඉල්ලීම වැනි නොයෙකුත් දේ සිදු වෙනවා. උපරිමය විධියට කාන්තාවන් සිය දිවි නසා ගැනීම දක්වාම මේ තත්ත්වය උග්‍ර වුණා. හැබැයි, මේ ගරු සභාව නියෝජනය කරමින් හිටපු කාන්තා මන්ත්‍රීවරියන්ගෙන් සමහර උදව්ය අදත් මේ පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතවරියන් වශයෙන් ඉන්නවා. ඔවුන් කවුරුවත් එදා මේ සම්බන්ධයෙන් හඬක් නැඟුවේත් නැහැ. අපේ රටේ කාන්තාවන්ට නිවැරදිව රාජ්‍ය බැංකුවකින් ණය ලබා ගැනීමට ඇති බාධා මොනවාද කියලා සොයා බැලුවේත් නැහැ. අපි අද ඒක ජය ගැනීමට පළමුවැනි පියවර තබා තිබෙන බව මම කියනවා.

ඒ වාගේම, කාන්තාවන් හා දරුවන් සම්බන්ධයෙන් කථා කරද්දී මම මේ කාරණයත් කියන්න කැමතියි. මෙවර අය වැයෙන් පෙර පාසල් දරුවන්ට උදෑසන ආහාර වේල සැපයීමේ වැඩසටහන යටතේ එක් ආහාර වේලකට කරනු ලබන ගෙවීම රුපියල් 60 සිට රුපියල් 100 දක්වා වැඩි කරන්න අපි යෝජනා කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කිරීම මේ අය වැයෙන් සිදු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ සියලුදෙනා බොහෝ අවස්ථාවලදී කෑ ගසා කියපු කාරණයක් තමයි අපි ත්‍රිපෝෂ නිෂ්පාදනය සහ බෙදා හැරීම නවත්වනවා කියන එක. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ත්‍රිපෝෂ ලබා දීම සඳහා රුපියල් මිලියන 5,000ක් මෙවර අය වැය ලේඛනයෙන් වෙන් කර තිබෙනවා. විපක්ෂයෙන් නිතරම කිව්වේ අපි ත්‍රිපෝෂ නිෂ්පාදනය සහ බෙදා හැරීම නතර කරනවා කියායි. නමුත්, අපි මේක වැදගත්කොට සලකන්නේ ඇයි? විශේෂයෙන්ම මම ජීවත් වන මහනුවර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ජනතාව විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ දරුවන්ට මූලික පෝෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීමේදී ත්‍රිපෝෂ කියන ආහාරය ඉතා වැදගත් පිටිවහලක් වෙනවා. එහි පෝෂණය ඉතා උසස් තත්ත්වයේ පවතිනවා. ඒ වාගේම අනෙක් අතට කාන්තාවක් හැටියට, මවක් හැටියට වෙනත් ආහාරයක් කඩිමුඩියේ දරුවාට පිළියෙල කරලා දෙන්න ගියාම ඒ සඳහා කොපමණ දේවල් අවශ්‍ය වෙනවාද? නමුත්, ත්‍රිපෝෂ කියන එක වැඩි වෙහෙසකින් තොරව සාදා ගන්නත් පුළුවන්. ඒ වාගේම, ඒක සාදා ගැනීමට වැඩිපුර වෙනත් ද්‍රව්‍ය අවශ්‍ය වෙන්නේත් නැහැ. ඒක දරුවාට දෙන්න පුළුවන් පෝෂණීය ආහාරයක්. අපි ඒ අතිරේක ආහාරය රැක ගන්න මේ අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීතුමෙක් සඳහන් කළා, ඔටිසම් ඇතුළු ස්නායු ආබාධ සහිත දරුවන් වෙනුවෙන් මේ අය වැයෙන් ලබා දී තිබෙන ප්‍රතිපාදන සම්බන්ධයෙන්. එතුමා ඒ ගැන ඉතා ප්‍රශංසාත්මකව කථා කළා. ඒක ඉතා වැදගත් දෙයක්. අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හොයාගෙන තිබෙනවා, මේ රටේ උපදින දරුවන්ගෙන් සියයට 10ක් විතර මේ වාගේ ආබාධ සහිතව උපදිනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි ආබාධ සහිතව උපදින දරුවන් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ යම් වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා කියලා අපට දැනගන්න ලැබිලා තිබෙනවා. පවුල් සෞඛ්‍ය සේවිකාවන් සායන මට්ටමේදී මේ වාගේ දරුවන් හඳුනා ගැනීම සිද්ධ වෙනවා. ඒ දරුවන් හඳුනා ගත්තාම MOH කාර්යාලය මඟින් ඒ දරුවන් අදාළ රෝහල්වලට යොමු කරනවා. ඒ රෝහල්වලදී මේ දරුවන්ට ඊට අදාළ ප්‍රතිකාර සහ සායනික චිකිත්සාව සිදු කරනවා. මහනුවර දිස්ත්‍රික්කයේ මෙවැනි රෝහල් කිහිපයක් තිබෙනවා. ඒවා තමයි, දිගන පුනරුත්ථාපන රෝහල, පේරාදෙණිය ශික්ෂණ රෝහල, මහනුවර ජාතික රෝහල වාගේම ගම්පොළ මූලික රෝහල. මෙම රෝහල්වලින් මේ දරුවන්ට ඒ ප්‍රතිකාර ලබා දෙනවා. ඒ ක්ෂේත්‍රයේ වෛද්‍යවරු පැහැදිලිව කියනවා, ඔටිසම් වැනි ආබාධයක් වයස අවුරුදු 3ට අඩුවෙන් හඳුනා ගත්තොත් ඒක සියයට සියයක්ම වාගේ සුව කිරීමේ පහසුකම් අපේ රට තුළ තිබෙනවාය කියලා. එම නිසා මෙවැනි දරුවන් වෙනුවෙන් මුදල් වෙන් කිරීමේ වැදගත්කම මේ තුළින් ඔබතුමන්ලාට වැටහෙනවා ඇති. ඒ වාගේම ඔටිසම් ඇතුළු ස්නායු ආබාධිත දරුවන් සඳහා සියල්ල අන්තර්ගත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 250ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා.

මෙවැනි සංවර්ධන යෝජනා මීට කලින් ක්‍රියාත්මක වුණේ කොහොමද? රටේ නායකයා හෝ පක්ෂයේ නායකයා හෝ තමන්ගේ එක එක මන්ත්‍රීවරයා, ඇමතිවරයා හෝ තමතමන්ට තිබෙන පෞද්ගලික හිතවත්කම් මත තමයි ඒ කාලයේ මේ දේවල් කළේ. ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කිරීමේදීත් මේ කථාව කිව්වා.

අපි එහෙම නොවෙයි කරන්නේ. සංවර්ධන යෝජනා සමානව රට පුරා බෙදී යනවා. ගරු ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව සඳහන් කළා, අවශ්‍යතාව මත තමයි සංවර්ධන යෝජනා රට පුරා බෙදී යෑම සිද්ධ වෙන්නේ කියන එක. අපි බලාපොරොත්තු වෙන්නේ,

රට පුරා ඒකාත්මික සංවර්ධනයක්. අපේ ගම්වල කථාවක් තිබෙනවා, "බත් ඇති තැනටමලු කොස්" කියලා. අන්න ඒ වාගේ තිබෙන තැනටම තව තවත් දෙනවා නොවෙයි. සමානව සංවර්ධනයක් ඇති කිරීම අපේක්ෂා කරමින් තමයි, අපි මේ අය වැය යෝජනාවලිය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේම, ප්‍රවාහනය ගැනත් මේ අය වැයෙන් කථා කරලා තිබෙනවා. ඇත්තටම අපි පසු ගිය කාලයේ වැඩ නිම වෙලා ගෙදර යන කාන්තාවන් ගැන කථා කළා. ඒ කාන්තාවන් කොහොමද යන්නේ? බොහෝ අය රජයේ සහ පෞද්ගලික අංශයේ සේවය කරන අය. ඒ නිසා අපට හොඳ ප්‍රවාහන සේවයක අවශ්‍යතාව තිබෙනවා. එහෙම හොඳ ප්‍රවාහන සේවයක් බලාපොරොත්තු වෙන අපි, ඒ සඳහා මේ මුදල් වෙන් කිරීම් ඉතා ප්‍රශස්තයි කියලා කියනවා.

ඒ වාගේම කෘෂි කාර්මික භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් දුම්රිය යොදා ගන්න මේ අය වැයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. මගේ ආසනය නාවලපිටිය. ඒක දුම්රිය නගරයක්. අපි දැකලා තිබෙනවා, ඉස්සර කාලයේ බණ්ඩාරවෙල සිට කැපූ මල් ප්‍රවාහනය කළේ දුම්රියෙන්. නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොයි තරම් කෘෂි කාර්මික නිෂ්පාදන තිබෙනවාද කියලා ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා කිව්වා. ඒ නිෂ්පාදන ප්‍රවාහනයට දුම්රිය යොදා ගන්න පුළුවන්. හැබැයි, දුම්රිය දියුණු කරනවා වෙනුවට, ඒ ප්‍රදේශයේ හිටපු දේශපාලනඥයන් මොකද කරලා තිබෙන්නේ කියලා මම කියන්නම්. දුම්රිය ඉඩම්වලට මොකද සිද්ධ වුණේ, කොහොමද දුම්රිය සංවර්ධනය කරන්නේ? රජයේ ඉඩම් (ඝන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ, නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ 75858 නඩු අංකය යටතේ නඩුවක් තිබුණා, පර්චස් 11.25ක් පෞද්ගලික පරිහරණයට ලබා ගැනීම සම්බන්ධයෙන්. පසු කාලීනව බදු පදනම යටතේ හෝ කුමන පදනමක් යටතේ හෝ අවසරයක් අරගෙන තිබෙනවා. හැබැයි, පර්චස් 78කට වැඩි ප්‍රමාණයක් අනවසරයෙන් භුක්ති විඳිනවා. ඒ වාගේම, ඒ ස්ථානයේ තිබුණු දුම්රිය සංචාරක බංගලාවට මොකද වුණේ? ඒ ස්ථානයේ තිබුණු කම්කරු නිවාස පෙළට මොකද වුණේ? මේවා ජනතාව ප්‍රශ්න කරනවා. කොහොමද, එතකොට පොදු ප්‍රවාහනය දියුණු කරන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) துஷாரி ஜயசிங்ஹ)
(The Hon. (Mrs.) Thushari Jayasingha, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව මිනිත්තුවක් දෙන්න.

ඒ වාගේම, මහනුවර දිස්ත්‍රික්කය කියන්නේ සියලු ශ්‍රී ලාංකික ජන ප්‍රජාව එක හා සමානම ජීවත් වෙන ප්‍රදේශයක්. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ වාගේම යුරේෂියානු කියන ජනතාවත් ඉන්නවා. ඒ සියලු දෙනාට මුළු ශ්‍රී ලාංකික ජනතාව හැටියට එකතු වෙන්න පුළුවන් ශ්‍රී ලාංකික දිනයක් ඇති කර ගැනීමටත්, මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා. අන්න ඒ ශ්‍රී ලාංකික දිනය සහ සමස්ත ශ්‍රී ලාංකික ජාතියක් වශයෙන් නැඟී සිටීම සම්බන්ධයෙන් අය වැය යෝජනාවේ මේ සඳහන් ප්‍රතිපත්ති ඉතා ප්‍රශස්තයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුනිල් බියන්විල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.25]

ගරු සුනිල් බියන්විල මහතා
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ මංගල අය වැය ලේඛනය ඉදිරිපත් කළාට පස්සේ, විපක්ෂයේ කණ්ඩායම් හොඳටම කලබල වෙලා ඉන්නවා. ඇයි, මේ කලබල වෙලා ඉන්නේ? ඒ ගොල්ලන් හිතුවා, ඒ ගොල්ලන් කඩා වට්ටපු රට ආයෙත් කිසිම කෙනෙකුට ගොඩ දමන්න බැරි වෙයි කියලා. අපි ඉතා කෙටි කාලයක් ඇතුළත, මාස තුනක් වාගේ කාලයක් තුළ අන්න ඒ තත්ත්වය වෙනස් කරලා, අපේ රටේ ආර්ථිකය යම් ප්‍රමාණයකට ශක්තිමත් කරලා, හොඳ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා ඒ ගොල්ලන් කල්පනා කරනවා, දැන් මේකට අභියෝග කරන්න පුළුවන් වෙන්නේ ජනතාව රවට්ටලා තමයි කියලා. ඒ අර්ථයෙන් විවිධ දේවල් කියනවා, ජනතාව රවට්ටන්න. හැබැයි, කල්පනා කරලා බලන්න. ඉතිහාසයේ කවදාවත් මෙවැනි අය වැයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. මුල් කාලයේ මේ ගොල්ලන් කිව්වා, මේ ආණ්ඩුවට යන්න පුළුවන් වෙන්නේ මාස හයයි, ඊට වඩා යන්න බැහැ කියලා. හැබැයි, අද විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කියනවා, අවුරුදු දෙකයි මේ ආණ්ඩුවට යන්න පුළුවන් වෙන්නේ කියලා. ඇයි, මොහොතින් මොහොත වෙනස් වෙනවා. අපිට මතකයි, මීට පෙර මැතිවරණ කාලයේ විපක්ෂයේ අය මොකක්ද කිව්වේ කියන එක. මාලිමාවට නම් ඡන්දය දෙන්න එපා. දුන්නොත් ආගම ඉවරයි කිව්වා. ජාතිය ඉවරයි කිව්වා. පෙරහැර ඉවරයි කිව්වා.

හැබැයි, මොකද වුණේ? අද ඒ මොනවත් වෙලා තිබෙනවාද? නැහැ. රට හොඳ ශක්තිමත් ගමනක් යනවා. ඉතින් අද මේ විපක්ෂයේ අය ජනතාවගෙන් සමාව ගන්න ඕනෑ, "එදා අපි බොරු කිව්වා, බොරු කියලා අපි මේ රටේ ගමන වෙනස් කරන්න උත්සාහ කළා" කියලා. අන්න, එතැන ඉඳලා තමයි මේ විපක්ෂයේ අය නැවත ජනතාව අමතන්න ඕනෑ.

අපි මේ වෙලාවේ විපක්ෂයේ කණ්ඩායමට ස්තුතිවන්ත වෙනවා. ඇයි? මහ මැතිවරණය එන වෙලාවේ අපි මෙච්චර ජයග්‍රහණයක් බලාපොරොත්තු වුණේ නැහැ; අපි ආසන 159ක් බලාපොරොත්තු වුණේ නැහැ. හැබැයි, අපිට 159ක කණ්ඩායමක් ලැබුණේ කොහොමද? අපිට එහෙම ලැබුණේ මේ විපක්ෂයේ කණ්ඩායම අසමත් වුණා ඒගොල්ලන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් වැඩ කරන්න. ඒගොල්ලන් විවිධ බොරු කිව්වා. බොරු කියන වෙලාවේ ජනතාව තේරුම් ගත්තා මේගොල්ලන්ට ඡන්දය දීලා කවදාවත් හරියන්නේ නැහැ, අනිවාර්යයෙන් මාලිමාවට ඡන්දය දෙන්න ඕනෑ කියලා. ඒ වෙලාවේ ජනතාව අපට ලොකු බලයක් අරගෙන දුන්නා. ඒකට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ දැන් විපක්ෂය මොකද කරන්නේ? අය වැය ආවාට පස්සේ අන්න තව කලබල වෙලා. මේගොල්ලන් මොකක්ද කියන්නේ? මේ ආණ්ඩුවට මාස හයයි කියනවා; අවුරුදු දෙකයි කියනවා. මේකෙන් වෙන්නේ මොකක්ද? බිමේ ජනතාවට ප්‍රශ්නයක් නැහැ. රාජ්‍ය සේවකයෝ සතුටින් ඉන්නවා. ගොවියෝ සතුටින් ඉන්නවා. රටේ නිෂ්පාදන ආර්ථිකයක් හැදෙමින් තිබෙනවා. මේ වෙලාවේ රටේ ජනතාවට ඇත්ත පණිවුඩයක් දෙන්න බැරි වුණාම විපක්ෂයට වෙන්නේ මොකක්ද? ඊළඟ ප්‍රාදේශීය සභා මැතිවරණයෙනුත් විශිෂ්ට ජයග්‍රහණයක් මාලිමාව අත්පත් කර ගන්නවා. ඒ නිසා දැන් විපක්ෂයට සටන් පාඨ නැහැ. ඒ නිසා දවසින් දවස, දවසින් දවස මාලිමාව ඉස්සරහට යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මේ අය වැය තුළ අපිට විශේෂ කාරණා කිහිපයක් දකින්න තිබෙනවා. ඒ ගැන අපේ සහෝදරවරු මතු කළා. කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තොත්,

[ගරු සුනිල් බියන්විල මහතා]

විශේෂයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ පොල් කර්මාන්තය සම්බන්ධව කථා කළ යුතුයි. පසුගිය ඉතිහාසය පුරාම මාතලේ දිස්ත්‍රික්කය තුළ පොල් නිෂ්පාදනය ඉතාම ඉහළින් තිබුණා. හැබැයි, මෙය නඩත්තු නොකරන නිසා, පොහොර සහනාධාර නැති නිසා නිෂ්පාදනය කඩා වැටුණා. අන්න, ඒ තත්ත්වයන් තේරුම් අරගෙන පොල් නිෂ්පාදනය වැඩි කරන්න මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි දන්නවා ඉන්දියාව වාගේ රටවල පොල් ගසකින් ගෙඩි 150ක විතර අස්වැන්නක් ගන්න බව. එහෙම ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ ඒ පොල් ගස්වලට ඕනෑ කරන දේ -පොහොර, වතුර- දෙන නිසා. හැබැයි, අපේ රටේ වෙලා තිබෙන්නේ පසුගිය ඉතිහාසය පුරාම පොල් ගසට ඕනෑ විධියට හැදෙන්න හැරියා. එහෙම තත්ත්වයක් තුළ අපට මේ අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වුණා. අන්න ඒ අර්බුදය තේරුම් අරගෙන පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මෙවර අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම කෘෂිකර්මයට විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා 2027 විතර වන විට පිට රටින් ගෙනෙන කෘෂි නිෂ්පාදන විශාල ප්‍රමාණයක් නතර කර ගන්න; සියයට 75ක ප්‍රමාණයක්වත් නතර කර ගන්න; ඩොලර් විශාල ප්‍රමාණයක් ඉතිරි කරගෙන අපේ සංචිත ඉහළ දමා ගන්න. කොහොමද, අපි ඒක කරන්නේ? විශේෂයෙන් ගත්තොත්, අල, ලූනු, රතු ලූනු විශාල ප්‍රමාණයෙන් අපේ රටට ගෙනෙනවා. අපි මේවා ආනයනය අඩු කර ගන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් බඩඉරිඟු නිෂ්පාදනය වැඩි කරන්න අපි මේ වෙලාවේ සැලසුම් හදමින් ඉන්නවා. පසුගිය අවුරුදු කිහිපය තුළම අපේ රටේ හෙක්ටෙයාර 10,000ක විතර තමයි බඩඉරිඟු වගා කරලා තිබෙන්නේ. අපි සැලසුම් කරලා තිබෙනවා මේ අය වැයෙන් පස්සේ හෙක්ටෙයාර 35,000ක භූමි ප්‍රමාණයක බඩඉරිඟු වගා කරන්න. හෙක්ටෙයාර 35,000ක භූමි ප්‍රමාණයක බඩ ඉරිඟු වගා කරන එක ඇතුළේ සත්ව ආහාරවලට සහල් ගන්න එක නතර කර ගන්න, ත්‍රිපෝෂ කර්මාන්තශාලාව අර්බුදයක් නැතිව ඉස්සරහට ගෙනියන්න අපි බලාපොරොත්තු වෙනවා. අන්න, එහෙම_අරමුණු සහිතව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිෂ්පාදනය අපි වැඩිදියුණු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. අපි මේ වෙලාවේ පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළව විවිධ සැලසුම් හදමින් ඉන්නවා. ඒ සඳහා විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අපේ රටේ ඉතිහාසය පුරාම -අවුරුදු 70 ගණනක් තිස්සේම- පශු සම්පත් ක්ෂේත්‍රයට මේ වාගේ ශක්තියක් දුන්නේ නැහැ. උදාහරණයක් විධියට කිරි ගවයන් කර්මාන්තය ගත්තොත්, එය කර්මාන්තයක් හැටියට ඉස්සරහට ගෙන ගියේ නැහැ. ඒක හරකුන් හදන විධියට තමයි මේ වෙනතුරුම අරගෙන ආවේ. ඒ තුළ විශාල නිෂ්පාදනයක් අපට ලබා ගන්න බැහැ. ඒ නිසා මේවා කර්මාන්ත බවට පත් කර නිෂ්පාදනය වැඩි කරන්න අපි කල්පනා කරනවා. දියුණු ගවයන් අභිජනනය කරලා, ඒ හරහා කිරි නිෂ්පාදනය විශාල වශයෙන් වැඩි කරගෙන, ඒ පැත්තෙන් අපේ රට ශක්තිමත් කරන්න අපි බලාපොරොත්තු වනවා.

අපි කල්පනා කරනවා, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් හදන්න; කෘෂිකර්මය දියුණු කරනවා වාගේම ඒ නිෂ්පාදනවලට හොඳ වෙළෙඳ පොළක් හදන්න. අන්න ඒ වෙළෙඳ පොළ හදන්න අපි සමුපකාර ක්ෂේත්‍රය දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ බලාපොරොත්තුව තියාගෙන තමයි මෙවර අය වැයෙන් අපි ආණ්ඩුවක් හැටියට මේ සමුපකාර ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙන්නේ.

අපි සමුපකාර, නිෂ්පාදන සමුපකාර බවට පත් කරනවා. විශේෂයෙන් මා නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කය ආදි දිස්ත්‍රික්ක ගත්තොත්, සුළු අපනයන භෝග විශාල වශයෙන් නිෂ්පාදනය වෙනවා. හැබැයි, ඔවුන්ට හොඳ වෙළෙඳ පොළක් තිබුණේ නැහැ. හොඳ වෙළෙඳ පොළක් නොමැති වීම තුළ පසුගිය ඉතිහාසය පුරාම ඒ නිෂ්පාදකයෝ කඩා වැටිලා හිටියා. අපි කල්පනා කරනවා, මේ වෙලාවේ අය වැයෙන් විශේෂයෙන් සුළු අපනයන භෝග නිෂ්පාදනය සඳහා වැඩි මුදලක් වෙන් කර තිබෙන හින්දා කුරුඳු, ගම්මිරිස් ආදි සුළු අපනයන භෝග නිෂ්පාදනය වැඩි කරලා, ඒකට හොඳ වෙළෙඳ පොළකුත් හදන්න. ඒ වෙළෙඳ පොළ හදද්දී, සමුපකාර ක්ෂේත්‍රය ඉතාම ශක්තිමත් ක්ෂේත්‍රයක් බවට පත් කරන්න අපි මේ වෙලාවේ සැලසුම් හදාගෙන යනවා. මේ වෙලාවේත් සමහර සමුපකාරවලට අපි යෝජනා කළා, වී මිල දී ගැනීම සඳහා සම්බන්ධ වෙමු කියලා. නමුත් ගබඩා පහසුකම්වල හිඟය හින්දා අපට බැරි වුණා, ඒ අවස්ථාව ලබා ගන්න.

මේ අය වැයෙන් සමුපකාර ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙන හින්දා අපි බලාපොරොත්තු වෙනවා, ඊළඟ කන්නය වෙනකොට සමුපකාර හරහාත් වී මිල දී ගැනීම ආරම්භ කරන්න. ඉතින් ඒ ක්ෂේත්‍ර ශක්තිමත් කරලා, දියුණු කරලා නිෂ්පාදන ආර්ථිකයක් හදලා අපි මේ රට මේ තිබෙන තැනින් එහාට අරගෙන යනවා. අපි විශ්වාස කරනවා, තවත් අවුරුද්දක්, දෙකක් යනකොට මේ රට ශක්තිමත් රටක් බවට පත් කරන්න අපට පුළුවන් වෙයි කියලා. අන්න ඒ ගමන යද්දී, අපට විවිධ බලපෑම් එනවා. මොකද, විපක්ෂයේ කණ්ඩායම් පසුගිය ඉතිහාසය පුරාම ජනතාව රවටමින්, ජනතාවගේ මුදල් අයථා ලෙස වියදම් කරමින්, රට හදනවා වෙනුවට, රටේ නිෂ්පාදන ආර්ථිකයක් හදනවා වෙනුවට උත්සාහ කළේ ජනතාව ශක්තිමත් කරනවා වෙනුවට ඒගොල්ලන් ශක්තිමත් වන්නයි.

මේ වෙලාවේ මේගොල්ලන්ට අපේ වැඩ පිළිවෙළ පිළිබඳව විවේචන නැති හින්දා අපේ දිස්ත්‍රික්කයේ සංවිධායක සහෝදරයෙකුට චෝදනා කරනවා අපි දැක්කා. එම සහෝදරයා තමාගේ භූමිය තුළ තමන්ගේ දේශපාලන වැඩකටයුතු කරද්දී නිතරම යම් යම් හිතවතුන්ගේ ගෙවල්වලට යනවා. ඒ අය සාමාන්‍යයෙන් ඔහුත් සමඟ ගමේ එකට ඉන්න, මරණාධාර සමිතියේ ඉන්න, එකට වෙනත් උත්සවවලට සම්බන්ධ වන හිතවත් අය. මංජුල ප්‍රසාද් කියන සහෝදරයා අන්න ඒ වාගේ ගෙදරකට ගිහිපු වෙලාවක මේ අය මොකද කළේ? එතුමා එහෙම ගෙදරකට ගියාට පස්සේ මේ අය ඔහුගේ කතාබහ වීඩියෝ කරගෙන ඒ වීඩියෝව ප්‍රචාරය කරනවා, මාලිමාවේ අය, මාලිමාවේ සංවිධායකයෝ දැන් තර්ජනය කරන්න පටන් ගෙන තිබෙනවා කියලා; තර්ජනය කරනවා කියලා. හැබැයි, එහෙම නොවෙයි වුණේ. එය ඔහුගේ බිම, ඔහුගේ ගම. ඔහු හැමදාමත් ඒ බිම තුළ තමන්ගේ දේශපාලන කටයුතු කරනවා. ඔහු එහිදී හැම කෙනෙකු සමඟම සම්බන්ධකම් පවත්වා ගනිමින් ඉන්නවා. ඔහු දේශපාලන වශයෙන් තමන්ගේ පක්ෂයේ අයට විතරක් විශේෂයක් කර සැලකුවේ නැහැ, අනික් පක්ෂවල අයට වෙනසක් කරන්න ඕනෑ කියලා හිතුවේ නැහැ. ඒ අර්ථයෙන් තමයි ඔහු ඔය කියන අවස්ථාවටත් සම්බන්ධ වන්නේ. අන්න එහෙම සම්බන්ධ වෙද්දී, ඒ අවස්ථාවේ විශේෂ හඬ පටයක් අරගෙන රට පුරා ප්‍රචාරය කරනවා, අපේ සංවිධායක සහෝදරවරු දැන් තර්ජනය කරන්න පටන් අරගෙන තිබෙනවා කියලා. ඒක මාධ්‍යයටත් ගෙන යනවා. සමහර මාධ්‍ය මල්මාලා දාලා පිළිගන්නවා. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? විපක්ෂයේ අයට දැන් සටන් පාඨ නැහැ. ඒකයි මේ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඉතාම බාල සටන් පාඨ පාවිච්චි කරමින් බලනවා, අපේ ගමන නවත්වන්න. අපේ ගමන නවත්වන්න බැහැ. අපට අභියෝග එන්න එන්න අපි ශක්තිමත්ව ඒවාට මුහුණ දෙනවා. මේ වෙලාවේ රටේ ජනතාව ඉල්ලන්නේ මේ වාගේ විපක්ෂයක් නොවෙයි. මීට වඩා දියුණු විපක්ෂයක්

තමයි රටේ ජනතාව ඉල්ලන්නේ. හැබැයි, මේ විපක්ෂයට දියුණු විපක්ෂයක් වෙන්න බැහැ. ඇයි එහෙම බැරි වෙලා තිබෙන්නේ? මාලිමාවේ ආණ්ඩුව අපේ රටේ ආර්ථිකය වේගයෙන් ශක්තිමත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරමින් ඉන්නවා.

අපි විශ්වාස කරනවා, මේ රටේ රාජ්‍ය සේවකයන්ට, අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයට ශක්තියක් දෙන්න පුළුවන් ඉතාම හොඳ අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා කියලා. ඉතින් මම විශ්වාස කරනවා, අප්‍රේල් මාසයෙන් පසුව විපක්ෂයේ අය එල්ල කරන මේ චෝදනාව ආයෙත් කරන්න බැරි වෙයි කියලා. මොකද, අප්‍රේල් මාසයේදී රාජ්‍ය සේවකයන්ගේ අතට වැටුප එනවා. වැටුප ආවාට පස්සේ මේ චෝදනාව කරන්න බැහැ. විපක්ෂය දැන් කල්පනා කරනවා, දැන් ජනතාව ළඟට අරගෙන යන පණිවුඩය මොකක්ද කියලා. ඒ හින්දා හැමදාමත් විපක්ෂයේ අය මොකක්ද හොයන්නේ? අලුත් පණිවුඩයක් හොයනවා. හැබැයි, අලුත් පණිවුඩයක් දෙන්න බැහැ. ඒ හින්දා විපක්ෂයේ අය හැමදාමත් ආපස්සට යනවා, මාලිමාවේ අපි ඉස්සරහට යනවා. ඇයි, අපි ඉස්සරහට යන්නේ? ජනතාව අවුරුදු 76ක් තිස්සේම බලාපොරොත්තු වුණු, ආර්ථිකය ශක්තිමත් වුණු දියුණු රට හදන්න වුවමනාව තිබෙන පාලකයෝ දැන් ඇවිල්ලා ඉන්නවා. ඒ පාලකයෝ කැප කිරීම් කරමින් ඉන්නවා. පසුගිය ඉතිහාසය පුරාම එහෙම වුණේ නැහැ. මේ මාස තුනක විතර කාලය ඇතුළත විශාල කැප කිරීම් ප්‍රමාණයක් කරමින් ආදර්ශ බොහොමයක් ලබා දුන්නා, ජනාධිපතිවරයාගේ සිට අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159දෙනාම. ඉතින් විපක්ෂයේ අය අප ගැන මොකක්ද කියන්නේ? "පව්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වාහනයක් නැහැ. වැටුප දෙන්න" කියලා ඒ අය කියනවා. එහෙම බලාපොරොත්තු සහිතව ආපු අය නොවෙයි මාලිමාවේ මේ 159දෙනා. මේගොල්ලන් ආවේ මොකටද? මේගොල්ලන් ආවේ කැප කිරීම් විශාල ප්‍රමාණයක් කරලා මේ රටේ ජනතාවට ලස්සන රටක් හදලා දෙන්නයි. ඒ හින්දා අපි විශ්වාස කරනවා, ජනතාව බලාපොරොත්තු වුණු අරමුණ ඉෂ්ට කරන්න අපට ඉතාම කෙටි කාලයක් ඇතුළත පුළුවන් වෙයි කියා.

හිටපු පාලකයන් අහනවා "කෝ, එදා කිව්ව දේවල් කළා ද?" කියලා. ඔව්, අපි ජනතාවට කියපු දේ කරනවා. ඒ වාගේම, මේ රට මෙතැනට ගෙනාපු, මේ රට කඩා වට්ටපු විපක්ෂයේ අයටත් අපි වෙච්ච පොරොන්දුව ඉෂ්ට කරනවා. අපි එදා කිව්වා, ඒගොල්ලන් මේ කරපු අපරාධයට දඬුවම් දෙනවා කියලා. ඒ පොරොන්දුවත් ඉෂ්ට කරලා, ජනතාවට දීපු පොරොන්දුත් අපි ඉෂ්ට කරනවා. මාලිමාව ජනතාවට පොරොන්දු වෙච්ච දේවල් ඉෂ්ට කරනවා කියන පණිවුඩය යළිත් ලබා දෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[4.38 p.m.]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Good afternoon, Hon. Presiding Member and my dear Colleagues! Sir, thank you for offering me this opportunity to speak regarding the Budget Speech.

First of all, I would like to thank the NPP Government for starting new initiatives such as digitalization, innovation, entrepreneurship and rural development with a primary focus on healthcare in rural areas. But, unfortunately, සමහර දේවල් මට කියන්න වෙනවා. මේ රටේ දෙමළ ජනතාව කියලා, සිංහල ජනතාව කියලා ජන වර්ග දෙකක් ඉන්නවා. දෙමළ ජනතාව ඇතුළේ තමයි අපි මුස්ලිම් ජනතාවත් ගණන් ගන්නේ. අවුරුදු 76ක history එකක් ගැන අපි කථා කරනවා. මම දැක්කා, ආණ්ඩු පක්ෂයේ ඉඳන් විපක්ෂයට ඇඟිල්ල දිගු කරනවා, විපක්ෂයේ ඉඳන් ආණ්ඩු පක්ෂයට ඇඟිල්ල දිගු කරනවා. කවුරුත් පරණ දේවල් ගැන කථා කරනවා. හැබැයි අපේ රට ඉස්සරහට ගෙනියන්න පුළුවන් මොකක් හරි වැඩ පිළිවෙළක් හැදුවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒකට හොඳ උදාහරණයක් තමා, අපේ communities දෙක මැද communication gap එකක් තිබීම. ගොඩක් වෙලාවට උතුරේ ඉන්න ජනතාවට සිංහල කථා කරන්න බැහැ; දකුණේ ඉන්න ජනතාවට දෙමළ කථා කරන්න බැහැ.

1970 කාලයේ මොකද වුණේ? අපට කථා කරන්න දෙන්නේ නැතුව අපේ බෙල්ල හිර කළා. 1976දී අපට විශාල ප්‍රශ්නයක් ඇති වුණා. ඊට පස්සේ 1983දී මොකද වුණේ? 1983දීත් අපේ අයව මරලා දැම්මා; කැලි කැලිවලට කපලා දැම්මා. මම එකක් කියන්න කැමතියි. මම පොඩි කාලේ - මම Grade Five Scholarship Exam එක කළේ 1993දී - කවදාවත් එක සිංහල මිනිහෙක්වත් දැකලා නැහැ. එතකොට අපිට කියලා තිබුණේ මොකක්ද? සිංහල මිනිහා කියන්නේ බඩ පළලා කන්න පුළුවන් ජාතියේ කෙනෙක් කියලායි. එහෙම තමයි අපිට කියලා තිබුණේ. ඒ වාගේම ඔබතුමන්ලාටත් සමහර වෙලාවට මාධ්‍යයෙන් කියලා ඇති, දෙමළ මිනිස්සු කියන්නේ බෝම්බ පුපුරවන, මාළිගාව පුපුරවන්න හදපු, මිනිස්සු මරන අය කියලා. ඒ විධියට තමයි ඔය ගොල්ලොත් හිතාගෙන හිටියේ. හැබැයි 2009න් පස්සේ, ජාති දෙකේම අපි එකතු වුණාට පස්සේ අපට හොඳ understanding එකක් ඇවිල්ලා තියෙනවා. දැන් බලන්න, මේ පාර්ලිමේන්තුවේ පක්ෂ වුණත් විපක්ෂ වුණත් අපට කථා කරන විධිය කොච්චර හොඳයි ද කියලා. ඒ වුණාට අපේ ගම්වලට ගියාම අපි කරන්නේ මොකක්ද? අපි ආයේ ජාතිවාදය අවුස්සනවා. දෙමළ මිනිස්සු මරන්න ඕනෑ කියනවා. මම හොඳ උදාහරණයක් කියන්නම්. Jaffnaවල තෙයඩි කියන ගමේ තිබෙනවා, පන්සලක්. අපේ මන්ත්‍රීවරු 6දෙනෙක් ඉන්නවා. 5දෙනෙක් කිව්වා, ඒක කඩන්න ඕනෑ කියලා. හැබැයි මම නම් විශ්වාස කරනවා, මේ රටේ එක පන්සලක් කැඩුවොත්, එක කෝවිලක් කැඩුවොත්, එක church එකක් කැඩුවොත් ආයෙත් ජාතිවාදය ඔළුව උස්සන්න පුළුවන් කියලා. මම එහෙම විශ්වාස කරන නිසා මම ජනාධිපතිතුමාට කිව්වා, ඒක කරන්න දෙන්න එපා කියලා. අපේ politiciansලා ගොඩක් ඉන්නවා. නමුත් දැන් මෙතැන ඒ කවුරුවත් දකින්න නැහැ. ඒගොල්ලන් අපේ දෙමළ ජනතාවට කියන්නේ, "අපි කොහොම හරි දෙමළ ඊළම ගන්නවා" කියලා. සිංහල politiciansලා ගිහිල්ලා සිංහල ජනතාවට කියන්නේ, "අපි කොහොම හරි එක රටක් විධියට එකට ජීවිත් වෙනවා, උන් රට කඩන්න හදනවා, අපි ඒක නවත්තනවා" කියලා. හැබැයි අද වෙලා තිබෙන්නේ මොකක්ද? එක දෙමළ මිනිහෙකුගේවත් හිතේ නැහැ, රට දෙකට කඩන්න ඕනෑ කියලා. අපි කවදාවත් හිතන්නේ නැහැ, රට දෙකට කඩන්න ඕනෑ කියලා. මම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දවස් 77ක් -77 days- වෙනවා. මට කථා කරන්න දුන්නේ නැත්නම්, මට හැසිරෙන්න වෙනවා ත්‍රස්තවාදී විධියට. ඔන්න එතකොට මේ එක්කෙනෙක් කිව්වා, මට පිස්සු කියලා. දැන් අන්තිමට, කථා කරන්න වෙලාව දීලා තිබෙනවා.

මම අනුර කුමාර දිසානායක මහත්තයාගේ ආණ්ඩුවට එක දෙයකට ස්තුතිවන්ත වෙනවා. ඒ, මේ වාගේ හොඳ Budget එකක් අපට දුන්නාට. හැබැයි, ඔබතුමන්ලාගේ පපුවට ටිකක් රිදුණත් මම මේ ටිකත් කියන්න ඕනෑ. ඔබතුමන්ලා කථා කළා, Jaffna Library එක ගැන. ඉතුරු ටික මම දෙමළෙන් කියන්න කැමතියි.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්විසුතා මහතා]

நீங்கள் யாழ்ப்பாணம் Libraryக்கு 100 மில்லியன் ரூபாய் ஒதுக்கியிருப்பதாகச் சொல்லியிருந்தீர்கள். அது total Capital Expenditure 1,315 பில்லியன் ரூபாயிலே 0.0076 சதவீதமாகும். பிச்சை போடுவது போன்று யாழ்ப்பாண நூலகத்துக்கு 100 மில்லியன் ரூபாயினை ஒதுக்கியிருக்கிறீர்கள், பரவாயில்லை! அடுத்து, வட மாகாணத்தின் உள்ளூர் வீதிகளை மேம்படுத்துவதற்காக 5,000 மில்லியன் ரூபாயை ஒதுக்கியிருக்கிறீர்கள். நான் இந்த வரவு செலவுத்திட்ட மதிப்பீட்டுப் புத்தகங்கள் அனைத்தையும் வீட்டுக்கு கொண்டுசென்று நன்றாகப் படித்திருக்கிறேன். 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கியதற்காக நன்றி சொல்கிறோம்; அதையிட்டுச் சந்தோசப்படுகிறோம். ஆனால், அது total Capital Expenditure இலே 0.38 சதவீதம்! அதுவும் தமிழனுக்குப் போட்ட பிச்சையே ஆகும். ஏனென்றால், உள்ளூராட்சிச் சபைத் தேர்தல், மாகாண சபைத் தேர்தல் போன்றவை வரவிருப்பதால், Budgetஇல் எதிர்க்கட்சியைக் குத்துவதற்காக நீங்கள் எங்களுடைய libraryஐப் பாவித்திருக்கிறீர்களே தவிர, வேறொன்றுமில்லை.

அதைவிட, வடக்கு, கிழக்கில் ஏறத்தாழ 35 ஆண்டுகள் பெரும் போர் நடந்தது. அந்தப் போரால் நான் உட்பட எனது சமூகம் கட்டிய வீட்டைக்கூட இழந்து இடம்பெயர்ந்தது. ஆனால், வடக்கு, கிழக்கு மீள்குடியேற்றத் தேவைக்காக நீங்கள் ஒதுக்கியது வெறும் 1,500 மில்லியன் ரூபாய்; அது total Capital Expenditureஇல் 0.01 சதவீதம்! எங்களது வீடுகளை இடித்து, காணிகளைப் பிடித்து, எங்களுடைய மக்களில் 45,000 பேரைக் கொன்றுவிட்டு, நீங்கள் எங்களுக்குப் போடும் பிச்சை 0.01 சதவீதமாகும். இவற்றைக் கொடுத்து விட்டுத்தான் "நாங்கள் வடக்குக்கு நிதி ஒதுக்கியிருக்கிறோம்" என்று சொல்கிறீர்கள்.

நான் இன்னுமொரு விடயத்தைச் சொல்ல வேண்டும். வட்டுவாகல் பால நிர்மாணிப்புக்காக 1,000 மில்லியன் ரூபாயை ஒதுக்கியிருப்பதாகச் சொல்கிறீர்கள். அது total Capital Expenditureஇலே 0.076 சதவீதமாகும். நான் இந்த வருட Capital Expenditureஐப் பற்றி மட்டுமே சொல்கிறேன்; Recurrent Expenditureஐப் பற்றிக் கதைக்கவில்லை. அந்தப் பிச்சைக்கும் எங்களது நன்றி. *[இடைமீடு]* கதைப்போம்!

அடுத்து, சுகாதாரத் துறையிலும் எங்களுக்கு ஏதாவது பிச்சை போட்டிருக்கிறீர்களா என்று பார்ப்போம். சுகாதாரத் துறைக்கு கிட்டத்தட்ட 382 பில்லியன் ரூபாய் total Capital Expenditureக்கு ஒதுக்கிவிட்டு, வடக்குக்கு PHSSP எனப்படுகின்ற அந்த ஒரேயொரு projectக்காக ஒதுக்கியிருப்பது 0.66 சதவீதம்! வடக்குக்கு உங்களுடைய பிச்சை எந்தளவில் இருக்கிறது என்பதைப் பார்த்துக் கொள்ளுங்கள்! அதுபோல், கிழக்குக்கு நீங்கள் போட்டிருக்கும் பிச்சை 0.8 சதவீதம்! ஆனால், தமிழர்கள் பிச்சை எடுப்பதற்குத் தயாராக இல்லை என்ற விடயத்தை நான் உங்களுக்குச் சொல்ல விரும்புகிறேன். எங்களுடைய சகோதரர்கள் வெளிநாடுகளில் இருக்கிறார்கள். முடிந்தால், நீங்கள் Prevention of Terrorism Actஇனை நீக்கி விடுங்கள்; நாங்கள் பில்லியன், ரில்லியன் கணக்கான பணத்தை உங்களுக்குக் கொண்டுவருவோம். நாங்கள் உங்களுக்குப் பிச்சை போடுவோம். நீங்கள் இந்தியாவிடம், சீனாவிடம் பிச்சை எடுத்து, அந்தப் பிச்சையிலே 0.01 சதவீதத்தை எங்களுக்குப் போடுவீர்கள். சனாதிபதி அவர்கள் வந்து சொல்வார் வடக்கு மாகாணத்திற்குப் பிச்சை போட்டிருக்கிறேன் என்று. பிச்சையிலும் பிச்சை! "எடுப்பானாம் ஆண்டி பிச்சை, அதுக்கு பிறகு போடுவானாம் பிச்சை!" இது ஒரு கேவலமான செயல் ஐயா! இதில் எங்களுக்குச் சரியான மனவருத்தம்.

நான், இந்த அரசாங்கத்தின் வரவு செலவுத்திட்டம் தொடர்பாக மிகவும் எதிர்பார்ப்போடு இருந்தவன். சரி, அது வேண்டாம், பரவாயில்லை! இன்னுமொன்றைச் சொல்கின்றேன், யாழ்ப்பாணத்திலே industrial park கட்டுவார்களாம். அதைவிட, தொழில்நுட்ப வலய அபிவிருத்திக்கான மொத்த ஒதுக்கீடு 500 மில்லியன்ரூபாயிலே வடக்கில் 3 இடங்கள் தொிவு செய்யப்பட்டு 300 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கிறதாம். அது எவ்வளவு தெரியுமா? கைத்தொழிலுக்கு ஒதுக்கிய மொத்தச் செலவினத்தில் 1.4 சதவீதமாகும். கே.கே.எஸ். தொழிற்சாலையை நாங்கள் - தமிழர்கள் கட்டுகிறோம்; உங்களால் முடிந்தால் அதை எங்களிடம் தாருங்கள்! நாங்கள் கட்டி, உங்களுக்குச் சீமெந்து தருகின்றோம். ஒரு காலத்திலே நாங்கள் உங்களுக்குக் கிண்ணியாவிலிருந்து கரும்பு தந்தோம்; வடக்கு மாகாணத்திலிருந்து சீமெந்து தந்தோம்; ஆனையிறவிலிருந்தும் உற்பத்திகளைச் செய்து தந்தோம்; எல்லாவற்றையுமே தந்தோம். எங்களுடைய உதிரத்தை முழுவதுமாக எடுத்து, எமது இனத்தை அழித்துவிட்டு, நீங்கள் இப்பொழுது எங்களுக்கு தருவதென்பது 0.0 அளவிலான பிச்சை! அந்த பிச்சைதான் உங்களுடைய Budget! அதற்காகத்தான் எங்களுடைய வாக்கு உங்களுக்கு வேண்டியிருந்ததா? எமது தமிழ் மண், மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் 13ஆவது திருத்தச் சட்டம் தொடர்பில் எங்களுக்கு ஏதாவது செய்வார் என்று பிழையாகப் போட்ட வாக்குகளால், இன்றைக்கு ஒரு பேப்பரைக்கூடச் சரியாக வாசிக்கத் தெரியாத 3 MP மாரைத்தான் கொடுத்திருக்கிறார்கள்.

இப்போது நாங்கள், சிங்கள - தமிழ் மக்கள், ஒன்றாக வாழ்வதற்குதான் ஆசைப்படுகின்றோம். சிங்கள மக்கள் எதிரிகள் என்ற எண்ணம் எனது மனதில் இல்லை. ஆனால், நான் இங்கு வந்த முதல் நாளிலிருந்து இந்தப் பாராளுமன்ற ஆசனம் என்னை அவமதித்தது; இன்றுவரையும் என்னை ஓர் எதிரியாகத்தான் பார்க்கிறது. ஆளுங்கட்சிக்கும் எதிர்க் கட்சிக்கும் இடையிலான அடிபாட்டிலே நாங்கள்தான் அவதிப்படுகின்றோம்; அது இன்று நேற்று அல்ல! 1948ஆம் ஆண்டு வெள்ளைக்காரர் இராச்சியத்தை இலங்கையருக்குத் தந்திருந்தபோது, அவர்கள் சிரித்துவிட்டுத்தான் போயிருப்பார்கள். ஏனென்றால் அவர்களுக்குத் தெரியும், சிங்கள இனமும் தமிழ் இனமும் ஒன்றாக வாழாது; இவர்கள் ஒருவரையொருவர் அடித்துக் கொல்வார்கள் என்று. ஆனாலும், உங்களுடைய பிச்சையையாவது நாங்கள் முழுமையாகப் பாவிக்கலாம் என்பதுதான் என்னுடைய ஆசை. ஆனால், நீங்கள் பாராளுமன்ற உறுப்பினர்களுக்காக ஒதுக்குகின்ற பன்முகப்படுத்தப்பட்ட நிதி 56 மில்லியன் ரூபாயில் உங்களுடைய GA பிரதீபன் அவர்கள் 35 மில்லியன் ரூபாயை எடுக்கப்போவதாக DCC meetingஇல் சொன்னாராம். அவருடைய மகன் நேற்றைய தினம் அரசாங்க வாகனம் ஒன்றைக் கொண்டுபோய் உடைத்திருக்கிறார். பரவாயில்லை, எங்களுக்கு வாகனம் வேண்டாம்! வடக்கு, கிழக்கிலே நாங்கள் என்ன தேங்காய்களை ஆய்வதா?

இந்த விடயத்தைச் சொல்லும்போதுதான் எனக்கு ஞாபகம் வருகிறது. வடக்கு, கிழக்கிலே தென்னை மரங்களை வெள்ளை ஈக்கள் தாக்கியதன் காரணமாக 250 ரூபாய்க்குக்கூட ஒரு தேங்காய் விலை போகிறது. அதற்குரிய நடவடிக்கை எடுக்க வேண்டிய உங்களுடைய விவசாய அமைச்சரை வடக்குப் பக்கம் காணவேயில்லை!

அடுத்து, என்னுடைய சகபாடிகளான வைத்தியர்களைப் பற்றிப் பார்ப்போம்! இந்த நாட்டிலே ஒரு வைத்தியர் கார் ஒன்றை வாங்குவதாக இருந்தால் 50,000 ரூபாய்ப்படி மிச்சம்

පිටිත්තාල් අවුරුක්කු 40 ආණ්ඩුකළ් සේමික්ක වේණ්ටි යිරුක්කුම්. නාන් සුකාතාර අමෙච්චරිටම් කේට්ටේන්, මුටින්තාල් එංකළුටන් කතෙයුංකළ් එන්රු. ඒන්, එංකළුටන් කතෙප්පතිල් එන්න පයම්? නාන් ඉංකේ කතෙප්පතර්කු එළුම්පිනාල් 'මෙක්'ඉ off පණ්ණුකිරාර්කළ්. එතර්කාකප් පයප්පටුකිරීර්කළ්? ඒනෙන්රාල්, නීංකළ් ඔදුක්කිය පිච්සෙකළ් එල්ලාවර්රෙයුම් කණක්කුටන් කාට්ටුවතර්කු එන්නාල් ඉයලුම්.

අතු තවිර, නාංකළ් එතිර්පාර්ප්පතු තමිල්, සිංකළ මක්කළ් ඔන්රාක වාළ වේණ්ටුම් එන්රුතාන්. ආනාල්, අනුර කුමාර තිසානායක්කවින් අරසාංකත්තිර්කෝ අල්ලතු ඉප්පෝතු එතිර්ක්කට්චියිල් ඉරුප්පවර්කළ් මරුපටියුම් අරසාංකමාක මාරි අන්තප් පක්කම් පෝය් ඉරුන්තාලුමෝ එංකළුටෙය පිරච්සිනෙකළෙ මුටිප්පතර්කු උංකළුක්කු විරුප්පමිල්ලෙ. නීංකළ් සොන්නීර්කළ් PTAඉ නීක්කුවතාක. ඉප්පෝතු නීති අමෙච්චර් කේට්කිරාර් PTAඉන්කීළ් ඉරුප්පවර්කළුටෙය listඉත් තාරුංකළ් එන්රු. කේවලම්! නාන් ඉන්නුමොන්රෙච් සොල්කින්රේන්, එනතු සකෝතරර්කළ් -

මම මේක සිංහලෙන් කියන්න කැමැතියි. අපේ අයියලා, අක්කලා 55,000ක් මැරුණේ අපේ ජනතාව අතරින් ඇවිල්ලා. ඒගොල්ලෝ උඩ ඉඳන් පහළ වෙලා නැහැ. ඒගොල්ලෝ අපේ ජනතාවගෙන් තමයි ඇවිල්ලා තිබුණේ. එතකොට අපි ත්‍රස්තවාදියි. හැබැයි 88,000ක් මැරුණා. දළදා මාළිගාවේ බෝම්බයක් පිපිරුවා. ඔයගොල්ලෝ ත්‍රස්තවාදී නැහැ. ඔයගොල්ලොන්ගේ රෝහණ විජේවීර ත්‍රස්තවාදී නැහැ. අපේ ප්‍රභාකරන් ත්‍රස්තවාදියි. ඒකට එකම එක හේතුව තමයි අපි දෙමළ, ඔයගොල්ලෝ සිංහල. හැබැයි අපේ generation එකේ අයගේ ඔලුවේ ඒක නැහැ. මගේ හිතේත් නැහැ. මම කවදාවත් ඔයගොල්ලොත් එක්ක ඒ විධියට හැසිරිලා නැහැ. මාත් එක්ක ඔයගොල්ලෝ කන්න එනවා හැම දාම පාර්ලිමේන්තුවේ.

මම දැන් කියන්නම්. ඇත්ත කියන්න MPsලා කවුරුත් මෙතැන නැහැ. අපේ ඉන්න සමහර මන්ත්‍රීවරු එන්නේත් නැහැ මේ වෙලාවට. ඒගොල්ලෝ ඔයගොල්ලොත් එක්ක ගේම් එකක් ගහලා අපේ මිනිස්සුන්ට කියනවා, "ඔන්න මචං අපි දෙමළ ඊළම කොහොම හරි ගන්නවා" කියලා. එතකොට මම කිව්වොත් පන්සල කඩන්න එපා කියලා, මම ජනතා විරෝධී වෙනවා. ඒගොල්ලෝ ජනතාවගේ නායකයෝ වෙනවා. මම දැන් හදවතින් කථා කරන්නේ. For 77 days, I was deprived of speaking in this Parliament. මට ඒ වෙනුවෙන් කවදාවත් මොකුත් කරලා නැහැ.

ඊට අමතරව, Clean Sri Lanka. Well done, well done!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Clean Sri Lanka එනේ සොල්ලි 5,000 මිල්ලියන් රූපාය් ඔදුක්කියිරුක්කිරීර්කළ්. ආනාල්, ආසියාවිලේයේ මිකප්පෙරිය නූලකමාකවිරුන්ත එංකළුටෙය යාෆ්ප්පාණත් තේසිය නූලකත්තෙ - සුවාමි විපුලානන්තර්, මකාත්මා කාන්ති ආකියෝර් එළුතිය පුත්තකංකළ් ඉරුන්ත අන්ත libraryඉ - එරිත්ත උංකළුටෙය ඉනම්, එංකළුක්කුප් පෝට්ට පිච්සෙ 1.2 සතවීතම්! Clean Sri Lanka නිකළ්ච්චිත්තිට්ටත්තිල් ඔරු තමිළනුම් ඉල්ලෙ, ඔරු මුස්ලිමුම් ඉල්ලෙ. ඉරුන්තුම් 1.2 සතවීතත්තෙ මාත්තිරමේ තන්තිරුක්කින්රීර්කළ්. අතාවතු, මොත්ත 5,000 මිල්ලියන් රූපාය් ඔදුක්කීට්ටිල් එංකළුටෙය libraryක්කාක ඔදුක්කියතු 1.2 සතවීතම් මාත්තිරමේ! අතුකූටප් පරවායිල්ලෙ. ඉන්නොරු joke සොල්කිරේන්.

උළ්නාට්ටිල් ඉටම්පෙයර්න්තවර්කළින් වීටමෛප්පුක්කාක 1,500 මිල්ලියන් රූපාය් ඔදුක්කප්පට්ටිරුක්කින්රතු. එංකළුටෙය තීවකප් පකුතිකළිල් - නයිනාතීවාක ඉරුක්කලාම්, Delftආක ඉරුක්කලාම්. කාරෛනකරාක ඉරුක්කලාම් - කුටිප්පතර්කුත් තණ්ණීර් ඉල්ලාමල් එංකළුටෙය සනම් අංකු ඉරන්තුකොණ්ටු ඉරුක්කින්රතු. අප්පටියිරුක්කුම්පෝතු, තෙර්කින් තණ්ණීර් වළංකලුක්කාක 41,234 මිල්ලියන් සෙලවළික්කවිරුක්කිරීර්කළ්. අතර්කාක 20,000 මිල්ලියන් රූපාය් ඔදුක්කියිරුක්කිරීර්කළ්. ආනාල්, වටක්කුක්කුත් තණ්ණීර් ඉල්ලෙ. වටක්කිල් මේර්කොළ්ළප්පටවිරුන්ත ඉරණෙ මටුක්කුළත් තිට්ටම්කූට කාය්න්ත නිලෙයිලේතාන් ඉරුක්කින්රතු. උංකළුක්කු එංකළුටෙය මක්කළින් වලිකළ් තෙරියාතු. නාංකළ් උණ්මෙයෙයෛ කතෙත්තාල්, ජනතා විරෝධී එනච් සොල්කිරීර්කළ්. ආනාල්, game කාට්ටුපවර්කළ් උංකළුක්කු නල්ල politicianආකත් තොිකිරාර්කළ්. නාංකළ් උණ්මෙයෙයෛ කතෙත්තාල්, උංකළුක්කු මුතුකු නෝකුම්, අවර්කළුක්කු ඉතයම් නෝකුම්. අතුතාන් උණ්මෙ.

ඉප්පොළුතුම් නාන් සොල්කිරේන්, එංකළුටෙය ඉනප් පිරච්සිනෙයෛත් තීර්ක්කාමල්, එන්නුටෙය ඉනත්තෙ අළිවිලිරුන්තු තිරුම්පක් කට්ටියෙළුප්පාමල්, නාංකළ් ඔරුපෝතුම් ඉන්ත නාට්ටිල් නිලෙයාන සමාතානත්තෛක් කොණ්ටුවර මුටියාතු. නාන් ඉතය සුත්තියුටන් ඉරුක්කිරේන්. කටෛසියාක නටන්ත තේර්තලිල් වටක්කිල් එනක්කු 85සත වීතමාන වාක්කුකළ් කිටෛත්තන. මුටින්තාල් උංකළුටෙය MP ඔරුවරිටම් අව්වාරු 85 සතවීතමාන වාක්කුකළෛප් පෙට්රුක් කාට්ටච් සොල්ලුංකළ්! නේට්රුක්කූට YouTubeඉල් පෝට්ටිරුන්තාර්කළ්, එනක්කු 87 සතවීතමාන වාක්කුකළ් ඉරුප්පතාක. ඒනෙන්රාල්, උණ්මෙයෙයෛක් කතෙප්පවන් නාන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව තත්පර 20ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මේ පාර්ලිමේන්තුවට ආවේ hospital එකේ ඉඳලා. කොඩ් උස්සලා, පොල්ලක් උස්සලා මම පාර්ලිමේන්තු ආවේ නැහැ. දවස් 91න් මම ස්වාධීනව ඡන්දේ ඉල්ලලා මේ පාර්ලිමේන්තුවට ආවා. මම ඉස්සරහටත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා නම් මේ කරන හොරකම් ඔක්කෝම එළියට එනවා.

මට කථා කරන්න වෙලාව දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු උපාලි සමරසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு அரவிந்த செனரத் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. ARAVINDA SENARATH took the Chair.

[අ.භා. 4.52]

ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා 65ක් විතර මෙතැන ඉන්න ඕනෑ කියලා මම හිතනවා. නමුත් මේ මොහොතේ මෙතැන ඉන්නේ 4දෙනෙක් හෝ 5දෙනෙක් පමණයි. විශේෂයෙන්ම මෙවැනි අය වැය විවාදයකදී විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම, ඇහුම්කන් දීම තමයි අය වැය සම්බන්ධව නිවැරදි කිරීම් කරගන්න හේතු කාරණා වන බව අවංකව අපි විශ්වාස කරන්නේ. පත්තරේට, යූටියුබ් එකට, එහෙම නැත්නම් මොකක් හරි වැනල් එකකට විනාඩි 5කට, 10කට සම්බන්ධ වෙලා තමන්ගේ පොඩි වටිනාකමක් මතු කරගන්න වැඩ කරනවා හැරුණුකොට අය වැය සම්බන්ධයෙන් හෝ රට සම්බන්ධයෙන් එවැනි හැඟීමක් ඇතිවෙනවා කියලා අපිට මේ දවස් කීපයේ පෙනෙන්නට තිබෙන කාරණාවලින් අපි විශ්වාස කරන්නේ නැහැ. සාමාන්‍යයෙන් වියතුන්ගේ කියමනක් තිබෙනවා, යම් පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක ජයග්‍රහණය හෝ ඔහුගේ ඉදිරි ගමන මනින්නේ තමන්ගේ හිතවතුන්ගේ, මිතුරන්ගේ හොඳවලින් නොවෙයි, තමන්ගේ සතුරන්ගේ හා සමාජ ප්‍රගමනයන්ගේ ප්‍රකාශවලින් කියලා. මේ දවස් ටිකේම මේ රටේ සමාජ මාධ්‍ය, විවිධ ජන කණ්ඩායම් සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන යම් පුද්ගලයන්ගේ අදෝනා සහ අවලාදවලින් පෙනෙන්නේ අපේ ජයග්‍රහණය.

පසුගිය කාලයේ ඉදිරිපත් කරපු අය වැයවලට වඩා, ජාතික ජන බලවේගයේ මංගල අය වැයේ සුවිශේෂ කාරණා 4ක් මම දකිනවා. අපි දැකපු එක දෙයක් තිබෙනවා. අය වැයක් ඉදිරිපත් කරනකොට මෙතැනට පෙට්ටියක් උස්සාගෙන ආව ආකාරය අපි පුංචි කාලයේ දැක තිබෙනවා. ඒක මහා බරපතළ, රහසිගත පෙට්ටියක් කියලා අපි හිතුවා. දශක දෙකක්, තුනක් අපි මේක බලාගෙන හිටියා. ඒක තුළ හැම දාම මේ රටේ තිබෙන යම් යම් ආයතන, දෙපාර්තමේන්තු ඇතුළු හැම දෙයකම දිගුවක් ලෙස අය වැයක් කියවනවා තමයි අපි දැක්කේ. අධ්‍යාපනය ගත්තොත්, අධ්‍යාපනයේ දිගුවක් ලෙස අය වැයක් කියවනවා, ප්‍රවාහනයේ දිගුවක් ලෙස අය වැයක් කියවනවා. තිබෙන තත්ත්වයන් තවත් වැඩිදියුණු කරගන්න, ඒක පැලැස්තරයෙන් වහගන්න අය වැයක් කියවනවා. අපි ඒක තමයි මීට පෙර දැක්කේ. හැබැයි මෙවර අය වැය තුළ මුල් වතාවට මේ රටේ අධ්‍යාපනය තව අවුරුදු 5කින් කොතැනටද ගෙනියන්නේ කියන එක, ඒ සඳහා වන ප්‍රගමනයන්, ඒ සඳහා වන උපාය; උපක්‍රම, ඒ සඳහා වන ක්‍රමවේද සහිතව අය වැයක් කියවනවා අපි දැක්කා.

තව අවුරුදු 5ක් යනකොට පොදු ප්‍රවාහන සේවය මහජනතාවට වඩාත් පහසුදායි, හොඳ සේවාවක් බවට පත් කරන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් යෝජනා ගෙනැල්ලා තිබෙනවා. මේ තිබෙන තත්ත්වයන් වෙනස් කිරීම සඳහා ඉතිහාසයේ කවදාවත් නොකරන ලද උත්සාහයක් මේ අය වැය තුළින් කර තිබෙනවා. විවිධ ජනප්‍රජාවගේ සුභසිද්ධිය නඟා සිටුවීම වෙනුවෙන් ඉතිහාසයේ කවදාවත් වාර්ෂික අය වැයකින් කථා නොකරපු දේවල් මෙවර අය වැය ඇතුළේ සාකච්ඡාවට භාජන වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් උදාහරණ කිහිපයක් මම සඳහන් කරන්නම්.

පසුගිය කාලයේ බන්ධනාගාරවලට, ආරක්ෂක අංශවලට සල්ලි වෙන් කළා. හැබැයි, සිරකරුවන්ගේ සුභසිද්ධිය, ඔවුන් යහපත් පුරවැසියන් කරන්න කිසිම අයුරකින් මුදල් වෙන් කර තිබුණේ නැහැ. හැබැයි, මෙවර අය වැයෙන් සිරකරුවන්ගේ ජීවිත යහපත් කරන්න රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම පරිවාස භාරයේ සිටින ළමුන් සඳහා. පසුගිය කාලය තුළ ළමා අධිකරණවලට මුදල් වෙන් කළත්, පරිවාස භාරයේ සිටින ළමුන්ගේ අධ්‍යාපනය, ආරක්ෂාව සහ අනාගතය වෙනුවෙන් මුදල් වෙන් කර තිබුණේ නැහැ කියන එක අපි දන්නවා. ඒ වාගේම මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්, ආබාධිත ප්‍රජාව, රැඳවුම් කඳවුරුවල ළමුන්, මේ වාගේ විවිධ ක්ෂේත්‍රවල සිටින අපේ සමාජයට අනුබද්ධ වෙච්ච අනාගත පරම්පරාව වෙනුවෙන්, ඔවුන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

අපේ මන්ත්‍රීතුමන්ලා කිව්වා, ඉතිහාසයේ මුල් වතාවට රුපියල් බිලියන 483ක් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වෙන් කර තිබෙනවා කියලා. ඒ කියන්නේ, තව අවුරුදු 5ක් යනකොට අපේ දුම්රිය මැදිරි වායුසමීකරණය කරලා, වෙලාවට යන වේගවත් දුම්රිය සේවාවක් බවට පත් කරලා, දුම්රිය සේවාව නවීකරණය කරන්නට කටයුතු කරනවා. ඒ වාගේම නගරය තුළ හොඳ බස් රථ සේවාවක් -වායුසමීකරණය කරන ලද, මිනිස්සුන්ට පහසුකම් තිබෙන, වෙලාවට ගමන් කරන බස් රථ සේවාවක්- ඇති කිරීමට අපි සැලසුම් කර තිබෙනවා.

අධ්‍යාපනයට රුපියල් බිලියන 619ක් වෙන් කර තිබෙනවා. මේ රටේ දුක් විඳින, වැඩ කරන ජනතාවගේ දරුවන්ට අනාගතය වෙනුවෙන් තිබෙන එකම දේ තමයි අධ්‍යාපනය. ඒ නිසා මේ රජය විසින් සෑම දරුවෙකුම පාසල් යවන්නත්, පාසල් ජීවිතයේදී

ඔවුන්ගේ වියදමින් සියයට 50ක, 60ක ප්‍රමාණයක් ආණ්ඩුව දරන්නත්, ඒ සෑම දරුවෙකුම පාසලෙන් එළියට එනකොට වෘත්තීය අධ්‍යාපනය හෝ අධ්‍යාපනයේ නිපුණතාවෙන් ලත් රැකියාවක් ලැබීම සඳහා වූ වැඩ පිළිවෙළක් සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම විශ්වවිද්‍යාල ප්‍රමාණය. අද ගත්තොත්, ලංකාවේ විශ්වවිද්‍යාලවලට වඩා දෙගුණයක් බන්ධනාගාර; සිර ගෙවල් තිබෙනවා. හැබැයි, දියුණු සමාජයක් ඇතුළේ විශ්වවිද්‍යාල වැඩි වෙන්න ඕනෑ, සිර ගෙවල් අඩු වෙන්න ඕනෑ කියලා අපි හිතනවා. මෙවැනි විශාල මුදලක් වෙන් කිරීම ඇතුළේ අපේ ඉලක්කය තිබෙන්නේ, ඉදිරියේදී විශ්වවිද්‍යාල තවත් වැඩිදියුණු කරලා, ඒවාට විවිධ පාඨමාලා ඇතුළත් කරලා, මේ රටේ දරුවන්ට දේශීය හෝ විදේශීය පෞද්ගලික ආයතනවල රැකියාවක් කරන්න පුළුවන් මට්ටමට අධ්‍යාපනය දියුණු කරන්න ඕනෑ කියන එකයි.

ඊළඟට, සෞඛ්‍ය ක්ෂේත්‍රය. සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා රුපියල් බිලියන 604ක් වෙන් කර තිබෙන බව අපි දන්නවා. හැබැයි, අද දුෂ්කර ප්‍රදේශවලට ගියාම අපට පෙනෙනවා, ඒ රෝහල්වල වෛද්‍යවරයෙක් නැහැ; බෙහෙත් ටික නැහැ; අවශ්‍ය පහසුකම් ටික නැහැ. නමුත්, මේ අය වැයෙන් උත්සාහ කරනවා තව වසරක් දෙකක් යනකොට මේ රටේ ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය බෙහෙත් ටික ලබා දෙන්න, රෝහලට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න, ඒ රෝහල්වලට වෛද්‍යවරු ලබා දෙන්න. මේ සියලු කාරණා ඇතුළේ මම කියන්න උත්සාහ කළේ මෙකයි. ඒ තමයි, මෙතෙක් ඉතිහාසයේ සිදු නොවුණු විධියට මේ සමාජය වෙනත් තලයකට ඔසවා තබන්න, මේ සමාජය තුළ සිටින විවිධ ක්ෂේත්‍රයන්වල වෘත්තිකයන් වෙනත් තලයකට ගෙන එන්න ඕනෑ මහ පෙන්වීම සඳහා වූ වැඩ පිළිවෙළක් මේ අය වැය ඇතුළේ ඉදිරිපත් කර තිබෙනවා කියන එක.

ඒ වාගේම මේ අය වැය තුළ කිව යුතු තව කාරණයක් තිබෙනවා. ඒ තමයි, පසුගිය කාලය පුරා අය වැය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරනවා අපි දැක්කා. ඊට පස්සේ මේ ඇතුළේ තිබෙනවා, ආදායම සහ වියදම. අය වැය හිඟය පියවා ගන්න පසුගිය ආණ්ඩු ගොඩක් කළේ ජනතාව මත බදු පිට බදු පටවපු එක, එහෙම නැත්නම් අපේ රටේ සම්පත් විකුණපු එක. හැබැයි, ඇත්තටම මේ අය වැය හිඟය පියවා ගැනීම සඳහා වර්තමාන රජය - ජාතික ජන බලවේගයේ ආණ්ඩුව - ජනතාව මත ඉතාම අඩු බදු බරක් තමයි තබා තිබෙන්නේ. ඒ වාගේම මේ රටේ බිම් අහලක්වත් විකුණන්නේ නැතිව තමයි Budget එක බෙරාගෙන තිබෙන්නේ.

මේ අය වැයේ තවත් විශේෂත්වයක් තිබෙනවා. පසුගිය කාලයේ ගෙනා අය වැයවලින් විධායකයට, ව්‍යවස්ථාදායකයට වාගේම මන්ත්‍රීවරුන් සඳහාත් දැවැන්ත මුදලක් වෙන් කරලා තිබුණා. හැබැයි, මේ අය වැය තුළින් විධායකයේ - ජනාධිපතිතුමාගේ- සිට අගමැතිතුමිය, කැබිනට් මණ්ඩලය සහ මන්ත්‍රීවරුන් දක්වා මෙතෙක් වෙන් කර තිබූ වරදාන, වරප්‍රසාද සියයට 80ක් විතර කප්පාදු කරලා තිබෙනවා. ඒ, ජනතාව වෙනුවෙනුයි. මේ අය වැය තුළින් එම වරප්‍රසාද කප්පාදු කරලා මේ වෙනකොට ඒ මුදලුත් මේ රටේ ජනතාවගේ අනාගතය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා.

මෙතැනදී එක් මන්ත්‍රීවරයෙක් මෙන්න මෙවැනි කාරණයක් මතු කළා. එතුමා කිව්වා, වසර 76ක ශාපය සම්බන්ධයෙන් අපි නිතරම කියනවා, ඒ වාගේම ඒ කාලයේ හිටපු පාලකයෝ මේ රට හොඳින් පාලනය කළා, මේ රට හොඳ තත්ත්වයකට ගොඩනඟලා තිබෙනවා, ඒ නිසා එහෙම කියන්න එපා කියලා. දැන් ඒ මන්ත්‍රීතුමා මේ සභාව තුළ නැහැ. එතුමා කිව්වා, මේ රටේ ආර්ථිකය ගොඩනැඟුවාලු, ලෝකයේ සහ ආසියාවේ රටවල් උදාහරණ ගන්න තැනට අපේ රට ගෙනාවාලු. හැබැයි එතුමාට අමතකද දන්නේ නැහැ, මේ රටේ ඉංග්‍රීසි ආණ්ඩුව -බ්‍රිතාන්‍ය ආණ්ඩුව- ලංකාවෙන් යනකොට අපේ රටේ මහා භාණ්ඩාගාරයට යම් මුදලක් ඉතිරි කරලා ගියා කියන එක. එතුමා කියනවා වාගේ 70 ගණන්වල, 80 මුල් භාගයේ සිංගප්පූරුවෙන්, කොරියාවෙන් ඇවිල්ලා ලංකාව ආදර්ශයට ගන්නකොට අපි කොතැනද සිටියේ? අපි දිහා බලලා අපෙන් ආදර්ශ ගත් එතුමා කියන නායකයෝ කොරියාව අද තිබෙන තැනට ගන්න, මලයාසියාව අද තිබෙන තැනට ගන්න, සිංගප්පූරුව අද තිබෙන තැනට ගන්න කටයුතු කරනකොට, 76 වසරක් තිස්සේ අපේ රට පාලනය කළ පාලකයෝ අපේ රට කොතැනටද ගෙනැල්ලා තිබෙන්නේ? ඒ නිසා අපි තේරුම් ගන්න ඕනෑ කාරණය තමයි, අපේ ඉතිහාසයේ වරදක් වෙලා තිබෙනවා කියන එක.

අපි තව තවත් අපේ දේශපාලන පක්ෂවල සාමාජිකයන් රැක ගනිමින්, අපේ දේශපාලන ව්‍යාපාරවල පවුල් සම්බන්ධතා රැක ගනිමින්, තවමත් ඒවා නිවැරදි නොකර ඉන්නවා වෙනුවට ඇත්ත දකිමින් ඉස්සරහට යෑමේ ඕනෑකම අපට තිබෙනවා. එතුමා තවදුරටත් කිව්වා, අපි ආණ්ඩු කළා, අපේ කෙටි කාලීන ආණ්ඩුව ඇතුළේ අපේ නායකයා, හිටපු අගමැතිතුමා මේ රට බෙරාගන්න, මේ රට ගොඩනඟන්න රැකියා දුන්නේ නැහැ, පෞද්ගලීකරණයට ගියේ නැහැ කියලා. හැබැයි, එතුමන්ලා තමයි පුරවැසිභාවයක් නැතුව හිටපු අර්ජුන මහේන්ද්‍රන්ලාව ලංකාවට ගෙනැල්ලා, මහ බැංකුව භාර දීලා, මහ බැංකුව මංකොල්ල කෑලා මේ රට මෙතැනට ගෙනාවේ. අවුරුදු 76ක් තිස්සේ මේ රට පාලනය කරපු හැමෝම මේ රටේ පවත්වපු මැතිවරණවලින් දිනුවා. ඒ හැම රජයකටම ජනතාව බදු ගෙවලා තිබෙනවා. අපේ ආණ්ඩුවටත් එහෙමයි. අපේ ආණ්ඩුවටත් අපි ඉන්න තාක්කල් මේ රටේ වැඩ කරන ජනතාව බදු ගෙවනවා. ඒ බදුවලින් අපි හැමෝම වැඩ කරන්න ඕනෑ තමයි. හැබැයි ප්‍රශ්නය වෙන්නේ, මෙතෙක් කාලයක් ගත් බදුවලින් ඉෂ්ට කරපු වගකීම මොකක්ද, බදු අරගෙන හදපු රට මොකක්ද කියන එකයි. එම නිසා අපි දන්නා විධියට ඉතිහාසයේ හිටපු කිසිම නායකයෙක් තමන්ගේ බුද්ධිය වියදම් කරලා මේ රට හදලා නැහැ, මේ රට ගොඩඟලා නැහැ. පත්වන හැම පාලකයෙක්ම රට හදන්න ඕනෑ. ඒ සඳහා ජනතාව බදු ගෙවනවා. ඒ සඳහා රටේ සම්පත් තිබෙනවා.

වර්තමාන පාර්ලිමේන්තුවට අලුතින් පත් වුණු මන්ත්‍රීවරුන් විපක්ෂයේත් ඉන්නවා. අපි හිතුවා, ඇත්තටම ඒ පත් වුණු මන්ත්‍රීවරුන්වත් මේ දේශපාලන සංස්කෘතිය, මේ දේශපාලන වෙනස තේරුම් ගනිමින් පාර්ලිමේන්තුවේ හැසිරෙයි කියලා. නමුත් අපට තේරෙන්නේ, අලුතින් පත් වුණු බොහෝ මන්ත්‍රීවරුනුත් විපක්ෂයේ පරණ නායකයින් ලෙස තම තමන්ගේ දේශපාලන ව්‍යාපාරය ආරක්ෂා කර ගන්න මහන්සි වෙන බවයි. ඉතින් අපි ඒ මන්ත්‍රීවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, අපි හැමෝම එකතුවෙමු, වර්තමාන තත්ත්වය දකිමු, දැකලා මේ තත්ත්වය වෙනස් කරන්න මහන්සි වෙමු කියලා.

ඒ වාගේම මට තව විශේෂ කාරණයක් කියන්න තිබෙනවා. උතුරු පළාත නියෝජනය කරන මන්ත්‍රීවරුන් කවුරුවත් මේ වෙලාවේ මෙතැන නැහැ. අර්ච්චුනා මන්ත්‍රීතුමාත් කථා කරලා යන්න ගියා, voice-cut එකක් යූටියුබ් එකට දාන්න වෙන්න ඇති. හැබැයි ඇත්තටම ගත්තොත්, උතුරු පළාත නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන් පැවැති මැතිවරණයේදීත් ජාතික ජන බලවේගය පරද්දන්න, ජාතික ජන බලවේගය සමාජය තුළ වෙන් කරන්න, බෙදන්න තමයි උත්සාහ කළේ. උතුරේ ජනතාවට අපි ගෞරව කරනවා, අපි ස්තුතිවන්ත වෙනවා, ඒ පාරම්පරික, ඒ ජාතිවාදී, උතුරේ තිබුණු බෙදුම්වාදී දේශපාලනය අතහැරලා අපිත් එක්ක එකතුවෙලා ජාතික ජන බලවේගය ජයග්‍රහණය කරවන්න වැඩ කිරීම පිළිබඳව. ඒ වෙනුවෙන් අපේ ගෞරවය ඔවුන්ට

[ගරු උපාලි සමරසිංහ මහතා]

නැවතත් මා පුද කරනවා. විශේෂයෙන්ම අපි වන්නි දිස්ත්‍රික්කය ජයග්‍රහණය කළා, යාපනය දිස්ත්‍රික්කයෙන් මන්ත්‍රී ධුර තුනක් ලබා ගත්තා.

එම නිසා මෙතුමන්ලා දැන් කියන්න උත්සාහ කරනවා, ජනතාව අපට සලකලා තිබෙනවා, උදව් කරලා තිබෙනවා, ඒ නිසා අපේ පැත්තෙන් මේ ගැන බලන්න කියලා. අපි ඔබතුමන්ලාට කියන්න ඕනෑ, මේ අය වැයේදී ලංකා ඉතිහාසයේ මුල් වතාවට උතුරු පළාත වෙනුවෙන් ලොකුම මුදල අපි වෙන් කරලා තිබෙන බව. සමහර විට මේ මන්ත්‍රීවරුන් හිතනවා ඇති, කොළඹ දිස්ත්‍රික්කයට සාපේක්ෂව යාපනය දිස්ත්‍රික්කයටත් සල්ලි දෙන්න ඕනෑය කියලා. මොළයක් තිබෙන මිනිහෙක් කල්පනා කරන්න ඕනෑ, කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්න ජනතාවටයි, එහි තිබෙන යටිතල පහසුකම් ටිකටයි සාපේක්ෂව යාපනය දිස්ත්‍රික්කයේ සිටින ජනතාව සංසන්දනය කරලා තමයි මුදල් වෙන් කරන්න වෙන්නේ කියන එක. මා හිතනවා, මේ අය වැයේදී අපි සාධාරණව හැමෝටම උපරිමය ඉෂ්ට කරලා තිබෙනවා කියලා. ඒ සඳහා මම ඔබතුමන්ලාට උදාහරණයක් කියන්නම්. උතුරේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර 1,200ක් සංවර්ධනය කරන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ලංකාවේ කිසිම දිස්ත්‍රික්කයකට එච්චර මුදලක් වෙන් කරලා නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු උපාලි සමරසිංහ මහතා
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)
මට තව සුළු වේලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග සහ පාලම් හදන්න රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මුලතිව් වඩඩුවාකල් පාලම හදන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. උතුරු පළාතේ සහ නැඟෙනහිර පළාතේ අවතැන් වුණු ජනතාව නැවත පදිංචි කරවන්න රුපියල් මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා. යාපනය පුස්තකාලයේ තිබෙන අඩු පාඩු හදන්න රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. උතුරු පළාතේ පොල් වගා කරන්න අක්කර 16,000ක් වෙන් කරලා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම වවුනියා දිස්ත්‍රික්කයේ විතරක් වැව් 162ක් හදන්න රුපියල් කෝටි 50ක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේ වාගේ දැවැන්ත මුදලක් උතුරේ ජනතාව වෙනුවෙන් අපි මෙවර වෙන් කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඉල්ලා සිටින මස් රාත්තලම දෙන්න අපට අමාරුයි. නමුත් අපි උතුරේ ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම දේ සාධාරණව කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් රණසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.07]

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කරන්න මම කැමැතියි, ලෝකයේ හිටපු ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙක් වූ මයිකල් ආන්ජලෝ කලාකරුවාගේ ප්‍රකාශයකින්. ඔහු කියනවා, "අප හමුවේ ඇති විශාලතම අනතුර නම්, අපි ඉහළ අරමුණු ඉලක්ක කර ඒවා ළඟා කර ගැනීමට අපොහොසත් වීම නොව, අපි ඉතාම කුඩා අරමුණු ඉලක්ක කර ඒවා ළඟා කර ගැනීමයි" කියලා. මා හිතනවා, අපේ රටට, එහෙම නැත්නම් අපේ ආර්ථිකයට වෙලා තිබෙන දේටත් මේක අදාළයි කියලා. හරියට අපේ විපක්ෂය වාගේ. උදේම ඇවිල්ලා මොනවා හරි කියලා, පොඩි voice-cut එකක් මාධ්‍යයට දා ගන්න, එහෙම නැත්නම් සමුපකාරයක් දිනලා රතිඤ්ඤයක් පත්තු කරන්න, එහෙම නැත්නම් මේ විපක්ෂ නායක පුටුව කොහොමද අල්ලාගෙන ඉන්නේ කියලා බලන්න, එහෙමත් නැත්නම් පොඩි සද්දයක් දාලා, ගිරිය පුප්පලා, අඩිය හප්පලා, අපි තමයි වණ්ඩි, අපි තමයි මේකේ seniorsලා කියලා පොඩි සත්තමක් දාන තත්ත්වයට පත්වන්න, අන්න ඒ වාගේ petty goalsවලට යටවෙලා ඉන්න විපක්ෂයක් තමයි අද අපට හම්බවෙලා තිබෙන්නේ. We find a petty Opposition with petty goals and a petty mindset. But, we have much bigger and wider aspirations. That is, to build this country to a thriving nation and create a beautiful life for each and every citizen of this country. And, this Budget our President has presented is the stepping stone to achieve those aspirations.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රකාශ කරන්න කැමැතියි, අපි මේ ඉදිරිපත් කරලා තිබෙන මංගල අය වැය ඓතිහාසික අය වැයක් කියලා. ඊට හේතුව මෙයයි. මීට පෙර අපේ ගරු මන්ත්‍රීතුමා කථා කළ ඇත උතුරේ ඉන්න ජනතාව, කඳුකරයේ ජනතාව, පෙර පාසල් දරුවන්, පාසල් දරුවන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, දැවැන්ත ව්‍යවසායකයින්, විදේශ ආයෝජකයන්, තරුණයන්, සිරකරුවන් සහ වීදි දරුවන් වාගේ මේ සමාජයේ සිටින සෑම ජන කොට්ඨාසයක්ම අරමුණු කර ගත්, ඒ සියලු ජන කණ්ඩායම්වලට, ඒ පුද්ගලයන්ට මේ ආණ්ඩුවට සහ ආර්ථික කටයුත්තට සම්බන්ධ වෙන්න පුළුවන් අය වැයක් තමයි අපේ රජයේ පළමු අය වැය විධියට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

හැබැයි, දැන් තැන්-තැන්වල විපක්ෂයේ මන්ත්‍රීවරු කියවනවා, මොකක්ද මෙතුමන්ලාගේ ආර්ථික දර්ශනය කියලා. අපේ ලාල් කාන්ත ඇමතිතුමා පසුගිය දවසක එතුමන්ලාට පැහැදිලි කරලා දුන්නා, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන එක තමයි අපේ මේ අය වැයේ මූලික අරමුණ කියලා; ආර්ථික අවස්ථා නිර්මාණය කරන එක තමයි අපේ මේ අය වැයේ ප්‍රධාන අරමුණ. ඒක අරමුණු කරගෙන තමයි අපි මෙම අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

කලින් කථා කළ මන්ත්‍රීතුමා විග්‍රහ කරන්න උත්සාහ කළා, ඇත්තටම අපි racist අය වැයක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. I have to deny that. He was trying to raise the fact that we have not given priority to the people of the North. The Hon. Member who spoke before me referred to the funds we have allocated to the North. I can remember, there were some previous Governments which did not even openly discuss about the North because they

used racism in doing politics in the South. But, in this Budget, we have allocated funds, as discussed, to build bridges, develop infrastructure like roads and all other tourism-related infrastructure in the North. Moreover, we have allocated Rs. 200 million to enhance library facilities in this country in this Financial Year. And, 50 per cent of that - that is Rs. 100 million - is allocated to the Jaffna Library, which was burnt down in the past by the masters of some Opposition party Membrs seated in front of us. But, our Government has totally eradicated this racist based fund allocation in this Budget.

We had two key targets in this Budget. The first one is to be in line with the IMF framework. The Opposition is now trying to highlight the fact that we are within the frame of the IMF. Yes, we are. හැබැයි, අපි හිතන්න ඕනෑ, ඇයි අපි IMF එකට ගියේ කියලා. අපව IMF එකට යවන්න වැඩ කළේ කවුද? ඒ, ඔබතුමන්ලාගේ ආණ්ඩු තමයි. එම නිසා තමයි අපට IMF framework එකේ ඉඳලා මෙම අය වැය ඉදිරිපත් කරන්න සිදු වෙලා තිබෙන්නේ. And, the second key target is nation building. අපි දන්නවා, 2028 වනකොට අපට ණය ගෙවීම නැවත ආරම්භ කරන්න තිබෙන බව. ඒ සඳහා අපේ ආර්ථිකය පුළුල් කළ යුතුයි; we have to go for economic expansion. ඒ සඳහාත් අපට මෙම අය වැයේදී අවධානය යොමු කරන්න වෙලා තිබෙනවා.

I would like to highlight some significant facts in this Budget. The first is, our governance measures. In this, as a Government, we have highlighted and recognized the open market conditions, the price-driven market conditions. The second is, regulation. We have also recognized that the Government needs to regulate the economy. Thirdly, Government intervention in economic activities. Our Government is coming forward to intervene, wherever necessary, in economic activities. Finally, the Government's production, manufacturing and distribution. That means, the Government participates in economic activities, and this economic ideology is the economic democracy that is highlighted in the Budget Proposals. Furthermore, I can remember that our President, in his Budget Speech, highlighted about lost decades. The idea is that we can learn from development economics in the world, which came up in the 1800s. A number of economies went bankrupt, yes, due to different reasons, maybe, due to natural disasters or economic recessions. But, our economy went bankrupt because of the nasty politics of the previous Governments which ruled this country.

Anyhow, we have been bold enough to project a 5 per cent economic growth for this year. It is just three months since we have taken over the control of the economy and we project a 5 per cent growth for this year.

Sir, there are two examples we can learn from. In 1997, the South Korean economy went bankrupt due to a deep economic recession and by 2000, they came out of it and made a normal recovery or reached the normal economic growth stage. They focused on economic expansion, export orientation and strict regulation of the economy, which we can learn from. The second example is the economy of Chile, which went bankrupt in 2010. They also put the economy back on track by 2013 with tough regulation of the economy as well as export orientation. Within a very short period of being in power, we have been able to put our economy on the right track and our Budget is also totally focusing on putting the economy on the right track.

දැන් විපක්ෂයේ මන්ත්‍රීවරු උදේට ඇවිල්ලා කෑ ගහලා කියනවා, අතැනට funds allocate කරලා නැහැ; මෙතැනට allocate කරලා නැහැ කියලා. තේ කර්මාන්තයට, උසාවියට, එහාට, මෙහාට funds allocate කරලා නැහැ කියමින් විවිධ කාරණා එතුමන්ලා කියනවා. හැබැයි, අපි කියපු, අපේ දීර්ඝ කාලීන සැලසුමට අනුව තමයි මේ අය වැයෙන් අපි යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ සැලසුම ක්‍රමානුකූලව ළඟා කර ගන්න තමයි මේ අය වැය අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපට Rs. 3 trillion වෙන් කරන්න වෙලා තිබෙනවා, පොලී ගෙවන්න. ඒක අපේ රජයේ ආදායමෙන් කෙරෙන විශාල වියදමක්. හැබැයි, මොනවාටද අපට පොලී ගෙවන්න වෙලා තිබෙන්නේ? ඒ පොලී ගෙවන්න වෙලා තිබෙන්නේ, විපක්ෂයේ වාඩි වෙලා සිටින කට්ටිය කාලයෙන් කාලයට ඒ පැත්තට, මේ පැත්තට මාරු වෙලා කරපු නාස්තිකාර ව්‍යාපෘති වෙනුවෙන් ගත්ත ණයවලටයි. කුලුනු, සම්මන්ත්‍රණශාලා වැනි අපේ ආර්ථිකයට නැවත අරමුදල් එකතු නොවන නාස්තිකාර, විනාශකාරී ව්‍යාපෘතිවලට ගත්ත ණයවලට තමයි අපට විශාල වශයෙන් පොලී ගෙවන්න වෙලා තිබෙන්නේ. අපි ආණ්ඩු බලයට පත් වෙලා මාස තුනක් ඇතුළත මේ කාර්යය ඉටු කරලා තිබෙන්නේ අන්න ඒ කියන අභියෝගත් මැද තමයි.

මේ අය වැයෙන් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කර තිබෙනවා. නමුත්, වැටුප් වැඩි කළා මදි කියලා විශාල වශයෙන් සාකච්ඡා වෙනවා. මම හිතනවා, මොළයක් තිබෙන ඕනෑ කෙනෙකුට තේරෙනවා ඇති කියලා, මෙච්චර අමාරු ආර්ථික තත්ත්වයක් තියාගෙනත් අපි සියලු ක්ෂේත්‍රවලට සැලකිය යුතු මට්ටමෙන් වැටුප් වැඩි කිරීමක් ලබා දීලා තිබෙන බව.

මම රාජ්‍ය සේවයේ අවුරුදු 15ක් වැඩ කළා. ඒ ඉතිහාසයේ කවදාවත් වාර්ෂික වැටුප් වර්ධකය වැඩි වෙලා නැහැ. හැබැයි, අපේ මේ පළමු අය වැයෙන් අපි සියයට 80කින් වාර්ෂික වැටුප් වර්ධකය වැඩි කරලා තිබෙනවා. අපි විශ්වවිද්‍යාලවල වැඩ කරපු කාලයේ රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළා, APIT එක අඩු කරන්න කියලා. ඒ වෙලාවේදී අපට උත්තර දුන්නා, ඔයගොල්ලන් ගිහිල්ලා IMF එකට කියන්න කියලා. ඒ වාගේම අපට මතකයි, ගුරුවරු හා විදුහල්පතිවරු තමන්ගේ වැටුප වැඩි කරන්න කියලා පාරට බහිනකොට වික්‍රමසිංහ - රාජපක්ෂ ආණ්ඩුව ඒගොල්ලන්ට කොහොමද සැලකුවේ කියලා. ඒගොල්ලන්ට මහ මහදී පහර දුන්නා. ඒ විතරක් නොවෙයි. ඒගොල්ලන්ගේ වැටුප් වැඩි කරන්න නම් ඒ වෙලාවේ සියයට 18 තිබෙන VAT එක සියයට 22 දක්වා වැඩි කරන්න වෙයි කියලා හිටපු ජනාධිපතිතුමා කිව්වා. හැබැයි, තමන්ම පත් කරපු මහ බැංකු අධිපතිවරයාත් එක්ක එතුමා Central Bank එකට ගේම දුන්නා. අන්න එහෙම තමයි ඒගොල්ලන් කටයුතු කළේ. එහෙම තිබුණු ආර්ථිකයක් තමයි අපි ක්‍රමානුකූලව මේ ගොඩනඟමින් යන්නේ.

අපි මේ අය වැයෙන් කිසිම අලුත් බද්දක් පනවා නැහැ. මේ රටේ පොදු මහජනතාවට අලුතින් බදු එකතු කරලා නැහැ. හැබැයි ඔය ටයි දාගෙන කෑ ගහන මහත්වරුන්ට, ඔය ව්‍යාපාරවලට සම්බන්ධ වෙලා ඉන්න අයට අපි කියනවා, බදු නොගෙවා කරපු ඒ ව්‍යාපාරවල බදු එකතු කරගන්න අපේ රජය කටයුතු කරනවා, රාජ්‍ය බලය පාවිච්චි කරලා බදුවලින් මහ හරින්න අපි කිසිසේත්ම ඉඩ තියන්නේ නැහැ කියලා. අපි ඉදිරියේදී ඒවාට ක්‍රියාමාර්ග ගන්නවා.

ඒ වාගේම වැඩිහිටි ස්ථාවර තැන්පතු පොලිය ගැන විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මෙතැන කෑ ගහලා කියනවා මම දැක්කා. ඒගොල්ලන්ට ලොකු දුකක් ඇති වෙලා තිබෙනවා. හැබැයි

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

ඒගොල්ලන් අත ඔසවලා පත් කරපු ජනාධිපතිවරයා ඉන්න කොට; රාජපක්ෂ - වික්‍රමසිංහ රජය තුළ කටයුතු කරනකොට ඒගොල්ලන්ට මතක් වුණේ නැහැ, අර අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තමන්ගේ මුළු ජීවිත කාලයම රාජ්‍ය සේවයට දිය කරලා ගත්තු gratuity එක ස්ථාවර තැන්පතුවක දැම්මාට පස්සේ එයට සියයට එකක්, දෙකක් පොලිය වැඩි කරන්න. ඒ වෙනුවට ජනාධිපති අරමුදල ඒගොල්ලන් බෙදා ගත්තා. ඒ වාගේම ඒගොල්ලන් වන්දි කියලා කෝටි ප්‍රකෝටි ගණන් මුදල් බෙදා ගත්තා. හැබැයි, අර ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොලිය සියයට එකක්, දෙකක් වැඩි කරලා දෙන්න ඒගොල්ලන්ට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. අපේ රජය තීරණයක් ගත්තා, අප්‍රේල් 01වැනි දා ඉඳලා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සියයට 3කින් පොලී අනුපාතය වැඩි කරලා දෙන්න.

ඒ වාගේම මම වචනයක් කියන්න ඕනෑ SriLankan Airlines ගැන. අපට මතකයි ඔය කෑ ගහන සාටක නාටකලා තමන්ගේ අංගනාවෝ ඒකට දාලා වැටුප් ගෙව්වේ. සිය ගණන් පුරවගෙන තමයි ඒගොල්ලන් විදේශ චාරිකා ගියේ. එහෙම කරලා විනාශ කරපු SriLankan Airlines නැවත ගොඩ නහන්න අපි රුපියල් බිලියන 20ක් -රුපියල් මිලියන 20,000ක්- වෙන් කරලා තිබෙනවා. මේ ආර්ථිකය නැවත ගොඩ නහන්න මේ වාගේ යහපත් ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා.

විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රය පිළිබඳවත් මම කථා කරන්න අවශ්‍යයි. අපි දන්නවා, මේ ආර්ථිකය කෙටි කාලීනව යම්කිසි මට්ටමකට ගන්න විශාල කැප කිරීමක්, දායකත්වයක් දුන්නේ සංචාරක ක්ෂේත්‍රය බව. අන්න ඒ ගෞරවය මේ ක්ෂේත්‍රයේ වැඩ කරන, දුක්මහන්සියෙන් තමන්ගේ ව්‍යාපාර කරන ප්‍රජාවට දෙන්න කැමැතියි. විශේෂයෙන් ඒ කර්මාන්තයේ ඉන්න අයගේ ජීවිත යහපත් කරන්න, අමාරු කාලවලදී ඒගොල්ලන්ගේ ජීවිත ගෙවන්න පුළුවන් ආකාරයට දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකස් කරන්න අපි යෝජනා කරනවා. ඒ විතරක් නොවෙයි. අපි ඒගොල්ලන්ට සමාජ ආරක්ෂණ අරමුදලක් ඇති කරන්න මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා.

අපේ රත්නපුරයේ මන්ත්‍රීතුමා මේ කාරණය මතක් කළා. තෝරාගත් ගමනාන්ත 100ක් හඳුනාගෙන ඒවා සංවර්ධනය කරන්න එක ගමනාන්තයකට රුපියල් මිලියන 10 ගණනේ ලබා දෙන්න ඒ වාගේම ඒවා ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කරන්න අපි මේ අය වැයෙන් පියවර අරගෙන තිබෙනවා. විශේෂයෙන් අපි දන්නවා, සංචාරක ක්ෂේත්‍රයේ self-financing organizations අපට තිබෙන්නේ. මේ අය වැයෙන් අපි යෝජනා කරනවා, රුපියන් මිලියන 500ට අමතරව තවත් රුපියල් මිලියන 5,000ක්, 6,000ක් මේ අවුරුද්ද තුළ මේ ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න සහ ප්‍රවර්ධනය කරන්න යොදා ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම තව කාරණයක් කියන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
මේ දවස්වල විපක්ෂය යම්කිසි අදහසක් ඇති කරනවා, ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු උද්ධච්චයි කියලා. මම ඒක ගැන වචනයක් කියලා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතැන ඉන්න ඇමතිවරු, මන්ත්‍රීවරු බොහොමයක් බැලුවොත් ඒ අය තමන්ගේ ව්‍යාපාර අත්හැරලා, තමන්ගේ වෘත්තීන් අත්හැරලා මෙතැනට ආවේ. ඒගොල්ලන්ට අවශ්‍යතාවක් නැහැ, මේ ආර්ථිකය විනාශ කරපු, එහෙම නැත්නම් අපේ රට මේ අගාධයට ඇද දාපු දේශපාලකයන්ට උද්ධච්චකම් පෙවන්වන්න. හැබැයි උද්ධච්ච ලෙස මේ රට විනාශ කරපු අයට මේ රට ගොඩනඟලා පෙන්වන්න තමයි අපේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනෙක් මේ පාර්ලිමේන්තුවට ආවේ. අන්න ඒ කාර්යය ආරම්භ කරන පළමුවැනි අය වැය තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 22ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.22]

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආරම්භ කරනවා අපේ ගරු මන්ත්‍රීතුමා අවසන් කරපු තැනින්. හොඳ අරමුණක් වෙනුවෙන් එතුමන්ලා පෙළ ගැහිලා ඉන්න වෙලාවේ විපක්ෂයට ඇත්තටම ඇමතිතුමන්ලාගේ, මන්ත්‍රීතුමන්ලාගේ උද්ධච්චකම් හොයන්න වැඩක් නැහැ. විපක්ෂයට තිබෙන්නේ විපක්ෂයේ කාර්යභාරය කරන්න. එහෙම කවුරු හරි කියලා තිබෙනවා නම් එතැන වැරැදීමක් තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

හැබැයි, එක දෙයක් මම කියන්න ඕනෑ. මේ රටේ මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු 159දෙනෙක් හැදුණේ කොහොමද කියන එක අපි හරියට කියවා ගන්න ඕනෑ. මේ රටට සැබැවින්ම ආදරය කරන මේ රටේ මිනිස්සු මේ 159දෙනාම පාර්මේන්තුවට ගෙනාවේ, පසුගිය කාල සීමාවේ ආණ්ඩු කරපු පාලකයෝ ගෙන ගිය, මේ රටේ ජනතාවට විශ්වාසයක් තබන්න බැරි පාලනයට විරුද්ධව. ඒක අපි කියවා ගන්න ඕනෑ. ඒක මම හිටපු ආණ්ඩුවෙන් කළාද, ඒක වෙන කාගේ ආණ්ඩුවක් කළාද කියන එක නොවෙයි ප්‍රශ්නය. අපේ පැත්තේ වාඩි වෙලා ඉන්න නාමල් රාජපක්ෂලා පිරිසිදුයි කියන්න තරම් අපි මෝඩ දේශපාලනයක් කරන්නේ නැහැ. පසුගිය අවුරුදු හයේ, පසුගිය අවුරුදු දහයේ අපි විවේචනයට ලක් කළේ ඒ නාමල් රාජපක්ෂලාගේ රාජපක්ෂ යුගය කරපු දේවල්. හැබැයි, රාජපක්ෂලා පරාද වෙලා අද විපක්ෂයේ වාඩි වෙලා ඉන්න කොට රාජපක්ෂලා අපේ ගොඩට දාලා කථා කරන්න තරම් උගත්, වියතුන් විධියට පාර්ලිමේන්තුවට ආපු ඔබතුමන්ලා පහතට වැටෙන්න එපා.

ඒ නිසා හරියට මේක කියවා ගන්න. මේ රටේ උගත්, බුද්ධිමත්, දැනඋගත් පරම්පරාවේ බහුතර ඡන්දයකින් තමයි ඔය 159දෙනා පාර්ලිමේන්තුවට ආවේ. හරි සරලව කිව්වොත්, ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ දේශපාලනය කරන්නේ දැන් අවුරුදු කියක් තිස්සේද? හැමදාම මේ පාර්ලිමේන්තුවේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු තුන් හතර දෙනායි හිටියේ. මමත් මේ තුන්වැනි වතාවටයි පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. අපි මෙතැන දකින කාලයේත්, ඊට ඉස්සෙල්ලාත් ඒ ගණන වැඩි වුණේ නැහැ. The Hon. (Dr.) Nihal Abeysinghe වැනි අය එකතු වෙලා අලුත් දේශපාලන සංස්කෘතියක් මේ රටේ හැදුවා. ඒ දේශපාලන සංස්කෘතිය කෙරෙහි ලොකු විශ්වාසයක් අපේ රටේ ජනතාව තැබුවා, පාරම්පරිකව, සාම්ප්‍රදායිකව හැදිච්ච කණ්ඩායමට එහා ගිය අලුත් ගමනක් යන්න පුළුවන් විධියේ කණ්ඩායමක් තමයි මේ එන්නේ කියලා. ඒ අනන්‍යතාව රැක ගන්න තමයි, ඒ ගමන යන්න තමයි ඔබට මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ. නැත්නම් JVP එකේ ලක්ෂ 3ක, 4ක ඡන්ද ප්‍රතිශතය, ඡන්ද ලක්ෂ 68ක්,

69ක් දක්වා වැඩි වෙන්නේ නැහැ නේ. මේ රටේ වෙනත් දේශපාලන මත දරපු පිරිස් මේ රටට අත් වෙච්ච ඉරණම හොඳින් දැක්කා. මොකද, අපේ රට බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කරපු රටක් වුණා. යමක් කමක් තේරෙන මිනිස්සු කල්පනා කළා, මේ උදව්යට ආපහු බලය දීලා තේරුමක් නැහැ කියලා. ඒ ජනවරම - mandate එක - තමයි ඔබතුමන්ලා ගාව තිබෙන්නේ. එහෙම නැතිව මේක වැරදියට කියවා ගන්න එපා. අපි යම් කෙනෙක් උද්ධච්චයි කියලා කියන්නේ ඇහෙන්, මුහුණෙන් නෙවෙයි. අපි කථා කරන පරාසය තුළ ගැඹුවෙලා තිබෙන්නේ මොකක්ද?

ඊයේ ඇමතිවරයෙක් කියනවා, "අවුරුදු 25ක් යනතුරු ආයෙත් හිතන්න එපා මාලිමාව යවන්න" කියලා. ඔහොම තමයි ගෝඨාභය මහත්මයාත් කිව්වේ. ගෝඨාභය මහත්මයා 69ලක්ෂයක් ඡන්ද අරගෙන මේකේ වාඩිවෙලා තුනෙන් දෙකක බහුතරය අරගෙන රඟපු රඟහිල්ල දැක්කාද? බැසිල් රාජපක්ෂට ඕනෑ වුණා මේ රටේ පාර්ලිමේන්තුවට එන්න. මේ රටේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයකු විධියට එන්න බැසිල් රාජපක්ෂට ඇමෙරිකාවේ citizenship එක අයින් කර ගන්න බැහැ; හැබැයි, ඒ වෙනුවෙන් අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කළා. ඒක කරන්න අත උස්සපු අය කිහිප දෙනෙක් තවමත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. බැසිල් රාජපක්ෂට පාර්ලිමේන්තුවට එන්න අපේ රටේ මූලික නීතිය වෙනස් කරන්න අත ඉස්සුවා. ඒ තරම් බලයක් තිබුණා. හැබැයි, අවුරුදු එකහමාර යනකොට ගෝඨාභය රාජපක්ෂ මේක දාලා ගියා. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් කියන්නේ, ජනතා නියෝජිතත්වයක් කියන්නේ, මේකේ අපේ වගකීම මොකක්ද කියලා හරියට තේරුම් අරන් කටයුතු කරන්න ඕනෑ.

මෙතැන ඉන්න ව්‍යක්තිකයෝ බහුතරයකට මගේ ලොකු ගෞරවයක් තිබෙනවා. ඒ ව්‍යක්තිකයෝ ලොකු කැප කිරීමක් කරන්නේ. ඒ ඇවිල්ලා තිබෙන්නේ සැබවින්ම මේ රටට ආදරය නිසා මේ කටයුතු කරගෙන යන්නයි. හැබැයි, යම් ප්‍රමාණයක් ඉන්නවා, මේ ලැබිච්ච බලය -මේ අපිත් එක්ක එකට හිටපු මිත්‍රයන්ට පවා මේක දරා ගන්න බැහැ- අමුතු විධියට පාවිච්චි කරන්නේ. ඒ නිසා අපි ඉල්ලීමත් කරනවා. විපක්ෂයේ අපි මේ රටේ පුරවැසියෝ කොටසක්. අපි විපක්ෂයේ වාඩිවෙලා ඉන්නේ අපට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයට යන්න තරම් ප්‍රමාණවත් මන්ත්‍රී ධුර ප්‍රමාණයක් නැති නිසායි. ඒ නිසා විපක්ෂයේ ඉන්නේ ආණ්ඩුව කඩාකප්පල් කරන, ආණ්ඩුවට ගහන්න කැති පොලු අරන් ඉන්න පිරිසක් කියලා හිතන මානසිකත්වයෙන් අයින් වෙන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. එහෙමත් හිතන උදව්ය ඇති. හැබැයි, අපි ඒ ගොඩේ නැහැ. අනෙක, අපට ඔය කියන වෝදනාවලුත් නැහැ. දැන් "රට විනාශ කරපු, මේ රට හතරගාතේ දාපු, බංකොලොත් කරපු.." කියලා අපි දිහා බලනවා. ඒ ඔක්කෝම අපේ ගොඩට දාන්නේ නැතිව, එවැනි දේවල් තිබෙනවා නම් පෞද්ගලිකව කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය වැය විවාදය තුළ අපි දැක්කා හොඳ කරුණු කාරණා රාශියක් කථා කරනවා. ඒවා හොඳ සාධනීය කාරණා. මම නියෝජනය කරපු පසුගිය පාර්ලිමේන්තු දෙකේදී නොදැකපු හොඳ සාධනීය කරුණු, මේ රටේ අනාගතය වෙනුවෙන් අපට හිතන්න පුළුවන් කාරණා මේක ඇතුළේ කථා වුණා. හැබැයි, තව බොහෝ දේවල්, මේ රටේ කළ නොහැකි දේවල්,- යමක් අවබෝධ කර ගන්න පුළුවන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම මේ යෝජනාව කරනවා. ඔබට මේ වෙලාවේ තිබෙන අභියෝගය මොකක්ද කියලා ඔබ කල්පනා කර බලන්න. ඒ අභියෝගය විපක්ෂය නොවෙයි. ඔබට තිබෙන අභියෝගය, ඔබ එදා විපක්ෂයේ සිටියදී දේශපාලන වේදිකාවල ඔබ කරපු කථා ටික තමයි ඔබට අභියෝගයක් වෙලා තිබෙන්නේ. ඔබ එදා දීපු පොරොන්දු තමයි අද ඔබට අභියෝගයක් වෙලා තිබෙන්නේ. ඒවා රටේ ජනතාව තමන්ගේ තිබෙන දැනුම් තේරුම් ගැනීමේ හැකියාව පරිදි තේරුම් ගත්තා.

අනුර කුමාර දිසානායක වත්මන් ජනාධිපතිතුමා ඒ කාලයේ කළ ප්‍රකාශයක් තිබෙනවා. ඒක මමත් කියන්න පුළුවන් හැමතැනම කියනවා. එතුමා කිව්වා, "අපට බලය දෙන්න; මාස 6න් මේ රට ගොඩදාලා පෙන්වන්නම්" කියලා. එතුමා මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉදිරි පෙළ ආසනයක ඉන්නකොට මමත් හිටියේ එතුමාගේ ආසන්නයේමයි. මම දන්නේ නැහැ, ගොඩ දානවා කියන එකේ ප්‍රමාණය කොච්චර ද කියලා. ඒ ආකාරයට මාස 6න් රට ගොඩදානවා කියලා කිව්වේ, එතුමා ජනාධිපති වෙලා ද, පාර්ලිමේන්තුවේ බලය අරගෙන ද කියන කාරණාව පැහැදිලි නැහැ. ජනාධිපතිවරයා වෙලා නම් මාර්තු 21වැනි දා වෙනකොට මාස 6 අවසන්. පාර්ලිමේන්තු බලය අරගෙන නම් මැයි මාසේ 14වැනි දා වෙනකොට මාස 6 අවසන්.

ඒ නිසා අපි විපක්ෂය හැටියට නිශ්ශබ්ද වෙලා, ආණ්ඩුවට කිසිම හානියක් නොකර, ආණ්ඩුවේ කකුලෙන් අදින්නේ නැතුව, ආණ්ඩුවට එරෙහිව පාරට බැහැලා කෑ ගහන්නේ නැතුව මාස 6ක කාලයක් දෙනවා. නමුත්, දේශපාලනික වශයෙන් ඔබතුමන්ලා ලබා ගත්තු මේ මහා විශාල -සුවිශාල- ජයග්‍රහණය මේ රටේ සුවහසක් ජනතාවගේ බලාපොරොත්තු ටික ඉටු කරන්න ගන්නා ප්‍රවේශය හරි තැනක ද තිබෙන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අපි දන්නවා, මේ ප්‍රශ්න ඉවර කරන්න බැරි බව; මේ තිබෙන ප්‍රශ්න ඔක්කෝටම එක වර උත්තර හොයන්න බැරි බව.

චතුරංග නියෝජ්‍ය ඇමතිතුමා පොල් ගැන කියපු කථාව මේ රටේ මිනිස්සු ගත්තේ වැරදි විධියට කියලායි මා හිතන්නේ. මොකද, ඒ කාරණය සමාජයට දුන්නේ වැරදි විධියට. ඒ කතාවේ ගැඹ වෙච්ච අර්ථය සාධනීයයි. ඒ කාරණය හරහා අපේ රටේ මිනිසුන්ට නොතේරෙන තැනක්, කියලා දෙන්න ඕනෑ තැනක් මතු කළ බව කියනවා.

සාධනීය කාරණා වාගේම සාධනීය නොවන කාරණාත් තිබෙනවා. මම එය වගකීමෙන් කියනවා. ගොඩක් කාලයක් - ලොකු කාලයක්- ආණ්ඩු බලයක් නැතුව හිටපු කණ්ඩායම්, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ඇමතිකම් දරපු සමහර අය මේ ලැබුණු අවස්ථාවෙන් ක්ෂණික ප්‍රයෝජන ගන්න උත්සාහ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, මේ ඉන්න ව්‍යක්තිකයන් ඒක පාලනය කරන්න කියලා. සමහරු එයින් වාසි ගන්න උත්සාහ කරනවා.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා සැබෑ උත්සාහයක් ගන්නවා වෙන්න පුළුවන් රට හදන්න; හොරකම, වංචාව, දූෂණය නතර කරන්න. හැබැයි, අපට හෙට අනිද්දාට, නම් කරලාම කියන්න පුළුවන් කාරණා මතු වෙමින් තිබෙනවා නම්, රාජපක්ෂ ආණ්ඩුවයි, මේ ආණ්ඩුවයි අතර වෙනසක් නැහැ කියන්න - මම උදාහරණයක් ගන්නම් - මේ ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනා අවංකවම සාක්ෂි දරන්න ඕනෑ කාරණාවක් මේක. පසුගිය මාස දෙකකට ඉස්සර වෙලා මේ රටේ හාල් හිඟයක් ආවා. හාල් ආනයනය කරන්නේ නැහැ කියලා ඔබතුමන්ලා කිව්වා. නමුත්, ඒ ආපු තත්ත්වයත් එක්ක හාල් ආනයනය කරන්න සිද්ධ වුණා. හැබැයි, හාල් ආනයනය කරන්න සතොසට ටෙන්ඩර් එකක් දාගන්න කිහිප වතාවක්ම බැරි වුණා කියලා, ඒ වැරදීම් වුණා කියලා ඔබතුමන්ලා අවංකව පිළිගන්නවා ද? ඒක පිළිගන්නවා නම් මා හිතන්නේ දේශපාලනික වශයෙන් ඔබතුමන්ලා තවත් කියවන්න ඕනෑ කියලායි. කියවීම මදි, දැනීම මදි. මේ රටේ සාමාන්‍ය දැනීම තිබෙන, මේ රටේ අමාත්‍යාංශවල හැසිරීම ගැන යම්කිසි අවබෝධයක් තිබෙන, මේ රටේ සමහර රාජ්‍ය සේවකයින් එකතු වෙලා ගහන ගේම්වල ගැඹුර ගැන අවබෝධයක් තිබෙන මිනිස්සු දන්නවා, මේවා ගේම් කියලා. මේ කාරණය ඇතුළේ යම්කිසි දෙයක් ගැඹ වෙලා තිබෙනවා කියන එක මම මතු කරනවා. ඔය වාගේ දේවල් නොවෙයි ඒ කාලයේ වුණේ. මම මේ

[ගරු ඡේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

කියන්නේ මේවා නතර කරන්න කියලායි; මේවා මෙතැනින් එහාට ආපසු නොදකින්න අවශ්‍ය කටයුතු කරන්න කියලායි.

මම මේ වෙලාවේ තවත් කාරණාවක් මතු කරලා දෙන්න කැමැතියි. මම පසුගිය පාර්ලිමේන්තුව තුළ මේ රටේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳව විශාල වශයෙන් කථා කළා; විවාද ගණනාවකට සම්බන්ධ වුණා. ඒ විවාද එකක්වත් වැඩක් වුණේ නැහැ, ඵලදායි විසඳුමකට ආවේ නැහැ. එදා හිටපු ජනාධිපතිතුමාගේ හිතවතුන්, හිටපු ජනාධිපතිතුමාගේ ලේකම්ලා ඒ කාරණය ඒ අදාළ තැනට එන්න පාර කැපුවේ නැහැ. එදා ක්‍රීඩා ඇමතිවරයා විධියට රොෂාන් රණසිංහ ඇමතිවරයාත් සමහර වෙලාවට උත්සාහ කළා ක්‍රිකට් ආයතනය යන ගමන නිවැරදි තැනකට ගෙන යන්න. අන්තිමට රොෂාන් රණසිංහ කැබිනට් ඇමතිවරයාට ගෙදර යන්න වුණා. එදා තත්ත්වය අදත් වෙනවා නම්, එදා වෙච්ච දේ අදත් වැරදිලා හරි මේ ආණ්ඩුවෙනුත් වෙනවා නම්, මම හිතනවා රාජපක්ෂ ආණ්ඩුවයි, මේ ආණ්ඩුවයි අතර වෙනසක් නැහැ කියලා. මම ඒ කාරණාව පිළිබඳව තවත් පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්.

අපේ රටේ දූෂිතම ආයතනයක් තමයි Sri Lanka Cricket. එය, ක්‍රීඩා සංගම්වලින් වැඩිම ආදායමක් තිබෙන ආයතනයයි. ඒක දූෂිතයි කියන එක අනුර කුමාර දිසානායක වත්මන් ජනාධිපතිතුමා, හිටපු ක්‍රීඩා ඇමතිවරයකු වන දයාසිරි ජයසේකර මන්ත්‍රීමා ඇතුළු අපි සියලු දෙනා COPE එකේදී ඇස් දෙක ඉස්සරහා දැක්කා. COPE එක ඉස්සරහට ආපු Sri Lanka Cricket එක කොච්චර ගේම් ගහලා තිබෙනවාද කිව්වොත්, COPE එකේ සභාපතිතුමාත් සල්ලිවලට අරගෙන තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට මතක ඇති, පසුගිය කාලයේ ඇහෙන්, කනින් සංඥා කරපු සිද්ධිය. COPE එකේ සභාපතිතුමා -ඒ මහාචාර්යතුමා- අන්තිමේදී ඉල්ලා අස් වුණා. ඒ තරමටම තමන්ගේ බලය මේ රටේ පතුරුවන ආයතනයක් තමයි Sri Lanka Cricket කියන්නේ. අපට ඒකේ ඉන්න මිනිස්සුත් එක්ක ප්‍රශ්නයක් නැහැ. ඒකේ ඉන්න මිනිස්සු කවුද කියලාවත් මම දන්නේ නැහැ. ඔය ශම්මි සිල්වා තවම මගේ මුහුණට හමු වෙලාත් නැහැ. නමුත්, ඒ ආයතනය ඇතුළේ වෙන්නේ මොකක්ද කියන එක ගැන අපි දන්නවා. ඔබතුමන්ලා ඒ පිළිබඳව හඬක් නඟලා, ඒ සම්බන්ධව අවශ්‍ය පියවර ගනියි කියලා අපි බලාපොරොත්තු වුණා. අපේ ආණ්ඩුවක් ආවා නම් අප ඒකට කරන්නේ මොකක්ද කියන කාරණාව ගැන අපි සමාජයට, රටට කියලා තිබෙනවා.

හැබැයි අද වෙනකොට මොකක්ද වෙලා තිබෙන්නේ? මේ ආණ්ඩුවේ එම විෂය භාර වත්මන් ඇමතිවරයාට අපි කිව්වා, මෙන්න මේ ප්‍රශ්න ටිකයි තිබෙන්නේ, ඔබතුමා ඒවාට අවශ්‍ය පියවර ගන්න කියලා. අපි හිතනවා, ජාතික ජන බලවේගයෙන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්න බහුතරයක් මේ රටේ, සමාජයේ විශ්වාසයක් තිබෙන පුද්ගලයන්ය කියලා. ඒ ඇවිල්ලා ඉන්න පිරිස අතුරින් ක්‍රීඩාවට සම්බන්ධතාවක් තිබෙන කවුරු හෝ එකතු කරගෙන විශේෂයෙන්ම ක්‍රිකට් ආයතනය වාගේ ආයතන දියුණු කරන්න, පාලනය කරන්න, නියාමනය කරන්න අවශ්‍ය පියවර ගන්න.

පසුගිය දිනක මම ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළාම ගරු ක්‍රීඩා ඇමතිතුමා මට පොරොන්දුවක් දුන්නා. එම ආයතනයේ කරලා තිබෙන දූෂණ, වංචා ගැන කරුණු කාරණා කෙටියෙන්, පොඩි වෙලාවක් තුළ මම පැහැදිලි කළා. එතුමා කිව්වා, සති දෙකක් දෙන්න -දින 14ක් දෙන්න-, ඊට පස්සේ ඔබතුමාට බලාගන්න පුළුවන් වෙයි මොකද වෙන්නේ කියලා යනුවෙන්. අද වෙන කොට දින 14 පැනලා තිබෙනවා. ඇමතිතුමා මේ වෙලාවේ මෙම ගරු සභාවේ නැහැ. හැබැයි, එතුමාට මොකුත් කර ගන්න බැරි වෙලා තිබෙනවා.

මම නිකමට සොයා බැලුවා මොකද වෙන්නේ කියලා. හෙට අනිද්දාට එහි නිලවරණය පැවැත්වෙනවා. ඒ නිලවරණය පැවැත්වෙන හින්දා මේ වෙලාවේ ලහිලහියේ මොකද කරන්නේ? COPE එකේ හිටපු සභාපතිවරයෙකු දැලේ දාගන්න පුළුවන් වුණු ඒ කණ්ඩායමට වෙන මොනවාද කරන්න බැරි කියලා මම දන්නේ නැහැ.

මේ වෙනකොට ආපහු අලුත් බිල් එකක් යනවා. මේ ආණ්ඩුවේ 159 දෙනාගෙන් මේ රටේ ක්‍රීඩාවට ආදරය කරන, ඇත්ත කාරණා වෙනුවෙන් පෙනී සිටින එක්කෙනෙක් හරි ඉන්නවා නම්, ඒ කෙනාට දැන ගන්නයි මම මේ කියන්නේ. දැන් අලුත් බිල් එකක් යනවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඇමතිවරයා අල්ලාගෙන. "මාතරට ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් හදන්න යෝජනාවක් ගේනවා, අපි ඒකට සල්ලි ටික දෙනවා, මේ ඡන්දය ගොඩ දාලා දෙන්න" කියලා කියනවා. මාතර ඒ වැඩේ දැන් ලහි ලහියේ යනවා. මාතර ground එකක් හදනවා කියලා ප්‍රකාශ කරලා තිබෙන ඉඩම පන්සලේ ඉඩමක්. පොල්හේනේ ground එකක් හදනවා කියලායි කියන්නේ. එහෙම කියන කොටම මම බැලුවා, පොල්හේනේ කොහේද අක්කර 9ක්, 10ක් තිබෙන්නේ කියලා. පොල්හේනේ අක්කර 9ක්, 10ක් නොවෙයි, පර්චස් 9ක් සොයා ගන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පස්සේ හොයලා බලන කොට ඒක පඹුරණ ඉඩමක්. දැන් මෙතැන ඉන්නවා, මාතර අපේ ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමා. එතුමාගෙනුත් මම ඒ ගැන ඇහුවා. ඒ ඉඩම පන්සලේ ඉඩමක්. මම හිතනවා, හදුන්නෙත්ති ඇමතිවරයා මේ කුණු ගොඩට කර තියන එකක් නැහැ කියලා. ඒ කට්ටිය උත්සාහ කරනවා මේ රටේ ක්‍රීඩාව නංවන්න ආපු සල්ලි ටික, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නංවන්න ආපු සල්ලි ටික තමන්ගේ ඊළඟ term එක ඇද ගන්න, ඡන්දය දිනා ගන්න පාවිච්චි කරන්න. ඡන්දය තිබ්බොත් ඒ අය දිනනවා. ඒ ගැන කිසිම කථාවක් නැහැ. ඡන්දය තිබ්බොත් ක්‍රිකට් ආයතනයේ ඉන්න කණ්ඩායම එනවා. මොකද, වෙන කාටවත් එන්න බැරි විධියට පසුගිය කාලයේ වැඩ පිළිවෙළ හදලායි තිබෙන්නේ. ඒ නිසා අර කියපු අක්කර 9 පෙන්නලා ඡන්දය ගොඩ දාගන්න හදනවා. මම මෙහිදී ඉල්ලීමක් කරනවා. ඔබගේ යෝජනාව මාතරට ground එකක් හදන එක නම්, මම ඒක නරකයි කියන්නේ නැහැ. හැබැයි ඉතින්, මේ රටේ grounds හදලා වැඩක් නැහැ. මේ රටේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ පහක් තිබෙනවා. ක්‍රිකට් ආයතනයට අද කොන්ද කෙළින් තියාගෙන කථා කරන්න බැහැ. මේ අවුරුද්දට අපේ රටට ලැබිලා තිබෙන්නේ ටෙස්ට් මැච් 4යි. ටෙස්ට් මැච් 4ක් ගහන්න grounds 5ක් තිබෙනවා. ඒවායෙනුත් මැච් 2ක් ඉවරයි. ගාල්ලේ ගහලා ඒ 2කම පරාදයි. තව ටෙස්ට් මැච් 2යි අවුරුද්දටම තිබෙන්නේ. හැබැයි, තව ground එකක් හදන්න යනවා. Grounds හදන එක නොවෙයි අපට කරන්න තිබෙන්නේ, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව නැංවීමයි.

2028 ඔලිම්පික් තරගාවලිය පැවැත්වෙනවා, ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් නගරයේ. මොකක්ද ඒකට තිබෙන සූදානම? ඔලිම්පික් තරගාවලියට ගිය ක්‍රීඩකයෙක් තමයි ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිතුමා හැටියට ඉන්නේ. එතුමා ක්‍රීඩාව වෙනුවෙන් වචනයක් කථා කරනවා මම දැක්කේ නැහැ; එතුමා ගත්තු පියවරක් දැක්කේ නැහැ. දැන් මාස දෙකතුනක් ගියා නේ. ක්‍රීඩාව සංවර්ධනයටයි අප යන්න ඕනෑ. මේවා අපට කාත් එක්කවත් පෞද්ගලිකව තිබෙන

ප්‍රශ්න නොවෙයි. අපි හිතනවා, මේ කියන අවබෝධය ඔබතුමන්ලාට තිබෙන්න ඕනෑ කියලා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, මේක හරි තැනට අරගෙන යන්න කියලා. ගරු හඳුන්නෙත්ති ඇමතිතුමා මේ වෙලාවේ මෙහි නැති නිසා මම ඒ ගැන වැඩිදුර කථා කරන්නේ නැහැ. මා ඒ කිව්වේ මාතර සිද්ධියක්. ඔබතුමන්ලා බලාපොරොත්තු වන අයුරින් මාතරට ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් අවශ්‍ය නම් ඒක ඉදි කරන්න; නිර්මාණය කරන්න. මංගල සමරවීර මැතිතුමා ජීවත්ව සිටි කාලයේ එතුමා පඹුරණ ප්‍රදේශයේ ජර්මන් ටෙක් ආයතනයේ ශාඛාවක් පිහිටුවන්න හදපු ඉඩම තමයි ඔය ගන්න හදන්නේ. නමුත් ඒක පන්සලේ ඉඩම. තවම රජයට පවරාගෙනත් නැහැ. ඒක අවශ්‍ය නම්, මේ රටේ ක්‍රිකට්වලට ආදරය කරන, මේ රටේ ක්‍රිකට්වල අනාගතය ගැන විශ්වාසය තියන්න පුළුවන් පිරිසකට ක්‍රිකට් ආයතනය භාර දීලා ඒ කට්ටියත් එක්ක ඔය වැඩේ කරන්න. එහෙම නැතිව හොරු රැළක් ගෙනැල්ලා ඒ හොර රැළට කියලා ඒ වැඩේ කරවා ගන්න යන්න එපා. මොකද, ඒ වැඩේ කළත් ඔබතුමාට ඒ ගෞරවය ලැබෙන්නේ නැහැ. මේ රටේ ක්‍රිකට් ගැන දන්නා, ඕවරයට බෝල ගණන කියද කියලා කියන්න පුළුවන් හැම කෙනාම දන්නවා, මේ රටේ ක්‍රිකට් ආයතනය දූෂිතයි කියලා.

අනෙක් ක්‍රීඩාවල වටපිටාවේ තිබෙන ප්‍රශ්න ගැනත් අපි කථා කරනවා. අපි ලබන මාසයේ 10වැනි දා මේ රටේ සියලු ක්‍රීඩා සංගම්වලට ආරාධනා කරලා තිබෙනවා, ඔවුන්ගේ ඉල්ලීම මත. ආණ්ඩුවට රිද්දවන්න, ආණ්ඩුවට කරදරයක්, වදයක් දෙන්න නොවෙයි අපි එහෙම කරන්නේ. මාර්තු මාසයේ 18වැනි දා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ විවාදය පැවැත්වෙනවා. එදාට අවශ්‍ය තොරතුරු ටික දෙන්න, අපි ක්‍රීඩා සංගම් එක්ක විපක්ෂයක් විධියට කථා කරනවා. අපෙන් ඉල්ලීම් කරලා තිබෙනවා, ඒ තොරතුරු ටික දෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් ආයතනය ගැන වත්මන් ක්‍රීඩකයෝ සහ මේ රටේ හිටපු ක්‍රීඩකයෝ දීපු තොරතුරු ගත්තාම ඇඟ හිරි වැටෙනවා, ඒක ඇතුළේ වෙලා තිබෙන්නේ මොනවාද කියලා දැක්කාම. ඒ නිසා අපි ලබන 18වැනි දා එම තොරතුරු ලබා දෙන්නම්, මේ රටේ ජනතාව තෝරා පත් කර එවපු 159දෙනෙකුගෙන් සැදුම්ලත් මේ ආණ්ඩුවට. පසුගිය දවසක මම ක්‍රිකට් සම්බන්ධව ඉදිරිපත් කළ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවට අදාළව තරුණ මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ඉතාම සාධනීය තොරතුරු දක්වමින් අවංකව කථා කළා. වෙන දා නම් එහෙම නොවෙයි. සාමාන්‍යයෙන් ආණ්ඩුව බලා ඉන්නේ හැම වෙලාවේම විපක්ෂයෙන් යම් යෝජනාවක් ගෙනාවාම ගහලා දමන්නයි, ඒ යෝජනාව හොඳ වුණත්, නරක වුණත්. නමුත් මම සතුටු වෙනවා, පසුගිය දවසක මම ඉදිරිපත් කළ කල්තැබීමේ යෝජනාව ගැන ආණ්ඩු පක්ෂයෙන් සාධනීය පිළිතුරු ටිකක් ලැබීම ගැන. ඒක තමයි වෙන්න ඕනෑ. එහෙම වෙනවා නම් විපක්ෂයේ අපි මේ ආණ්ඩුව ගෙනයන වැඩ පිළිවෙළට උපරිම සහයෝගය දෙනවා. මොකද, අපේ අරමුණත් ඒකයි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය ඉදිරිපත් කරන කාරණා යටපත් කරන්න, විපක්ෂය ඉදිරිපත් කරන කාරණා වැරදි විධියට වහලා දමන්න උත්සාහ කරනවා නම්, අපි බලාපොරොත්තු වෙන දේ ඉටු වෙන්නේ නැහැ. මම මේ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට සහ ඇමතිවරුන්ට කියා සිටිනවා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ දක්වා කර තිබෙන දූෂණ, වංචා සියල්ල එකින් එක, එකින් එක, සාක්ෂි සහිතව ලබන 18වැනි දාට මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන බව. ඒ වාගේම වර්තමානයේ ඉන්න කණ්ඩායම ගැන කියනවා නම්, ෆුට් සයිකලයෙන් ආපු මිනිස්සු දැන් ඕස්ට්‍රේලියාවේ ඉඩම් අරගෙන, ගෙවල් අරගෙන කෝටිපතියෝ වෙලා. අර දඹුල්ල රජමහා විහාරස්ථානයට අයිති ඉඩම් සියල්ලම වාගේ බදු අරගෙන කෝටි ගණන්වලට බදු දීලා තිබෙනවා. මම ඒ නම කියලාම කියන්නම්. සුජීව ගොඩලියද්ද මහත්තයා. නම කියලාම මේක කියන්නේ මේවා බලාගෙන ඉන්න බැරි නිසා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි සූදානම්, 18වැනි දාට ආණ්ඩුවට ඒ අවශ්‍ය තොරතුරු ටික දෙන්න. අපි හිතනවා, ආණ්ඩුව මේ වංචාකරුවන්, හොරු හොයාගෙන, - ෆයිල් හදාගෙන කණ්ඩායමක් ඉන්න නිසා- අවශ්‍ය පියවර ගනියි කියලා. ඒකට අවශ්‍ය සහයෝගය, ශක්තිය දෙන්න කියා ඉල්ලන ගමන්, ලැබී තිබෙන කෙටි කාලය තුළ මම තව පොඩි කාරණා 2ක්, 3ක් කියන්න කැමැතියි, අපේ ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් මෙතැන ඉන්නා නිසා.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා පසුගිය කාලයේ මේ රටේ රැකියා විරහිත උපාධිධාරී තරුණ කණ්ඩායමවලට යම් කිසි බලාපොරොත්තුවක් දුන්නා. ඒ කණ්ඩායම පසුගිය මැතිවරණයේදී සියයට 100ක් ඔබතුමන්ලා වෙනුවෙන් පෙළ ගැසුණා. නමුත් අද ඔවුන් ගැන මේ අය වැය තුළ පැහැදිලි සටහනක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත වෙලාව අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මම අවසන් කරනවා, තත්පර 30කින්.

ඒ අය ගැන මේ අය වැය තුළ පැහැදිලි සඳහනක් නැහැ. මේ රටේ ජීවනාලිය බඳු ඒ උගත් තරුණ පරම්පරාවේ අනාගතය දේශපාලනික වශයෙන් පැත්තකට දමන්න හදන්න එපා. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේ බැසිල් රාජපක්ෂ අර ඇට පැකට් විකුණන්න කට්ටියට රස්සා දුන්නා වාගේ මේ අය ඒ තැනට දමන්න එපා. ඔවුන්ට ඒ දීපු පොරොන්දුව ඇත්තක් වෙන්න මේ අය වැයේ ඇතුළේ ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරගෙන ඒ කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරන ගමන්, ලබන 18වැනි දා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන විවාද කරන අවස්ථාවේදී අපි වැඩිදුර තොරතුරු මේ සභාවට ගෙන එන බව සඳහන් කරනවා. මේ කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.42]

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසර්ජන පනත් කෙටුම්පත, 2025 දෙවැනි වර කියවීමේ විවාදයේ හයවැනි දවස වන අද දවසේ අවසන් මිනිත්තු කිහිපයටයි අප එළඹ තිබෙන්නේ. අපි මේ කථා කරමින් ඉන්නේ අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ඉදිරිපත් කරපු අය වැයේ ආර්ථික වැඩ පිළිවෙළ පිළිබඳවයි. පසුගිය දිනවල අපි සාකච්ඡා කරමින් හිටියේ, ආණ්ඩුව හැටියට ආදායම් ලබා ගන්නා ආකාරයයි. ඒ වාගේම අපි -ජාතික ජන බලවේගය- මේ රටට ඉදිරිපත් කරපු ඒ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ජනතාවට අත්පත් කර දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියලා අපි සාකච්ඡා කළා.

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා]

දැන් කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, මාස 6ක් ඇතුළත අපි රට ගොඩ දමන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව. මම හිතන විධියට ඒ මන්ත්‍රීතුමාට අමතක වෙලා තිබෙනවා, අපි භාර ගත්තේ බංකොලොත් රටක් කියන කාරණය. 2022 අප්‍රේල් මාසයේ ඉඳලා ලෝකය ශ්‍රී ලංකාව හඳුනා ගෙන තිබුණේ බංකොලොත් රටක් හැටියටයි.

ඩොලර් බිලියන 100කට වඩා ණය අරගෙන ණය ගෙවා ගන්න බැරුව, පොලී වාරික ගෙවා ගන්න බැරුව බංකොලොත් වෙච්ච රටක් තමයි අපේ අනුර දිසානායක ජනාධිපතිතුමා පසුගිය නොවැම්බර් 14වැනි දා භාර ගත්තේ. හැබැයි, මේ වෙනකොට අපි ඉන්නේ බංකොලොත් රටක නොවෙයි. අපි ඒ බංකොලොත්භාවයෙන් මිදිලායි ඉන්නේ. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කරගෙන, ඒක අවසන් කරගෙන, Fitch Ratings, Moody's ඔවුන්ගේ ratings ඉහළට දමපු රටක තමයි අපි දැන් ඉන්නේ. ඒ නිසා තවදුරටත් අපි බංකොලොත් රටක නොවෙයි ඉන්නේ. ඔබතුමන්ලා දන්නවා, මේ වෙනකොට ජාත්‍යන්තරයේ විවිධ රටවලට ශ්‍රී ලංකාව පිළිබඳව බරපතළ විශ්වාසයක් ගොඩනැඟිලා තිබෙනවා කියලා. පසුගිය කාර්තුවේ සංචාරකයන් විශාල ප්‍රමාණයක් මේ රටට ආවා, මේ රට කෙරෙහි ඇති වෙච්ච විශ්වාසය නිසාම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රටවල් අපේ රට තුළ නොයෙක් ආයෝජන කරමින් හිටියා. පසුගිය කාලයේ ඒවා නවත්වා දමා තිබුණා. ඒ විධියට ජපානය විසින් නවත්වා දමා තිබිච්ච ආයෝජන 11ක් අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ආරම්භ කළා. ඒ වාගේම නොයෙක් ආකාරයේ ආයෝජන මේ රටට කැඳවමින් තිබෙනවා. අපි විශ්වාස කරනවා, අපි මේ රට වැටිලා තිබෙන බරපතළ අර්බුදයෙන් ගොඩ ගත්තා කියලා. විපක්ෂයේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණුවලට තමයි මම ඒ උත්තරය දුන්නේ.

අපේ ආණ්ඩුව මේ අය වැය වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ, ආර්ථික වර්ධනයට හවුල් වීමට ඇති අවස්ථා හඳුනා ගැනීමට, ආයෝජකයන්ට ඉඩ සැලසීමට, ආයෝජන අවස්ථා මොනවාද කියලා ඉදිරියේදී අපේ ආයෝජකයන් හඳුනා ගැනීමට අවශ්‍ය උත්තේජනය ලබා දීමට. ඒ වාගේම ආණ්ඩුවේ ප්‍රමුඛතා හඳුනා ගැනීමට සහ ඒ සඳහා ආයෝජන කැඳවීමට. අපේ බදු මුදල් කොහොමද වියදම් කරන්නේ කියන එක ජනතාවට දැන ගැනීමට තමයි අපි අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. අය වැය වාර්තාවේ පූර්විකාවේ ඉතාම පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, - සමහර විට ඔබ දකින්න ඇති- අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති නිසා, අසීමිත ණය ගැනීම, දේපළ විකිණීම, බදු දීම නිසා තමයි අපේ රට බංකොලොත්භාවයට පත් වුණේ කියලා. ඒ වාගේම ඒ පූර්විකාවේ සඳහන් වෙනවා, වගකීම් විරහිත මූල්‍ය කළමනාකරණය ගැන. අවුරුදු ගණනක් තිස්සේ තිබිච්ච ආණ්ඩු නොයෙක් දේවල් කරන්න නොයෙක් ආකාරයට මුදල් වෙන් කළා. නමුත්, ඒ අසාර්ථක වගකීම් විරහිත මූල්‍ය කළමනාකරණය නිසා, මෙතෙක් මේ රට පාලනය කරපු ආණ්ඩුවලට හරියාකාරව කාර්යයන් කරගන්න බැරි වෙච්ච නිසා තමයි අපේ රට බංකොලොත්භාවයට පත් වුණේ. ඒ වාගේම මේ අය වැය කථාව හරහා -ඉදිරිපත් කළ මේ අය වැය හරහා- අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව, මේ ආර්ථික අර්බුදය විසින් නිර්මාණය කර ඇති සමාජ අර්බුදය ඉතාම පැහැදිලිව වටහා ගෙන තිබෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරු චෝදනා කළා, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති, වැඩ පිළිවෙළට අනුව නොවෙයි, මේ අය වැය කාරණා අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. නමුත් මම කැමැතියි ඔබතුමන්ලාට මෙන්න මේ කාරණා ටික පෙන්වා දෙන්න. කර්මාන්ත සේවා හා කෘෂි නිෂ්පාදනයට දිරි දීම මේ අය වැයේ මූලික මූලධර්මයක් ලෙස සලකා තිබෙනවා. ඒ වාගේම වැඩි පිරිසක් ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම අපේ ආර්ථික වැඩ පිළිවෙළේ මූලධර්මයක් හැටියට අපි සලකා තිබෙනවා. ආර්ථික ප්‍රතිලාභ සාධාරණව සියලු කොටස්වලට බෙදී යෑමට සැලැස්වීම අපේ මූලධර්මයක් හැටියට මේ අය වැයෙන් අපි සලකා තිබෙනවා. ඒ, අපේ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළට අනුව. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලකට, ගුණාත්මකව, අඛණ්ඩව සැපයීම මූලික කාරණයක් හැටියට සලකා තමයි ජාතික ජන බලවේගය මේ අය වැය අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ වාගේම වෙළඳ පොළ ඉල්ලුම සැපයුම සහ මිල නියාමනය පිළිබඳව ඉතාම පැහැදිලිව ජාතික ජන බලවේගයේ වැඩ පිළිවෙළේ සඳහන් කර තිබෙනවා. වෙළඳ පොළ ඉල්ලුම සහ සැපයුම පිළිබඳව අපි සැලකිලිමත් වෙනවා.

ඒ වාගේම මිල නියාමනයකටත් අපි මැදිහත් වෙනවා. ඒවාට අදාළව තමයි, අපි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ. එම වැඩ පිළිවෙළේ අපි සඳහන් කළා, තෝරා ගත් ක්ෂේත්‍ර සඳහා රාජ්‍ය සක්‍රිය දායකත්වය ලබා දෙනවා කියලා. ඒ නිසාම තමයි ප්‍රවාහනය, ආහාර සුරක්ෂිතාව හා විදුලි බලය වැනි ක්ෂේත්‍ර සඳහා රාජ්‍ය මැදිහත්වීම අපි මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

2024දී රනිල් වික්‍රමසිංහ මහතා අය වැය ලේඛනය ඉදිරිපත් කරපු ආකාරය ඔබතුමන්ලාට මතක ඇති. ඒගොල්ලෝ මැතිවරණ දිනුවේ ආණ්ඩුවේ රක්ෂා දෙනවා, සහන මලු දෙනවා, බඩු මිල අඩු කරනවා කියලා. ඊළඟට, වැඩි වැටුප් පිළිබඳව පොරොන්දු දෙමින් තමයි පසු ගිය කාලයේ ආණ්ඩු පිහිටවුයේ. ඒ වාගේම දුප්පත් අයට රක්ෂා ලබා දීලා, වැටුප් වැඩි කරලා, නිකම් භාල් දීලා, සහන දීලා, රාජ්‍ය ව්‍යවසාය නඩත්තු කරලා, ණය වෙලා, සල්ලි අච්චු ගහලා තමයි මීට ඉස්සෙල්ලා තිබුණු ආණ්ඩු නොයෙක් ආකාරයෙන් බලය ලබා ගත්තේ. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒ අය වැය කථාවේදී කිව්වා, වියදම් කළ යුත්තේ ආදායමට සරිලන විධියට කියලා. ඒ විධියට තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ මීට පෙර හිටපු රාජ්‍ය පාලකයෝ අපේ රට පාලනය කළේ. 2024දී අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට, තමන්ම කියා ගත්තේ ඒ විධියට තමයි.

ඒ නිසා "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියලා අපි ඉදිරිපත් කරපු ප්‍රතිපත්තිය වැදගත් වෙන්නේ මෙතැනදීයි. අපි ඉදිරිපත් කරලා තිබෙන අය වැය ලේඛනය තුළින් මේ රටේ විවිධ ක්ෂේත්‍රවල, විවිධ ජන කොටස්වල අවශ්‍යතා හඳුනා ගෙන තිබෙනවා. පසු ගිය දිනවල මගේ මිත්‍රයෙක් මුණ ගැසුණා. එතුමා පුංචි කාලයේ සිට මාත් එක්ක ඉගෙන ගත්ත මිත්‍රයෙක්. එතුමා දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දේශපාලනය කරලා, පොදු පෙරමුණෙන් දේශපාලනය කරලා, අවසන් මොහොතේදී ජාතික ජන බලවේගය යටතේ අපේ දේශපාලනයට එක් වුණා. එතුමා කිව්වා, මේ අය වැය යෝජනා ඉතාම හොඳයි කියලා. මොකද, අවුරුදු ගණනක් තිස්සේ ඒගොල්ලෝ මහන්සි වෙච්ච දේශපාලනයෙන් නොලැබුණු අය වැය යෝජනා, මෙවර අපි ඉදිරිපත් කරලා තිබෙනවා කියලා කිව්වා. ඒ වාගේම, අපේ රටේ වෛද්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් මට ළඟදී මුණ ගැසුණා. එතුමා කිව්වා, මේ රටේ පළමුවැනි වතාවට අනාථ දරුවන් පිළිබඳව ඉතාම පැහැදිලි වැඩ පිළිවෙළක් අපේ අය වැය ලේඛනය තුළ ඉදිරිපත් කරලා තිබෙනවා කියලා.

ඔබතුමන්ලාට මතක ඇති, පසු ගිය 2023 සැප්තැම්බර් මාසයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන -UNDP එක- 25,000ක් householdsලා භාවිත කරලා National Citizen Survey එකක් කළා. ඒක කළේ Oxford Poverty and Human Development

Initiative එකත් එක්ක එකතු වෙලා. එහිදී ඒගොල්ලෝ වාර්තාවක් එළි දැක්වූවා, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 55.7ක් බහුවිධ අවදානම් තත්ත්වවලින් පෙළෙනවා කියලා. ජනගහනය මිලියන 12.3කින් බහුවිධ අවදානම් තත්ත්වවලින් පෙළෙන ග්‍රාමීය ජනතාව මිලියන 10.1ක් වෙනවා. ඒ කියන්නේ හැම දහදෙනෙකුගෙන්ම හයදෙනෙක් බහුවිධ අවදානම් තත්ත්වලින් පෙළෙනවා කියලා කියනවා. ඒ කියන්නේ, ඒගොල්ලන්ට හරියට ආදායමක් නැහැ, හරියට ඉන්න හිටින්න නිවාසයක් නැහැ, ඒ නිවාසයට අවශ්‍ය කරන විදුලිය, ජලය නැහැ. දරුවන්ට උගන්වා ගන්න බැහැ, දරුවන්ට හරියට ආහාර වේලක් දෙන්න බැහැ. ඒ වාගේම විවිධ අවදානම් තත්ත්වවලින් ඒ අය පෙළෙනවා කියලා එම සමීක්ෂණයෙන් හඳුනා ගෙන තිබුණා. ඒ වාගේම ඒගොල්ලෝ කිව්වා, 2023දී දුප්පත්කම දෙගුණ වුණා කියලා. ඒ අනුව සියයට 26ක් ඉන්නේ දරිද්‍රතා රේඛාවෙන් පහළ. ඒ කියන්නේ රටේ ජනතාවගෙන් සියයට 26ක් ඇමෙරිකානු ඩොලර් 3.65කට වඩා දවසකට ආදායම නොලබන කණ්ඩායම කියලා එම වාර්තාවෙන් කියනවා. ඒ නිසා, මේ රටේ දිළිඳුම කණ්ඩායම; දුප්පත්ම කණ්ඩායම; නොයෙක් බාධකවලින් ගැහැට විඳින ඒ කණ්ඩායම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා තමයි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ අය වැය ලේඛනය සකස් කරලා තිබෙන්නේ.

අපි අස්වැසුම සඳහා රුපියල් බිලියන 232ක් වෙන් කරලා තිබෙනවා. එයින් අවදානම් පවුල් සඳහා රුපියල් බිලියන 160ක්, අඩු ආදායම් ආබාධිත පවුල් සඳහා බිලියන 36ක්, අඩු ආදායම් වැඩිහිටි පවුල් සඳහා බිලියන 28ක් සහ වකුගඩු රෝගයෙන් පෙළෙන අය සඳහා බිලියන 4.5ක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ අපි මේ හඳුනා ගත්ත දරිද්‍රතාවෙන් පෙළෙන කොටස් සඳහා විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම වයස්ගත ජනගහනය ඉහළ යාම, ආබාධිත පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් සමාජයේ සිටීම, අනාථ දරුවන් යන සියලුදෙනා පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වලා තමයි අපි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. ඒ වාගේම අපි සෞඛ්‍යය වෙනුවෙන් රුපියල් බිලියන 604ක මුදලක් වෙන් කරලා තිබෙනවා. එය ඉතිහාසයේ වෙන් කළ වැඩිම මුදලක් වෙනවා. ඒ, මේ රටේ ජනතාවගේ සෞඛ්‍ය ගොඩ ගන්නයි.

පසුගිය කාලය තිස්සේ අපේ රටේ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඉතාම බරපතළ ගැටලු ගණනාවකට මුහුණ දුන් බව ඔබතුමන්ලා දන්නවා. ඖෂධ මිල ඉතා ඉහළට ගිහිල්ලා තිබෙනවා. මේ ඖෂධ හිඟය මැඩපවත්වා ජනතාවට හොඳ සෞඛ්‍ය සේවයක් ලබා දෙන්න මේ වෙනකොටත් අපි නොයෙක් ආකාරයේ ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. අද ඖෂධ මිලත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඉදිරි කාල සීමාව තුළ මේ ඖෂධ මිල සෑහෙන දුරකට පහළ දමන්නට අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි බුද්ධි ගලනය නිසා වෛද්‍යවරු, සෞඛ්‍ය සේවකයෝ, පුහුණු නිලධාරීන් අපේ රටට අහිමි වෙමින් තිබෙනවා. මේ අයට නොයෙක් ගැටලු තිබෙනවා, ඒගොල්ලන්ගේ සේවාව සපයන්නට. ඒ නිසා ඉදිරියේදී සෞඛ්‍ය සේවය වෙනුවෙන් වෙන් කරලා තිබෙන විශාල මුදලෙන් මේ සෞඛ්‍ය සේවකයින්ගේ ගැටලු පිළිබඳව සොයා බලලා, ඒ අයගේ ගැටලු විසඳලා ඒ අය මේ රටේ රඳවා ගෙන මේ සෞඛ්‍ය සේවය වඩා යහපත් දිශාවකට ගෙන යන්න අපට පුළුවන් වෙනවා.

රටේ දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් අපි රුපියල් බිලියන 619ක් වෙන් කරලා තිබෙනවා. මේ මෑත ඉතිහාසයේ වෙන් කරපු වැඩිම මුදල එයයි කියලා මම හිතනවා. ඒ කියන්නේ, මේ රටේ තවමත් විද්‍යා අධ්‍යාපනය ලබා නොදෙන පාසල් තිබෙනවා. සමහර දිස්ත්‍රික්කවල කිසිම දෙමළ මාධ්‍ය පාසලක උසස් පෙළ අධ්‍යාපනය නැහැ මේ වාගේ බරපතළ දුෂ්කරතාවලට මුහුණ දෙමින් තමයි මේ රටේ දරුවෝ තවමත් ඉගෙන ගන්නේ. අපි මේ සා විශාල මුදලක් මේ රටේ දරුවන්ගේ අධ්‍යාපනයනට වෙන් කරලා තිබෙනවා. මොකද, දරුවන්ට අධ්‍යාපනය ලබා දුන්නොත් තමයි ඒගොල්ලන් දැන් සිටින දරිද්‍රතා තත්ත්වයෙන් මිදිලා, ඒගොල්ලන්ට හොඳ අනාගතයක් ලබා ගන්න පුළුවන් වෙන්නේ කියලා අපි විශ්වාස කරනවා.

කෘෂිකර්මාන්තයේ නවීකරණය සඳහා ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව වෙනුවෙන් අපි රුපියල් බිලියන 2,254ක් වැය කරලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න, ඩිජිටල්කරණය සඳහා අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව රාජ්‍ය සේවයේ ඵලදායීතාව වැඩි කරන්න කටයුතු කරනවා. දූෂණ, වංචා අවම කරන්න, රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ආරක්ෂා කර ගන්න, ඒක වර්ධනය කර ගන්න, ආර්ථික අවස්ථා ප්‍රවර්ධනය කරන්න, තොරතුරු සන්නිවේදනය කාර්යක්ෂම කරන්න කටයුතු කරනවා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පොලී සහනාධාරය අපි ජූලි මාසයේ සිට වැඩි කරනවා. ඒ නිසා මෙතෙක් ඒගොල්ලන්ට ලැබුණේ නැති යම් කිසි සහනයක් ලැබෙයි කියලා අපි හිතනවා. ඒ වාගේම ප්‍රාග්ධන වියදම් සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් වෙන් කරලා තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම, පොදු ප්‍රවාහනය ශක්තිමත් කිරීම, ග්‍රාමීය සංවර්ධනය ශක්තිමත් කිරීම, කෘෂිකර්මයේ පුනර්ජීවනය සහ පර්යේෂණය දිරි ගැන්වීම සඳහා. ඒ නිසා, මේ අය වැය අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ ජනතාව පුල පුලා බලා හිටපු අය වැයක් කියලා අපි විශ්වාස කරනවා. අපේක්ෂා ගොන්නක් ඇතිව සිටින ජනතාවගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කර ගන්න ජාතික ජන බලවේගයේ අපි ඉදිරිපත් කරපු "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන වැඩ පිළිවෙළ මේ රට තුළ ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්න අවශ්‍යකරන ඒ මූලික පියවර ගන්නට ඉදිරි මාස 8 තුළ අපිට හැකියාව ලැබෙනවා කියන එක කියන්නට ඕනෑ. ඒ නිසා, ඉදිරි වසර 5 තුළ ඒ ප්‍රතිපත්ති ක්‍රියාවට නඟලා මේ රටේ ජනතාවගේ ජන ජීවිතය මීට වඩා විශාල ප්‍රමාණයකින් ඉහළට ගෙන යන්නට අපට හැකිවෙයි කියලා අපි විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විශ්වාසයත් ඇතිව මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 25 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 6.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.

விவாதம், 2025 பெப்ருவரி 25, செவ்வாய்க்கிழமை மீளத் தொடங்கும்.

It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Tuesday, 25th February, 2025.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

ආබාධිත ප්‍රජාව පිළිබඳ ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක්
மாற்றுத்திறனாளிகளுக்கான கொள்கைசார் வேலைத்திட்டம்
A POLICY-DRIVEN PROGRAMME FOR THE DISABLED

[අ.භා. 5.59]

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"නිර්භාධිත සමාජ ජීවිතයක් උදෙසා ලක්ෂ සංඛ්‍යාත ආබාධිත ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිස අයිතිවාසිකම් පාදක කර ගත් සුබසාධනය, බලගැන්වීමේ වැඩපිළිවෙළක් ඉදිරිපත් කළ යුතුව ඇත.

මෙම වැඩපිළිවෙළ තුළ එක්සත් ජාතීන්ගේ ආබාධිත සහිත පුද්ගලයින් පිළිබඳ ප්‍රඥප්තියට සමපාතව දේශීය නීතිය සඳහා නව පනතක් සැකසීමටත්, ආබාධිත ප්‍රජාව තුළ පවතින ආර්ථික විභවයන් සමාජ සංවර්ධනයට අවශෝෂණය කර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමටත් අවශ්‍ය වී ඇත. එබැවින් ආබාධිත සහිත ප්‍රජාව පිළිබඳ ප්‍රතිපත්ති සහිත වැඩපිළිවෙළක් විද්‍යාත්මක පසුබිමක් යටතේ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වර්ගීකරණය සහ දත්ත රැස්කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෘෂ්‍යාබාධිත පුද්ගලයකු විධියට පළමු වතාවට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් බ්‍රේල් මාධ්‍යයෙන් ලියාගෙන ඇවිල්ලා කියවන්න මේ අවස්ථාව ලැබීම පිළිබඳව ඇත්තටම මම ආඩම්බර වෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව මා මෙම ප්‍රකාශය කරනවා.

අද ලංකා පාර්ලිමේන්තුවේ ඓතිහාසික අවස්ථාවක්. සුගත් වසන්ත ද සිල්වා මැතිතුමා කථා කරන්නේ බ්‍රේල්වලින් ලියන ලද සටහනක් භාවිත කරමින්. ඒක විශේෂ අවස්ථාවක් විධියට පාර්ලිමේන්තු ඉතිහාසයට එකතු වෙයි කියා මම හිතනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව කරගෙන යන්න.

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
බොහොම ස්තුතියි.

අපි දන්නවා, ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ යම්කිසි තොරතුරක්, දත්තයක් අපට ආසන්න වශයෙන් ලැබෙන්නේ 2012 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවෙන් බව. එම වාර්තාවේ කියන විධියට ලක්ෂ 17කට අධික ආබාධ සහිත ප්‍රජාවක් ඉන්නවා. මේ ප්‍රජාව තුළ විවිධ ආබාධ සහිත පුද්ගලයන් ඉන්නවා. විශේෂත්වය තමයි මේ සංඛ්‍යාවෙන් සියයට 57ක්ම ආබාධ සහිත කාන්තාවන්. සාමාන්‍ය තත්ත්වයේදී කාන්තාවන් ඉන්නේ සියයට 52යි. ආබාධ සහිත ප්‍රජාව ගත්තාම, කාන්තාවන් සියයට 57ක් ඉන්නවා. ඒක විශේෂිතයි.

අනෙක් වැදගත්ම කාරණය තමයි, මේ ආබාධ සහිත ප්‍රජාවගේ ශ්‍රම බලකායෙන් සියයට 71ක් රැකියා විරහිතව සිටීම. ඒ කියන්නේ, ආර්ථික වශයෙන් ඵලදායී කිසිදු කටයුත්තක යෙදෙන්නේ නැති පිරිස සියයට 71ක් කියලා තමයි තිබෙන්නේ. මේ වාගේ චිත්‍රයක් තමයි ශ්‍රී ලංකාවේ ආබාධ සහිත ප්‍රජාව පිළිබඳව තිබෙන්නේ. ඒ, මීට අවුරුදු 12කට පෙර තිබුණු චිත්‍රය. අද ඒ චිත්‍රය ඊට වඩා සංකීර්ණ වෙලා ඇති; විකෘති වෙලා ඇති; විෂම වෙලා ඇති. අපි දන්නවා, ආබාධ සහිත ප්‍රජාවට ආර්ථික ක්ෂේත්‍රයට තිබෙන ප්‍රවේශය ඉතා පටු බව. ආබාධ සහිත පුද්ගලයන්ට රැකියා අංශයෙන් සියයට 3ක අවස්ථාවක් දිය යුතු බවට වූ වක්‍රලේඛයක් තිබෙනවා. ඒ වක්‍රලේඛය ක්‍රියාත්මක වෙන්නේ 1988 වර්ෂයේ ඉඳලායි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමාට අවශ්‍ය කාලය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ කාලය අපේ ආණ්ඩු පක්ෂයේ කාලයෙන් අඩු කරගන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
බොහොම ස්තුතියි.

1988දී තමයි එම චක්‍රලේඛය නිකුත් කරලා තිබෙන්නේ. නමුත්, ඒක යථාර්ථයක් වෙලා නැහැ. ආබාධ සහිත ප්‍රජාවගෙන් සියයට 71ක් රැකියා විරහිතව ඉන්නවා. අපි දන්නවා, පෞද්ගලික අංශය තුළින් විශාල රැකියා අවකාශයක් නිර්මාණය කිරීමේ වගකීම පැවරෙන බව, ආබාධ සහිත ප්‍රජාව පිළිබඳව සොයා බලන අමාත්‍යාංශයට, ලේකම් කාර්යාලයට. ඒ වාගේම රාජ්‍ය අංශය විධියට අපට සිද්ධ වෙනවා, ආබාධ සහිත ප්‍රජාව රැකියා සඳහා අනිවාර්යයෙන්ම මැදිහත් කර ගැනීමට. රජය විසින් රැකියා අංශයෙන් සියයට 3ක් සඳහා ආබාධ සහිත ප්‍රජාවට අවකාශ සලස්වන්නේ නැතුව, පෞද්ගලික අංශයෙන් අපට එම ඉල්ලීම කරන්න බැහැ; බලපෑම් කරන්න බැහැ. මොකද, ඒක සදාචාරාත්මක නැහැ. කෙසේ වෙතත්, ආබාධ සහිත ප්‍රජාව සියයට 3ක් සේවයේ යෙදෙන කිසිදු ආයතනයක් මා දන්නා තරමින් නම් නැහැ. ඒ නිසා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයට අපි යෝජනා කරනවා, ආබාධ සහිත ප්‍රජාවට රාජ්‍ය ආයතනවල ලබා දිය හැකි රැකියා අවස්ථා පිළිබඳව සොයා බලන්න කියලා.

උදාහරණයක් විධියට කියනවා නම්, දුම්රිය දෙපාර්තමේන්තුවේ පුටු විවීමේ අංශයේ දෘෂ්‍යාබාධිත පුද්ගලයන් ගණනාවක් වැඩ කරනවා. ඒ අංශය අපට තවත් පුළුල් කළ හැකියි. ඒ වාගේම ස්ථිර වශයෙන්ම මම දන්නවා, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දෘෂ්‍යාබාධිත අය සඳහා බ්‍රේල් මුද්‍රණාලයක් පවතින බව. කිහිපදෙනෙක් විශ්‍රාම ගියත්, නිෂ්පාදනයේ අවශ්‍යතාව තිබුණත්, ඒ රැකියා අවස්ථා අද වන විට ඇහිරිලා තිබෙනවා, විවිධ චක්‍රලේඛ නිසා.

ඒ වාගේම අපි දන්නවා, බහුකාර්ය යෝජනා ක්‍රමය යටතේ තිස් ගණනක් බඳවා ගත් බව. ඔවුන් සමාජ සේවා දෙපාර්තමේන්තුවට බඳවාගෙන විවිධ ආයතනවලට යොමු කරලා තිබෙනවා. නමුත්, ඔවුන්ගෙන් ඵලදායී සේවයක් ලබා ගැනීමට කළමනාකාරිත්වය අසමත් වෙලා තිබෙනවා. මේවා ගැන නැවත හිතා බැලුවොත් තමයි ආබාධ සහිත ප්‍රජාව ආර්ථික වශයෙන් බලගන්වන්නත්, ඔවුන්ගේ පවුල් ජීවිත සාර්ථක කර ගන්න අවස්ථාව සලසා දෙන්නත්, කොටින්ම කිව්වොත් ඔවුන්ට ලස්සන ජීවිතයක් උරුම කර ගන්න අවස්ථාව සලස්වන්නත් අපට හැකියාව ලැබෙන්නේ. ඒ වාගේම ආණ්ඩුවක් විධියට අපි වග කියන්න ඕනෑ, අපි අනිවාර්යයෙන්ම වග කියනවා, ඔවුන් පිළිබඳ සුබසාධනවාදී වැඩ පිළිවෙළ දියත් කිරීම සඳහාත්.

ඒ වාගේම ඔවුන් සමාජ බලගැන්වීමත් අපි තහවුරු කරන්න ඕනෑ. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට ශ්‍රී ලංකා රජය අත්සන් කරලා තිබෙනවා. ඒක අපරානුමත කරලා තිබෙනවා. ඒ, මීට අවුරුදු 8කට කලින්. හැබැයි අපට තවමත් බැරිවෙලා තිබෙනවා, දේශීය නීතිය එම ප්‍රඥප්තියට අනුකූල විධියට නිර්මාණය කරන්න. ඒකෙන් මොකක්ද කියැවෙන්නේ? ජාත්‍යන්තර නීති රීති, රෙගුලාසි අපි පිළිගන්නවා, නමට. හැබැයි, තමන්ගේ බිමේ ඒක ක්‍රියාත්මක කරන්න පොහොසත් නැහැ. ඒක ක්‍රියාත්මක කරන්න ඉදිරිපත් වෙන්නේත් නැහැ. ආබාධ සහිත ප්‍රජාවට ඒකෙන් අහිමි වෙන්නේ, ඔවුන්ගේ ජීවිතය සඵලදායීව පවත්වාගෙන යෑමට තිබෙන අයිතිවාසිකම් 25ක්. අනෙක් පැත්තෙන් ඔවුන්ගේ වුවමනා. ඒ නිසා ඔවුන් නිරීක්ෂණය කරන, ඔවුන් අධීක්ෂණය කරන රාජ්‍ය යන්ත්‍රණයේ සැකසීම් සිදු කළ යුතුව තිබෙනවා.

ඒ සඳහා ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 33වැනි වගන්තියෙන් අපට ඉතා පැහැදිලිව මහපෙන්වීම් කරනවා. මේ මහපෙන්වීම් පාදක කරගෙන තමයි, "එක්ව අත් නොහැර" ප්‍රතිපත්තිය ජාතික ජන බලවේගය විධියට අපි ගොඩනැඟුවේ. අපේ බලාපොරොත්තුව, අපේ සිහිනය තමයි, අපට සමාජ ජීවිතයේදී නිර්බාධිත තත්ත්වයක් නිර්මාණය කරමින් ආබාධ සහිත ප්‍රජාවට ස්වෛරී, නිදහස්, ලස්සන, පොහොසත් ජීවිතයක් ගත කිරීමට තිබෙන අවකාශ පුළුල් කරගන්න එක. රජයක් විධියට, සමාජයක් විධියට ශිෂ්ට සම්පන්න බව තුළ අනිවාර්යයෙන්ම ඒක තහවුරු වෙන්න ඕනෑ. එහෙම නොවුණොත් අපි මේ දකින හීනය අපේ ඇස් පනාපිටම කඩාගෙන වැටෙවි, ශිෂ්ටත්වයෙන් අපි ඈත් වේවි.

අති බහුතරය සහිත රජයක් විධියට ජාතික ජන බලවේගයේ අපි බලාපොරොත්තු වෙන දේ තමයි, මම ඉදිරිපත් කරපු යෝජනාව අනුව විද්‍යාත්මක දත්ත රැස් කිරීමක් හරහා ආබාධ සහිත පුද්ගලයන් වර්ගීකරණය නෛතික තත්ත්වයට ගෙනැල්ලා විදේශීය අත්දැකීම් සහිතව ඔවුන් වෙත අනිවාර්යයෙන්ම සේවා සහ ප්‍රතිලාභ ලැබෙන ක්‍රමයක් නිර්මාණය කිරීම. ඒ හරහා ඔබතුමන්ලා යෝජනා කරන, අපි යෝජනා කරන, අපට ලැබිච්ච වරම තුළින් මනුෂ්‍යත්වයෙන් පොහොසත් රටක් නිර්මාණය වෙනකොට ලස්සන ජීවිතයකට උරුමකම් කීමට මෙන්න මේ ලක්ෂ සංඛ්‍යාත වූ ආබාධ සහිත ප්‍රජාවට අවකාශ සැලසීම. එසේ අවකාශ සැලසීමට නම් අනිවාර්යයෙන්ම අපි ආබාධ සහිත ප්‍රජාව පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතුයි, ඒක යාවත්කාලීන විය යුතුයි, ඒක වර්ගීකරණය විය යුතුයි. මේ සියලු ප්‍රතිපත්ති, මේ සියලු වැඩ පිළිවෙළ අනිවාර්යයෙන්ම දත්ත මත පදනම් වෙච්ච විද්‍යාත්මක ක්‍රමය ඔස්සේ යා යුතුයි. එහෙම නොවුණු නිසා තමයි, පසුගිය අවුරුදු 76ක කාලය පුරාම දියත් කරපු සියලු වැඩසටහන් ගහට කැපූ ඉනි මෙන් අපතේ ගිහිල්ලා තිබෙන්නේ; අපේ බලාපොරොත්තු සුන් කරමින් අපතේ ගිහිල්ලා තිබෙන්නේ.

මට මේ කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා.

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.11]

ගරු තනුර දිසානායක මහතා
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට විශේෂයෙන්ම දකින්න තිබෙන කාරණයක් තමයි, විවිධ ප්‍රතිපත්ති සකස් කිරීමේදී, ක්‍රියාමාර්ග ගැනීමේදී සහ තීන්දු-තීරණ ගැනීමේදී විද්‍යාත්මක පදනමක් සඳහා දත්ත අත්‍යවශ්‍ය වන බව. අපේ ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු ආකාරයට අපේ රටේ ආබාධ සහිත ජනතාව පිළිබඳව අප සතුව ඇති දත්ත දශකයකට වඩා පැරණියි. ඒ නිසා මම යෝජනා කර සිටිනවා, කාලීන නැත්නම් වත්මන් තත්ත්වයට ගැළපෙන දත්ත අපි එක්රැස් කරගත යුතුයි කියලා. ඒ වාගේම ආබාධ සහිත ජනතාවගේ පරාසය, වර්ගීකරණය යන කරුණු අවශ්‍ය වෙනවා, ඔවුන්ගේ ජීවිත සුවපත් කිරීම සඳහා, යහපත් කිරීම සඳහා සහ සම අයිතිවාසිකම් සහිත සමාජයක් තහවුරු කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපත්ති රාමු සකස් කිරීම සඳහා. ඒ වාගේම ඔවුන් ආර්ථිකයට සම්බන්ධ කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග සහ වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහා අමාත්‍යාංශවලට මේ දත්ත වැදගත් වෙනවා. ඒ නිසා මම යෝජනා කරන්න කැමැතියි, නවීනතම දත්ත එහෙම නැත්නම් කාලීනම දත්ත ලබා ගැනීම සඳහා යම් ක්‍රමයක් අප සකස් කළ යුතුයි කියා.

අපි ගොඩක් වෙලාවට දකිනවා, අපේ රටේ පොදු ප්‍රවාහන සේවා ඇතුළු ප්‍රවේශ ස්ථාන ගත්තොත්, විශේෂයෙන්ම බස් රථ ගත්තොත් ආබාධ සහිත ජනතාවට පමණක් නොවෙයි, සාමාන්‍ය ජනතාවටත් ප්‍රවේශවීමට ඉතාම අපහසු හා අසීරු විධියට තමයි දීර්ඝ කාලයක් තිස්සේ නිර්මාණය වෙලා තිබෙන්නේ කියන එක. අපි ගොඩනැඟිලි ගත්තත්, බස් රථ ගත්තත්, වෙනත් ප්‍රවාහන මාධ්‍යයන් ගත්තත් ඒ අයට මේවා පහසු නැහැ. මේවායේ සම්ප්‍රදායයන් ගත්තත්, ප්‍රවාහන සේවා ලබා දීමේදී තිබෙන ගුණාත්මකභාවය ගත්තත් සාමාන්‍ය ජනතාවටත් අපහසුතාවලට ලක් වන්න සිදුවනවා. විශේෂයෙන්ම ගත්තොත්, මේ ආබාධ සහිත ජනතාව ප්‍රවාහන සේවා භාවිතයේදී ඉතා විශාල අසීරුතාවකට පත් වෙනවා. ඒ වාගේම රෝහල්වලදී පවා ඔවුන් අසීරුතාවට පත් වෙනවා. මොකද, පසුගිය කාලය තුළ අපේ රටේ රෝහල් මේ තත්ත්වයට ඔරොත්තු දෙන්න, මේ ජනතාවට වඩාත් පහසුවෙන් ප්‍රවේශ වෙන්න පුළුවන් විධියට නිර්මාණය කර තිබෙන බවක් අපට පෙනෙන්නේ නැහැ.

ඒ නිසා අපට අවශ්‍ය වෙනවා, ගොඩනැඟිලි ඉදිකිරීමේදී, ප්‍රවාහනයේදී නව ප්‍රතිපත්ති හඳුන්වා දෙන්න වාගේම, මේ ජනතාවට මෙම ප්‍රවේශය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගන්න. ඒ වාගේම, අද අපි ජීවත් වන ලෝකයේ ප්‍රවේශය පැත්තෙන් ගත්තොත්, තොරතුරු තාක්ෂණයට විශාල ප්‍රවේශයක් තිබෙනවා. විශේෂයෙන්ම ආබාධ සහිත ජනතාවගේ ආර්ථික මට්ටම නහාසිටුවීම සඳහා අපේ අය වැය යෝජනා තුළින් එම දීමනා වැඩි කර තිබෙනවා. නමුත්, මම හිතන විධියට අපට තව පියවරක් ඉදිරියට යන්න වෙයි. මොකද, ලෝකයත් එක්ක සම්බන්ධ වෙන්න ඔවුන්ට විශාල බාධා ප්‍රමාණයක් තිබෙනවා, ඔවුන්ගේ ආර්ථික තත්ත්වයත් එක්ක තොරතුරු තාක්ෂණය, නවීන තාක්ෂණය බද්ධ වෙන්නේ කොහොමද කියන කාරණය නිසා. ඒ නිසා මම මේ ගරු සභාවට යෝජනා කරන්න කැමැතියි, ඔවුන් තොරතුරු තාක්ෂණය පැත්තටත් සම්බන්ධ කර ගැනීම සඳහා අවශ්‍ය නව වැඩ පිළිවෙළක් සකස් විය යුතුයි කියා. ඔවුන් පොහොසත් රටක ජීවත් වන ලස්සන පුරවැසියන් බවට පත් කර ගැනීම සඳහා අපි සියලුදෙනාම එක්ව කටයුතු කරමු කියන ඉල්ලීමත් කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.13]

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම හිතන විධියට ආබාධිත සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳව ඉතා වැදගත් යෝජනාවක් මෙවර අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවා. ආබාධිත සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳව පසුගිය පාර්ලිමේන්තුවේදීත් විශේෂ පාර්ලිමේන්තු සංසදයක් තිබුණා, Parliamentary Caucus for Persons with Disabilities කියලා. ඩලස් අලහප්පෙරුම හිටපු ඇමතිතුමාගේ සභාපතිත්වය යටතේ තිබූ ඒ Caucus එක හරහාත් මේ ජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් සිදු කළා. මම මේ ආණ්ඩුවට යෝජනා කරනවා, ඒ Parliamentary Caucus එකෙන් ඉටු කළ කාරණාත් ඇතුළත් කරගෙන මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයන්න කියලා.

මට පෙර කථා කළ අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වා, ආබාධිත සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙනුවෙන් ලබා දෙන දීමනාව මෙවර අය වැය තුළින් වැඩි කර තිබෙනවා කියලා. මුදල් නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්න නිසා මම දැනගන්න කැමැතියි, මේ අවුරුද්දේ ඒ දීමනාව වැඩි කර තිබෙනවාද, නැද්ද කියලා. අය වැය ලේඛනය තුළ මේ දීමනාව වැඩි කර තිබෙන බවක් මම නම් දැක්කේ නැහැ. මම දන්නා විධියට 2008දී ආබාධිත හා විශේෂ,-

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු මන්ත්‍රීතුමනි, අය වැය කථාවේ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, ආබාධ සහිත පුද්ගලයන් සඳහා දැනට මාසිකව ලබා දෙන රුපියල් 7,500ක දීමනාව රුපියල් 10,000 දක්වා වැඩි කරන බව.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අප්‍රේල් මාසයේ ඉඳලාම රුපියල් 10,000 දක්වා වැඩි වෙනවාද?

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ඔව්. අය වැය කථාවේ ඒ බව ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. අප්‍රේල් මාසයේ සිට එම දීමනාව ලබා දෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මම අහන්නේ අප්‍රේල් මාසයේ ඉඳලා දීමනාව වැඩි වනවාද කියායි.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ඔව්, අප්‍රේල් මාසයේ ඉඳලාම ඒ දීමනාව ලබා දෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මට ඒ කාරණාව අතපසු වෙන්න ඇති. රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා ඒ දීමනාව වැඩි කළ එක හොඳයි. මම හිතන හැටියට ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දේශපාලන වේදිකාවල, මීට පෙර මැතිවරණ ව්‍යාපාරවලදී දැකපු නැති විධියට බලය ලබා ගැනීම සඳහා ආබාධිත අය සහ විශේෂ අවශ්‍යතා තිබෙන අයගේ ගැලවුම්කරුවන් වශයෙන් ඉදිරිපත් වුණා. ඒ ගැන අපි සතුටු වෙනවා. පළමුවෙනි වතාවට ඒ කියපු විධියටම ජාතික ලැයිස්තුව හරහා ගරු මන්ත්‍රීවරයෙකුත් පාර්ලිමේන්තුවට ගෙනැවිත් තිබෙනවා. ඇත්තටම ඒක අපි අගය කරන්න ඕනෑ.

මම මේ අවස්ථාවේදී මේ කාරණයත් මතු කරන්න කැමතියි. දැන් කියන්න පුළුවන්, කුහක වෙන්න එපා කියලා. එහෙම නොවෙයි, උදාහරණ ඇතිව අපි කියන්නේ මේක කොහොමද කරන්න තිබුණේ කියන එකයි. අය වැය විවාදය අවස්ථාවේ මම කථා කරනකොටත් යම් යම් කාරණා මතු කළා; ගොඩක් ප්‍රශ්න මතු කළා. ඊයේ-පෙරේදා දෙකේම අය වැය පිළිබඳ කථා පවත්වන වෙලාවේ මේ ගරු සභාව ඇතුළේ නොසිටියත් මම අහපු ප්‍රශ්නවලට පිළිතුරු දෙනවාද කියලා රේඩියෝ එකෙන් ඇහුවා. නමුත්, ඒ එකකටවත් පිළිතුරු ලැබුණේ නැහැ, කිසිම ඇමතිවරයෙකුගෙන්. මේ කාරණය මම ඉදිරිපත් කරන්නේ ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනයට අදාළ දෙවැනිවර කියවීමේ විවාදයේදී මම ඉදිරිපත් කළා, that the revenue loss due to tax exemptions surpasses the individual budgets for education, health and social welfare. මේ ආණ්ඩුව බලයට එනකොට පොඩි මිනිහා වෙනුවෙන් ආණ්ඩුවක් එනවා කියලා තමයි කිව්වේ. අද මේ අය වැය කථාවෙන් ආබාධ සහ විශේෂ අවශ්‍යතා තිබෙන අය ගැන කියන නිසායි මම මේ කාරණය කියන්නේ. මේ කණ්ඩායම වෙනුවෙනුත් පෙනී සිටින කණ්ඩායමක් හැටියට තමයි මේ ආණ්ඩුව මැතිවරණයට ගියේ. හැබැයි, මේ මන්ත්‍රීවරුත් මතක තබා ගන්න, පසුගිය රජයෙන් රුපියල් බිලියන 966ක් මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට, කෝටි ගණන් ලාභ උපයන විශාල ව්‍යාපෘතිවලට බදු සහන - tax exemptions - දීලා තිබෙන බව.

NPP රජයක් යටතේ අපි බලාපොරොත්තු වුණේ මොනවාද? මේ රුපියල් බිලියන 966ක බදු සහනය මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට දෙන්නේ මොකටද? Multinational corporationsවලට කවුද බදු සහන දෙන්න කිව්වේ? ඒවා පසුගිය ආණ්ඩුවෙන් දුන් ඒවා කියලා කියන්න පුළුවන්. මෙන්න මේ වාගේ තීන්දු - තීරණ වෙනස් කරන්න තමයි මේ රටේ ජනතාව ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් දීලා තිබෙන්නේ. අදටත් විධායක බලතල ශක්තිමත්ව තිබෙනවා; විධායක ජනාධිපතිවරයෙක් ඉන්නවා. මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට දීලා තිබෙන රුපියල් බිලියන 966ක් වන tax exemptions මේ අය වැය ලේඛනයේ කොහේවත් අපට පෙනෙන්නේ නැහැ. මේ tax exemptions එකක්වත් නැති කරලා නැහැ. මේ අවුරුද්දේත් ඒවා තිබෙනවා. ඒ අනුව පොඩි මිනිහාගේ වැටුපට බදු ගහනවා; VAT ගහනවා; කාර්වලට බදු ගහනවා. රුපියල් ලක්ෂ 12ට ගන්න විටිස් කාර් එකක් නැහැ. බජාජ් ත්‍රිරෝද රථයක් රුපියල් ලක්ෂ 19යි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, මම මේ කියන්නේ මේ මුදල ඉතිරි කරලා තිබුණා නම්, "අස්වැසුම" හතර වතාවක් දෙන්න තිබුණා කියන එකයි. "අස්වැසුම" සඳහා වැය වෙන්නේ රුපියල් බිලියන 233යි; පෙන්ෂන්වලට වැය වෙන්නේ රුපියල් බිලියන 480යි. මම මේ කාරණය මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී කිව්වා. ඉතින්, මේ ආණ්ඩුව යටතේත් මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට සහන දෙන එක දිගටම කරගෙන යනවා. මේ පාර්ලිමේන්තුව තුළදීත් මම කියන්නේ, ඒගොල්ලන්ගෙන් අය කරගත යුතු බදු ටික අය කර ගන්න කියායි. ඒක කුහකකමක් නොවෙයි.

ආබාධිත පුද්ගලයන් සඳහා වන මාසික දීමනාව මෙවර අය වැයෙන් රුපියල් 10,000ක් කරලා තිබෙනවා. ඒක හොඳයි. ඇයි, ඒක රුපියල් 20,000ක් කරන්න බැරිද? ඒ සඳහා මෙන්න මේ බදු සල්ලි ටික ගන්න බැරි ඇයි? සිගරට්වලට අඩුවෙන් බදු ගහපු එක ගැන මම ප්‍රකාශ කළා. ඒගොල්ලන්ට බදු ගහලා මේ දීමනාව දෙන්න තිබුණා.

අපේ හිටපු නායක ගරු සම්පන්දන් මහත්මයා මේ පාර්ලිමේන්තුවේ ඉදිරි අසුනකට එනකොට අපි බොහොම අමාරුවෙන් තමයි එතුමා ගෙනැල්ලා වාඩි කෙරෙව්වේ. ඇයි ඒ? පාර්ලිමේන්තුව ඇතුළේවත් ආබාධිත අයට අවශ්‍ය පහසුකම් නැහැ. ඊට පෙර සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය හැටියට මේ පාර්ලිමේන්තුවේ හිටපු කාලයේ එතුමිය රෝද පුටුවෙන් කැඳවාගෙන ඇවිල්ලා පිටුපස ආසනයක ලූ වාඩි කෙරෙව්වේ. ඒක නිසා මම කියන්නේ මේකයි. මේ සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් ගේන එක මම ඉතාම අගය කරනවා. ඒක හොඳයි. ඒ පනත් කෙටුම්පතට පරණ දේවලුත් එකතු කර ගන්න; අනික් අයගෙනුත් කරුණු අහන්න. මේ රටේ ජනතාව ඊළඟ අය වැය එනකල් තව අවුරුද්දක් බලාගෙන ඉන්න ඕනෑ. *[බාධා කිරීමක්]* මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

மிக முக்கியமாக, இன்றைய தினம் விசேட தேவையுள்ளவர்களுக்கான ஒரு சட்டமூலம் மற்றும் அவர்கள் தொடர்பான வேலைத்திட்டத்தை வகுப்பது பற்றிய ஒத்திவைப்புவேளைப் பிரேரணையொன்று கொண்டுவரப் பட்டிருக்கின்றது. பிறப்பிலேயிருந்து விசேட தேவையுடையவர்களாக இல்லாது, கடந்த காலத்தில் நடந்த போராட்டத்தினூடாக ஊனமுற்றவர்களாக மாற்றப்பட்ட ஆயிரக்கணக்கானவர்கள் வடக்கு, கிழக்கில் இருக்கின்றார்கள். அவர்களையும் நீங்கள் விசேட தேவையுடையவர்களுக்கான பட்டியலில் உள்வாங்க வேண்டும். உதாரணமாகச் சொல்லப்போனால், மட்டக்களப்பிலே இன்றைக்கு 8,310 பேர் அங்கவீனமானவர்கள் இருப்பதாகப் பட்டியலிடப் பட்டிருக்கிறது.

ஆனால், ஊனமுற்றவர்களுக்கு வழங்குகின்ற கொடுப்பனவு 7,750 பேருக்கு மட்டுந்தான் வழங்கப்படுகின்றது. ஆகவே, பிறப்பிலேயிருந்து ஊனமில்லாத, போரால்

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

பாதிக்கப்பட்டு ஊனமுற்றிருக்கின்ற ஆயிரக்கணக் கானவர்களைப் பற்றியும் சிந்தித்து, ஊனமுற்றவர்கள் சார்பாக நீங்கள் எடுக்கின்ற தீர்மானத்திற்குள் அவர்களையும் உள்வாங்க வேண்டுமென்பதுதான் எங்களுடைய வேண்டுகோள். ஏனென்றால், அவர்களுக்காகக் குரல் கொடுக்க நாங்கள் மட்டுந்தான் இருக்கிறோம். வடக்கு, கிழக்கிலே ஒரு மாகாண சபை அதிகாரமுள்ளவகையில் இயங்குமாகவிருந்தால், சட்டங்களை இயற்றி, நாங்களே எங்களுடைய மக்களைப் பாதுகாக்கலாம்; எங்களுடைய மக்களின் வாழ்வாதாரத்தை அதிகரிக்கலாம். ஆனால், அதை நீங்கள் பறித்து வைத்திருக்கிறீர்கள்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இந்த நாட்டிலே தமிழ் மக்கள் தங்களைத் தாங்களே ஆளக்கூடியவகையான ஓர் ஆட்சிமுறைமை இல்லாதபடியால், சில விடயங்களை எங்களால் செய்ய முடியாது. எனவே, நான் மேற்சொன்ன விடயங்களை நீங்கள் கரிசனையில் எடுப்பீர்களென்று நம்புகிறேன். இந்த ஒத்திவைப்புப் பிரேணையைக் கொண்டுவந்த கௌரவ உறுப்பினருக்கு என்னுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු පහක කාලයක් ලැබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා කථා කරපු එක් කරුණක් පිළිබඳව මම පැහැදිලි කරන්නම්.

පසුගිය රජයන්වලින් කිසිම වග විභාගයකින් තොරව ඒ අයට ලැබුණු කොමිෂන් එකේ - නැත්නම් කුට්ටියේ - තරමට තමයි ආයතනවලට සහ පුද්ගලයන්ට බදු සහන දීලා තිබුණේ. වර්තමාන රජයේ පරමාර්ථය සහ වැඩ පිළිවෙළ තිබෙන්නේ ඒ විධියට බදු සහන දෙන්න නොවෙයි. ඒ වෙනුවෙන් වෙනත් ක්‍රමයක් දැනටමත් සූදානම් කරලා තිබෙනවා. ඉදිරියේදී ඒක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. එරාවුර් ආයෝජන කලාපයේ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මම මීට කලින් පාර්ලිමේන්තුවේදී කථා කරපු අවස්ථාවකදීත් සඳහනක් කළා. ඒ කියන්නේ, පුද්ගලයාගේ පෙනුම, තරාතිරම බලලා නොවෙයි ඒක දෙන්නේ. රටට ලැබෙන ආයෝජනයේ ප්‍රමාණය, එයින් ජනිත වන රැකියා ප්‍රමාණය, අදාළ පරිසරයට, අදාළ දිස්ත්‍රික්කයට ඒ තුළින් ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා බලා තමයි ඉදිරියේදී ආයෝජකයන්ට බදු සහන ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරවන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය අමාත්‍යතුමා. දැන් ඔබතුමාට කථා කරන්න අවස්ථාව තිබෙනවා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරණයක් කියන්න මට අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. *[බාධා කිරීමක්]*

[අ.භා. 6.22]

ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට ගරු හර්ෂණ සූරියප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දුන්නා. කාල වේලාව ගෙවෙන නිසා ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමාට අවස්ථාව දෙනවා. *[බාධා කිරීමක්]*

ගරු වසන්ත පියතිස්ස මහතා
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
මේ රටේ සමස්ත ආබාධිත ප්‍රජාව වෙනුවෙන් මෙවැනි වැදගත් යෝජනාවක් ඉදිරිපත් කිරීම වෙනුවෙන් ප්‍රථමයෙන්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කරුණු ඉදිරිපත් කිරීමට ගෞරවයක් පිණිස පිළිතුරු දුන්නා. ඒ කරුණ විවාදයකට ගන්න බැහැ. ඔබතුමාගේ ප්‍රශ්නයට නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු ලබා දුන්නා. ඒක තමයි ඔබතුමාට කරන්න පුළුවන් ගෞරවය. ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා කථාව කරන්න.

ගරු වසන්ත පියතිස්ස මහතා
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
ආබාධිත ජනතාව වෙනුවෙන් කථා කරන්න පැය භාගයක් වෙන් කරලා තිබෙනවා. ඒ පැය භාගය තුළත් අනවශ්‍ය දේවල් කථා කරන එකෙන් ඔබතුමා ආබාධිත ජනතාවට විශාල අපහාසයක්, අගෞරවයක් කරනවා ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේ ඉස්සෙල්ලාම ඒක තේරුම් ගන්න. *[බාධා කිරීමක්]* ඒ වුණාට ආබාධිත ජනතාව වෙනුවෙන් වෙන් කළ කාලය ගන්නේ තමුන්නාන්සේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ කිසිදු ආණ්ඩුවක් නොකළ තරමට වර්තමාන ආණ්ඩුව පක්ෂයක් විධියට මැතිවරණයට පෙරත් ආබාධිත ප්‍රජාව වෙනුවෙන් විශාල අවධානයක් යොමු කළා. *[බාධා කිරීමක්]*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අසුන් ගන්න. එතැන point of Order එකක් නැහැ. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඕනෑ, ඕනෑ විධියට කථා කරන්න බැහැ මේ සභාවේ.

ගරු වසන්ත පියතිස්ස මහතා
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
ඉතාම කනගාටු වෙනවා මේ අවස්ථාවේදී එම මන්ත්‍රීවරයා මේ විවාදයට බාධා කරමින් ආබාධිත ජනතාවට අගෞරව වන විධියට හැසිරීම පිළිබඳව. මොකද, අපට ඕනෑ තරම් වාද විවාද කරන්න පුළුවන්කම තිබෙනවා. එතුමාට විනාඩි 7ක කාලයක් ලබා දුන්නා. ඊට පස්සේත් විනාඩි තුන හතරක කාලයක් ගත්තා. දැන් මේ තත්ත්වය කවුරුන් හෝ බලාගෙන හිටියා නම් ආබාධිත ජනතාවට කරන අගෞරවයක් විධියට තමයි තේරෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන කිසිදු රජයක් නොකරන ආකාරයට වර්තමාන රජය විශාල අවධානයක් යොමු කරලා තිබෙනවා ආබාධිත ප්‍රජාවට පහසුකම් සපයන්නේ කොහොමද කියන කාරණයට. අපේ ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවේ වැදගත්කම මොකක්ද, එතුමා ඉල්ලා සිටින්නේ මොකක්ද? සියලු ආබාධිත ප්‍රජාවට බාධාවකින් තොරව තමන්ගේ ජීවිතය පවත්වාගෙන යන්න අවස්ථාවක් දෙන්න කියලා එතුමා ඉල්ලනවා. අපට පාරේ යනකොට ආබාධිත පුද්ගලයන් පේන්න නැත්තේ ඇයි? බස් එකේදී පේන්න නැත්තේ ඇයි? වැඩ පොළකදී පේන්න නැත්තේ ඇයි? ටවුමකදී පේන්න නැත්තේ ඇයි? වෙළෙඳ සැලකදී පේන්න නැත්තේ ඇයි? කෙනෙකුට හිතෙන්න පුළුවන් එහෙම අය ලංකාවේ නැද්ද කියලා. නමුත් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් ඉන්නවා. අපි රටක් විධියට අසමත් වෙලා තිබෙනවා ඒ ජනතාවට පහසුකම් දෙන්න. ඒ අයට බස් එකක ගමනක් යන්න අවශ්‍ය පහසුකම් දෙන්න අපි අසමත් වෙලා තිබෙනවා. ඒ ජනතාවට නගරයට එන්න පහසුකමක් නැහැ. ඒ වාගේම ආයතනයක සේවය කරන්න, රැකියාවක් කරන්න අයිතිය දෙන්න කියලා කොයි තරම් නීති රීති තිබුණත් ඒවා මෙතෙක් කල් ක්‍රියාවට නැඟිලා නැහැ. ඒ නිසා ඒ ජනතාව තමන්ගේ නිවසට වෙලා, තමන්ගේ කාමරයට වෙලා, සමහර විට තමන්ගේ ඇඳට වෙලා දෙමාපියන් එක්ක, පවුලේ අය එක්ක ඉතාම දුක්බිත ජීවිතයක් ගත කරනවා. මේක ඉතාම සංවේදී කාරණයක්. ඒ නිසා වර්තමාන රජය මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සියලු යෝජනා ක්‍රියාවට නහන්න අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. අපේ අමාත්‍යාංශය හරහාත් ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.27]

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ මේ යෝජනාව ඉතාම වැදගත්, කාලීන යෝජනාවක් විධියට අපි ආණ්ඩුවක් විධියට සලකනවා. ඒ වාගේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි ආබාධ සහිත තැනැත්තෙක් මේ සභාව නියෝජනය කරන්නේ.

ආබාධ සහිත පුද්ගලයෙකු වශයෙන් ඒ ගරු මන්ත්‍රීතුමා විසින් අපේ රටේ ආබාධ සහිත පුද්ගලයන් නියෝජනය කරමින්, ඒ අය සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක්, අවධානයක් යොමු කිරීම ඉතාම වැදගත් කාරණයක්.

ආණ්ඩුවක් විධියට අපි දන්නවා, ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව අනුමත කළ ප්‍රතිපත්තියක් 2003 සිට ලංකාවේ ක්‍රියාත්මක වෙන බව. නමුත් වසර ගණනාවක් පැරණි ඒ ප්‍රතිපත්තිය යාවත්කාලීන කර අද සමාජයට, අපේ රටට ගැළපෙන විධියට නැවත සකස් කර මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, අනුමත කර ගැනීම සඳහා අපි රජයක් විධියට කටයුතු කරන බව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

අපේ රටේ ඉතිහාසය බැලුවොත් අපි බොහෝ වෙලාවට ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව බැලුවේ, ඒ අය අනුකම්පාව, දයාව, කාගේ හරි උපකාරයක් ලබාගත යුතු පුද්ගලයන් විධියට. න්‍යායාත්මකව බැලුවොත්, වෛද්‍යමය ආකෘතියකින් - medical model - තමයි ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ප්‍රශ්නය දෙස බැලුවේ. නමුත් ආබාධ සහිත පුද්ගලයන් - people with disabilities -කියන්නේ එහෙම වෛද්‍යමය කාරණාවකින් විතරක් තේරුම් ගන්න පුළුවන් පිරිසක් නොවෙයි. එතැනින් එහාට ගිහිල්ලා අද ලෝකය දියුණු වෙලා තිබෙනවා. සමාජයීය ආකෘතියකින් - with a social model of disability - තමයි අපි ඒ පුද්ගලයන් ගැන සලකන්නේ. ඒ පුද්ගලයනුත් සමාජයේ සාමාන්‍ය පුරවැසියන්

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

විධියට සලකන ආකෘතියකින් අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඒ අය ගැන සලකනවා.

විශේෂයෙන් මේ යෝජනාවේ සඳහන් වෙලා තිබෙන කරුණ පිළිබඳව අවධානය යොමු කළොත් ආබාධ සහිත පුද්ගලයෙකු පිළිබඳව තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අපට ඉතා වැදගත් වෙනවා, දත්ත.

නමුත් කියන්න කනගාටුයි, පසුගිය වසර ගණනාව තුළ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව ආධාර දෙන ගැසට් පත්‍රවල පුද්ගලයන්ගේ ප්‍රමාණය සඳහන් වෙනවා. උදාහරණයක් විධියට, පසුගිය ආණ්ඩුවෙන් ආබාධ සහිත පුද්ගලයන් හැඳින්වූයේ විවිධ හැකියාවන් ඇති තැනැත්තන් කියලා. ඒ තැනැත්තන් 410,000කට ආධාර දෙනවා කියලා සඳහන් කර තිබෙනවා. නමුත් ඇත්ත තත්ත්වය තමයි ඒක සම්පූර්ණ වැරැදි තොරතුරක්. සත්‍ය තත්ත්වය ගත්තොත් අපි දන්නවා, මේ රටේ ආබාධ සහිත පුද්ගලයන්ට ආධාර ලබා දෙන්නේ, 150,000කට අඩු ප්‍රමාණයකට බව. ඒකෙන්ම පෙනෙනවා මේ ගරු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සත්‍ය තොරතුරු මත නොවෙයි තීරණ අරගෙන තිබෙන්නේ කියලා. ඒ නිසා ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියටත්, විශේෂයෙන්ම අපේ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විධියටත් ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව පුළුල් ප්‍රතිපත්තියක් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තීන්ට අනුකූලව සකස් කිරීම සඳහා විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා.

ඒත් එක්කම, මේ වසරේදී ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා මෙම අය වැය කථාවේදී ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා විධියට අමතර රුපියල් මිලියන 100ක් වෙන් කරපු බව මම මේ සභාවට සඳහන් කරන්න කැමැතියි. මේ සියල්ල ඔස්සේ ආබාධ සහිත පුද්ගලයන්ගේ රැකවරණයත්, ඒ වාගේම පුළුල් ලෙස ඔවුන් සවි බලගැන්වීම සඳහාත් අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරන බව සඳහන් කරමින් මේ යෝජනාවට අපේ ආණ්ඩුවේ සම්පූර්ණ සහාය පළ කරමින් ඒ පිළිබඳව කටයුතු කරන බව සඳහන් කරමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 පෙබරවාරි 06 වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 25වන අඟහරුවාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது, பி. ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், அதனது 2025 பெப்ருவரி 06ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 25, செவ்வாய்க்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly until 9.30 a..m., on Tuesday, 25th February, 2025, pursuant to the Resolution of Parliament of 06th February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

317 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 317 - இல. 08
Volume 317 - No. 08

2025 පෙබරවාරි 25වන අඟහරුවාදා
2025 பெப்ருவரி 25, செவ்வாய்க்கிழமை
Tuesday, 25th February, 2025



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

2025 පෙබරවාරි 25වන අඟහරුවාදා
2025 பெப்ருவரி 25, செவ்வாய்க்கிழமை
Tuesday, 25th February, 202

අන්තර්ගත ප්‍රධාන කරුණු

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 1356]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 1360-1381]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
පාසල් ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ දහම් පාසල් ගුරුවරුන්ගේ දීමනාව [තීරුව 1381]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම [තීරුව 1386]

වරප්‍රසාද:
ආරක්ෂාවට තර්ජන එල්ල වීම [තීරුව 1392]

විසර්ජන පනත් කෙටුම්පත, 2025 – [හත්වන වෙන් කළ දිනය]:
දෙවන වර කියවීම - විවාදය අවසන් කරන ලදී
පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී [තීරු 1394-1532]

பிரதான உள்ளடக்கம்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1356]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1360-1381]

தனி அறிவித்தல் மூல வினா:
பாடசாலைகளுக்கு ஆசிரியர்களை ஆட்சேர்ப்புச் செய்யும் செயன்முறையும் அறநெறிப் பாடசாலை ஆசிரியர்களுக்கான கொடுப்பனவுகளும் [ப: 1381]

மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்னவினது சொந்த விளக்கம் [ப: 1386]

சிறப்புரிமை:
பாதுகாப்புக்கு அச்சுறுத்தல் [ப: 1392]

ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025 - [ஒதுக்கப்பட்ட ஏழாம் நாள்]:
இரண்டாம் மதிப்பு - விவாதம் முடிவுற்றது
சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது [ப: 1394-1532]

PRINCIPAL CONTENTS

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1356]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1360-1381]

QUESTION BY PRIVATE NOTICE:
Recruitment Procedure of School Teachers and Allowance Paid to Dhamma School Teachers [Col. 1381]

PERSONAL EXPLANATION BY HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA [Col. 1386]

PRIVILEGE:
Threat to Security [Col. 1392]

APPROPRIATION BILL, 2025 – [Seventh Allotted Day]:
Second Reading – Debate Concluded
Bill Committed to a Committee of the Whole Parliament [Cols. 1394-1532]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2025 පෙබරවාරි 25වන අඟහරුවාදා
2025 பெப்ருவரி 25, செவ்வாய்க்கிழமை
Tuesday, 25th February, 2025

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් රෙගුලාසි ඉදිරිපත් කරමි.

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 27 දිනැති අංක 2421/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 31 දිනැති අංක 2421/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි.

මෙම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල බදුල්ල, ගාල්ල, පොළොන්නරුව, කෑගල්ල, ගම්පහ, නුවරඑළිය, වවුනියාව, මන්නාරම, මඩකලපුව, මාතලේ, මහනුවර, කළුතර, මාතර, කුරුණෑගල, අනුරාධපුර, පුත්තලම, කොළඹ, මොනරාගල, මුලතිව්, අම්පාර, රත්නපුර, හම්බන්තොට, යාපනය, කිලිනොච්චිය සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the Appropriation Bill for the Financial Year 2025 in terms of Standing Order No. 121 (5) (i) of Parliament (on the fiscal, financial and economic assumptions used as the basis in arriving at

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

total estimated expenditure and revenue of the Budget) only in the English language with special leave of the House and the copies in Sinhala and Tamil languages will be presented as soon as possible.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, let me take three minutes of your valuable time to give a brief summary of the Report. Every Member has this Report on the table right now. What we have done is, we have looked at the Budget that was presented a week ago. According to the Standing Orders, we must present a Report on the fiscal, financial and economic assumptions used as the basis in arriving at the total estimated expenditure and revenue before the commencement of the Committee Stage Discussion of the Appropriation Bill. So, this is the first Report. There is another Report that is due. We will present that. It refers to the Estimates and looks into whether the allocation of money is in compliance with Government policies. That Report, Sir, we will present to this House on Thursday morning before the Committee Stage Discussion begins.

Sir, this Report consists of 92 pages. We have gone through the Budget, looked at the assumptions on revenue and expenditure and prepared this summary Report. First, the Report refers to the legislative background upon which these Reports are presented and also the Budget is prepared. Sir, the key legislations are, the Public Financial Management Act, the Economic Transformation Act and the Public Debt Management Act. Next, we have looked at the key macroeconomic projections in the Budget for 2025. The basic projection is the growth rate of the economy, which is expected to be between 3 per cent to 5 per cent this year. We have mentioned here that, however, the growth remains vulnerable to global trade uncertainties, geopolitical risks and climate-related disruptions.

Sir, the inflation is expected to return to the 5 per cent target by the third quarter of this year, after several quarters of deflation. The relaxation of import restrictions is expected to boost tax revenue, but it may also widen the trade deficit and exert pressure on foreign exchange reserves. Here, we also discuss about ensuring fiscal and monetary policy coordination along with structural reforms, which will be crucial for maintaining macroeconomic stability and achieving fiscal targets for 2025.

Then, in Section 3, we analyse the revenue projections in the Budget for 2025. The estimates for this year project the revenue to increase by 1.67 per cent of GDP primarily driven by indirect taxes. The Government's revenue strategy heavily relies on vehicle imports, contributing to between 50 per cent to 70 per cent of the total revenue increase.

Then, Sir, compliance with the IMF's Extended Fund Facility targets hinges on achieving a tax-to-GDP ratio of 13.9 per cent, but any delays or setbacks in vehicle importation or administrative inefficiencies could jeopardize this goal.

Section 4 of this Report looks at the Government expenditure, projecting a 17.3 per cent increase in 2025, which is an increase from 14.4 per cent in 2024. This excludes debt amortization. It is primarily driven on account of a 61 per cent increase to Rs. 1.3 trillion in Capital Expenditure, in comparison to a 12.4 per cent reduction to Rs. 817 billion last year. The increase is mainly on account of the resumption of foreign-funded projects, post-debt restructuring.

Then, in Section 5, we look at the Debt Sustainability Analysis, which is a key important factor, and the IMF Debt Sustainability Analysis - DSA - targets. Sir, by the end of 2024, Sri Lanka outperformed IMF projections with Central Government debt-to-GDP at 98.7 per cent compared to the IMF's target of 108.8 per cent. Sri Lanka's debt trajectory remains on a positive path, benefiting from improved economic performance, a stable exchange rate and lower-than-expected inflation, as per the IMF projections.

Finally, Sir, we conclude with some concerns pertaining to the Budget process. The initial assumptions provided to our Committee stipulated that the Budget estimates are prepared based on the assumption of Sri Lanka recording a 10 per cent nominal growth rate and this was made up of a 3 per cent real growth and a 6.7 per cent GDP deflator for this year. We observe that these initial assumptions by the Ministry of Finance differ from the assumptions presented in the documents of Budget, 2025, which refer to an estimated real economic growth rate of 5 per cent in 2025. That concludes the summary.

Sir, finally, I want to mention that we have not still got our team in place; we still have not got a technical team. We had a number of volunteers. I want to briefly mention them because they did it as volunteers. The team was led by Dr. Roshan Anne Perera and consisted of Dr. Venura Welagedara, Mr. Umesh Moramudali, Ms. Chethana Ranatunga, Ms. Hansini Yasu-e Karunaratne, Ms. Fathima Hafsa Haniffa, Mr. K.D.D.B. Vimanga and Mr. Damintha Gunasekera.

Thank you very much.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
(මාණ්පුමිකු කේ. සුජිත් සඤ්ජය පෙරේරා)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කිතුල්ගල, මහබාගේ, පරන්තවල යන ලිපිනයෙහි පදිංචි බී.එම්. හැරියට් නෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) කෑගල්ල, ඇෂ්ලි පිරිස් මාවත, අංක 36/ඒ දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ. අමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) කතරගම, දෙටගමුව, 13 කණුව ඉදිරිපිට, අංක 61 දරන ස්ථානයෙහි පදිංචි ආර්. ප්‍රදීපිකා විතාන මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(මාණ්පුමිකු රෝහණ පණ්ඩාර)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කැබිතිගොල්ලෑව, ගෝනමැරියාව යන ලිපිනයෙහි පදිංචි බී.ඩබ්ලිව්.එම්. සාන්ත ගුණතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පදවිය, ඒ යාය, අංක 74 දරන ස්ථානයෙහි පදිංචි එච්.ආර්. පොඩි මැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු ගයාන් ජනක මහතා
(මාණ්පුමිකු කයාන් ජනක)
(The Hon. Gayan Janaka)

ගරු කථානායකතුමනි, මාරවිල, පහත හත්තිනිය, රෙඩ් ලෑන්ඩ් පාර යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්.ඒ.ඒ.සී.ඩබ්ලිව්. මොන්ටිලෝව් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා
(මාණ්පුමිකු සුසන්ත කුමාර නවරත්න)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මැදවච්චිය, උසාවිය පාර, අංක 3/10 දරන ස්ථානයෙහි පදිංචි ඩී.කේ. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අනුරාධපුර, පණ්ඩුකාභයපුර, මහවැව යන ලිපිනයෙහි පදිංචි එස්. රාජකරුණා මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු අරුණ පනාගොඩ මහතා
(මාණ්පුමිකු අරුණ පනාකොට)
(The Hon. Aruna Panagoda)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) වැල්මිල්ල, හාලපිටිය, අංක 502/බී /1/ඒ දරන ස්ථානයෙහි පදිංචි රජීව හෙට්ටිගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මීගොඩ, ගැහැණුවල පාර, පාසල් මාවත, නොම්මර 554/ඊ දරන ස්ථානයෙහි පදිංචි ටී. ප්‍රේමලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු නිශාන්ත පෙරේරා මහතා
(මාණ්පුමිකු නිෂාන්ත පෙරේරා)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, පොරවගම, මගලියැද්ද යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. කාන්තිලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
(මාණ්පුමිකු රවීන්ද්‍රිර පණ්ඩාර)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, හල්දුම්මුල්ල සිංහල විදුහල අසල යන ලිපිනයෙහි පදිංචි නිමල් සතරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(මාණ්පුමිකු ලෙප්ටිනන් කමාණ්ඩර් (ඉවත්වුපෙත්ත) පිරකීත් මතුරඟ)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මන්දාරම්නුවර, ගුඩ්වුඩ් ජනපදය, අංක 84 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්.ජී. විජේරත්න බණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චන්දන සූරියආරච්චි මහතා
(මාණ්පුමිකු චන්දන සූරියආරච්චි)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, රුවන්වැල්ල, කහටගස්තැන්න, අංක 332/20 දරන ස්ථානයෙහි පදිංචි ජී.පී. තෙබුලන්දගේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -6/2024- (1), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -62/2024- (1), ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -66/2024- (2), ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය: විස්තර
ஸ்ரீலங்கன் எயார் லைன்ஸ் நிறுவனம்: விபரம்
SRILANKAN AIRLINES: DETAILS

82/2024

4. ගරු රෝහණ බණ්ඩාර මහතා
(මාණ්පුමිකු රෝහණ පණ්ඩාර)
(The Hon. Rohana Bandara)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- (1):

(අ) (i) ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය සතුව මේ වනවිට ඇති ගුවන්යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනය විසින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන ගුවන් ගමනාන්තයන් කවරේද;

(iii) මේ වනවිට ඉහත ආයතනයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

(iv) ඉහත ආයතනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் ஸ்ரீலங்கன் எயார் லைன்ஸ் நிறுவனம் வசமுள்ள விமானங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அந்நிறுவனம் எவ்வெவ் விமானச்சேரிடங்களுக்குச் சேவை வழங்குகிறது என்பதையும்;

(iii) தற்போது மேற்படி நிறுவனத்தில் பணிபுரியும் ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) மேற்படி நிறுவனத்தை மேலும் வலுவூட்டுவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) number of aircraft owned by the SriLankan Airlines, as of today;

(ii) destinations to which the flights are operated at present;

(iii) number of employees who are serving in the aforesaid airline at present; and

(iv) measures that will be taken to further strengthen the airline concerned?

(b) If not, why?

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ශ්‍රීලන්කන් ගුවන් සේවය සතු සියලුම ගුවන් යානා කල්බදු පදනම මත ලබාගෙන ඇති අතර, එලෙස ලබාගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව 22කි.

නමුත්, මේ ගුවන් යානා 22න් යානා 3ක් වසර ගණනාවක් තිස්සේ පාවිච්චියට නොගෙන තිබියදී ඒවාට අවශ්‍ය වාරික ගෙවමින් තිබිලා තිබෙනවා. මසකට ඩොලර් ලක්ෂ 9කට ආසන්න ප්‍රමාණයක් continuously ගෙවලා තිබෙනවා.

Wide-body වර්ගයේ ගුවන් යානා -

Airbus A330 මාදිලි එකතුවට අයත් - 9

Narrow-body වර්ගයේ ගුවන් යානා

- Airbus A320 මාදිලි එකතුවට අයත් - 13

එකතුව - 22

(ii) ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය විසින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන ගුවන් ගමනාන්තයන් පහත සඳහන් වේ. ඒ සම්බන්ධයෙන් ඉන්දියානු අර්ධද්වීපය, මැද පෙරදිග, යුරෝපය, ඇත පෙරදිග යනාදී වශයෙන් කලාපවලට බෙදලා ඒ විස්තර පහතින් දීර්ඝ ලෙස දක්වා තිබෙනවා.

කලාපය	ගමනාන්තය	අකුරු 3 කේතය
ඉන්දියානු අර්ධද්වීපය	කොළඹ	CMB
	බෙංගලූරු	BLR
	චෙන්නායි	MAA
	කොචින්	COK
	දිල්ලි	DEL
	ඩකා	DAC
	ගෑන්, මාලදිවයින	GAN
	හයිද්‍රාබාද්	HYD
	කරච්චි	KHI
	කත්මණ්ඩු	KTM
	ලාහෝර්	LHE
	මදුරෙයි	IXM
	මාලේ	MLE
	මුම්බායි	BOM
	තිරුවනන්තපුරම්	TRV
	තිරුච්චිරපල්ලි	TRZ
මැද පෙරදිග	අබුඩාබි	AUH
	දමාම්	DMM
	දෝහා	DOH
	ඩුබායි	DXB
	කුවේට්	KWI
	රියාද්	RUH
යුරෝපය	ෆ්‍රැන්ක්ෆර්ට්	FRA
	ලන්ඩන්	LHR
	පැරිස්	CDG
ඇත පෙරදිග	බැංකොක්	BKK
	කැන්ටන්	CAN
	ඉන්චියෝන්, දකුණු කොරියාව	ICN
	ජකර්තා	CGK
	ක්වාලාලම්පූර්	KUL
	මෙල්බර්න්	MEL
	නරිටා, ජපානය	NRT
	සිංගප්පූරුව	SIN
	සිඩ්නි	SYD

(iii) 2025 ජනවාරි 14 දින වන විට ගුවන් සේවයේ කාර්ය මණ්ඩලය සේවක සේවිකාවන් 6,056 දෙනෙකුගෙන් සමන්විත විය.

ප්‍රධාන ගුවන් සේවයේ සේවය		
කරන සංඛ්‍යාව	-	3,194
ක්‍රමෝපායික ව්‍යාපාර ඒකකවල		
සේවය කරන සංඛ්‍යාව	-	2,862
එකතුව	-	6,056

(iv) සිය මෙහෙයුම් ශක්තිමත් කරමින් තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ගුවන් සේවය විසින් 2025/26 මූල්‍ය වර්ෂයේ සිට 2029/30 මූල්‍ය වර්ෂය දක්වා වන කාලසීමාව සඳහා පංච වාර්ෂික ව්‍යාපාර සැලසුමක් - five-year business plan එකක් - සකස් කර තිබේ. අමාත්‍යාංශය ද මූලික මට්ටමින් මෙම සැලසුම සමඟ සමගාමී මතයක සිටී.

ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙමින් සිටිනවා.

ඒ යටතේ තම ව්‍යාපාර කටයුතු වැඩිදියුණු කර ගැනීම සඳහා ගුවන් සේවය විසින් ප්‍රධාන කාරණා කිහිපයක් ගැන අවධානය යොමු කරමින්, focus කරමින් පහත සඳහන් පියවර ගනු ලැබීමට නියමිත ය.

මෙහෙයුම් ලාභදායීත්වය සහ රජයේ සහයෝගය

ගුවන් සේවය මේ වන විට මෙහෙයුම් අතින් ලාභදායී වන අතර, මෙම තත්ත්වය සැලසුමට අදාළ වසර 5 තුළ ද අඛණ්ඩව පවත්වා ගැනීමට ගුවන් සේවය බලාපොරොත්තු වෙනවා. ශුද්ධ ලාභදායීත්වයට එල්ල වන ප්‍රධානතම අභියෝග වන්නේ, අතීතයේදී ලබා ගෙන තිබෙන ණය පියවීම සහ ගුවන් යානා කල්බදු පදනම මත ලබා දී ඇති සමාගම්වලට සහ එන්ජින් අලුත්වැඩියාවන් සිදු කරන සමාගම්වලට ගෙවිය යුතු මුදල් ගෙවීමට නොහැකිභාවය කියන ගැටලුවයි. මෙම අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වැඩ පිළිවෙළ සූදානම් කර ගැනීමටත්, අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහාත් අමාත්‍යාංශය මේ වන විටත් ගුවන් සේවය සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. මේ තුළින් මූල්‍ය ස්වාධීනත්වය - financial independence - සහ self-sustainability ළඟා කර ගැනීම සඳහා ගුවන් සේවයේ ශේෂ පත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම ද ඊට ඇතුළත් වෙනවා.

ඒ වාගේම ආයතනයක් විධියට ගුවන් යානා සංඛ්‍යාව වැඩි කර ගැනීම, ආදායම් වර්ධනය කරවා ගැනීම, පිරිවැය කාර්යක්ෂමතාවය සහ පරිමාණය විශාලවීම මඟින් ලැබෙන පිරිමැසුම් - economies of scale - මෙයට ඇතුළත් වෙනවා. By increasing the number of flights and the number of operating routes, the cost per unit is expected to be reduced.

ඊළඟට, වෙළඳපොළ ප්‍රතිශතය වර්ධනය කර ගැනීම සහ නායකත්ව වෙළඳපොළවලින් ලැබෙන ආදායම පිළිබඳව කිව්වොත්, which means the market leadership in some of the segments that Sri Lanka can claim. Unfortunately, we were not able to do that in the past, ඒකට අවශ්‍ය නිසි ප්‍රතිපාදන, ගුවන් යානා නොතිබූ නිසා. නමුත් මෙම වර්තමාන වර්ධන සැලැස්ම ඔස්සේ වර්තමාන වෙළඳපොළ ප්‍රතිශතය වන සියයට 35 සිට ඉදිරියේදී සියයට 45 දක්වා වර්ධනය කර ගැනීමට, විශේෂයෙන්ම කොළඹ සහ ලෝකය අතර, ප්‍රධාන මාර්ගගත වෙළඳපොළ සඳහා යොමුවීමට ශ්‍රීලන්කන් ගුවන් සේවය බලාපොරොත්තු වෙයි.

මෙමඟින් ගුවන් සේවයට මිල ගණන් නියම කිරීමේදී වැඩි බලයක් හිමි වනු ඇති අතර, ආදායම් ස්ථාවර කර ගැනීමටත්, ආදායමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කර ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත. මීට අමතරව තමන් නායකත්වය දරන වෙළෙඳ පොළවල් වර්ධනය කර ගැනීමට අවධානය යොමු කිරීම ඔස්සේ ක්‍රමයෙන් ඉහළ යන තරගකාරිත්වය සහ ක්ෂේත්‍රයේ පහළ යමින් පවතින ආදායම හමුවේ පවා තම ආදායම් ස්ථාවර කර ගැනීමට ගුවන් සේවයට හැකියාව ලැබෙනු ඇත. මේ වන විට ගුවන් සේවය නායකත්වය දරන වෙළෙඳ පොළවලින් ලැබෙන ආදායම එහි සමස්ත ආදායමෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් -සියයට 37ක්- වන අතර, 2029/2030 මූල්‍ය වර්ෂය වන විට මෙය සියයට 60ක් දක්වා වර්ධනය කර ගැනීම ගුවන් සේවයේ අපේක්ෂාවයි.

ඊළඟට, නිෂ්පාදන සඳහා ආයෝජනය.

මේ පිළිබඳව කිව්වොත්, අරමුදල් ලබා ගැනීමට හැකි වීම තුළින් ගුවන් සේවයට නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහාත්, repair කටයුතු කර ගැනීම සඳහාත්, අලුත් ක්‍රමවේද හඳුන්වා දීම ඔස්සේ පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමටත් හැකියාව ලැබෙනවා. මෙම ආයෝජන මඟින් සේවාවේ ගුණාත්මකභාවය ඉහළ ගොස් පාරිභෝගික විශ්වාසය නැවත නිර්මාණය වී ගුවන් සේවයේ කීර්ති නාමය යළි ගොඩ නංවා ගැනීමට හැකි වෙනවා.

(ආ) පැන නොනඟී.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන විධියට, මේ SriLankan Airlines නඩත්තු කරනවා කියන්නේ සුදු අලියෙක් නඩත්තු කරනවා වාගේ තත්ත්වයක්. ජීවිතයේ කවදාවත් ගුවන් යානයකට ගොඩ නොවුණු, ඉතා දුෂ්කර ගම්මානවල ජනතාව පවා ඒ පාඩුව - අලාභය - විඳින තත්ත්වයක් තමයි අද තිබෙන්නේ. අදත් අපට දැනගන්න ලැබුණා, SriLankan Airlines එකේ ණය බර රජය භාර අරගෙන තිබෙනවාය කියලා. ඒ වාගේම අපි දැක්කා, ඛනිජ තෙල් සංස්ථාවේ ණය බරත් රජය භාරගෙන තිබුණු ආකාරය.

ඒකට ඉන්ධන ලීටරයකින් රුපියල් 50ක් අය කරගෙන යනවා, රජය වෙනම. ඉන්ධන පරිභෝජනය කරන අයට විතරයි ඒකේ ණය බරට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ. හැබැයි, SriLankan Airlinesහි මේ සම්පූර්ණ ණය බර ගත්තාම, 2024 අප්‍රේල් ඉඳලා 2024 ඔක්තෝබර් දක්වා වූ මාස කීපයට රුපියල් බිලියන 2ක් මේ වෙනකොට අලාභ ලබලා තිබෙන බව කියනවා. මේ සියල්ලම පියවා ගන්නේ පරිභෝජනය කරන අයගෙන් පමණක් නොවෙයි නේ. රජය මේවා පවරා ගත්තාම ඒ අලාභ පියවා ගන්නේ ඉන්ධනවලට වාගේ මේ ගුවන් යානා භාවිත කරන අයගෙන්ම නැවත ටිකටවලින් අය කරලාද, නැත්නම් සමස්තය විධියට රජයේ භාණ්ඩාගාරයටම දාලා මේ රටේ සම්පූර්ණ වක්‍ර බදුවලින් අය කරගන්නා මුදල්වලින්ද කියලා මම දැනගන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ඔබතුමා දකින්න ඇති, මේ සැරේ අය වැයේත් දාලා තිබෙන - allocate කරලා තිබෙන - රුපියල් බිලියන 20ක ප්‍රමාණය පාවිච්චි කරලා තිබෙන්නේ ආයතනයේ operating lossesවලට නොවෙයි කියලා. ඒ මුදල operating profit එකක් විධියට ආයතනයේ ක්‍රියාත්මක වෙනවා. නමුත් මෙවර ඒ රුපියල් බිලියන 20 වෙන් කරලා තිබෙන්නේ මේවා නිසායි. පසුගිය කාලයේදී දේශීය වශයෙන් විතරක් නොවෙයි, ජාත්‍යන්තරයේ නම ගිය වංචා සහ දූෂණවලට - corruptionවලට - පවා මේ ආයතනය සම්බන්ධ වෙලා තිබෙනවා. ජාත්‍යන්තර අධිකරණයේ තිබෙනවා, planes ගන්න කියලා commission ගත්ත ඒවා සම්බන්ධයෙන් වන නඩු. ඒවා මේ වෙනකොටත් ඇහෙමින් පවතිනවා, ජාත්‍යන්තර අධිකරණවල පවා. වංචාව, දූෂණය නිසා මේ රට මතට පටවා තිබෙන බර ඉතා ඉහළයි. SriLankan Airlines එකට planes ගන්නකොට market rate එකට වඩා අතිශය වැඩි මුදලකට තමයි lease එකට planes අරගෙන තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහනකොට ඔය පැත්තටම හැරිලා බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ පසුගිය දශක ගණනාව තුළ මේ රට කරවපු රජයන් විසින් මේ ආයතනයට විතරක් නොවෙයි, රටට දරාගන්න බැරි බරක් ඒ ආයතනයට පටවලා තිබෙන්නේ, ඒ ආයතනයේ තිබෙන inefficiency එකක් නිසා නොවෙයි.

දේශපාලනීකරණයට ලක් කරලා, දේශපාලනය මැදිහත් කරලා, වංචාව දූෂණය සිද්ධ කරලා, දේශීය අධිකරණ පද්ධතිය තුළ විතරක් නොවෙයි, ජාත්‍යන්තර අධිකරණවල පවා නඩු අහන තත්ත්වයට වංචා, දූෂණවලට මේ ආයතනය සම්බන්ධ කරවලා තිබෙනවා. ඒ නිසා වර්තමාන රජයේ වැඩ පිළිවෙළ යටතේ මම කියපු පස් අවුරුදු - 2025-2030 දක්වා - සැලැස්ම තුළ ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී සඳහන් කළා වාගේ, operating expenses manage කරගන්න අය වැයෙන් මුදල් ලබා දෙන්නට කිසිම බලාපොරොත්තුවක් නැහැ. ඒ ආයතනය විසින් self-sustainability ඇතිකර ගන්නට ඕනෑ. නමුත්, පසුගිය ආණ්ඩුවල පව් ඒ ආයතනය මතට පටවලා, රට මතට පටවලා තිබෙනවා. දැනට එම ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය සාකච්ඡා අපි කරගෙන යනවා. ඒ ආයතනයත් ඩොලර්වලින් ණය ලබාගෙන තිබෙනවා. මේ කරුණු සියල්ල නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් ඉදිරියේදී රටේ ජනතාවට මේ බර පටවන්න සිදු නොවනු ඇතැයි කියා අපි විශ්වාස කරනවා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, අපි දිහාවටම ඇඟිල්ල දිගු කරන්න ඕනෑය කියලා. මම හිතන විධියට, අපි ආපහු හැරිලා බලන්න කිසි අවශ්‍යතාවක් නැහැ. අපේ එක පාලන යුගයක ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එක එම්රේට්ස් එකත් එක්ක සම්බන්ධ කරලා තිබුණාම ලාභ ලබමින් තිබුණා. ඔබතුමන්ලා තමයි රට බෙරා ගන්න කියලා මහින්ද රාජපක්ෂ මැතිතුමාව බලයට ගෙනාවේ. ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි මේ ආයතනය ආපහු ලංකාවට පවරා ගෙන සියලු අලාභ සිද්ධ වන තැනට කටයුතු කළේ. මේ ආයතනයේ සේවකයෝ හයදහස් ගණනක් ඉන්නවා. ගුවන් යානා 19ක් තිබෙනවා. ඔබතුමා දන්නවා, ඔබතුමන්ලාට ඡන්දය දෙන්නත් විශාල උනන්දුවකින් පිට රට ඉඳලා යම් යම් පිරිස් ආ බව. ඒ ඔක්කෝම ලංකාවට directly fly කරන්න ආසයි. මොකද, එහෙම කරන්න තිබෙනවා නම් පහසුයි.

එතකොට අපේ ගුවන් යානා ටික හරියාකාරව ක්‍රියාත්මක කළොත්, විදේශගත වෙලා සිටින ශ්‍රී ලාංකිකයින් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකම පාවිච්චි කරාවි. ඒ අය අපේ ගුවන් යානා පාවිච්චි කරන්න කැමැතියි. හැබැයි, ඒවා උදේට ප්‍රමාද වෙනවා; උඩ නග්ගපු ගුවන් යානා ආපහු බස්සනවා; එක්කෝ වෙලාවල් cancel වෙනවා. උඩින් එනවා කියන්නේ, ජීවිත අවදානමකුත් එක්ක නේ එන්නේ. හැමදෙනාම අපේ ගුවන් යානා පාවිච්චි කරන්න තිබෙන භය නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා අතීතයට ශාප කරමින් ඉන්නවාට වැඩිය මෙවැනි දේවල් ගැන බැලුවා නම් හොඳයි. අපි යහ පාලන රජය කාලයේ මෙහි දූෂණ සොයන්න ජේ.සී. වැලිඅමුණ කමිටුව පත් කළා. හැබැයි, පසුගිය ආණ්ඩු පෙරළියත් එක්ක ඒ සියල්ල නතරවෙලා තිබෙනවා. යහ පාලන රජය කාලයේත් ඔබතුමන්ලා මේ කටයුතුවලට සහභාගි වුණා. ගෝඨාභය රාජපක්ෂ රජයත් එක්ක මේ කටයුතු නතරවෙලා තිබෙනවා. ජේ.සී. වැලිඅමුණ කමිටුව තුළින් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එකේ හොරකම් සහ දූෂණ පිළිබඳව මෙරට ප්‍රධාන පෙළේ නායකයින්ට චෝදනා එල්ල වෙලා තිබෙනවා. මේ කටයුතු ඔබතුමන්ලා තව ඉස්සරහට අරගෙන යන්න. එහෙම නැතුව එක එක දේවල් කියමින් ඉඳලා වැඩක් නැහැ නේ. ඔබතුමන්ලාට දැන් බලය ලැබිලා තිබෙනවා. මේ කටයුතු ක්‍රියාත්මක කරලා, ඒ අයට දඬුවම් ලබා දීලා, ශ්‍රී ලංකා රජයට සිදු වූ අලාභය නැවත අය කර ගන්නට ඔබතුමන්ලාගේ යම්කිසි සැලැස්මක් තිබෙනවාද කියා මම දැනගන්න කැමතියි.

ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලිවම ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න වර්තමාන ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. මම කලින් කිව්වා වාගේ සමහර නඩු ජාත්‍යන්තර අධිකරණයේ තිබෙන්නේ. දේශීය වශයෙන් තිබෙන සමහර නඩුවලට අවශ්‍ය වැඩ කටයුතු -විමර්ශන- කෙරීගෙන යනවා. ඒවායේ කටයුතු අවසන් වෙනකොට නිසි ප්‍රතිඵල ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඔබතුමා කිව්වා වාගේම පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කළාට පස්සේ ශ්‍රී ලාංකිකයන් විධියට මේ ආයතනය පිළිබඳව අභිමානයෙන් කථා කරන්න පුළුවන්. ඒ වාගේම, සෑහෙන්න පිරිසක් ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ගුවන් සේවය පාවිච්චි කරන නිසා ලංකාවට එන විදේශීය සංචාරකයන්ට transit traffic එකක් තිබෙනවා. එම නිසා මේ වැඩකටයුතු සාර්ථකව ඉදිරියට කරගෙන ගිහිල්ලා, අපේ ගුවන් සේවය රටට බරක් නොවන විධියට සකස් කරන්නට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කරනවා.

2015 සිට සහල් ආනයනය: විස්තර
2015 முதல் அரிசி இறக்குமதி: விபரம்
IMPORT OF RICE FROM 2015: DETAILS

90/2024

5. ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද;
(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;
(iii) එම සහල් ආනයනය කරන ලද රටවල් කවරේද;
(iv) එම සහල් ආනයනය කරන ලද ආයතන කවරේද;
(v) සහල් ආනයනය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;
යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட அரிசியின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) அதற்காகச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி அரிசி எந்த நாடுகளிலிருந்து இறக்குமதி செய்யப்பட்டது என்பதையும்;

(iv) மேற்படி அரிசியை இறக்குமதி செய்த நிறுவனங்கள் யாவை என்பதையும்;

(v) அரிசி இறக்குமதியைக் குறைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development :

(a) Will he inform this House the -

(i) quantity of rice that has been imported to Sri Lanka up to now since 2015;

(ii) amount spent thereon;

(iii) countries from which the rice was imported;

(iv) institutions that imported the rice; and

(v) measures that will be taken to reduce the importation of rice?

(b) If not, why?

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

වර්ෂය	ආනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)
2015	285,604.2
2016	29,524.0
2017	747,800.0
2018	248,900.9
2019	24,192.7
2020	15,770.3
2021	147,091.3
2022	783,420.0
2023	29,605.6
2024 ජනවාරි සිට 2025 ජනවාරි 20 දක්වා	176,000

(ii)

වර්ෂය	CIF වටිනාකම	
	රුපියල්	රුපියල් මිලියන
2015	17,956,036.95	17.96
2016	1,871,762.00	1.87
2017	45,881,279.14	45.88
2018	16,678,873.56	16.68
2019	2,292,500.44	2.29
2020	1,936,087.68	1.94
2021	14,680,281.20	14.68
2022	87,422,715.63	87.42
2023	5,602,763.68	5.60
ජනවාරි සිට නොවැම්බර් දක්වා 2024	12,419,542.68	

2024 ජනවාරි සිට 2025 ජනවාරි දක්වා CIF වටිනාකම රුපියල් මිලියන 24,278යි.

(iii)

අනු අංකය	ආනයනික රට
1	ඉන්දියාව
2	මියන්මාරය
3	පාකිස්තානය
4	චීනය
5	බංග්ලාදේශය
6	තායිලන්තය
7	ඇමෙරිකා එක්සත් ජනපදය
8	ඉන්දුනීසියාව
9	සිංගප්පූරුව
10	වියට්නාමය
11	චීන තායිපේ
12	එක්සත් අරාබි එමීර් රාජ්‍යය
13	මලයාසියාව
14	ඕස්ට්‍රේලියාව
15	කාම්බෝජය
16	ඉතාලිය
17	හොංකොං (චීන)
18	දකුණු කොරියාව
19	වෙනිසියුලාව
20	ජපානය
21	මාලදිවයින
22	ජර්මනිය
23	එක්සත් රාජධානිය
24	කටාර්

[ගරු වසන්ත සමරසිංහ මහතා]

(iv) ගරු කථානායකතුමනි, අදාළ ආනයනකරුවන් කවුද කියන ප්‍රශ්නයට අදාළව පිටු 25ක, 30ක විතර ලේඛනයක් තිබෙනවා. ඊට අදාළ පිළිතුර සීඩී පටයෙහි තිබෙනවා. එම සීඩී පටය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

(v) මේ වසර තුළ මෙන්ම පසුගිය ආසන්න වසරවල ආනයනික දත්ත සැලකූ විට 2015, 2017, 2018, 2021 හා 2022 වසරවල සැලකිය යුතු ප්‍රමාණවලින් සහල් ආනයනය කර ඇත.

ප්‍රධාන සහල් ආනයනය කරනු ලබන රටවල් ඉහත (අ) (iii) මඟින් දක්වා ඇති අතර, ශ්‍රී ලංකා රේගුවේ දත්තයන් තුළ රටේ ජනතාවගේ සාමාන්‍ය පරිභෝජනය සඳහා ආනයනය කළ ප්‍රමාණයන්ට අමතරව, ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති විදේශ තානාපති/මහ කොමසාරිස් කාර්යාල විසිනුත් ඔවුන්ගේ රටවලින් සහල් ගෙන්වලා තිබෙනවා.

පරිභෝජනය උදෙසා ඔවුන්ගේ මෙරට පිහිටා ඇති සමහර restaurantsවලට, හෝටල්වලට සහල් ගෙනැල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, විශේෂ අවශ්‍යතාවන් සලකා Jasmine Rice, Basmati Rice සහ Sticky Rice වැනි විශේෂ සහල් වර්ග සුදුසු පරිදි ආනයනය කිරීම සඳහා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් අවසර දීම සිදු කරනු ලබනවා. ඒ කියන්නේ විවිධ තානාපති කාර්යාල සහ restaurantsවලට ඒ ඒ රටවල තිබෙන විශේෂ සහල් වර්ග ගෙන්වන්න ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් අවසර ලබා දීලා තිබෙනවා. බාස්මතී ඇතුළු සහල් ප්‍රමාණයක් වාර්ෂිකව අපේ රටට එනවා.

අප අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද සමීක්ෂණයන්ට අනුව 2024 වර්ෂයේ දෙසැම්බර් මස වනවිට සහල් හිඟයක් ඇති විය හැකි බව හඳුනා ගත් නිසා, 2024.12.08 දින සිට 2025.01.10 දක්වා කාලය තුළ සහල් මෙට්‍රික් ටොන් 169,470ක් ආනයනය කරලා තිබෙනවා.

එසේ වුවද, නව රජයේ ප්‍රතිපත්තිය වනුයේ දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කර සහල් ආනයනය අවම කිරීම වන අතර, ඒ අනුව ඉදිරි කාලය තුළ සහල් ආනයනය අවම කිරීම සඳහා මෙතෙක් රට තුළ සහල් හිඟවීමට බලපෑ කාරණා ද සැලකිල්ලට ගෙන නව වැඩ පිළිවෙළක් සකස් කිරීමටත්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් ආයතන විසින් අවශ්‍ය කටයුතුත් කරගෙන යනු ලබනවා. ඒ වාගේම වී තොගයක් මිලදී අරගෙන යම් ප්‍රමාණයකට වෙළෙඳ පොළ පාලනය කිරීම සඳහාත් අප රජය විසින් මැදිහත් වෙනවා.

(ආ) අදාළ නොවේ.

---

* *ප්‍රස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු කිංස් නෙල්සන් මහතා
(*மாண்புமிகு கிங்ஸ் நெல்சன்*)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලයේ රට තුළ ඇති වුණු සහල් හිඟයත් එක්ක රජය මැදිහත් වෙලා සහල් මෙට්‍රික්ටොන් 160,000ක් ආනයනය කරන්න සතොසට, Sri Lanka State Trading Corporation එකට සහ පෞද්ගලික ආයතනවලට අවසරය ලබා දුන්නා. මම දන්නා විධියට සතොස ආයතනයේ ටෙන්ඩර් එක තුන් හතර වතාවක්ම reject වුණා. Sri Lanka State Trading Corporation එක සහ පෞද්ගලික අංශවලින් සහල් මෙට්‍රික්ටොන් 160,000ක් ලංකාවට ගෙනාවා. ඒ ගෙනාපු සහල්වලට කිලෝ එකකට රුපියල් 65ක බද්දක් අය කළා. රජය ඒකෙන් විශාල මුදලක් හම්බ කර ගත්තා. කමක් නැහැ. රජයේ ආදායම වැඩි කර ගන්න ඕනෑ නේ.

ගරු කථානායකතුමනි, දැන් එන අප්‍රේල් මාසයේ සිංහල, හින්දු අලුත් අවුරුදු කාලය එනවා. රජය විසින් සහල්වලට රුපියල් 225ක සහතික මිලක් නියම කර තිබුණත්, දැන් නැවතත් නාඩු සහල්වල හිඟයක් රට තුළ පවතිනවා. ගරු ඇමතිතුමනි, මෝල් මුදලාලිලා කියනවා, "අපි සහල් ගෙනැල්ලා බාන්නම් කිලෝ එක රුපියල් 230ට" කියලා. එතකොට ඒ අය රුපියල් 230ට දුන්නාම කඩවලින් කීයටද හාල් විකුණන්නේ? රජය සහතික මිලකුත් දීලා තිබෙනවා. ඒ වාගේම රජය විශාල මුදලකුත් අය කර ගත්තා පිට රටින් ගෙනාපු සහල් මෙට්‍රික්ටොන් 160,000ට කිලෝඑකට රුපියල් 65ක බද්දක් ගහලා. එම බද්දෙන් එකතු කර ගත්ත සල්ලිවලින් ජනතාවට යම් සහනයක් ලබා දෙනවා ද, නැත්නම් පාරිභෝගිකයාට යම් විශේෂ වැඩ පිළිවෙළක් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරනවා ද කියලා පොඩ්ඩක් පැහැදිලි කරන්න පුළුවන්ද?

ගරු වසන්ත සමරසිංහ මහතා
(*மாண்புமிகு வசந்த சமரசிங்ஹ*)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ආනයනික සහල් සඳහා කිලෝ එකකට රුපියල් 65ක බද්දක් අය කරන්නේ විශේෂයෙන් ලංකාවේ වෙළෙඳපොළේ සහල් මිල සහ ගොවියාගේ වී මිල ආරක්ෂා කිරීම සඳහා. ඉන්දියාවෙන් සහල් ආවේ කිලෝ එක රුපියල් 135ක් වාගේ මිලකට. ආනයනික සහල් සඳහා ඒ බද්ද අය කළේ නැත්නම් ලංකාවේ ගොයම් කපන කාලයට සහ මේ වන විට සහල් වෙළෙඳපොළේ ප්‍රශ්නය මීට වඩා බරපතළ වෙනවා. ඒ වාගේම ගොවියාගේ වී මිල පිළිබඳත් බරපතළ ප්‍රශ්නයක් මතු වෙනවා. ආණ්ඩුව නාඩු වී කිලෝ එකක් සඳහා රුපියල් 120ක සහතික මිලක් නියම කර තිබෙනවා. ඒ වාගේම සම්බා වී කිලෝ එකක් සඳහා රුපියල් 125ක සහතික මිලක් නියම කර තිබෙනවා. ඒ නිසා ගොවියා ආරක්ෂා කිරීම ඉලක්ක කරගෙන මෙම බදු අය කර තිබෙන්නේ, වෙළෙඳපොළට ආනයනික සහල් සැපයීමේ යම් සීමාවක් පැනවීම සඳහායි.

ඔබතුමා අහන්නේ, සහල් මෝල් හිමියන් විසින් සිදු කරන මේ ක්‍රියාවලිය නිසා වෙළෙඳපොළේ පාලනයක් නැති වන එක ගැනයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන ප්‍රශ්නය හරි. ගරු කථානායකතුමනි, ඊයේ දවසේත් පාරිභෝගික සේවා අධිකාරිය මෝල්වල සහල් නිෂ්පාදනය සහ සහල් නිකුත් කිරීම කියන කාරණය check කළා. ඒවා පරීක්ෂාවට ලක් කරනවා. පොළොන්නරුවේ එක මෝලක් අත්තනෝමතික ලෙස මේ කටයුත්ත සිදු කරමින් සිටිනවා.

ඔබතුමා කිව්වා වාගේ, මෝලෙදි සහල් කිලෝ එකක මිල රුපියල් 215යි කියලා කිව්වාට, කඩෙට කියනවා රුපියල් 230යි කියලා. එතකොට, රුපියල් 15ක් අතින් දෙන්න ඕනෑ; අරන් යන

කෙනා ඒ මුදල අතින් දෙන්න ඕනෑ. රුපියල් 255ට තිබෙන කීරි සම්බා කිලෝව රුපියල් 275ට දෙන්න තමයි ඒ මෝල කටයුතු කරමින් සිටින්නේ. ඒ මෝල පසුගිය කාලයේ රජයේ බැංකුවලින් රුපියල් බිලියන 15ක් ණය අරගෙන තිබෙනවා. බිලියන 15ක්! ආණ්ඩුවෙන් දෙන ණය පහසුකම පාවිච්චි කරලා ගන්න වී සහල් කරලා විකිණීමේදී, අද දවසේත් පාරිභෝගිකයාට අත්තනෝමතික විධියට ඒවා ලබාදීමට ඒ අය කටයුතු කරනවා. මෝල් 15ක් අපි අධීක්ෂණය කරනවා, ගරු කථානායකතුමනි. එම මෝල් 15න් මේ කියන මෝල හැර අනෙක් හැම මෝලක්ම පාලන මිලට සහල් දෙනවා. ඊයේ දවස වෙනකොටත් අපි මේක check කළා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන ප්‍රශ්නයට අදාළව, මේ මෝල සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පරීක්ෂණ ආරම්භ කර තිබෙනවා. අපි දිගටම වැටලීම් කරනවා. ඊයේ දවසේත් වැඩි මිලට සහල් විකුණපු කඩ 38ක් වැටලීම් කර අදාළ අය අත්අඩංගුවට අරන් තිබෙනවා. රජයේ ණයත් ලබාගෙන මේ විධියට වැඩ කරන ඒ මෝල පිළිබඳවත් ඉදිරියේදී අපි විශේෂ තීරණයක් ගන්නවා. වෙළෙඳ පොළේ පාලන මිලට උඩින් යන්න දෙන්නේ නැති වෙන්න අපි ඒ වෙනුවෙන් මැදිහත් වෙනවා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය ඇසීමට පෙර, ගරු ඇමතිතුමා දුන්නු පිළිතුර සම්බන්ධයෙන් මට කාරණයක් පැහැදිලි කරගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු විධියට වී සඳහා රුපියල් 120ක සහතික මිලක් රජය දුන්න එක ඇත්ත. හැබැයි, එහිදී වීවල ප්‍රමිතිය, ඒ කියන්නේ තෙතමනය සියයට 14ට බලනවා. කබලට දාලා අඟුරු පුච්චලා දෙනවා වාගේ වේළලා දුන්නොත් තමයි කිලෝවක් රුපියල් 120ට ගන්නේ. හැබැයි අද තෙත වී රුපියල් 110ට ඕනෑ තරම් ගන්නවා. ගොවියාට දැන් පාරවල් ගානේ දාගෙන වී වේළන්න වේලාවකුත් නැහැ. ගොවියාට ඒ විධියට වී ටික තියාගන්න විධියකුත් නැහැ.

ගරු ඇමතිතුමාත් දන්නවා, උතුරු මැද පළාත ගත්තාම ඒ ගොවියෝත් මොන තරම් අමාරුවෙන් ද ඉන්නේ කියලා. මෙතැන ගැටලුව මතු වෙන්නේ දැන් මේ ඇතිවෙලා තිබෙන සහල් හිඟයත් එක්කයි, ගරු ඇමතිතුමනි. නැවතත් මෝල්වල නාඩු තිබෙනවා. හැබැයි මේ මෝල් මුදලාලිලා තමයි රටේ සහල් මිලයි, වී මිලයි තීරණය කරන්නේ. ඔබතුමන්ලා කිව්වේ එක පැත් පහරින් මේවා වෙනස් කරන්න පුළුවන් කියලායි. ඒ නිසා අපි මේවා වෙනස් කරමු. වෙනස් කරලා ඉදිරි අවුරුදු සමය වෙනකොට රටේ බත් කන මිනිසුන්ට සහල් සම්බන්ධයෙන් හොඳ මිලක් ලබා දෙමු. ගොවියා මේ මහ කන්නයේ අස්වැන්න නෙළනවා. අපි ගොවියාගේ වීවලට හොඳ මිලක් දෙනවා වාගේම පාරිභෝගිකයාටත් හොඳ මිලක් දෙන්න කටයුතු කරමු. මේ වෙනකොට රජය ලොකු මුදලක් හම්බ කරගෙනත් තිබෙනවා නේ.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අද විශේෂයෙන්ම ටින් මාළු නිෂ්පාදනය ගැන කථා කරනවා. රටේ ටින් මාළු අවශ්‍යතාවෙන් සියයට 95ක්-*[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

සහල් පිළිබඳව නොවෙයි නේ, ඔබතුමා ඔය අහන්නේ

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, සහල්වලට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු ඇමතිතුමනි, මේකත් ඔබතුමාගේ විෂයට අදාළ නිසා පැහැදිලි කිරීමක් කරගන්නයි අහන්නේ. මේ කාරණය ඔබතුමාගේ විෂයට අදාළයි, ගරු ඇමතිතුමා. සැමන් කර්මාන්තය ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් වෙනවා. ඒකයි පොඩි පැහැදිලි කර ගැනීමක් වෙනුවෙන් අවස්ථාව ඉල්ලන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

ටින් මාළු ගේන්නේ ඔබතුමා නේ, ගරු ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමා, මුල් ප්‍රශ්නයෙන් සහල් ගැන අහලා, අතුරු ප්‍රශ්නවලදී සැමන් ගැන අහන්න එපා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

සතොස ඇතුළේ තිබෙන දේවල් ගැන මම කථා කරන්නේ. පොඩි පැහැදිලි කර ගැනීමක් සඳහායි අහන්නේ. *[බාධා කිරීමක්]*

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ඔබතුමා ඔය ප්‍රශ්නය ඇහුවොත් මම උත්තර දෙනවා. *[බාධා කිරීමක්]* නමුත්, ඔබතුමා සහල් සම්බන්ධව මුල් ප්‍රශ්නය අහලා තමයි අතුරු ප්‍රශ්නවලදී සැමන් ගැන අහන්නේ.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මට පැහැදිලියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රධාන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

එම ප්‍රශ්නයට අදාළව තමයි මම මේ ප්‍රශ්නය අහන්නේ, ගරු කථානායකතුමනි. රටේ අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳවයි මම අහන්නේ. ඉතින්, ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අදාළව තිබෙන ගැටලුවක් තමයි මේ ටින් මාළු පිළිබඳ ප්‍රශ්නය. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයට දැන් උත්තරයක් දෙන්න ඕනෑ නැහැ, පසුව උත්තරයක් ලබා දෙන්න. මම ප්‍රශ්නය අහන්නම්. ගරු කථානායකතුමනි, රටේ ටින් මාළු අවශ්‍යතාවෙන් සියයට 95ක් නිෂ්පාදනය කරන්නේ දේශීය නිෂ්පාදකයින්. දැන් පිට රටින් ගෙන්වන,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝගවලට අනුව, අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් වන්නේ අසන ලද මුල් ප්‍රශ්නයට අදාළවයි. ඒ නිසා අහපු ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ අවසරය මතයි මම මේ ප්‍රශ්නය අහන්නේ. එතුමා උත්තර දෙන්න කැමැතියි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු ඇමතිතුමා එකඟ නම් අහන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවාද?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු ඇමතිතුමා එකඟයි කිව්වා, ගරු කථානායකතුමනි. මම ඒකයි අහන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම උත්තර දෙන්න ද?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම ප්‍රශ්නය අහලා ඉවර නැහැ. මම ඉක්මනින් ප්‍රශ්නය අහන්නම්.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා ප්‍රශ්නය අහන්නකෝ. මොකද, හාල් ගැන නේ මට උත්තර දෙන්න තිබෙන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
හදිස්සි ඇයි?

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
කලබල වෙන්න එපා, ගරු ඇමතිතුමා. මේක වැදගත් ප්‍රශ්නයක්. දැන් දේශීය සැමන් නිෂ්පාදනවලට සියයට 18ක් VAT ගහලා තිබෙනවා, ආනයනය කරන සැමන්වලට VAT එක අයින් කරලා තිබෙනවා. මේක සත්‍ය තොරතුරක් ද කියන එක විතරයි මට දැන ගන්න අවශ්‍ය වන්නේ, ගරු කථානායකතුමනි. මට දැන ගන්න අවශ්‍ය එච්චරයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, මෙතුමා දැන් සහල් ගැනයි ප්‍රශ්නය ඇහුවේ. සහල් ආනයනය සීමා කිරීමට වාගේම සහල් වෙළෙඳ පොළේ හිඟය පාලනය කිරීමට ආණ්ඩුව මැදිහත් වෙලා තිබෙනවා. මොකද, මේ මිල සහ බදු අතර ප්‍රශ්නය මම කලිනුත් පැහැදිලි කළා. එතුමා දැන් සහල් ගැන ප්‍රශ්නය අමතක කරලා සැමන් ගැන අහපු නිසා මම ඒ ගැනත් කියන්නම්.

සැමන් නිෂ්පාදනයට අපේ රටේ කර්මාන්ත ශාලා 26ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. එම කර්මාන්ත ශාලා 26න් දවසකට නිෂ්පාදනය කරනවා, ග්‍රෑම් 425 සැමන් ටින් 500,000කට වැඩියෙන්. කර්මාන්තශාලා 26ක් තිබෙනවා, ඒ 26න් දවසකට සැමන් ටින් 500,000කට වඩා නිෂ්පාදනය කිරීමට production capacity එකක් තිබෙනවා. හැබැයි, අපේ දේශීය අවශ්‍යතාව, එහෙම නැත්නම් අපේ demand එක තිබෙන්නේ 180,000ක් පමණ ප්‍රමාණයක්. මේ සැමන් නිෂ්පාදකයන්ට බලපාන ප්‍රශ්න කීපයක් තිබුණා. ආනයනික මාළුවල ප්‍රශ්නය තිබුණා, ටින්වල ප්‍රශ්නය තිබුණා. VAT අය කරන එක තිබෙනවා. දේශීය නිෂ්පාදන සියල්ලෙන්ම VAT අය කරනවා. ඒක VAT පනත අනුව තිබෙන කාරණයක්. හැබැයි, එහෙම අය කළා කියලා ප්‍රශ්නයක් වෙලා නැහැ. මොකද, අපි පසුගිය දවස්වල නිෂ්පාදකයන් විසින් ඉල්ලීමක් කරනු ලැබූ නිසා දේශීය සැමන්වලට උපරිම සිල්ලර මිලක් - MRP එකක් - දැම්මා, රුපියල් 380යි කියලා. රුපියල් 380ක්, රුපියල් 420ක්, රුපියල් 517ක් වශයෙන් සැමන් වර්ග 3ක් නිෂ්පාදනය කරනවා. VAT එක ඕනෑම දේශීය නිෂ්පාදනයකින් අය කරනවා. හැබැයි, ආනයනික සැමන් ටින් එකක් ලංකාවට එන්නේම රුපියල් 520ට වඩා වැඩි මිලකින්. ඒ නිසා, නිෂ්පාදකයන්ගේ ඉල්ලීම මතම පාලන මිලක් දාලා අපි මේ වන කොට පාරිභෝගිකයාට සැමන් ටින් එකක් රුපියල් 380ට දෙන්න කටයුතු කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

මාවනැල්ලේ බුද්ධ ප්‍රතිමා කඩා දැමීම පිළිබඳ පරීක්ෂණ: ප්‍රගතිය

மாவனெல்லையில் புத்தர் சிலைகள் உடைப்பு தொடர்பான விசாரணைகள்: முன்னேற்றம்

INVESTIGATIONS INTO DAMAGING BUDDHA STATUES IN MAWANELLA: PROGRESS

6/2024

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙර මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම කඩා දැමීමේ සිද්ධිය වාර්තා වූ දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් අත් අඩංගුවට ගන්නා ලද පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ ආරක්ෂක නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යෑමේදී එම ආරක්ෂක නිලධාරීන්ට බලපෑම් එල්ල කරනු ලැබූ එවකට ආණ්ඩුකාරවරුන්ගේ සහ ආණ්ඩුවේ ප්‍රබල පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සිද්ධියට අදාළ පරීක්ෂණවල වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உயிர்த்த ஞாயிறு தாக்குதலுக்கு முன்னர் மாவனெல்லை பிரதேசத்தில் புத்தர் சிலைகள் உடைக்கப்பட்ட சம்பவம் பதிவாகிய திகதி யாது என்பதையும்;

(ii) மேற்படி சம்பவத்துக்காக கைதுசெய்யப்பட்ட வர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) இவர்களுக்கு எதிராக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேலே (அ)(i)இல் குறிப்பிடப்பட்டுள்ள சம்பவத்தை விசாரணைசெய்த பாதுகாப்பு அலுவலர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(ii) விசாரணைகள் முன்னெடுக்கப்பட்டபோது அந்தப் பாதுகாப்பு அலுவலர்களுக்கு அழுத்தம் பிரயோகித்த அப்போதைய ஆளுநர்கள் மற்றும் அரசாங்கத்தில் பலம்வாய்ந்த நபர்களின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி சம்பவம் தொடர்பான விசாரணைகளின் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House the -

(i) date on which the incident of breaking Buddha statues occurred in Mawanella area before the Easter Sunday attack;

(ii) names and addresses of persons arrested in connection with the incident concerned; and

(iii) measures that have been taken against them?

(b) Will he also inform this House the-

(i) names of the security officers who conducted investigations into the incident referred to in (a) (i) above;

(ii) Governors and powerful persons of the then Government who influenced the security officers concerned in the conduct of their investigations, separately; and

(iii) present progress of the investigations into the above-mentioned incident?

(c) If not, why?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)

(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 2018.12.23

(ii) මෙම සිද්ධිය, ජාතික ආරක්ෂාව සම්බන්ධ ඉතා සංවේදී කරුණක් වන පාස්කු ඉරිදා ප්‍රහාරය හා බැඳී පවතින බැවින් හා එහි විමර්ශන තවදුරටත් ක්‍රියාත්මක වන නිසා සැකකරුවන්ගේ නම් සහ ලිපිනයන් මෙම අවස්ථාවේදී ඉදිරිපත් කිරීම සුදුසු නැත.

(iii)
- සැකකරුවන් 06ක් සඳහා කෑගල්ල මහාධිකරණයේ නඩු පවරා වරද පිළිගැනීම නිසා එක් චෝදනාවකට මාස 03 බැගින් සිර දඬුවම් හා රු.10,000.00ක දඩ නියම කර එය වසර 07ට අත්හිටුවා ඇති අතර, නඩු කටයුතු අවසන් කර ඇත.
- සැකකරුවන් 03ක් කෑගල්ල මහාධිකරණයේ නඩු පැවරීමෙන් පසු සාක්ෂි ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අධිකරණය මඟින් මුදා හැර ඇත.
- සැකකරුවන් 14ක් සඳහා කෑගල්ල, කොළඹ, පුත්තලම මහාධිකරණවල නඩු පවරා නඩු කටයුතු විභාග වෙමින් පවතී.
- සැකකරුවන් 14ක් සඳහා මාවනැල්ල මහෙස්ත්‍රාත් උසාවියේ නඩු පවරා නීතිපති උපදෙස් මත නිදහස් කර ඇත.
- සැකකරුවන් 10ක් සඳහා මාවනැල්ල මහාධිකරණයේ නඩු පවරා නීතිපති උපදෙස් මත ඇප නියම කර ඇත. නඩු පැවරීම සඳහා නීතිපති උපදෙස් ලැබීමට නියමිතව ඇත.
- සැකකරුවන් 03ක් සඳහා මාවනැල්ල මහෙස්ත්‍රාත් උසාවියේ නඩු පවරා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 11(1) වගන්තිය යටතේ මුදා හැර ඇත.

(ආ) (i) මෙම සිද්ධිය, ජාතික ආරක්ෂාව සම්බන්ධ ඉතා සංවේදී කරුණක් වන පාස්කු ඉරිදා ප්‍රහාරය හා බැඳී පවතින බැවින් හා එහි විමර්ශන තවදුරටත් ක්‍රියාත්මක වන නිසා සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ විමර්ශන නිලධාරීන්ගේ නම් මෙම අවස්ථාවේදී ඉදිරිපත් කිරීම සුදුසු නැත.

(ii) වාර්තා වී නැත.

(iii) අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සඳහා ප්‍රශ්න අංක (අ) (iii)හි පිළිතුරු පරිදි පියවර ගෙන ඇත. කොළඹ මහාධිකරණයේ නඩු පවරා ඇති සැකකරුවන්ට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ හා ලංකා දණ්ඩ නීති සංග්‍රහ පනතේ අධිචෝදනා 23230ක් යටතේ නඩු පවරා, නඩු දිනය 2025.02.13 දින යෙදී තිබුණු අතර ඉදිරි නඩු දිනය 2025.03.12 වේ. පුත්තලම මහාධිකරණයේ නඩු පවරා ඇති සැකකරුවන්ට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා 14ක් යටතේ නඩු පවරා නඩුව විභාග වන අතර ඉදිරි නඩු දිනය 2025.03.18 වේ.

(ඇ) පැන නොනඟී.

සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම: විස්තර

சாதாரண சேவையின்கீழ் கடவுச்சீட்டுகளை வழங்குதல்: விபரம்

ISSUANCE OF PASSPORTS UNDER NORMAL SERVICE: DETAILS

62/2024

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chaminda Wijesiri)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024.01.01 වැනි දින සිට මේ දක්වා සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව එක් එක් මාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ලබා දීම සඳහා අය කරනු ලබන ගාස්තුව කොපමණද;

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් කඩිනමින් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.01.01ஆம் திகதியிலிருந்து இதுவரை சாதாரண சேவையின்கீழ் கடவுச்சீட்டுகளைப் பெற்றுக்கொள்வதற்காக குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களத்துக்குக் கிடைத்துள்ள விண்ணப்பங்களின் எண்ணிக்கை மாத வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) சாதாரண சேவையின்கீழ் கடவுச்சீட்டுகளை வழங்குவற்கு அறவிடப்படும் கட்டணம் யாது என்பதையும்;

(iii) சாதாரண சேவையின்கீழ் சமர்ப்பிக்கப்படும் விண்ணப்பங்களுக்குத் துரிதமாக கடவுச்சீட்டுகளை வழங்குவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House the-

(i) number of applications received by the Department of Immigration and Emigration for obtaining passports under the normal service from 01.01.2024 up to now on monthly basis, separately;

(ii) fee charged for issuing a passport under the normal service; and

(iii) actions that will be taken to issue passports expeditiously for applications submitted for obtaining passports under the normal service?

(b) If not, why?

ගරු ආනන්ද විජේපාල මහතා

(மாண்புமிகு ஆனந்த விஜேபால)

(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i)

වර්ෂය	මාසය	අයදුම්පත් සංඛ්‍යාව
2024	ජනවාරි	25,644
	පෙබරවාරි	14,588
	මාර්තු	11,688
	අප්‍රේල්	10,134
	මැයි	13,059
	ජූනි	11,269
	ජූලි	10,126
	අගෝස්තු	6,494
	සැප්තැම්බර්	4,106
	ඔක්තෝබර්	6,953
	නොවැම්බර්	5,750
	දෙසැම්බර්	9,969
2025	ජනවාරි	9,345
එකතුව		**139,125**

(ii)

- සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව - රු. 10,000.00
- මාර්ගගත ක්‍රමය ඔස්සේ සාමාන්‍ය ක්‍රමවේදයට විදේශ ගමන් බලපත්‍ර ගාස්තුව - රු. 10,000.00
- වයස අවුරුදු 16ට අඩු අයදුම්කරුවන්ට වසර 03ක වලංගු කාල සීමාවක් සඳහා සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර සඳහා ගාස්තුව - රු. 3,000.00
- වයස අවුරුදු 16ට අඩු අයදුම්කරුවන්ට වසර 10ක වලංගු කාල සීමාවක් සඳහා සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ගාස්තුව - රු. 10,000.00

(iii) සාමාන්‍ය ක්‍රමවේදය යටතේ විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් එසේ ඉදිරිපත් කරන ලද දිනයේ සිට මාසයක කාලයක් සම්පූර්ණ වූ පසු අයදුම්කරුවන්ගේ ඉල්ලීම් ප්‍රමුඛතාව මත පදනම්ව විදේශ ගමන් බලපත්‍ර දෛනිකව නිකුත් කරනු ලබන අතර, නැවත හිස් විදේශ ගමන් බලපත්‍ර තොග ලැබෙන තෙක්, මේ වන විට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුව පවතින හිස් ගමන් බලපත්‍ර තොග කළමනාකරණය කිරීම සඳහා මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කර ඇත.

(ආ) පැන නොනඟී.

මඩකලපුව, වාකරේ ප්‍රා.ලේ. කොට්ඨාසය: නීති විරෝධී ඉල්මනයිට් කැණීම්

மட்டக்களப்பு, வாகரை பிரதேச செயலாளர் பிரிவு: சட்டவிரோத இல்மனைட் அகழ்வு

VAKARAI DS DIVISION, BATTICALOA: ILLEGAL ILMENITE MINING

66/2024

3. ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරලේපත්තුව-උතුර, වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නීති විරෝධී ලෙස ඉල්මනයිට් කැණීම් සිදු කරන බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට සෞඛ්‍යය, ජීවනෝපාය හා පානීය ජල ගැටලු ඇති විය හැකි බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, නීති විරෝධීව සිදු කරන ඉල්මනයිට් කැණීම් කටයුතු තහනම් කිරීම සඳහා පියවර ගන්නේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின், கோரளைப்பற்று - வடக்கு, வாகரை பிரதேச செயலாளர் பிரிவில் சட்டவிரோதமாக இல்மனைட் அகழ்வு மேற்கொள்ளப்படுகின்றது என்பதையும்;

(ii) இதன் காரணமாக அப்பிரதேசத்தில் வாழும் மக்களுக்குச் சுகாதாரம், வாழ்வாதாரம் மற்றும் குடிநீர் சார்ந்த பிரச்சினைகள் ஏற்படக்கூடும் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், சட்டவிரோதமாக மேற்கொள்ளப்படும் இல்மனைட் அகழ்வுச் செயற்பாடுகளைத் தடை செய்வதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Is he aware that -

(i) illegal mining of Ilmenite is being carried out in the Koralaipattu North, Vakarai Divisional Secretary's Division of the Batticaloa District; and

(ii) the said illegal mining may cause issues relating to the health and the livelihoods of the people living in the area and relating to drinking water in that area?

(b) If so, will he inform this House whether steps will be taken to prohibit the said illegal Ilmenite mining activities in that area?

(c) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් 2025.01.08 දින සිට 2025.01.09 දින දක්වා සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණයකට අනුව එම වෙරළ තීරයේ සුළු වශයෙන් වැලි කැණීමක් සිදු කර ඇති බවත් ඒ සඳහා ට්‍රැක්ටර් යන්ත්‍ර භාවිත කර ඇති බවත් නිරීක්ෂණය කර ඇත. එම කැණීම් සඳහා ප්‍රදේශවාසීන්ගේ දැඩි විරෝධයන් ඇති වී ඇති අතර එම නිසා නීති විරෝධී කැණීම් දිගටම සිදු කර නොමැත. එසේම මෙම කණින ලද වැලි කුමන ප්‍රයෝජනයක් සඳහා, කුමන ප්‍රදේශයකට ප්‍රවාහනය කළේ ද යන්න පිළිබඳ තොරතුරු හෙළිදරව් කර ගැනීමට නොහැකි වී ඇත.

කෙසේ වෙතත් ඉල්මනයිට් යනු, කාර්මික ඛනිජයක් වන අතර එය කැණීම් සිදු කිරීමෙන් පසුව පිරිපහදු මධ්‍යස්ථානයකට අනිවාර්යයෙන්ම යැවීමට සිදු වන අතර එසේ නොමැතිව එම ඛනිජ ශ්‍රී ලංකාව තුළ භාවිත කිරීමක් සිදු කළ නොහැක. මෙම ඛනිජය පිරිපහදු මධ්‍යස්ථානයකට ලබා ගැනීම පිළිබඳ වාර්තාවක් නොමැත. එම නිසා මෙම නීතිවිරෝධී වැලි කැණීම මහා පරිමාණයෙන් සිදු වී ඇති බවට පැහැදිලි සාක්ෂි නොමැත.

කෙසේ වුවද මෙම වෙරළ තීරයේ ඛනිජ වැලි ඉවත් කිරීම සඳහා පුද්ගලික සමාගමක් නමින් IML/A/HO/8489 හා IML/A/HO/8490 දරන ඛනිජ වැලි කැණීම් බලපත්‍ර නිකුත් කර ඇති නමුත් මේ දක්වා කැණීම් සිදු කර නොමැත.

2024.12.08 දින සිට මෙම බලපත්‍රවල ද වලංගු කාලය අවසන් වී ඇත.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

කැණීම් බලපත්‍ර විස්තර:

කැණීම් බලපත්‍ර අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ග්‍රාම නිලධාරී කොට්ඨාසය	නිකුත් කළ දිනය	අවලංගු වන දිනය
IML/A/ HO/8489	වාකරේ	පල්වෙනායි	2014.12.09	2024.12.08
IML/A/ HO/8490	වාකරේ	පල්වෙනායි	2014.12.09	2024.12.08

(ii) කිසියම් කැණීම් කටයුත්තක් හේතුවෙන් ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට සෞඛ්‍ය, ජීවනෝපාය හා පානීය ජල ගැටලු ඇති විය හැකි බව ප්‍රදේශවාසීන් සමඟ සිදු කළ සාකච්ඡාවලදී දැනට නිරීක්ෂණය වී නොමැත. එවැනි ගැටලුවක් දැනට නිකුත් කර ඇති බලපත්‍ර හේතුවෙන් ඉදිරියේදී ඇති වුවහොත්, ඊට අදාළ දෙපාර්තමේන්තු හා ආයතන මඟින් අදාළ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන අතර ඒ අනුව කැණීම් බලපත්‍රය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් තීරණය කරන බව දන්වමි.

(ආ) 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍ය පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව බනිජ කැණීම, ප්‍රවාහනය, වෙළෙඳාම, ගවේෂණය, අපනයනය හා පිරිසැකසුම සඳහා කාර්යාංශය මඟින් නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරය යටතේ මිස අන්‍යාකාරයකින් සිදු කිරීම නීතිවිරෝධී වේ.

ඒ අනුව ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්ය බලකාය හා අවස්ථානුකූලව ආරක්ෂක හමුදා සහාය ලබා ගනිමින් වැටලීම් කටයුතු සිදු කර නීත්‍යානුකූල නොවන කැණීම් මැඩ පැවැත්වීමට කටයුතු කරනු ලබන බව දන්වමි.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

පාසල් ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ දහම් පාසල් ගුරුවරුන්ගේ දීමනාව
பாடசாலைகளுக்கு ஆசிரியர்களை ஆட்சேர்ப்புச் செய்யும் செயன்முறையும் அறநெறிப் பாடசாலை ஆசிரியர்களுக்கான கொடுப்பனவுகளும்
RECRUITMENT PROCEDURE OF SCHOOL TEACHERS AND ALLOWANCE PAID TO DHAMMA SCHOOL TEACHERS

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. එම ප්‍රශ්න ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ජාතික වැදගත්කමකින් යුතු ගැටලු වන හෙයින් පහත ප්‍රශ්න සඳහා පැහැදිලි පිළිතුරු අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් අපේක්ෂා කරමි.

01. පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ ආණ්ඩුවේ වත්මන් ප්‍රතිපත්තිය කුමක් ද? ඒ අනුව ගුරුවරුන් වශයෙන් සේවයට බැඳීමට අවශ්‍ය අවම සුදුසුකම් මොනවා ද?

02. දැනට ජාතික හා පළාත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව දිස්ත්‍රික්ක වශයෙන් කොපමණ ද?

03. (i) ජාතික හා පළාත් පාසල්වල ආගමික විෂයයන් ඉගැන්වීම සඳහා ධර්මාචාර්ය සමතුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II (ආ) ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට 2019 දී මුහුණ දුන් බෞද්ධ, හින්දු, ඉස්ලාම්, රෝමානු කතෝලික හා ක්‍රිස්තියානි ආගමික විෂයයන් නියෝජනය කරන එම ගුරු විභාග සමතුන් ගුරු සේවයට බඳවා ගන්නේ ද?

(ii) බඳවා ගන්නේ නම් ඒ කවදා ද?

(iii) බඳවා නොගන්නේ නම් ඒ මන්ද?

යන්න එතුමිය සභාවට දන්වන්නේ ද,

(iv) නොඑසේ නම් ඒ මන්ද?

04. පිරිවෙන් හා දහම් පාසල් ගුරුවරුන් ලෙස කොපමණ ප්‍රමාණයක් මේ වන විට සේවය කරයි ද? දැනට කොපමණ පිරිවෙන් හා ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාවක් තිබේ ද? දහම් අධ්‍යාපනය හා පිරිවෙන් අධ්‍යාපනයෙහි ගුණාත්මක බව වර්ධනය සඳහා රජය සතුව යම් අධ්‍යයනයක් හා වැඩ පිළිවෙළක් තිබේ ද? නොඑසේ නම් ඒ මන්ද?

(i) දහම් පාසල්වල උගන්වනු ලබන ගුරුවරුන්ගේ රුපියල් 5,000ක අවම මට්ටමක පවතින වාර්ෂික දීමනාව රුපියල් 15,000 දක්වා වැඩි කරන්නේ ද?

(ii) එම දීමනාව වැඩි කරන්නේ නම්, ඒ කවදා ද?

යන්න එතුමිය සභාවට දන්වන්නේද?

(iii) දීමනාව වැඩි නොකරන්නේ නම්, ඒ මන්ද?

ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමිය මේ සතිය ඇතුළත එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක ඇමතිතුමා ගරු සභාවේ සිටින මේ මොහොතේ මම එතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමතියි. එතුමාගේ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අපි සාකච්ඡා කළා, රට තුළ ක්‍රියාත්මක වන මේ අපරාධ රැල්ල පිළිබඳව. ඒ සාකච්ඡාවේදී එතුමා බොහොම පැහැදිලිව ප්‍රකාශ කළා, මේ අපරාධ රැල්ල මැඩ පවත්වන්නට විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා කියලා. මොකද, අද ජන සමාජයේ හැම දෙනාම පාහේ බියෙන් සැකයෙන්, මහ භීතිකාවකින් සිටින්නේ. අපේ යෝජනාවට සවන් දීලා එතුමා බොහොම පැහැදිලිව කිව්වා, මේ අපරාධ රැල්ල මැඩ පවත්වන්නට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාවිච්චි කරන්න යන්නේ නැහැ, එය වෙනුවට අපරාධ නඩු විධාන සංග්‍රහය - Code of Criminal Procedure - තවදුරටත් ශක්තිමත් කරන්නට කටයුතු කරනවා කියන කාරණාව. ගරු ඇමතිතුමනි, මේ ඝාතන සංස්කෘතිය, අපරාධ රැල්ල අපේ රටේ ජාතික ආරක්ෂාවට බරපතළ ගැටලුවක්. ඔබතුමාත් ඒක අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී පිළිගත්තා. ඒ කාරණය අපි හැමෝම පිළිගන්නවා, පක්ෂ භේදයෙන් තොරව. මේ අපරාධ රැල්ල මැඩ පවත්වන්නට දණ්ඩ නීති සංග්‍රහය භාවිත කරනවාද? මේ අපරාධකරුවන්, ඒ විනාශකාරී මංකොල්ලකාරී මිනීමරුවන් නීතිය හමුවට ගෙනැල්ලා මේ අපරාධ රැල්ල මැඩ පවත්වන්නට ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද? මොකද, හැම ක්ෂේත්‍රයකටම මෙය බරපතළ ලෙස බලපා තිබෙනවා. සිවිල් සමාජයටත් බලපා තිබෙනවා.

මම ඔබතුමාට විශේෂයෙන් මේ කාරණයත් මතක් කරන්න කැමතියි, ගරු ඇමතිතුමනි. අපි හැමෝම බලාපොරොත්තු වෙනවා, සංචාරකයින් විශාල ප්‍රමාණයක් මේ වසරේ මේ රටට එයි කියලා. අපි ඒ ගැන සතුටු වෙනවා. නමුත්, සංචාරක ක්ෂේත්‍රය නියෝජනය කරන විවිධ කණ්ඩායම් අද ඉදිරිපත් වෙලා කියනවා, මේ ඝාතන රැල්ල, මේ ඝාතන සංස්කෘතිය ඇත්තවශයෙන්ම ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් වාගේම අපේ රටේ සංචාරක අංශය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවලටත් බරපතළ ප්‍රශ්නයක් බව. ඒ වාගේම ගරු කථානායකතුමනි, මට අහන්නට ලැබුණා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කෙටියෙන් කියන්න.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි,

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමතියි. මෙතැන පක්ෂ නායකයන්ට විශේෂ අවස්ථාවක් තිබෙනවා. කලින් දැනුම් දීලා, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් යොමු කරලා නිසි පරිදි අමාත්‍යවරයෙකුට පිළිතුරු දෙන්න අවස්ථාව ගන්න පුළුවන්. ඒ වාගේම අපි පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක් පවත්වාගෙන යනවා, රටේ විශේෂ වැදගත්කමක් තිබෙන ප්‍රශ්නයක් පැන නැඟුණාම පක්ෂ නායකයන්ට හෝ මන්ත්‍රීවරයෙකුට හෝ ඔබතුමාගේ සාමාන්‍ය පොදු අවබෝධය මත ඒ කාරණය මතු කරන්න අවස්ථාව ලබා දෙන්න. නමුත් දැන් අපට පෙනී යන දෙයක් තිබෙනවා. ආරක්ෂාව පිළිබඳ මේ ප්‍රශ්නය මෙතුමාම දැන් මතු කරන්නේ තුන්වැනි වතාවට. මේ කාරණය මෙතැනදී විශාල වශයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා, ඇමතිතුමා ඇති තරම් පිළිතුරු දීලා තිබෙනවා. ඒ වාගේම දැන්, "ජාතික ආරක්ෂාව අනතුරේ, ජාතික ආරක්ෂාව අනතුරේ" කියන මතය ගොඩනඟන්න සැලකිය යුතු උත්සාහයක් දරමින්, කොටි නැඟිටිනකල් බලා හිටියා වාගේ බලාගෙන ඉන්න team එකකුත් ඉන්නවා. ඒ team එකත් අනාථ වෙලා ඉඳලා දැන් ආයෙත් නැඟිටිමින් ඉන්නවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්න කැමැතියි, පක්ෂ නායකයන් ස්ථාවර නියෝග 27 (2) යටතේ ඉදිරිපත් කරන ප්‍රශ්නවලට අමතරව මේ විධියට විපක්ෂ නායක හෝ පක්ෂ නායකයින් හෝ කවුරු හෝ හදිසි වැදගත්කමකුත් නැති ප්‍රශ්නයක් දිගින් දිගටම මතු කරනවා නම් - මේ ප්‍රශ්නයත් දිගින් දිගට මතු කර තිබෙනවා- කළ යුතු දේ සම්බන්ධයෙන්.

ඒ විධියට දිගටම මතු කරනවා නම්, ගරු කථානායකතුමනි, අඩුම ගණනේ ඔබතුමාගේ අවබෝධයක් සහිතව ඒක කරන්න අවශ්‍යයි. අපි ඒ විධියට මේ පාර්ලිමේන්තුව තුළ කටයුතු කර තිබෙනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරගන්න කල් නැති වෙන්න පුළුවන්. එතකොට අපි සාමාන්‍යයෙන් උදේට කථානායකතුමා මුණ ගැහිලා එතුමාගේ අවබෝධය මත, සභාවේ නැගිටලා ඒ ගැන කථා කරලා තිබෙනවා, 27(2) යටතේ නැතුව. නමුත් අපට පෙනෙනවා, මේක වෙනත් දෙයක් බව. මේ ගැන නිතර නිතර මෙහෙම කීමෙන් වෙන්නේ රටේ සංචාරක කර්මාන්තයට බාධා වෙන එක. ඒක තමයි දැන් මේ වෙන්නේ. ඒ නිසා ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විපක්ෂ නායක හෝ කවුරු හෝ මෙහෙම කරනවා නම් ඒකට ඔබතුමාගෙන් විශේෂ අවසරයක් ගන්න ඕනෑ, එම කාරණය ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන එකක් නොවෙයි නම්. දැන් වෙන්නේ මොකක්ද? නිකම්ම නැගිටිනවා; කථා කරනවා. අපි ඒකට කිසිසේත්ම එකඟ වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, පාර්ලිමේන්තුවේ කවුරුත් මේ කටයුතු සාධාරණව කරගෙන යන්න අවශ්‍යයි කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කරුණාකර අසුන් ගන්න. *[බාධා කිරීමක්]*

ස්ථාවර නියෝග 27 (8) යටතේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු රෝහිණී කවිරත්න මහත්මිය. *[බාධා කිරීමක්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක? මේ කාරණාව ගැන ඔබතුමා මා දැනුවත් කළේත් නැහැ. [බාධා කිරීමක්] ඔබතුමාට තිබෙන ගරුත්වය නිසා, ගරු විපක්ෂ නායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඔබතුමා Erskine May සහ "Practice and Procedure of Parliament" by Kaul and Shakdher කියවා බලන්න. [බාධා කිරීමක්] මට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] මගේ කට වහන්න එපා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පාර්ලිමේන්තු සම්ප්‍රදායයට අනුව විපක්ෂ නායකවරයාට කාලීන, වැදගත් ප්‍රශ්න ගැන කථා කරන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා කිව්වා වාගේ ඔබතුමා මේ කාරණාව - *[බාධා කිරීම්]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇත්ත වශයෙන්ම මම කථා කළේ - *[බාධා කිරීම්]* බලන්න, ඊයේ දවසේ සංචාරක ක්ෂේත්‍රය නියෝජනය කරන පාර්ශ්වකරුවන් *[බාධා කිරීම්]* බොහොම පැහැදිලිව ප්‍රවෘත්ති සාකච්ඡාවක් පවත්වා කිව්වා, - *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(8) යටතේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය. *[බාධා කිරීම්]* ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමා, කරුණාකර අසුන් ගන්න. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමා, කරුණාකර අසුන් ගන්න. *[බාධා කිරීම්]* ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය, පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම ඉදිරිපත් කරන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்னவினது சொந்த விளக்கம்
PERSONAL EXPLANATION BY HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 27(8) යටතේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීමකට අවස්ථාව ඉල්ලනවා. මම කනගාටු වෙනවා, මාත් එක්ක ඒ කාලයේ එකම පාසලේ; මාතලේ, වේරගම පරාක්‍රම විද්‍යාලයේ සේවය කරපු, එකට staff එකේ හිටපු, එක බත් එක බෙදා ගෙන කාපු වත්මන් ආණ්ඩුවේ ඉන්නා ගරු නියෝජ්‍ය ඇමතිතුමෙක් ඊයේ පට්ටපල් බොරුවක් මගේ පවුල් සම්බන්ධ කරගෙන ප්‍රකාශ කිරීම ගැන. පංච ශීලය ගැන, අෂ්ට ශීලය ගැන, දස ශීලය ගැන, කෝටියක් සංවර ශීලය ගැන හොඳට දැනගෙන හිටියත්, පන්සිල්වල තිබෙන "මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි" කියන සිල් පදයේ අර්ථය එතුමා දන්නවාද කියන එක ගැන මට ගැටලුවක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, එතුමා ප්‍රකාශ කළා අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන තැනැත්තියගේ පියා එදා "ලග්ගලින් විජය දිනවමු" කියලා බැනරයක් ප්‍රදර්ශනය කළ 8දෙනෙක් ඝාතනය කළා කියලා. මගේ අප්පච්චිට පක්ෂව බැනර් එකක් දමපු 8දෙනෙක් ඝාතනය කරන්න - එහෙම නම් මගේ අප්පච්චිට තිබිලා තිබෙනවා, මානසික රෝගයක්. මම කනගාටු වෙනවා, මෙතුමා වාගේ සිල්වත් විය යුතු කෙනෙක්, -මොකද, එහෙම පරිවයක් තිබෙන නිසා-, ගුරුවරයකු හැටියට සේවය කරපු කෙනෙක්, සමාජය යහමගට යවන කෙනෙක් මේ විධියේ පට්ටපල් බොරුවක් ප්‍රකාශ කරන්න පෙලඹීම ගැන.

මේක සමාජ මාධ්‍යයට මුලින්ම දමා තිබුණේ කෝට්ටේ මඩ බලකාය. කෝට්ටේ මඩ බලකාය හදපු දෙයක් තමයි මෙතුමා ගෙඩිය පිටින් මෙතැන ප්‍රකාශ කළේ. ඊයේ මේක ප්‍රචාරය වන වෙලාවේ මම හිටියේ මාතලේ නගරයේ. එතකොට මා වට කරගත් කණ්ඩායම් කිව්වා, මන්ත්‍රීතුමිය, ඔය කථා කරන අය කනංගමුවේ රජයේ රියැදුරෙකු හැටියට කටයුතු කළ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමනසේන ඇතුළු 8දෙනෙක් නම් එක තැන මැරුවා කියලා.

ඒ වාගේම ඒ ගෙදර තිබුණු වටිනා කියන සියලු දේවල් කොල්ල කෑවා කිව්වා. ලග්ගල කොතැනකවත් 8දෙනෙක් ඝාතනය කළා කියලා අපි දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට මාසයක් කල් දෙනවා, ඔබතුමා ඔය කාරණය මෙතැනින් එළියට ඇවිල්ලා කියන්න. මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදවලට මුවා වෙලා එක එක්කෙනාට මඩ ගහන්න ඔබතුමා ලෑස්ති වෙන්න එපා.

ඒ ප්‍රකාශයේ තව තැනක තිබෙනවා, "තමන්ගේ තාත්තාගේ රියදුරු වුණු මාතලන්ට ..." කියලා. මගේ තාත්තා ශක්‍ර දෙයියෝද? ශක්‍ර දෙයියන්ගේ රියදුරා තමයි මාතලන්. මම ඔබතුමාට අභියෝග කරනවා. 1977දී තමයි මගේ අප්පච්චි පාර්ලිමේන්තුවට ආවේ. 1994 වෙනකල් හිටියා. එතුමා මේ රටේ මිනිස්සුන්ගේ ආදරය දිනා ගත්තා මිසක කවදාවත් පිරිහුණේ නැහැ. ගොවීන්ට විශ්‍රාම වැටුප ගෙනාවේ එතුමා. ගරු නාමල් කරුණාරත්න මැතිතුමනි, ඔබතුමාට දැන් ඔය ගොවි සංවිධාන එකතු කරගන්න පුළුවන්

වෙන්නේ, මගේ අප්පච්චි කෘෂිකර්ම රාජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ ගොවි සංවිධාන හදපු නිසා. 1977 ඉඳලා 1994 වෙනකල් මගේ අප්පච්චිගේ මන්ත්‍රී කාර්ය මණ්ඩලයේ හරි, ඇමති කාර්ය මණ්ඩලයේ හරි "මාතලන්" කියලා රියදුරෙක් හිටියා නම් මට පෙන්වන්න කියලා ඒ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම කියනවා. මම ඔබතුමාට කියනවා, මඩ ගහන දේශපාලනය අවසන් කරන්න. මොකද, මේ රටේ ජනතාව 68 ලක්ෂයක් ඡන්දය දීලා මේ පාර්ලිමේන්තුව සුද්ද කරනවා, මල් පැළ හිටවනවා කියලා ඔබතුමන්ලා ගෙනාවේ. හැබැයි, මේවා වල් පැළඳ කියලා අපට හිතෙනවා. මම ඔබතුමාට කියනවා, පුළුවන් නම් දළදා හාමුදුරුවන් ඉස්සරහට එන්න. එන්න වීර කැප්පෙටිපොළ පිළිරුව ඉස්සරහට. ඇවිල්ලා, පුළුවන් නම් ඔය කාරණය කියන්න. බැනරයක් ප්‍රසිද්ධ කළා කියලා, 1989 මැතිවරණයේදී බැනරයක් දැම්මා කියලා, ඒ බැනරය දාපු 8දෙනා ඝාතනය කළා කියලා ඔබතුමා කියනවා නම්, එන්න ඉස්සරහට. එළියට ගිහිල්ලා ඒ ගැන කථා කරන්න.

ගරු කථානායකතුමනි, මට ඇහුණා, මැයි මාසය කිට්ටු කරලා උතුම් දළදා වහන්සේ ප්‍රදර්ශන මංගල්‍යයක් පවත්වන්න යනවා කියනවා. අනේ සාදු, සාදු! ඒක ඉතාම හොඳයි.

ගරු කථානායකතුමනි, මම කියන්න ඕනෑ දළදා වහන්සේට බෝම්බ තියන්න ගියේ, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
නැහැ, නැහැ, ඉන්න. මම මේක පැහැදිලි කරන්න අවශ්‍යයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
නැහැ, නැහැ. කථා කරන්න දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කථා කරන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම කථා කරනවා, ගරු කථානායකතුමනි. ඔබතුමා අහගෙන ඉන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම කරන්න. අදාළ පෞද්ගලික පැහැදිලි කිරීම කරන්නකෝ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මාතලේ ගංගා, නිලන්ති, වීරසිංහ, නදීකා, මංගලිකා කියන අය. දිනය මම කියන්නම් අහගන්න. 1989 පෙබරවාරි 08. මහනුවර මුර පොළවල් පහකට ගැහුවා. T56 81යි, රයිෆල් තුවක්කු 9ක්. ගරු කථානායකතුමනි, මම ඔබතුමාට කියන්න ඕනෑ, අද මල්වතු පාර්ශ්වයේ හිටපු මහා නායක හාමුදුරුවෝ, අතිපූජ්‍ය සිරිමල්වත්තේ ආනන්ද මහානායක හිමියන් ජීවතුන් අතර හිටියා නම්, උන් වහන්සේ මේවාට සාක්ෂි දරයි. අද ඒ ගැන මාතලේ අය කියනවා. ඒ බෝම්බ ගහන්න සිවුර අස්සේ හංගා ගෙන ආයුධ ගෙනිච්චේ කවුද කියලා මම මේ ගරු සභාවෙන් අහනවා. එහෙම ඉතිහාසයක් තියාගෙන, බුද්ධ ශාසනයත් විකුණාගෙන, මේ විධියට හැසිරෙන එක ගැන මම කනගාටු වෙනවා.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමියත් මේ අවස්ථාවේ සභාවේ හිටියා නම් හොඳයි. එතුමිය කොතැනක හරි ඉඳගෙන මේ කථාව අහගෙන ඇති. මේ බුද්ධ ශාසන නියෝජ්‍ය ඇමතිතුමා තියාගෙන දළදා ප්‍රදර්ශනය පවත්වනවා නම්, වැල් බෝධිය යටින් නම් යන්න එපා, නාථ දේවාලය ඉස්සරහින් යන්නත් එපා, පත්තිනි දේවාලය ඉස්සරහින් යන්නත් එපා කියලා මම කියනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
පොඩ්ඩක් ඉන්න, ගරු කථානායකතුමනි. ඔබතුමා අහගන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම කරන්නකෝ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මොකද, මේකෙන් වුණේ මගේ පවුලට හානියක්. ගරු කථානායකතුමනි, ඒ වාගේම ඔබතුමා අහගන්න. මේ, මිය ගිය කෙනෙක්. මගේ පියාට ඇවිල්ලා මේකට උත්තර දෙන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම කරන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණී කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ගැන කථා කරන්න. මගේ පියා ගැන කථා කරනවා නම්, එතුමා වෙනුවෙන් ඒක නිවැරැදි කරන්න හෝ එතුමා වෙනුවෙන් කරුණු දක්වන්න හෝ මට අයිතියක් තිබෙනවා. ඊළඟට මම කියන්න ඕනෑ, එදා ගරු අමරකීර්ති අතුකෝරළ මැතිතුමා ඝාතනය වුණේත්, සාමකාමී අරගළය මෙවැනි ප්‍රකාශවලින් ආවේගශීලී, එහෙම නැත්නම් ප්‍රචණ්ඩත්වයට ගෙන ගිය නිසා කියන එක. අද

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකත්‍රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

කරන්න හදන්නේත්, මේ පාර්ලිමේන්තුවේ සිටින මා ඇතුළු සියලු කණ්ඩායම මහ මහදී මරා දමන තැනට මේ රටේ ප්‍රචණ්ඩත්වය ගෙනයන එකයි. ඒ නිසා ඒක කරන්න දෙන්න එපා. මේ වල් පැළඳ, මල් පැළඳ කියලා අපිට අහන්න වෙනවා.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ගරු නලින් හේවාගේ නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන හිටියා නම් හොඳයි. මම මේ කාරණය ගැනත් කියන්න ඕනෑ. එතුමා එදා ප්‍රකාශයක් කළා, මම පත්තරේ දාලා නම වෙනස් කරගෙන තිබෙනවා කියලා. මට මගේ දෙමව්පියන් දීපු ලස්සන නමක් තිබෙනවා. ඒ නම වෙනස් වුණේ, 1994 මැයි මාසයේ 27වැනි දා මහා ප්‍රසිද්ධියේ, එහෙම නැතුව පත්තරේ දාලා නොවෙයි.

ඒ නිසා මම එතුමාට කියනවා, තමන්ගේ පක්ෂයේ ළමාතැනීලත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක එහෙම විසඳා ගන්න, වෙන වෙන ළමාතැනීලත් එක්ක ප්‍රශ්න තිබෙනවා නම් ඒවාත් වෙනම විසඳා ගන්න කියලා. අපිව පළිහක් කර ගන්න එපා කියලා මම මේ අවස්ථාවේදී එතුමාට කියනවා. මම එතුමාට මේකත් කියන්න කැමතියි. මම අහපු ප්‍රශ්නයේ තිබෙන්නේ, ශක්‍යතා අධ්‍යයනයට කෝටි 10ක් වැය කරලා, මුළු කැලණිවැලි දුම්රිය මාර්ගයටම කෝටි 25ක් වෙන් කරපු එක සාධාරණයි ද කියන එකයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණි කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට පොඩ්ඩක් වෙලාව දෙන්න, ගරු කථානායකතුමනි. මම අවසන් කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) නළින්ත ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමියනි. ගරු කථානායකතුමනි, මෙහෙම සම්ප්‍රදායයක් නැහැ. අපි දැන් අවස්ථාවක් දීලා තිබෙනවා. හැබැයි, දැන් වටේ තිබෙන ඔක්කෝම කියාගෙන, කියාගෙන යනවා. ඔබතුමා මේ මන්ත්‍රීතුමියගේ නමවත් කියන්නේ නැතිව කරපු කථාවක් වෙනුවෙන් යම් අවස්ථාවක් දීලා තිබෙනවා. ඒක අවභාවිත කරනවා. මෙහෙම කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමියනි. මෙහෙම වුණොත් හැමෝම මේ විධියට කථා කරන්න පටන් ගනීවි. ගරු කථානායකතුමනි, එතුමියට පුළුවන් වෙලාව ඉල්ලා ගෙන කථාවක් කරන්න. නමුත්, මතක තියා ගන්න. *[බාධා කිරීමක්]* ඔබතුමිය වෙනුවෙන් ඒ කථාවේ එම කොටස ඉවත් කර ගන්න කියලා අපි කිව්වා. ඒක නිසා මෙහෙම යන්න දෙන්න එපා, ගරු කථානායකතුමනි. ඔබතුමියට තිබෙන අවස්ථාව පාවිච්චි කරලා මේ හතර වටේටම මඩ ගහන්න දෙන්න බැහැ නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් අවසන් කරන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණි කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. නලින් හේවගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා ගොඩින් එනවා නම් ගොඩින් එන්න, විවාදයකදී කරුණු ඉදිරිපත් කළාම ඒක බිඳින්න ඕනෑ නම් ඒ විධියට එන්න. මා වෙනුවෙන් පෙනී හිටපු ගරු විපක්ෂ නායකතුමාට, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට, ගරු අගමැතිතුමියට, ගරු කෞෂල්‍යා ආරියරත්න මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, කථාව අවසන් කරන්න.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) රෝහිණි කුමාරි විජේරත්න)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. මම නම වෙනස් කර ගත්තේ නැහැ, ගරු කථානායකතුමනි. නම වෙනස් කර ගත්ත අය මෙතැන ඇති. එතුමාත් නම වෙනස් කර ගත්ත කෙනෙක්. මට අදාළ නැහැ. ඔය ගොල්ලන්ගේ ජනාධිපතිතුමාත් නම වෙනස් කර ගත්තා. "අරවින්ද දිසානායක", අනුර කුමාර දිසානායක වුණා. අපිට ඒවා අදාළ නැහැ. හැබැයි, මම එකක් කියනවා. නලින් හේවගේ නියෝජ්‍ය ඇමතිතුමනි, එක දෙයක් කරන්න. ප්‍රසිද්ධියේ තමන්ගේ අත් දෙක උස්සලා දඹර ඇඟිලි දෙක පෙන්වන්න. දඹර ඇඟිල්ලේ පුරුකක් අඩු වුණේ ඇයි කියන එක මැදවච්චියේ බිංදුසාර මහත්තයාගෙන් අහන්න. දැන් එයා ගුරුවරයෙක්.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, මෙතුමිය සම්බන්ධව කිසිම තැනක මම නමක් සඳහන් කරලා නැහැ.

ඊයේ දිනයේ මා මෙම පාර්ලිමේන්තුවේ කළ ප්‍රකාශය හරියට අධ්‍යයනය කළොත්, තේරුම් ගන්න පුළුවන්. කිසිම කෙනෙකුගේ නමක් සඳහන් නොකර තමයි මම ඒ අදාළ විවේචනය ඉදිරිපත් කළේ. මේ විවේචනය එතුමිය ගන්නේ එතුමියට ඒක අදාළ නිසා.

ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ සිද්ධ වෙච්ච සිදුවීම් පිළිබඳව නොයෙකුත් ආකාරයේ සංවාද මේ තුළ ඇති වෙලා තිබෙනවා. දැන් ඒ සංවාදය තමන්ගේ කර ගනිමින් මේ කරුණු ඉදිරිපත් කරන්නේ තමන්ට ඒක අදාළ වන නිසා. අපේ ජනප්‍රවාදයේ කථාවක් තිබෙනවා, ගලේ පහරපු බළලුන්ට ඇති වෙච්ච තත්ත්වයක් ගැන. එහෙම තත්ත්වයක් තමයි දැන් උදා වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ කාරණය පිළිබඳව දීර්ඝ වශයෙන් මා කරුණු කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය දැන් නිශ්චිතව සඳහන් කරපු කාරණා ඇතුළත් කරපු වාර්තා ගොනුවක් මා ළඟ තිබෙනවා. පසුගිය කාලය තුළ සිද්ධ කරපු ඝාතන සිද්ධීන් ගණනාවක් පිළිබඳව. මම මේ වෙලාවේ ඔබතුමාගේ අවධානය ඇතුව ඉතාම කෙටියෙන් මේ කාරණය කියන්නම්, ගරු කථානායකතුමනි. පසුගිය කාලයට අදාළව සිද්ධ වෙච්ච ඝාතනවල වැඩිම සමූහ මිනීවල මතු වුණේ මාතලේ දිස්ත්‍රික්කයෙන්. 143දෙනෙක් ඝාතනය කරලා මාතලේ දිස්ත්‍රික්කයේ සමූහ මිනීවලෙන් මතු වුණා. අපි අද ඒ සම්බන්ධයෙන් උසාවි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා; අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. *[බාධා කිරීම්]* ඒ ක්‍රියාමාර්ග හෙට දවසේ හෙළිදරව් වෙනකොට කයිකාවල මංසන්ධියේ මැරුවේ කවුද, ඉලුක්කුඹුර බොරලු වලේ මැරුවේ කවුද, නාවුල අඹවත්ත වදකාගාරයේ තරුණයන් මැරුවේ කවුද, 142දෙනෙක් මරා

මාතලේ සමූහ මිනී වළේ දමන්න කටයුතු කළේ කවුද කියන එක අපට අධිකරණ ක්‍රියාමාර්ග හරහා තේරුම් ගන්න පුළුවන් වෙයි. මම මීට වඩා කාලයක් ගැනීමට බලාපොරොත්තු වන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

මේ සියලු කාරණා පාර්ලිමේන්තුව ඇතුළේදී වාගේම පාර්ලිමේන්තුවෙන් පිටතදීත් හමු වෙලා අපි බෙරා ගනිමු. අපි ඒ සියල්ලට සූදානම්. *[බාධා කිරීම්]* පාර්ලිමේන්තුව ඇතුළේ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවෙන් එළියෙත් මේක බෙරගන්න පුළුවන්. තමුන්නාන්සේ යෝජනා කළා, මාලිගාව ඉස්සරහා විවාද කරමු කියලා. මාලිගාව ඉස්සරහ නොවෙයි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ Alwis Pond එක ඉස්සරහා, අර මිනී ඔළු ගහලා තිබිච්ච අල්විස් වට රවුමේ ඉඳලා අපි මේ ගැන විවාද කරමු. අපි ඒකට සූදානම්. *[බාධා කිරීම්]*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, එතුමිය point of Order එකක් ඉල්ලනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වරප්‍රසාද ප්‍රශ්ණය ඉදිරිපත් කරන්න. - *[බාධා කිරීමක්]*

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එක අහන්න, ගරු කථානායකතුමා. *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්ණය, - *[බාධා කිරීමක්]* ගරු රෝහිණී විජේරත්න මන්ත්‍රීතුමිය, කරුණාකර වාඩි වෙන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, මම Standing Order එක කියවා බැලුවා. කවුරු හරි මන්ත්‍රීවරයෙක් point of Order එකක් ඉල්ලුවොත්, ඒක අහන්න ඔබතුමාට අයිතිය තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඔබතුමා point of Order එක අහන්න. නැත්නම් Standing Order එක කියවන්න.*[බාධා කිරීමක්]* මට කථා කරන්න අවස්ථාව දෙන්නකෝ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, මේ සභාව මෙහෙයවන්නේ මම. ඔබතුමා නොවෙයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හොඳයි, මම ලිඛිතව දීලා තිබෙන එක කියවන්නම්. මට කියවන්න ඉඩ දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, point of Order එකට අවස්ථාව ඉල්ලලා ඒක පාවිච්චි කරන්න යන්නේ මොකටද කියලා ඔබතුමාට තේරෙනවා නේ. ඒ සම්බන්ධයෙන් authority එක තිබෙන්නේ ඔබතුමාට. ඒ නිසා රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියන්න. මේ සභාවේදී මීට වඩා ඒ විවාදය අවශ්‍ය නැහැ. එළියේදී පුළුවන් නේ විවාද කරන්න. එළියේදී විවාද කර ගනිමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. You present your written matter of Privilege now.

වරප්‍රසාද: ආරක්ෂාවට තර්ජන එල්ල වීම
சிறப்புரிமை : பாதுகாப்புக்கு அச்சுறுத்தல்
PRIVILEGE: THREAT TO SECURITY

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, I know that you are stressed and I do not want to make you more stressed after this. So, I will read out the Question of Privilege submitted in writing.

I, Dr. Ramanathan Archchuna, Member of Parliament and the Leader of Independent Group 17, being the sole Representative of my party in Parliament, wrote to you formally to request for an opportunity to raise a Privilege issue in the House on 22nd February, 2025 regarding a serious incident that poses a direct threat to my safety and security.

On the night of 12th February, 2025, approximately at 10.25 p.m. while being in Valampuri Hotel, I was physically assaulted by two known individuals. In the same incident, my personal legal secretary, Miss Kowshalya Narendran, was also attacked. Immediately following the attack, I reported the matter to the police via the Emergency Hotline 119 and personally lodged a complaint at the Jaffna Police Station. The police conducted an inquiry, leading to the arrest of the suspects. However, in an unexpected turn of events, a case was filed against me for self-defence, which was wrongly interpreted by the authorities. Subsequently, complaints from both sides were withdrawn.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්වියුනා මහතා]

This incident is of grave concern as it directly impacts on my right to function as a Member of Parliament without fear for my life. As you are well aware, the recent murder of Mr. Ganemulle Sanjeewa within the courts and the continuous killings that have occurred in the past week have heightened my concern regarding every Member's personal security, including mine. Given the current security situation and the threat I have experienced, I respectfully urged you to allow me to raise this Privilege issue in Parliament on 22nd February, 2025 and I thank you for the opportunity given at least after three days.

In light of these circumstances, I also request that two security personnel be assigned to me at the earliest to ensure my safety. Additionally, I kindly ask that this request be forwarded to the Hon. Minister in charge of police and public security for immediate action.

I appreciate your kind consideration of this request and look forward to your positive response after facilitating my right to bring this urgent matter before the House.

I do not want to make you more stressed, Sir.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට කටයුතු කරන්නම්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, ගමගෙදර දිසානායක මන්ත්‍රීතුමා නැවත වතාවකුත් කළේ, මට මඩ ගැසීමක්. ඒ නිසා මම ඔබතුමාට කියනවා, මේ පාර්ලිමේන්තුව මේ වාගේ දේවල්වලට නම්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, එතැන point of Order එකක් නැහැ. කරුණාකරලා ඉඳගන්න.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේ දී යෝජනා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල හා 2025 පෙබරවාරි 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

විසර්ජන පනත් කෙටුම්පත 2025, දෙවන වර කියවීම. හත්වන වෙන් කළ දිනය.

විසර්ජන පනත් කෙටුම්පත, 2025
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2025
APPROPRIATION BILL, 2025

කල් තබන ලද විවාදය නවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.
ඊට අදාළ ප්‍රශ්නය - [පෙබරවාරි 17]
"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]
ප්‍රශ්නය යළින් සභාභිමුඛ කරන ලදී.

ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.
சம்பந்தப்பட்ட வினா - [பெப்ருவரி 17]
"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" .- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.

Order read for resuming Adjourned Debate on Question - [17th February]
"That the Bill be now read a Second time". - [The Hon. Anura Kumara Dissanayake]
Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. R.M. Ranjith Madduma Bandara to start the Debate. You have 20 minutes.

[පූ.භා. 10.39]

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, වසර 76ක ඉතිහාසය ගැන වැරදි කියලා තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. අපි දන්නවා, මේ රටේ ඉතිහාසයේ ප්‍රථම වරට සමාජවාදී පක්ෂයක් -වාමාංශික කඳවුර- තනිවම බලයට පත්වෙලා තිබෙන බව. මීට ඉස්සරවෙලා අපි දැක්කා, වාමාංශික පක්ෂ එක්කහු කරගෙන මේ රටේ බලය පිහිටුවපු ආණ්ඩු තිබුණු ආකාරය; ඒ අයගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වුණු ආකාරය. අපි අහලා තිබෙනවා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව සංවෘත ආර්ථිකයක් එක්ක සමාජවාදී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරපු ආණ්ඩුවක් කියලා. ඒ ආණ්ඩුවේ පාලකයින්ට කොන්දක් තිබුණා, කිසිම භයක් නැතුව ඔවුන්ගේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න. ඊට පස්සේ 1977දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා මේ රටේ system change එකක් කළා.

එතුමා වෙළෙඳ පොළ ආර්ථිකයත් එක්ක; විවෘත ආර්ථිකයත් එක්ක මේ රට ගෙනියන්න ඕනෑය කියලා, නොයෙක් විරෝධතා මැද්දේ මේ රට දියුණු ආර්ථිකයකට ගෙනියන්න කටයුතු කළා. පසුගිය ආණ්ඩු සියල්ලම එතුමාගේ ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළා. නමුත් ජනතා විමුක්ති පෙරමුණ; NPP එක බලයට ආවේ, 76 වසරක ආර්ථික ප්‍රතිපත්තිය හොඳ නැහැ, අලුත් දෙයක් ගේනවා, system එක change කරනවා කියලායි. මම හිතනවා, ඒ කියපු සියල්ල අද වන විට වෙනස් වෙලා තිබෙනවා කියලා. මෙතුමන්ලාම තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව හොඳ නැහැ කියලා 1971දී කැරැල්ලක් ගෙනාවේ, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව හොඳ නැහැ කියලා 1988-1989 කාලයේදී කැරැල්ලක් ගෙනාවේ. නමුත් අද වන විට අතීතයේ කථා කරපු දේවල් වෙනස් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා පෞද්ගලීකරණයට විරුද්ධ වෙලා හිටියේ, විදේශීය ආයෝජනවලට විරුද්ධ වෙලා හිටියේ. මම හිතන විධියට අද system එක නොවෙයි change වෙලා තිබෙන්නේ, තමුන්නාන්සේලාගේ ඇතුළේ system එක. තමුන්නාන්සේලා පෞද්ගලික විශ්වවිද්‍යාලවලට විරුද්ධ වුණා. උතුරු කොළඹ වෛද්‍ය පීඨයට විරුද්ධ වෙච්ච අය දැන් කියනවා, මේ රටේ තරුණයෝ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යන්න ඕනෑය කියලා. සයිටම් එකත්, නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහලත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකට අනුබද්ධ කරනවාට විරුද්ධ වෙච්ච අය අද කියනවා, පෞද්ගලික විශ්වවිද්‍යාල මේ රටේ ආරම්භ කරන්න ඕනෑය කියලා. බලන්න, තමුන්නාන්සේලා මේ තත්ත්වයට දැන් පත් වෙලා තිබෙන ආකාරය.

තමුන්නාන්සේලා කථා කළා, ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික ඉන්දියාවට දෙන්න එපා කියලා තමුන්නාන්සේලා එදා කිව්වා. නමුත්, අද කිසිම ලජ්ජාවක් නැතුව වචනයක් වෙනස් කරන්නේ නැතුව ඒ පරණ ආණ්ඩුවල දේවල් ක්‍රියාත්මක කරනවා. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා හම්බන්තොට වරාය ගැන කථා කළා. අද ප්‍රධාන දෙයක් තමයි, හම්බන්තොට වරායේ තෙල් පිරිපහදුව. මේ ආණ්ඩුවේ කාලය දැන් දින 150ත් ඉක්මවලා තිබෙන්නේ; මාස 5ත් ඉක්මවලා තිබෙන්නේ. මොකක්ද, තමුන්නාන්සේලා IMF ගිවිසුම ගැන කිව්වේ? IMF ගිවිසුම ගැන කිව්වේ මෙකයි. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, "දුප්පත් හා අසරණභාවයට පත්කොට ඇති ජනතාව එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා වඩාත් ශක්තිමත්, නිවැරදි වැඩ පිළිවෙළක අඩංගුව හා එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ නැවත සාකච්ඡා කිරීම..." කියලා. මේක තිබෙන්නේ ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ. මේ ආණ්ඩුව නියෝජනය කරන ඔබතුමන්ලාගෙන් අපි අහනවා, IMF ගිවිසුමේ වචනයක්වත්, අකුරක්වත් වෙනස් කරලා තිබෙනවාද කියලා.

එහෙම නම්, මේ රටේ ජනතාවගෙන් ගත් බලය අනුව ඒ ප්‍රතිපත්ති වෙනස් කරලා ආණ්ඩුව ක්‍රියාත්මක කරන්න. එහෙම නොවන නිසායි අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්නේ, ගරු කථානායකතුමනි.

අපට කිව්වා, රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරනවා කියලා. මැතිවරණයට ඉස්සෙල්ලා කිව්වේ, සොච්චමක් වැඩි කරලා වැඩක් නැහැ, රුපියල් 20,000කින්, 25,000කින් වැටුප් වැඩි කරන්න ඕනෑය කියලායි. පසුගිය ආණ්ඩුව රුපියල් 25,000ක් වැටුප් වැඩි කරන්න ඕනෑය කියලා කියනකොට මේ අය කිව්වා, ඔවුන් එතැනින් නවතින්නේ නැහැ, මාස හයෙන් හයට වැටුප් වැඩි කරනවා කියලා. අය වැයේ ප්‍රධාන දෙයක් තමයි, වැටුප් වැඩි කිරීම. මේ අය කියනවා, රුපියල් 15,750ක් මූලික වැටුපට එක්කහු කරනවා කියලා. අපි අහනවා, ආණ්ඩුවට ලජ්ජාවක් තිබෙනවාද කියලා. මොකද, ඉස්සෙල්ලා දුන් රුපියල් 7,500ක දීමනාවත් මේ මූලික වැටුපට එක්කහු කර තිබෙනවා. එතකොට රුපියල් 8,250ක් දෙනවා කිව්වාට, ඒ රුපියල් 8,250ත් අවුරුදු 3කදී තමයි වැටුපට එකතු කරන්නේ. මේ අවුරුද්දේ එකතු කරන්නේ රුපියල් 5,975යි. පසුගිය රනිල් වික්‍රමසිංහ-රාජපක්ෂ ආණ්ඩුව මාර්තු මාසය වනකල් රුපියල් 5,000ක් දුන්නා. ඒ රුපියල් 5,000 නැතිව ගත්තොත්, රුපියල් 975යි වැඩි වෙලා තිබෙන්නේ. ජනාධිපතිතුමා 2015දී වූ වැටුප් වැඩි වීම ගැන මේ සභාවේදී කිව්වා. අපි කියනවා, මේ රටේ වැඩිම වැටුප් වැඩි වීම වුණේ යහ පාලන ආණ්ඩුවෙන් කියලා. යහ පාලන ආණ්ඩුව කාලයේ හැම රජයේ සේවකයෙකුගේම වැටුප අවම වශයෙන් සියයට 107කින් වැඩි වුණා. කාර්යාල කාර්ය සහායක සේවකයෙකුගේ රුපියල් 11,730ක මූලික වැටුප රුපියල් 24,250ක් වුණා. සංවර්ධන නිලධාරියෙකුගේ රුපියල් 15,250ක මූලික වැටුප රුපියල් 31,490ක් වුණා. හෙද සේවයේ රුපියල් 15,000ක මූලික වැටුප රුපියල් 32,000ක් වුණා. වෛද්‍ය සේවයේ ආරම්භක ශ්‍රේණියේ රුපියල් 25,000ක මූලික වැටුප රුපියල් 47,000ක් වුණා. අපේ ආණ්ඩුව යටතේ වැටුප් වැඩි කළාම මූලික වැටුප රුපියල් 60,000ක් ගත් පරිපාලන සේවයේ නිලධාරියෙක් මට ඇවිල්ලා කිව්වා, ඔහු දැන් රුපියල් 130,000ක් ගන්නවා කියලා. අපි එහෙමයි වැටුප් වැඩි කළේ. තමුන්නාන්සේලා අද රුපියල් 5,975ක් දෙනවා කිව්වාට රනිල් වික්‍රමසිංහ මහත්මයා දුන් රුපියල් 5,000ත් අඩු කළාම රුපියල් 975යි වැඩි වෙලා තිබෙන්නේ. අපි දන්නේ නැහැ, මේක කොහොමද වැඩි වෙන්නේ කියලා. ජනාධිපතිතුමා කියපු කථාවයි අපි මේ කියන්නේ. ගුරුවරුන්ට මොනවාද කිව්වේ?

ඒ විතරක් නොවෙයි. මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ ගරු සභාවේ ඉන්නවා, මහාචාර්යවරු, ආචාර්යවරු, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරු. අපේ යහ පාලන ආණ්ඩුව යටතේ අපි එකට තුනක් ලෙස ඔවුන්ගේ වැටුප වැඩි කළා. ඒ අනුව රුපියල් 150,000ක වැටුපක් ගත් කෙනෙකු රුපියල් 450,000ක වැටුපක් ගත්තා.

මේ රටේ අධිකරණ සේවයේ නිලධාරින්ගේ වැටුප එකට තුනකින් වැඩි කළා. ආණ්ඩුවේ විශාල පිරිසක් වැටුප් වැඩිවීම ගැන මහ ලොකුවට කථා කරනවා මම දැක්කා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? මට මතකයි, අපි බලයට එනකොට පොලීසියේ රාළහාමි කෙනෙක් වැටුප විධියට ගත්තේ රුපියල් 23,000යි. අපි එය රුපියල් 58,000 දක්වා වැඩි කළා. හැබැයි, පොලිස් නිලධාරින් පැය අටේ සේවයේ නොවෙයි යෙදෙන්නේ. ඔවුන් දවසකට පැය 16ක්, සමහර වෙලාවට පැය 18ක් වැඩ කරනවා. ඒ අයගේ වැටුපෙන් සියයට 40ක දීමනාවක් අපි ඔවුන්ට ලබා දුන්නා.

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

තමුන්නාන්සේලා මේ අය වැයෙන් මොකක්ද කරලා තිබෙන්නේ? ඒ සියයට 40 දීමනාව සියයට 22 වනතුරු අඩු කරලා තිබෙනවා. එක පැත්තකින් සොච්චමක් වැඩි කරනකොට අනෙක් පැත්තෙන් දීමනාව අඩු කරලා තිබෙනවා.

විශ්වවිද්‍යාල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුට සියයට 209ක විශේෂ දීමනාවක් දුන්නා. එය සියයට 112 දක්වා අඩු කරලා තිබෙනවා. මෙන්න, තමුන්නාන්සේලාගේ වැටුප් අඩු කිරීම. මේ පාර්ලිමේන්තුවේ සේවකයින්ට වැටුපට අමතරව තුනෙන් එකක දීමනාවක් දුන්නා. තමුන්නාන්සේලා අද ඒක හතරෙන් එක දක්වා අඩු කරලා තිබෙනවා. මේකද, වැටුප් වැඩි කිරීම? පාර්ලිමේන්තු සේවකයින්ගේ දීමනාව හතරෙන් එකක් දක්වා අඩු කරලා තිබෙනවා. ඒ වාගේම, දීමනා සියල්ල එක එක විධියට අඩු කරලා, වැටුපට සොච්චම් මුදලක් වැඩි කරලා තිබෙනවා.

මේ රටේ රජයේ සේවකයෝ බලාගෙන ඉන්නේ අප්‍රේල් මාසයේ වැටුප හැටියට අතට කීයක් එනවාද කියායි. එදාට තේරෙයි, මේ ආණ්ඩුවේ තරම. මූලික වැටුපට රුපියල් 15,000ක් වැඩි කරනවා කිව්වත්, පරණ දීමනාවක් විධියට තිබුණු රුපියල් 7,500ත් මූලික වැටුපට එකතු කරලා තමයි මේක හදලා තිබෙන්නේ. අපි කියනවා, මේ රටේ ජනතාවට ඇත්ත කියන්න කියලා. ඔවුන්ට මේ තත්ත්වය තේරෙයි. හැබැයි, එක දෙයක් නම් කරලා තිබෙනවා. 2016 ඉඳලා 2020 වනතුරු විශ්‍රාම ගිය අයට 03/2016 චක්‍රලේඛය අනුව 2020 වැටුප් පාදක කරගෙන තමයි විශ්‍රාම වැටුප ගෙවන්න ඕනෑ. මට මතකයි, මම එදා රාජ්‍ය පරිපාලන ඇමතිවරයා විධියට කටයුතු කරනකොට මේ සඳහා කැබිනට් තීන්දුවකුත් අරගෙන චක්‍රලේඛයකුත් නිකුත් කරලායි තිබුණේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට ඇවිල්ලා ඒ නියෝගය අත්හිටෙව්වා. මේ ආණ්ඩුව අද ඒක දීලා තිබෙනවා. ඒ ගැන මම සන්තෝෂ වෙනවා. ඒක අපි කරපු යෝජනාවක්. 2016 ඉඳලා 2020 වනතුරු විශ්‍රාම ගිය අය වෙනුවෙන් අපි යෝජනා කරපු විශ්‍රාම වැටුප තමුන්නාන්සේලා ලබා දීලා තිබෙනවා.

ඊළඟ එක තමයි, ගොවීන්ට තිබෙන ප්‍රශ්න. මේ ගරු සභාවේදී ගොවීන් ගැන කථා කළා; වී මිල ගැන කථා කළා; ඒ වාගේම පොහොර සහනාධාරය ගැනත් කථා කළා.

තමුන්නාන්සේලා පොහොර සහනාධාරයට වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 36යි. මට මතකයි, අපි ආණ්ඩු කරද්දීත් මේ රුපියල් බිලියන 36ම වෙන් කළා. ඊට ඉස්සෙල්ලා පැවති ආණ්ඩුවෙනුත් මේ රුපියල් බිලියන 36ම වෙන් කළා. කෘෂිකර්ම ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. නමුත්, කාටද අද පොහොර සහනාධාරය දෙන්නේ? වී ගොවීන්ට විතරයි. බඩ ඉරිඟු ගොවීන්ට නැහැ; එළවලු ගොවීන්ට නැහැ; උක් ගස් වවන ගොවීන්ට නැහැ; රතු ලූනු වවන අයට නැහැ; තේවලට, රබර්වලට, පොල්වලට, අර්තාපල්වලට මේ පොහොර සහනාධාරය නැහැ. මට මතකයි, යහ පාලන ආණ්ඩුව යටතේ අපි මේ රටේ හැම ගොවියෙකුටම රුපියල් 1,500ට පොහොර මිටියක් ගන්න පුළුවන් වන විධියට පොහොර සහනාධාරය දුන්නා. ඒ එක්කම අපනයන භෝග සඳහා - ගම්මිරිස්, කුරුඳු, සාදික්කාවලටත් - තමුන්නාන්සේලාගේ අය වැයෙන් පොහොර සහනාධාරය ලබා දෙන බවට යෝජනාවක් නැහැ. එහෙම නම්, මේ රටේ ගොවීන්ගෙන් සියයට 50කට වැඩි පිරිසකට පොහොර සහනාධාරය ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපි මේ අය වැයට විරුද්ධ වෙන්නේ; මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්නේ.

දැන් මේ සභාවේ ඉන්නවා, කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය ඇමතිතුමා. එතුමා එදා වෘත්තීය සමිති ව්‍යාපාර නායකයෙක්; අපේ හොඳ මිත්‍රයෙක්. එදා එතුමන්ලා කිව්වේ වී කිලෝවක් රුපියල් 152ට ගන්නවා කියායි. අද වී කිලෝවක් ගන්නේ රුපියල් 115ට. තමුන්නාන්සේලා කිව්වා, "මේ රටේ මෝල් හිමියන්ට අපි ඒකාධිකාරයක් පවත්වාගෙන යන්න දෙන්නේ නැහැ, අපි සියයට 10ක වී සංචිතයක් තියා ගන්නවා" කියලා. සියයට 10ක් කියන්නේ මහ කන්නයේ අස්වැන්නෙන් ටොන් ලක්ෂ 3ක් විතර. ටොන් ලක්ෂ 30ක්, 35ක් විතර නේ අස්වැන්න හම්බ වෙන්නේ. තමුන්නාන්සේලා ඒ වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 5යි. ඒකෙන් ටොන් 40,000 ගන්න පුළුවන්. මම හිතන විධියට මේ සැරේ ගොවි ජනතාව තමුන්නාන්සේලාට වී දෙන්නේත් නැහැ. වී අළෙවි මණ්ඩලයට වී ගන්න මුදලුත් නැහැ. රුපියල් බිලියන 5කින් ගන්න පුළුවන් ටොන් 40,000යි. ඒක දවස් කීයකටද? මම තමුන්නාන්සේලාට කියනවා, නැවත මේ රටේ සහල් මෝල් හිමියන්ගේ ඒකාධිකාරයට අනුව සහල් මිල පාලනය කරන්න වෙයි කියලා. මම අහනවා, කොහේද මේ සංචිත එක්කහු කරලා තිබෙන්නේ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගොවියා ගැන කථා කරමින් හිටියේ. දැන් පොල් මිල අහස උසට නැඟලා; හාල් මිල, බඩු මිල සියල්ල අහස උසට නැඟලා. තමුන්නාන්සේලා බලයට එද්දී කිව්වේ මොකක්ද? තමුන්නාන්සේලා කිව්වා, අපි බලයට ආපු වහාම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල VAT එක සියයට 10ට අඩු කරලා, බඩු ලාභයට දෙනවා කියලා. අද වෙනකොට හැම බඩුවකම මිල වැඩි වෙලා. අපි රජයෙන් අහනවා, සියයට 10 VAT එක ඇයි අඩු කරන්නේ නැත්තේ කියලා. තමුන්නාන්සේලා ඒ පොරොන්දුව ඉෂ්ට කරන්නේ නැති නිසා තමයි අද අපේ රටේ ජනතාව වෙනුවෙන් අපි මේ අය වැයට විරුද්ධත්වය ප්‍රකාශ කරන්නේ.

පාසල් ළමයින්ගේ අධ්‍යාපනයට මෙවර අය වැයෙන් වැඩියෙන් මුදල් වෙන් කරලා තිබෙනවා ලු. හැබැයි, අධ්‍යාපනයට වැඩියෙන් මුදල් වෙන් කරද්දී අනෙක් පැත්තෙන් පාසල් පොත්වලට සියයට 18ක VAT එකක් ගන්නවා. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, VAT එක අයින් කරනවා කියලා. තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා, ඒක අයින් කරන්න. මන්ත්‍රීවරයෙකු කථා කරනකොට කියනවා මම අහගෙන හිටියා, අපි අලුතින් බදු දැම්මේ නැහැ කියලා. හැබැයි, පරණ බදු ටික ඔක්කෝම ගන්නවා. ඔබතුමන්ලා බලයට ආවේ බදු අඩු කරනවාය කියායි. නමුත් ඒ පරණ බද්දෙන්ම තමයි පවත්වාගෙන යන්නේ.

අපි තමුන්නාන්සේලාගෙන් මේ කාරණයත් අහනවා. බෙහෙත්වලට තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙනුත් තවම සියයට 18ක VAT එකක් ගන්නවා. සෞඛ්‍ය ඇමතිතුමා කියනවා, "අපි සෞඛ්‍යයට වැඩියෙන් මුදල් වෙන් කරලා තිබෙනවා" කියලා. හැබැයි, අනෙක් පැත්තෙන් ලෙඩ්ඩු බෙහෙත් ගනිද්දී සියයට 18ක VAT එක ගන්නවා.

ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වා, අපි අලුත් අවුරුදු සමය වෙනුවෙන් බඩු මල්ලක් දෙන්න රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවාය කියලා. සාමාන්‍යයෙන් ආණ්ඩුවක් කරන්නේ මොකක්ද? අපි අතීතයේ දැකලා තිබෙනවා, ඒ සහන සිංහල - දෙමළ අලුත් අවුරුද්දට විතරක් නොවෙයි, මුළු අවුරුද්දටම ලබා දෙනවා; අවුරුද්ද පුරා ඒ සහනය දෙනවා. මේ රටේ ඉතිහාසයේ එහෙමයි කටයුතු කරලා තිබෙන්නේ.

2015දී අපේ යහ පාලන ආණ්ඩුව බලයට ආපු වෙලාවේ භාණ්ඩ 16කට රජයේ සහනාධාරය දීලා දිගටම ඒවායේ මිල අඩු කරලා තිබුණා. ඇයි, මේ සිංහල-දෙමළ අලුත් අවුරුද්දට විතරක් බඩු මල්ලක් දෙන්නේ? මේ අල්ලසක් දෙන්නේ. පළාත් පාලන මැතිවරණයෙන් ඡන්ද ටික ගන්න අලුත් අවුරුදු සමය වෙනුවෙන් බඩු මල්ලක් දෙන්න රුපියල් මිලියන 1,000ක් අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ, මැතිවරණය එන නිසා ඡන්ද ටික ගන්න. මම අහන්නේ මෙහෙමද ආණ්ඩුවක් කටයුතු කරන්නේ කියායි. පළාත් පාලන මැතිවරණය ඉස්සරහට තියාගෙන අල්ලසක් විධියට බඩු මල්ලක් දෙන්න යනවා. මේ බඩු මලු දෙද්දී, මේ මිල අඩු කරද්දී, මේ සහන දෙද්දී එය අවුරුද්ද පුරාම කරන්න කියලා අපි ආණ්ඩුවට කියනවා.

අනෙක් කාරණය තමයි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා දෙන පොලිය. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතුවලට රටේ පවතින පොලියට අමතරව සියයට පහක් එක්කහු කරනවා කියලා. නමුත් තමුන්නාන්සේලා සියයට තුනයි එක්කහු කරලා තිබෙන්නේ. දැන් බැංකු තැන්පතු පොලිය සියයට 8.5යි. එතකොට ඒ සියයට 11.5න් තමුන්නාන්සේලා සියයට 10ක රඳවා ගැනීමේ බද්දක් අය කරනවා. ඒ කියන්නේ, මේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ඔවුන්ගේ තැන්පතුවලට සියයට 10ක පොලියක් ලැබෙන්නේ. හැබැයි, අපේ ආණ්ඩුව තිබෙද්දී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සියයට 15ක පොලියක් දුන්නා. එහෙම නම් තමුන්නාන්සේලා ජනතාවට දුන්නු පොරොන්දු කඩ කරලා තිබෙනවා. ඒ අය ජීවත් වෙන්නේ ඒ තැන්පතුවලට ලැබෙන පොලියෙන්. අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ බෙහෙත් ටික ගනිද්දී සියයට 18ක VAT එකක් ගෙවන්න ඕනෑ. බැංකුවල රඳවා ගැනීමේ බද්ද - Withholding Tax එක - සියයට 10යි. හැබැයි, තමුන්නාන්සේලා කියනවා, බදු ගහන්නේ නැහැ කියලා. තමුන්නාන්සේලා මෙහෙමයි මේ රටේ ජනතාවට සලකන්නේ.

අපේ ගරු ඇමතිතුමන්ලා පැහැදිලිව කිව්වා, "වාරයේ තෙල් බාන ගණනට අපි තෙල් දෙනවා" කියලා. තමුන්නාන්සේලා දැනුත් පෙට්‍රල් ලීටරයකින් රුපියල් 110ක් බදු ගන්නවා. ඩීසල් ලීටරයකින් රුපියල් 75ක් බදු ගන්නවා. තමුන්නාන්සේලා Excise Duty එකක් කියලා ඩීසල්වලින් රුපියල් 50කත්, පෙට්‍රල්වලින් රුපියල් 70කත් විශේෂ බද්දක් අය කරනවා. ඇයි, ඒ බදු දැන් අඩු කරන්නේ නැත්තේ? අද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන ගණනින් ලාභ ලබනවා. එසේ ලාභ ලබද්දිත් තමුන්නාන්සේලා ජනතාවට දුන්න පොරොන්දු කඩ කරනවා.

ඒ විතරක් නොවෙයි, එදා තමුන්නාන්සේලා ජනතාවට දුන්න පොරොන්දු විශාල ප්‍රමාණයක් අද කඩ කරලා තිබෙනවා. මේ රටේ ජනතාව අවුරුදු 76ක්ම මේ රට පාලනය කරපු පක්ෂ එපා කියලා සමාජවාදී පක්ෂයක්, මේ රටේ වාමාංශික දේශපාලනය කරපු පක්ෂයක් බලයට ගෙනැල්ලා හිතුවා, රටට අලුත් දෙයක් කරාවි කියලා. හැබැයි, අපි දැක්කේ නැහැ අලුත් දෙයක් කියනවා. අපි දැක්කේ නැහැ අලුත් දෙයක් කරනවා.

ලෝකයේ දේශපාලන නායකයෝ අලුත් දේවල් කළා. ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිතුමා එතුමාගේ ප්‍රතිපත්ති වෙනස් කළා. එතුමාගේ සම්පූර්ණ වැඩ පිළිවෙළ වෙනස් කළා. මම අහනවා, මොකක්ද තමුන්නාන්සේලා වෙනස් කරලා තිබෙන්නේ කියලා.

තමුන්නාන්සේලා මෙතැනට ඇවිල්ලා කියනවා, මන්ත්‍රීවරුන්ට වාහන ඕනෑ නැහැ කියලා. බංකොලොත් රටක අපට ඕනෑත් නැහැ, ඒවා. අපි පසුගිය ආණ්ඩුවේදී ගත්තෙත් නැහැ. හැබැයි, තමුන්නාන්සේලා ඒවා කිය කියා තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ට ආණ්ඩුවේ වාහන පාවිච්චි කරන්න දීලා තිබෙනවා. ඒ වාහන අංකත් එක්ක අපි දෙන්නම්. ඇයි, ඒ වාගේ දේවල් කරන්නේ? කියන්නේ එක දෙයක්, කරන්නේ වෙන දෙයක්. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු එක දෙයක් කිය කියා, වෙන දෙයක් කරන්නේ.

ඔබතුමන්ලා කිව්වා, හිටපු ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද අයින් කරනවා කියලා. මම අහනවා, තමුන්නාන්සේලා ජනතාවට දුන්න ඒ පොරොන්දුව ඉෂ්ට කරලා තිබෙනවාද? ඒගොල්ලන්ගේ පඩි නඩි, ලබා දෙන දීමනා, නිල නිවාස ඔක්කෝම වරප්‍රසාද අයින් කරලා තිබෙනවා ද? තමුන්නාන්සේලා දුන්න පොරොන්දු ඉෂ්ට කරන්න. තමුන්නාන්සේලා දුන්න පොරොන්දු ඉෂ්ට නොකරන නිසා අපි තමුන්නාන්සේලාගේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්න තීන්දු කරලා තිබෙනවා.

ශ්‍රී ලංකා රේගුවේ සිදු වන දූෂණ බලන්න. දූෂණය නැති කරන්න ආපු අය රේගුවේ කන්ටේනර් 300 ගණනක් පරීක්ෂාවකින් තොරව නිදහස් කළා. රේගු නිලධාරීන් red tape එක ගහපු ඒවා තමුන්නාන්සේලා නිකම් එළියට යැව්වා. අපි කියනවා රජයට, ඒ වාගේම මුදල් ඇමතිතුමාට, ඒ යවපු කන්ටේනර් 323ට අදාළ නම් ලැයිස්තුව හෙළි කරන්න කියලා. මේ රටට හෙළි කළා නේ, බෙහෙත් ගන්න ජනාධිපති අරමුදලෙන් ගත්ත සල්ලි ගැන විස්තර. බොහොම හොඳයි.

කිව්වා නේ, එක එක ණය ගත්ත ඒවා. අපි කියනවා, අර කන්ටේනර් 323 ඇතුළේ තිබුණේ මොනවාදැයි කියන්න කියලා. ඒ කන්ටේනර් පරීක්ෂා කරලා එළියට දාන්න කියලා රේගු නිලධාරීන් කියා තිබෙනවා. ඒ විස්තර ටික තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව කථා කරන දවසට අපි ඒ ගැන කථා කරමු. තමුන්නාන්සේලාට ඒ නම් ලැයිස්තුව එළියට දමන්න බැරි ඇයි? පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ කන්ටේනර් 323 පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න කියලා. ඒ කන්ටේනර් අයිති කොම්පැනිය මොකක්ද; ඒවායේ තිබුණේ මොනවාද; මේවා නිදහස් කළේ ඇයි කියලා අහන්න්. තමුන්නාන්සේලා දූෂණ විරෝධී වැඩකට නේ ආවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
හොඳයි.

ලංකාවේ වැඩියෙන්ම ආදායම තිබෙන්නේ රේගුවෙන්, සුරාබදු දෙපාර්තමේන්තුවෙන් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන්. ශ්‍රී ලංකා රේගුවත් දූෂිත තත්ත්වයකට පත් වෙන ආකාරයට

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

තමුන්නාන්සේලා කටයුතු කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ හිතවතුන්, තමුන්නාන්සේලා උදව් කරපු අය එතැන ඉන්නවා ද කියලා අපට දැනගන්න ඕනෑ. කරුණාකරලා අපට ඒ ගැන කියන්න. අපි කියනවා, ඒ කන්ටේනර් 323හි ලැයිස්තුවයි, එහි තිබුණේ මොනවාද, ඒවා නිදහස් කළේ ඇයි කියා අපට දන්වන්න කියලා. අපේ සමහි ජන බලවේගය පක්ෂයත්, විපක්ෂයේ අනෙකුත් කණ්ඩායමුත් අද මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙන්න හින්දූ කර තිබෙන බව ප්‍රකාශ කරමින් මා නවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Prime Minister. You have 20 minutes.

[පූ.භා. 11.00]

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැය ඉදිරිපත් කරන මේ මොහොතේ කථා කිරීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මම අපේ රටේ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යාලේඛනවලට එහා ගිහිල්ලා, මෙම අය වැය තුළ ප්‍රකාශ වන චින්තනය හොඳින් අධ්‍යයනය කරන්න, ඒකට ඇහුම්කන් දෙන්න කියලා. මේ අය වැය කියන්නේ අපේ රටට අලුත් දිශානතියක්, අලුත් චින්තනයක්. විශේෂයෙන්ම අපේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ පදනම් වෙලා තිබෙන අපේ වටිනාකම්, අපේ මූලධර්ම - values and principles - ප්‍රකාශයට පත් කරන, ප්‍රකාශයට පත් වන ඒ මත හැදුණු අය වැයක් කියන එක මම පැහැදිලිවම පෙන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා.

මේ අය වැය තුළ අපි පෙන්නුම් කරන්නේ අපේ ඉදිරි ක්‍රියාවලිය, අපේ ඉදිරි ගමන්මඟ මොන පදනමක් මත සිටගෙනද අපි යන්නේ; අපි මොන වාගේ සමාජයක් නිර්මාණය කරන්න ද බලාපොරොත්තු වන්නේ; අපි මොන වාගේ රටක් හදන්නද යන්නේ කියන එකයි. ඒ හදන රට තුළ තිබිය යුතු වටිනාකම් මොනවාද කියන එක ඉතාම පැහැදිලිව මේ අය වැය තුළින් සලකුණු වෙනවා කියන්නත් මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය දිගින් දිටගම මෙම අය වැය පිළිබඳ විවේචන ඉදිරිපත් කරනකොට, මේක නවලිබරල්වාදී අය වැයක්; මේක රනිල්ගේ ප්‍රතිපත්තිවල දිගුවක් කියා නිතරම ප්‍රකාශ කර සිටියා. සමහර වෙලාවට කියනවා, මේක ඔවුනුත් කරන්න හිටපු දේ; ඔවුන්ගේ යෝජනා තමයි අපි මේ කථා කරන්නේ කියලා. ජාතික ජන බලවේගය කියන්නේ වාමාංශික පක්ෂයක්; ඒ නිසා මේවා පරස්පරයි කියලා කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම තර්කය ගොඩ නහන්න උත්සාහ කරන විපක්ෂයට ඔවුන්ගේ චින්තනයත් පටලැවිලා තිබෙන්නේ. ඔවුන්ට අපේ චින්තනය නම් කොහොමටත් තේරෙන්නේ නැහැ. ඒක ගැන කිසිම තර්කයක් නැහැ. නමුත්, විපක්ෂය තමන්ගේ චින්තනයත්, තමන්ගේ දේශපාලන මතයත් පටලවාගෙනයි ඉන්නේ.

දැන් ඒ අය කියන්නේ මේ අය වැය තුළ තිබෙන්නේ නවලිබරල්වාදය කියලා නේ. අපි මේ ඉදිරිපත් කර තිබෙන්නේ නවලිබරල්වාදී අය වැයක් කියලා කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නවලිබරල්වාදය ගැන කථා කරන කොට ඒකට පදනම් වන මූලික දේවල් කිහිපයක් තිබෙනවා. එකක් තමයි, ආර්ථික ක්‍රියාවලිය තුළින් රජය ඇත් කිරීම. තව එකක් තමයි, වෙළෙඳ පොළට ප්‍රධාන තැන දෙන එක. වෙළෙඳ පොළ තරයේ විශ්වාස කරමින් වෙළෙඳ පොළ හසුරුවන්න සම්පූර්ණ නිදහස දෙන එක තවත් කාරණයක්. තුන්වැනියට වැදගත් කාරණයක් තිබෙනවා. බොහෝ වෙලාවට නවලිබරල්වාදය ගැන කථා කරනකොට අපි ඒක ආර්ථිකයකට පමණක් ලඝු කළාට නවලිබරල්වාදී චින්තනය තුළ සමාජයම ප්‍රතිසංවිධානය වුණා.

ඒ සමාජය ප්‍රතිසංවිධානය වෙන්න තිබුණු මූලික කරුණක් තමයි නවලිබරල්වාදය තදින් විශ්වාස කරන පුද්ගලවාදය. සමාජයක් ගැන නොවෙයි ඔවුන් කථා කරන්නේ. සාමූහිකයක් ගැනයි කථා කරන්නේ. පුද්ගලයන් කේන්ද්‍ර කරගත්ත චින්තනයක් නවලිබරල්වාදයේ තිබෙන්නේ. ඒකට හොඳම උදාහරණය තමයි නවලිබරල්වාදයේ ප්‍රධාන න්‍යායාචාර්යවරියක් හැටියට ගණන් ගන්නා, දේශපාලනිකව ඒකට නායකත්වය දුන් මාග්‍රට් තැචර් එක් වරෙක කියපු කථාවක්. මම ඒක එතුමිය කියපු විධියටම නොවෙයි කියන්නේ. එතුමිය කියනවා, සමාජයක් කියලා දෙයක් නැහැ, ඉන්නේ පුද්ගලයන් පමණයි කියලා - "that there is no such thing as society, there are individuals". ඒකෙන්ම පෙන්නුම් කරන්නේ නවලිබරල්වාද චින්තනය තුළ තිබෙන ඒ පුද්ගලවාදී අදහසයි. ඒක එකක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නවලිබරල්වාදයේ ඒ අර්ථකථනය පැත්තක තබා අපි වුටිටක් කල්පනා කරලා බලමු, ලංකාවේ මෙච්චර කාලයක් ක්‍රියාත්මක වුණේ නවලිබරල්වාදය ද කියලා. ඒ පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඒ නවලිබරල්වාදය නොවෙයි මේ රටේ විපක්ෂය නියෝජනය කරන දේශපාලන පක්ෂවලින් ඇත්තටම ක්‍රියාත්මක කළේ. ඒක ඔවුන් නවලිබරල්වාදය කියලා ඉදිරිපත් කළාට නවලිබරල්වාදයත් නොවෙයි. මොකද, අපි මේ රට භාරගන්නකොට රට තුළ තිබුණේ නවලිබරල්වාදයකුත් නොවෙයි, මොන වාදයකුත් නොවෙයි. ඇත්තවශයෙන්ම තිබුණේ පවුල්වාදය සහ ගජ මිතුරු කණ්ඩායමකට උදවු කරන පාලන ක්‍රමයක් සහ ආර්ථිකයක්. මොකද, නවලිබරල්වාදයේ classical අර්ථය අනුව රාජ්‍ය සේවයෙන් ඈත් විය යුතුයි. නමුත්, මෙතෙක් කල් මේ රට පාලනය කරපු අය රාජ්‍ය සේවය ඔවුන්ගේ පෞද්ගලික දඩබිමක් හැටියට - පෞද්ගලික ආයතනයක් හැටියට - සලකමින් අත්තනෝමතික ලෙස මේ රාජ්‍ය සේවය පුළුල් කළා.

රාජ්‍ය සේවය බරක් වන තැනකට, සමාජය රාජ්‍ය සේවය බරක් ලෙස දකින තැනකට ඇදගෙන ගියා. වෙළෙඳ පොළ විකෘති කළා. වෙළෙඳ පොළට නිදහසේ ක්‍රියාත්මක වෙන්න කුමක් හෝ නියාමනයක් කරන්න නොවෙයි ඒ අය මැදිහත් වුණේ. වෙළෙඳ පොළ විකෘති කළා, තමන්ගේ ගජ මිතුරු සංග්‍රහය තුළිනුත්, පවුල්වාදය හරහාත්. අපේ රටේ කොයි වෙලාවකවත් නව ලිබරල්වාදය ක්‍රියාත්මක වුණේ නැහැ. එහෙම එකක් නොවෙයි අන්තිමට ඇති වුණේ. ඉතාම දූෂිත, පෞද්ගලික හේතු මත තීන්දු තීරණ ගන්නා විකෘති වෙච්ච ආර්ථිකයක් තමයි ක්‍රියාත්මක වුණේ. ඉහත කී ආර්ථික මතවාදයක් තිබුණේ නැහැ. තිබුණේ පෞද්ගලික මතවාදයක් පමණයි.

ඒ විකෘති කරපු, කඩා වට්ටපු, දූෂිත රට තමයි අපට භාර ගන්න සිද්ධ වුණේ. එතකොට අපට පටන් ගන්න වෙන්නේ එතැනින්. මේ රට හරි ලස්සන, සුපිරිසිදු, හරියාකාරව ක්‍රියාත්මක වුණු, නව ලිබරල්වාදය තුළ පැවතුණු රටක් නොවෙයි. දූෂිත වුණු, විකෘති

වුණු ආර්ථිකයක්, සමාජයක් තමයි අපට භාර ගන්න සිද්ධ වුණේ. එතැන් සිට තමයි අපට පටන් ගන්න වෙලා තිබෙන්නේ. එතැනින් පටන් ගන්න කොට මොනවාද අපි ඉදිරිපත් කරන්නේ? මේ අය වැය තුළින් ඉදිරිපත් වන වටිනාකම්, ප්‍රතිපත්ති සහ චින්තනය මොනවා ද? මේක තුළ තිබෙනවා, සාමූහිකත්වය. මේක තුළ තිබෙනවා, සමාජය ශක්තිමත් කරන්න ගන්නා මැදිහත් වීම්. මේක තුළ තිබෙනවා, සමානාත්මතාව සහ සාධාරණත්වය. මේක තුළ තිබෙනවා, ප්‍රජාතන්ත්‍රවාදය. එම ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ නිකම් මතුපිටින් තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි; ඇත්තටම අර්ථවත් ජන සහභාගිත්වය තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය; වෙළෙඳ පොළ නියාමනය ශක්තිමත් කරන එක. වෙළෙඳ පොළ නියාමනය කරන එක විතරක් ද නොවෙයි. රජයේ වගකීම ලෙස වෙළෙඳ පොළ නියාමනය කරන එක විතරක් නොවෙයි අපේ චින්තනය තුළ තිබෙන්නේ. වෙළෙඳ පොළට රජයත් මැදිහත් වෙනවා. එහි පෞද්ගලික ක්ෂේත්‍රයත් තිබෙනවා; රජයත් මැදිහත් වෙනවා. මේ දෙකම තිබෙනවා. අපි දකින්නේ නැහැ, රජයේ එකම කාර්ය භාරය වෙළෙඳ පොළ නියාමනය කිරීමයි කියලා. රජයටත් මෙතැනදී කාර්ය භාරයක් තිබෙනවා. මේ සියල්ලම තමයි අපේ අය වැය තුළ, අප තුළ තිබෙන චින්තනය. ඒ චින්තනයට තමයි අපි ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියලා අර්ථකථනයක් දීලා තිබෙන්නේ.

මේක කොහොමද සිද්ධ වෙන්නේ? අපට ඕනෑ තරම් උදාහරණ මේ අය වැය තුළින්ම ගෙනැල්ලා පෙන්වන්න පුළුවන්. මේ අය වැය තුළ අපි කවුරුවත් අත් හැරලා නැහැ. පීඩාවට පත් වුණු සියලුම ජන කොටස් ආමන්ත්‍රණය කරලා ඔවුන්ට යම් සැලකීමක් දක්වන අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. සියලු ජන කොටස් ආමන්ත්‍රණය කරලා තිබෙනවා. කාන්තාවන්, දරුවන් ගැන විශේෂයෙන් අවධානය යොමු කර තිබෙනවා. අවුරුදු ගණනක් තිස්සේ ආයතනගත වෙලා හිටපු දරුවන්ගේ ආරක්ෂාව, ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් වසර ගණනක් තුළ සටන් කරලා ඉල්ලපු දේවල් මේ අය වැය තුළ නියෝජනය වෙනවා. දරුවන් උසාවියට ගෙන යන ක්‍රමය ගැන, ආයතනගත වෙලා ඉන්න ළමයින් නැවත සමාජගත කරන්න තිබෙන ක්‍රියාවලිය ගැන -මේ සියල්ල ගැන- අපි සලකා බලා තිබෙනවා.

කාන්තාවන් ආර්ථිකයට හවුල් කරන එක, හවුල් කිරීමේදී එන බාධා, සුරැකුම් වැඩ නිසා කාන්තාවන්ට එන බාධා ලිහිල් කරන්නේ කොහොමද යන ආදි සියල්ලම මේ අය වැය තුළ පෙන්නුම් කරනවා. අපි සමාජය ශක්තිමත් කරන්න කටයුතු කරනවා. පුද්ගල බද්ධව, පුද්ගලයාට සියලුම වගකීම දීලා යන ප්‍රතිපත්තියක් තුළ නොවෙයි අපි ඉන්නේ. පුද්ගලයා ජීවත් වන සාමාජය ශක්තිමත් කරන්න අපි මැදිහත් වෙන යෝජනා ගණනාවක් මේ අය වැය තුළ තිබෙනවා. ඒ නිසා තමයි අපි සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවලට ලබා දෙන මුදල් ප්‍රමාණය වැඩි කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මෙතැනදී දිගින් දිගටම කියනවා, බෙහෙත්වලට VAT එකක් දමලා, VAT එකක් එකතු කරලා කියලා. බොරු නේ කියන්නේ. බෙහෙත්වලට VAT එකක් නැහැ. ඔබතුමාත් ඒක හොඳින්ම දන්නවා. බෙහෙත්වලට VAT එකක් නැහැ විතරක් නොවෙයි, දේශීයව නිෂ්පාදනය කරන බෙහෙත්වල packagingවලට අවශ්‍ය අමු ද්‍රව්‍යවලට තිබෙන VAT එකත් අපි අයින් කරලායි තිබෙන්නේ. දේශීය බෙහෙත් නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා අපි ඒ VAT එක අයින් කරලායි තිබෙන්නේ. ඉතින් මොනවාද මේ කියන බොරු? *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, මගේ කථාව අවසන් වුණාම කියන්න. *[බාධා කිරීමක්]*

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்துும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
පිට රටින් ගෙනෙන ඒවාට?

ගරු (ආචාර්ය) හරිනී අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
පිට රටින් ගෙනෙන ඒවාට VAT එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ඒවාට VAT එකක් නැහැ. බෙහෙත්වලට VAT එකක් කොහේවත් නැහැ. *[බාධා කිරීමක්]* ඒ නිසා අසත්‍ය තොරතුරු කියන්න එපා. *[බාධා කිරීමක්]*

ඊළඟට, අපි මේ වසර තුළ අධ්‍යාපනයට වෙන් කරන මුදල විශාල වශයෙන් වැඩි කරලා තිබෙනවා. පූර්ව ළමාවිය අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වාම අපි ඒ තත්ත්වය පෙන්නුම් කර තිබෙනවා. අපි ඒ වෙනුවෙන් වන capital investment එක වෙනදාට වඩා රුපියල් බිලියන 6,019කින් වැඩි කර තිබෙනවා. Special needs education, ආබාධිත අයට ලබා දෙන අධ්‍යාපනය සඳහා විශේෂයෙන්ම නම් කරලා මුදල් වෙන් කර තිබෙනවා. ඉතින් මොනවාද විපක්ෂයේ අය මේ කථා කරන්නේ? මෙන්න, අපි සමාජය ශක්තිමත් කරන්න කර තිබෙන මැදිහත්වීම. අපි සමාජ ආරක්ෂණය වැඩි කරන්න ඒ වෙනුවෙන් විශේෂ වැඩසටහන් ඉදිරිපත් කර තිබෙනවා.

සාමූහිකත්වය ඇති කරන්න, ජාතික සමඟිය ඇති කරන්න, "ශ්‍රී ලාංකික දිනය" නම් කරලා ඒ සඳහා මේ අය වැයෙන් රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා. ඔබ දන්නවා, අපි ජාතික වශයෙන් බොහෝ දිනයන් සැමරුවේ කොහොමද කියලා. යම් යම් කාණ්ඩ අත්හැරලා - exclude කර - තමයි අපි එවැනි දින මෙච්චර කල් සැමරුවේ. නමුත් මෙවර අය වැය තුළ පළමු වතාවට අපි ශ්‍රී ලාංකික දිනයක් යෝජනා කර තිබෙනවා. සියලු දෙනාටම තමන්ගේ විවිධත්වය තියාගෙන ඒ විවිධත්වය තුළින් මේ රට ලස්සන වෙන්නේ කොහොමද කියන එක, මේ රට ගැන ආඩම්බර වෙන්නේ කොහොමද කියන එක තහවුරු කරන්න තමයි, පුරවැසියන් හැටියට සියලු දෙනාටම - කවුරුවත් අත් හරින්නේ නැතුව - සහභාගි වෙන්න පුළුවන් වන විධියට "Sri Lankan Day" එකක් යෝජනා කර තිබෙන්නේ. ඒ inclusivity එක සඳහායි, කවුරුවත් අත හරින්නේ නැති නිසා සහ සාමූහිකත්වය ගොඩ නගන්න ඕනෑ නිසායි එහෙම කරලා තිබෙන්නේ. ඒක තුළිනුත් මොකක්ද අපි පෙන්නුම් කරන්නේ? සාමූහිකත්වය කියන එකට මේ රජය ප්‍රායෝගිකව මැදිහත් වෙන්නේ කොහොමද කියන එකයි පෙන්නුම් කරන්නේ. ඒක වචනයක් විතරක් නොවෙයි. සාධාරණත්වය, සමානාත්මතාව කියන එක දිගින් දිගටම මේ අය වැය තුළ හැම පිටුවකම, හැම වචනයක් තුළම පෙන්නුම් කර තිබෙනවා.

ප්‍රජාතන්ත්‍රවාදය කියන එක අපි අර්ථකථනය කරන්නේ කොහොමද? ඒකට ජනතාවගේ -පුරවැසි- සහභාගිත්වය ලබා ගත යුතුයි. ඒ පුරවැසි සහභාගිත්වය ලබා ගන්නත් එක්ක තමයි, අප බලාපොරොත්තු වන සමාජ පරිවර්තනයට ජනතාව හවුල් කර ගන්න තමයි අපි Clean Sri Lanka ක්‍රියාවලිය ආරම්භ කර තිබෙන්නේ. ඒක නොවෙයිද, ප්‍රජාතන්ත්‍රවාදය? පුරවැසියන් සහභාගි වන එක නොවෙයිද, ප්‍රජාතන්ත්‍රවාදය? එහෙම නැතුව මැතිවරණයකදී ගිහිල්ලා ඡන්දය දමන එක විතරක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය. ඒකත් ඒකේ කොටසක්. නමුත් ඒක විතරක් නොවෙයි. එතැනට සීමා වුණු ප්‍රජාතන්ත්‍රවාදය අපි පුළුල් කර තිබෙනවා, මේ ක්‍රියාවලිය තුළ. එසේ කර තිබෙන්නේ ජනතාවට මේ ක්‍රියාවලියට පුරවැසියන් හැටියට සහභාගි වෙන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට බංකොලොත් වෙලා තිබුණු විධියත්, මේ රට තුළ සමාජ අර්බුදය ගොඩ නැගී තිබුණු විධියත් එක්ක බලන කොට අපි මේ රට භාර ගනිද්දී අපට තෝරා ගැනීම් 2ක් තිබුණා. එක්කෝ හකුළා ගන්නා එක. ඒ

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කියන්නේ, බය වෙලා හකුළා ගෙන, තිබෙන එක විතරක් ආරක්ෂා කර ගනිමින් කටයුතු කරනවා ද කියන එක. අනෙක තමයි, මේ රටේ ඇති වී තිබෙන මේ අර්බුදය එක් අවස්ථාවක් හැටියට අත්දැක ගැඹුරු පරිවර්තනයකට යන්න අපි නිර්භීත වෙනවා ද කියන එක. අපි තෝරා ගත්තේ ඒ දෙවැනි තේරීමයි. ඒ නිර්භීත තෝරා ගැනීමයි අප කළේ. මොන බාධක තිබුණත්, මොන අභියෝග තිබුණත් අවුරුදු 70 ගණනක් තිස්සේ ඇදගෙන ආපු විධියට නොවෙයි අපි මේ රට ඉදිරියට ගෙන යන්නේ. මේ රට පරිවර්තනය කරනවා කියන අධිෂ්ඨානයත් එක්කයි අපි කටයුතු කරන්නේ. ඒ අධිෂ්ඨානයේ පළමුවෙනි අය වැය තමයි මේක. මේ පළමුවෙනි අය වැය තුළ කරන්න පුළුවන් උපරිමය අපි කර තිබෙනවා. බංකොලොත් රටක් නේ, අපි භාර ගත්තේ. ඔව්, සමාජ ආරක්ෂණයට අපිට මීට වඩා වැඩියෙන් දෙන්න පුළුවන්. අපි කැමැතියි ඒකට. හැබැයි, අපි මේ සීමා තුළයි මෙය කර තිබෙන්නේ. නමුත් මේ සීමා තුළ වුණත් යන්න තිබෙන දිශානතිය අපි හොඳින් පෙන්නුම් කර තිබෙනවා කියා මට විශ්වාසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් චෝදනාවක් එනවා, අපේ බලවේගවලට අපි අසාධාරණයක් කර තිබෙනවා, අපි දුන් පොරොන්දු ඉෂ්ට කරලා නැහැ කියලා. ඒකත් බොරු නේ. ඔබතුමාත්, මේ සියලු දෙනාත් හොඳින්ම දන්නවා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ මේ සියලුම කරුණු අඩංගු වන බව.

"ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය" කියන වචන කී පාරක් අපේ ප්‍රතිපත්තිය තුළ තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. අපි මේ සියල්ලම කථා කර තිබෙනවා. ජනාධිපතිතුමාගේ කථාව අහනකොට මට ඇත්ත වශයෙන්ම පුදුම ආඩම්බරයක්, සතුටක් දැනුණා. මොකද, අපි අවුරුදු ගණනාවක් තිස්සේ කථා කරලා, මහන්සි වෙලා ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයට දමපු කරුණු අපේ මංගල අය වැය තුළ ක්‍රියාත්මක වෙන්න යනකොට පුදුම සතුටක් අපට දැනෙන්නේ. මේක අපි අද ඊයේ කථා කරලා හදිසියේ සකස් කර ගත්ත එකක් නොවෙයි. මේවා අවුරුදු ගණනාවක් තිස්සේ කථා වෙලා සකස් කර ගත්ත දේවල්. ඒවා අපේ මංගල අය වැය තුළින් අපි පෙන්නුම් කර තිබෙනවා.

තව බොරු කථාවක් කියනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පඩි වැඩි කරලා නැහැ, අරකද මේකද කියලා. ඊයේ එක මන්ත්‍රීවරයෙක් කියනවා මට ඇහුණා, ගුරුවරුන්ගේ වැටුප් ඉහළම ශ්‍රේණි 10න් එකකට ගේන්න අපි පොරොන්දු වෙලා තිබුණා, ඒක වෙලා නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක වෙලා තිබෙනවා. මේ පඩි වැඩිවීමත් සමඟ විදුහල්පතිවරු ඉහළම ශ්‍රේණි අතරින් 7වෙනි තැනත් ගුරුවරු 8වෙනි තැනත් ඉන්නවා. ඔවුන් වැඩිම වැටුප් 10 ඇතුළට අපි ගෙනැල්ලායි තිබෙන්නේ. විදුහල්පතිවරයෙකුගේ වැටුප රුපියල් 30,105කින් වැඩි වෙලා. ගුරුවරයෙකුගේ වැටුප රුපියල් 25,360කින් වැඩි වෙලා. රුපියල් 15,750කින් වැඩි වෙලා තිබෙන්නේ, අවම ශ්‍රේණියේ අවම වැටුප.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ඒක හංගන්න හදනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
දැන් ගුරුවරු ඉන්නේ ඉහළම ශ්‍රේණි අතරින් 8 වෙනි තැන. විදුහල්පතිවරු ඉන්නේ 7වෙනි තැන. අන්න, අපේ තවත් පොරොන්දුවක් අපි ඉෂ්ට කරලායි තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, මේ පඩි වැඩි වීම අපි බැරෑරුම් ලෙස භාර ගන්න ඕනෑ දෙයක්. මොකද, අපේ ප්‍රතිපත්තිය තුළ, අපේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුළ රාජ්‍ය සේවයට අපි ගරුත්වයක් දෙනවා. හැබැයි, පෙර ආණ්ඩු මොනවාද කළේ? අත්තනෝමතික විධියට බඳවා ගැනීම් කරලා, විශාල අවුල් ඇති කරලා රාජ්‍ය සේවය විනාශ කළා විතරක් නොවෙයි, රාජ්‍ය සේවය පිළිබඳව රාජ්‍ය සේවකයන්ට තිබුණු විශ්වාසයත් නැති කළා. සමාජය තුළ රාජ්‍ය සේවය පිළිබඳ ඉතාම ඍණාත්මක අදහස් ගොඩ නැඟුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, රටක් දියුණු වෙන්න නම් ශක්තිමත්, විශ්වාසනීය, ජනතාවාදී රාජ්‍ය සේවයකුත් අවශ්‍යයි. ඒ වෙනුවෙන් තමයි අපි මේ ආයෝජනය කරන්නේ. ඒ වෙනුවෙන් තමයි ඉතාම දුෂ්කර කොන්දේසි යටතේ වුණත් මේ මූලික වැටුප වැඩි කරන්න අපි මැදිහත් වෙලා තිබෙන්නේ. ඒක අපි ක්‍රමානුකූලව කරගෙන යනවා. අපි සීමා ගොඩක් එක්කයි මේ වැඩ කරන්නේ. අපි දන්නවා, ජනතාව මේක තේරුම් අරගෙන ඉන්නා බව. විපක්ෂයේ මන්ත්‍රීවරු මොනවා කිව්වත් මේක ජනතාව තේරුම් ගෙන තිබෙනවා. ජනතාව දන්නවා, මොකක්ද අපි මේ කරන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Prime Minister, you have two more minutes.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Thank you, Hon. Deputy Speaker. I will conclude.

අපි ජනතාව සමඟයි මේ දේවල් කරගෙන යන්නේ. ජනතාවට ඒ විශ්වාසය තිබෙනවා කියන එකත් අපි හොඳින් දන්නවා. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙයයි. මෙය ඓතිහාසික අය වැයක්; මේ රටේ හැරවුම් ලක්ෂ්‍යයක් සලකුණු කරන අය වැයක්. අපි 1977 ගැන කථා කරනවා. මෙතැන රොනී ද මැල් මුදල් ඇමති ගැන ගොඩක් දේවල් කථා වුණා. ඒ අය වැයත් මේ රට වෙනස් කළා. ඒකට අපි එකඟද නැද්ද කියන දේශපාලන විවේචන ඔක්කොම තිබෙද්දී මේ රට තීරණාත්මක විධියට අවුරුදු 30, 40කට වෙනස් කළා. ඒ හා සමාන වැදගත්කමක් තිබෙන අය වැයක් තමයි මේ ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මේ රටේ දිශානතිය වෙනස් කරන, මේ රටේ චින්තනය වෙනස් කරන, මේ රටේ සමාජය සංවිධානය වෙලා තිබෙන විධිය වෙනස් කරන, මේ සමාජයේ ව්‍යුහයන් වෙනස් කරන තරම් වැදගත්, බරපතළ අය වැයක් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ දිශානතියයි අපි මේ පෙන්වන්නේ. මේක අපේ පළමුවැනි අය වැය. අපට තව යන්න බොහෝ දුරක් තිබෙනවා. හැබැයි, පළමුවැනි අය වැය තුළින්ම අපි සලකුණු කර තිබෙනවා, අපි හඳන්න යන රට මොකක්ද කියලා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන එක අපි අර්ථකථනය කළා විතරක් නොවෙයි, අපි ඒකට ජීවයක් දීලාත් තිබෙනවා. පෙර ආණ්ඩුවලින් මොනවාද කළේ? කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරලා පනත් ගෙනාවා. ඒ පනත්වලට අපි එකඟයි. පනත් හොඳයි. නමුත් පනත්වලට, ප්‍රතිපත්තිවලට සීමා වුණාම කාන්තා අයිතිවාසිකම් හම්බ වෙන්නේත් නැහැ; ළමා අයිතිවාසිකම් හම්බ වෙන්නේත් නැහැ.

ඒක එහෙම නම් ඒ ව්‍යුහය තුළ අමාත්‍යාංශය තුළ මුදල් වෙන් වෙන විධිය, වැඩසටහන්වලට මුදල් වෙන් වෙලා තිබෙන විධිය තුළ තමයි ඒක අර්ථවත් වෙන්නේ. ඒක අපි කරලා තිබෙනවා. අපි මෙතැනදී ප්‍රතිපත්තියක් හදන එකට විතරක් සීමා වෙලා නැහැ; පනතක් ගේන්න විතරක් සීමා වෙලා නැහැ. ඇත්තටම මිනිස්සුන්ට දැනෙන තැන්වලට අපි මුදල් යොදවලා තිබෙනවා. ඒ නිසා තමයි මේ අය වැය සාධාරණත්වය, සමානාත්මතාව, සාමූහිකත්වය, මනුෂ්‍යත්වය වෙනුවෙන් මේ මුළු රටම හරවන අය වැයක් බවට පත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
State your point of Order, please.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(මාණ්පුමිකු ආර්.එම්. රඤ්ජිත් මත්තුම පණ්ඩාර)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියපු කාරණාව අසත්‍යයක් කියලා ගරු අගමැතිතුමිය කිව්වා. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 103 පිටුවේ තිබෙනවා, ළදරු කිරි, ඖෂධ, පාසල් පොත් හා උපකරණ, පුස්තකාල සේවා, කෘෂිකර්ම උපකරණ, සූර්ය පැනල ආදී වශයෙන්. ඒ සියලු දේ සඳහා VAT එක බින්දුවට ගේනවා කියලා තිබෙනවා. ඒ කියන්නේ VAT එකක් තිබෙනවා නේ. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා හවස පැහැදිලි පිළිතුරක් ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක නම්, ජනාධිපතිතුමා අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට කලින් මේ පාර්ලිමේන්තුවට යම් ප්‍රතිපත්ති ප්‍රමාණයක් ඉදිරිපත් කළා. එහිදී එතුමා කිව්වා, VAT එක අඩු කරන ඒවා, PAYE Tax එක අඩු කරනවා ඒවා පිළිබඳව. මේ අය වැය ලේඛනය සම්මත වුණාට පස්සේ, ඒ පනත් කෙටුම්පත් ගේන්න අපි සියල්ල සූදානම් කරලා තිබෙන්නේ. ඒ නිසා ඒවායේ හරියටම VAT එක අඩු වෙනවා. PAYE Tax එකේ slabs, charges වෙනස් වෙනවා, මිනිස්සුන්ට සහනයක් ලැබෙන විධියට.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sunil Handunnetti?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය ගත්තොත්, දේශීය වශයෙන් කරන pharmaceutical නිෂ්පාදනවලට VAT එක තිබුණා. පිටරටින් ආනයනය කරන ඒවාට, ඒ bulk එක මෙහේට ගෙනැල්ලා packing කළාම ඒ pharmaceuticalsවලට VAT එක තිබුණා. මෙහි Annexesවල තිබෙනවා, මෙවර අය වැයෙන් ඒ pharmaceutical itemsවලටත් VAT එක ඉවත් කරලා තිබෙනවා කියලා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(මාණ්පුමිකු சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, ඔබතුමන්ලා පැහැදිලිවම කිව්වා, රුපියල් 9,000ක විදුලි බිල රුපියල් 6,000ක් කරනවා, රුපියල් 3,000ක විදුලි බිල රුපියල් 2,000ක් කරනවා කියලා. තුනෙන් එකකින් විදුලි බිල අඩු කරනවා කිව්වා. හැබැයි, මේ රටේ ජනතාව මත පීඩනයක් පටවලා, දැන් විදුලි බිල සියයට 20කින් සාමාන්‍යයක් හැටියට අඩු වෙලා තිබෙනවා. හැබැයි, ඊයේ බලශක්ති ඇමතිතුමා කියනවා අපට අහන්නට ලැබුණා, විදුලි බිල වැඩි වෙනවා කියලා. ඇත්ත වශයෙන්ම මම ගරු අගමැතිතුමියගෙන් පැහැදිලි කිරීමක් කර ගන්න කැමැතියි. මේ විදුලි මිල සූත්‍රය ඔබතුමන්ලා වෙනස් කරනවා කිව්වා; ජනතාවාදී කරනවා කිව්වා. එතකොට කොහොමද, බලශක්ති ඇමතිතුමා කියන්නේ විදුලි බිල සියයට ගණනකින් ඉදිරියේදී වැඩි වෙනවා කියලා? ඒක හරි අසාධාරණයක් නේ. ගරු අගමැතිතුමියනි, මට විනාඩියක් දෙන්න. ඉතින් කොහොමද මේ රටට අලුත් ආයෝජන එන්නේ? කොහොමද මේ රටේ පාරිභෝගික ජනතාව මේකට මුහුණ දෙන්නේ? සාමාන්‍ය ජනතාව ඒකට මුහුණ දෙන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, I think your question is clear.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(මාණ්පුමිකු (කලානිති) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Deputy Speaker, the Committee Stage Discussion is coming up. When the Vote on the Ministry of Energy is taken up, we can discuss that in detail.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have 16 minutes.

[மு.ப. 11.24]

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான பாதீடு பற்றிய எனது பகுப்பாய்வு மற்றும் பரிந்துரைகளை இந்தச் சபையில் எடுத்துரைக்க விழைகின்றேன். இந்த அரசால் முன்வைக்கப்பட்டுள்ள பாதீடானது, பொருளியல் மாற்றம், எண்ம மயமாக்கல், சமூக நலன் விரிவாக்கம் முதலியவற்றை இலக்குகளாகக் கொண்ட பல நல்ல திட்டங்களை முன்வைக்கின்றது. எனினும், இந்த முன்மொழிவுகளில் பல அவற்றின் செயற்படுத்தும் உத்திகள் மற்றும் எதிர்பார்க்கப்படும் தாக்கங்கள் பற்றிய தெளிவைக் கொண்டிருக்கவில்லை. பொது மக்களுக்கும் பங்குதாரர்களுக்கும் தெளிவான புரிதலை அளிக்கும் பொருட்டு இந்த முன்முயற்சிகள் எவ்வாறு செயற்படுத்தப்படும் என்பது பற்றி அரசு விரிவான விளக்கமளிப்பது நன்மை பயக்கும். முதன்மையான துறை ஒவ்வொன்றின்கீழும் நேரான கூறுகள், மறையான கூறுகள், அறைகூவல்கள் மற்றும் பரிந்துரைகளை இவ்விடத்தில் பார்ப்பது பொருத்தமானதென நான் நம்புகின்றேன்.

முதலில் பொருளாதார வளர்ச்சி, வர்த்தகம் மற்றும் முதலீடு - economic growth, trade and investment - பற்றி பார்ப்போம். சுதந்திர வர்த்தக ஒப்பந்தங்களின் விரிவாக்கமானது, குறிப்பாக ASEAN மற்றும் பிராந்திய விரிவான பொருளாதாரக் கூட்டாண்மையானது, ஏற்றுமதியை அதிகரிப்பதற்கும் வெளிநாட்டு முதலீடுகளை ஈர்ப்பதற்கும் நம்பிக்கைக்குரிய ஒரு படியாகும். பொருளாதார மாற்றச் சட்டத் திருத்தம், அரச - தனியார் கூட்டுச் சட்ட அறிமுகம் முதலியன வணிக நம்பிக்கை மற்றும் உட்கட்டமைப்பு மேம்பாட்டை நோக்கமாகக் கொண்டுள்ளன. எனினும், இந்த ஒப்பந்தங்கள் எவ்வாறு கட்டமைக்கப்படும் அல்லது எந்தக் குறிப்பிட்ட தொழில்கள் பயனடையும் என்பது பற்றிய தெளிவான வரைபடத்தை அரசு வழங்கவில்லை. அது வழங்கப்பட வேண்டும். மேலும், குறைவான பயன்பாட்டிலுள்ள அரசுக்குச் சொந்தமான நிலங்களை குத்தகைக்கு விடுவதானது, பொருண்மிய உற்பத்தியை ஊக்குவிக்கும் என்றாலும், தவறான பயன்பாடு அல்லது ஊழலைத் தவிர்க்கும் செயன்முறை வெளிப்படையானதாக இருக்க வேண்டும். இந்தக் கவலைகளைச் சீர்செய்ய, அரசு தெளிவானதொரு செயலாக்கத் திட்டத்தை முன்வைக்க வேண்டும். இத்திட்டத்தில் குறிப்பிட்ட துறைகளை இலக்காகக்கொண்ட சுதந்திர வர்த்தக ஒப்பந்தங்கள், நில ஒதுக்கீடுகள், அரச - தனியார் பங்குடமை திட்டங்களுக்கான வெளிப்படைக் கட்டமைப்பு ஆகியன அடங்கும்.

அடுத்து, எண்மப் பொருளாதாரம் மற்றும் தொழில்நுட்பம் - digital economy and technology - பற்றி பார்ப்போம். Sri Lanka Unique Digital Identification - SL-UDI - என்ற முன்முயற்சியானது, எண்மப் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு ஒரு முதன்மையான படியாகும். மேலும், எண்ம பொருளாதாரத்தின் பங்களிப்பை 15 பில்லியன் அமெரிக்க டொலராக அதிகரிப்பது இலட்சியமானதும் நம்பிக்கைக்குரியதுமாகும். இருப்பினும், எண்ம உட்கட்டமைப்பு மேம்பாடு, இணையப் பாதுகாப்பு நடவடிக்கைகள், எண்ம கல்வியறிவு முதலிய முன்முயற்சிகள் எவ்வாறு செயற்படுத்தப்படும் என்பது குறித்துத் தெளிவு இல்லை. இது தெளிவுபடுத்தப்பட வேண்டும். மேலும், புதிய முயற்சியாளரும் சிறிய தொழில்நுட்ப நிறுவனங்களும் தத்தம் செயற்பாடுகளை விரிவாக்க சிறப்பான வரிவிலக்கு மற்றும் நிதி ஆதரவு வழங்கப்படவில்லை. அரசு இதில் கவனம் செலுத்த வேண்டும். பெறுபேறுகளை அதிகரிக்க வேண்டுமாயின், எண்ம உட்கட்டமைப்பு, 'சைபர்' பாதுகாப்பு நெறிமுறைகள் மற்றும் புதிய முயற்சிகளுக்கான ஊக்கத் தொகைகளை மேம்படுத்துவதற்கான நடவடிக்கைகளை அரசு தெளிவாகக் கோடிட்டுக்காட்ட வேண்டும். அத்தோடு, எண்ம மாற்றம் கிராமப்புற சமூகங்களைச் சென்றடைவதையும் உறுதிசெய்ய வேண்டும்.

அடுத்து, நிதி மேலாண்மை மற்றும் வருவாய் உருவாக்கம் பற்றி பார்ப்போம். சமூக செலவினங்களை அதிகரிக்கும்பொழுது ஏற்படும் 6.7%ஆன மொத்த உள்நாட்டு உற்பத்திப் - GDP - பற்றாக்குறையை கட்டுப்படுத்துவதை இந்தப் பாதீடு இலக்காகக் கொண்டுள்ளது. வாகன இறக்குமதியின் தாராளமயமாக்கல், எண்மச் சேவைகள் மீதான பெறுமதிசேர் வரி, பெருநிறுவன வரி உயர்வு ஆகியன கணிசமான வரி வருவாயை உருவாக்கும் என்று எதிர்பார்க்கப்படுகின்றது. எவ்வாறாயினும், வாகன இறக்குமதி வரிகள் போன்ற தற்காலிக நடவடிக்கைகளுக்கு அப்பால், நீண்டகால வருவாய் நிலைத்தன்மையை அரசு எவ்வாறு உறுதிசெய்யும் என்பதை இந்தப் பாதீட்டில் குறிப்பிடப்படவில்லை. அத்தோடு, அரச ஊழியர்களின் ஊதியத்தை மூன்று ஆண்டுகளில் 325 பில்லியனாக உயர்த்தும் நடவடிக்கையானது வருவாய் வளர்ச்சியுடன் பொருந்தவில்லை என்றால், அது நிதி அழுத்தத்தை மோசமாக்கும். நிதி நிலையின் உறுதித் தன்மையைப் பேணும் பொருட்டு மாற்று வருவாய் வழிமுறைகள், வரிச் சீர்திருத்தங்கள், செலவினக் கட்டுப்பாட்டு வழிமுறைகள் உள்ளிட்ட விரிவான நிதி உத்திகளை அரசு அறிவிக்க வேண்டும்.

அடுத்து, சமூகநலன் மற்றும் வருமான வளர்ச்சி - social welfare and income growth - பற்றி பார்ப்போம். சமூகப் பாதுகாப்புச் செலவினங்களை 232.5 பில்லியன் ரூபாயாக உயர்த்துதல், அரச ஊழியர்களது ஊதியம் மற்றும் பெருந்தோட்டத் தொழிலாளர்களது கொடுப்பனவை உயர்த்துதல் முதலிய முன்மொழிவுகள் வாழ்க்கைத் தரத்தை மேம்படுத்துவனவாக இருப்பினும், இவ்வுதிய உயர்வுக்கான படிப்படியான அணுகுமுறையானது, அரசின்மீதான அதிருப்திக்கு வழிவகுக்கும்.

மேலும், ஊதிய உயர்வுகள் உற்பத்தித்திறன் வளர்ச்சியுடன் பொருந்தவில்லை என்றால், பணவீக்க அபாயம் உருவாகும். இந்த நலத் திட்டங்களுக்கு நிலையான நிதியை எவ்வாறு பெறுவது என்பது பற்றிய விரிவான உத்திகளை அரசு வழங்கவில்லை. பொருளாதார உறுதித் தன்மையுடன் சமூக நலனைச் சமநிலைப்படுத்த வேண்டுமாயின், அரசு உற்பத்தித்திறன் இணைக்கப்பட்ட ஊதிய முறை, பரந்த ஊதிய உயர்வுகளுக்கு மாற்றாக இலக்குப் பணப் பரிமாற்றம், ஒரு கட்டமாக நிதி ஒழுங்கு செய்தல் முதலிய திட்டங்களை அறிமுகப்படுத்த வேண்டும். மேலும், இலங்கையின் குடித்தொகையில் 52 சதவீதத்தைக்கொண்ட பெண்கள் தொடர்பான மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சுக்கு கடந்த நிதியாண்டில் கிட்டத்தட்ட 20 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. இந்த நிதியாண்டில் அது 15 பில்லியனாகக் குறைக்கப்பட்டுள்ளது. இந்த நாட்டில் பெருந்தொகையான பெண் தலைமைதாங்கும் குடும்பங்கள் உள்ளன. குறிப்பாக, வடக்கு, கிழக்கில் 92,000 பெண் தலைமைதாங்கும் குடும்பங்களில் உள்ளவர்களுக்கு நிலையான வருமான வழிமுறைகள் இல்லை. இதனால் அக்குடும்பங்களிலுள்ள

பிள்ளைகளது எதிர்காலம் கேள்விக்குறியாக உள்ளது. எனவே, பெண் தலைமைதாங்கும் குடும்பங்களுக்கு வருவாய் பெறக்கூடிய சுயதொழில்களை உருவாக்கிக் கொடுக்க வேண்டும். இதன்பொருட்டு இந்த அமைச்சுக்கான நிதி ஒதுக்கீடு பன்மடங்கு அதிகரிக்கப்பட வேண்டும்.

அடுத்து, விவசாயம் மற்றும் ஊரக வளர்ச்சி - agriculture and rural development - பற்றி பார்ப்போம். இலங்கையின் பொருளாதாரத்தில் விவசாயத்தின் பங்கு கணிசமாக இருந்தபொழுதிலும், இந்தப் பாதீட்டில் நீர்ப்பாசன மேம்பாடுகள் மற்றும் எந்திரமயமாக்கல் உத்திகள் பற்றித் தெளிவாகக் குறிப்பிடப்படவில்லை. இந்தப் புறக்கணிப்பானது, குறைந்த விவசாய உற்பத்தியின் வழியாக உணவுப் பணவீக்கத்துக்கு வழிவகுக்கும். கூடுதலாக, வழங்கல் சங்கிலிச் செயற்றிறனை மேம்படுத்துவதற்கு அல்லது கிராமப்புறச் சந்தை அணுகலை மேம்படுத்துவதற்கான வழிமுறைகள் எதுவும் இதில் கூறப்படவில்லை. எந்திரமயமாக்கல், கிராமப்புற உட்கட்டமைப்பு உள்ளிட்ட விவசாயத்தை நவீனமயமாக்குவதற்கான தெளிவான கொள்கைக் கட்டமைப்பை அரசு வழங்க வேண்டும். இந்தப் பாதீட்டில் கைத்தொழிற்றுறைக்கு கிட்டத்தட்ட 13 பில்லியன் ரூபாயே ஒதுக்கப்பட்டுள்ளது. விவசாயத்துறை உற்பத்திகளைவிட கைத்தொழிற்றுறை உற்பத்திகளே அதிக கேள்வி நெகிழ்ச்சித் தன்மை - elasticity of demand - கொண்டவை என்பதையும், தேசிய உற்பத்தியில் கைத்தொழிலின் பங்கு அதிகமாகவுள்ள நாடுகளே அபிவிருத்தி அடைந்த நாடுகளாக உள்ளன என்பதையும் அரசு உணர வேண்டும். அதற்கேற்ப கைத்தொழிலுக்கான மூலதன ஒதுக்கீடுகள் அதிகரிக்கப்பட வேண்டும் என்பதை இந்த இடத்தில் கூறுவது பொருத்தமாக இருக்குமென நான் நம்புகின்றேன்.

கல்வி, உயர் கல்வி மற்றும் ஆராய்ச்சி பற்றி பார்த்தால், தொழிற்சந்தைத் தேவைகளோடு கல்வியை இணைப்பதற்குத் தெளிவான திட்டம் எதுவும் இந்தப் பாதீட்டில் இல்லையென்பது புரியும். தொழிற்பயிற்சி, ஆராய்ச்சி நிதி மற்றும் STEM - அறிவியல், தொழில்நுட்பம், பொறியியல் மற்றும் கணிதம் - திறன் மேம்பாட்டுத் திட்டங்களை உள்ளடக்கிய நன்கு வரையறுக்கப்பட்ட உயர் கல்விச் சீர்திருத்த உத்தியை அரசு அறிமுகப்படுத்த வேண்டும். இந்தப் பாதீடானது பொதுக் கல்விக்காக நிதி ஒதுக்கீடு செய்துள்ளது. எனினும், உயர் கல்வி நிறுவனங்கள் மற்றும் பின்தங்கிய பகுதிகளில் கூடுதல் கவனம் செலுத்தப்பட வேண்டும். வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் அமைந்துள்ள பல்கலைக்கழகங்கள் உள்ளிட்ட நாட்டிலுள்ள பெரும்பாலான பல்கலைக்கழகங்கள் மோசமான உட்கட்டமைப்பு மற்றும் வரையறுக்கப்பட்ட ஆய்வு நிதியால் பாதிக்கப்பட்டுள்ளன. அறிவு சார்ந்த பொருளாதாரமாக இலங்கை மாறுவதை நோக்கமாகக் கொண்டால், இந்தப் பல்கலைக்கழகங்கள் நவீன வசதிகள், ஆராய்ச்சி நிதி மற்றும் வினைத்திறனான ஆசிரியர் குழாத்தைக் கொண்டதாக இருக்க வேண்டும். உயர் கல்வி மற்றும் தொழில்நுட்பக் கல்வியின் தரத்தை மேம்படுத்தும் பொருட்டு, உட்கட்டமைப்பு மேம்பாடு, ஆராய்ச்சி மானியங்கள் மற்றும் தொழிற்றுறை ஒத்துழைப்பு ஆகியவற்றுக்கான நிதி ஒதுக்கீடுகளுக்கு அரசு முன்னுரிமையளிக்க வேண்டும்.

அடுத்து, சுற்றுலா மற்றும் சேவைத்துறை வளர்ச்சி - tourism and service sector development பற்றி பார்ப்போம். வெளிநாட்டு நாணயமாற்றை ஈட்டித்தரும் முதன்மைத் துறையான சுற்றுலாத்துறைக்கு இந்தப் பாதீட்டில் போதுமான நிதி ஒதுக்கீடு அல்லது மீட்புக்கான ஊக்கத்தொகை ஒதுக்கப்படவில்லை. சுற்றுலா மேம்பாடு, உட்கட்டமைப்பு மேம்பாடு மற்றும் முதலீட்டு ஊக்குவிப்புக்கான உத்திகள் இல்லாவிடின், சுற்றுலாத்துறையின் மீட்சி மெதுவாகவே இருக்கும். முதலீட்டாளர்களுக்கான வரிச் சலுகைகள், பன்னாட்டு சந்தைப்படுத்தல் பரப்புரைகள், உட்கட்டமைப்பு மேம்பாடுகள் உள்ளிட்ட சுற்றுலா மீட்புப் பாதை வரைபடத்தை அரசு அறிமுகப்படுத்த வேண்டும்.

இந்தப் பாதீட்டில், இலங்கையின் பண்பாட்டை உலகளவில் மேம்படுத்துவதையும் வெளிநாட்டுச் சுற்றுலாப் பயணிகளை ஈர்ப்பதையும் இலக்காகக்கொண்ட ஒரு விழாவை 'இலங்கை நாள்' - 'Sri Lanka Day' எனும் பெயரில் தொடங்குவதற்கு முன்மொழிவு செய்யப்பட்டுள்ளது. இது நாட்டின் மென் வலுவை மேம்படுத்தவும் சுற்றுலாத்துறையை மேம்படுத்தவும் இலங்கையின் செழுமையான மரபுகளை உலகுக்கு வெளிப்படுத்தவும்கூடிய பாராட்டுக்குரிய ஒரு முயற்சியாகும். இலங்கை நாளின் அறிமுகமானது - தேசிய அடையாளம், பண்பாட்டு மரபுகள் ஆகியன - சுற்றுலாத்துறையை மேம்படுத்துவதில் ஒரு சாதகமான படியாகும். உச்ச சுற்றுலாப் பருவமான மார்கழி மாதத்தில் திட்டமிடப்பட்டுள்ள இந்த முயற்சியானது, இலங்கையின் பல்வேறு மரபுகள், கலைகள், இசைகள், நடனங்கள், உணவுகள் முதலியன பற்றிய உலகளாவிய தளத்தை உருவாக்க உதவும். மேலும், இந்த விழாவை ஒழுங்கு செய்வதில் தனியார்துறையின் ஈடுபாடானது நிலையான மற்றும் கூட்டு அணுகுமுறையை உறுதி செய்கின்றது.

எனினும், அதன் பெறுபேறுகளை உயர்த்துவதற்கு அரசானது தெளிவான விளம்பர உத்தியை உருவாக்குதல் வேண்டும். எண்ம தளங்கள், சமூக ஊடகங்கள், பன்னாட்டு கூட்டாண்மைகளைப் பயன்படுத்தி உலகளாவிய பார்வையாளர்களை ஈர்க்கும் வகையில், ஒரு விரிவான சந்தைப்படுத்தல் பரப்புரையைச் செய்ய வேண்டும். வெளிநாடுகளில் வாழும் இலங்கையர்கள் அந்தந்த நாடுகளில் நடைபெறும் பரப்புரைகளில் பங்கேற்க ஊக்குவிப்பது பன்னாட்டுப் பார்வையை விரிவுபடுத்தும். இலங்கையில் பல்வேறு மரபுகள், இனங்கள் மற்றும் சமூகங்கள் அடங்கியிருப்பதை உறுதிசெய்யும் பொருட்டு, அனைத்து மாகாணங்களில் இருந்தும் பண்பாட்டுக் கூறுகளை முன்னிலைப்படுத்த வேண்டும். சுற்றுலா முன்முயற்சிகளோடு இணைக்கவும், உள்ளூர் வணிகங்கள் மற்றும் கைவினைஞர்களுக்கான பொருளாதார நன்மைகளை மேம்படுத்தவும், சிறப்புப் பயணப் பொதிகள், பண்பாட்டுச் சுற்றுலாக்கள் முதலியன சுற்றுலாத் திட்டங்களுடன் இணைக்கப்பட வேண்டும்.

ஓர் ஆண்டு நிகழ்வு என்பதற்கு அப்பால், இலங்கையை ஆண்டு முழுவதும் பண்பாட்டுச் சுற்றுலாத்தலமாக நிலைநிறுத்தும் பொருட்டு, திருவிழாக்கள், கலைகள் மற்றும் வரலாற்றுப் பட்டறிவுகளைச் சுற்றுலாக் கொள்கைகளில் ஒருங்கிணைக்க வேண்டும். இந்தப் பாதீட்டில் அரசு பல இலட்சியச் சீர்திருத்தங்களை அறிவித்தாலும், இந்த முயற்சிகள் எவ்வாறு செயற்படுத்தப்படும்? யார் பொறுப்பேற்பார்கள்? அல்லது வெற்றியை அளவிடுவதற்காக எந்த அளவீடுகள் பயன்படுத்தப்படும்? என்பன பற்றிய போதுமான தகவல்களை அரசு வழங்கவில்லை. இந்தத் தெளிவின்மையானது, குழப்பத்துக்கும், செயற்படுத்துவதில் தாமதத்துக்கும், கொள்கைச் செயற்பாட்டில் திறமை இன்மைக்கும் வழிவகுக்கும்.

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

මේලුම්, තිට්ටම් සෙයර්පඩුත්තුවතර්කාන කාලක්කෙඩු, පොරුප්පාන නිරුවනඞ්කළ් මර්රුම් එතිර්පාර්ක්කප්පඩුම් මුඩිවුකළ් උට්පඩ ඔව්වොරු මුතන්මෙයාන තිට්ටත්තුක්කුම් විරිවාන සෙයර්පඩුත්තල් තිට්ටත්තෛ අරසු වෙළියිඩ වේණ්ඩුමෙනප් පරින්තුරෛක්කින්රේන්. පොරුප්පුණර්ච්චියෛ උරුතිසෙය්වතර්කාක ඔළුඞ්කාන ඉර්රෛප්පඩුත්තල්කළ්, වෙළිප්පඩෛයාන අර්රික්කෙයිඩල් මුතලිය වළිමුරෛකළ් නිරුවප්පඩ වේණ්ඩුම්. වණිකර්කළ්, කල්වියාළර්කළ් මර්රුම් පොතුමක්කළින් කවලෛකළෛත් තීර්ක්කුම් පොරුට්ටු, පඞ්කුතාරර්කළුඩන් කලන්තාය්වුකළ් නඩත්තප්පඩල් වේණ්ඩුම්. සුරුක්කමාකක් කූරිනාල්, ඉන්තප් පාතීටානතු පොරුළාතාර මාර්රම්, එණ්ම මයමාක්කල් මර්රුම් සමූක නලනුක්කාන වලුවාන තිසෙයෛක් - strong direction - කාට්ටුකින්රතු. ඉරුප්පිනුම්, නිති නිලෛත්තන්මෛ, තනියාර්තුරෛ පඞ්කේර්පු, විවසාය නවීනමයමාක්කල්, සෙයර්පඩුත්තල් තෙළිවින්මෛ ආකියවෛ මුතන්මෙයාන කුරෛපාටුකළාක උළ්ළන. අරසු අතන් සෙයර්පඩුත්තුම් තිට්ටත්තෛත් තෙළිවාක අර්රිවික්ක වේණ්ඩුම්. අත්තෝටු, පොතු නම්පික්කෛයෛ උරුවාක්කුවතර්කුම්, අතන් කොළ්කෛකළින් සෙයර්පිරනෛ අතිකරිප්පතර්කුම් වෙළිප්පඩෛත් තන්මෛයෛ උරුති සෙය්ය වේණ්ඩුම්. නන්රි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sarath Kumara. You have ten minutes.

[පූ.භා. 11.36]

ගරු නීතිඥ සරත් කුමාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂය වෙනුවෙන් අපේ ආණ්ඩුව ඉදිරිපත් කළ මංගල අය වැය විවාද කරන මේ අවස්ථාවට සම්බන්ධ වෙලා මගේ කථාව පවත්වන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා.

අපේ රටේ දශක ගණනාවක් තිස්සේම මේ පාර්ලිමේන්තුවට අය වැය වාර්තා ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, ඒ ඉදිරිපත් කළ අය වැය වාර්තා එකක්වත් මේ රටේ මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වුණේ නැහැ කියන කාරණාවත් අපි දන්නවා. ඒවා හුදු සාම්ප්‍රදායික ලියවිලිවලට විතරයි සීමා වෙලා තිබුණේ. ඒ නිසා තමයි මේ රටේ මිනිස්සු තුළ මේ රටේ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ කෙරෙහි තිබුණු ඒ විශ්වාසය බිඳ වැටුණේ. ඒ හින්දා තමයි පසුගිය කාලයේ අපේ රටේ දේශපාලනයේ ගලිවර්ලා වාගේ තිබුණු දේශපාලන පක්ෂ අද ලිලිපුට්ටෝ බවට පත් වෙලා තිබෙන්නේ. අද තමුන්නාන්සේලාට මේ රටේ පිළිගැනීමක් නැහැ. ඒ නිසා අද රටේ ජනතාවට විශ්වාස කරන්න පුළුවන් විධියේ අය වැයක් මේ රටට ඉදිරිපත් කරන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි විශේෂයෙන් සතුටු වෙනවා. ඒ අනුව මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් අය වැයක් තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා ජාතික ජන බලවේග ආණ්ඩුව විසින් ඉදිරිපත් කරලා තිබෙන මේ අය වැය සම්බන්ධයෙන් අපේ රටේ උතුර, දකුණ ඇතුළු සදිසාවේම පීඩාවට පත් වෙලා හිටපු ඒ ජනතාව තෘප්තිමත් වෙනවා කියන විශ්වාසය අපට තිබෙනවා. දැනට අවුරුදු දෙකකට විතර එහා පැත්තේ කාලය අපි හැමෝටම මතකයි. අපි හිටියේ අපේක්ෂා භංගත්වයට පත් වෙලා. අනාගතය පිළිබඳව මොකක්වත් අපේක්ෂාවක් අපට තිබුණේ නැහැ. ඒ වාගේම අපේ ආර්ථිකය ගත්තාම, ඒක ඉතාම අවිනිශ්චිත තත්ත්වයකට පත් වෙලා තිබුණේ. ඒ අවිනිශ්චිත තත්ත්වයට පත් වෙලා තිබුණු ආර්ථිකය අද වෙනකොට යම්කිසි ස්ථාවර මට්ටමකට ගේන්න රජයක් හැටියට අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ අය වැය හරහා මේ රටට නැවුම් බලාපොරොත්තුවක් ගේන්නත් අපි සමත් වෙලා තිබෙනවා කියන පණිවුඩය මේ අවස්ථාවේදී මම ලබා දෙන්න කැමැතියි.

පසුගිය දිනවල මේ පාර්ලිමේන්තුවේ අය වැය විවාදය යන අතර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ අය වැය ඓතිහාසික ලේඛනයක් බවට පත් වෙන්නේ නැහැ කියලා. ඔබතුමන්ලාට සාපේක්ෂව ඒක හරි. මොකද, ඔබතුමන්ලා ඉදිරිපත් කරපු අය වැය ලේඛන කොහෙත්ම ඓතිහාසික ලේඛන බවට පත් වුණේ නැහැ. ඒවා හුදු සාම්ප්‍රදායික ප්‍රලාපවලට පමණයි සීමා වුණේ. හැබැයි, අපි ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය, අපේ රටේ සමාජ, ආර්ථික දේහය ශීඝ්‍ර පරිවර්තනයකට ලක් කරන්න සමත් අය වැය ලේඛනයක් බව අපි බොහොම ආඩම්බරයෙන් කියන්න කැමැතියි. ඒ නිසා ඒක ඓතිහාසික ලේඛනයක් බවට පත් වෙනවා කියන කථාවත් මේ වෙලාවේ විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි.

අපට අද පෙනෙනවා, මේ රටේ ඉල්ලීම් දිනාගන්න වැඩ වර්ජන කරන අය, උද්ඝෝෂණ කරන අය, පෙළපාළිවලට යන අය නැහැ කියන එක. ඇයි, එහෙම වෙලා තිබෙන්නේ? මේ රටේ ජනතාවගේ හද ගැස්ම හඳුනන රජයක් හදන්න අද අපි සමත් වෙලා තිබෙනවා. මේ රටේ ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව සහකම්පනයක් අපට තිබෙනවා. ඔවුන්ගේ වේදනාව අපට දැනෙනවා. ඔවුන්ගේ ප්‍රශ්න ගැන අපට අවබෝධයක් තිබෙනවා. අන්න ඒ නිසාම මේ අය වැය සංවේදී අය වැයක් බවට පත් කරන්න අපට පුළුවන්කම ලැබුණා. රාජ්‍ය සේවක වැටුප් අපි වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල සිසුන්ට ලබා දෙන ශිෂ්‍යාධාර මුදල, මහපොළ ශිෂ්‍යාධාරය අපි වැඩි කරලා තිබෙනවා. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කරන්න අපි පියවර අරගෙන තිබෙනවා. චතු ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් අපි කටයුතු කරලා තිබෙනවා. ගොවියාගේ ද, කම්කරුවාගේ ද, ශිෂ්‍යාගේ ද මේ හැමෝගේම ප්‍රශ්න පිළිබඳව මෙවර අය වැයෙන් අපි අවධානය යොමු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන අය වැය හරහා අපේ රටේ ආර්ථික, සමාජ දේහයේ ශීඝ්‍ර පරිවර්තනයක් අපි බලාපොරොත්තු වෙනවා. අපි මේ අය වැයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් රුපියල් බිලියන 604ක් වෙන් කරලා තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් රුපියල් බිලියන 619ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ප්‍රවාහනය වෙනුවෙන් රුපියල් බිලියන 483ක් වෙන් කරලා තිබෙනවා. ඊළඟට, ජලසම්පාදනය, නිවාස පහසුකම්, ග්‍රාමීය සංවර්ධනය, ක්‍රීඩා සහ තරුණ කටයුතු වෙනුවෙන් රුපියල් බිලියන 190ක මුදලක් වෙන් කරලා තිබෙනවා. කෘෂි කර්මාන්තය වෙනුවෙන් රුපියල් බිලියන 254ක් වෙන් කරලා තිබෙනවා. පාරිසරික කටයුතු වෙනුවෙන් රුපියල් බිලියන 44ක් වෙන් කරලා තිබෙනවා. මහජන ආරක්ෂාව වෙනුවෙන් රුපියල් බිලියන 278ක් වෙන් කරලා තිබෙනවා. ජාතික ආරක්ෂාව වෙනුවෙන් රුපියල් බිලියන 404ක් වෙන් කරලා තිබෙනවා. ආර්ථික සේවා හා ව්‍යවසාය සංවර්ධනය වෙනුවෙන් රුපියල් බිලියන 99ක් වෙන් කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. බලශක්තිය සැපයීම වෙනුවෙන් රුපියල් බිලියන 21ක් වෙන් කරලා තිබෙනවා. රාජ්‍ය සේවය වෙනුවෙන් රුපියල් බිලියන 296ක් වෙන් කරලා තිබෙනවා. සමාජ ආරක්ෂණය වෙනුවෙන් දැවැන්ත මුදලක්, එනම් රුපියල් බිලියන 749ක් වෙන් කරන්න අපි සමත් වෙලා තිබෙනවා. එතකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන් අහනවා, මේ වියදම් කොයි

විධියටද පියවා ගන්නේ, ඒක කරන්න පුළුවන්ද කියලා. අපි කියන්න කැමැතියි, තමුන්නාන්සේලාට මේක කරන්න බැරි බව අපි දන්නවා කියලා.

ඒ නිසා තමයි තමුන්නාන්සේලාට විපක්ෂයට යන්න වෙලා තිබෙන්නේ. අපි තමුන්නාන්සේලාට කියනවා, අපි මේ වැඩය කරන හැටි බලාගෙන ඉන්න කියලා. අපට මේ වැඩය කරන්න පුළුවන් කියන විශ්වාසය තිබෙනවා; ඒ දැක්ම තිබෙනවා. ඒ වෙනුවෙන් අපි ක්‍රියාත්මක වෙනවා.

2025 අවුරුද්දේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් බිලියන 4,990ක්, බදු ආදායම හැටියට රුපියල් බිලියන 4,590ක්, බදු නොවන ආදායම හැටියට රුපියල් බිලියන 370ක්, ප්‍රදාන හැටියට රුපියල් බිලියන 30ක් තිබෙනවා. ඒ වාගේම ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 8,835ක් වනවා. ඒ නිසා අය වැය හිඟය අපි පියවා ගන්න බලාපොරොත්තු වෙනවා, දේශීය හා විදේශීය ණය මුදල්වලින්. ඒ නිසා මේ අය වැය හිඟය පියවන විධිය, මේ රටේ මේ අය වැය අපි කළමනාකරණය කර ගන්නේ කොහොමද කියන කාරණාව සම්බන්ධයෙන් විපක්ෂයේ ඉන්න කවුරුවත් කලබල වෙන්න ඕනෑ නැහැ කියන එකත් මේ වෙලාවේ විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි.

අපේ රටේ ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ විශාල පීඩාවකට මුහුණ දීලා ඉන්නේ. ඇත දියඹේ සති ගණන්, දින ගණන් අවවට වේළෙමින්, වැස්සට තෙමෙමින් තමන්ගේ ශ්‍රමය වගුරවන ඒ ධීවර ජනතාව ගැන තමුන්නාන්සේලා සංවේදී වුණේ නැහැ අපේ රටේ ආණ්ඩු කරනකොට. ඒ වාගේම අපේ රටේ ගොවි ජනතාව කියන්නේ, උදේ ඉඳලා රෑ වෙනකල්, අත්වල කරගැට එන තෙක් පොළොවත් එක්ක හැප්පෙන ජීවිත ගෙවපු පිරිසක්. ඔවුන් ගැනත් ඔබතුමන්ලා මීට කලින් සංවේදී වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි දන්නවා, අපේ ඈත කඳුකරයේ, ඒ හිම මිදෙන සීතලේ අපේ මලයගම් සහෝදර-සහෝදරියෝ අපේ රටට අවශ්‍ය ජාතික ධනය උත්පාදනය කරන්න මොන තරම් වෙහෙසක් ගත්තාද, මොන තරම් ශ්‍රමයක් වගුරවනවාද කියලා. හැබැයි, මේ විපක්ෂය ආණ්ඩු කරන කාලයේදී ඒ ජනතාව ගැනත් සංවේදී වුණේ නැහැ. අන්න ඒ නිසා මේ හැම කෙනෙක් ගැනම සංවේදී වුණු අය වැයක් තමයි අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපේ රටේ ගොවියෝ ද, කම්කරුවෝ ද, වතු ජනතාව ද, රාජ්‍ය සේවකයෝ ද, පෞද්ගලික අංශය ද කියන මේ හැම කෙනෙක්ම පුළුවන් තරම් තෘප්තිමත් කරන්න පුළුවන් විධියේ අය වැයක් ඉදිරිපත් කරන්න අපි මෙවර සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ හැම කෙනෙක්ම මේ රට වෙනුවෙන් ලබා දෙන නිෂ්පාදනයට සාධාරණ පංගුවක් ඔවුන් වෙනුවෙන් වෙන් කරන්නත් අපි තීරණය කරලා තිබෙනවා.

එතකොට තමයි අහන්නේ කොහොමද මේ වැඩය කරන්නේ කියලා. ඒ, ඇයි? තමුන්නාන්සේලා කැමැති නැහැ, මේ රටේ ඉතිහාසය පුරා පීඩාවට පත් වෙලා ඉන්න මිනිස්සුන්ට සහනයක් දෙනවාට. හැබැයි, මෙහිදී අපි තීන්දුවක් අරගෙන තිබෙනවා. අපට ඒ ජනතාවගේ හඳ ගැස්ම දැනෙනවා. ඒ ජනතාවගේ වේදනාව අපට දැනෙනවා. ඔවුන්ගේ ප්‍රශ්න අපට දැනෙනවා. ඒ නිසා ඔවුන් වෙනුවෙන් යම් දෙයක් කරන වගකීම කරට අරගෙන, ඒ වෙනුවෙන් තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විශේෂයෙන් කියන්න කැමැතියි, මේ හැම වගකීමක්ම දරන්න පුළුවන් ආණ්ඩුවක් තමයි අපි හදලා තිබෙන්නේ, ඒ නිසා මේ ආණ්ඩුවේ අය වැය සම්බන්ධයෙන් ඒ වගකීම අපි දරනවා කියන එක. ඒ නිසා අපි හදලා තිබෙන, අපි ඉදිරිපත් කරලා තිබෙන මේ අය වැය තුළින් සෑම සමාජ ස්තරයක් වෙනුවෙන්ම සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් උත්සාහය අපි ගන්නවා කියන එකත් මේ වෙලාවේ විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමැතියි.

රාජ්‍ය සේවාව සම්බන්ධයෙන් අද විශාල විවේචනයක් තිබෙනවා. ඒ අභියෝගය අපි දිනන්න ඕනෑ. ඒ අභියෝගය දිනන්න ඕනෑ නිසා තමයි අපි රාජ්‍ය සේවාව ඩිජිටල් කිරීම වෙනුවෙන් රුපියල් බිලියන 21.8ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම අපේ රටේ තිබෙන යටිතල පහසුකම් නඩත්තුව හා ප්‍රතිසංස්කරණය වෙනුවෙන් අපි රුපියල් බිලියන 255ක් වෙන් කරලා තිබෙනවා. පර්යේෂණ හා සංවර්ධන කාර්යය කියන එක දියුණු වන රටකට අත්‍යවශ්‍ය දෙයක්. ඒ වෙනුවෙන් අපි වෙන් කරලා තිබෙනවා, රුපියල් බිලියන 20.9ක්. මොකද, විශේෂයෙන්ම අපේ රටේ දරුවන්ගේ අනාගතය ගැන අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම සහිතව තමයි අපි මේ අය වැය මේ රටට ඉදිරිපත් කරලා තිබෙන්නේ.

අපි දැක්කා, ජාතික තරුණ සේවා සභාවක් හදලා තිබුණු බව. ඒ මොකටද? මේ රටේ තරුණයන්ගේ ජීවිත ආලෝකමත් කරන්න. හැබැයි, පසුගිය දවස්වල ව්‍යවස්ථාවට මුවාවෙලා අපේ රටේ ජනාධිපතිවරයා බවට පත් වෙච්ච චික්‍රමසිංහ මහත්තයා ප්‍රමුඛ එතුමාගේ බලකාය මොකක්ද කළේ? තරුණයන්ට වෙන් කරලා තිබුණු මුදල අවභාවිත කරලා තිබුණා. පසුගිය දවස්වල COPE එකේ ඒ සම්බන්ධයෙන් විමර්ශනය කළා. අපි දැක්කා, රුපියල් ලක්ෂ 1,800ක මුදලක් ජනාධිපතිවරණයට කලින් දවසේ චෙක්පත් ලියාගෙන හුවමාරු කරගෙන තිබෙන විධිය. අන්න එහෙමයි තමුන්නාන්සේලාගේ පූර්වගාමියෝ මේ රටේ තරුණයන් වෙනුවෙන් කටයුතු කරලා තිබෙන්නේ. ඒ බෙදජනක ඉතිහාසය අපි වෙනස් කරනවා. මේ රටේ දරුවෝ වෙනුවෙන්, මේ රටේ තරුණයෝ වෙනුවෙන්, ඒ වාගේම මේ රටේ මහජනතාව වෙනුවෙන් අපි වග කිවයුතු ආණ්ඩුවක් හැටියටත් කටයුතු කරනවා. ඒ වෙනුවෙන් අපි සාර්ථක අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා කියන කාරණය මේ අවස්ථාවේදී විශේෂයෙන් මම සඳහන් කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවදත් ආදරය කරන මානවවාදියෙක් තමයි, අර්නෙස්ටෝ චේ ගුවේරා. එතුමා කියා තිබෙනවා, "පෘථිවිය මත සිටින විශාලතම ධනවතා සතු ධනයට වඩා මේ මිහිමත සිටින එක මිනිහෙකුගේ ජීවිතය අපට වටිනවා" කියලා. ඒ නිසා මේ රටේ ජීවත් වෙන හැම මිනිහෙකුගේම ජීවිතය සම්බන්ධයෙන් අපට වගකීමක් තිබෙනවා. අපි අනුගමනය කළ පරමාදර්ශය ඒකයි. අන්න ඒ පරමාදර්ශය තුළ සිට අපි මේ රටේ මහජනතාවගේ ජීවිත සුඛිත, මුදිත කිරීමේ අරමුණින් කටයුතු කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. D.V. Chanaka. You have 15 minutes.

[ප.භා. 11.46]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවෙන්ම සුබ පතනවා, මේ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීම පිළිබඳව. ඒ වාගේම රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ වෙනස, ඒ

[ගරු ඩී.වී. චානක මහතා]

සංවර්ධනය කරන්න හැකි වෙන්න කියාත් මම ප්‍රාර්ථනා කරනවා. මේකේ හොඳ සාධනීය කාරණා විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, 159දෙනෙක්ම ඉන්නවා, මේ අය වැයේ තිබෙන හොඳ කියන්න. ඒ නිසා මම ඒ පිළිබඳව අවධානය යොමු කරන්නේ නැහැ. මොකද, 65දෙනෙක් පමණ තමයි මේ අය වැයේ අඩුපාඩු තිබෙනවා නම් ඒවා පෙන්වා දෙන්න ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය පිළිබඳව කථා කරන්න කලින් මම ඊයේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා කළ ප්‍රකාශයක් පිළිබඳව අවධානය යොමු කරන්න කැමැතියි. එතුමා පළමුවෙන් පෙන්වූවා, සියයට 3 ඉඳලා සියයට 52 දක්වා එතුමන්ලාගේ දේශපාලනය කරගෙන ගියපු විධිය; තුනෙන් දෙකක ආණ්ඩුවක් හදපු ආකාරය එතුමා පෙන්වූවා. අනෙක් පැත්තෙන් එතුමා කියනවා, සියයට දෙක හමාරේ කණ්ඩායම ගැන. සියයට දෙක හමාරේ කණ්ඩායමට නම් ඒවා හදේ කියලා එතුමා කිව්වා. හදෙන් හරි, ඉරෙන් හරි, අහහරුවලින් හරි, නෙප්චූන්වලින් හරි එහෙම නැත්නම් ප්ලූටෝවලින් හරි අපි, අපේ වැඩේ කර ගන්නම්. හැබැයි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමන්ලාගේ ලක්ෂ 68 ආරක්ෂා කරගන්න ඔබතුමන්ලා කටයුතු කරන්න.

පළාත් පාලන මැතිවරණය එනවා. හැබැයි, දැන් පොහොට්ටුව ගැන කථා කරනවා වැඩියි. ඉස්සර නම් කථා කළේ නැහැ. සමීක්ෂණ වාර්තා අවුලක් නැතුව ඇති නේද, වසන්ත සමරසිංහ ඇමතිතුමා? එම නිසා ඒ පිළිබඳව පොඩ්ඩක් අවධානය යොමු කරන්න. අපේ සියයට දෙක හමාර මාසයක් යනකොට සියයට 3 වුණා. ඒකවත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දන්නේ නැහැ. හැබැයි, කමක් නැහැ. ඔබතුමන්ලා, ඔබතුමන්ලාගේ වැඩේ කරන්න. අපි, අපේ වැඩේ කරගෙන යන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි මේ අය වැයේ සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ -අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය නොවෙයි, මාලිමාවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය- අතර විශාල පරස්පරතා දකිනවා. එකක් තමයි, මේ අය වැය හඳුන්වලා දුන්නේ බදු නැති අය වැයක් කියලා. අනුර කුමාර දිසානායක මහත්මයා, ඒ වාගේම අග්‍රාමාත්‍යතුමිය ඇතුළු සියලුදෙනා මේක හඳුන්වා දුන්නේ, බදු නැති අය වැය කියලා. හැබැයි, අනෙක් පැත්තෙන් මේ අය වැය කථාවේම තිබෙනවා, සියයට 24ක බදු වැඩි කිරීමක් බලාපොරොත්තු වෙනවාය කියලා. ඒ වාගේම තමයි රුපියල් බිලියන 4,600ක - Rs. 4.6 trillion - බදු ආදායමක් බලාපොරොත්තු වෙනවාය කියනවා. බදු සියයට 24ක් වැඩි වෙනවා. හැබැයි, ඉතාම ලස්සනට ඒක අය වැයෙන් වැඩි කරන්නේ නැතුව හැම දෙයම ඊට කලින් වැඩි කළා. ඔබතුමන්ලා පොරොන්දු වුණේ බදු අඩු කරනවාය කියලා. *[බාධා කිරීමක්]* ගරු අග්‍රාමාත්‍යතුමිය නැහැ කිව්වාට ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, ඖෂධවලට අදාළ වැට් එක අයින් කරනවා, පාසල් උපකරණවලට අදාළ වැට් එක අයින් කරනවාය කියා. ඒ වාගේම solar panelsවලට අදාළ VAT එක අයින් කරනවාය කියාත් තිබෙනවා. එමෙන්ම අනුර කුමාර දිසානායක මහත්මයා ඒක පළමුවැනි අය වැයෙන් කරනවාය කියාත් රැස්වීම්වල කියලා තිබෙනවා. මගේ ළඟ ඒ වීඩියෝ තිබෙනවා. ඒ වාගේම තොරතුරු තාක්ෂණ - IT - ක්ෂේත්‍රයට අදාළ VAT එක අයින් කරනවාය කියලාත් තිබෙනවා. ඒ වාගේ list එකක් මගේ ළඟ තිබෙනවා. මම ඒ list එක මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ සියල්ලටම අදාළව වැට් එක අයින් කරනවාය කියලා ජනාධිපතිතුමා කියා තිබෙනවා. හැබැයි, එහෙම වැට් එක අයින් කිරීමක් නම් අපි දැක්කේ නැහැ. බොරු පොරොන්දුවක් තමයි ඒ දීලා තිබෙන්නේ. ඒ වාගේම තමයි බදු ගැහුවේ නැහැ කිව්වාට අය වැයට කලින්ම බදු ටික ගහ ගත්තා. රඳවා ගැනීමේ බද්ද - Withholding Tax - සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කළා. සාමාන්‍යයෙන් සියයට 5න් විතරක් රුපියල් බිලියන 180ක ආදායමක් පසුගිය අවුරුද්දේ ලැබිලා තිබෙනවා. එහෙම නැත්නම් රුපියල් කෝටි 18,000ක ආදායමක් ලැබිලා තිබෙනවා, සියයට 5න්. හැබැයි, සියයට 5, සියයට 10ට වැඩි කරනවා. ඒ කියන්නේ මොකක්ද? තවත් රුපියල් කෝටි 18,000ක අලුත් බදු එකතු කරලා තිබෙනවා, රටේ ජනතාවට; කෝටිපති ව්‍යාපාරිකයාට නොවෙයි. අග්‍රාමාත්‍යතුමියත් හැම තිස්සේම කියන්නේ, "ගජමිතුරු කෝටිපතින්ට" කියලා. හැබැයි, ගජමිතුරු කෝටිපතින්ට නොවෙයි මේ බදු ගහලා තිබෙන්නේ. මේ බදු ගහලා තිබෙන්නේ තැන්පතුකරුවන්ට. ලංකාවේ කෝටිපතින් තැන්පතු පවත්වාගෙන යන්නේ නැහැ; savings accountsවල සල්ලි දමන්නේ නැහැ. සාමාන්‍යයෙන් ඒවායේ තිබෙන්නේ එක්කෝ ETF එකෙන් ඉතුරු වෙන සල්ලි ටික එහෙම නැත්නම් EPF එකෙන් ඉතුරු වෙන සල්ලි ටික, pension එකෙන් විශ්‍රාමිකයාට හම්බ වෙච්ච සල්ලි ටික එහෙම නැත්නම් පුංචි දරුවෙක් ඉපදුණු දවසේ ඉඳලා කැකුළු ගිණුම්වලට දමපු සල්ලි ටික. ඒවාට තමයි මේ බදු ගැහුවේ. එහෙම නැතුව කෝටිපති ව්‍යාපාරිකයන්ට නොවෙයි. රටේ සමස්ත ජනතාවට, මධ්‍යම පාන්තිකයාට, ගමේ දුප්පත් මනුස්සයාට තමයි මේ රුපියල් කෝටි 18,000ක බද්ද ගහලා තිබෙන්නේ.

ඒ වාගේම අනෙක් පැත්තෙන් අපි දැක්කා, වැඩිහිටි අයට තවත් බද්දක් ගහනවා. මත්පැන්වලට එක පැත්තකින් බදු ගහලා තිබෙනවා. මත්පැන් බොන්නේත් අපේ රටේ ජනතාවම තමයි. වැඩිහිටියන්ට මත්පැන්වලට බදු ගහනවා; පොඩිහිටියන්ට -පුංචි ළමයින්ට- බීම බෝතලේට බදු ගහනවා.

මේ බදු පනවා තිබෙන්නේ "ස්මැක්" කොම්පැනියට නොවෙයි; "කොකාකෝලා" කොම්පැනියට නොවෙයි; "පෙප්සි" කොම්පැනියට නොවෙයි; "රෙඩ්බුල්" කොම්පැනියට නොවෙයි. මේක indirect tax එකක්. මේ බදු කෙළින්ම ගෙවන්න වෙන්නේ බීම බෝතලයක් බොන රටේ පුංචි දරුවන් වෙනුවෙන්. "ෆැන්ටා" එක බිව්වත් එහෙමයි; "ක්‍රීම්සෝඩා" එක බිව්වත් එහෙමයි. ඒවාට වෙනම බදු දාලා තිබෙනවා.

ඊට අමතරව වාහනවලට අය කරන බද්ද වැඩි කරලා තිබෙනවා. රටේ ජනතාව බලාගෙන හිටියා, රුපියල් ලක්ෂ 12ට, රුපියල් ලක්ෂ 20ට කාර් එකක් ගන්න. අන්තිමට මොකද වුණේ? කාර්වලට තිබුණාටත් වැඩිය බදු වැඩි කළා. අපි හිතුවේ පුංචි මිනිහාට, මධ්‍යම පාන්තිකයාට වාහන ගන්න සිහිනය ඇති කරයි කියලා. අන්තිමට ත්‍රී වීලර් එක රුපියල් ලක්ෂ 20යි; මෝටර් බයිසිකලය රුපියල් ලක්ෂ 10යි. මේක තමයි පුනරුද ආණ්ඩුව ගෙනාපු වෙනස.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඒකට නිදහසට කියන කාරණය මොකක්ද? නිදහසට කාරණය විධියට කියනවා, මේ වෙලාවේ බදු අඩු කරලා වාහන මිල අඩු වුණොත් ලීසිං කොම්පැනි කඩාගෙන වැටෙනවා ලු, වාහන සේල් ටික කඩාගෙන වැටෙනවා ලු කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කථාව හැමදාටම වලංගුයි නේ. මේ අවුරුද්දේ බදු අඩු කළොත් එහෙම නැත්නම් මේ අවුරුද්දේ තිබෙන බදුත් එක්ක වාහන ගෙනාවොත් මේ ලීසිං කොම්පැනි කඩාගෙන වැටෙනවා. ලබන අවුරුද්දේ තත්ත්වය මොකක්ද? එහෙනම් ලබන අවුරුද්දේත් බදු අඩු කරන්න බැහැ. ලබන අවුරුද්දේ බදු අඩු කළොත් මේ අවුරුදේ වාහන ගෙනාපු වාහන නිසා ලීසිං කොම්පැනි කඩාගෙන

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වැටෙනවා. එතකොට ඊළඟ අවුරුද්දේ බදු අඩු කළොත් මොකද වෙන්නේ? ඊළඟ අවුරුද්දේත් ඒකම වෙනවා. මේ විධියට කළොත් කවදාවත් අපේ රටේ ජනතාවට වාහනයක් ගන්න වෙන්නේ නැහැ.

ඒ වාගේම තමයි අනෙක් condition එක. අනෙක් condition එක තමයි වාහන ආනයනයේදී නීතියක් දමනවා, අවුරුදු 2ක් පරණ වාහන විතරයි ගේන්න පුළුවන් කියලා. අපි දන්නවා, ජපානය වාගේ රටවල වාහන මිල අඩු වෙන්නේ සාමාන්‍යයෙන් අවුරුදු 4ක් ගත වුණාම කියලා. මොකද, ඒ රටේ තිබෙන road condition එක එක්ක සාමාන්‍යයෙන් අවුරුදු 4ක් ගත වුණාම තමයි වාහන මිල අඩු වෙන්නේ. හැබැයි, සිතාමතාම මේක අවුරුදු දෙකක් කියලා දමපු ගමන් මොකද වෙන්නේ? අන්තිමට වෙන්නේ රටේ ජනතාවට අඩුවට ගන්න තිබෙන වාහන නැති වන එකයි. මේක කෝටිපතියාට, ප්‍රකෝටිපතියාට විතරක් වාහන ගේන්න පුළුවන් විධියට හදපු අය වැයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ආණ්ඩු පාර්ශ්වය පැත්තෙන් මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, මේක ධීවරයන් සහ කෘෂි කර්මාන්තය ගැන හිතලා හදපු අය වැයක් කියලා. හැබැයි අපි දන්නවා, මේ රජය ධීවරයන් වෙනුවෙන් කරපු හොඳ කාරණයක්. අනුර කුමාර දිසානායක මහත්තයා ආපු ගමන්ම ධීවරයන් වෙනුවෙන් තෙල්වලට රුපියල් 25ක් අඩු කරලා දෙනවාය කියනවා අපි දැක්කා; තෙල්වලින් රුපියල් 25ක් අඩු කරලා දෙනවා කියලා එතුමා කිව්වා. හැබැයි, ඇත්තටම ඒක වුණාද? ඒක වුණා, මාස දෙකක්. පසුගිය නොවැම්බර් මාසයේ මැතිවරණය ඉවර වෙච්ච දවසේ ඉඳන් අද දක්වා ධීවරයන්ට එක මාසයකවත් ධීවර සහනාධාරය ලැබිලා නැහැ. ධීවරයෝ දවස් ගණනක් බෝට්ටුවලින් මුහුදු ගිහිල්ලා එනවා. හැබැයි, ධීවරයන්ට හම්බ වෙච්ච කිසිම ධීවර සහනාධාරයක් නැහැ. සමහර විට වසන්ත සමරසිංහ ඇමතිතුමා පළාත් පාලන මැතිවරණය ආවාම ඒවා දෙන්න බලාගෙන ඉන්නවාද දන්නේ නැහැ. හැබැයි, මේ වෙලාවේ නම් එහෙම කිසිම ආධාරයක් ධීවරයන්ට ලැබෙන්නේත් නැහැ.

ඒ වාගේම කෘෂි කර්මාන්තය උදාහරණයකට ගනිමු. දැන් ගොවි මහත්තුරු ඇවිල්ලා කියනවා, අපිට වී කිලෝවකට රුපියල් 120 මදි, රුපියල් 130ක් දෙන්න කියලා. වී කිලෝවකට රුපියල් 10ක වැඩි කිරීමක් ජනාධිපතිතුමාගෙන් ඉල්ලනවා. මොකද, ජනාධිපතිතුමා අනුරාධපුරයේ තඹුත්තේගම ගොවි මහත්තයෙකුගේ පුතෙක් විධියට ආපු නිසා ජනතාව එතුමාගෙන් වී කිලෝවකට රුපියල් 10ක් වැඩි කරලා ඉල්ලනවා. හැබැයි, මොකද වුණේ? ගොවි මහත්තුරුන්ට කිව්වේ රුපියල් 10ක් වැඩි කරනවා කියලා නොවෙයි. ඇමතිතුමා කියනවා, මේ සැරේ ඒ මිලට වී දුන්නේ නැත්නම් රටේ බදු මුදල්වලින් තමයි තෙල් ටික දෙන්නේ, වතුර ටික දෙන්නේ, පොහොර ටික දෙන්නේ, මේගොල්ලන්ට තවදුරටත් පොහොර දෙනවාද, වතුර දෙනවාද කියලා අපි අවධානය යොමු කරනවාය කියලා. එහෙම කරන්නේ පොඩි මිනිහාට; ගොවියාට. හැබැයි, ගමේ මුදලාලි ආවාම කොහොමද? හාල් මෝලේ මුදලාලි ඇවිල්ලා ජනාධිපතිතුමා හමු වෙලා හාල් මිල රුපියල් 280 කියපු ගමන් රුපියල් 220ට තිබුණු පාලන මිල රුපියල් 230ට වැඩි වුණා. ගොවි මහත්තයා ඇවිල්ලා ඉල්ලුවාම රුපියල් 10ක් වැඩි කරලා දෙන්න බැහැ. හැබැයි, හාල් මෝල්හිමියා ඇවිල්ලා ඉල්ලපු ගමන් රුපියල් 10 වැඩි කරලා දෙන්න ගත වුණේ විනාඩි 5යි. ඕක තමයි ඇත්ත තත්ත්වය. මේ අය වැය, පොඩි මිනිහා ගැන හිතන අය වැයක් නොවෙයි.

හැබැයි, ඇත්තම තත්ත්වය මේකයි. මේ ආණ්ඩුව මේ රටේ ජනතාව රැවැට්ටුවා. අනෙක් පැත්තෙන් උපාධිධාරීන් 35,000ක් දැන් බලාගෙන ඉන්නවා, රැකියා දෙන තුරු. වයස අවුරුදු 45ට වැඩි අයටත් රැකියා දෙනවා කියලා පොරොන්දු වුණා. රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගම් අපිව හම්බ වුණාම කියනවා, 35,000කට රැකියා දෙනවා, වයස අවුරුදු 45ට වැඩි අයටත් රැකියා දෙනවා කියලා තමයි මේ ආණ්ඩුව පොරොන්දු දුන්නේ කියා. හැබැයි, අද ඒවා නැති වේගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ ආණ්ඩුව කියනවා, අපි වාහන පර්මිට් දෙන්නේ නැහැ කියලා. මේ කොහේ තිබුණු වාහන පර්මිට් එකක්ද? 2019න් පස්සේ කොහොමත් වාහන පර්මිට් දුන්නේ නැහැ. මේ ගරු සභාවේ ඒ කාලයේ හිටපු මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම් දන්නවා, 2019න් පස්සේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා මන්ත්‍රීවරුන්ට වාහන පර්මිට් දුන්නේ නැහැ කියන එක.

රනිල් වික්‍රමසිංහ මහත්මයා වාහන පර්මිට් දුන්නේ නැහැ. මේ අලුතින් කරපු දෙයක් නොවෙයි. මේවා කොහොමත් දුන්නේ නැහැ. ඒ වාගේම 2024ට කලින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වාහනයක් වෙන් වෙලා තිබුණෙත් නැහැ. හැබැයි, ඇමතිවරුන්ට තිබුණා. මේ ඇමතිවරුන්ටත් ඒ විධියටම ඒ ගණනටම තිබෙනවා. එහෙම නැතිව අලුතින් කළා වාගේ ජනතාව රවට්ටනවා.

හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 සිට 2023 දක්වා මන්ත්‍රීවරුන්ට පර්මිට් එක දුන්නේ නැති වුණාට රාජ්‍ය සේවකයන්ට පර්මිට් එක දුන්නා. විධායක ශ්‍රේණිවල නිලධාරීන්ට පර්මිට් එක දුන්නා, වෛද්‍යවරුන්ට පර්මිට් එක දුන්නා. එහෙම පර්මිට් එක ලැබුණු විධායක ශ්‍රේණියේ නිලධාරීන්, වෛද්‍යවරු අද බලාගෙන ඉන්නවා, තමන්ට වාහනයක් ගෙනෙන්න. තමන් අවුරුදු 4ක් බලාගෙන ඉඳලා, වාහන ආනයනය කරන්න අවසර දුන් ගමන්ම මොකද වුණේ? පර්මිට්වලට වාහන ගෙනෙන්න දෙන්නේ නැහැ ලු. අසාධාරණ නැද්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඔබතුමා වෛද්‍යවරයෙක්. මේකේ ලොකුම අසාධාරණය වෙන්නේ වෛද්‍යවරුන්ට. මොකද, ලංකාවේ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට රියදුරු මහත්මයෙකු සමඟ වාහනයක් ලැබෙන බව අපි දන්නවා. විධායක ශ්‍රේණියේ සියලු නිලධාරීන්ට -ප්‍රාදේශීය ලේකම් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් දිසාපතිතුමා වෙන්න පුළුවන්, Additional Secretary කෙනෙකු වෙන්න පුළුවන්, Secretary කෙනෙකු වෙන්න පුළුවන් - වාහනයකුයි, රියදුරෙකුයි ලැබෙනවා. හැබැයි, වෛද්‍යවරයෙකුට වාහනයක් ලැබෙන්නෙත් නැහැ, රියදුරෙක් ලැබෙන්නෙත් නැහැ. ඒ ගොල්ලන්ට හම්බ වෙන්නේ පොඩි දීමනාවක් පමණයි. රියදුරාටයි, ඔක්කොටම දෙන්නේ රුපියල් 70,000ක දීමනාවක් පමණයි. හැබැයි, ඒ ගොල්ලන් බලාගෙන හිටියා දීමනාව පමණක් ලැබුණාට කමක් නැහැ, අපි පර්මිට් එකෙන් වාහනයක් ගෙනෙනවා කියලා. හැබැයි, මොකද වුණේ? අද ඒගොල්ලන්ටත් ඒ පර්මිට් එකෙන් වාහනයක් ගෙනෙන්න අවසරය නැහැ. විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගෙන් සහ අග්‍රාමාත්‍යතුමියගෙන් ඉල්ලන්න කැමැතියි, මෙහෙම අසාධාරණකම් කරන්න එපා කියලා; මෙහෙම අසාධාරණකම් කරන්න එපා. මන්ත්‍රීවරුන්ට පර්මිට් එපා. හැබැයි, විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට දුන් පර්මිට් එකෙන්, වෛද්‍යවරුන්ට දුන් පර්මිට් එකෙන් ඒගොල්ලන්ට වාහනයක් ගෙනෙන්න අවසර ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි දැක්කා දිගටම මර්දනය. අපි දැක්කා දිගටම තර්ජනය. අපේ නලින්ද ජයතිස්ස මැතිතුමා නම් තර්ජනයක් නොවෙයි කළේ. එතුමා කිව්වා, හඳේ කථාවක්. හැබැයි, ඊයේ දිනයේ මේ ආණ්ඩුවේම නියෝජ්‍ය ඇමතිවරයෙකු අපේ පක්ෂයේ නායකතුමා -අපේ කණ්ඩායමේ නායකතුමා- වන නාමල් රාජපක්ෂ මැතිතුමාට කියනවා, "ගමට ගියොත් යන්න වෙන්නේ වළට" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, නාමල් රාජපක්ෂ මැතිතුමා ගමින්

[ගරු ඩී.වී. චානක මහතා]

ගමට වැඩසටහනට ගමට ගියොත් යන්න වෙන්නේ වළට කියලා. මොකක්ද මේ තර්ජනය? එක පැත්තකින් රටේ සිද්ධ වන සියලු පාතාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ආණ්ඩුව බෝලය පාස් කරනවා, රාජපක්ෂවරුන්ගේ පැත්තට. අනෙක් පැත්තෙන් නියෝජ්‍ය ඇමතිවරයා සෘජුවම මරණ තර්ජනය කරනවා, "වළට තමයි යන්න වෙන්නේ" කියලා. මේක පැලවත්තෙන් කරපු plan එකක්ද? ඔබතුමා බලන්න, ඊයේ සියලුම මාධ්‍ය මේක වාර්තා කළා. පැලවත්තෙන් කරපු plan එකක් කටින් පැන්නාද? මාධ්‍යයෙන් ප්‍රශ්න කරනවා, නාමල් රාජපක්ෂ මහත්මයා ගමින් ගමට යනවා කියලා. එතකොට නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, "එතුමාට ගමට නොවෙයි වළට තමයි යන්න වෙන්නේ" කියලා. මේ තමයි තර්ජනය. එදා ඔබතුමන්ලාගේ ජනතා විමුක්ති පෙරමුණේ ගති එළියට එනවා. මේ NPP එකේ අය නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණේ එදා මිලේච්ඡ ගතිය, ඒ මිනීමරු ගතිය හිටපු ගමන් එළියට පනිනවා. ඒක තමයි අපි දැක්කේ. ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිති නායකයා, එහෙම නැත්නම් මේ ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයා කරපු තර්ජනය අපි තරයේ හෙළා දකිනවා. එක පැත්තකින් ආරක්ෂාව අයින් කරනවා. අනෙක් පැත්තෙන් වළට යවන්න බලාගෙන ඉන්නවා. තමන් අසාර්ථක වනකොට; ආණ්ඩුව අසාර්ථක වනකොට; රට අසාර්ථක වනකොට මෙතුමන්ලාගේ උත්සාහය විපක්ෂයේ මන්ත්‍රීවරු මර්දනය කරන්නයි. මෙතුමන්ලා උත්සාහ කරනවා, වළට යවලා හරි මේ කටවල් වහන්න. හැබැයි, ඒවාට නම් වසන්ත ඇමතිතුමනි, අපි ඉඩ දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමා කිව්වේ නැහැ. ඔබතුමා ගිහිල්ලා ඔබතුමාගේ පිටුපස ඉන්න නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න මොකක්ද මේ වළේ කථාව කියලා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
වමුදිතත් එක්ක කරපු interview එකේදී නම් කිව්වේ රාජපක්ෂලාගෙන් පරිස්සම් වෙන්න ඕනෑ කියලායි.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
වමුදිත මහත්මයාත් එක්ක කරපු ගොඩක් interviews තිබෙනවා. ඔබතුමන්ලාගෙනුත් පරිස්සම් වෙන්න කියලා කියපු interviews තිබෙනවා. එකක් විතරක් බලන්න එපා. ඔක්කොම බලන්න. හැබැයි, ගරු ඇමතිතුමනි, ඕක නොවෙයි ප්‍රශ්නය. ඔබතුමන්ලාගේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ගිහිල්ලා අහන්න, නාමල් රාජපක්ෂ මැතිතුමාව වළට යවනවා කිව්වේ ඇයි කියලා. එතුමා ගමට ගියොත් වළට යවනවා කිව්වේ ඇයි? මේක සාමාන්‍ය කෙනෙකුගේ නොවෙයි, ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමති කෙනෙකුගේ ප්‍රකාශයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ ප්‍රබල අමාත්‍යවරයෙකුගේ මේ තර්ජනය නිසා එක පැත්තකින් වරප්‍රසාද කඩවෙලා තිබෙනවා, තව පැත්තකින් තර්ජනයක් වෙලා තිබෙනවා, තවත් පැත්තකින් ජීවිත තර්ජනයක් වෙලා තිබෙනවා. ඔවුන්ගේ ඇහ ඇතුළෙන් එන්නේ ඔවුන් කරපු plans ද? මේවාද ඉස්සරහට බලාපොරොත්තු වෙන්නේ? ගොවියා එළියට බහිනකොට, ධීවරයා එළියට බහිනකොට විපක්ෂයේ මන්ත්‍රීවරු වළට යවන්නද සූදානම් වෙන්නේ කියලා අපි මේ වෙලාවේ අහනවා.

Thank you very much, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Asitha Niroshana Egoda Vithana. You have 11 minutes.

[අ.භා. 12.01]

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පළමුවැනි අය වැයේ දෙවන වර කියැවීමේ විවාදයේ අවසන් දවසේ අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මීට පෙර අදහස් දක්වපු ඩී.වී. චානක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, රටේ ජනතාව පොහොට්ටුව ගැන වැඩිපුර කථා වෙනවා කියලා. ඔව්, ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේලා ගැන වැඩිපුරම කථා වෙනවා. රටේ මහජන බදු මුදල් හොරා කාලා, අහිංසක ජනතාව වෙනුවෙන් තිබෙන ජනාධිපති අරමුදලේ සල්ලි මිලියන ගණන් තමන්ගේ සුබවිහරණය වෙනුවෙන් පාවිච්චි කරලා, නිවාස වන්දි ලෙස උපරිම ගන්න පුළුවන් ලක්ෂ 25ක් වුණත්, රුපියල් මිලියන 56, මිලියන 76, මිලියන 95 වාගේ ප්‍රමාණයන් අරගෙන ඒ කරපු අපරාධවලට, ක්‍රිෂ් ගොඩනැඟිල්ලේ වංචාවට, මනුෂ්‍ය ඝාතනවලට හිරේ යන්න ඉන්න පොහොට්ටුවේ කට්ටියගේ list එක පිළිබඳව රටේ ජනතාව අද සාකච්ඡා වෙනවා. වැඩිපුරම සාකච්ඡා වෙන්නේ දැන් ඒක.

ඒ විතරක් නොවෙයි. මේ මන්ත්‍රීවරුන්ගේ පියතුමන්ලා ධීවරයෝ ගැන කථා කරමින් හම්බන්තොට වරායවල් හැදුවා. රෑකව වරාය, මාවැල්ල වරාය හැදුවා, කිරින්ද වරාය හැදුවා. බෝට්ටුවකට යන්න පුළුවන්ද? ධීවරයෝ බෝට්ටු අරගෙන වරායට ඇතුළු වෙන්න බලාගෙන ඉන්නවා, රළ කඩනය ළඟට වෙලා. වරායවල් හදනකොට තමන්ගේ ගල් මෝලෙන් ගල් අරගෙන ගියේ. අන්න එහෙම තමයි පියතුමන්ලා ඒවා හැදුවේ. ඉංජිනේරු වාර්තාවක් අරගෙන නැහැ.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිසිම මන්ත්‍රීවරයෙකුගේ නමක් ප්‍රකාශ කළේ නැහැ.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මම කිසිම මන්ත්‍රීවරයෙකුගේ තාත්තා කෙනෙකුගේ නමක් ප්‍රකාශ කළේ නැහැ. ඒ නිසා point of Order එකක් නැහැ. කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* Point of Order එකක් නැහැ. මම කිසිම මන්ත්‍රීවරයෙකුගේ නමක් කිව්වේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Asitha Niroshana Egoda Vithana, please proceed with your speech.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ඉංජිනේරුවාත් තාත්තා, කොන්ත්‍රාත්කාරයාත් තාත්තා, ගල් ගත්තේත් තාත්තාගේ ගල් මෝලෙන්. අන්න එහෙම තමයි මාවැල්ල, කිරින්ද ඔය වරායවල් ටික හැදුවේ. අද ධීවරයෝ අසරණ වෙලා ඉන්නවා. මේ අය අද ධීවරයෝ ගැන කිඹුල් කඳුළු හෙළනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට සුද්ධ කරන්න ගොඩක් දේවල් තිබෙනවා.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. D.V. Chanaka? Pease make it very short.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මගේ නම සඳහන් කළා. මෙතුමා කථාව පටන් ගත්තේම ඩී.වී. චානක මන්ත්‍රීතුමාට උත්තර දෙනවා කියලා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. Let me explain.

ගරු මන්ත්‍රීතුමනි, ඔය කියපු ධීවර වරායවල් ඔක්කෝම හැදෙන්නේත් යහ පාලන ආණ්ඩුව කාලයේ. ඒවා design කළේ ධීවර අමාත්‍යාංශය. ඒවා design-build විධියට දෙන්නේ නෑ. ඔබතුමන්ලා නොදන්නා දේවල් කථා කරන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. D.V. Chanaka, you have clarified your point. Hon. Asitha Niroshana Egoda Vithana, you may proceed now.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
කට්ටිය කලබල වෙලා තිබෙන්නේ. කනත්ත ළඟින් යනකොට දැන් ඉතිපිසෝ ගාථාව කියැවෙනවා. පෝලිමට හිරේ යන්න ලැහැස්තිවෙලා ඉන්න කට්ටියට දැන් ඉතිපිසෝ ගාථාව කියැවෙනවා. භයවෙලා දහලනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය මේ මහජන බලයට භයවෙලා තිබෙන්නේ. අපට සුද්ධ කරන්න ගොඩක් තැන් තිබෙනවා.

හම්බන්තොටට, බෙලිඅත්තට කුඩු එන එකත් නතර කරන්න ඕනෑ. අපි දන්නවා, ගුරු පොකුණ වරායට කුඩු එන්නේ කොහොමද කියලා. කිරින්ද ධීවර වරායට, ගුරු පොකුණ ධීවර වරායට කුඩු එන එකත් නතර කරන්න ඕනෑ. අපි ඒ කටයුතු පටන් ගන්නවා. කට්ටියක් දැන් කලබල වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් අය වැය ගැන කථා කරන්නම්. මේක තමයි අපේ පළමුවැනි අය වැය ලේඛනය. ඔබ දන්නවා, රජයේ මූලික ප්‍රතිපත්ති ප්‍රකාශනවලින් වැදගත්ම ලියවිල්ලක් තමයි අය වැය ලේඛනය කියන්නේ. රටේ මහ ජනතාවගේ අයිතිවාසිකම් ඉටු කරන්න, ඒ අයිතිවාසිකම් ජයග්‍රහණය කරවන්න, සියලු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් සමානාත්මතාවයේ පදනම මත මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කරන්න, ඒවා අධීක්ෂණය කරන්න, නියාමනය කරන්න, ජනතාවගේ ජීවිත අදාළ මුදල් වර්ෂය ඇතුළේ ඉහළට ඔසවා තබන්න ඉදිරිපත් කරන මූලිකම ලියවිල්ල, ඒ ජනතා අභිලාෂයන් මුදුන් පමුණුවාලන මූලිකම ලියවිල්ල තමයි අය වැය ලේඛනය කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඕනෑ නම් පුළුවන් රටක තිබෙන ආදායම් සහ වියදම් පිළිබඳ සංඛ්‍යා, දත්ත ටිකක් නිකම්ම කොළයකට අරගෙන අය වැයක් විධියට ඉදිරිපත් කරන්න. නමුත් අය වැය ලේඛනය කියන්නේ සංඛ්‍යාලේඛන පමණක් නොවෙයි. මේ සංඛ්‍යාලේඛන ඇතුළේ මිනිස් ජීවිත ස්පර්ශ වෙලා තිබෙනවා.

මේ රටේ ගොවීන්ගේ ජීවිත, ධීවරයන්ගේ ජීවිත, ඈත පරිධියේ ගම්මානවල ඉන්න මිනිසුන්ගේ ජීවිත මේ රටේ ආර්ථික දේහයෙන් පිට මං කළ අන්ත අසරණ මිනිසුන්ගේ ජීවිත මේ අය වැය ස්පර්ශ කර තිබෙනවා. දැවැන්ත මිනිස් පරම්පරාවක් ඉන්නවා, මෙතෙක් ඉතිහාසයේ අය වැය ලේඛනවලින් පිට මං කරපු. නිකම්ම නිකම් සංඛ්‍යා දත්ත වෙනුවට, අය සහ වැය විධියට දාපු සංඛ්‍යා දත්ත වෙනුවට මේ මිනිස් ජීවිතත් එක්ක සම්බන්ධ වෙච්ච පණ ගැහෙන ලියවිල්ලක් තමයි අය වැය ලේඛනය කියන්නේ. අප මේ ඉදිරිපත් කර තිබෙන්නේ ඓතිහාසික අය වැයක්. මේක නිකම්ම නිකම් අය වැයක් නොවෙයි, මේක පුරවැසියා පදනම් කර ගත්තු අය වැයක්; මේක පුරවැසි ලියවිල්ලක්. මේක මනුෂ්‍යත්වය ඉහළට ගොඩ දාන ලියවිල්ලක්. *[බාධා කිරීමක්]* අපි ඔය මන්ත්‍රීවරුන්ට කියනවා, මේක පොඩ්ඩක් අහගෙන ඉන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඉදිරිපත් කළේ පුරවැසි ලියවිල්ලක්, පුරවැසි අය වැය ලේඛනයක්, සියලු මිනිසුන්ගේ හදවත් ස්පර්ශ කරන අය වැය ලියවිල්ලක්. එම නිසා මෙය පූර්ණ ජනතා සහභාගිත්ව අය වැය ලියවිල්ලක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා දන්නවා පාර්ලිමේන්තුවේ අසුන් ගෙන ඉන්න අපේ ජාතික ජන බලවේගයේ මේ මහජන නියෝජිතයෝ 159 දෙනාම මේ රටේ සාමාන්‍ය අම්මා තාත්තාගේ දරුවන් බව. ඈත ගම් නියම් ගම් නියෝජනය කරමින්, ඈත වතුකරය නියෝජනය කරමින්, උතුරේ අභිංසක දෙමළ ජනතාව නියෝජනය කරමින්, සාමාන්‍ය රජයේ පාසල්වල අධ්‍යාපනය ලබපු, සාමාන්‍ය රජයේ විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා අධ්‍යාපනය ලබපු අයයි මේ. ඒ විතරක් නොවෙයි, ඈත පිටිසර රජයේ මූලික රෝහලෙන් බෙහෙත්, ප්‍රතිකාර ගත්තු, තමන්ගේ සෞඛ්‍ය රැකවරණය ලබා ගත්තු සාමාන්‍ය පන්තියේ අම්මා තාත්තාගේ දරුවන් තමයි මේ මහජන නියෝජිතයින් 159දෙනා කියන්නේ. මේ අය ගොවි බිම්වල වැඩ කරපු, කම්හල්වල වැඩ කරපු, වෘත්තීය අරගළවලට මැදිහත් වුණු, ශිෂ්‍ය ව්‍යාපාර ඇතුළේ ක්‍රියාත්මක වුණු මේ රටේ සාමාන්‍ය මිනිසුන්ගේ දරුවෝ. එම නිසා මේ අය වැය ලියවිල්ල පදනම් වන්නේ ඒ ඈත පිටිසර ඉන්න මිනිසුන්ගේ දුක් අදෝනාවන්. දශක ගණනාවක් දේශපාලනය කරමින්, ඒ මිනිසුන් එක්ක ජීවත් වෙච්ච මහජන නියෝජිතයන් විධියට තමයි අපි මේ අය වැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා තමයි මෙය මනුෂ්‍යත්වය එක්ක සම්බන්ධ වෙච්ච ලියවිල්ලක් කියලා අප කියන්නේ. මොකද අපත් එක්ක ජීවත් වෙන්නේ සාමාන්‍ය අම්මා තාත්තාගේ දරුවන්, සාමාන්‍ය මිනිසුන්, අන්ධ ජනතාව, විවිධ ආබාධවලට ලක් වෙච්ච පුරවැසියන්. මේ

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

සියලුදෙනා ද ඇතුළුව අපි එකම මනුෂ්‍යයන් විධියට පහුගිය කාල වකවානුවේ එකට ජීවත් වුණා. ඔවුන්ගේ වුවමනාව තමයි මේ අය වැය ලේඛනය තුළින් ප්‍රකාශයට පත් වන්නේ. ඒ නිසා මේ සමාජය සිරස්වත්, තිරස්වත් මේ අය වැය ලේඛනයේ පැතිරිලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඈත ගම් නියම් ගම් සම්බන්ධ කර ගත්තු අය වැය ලේඛනයක් බවට මෙය පත් වෙලා තිබෙනවා. මිනිස් ශරීරයේ ස්නායු පද්ධතිය වාගේම සියලු ස්ථාන එකට සම්බන්ධ කර ගත්තු අය වැය ලේඛනයක් තමයි අප ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා මිනිස් ජීවිතවලට නව වටිනාකම් දෙන ලිවිල්ලක් බවට මෙය පත් වෙලා තිබෙනවා.

ඔබතුමන්ලා දන්නවා මේ ආර්ථික දේහයෙන් පිට මං කළ සමාජ තීරු බොහෝ ගණනක් සිටින බව. හැම ආණ්ඩුවක්ම මූලික වශයෙන් ආමන්ත්‍රණය කරපු, ස්පර්ශ කරපු යම් ප්‍රමාණයක් තිබෙනවා වාගේම, මේ නව අය වැය ලේඛනයෙන් ඊට වඩා එහා ගිය පුළුල් වපසරියක් ස්පර්ශ කර තිබෙනවා. අඩු ආදායම්ලාභී ජනතාවගේ ප්‍රතිලාභ වෙනුවෙන් අපි රුපියල් බිලියන 161ක් වෙන් කර තිබෙනවා. ආබාධ සහිත ජනතාව වෙනුවෙන් අපි රුපියල් බිලියන 36.9ක් වෙන් කර තිබෙනවා. අවුරුදු 70ට වැඩි සහ අවුරුදු 100ට වැඩි වැඩිහිටියන් සඳහා මුදල් වෙන් කර තිබෙනවා. වකුගඩු රෝගීන් සඳහා වාගේම පාසල් සිසුන් සඳහා පොත්පත් ලබා දීමටත් අපි මුදල් වෙන් කර තිබෙනවා. මහා විශාල අදෝනාවක් බවට පත් වෙලා තිබුණා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතුරුම්වලට ගෙවන පොලී අනුපාතය අඩු කිරීම. ඒ නිසා අපි ඔවුන්ගේ ඉතුරුම්වලට අමතරව සියයට 3ක පොලී අනුපාතයක් ලබා දීම සඳහා රුපියල් බිලියන 15ක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උකස් භාණ්ඩ සින්න වෙච්ච ජනතාව වෙනුවෙන් ද අපි යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. දෘශ්‍යාබාධිත ජනතාව වෙනුවෙන් ද මුදල් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මෙතෙක් කාලයක් ස්පර්ශ නොකරපු ක්ෂේත්‍රයක් වන, අපේ රටේ ඔටිසම් රෝගයෙන් පෙළෙන ආදරණීය ජනතාව වෙනුවෙන් අපි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා ලෝක ජනගහනයෙන් සියයට 2ක් ඔටිසම් රෝගයෙන් පෙළෙන බව. ලංකාවේ වසරකට ඔටිසම් දරු උපත් 2,000ක් පමණ සිද්ධ වෙනවා. 2017 වසරේ සංඛ්‍යාලේඛනයක් තිබෙනවා, ඔටිසම් රෝගයෙන් පෙළෙන දරුවන් 4,500ක් පළමුවෙනි වසරට ඇතුළත් වෙලා තිබෙනවා කියලා. අප්‍රේල් 02වැනි දා "ලෝක ඔටිසම් දිනය" ලෙස නම් කරලා තිබෙනවා. මෙතෙක් ඉතිහාසයේ කිසිම ආණ්ඩුවකට හසු නොවුණු අපේ රටේ මේ ආදරණීය දරුවන් වෙනුවෙන්, මේ ආදරණීය ජනතාව වෙනුවෙන් අපි මුදල් වෙන් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔටිසම් දරුවන් වෙනුවෙන් අප වෙන් කර තිබෙන රුපියල් මිලියන 200 සමාන කළ හැක්කේ කුමකටද? කෙහෙළිය රඹුක්වැල්ල, ජොන්ස්ටන් ප්‍රනාන්දු, ප්‍රසන්න රණතුංග නිවාස වන්දි වෙනුවෙන් ගත්තු -මංකොල්ල කාපු- මුදල රුපියල් මිලියන 245ක් වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙච්චර බංකොලොත් කළ රටේ අපට ඔටිසම් දරුවන් වෙනුවෙන් වෙන් කිරීමට හැකියාව තිබෙන්නේ රුපියල් මිලියන 200යි. නමුත්, මේ රටේ මහජන ධනය රුපියල් මිලියන 245ක් ඒ හිටපු ඇමතිවරු තුන්දෙනා නිවාස වන්දි විධියට අරගෙන තිබෙනවා; කොල්ල කාලා තිබෙනවා. මේ අදෝනාව තමයි මේ රටේ ජනතාව වෙතින් නැහෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි මෙම අය වැයෙන් ඉතිහාසයට සාධාරණයක් ඉටුකරලා තිබෙනවා. 1981 මැයි 31වැනි දා මහ රෑ යාපනය පුස්තකාලයට ගිනි තියනවා. යාපනය පුස්තකාලය නැවත නඟා සිටුවීම වෙනුවෙන්, ඩිජිටල් පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් අපි මේ අය වැයෙන් රුපියල් මිලියන 100ක මුදලක් වෙන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යාපනය පුස්තකාලයට ගිනි තැබීම මේ රටේ ඉතිහාසයේ දැවැන්ත කළු පැල්ලමක්. මේ රටේ ජේ.ආර්. ජයවර්ධන පාලනය යටතේ එවකට ඇමතිවරුන් විධියට හිටපු රනිල් වික්‍රමසිංහ, ගාමිණී දිසානායක, ෆෙස්ටස් පෙරේරා, සිරිල් මැතිව් කියන කැබිනට් ඇමතිවරුන් හතර දෙනා යාපනයට යවලා ඒ පුස්තකාලය ගිනිබත් කරවනවා. ඉතිහාසයේ ඒ දැවැන්ත කළු පැල්ලම නිසා අපේ රටේ බෞද්ධවාදී යුද්ධයක් නිර්මාණය වුණා. මේ පාර්ලිමේන්තුවෙන් එළියට බහින කොට පෙනෙන, පාර්ලිමේන්තු ක්‍රීඩා පිටියේ කෙළවරේ රණවිරු ස්මාරකය පාමුල ලියා තිබෙන, යුද්ධයෙන් මිය ගිය අපේ රටේ රණ විරුවන්ගේ නාම ලේඛනයට වග කියන්න ඕනෑ මිනිස්සු තමයි මේ අප ඉදිරිපිට ඉන්නේ. ජේ.ආර්. ජයවර්ධන පාලනය විසින් -එවකට එක්සත් ජාතික පක්ෂයේ නායකයන් විසින්- කරපු ඒ මහා සංහාරය නිසා අපේ රටේ ජනතාවගෙන් බොහෝ දෙනෙකුගේ ඇස් අන්ධ වුණා; අතපය අහිමි වුණා. අපේ රටේ තරුණ පරම්පරාවේ ඒ අහිමි වූ ජීවිතවලට වග කියන්න ඕනෑ මේ අප ඉදිරිපිට විපක්ෂය පැත්තේ සිටින නායකයන්ගේ එවකට තිබුණු පක්ෂයයි. මුළු මහත් ඉතිහාසයේ කළු පැල්ලමක් අහෝසි කිරීම වෙනුවෙන් අපි යාපනය පුස්තකාලයට රුපියල් මිලියන 100ක් වෙන් කරමින් උතුරේ ඒ ආදරණීය ජනතාවට දකුණේ සහෝදරත්වයේ දෑත් දිගු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබී ඇති කාලය අවසානයි. මේ අය වැය ලේඛනය අංක ගණිතමය එකක් විතරක් නොවෙයි, මේ රටේ හැම සමාජ තීරුවක්ම ආමන්ත්‍රණය කරපු, ඒ හැම හදවතම ස්පර්ශ කරපු, මේ රටේ මනුෂ්‍යත්වයේ පදනම ගොඩ නඟපු අය වැයක්. හොරුන්ට, දූෂිතයන්ට මේ අය වැය ලේඛනය ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. ඔවුන් මේකට එරෙහිව කරුණු දක්වයි. නමුත් මේ රටේ සුවහසක් ජනතාව මේ අය වැය ආදරණීය ලෙස භාර ගෙන ඉවරයි. බොහොම ස්තූතියි.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. D.V. Chanaka? Could you please be very brief?

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මම තත්පර 15යි ගන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු මන්ත්‍රීතුමනි, මට, මගේ තාත්තාට, මගේ පවුලේ අයට එක රුපියලක හරි වංචා චෝදනාවක් තිබෙනවා නම්, වරප්‍රසාදවලට මුවා වෙන්නේ නැතුව පාර්ලිමේන්තුවෙන් එළියේ කියන්න කියලා මම අභියෝග කරනවා. ඔබතුමාගේ කොන්ද කෙළින් තිබෙනවා නම් එළියෙදි කියන්න. අධිකරණයේදී හමු වෙමු. මීට පෙර අපේ පවුලට එක්කෙනායි චෝදනා කළේ. ඒ, රන්ජන් රාමනායක මහත්මයා. අපි දැන් එතුමාට defamation case එකක් දාලා තිබෙනවා. අන්තිමට එතුමාට උසාවියට ඇවිල්ලා කියන්න වුණා, "සමාවෙන්න මම එහෙම කිව්වේ නැහැ" කියලා. ඔබතුමාට එක අභියෝගයයි කරන්නේ. පුළුවන් නම්, කොන්ද කෙළින් නම් පාර්ලිමේන්තුවෙන් එළියේ කියන්න. අපි අධිකරණයේදී හමු වෙමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. G.G. Ponnambalam, please. You have 18 minutes.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Pnnambalam)
I was told 20 minutes have been allotted to me, Hon. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have to economize on time as all the speakers are exceeding their time limits.

[12.13 p.m.]

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, I thank you for allotting me at least 18 minutes.

When this Government took office, Sir, I actually wanted to wish the Government well. The reason for that is this. As you know, we have had basically two parties governing this country for the last 77 years; there had been changes in names and certain postures but, by and large, it had been those two parties or formations which had governed this country. When the Hon. President, as Minister of Finance, Planning and Economic Development, presented the Budget, he mentioned that; he also mentioned that in his Policy Statement. So, this Government's coming into power marks a radical departure from that 77-year history and whatever one may say about the JVP, which is the predominant constituent of the National People's Power, it has stood for certain principles.

As a party, we might not agree with the way in which they look upon the ethnic problem or the Tamil nationalists' position with regard to the vision for this country. But, nonetheless, they have stood by certain principles and have stated that when they are in power, they will ensure the complete eradication of racism, which has been the bane of this country and which, we ourselves say, has been the backbone of the ethnic conflict. Racism, meaning a majoritarian Sinhala Buddhist nationalist ideology, unfortunately is exclusive in nature to a point where the Tamil-speaking people predominantly, but definitely the Tamil people of the North and the East, have been terribly targeted. So, it is in that backdrop, where there has been a clear departure, that my party and I were hoping that this Government would demonstrate a new beginning through this Budget.

So, when we look upon this Budget, the test, Sir, is whether there is a significant departure from the previous way of looking at the key issues facing the Tamil people of the North and the East - we represent the Tamil people of the North and the East - which had made us oppose the previous governments. That is not rocket science; that is the key test we would apply when we look at this Budget. So, in that sense, I mentioned that we were hopeful and were actually looking forward to this Budget because there is an element within this Government, the predominant party, the JVP, being a leftist-oriented party, that it would not be too enamored by centre-right and right-wing economic policies, but there would be a tendency towards looking at the vulnerable, paying special attention to them, to protect them and their economies, making sure their economies would grow. That is a key element of leftist thinking. So, that was something we were actually looking forward to in this Government's Budget.

Sir, one of the key things I was looking for - actually, the Hon. President, the Minister of Finance, mentioned it once or twice - is that to the North and the East, which, due to the war situation for over 30 years, has been specifically vulnerable, special attention would be paid.

And, that is true, that is exactly what we were expecting to see in this Budget. But honestly, Sir, there is nothing specific in this Budget for the North and the East, nothing specific to say that the North and the East, because of the war situation that existed for 30 years, is specifically vulnerable and must be protected.

The President mentioned, for the North and the East, certain projects. For example, he said that for rural road development project in the North, he is allocating Rs. 5 billion. That is, Rs. 5,000 million. When he was in Jaffna a few weeks ago and attended the District Coordinating Committee meeting, which I also attended, he specifically asked the officials of that particular department under the Provincial Council as to how much money they are capable of spending for rural road development in Jaffna. The gentleman who represented the particular department said that they have been allocated Rs. 1,300 million and they would be able to spend that amount for this year. Then, the President went on to say, "Okay, if you say that you can spend that money, I will allocate Rs. 5,000 million for the Northern Province". That is, Rs. 5 billion. This is a typical example where doubt creeps in. In the Northern Province, you have five districts. Assuming that you allocate the Rs. 5,000 million equally to those five districts in the war-affected area, Rs. 1,000 million will be allocated for each district. Jaffna, for this year, has been allocated Rs. 1,300 million and it is relatively developed when it comes to roads. It is the other districts in the Northern Province which actually need far more allocations. So, now, under his proposal of Rs. 5 billion, Jaffna is going to get, at best, only Rs. 1,000 million, Rs. 300 million less than what we have been allocated this year. So, to say in a sweeping statement that you are getting Rs. 5 billion looks quite good, but in the detail, there is a serious problem.

Another thing he specifically mentions is the allocation of Rs. 100 million to the Jaffna Public Library. Good, it is something that we welcome. But honestly, Sir, today, Rs. 100 million is nothing. You know that. I mean, a fairly wealthy person who tries to build a house in Colombo will not be able to complete it for Rs. 40 million

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

or Rs. 50 million. So, what is Rs. 100 million for an entire library that was completely destroyed and still not restored to its original splendour? Therefore, when it comes to the details, there is a problem. We have repeatedly said this in previous Budgets. I have been a Member of Parliament since 2001 and at that time, we spoke in terms of needing a special provision for the North and the East because it was war-affected. Certainly, since I got re-elected in 2020, we have been saying that after 2009, the consecutive Governments should have declared the North and the East a war-affected area, brought in certain protectionist measures for, maybe, five years or ten years to ensure that the economies of the people who are vulnerable, who are literally 40 years behind the rest of the country are protected, strengthened and are allowed to grow, and once they are ready to compete with the rest of the country, then you can have an all-encompassing policy for the whole country. We have been saying that to the previous Governments, but, of course, none of those Governments listened. So, we were hoping that this Government, which is dominated by the JVP, a leftist party, would actually take that point, but they have not. And, as a result, there are serious concerns, Sir.

Now, take, for example, the allocations of Capital Expenditure to the Kachcheries in the North and the East under the First Schdule of the Appropriation Bill. They are in this way: the District Secretariat/ Kachcheri - Jaffna has been allocated Rs. 187 million, the District Secretariat/ Kachcheri - Mannar, Rs. 189 million, the District Secretariat/ Kachcheri - Vavuniya, Rs. 100 million, the District Secretariat/ Kachcheri - Mullaitivu, Rs. 126 million and the District Secretariat/ Kachcheri - Kilinochchi, Rs. 179 million. You think that these are very good figures. They should be very good figures, especially because those are war-affected areas which need much more than the rest of the country. But, compare those figures with that of Hambantota. The District Secretariat/ Kachcheri - Jaffna has been allocated only Rs. 187 million, whereas the District Secretariat, Hambantota has been allocated Rs. 578 million as Capital Expenditure. The District Secretariat, Matara has been allocated Rs. 473 million, the District Secretariat, Galle, Rs. 545 million, the District Secretariat, Gampaha, Rs. 432 million, the District Secretariat, Kalutara, Rs. 516 million and the District Secretariat, Colombo, Rs. 452 million. These are fairly safe and developed areas. The District Secretariat, Kurunegala has been allocated Rs. 256 million, the District Secretariat, Anuradhapura, Rs. 309 million, the District Secretariat, Ratnapura, Rs. 566 million and the District Secretariat, Kegalle, Rs. 540 million. But, our allocations do not even go beyond Rs. 200 million! In the North and the East, an area affected by war for over 30 years, we do not get even more than Rs. 200 million, but well below Rs. 200 million. Surely, there is something wrong with these allocations. What is the message you are sending to people like us? The President and Minister of Finance, in his Budget Speech, says that the war-affected areas must be developed and special focus must be given. But, in reality, it is the complete opposite. So, those are our concerns.

There has been a lot of dedication to education. Sectoral-wise, there have been several matters that the present Budget has raised. Those, we welcome. Sir, if you take education - the Prime Minister is the Minister concerned - they talk of modernizing school education, pre-school nutrition programme, student scholarships and development of sports schools. All these are wonderful; these are things that we will give our support to. I ask the Hon. Prime Minister whether she, as Minister of Education, Higher Education and Vocational Education, is not aware that there is a thing called pre-schools. Under her Ministry, pre-school teachers in the North are paid something like Rs. 6,000 as an allowance. That is it, only Rs. 6,000.

And, the Ministry of Defence also has pre-school teachers under the Civil Security Department. Do you know what their wage is? Well over Rs. 20,000! If I am not mistaken, it is Rs. 30,000 or even more now. What does that mean? What is the message you are giving? Teachers who are supposed to perform the same job, under the Ministry of Education, are paid Rs. 6,000 whereas under the Ministry of Defence, which is a military institution, they are paid over Rs. 30,000! What is that? Why is that applied only to the North and the East, especially to the Northern Province? Is that not militarization of education? Does that not sound very sinister? But, this Government says nothing of it. It talks of pre-schools; it talks of developing that sector, but says nothing about this disastrous policy of the previous governments, their very racist and extremely counterinsurgency policy for even 15 or 16 years after the war, which we have opposed very vehemently. This Government is silent on that. That means, it is going to continue with that.

If we look at the Eastern Province, all that is said is, the Eastern Province is going to be promoted, made into a financial hub, and the entire burden is put on India, that India will be sought after, that India will come in and take the entire burden of developing the Eastern Province. Very good! We know that India will come forward. But, whilst you want India to come forward to help us, you are also announcing in this very same Budget that 39 tanks in the Trincomalee Oil Tank Farm are going to be bidded for internationally. You know that India is very interested in those oil tanks. If those 39 oil tanks are going to be palmed off to somebody else, do you think India would be interested in helping us? Do you think India would take that kindly? When India has repeatedly said that they have a special interest in completely taking over those oil tanks, since these commitments come under the Indo-Lanka Accord, you have chosen to go for international bids. And, we know what that means; if it were some other government, we would know for sure what that means. So, there is no guarantee that India would come forward to help us because on the one hand, you say you want India, but on the other, you aggravate the situation, creating doubts.

And the Eastern Province's entire future, according to this Budget, depends on India. All are up in arms, Sir. So, even in that regard, we have no definite commitment because of your own policies, which, very clearly, might negatively impact on India.

Then, agriculture and food security is another topic that the Budget speaks of. Sir, for the North and the East, the Forest Department and the High Security Zones are a curse! Soon after the war, High Security Zones were declared for the military and large swathes of lands were taken over by Forest Department, from which people were displaced because of the war situation. When they came back, their lands have been declared a forest area. We have been trying to get those back, but we have not been able to. People have been arrested and produced before courts without bail.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have only two more minutes.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Deputy Speaker, please give me two extra minutes; two more minutes over the two minutes I have.

And, there is nothing about any of that in this Budget. If you all do not tackle the Forest Department and the militarization in the North and the East, which the Government said it will - in the last three months, it has done nothing - then, this concept of agriculture and food security becomes a pipedream for people in the North and the East, Sir.

Then, you talk about dairy production. Well and good, we will be supporting it to the highest. But, in Mayilathamadu and Madhavanai in the Eastern Province, over 30,000 acres of dairy lands allocated are today being forcibly and illegally confiscated by people from outside districts, preventing dairy production there. In the past, previous Governments had stood against the Tamil people on this question of dairy lands in Mayilathamadu and Madhavanai. There is not a word from this Government also with regard to that very vexed problem. Those people who are affected are protesting even today. It is the second longest protest this country has ever seen next to that of the families of the disappeared from the North and the East because their livelihoods are being destroyed.

There is not a word from the Government! So, without tackling this question of dairy production in the areas of Mayilathamadu and Madhavanai, Sir, this becomes meaningless for the people of the Eastern Province.

Irrigation is another very good sector that we would strongly support. The Hon. President mentions in the Budget Speech two important projects. One is, the Maduru Oya Right Bank Development Project. Sir, do you know the reason why the people of Mayilathamadu and Madhavanai in the Eastern Province are facing such a calamitous situation with their lands being grabbed and them losing their livelihoods? It is, in fact, because of this Maduru Oya Right Bank Development Project. The previous Governments wanted to chase away the Tamil people and colonize those areas with people from outside districts. So, it is because of that this livestock problem in Mayilathamadu and Madhavanai became such a huge problem. Now, this Government talks of continuing and bringing that irrigation project to fruition without addressing those sinister colonization schemes of the previous Governments. This sends shivers down our spine, Sir, and the Government must have answers to that issue. Then, when the Lower Malwathu Oya Irrigation Project completes, actually, the ones who are affected are 15 Muslim families because their areas are low-lying and get flooded. But, the previous Governments had identified 1,500 families from the Anuradhapura District as the affected! This Lower Malwathu Oya Irrigation Project is carried out in Mannar District. My good Colleague, the Hon. SelvamAdaikkalanathan is from that district and it is actually carried out in Mannar District. But, 1,500 families have been identified from the Anuradhapura District saying that they are affected by this project and that they are going to be relocated. Where are they going to be resettled? They are going to be resettled in Chettikulam in the Vavuniya District.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ponnambalam, could you please wind up now? You have exhausted even the two minutes over your two minutes.

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am finishing up, Sir.

So, all of these schemes, Sir, are actually quite worrisome. Unless this Government comes up with very clear, unambiguous positions on the matters we have raised, this Budget goes the same way as the previous ones did. The policies of this Government are no different to the policies of the Governments we had opposed, whose Budgets we had opposed.

Then, Sir, military expenditure has also gone up, of which I will speak in great detail under the Ministry of Defence. But, these are all fundamental problems for the Members of Parliament who represent the Tamil people of the North and the East, none of which have been addressed. I am sad to say that it actually makes us lose hope, Sir. The only party that had not come to power in the last 77 years has come to power now. When that party came to power, we were hoping that there would be a radical change and a departure from the policies of the previous Governments. That was what we were looking for in this Budget for the North and the East. But, that has not happened. That means, Sir, that until the Government comes clean and gives us unambiguous answers for these issues we have raised, we have no choice, unfortunately, than to vote against this Budget.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Chandima Hettiaratchi. You have 11 minutes.

[අ.භා. 1.00]

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අය වැය විවාදය පවත්වන මේ වෙලාවේ මම කැමැතියි, මීට පෙර පැවති තීරණාත්මක අය වැය කථා තුනක් සම්බන්ධයෙන් කරුණු මතු කරන්න. 1970දී ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා තමන්ගේ අය වැය කථාව ඉදිරිපත් කරන අතර මෙසේ කියා තිබෙනවා.

> "In repudiating and rejecting the policies followed by the U.N.P -.F.P. Government, the country has endorsed the programme of the United Front of the Sri Lanka Freedom Party, the Lanka Sama-Samaja Party and the Communist Party. That programme lays the foundation for the building up of a socialist society. It assumes as its thesis that a developing country cannot leave development at the mercy of the inter-play of forces which are motivated solely by the profit instinct. It recognizes at this juncture that private enterprise has a part to play in building up and exploiting the resources of the country, but the leading part must be in the hands of the public sector."

ඒ වාගේම 1977දී රොනී ද මැල් අමාත්‍යවරයා අය වැය කථාව ඉදිරිපත් කරමින් කියා තිබෙනවා,

"මුදල් අමාත්‍යවරයා වශයෙන් මාගේ කාර්යය දුෂ්කර එකකි. එපමණක් නොව, කරුණු දෙකක් නිසා මේ වර්ෂයේදී මාගේ කාර්යය තවදුරටත් දුෂ්කර වී ඇත. එනම්, සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව විසින් විනාශයට පත් කරන ලද අපේ වර්තමාන ආර්ථිකය වහා පුනරුත්ථාපනය කිරීමේ සහ පණගැන්වීමේ අවශ්‍යතාව. දෙක, ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පදනමක් වශයෙන් මෙරට නිදහස් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව...." යනුවෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍ය ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා 2025 වර්ෂයට අදාළව ඉදිරිපත් කළ අය වැය කථාවේ පිටු අංක 4හි මෙසේ සඳහන් වනවා:

> "සියලුම පුරවැසියන්ට ආර්ථික ක්‍රියාවලියට සහභාගි විය හැකි පරිදි අවස්ථා වැඩිදියුණු කර, එහි ප්‍රතිඵල සමාජයේ සෑම ස්තරයකටම සාධාරණ ලෙස ලබා ගත හැකි අයුරින් ආර්ථික වර්ධනය සිදු විය යුතුයි. සමාජයේ සියලුම සාමාජිකයන්ගේ ජීවිත නහාසිටුවීමේ මාධ්‍යයක් මිස ආර්ථික වර්ධනය හුදෙක් ආර්ථික ක්‍රියාවලියේ ප්‍රසාරණයකට පමණක් සීමා වේ නම්, සමාජයට ඉන් ඇත්තේ කුඩා ප්‍රයෝජනයක් පමණයි. දශක කිහිපයක් තිස්සේ, ආර්ථික ක්‍රියාකාරකම් සහ ආර්ථික ප්‍රතිලාභ සංකේන්ද්‍රණය වී තිබෙන්නේ සුළු පිරිසක් අතරයි. මෑත කාලීන එනම් 2019 කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව, ඉහළම ආදායම්ලාභී කුටුම්භ සියයට 20ක් සමස්ත ගෘහස්ථ වියදම්වලින් සියයට 47ක් සිදු කරනු ලබයි. එමෙන්ම, 2023 වසරට අදාළව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 44ක් සඳහා දායක වී තිබෙන්නේ බස්නාහිර පළාතයි. ඒ අනුව අපට ඉදිරියට යාමට ආර්ථික අවස්ථා වඩාත් සාධාරණව බෙදී යන ආර්ථිකයේ විශාල ප්‍රජාතන්ත්‍රීකරණයක් අවශ්‍ය වෙනවා. පොදුජන අරගළ සහ පසුගිය වසරේ පැවැති මැතිවරණවලදී ජනතාව තම දේශපාලන අයිතීන් තහවුරු කර ගත්තා. දැන් අත්‍යවශ්‍ය වී තිබෙන්නේ ජනතාවගේ ආර්ථික අයිතිවාසිකම් ද තහවුරු කිරීමයි. මෙම අය වැයේ දර්ශනය වන්නේ එයයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය තුන ඉදිරිපත් කරන්නේ රටේ දේශපාලනයේ සහ ආර්ථිකයේ බරපතළ වෙනස්කම් සිද්ධ වුණු අවස්ථාවලදීයි. ඒ අය වැය ඉදිරිපත් කළ අවස්ථා තමයි, 1970, 1977 සහ 2025 වර්ෂය. අපි මේ අය වැය හරහා සියයට 5ක ආර්ථික වර්ධනයක් අත්පත් කර ගන්න - ළඟා කර ගන්න - බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් නිෂ්පාදන කර්මාන්ත, සේවා ක්ෂේත්‍රවලින් අපි වර්ධනයක් අත් කර ගන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි මේ වැඩේට රාජ්‍ය ආයෝජන සහ පෞද්ගලික ආයෝජන කැඳවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් විධියට ගත්තොත්, කෘෂි කර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා අපි නව පර්යේෂණ හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම නව වී ප්‍රභේද වාගේ දේවල් වෙනුවෙන් ආයෝජනය කරන්නත්, ඒ වෙනුවෙන් මැදිහත් වෙන්නත් අවශ්‍ය කටයුතු කර තිබෙනවා. දේශීය ඉල්ලුම ඉහළ දැමීමටත්, අපනයන වෙළෙඳ පොළේ කොටසක් අත්පත් කර ගැනීමටත් අපට ඒ හරහා පුළුවන් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සඳහා මේ වර්ෂයේ මුදල් වෙන් කර තිබෙනවා. ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණය සඳහා වූ විශේෂ වැඩසටහන, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම අරමුණු කර ගත් ක්‍රියාකාරකම් සඳහා සහායවීම, නිශ්චිත භෝගවල ඵලදායීතාව සහ නිෂ්පාදනය වැඩි කිරීම, කෘෂිකාර්මික කර්මාන්ත ප්‍රවර්ධනය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය, ජලය හා පාංශුපෝෂක කළමනාකරණය, භෝග ආරක්ෂාව. ව්‍යවසායකත්ව සංවර්ධනය ඒ අතරින් ප්‍රමුඛ වනවා. ඉතාම වැදගත් ලෙස අපි මැදිහත් වන අංගයක් තමයි, ව්‍යවසායකත්ව සංවර්ධනය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට අපි රාජ්‍ය සේවයෙන් බලාපොරොත්තු වෙනවා, කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගකීම. ඒ හරහා සේවා සැපයීමේ ගුණාත්මක වර්ධනයක් අපි අත්පත් කර ගන්න බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තුළින් අපි මහජන විශ්වාසය ගොඩ නැඟීමටත්, ඒ මහජන විශ්වාසය ගොඩනැඟීම තුළින් නැවතත් සේවා අංශයේ වර්ධනයක් අත්පත් කර ගැනීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒක තමයි මේ අය වැයේ එළඹුම. මේ අය වැය තල්ලු කරන් යන්නේ ආර්ථිකයේ එතැනටයි. ඊළඟට මොකක්ද වෙන්නේ? ඊළඟට, සේවා වියුක්තිය අවම වන දිශාවට අපේ ආර්ථිකය අරගෙන යන්න අපට පුළුවන් වෙනවා. එක පැත්තකින් නිෂ්පාදනයට සහාය දෙන ගමන්, නිෂ්පාදනය ප්‍රවර්ධනය කරන ගමන්, අනෙක් පැත්තෙන් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් මේ අය වැය තුළින් අපි බලාපොරොත්තු වෙනවා. එම නිසා මේ අය වැය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන තැනට අපි ගෙනැල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ ඉතා පැහැදිලිව පෙනෙන තැනක් තමයි, ඩිජිටල් පරිවර්තනය - digital transformation - සම්බන්ධයෙන් අපේ එළඹුම. අමාත්‍යාංශයකට මුදලක් වෙන් කරලා අපි නිකම් ඉන්නේ නැහැ. සාමාන්‍යයෙන් අමාත්‍යාංශයකට මුදල් වෙන් කරලා ඒ වැඩේ කරගෙන යන්න ඉඩ හරිනවා වෙනුවට අපි ක්ෂේත්‍ර 12ක් ඇතුළේ ආර්ථිකයට අය වැයෙන් මුදල් වෙන් කරද්දී, digital transformation පැත්තට අපි රුපියල් බිලියන 21.8ක් වෙන් කරලා තිබෙනවා. අදාළ අමාත්‍යාංශයට රුපියල් බිලියන 7.1කුත්, ඉතිරි අමාත්‍යාංශවලට රුපියල් බිලියන 14.7කුත් අපි වෙන් කරලා තිබෙනවා, මේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට. ඒ හරහා තමයි කාර්යක්ෂමතාව, වගවීම වැඩි කරගන්න අපි උත්සාහ කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිෂ්පාදනය කළාට වැඩක් නැහැ, ජනතාවගේ ක්‍රය ශක්තිය - මිලදී ගැනීමේ හැකියාව - වැඩි වෙන්නේ නැත්නම්.

ඒ නිසා තමයි අපි රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කරලා තිබෙන්නේත්, පෞද්ගලික අංශයේ අවම වැටුප වැඩි කිරීමට මැදිහත් වෙලා තිබෙන්නේත්. නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළේ භාණ්ඩ හා සේවා වෙළෙඳ පොළට එනකොට ඒ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ හැකියාව - ක්‍රය ශක්තිය - වැඩි කරන්න අපි රාජ්‍ය හා පෞද්ගලික අංශවල සේවකයන්ගේ වැටුප් වැඩි කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි, මේ වෙලාවේ තවත් කාරණයක් මතක් කරන්න. මේක තමයි, අපේ fundamental වෙනස. පසුගිය කාලවල ඉදිරිපත් කළ අය වැය තුනක් තුළින් මම උපුටා ගත් වෙනස තමයි මේ. But, the Hon. (Dr.) Harsha de Silva could not recognize it. He was saying that we were in the mix up. එතුමා කිව්වා, "පල්ලියේ බයිබලය, පන්සලේ කියනවා වාගේ" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය අනුව ජනතාව වෙනුවෙන් අපට ධම්මපදයත්, බයිබලයත්, කුරානයත්, බගවත් ගීතාවත් කියන මේ ඔක්කෝම එකට කියන්න වෙලා තිබෙනවා. ජනතාව වෙනුවෙන් අපි ඊට සූදානම්. ජනතාවගේ ආර්ථික ප්‍රජාතන්ත්‍රීකරණය වන මූලධර්මය වෙනුවෙන් මේ ඔක්කෝම එකට කියන්න ඕනෑ නම්, එකට කියන්න අපි සූදානම්. අපට එහි තර්කයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සීසර්ට කඩුවක් තිබුණු බවත්, ඒකේ තල දෙකක් තිබුණු බවත් කියනවා. ඒ තලවල පේළි දෙකක් ගහලා තිබෙන බවත් කියනවා. එක තලයක "To defend" කියලාත්, අනෙක් තලයේ "To defeat" කියලාත් ගහලා තිබෙනවා. අනුර දිසානායකටත් තිබෙනවා, කඩුවක්. හැබැයි, එහි තල තුනක් තිබෙනවා, one to defend, අනෙක් එක to defeat. තුන්වන තලය, to develop. තල තුනක, ක්ෂේත්‍ර තුනක එතුමාගේ අය වැය වැඩ කරනවා; සටන් කරනවා; පෙනී ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණය මතු කරන්න කැමැතියි. මේ අය වැය ඇතුළේ තිබෙන්නේ අපේ සිහිනයයි. මේ අය වැය ඇතුළේ තිබෙන්නේ රටේ ජනතාවගේ සිහිනයයි. අපේ අය වැය ඇතුළේ තරුණයන්ට රැකියා දෙන්න අපට සිහිනයක් තිබෙනවා. අපේ අය වැය ඇතුළේ අලුත් ව්‍යාපාර ගොඩනඟන්න අපට සිහිනයක් තිබෙනවා. ලෙඩ නැති මිනිසුන් හදන්න අපට සිහිනයක් තිබෙනවා. හැම දරුවෙකුටම අධ්‍යාපන අයිතිය තහවුරු කරන්න අපට සිහිනයක් තිබෙනවා. පොහොසත් මිනිසුන් ඉන්න රටක් හදන්න අපට සිහිනයක් තිබෙනවා. ලස්සන ජීවිතයක් හැම කෙනාටම දෙන්න අපට සිහිනයක් තිබෙනවා. ඒක අපේත් සිහිනය, මව් බිමේත් සිහිනය. ඒක යට කරන්න බැරි, පරද්දන්න බැරි සිහිනයක්. අපි ඒක යථාර්ථයක් බවට පත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පල් හොරුන් විසින් කල්වාරි කන්ද මුදුනේදී ජේසුතුමන්ව කුරුසයේ තබා ඇණ ගහද්දි උන්වහන්සේ කියනවා, "පියාණනි, ඔවුන් කුමක් කරන්නේ දැයි නොදන්නා සේක, කමා වුව මැනවි" කියලා. අද අනුර දිසානායක ජනාධිපතිවරයාව දියවන්නාව මැද්දේ කුරුසයක තියලා පල් හොරුන් එතුමාට ඇණ ගහන්න හදනකොට අපට කියන්න තිබෙන්නේත්, "ජනතාවනි, ඔවුන් කුමක් කරන්නේ දැයි නොදන්නා සේක, කමා වුව මැනවි" කියලායි.

එම නිසා අපි ජයග්‍රහණය තෙක් මෙම අය වැය හරහා මාතෘ භූමිය ඔසවා තබන ක්‍රියාවලිය ඉදිරියට අරගෙන යන්න කටයුතු කරනවා. මේ අය වැය කියන්නේ, අපේ සිහිනය; ජනතාවගේ සිහනය; මාතෘ භූමියේ සිහිනය. ඒ සිහිනය දිනවලා මිසක් අපි ආපහු හැරෙන්නේ නැහැ කියන කාරණය මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ajith Gihan. You have 10 minutes.

[අ.භා. 1.11]

ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දසවැනි පාර්ලිමේන්තුවේ මංගල අය වැය ඉදිරිපත් කරලා, මේ විවාදය පවත්වාගෙන යද්දි අපට දැනෙන හැඟීම තමයි, වර්තමාන ආණ්ඩුව කොච්චර ශක්තිමත්ද කියන එක. වසර 76ක පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉදිරිපත් කරපු අය වැයවල තිබුණු කරුණු සාකච්ඡාවට ගනිද්දි මුදල් ඇමතිවරයා හැටියට ගරු ජනාධිපතිතුමා අපේ රටේ අනාගතය, අපේ රටේ ආර්ථික දියුණුව පදනම් කර ගත් සැලසුම් සහගත අය වැයක් ඉදිරිපත් කර තිබෙන බව අපට පෙනෙනවා. ඉතිහාසය පුරා අපි දැකලා තිබෙනවා, අය වැය ඉදිරිපත් කරලා ආපසු හැරිලා බලද්දි මේ රටේ ජනතාව හිටපු තැනෙන් පහළට වැටිලා තිබෙන බව.

හිටපු තැනිනුත් පහළට වැටුණු රටක්, ආර්ථිකයක් තමයි අපි දැකලා තිබෙන්නේ. නමුත්, ජනතාවට සිහින ලබා දීලා තිබෙනවා අපි දැක්කා. පසුගිය අය වැය කථා ඇතුළේ සිහින පොදි ගණනින් ලබා දී තිබුණා. නමුත්, ආපසු හැරෙද්දීම අපට දැනෙනවා, ඒ ජනතාව දිළිඳු බවට පත් වෙලා, දිළිඳුකමින් විනාශ වෙලා කියලා. අය වැයක් සකස් වෙන්න ඕනෑ කොහොමද, අය වැයක පදනම කුමක්ද, රට තිබුණු තැන කොතැනද, අපි දැන් යන්න ඕනෑ කොතැනටද කියන කාරණා පදනම් කරගෙන තමයි අපි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. මේක ඇතුළේ මහා සිහින නැහැ; මැජික් නැහැ. මැජික් පෙන්වන්න පුළුවන් තැනකට නොවෙයි මේ රට ගෙනැල්ලා තිබෙන්නේ. මේ රට කාබාසිනියා කරලා, ආර්ථික වශයෙන් විනාශ කරලා, ලෝකයෙන් තනි කරපු රටක්. ඒ තැන ඉඳලා තමයි අපි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. මේකට ඕනෑ ආර්ථික පදනමක්. ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්තිය මත පදනම් වෙලා තමයි අපි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. ඒක තමයි ගරු ජනාධිපතිතුමාගේ ඉදිරිපත් කිරීම.

අය වැය කථාව ගත්තාම, මොකක්ද මේ අය වැයේ පදනම? දිළිඳුකම තුරන් කිරීම. දිළිඳුකම තුරන් කරන්න නම් මේ ශ්‍රී ලංකා භූමිය තුළ ආර්ථිකය නහාසිටුවන්න ඕනෑ; නිෂ්පාදනය මත ආර්ථිකයක් ගොඩනඟන්න ඕනෑ; සේවා ආර්ථිකයක් ගොඩනඟන්න ඕනෑ. ඒ මත තමයි අපට රටක් විධියට ඉදිරියට යන්න පුළුවන් වෙන්නේ. දැන් කුමක්ද වෙලා තිබෙන්නේ? මේක රටක්ද? මේ රට මෙතැනින් ඉදිරියට යන්න නම් අපි කුමක්ද කළ යුත්තේ? එහෙම නම්, ඒක තමයි මේ අය වැයේ පරමාර්ථය.

ආසියාව ගත්තාම, ආසියාවේ බොහොමයක් රටවල් අපිව පසු කරගෙන ගිහින් ඉවරයි. ඒ රටවල් ආර්ථික වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. හැබැයි, ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය ගත්තාම, පසුගිය වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 12.5ක

[ගරු අජිත් ගිහාන් මහතා]

අපනයන ආර්ථිකයක් අපි ලබාගෙන තිබෙනවා. එතැනින් එහාට අපි යන්න ඕනෑ නැද්ද? නිෂ්පාදන ආර්ථිකයක් මත, අපනයන ආර්ථිකයක් මත අපේ අය වැය වාර්තාව ඉදිරිපත් කරන්න ඕනෑ. අපි එතැනට තමයි සැලසුම් කරලා තිබෙන්නේ. ඒ වාගේම, විශාල පරතරයක් තිබුණු අය වැයක් තමයි අපි දැකලා තිබෙන්නේ. මේ අය වැය පරතරය අඩු කරගන්න අපි කරන්න ඕනෑ කුමක්ද? ඒ මත පදනම්ව තමයි අපි මෙන්න මේ අය වැය වාර්තාව හදලා තිබෙන්නේ. මේ අය වැය සාකච්ඡාව තුළ විපක්ෂයට තර්කානුකූලව, සාධාරණ ලෙස කරුණු ඉදිරිපත් කරන්න බැරි වෙයි කියලා අපි දන්නවා. මේකෙන් පැනලා යන්න එක එක කථා කියනවා මිසක් ඒවායේ පදනමක් නැහැ. IMF එක ගැන කථා කරයි, රනිල් මහත්මයාගේ පසුගිය අය වැය ගැන කථා කරයි. මේවාද පදනම් විය යුත්තේ? හොඳට මේ අය වැය කථාව කියවලා බලන්න. පිට කවරය පමණක් නොවෙයි, මේ අය වැය කථාව කියවලා බලන්න කුමක්ද එහි තිබෙන්නේ කියලා. ඉතිහාසය පුරා පුටු රත් කරමින් ඉදිරිපත් කරපු අය වැය සහ මේ ක්‍රියාවලිය ඇතුළේ නැවත වතාවක් හැරිලා බලද්දී පෙනෙනවා, මේ අය වැය ඉතාම සාර්ථක අය වැයක් බව; මේක සියලුදෙනාටම සාධාරණයක් වන අය වැයක්; ඒ වාගේම පදනමක් සහිත අය වැයක්. මේක ගන්න ඕනෑ එහෙමයි. මේක audience එකට -ජනතාවට- නිකම් මොනවා හරි දීලා voice-cut එකෙන් චූන් කරන අය වැයක් නොවෙයි.

අද ජනතාව බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? වසර 76ක් කඩා වැටුණු රට ගොඩනහන පදනම තමයි මේ අය වැයෙන් ජනතාව බලාපොරොත්තු වෙන්නේ. අපි දන්නවා, මේ අය වැය පදනම් වෙලා තිබෙන්නේ කුමක් මතද කියලා. අපි කෘෂි කර්මාන්තය ඉදිරියට ගන්න ඕනෑ. ආහාර නිෂ්පාදනය අපට අංක එකට තබන්න වෙලා තිබෙනවා. නමුත්, ආහාර නිෂ්පාදනය බිඳ වැටිලා තිබෙනවා. කෘෂි කර්මාන්තය ගැන හිතලා අපි මේ අය වැයෙන් ඒ වෙනුවෙන් විශාල ලෙස ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. මොකද, ආහාර සුරක්ෂිතතාව, අඛණ්ඩව ආහාර ලබා දීම සහ මිල සාධාරණත්වය අපේ රටේ ජනතාවට ලබා දෙන්න ඕනෑ. මන්දපෝෂණය වැඩි වෙලා විනාශ වුණු ජීවිත නහාසිටුවන්න නම් අපි ගන්න ඕනෑ ක්‍රියාමාර්ග මොනවාද? ඒ නිසා මේ අය වැයේදී අපි මූලික වශයෙන් අවධානය යොමු කරලා තිබෙනවා, ආහාර නිෂ්පාදනයට. අනෙකුත් ක්ෂේත්‍ර ගත්තාම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙවර අය වැයෙන් අපි අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ප්‍රවාහන ක්ෂේත්‍රය බිඳ වැටිලා. ලංගම ඩිපෝවකට ගියාම එතැන තිබෙන විනාශකාරී බව අපි දකිනවා. හැබැයි, හොඳ ප්‍රවාහන සේවයක් ලබා දෙන්න අපි කුමක්ද කරන්න ඕනෑ?

ඒ වාගේම, දිළිඳුකම තුරන් කිරීමටත් මේ අය වැයෙන් අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ සඳහා අස්වැසුම වැනි දිළිඳුකම තුරන් කරන වැඩසටහන්වලට වැඩි-වැඩියෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. අපි යන්න ඕනෑ කොතැනටද? අපට මානුෂිකව ඒ ගැන හිතන්න වෙලා තිබෙනවා. හැබැයි, මෙතෙක් කල් ඉදිරිපත් වුණු අය වැයවලින් මොකද වුණේ? යම් පිරිසක් බෙදා ගත්තා; යම් පිරිසක් මේ ආර්ථික වටිනාකම් එකතු කරගත්තා. හැබැයි, අපි කුමක්ද කරන්න සූදානම් වෙලා තිබෙන්නේ? මේ රටේ සමස්ත ජනතාව මේ ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්න වැඩ පිළිවෙළකයි අපි ඉන්නේ. අපේ ප්‍රතිපත්තිය ඒකයි.

ඔවුන් මේ ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්නවා. ඒකෙන් ලැබෙන ප්‍රතිලාභ සමස්ත ජනතාවට සාධාරණව ලැබෙන ක්‍රමයක් මේ අය වැය තුළ තිබෙනවා. ඒක තමයි අපි මූලිකව කරලා තිබෙන්නේ. මේ අය, අය වැය හදලා තිබෙන්නේම දුප්පත්කම තුරන් කිරීමේ අරමුණින්. අද කවුරුත් සතුටින්. අද රාජ්‍ය සේවකයා සතුටින් නැද්ද? රාජ්‍ය සේවකයා සතුටින් ඉන්නවා; පෞද්ගලික අංශයේ වැඩ කරන අය සතුටින් ඉන්නවා; වතු කම්කරුවා සතුටින් ඉන්නවා. මේ අය වැය ලේඛනය අධ්‍යයනය කරද්දී ඒ බව පෙනෙනවා. එහෙම නම් විපක්ෂයට තමයි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙන්නේ. රටට මංගල අය වැයක් වෙච්ච අය වැය විපක්ෂය තව මාධ්‍ය කිහිපයකුත් එක්ක එකතු වෙලා අවමංගල අය වැයක් බවට පත් කර ගන්න හදනවා. ඇත්ත මෙකද?

මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර තිබියදී දැන් සිදුවන මිනී මැරුම් සහ ප්‍රශ්න නිසා සංචාරක කර්මාන්තයට බලපෑමක් ඇති වෙනවා කියලා සමහර අය කියනවා. කොහොමද මේ රටේ ඉතිහාසයේ කටයුතු සිද්ධ වෙලා තිබෙන්නේ කියන කාරණය අපි නැවත වතාවක් මතක් කරලා බලන්න ඕනෑ. සංචාරකයින් ඝාතනය කළේ නැද්ද? සංචාරකයින් ඝාතනය කරලා, රටට කළු පැල්ලම් එකතු කරපු අය දැන් සාටක දමාගෙන ඇවිත් මේ ගරු සභාවේදී කියනවා, භයානක තත්ත්වයක් තිබෙන්නේ කියලා. මෙවැනි තත්ත්වයක් තමයි ඇති කරන්න හදන්නේ. දැන් තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී තත්ත්වයෙන්, ආර්ථිකය බිඳ වැටී තිබෙන තත්ත්වයෙන් අපේ රට ගොඩගන්න අපි සූදානම් වෙන්න ඕනෑ. ඒක තමයි විපක්ෂයේ හැසිරීම වෙන්න ඕනෑ. මේ රට ඉදිරියට යද්දී විපක්ෂයටත් දැන් වගකීමක් පැවරී තිබෙනවා. සාම්ප්‍රදායික ලෙස විවේචන ඉදිරිපත් කරනවා වෙනුවට දැන් අපට කාර්යභාරයක්, වගකීමක් පැවරී තිබෙනවා. අපි නොවෙයි, මේ රට බිඳ වට්ටලා තිබෙන්නේ. මේ රට බිඳ වට්ටලා තිබෙන්නේ මෙතෙක් කල් පුටු රත් කරපු කට්ටිය. එලෙස බිඳ වට්ටපු රට නැවත නහාසිටුවීමේ වගකීම සහ අභියෝගය අපි කාටත් පැවරී තිබෙනවා. මේ රට, අපි කාගේත් රට. වගකීමෙන් යුතුව වර්තමාන ආණ්ඩුව මේ ජනතාවගෙන් බලය ඉල්ලා ගත්තා, හොඳ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා. ඒ වැඩ පිළිවෙළ තමයි මේ ක්‍රියාත්මක වෙන්නේ. මේ වැඩ පිළිවෙළ තුළ ආදායම් එකතු කිරීම ගැන, ආදායම වියදම් කිරීම ගැන තිබෙන බව අපි දන්නවා.

වරාය ගත්තොත්, එහි වෙළෙඳ ක්‍රියාවලිය පවත්වා ගෙන යන්න අපි අලුතින් රේගු පනතක් ගේනවා. මෙතෙක් කල් නොගෙනාපු, මෙතෙක් කල් ඒවායෙන් රිංගන්න තිබුණු අවස්ථා වෙනස් කරලා සාධාරණ විධියට ආදායම් එකතු කරන්න ක්‍රමයක් හදලා තිබෙනවා. මේ අය වැය නිසා අද වනකොට කවුරුත් සතුටින් ඉන්නවා කියලා අපි දන්නවා. ඒ තුළින් ව්‍යාපාරිකයාට, වෙළෙඳාම් කරන අයට, ගොවි බිමේ ඉන්න කට්ටියට, ධීවර ජනතාවට සාධාරණයක් සිදු වෙනවා. මොකද, විදුලි බිල අඩු කිරීම තුළ ඔවුන්ට ප්‍රතිලාභ ලැබිලා තිබෙනවා. විපක්ෂයට මේවා තේරෙන්නේ නැද්ද? පේන්නේ නැද්ද? අපි දන්නවා, මේ කුහකකමක් තිබෙන්නේ කියලා. රටක් විධියට ඉදිරියට යන්න අවශ්‍ය නම් ඔබතුමන්ලාගේ මේ ආකල්ප වෙනස් කරගන්න ඕනෑ. වර්තමාන ආණ්ඩුව වංචා, දූෂණ නැතිව ප්‍රජාතන්ත්‍රවාදීව, විනිවිදභාවයෙන් යුතුව තමයි මේ පාලනය කරගෙන යන්නේ. මාස තුනක් යද්දී රට තිබුණු තැනින් ඉදිරියට ඇවිල්ලා තිබෙන බව අපි දන්නවා. අපි ජනතාවත් එක්ක එකහ වෙච්ච ගිවිසුමට තව වසර ගණනාවක් ඉතුරු වෙලා තිබෙනවා. හැබැයි, කෙටි කාලයක් ඇතුළත වර්තමාන ආණ්ඩුව සාර්ථකව කටයුතු කරන බව ඔබ කවුරුත් දන්නවා. ඒ පිළිබඳව ජනතාව තුළ විශ්වාසය ගොඩනැඟිලා තිබෙනවා. මිනිසුන්ට ව්‍යාපාර කරන්න අවස්ථාව ගොඩනැඟිලා තිබෙනවා; ආයෝජන එනවා; ආයෝජකයින් කැඳවමින් තිබෙනවා. මේ අය වැය යටතේ ඉතා ඉක්මනින් අපේ target එකට යන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා. අපේ ආර්ථික වර්ධන වේගය සියයට පහට පවත්වාගෙන යන්න ඕනෑ. වෙළෙඳ හිඟය පියවා ගන්න වැඩ පිළිවෙළක් හැදෙන්න ඕනෑ.

අපේ රට ඉදිරි කාලයේදී ණය ගෙවන්න ඕනෑ රටක් බව අපි දන්නවා. ඒ ඉලක්කයට යන්න අපි ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළක් ශක්තිමත්ව ක්‍රියාත්මක කරමින් යනවා. ඒක තමයි මේ අය වැය පුරා අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ අය වැය ලේඛනය හොඳට අධ්‍යයනය කරලා බැලුවාම මේ රට යන්නේ කොතැනටද කියලා ඉතා පැහැදිලියි. බිඳ වටිටපු රටක් නැවත යථාවත් කරලා, වේගවත්ව ඉදිරියට යන්න පුළුවන් තත්ත්වයක් අපි මේ අය වැය තුළින් ඇති කරලා තිබෙනවා. මේ සඳහා අවශ්‍ය මොකක්ද? ශ්‍රී ලංකාවේ ජනතාව ඒක රාශි කරලා, ඔවුන් මේ ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ කරලා වේගයෙන් ඉදිරියට යද්දී මේකේ ප්‍රතිලාභ සියලුදෙනාටම ලැබෙනවා. එකමුතුවෙන්, ශක්තිමත්ව ජනතාවගේ ප්‍රශ්න විසඳලා, දුප්පත්කම -දිළිඳුකම- තුරන් කරලා, ලෝකයේ තිබෙන හොඳ රටක්, පොහොසත් රටක් විධියට කොන්ද කෙළින් තියාගෙන ලස්සනට ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය කර ගැනීම තමයි ජාතික ජන බලවේගය විධියට අපේ වැඩ පිළිවෙළ. ඒ සඳහා සියලුදෙනාම කැප වෙන්න සූදානම්. අපි විපක්ෂයට ආරාධනා කරනවා, ඔබතුමන්ලාත් මේ ගැන අධ්‍යයනය කරලා, ඒ අනුව වැඩකටයුතු කරන්න සහයෝගය ලබා දෙන්න කියලා. මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Mujibur Rahman. You have 21 minutes.

[අ.භා. 1.21]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගයේ එහෙම නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කරපු පළමුවැනි අය වැය දෙවනවර කියවීමේ විවාදයේදී තමුන්නාන්සේලාගේ පැත්තෙනුත්, විපක්ෂය පැත්තෙනුත් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. අපි සියලුදෙනාම පිළිගන්න දෙයක් තමයි, 1977 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ජයග්‍රහණයත් එක්ක තමයි අපේ රට විවෘත ආර්ථිකයට, එහෙම නැත්නම් වෙළෙඳ පොළ ආර්ථිකයට පරිවර්තනය වුණේ කියන එක.

ඒ පරිවර්තනය ගැන නොයෙකුත් වාද-විවාද තිබෙනවා. ඒ පරිවර්තනය තුළ හොඳ දේවලුත් තිබෙනවා. ඒ පරිවර්තනය තුළ ඍණ දේවලුත් තිබෙනවා. අපි සියලු දෙනාම ඒ ගැනත් අවුරුදු ගණනාවක් තිස්සේ කථා කරනවා. 1977 ඉඳලා 1994 වෙනකම් පැවති ප්‍රේමදාස මැතිතුමාගේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ යුග තුළ අවුරුදු 17ක්ම විවෘත ආර්ථික දිශාවට තමයි අපේ රට ගමන් කළේ. ඉන්දියාව ඇතුළු අපේ අසල්වැසි රටවල් පවා ඒ වනවිට විවෘත ආර්ථිකයට ඇවිත් හිටියේ නැහැ. ඒ සියලු රටවල් විවෘත ආර්ථිකයට ආවේත් අපිට පසුවයි.

ඊළඟට, චන්ද්‍රිකා නෝනා බලයට ආවා 1994දී. එතුමිය එනකොට කිව්වා, මේ රටේ මානුෂික මුහුණුවරක් හදනවාය කියලා. මොකටද? විවෘත ආර්ථිකයට. එතුමිය එක්ක හිටියා, තමුන්නාන්සේලා වාගේම වැඩ කරන ලංකා සම සමාජ පක්ෂයේ උදවිය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ උදවිය. ඒ අයත් තමුන්නාන්සේලාගේ චින්තනයම තිබෙන උදවිය. ඒ සන්ධානයෙන් තමයි 1994දී පොදුජන එක්සත් පෙරමුණ කියලා ආණ්ඩුවක් හැදුවේ. එහෙම ආණ්ඩුවක් හදලා ඒගොල්ලන් මානුෂික මුහුණුවරක් දෙන්න ආවා, දේශීය කර්මාන්ත ඇති කරනවාය කියලා කිව්වා. පෞද්ගලීකරණය නවත්වනවාය කියලා චන්ද්‍රිකා නෝනා කිව්වා. ඇවිල්ලා මොකද වුණේ? එක්සත් ජාතික පක්ෂය අවුරුදු 17ටම පෞද්ගලීකරණය කර තිබුණේ රාජ්‍ය ආයතන 43යි. චන්ද්‍රිකා නෝනා අවුරුදු 9ට රාජ්‍ය ආයතන 53ක් පෞද්ගලීකරණය කළා. එහෙම කළේ වාමාංශික බලයක් හදන්න ආපු චන්ද්‍රිකා නෝනා. එක්සත් ජාතික පක්ෂයට වෝදනා තිබුණා, හැම දේම විකුණනවාය කියලා. එහෙම කිව්වත් එක්සත් ජාතික පක්ෂය අවුරුදු 17ක් තුළ රාජ්‍ය ආයතන 43යි පෞද්ගලීකරණය කර තිබුණේ. චන්ද්‍රිකා නෝනා අවුරුදු 9ක් යනකොට ආයතන 53ක් පෞද්ගලීකරණය කළා. ඊළඟට වෙනස් වුණේ නැහැ, ඒ model එකම තමයි ඉස්සරහට ගියේ.

ඊළඟට, මහින්ද රාජපක්ෂ මහත්තයා 2005දී බලයට ආවා. එතුමා මහින්ද චින්තනය හැදුවා. මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය ලියද්දී, තමුන්නාන්සේලාගේ උදවියත් ඒ කමිටුවේ හිටියා. ඒගොල්ලොත් එකතු වෙලා තමයි මහින්ද චින්තනය ලිව්වේ. තමුන්නාන්සේලා විශාල දායකත්වයක් දුන්නා, මහින්ද රාජපක්ෂ මහත්තයා බලයට ගෙනෙන්න. ඒ කාලයේ කථා කරපු ඒවා හැන්සාඩ් වාර්තාවල තිබෙනවා. තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා ඒ කාලයේ කළ කථා හැන්සාඩ් වාර්තා අරගෙන කියෙව්වොත්, ඒ දීපු දායකත්වය හිතා ගන්නත් බැරි වෙයි. ඒ තරම් දායකත්වයක් දීලා තිබෙනවා. දේශීය කර්මාන්ත හදනවාය කිව්වා. පෞද්ගලීකරණය නවත්වනවාය කිව්වා. හැබැයි මහින්ද චින්තනය තුළින් කළේ මොකක්ද? අන්තිමට අර යුද හමුදා මූලස්ථානයට අයිතිව තිබුණු ඉඩම සින්නක්කරව දුන්නා ෂැන්ග්‍රි-ලා එකට. ගෝල් ෆේස් එක ආශ්‍රිත මහ මුහුදෙන් අක්කර 500ක් චීනයට ලියා දුන්නා. ඔන්න, දේශීය සම්පත් ආරක්ෂා කරන්න ආපු නායකයෝ කරපු දේවල්. අන්තිමට යහපාලන ආණ්ඩුව ආවාට පසුව තමයි අර මහින්ද චින්තනය යටතේ සින්නක්කරව දීපු ඒවා නැවත හරවන්න බොහොම අමාරුවෙන් කටයුතු කළේ. චීන්නුන්ට දීපු ඒවා ගන්න බොහොම අමාරුවෙන් කටයුතු කළේ. 2015 තිබුණේ යහපාලන ආණ්ඩුව. තමුන්නාන්සේලා දන්නවා, අපේ ආර්ථික ප්‍රතිපත්ති ගැන. ඒවා ගැන අපි කියන්න ඕනෑ නැහැ.

ඊළඟට, 2019 වෙනකොට ගෝඨාභය රාජපක්ෂ බලයට ආවා. එතුමා මොකක්ද කිව්වේ? එතුමා අපි ඔක්කෝටම ඉන්න හිටින්න රටක් හදන්න ආවා. අපි ඔක්කෝටම ඉන්න හිටින්න රටක් හදන්න ආපු එතුමාට අන්තිමට යන්න එන්න රටක් නැති වුණා. ඒක තමයි වුණේ. දැන් තමුන්නාන්සේලා එතුමාගේ සහෝදරයාව ගෙදරින් එළියට දමා ගන්න බැරුව ඒ රණ්ඩුවේ පැටලිලා ඉන්නවා. රාජපක්ෂලා කියනවා, ලියුමක් එවන්න අපි යන්නම් කියලා. තමුන්නාන්සේලා ලියුමක් යවන්නේ නැහැ. ලියුම යවන්නේ නැතුව දැන් හිර වෙලා ඉන්නවා. අර සිංදුවකුත් තිබෙනවා, ඒ වාගේ. මේ දවස්වල මහින්ද රාජපක්ෂ මහත්තයාත් ගමින් ලියුමක් එනවාය කියන ඒ සිංදුව තමයි අහගෙන ඉන්නේ. මොකද, ඔයගොල්ලන් ලියුම යවන්නේ නැහැ. එතුමා කියනවා, ලියුම එවන්න, අපි යන්නම් කියලා. නමුත් ලියුම යවන්නේ නැහැ. එතුමා එතැනට වෙලා ඉන්නවා.

තමුන්නාන්සේලා බලයට ආවා, 2024දී. තමුන්නාන්සේලා ඇවිල්ලා එක එක කථා කියා තිබෙනවා. මම ඊයේ පෙරේදා ඇහුවා, ලාල් කාන්ත ඇමතිතුමාගේ කථාවක්. එතුමා කියනවා, "අපි නියෝ ලිබරල්වාදී නැහැ. අපි රජයේ පංගුව ආර්ථිකය ඇතුළේ ක්‍රියාත්මක කරනවා" කියලා. ඊළඟට "අපි සමාජවාදය අත හැර නැහැ" කියලා තමුන්නාන්සේලාගේ සමහර උදවිය කථා කරද්දී කිව්වා. NPP කට්ටිය කියනවා, "අපි IMF එකත් එක්ක තමයි යන්නේ" කියලා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

අපි IMF එකෙන් පිට පනින්නේ නැහැයි කියලාත් කියනවා. ලාල් කාන්ත ඇමතිතුමා ඊළඟට කියනවා, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය හදලා ලු තිබෙන්නේ. ඒගොල්ලන්ගේ මූලධර්මය ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය. ඒ හින්දා ගජ මිතුරු සැලකිලි නැහැයි කියලාත් කියනවා. ඒවා මොකුත් දැන් ආර්ථිකයේ නැහැ, අපි ඒවා ඔක්කොම දැන් නවත්වලායි තිබෙන්නේ කියනවා.

අද උදේ අගමැතිතුමිය කිව්වා, අපි මේ ආර්ථිකය අලුත් දිශාවකට ගෙනියනවා කියලා. මට ඇහුණා ඊයේ පෙරේදා මහ බැංකු අධිපති නන්දලාල් මැතිතුමා කිව්වා, දිශානතිය නම් වෙනස් වෙලා නැහැ, දිශානතිය ඒකම තමයි කියලා. අගමැතිතුමිය කියනවා, අලුත් දිශානතියකට යනවා ලු. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ බොරු බයිලා කියවන්න එපා කියලායි. 1977 ඉඳන් ආපු ආර්ථික මොඩලය තමයි ඉස්සරහට යන්නේ. මේකේ පොඩි පොඩි වෙනස්කම් කරන්න පුළුවන්. මේකේ පොඩි පොඩි technical දේවල් අයින් කරගන්න පුළුවන්. නමුත් මූලධර්මය එකයි. ඒ මූලධර්මය තමයි වෙළඳ පොළ ආර්ථිකය. ඒ ආර්ථිකය තමයි තවම යන්නේ. තමුන්නාන්සේලා ඒකේ අඩියක්වත් වෙනස් කරලා නැහැ.

ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ගැන. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ මොකක්ද? මොකක්ද, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ? ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, ප්‍රජාවගෙන් අහන එකට. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. දැන් කාගෙන් අහලාද මේ අය වැය හැදුවේ? අපට කියන්න. අපි දන්න විධියට නම් නන්දලාල් මැතිතුමායි, මහින්ද සිරිවර්ධන මැතිතුමායි, IMF එකේ අයගෙන් අහලා තමයි මේක හැදුවේ. *[බාධා කිරීමක්]* ඔව්, පීටර් බෲවර් ළඟ තියාගෙන තමයි මේ අය වැය හැදුවේ. වෙන කාගෙන්ද ඇහුවේ? දැන්, වී මිල තීන්දු කළා නේ රුපියල් 120යි කියලා. ඒ ගැන ගොවි සම්මිවලින් ඇහුවාද? ගොවි සම්මිවලින් ඇහුවේ නැහැ.

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ඇහුවා, ඇහුවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඇහුවා තමුන්නාන්සේලාගේ පැලවත්තේ තිබෙන සම්මිවලින්. පැලවත්තේ සම්මිවලින් ඇහුවා. ඒක හරි. ඒක මම පිළිගන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා එක්ක වැඩ කරන, ඔබතුමාට පක්ෂව voice-cuts දෙන ගොවීන්ගෙන් ඇහුවා. ඒක හරි. ඒක නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. අපි කියන්නේ මේකයි. පසුගිය කාලයේ අමුඩ ගහලා කොළඹ ගෙනාපු ගොවි සමූළු ටික තිබෙනවා නේ. අන්න ඒ ගොවි මහත්වරුන්ගෙන් ඇහුවේ නැහැ. *[බාධා කිරීමක්]* එතකොට තමුන්නාන්සේ එදා කිව්වා, රුපියල් 150යි කියලා. අද රුපියල් 120යි. තමුන්නාන්සේලා ගොවි සංවිධානවලින් ඇහුවේ නැහැ. එහෙම ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. හැබැයි, තමුන්නාන්සේලා එක දෙයක් ඇහුවා. හාල් මිල වැඩි කරනකොට-

ගරු නාමල් කරුණාරත්න මහතා
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 154යි. ගෝයාහය රාජපක්ෂගේ ආණ්ඩුව රසායනික පොහොර තහනම් කළාට පස්සේ වී කිලෝ එකකට,-

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ වෙලාව නේ ගන්නේ. *[බාධා කිරීමක්]* හරි. නමුත් අපි දැක්කේ ඔබතුමාගේ voice cuts එකක්. අපි දන්නේ නැහැ ඒක පසුගිය කාලයේද, කොයි කාලයේ දීපු එකක් ද කියලා. නමුත්, ඔබතුමාගේ voice cut එකක් දැක්කා. රුපියල් 150ක් ඕනෑ කියලායි කිව්වේ. ඔබතුමා එදා ගොවි බිමේ අමුඩය ගහගෙන හිටියේ. ඔබතුමා නියෝජ්‍ය ඇමති වුණාම රුපියල් 120ට දාලා තිබෙනවා.

අපි දැක්කා, හාල්වල මිල තීරණය කරන්න ජනාධිපතිතුමා හාල් මෝල් හිමියන් ඔක්කොම කැඳෙව්වා. පස් වතාවක් කැඳෙව්වා. ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? ජනාධිපතිතුමාට කේන්ති ගිහිල්ලා මෙසෙටත් ගහලා රුපියල් 10ක් වැඩි කරලා දුන්නා. අපි හිතුවා, මෙසෙට ගහපු ගමන් ගණන අඩු වෙයි කියලා. ගණන වැඩි වුණා. සාමාන්‍යයෙන් කේන්ති ගියාම ගණන අඩු වෙනවා නේ. නමුත්, මේ ජනාධිපතිතුමාට කේන්ති ගියාම ගණන වැඩි වුණා. ගණන වැඩි වෙලා මොකද කළේ? රුපියල් 10ක් වැඩි කරලා දුන්නා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් ඩඩ්ලි නිහඬයි, ගොවියෝ අඬයි. මොකද, ගොවීන්ට රුපියල් 150 හම්බ වුණේ නැහැ. ගොවියෝ දැන් අඬනවා. තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය අනුව තමුන්නාන්සේලා පැලවත්තේදී තීන්දු කළා, වී මිල රුපියල් 120 යි කියලා. දැන් ඒක තමයි ගොවීන්ට ලැබෙන්නේ. නමුත් ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ඩඩ්ලිට ලැබුණා. ගොවීන්ට ලැබුණේ නැහැ. ඩඩ්ලිට ලැබුණා, රුපියල් 10ක් වැඩි කරලා. ඒ හින්දා දැන් ඩඩ්ලි නිහඬයි, ගොවියෝ අඬයි. ඒක තමයි ලාල් කාන්ත මැතිතුමා කිව්ව ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයේ හැටි.

ඒ වාගේම තමුන්නාන්සේලා කිව්වා, ගජ මිතුරන්ට දෙන්නේ නැහැයි කියලා. ගජ මිතුරු ආර්ථිකයක් නැහැයි කිව්වා. මම මේක කියන්න කැමැතියි. මෙගාවොට් 50ක සුළං විදුලි බලාගාරය ටෙන්ඩර් එකෙන් ප්‍රතික්ෂේප වුණා; Procurement Committee එක reject කළා. Appeal එකත් Procurement Committee එක reject කළා. ඒ දෙකම reject වෙලා තිබෙද්දී කැබිනට් අනුමැතිය අරගෙන ඒ මෙගාවොට් 50 දුන්නේ, ගජ මිතුරෙකුට නොවෙයිද? ඒක කියන්නකෝ. ගජ මිතුරෙකුට නොවෙයිද? එයා තමුන්නාන්සේලාගේ පක්ෂයට ගජ මිතුරෙක්; තමුන්නාන්සේලාගේ ඡන්දවලට වියදම් කරපු ගජ මිතුරෙක්.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මුල ඉඳන්ම වියදම් කෙරුවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඔව්, මුල ඉඳන්ම වියදම් කළා. මොකද, ගජ මිතුරු ආර්ථිකයක් නැත්තේ? ඔහුට එය දුන්නා. ටෙන්ඩර් එකට පිටින් දුන්නා. දැන් ජනාධිපතිතුමා කියනවා, අඩුම ලංසුවට දුන්නා ලු. අපි මේ කථා කරන්නේ අඩුම ලංසුව ගැන නොවෙයි. අඩුම ලංසුවට දෙන්න ඕනෑ නම්, ටෙන්ඩර් කරන්න ඕනෑ නැහැ, වෙන්දේසියේ දමන්න. ටෙන්ඩර් ඕනෑ නැහැ නේ. වෙන්දේසියේ දැම්මා නම් ඉවරයි නේ. වෙන්දේසියේ දාලා අඩුම ලංසුවට දෙනවා.

ජනාධිපතිතුමනි, මේක ටෙන්ඩරයක්. ටෙන්ඩර්වල එකම කාරණාව අඩුම ගණන නොවෙයි. තවත් කාරණා තිබෙනවා. Technical support එක, ඒගොල්ලන්ට මේ project එක කරන්න පුළුවන්ද, financial background එක, මීට කලින් මේ වාගේ

projects කරලා තිබෙනවාද ආදි හැම දෙයක්ම එහි තිබෙනවා. ඒ ඔක්කොම බලලා තමයි Procurement Committee එකේ technical evaluation එක reject වුණේ. ඒක major deviation එකක්. ජනාධිපතිතුමා තැන් දෙකකදී උත්තර දුන්නා. ඔව්, ඉතින්, ජනාධිපතිතුමා තමයි උත්තර දෙන්න ඕනෑ. මොකද, මේක හොඳටම දන්නේ ජනාධිපතිතුමා නේ. අර කථාවකුත් තිබෙනවා නේ, "පුහුල් හොරා කරෙන් දැනේ" කියලා. ඒ වාගේ තමයි. එහෙම ගජ මිතුරු ආර්ථිකයක් නැහැ කියන්න බැහැ.

ඒ වාගේම, අර containers 323ට මොකද වුණේ? කාගේද ඒ containers? අද වෙනකල් ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා ද, ඒ containersවල අයිතිකරුවන් කවුද, ඒ containersවල ආපු බඩු භාණ්ඩ මොනවාද කියලා? කිසිම දෙයක් කිව්වේ නැහැ. අද වෙනකල් ඉදිරිපත් කළේ නැහැ. අපි නොවෙයි කියන්නේ, containers 323ක් රේගුවෙන් එළියට ගියා කියලා. රේගු නිලධාරීන්ගේ සංගමය කියන්නේ, ඔබතුමන්ලා කිසිම ආකාරයේ පරීක්ෂාවකට ලක් නොකරපු containers 323ක් එළියට ගියා කියලා. ඒ containers ගජ මිතුරන්ගේ නොවෙයි ද? කාගේද ඒ containers? ඒවා අපිට කියන්නේ නැහැ. ඒකටත් අපිට උත්තර ලැබුණේ නැහැ. ඒ හින්දා අපිට දැන් තේරෙනවා කාරණය.

අපි ලාල් කාන්ත ඇමතිතුමාට කියන්න කැමැතියි, තමුන්නාන්සේලාට ඡන්දය දුන්නු රතු කමිස අඳින උදවිය, රතු හැට්ට අඳින උදවිය, තමන්ගේ ප්‍රජාව නළවන්නට ලස්සන කථා කියලා වැඩක් නැති බව. ඒක තමයි අපට කියන්න තිබෙන්නේ. ඒ වාගේම අපිට කියන්න වෙනවා, "කුම්බලා මාළු කෑවා නම් විඳවාපන් බළලෝ" කියලා. ඒක තමයි ඇත්ත කථාව. කුම්බලා මාළු කෑවා නම් විඳවන්න ඕනෑ. දැන් වෙන වෙන දේවල් කියලා වැඩක් නැහැ.

දැන් තමුන්නාන්සේලා කිව්වා, වැටුප් වැඩි කිරීම ගැන. මේ රටේ රජයේ සේවකයන්ට මේ අවුරුද්දේ අවම වැටුප වැඩි කර තිබෙන්නේ රුපියල් 5,975කින්. රුපියල් අටදහස් ගණන ලැබෙන්නේ 2027දී. අද උදේ ගරු අගමැතිතුමියත් ගුරුවරුන්ගේ වැටුප් වැඩි කිරීම ගැන මොන මොනවාද කිව්වා. මේ අවුරුද්දේ ගුරුවරුන්ගේ වැටුප් වැඩි කිරීම වෙන්නේ රුපියල් 13,763යි. ඒ කියන්නේ, 2025දී පළමුවැනි ශ්‍රේණියේ ගුරුවරයෙකුට වැටුප් වැඩි වෙන්නේ රුපියල් 13,763යි. ගුරුවරයෙක් පළමුවැනි ශ්‍රේණියට එන්න අවුරුදු 20ක් ඉන්න ඕනෑ. එතකොට අවුරුදු 20ක් හිටපු ගුරුවරයෙකුට තමයි, මේ වැඩි වීම ලැබෙන්නේ. නමුත්, තමුන්නාන්සේලාට මතකද, තමුන්නාන්සේලා 2024 ඔක්තෝබර් මාසයේ 02වැනි දා උද්ඝෝෂණයක් කළා? තමුන්නාන්සේලා එදා සවස 4.00ට ගුරුවරු කොළඹට ගෙනාවා මතකද? මුළු රාජ්‍ය සේවය සම්බන්ධයෙන්ම මොකක්ද එදා කිව්වේ? රුපියල් 20,000ක් ඕනෑ කියලා කිව්වා. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය ඔක්තෝබර් 02 සවස 4.00ට කොටුව දුම්රිය පොළ ඉදිරිපිටදී උද්ඝෝෂණය කරමින් කිව්වා, "අවම වැටුප රුපියල් 20,000ක් ලබා දෙනු" කියලා. දැන් ඔබතුමන්ලා බලයට ආවාම ඒ රුපියල් 20,000 දෙන්නේ නැහැ. ඔබතුමන්ලා දෙන්නේ රුපියල් 15,000ක් බව කියනවා. ඒකත් අවුරුදු තුනකින්. ඔබතුමන්ලාගේම වෘත්තීය සමිති රුපියල් 20,000ක් ඕනෑ කියලා එදා රාජ්‍ය සේවකයෝ පාරට ගෙනාවා. දැන් ඒ රුපියල් 20,000ට මොකද වුණේ?

අපි තමුන්නාන්සේලාට කාරණයක් මතක් කර දෙන්න ඕනෑ. තමුන්නාන්සේලාගේ ඒ උද්ඝෝෂණයට ආපු හම්බන්තොට ගුරුවරයකුගේ -කණුමුල්දෙනිය විද්‍යාලයේ චන්ද්‍රසේන මහත්මයාගේ- ඇසක් අහිමි වුණා. ජල ප්‍රහාර වැදිලා ඔහුගේ ඇසක් පෙනෙන්නේ නැතුව ගියා, රුපියල් 20,000ක් ඉල්ලමින් කරපු තමුන්නාන්සේලාගේ ඒ උද්ඝෝෂණයට ඇවිල්ලා. රුපියල් 20,000ක් ඉල්ලමින් උද්ඝෝෂණයට ආපු ගුරුවරයාගේ මූලික වැටුපට තමුන්නාන්සේලා දැන් දීලා තිබෙන්නේ මේ කියන රුපියල් 13,000 තමයි. නමුත්, තමුන්නාන්සේලා ඒ ගුරුවරුන් ගෙනැල්ලා, රාජ්‍ය සේවකයන් ගෙනැල්ලා ඒගොල්ලන් එක්ක උද්ඝෝෂණ කරලා තමයි බලයට ආවේ. ඒ විධියට බලයට ආපු තමුන්නාන්සේලා අද මේ පාර්ලිමේන්තුව ඇතුළේ පවුඩර් දමාගෙන, ටයි කෝට් දමාගෙන ඉන්නවා. අර ගුරුවරයා තමුන්නාන්සේලා වෙනුවෙන් ඇසක් දන් දීලා, තවම පෞද්ගලික රෝහලේ ප්‍රතිකාර ලබමින් ඉන්නවා. මම යෝජනා කරනවා, ඔහුට වන්දියක් ගෙවන්න කියලා. මොකද, තමුන්නාන්සේලා නිසා ඒ මනුස්සයා කොළඹට ඇවිල්ලා, ඇසක් දන් දීලායි ඉන්නේ. තමුන්නාන්සේලා බලය ගත්තේ ඒ සටන්වල තිබෙන ආභාසය හා ඒ සටන් නිසා තමයි. ඒ නිසා රාජ්‍ය සේවකයාට සලකන්න. අද වෙන වෙන බයිලා කියන්න එපා. අද තමුන්නාන්සේලා ඔවුන්ට දීලා තිබෙන්නේ සොච්චමක්. එදා සටන් කළේ රුපියල් 20,000ක් දෙන්න කියලා.

ඊළඟට, තමුන්නාන්සේලා මේ අවුරුද්දේ platform IT ක්ෂේත්‍රයේ වැඩ කරන උදවියට සියයට 15ක බද්දක් ගහනවා. ඒ කියන්නේ web designing කරන උදවියට, web development කරන උදවියට, video editing කරන උදවියට සියයට 15ක බද්දක් ගහනවා. Freelance වැඩ කරන උදවියට, Fiverr, Upwork හරහා orders අරගෙන ගෙදර ඉඳන් වැඩ කරන උදවියට, පිටරටවලට වැඩ කරන උදවියට සියයට 15ක බද්දක් අය කරන්න යෝජනා කරලා තිබෙනවා. එතකොට online casinoවලට බදු කෝ? Online casinoවලට බද්ද නැහැ. අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ඒ ගැන කියලා කියලා ඒ කාරක සභාවට යෝජනාවකුත් ගෙනාවා. ඒ online casinoවලට සියයට 15කවත්, ශත පහකවත් බද්දක් නැහැ. බොහොම මහන්සි වෙලා, ලක්ෂ ගණන් මුදල් දීලා ඉගෙන ගෙන ගෙවල්වල ඉඳගෙන IT ක්ෂේත්‍රයේ නියැළෙන අයට සියයට 15ක බද්දක් ගහනවා. අපි දන්නේ නැහැ online casino බද්ද නැවැත්තුවේ කාගේ බලපෑමකට ද කියලා. ඒකත් දැන් අපිට හොයන්න වෙනවා. දැන් කැසිනෝකාරයොත් මේ ආණ්ඩුව අල්ලාගෙන ඉන්නවාද කියලා හොයන්න වෙනවා. මතක තියා ගන්න, පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරුන් වටකරගෙන හිටියා වාගේ තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමාත් චෞර වළල්ලකින් දැන් වටකර ගෙන ඉන්නේ; ජාවාරම්කාරයෝ ටික ජනාධිපතිතුමා වට කරගෙන ඉන්නේ. ඒක තමයි වරායෙන් කන්ටේනර් එළියට එන්නේ. ඒ නිසා තමයි විදුලි බලාගාර හදන්න ටෙන්ඩර්වලින් පිටත ලබා දෙන්නේ. ඒ නිසා තමයි online casinoවලට බදු ගහන්නේ නැත්තේ. ඒ ඔක්කෝම දැන් ජනාධිපතිතුමා අල්ලා ගෙන ඉන්නේ.

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා කිව්වා, දූෂණ මර්දන කමිටු කාර්යාලයක් හදනවා කියලා. එතුමා ඒ දූෂණ මර්දන කමිටු කාර්යාලය හදන්න ඇමතිවරයෙක්ගේ නිල නිවසක් ගත්තා කිව්වා. අපි කියනවා ජනාධිපතිතුමාට, බොහොම හොඳයි. දූෂණ හොයන්න ඕනෑ කියලා. පසුගිය ආණ්ඩුවල දූෂණ කරපු අයට දඬුවම් කරන්න ඕනෑ. ඒ ක්‍රියාදාමය කරගෙන යන්න. තවත් ඒකට නීති ඕනෑ නම් ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න. එක ඇමති කෙනෙකුගේ නිල නිවස ප්‍රමාණවත් නැත්නම් ඔක්කෝම ඇමතිවරුන්ගේ නිල නිවාස අරගෙන හරි ඒ කටයුත්ත කරන්න. ඒ කටයුත්ත කරන ගමන් මේ ආණ්ඩුවෙන් පටන් අරගෙන තිබෙන දූෂණ ටිකත් හොයන්න, ඒ ෆයිල් ටිකත් පෙරළන්න පටන් ගන්න. සුළං විදුලි බලාගාර ව්‍යාපෘතියේ ඉඳන්, කන්ටේනර් 324 ඉඳන් ඒ දේවල් ටිකත් දැන් හොයන්න ගන්න. මොකද, ආණ්ඩු මාරු වෙනකොට ෆයිල් අතුරුදන් වෙනවා. ඒක කාටත් පොදුයි. ඒ නිසා හොරු, ජාවාරම්කාරයෝ දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවත් අල්ලාගෙන ඉන්නේ, උඩ

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මට්ටමින්. තවම පහළට ආවේ නැහැ. පහළත් දැන් පොඩි පොඩි දේවල් ටිකක් ආරංචි වෙලා තිබෙනවා. හෙට අනිද්දා වෙනකොට අපි පාර්ලිමේන්තුවේ දී ඒ ගැන කියන්නම්. ටෙන්ඩර් නැතිව හුහක් බඩු භාණ්ඩ අරගෙන තිබෙනවා. නමුත්, දැන් උඩ මට්ටම අල්ලාගෙන ඉන්නේ. ඒ උඩ මට්ටම අල්ලා ගෙන ඉන්න අය හැම ආණ්ඩුවක්ම අල්ලා ගෙන හිටියා. ඒ නිසා අපි ගරු ජනාධිපතිතුමාට කියනවා, ඇමතිවරුන්ගේ නිල නිවාසයක පිහිටුවන කාර්යාලයෙන් පටන් ගන්නා විමර්ශනවලදී මේ ෆයිල් ටිකත් ගන්න කියලා. ඒ යෝජනාව කරන ගමන්ම VFS ගනුදෙනුව, passport ගනුදෙනුව ගැන සොයන එකත් පටන් ගන්න. ඒවා හංගන්න දෙන්න එපා. තමන්ගේ හිතවතුන්ගේ හොරකම් යට ගහන්න දෙන්න එපා. තමන් එක්ක ගනුදෙනු කරන අයගේ හොරකම් වංචා යට ගහන්න දෙන්න එපා. ඒ හැම කෙනාගේම හොරකම් අල්ලන්න ඕනෑ. ඒ හැම එකක්ම මේ රටේ ජනතාවගේ බදු මුදල් කියන එක මතක තියා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැනත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. දැන් මෙතුමන්ලා පාන් ගෙඩියට අයිසින් දාලා තිබෙනවා. නමුත් පසුගිය කාලයේ ගෙනාපු පාන් ගෙඩියම තමයි මේ පාන් ගෙඩිය. 1977 ඉඳන් ආපු පාන් ගෙඩියට මෙතුමන්ලා අයිසින් එකක් දාලා අපට කියනවා කේක් කියලා. නමුත් මේක කේක් නොවෙයි, මේක පාන්. නමුත් මෙතුමන්ලා අපිට මෙතැනට ඇවිල්ලා කියනවා, නැහැ, නැහැ මේක කේක් කියලා. මේ රටේ රාජ්‍ය සේවකයන්ටයි, ජනතාවටයි අපි කියනවා අප්‍රේල් මාසයේ මේ කේක් ගෙඩිය කපන කොට තේරෙයි ඒක ඇතුළේ තිබෙන්නේ කේක් නොවෙයි, පාන් කියලා. ඒක ජනතාව තේරුම් ගනියි කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Roshan Akmeemana.You have 11 minutes.

[අ.භා. 1.43]

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අය වැය සම්බන්ධයෙන් මේ සභාවේ අපි කථා කරනවා. ඒ කථා බහ ඇතුළේ විවිධ අදහස් මතු වෙලා තිබෙනවා. එක අතකින් මේ පාර්ලිමේන්තුවේ ඉන්න විපක්ෂයේ ආර්ථික විශේෂඥවරු ආඩපාළි කියමින් ඉන්නවා, අය වැය ගැන. මේ අය වැය වාමාංශික නැහැ, මේ අය වැයේ සමාජවාදය කෝ කියලා අහනවා. එක පැත්තකින් එහෙම කියන ගමන් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ, නව ලිබරල් අය වැයක් ය, හැබැයි, ඒක කියන්න තරම් ලිබරල් නැහැ, තව ටිකක් ලිබරල් වෙන්න ඕනෑ වාගේ කථාවක් කියනවා. තව එක්කෙනෙක් කියනවා රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිවෙලා මදි කියලා. හැබැයි, එහෙම කියන ගමන් කියනවා, මේ වැටුප් වැඩිවීම රජයට දරා ගන්න බැහැ, රාජ්‍ය මූල්‍යයට දරා ගන්න බැහැ කියලා. ඉතින් මේ වාගේ ව්‍යාජ තර්ක මතු කරනවා. කොහොම නමුත්, මේ රටේ සමාන්‍ය ජනතාව, වැඩ කරන පන්තියේ ජනතාව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්, ධීවරයෝ, ගොවියෝ මේ අය වැය අනුමත කරලා තිබෙනවා. ඒ නිසා විපක්ෂයේ ආර්ථික විශේෂඥවරුන්ට උත්තර දෙන්න පොඩි වේලාවක් ගන්න ගමන් මම කැමැතියි, මුලින්ම මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ පළමුවැනි අය වැය ඉදිරිපත් කරන්නේ මොන වාගේ ගෝලීය සහ දේශීය සන්දර්භයක් ඇතුළේ ද කියන එක මතක් කරලා දෙන්න.

අද වෙන විට තාක්ෂණික සමාගම් කිහිපයක හිමිකරුවන් කල්ලියක් විසින් මේ මුළු ලෝකයේම ග්‍රහණය ඔවුන්ගේ අතට ගන්න සැලසුම් කරමින් ඉන්න අවස්ථාවක්. ප්‍රජාතන්ත්‍රවාදයේ රන් දෙවොල ලෙස හඳුන්වපු ඇමෙරිකා එක්සත් ජනපදය අධිකාරිවාදයකට ගමන් කරමින් ඉන්න අවස්ථාවක්. ග්‍රීසියේ හිටපු මුදල් ඇමති, ආර්ථික විද්‍යාඥ යානිස් වරුෆකිස් කියනවා, නව තාක්ෂණික වැඩවසම් වාදයකට තමයි යුරෝපය ප්‍රමුඛ ඇමෙරිකාව මේ යන්න හදන්නේ කියලා. නිදහස් වෙළඳපොළ පරමාදර්ශය කරගෙන ක්‍රියාත්මක වෙච්ච ඇමෙරිකාව, අපට නිදහස් වෙළඳාම ගැන දේශන දීපු ඇමෙරිකාව අද retaliatory taxes - පළි ගැනීමේ බදු - සහ සම්බාධක පනවමින් ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගවලට යොමු වෙමින් ඉන්නවා. නිදහස් වෙළඳපොළ සම්බන්ධයෙන් ලෝකයට lectures දීපු යුරෝපය, අද සංක්‍රමණික ගැටලුව, ආර්ථික පසුබෑම හමුවේ අන්ත දක්ෂිණාංශය විසින් ගිල ගනිමින් ඉන්නවා. මේ අතර අපේ රට -ශ්‍රී ලංකාව- ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනයේත්, දේශීය ගජ මිතුරු දූෂිත ව්‍යාපාරික දේශපාලනික කල්ලියේත් හවුල්කාරිත්වය ඔස්සේ ණය අර්බුදයේ ගිලිලා ඉන්න වේලාවක තමයි අනාගතය පිළිබඳ සුබ සිහින දල්වමින් අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ පළමුවෙනි අය වැය ඉදිරිපත් කරන්නේ.

විපක්ෂයේ මහත්වරු අපෙන් අහනවා, අපේ ආර්ථික මොඩලය මොකක්ද කියලා. අපේ ආර්ථික මොඩලය මොකක්ද? මම දැක්කා, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් මේක කුරාණයද, බයිබලයද කියලා අහනවා. මා මතක් කරන්න කැමැතියි, වර්තමාන ලෝකය, පරමාදර්ශීය ආර්ථික මොඩල පිළිබඳව කළ සියලු අත්හදා බැලීම් අසමත් වෙච්ච වර්තමානයක තමයි ජීවත් වෙන්නේ කියන එක. මධ්‍යගත සැලසුම් ක්‍රමය පිළිබඳ නැගෙනහිර යුරෝපයේ, රුසියානු සමාජවාදය පිළිබඳ අත්හදා බැලීම බිඳ වැටුණා. අපි ඒක පිළිගත්ත වාමාංශික දේශපාලන ව්‍යාපාරයක්. ඒක විතරක් නොවෙයි, මෑත කාලයේ ග්‍රීසියේ Syriza අත්දැකීම, ස්පාඤ්ඤයේ Podemos අත්දැකීම මේ සියල්ල ගැන විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරපු, ඒ ගැන සැලකිල්ලෙන් බලපු වාමාංශික දේශපාලන ව්‍යාපාරයක් තමයි අපි. ඒ නිසා විසිවන සියවසේ රුසියානු සමාජවාදය පිළිබඳ අත්දැකීම අසාර්ථකයි කියලා පිළිගන්න, ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කරපු අපි තරම් දේශපාලන ව්‍යාපාරයක් ලංකාවේ නැහැ. හැබැයි, අද අපේ රටේ විපක්ෂයේ ඉන්න දක්ෂිණාංශික දේශපාලනඥයන්ට මොකද වෙලා තිබෙන්නේ?

2008 මූල්‍ය අර්බුදයෙන් පසුව ලෝකයේ නව ලිබරල් ධනවාදය අසාර්ථක වුණා. නිදහස් වෙළඳපොළ මිථ්‍යාවක් බවට පත් වුණා. Trickle-down economies වැඩ කරන්නේ නැහැ කියලා ඒ ආර්ථික විද්‍යාඥයන්ම පිළිගෙන තිබෙනවා. හැබැයි, ලංකාවේ විපක්ෂයට තවම පිළිගන්න බැරි වෙලා තිබෙනවා, නව ලිබරල්වාදය අසාර්ථකයි කියලා. මොනවාද නව ලිබරල් ධනවාදයෙන් අද ලෝකයට ඉතුරු කරලා තිබෙන්නේ? ඉතුරු කරලා තිබෙන්නේ ආදායම් විෂමතාවක්. ලෝකයේ සියයට 1ක් වෙච්ච සුළු පිරිසක් අත සමස්ත ලෝක ධනයෙන් සියයට 65ක් සංකේන්ද්‍ර වෙලා තිබෙනවා. මිලියන 800ක් ජනතාව සාගින්නෙන් පෙළෙනවා. මිලියන 700ක් විතර ජනතාව ඩොලර් 2ට වඩා අඩු ආදායමක් තුළ ජීවත් වෙනවා. න්‍යෂ්ටික යුද්ධයක් පිළිබඳ තර්ජන ඇවිල්ලා තිබෙනවා. ගෝලීය උෂ්ණත්වය වැඩි වෙලා තිබෙනවා. මෙන්න නව ලිබරල් ධනවාදය ලෝකයට වාගේම අපට ඉතුරු කරපු වර්තමානය. ඉතින් ආර්ථික මොඩලයක් පිළිබඳ අපෙන් අහන මහත්වරුන්ට අපට කියන්න තිබෙන්නේ, අද ලෝකය ඉන්නේ කුණාටු සාගරයක කියන එකයි.

රළු මුහුදක අපි ඉන්නේ. ගමනාන්තයක් පෙනෙන්නේ නැහැ. රුවල් බිඳිලා. මෙවැනි මොහොතක අපට කරන්න පුළුවන් මොකක්ද? මූලික වශයෙන් අපට එක දෙයක් කරන්න පුළුවන්.

මේ තිබෙන තත්ත්වය තව තවත් අවුල් වෙන්න හේතු වෙන, මේ තිබෙන අර්බුදයට තව තවත් හේතු වෙන කාරණා නොකර ඉන්න පුළුවන්. නැත්නම් මූලික වශයෙන් මෙවැනි අර්බුදයක් ඇති වෙන්න බලපෑ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති තවදුරටත් ක්‍රියාත්මක නොකර ඉන්න පුළුවන්. ඒ නිසා මෙවැනි තත්ත්වයක් යටතේ ශක්තිමත් ජාතික ආර්ථිකයක්, නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීමේදී අපි අපේ රටේ දැනට පවතින අර්බුදයට පමණක් විසඳුම් දීලා හරියන්නේ නැහැ. මේ ලෝකය, අපේ රට අනාගතයේදී මුහුණ දෙන්න නියමිත ගැටලුවලටත් ඔරොත්තු දීමේ හැකියාව තිබෙන, ආර්ථික කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාවක් තිබෙන ආර්ථිකයක් තමයි අපි ගොඩනඟන්න ඕනෑ. වර්තමාන ලෝකයේ විශිෂ්ට දාර්ශනිකයෙක් ඉන්නවා, Slavoj Žižek කියලා. ඔහු කියනවා, "නව ලිබරල් ගෝලීයකරණය වෙනුවට අද අපට ඕනෑ ගෝලීය සහයෝගිතාවක්" කියලා. Joseph Stiglitz, ලෝක බැංකුවේ හිටපු ප්‍රධාන ආර්ථික විද්‍යාඥයා - Chief Economist, ජ්‍යෙෂ්ඨ උප සභාපති, 2000 වර්ෂයේදී නව ලිබරල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න යනකොට ඔහු ලෝක බැංකුවෙන් ඉල්ලා අස්වුණා. ඔහු කියන්නේ මොකක්ද? ඔහු කියනවා, අද ජාතික රජයන්වලට අවශ්‍ය වෙන්නේ to reduce inequality, regulate market to correct failures, prioritize public investment and reject austerity. ඒ කියන්නේ මොකක්ද? මේ නව ලිබරල් ප්‍රතිසංස්කරණ ආපසු හරවන්න කියලා. ඒක තමයි අපි මේ අය වැයෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි අපේ පළමු අය වැයෙන් උත්සාහ කරලා තිබෙනවා, අපේ රටේ නිෂ්පාදන විභවතාව පුළුල් කරන්න. තවමත් අපි අපේ රටේ පූර්ණ සම්පත් උපයෝජනයට ඇවිල්ලා නැහැ. මේ වාගේ ආර්ථික අර්බුදයකින් පස්සේ පෞද්ගලික අංශයට විතරක් මේ සම්පත් සියල්ල උපයෝජනය කරන්න, ආයෝජන ගෙනෙන්න හැකියාවක් නැහැ. මොකද, ලාභ මූලික කරගෙන ක්‍රියාත්මක වෙන පෞද්ගලික අංශය මේ අවදානම -ඉහළ අවදානම- දරමින් මේ සම්පත් උපයෝජනය කරන්න විශාල වශයෙන් ඉදිරිපත් වෙන්නේ නැහැ. එවැනි අවස්ථාවක රජයේ කාර්යභාරය මොකක්ද? එවැනි අවස්ථාවක රජයේ කාර්යභාරය වෙන්නේ, රජයේ වියදම් තුළින් සමාහාර ඉල්ලුම ප්‍රවර්ධනය කරන්න, පෞද්ගලික අංශයට නිෂ්පාදනය දිරිගන්වන්න අවශ්‍ය කරන සමාහාර ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම සඳහා මැදිහත්වීමයි. Joseph Stiglitz කියන්නේ ඒක. ඒ නිසා තමයි අපි මෙවර අය වැයෙන් විශාල ප්‍රමාණයක් රජයේ වියදම්වලට වෙන් කරලා තිබෙන්නේ. Joseph Stiglitz කියනවා, මෙවැනි අර්බුද සමයකින් පස්සේ counter-cyclical spending ඕනෑ කියලා; රජය ආර්ථික අවපාතයෙන් ගොඩ එන්න ආයෝජන කරන්න ඕනෑ කියලා. ඒ නිසා තමයි අපි රුපියල් බිලියන 1,400කට ආසන්න ප්‍රමාණයක් රජයේ ප්‍රාග්ධන වියදම් ලෙස දරලා තිබෙන්නේ.

පසුගිය වර්ෂයට සාපේක්ෂව අපි රජයේ ආයෝජන වියදම සියයට 60කින් වැඩි කරලා තිබෙනවා. මීට කලින් ආණ්ඩු මොකක්ද කළේ? පෞද්ගලික අංශයේ පරිභෝජන වියදම කප්පාදු කළා. රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වුණේ මොකක්ද? කප්පාදුව - austerity! ජනතාවට පටි තද කර ගන්න කියන ගමන්, ආර්ථික අර්බුදයේ බර ජනතාවට දරා ගන්න කියන ගමන්, නව ලිබරල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. ජනතාවට වේල් දෙකකින් සෑහීමට පත් වෙන්න වුණා. කන කර බඩු උකස් තියන්න වුණා. විදුලිය කප්පාදු වුණා. ජල බිල්පත ගෙවා ගන්න බැරි වුණා. දරුවන්ගේ පාසල් අධ්‍යාපනය අඩාළ වුණා. උදේ වේල නොකා දරුවෝ පාසල් යන්න පටන් ගත්තා. මෙන්න මේ නව ලිබරල් කප්පාදු ආර්ථික ප්‍රතිපත්තිය ආපහු අනෙක් පැත්තට හරවන අය වැයක් තමයි අපි මේ 2025 වසර සඳහා ඉදිරිපත් කරලා තිබෙන්නේ. ආර්ථික අර්බුදයේ බර සාමාන්‍ය වැඩ කරන ජනතාව මත පමණක් පටවන්න අපි සූදානම් නැහැ. ඒ නිසා තමයි අපි මෙවර අය වැයෙන් රාජ්‍ය සේවක මූලික වැටුප ඉහළ දමලා තිබෙන්නේ. රාජ්‍ය සේවක මූලික වැටුප විතරක් නොවෙයි, පෞද්ගලික අංශයේ සේවකයන්ගේත් මූලික වැටුපත් ඉහළ නංවා තිබෙනවා. කලින් ආණ්ඩුව මොකක්ද කිව්වේ? වැටුප් ඉහළ නංවන්න නම් වැට් එක වැඩි කරන්න වෙයි කිව්වා, සියයට 22 වෙනකල්. ඉතින් අපි අපේක්ෂා කරන්නේ මොකක්ද? අපේ රටේ අවිධිමත් අංශයේ; කිසිම රැකවරණයක් නැති, රැකියා සුරක්ෂිතභාවයක් නැති සියයට 60ක ප්‍රමාණයක් ඉන්නවා. ශ්‍රම බලකායෙන් සියයට 60ක් අවිධිමත් අංශයේ ඉන්නවා. ඒ අයට විශ්‍රාම වැටුපක් නැත්නම්, රැකියා සුරක්ෂිතභාවයක් නැත්නම්, අඩුම ගණනේ හොඳ රැකියාවක් හොයා ගන්න අවස්ථාවක් තිබෙන්න ඕනෑ. ඒ නිසා අපට ඉතා ඉක්මන් ආර්ථික වර්ධනයක් අවශ්‍යයි. ඒ නිසා තමයි රජය විශාල ප්‍රමාණයක් ආයෝජනය කරලා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ක්ෂේත්‍රය ඉහළ නංවන්න ඇප රහිත ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසන් කරන්නම්.

ඒ වාගේම 2050 වෙනකොට අපේ රටේ වැඩිහිටි යැපුම් අනුපාතය වැඩි වෙනවා. ශ්‍රී ලංකාව, දකුණු ආසියාවේ වේගයෙන්ම වියපත් වන ජනගහනයක් සිටින රටක්. 2050 වෙනකොට අප රටේ වැඩ කරන සෑම පුද්ගලයන් දෙදෙනකුටම එක් වැඩිහිටියෙක් එනවා. 2050දී මේ වැඩිහිටියා බවට පත් වෙන්නේ වර්තමානයේ මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න ශ්‍රමය කැප කරන, ශ්‍රමය වගුරුවන, කැපකිරීම් කරන වැඩ කරන ජනතාවක්. තරුණ ශ්‍රම බලකාය 2050 වෙද්දි වැඩිහිටියන් බවට පත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ සංස්කෘතියක් තිබෙනවා. ඒ, වැඩිහිටියන්ව දරුවන් විසින්, මුනුපුරන් විසින් බලාගන්න සංස්කෘතියක්. හැබැයි මේ සංකීර්ණ ආර්ථික ක්‍රමය හමුවේ, ඉදිරියේ එන්න තිබෙන සංකීර්ණ ආර්ථික තත්ත්වය හමුවේ වැඩිහිටියන් රැක බලා ගැනීමේ වගකීම දරුවන්ට පමණක් පවරන්න බැහැ. ඒ නිසා තමයි, අපි රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මූලික වැටුප ඉහළ නංවන්නේ. ඒ ඔස්සේ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අර්ථසාධකය වැඩි වෙනවා; ඔවුන් විශ්‍රාම යද්දි හම්බවෙන අර්ථසාධකය වැඩි වෙනවා, රජයේ සේවකයන් විශ්‍රාම යද්දි හම්බ වෙන විශ්‍රාම වැටුප වැඩි වෙනවා. අපි මේ වැඩි වෙන වියදම හොයාගන්නේ කොහොමද? අපි ඉහළ ආදායම්ලාභීන්ට Capital Gain Tax එකක් දාලා තිබෙනවා. Withholding Tax එක දාලා තිබෙන්නේ, ලක්ෂ 18ට වඩා වැඩි ආදායම්ලාභීන්ට. මේක IMF අය වැයක් කියලා සමහර ආර්ථික විශේෂඥයෝ අපිට කියනවා. ඇයි එහෙම කියන්නේ? අපි සියයට 2.3ක primary surplus එකක් තියාගත්ත නිසා. මේ primary surplus එක කියන්නේ මොකක්ද? රජයේ ආදායමෙන් පොලී වියදම් ඇතුළුව රජයේ එදිනෙදා වියදම් ගෙවාගන්න පුළුවන් කියන එකයි. IMF එක ඒක කිව්වත්, නැතත් අපි රාජ්‍ය මූල්‍ය කාර්යක්ෂමතාව පවත්වාගෙන යනවා නම් අපි ඒ ඉලක්කයට යන්න ඕනෑ. ඒක අනුව මේක IMF අය වැයක් කියලා කියනවා නම්, ඒක වැරදියි කියලා කියන්න කැමැතියි. ඒ වාගේම, කලින් ආණ්ඩුව මේ primary surplus එකට යන්න මොකක්ද කළේ? සීනි මත බදු ගැහුවා, අර්තාපල්වලට බදු ගැහුවා, පෙට්ල්වලට, ඩීසල්වලට බදු ගැහුවා, මේ සම්පූර්ණ බර වැඩ කරන ජනතාව මත පැටෙව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have exhausted your additional time also.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
සමාවෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම අවසන් කරනවා. මට තව තත්පර 30ක් දෙන්න.

පොදු ප්‍රවාහන සේවය නවීකරණය කරන්න, දුම්රිය සේවය නවීකරණය කරන්න අපි සල්ලි දාලා තිබෙනවා. කලින් තිබුණේ මොකක්ද? පොදු ප්‍රවාහන සේවය පෞද්ගලීකරණය කරන ප්‍රතිපත්තියක්. අන්න අපේ ආර්ථික මොඩලය ගැන අහන මහත්තුරුන්ට අපි කියනවා, ඉඟියක් ගන්න කියලා. අපේ ආර්ථික මොඩලය ගැන අපි ඉඟියක් දීලා තිබෙනවා. පොදු ප්‍රවාහනය පෞද්ගලීකරණය කරනවා වෙනුවට පොදු ප්‍රවාහනය ශක්තිමත් කරන්න අපි සල්ලි දාලා තිබෙනවා. රාජ්‍ය සේවය කාර්යක්ෂම කරන්න, State-owned enterprises, holding company එකකට දාලා ඒ රාජ්‍ය සේවයෙන් අතිරික්තයක් ජනනය කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. මෙතුමන්ලා ලාභ ලබන SLT එක පවා විකුණන්න හිටියේ. අපෙන් ආර්ථික මොඩලය ගැන අහන මහත්වරුන්ට අන්න, අපි අපේ ආර්ථික මොඩලය ගැන ඉඟියක් දීලා තිබෙනවා.

මෙතුමන්ලා රාජ්‍ය සේවය කප්පාදු කරන්න හිටියේ; ලක්ෂ 5කින් රජයේ සේවකයෝ අයින් කරන්න හිටියේ. රාජ්‍ය සේවයේ අඩුපාඩු තිබෙන ඒවාට අපි තව 30,000ක් බඳවාගන්න යනවා. අන්න එතුමන්ලා අපේ ආර්ථික මොඩලය ගැන ඉඟියක් ගන්නවා. අධ්‍යාපනය සහ සෞඛ්‍ය වෙනුවෙන් ඉතිහාසයේ වෙන් කරපු ඉහළම මුදල් ප්‍රමාණය වෙන් කරලා තිබෙනවා. අන්න, අධ්‍යාපනය පෞද්ගලීකරණය කරනවා වෙනුවට; සෞඛ්‍ය පෞද්ගලීකරණය කරනවා වෙනුවට, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් රජය ප්‍රබල මැදිහත් ප්‍රතිපත්තියක් දාලා තිබෙනවා. අන්න අපේ ආර්ථික මොඩලය ගැන ඉඟියක් ගන්න.

අස්වැසුම සහනාධාරය වැඩි කරලා, පර්යේෂණ හා සංවර්ධන මුදල් වැඩි කරලා තිබෙනවා. ඒ නිසා අපෙන් ආර්ථික මොඩලයක් ගැන අහන මහත්වරුන්ට අපිට කියන්න තිබෙන්නේ, ආණ්ඩුවේ ආර්ථික මොඩලය ගැන හොයන්න ඉස්සෙල්ලා විපක්ෂයේ ආර්ථික මොඩලය ගැන එකතු වෙලා සාකච්ඡා කරගන්න කියන එකයි. මොකද, හර්ෂ ද සිල්වා මහත්මයා ලිබරල්කරණය ගැන කථා කරද්දි, රංජිත් මද්දුම බණ්ඩාර මහත්තයා ඇවිල්ලා, "ට්‍රම්ප් හොඳයි, ට්‍රම්ප් නියමයි, ට්‍රම්ප් නියමෙට කරනවා" කියලා කියනවා. ට්‍රම්ප් කරන්නේ එකක්. ලිබරල්කරණය කියන්නේ තව එකක්. ඔය මහත්තුරු ඉස්සෙල්ලා විපක්ෂයේ ආර්ථිකය මොඩලය ගැන කථා කරලා එන්න. අපි ඉදිරි ගමනක් යනවා. අපි අපේ ආර්ථික මොඩලය ගොඩනංවන්නේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය, පාරිසරික ගුණාත්මකභාවය ඔස්සේයි. මෙන්න මේ පදනම මත තමයි අපි ආර්ථික මොඩලය ගොඩනංවන්නේ. අපි මෙවර අය වැයෙන් ඒකට අවශ්‍ය ප්‍රධාන පියවර තබලා තිබෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Anushka Thilakarathne. You have 11 minutes.

[අ.භා. 1.57]

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
මට අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ජාතික බන බලවේග ආණ්ඩුවේ මංගල අය වැය පිළිබඳ විවාදයේ කථා බොහොමයකට මම ඇහුම්කන් දුන්නා. විපක්ෂයේ මන්ත්‍රීවරු රාශියක් සතියක් පුරා කථා කරපු දේවල් මම අහගෙන හිටියා. එතුමන්ලා තේරුම් ගත යුතු කරුණක් තිබෙනවා. මෙතෙක් මේ රට පවත්වාගෙන ආපු පාලනය දූෂිත පාලනයක් බව මේ අය වැය විවාදය පුරා සිදු කළ එතුමන්ලාගේ කථාවලින්ම තේරෙනවා. ඒ වාගේම එතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්තිය අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තියක් බව පෙනෙනවා. ඒ වාගේම එතුමන්ලාගේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වගකීම් විරහිත මූල්‍ය කළමනාකරණයන් බව එතුමන්ලා පුන පුනා කථා කරන දේවල්වලින් තේරෙනවා. ඒ නිසා තමයි මේ රටේ ජනතාව ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට තුනෙන් දෙකට එහා ගිය බලයක් ලබා දුන්නේ. ඒ දූෂිත පාලනය වෙනුවට හොඳ පාලනයක් මේ රටේ ස්ථාපිත කරන්න, අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති වෙනුවට සාර්ථක ආර්ථික ප්‍රතිපත්තියක් රටේ හදන්න, වගකීම් විරහිත රාජ්‍ය මූල්‍ය පාලනය වෙනුවට වගකීම් සහිත රාජ්‍ය මූල්‍ය පාලනයක් ලංකාවේ ඇති කරන්න තමයි ජනතාව ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට බලය ලබා දුන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ජන වරම තුළ අපි කියවා ගත යුතු කරුණක් තිබෙනවා. මේ ජන වරම නියෝජනය කරන මහ පොළොවේ ඉන්න ගොවියාගේ, මහ මුහුදේ යන ධීවරයාගේ ඉඳලා රටේ සිටින විශේෂඥයන්, විද්‍යාඥයන්, පර්යේෂකයන්, ගුරුවරුන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන්, කම්කරුවන් සහ ග්‍රාමීය, නාගරික ඇතුළු සියලු ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජන මතය අපි කියවා ගතයුතු වනවා. ඔවුන් මේ පාලන බලය හුවමාරු කරන්නේ හුදු දේශපාලන පරිවර්තනයක් වෙනුවෙන් විතරක් නොවෙයි. අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් කරමින්, හොඳ ස්ථාවර ආර්ථිකයක් ඇති කරමින්, සමාජ දේහයේ පරිවර්තනයක් ඇති කිරීම උදෙසා තමයි මේ ජන වරම අපට ලබා දීලා තිබෙන්නේ. තුනෙන් දෙකකට එහා අපි ලබා ගත්තා වූ දේශපාලන බලය ආර්ථික ස්ථාවරත්වය සමඟ සමාජ පරිවර්තනයක් දක්වා වූ ගමනකට ගෙනයන්න තමයි මේ ජන මතය අපට ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා මොන ආකාරයෙන් කෑ ගැහුවත්, මොන ආකාරයෙන් විවේචන ඉදිරිපත් කළත් මේ කියවා ගැනීම් ඇතුළේ අපට තිබෙන්නේ දේශපාලන පරිවර්තනයක්, ආර්ථික පරිවර්තනයක් සහ ඒ දෙක සම්මිශ්‍රණය වෙච්ච සමාජ පරිවර්තනයක් හරහා ලංකාව ඉදිරියට ගෙනයන්න ඕනෑය කියන උත්සාහයයි.

මේ අය වැය තුළ තිබෙන විෂය ක්ෂේත්‍ර රාශියක් සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් කථා කළා. ඒ තුළ අපි කථා කරන්න ඕනෑ ප්‍රධාන කාරණයක් තමයි, අධ්‍යාපන ක්ෂේත්‍රය. මම නියෝජනය කරන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කය. ලංකාවේ තිබෙන දිස්ත්‍රික්කවලින් අතිශය දුෂ්කර ජීවිතයක් ගත කරන, ජීවිතය අහිමි වෙච්ච මිනිස්සු වැඩි වශයෙන් ඉන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ. එම දිස්ත්‍රික්කයේ දරුවන්ගේ අධ්‍යාපනය ගැන කථා කළොත්, ඔවුන්ට ලැබුණු අයිතිවාසිකම්වලින් අඩුවෙන්ම ලැබුණු අයිතිවාසිකමක් තමයි, අධ්‍යාපනය ලැබීමේ අයිතිවාසිකම. භූමියේ පිහිටීම, කාලගුණ තත්ත්වය, දරිද්‍රතාව, මන්දපෝෂණය කියන මේ සියල්ල කැටි කරගත් නුවරඑළිය දිස්ත්‍රික්කය කියන්නේ, අධ්‍යාපනය අහිමි වෙච්ච දුෂ්කරම දිස්ත්‍රික්කයක්.

පසුගිය දවස්වල මම අහගෙන හිටියා, කාලයක් තිස්සේ පාර්ලිමේන්තුව නියෝජනය කළ විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් කථා කළ ආකාරය. එතුමන්ලා කිව්වා, දෙමළ ජනතාව -මලයගම් දමිළ ජනතාව- ජීවත් වෙන්නේ එතුමන්ලා නිසාය කියලා. එතුමන්ලාට මතක් කරන්න ඕනෑ, මලයගම් දමිළ ජනතාව ජීවත් වනවා නොවෙයි, හුස්ම ගන්නවා විතරයි කියන එක. ඔවුන්ට ජීවිතයක් නැහැ, ඔවුන්ට අධ්‍යාපනයක් නැහැ, ඔවුන්ට ජීව විද්‍යාත්මක අවශ්‍යතා ටික ඉටු කර ගන්න පුළුවන් ආරක්ෂිත නිවසක් නැහැ, හොඳ පරිසරයක් නැහැ, හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීම වෙනුවෙන් වූ පාසල් පද්ධතියක් නැහැ, ගුරුවරුන් හිටියත් ඒ පාසල්වලට යන්න ප්‍රවාහන පහසුකම් නැහැ. ඒකයි මම කිව්වේ, ඔවුන් ජීවත් වනවා නොව හුස්ම ගන්නවා විතරයි කියලා. ඒ නිසා අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ කාරණයත් මතක් කරනවා. ඒ දමිළ ජනතාව ජීවත්ව ඉන්නේ ඔබතුමන්ලා නිසා නොවෙයි. ඔබතුමන්ලා මෙතෙක් කල් පවත්වාගෙන ආපු අසාර්ථක ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙන් තමයි ඒ දමිළ ජනතාවට මෙවැනි ජීවිතයක් අත් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ගැන කථා කරනවා වාගේම, මේ කාරණයත් මම කියන්න ඕනෑ. කනගාටුයි කියන්න, වයස අවුරුදු 13ත්, 18ත් අතර දැරියන් ගර්භිණී තත්ත්වයට පත්වන දිස්ත්‍රික්ක අතරින් ප්‍රමුඛ දිස්ත්‍රික්කයක් තමයි, නුවරඑළිය දිස්ත්‍රික්කය. ඔවුන්ගේ දරිද්‍රතාව කොච්චර ඉහළ මට්ටමක තිබෙනවාද කිව්වොත්, ඔවුන් යාන්තම් දෙයක් කර ගන්න පුළුවන් වනකොට ගම දාලා නගරයට යනවා - අනාරක්ෂිත මෙහෙකාර සේවයට හෝ විවිධ රැකියාවලට වෙනත් ප්‍රදේශවලට යනවා. ඒ වාගේම අම්මා, තාත්තා වතු කම්කරුවන් ලෙස හම්බ කරන මුදලින් ත්‍රිරෝද රථයක් අරගෙන පාරට වැටෙන තරුණයන් තමයි කඳුකරයේ වැඩි වශයෙන් ඉන්නේ. ඔවුන්ගේ අධ්‍යාපනය ගැන කථා කරන්න මෙතුමන්ලාට අද තිබෙන අයිතිය මොකක්ද?

ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම මතක් කරන්න ඕනෑ, ජාතික ජන බලවේගයේ මංගල අය වැයෙන් මේ සමාජයේ අත් හැරුණු කොටස් කෙරෙහි අවධානය යොමු කර තිබෙන බව. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, අසරණභාවයට පත්වන, පරිවාස භාරයට පත්වන දරුවන් ඕනෑ. ඔවුන්ට වගකීම්සහගත ජීවිතයක් තිබෙන්න ඕනෑ. මේ දරුවන් ආරක්ෂා කරලා, වයස් පූර්ණත්වයට පත් වුණාට පස්සේ සමාජගත කරන්න ඕනෑ. ඔවුන් අත්හැරිය යුතු පිරිසක් නොවෙයි. ඔවුන් පවා නිෂ්පාදන ආර්ථිකයේ කොටසක්.

ඒ නිසා අපේ මංගල අය වැයෙන්, කවුරුවත් කථා කරන්නේ නැති, ඉතිහාසයේ මෙතෙක් අතහැර දැමූ එවැනි දරුවන් සම්බන්ධයෙන් පවා කථා කරලා තිබෙනවා. ඒ වාගේම පරිවාස භාරයේ සිටින දරුවන් සම්බන්ධයෙන්, බන්ධනාගාරගත වෙලා සිටින රැඳවියන් සම්බන්ධයෙන් මෙවර අපි කථා කරලා තිබෙනවා. මම හොඳින්ම දන්නවා, නුවරඑළිය දිස්ත්‍රික්කය කියන්නේ එවැනි විෂමාචාරවලට විශාල පිරිසක් හසුවන, විශාල වශයෙන් මැදිවන දිස්ත්‍රික්කයක් බව. ඉනින්, ඉතිහාසයේ මෙතෙක් කථා නොකරපු, අපට අනෙකා සම්බන්ධ සහකම්පනයක් නැති අය වැය ලේඛන රාශියක් පසු කරමින් ඇවිල්ලා, එවැනි දරුවන් සම්බන්ධයෙන්, එවැනි රැඳවියන් සම්බන්ධයෙන්, දුෂණයට ලක්වන ස්ත්‍රීන් සම්බන්ධයෙන්, සමාජයේ තිබෙන විෂමතා හේතුවෙන් අපරාධවලට ලක්වන කාන්තාවන් සම්බන්ධයෙන්, අනෙකුත් දරුවන් සම්බන්ධයෙන් මේ අය වැය ලේඛනය පුරා අපි කථා කරලා තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ගැන මට තව බොහෝ දේවල් කථා කරන්න තිබුණත්, ඒ සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීවරුන් බොහෝ දේවල් කථා කළ නිසා මම වෙනත් මාතෘකාවක් ගැන කථා කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නියෝජනය කරන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආසනය. නුවරඑළිය දිස්ත්‍රික්කය කිව්වාම අපි කාටත් මතක් වෙන්නේ, කොළ පාට - හරිත වර්ණයෙන් යුතු- ගස් වැල්, සීතල දියෙන් පිරි දිය ඇලි, ගංගා ආදිය. ඔබ විශ්වාස කරනවාද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවගෙන් සියයට 60කට වැඩි පිරිසකට පිරිසිදු පානීය ජලය අහිමි බව? විශේෂයෙන් කොත්මලේ ආසනයේ සියයට 60කට වැඩි පිරිසකට පිරිසිදු පානීය ජලය නැහැ. ඒ ප්‍රදේශයේ තිබෙන්නේ අපවිත්‍ර ජලය. ඒ ප්‍රදේශවල තිබෙන ජල මූලාශ්‍රවලට අයිතිකාරයෝ ඉන්නවා. හඟුරන්කෙත සුදු බණ්ඩා දිසානායකලා තීරණය කරලා තිබුණා, හඟුරන්කෙත ඉඳලා කොත්මලේ සංවර්ධනය කරන්නේ කොහොමද කියලා. කොත්මලේ ආසනයේ ග්‍රාම නිලධාරී වසම් 96ක් තිබෙනවා. එම ග්‍රාම නිලධාරී වසම් එකක් ගානේ අපි ඇවිදලා තිබෙනවා. එම වසම්වල සිටින ජනතාවට තිබෙන ප්‍රශ්න ගැන හොයා බලන්නේ නැතිව කොහේදෝ ඉඳලා තීන්දු-තීරණ ගත් දේශපාලනඥයන් තමයි නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිටියේ. ඒ ජනතාවට පානීය ජලය පිළිබඳ අතිවිශාල ප්‍රශ්නයක් තිබෙනවා.

අපේ ජාතික ජන බලවේග ආණ්ඩුව ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් වෙන් කරපු මුදලින් රුපියල් බිලියන 108.7ක් පානීය ජල සැපයුම වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. සන්තෝෂයි කියන්න, මේවා මෙතෙක් කාලයක් අහිමි වුණු මූලික මිනිස් අයිතිවාසිකම්. අපි මහ ලොකුවට පරිසරය ගැන කථා කරනවා, අපි මහ ලොකුවට ජනතාවට නොයෙක් දේවල් අත්පත් කර දුන්නා කියනවා. නමුත්, මෙතෙක් පැවති අසාර්ථක පාලනය හේතුවෙන් පිරිසිදු පානීය ජලය නැති දිස්ත්‍රික්කයක් බවට නුවරඑළිය දිස්ත්‍රික්කය පත්වෙලා තිබෙනවා. ජලය තිබුණාට ඒවා පිරිසිදු කරලා පළාත් පාලන ආයතන මඟින් ජනතාවට බෙදා හැරීම සඳහා නිසි ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් මිනිසුන්ට පානීය ජලය අහිමිවෙලා තිබෙනවා.

මේ අය වැය විවාදය පුරා කථා කරපු දේවල් ඇහුවාම මට පුංචි කවි පෙළක් මතක් වෙනවා. මම ඒ කවි පෙළේ පුංචි පද ටිකක් කියලාම මගේ කථාව අවසන් කරනවා. මේ කවිය ලියලා තිබෙන්නේ, ලියන්ගහවෙල පඤ්ඤාසේකර හාමුදුරුවෝ. "ඇතුළුවීම තහනම්" කියන පොතේ තිබෙන මේ කවියේ මාතෘකාව තමයි, "ප්‍රශ්න". ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දරුවෝ අපෙන් ප්‍රශ්න අහනවා; නිරන්තරයෙන් ප්‍රශ්න අහනවා. දරුවෝ අහන ප්‍රශ්න හරිම සුන්දරයි. ඔවුන් ඒවා අහන්නේ ඔවුන්ට තිබෙන කුතුහලය නිසායි. නමුත් මේ විපක්ෂයේ වාඩිවෙලා සිටින, අත්දැකීම් තිබෙනවාය කියන, කාලයක් තිස්සේ දේශපාලනය කළාය කියන අය අපෙන් අහන ප්‍රශ්නවලට අපට හිනායනවා. මේ කවියෙන් දරුවෝ අහන ප්‍රශ්න මෙවායි.

"උදේ පායන ඉරද රෑට හඳ වී එන්නේ
මුහුදේ මාළුවෝ කොහොම ලුණු තියෙන දිය බොන්නේ
සීයේ කකුළුවෝ නැද්ද කෙළින් යන හැටි දන්නේ
ඇයිද අර ගොළුබෙල්ලෝ කටුව ඇතුළෙම ඉන්නේ"

අය වැයේ අර ක්ෂේත්‍රයට වෙන් කළ මුදල තව බින්දු ගණනකින් වැඩි කරන්න බැරිද, තව දේවල් දෙන්න බැරිද, වේදිකාවේ ඔබතුමන්ලා කියපු දේවල් කරන්නේ නැද්ද, රාජ්‍ය සේවකයන්ට මේ විධියේ තනතුරක් දෙන්නේ නැද්ද, උසස්වීම් දෙන්නේ නැද්ද, වාහන දෙන්නේ නැද්ද කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් අපෙන් ප්‍රශ්න කරනවා. උදේටත් අහනවා, දවල්ටත් අහනවා, හවසටත් අහනවා. මේ දේවල් ඔබ ඔබගෙන්ම ප්‍රශ්න කරගන්න. දරුවෝ ප්‍රශ්න ඇහුවාම සුන්දරයි. හැබැයි, වැඩිහිටියෝ දරුවෝ වාගේ ප්‍රශ්න ඇහුවාම අපට හිනායනවා. එම නිසා ඔබ ඔබගෙන් ප්‍රශ්න කර ගන්න, මේවා මේ තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ ඇයි කියලා. මෙවැනි ආකාරයක අය වැයකින් හෝ සන්තෝෂ වෙන්න පුළුවන් තත්ත්වයකට ජාතික ජන බලවේග ආණ්ඩුව කැප කිරීම් කරලායි මේ ඇවිල්ලා ඉන්නේ.

[ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය]

මේ ඉන්න එකම මන්ත්‍රීවරයෙකුවත්, මන්ත්‍රීවරියකවත් වාහන ඉල්ලන්නේ නැහැ, වෙනත් දේවල් ඉල්ලන්නේත් නැහැ. ඒ සියල්ල කැප කරලා ජන මතයට වග කියන මන්ත්‍රීවරුන් පිරිසක් තමයි අපට ඉන්නේ. ඒ නිසා පුංචි දරුවෝ ප්‍රශ්න අහනවා වාගේ අපෙන් ප්‍රශ්න අහන්න එපා. අපි කැමැතියි, ඉලක්කම්වල බින්දු ගණන වැඩි කරන්න. බින්දුවලින් මිනිසුන්ගේ සතුට තීරණය කරන්න පුළුවන් නම් ලෝකයේ සතුටට නිමාවක් නැහැ. නමුත් අපි කියනවා, සතුට කියන්නේ බින්දුවලින් ලැබෙන සතුට විතරක් නොවෙයි කියලා. මේක දේශපාලන පරිවර්තනයක්, ආර්ථික පරිවර්තනයක් සහ ඒ දෙක කැටි කර ගත් සමාජ පරිවර්තනයක්. ඒ සඳහායි අපි මේ යන්නේ. ඒ නිසා ඔබ සියලුදෙනාට මම මතක් කරනවා, පුංචි දරුවෝ ප්‍රශ්න අහනවා වාගේ අපෙන් ප්‍රශ්න අහන්න එපා කියලා. පුංචි දරුවෝ අපෙන් ප්‍රශ්න කරනකොට අපට ඒක සුන්දරව දැනෙනවා. මොකද, ඔවුන් ඒක අහන්නේ නිර්ව්‍යාජව. ඔබ සත්‍ය නම් ඔබට නිර්වස්ත්‍රව ඕනෑ තැනක යන්න පුළුවන්. හැබැයි, ඔබ බොරුව ආටෝප කර ගත්තාට පස්සේ ගොඩක් දේවල් කියන්න සිද්ධ වෙනවා.

2025 වසරට ඉතිරිව තිබෙන්නේ තව මාස 9යි. අපි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ මාස 9කට අදාළ අය වැයක්. මේක සදාකාලිකයි, ස්ථිරයි, මේක තමයි අපේ අවසාන අය වැය කියලා හිතන්න එපා. අපි මේක 2025 වසරට අදාළව ඉදිරිපත් කළ අය වැය ලේඛනයයි. මම විපක්ෂයේ ඔබ සියලුදෙනාට ආරාධනා කරනවා, මේ රට හදන පුරවැසියන් විධියට, මේ රටේ දේශපාලනඥයන් විධියට, ව්‍යවස්ථාදායකය නියෝජනය කරන මහජන නියෝජිතයන් විධියට එකතු වෙලා වැඩ කරන්න, එකතු වෙලා වැඩ කරන්න අපෙන් ඉගෙන ගන්න කියලා. මේක අපේ රට, අපේ දේශය ශ්‍රී ලාංකීය මාතාව. ඒක රැක ගන්න උදව් වෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rauff Hakeem. You have 16 minutes.

[අ.භා. 2.10]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නවක මන්ත්‍රීතුමිය හැඟීම්බරව විපක්ෂය ගැන කථා කරමින්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් පොඩි ළමයි වාගේ හිනායන ප්‍රශ්න අහනවා කිව්වා. ඇත්ත, අපි අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමියට කිව යුතුයි, මෙම ආණ්ඩුව පොල් ගණන් යනකොට රිළවුන්ට බැන්නා, හාල් ගණන් යනකොට පූසන්ටයි, බල්ලන්ටයි දොස් කිව්වා, විදුලි පද්ධතිය කඩාගෙන වැටෙනකොට නැවත වතාවත් ඒ වගකීම වදුරෙකුට පැවරුවා. ඒ වාගේ හාස්‍ය සපයන ආණ්ඩුවක් ඉදිද්දි අපිත් ඉනින් ඉඳලා හිටලා ඒ වාගේ හිනායන දේවල් කියනවා, ඒවා ගණන් ගන්න එපා කියලා.

අද උදේ අපේ අග්‍රාමාත්‍යතුමිය කථා කරනකොට අලුත් දිශානතියක් ගැන කථා කළා. මේ ආණ්ඩුව අලුත් දිශානතියකට ගමන් කරන, අලුත් හැරවුම් ලක්ෂ්‍යයක් ඇති කරන අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා කිව්වා. ඇත්ත. වමට සිග්නල් දාලා දකුණට හරවපු ආණ්ඩුවක් හැටියටයි මම නම් මේ ආණ්ඩුව දකින්නේ. *[බාධා කිරීමක්]* අපේ සභානායකතුමා කියනවා, කෙළින් යන්නේ කියලා. කෙළින් ගිහිල්ලා වළේ වැටෙන ආණ්ඩුවක්. මේ ආණ්ඩුව එහෙ මෙහෙ බලන්නේ නැතිව ඉදිරියට ගිහිල්ලා වළේ වැටෙන ආණ්ඩුවක් බව හොඳටම පේනවා.

මගේ කථාවේ ඉතිරි කොටස ඉංග්‍රීසි භාෂාවෙන් කරන්න අවසරයි.

Recognizing both its growth potential and that risks must be managed for economic stability of our nation, the Hon. President, as Minister of Finance, Planning and Economic Development, has presented this Budget at a crucial juncture in our economic recovery, where fiscal discipline is imperative to sustain growth while ensuring economic stability. Given the IMF Extended Fund Facility - EFF - Programme, fiscal consolidation remains a key priority with expenditure constraints playing a significant role in shaping allocations. As a matter of fact, the risks, challenges, fiscal constraints and revenue concerns are matters which we have to focus on. The total revenue for 2025 is estimated at 15.1 per cent of GDP, while expenditure stands at 21.8 per cent of GDP. The projected Budget deficit of 6.7 per cent raises concerns about financial sustainability.

If we take debt servicing and fiscal sustainability, a significant portion of revenue is earmarked for debt servicing costs. Any drastic increase in interest rates and the depreciation of the rupee could definitely trigger an unsustainable imbalance, in which negative consequences can be experienced. Therefore, any dip in revenue collections or external shocks could lead to fiscal imbalances.

Then, Sir, let me point out what the "Daily Mirror" of 24th February, 2025 states. I quote;

> ".....Duminda Hulangamuwa, the Senior Economic Adviser to the President said Sri Lanka can spend up to US$ 1.2 billion in foreign currency on vehicle imports in its first year of re-opening and earmarks about Rs. 300 billion or roughly 1.2 per cent of Gross Domestic Product from its taxes."

When the Senior Economic Adviser to the President says this, what does his Deputy Minister of Economic Development, the Hon. (Prof.) Anil Jayantha say? Again, I am picking up this headline from the "Business News" section of the "Daily Mirror" of 24th February, 2025. It states "Govt. targets Rs. 300 billion from vehicle taxes, but many remain skeptical". Why are they skeptical? It is because people like the Deputy Minister says things like this. That article states, I quote:

> "Professor Jayantha last week hinted that they could revise down vehicle import taxes if the demand fails to pick up for vehicles."

මේක ඥානාන්විත ප්‍රකාශයක්ද? කවුරු හෝ, අමාත්‍යවරයෙක් මේ වාගේ අවස්ථාවක මෙවැනි දෙයක් කියනවාද? එහෙම කිව්වාම කවුරුවත් වාහන ඇණවුම් කරයිද? රුපියල් බිලියන 300ක් බලාපොරොත්තුවෙන් ජනාධිපතිතුමා අය වැය ප්‍රකාශනයේදී එහෙම කියද්දී, නියෝජ්‍ය ඇමතිවරයා තවදුරටත් මෙහෙම කියනවා:

> "..... now an indication has been given by the Central Bank about the possibility of reducing import duties, Jayantha was quoted to have said in a post-cabinet media briefing last week."

He says this at a media briefing! What a jovial thing to do! මෙක තමයි විහිළුව. නියෝජ්‍ය ඇමතිවරයෙක් කියනවා, "අපි දැන් බලාපොරොත්තු වෙනවා tax එක අඩු කරන්න" කියලා. ආනයනය කරන වාහනවල tax අඩු කිරීමේ ප්‍රවණතාවක් තිබෙන බව එතුමා කියනකොට කවුරුවත් වාහන ආනයනය කරයිද? වාහන ඇණවුම් කරයිද? මෙක තමයි විහිළුව. මෙහෙම දේවල් වෙද්දී, විහිළු සපයන්න වෙන කවුරුවත් හොයන්න ඕනෑ නැහැ. ඒ අය අමාත්‍ය මණ්ඩලයේම ඉන්නවා.

Now, this is what Fitch Ratings says. Fitch Ratings' statement has been reported in the "Economynext" of 20th February, 2025, which states, I quote:

> "Sri Lanka's 2025 revenue target achievable, but long-term challenging."

මධ්‍ය කාලීන සහ දිගු කාලීන ඉතා අභියෝගාත්මක දිශානතියක තමයි අපට ගමන් කරන්න සිදු වන්නේ කියලා Fitch Ratings ආයතනය අනාවැකියක් පළ කරනවා. It further states, I quote:

> "Sri Lanka's 15 per cent revenue target in 2025, can be achieved and the deficit may be better than expected depending on the rollout of capital expenditure, but in the long term remains challenging, Fitch Rating has said.
>
> 'Fitch believes the goal is achievable, given revenue-raising measures already announced and implemented,' the rating agency said in a statement.
>
> 'However, it will depend heavily on a smooth liberalization of import restrictions, notably for vehicles.'"

When Fitch Ratings says this, your Deputy Minister says otherwise. He is already discouraging people from opening LCs to bring down vehicles, hinting that the duties may be reduced soon. So, how can you ever reach this Rs. 300 billion revenue target? That is the problem.

Now, I would like to offer some advice, but, of course, it may not be looked upon well. Anyway, I have to responsibly critique this Budget, Sir.

Let us take public pension system sustainability. We have to be really concerned about this. With the increase in public sector wages and pension adjustments, a serious concern arises over the strain on State resources in the medium to long term. This is what Fitch Ratings is talking about. Sri Lanka's public pension scheme is an unfunded scheme, meaning that pensions are paid directly from the Consolidated Fund, making it financially unsustainable as the ageing population increases and there is going to be a serious strain on the country's Treasury. Therefore, a sustainable pension reform strategy is required to transition towards a contributory pension system while ensuring the current beneficiaries are not affected. Sir, the Government must take this issue head-on and initiate a transition strategy. Gradual transition to a contributory pension scheme and introducing a hybrid pension system where new entrants to the public sector contribute to a pension fund while existing employees could have partially funded pensions is important. As far as public-private pension fund management is concerned, an independent pension fund managed with strict oversight and professional investment strategies must be established. Moreover, private sector pension schemes that complement public pensions must be encouraged. Indexing pensions to economic indicators is needed to ensure that pension increments are tied to inflation and GDP growth, rather than arbitrary increases. What you have now introduced is an arbitrary increase. Encouragement of a retirement savings culture, IMF-backed pension reforms and aligning of pension reforms with global best practices and IMF recommendations to ensure financial sustainability are also important. You can, of course, ask for technical assistance from multilateral and bilateral development agencies. The Government should actively seek help and support from both multilateral and bilateral development agencies to adopt a pension reform programme. The Hon. Prime Minister, in the morning, was talking about new directions. These should be the new directions.

අලුත් දිශානතියක් ගැන කථා කරන කොට අපි මේ වාගේ අලුත් දිශානතියක් ගැනයි කථා කරන්න ඕනෑ. එහෙම කරනවා මිසක්, හිතා මතා මේ විශ්‍රාම වැටුප් වැඩි කරන කොට අපි විකල්පයක් හැටියට වෙනත් අත්හදා බැලීම් කරන්න පුළුවන්ද කියලා කල්පනා කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ සභා ගර්භයේ අපේ අධිකරණ ඇමතිතුමාත් ඉන්න නිසා තව කාරණයක් මතු කරන්න කැමැතියි. අද උදේත් අපේ විපක්ෂ නායකතුමා ඒ කාරණය පැන නැඟුවා. විශේෂයෙන් ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා කියලා අද කථා වුණා. මම නම් පිළිගන්න විධියට ජාතික ආරක්ෂාවට නොවෙයි, මහජන ආරක්ෂාවට ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. මේ ආණ්ඩුව ආපු වෙලාවේ ඉඳලා මිනීමැරුම් 70කට වැඩිය රට තුළ සිදු වෙලා තිබෙනවා. මේ පිළිබඳව ගන්නා පියවර කුමක්ද?

අපි දැක්කා උසාවිය තුළ ගනේමුල්ල සංජීව ඝාතනය වීමේ සිද්ධිය. ඒක සිදුවෙලා පැය 48ක් යෑමට පෙර අත්අඩංගුවට ගත් දෙන්නෙක් පොලීසියෙන් ඝාතනය කරනවා. This is a very serious matter. මේ වාගේම කාරණාවක් පිළිබඳව අපේ අතිගරු ජනාධිපතිතුමන් විපක්ෂයේ ඉන්න කොට කරපු කථාවක් දැන් සමාජ මාධ්‍යවල සංසරණය වෙනවා. එතුමා මොකක්ද කිව්වේ? "මේ වාගේ අත්අඩංගුවට ගත් රැඳවියන්ට වෙඩි තියලා ඊට පස්සේ පොඩි ළමයින් රණ්ඩු කරන කොට කථාව මාරු කරලා කියනවා වාගේවත් කථාවක් කරන්න කෝ" කියලා එතුමා හිනා වෙනවා. එකම කථා කියන ආණ්ඩුවක් ගැන එවේලේ එතුමා දොස් කියද්දී, දැන් එතුමාගේ ආණ්ඩුවෙන්ම මේ වාගේ සිදුවීම් වෙන කොට ඒ පිළිබඳව මොකක්ද කියන්න තිබෙන්නේ?

Sir, today's "Daily Mirror" has reported, I quote:

> "Bar Association urges IGP to launch inquiry
>
> Calls for preventive measures against future encounter killings and custodial deaths"

අපේ අධිකරණ ඇමතිතුමා දන්නවා, Hon. Minister, you know very well what has been happening. It further states,

> "The Bar Association of Sri Lanka (BASL) yesterday announced that extrajudicial killings could never be a solution to addressing the rise in criminal activity and that crime could be best curbed when the State adhered to the rule of law.
>
> The BASL is urging the Acting Inspector General of Police to promptly initiate an impartial inquiry…"

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

අපේ සුප්‍රීම් උසාවිය 2023දී නියෝගයක් ලබා දුන්නා, පොලිස්පතිතුමාට. රැඳවියන් භාරයට ගන්න කොට පොලීසිය කුමක්ද කරන්න ඕනෑ කියන එක පිළිබඳ මාර්ගෝපදේශයක් ලබා දෙන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඒකට අනුකූලවද දැන් පොලීසිය කටයුතු කරන්නේ? මොන වාගේ දරුණු ක්‍රියා කළත් අත්අඩංගුවට ගත්තු කෙනෙක් වෙඩි තියලා මරා දැමීම, එහෙම නැත්නම් මත්ද්‍රව්‍ය පෙන්වන්න ගෙන ගියා, අවි ආයුධ පෙන්වන්න ගෙන ගියා, එතැනදී අවිආයුධ උදුරා ගන්න ගිය වෙලාවේ වෙඩි තිබ්බා කියලා බොළඳ කථා කීම සම්පූර්ණයෙන්ම මේ රටේ නීතියේ ආධිපත්‍යයට විශාල අභියෝගයක් කියන එක මතක් කළ යුතුයි.

අග්‍රාමාත්‍යතුමිය ඊයේ මේ සභා ගර්භයේදී නිශ්චිතව කියා සිටියා, පාතාල ලෝකයේ අය මර්දනය කරන්න කටයුතු කරනවා කියලා. ඔබතුමන්ලා පාතාලය අතේ තිබෙන අවිආයුධ පිළිබඳ නිවැරැදි සංඛ්‍යානයක් කළාද? කුමක්ද වෙලා තිබෙන්නේ කියා බැලුවාද? ඒ වාගේම නොයෙකුත් අවිගත් කණ්ඩායම් හිටියා. අවි ගත්ත නොයෙකුත් කණ්ඩායම් හිටියා. ප්‍රචණ්ඩත්වයට ගිය නොයෙකුත් කණ්ඩායම් හිටියා. ආණ්ඩුවේ ඉන්න අයත් එක කාලයකදී ප්‍රචණ්ඩත්වයට ගිය අය තමයි.

අපි දන්නවා, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය ගැන. එදා මහජනයා අතරේ තිබුණු තුවක්කු උදුරා ගත්තා. නොයෙකුත් අවි ගබඩාවලින් අවි හොරකම් කළා. ඒ අවි කොහේද තිබෙන්නේ? ඒවා හොයන්න. හොයලා නැවත රජයේ භාරයට ගන්න. ඒවා නිශ්ක්‍රිය කරන්න. ඒවා සම්පූර්ණයෙන්ම නිශ්ක්‍රිය කරන්න කුමක්ද ගන්න ක්‍රියා මාර්ගය? ඒකයි අපි අහන්නේ. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

නිල අවිවලින් වන ඝාතන තිබෙන්නේ ඉතා සුළු ප්‍රමාණයක්. ඇත්ත වශයෙන්ම නිල නොවන ආකාරයට ගත්ත අවිවලින් තමයි වැඩිපුරම මේ වාගේ සිදුවීම් වෙන්නේ කියන එක අපි දන්නා කාරණයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය අවධාරණය කරනවා. I would like to end with these few issues, particularly on enhancing tax revenue. We have to enhance tax collection mechanisms to prevent revenue shortfalls. There is going to be revenue shortfalls with this type of conflicting statements coming from Government authorities, particularly with what the Deputy Minister has said. You have to ensure fiscal discipline by streamlining public expenditure and reducing inefficiencies, encourage private sector-led growth by incentivizing investment and entrepreneurship, increase transparency in public spending to restore public confidence in fiscal management and strengthen social safety nets while targeting subsidies effectively to benefit those who need them most.

Of course, the Budget presented by the Hon. President has addressed some of those issues. All that has been done in keeping with the IMF guidelines. We appreciate that; we are quite appreciative of that. But, if we take the way this Government is going about, certainly, it is turning to right while having put the signal to the left; that is the current position. We would like the Government to turn right rather than to left.

Finally, wishing the Government well in this process, I would say that we are constrained since we have many issues, particularly with the treatment of the Opposition in this House. Our composition in Committees has still not been properly restored. Under those circumstances, we are constrained to vote against this Budget to show our protest against the conduct of the Government as regards the Opposition's rightful place in this Parliament. Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Prof.) L.M. Abeywickrama. You have ten minutes.

[අ.භා. 2.26]

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ මංගල අය වැය පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා වාගේම, සතුටු වනවා. පසුගිය දවස් හය පුරාම අපේ මංගල අය වැය පිළිබඳ විවිධාකාර කථා අපට අහන්න ලැබුණා. ඒ කථාවල යම් යම් සාධනීය විවේචන තිබුණත්, ගොඩක් වෙලාව අපට ඇහුණු කථා hollow rhetoric. අය වැය සම්බන්ධ කථාවලට වඩා අපට අහන්න ලැබුණේ, වෙන වෙන කථා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කථා ඇතුළේ, විවේචන ඇතුළේ තිබුණා සමහර ක්ෂේත්‍රවලට තිබෙන අඩු පාඩු සහ ඒවාට අය වැයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන මදි බව. අනෙක් පැත්තෙන් එක එක ක්ෂේත්‍ර සම්බන්ධව තනි තනිව කරපු කථා. මේ ඔක්කෝම ගත්තාම අපි වැඩියෙන්ම දැක්කේ තමන්ගේ ක්ෂේත්‍රයට මොනවාද අඩුවෙන් ලැබුණේ, මොනවාද තමන්ට වැඩියෙන් ලැබෙන්න ඕනෑ කියන කාරණා.

ඇත්තෙන්ම අපි කවුරුත් ආසයි තම තමන්ගේ ක්ෂේත්‍රවලට වැඩියෙන් ලැබෙනවා නම්. නමුත් අපි බලන්න ඕනෑ මෙය සාර්ව අය වැයක් විධියට. මෙය කේතුමතී රාජධානියේ අය වැය නොවෙයි. අපි මේ අය වැය හදන වෙලාව වනකොට අපේ රටේ ජනතාවගෙන් සියයට 26ක් දරිද්‍රතා රේඛාවෙන් පහළ හිටියේ. විශේෂයෙන් වතු ක්ෂේත්‍රයේ ජනතාවගෙන් සියයට 50ක් දරිද්‍රතා රේඛාවෙන් පහළ හිටියේ. ඒ වාගේම අපේ රටේ ජනතාවගෙන් පවුල් සියයට 42ක් ආහාර අඩු කරලා, එක්කෝ ආහාර වේල් ප්‍රමාණය අඩු කරලා, එහෙම නැත්නම් ආහාර වේලකට ගන්න ප්‍රමාණය අඩු කරලා, එහෙමත් නැත්නම් ගුණාත්මකභාවය අඩු, අකැමැති ආහාර ගන්න තත්ත්වයට පත් කරලා තිබුණු රටක් මේක.

විශේෂයෙන් රාජ්‍ය සේවකයන් පැත්තෙන් ගත්තොත්, සාමාන්‍යයෙන් දරුවෝ දෙදෙනෙක්, තුන්දෙනෙක් ඉන්න පවුල් සියල්ලම දරිද්‍රතා රේඛාවෙන් පහළ හිටියේ. හතරදෙනෙක් ඉන්න පවුලක මාසික ආදායම රුපියල් 60,000ට වඩා අඩු නම් එම පවුල් ඔක්කෝම දරිද්‍රතා රේඛාවෙන් පහළ හිටියේ. මේක ඒ වාගේ තිබුණු රටක්.

ඊළඟට, රටේ කෘෂි කර්මාන්තය කඩා වට්ටවලා, කර්මාන්ත කඩා වට්ටවලා, හතරඅතේ ණය වෙලා තිබුණේ. අපේ වරායවල්, ගුවන් තොටුපොළවල්, ඉඩම් විකුණන්න නියමිත වෙලා තිබුණේ.

එහෙම තිබුණු රටක ආර්ථිකය ගොඩ ගන්න තමයි අපට මේ අය වැය සකස් කරන්න සිද්ධ වුණේ.

ඇත්ත වශයෙන්ම මේක ඉතා අමාරුවෙන්, ඉතා ප්‍රවේශමෙන්, ඉතා සැලකිලිමත්ව හදපු අය වැයක්. සමස්තය වශයෙන් ගෙන බැලුවාම තමයි මේ අය වැය තේරුම් ගන්න පුළුවන්. බොහෝදෙනෙකුට මේ අය වැය තේරුම් ගන්න වුවමනාවක් තිබුණේ නැහැ. බොහෝදෙනෙකුට අවශ්‍ය වුණේ තමන්ගේ චරිතය පුම්බා ගන්නයි. තමන් වීරයෝ වෙන්න මෙතැන කථා කළා මිසක්, මේ අය වැය ගැන සාධනීය විවේචන ඉදිරිපත් කරනවා අපි දැක්කේ නැහැ.

මේ අය වැයේ තිබෙන විශේෂත්වය තමයි, සමස්ත ආර්ථිකය ගැන සලකා බැලීම. කලින් ආණ්ඩු අය වැය ඉදිරිපත් කරනවා අපි අහගෙන ඉඳලා තිබෙනවා; ඒවා කියවලා තිබෙනවා. ඒවායේ අපි දැක්කේ එක එක ඇමතිවරුන්ගේ, එක එක පවුල්වල චරිත පුම්බා ගන්න කටයුතු කිරීම. ඒ, ඒ, අමාත්‍යාංශයට කොච්චර වෙන් වුණාද, අර ඇමතිට වඩා මේ ඇමතිට කොච්චර වෙන් වුණාද, ඒ ඇමතිට මොනවාද කරන්න පුළුවන් ආදී ලෙස චරිත පුම්බා ගන්න හදපු අය වැය තමයි එදා තිබුණේ. මේ අය වැය එහෙම අය වැයක් නොවෙයි. මේ අය වැය ඇතුළේ තිබෙන්නේ සමස්ත ආර්ථිකය කොහොමද මේ වළෙන් ගොඩ ගන්නේ කියන එක. එවැනි දැක්මක් සහිතව හදපු අය වැයක් තමයි මේ තිබෙන්නේ.

මම විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කෙනෙකු විධියට මෙම අය වැයේ ඇති points කිහිපයක් මතු කරන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම මම කැමැතිම කාරණාව තමයි, අධ්‍යාපන ක්ෂේත්‍රයට කර ඇති වෙන් කිරීම. මොකද, අපි කාලයක් තිස්සේ අය වැයෙන් සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න කියලා පෙළපාළි ගිය කණ්ඩායමක්. මේ අය වැයේ ප්‍රමුඛතම, එහෙම නැත්නම් වැඩිම වෙන් කිරීම කරලා තිබෙන්නේ අධ්‍යාපනය වෙනුවෙන්. විශේෂයෙන් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ මහපොළ ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 7,500ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඊළඟට, ළමුන්ගේ පෝෂණය වෙනුවෙන්, -විශේෂයෙන්ම පෙර පාසල්වල, ප්‍රාථමික පාසල්වල- වෙන් කරන මුදල බිලියන 32.5ක් දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම පාසල්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය නංවන්න, අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කරන්න විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙම අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ඊළඟට, ප්‍රවාහන ක්ෂේත්‍රය ගනිමු. පසුගිය වකවානුවේ පැවති ආණ්ඩු වුවමනාවෙන් ප්‍රවාහන ක්ෂේත්‍රය කඩා වැටිවලා තිබුණා. ග්‍රාමීය පාරවල්වල යන්න බැහැ. බොහෝ ග්‍රාමීය පාරවල්වල බස් සේවා නතර කරලා -විශේෂයෙන් ලංගම බස් සේවාව නතර කරලා - ඒ මිනිසුන්ට ප්‍රවාහන කටයුතු කර ගන්න නොහැකි තත්ත්වයට පත් කරලා, විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරගෙන ත්‍රිවීලර්වල යන්න සලස්වා තිබුණා. එම නිසා මේ අය වැයෙන් මේ ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් ග්‍රාමීය පාරවල් සංවර්ධනය කරන්න විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා.

අනෙක් පැත්තෙන්, ආර්ථික වශයෙන් වාසිදායක නොවන පාරවල ගමනාගමනය සඳහා ලංගම බස් රථ 1,500ක් පමණ යොදවන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ අය වැයෙන් ලබා දීලා තිබෙනවා. ඒක අප ලබපු විශාල ජයග්‍රහණයක්.

විශේෂයෙන්ම පසුගිය වකවානුවේ අපේ රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අයත් බීජ ගොවි පොළවල් වුවමනාවෙන්ම වැහෙන්න සැලැස්වූවා. මහඉලුප්පල්ලම, පැල්වෙහෙර ආදි විවිධ ස්ථානවල තිබුණු බීජ ගොවි පොළවල් වහලා, බීජ නිෂ්පාදනය නතර කරලා තිබෙනවා. අද වන කොට අපේ ගොවීන්ට සිදු වෙලා තිබෙනවා, බීජ මහා විශාල ප්‍රමාණයක් ආනයනය කරන්න. 2023 අවුරුද්දේ රුපියල් මිලියන 2,831ක බීජ ප්‍රමාණයක් අපි ආනයනය කර තිබෙනවා. අපේ ගොවීන්ට අද සිද්ධ වෙලා තිබෙනවා, එක පැපොල් ඇටයකට රුපියල් 70ක් ගෙවන්න; එක ගර්කින් ඇටයකට රුපියල් 50ක් ගෙවන්න. අද වන විට අපේ ගොවි පොළවල බීජ නිෂ්පාදනය සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබෙනවා. මේ නිසා අපේ කෘෂිකර්ම ක්ෂේත්‍රය විශාල අභියෝගයකට මුහුණ දීලා තිබෙනවා. එම නිසා මේ අය වැයෙන් විශේෂයෙන්ම බීජ ගොවි පොළවල් නඟා සිටුවන්න, බීජ නිෂ්පාදනය කරන්න විශාල මුදල් ප්‍රතිපාදනයක් කර තිබෙනවා. මේකත් අපි ලබපු තවත් ජයග්‍රහණයක්. මේවායේ ප්‍රතිඵල පසුවයි අපට ලැබෙන්නේ. ඒ වාගේම, කෘෂි කර්මාන්තයේ අලුත් මායිම්වලට යන්න, අලුත් දැක්මක් සහිතව ගමන් කරන්න විශාල ප්‍රතිපාදනයක් වෙන් කර තිබෙනවා. සුහුරු කෘෂි කර්මාන්තය - smart agriculture - නඟා සිටුවන්න රුපියල් බිලියන 8.7කුත්, කෘෂි කර්මාන්තයේ තිබෙන පසුගාමී ක්ෂේත්‍රයක් වන ව්‍යවසාය ගොඩ නැඟීම සඳහා රුපියල් බිලියන 3.4කුත්, වාරිමාර්ග සංවර්ධනය සඳහා -විශේෂයෙන්ම සුළු වාරිමාර්ග ව්‍යාපෘති සඳහා- විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම තමයි පර්යේෂණ ක්ෂේත්‍රය. මම ඒ ගැන විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. පසුගිය වසර 10 පුරාම විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවල, පර්යේෂණ ආයතනවල ඒ ප්‍රතිපාදන කපා හැරලා තිබුණේ, පර්යේෂණ සිදු වුණේ නැහැ. පර්යේෂණවලින් තමයි නව නිෂ්පාදන බිහි වන්නේ. පර්යේෂණ හරහා තමයි රටවල් සංවර්ධනය වෙන්නේ. අපේ රටේ හිටපු පාලකයෝ පසුගිය කාලය පුරාම පර්යේෂණ සඳහා වන ප්‍රතිපාදන සම්පූර්ණයෙන් කපා හැරලා තිබුණේ. අපේ රටේ පර්යේෂණ කරන්න පුළුවන් හොඳ විද්‍යාඥයන් විශාල සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලවල, පර්යේෂණ ආයතනවල, අනෙකුත් ආයතනවල හිටියත්, අදාළ ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් නව නිෂ්පාදන අපේ රටේ බිහි වුණේ නැහැ. එම නිසා මේ අය වැයේ වැදගත් කාරණයක් තමයි, පර්යේෂණ සඳහා වන ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් වෙන් කර තිබීම. එයිනුත් වැඩි ප්‍රමාණයක් වෙන් කර තිබෙන්නේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහායි. විශ්වවිද්‍යාලයක වාගේම, පර්යේෂණ ආයතනවල කටයුතු කළ අයෙකු වශයෙන් මට ඉමහත් සතුටක් දැනෙනවා, මේ අය වැයෙන් පර්යේෂණ සඳහා ප්‍රතිපාදන වැඩි කිරීම පිළිබඳව.

අපේ රටේ විශාල විභවයක් තිබෙන ක්ෂේත්‍රයක් තමයි කුරුඳු කර්මාන්තය සහ තේ කර්මාන්තය. සමහර අවස්ථාවල විපක්ෂයෙන් අපට අහන්නට ලැබුණා, තේ කර්මාන්තයට, කුරුඳු කර්මාන්තයට වෙන් කරපු මුදල මදි කියලා. ඇත්ත වශයෙන්ම තේවලට, කුරුඳුවලට යනුවෙන් තනි තනිව ගත් විට ඒවාට වෙන් කරපු මුදල අඩුයි වාගේ පෙනුණාට, සමස්තයක් වශයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනය වන කොට, ග්‍රාමීය වාරි කර්මාන්ත සංවර්ධනය වන කොට, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය වන කොට ඒ ප්‍රතිලාභ ලැබෙන්නේත් මේ ක්ෂේත්‍රවලටමයි. සමස්තයක් වශයෙන් ගත්තොත්, විශේෂයෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හරහා මේ ක්ෂේත්‍ර වර්ධනය කරන්න පුළුවන්.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. අපේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි කසළ කළමනාකරණය. මේක නොසලකා හැරපු ක්ෂේත්‍රයක්. වැසි කාලවල අපට නගරවල ඇවිදින්න බැහැ. මොකද, කසළ තිබෙන්නේ පාරේ. මේ ප්‍රශ්නයට විද්‍යාත්මක දැක්මක් පසුගිය පාලකයන්ට තිබුණේ නැහැ. ඒ නිසා අපේ පාලනය තුළ අපි කසළ කළමනාකරණයට ප්‍රමුඛත්වය දීලා තිබෙනවා. වෙනත් රටවලට කසළ කියන්නේ ඇත්ත වශයෙන්ම බලශක්තිය නිෂ්පාදනයට, කාබනික පොහොර නිෂ්පාදනයට

[ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා]

වාගේම ප්‍රතිවක්‍රීකරණය හරහා වෙනත් නිෂ්පාදනවල අමු ද්‍රව්‍යයක්. කසළ කියන්නේ මුදල්. මේ අය වැය හරහා විශාල මුදල් ප්‍රතිපාදනයක් වෙන් කර තිබෙනවා, විශේෂයෙන්ම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විද්‍යාත්මක වශයෙන් සිදු කිරීම හරහා අපේ රටේ ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන්න. මේ අනුව අපි දකිනවා, මෙය සමස්තයක් ලෙස ගෙන බැලිය යුතු අය වැයක් බව. මේකේ එක එක කෑලි වෙන වෙනම අරගෙන කථා කරන්න අපට බැහැ. මේ අය වැය දෙස සමස්තයක් වශයෙන් බලලා තමයි කථා කරන්න වෙන්නේ. මේක අපේ ආණ්ඩුවේ මංගල අය වැය. මේ අය වැය ක්‍රියාත්මක කිරීම හරහා අපි විශ්වාස කරනවා, අප බලාපොරොත්තු වෙච්ච "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන සංකල්පයට ඉතා කෙටි කාලයකින් ළඟා වෙන්න පුළුවන් මූලික අඩිතාලම මේ අය වැයෙන් වැටෙයි කියලා.

කලින් කථාවකදී විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, පසුගිය මාස දෙකතුන තුළ මිනිස් ඝාතන විශාල ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා කියලා. මම එතුමාට කියන්න කැමැතියි, සංඛ්‍යාලේඛන අනුව, 2023 අවුරුද්දේ මනුෂ්‍ය ඝාතන 572ක් සිදු වෙලා තිබෙන බව.

2024 අවුරුද්දේ මනුෂ්‍ය ඝාතන 555ක් සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම, බරපතළ තුවාල සිදු කිරීම් ගත්තොත්, 2023 අවුරුද්දේ 1,457ක් සිදු වෙලා තිබෙනවා. 2024 අවුරුද්දේ 1,348ක් සිදු වෙලා තිබෙනවා. මේ ආකාරයට ඝාතන විශාල ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා. මේ අපරාධ, මේ ඝාතන ඇත්ත වශයෙන්ම අපේ ආණ්ඩුව පැවැති මාස තුනේ ප්‍රතිඵල නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවලින් හදපු සංස්කෘතියේ ඵල විපාක තමයි අදත් අපට පාලනය කරන්න බැරි වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප බලාපොරොත්තු වුණු හැරවුම් ලක්ෂ්‍යයට අපි ළඟා වෙලා තිබෙනවා. අපේ ඉලක්කය ඉතාම කෙටි කාලයක් තුළ ළඟා කර ගන්න, අත්පත් කර ගන්න අවශ්‍ය හැකියාව තිබෙන, දැක්ම තිබෙන ජනතාවක් තමයි අපත් එක්ක එකතු වෙලා ඉන්නේ. එසේ කියමින් මගේ වචන ස්වල්පය මෙතැනින් අවසන් කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Sellaththamby Thilaganathan. You have 10 minutes.

[பி.ப. 2.37]

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் வடக்கு மாகாண அபிவிருத்திக்குப் பெருமளவான நிதி ஒதுக்கப்பட்டுள்ளது. குறிப்பாக, வடக்கு மாகாணத்திலுள்ள கிராமிய வீதிகளை மேம்படுத்துவதற்காக 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. அந்த நிதியானது, முல்லைத்தீவு, மன்னார், வவுனியா, யாழ்ப்பாணம், கிளிநொச்சி ஆகிய ஐந்து மாவட்டங்களுக்கும் கிட்டத்தட்ட சரிசமமாகப் பிரிக்கப்பட்டுள்ளது. கடந்த காலத்தில் ஏற்பட்ட அனர்த்தத்தால் பெருமளவான வீதிகள் பாதிப்படைந்துள்ளதால், விவசாயிகளின் உற்பத்திப் பொருட்களைச் சந்தைப்படுத்த முடியாத நிலை காணப்படுகின்றது. அதேநேரம், போக்குவரத்துப் பாதைகளும் சீரற்றுக் காணப்படுகின்றன. வட மாகாணத்துக்கு ஒதுக்கப்பட்ட இந்த நிதியால் அம்மாகாணத்தில் வாழ்கின்ற மக்கள் பாரிய நன்மைகளைப் பெற்றுக்கொள்வார்கள் என்பதை நான் இந்த உயரிய சபையில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

வட மாகாணத்துக்கு ஒதுக்கப்பட்ட நிதியில் அங்குள்ள தொழிற்சாலைகளையும் அபிவிருத்தி செய்ய வேண்டும். காங்கேசன்துறையில் அமைந்திருக்கின்ற சீமெந்துத் தொழிற்சாலையானது, 1950ஆம் ஆண்டு உருவாக்கப்பட்டது. அக்காலப் பகுதியில் அத்தொழிற்சாலையானது ஒரு வருடத்துக்கு 100,000 மெற்றிக்தொன் சீமெந்தை உற்பத்தி செய்தது. அந்தத் தொழிற்சாலையானது 1991ஆம் ஆண்டுவரை இயங்கி வந்தது. பின்னர், யுத்தம் காரணமாக அத்தொழிற்சாலை மூடப்பட்டது. அதனால் அங்கு வாழ்கின்ற மக்களுடைய வேலைவாய்ப்புகள் இழக்கப்பட்டதுடன், அவர்களுடைய பொருளாதாரமும் பாதிக்கப்பட்டது. குறிப்பாக, இந்த சீமெந்துத் தொழிற்சாலைக்கு மன்னார் மாவட்டத்தின் முருங்கன் பிரதேசத்திலிருந்துதான் களிமண் கொண்டுவரப்பட்டது. களிமண் தொடர்பான வேலைகளில் ஈடுபட்ட மக்களது வாழ்வாதாரம் பாதிக்கப்பட்டது. மீண்டும் அந்தச் சீமெந்துத் தொழிற்சாலையை ஆரம்பித்து, அங்குள்ள மக்களுடைய வாழ்வாதாரத்தையும் பொருளாதாரத்தையும் உயர்த்துவதற்காக எமது அரசாங்கமானது பெருமளவு நிதியை ஒதுக்கீடு செய்துள்ளது என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

அதேபோல், பரந்தனில் அமைந்துள்ள இரசாயனக் கூட்டுத்தாபனமானது 1954ஆம் ஆண்டு உருவாக்கப்பட்டது. அன்றிலிருந்து 1985ஆம் ஆண்டு வரை இலங்கைக்குத் தேவையான sodium hydroxide, chlorine, hydrochloric acid போன்றவை உள்நாட்டிலேயே உற்பத்தி செய்யப்பட்டது. இந்தக் கைத்தொழிற்சாலை பாதிக்கப்பட்டதன் பின்னர், பெருமளவு நிதியைச் செலவிட்டு வெளிநாடுகளிலிருந்து இவற்றை இறக்குமதி செய்யும் ஒரு துர்ப்பாக்கிய நிலைக்கு இலங்கை நாடானது தள்ளப்பட்டுள்ளது.

முல்லைத்தீவு மாவட்டத்தின் ஒட்டுசுட்டானிலுள்ள ஓட்டுத் தொழிற்சாலையானது, 1968ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்டது. எனினும், யுத்தம் நடைபெற்ற காரணத்தால் குறிப்பிட்ட காலத்தின் பின்னர் அந்தத் தொழிற்சாலையும் மூடப்பட்டது. அந்தத் தொழிற்சாலை இயங்கிய காலத்தில் இலங்கைக்குத் தேவையான ஓடுகள், குறிப்பாக வன்னி மற்றும் யாழ்ப்பாணப் பிரதேசங்களுக்குத் தேவையான ஓடுகள் அங்கிருந்துதான் பெறப்பட்டன. அந்தத் தொழிற்சாலையானது, மீண்டும் எமது அரசாங்க காலப்பகுதியில் ஆரம்பிக்கப்படவுள்ளது என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக் கொள்கின்றேன்.

வட மாகாணத்திலுள்ள முல்லைத்தீவு மாவட்ட செயலகத்துக்கு 126 மில்லியன் ரூபாயும், வவுனியா மாவட்ட செயலகத்துக்கு 100 மில்லியன் ரூபாயும், மன்னார் மாவட்ட செயலகத்துக்கு 189 மில்லியன் ரூபாயும், யாழ். மாவட்ட செயலகத்துக்கு 187 மில்லியன் ரூபாயும், கிளிநொச்சி மாவட்ட செயலகத்துக்கு 179 மில்லியன் ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது. முல்லைத்தீவு மாவட்டத்தின் சனத்தொகை 99,000 ஆகும். அம்மாவட்டத்திலுள்ள ஒரு நபருக்குச் சராசரியாக 1,272 ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. கொழும்பு மாவட்ட செயலகத்துக்கு ஒதுக்கப்பட்டுள்ள நிதியின் அளவு 452 மில்லியன் ரூபாய்! கொழும்பு மாவட்டத்தின் சனத்தொகை 2,460,000 ஆகும். இதன்படி, அம்மாவட்டத்திலுள்ள ஒரு

நபருக்கு ஒதுக்கப்பட்டுள்ள நிதி 183 ரூபாய்! சற்று முன்னர் இங்கு பேசிய எதிர்க்கட்சி உறுப்பினர் ஒருவர் சொன்னார், வடக்கு மாகாணத்தில் முல்லைத்தீவு மாவட்டத்துக்கு மிகவும் குறைந்தளவு நிதியே ஒதுக்கப்பட்டுள்ளது என்று. அவ்வாறு அவர் கூறியது தவறு! இதனை calculation செய்து பார்க்க வேண்டும். கொழும்பு மாவட்டத்திலுள்ள ஒரு நபருக்கு 183 ரூபாயும் முல்லைத்தீவு மாவட்டத்தில் வாழுகின்ற ஒரு நபருக்கு 1,272 ரூபாயும் ஒதுக்கப்பட்டுள்ளது. உண்மையிலேயே எமது அரசாங்கம் யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு அதிகளவு நிதியை ஒதுக்கியுள்ளது என்பதை நான் இங்கு பெருமையுடன் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, வட்டுவாகல் பாலம் பற்றி கூற வேண்டும். இப்பாலமானது 1950ஆம் ஆண்டு அமைக்கப்பட்டது. அன்றிலிருந்து இன்றுவரை அந்தப் பாலம் புனரமைக்கப் படவில்லை. இதனால் மக்கள் கடும் சிரமத்துடனேயே புதுக்குடியிருப்பிலிருந்து முல்லைத்தீவுக்கு வருகின்றார்கள். வடக்கு மாகாண சபை மிகவும் சக்திவாய்ந்ததாக இருந்த கடந்த ஆட்சிக் காலத்தில்கூட, அம்மாகாணத்தைப் பிரதிநிதித்துவப் படுத்திய அரசியல்வாதிகள் அந்தப் பாலம் பற்றி சிந்தித்துக்கூட பார்க்கவில்லை. ஆனால், எமது அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒருசில மாதங்களிலேயே அந்தப் பாலத்தைப் புனருத்தாரணம் செய்வதற்குரிய நிதியை ஒதுக்கீடு செய்துள்ளது என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், வவுனியா மாவட்டத்திலும் கிளிநொச்சி மாவட் டத்திலும் தீயணைப்புப் பிரிவு - Fire Brigade - காணப்படு கின்றது. எனினும், மன்னார் மற்றும் முல்லைத்தீவு மாவட்டங்களில் தீயணைப்புப் பிரிவு இதுவரை ஸ்தாபிக்கப் படவில்லை. அங்கு பாடசாலைகள், தனியார் கட்டிடங்கள் மற்றும் தொழிற்சாலைகள் இருக்கின்றன. அவற்றில் தீ ஏற்பட்டால்கூட, அதை அணைப்பதற்கு அங்கு தீயணைப்புப் பிரிவு இல்லை. இதனால் இந்த வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின்மூலம் இந்த இரண்டு மாவட்டங்களிலும் தீயணைப்புப் பிரிவை உருவாக்கிக் கொடுக்கவுள்ளோம் என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்திலுள்ள மாவட்ட வைத்தியசாலையில் ஆண்கள் விடுதியில் 23 கட்டில்கள்தான் காணப்படுகின்றன. அங்கு நோயாளர்களின் எண்ணிக்கை 110ஆக அதிகரிக்கையில், பலர் விடுதிக்கு வெளியில் தங்கி சிகிச்சை பெறவேண்டியுள்ளது. இதனால் இந்த வருடம் 250 மில்லியன் ரூபாயை முல்லைத்தீவு மாவட்ட வைத்தியசாலைக்கு ஒதுக்கி, அதன்மூலம் அங்கு ஒரு கட்டிடத்தை அமைத்து, அந்த வைத்தியசாலையை அபிவிருத்தி செய்யவுள்ளோம் என்பதை நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்கின்றேன். முல்லைத்தீவு மாவட்டத்தில் இதுவரை காலமும் ஒரு பொது நூலகம் இருக்கவில்லை. எமது ஆட்சிக் காலத்தில் அம்மாவட்டத்துக்கென ஒரு பொது நூலகத்தை அமைக்கவுள்ளோம். அதேபோல், முல்லைத்தீவு, மன்னார் மாவட்டங்களில் இதுவரை காலமும் கலாசார மண்டபம் அமைக்கப்படவில்லை. எமது ஆட்சியில் இந்த இரண்டு மாவட்டங்களுக்கும் தனித்தனி கலாசார மண்டபங்களை அமைத்துத் தருவோம் என்பதையும் நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மன்னார் மாவட்டத்தில் கிட்டத்தட்ட 90,000 கால்நடைகள் காணப்படுகின்றன. எனினும், அவற்றுக்கு இதுவரை காலமும் மேய்ச்சல் தரை ஒதுக்கப்படவில்லை. எமது ஆட்சியில் கட்டுக்கரைக் குளத்துக்குக் கீழுள்ள நிலத்தில் - அதாவது, வன வளப் பிரதேசத்தில் - அந்தக் கால்நடைகளை மேய்ச்சலுக்கு விடுவதற்கான அனுமதியைப் பெற்றுக்கொடுத்து இருக்கிறோம் என்பதையும் நான் இந்த உயரிய சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

சற்று முன்னர் எதிர்க்கட்சி உறுப்பினர் ஒருவர், இலங்கை யிலே அரிசிப் பற்றாக்குறைக்கு நாய்களை நாங்கள் காரணமாகச் சொல்கிறோம் என்று சொல்லியிருந்தார். இலங்கையில் பத்து நபர்களுக்கு ஒரு நாய் என்ற அடிப்படையில் நாய்கள் காணப்படுகின்றன. இலங்கையில் சாதாரண ஒரு மனிதனின் உணவுக்குத் தேவைப்படுகின்ற அரிசியிலும் பார்க்கக் கூடியளவு அரிசி நாய்களின் உணவுக்குத் தேவைப்படுகின்றது. இது சம்பந்தமாக கருத்துத் தெரிவித்த பாராளுமன்ற உறுப்பினர் அவர்கள் நாய் வளர்க்காதபடியால், அவருக்கு இதுசம்பந்தமான அறிவு இல்லையோ எனத் தோன்றுகின்றது எனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani. You have 11 minutes.

[අ.භා. 2.47]

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මෙය ආර්ථික අර්බුදයක කෙළවර සිදු වුණු දේශපාලන පරිවර්තනයක්. පසුගිය දශකය තුළ, පසුගිය අවුරුදු කිහිපය තුළ අපේ රට දැවැන්ත ආර්ථික අර්බුදයක් කරා ළඟා කළා. එසේ ළඟා කරවීමේ ප්‍රතිවිපාක හැටියට අපේ රටේ ජනතාව එක මිටකට එකතු වෙලා දේශපාලන පරිවර්තනයක් තුළින් දේශපාලන අයිතිවාසිකම් අත්පත් කර ගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම මැතිවරණයක් තුළින් තමන්ගේ දේශපාලන අයිතිවාසිකම් අත්පත් කර ගන්නකොට, ඒ අයිතිවාසිකම ඇතුළේ රටේ ජනතාවගේ ආර්ථික අයිතිය තහවුරු කරන එක තමයි මේ අය වැයේ ප්‍රධාන දර්ශනය වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි භාර ගත්තේ සෑම අතින්ම කඩා වැටුණු රටක්. ආර්ථික වශයෙන්, සෞඛ්‍ය වශයෙන්, දේශපාලන වශයෙන්, සමාජයීය වශයෙන් ආදී සෑම අතින්ම කඩා වැටුණු රටක තමයි අපි දේශපාලන බලය අත්පත් කර ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම කඩා වැටුණු රටක් ඇතුළේ අපේ ගරු ජනාධිපතිතුමා රටේ සියලු ක්ෂේත්‍ර නියෝජනය වන විධියට සාධාරණ, සහකම්පනයක් සහිත, ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම ප්‍රථමයෙන්ම ඒ පිළිබඳව ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගොවි ජනතාව, කම්කරු ජනතාව, ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයන්, කාන්තාවන්, දරුවන්, වතු කම්කරුවන් ආදී මේ රටේ සෑම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරමින් මේ අය වැය ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම, මේ රටේ ජීවත් වන සෑම පුරවැසියෙක්ම මේ අය වැයට සහභාගිවන්නන්; මේ අය වැයේ පාර්ශ්වකරුවන්; මේ අය වැයේ ප්‍රතිලාභීන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට දවසේ මේ රටේ පුරවැසියන්ට පොහොසත් රටක් හදන, පුරවැසියන්ගේ ජීවිත ලස්සන කරන වැඩ පිළිවෙළ තමයි සමස්තයක් වශයෙන් මේ අය

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

වැය පුරාම කථා කරන්නේ. දිළිඳු ජනතාව වාගේම, වඩාත්ම අවදානමට ලක්විය හැකි ප්‍රජාව ශීඝ්‍රයෙන් වැඩි වෙමින් තිබුණු රටක් තමයි අපි භාර ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම රටක අස්වැසුම දීමනාව තිබුණාට වඩා ප්‍රමාණාත්මකව සහ සංඛ්‍යාත්මකව වැඩි කරන්න අද වෙනකොට අපට සිද්ධ වෙලා තිබෙනවා. ආබාධ සහිත පුද්ගලයන් සඳහා, වකුගඩු රෝගීන් සඳහා, අනෙකුත් සුබසාධක වැඩසටහන් සඳහා රුපියල් බිලියන 749ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ තුළ තිබෙන සංඛ්‍යා දෙස බලනවාට වඩා, මේ අය වැය අනෙකා දැනෙන සහකම්පනයක් සහිත අය වැයක් කියන එක කියන්න මම කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විපක්ෂයෙන් නිතරම මතු කළා අපි අපේ ප්‍රතිපත්ති මත පිහිටලා මේ අය වැය ඉදිරිපත් කළේ නැහැ කියලා. අපේ රටේ කාන්තාවට නිදහස, ගෞරවය, රැකවරණය අහිමි සමාජ වටපිටාවක් තමයි මේ රටේ ඉතිරි වෙලා තිබුණේ. විශේෂයෙන්ම අපි මේ අය වැය ඇතුළේ කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නියෝජනය කරන්නේ මොනරාගල දිස්ත්‍රික්කය. මොනරාගල දිස්ත්‍රික්කය ගත්තොත්, තමන්ගේ දරුවන්ට ජීවිතය හොයන්න මහ පොළොවත් එක්ක පොර බදිමින්, උක් වතු එක්ක පොර බදිමින් ජීවිතය ගෙවන ආදරණීය කාන්තාවන් තමයි ඒ දිස්ත්‍රික්කයේ ඉන්නේ. විශේෂයෙන්ම මේ අය වැය තුළින් එවැනි කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන්, ඒ වාගේම කාන්තාවන්ට හා දරුවන්ට නිදහස, රැකවරණය, ගෞරවය හිමි සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 120කට වැඩි මුදලක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම පසුගිය කාලයේ දරු පැටව් සිය දෙනෙක් උපදිනකොට ඒ සිය දෙනාගෙන් පස් දෙනෙක් රක්තහීනතාවෙන් පෙළුණා. ඒකට හේතුව මොකක්ද? ගර්භිණී කාලයේ අම්මාට හොඳ පෝෂ්‍යදායී ආහාරයක් ලැබෙන්නේ නැති වෙනකොට උපදින දරුවා රක්තහීනතාවෙන් පෙළෙනවා. ඒ නිසා අපට අඛණ්ඩව මේ සමාජයට වගකියන දරුවෙක් නිර්මාණය කරන්න බැරිකමක් තිබුණා. ඒ නිසා මේ අය වැය ඇතුළේ කාන්තාවන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 7,500ක මුදලක් වෙන් කරලා තිබෙනවා.

විපක්ෂයේ දේශපාලන අධිකාරිය විවිධ අවස්ථාවලදී -මේ මැතිවරණයට කලින් හැම මැතිවරණ වේදිකාවකම- අපට එල්ල කරපු අභූත චෝදනාවක් තමයි, අපි බලයට ආවොත් ත්‍රිපෝෂ කර්මාන්තශාලාව වසා දමනවාය කියන එක. මම හිතනවා මේ අය වැයෙන් තමයි අපට ඒකට හොඳම උත්තරය ලබා දෙන්න පුළුවන්කම ලැබුණේ කියලා. ඒ අනුව මවුවරුන්ගේ හා දරුවන්ගේ පෝෂණය වෙනුවෙන් ත්‍රිපෝෂ වැඩසහනට රුපියල් මිලියන 5,000කට වැඩි මුදලක් අපි මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය ඇතුළේ තිබෙන සංඛ්‍යා දත්තවලට එහා ගිහින්, මේ අය වැයේ යථාර්ථය අපි මේ රටේ පුරවැසියන් හැටියට තේරුම් ගත යුතුයි.

කිසි දවසක අය වැයකින් අවධානයට ලක් නොවුණු ඔටිසම් හා ස්නායු ආබාධ සහිත දරුවන් වෙනුවෙන් දැවැන්ත පහසුකම් ප්‍රමාණයක් මේ මහ පොළොව තුළ ස්ථාපිත කරන්නට අපි මේ අය වැයෙන් කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන් ඔටිසම් සහ ස්නායු ආබාධ තිබෙන පවුලක ආදරණීය අම්මා කෙනෙක් තමන්ගේ දරුවා වෙනුවෙන් මොන තරම් වේදනාවක් විඳිනවාද? ඒ වේදනාව අපටත් හොඳටම දැනිලා තිබෙනවා. ඒ නිසා තමයි ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව ඒ අයට ප්‍රතිකාර ලබා ගැනීමට රිජ්වේ ආර්යා ළමා රෝහලේ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 200ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ. මේ ආරම්භයක් පමණයි. ඉදිරි අවුරුදු පහ තුළ සෑම දිස්ත්‍රික්කයකම මෙවැනි දරුවන්ට ප්‍රතිකාර ලබා ගැනීමට ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ අඩිතාලම තමයි මේ දාලා තිබෙන්නේ. මෙවැනි දරුවන් රැක බලා ගන්න, පෙර පාසලේ සිට අධ්‍යාපනය ලබා දෙන්න අද වෙනකොට බැරි හෝ අහිමි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි රුපියල් මිලියන 250ක මුදලක් ඒ අය වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ආදර්ශ පෙර පාසල් ඉදිකිරීම වෙනුවෙන් වෙන් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ මිනිසුන්ගේ ජීවත් වීමේ අයිතිය තහවුරු කරනවා වෙනුවට, මිනිසුන්ගේ ජීවිත අහිමි වන වටපිටාවක් සෞඛ්‍ය පද්ධතිය ඇතුළේ තිබුණා. ඒ නිසා මේ අය වැයෙන් ඉතිහාසගත විධියට සෞඛ්‍යයට වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරමින් -රුපියල් බිලියන 6.4ක මුදල් ප්‍රමාණයක් වෙන් කරමින්- මේ රටේ මිනිසුන්ගේ ජීවත් වීමේ අයිතිය තහවුරු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 අවුරුද්දේ ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ අවුරුදු තුනේ සිට අවුරුදු 21 දක්වා දරුවන්ගෙන් සියයට 21කට වැඩි ප්‍රමාණයක් අධ්‍යාපනයෙන් පිටමං වූ ආකාරය ගුරුවරියක හැටියට මා දන්නවා. විශේෂයෙන් පෙර පාසලේ සිට විශ්වවිද්‍යාලය දක්වා දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කරමින් රුපියල් බිලියන 619ක් වාගේ දැවැන්ත මුදල් ප්‍රමාණයක් මේ රටේ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. අපි ආණ්ඩුවක් හැටියට පිළිගන්නවා, බුද්ධිමත් නිරෝගී පරපුරක් හෙට දවසේ අපේ රටට අවැසියි කියන එක.

පෙර පාසල් දරුවන්ගේ ආහාර දීමනාව රුපියල් 60 සිට රුපියල් 100 දක්වා වැඩි කරමින් එම දීමනාව ගෙවීම වෙනුවෙන් රුපියල් මිලියන 1,000ක මුදල් ප්‍රමාණයක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. පෙර පාසල් ගුරුවරුන්ගේ වැටුප රුපියල් 1,000කින් වැඩි කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 100ක මුදලක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තෝරා ගත් මුල් ළමාවිය මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 80ක් වාගේ මුදල් ප්‍රමාණයක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් 750 ශිෂ්‍යත්ව දීමනාව රුපියල් 1,500 දක්වා වැඩි කරලා තිබෙනවා. මහපොළ සහ ශිෂ්‍යාධාර ලබන දරුවන් විශ්වවිද්‍යාල ඇතුළේ අධ්‍යාපනය ලබන්නේ අධ්‍යාපනයට අමතරව තවත් මොකක් හෝ රැකියාවක් කරමින්. ඒ අයට දෙන දීමනාව රුපියල් 2,500කින් වැඩි කර ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ චමෝදි ප්‍රබෝධා හා චේතනා විමුක්ති කියන දරුවන් අද වෙනකොට ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරනවා.

ඒ දෙමවුපියන් ගඩොල් කපලා තමයි ඒ දරුවන්ට උගන්වලා මේ තත්ත්වයට ගෙනැවිත් තිබෙන්නේ. ඒක මොන තරම් ඛේදනීය තත්ත්වයක්ද! ඒ නිසා ක්‍රීඩා පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ට ලබා දෙන දීමනාව රුපියල් 5,000 සිට 10,000 දක්වා වැඩි කර දීම ඔවුන්ට ශක්තියක් කියන එක මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තමයි රැඳවුම් නිවාසවල සිටින දරුවන්ට රුපියල් 5,000ක් ලබා දෙන්න යෝජනා කර තිබෙනවා. ඒ තුළ තිබෙන මූල්‍ය වටිනාකම දිහා නොවෙයි, අපි බැලිය යුත්තේ. ඒ දරුවන් තුළ අවිනිශ්චිතභාවයක් තිබෙනවා, සමාජයට මුදා හැරියාම ඔවුන් ජීවත් වෙන්නේ කොහොමද කියලා. ඔවුන්ට මේ සමාජය කෙරෙහි විශ්වාසය ගොඩනඟා ගනිමින් ජීවත් වෙන්න පුළුවන් විධියට ආරක්ෂිතව නිවසක් ඉදිකර ගැනීම සඳහා රුපියල් මිලියනයක පරිත්‍යාගයක් කරන්න මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා. ඒ වාගේම මේ රැඳවුම් නිවාසවල සිටින දරුවන්ගේ පාසල් අධ්‍යාපනය, ව්‍යක්තිය අධ්‍යාපනය, රැකියා අයිතිය කියන මේ සියල්ලම තහවුරු කිරීමේ හැකියාව මේ අය වැය තුළින් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජයේ අනාරක්ෂිත දරුවන් දැඩි ලෙස අපචාරවලට, දූෂණවලට, වංචාවලට යොමුවන බව අපි දකිනවා. එවැනි දරුවන්ට අවශ්‍ය රැකවරණය සැලසීම සඳහාත් මේ අය වැය තුළින් කටයුතු කර තිබෙනවා. මම කැමැතියි, මෙන්න මෙහෙම කියන්න. කුෂ්වාන්ත් සිං විසින් රචිත, කුලසේන ෆොන්සේකා විසින් පරිවර්තනය කරන ලද, "අන්තිම දුම්රිය" නමැති නිර්මාණය තුළ කියා තිබෙනවා, "අපරාධකාරයෝ උපදින්නේ නැහැ. කුසගින්න, නැති බැරිකම හා සමාජ අසාධාරණය ඔවුන් නිර්මාණය කරනවා" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்காணி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ මට ඇහුණා මේ සභා ගර්භය තුළ කියනවා, මාලිමාවේ ඉන්න මන්ත්‍රීවරියන් ළමාතැනීලා කියලා. මට එහෙම වචනයක් ඇහුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාලිමාවේ කිසිම මන්ත්‍රීවරියක් ළමාතැනී කෙනෙක් නොවෙයි කියන එක මම මේ මොහොතේ කියන්න කැමැතියි. අපේ අවසාන පරමාර්ථය තමයි මේ රට පොහොසත් රටක් කරන එක, මේ රටේ ජීවත් වෙන පුරවැසියන්ගේ ජීවිත ලස්සන කරන එක. මාලිමාව ඇතුළේ සිටින සියලු කාන්තාවන් ශක්තිමත්. අපි හැමදෙනාම හෙට දවසේ බලාපොරොත්තු වෙන ඒ පොහොසත් රට ගොඩනඟා, මේ රටේ පුරවැසියන්ගේ ජීවිත ලස්සන කරලා මිසක් අපි ආපසු හැරෙන්නේ නැහැ කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Kavinda Heshan Jayawardhana. You have 15 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Rohini Kumari Wijerathna to the Chair?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.

[අ.භා. 2.59]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මට කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඇත්ත වශයෙන්ම මේ අය වැය ඉදිරිපත් කරන්නේ අපේ රටේ ජනතාව 2/3ක බලයක් ලබා දුන් පාර්ලිමේන්තුවක්. මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් 159 දෙනෙක් ආණ්ඩු පක්ෂයේ අසුන් ගෙන, මේ රටේ වගකීම ඒ අය භාර අරගෙන ඉදිරිපත් කරන අය වැයක්. මෙතැනදී අපි මේ හැම දෙයක්ම නරකයි කියන්න උත්සාහ ගන්නේ නැහැ. අපි දැක්කා, යාපනයේ පුස්තකාලය ගිනි තැබීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා කථා කළා. අපි සියලුදෙනාම ඒ පිළිබඳව සංවේදීයි. අධ්‍යාපනයට ආදරය කරන පිරිසක් හැටියට, විශේෂයෙන්ම ජාතීන් අතර ආගම් අතර තිබෙන සංහිඳියාව ගොඩ නඟන්න උත්සාහ ගන්නා කණ්ඩායමක් හැටියට එතුමා යාපනය පුස්තකාලය සඳහා මිලියන 100ක් වෙන් කිරීමේ කටයුත්ත අපි අගය කරනවා. මොකද, මේ රටේ කවුරු වරදක් කළත්, වරද වරදමයි. හැබැයි, ඒ ප්‍රදේශවල සිටින ජනතාවට සාධාරණත්වය, යුක්තිය ඉෂ්ට කරන්න නම් මෙවැනි අඩිතාලමක් දැමිය යුතුයි. අපි එය අගය කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ අය වැය තුළ දැක්කා මව්වරුන්ටත්, දරුවන්ටත් පෝෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන බව. හොඳයි. මොකද, අපේ දරුවන් තමයි අපේ අනාගතය. ඒ නිසා දරුවන්ට හොඳ පෝෂණයක් ලැබීම, හොඳ අධ්‍යාපනයක් ලැබීම ඉතාම වැදගත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හැබැයි අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන කථා කරනකොට, පානීය ජලය නැති, වැසිකිළි-කැසිකිළි පහසුකම් නැති පාසල් මොන තරම් ප්‍රමාණයක් අපේ රටේ තිබෙනවාද කියන කාරණයත් සඳහන් කළ යුතුයි. ඒ නිසා ඒ පිළිබඳවත් මේ රජය අවධානය යොමු කරන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුව පසුගිය කාලයේ වේදිකාවක්, වේදිකාවක් ගණනේ මේ රටේ ජනතාවට දුන් පොරොන්දුවලින් ප්‍රධාන එකක් තමයි අධ්‍යාපනය සම්බන්ධයෙන් වන පොරොන්දුව.

ඒ ලබා දුන් පොරොන්දු මේ රටේ ජනතාව විශ්වාස කළා. ඒ පොරොන්දු හිස් වචන නොවෙයි කියලා හිතලා කතිරය ගහලා ජනාධිපතිවරයෙක් සහ තුනෙන් දෙකක බලයක් සහිත ප්‍රබල ආණ්ඩුවක් මේ රටේ ජනතාව බිහි කළා. ඒ පොරොන්දුවලින් එකක් තමයි, පාසල් දරුවන්ට අවශ්‍ය ලිපිද්‍රව්‍යවලට ගහලා තිබෙන බදු, එහෙම නැත්නම් ඒ VAT එක ඉවත් කරනවා කියන එක. ඒ බලාපොරොත්තුවත් සහිතව තමයි මේ රටේ ජනතාව වර්තමාන රජයට ඡන්දය ලබා දුන්නේ. හැබැයි, මේ ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ? එක පැත්තකින් පාසල් දරුවන්ට අවශ්‍ය ලිපිද්‍රව්‍යවලට ගහලා තිබෙන බදු නැති කරනවා, කප්පාදු කරනවා, ඉවත් කරනවා කියලා පොරොන්දු වෙච්ච ආණ්ඩුව, පාසල් යන සමහර දරුවන් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් හැටියට නම් කරලා ඔවුන්ට පොත් පත් ලබා ගැනීම සඳහා රුපියල් 6,000ක වවුචරයක් දෙන්න කටයුතු කළා. මේක වේදනාත්මක

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ක්‍රියාදාමයක්. අපට පුළුවන්ද දරුවෙක් නම් කරන්න, මෙයා අඩු ආදායම්ලාභී පවුලක දරුවෙක් කියලා? මම පත්තරයක තිබෙනවා දැක්කා, රජයෙන් දෙන රුපියල් 6,000ක වවුචරය, ඕනෑ නම් පාසල් සංවර්ධන සමිති ගාස්තු ගෙවන්න පාවිච්චි කරන්න පුළුවන් කියලා පළ වෙච්ච ප්‍රවෘත්තියක්. දරුවන්ගෙන් සල්ලි එකතු කරන්න එපා කියලා චක්‍රලේඛ එවලා තිබුණාට, රජයෙන් පාසල්වලට සල්ලි දෙන්නේ නැහැයි කියලා විදුහල්පතිතුමා කියනවා ලු. එම නිසා පාසල්වල ඉන්න අස්වැසුම ප්‍රතිලාභී පවුල්වල දරුවන් රුපියල් 6,000ක වවුචරය ලබා ගැනීමට ගිය අවස්ථාවේ විදුහල්පතිතුමා කියලා තිබෙනවා, ඒකෙන් පාසල් සංවර්ධන සමිති ගාස්තු ගෙවන්න කියලා. හේතුව, රජයෙන් සල්ලි දෙන්නේ නැහැයි කියන එක. රජය එදා වෙච්ච පොරොන්දුව ඇයි මේ අය වැයෙන් ඉෂ්ට කරන්නේ නැත්තේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැනත් කථා කළා. සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙනුත් මේ ආකාරයෙන්ම පොරොන්දු වුණා, අනිවාර්යයෙන්ම ඒ හා සම්බන්ධ බදු ඉවත් කරනවා කියලා. ඔබතුමන්ලා දන්නවා, අද ඖෂධ මොන තරම් මිල අධිකද කියලා. රජයේ සමහර රෝහල්වලට ගියාම පරීක්ෂණය එළියෙන් කරන්න කියනවා. එහෙම නැත්නම් යම් ඖෂධ ප්‍රමාණයක් එළියෙන් මිලදී ගන්න කියනවා. සමහර වෙලාවට සැත්කම් -ශල්‍යකර්ම- කරන්න පෞද්ගලික රෝහල්වලට යන්නත් වෙනවා. ඒ සියල්ලටම ගහන බදු ගෙවන්න වෙන්නේ මේ රටේ දුක් විඳින අහිංසක මිනිස්සුන්ට කියන එක අපි මේ ආණ්ඩුවට මතක් කර දෙනවා.

මේ රටේ ආර්ථිකයට ප්‍රධාන වශයෙන්ම බලපාන්නේ මොකක්ද? මේ රටේ ආර්ථිකයට ප්‍රධාන වශයෙන්ම බලපාන දෙයක් තමයි, කෘෂි කර්මාන්තය. අපේ රට කෘෂිකාර්මික රටක්. අපේ රටේ සිටින බොහෝදෙනෙක් කන්නේ බත්. එවැනි තත්ත්වයක් තිබෙනකොට ගොවියාට වී සඳහා සාධාරණ මිලක් ලබා දෙන්න ආණ්ඩුව තටම-තටම හිටියා. ඊට පස්සේ ආණ්ඩුව වීවලට මිලක් නියම කරනකොට ගොවීන් පෞද්ගලික අංශයේ වී මෝල් හිමියන්ට වී ටික දෙන්න පටන් ගත්තා. ඒ සඳහා ආණ්ඩුවෙන් රුපියල් බිලියන 5ක් වෙන් කළා. "සති අග අරුණ" පත්තරේ තිබෙනවා, වී මෙට්‍රික්ටොන් මිලියන 26ක් මිලදී ගැනීම සඳහා රුපියල් බිලියන 325ක් අවශ්‍ය නමුත්, ආණ්ඩුව වෙන් කර ඇත්තේ රුපියල් බිලියන 5ක් පමණයි කියලා. වී අලෙවි මණ්ඩලය මේ වන විට ලබාගෙන ඇත්තේ වී කිලෝග්‍රෑම් 2,000කට අඩු ප්‍රමාණයක් කියලාත් පත්තරේ සඳහන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මොකක්ද මේකෙන් වෙන්නේ? ඊළඟට වෙන්නේ, ගොවීන්ගෙන් වැඩි මිලට වී ගත්තා කියලා වී මෝල් හිමියන් වැඩි මිලට හාල් ටික විකුණන්න පටන් ගැනීම. එතකොට පාරිභෝගිකයාට හාල් ගන්න වෙන්නේ වැඩි මිලට. ආණ්ඩුව කිව්වේ මොකක්ද? ඔවුන් මේ හාල් ප්‍රශ්නයට මැදිහත් වන ක්‍රමය විධියට කිව්වේ, මේ කන්නයේ තිබෙන වී ටික -මේ අස්වැන්නම- ලබාගෙන මේ හාල් මිල පාලනය කරනවා කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒක කොහොමද කරන්නේ? හරි සරල ප්‍රශ්නයක්. අපට හැමදාම බොරු කියන්න පුළුවන්. හැබැයි අපට හැමදාම බොරු කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. කල්පනා කරලා බලන්න. දැන් අපට බත් කන්න බැරි නම්, පාන් කන්න පටන් ගත්තා කියලා හිතමු. පාන් කන්න පටන් ගත්තොත්, අවම වශයෙන් පවුලකට වේලකට පාන් ගෙඩි දෙකක්වත් කන්න වෙනවා. පරිප්පු හොද්දක් එක්ක වේල් තුනම පාන් කෑවොත්, දවස් 30ට රුපියල් 31,500ක්වත් අවම වශයෙන් වියදම් කරන්න වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පෞද්ගලික අංශයේ පඩියක් ලබන අය, එදා වේල හම්බ කරගන්නා අය, රාජ්‍ය සේවකයෙක් වුණත් රුපියල් 31,500ක් පානුයි, පරිප්පුයි කන්න වියදම් කළොත්, ළමයාට පොත් පත් ටික අරගෙන දෙන්නේ කොහොමද? අසනීපයක් හැදුනාම බෙහෙත් ටිකක් ගන්නේ කොහොමද? බස් එකේ, කෝච්චියේ, ත්‍රී වීලර් එකේ යන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කිසිම දෙයක් ගැන ආණ්ඩුව සංවේදී වෙලා තිබෙනවා කියලා අපට හිතන්න හරි අමාරුයි.

මේ අය වැයෙන් අපේ රටේ ජනතාව සහන බලාපොරොත්තු වුණා. යම් යම් ආකාරයෙන් ඒ සහන ලබා දෙන හැටිත් අය වැය ඉදිරිපත් කරද්දී කියවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දැක්කා, ඊට කලින් මෙතුමන්ලා මැතිවරණ වේදිකාවේ කිව්වේ මොකක්ද කියලා. රජයට අයිති, හිටපු ඇමතිවරු පාවිච්චි කළ වාහන වෙන්දේසි කරනවා, රජයට අයිති නිවාස වෙන්දේසි කරනවා කිව්වා. ඒක හොඳයි. ඉක්මනට ඒ ටික කරලා, ඒකෙන් ලැබෙන ප්‍රතිලාභය, ඒ සහන ටික මේ රටේ ජනතාවට ලබා දෙන්න කියන ඉල්ලීම අපි කරනවා.

මේ අය වැය තුළින් රටේ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟෙයි කියලා ආණ්ඩුව බලාපොරොත්තු වෙනවාද? මම හිතන්නේ නැහැ, එහෙම නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟෙයි කියලා. නමුත්, නිෂ්පාදන ආර්ථිකයක් මේ රට තුළ ගොඩනැඟිය යුතුයි. මේ රටේ නිෂ්පාදනය ගොඩනඟන්නේ කොහොමද කියලා මේ රජය අවධානය යොමු කරන්න ඕනෑ. අපේ රටේ තිබෙන වටිනාම සම්පත තමයි, මානව සම්පත. ඒ මානව සම්පත දියුණු කරන්නේ කොහොමද කියලා රජය අවධානය යොමු කරන්න ඕනෑ. මේ රට educational hub එකක් බවට පත් කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේ රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ.

අපේ රටේ දරුවෝ ඉගෙන ගන්න පිට රට යනවා. ඒ නිසා ඇමෙරිකානු ඩොලර් බිලියන ගණනක් අපට අහිමි වෙනවා. නමුත්, ඒක කළ හැකි අවස්ථාව සහ අවකාශය මේ රටේ තිබෙනවා. මේ රටේ ආචාර්යවරු, මහාචාර්යවරු, කථිකාචාර්යවරු ඉන්නවා. අනෙක් පහසුකම් තිබෙනවා. වෙනත් රටවල විශ්වවිද්‍යාලවලට යන්න කැමැති පිටරට දරුවෝ මේ රටට ගෙන්වාගන්න අපට පුළුවන්. උදාහරණයක් ලෙස ගත්තොත්, යුරෝපයේ දරුවන්ට scholarship එකක් දෙනවා, ලෝකයේ වෙනත් රටවලට ගිහිල්ලා ඉගෙන ගන්න. අපි ඒ අවකාශය, අවස්ථාව, පහසුකම් ටික දුන්නොත් ඒ අය බොහොම සතුටු වෙනවා, අපේ රට වාගේ රටකට ඇවිල්ලා අධ්‍යාපනය ලබන්න පුළුවන්වීම ගැන. ආණ්ඩුව ඒ සඳහා අය වැය තුළින් මුදල් වෙන් කරලා, එවැනි කටයුත්තක් කිරීම සඳහා අවධානය යොමු කරයි කියලා මා බලාපොරොත්තු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ ධීවර ජනතාව ගැනත් කථා කරන්න ඕනෑ. උදාහරණයක් විධියට ගත්තොත්, මම නියෝජනය කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ආසනය. ධීවර ජනතාවට ලබා දෙනවා කියපු සහනාධාර මීගමුවේ ධීවරයන්ට නම් තවම ලබා දෙන්න පටන් අරගෙන නැහැ. ඒ වාගේම ඒ ධීවර ජනතාව තවමත් කරන්නේ පාරම්පරික ධීවර කර්මාන්තයමයි. අනුර කුමාර දිසානායක මහතා ජනාධිපති වෙන්න කලින් රැස්වීමකදී ප්‍රකාශ කරනවා මම දැක්කා, ඉන්දියාවේ හා ලෝකයේ අනෙක් රටවල ධීවර කර්මාන්තය කරන ආකාරය ගැන. සැටලයිට් තාක්ෂණය භාවිත කරලා මාළු ඉන්න ප්‍රදේශ හඳුනාගෙන, ධීවර ජනතාවට ඒ ප්‍රදේශ පිළිබඳව දැනුම් දුන්නාම ඒ අය ගිහිල්ලා ඒ මාළු අස්වැන්න ලබාගෙන තමයි ඒ රටවල ධීවර කර්මාන්තය කරන්නේ. හැබැයි, අපේ රටේ ධීවර කර්මාන්තය කොහොමද වෙන්නේ? අපේ රටේ බෝට්ටු ටික ඔහේ යනවා, ඔහේ එනවා, මත්ස්‍යයෝ හම්බ

වුණොත් හම්බ වුණා, නැත්නම් නැහැ. මේක මම කියන කථාවක් නොවෙයි. මේක වර්තමාන ජනාධිපතිතුමා කියපු කථාවක්. අපි බලාපොරොත්තු වුණා, මේ අය වැයෙන් ධීවර ජනතාවට මත්ස්‍ය සම්පත වැඩිපුර ලබා ගැනීම සඳහාත්, මේ රටේ ජනතාවට හොඳ ආහාර වේලක් ලබා ගැනීමට අවශ්‍ය මත්ස්‍ය සම්පත ලබා ගැනීම සඳහාත්, නව තාක්ෂණය හඳුන්වා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරයි කියලා. නමුත්, ඒ ගැන මේ අය වැයේ නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, කරුණාකරලා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා.

ගොවි ජනතාවගේ තත්ත්වයත් එහෙමයි. ඔවුන්ට අලුත් තාක්ෂණය හඳුන්වා දෙනවා කිව්වා. එහෙත් ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. අපි දන්නවා, එතුමාගේ සංකල්ප හොඳ බව. එතුමා කියනවා, කිරි ටික දොවලා, ඒ ටික පිටි කරලා, ආපසු වතුර කරලා අපි බොනවා, ඊට වඩා නැවුම් කිරි ලබා දීමේ වැඩ පිළිවෙළක් රටේ ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. ඒ ක්‍රම, එතුමාගේ ඒ සංකල්ප හොඳයි. ඒවා මහ පොළොවේ ක්‍රියාත්මක කරන්න මේ අය වැය උපයෝගි කර ගන්න කියා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ සියයට 15ක් කැසිනෝවලට බදු ගහනකොට, අධ්‍යාපනයට අදාළ ලිපිද්‍රව්‍ය සහ පොත්පත්වලට සියයට 18කට ආසන්න ප්‍රමාණයක් බදු ගහලා තිබෙනවා.

සියයට 80කට ආසන්න ප්‍රමාණයක් මේ රටේ රාජ්‍ය සේවකයෝ වර්තමාන රජයට තමයි ඡන්දය දුන්නේ. නමුත් වර්තමාන රජයට ඡන්දය දුන්නාට මේ වනකොට කී දෙනෙක් දේශපාලන වශයෙන් මාරුවීම්වලට ලක්වෙලා සිටිනවාද කියලා සැකයක් තිබෙනවා. ඒ වාගේම senior SLAS officersලා කී දෙනෙක් pool එකේ ඉන්නවාද? කී දෙනෙක් කලින් විශ්‍රාම ගිහිල්ලා තිබෙනවාද කියන එක පිළිබඳව අවධානය යොමු කරන්න කියන ඉල්ලීමත් අපි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය ගැන කථා කරනකොට ගොඩක් අය කිව්වා, "මේ අය වැය IMF අය වැයක්" කියලා. ඒක අපි කියනකොට හිතන්නේ දේශපාලන කුහකත්වයෙන් කියනවා කියායි.

2025 පෙබරවාරි 23වන දින "The Morning" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා:

> "It anticipates a 23% increase in total revenue, a 13.5% rise in non-tax revenue, and a 17% expansion in Government spending. In evaluating the IMF compliance of these key fiscal parameters, particularly the projected primary surplus target of 2.3% of GDP in 2025, many economists believe that Budget 2025 aligns closely with most IMF targets."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "The IMF suggests a revenue target of 15.1% of GDP in 2025, which is in line with the 15.1% total revenue estimation in Budget 2025."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක අපි කිව්වා නම් හිතන්නේ කුහකත්වයෙන්, දේශපාලන කෝණයෙන් හිතලා කියනවා කියලායි. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, IMF එක ගැන එදා අපි කථා කරනකොට ඔබතුමන්ලා අප දැක්කේ දුෂ්ටයන් වාගේයි. අද IMF එකත් එක්ක හරි-හරියට වැඩ කරමින් ඒ අයගේ අවශ්‍යතාවලට, වුවමනාවලට සරිලන ආකාරයේ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවාය කියන එක ඉතාම පැහැදිලියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පැහැදිලිවම මේ රටේ ජනතාව අද කබලෙන් ළිපට වැටෙන්න හේතු සාධක වුණේ මොකක්ද කියන කාරණයට අවධානය යොමු කරන්න ඕනෑ. එදා IMF එකට බැන්නාට අද IMF එක හොඳ වෙලා තිබෙනවා කියන එක තමයි මේකෙන් පැහැදිලි වෙන්නේ. මේ tranche එක හම්බ වුණේ නැත්නම් ආසියානු සංවර්ධන බැංකුවෙන්, ලෝක බැංකුවෙන් ලැබෙන්න තිබුණු මුදල් ටික ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ ගමන් මාවතේ යන්න තිබෙනවා. හැබැයි, එදා කියපු කථාව නොවෙයි අද මහ පොළොවේ ක්‍රියාත්මක වෙන්නේ කියන එක මතක් කරමින්, මට කථා කරන්න කාලය ලබා දුන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.15]

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2025 අවුරුද්ද සඳහා ජාතික ජන බලවේගය විධියට අපේ ආණ්ඩුව ඉදිරිපත් කළ මේ අය වැය යෝජනාවලිය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට ලැබීම ගැන සතුටට පත් වෙමින් මගේ අදහස් මේ සභාව හමුවේ තබනවා. විශේෂයෙන් දින 7ක් මුළුල්ලේ පැවැති මේ අය වැය දෙවැනිවර කියවීමේ විවාදයේදී ආණ්ඩු පක්ෂය මඟින් ඉදිරිපත් කළ ඉතා සාධනීය, දියුණු, ප්‍රශස්ත අදහස් පිළිබඳව අපට අභිමානයක් තිබෙනවා; අපට දැක්මක් තිබෙනවා. විපක්ෂය මඟින් මේ කාලය පුරාවටම කරුණු ඉදිරිපත් කරද්දි, තරුණ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් යම් සාධනීය කරුණු ප්‍රමාණයක් මතු කරන්න උත්සුක වුණා කියන එකත් විශේෂයෙන් අපි මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

නමුත් අවුරුදු ගණනාවක් ආණ්ඩුක කරලා මහා අත්දැකීම් තිබෙනවා යැයි කියන, ඒ ගැන උදන් අනන මන්ත්‍රීවරු ඉදිරිපත් කළ ඉතා සරල, සිල්ලර පන්නයේ තර්ක විතර්ක දිහා බැලුවාම අපට පෙනෙන්නේ - අපට මතක් වෙන්නේ - අපේ සම්භාව්‍ය සාහිත්‍යයේ තිබෙන කියමනක්. ඒ කියමන තමයි, "අම්බං පුටියෝ ලබුජං ව්‍යාකරෙය්‍ය" -අඹ ගැන විමසන කළ දෙල් ගැන කියනවා- කියන එක. අන්න ඒ වාගේ අදහසක් තමයි අපට ඒ තුළින් මතු වෙන්නේ.

එතුමන්ලා හැම වෙලාවේදීම මේ තුළ දැක්කේ මිනිසුන් අතර සැකය, සංකාව, භීතිය මවන දේවල්. අපේ අය වැය ඇතුළේ තිබෙන ආර්ථික න්‍යාය මොකක්ද කියන එක පැහැදිලි කර ගන්න බැරිව, අපි ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම සඳහා යන මේ ගමන හඳුනා ගන්න බැරිව එතුමන්ලා උත්සාහ කළා, ඇඩම් ස්මිත්ගේ මතවාදවල එල්ලිලා මේකෙන් ගොඩ යන්න පුළුවන්ද කියලා. හැබැයි, ඒක එතැනට අදාළ වෙන්නේත් නැහැ. ඒ වාගේම කාල් මාක්ස්ගේ "ප්‍රාග්ධනය" කියන කෘතිය පදනම් කරගෙන ඒකෙන් ගොඩයන්න උත්සාහ කළා. ඒක ලෝකයට දැවැන්ත සමාජ, ආර්ථික පරිවර්තනයක් වෙනුවෙන් යෝජනා ගෙනාපු කෘතියක්. විචාරකයෝ ඒ කෘතිය ගැන කිව්වේ, ඉතිහාසයේ උකුළ මත නිද්‍රාශීලීව තිබූ සමාජ බලවේග අවදි කරනු ලැබුවේ මේ මාක්ස්වාදී ප්‍රවණතාව විසින් කියායි. ඒ නිද්‍රාශීලී සමාජ බලවේග අවදි කරන්න ඉදිරිපත් කළ, ඒ දැවැන්ත සමාජ, ආර්ථික න්‍යායේ

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

වචනයක් විතරක් අල්ලාගෙන ඒකේ හැංගෙන්න එතුමන්ලා උත්සාහ කළා. හැබැයි, ඒකත් අසාර්ථක වුණා. ඊළඟට, ධම්මපදයේ එල්ලිලා, බයිබලයේ එල්ලිලා, කුරානයේ එල්ලිලා ආගමික පැත්තටත් දාලා, ආගමානුකූල ආවරණයක් ලබාගෙන මේ අය වැය ඇතුළේ තිබුණු ඉතා වටිනා අදහස් වහලා දමන්න උත්සාහ කළා. ඒ වාගේ මේ සමාජය ඇතුළේ තිබෙන මොනවා හරි දේවල් - ආගම, ජාතිය, කුලය ආදී දේවල් - අල්ලාගෙන හැමදාම ඒවා ඇතුළේ සැඟවෙමින් තමයි මෙතුවක් කල් එතුමන්ලාගේ පැවැත්ම තහවුරු කර ගත්තේ. ඒ අභ්‍යාසය නිසා දෝ මේ අය වැය පිළිබඳව ඉදිරිපත් කළ අදහස් අතර තිබුණේ අන්න ඒ වාගේ සරල, සිල්ලර පන්නයේ තර්ක විතර්ක ටිකක්.

නමුත් ඇත්ත වශයෙන්ම අපි මේ අය වැය ඉදිරිපත් කරමින් උත්සාහ කරන්නේ දැවැන්ත සමාජ පරිවර්තනයක ආරම්භක පියවර තබන්නයි; පුනරුදය යුගයක සමාරම්භය සනිටුහන් කරන්නයි. ඒක ලේසි පහසු වැඩක් නොවෙයි. ඒක අමාරු වැඩක්. හැබැයි, ඒක අමාරුවෙන් හරි කරන්න ආරම්භ නොකළොත්, මේ රටට මෙතැනින් ඉස්සරහට ගමනක් නැහැ. ඒ ආකාරයට ඉස්සරහට යන ගමනක් නැති කරපු රටක් තමයි අපට ලැබුණේ. ඒ නිසා පුනරුදය යුගයක් ආරම්භ කරන්නට අද ආණ්ඩුවක් විධියට කටයුතු කරමින් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ මේ සමාජයේ විවිධ ක්ෂේත්‍රවල හිටපු අය. වෛද්‍යවරු, ඉංජිනේරුවන්, කෘෂි තාක්ෂණවේදය සම්බන්ධ විශේෂඥයන්, සමාජ විද්‍යාඥයන්, විශ්වවිද්‍යාල ආචාර්ය, මහාචාර්යවරු, ගුරුවරු, විදුහල්පතිවරු ආදී වශයෙන් සෑම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරන පිරිසක් තමයි අපේ ආණ්ඩුව ඇතුළේ ඉන්නේ. එතුමන්ලා මේ කරන්නේ කැප කිරීමක්. එතුමන්ලා මේ කරන්නේ මේ සමාජය පරිවර්තනය සඳහා යන ගමනට අදාළ කරන ඒ ජවය, භයිය, ශක්තිය දෙන්න දරන උත්සාහයක්. ඒක දේශපාලනය මඟින් තමන්ගේ බඩ වඩා ගැනීම, පවුල් නඩත්තු කිරීම, පෝෂණය කිරීම හුරුපුරුදු කර ගත් විපක්ෂයට සම්බන්ධ ඇතැම් දේශපාලන නායකයන්ට දැනෙන්නේ නැහැ.

දැනෙන්නේ නැත්තේ ඇයි? මේ පරිත්‍යාගය පිළිබඳව, නැත්නම් මේ අපි දරන උත්සාහය පිළිබඳව ඔවුන්ට දැනෙන්න, පෙනෙන්න හේතුවක් නැහැ. ඒකට හේතුව, ඔවුන් හැමදාම මේ සමාජය සූරාගෙන කන ආකාරයේ, මේ සමාජය ප්‍රපාතයට ඇද හෙළන ආකාරයේ ආර්ථික ප්‍රතිපත්ති, ආර්ථික න්‍යාය තමයි අනුගමනය කළේ. අපට දැන් පෙනෙනවා, මේ දිනවල කෝප් කමිටුව ඇතුළේ සාකච්ඡා කරන දේවල් ඔස්සේ, පසුගිය කාල පරිච්ඡේදය තුළ ඔවුන් මොන තරම් අපේ රටේ ආර්ථිකය අවභාවිත කරලා තිබෙනවාද කියලා.

අපි මේ උත්සාහ කරන්නේ, ආර්ථිකය යන වචනයේ අදහස කෘත්‍රිම තර්ක බුද්ධිය ඇතුළේ සඟවලා, තාක්ෂණික වචනයක් බවට පත් කරලා ඒක අනාථ කරන්න නොවෙයි. අපි ඒ වචනය හැබෑ වශයෙන්ම විග්‍රහ කරගෙන, හඳුනාගෙන මේ සමාජය පරිවර්තනය කිරීම සඳහා, මේ සමාජය ඉදිරියට ගෙන යෑම සඳහා කටයුතු කරනවා. සමහර ක්ෂේත්‍රවල ප්‍රමාණාත්මක වශයෙන් ඇති කරන දියුණුවක් වාගේම, සමහර ක්ෂේත්‍රවල ගුණාත්මක වශයෙන් ඇති කරන දියුණුවක් ඔස්සේ මේ පුනරුදය යුගය, නැත්නම් මේ සමාජ පරිවර්තනය ඇති කිරීමට ආරම්භය ලබා දෙනවා. ඒ ආරම්භය ලබා දෙනකොට විපක්ෂය විසින් නිරන්තරයෙන් ඉදිරිපත් කරන ආර්ථික න්‍යාය ගොබෙල්ස් න්‍යායක් කියලායි මට පෙනෙන්නේ. ඒ කියන්නේ, එකම බොරුව සිය වතාවක් මතුරමින්, පතුරමින් ඉදිරිපත් කරන්න උත්සාහ කරන ඒ අදහස් මේ රටේ ව්‍යාජත කරලා, මේ ආණ්ඩුව යන සාධනීය ගමනට කිසියම් ආකාරයක බාධාවක් එල්ල කරන්න උත්සාහ කරනවා. හැබැයි මා විශ්වාස කරනවා, ඒ අයට ඒ බාධාව මෙවර කරන්න හම්බ වෙන්නේ නැහැ. අපි ඉතාම අධිෂ්ඨානශීලීව, මනා කළමනාකරණයකින් යුතුව, හොඳ දැක්මක් සහිතව, හොඳ ශක්තිමත් ආණ්ඩුවක් විධියට මේ ගමන යන්න සූදානම් වෙනවා.

විශේෂයෙන් අපේ අය වැය ඇතුළේ ඉදිරිපත් කර තිබෙන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති විවිධ ක්ෂේත්‍ර 26ක් යටතේ හඳුනාගෙන, ඒ යටතේ ව්‍යාපෘති 287ක් සම්පූර්ණ කරන්න අපි බලාපොරොත්තු වෙනවා, මේ අවුරුද්ද හමාර ඇතුළත. සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය, යෞවන සහ ක්‍රීඩා, සෞඛ්‍ය, ආගමික සංස්කෘතික උරුමයන් ආදී වශයෙන් ක්ෂේත්‍ර 26ක් ඔස්සේ අපි නව ව්‍යාපෘති 287ක් මේ රට ඇතුළේ ක්‍රියාත්මක කරනවා. සමහර ඒවා මේ අවුරුද්ද ඇතුළත අවසන් කරන්න සැලසුම් කරලා තිබෙනවා. සමහර ඒවා අපි ඉදිරි අවුරුදුවලදී අවසන් කරන්න සැලසුම් කරලා තිබෙනවා.

ඒ වාගේම අපට සතුටු වෙන්න පුළුවන්, මීට පෙර කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරයාත් පැහැදිලි කළා, මේ රටේ අධ්‍යාපනය දියුණු කරන්න ඕනෑ කියලා. ඔව්. අපි ඒක ඉතාම ගැඹුරෙන්, ඉතාම වුවමනාවෙන් අපේ අය වැය අතුළේ අන්තර්ගත කරලා තිබෙනවා. ඉතිහාසයේ කිසිම දිනෙක අධ්‍යාපනය වෙනුවෙන් වෙන් නොකළ මුදලක්, රුපියල් බිලියන 619ක් වැනි මුදලක් අපි අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. එමඟින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? අපි දන්නවා, ලෝකය ඉදිරියට යමින් තිබෙන්නේ "දැනුම ධනය වේ" කියන පදනම මත. අන්න ඒ පදනම මත අපේ රට පොහොසත් රටක් බවට පත් කරන්න නම් අපට සිද්ධ වෙනවා, මේ රටේ අධ්‍යාපනය දියුණු කරන්න. විශ්වවිද්‍යාලවල ඉගෙන ගත්ත, මේ රටේ දුප්පත් ඈත ගම් දනව්වල පාසල්වල ඉගෙන ගත්ත අය විධියට අපි දන්නවා, නිදහස් අධ්‍යාපනයේ අරුණාලෝකය අපේ ජීවිතවලට වැටුණු නිසා තමයි කිසියම් ආකාරයකට අපට මේ සමාජය ඇතුළේ යම් කාර්යභාරයක් කරන්න, ඒකට දායකත්වය සපයන්න හැකියාව ලැබී තිබෙන්නේ.

නිදහස් අධ්‍යාපන පනත ඉදිරිපත් කරනකොට තෝමස් ග්‍රේ කවියාගේ කවියක් ඉදිරිපත් කරමින් තමයි කන්නන්ගර මහත්මයා ඒ පනත ඉදිරිපත් කළේ. ඒ කවියෙන් කියැවුණේ, අඳුරු මුහුදු පත්ලට සූර්යා ලෝකය නොවැටුණොත් ඒ මුහුදු පත්ලේ තිබෙන අගනා මිණි කැට සඳාකල් අඳුරේම සැඟව යනවා, අඳුරේම විනාශ වෙලා යනවා කියලායි. අන්න ඒ වාගේ තමයි මේ අධ්‍යාපනය කියන කාරණයත්. මේ රටේ ඉන්න ඉතාම දුප්පත්, පීඩිත දරුවන්ගේ ජීවිතවලට එල්ල කරන අරුණාලෝකයක් තමයි අධ්‍යාපනය කියන්නේ. ඔවුන්ගේ ජීවිත අධ්‍යාපනයෙන් නහා සිටුවීමෙන් තමයි මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න පුළුවන් වෙන්නේ කියන පදනම මත පිහිටා අපි මේ අය වැයෙන් අධ්‍යාපනය වෙනුවෙන් වැඩිම මුදලක් වෙන් කරලා තිබෙනවා.

මෙන්න මේ වාගේ පදනමක් මත අපේ රට ඉදිරියට ගෙනයන්න ඕනෑ කරන ප්‍රතිපත්ති විශාල ප්‍රමාණයක් මේ අයට වැය තුළ ඇතුළත් කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර ඇති කාලය අවසානයි.

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

මගේ කථාව අවසන් කිරීමට මත්තෙන් එක කාරණයක් කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ප්‍රහසනාත්මක යථාර්ථ රීතියක් ඔස්සේ අපූරු සිනමා කෘති ලෝකයට නිර්මාණය කළ චාලි චැප්ලින් කියන නිර්මාණවේදියා එක අදහසක් ඉදිරිපත් කරනවා. ඒ, "ඔබ ඉර දෙස බලන්න. ඔබට දෙවියන්ගේ බලය පෙනේවි. ඔබ සඳ දෙස බලන්න. ඔබට දෙවියන්ගේ සෞන්දර්ය පෙනේවි. ඔබ කණ්ණාඩියක් ඇතුළට එබී බලන්න. ඔබට දෙවියන්ගේ ශ්‍රේෂ්ඨ නිර්මාණය පෙනේවි. ඒ ශ්‍රේෂ්ඨ නිර්මාණය මත විශ්වාසය තබන්න. ඒ ශ්‍රේෂ්ඨ නිර්මාණය තමයි මිනිසා" යන්නයි. ඒ නිසා ඒ මිනිසා බල ගන්වමින් මේ රට පොහොසත් රටක් කිරීම තමයි අපේ මේ අය වැයේ අනාගත දැවැන්ත ඉලක්කය කියන එක සිහිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.27]

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැය ලේඛනය දෙවන වර කියැවීමේ විවාදයේ අවසාන දිනය අද. පුරා දින 7ක් -පුරා සතියක්- මුළුල්ලේ අය වැය සම්බන්ධයෙන් බොහෝ කරුණු-කාරණා ගණනාවක් සංවාදයට, සාකච්ඡාවට භාජන වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය ලේඛනය ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මංගල අය වැය ලේඛනය. මේ අය වැය පිළිබඳව මීට කලින් ඉදිරිපත් වෙච්ච සාධනීය කරුණු වාගේම, බැහැර කළ යුතු නිෂේධනාත්මක කරුණු සියල්ලක් සැලකිල්ලට ගනිමින් මම දකිනවා, මේ අය වැය ලේඛනය ඇතුළේ විශේෂිත කරුණු-කාරණා ගණනාවක්. ඒ විශේෂිත කරුණු-කාරණා ගණනාව මතු වෙන්න මූලික පදනමක් තිබෙනවා. අපේ රට මේ දැන් තිබෙන තැනින්, අපේ රට ඉතිහාසය පුරා ආපු ගමනින් පියවර කීපයක් ඉහළට ඔසවා තැබීමට සමත්, පියවර කීපයක් ඉහළට ඔසවා තැබීමට පදනම සකස් කරපු අය වැය ලේඛනය තමයි අපි අද මේ විවාද කරන අපේ මංගල අය වැය ලේඛනය ලෙස.

සමාජය ආර්ථික වශයෙන්, සමාජමය වශයෙන් දේශපාලන සංස්කෘතිය තුළ අලුත් තලයකට ඔසවා තැබීමට සමත් අය වැය ලේඛනයක් බවට මේ අය වැය ලේඛනය පත් වෙලා තිබෙනවා. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ විශේෂ කරුණු කීපයක් එක්ක. මේ සමස්ත අය වැය ලේඛනයේ මූලික පදනම ගොඩනැඟිලා තිබෙන්නේ ප්‍රධාන කුලුනු තුනක් මත. ඒ ප්‍රධාන කුලුනු තුනක් මත ගොඩනැඟිච්ච අය වැය ලේඛනයක් තමයි අපි 2025 වසරට ඉදිරිපත් කරලා විවාද කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය ලේඛනයේ පදනම සකස් වෙලා තිබෙන පළමුවැනි කුලුන තමයි, රටේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි කිරීම ඉලක්ක කරගෙන, රටේ ආර්ථිකය නිෂ්පාදන ආර්ථිකයක් බවට පත් කිරීම පදනම් කරගෙන රට නිෂ්පාදන ක්‍රියාවලියේ යෝධ පිම්මක් ඉහළට ඔසවා තැබීමේ අරමුණ.

විශේෂයෙන්ම මීට කලින් අපට අත්දැකීම් තිබෙනවා. පෞද්ගලිකව ගත්තත්, මීට ප්‍රථම මේ පාර්ලිමේන්තුව ඇතුළේ අය වැය ලේඛන 10ක, 15ක වාද විවාදවලට සම්බන්ධ වෙලා තිබෙනවා. ඒ හැම අය වැය ලේඛනයකටම වඩා වෙනසක් මේ අය වැය ලේඛනය තුළ තිබෙනවා. ඒ මොකක්ද? මීට කලින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ, මේ පාර්ලිමේන්තුව ඇතුළේ විවාද කරලා සම්මත කළ අය වැය ලේඛනවල මූලික පදනම බවට පත් වෙලා තිබුණේ රටේ සේවා ක්‍රියාවලිය ඉහළට ඔසවා තැබීම, රටේ ආර්ථිකය සේවා ආර්ථිකයක් බවට පත් කර ගැනීම, රටේ ආර්ථිකයේ සේවා පළල් කිරීම යනාදිය. හැබැයි, මේ අය වැය ලේඛනයේ සුවිශේෂත්වය තමයි, මෙය රටේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය ඉහළට ඔසවා තැබීම අරමුණු කර ගත්, රට නිෂ්පාදන ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම අරමුණු කර ගත් අය වැය ලේඛනයක් වීම.

මේ සමස්ත අය වැය ලේඛනය රඳා පවතින දෙවෙනි කුලුන තමයි, රටේ සමස්ත ජනතාව ආර්ථික ක්‍රියාවලියට සහසම්බන්ධ කර ගන්න, රටේ ආර්ථික ක්‍රියාවලියට බද්ධ කර ගන්න සමත් වීම. මෙය රටේ සෑම ජන කොටසක්ම, රටේ සෑම ක්ෂේත්‍රයක්ම, සෑම අස්සක් මුල්ලක් නැරම ආවරණය කිරීමට සමත් වූ අය වැය ලේඛනයක් හැටියට මේ අය වැය ලේඛනය දකින්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා රටේ නිෂ්පාදනයේ ප්‍රතිඵල, ප්‍රතිලාභ මුළු මහත් රට පුරා ගලා යන්න ඉඩ කඩ, අවස්ථා විවර වෙලා තිබෙනවා. මීට කලින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අය වැය ලේඛන තුළ නොතිබුණු විශේෂත්වයක් තිබෙනවා. ඒ තමයි, කොල්ලුපිටියේ සිට ඇඹිලිපිටිය දක්වා සමස්ත රටටම ආර්ථිකයේ ප්‍රතිඵල, ප්‍රතිලාභ ගලා යෑම. ඒ විතරක් නොවෙයි, කිරුළපන ඉඳලා කැබිතිගොල්ලෑවට, කිරුළපන ඉඳලා වැල්ලවායට, මොනරාගලට, මුළු මහත් රටටම ආර්ථිකයේ ප්‍රතිඵල, ප්‍රතිලාභ බෙදී යන විධියට ආර්ථික ක්‍රියාවලියට රටේ සමස්ත ජනතාව බද්ධ කර ගන්නට සමත් වී තිබෙනවා. ඒක මේ අය වැය ලේඛනය තුළ විශේෂත්වයක් හැටියට දකින්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අය වැය ලේඛනයේ මූලික පදනම වූ තුන්වෙනි කුලුන මොකක්ද? එනම්, නිෂ්පාදනය වැඩි කර ගැනීම, නිෂ්පාදන ක්‍රියාවලියට රටේ සමස්ත ජනතාව බද්ධ කර ගැනීම -ඒකාබද්ධ කර ගැනීම- විතරක් නොව, ඒ නිෂ්පාදනවල ආර්ථික ප්‍රතිඵල, ප්‍රතිලාභ රටේ මුළුමහත් ජනතාවට සමාජ සාධාරණත්වය මත සාධාරණ ආකාරයට බෙදී යන අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබී තිබීමයි. මීට කලින් අපේ රටේ, මීට කලින් මේ පාර්ලිමේන්තුව ඇතුළේ වාද විවාද කරලා සම්මත කළ අය වැය ලේඛන තුළ අප දැක්කේ "කොළඹට කිරි ගමට කැකිරි" සංකල්පය. හැබැයි, මේ රටේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රතිඵල, ප්‍රතිලාභ සමාජ සාධාරණත්වය රැකෙන පරිදි, මුළුමහත් සමාජ බලවේග සියල්ලටම සාධාරණ වන විධියේ, මුළු රටටම බෙදී යන විධියේ අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්න අද පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ නිසා මෙමඟින් සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වෙලා තිබෙනවා. මෙයට හසු නොවුණු තැනක් නැහැ. රාජ්‍ය සේවකයා වෙන්න පුළුවන්, පෞද්ගලික අංශය වෙන්න පුළුවන්, වතු ක්ෂේත්‍රය වෙන්න පුළුවන්, කම්කරුවා වෙන්න පුළුවන්, ධීවරයා වෙන්න පුළුවන්, තරුණයා වෙන්න පුළුවන්, වීදි දරුවා වෙන්න පුළුවන්, පුනරුත්ථාපන කඳවුරක ඉන්න දරුවෙකු වෙන්න පුළුවන්, අනාථ නිවාසයක ඉන්න කෙනෙකු වෙන්න පුළුවන්, අබාධිත තත්ත්වයක සිටින පුරවැසියෙකු වෙන්න පුළුවන්, ඒ සෑම කෙනෙකුටම මේ අය වැය ලේඛනයේ ප්‍රතිඵල, ප්‍රතිලාභ සාධාරණ වන විධියට බෙදා දීමට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ හැකියාව අපට ලැබී තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

සමාජ නිෂ්පාදනය මත පදනම් වෙච්ච, නිෂ්පාදනයේ ප්‍රතිඵල, ප්‍රතිලාභ සාධාරණව ලැබෙන අය වැය ලේඛනයක් හැටියට අපට මේ අය වැය ලේඛනය දකින්න පුළුවන්කම තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ අය වැය ලේඛනය තුළ මුදල් වෙන් කර තිබෙන ආකාරයේත් විශේෂත්වයක් තිබෙනවා. අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට මෙතෙක් ඉතිහාසයේ වෙන් නොකරපු මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. 2025 වසර සඳහා අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 619ක්, සෞඛ්‍යය වෙනුවෙන් රුපියල් බිලියන 604ක් වෙන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ විධියට මේ අය වැය ලේඛනයෙන් අධ්‍යාපනයටයි, සෞඛ්‍යයටයි විතරක් වෙන් කරපු මුදල් ප්‍රමාණය එකතු කළොත්, එතැන රුපියල් බිලියන 1,223ක්. ඒ අනුව, මෙතෙක් ඉතිහාසයේ අධ්‍යාපනය හා සෞඛ්‍යය වෙනුවෙන් වැඩිම මුදල් ප්‍රමාණය වෙන් කරලා තිබෙන්නේ ජාතික ජන බලවේගයේ මේ මංගල අය වැය ලේඛනයෙන්.

ඒ විතරක් නොවෙයි, ආර්ථිකය සහ රට අලුත් දිශාවකට ගෙනයන්න, රටට අලුත් ගමනක් උරුම කර දෙන්න, රාජ්‍ය ඩිජිටල්කරණයට අවශ්‍ය තීන්දු තීරණ ගන්න අවශ්‍ය පියවර තබන්නත් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න පුළුවන්කම, හැකියාව මේ අය වැයෙන් ලැබී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි, අපි කවුරුත් දන්නවා, ඉතිහාසයේ මෙතෙක් කාලයක්, පරම්පරා ගණනක් අය වැය ලේඛන තුළ අපි ලියපු එකම රචනාවක් තිබෙන බව. අපි ඉස්කෝලේ ගිය කාලයේ මගේ රට ගැන ලියපු රචනාවක් තිබෙනවා. මොන පාටට, මොන පක්ෂයට, මොන ජාතියට, මොන කුලයට, මොන ආගමට අයත් වුණත්, අපි හැම කෙනෙක්ම පාසල් ගිය කාලයේ මගේ රට සම්බන්ධයෙන් ලියපු රචනාව මතක් කර ගනිමු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒක තමයි, "ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින තුන්වැනි ලෝකයේ රටකි" කියන කාරණය. ඒක තමයි මෙතෙක් අපි හැම කෙනෙක්ම අපේ රට ගැන ලියපු එකම රචනාව. පාසල් ගිය කාලයේ මමත් ඒක ලිව්වා. මට කලින් පාසල් ගිය අපේ දෙමව්පියන්ගෙන් ඇහුවොත්, අපේ වැඩිහිටි පරම්පරාවෙන් ඇහුවොත් මගේ රට ගැන ලියපු රචනාව මොකක්ද කියලා, ඒත් කියන්නේ "ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින තුන්වැනි ලෝකයේ රටකි" කියන කාරණයම තමයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපි මෙතෙක් කාලයක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ අය වැය සම්මත කරලා, මේ පාර්ලිමේන්තුව ඇතුළේ නීති සම්මත කරලා, පරම්පරා ගණනක් ලියපු එකම රචනාව, අපේ අම්මා, තාත්තා, අත්තා, සීයා ඇතුළු පරම්පරා ගණනක් ලියපු, අපිත් ලියපු එකම රචනාව වෙනස් කරලා, අලුත් පරම්පරාවට අලුත් රචනාවක් ලියන්න, "ශ්‍රී ලංකාව සංවර්ධිත රටකි" කියන අලුත් මාතෘකාව යටතේ රචනාව ලියන්න මේ මංගල අය වැය ලේඛනය තුළින් ඉඩ කඩ සහ අවස්ථාව විවර වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මගේ කථාව නිම කරන්න පෙර අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මේ විවාදය තුළ විපක්ෂය පැත්තෙන් මට හීන් කෙදිරිලි හඬක් ඇහුණා, අදෝනාවක් ඇහුණා. ඒ අදෝනාව, හීන් කෙදිරිල්ල ඇතුළේ තිබුණේ "මෙය IMF එක මත පදනම් වුණු අය වැය ලේඛනයක්, පරණ පාරේම යන අය වැය ලේඛනයක්, එම නිසා ආණ්ඩුවේ ජනප්‍රියතාව බිඳිලා, රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි වීම වැඩක් නැහැ, අහවල් අහවල් ක්ෂේත්‍රවලට මුදල් වෙන් කරලා නැහැ, ඒ නිසා ජනතාව ආණ්ඩුව කෙරෙහි කලකිරිලා ඉන්නේ" යන්නයි. විපක්ෂය පැත්තෙන් එවැනි හීන් කෙදිරිල්ලක් ඇහුණා. ඒ හීන් කෙදිරිල්ලටත් මම අවසාන උත්තරය දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ උත්තරය මේකයි. මේ වන කොට ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව සමීක්ෂණ වාර්තාවක් එළි දක්වා තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වෙලා මාස 6ක් ගත වුණේ නැහැ. නමුත්, ඒ සමීක්ෂණ වාර්තාවට අනුව, ආණ්ඩුවේ ජනප්‍රියතාව -ජනතාවගේ ප්‍රසාදය- සියයට 24 සිට සියයට 62 දක්වා වර්ධනය වෙලා තිබෙනවා කියන කාරණය මතක් කරමින් මගේ කථාව නිමා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩි 17ක කාලයක් තිබෙනවා නේද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, විනාඩි 12ක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ.භා. 3.41]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුවේ මංගල අය වැය ලේඛනය පිළිබඳ විවාදයේදී කථා කරන්න අවස්ථාව ලැබීම භාග්‍යයක් හැටියට සලකනවා.

ඕනෑම අය වැයක ධනාත්මක සහ ඍණාත්මක කරුණු තිබෙනවා.

වග කිව යුතු විපක්ෂයක් හැටියට අපි තමුන්නාන්සේලාට මෙහි තිබෙන ඍණාත්මක කරුණු ඉදිරිපත් කරනකොට අපි දිහා වපර ඇහෙන් බලන්න එපා. මේ අය වැයෙන් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට ලබා දී ඇති මුදල් දිහා බලනකොට එය විශිෂ්ට ජයග්‍රහණයක්. මේ රටේ අධ්‍යාපනය ගොඩනැංවීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී ආණ්ඩුවට ඒ සම්බන්ධයෙන් ප්‍රසංශා කරනවා. ඒ වාගේම අපේ සෞඛ්‍ය තත්ත්වය දිහා බලනකොට, කාන්තාවන්ගේ සනීපාරක්ෂක තුවා සඳහා රුපියල් බිලියන 2.5ක් වෙන් කිරීම අත්‍යවශ්‍ය කරුණක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ වාහන තීරු බදු ප්‍රතිපත්තිය දිහා බලනකොට, ජාතික ජන බලවේගය දුන් පොරොන්දු මම මේ අවස්ථාවේදී මේ සභාවට මතක් කරනවා. ඔබතුමන්ලා කිව්වා push cycle එකෙන් යන මනුස්සයෙකුට මෝටර් බයිසිකලයක් ලබා ගැනීමේ හැකියාවක් දෙනවා කියලා. මෝටර් බයිසිකලයක් තිබෙන කෙනෙකුට ත්‍රීරෝද රථයක් හෝ පුංචි වාහනයක් ලබා ගැනීමේ වරම ලබා දෙනවා කියලාත් තමුන්නාන්සේලා කිව්වා. හැබැයි, අද තිබෙන බදු ප්‍රතිපත්ති දිහා බලනකොට මෝටර්සයිකලයක් ලක්ෂ 6ක් වෙනවා, වාහනයක් මිලියන 5ක්, 6ක් වෙනවා. ඒ නිසා පොඩි මිනිහාගේ සිහිනය ඉෂ්ට කිරීමේ හැකියාව මෙම අය වැයට තිබෙනවාද කියන එක මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි. තමුන්නාන්සේලා මේ රටේ තීරු බදු ප්‍රතිපත්තිය තුළින් යම් පන්තියකට පමණක් වාහන ලබා ගැනීමේ හැකියාව දීම මම හිතන විධියට පොඩි මිනිහාට කරන ලොකු අසාධාරණයක්. තමුන්නාන්සේලා දන්නවා, අවුරුදු 5ක් මේ රටට වාහන ගෙන ඒමේ තහනමක් තිබුණු බව. මේ රටේ ත්‍රීවීලර් රථයක ආයුෂ කාලය අවුරුදු 5යි. හැබැයි අද ත්‍රීවීලර් රථයක් ගෙන්වනවා නම් මිලියන 2ක් යනවා, ගරු ඇමතිතුමනි. *[බාධා කිරීමක්]* මම ඇමතිවරයෙක් වෙලා හිටපු බව ඇත්ත, ගරු බිමල් රත්නායක මැතිතුමනි. මම තමුන්නාන්සේලාට ධනාත්මක සහ ඍණාත්මක කරුණු ඉදිරිපත් කරනවා. ඔබතුමා පිළිගන්නවා නම් පිළිගන්න. හැබැයි, තමුන්නාන්සේලා වෙනුවෙන් විශාල කැප කිරීමක් කළා මේ රටේ ත්‍රීරෝද රථ හිමියෝ, ත්‍රීරෝද රථ පදවන උදවිය. ඒ උදවියට සිහිනයක් තිබෙනවා. ඒ වාගේම මෝටර් සයිකලයක් හිමි පුද්ගලයෙකුට සිහිනයක් තිබෙනවා වාහනයක් මිලදී ගන්න. නමුත් අද වාහනයක් මිලදී ගැනීමේ හැකියාවක් පොඩි මිනිහාට නැහැ. ඒ වාගේම තමුන්නාන්සේලා වෙනුවෙන් රාජ්‍ය සේවකයන් විශාල කැපවීමක් කළා. මේ රටේ රාජ්‍ය සේවකයෝ ලක්ෂ 10කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට තීරු බදු රහිතව වාහන ගෙන්වන්න පර්මිට් එකක් දුන්නා. මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ රාජ්‍ය සේවකයන්ට රටේ තීරු බදු ප්‍රතිපත්තියට අනුකූලව වාහනයක් ලබා ගැනීමේ හැකියාවක් නැහැ. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා ඒ රාජ්‍ය සේවකයන්ට දිය යුතු පර්මිට් එක ලබා දෙන්න කියලා. හේතුව, ඒ උදවිය මේ රට වෙනුවෙන් විශාල කැප කිරීමක් කරනවා. ඒගොල්ලන්ට දැන් තිබෙන මිල ගණන් අනුව වාහනයක් ගැනීමේ හැකියාවක් නැහැ.

මම තමුන්නාන්සේලාගෙන් තව ඉල්ලීමක් කරනවා, ඉලෙක්ට්‍රික් වාහන සම්බන්ධයෙන් වෙන බදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න කියලා. ගරු අගමැතිතුමියනි, මේ රටට අවුරුදු 5ක් වාහන ගෙන්වීමේ හැකියාවක් තිබුණේ නැහැ. ඒ තුළින් විශාල පරිසර දූෂණයක් සිදු වුණා. ඒ පරිසර දූෂණයට විකල්පය තමයි පුළුවන් තරම් electric cars ලංකාවට ගෙන ඒම. ඒ නිසා electric motorcycles, electric three-wheelers, ඒ වාගේම පොඩි මිනිහාට සරිලන වාහන ගෙන්වනකොට අඩු බදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න. ඉලෙක්ට්‍රික් වාහන සම්බන්ධයෙන්, a lenient duty approach should be adopted by the Government.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට ඉදිකිරීම් ක්ෂේත්‍රය දිහා බලමු. අපි දන්නවා, ඕනෑම කෙනෙකුට නිවසක් තැනීමේ සිහිනයක් තිබෙන බව, නිවසක් අයිති කර ගැනීමේ සිහිනයක් තිබෙන බව. හැබැයි අද තිබෙන ගණන් අනුව ගොඩනැඟිල්ලක් තැනීමේ වියදම ඉහළයි. ගොඩනැඟිලි ද්‍රව්‍යවල තීරු බදු ප්‍රශ්නය නිසා, තීරු බදු වැඩිවීම නිසා සාමාන්‍ය කෙනෙකුට නිවසක් තැනීමේ වරම නැහැ. ඒ වාගේම පසුගිය කාලයේ ගොඩනැඟිලි ද්‍රව්‍ය ආනයනයට යම් තහංචි පැනවුවා. ලංකාවේ ඒ දේශීය කර්මාන්ත බිහි වුණා. හැබැයි, ඒ දේශීය කර්මාන්ත තුළින් පාරිභෝගිකයාට සෙතක් වුණේ නැහැ, සමහර ආයතනවලට තමයි වාසියක් වුණේ. ඒ නිසා ඒ සම්බන්ධවත් කාරුණිකව සලකා බලන්න කියලා තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දන්නවා ඕනෑම රටක first-home owner කෙනෙකුට බදු සහන ලබා දෙන බව; පළමුවෙනි නිවස ලබා ගැනීමේදී බදු සහන ලබා දෙනවා. කලින් මේ පහසුකම තිබුණා, නමුත් දැන් ඒක නැති කරලා දාලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් නොවෙයි. ඒ නිසා, if you all could consider a tax concession for the first-home owner, that would be really beneficial to the people of this country. මම ඒ සම්බන්ධවත් තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා.

අපේ රටේ සංචාරක ක්ෂේත්‍රය දිහා බලනකොට, සංඛ්‍යාත්මක වශයෙන් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, දකුණට හෝ නැඟෙනහිර පළාතට ගියොත්, විදේශිකයන් රැකියාවල නිරත වීමක් අපි දකිනවා.

ශ්‍රී ලංකාවේ නීතිය අනුව ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ඇතුව ඩොලර් ලක්ෂ දෙකහමාරක් ආයෝජනය කරලා විදේශිකයෙකුට සංචාරක ක්ෂේත්‍රයේ නියැළෙන්න පුළුවන්. හැබැයි, සාමාන්‍ය නීතිය යටතේත් සමාගම් ලියාපදිංචි කරලා Sri Lanka Tourism Development Authority එකට ගිහිල්ලා අවසර ලබා ගන්නවා. ඒ තුළින් අද වනවිට විදේශිකයන් විශාල ප්‍රමාණයක් රැකියාවල යෙදෙනවා. ඒ තුළින් අපේ දේශීය අයගේ රැකියා අහිමිවීමක් සිදු වෙනවා. මම කලින් සංචාරක ඇමති වශයෙන් යම් කාලයක් කටයුතු කළා. ඒක නිසා මම ඉල්ලා සිටිනවා, විදේශිකයන් මේ රටේ රැකියාවල යෙදීම සම්බන්ධයෙන් දැඩි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න කියලා. මම හිතන විධියට Immigration and Emigration Department එක සහ සංචාරක මණ්ඩලය විශේෂ වැඩසටහන් දියත් කරන්න ඕනෑ, විශේෂයෙන් දකුණ සහ නැඟෙනහිර පළාත්වල විදේශිකයන් රැකියා කිරීම සම්බන්ධව. එම ප්‍රමාණය සංඛ්‍යාත්මක වශයෙන් විශාල වැඩි වීමක් අපි දකිනවා. හැබැයි, ඒ තුළින් ප්‍රතිලාභ ගන්නේ ලාංකික ජනතාව නොවෙයි, විදේශිකයන්. ඒ වාගේම kitesurfing, water skiing සම්බන්ධයෙන් අද විදේශ පුහුණුකරුවන් ඇවිල්ලා අපේ ලාංකිකයන්ගේ අවස්ථා නැති කරනවා. මෙම අය වැය ලේඛනය තුළින් බලාපොරොත්තු වෙනවා, සංචාරක ක්ෂේත්‍රයෙන් විශාල මුදලක් ලබා ගැනීමට. හැබැයි, ඒ නිසි මුදල අහිමි වෙනවා, අපි ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගත්තේ නැත්නම්. මම තමුන්නාන්සේලාට දොස් කියනවා නොවෙයි. ඕනෑම විදේශිකයෙකුට ලංකාවට ඇවිල්ලා අවුරුදු 99කට ඉඩමක් බද්දට ගන්න පුළුවන්. මේ අය වැය ලේඛනයෙන් පස්සේ ඒ සම්බන්ධයෙන් සියයට 2ක මුද්දර ගාස්තු ගෙවීමේ අවශ්‍යතාවක් තිබෙන්නේ. සින්නක්කර ඔප්පුවක් ලිව්වා නම් Government Valuerගේ නිසි valuation එකක් අරගෙන ඒක කරන්න ඕනෑ.

මුදල් නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මම එතුමාට මතක් කරන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් නැවත සලකා බලන්න කියලා. විදේශිකයෙකුට

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

දකුණේ සහ නැහෙනහිර ඉඩම් වර්ෂ 99ක් දක්වා බද්දකට ලබා ගන්න පුළුවන්. Those leasehold rights can also be mortgaged to the bank. ඒක නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වෙනසක් ඇති කරන්න ඕනෑ. 2012, 2013 කාලයේ සියයට 100ක්ම මුද්දර ගාස්තු ගෙවීමේ අවශ්‍යතාවක් තිබුණා. මේ වෙනස්කම් තුළින් විදේශිකයන් බෙන්තොට, අරුගම්බේ වැනි ප්‍රදේශවල ඉඩම් බද්දට ගන්නවා, අවුරුදු 99කට. ඕනෑම මුදලක් ඒ බද්දට ඇතුළත් කරන්න පුළුවන්. මොකද සින්නක්කර ඔප්පුවකට පමණයි රජයේ තක්සේරුව අවශ්‍ය. ඒ නිසා මේ සංචාරක ක්ෂේත්‍රයේ දියුණු වීමේ ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් වන්නේ මා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් යම් යම් ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන මේ තත්ත්වය වෙනස් කළොත් පමණයි.

එහෙම නැත්නම්, අපේ ලාංකික ජනතාවට සංචාරක ක්ෂේත්‍රයෙන් ලබා ගන්න ප්‍රතිලාභ නැති වෙනවා කියන එක මම මේ අවස්ථාවේ තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. ඒ වාගේම ඕනෑම රටක ආයෝජනයක් නැත්නම් දියුණු වෙන්න බැහැ. හැබැයි, මේ අය වැය ලේඛනය දිහා බලන කොට ආයෝජනය සම්බන්ධයෙන් ලබා දී ඇති සහන නැවත සලකා බලන්න කියලා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. හේතුව මේකයි. අපේ අනෙක් ආසියානික රටවල් දිහා බලන කොට බදු සහන සහ නොයෙකුත් සහන දීලා තිබෙනවා. අපි කර්මාන්තපුර හදලා වැඩක් නැහැ, ඒ කර්මාන්තපුර සම්බන්ධයෙන් යම් යම් සහනදායී ප්‍රතිපත්තියක් අනුගමනය කළේ නැත්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
අපි පගාව ගන්නේ නැහැ.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි පෙසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha, PC)
මොකක්ද සභානායකතුමා?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
අපි කොමිස් ගන්නේ නැහැ.

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු සනාතිපති සට්ටත්තරණි පෙසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha, PC)
අපිත් දූෂණයට විරුද්ධයි. තමුන්නාන්සේලා දූෂණයට විරුද්ධව ගන්න ක්‍රියාමාර්ග හොඳයි. හැබැයි, හැම දේම දූෂණය නොවෙයි, ගරු ඇමතිතුමනි. *[බාධා කිරීමක්]* මේ රටේ ආයෝජනයන් ඇති කරන්න අවශ්‍ය වාතාවරණයක් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම ආයෝජකයන් ලංකාවේ ආයෝජන කරන්න දිරි ගන්වන්න ඕනෑ. හැම දේම දූෂණය, දූෂණය කියලා බැහැ, ගරු ඇමතිතුමනි.

ගරු ඇමතිතුමනි, අපි යම් වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. මේ රටට FDIs ගෙනෙන්න නැතුව අපට සංවර්ධනයක් ලබා ගන්න බැහැ. අපි දන්නවා, BPO operations ගැන. ඔබතුමන්ලා සියයට පහළොවක බද්දක් අය කරලා තිබෙනවා. මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ ගැන නැවත සලකා බලන්න කියලා. හේතුව මේකයි.

BPOs operate providing services to foreign countries' call centres. You all have imposed a 15 per cent tax on those services. They can easily keep their monies out, sending only the actual cost here. Therefore, if you all want to encourage outsourcing, I respectfully urge the Hon. Minister to take a more prudent approach and consider giving tax incentives to them without adopting taxation because that is detrimental to investment. So, I humbly request - this Budget has a lot of positives - that with regard to investment, you focus a little more, Hon. Minister, because through loan capital, you cannot take this country forward. The only way this country could move forward is through investment. ළිඳේ සිටින ගෙම්බන් හැටියට අප සලකන්න බැහැ. බොහෝ රටවල ආයෝජන සඳහා නොයෙකුත් දිරි ගැන්වීමේ වැඩසටහන් තිබෙනවා. If you take India, they have a plug-in system, where all the infrastructure facilities and concessions are given to investors. Therefore, I humbly beg the Government to take connaissance of what I have mentioned, not to take these aspects in a spirit of confrontation but to consider them, which, I think, would help take Sri Lanka to a better position.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු සුන්දරලිංගම් ප්‍රදීප් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[ප.ව. 3.54]

ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)
கௌரவ තලைමைතාங்கும් උරුප්පිනර් අවර්කළේ, 2025ஆம் ஆண்டுக்கான இந்த வரவு செலவுத்திட்டமானது இன்று இலங்கையிலே எல்லோராலும் பேசப்படுகின்ற, விவாதிக்கப்படுகின்ற முக்கியமான ஒரு விடயமாகக் காணப்படுகின்றது. விசேடமாக, இனம், மொழி, பிரதேச வேறுபாடு இல்லாது, நாட்டின் அனைத்துப் பகுதிகளிலும் வாழுகின்ற மக்களை ஒரே நோக்கில் பார்த்து நிதி ஒதுக்கப்பட்ட ஒரு வரவு செலவுத்திட்டமாக இதனை நாம் நோக்கலாம். அதாவது, வடக்கு, கிழக்காக இருக்கலாம், தென்பகுதிகளாக இருக்கலாம், மலையகப் பகுதிகளாக இருக்கலாம், எல்லாப் பகுதி மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கும் அவர்களது வாழ்வியலை மேம்படுத்துவதற்கும் சிறந்த முறையிலும் சமமான முறையிலும் நிதி ஒதுக்கீடு செய்திருக்கும் முக்கியமான வரவு செலவுத்திட்டமாக நாங்கள் இதைப் பார்க்கலாம்.

மலையக மக்களைப் பொறுத்தவரை, அவர்கள் தென்னிந்தியாவிலிருந்து இலங்கைக்கு வந்து 200 வருடங்கள் ஆகியிருக்கின்றது. அவ்வாறு 200 வருடங்களாக இங்கு வாழ்ந்துவரும் இந்த மக்கள் இன்றுவரை முகவரி அற்றவர்களாகவும் வீடற்றவர்களாகவும் காணி உரிமையற்றவர்களாகவுமே வாழ்ந்து வருகிறார்கள். கடந்த காலங்களில் அந்த மக்களுக்கான மேம்பாட்டுத் திட்டங்களை

வகுப்பதாகக் கூறி அவர்களின் வாக்குகளைப் பெற்ற அரசியல்வாதிகள், அந்த மக்களின் வாழ்க்கையை உயர்த்துவதற்கு எவ்வாறான நடவடிக்கைகளை மேற்கொண்டார்கள் என்பதையிட்டு நாங்கள் சற்றுச் சிந்திக்க வேண்டும். தேர்தல் காலங்களில் அம்மக்களிடம் வந்து பொய்யான வாக்குறுதிகளை வழங்கி வாக்குகளைப் பெற்றார்களேயொழிய, வெற்றிபெற்று அமைச்சுப் பொறுப்புக்களை ஏற்ற பின்பு அவர்களால் அந்த மக்களின் கோரிக்கைகள் ஒருபோதும் நிறைவேற்றப்படவில்லை. அதனால்தான் இன்று நாட்டில் ஏற்பட்ட பாரிய அரசியல் மாற்றம் மலையகத்திலும் ஏற்பட்டிருக்கின்றது. இன்று மலையக மக்களின் அதிகூடிய விருப்பாகத் தேசிய மக்கள் சக்தி விளங்குகின்றது என்பதை நான் தெரிவித்துக் கொள்கின்றேன்.

மலையகத்திலே 250,000 குடும்பங்கள் இருக்கின்றன. அவர்கள் இன்னமும் வீடற்றவர்களாகவே இருக்கிறார்கள். வெள்ளையர்கள் காலத்தில் கட்டப்பட்ட அதே 'லயன் காம்பரா' களிலே, அடிப்படை வசதிகள் இல்லாமல் அவர்கள் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். இந்திய அரசாங்கம் எமது மலையக மக்களுடைய வாழ்க்கை நிலையை உணர்ந்து, அவர்களது வாழ்வியலை மேம்படுத்துவதற்காகக் கடந்த காலத்தில் 10,000 வீட்டுத் திட்டத்தை வழங்கியிருந்தது. முன்னைய ஆட்சியாளர்கள் அதில் 1,300 வீடுகளைக் கட்டுவதற்கு நடவடிக்கையெடுத்திருந்தாலும், 600 வீடுகளை மாத்திரமே கட்டி முடித்திருந்தார்கள். எஞ்சிய 700 வீடுகள் இன்னும் முழுமையாகக் கட்டப்படாமல் இருக்கின்றது. இந்த வரவு செலவுத்திட்டத்தினூடாக மலையகப் பகுதிகளிலே இவ்வருடத்தில் புதிதாக 4,700 வீடுகளைக் கட்டிமுடிப்பதற்குத் தேசிய மக்கள் சக்தி தீர்மானித்திருக்கிறது. அந்த வகையில், கடந்த காலத்தில் கட்டிமுடிக்காது எஞ்சியிருந்த 700 வீடுகளையும் சேர்த்து, மொத்தமாக 5,400 வீடுகளை இந்த வருடத்திலே கட்டுவதற்கு நாங்கள் தீர்மானித்திருக்கிறோம். அதுமட்டுமல்லாது, கடந்த காலங்களிலே வீடுகள் வழங்கப்படுகின்றபொழுது கட்சி ரீதியாக, தொழிற்சங்க ரீதியாகப் பாகுபாடு காட்டப்பட்டது. ஆனால், தேசிய மக்கள் சக்தி அரசாங்கமானது யாருக்கு வீடு தேவையோ, எந்த மக்களுக்குத் தேவை இருக்கிறதோ, அந்த மக்களுக்கு அந்த வீடுகளை வழங்குவதற்குத் தீர்மானங்களை மேற்கொண்டிருக்கின்றது.

இன்று தோட்டப்புறங்களிலே இருக்கின்ற மக்களை எடுத்துக்கொண்டால், அவர்களுக்கு மொழி ரீதியான பிரச்சினை காணப்படுகின்றது. அவர்கள் அரச நிறுவனங்களிலே அன்றாட கருமங்களை மேற்கொள்கின்றபொழுது மொழிரீதியாகப் பல சிக்கல்களை எதிர்கொள்கிறார்கள். எனவே, எதிர்வரும் காலங்களிலே அந்த மொழிப் பிரச்சினையைத் தீர்ப்பதற்காக நாங்கள் நடவடிக்கைகளை மேற்கொண்டிருக்கின்றோம்.

அதுமட்டுமல்லாது, 'Clean Sri Lanka' வேலைத்திட்டத்தினூடாக மலையகப் பகுதிகளிலே தெரிவுசெய்யப்பட்ட 75 தொடர் வீடுகளை நாங்கள் திருத்தி அமைக்கவிருக்கின்றோம். அதற்கிணங்க, அந்த வீடுகளுக்கு நிறம் பூசுதல், சுவர்கள் மற்றும் தரைகளைத் திருத்துதல், அவர்களுக்கான கழிப்பறைகளை அமைத்துக் கொடுத்தல் போன்ற பல்வேறுபட்ட நடவடிக்கைகள் ஊடாக இந்த வீடுகள் திருத்தி அமைக்கப்படவிருக்கின்றன. அந்தத் தொடர் வீடுகளில் அடையாள அட்டை, பிறப்புச் சான்றிதழ், திருமணச் சான்றிதழ் போன்ற பல்வேறுபட்ட சான்றிதழ்களைப் பெறமுடியாது வசிக்கின்ற மக்களுக்கு நாங்கள் அவற்றைப் பெற்றுக் கொடுக்கவிருக்கிறோம். மலையகத்திற்கு வரவிருப்பது மாடி வீடா, கோடி வீடா? என்று கேட்கின்றார்கள். கோடி வீடும் அல்ல, மாடிவீடும் அல்ல, தனி வீடுதான் மலையகத்திற்கு வரப்போகிறது என்பதை நாங்கள் அந்த உறுப்பினர்களுக்குக் கூறிக்கொள்ள விரும்புகின்றோம்.

இந்த நாட்டினுடைய வருமானத்துக்கு மிக முக்கிய காரணியாக விளங்குகிறவர்கள் தோட்டத் தொழிலாளர்கள்தான். அவர்கள் வேலைக்குச் சென்று தமது உதிரத்தை வியர்வையாக அந்த மண்ணில் சிந்துகின்றார்கள். அவர்களின் இறந்த உடல்களைத் தேயிலைத் தோட்டத்திலே புதைக்கின்றபொழுது, அவை அந்தச் செடிகளுக்கு உரமாக மாறுகின்றன. ஆனால், இதுவரை காலமும் அந்த மலையக மக்களின் சம்பள உயர்விலே பாரபட்சம் காட்டப்பட்டது. அவர்களுடைய வாழ்வியலை மேம்படுத்தி, வாழ்க்கைத் தரத்தை உயர்த்துவதற்கான சம்பள அதிகரிப்பானது கடந்த காலங்களிலே வழங்கப்படவில்லை. எமது சனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்டத்திலே தோட்டத் தொழிலாளர்களுடைய சம்பளத்தை 1,700 ரூபாயாக உயர்த்துவதற்கு உத்தரவாதம் அளித்திருக்கிறார். மிக விரைவிலேயே சம்பந்தப்பட்ட கம்பனிகளுடன் கதைத்து அதனைப் பெற்றுக் கொடுப்பதற்கு நாங்கள் முயற்சி செய்வோம் என்று கூறிக்கொள்ள விரும்புகிறேன்.

அதுமட்டுமல்லாது, இன்று போஷாக்கின்மை காரணமாக மலையகப் பகுதி மாணவர்களுடைய கல்வி நடவடிக்கைகள் பாதிப்படைவதைக் காணக்கூடியதாக இருக்கிறது. நான் ஓர் ஆசிரியராக அங்கு 18 வருடங்கள் சேவையாற்றியிருக்கிறேன். நான் கற்பித்த பாடசாலையிலே காலை நேரம் கூட்டங்கள் நடைபெறுகிறபொழுது, கொஞ்சம் வெயில் பட்டாலும்கூட மாணவர்கள் மயங்கி விழும் நிலை காணப்பட்டது. அது தொடர்பாக நாங்கள் தேடிப் பார்த்தபொழுது, மூன்று வேளை உணவை உட்கொள்ள முடியாது, ஒருவேளை உணவை மாத்திரமே உட்கொண்டுவிட்டுப் பாடசாலைக்கு வருகின்ற எத்தனையோ மாணவர்களைக் காண முடிந்தது. எனவே, போஷாக்கு வேலைத்திட்டமானது மலையக மாணவர்களுக்குப் பாரிய நன்மை பயப்பதாகக் காணப்படுகிறது. இதனைவிட, இன்று மலையகப் பாடசாலைகளிலே மாணவர்களின் இடைவிலகல் அதிகமாகக் காணப்படுகிறது. அதனைத் தவிர்ப்பதற்கான வேலைத்திட்டங்களையும் நாங்கள் முன்வைத்திருக்கிறோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மலையகக் கல்வியைப் பொறுத்தமட்டில் கடந்தகால அரசாங்கம் ஆசிரியர்கள் நியமனத்தின்போதும், கட்டிடங்கள் போன்ற பௌதிக வளங்களை வழங்குகின்றபோதும் பாரபட்சத்தைக் காட்டியிருந்தது. இன்றும் மலையகத்திலுள்ள எத்தனையோ பாடசாலைகளில் கழிப்பறை வசதி இல்லை, நீர் வசதி இல்லை, விஞ்ஞான மற்றும் ஆய்வுகூட வசதிகள் இல்லை, நூல் நிலைய வசதிகள் இல்லை. அந்த மாணவர்கள் மிகுந்த கஷ்டத்தின் மத்தியிலேயே தமது கல்வியைக் கற்றுக் கொண்டிருக்கிறார்கள்.

இரத்தினபுரி மாவட்டத்தைப் பொறுத்தவரையிலே, உயர்தரப் பாடங்களைக் கற்பிக்கின்ற சிறந்த பாடசாலைகள் அங்கு காணப்படவில்லை. அங்கு மொத்தமாக 104 பெருந்தோட்டப் பாடசாலைகள் காணப்படுகின்றன. அதிலே 95 பாடசாலைகள் பாரிய பிரச்சினைகளுக்கு முகம்கொடுத்து வருகின்றன. அங்குள்ள சென். ஜோன்ஸ் தமிழ் மகா வித்தியாலயம், கனகநாயகம் தமிழ் மகா வித்தியாலயம், இரத்தினபுரி தமிழ் மகா வித்தியாலயம், ஜெய்லானி மகா வித்தியாலயம் போன்ற பாடசாலைகளில் மாத்திரம்

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

උයර්තරත්තිල් විඤ්ඤාන, කණිතප් පිරිවුකළ් කාණප්පටුකින්රන. අන්තප් පිරිවුකළුම්කූට පාටසාලෙ අතිපර්කළුටෙය මුයර්සියිනාල් මාත්තිරම් අංකු කොණ්ටුවරප්පට්ටතේ ඔළිය, වළංකළෙයෝ, ආසිරිය නියමනංකළෙයෝ අන්තප් පාටසාලෙකළුක්කු වළංකාමල් කටන්තකාල අරසාංකංකළාල් ඉරත්තිනපුරි මාවට්ටත් තමිළ් මක්කළ් පුරක්කණික්කප්පට්ටතෙ නාංකළ් අවතානිත්තිරුක්කිරෝම්.

ඉරුතියාක, ඉන්නුමොරු විටයත්තෙක් කූරික්කොළ්ළ විරුම්පුකිරේන්. එතිර්ක්කට්සියිනර් ඉන්රු පාතාළ උලකක් කෝෂ්ටියිනරෙප් පර්රිප් පේසුකිරාර්කළ්. කටන්ත කාලත්තිලේ ඉන්තප් පාතාළ උලකක් කුළුවිනරෙත් තෝර්රුවිත්තවර්කළ් යාර්? අවර්කළුක්කු ආයුතංකළෙ වළංකියවර්කළ් යාර්? එන්රු තේටිප් පාර්ක්කින්රපෝතු, ඉතෙ උරුවාක්කියවර්කළේ අවර්කළ්තාන්! කටන්ත කාලත්තිල් මලෙයකප් පකුතිකළිලුම් අරසියල් අටාවටිත්තනංකළ් මේර්කොළ්ළප්පට්ටන. ඉවර්කළ්තාන් ඉන්රු නාට්ටිනුටෙය නල්ලාට්සියෙයප් පර්රිප් පේස වරුකිරාර්කළ්. එනවේ, මීණ්ටුම් ඉන්ත නාට්ටිල් ඉනවාතත්තෙත් තෝර්රුවිත්තු, කුළප්පංකළෙ උරුවාක්කුම් සෙයර්පාට්ටිල් ඊටුපට්ටුක්කොණ්ටිරුක්කින්ර ඉන්ත එතිර්ක්කට්සියිනරුක්කු ඔන්රෙක් කූරික්කොළ්ළ විරුම්පුකිරේන්. අතාවතු, ඉන්ත නාට්ටිලේ ඉන්රු ඉනවාතමර්ර ඕර් ආට්සියිරුක්කිරතු; අතිකූටිය සිංකළ, තමිළ්, මුස්ලිම් මක්කළුටෙය විරුප්පාකත් තේසිය මක්කළ් සක්ති අරසාංකම් ආට්සි අමෙත්තුළ්ළතු එන්පතෙක් කූරික්කොණ්ටු, එනතු උරෙයෙ නිරෙවුසෙය්තු කොළ්කින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු දිනේෂ් හේමන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (වෛත්තියර්) තම්මික පට්ටපෙන්ති - සුර්රාටල් අමෙච්සර්)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
වැනා විටුක්කප්පට්ටු ඒර්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු (තිරුමති) රෝහිණි කුමාරි විජේරත්න අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (පේරාසිරියර්) සේන නාණායක්කාර අවර්කළ් තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 4.05]

ගරු දිනේෂ් හේමන්ත මහතා
(මාණ්පුමිකු තිනේෂ් හේමන්ත)
(The Hon. Dinesh Hemantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහසින් පසුව මේ පාර්ලිමේන්තුව තුළ සමාජවාදී මොඩලයට වේවා, නව ලිබරල් හෝ සමාජවාදී වෙළෙඳ පොළ ක්‍රමයට වේවා ඒ විවිධ ආර්ථික න්‍යායයන් සහ මොඩල ඔස්සේ විවිධ අය වැය ඉදිරිපත් කරලා, ඒ අය වැයවල අවසාන ප්‍රතිඵලය විධියට 2024 අවුරුද්දේ ජාතික ජන බලවේගය ආණ්ඩුවට භාර දුන්නේ බංකොලොත් වෙච්ච රටක්. ලෝකයේ සම්මත යැයි, පිළිගත් යැයි, අතිවිශිෂ්ට යැයි, උත්කෘෂ්ට යැයි හඳුන්වමින් යම් යම් ආර්ථික මොඩල ගැන කථා කරන මේ විපක්ෂයේ මහත්වරු අවසාන වශයෙන් අපට භාර දුන්නේ බංකොලොත් රටක් කියන එක තමයි ඇත්ත.

රටක් බංකොලොත්භාවයෙන් මිදෙන්න නම්, රටක දළ ජාතික නිෂ්පාදිතය පසුපසට ගමන් කරන එක නතර කරන්න අවශ්‍යයි. ආර්ථික විද්‍යාත්මකව කියනවා නම්, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සියයට 2ත්, 4ත් අතර ප්‍රමාණයකින් කාර්තු දෙකක් වැනි කාලයක් ඇතුළත ආපස්සට යනවා නම් අපි කියනවා, ඒ රට ආර්ථික පසුබැසීමකට මුහුණ දීලා ඉන්නවා කියලා. ඒ ආර්ථික පසුබැසීම සියයට දහයකටත් වැඩිය ඉහළට ගිහිල්ලා අවුරුද්දකටත් වඩා වැඩි කාලයක් පවතිනවා නම් අපි කියනවා, ඒ රට අර්ථික පරිහානියකට, අවපාතයකට පත්වෙමින් තිබෙනවා කියලා.

ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ රට භාර ගන්නකොට සංකෝචනය වූ එහෙම නැත්නම් හැකිළුණු ආර්ථිකයක් තිබුණේ. එවැනි රටක් භාරගෙන ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට යන අවස්ථාවක තමයි අපි මංගල අය වැය සකස් කළේ. මේ වැටිලා තිබෙන ආර්ථිකය තවත් ඉහළ නැනකට අරගෙන යන්න දිගු කාලීන ආර්ථික සැලැස්මක් ඇතුළේ 2025 අවුරුද්දේ කරන්න පුළුවන් උපරිම කාර්යභාරය කරන්න තමයි අපි මේ අය වැය නිර්මාණය කරලා තිබෙන්නේ.

ආදායම, වියදම, නිෂ්පාදනය කියන ප්‍රවේශ ඔස්සේ ජාතික ගිණුම් හදනකොට වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන අවස්ථාවක, ප්‍රධාන සංරචක හතරක් ඒ සඳහා යොදා ගන්නවා. රටේ පෞද්ගලික පරිභෝජන වියදම, රාජ්‍ය පරිභෝජන වියදම, රටේ දළ ආයෝජන වියදම සහ ශුද්ධ අපනයනය කියන සංරචක හතරේ එකතුවෙන් තමයි දළ දේශීය නිෂ්පාදිතය ගණනය වෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුව විධියට මේ හැකිළිලා තිබෙන ආර්ථිකයට නව ඉල්ලුමක් ඇති කරන්න, රටේ පවතින භාණ්ඩ හා සේවා ඉල්ලුම ඉහළ දමන්න අපේ පාර්ශ්වයෙන් කරන්න පුළුවන් දෙයක් විධියට තමයි ගුරුවරුන්ගේ, වෛද්‍යවරුන්ගේ, ඉංජිනේරුවන්ගේ, කාර්යාල කාර්ය සහායකයන්ගේ සිට සියලු රාජ්‍ය සේවකයන්ගේ වැටුප ඉහළට ගත්තේ. ඒ වැටුප ඉහළට ගැනීමේ ප්‍රතිඵලයක් තමයි, ඔවුන්ගේ ආදායම ඉහළ යෑම. එම නිසා රටේ පවතින භාණ්ඩ හා සේවා ඉල්ලුමට ඔවුන් ධනාත්මක ප්‍රතිචාරයක් දක්වනවා.

ඒ වාගේම අස්වැසුම දීමනාව වැඩි කරලා, විශ්‍රාම වැටුප වැඩි කරලා, රටේ සහන දෙන්න පුළුවන් හැම පාර්ශ්වයකටම ලබා දෙන මූල්‍යමය සහනාධාරය වැඩි කරලා තිබෙන්නේ වක්‍රාකාරව හෝ පෞද්ගලික පරිභෝජනය ඉහළ ගිහින් රටේ පවතින භාණ්ඩ හා සේවා ඉල්ලුම ඉහළ දමන්න ඒ පැත්තෙනුත් සහයෝගයක් ගන්න ඕනෑ නිසායි. රටක පවතින භාණ්ඩ හා සේවා ඉල්ලුම ඉහළ යනකොට ඊට ගැළපෙන විධියට රටේ සමස්ත සැපයුමත් හැඩගැහෙන්න ඕනෑ. ඒ සමස්ත සැපයුම හැඩගැහෙන්න නම් නිෂ්පාදනය වැඩි වෙන්න ඕනෑ. රටක නිෂ්පාදනය ක්‍රම ක්‍රමයෙන්

වැඩි වෙනකොට රටේ සේවා වියුක්තිය අඩු වෙලා සේවා නියුක්තිය ඉහළ යනවා. එතකොට රැකියා විරහිත උපාධිධාරීන් කියන රැකියා නොමැතිව ඉන්න අපේ තරුණ තරුණියන් 35,000කට රැකියා දීමේ අවස්ථාව අපට ලැබෙනවා. කලින් ආණ්ඩු කළා වාගේ නමක් නැති, වැටුප් වර්ධකයක් නැති, තනතුරු නාමයක් නැති, උසස් වීමක් නැති බොරු තනතුරු බිහි කරලා රාජ්‍ය සේවය පුරවන්න, රාජ්‍ය සේවයට බරක් ඇති කරන්න අපට අවශ්‍යතාවක් නැහැ. අපි මේ හැම සැලසුමක්ම දීර්ඝ කාලීනව හදලා තිබෙන්නේ අන්න ඒ සියලු ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුම් ලැබෙන විධියට. රටේ සමස්ත නිමැවුම ඉහළ යද්දී සේවා නියුක්තිය වැඩි වෙනකොට ඔය කියන තරුණ තරුණියන් ඉතා දුක් මහන්සියෙන් ඉගෙනගෙන ලබා ගත් ඒ උපාධියට නියම වටිනාකමක් ලැබෙන රැකියාවකට යෑමේ අවස්ථාව ලැබෙනවා. මේ වැඩේ කරනකොට අපි බලන්න ඕනෑ දෙයක් තිබෙනවා. ඒ අනුව, දේශීය ආයෝජකයන්ට, එහෙම නැත්නම් ලංකාවට එන්න බලාගෙන ඉන්න විදේශීය ආයෝජකයන්ට ඔවුන්ගේ ආයෝජන කටයුතු කරගෙන යන්න පුළුවන් ආකාරයට සාර්ව ආර්ථික විචල්‍යයන් තුළිතව නැත්නම් ස්ථාවරව පවත්වා ගෙන යන විධියට අපි මේ සියලු තීන්දු-තීරණ ගන්න ඕනෑ.

රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කරනවා, රාජ්‍ය වියදම වැඩි කරනවා, සමහර භාණ්ඩවල ඉල්ලුම වැඩි කරනවා කියලා ආර්ථිකයට දරාගත නොහැකි මට්ටමින් ඒ කටයුතු කරන්න බැහැ. ආර්ථිකයට දරා ගත නොහැකි මට්ටමට මේ වැඩේ කළොත් සැපයුමට එහා ගිය, සැපයුමට දරාගත නොහැකි ඉල්ලුමක් බිහි වී රටේ භාණ්ඩ හිඟයක් ඇති වෙලා උද්ධමනයක් ඇති වනවා. ඒ වාගේ උද්ධමනයක් රටක ඇති වුණොත් ආර්ථිකයේ සියලු සංරචක වෙනස් වෙන්න පටන් ගන්නවා. ලෝකයේ කිසියම් රටක ආර්ථික දර්ශකයක් දිහා බලද්දී මිල ස්ථායීතාව එහෙම නැත්නම් ආර්ථික ස්ථායීතාව පවත්වාගෙන යනවාද කියලා බලන ප්‍රධානම සංරචකය තමයි, ඒ රටේ උද්ධමන අනුපාතය කොතැනද තිබෙන්නේ කියන එක. ලෝකයේ රටක ආර්ථික දර්ශකය හරි ලස්සනට තිබෙනවා කියන්න හොඳම උදාහරණය තමයි, එම රටේ උද්ධමන අනුපාතිකය තනි ඉලක්කමක, මැද අගයක පවතිනවා කියන එක.

ඒ නිසා වැටුප් වැඩි කරනවා එහෙම නැත්නම් සහනාධාර දෙනවා කියන සීමාවෙන් ඔබ්බට ගිහිල්ලා දරා ගත නොහැකි මට්ටමින් අපට ඒ වාගේ දේවල් කරන්න විධියක් නැහැ. වැටුප් වැඩි කිරීම තල කිහිපයක් යටතේ කරන්න එක හේතුවක් වෙන්නේත් අන්න ඒකයි. අපි වැටුප් වැඩි කිරීම කාණ්ඩ කිහිපයකට වෙන් කළේ අන්න ඒ නිසායි. උද්ධමනයත් වළක්වා ගනිමින්, තනි ඉලක්කමක උද්ධමනය පවත්වා ගනිමින්, මේ ආර්ථිකය ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. තනි ඉලක්කමක උද්ධමනය පවතිනවා කියන්නේ, අද ආයෝජනය කරන මුදලට අනාගත ප්‍රතිලාභ හරියට ලැබෙනවා කියලා ආයෝජකයා දන්නවා කියන එකයි. ඉහළ උද්ධමනයක් තිබුණොත් ආයෝජකයාට ආයෝජනය කරන්න තිබෙන හැකියාව, ධෛර්යය සහ ශක්තිය අඩු වෙලා යනවා. තමන්ගේ අනාගත ඉපැයීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවක් ඇති වුණොත් ඔය මොන පහසුකම් දුන්නත් ආයෝජකයෝ ලංකාවට එන්නේ නැහැ. එම නිසා අපි කොමිස් ගන්න එක නතර කරලා, ආයෝජකයාට තමන්ගේ ආයෝජන නිදහසේ කරන්න ඕනෑ කරන වට පිටාව මේ ආර්ථිකය ඇතුළේ - මේ රට ඇතුළේ - බිහි කරන ගමන්ම වර්තමාන ආයෝජනවල අනාගත ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් වට පිටාවක් නිර්මාණය කරන්න ඕනෑ. ඒ අරමුණින් තමයි උද්ධමනය තනි ඉලක්කමක පවත්වාගෙන යන්න අපි උත්සාහ දරන්නේ.

ඒ එක්කම, මෙම අය වැය විවාදයේදී වැඩිපුරම කථා වෙච්ච මාතෘකාවක් තමයි, වී මිල. රුපියල් 154ක්, රුපියල් 155ක් දීලා වී කිලෝවක් ගන්නවා කිව්ව මේ ආණ්ඩුව, කිලෝවකට රුපියල් 120ක මිලක් දීලා නේද වී මිලදී ගන්නේ කියන එකට උත්තරයකුත් දෙන්න ඕනෑ. වැසි දියෙන් නොවෙයි, තමන්ගේ දහඩියෙන් පොළව පොහවලා, පස සකස් කරලා, රටට බත සපයන ගොවි මහතාට රුපියල් 120ක්, රුපියල් 220ක් නොවෙයි, රුපියල් 520ක් වුණත් දෙන්න හැකියාව තිබෙනවා නම් ඒ ගැන දෙතැවක් හිතන්නේ නැතුව ඒ මිල දෙන්න කැමැති ආණ්ඩුවක් තමයි, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව. හැබැයි, තිබෙන ප්‍රශ්නය මෙයයි. කිලෝවක් රුපියල් 120ට ගන්න වී ඇටවල පොත්ත ගලවලා සහල් කළාට පසුව, ඒ සහල් පරිභෝජනය කරන්න ලෑස්ති තවත් මිනිසුන් කණ්ඩායමක් මේ රටේ ජීවත් වනවා. රුපියල් 120ට වඩා වැඩි මිලකට වී කිලෝවක් මිලදී ගත්තොත්, සහල් කිලෝවක මිල රුපියල් 230ට ඉහළ ගිහිල්ලා පාරිභෝගිකයාට අසාධාරණයක් වනවා. ඒ නිසා මේ මහ පොළවත් එක්ක හැප්පෙන අපේ ආදරණීය ගොවි මහත්වරුන්ට මේ වෙලාවේ දෙන්න පුළුවන් සාධාරණම මිල නියම කරලා තිබෙනවා.

නැවත වතාවක් මම කියනවා, මේ මොහොතේ වී කිලෝවකට දෙන්න පුළුවන් සාධාරණ මිල තමයි රුපියල් 120 ලෙස සලකා අපි දීලා තිබෙන්නේ කියන එක. විපක්ෂය අටවා ගත්ත සමහර සංගම්වල ගොවි මහත්වරුන්ට වී කිලෝවකට ලබා දෙන රුපියල් 120ක මුදල මදි වුණාට, බහුතරයක් මේ රටේ සැබෑ ගොවි මහත්වරු මේ රුපියල් 120ක මිල පිළිගෙන ආණ්ඩුවට වී දෙන්න කටයුතු කරමින් ඉන්න අවස්ථාවකයි අපි මේ කථා කරන්නේ. ඒ අවස්ථාවේදී විපක්ෂයෙන් එල්ල වෙච්ච තවත් චෝදනාවක් තමයි, රුපියල් 120ට වී මිල නියම කළා, දැන් එක වී ඇටයක්වත් වී ගබඩාවලට ඇවිල්ලා තිබෙනවාද කියන එක. ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් යම් දැනුමක් තිබෙන කෙනෙක් වේ නම් ඔහු දන්නවා, අවම මිලක් නියම කිරීමෙන් පසුව අධිසැපයුමක් වෙළෙඳ පොළට එනවා නම්, අන්න ඒ අධිසැපයුම මිලදී ගන්න විතරයි රජය මුදල් වෙන් කරන්නේ, රජයේ අරමුදල් වෙන් කරන්නේ කියන එක. මේ රුපියල් 120 කියන මිල යටතේ සියලු වී රජය මිලදී ගන්නවා කියලා අපි කොහේවත් කියලා නැහැ. රුපියල් 120ට වී මිල නියම කළාට පස්සේ වී මිලදී ගන්නේ රුපියල් 220ට, රුපියල් 320ට, රුපියල් 520ට වුණත්, වී මිලදී ගන්නා පෞද්ගලික අංශයේ උදවියට සිද්ධ වෙනවා, සහල් කිලෝවක් රුපියල් 230ට දෙන්න. ඒ නිසා අපි වී මිලදී ගත්තත්, නැතත් රුපියල් 120 කියන මිල නියම කිරීමෙන් පාලනයක් දාලා තිබෙනවා. ගොවි මහත්මයාට අඩුම තරමින් වී කිලෝවක් විකිණීමෙන් රුපියල් 120ක් අතට එන්න ඕනෑ. වී මිලදී ගන්නා අය කීයට ගත්තත්, සහල් කිලෝවක් රුපියල් 230ට වඩා අඩු මිලට දෙන්න ඕනෑ. අපේ ගබඩාවල සහල් නැත්නම්, අපේ ගබඩාවල වී නැත්නම් අපි සැලසුම් කර තිබෙනවා, මාස 3කට සරිලන සහල් සංචිතයක් ආනයනය කරලා හෝ රුපියල් 230 කියන මිල අපි පවත්වාගෙන යනවා කියලා. පෞද්ගලික අංශයේ තිබෙන ඔය ඒකාධිකාරය හදපු මහත්වරුන්ටම අපි කියනවා, එම ඒකාධිකාරී වී මිල පාලනය කරන්න අවශ්‍ය වැඩ කටයුතු අපි ඉදිරියේදී අරගෙන එන බව.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. විපක්ෂය මේ ආර්ථික මොඩලය ගැන ප්‍රශ්න කරනවා. මේක සමාජවාදී ද, ධනවාදී ද, ලිබරල් ද, සමාජයීය වෙළෙඳ පොළ මොඩලයද කියලා අපෙන් ප්‍රශ්න කරනවා. අපේ රට ආර්ථික නිදහසක් සහිත, ප්‍රජාතන්ත්‍රවාදී නිදහසක් සහිත පාලනයකට, මොඩලයකට ගැළපෙන විධියට අරගෙන එනවා කියලා අපි කිව්වා. ඒක හරියට මෙන්න මේ වාගේ දෙයක්.

16වැනි ශත වර්ෂයේදී ක්‍රිකට් ලෝකයට ආවා. 16වැනි ශත වර්ෂයේ ඉඳලා 2009 අවුරුද්ද වෙනකම් ක්‍රිකට් සෙල්ලම් කරපු

[ගරු දිනේෂ් ගේමන්ත මහතා]

හැම ක්‍රීඩකයෙකුම, හැම පිතිකරුවෙකුම - හැම batsman කෙනෙක්ම - තමන්ට එන පන්දුවට ඉදිරියට යන්න පහරක් ගහලා ලකුණු රැස් කරන්නේ කොහොමද කියලා තමයි කල්පනා කළේ. ඉදිරියෙන් එන පන්දුවට ඉදිරියට පහරක් ගහලා කොහොමද ලකුණු රැස් කරන්නේ කියලා තමයි ඔවුන් කල්පනා කළේ. ඒක ක්‍රිකට් ඉතිහාසයේ වැඩිම ප්‍රතිශතයක් - average එකක් - පවත්වාගෙන ගිය ඩොනල්ඩ් බ්‍රැඩ්මන් ක්‍රීඩකයාට වේවා, වැඩිම ශතක ප්‍රමාණයක් ලබා ගත් සචින් තෙන්ඩුල්කාර් ක්‍රීඩකයාට වේවා ඒ හැමෝටම ඒක පොදුයි. හැබැයි, 2009 අවුරුද්දේ අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ටී.එම්. ඩිල්ෂාන් කියන ක්‍රීඩකයා හැමෝම ඉස්සරහට ගහලා ලකුණු රැස් කරනකොට, පිටුපසටත් ගහලා ලකුණු රැස් කරන්න බැරි ඇයි ද කියන චින්තනයට ඇවිල්ලා, "Dilscoop" කියන shot එක අද ලෝකයට හඳුන්වා දී තිබෙනවා.

ප්‍රතිවිරුද්ධ අදහස් ඇතිව, අලුත් අදහස් ඇතිව හිතන මිනිසුන්ට පැරණි මොඩලයේම හිරවෙලා ඉන්න ඕනෑ කියලා නීතියක් නැහැ. ඒ නිසා අපි අලුත් මොඩලයක් හදලා තිබෙනවා. මේක ධනවාදී ද, සමාජවාදී ද එහෙම නැත්නම් ලිබරල් ද, නවලිබරල් ද, සමාජයීය වෙළෙඳ පොළ ද කියන කැමති නමක් තමුන්නාන්සේලාට ආරුඪ කර ගන්න පුළුවන්. අපි හදලා තිබෙනවා, මොඩලයක්. ඒ මොඩලයේ අවසාන උත්තරය විය යුත්තේ මෙයයි. ශ්‍රී ලංකාවේ ජනතාව අවුරුදු 76ක් තිස්සේ තවමත් දුක් විඳිනවා. මේ රටේ පැවති ආණ්ඩු අවුරුදු 76ක් තිස්සේ මාරුවෙන් මාරුවට මේ රට පාලනය කරලා, හප කරලා, නට්ටං කරලා, නැති හංගස්ථාන කළා. ඒ රට යම් තලයකට අරගෙන ගිහිල්ලා ගොඩ දාලා, උසස් තලයක තියන්න ඕනෑ කරන ආර්ථික මොඩලයක් අපි හදලා තිබෙනවා. ඇවිදගෙන හරි, දුවලා හරි, දණ ගාගෙන හරි, බඩ ගාගෙන හරි ගිහිල්ලා මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 159දෙනා ඇතුළු ස්වේච්ඡා බලඇණිය මේ අවසාන අරමුණ කරා ගමන් කරනවා. එලෙස ගමන් කරන්න අවශ්‍ය ශක්තිය මේ ජාතික ජන බලවේග ආණ්ඩුවට තිබෙනවා කියන එකත් පවසමින්, අද දවසේ මට කථා කරන්න කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 36ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරපු විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියැවීමේ විවාදයේ අවසාන දවසේ, අවසාන අදියරේ විවිධ අදහස් ඉදිරිපත් වුණා. මේ විසර්ජන පනත් කෙටුම්පත තමයි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබන ලියවිල්ල.

ඒකට තමයි අපි සාම්ප්‍රදායිකව අය වැය ලේඛනය කියලා කියන්නේ. එය සාමාන්‍යයෙන් ආණ්ඩුවේ ඉදිරි වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු කිරීමත්, ඒ වියදම් මූල්‍යනය කර ගන්නා ආකාරයත් පිළිබඳව ඉදිරිපත් කරන ඇස්තමේන්තුවක්.

සාමාන්‍යයෙන් අය වැය කිව්වාම ආදායම් සහ වියදම් තිබෙනවා. පෞද්ගලිකවත් අපට අය වැය හදාගන්න පුළුවන්. ව්‍යාපාර ආයතනයකට වුණත් අය වැය හදාගන්න පුළුවන්. එවැනි තත්ත්වයකදී තිබෙන පොදු ලක්ෂණය තමයි, එවැනි අය වැය සකස් කරන්න මූලික වෙන්නේ ආදායමයි. ආදායම් ඉපැයීමේ මාර්ග හොයලා, ආදායමට අනුව ඒ ආදායම ඇතුළත පමණයි වියදම් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ආදායමට වඩා වියදම් කරන්න ලැබෙන්නේ නැහැ.

හැබැයි, ආණ්ඩුවක අය වැය ඊට වඩා වෙනස්. ඊට වඩා නෛතික පසුබිමකුත් ඒකට තිබෙනවා. හේතුව, ඒ තුළින් මහජනතාවගේ පොදු අරමුදල්, මහජනතාව වෙනුවෙන් කළමනාකරණය කිරීමටයි රජය කටයුතු කරන්නේ. ඒ නිසා අය වැයක් සකස් කිරීමේ පදනම වන්නේම ඒ ආණ්ඩුවේ අරමුණු, ආර්ථික දැක්මේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා වියදම් කළමනාකරණය කිරීමයි. වියදම් පුරෝකථනය කිරීම තමයි ඉස්සරහට එන්නේ. ඒ වියදම් ඇස්තමේන්තු කිරීම. අය වැය ලේඛනය කියලා අපි කියන්නේ, වියදම් මූල්‍යනය කරගන්නේ කොහොමද කියන කාරණයයි. ඒ අර්ථයෙන් ගත්තාම, අපි ඉදිරිපත් කරලා තිබෙන මේ 2025 විසර්ජන පනත් කෙටුම්පතින් ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ තිබෙන අරමුණුත්, ඒ වාගේම අපට පැනවී තිබෙන සීමා යටතේ තිබෙන තත්ත්වයනුත් සියල්ල සලකා බලා රුපියල් බිලියන 7,190ක් ලෙස වියදම් ඇස්තමේන්තුව ඉදිරිපත් කරනවා. ඒ රුපියල් බිලියන 7,190 මූල්‍යනය කරගන්න අපි උත්සාහ කරනවා බදු, බදු නොවන මාර්ග සහ ආණ්ඩුවේ ආදායම් සහ ප්‍රදාන සහිතව රුපියල් බිලියන 4,990ක්. එතකොට අපට ආදායම් සහ ප්‍රදාන විධියට ලැබෙන්නේ රුපියල් බිලියන 4,990යි. අපි වියදම් ඇස්තමේන්තුගත කරලා තිබෙනවා රුපියල් බිලියන 7,190ක්. ඒ අනුව රුපියල් බිලියන 2,200ක වෙනසක් එනවා. එයට කියනවා සමස්ත අය වැය හිඟය කියලා. එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 6.67ක්. සාමාන්‍යයෙන් ඒක සියයට 5ක වාගේ අගයක රඳවා ගැනීම තමයි benchmark එකක් විධියට සලකන්නේ. කෙසේ වෙතත්, පසුගිය වර්ෂයට සාපේක්ෂවත්, අපට තිබෙන සීමා කිරීම් යටතේත් මම හිතනවා මේ සියයට 6.67ක රඳවා ගැනීම විශාල ජයග්‍රහණයක් කියලා.

ඒ වාගේම, මේ රුපියල් බිලියන 2,200ක හිඟය කොහොමද පියවා ගන්නේ? ඒ සඳහා විවිධ මාර්ග තිබෙනවා. ණය ගැනීම්, අලුතින් බදු පැනවීම්. ඒ වාගේම මූල්‍ය ප්‍රසාරණය වීම් සිද්ධ වෙනවා. අපි සාමානයෙන් කියනවා මුදල් අච්චු ගැසීම වැනි කාරණා. ඒවාට අපි කියනවා monetary financing කියලා. හැබැයි, මේ අය වැය ඇතුළත අපි උද්ධමනය ඇති වෙන මාර්ගවලට යොමු වෙලා නැහැ. අලුතින් බදු පැනවීම් සිද්ධ කරලා නැහැ. ඒ වෙනුවට මූල්‍ය නොවන, ඒ කියන්නේ විශේෂයෙන් බැංකු පද්ධතිය නොවන, වෙළෙඳ පොළේ මුදල් ප්‍රසාරණය නොවන, දේශීය වෙළෙඳ පොළෙන් රුපියල් බිලියන 2,125කුත්, විදේශීය වෙළෙඳ පොළෙන් රුපියල් බිලියන 75කුත් ණය ලබා ගැනීමට අපේක්ෂා කරනවා.

ඊට අමතරව ආණ්ඩුවේ වියදම් පියවා ගත්තාට පස්සේ ආණ්ඩුවට සිද්ධ වෙනවා, මේ රුපියල් බිලියන 2,200ට අමතරව තවත් කාරණා කිහිපයකට මුදල් සොයාගන්න. ඉන් එකක් තමයි, ආණ්ඩුව ලබා ගත් ණය ආපසු ගෙවීම. ඒ ණය වාරික ගෙවීම සඳහා රුපියල් බිලියන 1,600ක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම අපි

දන්නවා, ණය ගැනීමේදී රජයේ සුරැකුම්පත් විධියට භාවිත කරන භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ලබා ගන්නා මූල්‍ය අගයත්, ආපසු ගෙවීමේ මුහුණත අගයත් අතර වෙනසක් තිබෙනවා. ඒ වෙනස පියවන්නේ ඒවා කල් පිරීමේදීයි. ඒ වෙනස වෙනුවෙන් අපට රුපියල් බිලියන 200කුත් ගෙවන්න සිද්ධ වෙනවා. ඒ අනුව රුපියල් බිලියන 4,000ක අවශ්‍යතාවක් තිබෙනවා. අපේ ණය ගැනීමේ සීමාව තමයි මේ විසර්ජන පනත් කෙටුම්පත හරහා රුපියල් බිලියන 4,000ක් ලෙස මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. එය 2024 වර්ෂයට සාපේක්ෂව විශාල පහළ යෑමක්. 2024 වර්ෂයේදී එය රුපියල් බිලියන 7,350ක් වුණා.

ඒ වාගේම මේ අය වැය විවාදයේදී අද දවසත් ඇතුළුව පසුගිය දවස් 7 පුරාම ඉදිරිපත් වූ විවිධ කරුණු කාරණා මැද විශේෂයෙන් විපක්ෂය අපට එල්ල කළ චෝදනා සහ විවේචන අතරේ තිබුණේ, මෙය රනිල් වික්‍රමසිංහගේ අය වැයක්; IMF එකේ අය වැයක් කියන කාරණා. ඒ විධියේ සරල, මතුපිටින් බලලා විවේචනයක් ඉදිරිපත් කළා මිසක්, මේ අය වැය ඇතුළේ අපි මොන වාගේ කාරණාද ඉදිරිපත් කර තිබෙන්නේ, මේ අය වැයේ අන්තර්ගතය මොකක්ද, මෙය ක්‍රියාත්මක කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය මොකක්ද කියන කාරණා පිළිබඳව දීර්ඝව විස්තරාත්මකව විශ්ලේෂණය කරපු බවක් අපට පෙනෙන්නට තිබුණේ නැහැ. සමහර විට විපක්ෂය අදහස් ඉදිරිපත් කිරීමේදී මේ අය වැයෙහි හරය, සැබෑ ස්වරූපය, අන්තර්ගතය පිළිබඳව ඇත්ත තත්ත්වය හිතා මතාම සැඟවීමටත්, මේ පිළිබඳ හොඳ කථාවක් සමාජයේ නිර්මාණය වීම වැළැක්වීමටත්, මහජනතාව නොමඟ යැවීමටත් ඒ විධියට කටයුතු කළාද කියන්න අපි දන්නේ නැහැ.

මම එහෙම කියන්නේ මේකයි. පසුගිය කාලයේ ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛන අපට විවිධ ආකාරයට විශ්ලේෂණය කර බලන්න පුළුවන්. සමහර අය වැය ලේඛන යම් අගය කිරීම්වලට ලක් කරපු තත්ත්ව තිබෙනවා. නමුත් විශේෂයෙන්ම පසුගිය දශක දෙක ඇතුළත ඉදිරිපත් කරපු අය වැය ලේඛන ඇත්තටම සමාජගත වුණේ, පාර්ලිමේන්තුවේ නීතිමය අනුමැතිය ලබා ගන්නා හුදු සංකේතාත්මක ලියවිල්ලක් විධියට. ඒ සම්බන්ධයෙන් සමාජයේ එච්චර උනන්දුවක් නැති වුණා; සමාජ උනන්දුව ගිලිහී ගියා. සමහර වෙලාවට මහජනතාව බැලුවේ, මේ අය වැය ලේඛනයෙන් අපට යම් බදු සහනයක් ලැබෙනවාද, වෙනත් සහනයක් ලැබෙනවාද කියා පමණයි. ඒ වාගේ පුංචි, සරල අදහසක් මිසක්, අය වැය ලේඛනයකින් සමස්ත ආර්ථිකයක් ගොඩගන්න කටයුතු කිරීම කියන කාරණය, අදහස ගිලිහී ගිහින් තිබුණා. ඒකට ප්‍රධාන හේතුව වුණේ පසුගිය ආණ්ඩු විසින් හුදෙක් නීතිමය අවශ්‍යතා පාර්ලිමේන්තුවෙන් අරගෙන, අය වැය ලේඛනයෙන් වියදම් සඳහා වෙන් කරන මුදල් - රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමේදී - තමන්ට රිසි සේ, කැමැති පරිදි වියදම් කිරීමේ අනීත අත්දැකීමක් තිබෙන නිසා වෙන්නට ඇති.

නමුත් පළමුවැනි වතාවට අද වනවිට සමාජයේ කථා බහට ලක් වෙනවා, මේ අය වැයේ මුදල් වෙන් කර තිබෙන ආකාරය ගැන, ඒ මුදල් ගලා ගොස් තිබෙන ආකාරය ගැන. එක එක ක්ෂේත්‍ර වෙන වෙනම අරගෙන ඒවා ගැන තර්ක විතර්ක කරන්න, ඒවායේ හොඳ නරක ගැන වාද විවාද කරන්න පුළුවන්. එවැනි දේවල් සමාජයේත් තිබෙනවා. හැබැයි, සමස්තයක් ලෙස ගත්තාම පාර්ලිමේන්තුවෙන් එළියේ ඉන්නා පක්ෂ විපක්ෂ සමාජ කණ්ඩායම් විසින් මේ අය වැය ලේඛනයේ අන්තර්ගතය ගැන අන් කවරදාටත් වඩා කථා බහට ලක් කරනවා. මම හිතනවා, ඒක හොඳ ලක්ෂණයක් කියලා.

මේ අය වැය පිළිබඳ විවිධ ලේඛල ඇලෙව්වත් මම කියන්න කැමැතියි, කලින් ඉදිරිපත් කර තිබෙන අය වැයවලට වඩා අපේ අය වැය වෙනස් වෙන්නේ කොහොමද කියලා. ඔබතුමන්ලා සඳහන් කරන රනිල් වික්‍රමසිංහගේ අය වැය වේවා, IMF එකේ අය වැය වේවා, වෙනත් -ලිබරල්- අය වැයක් වේවා, ඒ කියන ලේබල් ඇලෙව්වත් ඒවාට වඩා මේක වෙනස් වෙන්නේ ඇත්තටම පසුගිය කාලවල විවිධ නම්වලින්, විවිධ ක්‍රමවලින් අදූරදර්ශී දේශපාලන සහ ආර්ථික ප්‍රතිපත්ති මත අරගෙන ආපු විනාශ මූලික දේශපාලනයකට තිත තියපු අය වැයක් නිසායි. ඒ විධියට මම මේ අය වැය නම් කරන්නට කැමැතියි. ඒ වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී වංචාව, දූෂණය නතර කරපු, ඒ වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී මහජන ඇල්ම වෙනුවට පෞද්ගලික ඇල්ම ඉස්මතු කිරීම නතර කරපු අය වැයක් විධියට මම මෙය දකින්න කැමැතියි. ඒ වාගේම මම කලින් සඳහන් කරපු ආකාරයට සංක්‍රාන්තිමක අවසරය පාර්ලිමේන්තුවෙන් ලබා ගන්නවා වෙනුවට, මහජනතාවගේ මුදල් නිසි කළමනාකරණයකට සහ වගවීමකට යටත් වෙමින් ඉදිරිපත් කරපු අය වැයක් විධියට මම මේක දකින්නට කැමැතියි.

ඒ සඳහා මම එක් උදාහරණයක් ඉදිරිපත් කරන්නම්. අපි කවුරුත් දන්නවා, ආණ්ඩුවක් අය වැය ලේඛනයක් සකස් කරනකොට, අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීම සඳහා යම් වෙන් කිරීමක් කරන්න පුළුවන් බව. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ, ඒකට දැන් කියන්නේ අය වැය සංචිතය - Budget reserve - කියලා. අපි කලින් අනපේක්ෂිත වියදම් සඳහා වෙන් කරන මුදලට භාවිත කළ නම තමයි contingency කියන එක. හොඳ අය වැයක අනපේක්ෂිත වියදම් සඳහා වැඩිපුර මුදල් ප්‍රමාණයක් තිබෙන්න බැහැ. හැබැයි, අපට අතීතයේ දකින්න ලැබුණේ ඒ සඳහා අය වැය හරහා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරගෙන මැති ඇමතිවරුන් ඒ මුදල් අවභාවිත කළ ආකාරයයි. ඊට හොඳම උදාහරණය තමයි 2024 අය වැය. එම අය වැය තුළින් contingencies සඳහා පුනරාවර්තන වියදම් විධියට රුපියල් බිලියන 200කුත්, ප්‍රාග්ධන වියදම් විධියට රුපියල් බිලියන 100කුත් - සමස්තය බිලියන 300ක් - වෙන් කර තිබුණා.

ඒවා මොන ආකාරයට පාවිච්චි කළා ද කියන එක අපට විශ්ලේෂණය කර බලන්න පුළුවන්. නමුත් ඒකෙන් ගම්‍ය වෙනවා, නිසි ආකාරයට මේ කළමනාකරණය සිද්ධ කළේ නැහැ කියන කාරණය. ඒ නිසාවෙන්ම පසුගිය කාලයේ මේ ආර්ථික අර්බුදයත්, රට බිඳ වැටීපු තත්ත්වය නිර්මාණය වීමත් හරහා අපට යම් යම් සීමා කිරීම්වලට යන්න වුණා. ඒ සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා කරන්න සිද්ධ වුණා. එහි අවසාන ප්‍රතිඵලයක් විධියට 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ගෙනෙන්න සිද්ධ වුණා. ඒ පනත ඇතුළේ හොඳ ලක්ෂණ වාගේම, සීමා කිරීම් ගණනාවකුත් තිබෙනවා. ප්‍රධාන සීමා කිරීමක් තමයි ප්‍රාථමික වියදම. මම ඒ ගැන පසුව කථා කරන්නම්. විශේෂයෙන්ම contingency, නැත්නම් Budget reserve එක සම්බන්ධයෙන් සීමාවක් පනවා එය නීතියක් බවට පත් කරගෙන තිබෙනවා. ඒ, නිතුමතේ වියදම් කරන එක සීමා කරන්නයි. රටේ ප්‍රාථමික වියදම්වලින් සියයට 2කට වඩා වැඩි ප්‍රමාණයක් ඒ reserve එකට ගෙන යන්න දැන් බැහැ. ඒ අනුව තමයි අප මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. ප්‍රාථමික වියදම් -ඒ කියන්නේ, රුපියල් බිලියන 4,285- සැලකිල්ලට ගත්තාම, එයින් සියයට 2ක් කියන්නේ බිලියන 85ක වාගේ ප්‍රමාණයක්. ඕනෑ නම් අපට තිබුණා, ඒ contingency, නැත්නම් Budget reserve එක මේ අය වැය ඇතුළේත් බිලියන 85ක තියන්න. නමුත්, අපි නිවැරදි සැලසුම්කරණයකට, කළමනාකරණයකට යමින්, නිසි පරිදි මූල්‍ය විනය පවත්වා ගනිමින් එම බිලියන 85නුත් විශාල මුදල් ප්‍රමාණයක් හඳුනාගත්, ඉලක්ක කරගත් සංවර්ධන ව්‍යාපෘතිවලට, සහන ව්‍යාපෘතිවලට, යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට වෙන් කළා. Budget reserve එක වශයෙන් මේ අවුරුද්දේ අපි තියාගත්තේ, රුපියල් බිලියන 38ක් පමණයි.

[ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය වෙනස් වෙනවා, අනෙක් අය වැයවලින්. අතීතයේ හැන්සාඩ් වාර්තා අරගෙන Budget Speeches බැලුවාම අපට පෙනී යනවා, බොහෝදුරට අය වැය ඇතුළේ අන්තර්ගතය සාකච්ඡා කරනවා වෙනුවට ඒවා ඉතා අලංකාර වචනවලින් සරසලා වාක්‍ය ඛණ්ඩ සහිත පිටු ගණන් ලියා තිබෙන ආකාරය. හැබැයි, අපේ අය වැය එහෙම අලංකාර වචනවලින් පටන් ගන්නේ නැහැ. මේ අය වැය පටන් ගන්නේ, අප ආණ්ඩු බලය ලබා ගන්න කලින් තිබිච්ච ආර්ථික තත්ත්වය විශ්ලේෂණය කරමින්. ඒ වාගේම, අප ආණ්ඩු බලය ලබා ගත්තාට පස්සේ තිබුණු ආර්ථික තත්ත්වයත් විශ්ලේෂණය කරමින්. ඒ පැවැති තත්ත්වය යටතේ, විශේෂයෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කිරීමේදී අපට ගත හැකි විකල්ප මොනවාද කියලා සැලකිල්ලට භාජන කරලා ඒ විකල්ප අතරින් වඩාත් හොඳම විකල්පය තෝරාගෙන වැඩකටයුතු කිරීමක් තමයි මේ අය වැය තුළ පෙන්නුම් කරන්නේ. ඒ වාගේම මේ අය වැයේ තවත් විශේෂත්වයක් තිබෙනවා. අපේ දැක්ම, අපේ දර්ශනය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනය එකට කැටි කරලා මේ අය වැය ඇතුළේ පෙන්වා තිබෙනවා. ඒ තමයි, අපේ අය වැය තේමාව.

අපි මොන තර්ක ඉදිරිපත් කළත්, මුහුණ දී තිබෙන මේ අර්බුදයෙන් එළියට යන්න, අපට හොඳ රටක් හදා ගන්න, මනුෂ්‍යත්වයට ගරු කරන ආර්ථිකයක් හදා ගන්න නම් රටේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩි කරන්නට ඕනෑ. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩි කර ගන්නේ කොහොමද, ඵලදායිතාව වැඩි කර ගන්නේ කොහොමද, විදේශීය වෙළෙඳ පොළ ඉලක්ක කර ගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන්නේ කොහොමද, නව ලෝකයත් එක්ක ගැළපෙන ගෝලීය සැපයුම්දාම එක්ක අප අත්වැල් බැඳ ගන්නේ කොහොමද, ලෝකයේ සිද්ධ වෙලා තිබෙන තාක්ෂණික දියුණුව නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්නේ කොහොමද කියන කාරණා, ඒ වාගේම භාණ්ඩ හා සේවා ඉතා කාර්යක්ෂමව බෙදා හරින්නේ කොහොමද, ඒ සඳහා මහ ජනතාව සම්බන්ධ කර ගන්නේ කොහොමද, එහි ප්‍රතිලාභ මහ ජනතාවට බෙදා හරින යන්ත්‍රණය මොකක්ද කියන කාරණා පිළිබඳව මූලික වශයෙන්ම අපි මේ අය වැයෙන් සාකච්ඡා කර තිබෙනවා. මේ අය වැයේ ප්‍රවේශය විධියට අපි ඒවා ගැන සාකච්ඡා කර තිබෙනවා. ඒ අය වැය ප්‍රවේශය අරගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන කොට, වෙළෙඳ පොළ කියන්නේ ඉතාම වැදගත් වන යන්ත්‍රණයක්. ඒ වෙළෙඳ පොළ හැසිරවීමේදී මහ ජනතාවට අවශ්‍ය වෙනවා, ඉහළ ගුණත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා අඛණ්ඩව, සාධාරණ මිලකට ලබා ගන්න. අතීතයේ අනුගමනය කරපු ක්‍රියාමාර්ග තුළ, වෙළෙඳ පොළට කරපු යම් යම් බලපෑම් තුළ අපට මුහුණ දෙන්න සිද්ධ වෙච්ච තත්ත්ව තිබුණා. යම් භාණ්ඩවල හිඟයක් ඇති වුණා. නමුත් අපේ දැක්ම, දර්ශනය තමයි, මේ අවුරුද්ද ඇතුළත වෙළෙඳ පොළේ භාණ්ඩ හා සේවා අඛණ්ඩව, සාධාරණ මිලකට, ඉහළ ගුණත්වයකින් යුතුව ලබා දීම. එතැනදී වෙළෙඳ පොළ හැසිරවීමට ආණ්ඩුව ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? මේ ආණ්ඩුව හුදෙක් අතීතයේ තිබුණු *laissez-faire* economy එක වාගේ සමස්ත ආර්ථික ක්‍රියාවලියෙන් පැත්තකට ගිහින් නීතිය හෝ වෙනත් රාජ්‍ය සේවා පවත්වා ගෙන යෑමේ කාර්යය විතරක් ඉදිරිපත් කරන ආණ්ඩුවක් නොවෙයි.

අද තිබෙන ලෝක තත්ත්වය එක්ක ලෝකය දියුණු වෙලා තිබෙනවා. සමහර ප්‍රශ්නවලට ලෝක පරිමාණයෙන් උත්තර සොයන්න සිද්ධ වෙලා තිබෙනවා. තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. ඒ නිසා ජාත්‍යන්තරයත් එක්ක ගැට ගැහුණු තත්ත්වයකදී, වෙළෙඳ පොළ හැසිරවීමට, වෙළෙඳ පොළ තුළ ක්‍රියාත්මක වීමට ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය අපි යෝජනා කරනවා. ඒ වාගේම, තෝරා ගත් ක්ෂේත්‍රවලට වෙළෙඳ පොළේ පූර්ණ තරඟකාරිත්වය, තරඟකාරී ප්‍රවේශය අපි පිළිගන්නවා. ඒ වාගේම, අනෙක් අවශ්‍ය තැනදී නිසි වේලාවට රාජ්‍යයේ මැදිහත් වීම සිදු කරනවා. ඒක නියාමනය කිරීමක් හරහා කරනවා වෙන්න පුළුවන්, වෙළෙඳ පොළ සංවිධානය කිරීමක් හරහා කරනවා වෙන්න පුළුවන්, ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමක් හරහා කරනවා වෙන්න පුළුවන්, නවත් ආයතන බිහි කිරීම හරහා කරනවා වෙන්න පුළුවන්, නව සමුපකාර පද්ධතියක් හරහා කරනවා වෙන්න පුළුවන්. ඒ වාගේම, රාජ්‍යයේ මැදිහත් වීම රාජ්‍ය ආයතන හරහා වෙළෙඳ පොළෙන් යම් සැලකිය යුතු පංගුවක් අත්පත් කර ගැනීම හරහා කරනවා වෙන්නත් පුළුවන්. ඒ කරුණු අනුව කලින් අය වැය ලේඛනවලට වඩා අපේ අය වැය ලේඛනය වෙනස් වනවා.

ඒ වාගේම, න්‍යායාත්මකව ගත්තත් අපේ අය වැය ලේඛනය මෙන්න මේ කාරණය නිසා වෙනස් වෙනවා. ඒ කාරණය මේකයි. ඔබතුමන්ලා කවුරුත් දන්නවා, අපේ රටේ අර්බුදය තිබුණු කාලයේත්, ඊට පෙර අතීතයේදීත් බොහෝ දුරට මහ ජනතාව ගැන හිතන්නේ නැති ආණ්ඩු, ආණ්ඩුවේ පැවැත්ම විතරක්, දේශපාලන පැත්ත විතරක් හිතුවාම අනුගමනය කරන එක්තරා ආර්ථික විද්‍යාත්මක න්‍යායක් තිබෙන බව. ඒකට අපි කියනවා, contractionary expansion theory කියලා. Contractionary expansion theory එක යටතේ කරන්නේ මොකක්ද? පළමු කොටම ආර්ථිකය හිර කරනවා, කොටු කරනවා, පටි තද කර ගන්න කියනවා, ටික කාලයක් ගියාම ස්වාභාවිකව ආර්ථිකය ප්‍රසාරණය වෙයි කියලා හිතනවා. එහි අදහස, තර්කනය මේකයි. සංඛ්‍යාවක් විධියට දකිමින් ආර්ථිකය ඇමෙරිකානු ඩොලර් බිලියන 100යි කියලා අපි හිතමු. ඒ ඇතුළේ රාජ්‍යයේ වියදම් තිබෙනවා. රටේ නිෂ්පාදනය, අනෙක් පැත්තෙන් වියදම් විධියට එන්නේ. රටේ නිෂ්පාදනය කර්මාන්ත, කෘෂි කර්මාන්තය හා සේවා විධියට තිබෙනවා. එහි සමස්ත වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 100 වියදම් විධියට තිබෙනවා. එහි ප්‍රධාන පංගු දෙකයි. ඒවා තමයි ආණ්ඩුවේ වියදම් සහ පෞද්ගලික අංශයේ වියදම්.

මේ contractionary expansion theory එකෙන් කියන්නේ, ආණ්ඩුව පුළුවන් තරම් හැංගෙන්න, හැකිළෙන්න, වෙළෙඳ පොළ තත්ත්වය ගැන කලබල වෙන්න යන්න එපා කියලායි. අර කලින් කිව්ව ආකාරයට 100න් 40කට ආණ්ඩුව මැදිහත් වෙලා තිබුණා නම්, දැන් ඒක සියයට 30 කරන්න, 20 කරන්න, 10 කරන්න, පුළුවන් තරම් හකුළුවන්න කියලායි. Austerity measures කියන්නේ ඒකයි. පීඩනය පුළුවන් තරම් මහ ජනතාවට අත් පත් කරනවා. හැබැයි, උපකල්පනයකට එනවා. මොකක්ද, උපකල්පනය? ආණ්ඩුවේ ක්‍රියාකාරකම් හකුළුවන කොට පෞද්ගලික අංශය මේ ආර්ථික ක්‍රියාවලිය මැදට පැනලා, ආර්ථිකය ප්‍රසාරණය කරයි කියන එක. වග විභාගයකින් තොරව, ආණ්ඩුව පැත්තකට වෙලා පෞද්ගලික අංශයට ඕනෑම දෙයක් කරන්න කියන theory එක තමයි එතැන තිබෙන්නේ. ඒක සමහර රටවල යම් යම් කාල පරිච්ඡේදවලදී සාර්ථක වෙච්ච තැන් තිබෙනවා. හැබැයි, ඒ සඳහා ඉතාම කෙටි උදාහරණ දෙකතුනක් පමණයි තිබෙන්නේ. ඒවායෙන් වුණත් contractionary expansion theory එක සාර්ථක වෙලා තිබෙන්නේ, රටවල් කිහිපයක විතරයි. ඒ විශාල වශයෙන් ආදායම් තිබෙන, බැර කර්මාන්තය විශාල වශයෙන් තිබෙන, විදේශ විනිමය අනුපාතය, hot currencies තිබෙන රටවල මිසක් අනෙක් රටවල නොවෙයි. ඒ නිසා අපේ රටත් අර්බුදයට යන කොට අනුගමනය කරමින් ආවේ, contractionary expansion theory එකක්. අපි ඒ වෙනුවට විකල්පය යෝජනා කරනවා. මේ දුෂ්කර මොහොතේදී පවා ආර්ථිකය ප්‍රසාරණය කිරීම සඳහා මහ ජනතාව බද්ධ කර ගැනීම, ජාත්‍යන්තර සංවිධාන බද්ධ කර ගැනීම හා ජාත්‍යන්තර ආයෝජකයන් කැඳවීම සඳහා කටයුතු කරනවා. අන්න ඒ අනුව තමයි, අපේ ආණ්ඩුවේ අය වැය ලේඛනය කලින් තිබුණු අය වැය ලේඛනවලට වඩා වෙනස් වන්නේ.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ සීමාවක් පැනවී තිබෙනවා කියලා මම කිව්වා. ඒ සීමාව නීත්‍යානුකූල තත්ත්වයක්. සියයට 13ක් තමයි, දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රාථමික වියදම් සඳහා වැය කරන්න තිබෙන්නේ. ඒ අනුව එය රුපියල් බිලියන 4,185යි.

ඒත් එක්කම අපට මහ හරින්න බැරි පොලී වියදමක් තිබෙනවා, රුපියල් බිලියන 2,950ක. ඒ අනුව තමයි මේ වියදම් සැලකිය යුතු මට්ටමකින් වැඩි වෙලා තිබෙන්නේ. එහෙම නම්, අපේ අය වැය ලේඛනය ඇතුළේ ගැඹුරට ගිහිල්ලා, මේ අය වැය ලේඛනය මොන වාගේ එකක්ද කියලා විශ්ලේෂණාත්මකව බැලුවොත් පෙනෙන කරුණු කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි.

විශේෂයෙන්ම ආයෝජනය සහ වෙළෙඳාම පුළුල් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සඳහා මුදල් වෙන් කිරීම් මේ අය වැය ඇතුළේ විශාල වශයෙන් තිබෙනවා. ඒවාට උදාහරණ කිහිපයක් - එකක්, දෙකක් පමණක්- මම ඉදිරිපත් කරන්නම්. අය වැයෙන් වෙන් වෙලා තිබෙන මුදල් විවිධ ව්‍යාපෘති යටතේ සාරාංශගත කරලා ගත්තොත්, ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති 37ක් තිබෙනවා. සමහර ඒවා දැනටමත් පටන් අරගෙන ක්‍රියාත්මක කරපු ඒවා. අපි අලුතින් යෝජනා කරපු ව්‍යාපෘතින් ඇතුළුව සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 492,656ක විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වෙනවා. මේ තුළ මාර්ග, පාලම් වාගේ විවිධ වූ යටිතල පහසුකම් වෙනුවෙන් ව්‍යාපෘති 37ක් තිබෙනවා.

අපේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු නව වියදම් යෝජනා ඇමුණුමක් විධියට අය වැය කථාවේ අවසානයේ ඇතුළත් කර තිබෙනවා. ඒ නව වියදම් යෝජනාවල යෝජනා 54ක් තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 215,150ක් වෙන් වෙලා තිබෙනවා. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් ඒවාට මුදල් වෙන් වෙච්ච හැටි තිබෙනවා. මම ඒ එකින් එක පැහැදිලි කරන්නම්.

ප්‍රධාන වශයෙන් සාරාංශයක් හැටියට ගත්තාම අපට මෙන්න මෙහෙම කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. ක්ෂේත්‍ර 12ක් ඔස්සේ ඒ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණය, යහපත් සුවපත් දිවියක්, රටේ ආහාර සුරක්ෂිතතාව, ආහාර පෝෂණය, කෘෂිකර්මාන්තයේ දියුණුව, පරිසරය, සදාහරිත ජීවිතයක්, සාමකාමී හා සාධාරණ සමාජයක් වෙනුවෙන් සහාය වීම, ජාතික ආරක්ෂාව, ව්‍යවසායකත්වය වර්ධනය කිරීම, තිරසාර හා ආර්ථික බලශක්තිය සැපයීම, රාජ්‍ය සේවය කියන කරුණු වෙනුවෙන් වෙන් වෙච්ච මුදල් ප්‍රමාණයක් තිබෙනවා. ඒ අතර කැපී පෙනෙන වියදම් ක්ෂේත්‍ර කිහිපයක් තිබෙනවා. ඒ අනුව අධ්‍යාපනයේ ගුණාත්මක බව, සමානාත්මතාව හා විශිෂ්ටත්වය ළඟා කර ගැනීම සඳහා රුපියල් බිලියන 619ක් වෙන් කරලා තිබෙනවා. අනෙක් එක, සෞඛ්‍ය ඇතුළු නිරෝගී දිවියක් වෙනුවෙනුත් රුපියල් බිලියන 604ක් වෙන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට යටිතල පහසුකම් සහ මූල්‍ය පහසුකම් දෙන අතරතුර, ඔවුන්ට මහ පෙන්වීම, අවශ්‍ය පහසුකම් ලබා දීම වෙනුවෙන් රාජ්‍ය යන්ත්‍රණය මැදිහත් වෙන්න ඕනෑ. විශේෂයෙන් ඒ සඳහා මූල්‍ය පහසුකම් ලබා ගන්න ගියාට පස්සේ ප්‍රශ්න ගණනාවකට ලක් වෙනවා; ලක් වෙලා තිබෙනවා. දැනට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ණය ගෙවා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයකදී ඔවුන් බැංකුවකින් ණය ලබා ගන්නකොට අදාළ ඇපකර නිකුත් කිරීම සඳහාත්, නව මූල්‍ය සම්පාදනය කර ගැනීම සඳහාත් නව සංවර්ධන බැංකු ආකෘතියක් ඉදිරිපත් කරමින් මේ ඇපකර සඳහා National Credit Guarantee Institution එක මැදිහත් වෙලා කරන වැඩසටහනක් අපි යෝජනා කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිෂ්පාදනය වැඩි කිරීම, සංචාරක කර්මාන්තය දියුණු කිරීම, වෘත්තිය පුහුණුව සඳහා දීමනා වැඩි කිරීම, තරුණයන්, කාන්තාවන් ඇතුළු තරුණ නායකත්වය ව්‍යවසායකත්වය සමුපකාර සඳහා කැඳවීම සඳහා රුපියල් මිලියන 3,300ක විවිධ වූ වැඩසටහන් යටතේ රට ඇතුළේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහාත් ව්‍යවසායකත්වය නැංවීමට මුදල් වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය හා ක්‍රීඩා මානසික සුවය වැඩිදියුණු කිරීම සඳහා නව වියදම් යෝජනා ඇතුළත්ව රුපියල් මිලියන 2,600ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ඒ ක්ෂේත්‍රය නියෝජනය කරමින් 5 වසර සමත් සිසුන් සඳහා අධ්‍යාපනය නවීකරණය කිරීම, ක්‍රීඩා සංස්කෘතිය නිර්මාණය කිරීම, විදේශ රටවල අධ්‍යාපනය සඳහා දේශීය සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීම, ප්‍රාදේශීය පුස්තකාල වැඩිදියුණු කිරීම, යාපනය පුස්තකාලය සංවර්ධනය කිරීම, පෙර පාසල් ගුරුවරුන්ට දීමනා ලබා දීම ඇතුළු අධ්‍යාපනය, ක්‍රීඩා හා යහපත් මානසික මට්ටමකට දියුණු කර ගැනීම කියන කරුණු ගැන හිතලා මුදල් වෙන් කරලා තිබෙනවා.

මේ මුදල් වෙන් කිරීම්වල දිශානතිය පෙන්නුම් කරන්න මම උත්සාහ කරන්නේ හුදෙක්ම සංඛ්‍යාවලින් එහාට ගිය ගුණාත්මක කරුණු කාරණා ගණනාවක් මේ අය වැය ලේඛනය ඇතුළේ තිබෙන නිසායි. ඒ දෙස අපි විශ්ලේෂණාත්මකව බැලීම වැදගත් වෙන නිසායි මේ කාරණා ඉදිරිපත් කරන්නේ.

ඒ වාගේම ආයෝජන ඉතාම වැදගත්. සෘජු විදේශීය ආයෝජන ලංකාවට ඇවිල්ලා නැහැ. සෘජු විදේශීය ආයෝජන ලංකාවට නොඒම පිළිබඳ හේතු කාරණා ඇතුළේ විශේෂයෙන්ම වංචා, දූෂණ, පගා, කොමිස් ඉල්ලීම කාරණා විධියට තිබුණු බව ඇත්ත. අපි ඒවා දැනටම අයින් කරලා තිබෙනවා. ඒත් එක්කම, ආයෝජකයන්ට යම් විශ්වාසයක් වෙළඳපොළ තුළ ගොඩනැගෙන්න ඕනෑ. ඒ සඳහා හොඳ බදු ප්‍රතිපත්තියක්, ස්ථාවර බදු ප්‍රතිපත්තියක්, මූල්‍ය වෙළඳපොළේ ස්ථාවරත්වයක්, විදේශ විනිමයේ ස්ථාවරත්වයක් කියන ඒ කාරණා පිළිබඳව වැඩකටයුතු කරන්න මැදිහත්වීමක් කරන්න වෙනවා. ඒ වාගේම මේ ආයෝජන කැන්දනකොට ඔවුන්ගේ ව්‍යාපාර පහසුව ඇති කර ගැනීම, ආයෝජනවල ආරක්ෂාව සහතිකවීම ආදියත් වැදගත් වෙනවා. එපමණක් නොවෙයි, රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමත්, දේශීය නිෂ්පාදනය දියුණු කිරීමත් කියන කාරණාවලදී නීති රීති, අණපනත් අලුතින් ගෙන ඒමත්, සංශෝධනය කිරීමත් කරන්නට වෙනවා. ඒ සඳහා මේ අය වැය ලේඛනය ඇතුළේ යෝජනා කරලා තිබෙනවා, -සමහර ඒවාට මුදල් ප්‍රතිපාදන සහිතවත්, සමහර ඒවාට මුදල් ප්‍රතිපාදන නැතුවත්- ප්‍රධාන අණපනත් 11ක් අලුතින් ඉදිරිපත් කිරීම හෝ යම් සංශෝධනවලට ලක් කිරීමට. එහිදී විශේෂ වෙනවා, රාජ්‍ය ආයතන අතර තොරතුරු හුවමාරු කිරීමේ පනත. දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ අනෙකුත් දේපළ ඒක රාශි වෙන තැන් අතර තොරතුරු හුවමාරු වෙන්නේ නැහැ. ඒවාට නීතිමය වශයෙන් බාධා තිබෙනවා. අන්න ඒ බාධා අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන අතර තොරතුරු හුවමාරු කිරීම පිළිබඳ පනතක් යෝජනා වෙලා තිබෙනවා. ඒ වාගේම ආයෝජන ආරක්ෂණ පනතක් යෝජනා වෙලා තිබෙනවා. රාජ්‍ය ව්‍යාපාර ව්‍යවසාය කළමනාකරණ පනත, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ආයෝජන කළමනාකරණ පනත, ඒ වාගේම නව ආයෝජන කැන්දවීමේ පසුබිමක් විධියට සංඛ්‍යාලේඛන පනත, තක්සේරු පනත, රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත, රාජ්‍ය ප්‍රසම්පාදන නීතිය, ක්ෂුද්‍ර මූල්‍ය ණය සහ මුදල් විශුද්ධිකරණයට එරෙහි වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම යන කරුණු සම්බන්ධයෙන් අපි විශේෂ වැඩසටහනකට යොමු වෙමින්

[ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඉන්නවා. විශේෂයෙන්ම මේ සඳහා යොමු කරලා තිබෙන කාර්ය සාධක බලකායට ලංකාවේ රාජ්‍ය ආයතන -සම්බන්ධ වෙන සියලු කණ්ඩායම්- එකට එකතු කරගෙන වේගවත් වැඩ පිළිවෙළක් සඳහා කාල රාමුවක් ඇතුළේ වැඩ කරනවා. මමත් එහි සාමාජිකයකු විධියට වැඩකටයුතු කරනවා. මූල්‍ය විශුද්ධකරණය කියන රාමුවේ දැනට අපි ඉන්නේ Grey List එකේ. 2026 වසර මැද වෙනකොට එතැනින් එළියට ඒමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. ඒ වාගේම ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරි පනත ගෙන ඒමත්, 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත සංශෝධනය කිරීමටත් මේ යටතේ අපි බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම සමහර විට අපට චෝදනා මුඛයෙන් කියන්න පුළුවන්, මේ අය වැය තුළින් මුදල් බෙදා හැරීම්, මුදල් ලබාදීම් සිද්ධ කරනවා කියලා. ඒ වාගේම සමාජ සුබසාධනය සඳහා වැඩිපුර කටයුතු කරනවා කියලා. ඇත්තටම ගත්තොත්, මෙහිදී විවිධ වූ සමාජ සුබසාධන වැඩසටහන් සහ දැනටමත් පවත්වාගෙන එන අස්වැසුම් සුබසාධන වැඩසටහන විශේෂයි. ඒවාට යම් මුදලක් වැඩි කළේ විශේෂ වූ හේතුවක් නිසා. එකක් තමයි අපට තිබිච්ච අභියෝග.

පළමුවෙනි අභියෝගය වුණේ මේ රට නිවැරදි තැනකට ගෙනියන්න රට ඇතුළේ මූල්‍ය පද්ධතිය, ආර්ථිකය, විදේශීය අංශය ස්ථාවර කර ගැනීමයි. ඒ සඳහා වැඩකටයුතු සිද්ධ වෙමින් තිබෙනවා. හැබැයි, අනෙක් පැත්තෙන් ගත්තොත්, මේ රටේ සමස්ත ජනගහනයෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයක් දුප්පත්භාවයෙන් මිරිකිලා ජීවත් වෙන්න බැරුව ඉන්නේ. ඒ නිසා ඔවුන් සමාජයීය වශයෙන් බලගැන්වීමත්, ඔවුන්ට යම් ආර්ථික ශක්තියක් ලබා දීමත්, ක්‍රමිකව ඔවුන් සවිබලගන්වමින් ආර්ථික ක්‍රියාවලියට ගෙන එන්න නම් තෝරා ගත්ත ඉලක්කගත ආකාරයකට සමාජ සුබසාධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. අන්න ඒ සමාජ සුබසාධන වැඩ පිළිවෙළ යටතේ තමයි සමස්තයක් වශයෙන් ගත්තාම, -විවිධ වූ වැඩසටහන් ඇතුළේ- රුපියල් බිලියන 749ක් වෙන් කරලා තිබෙන්නේ. නව වියදම් යෝජනා යටතේ විශේෂයෙන් අනාථභාවයට, අසරණභාවයට පත් වෙලා ඉන්න දරුවන් රැකබලා ගැනීම, ළමා නිවාසවල ඉන්න දරුවන්ගේ, අනුමත රැඳවුම් නිවාසවල ඉන්න දරුවන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම, අතිරේක පහසුකම් ලබාදීම කියන කාරණා පිළිබඳත් අපි අවධානය යොමු කරලා තිබෙනවා. විශේෂයෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමට අවධානය යොමු වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ද මේ සමාජයේ මනුෂ්‍යයෝ; පුරවැසියෝ;කොටස්කරුවෝ.

අපේ පරමාර්ථය වන්නේ හුදෙක් ඔවුන් පුනරුත්ථාපනය කරලා නැවතත් වැරදිවලට නොපෙළඹීමට ඉඩ ප්‍රස්ථා සලසනවා වෙනුවට, එතැනින් එහාට එලදායී දෙයකට, ආර්ථිකයට ඔවුන් ඒකාබද්ධ කර ගැනීමයි. ඒ වාගේම විවිධ වැරදිවලට හසුවෙලා හිරේ විලංගුවේ වැටිලා නිදහස්වෙලා එන අයත් නැවත නැවත සිරගතවීමේ තත්ත්වයක් ලංකාවේ තිබෙනවා. ඒ අයත් මේ රටේ මිනිස්සු. ඒ අයත් ආර්ථිකයට එලදායී ලෙස සම්බන්ධ කර ගන්න නම් ඒ අයගේ හැකියාව දක්ෂතාව දියුණු කරන්න ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරලා අවශ්‍ය පුහුණුව ලබා දෙන්න ඕනෑ. ඒ සඳහා වන වැඩ පිළිවෙළකුත් අපි යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම ආබාධිත අය හඳුනා ගැනීම, ඔවුන්ට අවශ්‍ය උපකරණ ලබාදීම සම්බන්ධයෙනුත් විශේෂ මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. ඒ අනුව නව වියදම් යෝජනා යටතේ, මම කලින් සඳහන් කළ වියදම් යෝජනා 54 යටතේ මේ කාරණා සඳහා රුපියල් මිලියන 7,450ක් වෙන් වෙනවා. ඒ වාගේම අපේ රටේ තිබෙන මේ දුප්පත්කම පිටුදැකීම කියන කාරණයේදී දුප්පත්කම ආර්ථිකයට, ආදායමට විතරක් සීමා වෙන්නේ නැහැ, අනෙක් හැම තැනකටම ගලාගෙන යනවා. එතැනදී වාසස්ථානයක්, ජීවත් වෙන්න පුළුවන් නිවසක් නොමැතිකම විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ සඳහා විශේෂ අවධානය යොමු කරලා කලින් පැවැති ව්‍යාපෘතිත් සහිතව, නව ව්‍යාපෘතිත් සහිතව 2025 වසරේදී නිවාස අලුත්වැඩියා කිරීම, නව නිවාස සකස් කිරීම සහ නිවාස සංවර්ධනය සඳහා පමණක් රුපියල් මිලියන 37,000ක ප්‍රතිපාදනයක් -රුපියල් බිලියන 37ක්- වෙන්කර තිබෙනවා. මේ ආකාරයට මේ අය වැය පුරාවට මේ වියදම් යෝජනා ඉදිරිපත් කරලා තිබෙන්නේ, හුදෙක් මුදල් වෙන් කිරීමේ තනි තනි කාරණාවලට එහා ගිය සමස්ත වැඩ පිළිවෙළක් වෙනුවෙන්. ඒ නිසා මම විශේෂයෙන්ම විපක්ෂයට යෝජනා කරනවා, මේ අය වැය ඇතුළේ පෙනෙන සංඛ්‍යාලේඛනවලින් එහාට -ඔබ්බට- දකින්න කියලා. සියලු දේ සංඛ්‍යාලේඛනවලින් මනින්න බැහැ. අපි සමහර වෙලාවට හුරු පුරුදු වෙලා ඉන්නවා පරිසරය, සමාජය දකින්න. ගස් කොළන්වල වට අඩි ප්‍රමාණය දකින්න; පරිසරයේ තිබෙන ගල් කඩලා කියුබ්වලට පරිවර්තනය කරලා රුපියල් සතවලට පරිවර්තනය කරන්න මිනිස්සු පුරුදු වෙලා සිටියා. නමුත් මේ අය වැය ඇතුළේ රුපියල් සතවලින් එහාට ගිහිල්ලා දකින්න පුරුදු වෙන්න කියලා කියනවා. මොකද, මේක ඇතුළේ ජීවිතය තිබෙනවා.

ඒ වාගේම විශේෂ චෝදනාවක් ආවා, මේ අය වැය ඇතුළේ අපි ආදායම් එකතු කර ගන්නකොට අලුතින් බදු පැනෙව්වාය කියලා. අපි විශේෂ බදු පැනවීමක් කළේ නැහැ. පසුගිය අවුරුදු තුන ඇතුළත පළමුවැනි වතාවට තමයි ලංකාවේ වැට් බදු වැඩි නොකර තිබෙන්නේ. ඒ කියන්නේ මේ කාලයේදී තමයි අවුරුදු තුනක් යනකල්ම වැට් බදු වැඩි නොකර තිබිලා තිබෙන්නේ. අපි මෙවරත් සමත් වෙනවා, කිසිම වැට් බද්දක් වැඩි නොකරන්න. ඒ වෙනුවට වැට් බදු සහනයක් ලබා දෙන්නත්, ඒ වාගේම ආදායම් බදුවලට විශේෂ සහනයක් ලබා දෙන්නත් යෝජනා කරලා තිබෙනවා. ආදායම් බදු එකතු කර ගැනීමේ කාර්යක්ෂමතාව වැඩිකර ගන්නත්, අනෙකුත් කටයුතු සිද්ධ කරන්නත් යෝජනා කරලා තිබෙනවා. වැරදි අදහසක් විපක්ෂයෙන් මතු වුණා, බදු අඩු කරන්න අපි යෝජනා කළා කියලා. නැහැ, සමාජ මාධ්‍ය විසින් අපි ඉදිරිපත් කරපු අදහසක් වැරදි විධියට අර්ථකථනය කිරීමෙන් තමයි එවැනි දෙයක් සිද්ධ වුණේ. එහෙම යටින් හංගලා බදු අඩු කරන්න හෝ වැඩි කරන්න යෝජනාවක් නැහැ. මේ අපි ඉදිරිපත් කරලා තිබෙන තිරසර ආකාරයෙන් ආදායම් බදු අය කර ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ සමාජයේ සිටින විද්වත් බුද්ධිමත් අයට, මේ අය වැය විශ්ලේෂණාත්මකව දකින්න කියලා මම යෝජනා කරනවා. අර අරගෙන ආපු පැරණි පාර බණ්ඩනය කරන, බණ්ඩනය කරලා නව දිශාවකට ජීවිතය කැන්දන අය වැය ලේඛනයක් විධියට මේ අය වැය විශ්ලේෂණය කරලා දකින්න. විශ්වවිද්‍යාලවල සිටින දරුවන්ට, අනෙකුත් පර්යේෂකයන්ට මම යෝජනා කරනවා, මේ අය වැය දකින්න, පර්යේෂණ කරන්න කියලා. මේ අය වැය ඇතුළේ රාජ්‍ය මූල්‍ය හරියට කළමනාකරණය කරන්නේ, ඒ සඳහා වග වෙන්නේ, රටට සංවර්ධනය කැන්දන්නේ, තිරසර සංවර්ධනය කැන්දන්නේ කොහොමද කියලා පර්යේෂණ කරන්න කියලා මම යෝජනා කරනවා. විශේෂයෙන්ම සංඛ්‍යාලේඛනවලින් ඔබ්බට ගිහිල්ලා මේ ඇතුළේ තිබෙන සමස්ත ජීවිතය, මේ සංවර්ධනය කරන ජීවිතය දකින්න ඇස් කවුළු විවර කරන්න කියලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් මම යෝජනා කරනවා. එහෙම කළොත් මේ අය වැයට විරුද්ධ වෙන්න කිසි කෙනෙකුට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා. මේ අය වැයට සෑම කෙනෙකුගේම සහයෝගය අපේක්ෂා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.53]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේග රජයේ, නැත්නම් ජනතා විමුක්ති පෙරමුණේ මංගල අය වැය කියන්නේ ජනාධිපතිවරණයේදීත්, ජනාධිපතිවරණයට කලිනුත් එතුමන්ලා ජනතාව අන්දන්න, මුළා කරන්න කියපු බොරු ටික එළිවෙන අය වැයක්. ණය අරගෙන රට පාලනය කරන්න ආණ්ඩු මොකටද කියලා පහුගිය කාලයේ මෙතුමන්ලා ඇහුවා. හැබැයි මේ අය වැයේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනා අනුව රුපියල් බිලියන 2,200ක අය වැය පරතරයක් තිබෙනවා. ඒක පියවාගන්න හදන්නේ විදේශීය වශයෙන් රුපියල් බිලියන 75කුත්, දේශීය වශයෙන් රුපියල් බිලියන 2,125කුත් ණය අරගෙන. ඒ කියන්නේ මේ අවුරුද්දේ ඩොලර් බිලියන 7.3ක් ණය ගන්න හදනවා. ලංකාවේ සමස්ත ණය මේ අවුරුදු 76ටම තිබෙන්නේ ඩොලර් බිලියන 95යි.

ඊළඟට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකතු වෙලා ඔක්කෝම ණය ප්‍රතිව්‍යුහගත කරලා, ණය ගෙවන්න ඕනෑ නැහැ කියලා කිව්වා. පට්ටපල් බොරු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ණය වාරික ගෙවන්න මේ අය වැයෙන් රුපියල් බිලියන 2,950ක් වෙන් කරලා තිබෙනවා. මොකද, මේ ඩොලර් බිලියන 95න්, ඩොලර් බිලියන 12.5යි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තිබෙන්නේ. ඒකේ ණය පොලිය ගෙවන්න ඕනෑ ප්‍රාග්ධනය තමයි 2028 වෙනකම් ගෙවන්න වෙන්නේ නැත්තේ. ඉතුරු සියලු ණයවල පොලිය සහ ප්‍රාග්ධනය කියන දෙකම අඛණ්ඩව ගෙවන්න සිද්ධ වෙනවා. අලුතින් රුපියල් බිලියන 889ක ආදායමක් හොයනවා කියලා තිබෙනවා. හැබැයි හොයන විධිය නැහැ, ඒක එන විධිය නැහැ. බලාපොරොත්තු වෙන ආදායම රුපියල් බිලියන 4,990යි. ඒකෙන් රුපියල් බිලියන 4,590ක්ම බදුවලින් තමයි අය කරගන්නේ. අපේක්ෂිත බදු ආදායම සියයට 100ක් ඒ ආකාරයට ලැබෙන්නේ නැහැ කියලා අපි දන්නවා. මේ වියදම් ටික ඒ විධියටම කළා නම් අර රුපියල් බිලියන 2,200 නැත්නම් ඩොලර් බිලියන 7.3ටත් වැඩිය මේ ආණ්ඩුවට ණය ගන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් මේ කියලා තිබෙන සුබසාධන වියදම් රුපියල් බිලියන 1,290න් හෝ සංවර්ධන කටයුතු සඳහා වෙන් කරලා තිබෙන රුපියල් බිලියන 1,315න් අනිවාර්යයෙන්ම අඩුවෙන් තමයි වියදම් කරන්න වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇන්දිල්ලේ පළමුවැනි එක දැන් මම කියන්නම්. ඇන්දිල්ලේ පළමුවැනි එක මෙයයි. ගිය අවුරුද්දේ උද්ඝෝෂණය කළා. රාජ්‍ය සේවකයන්ට රුපියල් 20,000ක වැටුප් වැඩිවීමක් ඕනෑය කියලා කියපු කට්ටිය එදා මෙතැනට ඇවිල්ලා මෙහෙම කිව්වා. හරියට තුන් තේරවිල්ලක් වාගෙයි, ජනාධිපතිතුමා ඒක කිව්වේ. අවම වැටුප රුපියල් 15,750කින් වැඩි කරනවා කියලා කිව්වාම, අන්න ලබන අප්‍රේල් මාසයේ 08වැනි දා ඉඳලා ඔවුන්ගේ වැටුප රුපියල් 15,750කින් වැඩි වෙයි කියලා රාජ්‍ය සේවකයෝ ඔක්කෝම එදා දවල් හිතුවා. හවස් වෙනකොට, රෑ වෙනකොට තමයි දන්නේ මේකට වැඩේ දීලා තිබෙන්නේ කියලා. වැඩේ දීලා තිබෙන්නේ කොහොමද? දැනට allowances විධියට හම්බ වෙන රුපියල් 2,500කටයි, රුපියල් 5,000කටයි "ෂොට්" එක දීලා. එතකොට ඒ රුපියල් 15,750න් රුපියල් 7,500 අඩු වුණාම රුපියල් 8,250යි වැඩිවෙන්නේ. ඒ රුපියල් 8,250 වැඩි වෙන්නේත් අවුරුදු තුනකින්. මේ අවුරුද්දේ කලින් රජයෙන් යෝජනා කරලා තිබුණු රුපියල් 5,000යි, රුපියල් 8,250න් ඉතුරු රුපියල් 3,250 තුනෙන් බෙදුවාම එන රුපියල් 975යි තමයි වැඩිවෙන්නේ. ඒ කියන්නේ රුපියල් 5,975යි. තැපෑලෙන් ඡන්දය දුන් කට්ටියට අට වැනිදාට තැපෑලෙන් තේරේවි, මේ මොකක්ද වුණේ කියලා. මේ තුන් තේරවිල්ලෙන් කොහොම ඇන්දිල්ලක්ද ඇන්දුවේ කියලා තේරේවි.

අද වෛද්‍යවරු උද්ඝෝෂණය කරන්න හදනවා. අද වෘත්තිකයන් ඔක්කෝම තමන් අන්දපු බව, ඇන්දිච්ච බව, රැවටිච්ච බව තේරුම්ගෙන තිබෙනවා. මෙන්න මේ වාගේ රවටිටන එකට තමයි ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියලා කියන්නේ කියන එක තමයි මට නම් කියන්න තිබෙන්නේ.

ඊළඟට, මාස හයෙන් හයට වැටුප් සමාලෝචනය කරන්න ඕනෑ කියලා කියපු කට්ටිය ඔන්න අවුරුදු තුනකටම වැටුප රුපියල් 8,250ක් දීලා "සීල්" කරලා තිබෙනවා ආයේ කට අරින්න එපා කියලා. රැවටිච්ච සියයට 70ක රාජ්‍ය සේවකයා ගැන මට නම් කනගාටුවක් තමයි තිබෙන්නේ. හැබැයි අපි ඔවුන්ට උසුළු-විසුළු කරන්න යන්නේ නැහැ. මීට පස්සේවත් දෙපාරක් හිතන්න කියලා තමයි අපට කියන්න තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැඩි කරපු රුපියල් 8,250 දෙනවා නම් රුපියල් බිලියන 300ක් ඕනෑ. රුපියල් බිලියන 300ක් සඳහා වාර්ෂිකව උපයන විට ආදායම් බද්දෙන් රජය ලබන ආදායම වාගේ දෙගුණයක් හොයන්න ඕනෑ. වාර්ෂිකව උපයන විට ආදායම් බද්දෙන් හොයනවා වාගේ දෙගුණයක් ඕනෑ. ඒකෙන් පෙනෙන්නේ මොකක්ද? මේ වැඩේ ක්‍රියාත්මක කරගෙන යද්දි ණය වැඩි වෙනවා, borrowings තව ගන්න වෙනවා, බදු වැඩි වෙනවා. එහෙම කරන්න ගියොත් ආර්ථිකය අස්ථාවර වීම කාටවත් නවත්වන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ඇන්දිල්ලේ අංක දෙක බලමු. මෙතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 66 පිටුවේ තිබෙනවා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා සියයට 5ක වැඩි පොලී ප්‍රතිශතයක් දෙනවා කියලා. මේවාට තමයි මිනිස්සු ඡන්දය දුන්නේ. හැබැයි, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා දීලා තිබෙන්නේ සියයට 3යි. ඇන්දුවා, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්.

ඊළඟට, අංක තුන බලමු. සාමාන්‍ය ජනතාවට මේ අය වැයෙන් ලැබී තිබෙන ප්‍රතිලාභ මොනවාද? රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව අහුවෙන, අහුවෙන හැම එකටම බදු ගහනකොට, මේ රටේ ජනතාවගේ රීරි මාංස උරා බොනවා වාගේ මිරිකලා බදු ගහනකොට ජනතාවට ජීවත් වෙන්න අමාරු මට්ටමකට ආවාට පස්සේ මේගොල්ලන් මොකක්ද කිව්වේ? ඕනෑ නම් මා ළඟ video එක තිබෙනවා, පෙන්වන්න පුළුවන්. විශේෂයෙන්ම ජනාධිපතිතුමා කිව්වා, ජාතික ජන බලවේග ආණ්ඩුවේ පළමුවැනි අය වැයෙන් ආහාර, අධ්‍යාපනය, සෞඛ්‍යය කියන ක්ෂේත්‍ර තුනට අදාළව තිබෙන බදු අයින් කරනවා කියලා. මම ඊයේත් එතුමාගේ කථාව නැවත බැලුවා. ඒ කථාවේදී එතුමා කියනවා, කන්න ගියාමත් බදු ගහනවා, ලෙඩ වෙලා ඉස්පිරිතාලෙට ගියාමත් බදු ගහනවා, දරුවෙකු ඉගෙන ගන්න එකටත් බදු ගහනවා, ඒ නිසා එතුමන්ලාගේ ආණ්ඩුවේ පළමුවැනි අය වැයෙන්ම ඒ බදු අඩු කරනවා, ඒ බදු බින්දුවක් කරනවා කියලා. නමුත්, ඒ එකක්වත් කරලා නැහැ. ඔන්න මිනිස්සුන්ට කොකා පෙන්නපු හැටි! YouTube බලපු කාන්තාවෝ, TikTok බලපු තරුණ කාන්තාවෝ කෑම බීමවල මිල, තෙල් මිල, වතුර බිල, විදුලි බිල අඩු වෙලා මේ තත්ත්වය හරි යයි කියලා හිතලා තමයි ඡන්දය දුන්නේ. අන්න, ඒ අයටත් කොකා පෙන්නලා තිබෙනවා.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1950 වසරේ යුනෙස්කෝ එකේ "ෆ්ලෝරන්ස් ගිව්සුම" අනුව අපි පොත් පත් සඳහා අමු ද්‍රව්‍ය ආනයනයේදී බදු ගෙවන්න ඕනෑ නැහැ. නමුත්, මේ මොහොතේදී අපට ශ්‍රමය හැර නිෂ්පාදනය කිරීමට ගෙන්වන සියල්ල සඳහා බදු ගෙවන්න ඕනෑ. එකපාරක් නොවෙයි, දෙපාරක් බදු ගෙවන්න වෙලා තිබෙනවා. අමු ද්‍රව්‍ය ආනයනය කරද්දී සියයට 33.045ක් බදු ගෙවන්න ඕනෑ. ඊට පස්සේ නිෂ්පාදනය කරලා විකුණනකොට සියයට 18ක් VAT විධියට ගෙවන්න ඕනෑ. ජනාධිපතිතුමා, JVP එකේ මේ මන්ත්‍රීවරුන් එදා වේදිකාවල කිව්වේ, මේ බදු ඔක්කෝම අයින් කරනවා කියලායි. විශේෂයෙන්ම ඒගොල්ලන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පරිච්ඡේද ගණනාවක ඒක වෙන් වෙන් වශයෙන් සඳහන් කර තිබෙනවා. මට දැන් ඒ ඔක්කෝම කියවන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2023දී පැවති අය වැය විවාදයේදී මේ ජනාධිපතිතුමා කියපු කථා ටිකක් තිබෙනවා. මේ අය වැය රනිල් වික්‍රමසිංහගේ අය වැයක් කියලා අපි කිව්වාම පිළිගන්නේ නැහැ නේ. ඔන්න, මම ඒක ඔප්පු කරලා පෙන්වන්නම්. 2023.11.20වැනි දා අය වැය විවාදය අවස්ථාවේ කථාවක් කරමින් අනුර කුමාර දිසානායක මහත්මයා කියා තිබෙනවා, "රක්ෂණ සංස්ථාවේ ලාභය මිලියන 19,451යි. අවශ්‍ය නම් ආණ්ඩුවට නීති සම්පාදනය කරන්න පුළුවන්, මෙය රජය සතු සමාගමක්, මිලියන 19,451ක් ලාභ ලබනවා, ඒකෙන් සියයට 50ක් භාණ්ඩාගාරයට දෙන්න, සියයට 50ක් ආයතනය දියුණු කිරීමට යොදවන්න" කියලා. ඊට පස්සේ එතුමා ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම පිළිබඳවත් සඳහන් කර තිබෙනවා. මේ ඔක්කෝම විකුණනවා කියලා තමයි කිව්වේ. දැන් මේවා විකුණන්නේ අලුත් විධියකට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සඳහා සිංහල ශබ්දකෝෂයේ තිබෙන වචන අලුතින් ඇඳලා තිබෙනවා. වරාය පර්යන්තය විකුණනවාට කියන්නේ "අභිලාෂ කැඳවීම" කියලා. හරිද? රනිල් වික්‍රමසිංහ නම් ඒකට කිව්වේ EoIs - Expressions of Interest - කියලායි. එතුමා අමුවෙන් කිව්වා. මෙගොල්ලන් වටේ ගහලා තමයි මේවා විකුණන්නේ. ඊළඟට, පාඩු ලබන සමාගම් කොටස් වෙළෙඳ පොළ තුළ ලැයිස්තුගත කරනවා කිව්වා. ඒවා ලැයිස්තුගත කරන්නේ document කරන්නද? විකුණන්නයි ලැයිස්තුගත කරන්නේ. වෙන මොකටද? ඒක කලින්ම කිව්වා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. මේක චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාට තේරෙනවා. මහින්ද සිරිවර්ධනටයි, මහ බැංකු අධිපතිටයි බැණලා Facebook notes දමපු නිසා, හද්ද නෝන්ඩ් වෙලා දැන් මොකක්ද එක හිර වුණා වාගේ ඉන්නවා. ඒකට අපට කරන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තාවන් සහ ළමුන් සඳහා වෙන් කළ මුදල් ගැන කිඹුල් කඳුළු හෙළපු අය ඉන්නවා. හැන්සාඩ් වාර්තාවේ මේවා තිබෙනවා. මේවා කියවන්න ගියොත් මගේ කාලය නාස්ති වෙනවා. 2021.11.16වන දින ගරු අගමැතිතුමිය අය වැය විවාදයට එක් වෙමින් කාන්තා සහ ළමා කටයුතු සඳහා අවුරුද්දෙන් අවුරුද්ද අඩු කළ මුදල කොච්චරක්ද කියලා analyze කර පෙන්වා තිබෙනවා. මම කියනවා, ගිය අවුරුද්දේ අය වැයෙන් කාන්තා සහ ළමා කටයුතු සඳහා රුපියල් මිලියන 19,723ක් වෙන් කර තිබුණු බව. එක මිටට කාන්තාවෝ රොද බැඳගෙන ගිහිල්ලා බලයට ගෙනාපු මේ උදව්ය, රුපියල් මිලියන 19,723ක් වෙන් කර තිබුණු එක රුපියල් මිලියන දහහතර දහස් ගණනක් දක්වා අඩු කර තිබෙනවා. ඒක රුපියල් මිලියන පන්දහස් ගණනක අඩුවීමක්.

මේ රටේ කාන්තාවන්ගෙන් සියයට 70ක් ඡන්දය දුන්නේ ඔබතුමන්ලාට. අන්න ඒ කාන්තාවන්ටයි, ළමා පරපුරටයි දැන් කොකා පෙන්වා තිබෙනවා. මේ එකක්වත් මම කියන දේවල් නොවෙයි, අනුර කුමාර දිසානායක මුදල් ඇමතිතුමා, එතුමාගේ අය වැයේ සඳහන් කර තිබෙන දේවල්. ඊළඟට, ඉඩම් සම්බන්ධවත් මම කියන්නම්.

රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් කළ 2024 අය වැය කථාවේ පිටු අංක 36හි මෙසේ සඳහන් වනවා:

> "... ආර්ථික සංවර්ධනය සඳහා ඉඩම් උපරිම ප්‍රයෝජනයට ගැනීම සඳහා රජය විසින් නව ආයතනික වෙනස්කම් සමඟ නව ඉඩම් නීතියක් හඳුන්වා දෙනවා."

අනුර කුමාර දිසානායක මහතා ඉදිරිපත් කළ 2025 අය වැය කථාවේ පිටු අංක 23හි මෙසේ සඳහන් වනවා:

> ".. ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන එම ඉඩම්වල යෝග්‍යතාවය පිළිබඳ සැලකිල්ලට ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ඇතුළත් පුද්ගලික ආයෝජන සඳහා යොමු කිරීමට කටයුතු කරනවා."

මේ දෙකෙන්ම කියන්නේ මොකක්ද? දෙකෙන්ම කියන්නේ "විකුණනවා" කියන එක. රනිල් වික්‍රමසිංහ අමුවෙන් විකුණනකොට, ඔබතුමන්ලා නොයෙක් වචන දාලා වටෙන් ගිහිල්ලා විකුණනවා. මේ දෙකේම තිබෙන්නේ "විකිණීම". මේ අය වැය ලේඛන දෙක තුළ මම මේ විධියට සංසන්දනය කරපු දේවල් පෝලිමක් තිබෙනවා. ඒවා කියවන්න වෙලාව යන නිසා මම ඒ ඔක්කෝම කියවන්නේ නැහැ. කොහොම වුණත් මම තව එකක් කියවන්නම්. නැත්නම් මදි වාගේ, නේද?

රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත ගැන රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් කළ 2024 අය වැය කථාවේ පිටු අංක 36හි මෙසේ සඳහන් වනවා:

> "... රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ නීතිය දැනටමත් අවසන් කර ඇති අතර ඒවා දෙසැම්බර් මාසයේ හෝ 2024 පළමු කාර්තුව තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතයි"

දැන් ඒකම මේ අය වැයේ කියන්නේ කොහොමද? 2025 අය වැය ලේඛනයේ පිටු අංක 97හි එය මෙසේ සඳහන් වනවා:

> "The Government intends to introduce new legislation for non-financial asset management to ensure the effective utilization, proper maintenance, and optimal value extraction of those properties."

මේ අය වැය වාමාංශික රන් ආලේපිත අන්ත දක්ෂිණාංශික අය වැයක් කියලා අපි කියන්නේ මේ නිසායි. මේක වාමාංශික රන් ආලේප කරපු, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියලා ගරු ලාල් කාන්ත ඇමතිතුමා -ලාල් කාන්ත ඇමතිවරයා මම හරිම කැමැති ඇමතිවරයෙක්- හොඳ කථාවක් කරලා, මාතෘකාව පොඩ්ඩක් අනෙක් පැත්තට ගෙනිච්චා. මොකද, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය කියන වචනය අලුත් නේ. පරිණතභාවයෙන්, අත්දැකීමෙන් එතුමා ජනතාවගේ අවධානය අනික් පැත්තට ගෙනිච්චා. හැබැයි, තිබෙන්නේ අන්ත ලිබරල්වාදය. විජේවීර මහත්මයා ඉන්න තැනක ඉඳගෙන මේ ගැන මොනවා කියනවාද කියලා මම දන්නේ නැහැ. මේ විධියටම ආයෝජන නීතිය වාගේ දේවල් සම්බන්ධයෙනුත් මට ගොඩක් දේවල් කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන කථා කරන මෙතුමන්ලා ඔක්කෝම කියන්නේ, අවුරුදු 76ක ශාපය කියලා නේ. මම අහනවා, 1981දී වාහන එකලස් කරන සමාගම් පිහිටුවන්න ජපාන ආයෝජකයෝ ලංකාවට එනකොට උද්ඝෝෂණය කරලා එළෙව්වේ මේ අවුරුදු 76දී නොවෙයිද

කියලා. එතකොට ඒකෙන් වෙච්ච පාඩුව කෝටි ගණනක්. ඒක වුණේ මේ අවුරුදු 76දී නොවෙයිද? ඊළඟට, 2001දී "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩසටහන ගේනකොට කෝටි 45,000ක ආයෝජන ලංකාවට ආවා. රවී කරුණානායක මැතිතුමාට ඒක මතක ඇති. පාඩු ලබන සමාගම් ප්‍රතිව්‍යුහගත කරන්න කෝටි 45,000ක ආයෝජන ලංකාවට ආවා. එදා ඒ පාඩු ලබන සමාගම් ප්‍රතිව්‍යුහගත කරලා ලාභ ලබන සමාගම් බවට පත් කරලා තිබුණා නම්, අවුරුදු 25ක් තිස්සේ මෙච්චර පාඩුවක් අපේ රටට දරාගන්න වෙන්නේ නැහැ. ඒ වාගේම මෙච්චර ණය ප්‍රමාණයක් ගන්න වෙන්නේත් නැහැ. අද අවුරුදු විස්සේ, විසිපහේ තරුණ තරුණියෝ දන්නේ නැහැ, ඔවුන් ඉපදෙනකොටම මේ ප්‍රචණ්ඩ වැඩ වර්ජනවලින්, උද්ඝෝෂණ මාලාවලින් ඔවුන්ගේ අනාගතය මරලා දැම්මේ ජනතා විමුක්ති පෙරමුණේ අය කියලා. ඒවා වුණේ, පසුගිය අවුරුදු 76දී නොවෙයිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව එක කාරණයක් කියන්න ඕනෑ. නිදහස් වෙළෙඳ කලාප හදනකොට විජේවීර මහත්මයා කිව්වා, "මෙවා තුළින් අපේ භූමිය අධිරාජ්‍යවාදීන්ට කීතු කීතු කරලා කඩලා දෙනවා, ජනතා විමුක්ති පෙරමුණු ආණ්ඩුවක් ආපු දවසක ශත පහක වන්දියක් ගෙවන්නේ නැතුව අපි මේ ඔක්කෝම අත්පත් කර ගන්නවා" කියලා. එතකොට මොන ආයෝජකයෝද මෙහේට එන්නේ? ඒක වුණේ මේ අවුරුදු 76දී නොවෙයිද? ඒ වාගේම තමයි, ඇල්ල-වැල්ලවාය පාර හදනකොට කිව්වා, "මේ පාර හදන්නේ ඇමෙරිකන්කාරයන්ගේ planes බාන්න කියලා. මම ඒ කථාව ඒ කටහඬින්ම අහලා තිබෙනවා. එදා ඇල්ල-වැල්ලවාය මාර්ගය හදපු හින්දා නොවෙයිද, ඇල්ල ප්‍රදේශය අද සංචාරක මර්මස්ථානයක් බවට පත්වෙලා තිබෙන්නේ? *[බාධා කිරීමක්]* මොකුත්ම කියන්න බැහැ, නිකම් කෑ ගහනවා.

ඇහලුම් කර්මාන්තශාලා හදනකොට කිව්වා, අන්න අපේ තරුණියෝ දාලා සුද්දියන්ට ජංගි මහන්න හදනවා කියලා. එදා එහෙමයි කිව්වේ. එහෙම කියලා ඒකත් නවත්වන්න හැදුවා. හැබැයි, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාට කොන්දක් තිබුණා, භය නැතුව ඒ වැඩේ කරන්න. එදා එතුමා ඒ වැඩේ කරපු හින්දා අද තේ, පොල්, රබර්වලින් නොවෙයි ලංකාවට වැඩිම අපනයන ආදායම එන්නේ. අද වැඩිම අපනයන ආදායම එන්නේ ඇහලුම් කර්මාන්තයෙන්. එදා රණසිංහ ප්‍රේමදාස භය වුණා නම් අපේ රට බංකොලොත් වෙන්නේ 2022දී නොවෙයි, ඊට බොහෝ කාලයකට කලින්.

ඊළඟට, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 2001 ආණ්ඩු කාලයේ ඉන්දියාවට ලබා දෙන්න හදනකොට කිව්වා, ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියලා. එදා ඒක ඉන්දියාවට දෙන්න ගියේ, නිකම් තිබෙන එකෙන් ලාභ ලබන්න, ආදායමක් ලබන්න. ඒක ඉන්දියාවට දුන්නා නම් එදා LTTE එකට ඒවාට ගහන්න බැහැ. ඒක තේරෙන්නේ නැතිව ජනතාව කුපිත කරලා ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියපු කට්ටිය ඔන්න දැන් ඉන්දියාවත් එක්ක තෙල් බටයක් දාන්නත් agree වෙලා තිබෙනවා.

පසුගිය මැතිවරණ වේදිකාවල ජනාධිපතිතුමා මොනවාද කිව්වේ? මේ තෙල් ටැංකි 69 භාවිත කරලා කලාපයේ තෙල් අපනයනය කරන කේන්ද්‍රස්ථානයක් බවට පත් කරනවා කිව්වා, රාජ්‍ය -පෞද්ගලික හවුල්කාරිත්වයෙන්; තෙල් සංස්ථාවයි, ආයෝජකයෝයි එක්ක. මේක තමයි ලිබරල්වාදය, දක්ෂිණාංශය. මම දන්නේ නැහැ, මේක කොයි මාක්ස්වාදය ද, කොයි වාමාංශික මතය ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Port City එක හදනකොට කිව්වා, ලංකාවේම තිබෙන ගල් මදි, ඒ නිසා සීගිරි පර්වතයත් කඩන්න වෙයි කියලා. දැන් චීනයත් එක්ක ගිවිසුමක් අත්සන් කරන්න හදනවා, Port City එක base කරගෙන ආයෝජන කරන්න. එතකොට මේවා 76 වසර තුළ කරපු ආර්ථික අපරාධ නොවෙයිද? ඊළඟට, අධිවේගී මාර්ග හදනකොට කිව්වා, මහින්ද රාජපක්ෂලා මාළු ඇඹුල්තියල් ගේන්න තමයි මේවා හදන්නේ කියලා. අපි ඒක පැත්තකින් තියමුකෝ. හැබැයි, මේ සභාවේ ඉදිරි පෙළ ඉන්න එක ඇමතිවරයෙක් කිව්වා, වාහනයක යනකොට මල්ලක් දාගෙන යන්න කියලා. මොකක්ද හේතුව? වාහනවල හැප්පෙන සතුන්ගේ දඩ මස් ටික ගන්න පුළුවන් කියලා. එහෙම කිව්වේ අද මේ ඉස්සරහ පේළියේ ඉන්න ඇමතිවරයෙක්. මම එතුමාගේ නම කියන්නේ නැහැ. මොකද, එතුමා නැතිවිටොත් මට කථා කරන්න වෙලාව මදි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව පැත්තේ ඉදිරි පෙළ ආසනයක සිටින තව ඇමතිවරයෙක් Light Rail Transit Project එක එනකොට කිව්වා, අන්න එක පැත්තකට යන්න කෝච්චි පෙට්ටි ටිකක් හදන්න යනවා කියලා. ඒ ටික අනෙක් පැත්තට ගේන්න ලොරියක් ඕනෑ කිව්වා. එහෙම කියපු කට්ටිය තමයි දැන් ආණ්ඩු කරන්නේ. දෙවයේ සරදම කොච්චරද කියනවා නම් දළදා මාළිගාවට බෝම්බ ගහපු කට්ටියටම දැන් සිද්ධ වෙලා තිබෙනවා, දළදා පෙරහැර තියන්න. ඒ දවල්වල ජනාධිපතිතුමා TV interview එකකදී කිව්වා, "මම දළදා මාළිගාවට යද්දී, එහෙම නැත්නම් ශ්‍රී මහා බෝධියට යද්දී මාධ්‍ය අරගෙන යන්නේ නැහැ" කියලා. ඒ වීඩියෝ එක මා ළඟ තිබෙනවා. ඒක බෞද්ධයන්ගේ විශ්වාසය, ඒ නිසා අපි ඒක එහෙම කරන්නේ නැහැ කිව්වා. එහෙම කියපුවා තනිකරම දැන් අනික් පැත්තට තමයි කරන්නේ.

ඊළඟට, රාගම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයටත් වැඩේ දීලා තිබෙන්නේ. ඒ නිසා දොස්තරලා ටික මලයාසියාවට ගියා. ඒ උද්ඝෝෂණ කරපු අයගෙන් අද මම අහනවා, පෞද්ගලික විශ්වවිද්‍යාල ගේනවාද, මාලබේ SAITM එකට දැන් මොකක්ද කරන්නේ කියා. ඒවාට උත්තර කියන්න. මට එක දෙයක් පේනවා. අපටත් වඩා අන්න ලිබරල්වාදී, අන්න දක්ෂිණාංශික කට්ටියක් බලය රැක ගැනීම සඳහා තමන්ගේ ප්‍රතිපත්ති පාවා දීලා, බොරු කියලා රවට්ටලා, අන්දවලා තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට එතුමන්ලා ජනතාවගෙන් ඡන්දය ගන්න කියපු බොරු පොරොන්දු ටික මම කියන්නම්. ඔබතුමන්ලාගේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 31හි මෙසේ සඳහන් වනවා:

> "තරුණ විවාහක පිරිස් සඳහා නව නිවසක් මිලදී ගැනීමට හෝ නිවසක් ඉදිකර ගැනීමට මූල්‍ය පහසුකම් ලබා දෙනවා."

අය වැයේ මොන යෝජනාවේද දන්නේ නැහැ, එහෙම තිබෙන්නේ. මම නම් එහෙම දෙයක් තිබෙනවා දැක්කේ නැහැ.

ඊළඟට, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 31හි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> "රාජ්‍ය නිලධාරීන් සඳහා සේවා ස්ථාන සමීපයේ නිල නිවාස ලබාදීමේ වැඩසටහන්"

වැටුපටත් වැඩේ දීලා, allowance එකටත් වැඩේ දීලා සේවා ස්ථානය ළඟින් නිල නිවාස දෙන්න කථා කරනවා. මම දන්නේ නැහැ, කොහොම රාජ්‍ය සේවකයා ළඟට යන්න හදනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පෞද්ගලික අංශය, විධායක නිලධාරීන් කියන්නේ දෙපැත්තකින් මිරිකෙන කට්ටියක්.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පෞද්ගලික අංශයේ වැඩ කරන අය පඩිපත ගනිද්දීම PAYE Tax එක ගෙවන්න ඕනෑ. ඊළඟට ඉතුරු වෙන මුදලින් බඩු ගන්න කඩේට ගියාම VAT එක ගෙවන්න ඕනෑ. ඒ කට්ටිය ඇන්දුවේ කොහොමද?

ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 103හි මෙසේ සඳහන් වනවා:

"පුද්ගලයින් සඳහා වන වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 12 සිට ලක්ෂ 24 දක්වා වැඩි කිරීමට සහ බදු කාණ්ඩ හා බදු අනුපාත සාධාරණ ලෙස සංශෝධනය කිරීම."

ඒ කියන්නේ මාසකට රුපියල් ලක්ෂ 2ක් දක්වා tax-free කරනවා කිව්වා. දැන් රුපියල් ලක්ෂ එකහමාර කරලා තිබෙන්නේ. මම දන්නේ නැහැ, මෙහෙම කරලා මිනිස්සුන්ට ආපසු මොනවා කියන්නද කියලා. විපක්ෂයේ ඉඳගෙන සමාජ මාධ්‍ය දේශපාලනය කරන්න පුළුවන්. හැබැයි, ආණ්ඩුවේ ඉඳගෙන සමාජ මාධ්‍ය දේශපාලනය හරියන්නේ නැති බව ඊළඟ මැතිවරණය වෙද්දී තේරෙයි කියලා තමයි මට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 103හි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"දේශීයව නිෂ්පාදනය කරන කිරි, බිත්තර ඇතුළු අත්‍යවශ්‍ය ආහාර, ළදරු කිරි, ඖෂධ, පාසල් පොත් හා උපකරණ, සඟරා, පුස්තකාල සේවා, කෘෂි උපකරණ, පොහොර, සූර්ය පැනල සහ උපාංග, පුනර්ජනනීය බලශක්ති ජනන යන්ත්‍ර, ආබාධ සහිත පුද්ගලයන් භාවිත කරන වාහන උපකරණ පරිපථ, පර්යේෂණ හා සංවර්ධන සේවා සඳහා වැට බද්ද බින්දුවේ අනුපාතයට ගෙන ඒම."

කෝ, ඒවා කළාද? මේවාට තමයි ජනතාව ඡන්දය දුන්නේ. කෝ, ඒවා කළාද? ඒ වාගේම සමාජයේ දරිද්‍රතා රේඛාවේ පහළම ඉන්න මිනිස්සු අන්දපු තව දෙයක් මම පෙන්වන්නම්.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 167හි මෙසේ සඳහන් වනවා:

"මාසික විදුලි පරිභෝජනය ඒකක 60ට අඩු ගෘහස්ථ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නව විදුලි සබඳතා ලබා ගැනීමට හෝ විසන්ධි කර සබඳතා යළි ලබා ගැනීමට වැයවන මූලික පිරිවැය එකවර ගෙවීම වෙනුවට කොටස් වශයෙන් ගෙවීම සඳහා මාසිකව බිල්පතට එකතු කිරීම."

ජනාධිපතිතුමා පත් වෙලා පසුගිය 21වැනි දාට මාස පහක් වෙනවා. මම දන්නේ නැහැ, කෙඳිරි ගානවාද කියලා. තවම ඒ කියපු එක වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලාගේ වැඩසටහන් පිළිබඳව අපට තව ගොඩක් දේවල් කථා කරන්න පුළුවන්. මේ අය වැය ලේඛනය රනිල් වික්‍රමසිංහගේ අය වැයක් කියලා කිව්වාම පිළිගන්නේ නැති උදව්යට මම තව උදාහරණ කිහිපයක් කියන්නම්.

2024 අය වැය කථාවේ පිටු අංක 38හි "ගෝලීය ආර්ථික සබඳතා" යටතේ මෙසේ සඳහන් වනවා:

"ගෝලීය යහපත් පරිචයන්ට අනුරූපව රේගු නීති සකස් කිරීමේ අරමුණින් තවදුරටත් රේගු නීති නවීකරණය කිරීමට පියවර ගන්නවා."

ඒ කාරණයම අනුර දිසානායක මැතිතුමාගේ අය වැය කථාවේ මෙසේ සඳහන් වනවා:

"The new Customs Law will be introduced to enhance trade facilitation and revenue collection."

ඊළඟ එක තමයි, National Single Window; ආයෝජන කවුළුව. රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් කළ 2024 අය වැය කථාවේ පිටු අංක 38හි මෙසේ සඳහන් වනවා:

"එලදායී වෙළෙඳ පහසුකම් සැලසීම සඳහා වන ජාතික කමිටුව, ජාතික තනි කවුළුව කඩිනම්ව ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වෙනවා."

අනුර කුමාර දිසානායක මහතා ඉදිරිපත් කළ 2025 අය වැය කථාවේ පිටු අංක 9හි මෙසේ සඳහන් වනවා:

"ප්‍රධාන විදේශ වෙළෙඳාම සම්බන්ධ ආයතන (key border agencies) සහ අපනයනකරුවන් ලියාපදිංචිය ස්වයංක්‍රියකරණය හා ඩිජිටල්කරණය කිරීම තුළින් ජාතික තනි වෙළෙඳ කවුළුව (TNSW) ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත."

මේ, රනිල්ගේ අය වැයම තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර කුමාර දිසානායක මැතිතුමා ආණ්ඩුව භාර ගන්නකොට හාල් කිලෝව කීයද? දැන් රුපියල් 280යි, හාල් කිලෝව. අද මේ අය ඒ හාල් මාෆියාවට යට වෙලා තිබෙනවා. ඇයි, එහෙම හාල් මාෆියාවට යට වෙන්න වුණේ? පසුගිය අවුරුදු 76 කරපු වැඩ නිසා තමයි. වී මෝල් 18ක් ගිනි තැබුවා. මෙට්‍රික්ටොන් මිලියන 800ක යටියන වී මෝල ගිනි තැබුවා; මෙට්‍රික්ටොන් මිලියන 300ක තෙබුවන වී මෝල ගිනි තැබුවා; මෙට්‍රික්ටොන් මිලියන 500ක හසලක වී මෝල ගිනි තැබුවා; මෙට්‍රික්ටොන් මිලියන 900ක මිද්දෙනිය වී මෝල ගිනි තැබුවා; මෙට්‍රික්ටොන් මිලියන 830ක මොනරාගල "රණහංස" වී මෝල ගිනි තැබුවා; මෙට්‍රික්ටොන් මිලියන 700ක උනාකුරුව වී මෝල ගිනි තැබුවා; මෙට්‍රික්ටොන් මිලියන 900ක අහුනකොළපැලැස්ස වී මෝල ගිනි තැබුවා. ඒ වාගේ තව වී මෝල් තිබෙනවා. මේ අය ඒවා ගිනි තියපු නිසා ආණ්ඩුවට අද හාල් එකතු කරලා ගබඩා කරන්න බැහැ. ඒක නිසා පෞද්ගලික අංශයේ මාෆියාවට ඔවුන් සම්පූර්ණයෙන්ම යට වෙලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි. මැතිවරණයට පෙර කිව්වා,- *[බාධා කිරීමක්]* ඉන්න, පොඩ්ඩක් අහගෙන. කහින්නේ නැතුව ඉන්න. දන්නේ නැහැ, තවම ආධුනිකයි. පොඩ්ඩක් අහගෙන ඉන්න. *[බාධා කිරීම්]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිවරණයේදී වාගේම ඊට කලිනුත් කිව්වා, IMF එකත් එක්ක තිබෙන එකඟතා සමාලෝචනයට ලක් කරන්නේ නැතුව ආර්ථිකය හරියට පවත්වාගෙන යන්න බැහැ කියලා. ඇත්ත වශයෙන්ම දෙවතාවක් කොට්ටේ පිට උරය කරකවලා රනිල් දානවටත් වඩා උඩට දාලා තිබෙන්නේ. IMF එකේ එකඟතා නොවෙයි, IMF එකේ කර උඩ නැඟගෙන යන්නේ. ඇමතිවරු කිහිපදෙනෙක් කියනවා මට ඇහුණා, 2027 වෙනකල් IMF අය වැයක් තමයි එන්නේ, 2028දී තමයි අපේ අය වැයක් එන්නේ කියලා. ඇයි, ජනතාවට මැතිවරණ කාලයේ එහෙම කිව්වේ නැත්තේ? බොරු කියපු බව, ජනතාව අන්දපු බව පිළිගන්න; ජනතාව රවට්ටපු බව පිළිගන්න; ඡන්දය ඕනෑ නිසා ප්‍රතිපත්ති පාවා දුන් බව අඩු තරමින් පිළිගන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව කාලයේ දේශීය ණය ප්‍රශස්ත කරනවා කියලා EPF ප්‍රතිලාභීන්ට ලැබිය යුතු පොලී මුදල අඩු කළා. ඒ දවස්වල කිඹුල් කඳුළු හලමින් කිව්වා, මෙන්න පෞද්ගලික අංශයේ වැඩ කරන අය දහඩිය මහන්සියෙන් හම්බ කර ගත්ත සල්ලි ටික කොල්ල කන්න හදනවා, මේකටත් ගේමක් දෙන්න යනවා, ඒ නිසා අපේ ආණ්ඩුවක් ආවාම ඒවා යළි සලකා බලනවා කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විවිධ වෙළෙඳ සමාගම්වල ඉන්න සේවකයන් උද්ඝෝෂණවලට යොමු කරලා, වැඩ වර්ජනවලට යොමු කරලා, ඒ කොම්පැනිවල ආර්ථිකය කඩාකප්පල් කරන්න දායක වෙච්ච උදවිය අද මෙතැන ඉන්නවා.

අද කෝ, EPF එක වෙනුවෙන් මොකක් හරි කළාද? දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය තුළින් වෙච්ච අසාධාරණයට විරුද්ධව මොකක් හරි කළාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ 12ට Vitz car එකක් ගන්න පුළුවන් කියලා හීන මවපු රටක් මේක. මෙතුමන්ලා හීන මැවෙව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
පොඩ්ඩක් ඉන්න, අවසන් කරන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, JVP ආණ්ඩුවේ මංගල අය වැය කියන්නේ, මේ රටේ ජනතාවගේ වාහන හීනය හීනයක්ම කරලා දාපු අය වැයක්. මට කෙටියෙන්ම කියන්න තිබෙන්නේ, රනිල්ගේ කලිසම අනුරගේ වාගේ ඇදගෙන JVP එකේ කට්ටිය අගේට යනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, පිළිතුරු කථාව. ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 40ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.19]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවේ පළමු අය වැය දෙවැනි වර කියැවීමේ විවාදයේ අවසාන අවස්ථාවට අපි ඇවිල්ලා තිබෙන්නේ. ඇත්තටම අපි සතුටු වනවා, පක්ෂයක් විධියට අප තුළ තිබුණු අදහස්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ලැබීම ගැන. අවුරුදු 50ක්, 60ක් තිස්සේ අපේ පරම්පරා ගණනාවක් විශ්වාස කළා, අපේ අත්වලින් මේ රට හදන්න ඕනෑ කියලා. අපේ ප්‍රතිපත්තිවලින් අපේ රටට යම් බලපෑම් වෙලා ඇති. නමුත්, අපිම ප්‍රධාන වශයෙන් සැලසුම් කරලා, ඒ සැලසුම් කරපු ප්‍රතිපත්තිවලට ජනතාගේ ජනවරමක් අරගෙන, ඒ ජනවරම මත පදනම් වෙලා අපි අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. දැන් අපි මාර්තු 21න් පසුව අපේ අත්වලින් මේ රට හදන්න යනවා. ඒක මම හිතනවා මිය ගිය, මරා දමන ලද දස දහස් ගණනක් අපේ පක්ෂයේ සාමාජික සහෝදර සහෝදරියන්ගේ එක්තරා විධියකට සිහිනයක් සැබෑ කිරීමක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හයියෙන් කථා කළාම ඒක ඇත්ත වෙනවා නම්, මම හිතනවා අපට ඉතින් හරිම සරලයි ජීවිතය කියලා. ඇත්තටම මම මේ දවස් හතේ වැඩි දවස් ප්‍රමාණයක් විපක්ෂයේ ඉන්න විවිධ පක්ෂවල මන්ත්‍රීතුමන්ලාගේ කථා අහගෙන හිටියා. අපි බලාපොරොත්තු වනවා වෙලාව ලැබෙන විධියට ඒ ගැන කථා කරන්න. ඩෙන් ෂියාඕපිං කියලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "Seek the truth from facts" කියලා. ඒ කියන්නේ, "කරුණු තුළින් ඇත්ත සොයන්න" කියලා. එහෙම නැතිව, සද්දෙන්, ඩෙසිබල් ගණනින් නොවෙයි, voice-cutsවලින් නොවෙයි.

අපි දන්නවා ආර්ථික කළමනාකරණයයි, රට කළමනාකරණයයි කියන්නේ දෙකක්. නමුත්, ආර්ථික විද්‍යාවෙන් තොර දේශපාලන විද්‍යාවක් නැහැ. දේශපාලන විද්‍යාවෙන් තොර ආර්ථික විද්‍යාවකුත් නැහැ. මේ දෙක සියයට සියයක් සමපාත නොවුණාට අපි හිතනවා - මේ වනකොට දින සියයක් වනවා අපේ ආණ්ඩුවට, අනුර සහෝදරයා ජනාධිපති වෙලා. හරිනි සහෝදරිය අගමැතිනිය වෙලා. ඊට දින කීයක් හෝ වැඩි වෙන්න පුළුවන්. නමුත්, අපි ජනවරමකින් ආණ්ඩු බලය අරගෙන දවස් සියයක් වනවා. ඒ නිසා අපි මේ දින සියය තුළදි සමාලෝචනය කළ යුතු වන්නේ, හුදු අය වැය ලේඛනය පමණක් නොවෙයි; අය වැය කථාව පමණක් නොවෙයි, අපි මේ දවස් සියය කොහොමද රට පාලනය කළේ, කොහොමද ආර්ථිකය කළමනාකරණය කළේ, කොහොමද සමාජය කළමනාකරණය කළේ කියන කාරණත් එක්ක.

දැන් ආර්ථිකයට අදාළව ගත්තොත් ගොඩක් අය කියන්නේ, මූල්‍ය විනය තිබෙන්න ඕනෑ කියලානේ. නමුත්, මම හිතුවා ආර්ථිකය ගැන අපේ ගරු ඇමතිවරු කථා කළ නිසා ප්‍රධාන කරුණු තුනක් ගැන කියලා කථාව පටන් ගන්න.

මේ දින සියය තුළදී අපි ආණ්ඩුවක් වශයෙන් පෙන්වපු දේවල් කිහිපයක් තිබෙනවා. එකක් තමයි, අපේ දේශපාලන කළමනාකරණය සහ විනය කොහොමද කියන එක. දෙක, අපේ සමාජ ස්ථාවරභාවය හා සමාජ විනය හදන්න අපි කරපු දේවල් මොනවාද කියන එක. තුන, ආර්ථික කළමනාකරණය හා මූල්‍ය විනය කොහොමද කියන එක. අලුත් ආණ්ඩුවක් වුණාම අපි ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වුණේ ඇත්තටම එවැනි දේවල්. නැවත කිව්වොත්, දේශපාලන කළමනාකරණය හා විනය කොහොමද? දේශපාලන කළමනාකරණයකින් තොරව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකයක් කළමනාකරණය කරන්න බැහැ. ඒකනේ හුඟක් අය හිතන්නේ. ලංකාවට ලෝකයේ ඉන්න හොඳම economic expertsලා ගෙනාවත් දේශපාලන කළමනාකරණය නැත්නම් රට ගෙන යන්න බැහැ. ඒකනේ කියන්නේ, ආයෝජකයෝ ගොඩක් හැරිලා ගියා කියලා.

දැන් කියනවා, කෝටි 45,000ක ආයෝජන ආවා ලු. කෝටි 45,000ක නොවෙයි, කෝටි 75,000ක් ආවත් ඒ ආයෝජකයන්ට මේ රටේදී සිද්ධ වුණේ මොකක්ද? ඒ නිසා කොයිතරම් විශාල ආර්ථික විද්‍යාඥයන් සිටියත් දේශපාලන කළමනාකරණය හා විනයෙන් තොරව රටක් ඉදිරියට ගෙනියන්න බැහැ.

[ගරු බිමල් රත්නායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප්‍රිකානු රටවල් දියමන්ති නිධි උඩ, තෙල් නිධි උඩ ඉන්නවා. නමුත් ඒ රටවල් දියුණු වෙන්නේ නැහැ. ඒ රටවල ජනතාවට සාමාන්‍ය මට්ටමේ ජීවිතයක්වත් නැහැ. අප්‍රිකාවේ තිබෙන එකම අප්සෙට් එක මොකක්ද? අප්‍රිකාවේ ඔක්කෝම හොඳයි. නමුත් අප්‍රිකාවට ජනතාවාදී දේශපාලන නායකත්වයක් නැහැ. ඒ නිසා එක, දේශපාලන කළමනාකරණය හා විනය. දෙක, සමාජ ස්ථාවරභාවය හා විනය. තුන, ආර්ථික කළමනාකරණය හා විනය. අපේ ආණ්ඩුව දිහා කවුරු හරි කෙනෙක් clinically බලලා අප විවේචනය කරනවා නම්, ඔන්න ඔය පැති තුනෙන් බලලා විවේචනය කරනවා නම් අපි සතුටුයි. මොකද, අපි perfect නැහැ. අපට පොඩ්ඩක්වත් අං ඇවිල්ලා නැහැ; අපි පොඩ්ඩක්වත් ගොනාට ඇඳලා නැහැ. අපි ලෝකයේ තිබෙන හොඳම ආණ්ඩුව හදලා නැහැ. අපේ හිත්වල තිබෙනවා, අපේ රටේ ජනතාව ගෙනියන්න ඕනෑ තැනක්. අපි මේ අය වැය එතැනට ගෙනැල්ලා නැහැ. අපි ඒකයි කිව්වේ, විපක්ෂය බලාපොරොත්තු වෙන්නේ ඒක කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට පසුගිය කාලයේ විපක්ෂය ඉදිරිපත් කරපු චෝදනා මොනවාද කියලා ඔබතුමා දන්නවා. අපට එක චෝදනාවක් ආවා, පාස්පෝට් පෝලිම සම්බන්ධයෙන්. දෙවැනි චෝදනාව තමයි, සහල්, පොල් සහ ලුණු හිඟය පිළිබඳ ප්‍රශ්නය. තුන්වැනි චෝදනාව තමයි, වරායේ කන්ටේනර් හිරවීම පිළිබඳ ප්‍රශ්නය. ඊට පස්සේ අපි බලයට ආපු ගමන්ම ආවා, පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍ර පිටවීම නිසා ඇතිවී තිබුණු ගැටලුව. ඊට පස්සේ ආවා භාණ්ඩ මිල පිළිබඳ ප්‍රශ්නය. ඊට පස්සේ මෑත භාගයේදී ඇවිල්ලා තිබෙනවා, පාතාල ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රශ්නය. ප්‍රධාන වශයෙන් ගත්තොත් පසුගිය කාලයේ ඇති වෙච්ච, ජනතාව වැඩි අවධානයක් දිනා ගත්ත ප්‍රශ්න බවට පත් වුණේ මේවා. මේවාට අමතරව අනුර කුමාර සහෝදරයාගේ කමිසයේ බොත්තම මාරුවීම වාගේ ප්‍රශ්නයත් විපක්ෂයට විශාල වැදගත් දේවල් බවට පත් වෙලා තිබුණා. නමුත් ජනතාවට වැදගත් වෙලා තිබුණු ප්‍රශ්න තමයි මම කලින් කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එක ප්‍රශ්නයක්වත් අප විසින් ගන්නා ලද තීන්දු නිසා ඇති වෙච්ච දේවල් නොවෙයි. පාස්පෝට් ප්‍රශ්නය පසුගිය ආණ්ඩුවල වැරදි නිසා ඇතිවී තිබුණු ප්‍රශ්නයක්. අද පාස්පෝට් ප්‍රශ්නය සැලකිය යුතු දුරකට අපි විසඳා තිබෙනවා. අද පාස්පෝට් එක ගන්න පුළුවන්, පෝලිම්වල ඉන්නේ නැතිව ගන්න පුළුවන්. නමුත් එතැන තව ඉතිරි වෙච්ච ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒක තවම clear නැහැ. නමුත් අපි ඒ ප්‍රශ්නය විසඳලා තිබෙනවා.

දෙවැනි එක තමයි, සහල්, පොල් සහ ලුණු ප්‍රශ්නය. එවැනි ප්‍රශ්නයක් තිබුණු බව අපි දන්නවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. නමුත් ඒ ප්‍රශ්නය අපි ගත්ත තීන්දු මත ඇති වෙච්ච දෙයක් නොවෙයි, අපට දෙස්දෙවොල් තිබ්බාට. අද ඒක අපි යම් ප්‍රමාණයකට විසඳීමේ කටයුතු කළමනාකරණය කරගෙන තිබෙනවා. අපි දැන් සැලසුම් කරගෙන යනවා, ඊළඟ නොවැම්බරය වෙනකොට මේ ප්‍රශ්න වෙන්නේ නැති විධියට සැලසුම් කරගෙන යන්න.

තුන්වැනි එක තමයි, වරායේ container backlog එක සම්බන්ධ ප්‍රශ්නය. අපි මැදිහත් වෙලා ඒක විසඳලා තිබෙනවා. අපි ඒක විසඳලා තිබෙන්නේ perfect solutions ගෙනැල්ලා නොවෙයි. යම් ප්‍රමාණයකින් දැනට ඒ ප්‍රශ්නය විසඳලා තිබෙනවා. ඒ සඳහා මැදකාලීන, දිගුකාලීන විසඳුම්වලට අපි යමින් තිබෙනවා.

පහ වසර ශිෂ්‍යත්ව විභාගය පිළිබඳ ප්‍රශ්නය ගැනත් මම කියන්නම්. ඒ සම්බන්ධයෙන් ගරු අගමැතිතුමිය මහන්සි වුණා; ජනාධිපතිතුමා මහන්සි වුණා. ඊට පස්සේ ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් නඩු ගියා. නඩු ගියාට පස්සේ උසාවියෙන් තීන්දුව විධියට දුන්නේත් අගමැතිතුමිය යෝජනා කරපු ස්ථාවරය තමයි. ඒ නිසා දරුවන්ගේ ශිෂ්‍යත්ව විභාගය නැවත ප්‍රශ්න පත්‍රවලට යන්නේ නැතිව, විභාග ප්‍රශ්න පත්‍ර පිටවීම නිසා දරුවන්ට වෙච්ච අසාධාරණයටත් විද්‍යානුකූල උත්තරයක් සහිතව විසඳා තිබෙනවා. මොකද, ප්‍රශ්න පත්‍රයක් පිට වුණාම, සියයට 100ක් උත්තර හම්බ වෙන්නේ නැහැ සියලුදෙනාටම. නමුත්, ඒ ප්‍රශ්නයත් දැන් විසඳලා තිබෙනවා.

ඊට පස්සේ භාණ්ඩ මිල පිළිබඳ ප්‍රශ්නය ගත්තොත්, භාණ්ඩ මිල අඩුවෙලා තිබෙනවා. නමුත් තවම එය ජනතාවගේ ආදායමට වඩා වැඩියි. නමුත් භාණ්ඩ මිල දැන් අඩු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා ලංකාවේ තිබෙන ප්‍රධාන retail chainsවලින් අහලා බලන්න, ඒ ගොල්ලන්ගේ වෙළෙඳ පොළවල, විශේෂයෙන්ම ප්‍රාදේශීය ප්‍රදේශවල sales වැඩිවෙලා තිබෙන්නේ කොහොමද කියලා. මම ඒවායේ නම් කියන්න යන්නේ නැහැ, ඔබතුමන්ලා අහලා බලන්න. Retail chains දෙකක් නේ තිබෙන්නේ ලොකුවට. ඔබතුමන්ලා ඒවායෙන් අහලා බලන්න. මොකද, මිනිසුන්ගේ ක්‍රය ශක්තිය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මිනිසුන්ට වැඩිපුර මිලදී ගන්න පුළුවන්. මම කියන්නේ නැහැ, ඒ නිසා මිනිස්සු දැන් ලොවේත් නැති විධියට buying කරනවා කියලා. නමුත්, inflation එක අඩුවෙලා තිබෙනවා. ඒක fact එකක්. ඒක එක නිශ්චිත කරුණක්. ඒ නිසා ඒක නැහැ කියන්න බැහැ.

ඊට පස්සේ පාතාලය පිළිබඳ ප්‍රශ්නය. දේශපාලන අනුග්‍රහය මත තමයි පාතාලය ඇති වුණේ; පවත්වාගෙන ගියේ; ගොඩ නැහුවේ කියලා ඔබතුමන්ලා දන්නවා. ඒවා ඉතිහාසයට යා යුතු නැහැ. ඒ පාතාල ප්‍රශ්නයෙන් අපේ රට මේ දවස්වල බැට කමින් ඉන්නවා. අපි හිතනවා, අපට පාතාල ප්‍රශ්නය තනිකර militaristic වෙලා පොලිස් ක්‍රියාමාර්ගවලින් පමණක් මැඩපවත්වන්න බැහැ කියලා. ඒකට උත්තර මොනවාද කියලා අපි පසුවට කියන්නම්. නමුත් දැනට අපි පොලිස් ක්‍රියාමාර්ගවලිනුත් ඒකට අදාළ මැදිහත්වීම් කරමින් තිබෙනවා. එකම දේ, පසුගිය දවස්වල පාතාලය "අන්දොස්" වෙලා ඉන්නේ. මොකද, පාතාලයට ආණ්ඩුවෙන් connection එකක් හදා ගන්න බැරිව ඉන්නේ. ආණ්ඩුවෙන් connection එකක් හදා ගන්න බැරිව ඉන්නේ. ඒ නිසා තමයි දැන් පාතාලය "අන්දොස්" වෙලා ඉන්නේ.

අපි පාතාලයේ දැන් ඉන්න කට්ටියට කියනවා, කරුණාකර ඔය ක්‍රියා නතර කරලා සාමාන්‍ය විධියට තමන්ගේ ජීවිතය ගොඩ නහා ගන්න මහන්සි වෙන්න කියලා. එහෙම නැතිනම්, එය සැලකිය යුතු ප්‍රමාණයකට මර්දනය කරන්න අවශ්‍ය කරන දේවල් රජය විසින් නීත්‍යානුකූල සීමාව ඇතුළේ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට ඉහතින් පෙන්වා දුන්නේ සමාජයේ අතිබහුතරයකට බලපා තිබෙන ප්‍රශ්න. ඊට අමතරව, අප සම්බන්ධයෙන් මතු වුණා, අධ්‍යාපන සහතික පිළිබඳ ප්‍රශ්නයක්. සදාචාරමය ප්‍රශ්න දෙකක් මතු වුණා, අපේ ආණ්ඩුවට. එකක්, අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ප්‍රශ්නය. දෙක, ඊයේ පෙරේදා මතු වෙච්ච නම් වෙනස් කිරීම පිළිබඳ ප්‍රශ්නය. මා හිතන්නේ, ඒක තමයි ගොඩක්ම අපට moral පැත්තෙන් ආවේ. අපි මොනවාද ඒවාට ගත්තු තීන්දු? අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ප්‍රශ්නයේදී අපි උත්සාහ කළා කෙටි කාලීන උත්තරයක් සොයා ගන්න. නමුත්, අපට තේරුණා ඒකට ඊට වඩා වැඩි කාලයක් ගත වෙනවා කියලා. එම නිසා අපි අපේ කථානායක ඉල්ලා අස් කරගත්තා. ඒ වාගේම, එක්තරා මන්ත්‍රීවරියකගේ නම සම්බන්ධ ප්‍රශ්නයක් ආවාට පස්සේ අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වෙන කවුරුත්

කියන්න කලින්, එම ප්‍රකාශය ඉල්ලා අස් කර ගත්තා. ඒ අවස්ථාවේ ඔබතුමාම තමයි මූලාසනයේ සිටියේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කිව්වා.

අපට ආපු moral issuesවලදී අපි ඒ විධියට ක්‍රියා කර තිබෙනවා. මොකද, ආණ්ඩුවක් ගත්තාම, දේශපාලන කළමනාකරණය සහ විනය කියන කාරණා දෙකේදී ආණ්ඩුවේ දේශපාලන විනය සදාචාරමය වශයෙන් අපි පෙන්වා තිබෙනවා. ඒවා එකක්වත් නීතිමය ප්‍රශ්න නොවෙයි. නමුත්, සදාචාරමය වශයෙන් අපි දේශපාලන විනය උපරිම වශයෙන් පෙන්වා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට සතුටුයි ලංකාවේ ජනතාවගේ දේශපාලන ඥානය, ආණ්ඩුව කරන කණ්ඩායමේ දේශපාලන සදාචාරයේ මට්ටම, PhD degree certificate එකක් තිබෙනවාද කියලා check කරන level එකට ආපු එක ගැන. අපි කැමැතියි, මන්ත්‍රීවරයෙකුගේ හෝ මන්ත්‍රීවරියකගේ හෝ නමේ යම්කිසි විකෘතියක් කළාම ඒකට මහා විශාල සමාජ ආන්දෝලනයක් ඇති වන මට්ටමට රට ඇවිල්ලා තිබෙන එක ගැන. අපි කැමැතියි, ඒ parametersවලින් bat කරන්න. අපට, NPP එකට, පුළුවන් ඒ parametersවලින්, ඒ qualitiesවලින් ඉස්සරහට යන්න. ඔබතුමන්ලාට තමයි ඒක අමාරු වුණොත් අමාරු වෙන්නේ. ඒ නිසා අපි ඔබතුමන්ලාටත් කියන්නේ, ඒ පාරෙන් එන්න කියලායි. ඒක හොඳයි. ඒ නිසා qualities up කරන එක අපි මේ රටේත්, පාර්ලිමේන්තුවේත් හැම තැනම හිතා මතා කරන දෙයක්. ආණ්ඩුවට ඡන්දය දුන්නත්, නැතත් ජනතාව බලාපොරොත්තු වෙන්නේ, ඒ up වෙච්ච qualities කියලා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන කළමනාකරණය ගැන මම තව පොඩ්ඩක් ඉක්මනින් කියන්නම්. අපි ඥාති සංග්‍රහයක් කරලා නැහැ. එවැනි කිසිම චෝදනාවක් විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ දවස් හත තුළ අපට කළේ නැහැ. අපි අරයාට, මෙයාට අයුතු බලපෑම් කළා කියලා කිසිම චෝදනාවක් නැහැ. ඒ වාගේම, එක දූෂණ චෝදනාවක් නැහැ. ඔය නිකම් අරහෙන් මෙහෙන් කිව්වාට, හරියාකාරව කරපු එවැනි එක චෝදනාවක්වත් නැහැ.

ජනාධිපතිතුමා අය වැය කථාව කරමින් මෙතැන කථා කළා පැය දෙකයි විනාඩි 45ක්. එතුමා එක් තැනකදීවත් කිව්වාද මේවා මගේ සංකල්ප කියලා? එතුමාගේ කථාවේ "මගේ" කියන වචනය තිබුණා ද? අය වැය කථාව කියවා බැලුවොත් තේරුම් යයි, "මගේ" කියන වචනය ඒ තුළ නැති බව. ඒකේ තිබෙන්නේ "අපේ" කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන මුදල් ඇමති ද, "අපේ" කියලා අය වැය කථාව ඉදිරිපත් කරලා තිබෙන්නේ? අපේ කැබිනට් මණ්ඩලය ගත්තත්, ඇමතිවරු ගත්තත් එහෙමයි. අපි team එකක්. අපි එක්කෙනෙකුගේ සංකල්පයක් කියලා එකක්, මගේ සංකල්පය කියලා එකක් නැහැ. "අනුරගේ සංකල්ප" කියලා ජාතියක් නැහැ. මන්ත්‍රීවරු කථා කරද්දී එහෙම කිව්වා. අපේම සමහර මන්ත්‍රීවරුත් එහෙම කිව්වා. හැබැයි, "අනුර දිසානායකගේ සංකල්ප" කියලා මොකුත් මේකේ නැහැ. මේකේ තනිකර තිබෙන්නේ ජාතික ජන බලවේගයේ, ජනතාව ඡන්දය දීලා අනුමත කරපු ප්‍රතිපත්ති. *[බාධා කිරීමක්]* හරි, මම එතැනට එනවා. පොඩ්ඩක් අහගෙන ඉන්න. ඉතාම පැහැදිලිව ගත්තොත්, අපි කණ්ඩායමක්. අපේ කැබිනට් මණ්ඩලයත්, අපේ නියෝජ්‍ය ඇමති මණ්ඩලයත්, අපේ මන්ත්‍රී කණ්ඩායමත් එක දිශාවකට යන්නේ. අප අතර අරයාගේ සංකල්ප, අරයාගේ දිස්ත්‍රික්කයට ඇදිලි, මෙයාගේ දිස්ත්‍රික්කයට ඇදිලි නැහැ. මන්ත්‍රීවරු අතර උනන්දුවක් තිබෙනවා තමන්ගේ දිස්ත්‍රික්කයේ වැඩ කර ගන්න. නමුත්, දේශපාලන අල්ලස් දීලා අපි කිසිම ප්‍රතිපත්තියක් නවලා නැහැ, වෙනස් කරලා නැහැ. අපි දේශපාලන කළමනාකරණය සහ විනය කියන එක වැදගත් කොට සලකනවා.

ඔය Thambuththegama Railway Station එක සම්බන්ධ feasibility study එකකට රුපියල් මිලියන 100ක් දාන එක ඇත්තටම ජනාධිපතිතුමා දන්නේ නැහැ. එතුමා සම්බන්ධ කරලා ඒ පිළිබඳව කීම ගැන අපි කනගාටු වෙනවා. ඒ යෝජනාව අය වැය කථාවේදී කිව්වේ එතුමා තමයි. ඒ යෝජනාව කොහොමද ආවේ? අපි අවංකව කියන්නම් ඒක. දුම්රියෙන් එළවලු ප්‍රවාහනය පිළිබඳ යෝජනාව ගෙනාවේ, අපේ අමාත්‍යාංශයෙන් - ප්‍රවාහන අමාත්‍යාංශයෙන්. අපි දඹුල්ල ගැන සොයා බැලුවා. නමුත්, දඹුල්ලේ කෝච්චි පාරවල් නැහැ. ඒ නිසා අපි යෝජනා කළා Kekirawa Railway Station එක හරහා ඒක කරන්න. නමුත්, Kekirawa Railway Station එක හරහා ඒක කරන්න, එතැන ලොකු ආර්ථික මධ්‍යස්ථානයක් ගොඩ නැඟිලා නැහැ. මම සියයට 100ක් වගකීමෙන් කියනවා, තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය හරහා මේ එළවලු ප්‍රවාහනය කළ යුතුයි කියන යෝජනාව තනිකරම දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන්ගේ යෝජනාවක් බව. මොකද, තඹුත්තේගම Economic Centre එකක් තිබෙනවා. ඒක හැදිලා ඉවරයි. අනෙක, ජනාධිපති කෙනෙක් රුපියල් මිලියන 100ක් විතරක් වෙන් කර ගනියිද තඹුත්තේගමට?

මෙතැන රුපියල් ට්‍රිලියන 1.3ක Capital Budget එකක් තිබියදී ජනාධිපතිතුමා රුපියල් මිලියන 100ද වෙන් කර ගන්නේ? රුපියල් බිලියන 1,300 ගණනක - රුපියල් මිලියන 130,000ක - Capital Budget එකක් ඉදිරිපත් කරන අනුර දිසානායක සහෝදරයා රුපියල් මිලියන 100ක් තඹුත්තේගමට දාගෙන තිබෙනවා ලු. ඒ විධියට ද එතුමා තඹුත්තේගමට සලකා තිබෙන්නේ? "ලොස්ට් පොරවල්" ඔය ගොල්ලෝ! ඒක දුම්රිය දෙපාර්තමේන්තුවේ අපි දන්නේත් නැති නිලධාරි මහත්මයෙක් කරපු යෝජනාවක්. අපේ ළඟ ඒ වාගේ වැඩ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලා බලන්න, පාර්ලිමේන්තුවේ දැන් තත්ත්වය ගැන. මෙහි level එක up කරන්න, මෙහි තිබෙන qualities වැඩි කරන්න අපි මහන්සි වෙනවා. ඔබතුමන්ලා ඒ ගැන දන්නවා. ඔබතුමන්ලා දින 100ක් ගැන කිව්වා නේ. අපේත් දින 100 මේ. අපි අපිවත් check කර ගන්නවා; අපි හැම වෙලාවේම microscope එකෙනුත් අපව බලා ගන්නවා. ඔබතුමන්ලා telescope එකෙන් බලලා කියනවා වාගේම, අපි හැම වෙලාවේම microscope එකෙන් අපව බලා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම සඳහා මම මේ කාරණා ටික කියන්න කැමැතියි.

මේ ගරු සභාවේදී පසුගිය දින 100 ඇතුළත විවිධ මන්ත්‍රීවරු ප්‍රශ්න 105ක් අහලා තිබෙනවා. ඒ අහපු දාම ප්‍රශ්න 94කට උත්තර දීලා තිබෙනවා. ඉතිරි ප්‍රශ්න 11ට විතරයි පිළිතුරු දෙන්න කල් අරගෙන තිබෙන්නේ. ඒවා ඔක්කෝටමත් උත්තර දීලා තිබෙනවා. වාචික පිළිතුරු අපේක්ෂා කරන එක ප්‍රශ්නයකටවත් උත්තර pending නැහැ. කවදාද එහෙම වෙලා තිබෙන්නේ? අපි දන්නවා නේ කලින් අපි පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවාම මොකද වුණේ කියලා. මේ තිබෙන්නේ පාර්ලිමේන්තුවේ Order Paper එක. අපේ අලුත් මන්ත්‍රීතුමන්ලා තවම දන්නේ නැහැ මේ කියන්න යන කාරණය ගැන. මේ Order Paper එකේ ප්‍රශ්න ඇතුළත් කර තිබෙනවා. සාමාන්‍යයෙන් ඒ ප්‍රශ්නයකට අදාළව අපේ Table Office එක වරහන් තුළ සඳහන් කරනවා අංකයක්. මේ තිබෙන න්‍යාය පත්‍රයේ 1 වන ප්‍රශ්නයට අදාළව දාලා තිබෙන්නේ (1) කියලායි. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතාගේ ප්‍රශ්නයට අදාළව (1) කියලා දාලා තිබෙන්නේ මොකක්ද? ඒ, එම ප්‍රශ්නය පළමුවැනි වතාවට අහන නිසා. ගරු හේෂා මන්ත්‍රීතුමා දන්නවා ඒ ගැන. නමුත්, අපට පසුගිය කාලයේ තිබුණු අත්දැකීම මොකක් ද? මේ ඉලක්කම (2) වෙනවා, (3) වෙනවා, (4) වෙනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

කවදාවත් ඒ ප්‍රශ්නවලට උත්තර ලැබුණේ නැහැ. නමුත්, අපි අද පාර්ලිමේන්තුවේ quality එක up කරලා තිබෙනවා. මා මෙය නිහතමානීවයි කියන්නේ. තවත් ගොඩක් දේවල් කරන්න තිබෙනවා. අපි ඒවාත් කරනවා.

ගරු මන්ත්‍රීතුමන්ලා අහපු ප්‍රශ්න 105න් 105ටම උත්තර දීලා තිබෙනවා. ස්ථාවර නියෝග 27(2) යටතේ පක්ෂ නායකයෝ අහලා තිබෙනවා, ප්‍රශ්න 10ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්න 10න් ප්‍රශ්න 8කට උත්තර දීලා තිබෙනවා. ඒ වාගේම, ගරු අගමැතිතුමියගෙන් ප්‍රශ්න 8ක් අහලා තිබෙනවා. ඒ ප්‍රශ්න 8ටම උත්තර දීලා තිබෙනවා. වෙන දා අගමැතිවරු ලොවේත් හිටියේ නැහැ. මා හිතන්නේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති තනතුර දැරූ මුළු කාලයටම සිටියාට වඩා වැඩි කාලයක් හරිනි අගමැතිතුමිය මේ මාස තුනට පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය අපට නිරන්තරයෙන් චෝදනාවක් කළා. මොකක්ද ඒ? ඒ තමයි, එතුමන්ලාට කාරක සභාවල අවස්ථා දෙන්නේ නැහැ කියන චෝදනාව. අදත් මට එක මන්ත්‍රීවරයෙක් කිව්වා, "අද ඒ ගොල්ලන් විරුද්ධව ඡන්දය දෙනවා, අවස්ථාව දුන්නේ නැහැ" කියලා. මම ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. අපි ගරු කථානායකතුමාට ලියුමක් ඉදිරිපත් කළා, කාරක සභාවල සාමාජික සංඛ්‍යාව වැඩි කර ලබා දීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය දන්වමින්. මම දැන් එය **සභාගත*** කරනවා.

ඔබතුමන්ලා මේකත් පිළිගන්නේ නැතිනම්, අපි ඒ ගැන දැනගන්න කැමතියි. එතකොට අපට මේක withdraw කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරක සභාවලට අදාළව විපක්ෂය සඳහා වැඩි කරපු සාමාජික මන්ත්‍රීවරුන් සංඛ්‍යා මම ඉක්මනින් කියන්නම්. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට ඔබතුමන්ලා දැන් ඉල්ලා තිබෙන ප්‍රමාණය අනුව අපි එක් සාමාජික මන්ත්‍රීවරයෙක් වැඩි කරලා තිබෙනවා. ගෘහ්‍ය කාරක සභාවට තුන්දෙනෙක් වැඩි කරලා තිබෙනවා. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට තුන්දෙනෙක් වැඩි කරලා තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට හතරදෙනෙක් වැඩි කරලා තිබෙනවා. අපි ඔබතුමන්ලාට එහි සභාපතිකම දෙනවා කියලාත් කියලා තිබෙනවා. මේ, මෙතෙක් දීලා තිබෙන ප්‍රමාණයට වැඩියෙන් දීලා තිබෙන ප්‍රමාණය. ඒ ඔබතුමන්ලා ඊයේ පෙරේදා ඉල්ලපු ප්‍රමාණයට අදාළවයි. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අපි හතරදෙනෙක් වැඩි කරලා තිබෙනවා, මෙතෙක් දුන්නාට වැඩියෙන්. ඒ කියන්නේ, දැනටත් වැඩි කරලා තිබෙනවා; තවත් වැඩි කරලා තිබෙනවා. ඔබතුමන්ලා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට දැන් තිබෙනවාට වඩා වැඩියෙන් ඉල්ලා තිබෙනවා. ඒකට දෙදෙනෙක් වැඩි කරලා තිබෙනවා. ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවට තුන්දෙනෙක් වැඩි කරලා තිබෙනවා. දැනට වැඩි කරලා තිබෙන ප්‍රමාණයට වැඩියෙන් වැඩි කරපු සංඛ්‍යාවයි මේ හැම එකකටම අදාළව මා කියන්නේ. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට ඔබතුමන්ලා පස්දෙනෙක් ඉල්ලුවා. පස්දෙනාම වැඩි කරලා තිබෙනවා. ඒ, දැනට ඉන්න ප්‍රමාණයට වඩා වැඩියෙන්. High Posts Committee එකට දැනට ඉන්නවාට වඩා තවත් තුන්දෙනෙක් වැඩි කරලා තිබෙනවා. ඔබතුමන්ලා පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවට -Backbencher Committee එකට - වැඩිපුර දෙදෙනෙක් ඉල්ලුවා. එයට දෙදෙනෙක් වැඩි කර දීලා තිබෙනවා. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට වැඩි කරන්න කියලා ඔබතුමන්ලා ඉල්ලුවේ නැහැ. නමුත්, අපි ඒවාට තවත් සාමාජික මන්ත්‍රීන් හතරදෙනෙක් දීලා තිබෙනවා. අපි ඔබතුමන්ලාට ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මන්ත්‍රීවරු දෙදෙනෙක් වැඩි කර දීලා තිබෙනවා. මේ අනුව විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අවස්ථා 213ක් අපි නිර්මාණය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව කියන්න කැමැතියි, පාර්ලිමේන්තුවේ quality එක up කරන්න අපි මහන්සි වන බව. ඉස්සර පාර්ලිමේන්තුවේ ආණ්ඩුවේ Business පටන් ගත්තේ පස් වරු 1.30ට. ඔබතුමන්ලා සොයා බලන්න. ඒ කාලයේ මෙතැන ස්ථාවර නියෝග ක්‍රියාත්මක වුණේ නැහැ. මෙතැන නිකම් පිස්සන් මඩුවක් වාගේ, කෝලම් මඩුවක් වාගේ ඔහේ පවත්වාගෙන ගියා; ඒවා මේවා කළා. හිතෙන හිතෙන දේ කථා කළා. එදා හැම කෙනාම පක්ෂ නායකයන්. අද ගොඩක් වෙලාවට time management හරියට කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම දන්නවා, මේක ඉස්කෝලයක් කරන්න ඕනෑ නැති බව. මේකේ පොඩි play එකක් තිබෙන්න ඕනෑ; මෙහි පොඩි අවස්ථාවක් තිබෙන්න ඕනෑ, මැති ඇමතිවරුන්ට කථා බහ කරන්න. මේක ඉස්කෝලයක් නොවෙයි. මේක ලොකු clerk කෙනෙක් පාලනය කරන ආයතනයක් නොවෙයි. ඒ වාගේම මේක video cuts දෙන, mediaවලට රහපාන තැනක් බවට පත් කරන්නත් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපිටත් ඒවා කරන්න පුළුවන්. මොකද, අපට මන්ත්‍රීවරු 159 දෙනෙක් ඉන්නවා.

අද පාර්ලිමේන්තුව live බලන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුව මහජන මුදලින් නඩත්තු වෙන්නේ. මේක අමුතු තැනක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි පාර්ලිමේන්තුවේ quality එක up කරන්න කටයුතු කරගෙන යනවා, තවදුරටත් ඒක කරනවා.

ඒ වාගේම අපි කල්දමා තිබුණු මැතිවරණ පවත්වනවා. අපි මැතිවරණවලදී කොහෙත්ම රාජ්‍ය දේපළ පාවිච්චි කරන්නේ නැහැ. රාජ්‍ය මාධ්‍ය අපි වැරදි විධියට පාවිච්චි කරන්නේ නැහැ. ඒ නිසා, මැතිවරණය කල් දමන්න කියලා විපක්ෂයේ සමහර පක්ෂ වක්‍රව කියද්දී, අපි මැතිවරණ කොමිසමට දැන්වුවා එම මැතිවරණය පවත්වන්න, අපි ලෑස්තියි සාමකාමී, සාධාරණ ඡන්දයක් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. අර මිරිස් කුඩු ගහපු සිද්ධිය ගැන හොයන්න පත් කළ Select Committee එකේ මම හිටියා. ඒ කාලයේ හිටපු කථානායක කරු ජයසූරිය මැතිතුමාට මම ඒ ගැන ප්‍රසිද්ධියේ කරුණු කියා තිබෙනවා. ඒ Select Committee එකේ හිටියා, මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු නියෝජ්‍ය කථානායකවරයෙකු වන ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාත්. මම හිතන විධියට තව මන්ත්‍රී කෙනෙක් හිටියා. ඒ Select Committee Report එක සකස් කිරීමේදී අපි පැය තිස් ගණනක් වීඩියෝ බැලුවා. කැමරා 8කින්ද, 6කින්ද රෙකෝඩ් කරපුවා බැලුවා. ඒ සිදුවීමට අදාළ වැරදිකාරයෝත් හඳුනා ගත්තා. නමුත් රනිල් වික්‍රමසිංහ උන්නැහේ ගරු කථානායක වශයෙන් කටයුතු කළ කරු ජයසූරිය මැතිතුමාට ඒ Report එක ඉදිරිපත් කරන්න දුන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. ඊට පස්සේ එදා මෙතැන මයික් කඩපු කට්ටිය ඔය මූලාසනයේ වාඩි කළා, රනිල් වික්‍රමසිංහලා. ඔය සභාපති පුටුවේ වාඩි කළා! මම කරු ජයසූරිය මැතිතුමාට කිව්වා,

---

** ප්‍රශ්නකාලයේ නබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

අඩු ගණනේ ඒ මිරිස් කුඩු කල්ලිය කථානායක පුටුවේ වාඩි කරවන්න එපා, Chairmen's Panel එකට ගන්න එපා කියලා. එදා එහෙම තමයි මේ සභාව පිස්සු මඩුවක් කළේ. නමුත් අද අපි ආවාට පස්සේ මෙතැන වැදගත් විධියට කථා කරන්න පුළුවන් තැනක් බවට පත් වෙලා තිබෙන එක ගැන අපි සතුටු වෙනවා. ගරු මන්ත්‍රීතුමියකගේ නමේ පොඩි වෙනසක් වුණාම ෆයර් වෙන පාර්ලිමේන්තුවක් අපි හදලා තිබෙනවා. අපි කැමැතියි ඒකට. හැබැයි, මිරිස් කුඩු ගහපු අයත් හිටපු පාර්ලිමේන්තුවක් මේක. මට මතකයි, ඒක හොලිවුඩ් දර්ශනයක් වාගේ. *[බාධා කිරීම්]* ඒ අයත් එක්ක ඔයගොල්ලන් සාකච්ඡා කරනවා නේ, නලින්. *[බාධා කිරීම්]*

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පාර්ලිමේන්තුවේ කාමරවල නේ, කථා කරන්නේ. *[බාධා කිරීම්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒවා කරගන්න. ඒවා කරගන්න. මම කියන්නේ මේකයි. අපි මේකේ quality එක up කරනවා. අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කරුණාවෙන් ඉල්ලීමක් කරනවා, ජනතා කැමැත්ත තිබෙන්නේ ඒකට නිසා මේකේ quality එක up කරන්න එන්න. ඒ ඇතුළේ අපි political comments හදා ගනිමු. ඒක තර්ජනයෙන්, ගර්ජනයෙන් කරන්න එපා කියන ඉල්ලීමත් අපි කරනවා. ඒකයි මම කිව්වේ, දේශපාලන කළමනාකරණය සහ විනය කියන එක අපි ගොඩනඟාගෙන යනවා කියලා, රටෙත්, මෙතැනත්.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි ඉදිරිපත් කරපු අය වැය විද්‍යාත්මක අය වැයක් බව. ඒ කියන්නේ සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව යොදාගෙන හදපු අය වැයක් තමයි අපි ඉදිරිපත් කර තිබෙන්නේ. අපි ඒ තුළින් සමාජ ස්ථාවරභාවය හා විනය හදන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගොඩක් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජීවිතයේ ලස්සන දෙයක් තමයි, තමන් ඉගෙන ගත් දේවල් යොදා ගන්න ලැබෙන එක, යමක් හදන්න. සමාජයක් හදන්න හෝ ගොඩනැඟිල්ලක් හදන්න හෝ දරුවෙකුට උගන්වන්න හෝ තමන් ඉගෙන ගත් යමක් යොදා ගන්න අපි කාටත් යම් කිසි ආශාවක් තිබෙනවා. ඒ කියන්නේ, අපි දන්නා දෙයක් apply කරලා බලන එක. ඔබතුමන්ලා දන්නවා, මේ අය වැය ගත්තොත් මේක ඇත්තටම පීඩිතයන්ගේ පැත්තෙන් බලා ඉදිරිපත් කරපු අය වැයක් බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SPEAKER took the Chair.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා මූලාසනයට පැමිණීම සතුටක්.

ගරු කථානායකතුමනි, මම කියමින් සිටියේ අපේ සමාජ ස්ථාවරභාවය සහ විනය හැදීම අරමුණු කරගෙන තමයි මේ අය වැය අපි හදා තිබෙන්නේ කියන එක. ඒ සඳහා අපි සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව පාවිච්චි කර තිබෙනවා. අපි දන්නා දෙයක්, දන්නා science එකක් යොදා සමාජයේ ප්‍රශ්නයක් විසඳනවා දැක්කාම අපි කාටත් සතුටුයි. ව්‍යාපාරිකයෙකුට වුණත්, යම් කිසි strategy එකක් අනුව business එක launch කරලා ඒ business එකෙන් ලාභයක් ආවාම එයාට සතුටුයි. අපි මෙතැනදී අය වැයක් කියන්නේ මොකක්ද? ඒ වාගේ exercise එකකට. ගරු කථානායකතුමනි, පීඩිත අය වෙනුවෙන්, අසරණ කරපු අය වෙනුවෙන්, කොන් කරපු අය වෙනුවෙන්, පැත්තකට දමපු අය වෙනුවෙන්, ගණන් ගත්තේ නැති අය වෙනුවෙන් හදපු අය වැයක් මේක ඇතුළේ තිබෙනවා. කාන්තාවන් ගැන, දරුවන් ගැන විතරක් නොවෙයි, ඔබතුමා බලන්න, ළමා නිවාසවල ඉන්නා දරුවන් ගැන, රැඳවුම් නියෝග මත ඉන්න දරුවන් ගැන මේ අය වැය තුළ කථා කරලා තිබෙනවා. අද පාතාලය මර්දනය කරන්න බැහැ, ඒගොල්ලන්ට දඬුවම් දීලා විතරක්.

අද අය වැයේ මොකක්ද තිබෙන්නේ? මේ අය වැයෙන් ඒගොල්ලන් ඔක්කොම දිහා බලලා තිබෙනවා. රැඳවුම් නියෝග මත ඉන්න දරුවන්ට අනුර දිසානායක සහෝදරයා කියලා තිබෙනවා, "පුතා, term එක ගෙවලා පරිස්සමින් එන්න, අපි ඔයගොල්ලන් බලා ගන්නවා" කියලා. ඒකට මේ අය වැයෙන් කොච්චර සල්ලි වෙන් කරලා තිබෙනවාද? මොන ආණ්ඩුවද රැඳවුම් නියෝග මත ඉන්න දරුවන් වෙනුවෙන් සල්ලි වෙන් කරලා තිබෙන්නේ? ඒ වාගේම, අනාථ නිවාසවල ඉන්න දරුවන් විවාහ වන අවස්ථාවක රුපියල් මිලියනයක් ලබා දෙන්න යෝජනා කරලා තිබෙනවා. ඒකෙන් කියන්නේ මොකක්ද? ඔබේ ජීවිතය නාස්ති කරගන්න එපා. ජීවිතය කියන්නේ වටිනා දෙයක්; එක වතාවක් විතරක් ලැබෙන දෙයක්. ඒක නාස්ති කරගන්න එපා. ඔයා හොඳින් ඉඳලා එළියට එන්න, අපි ඔයා භාර ගන්නවා කියන එක.

අපේ රටේ දෙමළ ජනතාව ගැන කථා කළොත්, ඔවුන් හැමදාම ඇත් කරලා තිබුණේ. අපි ඒ ඇත් කරපු ජනතාව මේ අය වැයෙන් බදාගෙන තිබෙනවා. අපි ඔවුන් වැලඳගෙන තිබෙනවා. අපි පෙන්වා තිබෙනවා ඒක.

ඒ වාගේම තමයි ඔටිසම් දරුවන්. ඔය කවුරුත් බලලා ඇති, "Taare Zameen Par" කියන චිත්‍රපටය. බලලා නැත්නම් බලන්න. මම හිතන විධියට, ඔටිසම්වලින් වැඩියෙන්ම පීඩා විඳින්නේ දරුවා නොවෙයි, අම්මා. ඒක ඒ තරම් කැපවීමක්. මම පෞද්ගලිකව හිතනවා, මට නම් ඒක කරන්න බැහැ කියලා. ඒක පුදුම කැපකිරීමක්. තරුණ, උගත් අම්මලා කී දාහක් මේ රටේ ඔටිසම් දරුවන් එක්ක පීඩා විඳිනවාද? අපි මේ දුන්නු solution එක ඒ ප්‍රශ්නයට තිබෙන මහා golden solution එක නොවෙන්න පුළුවන්. නමුත්, අපි ඒ අය වෙනුවෙන් හිතලා තිබෙනවා. ඒ අය වෙනුවෙන් දෙයක් කරන්න පටන් ගෙන තිබෙනවා. මම ඒකයි කිව්වේ. මේක අර "මිහිතලයේ අසරණයෝ" කියලා සිංහල පරිවර්තනයක් තිබෙන ෆ්‍රාන්ට්ස් ෆැනන් ලිව්ව පොත වාගේ, ලංකාවේ ආර්ථික අසරණභාවයම නොවෙයි මේ තිබෙන්නේ. ආර්ථික recognition කියන එක වැදගත්, ගරු කථානායකතුමනි. පසුගිය කාලයේ Englandවල තිබිච්ච ජනතා නැඟිටීම්වලදී වෙස්මින්ස්ටර්වලට උද්ඝෝෂණය කරන්න ආපු ගෑනු ළමයි

[ගරු බිමල් රත්නායක මහතා]

දෙදෙනෙකුගෙන් BBC journalistsලා අහනවා, ඇයි ඔයගොල්ලන් උද්ඝෝෂණය කරන්න වෙස්මින්ස්ටර්වලට ආවේ කියලා. ඒ girlsලා කියනවා, "අපි ඉන්න බව ලොකු උන්ට ජේන්න" කියලා. "අපිත් ඉන්න බව." මේ අයත් ඒ වාගේ හඬක් නැතුව හිටපු මිනිස්සු. මේ රටේ ජනාධිපතිවරයා, මේ රටේ පාර්ලිමේන්තුව පිළිගෙන තිබෙනවා, "ඔව්. අපි දන්නවා, ඔයගොල්ලන් ඉන්නවා කියලා. අපි ඔයගොල්ලන් බලාගන්නවා" කියන එක.

ආබාධිත අය ගැන හිතුවොත්, අපි ඒ history එක වෙනස් කළා. අපේ සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා බ්‍රේල් ක්‍රමයෙන් කථා කළා. ඒක කළේ ජනවරම ඇතුළේ අපි ගෙනාපු දේ නිසා. ඔය පාතාලයේ වැඩවලට යන ළමයාට, කුඩු විකුණන ළමයාට අදහසක් තිබෙන්න ඕනෑ. ඒ මොකක්ද? මට chance එකක් තිබෙනවා, මේ වැඩේ නොකර හරි පැත්තට ආවොත් මේ ආණ්ඩුවෙන් මට අවස්ථාවක් තිබෙනවා කියලා. අපි තව ගොඩක් දේවල් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, Icelandවල ඉතා හොඳ සමාජ විද්‍යා පරීක්ෂණයක් කළා. අවුරුදු 15, 16, 17 වයසේ පසුවන ළමයි alcoholවලට ගොඩක් ඇබ්බැහි වෙලා. එහිදී social scientistsලාට භාර දුන්නා -අපේ අගමැතිතුමිය වාගේ අයට භාර දුන්නා - ඒකට තිබෙන solution එක මොකක්ද කියලා බලන්න. බැලුවාට පස්සේ ඒගොල්ලන් හදුනා ගත්තා, ළමයි sportsවලට එනවා නම් මේ වාගේ පැතිවලට යන එක වෙනස් කරන්න පුළුවන් කියලා. ඊට පස්සේ Iceland Government එක පරීක්ෂා කළා, ඒ දරුවන් sportsවලට යන්නේ නැත්තේ ඇයි කියලා. ඒකට එක හේතුවක් තමයි සල්ලි නැතිකම. ලංකාවෙත් එහෙම නේ. Sports කළොත් හවස school bus එකේ යන්න බැහැ. අම්මා හරි තාත්තා හරි එන්න ඕනෑ එක්ක ගෙන යන්න. අපිත් ඒ කට්ට කාලා තිබෙනවා. ඒ නිසා Icelandවල යෝජනා කළා, යුරෝ 180ක් ඒ දරුවන්ට දෙන්න. Sports කරන්න කැමැති දරුවන්ගේ පවුල්වලට මාසයකට යුරෝ 180ක් දුන්නා, sports කිරීම වෙනුවෙන්. අවුරුදු 2කට පස්සේ නැවතත් ඒ social scientists' team එක බැලුවා, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. දරුවන් අතර ක්‍රීඩාව වැඩි වෙලා, drugs සහ beer අනං මනං පාවිච්චි කරන එක අඩු වෙලා. ඉතින් කොච්චර ලස්සනයිද? Science පාවිච්චි කරනවා, සමාජ ප්‍රශ්න විසඳන්න. අපි මේ සමාජ ස්ථායීකරණය හදන්න හදන්නේ security State එකක් හදලා නොවෙයි. පසුගිය දවස්වල වෙඩි තියලා තුන්දෙනෙක්ද, හතරදෙනෙක්ද මැරිච්ච බව ඇත්ත. Dramatic තමයි, උසාවියක් ඇතුළේ වෙඩි තියපු එක. නමුත්, ඒක පාවිච්චි කරලා මේ හදන සංවාදය සම්පූර්ණයෙන්ම ඔබතුමන්ලා කොතැනටද අරගෙන යන්න හදන්නේ? ඔබතුමන්ලාට ඕනෑ හැම තැනම checkpoint දමන රටක්ද? ඔබතුමන්ලාට ඕනෑ ආණ්ඩුවට ෂොට් එක දෙන්න නේ. ඒකට කමක් නැහැ. ආණ්ඩුව විවේචනය කළාට කමක් නැහැ නේ. හැබැයි, අපි ඒක භාර ගත්තොත් මොකද වෙන්නේ? ගෙදරින් එළියට බහින්න හම්බ වෙන්නේ නැහැ, ඔබතුමන්ලා check කර කර තමයි ඉන්න වෙන්නේ. කැමැතිද ඒකට? ඉස්පිරිතාලෙත් check කරන්න වෙනවා; bus stand එකෙත් check කරන්න වෙනවා. දැන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් කියලා නේ කියන්නේ. එතකොට ඒකට තෝරන්න තිබෙන සාමාන්‍ය උත්තර මොනවාද? ඒකට rocket science නැහැ නේ. Check කරන්න තමයි තිබෙන්නේ. අපි එහෙම පටන් ගනිමුද? ඒ නිසා cheap වැඩ කරන්න එපා. ඒකෙන් ඊළඟ පරිජ්පුව කාටද එන්නේ? මෙහේ බෝම්බ ගැහුවාම, මෙහේ වෙඩි තිබ්බාම checkpoint වැටෙන්නේ උතුරේ. මම කියන්නේ මේකයි. ඒ සිද්ධියේදී පාතාලයේ කවුරු හරි වෙඩි තිබ්බා.

දැන් ඒකේ එල්ලෙන්න හදනවා. ඔබතුමන්ලාට strategy එකක් නැහැ, plan එකක් නැහැ, desperate to the core. ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? පාතාලයේ සිද්ධියක් වුණාම ගණේමුල්ල සංජීවගේ, එහෙම නැත්නම් සංජීවට වෙඩි තියපු මෑන්ගේ හරි එල්ලෙනවා. එහෙම එල්ලිලා මේ සතිය පහු කර ගන්නවා. ඒ නිසා අපි කියන්නේ මේකයි. අපි security State එකක් හදන්න යන්නේ නැහැ. ආරක්ෂක අංශවලින් ඒවා ගැන පරීක්ෂා කරලා දඬුවම් දෙයි. නමුත්, අපි අනෙක් පැත්තෙන් කල්පනා කළොත්, පාතාලයට යන්නේ අමුතු අය නොවෙයි. එහෙම අය ඉපදෙන්නේ නැහැ. ඒ නිසා සමාජය ස්ථායීකරණය කරලා, සමාජ සුරක්ෂිතභාවය හදලා, ඒ පාතාලය පැත්තට යමින් ඉන්න දරුවන්ට "පුතා ඔයා තුවක්කුව ගන්න එපා. ඔයා මේ පැත්තට එන්න. ඔයාට පාරක් තිබෙනවා" කියන තැනට තමයි අපි මේ අය වැය ලේඛනය හදලා තිබෙන්නේ. මම ඒකයි Iceland උදාහරණය කිව්වේ. සමාජමය වශයෙන් තිබෙන විද්‍යාත්මක දේවල් සමාජ ප්‍රශ්න විසඳන්න යොදා ගන්න පුළුවන්, ගරු කථානායකතුමනි. ඒ නිසා අපට සමාජය ඒ පැත්තට යොමු කරලා තමයි සමාජය ඇතුළේ විනය හදන්න පුළුවන් වෙන්නේ; ස්ථාවරභාවය හදන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතුව තනිකර militaristic approach එකකින් මේ ප්‍රශ්න විසඳන්න බැහැ. අපි ආණ්ඩුවක් වශයෙන් ඒක විශ්වාස කරන්නේ නැහැ.

අපි ආර්ථිකය ගැන ගොඩක් කථා කළා. ඊළඟට ගත්තොත්, අපේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අපට පුදුම විධියට බැන්නා. මම ඇත්තටම දුක් වුණා, අපි ඇත්තටම ලොකු වැරැද්දක් කළොත් ඔබතුමන්ලා අපිට මොනවා කරයිද කියලා. අපේ පාලනයේ මාස තුන හතරක් තුළ වෙච්ච අඩු පාඩුකම් ගත්තාම, පසුගිය ආණ්ඩු ගත් තීන්දු නිසා තමයි අපි පරිජ්පු කෑවේ. පාස්පෝට් පෝලිම ගත්තත්, හාල් හිඟය ගත්තත් එහෙමයි. ඔබතුමන්ලා අපට මාර විධියට බැන්නා. හැබැයි, ඔබතුමන්ලා අපට බැන්නාට, කවුරුත් පිළිගන්නා මේ Verité Research ආයතනයෙන් මොකක්ද කියලා තිබෙන්නේ? Verité Research එකෙන් කරපු research එකක post එකක් දාලා තිබෙනවා. ඔබතුමන්ලා කවුරුත් දන්නවා, ඒකේ මොකක්ද තිබෙන්නේ කියලා. It states, I quote:

> “Approval of government at a high of 62% in February.”

මේ බලන්න Government's rating එක, 62 per cent approved. මේ මිනිස්සුන්ගේ අදහස්; ජනතාවගේ අදහස්. ඊට පස්සේ තිබෙනවා, "Economic Outlook". ඒ ගැන මිනිසුන්ගෙන් සියයට 55ක් කියනවා, "Getting better" කියලා. ඊට පස්සේ තිබෙනවා, "State of the Economy". ඒ ගැන මිනිස්සු කියනවා, "Good" or "Excellent" කියලා. මම මේ කියන්නේ, මේ තමයි ලංකාවේ ආණ්ඩුවේ මේ මාස තුන හතරක ගමන පිළිබඳව පොදු ජනතාවගේ අදහස්.

මා ළඟ තිබෙනවා, අද උදේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඉදිරිපත් කරපු වාර්තාව. එහි පිටු 92ක් තිබෙනවා. අපි එහි සභාපතිතුමා, සාමාජිකයන් ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. මේ වාර්තාව හදන එක ලේසි වැඩක් නොවෙයි. මේ වාර්තාවේ Executive Summary එකේ තිබෙන්නේ මොකක්ද? මම ඒක quote කරන්නම්. ගොඩක් වෙලා quote කරන්න බැරි වෙයි. නමුත්, පුළුවන් උපරිම quote කරන්නම්. එම වාර්තාවේ Executive Summary එකේ මෙහෙම තිබෙනවා:

> “The section highlights Sri Lanka’s economic recovery post-2022 crisis, noting GDP growth, declining inflation, and exchange rate stability, while also acknowledging fiscal challenges such as balancing expenditure with debt sustainability targets under the IMF’s Extended Fund Facility (EFF).”

මොකක්ද මේ පළමුවැනි ඡේදයෙන් කියන්නේ? ඒකෙන් පිළිගන්නා දේ තමයි, 2022 ආර්ථික අර්බුදයෙන් පස්සේ GDP growth එකක් දකිනවා කියන එක. Declining inflation - උද්ධමනය අඩු වෙමින් තිබෙනවා. Exchange rate එක, ඩොලර් එකත් එක්ක තිබෙන rate එක, stable. මම දන්නවා, මෙතැන ව්‍යාපාරික මහත්වරු ගොඩක් ඉන්නවා. වැඩියෙන්ම අවශ්‍ය දේ තමයි stability කියන එක. ඒක මේ Public Finance Committee එක කියනවා. ඊට පස්සේ තව මෙහෙම කියනවා:

> "The economy is projected to grow by 3-5%, ..."

Economy එක සියයට තුනේ ඉඳලා සියයට පහ දක්වා වර්ධනය වෙනවා කියලා. සියයට තුනත්, පහත් අතර කියලා. තවදුරටත් එහි මෙසේ කියනවා :

> "… driven by accommodative monetary policy and greater fiscal space providing room for lower interest rates and investments."

ඔක්කොම තිබෙන්නේ positive ඒවා. ඊළඟට,

> "Continuing growth in tourism and the expected pick up in large capital infrastructure projects could also boost growth. However, growth remains vulnerable to global trade uncertainties, geopolitical risks and climate-related disruptions."

ගරු කථානායකතුමනි, ලෝකයේ ආර්ථික කටයුතුවල තිබෙන යම් ගැටලු, ලෝකයේ තිබෙන geopoliticsවලින් එන්න පුළුවන් අර්බුදවලින් ආර්ථිකය දුර්වල වෙනවා කියන එක ලංකාවට විතරක් අදාළ වෙන දෙයක් නොවෙයි. ඒ වාගේම, ඒවායෙන් වාසි වෙන්නත් පුළුවන්. දැන් Yemen *de facto* Government එකේ Houthisලාගේ attack එකෙන් කොළඹ වරායට වාසි වුණා. ඒ නිසා හැම crisis එකක්ම අවාසි වෙන්නේ නැහැ. මම මේ කියන්නේ Public Finance Committee එකේ වාර්තාවෙන්.

ඊළඟට කියන්නේ මොකක්ද? මේක වැදගත්. මේකේ කියනවා, IMF ගැන.

It states, I quote:

> "By the end of 2024, Sri Lanka outperformed IMF projections, with central government debt-to-GDP at 98.7% compared to the IMF's 108.8% target."

IMF එක හිතුවා, අපේ ණය සහ GDP එක අතර පරතරය සියයට 108ක් වෙයි කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව කියනවා, "ඒක IMF එක කිව්වාටත් වඩා හොඳ පැත්තට අපි කරලා තිබෙනවා. සියයට 98ට බැහැලා තිබෙනවා" කියලා. මේ පාර්ලිමේන්තු කමිටුව එහෙම කියනවා.

ඒ නිසා අපි ඔබතුමාට කියන්නේ මේකයි. මේ වාර්තාවෙන් කියනවා, ජනතාව අපි වැඩ කරන විධියට කැමතියි කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාවෙන් කියනවා, මේක හොඳයි කියලා. මේ කමිටුවේ expertsලා ඉන්නේ. මන්ත්‍රීතුමන්ලා වුණාට ඒගොල්ලෝ ආර්ථිකය ගැන වැඩි දැනුමක් තිබෙන අය. ඒ අය අපි වාගේ අය නොවෙයි. අඩුම තරමේ මම වගේ අය නොවෙයි. ඉතින් ඒ නිසා මොනවාද කියන්නේ? ගරු කථානායකතුමනි, අපි ජනතාවත් දිනාගෙන තිබෙනවා; expertsලාත් දිනාගෙන තිබෙනවා. අපි කොහොමත් සජබේ කට්ටිය දිනා ගන්න උත්සාහ කරන්නේ නැහැ. ඒ නිසා අපි ජනතාව එක්ක ඉස්සරහට යනවා. ඔබතුමන්ලා ඔතැන ඉන්න. අපි ඔබතුමන්ලා පරිස්සම් කරනවා; බලාගන්නවා. ඔතැනම දිගටම ඉන්න විධියට අපි වැඩේ plan කරනවා.

මම ජනාධිපති වැය ශීර්ෂය පිළිබඳ විවාදයේ දී කථා කරන්න බලාපොරොත්තු වෙන අතරේ, *-[බාධා කිරීමක්]* ඔව්, විපක්ෂ නායකතුමා, - අනිවාර්යෙන් gazette කරනවා. අලුත් Constitution එකට දානවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සදාකාලික විපක්ෂ නායක.-[බාධා කිරීමක්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමෙක් ඇහුවා, අපේ Constitution එක ගැන. අපි Constitution එක ගේනවා. ගරු කථානායකතුමනි, අනිවාර්යයෙන් එතුමාගේ නම දාලා විපක්ෂ නායක ධුරය එතුමාටම යාවජීව ලෙස තිබිය යුතුයි කියලා අපි දානවා. අපි එතුමා බලාගන්නවා; පරිස්සම් කරනවා. සල්ලිත් දෙන්නම්.

ගරු කථානායකතුමනි, අපි වියදම් කරන්නේ කොහොමද කියන එක මෙතැන තිබෙනවා. අපි පසුවත් මේ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මෙහෙමයි. අපේ ආණ්ඩුව යටතේ තිබෙන ප්‍රධාන ආයතනවල සභාපතිලා වැඩ කරන්නේ ස්වේච්ඡාවෙන්. අපේ බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිතුමා ගැන බොරු කියලා සමහරුන්ට නඩු පවා වැටිලා තිබෙනවා, මම දැක්කා. ගරු කථානායකතුමනි, මේ බලන්න. BoC, Peoples Bank, NSB, Sri Lanka Insurance, SLT, Hilton, Litro, Waters Edge, Sathosa, Lotus Tower complex, Lanka Hospitals, SriLankan Airlines, Lanka Coal, BOI, Port City, EDB යන ආයතනවල සභාපතිලා වැඩ කරන්නේ ස්වේච්ඡාවෙන්, සතයක්වත් ගන්නේ නැතිව. මේ අවස්ථාවේ ඒ ගොල්ලන්ගේ නම් කියන්න වෙලාව නැති නිසා, මම පසුව හැන්සාඩ්ගත කරන්නම්. ගරු කථානායකතුමනි, Advisers to the President, Dr. Hans Wijayasuriya, Prof. Gomika Udugamasooriya, Dr. Duminda Hulangamuwa - මම දැක්කා එතුමාට බැණලාත් තිබෙනවා. ඒ තිබෙන්නේ ඊර්ෂ්‍යාව. තමන්ගේ යාලුවෝ වෙන අයත් එක්ක වැඩ කරනකොට පොඩි jealousy එකක් එනවා - මේ සියලුදෙනාම වැඩ කරන්නේ ස්වේච්ඡාවෙන්. අපි රටේ දක්ෂ මිනිස්සුන්ගේ දක්ෂතාව අපි යොදාගෙන තිබෙනවා. ඒක තමයි දේශපාලන කළමනාකරණය.

ගරු කථානායකතුමනි, අපට කනගාටුව තිබෙන්නේ මේකයි. අපි වියදම් කළමනාකරණය කරන්න හදනවා. මෙතැන සමහර අය ඉන්නවා, රුපියල් මිලියන 20ක මාසික පඩියක් දාලා ඇවිත් වැඩ කරන අය. සමහර අය ඉන්නවා, රුපියල් මිලියන 10ක මාසික පඩි දාලා ඇවිත් වැඩ කරන අය. ඔබතුමන්ලාට ඒක හිතා ගන්නවත් බැහැ. ඔබතුමන්ලා හිතන්නේ "ආ, මෙයා රුපියල් මිලියන 10ක් දාලා ඇවිල්ලා ඇත්තේ රුපියල් මිලියන 100කටවත් වැඩේ දෙන්න" කියලා. එහෙම වෙන්නේ නැහැ. නමුත් අපි හිටපු ජනාධිපතිවරුන්ගේ, හිටපු මන්ත්‍රීවරුන්ගේ වියදම් අඩු කරන්න යෝජනා කළාම, ඔබතුමන්ලා ගිහිල්ලා ඒ හොරුන්ගේ පිලේ හිට ගන්නවා. විශේෂයෙන්ම සජබයේ මන්ත්‍රීතුමන්ලා ගැන අපි කියන්නේ. ඔබතුමන්ලාගේ ජනාධිපතිවරු,- මම හිතන විධියට දැන් ඉන්න අය කවුරුවත් එහෙම කරන්නේ නැහැ. නමුත්, එහෙම පාවිච්චි කරන අය වෙනුවෙන් තමුන්නාන්සේලා පෙනී ඉන්නේ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි පෙනී ඉන්නේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

පෙනී ඉන්නේ නැද්ද? එහෙනම්, thank you! ඔබතුමන්ලාගේ ලොක්කන්ට කියන්න 'එපා' කියලා. අර press conferencesවලට එන අයට කියන්න, ගරු මන්ත්‍රීතුමා. අපි ඔබතුමාට respect කරනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මොකක්ද? දැන් විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ උපක්‍රම මොනවාද? අපි ඉස්කෝලේ hostel එකේ ඉන්න කොට හවසට ක්‍රිකට් ගැහුවා. Big Match එකත් එනවා; එන්න කියලා ආරාධනාවක් තිබෙනවා; නමුත්, යන්න පුළුවන් වෙයි ද දන්නේ නැහැ. අපේ teams ගොඩක් තිබුණා. නමුත්, අපි හවසට ක්‍රිකට් ගහද්දි එක team එකක bowler කෙනෙක් හිටියා. ඔහු බෝලය දාන්න දුවගෙන එන විධිය දැක්කාම මයිකල් හෝල්ඩින්ග් එනවා වාගෙයි, ගරු කථානායකතුමනි. එතකොට මම හයේ පන්තියේ හිටියේ. ඒ කාලයේ hero මයිකල් හෝල්ඩින්ග්. මයිකල් හෝල්ඩින්ග් වාගේ දුවගෙන ඇවිල්ලා, නැත්නම් සුගත් තිලකරත්න වාගේ දුවගෙන ඇවිල්ලා බෝලේ දාන්නේ, මෙන්න මේ විධියට - slow motion.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Slow balls දාන්නේ?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒ කාලයේ එහෙම තිබුණේ නැහැ. මයිකල් හෝල්ඩින්ග් slow balls දැම්මේ නැහැ, කෙළින්ම විකට් යන්න දුන්නා, අපි වාගේ. ගරු කථානායකතුමනි, දැන් මේ අය, එනවා නිකම් සුගත් තිලකරත්න වාගේ, මයිකල් හෝල්ඩින්ග් වාගේ, ඇවිල්ලා, අයියෝ! දැන් මේ ගොල්ලොත් එහෙමයි. දැන් මේ ගොල්ලො මාර සද්දෙන් විවේචනය කරනවා; බණිනවා. ඇත්තටම මමයි, ගරු හරිනි අගමැතිතුමියයි කථා වුණා, අපි මොන වැරැද්දක් කරලා ද මේ බැණුම් අහන්නේ කියලා.

Truly, අපි ඔබතුමන්ලාගේ කථා seriously ගන්නවා. අපි ඔබතුමන්ලා alienate වෙච්ච මිනිස්සු, double life ඇති අය කියලා හිතන්නේ නැහැ. මොකද, කටයි, මොළයයි අතර සම්බන්ධයක් තබාගෙන කථා කරනවා කියලා තමයි අපි හිතන්නේ. එතකොට අපට මාර shocking, ඇයි අපි මෙච්චර බැණුම් අහන්නේ කියලා. ගරු කථානායකතුමනි, නමුත් මේ දවස් හත දිහා බැලුවාම, අපට තේරුණු දේ තමයි, ලොකු සද්දයක් තිබුණාට කිසිම content එකක් නැහැ කියන එක. ඒ නිසා ඔබතුමන්ලා fast running, slow bowling; පුස් වෙඩිවත් නොවෙයි, ඔබතුමන්ලා.

මම ඇත්තටම අහන්නේ, මට තවම තේරුම් ගන්න බැහැ, ඔබතුමන්ලා මේ අය වැය සම්බන්ධයෙන් අපට කරපු විවේචනය මොකක්ද කියලා. අය වැයට කරපු ඇත්ත, serious විවේචනය මොකක්ද? *[බාධා කිරීම්]* ඔව්, ඒක මම කියන්නම්. ඒකට එනවා. දැන් මොකක්ද, මේ උත්සාහය? ගරු කථානායකතුමනි, මෙතුමන්ලා අපට බැණලා බැණලා මතයක් හදන්න යනවා, මේ අය වැය upset කියලා. මෙතුමන්ලාගේ උත්සාහය ඒක. ඒකයි මම මුලින්ම කිව්වේ, සත්‍ය කරුණු හොයන්න කියලා. "Seek truth from facts", මම නොවෙයි, ඩෙන් ෂියාඕ පිං තමයි එහෙම කියලා තිබෙන්නේ. මේගොල්ලන් අපි බිත්තියට හේත්තු කරන්න කියලා හිතාගෙන කරන වැඩ තිබෙනවා. අපි කරනවා කියලා කියපු නැති ඒවා, අපි කරනවා කිව්වා කියලා එතුමන්ලා අපට දෙස් දෙවොල් කියනවා. ගරු කථානායකතුමනි, ආණ්ඩුවකට වැදගත් වෙන්නේ මොකක්ද? අපි තැන් තැන්වල ගිහිල්ලා කියන ඒවාත් වැදගත්. විශේෂයෙන් ජනාධිපති අපේක්ෂකයා වාගේ කෙනෙක් කියන ඒවා වැදගත් වෙනවා. ඒක මම පිළිගන්නවා. නමුත්, අපි NPP Manifesto එකක් දාලා තිබෙන්නේ. ඒක ලක්ෂ ගණනින් බෙදලා තිබෙනවා. එතකොට ඒකට තමයි ජනතාව ඡන්දය දුන්නේ. සාමාන්‍යයෙන් ලෝකයේ මොකක්ද තිබෙන්නේ? සාමාන්‍යයෙන් ඉදිරිපත් කරපු මැනිවරණ ප්‍රකාශනය හරිද, වැරදිද කියන එක මත තමයි විවේචනය ගොඩනැහෙන්නේ. ඔබතුමන්ලාට PR company එකකින් කවුරු හරි ලණුවක් දුන්නා. ඔබතුමන්ලාට කිව්වා, මේ අය වැය IMF අය වැයක් කියලා කියන්න කියලා.

මට කලින් කථා කළා, විපක්ෂයේ අවසාන කථිකයා. එතුමා දක්ෂ කථිකයෙක්. හැබැයි සජිත් ප්‍රේමදාස කියන නම කිව්වේ නැහැ නේ. රනිල්ගේ නම නේ කිව්වේ. එහෙම නේද? ගරු කථානායකතුමනි, සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති අපේක්ෂකයා වශයෙන් රටට ඉදිරිපත් කළ වැඩ පිළිවෙළක් තිබෙනවා. දැන් සජබයේ නායකයෝ කරන්න ඕනෑ මොකක්ද? සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළයි, ජනාධිපතිතුමා ඉදිරිපත් කළ වැඩ පිළිවෙළයි අතර තිබෙන අඩුව පෙන්වන එකයි කරන්න ඕනෑ. හැබැයි, ඔබතුමන්ලා ගත්තේ මොකක්ද? ගත්තේ, රනිල්. තේරෙනවාද? ඒ කියන්නේ ඔයගොල්ලන් කරපු fundamental error එක තේරෙනවාද? ඔයගොල්ලන් හිතුවා, අපට IMF ලේබල් එක ඇලවීමෙන් ඔයගොල්ලන්ට මාර milage එකක් ගන්න පුළුවන් කියලා. මම කියන්නම්, ඒක කොහොමද වෙන්නේ කියලා. ඒකයි මම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අරගෙන පෙන්වන්නේ. මේවා සෙල් ලිපි නොවෙයි, සමාජය වෙනස් වෙනවා. නමුත්, අපි, true to our word. අපි උපරිම උත්සාහ කරලා තිබෙනවා, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ උපරිම ප්‍රමාණයක් -සියයට 80කට, 90කට වැඩි ප්‍රමාණයක්- පළමුවෙනි අවුරුද්දේදීම accommodate කරන්න. තව අවුරුදු 5ක් තිබෙනවා නේ. අවුරුදු දෙකහමාරෙන් ජනාධිපතිකම ගන්නත් එක්කෙනෙක් ඉන්නවා. නමුත් ඉතින්, - *[බාධා කිරීම්]*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒවා හදේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අවුලක් නැහැ. *[බාධා කිරීමක්]* ඔබතුමාට මේකම තමයි කරගෙන යන්න වෙන්නේ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, මම කියන්න කැමැතියි, මේ ප්‍රධාන පෙළේ නායකයෝ ඉතාම පැහැදිලිව අසත්‍ය කියන බව. ඇත්තටම එහෙම කරන්න එපා. ඔබතුමන්ලාගේ තරුණ මන්ත්‍රීවරුන් හොඳයි. උදාහරණයක් විධියට ගත්තොත්, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළේ නැහැ කියලා පුන පුනා කියනවා. දෙයියනේ! රජයේ සේවකයන්ට වැටුප් හම්බ වෙන්නේ කවද්ද මහින්ද සහෝදරයා? *[බාධා කිරීම්]* අප්‍රේල් 10වෙනි දා රජයේ සේවකයන්ට වැටුප් හම්බ වෙනවා. එහෙම නම් ඒ අයට 11වෙනි දා call කරලා බලන්න. නිකම් නානවා නේ. VAT එක අඩු කළේ නැහැ කියලා මේ දැන් කිව්වා. VAT එක අඩු කරන බව ජනාධිපතිතුමා මීට කලින් ආර්ථික ප්‍රකාශනයෙන් සඳහන් කළා. ගරු කථානායකතුමනි, අනික අපි තේරුම් ගන්න ඕනෑ, අය වැය කථාවයි, අය වැය ලේඛනයයි කියන්නේ දෙකක් බව. අය වැය ලේඛනයේ තමයි සියයට 90ක්ම ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය තිබෙන්නේ. අය

වැය කථාව කියන්නේ ඒකේ නිකම් අර උඩින් තිබෙන crown එක වාගේ කොටස. මෙතුමන්ලා අය වැය ලේඛනය බලන්නේ නැහැ, ඒකේ තිබෙන Estimates බලන්නේ නැහැ. ඒවා මොකුත් බලන්නේ නැතුව, අය වැය කථාවේ මොකක් හරි කොටසක් අල්ලාගෙන, ආ ඒකේ මේක නැහැ කියනවා. ඉතින් කියන කියන එක වදිනවා. එක්කෙනෙක් දැන් තව මොකක්ද කිව්වා. මට නියෝජ්‍ය ඇමතිතුමා ලියලා දුන්නා, 2025දී රුපියල් බිලියන 2,950ක් ණය සඳහා ගෙවනවා කියලා දැන් කියපු බව. ගරු කථානායකතුමනි, ඇත්තටම ඒ ගෙවන්නේ කලින් ගත් ණය. නමුත්, 2025 අවුරුද්දේම ණය ගෙවන්න වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 1,600යි.

ඒ නිසා පාඩම් කරලා එන්න ඕනෑ. දැන් මේ NPP team එක හොඳට පාඩම් කරලා ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා නිකම් කණගාටට ගහන්න එපා. මම පාර්ලිමේන්තුවේ පුස්තකාලයෙන් වාර්තාවක් ඉල්ලා තිබෙනවා, අපේ මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියලා පාර්ලිමේන්තු පුස්තකාලය කොච්චර පාවිච්චි කරනවාද කියලා බලන්න. ඒගොල්ලන් හිතනවා, මම ඒ වාර්තාව ගන්නේ ඒක බලලා පොඩි සද්දයක් දමන්නද දන්නේ නැහැ කියලා. Librarian කියනවා, වෙනදාට වඩා දැන් මන්ත්‍රීවරුන් ගොඩක් එනවා, ගොඩක් තොරතුරු ඉල්ලනවා කියලා. ඒ නිසා මේක දහම් පාසල් වීම් එකක් නොවෙයි. ආධුනිකයි කියලා හිතාගෙන බැට කළොත්, හොඳටම පරදින්න ඉඩ තිබෙනවා.

ඔබතුමන්ලා අහනවා, revenue එක ගැන. Revenue එක දැනටම වැඩි කළා නේ. රේගුවේ, සුරාබදු දෙපාර්තමේන්තුවේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම වැඩි වුණේ නැද්ද? අනිල් ජයන්ත ඇමතිතුමනි, වැඩි වුණා නේද?

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
වැඩි වුණා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ වැඩි වුණේ ඇයි? අපි high tech කරලාද? මොන tech එකක්වත් නැතුව, භයට. මොකද, අපි සල්ලිවලට ගන්න බැහැ නේ. වෙනදා නම් රුපියල් මිලියන 500 tax එක වෙනුවට ඇමතිට දුන්නා, රුපියල් මිලියන 50ක්; tax එක දෙන්නේ නැහැ. දැන් ලොවෙත් එහෙම වෙන්නේ නැහැ. අර්ජුන් ඇලෝසියස් උසාවියෙන් නිදහස් කළා. ඒක කළේ අපි නොවෙයි. ඔහු ගෙවන්න තිබෙනවා, රුපියල් මිලියන 3,500ක්; මෙතැන යහළුවෝ ගොඩක් ඉන්නවා; මගේ ඉස්සරහත් ඉන්නවා, පොඩ්ඩක් වම් පැත්තට වෙන්න. ඔහු අනිවාර්යයෙන් ඒ මුදල ගෙවන්න ඕනෑ. ගෙව්වේ නැත්නම් ඇතුළේ. *[බාධා කිරීමක්]* වම් පැත්තට වෙන්න කියලා කිව්වේ. ඔබතුමා කෙළින් නේ ඉන්නේ. සුජීව මන්ත්‍රීතුමා කෙළින් නේ ඉන්නේ. ඔබතුමා ඇයි ඒවාට උත්තර දෙන්නේ? *[බාධා කිරීමක්]* මම වම් පැත්ත ගැන කිව්වේ. *[බාධා කිරීමක්]* මම ඇත්තටම කනගාටු වෙනවා, ඔබතුමන්ලාගේ ප්‍රධාන කථිකයෝ සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක වචනයක්වත් කිව්වේ නැති එක ගැන. ඔබතුමන්ලා එතුමා එළවලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා නායකත්වයට ගන්නද දන්නේ නැහැ හදන්නේ. රවී කරුණානායක මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඒ ගැන බලන්න. කරුණු අධ්‍යයනය කරලා කථා කරනවා නම්, අපට ඉගෙන ගන්න දේවල් තිබෙනවා. අපි කැමැතියි, ඔබතුමන්ලාගෙන් හොඳ දේවල් ඉගෙන ගන්න.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
රනිල් වික්‍රමසිංහ ඉන්නේ ඔබතුමන්ලා එක්ක නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ආ ඇත්තද? ගරු කථානායකතුමනි, මේක කියන්නේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා. රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා, මෙන්න බලාගන්න, කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියනවා, අපි ඉන්නේ රනිල් එක්ක ලු. එතුමා නේ රනිල් එක්ක හිටියේ. *[බාධා කිරීම්]* හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සාක්ෂි. *[බාධා කිරීම්]* මෙතුමා හිටියා නේද? *[බාධා කිරීම්]* මෙතුමා නේද හිටියේ? එළියට ආවා නම් සුජීව මන්ත්‍රීතුමා මේ ගැන පැහැදිලි කරාවි. සාකච්ඡාව blast කළේත් මම හිතන විධියට සුජීව මන්ත්‍රීතුමන්ලා තමයි. *[බාධා කිරීමක්]* නැද්ද? හරි. කබීර් හෂීම් මන්ත්‍රීතුමා, ඔබතුමා 2003දී ඉතා වැදගත් තොරතුරු කියපු පුද්ගලයෙක්. අපි ඇත්තටම ඔබතුමාගේ තොරතුරු ගැන, කරුණු ගැන ගරු කළා. දැන් ego එකකට ගිහිල්ලා තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා රනිල් සහ සජිත් ගැන කිව්වා. අනුර ගැන කිව්වේ නැහැ නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම අනුර ගැන තමයි කියන්නේ. It is a bad, loose ball එකක්. *[බාධා කිරීම්]* හරි. අපි විවාදය අවසන් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මම කියන්න ඕනෑ, මෙතුමන්ලාගේ ඔක්කෝම කථාවලින්, ඒ වැරදි PR company එකේ උපදෙස් මත මෙතුමන්ලා උත්සාහ කළේ මොකක් කියන්නද, අපි IMF neoliberal project එකේ යනවාය කියන්න. ඒක නේ කිව්වේ. ඒක නේ ඔබතුමන්ලා කියන්න හැදුවේ. එතකොට දැන් අපි යනවා, neoliberal IMF line එකේ. හැබැයි අපේ මැනිවරණ ප්‍රකාශනය අනුව ගත්තොත්, අපි වමේ පක්ෂයක්. එතකොට ඔබතුමන්ලාට අනුව අපි මොකක්ද කරමින් ඉන්නේ? අපි වමේ පක්ෂයක ඉඳලා දකුණට යනවා, neoliberal ක්‍රමයට යනවා. ඔබතුමන්ලා ඇවිල්ලා මොකද කරන්නේ? අපිව විවේචනය කරලා අපට කියනවා, වමට යන්න කියලා. එතකොට ඔබතුමන්ලා කියන එක අහලා අපි වමට ගියාම මොකද වෙන්නේ? ජනතාව අපට තවත් කිට්ටු වෙනවා. ජනතාව අපට කිට්ටු වුණාම ඔබතුමන්ලාට මොකද වෙන්නේ? ඔබතුමන්ලාට සොරි වෙනවා; තව නැති වෙනවා.

දැන් ඔබතුමන්ලාගේ විවේචනය අනුව ගත්තාට පස්සේ, ඔබතුමන්ලා කියන ටික කළාට පස්සේ මොකද වෙන්නේ අපට? අපි දැන් ඔබතුමන්ලා කියන නිසා දකුණට යන්නේ නැහැ; ජනතා වරම අනුව යනවා. එතකොට මොකද වෙන්නේ, ගරු කථානායකතුමනි? ජනතාව අපේ පැත්තට එනවා. ජනතාව අපේ පැත්තට ආවාම ඔබතුමන්ලාට දිගටම ඔතැන ඉන්න වෙනවා. ඊට පස්සේ ඔබතුමන්ලාගේ පරණ යහළුවන්ට මොකද වෙන්නේ, IMF කණ්ඩායමට? ඔබතුමන්ලාගේ යහළුවෝ නේ IMF කණ්ඩායම. ඔබතුමන්ලා දැන් World Bank එකට, IMF එකට මෙතැන ඉඳන් බණිනවා. ඔබතුමන්ලාට අන්තිමට මොකද වෙන්නේ? ඔය PR company එකේ යෝජනාව ගත්තාම මොකද වෙන්නේ? ඔබතුමන්ලාට ජනතාවත් නැති වෙනවා, IMF එකත් නැති වෙනවා. දැන් තේරෙන්නේ නැහැ. අද රෑට ගෙදර ගිහිල්ලා කල්පනා කරලා බලන්න, මොකක්ද අපි කළේ කියලා.

ඒ නිසා තමන් දකුණේ ඉඳගෙන වමට සිග්නල් ගහන්න බැහැ. තමන් පිළිගන්න දෙයක් වෙනුවෙන් ඕනෑ විවේචනය කරන්න. ඔබතුමන්ලා හිතනවා, ඔබතුමන්ලා පිළිගන්න මතවාදය ස්ථාවරව

[ගරු බිමල් රත්නායක මහතා]

කියන්නේ නැතුව ආණ්ඩුව විවේචනය කරන්න. මම ඒකයි ඔබතුමන්ලාට කිව්වේ, කරකවලා අත්හැරියා වාගේ වැඩක් තමයි ඔබතුමන්ලාට මේ වෙලා තිබෙන්නේ කියලා. කොල්ලෝ ඒකට කියන්නේ "නින්ජා ගේමක්", "නින්ජා ගැහිල්ලක්" ගහලා තිබෙන්නේ කියායි; නින්ජා ෂොට් එකක් තිබෙන්නේ. තේරෙන්නේ නැහැ, කොහෙන් ගහන්නද කියලා. තේරෙන ටික දෙනෙක් පිටුපස ආසනවල ඉන්නවා. හැබැයි, ඒගොල්ලන් දන්නවා, ආණ්ඩුවක් ගන්න තව කාලයක් යන්න ඕනෑ කියලා. ඒගොල්ලන්ට ඉවසිලිවන්තකම තිබෙනවා. සමහර මන්ත්‍රීතුමන්ලාගේ නම කියන්න හොඳ නැහැ. මොකද, එතුමන්ලා නම කිව්වා කියලා නැඟිටිවි. ගරු කථානායකතුමනි, මම ඒකයි කියන්නේ මෙතුමන්ලා සහමුලින්ම හත්පොළේ ගාගෙන දැන් මේකට විරුද්ධත් වෙන්නයි යන්නේ කියලා. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්නේ අප නියෝ ලිබරල් ක්‍රමයට යනවා නම් ඒකට පක්ෂ වෙන්න, ඒකට ඡන්දය දෙන්න කියායි. ඒකයි මම කිව්වේ, ඔබතුමන්ලාට ජනතාවත් නැති වෙලා, IMF එකත් නැති වෙනවාය කියලා.

මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. පොඩ්ඩක් වැඩිපුරත් වෙලාව ගත වුණා. ඒ නිසා අපි කියන්න කැමැතියි, අප මේ ගමන ස්ථාවරව, සන්සුන්ව යනවාය කියන එක. දේශපාලන කළමනාකරණයත්, විනයත් අපිට තිබෙනවා. අපි සමාජ ස්ථාවරභාවය උපරිම වශයෙන් ගොඩනඟාගෙන තමයි ඉස්සරහට යන්න හදන්නේ. ඒ වාගේම අපි ඔප්පු කරලා තිබෙනවා, අපිට ආර්ථිකය කළමනාකරණය කරන්න පුළුවන් කියලා. ඒක තමයි මේ හැම වාර්තාවකින්ම ඔප්පු කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අපේ වෘත්තීයභාවය, අවංකභාවය සහ සාමූහික බව කියන ඒවායෙන් තමයි අපි මේ ගමන යමින් තිබෙන්නේ. අපේ අඩුපාඩුකම් මොනවාද කියා අපි දන්නවා. අපි කියන්නේ නැහැ, මෙය ලංකාවේ ජනතාවගේ හොඳම අය වැය කියලා. අපිට ඊට වඩා ගොඩක් දේවල් ඒගොල්ලන් වෙනුවෙන් කරන්න තිබෙනවා. අපිට ආසාවක් තිබෙනවා, අපේ රටේ මිනිස්සු තමන් කැමති කෑමක් කාලා, තමන් කැමති ඇඳුමක් දරු පැටවුන්ට අරන් දීලා, තමන් කැමති රටකට, තමන් කැමති ගමනක් යන්න පුළුවන් ආර්ථිකයක් හදන්න. අපිට ඕනෑකමක් තිබෙනවා, ජේදුරුතුඩුවේ වැල්වැටිතුරෙයි ඉන්න දරුවෙකුත්, මාතර අකුරැස්සේ ඉන්න දරුවෙකුත් කියන දෙදෙනාම මේක මගේ රට කියලා හිතන රටක් හදන්න. ඒක අපි තෝරා ගත්ත life mission එකක්. එහෙම ලස්සන රටක් හදන එක ජනතාව ඡන්දය දෙන්න කලින්ම අපි පවරා ගත්ත දෙයක්. ජනතාව ඡන්දය දුන්නේ මේ ළඟදී. අපේ මුළු life එකම ගත්තොත්, ගරු කථානායකතුමනි, අපි ඒ ideals වෙනුවෙන් තමයි ජීවත් වෙලා තිබෙන්නේ. මට මේවාට පුදුම හිතෙනවා. අගමැතිතුමියයි, මමයි කථා වෙනවා, කොහොමද මෙතුමන්ලා මෙහෙම අසත්‍ය කියන්නේ කියලා. අපි විපක්ෂයේ සිටියදීවත් ගරු කථානායකතුමනි, බොරු විවේචන කරලා නැහැ. මේක life mission එකක්. ඒ life mission එක මොකක්ද? ඔව්, ඇත්ත. අපි හැඟීම්බර, සත්‍යගරුක මිනිස්සු. ඇත්තටම අපිට dual life එකක් නැහැ; අපිට දෙබිඩි ජීවිතයක් නැහැ. අපි කරන්න ආපු දේ තමයි මේ කියන්නේත්; ඒක තමයි කරන්නේත්. ඒ නිසා අපි ඔබතුමන්ලාට කියන්නේ තව අවුරුදු 10කින් හරි ආණ්ඩුව ගන්න ඕනෑ නම් මෙන්න මේ අපි යන පාරෙන් ඇවිල්ලා, අපිට ගේම දෙන්න කියායි. ඔය පාරේ ගියොත් නම් sorry, ඔහොමම ඉන්න වෙනවා.

සියලුදෙනාට බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විසර්ජන පනත් කෙටුම්පත - 2025, දෙවන වර කියවීම, සභාව එකඟද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Divide!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය විමසන අවස්ථාව.

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

විසර්ජන පනත් කෙටුම්පත, 2025 දෙවන වර කියවීමට පක්ෂ නම් කොළ පාටත්, විරුද්ධ නම් රතු පාටත්, ඡන්දය දීමෙන් වැළකී සිටිනවා නම් කහ පාටත් භාවිත කළ හැකියි.

මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් අමාත්‍යතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
පක්ෂයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජගත් විතාන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

ගරු ජගත් විතාන මහතා
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා තවත් සිටිනවාද?

කවුරුවත් නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සහා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.
(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)
(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 154; විරුද්ධව 45; වැළකී සිටී 0 යනුවෙන් බෙදුණේය.
இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 154; எதிராக 45; விலகியிருந்தோர் 0.
According to Electronic Voting, Parliament divided: Ayes 154; Noes 45; Abstain 0.

G 001. K.V. Samantha Viddyarathna	Yes
G 002. Sunil Handunnetti	Yes
G 003. K.D. Lal Kantha	Yes
G 005. Nalinda Jayathissa	Yes
G 006. Bimal Rathnayake	Yes
G 007. Harini Amarasuriya	Yes
G 010. Wasantha Samarasinghe	Yes
G 011. A.H.M.H. Abayarathna	Yes
G 012. Chrishantha Abeysena	Yes
G 013. Anil Jayantha	Yes
G 014. Harshana Nanayakkara	Yes
G 015. Dammika Patabendi	Yes
G 016. Saroja Savithri Paulraj	Yes
G 017. Ananda Wijepala	Yes
G 018. Hiniduma Sunil Senevi	Yes
G 019. Sunil Kumara Gamage	Yes
G 020. Kumara Jayakody	Yes
G 021. Rizvie Salih	Yes
G 022. Anura Karunathilaka	Yes
G 023. Upali Pannilage	Yes
G 025. Nihal Abeysinghe	Yes
G 026. Namal Karunaratne	Yes
G 027. Wasantha Piyathissa	Yes
G 028. Gamagedara Dissanayake	Yes
G 029. R.M. Jayawardhana	Yes
G 030. Sunil Watagala	Yes
G 031. Rathna Gamage	Yes
G 032. Mahinda Jayasinghe	Yes
G 033. Chathuranga Abeysinghe	Yes
G 034. Eranga Gunasekara	Yes
G 035. Upali Samarasingha	Yes
G 036. T.B. Sarath	Yes
G 037. Nalin Hewage	Yes
G 038. Prasanna Gunasena	Yes
G 039. Anton Jayakody	Yes
G 040. Sundaralingam Pradeep	Yes
G 041. Hemali Weerasekara	Yes
G 042. Ruwan Ranasinghe	Yes
G 043. Muneer Mulaffer	Yes
G 044. Susil Ranasinghe	Yes
G 045. Hansaka Wijemuni	Yes
G 046. Eranga Weeraratne	Yes
G 047. Namal Sudarshana	Yes
G 048. P. Ruwan Senarath	Yes
G 049. Madhura Senevirathna	Yes
G 050. Arun Hemachandra	Yes
G 051. Janitha Ruwan Kodithuwakku	Yes
G 052. Aruna Jayasekera	Yes
G 053. Sugath Thilakaratne	Yes
G 054. Harshana Suriyapperuma	Yes
G 055. Ashoka Ranwala	Yes
G 056. Lakshman Nipuna Arachchi	Yes
G 057. R.M. Gamini Rathnayake	Yes
G 058. Manjula Suraweera Arachchi	Yes
G 060. Shantha Pathma Kumara Subasinga	Yes
G 061. Samanmali Gunasingha	Yes
G 062. Gayan Janaka	Yes
G 063. Ajith Agalakada	Yes
G 064. Sagarika Athauda	Yes
G 065. Roshan Akmeemana	Yes
G 066. U. P. Abeywickrama	Yes
G 067. L.M. Abeywickrama	Yes
G 068. M.K.M. Aslam	Yes

G 069. Kaushalya Ariyarathne	Yes
G 070. Asitha Niroshana Egoda Vithana	Yes
G 071. Arkam Ilyas	Yes
G 072. Oshani Umanga	Yes
G 073. Krishnan Kalaichelvi	Yes
G 074. Upul Kithsiri	Yes
G 075. Wasantha Pushpa Kumara	Yes
G 076. Chaminda Lalith Kumara	Yes
G 077. Sarath Kumara	Yes
G 078. Nilanthi Kottahachchi	Yes
G 079. M.A.C.S. Chathuri Gangani	Yes
G 080. Lasith Bhashana Gamage	Yes
G 081. Thilanka U. Gamage	Yes
G 082. Nilusha Lakmali Gamage	Yes
G 083. Ajantha Gammeddage	Yes
G 084. Ajith Gihan	Yes
G 085. Jagath Gunawardana	Yes
G 086. Ashoka Gunasena	Yes
G 087. Ruwanthilaka Jayakody	Yes
G 088. Kosala Nuwan Jayaweera	Yes
G 089. Thushari Jayasingha	Yes
G 090. T.K. Jayasundara	Yes
G 091. Mayilvaganam Jegatheeswaran	Yes
G 092. Rajeevan Jeyachandramoorthy	Yes
G 093. Sellaththamby Thilaganathan	Yes
G 094. Anushka Thilakarathne	Yes
G 095. Chandana Thennakoon	Yes
G 096. Thanura Dissanayake	Yes
G 097. Sugath Wasantha de Silva	Yes
G 098. Dharmapriya Dissanayake	Yes
G 099. Sujeewa Dissanayake	Yes
G 100. Susantha Dodawatta	Yes
G 101. Susantha Kumara Nawarathna	Yes
G 102. Sena Nanayakkara	Yes
G 103. Nandana Pathmakumara	Yes
G 104. Aruna Panagoda	Yes
G 105. Nimal Palihena	Yes
G 106. Nishantha Perera	Yes
G 107. Stepni Fernando	Yes
G 108. Kanthasamy Prabu	Yes
G 109. Lal Premanath	Yes
G 110. Nanda Bandara	Yes
G 111. Padmasiri Bandara	Yes
G 112. Ravindra Bandara	Yes
G 114. Sri Bavanandarajah	Yes
G 115. E. M. Basnayaka	Yes
G 116. Wijesiri Basnayake	Yes
O 001. Mano Ganeshan	No
O 002. Kabir Hashim	No
O 004. Rishad Bathinudeen	No
O 005. Rauff Hakeem	No
O 006. R.M. Ranjith Madduma Bandara	No
O 007. Gayantha Karunathilleka	No
O 008. Sajith Premadasa	No
O 009. Ravi Karunanayake	No
O 011. Namal Rajapaksha	No
O 012. Jeevan Thondaman	No
O 014. Amirthanathan Adaikkalanathan	Yes
O 015. G.G. Ponnambalam	No
O 017. M.A.M. Thahir	No
O 021. Dayasiri Jayasekara	No
O 022. Harsha de Silva	No
O 023. Ajith P. Perera	No
O 024. Sujeewa Senasinghe	No
O 026. Dilip Wedaarachchi	No
O 027. J. C. Alawathuwala	No
O 028. Nalin Bandara Jayamaha	No
O 030. Hesha Withanage	No
O 031. Kavinda Heshan Jayawardhana	No
O 032. Sujith Sanjaya Perera	No
O 033. S.M. Marikkar	No
O 034. Imran Maharoof	No
O 035. Harshana Rajakaruna	No
O 036. Rohini Kumari Wijerathna	No
O 037. Faizer Musthafa	No
O 041. Chaminda Wijesiri	No
O 042. Mujibur Rahman	No
O 044. Kins Nelson	No
O 045. Rohana Bandara	No
O 046. W.H.M. Dharmasena	No
O 048. B. Ariyawansha	No
O 049. Chamindranee Kiriella	No
O 050. Chathura Galappaththi	No
O 051. Chithral Fernando	No
O 052. Amila Prasad	No
O 053. Anuradha Jayaratne	No
O 055. D.V. Chanaka	No
O 056. Chanaka Madugoda	No
O 057. M.S. Uthumalebbe	No
O 058. Mohamed Sali Naleem	No
O 061. Suranga Rathnayaka	No
O 063. Ismail Muththu Mohamed	No
O 064. Nissam Kariyappar	No
O 065. Sunil Biyanwila	Yes
O 066. S. Sandaruwan Madarasinghe	Yes
O 067. Prageeth Madhuranga	Yes
O 068. Jagath Manuwarna	Yes
O 069. Ruwan Mapalagama	Yes
O 070. Nanadana Millagala	Yes
O 071. Riyas Farook	Yes
O 072. Danushka Ranganath	Yes
O 081. Sanjeewa Ranasingha	Yes
O 082. Sunil Rathnasiri	Yes
O 083. Manjula Sugath Rathnayaka	Yes
O 084. A.M.M.M. Rathwaththe	Yes
O 085. Manoj Rajapaksha	Yes
O 086. Sunil Rajapaksha	Yes
O 087. Hasara Liyanage	Yes

O 088. Deepthi Wasalage	Yes
O 089. Kanchana Welipitiya	Yes
O 090. R. G. Wijerathna	Yes
O 091. Nishantha Samaraweera	Yes
O 092. Priyantha Wijerathna	Yes
O 093. Ruwan Wijeweera	Yes
O 094. Darmapriya Wijesinghe	Yes
O 095. Hiruni Wijesinghe	Yes
O 096. Athula Welandagoda	Yes
O 097. Fasmin Sharif	Yes
O 098. Dinindu Saman	Yes
O 099. Thilina Samarakoon	Yes
O 100. Ambika Samivel	Yes
O 101. Dewananda Suraweera	Yes
O 102. Chandana Sooriyaarachchi	Yes
O 103. Sooriyabandara	Yes
O 104. Aravinda Senarath	Yes
O 105. Kitnan Selvaraj	Yes
O 106. Janaka Senarathna	Yes
O 107. Chandima Hettiaratchi	Yes
O 108. Champika Hettiarachchi	Yes
O 109. Dinesh Hemantha	Yes
O 110. Geetha Herath	Yes
O 111. Bhagya Sri Herath	Yes
O 112. Muhammad Faizal	Yes
O 113. Aboobucker Athambawa	Yes
O 114. Najith Indika	Yes
O 115. Lakmali Hemachandra	Yes

Electronic Voting Results:

Participants:

Present	199

Votes:

Yes	154
No	45
Abstain	0

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 154යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 155යි.

විද්‍යුත් ඡන්ද විමසීම අනුව විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 45යි; නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව විරුද්ධව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 46යි.

ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2025 දෙවන වර කියවීම වැඩි ඡන්ද 109කින් සම්මත වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
අදාළ පරිදි, සභා සම්මතය පරිදි දෙවන වර කියවන ලදී.
Bill accordingly read a Second time.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(මාණ්පුමිකු (කලානිදි) හරිණි අමරසූරිය)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන්, "විසර්ජන පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විදුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කාරක සභාව කවදාද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(මාණ්පුමිකු (කලානිදි) හරිණි අමරසූරිය)
(The Hon. (Dr.) Harini Amarasuriya)
2025 පෙබරවාරි 27වන බ්‍රහස්පතින්දා.

පනත් කෙටුම්පත, අංක 57 දරන ස්ථාවර නියෝගය යටතේ, 2025 පෙබරවාරි 27වන බ්‍රහස්පතින්දා පවත්වන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී.
சட்டமூலம், நிலைக்கட்டளை இல. 57இன்படி, 2025 பெப்ருவரி 27, வியாழக்கிழமை நடைபெறவிருக்கும் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது.
Bill committed to a Committee of the whole Parliament under Standing Order No. 57 for Thursday, 27th February, 2025.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ.භා. 6.00 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.24ට, 2025 පෙබරවාරි 21වන දින සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 27වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 6.00 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி, பி.ப. 6.24க்கு, பாராளுமன்றம் அதனது 2025 பெப்ருவரி 21ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 பெப்ருவரி 27, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 6.00 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.24 p.m. until 9.30 a.m. on Thursday, 27th February, 2025, pursuant to the Resolution of Parliament of 21st February, 2025.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.